**SENIOR TRANSLATOR -** Mr. S.M.A.K. Karunaratne

**SENIOR COMPUTER OPERATORS** - Mrs. P. Jehanya, Mr. J.S. Colombage, Mrs. K.G.S. Sewwandhi, Mrs. N.N. Hettige, Mr. W.H.U.D. Piyatunga, Mr. A.G.R.K. Abeyrathne, Mr. N.D.D.P. Premasiri,Mr. K.P.P.S. Romawardene, Mr. K.D.G.M. Chrishantha, Mrs. W.D.A. Jayarukshi, Mr. L.G. Ashik Ali, Mr. A.R.M. Rikaz Ali , Mr. A.M. Fouzul Ameen

**SENIOR COMPUTER TECHNICIANS -** Mr. G.M.T. Perera, Mr. H.S. Sathyajith

**SENIOR TECHNICAL ASSISTANTS-** Mr.V.R.S.J.Somaratne, Mr.W.S.Suranga

# පාර්ලිමේන්තු විවාද

නිල වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

අට වන පාර්ලිමේන්තුව - දෙවන සභා වාරය

# பாராளுமன்ற விவாதங்கள்

அதிகார அறிக்கை

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்

எட்டாவது பாராளுமன்றம் - இரண்டாவது கூட்டத் தொடர்

# PARLIAMENTARY DEBATES

OFFICIAL REPORT

**THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**EIGHTH PARLIAMENT - SECOND SESSION**


**263 වන කාණ්ඩය** **தொகுதி 263** **VOLUME 263**


## පාර්ලිමේන්තුව

## பாராளுமன்றம்

## PARLIAMENT

***2018 සැප්තැම්බර් 04 වන අඟහරුවාදා***

*2018 செப்ரெம்பர் 04, செவ்வாய்க்கிழமை*

*Tuesday, 04th September, 2018*

අ.භා.1.00ට පාර්ලිමේන්තුව රැස් විය.

**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.

சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,

MR. SPEAKER [THE HON. KARU JAYASURIYA ] in the Chair.

## නිවේදන

## அறிவிப்புக்கள்

## ANNOUNCEMENTS

### I

### කථානායකතුමාගේ සහතිකය

### சபாநாயகரது சான்றுரை

### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 සැප්තැම්බර් 03 දින "සුරාබදු (සංශෝධන)" සහ "අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය" නමැති පනත් කෙටුම්පත්වල ම'විසින් සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

### II

### පාර්ලිමේන්තුවේ වෙත්‍රධාරි පත් කිරීම

### பாராளுமன்ற படைக்கலச் சேவிதர் நியமனம்

### APPOINTMENT OF SERJEANT-AT-ARMS OF PARLIAMENT

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙත්‍රධාරි තනතුර සඳහා නියෝජ්‍ය වෙත්‍රධාරි නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා 2018 අගෝස්තු මස 30 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි පත් කරනු ලැබ ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

2017 වර්ෂය සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් පිළිගැනිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් නියමය සහ නියෝග මම ඉදිරිපත් කරමි.

(i) ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ඝෝෂණ පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ තුර්කි ජනරජය අතර උද්ඝෝෂණ ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 13 දිනැති අංක 2079/77 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනතේ 18 වගන්තිය යටතේ ගාස්තු අය කිරීම සංශෝධනය සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 07 දිනැති අංක 2074/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

එම නියමය සහ නියෝග ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් පිළිගැනිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂයේ ජනාධිපති කාර්යාලයේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තා මම ඉදිරිපත් කරමි.

එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් පිළිගැනිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂයේ සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් පිළිගැනිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් පිළිගැනිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් වාර්තා සහ නිවේදන මම ඉදිරිපත් කරමි.

(i) 2018 වර්ෂයේ පළමු කාර්තුවේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වාර්තාව;

(ii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iii) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජූනි 13 දිනැති අංක 2075/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය (අංක 10/2018 දරන සුරාබදු නිවේදනය); සහ

(iv) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජූනි 13 දිනැති අංක 2075/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය (අංක 11/2018 දරන සුරාබදු නිවේදනය)

එම වාර්තා සහ නිවේදන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් පිළිගැනිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු තිලක් මාරපන මහතා (සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலக் மாரபன - அபிவிருத்திப் பணிப்பொறுப்புகள் அமைச்சரும் வெளிநாட்டலுவல்கள் அமைச்சரும்)
(The Hon. Tilak Marapana -Minister of Development Assignments and Minister of Foreign Affairs)

ගරු කථානායකතුමනි, 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වගන්තිය යටතේ 2018 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ (ඉරානයට අදාළව සම්බාධක පැනවීමේ) නියෝග සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 21 දිනැති අංක 2085/11 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2018 ජූලි 17 දිනැති අංක 2080/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

එම නියෝග ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂයේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තා මම ඉදිරිපත් කරමි.

එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂයේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ සහ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂයේ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ, පොලිස් දෙපාර්තමේන්තුවේ සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ එස්එල්ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට තාක්ෂණවේදී විද්‍යුත් ගෞරව උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 10 දිනැති අංක 2083/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරමි.

එම නියමය අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂයේ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂයේ කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂයේ තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ, මුස්ලිම් ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සහ තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන්

කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු ලකී ජයවර්ධන මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்கி ஜயவர்தன - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Lucky Jayawardana - State Minister of City Planning and Water Supply)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) 2013 සහ 2014 වර්ෂ සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තා;

(iii) 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(iv) 2013 වර්ෂය සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව;

(v) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(vi) 2011, 2012 සහ 2013 යන වර්ෂ සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි වාර්ෂික වාර්තා;

(vii) 2014 සහ 2015 යන වර්ෂ සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(viii) 2014 සහ 2015 යන වර්ෂ සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(ix) 2014 සහ 2015 යන වර්ෂ සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තා; සහ

(x) 2017 වර්ෂය සඳහා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ සහ 20(4)(ආ) වන වගන්ති යටතේ නියමයන්;

(ii) 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා හා ගිණුම්;

(iii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iv) 2015 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තිස්හත් වැනි වාර්ෂික වාර්තාව;

(v) 2015 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(vi) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vii) 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා;

(viii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කැළණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(ix) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(x) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැහෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xi) 2015 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xiii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xiv) 2015 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xv) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව;

(xvi) 2015 වර්ෂය සඳහා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xvii) 2015 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xviii) 2015 වර්ෂය සඳහා නැහෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xix) 2015 වර්ෂ සඳහා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xx) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxi) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(xxii) 2015 වර්ෂය සඳහා කැළණිය විශ්වවිද්‍යාලයේ පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxiii) 2015 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxiv) 2015 වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව;

(xxv) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxvi) 2015 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

(xxvii) 2016 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තිස්අට වැනි වාර්ෂික වාර්තාව;

(xxviii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xxix) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xxx) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xxxi) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxxii) 2016 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(xxxiii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxxiv) 2015 සහ 2016 වර්ෂ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තා හා ගිණුම්; සහ

(xxxv) 2015 සහ 2016 වර්ෂ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තා අවුරුදු දෙකක් ප්‍රමාදයි. අපි මේ වන විට ඉන්න ඕනෑ 2015 වාර්තාවල නොවෙයි, 2017 වාර්තාවලයි. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන්ටයි මෙක කියන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත;

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ නියෝගය;

(iii) 2016 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව;

(iv) 2015 හා 2016 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තා;

(v) 2017 වර්ෂය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vi) 2017 වර්ෂය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vii) 2017 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(viii) 2017 වර්ෂය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ix) 2017 වර්ෂය සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Speaker, I present the Report of the Committee on Public Finance on "Resolution for Paying Emoluments for the Members of the Office on Missing Persons" which was referred to the Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු කථානායකතුමනි, මම අගලවත්ත, කැකුලන්දල, අංක 126 දරන ස්ථානයෙහි පදිංචි නිමල් සමරසුන්දර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு புத்திக பதிரண - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) මාතර, සුල්තානාගොඩ, පලේවිල යන ලිපිනයෙහි පදිංචි චමින්ද ප්‍රියශාන්ත සූරියබණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) සුල්තානාගොඩ, වරකපිටිය, "ප්‍රදීප්" යන ලිපිනයෙහි පදිංචි එච්.ජී. සිරිසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මාතර, කුමාරදාස මාවත, අංක 54 යන ලිපිනයෙහි පදිංචි රූපලතා වැල්ලහේවා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) මාදුරාගොඩ, නිතුල්පිටිය යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. සුනිල් ජයසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මම කොළඹ 03, 8වන පටුමඟ, අංක 21/19/2/1 දරන ස්ථානයෙහි පදිංචි විභූති මන්දිරා පටබැඳිගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(i) ත්‍රිකුණාමලය, ඩොක්යාර්ඩ් පාර, අංක 17 දරන ස්ථානයෙහි පදිංචි ඒ.පී. කුසුමාවති ද සිල්වා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(ii) කොළඹ 05, කැප්පෙටිපොල මාවත, සමුළු නිවාස, අංක 19 ඒ දරන ස්ථානයෙහි පදිංචි වමල් සුදුසිංහ පියසුන්දර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(iii) කුරුණෑගල, වටුරාගල, ඇල්වත්ත, පළමු පටුමඟ යන ලිපිනයෙහි පදිංචි ඩී.ආර්.එම්.සී. හේනේගම මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(iv) ත්‍රිකුණාමලය, ඕර්ස්හිල්, මධ්‍යම පාර, අංක 21 දරන ස්ථානයෙහි පදිංචි පුනිදකුමාර් චන්ද්‍රාවති මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

ගරු කථානායකතුමනි, මම මැදිරිගිරිය, දිවුලන්කඩවල, ට්‍රැක් 9, අංක 824 දරන ස්ථානයෙහි පදිංචි එන්.ඩබ්ලිව්.ජී.එස්.ආර්. නානායක්කාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු දිළුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)

ගරු කථානායකතුමනි, මම මහනුවර, ලේවැල්ල පාර, අංක 109/1 ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්. අශෝක දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මම කොළඹ 02, වොක්ෂෝල් වීදිය, 256/2 දරන ස්ථානයෙහි පදිංචි එන්.එම්.යූ. සහෙයිබා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

## විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් උපයනු ලබන විදේශ විනිමය : බදු අය කිරීම
## வெளிநாட்டிலுள்ள இலங்கைத் தொழிலாளர் அனுப்பும் அந்நியச் செலாவணி : வரி அறவிடல்
## FOREIGN EXCHANGE REMITTED BY SRI LANKAN MIGRANT WORKERS: LEVYING OF TAXES

10/'18

**1. ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මැදපෙරදිග ගෘහ සේවය ඇතුළු විදේශ රැකියාවල යෙදෙන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් මාසිකව ශ්‍රී ලංකාවට එවනු ලබන විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(iii) විදේශ රැකියාවල යෙදෙන ශ්‍රී ලාංකිකයන් ලබා ගන්නා වැටුපෙන් ශ්‍රී ලංකාවට එවනු ලබන මුදල් සඳහා රජය විසින් බදු අය කරන්නේද;

(iv) එසේ නම්, එම මාසික බදු ප්‍රතිශතය කොපමණද;

(v) විවිධ දුෂ්කරතා මධ්‍යයේ තම ශ්‍රමය වැය කර ලබා ගන්නා වැටුපෙන් රජය බදු අය කිරීම සාධාරණ වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

තොලෙත් තොදර්පුකළ්, ටිජිට්ටල් උට්කට්මෙප්පු වසතිකළ් මර්රුම් වෙළිනාට්ටුත් තොළිල්වාය්ප්පු අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) මත්තිය කිළක්කු මනෙච්චේවෙ උළ්ළිට්ට වෙළිනාට්ටුත් තොළිල්කළිල් ඊටුපට්ටුළ්ළ ඉලංකෙ උළෙප්පාළිකළින් එණ්ණික්කෙ එව්වළවු;

(ii) අවර්කළ් මාතාන්තම් ඉලංකෙක්කු අනුප්පි වෛක්කින්ර අන්නියච්චෙලාවණියින් අළවු එව්වළවු ;

(iii) වෙළිනාට්ටුත් තොළිල්කළිල් ඊටුපටුකින්ර ඉලංකෙයර් පෙරුකින්ර චම්පළත්තිලිරුන්තු ඉලංකෙක්කු අනුප්පිවෛක්කින්ර පණත්තිර්කාක අරචාංකත්තිනාල් වරි අරවිටප්පටුකින්රතා;

(iv) ආමෙනිල්, මේර්පටි මාතාන්ත වරිවීතම් එව්වළවු;

(v) පල්වේරු චිරමංකළුක්කු මත්තියිල් තමතු උළෙප්පිනෛච් චෙලවිට්ටුප් පෙරුකින්ර චම්පළත්තිලිරුන්තු අරචාංකම් වරි අරවිටුවතු නියායමානතා;

එන්පතෛ අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ஆ) ඉන්රෙල් ඒන්?

[ගරු කනක හේරත් මහතා]

asked the Minister of Telecommunication, Digital Infrastructure and Foreign Employment:

(a) Will he inform this House-

(i) the number of Sri Lankans who are employed abroad including domestic service in the Middle-East;

(ii) the amount of foreign exchange sent by them to Sri Lanka monthly;

(iii) whether the Government levies taxes on the money the migrant Sri Lankans send to Sri Lanka from their earnings abroad;

(iv) if so, such tax percentage per month; and

(v) whether it is fair for the Government to levy taxes on the money those workers earn under trying circumstances?

(b) If not, why?

**ගරු මනුෂ නානායක්කාර මහතා (විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்பு பிரதி அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara - Deputy Minister of Telecommunication, Digital Infrastructure and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2018.04.30 වන දිනට එක් එක් රට අනුව, විදේශයන්හි සේවයේ නියුතුව සිටි ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව 637,534කි.

අදාළ ලේඛනය ඇමුණුම අංක 01 යටතේ ඉදිරිපත් කර ඇත.

(තොරතුරු මූලාශ්‍රය - අදාළ රටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයන්හි කම්කරු අංශ)

(ii) 2009 වර්ෂයේ සිට 2018 වර්ෂයේ මැයි මස දක්වා ශ්‍රී ලංකාවට එවනු ලැබූ විදේශ විනිමය ප්‍රමාණයන් සහිත ලේඛනය ඇමුණුම අංක 02 ලෙස ඉදිරිපත් කර ඇත.

(iii) විදේශගත ශ්‍රී ලාංකිකයන් ශ්‍රී ලංකාවට එවනු ලබන මුදල් මත බදු අය කිරීමක් සිදු කරනු නොලැබේ.

(iv) ඉතිරි කිරීමේ ගිණුම් සහ ස්ථිර තැන්පතුවල ආයෝජනයෙන් උපයන පොලිය මත 5%ක රඳවා ගැනීමේ අවසාන බද්දක්.

(v) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

ඇමුණුම් **සභාගත*** කරමි.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම අපේ ගෘහ සේවිකාවන් ඒ රටවලදී නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණ දෙනවා. ඔවුන් විදේශවලදී කටුක ජීවිත ගත කරන්නේ; දූෂණයට ලක් වෙනවා; නොයෙකුත් විධියට මරණයට පත් වෙනවා. මේ ආකාරයේ නොයෙකුත් ගැටලු තිබියදීත් ඔවුන් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් අපේ රටට ගෙනෙනවා. පසුගිය රජය කාලයේදීත් මේ සම්බන්ධයෙන් විවිධ කටයුතු කළා. නුපුහුණු ශ්‍රමිකයන්ගේ ප්‍රමාණය අඩු කරලා, ඒ වෙනුවට පුහුණු ශ්‍රමිකයන් විදේශ රටවලට යවන්න කටයුතු කරනවා නම් හොඳයි.

උදාහරණයක් හැටියට ගෘහ සේවිකාවන්ටත් ඒ පුහුණුව ලබා දුන්නාම, ඔවුන්ගෙනුත් ඊට වඩා වැඩි මුදලක් ලබා ගන්න පුළුවන් තත්ත්වයක් ඇතිවනවා කියායි මම හිතන්නේ. නමුත්, මේ වැඩසටහන තවමත් ක්‍රියාත්මක නොවන්නේ ඇයි කියන එක මම අහන්න කැමැතියි.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු කථානායකතුමනි, මේ වැඩසටහන ක්‍රියාත්මක වනවා. දැනට අපි ගෘහ සේවය සඳහා කාන්තාවන් විදේශයන්ට යැවීම සීමා කර තියෙනවා. ඒ අනුව මේ වනකොට කාන්තාවන් විදේශගතවීම සීමා කර තියෙනවා. මේ අවුරුද්ද වනකොට විදේශගතවන සමස්ත ප්‍රමාණයෙන් විදේශගතවන කාන්තාවන්ගේ ප්‍රතිශතය සියයට 28 දක්වා අඩු කර ගන්න අපට පුළුවන් වෙලා තියෙනවා.

ඊට අමතරව පුහුණු ශ්‍රමිකයන් විදේශ රටවලට යැවීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග අනුගමනය කරනවා වාගේම, නුපුහුණු ශ්‍රමිකයන් අපි විදේශ රටවලට යවන්නේම නැහැ. කාන්තාවන් ගෘහ සේවයට යැවීවත් යවන්නේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබා දෙන පුහුණුව ලබා දීලා NVQ සහතිකය සහිතවයි.

ඊට අමතරව රැකී රක්ෂා සඳහා යවන්න ජපානය, ඊශ්‍රායලය, ඒ වාගේම යුරෝපයේ අනෙකුත් රටවල අලුත් වෙළෙඳ මධ්‍යස්ථාන අපි හොයා ගෙන තියෙනවා. ඒ රටවලට ශ්‍රමිකයින් යැවීම තමයි මේ වනකොට වැඩි වශයෙන් කෙරෙන්නේ. විශේෂයෙන් කොරියාව වාගේ රටවලට. මැද පෙරදිගට ඉලක්ක වෙලා තිබුණු මේ ක්ෂේත්‍රය ලෝකයේ අනික් රටවල් වෙත ලබා ගැනීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කර තියෙනවා. ඒකේ සාර්ථක ප්‍රගතියකුත් මේ වනකොට අපි අත් කර ගෙන තියෙනවා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. අද අපේ රටේ ආර්ථිකය කඩා වැටිලා තියෙන අවස්ථාවක මම හිතන්නේ වැඩිම විදේශ විනිමයක් -වැඩි විදේශ මුදල් ප්‍රමාණයක්- විදේශ රැකියාවලින් තමයි ගෙනෙන්නේ. පසුගිය දිනවල පත්තරවල දැක ගන්න ලැබුණා, විශේෂයෙන්ම අවුරුදු 5කට වඩා අඩු වයස දරුවන් සිටින කාන්තාවන්ට ගෘහ සේවය සඳහා විදේශ රටවලට යන්න බැරි නීතියක් ඇතුළත් කර කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තියෙනවා කියා. විශේෂයෙන්ම සමාජ ආරක්ෂණය වෙනුවෙන්, ළමා ආරක්ෂණය වෙනුවෙන් තමයි ඒ නීතිය ගෙනැල්ලා තියෙන්නේ.

ඒ සම්බන්ධව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ පත්‍රිකාව අනුමත වුණා ද නැද්ද කියන එක පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා පැහැදිලි කිරීමක් කරන්න.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

එය කැබිනට් මණ්ඩලයෙන් අනුමත කර නැහැ. මේ සඳහා අමාත්‍ය මණ්ඩලයේ පස් දෙනෙකුගෙන් යුත් කැබිනට් අනු කමිටුවක් පත් කර තිබෙනවා. එහිදී අපි යෝජනා කර තිබෙන්නේ අවුරුදු පහට අඩු දරුවන් සිටින කාන්තාවන් පිට රට යැවිය යුතුයි කියා නොවෙයි. නමුත් මේ කාරණයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, ඒ වාගේම ග්‍රාම නිලධාරියාගේ තැන ඉඳලා අයථා විධියට දූෂණ ක්‍රියා රාශියක් සිදු වෙනවා. මෙම සීමා කිරීම හරහා අවුරුදු 5ට අඩු දරුවන් සිටින කාන්තාවන් පිට රට යන එක වළක්වා ගන්න පුළුවන් වෙලා නැහැ. මේ කාන්තාවන් ගුවන් තොටුපොළ හරහා visit visa මාර්ගයෙන් හොර රහසේ විදේශගතවීමේ ජාවාරමක් සිදු වෙනවා. ඒක නවත්වන්න කොතරම් උත්සාහ කළත් ගුවන් තොටුපොළ හරහා මෙම සංසිද්ධිය ක්‍රියාත්මක වෙනවා. මේ නිසා සිදු වන්නේ මෙම කාන්තාවන් පිළිබඳ ආගිය තොරතුරු කිසිවක් නැතිව විදේශ රටවලට යෑමයි. ඒ අය පිළිබඳ තොරතුරක් අප ළඟ කිසිසේත්ම සඳහන් වෙන්නේ නැහැ. ඔවුන්ට කරදරයක් වුණාම, වැටුප් ගෙවීමක් සිදු නොවුණාම ඔවුන් පිළිබඳ වගකීමක් ගන්න අපට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි කියන්නේ අවුරුදු 5ට අඩු දරුවන් සිටින අම්මලා රට යැවීම සඳහා -අපි කියන්නේ රට යවන්න කියන එක නොවෙයි.- පවතින නීතිය වෙනස් කර, යම් ක්‍රමවේදයක් සකස් කර ඒ සඳහා ඉඩ හදන්න කියායි. ඊට අමතරව අපට ජාත්‍යන්තර වශයෙනුත් බලපෑමක් එල්ල වෙලා තිබෙනවා. ඒ තමයි විශේෂයෙන්ම කාන්තාවන්ට discrimination එකක් සිදු වෙනවා, කාන්තාවක් වීම නිසා විදේශගතවීම වැළැක්වීම කියන කාරණාව සහ වයස නිසා විදේශගතවීම වැළැක්වීම කියන මූලික අයිතිවාසිකමක් අපි උල්ලංඝනය කළාය කියන කාරණා සම්බන්ධයෙන්. නමුත්, අපි කියන්නේ මෙය අයින් කර අවුරුදු 5ට වඩා අඩු දරුවන් ඉන්න අම්මලාට යන්න දෙන්න කියා නොවෙයි. මේ සම්බන්ධයෙන් වඩාත් උචිත ක්‍රියා මාර්ගයක් ගත යුතුයි කියන එකයි අප යෝජනා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, අතුරු ප්‍රශ්න දෙක සඳහා තිබුණු අවස්ථාව අවසන්. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමා තවදුරටත් පැහැදිලි කිරීමක් ඉල්ලා සිටිනවා. ඒ සඳහා ඔබතුමා එකඟද?

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
එකඟයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මට පොඩි අවස්ථාවක් දෙන්න. ගරු කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා මෙම ප්‍රශ්නය මතු කිරීම ගැන. [බාධා කිරීමක්] ඇත්තටම වයස අවුරුදු 5ට වඩා අඩු දරුවන් සිටින කාන්තාවන් විදේශ රැකියා සඳහා යෑම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවෙලා තිබෙනවා. [බාධා කිරීමක්] දැන් බලපෑම තිබෙන්නේ- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ගරු කනක හේරත් මන්ත්‍රීතුමාට අවස්ථාව දීලා ඔබතුමාට ඊළඟ අවස්ථාව දෙන්නම්.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ තුළින් දූෂණයක් වෙනවා කියන එකට අපේ දරුවෝ පළි නැහැනේ. අවුරුදු 5ට වඩා අඩු දරුවන් සිටින කාන්තාවන් විදේශ රැකියා සඳහා යවන එක කාන්තා හිංසනයට විතරක් නොවෙයි දරුවන්ගේ හිංසනයටත් බලපානවා. එහෙම බැලුවොත් කසිප්පු පෙරන එක නීතිගත කරන්නට පුළුවන්නේ, කසිප්පු පෙරන එකෙන් දූෂණයක් වෙනවා කියන හේතුව මත. එම නිසා අපි විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා අවුරුදු 5ට වඩා අඩු දරුවන් සිටින කාන්තාවන් විදේශගත කරන එක නවත්වන්නට කියා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

අවුරුදු 5ට වඩා අඩු දරුවන් සිටින කාන්තාවන් විදේශගත කිරීමේ කිසිම අවශ්‍යතාවක් නැහැ, ගරු කථානායකතුමනි. අපි කියන්නේ මේ සඳහා නියමිත ක්‍රමවේදයක් අනුගමනය නොකළොත්, -අපේ දැනුවත් වීමකින් තොරව, ලියා පදිංචියකින් තොරව, හොර රහසේ visit visa මාර්ගයෙන් විදේශගත වුණාම ඒ අය ගැනවත්, ඒ අයගේ දරුවන් ගැනවත් කිසිම සොයා බැලීමක් කරන්නට අපට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ අයට පිට රටදී කරදර සිද්ධ වුණත්, පිට රටදී අනතුරක් සිද්ධ වුණත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් ගැනීමේ හැකියාවක් නැතිවෙලා තිබෙනවා. ලියා පදිංචිය සහිතව විදේශගත වුණු මවක් සිටින පවුලක් සම්බන්ධයෙන් අප දැනගත්තාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉන්න සංවර්ධන නිලධාරින් ගිහින් ඒ පවුල පිළිබඳව සොයා බලනවා, ඒ දරුවන්ගේ ප්‍රගතිය පිළිබඳව සොයා බලනවා සහ ඒ පවුල සඳහා සුභ සාධනය කරනවා. නමුත්, හොර රහසේ විදේශගත වුණාම මේ කිසිවක් සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසායි මා කියන්නේ, මේ පිළිබඳව නීතියේ යම් සංශෝධනයක් කරලා, මේ සඳහා නියමිත ක්‍රමවේදයක් සකස් කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමක් සඳහා මා අවසර ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පැහැදිලි කර ගැනීමක් සඳහා අවසර ඉල්ලා සිටිනවා. එතුමාට අවසර දෙන්න පුළුවන්ද?

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
අවසර දෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, පවුල් පසුබිම් වාර්තාව අත් හිටෙව්වාය කියා visit visa මඟින් හොර රහසේ විදේශගත වන එක නතර

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

වන්නේ නැහැ. පවුල් පසුබිම් වාර්තාව අත් හිටුවීම මඟින් හොර රහසේ විදේශගත වන එක නවත්වන්න පුළුවන්ය කියන එක අහසට පොළොව වාගේ. ඒක විහිළු කථාවක්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අනික් කාරණය මෙයයි. මෙහිදී ජාත්‍යන්තර බලපෑමකට වඩා තිබෙන්නේ රැකියා ඒජන්සිකරුවන්ගේ බලපෑමයි. කෙසේ හෝ කවුරුන් හෝ අල්ලා රට යවන්න ඕනෑකම තිබෙන්නේ රැකියා ඒජන්සිකරුවන්ටයි. ඒ අයට මානව බැඳීම් ගැන, පවුල් සංස්ථාවන් ගැන, අපේ රටේ අම්මලා දරුවන් එකට ඉන්න ඕනෑය කියන එක ගැන හැඟීමක් නැහැ. ඇත්තටම පවුල් පසුබිම් වාර්තාව නිසා කාන්තාවන් විදේශගත වීම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවෙලා තිබෙනවා. මෙය, ගරු ඇමතිතුමිය මොනවා හෝ විශේෂ සෙවිල්ලක්, බැලිල්ලක් කරලා ගෙනාපු දෙයක්. ඒ නිසා රටේ කාන්තාවන්ට සිදු වුණු යහපතක් තිබෙනවා. කාන්තාවන්ට විතරක් නොවෙයි, දරුවන්ටත් සිදු වුණු යහපතක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ ගැන විශේෂ අවධානය යොමු කරලා පවුල් පසුබිම් වාර්තාව ඉවත් කරන්න එපාය කියන ඉල්ලීම තමයි අපි කරන්නේ. මේ ගැන වහාම සොයා බලන්න. මෙය ඒජන්සිකරුවන්ගේ ගැටයක්. ඒජන්සිකරුවන්ගේ ගැටවලට අහුවෙන්න එපා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු කථානායකතුමනි, අපි යෝජනා කර තිබෙන්නේ පවුල් පසුබිම් වාර්තාව ඉල්ලීම ඉවත් කරන්න කියලා නොවෙයි; මේ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලායි. අතිගරු ජනාධිපතිතුමාත් මේ සම්බන්ධයෙන් නිර්දේශ ලබා දී තිබෙන්නේ ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරන හැටියටයි. නමුත් සංඛ්‍යා ලේඛන සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලබා ගත් තොරතුරු අනුව අපට අනාවරණය වුණු කාරණාව තමයි, පවුල් පසුබිම් වාර්තාව හරහා විදේශගත වීම නවත්වන ලද කාන්තාවන්ගෙන් බහුතරය වෙනත් ව්‍යාජ ක්‍රමවලින් විදේශගත වී තිබෙන බව. එය තමයි යථාර්ථය.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය (කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Chandrani Bandara - Minister of Women and Child Affairs)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චන්ද්‍රානි බණ්ඩාර ඇමතිතුමිය පැහැදිලි කිරීමක් කරනවාද?

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார)
(The Hon. (Mrs.) Chandrani Bandara)

ඔව්, ගරු කථානායකතුමනි. අපිත් එම ස්ථාවරයේමයි ඉන්නේ. අවුරුදු පහට අඩු දරුවන් සිටින අම්මලා විදේශ රැකියා සඳහා යවන්න එපා කියන තැන තමයි අපිත් ඉන්නේ. පුළුවන් නම් කිසිම කාන්තාවක් විදේශ රැකියා සඳහා නොයනවා නම් ඒක ඊට වැඩිය හොඳයි.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමියගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ගරු කථානායකතුමනි, මීට කලින් අමාත්‍යාංශයෙන් පත් කරන ලද subcommittee එකක් මඟිනුත් පවුල් පසුබිම් වාර්තාව ඉවත් කරන්න එපා කියන තීන්දුව ගත්තා. මොකද, ළමා අයිතිවාසිකම් ගැන කථා කරන්න කවුරුවත් නැහැ, කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීම ගැන කථා කළාට. ළමා අයිතිවාසිකම් බොහෝදුරට උල්ලංඝනය වෙලා මේ රටේ මානව සම්පතේ ආරම්භය විනාශ වෙනවා. එම නිසා පවුල් පසුබිම් වාර්තාව ලබා ගැනීම ඉවත් කරන්න එපා කියන ඉල්ලීම කරනවා. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු කථානායකතුමනි, මම අවසන් කරන්නම්. අතිගරු ජනාධිපතිතුමා 2015 ජනාධිපතිවරණයේදී ප්‍රකාශ කළේ කාන්තාවන් ගෘහ සේවය සඳහා විදේශගත වීම වළක්වන්න කියන කාරණයයි. කාන්තාවන් ගෘහ සේවය සඳහා විදේශගත වීම වළක්වන්න පුළුවන් නම් ඒකට අපේ කිසිදු විරෝධයක් නැහැ. අපි ඒකට සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. නමුත් රජයක් විධියට වෙන ක්‍රමවේද සොයා ගැනීමට තීන්දුවක් ගත යුතුයි. ඒ අයට ශ්‍රී ලංකාව ඇතුළත රැකියා සොයා දෙන ක්‍රමවේදයක් සහ මේ අය විදේශවලට නොයැවීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත යුතුයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා පාර්ලිමේන්තු මතයත් දැක්කා නේ. එම නිසා ඒ ගැන අවධානය යොමු කරන්න. බොහොම ස්තුතියි.

## ජම්බුගහමුලදෙනිය කුඹුර පුරවා පෞද්ගලික මාර්ගයක් ඉදිකිරීම : ගනු ලබන පියවර
## ஜம்புகஹமுலதெனிய வயல் நிரப்பப்பட்டுத் தனியார் வீதி நிர்மாணிக்கப்படுதல் : எடுக்கப்பட்ட நடவடிக்கை
## CONSTRUCTION OF PRIVATE ROAD RECLAIMING JAMBUGAHAMULADENIYA PADDY FIELD : STEPS TAKEN

29/'18

**2. ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ ගොවිජන බලප්‍රදේශයේ, ගිරිඋල්ල විහාරස්ථානයට අයත් ජම්බුගහමුලදෙනිය නමැති කුඹුර නිසි අවසරයකින් තොරව පුරවා පෞද්ගලික මාර්ගයක් ඉදිකර ඇති බවත්;

(ii) මේ සඳහා කුට ලේඛන සකස් කිරීමට රජයේ මුදල් වියදම් කර ඇති බවත්;

(iii) ඉහත මාර්ගය ඉදිකර ඇත්තේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයෙකුගේ නිවසක් සඳහා ප්‍රවේශ මාර්ගයක් වශයෙන් බවත්;

(iv) ඉහත මාර්ගයේ ආරම්භක කොටසද අනවසර ලෙස ඉදිකර ඇති බවත්;

(v) මෙම ස්ථානයේ අඩිපාරක් හෝ නොතිබුණු බවත්; ප්‍රාදේශීය සභාවට අයත් නොවන බවත්;

එතුමා දන්නේද?

(ආ) මහජන මුදල් අවභාවිත කරන මෙවැනි නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොழිල් අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) கண்டி மாவட்டத்தின், கங்க இஹல கமநல ஆளுகைப் பிரதேசத்தின், கிரிஉல்ல விஹாரைக் குரித்தான ஜம்புகஹமுலதெனிய எனும் வயல், முறையான அனுமதியின்றி நிரப்பப்பட்டுத் தனியார் வீதியொன்று நிர்மாணிக்கப்பட்டுள்ளது என்பதையும்;

(ii) இதற்குப் போலி ஆவணங்களைத் தயார் செய்ய அரச நிதி செலவிடப்பட்டுள்ளது என்பதையும்;

(iii) கமத்தொழில் ஆராய்ச்சி உற்பத்தி உதவியாளருக்கான வீட்டுக்கான பிரவேசப் பாதையாகவே மேற்படி வீதி நிர்மாணிக்கப்பட்டுள்ளது என்பதையும்;

(iv) மேற்படி வீதியின் ஆரம்பப் பகுதியும் அனுமதியின்றி நிர்மாணிக்கப்பட்டுள்ளது என்பதையும்;

(v) இந்த இடத்தில் ஒற்றையடிப் பாதையொன்றேனும் இருக்கவில்லை என்பதையும்; பிரதேச சபைக்கு உரித்தானதல்ல என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) பொது மக்களின் நிதியை முறைகேடாகப் பயன்படுத்துகின்ற இவ்வாறான அலுவலர்கள் தொடர்பாக மேற்கொள்ளப்படுகின்ற நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Is he aware that -

(i) a private road has been constructed by reclaiming the paddy field named Jambugahamuladeniya belonging to the Giriulla Temple within the Ganga Ihala Agrarian Division in the Kandy District without obtaining proper permission;

(ii) government funds have been spent for forging false documents for this purpose;

(iii) the above-mentioned road has been constructed as an access road to a house of an Agricultural Research Production Assistant;

(iv) even the initial part of the said road has been constructed without permission; and

(v) not even a footpath had existed in this place and neither does it belong to the Pradeshiya Sabha?

(b) Will he inform this House what steps will be taken against such officers who misuse public funds?

(c) If not, why?

**ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ජම්බුගහමුලදෙනිය කුඹුර පස් දමා ගොඩ කිරීමක් සිදුකර නොමැති අතර ඉම් නියර සම්පූර්ණයෙන්ම යට වන ලෙස කොන්ක්‍රීට් අතුරා ඇත. මෙම මාර්ගය ගම නැඟුම සංවර්ධන වැඩසටහන 2014 යටතේ, ''එක ගමකට එක් වැඩක්'' ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කර ඇත.

(ii) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලේඛන සකස් කිරීමක් හෝ මුදල් වැය කිරීමක් සිදු කර නොමැත.

(iii) එම මාර්ගය කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයකුගේ නිවාසය ඇතුළු තවත් නිවාස 02ක් සඳහා ප්‍රවේශ මාර්ගයක් ලෙසත්, ගිරිඋල්ල විහාරස්ථානයට විකල්ප මාර්ගයක් ලෙසත්, මාර්ගය ආසන්නයේ පිහිටි කුඹුරුවලට අදාළ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිත කරන පොදු මාර්ගයක් ලෙසත් භාවිත වේ.

(iv) එම මාර්ගයේ ආරම්භක කොටස කුඹුරු ඉඩමක් නොවේ.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාටත් කවුරුන් හෝ ලියලා දෙන පිළිතුරක් තමයි ඔබතුමා මෙතැන කියවන්නේ. එහිදී "හොරාගෙ අම්මගෙන් ජේන ඇහුවා වාගේ" දෙයක් තමයි සිදු වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, එම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා මමයි. මගේ ගෙදර තිබෙන ප්‍රදේශයට පහළ ප්‍රදේශයේ තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. මේ කියන ජම්බුගහමුලදෙනිය නමැති අක්කර 05ක කුඹුරු ඉඩම පන්සලට පරිත්‍යාග කර තිබෙන්නේ මගේ අත්තා. මේ පන්සල හදලා තිබෙන්නේත් අපේ පවුලේ ඉඩමක. ඒ නිසා මේ පිළිබඳව මම හොඳින් දන්නවා. ප්‍රාදේශීය සභාවේ ලියා පදිංචි නොකළ, අපි පොඩි කාලයේදීවත් අඩි පාරක් හෝ නොතිබුණු ඉඩමක වෙලේ, කුඹුරේ ප්‍රධාන නියරේ, මේ පාරක් ඉදි කර තිබෙන ඇළ වේල්ලේ පළල අඩි 10ක් වනවාද කියා මම අහනවා. ඒ නිසා සම්පූර්ණ බොරුවක් කර තිබෙන්නේ. මේකට කෘෂිකර්ම අමාත්‍යාංශයේ

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

මුදල් වියදම් නොකරන්න ඇති. හැබැයි, ආණ්ඩුවේ මුදල් වියදම් කරලා තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගේ පිළිතුරෙන් දැන ගත්තා, මේ මාර්ගයේ මුල් කොටස කුඹුරේ කොටසක් නොවෙයි කියලා. මේ මාර්ගයේ මුල් කොටස සම්බන්ධ කරලා ඒ මාර්ගය ඉදි කළාය කියලා ඒ ගොඩ ඉඩම් කොටසේ අයිතිකරු වන පොලිස් සැරයන් වික්‍රමසිංහ මහතා නඩුවක් පවරා තිබෙනවා, ගොවි නියාමකවරයාට විරුද්ධව.

ඒ නිසා ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන උත්තරය කොහොමටවත් මා පිළිගන්නේ නැහැ. කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරියාගේ පෞද්ගලික නිවසට වාහනවලින් යන්න පුළුවන් මහ පාරක් තිබෙනවා. ඇල වේල්ල දිගේ පන්සලට යන්න පාරක් තිබෙනවා. මේක තනිකරම පෞද්ගලික ගෙදරකට යාමට ඉදි කර තිබෙන පාරක්. මේ නිලධාරියා විසින් අපේ ඒ කොටියාසයේම ගොඩ කිරීම් 10ක් 15ක් කර තිබෙනවා. සමහර අයට ගොඩ ඉඩම් බින්දුවක්වත් නැහැ; කුඹුරේ පැලක් හදාගෙන පැලේ ජීවත් වෙනවා. හැබැයි, ඒ අයත් එළියට දමන්න නඩු දමලා තිබෙනවා. නමුත් මේ නිලධාරියාට විරුද්ධව නීත්‍යානුකූලව කිසිම පියවරක් අරගෙන නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් අහනවා මේ නිලධාරියාට විරුද්ධව පරීක්ෂණයක් කරන්න ඔබතුමා එකඟ වෙනවාද කියලා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare )

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නයට තමයි පිළිතුර ලබා දී තිබෙන්නේ. ඒක ප්‍රමාණවත් නැත්නම් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන්න මම කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි. තවත් අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

මේ පිළිබඳව පරීක්ෂණයක් කරන ලෙස මම ඉල්ලීමක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 - 57/'18-(1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 - 142/'18-(1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කන්තලේ සීනි කර්මාන්තශාලාවේ යකඩ විකිණීම : විස්තර
## கந்தளாய் சீனித் தொழிற்சாலை இரும்பு விற்பனை: விபரம்
## SALE OF IRON AT KANTALE SUGAR FACTORY: DETAILS

174/'18

**5. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කන්තලේ සීනි කර්මාන්තශාලාවේ ඇති යකඩ විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වූ සමාගම් හා ඔවුන්ගේ මිල ගණන් කවරේද;

(iv) එම ටෙන්ඩරය ලබාගත් සමාගම කවරේද;

(v) මෙම කර්මාන්තශාලාව සඳහා ඉන්දියානු සමාගමක් සමඟ ආයෝජන ව්‍යාපෘතියක් සැලසුම් කර තිබුණේද;

(vi) එසේ නම්, එම සමාගම කවරේද;

(vii) එම ආයෝජන ගිවිසුම සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

අරස තොழිල්முයற්சි மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கந்தளாய் சீனித் தொழிற்சாலையில் உள்ள இரும்புகளை விற்பனை செய்வதற்கு கேள்விப் பத்திரங்கள் கோரப்பட்டதா;

(ii) ஆமெனின், அத்திகதி யாது;

(iii) கேள்விப்பத்திரங்களுக்காக முன்வந்த கம்பனிகள் மற்றும் அவர்கள் சமர்ப்பித்த விலைகள் யாவை;

(iv) அந்தக் கேள்விப்பத்திரத்தைப் பெற்றுக்கொண்ட கம்பெனி யாது;

(v) மேற்படி தொழிற்சாலைக்கு இந்தியக் கம்பனி யொன்றுடன் முதலீட்டுக் கருத்திட்டமொன்று திட்டமிடப்பட்டிருந்ததா;

(vi) ஆமெனின், அந்தக் கம்பெனி யாது;

(vii) அந்த முதலீட்டு உடன்படிக்கையைச் சபையில் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச் சபையில் சமர்ப்பிப்பாரா;

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise & Kandy City Development:

(a) Will he inform this House-

(i) whether tenders were called for selling iron of the Kantale Sugar Factory;

(ii) if so, on which date;

(iii) what companies came forward to tender and what their quotations were;

(iv) what company received the tender;

(v) whether an investment project had been planned with an Indian company for this factory;

(vi) if so, what the particular company is; and

(vii) whether he will table the investment agreement in this regard?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. ඇමුණුම 01හි දක්වා ඇත.

(ii) 2017.06.05

(iii) ඇමුණුම 02හි දක්වා ඇත.

(iv) යකඩ විකිණීම සඳහා කැඳවූ මිල ගණන් ඇගයීමට ලක්කර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අපහරණ කමිටුව මගින් වැඩිම මිල ඉදිරිපත් කළ වත්තල, කෙරවළපිටිය, ඉන්ඩස්ට්‍රියල් පාර, අංක 93/1හි පිහිටි මීරිගම ඉන්ඩස්ට්‍රීස් ලංකා පුද්ගලික සමාගම ජයග්‍රාහී ලංසුකරු ලෙස නම් කරමින් නිර්දේශ ලබා දී ඇත.

(v) ඔව්.

(vi) MG Sugars Lanka (Pvt.) Ltd.

(vii) ඔව්. ඇමුණුම 03 සහ 04 හි දැක්වේ.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. මේ ක්‍රියාවලිය පටන් ගන්න කලින් මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයත්, BOI එකත්, company එකත් ගිවිසුමකට එළඹුණාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඉස්සෙල්ලාම කැබිනට් තීරණයක් ගත්තා, ඉඩම විතරක් දෙන්න.

ඊට පසුව agreement එක අත්සන් කරන කොට, වැරැදියට අත්සන් කරලා ඉඩම සහ factory එක කියන දෙකම දුන්නා. ඒකයි ඇත්තටම සිදු වුණේ. ඒකයි ප්‍රශ්නය.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
කවුද අත්සන් කළේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එය මුදල් අමාත්‍යාංශයයි අත්සන් කර තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ ගැන තර්කයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

කන්තලේ සීනි සමාගමේ ඉඩම් අක්කර 23,000ක් විතර තිබෙනවා. අමාත්‍යතුමා කියන මේ කරුණු අනුව පැහැදිලි වන්නේ මොකක්ද? කැබිනට් මණ්ඩලය තීරණයක් ගන්නවා, ඒ ඉඩම් අක්කර 23,000 පමණක් ඉන්දියානු සමාගමට ලබා දෙන්න.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ ඔක්කෝම නොවෙයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ ඔක්කෝම නොවෙයි; factory එකට අයිති ඉඩම් ටිකයි. Factory එකට අයිති ඉඩම් ටික ලබා දෙන්න කැබිනට් මණ්ඩලය තීරණයක් ගන්නවා. ගරු කථානායකතුමනි, ගිවිසුම සකස් කළ යුතු වන්නේ කැබිනට් මණ්ඩලයේ තීරණය ප්‍රකාරවයි. හැබැයි දැන් ඇමතිතුමාම කියන පරිදි මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒක තමයි අපටත් තිබුණු ප්‍රශ්නය. කැබිනට් මණ්ඩලයේ තීරණය ඉඩම් ලබා දීම සඳහා ලබා දුන්නාට, ගිවිසුම සකස් කොට තිබෙනවා, factory එකත් ලබා දෙන්න. දැන් අප තමුන්නාන්සේගෙන් දැනගන්න කැමැතියි,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ ගැන තර්කයක් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ආණ්ඩුව තීරණයක් ගන්නවා, ඉඩම් දෙන්න. හැබැයි ගිවිසුමක් අත්සන් කරනවා, ඉඩම් සහ factory එක දෙන්න. ඒ ගිවිසුම සකස් කළේ කවුද? ගිවිසුම අත්සන් කළේ කවුද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ ගැන තර්කයක් නැහැ. ගිවිසුමකින් - agreement එකකින්- ඉන්දියානු සමාගමකට - MG Sugars Lanka (Pvt.) Limited එකට - දුන්නා. දැන් ඒ අය සිංගප්පූරුවේ arbitration සඳහා ගිහින් තිබෙනවා. අපි නීතිපතිතුමාගේ උපදෙස් ඉල්ලා තිබෙනවා. කැබිනට් තීරණය, එකක්; agreement එක, තවත් එකක්. දෙවිධියකටයි දී තිබෙන්නේ. අපි ඒක පිළිගන්නවා. එතැන වැරැදීමකුයි සිද්ධ වෙලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වැරැද්දක් වෙලා තිබෙනවා ලු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි මේ සම්බන්ධයෙන් නීතිපතිතුමාගෙන් උපදෙස් ඉල්ලා තිබෙනවා. මා කලින් කිව්වා වාගේම, ඒ අය සිංගප්පූරුවේ arbitration සඳහා ගිහින් තිබෙනවා. ඒ අයගේ අයිතිය පෙන්වන්න ඒ අයට ගිවිසුමක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හැබැයි, වැරැදීමකින් ලු එය කර තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙය මේ අමාත්‍යතුමා කියන තරම් සරල නැහැ. 'අපි ඉස්සරහට මොකක්ද කරන්නේ?' කියන එක ගැන නීතිපතිවරයාගෙන් විමසුමක් අරගෙන, එය බේරා ගැනීම සඳහා දරන ප්‍රයත්නයක් තමයි එය. හැබැයි දැන් මෙහි නිශ්චිත ප්‍රශ්නයක් තිබෙනවා. කැබිනට් මණ්ඩලය විසින් ගන්නා ලද තීන්දුව තමයි ආණ්ඩුවේ තීරණය. හැබැයි ඒ තීන්දුව අභිභවා ගොස්, නිකම්ම නොව කර්මාන්තශාලාවකුත් පවරා දී තිබෙනවා. ඉන්දියානු සමාගම සහ BOI එක අතර අත්සන් කරන ලද ගිවිසුමේ තිබෙන්නේ ඉන්දියානු සමාගමට එම ඉඩම් සහ factory එක කියන දෙකම දෙන බවයි. මුදල් අමාත්‍යාංශය එය අත්සන් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා දැන් එය පිළිගත්තා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ගිවිසුම අත්සන් කර තිබෙන නිසා තමයි එසේ දී තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා පොඩ්ඩක් ඉන්න. පනින්න එපා. මුදල් ඇමතිවරයා ඇතුළු ඇමතිවරුන්, නිලධාරීන් නිකම් ඔහේ ගෙනැවිත් දෙන බහුබූත ලියවිල්ලකට අත්සන් කරන්නේ නැහැ නේ. ඒ අය අත්සන් කළ යුතු වන්නේ, කැබිනට් මණ්ඩලය ගත් තීරණය ප්‍රකාරවයි. කැබිනට් මණ්ඩලයේ තීරණය වෙනම එකක්. හැබැයි එම සමාගම සහ BOI එක අතර තිබෙන එකඟතාව අනුව සමාගමට ලැබෙනවා, ඒ ඉඩම් සහ කර්මාන්තශාලාව කියන දෙකම. සමාගම දැන් ජාත්‍යන්තර බේරුම්කරණයකට ගිහිල්ලායි තිබෙන්නේ. අමාත්‍යතුමනි, ඒ නිසා මෙය තමුන්නාන්සේ කියන තරම් ලෙහෙසි නැහැ.

මොකද, සමාගම බැඳිලා ඉන්නේ ගිවිසුමට. තමුන්නාන්සේලා තමයි බැඳිලා ඉන්නේ, ආණ්ඩුවේ තීරණයට. ගිවිසුම ප්‍රකාරව සමාගමට ඇති අයිතිය තමයි බේරුම්කරණ මණ්ඩලයෙන් සමාගම ඉල්ලා සිටින්නේ. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, කැබිනට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය අභිභවා මේ ගිවිසුම අත්සන් කිරීම සඳහා මැදිහත් වුණේ කවුද, ගිවිසුම අත්සන් කළේ කවුද, මේ ගිවිසුම කියෙව්වේ නැද්ද කියලා. මේ factory එකක් පවරා දෙන්නේ ගිවිසුමක වගන්තියකින්. ඒ ගැන තමුන්නාන්සේ මේ පාර්ලිමේන්තුවට කරුණු කියන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ ගැන තර්කයක් නැහැ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ තර්කය අපි පිළිගත්තා. කැබිනට් තීරණය තිබෙන්නේ, ඉඩම දෙන්න. නමුත් agreement එකේ තිබෙන්නේ, ඉඩමයි factory එකයි දෙකම දෙන්න. ඇත්ත වශයෙන්ම වෙලා තිබෙන්නේ ඒකයි. ඒ සිද්ධිය අවසන් වුණාට පස්සේ අපි වෙනම ටෙන්ඩර් කැඳෙව්වා. ඒ කියන්නේ, අමාත්‍යාංශයෙන්. අමාත්‍යාංශයෙන් වෙනම ටෙන්ඩර් කැඳවලා, තව එක්කෙනෙකුට දුන්නා. දැන් එයත් අයිතිවාසිකම් කියනවා. [බාධා කිරීම්] මේක නිසා දෙන්නෙක් හිරේත් ගියා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මම අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්න තුනක් අහන්න අවස්ථාව දෙන්නේ නැහැ. අතුරු ප්‍රශ්න දෙකයි අහන්න දෙන්නේ. ගරු අමාත්‍යතුමා උත්තර දෙන්න කැමැති නම් ප්‍රශ්නය අහන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කැමැතියි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු ඇමතිතුමනි, දැන් අනුර දිසානායක මන්ත්‍රීතුමා ඇහුව අතුරු ප්‍රශ්නයට අදාළයි මම අහන ප්‍රශ්නය.

ගරු ඇමතිතුමනි, ඒ කැබිනට් පත්‍රිකාවෙන් පස්සේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ BOI එකේ සභාපතිතුමා, MG Sugars Lanka (Pvt.) Limited එකත් එක්ක ගිවිසුම අත්සන් කළේ නීතිපති දෙපාර්තමේන්තුවෙනුත් ඊට අනුමැතිය දුන්නාට පසුවයි. නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය නැතිව අත්සන් කළා නම් අපට හිතා ගන්න පුළුවන්, ඒකේ යම් වරදක් තිබෙනවා කියා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිකම් ලියවිල්ලක් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට දෙන්නේ නැහැ නේ. මුදල් අමාත්‍යාංශය කියන්නේ මේ රටේ තිබෙන ප්‍රධාන අමාත්‍යාංශය නේ. මෙහි යම් වරදක් වෙලා තිබෙනවා නම් ඒක CID එකට භාර දීලා inquire කරන්න පුළුවන්ද කියලා මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දැන් අපි මේ ප්‍රශ්නය විසඳන්න කියලා, නීතිපතිතුමාටම ප්‍රශ්නය භාර දීලා තිබෙනවා. [බාධා කිරීම්] මොකද, කැබිනට් තීරණය එකක්. ගිවිසුමේ තිබෙන්නේ තව එකක්. එකකට එකක් පටහැනියි. අපි -[බාධා කිරීම්] We have asked the Attorney-General to settle this.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
Cabinet decison එකක් කියන්නේ, -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දැන් ඇති. I think that is enough, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, that is enough.

ප්‍රශ්න අංක 6 - 209/'18 - (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඉරනෙයියාලෙයි සහ ආනන්දපුරම් ප්‍රදේශ : පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරීම
## இரணையாலை மற்றும் ஆனந்தபுரம் பிரதேசம்: வெடிபொருட்களை அகற்றுதல்
## IRANEYYALAI AND ANNANDAPURAM AREAS: REMOVAL OF EXPLOSIVES

226/'18

**7. ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මූලිකව් දිස්ත්‍රික්කයේ, පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා තිබෙන ඉරනෙයියාලෙයි සහ ආනන්දපුරම් ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කර ඇති බවත්;

(ii) එකී ජනතාව එම ප්‍රදේශවල වතු ඉඩම් ශුද්ධ පවිත්‍ර කිරීමේදී විශාල වශයෙන් පුපුරන ද්‍රව්‍ය හමු වී ඇති අතර ඒ සම්බන්ධව නිසි බලධාරීන්ට දන්වා ඇති බවත්;

(iii) එම නිසා අදාළ ප්‍රදේශයේ පුපුරණ ද්‍රව්‍ය ඇති බවට දැන්වීම් පුවරු සවිකර තිබෙන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම ප්‍රදේශයේ පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා මේ වන විට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පුපුරණ ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு அபிவிருத்தி மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு மாவட்டத்தின், புதுக்குடியிருப்பு பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள இரணையாலை மற்றும் ஆனந்தபுரம் பிரதேசங் களில் மக்கள் மீள்குடியேற்றப்பட்டுள்ளனர் என்பதையும்;

(ii) மேற்படி மக்கள் அப்பிரதேசங்களில் காணி களைச் சுத்தஞ்செய்கையில் பாரியளவில் வெடி பொருட்கள் கிடைத்துள்ளதோடு அது சம்பந் தமாக உரிய அதிகாரிகளுக்கு அறிவிக்கப்பட் டுள்ளதென்பதையும்;

(iii) இதனால் சம்பந்தப்பட்ட பிரதேசத்தில் வெடி பொருட்கள் உள்ளனவென அறிவித்தல் பலகைகள் பொருத்தப்பட்டுள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i ) இப்பிரதேசத்தில் வெடிபொருட்களை அகற்று வதற்காக இன்றளவில் ஏதேனும் நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா;

(ii) ஆமெனில் மேற்படி வெடிபொருட்களை முற்றாகவே அகற்றுவதற்கு எடுக்கும் காலம் எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Resettlement, Rehabilitation, Northern Development & Hindu Religious Affairs:

(a) Is he aware that-

(i) people have been resettled in Iraneyyalai and Annandapuram areas in the Puthukuduirippu Divisional Secretary's Division in the Mullaitivu District;

(ii) those people have found a lot of explosives in clearing the lands in those areas and that they have informed the relevant authorities of it; and

(iii) notices have been put up to inform the people that explosives are found in the area?

(b) Will he inform this House-

(i) whether arrangements have been made to remove explosives from that area by now; and

(ii) if so, the time, the total removal of such explosives will take?

(c) If not, why?

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு அபிவிருத்தி மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)

(The Hon. D.M. Swaminathan - Minister of Resettlement, Rehabilitation, Northern Development and Hindu Religious Affairs)

(அ) (i) ஆம்.

(ii) ஆம்.

இடம்பெயர்ந்த மக்கள் மீள்குடியமர்த்தப்பட்ட பின் பாரியளவில் வெடிபொருட்கள் கண்டெடுக் கப்பட்டன என்று இன்னும் நிலக்கண்ணிவெடி செயற்பாட்டு மத்திய நிலையத்திற்கு அறிக்கை யிடப்படவில்லை. எனினும், பாதுகாப்பு அமைச்சின் ஊடாக இந்நிலையத்திற்கு மேற்சொன்ன விடயங்கள் முன்வைக்கப்பட்ட வேளையில், அப்பகுதிக்குரிய தரைப்படை பொறியியல் பிரிவின்மூலம் அதுகுறித்து விசாரிக்கப்பட்டது. அவர்கள் தற்போது அப்பிரதேசத்தில் தொழில்நுட்பம் சாராத கணிப்பீடொன்றை மேற்கொண்டுவருவதாக பிரதேச நிலக்கண்ணிவெடி அகற்றும் அலுவலகத்திற்கு அறிவித்துள்ளனர். அதன்படி, சொல்லப்பட்ட கணிப்பீட்டு அறிக்கை கிடைக்கப்பெற்றதும், அப்பிரதேசத்தில் மேலும் வெடிபொருட்கள் உள்ளனவா என்பது உறுதிப் படுத்தப்படுமாயின், நிலக்கண்ணிவெடியகற்றும் அமைப்புகளின் பங்களிப்புடன் அவற்றை அகற்ற பிரதேச நிலக்கண்ணிவெடி அகற்றும் அலுவலகத்தினால் நடவடிக்கை எடுக்கப்படும்.

(iii) இல்லை.

இப்பிரதேசத்தில் அடையாளம் காணப்பட்ட ஆபத்தான இடங்களில் நிலக்கண்ணிவெடி அகற்றும் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு அவ்வேலைகள் பூர்த்திசெய்யப்பட்டிருப்பதால், அறிவித்தல் பலகைகள் பொருத்தப்படவில்லை யென்பதுடன், நிலக்கண்ணிவெடிகள் அல்லது வெடித்துச் சிதறாத யுத்த உபகரணங்கள் கண்டெடுக்கப்படின், அங்கு செயலாற்ற வேண்டிய விதம் குறித்து நிலக்கண்ணிவெடி ஆபத்துக் கல்வி நிகழ்ச்சித்திட்டங்கள் (MRE) மூலம் பொதுமக்கள் அறிவுறுத்தப்பட்டுள்ளனர். எனினும், யாதேனும் ஒரு யுத்த உபகரணம் கண்டெடுக்கப்படுமாயின், அது நிலத்திலிருந்து அகற்றப்படும் வரையில் சர்வதேச நியமங்களின் படி அவ்விடத்தில் அறிவித்தல் பலகையொன்று பொருத்தப்படுகிறது.

(ஆ) (i) ஆம்.

குறிப்பாக நிலக்கண்ணிவெடி செயற்பாட்டுத் தேசிய நிலையத்தின் மேற்பார்வையின்கீழ் நிலக்கண்ணிவெடி அகற்றும் அமைப்புகளினால் சர்வதேச நியமங்களின்படி நிலக்கண்ணிவெடி அகற்றப்படுவது நில மேற்பரப்பிலிருந்து 15 சென்ரி மீற்றர் பரப்பில் மட்டுமே. அதன்படி நிலக்கண்ணிவெடிகளும் வெடித்துச் சிதறாத யுத்த உபகரணங்களும் பொதுமக்களின் பல்வேறு செயற்பாடுகளும் காலநிலை நிலைமைகளும் காரணமாக பிற்காலத்தில் இடையிடையே கண்டெடுக்கப்படுவதற்கான சாத்தியக்கூறு உள்ளது. நிலக்கண்ணி வெடிகளை அகற்றும் பணிகள் பூர்த்தியடைந்த போதும், இடையிடையே கண்டெடுக்கப்படும் வெடித்துச் சிதறாக யுத்த உபகரணங்கள் பற்றி பல்வேறு சந்தர்ப்பங்களில் அறியக்கிடைத் துள்ளது. அதன்போது பிரதேச நிலக்கண்ணி வெடி அகற்றும் அலுவலகத்தின் மேற்பார்வை யின்பேரில் தரைப்படையின் மனிதாபிமான

நிலக்கண்ணிவெடி அகற்றும் குழுக்களின் பங்களிப்புடன் அவை துரிதமாக அகற்றி அழிக்கப்படும்.

(ii) தற்போது இலங்கையில் சர்வதேச நியமங்களின் படி நிலமேற்பரப்பிலிருந்தது 15 சென்ரி மீற்றர் ஆழத்தில் மட்டுமே நிலக்கண்ணிவெடி அகற்றப்படுவதால் அந்த அளவைவிட நிலத்தின் ஆழத்தில் வெடிபொருட்கள் இருக்கலாம். அவற்றை அகற்றுவதற்கு அதிக காலமும் செலவும் ஏற்படுவதால், முற்றாக நிலக்கண்ணி வெடிகளை அகற்றுவதற்கு நீண்டகாலம் எடுக்கும்.

எவ்வாறாயினும், ஆள் எதிர்ப்பு நிலக்கண்ணி வெடிகளைத் தடைசெய்யும் சர்வதேச சமவாய மொன்றான ஒட்டாவா சமவாயத்திலும் இலங்கை கைச்சாத்திட்டிருப்பதுடன், அதில் குறிப்பிடப்படும் சிபாரிசுகளுக்கு அமைய இலங்கையில் நிலத்துள் புதைக்கப்பட்டுள்ள ஆள் எதிர்ப்பு நிலக்கண்ணிவெடிகளை அகற்ற வேண்டியுள்ளது. இதற்குப் புறம்பாகத் தேசிய மற்றும் சர்வதேச நியமங்களுக்கு அமைய நிலக்கண்ணிவெடிகளை அகற்றும் பணி முன்னுரிமை அடிப்படையில் இடம்பெற்று வருகிறது. அதேபோல் 2020ஆம் ஆண்டளவில் இலங்கையில் நிலக்கண்ணிவெடிகளை முற்றாக அகற்றுவதற்கான உபாயமுறைத் திட்டம் தற்போது தயாரிக்கப்பட்டுள்ளதுடன், எழக்கூடிய நடைமுறை நிலைமைகள், அதற்கவசியமான காலநிலை மாற்றங்கள் மற்றும் குறிப்பாக நிதி ஒதுக்கீடுகள் இடையூறின்றிக் கிடைக்குமாயின், இக்காலப்பகுதியில் மேற்சொன்ன பணியைப் பூர்த்தி செய்வதற்கான ஆற்றல் கிடைக்கும்.

அதேபோல், இன்றளவில் வெடிபொருட்களை அகற்றி அழிக்கும் செயன்முறை மிகவும் சிக்கலான நிலையை அடைந்துள்ளது. குறிப்பாக, யாதேனும் வெடித்துச் சிதறாத தரைப் படை உபகரணமொன்று குறித்துப் பொது மக்களினால் அறிக்கையிடப்பட்ட சந்தர்ப்பத்தில், அது சம்பந்தமாகத் துரிதமாகச் செயலாற்றும் ஆற்றல் தற்போது நிலக்கண்ணிவெடி செயற் பாட்டுத் தேசிய நிலையம், தரைப்படை மனிதாபிமான நிலக்கண்ணிவெடி அகற்றும் பிரிவின் வசமில்லை. காரணம், முதலில் வெடித்துச் சிதறாத யுத்த உபகரணங்கள் கண்டெடுக்கப்பட்ட பிரதேசம் சார்ந்த பொலிஸ் நிலையத்திற்கு அதுபற்றி அறிவித்து, அப்பொலிஸிலிருந்து அத்தகைய வெடித்துச் சிதறாத யுத்த உபகரணங்களை வெடிக்கச் செய்து அழித்துவிடுவதற்கு நீதிமன்ற உத்தர வொன்றைப் பெற்றுக்கொள்ள வேண்டியுள்ளது. அது பெறப்பட்ட பின் அவ்வாறு வெடித்துச் சிதறாத யுத்த உபகரணங்களை அழித்துவிட தரைப்படை மனிதாபிமான நிலக்கண்ணிவெடி அகற்றும் குழுக்களுக்கு அனுமதி அளிக்கப் படுகிறது. இவ்வாறான செயன்முறையின்போது குறித்த தரைப்படை உபகரணங்களை அவ்விடத் திலிருந்து நீக்கி, மக்கள் நடமாற்றமற்ற பிரதேச மொன்றில் வைத்து அழித்துவிட முன்னரைவிடக் கூடுதல் காலம் எடுக்கலாம்.

மேலும், மேற்குறிப்பிட்ட பிரதேசச் செயலாளர் பிரிவில் நிலக்கண்ணிவெடி ஆபத்துள்ள மொத்த நிலப்பரப்பு 40,622,395 சதுர மீற்றர்கள் என அடையாளம் காணப்பட்டுள்ளதுடன், அப்பகுதி யிலிருந்து 40,282,553 சதுர மீற்றர் அளவில் நிலக்கண்ணிவெடிகளை அகற்றி அப் பிரதேசங்கள் பொதுமக்களின் பயன்பாட்டுக் காக விடுவிக்கப்படும். எஞ்சியுள்ள 339,842 சதுர மீற்றர் பரப்பளப்பில் தற்போது தரைப்படையின் நிலக்கண்ணிவெடி அகற்றும் பிரிவும் "டேஷ்" அமைப்பும் இணைந்து நிலக்கண்ணிவெடிகளை அகற்றும் பணிகளை மேலும் முன்னெடுத்து வருகிறது.

(இ) எழமாட்டா.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

நன்றி! கௌரவ அமைச்சர் அவர்களே, வட மாகாணத்தில் இதுவரை கண்ணிவெடிகள் அகற்றாத பகுதிகள் எவ்வளவு இருக்கின்றன என்று சொல்ல முடியுமா?

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

அதை இப்பொழுது கூறினேன். அப்பகுதிகளிலுள்ள கண்ணிவெடிகளை 2020ஆம் ஆண்டுக்கு முதல் அகற்ற நடவடிக்கை எடுக்கப்படும்.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

தற்பொழுது, வீட்டுத்திட்டம் எந்தளவில் இருக்கின்றது? மழைக்காலம் வருவதற்கு முன்னர் வீட்டுத்திட்டங்கள் ஆரம்பிக்கப்படுமா?

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

பல மழைக் காலங்கள் வந்திருக்கின்றன. அது என்னுடைய கையில் இல்லை. பிரதமருடைய கையிலேதான் இருக்கிறது. அதற்கான சிபாரிசுகளை நாங்கள் செய்திருக்கின்றோம். அதற்கேற்ற விதத்தில், அவர் ஒரு முடிவை எடுப்பார்.

## 2020 වනවිට විදුලි ඉල්ලුම සැපයීම: යෝජිත වැඩ පිළිවෙළ

## 2020 ஆம் ஆண்டளவில் மின் விநியோகத்திற்கான கேள்வி : உத்தேச வேலைத்திட்டம்

SUPPLY OF ELECTRICITY DEMAND BY 2020 : PROPOSED PROGRAMME

254/'18

**8. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2020 වන විට ශ්‍රී ලංකාවේ විදුලි පද්ධතිය තුළ අපේක්ෂිත ඉල්ලුම කවරේද;

[ගරු හේෂාන් විතානගේ මහතා]

(ii) එම ඉල්ලුම සපුරා ගැනීම සඳහා සහ විදුලි හිඟයක් ඇතිවීම වැළැක්වීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

(iii) හදිසි නියහ තත්ත්වයකට මුහුණදීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සතුව වැඩ පිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම් , ඒ මන්ද?

මින්වලු මත්‍රුම් පුඳුප්පික්කත්තක්ක සක්ති අමෛච්චරෙක් කේට්ට විනා:

(அ) (i) 2020ஆம் ஆண்டளவில் இலங்கையின் மின்சார முறைமையினுள்ளான உத்தேச கேள்வி யாது என்பதையும்;

(ii) மேற்படி கேள்வியை நிறைவு செய்வதற்காக மற்றும் மின்சாரப் பற்றாக்குறை ஏற்படுவதைத் தடுப்பதற்காக அமைச்சு மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) திடீர் வரட்சி நிலையை எதிர்கொள்வதற்கு இலங்கை மின்சார சபையிடம் வேலைத்திட்டம் ஒன்று உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House-

(i) the expected demand for electricity within Sri Lanka by 2020;

(ii) the steps taken by the Ministry to meet that demand and to prevent a shortage of electricity; and

(iii) whether there is a programme with Ceylon Electricity Board to face a sudden drought?

(b) If not, why?

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)

(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) වර්ෂ 2020 වන විට ශ්‍රී ලංකාවේ විදුලි පද්ධතිය තුළ අපේක්ෂිත උපරිම ධාරිතා ඉල්ලුම - peak demand - 3077 MW ලෙසද, බලශක්ති ඉල්ලුම - energy demand - 16646 GWh ලෙස ද පුරෝකථනය කර තිබෙනවා.

(ii) එම ඉල්ලුම සපුරා ගැනීම සඳහා සහ විදුලි හිඟයක් ඇතිවීම වැළැක්වීම සඳහා ගන්නා වූ පියවර පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විමසා තිබෙනවා. ඒ පිළිබඳව අපි පියවර ගණනාවක් අරගෙන තිබෙනවා. මම ඉක්මනින් ඒ ගැන දැනුම් දෙන්නම්.

**2018 වසර**

**තාප විදුලි බලාගාර**

* 24 MW බැගින් මොණරාගල, පල්ලේකැලේ, හොරණ හා හබරණ තාප විදුලි බලාගාර හතරක් ඉදිකිරීම.
* 100 MW barge mounted තාප විදුලි බලාගාරයක් දකුණු පළාතේ ඉදිකිරීම.

මේක පා වෙන නැවක් වැනි විදුලි බලාගාරයක්. ඒකට barge එකක් කියලාත් කියනවා.

**පුනර්ජනනීය විදුලි බලාගාර**

මේ යටතේ පහත සඳහන් පරිදි විදුලි බලාගාර හතරක් සැලසුම් කර තිබෙනවා.

* 15 MWක් වූ කුඩා පරිමාණ ජල විදුලි බලාගාර
* 5 MWක් වූ ජෛව ස්කන්ධ විදුලි බලාගාර
* වහලය මත සවි කරන සූර්ය පියැසි විදුලි බලාගාරවලින් 25 MWක් ලබා ගැනීම.
* 10 MWක් බැගින් වූ සුළං විදුලි බලාගාර දෙකක් චුන්නාකම්වල ඉදිකිරීම. එය දැනට ඉදිවෙමින් පවතිනවා.

**2019 වසර**

**තාප විදුලි බලාගාර**

* 35 MW ගෑස් ටර්බයිනර් බලාගාර දෙකක් ඉදිකිරීම.
* 300 MW ස්වාභාවික වායුවලින් ක්‍රියාත්මක වන ද්විත්ව චක්‍රීය විදුලි බලාගාරයක් කෙරවලපිටියේ ඉදිකිරීම්.

මේ බලාගාරය පිළිබඳ අපේ වගකීම් ඉවර කළත්, දැන් ඒ ටෙන්ඩර්කරුවන් අතර නඩු තිබෙනවා. ඒ නිසා යම් ප්‍රමාදයක් තිබෙනවා.

**පුනර්ජනනීය විදුලි බලාගාර**

* 122 MW ලබා ගන්නා උමා ඔය විදුලි බලාගාරය ඉදිකිරීම.
* 10 MW බැගින් වූ බලාගාර පහක් ත්‍රිකුණාමලයේ, කිලිනොච්චියේ සහ නුවරඑළියේ ඉදිවෙනවා. මේවා ඔක්කෝම සුළං විදුලි බලාගාර.
* වහලය මත සවි කරන සූර්ය පියැසි විදුලි බලාගාරවලින් 70 MWක ධාරිතාවක් ලබන අවුරුද්දේ ලබා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. නමුත් පෙනෙන හැටියට අපට ඊට වඩා වැඩි ඉලක්කයකට යන්න පුළුවන්.
* 10 MW බැගින් වූ සූර්ය විදුලි බලාගාර දෙකක් වාලච්චේන සහ වච්නතිව්වල ඉදිකිරීම.

ඒවා අපි ටෙන්ඩර් මඟින් ලබා දී තිබෙනවා.

* 15 MW බැගින් වූ කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉදිකිරීම.
* 5 MW ජෛව ස්කන්ධ විදුලි බලාගාර ඉදිකිරීම.
* 1MW බැගින් වූ සූර්ය විදුලි බලාගාර 36ක් ඉදිකිරීම.

ඒ සඳහා අපි ටෙන්ඩර් මඟින් අවසර දුන්නා. ලබන අවුරුද්දේ ඒවා ඉදිකර අවසන් වෙනවා.

**2020 වසර**

**තාප විදුලි බලාගාර**

* 35 MWක ගෑස් ටර්බයිනර් බලාගාරයක් ඉදිවෙනවා.

**පුනර්ජනනීය විදුලි බලාගාර**

* 35 MW බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරයක් ඉදි කරන්න අපි බලාපොරොත්තු වෙනවා.
* 15 MW තල්පිටිගල ජල විදුලි බලාගාරය ඉදිකිරීම.
* 100 MW මන්නාරම සුළං බල උද්‍යානය පිහිටුවීම.

මෙය ඉතා වැදගත්ම බලාගාරයක්. එහි ටෙන්ඩර් කටයුතු ඉතාම සාර්ථක වුණා.

- 1 MW x 90 සූර්ය බලාගාර

-ඒ සියලුම වැඩ කටයුතු 2020 වසරේ අවසන් වෙයි කියලා බලාපොරොත්තු වෙනවා.-

- 15 MW සූර්ය පියැසි විදුලි බලාගාර -වහලය මත සවි කරන බලාගාර-
- 15 MW කුඩා පරිමාණ ජල විදුලි බලාගාර
- 5 MW ජෙව ස්කන්ධ විදුලි බලාගාර

මේ සියල්ල ඉදි කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**2021**

තාප විදුලි බලාගාර

- 300 MW ස්වභාවික වායුවලින් ක්‍රියාත්මක ද්විත්ව චක්‍රිය විදුලි බලාගාරය -LNG බලාගාරය-

එම බලාගාරය දකුණු පළාත ආශ්‍රිතව ඉදි කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

පුනර්ජනනීය විදුලි බලාගාර

- 50 MW ඇතිමලේ, මොණරාගල සුළං බල උද්‍යානය

පසුව එයට තවත් මෙගාවොට් 50ක් එකතු කරනවා.

- 20 MW සූර්ය පියැසි විදුලි බලාගාර
- 170 MW පුනරීන් සුළං බල උද්‍යානය
- 50 MW මන්නාරම සුළං බල උද්‍යානය
- 10 MW කුඩා පරිමාණ ජල විදුලි බලාගාර
- 5 MW ජෙව ස්කන්ධ විදුලි බලාගාර

**2022**

පුනර්ජනනීය විදුලි බලාගාර

- 30 MW මොරගොල්ල ජල විදුලි බලාගාරය
- 20 MW සීතාවක ජල විදුලි බලාගාරය
- 20 MW ගිංගඟ ජල විදුලි බලාගාරය
- 20 MW සූර්ය පියැසි විදුලි බලාගාර -වහලය මත සවි කරන විදුලි බලාගාර-
- 50 MW මන්නාරම සුළං බල උද්‍යානය
- 10 MW කුඩා පරිමාණ ජල විදුලි බාලාගාර
- 5 MW ජෙව ස්කන්ධ විදුලි බලාගාර

ඇති වෙනවා.

**2023**

තාප විදුලි බලාගාර

- 300 MW අධි කාර්යක්ෂම ගල් අඟුරු තාප විදුලි බලාගාරය

  සංශෝධිත ජනන සැලැස්ම අනුව ගල් අඟුරු බලාගාරයක් සඳහා අපට අවසර ලැබී තිබෙනවා. ඒ අනුව එම බලාගාරය ඉදි වෙනවා.
- 500 MW ස්වභාවික වායුවලින් ක්‍රියාත්මක ද්විත්ව චක්‍රිය විදුලි බලාගාරය -LNG බලාගාරය- (කෙරවලපිටිය)

පුනර්ජනනීය විදුලි බලාගාර

- 50 MW පුනරීන් සුළං බල උද්‍යානය
- 20 MW සූර්ය පියැසි විදුලි බලාගාර
- 60 MW මන්නාරම සුළං බල උද්‍යානය
- 5 MW ජෙව ස්කන්ධ විදුලි බලාගාර
- 10 MW කුඩා පරිමාණ ජල විදුලි බලාගාර

**2024**

තාප විදුලි බලාගාර

- 300 MW අධි කාර්යක්ෂම ගල් අඟුරු තාප විදුලි බලාගාරය
- 500 MW ස්වභාවික වායුවලින් ක්‍රියාත්මක ද්විත්ව චක්‍රිය විදුලි බලාගාරය (කෙරවලපිටිය)

පුනර්ජනනීය විදුලි බලාගාර

- 50 MW පුනරීන් සුළං බල උද්‍යානය
- 20 MW සූර්ය පියැසි විදුලි බලාගාර
- 50 MW කොකාවිල් සුළං විදුලි බලාගාරය
- 10 MW කුඩා පරිමාණ ජල විදුලි බලාගාර
- 5 MW ජෙව ස්කන්ධ විදුලි බලාගාර

**2025**

තාප විදුලි බලාගාර

- 300 MW අධි කාර්යක්ෂම ගල් අඟුරු තාප විදුලි බලාගාර

පුනර්ජනනීය විදුලි බලාගාර

- 200 MW පොම්පාගාර ජල විදුලි බලාගාරය (Pump Storage)
- 35 MW සූර්ය පියැසි විදුලි බලාගාර
- 50 MW පුත්තලම සුළං විදුලි බලාගාරය
- 30 MW යාපනය සුළං විදුලි බලාගාරය
- 10 MW කුඩා පරිමාණ ජල විදුලි බලාගාර
- 5 MW ජෙව ස්කන්ධ විදුලි බලාගාර

ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ආකාරයට බලාගාර ඉදි කරන්න සැලසුම් කරලා තිබෙනවා. අපි මෙහෙම කිව්වත්, ඒවා නිසි ලෙස, නිසි දිනට ඉදිවීම පිළිබඳ ප්‍රශ්න තිබෙන බව අපි පිළිගන්නවා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(iii) ලංකා විදුලිබල මණ්ඩලය මඟින් ප්‍රකාශිත 2018 - 2037 සඳහා වූ දිගුකාලීන විදුලි ජනන සැලැස්ම මඟින් හඳිසි තත්ත්ව 04ක් සඳහා අවශ්‍ය ධාරිතා යෝජනා කර ඇත.

i. අධික වියළි කාලගුණික තත්ත්වයක් සඳහා මුහුණ පෑම.

ii. ප්‍රධාන විදුලි බලාගාරයක් ඇණ හිටීම.

iii. යෝජිත ප්‍රධාන විදුලි බලාගාර ඉදිවීම ප්‍රමාද වීම.

iv. විදුලි ඉල්ලුම අනපේක්ෂිත ලෙස වැඩි වීම.

ඉහත හඳිසි අවශ්‍යතා කිහිපයක් එකවර සිදුවුවහොත් එම විදුලි ඉල්ලුම සපුරාලීමට අතිරේක මෙගාවොට 150ක ධාරිතාවක් තාප විදුලි බලාගාර මඟින් අවශ්‍ය අවස්ථාවලදී ලබා ගැනීමට සැලසුම් කර ඇත.

ගරු මන්ත්‍රීතුමනි, නියඟයක් පමණක් නොවෙයි මෙම තත්ත්වයන් හතර සඳහාම විසඳුම් අපි දිගු කාලීන ජනන සැලැස්මෙන් පුරෝකථනය කරලා තිබෙනවා.

මේ තත්ත්වයන් යටතේ අවශ්‍ය වුණොත් හදිසි මිලදී ගැනීම් සිදු කරනවා. එවැනි අවස්ථාවක තාප විදුලි බලයෙන් මෙගා වොට් 150ක විදුලිය උත්පාදනය කරන්න අපි අපේක්ෂා කරනවා. මේවා කලින් කලට වෙනස් වෙන්න පුළුවන්. නමුත් අපට වග කීමෙන් මේ කාරණය කියන්න පුළුවන්. සමහරු කිව්වා, 2015 විදුලි පද්ධතිය බිඳ වැටෙනවා කියලා. සමහරු කිව්වා, 2016 කඩාගෙන වැටෙනවා කියලා. 2017 කඩාගෙන වැටෙනවා කියලා කිව්වා. 2018 කඩාගෙන වැටෙනවා කිව්වා. විදුලිබල පද්ධතිය කඩාගෙන වැටෙන්නේ නැතුව ඉදිරියට පවත්වාගෙන යන්න අවශ්‍ය කරන සැලසුම අපට තිබෙනවා. දුෂ්කරතා මධ්‍යයේ අපි ඒවා ක්‍රියාත්මක කරනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දීර්ඝ උත්තරයක් ලබා දීම ගැන ගරු රාජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මම මේ කාරණය ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. මට, නම් මතක තියා ගන්න බැරි තරමේ විස්තරයක් ඔබතුමා කිව්වා. මේ කියන බලාගාර ප්‍රමාණය ඇත්තටම හැදෙනවාද? මා නියෝජනය කරන ඇඹිලිපිටිය කොට්ඨාසයේ තාප විදුලි බලාගාරවලින් යුනිට් එකකට රුපියල් 60ක්, 70ක් දීලා ඔබතුමන්ලා තවමත් විදුලිය ගන්නවා. ඒවාත් පද්ධතියට එකතු කරනවා. මේ වාගේ විශාල මුදලක් දීලා පෞද්ගලික තාප විදුලි බලාගාරවලින් විදුලිය ලබා ගන්න තත්ත්වයක් තිබෙද්දී, මේ කියපු ලේඛනයට අනුව ඇත්තටම බලාගාර ඉදිවෙනවාද කියලා අපි දන්නේ නැහැ. මාධ්‍ය තුළින් දැන ගන්නේත් නැහැ. ඔබතුමා දැන් කියපු එක ගැන විතරයි අපි දන්නේ. මේක ඇත්තටම යථාර්ථයක් බවට පත් වෙනවාද කියලා ඔබතුමාගෙන් ස්ථිර වශයෙන්ම දැන ගන්න කැමැතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමනි, අපි සැලැස්මක් අනුව වැඩ කරගෙන යද්දී අපට එම සැලැස්මේ තිබෙන සියලුම විදුලි බලාගාර ඒ දිනවලටම ඉදිවෙනවා කියලා කියන්න පුළුවන්කමක් නැහැ. සාම්පූර් විදුලි බලාගාරය අපේ සැලැස්මේ තිබුණා. වසර 10ක් ඉෂ්ට වුණේ නැහැ. අපේ රජය බලයට පත් වෙලා මාස අටක් ඇතුළත අපි මහන්සි වෙලා ඒක ටෙන්ඩර් කරන අවස්ථාවේදී රජයේ ප්‍රතිපත්තියක් අනුව එම බලාගාරය නතර කළා. ඒක නිසා ඒක කර ගන්න බැරි වුණා. ඒ වාගේම කෙරවලපිටියේ තවත් මෙගා වොට් 300ක මහා පරිමාණ තාප බලාගාරයක් ඉදි කරන්න ටෙන්ඩර් කළා. අපි අපේක්ෂා කළේ මේ වන කොට ටෙන්ඩර් කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කරලා බලාගාරය ඉදිකිරීම් ආරම්භ වෙයි කියලා. නමුත් අවාසනාවකට ඒ ජයග්‍රාහකයා සහ අනෙක් අය අතර නඩු කියන තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා, මේ ටෙන්ඩරයේ අයිතිය වෙනුවෙන්. ඉතින් මේවා රටේ තිබෙන ප්‍රායෝගික තත්ත්වයන්. ඔබතුමාට මම වග කීමෙන් කියන්න කැමැතියි, බොහෝ බලාගාර නියමිත ඉලක්කවලට ඉදි වෙනවා කියලා. විශේෂයෙන්ම අද ලෝකයේ වේගයෙන්ම ඉදිරියට යන්නේ පුනර්ජනනීය බලශක්තිය. මුළු ලෝකයේම බැලුවොත්, පසුගිය කාලයේ වැඩිම බලාගාර ප්‍රමාණයක් ඉදිවෙලා තිබෙන්නේ පුනර්ජනනීය බලශක්තිය වන සුළං බලය, සූර්ය බලය මඟින් විදුලිය නිෂ්පාදන කරන බලාගාර. අපේ රටේ සූර්ය බල පද්ධතිය සම්බන්ධයෙන් ලොකු දියුණුවක් ඇති වෙලා තිබෙනවා. 2015න් පස්සේ මෙගා වොට් 150කට ආසන්න ප්‍රමාණයක් සූර්ය බලය අපේ පද්ධතියට එකතු වෙලා තිබෙනවා. සූර්ය බල සංග්‍රාමය හරහා විතරක් මෙගා වොට් 100ක් එකතු වෙලා තිබෙනවා. සූර්ය බලය සම්බන්ධයෙන් නම් අපි පුරෝකථනය කරන ප්‍රමාණයට වඩා වැඩියෙන් එකතු වෙලා තිබෙනවා.

නමුත් විවිධ ගැටලු බලපානවා. එනම් පරිසරය පිළිබඳ ගැටලු, දේශපාලනික කාරණා, ඒ වාගේම ඒ කොන්ත්‍රාත්කරුවන් නිසා ඇතිවන ගැටලු, මහජන විරෝධතා කියන ඔක්කෝම කාරණා මේ බලාගාර ඉදිකරද්දී බලපානවා. ප්‍රමාදයක් තිබෙනවා. නමුත් ඒ ප්‍රමාදය තුළ පවා රටට විදුලිය සැපයීම තහවුරු කරන්න පුළුවන් තත්ත්වයක අපි ඉන්නවා කියලා මට වගකීමෙන් කියන්න පුළුවන්.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මම කෙටියෙන් අහන්නම්. විශේෂයෙන්ම රත්නපුර මැතිවරණ කොට්ඨාසය අවට පුංචි ජලාශයක් දැක්කත්, විදුලි බලාගාරයක් ඉදි කරනවා. කොහේවත් එවැනි ජලාශයක් දැන් ඉතිරි වෙලා නැහැ. විශේෂයෙන්ම කියන්න ඕනෑ, දේශපාලනඥයන් මේ හැම එකකම අයිතිකාරයන් බවට පත්වෙලා තිබෙන බව. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙහි නියාමනයක් තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි. මොකද, අහුවෙන තැනක ප්‍රාදේශීය සභාව set කරගෙන වැඩේ කරනවා. ඒ නිසා මෙය එච්චර සුදුසු නැහැ කියලා මම හිතනවා. මෙගාවොට් 1, 2 වාගේ විදුලි බලාගාර හැම තැනම හැදෙනවා. සමහරවිට මේ නිසා ජන ජීවිතයටත් බලපෑම් එල්ල වෙනවා. විදුලි බල මණ්ඩලයෙන් මේ සඳහා නියාමනයක් ඇති කරනවාද කියලා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මා දැන ගන්න කැමැතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමා, කිසිම කුඩා ජල විදුලි බලාගාරයක් ඉදි කිරීම සඳහා ප්‍රායෝගිකව අවසර දෙයි කියා අපට හිතන්න පුළුවන්කමක් නැහැ. මොකද, කරනවා නම් දැන් ඉතුරු වෙලා තිබෙන්නේ පරිසර සංවේදී දුෂ්කර ව්‍යාපෘති පමණයි. පහසුවෙන් කරන්න පුළුවන් ඵලදායී ව්‍යාපෘති හැම එකක්ම වාගේ - සියයට 90ක් පමණ - දැන් කෙරිලා අවසන්. ඕනෑම සංවර්ධන ව්‍යාපෘතියකින් පරිසරයට යම් අහිතකර බලපෑමක් ඇති වෙන්න පුළුවන්. නමුත් අපේ රටේ විදුලි පද්ධතියට මෙගාවොට් 300කට වඩා ලබා දීමට මේ කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉවහල් වුණා කියන කාරණය අපි අමතක කරන්න නරකයි. ඒ නිසා කුඩා ජල විදුලි බලාගාර නරකයි කියලා කියන්නේ නැහැ. හැබැයි, දැන් ඉතුරු වෙලා තිබෙන දුෂ්කර ස්ථානවල බලාගාර ඇති කළොත් පරිසර දූෂණය සිදු වෙන්න පුළුවන්. විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ. ඔබතුමා කියන කාරණය ඉතාම හරි. ඔබතුමා එම ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියට, ගොඩක් අවස්ථාවල ඒ පිළිබඳව සංවේදී වෙලා අපට කරුණු කියා තිබෙනවා. රත්නපුරයේ තිබෙන එම සංවේදී පරිසරයට අහිතකර වන එකම බලාගාරයක්වත් අපි අලුතෙන් ඉදි කරන්න දෙන්නේ නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, විදුලි බලාගාර ඉදි කිරීම් ගැන ඔබතුමා දීර්ඝ විස්තරයක් කළා. ඒ පිළිබඳව ඔබතුමාට ස්තුතියි. මේවායේ සමාජ පිරිවැය ගැනත් මම අහන්න කැමතියි. ඔබතුමා කිව්වා, මේ බලාගාර නිසා ඇතිවන අපහසුතා සහ සමාජ ගැටලු තිබෙනවා කියලා. ඒ නිසා මේකේ සමාජ පිරිවැයක් තිබෙනවා. ඒ පිළිබඳව වාර්තාවක් සකස් කරලා, එම විදුලි බලාගාරවලින් ඇති වන ඒ, ඒ ගැටලුවලට විසඳුම් ලබාදීමට ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ කටයුතු කරනවාද?

ඒ වාගේම නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය නිසා දූවිලි හා අළු පියාසර කර ගොස් විශාල බිම් ප්‍රමාණයක් ඒවාට යටවී තිබීමත් සමඟ මිනිසුන්ට ඇතිවී තිබෙන හානි ගැන වන්දි ගෙවීමේ ක්‍රමයක් තමුන්නාන්සේලා සූදානම් කරනවාද?

කුරු ගහ හරස් කරලා හතරවැනි විදුලි බලාගාරයත් හදන්න සූදානම් වෙද්දි, මිනිසුන්ට නාන්න වතුර ටිකක්වත් කුරු ගහේ පහළ නැති වෙන තත්ත්වයක් තිබෙන බව අපි විරෝධයක් පාලා ඔබතුමාට කියා තිබෙනවා. ඒ ගැන ඔබතුමාගේ තීන්දුවක් අපට දෙනවාද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි බලාගාරය පිළිබඳව විශාල වශයෙන් විවේචන තිබුණා. මේ බලාගාරය නිසා පරිසරයට හානි වන ක්‍රම කීපයක් තිබෙනවා. එයින් ප්‍රධානම ප්‍රශ්නය වශයෙන් අපි හඳුනා ගත්තේ, ගල් අඟුරුවල තිබෙන කළු පාට කුඩා අංශු - dust එක - සුළඟත් එක්ක විශාල වශයෙන් පැතිරිලා යන එකයි. මේ ගල් අඟුරු දහනය කිරීමෙන් පසු ඉතිරි වන අළු - "fly ash" කියා ඉහළින් නිකුත් වන අළු තිබෙනවා - පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි බලාගාරයේ අළු සහ ගල් අඟුරු ගබඩා කර ඇති ප්‍රදේශය වටා ආවරණ තාප්පයක් ඉදිකිරීමේ සැලසුමක් තිබුණා. නමුත් එය ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය මතු වුණේ. ගරු මන්ත්‍රීතුමනි, අපි දැනට මාස දෙකකට කලින් මුල් ගල් කියලා, කෝටි 150කට වැඩි මුදලක් වියදම් කරලා, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ අළු සහ ගල් අඟුරු සුළඟේ බලපෑමෙන් පරිසරයට විහිදී යෑම සියයට සියයකින්ම වළක්වන්න, බලාගාරයේ භූමියේ හතර පැත්තම ආවරණය වන පරිදි මීටර් 15ක් උස තාප්පයක් ඉදිකිරීමේ වැඩ කටයුතු පටන් ගත්තා. තව මාස 9කින් පමණ එම කටයුතු අවසන් කරන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. එතකොට නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි බලාගාරය සම්බන්ධයෙන් මතුවී තිබෙන එම ප්‍රශ්න විසඳෙනවා.

කුරු ගඟ සම්බන්ධයෙනුත් ඔබතුමා විටින් විට සඳහන් කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. කුරු ගඟ ආශ්‍රිතව සිදු කරන එම කටයුත්තේ අවසාන අදියරේ මතු වී තිබෙන පාරිසරික ගැටලු පිළිබඳව අපේ අවධානය යොමු කර තිබෙනවා. අප අමාත්‍යාංශය යටතේ තිබෙන සුනිත්‍ය බලශක්ති අධිකාරිය මේ පිළිබඳව ගවේෂණය කර, පරිසරයට හානිකර බලපෑම් මතු කරන දේවල් වළක්වන්න කටයුතු කරනවා. අපේ ලාභයට වඩා පාඩුව වැඩියි නම්, ඉදිරියේදී එවැනි බලාගාර ඉදිනොකරන්න අපි අදහස් කර තිබෙනවා.

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)
ගරු කථානායකතුමනි, මටත් කාරණයක් අහන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජේතුංග මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීම් ගොඩාක් තිබුණා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේක ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක් නිසා, එතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න ඔබතුමා කැමතිද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමාට ප්‍රශ්නය අහන්න කියන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජේතුංග මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)
ගරු කථානායකතුමනි, කුරු ගඟ පිළිබඳව තිබෙන මේ ප්‍රශ්නය පිළිබඳව අපි වග කිවයුත්තන්ට හතර පස් වතාවක්ම කිව්වා. දේශපාලනඥයෝ තමයි මේ ප්‍රශ්නය පිටුපස ඉන්නේ. මේ වන විටත් කුරු ගඟ විනාශ වෙලා ඉවරයි. ඒ ගඟේ සිටි මත්ස්‍ය වර්ග, සත්ව වර්ග විනාශ වෙලා ගිහින් තිබෙනවා. නාය යෑම් පවා සිදුවෙන්න පටන්ගෙන තිබෙනවා. නමුත් මේ ක්‍රියාවලිය තවමත් කෙරිගෙන යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
[බාධා කිරීමක්] එතුමා පසුව ඒ ගැන පැහැදිලි කරාවි, ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්න අංක 9 -393/'18- (2), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම මම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා : කාර්යාල හා පෞද්ගලික කාර්ය මණ්ඩලය

### அரச நிருவாக, முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சர்: அலுவலகங்கள் மற்றும் பிரத்தியேகப் பதவியணி

MINISTER OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT AND LAW AND ORDER : OFFICES AND PERSONAL STAFF

462/'18

**10. ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) 2015 සිට 2017 වර්ෂය දක්වා ගෙවා ඇති මුළු කුලී/ බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரச நிருவாக, முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சரின் அமைச்சு அலுவலகங் களின் முகவரிகள் யாவை என்பதையும்;

(ii) அந்த அலுவலகங்களுக்காக வாடகை அல்லது குத்தகை செலுத்தப்படின் அந்த மாதாந்த வாடகை/ குத்தகை தொகை எவ்வளவென் பதையும்;

(iii) 2015 - 2017 ஆம் ஆண்டு வரை செலுத்தப் பட்டுள்ள மொத்த வாடகை/ குத்தகைத் தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அமைச்சரின் பிரத்தியேக பதவியணியின் உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) அந்த பிரத்தியேக பதவியணிக்கு ஒதுக்கப்பட்ட வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அமைச்சருக்காக ஒதுக்கப்பட்டுள்ள வாகனங் களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Management and Law and Order:

(a) Will he inform this House-

(i) the addresses of ministerial offices of the Minister of Public Administration and Management and Law and Order;

(ii) if rent or lease is paid for the said offices, the monthly rental/lease; and

(iii) the total rent/lease paid from the year 2015 up to the year 2017?

(b) Will he also inform this House-

(i) the number of officials in the personal staff of the Minister;

(ii) the number of vehicles allocated to the said personal staff; and

(iii) the number of vehicles allocated to the Minister?

(c) If not, why?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Law and Order)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයම මීට පෙරත් අහලා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, ගරු ඇමතිතුමනි. ඒ මේ ප්‍රශ්නය නොවෙයි, වෙනත් ප්‍රශ්නයක්. මෙහිදී මට නිශ්චිතව දැනගන්න අවශ්‍ය වන්නේ, මෙම ප්‍රශ්නයේ (අ) හි (iii) වන කොටසට සහ (ආ) හි (i) වන කොටසට පිළිතුරයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ලිපිනය: රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

(ii) එම කාර්යාලය වෙනුවෙන් කුලී හෝ බදු ගෙවීමක් සිදු නොකරයි.

(iii) බදු හෝ කුලී ගෙවා නොමැත.

(ආ) (i) පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව

| අංකය | තනතුරු නාමය | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පෞද්ගලික ලේකම් | 1 |
| 2 | සම්බන්ධීකරණ ලේකම් | 2 |
| 3 | මාධ්‍ය ලේකම් | 1 |
| 4 | මහජන සම්බන්ධතා නිලධාරී | 1 |
| 5 | පුද්ගලික සහකාර | 1 |
| 6 | කළමනාකරණ සහකාර | 5 |
| 7 | කාර්යාල කාර්ය සහායක | 2 |
| 8 | රියැදුරු | 8 |
| එකතුව | | 21 |

(ii) පෞද්ගලික කාර්ය මණ්ඩලයට වෙන් කර ඇති වාහන පිළිබඳ තොරතුරු

| තනතුර | වාහන සංඛ්‍යාව | වාහන අංකය |
|---|---|---|
| පෞද්ගලික ලේකම් | 01 | KU - 7910 |
| සම්බන්ධීකරණ ලේකම්වරු දෙදෙනා සඳහා | 02 | PC - 5366 |
| | | KQ - 0515 |
| මහජන සම්බන්ධතා නිලධාරී | 01 | PH - 1232 |
| මාධ්‍ය ලේකම් | 01 | PC - 8073 |
| අමාත්‍ය කාර්යාලය සඳහා වෙන් කර ඇති සංචිත වාහන 03කි. | | PH - 1233 |
| | | KW - 7148 |
| | | PD - 8044 |

(iii) 03කි.

වාහන අංක :- 1. CAS 9594 2. KX-5715
3. CAD 7194

(ඇ) අදාළ නොවේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය ධුරයත්, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය ධුරයත් වශයෙන් අමාත්‍ය ධුර දෙකක් දරනවා. ඔබතුමා ඒ අමාත්‍ය ධුර දෙකට කාර්ය මණ්ඩල දෙකක් පවත්වා ගෙන යනවාද, නැත්නම් එක කාර්ය මණ්ඩලයද ඉන්නේ කියා මම දැනගන්න කැමැතියි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයත්, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයත් මුලදී වෙන් වෙන් වශයෙනුයි තිබුණේ. එම අමාත්‍යාංශ දෙක වෙනම නිබියදී කාර්ය මණ්ඩල දෙකක් සිටියා. දැන් මෙම අමාත්‍යාංශ දෙකම එක අමාත්‍යාංශයක් කර තිබෙනවා. එම නිසා ඒ අමාත්‍යාංශ දෙක සඳහාම දැන් එක කාර්ය මණ්ඩලයයි සිටින්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය මම අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමාගේ දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, පොලිස් ආරක්ෂක සහායකයන් පොලිස් සේවයට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් මම සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කළ අවස්ථාවේ -මීට මාස එකහමාරකට කලින් - සතියක් ඇතුළත එය ඉටු කරනවාය කියා නියෝජ්‍ය අමාත්‍යතුමා පොරොන්දු වුණා. නමුත්, තවම ඒ වැඩ කටයුතු සිද්ධ වෙලා නැහැ. මොකක්ද මේ තිබෙන ප්‍රමාදය? ඔබතුමන්ලා ඒ වැඩ කටයුතු නිම කරන්නේ කවදාද කියා මම දැනගන්න කැමැතියි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඒ සම්බන්ධව අවශ්‍ය තීරණ අරගෙන මම කැබිනට් පත්‍රිකාවකුත් ඉදිරිපත් කළා. ඒ සඳහා කැබිනට් මණ්ඩලයේත් අනුමැතිය ලැබී තිබෙනවා. ඒ අවශ්‍ය කටයුතු දැන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ අනුව, ඉතා ඉක්මනින් ඒ අයව පොලිස් සේවයට බඳවා ගන්න කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

## ඌව පළාත් සභාවේ අක්‍රමිකතා: විගණකාධිපති වාර්තාව

**ஊவா மாகாண சபையில் இடம்பெற்ற முறைகேடுகள்: கணக்காய்வாளர் தலைமையதிபதியின் அறிக்கை**

MALPRACTICES IN UVA PROVINCIAL COUNCIL: REPORT BY AUDITOR-GENERAL

474/'18

**11. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් අංක SIN/B/AG/KI/2017/02 හා 2017.04.20 දිනැති විමර්ශන වාර්තාවක් ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති අතර එම වාර්තාවේ පළාත් පාලන ආයතන

[ගරු චමින්ද විජේසිරි මහතා]

මඟින් පාසල් පොත් බෙදා හැරීම සම්බන්ධව අනාවරණය කර ඇති ඡේද අංක 6 (අ) (i) සිට (iii) දක්වා කරුණු;

(ii) එම අනාවරණයන්ට අදාළව (ආ) (i) සිට (vi) දක්වා සිදු කර ඇති නිරීක්ෂණය කර ඇති කරුණු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

මාකාණ සපෙකළ්, උළ්ලූරාට්චි මට්රුම් විළෙයාට්ටුත් තුරෙ අමෙච්චරෛක් කේට්ට විනා:

(අ) (i) ඌවා මාකාණ සපෙයිල් නටෙපෙට්රුළ්ළ මට්රුම් නටෙපෙට්රුක්කොණ්ටිරුක්කුම් මුරෙ කේටුකළ් තොටර්පාක කණක්කාය්වාළර් තලෛමෙයතිපතියිනාල් SIN/B/AG/KI/2017/02 ආම් ඉලක්ක මට්රුම් 2017.04.20ආම් තිකතිය පුලනාය්වු අරික්කෛයිල් උළ්ලූරාට්චි නිරුවනඞ්කළින් මූලම් පාටචාලෛ පුත්තකඞ්කළ් විනියෝකික්කප් පට්ටමෛ තොටර්පාක වෙළිප්පටුත්තප්පට්ටුළ්ළ 6 (අ) (i) තොටක්කම් (iii) වරෙයාන පන්තිකළිල් එටුත්තුක්කාට්ටප්පට්ටුළ්ළ විටයඞ්කළෛ ඉච් සපෙයිල් සමර්ප්පිප්පාරා;

(ii) ඉන්ත වෙළිප්පටුත්තල්කළ් තොටර්පිල් (ආ) (i) තොටක්කම් (vi) වරෛ මේට්කොළ්ළප්පට්ටුළ්ළ අවතානිප්පුකළෛච් සමර්ප්පිප්පාරා;

එන්පතෛ අවර් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House-

(i) whether he will submit to this House the matters incorporated in paragraph 6(a) (i) up to (iii), which make revelations related to the distribution of school textbooks by local government bodies, in the investigation report No. SIN/B/AG/KI/2017/02 dated 20.04.2017 sent by the Auditor General to the Chief Secretary of Uva Province in regard to the malpractices that are occurring and have occurred in Uva Provincial Council; and

(ii) whether he will submit the observations made in (b) (i) to (vi) in regard to the aforesaid revelations?

(b) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

උඟව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදු වෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් අංක SIN/B/AG/KI/2017/02 හා 2017.04.20 දිනැති විමර්ශන වාර්තාවක් උඟව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති අතර, එම වාර්තාවේ පළාත් පාලන ආයතන මඟින් පාසල් පොත් බෙදා හැරීම සම්බන්ධව අනාවරණය කර ඇති ඡේද අංක 6(අ)(i) සිට (iii) දක්වා කරුණු ඇමුණුම අංක 01 මඟින් දක්වා ඇත.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, ඇමුණුම අංක 01 කියවන්න පුළුවන්ද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

පුළුවන්. මේ යවා තිබෙන වාර්තාවේ අනාවරණ තමයි ඇමුණුම අංක 01හි දක්වා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. මම එය කියවන්නම්.

"6. පළාත් පාලන ආයතන මඟින් පාසල් පොත් බෙදා හැරීම.

(අ) බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන මඟින් මිලදීගෙන බෙදා හරින ලද පෙර පාසල් පොත් බෑග් සම්බන්ධයෙන් මොනරාගල හා බදුල්ල විගණන උපකාර්යාල විසින් UVP/MG/B/මොපපා/05/15/24 හා UVP/BDIE/CLG/2016/67 විගණන විමසුම් මඟින් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණයන්ට අමතරව පහත සඳහන් අනාවරණ කරනු ලැබේ.

(i) බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 17ක් විසින් තම බල ප්‍රදේශවල පෙර පාසල් දරුවන්හට බෙදා දීම සඳහා තම සභා අරමුදලින් පාසල් බෑග් 13,388ක් රු. 3,059,987ක් වැය කර මිලදී ගෙන තිබූ අතර, එම බෑග් බෙදා දීම සඳහා පැවැති උත්සව වෙනුවෙන් රු. 1,113,121ක මුදලක් වැය කර තිබුණි. එම මුදල වැය කළ ආකාරය පිළිබඳ විස්තර ඇමුණුම අංක 03හි දැක්වේ.

(ii) තවද, 2015/2016 වර්ෂවලදී මොනරාගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 10ක් විසින් තම බල ප්‍රදේශය තුළ පෙර පාසල් දරුවන්හට බෙදා දීම සඳහා ඒ ඒ ප්‍රාදේශීය සභා අරමුදලින් පාසල් බෑග් 9,007ක් රු. 1,947,500ක් වැය කර මිලදී ගෙන තිබූ අතර, එම බෑග් බෙදා දීම සඳහා පැවැති උත්සව වෙනුවෙන් රු. 422,473ක මුදලක් ඒ ඒ සභා අරමුදල්වලින් දරා තිබුණි. එම විස්තර ඇමුණුම අංක 04හි දැක්වේ.

(iii) මොණරාගල හා බදුල්ල විගණන උපකාර්යාල විසින් UVP/MG/B/මොපපා/05/15/24 හා UVP/BDIE/CLG/2016/67 විගණන විමසුම් මඟින් ඉහත මිලදී ගැනීම් සම්බන්ධයෙන් නිරීක්ෂණයන් දක්වා ඇත."

ඒ නිරීක්ෂණයන් ඇමුණුම් 02හි සඳහන් වෙනවා. නිරීක්ෂණයන් ගැන කථා කරනකොට ඒක මෙම ප්‍රශ්නයේ (අ) (ii) කොටසට තමයි අදාළ වෙන්නේ.

(ii) ඔව්. ඉහත සඳහන් අනාවරණයන්ට අදාළව (ආ)(i) සිට (vi) දක්වා සිදු කර ඇති නිරීක්ෂණ ඇමුණුම් 02 මඟින් දක්වා ඇත. ඇමුණුම් 02 **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඇමුණුම් 02 කියවන්න.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ඇමුණුම් 02හි මෙසේ සඳහන් වෙනවා:

"(ආ) ඉහත අනාවරණයන්ට අනුව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බදුල්ල දිස්ත්‍රික්කයේ පෙර පාසල් දරුවන්ගේ බෑග් මිලදී ගැනීම සඳහා 2015/2016 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන විසින් එකතුව රුපියල් 3,059,175ක් දරා තිබුණු අතර, එම පෙර පාසල් බෑග් බෙදා දීමේ උත්සව හා සංග්‍රහ කටයුතු වෙනුවෙන් එකතුව රුපියල් 1,160,867.25ක වියදමක් දරා තිබුණි. ඒ අනුව පාසල් බෑග් වියදමට සාපේක්ෂව උත්සව සංග්‍රහ වියදම් සඳහා සියයට 38ක වියදමක් දරා ඇති බව නිරීක්ෂණය කරනු ලැබේ.

(ii) මොණරාගල දිස්ත්‍රික්කයේ පෙර පාසල් දරුවන්ගේ බෑග් මිලදී ගැනීම සඳහා එකතුව රුපියල් 1,947,500ක් දරා තිබුණු අතර එම බෑග් බෙදා දීමේ උත්සව හා සංග්‍රහ කටයුතු වෙනුවෙන් එකතුව රුපියල් 427,473ක වියදමක් දරා තිබුණි. ඒ අනුව පාසල් බෑග් මිලදී ගැනීමේ වියදමට සාපේක්ෂව උත්සව සංග්‍රහ වියදම් සඳහා සියයට 22ක වියදමක් දරා ඇති බව නිරීක්ෂණය කරනු ලැබේ.

(iii) බදුල්ල දිස්ත්‍රික්කයේ හා මොණරාගල පළාත් පාලන ආයතන 28ක පාසල් බෑග් සඳහා වියදම හා එම බෑග් බෙදා දීම සඳහා උත්සව වියදම් සැසඳීමේදී බදුල්ල ප්‍රාදේශීය සභාව මඟින් බෑග් සඳහා රුපියල් 137,500ක් ද, උත්සවය සඳහා රුපියල් 199,800ක් ද දරා තිබුණි. ඒ අනුව සියයට 145ක උත්සව වියදම් දැරීමක් නිරීක්ෂණය කරනු ලැබේ. ..."

නිරීක්ෂණ කාරණා තමයි ඒවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න දෙක අහන්න.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
හොඳයි. අතුරු ප්‍රශ්න අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වන්න ඕනෑ. ඔබතුමා නිසා තමයි මෙය සිදු වෙන්නේ. අවුරුදු ගණනාවක් තිස්සේ මේ ප්‍රශ්නයට පිළිතුර සභාගත වුණා. තව බොහෝ දෙයක් කියන්න තියෙන නිසා මම කාලය ගත්තා.

ගරු කථානායකතුමනි, පෙර පාසල් යන්නේ අපේ පුංචි දරුවෝ. මේ දරුවන්ට බෑග් ලබා දීමේදී බෑග්වලට වඩා වියදමක් සංග්‍රහ වියදම් සහ උත්සව වියදම් සඳහා දරා තියෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, මේ කාරණය ඔබතුමියටත් තේරෙනවා ඇති. සංග්‍රහ වියදම් සහ උත්සව වියදම් සඳහා සියයට 145ක වියදමක් දරා තියෙනවා. මේ වනකොට මේ සම්බන්ධව විගණනයට ලක් වෙලා තියෙනවා. මෙවැනි දැවැන්ත අපරාධයක් සිද්ධ වෙලා තිබෙනවා. මේ අධිභාරයට ලක්වූ මුදල් නැවත අය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් ඇති කිරීමට හෝ මේ කටයුත්ත කරපු ප්‍රධාන ඇමතිවරයා සම්බන්ධයෙන් කටයුතු කිරීමට පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශය හරහා ඔබතුමියට හෝ වර්තමාන රජයට හැකියාවක් තිබේද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මන්ත්‍රීතුමනි, මේ වනකොට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මෙම කාරණය පරීක්ෂාවට ලක් කරනවා. ඒ අනුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මේ සම්බන්ධයෙන් තීරණයක් ගන්න පුළුවන්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නයට එතුමිය හොඳ මාවතක් හැදුවා. මේ ප්‍රශ්නය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී පරීක්ෂාවට ලක් වුණා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළ මේ ප්‍රශ්නයට හාස්‍යජනක පිළිතුරක් තමයි ලැබුණේ, ගරු කථානායකතුමනි. මම ඒ කමිටුවට සහභාගි වුණා. මම එහි නියෝජිතයෙක් නොවෙයි. මෙහිදී "හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ වැඩක්" වුණේ, ගරු කථානායකතුමනි. යම් ගනුදෙනුවක් සම්බන්ධව අධිභාරයකට ලක් වෙලා තිබුණා නම්, ඒ අධිභාරය නොසලකා හැරීමේ බලය ප්‍රාදේශීය සභා පනත අනුව විෂය භාර ඇමතිවරයා සතුව තිබෙනවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට සම්බන්ධ වුණු උෑව පළාතේ රාජ්‍ය නිලධාරි දීපු පිළිතුර තමයි මම කලින් සඳහන් කළ පරිදි අධිභාරයට ලක් වෙලා තිබෙනවා කියන එක. ඒක අයින් කරන්නට කටයුතු කළා. නමුත් ගරු කථානායකතුමනි, ඒක අධිභාරයට ලක් වෙලා නැහැ. අධිභාරයට ලක් කිරීම සඳහා තින්දුවක් ගැනීම තිබෙන්නේ විගණකාධිපතිතුමා සතුවයි. විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඒකට සහභාගි වෙලා තිබේද්දිත්, "අධිභාරය" කියන කාරණය නොසලකා එය පන්නලා ගියා.

ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය වන්නේ මෙයයි. මම යෝජනා කරනවා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා ප්‍රමුඛ නිලධාරින් මෙම මහා මූල්‍ය වංචාව වසා ගැනීම වෙනුවෙන් කාගේ හෝ බලපෑමකට යටත්ව මෙම කටයුත්ත යටගැස්සුවා කියා. මොකද, අල්ලස් හෝ දූෂණ කටයුත්තකට විරුද්ධව පාර්ලිමේන්තුවේ අපේ මන්ත්‍රීවරුන් අට දෙනෙක් සම්බන්ධව චෝදනා ගොනු කළා. රජයේ කාගේ හෝ ඉහළ නිලධාරියෙකුගේ බලපෑමක් අනුව එම විමර්ශන කටයුතු නවත්වලා තිබෙනවා කියන කාරණය මම යෝජනා කළොත් ඔබතුමිය පිළිගන්නවාද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ඒ යෝජනාව ගැන මම දන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමිය, ඔබතුමිය මේ ගැන සොයා බලන්න.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(මාණ්ඩලික (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මේ වන විට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාකච්ඡාවට ලක් වුණු කාරණයක් මෙය. ප්‍රශ්නයක් තිබෙනවා නම් අපට ඒ ගැන සොයා බලන්න පුළුවන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩලික சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඒ කාරණාව ගැන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව දැනුවත් කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(මාණ්ඩලික சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ ඉල්ලීම අනුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු වුණා. යොමු වීම තුළ ගරු කථානායකතුමනි, හාස්‍යජනක සිදුවීමක් සිදු වුණා. සාමාන්‍යයෙන් පළාත් පාලන අමාත්‍යවරයාට බලය තිබෙනවා, යම් අධිභාරයක් තිබුණොත් ඒක නොසලකා හරින්න. හැබැයි, මේක අධිභාරයට ලක් වෙලා නැහැ. ඇයි? මේක අධිභාරයට ලක් කරන්න බැහැ, ගරු කථානායකතුමනි. මේක ප්‍රධාන ඇමතිවරයා විසින්ම එතුමාගේ උපදෙස් පත්‍රිකාව සහ උපදෙස් මාලාව අනුව සිදු වෙන වංචාවක්. එතකොට ඔහුම මේක හොරකම් කරන්න කියා, ඔහුම මේක නොසලකා හරිනවා කියන එක සදාචාර සම්පන්න නැහැ; නීතිගරුකත් නැහැ. හැබැයි, එතැන ඉන්න සියලු නිලධාරීන් මෙය පිළිගත්තා, අධිභාරයක් සේ සලකා කටයුතු කර නොසලකා හරින්න. ඕනෑ නම් ඒ පිළිබඳ වාර්තාත් තිබෙනවා. හැබැයි, මේ වෙන විටත් මේක අධිභාරයට ලක් වෙලා නැහැ. හැබැයි, ඒ තීන්දුව ඔබතුමියගේ හෘදය සාක්ෂියට එකඟව බැලුවොත් නීතිගරුක නැහැ නේද? වැදගත් වූ, බුද්ධිමත් වූ ඇමතිවරියක් ඔබතුමිය. නීතීඥවරියක් හැටියට මා ඔබතුමියට කියනවා, මේ රටේ මූල්‍ය වංචාවන් හා අවභාවිත කිරීම පිළිබඳ වසන් කිරීම සාධාරණ ද කියා ඔබතුමියගේ හෘදය සාක්ෂියට අනුව කියන්න කියා.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(මාණ්ඩලික (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමා, අධිභාරයට ලක් වෙලා නැත්නම් ඒ ගැන තීන්දුවක් දෙන්න මට මේ අවස්ථාවේ හැකියාවක් නැහැ. ඒක ආයතනයෙන් ගන්න ඕනෑ තීරණයක්. ඒ වාගේම වංචාවක් වෙලා තිබෙනවා නම් මේ රටේ අපරාධ නීතිය අනුව වෙනම ක්‍රියා කරන්න පුළුවන්කමක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩලික சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි.

## 2017 ඇති වූ ගංවතුර හා නායයාම්: වන්දි
## 2017இல் ஏற்பட்ட வெள்ளப்பெருக்கு மற்றும் மண் சரிவு: இழப்பீடு
FLOODS AND LANDSLIDES IN 2017 : COMPENSATION

526/'18

**12. ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2017 වර්ෂයේ ඇති වූ ගංවතුර හා නායයාම්වලින් අගතියට පත් පවුල්වලට ලබාදෙන බවට ප්‍රකාශ කරන ලද රක්ෂණ වන්දි මුදල එම පවුල්වලට ලැබී තිබේද;

(ii) 2016 වර්ෂයේ ගංවතුර ඇතිවූ අවස්ථාවේදී හානි වූ නිවසකට උපරිමය ලක්ෂ 25 දක්වා රක්ෂණ වන්දි මුදල් ලබාගත හැකි බව අග්‍රාමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළද, එකී ගංවතුරට ලක් වූ කොළොන්නාව, අංගොඩ, වැල්ලම්පිටිය, සේදවත්ත, කැළණිමුල්ල, පෑලියගොඩ, කඩුවෙල හා පහළ බෝමිරිය යන ප්‍රදේශයන්හි පිහිටි කිසිදු නිවසකට මේ දක්වා එබඳු රක්ෂණ වන්දි මුදලක් ලැබී නොමැති බව පිළිගන්නේද;

(iii) 2016 හා 2017 වර්ෂවලදී විපතට පත්වූවන්ගේ හානි වූ නිවාස තක්සේරු කර රක්ෂණ වන්දි මුදලක් හෝ කවර හෝ වන්දි මුදලක් ගෙවීමට පියවර ගනු ලබන දිනය කවරේද;

(iv) හානිවූ නිවාස සඳහා මේ වන විට යම් වන්දි මුදලක් ගෙවා ඇත්නම්, එසේ වන්දි ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(v) එම රක්ෂණ මුදල් ගෙවා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

*நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:*

(அ) (i) 2017ஆம் ஆண்டில் ஏற்பட்ட வெள்ளப்பெருக்கு மற்றும் மண் சரிவினால் பாதிக்கப்பட்ட குடும்பங்களுக்கு வழங்கப்படுமென அறிவிக்கப் பட்ட காப்புறுதி இழப்பீட்டுத் தொகை அக்குடும்பங்களுக்குக் கிடைத்துள்ளதா என்பதையும்;

(ii) 2016ஆம் ஆண்டில் வெள்ளப்பெருக்கு ஏற்பட்ட போது சேதமடைந்த வீடு ஒன்றுக்கு அதிக பட்சம் ரூபா 25 இலட்சம்வரை காப்புறுதி இழப்பீட்டுத் தொகையைப் பெற்றுக்கொள்ள முடியுமெனப் பிரதம அமைச்சரினால் பாராளு மன்றத்தில் அறிவிக்கப்பட்டபோதிலும், அந்த வெள்ளப்பெருக்கினால் பாதிக்கப்பட்ட கொலொன்னாவ, அங்கொட, வெல்லம்பிட்டிய, சேதவத்த, களனிமுல்ல, பேலியகொட, கடுவலை மற்றும் பஹல போமிரிய ஆகிய பிரதேசங்களில் அமைந்துள்ள எந்தவொரு வீட்டுக்கும் இதுவரை அக்காப்புறுதி இழப்பீட்டுத் தொகை கிடைக்க வில்லையென்பதை ஏற்றுக்கொள்வாரா என்ப தையும்;

(iii) 2016 மற்றும் 2017ஆம் ஆண்டுகளில் பாதிக்கப் பட்டவர்களின் சேதமடைந்த வீடுகளை விலை மதிப்புச் செய்து காப்புறுதி இழப்பீட்டுத் தொகையொன்றை அல்லது வேறு ஏதேனும் இழப்பீட்டுத் தெகையொன்றைச் செலுத்த நடவடிக்கை எடுக்கும் திகதி யாது என்பதையும்;

(iv) சேதமடைந்த வீடுகளுக்கு இன்றளவில் ஏதேனும் இழப்பீட்டுத் தொகை செலுத்தப்பட்டிருப்பின், அவ்வாறு இழப்பீடுபெற்ற குடும்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) அத்தகைய காப்புறுதி இழப்பீட்டுத் தொகை செலுத்தப்பட்டுள்ள பிரதேச செயலாளர் பிரிவு யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources and Disaster Management:

(a) Will he inform this House-

(i) whether the insurance payment promised to the families affected by floods and landslides that occurred in 2017, has been received by those families;

(ii) whether he admits that no household in the areas of Kolonnawa, Angoda, Wellampitiya, Sedawaththa, Kelanimulla, Peliyagoda, Kaduwela and Pahala Bomiriya that were affected by the said flood has received any such payment of insurance, even though the Prime Minister stated in Parliament that a maximum of Rs. 25 lakhs could be obtained as insurance payment for a house damaged during floods in 2016;

(iii) the date by which steps would be taken to pay insurance payment or any other compensation after valuation of the damaged houses of the victims in 2016 and 2017;

(iv) the number of families who received compensation, if any compensation has been paid for damaged houses by now; and

(v) the Divisional Secretaries' Divisions where such insurance has been paid?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

2017 මැයි මස සිදු වූ ගංවතුර හා නාය යෑමේ ආපදාවලින් විපතට පත්වූ, රජය මඟින් ක්‍රියාත්මක කරන ලද ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ රක්ෂණ හිමිකම ලැබීමට සුදුසු පවුල් 115,370ක් සඳහා වන්දි මුදල් ගෙවීමට කටයුතු කර ඇත. මීට අමතරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් ඉහත රක්ෂණාවරණ වැඩසටහන යටතේ හිමිකම් නොලැබූ පවුල් සඳහා අංක අමප/18/1088/809/029 දරන 2018.05.30 දිනැති "2017 වර්ෂයේදී ගංවතුර බලපෑමට ලක් වූ ගෘහ ඒකක සඳහා කරනු ලබන ගෙවීම් කඩිනම් කිරීම" මැයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව වන්දි ලබා දීමට කටයුතු කරමින් පවතී. (ඇමුණුම 01* මඟින් දක්වා ඇත.)

(ii) ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ ආවරණ වැඩසටහන යටතේ ස්වාභාවික ආපදාවකින් හානියට පත් නිවසකට හානි පූර්ණ මූලධර්මය යටතේ රුපියල් මිලියන 2.5ක් දක්වා රක්ෂණ වන්දි ලබා දිය හැකිය. හානියට පත් නිවාස හිමි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් විසින් පත් කරන ලද තාක්ෂණික නිලධාරියෙකුද ඇතුළත් කමිටුවක් මඟින් නිවාස හානි තක්සේරු කර අදාළ නිර්දේශ ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කරයි. ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් හානි පූර්ණ මූලධර්මය යටතේ රක්ෂණ හිමිකම් ගෙවීමට කටයුතු කරයි. ඒ අනුව 2016 වර්ෂයේ ගංවතුර හේතුවෙන් නිවාස හානි වූ කොළඹ දිස්ත්‍රික්කයේ පවුල් 20,304ක් සඳහා රක්ෂණ වන්දි මුදල් ගෙවා ඇත. (ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ගෙවා ඇති ආකාරය ඇමුණුම 02* මඟින් දක්වා ඇත.)

(iii) 2016 මැයි හා 2017 මැයි මාසවල සිදු වූ ගංවතුර හා නාය යෑම් හේතුවෙන් හානියට පත් නිවාස සඳහා ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ වන්දි මුදල් ලබා දී ඇත. 2016 වර්ෂයේ රක්ෂණ හිමිකම් ලැබූ 70,011කටද, 2017 වර්ෂයේ රක්ෂණ හිමිකම් ලැබූ 115,370කටද රක්ෂණ වන්දි මුදල් ලබා දී ඇත. (ප්‍රගතිය ඇමුණුම 03* හා 04* මඟින් දක්වා ඇත.) කොළොන්නාව හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වන්දි මුදල් නොලැබුණු බවට අභියාචනා ඉදිරිපත් වී ඇත. එම අභියාචනා පිළිබඳව පරීක්ෂා කර බලා රක්ෂණ ප්‍රතිලාභ ලැබීමට සුදුසු පවුල් තවදුරටත් හඳුනාගෙන වන්දි ගෙවීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

(iv) 2016 මැයි මාසයේ ඇති වූ ගංවතුර ආපදා තත්ත්වය සඳහා පවුල් 70,011කටද, 2017 මැයි මාසයේ ඇති වූ ගංවතුර හා නාය යෑමේ ආපදා තත්ත්වය සඳහා පවුල් 115,370කටද වන්දි මුදල් ලබා දී ඇත. (ඒ පිළිබඳ විස්තර ඇමුණුම් 03 සහ 04හි සඳහන් වේ.)

(v) 2016 වසරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 200කටද, 2017 වසරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 115කටද රක්ෂණ මුදල් ගෙවා ඇත. අදාළ පිළිතුර ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

(ආ) පැන නොනඟී.

ඇමුණුම් **සභාගත*** කරමි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු ඇමතිතුමනි, මේ කියන විස්තර සියල්ලක්ම ඇමුණුම්වල අඩංගු වන නිසා මම ඒවා පරීක්ෂා නොකර ඔබතුමාගෙන් හෝ අදාළ ඇමතිවරයාගෙන් අතුරු ප්‍රශ්න ඇසිය නොහැකියි. ඒ නිසා මේ ප්‍රශ්නය පදනම් කරගෙන ලැබුණු උත්තරයට ආනුෂංගිකව තවත් කරුණු මතු කිරීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා ඇමතිවරයාගේ අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා. පළමුවන කාරණය එයයි.

දෙවන කාරණය මෙයයි. මා මේ ප්‍රශ්නය අහන්න යෙදුණේ 2017 ජූනි 11වන දින "රාවය" පත්‍රයේ පළ වූ ලිපියක් නිසායි. ඒ ලිපියේ සඳහන් වූ කරුණු අනුව මේ කියන විධියට වන්දි ගෙවීම් කරලා නැහැ. නිවාස හානියට පත් වූ පුද්ගලයන්ගේ පින්තූර සමඟ ඔවුන්ගේ ප්‍රකාශයන් ඒ පත්‍රයේ පළ කරලා තිබෙනවා. ඒ පුවත් පත අදාළ ඇමතිතුමා වෙත යවා, ඒ පුවත් පතේ තිබෙන කරුණු ගැන තවදුරටත් අදහස් දැක්වීමක් එතුමාගෙන් ලබා ගැනීමට මම බලාපොරොත්තු වෙනවා. ඇමුණුම් කියවා බලා, පසුව මගේ ඊළඟ විමසීම කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## වයඹ පළාතේ ගුරුවරුන්ට ආපදා ණය ගෙවීම: විස්තර
## வடமேல் மாகாண ஆசிரியர்களுக்கான இடர்கடன்: விபரம்
## DISTRESS LOANS TO TEACHERS IN NORTH WESTERN PROVINCE : DETAILS

562/'18

**13. ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වයඹ පළාතේ සේවය කරන ගුරුවරු සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ගුරුවරුන්ට ආපදා ණය ගෙවීම සඳහා නිදහස් කර ඇති මුදල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) 2015 සිට මේ දක්වා ආපදා ණය ඉල්ලුම් කළ ගුරුවරුන් සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මේ වන විට ආපදා ණය ගෙවා ඇති ගුරුවරු සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) දැනට ආපදා ණය ගෙවා නොමැති ගුරුවරුන්ට එම ණය ගෙවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i)

| | කලාපය | කොට්ඨාසය | | සේවය කරන ගුරුවරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | කුරුණෑගල | 1 | කුරුණෑගල | 2,236 |
| | | 2 | මාවතගම | 1,097 |
| | | 3 | පොල්ගහවෙල | 980 |
| | | | **එකතුව** | **4,313** |
| 2 | ඉබ්බාගමුව | 4 | ගණේවත්ත | 456 |
| | | 5 | රිදීගම | 994 |
| | | 6 | ඉබ්බාගමුව | 1,022 |
| | | | **එකතුව** | **2,472** |
| 3 | ගිරිඋල්ල | 7 | අලව්ව | 1,275 |
| | | 8 | පන්නල | 1,118 |
| | | 9 | කුලියාපිටිය-නැගෙනහිර | 733 |
| | | | **එකතුව** | **3,126** |
| 4 | කුලියාපිටිය | 10 | බිංගිරිය | 657 |
| | | 11 | පඩුවස්නුවර | 663 |
| | | 12 | උඩුබද්දාව | 467 |
| | | 13 | දහනෙක්ගෙදර | 373 |
| | | 14 | කුලියාපිටිය -බටහිර | 1,231 |
| | | | **එකතුව** | **3,391** |
| 5 | මහව | 15 | ගල්ගමුව | 975 |
| | | 16 | ගිරිබාව | 467 |
| | | 17 | මහව | 1,117 |
| | | 18 | පොල්පිහිගම | 913 |
| | | | **එකතුව** | **3,472** |
| 6 | නිකවැරටිය | 19 | කොටවෙහෙර | 550 |
| | | 20 | නිකවැරටිය | 674 |
| | | 21 | කොබෙයිගනේ | 390 |
| | | 22 | වාරියපොළ | 1,228 |
| | | | **එකතුව** | **2,842** |
| 7 | හලාවත | 23 | නාත්තණ්ඩිය | 1,102 |
| | | 24 | වෙන්නප්පුව | 1,064 |
| | | 25 | ආරච්චිකට්ටුව | 395 |
| | | 26 | හලාවත | 1,191 |
| | | | **එකතුව** | **3,752** |
| 8 | පුත්තලම | 27 | පුත්තලම -දකුණ | 832 |
| | | 28 | කල්පිටිය | 848 |
| | | 29 | ආනමඩුව | 842 |
| | | 30 | පුත්තලම- උතුර | 1,148 |
| | | 31 | පල්ලම | 562 |
| | | | එකතුව | **4,232** |
| | | මුළු එකතුව | | **27,600** |

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of teachers serving in the North Western Province in respect of each educational division separately;

(ii) the amount of money that have been released to pay distress loans to the teachers from 2015 up to now;

(iii) the number of teachers who applied for distress loans from 2015 up to now in respect of each educational division separately;

(iv) the number of teachers to whom the distress loans have been paid by now in respect of each educational division separately; and

(v) the steps taken by the ministry to pay distress loans to teachers to whom the distress loans have not been paid up to now?

(b) If not, why?

(ii) පළාත් සභා පාසල් ගුරුවරුන් සඳහා,

| වර්ෂය | | | එකතුව |
|---|---|---|---|
| 2015 (රු.) | 2016 (රු.) | 2017 (රු.) | (රු.) |
| 197,699,811.00 (රු.මිලි.197.69) | 199,663,497.00 (රු.මිලි.199.66) | 219,750,342.84 (රු.මිලි.219.75) | **617,113,650.84 (රු.මිලි.617.11)** |

මධ්‍යම රජයේ පාසල් ගුරුවරුන් සඳහා,

| වර්ෂය | | | එකතුව |
|---|---|---|---|
| 2015 (රු.) | 2016 (රු.) | 2017 (රු.) | (රු.) |
| 59,796,765.00 (රු.මිලි.59.79) | 49,305,294.00 (රු.මිලි.49.30) | 72,003,522.92 (රු.මිලි.72) | **181,105,581.92 (රු.මිලි.181.10)** |

(iii)

| කලාපය | වර්ෂය | | | එකතුව |
|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | |
| කුරුණෑගල | 268 | 243 | 313 | **824** |
| ඉබ්බාගමුව | 148 | 138 | 129 | **415** |
| කුලියාපිටිය | 241 | 222 | 440 | **903** |
| ගිරිඋල්ල | 272 | 276 | 232 | **780** |
| නිකවැරටිය | 161 | 173 | 201 | **535** |
| මහව | 228 | 277 | 325 | **830** |
| හලාවත | 210 | 222 | 194 | **626** |
| පුත්තලම | 139 | 178 | 147 | **464** |
| එකතුව | **1,667** | **1,729** | **1,981** | **5,377** |

(iv)

| කලාපය | වර්ෂය | | | එකතුව |
|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | |
| කුරුණෑගල | 245 | 226 | 298 | **769** |
| ඉබ්බාගමුව | 163 | 171 | 157 | **491** |
| කුලියාපිටිය | 241 | 178 | 299 | **718** |
| ගිරිඋල්ල | 222 | 168 | 358 | **748** |
| නිකවැරටිය | 154 | 159 | 191 | **504** |
| මහව | 228 | 182 | 194 | **604** |
| හලාවත | 177 | 177 | 216 | **570** |
| පුත්තලම | 148 | 210 | 177 | **535** |
| එකතුව | **1,578** | **1,471** | **1,890** | **4,939** |

(v) ඔව්.

2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වයඹ පළාතේ ජාතික පාසල්වල ආපදා ණය ඉල්ලුම් කළ ගුරුවරුන් අතරින් ගෙවීමට නොහැකි වී ඇත්තේ ගුරුවරුන් 77දෙනෙකු සඳහා පමණි. එය ආපදා ණය ඉල්ලුම් කළ ජාතික පාසල් මුළු ගුරුවරුන් සංඛ්‍යාවෙන් 5%ක් පමණ වන අතර, මහා භාණ්ඩාගාරය මඟින් ලබා දෙන අක් මුදල් ප්‍රමාණවත් නොවීම සහ වර්ෂය අවසානයේදී ආපදා ණය ඉල්ලුම් කරන ප්‍රමාණය ඉහළ යාම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. ඉතිරි ගුරුවරුන් 77 දෙනාටද 2018 වර්ෂයේ ප්‍රතිපාදන මඟින් ආපදා ණය ගෙවීමට පියවර ගනී.

පළාත් සභා පාසැල්වල ආපදා ණය ඉල්ලුම් කළ ගුරුවරුන් අතරින් ගෙවීමට නොහැකි වී ඇත්තේ ගුරුවරුන් 361ක් සඳහා පමණි. එය ආපදා ණය ඉල්ලුම් කළ පළාත් පාසල් මුළු ගුරුවරුන් සංඛ්‍යාවෙන් 10%ක් පමණ වන අතර, පළාත් භාණ්ඩාගාරයෙන් ලබා දෙන අක් මුදල සහ ප්‍රතිපාදන මත ඉදිරි කටයුතු සිදු කරනු ලබයි.

(ආ) අදාළ නොවේ.

---

*[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]*
*[இந்த வினாவிற்கான விடை நூலகத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This reply is also placed in the Library.]*

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, අපේ වයඹ පළාත නියෝජනය කරන රටේ ගරු අධ්‍යාපන ඇමතිතුමා ඉතාම සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මේ පිළිතුරෙන් පස්සේ පළාත තුළ ගුරුවරුන් තුළ ඇති කර තිබෙන භිය එහෙම නැත්නම් ඔවුන් තුළ මතු වෙලා තිබෙන ප්‍රශ්නය නිරාකරණය වෙනවා. නමුත්, මෙතැන තිබෙන ප්‍රශ්නය වන්නේ, -අවස්ථා කිහිපයකදීම අපි මේ ගැන කථා කළා.- පළාත් සභාවයි, රේඛීය අමාත්‍යාංශයයි අධ්‍යාපන ක්ෂේත්‍රයේ බෙදීම -වෙන් කිරීම,- තුළ පළාත් සභා පාසල්වලින් සමාජයේ සමස්ත ගුරුවරුන්ට වැරදි මතයක් ගෙන යාමයි. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමාත් වයඹ පළාතේ ඉන්න නිසා මම ඔබතුමාගෙන් අහනවා, වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා මෙවැනි ප්‍රශංසනීය සේවයක් මේ ගුරුවරුන්ට සිදු කරද්දීත් ගුරුවරුන් අසන්තෝෂයෙන්, කලහකාරී විධියට, බොහොම දරදඬු විධියට එහෙමත් නැත්නම් හිතුවක්කාරී විධියට පාසල් පාලනය කරන්නේ ඇයි කියන එක.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, හිතුවක්කාර ලෙස හා කලහකාරී ලෙස යනුවෙන් අදහස් කරන්නේ මොකක්ද කියා පැහැදිලි කරනවා නම් හොඳයි.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු ඇමතිතුමනි, පළාත් සභා පාසැල්වල - විශේෂයෙන්ම වයඹ පළාතේ,- ගුරුවරු වැඩ කටයුතු කරන්නේ රජය දෝෂාරෝපණයට ලක් කරමින් බව ඔබතුමාත් දන්නවා. අපි මැදිහත් වෙලා මේ තත්ත්වය විසඳිය යුතුයි. එහෙම නැත්නම් දරුවන්ටයි අසාධාරණය සිදු වන්නේ. සමහර අවස්ථාවල මෙම ගුරුවරු පළාත තුළ ප්‍රසිද්ධියේ රජයට විරුද්ධව වැඩ කටයුතු කරනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, සමහර අවස්ථාවල මෙවැනි සිදුවීම් සිදු වන බවට අපටත් ආරංචි ලැබී තිබෙනවා. මම හැමදාම කියන කථාවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. විභාග පවත්වා iii වන ශ්‍රේණියේ විදුහල්පතිවරු 4,000ක් බඳවා ගත්තා. එයින් 3,000ක් පමණ තවම ඉන්නේ විදුහල්පතිවරු වශයෙන් නොවෙයි. ඔවුන් එක එක තැන්වල සේවය කරන්නේ. ඔවුන්ට පාසැල් ලබා දී නැහැ. වැඩ බලන ගුරුවරු තමයි ඉන්නේ. පසුගිය කාලයේ මේවා දේශපාලනීකරණය වෙලා තිබුණේ. ඒවා තවමත් ක්‍රියාත්මක වෙනවා වෙන්න ඇති. 'ළඟම පාසල-හොඳම පාසල' ව්‍යාපෘතිය තුළින් සම්පත් ලබා දී තිබියදී, 'සුරක්ෂා' වැනි රක්ෂණ ක්‍රම රජයෙන් ලබා දී තිබියදී, අධ්‍යාපනය වෙනුවෙන් මෙතරම් විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කරද්දී, මෙහෙම විවේචනය කරනවා නම් ඒක කරන්නේ හොඳ පරමාර්ථයෙන් නොවෙයි; කුහක සිතින්. [බාධා කිරීම්]

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

මන්ත්‍රීතුමන්ලා මේක අපහාසයට, උපහාසයට ගන්න එපා. මෙය රටේ දරුවෝ වෙනුවෙන් ඉදිරිපත් කරන ප්‍රශ්නයක්. හිටපු අධ්‍යාපන ඇමතිතුමා පළාත තුළ ඇති කරපු විනාශකාරී තත්ත්වය

[ගරු අශෝක ප්‍රියන්ත මහතා]

තමයි අද අධ්‍යාපන ඇමතිතුමාටත්, අපටත් විසඳන්න බැරි වෙලා තිබෙන්නේ. එතුමා සම්පූර්ණයෙන් පොහොට්ටුවේ දේශපාලනය කරලා, පළාත විනාශ කරලා ඒ පැත්තට ගිහින් තිබෙන්නේ. අනෙක් අය ඇදගෙන දහලන්න එපා. අධ්‍යාපන ඇමතිතුමාත්, මමත් නියෝජනය කරන පළාත නිසා, පළාත් අධ්‍යාපන ඇමතිතුමාත් සමඟ එකතු වෙලා රටට ආදර්ශයක් සපයන අන්දමින්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පළාත් පාසල්, ජාතික පාසල් කියලා බෙදීමට ලක් නොකර, මේ ප්‍රශ්න සමනය වන ක්‍රමවේදයකට, එහෙම නැත්නම් පාලනය වන ක්‍රමවේදයකට ගෙන යන්න කියා මම ඔබතුමාට යෝජනා කරනවා. ඔබතුමා කැමති නම් එම ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. නැතත් කමක් නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

## පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථාන: පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

## தொல்பொருளியல் முக்கியத்துவம் வாய்ந்த இடங்கள்: பதியத்தலாவை பிரதேச செயலாளர் பிரிவு

## PLACES OF ARCHAEOLOGICAL INTEREST: PADIYATALAWA DS DIVISION

991/'18

**14. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

උයර්කල්වි මට්‍රුම් කලාසාර අලුවල්කළ් අමෛච්සරෛක් කේට්ට වින්නා:

(අ) (i) අම්පාරෛ මාවට්ටත්තින් පතියත්තලාවෛ පිරතේස සෙයලාළර් පිරිවිල් අමෛන්තුළ්ළ අටෛයාළම් කාණප්පට්ට තොල්පොරුළියල් ඉටංකළින් එණ්ණික්කෛ මට්‍රුම් අවට්‍රින් පෙයර්කළ් යාවෛ;

(ii) අප්පිරිවිල් අකළ්වුකළ් මේට්කොළ්ළප්පටාත එනිනුම්, අටෛයාළම් කාණප්පට්ට තොල් පොරුළියල් ඉටංකළ් අමෛන්තුළ්ළනවා;

(iii) ආමෙනිල්, අවෛ යාවෛ;

(iv) මේට්පටි පිරිවිල් අමෛන්තුළ්ළ තොල් පොරුළියල් මුක්කියත්තුවම් වාය්න්ත රජමකා විකාරෛකළින් එණ්ණික්කෛ එව්වළවු; අතු පට්‍රිය අරික්කෛයොන්ට්‍රෛච් චමර්ප්පිප්පාරා;

(v) මේට්පටි තොල්පොරුළියල් ඉටංකළින් පේණල් නටවටික්කෛකළුක්කාක ඔතුක්කප්පට්ටුළ්ළ ඒට්පාටුකළ් පට්‍රිය මුළුමෛයාන අරික්කෛයොන්ට්‍රෛ ඉච්චපෛක්කුච් චමර්ප්පිප් පාරා;

එන්පතෛ අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Cultural Affairs:

(a) Will he inform this House-

(i) the number of archaeological sites that have been identified in Padiyatalawa Divisional Secretary's Division in Ampara District, along with their names;

(ii) whether there are any archaeological sites in the aforesaid division, which have been identified but excavations have not been done;

(iii) if so, the aforesaid archaeological sites;

(iv) the number of Rajamaha Viharas in the aforesaid division, which have an archaeological value; whether a report of them will be submitted; and

(v) whether a comprehensive report of the allocations made for the conservation activities of the aforesaid archaeological sites will be submitted to this House?

(b) If not,why?

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education and Cultural Affairs)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 25.

ස්ථාන නාමාවලිය ඇමුණුම් අංක 01හි දැක්වේ.

(ii) ඔව්.

(iii) ඇමුණුම් අංක 02හි දැක්වේ.

ඒක ටිකක් දීර්ඝ ලැයිස්තුවක්. නාමාවලිය අනුව හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන 25ක් තිබෙනවා. ඒ නාමාවලිය අමුණා තිබෙනවා. කැණීම් නොකරන ලද, එහෙත් හඳුනා ගත් පුරාවිද්‍යා ස්ථානත් තිබෙනවා. එහිත් ඇමුණුමක් තිබෙනවා. දීර්ඝ ලැයිස්තුවක් තිබෙන්නේ.

(iv) 04 යි.

ඔව්. ඇමුණුම් අංක 03හි දැක්වේ.

(v) 2018 වර්ෂය සඳහා වාස්තු විද්‍යා සංරක්ෂණයට අදාළව ප්‍රතිපාදන වෙන් වී නොමැත.

එහෙත් නඩත්තු කටයුතු යටතේ පදියදොර පුරාවිද්‍යා ස්ථානයේ පෙත් මං හා ස්මාරක අවට වැලි ඇතිරීම සඳහා රු. 84,760.00ක ප්‍රතිපාදන වෙන් වී ඇත. තවද, දිස්ත්‍රික්කය තුළ පුරා විද්‍යා ස්ථානයක් දැක්වෙන මාර්ග සංඥා පුවරු සැකසීම සඳහා රු. 2,477,255.00ක ප්‍රතිපාදන වෙන් වී ඇත.

ඒ හැර ප්‍රතිපාදන වෙන් වී නැහැයි කියලායි තිබෙන්නේ.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. ගරු කථානායකතුමනි, අම්පාර දිස්ත්‍රික්කය කියන්නේ ඓතිහාසික වශයෙන් වැදගත් වන පුරාවිද්‍යා ස්ථාන ගණනාවක් තිබෙන ඓතිහාසික භූමියක් බව මෑත කාලයේ අම්පාර දිස්ත්‍රික්කයට ගිය නිසා ඔබතුමා දන්නවා ඇති. පසුගිය කාලයේ රටේ මාධ්‍යවල කිහිප වතාවක් මේ පිළිබඳව වාර්තා පළ වුණා. මේ වෙලාවේ විෂය භාර අමාත්‍යවරයා හිටියා නම් හොඳයි කියන එකයි මගේ විශ්වාසය. නමුත් ඔබතුමාට උත්තරයක් දිය හැකිවේවි කියලා මම විශ්වාස කරනවා. අපි දන්නවා අම්පාර දිස්ත්‍රික්කයේ සමන්තුරේ, වලතාපිටිය කියන පුරාවිද්‍යා ස්ථානයට ආක්‍රමණයක් සිදු වුණු බව. ඒ අනුව ඒ පූජා භූමිය, ඒ පුරා විද්‍යා ස්ථාන විනාශයට පත්වෙලා තිබෙනවා. මේ පිළිබඳව ලිපි පළ වුණා. ඒ වාගේම අම්පාර දිස්ත්‍රික්කයේ මාණික්කාමඩුව, දීඝවාපිය කියන ස්ථානයේත් ඒ පූජාභූමිය සහ ඒ පුරාවිද්‍යා උරුමයන් තර්ජනයට ලක්වෙලායි තිබෙන්නේ. විටින් විට, විටින් විට එහි පුරාවිද්‍යා විනාශයන් සිදු වී තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒක සංවිධානාත්මකව සිදුවන දෙයක්. අනෙක් කාරණාව මේකයි. අම්පාර පදියතලාවට ආසන්න මඩකලපුව දිස්ත්‍රික්කයේ කෙවිලියාමඩුව හා මංගලගම ඓතිහාසික පුරාවිද්‍යා ස්ථාන විනාශවෙලා තිබෙන බවත් පසුගිය දවස්වල මාධ්‍යවලින් වාර්තා වුණා. ඒ විතරක් නොවෙයි, ඓතිහාසික මුහුදු මහා විහාරයට අයත් ඉඩම් අක්කර 700ක් තිබුණා. පසුගිය දවස්වල ඒ ඉඩමෙන් අක්කර 697ක ප්‍රමාණයක් ඓතිහාසික මුහුදු මහා විහාරයට අභිමිවෙලා තිබෙනවාය කියලා මාධ්‍යවල වාර්තා වුණා. ඒ කියන්නේ එයට අයත් භූමිය අක්කර 3ක් වැනි ප්‍රමාණයකට සීමා වන තරමට ඒ මුහුදු මහා විහාරයේ ඓතිහාසික පුරාවිද්‍යා උරුමය මේ රටට නැතිවෙමින් තිබෙන්නේ. මේ විධියට අම්පාර ගත්තත්, මඩකලපුව ගත්තත් එහෙමයි. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා නැහෙනහිර පළාතේ අරිසිමලේ ආරණ්‍ය සේනාසනය. මේ වන විට අරිසිමලේ ආරණ්‍ය සේනාසනයටත් ප්‍රකාශන බලපත්‍ර, ඔප්පු හදලායි තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි නැදුන්කර්නිවල පුරාවිද්‍යාත්මක ස්ථාන ගණනාවක් ඉතා සංවිධානාත්මකව නැතිවෙමින් තිබෙනවා. මූලතිව් ප්‍රදේශයේත් එහෙමයි. මම අහන්නේ මේ පිළිබඳව තමුන්නාන්සේලා මේ වන විට අරගෙන තිබෙන ක්‍රියා මාර්ග පිළිබඳව මේ පාර්ලිමේන්තුව දැනුවත් කළ හැකිද කියලායි. විශේෂයෙන් අම්පාර දිස්ත්‍රික්කයට අදාළව මා නම් කරලාම සඳහන් කළ ස්ථාන පිළිබඳව විෂය භාර අමාත්‍යවරයා නැති වුණත් ඔබතුමාට පිළිතුරක් දිය හැකිද?

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

ගරු කථානායකතුමනි, එයට පිළිතුරු ලබා දෙන ලෙස ගරු අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. කලින් මේ විෂයය භාරව හිටපු අමාත්‍යතුමා වශයෙන් එතුමා එයට පිළිතුරු ලබා දෙනවා ඇති.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මම කියා සිටින්නේ, ඇත්ත වශයෙන්ම 2009 යුද්ධය අවසන් වුණත් 2015 වන තෙක් ඒ ප්‍රදේශවල මෙම පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීමේ විධිමත් වැඩ පිළිවෙළක් තිබුණේ නැති බවයි. ගොඩක් ස්ථාන විනාශ වුණා. ඒවා බලා ගන්න පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් සේවකයන් සිටියේ නැහැ; ආරක්ෂක නියාමකවරුන් සිටියේ නැහැ.

අපි ඒ ප්‍රදේශවලම අය -250කට 300කට වැඩි පිරිසක්- බඳවාගෙන මේ වන කොට ඒ බොහෝ ප්‍රදේශවල ස්ථානගත කර තිබෙනවා. ඒ වාගේම ඒ ප්‍රදේශවල සංරක්ෂණ කටයුතු සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලින් වෙනදාට වඩා විශාල මුදල් ප්‍රමාණයක් පොම්ප කර තිබෙනවා. ගරු අමාත්‍යතුමා සිටියා නම් details සහිතවම ඒ ගැන දැනගන්න පුළුවන්කම තිබුණා. පසුගිය කාලයේ ගත් ක්‍රියා මාර්ග නිසා දැන් ඒ තත්ත්වය වෙනස් වෙමින් තිබෙන්නේ.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මේ කාරණාවට උත්තරයක් දෙන්න මැදිහත් වෙච්ච එක හොඳයි, කලින් මේ විෂයය ඔබතුමාට භාරව තිබුණු නිසා. දැන් ඔබතුමා කියූ ආකාරයට ඒ ප්‍රදේශවලින්ම නිලධාරීන් බඳවා ගෙන තිබෙනවා. නමුත්, පසුගිය සති දෙකකට කලින් මුහුදු මහා විහාරයේ ඓතිහාසික උරුමය නැවත විනාශයකට ලක් වෙලා තිබෙනවා. එසේ සිදු වූයේ පසුගිය සති දෙකකට ආසන්න කාලයේයි. මුහුදු මහා විහාරය කියන්නේ කුමන රජයක් ආවත් රැකිය යුතු උරුමයක්. මොකක්ද රජය, ඒ මේ රජයද, වෙනත් රජයක්ද, ආණ්ඩුව කරන්නේ කුමන දේශපාලනඥයන්ද කියන එක වැදගත් නැහැ. එය ඓතිහාසික උරුමයක්. ඒ උරුමය රැක ගන්න බැහැ කියන්නේ අප ලජ්ජා විය යුතු කාරණයක්. ඒ නිසා මා කියන්නේ, ඒ උරුමය රැක ගැනීම වෙනුවෙන් ගත් ක්‍රියා මාර්ග මොනවාද කියන එක ගැන මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න කියායි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, සති දෙකක් සම්බන්ධයෙන් නම් මා දන්නේ නැහැ. විෂයය භාර අමාත්‍යවරයා මා නොවෙයි. මධ්‍යම සංස්කෘතික අරමුදලේ සභාපතිවරයා විධියට ගරු අග්‍රාමාත්‍යතුමා ඒ කාලයේ අපට උපදෙස් දී තිබුණා, සියලු පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය කරන්න; ආරක්ෂා කරන්න කියා. ඒ නිසා මුහුදු මහා විහාරය ආශ්‍රිතව සංරක්ෂණ කටයුතු පටන් ගත්තා. ඔබතුමන්ලා දකින්න ඇති රුවන්වැලි මහා සෑයේ වැලි ඇතිරීම ආදී කටයුතු.

---

* *ප්‍රස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

ඒ වාගේම, කඩා වැටීමට ලක් වෙලා තිබුණු දීඝවාපිය පවා සංරක්ෂණය කරන්න උපදෙස් දී තිබුණා. මේ සති දෙක තුළ වෙච්ච දේවල් ගැන නම් මා දන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අපේ ගරු අමාත්‍යතුමා සිටින වේලාවක ඇහුවොත්, එතුමා ඒ ගැන කියාවි. පොදුවේ ගත්තොත්, පසුගිය කාලයට සාපේක්ෂව පුරා විද්‍යාත්මක ස්ථාන විශාල ප්‍රමාණයක් සංරක්ෂණය කරන්න, ආරක්ෂා කරන්න, නැවත නඟා සිටුවන්න මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ ප්‍රදේශවල විහාරස්ථානවල එදා පැවැති තත්ත්වය මොකක්ද? නැහෙනහිර පළාතේ සමහර ප්‍රදේශවල තිබුණු විහාරස්ථාන ස්වාමීන් වහන්සේනමක්වත් වැඩ ඉන්නේ නැති තත්ත්වයට එදා පත් වෙලා තිබුණා. ඒ විහාරස්ථානවල වැඩ වසන ස්වාමීන් වහන්සේලාට දානය නොලැබෙන නිසා පුරාවිද්‍යා සේවක මට්ටමින්ම වැටුප් හදා ඒ ස්ථානවල ස්වාමීන් වහන්සේලා ස්ථානගත කරන්න ඕනෑ කියන තීන්දුව -තීරණය- ගත්තා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු දයා ගමගේ මහතා (සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயா கமகே - சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Social Welfare and Primary Industries)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, විනාඩි 43ක් විතර ප්‍රමාද වෙලා තිබෙනවා. හොඳයි, ඔබතුමාගේ කාරණයත් කියන්න, ගරු අමාත්‍යතුමා.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ගරු කථානායකතුමනි, ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය ගැනයි මා කියන්නේ. අම්පාර, සමන්තුරේ පිහිටි වලතාපිටිය ප්‍රදේශය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් වූවක් ලෙස ලකුණු කර තිබුණේ නැහැ. එහි ඇතිවූ සිද්ධියෙන් පසුව අපි එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයිති කරගෙන ඒ පුද්ගලයන් ඉවත් කළා. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, ඔබතුමා කිව්වා, අම්පාර මාණික්කාමඩුව ප්‍රදේශයේ පූජා භූමිය ගැනත්. අප එම ස්ථානයත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අරගෙන එතැන චෛත්‍යයක් හදන්න කටයුතු කරනවා. ඇත්ත වශයෙන්ම කියනවා නම්, එදා ස්වාමීන් වහන්සේනමකට එහි බුදු පිළිමයක් තැන්පත් කරන්න ඉඩ දුන්නේ නැහැ. නමුත් අද ඒ බුදු පිළිමයත් තැන්පත් කරලා අනෙක් වැඩ කටයුතුත් කරගෙන යනවා. ඒ ඉඩමත් දෙන්න අපි කටයුතු කර තිබෙනවා. ඊළඟට, මුහුදු මහා විහාරය පිළිබඳ ප්‍රශ්නය ගත්තොත් එම ප්‍රශ්නය අද ඊයේ ආ එකක් නොවෙයි. සමහර පොඩි පොඩි ප්‍රශ්න දිගටම එනවා. නමුත් අප ජාතින් අතර ප්‍රශ්න ඇති කර ගන්නේත් නැතිව ඒ සෑම පුරාවිද්‍යා ස්ථානයක්ම ආරක්ෂා කරගෙන ඒවා සංරක්ෂණය කරනවා කියන එක විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න ඕනෑ. දීඝවාපිය සංරක්ෂණය කරන්නත් අපි විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ හැම වැඩ පිළිවෙළක්ම පසුගිය රජයට වඩා ඉතාම හොඳින් ඉදිරියට කරගෙන යනවා කියන එක මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### *"ජනබලය කොළඹට"* උද්ඝෝෂණයට ඇති බාධා
### *"ஜனபலய கொலம்பட்ட"* ஆர்ப்பாட்டத்துக்கான இடையூறுகள்
### OBSTRUCTIONS ON *"JANABALAYA KOLOMBATA "* DEMONSTRATION

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් මේ ප්‍රශ්නය නඟනවා.

ශ්‍රී ලංකාවේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී හා මූලික අයිතිවාසිකම්, මානව අයිතිවාසිකම් වෙනුවෙන් ඒ මහජනතාවගේ ගමනාගමනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික බස්රථ සේවාව පවතින බව හා ඒවා පවත්වාගෙන යෑම සුරක්ෂිත කිරීමට ආණ්ඩුව බැඳී සිටින බව සැම දෙනා දන්නා කාරණයක්. එහෙයින්,

1. සැප්තැම්බර් 1වන දින සිට සතියක කාලයක් මහජනතාවගේ ගමනාගමනයට හා මහජනතාව විසින් වෙන් කර ගෙන සිටින විශේෂ ගමනාගමන අවස්ථා සඳහා පෞද්ගලික බස් රථ ලබා නොදී අත්හිටුවීමට ආණ්ඩුව ගෙන ඇති ක්‍රියා මාර්ගය ඉහත සඳහන් අයිතිවාසිකම් යටතේ වැරදි හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක් බව පිළිගන්නවා ද?

   එම අත්හිටුවීමේ නියෝගය වහාම ඉවත් කිරීමට ආණ්ඩුව පියවර ගන්නවා ද?

2. ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී හා ජනතා විරෝධී ක්‍රියාවලට එරෙහිව සාමකාමීව, අවිහිංසාවාදීව කොළඹ නගරයේ පැවැත්වෙන "ජනබලය කොළඹට" සැප්තැම්බර් 5 උද්ඝෝෂණය සඳහා පැමිණෙන ජනතාවගේ අයිතියක් වන ප්‍රවාහන පහසුකම් වැළැක්වීමට ගෙන ඇති තීරණ ඉවත් කරනවාද ?

ගරු අගමැතිතුමනි, මේ වන විට රැස්වීමේ නිදහස පවා තහනම් කරන්නට මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් කටයුතු කරන්නට පටන්ගෙන තිබෙනවා. අප සඳහා කොළඹ නගරයේ වෙන් කරන ලද -ඒකාබද්ධ විපක්ෂය සහ කොළඹ නාගරික මන්ත්‍රීවරු සඳහා වෙන් කරන ලද- භූමි භාගවල රැස්වීමේ නිදහස උල්ලංඝනය කරමින් කටයුතු කිරීමට ඔබතුමන්ලා පටන් ගෙන තිබෙනවා.

එයට අතිරේකව ගරු කථානායකතුමාගේ යටතේ පවතින පාර්ලිමේන්තුවේ ආරක්ෂාව සඳහාය කියමින් වැලිකඩ පොලිසිය අධිකරණයට ගිහින් මහජනතාව එකතුවීම වළක්වන්න

නියෝගයක් ගන්න හදනවා. මහජනතාව රැස්වෙන එක වළක්වන්න හදනවා. "ජනබලය කොළඹට" නමින් පැවැත්වෙන උද්ඝෝෂණයට මහජනතාව කොළඹ නගරයට පැමිණීම වළක්වන්න කටයුතු කරනවා. අලුත්කඩේ උසාවියෙන් ඒ සඳහා අධිකරණ නියෝග ඉල්ලනවා. තවත් උසාවිවලින් නියෝග ඉල්ලනවා. ඇයි ඒ? අපි දන්නවා රජය භය වෙලා ඉන්න බව. මහජනතාවට රජය භයයි. ඒකයි පළමුවන කාරණය. නීතියක් රීතියක් යටතේ ගමනාගමනයට බලපත්‍රයක් දුන්නාම, මූලික අයිතිවාසිකම් යටතේ රැස්වෙන්න, ගමන් කරන්න, පෙළපාළි යන්න පිටිටනියකට බලපත්‍රයක් දුන්නාම ජනතාවට ඒ කටයුතු කරන්න අයිතිය තිබෙනවා.

මේ එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ මහ ලොකුවට "යහ පාලනය" ගැන දිවුරා පොරොන්දු වී ලෝකයට ප්‍රකාශ කරනවා. නමුත් ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා සහ රජය මේ මහා ජන ගංගාවට කොළඹට පැමිණීම සඳහා අවහිරතා ඇති කිරීමට ක්‍රියාවෙන් පටන් ගෙන තිබෙනවා. ඒ අවහිරතා ඉවත් කිරීමට කටයුතු නොකළොත් මේ ආණ්ඩුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන ප්‍රජාතන්ත්‍ර විරෝධී ආණ්ඩුවක් බවට හෙට දිනයේදී මහජනයා ඉදිරියේදී පත්වන බව ප්‍රකාශ කරමින් මේ අවස්ථාවේදී මේ ප්‍රශ්නයට පිළිතුරු ඉල්ලනවා.

මා ගරු කථානායකතුමාගෙනුත් අහනවා, ඔබතුමා පොලීසියට පැමිණිල්ලක් කළාද-

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ. නැහැ. මම කිසිම පැමිණිල්ලක් කරලා නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
-ඔබතුමාට පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න බැහැ කියලා?

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අසත්‍ය චෝදනා කරන්න එපා. ඒක ඉතාම අසාධාරණයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
වැලිකඩ පොලීසිය අධිකරණයට ගිහින් නියෝගයක් ඉල්ලනවා. මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බිය වී තිබෙන්නේ කුමකටද?

**කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ඔබතුමා අසත්‍ය දේවල් හදනවා. මම කිසිම පැමිණිල්ලක් කළේ නැහැ. එහෙම අසත්‍ය දේ කියන්න එපා. එහෙම අසාධාරණ වෙන්න එපා. ඔබතුමා හැම දාම මේ වාගේ අසත්‍ය චෝදනා කරනවා. [බාධා කිරීමක්] මම එහෙම එකක් කියලා නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මම නොවෙයි. වැලිකඩ පොලීසිය අසත්‍යයක් කියන්නේ කියලායි ඔබතුමා කියන්නේ. ඔබතුමා කියන්නේ වැලිකඩ පොලීසිය කියන්නේ අසත්‍යයක් කියලාද? [බාධා කිරීමක්]

වැලිකඩ පොලීසිය බොරුවට උසාවියට යන්නේ මොකටද?

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පොලීසියේ දේවල් ගැන මට චෝදනා කරන්න එපා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
පාර්ලිමේන්තුවෙන් පැමිණිල්ලක් නැත්නම්-

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවෙන් පැමිණිල්ලක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
පාර්ලිමේන්තුවෙන් පැමිණිල්ලක් නැත්නම් වැලිකඩ පොලීසිය කොහොමද උසාවියට ගිහින් කියන්නේ, "පාර්ලිමේන්තුවට අවහිර වෙනවා" කියලා? ගරු කථානායකතුමනි, අද ප්‍රජාතන්ත්‍රවාදය නමට විතරයි. අද බස් නැති ප්‍රජාතන්ත්‍රවාදයකට රට ඇවිල්ලා තිබෙන්නේ. විහිළුකාර ප්‍රජාතන්ත්‍රවාදයකටද රට ගෙනෙන්න හදන්නේ?

ගරු අග්‍රාමාත්‍යතුමනි, මා ස්ථාවර නියෝග 27(2) යටතේ ඇසූ මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. ආණ්ඩුවක් හැටියට ඔබතුමන්ලාට භයේ පැන යන්න වන බව අපි දන්නවා. ඒක ආණ්ඩුවට අනිවාර්යයෙන් වන දෙයක්. නමුත්, පිළිතුරු දෙන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Public Administration and Management and Law and Order)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, what is your point of Order?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඉරිදා පත්තරේක තිබෙනවා, "5වැනි දා ඒකාබද්ධය පාර්ලිමේන්තුව වටලයි" කියලා. අපි මෙතුමන්ලාට පැහැදිලිව කියනවා ගරු කථානායකතුමනි, අපි උද්ඝෝෂණවලට භය නැති බව. මෙතුමන්ලායි භය. පුළුවන් නම් උද්ඝෝෂණය පවත්වන තැන කියන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is not a point of Order. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වාඩි වෙන්න. [බාධා කිරීම්] Order, please!

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමනි, මාත් පැහැදිලි කිරීමක් කළ යුතුව තිබෙනවා. කථානායකවරයා හැටියට මම පොලීසියකටවත්, කාටවත් කිසිම දෙයක් කිව්වේ නැහැ. ඒක සම්පූර්ණ අසත්‍යයක්. නමුත් එතුමා සෑම අවස්ථාවකම මා එල්ල කරගෙනමයි ප්‍රකාශ කරන්නේ. මම ඒ ගැන කනගාටු වනවා. බොරු ගොත, ගොත අපහසුවට පත් කරන්න කටයුතු කරනවා. මම ඒ ගැන කනගාටු වෙනවා. පාර්ලිමේන්තුවේ මොකක් හෝ දෙයක් වුණාම දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා හැම දාම කථානායකවරයාගේ ඇඟට තමයි ඒවා දාන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, හෙට නිවාඩු දිනයක් නෙවෙයි. ඒ නිසා කණ්ඩායම් නගරයට එනවා; නගරයෙන් පිට වෙනවා. පාසල් දරුවන්, ශිෂ්‍යයන්, රජයේ සේවකයන් නගරයට එනවා. ඒ සියලුදෙනාටම ගමනාගමන පහසුකම් සැලසෙන ආකාරයට, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්ව හැටියට මහ ජනතාවගේ ගමනාගමනයට ඇති රාජ්‍ය හා පෞද්ගලික බස්රථ සේවාව අපි ආරක්ෂා කරන්න ඕනෑ. ඒ අයට හිරිහැර වන විධියට ඒ අයගේ ගමන් බිමන් අඩපණ කරන්න ඔබතුමන්ලාට වුවමනා නැහැනේ? ඒවා අඩපණ වෙන්න ඉඩ දෙන්න එපා කියලයි එතුමා කියන්නේ. ඊට වඩා මොකුත් කියලා නැහැ. දැන් මෙතැන කියන්නේ, ඒ සේවා අඩ පණ කරන්න කියලායි. මම දන්නේ නැහැ ඇයි මෙහෙම කියන්නේ කියලා.

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ "උපලේඛනය, 'අ' කොටස" 1. යටතේ තිබෙනවා, "පාර්ලිමේන්තුවට පැමිණෙන හෝ පාර්ලිමේන්තුවෙන් පිට වී යන හෝ යම් මන්ත්‍රීවරයකුට පාර්ලිමේන්තුව තුළ දී පහර දීම, නින්දා කිරීම හෝ භීතා මතා බාධා පැමිණවීමක් කළොත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කළ හැකි වරදක්" කියලා. එතකොට, පොලීසිය අපෙන් අහන්න අවශ්‍ය නැහැ, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත යටතේ ක්‍රියා කරන්න පොලීසියට පුළුවන්. නීතියේ සඳහන් වෙලා තිබෙන්නේ ඒකයි. වෙන දෙයක් නොවෙයි.

ගරු කථානායකතුමනි, ඒත් මම එක කාරණයක් කියන්න කැමැතියි. උද්ඝෝෂණයට සහාය දෙන මන්ත්‍රීවරු කීප දෙනෙක් මට කිව්වා, "මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, ඔබතුමාත් යටතේ තිබෙන ආණ්ඩුවේ නිදහස නිසා තමයි අපට කොළඹට එන්න පුළුවන්" කියලා. [බාධා කිරීම්] ඔව්. නැත්නම්, ඒක කරන්න බැහැ කිව්වා. [බාධා කිරීම්] ඇත්ත නේ. [බාධා කිරීම්] ඔව්, මට කිව්වා. ඒ කවුද කියලා මම මෙතැන කියන්නේ නැහැ. මට එහෙම කිව්වා. අනෙක මේ අය ගිහින් පෞද්ගලික මාධ්‍යවලට කියලා තිබෙනවා, "මේක පෙන්වන්න ඕනෑ. පෙන්නුවේ නැත්නම්, ඔයගොල්ලන්ගේ මාධ්‍ය කාර්යාලය වට කරනවා" කියලා. එහෙම තර්ජනය කරලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලජ්ජයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, "දෙරණ"ට කිව්වා ලු, "ගෝඨාභය විතරක් පෙන්වන්න එපා. අපිවත් පෙන්වන්න ඕනෑ" කියලා. [බාධා කිරීම්] ඒ කථා ඔක්කෝම දැන් ටිකෙන් ටික එළියට එනවා. කවුරුත් කියලා නැහැ, මිනිසුන්ට නගරෙට එන්න එපා කියලා. නගරෙට එන්නත් පුළුවන්; යන්නත් පුළුවන්. තැබෑරුම්කාරයෝ හිතන්නේ, හෙට හොඳට බිස්නස් තියෙයි කියලා.

දැන් නිදහස තිබෙනවා. දැන් බලන්න පත්තරවල තිබෙන දේවල්. කොහොමද පාර්ලිමේන්තුව වටලන්නේ? මම කියන්නේ මේකයි. අද ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන නිසා, එදා එක්නැළිගොඩට වුණ දේ අද වෙන්නේ නැහැ; මරලා දමන්නේ නැහැ. ලසන්ත වික්‍රමතුංගට කළා වාගේ, වෙඩි තියලා මරා දමන්නේ නැහැ. කීත් නොයාර්ට කළා වාගේ ගහන්න යන්නේ නැහැ. උපාලි තෙන්නකෝන්ට කළා වුණා වාගේ පහර දෙන්නේ නැහැ. [බාධා කිරීම්] ඒවාත් ඔක්කෝම බලන්න පුළුවන් UNP එක යටතේ නේ. දැන් සම්පූර්ණ නිදහස තිබෙනවා. බලන්න,- [බාධා කිරීම්] ඇයි ඔබතුමන්ලා කෑ ගහන්නේ? බලන්න, හැම දාම බණින්නේ මට. වෙන කාටවත් නොවෙයි, බණින්නේ මට. ඒ සම්පූර්ණ නිදහස තිබෙනවා.

මෙවා නවත්වන්න යන්නේ නැහැ. මේ අයට පුළුවන් උසාවියට ගිහින් ඕනෑ නම්, මූලික අයිතිවාසිකම් නඩු දමන්න; ඒ සම්බන්ධව ක්‍රියා කරන්න. අද අපි ලබා දී තිබෙන මේ නිදහස් සමාජය නිසා හෙට ඔබතුමන්ලාට මේ උද්ඝෝෂණය සිදු කරන්න පුළුවන් කියලා අපි කියන්න කැමැතියි. [ඝෝෂා කිරීම්]

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ජය වේවා!

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
නැත්නම් ඕක කරන්න බැහැ නේ. නැත්නම් ඕක වෙන්නේ නැහැ නේ. අද මේ ආණ්ඩුව නිසා අවස්ථාව ලැබී තිබෙනවා. [ඝෝෂා කිරීම්] ඉතින් ඇයි, ඔව්වර බය වෙන්නේ? දැන් හේතු හොයාගෙන ඉන්නවාද, සෙනහ ආවේ නැති වුණොත්, සෙනහ අඩු වුණොත් මට බණින්න; නැත්නම් ආණ්ඩුවට බණින්න? දැන්

එක එක ඒවා හොයා ගෙන යනවා. අපි බලමු, මොකක්ද වෙන්නේ කියලා. මේක ප්‍රජාතන්ත්‍රවාදී රටක්. ප්‍රජාතන්ත්‍රවාදය අනුව අපට ක්‍රියා කරන්න පුළුවන්. මේ රටේ ජනතාවට අවභිරයක් නොවන විධියට වැඩ කටයුතු ගෙන යන්න කියලා විතරයි අපි කියා තිබෙන්නේ. වෙන එකක් වුවමනා නැහැ. කොහොමත් මේ ගොල්ලන් පාර්ලිමේන්තුවට මොකුත් කරන්න යන්නේ නැහැ නේ. එතකොට පොලීසිය නිකම් පල්වෙනවා, මේ ගොල්ලන් පාර්ලිමේන්තුව ළඟට එන්නේ නැත්නම්. එච්චරයි තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ස්ථාවර නියෝග 27. (2) යටතේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ප්‍රශ්නයක් ඇහුවා. ඒකට ගරු අගමැතිතුමා පිළිතුරු දුන්නා. ඒක එතැනින් ඉවරයි. [ඝෝෂා කිරීම්] තව අවස්ථාව ඕනෑ නම්, - [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, what is your point of Order?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(මාණ්පුමිකු பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
Sir, I rise to a point of Order.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා. [ඝෝෂා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි සභාවේ ඊළඟ වැඩ කටයුතු ආරම්භ කරමු. [ඝෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඕනෑ නම් දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට අවස්ථාව දෙන්න පුළුවන්. [ඝෝෂා කිරීම්] අගමැතිතුමා එකඟ නම්, දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට පැහැදිලි කරගැනීමක් කරන්න පුළුවන්. [ඝෝෂා කිරීම්] - there is no debate on this. Do you have any questions? [ඝෝෂා කිරීම්] දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ඔබතුමා ප්‍රශ්නය ඇසුවා. ස්ථාවර නියෝග ගැන ඔබතුමන්ලා හොඳින්ම දන්නවා නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම ස්ථාවර නියෝග ගැන දන්නා නිසා තමයි ඔබතුමාගෙන් යළිත් ඉල්ලීමක් කරන්නේ. ස්ථාවර නියෝග යටතේ ප්‍රශ්නයක් ඇසුවාම, ප්‍රශ්නයට උත්තරය දෙන්න ඕනෑ. වෙන ඕනෑ එකක් කියන්න පුළුවන්. වෙන ඕනෑ එකක් කිව්වාට මට කමක් නැහැ. නමුත් ගරු අගමැතිතුමාගෙන් අහපු ප්‍රශ්නය මේකයි.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අගමැතිතුමා පිළිතුරක් දුන්නා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාගේ ආණ්ඩුව, ඔබතුමාගේ අමාත්‍යවරුන් නියෝගයක් දීලා තිබෙනවා, අපේ විවිධ මන්ත්‍රීවරුන්ට නිකුත් කරපු, මහජනයාට නිකුත් කරපු බලපත්‍ර අවලංගු කරන්න. අපට ලබා දුන් පිටිටනිය - [ඝෝෂා කිරීම්] අවලංගු කරන්න.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමා, පිළිතුරු දෙනවාද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(මාණ්පුමිකු ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මට තිබෙන්නේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නයි. ඒ ගැන මෙතුමන්ලා සෑහීමකට පත් වෙයිද, නැද්ද කියලා මම දන්නේ නැහැ. අද මේ රටේ මාධ්‍ය, බස්රථ පාලනය කරන අධිකාරි දහයක් තිබෙනවා. ආණ්ඩුව යටතේ තිබෙන්නේ එකයි. අනෙක් නවය තිබෙන්නේ පළාත් සභාවල. අපේ control එකක් නැහැ. ඉතින් තමන් අතරම ප්‍රශ්න තිබෙනවා නම්, මම මොනවා කරන්නද? [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order නම් අවස්ථාව දෙන්න පුළුවන්. [ඝෝෂා කිරීම්] ගරු සභානායකතුමා, first you wanted to raise a point of Order. -[*Interruption.*]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order? -[*Interruption.*]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඔබතුමා අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කරන නායකතුමා. ඊයේ පොලිස්පතිතුමා ප්‍රසිද්ධියේ බොහොම පැහැදිලිව කියලා

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

තිබෙනවා, හෙට දිනයේ පැවැත්වෙන උද්ඝෝෂණයට අවම බලය නොවෙයි, "අවශ්‍ය" බලය පාවිච්චි කරනවා කියලා. [ඝෝෂා කිරීම්] දැන් මේ පොලිස් රාජ්‍ය සංකල්පය යටතේ පොලිස්පති මහතුවර පෙරහැරේ නටනවා වාගේයි ඒවා කරන්නේ - [ඝෝෂා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please allow the Hon. Kiriella to speak.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඒකාබද්ධ විපක්ෂය ලැහැස්ති වෙන්නේ, බිලි පූජාවකට. [බාධා කිරීම්] බිලි පූජාවකට ලැහැස්ති වෙන්නේ. [බාධා කිරීම්]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමන්ලා බය වෙලාද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
නැහැ, නැහැ. -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලාගේ උද්ඝෝෂණය නවත්වන්න අපි කිසිම නියෝගයක් උසාවිවලින් අරගෙන නැහැ. [ඝෝෂා කිරීම්] අපි නියෝගයක් අරගෙන නැහැ. [ඝෝෂා කිරීම්] නැහැ, නැහැ. අපි කියන්නේ මේකයි. අපි ඉඩ දෙනවා, බොහොම වැදගත් විධියට හැසිරෙන්න. එච්චරයි. වැදගත් විධියට හැසිරෙන්න. [ඝෝෂා කිරීම්] තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙන්නේ, කියලා ගස්සවා ගන්නයි. බය වෙන්න එපා, අපි ගහන්නේ නැහැ. [ඝෝෂා කිරීම්] බය වෙන්න එපා. අපි තමුන්නාන්සේලාගේ ඒවාට රැවටෙන්නේ නැහැ. [ඝෝෂා කිරීම්] අපි රැවටෙන්නේ නැහැ. [ඝෝෂා කිරීම්] සාමාන්‍ය මිනිසුන්ට කරදර වෙන දේවල් කරන්න එපා, එච්චරයි. රවුමක් ගහලා යන්න. අපි දන්නවා, රහස් සාකච්ඡා - [ඝෝෂා කිරීම්]

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමා, you cannot have an argument, point of Order එකට පමණක් අවස්ථාව දෙන්නම්, එතැනින් එහාට බැහැ. විවාද කරන්න බැහැ, එතුමා එකඟ වෙන්නේ නැත්නම්.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, හෙට දවසේ මාතර පල්ලියේ ආගමික උත්සවයක් පැවැත්වෙනවා. මම මැදිහත් වෙලා ඒ සඳහා බස් රථ යොදාගන්න කටයුතු කරලා තිබියදී,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ගැන පොලිස්පතිතුමාට, නැත්නම් පොලීසිය භාර ඇමතිතුමාට දැනුම් දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
මම මේ කියන එක අහන්න කෝ, ගරු කථානායකතුමනි. [බාධා කිරීම්] ඔබතුමා මම කියන දේ අහලා ඉන්න. ඊට පස්සේ තීරණය කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
බස්නාහිර ප්‍රවාහන අධිකාරිය විසින් බස් රථ ලබා දීම නවත්වන්න කටයුතු කරලා තිබෙනවා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, 1996,-

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ පිළිබඳව මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නම්.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(මාණ්පුමිකු පිරසන්න රණතුංක)
(The Hon. Prasanna Ranatunga)
මම කියන දේ ඔබතුමා අහන්නේ නැතුව මොකක්ද අවධානයට යොමු කරවන්නේ?

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කියන්න, කියන්න. කියලා ඉවර කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(මාණ්පුමිකු පිරසන්න රණතුංක)
(The Hon. Prasanna Ranatunga)
1996 දී ගැසට් පත්‍රයක් නිකුත් කරලා තිබෙනවා, අවසර පත්‍ර ලබා දෙන්න කටයුතු කරන්න කියලා. [බාධා කිරීම්] එම ගැසට් පත්‍රය මගේ ළඟ තිබෙනවා. [බාධා කිරීම්] එවැනි ගැසට් පත්‍රයක් තිබියදී එම අවලංගු කිරීම වැරැදියි, ගරු කථානායකතුමනි. මාර්ග බලපත්‍ර නොමැතිව ගමන් කළොත් රුපියල් 1,000ක දඩයක් පමණයි ගහන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ සඳහා මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නම්. ගරු රංජිත් මද්දුම බණ්ඩාර අමාත්‍යතුමා. [බාධා කිරීම්]

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(මාණ්පුමිකු පිරසන්න රණතුංක)
(The Hon. Prasanna Ranatunga)
මෙතුමන්ලා භයේ ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා. [බාධා කිරීම්]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීමක්] මොකක්ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මොකක්ද point of Order එක? හැබැයි, point of Order කියලා ඒකෙන් පිට යන්න බැහැ. [බාධා කිරීම්] අද දවසේ වැඩ තිබෙනවා. [බාධා කිරීම්] ගරු කුමාර වෙල්ගම මැතිතුමා. මොකක්ද point of Order එක?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය මා ඔබතුමා මඟින් පොලීසිය භාර ඇමතිවරයාට යොමු කරනවා. අපි හෙට පවත්වන "ජන බලය කොළඹට" උද්ඝෝෂණයට ගොඩක් භයවෙලා තිබෙන බව පෙනෙනවා. මෙන්න මේකයි point of Order එක. [බාධා කිරීම්] කෑ ගහන්න එපා, කෑ ගහන්න එපා. අද ඔබතුමන්ලා කෑ ගහනවා, හෙට අපි කෑ ගහනවා. ගරු කථානායකතුමනි, පෙරේදා රෑ 11ට කලුතර උතුරේ,- [බාධා කිරීම්] රෑ 11ට නෙමෙයි, මම පාන්දරත් යනවා. පෙරේදා රෑ 11ට පෝස්ටර්ස් ගහපු ළමයින්ව අත් අඩංගුවට අරගෙන කලුතර උතුර පොලීසියට අරගෙන ගියා. මොකක්ද හේතුව? "පරිසර දූෂණය." පෝස්ටර් ගහන එක පරිසර දූෂණයක්ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(මාණ්පුමිකු උறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලජ්ජයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මොන පොලීසියටද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
කලුතර උතුර පොලීසියට, පෙරේදා රෑ ගෙන ගියා. මම කියන්නේ බොරුද කියලා ඔබතුමා සොයා බලන්න.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(මාණ්පුමිකු අසෝක්ක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා, What is your point of Order?

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(මාණ්පුමිකු අසෝක්ක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මෙතැන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේකයි. මෙතුමන්ලා පසුගිය කාලයේ ලබා ගත් බස් සඳහා තවම මුදල් ගෙවලා නැහැ. ඒ නිසා සිටිබී බස් දෙන්නේ නැහැ. ඒ මුදල් ගෙවිවා නම් බස් ටික එනවා. [බාධා කිරීම්] මුදල් ගෙවිවේ නැති නිසා මෙතුමන්ලාට සිටිබී බස් දෙන්නේ නැහැ. ඒකයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. ඒ මුදල් ටික ගෙවලා බස් ගත්තා නම් හරි.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(මාණ්පුමිකු නාමල් රාජපක්ෂ)
(The Hon. Namal Rajapaksa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුවා. හැබැයි, ගරු අගමැතිතුමාවත්, විෂය භාර ඇමතිවරයාවත් ඒ සඳහා පැහැදිලි පිළිතුරක් ලබා දුන්නේ නැහැ. ඔබ තමුන්නාන්සේලාට පැහැදිලි පිළිතුරක් දෙන්න බැරි නම්, බැහැ කියලා කියන්න. හැබැයි, ඔබතුමන්ලා පිළිතුරක් දෙන්නේ නැතුව අවසානයේ පාර්ලිමේන්තුව නොමඟ යවන්නයි උත්සාහ කරන්නේ. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. මාරුවෙන් මාරුවට අවස්ථාව දෙන්න ඕනෑ. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට මම සුබ පතනවා. දැන් එතුමා මෙතැන නැඟිටලා පෙන්වනවා, එතුමා තමයි නායකයා කියලා. [ඝෝෂා කිරීම්] ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට මම දෙපාරක් පිළිතුරු දුන්නා. මට නැවත පිළිතුරු දෙන්න චූවමනාවක් නැහැ. නමුත්, මෙතුමා අහපු නිසා තමයි මම මෙතුමාටත් පිළිතුරක් දුන්නේ. [ඝෝෂා කිරීම්] බස්නාහිර ප්‍රවාහන අධිකාරිය පාලනය කරන්නේ මහ ආණ්ඩුවෙන් නොවෙයි. [ඝෝෂා කිරීම්]

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න. මේක විවාදයක් කර ගන්න එපා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු අගමැතිතුමනි, ඔබතුමාගේ හිතේ තිබෙන දේ කිව්වාට මට කරන්න දෙයක් නැහැ. නමුත්, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට ඔබතුමා පිළිතුරක් දෙන්න. ඔබතුමා පිළිතුරු දෙන්නේ නැතිව කථාව වෙන පැත්තකට හරවන්න ලැහැස්ති වෙන්න එපා. [ඝෝෂා කිරීම්]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புகள் அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication and Digital Infrastructure and Foreign Employment)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හරින් ප්‍රනාන්දු අමාත්‍යතුමා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 (2) යටතේ මෙතුමා ප්‍රශ්නයක් ඇහුවා. මට පුංචි ප්‍රශ්නයක් තිබෙනවා. කොළඹට එනවා කිව්වාට, එන තැනක් තවම කියලා නැහැ. කොළඹට ඇවිල්ලා සාමකාමීව උද්ඝෝෂණය කරලා යනවා නම් මගෙන් බත් පැකට් 1,000ක් දෙනවා. [ඝෝෂා කිරීම්]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ මොකක්ද? [බාධා කිරීමක්]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. [බාධා කිරීම්] ගරු රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා මේ සභාව නොමඟ යවනවා. මේ වන විටත් පොලීසිය භාවිත කරලා තහනම් නියෝග ගන්න අවශ්‍ය වැඩ කටයුතු කරනවා. [බාධා කිරීම්] හැබැයි, උසාවියෙන් ආණ්ඩුවට අවශ්‍ය තීන්දුව මේ වන විට ලබා දීලා නැහැ. [බාධා කිරීම්] ඒ නිසා රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා මේ සභාව නොමඟ යවන්නයි උත්සාහ කරන්නේ. [බාධා කිරීම්] අධිකරණයට කරුණු වාර්තා කරලා තහනම් නියෝග ලබා ගන්න එතුමන්ලා පොලීසිය භාවිත කරනවා. කරුණාකර මේක නවත්වන්න. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ, මේ ආණ්ඩුවේ මේ අන්තවාදය නොවෙයි.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රිති ප්‍රශ්නය මොකක්ද? [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමනි, ඊට පසුව ඔබතුමාට අවස්ථාව දෙන්නම්. [බාධා කිරීම්]

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, මීගමුව ප්‍රදේශය නියෝජනය කරන මම කතෝලික බැතිමතෙක්. මීගමුවේ අපේ කතෝලික ජනතාවට මාතර සිද්ධස්ථානය වන්දනාමාන කරගන්න බස් රථ වෙන් කරගන්න ගියාම,- [බාධා කිරීම්] බස් රථ වෙන් කිරීම සම්පූර්ණයෙන් - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමනි, - [බාධා කිරීම්]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, මේ උද්ඝෝෂණ නවත්වන්න පොලීසිය විසින් කිසිම තහනම් නියෝගයක් අරගෙන නැහැ. [බාධා කිරීම්] කොහෙන්වත් තහනම් නියෝග අරගෙන නැහැ. [බාධා කිරීම්] මම වග කීමක් ඇතිවයි කියන්නේ. තමුන්නාන්සේලාට එන්න පුළුවන්. [බාධා කිරීම්] ඇවිල්ලා කලබල කළාය කියා අපි එහෙම කරදරයක් කරන්නේ නැහැ. [බාධා කිරීම්] හැබැයි, නාමල් රාජපක්ෂ මහත්මයා නායකයා කරන්න තමයි මේ උද්ඝෝෂණය කරන්නේ කියා අපට තොරතුරු ලැබී තිබෙනවා, [ඝෝෂා කිරීම්] තමුන්නාන්සේලාට මොකුත් නැහැ. [ඝෝෂා කිරීම්] බැසිල්ටයි, දිනේෂ්ටයි විරුද්ධව නාමල් රාජපක්ෂ නායකයා කරනවා කියා අපට තොරතුරු ලැබී තිබෙනවා. [ඝෝෂා කිරීම්]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මේ ජන බලවේගය විතරක් නොවෙයි, කලිනුත් ජන බලවේග රාශියක් ක්‍රියාත්මක වුණා. ඒ අවස්ථාවලදී ආණ්ඩුවක් හැටියට අපි ඔවුන්ට අවස්ථාව දුන්නා. මම උදාහරණයක් කියන්නම්. ගෝල්ෆේස් එකේත් අපි ඔවුන්ට අවස්ථාව දුන්නා. ඊට පසුවදා ආණ්ඩුව ගන්නවාය කියා ඒ මොහොතේත් එතුමන්ලා කිව්වා. අපි භය නැහැ, ගරු කථානායකතුමනි. හැබැයි, පොලීසිය භාර අපේ ඇමතිතුමාට අපි වග කීමකින් යුතුව මේ කාරණය කියනවා. ගරු කථානායකතුමනි, ඒකාබද්ධ විපක්ෂයේ එක්තරා මන්ත්‍රීවරයෙක් කියනවා, "මේ රැළිය තුළ අභ්‍යන්තර ගැටුමක් නිර්මාණය වෙන්න ඉඩ තිබෙනවා; මිනිස් ජීවිත ගණනාවකට හානි වෙන්න ඉඩ තිබෙනවා" කියා. එවැනි දෙයක් වැළැක්වීම තමයි වග කිවයුතු ආණ්ඩුවක පොලීසිය භාර ඇමතිතුමාගේ වග කීම වන්නේ. ගරු කථානායකතුමනි, ඒ මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය තුළම සඳහන් වෙනවා, ඒ කණ්ඩායම දෙපිලකට බෙදිලා මේ එන අහිංසක ජනතාව ඝාතනය කරන්න හදනවාය කියන එක. අහිංසක ජනතාව මේක දන්නේ නැහැ. අභ්‍යන්තරයේ මේ ප්‍රශ්නය ඇති කරලා ආණ්ඩුව මේක කළාය කියා චෝදනා කරාවි. ඒ නිසා මේ ගැන සොයා බලන එක ආණ්ඩුවේ වග කීමක්, ගරු කථානායකතුමනි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order. අපටත් අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාටත් අවස්ථාව දෙනවා. ඔව්, කියන්න ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, පොලීසිය භාර අපේ ඇමතිතුමා මේ පාර්ලිමේන්තුව නොමඟ යැව්වා. අද වැලිකඩ පොලිස් ස්ථානාධිපතිතුමා, - [බාධා කිරීමක්]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
නැහැ, නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම උසාවියේ හිටියා නේ. ඔබතුමා කොහොමද නැහැ කියන්නේ? මම උසාවියේ හිටියා. මම උසාවියේ ඉන්න කොට තමයි OIC ආවේ. ඔබතුමා කොහොමද නැහැ කියන්නේ? [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, වැලිකඩ පොලිස් ස්ථානාධිපතිතුමා අද උදේ කොළඹ මහෙස්ත්‍රාත්තුමා ළඟට ගිහින් තහනම් නියෝගයක් ඉල්ලුවා. අධිකරණයෙන් තහනම් නියෝගය දුන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම කළේ නැහැ කියා ඇමතිතුමා කියනවා නම් මොනවා කරන්නද, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පුදුම කථාවක් නේ, ඔබතුමා කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ කථාව කියන්න. හැබැයි ඇමතිතුමා නැහැයි කියනවා. ඔබතුමා කියනවා ඉල්ලුවා කියලා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තහනම් නියෝගය දුන්නේ නැහැ. ඊට පස්සේ, "තහනම් නියෝගයක්" නොවෙයි, එය සංශෝධනය කරලා සාමකාමී උද්ඝෝෂණයක් කරන්න දෙන්න කියා ඉල්ලුවා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවෙන් කළ පැමිණිල්ලක් අනුව තමයි මේක කළේ කියලා කිව්වා. ඒක ඔබතුමාටත් හොඳ නැහැ. ගරු කථානායකතුමාගේ ඉල්ලීමක් හැටියට තමයි මෙය දකින්නේ; කථානායකතුමා කරන ලද ඉල්ලීමක් අනුව තමයි වැලිකඩ පොලිසියේ ස්ථානාධිපතිතුමා ගියා කියලා කියන්නේ. එහෙම දෙයක් නැහැ කියා පොලීසිය භාර ඇමතිතුමා කියනවා. හැබැයි, ගරු ඇමතිතුමනි, එවැනි සිදුවීමක් අද කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේදී සිදු වුණා. එහෙම දෙයක් වුණේ නැහැය කියා ඔබතුමා වග කීමකින් කියනවාද? වැලිකඩ පොලිස්

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ස්ථානාධිපතිතුමා මෙවැනි තහනම් නියෝගයක් ගන්න උසාවි ගියේ නැහැ කියා ඔබතුමා වග කීමකින් කියනවාද? මට කියන්න, ඔබතුමා වග කීමකින් ඒ කාරණා කියනවාද? [බාධා කිරීම්]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

කිසිම උද්ඝෝෂණයක් නවත්වන්න අපි කිසිම උසාවි නියෝගයක් අරගෙනත් නැහැ, උසාවියෙන් එහෙම ඉල්ලීමක් කරලාත් නැහැ, කථානායකතුමා එහෙම පැමිණිල්ලක් කරලාත් නැහැ කියා මම වග කීමෙන් කියනවා. අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. [බාධා කිරීම්]

තමුන්නාන්සේලා කොළඹට එන්න. අපි ආරක්ෂාව දෙන්නම්. බය වෙන්න එපා. [බාධා කිරීම්]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, අපි මේ වෙනුවෙන් පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කරන්න හොඳ නැහැ. මොකද, මෙතුමන්ලා පසුගිය මාස 7, 8 තුළ ආණ්ඩු ගණනාවක් පෙරළුවා. අනිද්දා ඔබතුමන්ලා ආණ්ඩුවක් හදනවාද කියා මම දැන් ඔබතුමන්ලාගෙන් අහන්න කැමැතියි. කවුද, ඒකේ ඇමතිවරු? කැබිනට් ඇමතිවරු කවුද? අගමැති කවුද? නාමල් මහත්මයාද? [බාධා කිරීම්] මට පොඩ්ඩක් කියන්න, ඔබතුමන්ලා අනිද්දා අලුත් ආණ්ඩුවක් හදනවාද? [බාධා කිරීම්] අපට ඒකයි දැන ගන්න ඕනෑ. ඔය පැත්තට එන අය බලාගෙන ඉන්නේ අලුත් ආණ්ඩුවක් හදන්නයි. මෙතුමන්ලා හැම දාම භීනෙන් නැඟිටලා වාගේ කෑ ගහනවා; පහුවදාට ඇඳෙන් වැටෙනවා. එතුමන්ලා හැම දාම බොරුවට ආණ්ඩු හදනවා. තව අවුරුදු දෙකක් යනතුරු මේ ආණ්ඩුව හොල්ලන්න බැහැ. තමුන්නාන්සේලා ඒක හොඳට මතක තියා ගන්න. අවුරුදු දෙකක් යනතුරු මේ ආණ්ඩුව හොල්ලන්න දෙන්නේ නැහැ. අපටත් මිනිසුන් ඉන්නවා, කොළඹට ගේන්න.[බාධා කිරීම්]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ මොකක්ද?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉතාම ගෞරව සම්ප්‍රයුක්තව මේ සභාවේ ප්‍රශ්නයක් මතු කළා. ගරු අගමැතිතුමා ඒකට උත්තර දුන්නාය කියා මේ මොහොත දක්වා කිව්වාට, ඒ ප්‍රශ්නය මොකක්ද? තමුන්නාන්සේලා කියන තරු පහේ ප්‍රජාතන්ත්‍රවාදය යටතේ අපි සාමකාමී, අවිහිංසාවාදී උද්ඝෝෂණයක් කරනවා.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
කොහේද?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
අගනුවර. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, අපට තිබෙන කථා කිරීමේ කාලය පවා වැඩි කරනවාය කියා මීට මාසයකට පෙර මේ සභාව තුළදී ඔබතුමා අපට සහතික වුණා. නමුත් මේ දක්වා ඒකවත් වෙලා නැහැ. දියවන්නාවෙන් එළියට ගිහිල්ලා අපට කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ, දියවන්නාව ඇතුළේ මේ මන්ත්‍රීවරු 69කට තිබෙන අවස්ථා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා කවුරුවත් අද කථා කිරීමට ඉල්ලලාවත් නැහැ. එහෙම චෝදනා කරන්නේ ඇයි?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මේ සභාවේ මතු වුණු ප්‍රශ්න දෙකක් තිබෙනවා. එකක් තමයි, බස් රථ බලපත්‍ර. තාවකාලික බලපත්‍ර ලබා ගැනීම සම්බන්ධයෙන්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම කියන්නේ කථා කිරීම ගැනයි. නමුත් අද කථා කරන්න කවුරුවත් ඉල්ලා නැහැ.[බාධා කිරීම්]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මේ මොහොත වන විට සබරගමුව පළාත් සභාව ඇතුළේ,-[බාධා කිරීම්] අපේ ගරු ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් මතු කළා, මාතර අප ස්වාමිදුවගේ දේවස්ථානයේ තිබෙන මංගල්‍යයටවත් බස් රථ දෙන්නේ නැහැ කියා. ගරු කථානායකතුමනි, බස් රථ නොදී ඉඳීම පමණක් නොවෙයි, රාජ්‍ය ආයතනවල සේවකයන්ගේ නිවාඩු පවා අවලංගු කර තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, I took your point.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Prime Minister, do you want to reply that?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, [බාධා කිරීම්] මගෙන් ප්‍රශ්නයක් ඇසුවා. ඊට මම පිළිතුරු දුන්නා. ඒක අවසන් කරලා දැන් මූලික වැඩ කටයුතු පටන් ගන්න තිබෙනවා. අපට අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවකුත් විවාදයට ගන්න තිබෙනවා. ස්ථාවර නියෝග 27 (2) යටතේ එක මන්ත්‍රීවරයකුට ප්‍රශ්නයක් අහන්න පුළුවන්. ඊට පස්සේ, නියම කරලා තිබෙන ඇමතිවරයා පිළිතුරු දෙන එකයි කරන්න තිබෙන්නේ. ඊට වඩා ඒ වැඩ කටයුත්ත කරන්න බැහැ. [බාධා කිරීම්] මම කියන දේ අහගන්න කෝ. නැවත පුළුවන් අද කල් තැබීමේ යෝජනාව යටතේ ඔබතුමන්ලාගේ පැත්තේ මන්ත්‍රීවරු දෙදෙනෙකුට ඒ ගැන කථා කරන්න. නමුත් දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා මේ කාරණය ගැනම කල් තැබීමේ යෝජනාවකුත් දීලා, දැන් ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය අහන කොටත් ඒ ගැන කථා කරනවා. එතුමා මේ 27 (2) ප්‍රශ්නය යටතේ ඒ ගැන කථා කළා නම්, කල් තැබීමේ යෝජනාවක් ගන්න බැහැ. මොකද, එකම දේ ගැන නේ මේ කථා කරන්නේ. දෙවතාවක් ඒ ගැන කථා කරන්න බැහැ. [බාධා කිරීම්] ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, ඔබතුමාට දැන් ඒ ගැන කථා කරන්න අයිතියක් නැහැ. [බාධා කිරීම්] දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට අහන්න අයිතියක් තිබුණා. ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, ඔබතුමාට අයිතිය තිබෙන්නේ ස්ථාවර නියෝග 27 (2) යටතේ අහන ප්‍රශ්නයේදී නොවෙයි, ඔබතුමාගේ යෝජනාවේදී ඒ ගැන අහන්නයි. දැන් කථා කළාට මට ප්‍රශ්නයක් නැහැ. නමුත් එහෙම කථා කළොත්, නැවත කල් තැබීමේ යෝජනාව යටතේ ඒ ගැන කථා කරන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කල් තැබීමේ යෝජනාව විවාදයට ගන්න කෝ. එතකොට ඉවරයි නේ. [බාධා කිරීමක්] ගරු සභානායකතුමා. [බාධා කිරීම්]

අපි මේ කාරණය අවසන් කරමු. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. Points of Order කියලා ඔබතුමන්ලා සියලුදෙනාම කථා කරන්නේ එකම කරුණ ගැන නේ. නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමා වර්තමාන තත්ත්වය ගැන පැහැදිලි කළා. ඒක පිළිගන්න. නමුත් නාමල් රාජපක්ෂ මැතිතුමාගේ නම සඳහන් කළ නිසා එතුමාට අවස්ථාවක් දෙනවා. ඊට පස්සේ මේ කාරණය අවසන් කරනවා. එතුමාගේ නම සඳහන් වුණු නිසා එතුමාට අවස්ථාව දෙනවා. ඊට පසුව අපි අද ප්‍රධාන කටයුතුවලට යන්න ඕනෑ. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අපි නඟපු ප්‍රශ්නයට පොලීසිය භාර ඇමතිතුමා නැඟිටලා ප්‍රකාශයක් කර, ඔබතුමා සහ පාර්ලිමේන්තුව නොමඟ යැව්වා. පොලීසිය කරන දේ එතුමාවත් දන්නේ නැහැ. වැලිකඩ පොලීසිය සහ කුරුඳුවත්ත පොලීසිය උසාවියට ගිහිල්ලා ඉල්ලපු නියෝගය ප්‍රතික්ෂේප කර තිබෙනවා. මොකක්ද මේ? පාර්ලිමේන්තුවට මේ වාගේ අසත්‍ය ප්‍රකාශ කරන්නේ නැතිව තමුන්නාන්සේ ඉල්ලා අස්වෙන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
කථානායකතුමනි, මම පැහැදිලිව කිව්වේ මේකයි. වැලිකඩ පොලීසියට ඔබතුමා පැමිණිල්ලක් කර නැහැ. උද්ඝෝෂණ නවත්වන්න කියා අපි කොහෙන්වත් නියෝග අරගෙනත් නැහැ. අපි ඒවා නවත්වන්න උසාවි ගිහිල්ලත් නැහැ. හැබැයි, තමුන්නාන්සේ දන්නේ නැතිව නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා පක්ෂය ඇතුළේ වැඩ කරනවා. තමුන්නාන්සේලා ඒවා දන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා. ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා පැහැදිලි කරන්න. මෙතනින් එහාට මේ ප්‍රශ්නය ඉවරයි. We will move on to the main Items.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, දැන් මේ විෂය භාර ඇමතිවරයාට ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනදී ජනබලය සංවිධානය කරන කමිටුව ගැන කථා කරන්න නොවෙයි. විෂය භාර ඇමතිවරයාගෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුවා. හැබැයි, එතුමා පුන පුනා පාර්ලිමේන්තුවට කිව්වා, "උසාවි ගියේ නැහැ." කියා. නමුත්, මාධ්‍යයෙන් දැන් SMS එකක් එනවා, "ඒකාබද්ධ විපක්ෂය හෙට විරෝධතාව මහජන පීඩාවක් නොවන අයුරින් සිදු කරන ලෙස දන්වන නියෝගයක් ඉල්ලා කුරුඳුවත්ත පොලීසිය කළ ඉල්ලීම අධිකරණය ප්‍රතික්ෂේප කරයි." කියා. දැන් ගරු ඇමතිවරයා පාර්ලිමේන්තුවේදී කියනවා, එවැනි නියෝගයක් අධිකරණයෙන් ඉල්ලා නැහැ කියා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව නොමඟ යවන්නේ ගරු විෂය භාර ඇමතිවරයායි. විෂය භාර ඇමතිවරයා තමයි ඔබතුමාගේ තනතුර හැල්ලු කරන්නේ. විෂය භාර ඇමතිවරයා ඔබතුමාගේ තනතුර හැල්ලු කරනවා විතරක් නොවෙයි,- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා. [බාධා කිරීම්]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔබතුමන්ලා පොඩ්ඩක් අහගන්න. මම පැහැදිලිව කිව්වා, උද්ඝෝෂණ නවත්වන්න අපි උසාවියට ගිහිල්ලා කොහෙන්වත් ඉල්ලීමක් කර නැති බව. ඒවා අසත්‍ය. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එළියේ ගහන ඒවා අපට වැඩක් නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා කථා කරන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි,-[බාධා කිරීමක්]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
උද්ඝෝෂණ නවත්වන්න අපි කොහෙන්වත් නියෝග ඉල්ලා නැහැ. පැහැදිලිව, වගකීමෙන් මම ඒ බව කියනවා. තමුන්නාන්සේලා පාර්ලිමේන්තුව නොමඟ යවන්න එපා. [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පොලීසිය ඔබතුමා කියන දේවල් අහන්නේ නැහැ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
නැත්තේ මොකද්? මම කියන දේ අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා කථා කරන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා දැන් මේ අවස්ථාවේදී කිව්වා, "වැලිකඩ පොලීසිය විසින් උසාවියට ඉදිරිපත් කරන ලද ඒ ඉල්ලීම උසාවිය ප්‍රතික්ෂේප කළා." කියා. ඒ කියන්නේ, එතුමාට අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳව විශ්වාසයක් තිබෙනවා කියන එකයි. ගරු කථානායකතුමනි, එහෙම නම් මම අහනවා, අධිකරණ ක්‍රියාවලිය විශ්වාසයි නම් අලුත් උසාවි දැම්මාට පස්සේ ඒවාට භයේ ඇයි මේ කොළඹට සෙනහ ගෙනෙන්නේ කියා. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම මීට කලිනුත් කිව්වා. මේ මාතෘකාව පිළිබඳව මීට වඩා කථා කරන්න බැහැ. අපි දැන් ප්‍රධාන කටයුතුවලට යමු. මම සෑම දෙනාටම සාධාරණ විධියට අවස්ථාව දුන්නා. අපි අද ප්‍රධාන කටයුතුවලට යන්න ඕනෑ. ඒ නිසා මීට වඩා අවස්ථාව දෙන්න බැහැ. ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

# පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

## මුදල් පනත් කෙටුම්පත
## நிதிச் சட்டமூலம்
## FINANCE BILL

"2003 අංක 25 දරන මුදල් පනත, 2005 අංක 5 දරන මුදල් පනත, 2012 අංක 12 දරන මුදල් පනත, 1995 අංක 16 දරන මුදල් පනත සහ 2015 අංක 10 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස ද; සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද, වාහන හිමිකම් අය බද්ද, වාර්ෂික සමාගම් ලියා පදිංචි කිරීමේ අය බද්ද, ණය ආපසු ගෙවීමේ අය බද්ද, කාබන් බද්ද, දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද, ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.***

***2018 සැප්තැම්බර් 18වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයි ද, එය මුද්‍රණය කළ යුතුයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයි ද නියෝග කරන ලදී.***

*நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர் சார்பில் மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2018 செப்ரெம்பர் 18, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்படவேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Finance and Mass Media;*

*to be read a Second time upon Tuesday, 18th September, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනා පිළිබඳ දැනුම් දීම, ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move Item 3.

We are not moving Item Nos. 1 and 2.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින සලකා බැලීමට නියමිත න්‍යාය පත්‍රයේ විෂය අංක 3 ලෙස සඳහන්, "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන් සඳහා පාරිශ්‍රමිකයන් ගෙවීම" යන යෝජනාව 2018 අගෝස්තු 28 වන දින නිකුත් කරන ලද අංක 2 දරන පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයේ පළ කරන ලදුව, 2018 සැප්තැම්බර් 2 වෙනි දින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සලකා බලා ඒ සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව 2018 සැප්තැම්බර් 4 වන දින, එනම් අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද බවත් දැනුම් දීමට කැමැත්තෙමි.

# අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන් සඳහා පාරිශ්‍රමිකයන් ගෙවීම

## காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகத்தின் அங்கத்தவர்களுக்கு ஊதியமொன்றைச் செலுத்தல்

## PAYING EMOLUMENTS FOR THE MEMBERS OF THE OFFICE ON MISSING PERSONS

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"Whereas seven members including a Chairman have been appointed on the recommendation of the Constitutional Council for the Office on Missing Persons in terms of the provisions of the Act No. 14 of 2016 of the Office on Missing Persons (Establishment, Administration, and Discharge of Functions) and as per Section 20 of the said Act, the salaries of the members of that office shall be determined by Parliament, shall be charged to the Consolidated Fund;

And whereas this office is mandated to search, trace and clarify the circumstances of missing persons and provide reparation psychosocial support and other assistance to the family members of the missing persons and to make recommendations to the relevant authorities towards minimizing the number of incidents of the missing persons;

And whereas accordingly, Cabinet Memorandum submitted by the President on 22nd March 2018 in respect of this office, as decided at the meeting of the Cabinet of Ministers held on 05th June 2018, has granted approval to pay the emoluments of members as follows;

Pay a monthly allowance of Rs.100,000/-, a monthly telephone allowance of Rs.10,000 and an official vehicle with a quota of 225 litres of fuel per month to the Chairman of this office; and

Pay a monthly allowance of Rs. 75,000/-, a monthly telephone allowance of Rs.8,000/- and a transport allowance of Rs. 25,000/- to the members up to a limit of 350 km or a transport allowance of Rs. 50,000/- for a distance over and above 350 km depending on the distance from the residence to the office,

Accordingly, that this Parliament determines to pay emoluments and other allowances of members of the said office to be charged to the Consolidated Fund as above as per Section 20 of the Office on Missing Persons (Establishment, Administration and Discharge of Functions) Act, No.14 of 2016."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

No, I cannot allow any point of Order. [බාධා කිරීම්] ගරු අගමැතිතුමා. [බාධා කිරීම්] ගරු රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, උද්ඝෝෂණ නවත්වන්න කියා අපි කිසිම නියෝගයක් පොලීසියෙන් ඉල්ලා නැහැ. අපි පොලීසියෙන් ඉල්ලා තිබෙනවා, පාර්ලිමේන්තුවේ කටයුතු බාධාවකින් තොරව කර ගෙන යන්න අවසර දෙන්න කියා. මන්ත්‍රීවරුන්ට බාධාවකින් තොරව පාර්ලිමේන්තුවට එන්න සලස්වන්න. මාර්ග අවහිර කරන්න එපා කියා අපි උසාවියෙන් ඉල්ලා තිබෙනවා. එපමණයි. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු - [බාධා කිරීම්] ගරු අගමැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන් හත්දෙනෙක් සිටිනවා. ඒ අය ආරම්භ කර තිබෙනවා, මුළු රට වටේම, -උතුර පමණක් නොවෙයි දකුණේත් හැම ප්‍රදේශයකම- අතුරුදහන් වූ පුද්ගලයන් ගැන විශේෂයෙන්ම,- [බාධා කිරීම්]

***[මේ අවස්ථාවේදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට වූහ.]***

*[இச்சந்தர்ப்பத்தில் எதிர்த்தரப்பு உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமிட்டனர்.]*

*[At this stage, some Members of the Opposition walked into the Well of the House and created an uproar.]*

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

Sir, I rise to a point of Order. -[*Uproar.*] උසාවි නියෝගයකින් - [ඝෝෂා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඒ සාමාජිකයන් විශාල සේවයක් කරනවා. දැනට අතුරුදහන් වූවන් ගැන දහස් ගණන් පුද්ගලයන් ඒ සාමාජිකයන් මුණ ගැහිලා තිබෙනවා; කාර්යාලයට ගිහින් තිබෙනවා. ඒ සාමාජිකයන්ට වුවමනා වැටුප් හා දීමනා නියම කිරීම සඳහායි මේ යෝජනාව අපි ඉදිරිපත් කර තිබෙන්නේ. මේ ගරු සභාවේ සියලු දෙනාම මේ කෙටුම්පත නීතිගත කරන්න එකඟ වුණා. එසේ නීතිගත කළාට පසුව අපි මේ ගරු සභාවට යෝජනා කරනවා, ඒ අදාළ ගෙවීම් හා දීමනා ලබා දෙන්න කියා. [ඝෝෂා කිරීම්] එහෙම නම් අපි ඡන්දයකට යමු. [ඝෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා. Hon. Sunil Hadunnetti, do you want to say anything? -[Uproar.]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපි ඡන්දයකට යමු; ඡන්දයකට යමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, Hon. Sunil Handunnetti wants to say something. කථා කරනවාද? [සෝෂා කිරීම්]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ. [සෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Item No. 3 - Paying Emoluments for the Members of the Office on Missing Persons. Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා. [සෝෂා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move Item Nos. 4 and 5.

## ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සහජීවනය සහතික කිරීම පිණිස ඒ පිළිබඳව අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව

## இலங்கையில் இன மற்றும் மத ஒற்றுமையை உறுதி செய்வதை ஆராய்ந்து அதன் விதப்புரைகளைப் பாராளுமன்றத்துக்கு அறிக்கையிடுவதற்கான தெரிகுழு

## SELECT COMMITTEE TO STUDY AND REPORT TO PARLIAMENT ITS RECOMMENDATIONS TO ENSURE COMMUNAL AND RELIGIOUS HARMONY IN SRI LANKA

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக්ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

" Hon. J. M. Ananda Kumarasiri
Hon. Lakshman Kiriella
Hon. Gayantha Karunatileka
Hon. (Mrs.) Thalatha Atukorale
Hon. Ruwan Wijewardene
Hon. Velu Kumar
Hon. Ranjith Madduma Bandara
Hon. M. A. Sumanthiran
Hon. Selvam Adaikkalanathan
Hon. Douglas Devananda
Hon. D. M. Swaminathan
Hon. Lucky Jayawardana
Hon. Rauff Hakeem
Hon. ( Dr.) Wijeyadasa Rajapakshe
Hon. Mano Ganesan
Hon. Rajavarothiam Sampanthan
Hon. A. D. Susil Premajayantha

Hon. John Amaratunga,- Select Committee of Parliament to study and report to Parliament its recommendations to ensure Communal and Religious Harmony in Sri Lanka,-

Whereas the recent unfortunate incidents reported in various parts of Kandy District early March of this year;

And whereas, the unfortunate incidents reported in the Beruwela Electorate in June, 2014, Ampara District in February 2018;

And whereas, it observes the escalation of communal hatred among the different ethnic communities in the recent past;

And whereas, the necessity to establish a proper mechanism to address such situations and to prevent repetition of such misunderstanding among communities in the future;

And whereas, the initiative taken by the Honorable Speaker of Parliament with the fullest support and co-operation of both the Members of Parliament in the Government and Opposition to visit the places, where the incidents took place in the Kandy District, on a fact finding mission on 10th March, 2018;

And whereas, consequent to the said visit, the steps taken by the Honorable Speaker of Parliament to convene a Summit represented by all venerable Nayaka Theros and other Reverend Religious Leaders including Leaders/ Representatives of Political Parties in Parliament; Heads of relevant Government Institutions, Representatives of Civil Society Organizations, State and Private Media Institutions and Heads of Security Forces on the 19th April, 2018 and subsequently on 29th June, 2018;

And whereas, it was unanimously decided at the Summit held on 29th June, 2018 to explore the possibility to establish a "Select Committee of Parliament" under the Chairmanship of the Honorable Speaker of Parliament consisting both Government/Opposition Members representing all ethnic communities;

And whereas, the Committee on Parliamentary Business had also endorsed the appointment of the Select Committee of Parliament under reference at its meeting held on 05th July, 2018;

This Parliament resolves that a Select Committee of Parliament be appointed to study and report to Parliament, its recommendations to ensure Communal and Religious Harmony in Sri Lanka on the following areas:-

(a) to prevent the propagation of defamatory opinions/ opinions that undermine national harmony or engagement in such activities and the necessity of taking firm legal action against individuals who engage in such activities;

i.e. to discuss and decide on the suitability of including hate speech as a crime in the Penal Code.

(b) to promote the future generation from inheriting the differences that prevailed in the past along with the undue consequences created;

(c) to value the direct and frank intervention and contribution of all parties concerned to ensure the religious and national reconciliation.

(d) to categorize the school system on a non-racial or non-religious basis;

(e) to establish a Parliamentary Committee, empowered to entertain complaints about the issues and problems encountered by the minority ethnic groups living in the Northern and Eastern areas and in the other areas and solve those problems and issues through discussion;

(f) to ban conducting of private tuition classes on Sunday mornings, which is an obstacle in conducting Dhamma Schools;

(g) to formulate the relevant legal provisions required for the general implementation of the law when establishing places of religious worship and installing images, statues and the necessity of a common code of law for same;

(h) to introduce a special subject into the school curriculum in order to create national reconciliation and to build up co-operation among races having made children aware of the fact that their minds have been spoiled on the racial amity;

(i) to avail the contributions of the academics, intellectuals and the persons, who have won the recognition and respect of the public, to this national and religious reconciliation programme;

(j) to establish a panel of experts, which is represented by all religions at national level and the importance of accumulating academics, intellectuals and eminent persons, who have won the recognition and the respect of the public;

(k) to establish a mechanism to avail the contribution of the security forces, the Police and the places of religious worship under the patronage of the Divisional Secretary or the District Secretary with the coordination of the Hon. Ministers and Members of Parliament in order to solve the problems prevalent at local level and to convene discussions by the aforesaid groups at district level at least once in every three months;

(l) to formulate norms that should be followed when expressing views via social websites, various media networks, print/ electronic media;

(m) to ban publishing of the news, which disturbs national amity and how to formulate laws in that regard;

(n) to ensure that every religion and every race enjoy equal rights in presenting their views through both print and electronic media;

(o) to prevent disruption of national harmony through false and hateful statements, and to formulate guidelines for the media institutions to prevent the occurrence of such situations through media programmes that are held with the participation of highly recognized persons such as religious leaders, scholars and other elites;

(p) to resolve issues related to the national language policy; and

(q) to make arrangements to change the mindset of the public effectively on establishing national harmony and emphasizing its importance through the relevant Ministries and established institutions within the relevant mechanisms administered by the government, particularly institutes such as the National Youth Services Council.

(r) to enact Legislation to establish a “Race Relations Board” with necessary powers, funding and decision making authority to entertain complaints by any member of the public to seek relief when affected by incidents of racial hatred;

(s) to examine and recommend changes to the Police Ordinance and policing in general to ensure better public confidence in the Sri Lanka Police Department.

This Parliament resolves that a Select Committee of Parliament be appointed, to look into and report on the above matters.

(a) That the Committee and its Chairman shall be nominated by Mr. Speaker;

(b) That notwithstanding the provisions of Standing Order 101, of the Parliament the Committee shall consist of not more than twenty five (25) Members.

3. That the Committee shall have the power to:

(a) fix its quorum;

(b) send for persons, papers and records, may order any person to attend before Parliament or before such Committee, and to produce any paper, book, record or document in the possession or under the control of such person;

(c) verify or otherwise ascertain by oral examination of witnesses and examine witnesses upon oath or affirmation which the Chairman of the Committee or a person specially authorized for that purpose may administer;

(d) obtain the services of Specialists and Experts in the relevant fields to assist the Committee; and

(e) make interim reports from time to time and to sit notwithstanding any adjournment of Parliament.

4. The Committee shall make its Report within Six Months (06) of the date of its first sitting or such other or further time period as Parliament may grant."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## இலங்கை ஔடதங்கள் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
## PHARMACEUTICAL SOCIETY OF SRI LANKA (INCORPORATION) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That the Bill be now read a Second time."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදින්, **53 (3)** වන ස්ථාවර නියෝගය යටතේ, ගරු කථානායකතුමා විසින් එය ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.*

*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 53(3)இன்படி சட்டவாக்க நிலையியற் குழுவுக்கு மாண்புமிகு சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*

*Bill accordingly read a Second time, and allocated by MR. SPEAKER to Legislative Standing Committee under Standing Order 53 (3).*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තැබීම, ගරු සභානායකතුමා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Now the Adjournment Motion to be moved by the Hon. Dullas Alahapperuma - [*Uproar.*] Adjournment Motion එක ගන්නේ නැද්ද? [සෝෂා කිරීම්] Okay, we will adjourn Parliament.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. **3.25**ට, **2018** සැප්තැම්බර් මස **05** වන බදාදා අ.භා. **1.00** වන තෙක් කල් ගියේය.*

*அதன்படி பி. ப. 3.25 மணிக்கு பாராளுமன்றம், 2018 செப்ரெம்பர் 05, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 3.25 p.m. until 1.00 p.m. on Wednesday, 05th September, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 263 - இல. 2
Volume 263 - No. 2

2018 සැප්තැම්බර් 05 වන බදාදා
2018 செப்ரெம்பர் 05, புதன்கிழமை
Wednesday, 05th September, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

## නිල වාර්තාව

## அதிகார அறிக்கை

## OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

**ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදි.

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත –[ ගරු විජිත හේරත් මහතා] -
පළමුවර කියවන ලදි.

**තැපැල් කාර්යාල ආඥා පනත:**
ව්‍යවස්ථා

---

# பிரதான உள்ளடக்கம்

**ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவின் அறிக்கை**

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம் :**
முதன்முறை மதிப்பிடப்பட்டது.

**தனி உறுப்பினர் சட்டமூலங்கள் :**
அரசியலமைப்புக்கான இருபதாவது திருத்தம் சட்டமூலம் – [மாண்புமிகு விஜித ஹேரத்] -
முதன்முறை மதிப்பிடப்பட்டது.

**அஞ்சல் அலுவலகக் கட்டளைச் சட்டம் :**
ஒழுங்குவிதிகள்

---

# PRINCIPAL CONTENTS

REPORT OF THE COMMITTEE ON ETHICS AND PRIVILEGES

QUESTIONS POSED TO HON. PRIME MINISTER

ORAL ANSWERS TO QUESTIONS

SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL:
Read the First time

PRIVATE MEMBERS' BILLS:
Twentieth Amendment to the Constitution Bill - [The Hon. Vijitha Herath] – Read the First time

POST OFFICE ORDINANCE:
Rules

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2018 සැප්තැම්බර් 05වන බදාදා***
*2018 செப்ரெம்பர் 05, புதன்கிழமை*
*Wednesday, 05th September, 2018*

**අ.භා.1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2016 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2016 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(v) 2016 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2016 වර්ෂය සඳහා ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON ETHICS AND PRIVILEGES

**ගරු තිලක් මාරපන මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலக் மாரபன - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Tilak Marapana -Minister of Foreign Affairs)

ගරු කථානායකතුමනි, අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මම "එම වාර්තාව මුද්‍රණය කළ යුතු ය"යි යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් අලුවිහාරේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මැදවච්චිය, මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලයේ සේවය කරන ඩී.එම්.ඩී.එන්. දිසානායක මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම;

(2) මතුගම, අලුත්ගම පාර, අංක 392/3 දරන ස්ථානයෙහි පදිංචි කේ.කේ.පී. කන්නන්ගර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) දේවාලේගම, බංගලාවත්ත, ජීවාන පාර, "රත්නගයා" යන ලිපිනයෙහි පදිංචි එන්.එම්. සෝමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

ප්ලාස්ටික් සහ අපද්‍රව්‍ය අවධිමත් පරිදි එක් රැස් කර නිසි ක්‍රමවේදයකින් තොරව පරිසරයට මුදා හරින සුළු හා මහා පරිමාණ කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් මෙරට තුළ ක්‍රියාත්මක වනවා. ඒ අනුව ගරු අගමැතිතුමාගෙන් මම පහත සඳහන් ප්‍රශ්න අසනු ලබනවා.

(i) එවැනි කර්මාන්තශාලා පවත්වාගෙන යෑම සඳහා යොදා ගත යුතු පිළිගත් ක්‍රමවේදයක් තිබේද?

(ii) මෙවැනි කර්මාන්තශාලා සඳහා ස්ථාන තෝරා ගැනීමේදී සහ අවසර ලබා දීමේදී පිළිගත හැකි ක්‍රමවේද තිබේද?

(iii) සහ අපද්‍රව්‍ය ප්‍රතිශක්තිකරණය කිරීමේදී ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් තිබේද?

(iv) එවැනි ක්‍රමවේද තිබියදී ඒවා නොසලකා හැර කටයුතු කරන ආයතනවලට විරුද්ධව ගත හැකි හා ගත යුතු නීතිමය පියවර කුමක්ද?

(v) මෙවැනි කර්මාන්තශාලා මඟින් භූගත ජලය දූෂණය වී ළිං ජලය පානයට නුසුදුසු වීම හා විවිධ පාරිසරික ගැටලු මතුවීමෙන් සෞඛ්‍ය පිරිහීම වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

ගරු කථානායකතුමනි, ප්ලාස්ටික් සහ අපද්‍රව්‍ය එක්රැස් කර ගබඩා කිරීමේ ක්‍රියාවලිය පරිසරය දූෂණය කරනු ලබන කර්මාන්තයක් ලෙස ජාතික පාරිසරික පනත යටතේ හඳුන්වා දී නැහැ. ඒ නිසා ඒ සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නැහැ. ඒ වාගේම ප්ලාස්ටික් සහ අපද්‍රව්‍ය එකතු කර ගබඩා කිරීම සඳහා ස්ථානයක් තෝරා ගැනීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ලබා ගැනීම ද අවශ්‍ය වන්නේ නැත. නමුත් ඒ සඳහා වෙළෙඳ බල පත්‍රයක් ලබා ගත යුතු වෙනවා. ඒ වාගේම සහ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කරනු ලබන කර්මාන්ත ජාතික පාරිසරික පනත යටතේ ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වෙනවා.

ගරු කථානායකතුමනි, පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නොමැතිව ප්ලාස්ටික් සහ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කරනු ලබන කර්මාන්ත පවත්වා ගෙන යනවා නම් ඒ සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් නීතිමය පියවර ගන්නවා ඇත. ඒ වාගේම ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණය කරනු ලබන කර්මාන්තශාලාවලින් පිටකරනු ලබන අපජලය යම් ප්‍රමාණයක් භූගත ජලයට මුසුවීම සඳහා ඉඩ සලසන කර්මාන්තයක් යමෙකු පවත්වා ගෙන යන්නේ නම්, එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ජාතික පාරිසරික පනත යටතේ නීතිමය පියවර ගැනීමටත් පුළුවන් වනවා.

ඒ සඳහා උපරිමය වසර දෙකක සිර දඬුවමක් හෝ රුපියල් 10,000කට නොවැඩි දඩ මුදලක් හෝ මේ දඬුවම් දෙකම එකවර ලබා දිය හැකිය.

ප්ලාස්ටික් - සහ අපද්‍රව්‍ය අපේ පරිසරයට හානි කරන ප්‍රධාන ගැටලුවක් නිසා එම කරුණ මෙම ගරු සභාවේ අවධානයට යොමු කිරීම ගැන ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, ප්ලාස්ටික් - සහ අපද්‍රව්‍ය සම්බන්ධයෙන් පවතින නීති රීති තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගැනීම කාලීන අවශ්‍යතාවක් නිසා ඒ පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියේ අවධානය යොමු කිරීමට කැමැතියි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු අගමැතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා සාර්ථක පිළිතුරක් ලබාදීම සම්බන්ධව.

මේ සංවේදී ප්‍රශ්නය විසඳීම වෙනුවෙන්, සන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීම, මේ රටින් තුරන් කිරීම එහෙම නැත්නම් අවම කිරීම වෙනුවෙන් රජයක් විධියට අපි ඉතාම ප්‍රගතිශීලී යෝජනා කීපයක්ම ගෙනාවා. ඒ අනුව පොලිතීන් මලු, - shopping bags - තහනම් කළා.

මා ගරු අගමැතිතුමාගෙන් අහන පළමු අතුරු ප්‍රශ්නය මෙයයි.

එදා රතුපස්වල සිද්ධිය නිර්මාණය වුණේ ඒ ප්‍රදේශයේ පානීය ජලය සම්බන්ධයෙන් ඇති වූ ගැටලුවක් නිසායි. ගරු අගමැතිතුමනි, ප්ලාස්ටික් භාවිත කරන විශාල කර්මාන්තශාලා තිබෙන ප්‍රදේශවල ළිං ජලය අපවිත්‍ර වෙනවා. ජලය ඒ විධියට අපවිත්‍ර වුණාම, ඒවා ගැන පරීක්ෂාවක් කර ගන්න විශාල මුදලක් වැය වෙනවා. එම නිසා එවැනි අවදානමක් තිබෙන ප්‍රදේශයක ජනතාව පානය කරන ජලයේ පිරිසිදුභාවය පිළිබඳව පරීක්ෂණයක් කර ගන්න රජයේ මැදිහත් වීමෙන් යම් සහයෝගයක් ලබා දීමේ ක්‍රමවේදයක් තිබේද කියලා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, කර්මාන්තශාලා හේතුවෙන් ළිං ජලය දූෂණය වී ඇතැයි යම් පාර්ශ්වයක් පැමිණිලි කරන්නේ නම්, අදාළ ළිං ජල සාම්පල ගාස්තුවකින් තොරව මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පරීක්ෂා කර ගැනීමට දැනටමත් කටයුතු යොදා තිබෙනවා. මීට අමතරව, ජල සම්පාදන මණ්ඩලයේ පරීක්ෂණාගාරවලිනුත් පරීක්ෂා කර ගත හැකිය.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මෙයටම අදාළ කාරණාවක් මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට ගරු අගමැතිතුමාගෙන් අහනවා.

අපේ රටේ ජල සම්පත නිසි ක්‍රමවේදයකින් පාලනය කර ජනතාවට ලබා දෙනවා වාගේම, අපි විශාල වශයෙන් විදේශ වෙළෙඳ පොළට ජලය අළෙවි කර ආදායමක් ලබනවා. ගරු අගමැතිතුමනි, එසේ වුවත්, මහා පරිමාණයෙන් ජලය බෝතල් කරන සමාගම් නියමානුකූල ක්‍රමවේදවලින් තොරව ජලය ඇසුරුම් කරනවා. උදාහරණයක් විධියට කිව්වොත්,කැගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල වාගේ ප්‍රදේශවලින් ජලය ලබාගෙන ප්‍රවාහනය කර බෝතල් කරනවා. ගරු අගමැතිතුමනි, එවැනි ක්‍රමවේදයක් තුළ ආරක්ෂාකාරීව ජනතාවට ජලය ලබා දීමේ හැකියාවක් නැහැ. මෙය දීර්ඝ කාලයක් තිස්සේ සිදු වන අක්‍රමවත් වැඩපිළිවෙළක්. මෙම වටිනා සම්පත සුරක්ෂිත කිරීමට රජයට යම් සැලසුම් සහගත පියවරක් ගන්න පුළුවන්ද කියා මා දැන ගන්න කැමතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, විෂ රසායනික ශරීරගතව ඇති බව දැනගැනීමට රෝග වැලදීමට පෙර ජනතාව පරීක්ෂාවට ලක් කරන ක්‍රමයක් දැනට ක්‍රියාත්මක වන්නේ නැහැ. නමුත් බොහෝ බෝ නොවන රෝග වැලදීමට ප්‍රථම, එම රෝග කල් තබා හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් දැනටත් රජයේ රෝහල්වල තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා ප්‍රශ්නය කලින් දන්නවා වාගේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔව්, ඔව්. නැත්නම්?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, පිළිතුරු බලාපොරොත්තුවෙන් මා ගරු අගමැතිතුමාගෙන් මේ ප්‍රශ්නය අහනවා.

(1) පසුගිය කාලයේ මේ රටේ සිදු වූ බරපතළ වංචා, දූෂණ හා අල්ලස් අපරාධ සම්බන්ධ කඩිනමින් නඩු විභාග කිරීම සඳහා විශේෂ මහාධිකරණ පිහිටුවීමට අදාළ පනත් කෙටුම්පත බොහෝ ප්‍රමාදයකින් පසුව පසුගිය මැයි මාසයේ 09වැනි දා සම්මත කරගනු ලැබුවා. එම පනතට අදාළව මේ වන විට එවැනි විශේෂ අධිකරණ කොපමණ සංඛ්‍යාවක් පිහිටුවා තිබේද?

(2) මේ වන විට එම අධිකරණ සඳහා යොමු කර ඇති පැමිණිලි ගණන කොපමණද?

(3) එම පැමිණිලි එම අධිකරණ වෙත යොමු කිරීම සඳහා තෝරා ගන්නා ලද පදනම සහ ක්‍රියාපටිපාටි කවරේද?

(4) පාර්ලිමේන්තුවේ 'කෝප්' වාර්තාවකින් සහ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවකින් මහා පරිමාණ වංචාවක් සිදු වී ඇති බවට හෙළිදරවු වී තිබෙන මහ බැංකු බැඳුම්කර ගනුදෙනුවට අදාළ පරීක්ෂණවල වර්තමාන තත්ත්වය කුමක්ද?

(5) බැඳුම්කර වංචාව, ඉක්මනින් නඩුව අවසන් කර වරදකරුවන්ට දඬුවම් ලබා දිය යුතු වරදක් බව පිළිගනු ලබන්නේද? එසේ වන්නේ නම් මහ බැංකු බැඳුම්කර වංචාවට අදාළ නඩුව විභාග කිරීම සඳහා එම විශේෂ අධිකරණය භාවිත කරනු ලබන්නේද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, 2018 අංක 9 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනතේ විධිවිධාන ප්‍රකාරව, එක් විශේෂ මහාධිකරණයක් බස්නාහිර පළාතේ පිහිටුවා තිබෙනවා. ඒ වාගේම, තවත් එක් විශේෂ මහාධිකරණයක් බස්නාහිර පළාත තුළ පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතිනවා.

2018 සැප්තැම්බර් 03වැනි දින වන විට විශේෂ මහාධිකරණයට පැමිණිලි දෙකක් ලැබී තිබෙනවා. එකක් තමයි, නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදල් අවභාවිත කරමින් මැදමුලන රාජපක්ෂ ස්මාරකය ඉදි කිරීම පිළිබඳ පැමිණිල්ල.

අනෙක් එක තමයි ගාමිණී සෙනරත් ඇතුළු අයට එරෙහිව ලිට්රෝ ගෑස් මුදල් අවභාවිත කිරීම පිළිබඳ නඩුව.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ගරු කථානායකතුමනි, 2018 අංක 9 දරන අධිකරණ සංවිධාන පනතේ ප්‍රතිපාදන අනුව සුදුසු පරිදි නීතිපතිවරයා විසින් හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විධානය මත, අල්ලස් හා දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනතේ සඳහන් වන යම් වරදකට අදාළව එකී වරදේ අවස්ථානුගත කරුණු සලකා බලා ඒ වරද සම්බන්ධව අපරාධ නඩු කටයුතු ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ පවරනු ලැබිය යුතුද යන්න පිළිබඳ විධානයක් ලබා ගැනීමට එකී වරද සිදු කිරීමට අදාළ තොරතුරු අගවිනිසුරුතුමා වෙත යොමු කරනු ලැබිය යුතු වෙනවා. අගවිනිසුරුතුමා විසින් එම තොරතුරු සලකා බලා පනතේ දක්වා ඇති නිර්ණායක එකක් හෝ ඊට වැඩි ගණනක් සපුරා ඇති බව සිය මතය වන අවස්ථාවකදී එතුමා විසින් තම අත්සන යටතේ වූ ආඥාවක් මගින් එම වරද සම්බන්ධයෙන් අපරාධ නඩු කටයුතු ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැවැත්විය යුතු බවට විධාන කරනවා.

විශේෂ මහාධිකරණය වෙත නඩු කටයුතු යොමු කිරීමේ ක්‍රියා පටිපාටිය වන්නේ මෙයයි. මෙය ඉතාම පාරදෘශ්‍ය විධියට කරන ක්‍රියා පටිපාටියක්. දේශපාලන කරුණු කාරණා මෙතැනදී අදාළ වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මහා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම හා විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව 2017 දෙසැම්බර් 30 වැනි දින ගරු ජනාධිපතිතුමන් වෙත භාර දුන්නා. එකී වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා නීතිය බලාත්මක කරන ආයතන වන නීතිපතිතුමා වෙත හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පිළිවෙළින් 2018 ජනවාරි 2 වැනි දිනත්, 2018 පෙබරවාරි 10 වැනි දිනත් ඉදිරි කටයුතු කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් එම වාර්තාවේ පිටපත් යොමු කර තිබුණා.

ගරු කථානායකතුමනි, එකී වරදකරුවන්ට දඬුවම් ලබා දීම දැනට පවතින නෛතික ප්‍රතිපාදනවලට අනුකූලව සිදු කරනු ඇති. මේ සඳහා මම කලින් සඳහන් කළ ක්‍රියා මාර්ග අනුගමනය කරමින් නඩු පැවරීම අවශ්‍යයි.

ගරු කථානායකතුමනි, 2018 අංක 9 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනතේ විධිවිධාන අනුව පනතේ සඳහන් වන වැරදි සඳහා එකී මහාධිකරණයේ නඩු පැවරීම නීතිපති හෝ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විධානය මත අල්ලස් හා දූෂණ වළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ පිළිබඳ විස්තර ගරු අග විනිසුරු වෙත යොමු කිරීමෙන් පසුව ඒ පිළිබඳව තීරණයක් අග විනිසුරු විසින් ගන්නවා ඇති.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට මේ විශේෂ මහාධිකරණය සහ එහි ක්‍රියාකාරිත්වය ගැන තිබෙන උනන්දුව මම අගය කරනවා. අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමේදී ඒ සඳහා යම් කාලයක් ගත වෙනවා. අප කිසිම විධියකින් අධිකරණයට බලපෑම් කරන්නේ නැහැ. ආණ්ඩුව සහ පාර්ලිමේන්තුව හැටියට අපි කළ යුතු දේ කළා. විශේෂ මහාධිකරණය පිහිටෙව්වා. තවත් විශේෂ මහාධිකරණයක් ළඟදීම පිහිටුවනවා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මම කියන්නේ තව ටිකක් ඉවසිලිවන්ත වෙන්න කියලායි. නීතිපතිතුමාත්, අග විනිසුරුතුමාත්, විශේෂ මහාධිකරණයත් යන ආයතන තුන යුක්තිය, සාධාරණය ඉටු කරන බව මට විශ්වාසයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ඉවසලා නම් දැන් බොහොම කාලයක්. අවුරුදු තුනහමාරක් ගතවෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, කොහොම වුණත් මෙම බැඳුම්කර ගනුදෙනුවේ ප්‍රධාන පාර්ශ්ව දෙකක් තිබෙනවා. එකක් තමයි එම ගනුදෙනුවෙන් අයුතු ලාභ උපයා ගන්නා ලද පර්පෙචුවල් සමාගමේ පාර්ශ්වය.

දැන් විශාල ලෙස ආන්දෝලනයට තුඩු දී තිබෙන්නේ; කථා බහට ලක් වී තිබෙන්නේ, රිමාන්ඩ්ගත වී සිටින්නේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ පාර්ශ්වයයි. හැබැයි, ඔවුන් නොවෙයි රටට වග කියන්න ඕනෑ. රටට වග කිව යුතු පාර්ශ්වය තමයි මහ බැංකුව සහ එයට දේශපාලන නායකත්වය දෙන පාර්ශ්වය. හැබැයි දැන් මුළු බැඳුම්කර ගනුදෙනුවම හේත්තු වෙමින් යන්නේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම වෙතයි. ගරු කථානායකතුමනි, ඔවුන්ට ගොනු කළ යුතු වන්නේ අයුතු ලාභ උපයා ගැනීම සඳහා අභ්‍යන්තර තොරතුරු ලබා ගැනීම පිළිබඳ චෝදනාව පමණයි. හැබැයි රටට සහ රජයට වග කිව යුතු වන්නේ මහ බැංකුව ඒ සඳහා ලබා දෙන දායකත්වය පිළිබඳවයි. එම නිසා අර්ජුන මහේන්ද්‍රන්, මහ බැංකුවේ හිටපු අධිපතිවරයාගේ අභිශය වැදගත් කාර්ය භාරය තමයි රටට සහ ජනතාවට වග කීම. නමුත් දැන් මේ පිළිබඳව බොහෝ දේ සිදු වී තිබුණත් රටට, රජයට වග කිව යුතු පාර්ශ්වය පිළිබඳව තිබෙන්නේ ඉතාම නිහඬ පිළිවෙතක්. විශේෂයෙන්ම මහ බැංකුවේ අධිපතිවරයා, නිලධාරීන් සහ දේශපාලන නායකත්වය කියන මේ ඔක්කෝම පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම බිල්ලට දීලා සැඟවී ඉන්නවා. සමහර අය සිංගප්පූරුවට ගිහින් ඉන්නවා. උදර්පණ නීතිය යටතේ කැඳවන්න උත්සාහ කරනවා කියා නීතිපතිතුමා අධිකරණයට වාර්තා කර තිබෙනවා, මා දැක්කා. ඒ නිසා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට අයුතු ලාභ උපයා ගැනීම සඳහා ආණ්ඩුව පැත්තෙන් සිදු කරන ලද කාර්ය භාරය රටට හෙළිදරව් විය යුතුව තිබෙනවා. එය අතිශය වැදගත්. නීතිපතිවරයාට මෙම වාර්තාව ඉදිරිපත් කරලා දැන් සැලකිය යුතු කාලයක් ගත වී තිබෙනවා. ඒ වාගේම COPE එකේ වාර්තාවත් ඔබතුමා විසින්ම නීතිපතිතුමාට යොමු කරනු ලැබුවා. එයටත් සැලකිය යුතු කාලයක් ගත වී තිබෙනවා. දැන් විශේෂ අධිකරණ වෙත එවැනි පැමිණිලි ගොනු කිරීමේ කාර්ය භාරයේ දී පළමු පියවර තැබිය යුතුව තිබෙන්නේ, නීතිපති දෙපාර්තමේන්තුව සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවයි. ඔවුන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරතුමා වෙත යැව්වාට පසුව ඔහු විසින් පනතේ තිබෙන යම් යම් වගන්ති ප්‍රකාරව මෙය එකී අධිකරණ **වෙත** යොමු කළ යුතුය කියා තීරණයක් ගන්නවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවෙත් මේ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වෙනවා. නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් වාර්තා ඉදිරිපත් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා දැන් නීතිපතිවරයා විසින් කළ යුතු වන්නේ විශේෂ අධිකරණයට යොමු කිරීමේ අරමුණ සහිතව කිසිදු ප්‍රමාදයකින් තොරව මෙය ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමා වෙත යොමු කිරීමයි.

ඒ නිසා, "මේ පිළිබඳව වහාම විශේෂ අධිකරණයට යොමු කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමාට මෙම කරුණු වාර්තා කරන්න" කියා ආණ්ඩුව පැත්තෙන් නීතිපතිවරයාට උපදෙස් ලබා දෙන්න; එතුමා දැනුවත් කරන්න ඔබතුමන්ලා සූදානම්ද කියා මා දැන ගන්න කැමැතියි. මොකද, නීතිපතිවරයා කියන්නේ රජයේ නීතිඥයායි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමනි, නීතිපතිතුමාගෙනුත්, කොමිසමෙනුත් අපි පළමුවෙන්ම ඉල්ලා තිබෙන්නේ, ඒ ගොල්ලන්ගේ වැඩකටයුතු අවසන් කරන්න කියායි. ඒ වැඩකටයුතු අවසන් කළාට පසුව නීතිපතිතුමාටයි, කොමිසමටයි ඒ වාර්තාව කෙළින්ම ශ්‍රේෂ්ඨාධිකරණයට එවන්න පුළුවන්. නීතිපති දෙපාර්තමේන්තුවයි, කොමිසමයි තවම ඒ සම්බන්ධ පරීක්ෂණ කරගෙන යනවා. එම පරීක්ෂණ අවසන් කළාම ඉදිරි කටයුතු කරගෙන යන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්ව විධියට, පරීක්ෂණ අවසන් කරලා ඒ වාර්තාව යවන්න කියා අපි නීතිපතිවරයාට යළිත් දැනුම් දෙන්නම්.

පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ බැංකු ගිණුමේ තිබුණු බිලියන 11ක මුදලක් බැංකුවෙන් පිට කිරීම දැනට මහ බැංකුව විසින් තහනම් කර තිබෙනවා. මම හිතන හැටියට ඒක අලාභයටත් වඩා විශාල මුදලක්. නීතිපති දෙපාර්තමේන්තුව ඒ සඳහා දිස්ත්‍රික් උසාවියේ නඩු පවරා තිබෙනවා. ඒත් වැඩි කල් යන්නේ නැතිව, නීති මාර්ගයෙන් කෙටි කාලයකින් අපට මේ මුදල් ටික ආපසු ලබාගන්න පුළුවන්ද කියා මුදල් ඇමතිතුමාත්, මමත් නීතිපතිතුමාගෙන් ඇහුවා. ඒ ගැනත් අපට උපදෙස් ලබාදෙයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මුදල් ලබා ගැනීමෙන් වංචාව වැහෙන්නේ නැහැ. බලන්න, "වීරකැටිය ව්‍යාපෘතිය" පිළිබඳවත් විශේෂ මහාධිකරණයේ දැන් නඩුවක් ගොනු කර තිබෙනවා.

හැබැයි, වීරකැටිය ව්‍යාපෘතියේත් මුදල් නැවත එම චූදිත කණ්ඩායම විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබෙනවා. මම තවත් කාරණයක් කියන්නම්. හිටපු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ඊයේ-පෙරේදා රිමාන්ඩ් භාරයට පත් වුණා. එතුමාටත් සතොස මුදල් ගනුදෙනුවක් පිළිබඳව තමයි චෝදනාව එල්ල වී තිබුණේ. හැබැයි, ලක්ෂ 50ක් වූ සතොසට අයත් ඒ මුදල නැවත ඔහු ලබා දී තිබෙනවා. ඒ අනුවත් පෙන්නුම් කරනවා, මුදල් ලබාදීමෙන් පමණක් යුක්තිය ඉටු වන්නේ නැති බව. ඒ නිසා පර්පෙචුවල් සමාගම විසින් මහ බැංකුවේ රඳවා ගෙන තිබෙන මුදල් යළි අත්පත් කර ගැනීමෙන් වංචාවට අදාළ සියල්ල නිරාකරණය වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ පරීක්ෂණ කිරීමේදී වැදගත්ම වන්නේ කවුද? මේ පරීක්ෂණවලදී අතිශය වැදගත් කාර්ය භාරයක් තිබෙන්නේ මහ බැංකු අධිපතිවරයාටයි. ගරු අගමැතිතුමනි, මහ බැංකුවේ මේ අධිපතිවරයා ඔබතුමාගේ සමීපතම මිත්‍රයෙක්. ඒ වාගේම ඔබතුමාගේ පෞද්ගලික නිර්දේශය මත තමයි ඔහු මහ බැංකු අධිපතිවරයා ලෙස පත් වෙන්නේ. මේ පාර්ලිමේන්තුවේදී අවස්ථා ගණනාවකදී ඔබතුමා මහ බැංකු අධිපතිවරයා වෙනුවෙන් පෙනී සිටියා. පසුගිය දවස්වල සමහර වෙබ් අඩවි වාර්තා කර තිබුණා, ඔබතුමා සිංගප්පූරුවට ගිය වෙලාවේත් ඔහු මුණ ගැසුණු බව. මම දන්නේ නැහැ, මට ඒ පිළිබඳව සහතිකයක් නැහැ. නමුත් සිංගප්පූරුවට ගිය වෙලාවේත් ඔබතුමා එතුමා මුණ ගැසුණාය කියා සමහර වාර්තාවල සඳහන් කර තිබුණා. එතුමා ඔබතුමාගේ සමීපතම මිත්‍රයෙක් බව අවස්ථා ගණනාවකදී කරුණුවලින් හෙළිදරව් වී තිබෙනවා. එහෙම නම්, දැන් මේ පරීක්ෂණ ඉදිරියට ගෙන යාම සඳහා අත්‍යවශ්‍යම පුද්ගලයා තමයි, හිටපු මහ බැංකු අධිපතිවරයා. ඔබතුමා මේ උදර්පන නීති, අධිකරණ නියෝග, රතු නිවේදන, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාමාර්ග, අධිකරණයේ ක්‍රියාමාර්ග පසෙක තබා, මිතුරෙක් හැටියට සලකා මේ වෙනුවෙන් මැදිහත් වෙන්න. එතුමා ඔබතුමාගේ මිතුරෙක් නිසා අගමැතිවරයා හැටියට ඔබතුමාට ඒ ගැන වගකීමක් තිබෙනවා. ඔබතුමා තමයි ඔහු පත් කළේ. එම නිසා, ඔහු මෙරටට ගෙන්වා ගැනීම පිළිබඳව ඔබතුමාට පෞද්ගලිකව වගකීමක් නැද්ද කියා මම විමසන්න කැමැතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමනි, මේ මුදල් ආපසු ලබා ගන්න කියලා නීතිය ගැන යෝජනා කළේ කොමිසමෙන්. ඒ නිසා තමයි, ඒ ගැන දැනුම් දෙන්න කියා අපි කොමිසමෙන් ඉල්ලා තිබෙන්නේ. ඒ මුදල් ආපසු ලබා ගත්තාය කියා, අපරාධයක් වෙලා තිබෙන තැනක ඒ අපරාධය එතැනින් අවසන් වෙන්නේ නැහැ.

අපරාධය තිබුණේ වෙනත් අවස්ථාවකයි. විශේෂයෙන්ම අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා ගැනත්, මීට අදාළ අනෙක් අය ගැනත් නීතිය ක්‍රියාත්මක කරගෙන යනවා. ඔවුන් පිට රට ඉන්නවා නම්, ඒ සඳහා ක්‍රියා කරන්න ගත යුතු ක්‍රියාමාර්ග සියල්ලම අරගෙන තිබෙනවා. ඒ ගැන ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාත් දන්නවා. ඊට අමතරව අප විසින් ගත යුතු ක්‍රියාමාර්ගයක් අපි නොගෙන තිබෙනවා නම්, කරුණාකර ඒ පිළිබඳව මට දැනුම් දෙන්න. ඒ පැත්තෙනුත් නීතිඥ මහත්වරු තොරතුරු ඉල්ලා තිබෙනවාය කියා පත්තරේ වාර්තා වෙලා තිබෙනවා මම දැක්කා. මම ඊට වඩා එය කියවන්න ගියේ නැහැ. ඒ පියවර අරගන්න කියා පොලීසියටත්, නීතිපති දෙපාර්තමේන්තුවටත් අපි දැනුම් දීලා තිබෙනවා.

අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා ලංකාවෙන් ගියාට පසු මම එතුමා සමඟ කිසිම සම්බන්ධයක් පවත්වලාත් නැහැ, සම්බන්ධ වෙලාත් නැහැ. මොකද, මගේ නීතිඥ මහත්වරු මට උපදෙස් දුන්නේ, සම්බන්ධකම් කිසිවක් තියාගන්න එපා කියායි. මම එතුමා සමඟ සම්බන්ධකම් පවත්වා නැහැ. ඒ අනුව රජයේ නීතිඥ මහතාටත්, පොලීසියටත් ඒ වැඩ කටයුතු කරන්න අපි සම්පූර්ණ අවස්ථාව දීලා තිබෙනවා. එය කිසි විටෙක නවත්වලා නැහැ. පළමුවෙන්ම මේ පරීක්ෂණ කටයුතු අවසන් කරන එකයි දැන් කරන්න තිබෙන්නේ. එම පරීක්ෂණ කටයුතු අවසන් කළාට පසුව නීතිපතිතුමාත්, කොමිසමත් තීරණය කරන්න ඕනෑ, එම පරීක්ෂණ වාර්තාව අනුව සහ මෙම සංශෝධන පනත යටතේ නඩු දමන්න පුළුවන්ද කියා. නඩු දමන්න අවස්ථාවක් තිබෙනවාය කියා ඒ අය නිගමනය කළොත්, ඒක තමයි පළමුවැනි තීරණය වන්නේ. ඊට පසු අග්‍ර විනිශ්චයකාරතුමා තීරණය කරන්න ඕනෑ, එම යෝජනාව පිළිගන්න. මේ කාරණයේදී නීතිපතිතුමා සහ කොමිසම කියලා දෙපාර්ශ්වයක් තිබෙනවා. ඒ අය තීරණය කළාට පසුව, මෙහෙම නඩුවක් තිබෙනවාය කියා අග්‍ර විනිශ්චයකාරතුමා තීරණය කරන්න ඕනෑ. ඒ පියවර දෙකම ගන්න පුළුවන් වෙන්නේ පරීක්ෂණය අවසන් කළාට පසුවයි, ගරු මන්ත්‍රීතුමනි.

දැනට තිබෙන මේ නඩු දෙකේදීම පළමුවෙන්ම නීතිපතිවරයා තීරණය කළා, මේ නඩු ඉදිරියට ගෙනයන්න පුළුවන් කියා. මෙම සංශෝධන පනත යටතේ නඩු දමන්න පුළුවන් කියා. ඊට පස්සේ ඒ ලිපිගොනු තමන්ගේ අනුමැතිය ඇතිව අග්‍ර විනිශ්චයකාරතුමාට එව්වා. ඉන්පසු අග්‍ර විනිශ්චයකාරතුමා මේ ලිපි ගොනු දිහා බලලා, මේ ඉල්ලීම් දිහා බලලා එකඟ වුණා, මේ නඩු දෙක මහාධිකරණයට ඉදිරිපත් කරන්න කියා. ඒ අනුව තමයි මේ නඩු දෙකත් ඉදිරිපත් වෙලා තිබෙන්නේ. එහෙම නම් මෙතැනට යන්න පියවර ගණනාවක් තිබෙනවා. පාර්ලිමේන්තුව යෝජනා කළේ මේ පියවර, උසාවිය යෝජනා කළේ මේ පියවර. ඉතින්, පරීක්ෂණය අවසන් කර ඉදිරියට යන්න පුළුවන්.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -58/'18- (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

## රත්නපුර දිස්ත්‍රික්කයේ ලංගම ඩිපෝ ශක්තිමත් කිරීම : අමාත්‍යාංශයේ පියවර
## இரத்தினபுரி மாவட்டத்தில் இபோச டிப்போக்களை வலுவூட்டுதல்: அமைச்சினது நடவடிக்கை
## STRENGTHENING OF SLTB DEPOTS IN RATNAPURA DISTRICT: ACTION BY MINISTRY

255/'18

**2. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Hesha Withanage)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ලංකා ගමනාගමන මණ්ඩලය සතු ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) දැනට එක් එක් ඩිපෝව මඟින් ධාවනය කරනු ලබන ලංගම බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රත්නපුර දිස්ත්‍රික්කයේ ලංගම ඩිපෝ ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் உள்ள இலங்கை போக்குவரத்து சபைக்கு சொந்தமான டிப்போக் களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அந்த டிப்போக்களின் பெயர்கள் யாவையென் பதையும்;

(iii) தற்போது ஒவ்வொரு டிப்போக்களினாலும் சேவையில் ஈடுபடுத்தப்பட்டுள்ள இ.போ.ச பஸ் வண்டிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாவையென்பதையும்;

(iv) இரத்தினபுரி மாவட்டத்தில் இபோச டிப்போக் களை வலுவூட்டுவதற்காக அமைச்சினால் மேற் கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House -

(i) the number of Sri Lanka Transport Board depots in Ratnapura District;

(ii) the names of the aforesaid depots;

(iii) separately, the number of buses deployed by each aforesaid depot by now; and

(iv) the measures taken by the Ministry in order to strengthen SLTB depots in Ratnapura District?

(b) If not, why?

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 05 (පහයි)

(ii) * රත්නපුර
* බලංගොඩ
* ඇඹිලිපිටිය
* කලවාන
* ගොඩකවෙල

(iii) 2018 ජූනි මස දිනකට ධාවනය කළ සාමාන්‍ය බස් රථ ප්‍රමාණය පහත පරිදි වේ.

| ඩිපෝව | ධාවනය කළ බස් රථ සංඛ්‍යාව |
|---|---|
| රත්නපුර | 80 |
| බලංගොඩ | 100 |
| ඇඹිලිපිටිය | 54 |
| කලවාන | 49 |
| ගොඩකවෙල | 38 |
| එකතුව | 321 |

(iv) රත්නපුර දිස්ත්‍රික්කයේ ඩිපෝවල බස් රථ ඇණිය වර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර සාරාංශගතව පහත සඳහන් කර ඇත.

රත්නපුර දිස්ත්‍රික්කයේ ඩිපෝවල බස් රථ ඇණිය වර්ධනය කිරීම සඳහා පහත සඳහන් පරිදි නව එන්ජින් කට්ටල් ලබා දී ඇති බව දන්වන අතර, එම එන්ජින් කට්ටල ගලවා ඉවත් කිරීමේදී ඒවා නැවත අලුත්වැඩියා කිරීමට ද විස්තර අනුව කටයුතු කර ඇති බව ද දන්වමි. තවද, ඉදිරියේදී ලබා ගැනීමට නියමිත බස් රථවලින් ද එම දිස්ත්‍රික්කයේ බස් රථ ඇණිය තවදුරටත් ශක්තිමත් කිරීමට ද බලාපොරොත්තු වෙමි.

| ඩිපෝව | නව එන්ජින් කට්ටල ලබා දීම අනුව ධාවනයට එක් කරන ලද බස් රථ සංඛ්‍යාව | ගලවන ලද එන්ජින් කට්ටල අලුත්වැඩියා කිරීම අනුව ධාවනයට එක් කරන ලද බස් රථ සංඛ්‍යාව |
|---|---|---|
| රත්නපුර | 05 | 03 |
| බලංගොඩ | 05 | 02 |
| ඇඹිලිපිටිය | 06 | 05 |
| කලවාන | 04 | 01 |
| ගොඩකවෙල | 04 | 02 |
| එකතුව | 24 | 13 |

එසේම, රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් නොව මුළු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට හා සේවය කරන සේවකයින්ගේ දියුණුව සඳහා පසුගිය වකවානුව තුළ සිදු නොකෙරුණු වැඩසටහන් රාශියක් දැනට දියත් කරමින් පවතී. ඒවායේ ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය කාලවකවානුව තුළ පැවති අයහපත් මූල්‍ය තත්ත්වය ශක්තිමත් කර ගනිමින් දැනට ශ්‍රී ලංගම සෑම ඩිපෝවකම නියමිත දිනට වැටුප් ගෙවන තත්ත්වයක් පවතින අතර, මේ වන විට සේවක අර්ථ සාධක අරමුදලට 2015 සැප්තැම්බර් මස සිට අඛණ්ඩව ගෙවීම් කරනු ලබයි. එම භාරකාර අරමුදල, සේවක පාරිතෝෂික ගෙවීම්, තෙවන පාර්ශ්වීය ගෙවීම් යනාදී අයිතමයන් සඳහා පැවති හිඟ මුදල් අවම මට්ටමකට රඳවා ගැනීමට ආයතනයක් වශයෙන් සමත්ව ඇති බවට කරුණු වාර්තා කරමි.

එසේම, ශ්‍රී ලංගම විසින් බුක්ති විඳින ඉඩම් සම්බන්ධ ගැටලු රාශියක් වර්තමාන රජය පත්වීමෙන් අනතුරුව නිරවුල්කර දීමට ද සමත්ව ඇත.

තවද, 2005 වර්ෂයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවීමෙන් අනතුරුව මෙතෙක් අනුමත කර ගැනීමට නොහැකි වූ සේවක සංයුති සැලැස්මක් හා බඳවා ගැනීමේ, උසස් කිරීමේ පටිපාටියක් අනුමත කිරීම සම්බන්ධ වැඩ කටයුතු ද දැනට සිදු වෙමින් පවතින බවට කරුණු වාර්තා කරමි. තවදුරටත් සේවක සුබසාධනය ඇති කිරීමට හා ආයතනයේ ඵලදායිතාව හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට වැඩසටහන් රාශියක් දැනට ක්‍රියාත්මකව පවතින බව ද දන්වනු කැමැත්තෙමි.

ඉහතින් සඳහන් විස්තර අනුව රත්නපුර දිස්ත්‍රික්කය පමණක් නොව සමස්ත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයම ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

(ආ) පැන නොනඟී.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, අපේ අමාත්‍යතුමාත් මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ මේ ප්‍රශ්නයට සාර්ථක පිළිතුරක් ලබා දීම සම්බන්ධව අපේ නියෝජ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ කාරණය මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කරනවා. මේ දවස් කිහිපයේ ශ්‍රී ලංගමයේ ගැටලුකාරී ප්‍රශ්න රාශියකට ගරු ඇමතිතුමා ඊයේ උත්තර ලබා දීලා, ඒ සේවකයන්ගේ ගැටලුවලට සහනයක් ලබා දීලා තිබෙන වෙලාවක, රත්නපුර දිස්ත්‍රික්කය ගැන මම මේ අහන ප්‍රශ්නය මුළු රටටම අදාළයි, ගරු ඇමතිතුමනි.

දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංගම පාඩු ලබන ආයතනයක් බවට පත්ව තිබෙනවා. යම් අවස්ථාවකදී ඔබතුමන්ලා උත්සාහ කරනවා මේ ආයතනය ලාභ ලබන තැනකට ගෙනෙන්න. අපි දන්නවා මේ ආයතනයෙන් ලබා දෙන සේවාව පොදු සේවාවක් බව. ලාභ ලබනවාට වඩා මේ ආයතනය මේ රටේ ජනතාවට ජාතික මෙහෙවරක් කරනවා. ජාතික සේවාවක් ලබා දෙනකොට හැම වෙලාවේම ලාභ ලබන්න බැහැ කියා මම විශ්වාස කරනවා. මම හිතනවා, ඔබතුමන්ලාගේත් විශ්වාසය එයයි කියා.

සමහර අවස්ථාවලදී ග්‍රාමීය ප්‍රදේශවල, විශේෂයෙන්ම මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල සහ බලංගොඩ ඩිපෝ දෙකේ සේවාව ලබා ගන්නකොට, ඒ ආයතනවල තිබෙන මූල්‍යමය ගැටලු නිසා ඔවුන් හැම වෙලාවේම උත්සාහ කරන්නේ දුර ගමන් සේවාවලට -කොළඹට එන්න, බදුල්ලට යන්න වාගේ දුර ගමන් සේවාවලට- ප්‍රමුඛතාව දෙන්නයි. මොකද, ඒ රියැදුරන්ට, ඒ කොන්දොස්තර මහත්වරුන්ට, ඒ ඩිපෝවලට ලාභ ලබා ගන්න පුළුවන් වන්නේ දුර ගමන් සේවාවල යෙදුණොත් විතරයි. ගරු ඇමතිතුමනි, හැබැයි එතකොට අප බලාපොරොත්තු වන ජාතික ප්‍රවාහන සේවා සැපයීමේ වගකීමෙන් අපි පොඩ්ඩක් දුරස් වෙනවා. ග්‍රාමීය මාර්ගවල, මගේ ආසනයේ තිබෙන රම්මල මාර්ගයේ ඉස්සර බස් රථයක් ගමන් කළත්, දැන් බස් එක කැඩිලා කියලා යන්නේ නැහැ. ඒ වාගේ ග්‍රාමීය මාර්ග විශාල සංඛ්‍යාවක් තිබෙනවා. මේ ගැන අපි ඩිපෝ අධිකාරිවරුන් සමඟ කථා කළාම ඔවුන් දෙන උත්තරය තමයි, "ඒ සඳහා ප්‍රමාණවත් බස් රථ නැහැ, දුර ගමන් සේවා නතර කළොත් ඩිපෝවේ ආදායම අඩු වෙනවා" කියන එක. ඒ නිසා මම නැවත වතාවක් මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඔබතුමාටත් ඔය ප්‍රශ්නය ඇති. ඒ නිසා, ගරු ඇමතිතුමා ලංකා ගමනාගමන මණ්ඩලය ලාභ ලබනවා කියන තැනට අරගෙන යනවා වාගේම ජනතාවට -පාසල් දරුවන්ට, රැකියාවලට යන අයට- පහසුකම් සැලසීම වෙනුවෙන්, ග්‍රාමීය ප්‍රවාහන සේවය නඟා සිටුවීම වෙනුවෙන් වූ යම් ස්ථිර වැඩසටහනක් අමාත්‍යාංශයට තිබෙනවාද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ලංකා ගමනාගමන මණ්ඩලයේ 5,500ක පමණ බස් රථ ඇණියක් තමයි දැනට තිබෙන්නේ; සේවකයින් 32,000ක් පමණ සිටිනවා. මේ රජය බලයට පත් වෙද්දී සේවකයින් 36,700ක් සිටියා. එක බස් රථයකට සේවකයන් හත්දෙනෙක් සිටියා. ඩිපෝ 106න් ඩිපෝ 79ක පඩි ගෙවලා තිබුණේ නැහැ. සේවක භාරකාර අරමුදල, සේවක අර්ථසාධක අරමුදල සහ පාරිතෝෂික මුදල් සඳහා රුපියල් කෝටි 1,550ක් බැර කරලා තිබුණේ නැහැ. ගරු ඇමතිතුමාගේ නායකත්වය යටතේ අපි දැන් ඒ ඩිපෝ 106ටම නියමිත වෙලාවට පඩි ගෙවනවා. දැන් සෑම ඩිපෝ එකකම අතිරික්ත මුදල් -ස්ථිර තැන්පතු- තිබෙනවා. ඒ වාගේම සේවක භාරකාර අරමුදලට, ඒ වාගේම පාරිතෝෂික මුදල් ආදී සියල්ලම අපි දැන් නියමිත වෙලාවට ගෙවනවා. ඒ තත්ත්වයට ඇවිල්ලා, පසුගිය වසරේ රුපියල් එකසියහැටඑක්කෝටි අසුලක්ෂයක ලාභයකුත් ලැබුවා. ඒ කෙසේ වෙතත් සේවකයන්ගේ ප්‍රශ්න තිබෙනවා. ඊයේ ගරු ඇමතිතුමාගේ නායකත්වය යටතේ තීන්දුවක් ගත්තා, 2006 හා 2016 වර්ෂවල වැටුප් වැඩි කිරීමට අදාළ චක්‍රලේඛ අනුව ඔක්තෝබර් පළමුවන දා ඉඳලා සේවකයන්ගේ පඩි වැඩි කිරීමට. අපි පාරිතෝෂික මුදලුත් ලබා දෙනවා. ඒ වාගේම ඒවායේ තිබෙන ප්‍රශ්න, අනුචිත ආවරණ ප්‍රශ්නත් මේ මාස කිහිපය තුළ විසඳන්න අපි තීන්දුවක් ගත්තා, මේ මාසයේ 10 වනදා පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඒවා ඉදිරිපත් කරලා.

කෙසේ වෙතත්, 2014 වසරෙන් පසුව ලංකා ගමනාගමන මණ්ඩලයට බස් රථ ගෙනැල්ලා නැහැ. වසරකට බස් රථ 550ක් 600ක් අතර ප්‍රමාණයක් සේවයෙන් ඉවත් වෙනවා. 2014 වසරේ ඉඳලා මේ දක්වා බස් රථ නොගැනීම තුළ බස් රථ ඇණිය පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අවුරුදු පහළොවකට-විස්සකට වඩා පැරණි බස් රථ 1,500කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගේ නායකත්වය යටතේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, කැබිනට් පත්‍රිකාව අනුමත වුණා, බස් රථ 500ක් ගෙනෙන්න. ආසන 54 බස් රථ 400ක්, ආසන 35 බස් රථ 100ක් අපි දැන් ඇණවුම් කරලා තිබෙනවා, ඉන්දියාවේ ණය යෝජනා ක්‍රමයක් යටතේ.

[ගරු අශෝක් අබේසිංහ මහතා]

තව මාස කිහිපයක් ඇතුළත ඒ බස් රථ ලැබෙයි කියලා මම හිතනවා. ඒ බස් රථ ලැබුණාම අපි මේ සෑම ඩිපෝ එකකටම ඒ අවශ්‍ය බස් රථ ප්‍රමාණය බෙදා දෙනවා. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට රජයෙන් වසරකට රුපියල් කෝටි 1,600ක මුදලක් දෙනවා. අපි "සිසු සැරිය", "ගැමි සැරිය", "නිසි සැරිය" යනුවෙන් විශේෂ බස් රථ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා. "නිසි සැරිය" කියන්නේ රාත්‍රී කාලයේ ගමන් කරන බස් රථ සේවාවක්. "ගැමි සැරිය" කියන්නේ අනාර්ථික මාර්ගවල ගමන් කරන බස් රථ සේවාවක්. ඒ කියන්නේ අපට කිසිම ලාභයක් නැතිවයි මේ බස් රථ සේවාව ක්‍රියාත්මක කරන්නේ. මෙහිදී කිලෝමීටරයක් ගමන් කරන්න රුපියල් 80ක් පමණ වැය වනවා. නමුත්, රුපියල් 25ක් පමණ තමයි අනාර්ථික මාර්ගවලින් ලැබෙන්නේ. අපි ඒ විධියට ක්‍රමානුකූලව මේ කටයුතු කර ගෙන යනවා. නව බස් රථ ඇණිය ලැබුණු පසුව ඔබතුමා කියන රත්නපුර ප්‍රාදේශිකයේ තිබෙන ඩිපෝ සියල්ලටමත් බස් රථ ලැබෙයි.

ඩිපෝවලට දැන් අපි සේවකයන් බඳවා ගන්නේ කොන්ත්‍රාත් පදනම මත. ඒ බස් රථයෙන් හම්බ කරලා තමයි, ඒ සේවකයන්ට වැටුප් ගෙවන්න ඕනෑ. බස් රථ අඩු හැම ඩිපෝ එකක්ම ඉල්ලන බස් රථ ප්‍රමාණය ඉදිරියේදී අපි ලබා දෙනවා. මේ මාසයේ 15 වෙනි දා නැවත අපි ඒ සේවකයන් වෙනුවෙන් සම්මුඛ පරීක්ෂණ පවත්වනවා. මේ ප්‍රශ්නය දැන් අපි තේරුම් ගෙන තියෙනවා. ඇමතිතුමාගේ නායකත්වය යටතේ අපි මේ ප්‍රශ්නයට විසඳුම් ලබා දීලා තියෙනවා. ගරු මන්ත්‍රීතුමා දැන් මතු කරන ප්‍රශ්නයත් තව මාසයක් ඇතුළත විසඳෙයි. ඒ බස් රථ ලැබුණු පසුව "ගැමි සැරිය", "සිසු සැරිය" වැනි විශේෂ බස් රථ සේවා සඳහා තවත් බස් රථ යොදවන්න අපට පුළුවන්. එතකොට ඒ ගමේ තියෙන ඒ ප්‍රශ්නත් විසඳන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු හේෂා විතානගේ මහතා**
(මාණ්පුමිකු ஹேசான் விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මම ගරු ඇමතිතුමාගෙන් අහනවා.

මේ රජය බලයට පත් වූ මුල් කාලයේදීත් මේ සම්බන්ධයෙන් මම ප්‍රශ්න කළා, ඒ සඳහා ගරු ඇමතිතුමා පිළිතුරු ලබා දුන්නා. පසුගිය කාලයේ දේශපාලන අවශ්‍යතා මත බස් රථ ලබා ගැනීම වෙනුවෙන් මේ ඩිපෝවලට විශාල මුදල් ප්‍රමාණයක් ලබා ගන්න තියෙනවා. ඒ ගණන් එක්කම මේ පාර්ලිමේන්තුවේදී ඊට අදාළ කරුණු සභාගත කළා. ගරු ඇමතිතුමා මැදිහත් වෙලා සේවක ප්‍රශ්නයකට ඉතා සාධනීය ලෙස උත්තර ලබා දෙන ආකාරය ඊයේ අපි දැක්කා. මේ ගැටලු සියල්ලම විසඳන අතරේ මේ මුදල් අය කර ගැනීම පොඩ්ඩක් අමතක වෙලා තියෙනවා. මේ මුදල් අය කර ගැනීම වෙනුවෙන් අමාත්‍යාංශය විධියට අරගෙන තියෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා විශේෂයෙන්ම මම දැනගන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ ඉදිරියේදී බස් රථ ටික ලැබුණාම, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමන්ලාට පෞද්ගලික ප්‍රශ්න ඇති වෙලා එතුමන්ලා ඔය වාගේ අපහසුතාවන්ට පත් නොවෙන්න බස් දෙන්න පුළුවන් තත්ත්වයකට අමාත්‍යාංශය දියුණු වනවා වාගේ දැන් අපට පෙනෙනවා. කෙසේ හෝ පසුගිය කාලයේ එතුමන්ලා අරගත් මුදල් ටික -මම හිතන්නේ අපේ ඇමතිතුමාත් මේ සම්බන්ධයෙන් දන්නවා.- ආපහු අය කර ගන්න ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)
ඒ පිළිබඳව දැනට කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු පවරා තියෙනවා. දැනට ඒ නඩුව විභාග වනවා. මුදල් නොගෙවපු බස් රථ වෙනුවෙන් මුදල් අය කර ගැනීමට ඒ නඩුවෙන් -නීත්‍යානුකූල මාර්ගයෙන්- අපි කටයුතු කර ගෙන යනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Hesha Withanage)
ස්තුතියි, ගරු ඇමතිතුමනි.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අමාරුයි.

ප්‍රශ්න අංක 3 -492/'18- (2), ගරු චමින්ද විජේසිරි මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -525/'18- (1), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -527/'18- (2), ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා- *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6, 563/'18 - (1), ගරු අශෝක ප්‍රියන්ත මැතිතුමා.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු කථානායකතුමනි, ඒකාබද්ධයේ මන්ත්‍රීවරු සභා ගර්භයේ නැති නිසායි මම කලින් අවස්ථාවේදී පැහැදිලි කර ගැනීමකට අවස්ථාව ඉල්ලුවේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
විෂය භාර ඇමතිතුමාත් නැහැ, උත්තරයත් නැහැ.

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, සති දෙකක් යද්දි පළාත් සභාවේ කාලය ඉවරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ප්‍රශ්නය කීවෙනි වරටද ඉදිරිපත් කරලා තිබෙන්නේ?

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
පළමුවෙනි වරට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් තුන් වතාවකට වැඩිය කල් ගන්න අවස්ථාව දෙන්නේ නැහැ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම : පියවර
## உள்நாட்டுப் பால் உற்பத்தியை அதிகரித்தல்:
## நடவடிக்கை
## UPLIFTMENT OF LOCAL DAIRY INDUSTRY: MEASURES TAKEN

583/'18

**7. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ දේශීය කිරි නිෂ්පාදනය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) යහපාලන රජය යටතේ දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை இலங்கையில் உள்நாட்டு பால் உற்பத்தி ஆண்டு அடிப்படையில் தனித்தனியே எவ்வளவென் பதையும்;

(ii) நல்லாட்சி அரசாங்கத்தின் கீழ் உள்நாட்டு பால் உற்பத்தியை அதிகரிப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs:

(a) Will he inform this House-

(i) Separately, of the annual local dairy production of Sri Lanka from the year 2010 up to now; and

(ii) of the measures taken by the Government of Good Governance to uplift the local dairy production?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

| වර්ෂය | වාර්ෂික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) |
|---|---|
| 2010 | 247.55 (දෙසිය හතළිස් හතයි දශම පහයි පහයි) |
| 2011 | 258.30 (දෙසිය පනස් අටයි දශම තුනයි) |
| 2012 | 299.25 (දෙසිය අනූ නවයයි දශම දෙකයි පහයි) |
| 2013 | 329.17 (තුන්සිය විසි නවයයි දශම එකයි හතයි) |
| 2014 | 333.90 (තුන්සිය තිස් තුනයි දශම නවයයි) |
| 2015 | 374.44 (තුන්සිය හැත්තෑ හතරයි දශම හතරයි හතරයි) |
| 2016 | 384 ( තුන්සිය අසූ හතරයි) |
| 2017 | 396.20 (තුන්සිය අනූ හයයි දශම දෙකයි) |

(ii) ඉහළ නිෂ්පාදන හැකියාවක් සහිත වූ උසස් ආරයේ ගැබ්ගත් කිරි දෙනුන් ආනයනය කර ව්‍යාවසායකයින් වෙත සහන මිලට ලබා දීම.

රේඛීය අමාත්‍යාංශය යටතේ පවත්නා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් කිරි ගොවීන් වෙත අවශ්‍ය තාක්ෂණික දැනුම හා අභිජනන ද්‍රව්‍ය ආදී යෙදවුම් මෙන්ම කිරි ගවයින් සඳහා අවශ්‍ය වන එන්නත් හා පශු වෛද්‍ය සේවාව ලබා දීම.

කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට අදාළ පර්යේෂණ හා රෝග විමර්ශන කටයුතු සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අනුබද්ධිත පශු පර්යේෂණ ආයතනය මඟින් සිදු කිරීම.

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා ව්‍යවසායකයින් වෙත අඩු පොලී අනුපාතිකය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ණය ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

කිරි ගොවීන් නිෂ්පාදනය කරනු ලබන කිරි අමාත්‍යාංශය යටතේ පවත්නා "මිල්කෝ" සමාගම මඟින් මිලදී ගැනීම.

අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මඟින් ජාතික කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ඉහළ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

දායකත්වයක් සැපයීම සහ දේශීය කිරි ගොවීන් සඳහා අවශ්‍යවන කිරි ගව පැටවුන් හා තෘණ දඩු, තාක්ෂණික දැනුම හා පුහුණුව ලබා දීම.

(ආ) පැන නොනඟී.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, අදාළ විෂයභාර අමාත්‍යතුමාගෙන් නිරවුල් කර ගන්න කාරණා කිහිපයක් තිබුණා. නමුත් එතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ නැහැ. අපි පසුගිය දිනවල දී මාධ්‍යවලින් දැක්කා, අපේ රටේ කිරි නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා අපේ රජය යටතේ විශාල දායකත්වයක් ලබා දීලා තිබෙන බව. ඒ පිළිබඳව රජයට ස්තුතිවන්ත වනවා.

ඒ හා සම්බන්ධවම ඒ අරමුණින් පසුගිය දිනවල විදේශයෙන් කිරි ගවයන් රාශියක් ගෙනාවා. ඒ කිරි ගවයන් සම්බන්ධව ගැටලු ගණනාවක් තිබුණා. අපි දැක්කා, මේ හරකුන් ගෙන ඒම නිසා විපක්ෂයේ දේශපාලකයින් ඒ අය "අම්බරුවන්" හැටියටත් සඳහන් කළ බව. ගරු කථානායකතුමනි, සමාජ මාධ්‍ය ජාලවල, විද්‍යුත් මාධ්‍යවල පසුගිය දින ගණනාව තුළම අපි දැක්කා, ලංකාව පුරාම සිටින විශාල හරක් රැළක් අද කොළඹට එනවාය කියන ප්‍රකාශ. අපේ රටේ ජනතාවට මම හරක් රැළක් හෝ හරකුන් යැයි-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්නකෝ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කිරීමක්. අපේ රටේ ජනතාවට හරක් රැළක් හෝ හරකුන් කියලා එහෙම අපහාස කරන්නට මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. [බාධා කිරීමක්] මට තව තත්පර තිහක් දෙන්න ගරු කථානායකතුමනි. නමුත් මම දන්නේ නපුරු ගව පල්ලන් රාශියක් අපේ අහිංසක ජනතාව දක්කාගෙන කොළඹට එනවාය කියන එකයි. මේ වන විට නාරම්මල ප්‍රාදේශීය සභාවෙන් මට දුරකථන ඇමතුමක් ලැබුණා, දරුවෙකු ලැබිලා මාස කිහිපයක් ගතවුණු ප්‍රදේශීය සභාවේ සේවිකාවක ගැන. සාමාන්‍යයෙන් ගව රැළක වුණත්, ගව පට්ටියක වුණත් පැටවුන් බිහි කරපු, පැටවුන් වදපු සතුන් ගැන අපි හැම කෙනෙකු තුළම ගෞරවයක්, කරුණාවක් තිබෙනවා. හැබැයි, ඒ සේවිකාවට පවා, වියපත් සේවකයින්ට පවා, රෝගී සේවකයින්ට පවා බරපතළ විධියට තර්ජනය කරලා තිබෙනවා අනිවාර්යයෙන්ම මේ රැළියට සහභාගි වෙන්න ඕනෑය කියලා. නපුරු ගව පල්ලන් පිරිසක් විසින් ගව රැළක් වාගේ ඒ සේවකයන්ව දක්කාගෙන ඒමක් අද සිද්ධ වෙනවා. ඊයේ දවස වන විටම ඒ ඒ පළාත් පාලන ආයතනවලට මත් පැන් ගෙනාවා කියලාත් වාර්තා වුණා. මේ සම්බන්ධයෙන් පුළුවන් නම් මට උත්තරයක් දෙන්න.

කාන්තාවක් දරුවකු ප්‍රසූත කළාම අවශ්‍ය කාලය විවේකීව සිටිය යුතුයි. අපි සතෙකුට වුණත් අනුකම්පා කරන කාලයක් ඒක. නපුරු ගව පල්ලන් රාශියක් විසින් අපේ අහිංසක ජනතාව අද ගව රැළක් වාගේ කොළඹට ගේනවා. මේ පිළිබඳව අපි කාගේත් අවධානය යොමු වුණොත් හොඳයි කියන කාරණය මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි ජනතාවයි, සතුන්වයි වෙන් වෙන්ව සඳහන් කරන්න ඕනෑ. එහෙම නැතිව සඳහන් කිරීම වැරදියි.

ප්‍රශ්න අංක 8 -992/'18- (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -58/'18- (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයට නොවෙයි, මුදල් අමාත්‍යාංශයටයි අදාළ වන්නේ. එම නිසා, නැවත අහන්නට වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඒ ප්‍රශ්නය මුදල් අමාත්‍යාංශයට යොමු කරන්න.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතු තෙල් ටැංකි : විස්තර
## இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்திற்குரிய எண்ணெய்த் தாங்கிகள்: விபரம்
## OIL TANKS BELONGING TO CEYLON PETROLEUM CORPORATION: DETAILS

492/'18

**3. ගරු හේෂා විතානගේ මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹேசான் விதானகே - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Hesha Withanage on behalf of the Hon. Chaminda Wijesiri)

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතු තෙල් ටැංකි තිබේද;

(ii) එසේ නම්, එම තෙල් ටැංකි සංඛ්‍යාව කොපමණද;

(iii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු තෙල් ටැංකි බදු දී තිබේද;

(iv) එසේ නම්, එම තෙල් ටැංකි බදු දී ඇති ආයතන හා රටවල් කවරේද;

(v) යහපාලන රජය බලයට පත්වීමෙන් පසු එම තෙල් ටැංකි බදු දීමෙන් සංස්ථාව ලබා ගත් ආදායම, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පෙට්‍රෝලිය වලංකල් අපිවිරුත්ති අමෛච්චරෛක් කේට්ට විනා:

(අ) (i) තිරුකෝණමලෛ තුරෛමුකත්තෛච් චාර්න්තතාක පෙට්‍රෝලියක් කූට්ටුත්තාපනත්තිර්කුරිය එණ්ණෙය්ත් තාංකිකළ් ඉරුක්කින්රනවා එන්පතෛයුම්;

(ii) ආමෙනිල්, අන්ත එණ්ණෙය්ත් තාංකිකළින් එණ්ණික්කෛ එව්වළවෙන්පතෛයුම්;

(iii) ඉලංකෛ පෙට්‍රෝලියක් කූට්ටුත්තාපනත්තිර් කුරිය එණ්ණෙයත් තාංකිකළ් කුත්තකෛක්කු වළංගප්පට්ටුල්ළනවා එන්පතෛයුම්;

(iv) ආමෙනිල්, අන්ත එණ්ණෙය්ත් තාංකිකළ් කුත්තකෛක්කු වළංගප්පට්ටුල්ළ නිරුවනංකළ් මර්රුම් නාටුකළ් යාවෛ එන්පතෛයුම්;

(v) නල්ලාට්චි අරසු අතිකාරත්තිර්කු වන්තතන් පින්නර් අන්ත එණ්ණෙය්ත් තාංකිකළෛ කුත්තකෛක්කු වළංගියතන්මූලම් කූට්ටුත් තාපනම් පෙට්‍රුක්කොණ්ට වරුමානත්තෛ ඔව්වොරු වරුටත්තිර්කමෛය වෙව්වේරාක සමර්ප්පිප්පාරා එන්පතෛයුම්;

අවර් ඉච්චපෛයිල් අරිවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Petroleum Resources Development:

(a) Will he inform this House-

(i) whether oil tanks belonging to the Ceylon Petroleum Corporation are located at the Trincomalee Harbour;

(ii) if so, the number of such oil tanks;

(iii) whether oil tanks belonging to the Ceylon Petroleum Corporation have been leased out;

(iv) if so, the names of the institutions and countries to which the above-mentioned tanks have been leased; and

(v) whether information on the income earned by the Corporation by leasing the aforementioned oil tanks after the Government of Good Governance came to power will be submitted, seperately on per year basis?

(b) If not, why?

**ගරු අර්ජුන රණතුංග මහතා (ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Petroleum Resources Development)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

තෙල් ටැංකි ත්‍රිකුණාමලයේ, වීන වරායේ, මීනන්වායි හි පිහිටා ඇත.

**සැ.යු.** 1963 දෙසැම්බර් කාලය තුළදී මුළු වටිනාකම ස්ටර්ලිං පවුම 250,000ක මුදලකට මෙම පරිශ්‍රයේ පවතින ගොඩනැඟිලි සහ තෙල් ටැංකි පර්යන්තය මිල දී ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගිවිසුමකට එළඹ ඇත. මෙම මුදල් ප්‍රමාණය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් වාරික 03කින් ගෙවා ඇත. ඉන් පසු 1964 සිට මෙම පරිශ්‍රයේ සමස්ත පාලනය සහ කළමනාකරණය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 1964 සිට භාවිත කරමින් සිටින ලදී. එනමුත් භූමියේ අයිතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත පවරා නොමැත.

(ii) තෙල් ටැංකි 99

(iii) නැත.

සැ.යු. වර්ෂ 2002දී ඛනිජ තෙල් කර්මාන්තය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සිදු කරන අවධියේ මෙම තෙල් ටැංකි පරිශ්‍රය ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (LIOC) වෙත බදු පදනම යටතේ ලබා දීමට තීරණය කර ඇත. කෙසේ නමුත්, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම විසින් තෙල් ගබඩා පහසුකම හා ඊට අනුබද්ධ භූමිය භාර ගත්තද ඊට අදාළ බදු ගිවිසුමක් අත්සන් කර නොමැත.

(iv) ඉන්දියාව - ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (LIOC)

(v) ඔව්.

2015 - ඩොලර් 100

2016 - ඩොලර් 100

2017 - ඩොලර් 100

2018 - ඩොලර් 100

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -525/'18- (1), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*විනාඩි 30 ක් ඉක්මවා ගිය බැවින් ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*Question ordered to stand down.*

## සීමාසහිත සෙලින්කෝ රියැලිටි ඇන්ඩ් කොන්සොලිඩේටඩ් සමාගම : තැන්පත්කරුවන්ට වංචා කිරීම

## වරෙයාරුක්කප්පට්ට සෙලිංකෝ රියල්ටි අන්ට් කොන්සොලිඩේරට් කම්පනි: වෙප්පාළර්කළෙ මෝසඩි සෙය්දල්

## CEYLINCO REALITY AND CONSOLIDATED LIMITED : DEFRAUDING DEPOSITORS

527/'18

**5. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට)**
(මාණ්පුමිකු ජෝන්ස්ටන් පර්නාන්දු - මාණ්පුමිකු වාசுதேவ நாணாயக்கார சார்பாக)
(The Hon. Johnston Fernando on behalf of the Hon. Vasudeva Nanayakkara)

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නො. 25/14, මරදාන වත්ත, හැඳල, වත්තල ලිපිනයෙහි පදිංචි ආර්. ජයබාල් මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි සීමාසහිත සෙලින්කෝ රියැලිටි ඇන්ඩ් කොන්සොලිඩේටඩ් සමාගමේ රුපියල් මිලියනයක්, වසර තුනකට තැන්පත් කර එයින් ලැබෙන පොලී ආදායමෙන් ජීවත් වූ බවත්;

(ii) මෙම මුදල සඳහා ගෙවිය යුතු පොලිය වරින් වර අක්‍රමවත්ව ගෙවා ඇති බවත්;

(iii) මූලික තැන්පතු මුදලින් ඉතිරිව ඇති රු. 525,000/- ක මුදල කල් පිරීම මත ආපසු ගෙවීමට නියමිත වුවද, කොපමණ ඉල්ලීම් කළද සමාගම විසින් එම මුදල ආපසු ලබා නොදෙන බවත්;

එතුමා දන්නේද?

(ආ) ඉහත කී සමාගම ඇතුළු මෙබඳු තවත් සමාගම් රාශියක් මේ අයුරින් තැන්පත්කරුවන්ට වංචා කිරීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**නිති මත්රුම් වෙකුසන ඌටක අමෛච්සරෛක් කේට්ට විනා:**

(அ) (i) இல. 25/14, மரதான வத்த, ஹெந்தல, வத்தளை எனும் முகவரியில் வதியும் திரு. ஆர். ஜயபால், இலங்கை மத்திய வங்கியில் பதிவுசெய்யப் பட்டுள்ள வரையறுக்கப்பட்ட செலிங்கோ றியல்ரி அன்ட் கொன்சொலிடேரட் கம்பனியில் ஒரு மில்லியன் ரூபாவை, மூன்று ஆண்டு காலத்திற்கு வைப்பிலிட்டு அதிலிருந்து கிடைக்கும் வட்டி வருமானத்தில் வாழ்க்கை நடத்தி வந்தார் என்பதையும்;

(ii) இப்பணத்திற்காகச் செலுத்தவேண்டிய வட்டி ஒழுங்குமுறையற்ற விதத்தில் செலுத்தப்பட்டுள்ளதென்பதையும்;

(iii) ஆரம்ப வைப்புத் தொகையில் எஞ்சியுள்ள ரூபா 525,000 /= பணத்தொகை முதிர்ச்சியடைந்ததன் அடிப்படையில் திருப்பிச் செலுத்த உத்தேசமாயிருந்த போதிலும், எவ்வளவுதான் கோரிக்கை விடுக்கப்பட்ட போதிலும் அத்தொகை திருப்பி வழங்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மேற்படி கம்பனி உட்பட இத்தகைய பல கம்பனிகள் இவ்வாறு பண வைப்பாளர்களுக்கு மோசடி செய்தல் தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Is he aware that-

(i) Mr. R. Jayabal residing at No. 25/14, Maradana Watta, Hendala, Wattala, depended on the interest income received by depositing Rs. 1 million for three years with Ceylinco Reality and Consolidated Ltd., a company that was registered with the Central Bank of Sri Lanka;

(ii) the interest payable on the said amount has been paid intermittently in an irregular manner; and

(iii) even though the balance Rs. 525,000 out of the amount initially deposited has to be paid back on maturity, the company has failed to provide that amount despite repeated requests?

(b) Will he inform this House of the steps that will be taken regarding defrauding of depositors in this manner by several such companies including the aforesaid one?

(c) If not, why?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 'සෙලින්කෝ රියලටි ඇන්ඩ් කොන්සොලිඩේටඩ් ලිමිටඩ්' නම් ආයතනය 1988 අංක 30 දරන බැංකු පනතේ හෝ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ (කලින් 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත) ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍ර ලබා ඇති ආයතනයක් නොවන අතර ඒ අනුව එම ආයතනයට මහජනයාගෙන් තැන්පත් භාර ගැනීමට බලයක් නොමැත.

(ii) එම ආයතනයට මහජනයාගෙන් තැන්පතු භාර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් බලපත්‍රයක් ලබා නොතිබූ හෙයින් මේ සම්බන්ධව අධීක්ෂණයක් සිදු නොකෙරේ.

(iii) මෙම ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී ආයතනයක් නොවන බැවින් මෙම ගැටලුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට ලක් නොවූ අතර ගැටලු මතු වීමෙන් පසුව මෙවැනි ආයතනවල මුදල් තැන්පත් කිරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් දිගින් දිගටම පවත්වනු ලැබේ.

(ආ) බලපත්‍රලාභී බැංකු හා බලපත්‍රලාභී මුදල් සමාගම්හි නියාමන බලධාරියා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සුදුසු සුපරීක්ෂණ ක්‍රමවේද යොදා ගනිමින් බැංකු හා මුදල් සමාගම්වල තැන්පත්කරුවන් ආරක්ෂා කිරීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව දැනට එසේ ලියා පදිංචිව සිට මූල්‍ය අර්බුදයන්ට ලක්ව ඇති මුදල් සමාගම්හි මුදල් තැන්පත්කරුවන්ට සිදුවන අලාභය අවම කිරීමට අවශ්‍ය මැදිහත්වීම් සිදු කර ඇත.

උදාහරණයක් ලෙස ප්‍රමුඛ බැංකුවෙහි තැන්පතුකරුවන් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවට අන්තර්ග්‍රහණය කර නැවත තැන්පත් මුදල් ආපසු ගෙවීම දැක්විය හැකිය.

එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 'ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය'ක් ස්ථාපිත කර ඇති අතර ඒ හරහා මූල්‍ය අර්බුදයට ලක් වන ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි බැංකුවක හෝ මුදල් සමාගමක බලපත්‍රය අවලංගු කිරීමකදී එක් තැන්පත්කරුවෙකුට රු.600,000ක උපරිමයකට යටත්ව වන්දි මුදලක් ලබා ගැනීමේ හැකියාව ඇත.

කෙසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරයකින් තොරව මහජන තැන්පත් භාර ගන්නා ආයතන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මඟින් එකී ආයතන මුදල් ව්‍යාපාර පනතේ හෝ බැංකු පනතේ ප්‍රතිපාදනයන්ට පටහැනිව මුදල් ව්‍යාපාරයන්හි නිරතවන බව නිශ්චය කිරීමෙන් අනතුරුව එකී පනත යටතේ සුදුසු නීතිමය පියවර ගනු ලබයි. උදාහරණ කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

ඔකඳ ෆිනෑන්ස් ලිමිටඩ් - වූදිතයන් වරදකරුවන් බවට 2011 වසරේදී තීරණය වී ඇත.

රූරල් ඩිවලොප් ඉන්වෙස්ට්මන්ට් - සියලු වූදිතයන් වරදකරුවන් බවට 2017 වසරේදී තීරණය වී ඇත.

ජනහද ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් ) මෙම ආයතන සම්බන්ධයෙන්

සක්විති හවුස් කන්ස්ට්‍රක්ෂන්ස් ) නීතිමය පියවර ගැනීම සඳහා

ඩී.කේ උදයසිරි ) නීතිපතිතුමා වෙත යොමු කර ඇත.

සී.අයි.එෆ්.එල්. ෆිනෑන්ස් ඇන්ඩ් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ් ) සෙලින්කෝ ඉන්ටනැෂනල් රියලටි ලිමිටඩ් )

(ඇ) පැන නොනඟී.

## පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන : මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

## தொல்பொருளியல் முக்கியத்துவம்வாய்ந்த இடங்கள்: மகாஓயா பிரதேசச் செயலாளர் பிரிவு

## PLACES OF ARCHAEOLOGICAL INTEREST: MAHAOYA DIVISIONAL SECRETARY'S DIVISION

992/'18

**8. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Johnston Fernando on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உயர்கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) அம்பாறை மாவட்டத்தின் மகாஓயா பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள அடையாளம் காணப்பட்ட தொல்பொருளியல் இடங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை;

(ii) அப்பிரிவில் அகழ்வுகள் மேற்கொள்ளப்படாத எனினும், அடையாளம் காணப்பட்ட தொல் பொருளியல் இடங்கள் அமைந்துள்ளனவா;

(iii) ஆமெனில், அவை யாவை;

(iv ) மேற்படி பிரிவில் அமைந்துள்ள தொல் பொருளியல் முக்கியத்துவம் வாய்ந்த ராஜமகா விகாரைகளின் எண்ணிக்கை எவ்வளவு; அது பற்றிய அறிக்கையொன்றைச் சமர்ப்பிப்பாரா; மற்றும்

(v ) மேற்படி தொல்பொருளியல் இடங்களின் பேணல் நடவடிக்கைகளுக்காக ஒதுக்கப்பட்டுள்ள ஏற்பாடுகள் பற்றிய முழுமையான அறிக்கையொன்றை இச்சபைக்கு சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Cultural Affairs:

(a) Will he inform this House-

(i) the number of archaeological sites that have been identified in Mahaoya Divisional Secretary's Division in Ampara District along with their names;

(ii) whether there are any archaeological sites in the aforesaid division which have been identified, but excavations have not been done in them;

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

(iii) if so, the aforesaid archaeological sites;

(iv) the number of Rajamaha Viharas in the aforesaid division which have an archaeological value; whether a report of them will be submitted; and

(v) whether a detailed report of the allocations made for the conservation activities of the aforesaid archaeological sites will be submitted to this House?

(b) If not, why?

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education and Cultural Affairs)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 51. ස්ථාන නාමාවලිය ඇමුණුම අංක 01හි** දැක්වේ.

(ii) ඔව්.

(iii) ඇමුණුම අංක 02හි** දැක්වේ.

(iv) 12. ඔව්. ඇමුණුම අංක 03හි** දැක්වේ.

(v) 2018 වර්ෂය සඳහා වාස්තු විද්‍යා සංරක්ෂණයට අදාළව ප්‍රතිපාදන වෙන් වී නොමැත.

එහෙත්, නඩත්තු කටයුතු යටතේ හෙනන්නේගල පුරාවිද්‍යා ස්ථානයේ ලෙන් බෑම පිළිසකර කිරීම සඳහා රු. 53,839.50ක සහ රඹකැන්ඔය පුරාවිද්‍යා ස්ථානයේ නළ ළිඳක් ඉදිකිරීම සඳහා රු.142,075.00ක ප්‍රතිපාදන වෙන් වී ඇත. තවද, දිස්ත්‍රික්කය තුළ පුරාවිද්‍යා ස්ථානයක් දැක්වෙන මාර්ග සංඥා පුවරු සැකසීම සඳහා රු. 2,477,255.00ක ප්‍රතිපාදන වෙන් වී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

# පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

## ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත
## இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்
## SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL

"2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.***

***2018 සැප්තැම්බර් මස 18වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர் சார்பில் மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக் கப்பட்டது.*

*2018 செப்ரெம்பர் 18, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Power and Renewable Energy; to be read a Second time upon Tuesday, 18th September, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

# පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

## විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත
## அரசியலமைப்புக்கான இருபதாவது திருத்தம் சட்டமூலம்
## TWENTIETH AMENDMENT TO THE CONSTITUTION BILL

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.*

*වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.*

*විනා විවාදයකින් පසුව, ඒ අනුව කරන ලදී.*

*ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.*

*වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.*

*විනා විවාදයකින් පසුව, ඒ අනුව කරන ලදී.*

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Prime Minister, Minister of National Policies and Economic Affairs for report.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කෙටියෙන් පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු විජිත හේරත් මැතිතුමා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, මේ රටේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන පොරොන්දු රාශියක් ජනාධිපතිවරණවලදී විවිධ අපේක්ෂකයන් විසින් ලබා දී තිබුණා. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන අවස්ථාවලදී මේ සාකච්ඡාව ඉදිරිපත් වුණා.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරන වේලාවේදීත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ සාකච්ඡාවක් මතු වුණා. නමුත්, මුළුමනින්ම අහෝසි කිරීමක් සිද්ධ වුණේ නැහැ.

අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය මඟින් ආරම්භ කර තිබෙනවා. නමුත්, ඒ සඳහා බොහෝ කාලයක් ගත වන බවක් පෙනී යනවා.

ඒ වාගේම ගරු කථානායකතුමනි, රටේ ජනතාව රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම වෙනුවෙන් විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ අපේක්ෂාවෙන් ඉන්නවා. මේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම සඳහා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විසිවන සංශෝධනය ලෙස අපි මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ. මෙහි මූලික අරමුණ තනි පුද්ගලයකුට ඒකාධිපති බලයක් පැවරෙන, අත්තනෝමනික බලයක් පැවරෙන විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීමයි. ඒ නිසා අපි මේ පාර්ලිමේන්තුවෙන් ඒ සඳහා අවශ්‍ය කරන අනුමැතිය බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ඒ සඳහා අවශ්‍ය කරන සහයෝගය මේ රටේ ජනතාවගෙන් බලාපොරොත්තු වෙනවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරලා ශිෂ්ටසම්පන්න රටක් බිහි කිරීම සඳහා රට තවත් ඉදිරියට ගෙන යන්න මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවහල් වේවිය කියා අප අපේක්ෂා කරනවා. ඒ වෙනුවෙන් තමයි අද මේ සංශෝධනය ඉදිරිපත් කරනු ලබන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින සලකා බැලීමට නියමිත න්‍යාය පත්‍රයේ විෂය අංක 1හි සඳහන් තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථා 2018 ජූනි මස 20වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, 2018 ජූලි 3වැනි දින අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සලකා බලා ඒ සම්බන්ධව එකී කාරක සභාවේ වාර්තාව 2018 ජූලි මස 5වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද බව මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

## තැපැල් කාර්යාල ආඥා පනත : ව්‍යවස්ථා
## அஞ்சல் அலுவலகக் கட்டளைச் சட்டம்: ஒழுங்குவிதிகள்
## POST OFFICE ORDINANCE: RULES

[අ.භා. 1.47]

**ගරු කබීර් හාෂිම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development)

ගරු කථානායකතුමනි, තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ 7 වැනි වගන්තිය යටතේ තැපැල් ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ එකඟතාව ඇතිව තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 07 දිනැති අංක 2074/32 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.20 දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථා අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, වැඩබලන අමාත්‍යවරයා හැටියට දේශීය තැපැල් ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වන තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථා ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමා විසින් 2018 ජූනි 07 දිනැති අංක 2074/32 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ මෙම තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථා පළ කරනු ලැබුවා. ඒ අනුව, කාලීන අවශ්‍යතාව මත තැපැල් කටයුතු මෙහෙයවීම් සඳහා යන වියදම් වැඩි වීමත් එක්ක යම් යම් සංශෝධන කරන්න සිද්ධ වෙලා තිබෙන බව විශේෂයෙන් දැනුවත් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසන් වරට තැපැල් ගාස්තු සංශෝධනයක් සිදු වුණේ මීට වසර හතරකට කලින්. පසුගිය රජය 2014 ජූනි මාසයේ 07 වැනි දා ගැසට් නිවේදනයකින් ඒ සංශෝධනය ක්‍රියාත්මක කළා. එයින් අවුරුදු හතරකට පසු මේ අවස්ථාවේ තැපැල් ගාස්තු සංශෝධනයක් ගෙන ඒම කාලීන බවට අමාත්‍යාංශය තීරණයක් අරගෙනයි ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම ගැසට් නිවේදනය නිකුත් කර තිබෙන්නේ.

2010 වර්ෂයේ ඇස්තමේන්තුව මත සාමාන්‍යයෙන් ග්‍රෑම් 20ක ලිපියක් බෙදා හැරීමට යන වියදම රුපියල් 18යි. ඒක 2010 වර්ෂයේ කළ ඇස්තමේන්තුවක්. අද වෙනකොට ග්‍රෑම් 20ක ලිපියක් බෙදා හැරීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුවට ඊට වඩා විශාල වියදමක් දැරීමට සිදුවන බව විශේෂයෙන් සඳහන් කරන්නට කැමතියි. එනමුත් මෙය විශේෂ සේවාවක් හැටියට කරන දෙයක් නිසා ඒ සම්පූර්ණ වියදම ජනතාවට පටවන්නේ නැතිව රජය එහි කොටසක් දරා ගැනීමට සුදුසු බව තමයි අමාත්‍යාංශය තීරණය කළේ.

පෞද්ගලික ලිපි තැපෑල සහ ව්‍යාපාරික ලිපි තැපෑල කියන වර්ග දෙකෙන් රුපියල් 10කට තිබුණු ඒ පෞද්ගලික ලිපි තැපැල් ගාස්තුව පමණක් රුපියල් 15 දක්වා වැඩි කරන්නට කටයුතු කර තිබෙන අතර, ව්‍යාපාරික ලිපි තැපැල් ගාස්තුව වෙනස් නොකරන බව අමාත්‍යාංශය සඳහන් කරනවා.

දේශීය තැපැල් සේවයේ courier service සඳහා කාලීන ගාස්තු සංශෝධනයක් ක්‍රියාත්මක කරන අතර, සමහර ඒවායේ මිල අඩු කරන්නට අමාත්‍යාංශය තීරණය කර තිබෙනවා. විශේෂයෙන් parcel post වැඩියෙන් පාවිච්චි කරන එකක් හැටියට සලකා එහි මිල අඩු කිරීමක් මේ ගැසට් පත්‍රයෙන් කර තිබෙනවා.

කලින් තිබුණු ක්‍රමයට Logi Post හරහා කිලෝග්‍රෑම් 20ක් කෙනෙකුට යවන්න පුළුවන් නම් එය කිලෝ ග්‍රෑම් 40 දක්වා වැඩි කර තිබෙනවා, සේවාව පහසු කරන්නට.

කලින් තිබුණු ලියාපදිංචි තැපැල් සේවා විමසීම් ගාස්තු අය කිරීම සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබෙනවා. ඒ අනුව,නොමිලේ ඒ විමසීම් කටයුතු කරන්නට අද අවස්ථාව තිබෙනවා.

විශේෂයෙන් පාසල් දරුවන් පාවිච්චි කරන තැපැල් හැඳුනුම් පත් සේවාවේ ගාස්තුවල වෙනසක් නොකර, තිබෙන ගාස්තුවම අය කිරීම සඳහා කටයුතු කර තිබෙන බවටත් මා මේ සභාව දැනුවත් කරනවා.

පුණ්‍යායතන පිළිබඳව විවිධ මත තිබුණා. පුණ්‍යායතන ඒ category එකෙන් ඉවත් කරනවාය කියන මතයක් තිබුණා. නමුත් එවැනි කිසි වෙනසක් පුණ්‍යායතන සම්බන්ධයෙන් කරන්නේ නැති බවත් අමාත්‍යාංශය දන්වා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමා වෙනුවෙන් තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථා මේ සභාවේ අනුමැතිය සඳහා මා ඉදිරිපත් කරනවා. ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[பி.ப. 1.51]

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று நடைபெறுகின்ற தபால் தொடர்பான விவாதத்திலே கலந்து கொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறுகிறேன். தபால் சேவை முக்கிய அரச சேவைகளில் ஒன்றாகவும் சமூகம் சார்ந்த சேவைகளின் முதுகெலும்பாகவும் விளங்குகிறது. அந்த வகையிலே, தபால் சேவைக்கூடாக ஒரு காத்திரமான சேவையை வழங்கவேண்டியது அமைச்சினதும் அமைச்சோடு சம்பந்தப்பட்ட திணைக்களங்களினதும் முக்கிய கடமையாக இருக்கின்றது.

கடந்த மூன்று தசாப்தங்களுக்கு மேற்பட்ட யுத்த சூழ்நிலையினால், வடக்கு, கிழக்கு மாகாணங்களிலே குறிப்பாக தமிழ் மக்கள் அதிகம் செறிந்து வாழுகின்ற பகுதிகளிலே இயங்கிய பல தபால் நிலையங்கள் முற்றுமுழுதாகச் சீரழிந்து, இயங்க முடியாது போனமை உங்களுக்குத் தெரியும். இன்று அவற்றில் சில தபால் நிலையங்கள் அடிப்படை வசதிகள்கூட இல்லாத நிலையில் இயங்குவதைக் காண முடிகிறது. இந்த நிலையிலே, இந்த அரசாங்கம் தனது ஆட்சியில் மூன்று வருடங்களைக் கடந்திருக்கிறது. இந்த மூன்று வருடங்களில் மூன்று வரவு செலவுத் திட்டங்களை நாங்கள் சந்தித்திருக்கிறோம். இந்த மூன்று வரவு செலவுத் திட்டங்களின்போதும் தபால், தபால் சேவைகள் அமைச்சுத் தொடர்பாகப் பல்வேறு தேவைப் பாடுகள் குறித்த கோரிக்கைகளை நாங்கள் முன்வைத்திருக் கின்றோம். ஆனால், அத்தகைய கோரிக்கைகள், திட்ட முன்மொழிவுகளாக இருக்கின்றதே ஒழிய, செயற்பாட்டுக்கு வந்ததாக இல்லை. ஆகவே, வடக்கு, கிழக்கு மாகாணங்களில் தபால் துறையை மேம்படுத்த வேண்டிய - வளப்படுத்த வேண்டிய பாரிய பொறுப்பு தபால் துறை அமைச்சுக்கு இருக்கின்றது. இந்த ஆட்சிக்கு இன்னும் இரண்டு வருடங்கள்தான் எஞ்சியிருக்கின்ற நிலையில் கடந்த மூன்று வருடங்களில் நிறைவேற்றாத தபால் துறை சார்ந்த விடயங்களை எஞ்சியுள்ள காலப்பகுதியில் இந்த ஆட்சியாளர்கள் எந்தளவுக்கு நிறைவேற்றப்போகிறார்கள்? என்ற சந்தேகம் எங்களுக்கு இருக்கின்றது. ஆகவே, முன்வைக்கப்படுகின்ற திட்ட முன்மொழிவுகள் சரியான முறையில் நடைமுறைப்படுத்தப்பட வேண்டும்.

இன்று மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு பிராந்திய தபால் தரம் பிரிக்கின்ற நிலையம் ஒன்றும் 21 தபால் கந்தோர்களும் 66 உப தபாலகங்களும் இருக்கின்றன. இவற்றில் 75 வீதமான தபால் நிலையங்கள் மற்றும் உப தபால் அலுவலகங்கள் மலசலகூட வசதிகள்கூட இல்லாத நிலையில் இயங்குகின்றன. மிகவும் வேதனைப்படவேண்டிய விடயம் என்னவெனில், மட்டு. நகரில் இருக்கின்ற பிராந்திய தபால் தரம் பிரிக்கும் நிலையம்கூட ஆண்களுக்குரிய கழிவறை வசதிகள் இல்லாத நிலையிலே இயங்குகின்றது. அங்கு வேலை செய்கின்ற ஊழியர்கள் ஓய்வெடுப்பதற்கான restroom கூட இல்லை. அங்கு மலசலகூட வசதியே சீராக இல்லா நிலையில் ஓய்வறை வசதியை எவ்வாறு எதிர்பார்க்க முடியும்?

இன்று மட்டக்களப்பு மாவட்டத்தில் இரண்டே இரண்டு வாகனங்கள்தான் தபால் சேவையில் ஈடுபடுகின்றன. அவையும் பழைய வாகனங்கள். அதில் ஒரு வாகனம் மட்டக்களப்பு - பாணம வரை கிட்டத்தட்ட 300-350 கிலோமீற்றர் தூரம் சேவையில் ஈடுபடுத்தப்படுகின்றது. அந்த

வாகனமும் மிகவும் பழுதடைந்த நிலையிலே அதாவது பாவிப்பதற்கு மிகவும் கஷ்டமான நிலையிலேயிருக்கின்றது. அடுத்த வாகனம் மட்டக்களப்பிலிருந்து கதிரவெளிக்கு கிட்டத்தட்ட 240 - 280 கிலோ மீற்றர் வரை சென்று வரவேண்டியிருக்கின்றது. அதாவது முழு மாவட்டத்துக்குள்ளும் மாகாணத்தைக் கடந்தும் இந்த இரண்டேயிரண்டு வாகனங்கள்தான் சேவையில் ஈடுபட வேண்டியிருக்கின்றது. இந்தக் குறைபாட்டை நிவர்த்தி செய்வது தொடர்பாகப் பல கோரிக்கைகள், பல முன்மொழிவுகள் சமர்ப்பிக்கப்பட்டன. ஆனால், தபால் துறை அமைச்சு இந்த விடயத்திலே கூடுதலான அக்கறை எடுத்ததாகத் தெரியவில்லை.

அதேவேளையிலே, பொதுமக்கள் photocopy சேவையைப் பெற்றுக் கொள்வதற்குரிய ஓர் இயந்திரம்கூட இல்லாத நிலையிலே இன்று அந்தப் பிரதான தபால் நிலையம் இயங்குகின்றது. அலுவலகப் பாவனைக்குக்கூட photocopy இயந்திரமில்லாத நிலையிருக்கின்றது. இது மாத்திரமல்ல, அங்கு நான்கே நான்கு கணினிகள்தான் பாவனையிலிருக்கின்றன. அவை ஒவ்வொன்றும் 8 வருடங்கள், 10 வருடங்கள் பாவனையைக் கொண்டவையாகக் காணப்படுகின்றன. நான் தபால் துறை அமைச்சுக்கு முன்வைக்கின்ற இந்தத் தேவைகள் - photocopy இயந்திரமாக இருக்கலாம், கணினியாக இருக்கலாம், வாகனம் தொடர்பான விடயமாக இருக்கலாம் - அவை சாதாரணமான தேவைகள். இந்தக் குறைபாட்டை நிவர்த்தி செய்ய வேண்டிய தேவை சம்பந்தப்பட்ட அமைச்சுக்கு இருக்கின்றது. ஆகவே, இந்த விடயத்திலே அமைச்சு கூடுதல் கவனம் செலுத்த வேண்டும்.

இன்று அரச நிறுவனங்களிலே சிறப்பாகச் சேவைகளைச் செய்த அவற்றின் தலைவர்களுக்கு அதிமேதகு ஜனாதிபதி மற்றும் கௌரவ பிரதமர் ஆகியோரின் தலைமையிலே விருதுகள் வழங்கப்பட்டன. ஆனால், மட்டக்களப்பு மாவட்டத்திலே உள்ள 169 சதுர கிலோ மீற்றருக்கு மேற்பட்ட பரப்பளவைக் கொண்ட மிகப் பெரிய பிரதேச சபையான பட்டிப்பளைப் பிரதேச சபையினுடைய சேவைகளைச் சரியான முறையிலே செய்வதற்கு அந்தச் சபைக்கு வாகன வசதியில்லாத நிலைமை காணப்படுகின்றது. அதன் தவிசாளருக்குக்கூடச் சிறந்த வாகனம் இல்லாத நிலையிலேயே அந்தச் சபை இயங்குகின்றது. அதேபோன்று, வவுணதீவுப் பிரதேச சபை, வாகரைப் பிரதேச சபை, ஆரையம்பதிப் பிரதேச சபை, வெல்லாவெளிப் பிரதேச சபை என்று மட்டக்களப்பிலே யிருக்கின்ற பிரதேச சபைகளிலே தவிசாளர்கள் வாகனம் இல்லாத நிலையிலே தங்களுடைய கடமைகளைச் செய்ய வேண்டிய துர்ப்பாக்கிய நிலைக்குத் தள்ளப்பட்டிருக் கின்றார்கள். கிட்டத்தட்ட 549 சதுர கிலோ மீற்றர் பரப்பளவைக் கொண்ட அதாவது, இலங்கையின் மொத்த நிலப்பரப்பிலே கிட்டத்தட்ட ஒரு வீத நிலப்பரப்பைக் கொண்ட அந்தப் பிரதேச சபைகளிலே மக்களை நோக்கிய சேவைகளைச் செய்வதற்குரிய வாகன வசதியில்லை. அதுபோல், கொழும்பு மாவட்டத்தோடு ஒப்பிடும்போது, நிலப்பரப்பிலே கிட்டத்தட்ட 4 மடங்கு கூடிய மட்டக்களப்பு மாவட்டத்திலே தபால் சேவை செய்வதற்கென்று இரண்டேயிரண்டு பழைய வாகனங்கள்தான் இருக்கின்றன. வாகனம், photocopy இயந்திரம், கணினி போன்றவை தொடர்பான இந்தத் தேவைகளைக் கடந்த 3 வருடங்களாக நாங்கள் முன்வைத்து வருகின்றோம். எனவே, இப்பொழுது இங்கு வந்திருக்கின்ற தபால் துறை அமைச்சினுடைய அதிகாரிகளாவது இந்த விடயங்களைக் கவனத்திற்கொண்டு இந்தச் சேவையை வழங்க வேண்டும்.

இந்த நாட்டு மக்களுக்குரிய சேவையை வழங்குகின்ற, இந்த நாட்டின் முதுகெலும்பாக இருக்கின்ற தபால் துறை தொடர்பான விவாதம் நடைபெறும்போது, சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் இங்கில்லை. இது மிகவும் கவலைப்படக்கூடிய விடயம். அவர் மாத்திரமல்ல, பிரதி அமைச்சர்கூட இல்லை. இங்கே நாங்கள் குறிப்பிடுகின்ற விடயங்கள் வெறுமனே பேச்சளவிலேயே இருக்கின்றன; முன்வைக்கின்ற கோரிக்கைகள் வெறும் கோரிக்கைகளாகவே இருக்கின்றன. நாங்களும் 'தீர்வு' என்ற ஒரு விடயத்தை மையப்படுத்தி இந்த அரசுக்கு வரவு செலவுத் திட்டம் தொடக்கம் ஒவ்வொரு விடயத்திற்கும் ஆதரவை வழங்கி வருகின்றோம். ஆனால், அமைச்சர்களை நோக்கி, அமைச்சின் செயலாளர்களை நோக்கி நாங்கள் முன்வைக்கின்ற கோரிக்கைகள் எதுவும் நிறைவேற்றப்பட்டதாகத் தெரியவில்லை. அதாவது எங்களால் முன்வைக்கப்படுகின்ற திட்டங்கள், திட்ட முன்மொழிவுகள் நடைமுறைப் படுத்தப்படாமல், செயல் வடிவம் பெறாமல் வெறும் பேச்சளவிலும் எழுத்தளவிலும் அடங்கிவிடுகின்றன.

அதுமாத்திரமல்ல, மட்டக்களப்பு மாவட்டத்திலே கடந்த 30 வருடமாக நடந்த யுத்தத்தின் காரணமாகச் சில தபால் நிலையங்கள் நகரை நோக்கிக் கொண்டுவரப்பட்டன. குறிப்பாக வாகனேரி தபால் நிலையம் யுத்த சூழ்நிலையினால் ஓட்டமாவடிப் பிரதேசத்தை அண்டிக் கொண்டுவரப்பட்டது. இன்று யுத்தம் முடிந்து 10 வருடங்கள் ஆகின்றன. இந்நிலையிலும் அந்தத் தபால் நிலையம் மீண்டும் உரிய இடத்திற்குக் கொண்டு செல்லப்படவில்லை. யுத்தத்தினால் பாதிக்கப்பட்ட மக்கள் தமது தேவைகளுக்காக இன்று கிட்டத்தட்ட 10 கிலோமீற்றருக்கும் மேற்பட்ட தூரம் நகரைநோக்கி நடந்து வரவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலையிருக்கின்றது. இந்த நிலை மாற்றப்பட வேண்டும். அதற்கான நடவடிக்கையை அமைச்சு உடனடியாக மேற்கொள்ள வேண்டும். இன்று பொதுசன மாதாந்த உதவிப் பணமான 250 - 300 ரூபாய் பணத்தைப் பெறுவதற்காகக்கூட வயது முதிர்ந்தவர்கள் 10 - 15 கிலோமீற்றர் தூரம் போக்குவரத்துச் செய்ய வேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலையிருப்பதும் உங்களுக்குத் தெரியும். ஆகவே, வறுமைக் கோட்டுக்குக்கீழ் வாழ்கின்ற அந்த முதியவர்களுக்குக் கொடுக்கப்படுகின்ற 250 - 300 ரூபாய் பணத்தை அவர்களின் காலடிக்குக் கொண்டுவந்து கொடுப்பதற்கேற்றவாறு தபால், தபால் சேவைகள் அமைச்சு விசேட நடமாடும் சேவைகளை ஏற்படுத்த வேண்டும். எல்லா இடங்களிலும் தபால் நிலையங்களைத் திறக்காவிட்டாலும் பரவாயில்லை. மக்களுடைய அசௌகரியத்தைப் போக்குவதற்கான நடமாடும் சேவைகளையாவது விரிவுபடுத்த வேண்டுமென்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

களுவாஞ்சிக்குடி பிரதேசச் செயலக பிரிவை உள்ளடக்கிய பகுதி கிட்டத்தட்ட 65 - 66 சதுர கிலோ மீற்றர் நிலப் பரப்பைக் கொண்டதாகும். ஆனால், அங்கிருக்கின்ற தபால் நிலையத்திற்கு உரிய கட்டிட வசதியில்லாமல் இருக்கின்றது. எனவே, அதற்கான கட்டிட வசதியை ஏற்படுத்திக் கொடுக்க வேண்டும். இதனை அமைச்சு கவனத்தில் எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். இன்று இங்கே கௌரவ அமைச்சர் அவர்கள் சமுகமளிக்காவிட்டாலும், அமைச்சின் உயர் அதிகாரிகள் எனது உரையைச் செவிமடுத்துக் கொண்டிருக்கிறார்கள். அவர்கள் இந்த விடயங்களைச் செவிமடுப்பது மாத்திரமல்லாமல், அவற்றை அமைச்சுக்கூடாக நடைமுறைப்படுத்துவதற்குரிய நடவடிக் கைகளையும் மேற்கொள்ள வேண்டும். அப்பொழுதுதான் அங்குள்ள மக்கள் வினைத்திறன்மிக்க தபால் சேவையைப் பெற்றுக்கொள்ளக்கூடிய வாய்ப்பு ஏற்படும்.

[ගරු එස්. වියාලේන්දිරන් මහතා]

மட்டக்களப்பு மாநகரிலேயிருக்கின்ற கோட்டமுனை தபால் நிலையத்திற்கும் கட்டிடம் தேவைப்படுகின்றது. அங்கு இருக்கின்ற ஏறாவூர்ப்பற்று பிரதேச செயலகப்பிரிவு சுமார் 640 சதுர கிலோ மீற்றர் அளவான மிகப்பெரிய நிலப்பைக் கொண்ட பிரதேசமாக இருக்கின்றது. கொழும்பை எடுத்துக் கொண்டால் அது கிட்டத்தட்ட 699 சதுர கிலோ மீற்றராகும். ஆனால், அவ்வாறான பெரிய பிரதேச செயலகப் பிரிவிலுள்ள ஓர் உப தபால் அலுவலகக் கட்டிடம் அங்கே வேலை செய்கின்றவர்களின் தலையிலும் சேவையைப் பெறுவதற்கு வருகின்றவர்களின் தலையிலும் எப்போது இடிந்து விழுமோ என்ற அபாய நிலையிலே இயங்குகின்றது. அங்கு எதுவித வசதிகளும் இல்லை. எனவே, தபால் துறை சார்ந்திருக்கின்ற பௌதிக வளப் பிரச்சினைகள், பௌதிக வளக் குறைபாடுகள் நிவர்த்தி செய்யப்பட வேண்டும். அரசு இந்த விடயத்திலே உரிய நடவடிக்கையை மேற்கொள்ள வேண்டும்.

வடக்கு, கிழக்கிலே குறிப்பாக யுத்தம் நடந்த பகுதிகளில் சேதமாக்கப்பட்ட தபால் நிலையங்கள் இன்று எந்தவிதமான புனரமைப்புகளும் இல்லாமல், அடிப்படை வசதிகள் இல்லாமல் இயங்கிக் கொண்டிருக்கின்றனவென்பது உங்களுக்குத் தெரியும். ஏறாவூர்ப்பற்றிலே கரடியனாற்றுப் பகுதியிலே இயங்குகின்ற தபால் நிலையம் மிக மோசமான நிலையில் காணப்படுகின்றது. மாட்டுக்கொட்டில்கூட அவ்வாறு இருக்காது. படுவாங்கரைப் பகுதியிலே இருக்கின்ற சில உப தபால் நிலையங்கள் மாட்டுக் கொட்டில்களை விடவும் மோசமாக இருக்கின்றன. அவற்றின்மூலம் சிறந்த சேவையைப் பெற்றுக் கொள்ள முடியாத சூழல் காணப்படுகின்றது. பாடசாலை மாணவர்கள் உட்பட வயோதிபர்கள் வரை தபாற்சேவையோடு மிகவும் பின்னிப்பிணைக்கப்பட்டிருக் கின்றார்கள். கல்வி, சமூகம், பொருளாதாரம் என்று பல்வேறு துறைகளும் தபால் சேவையுடன் இணைந்திருக்கின்றன. அதாவது மக்கள் பல்வேறு துறை சார்ந்த சேவைகளைத் தபால் சேவைக்கூடாகப் பெற்றுக் கொள்கின்றார்கள். இந்த நிலையிலே, யுத்தம் நடந்த பகுதிகளிலே வலுவிழந்து, செயலிழந்து மீள் கட்டுமானமோ, புனரமைப்போ இல்லாமல் இயங்குகின்ற தபால் சேவையானது நிச்சயமாக விரிவு படுத்தப்பட வேண்டும்.

கழிவறை வசதி ஓர் அடிப்படைத் தேவையாகும். ஆனால், மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற கிட்டத்தட்ட 87 தபால், உப தபால் நிலையங்களில் அநேகமானவை மலசலகூட வசதியில்லாமல் இருக்கின்றன. அந்த மாவட்டத்திலிருக்கின்ற ஒரேயொரு பிராந்தியத் தபால் தரம் பிரிக்கும் நிலையம் - Main Post Office கூட கழிவறை வசதி இல்லாமல் இயங்குகின்ற தென்றால் அங்குள்ள உப தபால் நிலையங்களின் வசதிகளைப் பற்றிக் கேட்க வேண்டிய அவசியமில்லை. ஆகவே, தபால் அமைச்சு இதிலே கூடுதல் கவனம் செலுத்த வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன். அத்துடன், அந்தப் பிரதேசத்தில் தபால் நிலையப் பொறுப்பதிகாரிகள் - Post Masters - தங்குவதற்குரிய வசதி வாய்ப்புக்கள்கூட இல்லை. செங்கலடி தபால் நிலையத்திலே இருக்கின்ற அவ்வாறானதொரு கட்டிடம் எந்தவிதமான திருத்தங்களும் இல்லாமல் - புனரமைக்கப் படாமல் பழுதடைந்த நிலையில் இருக்கின்றது. இதையும் அமைச்சு கவனத்திலே கொண்டு உரிய நடவடிக்கை எடுக்க வேண்டும். ஏற்கெனவே நான் சொன்னதுபோல, இந்த நாட்டில் மக்களுக்குரிய மிக முக்கியமான சேவைகளில் ஒன்றாக இருக்கின்ற, மக்களின் தேவைகளை இலகுபடுத்தக்கூடிய தபால் சேவை முடக்கப்படுமானால் அல்லது அச்சேவை மந்த கதியிலே இயங்குமானால் நிச்சயமாக மக்கள்தான் அதனால் பாதிக்கப்படுவார்கள்.

நகரை அண்டி வாழ்கின்ற மக்கள் மின்னஞ்சல் முதலிய ஏதோ ஓர் அடிப்படையிலே நவீன தொடர்புச் சாதனங்களோடு தங்களைத் தொடர்புபடுத்தித் தங்களுடைய குறித்த தேவைகளை ஓரளவாவது பூர்த்தி செய்து கொள்ள முடியும். ஆனால், கிராமத்திலே இருக்கின்ற மக்களுக்கு அவ்வாறான வசதிகள் குறைவு. மட்டக்களப்பை எடுத்துக்கொண்டால் அங்கு 85 வீதமான நிலப்பரப்பையும் 85 வீதமான மக்களையும் கொண்ட பகுதியான படுவான்கரைப் பகுதிகளிலே இருக்கின்ற அடிமட்டக் கிராம மக்கள் தபால் சேவைக் கூடாகத்தான் தங்களது குறித்த தேவைகளை நிறைவேற்றிக் கொள்ள வேண்டும். ஆகவே, இந்த விடயங்களில் அமைச்சு கூடுதலான கவனத்தைச் செலுத்த வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். இறுதியாக, இன்று நடைபெறும் இந்த முக்கியமான விவாதத்தில் சம்பந்தப்பட்ட அமைச்சரோ பிரதி அமைச்சரோ கலந்துகொள்ளாதது மிகவும் வேதனைக்குரிய விடயம் என்பதைக் கூறி, வாய்ப்புக்கு நன்றி தெரிவித்து, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

[பி.ப. 2.10]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று உரைநிகழ்த்துவோர் நிரலில் எனது பெயர் இறுதியாக இருந்தாலும்கூட இப்பொழுது எனக்குப் பேசுவதற்கு வாய்ப்பளித்த உங்களுக்கு நன்றி கூறுகின்றேன். இன்று இந்தச் சபையிலே மிக முக்கியமான ஒரு தலைப்பிலே விவாதம் இடம்பெற்றுக் கொண்டிருக்கின்றது. தபால் துறை தொடர்பான இந்த அமைச்சை இந்த நாட்டு மக்களின் வாழ்க்கையோடு சம்பந்தப்பட்ட ஓர் அமைச்சு என்று சொன்னால் அதனை எவராலும் மறுதலிக்க முடியாது. அந்தளவுக்குத் தபால் துறை அமைச்சு மக்களோடு தொடர்புபட்ட, மக்களுக்குச் சேவையாற்றும் ஓர் அமைச்சாக அடையாளப்படுத்தப்பட்டிருக்கின்றது.

முன்பெல்லாம் நாட்டிலேயுள்ள பிரதான அமைச்சுக்களுக்குச் சமமானதாக இந்த அமைச்சும் அடையாளப்படுத்தப்பட்டு, அதற்கென ஒரு தனிக் கௌரவம் வழங்கப்பட்டிருந்தது. ஆனால், இப்பொழுது அந்த நிலையைக் காணக்கூடியதாக இல்லை. அதற்குப் பல்வேறு காரணங்கள் உண்டு. தபால் துறையை நம்பியிருந்தவர்கள், அந்தத் துறையிலே எதிர்பார்ப்போடிருந்தவர்கள் எல்லாம் விசேடமாகத் தொழில்நுட்ப வளர்ச்சியின் காரணமாக இன்று வெவ்வேறு விதமாகத் தங்களது தொடர்பாடல்களை மேற்கொண்டு வருகின்றார்கள். இருந்தாலும்கூட, இந்த அமைச்சை சாதாரண பிரஜைகளோடு மிக நெருங்கிய அமைச்சாக நாங்கள் பார்க்க வேண்டியிருக்கின்றது. அதாவது, இந்த அமைச்சின் அல்லது தபால் திணைக்களத்தின் தேவைகள் வசதி படைத்தவர்களுக்கு, வசதி படைத்த நிறுவனங்களுக்கு முக்கியமில்லாவிட்டாலும்கூட, சாதாரண ஏழை மக்களின் தொடர்பாடலுக்குத் தேவையான ஒரு திணைக்களமாகத் தபால் திணைக்களத்தை நாங்கள் பார்க்க முடியும்.

இன்று தொழில்நுட்பம் வளர்ந்திருக்கின்றது. அந்த வகையில் பல்வேறு விடயங்களும் கணினிமயப்படுத்தப்படுதல் மிக வேகமாக இடம்பெற்றுக் கொண்டிருக்கின்றது; Website என்று சொல்லப்படுகின்ற இணையத்தளம் அதிவேகமாக வளர்ந்து வருகின்றது. குறுஞ்செய்திகள் அனுப்புவது, WhatsApp, Viber, Messenger போன்ற இன்னோரன்ன புதிய

தொழில்நுட்பங்களினூடாக தகவல்களைப் பரிமாறிக் கொள்ளும் வசதிகள் இப்போது ஏற்படுத்தப்பட்டிருக்கின்றன. முன்பெல்லாம் தபாற்காரர் எத்தனை மணிக்கு வருவார்? என்று வாசலிலே மக்கள் காத்துக்கிடந்த ஒரு காலம் இருந்தது. ஆனால், இன்று அதிலே மாற்றம் ஏற்பட்டுள்ளது. ஆயினும், நான் எற்கனவே கூறியதுபோல் தபால் துறை தொடர்பான அமைச்சும் தபால் திணைக்களமும் சாதாரண பிரஜைகளோடு இன்றும் ஒன்றாகக் கலந்திருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. அரச திணைக்களங்கள் அனைத்தும் இந்தத் தபால் திணைக்களங்கள் ஊடாகவே தங்களது பல பணிகளையும் ஆற்றிவந்த தன்மை இன்றும் தொடர்ந்து கொண்டிருக்கின்றது. இவ்வாறிருக்கும்போது தபால் துறை அமைச்சின் செயற்பாடுகள் மற்றும் அதனோடிணைந்த தபால் திணைக்களத்தின் செயற்பாடுகள் மக்களால் முழுமையாக ஏற்றுக் கொள்ளப்பட்டிருக்கின்றனவா? மக்களின் தேவைகளை அவை முழுமையாக ஈடுசெய்கின்றனவா? என்றொரு சந்தேகம் மக்கள் மனதிலே இருந்து கொண்டிருக்கின்றது.

நாட்டின் சனத்தொகை பெருகிக் கொண்டிருக்கின்ற, புதிது புதிதாகக் கிராமங்கள், நகரங்கள், பாரிய நகரங்கள் வளர்ந்து கொண்டுபோகின்ற இந்தக் காலகட்டத்திலே தபால் துறைச் சேவைகளும் அவற்றிற்கு ஈடுசெய்யும் வண்ணம் சமமாக வளர்கின்றனவா? என்று கேட்டால், 'இல்லை' என்ற ஒரு பதில்தான் ஒவ்வொருவரிடமிருந்தும் வரும். இதற்கு என்ன காரணம் என்பதை நாங்கள் மிக ஆழமாக அறிய வேண்டியிருக்கின்றது. தபால் திணைக்களம் என்பது இந்த நாட்டிலேயுள்ள திணைக்களங்களில் ஒரு பிரதான திணைக்களம். முன்பெல்லாம் தபால், தொலைத்தொடர்பு அமைச்சு என்று சொன்னால், அதன் அமைச்சருக்கு இருக்கின்ற கௌரவமே அலாதி! தபால், தொலைத்தொடர்பு அமைச்சராக இருந்த மறைந்த கௌரவ விஜேதுங்க அவர்கள் இந்த நாட்டின் ஜனாதிபதியாக உயர்ந்த வரலாறும் இருக்கின்றது. அந்தளவுக்கு அந்த அமைச்சை நாங்கள் ஒரு பிரதான அமைச்சாகப் பார்த்திருக்கின்றோம். ஆனால், இப்பொழுது அந்தத் தன்மை இருக்கின்றதா? என்று கேட்டால், "இல்லை" என்ற பதிலைத்தான் கூறவேண்டி இருக்கிறது. ஆனால், அந்தத் துறை மக்களின் எதிர்பார்ப்புக்களை, அன்றாடத் தேவைகளைப் பூர்த்தி செய்யும் ஒரு துறையாக இன்றும் இருந்துகொண்டுதான் இருக்கிறது. அதாவது, எந்தளவுக்குத் தொழிநுட்பம் வளர்ந்துகொண்டு போனாலும், எந்தளவுக்கு மக்கள் நவீன துறைகளினூடாகத் தங்களது தேவைகளைப் பூர்த்திசெய்து கொண்டாலும், சாதாரண மக்கள் இன்றும்கூட இந்தத் தபால் திணைக்களத்தின் சேவைகளைத்தான் நம்பியிருக்கிறார்கள். அந்த வகையிலே பார்க்கும்போது, இந்த அமைச்சினதும் அதுசார்ந்த திணைக்களத்தினதும் செயற்பாடுகளை நாங்கள் இன்னும் விரிவாக்கவேண்டிய, நவீனப்படுத்தவேண்டிய அவசியம் இருக்கின்றது. எனவே, இந்தத் துறையின் வளர்ச்சிக்காக இன்னும் பல நடவடிக்கைகளை நாங்கள் மேற்கொள்ளவேண்டி இருக்கின்றது.

சக உறுப்பினர் கௌரவ வியாழேந்திரன் அவர்கள், தனது பிரதேசத்தில் இருக்கும் குறைபாடுகளைப் பற்றி மிகத் தெளிவாக இங்கே எடுத்துக் கூறினார். வடக்கு, கிழக்குப் பிரதேசத்தைப் பொறுத்தளவிலே, அப்பிரதேசம் நீண்ட கால உள்நாட்டு யுத்தத்துக்கு முகம்கொடுத்த ஒரு பிரதேசம். இதனால், அந்தப் பிரதேசத்தின் அன்றாட நடவடிக்கைகள் அனைத்தும் சீர்குலைந்து போனது. இப்பொழுது, நாங்கள் அதனை மீண்டும் கட்டியெழுப்புகின்ற ஒரு நடவடிக்கையிலே இறங்கியிருக்கின்றோம். அதற்காக அரசாங்கம் முழு மூச்சோடு செயல்படுவதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அந்தப் பிரதேசங்களிலே மிக அவசரமாகவும் அவசியமாகவும் தபால் துறைசார்ந்த தேவைகளை நிவர்த்தி செய்யவேண்டிய தேவை அரசாங்கத்திற்கு இருக்கின்றது.

நான் பிரதிநிதித்துவப்படுத்தும் மலையகத்தைப் பற்றியும் இதேநேரத்தில் இங்கே குறிப்பிட்டே ஆகவேண்டும். இந்தத் துறையைப் பொறுத்தளவிலே, இன்னும் வளர்ச்சி காணாத ஒரு பிரதேசமாகவே மலையகம் இருக்கின்றது. அங்கே தபாற் கந்தோர்கள் இருக்கின்றன; உப தபாற் கந்தோர்கள் இருக்கின்றன. ஆனால், அதன் சேவைகள் மக்களின் தேவைகளை ஈடு செய்யும் வகையில் இருக்கின்றதா? என்று கேட்டால், "இல்லை" என்ற பதிலைத்தான் இந்த இடத்திலே மிகத் தெளிவாகவும் உறுதியோடும் கூற முடியும். மலையகம் விசாலமான ஒரு பிரதேசம். அங்கு ஆயிரக்கணக்கான ஏக்கர்களைக் கொண்ட தோட்டங்கள் தனித்தனியாகப் பிரிக்கப்பட்டிருக்கின்றன. ஒவ்வொரு தோட்டத்திலும் ஆயிரக் கணக்கானவர்கள் வாழ்கின்றார்கள்; ஆயிரக்கணக்கான குடும்பங்கள் இருக்கின்றன. அவர்கள் எல்லோரும் வசதி படைத்தவர்கள் அல்லர்; கணினியைப் பாவிக்கக்கூடிய தன்மை கொண்டவர்கள் அல்லர். இவர்கள் தங்களது அன்றாடத் தொடர்பாடல்களுக்கு அந்தப் பிரதேசத்திலே இருக்கும் தபால் கந்தோர்களில் மாத்திரம்தான் தங்கியிருக்கிறார்கள்.

மலையகத்திலே தபால் கந்தோர்களின் சேவைகள் சரியாக இடம்பெறுவதில்லை என்ற காரணத்தினால், முன்பு தோட்டப்புறங்களிலே ஆங்காங்கே முகவர் தபால் நிலையங்கள் ஏற்படுத்தப்பட்டாலும்கூட, அந்த முகவர் தபால் நிலையங்களினூடாக அங்குள்ள மக்கள் தங்களது சேவைகளைச் சரியாகப் பெற்றுக்கொள்ள முடியாத ஒரு நிலைமையிலே, அவ்வாறு அமைக்கப்பட்ட முகவர் தபால் நிலையங்கள் அனைத்தும் இன்று மூடப்பட்டுக் கிடக்கின்றன. இந்த முகவர் தபால் நிலையங்களின் கட்டடங்களை மாத்திரமே இப்பொழுது மலையகத்திலே - தோட்டப்புறங்களிலே பார்க்கக்கூடியதாக இருக்கின்றது. அப்படியென்றால், ஒன்றில் தபால் திணைக்களம் நேரடியாகத் தலையிட்டு அந்தப் பிரச்சினையைத் தீர்க்கவேண்டும். இல்லாவிடின், இவ்வாறான முகவர் தபால் நிலையங்களுக்கு மீண்டும் உயிர் கொடுப்பதற்கான அல்லது மீண்டும் அவற்றை இயங்க வைப்பதற்கான நடவடிக்கைகளில் இறங்கவேண்டும். மலையகத்தைப் பொறுத்தளவிலே, இரண்டும் கெட்டான் நிலைமை!

மலையகத்திலே இருந்து தொழில்களுக்கு விண்ணப்பிக் கின்றவர்கள் நேர்முகப் பரீட்சைக்கான கடிதங்களை எதிர்பார்த்தவண்ணம் இருக்கின்ற ஒரு நிலைமை இருக்கின்றது. ஆனால், துரதிருஷ்டவசமாக என்ன நடக்கின்றது? நேர்முகத் தேர்வுக்காக அனுப்பப்படும் கடிதங்கள் பெரும்பாலான சந்தர்ப்பங்களில் விண்ணப்பதாரி களுக்கு அந்தத் திகதிக்குப் பின்னரே கிடைக்கின்ற அவலம்தான் இன்றும் இருந்துவருகின்றது. இதனை நான் இங்கே கவலையோடு பதிவுசெய்ய வேண்டிய நிலையிலிருக்கின்றேன். அப்படியென்றால், இந்த நாட்டிலே பிரஜைகளுக்கு மத்தியிலே வித்தியாசம்! பிரதேசங்களுக்கு மத்தியிலே வித்தியாசம்! எனவே, இன்று இந்த நாட்டின் மக்களுக்கு மத்தியிலே ஏற்றத்தாழ்வான சேவைகள் இடம்பெற்றுக்கொண்டிருப்பதை இந்த இடத்திலே நான் பதிவுசெய்ய விரும்புகின்றேன். ஆகவே இந்த உயரிய சபை இந்த விடயத்திலே அதிக அக்கறைகாட்டி இந்தக் குறைபாட்டை நிவர்த்தி செய்ய விசேட வேலைத்திட்டத்தை மேற்கொள்ள வேண்டுமென்று வலியுறுத்துகின்றேன்.

[ගරු අ. අරවින්ද් කුමාර් මහතා]

අතුමාත්තිරමල්ල, තපාර්කන්තෝරුක්කුප් පෝය් 250 - 300 රූපාය් මාතාන්ත උතවිප් පණත්තෛප් පෙර්රුක් කොළ්වතර්කුක්කූට අන්ත මක්කළ් පල්වේරු අසෞකරියඞ්කළුක්කු මුකම් කොටුක්කිරාර්කළ් එන්ර විටයත්තෛ ඉන්රු සක උරුප්පිනර් වියාළේන්තිරන් අවර්කළ් කවලෛයෝටු පතිවු සෙය්තාර්. අතනෛ නාන් ආමෝතික්කින්රේන්. කුරිත්ත තපාර්කන්තෝරිල් එන්තෙන්තප් පිරතේසම් උළ්වාඞ්කප්පට්ටිරුක්කින්රතෝ අඞ්කෙල්ලාම් තිනන්තෝරුම් තපාර්කාරර්කළ් පෝකිරාර්කළ්. ආනාල්, මලෛයකත්තෛප් පොරුත්තළවිලේ පෙරුම්පාලුම් අවර්කළ් සරියාක ඉයඞ්කුවතිල්ලෛයෙන්ර කුර්රච්චාට්ටු ඉරුක්කින්රතු. අතනෛ ඉඞ්කු සුට්ටික්කාට්ටියේ ආකවේණ්ටුම්. මේලුම්, ඉන්ත උතවිප් පණමාන සිරුතොකෛප් පණත්තෛප් පෙරුවතර්කුච් සම්පන්තප්පට්ටවර්කළ් පෙරුම් තොකෛප් පණත්තෛච් සෙලවළිත්තු තපාර්කන්තෝරුක්කු වන්තු අලෛක්කළියාත වකෛයිල් අන්තච් සේවෛ විස්තරික්කප්පට වේණ්ටුම්. ඔව්වොරු පිරතේසත්තිලුම් තිනන්තෝරුම් වීටුකළුක්කුප් පෝකින්ර තපාර්කාරර්කළ් ඌටාක ඉන්ත උතවිප් පණත්තෛ වළඞ්කුවතර්කාන ඒර්පාටුකළෛ ඒන් සෙය්ය මුටියාතු? එන්ර කේල්වියෛයුම් ඉඞ්කේ එළුප්ප විරුම්පුකින්රේන්. අව්වාරු සෙය්තාල් තපාල් තිණෛක්කළත්තිර්කුම් ඔරු කෞරවම්! අන්තච් සොච්චත්තෛප් පෙර්රුක්කොළ්පවර්කළුක්කුම් ඉන්තත් තොකෛයෛක් කෂ්ටමිල්ලාමල් නාඞ්කළ් පෙර්රුක්කොණ්ටෝම් එන්ර ඔරු තිරුප්ති! සම්පන්තප්පට්ටවර්කළ් ඉන්ත 250 - 300 රූපායෛප් පෙර්රුක් කොළ්වතර්කු 100 - 150 රූපායෛච් සෙලවු සෙය්තු කොණ්ටු පෝවතිලේ එන්ත අර්ත්තමුම් ඉරුප්පතාක එනක්කුත් තෙරියවිල්ලෛ. අවර්කළින් සිරමත්තෛයුම් සෙලවිනත්තෛයුම් පාර්ක්කුම්පෝතු අවර්කළ් අතනෛප් පෙර්රුක් කොළ්ළාමල් සුම්මාවේ ඉරුක්කලාම්. එනවේ, ඉන්ත නිලෛමෛ මාර වේණ්ටුම්.

අතේනේරත්තිල් මලෛයකත්තිල් ඉයඞ්කික් කොණ්ටිරුක්කුම් තපාර්කන්තෝර්කළිලේ ආළණිප් පර්රාක්කුරෛ නිලවුකින්රතු. ඉතනෛ උටනටියාක නිවර්ත්ති සෙය්යවේණ්ටිය තේවෛ ඉන්ත අමෛච්චුක්කුම් තපාල් තිණෛක්කළත්තිර්කුම් ඉරුක්කින්රතු එන්පතෛයුම් නාන් ඉන්ත ඉටත්තිලේ තෙළිවාකක් කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්. එනවේ, ඉන්ත විටයත්තිලුම් මිකක් කරිසනෛයෝටු සෙයර්පට වේණ්ටුම්.

තපාල් තුරෛ එන්පතු උලකළාවිය රීතියිලේ මිකවුම් පිරපල්යම් වාය්න්ත ඔරු තුරෛයාක ඉරුක්කින්රතු. ඉඞ්කිලාන්තිලේ උළ්ළ Royal Mail මිකප් පිරපල්යම් වාය්න්තතු. අතර්කුත් තනි මවුසු ඉරුක්කින්රතු; තනි කෞරවම් ඉරුක්කින්රතු. තපාල් සේවෛ අඞ්කේයිරුන්තුතාන් එල්ලා ඉටඞ්කළුක්කුම් විරිවුපට්ටතාක නාන් නිනෛක්කින්රේන්. අන්ත වකෛයිලේ පාර්ක්කුම්පෝතු, ඉන්ත තපාල් තුරෛයිලේ ඉන්නුම් පල කට්ටඞ්කළෛ නාඞ්කළ් තාණ්ට වේණ්ටිය තේවෛයුම් අවසියමුම් ඉරුක්කින්රතු. ආකවේ, ඉන්තත් තුරෛයෛ මක්කළෝටු සම්පන්තප්පට්ට ඔරු තුරෛයාක, මක්කළින් අන්රාට වාළ්ක්කෛයෝටු සම්පන්තප්පට්ට ඔරු තුරෛයාක, මක්කළින් පිරච්චිනෛකළෛත් තීර්ප්පතර්කාන ඔරු තුරෛයාක, මක්කළුක්කුච් සේවෛයාර්රුවතර්කාන ඔරු තුරෛයාක නාඞ්කළ් මාර්රියමෛක්ක වේණ්ටුම්. අතර්කු නාඞ්කළ් එල්ලෝරුම් ඉණෛන්තු සෙයර්පට වේණ්ටුමෙන්රු කේට්ටුක්කොණ්ටු, ඉන්තච් සන්තර්ප්පත්තෛ වළඞ්කිය අවෛ මුතල්වර් අවර්කළුක්කු මීණ්ටුම් නන්රි කූරි, විටෛපෙරුකින්රේන්. නන්රි. වණක්කම්.

[අ.හා. 2.26]

**ගරු බිමල් රත්නායක මහතා**
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තැපැල් ගාස්තු වැඩි කිරීම පිළිබඳව ඉදිරිපත් කර තිබෙන ගැසට් නිවේදනය සම්බන්ධ විවාදයේදී මූලික වශයෙන් කරුණු කිහිපයක් කියන්න මම කැමැතියි. පළමුවැනි කාරණය තමයි, තැපැල් ගාස්තු සංශෝධනය සම්බන්ධයෙන් ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන ගැසට් පත්‍රය ගැන සාකච්ඡා කරන්න, අඩු ගණනේ අදාළ ඇමතිවරයා හෝ ගරු සභා ගැබේ මේ අවස්ථාවේදී නැහැයි කියන කාරණය. අද ආණ්ඩුවේ ඇමතිවරු දෙදෙනෙක් මෙම අවස්ථාවේදී ගරු සභාව තුළ ඉන්නවා. ඒ දෙදෙනා මෙම විෂය භාර අමාත්‍යවරු නොවෙයි. ඒ නිසා මේක විවාද කරන්නේ කවුරු එක්කද කියලා ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම විවාදය ආරම්භයේදීම මා තවත් කරුණක් සඳහන් කරන්න කැමැතියි. දැනට සතියකට පමණ කලින් අපේ රටේ කැරම් කණ්ඩායම ලෝක ශූරතාව දිනා ගත්තා. පසුගිය වසර ගණනාවක් තිස්සේම ලංකාවේ කැරම් කණ්ඩායම්, විශේෂයෙන්ම පිරිමි කණ්ඩායම වාගේම කාන්තා කණ්ඩායමත්, ඉහළ මට්ටමක සිටිනවා. ඒ අය විශාල ජයග්‍රහණ රටට ගෙනත් දීලා තිබෙනවා. අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ අයත් මේ ශූරතාවන් ලබා ගැනීමට විවිධ අවස්ථාවන්වල දායකවෙලා තිබෙනවා. නමුත් තිබෙන ගැටලුව මේකයි. මෙවැනි ලෝක ශූරතා අපි ජයග්‍රහණය කර තිබෙන්නේ කිහිපයයි. අවස්ථා දෙකකදී අපි ක්‍රිකට් ලෝක ශූරතාව ජයග්‍රහණය කර තිබෙනවා. ඉතා කලාතුරකින් තමයි ලංකාවට කැරම් ක්‍රීඩා ශූරතාවක් ලැබෙන්නේ. නමුත් අදාළ ඇමතිවරයා හෝ රජය හෝ මේ ක්‍රීඩාව නැංවීමට සහ ක්‍රීඩකයන් දිරිමත් කරලා ඉදිරියට ගන්න කිසිම ආකාරයකින් කටයුතු කරන බවක් අපි නම් දුටුවේ නැහැ. ඒකයි ප්‍රශ්නය. විශේෂයෙන්ම තරුණ තරුණියන් ක්‍රීඩාවට යොමු කිරීම හරහා ක්‍රීඩා ශූරතා ජයග්‍රහණය පමණක් නොවෙයි, ඔවුන්ගේ ජීවිත සකස් කර ගන්නත් එය උදවු වෙනවා. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි ඒ ජාතික කැරම් කණ්ඩායමට අපේ ගරුත්වය, ප්‍රණාමය පුද කරනවා. මොකද, පරාජයන් පමණක්ම වාගේ හිමිවෙලා තිබුණු රටකට බලාපොරොත්තුවක් ගෙන එන්න ඔවුන් සමත් වී තිබෙන නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දිනයේ පැවැත්වෙන මෙම විවාදයට අදාළ ගැසට් පත්‍රය මම දුටුවා. ගාස්තු වැඩි කිරීම හරහා තැපැල් දෙපාර්තමේන්තුව දියුණු කරන්න පුළුවන්ය කියන යෝජනාව තමයි එහි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමු කරුණ තමයි දැනටමත් තැපැල් දෙපාර්තමේන්තුව පාඩු ලබනවාය කියන එක. මේ ආයතනය ඉතාම දූෂිත ආයතනයක් බවට පත් වී තිබෙනවා; අකාර්යක්ෂම වී තිබෙනවා. එය සත්‍යයක්. එතකොට ප්‍රධාන වශයෙන්ම එයට වග කියන්න ඕනෑකම තිබෙන්නේ මේ තැපැල් දෙපාර්තමේන්තුව පාලනය කරන ලද එක්සත් ජාතික පක්ෂයේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරුත්, ඒ දෙපාර්තමේන්තුවේ හිටපු විවිධ ප්‍රධානීනුත්. ඒ වාගේම සේවක සේවිකාවන් යම් කිසි පිරිසකගේත් දායකත්වය මෙයට ලැබී තිබෙනවා.

නමුත් දැන් අපට තිබෙන තොරතුර තමයි, "තැපැල් දෙපාර්තමේන්තුව ස්වාධීන ආයතනයක් කරන්න යනවා, තැපැල් දෙපාර්තමේන්තුවේ ව්‍යුහය වෙනස් කරන්න විශේෂයෙන්ම ආණ්ඩුව පැත්තෙන් යම් සැලැස්මක් යටින් ක්‍රියාත්මක වනවා"

කියන කාරණය. මීට කලිනුත් මේ යෝජනාව තිබුණා. ඒ නිසා අප ආණ්ඩුවෙන් දැනගන්න කැමැතියි, තැපෑල විකුණන්නද හදන්නේ, තැපෑල පෞද්ගලීකරණය කරන්නද හදන්නේ, එහෙම නැත්නම්, ආණ්ඩුව දැන් කෝකටත් තෙලය ලෙසට කියන පෞද්ගලික-රාජ්‍ය හවුලක් බවට එම දෙපාර්තමේන්තුව පත් කරන්නද හදන්නේ කියන කාරණය. මෙන්න මේ අවිනිශ්චිතභාවය නිසාත් තැපැල් දෙපාර්තමේන්තුවේ අරාජිකත්වය වැඩි වී තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවෙන් දැනගන්න කැමැතියි, ආණ්ඩුව තැපෑලට කරන්න යන්නේ මොකක්ද කියා. මොකද, පසුගිය තැපැල් උද්ඝෝෂණය වෙලාවේත් අපි දුටුවා, තැපෑල විකිණීමේ දිශාවට යන, එයට අවශ්‍ය කරන යම් වටාපිටාවක් සකස් වුණා කියන එක. ඒ එක්කම අපි තවත් කාරණයක් කියන්න කැමැතියි. රජයේ අකාර්යක්ෂමතාව නිසා සහ රජයේ දේශපාලනඥයන්ගේ දූෂිතභාවය නිසා විකුණනවා නම් විකුණන්න තිබෙන්නේ මේ පාර්ලිමේන්තුව වාගේ ඒවායි, කැබිනට් මණ්ඩලය වාගේ ඒවායි, ජනාධිපති ධුරය වාගේ ඒවායි. ඒවා තමයි පෞද්ගලික අංශයට දෙන්න ඕනෑ. මොකද, ඒවා තමයි වැඩියෙන්ම දූෂිත ආයතන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා, ජනාධිපති ධුරය කියන එක දැන් අන්ත දූෂිත තත්ත්වයට පත් වෙලා තිබෙනවා කිය කාරණය. මේ රටේ දූෂණයේ මුදුන් මල්කඩ ජනාධිපති ධුරය බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාගේ මැදිහත් වීමෙන් අප විසින් අද දිනයේදී ඉදිරිපත් කරනු ලැබුවා, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා වන විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. මොකද, ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීමේ මූලික ආයතනය විධායක ජනාධිපති ධුරය පමණක් නොවෙයි. ලංකාවේ දූෂණයේ සහ නාස්තියේ මුදුන් මල්කඩ විධායක ජනාධිපති ධුරයයි කියන එක පසුගිය අවුරුදු 20 තුළ තත්ත්වය ගෙන බැලුවාම අපට පෙනෙනවා. ඒ සඳහා වැඩි විස්තරවලට යන්න ඕනෑ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා දන්නවා, වර්තමාන ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩල ප්‍රධානියා පගාව අරගෙන අතට හසු වෙලා රිමාන්ඩ් භාරයේ සිටිනවා; හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ කාර්ය මණ්ඩල ප්‍රධානියා පගාව අරගෙන රිමාන්ඩ් එකේ ඉන්නවා; හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාර්ය මණ්ඩල ප්‍රධානියා මුදල් අවභාවිත කරලා රිමාන්ඩ් එකේ ඉඳලා දැන් ඇප පිට ඉන්නවා; හිටපු ජනාධිපතිවරයාගේ ලේකම්වරයාත් -ලලිත් වීරතුංග මහත්මයා- මුදල් අවභාවිත කරලා වැරැදිකරු වෙලා අභියාචනාධිකරණයෙන් ඇප අරගෙන ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට පෙනෙනවා, දූෂණය සිදු කරන්නේ යම්කිසි ජනාධිපතිවරයකු නම්, මේ තිබෙන්නේ යම්කිසි පුද්ගලයකුගේ වරදක් නම්, ඒ එන එන හැම ලේකම්වරයාම හොරෙකු වන්න හේතුවක් නැහැ කියන කාරණය.

දූෂිතයා ලලිත් වීරතුංග විතරක් නම්, තේරුම් ගන්න පුළුවන්, තනතුරේ ප්‍රශ්නයක් නොවෙයි, පුද්ගලයාගේ ප්‍රශ්නයක් තිබෙන්නේ කියලා. දැන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට පෙනෙනවා ඇති, පත් වන හැම ලේකම්වරයාම හොරකම් කරලා අහු වෙලා තිබෙන බව. එහෙම නම්, දූෂණයේ මධ්‍යස්ථානය තනතුර බව පැහැදිලියි. 'ජනාධිපතිවරයා' කියන පුද්ගලයාට විරුද්ධව නඩු පවරන්න බැරි නිසා, එතුමාගේ ලේකම් තමයි අහු වෙන්නේ. ඒ නිසා දූෂණයට වැට බඳින්න මේ රටේ කවුරු හෝ කල්පනා කරනවා නම්, ඉස්සෙල්ලාම කරන්න තිබෙන දේ තමයි, දූෂණයේ මුදුන් මල්කඩ වෙච්ච මේ විධායක ජනාධිපති ධුරය විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් අහෝසි කරලා, කැබිනට් මණ්ඩලයක් සහ පාර්ලිමේන්තුවට වග කියන අගමැති ක්‍රමයක් හැදීම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නාස්තියත් එහෙමයි. එය මම වග කීමෙන් කියනවා. මේ මාතෘකාවට අදාළ නොවුණත් මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය ගැන මා කිව යුතුයි. මොරගහකන්ද ජලාශය හදපු එකෙන් ජනතාවට යම් ප්‍රයෝජනයක් තිබෙන්න පුළුවන්. මම ඒ ගැන ප්‍රශ්න කරන්න යන්නේ නැහැ. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මොරගහකන්ද ජලාශය හතර සැරයක් විවෘත කර තිබෙනවා. හතර සැරයක්! මොරගහකන්ද ව්‍යාපෘතියට මුල්ගල තියන්න ජාතික උත්සවයක් පැවැත්තුවා, මොරගහකන්ද ව්‍යාපෘතියේ නිධන් වස්තු තැන්පත් කරන්න ජාතික උත්සවයක් පැවැත්තුවා, මොරගහකන්ද ජලාශයට වතුර පුරවන්න ජාතික උත්සවයක් පැවැත්තුවා, මොරගහකන්ද ජලාශයේ වතුර ඉවත් කරන්න ජාතික උත්සවයක් පැවැත්තුවා. ඊළඟට ලබන අවුරුද්දේ වතුර හිඳුනාම තව උත්සවයක් පවත්වයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා දකින්න ඇති, අද ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ආවා. රටේ පාලකයා වශයෙන් එතුමාට එන්න අයිතියක් තිබෙනවා. මම ඒ ගැන ප්‍රශ්න කරන්නේ නැහැ. නමුත්, ඒ වෙනුවෙන් කොපමණ නිලධාරීන් සංඛ්‍යාවක් ආවාද; කොපමණ රාජ්‍ය මුදලක් වැය වනවාද? මම කියන්නේ නැහැ, ඒ නිසා ජනාධිපතිවරයාට ගෙදරට වෙලා ඉන්න කියලා. ජනාධිපතිවරයා රාජකාරිමය අවශ්‍යතාවකට ආවත් කෝටි ගණනක් වියදම් වනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එකම ජලාශයක් විවෘත කරන්න හතර පාරක් ජාතික උත්සව පවත්වන්න කොපමණ මුදලක් නාස්ති කරනවා කියලා ඔබතුමා හිතනවාද? එය ප්‍රශ්න කරන්න විධියක් නැහැ නේ? ප්‍රශ්න කරන්න බලයක් නැහැ. මතක තබා ගන්න, මේ, නාස්තියේ මුදුන් මල්කඩ. සාමාන්‍යයෙන් මේවා දකිනකොට අලුත් උපාධිධාරියෙක් මොනවාද හිතන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? මුළු දිස්ත්‍රික්කයක් ගොඩ නහන්න පුළුවන් මුදලක් එක ජාතික උත්සවයකට නාස්ති කරනවා නේ. ජනාධිපති මන්දිරයෙන් අපට එන invitation ටික අරගෙන බලන්න කෝ. මම මේ කියන්නේ, උත්සව පවත්වන්න එපා; හැංගිලා ඉන්න කියන එක නොවෙයි. තවම එක කන්නයක් වගා කරන්නවත් කුඹුරු අක්කරයකට වතුර දීලා නැති වුණාට මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය හතර සැරයක් විවෘත කරලා තිබෙනවා. ඒ නිසායි මම ඒ කාරණය මතු කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පෞද්ගලීකරණය කරනවා නම් කරන්න තිබෙන්නේ මෙන්න මේවා. ජනාධිපති ධුරය, අගමැති ධුරය, පාර්ලිමේන්තුව, කැබිනට් මණ්ඩලය හා හොරකම් කරනවා නම් මහ බැංකුව. ඔබතුමන්ලා ඒවා පෞද්ගලීකරණය කරන්නේ නැහැ.

දැන් බොහෝ අවස්ථාවලදී ලංකාවේ දූෂණයේ අග්‍රස්ථානයට පොලීසිය පත් වෙලා තිබෙනවා. නමුත් එය පෞද්ගලීකරණය කරන්නේ නැහැ නේ. ඊළඟට, මහෙස්ත්‍රාත් අධිකරණය පත් වෙලා තිබෙනවා. මම දැක්කා, Transparency International එකෙන් ඒ ගැන කියනවා. නමුත් එය පෞද්ගලීකරණය කරන්නේ නැහැ නේ. ඒ නිසා අපි කියන්නේ තැපැල පෞද්ගලීකරණය කරන්නේ නැතුව හදන්න ඕනෑකමයි තිබෙන්නේ කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට දෙවැනි කාරණය මම කියන්නම්. ඔබතුමාත් දන්නවා, මාසයකට අධික කාලයක් තැපැල් වැඩ වර්ජනයක් තිබුණු බව. 06/2006 චක්‍රලේඛයේ හොඳ පැති ගොඩක් තිබුණා වාගේම තැපැල් දෙපාර්තමේන්තුවේ සේවක-සේවිකාවන්ට එයින් යම් ගැටලුවක් ඇති වුණා. මොකද, තැපැල් දෙපාර්තමේන්තුවේ සිටින සේවක-සේවිකාවන්ට ශ්‍රේණි 17ක් තිබෙනවා. මම හිතන විධියට සුද්දෝ හදපු ශ්‍රේණි තමයි ගොඩාක් තිබෙන්නේ. ඒ ශ්‍රේණි ක්‍රමය තදට

[ගරු බිමල් රත්නායක මහතා]

තිබෙනවා; පවත්වා ගෙන යනවා. 06/2006 චක්‍රලේඛය නිසා මේ සමහර ශ්‍රේණිවලට අසාධාරණයක් වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උදාහරණයක් වශයෙන් ගත්තොත් 06/2006 චක්‍රලේඛයට අනුව සමහර සේවක මහත්ම-මහත්මීන්ට උසස්වීම් ලැබුණාම වැටුප් අඩු වෙනවා. -මේ පාර්ලිමේන්තුවේත් එහෙම ගොඩක් ප්‍රශ්න තිබෙනවා. නමුත් මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.- ඒ නිසා ඔවුන් මේකට වැඩ වර්ජනයක් පැවැත්වූවා. වැඩ වර්ජනයක් පැවැත්වූවාට පසුව තැපැල් අමාත්‍යාංශය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, වැටුප් කොමිසම ඇතුළු ආයතන හතරක් එකතු වෙලා කමිටුවක් පත් කරලා, යම්කිසි විසඳුමකට ආවා. අපට දැනට දැන ගන්න ලැබී තිබෙනවා, ඒ විසඳුම ක්‍රියාත්මක කරන්න ගියාට පසුව ජනාධිපතිතුමා නැවත වැටුප් කොමිසමක් පත් කරලා තිබෙන බව. අර ආයතන හතරක් එක්ක ලොකු කමිටුවක් එකතුවෙලා හදපු වාර්තාව නැවත ජනාධිපති කොමිසමට දමන්න දැන් කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා වෙලා තිබෙන දෙය තමයි, නැවත තැපැල් වැඩ වර්ජනයකට අවශ්‍ය කරන පසුබිම නිර්මාණය වී තිබීම.

ඔබතුමා දන්නවා, කලාකරුවන්ට බදු ගැසීම පිළිබඳව අපි ඊයේ කලාකරුවන් සමඟ මාධ්‍ය සාකච්ඡාවක් සිදු කළ බව. එතැනදී පෙනී ගිය දෙය තමයි, රටේ ජනාධිපතිවරයා එක පරිපාලනයක් ක්‍රියාත්මක කරනවා; අග්‍රාමාත්‍යවරයා තව පරිපාලනයක් ක්‍රියාත්මක කරනවා කියන එක. ඔබතුමාත් දන්නා පරිදි සිනමා කර්මාන්තය පිළිබඳව ජනාධිපතිවරයා දැන් පොරොන්දුවක් මත රටේ ඉන්නා ප්‍රධාන විද්වතුන්, කලා ක්ෂේත්‍රයේ සිටින විද්වතුන්, සිනමා ක්ෂේත්‍රයේ ඉන්නා උගතුන් එකතු වෙලා සිනමා ප්‍රතිපත්තියක් හැදුවා. අධ්‍යක්ෂවරුන්, නිෂ්පාදකයන් විසින් එම ප්‍රතිපත්තිය හදලා එය ක්‍රියාත්මක කරන්න පටන් ගන්න කොට, තවත් පිරිසක් ජනාධිපතිතුමා පත් කරන ලද කමිටුවක් සමඟ එකතු වෙලා ඔවුනුත් නිර්දේශ ඉදිරිපත් කළා. අන්තිමට වෙච්ච දෙය තමයි, කලාකරුවන් විශාල පිරිසක් එකතු වෙලා අවුරුද්දක් විතර මහන්සි වෙලා හදපු යෝජනාවලිය ක්‍රියාත්මක වෙනවා වෙනුවට, එක්කෙනෙක්-දෙදෙනෙක් මැදිහත් වෙලා හදපු යෝජනාවලිය ක්‍රියාත්මක වීම. ඒකෙන් තමයි චිත්‍රපට සංස්ථාවට පමණක් චිත්‍රපට බෙදා හැරීම ලබා දිය යුතුයි කියන භාග තීන්දුව ගත්තේ. ඒක විතරක් එම කොමිෂන් වාර්තාවෙන් ගත්තා. අනෙක් එකට නඩු ගිහින් තිබෙනවා.

මම මේ උදාහරණය ගත්තේ එක ක්‍රමයක් නැති බව පෙන්වන්නයි. චිත්‍රපට කර්මාන්තය සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් එක කමිටුවක් හදනවා; ඒකෙන් එකක් කරනවා. ජනාධිපතිතුමා තව කමිටුවක් හදනවා; ඒකෙන් තව එකක් කරනවා. තැපැල් දෙපාර්තමේන්තුවේ strike එක නිසා ජනතාවට විශාල පීඩනයක් තිබුණා; විශේෂයෙන්ම විදේශගත ශ්‍රී ලාංකිකයන්ට. හැබැයි වෙච්ච දේ තමයි, ජනාධිපති එකක් කළා; අගමැති තව එකක් කළා. ඒ නිසා සේවකයන්ගේ ප්‍රශ්න නොවිසඳී තිබෙනවා. ඒ නිසා තවත් තැපැල් වැඩ වර්ජනයක් ආවොත් ජනාධිපති සහ අගමැති වග කියන්න ඕනෑ. මොකද, මේක සේවක සේවිකාවන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව කරන ලද සාකච්ඡාවේදී ඔවුන් එකඟතාවකට පැමිණි තිබියදී තමයි ඒ එකඟතාව කඩලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟ කාරණය මෙයයි. දැනට තැපැල් දෙපාර්තමේන්තුව තුළ විමර්ශන සිදු කළ යුතු සැලකිය යුතු මට්ටමේ වංචා 1,000ත් 1,200ත් අතර ප්‍රමාණයක් තිබෙන බව ඔබතුමා දන්නවා. විශේෂයෙන්ම තැපෑලේ විදේශ භාණ්ඩ අංශය අන්ත දූෂිතයි කියන එකත් ඔබතුමා දන්නවා. ඒ තැපැල් අංශයේ සිටින අවංක නිලධාරීන් පවා ඒක කියනවා. ඒක අද ඊයේ ඇති වුණු දෙයක් නොවෙයි. කාලයක් තිස්සේ ඉඳලා විදේශ තැපැල් අංශයේ විශාල දූෂණ ප්‍රමාණයක් සිද්ධ වෙනවා. හැබැයි, ප්‍රශ්නය වෙන්නේ මේකයි. මිනිස්සු එවන පාර්සල් කඩලා ගන්නවා, මුදල්, එහෙම නැත්නම් මිනිස්සු එවන භාණ්ඩ නියමිත අයට හරියාකාරව ලැබෙන්නේ නැහැ. විශ්වාසය පළුදු වෙලා තිබෙනවා. Cadre එක අනුව තැපැල් දෙපාර්තමේන්තුව සතුව විමර්ශන නිලධාරීන් 53දෙනෙක් ඉන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් ඉන්නේ කී දෙනාද? තුන්දෙනායි. අනික් අය විවිධ ඉහළ තනතුරුවලට ගිහිල්ලා තැපැල් අධිකාරි තනතුරුවල වැඩ බලනවා. ඒ නිසා මහා පරිමාණ නාස්තිවීම් වෙනවා; විනාශවීම් වෙනවා. මොකද, විදේශ තැපෑල කියන්නේ විශාල අදායමක් ගන්න පුළුවන් අංශයක්. විශාල ආදායමක් ගන්න පුළුවන් එම අංශය සම්පූර්ණයෙන්ම බිඳ වටිටලා දූෂිත භාවයට පත් කරලා තිබෙනවා. එම නිසා අයිතිකරුවන්ට භාණ්ඩ ලැබෙන්නේ නැහැ; ඒවා නිසි ප්‍රමිතියට භාර දෙන්නේ නැහැ. මිනිස්සු තමන්ගේ භාණ්ඩ තැපැල් දෙපාර්තමේන්තුව හරහා එවීම ප්‍රතික්ෂේප කිරීම නිසා විදේශ තැපැල් අංශය බිඳ වැටෙමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හතරවැනි කරුණ මෙයයි. ඔබතුමාත් දන්නවා, අපි email පිළිබඳව කථා කරන බව. Information Technology කියලා කථා කරන විෂයය, දෙපාර්තමේන්තුගත විෂයයක් ලෙස හිතුවොත්, එය මුලින්ම එන්න තිබුණු තැන තමයි තැපෑල. ඔබතුමා දන්නවා, මිනිස්සු සන්නිවේදනය සඳහා තැපෑල පාවිච්චි කරන බව. ලිපි හුවමාරුවෙන් පසු telephone එකට පරිවර්තනය වුණා. අපට මතකයි, ගමේ මිනිස්සු telephone calls ගත්තේ තැපැල් කන්තෝරුවට ගිහිල්ලා කියන එක. ඉස්සර telephone calls ගන්න හැම තැනම පහසුකම් තිබුණේ නැහැ. කරකවන අංක තිබෙන telephones තමයි 1980 දශකය වනකල්ම තිබුණේ.

මිනිස්සු ඒවා තමයි පාවිච්චි කළේ. ඊට පස්සේ mobile phonesවලට ඇවිල්ලා, GSMවලට ඇවිල්ලා අද ලෝකය සන්නිවේදන පැත්තෙන් ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. ඒක නිසා ලෝකයේ තැපැල් දෙපාර්තමේන්තු කියලා තිබුණු ඒවා තාක්ෂණයත් එක්ක හුගක් ඉස්සරහට ගියා. යුරෝපා රටවල් උදාහරණයට ගන්න එක තේරුමක් නැහැ. ඒවා ඉතා ඉහළ මට්ටමට වර්තමාන තාක්ෂණය පාවිච්චි කරනවා. නමුත් අද ලංකාවේ වෙලා තිබෙන්නේ මොකක්ද? ලංකාවේ තැපැල් දෙපාර්තමේන්තුව තවම පවතින්නේ ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් යුගයේ. ඒක නවීකරණය වෙන්නේ නැහැ. දැන් නම් සමහර තැපැල් කන්තෝරු වෙනස් වෙලා තිබෙනවා. ලියුම් කවර අලවන්න තිබෙන ගම් එක දැක්කාම දුවන්න හිතෙනවා. එක තැනක, දෙකක වෙනස් වෙලා තිබෙනවා. ඒ ලියුම් කවර අලවන්න තිබෙන ගම් එක දැක්කාම ඇත්තටම මට්ටක්කුලිය කුණු කන්ද මතක් වෙනවා. අඩු ගණනේ ඒවා වෙනස් වෙලාවත් නැහැ. ඒක නිසා email ගැන කථා කරලා තේරුමක් නැහැ. අපි කියන්නේ, සේවක සුරක්ෂිතභාවය ඇති කරමින් තැපෑලට තාක්ෂණය ගෙනෙන්න කියන එකයි. තාක්ෂණය නිසා සමහර විට සේවකයන්ගේ රැකියා නැති වෙනවා වාගේ ප්‍රශ්නයක් මතු වෙන්න පුළුවන්. තාක්ෂණය නිසා රැකියාවල වෙනස්කම් සිද්ධවෙන බව ඇත්ත. නමුත් අපි දකින්නේ තාක්ෂණය දෙන්නේ නැතුව ගියොත් මේ ආයතනය වහන්න වෙනවා කියන එකයි.

තැපැල් දෙපාර්තමේන්තුව කොතරම් අකාර්යක්ෂම වෙලා තිබෙනවාද කියනවා නම් අද පෞද්ගලික අංශයේ කුරියර් සේවාවන් වැඩි වෙලා තිබෙනවා. තැපෑල තමයි කුරියර් සේවාව කරන්න දැවැන්තම ආයතනික ශක්තිය තිබෙන දෙපාර්තමේන්තුව. හැම තැනම පුංචි පුංචි තැපැල් කන්තෝරු

තිබෙනවා. මිනිස්සු විශ්වාස කරනවා, මොනවා වුණත් රාජ්‍ය අංශයේ යම් කිසි වග කීමක් තිබෙනවා කියලා. ඒක නිසා මිනිස්සු කැමැතියි, රාජ්‍ය අංශයෙන් හරි සේවයක් දෙනවා නම් මේ කුරියර් සේවාව පාවිච්චි කරන්න. නමුත් අදටත් අපට පෙනෙන දේ මොකක්ද? සාමාන්‍ය පෞද්ගලික අංශයේ කුරියර් සේවාවේ ගාස්තුවට වඩා තැපැල් දෙපාර්තමේන්තුවේ ගාස්තුව වැඩියි. ඒක නිසා මිනිස්සු ඒක පාවිච්චි කරන්නේ නැහැ. දැන් මිනිස්සු ලියුම් යවන්නේ නැහැ. අද තැපැල් මහත්වරු බෙදන ලියුම්වලින් වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ කොම්පැනිවල ලියුම්. ලෝකයේත් එහෙම තත්ත්වයක් තමයි තිබෙන්නේ. ගොඩක් මිනිස්සු දැන් ලියුම් යවනවා අඩුයි. එක්කෝ bank statements එනවා; telephone bills එනවා; නැත්නම් magazines එනවා. එහෙම නැත්නම් මිනිසුන්ට ණය ගෙවන්න කියලා ලියුම් එවනවා. ඒවා තමයි ගෙවල්වලට ගොඩක් එන්නේ. මිනිසුන්ට යන්න-එන්න අමාරු නිසා කුරියර් සේවාවේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒවා දියුණු කරනවා වෙනුවට සිද්ධවෙලා තිබෙන්නේ මොකක්ද? මගේ මතකය හැටියට මේ යෝජනාවෙන් තිබුණේ ගාස්තු වැඩි කිරීම සම්බන්ධවයි. ඔබතුමන්ලා ගාස්තු වැඩි කිරීම හරහා තමයි ආදායම් වැඩි කර ගන්න බලාපොරොත්තු වෙන්නේ.

ඊළඟට මධ්‍යම තැපැල් භූවමාරුව ගැන යමක් කියන්න ඕනෑ. මධ්‍යම තැපැල් භූවමාරුව තුළ ලියා පදිංචි තැපැල කියන එක ක්‍රියාත්මක වෙනවා. අපට ඒ වෘත්තීය සමිතියේ සාමාජික මහත්වරු ලබා දුන්නු තොරතුරු අනුව ගත්තොත් ඒ ලියා පදිංචි තැපැල කරන්න තරම් අවශ්‍ය නිලධාරින් මේ දෙපාර්තමේන්තුවේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපටත් අත්දැකීමක් තිබෙනවා. ලියුමක් සාමාන්‍ය ලෙස දැම්මොත් ඉක්මනට හම්බ වෙනවා. ලියා පදිංචි කරලා දැම්මොත් හම්බ වෙන්නේ පරක්කු වෙලා. ඒකට හේතුව තමයි, ලියා පදිංචි කිරීම් කරන්න අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගෙන නැතිවීම. ඔවුන් කියනවා, අතිකාල කළා වුණත් හැම මාසයකම විශාල ලියුම් තොගයක් ලියා පදිංචි කරන්න බැරි නිසා අත්හරිනවා කියලා. මේවා, දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම්. ඇමතිවරු මේවාට පත් වෙලා ඉන්නවා. ලේකම්ලා මේවාට පත් වෙලා ඉන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔවුන් වැටුප් ගන්නවා. ඔවුන් ඒ තාන්න-මාන්න භුක්ති විඳිනවා විතරයි, මේ දෙපාර්තමේන්තුව දියුණු කරලා ඒකේ අඩු පාඩුකම් නිවැරැදි කරන්න කටයුතු කරන්නේ නැහැ කියන එක තමයි තැපැලේ බදු වැඩි කරන්න යෝජනා කරද්දී අපට කියන්න තිබෙන්නේ.

ඔබතුමන්ලා යෝජනා කරලා තිබෙනවා, සාමාන්‍ය ලිපියක් තැපැලෙන් යැවීමේ ගාස්තුව රුපියල් පහළොව දක්වා ඉහළ දාන්න; ඒ වාගේම පාර්සල් යවන ඒවායේ මිල වැඩි කරන්න; ලියා පදිංචි තැපැල් ගාස්තුව තවත් වැඩි කරන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලියා පදිංචි තැපැල් ගාස්තුව රුපියල් 25 ඉඳලා රුපියල් 30 දක්වා වැඩි කරන්න ඔබතුමන්ලා යෝජනා කරලා තිබෙනවා. හැබැයි, දෙපාර්තමේන්තුවේ සේවකයෝ කියනවා, එන ටිකවත් ලියා පදිංචි කරන්න විධියක් නැහැ කියලා. මේවා එකකට එකක් පරස්පරයි. ආයතනය ශක්තිමත් කරන්නේ නැතුව බදු ගහනවා.

ඒ නිසා මිලියන 15,000ක වියදමක් දරන ආයතනයක් වුණත්, මේ ආයතනයේ අකාර්යක්ෂමතාවට පිළියමක් යොදන්නේ නැතුව, බදු බර වැඩිකිරීමෙන් ජනතාවට ප්‍රතිඵලයක් අත්වෙන්නේ නැහැ කියන එක තමයි අපට පෙනෙන දේ. ඒ කාරණය ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 2.46]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் பிரதி அமைச்சர்)

(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Public Administration and Management and Law and Order)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තැපැල ගැන කථා කරමින් අපේ බිමල් රත්නායක මන්ත්‍රීතුමා යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා. තාක්ෂණයේ දියුණුවත් එක්ක තැපැල කොයිතරමට බද්ධ වෙලා තිබෙනවාද කියන කාරණය අපි කල්පනා කරන්න ඕනෑ. තාක්ෂණයට සමගාමීව තැපැල දියුණු වෙලා තියෙනවාද කියන ප්‍රශ්නය අප තුළත් මතු වෙලා තිබෙනවා. නවීන ලෝකයට ගැළපෙන ආකාරයෙන් තැපැල දියුණු නොවුණොත්, බද්ධ නොවුණොත්, අනුගත නොවුණොත් තැපැලට අත්වන ඉරණම පිළිබඳ කියනවා නම්, බරපතළ කනගාටුදායක තත්ත්වයක් තමයි උදාවෙන්න නියමිත.

ඒ කෙසේ වෙතත්, තැපැල් සේවය අපට සුළුකොට තකන්න බැහැ. තාක්ෂණික වශයෙන් කොයිතරම් දියුණු වුණත් තැපැල අත්‍යවශ්‍ය සේවාවක් විධියට අපි දකිනවා, යම් යම් අවස්ථා වෙනුවෙන්, යම් යම් අංශ වෙනුවෙන් තැපැල් සේවය අත්‍යවශ්‍ය වන නිසා. විශේෂයෙන් විශ්‍රාමික මව්වරුන්, පියවරුන් ගොඩක් වෙලාවට තමන්ගේ විශ්‍රාම වැටුප ගන්න තැපැල් කාර්යාලයට යනවා. ඒ වාගේ සේවා ගණනාවක් තැපැල් සේවයෙන් සිද්ධ වෙනවා. ඒ නිසා මම හිතනවා, තැපැල අදටත්, හෙටටත්, අනාගතයටත් ගැළපෙන ආකාරයට නවීකරණය කළොත් ඒ තුළින් සේවාව ලබන බහුතරයකට ප්‍රයෝජනවත් වෙයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද පාර්ලිමේන්තුව දෙස බලනකොට අපට පෙනෙනවා, ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත්, TNA එකේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත් හැර විපක්ෂයේ වෙනත් මන්ත්‍රීවරු නියෝජනය වෙන්නේ නැහැ කියලා. මා හිතන හැටියට ඒකට හේතුව තමයි අද දිනයේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු විසින් කොළඹට පා ගමනක් ලැහැස්ති කරලා තිබෙන එක. අපි බලන්න ඕනෑ, මේ ගොල්ලන්ගේ මේ අරමුණු මොනවාද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තටම කියනවා නම් මේ ආණ්ඩුවට තව වසර දෙකක් තිබෙනවා. තවත් වසර දෙකක් තියෙන මේ අවස්ථාවේදී -කලින් අවස්ථා ගණනාවකදී කටයුතු කළා වාගේ- මේ ගොල්ලෝ නැවත වතාවක් මේ ආණ්ඩුව පෙරළන්න කියලා මහජනතාව කලබල කරලා, මහජනතාව කොළඹට ගෙනෙන අසාර්ථක උත්සාහයක තමයි මෙවරත් යෙදෙමින් ඉන්නේ.

අපි රජයක් විධියට වගකීමෙන් කටයුතු කරනවා. මේ රජය යටතේ ඕනෑම කෙනෙකුට උද්ඝෝෂණය කිරීමට, විරෝධතා දැක්වීමට ඇති අයිතිය අපි තහවුරු කරනවා. මේක ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක්; යහ පාලන රජයක්. අපි කවදාවත් උද්ඝෝෂණ මර්දනය කරලා නැහැ. රාජ්‍ය ආයතන යොදා ගෙන, මැර බලය යොදා ගෙන උද්ඝෝෂණ මැඩ පවත්වන්න අපි කටයුතු කරලා නැහැ. නමුත්, මහ ජනතාවගේ ආරක්ෂාව, පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව, මගීන්ගේ ආරක්ෂාව සහ පොදු දේපොළවල ආරක්ෂාව වෙනුවෙන් අපි රජයක් විධියට වගකීමෙන් කටයුතු කරනවා. ඒ නිසා ගරු අගමැතිතුමාත්, ගරු ජනාධිපතිතුමාත්, අපේ නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමා ඇතුළු අපි එකතු වෙලා පොලීසියට උපදෙස් දීලා තිබෙනවා, කිසිදු අවස්ථාවක මේ උද්ඝෝෂණවලට බාධා කරන්න එපා, ඒ වාගේම, මහ ජනතාවට අවහිරයක් වන ආකාරයකින් කටයුතු කරනවා නම්, මහ ජනතාවට පීඩාවක් වන

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ආකාරයෙන් කටයුතු කරනවා නම් ඒවා නිවැරැදි කරන්න මැදිහත් වෙන්න කියලා. ඒ වාගේම පොදු දේපොළවලට හානි කරන්න, රාජ්‍ය ආයතනවලට ඇතුළු වෙන්න, රාජ්‍ය දේපොළවලට හානි කරන්න කටයුතු කරනවා නම් අපට නීතිය ක්‍රියාත්මක කරන්න වෙනවා. ඒක වග කිවයුතු රජයක යුතුකම සහ වගකීම විධියටයි අපි දකින්නේ. අද උදේ වන විට අපට වාර්තා වෙලා තිබෙනවා, බස්වලින් කොළඹට සෙනහ ගෙන්වනවා කියලා. දැනටමත් බස් රථ හාරපන්සියයක් කොළඹට ඇවිල්ලා කියලා වාර්තා වෙලා තිබෙනවා. හැබැයි, ගහපු විසිල්වල හැටියට බල්ටි නම් තිබෙන පාටක් පේන්න නැහැ. බස් එක ඇතුළේ ඉන්න සෙනහ ගණන් කරලා බලන කොට, 10යි, 15යි ඉන්නේ කියන එකත් වාර්තා වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම, මේ ගොල්ලන් අද කොළඹට එන්නේ අද රාත්‍රියේ කොළඹ නතර වෙන්න කියන එකත් අපි දන්නවා. ඒ ගොල්ලන් බොහොම පැහැදිලිව ඒ බව කියා තිබෙනවා. කොළඹ නතර වෙන්නේ මොනවාටද? මේ ගොල්ලන් කොළඹ නතර වෙන්න උත්සාහ කරන්නේ මේ ආණ්ඩුව පෙරළන්නයි. ඒකාබද්ධ විපක්ෂයේ පවිත්‍රා වන්නිආරච්චි මන්ත්‍රීතුමිය ඊයේ කියලා තිබෙනවා, "ආණ්ඩුවක් අරගෙන තමයි ආපහු යන්නේ" කියලා. එතකොට කොළඹට එන මේ ජනතාව කොහේද ඉන්නේ? මේ ජනතාව පාරේ තමයි ඉන්නේ. මේ ජනතාව මොනවාද කන්නේ? මේ ජනතාව කන්නේ මේ ගොල්ලන් දෙන බත් පැකට් එකක් වෙන්න පුළුවන්. මේ ජනතාව බොන්නේ මේ ගොල්ලන් දෙන වතුර බෝතලයක් වෙන්න පුළුවන්. අපට තව තොරතුරු ලැබී තිබෙනවා තව බොන්න ජාතිත් දෙනවා කියලා. හැබැයි, මේ අයට ආණ්ඩු හදන්න ජනතාව පාරේ ලගිද්දී, පාරේ බුදියද්දී, එළිවෙනකම් නිදි වරද්දී, නායකයෝ වෙන්න උත්සාහ කරන අය දැනටමත් බොහොම සුඛෝපභෝගී කාමර වෙන් කරගෙන තිබෙනවාය කියන නිවුස් එකක් “Sri Lanka Mirror” වෙබ් අඩවියේ වාර්තා වෙලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා ටාජ් සමුද්‍රා හෝටලයේ 757 අංකය දරන suite එක බුක් කරගෙන තිබෙනවා. ඊට අමතරව, අනෙකුත් මන්ත්‍රීවරුන්ට සහ ඔවුන්ගේ හිත මිත්‍රයන්ට, ගජ මිතුරන්ට අද රාත්‍රිය ගත කරන්න හිල්ටන් සහ ෂැන්ග්‍රි-ලා හෝටල්වල කාමර වෙන් කරගෙන තිබෙනවා.

ඔන්න ඕකයි ඇත්ත කතන්දරය. මේ ගොල්ලෝ වෙනුවෙන් කොළඹට ගෙන්වලා තිබෙන ජනතාවට පාරේ බුදියන්න සලස්වලා, පාරේ කට්ට කන්න සලස්වලා, රුපියල් සියයක, එකසිය පනහක බත් පැකට් එකක් දීලා, වතුර බෝතලයක් දීලා, - තවත් බෝතල් දෙනවා කියලාත් ආරංචි තිබෙනවා- මේ ගොල්ලෝ බොහොම සැප සම්පන්නව ඒ අවට තිබෙන සුපිරි හෝටල්වල කාමර වෙන් කර ගෙන සුඛ විහරණය ලබනවා. මෙන්න මේකයි මේ ගොල්ලන්ගේ ඇත්ත කතන්දරය. අර "බැටළු හම පොරවාගෙන ඉන්න වෘකයෝ" වාගේ ජනතාව ඉදිරියේ සුදු පිරුවට පොරවාගෙන හිටියාට, ඇතුළේ ඉන්නේ ඊට වඩා හාත්පසින්ම වෙනස් චරිත ටිකක්.

අවුරුදු දෙකකට කලින් ආණ්ඩුවක් පෙරළීමේ මේ අයගේ අවශ්‍යතාව කුමක්ද? මේ යහ පාලන ආණ්ඩුව ජනතාව පීඩාවට ලක් කරන, මර්දනය ක්‍රියාත්මක කරන, ජනතාව ඝාතනය කරන ආණ්ඩුවක් බවට පත් වෙලා තිබෙනවාද? නැහැ, එහෙම වෙලා නැහැ. ජනතාවට ඕනෑවටත් වඩා ප්‍රජාතන්ත්‍රවාදය දීලා තිබෙනවා.

මේ ගොල්ලන්ට අවශ්‍ය වෙලා තිබෙන්නේ මොනවත් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. පසුගිය කාලයේ සිද්ධ වුණු වංචා, දූෂණ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙන කොට, ඒවා සම්බන්ධයෙන් නීතිය එන්න එන්න දැඩි වෙන කොට, තමන්ට තව මාස කිහිපයකින්, අවුරුද්දකින් අත් වෙන ඉරණම දැනෙන කොට, හැඟෙන කොට අන්න ඒකෙන් ගැලවෙන්න ජනතාව පළිහක් කර ගෙන, එක්කෝ ජනතාවගෙන් කිහිප දෙනෙක් ඝාතනය කර ගෙන, ගැටුමක් ඇති කර ගෙන, මිනී පෙට්ටි මතින් බලය ගැනීමේ හදිසි අවශ්‍යතාවක් තමයි මේ තුළින් පෙනෙන්නේ. ඒකයි ඇත්ත කථාව. එහෙම නැතිව ජනතාවට ආදරේටවත්, රටට ආදරේටවත් නොවෙයි මේවා කරන්නේ. "මව්බිම බේරා ගන්න කොළඹට එන්න" කියලා තමයි කියන්නේ. හැබැයි, මේ ගොල්ලෝ තමයි මව්බිම සින්නක්කර ලියලා දුන්නේ. අද මේ ගොල්ලන්ට කොළඹට එන්න අයිතියක් නැහැ. කොළඹ නගරයේ හදවත බදු අක්කර හතක් වූ ෂැන්ග්‍රි-ලා ඉඩම සින්නක්කරව විකුණපු කට්ටිය තමයි මේ අය. එහෙම නම්, කොළඹ නගරයේ හදවත විකුණපු අයට කොළඹ නගරයට ඇතුළුවීමේ අයිතියක් නැහැ. ඒ වාගේම, එතැනට ඉදිරියේ තිබෙන Port City එකේ හෙක්ටෙයාර් 22කට ආසන්න භූමි ප්‍රමාණයක් සින්නක්කරව චීනයට දුන්නු කට්ටිය තමයි මව්බිම බේරා ගැනීමේ අරමුණ වෙනුවෙන් කොළඹට එන්නේ. මව්බිම බේරා ගැනීමේ අරමුණ වෙනුවෙන් එන කට්ටිය තමයි ඒ විධියට කටයුතු කළේ.

ඒ නිසා අපි පැහැදිලිවම කියනවා, රජයක් විධියට අපි ඕනෑම අභියෝගයකට සූදානම් බව. ඒ ගොල්ලන්ට 50,000ක් ගෙනෙන්න පුළුවන් නම්, අපට ලක්ෂ පහක් ගෙනෙන්න පුළුවන්. හැබැයි, අපි ඒ බොරු සෙල්ලම් දමන්නේ නැහැ; බොරු සංදර්ශන දමන්නේ නැහැ. අපි රටට අවශ්‍ය දේවල් ටික කරනවා; ජනතාවට අවශ්‍ය දේවල් ටික කරනවා. ජනතාවට අපි හීන පෙන්වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද -සැප්තැම්බර් මස 5වැනි දින- මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 69දෙනෙක් එකතු වෙලා 'ජනබලය කොළඹට' කියලා දැවැන්ත උද්ඝෝෂණ මාලාවක්, එහෙම නැත්නම් සත්‍යග්‍රහයක් සිදු කරමින් මුළු කොළඹම වටලනවා කියලා කියනවා. මේ රටේ සිදු වුණු හොරකම, වංචාව, දූෂණය, නාස්තිය, මිනී මැරුම් කියන කාරණාවලට විරුද්ධව මේ රටේ ජනතාව 2015 ජනවාරි මාසයේ 8වැනි දින යහ පාලනය ගෙනෙන්න පෙලඹුණා. බලයෙන් ඉවත් වී මාස තුනක් ගතවීමටත් පෙර මේ අය නැවත මහින්ද මහත්මයා බලයට ගෙනෙන්න 'මහින්ද සුළඟ' කියලා නුගේගොඩින් පටන් ගත්තා. ඉන් පසුව නුවර සිට කොළඹට පා ගමනින් ඇවිත් ආණ්ඩුව පෙරළනවා කිව්වා. ඉන් පසුව Gall Face එකට සෙනඟ ගෙනැවිත් ආණ්ඩු බලය අරගෙන මහින්ද මහත්මයා අගමැති කරනවා කියලා කිව්වා. ඒකත් බැරි වුණාම මේ ආණ්ඩුව බලයට පත් වී තුන්වැනි අවුරුද්ද කිට්ටු වෙද්දී, පෙබරවාරි මස 10වැනි දින පැවැති පළාත් පාලන මැතිවරණයෙන් ගමේ බලය දෙන්න මහින්ද අගමැති කරනවා කියාගෙන ආවා. මේ හැම දෙයක්ම කරනකොට ඒ අය කිව්වේ ආණ්ඩුව පෙරළීමේ පළමුවැනි වෙඩි මුරය කියලායි. දැන් වෙඩි මුර හතරක් පත්තු කරලා, එම වෙඩි මුර හතරම පුස් වෙඩි මුර බවට පත් වෙලායි තිබෙන්නේ. අපි දන්න තරමට හෙට හෝ අෑසන්න ඉදිරි මාස හයක, හතක කාලය තුළ මේ රටේ ආණ්ඩුවක් පෙරළිය හැකි ජනාධිපතිවරණයක් හෝ පාර්ලිමේන්තු මැතිවරණයක් නැහැ. තියන්න පුළුවන් පළාත් සභා මැතිවරණයක් පමණයි. පළාත් සභා මැතිවරණය ඒ ගොල්ලන්ට ඕනෑ වාගේම, අපටත් ඕනෑ. අපි කැමති මනාප ක්‍රමයට යන්නයි. සීමා නිර්ණ අවුල තුළ මේ මැතිවරණය කල් දමනවාට අපිත් විරුද්ධයි. මේ හැටනවදෙනාට මැතිවරණය අවශ්‍ය නම්, මැතිවරණය පවත්වන්න පුළුවන්. ඒ අය මනාප ක්‍රමයට කැමතියි කියනවා. ඒ අයට පාර දිගේ, හන්දි හන්දි ගාණේ ඇවිදමින් රස්තියාදු වෙවි ඉන්න අවශ්‍ය නැහැ. තමන්ගේ පක්ෂය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. තමන් තරග කලේ එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන්. එහි නායකයා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. එතුමා එක්ක සාකච්ඡා කර මධ්‍යම කාරක සභාවේ දී තීන්දුවක් අරගෙන, ඒ ගොල්ලන් කැමතියි කිව්වොත් අපට මැතිවරණය පවත්වන්න පුළුවන්. මධ්‍යම කාරක සභාවට ගිහින් එක්සත් ජනතා නිදහස් සන්ධානය ඇතුළෙන් ඕක බෙරාගෙන එන්න අමාරුයි කියලා හිතෙනවා නම් මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනෙන්න ඒ ගොල්ලන්ට පුළුවන්. ඒ ගොල්ලන්ගේ හැටනවදෙනෙක් ඉන්නවා, අපේ එකසිය හයදෙනෙක් ඉන්නවා. එතකොට තුනෙන් දෙකකට වැඩි ඡන්දයක් ලබා දී අපට මේ මැතිවරණය පවත්වන්න පුළුවන්. හැබැයි, එම මැතිවරණය පැවැත්වුවා කියලා මහින්ද මහත්මයා අගමැති වෙන්නේත් නැහැ; ගෝඨාභය ජනාධිපති වෙන්නේත් නැහැ; මේ රටේ ආර්ථික ප්‍රතිපත්තිය වෙනස් වෙන්නේත් නැහැ; බදු ප්‍රතිපත්තිය වෙනස් වෙන්නේත් නැහැ; අධ්‍යාපන, සෞඛ්‍ය ප්‍රතිපත්ති වෙනස් වෙන්නේත් නැහැ. එම නිසා මේ කරන්නේ තනිකරම ප්‍රෝඩාවක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මෙහි අරමුණු තුනයි තිබෙන්නේ. පළමුවැනි අරමුණ මම පැහැදිලි කරන්නම්. අපි ජනාධිපතිවරණයේ දී පොරොන්දු වුණු ආකාරයට ඒ කාලයේ සිදු වුණු හොරකම්, වංචා, මිනී මැරුම්, දූෂණ සම්බන්ධව සිදු කළ පරීක්ෂණ අවසන් කර එම පරීක්ෂණ වාර්තා අධිකරණයට ඉදිරිපත් කර, විශේෂ අධිකරණයක් ස්ථාපිත කර මේ නඩු එදිනෙදා විභාග කිරීම ආරම්භ කරනවා. සතියක් දෙකක් ගත වන විට එම නඩු විභාගවල විස්තර දිනපතා රූපවාහිනී මාධ්‍යයෙන් වාර්තා වීමට පටන් ගන්නවා. මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ වාර්තා කළා වාගේ මේ පිළිබඳව වාර්තා කරනකොට මේකට රැල්ලක් හැදෙනවා. දෙසැම්බර් මාසයේ සිට කට්ටියටම පෝලිමේ කුඩුවට යන්න වෙනවා. එම නිසා අද විශාල සෙනඟක් කොළඹට ගෙනැවිත් අධිකරණ විනිශ්චයකාරවරුන්ට මානසික පීඩනයක් එල්ල කිරීමේ අරමුණින් තමයි ඔවුන් ක්‍රියා කරන්නේ. "අපි ආණ්ඩුව පෙරළන්න යන්නේ. අපට මෙපමණ බලවේගයක් තිබෙනවා. එම නිසා බලාගෙන තීන්දු දෙන්න. අපි ශිරාණි බණ්ඩාරනායක කනෙන් ඇදලා එළියට දැම්මා වාගේ තමුසේලාටත් පරිප්පුව දෙනවා" කියන පණිවුඩය ලබා දීම තමයි මේ ගොල්ලන්ගේ පළමුවැනි අරමුණ.

දෙවැනි අරමුණ වන්නේ මෙයයි. අද ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායමට ඒ අයගේ අභ්‍යන්තර ඉරි තැළීම, අභ්‍යන්තර දෙදරා යාම වළක්වා ගැනීමට උපක්‍රමයක් නැහැ. එක පැත්තකින් ආණ්ඩුව 'ගම්පෙරළිය' වැඩසටහන ගෙනැවිත් පසුගිය අවුරුදු තුනේ කරන්න බැරි වුණු අළෙවිකරණ වැඩ පිළිවෙළත් එක්ක ගමේ වැඩ ටික ආරම්භ කරලා ගම ඇතුළේ එක්සත් ජාතික පක්ෂය නැතිවිනකොට ඒ අයගේ අභ්‍යන්තර දෙදරා යාම තවත් වැඩි වෙන්නට ඉඩ තිබෙනවා. අද මහින්ද රාජපක්ෂ මහත්මයාට නැවත ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්න බැහැ කියන කරුණ සක්සුදක් සේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔප්පු වී තිබෙනවා. එම තත්ත්වය තුළ අද ගෝඨාභය රාජපක්ෂ මහත්මයාත්, බැසිල් රාජපක්ෂ මහත්මයාත් අතර 'කවුද අපේක්ෂකයා?' කියන පැහැදිලි බෙදීමක් තිබෙනවා. විශේෂයෙන්ම වෙල්ගම මහත්මයා එක ප්‍රකාශයක් කරනවා; මහින්දානන්ද මහත්මයා තව ප්‍රකාශයක් කරනවා. මේ දෙදරා යාම හංගලා 'ගම්පෙරළිය' හරහා ආණ්ඩුව මතුවීම වළක්වා ගැනීම තමයි මෙහි දෙවැනි අරමුණ වන්නේ.

තුන්වැනි අරමුණ මෙයයි. මේ ගොල්ලන් තමන්ගේ බලය රැක ගැනීම සඳහා ලේ ඉල්ලපු කට්ටිය; ලේ සොලවපු කට්ටිය; ලේවලින් රට හෝදපු කට්ටිය. රටක් වටින මාධ්‍යවේදීන් වන ලසන්ත වික්‍රමතුංග, ප්‍රගීත් එක්නැලිගොඩ වැනි අය අමු අමුවේ මරලා, ලේවලින් නහවපු කට්ටිය.

ඒ විතරක් නොවෙයි, වසිම් තාජුඩීන් වාගේ රගර් ක්‍රීඩකයන් ඝාතනය කළ, හලාවත ධීවරයෙක් වන ඇන්ටනීව ඝාතනය කළ, කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ රොෂේන් චානකව ඝාතනය කළ, බොන්න වතුර ටිකක් ඉල්ලපු රතුපස්වල මිනිසුන් දණ ගස්වා වෙඩි තියා මරපු කණ්ඩායමක් මේ; තව සිය ගණනක් සුදු වැන්වලින් මිය පරලොව යවපු කට්ටියක් මේ. එම නිසා ඒ අයට මරනවා කියන එක, තමන්ගේ බලය සඳහා ලේ පාවිච්චි කරනවාය කියන එක අමුතු දෙයකුත් නොවෙයි; භය වෙන්න දෙයකුත් නොවෙයි. දැන් ඒ අය දන්නවා, ඒ ගොල්ලන්ට වහල් ගැති සේවය කරන වහල්ලු රට පුරාම ඉන්නවාය කියා. මේ වහල්ලු ටිකට අරක්කු ටිකක් දීලා, බත් පැකට් එකක් දීලා, සල්ලි ටිකක් දීලා කොළඹට ගෙනැත්, ආණ්ඩුව භය කර, ප්‍රකෝප කර ආණ්ඩුව හරහා වෙඩි තියවා තව බිල්ලක්, දෙකක්, තුනක් අරගෙන ඒ මතින් හෝ බලය ලබා ගැනීම තමයි ඒ අයගේ තුන්වන අරමුණ වන්නේ. "ජනතාවට ජීවත් වෙන්න අමාරුයි, ඔවුන් පීඩා විඳිනවා, ඒ නිසා තමයි මේ උද්ඝෝෂණය කරන්නේ" කියා ඔවුන් කියනවා නම්, මීට වඩා හොඳ විධියට මේ උද්ඝෝෂණය කරන්න ඒ අයට පුළුවන්කම තිබුණා. අද කාර්යාල වැඩ කරන දවසක්; බදාදා දවසක්; රජයේ කාර්යාලවලට මහ ජනතාව එන දවසක්; පාසල් පවත්වන දවසක්. ඒ වාගේම මේ දවස්වල කොළඹ නගරයේ බොහෝ පාසල්වල අපොස උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල

විශ්ලේෂණය කරනවා. ඒ නිසා ඒ ගොල්ලන්ට මේ වැඩේ සෙනසුරාදා හෝ ඉරිදා දවසක කරන්න තිබුණා. එසේ කරන්නේ නැතිව අද මෙය කරන්නේ, ජනතාව තුළ ප්‍රකෝපකාරී හැඟීම් ඇති කරවා, වෙඩි තියලා, මරවලා ඒ ලේ උඩින් බලයට පත් වීමේ වුවමනාව මතයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය අද මේ වැඩසටහන කරන තත්ත්වයට පත් කළේත් අපේ ආණ්ඩුවම තමයි. ඒක අපේ ආණ්ඩුවේ වරදයි. හේතුව මොකක්ද? අපි ආණ්ඩු බලය අරගෙන, යහ පාලනය ස්ථාපිත කරලා, ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කර, නීතිය ක්‍රියාත්මක කර, මාධ්‍ය නිදහස ඇතිකර, මූලික මිනිස් අයිතිවාසිකම් ලබාදී, මානව අයිතිවාසිකම්වලට ලොකු වටිනාකමක් ලබාදී අසීමිත ප්‍රජාතන්ත්‍රවාදයක් ලබාදීමේ ප්‍රතිඵලයක් තමයි මේක. ශ්‍රී ලංකාව කියන්නේ, දියුණු රටක් නොවෙයි කියා අපි දන්නවා. මෙය දියුණු වෙමින් පවතින රටක්. හැබැයි, දියුණු රටකවත් නැති ප්‍රජාතන්ත්‍රවාදයක් තමයි අද ශ්‍රී ලංකාව කියන මේ දියුණු වෙමින් පවතින රාජ්‍යයට ලබාදී තිබෙන්නේ. ඒ නිසා තමයි, ඕනෑම කෙනෙකුට හිතන හිතන දෙය කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අද මාධ්‍යයට පමණක් නොවෙයි, ඕනෑම කෙනෙකුට ඕනෑම අසභ්‍ය වචනයක් කියලා, ඕනෑම තැනකදී අපහාසයක් කරලා පාඩුවේ ඉන්න පුළුවන් වෙලා තිබෙන්නේ එම නිසායි. මේ නිදහස පාවිච්චි කරලා තමයි මේ අය මේ වාගේ වැඩසටහන්වලට එළඹිලා තිබෙන්නේ.

"පිටි කිලෝවක් රුපියල් 5කින් ඉහළ ගියා, එම නිසා අපි පාන් රාත්තලක් රුපියල් පහකින් වැඩි කරනවා" කියා බේකරි හිමියන්ගේ සංගමයේ සභාපතිවරයා voice cut එකක් දෙනවා මා දැනට දවස් දෙකකට කලින් මාධ්‍ය තුළින් දැක්කා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. පාන් රාත්තලක බර ග්‍රෑම් 450යි. පිටි කිලෝග්‍රෑම් එකකින් පාන් රාත්තල් දෙකක් හදන්න පුළුවන්. පිටි කිලෝග්‍රෑම් එකක් රුපියල් 5කින් වැඩි වුණාම පාන් රාත්තලක් රුපියල් 5කින් වැඩි කරනවා. එවිට ඩබල් ලාභයක් ලබනවා; සියයට සියයක ලාභයක් ලබනවා. මේවා ඔහේ සිදු වෙනවා. පාලනයක් නැහැ. මේ දේවල් ගැන බලන්න කවුරුවත් නැහැ; ඒවාට නීති දමන්න කවුරුවත් නැහැ. අන්න එවැනි රටක් අපි නිර්මාණය කර දී තිබෙන නිසා තමයි මේ අයට මෙහෙම කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ ගොල්ලන්ගේ බලාපොරොත්තු ඉෂ්ට වුණාද, නැද්ද කියන කාරණය අද රාත්‍රියේ මාධ්‍ය තුළින් අපට දැකගන්න පුළුවන් වෙයි. අපිත් ගණන් හදලා බැලුවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒකාබද්ධ විපක්ෂයට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු 4,000ක් ඉන්නවා. ඒ එක්කෙනෙක් මිනිස්සු 20ක් අරගෙන ආවා නම් 80,000ක සෙනඟක් එන්න ඕනෑ. අපට වාර්තා වන ආකාරයට බස් රථ 1,100යි ඇවිත් තිබෙන්නේ. ඒ බොහෝ බස්වල ඉන්නේ මිනිස්සු දහයයි, පහළොවයි. මගේ කොළොන්නාව ආසනයෙන් සාමාන්‍යයෙන් මැයි දින රැළියකට මම නම්, බස් 25ක් 30ක් -එක බසයකට පණහ ගණනේ- මිනිස්සු පුරවාගෙන අරන් යනවා. අද ගෙනැල්ලා තිබෙන්නේ බස් 5යි. ඒ බස් පහේත් බස් එකක 15, 16 ගණනේ තමයි මිනිසුන් ඇවිත් තිබෙන්නේ; ඒ කියන්නේ එකසිය පණහට අඩුවෙන්. මේ අය මුළු කොළඹම වටලනවාය කියා මහා භයංකාර චිත්‍රයක් තමයි මැව්වේ. අපි දන්නේත් නැහැ; ඒ ගොල්ලෝ දන්නේත් නැහැ; කවුරුවත් දන්නේ නැහැ. "වැල්ලවත්තේ සිට, තුගේගොඩ සිට, අනික් පැත්තෙන් පෑලියගොඩ සිට මුළු කොළඹම එකම හිස් ගොඩක් බවට පත් වෙයි, හැම පාරක්ම එකම හිස් ගොඩක් බවට පත් වෙයි, කාටවත් යන්න බැරිවෙයි" කියා කිව්වා. අද පෞද්ගලික අංශයේ බොහෝ සේවකයෝ දවල් දොළහ වෙනකොට ගෙවල්වලට ගියා. බලන්න, මේක රටේ ආර්ථිකයට කොපමණ පාඩුවක්ද කියලා. අන්තිමට මේ අය ලේක්හවුස් හන්දියට සීමා වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දන්නවා නේ, අපිත් විරුද්ධ පක්ෂයේ ඉන්න කාලයේ හෙන්රි පේදිස් ක්‍රීඩාංගණයට පණස්දාහක් ගෙනැල්ලා පුරවනවාය කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතැනට දමන්න පුළුවන් පුටු 4,000යි. සුගතදාස ක්‍රීඩාංගණයට 15,000ක් ගේනවාය කියා අපිත් කිව්වා. සුගතදාස ක්‍රීඩාංගණයේ පුටු 5,004යි තිබෙන්නේ. මම ඉස්සර මාධ්‍ය වැඩ කරනකොට "සිරස සුපර්ස්ටාර්" අවසාන තරගය එම ක්‍රීඩාංගණයේ ලැහැස්ති කළා. ඒකේ පුටු 5,004යි තිබෙන්නේ කියා මම හොඳටම දන්නවා. ඒ නිසා ලේක්හවුස් වටරවුමේ ඉඳලා පාරේ හතර පැත්තෙන් කට්ටිය දැම්මත්, දමන්න පුළුවන් උපරිම සංඛ්‍යාව 15,000යි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
මට තව විනාඩියක් ලබාදෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඊයේ රෑ සිට තිබුණු මානසිකත්වය නොවෙයි ඒ අයට අද උදේ වන විට තිබෙන්නේ. ඒ මානසිකත්වයත් එක්ක තමයි අද හවස මේ රැළිය පවත්වන්න වෙලා තිබෙන්නේ. අද රෑ නතරවෙලා හෙට උදේ "ෂිෆ්ට්" එකට තව කට්ටියක් ගේනවා කියලා තමයි කිව්වේ. හෙට උදේ "ෂිෆ්ට්" එක කෙසේ වෙතත්, අද රෑට 20,000ක් නතර වුණොත් ඒක ඔවුන් ලබන ලොකු ජයග්‍රහණයක්ය කියන කාරණයත් මම මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද තමයි දවස. පළාත් පාලන මැතිවරණයේදී මේ අයට සියයට 50ක ඡන්ද ප්‍රමාණයක් ගන්න බැරි වුණා. ඒ නිසා, බල පෙරළියක් කරන්න ඕනෑ නම්; ආණ්ඩු මාරු කරන්න ඕනෑ නම් ජනාධිපතිවරණයේදී සියයට 51ක ඡන්ද ප්‍රමාණයක් ලබා ගන්න ඕනෑය කියන එක අද තමයි ඔවුන් තේරුම් ගන්නේ. සියයට 50ක ඡන්ද ප්‍රමාණයක් කවදාවත් ගන්න හම්බ වෙන්නේ නැහැය කියන එක ඒ අය අද තේරුම් ගනීවි. ඒ බව තේරුම් අරගෙන, අදින් පසුවවත් අපට නිදහසේ ආණ්ඩු කරගෙන යන්න ඉඩදීලා, මේ රට දියුණු කරන්න ඔවුන්ගේ සහයෝගය ලබාදෙයි කියා අපි විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා.

Order, please! Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.***

*අතන් පිරකු, මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, පිරතිච් සපානායකර් අවර්කළ් [මාණ්පුමිකු ජේ.එම්. ආනන්ද කුමාරසිරි] තලෙමෙ වකිත්තාර්කළ්.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

[අ.භා. 4.10]

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ ඉතාම වැදගත් විෂයක් වන, තැපැල් විෂයය පිළිබඳව අද දිනයේ පැවැත්වෙන විවාදයේදී කථා කරන්න මටත් අවස්ථාවක් ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රී ලංකාවේ උත්තරීතරම ආයතනය වන පාර්ලිමේන්තුවේත්, විධායකයේ ප්‍රධාන තනතුරුවලත් මූලික නිර්මාණයේදී පවා තැපැල් ක්ෂේත්‍රය ප්‍රමුඛත්වය අරගෙන කටයුතු කළා. මම එහෙම කියන්නේ මේ නිසායි. අපි දේශපාලනයට පිවිසුණාම, මුලින්ම මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන්න එන්න වෙන්නේ, ගමේ, එහෙම නැත්නම් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඡන්දවලින්. මේ සඳහා ඡන්ද පත්‍රිකාව ජනතාව අතරට ගෙන යන්න තැපැල් ක්ෂේත්‍රයේ ඉහළ නිලධාරියාගේ සිට පහළම නිලධාරියා දක්වාම මැදිහත් වෙනවා. මැතිවරණයකදී ප්‍රතිඵල විකාශනය කරනකොට, "Breaking News" කියා දමලා මුලින්ම ප්‍රකාශ කරන්නේත් තැපැල් ඡන්ද ප්‍රතිඵලයි. එවැනි වැදගත් ක්ෂේත්‍රයකට අදාළව පවත්වන මේ විවාදයට සම්බන්ධ වන්න මේ උත්තරීතර පාර්ලිමේන්තුවට තේරී පත් වී සිටින, එක දිගටම අවුරුදු 20ක් මේ රට පාලනය කළ, වර්තමානයේ තමන් හදාගත් ඒකාබද්ධ විපක්ෂය කියන කණ්ඩායමේ කවුරුවත් අද මේ ගරු සභාවේ නැහැ. මේක ඉතාම අභාග්‍ය සම්පන්න තත්ත්වයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද තැපැල් ක්ෂේත්‍රයේ තිබෙන නොයෙකුත් ප්‍රශ්න ගැන කිව්වා. මම ඒවා අහගෙන හිටියා. අවුරුදු 20ක් මේ රට පාලනය කළ අය ඒ ප්‍රශ්නවලට වග කියන්න ඕනෑය කියායි මම හිතන්නේ. තැපැල් ක්ෂේත්‍රය නව තාක්ෂණයත් එක්ක අලුත් ගමනකට යන්න ඕනෑ, නමුත් එහෙම ගමනක් ගිහින් නැහැය කියා ප්‍රධාන පක්ෂවල ප්‍රබල ජ්‍යෙෂ්ඨ නායකයෝ මේ පාර්ලිමේන්තුවේදී කියද්දි අපට හැහෙන්නේ මේ වසර 20ක කාලය තුළ ආණ්ඩුවේ හිටපු අය මොකුත්ම කර නැහැය කියන එකයි. මට හිතෙන විධියට මේ අමාත්‍යාංශයේ මේ විෂයය ඒ අයට ඒ තරම් රහ නැද්ද දන්නේ නැහැ. මේක ඒ අයට විවිධ වරදාන, වරප්‍රසාද ලබාගන්න, එහෙම නැත්නම් දැවැන්ත විධියට කළු සල්ලි සොයන්න බැරි අමාත්‍යාංශයක්ද කියලා මටම ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා මම තැපැල් ක්ෂේත්‍රයේ සිටින සියලුම නිලධාරින්ට කියනවා, ඊළඟට එන ඡන්දයේදී මේ කණ්ඩායමට හොඳ පාඩමක් උගන්වන්න කියා. මොකද, ඔබ සියලුදෙනා තමයි මේ රට කරවන, මේ රට කරවන්න අවශ්‍ය කරන විධිවිධාන, නීති පද්ධතිය සහ ඊට අවශ්‍ය රාජ්‍ය නිලධාරින්ට අවශ්‍ය ගනුදෙනු කරන්න මැදිහත් වන නිලධාරි කණ්ඩායම වන්නේ. ඒ නිසා ඔබට සාධාරණයක් කරන්න ඒකාබද්ධ කල්ලියට බැරි නම්; ඔබට සාධාරණයක් කරන්න මේ දැවැන්ත, ප්‍රබල විවාදයට සම්බන්ධ වෙන්න ඒ අයට බැරි නම්, ඒ අයට හොඳ පාඩමක් උගන්වන්න ඕනෑ. මම හිතන විධියට ඒක එම ක්ෂේත්‍රයේ අය කරාවි. ඒ ගැන මම බය නැතුව කියනවා.

තැපැල් ක්ෂේත්‍රයේ නිලධාරින්ට මම ගෞරව කරනවා. එදා, අපේ ගමේ තැපැල් මාස්ටර් කියා කෙනෙක් හිටියා. ඔහුට හරි කදිම ඇඳුමකුත් තිබුණා. ඒ ඇඳුම ඇඳගෙන තමයි ඔහු ඉන්නේ. තැපැල් මාස්ටර් කියන චරිතය පරණ චිත්‍රපටවල විකට ජවනිකාවක් වෙලාත් තිබුණා. ඔහු ගමේ ලියුම් හුවමාරු කළා. මේ තත්ත්වය කාලයත් සමඟ වෙනස් වෙන්න තිබුණු එකක් වුණත් එසේ වෙනස් කරන්නේ නැතුව එම කටයුතු මැද තැනක නවතා තිබෙනවා. මගේ මැතිවරණ කොට්ඨාසය වන නාත්තන්ඩිය මැතිවරණ කොට්ඨාසයට පසුගිය රජය යටතේ පැවැති මේ අමාත්‍යාංශය සේවයක් කෙරුවාද කියන එක ගැන කියන්නත් ලජ්ජයි. නාත්තන්ඩිය කියන ප්‍රධාන මැතිවරණ කොට්ඨාසයේ ප්‍රධාන නගරයටත් නිසි පරිදි තැපැල් කාර්යාලයක් නැහැ. අද තිබෙන්නේත් කාගෙන්ද කුලියට ගත් දිරාපත් වුණු පරණ පුංචි මඩුවක් වාගේ තැනක්. ඒකේ නිලධාරියෙකුටවත් ඉන්න බැහැ. ඔවුන් පුදුම අපහසුතාවකින් තමයි සේවය කරන්නේ. අද මේ ඒකාබද්ධ විපක්ෂයේ අය කොළඹට ජනබලය කැන්දන්න නම්, මේ අය කොළඹට ජනබලය ගෙනැල්ලා ආණ්ඩු පෙරළන්න නම්, මෙවැනි විෂය ක්ෂේත්‍ර තුළ ගම් මට්ටමෙන් විය යුතු වගකීම්, යුතුකම් ඉටු කර තබන්න ඕනෑ. මේ කණ්ඩායම සමාජයේ හැම තැනකින්ම ප්‍රතික්ෂේප කර, අයින් කර සිටින මොහොතක තමන්ට අහිමි වෙලා ගිය, තමන්ගෙන් ගිලිහී ගිය බලය ස්ථාපිත කරන්න මේ අය යළිත් උත්සාහ කරනවා, රටේ මොනවා හෝ සෙල්ලමක් දමනවා කියන එක අපිට දකින්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තරුණ මන්ත්‍රීවරුන් විධියට, අලුත් මන්ත්‍රීවරුන් විධියට බැලුවාම, ගම් මට්ටමේ ජනතාවට වැඩක් කරපු මෙවැනි රජයක් ඉතිහාසයේ කවදාවත් අපට දකින්න ලැබෙන්නේ නැහැ. ඒ වාගේම සියලු දෙනාට සාධාරණව, ස්වාධීනව ජීවත් වෙන්න අයිතියක් මේ සමාජය තුළ ස්ථාපිත කරපු මෙවැනි රජයක් අපි දැකලා නැහැ. හැබැයි, මේ රජය සම්බන්ධව ප්‍රශ්න ඇති වී තිබෙන මේ පුංචි කණ්ඩායම ගණින්න දන්නේත් නැහැ. ඔවුන්ගේ සංඛ්‍යාව 70ක් කියනවා. නමුත් 70ක් නැහැ. අපිට ආරංචි හැටියට එය 69ට බැහැලා. එයිනුත් කොටසක් දෙකට, තුනට ගැලවිලා පැත්තක. අපට ආරංචියි අදින් පසුව ඒකත් තුනකට විතර කැඩෙනවා කියා. ඔවුන් අතර නායකත්ව ප්‍රශ්නයක් එනවාලු. ආපසු මේක රාජපක්ෂ පවුලටම ඇද ගන්න, යට පෙළේ නායකයෙක් උඩට ගන්න හදනවා. දිනේෂ් ගුණවර්ධන මහත්මයා මේ වෙනකොටත් උද්ඝෝෂණ වේදිකාවට නඟිනවාද, නැද්ද කියන ප්‍රශ්නයක් තිබෙනවා කියා මට දැන ගන්න ලැබුණා. ඒ නිසා මේ රට වේගයෙන් සංවර්ධනය කරන, ඒ වාගේම රටේ සියලු ජන කොටස්වලට සමඟියෙන් ජීවත් වෙන්න පුළුවන් ස්ථීර වාතාවරණයක් සකසා තිබෙන මේ රජයට විරුද්ධව ගණන් කරගන්න දන්නේ නැති මෙවැනි කණ්ඩායමක් කැරලි ගහන්නේ, උද්ඝෝෂණය කරන්නේ ඇයි, කියන එක ගැන මට ප්‍රශ්නයක් තිබෙනවා. එක අතකින් ඔවුන් ව්‍යවස්ථාව ගැන නොදන්නාකම වෙන්න ඕනෑ. එහෙම නැත්නම් විපක්ෂයේ ඉන්න බැරිකම වෙන්න ඕනෑ. එහෙමත් නැත්නම් බලයට තිබෙන කෑදරකම, බලය පවුලෙන් ගිලිහී යයි කියන හේතුව වෙන්න ඕනෑ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එකතු වෙනවා නම්, පිරිසිදු ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා සමඟ එකතු වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනඟන්න පුළුවන්. එතැනට යන්නේත් නැහැ. මෙතැන තිබෙන්නේ කෙළින්ම රාජපක්ෂ පාලනය. මේ වතාව අතහැර හෝ තව term එකකින් හෝ තමන්ගේ පැත්තට බලය ගන්නයි උත්සාහ කරන්නේ. මේක දිනේෂ් ගුණවර්ධන මහත්මයාට දෙන්නේත් නැහැ. මේක වෙල්ගම මහත්මයාට දෙන්නේත් නැහැ. මම හිතන විධියට පවුලේ වැඩිමහල් සහෝදරයා වුණාට අපේ ගරු චමල් රාජපක්ෂ මැතිතුමාට දෙන්නේත් නැහැ. මේ බලය රාජපක්ෂ පවුල -මහින්ද රාජපක්ෂගේ පවුල- ඇතුළේම තබා ගන්න තමයි උත්සාහ කරන්නේ කියන ආරංචිය තමයි අපට දැන ගන්න ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා අද දවසේ ගෙනා මෙම ව්‍යවස්ථා පිළිබඳව මම එක අතකින් සතුටු වෙනවා. අපි පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් විධියට පත්වීමේදී තැපැල් සේවකයින් මුල ඉඳලා අවසානය දක්වාම ඒ සඳහා දරන ප්‍රයත්නය, උත්සාහය මා අගය කරනවා. අනෙක් අතින් මා අකමැති වෙනවා. මොකද, මේ විෂය ක්ෂේත්‍රය පිළිබඳව පසුගිය

වසර කිහිපය තුළ පැවැති ඒ රජයන්, ඒ සිටි ඇමතිවරුන් කටයුතු කර නැහැ. වර්තමාන ඇමතිවරයාටත් මම ටිකක් ඇඟිල්ල දිගු කරනවා. එතුමා වුණත් මේ අවුරුදු තුන ඇතුළත අපට දැනෙන්න තැපැල් ක්ෂේත්‍රයට වැඩ පිළිවෙළක් හදලා නැහැ. ඒ නිසා මේ යෝජනාව සම්බන්ධව විවාද කරන මේ මොහොතේ, එතුමා දැන්වත් ඒ සම්බන්ධව කටයුතු කළ යුතුයි කියන මගේ යෝජනාවත් අඳහසක් විධියට මා එකතු කරනවා. මෙතැනදී ලොකු දෙයක් දෙන්න බැරි වෙන්න පුළුවන්. නමුත් මේක පින් සිද්ධ වෙන වැඩක්.

අපිට මතකයි, එදා විදුලි පණිවුඩයක් -telegram එකක්- යවන්න අභිංසක මිනිස්සු තැපැල් කන්තෝරුවට ගිය ආකාරය. වැඩිහිටියන් තවම තමන්ගේ වැඩිහිටි දීමනාව ගන්න තැපැල් කන්තෝරුවට යනවා. ඒ වාගේම එදා දුරකථන පණිවුඩ දෙන්නත් තැපැල් කන්තෝරුවට ගියා. අද විශාල විධියට තාක්ෂණය සමාජගතවීමත් සමඟ මේ තැපැල් ක්ෂේත්‍රය අපෙන් අතහැරිලා ගියත්, අතීතයේ පටන් මිනිස් සංහතියට සුවිශාල, සුවිශේෂ සේවාවක් කරපු පැරණිතම ආයතනයක් තමයි තැපැල් දෙපාර්තමේන්තුව සහ තැපැල් ක්ෂේත්‍රය.

අපි ඒ පැරණිම ආයතනය දියුණු කරන්න ඕනෑ. අතීතය අමතක කර අපට රටක් විධියට හෝ සමාජයක් විධියට හෝ ගමක් විධියට හෝ ආයතනයක් විධියට හෝ ගොඩ නැඟෙන්න බැහැ. අතීතයේ මේ රට ගොඩ නහන්න මහඟු සේවාවක් කරපු තැපැල් ක්ෂේත්‍රය මීට වඩා ටිකක් කල එළි කර, ලස්සන කර, දියුණු කර එමඟින් ලෝකයට තවත් යමක් දෙන්න පුළුවන් අන්දමින් එය ගොඩ නහන්න පුළුවන් නම් අටවන පාර්ලිමේන්තුව විධියට අප තැපැල් ක්ෂේත්‍රයට සාධාරණයක් කළා වෙනවා කියා මා හිතනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ වත්මන් තැපැල් ඇමතිතුමාට මම කාරණයක් කියනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මෙතැනින් පසුව, නවවන පාර්ලිමේන්තුවේදි බැණුම් අහන්න ඉඩ තබන්නේ නැතිව, ඇස් දෙක ටිකක් ඇර බලා, ඔය චක්‍රලේඛන පොඩ්ඩක් පැත්තකට දමලා, ඔය ඉඩම් පවරා ගැනීම්වල, ඉඩම් අත් පත් කරගැනීම්වල ගැටලු තිබෙනවා නම් ඒවා පැත්තකට දමලා, සියලු මැති ඇමතිවරුන් එක්ක කතා කරලා තැපැල් දෙපාර්තමේන්තුව වෙනුවෙන් කුමන හෝ ක්‍රමයකට -leasing ක්‍රමයකට හෝ- සල්ලි ටිකක් වියදම් කර අඩුම තරමින් අත්‍යවශ්‍ය ප්‍රධාන නගර කේන්ද්‍ර කරගත් තැපැල් ආයතන ස්ථාපිත කර, ජනතාවට තැපැල් ක්ෂේත්‍රය තුළ සැපයිය හැකි උපරිම සේවාව සැපයිය යුතුය කියා මම යෝජනා කරනවා. මට නියමිත කාලය අවසන් නිසාද මන්දා ඔබතුමා මා දිහා දෙගමනක්, තුන්ගමනක් බැලුවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි මේ රටේ ජනතාවට ස්තුතිවන්ත වෙනවා. හැමදාම රටේ ජනතාව මෝඩ වන්නේ නැහැ. කථාවකුත් තිබෙනවා නේ, "රෑ වැටුණ වළේ දවල් වැටෙන්නේ නැහැ." කියා. මේ වතාවේ අලියෙකු උපද්දනවා වාගේ ලොකු සද්දයක් දමා අද කොළඹට ජන ගහක් ගෙනෙනවා කියා තිබෙනවා. මගේ දිස්ත්‍රික්කයෙන් නම් ඇවිත් තිබෙන්නේ බස් 23ක් විතර ලු. ඒ බස් දෙකක තුනකම තොරතුරු දැන් ටිකකට කලින් photos පිටින් මට ලැබුණා. ඒවායේ ඉඳලා තිබෙන්නේ driver එක්කම 8දෙනෙකු, 9දෙනෙකු පමණයි. එතුමන්ලා අසාර්ථක වැඩසටහනක් කර පාර්ලිමේන්තුවට එන්නේ නැතිව දැන් හැංගිලා ඉන්නවා. ඊයේ දවසේ ඔට්ටු වුණා, අප මේකට මොකක් හෝ උදැල්ලක් දැම්මා, කොක්කක් දැම්මා කියා මාධ්‍ය හරහා රටට මතයක් පතුරන්න. තැපැල් ඇමතිතුමා අද රාත්‍රියේ බොහොම සෝදිසියෙන් ඉන්න; කොළඹ මේ උද්ඝෝෂණය පැවැත්වෙන කාලය ඇතුළත රාත්‍රියේ තැපැල් කන්තෝරු ටික බේරා ගන්න. මා හිතන විධියට ඒ අය ඒවාටත් හානි කරන්න, එහෙම නැතිනම් යම්කිසි අයථා වැඩක් කර ඒකත් අපේ පිටට දමන්න උත්සාහ කරාවි. ඔය ඕනෑ ගහක් ගලපු දෙන්. මේ ආණ්ඩුව නමැති ගහ ඉදිරි කාලයේදී ඉතාම සාර්ථකව ඉස්සරහට ගලනවා කියන එක ඔබතුමාට සිහිපත් කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය විනාඩි 9යි.

[අ.භා. 4.21]

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ තැපැල් දෙපාර්තමේන්තුව අපේ පැරණිම දෙපාර්තමේන්තුවක්. අපේ රටේ ජනතාවට තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵල නොලැබුණු සහ ගම් මට්ටමින් විකාශනය නොවුණු යුගයක ගමේ ජනතාවට, මුළුමහත් රටේ ජනතාවට සුවිශාලම සේවාවක් කරපු දෙපාර්තමේන්තුවක් තමයි තැපැල් දෙපාර්තමේන්තුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලයත් සමඟ, යුගයත් සමඟ දියුණු විය යුතුව තිබුණු, සංවර්ධනය විය යුතුව තිබුණු දෙපාර්තමේන්තුවක් හැටියට අපි කවුරුත් අවිවාදයෙන් මේ දෙපාර්තමේන්තුව දකිනවා. නමුත් අවාසනාවකට, අකමැත්තෙන් වුණත් ප්‍රකාශ කරන්න සිදුව තිබෙනවා, අපේ රටේ සෙසු ආයතනත් සමඟ ගත් විට, මහ ජනයාත් සමඟ වැඩ කරන, මහ ජනයාට සේවා සපයන ආයතනත් සමඟ ගත් විට අපේ තැපැල් දෙපාර්තමේන්තුව, බිහි වෙච්ච ක්‍රමවේදයේ වරදක් නිසා දෝ, එහෙම නැත්නම් යුගයත් සමඟ පරිවර්තනය නොවීමේ වරද නිසා දෝ යම්කිසි පසුගාමීත්වයක තිබෙනවා කියා.

මට පෙර කථා කරපු අපේ ගරු මන්ත්‍රීතුමාගේ කතාවේ සඳහන් වූ විධියට බොහෝ තැපැල් කාර්යාල ඇත්ත වශයෙන්ම නවීන යුගයට, වර්තමාන යුගයට, තාක්ෂණික ලෝකයට ගැළපෙන විධියට දියුණු වෙලා නැහැ. එයින් මහ ජනයා අපේක්ෂා කරන සේවාව ඉටු වන්නේ නැහැ. වෙනදා තැපැල් කාර්යාලය අපේ ගමේ මනුස්සයාගේ බැංකුව බවට පත් වුණා. ගමේ මනුස්සයාගේ පණිවිඩ හුවමාරු කරන ස්ථානය පමණක් නොව සියලු සේවාවන් සපයන්න පුළුවන් කේන්ද්‍රස්ථානය බවට ද තැපැල් කාර්යාලය පත් වුණා. එක් පැත්තකින්, තාක්ෂණික දියුණුවත් සමඟ telegram යැවීම, ලිපි තැපැල් කිරීම, තැපැල් පත් යැවීම ආදිය ක්‍රමක්‍රමයෙන් අඩු වනවාත් සමඟම, තැපැල් දෙපාර්තමේන්තුව මඟ ජනයාට කරපු සේවය වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායිව කරන ස්ථානයක් බවට පත් කළ යුතුව තිබුණා. පසුගිය කාලයේ කරපු ඇතැම් අර්ථ ශූන්‍ය වැඩ වර්ජනත් සමඟ තවදුරටත් ඒ දෙපාර්තමේන්තුව ජනතාවගෙන් ඈත් වෙන හැටි අපි දැක්කා.

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්තයක් විධියට ගත්තාම අපේ රටේ රාජ්‍ය සේවයට අත් වුණු පොදු ඉරණමට හේතුව මේ රටට නායකත්වය දෙන දේශපාලන පක්ෂවල නායකයන් ඇතැම් අවස්ථාවල කරන කඹ ඇදිලි කියලායි මට හිතෙන්නේ. රට ගැන සිතිය යුතු ඇතැම් අවස්ථාවල රට ගැන හිතන්නේ නැතුව, රටේ ජනතාවගේ පොදු අරමුණු වෙනුවෙන් ක්‍රියා කිරීම පැත්තක තියලා, තමන්ගේ පටු දේශපාලන අරමුණු ඉටු කර ගැනීම සඳහා, තමන් බලයේ නැති අවස්ථාවකදී බොහෝ අය ප්‍රාර්ථනා කරන්නේ, "දැන් මේ රට විනාශ වන එක හොඳයි, රටේ යන්ත්‍රණය කඩා වැටෙන එක හොඳයි, රට ආපස්සට යන එක හොඳයි, කොටස් වෙළෙඳ පොළ කඩා වැටෙන එක හොඳයි, ආයෝජකයේ මේ රටට එන්නේ නැති එක හොඳයි" කියායි. අන්න ඒ විධියේ- ඒ අයට කියන්න සුදුසු වචන මේ පාර්ලිමේන්තුවේ සඳහන් කරන්න හොඳ නැහැ. - ඉතාම කුහක දේශපාලනයක් අපේ රටේ ඇතැම් දේශපාලනඥයන් තුළ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමාගෙන් පසු මේ රට යම් කිසි සාර්ථක තැනකට ගන්න පුළුවන් අවස්ථාව උදා වුණේ යුද්ධයෙන් පසුවයි. යුද ජයග්‍රහණය සඳහා දේශපාලනික වශයෙන් කවුරු නායකත්වය දුන්නද, යුදමය වශයෙන් කවුරු නායකත්වය දුන්නද, ඒ යුද ජයග්‍රහණය ගන්න පුළුවන් වුණේ කොයි හේතු නිසාද කියන එක වෙනම විග්‍රහ කරන්න අවශ්‍යයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ යුද ජයග්‍රහණය කවුරු නිසා අත් පත් කර ගත්තත්, එම ජයග්‍රහණයෙන් පස්සේ අපේ රටේ සෑම ක්ෂේත්‍රයක්ම යම් කිසි තැනකට ගෙන යන්න පුළුවන් අවස්ථාවක් උදා වුණා. ඒක හරියට සුනාමිය ආවට පස්සේ අපේ පළාත්වල මිනිස්සු තමන්ගේ ජීවිතය ගැන, ජීවිතයේ යථාර්ථය ගැන නැවත හිතන්න පටන් ගත්තා වාගේ. යුද්ධයෙන් පසු මිනිස්සු හිතුවා, "දැන් රටේ නායකයෝ යම් කිසි පොදු තීරණයක හිට ගන්නවා නම්, අල බතල කාලා හෝ කමක් නැහැ, මොන කැපවීම් කරලා හෝ රට වෙනුවෙන් අපි ඕනෑම ක්‍රියාමාර්ගයකට ඕනෑම තීන්දුවකට එන්න සූදානම්" කියලා. එම නිසා ඒ අවස්ථාව රටේ නායකයන්ට ලැබුණු හොඳම අවස්ථාවක්. මේ රට යන ගමන නිවැරදි දිශාවට හරවන්න, රටේ ජාතික ප්‍රතිපත්ති ටික හදන්න, රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න, බලය බෙදන්න අවශ්‍ය නම් කොයි තරම් දුරට බලය දෙන්න ඕනෑද කියලා හිතන්න පසුගිය රජය කරපු අයට, හිටපු ජනාධිපතිතුමාට හොඳම අවස්ථාවක් ලැබුණා.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් හැටියට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දවස තමයි අද දවස. අද දවස ඓතිහාසික දවසක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සුදුසු නැත්නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කළ යුතු සැබෑ වෙනස්කම් මොනවාද, රටේ ආර්ථිකය සම්බන්ධයෙන් ගත යුතු තීන්දු තීරණ මොනවාද, ජාතික ප්‍රතිපත්ති හදන්න ඕනෑ මොනවා සම්බන්ධයෙන්ද, ඒ කොයි විධියටද, යනාදී තීන්දුවලට එන්න තිබුණු හොඳම අවස්ථාව තමයි යුද්ධයෙන් පසු ඇති වුණු අවස්ථාව ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වෙලාවේ රට ගැන හිතුවා නම් දේශපාලන පක්ෂ පැත්තක තියලා මේ රටේ ජනතාව පෙළ ගැහෙනවා. නමුත්, මොනවාද කළේ? යුද්ධයෙන් පසුව බැලුවේ තමන්ගේ බල පරාක්‍රමය විහිදුවා ගන්න පුළුවන්ද කියන එකයි; තමන්ගේ පවුලේ බල පරාක්‍රමය විහිදුවා ගන්න පුළුවන්ද කියන එකයි. රටේ ආර්ථිකය හැදීම, එහෙම නැත්නම් අධ්‍යාපනය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති හැදීම, සෞඛ්‍ය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති හැදීම වැනි රටේ අනාගතය ගැන හිතන එක පැත්තක තියලා, බලය බෙදන්න අවශ්‍ය නම් බලය බෙදිය යුත්තේ කොයි ආකාරයෙන්ද කියලා හිතන එක පැත්තක තියලා, තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍රය දිහායි බැලුවේ; තමන් සදාකාලිකව වැජඹෙන්නේ කොහොමද කියන එක දිහායි බැලුවේ. ඒ නිසායි මේ උත්තරීතර පාර්ලිමේන්තුවට දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආවේ. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා රට හරවන්න හැදුවේ කොතැනකටද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකාධිපති පාලනයකට, පවුල් පාලනයකට තමයි රට හරවන්න හැදුවේ. මේ රට ඒ විධියට ගෙනයන්න හදලා, තමන්ට බලයේ ඉන්න අවුරුදු දෙකක් ඉතිරිව තිබියදී ඒ අවුරුදු දෙකත් නැති කරගෙන තමයි ජනාධිපතිවරණයකට යන්න සිද්ධ වුණේ. අනාගතය ගැන හිතන්නේ නැතුව, සුදු අලි වගේ සංචර්ධන ව්‍යාපෘති මේ රටේ හදලා, මුළු ජාතියම ණයකාරයෝ කරලා, ගෙවා ගන්න බැරි මහා ණය බරක් මේ රට මත, මේ රටේ සෑම පුද්ගලයෙක් මතම පටවලා, කෙටියෙන් කිව්වොත් රට ලොකු අමාරුවක දාලා, කලින් මැතිවරණ පවත්වලා කොහොම හෝ තමන් නැවත බලයට එන න්‍යාය පත්‍ර තමයි හිටපු පාලකයෝ ක්‍රියාත්මක කළේ.

එවැනි න්‍යාය පත්‍ර අනුව කටයුතු කරලා, රට අමාරුවේ දාලා, රට අසීරු අඩියකට ගෙනැල්ලා, අපේක්ෂා නොකළ අවස්ථාවක ජනාධිපතිවරණයකට ගොස් තමන් පරාජයට පත් වුණාම, ඒක දරා ගන්න බැරිව මොකක්ද කළේ? මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ වාඩි වුණු පළමු දවසේ ඉඳලා මෙතැනට ඇවිල්ලා කළේ, උද්ඝෝෂණ කරපු එක. මේ පාර්ලිමේන්තුවේ ආසනවල වැඩි කාලයක් වාඩි වෙලා හිටියාට වඩා කළේ, සභා ගර්භය මැදට පැනලා උද්ඝෝෂණ කරපු එක; සෙංකෝලය උදුරන්න හදපු එක; පාර්ලිමේන්තුව නාඩගම් මඩුවක් කර ගන්න උත්සාහ කරපු එක. ඒක තමයි පසුගිය කාලයේ කළේ. එහෙම කරලා බැලුවේ මොකක්ද? මේ රට අකර්මණ්‍ය කරන්න පුළුවන්ද කියලා, මේ රට ආපස්සට හරවන්න පුළුවන්ද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ කාර්ය භාරය වන්නේ කුහක දේශපාලනයේ නිරත වෙමින්, හැම දේටම විරුද්ධ වෙලා, රට ආපස්සට හරවන්න කටයුතු කරන එක නොවෙයි. නමුත්, එතුමන්ලා හැම විටම බැලුවේ මේ රට අස්ථාවරයි කියලා පෙන්වන්නයි. රටට විදේශ ආයෝජකයන්ගේ පැමිණීම නවත්වා, අපේ කොටස් වෙළෙඳ පොළ කඩා වට්ටන්න පුළුවන්ද කියලා බලලා, රට අස්ථාවර කරන්න තමයි බැලුවේ. ඒ නාඩගමේම එක ජවනිකාවක් තමයි අද මේ කොළඹ සිද්ධ වෙන්නෙත්. ඒ නිසා මම කියන්න ඕනෑ, අපේ රටේ තිබෙන දෙපාර්තමේන්තු ඇතුළු රාජ්‍ය ආයතන අද යම් පසුගාමීත්වයක තිබෙනවා නම්, ඉතිහාසය පුරා මේ රට පාලනය කරපු අපි සියලු දෙනාම ඊට වග කිව යුතු බව.

විශේෂයෙන්ම යුද්ධයෙන් පසුව මේ රටේ අභ්‍යන්තර අරගළ නැති වුණා. උතුරෙත් අරගළ නැති, දකුණෙත් අරගළ නැති, පළාත් සභා බලය තිබෙන, ප්‍රාදේශීය සභා සියල්ල පිහිටුවා තිබෙන, තුනෙන් දෙකක බලයක් ඇති ආණ්ඩුවක් හා විධායක ජනාධිපතිකම කියන සියලු බලතල එක්තැන් වුණු වෙලාවේ රටේ සියලු ජාතික ප්‍රතිපත්තීන් හදලා, ව්‍යවස්ථාමය වෙනසක් අවශ්‍ය නම් ඒ සියල්ලත් කරලා, රටේ ආර්ථිකයත් දියුණු කරලා, රට නිවැරදි තැනකට ගන්න තිබුණු වෙලාවේ තමන්ගේ පෞද්ගලික අරමුණු වෙනුවෙන් මේ රටේ දේශපාලනය හසුරවපු නායකයෝ අද මේ රටේ යම්කිසි ආයතනයක හෝ රාජ්‍ය යන්ත්‍රණය තුළ අර්බුදයක් ඇති වෙලා තිබෙනවා නම් ඒකට වග කිව යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ සිටින්නේ බුද්ධිමත් ජනතාවක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණත් මම කියන්නේ නැහැ, මේ ගෙවුණු කාලය තුළ මේ ආණ්ඩුවට හැමදේම සියයට 100ක්ම නිවැරදිව කරන්න පුළුවන් වුණා කියලා. අපේ ආණ්ඩුවේ අඩු පාඩු ඇති; වැරදි ඇති. තිබෙන වැරදි හා අඩු පාඩු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපි නිර්භයව පෙන්වා දුන් අවස්ථාත් තිබෙනවා. ගරු නියෝජ්‍ය

කථානායකතුමනි, අඩු පාඩු තිබුණාට ඒ දිහා බලන්න ඕනෑ සංසන්ධනාත්මකවයි. මේ ආණ්ඩුව ගෙවුණු වසර තුනේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, නිදහස වෙනුවෙන් සහ මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම වෙනුවෙන්, මේ රටේ පොදු ජනතාවගේ ප්‍රශ්න විසඳීම වෙනුවෙන් ගත් ක්‍රියා මාර්ග අපි සංසන්ධනාත්මකව බැලිය යුතුයි. මේ ආපු ගමනේදී අපට කොයි තරම් බාධා ඇති වුණාද; කොයි තරම් කඩාකප්පල්කාරී සිදුවීම් ඇති වුණාද; මේ පාර්ලිමේන්තුවම කොතරම් පහත් විධියට පාවිච්චි කළාද? එපමණක් නොවෙයි. ගරු කථානායකතුමාට පවා නිගරු කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා, අද දේශ ප්‍රේමීන් කියන උදවිය ගරු කථානායකතුමාට පවා නිගරු කරමින් මේ පාර්ලිමේන්තුවේ හැසිරුණු විධිය. හිස් මුදුනේ ඉඳලා පාදාන්තය තෙක් දේශ ප්‍රේමීත්වය තවරා ගෙන ඉන්න උදවිය මේ පාර්ලිමේන්තුවේ හැසිරුණු විධිය අපි දැක්කා. අද මහ පාරට බැහැලා කරන්නෙත් ඒ වික. අද මහ පාරට බැහැලා තිබෙන්නේ, ජනතාව වෙනුවෙන් නොවෙයි; රට වෙනුවෙන් නොවෙයි. අපි දන්නවා, සමහර උදවියට මුහුණ දෙන්න බැරි තරම් නඩු ඉස්සරහට එකින් එක එන්න තිබෙන බව. විශේෂ අධිකරණවලදී උත්තර දෙන්න බැරි කාරණා තිබෙනවා. ඒවාට මුහුණ දෙනවා වෙනුවට, අධිකරණවලටත් යම්කිසි විධියකින් බලපෑමක් ඇති වන විධියට ජනතාව පාවිච්චි කිරීමේ අරමුණ ඇතිව තමයි අද මහ පාරට බැහැලා තිබෙන්නේ. ජනතාව ඉස්සරහට දාලා, ජනතාව බිල්ලට දීලා, තමන් නඩුවලින් ගැලවෙන්නේ කොහොමද කියලායි ඔවුන් බලන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වන අතර, මට ලැබී තිබෙන අවසාන තත්පර දහයේදී මම මේ දේ කියනවා. මේ ආණ්ඩුවේ යම් යම් අඩු පාඩු තිබෙනවා. මේ ආණ්ඩුවේම මන්ත්‍රීවරු වුණත් සමහර කාරණා සම්බන්ධයෙන් අපටත් යම් යම් විවේචන තිබෙනවා. හැබැයි, 2015 ජනවාරි 8වැනි දා අපි ලබා ගත් ජයග්‍රහණය හා 2015 අගෝස්තු 17වැනි දා අප ලබා ගත් ජයග්‍රහණය පාරට බැහැලා, ඩෙගා නටලා, කෝලම් නටලා ආපස්සට හරවන්න අපි කිසිම ලෙසකින් ඉඩ තබන්නේ නැහැ කියලා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

Next, the Hon. Mylvaganam Thilakarajah. You have ten minutes.

[ප.ව. 4.33]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தபால் அலுவலகக் கட்டளைச் சட்ட ஒழுங்குவிதிகள்மீது உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக முதலில் உங்களுக்கு நன்றி தெரிவித்துக்கொள்ளக் கடமைப்பட்டிருக்கின்றேன். நமது நாட்டின் தபால் சேவை பற்றி இன்று எமது உறுப்பினர்கள் பலரும் பல முக்கியமான விடயங்களை முன்வைத்தார்கள்; குறைபாடுகளையும் சுட்டிக்காட்டினார்கள். என்னைப் பொறுத்தவரை பிரித்தானிய ஆட்சியாளர் நமது நாட்டின் தபால் சேவைக்கு மாத்திரமல்ல, நமது நாட்டின் கட்டடக் கலைக்கும் விட்டுச்சென்றிருக்கக்கூடிய மிக முக்கிய ஆவணமாக - அடையாளமாகத்தான் நான் தபால் சேவையைப் பார்க்கின்றேன்.

குறிப்பாக கடந்த காலங்களில் நுவரெலியா நகரத்தில் அமைந்திருக்கக்கூடிய தபாலகக் கட்டிடத்தை தனியார் உல்லாச விடுதியொன்றுக்கு வழங்குவது சம்பந்தமாக உரையாடல் இடம்பெற்றபோது அது சம்பந்தமாக மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்திலும் பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டத்திலும் என்னுடைய கருத்துக்களைத் தெரிவித்திருந்தேன். எமது நாட்டின் சில பிரதேசங்களில் காணப்படுகின்ற தபாலகக் கட்டிடங்கள் ஓர் அருங்காட்சியகமாக வைத்துப் பேணக்கூடிய அளவுக்குப் பழமை பொருந்தியவை. குறிப்பாக நுவரெலியா நகரத்தின் அழகை அங்குள்ள தபாலகம் வெளிப்படுத்துவதாக இருக்கின்றது. அதுபோல ஒவ்வொரு நகரத்திலும் இருக்கக்கூடிய பிரித்தானியர் காலத்திலே கட்டப்பட்ட தபாலகங்கள் இன்று முன்பு போன்று அந்தச் சேவைகளை வழங்காதபோதும்கூட அந்தக் கட்டடங்கள், அங்கு பயன்படுத்திய பண்டைய பொருட்கள் - உதாரணமாக அந்தத் தபாலகங்களிலே முன்னர் பயன்படுத்திய உபகரணங்கள், தொலைபேசி, தந்திக்காகப் பயன்படுத்திய முறைமைகள் - போன்று வேறு நாடுகளில் இருக்குமென்று நான் நினைக்கவில்லை. பிரித்தானியாவோடு ஒப்பிடும்போது நமது நாடும் அத்தகைய தன்மை கொண்டதாக இருக்கின்றது. அதைப் பாதுகாப்பதற்கு நடவடிக்கையெடுக்கின்ற அதே தருணத்தில்தான் நாங்கள் தபால் சேவையைப் புதுப்பிக்கவிருக்கின்றோம். காரணம், இன்று நாங்கள் கைத்தொலைபேசிப் பாவனைக்கு வந்துவிட்டோம்; 'பக்ஸ்' சேவை வந்துவிட்டது; 'ஈ-மெயில்' சேவை வந்துவிட்டது. இதனால் தந்தி முறைமை இல்லாமலாக்கப்பட்டிருக்கின்றது. எனவே, தபால் சேவை மறுசீரமைக்கப்பட வேண்டுமென்பதில் மாற்றுக் கருத்து இல்லை. அதற்கு மேலதிக ஆலோசனையாகத்தான் ஒவ்வொரு தபால் நிலையத்தையும் நாங்கள் அருங்காட்சியகமாக மாற்றி செயற்படுத்த முடியும் என்று நான் கருதுகின்றேன். அத்தகைய நிலையங்களை நாங்கள் வெளிநாடுகளில் அவதானிக்கின்றோம். அந்தப் பண்டைய அருங்காட்சியகத்தினூடாகவே புதிய சேவைகளையும் பெற்றுக் கொள்ளக்கூடிய முறைமைகளை நாங்கள் இந்தப் பாராளுமன்றத்தினூடாக தபால் சேவைக்குப் பிரேரிக்கக்கூடியதாக இருக்கும்.

இந்தத் தருணத்தில் தபால் சேவை இந்த நாட்டிலே குறித்த ஒரு தொகுதி மக்களுக்கு எவ்வாறு சென்றடைகின்றது சம்பந்தமாக நான் இந்தச் சபையின் கவனத்திற்குக் கொண்டு வர விரும்புகின்றேன். நான் அந்த மக்களைப் பிரதிநிதித்துவப்படுத்துபவன் என்ற வகையிலே, எற்கெனவே பலமுறை மலையகப் பெருந்தோட்ட மக்கள் எவ்வாறெல்லாம் இந்த நாட்டின் பொதுச் சேவைகளிலிருந்து விடுபட்டு நிற்கின்றார்களென்பது சம்பந்தமாக - நீங்கள் அவையில் இருக்கின்ற சந்தர்ப்பங்களில்கூட - பேசியிருக்கிறேன். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நீங்கள்கூட பெருந்தோட்டப் பகுதிகள் இருக்கின்ற மாவட்டமான மொனராகலை மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற உறுப்பினர் என்ற வகையில், பெருந்தோட்டப் பகுதி மக்களைப் பற்றி உங்களுக்கு நன்கு தெரியும். பிரசாவுரிமை பறிக்கப்பட்டது முதல் அவர்கள் இந்த நாட்டின் தேசிய நிர்வாக முறைமையில் ஓரங்கட்டப்பட்டார்கள். அந்த அடிப்படையில் கல்வி, சுகாதாரம், மின்சாரம், போக்குவரத்து, தொடர்பாடல் என எல்லாத் துறைகளிலிருந்தும் ஒதுக்கிவைப்பட்டிருந்த மக்களுக்குத் தபால் சேவையானது இன்று வரை முற்றுமுழுதாகக் கிடைக்கப்பெறாத ஒரு சேவையாக இருக்கின்றதென்பதை நாங்கள் இந்த சபையின் கவனத்திற்குக் கொண்டுவர வேண்டியிருக்கிறோம்.

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

நான் பல்லைகழகத்திற்குத் தெரிவானபோது தோட்டத்தில்தான் இருந்தேன். எங்கள் தோட்டத்திற்கு எனது பல்கலைக்கழக அனுமதிக் கடிதம் வர வேண்டும்; அது நேரடியாக எனது வீட்டுக்கு வராது. தோட்டத்தில் இருக்கின்ற அலுவலகத்திற்குத்தான் கடிதங்கள் செல்லும். அந்த அலுவலகத்தில் சேர்க்கப்படுகின்ற கடிதங்களை ஒரு வாரத்திற்கு அல்லது இரண்டு வாரங்களுக்கு ஒருமுறை ஒன்றுசேர்த்து அவற்றைத் தோட்டத் தொழிலாழி ஒருவரின் கையிலே கொடுத்து வேலைத் தளத்திலே வேலைகள் பகிரப்படுகின்ற muster shedஇலே ஒப்படைக்கப்பட்டு, அந்தக் கடிதங்களை அங்கே வேலை பார்க்கும் மேலதிகாரி ஒருவர் வேலை நேரம் முடிவின்போது சம்பந்தப்பட்டவர்களுக்குப் பகிருகின்ற ஒரு முறைமைதான் நீண்டகாலமாகக் காணப்பட்டது. இதுதான் இந்த நாட்டிலே அந்த மக்களுக்கு வழங்கப்பட்டிருந்த தபால் சேவை முறைமையாகும். எங்களுக்கென ஒரு முகவரி இருக்கவில்லை. அதனால் எனக்குக் கடிதம் வராது. தோட்ட முவரிக்கு வருகின்ற கடிதங்கள் அங்கிருந்து local service மூலம் அதாவது தோட்டத் தொழிலாளர்களின் ஊடாகப் பகிரப்படும். பல்கலைக்கழக அனுமதிக் கடிதங்கள், வேலைவாய்ப்புக்கான விண்ணப்பங்கள், நேர்முகப்பரீட்சைத் தெரிவுக்கான கடிதங்கள் என அனைத்தும் தாமதித்து வருகின்ற நிலைமை இன்று வரை பரவலாகக் காணப்படுகின்றது.

இந்த நிலையில்,1998ஆம் ஆண்டுக் காலப்பகுதியில் நுவரெலியா மாவட்டத்திற்கு மாத்திரமல்ல, அனைத்துப் பெருந்தோட்டப் பகுதிகளிலும் உப தபால் நிலையங்களை அல்லது முகவர் தபால் நிலையங்களை அமைக்க வேண்டுமென்ற கோரிக்கை முன்வைக்கப்பட்டது. அந்த வகையில் பெருந்தோட்ட மக்கள் வாழும் நுவரெலியா, கண்டி, பதுளை, மொனறாகலை, களுத்துறை போன்ற மாவட்டங்களில் 126 முகவர் தபால் நிலையங்களை நிறுவுவதற்கு ஏற்பாடு செய்யப்பட்டு, இறுதியாக அதில் 69 முகவர் தபால் நிலையங்கள் மாத்திரமே செயற்பாட்டுக்கு வந்தன. அவையும் செயற்பாடுகள் இழந்த நிலையில், அவற்றைத் தொடர்ச்சியாகக் கொண்டு நடாத்த முடியாதென்ற நிலையில் 2006ஆம் ஆண்டு estate postal peons என ஒரு தொகுதி தபாற்காரர்கள் நியமிக்கப்பட்டார்கள். எவ்வாறு estate sector medical assistants என வைத்திய முறைமை இருக்கின்றதோ அதே முறைமையைத் தபால் சேவையிலும் கொண்டு வந்தார்கள். அவர்களுடைய வேலை என்னவென்றால், தோட்டங்களுக்கு கடிதங்களைக் கொண்டு சேர்ப்பதாகும். அந்த வகையில், 500 தபாற்காரர்களை நியமிப்பதற்கு அனுமதி வழங்கப்பட்டபோதும், 300 பேருக்கு மாத்திரமே நியமனங்கள் வழங்கப்பட்டன. இன்னும் 200 தபாற்காரர்களுக்கான வெற்றிடங்கள் நிலவுகின்றன. அந்த நியமனங்களை வழங்குவது தொடர்பாக அமைச்சர் அவர்கள் கவனத்தைச் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தோட்டப் பகுதிக்கும் நகரப் பகுதிக்குமிடையில் இருக்கின்ற தூரம் எவ்வளவென்பது உங்களுக்குத் தெரியும். அதேபோல அங்கே உள்ள பாதைகளின் நிலை பற்றியும் உங்களுக்குத் தெரியும். நான் உரையாற்றும்போதுகூட அது பற்றிச் சொல்லியிருக் கிறேன். மொனறாகலை நகரத்தை அலியாவத்தைத் தோட்டத்திலிருந்து அல்லது மொனறாகலைத் தோட்டத்தி லிருந்து கண்ணால் பார்த்துவிடலாம். ஆனால், மொனறாகலை நகரத்திலிருந்து அந்த அலியாவத்தைத் தோட்டத்திற்கோ அல்லது மொனறாகெலே தோட்டத்திற்கோ செல்வதென்றால் வாகனத்தில் செல்ல முடியாது. அந்தளவுக்கு அந்தப் பாதை மோசமாக இருக்கின்றது. ஒரு பாராளுமன்ற உறுப்பினரான நான்கூட வாகனத்தை கீழ் பகுதியில் நிறுத்திவிட்டு, ஆட்டோ ஒன்றை hireசெய்து கொண்டுதான் மேலே உள்ள பகுதிகளுக்குச் சென்றுவரவேண்டிய நிலைமை இருக்கின்றது. அந்தப் பாதையினூடாகச் சென்றுதான் கடிதங்களைக் கொண்டு சேர்க்க வேண்டும். அங்கே தபால் உத்தியோகத்தர் கள் இல்லாத நிலையில் இது எவ்வாறு சாத்தியப்படும்? அந்தத் தோட்டங்களுக்குத் தபால்களை விநியோகிப்பது சம்பந்தமாக நாங்கள் பல கேள்விகளைக் கேட்க வேண்டியிருக்கிறோம்.

இந்த நிலையில், முகவர் தபால் நிலையங்களாக அல்லது உப தபால் நிலையங்களாகச் செயற்பட்டு வந்த 58 முகவர் தபால் நிலையங்கள் இப்பொழுது பல்வேறுவிதமாக அங்கே கைவிடப்பட்டிருக்கின்றன. ஒரு சில உதாரணங்களை மாத்திரம் தெரிவித்து, உரிய ஆவணங்களை ஹன்சாட் பதிவுக்காகவும் சபையில் *சமர்ப்பிக்கின்றேன்.

நுவரெலியா மாவட்டத்தில் அனுமதிக்கப்பட்ட 39 உப தபால் நிலையங்கள் அல்லது முகவர் தபால் நிலையங்களில் அரசாங்கத்தின் நேரடிக் கண்காணிப்பில் 13 உம், தனியார் வசம் 4 உம், தோட்டங்கள் வசம் 8 உம் இருந்தன. இவற்றில் மொத்தமாக 14 முகவர் தபால் நிலையங்கள் பயன்படுத்தப்படாமல் இருக்கின்றன. இதிலுள்ள பிரச்சினை என்னவென்றால், அரசாங்கத்தின் நேரடிக் கண்காணிப்பின்கீழ் நிறுவப்பட்ட 9 முகவர் தபால் நிலையங்கள் கிராம சேவகர் அலுவலகங்களாக மாற்றப்பட்டுவிட்டன; 3 நிலையங்கள் தற்காலிக பொலிஸ் அரண்களாக - police posts - மாற்றப்பட்டிருக்கின்றன. இன்னுமொன்று அபிவிருந்தி நிலைய உத்தியோகர் அலுவலகமாக மாற்றப்பட்டிருக்கிறது. தனியார் வசம் ஒப்படைக்கப்பட்டதில் 2 நிலையங்கள் கடைகளாகவும், 2 நிலையங்கள் வீடுகளாகவும், ஒரு நிலையம் nursery பாடசாலையாகவும் மாற்றப்பட்டிருக்கின்றது; 7 உப தபால் நிலையங்கள் களஞ்சியசாலைகளாக மாற்றப்பட்டிருக்கின்றன. அந்த இரண்டு கடைகளில் ஒன்று மதுபானசாலையாகப் பயன்படுத்தப்படுகின்றதென்பதை நாங்கள் இந்த சபையில் வருத்தத்தோடு தெரிவிக்க வேண்டியவர்களாக இருக்கின்றோம். அந்த வகையில் அங்கு முகவர் தபால் நிலையங்கள் அமைக்கப்பட்டனவே தவிர, அவை தபால் திணைக்களத்தினால் பொறுப்பேற்கப்படவில்லை. தனியார் பார்த்துக்கொள்ளட்டுமென அரசியல் ரீதியாக அவை கொடுக்கப்பட்டதன் காரணமாக கட்சி சார்ந்து செயற்பட்டவர்கள் அவற்றை வீடாகவோ, கடையாகவோ மாற்றிக்கொண்டார்கள்.

இதைப்போல, கேகாலை மாவட்டத்தில் 2 முகவர் தபால் நிலையங்கள் திறக்கப்பட்டன. இப்போது அவை செயற்பாட்டில் இல்லை. களுத்துறை மாவட்டத்தில் 3 முகவர் தபால் நிலையங்கள் திறக்கப்பட்டன; ஒன்று மாத்திரந்தான் இப்போது செயற்பாட்டில் இருக்கின்றது. பதுளை மாவட்டத்தில் 12 முகவர் தபால் நிலையங்கள் திறக்கப்பட்டன; அதில் 3 மாத்திரமே செயற்பாட்டில் இருக்கின்றன. இரத்தினபுரி மாவட்டத்தில் 2 முகவர் தபால் நிலையங்கள்

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* Placed in the Library.

திறக்கப்பட்டன; அதில் ஒன்று மாத்திரமே செயற்பாட்டில் இருக்கின்றது. எனவே, நான் தொடர்ச்சியாக விலியுறுத்துவது போல தபால் சேவையில் முறைமையொன்று கொண்டுவரப் படுகின்றபோது அது அரச முறைமையாக தபால் திணைக்களத்திற்குக் கீழாக இயங்குகின்ற வகையில் மாற்றம் கொண்டு வரப்பட வேண்டும்.

இவ்வாறு பெருந்தோட்டப் பகுதிகள் தபால் சேவை விடயத்தில் முற்று முழுதாகப் புறக்கணிக்கப்பட்டிருக்கக்கூடிய நிலையில்தான் தற்போது, கௌரவ அமைச்சர் திகாம்பரம் அவர்களின் தலைமையில் அமைக்கப்படுகின்ற புதிய கிராமங்களின்கீழ் நாங்கள் இந்தத் தபால் முறைமையை அங்கே ஒரு முகவரியூடாகக் கொண்டுவர வேண்டும் என்பதற்காக வீட்டுக்குவீடு இலக்கங்களை வழங்கி, அங்கே தபாற் பெட்டிகளை வழங்குகின்ற ஒரு முறைமையை ஆரம்பித்திருக்கின்றோம். கடந்த ஆண்டு அதிமேதகு ஜனாதிபதி அவர்கள் தலவாக்கலைக்கு வந்து திறந்து வைத்த ஊற்றுவெளிபுரம் என்கின்ற கிராமத்தில் நாங்கள் தபால் திணைக்களத்தோடு இணைந்து இந்த முகவரி வழங்குதல் என்கின்ற ஒரு திட்டத்தையும் ஆரம்பித்து, அதனூடாக அவர்களுக்கு அந்தத் தபால் சேவையைப் பெற்றுக் கொடுக்கின்ற முறைமையை சம்பிரதாயபூர்வமாக ஆரம்பித்து வைத்தோம். அது சட்டப்படியாக இன்னும் உருவாக்கப் படவில்லை. எனவே, இன்றைய விவாதத்தினூடாக நான் அதுபற்றி மிக முக்கியமான ஒரு கோரிக்கையை முன் வைக்கின்றேன். அத்துடன் இதனுடன் சம்பந்தப்பட்ட ஆவணங்களையும் சமர்ப்பிக்கின்றேன்.*

பெருந்தோட்டத் துறைத் தபால் சேவை தேசிய மயப்படுத்தப்பட வேண்டும் அல்லது அரச மயப்படுத்தப்பட வேண்டும். முற்றுமுழுதாகப் பெருந்தோட்டத் துறைக்குக் கீழிருக்கின்ற தபால் சேவை அரச மயப்படுத்தப்பட்டு, அங்கே தேவையானளவு உப தபாலகங்கள் நிறுவப்பட்டு, அங்குள்ள இளைஞர் யுவதிகளுக்கு வேலைவாய்ப்புகளும் பெற்றுக் கொடுக்கப்பட்டு, வேலைவாய்ப்புகள் இருக்கக்கூடிய இடங்கள் நிவர்த்திக்கப்பட வேண்டும்; இந்த மக்களையும் தேசியத் தபால் முறைமைக்குள் கொண்டுவர வேண்டும். அதற்கு அமைச்சு நடவடிக்கை எடுக்க வேண்டும் எனக் கேட்டுக் கொண்டு, வாய்ப்புக்கு நன்றி கூறி விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.43]

**ගරු සුජීත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு சுஜித் சங்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථා සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව සලසා දීම පිළිබඳව මා ඔබතුමාට පළමුකොටම ස්තුතිවන්ත වෙනවා. තැපැල් කාර්යාලවල ඒ වාගේම තැපැල් දෙපාර්තමේන්තුවේ ඉදිරි දියුණුව සඳහා ආදායම් වැඩි කර ගැනීමේ පරමාර්ථය පෙරටු කරගෙන තමයි මේ අවස්ථාවේදී මේ ව්‍යවස්ථාවන් ගෙනැල්ලා තිබෙන්නේ. තැපැල් සේවයේ ගාස්තු වෙනස් කිරීම් සම්බන්ධවයි ව්‍යවස්ථාවන් කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි මේ අවස්ථාවේදී කල්පනා කර බලන්න ඕනෑ, එදා තිබුණු තැපැල් සේවය නොවෙයි, අද තිබෙන්නේ කියන කාරණය. අද තැපැල් සේවය ඉතාම තරගකාරී තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. තාක්ෂණික පැත්තෙන් අනෙක් ක්ෂේත්‍ර දියුණු වෙන කොට සම්ප්‍රදායික ලෙස තැපැල් සේවාව අපට පවත්වාගෙන යන්න පුළුවන්කමක් නැති ප්‍රශ්නය තමයි තිබෙන්නේ. ඒ නිසා තමයි මේ තැපැල් සේවය දිනෙන් දින පාඩුවට ලක් වෙලා තිබෙන්නේ. එය රජයට නඩත්තු කර ගන්න හැකියාවක් නැති තත්ත්වයක් අද උදා වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට තිබෙන විසඳුම විධියට ගාස්තු වැඩිකිරීම් විතරක්ම ප්‍රමාණවත් වෙන්නේ නැහැ. අපේ රාජ්‍ය අංශයේ තිබෙන තැපැල් සේවාව පෞද්ගලික අංශයේ තිබෙන තාක්ෂණයත් එක්ක එකට යන -ඒකත් එක්ක බද්ධ වෙලා යන- වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරුවා නම් මේ තැපැල් සේවය අපට දියුණු කර ගන්න පුළුවන්කම ලැබෙනවා කියන එක අපි කවුරුත් දන්නා දෙයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අදහස නම් විශේෂයෙන්ම මේ තාක්ෂණය පැත්ත ගැන වැඩි අවධානයක් යොමු කළ යුතුයි කියන එකයි. තැපැල් කාර්යාලවලට Internet පහසුකම් ලබා දීලා තාක්ෂණික පැත්ත එයට බද්ධ කළොත් තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තැපැල් ක්ෂේත්‍රය දියුණු කරන්න පුළුවන් වෙන්නේ.

අලුත් තාක්ෂණයත් එක්ක කටයුතු කරන එක ක්ෂේත්‍රයක් තමයි, courier service එක. තැපැල මඟින් නොයෙකුත් ආකාරයේ සේවාවන් ලබා දීමට පෞද්ගලික අංශය කටයුතු කරලා තිබෙනවා. අපේ තැපැල් දෙපාර්තමේන්තුවට පෞද්ගලික අංශයත් එක්ක තරග කරන්න පුළුවන් කුරියර් සේවාවක් ආරම්භ කරන්න පුළුවන්කම තිබෙනවා නම් ඒ තුළින් විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා. රජයේ ආයතන විතරක් නොවෙයි පෞද්ගලික අංශයේ අය වුණත් කැමැති වෙයි, පෞද්ගලික අංශයේ කුරියර් සේවයකට වඩා රාජ්‍ය අංශයේ විශ්වාසයක් තිබෙන තැනකින් එවැනි කටයුත්තක් කර ගැනීමට. තැපැල් දෙපාර්තමේන්තුවට එහෙම කරන්න පුළුවන්කම ලැබුණොත් ලොකු ආදායමක් ලබා ගන්න පුළුවන් හැකියාවක් තිබෙනවා කියන එක අපි කියන්න ඕනෑ. මේ වාගේ අලුත් ක්‍රමවේදයන් අප අනුගමනය කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්සල් තැපැල් සේවය ගැනත් යමක් කියන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් සුළු ගාස්තු අඩු කිරීමක් කරලා තිබෙනවා. අපට ඒ සම්බන්ධවත් මීට වඩා ප්‍රචාරයක් කරන්න වෙනවා. මෙවැනි සේවාවක් තැපැල් දෙපාර්තමේන්තුව හරහා කරන්න පුළුවන් කියන එක සම්බන්ධව අනෙක් ආයතනවලට තිබෙන අවබෝධය මදි. "තැපැල් දෙපාර්තමේන්තුවෙන් මේ වාගේ සේවාවක් ලබා ගන්න පුළුවන්. මේ වාගේ වැඩ පිළිවෙළක් අපි ඉදිරි කාලයේදී ක්‍රියාත්මක කරනවා" කියලා මාධ්‍ය මඟින් ප්‍රචාරයක් කළොත් මීට වඩා ආදායමක් තැපැල් දෙපාර්තමේන්තුවට ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අනෙක් කාරණය තමයි ලිපි බෙදීම සම්බන්ධව ලබා දෙන්න ඕනෑ සේවාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තැපැල් සේවාව සම්බන්ධයෙන් කථා කරන කොට ගම්වල ලිපි බෙදීම සම්බන්ධව මම කථා කරන්නේ නැහැ. ඒ සම්බන්ධව ප්‍රශ්නයක් නැහැ. නිලකරාජා මන්ත්‍රීතුමා මීට පෙර එතුමාගේ කථාවේදී කිව්වා, වතු ක්ෂේත්‍රයේ ලිපි බෙදීම සම්බන්ධව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නියෝජනය කරන කොට්ඨාසයේත් විශාල

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුජිත් සංජය පෙරේරා මහතා]

වතු සංඛ්‍යාවක් තිබෙනවා. ඒ වතුවලට ලිපි බෙදීම සම්බන්ධව සෑහීමකට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වතුවල ඉන්න 'තපාල්කාරන්' කියන පුද්ගලයා - තැපැල්කරුවා- තමයි නගරයට ගිහිල්ලා තැපැල් කන්තෝරුවෙන් ලියුම් ටික එකතු කරගෙන එන්නේ. ඊට පස්සේ ඒ ලියුම් වත්තේ තිබෙන division office එකට යනවා. සමහර වෙලාවට කලට වෙලාවට වත්තේ ඉන්න පුද්ගලයන්ට ඒ ලියුම් හම්බ වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා වතු කම්කරුවන්ට ලොකු අසාධාරණයක් පසු ගිය කාලයේ සිද්ධ වුණා. මම දන්නා පවුල් දෙක, තුනකම දරුවන්ට රැකියා අවස්ථාවන්ට යන්න ආපු ලිපි නිසි ආකාරව ලැබුණේ නැති නිසා ඒ අවස්ථා අහිමි වුණා. ඒ සම්බන්ධයෙන් ඉතාම කනගාටුදායක තත්ත්වයක් තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධව නැවත වරක් අපි අවධානය යොමු කරන්න ඕනෑ. අපට මතකයි මීට දශකයකට, දෙකකට විතර ඉස්සෙල්ලා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය මැදිහත් වෙලා වතුවලටත් තැපැල් කාර්යාල, උපතැපැල් කාර්යාල පිහිටුවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරුවා. තැපැල්කරුවෙක් ඒකට පත් කරලා තිබුණා. ඔහුට වත්තෙන් පඩි ගෙවපු අවස්ථා තිබුණා. නමුත් කාලයාගේ ඇවෑමෙන් ක්‍රමක්‍රමයෙන් අද ඒක නතර වෙලා තිබෙනවා. ඒක අපේ තිලකරාජා මන්ත්‍රීතුමා හොඳින් පැහැදිලි කෙරුවා.

ඒ නිසා මම තැපැල් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින්නේ රජයේ ආයතනයක් හැටියට ආදායම ඉපදවීම විතරක් නොවෙයි, අවශ්‍ය සේවාවත් ලබා දෙන්න ඕනෑ බවයි. ඒ වාගේම, තැපැල්කරුවන් වතු ක්ෂේත්‍රයටත් සම්බන්ධ කරලා වතු ජනතාවට සාධාරණයක් ඉෂ්ට වෙන ආකාරයට තැපැල් සේවාව පවත්වාගෙන යන්න කටයුතු කරන්න ඕනෑ.

අනෙක් කාරණාව මෙකයි. කැබිනට් තීරණයක් අනුව දැන් අලුතින් තැපැල් කාර්යාල, උප තැපැල් කාර්යාල පිහිටුවන්නේ නැහැ; තිබෙන තැපැල් කාර්යාල ප්‍රමාණය වැඩි කරන්නෙත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තැපෑල පාඩු වෙන්නේ, ඒ ගාස්තු වැඩි කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ තැපැල් කාර්යාල නිසියාකාරව පවත්වාගෙන යන්නේ නැති නිසා. සමහර තැපැල් කාර්යාලවලින් කිසිම ලාභයක් ලැබෙන්නේ නැහැ. සමහර වෙලාවට ඒවාට කිසිම ආදායමක් නැහැ. දවසකට ලිපියක් දෙකක් තැපැල් කරනවා, එහෙම නැත්නම් මොනවා හරි සාමාන්‍ය කටයුත්තක් කරනවා. ඒ හැර මුදල් ලැබෙන කිසිම ප්‍රායෝගික කටයුත්තක් කෙරෙන්නේ නැහැ. ගම්වල ගත්තොත්, කිසිම ආදායමක් උපද්දන්නේ නැති උප තැපැල් කාර්යාල තිබෙනවා. මේ තත්ත්වය වෙනස් කරලා නගර ආශ්‍රිතව ජනගහනය වැඩි තැනකට ඒ තැපැල් කාර්යාල ටික යොමු කරන්න පුළුවන් නම්, ඒ තුළිනුත් අපේ තැපෑල දියුණු කරන්න පුළුවන්; තැපැල් දෙපාර්තමේන්තුවේ යම්කිසි පාඩුවක් තිබෙනවා නම් ඒ තුළින් අපට ඒක වෙනස් කර ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි තවත් කාරණාවක් තමයි, ආදේශකයන් බඳවා ගැනීම. තැපැල් කාර්යාලවලට ආදේශකයන් බඳවා ගැනීමේදී දැන් තිබෙන ක්‍රමවේදය තමයි, සාමාන්‍ය පෙළ විභාගයෙන් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම. සමහර වෙලාවට ආදේශක තනතුරු සඳහා සුදුසුකම් තිබෙන අය, ඒ තනතුරට එන්නේ නැති අවස්ථා තිබෙනවා. මොකද, ආදේශක තනතුරකට පත්වුණාම ඉන්පසු තැපැල්කරු හෝ වෙනත් තනතුරකට යන්න පුළුවන්කමක් නැති නිසා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අවම සුදුසුකම් "සාමාන්‍ය පෙළ දක්වා පෙනී සිටීම ප්‍රමාණවත්" කියලා සඳහන් කරන්න පුළුවන් වුණොත්, ගමේ උප තැපැල් කාර්යාලය අසල පදිංචි තරුණයෙකුට හරි තරුණියකට මේ සේවාවට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබෙනවා. ඒ සංශෝධනය කරන්න පුළුවන්කම තිබෙනවා නම්, ඒ තුළින් තැපැල්කරුවන් බඳවා ගැනීමේදී යම්කිසි සාධාරණයක් ඉෂ්ට කරන්න අපට පුළුවන්කම ලැබෙනවාය කියලා මම කියන්න ඕනෑ.

තැපැල්කරුවන් ගැන කථා කිරීමේදී තවත් කාරණයක් කියන්න ඕනෑ. අද මට දුරකතනයෙන් කථා කරලා මේ කාරණයත් සඳහන් කරන්න කිව්වා. විශේෂයෙන්ම ආදේශක තනතුරුවලට තැපැල්කරුවන් කියලා බඳවා ගත්තාම ඒ අයගෙන් සිද්ධ වෙන්නේ ආදේශක තැපැල් බෙදීම පමණයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට කලින් තැපැල්කරුවන් හැටියට බඳවා ගත්තාම විදුලි පණිවිඩ භාරකරු, කාර්යාල කාර්ය සහායක වාගේම ඒ කාර්යාලය ඇතුළේ සේවයට යන්නත් අවස්ථාව තිබුණා. නමුත් දැන් තිබෙන තත්ත්වය අනුව අදේශක තනතුරට බඳවා ගත්තාට පස්සේ සිද්ධ වෙන්නේ ඒ තනතුරේම ඉන්නයි. අවුරුදු 15ක් ගියත් ඒ අයට පුළුවන්කමක් නැහැ, තැපැල් කාර්යාලවල අනෙක් තනතුරුවලට අන්තර් ග්‍රහණය වෙලා කටයුතු කරන්න. ඒ නිසා ඒ සම්බන්ධයෙනුත් අපේ අවධානය යොමු කරන්න පුළුවන්කම තිබෙනවා නම් ඒක ඉතාම හොඳ දෙයක්.

අපි මීට කලින් තාක්ෂණය ගැන කථා කළා. අපි තාක්ෂණයත් එක්ක යන්න ඕනෑ; internet පහසුකම් එක්ක යන්න ඕනෑ. තැපැල් කන්තෝරුවලින් බිල් ගෙවන්න දැන් අවස්ථාව උදා කරලා තිබෙනවා. නමුත් විදුලි බිල, ජල බිල, අනෙකුත් බිල්පත් ගෙවන්න තැපැල් කාර්යාලවලට ගියාම ලොකු ප්‍රමාදයක් තිබෙනවා. මොකද, මේ internetවල වේගය සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා. සමහර අවස්ථාවලදී බිල්පත ගෙවන්න විනාඩි 10, 15 ඉන්න සිද්ධ වෙන අවස්ථා තිබෙනවා. ඒ නිසා හුහක් අවස්ථාවල බැංකුවලටත්, වෙනත් ආයතනවලටත් ගිහිල්ලා ඒ කටයුතු කර ගන්නවා කියන එක තමයි අපට දැන ගන්න තිබෙන්නේ. ඒ වාගේ ගැටලු නිසා තැපැල් දෙපාර්තමේන්තුවට ආදායමක් ගන්න තිබෙන එක, කොමිෂන් මුදලක් ගන්න තිබෙන අවස්ථාව අහිමි වෙනවා. මේවාට විසඳුම් සෙවීම තමයි තැපැල් ක්ෂේත්‍රය දියුණු කරන්න අපි යෝජනා කරන්නේ.

විශේෂයෙන්ම නව තාක්ෂණයත් එක්ක අපි යන්න ඕනෑ. පාර්සල් තැපැල් සේවය, කුරියර් සේවාව වැනි කටයුතුත් කරනවා නම් තමයි මේ සේවාව තුළින් නිසි ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතුව හැම දාම ගාස්තු වැඩි කරලා ජනතාවට බරක් පැටවීම නොවෙයි කළ යුත්තේ. තැපැල් සේවාවෙන් ආදායම උපද්දන්න, අලුත් තරගකාරිත්වයක් ඇති කරන්න කටයුතු කරනවා නම්, ඒක තමයි අපේ ජනතාවට කරන්න පුළුවන් ලොකුම සේවාව කියන එක මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ. මම අද ඊට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ ඒකාබද්ධ විපක්ෂයට සම්බන්ධවෙලා ඉන්න උදවිය හුඟ දෙනෙක් අද මේ සභාවට ඇවිල්ලා නැහැ. ඒ අයගේ උද්ඝෝෂණයක් තිබෙනවාය කියන එක තමයි අද අපි දැන ගත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උද්ඝෝෂණ කරන්න කිසිම කෙනෙකුට බාධාවක් නැහැ. විශේෂයෙන් මේ රටේ පාලනයට ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් පත් වුණාට පස්සේ, මේ නව ක්‍රමය ගැන විවිධ දෙනා විවිධ අදහස් දැරුවත් මේ ජාතික ආණ්ඩුව, යහ පාලන සංකල්පය තුළ හැම කෙනාටම ස්වාධීනව නිදහසේ ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන්න අවස්ථාව උදා කරලා තිබෙනවා. කාටවත් ඒක නැහැ කියන්න පුළුවන්කමක් නැහැ.

අද අපේ රටේ මාධ්‍ය නිදහස තිබෙනවා. ඒ නිසා අද අපේ රටේ මාධ්‍යයට ඕනෑ දෙයක් කියන්න පුළුවන්. තමන්ට හිතෙන දේ මාධ්‍ය මඟින්, රූපවාහිනී මඟින් කථා කරන්න අද මාධ්‍යවේදීන්ට නිදහස තිබෙනවා. තමන්ට හිතෙනවා නම් මේක මෙහෙමයි කියලා, ඒකත් කියන්න පුළුවන්. ඒ කරුණු ඇත්ත වෙන්නත් පුළුවන්; බොරු වෙන්නත් පුළුවන්. එවැනි තත්ත්වයකට අද අපි මේ රටේ නිදහස ඇති කරලා තිබෙනවා. පසුගිය කාලයේ රාජ්‍ය අංශයටත්, පෞද්ගලික අංශය ඇතුළු හැම කෙනෙකුටමත් කොළඹ නගරයට ඇවිල්ලා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සතියකට දවසක්, දෙකක් උද්ඝෝෂණය කරන්න අයිතිය තිබුණු බව අපි දන්නවා. අද වුණත් මේ උද්ඝෝෂණය කිරීමේ ප්‍රශ්නයක් නැහැ. නමුත්, අපට තිබෙන ප්‍රශ්නය මේ උද්ඝෝෂණය කරන්නේ ඇයි කියන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ උද්ඝෝෂණය කරන්නේ ඇයි? උද්ඝෝෂණය කරන්න කිසිම හේතුවක් නැහැ. අප සම්බන්ධයෙන් ඒ අයට කියන්න දෙයක් නැහැ. මේ රටේ මීට වඩා ලොකු ප්‍රශ්න පසුගිය කාලසීමාවේ තිබුණා. පසුගිය කාලයේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයක් තිබුණේ නැහැ. උද්ඝෝෂණය කරපු අය නොයෙකුත් ආකාරයෙන් මැරුවා. එවැනි අතීතයක් තමයි අපට තිබුණේ. ඒ බව තමුන්නාන්සේලා දන්නවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි උද්ඝෝෂණයක් අද කරන්න කිසිම හේතුවක් නැහැ. ඉන්ධන මිල වැඩියි කියලා අද මේ අයට උද්ඝෝෂණය කරන්න පුළුවන්කමක් නැහැ. අද ඉන්ධන මිල ගත්තත්, ගෘහස්ථ ගෑස් මිල ගත්තත් ඒ සම්බන්ධයෙන් උද්ඝෝෂණය කරන්න කාටවත් බැහැ. ඒවා එදා තිබුණු මිලට වඩා අඩුයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කවුරු කොහොම කිව්වත් ජීවන වියදමත් එක්ක අපි ආහාර ද්‍රව්‍යවල මිල සංසන්දනය කරලා බැලුවොත් එක හා සමාන මට්ටමකයි අද තිබෙන්නේ. අද ඖෂධ හැම එකකම මිල අඩු කරලා ජනතාවට සහන සලස්වා තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරලා තිබෙනවා. අපේ රටට ජාත්‍යන්තරව තිබුණු කීර්ති නාමය නැවත ඇති කරලා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

පසුගිය කාලයේ පළාත් සභා මැතිවරණය ගැනත් කථා වුණා. මම හිතන විධියට පළාත් සභා මැතිවරණයත් හේතුවක් කරගෙන තිබෙනවා, මේ උද්ඝෝෂණය කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා මැතිවරණය තියන්න බැරි ප්‍රශ්නයක් අද තිබෙන බව අපි දන්නවා. මේ රටේ මතයක් තිබුණා, ප්‍රාදේශීය සභා මැතිවරණය කොටියාස මට්ටමින් තියන්න ඕනෑ කියලා. ඒ වාගේම, පළාත් සභාවත් ඒකම අනුගමනය කරන්න ඕනෑ කියලා මන්ත්‍රීවරු වැඩි දෙනෙකුගේ මතයක් තිබුණා. ඒ නිසා තමයි, පළාත් සභා මැතිවරණය සම්බන්ධව අපි නැවත පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා ඒක සංශෝධනය කරන්න කටයුතු කළේ. ඒ සංශෝධනය කළාට පස්සේ තමයි අපි ඒකේ අඩුපාඩුකම් දැක්කේ; කොටියාස නිර්ණය කිරීම සම්බන්ධ අඩු පාඩුකම් දැක්කේ. ඒ නිසා මේ ක්‍රමය ක්‍රියාත්මක කරනවාට අද කවුරුවත් කැමැති නැහැ. ඒ අයවත් ඒ සීමා නිර්ණයට පක්ෂව ඡන්දය දුන්නේ නැහැ. ඔබතුමාට මතක ඇති, පසුගිය කාලයේ ඒ සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් තිබෙන කොට කවුරුවත් ඡන්දය දුන්නේ නැති බව. එහෙම නම් අපි දන්නවා, මේ තත්ත්වය උඩ පළාත් සභා ඡන්දය තියන්න පුළුවන්කමක් නැහැ කියලා. නමුත් ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, කථානායකතුමාත් පැහැදිලිවම කියලා තිබෙනවා, අනිවාර්යයෙන්ම පළාත් සභා ඡන්දය ජනවාරි මාසයේ තියනවා කියලා. එහෙම නම් අපට දැන් ලොකුවට මේ සම්බන්ධව හිතන්න ඕනෑ නැහැ. මොකද, තව මාස කීපයයි පළාත් සභා මැතිවරණයට තිබෙන්නේ. තව මාස දෙක තුනකින් පළාත් සභා මැතිවරණය තියන්න පුළුවන්. නොබෝ දිනකින් කාලය අවසන්වීමට නියමිත තවත් පළාත් සභා කීපයක් තිබෙනවා. එතකොට අපට ඒ පළාත් සභා සියල්ලේම මැතිවරණය, පළාත් සභා 6ක මැතිවරණය එකවර තියන්න පුළුවන්. එහෙම නම්, මේ උද්ඝෝෂණය කිසිම එලක් නැහැ. මේ උද්ඝෝෂණය නිසා අද වුණේ මොකක්ද? පාසල් යන දරුවන්ටත්, ඔවුන්ගේ දෙමව්පියන්ටත්, වැඩට යන එන අයටත් ප්‍රශ්න ඇති වෙච්ච එක විතරයි වුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ උද්ඝෝෂණය නිසා අපේ ආර්ථිකයට ලැබෙන්න තිබුණු දායකත්වයත්, අපේ රටේ ශ්‍රම සම්පතට වූ හානියත් දෙස බැලුවොත්, අපේ රටට විශාල පාඩුවක් වෙච්ච අවස්ථාවක් හැටියට අද දවස හඳුන්වන්න පුළුවන්.

මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම ඉතාම සතුටට පත් වෙනවා, අද දිනයේදී තැපැල් දෙපාර්තමේන්තුවේ අඩු පාඩුකම් ගැන කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව. ඔබතුමාට නැවත වරක් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 4.56ට, 2018 සැප්තැම්බර් 06වන බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 වන තෙක් කල් තියේය.***


*அதன்படி பி. ப. 4.56 மணிக்கு பாராளுமன்றம், 2018 செப்ரெம்பர் 06, வியாழக்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 4.56 p.m. until 10.00 a.m. on Thursday, 06th September, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 263 - இல. 3
Volume 263- No. 3

2018 සැප්තැම්බර් 06 වන බ්‍රහස්පතින්දා
2018 செப்ரெம்பர் 06, வியாழக்கிழமை
Thursday, 06th September, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

---

# பிரதான உள்ளடக்கம்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

---

# PRINCIPAL CONTENTS

**SECTORAL OVERSIGHT COMMITTEE REPORTS**

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2018 සැප්තැම්බර් 06 වන බ්‍රහස්පතින්දා*
*2018 செப்ரெம்பர் 06, வியாழக்கிழமை*
*Thursday, 06th September, 2018*

---

**පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**ගරු නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සහ තේරීම් කාරක සභාවේ රැස්වීම්
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம் மற்றும் தெரிவுக்குழுக் கூட்டம்
### MEETINGS OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS AND COMMITTEE OF SELECTION

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! 2018 සැප්තැම්බර් මස 06වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පූර්ව භාග 11.30ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත අතර එය නිමවූ වහාම තේරීම් කාරක සභාවේ රැස්වීමක්ද පැවැත්වෙන බැවින් එම රැස්වීමටද පැමිණ සහභාගි වන ලෙස එම කාරක සභාවන්හි සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ ගිණුම් මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා ටවර් හෝල් රහහල පදනමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය මම ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු මයන්ත දිසානායක මැතිතුමා වෙනුවෙන් ගරු බිමල් රත්නායක මැතිතුමා විසින් එම කාරක සභාවේ වාර්තාව පිළිගැන්වීම.

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මයන්ත දිසානායක මැතිතුමා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ නව සභාපතිවරයා වශයෙන් පත් වුණා. එතුමා මේ වෙනුවෙන් සභාගි වීමට බලාපොරොත්තුවෙන් සිටියත්, එතුමා දැන් කෝප් එකේ සාකච්ඡාවකට සභාගි වෙමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4වන වගන්තිය යටතේ නියෝග;

(ii) 2013 සහ 2015 වර්ෂ සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තා;

(iii) 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා;

(iv) 2015 සහ 2017 වර්ෂ සඳහා සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තා සහ ගිණුම්;

(v) 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තා;

(vi) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(vii) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දිලිප් වෙදආරච්චි මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු රංජිත් අලුවිහාරේ මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ranjith Aluvihare - State Minister of Tourism Development and Christian Religious Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතලේ, රත්තොට පාර, අංක 87/බී දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ.එල්. ෆයිසාල් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගණපූරණය නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාවේ ගණපූරණය නැහැ. එම නිසා ගණපූරණ සීනුව නාද කරන්න.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லை யெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා, Quorum එක නොසලකා පාර්ලිමේන්තුව පවත්වාගෙන යමු කියලා. මොකද, මේ විධියට පාර්ලිමේන්තුව රැස් කරලා කල් තබන්නට සිදුවීම හරි අපරාධයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු සභානායකතුමනි, ස්ථාවර නියෝග යටතේ මට ඒක කරන්නට පුළුවන්කමක් නැහැ. සභාව පවත්වාගෙන යන්න නම් අනිවාර්යයෙන්ම මන්ත්‍රීවරුන් 20 දෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සභා ගර්භයේ සිටිය යුතුයි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***පසුව, ගණපූරණයක් නොතිබුණෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් 11 වන ස්ථාවර නියෝගය යටතේ, ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව පූ.භා. 10.11ට, 2018 සැප්තැම්බර් 07වන සිකුරාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේ ය.***

*பின்னர் கூட்ட நடப்பெண் சேராததனால் மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் நிலைக் கட்டளை இல.11இன்படி வினா வின்றிப் பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, மு.ப.10.11க்கு, பாராளுமன்றம் 2018 செப்ரெம்பர் 07, வெள்ளிக்கிழமை மு.ப.10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*


*Later, a Quorum not being present,* THE HON. DEPUTY SPEAKER *adjourned Parliament, without Question put, under Standing Order No. 11.*

*Adjourned accordingly at 10.11a.m. until 10.00 a.m. on Friday, 07th September, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 263 - இல. 4
Volume 263 - No. 4

2018 සැප්තැම්බර් 07 වන සිකුරාදා
2018 செப்ரெம்பர் 07, வெள்ளிக்கிழமை
Friday, 07th September, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සහජීවනය සහතික කිරීම පිණිස ඒ පිළිබඳව අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව:සාමාජිකයන් නම් කිරීම

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

නියහයෙන් පීඩාවට පත් ජනතාවට සහන

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා**

**ආඥාඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය:**

විගණකාධිපතිවරයාගේ වැටුප හා දීමනා

**වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත :**

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි.

**ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත:**

නියෝග

**කල් තැබීමේ යෝජනාව:**

විදේශ අමාත්‍යාංශය රාජතාන්ත්‍රික සංචාර සංවිධානය කිරීමේදී මහජන මුදල් අවභාවිතය


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புக்கள்:**

இலங்கையில் இன மற்றும் மத ஒற்றுமையை உறுதி செய்வதை ஆராய்ந்து அதன் விதப்புரைகளைப் பாராளுமன்றத்துக்கு அறிக்கையிடுவதற்கான பாராளுமன்றத் தெரிகுழு: உறுப்பினர்களை நியமித்தல்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

வறட்சியால் பாதிக்கப்பட்ட மக்களுக்கான நிவாரணங்கள்

**அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்**

**அரசியலமைப்பின் கீழான தீர்மானம் :**

கணக்காய்வாளர் தலைமையதிபதியின் சம்பளம் மற்றும் படிகள்

**மருத்துவம் (திருத்தம்) சட்டமூலம் :**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது.

**தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டம் :**

ஒழுங்குவிதிகள்

**ஒத்திவைப்புப் பிரேரணை:**

வெளிநாட்டு அலுவல்கள் அமைச்சு ஒழுங்கு செய்கின்ற இராஜதந்திர விஜயங்களில் அரச நிதி தவறாகக் கையாளப்படுதல்


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Select Committee to Study and Report to Parliament its Recommendations to Ensure Communal and Religious Harmony in Sri Lanka: Nomination of Members

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Relief to People Affected by Drought

MINISTERIAL CONSULTATIVE COMMITTEES

DETERMINATION UNDER THE CONSTITUTION:
Salaries and Allowances of Auditor-General

MEDICAL (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

NATIONAL MEDICINES REGULATORY AUTHORITY ACT:
Regulations

ADJOURNMENT MOTION:
Misuse of Public Funds by Foreign Ministry in Organizing Diplomatic Visits

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2018 සැප්තැම්බර් 07 වන සිකුරාදා*
*2018 செப்ரெம்பர் 07, வெள்ளிக்கிழமை*
*Friday, 07th September, 2018*

**පූ. භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
**[ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள்
[மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සහජීවනය සහතික කිරීම පිණිස ඒ පිළිබඳව අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව : සාමාජිකයන් නම් කිරීම
### இலங்கையில் இன மற்றும் மத ஒற்றுமையை உறுதி செய்வதை ஆராய்ந்து அதன் விதப்புரைகளைப் பாராளுமன்றத்துக்கு அறிக்கையிடுவதற்கான தெரிவுக்குழு: உறுப்பினர்களை நியமித்தல்
### SELECT COMMITTEE TO STUDY AND REPORT TO PARLIAMENT ITS RECOMMENDATIONS TO ENSURE COMMUNAL AND RELIGIOUS HARMONY IN SRI LANKA: NOMINATION OF MEMBERS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සහජීවනය සහතික කිරීම පිණිස ඒ පිළිබඳව අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන විශේෂ කාරක සභාවේ සේවය පිණිස ගරු කථානායකතුමාගේ සභාපතිත්වයෙන් යුතුව, මතු සඳහන් මන්ත්‍රීවරයන් ගරු කථානායකතුමා විසින් පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා
ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා
ගරු ජෝන් අමරතුංග මහතා
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
ගරු අබ්දුල් හලීම් මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
ගරු වී.එස්. රාධාකෘෂ්ණන් මහතා
ගරු රුවන් විජයවර්ධන මහතා
ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
ගරු ඩග්ලස් දේවානන්දා මහතා
ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු සී.බී. රත්නායක මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව-

2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XII කොටස;

2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XX, XXI, XXIII හා XXIV කොටස්, සිව්වැනි කාණ්ඩයේ V හා VII කොටස් සහ හයවැනි කාණ්ඩයේ XIII කොටස; සහ

2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ I කොටස සහ දසවැනි කාණ්ඩයේ XIV හා XV කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ''එකී වාර්තා මුද්‍රණය කළ යුතුය'' යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
Question put, and agreed to.

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් 2017 අංක 30 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2018.07.01 සිට 2018.08.15 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන මම ඉදිරිපත් කරමි.

එම පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා මම ඉදිරිපත් කරමි.

එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

*ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා - [සභා ගර්භය තුළ නැත.]*

*ගරු චන්දිම ගමගේ මැතිතුමා - [සභා ගර්භය තුළ නැත.]*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

## 2016 අයවැය යෝජනා: ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලය
## 2016 வரவு செலவுத் திட்ட முன்மொழிவு: ஆரம்பக் கைத்தொழில் பேரவை
## BUDGET PROPOSALS 2016 : PRIMARY INDUSTRY COUNCIL

38/'18

**1. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2016 අයවැයෙහි අංක 182 යෝජනාවට අනුව, ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලයක් (Primary Industry Council) පිහිටුවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය සහ ස්ථානය කවරේද;

(iii) උක්ත අයවැය යෝජනාවෙහි, ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලයක් පිහිටුවීමේ අරමුණු හා ඒ සඳහා වූ වැඩ පිළිවෙළ සැකෙවින් පැහැදිලි කරන්නේද;

(iv) මෙම කවුන්සිලයට සම්බන්ධවන විශේෂඥයන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) උක්ත යෝජනාවෙහි සඳහන් වන ශ්‍රී ලංකාවේ දැනට සක්‍රීයව පවත්නා ප්‍රාථමික කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(vi) 2009 යුද ගැටුම් නිමවීමෙන් පසු, උතුරු නැගෙනහිර ඇතුළුව ශ්‍රී ලංකාව තුළ අලුතින් ඇරඹූ ප්‍රාථමික කර්මාන්තයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**සමූහ නලන්පුරි මැතිතුමා** (සමූහ නලන්පුරි මැතිතුමා)
(The Hon. Samoopa Nalanpuri)

සමූහ නලන්පුරි මැතිතුමා

(vi) 2009 இல் யுத்தம் முடிவடைந்த பின்னர் வடக்கு, கிழக்கு உள்ளடங்கலாக இலங்கையில் புதிதாக ஆரம்பிக்கப்பட்ட ஆரம்பக் கைத்தொழில்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Social Welfare and Primary Industries:

(a) Will he inform this House-

(i) whether a Primary Industry Council has been established as per Proposal No.182 of the Budget, 2016;

(ii) if so, the date on which it was established and its location;

(iii) whether he will briefly explain the objective of establishing a Primary Industry Council and the programme for same;

(iv) whether a list of experts to be involved in the Council is submitted;

(v) whether a list of primary industries active in Sri Lanka at present as indicated in the above Proposal is submitted; and

(vi) the primary industries newly started in Sri Lanka, including those in the North and East, with the conclusion of the armed conflict in 2009?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

2016 අය වැය යෝජනා අංක 167 යටතේ රුපියල් මිලියන 50ක් වෙන් කොට කුරුඳු සංවර්ධන අධිකාරියක් පිහිටු වීමටත්, අංක 182 යටතේ ප්‍රාථමික කර්මාන්ත කවුන්සලයක් පිහිටුවීමටත් යෝජනා වී තිබූ අතර, මෙම ආයතන පිහිටුවීම සම්බන්ධයෙන් ජාතික අය වැය දෙපාර්තමේන්තුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ මූලික සාකච්ඡා පවත්වන ලදී. පසුගිය රජය විසින් ඇති කළ ආයතන විශාල ප්‍රමාණයක් දැනට රජයේ නොයෙකුත් අමාත්‍යාංශ යටතේ පවත්වාගෙන ගියත් එයින් බලාපොරොත්තු වූ මූලික අරමුණු රටට යහපත් ලෙස ඉටු කර ගැනීමට අපොහොසත් වී ඇති නිසා අලුතින් ආයතන පිහිටුවීම නවතා දැමිය යුතු යැයි යහපාලන රජය ගත් තීරණය නිසා ඉහත ආයතන පිහිටුවීම වෙනුවට කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික සංස්ථා පනත මඟින් පිහිටුවනු ලැබූ කුළු බඩු හා ආශ්‍රිත අළෙවි මණ්ඩලය සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද අතර, එමඟින් අදාළ කටයුතු සිදු කිරීමට තීරණය කරන ලදී.

(ii) අංක 2050/14 හා 2017 දෙසැම්බර් 20වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම ආයතනය සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයට පවරා ඇත.

(iii) කුළු බඩු අපනයන ආදායම රුපියල් බිලියන 1.5ක් දක්වා ඉහළ දැමීමටත් අනෙකුත් ප්‍රාථමික කර්මාන්ත අගයදාම සංවර්ධනය තුළින් වසර 5ක් තුළ අපනයන ආදායම දෙගුණයක් කරලීමටත් අදාළව සාමූහික වැඩසටහන් සම්පාදනය කොට ක්‍රියාත්මක කරලීම අපේක්ෂාවයි.

(iv) අදාළ නොවේ.

(v) ප්‍රාථමික කර්මාන්ත යනු ස්වාභාවික සම්පත්, ඛනිජ, කෘෂි, ධීවර, සත්ව පාලන ආදී ක්ෂේත්‍ර යටතේ ගැනෙන කර්මාන්ත වේ. අප අමාත්‍යාංශය යටතේ ඇති විෂය පථයට සමගාමීව කර්මාන්ත අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය, ග්‍රාමීය හා පශු සම්පත් අමාත්‍යාංශය සහ පරිසර අමාත්‍යාංශය යටතට ගැනෙන විශාල ආයතන ප්‍රමාණයක් ඇතුළත් වී ඇත. සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, මෙම අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වෙමින් අගයදාම වැඩි කරන ක්‍රමවේද හා නවෝත්පාදන පාදක කර ගනිමින් ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් සඳහා පෞද්ගලික අංශයට දායකත්වය ලබා දෙයි. එසේම අපනයන ගම්මාන 5,500ක් ස්ථාපනය කිරීම ද සිදු වේ.

(vi) 2009 සිට 2015 වර්ෂය දක්වා කිසිදු ප්‍රාථමික කර්මාන්තයක් අලුතින් ආරම්භ වී නැත. 2015 සැප්තැම්බර් 21 වන දින සිට ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය අලුතින් ස්ථාපිත කර ඇත. වර්තමානයේ සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය කියන්නේ ඒක තමයි. රටේ සියලු අංශවල නිෂ්පාදන ඉතා පහළ මට්ටමක තිබීම හේතු කොට ගෙන ප්‍රාථමික කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කරන අමුද්‍රව්‍ය අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා එම නිෂ්පාදන වැඩි කිරීමට 2015 වර්ෂයේ කෘෂි අපනයන භෝග වගා ව්‍යාපෘති ආරම්භ කරන ලදී. 2015 වර්ෂය අවසන් වන විට අපනයන කෘෂි භෝග පැළ ලක්ෂ 70ක්ද, 2016 වර්ෂයේ ලක්ෂ 170ක්ද, 2017 වර්ෂයේ ලක්ෂ 250ක්ද වගා කිරීමට කටයුතු කර ඇත. මෙම වර්ෂයේ පැළ දස කෝටියක් වගා කිරීමට අප කළ සැලසුම් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ ගරු ඇමතිතුමා යම් කිසි උත්සාහයක් දරන, වැඩ කරන්න ඕනෑකමක් තිබෙන කෙනෙක්. පසු ගිය රජයට පහර ගහලා, තමන්ගේ නොහැකියාව වහ ගන්න නිලධාරීන් විසින් එවැනි ඇමතිවරයකුට සකස් කර දී තිබෙන උත්තරයක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

ගරු අමාත්‍යතුමා ඒ උත්තරයේ පැහැදිලිව කියනවා, පසු ගිය රජය යටතේ ආයතන විශාල සංඛ්‍යාවක් තිබීම නිසා 2016 අයවැයෙහි 182වන යෝජනාව ක්‍රියාත්මක කළේ නැහැ කියලා. තිබෙන ආයතන මොනවාද කියා දන්නේ නැතිව, කිසිම වගකීමකින් තොරව, අලුතින් ආයතන පිහිටුවනවා කියා විකාරරූපී යෝජනා සකස් කරලා අය වැය ලේඛනයට ඇතුළත් කරලා මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

මේ රටේ ප්‍රාථමික කර්මාන්ත ඇතුළු සමස්ත කර්මාන්ත පද්ධතියේ විශාල කඩා වැටීමක් තිබෙනවා. ඒ කඩා වැටීම නිවැරැදි කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය ගෙන තිබෙන පියවර පිළිබඳව මේ ගරු සභාවට පැහැදිලි කිරීමක් ලබා දෙන්නේද කියන එකයි මගේ පළමුවන අතුරු ප්‍රශ්නය.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

කලින් රජය කාලයේ පැවැති ආයතන සංඛ්‍යාව වැඩි නිසා ඒවා ඔක්කෝම අනෙක් අමාත්‍යාංශවල ආයතනවලට යොමු කරනවා කියලා තමයි ප්‍රශ්නයට උත්තරය විශයෙන් දී තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

එහෙම දැනගෙනත් 2016 අය වැයට අලුත් යෝජනාවක් දැම්මේ මොකටද? ඒ බව දන්නවා නම් මේ යෝජනාව දමන්න අවශ්‍ය නැහැ නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මේ තත්ත්වය දැනගත්තාට පසුව එම ආයතනවලටම අනුයුක්ත කර තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු අමාත්‍යතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය ඔබතුමා ගරු ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගේ හදිසි අවධානයට යොමු කළ යුතු වනවා. ඔබතුමාත් පිළිගන්නවා, අපිත් පිළිගන්නවා, රටත් පිළිගන්නවා මේ රටේ රෙදි පිළි සහ ඇඟලුම් පිළිබඳ ඉතා විශාල කර්මාන්තයක් තිබෙන බව. ඒ රෙදි පිළි සහ ඇඟලුම් කර්මාන්තය තුළ ස්වයං රැකියාව ලෙස ඇඳුම් මැසීම මඟින් ජීවනෝපාය සලසා ගන්නා රෙදි මහන කාන්තාවන් විශාල පිරිසක් -ලක්ෂ ගණනක්- සිටිනවා. ඒ අය දිරිගැන්වීම සඳහා පසු ගිය රජය යටතේ ආනයනය කරන රෙදි පිළිවලට බරට අනුව කිලෝවකට රුපියල් 100ක සෙස් බද්දක් තමයි අය කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගෝස්තු මාසයේ 16වැනි දා ඉඳලා ආනයනය කරන රෙදිවල වටිනාකමට සියයට 10ක markup එකක් දාලා, ලාභ තිරුවක් එකතු කරලා, ඒ එන උත්තරයට කිලෝවකට රුපියල් 100 ගණනේ බර අනුව සෙස් බද්දකුත් අය කරලා, අලුතින් සියයට 15ක වැට් බද්දකුත් ක්‍රියාත්මක වනවා. එවිට රෙදි පිළි කන්ටේනර් එකක් නිදහස් කර ගන්නා විට රුපියල් ලක්ෂ 22ක්, 23ක් හෝ 25ක් වැඩිපුර ගෙවන්න සිද්ධ වෙනවා. ඒ නිසා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ පිරිවැය විශාල ලෙස ඉහළ යෑමෙන්, සමස්ත ලංකාවේ රෙදිපිළි නිෂ්පාදකයන්, ඒ කර්මාන්තකරුවන් විශාල අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. මෙක මුළු රටේම කර්මාන්තවලට බලපා තිබෙන ප්‍රශ්නයක්.

ඒ වාගේම, අගෝස්තු 16වැනි දා සිට පිට රටින් ගෙන්වන දැවවලටත් සියයට 15ක බද්දක් පනවා තිබෙනවා.

පිට රටින් ගෙන්වන දැව සඳහා අපේ ආණ්ඩු කාලයේ බදු අඩු කළේ, වනාන්තර ආරක්ෂා වෙන්න ඕනෑ නිසා; ගස් කපන එක නවත්වන්න ඕනෑ නිසා. දැන් අපේ රටේ වන වගාව වැඩි කරන්න ජනාධිපතිතුමා ක්‍රියා කළත් මේ හේතුව නිසා දැන් කිසිම ගහක් ඉතුරු වෙන්නේ නැති වෙයි. පිට රටින් ගෙන්වන දැවවලට සියයට 15ක් බදු ගැහුවාම ලංකාවේ තිබෙන ඔක්කෝම වනාන්තර ටික මිනිස්සු හොරෙන් හෝ කපලා තමන්ගේ පාවිච්චියට ගන්නවා. ඒ නිසා ඉතා හදිසි අවශ්‍යතාවක් ලෙස සලකා, දැවවලට හා රෙදි පිළිවලට පනවා තිබෙන අලුත් වැට් බද්ද පිළිබඳව මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරන්න කියලා ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටින්න කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ ගැන අපි ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නම්. අපි ඒ ගැන දැනටමත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කණ්ඩායම් රැස්වීමේදී සාකච්ඡා කළා. අදාළ අමාත්‍යවරුන් සමඟ එම සාකච්ඡා ඉදිරියට කෙරෙනවා.

## මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් : විස්තර

மாத்தறை - பெலிஅத்தை புகையிரதப் பாதை நிர்மாணம்: விபரம்

CONSTRUCTION OF MATARA-BELIATTA RAILWAY LINE: DETAILS

175/'18

**2. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගයේ දිග කොපමණද;

(ii) එහි ඉදිකිරීම් ආරම්භ කළ දිනය කවරේද;

(iii) එහි ඉදිකිරීම් වියදම කොපමණද;

(iv) මාතර සිට බෙලිඅත්ත දක්වා ඉදිකරනු ලබන දුම්රිය ස්ථාන සංඛ්‍යාව, උමං මාර්ග සංඛ්‍යාව, පාලම් සංඛ්‍යාව හා ඒවාට යන වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ අනුව, එම දුම්රිය මාර්ගයේ කිලෝමීටරයක් ඉදිකිරීමට වැය වන වියදම කොපමණද;

(vi) ඉදිකිරීම අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

(vii) එම ඉදිකිරීම් සිදුකරන කොන්ත්‍රාත් සමාගම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පෝක්කුවරත්තු, සිවිල් විමාන සේවෛකළ් අමෛච්චර෈ක් කේට්ට විනා:

(அ) (i) மாத்தறை - பெலிஅத்தை புகையிரதப் பாதை யின் நீளம் எவ்வளவு;

(ii) அதன் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்பட்ட திகதி யாது;

(iii) அதன் நிர்மாணச் செலவு எவ்வளவு;

(iv) மாத்தறை தொடக்கம் பெலிஅத்தை வரை நிர்மாணிக்கப்படும் புகையிரத நிலையங்கள், சுரங்கப் பாதைகள், மற்றும் பாலங்களின் எண்ணிக்கை மற்றும் அவற்றுக்கான செலவு வெவ்வேறாக எவ்வளவு;

(v) அதன்படி அந்த புகையிரதப் பாதையில் ஒரு கிலோ மீற்றரை நிர்மாணிப்பதற்குச் செலவாகும் செலவு எவ்வளவு;

(vi) நிர்மாணப் பணிகள் நிறைவடையவுள்ள திகதி யாது;

(vii) மேற்படி நிர்மாணப் பணிகளை மேற்கொள்ளும் ஒப்பந்தக் கம்பனி யாது;

என்பதை அவர் இச் சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House-

(i) the length of the Matara-Beliatta railway line;

(ii) on which date its construction work was commenced;

(iii) what its construction cost is;

(iv) how many railway stations, tunnel and bridges will be constructed from Matara to Beliatta and what their expenditure will be, separately;

(v) accordingly, what will be the cost per kilometre for constructing that railway line;

(vi) when the construction work is due to be completed; and

(viii) what contracting company is carrying out the construction work?

(b) If not, why?

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) කිලෝමීටර් 26.75යි.

(ii) 2013.08.01.

(iii) ඇමෙරිකානු ඩොලර් මිලියන 278.2යි.

(iv) දුම්රිය ස්ථාන - 04යි. කැකනදුර, බඹරන්ද, වැවුරුකන්නල, බෙලිඅත්ත.

උප දුම්රිය ස්ථාන - 02යි. පිලදුව, වෙහෙරහේන.

උමං මාර්ග - 02යි. (මීටර් 616, මීටර් 267).

පාලම් සංඛ්‍යාව - 06යි. (නිල්වලා 1, නිල්වලා 2, බඹරන්ද, වත්තේගම පරණ, වත්තේගම දිගුව, වැවුරුකන්නල, වෙරලගොඩ, ඉහළගොඩ, සීනිමෝදර ඔය නො.1, සීනිමෝදර ඔය නො.2, සීනිමෝදර ඔය නො.3, බෙලිඅත්ත පාලම).

පාලම්වල මුළු දිග මීටර් 3,754යි.

(v) ඇමෙරිකානු ඩොලර් මිලියන 10.4යි.

(vi) 2018.10.26.

(vii) චයිනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් ඇන්ඩ් එක්ස්පෝට් කෝපරේෂන්.

(ආ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

බොහොම ස්තුතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන ආකාරයට කිලෝමීටර් 26.75ක් ඉදිකරන්නට ඇමෙරිකානු ඩොලර් මිලියන 278.2ක් වැය වෙනවා. ඒ කියන්නේ එක කිලෝමීටරයක් ඉදිකිරීමට ආසන්න වශයෙන් ඩොලර් මිලියන 10.4ක් -රුපියල් කෝටි 166ක්- වැය වෙනවා.

පසු ගිය කාලයේ ඉදි කිරීම් ආරම්භ කරන ලද දුම්රිය මාර්ගවලට ගිය අධික වියදම් සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශය හැටියට ඔබතුමන්ලා සෑහීමකට පත් වෙනවාද? ඒ වියදම සාධාරණයි කියලා කියනවාද?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, වියදම්වල සාධාරණ අසාධාරණකම නොවෙයි තිබෙන ප්‍රශ්නය. මේ සියල්ලම අපි ණය අරගෙන කරන ඒවා. ඩොලරයේ අගය වෙනස්වීම මත පසු ගිය කාලයේ ගිය වියදමට වඩා දැන් යන වියදම වෙනස් වෙන්න පුළුවන්. කෙසේ වෙතත්, ලංකාවේ දුම්රිය මාර්ග කිලෝමීටර් 1,562යි තිබෙන්නේ. ඉදි කරනු ලබන මාතර-කතරගම දුම්රිය මාර්ගයේ සමස්ත දිග ප්‍රමාණය කිලෝමීටර් 120යි. එයින් කොටසක් සඳහා යන වියදම තමයි මෙහි සඳහන් කරලා තිබෙන්නේ. වර්තමාන තත්ත්වය අනුව ඔබතුමා කියන මුදල එක් කිලෝමීටරයක් සඳහා වැය වෙනවා. ඒ කෙසේ වෙතත් "මේක දුම්රිය දෙපාර්තමේන්තුවෙන් කරන්නේ නැත්තේ ඇයි?" කියලා ඒ දවස්වල ඔබතුමන්ලා කවුරුත් කථා කළා. ඒ සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සහ අනෙකුත් යටිතල පහසුකම් නොමැතිකම තමයි එය දුම්රිය දෙපාර්තමේන්තුවෙන් නොකරන්න ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ. සමහර අවස්ථාවල ඔබතුමන්ලා ප්‍රශ්න කළා, "පැරැලිය අනතුර වෙලාවේ දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දුම්රිය මාර්ගය හැදුවා, එහෙම නම් දැන් ඒ විධියට කරන්න බැරි ඇයි?" කියලා. කෙසේ වෙතත් මෙම බෙලිඅත්ත දක්වා දුම්රිය මාර්ගයේ ඉදි කිරීම් කටයුතු පසු ගිය රජය කාලයේ, 2013 වසරේදී තමයි ටෙන්ඩර් කැඳවා ලබා දීලා තිබෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යාංශයටම අදාළව මෙම දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහන්න කැමැතියි. දැනට ප්‍රවාහන අමාත්‍යාංශයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ලයිසන්ස් ලබා දීමේදී කරනු ලබන පරීක්ෂණ කටයුතු මෝටර් රථ පරීක්ෂකවරුන්ගෙන් ඉවත් කරලා පෞද්ගලික අංශයට ලබා දෙන්න කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවාද? එම පරීක්ෂණ කටයුතුවලින් සියයට 75ක් පෞද්ගලික අංශයට ලබා දෙන්න කටයුතු කරනවාය කියලා මට ආරංචියක් ලැබී තිබෙනවා.

එවැනි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, ලංකා ඔටෝ මොබයිල් සංගමය වැනි ආයතනයකට එම කටයුත්ත භාර දෙන්න අදහස් කරනවාද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
එවැනි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. සියයට 75ක් ලබා දීලා නැහැ. ලංකා ගමනාගමන මණ්ඩලයටත්, ඒ වාගේම ලංකා ඔටෝ මොබයිල් සංගමයටත් අපි සියයට 25ක් ලබා දීලා තිබෙනවා. සියයට 25කුත් නොවෙයි. මුලින්ම සියයට 5ක් තමයි අපි ලබා දෙන්න බලාපොරොත්තු වෙන්නේ. මෙහි විශාල අක්‍රමිකතා සිදුවීම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ලංකා ඔටෝ මොබයිල් සමාගමත් සමඟ මා සාකච්ඡා කළා. එය ලංකා ගමනාගමන මණ්ඩලයටත් ලබා දෙනවා. "මේක ලබා දුන්නත් දැනට අපට කරන්න බැහැ. මොකද මේකෙන් ඉතාම අඩු මුදලක් තමයි අපට ලැබෙන්නේ. ඒ නිසා ඒ මුදලට කරන්න බැහැ" කියලා ඒ ගොල්ලන් කියනවා. කෙසේ වෙතත් මේක සිදු කරන්න බලාපොරොත්තු වෙන්නේ දැනට තිබෙන අක්‍රමිකතා නවත්වන්නයි. රියදුරු බලපත්‍ර ලබා දෙන මෝටර් රථ පරීක්ෂකවරුන් පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. අධික ඉල්ලුම නිසා ඒ, සිටින පරීක්ෂකවරුන්ට මෙය කරන්න බැරි තත්ත්වයක් තිබෙනවා. නිසා තමයි මේ පියවර ගෙන තිබෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකම ඇහුවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මට පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
දූෂණයක් තිබෙනවා නම්, අඩු-පාඩුකම් තිබෙනවා නම් එය නිවැරැදි කළ යුතුයි. අඩු-පාඩුකම් නිවැරැදි කරන්න පෞද්ගලික අංශයට ලබා දෙන එකෙන් උත්තරයක් නැහැ කියලා ඔබතුමාම කියා තිබෙනවා. Vehicle number plates ලබා දීම privatize කිරීමේ කාරණයේ දී ඔබතුමා කිව්වා, vehicle number plates ලබා දීමේ කොන්ත්‍රාත් එක ගන්න එන පුද්ගලයන් ඇමතිතුමාටයි, නියෝජ්‍ය ඇමතිතුමාටයි කොමිස් දෙන්න එනවා කියලා. "මම නම් එපා කිව්වා" කියලා ඔබතුමා කිව්වා. ඔබතුමා එය ප්‍රසිද්ධියේම කිව්වා. එහෙම නම්, ඊළඟට වෙන්න පුළුවන් දේ මෙයයි. ඔය ටෙන්ඩර් එක ගන්නත් ඇමතිතුමායි, නියෝජ්‍ය ඇමතිතුමායි හොයාගෙන එන්න පුළුවන්. අනෙක් දූෂණ වාගේම ඒකත් මහා පරිමාණ දූෂණයක්.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
අපේ රජය යහපාලන රජයක්. අපි දූෂණ වෙන්න ඉඩ තියන්නේ නැහැ. කෙසේ වෙතත් මම මේ පිළිබඳව සාකච්ඡා කළා.

අපට අවශ්‍ය, ජනතාවට තිබෙන ඒ ප්‍රශ්න විසඳීම සහ ඔවුන්ට තිබෙන අපහසුතාව වැළැක්වීමයි. විශේෂයෙන්ම ලංකා ගමනාගමන මණ්ඩලයටත් මේ සඳහා අවස්ථාව ලබාදී තිබෙනවා. මෙය නියමු ව්‍යාපෘතියක් විධියට තමයි කරන්නේ. එහි සාර්ථකභාවය අනුව තමයි අප තීන්දු ගන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමා පැහැදිලි කර ගැනීමක්ද බලාපොරොත්තු වන්නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්, පැහැදිලි කිරීමක් ලබාගන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විගණකාධිපතිතුමාගේ වාර්තා අනුව, මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගය ඉදිකිරීමට යන වියදම් ගැන මොනවා හෝ හෙළිවී තිබෙනවාද?

දෙවනුව මම අහන්නේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නයට අදාළ කාරණයක්. මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමේ පරීක්ෂකවරු අවශ්‍ය සංඛ්‍යාව බඳවා නොගන්නේ ඇයි?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඒ අය බඳවා ගන්න අවශ්‍ය සියලු වැඩකටයුතු අපි දැන් අවසන් කර තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී එම නිලධාරීන් බඳවා ගන්නවා, ගරු මන්ත්‍රීතුමනි.

මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු භාර දී තිබෙන්නේ පසුගිය රජය කාලයේයි. මේ ඩොලර් මිලියන 252ක මුදල වැය වෙන්නෙත් ඒ කාලයේ ගත් තීන්දු නිසායි. [බාධා කිරීමක්]

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීම් මේ කමිටුව : සාමාජිකයන්**
அரசியலமைப்பு சீர்திருத்தம் பற்றி பொதுமக்களின் கருத்துக்களை விசாரித்தறியும் குழு: அங்கத்தவர்கள்
PUBLIC REPRESENTATIONS COMMITTEE ON CONSTITUTIONAL REFORMS: MEMBERS

200/'18

**3. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව වෙනුවෙන් රජය විසින් දරන ලද මුළු වියදම කොපමණද;

(ii) එම කමිටුවේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) එකිකමිටුවට සාමාජිකයන් පත් කිරීමේ දී සලකා බැලූ නිර්ණායක කවරේද;

(iv) බුද්ධාගම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති දෙවන පරිච්ඡේදය ඒ අයුරින්ම පවත්වා ගෙන යෑමට නිර්දේශ කර ඇති කමිටු සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அரசியலமைப்பு சீர்திருத்தம் பற்றி பொதுமக்களின் கருத்துக்களை விசாரித்தறியும் குழுவுக்காக அரசாங்கத்தினால் ஏற்கப்பட்ட மொத்த செலவு எவ்வளவு;

(ii) மேற்படி குழு அங்கத்தவர்களின் பெயர்கள் யாவை;

(iii) மேற்படி குழுவுக்கான அங்கத்தவர்களை நியமிக்கையில் கருத்திற்கொண்ட மூலப்பிரமாணங்கள் யாவை;

(iv) பௌத்த மதம் தொடர்பில் அரசியலமைப்பில் உள்ள இரண்டாவது அத்தியாயத்தை அவ்வண்ணமே பேணிவருமாறு விதப்புரை செய்துள்ள குழு அங்கத்தவர்களின் எண்ணிக்கை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the total cost borne by the Government on the Public Representations Committee on Constitutional Reforms;

(ii) the names of the members of that Committee;

(iii) the criteria that were taken into consideration in appointing the members to that Committee; and

(iv) the number of Committee members who have recommended that Chapter II of the Constitution regarding the status of Buddhism should not be changed?

(b) If not, why?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රුපියල් අටමිලියන දහඅටදහස් නවසියඑකයි සත හැත්තෑ අටයි. (8,018,901.78)

(ii) ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(iii) දේශපාලන පක්ෂ නියෝජනය කරමින් හා සිවිල් සමාජය නියෝජනය කර ගනිමින් මෙම කමිටුව පත් කර ඇත.

(iv) බුද්ධාගම ඇතුළුව අනෙකුත් සියලු ආගම් සම්බන්ධයෙන් මෙම කමිටුවේ සියලු සාමාජිකයන් කටයුතු කර ඇත.

(ආ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

01. ලාල් විජේනායක මහතා
02. ජනාධිපති නීතිඥ ෆයිස් මුස්තාපා මැතිතුමා
03. මහාචාර්ය ගාමිණී සමරනායක මහතා
04. මහාචාර්ය නවරත්න බණ්ඩාර මහතා
05. මහාචාර්ය එම්.එල්.ඒ. කාදර් මහතා
06. එන්. සෙල්ව කුමාරන් මහතා
07. ගරු එස්. තවරාසා මැතිතුමා
08. ජනාධිපති නීතිඥ කුෂාන් ද අල්විස් මැතිතුමා
09. ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය
10. ආචාර්ය කුමුදු කුසුමී කුමාර මහතා
11. සුනිල් ජයරත්න මහතා
12. ආචාර්ය උපුල් අබේරත්න මහතා
13. තේමිය හුරුල්ලේ මහතා
14. වින්ස්ටන් පතිරාජ මහතා
15. ආචාර්ය එස්. විජය සන්දිරන් මහතා
16. එම්.වයි.එස්. ෆයිස් මහතා
17. එම්.කේ. නදීකා දමයන්ති මහත්මිය
18. කාන්ති රණසිංහ මහත්මිය
19. එස්.සී.සී. ඉලංකෝවන් මහතා
20. සිරිමසිරි හපුආරච්චි මහතා

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ප්‍රශ්නයේ (iv) වැනි කොටසින් මම අසා තිබෙන්නේ, "බුද්ධාගම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති දෙවන පරිච්ඡේදය ඒ අයුරින්ම පවත්වාගෙන යෑමට නිර්දේශ කර ඇති කමිටු සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද?" කියායි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඒ ප්‍රශ්නයට පිළිතුරක් දුන්නේ නැහැ. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට හෝ සලකා ඒකට උත්තරයක් දෙන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනුකමිටුවේ අතුරු වාර්තාවක් පසුගිය දා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. බුද්ධාගමට තිබෙන ප්‍රමුඛස්ථානය ඒ අයුරින්ම තියාගන්නත්, ඒ වාගේම, "බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය" කියන ඒ වගන්ති, අනෙකුත් ආගම් ආරක්ෂා කරමින් ඉස්සරහට ගෙන යනවා කියාත් ඒ අතුරු වාර්තාවේ විශේෂයෙන්ම සඳහන් වෙනවා. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාට මම මතක් කර දෙන්න ඕනෑ, බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දිය යුතු බව සහ බුද්ධාගම ආරක්ෂා කිරීම පිළිබඳව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළේ හිටපු ජනාධිපති, අතිගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා බව. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය හැටියට අපි හැම වෙලාවේම ඒ සම්බන්ධව කටයුතු කර තිබෙනවා. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමනි, ඔබතුමාට බුද්ධාගම ආරක්ෂා කරගන්න ඕනෑ නම්, අපි කාරණයක් මතක් කර දෙන්නම්. ඔබතුමන්ලාගේ රජය පැවැති පසුගිය කාලයේ දළදා මාලිගාව වටේ බේබිලා රේස් පැද්ද වෙලාවේදී, ඔබතුමා ඔය ගැන පොඩ්ඩක් කිව්වා නම්, මම හිතන විධියට මීට වඩා හොඳ තත්ත්වයක ඔබතුමන්ලා අද ඉන්නවා. අද වන විට අපි බුද්ධාගම විතරක් නොවෙයි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයත් ආරක්ෂා කර තිබෙනවා. ඔබතුමන්ලාට ඕනෑ තරම් විරෝධතා දක්වලා, පාරවල්වල ඕනෑ තරම් ඇවිදලා, රෑට වුණත් කොළඹ නවතින්න පුළුවන්. හැබැයි, මිනිසුන් ගෙනෙන්න බැරි නම් අපට කරන්න දෙයක් නැහැ. කොළඹ වටලනවාය කිව්වා. නමුත් ගිහින් වැටලුවේ ලේක් හවුස් වටරවුම විතරයි. ඒ නිසා අපට කරන්න දෙයක් නැහැ. දැන් ආයෙත් කියනවා, මහනුවරින් පටන් ගන්නවාය කියා. [බාධා කිරීමක්] මෙක අහගන්නකෝ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමනි, ඔබතුමාට දෙවැනි අතුරු ප්‍රශ්නයකුත් අහන්න තිබෙනවාද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමා තමන්ගේ දන්නාකම ප්‍රදර්ශනය කරන්න ගිහින් නොදන්නාකම ප්‍රදර්ශනය කළා. එතුමා පළමුවෙන්ම කියපු කාරණය මම නිවැරදි කරන්නම්. බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දුන්නේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා නොවෙයි. එය 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළේ ලංකා සමසමාජ පක්ෂයේ හිටපු නායක ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමායි. දෙවැනි කාරණය මෙකයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කරන ආකාරයට අගමැතිතුමාගේ වාර්තාවක් මෙහි නැහැ. මේ කමිටුවේ දහනවදෙනා අතර අගමැතිතුමා නැහැ. ඔබතුමා දන්නේ නැත්නම් දැනගන්න. රටේ සියලු පක්ෂ නියෝජනය කරමින්, සමාජයම නියෝජනය කරමින් මේ කමිටුව පත් කළා කළාය කියා ඔබතුමා කිව්වාට, මේ දහනවදෙනාගෙන් දෙදෙනායි බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දෙන වගන්තිය ඒ අයුරින් තියාගන්න ඕනෑය කියා කිව්වේ. තමුන්නාන්සේලා සමාජය නියෝජනය වන ආකාරයට කමිටුවක් පත් කළා නම්, අගමැතිතුමායි, ජනාධිපතිතුමායි කමිටු වාර්තාව පිළිගන්නේ නැහැ කියලා, - [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ප්‍රශ්නයට උත්තරය දන්නේ නැහැ නේ. ඒ නිසා මම මේ එතුමාට උත්තරය කියා දෙනවා. එතුමා පව්!

එතුමා හිතාගෙන ඉන්නේ, "ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දුන්නා, කමිටුවේ අගමැතිතුමා හිටියා, අගමැතිතුමා තමයි මේ නිර්ණායක ගෙනාවේ" කියායි. මේ පට්ටපල් අසත්‍ය, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ ගරු සභාව නොමඟ යවන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමනි, ඔය කාරණය ගැන කථා කිරීම දැන් අවසන් කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මගේ අතුරු ප්‍රශ්නය මෙකයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්නය අහන්න ආයෙත් අවස්ථාවක් දෙන්න බැහැ. ඔබතුමා කථාවක් කරනවා නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තවම අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

එහෙම නම් කරුණාකර දැන් අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයක තිබිය යුතු වචන සංඛ්‍යාවේ සීමාවක් තිබෙනවාද? නොදන්නාකමටයි මම අහන්නේ. මොකද, මම දීර්ඝ ප්‍රශ්නයක් මේ අහන්න යන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
සීමාවක් තිබෙනවාද, නැද්ද කියා කියන්න. සීමාවක් තිබෙනවා නම් මට ප්‍රශ්නය කෙටි කර ගන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්නය කෙටි කර අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ස්ථාවර නියෝග අනුව වචන ගණනේ සීමාව මොකක්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා කරුණාකර ප්‍රශ්නය අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ඔබතුමාත් දන්නේ නැහැ. මලකෙළියයි! අපේ ඇමතිතුමාත් දන්නේ නැහැ. ඔබතුමා රීති දන්නේ නැහැ. අපි කොහොමද දෙයියනේ මේ වැඩේ කරන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
අපි නැවත වතාවක් ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා, ඔය කමිටුවේ හිටිය දහනවදෙනාගෙන් කී දෙනෙක් බුද්ධාගම පිළිබඳ දෙවන පරිච්ඡේදය ඒ ලෙසම පවත්වාගෙන යාමට නිර්දේශ කර ඇත්ද කියා. අගමැතිතුමාත් හිටියේ නැත.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා හිතන විධියට මෙතුමා අද උදේ වැරදි පැත්තකින් නැඟිටලා ඇවිල්ලා. වයර් පැටලිලා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය විසින්- [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු රාජ්‍ය ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මේ රජය විසින්- [බාධා කිරීමක්] අර වෛද්‍ය ප්‍රතිකාරවලට යැව්වා නම් හරි. ඔළුව පොඩ්ඩක්- [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය විසින් කිසිම වෙනස්කමක් කරන්නේ නැහැ. බුද්ධාගමට තිබෙන ප්‍රමුඛස්ථානය, ඒ වාගේම බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කිසිම වෙනස්කමක් කරන්නේ නැහැ. ඒ අයුරින්ම පවත්වාගෙන යනවාය කියා අපි වගකීමෙන් කියනවා. [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 4-227/'18- (1), ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සභාවට දැනුම් දෙන්න කැමැතියි, අපි ඉතාමත් ඉක්මනින් නව ව්‍යවස්ථාවේ දළ කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව. ඉතාමත් ඉක්මනින් ඉදිරිපත් කරනවා. [බාධා කිරීමක්] අපි ඉදිරිපත් කරනවා. එතකොට බලාගන්න පුළුවන්. අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර දවස් දෙක-තුනක විවාදයක් දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் கேட்கின்றேன்.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
இந்தக் கேள்வி கேட்கப்பட்டு ஒரு வருடம் கடந்து விட்டது. One year has passed since this Question was raised.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මොකක්ද ඔබතුමාගේ රීති ප්‍රශ්නය?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, the Hon. Douglas Devananda and I were present at the Steering Committee of the Constitutional Assembly yesterday. There was no decision taken to present a draft Constitution to Parliament but only a Report of the Experts was being considered to be presented. So let the Hon. Leader of the House not mislead Parliament. It is a matter of the Constitutional Assembly.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ආණ්ඩුව සූදානම්, ඉතාමත් ඉක්මනින් දළ කෙටුම් පතක් ඉදිරිපත් කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පසු ගිය අවුරුද්දේ ඉඳලාම ආණ්ඩුව සූදානම්වෙලා හිටියා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙතුමන්ලා විරුද්ධ නම් මට කරන්නට දෙයක් නැහැ. ආණ්ඩුව සූදානම්. We are ready.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

## ක්ෂය රෝගීන්ට වෛද්‍ය පහසුකම් ලබා දීම: රත්නපුර දිස්ත්‍රික්කය

## காச நோயாளர்களுக்கு மருத்துவ வசதிகளை வழங்குதல்: இரத்தினபுரி மாவட்டம்

## PROVISION OF HEALTHCARE FACILITIES FOR TUBERCULOSIS PATIENTS: RATNAPURA DISTRICT

257/'18

5. **ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ වාර්තා වී ඇති ක්ෂය රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝගීන් වාර්තා වූ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස කවරේද;

(iii) රත්නපුර දිස්ත්‍රික්කයේ ක්ෂය රෝගීන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டிலிருந்து இன்றுவரை இரத்தினபுரி மாவட்டத்தில் பதிவாகியுள்ள காச நோயாளர்களின் எண்ணிக்கை எவ்வளவென் பதையும்;

(ii) மேற்படி நோயாளர்கள் பதிவாகியுள்ள சுகாதார மருத்துவ உத்தியோகத்தர் பிரிவுகள் யாவை என்பதையும்;

(iii) இரத்தினபுரி மாவட்டத்தில் காச நோயாளர் களுக்குத் தேவையான மருத்துவ வசதிகளை வழங்குவதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House-

(i) the total number of Tuberculosis patients that have been reported from the Ratnapura District from the year 2010 to date;

(ii) the names of MOH Divisions from which the aforesaid patients have been reported; and

(iii) the measures that will be taken by the Ministry to provide healthcare facilities that are necessary for the Tuberculosis patients in the Ratnapura District?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| වර්ෂය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| 2010 | 607 |
| 2011 | 569 |
| 2012 | 536 |
| 2013 | 585 |
| 2014 | 557 |
| 2015 | 566 |
| 2016 | 484 |
| 2017 | 507 |
| 2018 | 201 |

(ii)
1. රත්නපුර ප්‍රාදේශීය සභාව
2. රත්නපුර නගර සභාව
3. පැල්මඩුල්ල
4. කහවත්ත
5. කොළොන්න
6. බලන්ගොඩ
7. ඇහැලියගොඩ
8. කලවාන
9. නිවිතිගල
10. ගොඩකවෙළ
11. ඇළපාත
12. වැළිගෙපොළ
13. ඉඹුල්පේ
14. ඕපනායක
15. අයගම
16. කිරිඇල්ල
17. ඇඹිලිපිටිය
18. කුරුවිට

(iii)

- ක්ෂය රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා ළය චිකිත්සාගාරය රත්නපුර මහ රෝහල ආසන්නයේ පිහිටා ඇත.
- ක්ෂය රෝග නිර්ණය, ප්‍රතිකාරය හා රැක බලා ගැනීම සඳහා රත්නපුර මහ රෝහලේ සේවය කරන ළය රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයාගේ දායකත්වය ලබා දීම සිදු වේ.
- ළය රෝහලට අනුබද්ධව ක්ෂය රෝගීන්ගේ පහසුව සඳහා ශාඛා සායන කහවත්ත, බලංගොඩ, ඇඹිලිපිටිය, කලවාන, ඇහැලියගොඩ ආයතනවල පවත්වාගෙන යනු ලැබේ.
- දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන සායන, දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන වෛද්‍ය නිලධාරියෙකු යටතේ පාලනය වේ. එම සායනයෙහි වෛද්‍ය නිලධාරීන්, හෙද නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පීන්, ඖෂධවේදීන්, ඖෂධ සංයෝජකයින්, විකිරණ ශිල්පීන් හා සහායක සේවකයින්ගෙන් සමන්විත වේ. ඔවුන් රෝග නිශ්චය, රෝග ප්‍රතිකාර සඳහා රෝගීන් රැක බලා ගැනීම පිළිබඳව මනා පුහුණුවක් ලබා ඇත.
- රෝගීන්ගේ පහසුව සඳහා රත්නපුර මහ රෝහල, කහවත්ත, කලවාන, ඇඹිලිපිටිය, කිරිඇල්ල, ගොඩකවෙල, ඇහැලියගොඩ රෝහල් සහ කුරුවිට බන්ධනාගාරය යන ආයතනවල සෙම පටල පරීක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවා ඇත.
- ඒ ඒ ප්‍රදේශවල සිටින සැක කටයුතු රෝගීන් එම සෙම පටල පරීක්ෂණ මධ්‍යස්ථාන වෙත යොමු කිරීමෙන් ක්ෂය රෝගීන් ඉක්මනින් හඳුනාගෙන ප්‍රතිකාර ලබා දේ.
- ඍජු නිරීක්ෂණ ප්‍රතිකාර ක්‍රමය යටතේ රෝගීන්ට ආසන්නතම ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් ඖෂධ ලබා දීම සිදු වේ.
- ඊට අමතරව වතු ආශ්‍රිතව, පෞද්ගලික ආයතනවල ක්ෂය රෝග හඳුනා ගැනීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් වසර පුරාම ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.
- හඳුනා ගත් ක්ෂය රෝගීන්ට ප්‍රතිකාර කිරීම, සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම සහ පසු විපරම් කිරීම, මාස හයේ සිට අවුරුද්ද දක්වා ක්‍රියාත්මක වේ. ක්ෂය රෝගීන්ගේ ආශ්‍රිතයන් පරීක්ෂා කර ක්ෂය රෝග වැළඳී නොමැති අය පසු විපරම් කිරීම නිසි පරිදි සිදු කෙරේ.
- රත්නපුර දිස්ත්‍රික්කයේ පදිංචි අලුතින් හඳුනා ගත් රෝගීන් ලියාපදිංචි කිරීම දෛනිකව සිදු කෙරේ.
- ප්‍රතිකාර පැහැර හරින රෝගීන් සොයාගෙන නැවත ප්‍රතිකාර කිරීම සිදු වේ.
- බහු ඖෂධ ප්‍රතිරෝධක ක්ෂය රෝගීන්ට ප්‍රතිකාර කිරීම සහ ඖෂධ නිසා ඇති වන සංකූලතා නිසා රෝගීන් ඇහැලියගොඩ රෝහලේ රෝහල්ගත කර ප්‍රතිකාර කිරීම සිදු කෙරේ.
- ක්ෂය රෝගීන් සඳහා සමාජ සේවා අරමුදලෙන් ලැබෙන රුපියල් 500 මුදලක් රෝගීන්ට ලබා ගැනීම සඳහා අදාළ නිර්දේශය මෙම අමාත්‍යාංශය මඟින් ලබා දේ.

(ආ) පැන නොනඟී.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාර්ථක පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මම මේ ප්‍රශ්නය යොමු කරන්න ප්‍රධාන හේතුව වන්නේ, මම නියෝජනය කරන රක්වාන මැතිවරණ කොට්ඨාසයේ, රක්වාන ප්‍රදේශයේ වතු ආශ්‍රිතව මේ රෝගය යම් වැඩිවීමක් තිබීමයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙම අමාත්‍යාංශය භාර ගත්තාට පසුව එය ප්‍රතිශතාත්මක අඩුවීමක් තිබුණත්, අපේ ප්‍රදේශයේ මේ රෝගී තත්ත්වය හිස එසවීමක් තිබෙන නිසා මේ වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සපයන්න රෝහල්වල ඒ පහසුකම් ටික නැහැ. මම නියෝජනය කරන පළාතේ පළාත් රෝහල් තුනක් තිබෙනවා. ගොඩකවෙල රෝහල, රම්මල රෝහල සහ රක්වාන රෝහල කියන මේ රෝහල් තුනම පළාත් රෝහල්. මේ රෝහල්වල මේ රෝගයට වාගේම මූලික සෞඛ්‍ය පහසුකම් දීම සඳහා අවශ්‍ය පහසුකම්වත් නැහැ. ගිලන් රථ ගැන කියනවා නම්, ගොඩකවෙල වැනි රෝහල්වල අවුරුදු 20කට, 25කට වඩා පැරණි ගිලන් රථ තිබෙන්නේ.

මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. මේ පළාත් රෝහල්වල ප්‍රශ්නයට ප්‍රධාන හේතුව තමයි ගරු ඇමතිතුමනි, සබරගමුව පළාතේ පළාත් මහ ඇමතිවරයා පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා විධියට, රජයෙන් ලබා දෙන සියලුම සම්පත් ටික කැඟල්ලට ලබා දීම. ඒ නිසා අද වන විට රත්නපුර දිස්ත්‍රික්කයට ලබා දෙන පහසුකම් අවම මට්ටමක තිබෙන්නේ. ඒ නිසා මෙය සමපාත කරන්න අමාත්‍යාංශය විධියට යම් පියවරක් ගන්න පුළුවන්ද?

ගරු ඇමතිතුමනි, මධ්‍යම රජය මඟින් පාලනය වන රෝහල්වලට අවශ්‍ය පහසුකම් වුවමනා ප්‍රමාණයටත් වඩා ඔබතුමා

[ගරු හේෂා විතානගේ මහතා]

ලබා දී තිබෙනවා. මේ පළාත් රෝහල්වල තිබෙන ගැටලුව වෙනුවෙන් කුමන පියවරක් ගන්න බලාපොරොත්තු වනවාද කියා මම දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඔබතුමා කියන රක්වාන ප්‍රදේශයේ ක්ෂය රෝගීන් හඳුනා ගෙන නැහැ. හැබැයි, ගොඩකවෙල ප්‍රදේශයේ එම රෝගය තිබෙනවා. අනෙක් කාරණය, පළාත් සභා කියලා බලන්නේ නැතිව, රත්නපුර දිස්ත්‍රික්කයේ රෝහල් සියල්ලටම මම මුදල් වෙන් කරලායි තිබෙන්නේ.

පළාත් සභා රෝහල්වලට 2016 දී මගේ මුදල්වලින් රුපියල් බිලියන 3ක් දුන්නා; ඊට පස්සේ 2017 දී රුපියල් බිලියන 5ක් දුන්නා. ඒ නිසා පළාත් සභා රෝහල්වලට අපි මුදල් වෙන් කිරීමක් කරන්නේ නැහැ. අදාළ පළාත් සභා ඇමතිවරුනුත් එක්ක සාකච්ඡා කරලා මාස තුනකට වරක් අපි ඒ අවශ්‍ය දේවල් ලබා දෙනවා.

ගිලන් රථ 650ක් දැනට ලංකාවට එමින් පවතිනවා, කොටසින් කොටස. ගිලන් රථ අවශ්‍ය රෝහල් සියල්ලම අපි දැන් හඳුනා ගෙන තිබෙනවා. අපි එම ගිලන් රථ 650ම ගෙනැල්ලා, රේඛීය අමාත්‍යාංශය යටතේ තිබෙන රෝහල්වලටත්, පළාත් සභා යටතේ තිබෙන රෝහල්වලටත් අවශ්‍ය ගිලන් රථ සියල්ල ලබන අවුරුද්ද මැද වනකොට ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන පළාතට අදාළ රෝහල්වල තවත් මොනවා හෝ අඩු පාඩුකම් තිබෙනවාද කියලා ඔබතුමාට කියන්න පුළුවන් නම් අපි ඒ ගැන සොයා බලන්නම්. පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් දීලා තිබෙන අඩු පාඩු සකස් කිරීමේ වැඩ පිළිවෙළ අපි දැන් කර ගෙන යනවා. මොකද, හිටපු පළාත් මහ ඇමතිවරයාත් එක්ක මම දවසක් පුරාම ඔය හැම රෝහලකටම ගමන් කළා. එලෙස ගිහිල්ලා සොයා බලා, ඒ අඩුපාඩු සියල්ලම හදන්න අවශ්‍ය මුදල් වෙන් කළා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවෙනි අතුරු ප්‍රශ්නය මම අහනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඒ සඳහා ඉඩ දෙනවාද?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ඔව්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, SAITM රෝහල සම්බන්ධයෙන් දැන් මතු වෙලා තිබෙන තත්ත්වය සම්බන්ධයෙනුයි මම අහන්නේ. ඔබතුමාත්, ජනාධිපතිතුමාත් සහභාගි වෙලා SAITM රෝහල සම්බන්ධයෙන් ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් අත්සන් කළා, ඒ ආයතනයේ හිමිකාරිත්වය, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ මහජන බැංකුව අතරේ. ඊට පස්සේ ඒ ආයතනය විසින් එක් වරක පුවත් පත් දැන්වීමක් දැම්මා, ඒ රෝහල විකිණීම සම්බන්ධයෙන්. එය ඔබතුමාත් දන්නවා. දැන් කැබිනට් අනුකාරක සභාවක් පත් කරලා තිබෙනවා, ඒ රෝහල නැවත ශ්‍රී ලංකා ගුවන් හමුදා රෝහලක් බවට පත් කර ගන්න. ගත වූ අවුරුද්දක් වැනි කාලයක් තුළදී මේ රෝහල සියයට 100ක් රජයේ රෝහලක්ද, එහෙම නැත්නම් තවමත් එහි හිමිකාරිත්වය ඒ අයට තිබෙනවාද, ඒ අයට ඕනෑම අවස්ථාවක මේ රෝහල විකුණන්න පුළුවන්ද, එහෙම නැත්නම් එම රෝහල සම්බන්ධයෙන් දැනට පවතින තත්ත්වය මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ රෝහල දැනට පවතින්නේ තනිකරම රජයේ රෝහලක් විධියටයි. අපි ඒ රෝහලත් පවත්වා ගෙන යන්නේ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල පවත්වා ගෙන යන විධියට අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර ගෙනයි. මේ වනකොට රජයේ මුදලුත් නැතිව අපි දිගටම ඒ රෝහල ඉතා හොඳින් පවත්වා ගෙන යනවා. මෙම රෝහල සම්බන්ධයෙන් තවම අවසන් වශයෙන් ගිවිසුම්ගත කර නැති නිසා සියලුම සේවකයන් ලබා දීමේ අපහසුතාවක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් අවසන් වශයෙන් ගිවිසුම්ගත කළා නම්, අපි සියලුම ඇඳන් සංඛ්‍යාව සම්පූර්ණ කරනවා.

මම ගිය සතියේ ලකාවේ සිටියේ නැහැ. මොකද, ලෝක සෞඛ්‍ය සංවිධානයේ කලාපීය රැස්වීමට ගිය අවස්ථාවේ තමයි ඔය කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මම එහේ සිට අගමැතිතුමාටත් කථා කළා. කථා කරලා මේ රෝහල සම්බන්ධයෙන් ඉදිරි වැඩ කටයුතු කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් රජය තුළින්ම තවත් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න නියමිතයි.

මොකද මේ රෝහල ඉතා වැදගත්. අපි බලාපොරොත්තු වෙන්නේ එම රෝහලත්, මුල්ලේරියාව රෝහලත් නැහෙනහිර-කොළඹ ශික්ෂණ රෝහල බවට පත් කරන්නයි. එතකොට KDU එකේ වැඩිපුර සිටින ශිෂ්‍යයන්ටත් ඒ රෝහලේ සායනික කටයුතු අපට ලබා දෙන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 6-414/'18-(1), ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*වෙනත් දිනයක් සඳහා කල් තබන ලදී.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 7-463/'18-(1), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8-468/'18-(2), ගරු චමින්ද විජේසිරි මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

## නොරච්චෝලේ, ලක්විජය ගල් අඟුරු බලාගාරය : පරිසර හානිය අවම කිරීම
## நுரைச்சோலை, லக்விஜய நிலக்கரி மின் உற்பத்தி நிலையம்: சுற்றாடல் மாசடைவதைக் குறைத்தல்
## LAKVIJAYA COAL POWER PLANT, NOROCHCHOLAI : MINIMIZING ENVIRONMENTAL DAMAGE

488/'18

9. **ගරු හෙක්ටර් අප්පුහාමී මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) නොරච්චෝලේ, ලක්විජය ගල් අඟුරු බලාගාරය මඟින් සිදුවන පරිසර හානිය අවම කිරීම සඳහා යෝජිත සුළං ආවරණය ඉදිකිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) සුළං ආවරණය නොමැති වීමෙන් බලාගාරය අවට ජීවත්වන ගොවීන් බලවත් දුෂ්කරතාවයකට පත්වී ඇති බව දන්නේද;

(iii) සුළං ආවරණය ඉදිකිරීම ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) මෙම බලාගාර භූමිය තුළ අළු ගොඩ ගැසීම වැළැක්වීම සඳහා ගන්නා පියවර කවරේද;

(ii) බලාගාරයෙන් පිට වන අළු හේතුවෙන් වගා හානි වූ ගොවීන්ට ගෙවා ඇති වන්දි මුදල කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) මෙම බලාගාරය සඳහා වලංගු පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් තිබේද;

(ii) එම බලපත්‍රය නිකුත් කළ දිනය කවරේද;

(iii) එකී බලපත්‍රයේ කාලය අවසන් වන දිනය කවරේද;

(iv) එකී බලපත්‍රයේ සඳහන් කොන්දේසි ඉටු කිරීමට අසමත් වීමේ වගකීම ලංකා විදුලිබල මණ්ඩලය භාර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நுரைச்சோலை, லக்விஜய நிலக்கரி மின் உற்பத்தி நிலையத்தினால் ஏற்படும் சுற்றாடல் மாசடைவைக் குறைக்க உத்தேச காற்றுத் தடுப்பை நிர்மாணிக்க மேற்கொண்டுள்ள நடவடிக்கை யாதென்பதையும்;

(ii) காற்றுத் தடுப்பு இன்மையினால் மின் உற்பத்தி நிலையத்தைச் சூழவுள்ள பிரதேச விவசாயிகள் பாரிய சிரமங்களுக்குள்ளாகியுள்ளனர் என்பதை அறிவாரா என்பதையும்;

(iii) காற்றுத் தடுப்பை நிர்மாணித்தல் ஆரம்பிக்கப் படும் திகதி யாதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி மின் உற்பத்தி நிலைய வளவினுள் சாம்பல் குவிக்கப்படுவதைத் தடுக்க மேற்கொள் ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

(ii) மின் உற்பத்தி நிலையத்திலிருந்து வெளியேறும் சாம்பல் காரணமாக பயிர்கள் அழிவடைந்துள்ள விவசாயிகளுக்கு செலுத்தப்பட்ட இழப்பீட்டுத் தொகை எவ்வளவென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி மின் உற்பத்தி நிலையத்திற்கு செல்லுபடியான சுற்றாடல் பாதுகாப்பு உரிமப்பத்திரம் இருக்கின்றதா என்பதையும்;

(ii) அவ்வுரிமப்பத்திரம் வழங்கப்பட்ட திகதி யாதென்பதையும்;

(iii) அவ்வுரிமப்பத்திரத்தின் காலம் முடிவடையும் திகதி யாதென்பதையும்;

(iv) குறித்த உரிமப்பத்திரத்தில் குறிப்பிடப்பட்டுள்ள நிபந்தனைகளை நிறைவேற்றத் தவறியமைக் கான பொறுப்பை இலங்கை மின்சார சபை ஏற்றுக்கொள்கின்றதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he state-

(i) the steps that have been taken to construct the proposed wind shield for Norochcholai Lakvijaya Coal Power Plant for minimizing the damage caused to the environment by the power plant;

(ii) whether he is aware that the farmers living in areas surrounding the power plant are facing severe difficulties as there is no wind shield for the power plant; and

(iii) the date on which construction of the wind shield will be commenced?

(b) Will he also state-

(i) the nature of the steps that will be taken to prevent accumulation of ash in the premises of the power plant; and

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

(ii) the amount of the compensation that has been paid to the farmers whose cultivations have been damaged due to the ash that is emitted from the power plant?

(c) Will he inform this House-

(i) whether Norochcholai Plant has obtained a valid environmental protection licence;

(ii) if so, of the date on which the aforesaid licence was issued;

(iii) the date on which that licence will expire; and

(iv) whether the Ceylon Electricity Board will undertake responsibility for the failure of the power plant to fulfil the conditions stipulated in that licence?

(d) If not, why?

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නොරොච්චෝලේ, ලක්විජය ගල් අඟුරු බලාගාරය මඟින් සිදුවන පරිසර හානිය අවම කිරීම සඳහා යෝජිත සුළං ආවරණය පිළිබඳව නිසි තරඟකාරී කාර්ය පටිපාටියක් අනුගමනය කරමින් ටෙන්ඩර් නිකුත් කළා. ඒ ටෙන්ඩර් ඇගයීමෙන් පසුව 2018.02.05 දින ලාෆ් ඉංජිනියරින් (පුද්) සමාගම සහ සන්කෙන් කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම යන සමාගම් දෙකෙන් සැදුම්ලත් බද්ධ ව්‍යාපාරය -joint venture- වෙත එම ව්‍යාපෘතිය පිරිනමා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සඳහා ඉතා විශාල වියදමක් යනවා. දේශීය සංරචකය වශයෙන් රුපියල් 483,794,564ක් සහ විදේශීය සංරචකය වශයෙන් ඇමෙරිකන් ඩොලර් 1,485,068ක් වැය වනවා. මේ ආවරණයේ දිග මීටර් 1600යි -කිලෝ මීටර් 1.6ක්-. උස මීටර් 15ක් -අඩි 50ක් පමණ- සහ පදනම පළල මීටර් 5ක් වෙනවා. ඉතාමත් ශක්තිමත් ආවරණයක්. මෙමඟින් ඕනෑම දැඩි සුළඟකට, කුණාටුවකට ඔරොත්තු දීමේ හැකියාව තිබෙනවා. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ අළු සහ ගල් අඟුරු ගබඩා කර ඇති විශාල භූමිය හතර පැත්තෙන්ම සම්පූර්ණයෙන්ම වට වෙනවා. එතකොට කිසිම ලෙසකින් මුහුදු හුළඟ නිසා ගල් අඟුරු කුඩුවලින් හෝ අළුවලින් හානියක් වෙන්නේ නැහැ. කළු පාට සියුම් ගල් අඟුරු කුඩු තමයි හුඟක් හානිකර තත්ත්වයක් ඇති කළේ. මේ සුළං ආවරණය නිසා ඒ තත්ත්වය වැළැක්වෙනවා.

(ii) ඔව්. අපි ඒක දැනගෙන හිටියා. අපි ඒකට වන්දි ගෙව්වා. ඒ නිසා තමයි මේ ඉදි කිරීම කළේ.

(iii) සුළං ආවරණය ඉදි කිරීමේ කටයුතු 2018 ජූනි මාසයේ 20වැනි දා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය, ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කළා. 2019 - ලබන අවුරුද්දේ- ජූලි මාසය වනවිට එහි වැඩකටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කරනවා. දැන් වැඩ කටයුතු කෙරෙමින් පවතිනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් එම දිස්ත්‍රික්කය නියෝජනය කරන අනෙක් ගරු මන්ත්‍රීතුමන්ලා සහ ඇමතිතුමන්ලාටත් විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, මේ සම්බන්ධයෙන් දැක්වූ උනන්දුව පිළිබඳව. ගොඩක් බාධක මැද්දේ මේ කටයුත්ත ඉක්මනින් කර ගන්න පුළුවන් වුණේ, ඔබතුමන්ලාගේ උනන්දුව නිසායි.

(ආ) (i) මේ වන විට අළු බැහැර කිරීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවා නව ගැනුම්කරුවන් සමඟ ගිවිසුම් අත්සන් කර ඇත. 2018 මාර්තු මස 01වන දින සිට නව ටෙන්ඩරය අනුව ගැනුම්කරුවන් පස්දෙනකු විසින් අළු රැගෙන යනු ලබයි. තවත් ගැනුම්කරුවකු දිනකට ටොන් 360ක් බැගින් 2018.04.01 දින සිට අළු රැගෙන යනු ලබයි. තවද, දිනකට ටොන් 246ක් බැගින් තවත් ගැනුම්කරුවකු 2018 මැයි මස 01 දින සිට අළු රැගෙන යනු ලබයි. මේ අනුව බලාගාර භූමිය තුළ ගොඩ ගැසෙන සියලුම අළු ඉහත ගැනුම්කරුවන් වෙත ලබාදීමට හැකියාව ලැබී තිබේ. ඒ කියන්නේ, තව දුරටත් මේවා බලාගාර භූමිය තුළ රැස්වන්නේ නැහැ, ඉස්සර සිදු වුණා වාගේ.

තවද, මේ වනවිට ගොඩ ගසා ඇති අළු ඉවත් කිරීම සඳහා 2016 වර්ෂයේදී යෝජනා කැඳවා තිබූ අතර, එහිදී ඉදිරිපත් වූ යෝජනා සහ අලුතින් ඉදිරිපත් කර ඇති යෝජනා ද ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ අනුව එක් ආයතනයක් දිනකට ටොන් 80ක් රැගෙන ගොස් විශේෂිත ගඩොල් නිෂ්පාදන ක්‍රියාවලියක් 2018 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කිරීමට නියමිතයි. දැනට එම ආයතනයේ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතිනවා. තවත් ආයතනයක් දිනකට අළු ටොන් 650ක් බැගින් 2018 දෙසැම්බර් මස සිට රැගෙන ගොස් එම විශේෂිත වූ ගඩොල් නිෂ්පාදනය කිරීම සඳහා ගිවිසුම් අත්සන් කර තිබෙනවා. ඔවුන් මේ සඳහා අවශ්‍ය වන ඉඩම මිලදී ගැනීම සහ අවශ්‍ය පාරිසරික අනුමැතිය ලබාගැනීම සිදුකර තිබෙනවා.

(ii) බලාගාරයෙන් පිට වන අළු නිසා -ඇත්ත වශයෙන්ම අළු පමණක් නොවෙයි, ගල් අඟුරු කුඩුත් පිට වුණු බව අපි දැන් දන්නවා.- සිදු වුණු හානිය ගොවිජන සේවා සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවා, රුපියල් මිලියන 12.7ක් -රුපියල් ලක්ෂ 127ක්- වන්දි වශයෙන් අපි ගොවීන්ට ගෙවා තිබෙනවා. ඉදිරියේදී යම් හානියක් සිදු වුවත් අපි ඒ සඳහා වන්දි ගෙවන්න සූදානම්.

(ඇ) (i) මෙම බලාගාරය සඳහා වලංගු පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් තිබුණා.

(ii) එම බලපත්‍රය අවසාන වතාවට නිකුත් කළේ, 2016 ජූනි මස 30 දිනයි.

(iii) එම බලපත්‍රයේ වලංගු කාලය 2017 ජූනි මස 29 වන දිනෙන් අවසන් වී තිබෙනවා.

එසේ අවසන් වුණාට පසුව ඇති වුණු තත්ත්වයන් සලකා බලා විශේෂයෙන්ම වයඹ පළාත් සභාව විසින් කොන්දේසි රාශියක් පැනෙව්වා. ඒ කොන්දේසි අනුව අපි දැන් කටයුතු කරමින් ඉන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, 2017.06.14වැනි දා වයඹ පළාත් පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රය ප්‍රකාරව ඉදිරියේදී අප විසින් කර තිබෙන වැඩි දියුණු කිරීම් සලකා බලපත්‍රය ලැබෙවිය කියලා අපි අපේක්ෂා කරනවා.

(iv) අපි දැන් ඒ ඉදිරිපත් කර තිබුණු කොන්දේසි සියල්ලම සපුරා තිබෙනවා. ඒ නිසා මේ මොහොතේ පරිසර දූෂණයක් සිදු නොවන බව අපි කියන්න කැමැතියි.

(ඇ) අදාළ නොවේ.

මේ ප්‍රශ්නය ඇහුවාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු හෙක්ටර් අප්පුහාමී මහතා**
(*மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி*)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමා ලබා දුන් පිළිතුර සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය කියන්නේ ඉතාම සුන්දර වූ ප්‍රදේශයක්. ඒ වාගේම කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය පවත්වා ගෙන යන ප්‍රදේශයක්. නොරොච්චෝලේ විදුලි බලාගාරයේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් ඒ ජනතාවට ප්‍රශ්න රාශියක් තිබුණා. ඒකට නිසි විසඳුමක් ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. මේ විදුලි බලාගාරයෙන් ඉවත් වන ගල්අඟුරු අංශු අහිතකර නැහැයි කියලා වාර්තාවක් දෙන්න කියලා අපි ඉල්ලුවා. මොකද, ඒවා අහිතකර නැහැයි කියලා වාර්තාවක් දුන්නොත් අපට වැදගත් වෙනවා. දැනට මේ ගල් සැදීම සඳහා චීන සමාගම් දෙකක් තමයි ඇවිල්ලා තිබෙන්නේ. හැබැයි, දිස්ත්‍රික්කයක් හැටියට අපට ප්‍රාදේශීය සභා මට්ටමින් පාරවල්වලට තාර දැමීම සඳහා මේවා පාවිච්චි කරන්න පුළුවන් වෙනවා. ඒ සඳහාත් මේවා සුදුසුයි කියලා ගොඩක් දෙනෙක් සාකච්ඡා කර තිබෙනවා. ඒ නිසා මේවා පරිසරය සම්බන්ධයෙන්, එහෙම නැත්නම් ජනතාවගේ ජීවිතයට අහිතකර ද නැද්ද කියලා යම් කිසි ආකාරයකින් වාර්තාවක් - සහතිකයක්- දෙන්න පුළුවන් නම් අපේ දිස්ත්‍රික්කය තුළ සංවර්ධනයට මේවා ඉතාමත්ම ඉවහල් වෙයි. ඒ හා සමානවම මේ තිබෙන ප්‍රශ්නයටත් පිළිතුරක් ලැබෙයි. මොකද, මීට වඩා ප්‍රමාණයක් මේවා මිලදී ගැනීම කරයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අළු සම්බන්ධයෙන් විටින් විට පරීක්ෂණ ගණනාවක් කර තිබෙනවා. ලංකා ගල් අඟුරු සමාගම විසිනුත් මේවා ගඩොල් නිෂ්පාදනය සඳහා භාවිත කිරීමට පුළුවන්ද කියන කාරණය සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඉල්ලීමක් කළොත්, දැනට අප කර තිබෙන පරීක්ෂණවල ප්‍රතිඵල එතුමාට ලබා දෙන්න පුළුවන්. ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගල් අඟුරු අළු, ලෝකය පුරාම මාර්ග සංවර්ධන කටයුතු සඳහා යොදා ගන්නවා; මාර්ග ගොඩ කිරීමට යොදා ගන්නවා. ඒ වාගේම, කොන්ක්‍රීට් ආශ්‍රිත කටයුතුවලට යොදා ගන්නවා. ඒ පිළිබඳ කිසිම සැකයක් නැහැ. ඒ අළු එළියට දෙන්න පුළුවන්ද කියන කාරණය ගැන අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි ඒකට සූදානම්. පළාත් පාලන ආයතන සහ අනෙකුත් ආයතන තමන්ගේ කටයුතු කරද්දී අවශ්‍ය වන්නේ එම අළු සෞඛ්‍ය ආරක්ෂිතයි කියන සහතිකය නම්, දැනට තිබෙන පරීක්ෂණ වාර්තා ලබා දෙන්න අප සූදානම්.

**ගරු හෙක්ටර් අප්පුහාමී මහතා**
(*மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி*)
(The Hon. Hector Appuhamy)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. එම වැඩ පිළිවෙළ කරගෙන ගියොත් එය ඉතාම සාර්ථක වේවි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, එම ගොවීන්ට වන්දි ගෙවීමේදී විශාල ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. මොකද, ළඟම සිටින ගොවීන්ට නිසි ආකාරයෙන් වන්දි මුදල් හම්බ වෙලා නැහැ. ඊට පරිබාහිර කණ්ඩායමකට තමයි ඒ මුදල් ගිහින් තිබෙන්නේ. ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියන යෝජනාව ඔබතුමාට කරන ගමන්, මම දෙවන අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මෙවැනි කර්මාන්තශාලාවක් මුන්දලමේ පිහිටුවන්න ගියා. ඉඩමක් අරගෙන අවශ්‍ය ඒ සියලු කටයුතු කළා. හැබැයි, ජනතාවගේ විරෝධය නිසා එය වහන්න සිද්ධ වුණා. නමුත්, බලාගාරය ඇතුළේ එක ස්ථානයක නැවත ගඩොල් නිපදවීම කරන බවට තොරතුරු ලැබී තිබෙනවා. ඒ ගඩොල් නිපදවීම පිළිබඳව තොරතුරු කියවා බැලුවාම මට පෙනුණා, ඒ ගඩොල් නිපදවීම ඉතාම සාර්ථකයි කියලා. එය ඉතා සාර්ථකයි කියා තමයි මාත් විශ්වාස කරන්නේ. අනෙක් රටවල තිබෙන විස්තර මම අන්තර්ජාලය හරහා බැලුවා. ඒ විස්තර බැලුවාම පෙනෙනවා, එහි සාර්ථකත්වයක් තිබෙනවා කියලා. නමුත්, බලාගාරය අසලම ඒ කටයුත්ත කරන්න ගියාම නැවත විරෝධතාවක් මට ඇවිත් තිබෙනවා, ඒ සඳහා ජලය පාවිච්චි කිරීම සම්බන්ධයෙන්. මට විරෝධතාවක් ඇවිත් තිබෙන්නේ, මා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා වන නිසායි. ඒ කටයුත්ත සඳහා ජලය විශාල ප්‍රමාණයක් පාවිච්චි කරනවා. එසේ ජලය පාවිච්චි කිරීමෙන් ඒ ප්‍රදේශයේ ජල උල්පත් ටික හිඳෙනවාය කියලා ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. මොකද, ඒ ප්‍රදේශය ගොවිතැන් කරන ප්‍රදේශයක් නිසා. හැබැයි, මට දැනගන්න ලැබුණා, මුහුදු ජලය පිරිසිදු කරලා ඒ වැඩ පිළිවෙළට ගන්නවා කියලා. මේ සම්බන්ධයෙන් හොඳ පිළිතුරක් දුන්නොත්, මාධ්‍යයත් ඒ පිළිතුර අද ප්‍රචාරය කළොත් මම හිතනවා ඉතාම වැදගත් වෙයි කියලා. ඒ ප්‍රදේශයේ ජනතාව මෙයට පිළිතුරක් අපේක්ෂාවෙන් මේ වෙලාවේ බලාගෙන ඉන්නවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණු නිසි ලෙස නොදැනීමත්, විවිධ පුද්ගලයන් දේශපාලනිකව සහ ද්වේශසහගතව ඉදිරිපත් කරන, ප්‍රචාරය කරන කරුණුත් නිසා තමයි මේ තත්ත්වය මතු වෙලා තිබෙන්නේ.

අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ලංකා ගල් අඟුරු සමාගම එම අළු කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනයට සුදුසුද, නැද්ද කියන කාරණය පරීක්ෂා කළා; විද්‍යාත්මක වාර්තා සකස් කළා. ඒ නිසා අපට ඒ ගැන කිසිම සැකයක් තිබුණේ නැහැ. මුන්දලම ප්‍රදේශයේ ජනතාව නිසි ලෙස කරුණු දැන ගත්තා නම්, ඒ ප්‍රදේශයට වටිනා කර්මාන්තයක් හිමි වෙනවා. දැන් අපි අවසානයේ තීරණය කළා, අපේ පරිශ්‍රයට ආසන්න ස්ථානයක් තුළම එම කොන්ක්‍රීට් ගල් හදන්න. මොකද, ඒ ප්‍රදේශයේ ජනතාව අකැමැති දේවල් කරන්න ගිහිල්ලා ප්‍රශ්න ඇති කරන්න අපි කැමැති නැති නිසා. හැබැයි, භූගත ජලය භාවිත කිරීමෙන් වගා කටයුතුවලට යම් ආකාරයක හානියක් සිදු වෙනවා නම්, අපි ඒ ගැන සංවේදියි. ඒ පිළිබඳව තිබෙන ගැටලු ඉදිරිපත් කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මුන්දලම කියන්නේ විශාල වශයෙන් ගොවිතැන් සිදු වන ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ ගොවීන්ට කිසිම හානියක් වෙන්න අපි ඉඩ දෙන්නේ නැතිව ඒ කර්මාන්තයට අවශ්‍ය ජලය අපි විකල්ප ක්‍රමවලින් ලබා ගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ බලාගාරය ඇත්තටම ඒ ප්‍රදේශයේ ජනතාවට සම්පතක් විධියට හිතන්න වටිනවා. අළු ප්‍රශ්නය තිබුණා. ඒ වාගේම, ගල් අඟුරු ගබඩා කිරීමේ ප්‍රශ්නයක් තිබුණා. මීට අවුරුදු ගණනාවකට කලින් බලාගාරය හතර වටේට ආවරණ ඉදි කළා නම්, මේ අළු ප්‍රශ්නය නතර කරන්න තිබුණා. නමුත්, අවාසනාවකට අපි බලයට පත් වෙලා හොයලා බලනතෙක් එම කටයුත්ත සිදු වුණේ නැහැ. එම ආවරණයට පමණක් අති විශාල මුදලක් -ඒ කියන්නේ, රුපියල් කෝටි 60ක් විතර- වියදම් කරනවා. මේ ප්‍රශ්නයේ හැටියට, ඒ ආයෝජනය වටිනවා. ඒ ප්‍රදේශයේ ජනතාවට අළු සහ ගල් අඟුරු කුඩුවලින් සිදු වන හානිය ලබන වසර මැද වනකොට සම්පූර්ණයෙන් නතර වනවා. ඒ ගැන අපි සියයට සියයක් වග කියනවා. අපි බලාගාරය හතර වටේම ආවරණය කරනවා. ඒ වාගේම භූගත ජලයට හානි වන කිසිම දෙයක් නොකරන බව අපි වග කීමෙන් කියනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 10 - 538/'18 (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අසමි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වයඹ පළාතේ වකුගඩු රෝගීන්: විස්තර
## வடமேல் மாகாணத்திலுள்ள சிறுநீரக நோயாளர்கள்: விபரம்
## KIDNEY PATIENTS IN NORTH WESTERN PROVINCE : DETAILS

564/'18

**11. ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වයඹ පළාත තුළ වකුගඩු රෝගය ඉතා වේගයෙන් පැතිර යන බව දන්නේද;

(ii) එසේ නම්, දැනට වකුගඩු රෝගීන් හමුවී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා එම එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වී ඇති රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2010 වර්ෂයේ සිට පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කවලින් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) වයඹ පළාතේ වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රජය විසින් සලසා ඇති සෞඛ්‍ය පහසුකම් කවරේද;

(v) වකුගඩු රෝගීන් සිටින පවුල්වල සුබසාධනය සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடமேல் மாகாணத்தில் சிறுநீரக நோய் மிக வேகமாகப் பரவிவருவதை அறிவாரா;

(ii) ஆமெனின், தற்போது சிறுநீரக நோயாளர்கள் இனங்காணப்பட்டுள்ள பிரதேச செயலாளர் பிரிவுகள் மற்றும் அந்த ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவிலும் பதிவாகியுள்ள நோயாளர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(iii) 2010ஆம் ஆண்டு தொடக்கம் புத்தளம் மற்றும் குருணாகல் மாவட்டங்களில் பதிவாகியுள்ள சிறுநீரக நோயாளர்களின் எண்ணிக்கை எவ்வளவு;

(iv) வடமேல் மாகாணத்தில் சிறுநீரக நோயாளர் களுக்குச் சிகிச்சை பெறுவதற்காக அரசாங்கத் தினால் வழங்கப்பட்டுள்ள சுகாதார வசதிகள் யாவை;

(v) சிறுநீரக நோயாளர்கள் உள்ள குடும்பங்களின் நலன்புரிக்காக அமைச்சு எடுத்துள்ள நடவடிக்கை யாது;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House -

(i) that the kidney disease is spreading fast in the North Western Province;

(ii) if so, the Divisional Secretaries' Divisions from which patients of kidney disease have been found at present and the number of patients that has been reported from each of those Divisional Secretary's Division, separately;

(iii) the number of patients of kidney disease reported from the Kurunegala and Puttalam Districts from 2010;

(iv) the health facilities arranged by the Government for the patients of kidney disease in the North Western Province to obtain treatment; and

(v) the measures taken by the Government for the wellbeing of the families in which there are patients of kidney disease?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට උත්තර දෙනවා.

(අ) (i) නැත.

(ii) මුළු ඉතිහාසය පුරාම සිට අද දක්වා වාර්තා වී තිබෙන සංඛ්‍යාව

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| පොල්පිතිගම | 1451 |
| අඹන්පොල | 146 |
| කොබෙයිගනේ | 88 |
| නිකවැරටිය | 340 |
| මහව | 634 |
| කොටවෙහෙර | 238 |
| ගිරිබාව | 145 |
| ආනමඩුව | 157 |
| කරුවලගස්වැව | 109 |
| නාත්තන්ඩිය | 91 |
| නවගත්තේගම | 65 |
| ආරච්චිකට්ටුව | 175 |
| මහවැව | 16 |
| දංකොටුව | 28 |
| මාදම්පේ | 45 |
| කල්පිටිය | 40 |
| මහකුඹුක්කඩවල | 55 |
| පුත්තලම | 131 |
| වනාතවිල්ලුව | 51 |
| මුන්දලම | 69 |
| පල්ලම | 04 |
| හලාවත | 87 |
| වෙන්නප්පුව | 97 |

(iii) 2014 වනතෙක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් සංඛ්‍යාලේඛන හරියාකාරව අරගෙන ලේඛනගත කරලා නැහැ. 2014 වනතෙක් තෙක් රෝගීන් 1,431දෙනෙක් ඉඳලා තිබෙනවා. 2015දී 716යි, 2016දී 618යි, 2017දී 447යි. අද වනවිට එම ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. 2018 ජූලි වෙනකොට 344 දෙනෙක් වාර්තා වෙලා තිබෙනවා.

පුත්තලම දිස්ත්‍රික්කයේත් නිවැරදි සංඛ්‍යාලේඛන තිබිලා නැහැ. අද වනවිට වාර්තා වී තිබෙන සංඛ්‍යාව 797යි.

* මෙම දත්ත සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේ සිට පවත්වා ගෙන යනු ලබන අලුතින් ලියාපදිංචි වන වකුගඩු රෝගීන් පිළිබඳ ආවේක්ෂණ පද්ධතියෙන් ලබා ගන්නා ලදී.

* පුත්තලම දිස්ත්‍රික්කයේ 2017 වන තෙක් ඉහත දත්ත පද්ධතිය ක්‍රියාත්මක නොවූ බැවින් නිවැරදි තොරතුරක් ලබා ගැනීමට නොහැකි වී ඇත.

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කය කුරුණෑගල පළාත් මහ රෝහල හරහා වකුගඩු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ සේවය ලැබෙන අතර, සායන පහසුකම්වලට අමතරව රුධිර කාන්දු පෙරන යන්ත්‍ර 15කින් යුක්ත ඒකකය රෝගීන් 150කට කාන්දු පෙරන පහසුකම් සපයයි.

නිකවැරටිය, පොල්පිතිගම යන රෝහල්වල වකුගඩු රෝගීන් සඳහා සායන පහසුකම් සැපයේ.

නිකවැරටිය, පොල්පිතිගම යන රෝහල්වල කාන්දු පෙරන යන්ත්‍ර 04 බැගින් ඇත. මේවායින් කාන්දු පෙරන පහසුකම් සපයයි.

අලුතින් ගල්ගමුව හා කුලියාපිටිය යන රෝහල්වල රුධිර කාන්දු පෙරන ඒකක ස්ථාපිත කර ඇත.

රෝගීන් පෙර හඳුනා ගැනීමේ වැඩසටහන හරහා 2015 සිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුද්ගලයන් 72,308 දෙනෙක් රුධිරයේ ක්‍රියටිනින් පරීක්ෂාවට ලක්කර ඇත. මෙම වැඩසටහන වර්ෂය පුරාම ක්‍රියාත්මක වේ.

වකුගඩු රෝගය සෑදේ යැයි අනුමාන කරන පුද්ගලයන් ගල්ගමුව, නිකවැරටිය, පොල්පිතිගම මූලික රෝහල්වල කායික විශේෂඥ වෛද්‍යවරයෙකු වෙත යොමු කරනු ලැබේ.

<u>පුත්තලම දිස්ත්‍රික්කය</u>

පුත්තලම මහ රෝහලේ රුධිර කාන්දු පෙරන ඒකකයක් අලුතින් ඉදිකිරීම ආරම්භ කර ඇත. හලාවත මූලික රෝහලේ දැනට රුධිර කාන්දු පෙරන යන්ත්‍ර 03ක් ස්ථාපිත කර ඇත. මෙහි කටයුතු 2018දී ආරම්භ කර ඇත.

වකුගඩු රෝගීන් සඳහා සේවා මෙම රෝහල් දෙකෙහි කායික විශේෂඥ ඒකකය විසින් සපයයි. අවශ්‍ය නම් මෙම රෝගීන් කුරුණෑගල රෝහලේ වකුගඩු ඒකකය වෙත යොමු කරනු ලැබේ.

2017 ජූලි මස සිට ක්‍රියාත්මක වන වකුගඩු රෝගය පෙර හඳුනා ගැනීමේ වැඩසටහනින් ආනමඩුව, කරුවලගස්වැව හා ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුද්ගලයන් 5,399ක් රුධිරයේ ක්‍රියටිනින් පරීක්ෂාවට ලක්කර ඇත.

වයඹ පළාත තුළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්ය මණ්ඩල හරහා වකුගඩු රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ගම් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබයි.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

(v) පසුගිය රජය වකුගඩු රෝගීන් සඳහා මසකට දුන් රුපියල් 3,000 දීමනාව, රුපියල් 5,000 දක්වා වැඩි කර ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සියලු තොරතුරු මැනවින් ගොනු කරලා දීර්ඝ, සවිස්තරාත්මක පිළිතුරක් ලබාදීම පිළිබඳව මුලින්ම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, පුත්තලම දිස්ත්‍රික්කයට පමණක් නොවෙයි, මුළු ලංකාවටම බලපාන මෙම කාරණාව පිළිබඳව ඔබතුමාගේ මැදිහත්වීම, ඔබතුමාගේ දායකත්වය ඉතාම වැදගත් වෙනවා. විශේෂයෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ආසනය තුළ රුධිර පෙරණ යන්ත්‍ර ස්ථාපිත කිරීමට කටයුතු කිරීම පිළිබඳව අපේ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, කෙනෙක් වකුගඩු රෝගයට ගොදුරු වුණාම ඒ රෝගියා විතරක් නොවෙයි ඒ මුළු පවුල් සංස්ථාවම බිඳ වැටෙනවා. මම ඒක අත්දැකීමෙන් කියන්නේ. මගේ තාත්තා මිය ගියේත් වකුගඩු රෝගය වැලඳී දීර්ඝ කාලයක් ප්‍රතිකාර ගැනීමෙන් පසුවයි. බිරිඳට රෝගය වැලඳුනොත් ස්වාමියා සහ දරුවන්, ස්වාමියාට රෝගය වැළඳුනොත් බිරිඳ සහ දරුවන් එම රෝගයත් එක්කම ඔවිටු වෙලා මුළු පවුලම මැරෙනවා. ඒ රෝගියා රෝහලට ගෙනයන්න, පරීක්ෂණ පවත්වන්න, ඒ පරීක්ෂණවලට ප්‍රතිකාර ලබා දෙන්න ඒ අය සෑහෙන වෙහෙසක් දරන්න අවශ්‍යයි. මේ රෝගයට ගොදුරු වුණාම ඒ රෝගියාගේ ශරීරයේ සහ ලේවල වෙනස්කම් දවස ගානේ, පැයෙන් පැය සිදු වෙනවා. ගරු ඇමතිතුමනි, වකුගඩු රෝගීන් වෙනුවෙන් ආධාර ලබාදෙන දිස්ත්‍රික්කයක් බවට පසු ගිය කාලයේ පුත්තලම දිස්ත්‍රික්කය නම් වෙලා තිබුණේ නැහැ. ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් දැන් ඒ සඳහා පියවර අරගෙන තිබෙනවාද කියන්න මා දන්නේ නැහැ. ඒ නිසා පුළුවන් නම් පුත්තලම දිස්ත්‍රික්කයත් ඊට ඇතුළත් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඔබතුමා මේ රටේ වකුගඩු රෝගීන් වෙනුවෙන් ලොකු සේවාවක් කළ ගරු ඇමතිවරයෙක්. ගරු ඇමතිතුමනි, වකුගඩු රෝගියා ගැන පමණක් හිතන්නේ නැතුව, ඒ පවුල් සංස්ථාව වෙනුවෙන් යම් කිසි වැඩ පිළිවෙළක් දියත් කරන්න ඔබ අමාත්‍යාංශය තීන්දුවක් අරගෙන තිබෙනවාද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, කාරණා දෙකක් තිබෙනවා. එක් කාරණයක් තමයි, මෙම රෝගය සඳහා අවශ්‍ය ඖෂධ. රෝහල්වල ඒ සියලු රෝගීන් සඳහා අවශ්‍ය ඖෂධ කිසිදු හිඟයක් නොමැතිව අද නොමිලේ ලැබෙනවා. දෙවැනි කාරණය තමයි, මෙම රෝගය වැලඳී එක්තරා අදියරකට ආවාම කළ යුතු රුධිර කාන්දුකරණය. මම අමාත්‍ය ධුරයට එනකොට පසුගිය මුළු කාල පරිච්ඡේදයේදීම රුධිර පෙරණ යන්ත්‍ර 228යි ලංකාවට ගෙනැල්ලා තිබුණේ. 2016 අවුරුද්දේදී අපි රුධිර පෙරණ යන්ත්‍ර 264ක් අරගෙන ලංකාව පුරා රෝහල්වලට ලබා දුන්නා. ඊට පස්සේ හැම අවුරුද්දකම වාගේ දෙසිය ගණනක් දුන්නා. ලබන අවුරුද්දේ මැද විතර වෙනකොට ලංකාවේ රෝහල්වලට අවශ්‍ය රුධිර පෙරණ යන්ත්‍ර ලබාදීමේ ව්‍යාපෘතිය අපි අවසන් කරනවා.

ඒවා ජර්මනියෙන් ගෙන්වන්නේ. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපට ජර්මනියෙන් සියයට දශම හතක වැනි සුළු පොලියකට ණය ආධාරයක් ලැබෙනවා. එතකොට ඒක සම්පූර්ණ වෙනවා. තුන්වැනි එක තමයි වකුගඩු බද්ධ කිරීම. මම ඇමතිවරයා විධියට වැඩ භාර ගන්නකොට බද්ධ කිරීමේ වැඩ පිළිවෙළ තිබුණේ ඉතාම මන්දගාමී තත්ත්වයකයි. ලංකාවේ අවුරුද්දකට වකුගඩු රෝගීන් 30ක්, 40ක් විතර ප්‍රමාණයකට තමයි වකුගඩු බද්ධ කිරීම සිදු කළේ. අද අවුරුද්දකට වකුගඩු බද්ධ කිරීම් 400 ඉක්මවා ගිහින් තිබෙනවා. මම ගිය සතියේ මහනුවර රෝහලට ගියා. එහි විශේෂඥ වෛද්‍ය හරිස්චන්ද්‍ර මහත්මයාගෙන් මම ඇහුවා, ගිය අවුරුද්දට වකුගඩු බද්ධ කිරීම් කීයක් සිදු කළාද කියලා. අක්මා බද්ධ කිරීම සිදු කළ රෝගියා බලන්න මා ඒ වාට්ටුවට ගිය අවස්ථාවේ එම වෛද්‍යවරයා මට කිව්වා, පසුගිය අවුරුද්දේ එයා තනියෙන් සියයට වැඩි ප්‍රමාණයක් වකුගඩු බද්ධ කරලා තිබෙනවා කියලා. ඒ ආකාරයට අද වනවිට වකුගඩු බද්ධ කිරීම් ප්‍රමාණය විශාල වශයෙන් වැඩි කරලා තිබෙනවා. වකුගඩු බද්ධ කිරීමට පහසුකම් සලසා දීලා තිබෙනවා. ඒ සඳහා ශල්‍ය වෛද්‍යවරු පත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම අනුරාධපුරය, පොළොන්නරුව වැනි එම රෝගය උත්සන්නව තිබෙන ප්‍රදේශවලට ඒ පහසුකම් ලබා දීලා තිබෙනවා. ඇත්තටම අද ඒ නිසා තමයි වකුගඩු රෝගය පැතිරී යාම විශාල වශයෙන් පාලනය වෙලා තිබෙන්නේ. විශේෂයෙන් උතුරු මැද පළාත ඇතුළේ. දැන් මම ඔබතුමාට කියපු ආකාරයට වයඹ පළාතේ වුණත් එක්දහස් හාරසිය ගණනකට තිබුණු වකුගඩු රෝගීන් සංඛ්‍යාව ගිය අවුරුද්ද වන කොට හාරසිය ගණනකට අඩු වෙලා තිබෙනවා. මේ වැඩ පිළිවෙළ අනුව තමයි මේ වනවිට අපට වකුගඩු රෝගීන් ප්‍රමාණය අඩු කර ගන්නට පුළුවන් වෙලා තිබෙන්නේ.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අපේ නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අහනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊට පෙර මේ කාරණය පිළිබඳවත් මා සඳහන් කරන්න කැමැතියි. රටේම ජනතාව මේ ගැන දැනගත යුතුයි. මේ රටේ මෙච්චර රෝගීන් සිටිද්දී "සුවසැරිය" ව්‍යාපෘතියෙන් බීපු මිනිස්සු රෝහල්ගත කරන්න අපට සිදු වෙලා තිබෙනවා. ඒක අපරාධයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා මේ කාරණය සම්බන්ධයෙන් වයඹ පළාත ගැන අවධානය යොමු කිරීම වටිනවා. වකුගඩු රෝගීන් මුලින්ම වාර්තා වෙන්න පටන් ගත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙන්. ඔබතුමා ඒක දන්නවා. අනුරාධපුර පර්යන්ත රෝහල්වල මේ වකුගඩු රෝගීන් screen කරන එක ප්‍රමාදයක් වෙලා තිබෙනවා, serum creatinine බලන machine එක ගෙන්වීම තවදුරටත් ප්‍රමාද වෙලා තිබෙන නිසා. මම දන්නා හැටියට Technical Evaluation Committee එකේ තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ ගොල්ලන් දෙපැත්තට බෙදිලා යුරෝපයේ

machine එක ගෙනෙනවාද, චීන machine එක ගෙනෙනවාද කියලා කඹ ඇඳ ඇඳ ඉන්නවා. ඒක නිසා පර්යන්ත රෝහල්වලට එන රෝගීන්ට මෙය ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේක පළාත් සභාවට භාර දෙන්නේ නැතුව ජාතික ප්‍රශ්නයක් හැටියට සලකා මේකට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් විසඳුමක් දෙන්නේ කොහොමද කියන එක මම දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

එහි ප්‍රසම්පාදන කටයුතු කලින් පළාත් සභාවට භාර දීලා තිබුණා. ඒකේ අවාසි දෙකක් තිබෙනවා. මොකද, ඒ අය ප්‍රමාණාත්මකව විශාල මිල අඩු කිරීමක් කරනවා. ඉස්සර තිබුණු ක්‍රමයට මධ්‍යම රජයෙන් ඔක්කෝම එකට ගත්තා නම්, ඒ නිෂ්පාදකයන් එහි මිල විශාල ප්‍රතිශතයකින් අඩු කරනවා.

නමුත්, ඒ ප්‍රතිශතය අඩු කරන්නේ නැහැ, කැල්ලෙන්, කැල්ල ටෙන්ඩර් එකට යනකොට. ඒ අනුව මම ආපසු හින්දූ කර ගත්තා, රේඛීය අමාත්‍යාංශය හරහා මේ කටයුත්ත කරන්න. රාජ්‍ය සේවයේ රේඛීය අමාත්‍යාංශ ප්‍රසම්පාදනය තමයි හැම අමාත්‍යාංශයකම දීර්ඝ කාලීනව තිබෙන්නේ. සති දෙකකට පමණ පෙර ප්‍රසම්පාදන නිලධාරීන් ඔක්කෝම ගෙන්වලා මම මේ ගැන පැහැදිලි කළා. මොකද, මාස තුනහමාරකින් ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව මම කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. ඒක පිළිගත්තා. දැන් එය ක්‍රියාත්මකයි. නමුත් නිලධාරීන් අතින් ඒක ඒ විධියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. සමහර වෙලාවට ප්‍රසම්පාදනයට ගතවෙන කාලපරිච්ඡේදය වැඩියි, නිෂ්පාදකයන් එම උපකරණය නිෂ්පාදනය කිරීමට ගත කරන කාලයටත් වඩා. අන්තිමට මේ උපකරණ ගන්නෙත් පෞද්ගලික රෝහලකට ඒ උපකරණ ගන්න මුදලටත් වඩා වැඩි මුදලට. මොකද, ප්‍රසම්පාදනයේදී සිදු වන්නේ ගණන් මිණුම් දැම්මාම අන්තිම ගාණ බලලා නේ කරන්නේ. ප්‍රසම්පාදන ක්‍රියාවලිය මාස තුනහමාරකින් අවසන් කරන්න යෝජනා කළාම ආණ්ඩුව ඒක පිළිගත්තා. ප්‍රසම්පාදන කොමිසමත් පිළිගත්තා. අවසාන මිල ගත්තාම, ඒ මිල කේවල් කිරීමටත් ඉඩ ලබාදීලා තිබෙනවා. ඒ තවත් මිල අඩු කර ගන්න. ඒ අනුව මාස තුනහමාරක් ඇතුළත දී සියලුම ප්‍රසම්පාදනයන් අවසන් කරන්න මම දැන් නියෝග කරලා තිබෙනවා. අපි බලමු, මම හිතන විධියට ඉදිරියේ දී මීට වඩා හොඳ තත්ත්වයක් ඇති වෙයි.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද? ඔබතුමා අහන්න හදන්නේ අතුරු ප්‍රශ්නයක් ද?

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

මට පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවශ්‍යයි. මෙය වතුර පිළිබඳ ප්‍රශ්නයක්. එයත් වකුගඩු රෝගයට සම්බන්ධයි. ගරු ඇමතිතුමා, ග්‍රාමීය ජනතාව අතර දැන් මතයක් ගොඩනැගෙමින් පවතිනවා, මේ filtered වතුර දිගටම බොන එක හොඳ නැහැ කියලා. මම ඇහුවා, හේතුව මොකක්ද කියලා. එතකොට කියනවා, එම පෙරීමේ කටයුත්ත හරියටම සිදු වෙන්නේ නැති නිසා filtered වතුර දිගටම පානය කිරීමෙන් පසු කාලයේ දී වෙනත් රෝග හැදෙනවා කියලා. මම ඒක දෙවනාවක්, තුන්වනාවක් ඇහුවා. මා ඉදිරිපිටදීම පුද්ගලයෙක් filtered වතුර තිබෙද්දී, ළිඳෙන් ගෙනා වෙනත් වතුර බිව්වා. ඔහු ඒ වෙලාවේ මට ප්‍රකාශ කළේ "filtered වතුර දිගටම බීම වකුගඩුවලට හොඳ නැහැ" කියලායි. සමාජය අතර පැතිරෙමින් පවතින මේ මතය ඇත්තක්ද, බොරු මතයක්ද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මම නම් අහලා නැහැ, පෙරණයට ලක් කරපු ජලය නරකයි කියලා. ඒක මුළු ලෝකයේ හැම තැනම භාවිත කරන ක්‍රමවේදයක්. මොකද, ඒ පෙරීමට අවශ්‍ය iron වාගේ දේවල් යොදලායි එය හදන්නේ. එහි තත්ත්වය සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පරීක්ෂා කරනවා. හැම නිෂ්පාදනයක්ම අපේ තත්ත්ව පාලක ඒකකයෙන් බලලා තමයි අනුමත කරන්නේ. ඒ නිසා එහි නරකක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 12-584/'18-(1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 13-1126/'18-(1), ගරු විමල් වීරවංශ මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරිය: කාර්යාල සහ පෞද්ගලික කාර්ය මණ්ඩලය

*நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்: அலுவலகம் மற்றும் பிரத்தியேகப் பதவியணி*

MINISTER OF JUSTICE AND PRISON REFORMS: OFFICES AND PERSONAL STAFF

463/'18

**7. ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරියගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ගෙවා ඇති මුළු කුලී/බදු මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

[ගරු බිමල් රත්නායක මහතා]

(ආ) (i) අමාත්‍යවරියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) අමාත්‍යවරිය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

කොපමණ ද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

*නීති මත්‍රුම් සිරෙප්චාලෙකළ් මරුසීරමෙප්පු අමෙප්චරෛක් කේට්ට විනා:*

(அ) (i) *நீதி அமைச்சரின் அமைச்சு அலுவலகங்களின் முகவரிகள் யாவை என்பதையும்;*

(ii) *அந்த அலுவலகங்களுக்காக வாடகை குத்தகை செலுத்தப்படின் அந்த மாதாந்த வாடகை/ குத்தகை தொகை எவ்வளவென்பதையும்;*

(iii) 2015 - 2017 ஆம் ஆண்டு வரை செலுத்தப் பட்டுள்ள மொத்த வாடகை/ குத்தகைத் தொகை எவ்வளவென்பதையும்;

*அவர் இச்சபைக்கு அறிவிப்பாரா?*

(ஆ) (i) அமைச்சரின் பிரத்தியேக பதவியணியின் உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) அந்த பிரத்தியேக பதவியணிக்கு ஒதுக்கப்பட்ட வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அமைச்சருக்காக ஒதுக்கப்பட்டுள்ள வாகனங் களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and Prison Reforms:

(a) Will she inform this House-

(i) the addresses of Ministerial Offices of the Minister of Justice and Prison Reforms;

(ii) if rent or lease is paid for the said Offices, the monthly rental/lease; and

(iii) the total rent/lease paid from the year 2015 up to the year 2017?

(b) Will she also inform this House-

(i) the number of officials in the personal staff of the Minister;

(ii) the number of vehicles allocated for the said personal staff; and

(iii) the number of vehicles allocated to the Minister?

(c) If not, why?

**ගරු තලතා අතුකෝරල මහත්මිය (අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Justice and Prison Reforms)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12.

(ii) එම කාර්යාල අමාත්‍යාංශ ගොඩනැඟිල්ලේම පිහිටා ඇති බැවින් කිසිදු කුලී හෝ බදු මුදල් ගෙවීමක් සිදු නොවේ.

(iii) පැන නොනඟී.

(ආ) (i) මුළු නිලධාරීන් සංඛ්‍යාව 17කි.

| අනු අංකය | තනතුර | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පෞද්ගලික ලේකම් | 01 |
| 02 | සම්බන්ධීකරණ ලේකම් | 02 |
| 03 | මාධ්‍ය ලේකම් | 01 |
| 04 | මහජන සම්බන්ධතා නිලධාරී | 01 |
| 05 | පෞද්ගලික සහකාර | 01 |
| 06 | කළමනාකරණ සහකාර | 05 |
| 07 | කාර්යාල කාර්ය සහායක | 02 |
| 08 | රියැදුරු | 03 |
| 09 | උපදේශක | 01 |
| එකතුව | | 17 |

(ii) 05කි.

(iii) 03කි.

(ඇ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 8-468/'18-(2), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ආබාධිත දීමනාව ලබා දීම : වයඹ පළාත
## அங்கவீனர்களுக்கான கொடுப்பனவு: வடமேல் மாகாணம்
## GRANTING OF DISABILITY ALLOWANCE: NORTH WESTERN PROVINCE

584/'18

**12.ගරු හෙක්ටර් අප්පුහාමී මහතා (ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி - மாண்புமிகு துஷார இந்துனில் அமரசேன சார்பாக)
(The Hon. Hector Appuhamy on behalf of the Hon. Thushara Indunil Amarasena)

සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වයඹ පළාත තුළ දැනට ආබාධිත දීමනාව ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2015 වර්ෂයේ සිට විශාල පිරිසක් ආබාධිත දීමනාව ලබා ගැනීම සඳහා පොරොත්තු ලේඛනයේ සිටින බව දන්නේද;

(iv) පොරොත්තු ලේඛනයේ දිගු කාලයක් රැඳී සිටින පිරිසට ආබාධිත දීමනාව ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

සමූහ නලන්පුරි මැතිනිය සහ ආරම්භක කර්මාන්ත අමාත්‍යතුමා (ගරු දයා ගමගේ මහතා) වෙනුවෙන් පිළිතුරු දුන්නේය.

(அ) (i) வடமேல் மாகாணத்தில் தற்போது அங்கவீனர் களுக்கான கொடுப்பனவினைப் பெறும் ஆட்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) பிரதேச செயலாளர் பிரிவுகள் அடிப்படையில் அந்த எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) 2015ஆம் ஆண்டு தொடக்கம் பெருமளவானோர் அங்கவீனர்களுக்கான கொடுப்பனவினைப் பெறுவதற்காகக் காத்திருப்போர் பட்டியலில் இருப்பதை அறிவாரா என்பதையும்;

(iv) நீண்டகாலமாக காத்திருப்போர் பட்டியலில் இருப்பவர்களுக்கு அங்கவீனர்களுக்கான கொடுப்பனவினை வழங்க அமைச்சு எடுக்கும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Social Welfare and Primary Industries:

(a) Will he inform this House-

(i) the number of persons in the North Western Province who receive the Disability Allowance;

(ii) separately, the said number as per each Divisional Secretary's Division;

(iii) whether he is aware that a large number of persons remain in the waiting list since 2015 to get the Disability Allowance;

(iv) the steps taken by the Ministry to provide the Disability Allowance to the group of people who have been in the waiting list for a considerable period of time?

(b) If not, why?

**ගරු දයා ගමගේ මහතා (සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயா கமகே - சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Social Welfare and Primary Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පුද්ගලයන් 4,396කි.

(ii) ප්‍රාදේශීය මට්ටමින් තොරතුරු ඇමුණුම් අංක 1 සහ 2 හි සඳහන් වේ. ඇමුණුම් බලන්න.

ඇමුණුම 1

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් රු.3000/- ජීවනාධාර දීමනාව ලබන හා පොරොත්තු ලේඛණයේ සිටින ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව - 2018 වයඹ පළාත

කුරුණෑගල දිස්ත්‍රික්කය

| ප්‍රා.ලේ කොට්ඨාස ගණන | ප්‍රා.ලේ කොට්ඨාසයේ නම | රු.3000/- ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | පොරොත්තු ලේඛනයේ සිටින පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 30 | ඉබ්බාගමුව | 102 | 30 |
| | ඔහව | 116 | 48 |
| | වීරඔටෙර | 99 | 22 |
| | අඹින්පොළ | 79 | 22 |
| | කුලියාපිටිය බටහිර | 108 | 68 |
| | කිංගිරිය | 100 | 35 |
| | වාරියපොළ | 102 | 54 |
| | අලව්ව | 110 | 45 |
| | පිදිගම | 111 | 113 |
| | කුලියාපිටිය නැගෙනහිර | 93 | 130 |
| | කොකෙයිලතේ | 113 | 18 |
| | මහල්ගහවෙල | 101 | 100 |
| | ගඟන්චක්ක | 111 | 33 |
| | කොටවෙහෙර | 74 | 48 |
| | පොල්පිතිගම | 114 | 60 |
| | පන්නල | 116 | 55 |
| | නිකඩුරටිය | 101 | 48 |
| | මාවතගම | 108 | 95 |
| | ඇහැටුවැව | 109 | 68 |
| | මිල්ලවපිටිය | 102 | 15 |
| | කුරුණෑගල | 109 | 48 |
| | පඩුවස්නුවර බටහිර | 117 | 120 |
| | මාස්පොත | 109 | 4 |
| | ගිරිබාව | 105 | 45 |
| | උඩුබද්දාව | 107 | 57 |
| | බමුණාමඩකාටුව | 99 | 25 |
| | රක්නායකපුර | 106 | 50 |
| | පඩුවස්නුවර නැගෙනහිර | 62 | 65 |
| | නාරම්මල | 117 | 26 |
| | ගල්ගමුව | 110 | 60 |
| | | **3110** | **1607** |

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

ඇමුණුම 2

පුත්තලම දිස්ත්‍රික්කය

| ප්‍රා.ලේ කොට්ඨාස අංකය | ප්‍රා.ලේ කොට්ඨාසයේ නම | රු.3000/- ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සොරොක්තු ලේඛනයේ ඇතිවන පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 16 | මාදම්පේ | 78 | 28 |
| | දංකොටුව | 76 | 48 |
| | නාවඟත්තේගම | 77 | 31 |
| | මහවැව | 87 | 90 |
| | වනාතවිල්ලුව | 71 | 10 |
| | පුත්තලම | 79 | 95 |
| | මහකුඹුක්කඩවල | 76 | 12 |
| | ඹුන්දලම | 79 | 82 |
| | වෙන්නප්පුව | 87 | 73 |
| | පල්ලම | 78 | 55 |
| | නාක්තණ්ඩිය | 101 | 69 |
| | කරුවලඟස්වැව | 77 | 64 |
| | ආරච්චිකට්ටුව | 82 | 45 |
| | ආණමඩුව | 79 | 25 |
| | කල්පිටිය | 81 | 50 |
| | ඔලාවත්ත | 78 | 15 |
| | | 1286 | 792 |

(iii) ඔව්.

(iv) ඔව්. මෙවර අය වැය යෝජනා සඳහා ද ආධාර අපේක්ෂිත සියලු ආබාධ සහිත පුද්ගලයන්ට අදාළ දීමනාව ගෙවීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඇත. එසේම, දිවයිනේ සියලුම පොරොත්තු ලේඛනගත ආබාධ සහිත පුද්ගලයන් සඳහා මෙම දීමනාව ගෙවීමට ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ද ඉදිරිපත් කර ඇත.

(ආ) අදාළ නොවේ.

## ජාතික ලේඛනාගාරය : රහස්‍ය ලේඛන අධීක්ෂණය
## தேசிய ஆவணக் காப்பகம்: இரகசிய ஆவணங்களைக் கண்காணிப்புச் செய்தல்
## NATIONAL ARCHIVES: MONITORING CONFIDENTIAL DOCUMENTS

1126/'18

**13. ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ගරු විමල් වීරවංශ මහතා වෙනුවට)**

(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே - மாண்புமிகு விமல் வீரவங்ச சார்பாக)

(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle on behalf of the Hon. Wimal Weerawansa)

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ලේඛනාගාරයේ සියලු ප්‍රධාන අංශයන් අධීක්ෂණය කිරීම, එහි අධ්‍යක්ෂ ජනරාල්, මාණ්ඩලික නිලධාරි සහ ඒ සම්බන්ධයෙන් වගකීම් දරන උපාධිධාරි නිලධාරියකුගෙන් සමන්විත ක්‍රමවත් යන්ත්‍රණයක් මඟින් සිදු කිරීම මෙතෙක් අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය වුවද, එම ක්‍රමය වෙනස් කර ලේඛනාගාරයේ ඇති රහස්‍ය ලේඛන අධීක්ෂණය කිරීමේ වගකීම එහි වත්මන් අධ්‍යක්ෂ ජනරාල්වරිය තමා වෙත පමණක් පවරාගෙන තිබේද;

(ii) එසේ නම්, එයට හේතුව කවරේද;

(iii) රාජ්‍ය සේවය පිළිබඳ රහස්‍ය ලේඛන ආරක්ෂා කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ කිසිදු පූර්ව අත්දැකීමක් හෝ වෘත්තීය සුදුසුකමක් නොමැති එම අධ්‍යක්ෂ ජනරාල්වරිය අදාළ තනතුරට පත් කර ඇත්තේ කවර සුදුසුකම් මත ද;

(iv) ආයතනික ක්‍රියාවලිය, විශේෂයෙන් රහස්‍ය ලේඛන පිළිබඳ වගකීම එසේ තනි පුද්ගලයකු විසින් පවරා ගැනීමේ අවදානම් සහගත තීරණය, පිළිගත් ආයතනික ක්‍රමවේදයන්ට පටහැනි නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, එ මන්ද?

உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய ஆவணக் காப்பகத்தின் சகல பிரதான பிரிவுகளினதும் கண்காணிப்பானது அதன் பணிப்பாளர் நாயகம், பதவிநிலை அலுவர்கள் மற்றும் அது தொடர்பில் பொறுப்புவாய்ந்த பட்டதாரி அலுவலர் ஒருவரை உள்ளடக்கியதான முறையான ஒரு பொறிமுறை ஊடாக மேற்கொள்ளப்படுவதே இதுவரை பின்பற்றப் பட்டு வந்த முறையியலாக இருந்தபோதிலும், அந்த முறையை மாற்றி ஆவணக் காப்பகத்திலுள்ள இரகசிய ஆவணங்களைக் கண்காணிப்புச் செய்யும் பொறுப்பை, அதன் தற்போதைய பணிப்பாளர் நாயகம், தம்மிடம் மாத்திரம் வைத்துக்கொண்டுள்ளாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான காரணம் யாது என்பதையும்;

(iii) அரசாங்க சேவை தொடர்பிலான இரகசிய ஆவணங்களைப் பாதுகாத்தல் மற்றும் கண்காணிப்புச் செய்தல் பற்றிய எந்தவொரு முன்னனுபவமோ தொழில்சார் தகைமையோ இல்லாத மேற்படி பணிப்பாளர் நாயகம் குறித்த பதவிக்கு நியமனம் செய்யப்பட்டிருப்பது எவ்வாறான தகைமைகளின் அடிப்படையில் என்பதையும்;

(iv) நிறுவன நடைமுறை, குறிப்பாக இரகசிய ஆவணங்கள் பற்றிய பொறுப்பு அவ்வாறு தனியொரு நபரினால் பொறுப்பேற்றுக் கொள்ளப்படுவது பற்றிய அபாயகரமான தீர்மானம், ஏற்றுக்கொள்ளப்பட்ட நிறுவனச் முறையியல்களுக்கு முரணானது அல்லவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Cultural Affairs:

(a) Will he inform this House-

(i) whether the current Director General of National Archives has assigned to herself the exclusive authority of monitoring confidential documents deposited at the National Archives, although the methodology adopted to monitor all main sections of the National Archives up to now, was to follow a formal mechanism where the said responsibility is shared by the Director General, the Staff Officer and a graduate officer who holds responsibility in this regard;

(ii) if so, of the reason behind such action;

(iii) her qualifications which warranted the appointment as the Director General although she is not a person with any prior experience or professional qualifications in protecting and monitoring confidential documents of the Public Service; and

(iv) whether the risky decision to assign the responsibility of confidential documents to a single individual within the establishment procedure would not be in violation of accepted establishment procedures?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මෙතෙක් මෙම තනතුර දරා ඇත්තේ විෂය ක්ෂේත්‍රය පිළිබඳව ආචාර්ය උපාධියක් ඇති නිලධාරීන් විසිනි. ආයතනයේ පාලන කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල් අවසාන වශයෙන් වගකීම දැරිය යුතුය. රහස්‍ය ලේඛන අධීක්ෂණය කිරීම අධ්‍යක්ෂ ජනරාල් විසින් කරනු ලබයි.

(ii) රහස්‍ය ලේඛන පිළිබඳව වගකීම අවසන් ලෙස අධ්‍යක්ෂ ජනරාල් විසින් දැරිය යුතු වීම.

(iii) අධ්‍යාපන සුදුසුකම්.

ඉතිහාසය විෂය:

PhD (ලයිඩන් විශ්වවිද්‍යාලය), නෙදර්ලන්තය.

MPhil ලයිඩන් විශ්වවිද්‍යාලය, නෙදර්ලන්තය. - (ගෞරව පන්ති සාමාර්ථය)

බී.ඒ. ලයිඩන් විශ්වවිද්‍යාලය, නෙදර්ලන්තය. - (ගෞරව පන්ති සාමාර්ථය)

බී.ඒ. (ගෞරව), කොළඹ විශ්වවිද්‍යාලය. - (දෙවන පෙළ ඉහළ පන්ති සාමාර්ථය)

ලන්දේසි භාෂාව:

NT2, Programme II

වෘත්තීය සුදුසුකම්

Teaching and Research Assistant (AIO), Leiden University 2010-2013

ජාත්‍යන්තර ලෙස පිළිගත් සම්යුරු ප්‍රතිනිරීක්ෂණය (Peer-Reviewed Indexed) කරන ලද ජර්නල්වල පර්යේෂණ ලිපි පළ වූ පර්යේෂකයෙකු වීම.

තාවකාලික කථිකාචාර්ය - විවෘත විශ්වවිද්‍යාලය. 2016.04.01 සිට 2017.07.31 දක්වා.

ශ්‍රී ලංකාව, නෙදර්ලන්තය, එංගලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඉන්දියාව යන රටවල ලේඛනාගාරයන්හි අධිලේඛන පරිහරණය කිරීමේ වසර දහයක පළපුරුද්ද.

(iv) පිළිගත් ආයතනික ක්‍රමවේදයට පටහැනි නොවේ. කෙසේ වෙතත්, ඒ පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කිරීම අවශ්‍ය වේ නම්, ඒ අනුව සුදුසු වෙනස්කම් කිරීමට කටයුතු කරලු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 27.(2) යටතේ ප්‍රශ්නය. ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහන
### வறட்சியால் பாதிக்கப்பட்ட மக்களுக்கான நிவாரணங்கள்
### RELIEF TO PEOPLE AFFECTED BY DROUGHT

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! அண்மைக் காலமாக நாட்டில் ஏற்பட்டுள்ள வறட்சி காரணமாக நாடளாவிய ரீதியில் சுமார் 1,50,000க்கும் மேற்பட்ட குடும்பங்கள் பாதிக்கப்பட்டுள்ளதாகவும், வடக்கு, கிழக்கு மாகாணங்களில் வாழ்ந்து வருகின்ற மக்களே மேற்படி வறட்சி காரணமாக மிக அதிகமாகப் பாதிக்கப்பட்டுள்ளனர் என்றும் தெரிய வருகின்றது.

இதன் பிரகாரம், வடக்கு மாகாணத்தில் சுமார் 1,00,741 குடும்பங்களைச் சேர்ந்த 3,47,499 பேர் பாதிக்கப்பட்டுள்ளனர் என்றும், வடக்கு மாகாணத்தில் கிளிநொச்சி மாவட்டமே மிக அதிகப் பாதிப்புக்கு உள்ளாகியுள்ள மாவட்டம் என்றும், இங்கு சுமார் 33,165 குடும்பங்களைச் சேர்ந்த 1,09,735 பேர் வரையில் பாதிக்கப்பட்டுள்ளனர் என்றும் தெரியவருகின்றது. அதே நேரம், கிழக்கு மாகாணத்தில் சுமார் 32,426 குடும்பங்களைச் சேர்ந்த 1,05,732 பேர் பாதிக்கப்பட்டுள்ளனர் என்றும், குருணாகல், பொலன்னறுவை மற்றும் அநுராதபுரம் ஆகிய மாவட்டங்களில் சுமார் 10,000 குடும்பங்களைச் சேர்ந்த 40,000க்கும் மேற்பட்ட மக்கள் பாதிக்கப்பட்டுள்ளனர் என்றும் தெரிய வருகின்றது.

மேற்படி விடயம் தொடர்பிலான பின்வரும் எனது கேள்விகளுக்கான பதில்களையும், எடுக்கப்படக்கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ அமைச்சர் துமிந்த திசாநாயக்க அவர்கள் வழங்குவார் என எதிர்பார்க்கின்றேன்.

01. இம்முறை வறட்சி காரணமாகப் பாதிக்கப்பட்டுள்ள அனைத்து மக்கள் தொடர்பிலும் அனர்த்த முகாமைத்துவ அமைச்சு இதுவரையில் எடுத்துள்ள நடவடிக்கைகள் என்ன?

02. இதுவரையில் நிவாரணங்கள் ஏதேனும் வழங்கப் பட்டுள்ளனவா?

03. வழங்கப்பட்டுள்ளன எனில், என்னென்ன நிவாரணங்கள், எந்தெந்த மாவட்டங்களுக்கு வழங்கப்பட்டுள்ளன?

04. குடிநீர் தட்டுப்பாடுகள் நிலவும் பகுதிகளுக்கு, குடிநீர் கிடைக்கக்கூடிய இடங்களிலிருந்து குடிநீரைக் கொண்டுசெல்வதற்கும், குடிநீரைத் தேக்கி

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

වෛප්පතර්ක්කුම් වසතියාක පවුසර්කළ්, නීර්ත් තාංකිකළ් පෝන්රවර්රිනෛ වළංකුවතර්කු තංකළතු අමෛච්චින් මූලමාක ඒර්පාටුකළෛ මේර්කොළ් වතර්කු ඒතේනුම් මානියංකළ් උළ්ළනවා? ඉල්ලෛයෙනිල්, ඉතර්කෙන ඔරු විසේට තිට්ටත්තිනෛ ඒර්පටුත්ත මුටියුමා?

05. වටක්කු මාකාණත්තෛප් පොරුත්තවරෛයිල්, කටලෛ අණ්ටිය පකුතිකළිල් උවර් නීර් උට්පුකුන්තු කිටෛක්කක්කූටිය කුරිප්පිට්ටළවු නිලත්තටි නීරිලුම් උවර්ත් තන්මෛ කලන්තිරුප්පතාල්, උවර් නීර්ත් තටුප්පණෛකළෛ අමෛප්පතර්කු නටවටික්කෛ එටුක්ක මුටියුමා?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
The answer will be given on next Sitting day.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the Government Business shall have precedence this day."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා
## அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்
MINISTERIAL CONSULTATIVE COMMITTEES

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No.112 of the Parliament and the resolutions adopted by Parliament on 20th June 2018 and 17th July 2018, the Ministerial Consultative Committee on Defence and the Ministerial Consultative Committee on National Policies and Economic Affairs shall consist of eleven (11) Members."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of the Standing Order No.8 of the Parliament and the motion agreed to by Parliament on 20.06.2018, the hours of sitting of Parliament of this day shall be 10.00 a.m. to 12.30 p.m and 1.30 p.m. to 7.30 p.m.. At 5.30 p.m. Standing Order No. 8(5) of the Parliament shall operate. At 7.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, න්‍යාය පත්‍රයේ දිනට නියමිත කටයුතු යටතේ අංක 32 යෝජනාව ඉදිරිපත් කිරීමට, ගරු සභානායකතුමා.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය : විගණකාධිපතිවරයාගේ වැටුප හා දීමනා
## அரசியலமைப்பின் கீழான தீர்மானம் : கணக்காய்வாளர் தலைமையதிபதியின் சம்பளம் மற்றும் படிகள்
DETERMINATION UNDER THE CONSTITUTION: SALARY AND ALLOWANCES OF AUDITOR-GENERAL

[පූ.භා. 11.08]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වැනි ව්‍යවස්ථාවට අනුව, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව 2015.11.27 දින එච්.එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපති ලෙස පත් කර ඇත. ඔහුගේ වැටුප 153(2) ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

උක්ත කරුණට අදාළව 2017.12.19 දින මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද යෝජනාව මෙයින් ඉවත් කර ගැනීමට කටයුතු කරන අතර, ජනාධිපතිවරයා විසින් 2017.03.03 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ 2017.03.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ 2017.11.14 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහනට අදාළ 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති එච්.එම්. ගාමිණී විජේසිංහ මහතාට පහත පරිදි වැටුප් හා දීමනා ගෙවීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:-

(අ) 2015.11.27 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව SL - 4 වැටුප් පරිමාණයේ 08 වැනි වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හා තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමට;

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව 2016.01.01 දින සිට වැටුප පරිවර්තනය කිරීමේදී SL - 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමට සහ එම වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට; සහ

(ඇ) එච්.එම්. ගාමිණී විජේසිංහ මහතාගේ අධ්‍යාපන සුදුසුකම්, අත්දැකීම්, සේවා පළපුරුද්ද මෙන්ම පූර්ව සේවාවේ වැටුප ද විශේෂ අවධානයට ලක් කර ඒ මහතාට 2017.03.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඔහුට පමණක් පෞද්ගලික වන සේ, විගණකාධිපති තනතුරට අදාළ වැටුප් හා දීමනාවලට අමතරව මාසිකව රු. 50,000/- ක විශේෂ දීමනාවක් ලබා දීම.

ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව අනුව, විගණකාධිපති එච්.එම්. ගාමිණී විජේසිංහ මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*ඛිනා එවුත්තියම්පප්පෙට්‍රත්තු.*
*Question proposed.*

[පූ.භා.11.09 ]

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ස්වාධීන විගණන කොමිසමක් ඇති කරනවාය කියා අපේ රජය බලයට පත් වන අවස්ථාවේ පොරොන්දුවක් දුන්නා. එසේ විගණන කොමිසමක් ඇති කිරීමට සිදු වුණේ, අපේ රටේ පවතින රාජ්‍ය විගණන ක්‍රියාවලියේ නිරවද්‍යභාවය සනාථ කර ගැනීමට, ඒ වාගේම විගණන ක්‍රියාවලිය අවසානයේ ලැබෙන ප්‍රතිඵලය, එහි නිගමන, නිරීක්ෂණ සැබෑ ලෙසම යථාවත්ව ක්‍රියාත්මක කර ගැනීමට විගණන ක්‍රියාවලිය තුළ තිබුණු ශක්තිය ප්‍රමාණවත් නොවුණු නිසායි. හපන්න පුළුවන් වුණාට, හපන්න අවශ්‍ය කරන දත් තිබුණේ නැහැ; ශක්තිය තිබුණේ නැහැ. එම නිසා ජනතාවගේ අරමුදල්, රාජ්‍ය අරමුදල්, රාජ්‍ය ආයතන විගණනය කිරීම හරහා හෙළි වන අඩු පාඩු, ප්‍රතිපත්තිය පිළිබඳ අඩු පාඩු, වංචා දූෂණ පිළිබඳ නිරීක්ෂණය කළ විට එම නිරීක්ෂණවලට වටිනාකමක් ලැබෙන බලවත්, ශක්තිමත් ස්වාධීන ආයතනයක් අවශ්‍ය වුණා. එම නිසා අපේ රජය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වන සංශෝධනය හරහා ස්වාධීන විගණන කොමිසමක් ස්ථාපනය කළා. එම ස්වාධීන විගණන කොමිසමට අවශ්‍ය බලය ලබාදීමට, විගණන කොමිසම ක්‍රියාත්මක වීමට විගණන පනතක් අවශ්‍ය වුණා. එම විගණන පනත ඉදිරිපත් කිරීමේදී, එම පනතේ ඇති බලතල පිළිබඳව විශාල විවාදයක් තිබුණා. විශේෂයෙන්ම රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම පනත සම්බන්ධව ඔවුන්ගේ වටිනා අදහස් ඉදිරිපත් කළා.

කාලයක් ගත වුණත්, එම විගණන පනත් කෙටුම්පත සම්මත කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. මේ රටේ ජනතාවගේ අරමුදල් පිළිබඳ වගකීම තහවුරු කරන ක්‍රියාවලියක් මේ රටේ යථා ලෙසම ස්ථාපනය කර, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර, පාර්ලිමේන්තු පනතකින් සහතික කර, පුරවැසියන්ගේ මුදල්වලට වටිනාකමක් ලබාදෙන්න හැකියාව ලැබීම ගැන අපි රජයක් හැටියට ආඩම්බර වෙනවා. ඒ ගෞරවය අපේ රජයට හිමි විය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ හොඳම රටවලත් රාජ්‍ය මූල්‍ය පාලනයේ අඩු පාඩු සිද්ධ වෙනවා. සමහර රටවල මූල්‍ය පාලනය පිළිබඳ ප්‍රතිපත්තිවල අඩු පාඩුකම් වෙනවා. තවත් අවස්ථාවල රාජ්‍ය මූල්‍ය පාලනය තුළ අකාර්යක්ෂමතාව ඇති වෙනවා. තවත් අවස්ථාවල රාජ්‍ය මූල්‍ය පාලනය තුළ වංචා සහ දූෂණ සිදු වෙනවා. දියුණු රටවලත්, සංවර්ධනය වෙමින් පවතින රටවලත්, අපේ රට වාගේ මධ්‍ය ආදායම් ලබන රටවලත් මේවා සිද්ධ වෙනවා. මේ දේවල් වළක්වා ගන්න -ඒ සඳහා වන නිවැරැදි ප්‍රතිපත්තිය හැකිතාක් දුරට සකස් කර ගන්න- කාර්යක්ෂමතාව ඉහළ නංවා ගන්න, ඒ වාගේම මූල්‍ය පාලනය තුළ වංචා සහ දූෂණ වළක්වා ගන්න අවශ්‍ය කරන ඒ ශක්තිය ලබාදෙන රාජ්‍ය යන්ත්‍රණය හඳුන්වා දීම ගැන අපි සතුටු වෙනවා. ඒ පිළිබඳව අප තව බොහෝ දේ කළ යුතුව තිබෙනවා.

රාජ්‍ය මූල්‍ය ගැන වග කියන ප්‍රධාන නිලධාරියා විගණකාධිපතිතුමායි. විගණකාධිපති ධුරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර තිබෙනවා. එතුමා පත් කිරීමේ ක්‍රමවේදය වාගේම, එතුමා ඉවත් කිරීමේ ක්‍රමවේදයත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර තිබෙනවා. එම නිසා විගණකාධිපතිවරයකු පත් කිරීමේදී දක්ෂතම හා ස්වාධීන නිලධාරියකු පත් කරන්න හැකියාව ලැබෙනවා. ඒ වාගේම එම ධුරය ස්වාධීන නිසා එම නිලධාරියාට තමන්ගේ විශ්‍රාම යාම තෙක් පූර්ණ ධුර කාලයේ කිසිදු බාධාවකින් තොරව කටයුතු කිරීමට අවශ්‍ය ආරක්ෂාව ලබා දී තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකුට වාගේ, අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයකුට වාගේ, නීතිපතිවරයාට වාගේ, විගණකාධිපතිවරයාටත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂාව ලබා දී තිබෙනවා; ස්වාධීනත්වය ලබා දී තිබෙනවා. භය නැතිව කටයුතු කරන්න එතුමාට ඒ අවකාශය සලසා දීම ඉතාම අවශ්‍යයි.

විගණකාධිපතිවරයා පසුගිය කාලයේ තමන්ගේ ව්‍යවස්ථාපිත වගකීම් ඉෂ්ට කරන ආකාරය අපි දැක්කා. විගණකාධිපතිවරයාගේ රාජකාරිය පිළිබඳව විවිධ අයට විවිධ මත තිබෙන්න පුළුවන්; ඔහුගේ චෘත්තීමය නිගමන පිළිබඳ විවිධ මත තිබෙන්න පුළුවන්; ඒ වාගේම ආර්ථික විද්‍යාව පිළිබඳ, ගිණුම්කරණය පිළිබඳ, ප්‍රතිපත්ති පිළිබඳ වාද විවාද තිබෙන නිසා මේ නිගමන පිළිබඳ විවිධ අර්ථ නිරූපණ තිබෙන්න පුළුවන්. නමුත් ඒ තිබෙන බාධක මැඩගෙන ඉදිරියට යන්න අපේ රටේ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ශක්තිය තිබෙනවාය කියා මම විශ්වාස කරනවා. විගණකාධිපති ධුරය සහ විගණන කොමිසම පිළිබඳ ප්‍රශ්නයේදී ස්වාධීනත්වය විතරක් නොවෙයි වැදගත් වන්නේ. එම ධුරයේ නිසි ලෙස කටයුතු කරගෙන යන්න අවශ්‍ය වන ප්‍රායෝගික වාතාවරණය සකස් වෙන්නත් ඕනෑ. එහිදී අප කළ යුතු පළමුවන කාර්යය තමයි, විගණකාධිපතිවරයා ශක්තිමත් කිරීම. ඔහුගේ තනතුර ශක්තිමත් කරන්න ඕනෑ; ඔහුට අවශ්‍ය පහසුකම් දෙන්න ඕනෑ; ඔහුට සාධාරණ වැටුපක් ලබාදෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාවෙන් කරන්නේ, විගණකාධිපතිවරයාගේ වැටුප් සහ දීමනා ශක්තිමත් කිරීමයි. ඒ අනුව එතුමාට රාජ්‍ය සේවයේ තිබෙන වැටුප් තලවලට ගැළපෙන සාධාරණ වැටුපක් ලබා දෙන්න කටයුතු කරනවා. 2015 නොවැම්බර් මාසයේ 27වන දා සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව SL-4 වැටුප් පරිමාණයේ 08වැනි වැටුප් පියවරෙහි පිහිටුවා විගණකාධිපතිතුමාට වැටුප් ගෙවීමට සහ එම තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව 2016.01.01 දින සිට වැටුප පරිවර්තනය කිරීමේදී SL - 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමටත්, එම වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමටත් අපි යෝජනා කර තිබෙනවා. මම තවත් විශේෂ කරුණක් කිව යුතුයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වර්තමානයේ මෙම ධුරය දරන එච්.එම්. ගාමිණී විජේසිංහ මහතාගේ අධ්‍යාපන සුදුසුකම්, අත්දැකීම්, සේවා පළපුරුද්ද මෙන්ම

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

පූර්ව සේවාවේ එතුමා ලැබූ වැටුපද විශේෂ අවධානයට ලක් කර, 2017.3.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ඔහුට පමණක් පෞද්ගලික වන සේ, විගණකාධිපති තනතුරට අදාළ වැටුප් හා දීමනාවලට අමතරව ඒ මහතාට රුපියල් 50,000ක මාසික විශේෂ දීමනාවක් ලබාදීමටත් යෝජනා කර තිබෙනවා.

මීට කලින් මේ යෝජනාව ඉදිරිපත් කර පසුව ඉවත් කර ගත්තේ, මේ තුන්වන කාරණය වන රුපියල් 50,000ක අමතර දීමනාව පිළිබඳ කැබිනට් තීරණයේ තිබුණු කාරණා අන්තර්ගත කිරීම සඳහායි. එහෙම නැතුව වෙන කාරණයක් නිසා නොවෙයි. එම නිසා අපි සතුටු වෙනවා, වර්තමාන විගණකාධිපතිතුමා පමණක් නොව, එතුමාගෙන් පසු මේ ධුරය දරන විගණකාධිපතිවරුන්ටත් ගෞරවාන්විත, ප්‍රමාණවත් වැටුපක් ලබා ගැනීමට මෙම යෝජනාව හරහා ඉඩ සැලසීම සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වාධීනත්වය ඇති කළත්, විගණකාධිපතිතුමාගේ වැටුප් සහ දීමනා වැඩි කළත්, විගණකාධිපති දෙපාර්තමේන්තුවට තිබෙන කාලීන වගකීම් ඉටු කිරීමට නම් විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කළ යුතුව තිබෙනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුව පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේත්, ඒ වාගේම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේත් -ඒ සියල්ලගේම- කටයුතුවලදී අපට පෙනෙන දෙයක් තිබෙනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සේවය කරන අයගෙන් සියයට 90කටත් වඩා ගණකාධිකාරිවරුන් ලෙස වෘත්තීය සුදුසුකම් ලැබූ අය තමයි ඉන්නේ. නමුත් විගණනයේදී ගණකාධිකාරිවරුන්ගේ සේවය මූලිකව සැලකුවාට අද ලෝකයේ විගණනයට අදාළ විවිධ මිනුම් දඬු තිබෙනවා. උදාහරණයක් විධියට අද තිබෙනවා, "value for money" කියන එක. ඒ කියන්නේ, රජයේ මුදල්වලට කරන ආයෝජනයට ප්‍රමාණවත් ඵලදායිතාවක් තිබෙනවාද කියන ප්‍රශ්නය. මේ "value for money" ප්‍රශ්නය ආවාම එතැන තිබෙන්නේ ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක්, එතැන තිබෙන්නේ විද්‍යාත්මක දැනුම හෝ වෙනත් තාක්ෂණික දැනුම පිළිබඳ ප්‍රශ්නයක්. එහෙම නැත්නම් ආර්ථික විද්‍යා මූලධර්ම පිළිබඳ ප්‍රශ්නයක්. එවැනි අවස්ථාවක ගිණුම්කරණය පිළිබඳ විශේෂඥතාවක් සහ වෘත්තීයභාවයක් තිබූ පමණින් ඒ රාජකාරි නිවැරදිව ඉටු කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැහැයි කියන කාරණය අපට අවස්ථා ගණනාවකදී පෙනී ගිහින් තිබෙනවා. එම නිසා විගණකාධිපති දෙපාර්තමේන්තුව අලුත් තත්ත්වයකට පත් වෙලා කොමිසමක් බවට පත් වෙලා ශක්තිමත් වන මේ මොහොතේ, විගණකාධිපති දෙපාර්තමේන්තුවට ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂඥයෙක් -ඒ කියන්නේ අඩු ගණනේ ආචාර්ය උපාධියක්වත් තිබෙන්න අවශ්‍යයි.-, ඒ වාගේම ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂඥ සුදුසුකම් තිබෙන අය, ඒ වාගේම වෙනත් විද්‍යාත්මක ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥ සුදුසුකම් තිබෙන අය පූර්ණ කාලීනව බඳවා ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. මේවා නොකළොත් මේ නිගමනවලට පැමිණීමේදී, විශේෂයෙන්ම යම් යම් විශේෂඥභාවයක් අවශ්‍ය වන ක්ෂේත්‍රවල ප්‍රතිපත්තිමය නිගමනවලට පැමිණීමේදී දෝෂ මතු වන්නට පුළුවන්.

මේ තත්ත්වය නිසා විශේෂයෙන්ම අලුත් විගණන පනත අනුව රජයේ සේවකයන් වෙත විශාල බරක් පැටවෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම නිසා මම යෝජනා කරන්නට කැමැතියි අපේ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ ඉදිරි පියවරක් හැටියට, වෙනත් වෘත්තීන්වල විශේෂඥයන්ගේ සහාය ලබා දීම ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ රාජ්‍ය පාලනය පිළිබඳ යහ පාලන මූල ධර්ම මහ පොළොවේ ක්‍රියාත්මක වෙද්දී අපේ රටේ නැති විප්ලවයක් මවන්නට, නැති විප්ලව ඇති කරන්නට, නැති ප්‍රශ්න ඇති කර මහ පොළොවේ අලුත් ගැටලු නිර්මාණය කරන්නට විවිධ උත්සාහයන් ගන්නවා. අපි දැක්කා, පසු ගිය බදාදා මහා ජන ගහක් කොළඹට ගෙනැල්ලා පොලීසිය සහ හමුදාව සමඟ ගැටුම් ඇති කර, නීතියක් නැති තත්ත්වයක් කොළඹ නගරයේ ඇති කර, ජීවිත කිහිපයක් බිලි අරගෙන, -ඒ ලේවලින් බලය ලබන්නට- රටේ ආර්ථිකයේ කේන්ද්‍රස්ථානය, සංචාරක කර්මාන්තයේ කේන්ද්‍රස්ථානය වන කොළඹ නගරයේ අනාරක්ෂිත තත්ත්වයක් නිර්මාණය කර මේ රටේ ආර්ථිකය කඩා ඉහිරුවන්නට දැවැන්ත උත්සාහයක් ගත්ත බව. ඉතාමත්ම බුද්ධිමත්ව සහ ඉවසීමෙන් කටයුතු කර අපේ රට තුළ ඇති විය හැකිව තිබූ ලේ වැගිරීමක් වළක්වා ගන්නට කටයුතු කිරීම ගැන මම අපේ රටේ පොලීසියට, හමුදාවට සහ බුද්ධි අංශවලට ස්තුතිවන්ත වෙනවා.

ව්‍යාජ ප්‍රශ්න මවන උද්ඝෝෂකයන්ට අවශ්‍ය වුණේ ලේ, මළ මිනී සහ ආර්ථිකය කඩා ඉහිරවීමයි. හැබැයි, ඒ විනාශය වළක්වා ගන්නට අපේ රජය සමත් වුණා, අපේ රජයේ දක්ෂ නිලධාරීන් සමත් වුණා. පසුගිය බදාදා වුණු සිදු වීම දිහා බලලා ඒ අසාර්ථකත්වය දැකලා හිනාවෙන අතරේ, සන්තෝෂ වෙන අතරේ, උපහාසයට ලක් කරන අතරේ මේ විනාශය වළක්වා ගන්නට ප්‍රඥාවන්ත ලෙස කටයුතු කළ පොලිස් දෙපාර්තමේන්තුවට, ආරක්ෂක හමුදාවන්ට සහ බුද්ධි අංශවලට මාගේ සතුට පළ කරන්නට, මාගේ ස්තුතිය පළ කරන්නට මම කැමැතියි. මොකද, රටේ ඉදිරි ගමනට එවැනි දක්ෂ, ප්‍රඥාවන්ත රජයේ සේවකයන් අවශ්‍යයි. ඒක පක්ෂ දේශපාලනය පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. එම නිසා අපේ රටේ අනාගතය පිළිබඳ වගකීම මේ රාජ්‍ය අංශයට පැවරෙනවා. අපේ රජය විශ්වාස කරනවා මේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම ගැන. අපි බලාපොරොත්තු වෙනවා විගණන කොමිසම ශක්තිමත් කර ඒ හරහා අල්ලස් හෝ දූෂණ පිළිබඳ සොයා බැලීම් කර ඒ හරහා සොයා ගන්නා කරුණු මත මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්න, අපේ රටේ විශේෂ අධිකරණ ක්‍රියාත්මක කරන්න.

ඒ අධිකරණ ක්‍රියාත්මක වෙන්නේ කැලෑ නීතියට අනුව නොව අපරාධ නඩු විධාන සංග්‍රහය අනුව, සාක්ෂි ආඥාපනත අනුව, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවයි. ශක්තිමත්, ස්වාධීන අධිකරණ හරහා ඉක්මනින් යුක්තිය පසිඳලන්න අපි බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි තේරුම් ගන්න ඕනෑ එක කාරණයක් තිබෙනවා. අපේ රටේ යුක්තිය ඉටුවීම පිළිබඳ රටේ පුරවැසියෝ තුළ විශාල කම්පාවක්, සැකයක් තිබෙනවා. සමාජ සාධාරණත්වය සිදු වෙන්නේ නැහැයි කියා ඔවුන් තුළ හැඟීමක් තිබෙනවා. අපේ රටේ පාර්ලිමේන්තුව රටේ පුරවැසියෝ වෙනුවෙන් වග කීම ඉෂ්ට කරන්නේ නැහැයි කියා පොදු හැඟීමක් තිබෙනවා. UNP වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙන්න පුළුවන්, JVP වෙන්න පුළුවන්, ද්‍රවිඩ ජාතික සන්ධානය වෙන්න පුළුවන්, ඔවුන් පක්ෂයකට බැඳිලා නැති වෙන්න පුළුවන්, ඔවුන්ගේ ඡන්දය මොන පක්ෂයකට දුන්නත්, මේ රට තුළ සමාජ සාධාරණත්වය පිළිබඳ -social justice පිළිබඳ- ප්‍රශ්නයක් තිබෙනවා.

රටේ පුරවැසියෝ ඍජුව සහ වක්‍රව තමන්ගේ බදු රජයට ගෙවනවා. පුරවැසියෝ ආරක්ෂා කරන්න රජය බැඳිලා සිටිනවා. හැබැයි, අද සමාජය තුළ සමාජ සාධාරණත්වය පිළිබඳ ලොකු සැක සංකා තිබෙනවා. ඒ නිසා තමයි, රුපියල් ලක්ෂ හයහමාරක් වියදම් කර පළාත් සභාවට පුටුවක් ගෙනෙනකොට ඒ ගැන මිනිස්සු කෝපයට පත් වෙන්නේ; ඒක නිසා තමයි ගණපූරණය නොමැතිව පාර්ලිමේන්තුවේ කටයුතු අඩාල වෙනකොට අපේ රටේ පුරවැසියෝ කේන්ති ගන්නේ; ඒක නිසා තමයි අපේ රටේ පුරවැසියෝ මේ රටේ අධිකරණවල නඩු කටයුතු ප්‍රමාද වෙනකොට, යුක්තියක් ඉටු නොවන බව පෙනෙනකොට ඒ පිළිබඳව දැඩි ලෙස කම්පා වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සාධාරණත්වය පිළිබඳ ප්‍රශ්නය පක්ෂ පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. මෙහි මීට වඩා ගැඹුරට යන්නට ඕනෑ. අපට පෙනෙන මෑත ඉතිහාසය තුළ අපේ රටේ ලේ වැගිරීම් විශාල ප්‍රමාණයක් සිද්ධ වුණා. ඒවා සිද්ධ වුණේ, ප්‍රධාන පක්ෂ තමන්ගේ නායකයෝ බස්වලින් සෙනහ ගෙනැල්ලා කළ විප්ලව නිසා නොවෙයි. මේ මහ පොළොවේ ලක්ෂ ගණනක් මිනිස්සු මැරුණා. මේ රටට දරන්න බැරි තරම් ජීවිත ගණනක් මේ මහ පොළොවෙන් අපට අහිමි වුණා. ඒ නිසාම බුද්ධිමත් මිනිස්සු මේ රට අතහැර ගියා. ඒ නිසා මේ රට තුළ අපේ බුද්ධිමතුන් රඳවා ගන්න, මේ රට සාධාරණ රටක් බවට සමාජය ඉදිරියේ ඔප්පු කරන්න, මේ රටේ තරුණ බුද්ධිමත් මිනිසුන්ට මේ රට තුළ කටයුතු කරන්න අවශ්‍ය වාතාවරණය අපි සකස් කරන්නට ඕනෑ. එහි එක් වැදගත් පියවරක් රාජ්‍ය විගණනය පිළිබඳ වග වීම - accountability - තහවුරු කරන ක්‍රියාවලියන් ශක්තිමත් කිරීම. අද අපි එහි එක් පියවරක් තමයි ඉටු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලනඥයෝ විධියට; රජය හැටියට අපට මීට වඩා වග කීමක් තිබෙනවා. මේ ප්‍රශ්න දිහා ගැඹුරට බලලා, ඡන්දය දිනන්නේ කවුද, ඡන්දය පරදින්නේ කවුද කියන කාරණය නොවෙයි වැදගත් වන්නේ. පුරවැසියා දිනවන වැඩ පිළිවෙළකට එකතු වෙන්න අපට යුතුකමක් තිබෙනවාය කියන කාරණය මතක් කරමින් මම නතර වනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[ප.භා. 11.25]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විගණකාධිපතිතුමා නිසි වැටුප් තලයේ පිහිටුවීමට අදාළව ඉදිරිපත් කර තිබෙන යෝජනාවට ජනතා විමුක්ති පෙරමුණේ සභාය පළ කරනු ලබනවා. ඔබතුමාත් දන්නවා, සභානායකතුමා මෙම යෝජනාව න්‍යාය පුස්තකයෙන් ඉවත් කර ගන්නා ලද අවස්ථාවේදීත් අපි මේ ප්‍රශ්නය මතු කළ බව. විගණකාධිපති දෙපාර්තමේන්තුවත්, විගණකාධිපතිවරයාත් රට වෙනුවෙන් කරන ලද වගකීම් මේ ආණ්ඩුවට තීරණාත්මක ගැටලු ඇති කළා. මොකද, මේ ආණ්ඩුවට සම්බන්ධ නිලධාරීන් සහ දේශපාලනඥයන් විසින් කරන ලද මූල්‍ය දූෂණ සම්බන්ධව විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් හෙළිදරව් කිරීම් නිසා. කෙසේ වුවත්, නැවත වතාවක් එතුමා SL- 4 කියන ශ්‍රේණියේ පිහිටුවා එතුමාට අදාළ, අවුරුදු තුනකට ආසන්න කාලයක් ගෙවීම් ප්‍රමාද වී තිබෙන දීමනා ගෙවීමට අදාළව මේ යෝජනාව ඉදිරිපත් කිරීම තුළින් රටේ විගණන ක්‍රියාවලියට යම් ශක්තියක් ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. මොකද, ඒක ගාමිණී විජේසිංහ මහතාට පමණක් නොවෙයි, එතුමාගෙන් පසුව එම තනතුරට එන්න සිටින විගණකාධිපතිවරුන්ටත් බලපාන කරුණක් නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හොඳ දේවල් සියල්ලම එක්කෝ වෙන්නේම නැහැ; නැත්නම් සිදුවීමට බෙහෙවින් ප්‍රමාද වනවා; නැත්නම් ඒවායේ තියෙන හරය දියාරු කරනවා කියලා ඔබතුමාත් දන්නවා. ජාතික විගණන පනත ගේන්න තිබුණේ මේ ආණ්ඩුව බලයට පත් වෙලා දින 100 ඇතුළේදියි. නමුත්, ඒ කාලය තුළ ඒක ගෙනාවේ නැහැ. ඒක ඇති තරම් ප්‍රමාද කරලා ඒ ගෙනෙන්න තිබුණු පනතේ ශක්තියත් යම් ප්‍රමාණයකට අඩු කරලා අවසානයේ තමයි ඒ පනත ගෙනාවේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසානයේදී හෝ ජාතික විගණන පනත ගෙනා එක හොඳ වුණාට, ජනතාවගේ ජනවරමේ හැඟීම තිබෙන වෙලාවේ, නිලධාරීන්ගේ ජවය, උනන්දුව තිබෙන වෙලාවේ, පාලනයක් මාරු වුණාට පසු මිනිසුන් තුළ විශ්වාසය තිබෙන වෙලාවේ එය ගෙනාවා නම් තමයි, ඒවාට අදාළ කරන සංස්කෘතියත්, වැඩ පිළිවෙළත් ව්‍යාප්ත වන්නේ. අද මේ ආණ්ඩුව ලංකා ඉතිහාසයේ දැවැන්තම මූල්‍ය දූෂණය කළ, තනි මූල්‍ය දූෂණය කළ පාලනය බවටත්, ඒ මූල්‍ය දූෂණය ආරක්ෂා කළ ආණ්ඩුව බවටත් පත් වෙලා තිබෙනවා. මීට කලින් පැවැති ආණ්ඩු හැම එකක්ම දූෂණ වංචා කරලා තිබෙනවා. නමුත්, තනිව ගත්තාට පසු විශාලම මූල්‍ය දූෂණය, මහ බැංකුව සම්බන්ධ කර ගත් දූෂණය සම්බන්ධ ආණ්ඩුව බවට මේ ආණ්ඩුව පත් වී තිබෙනවා. එහිදී ඒ දූෂිතයන් ආරක්ෂා කිරීම පිළිබඳව මේ රටේ අග්‍රාමාත්‍යවරයාට සෘජුව චෝදනා එල්ල වී තිබෙනවා. ඒ වාගේම ඒ සම්බන්ධව කටයුතු කරපු කාරක සභාවලට නොයෙකුත් බාධා සිදු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත කිරීම, ජාතික විගණන පනත ඉදිරිපත් කිරීම, විගණකාධිපතිතුමාගේ වැටුප් වැඩි කිරීම හොඳ වුණාට, ඒ හරහාම ශ්‍රී ලංකාවට ලැබිය හැකිව තිබුණු ඒ ජවය එන්නේ නැහැ. ඔබතුමා දන්නවා, යමක් විය යුතු වෙලාවක් තිබෙනවා කියලා. මම මේ කටයුත්ත පහළට දමනවා නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් ඔබතුමාට මම කියන අදහස තේරෙනවා ඇති කියලා මම විශ්වාස කරනවා. මේක ආ යුතු වෙලාවේ නොවෙයි ඇවිල්ලා තිබෙන්නේ. දැන් නිකම් අර කරන්නත් වාලේ කරන තත්ත්වයට තමයි මේ දේ පත් වෙලා තිබෙන්නේ.

මේකත් එක්කම තවත් කරුණු කීපයක් ඉතා ඉක්මනින් මතු කරන්න මම කැමැතියි, වෙලාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙන නිසා. විශේෂයෙන්ම ඊයේ මේ පාර්ලිමේන්තුව විනාඩි 13කින් පසුව කල් තියන්න සිද්ධ වුණා. ඒ සම්බන්ධයෙන් මම ඉතා කනගාටු වනවා. පාර්ලිමේන්තුව රැස්වන දවසකට යන වියදම කොපමණද කියලා රටේ ජනතාවට විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් කියන්න ඕනෑ. මම ඇත්තටම විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් එම ඉල්ලීම කරනවා. ඒ වියදම සම්බන්ධයෙන් අපි පත්තරවලින් එක එක ගණන් දකිනවා. පාර්ලිමේන්තුව රැස්වන දවසකට පොලිස් නිලධාරීන් දහස් ගණනක් ගෙන්වනවා; නිලධාරීන් දහස් ගණනක් එනවා. එහෙම තිබියදී තමයි, ඊයේ පාර්ලිමේන්තුව කල් තබන්නේ. ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මන්ත්‍රීවරු විධියට අපි හයදෙනාගෙන් හතරදෙනෙක් ඊයේ මේ සභාවේ රැඳී සිටියා. නමුත්, මගේ දැනීමේ හැටියට ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් සිටියේ ඉතා සුළු මන්ත්‍රීවරු ප්‍රමාණයක්. කාටත් වගකීමක් තිබෙන බව ඇත්ත. නමුත්, විවිධ හේතු නිසා පාර්ලිමේන්තුවට කෙරෙන මුදල් නාස්තිය මහවිශාල බරක් වෙලා තිබෙනවා. විගණකාධිපතිතුමා අලුත් වැටුප් තලයක පිහිටුවීමත් එක්කම එතුමා ඇතුළු විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් මම ඉල්ලා සිටිනවා, පාර්ලිමේන්තුවේ රැස්වීම් දිනකට යන වියදම ගැන රටට හෙළිදරව් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි කරුණ මෙයයි. මට පැහැදිලි නැහැ, විගණන කොමිසමෙන් මේ බලතල ලැබී තිබෙන්නේ කෙසේද කියලා. නමුත්, හැම විටම අපට සිද්ධ වී තිබෙන්නේ සිදු වූ වංචා දූෂණ පිළිබඳව පශ්චාත් මරණ පරීක්ෂණ කරන්නයි.

ඒක හම්බන්තොට වරාය වුණත්, මත්තල ගුවන්තොටුපොළ වුණත්, මේ ආණ්ඩුවෙන් කරන කුමන හෝ ව්‍යාපෘතියක් වුණත් ඒ මඟින් හොරකම් කරලා, නාස්ති කරලා, අධික වියදම් කළාට පසුව

[ගරු බිමල් රත්නායක මහතා]

තමයි විගණනය කරන්න වෙන්නේ. ඒ නිසා මුල් කාලීනව අපේ යෝජනාවක් තිබුණා, රුපියල් මිලියන 100කට වැඩි -අඩුම ගණනේ රුපියල් මිලියන 50කට වැඩි,- මුදලක් යෙදවීමට කැබිනට් අනුමැතිය ලැබුණු ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර එම ව්‍යාපෘතියේ සංකල්පය සහ සැලැස්ම අනුව value for money කියන මුදලට අදාළ වටිනාකම ලැබෙනවාද කියන එක පිළිබඳ පූර්ණ විගණනයක් කරන්න. ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර විගණනයක් කරන්න, කොන්ත්‍රාත්කරුවන්ට එය පැවරීමට පෙර විගණනයක් කරන්න බලය විගණන කොමිසමට ලැබිය යුතු වෙනවා. එසේ නැතිව පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීමෙන් කිසිම තේරුමක් නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම දන්නවා, හැම ව්‍යාපෘතියක්ම මෙහෙම කරන්න බැහැ කියලා. මොකද, ඊට පසුවයි ඒවා දූෂණ, වංචා පැත්තට යන්නේ. ඒ දූෂණ, වංචාවට අදාළ පරීක්ෂණ කරලා ඒ දූෂිතයන්ගෙන් මුදල් අය කිරීමක් අපේ රටේ තවම වෙලා නැහැ. දූෂිතයෝ භය වෙලා ගිහිල්ලා මුදල් බඳින ඒවා තිබෙනවා. උසාවියකින් මුදල් අරගෙන දීලා නැහැ. ඒ නිසා ඒ පරීක්ෂණ වෙන්නේ නැහැ. ඒ නිසා තමයි අපි කියන්නේ මහා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඒවා විගණනය කරන්න අවස්ථාව ලබා දිය යුතුයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Budget Office එකක් පටන් ගන්නවා කියලා මෙම ආණ්ඩුව කිව්වා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති එම්.ඒ. සුමන්තිරන් මැතිතුමාට සහ එම කාරක සභිකයන්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් සුවිශේෂී කරුණු ගණනාවක් ඉදිරියේදී හෙළිදරව් වෙයි කියලා අපි හිතනවා. මම ඒ කරුණු කියන්න යන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ඉතා පැහැදිලිව පෙනෙන දෙයක් තමයි ඉදිරිපත් කරන අය වැයත්, ඉදිරිපත් කරන සැලසුම්වලත්, වෙන දේත් අතර ආලෝක වර්ෂයක විතර පරතරයක් තිබෙනවා කියන එක. කියන්නේ, කතරගම යනවා කියලා සමහර විට යන්නේ පුත්තලමේ. සම්පූර්ණ වෙනසක් තිබෙනවා. Budget Office එකක් ආරම්භ කරනවා කියලා ඡන්ද ගත්තා. හැබැයි. Budget Office එක තවම නැහැ. ඒවා නිකම් අග්‍රාමාත්‍යතුමාගේ සුන්දර කථා විතරයි; විනෝදාංශයක් වශයෙන් කියන කථා විතරයි. එතුමා පත්වී අවුරුදු තුනහමාරක් ගිහිල්ලාත් ඒවා කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කාරණාව, උත්සව වියදම් තිබෙනවා කියලා ඔබතුමාත් දන්නවා. විගණකාධිපති දෙපාර්තමේන්තුව පැත්තෙන් ගත්තොත්, අද රටේ දැවැන්ත ප්‍රශ්නයක් වෙලා තිබෙන උත්සව වියදම් විගණනය කිරීමේ දුෂ්කරතාවක් තිබෙනවා. මොකද, ජනාධිපතිවරයා එන උත්සවයක, අග්‍රාමාත්‍යවරයා එන උත්සවයක වියදම් සිදු වන්නේ ආයතන අතිවිශාල ප්‍රමාණයකිනුයි. විශේෂයෙන්ම පොලිසිය සහ හමුදාවෙන් යන වියදම් ප්‍රමාණය ගණනය කරන්නම බැහැ. ඊට අමතරව වැය වන මහවිශාල වියදම් ප්‍රමාණයක් තිබෙනවා. ඔබතුමාත් දන්නවා, පත්තර වාර්තාවල පැහැදිලිව මේ ගැන සඳහන් වෙලා තිබෙනවා කියලා. ජනාධිපතිවරයාගේ දියණියට අයත් ප්‍රචාරක සමාගම් තිබෙනවා. ඒ ප්‍රචාරක සමාගම්වලින් තමයි ජනාධිපතිතුමාගේ උත්සවවලින් වැඩි ප්‍රමාණයක් සංවිධානය වෙන්නේ කියලා තමයි පුවත්පත් වාර්තා කරන්නේ. පුවත්පත්වල සඳහන් වනවා පමණක් නොවෙයි, අපටත් ඒ ගැන අදහසක් තිබෙනවා. අපි දන්නේ නැහැ, අග්‍රාමාත්‍යවරයාගෙත් එහෙම තිබෙනවාද කියලා. එතුමාගේ පවුලේ අයගේ නොවෙන්න පුළුවන්, එතුමන්ගේ මිතුරන්ගේ එහෙම තිබෙන්න පුළුවන්. මේ ප්‍රචාරක වියදම් සඳහා වැය වන මුදල අතිවිශාලයි. මම පෙරේදා මේ පාර්ලිමේන්තුවේදීත් ප්‍රකාශ කළා, ජනාධිපතිතුමා මොරගහකන්ද ජලාශය හතර වතාවක් විවෘත කිරීම පිළිබඳ විගණනයක් කළ යුතුයි කියලා. මොකද, මොරගහකන්ද ජලාශය හතර වතාවක් විවෘත කරලා තිබෙනවා. එතකොට උත්සවවලට යන වියදම විගණනය වෙන්නේ කොහෙන්ද? දැන් බලන්න, ඔබතුමන්ලාගේ ගම් පෙරළියේ ප්‍රචාරක වියදම්වලට මගේ දැනීමේ හැටියට රුපියල් බිලියන 10ක් වෙන් කරලා තිබෙනවා. අදත් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා. ඒ, මොකටද? කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්පෙරළියේ සමාරම්භක උත්සවයට අදාළ වියදම් වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදන සැපයීම රුපියල් මිලියනයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අතිරේක ප්‍රතිපාදනයි. ඇත්ත ප්‍රතිපාදනය රුපියල් මිලියනය නොවෙයි. අපි දන්නවා, මේවාට ප්‍රචාරයත් අවශ්‍යයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මගේ වෙලාව ගන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභානායකතුමාට දෙන්න මට වේලාව නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩියක් පමණයි තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක තමයි. මට විනාඩියයි තිබෙන්නේ සභානායකතුමා.

මම මේ කියන්නේ ප්‍රචාරය කරන්න එපා කියලා නොවෙයි. මගේ කථාවේ එතැනින් අල්ලන්න එපා. ඒකට නේ සභානායකතුමා නැඟී සිටියේ. මම කියන්නේ එහෙම නොවෙයි. නමුත්, අපට රටක් වශයෙන් දරන්න පුළුවන් වියදම් තිබෙනවා. හැබැයි, මේවාට කිසිම guideline එකක්, කිසිම සීමාවක්, විගණනයක් නැහැ. පසුගිය අවුරුදු 5, 10 ඇතුළත මේ රටේ දැවැන්ත රාජ්‍ය උත්සව පැවැත්වුණා. ඒ රාජ්‍ය උත්සව 10ක්, 15ක් අරගෙන බැලුවොත් කොපමණ අනවශ්‍ය වියදමක් කර තිබෙනවාද කියලා මේ රටේ ජනතාවට -මේ රටට- කියන්න කියලා මම විගණකාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අජිත් පී. පෙරේරා ඇමතිතුමා ඉදිරිපත් කළ අදහස මම පිළිගන්නවා. විගණන කොමිසම, පරිපාලන සේවයේ සහ commerce අංශයේ auditing, accounting job එකක් පමණක් නොවෙයි. අද ලොකුම හොරකම් වෙන්නේ Technical Evaluation Committeesවල. ඒකේ සෞඛ්‍ය ඇමතිතුමා හිටියත්, හැම ආණ්ඩුවකම ලොකුම හොරකම් සිදු වෙන්නේ මොකෙන්ද? ඒ, Technical Evaluation Committeesවලින්.

මේ MRI machine එකද හොඳ, අර MRI machine එක ද හොඳ කියලා කියන්න accountancy කරපු කෙනකුට තේරෙන්නේ නැහැ. Structural drawing එකක් බලන්න chartered accountant කෙනකුට තේරෙන්නේ නැහැ. ඒ නිසා මේ ආධානග්‍රාහී, පරණ අදහස වෙනස් කරලා කරුණාකර, Audit Service Commission එක, Auditor-General's Department එක

ඉංජිනේරු, සෞඛ්‍ය, වෛද්‍ය, තාක්ෂණික සේවාවන්වලින් පුරවන්න ඕනෑ. හොංකොං වාගේ නගරවල, සිංගප්පූරුව වාගේ දූෂණ අඩුයි කියලා සලකන රටවල් ඇතුළු ගොඩක් රටවල විගණකාධිපති දෙපාර්තමේන්තුව CAS pass අයගේත්, commerce කරපු අයගේත් බුදලයක් කරගෙන නැහැ. ඒක මෝඩ අදහසක්. එහෙම දෙයක් හිතන්නවත් බැහැ. අපි ගරු ඇමතිතුමාගේ අදහස පිළිගන්නවා. ඒ වාගේම විගණන සේවා කොමිසමෙන් සහ ආණ්ඩුවෙන් අපි ඉල්ලා සිටිනවා, වහාම ක්‍රියාත්මක වන පරිදි උගත්, වෘත්තීයමය සුදුසුකම් තිබෙන, වෙනත් ක්ෂේත්‍රවල පළපුරුද්ද තිබෙන අය මේවාට බඳවා ගන්න කියලා. මම නම් කියන්නේ හමුදා බුද්ධි අංශයේ විශ්‍රාම ගිය අය පවා බඳවා ගන්න ඕනෑයි කියලායි. මොකද, මේ සමහර ඒවාට එවැනි investigative knowledge එකක් තිබෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසාන කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පොලීසියේ, CID එකේ හිටපු උසස්, වැදගත් නිලධාරීන් මේවාට බඳවා ගන්න ඕනෑ. එහෙම නැතිව මහා පරිමාණ හොරකම් අල්ලන්න බැහැ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සියලු අංශ ශක්තිමත් කරන එක හොඳයි. ඒ වාගේම විගණකාධිපති දෙපාර්තමේන්තුවට ස්වාධීනත්වය දෙන එකත් හොඳයි. ඒ විතරක් නොවෙයි. මා වගකීමෙන් කියනවා, විගණකාධිපති දෙපාර්තමේන්තුවේත් දූෂිත නිලධාරීන් ඉන්නවා කියා. මට ඉහළ මට්ටමේ නිලධාරීන් සම්බන්ධයෙන් තොරතුරු ලැබිලා නැහැ. නමුත්, මැද මට්ටමේ දූෂිත නිලධාරීන් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වයඹ පළාතේ මාර්ග සංවර්ධනය ඇතුළේ ලක්ෂ ගණනින්, කෝටි ගණනින් කෙරෙන දැවැන්ත වංචා පිළිබඳව මම විගණකාධිපති දෙපාර්තමේන්තුවට පැමිණිලි කළා. ඒ පැමිණිල්ලට දායක වුණු, මේ වංචාවට විරුද්ධ වුණු ඒ ප්‍රදේශයේම ඉන්න පුද්ගලයාට අද මොකක්ද වෙලා තිබෙන්නේ? හොරකම අල්ලන්න කියලා පැමිණිලි කරපු, වයඹ පළාතේ සමහර පුද්ගලයින්ට, සමහර සමාගම්වලට විරුද්ධව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වයඹ පළාතේ ඉන්න දූෂිත පුද්ගලයන් අද කටයුතු කරනවා. ඒ නිසා ගාමිණී විජේසිංහ මැතිතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා ඔබතුමාගේ දෙපාර්තමේන්තුව යටතේ ඉන්න දූෂිත නිලධාරිනුත් වහාම හෙළිදරවු කරන්නය කියලා. එහෙම නැති වුණොත් විගණනය බිඳ වැටෙනවා කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මගේ වේලාවෙන් නම් අඩු කරන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ප්‍රචාරක කටයුතු සම්බන්ධව ප්‍රකාශයක් කළා. ගරු මංගල සමරවීර ඇමතිතුමා අපට පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා, ගම්පෙරළිය වැඩසටහනට පෞද්ගලික අංශයෙන් සියයට 75ක දායකත්වයක් ලැබෙනවා කියලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
නැහැ, මේක දිගින් දිගට ගෙන යන්න පුළුවන්කමක් නැහැ. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීමක්]

**ගරු බිමල් රත්නායක මහතා**
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගේ ප්‍රශ්නයට පිළිතුරු දුන් නිසායි මා මේ කාරණය මතු කරන්නේ.

ගරු ඇමතිතුමනි, මේ වැඩසටහන්වල ප්‍රචාරක වියදම් දරන්නේ පෞද්ගලික අංශයෙන් කියලා ද ඔබතුමා කියන්නේ? [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමා කිව්වා, මොනරාගල තිබුණු වැඩසටහනේදීත් ප්‍රචාරක වියදම් සියයට 75ක් - [බාධා කිරීමක්]

**ගරු බිමල් රත්නායක මහතා**
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දන්නා දේ තමයි ගොඩක් ව්‍යාපාර බිඳ වැටිලා තිබුණාට ප්‍රචාරක සමාගම්වල ලාභ උතුරනවා-[බාධා කිරීමක්]

[පූ.භා. 11.39]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ විගණන කොමිසමක් ඇති කිරීම පිළිබඳවත්, රජයේ විගණකාධිපතිතුමාගේ වැටුප් මීට වඩා වැඩි ප්‍රමාණයකින් හෝ වර්ධනය වීම පිළිබඳව අපේ කිසිදු විරෝධතාවක් නොදක්වන අතර, වෘත්තීය මට්ටමේ රාජ්‍ය සේවකයින්ගේ වැටුප් පිළිබඳ මීටත් වඩා වැඩි අවධානයක් යොමු විය යුතුයි කියා අපි විශ්වාස කරනවා. රජය යටතේම තිබෙන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් වැනි ඉතා කුඩා ක්ෂේත්‍රයක් කරන අයට ගෙවන වැටුප ගැන

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

බැලුවොත්, යහපාලන රජය බලයට පත් වීමෙන් පසු ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් සමාගමේ විධායක තනතුරකට පත් කළ සුරේන් රත්වත්ත මහතාට දවසකට රුපියල් ලක්ෂයකට වඩා වැඩි වැටුපක් ලැබෙනවා. එතුමාට මාසික වැටුප වශයෙන් රුපියල් ලක්ෂ 32ක් ගෙවනවා.

සමස්ත රජය, රාජ්‍ය ආයතන විගණනය කරන විගණකාධිපති වාගේ නොවෙයි. ගුවන් සමාගමක ප්‍රධාන නිලයක් දරන දේශපාලන පත්වීමකට ලක්ෂ 32ක වැටුපක් ගෙවනකොට, අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු තුමන්ලාට, මුළු රට පිළිබඳ වගකීම් දරන කැබිනට් ඇමතිවරුන්ට එසේ නැත්නම් රාජ්‍ය අංශයේ වෙනත් විවිධ ව්‍යක්තිකයන්ට ගෙවන වැටුප් තල, රජය යටතේ තිබෙන රාජ්‍ය සංස්ථාවල වැටුප් තල සමඟ සසඳනකොට විශාල අර්බුදයක් තිබෙනවා. මා දුටුවා, මහජන බැංකුවේ සභාපතිවරයා ලබන වැටුප. ලක්ෂ ගණනින් තමයි වැටුප් ගෙවන්නේ. එතකොට මන්ත්‍රීවරුන්ගේ රුපියල් 54,000 වැටුප නැත්නම් ලක්ෂය පිළිබඳවයි කථාවෙන්නේ. රාජ්‍ය සංස්ථා හා ව්‍යාවස්ථාපිත මණ්ඩලවල වැටුප් ව්‍යුහයන් සමඟ සාපේක්ෂව සැසඳීමේදී රජයේ ඉහළ වගකීම් දරන ව්‍යක්තියමය වශයෙන් සුදුසුකම් ලැබූ අයගේ වැටුප් මට්ටම් පිළිබඳව වැටුප් කොමිසමේ විශේෂ අවධානය යොමු විය යුතුය කියා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය අංශයේ ප්‍රධාන ප්‍රශ්නය මෙයයි. දැන් ගණකාධිකරණ ක්ෂේත්‍රය ගත්තොත්, ඒ පිළිබඳ ප්‍රමාණික අවබෝධයක් තිබෙන කෙනෙක් ලෙස වරලත් ගණකාධිකාරිවරයෙක් -qualified Chartered Accountant කෙනෙක්- වුණාම හොඳ වැටුපක් ලබාගන්න පුළුවන්. අද තරුණ දරුවෝ විවිධ රටවලට ගිහින් අධ්‍යාපනය ලබා එනවා. Master's degree එකක් අරගෙන, ඉංග්‍රීසියෙන් වැඩ කරන්නට පුළුවන්, පරිගණකයෙන් වැඩ කරන්නට පුළුවන් හොඳ ගණකාධිකාරී වරයෙක් ලෙස එළියට එන අවුරුදු විසි හතරක, විසිපහක දරුවෙකුට පෞද්ගලික අංශයේ සමාගමක ගණකාධිකාරීවරයෙක් ලෙස ලක්ෂ දෙකක වැටුපක් ලංකාව ඇතුළේ කරදරයක් නැතිව ලබා ගන්නට පුළුවන්. සමහර වෙලාවට මූල්‍ය කළමනා කරුවෙකුට ලක්ෂ තුනක් හතරක්, ලක්ෂ පහක්, හයක් තමයි පෞද්ගලික අංශයේ වැටුප් වශයෙන් තියෙන්නේ. පෞද්ගලික අංශයේ එවැනි වැටුපක් ගෙවන විට විගණකාධිපති දෙපාර්තමේන්තුව යනාදියට විගණන ක්ෂේත්‍රයට අවශ්‍ය සුදුසුකම් ලැබූ පුද්ගලයන් බඳවා ගැනීම පිළිබඳ ප්‍රශ්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන විගණකාධිපති තුමාගේ කුඩා කාලය, එහෙම නැත්නම් එතුමා උසස් පෙළ හදාරන කාලය, එහෙම නැත්නම් එතුමාගේ විශ්ව විද්‍යාල කාලය, එහෙම නැත්නම් එතුමා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සිටි කාලය පිළිබඳ අනෙක් සියලු දෙනාට වඩා වැඩි අවබෝධයක් මට ඇත කියා මම හිතනවා. එම නිසා මා එතුමාගෙන් බලාපොරොත්තු වෙන්නේ තමන්ගේ ගුරුවරුන්ට, තමන්ගේ විශ්වවිද්‍යාලයට, තමන් දරන තනතුරට අභිමානයක් වන ලෙස, ගෞරවනීය ලෙස, දේශපාලනයට අදාළ නොවන, විගණන ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශන සඳහා පමණක් අවධානය යොමු කරමින් රටට විශාල සේවයක් ලබාදෙයි කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී මේ ගරු සභාව විසින් මුදල් පිළිබඳ අනුකාරක සභාවක් පත් කළා. එම අනුකාරක සභාව සමන්විත වෙන්නේ, බන්දුල ගුණවර්ධන මහතා (සභාපති), ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා, ගරු වී.එස්. රාධාක්‍රිෂ්ණන් මහතා, ගරු අනෝමා ගමගේ මහත්මිය, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, ගරු ඉරාන් වික්‍රමරත්න මහතා, ගරු මුතුසිවලිංගම් මහතා, ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා, ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, ගරු ඊ. සරවනපවන් මහතා, ගරු තාරක බාලසූරිය මහතා යන අයගෙනුයි. මේ අනුකාරක සභාවේ වාර්තාව මේ සභාවට පිළිගන්වා තිබෙනවා. අපේ අදහස වුණේ, ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනම පරිච්ඡේදයක් විගණකාධිපතිවරයා සඳහා වෙන් විය යුතුය කියායි. ඒ අනුව අපේ ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා යෝජනා කළ නිර්දේශ විශාල ප්‍රමාණයක් ඒ අනුකාරක සභාවේ සභාපතිවරයා වශයෙන් මා විසින් අනෙක් සියලුම සාමාජිකයන්ගේ පූර්ණ දායකත්වයෙන් ඉදිරිපත් කර තිබෙනවා. මේ අවස්ථාවේදී ඒ පිළිබඳ කොටස් කිහිපය මම කියවන්නට කැමතියි. විගණන විෂය පථය පිළිබඳව හා ඒ ඒ ක්ෂේත්‍ර පිළිබඳ විශාල පරිචයක් ලැබූ පුද්ගලයන්ගේ අදහස් උදහස් දැනගෙන තමයි මේ නිර්දේශ ටික අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනුකාරක සභාවේ වාර්තාව ලෙස ඉදිරිපත් කළේ. දැනට විගණනය තිබෙන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උප කොටසක් වශයෙනුයි. එම නිසා එම වාර්තාවේ අපි සඳහන් කර තිබෙනවා, "රජයේ විගණනය රජයේ මූල්‍යවල උප කොටසක් වශයෙන් නොව වෙනමම පරිච්ඡේදයක් යටතේ පෙන්වීම අවශ්‍ය බව නිර්දේශ කෙරේ" කියා.

උප කොටසක් වශයෙන් නොව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිසි ලෙස මේ රටේ හැදෙන අවස්ථාවේදී විගණනය වෙනම කොටසක් ලෙස තිබිය යුතුයි කියලා නිර්දේශ කර තිබෙනවා.

එහි 153(1) වගන්තියට අපි සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා, "සුදුසුකම්ලත් විගණකවරයෙකු, පිළිගත් ව්‍යක්තිකයෙකු විය යුතු වුවද, ගිණුම්කරණ ව්‍යක්තිය පමණක් ඒ සඳහා පදනම් වීම සුදුසු නොවන අතර, ව්‍යක්තිකයෙකු වීම පමණක් ව්‍යවස්ථාව තුළ ඇතුළත් කිරීම යෝග්‍ය වේ. එනම්, "සුදුසුකම්ලත් ව්‍යක්තිකයෙකු වන විගණකාධිපතිවරයෙකු සිටිය යුත්තේය" යනුවෙන් (ව්‍යක්තිකයෙකු යන වචනය අර්ථ නිරූපණය කිරීම යෝග්‍ය වේ.)" කියලා. මේ නිර්දේශය ගැන තමයි අපේ අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා කිව්වේ. ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, මූල්‍ය කළමනාකරණය, ඉංජිනේරු විද්‍යාව, වෙනත් ව්‍යක්තීයමය අංශ පිළිබඳ පුළුල් අවබෝධයක් හා දැක්මක් සහිත තැනැත්තන් සිටිය යුතුය කියන එක අපි නිර්දේශ කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මම ඉක්මනට මේ කරුණු ටික කියන්නම්. 153(3)(ඇ) වගන්තියට අපි සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා, "වයස අවුරුදු 60 වෙනුවට 'ධුර කාලය අවුරුදු 07 වන්නේය' යනුවෙන් සංශෝධනය කිරීම යෝග්‍ය වේ." කියලා.

153(3)(ඈ) වගන්තියට නිර්දේශිත සංශෝධනයක් තිබෙනවා, "විගණකාධිපතිවරයාගේ තනතුර පුරප්පාඩු වන විට, එම තනතුර මසක් ඇතුළත පිරවීම සඳහා ජනාධිපතිවරයා විසින් පියවර ගත යුත්තේය සහ එලෙස පත් කරනු ලබන විගණකාධිපතිවරයා එම පත් කරනු ලබන දිනයේ සිට වර්ෂ 07ක කාල සීමාවක් සඳහා සිය තනතුර දරනු ලබන්නේය" කියලා.

153(ඇ)2(අ) වගන්තියට අපි සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා, "152 වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, නීතිය මඟින් ස්ථාපිත කොට ඇති ජාතික විගණන කාර්යාලයේ

සහ විගණන සේවා කොමිසමේ වාර්ෂික ඇස්තමේන්තු පිළියෙළ කිරීම සහ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස පාර්ලිමේන්තු අය වැය කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම." කියලා.

153(ඇ)2(ඇ) වගන්තිය යටතේ අලුතින් ඇතුළත් කිරීමට අපි නිර්දේශ කරලා තිබෙනවා, "විගණකාධිපතිවරයාගේ රාජකාරී සහ කාර්යභාරය සම්බන්ධයෙන් මහ පෙන්වීම සහ උපදෙස් සැපයීම" සහ දැනට 153(ඇ)2(ආ) වගන්තිය යටතේ දක්නට ලැබෙන "දැන්" යන පදය ඉවත් කිරීමට.

153(ඇ) 6 යටතේ පහත කොටස අලුතින් ඇතුළත් කිරීමට අපි නිර්දේශ කරලා තිබෙනවා.

"උපවගන්ති 153(ඇ)2(ඇ)ට අනුකූලව, විගණකාධිපතිවරයා වෙත මහ පෙන්වීම් සහ උපදෙස් සැපයීම සඳහා විගණන සේවා කොමිසම වෙත විධිවිධාන සැකසීමේ දී සිය වගකීම් සහ කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා වෙත ලබා දී ඇති අභිමතානුසාරී බලය සම්බන්ධයෙන් වැරදි අවබෝධයකින් තොරව සංවරණ හා තුලන ක්‍රමය භාවිතයට ගැනීම යෝග්‍ය වේ.

ඒ සම්බන්ධයෙන් විගණන සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන කවර හෝ උපදෙස් හෝ මහ පෙන්වීම් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට විගණකාධිපතිවරයාට තිබිය යුතු අභිමතානුසාරී බලයට යටත්ව, ඔහු එසේ පිළිනොගන්නේ නම් හේතු දක්වමින් පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට විගණකාධිපතිවරයාට හා විගණන කොමිෂන් සභාවට අවස්ථාව සලසන විධිවිධාන සැලැස්වීම යෝග්‍ය වේ."

153(අ)(1)(අ) වගන්තියට අපි සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා, "නියෝජ්‍ය විගණකාධිපති හෝ ඊට වඩා ඉහළ තනතුරක් දරා ඇති විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික නිලධාරියකු" වශයෙන්.

153(අ)(1)(ඇ) කොටසට, "සාමාන්‍ය වෘත්තීයමය ජීවිතය තුළ ගෞරවයට පාත්‍ර වී ඇති විශිෂ්ටත්වය සහ අවංකභාවය සහිත පරිසර හිතකාමී පුද්ගලයකු සහ කවර හෝ දේශපාලන පක්ෂයක සාමාජිකයකු නොවන පුද්ගලයකු" යන කොටස් එකතු කරන්න කියලා අපි සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට නියමිත කාලය අවසන් වෙමින් පවතින නිසා මේ ඉල්ලීම කරනවා. මුදල් පිළිබඳ අනු කාරක සභාවේ වාර්තාවේ සඳහන් යෝජනා ඉතා වැදගත් විය හැකි බැවින්, "රජයේ විගණන සහ විගණකාධිපතිවරයා සඳහා යෝජනා" ඇතුළත් 25 වැනි පිටුවේ සිට 28 වැනි පිටුව දක්වා පිටු කිහිපය - මෙය විගණකාධිපතිවරයා සම්බන්ධයෙන් පමණක් තිබෙන නිසා- මගේ කථාවේ කොටසක් ලෙස හැන්සාඩ් වාර්තාවේ පළ කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මා එය **සභාගත*** කරනවා. මේ ගරු සභාව පත් කළ අනු කාරක සභාවක වාර්තාවේ කොටසක් නිසා ඒ කොටස අනාගතයේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හැදෙන විට වැදගත් වෙනවා.

මේ අවස්ථාවේ අපි විගණකාධිපතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරන්න කැමැතියි. මුදල් පිළිබඳ සම්පූර්ණ බලය පාර්ලිමේන්තුවට තිබෙනවා. අය වැය ලේඛන සකස් කිරීමේ ක්‍රියාවලියේදී මේ ගරු සභාව නොමඟ යවන ආකාරයට ඉතා විශාල අය වැය යෝජනා ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒවා සම්පූර්ණ අසත්‍ය හා ප්‍රායෝගික නොවන දේවල්. ඒ පිළිබඳව අපි ගරු කථානායකතුමාට පැමිණිලි කර තිබෙනවා. සමහර වෙලාවට බිලියන 125ක් - කෝටි 12,500ක්- මේ පාර්ලිමේන්තුවෙන් වැරැදි ලෙස වෙන් කර තිබෙනවා. හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතා විසින් ලංකා ඉතිහාසයේ කිසි දවසක කර නැති ආකාරයට මේ පාර්ලිමේන්තුව නොමඟ යැවීම පිළිබඳව අපි විශ්වාස භංග යෝජනාවකුත් භාර දී තිබෙනවා. ඒ වෙන් කිරීම් පිළිබඳව විගණකාධිපතිවරයා කිසිවක් කරලා නැහැ. ඒ යෝජනා පිළිබඳවත් විගණනයක් කරන ලෙස ඉල්ලා සිටිමින්, එතුමාගේ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ විපක්ෂය හැටියට අපගේ පූර්ණ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[පූ.භා.11.51]

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විගණකාධිපතිතුමාගේ වැටුප් වැඩි කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 මැතිවරණ පොරොන්දුවක් හැටියට ජාතික විගණන පනත ගෙනැල්ලා, එතුමාට ස්වාධීනව වැඩ කරන්න අවශ්‍ය බලතල හා නීතිමය රාමුව සකස් කර දීම යහපාලන ආණ්ඩුවේ තවත් දේශපාලන පොරොන්දුවක් ඉෂ්ට කිරීමක් හැටියට අපට හඳුන්වන්න පුළුවන්. පසු ගිය කාලය පුරාම මාධ්‍ය තුළින් වාගේම විපක්ෂයේ කණ්ඩායම්වලින් අපට විශාල චෝදනා තිබුණා. අපි මැතිවරණයේදී ලබා දුන් පොරොන්දුවක් හැටියට විගණන පනත ගෙන ඒම පමා කිරීම පිළිබඳව විපක්ෂයෙන් අපට යම් යම් චෝදනා එල්ල වුණා. නමුත් රජයක් හැටියට අපට පුළුවන්වෙලා තිබෙනවා, ඒ පනත් කෙටුම්පත ගෙනැල්ලා සම්මත කරන්න. ඒ නිසා දැන් විගණකාධිපතිතුමාගේ දීමනාව වැඩි කරන්න, එතුමාට ලබා දෙන වරප්‍රසාද වැඩි කිරීමේ යෝජනාවක් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගන්න අද පුළුවන්වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ බලයට පත් වන ඕනෑම රජයක් යටතේ විගණකාධිපතිතුමාට අතිවිශාල කාර්යභාරයක් තිබෙනවා. මේ රටේ ජනතාවගේ මුදල් අවභාවිත කිරීම, දේශපාලනඥයන් විසින් ජනතාවගේ මුදල් පරිහරණය කිරීමේදී කොයි තරම් දුරට ඒ මුදල් අවබෝධයෙන් පරිහරණය කරනවාද, නැත්නම් ඒවා කොයි තරම් දුරට අවභාවිත කරනවාද යනාදී වශයෙන් ඒ සියලුදේවල වගකීම, ඒ ගැන සොයා බැලීම හා පරීක්ෂණ පැවැත්වීම පිළිබඳව සියලු වගකීම් අද අපේ විගණකාධිපතිතුමාට පැවරී තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එතුමාගෙන් මීට වඩා දේවල් බලාපොරොත්තු වෙනවා. මොකද, දේශපාලනඥයන් ගැන අද සමාජය තුළ විශාල කථිකාවක් ඇති වී තිබෙන නිසා. විශේෂයෙන්ම මන්ත්‍රීවරු ගැන, ඇමතිවරු ගැන, ප්‍රාදේශීය සභාවේ සිට පාර්ලිමේන්තුව දක්වා සිටින සියලු ජනතා නියෝජිතයන් ගැන ජනතාව තුළ තිබෙන පැසසුම, ජනතාව තුළ මන්ත්‍රීවරුන් පිළිබඳව තිබෙන චිත්‍රය දෙස බැලුවාම අපි කාටවත් සන්තෝෂ වෙන්න බැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වෙන්න පුළුවන්, විපක්ෂයේ මන්ත්‍රීවරු වෙන්න පුළුවන්, ප්‍රාදේශීය සභාවල ඉන්න ජනතා නියෝජිතයන් වෙන්න පුළුවන් ඒ සියලුදෙනා පිළිබඳව අපි සියලුදෙනාටම සන්තෝෂ වෙන්න බැරි තත්ත්වයක් තමයි සමාජය තුළ තිබෙන්නේ. මා හිතන විධියට දේශපාලනඥයාට විරුද්ධව තමයි නිතරම දූෂණ චෝදනා එල්ල වන්නේ. දේශපාලනඥයන් ඉලක්ක කොට තමයි ඒ සියලුදේවල් වෙන්නේ. නමුත් ඊට අමතරව, අපි තව ටිකක් එහාට ගිහිල්ලා බැලුවොත් දේශපාලනඥයාට අමතරව මේ රටේ ඉන්න රාජ්‍ය නිලධාරීන්, මේ රටේ රාජ්‍ය සේවකයන්, ඉහළ නිලධාරීන් සම්බන්ධයෙන් තිබෙන දූෂණ චෝදනා දිහා බැලුවොත් දේශපාලනඥයන්ට වඩා චෝදනා රාජ්‍ය නිලධාරීන්ට තිබෙනවා.

නමුත්, අවාසනාවකට ඒ චෝදනා එළියට එන ප්‍රමාණය ඉතාම අවම මට්ටමකයි තිබෙන්නේ. අපි වෘත්තීය මට්ටමේ ඕනෑම ක්ෂේත්‍රයක් අරගෙන බැලුවොත් ඒවායේ ටෙන්ඩර් කැඳවීම් වෙන්න පුළුවන්, පරීක්ෂණ කිරීම් වෙන්න පුළුවන්, ගණන් හැදීම් වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් වෙනත් දෙයක් වෙන්න පුළුවන්. ඒවායේ සිදු වන වංචා හා දූෂණ ප්‍රමාණය බැලුවාම ඉතාම ඉහළ මට්ටමක තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ තිබෙන ස්ථාවර කමිටු ඇතුළු යම් යම් කමිටුවලදී අපි ඒවා මතු කරලා, ඒවා ගැන කථා බහ වුණත්, ඒවා එළියට ගෙනාවත්, ඒවා පිළිබඳව පවතින නීතිමය ගැටලු නිසා, නීතිය අනුව ඒවාට දෙන්න පුළුවන් තීන්දු, නීතියෙන් ඒවාට ගන්න පුළුවන් පියවර ඉතාම අවම මට්ටමකයි තිබෙන්නේ. ඒ නිසා අපට ඒවා ගැනත් හිතන්න වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ඒවා ගැනත් කල්පනා කරලා, එවැනි චෝදනා ඇති රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් අපට තීන්දු ගන්න පුළුවන් විධියට නීතිමය බලයක් හදන්න යම් බලාත්මක ක්‍රමවේදයක් හදා ගන්න වෙනවා. එහෙම නැතුව අපි හැම තිස්සේම මේ රටේ ඉන්න දේශපාලනඥයන්ටම ඇඟිල්ල දික් කරලා, දේශපාලනඥයන්ගේම වැරදි කථා කරලා, දේශපාලනඥයන්ගේ වංචා හා දූෂණ පිළිබඳව විතරක් කථා කරලා, මේ රටේ දූෂණ අවම කරන්නත් බැහැ; දූෂණ හා වංචා නවත්වන්නත් බැහැ. ඒ නිසා අපි මේ රටේ රාජ්‍ය තන්ත්‍රය තුළ සිදු වන දූෂණ හා අක්‍රමිකතා ගැන කථා කළ යුතුයි. ඒවා නිවැරදි කර ගැනීමේ යම් යාන්ත්‍රණයක් අපි සැකසිය යුතුයි. ඒවා නවතා ගැනීමේ යම් ක්‍රමවේදයක් ගැන අපට හිතන්න වෙනවා. ඒවා නවතා ගැනීමේ යම් ක්‍රමවේදයක් ගැන අපට අලුතෙන් කල්පනා කරන්න වෙනවා. මම හිතන විධියට අපි එවැනි කාල පරිච්ඡේදයකට අද ඇවිත් තිබෙනවා. මොකද, පසුගිය කාලයේ අපට කරන්න බැහැයි කියපු හුහක් දේවල්-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී ඔබතුමාගේ අවධානයට මේ කාරණය මා යොමු කරවන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මාසයේ 05වැනි දා ජනබල මෙහෙයුමට කොළඹට ආපු මිනිස්සුන්ට කිරි පැකට් වගයක් දීලා තිබෙනවා. ඒවාට "injection" එකකින් යම්කිසි විෂ ද්‍රව්‍යයක් ඇතුළත් කර තිබෙනවා. මාලිගාවත්තේදී මේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ ගෝලයෝ තමයි ඒ කිරි පැකට් ටික දීලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක Point of Order එකක් නොවෙයි. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විමල් වීරවංශ මන්ත්‍රීතුමා කරපු චෝදනාව ගැන මම ඇත්තටම ලජ්ජා වෙනවා. මා එතුමාට පළමුවෙන්ම කියන්න ඕනෑ, අපි හොඳ දේශපාලන ඉතිහාසයක් තිබෙන මිනිස්සු බව. අපි කවදාකවත් කිරි පැකට්වලට injection ගහලා දෙන්නේ නැහැ. දෙන දේ ඉස්සරහට ඇවිල්ලා මුහුණට මුහුණ හම්බ වෙලා දෙනවා මිසක් කිරි පැකට් දීලා බඩ යන්න සලස්වන වැඩ කරන්නේ නැහැ. ඒ වාගේ වැඩ කරලා තමුන්නාන්සේට පුරුදු ඇති. ඒ වැඩ තමුන්නාන්සේලාට පුරුදු නිසා තමුන්නාන්සේලා කරනවා. මම ඒ වාගේ දේවල් කරන්නේ නැහැ. කරන්න ඕනෑ නම් මුහුණට මුහුණ හමු වෙලා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගොල්ලෝ එදා - 05වැනි දා- කොළඹට ආවේ කොළඹ නගරය අරගෙන යන්න. කොළඹ නගරය අරගෙන යන්න ආපු මිනිස්සු. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කියනවා, රෑ නවය හමාර වනකොට හිටියේ 2,000යි කියලා. අපි නොවෙයි කියන්නේ. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමායි කියන්නේ. මෙතුමන්ලා කිව්වේ, "කොළඹට ලක්ෂයක් ගෙනෙනවා; අසූදාහක් ගෙනෙනවා. ගෙනැල්ලා කොළඹ වටලනවා" කියලායි. අපි හිතුවේ මෙතුමන්ලා සටන්කරුවෝ කියලා. සටන්කරුවෝ නම් 06වැනිදා ඉන්න ඕනෑ හිර ගෙවල්වල. හිර ගෙවල්වල නොවෙයි හිටියේ. බීලා, පාරේ වැටිලා හිටියේ. බීලා, පාරේ වැටිලා ඉස්පිරිතාලවලට ගෙන ගිහින් සිටියේ. ඉස්පිරිතාලවල හිටියේ. හිර ගෙවල්වල හිටියේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සටන්කරුවෝ, වීථි සටන්කරුවෝ ආණ්ඩුව පෙරලන්නයි ආවේ. ආණ්ඩුව පෙරලන්න ආපු මිනිස්සු අන්තිමට කොළඹ නගරයම අපවිත්‍ර කළා. කොළඹ නගරයම අපවිත්‍ර කරලා, බීලා, ඉස්පිරිතාලවල හිටියා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා, "06වැනි දා හිරේ ඉන්න ඕනෑ" කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොඩ්ඩක් සවන් දෙන්න කෝ.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
සටන්කරුවෝ නේ. සටන්කරුවෝ ඉන්න ඕනෑ හිරේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා, what is your point of Order?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මාලිගාවත්තේ කුඩුකාරයෝ කොහේද ඉන්න ඕනෑ?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකුමනි, මට තත්පර 30ක් දෙන්න කෝ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මන්ත්‍රීවරයෙක් හැටියට මගේ වරප්‍රසාද අයිතිය පිළිබඳව බලන්න. මේ රටේ මහ ජනතාව හිරේ දමන්නද ආණ්ඩුව කල්පනා කරගෙන හිටියේ? මොන තරම් බරපතළ ප්‍රකාශයක්ද මේ කරන්නේ.

මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කොහොමද එහෙම මන්ත්‍රීවරුන්ව, මේ රටේ ජනතාව හිරේ දමන්නේ? එහෙම කරන්න එතුමාට තිබෙන බලය මොකක්ද? අධිකරණය විසින් කළ යුතු කාරණා කොහොමද, මුජීබුර් මන්ත්‍රීතුමා කරන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකර එම ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. එහෙම නොවුණොත් විරුද්ධවාදීන් හිරේ දැමීම ආණ්ඩුවේ ප්‍රතිපත්තිය කියන එක අපි මුළු රටටම හෙළි කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම ඒක රජයේ ප්‍රතිපත්තිය කියලා කියන්න බැහැ. හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බොහොම ස්තුතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි කරන්නේ ඉතාම වැදගත් විවාදයක්. විගණකාධිපතිවරයාගේ වැටුප ගැනයි මේ විවාදය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම නම් ඔබතුමා බාධා කරන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඉතින් ඔබතුමා මට කියන්න දෙන්නේ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හරි. කියන්න, කියන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාට මට කලින් තරහා යනවා නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
තරහා ගිහිල්ලා නොවෙයි, -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනයේ සිටිද්දී පොඩ්ඩක් තරහා අඩු කර ගන්න. මොණරාගල නායකයන්ට සාමාන්‍යයෙන් තරහා යන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මම කියන්නේ, ඔබතුමා මේ විවාදයට බාධා කරන්න එපා කියලායි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මොණරාගල අනාගත නායකයන්ට ඔහොම තරහා යන්න හොඳ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණයට අදාළව විගණකාධිපතිවරයාගේ වැටුප ගැනයි විවාද කරන්නේ. ඒ ගැන විවාද කරන මේ වේලාවේ, මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කථා කරන්නේ විරෝධතා ව්‍යාපාරය පිළිබඳවයි. එතුමා එදා රාත්‍රියේ බීමත්ව ගිහිල්ලා එම ප්‍රදේශයේ සැරිසරනවා අපි දැක්කා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තමයි චෝදනාව තිබෙන්නේ. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තමයි චෝදනාව තිබෙන්නේ. [බාධා කිරීම්] එදා ඔබතුමාට තමයි චෝදනාව තිබුණේ. ඔබතුමා රාත්‍රියේ බීමත්ව ගිහිල්ලා මේක කළේ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තමයි චෝදනාව එල්ල වී තිබෙන්නේ කිරි පැකට්වලට වහ දැම්මා කියලා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඒ වාගේ වැඩ කරන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා කථා කරන්න.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම කනගාටු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ මහින්දානන්ද -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන විවාදයක පැටලෙන්නේ නැතිව අදාළ කාරණය ගැන කථා කරන්න.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියපු කාරණය සම්බන්ධව මම උත්තර දෙන්න ඕනෑ. එතුමා කිව්වා මම බීමත්ව සිටියා කියලා. මම බීලා ගියේ නැහැ. එතුමා තමයි එදා රාත්‍රියේ හොඳට බීලා යන්න බැරුව ෂැන්ග්‍රි-ලා එකේ සිටියේ. එතුමන්ලා ෂැන්ග්‍රි-ලා එකේ ඉඳගෙන, මිනිසුන් කොළඹට ගෙනැල්ලා පාරවල්වල අතරමං කරලා [බාධා කිරීම්] ඒ මිනිසුන්ට යන්න එන්න බස් නැතුව - [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බාධා කරන්න එපා. එතුමාට කථා කරන්න දෙන්න.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ අයට කන්න කෑම නැහැ. ඒ අයට දුන්නේ expire වෙච්ච කිරි. [බාධා කිරීම්] Expire වෙච්ච කිරි දීලා ඒවා විස වුණාම ඒ, චෝදනාවත් ගෙනැල්ලා අපේ ඇඟට දමනවා. ඒ අයට කිරි පැකට් දෙන්න අපට වුවමනාවක් නැහැ. අපි දෙන දෙයක් එහෙම අපි හංගලා දෙන්නේත් නැහැ. [බාධා කිරීම්] දෙන්න ඕනෑ නම්, අපි එළිපිට දෙනවා. ගැහැනු කරන වැඩ අපි කරන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කතාව අවසාන කරන්න.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මෙතුමන්ලාගේ ව්‍යාපාරය බංකොලොත් වෙලා තිබෙනවා. මේක නපුංසක දේශපාලන නායකයන්ගේ ව්‍යාපාරයක් කියලා 05 වැනි දා මේ රටේ ජනතාවට පෙන්නුවා. [බාධා කිරීම්] ඒක පෙන්නුවා. [ඝෝෂා කිරීම්] මේක නපුංසක නායකයන්ගේ ව්‍යාපාරයක්. කොන්ද පණ නැහැ. සටන් කරන්නයි ආවේ; මරාගෙන මැරෙන්නයි ආවේ. [ඝෝෂා කිරීම්] මරාගෙන මැරෙන්න ඇවිල්ලා රෑ නවයහමාර, දහය වෙනකොට කොළඹ නගරයෙන් පිට වෙලා ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීම්] මේ ගොල්ලන් කථා කළේ අරාබි වසන්තයක් ගැනයි. අරාබි වසන්තය කරන්න පැමිණි මිනිසුන් අන්තිමට අරක්කු වසන්තයක් කරලා තමයි ඉවර කළේ. අරාබි වසන්තය නොවෙයි, කළේ. [බාධා කිරීම්] අරාබි වසන්තය කරන්න ඕනෑ නම් එන්න, අපේ ළඟට. අපි කියලා දෙන්නම්, අරාබි වසන්තය කරන හැටි. [බාධා කිරීම්] අඩුම ගණනේ ඒකවත් දන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. මෙතුමන්ලාට ආණ්ඩුව අල්ලන්න නම්, කොළඹ නගරයේ සිටින ජනතාව නැඟිටින්න ඕනෑ. කොළඹ නගරයේ ජනතාව නැඟිටිටේ නැහැ. කොළඹ නගරයේ ජනතාව නැඟිටියොත් මේ ගොල්ලන්ට පැළියගොඩ හන්දියෙන් ඇතුළට එන්නත් බැහැ. ඒක හොඳට මතක තබා ගන්න. එදා, කොළඹ නගරයේ ජනතාව නිශ්ශබ්දව සිටියා. මේ අයට "පව්" කියලා, නගරයට ඇවිල්ලා යන්න ඉඩ දුන්නා. [බාධා කිරීම්] ඒ නිසා තමයි තමුන්නාන්සේලා නගරයෙන් පිටමං වුණේ. එහෙම නැතුව කොළඹ නගරයේ සිටින ජනතාව නැඟිටලා ඇවිත් තිබුණා නම්, එක බස් එකකට කොළඹ නගරයට එන්න හම්බ වෙන්නේ නැහැ. [බාධා කිරීම්] ඒක හොඳට මතක තබා ගන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අසාර්ථක උද්ඝෝෂණයක් කළේ. ජනතාව ගෙනෙන්න බැහැ. [බාධා කිරීම්] ජනතාව අද මෙතුමන්ලා එක්ක නැහැ; ජාතිවාදීන් එක්ක නැහැ; ඒකාධිපතිවාදීන් එක්ක නැහැ; පවුල්වාදයත් එක්ක නැහැ. අද ජනතාව සිටින්නේ යහ පාලනයත් එක්ක කියන එක තමයි පෙන්නුවේ. අද ජනතාව සිටින්නේ යහ පාලනයත් එක්කයි.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කතාව අවසාන කරන්න. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙනකොට සභාවේ ගණපූරණය නැහැ. ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කෑ ගහනවා. ඒ නිසා මෙතුමාට කෑ ගහන්න ගණපූරණය ගෙනැල්ලා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසාන කරන්න.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ගැන කථා කළේ නැහැ. මෙතැන සිටින එක මන්ත්‍රීවරයෙක් - විමල් වීරවංශ මන්ත්‍රීතුමා - අද උදේ මොනවා බීලා ආවාද දන්නේ නැහැ. එතුමා ඇවිල්ලා තමයි මගේ කථාවට බාධා කරමින් මේ කථාව පටන් ගත්තේ. මම කථා කරමින් සිටියේ විගණකාධිපතිතුමාගේ වැටුප් හා දීමනා සම්බන්ධවයි. [බාධා කිරීම්] එතුමා මොනවා බීලා ආවාද මම දන්නේ නැහැ. ඒ නිසා, එතුමා අද මේ කථාවට බාධා කරලා අහගන්න තිබෙන ඒවා ඔක්කෝම දැන් අහගත්තා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගණපූරණය නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා ගණපූරණය නැති කාරණය ඉදිරිපත් කරනවාද?

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඒක තමයි -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කරුණාකරලා කියන්න, ඔබතුමා මේ වේලාවේ ගණපූරණය පිළිබඳව කාරණය ඉදිරිපත් කරනවාද?

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගණපූරණය නැති නිසා, ගණපූරණය ඇති කරලා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

*පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.*
*පසුව ගණපූරණයක් තිබුණෙන්-*

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லை யெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present-*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. I. Charles Nirmalanathan, please. You have eleven minutes.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நன்றி. கணக்காய்வாளர் தலைமை அதிபதியினுடைய சம்பள அதிகரிப்பு உண்மையில் வரவேற்கத்தக்கது.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවේ කටයුතුවලට සමාන්තරව පාර්ලිමේන්තුවේ විවිධ කමිටු රැස් වනවා. ගරු මන්ත්‍රීවරු තවමත් එම කමිටුවල ඉන්නවා. එසේ තිබියදී විවාදයක් නැති, ප්‍රශ්නයක් නැති වෙලාවක, මේ වාගේ වැදගත් කාරණයක් සාකච්ඡා වන වෙලාවක, විගණකාධිපතිතුමාගේ වැටුප් වැඩි කිරීම කඩාකප්පල් කරන්න තමයි අද මේ විධියට ප්‍රශ්න නහන්නේ. මේවා බොහොම වැරදි වැඩ; ලජ්ජා නැති වැඩ.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මේ විවාදය සඳහා පස් වරු 12.30 වනතුරු පමණයි කාලය වෙන් කර තිබෙන්නේ. කරුණාකර, මෙය අවසන් කරන්න ඉඩ දෙන්න.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මගේ කථාව කරගෙන ගියේ විගණකාධිපතිවරයාගේ වැටුප් හා දීමනා සම්බන්ධ කාරණයට අදාළවයි කියන එක ඔබතුමාත් දකින්න ඇති. ඒ අතරතුරම තමයි විමල් වීරවංශ මන්ත්‍රීතුමා නැඟිටලා මගේ කථාවට බාධා කළේ. ඒ නිසා තමයි විෂයයට පරිබාහිරව මටත් කථා කරන්න සිද්ධ වුණේ. ඒ පිළිබඳව මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් සභාවේ ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය ඕනෑකමින්ම මතු කරලා, මේ සභාව පවත්වාගෙන යෑම වළක්වන්න හදනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. Hon. Nirmalanathan, please continue with your speech.

[மு.ப. 12.07]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கணக்காய்வாளர் தலைமை அதிபதியின் சம்பளம் தொடர்பான பிரேரணை இன்று இந்தப் பாராளுமன்றத்தின் அனுமதிக்காக முன்மொழியப்பட்டிருக்கின்றது. உண்மையிலே கணக்காய்வாளர் தலைமை அதிபதியினுடைய சம்பளம் அதிகரிக்கப்பட வேண்டும். நாடு முன்னேற வேண்டுமாக இருந்தால், சகல அமைச்சுக்களிலும் மற்றும் திணைக்களங்களிலும் அரச நிதி சரியாகப் பயன்படுத்தப்பட வேண்டும். அதற்காகக் கணக்காய்வாளர் திணைக்களம் சரியான முறையில் இயங்க வேண்டும். ஆகவே, கணக்காய்வாளர் தலைமை அதிபதியுடைய சம்பளம் மட்டுமல்ல, அதிகாரங்களும் அதிகரிக்கப்பட வேண்டும். வெறுமனே அவருக்குச் சம்பள அதிகரிப்பை மட்டும் வழங்கிவிட்டு, அதிகாரங்களை வழங்காதுவிட்டால், ஓர் அமைச்சில் அல்லது ஒரு திணைக்களத்தில் நடக்கின்ற ஊழல்கள் தொடர்பில் சட்ட நடவடிக்கை எடுப்பது மிகக் கடினமான விடயமாக இருக்கும். ஆகவே, இந்தச் சம்பள அதிகரிப்போடு மட்டும் நிற்காமல் அவருக்குரிய அதிகாரங்களும் வழங்கப்பட வேண்டும். அப்பொழுதுதான் அமைச்சுக்களிலும் மற்றும் திணைக்களங்களிலும் இடம்பெறுகின்ற மோசடிகள் சம்பந்தமாகப் பூரணமாக விசாரணை செய்து சம்பந்தப்பட்டவர்களுக்குத் தண்டனை வழங்க முடியும். ஆகவே, கணக்காய்வாளர் திணைக்களம் நேரடியாக நீதிமன்றங்களுக்குச் சென்று வழக்குத் தாக்கல் செய்யக்கூடிய வகையில் அதிகாரங்கள் வழங்கப்பட வேண்டும்.

கடந்த காலங்களில் சரியான முறையில் கணக்காய்வாளர் திணைக்களம் இயங்கவில்லை. அப்படிச் சரியான முறையில் இயங்கியிருந்தால், 20 வருடங்களுக்கு முன்பு அமைச்சர்களாக இருந்தவர்களின் சொத்துக்கள் தற்போது இவ்வளவு இருந்திருக்காது. அந்த அமைச்சர்களின் சொத்துக்கள் எவ்வளவு என்பதை இந்த நாடு அறியும். அதாவது, 20 வருடங்களுக்கு முன்பு சாதாரணமாக இருந்த அவர்கள் இன்று மிகப்பெரிய செல்வம் படைத்தவர்களாக இருக்கின்றார்கள். அவர்கள் அப்படி வருவதற்கான ஒரு சூழ்நிலை கணக்காய்வாளர் அதிபதி திணைக்களம் சரியான முறையில் இயங்காததனால்தான் ஏற்பட்டது. குறித்த அமைச்சுக்கு ஒதுக்கப்பட்ட நிதி, துறை சார்ந்த திணைக்களங்களூடாக மக்களைச் சென்றடைந்திருந்தால், சம்பந்தப்பட்ட அமைச்சர்களிடம் தற்போது பெருந்தொகைப் பணம் இருக்காது என்பதை இச்சபையில் குறிப்பிட விரும்புகின்றேன்.

ஆகவே, கணக்காய்வாளர் திணைக்களம் சரியான முறையில் இயங்க வேண்டும்; சுயாதீன திணைக்களமாக இருக்க வேண்டும். அது அரசியல் ரீதியாக ஜனாதிபதிக்குக் கட்டுப்பட்டதாகவோ அல்லது பிரதமருக்குக் கட்டுப்பட்டதாகவோ இருந்தால் சரியான முறையில் இயங்க முடியாது. ஒரு சில அரசியல்வாதிகளின் தவறுகள் பற்றிய விடயத்தை அதாவது, சம்பந்தப்பட்டவர்கள் மக்களுக்குச் செல்ல வேண்டிய பணத்தை முறையற்ற விதத்தில் பயன்படுத்துகின்றார்கள் என்ற விடயத்தை அதிமேதகு ஜனாதிபதி அவர்களிடமும் கௌரவ பிரதமர் அவர்களிடமும் நான் குறிப்பிட்டிருந்தேன். ஆனால், அவர்கள், தங்களுடைய அரசாங்கத்தைக் கொண்டு செல்ல வேண்டும்; இன்னுமொரு தேர்தலுக்குச் செல்ல வேண்டும். ஆகவே, நாட்டை ஆளுகின்ற ஜனாதிபதியும் பிரதமரும் அரசியல்வாதிகளைப் பகைக்க முடியாது என்ற வகையில், இவை அனைத்தும் தெரிந்தும், தெரியாததுபோல் இருக்கின்றார்கள். அதாவது, சம்பந்தப்பட்டவர்கள் பிழை செய்கின்றார்கள் என்று தெரிந்தும் அவர்களைக் கட்டுப்படுத்த அவர்களால் முடியவில்லை. அவர்களது பிழைகளைக் கேட்டால் தங்களுடைய கட்சியை விட்டுச் சென்றுவிடுவார்கள்; அரசாங்கத்தினுடைய பலம் கொஞ்சம் கொஞ்சமாகக் குறைந்துவிடும் என்றவொரு காரணத்திற்காக என்ன வேண்டுமென்றாலும் அவர்கள் செய்யலாம் என்ற ஒரு நிலைப்பாடு தற்போது காணப்படுகின்றது. ஆகவே, இந்த நாட்டினுடைய பணம் சரியான முறையில் மக்களைச் சென்றடைய வேண்டும். அதற்குக் கணக்காய்வாளர் திணைக்களம் அரசியல் தலையீடுகள் இல்லாத வகையில் சரியான முறையில் இயங்க வேண்டும். அப்படி இயங்கினால் மட்டும்தான் நாடு பொருளாதார ரீதியில் முன்னேற்றமடையும். இன்று ஒவ்வோர் அமைச்சுக்கும் வரவு செலவுத் திட்டத்தின்மூலம் பில்லியன் கணக்கில் நிதியொதுக்கீடுகள் செய்யப்படுகின்றன. ஆனால், அந்தப் பணங்களில் எவ்வளவு பணத்தைத் தங்களுக்கு உரியதாக்கலாம், தங்களுடைய உறவினரின் பெயருக்கு மாற்றலாம் என்றுதான் சில அமைச்சர்கள் சிந்தித்துச் செயற்பட்டுக் கொண்டிருக்கிறார்கள். ஆகவே, கணக்காய்வாளர் திணைக்களம் இந்த விடயத்தைக் கண்டுபிடித்து, சட்ட ரீதியாக நடவடிக்கை எடுக்க வேண்டும்.

கடந்த வாரம் நடந்த ஒரு நிகழ்வில், "அரச பணத்தை வீணாக்குபவர்கள் அல்லது கொள்ளையடிப்பவர்களுக்கு மரண தண்டனை கொடுக்க வேண்டும்" என்று நாட்டின் ஜனாதிபதி அவர்கள் கூறியிருக்கிறார். இதனை நான் செய்திமூலம் அறிந்தேன். உண்மையில் நான் அந்தக் கருத்தோடு ஒத்துப் போகின்றேன். குறித்த பணம் மக்களுடைய பணம் என்று தெரிந்தும் அதனைச் சம்பந்தப்பட்டவர்கள் முறையற்ற விதத்தில் பயன்படுத்துகிறார்கள்; கொள்ளையடிக்கிறார்கள். அவர்களிடம் அது சம்பந்தமாகக் கேட்டால் அவர்கள் அரசாங்கத்தைவிட்டுச் சென்றுவிடுவார்கள் என்று அரசாங்கம் பயப்படுகின்றது. குறித்த ஒரு சில விடயங்கள் தொடர்பாக நான் மாண்புமிகு பிரதமர் அவர்களிடம் ஆதாரத்துடன்

முறையிட்டேன். அவர் நடவடிக்கையெடுப்பதாகக் கூறியிருந்தார். ஆனால், இதுவரை எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை. ஆகவே, 2020ஆம் ஆண்டு ஜனாதிபதித் தேர்தலைச் சந்திக்க வேண்டும், குறித்த தேர்தலில் தங்களுக்கு ஆதரவு வேண்டும் என்ற நோக்கத்தில் அரச பணத்தைச் சம்பந்தப்பட்டவர்கள் எந்தவிதத்திலும் பயன்படுத்தலாம் என்று தற்போதைய ஆட்சியாளர்கள் நடந்து கொள்கின்றார்கள். ஆனால், அமைச்சுக்களில் இடம்பெறுகின்ற முறைகேடுகள் தொடர்பில் கணக்காய்வாளர் திணைக்களம் சரியான முறையில் நடவடிக்கை மேற்கொள்ள வேண்டும். கணக்காய்வாளர் திணைக்களத்துக்குச் சகல அதிகாரங்களும் வழங்கப்பட்டு, அவர்கள் உண்மையாகச் செயற்படுவார்களாக இருந்தால் இலங்கை பொருளாதார ரீதியில் முன்னேறும்; மக்கள் பணம் வீணடிக்கப்படாது.

கணக்காய்வாளர் தலைமை அதிபதியினுடைய சம்பளம் மட்டுமல்ல, அந்தத் திணைக்களம் சார்ந்த ஏனைய உத்தியோகத்தர்களது சம்பளங்களையும் அதிகரித்தால்தான் அவர்கள் ஒவ்வொரு திணைக்களத்திலும் உண்மையான, சுயாதீனமான முறையில் விசாரணைகளை மேற்கொள்வார்கள். இந்த விடயத்தைச் சரியாகக் கையாளவில்லையென்றால், இந்த நாட்டில் ஒதுக்கீடு செய்யப்படுகின்ற எத்தனையோ பில்லியன் பணத்தில் ஓரளவுகூட மக்களைச் சென்று சேராமல் போகும். இந்த நாட்டின் பணம் மக்களைச் சென்று சேரவேண்டும். அதற்கேற்றவாறு சகல திணைக்களங்களும் உழைக்க வேண்டும். ஆனால், இன்று சில அரச நிறுவனங்களில் பணங்கள் வீணடிக்கப்படுகின்றன. குறித்த நிறுவனங்கள் பற்றிய விபரங்கள் என்னிடம் இருக்கின்றன. ஆனால், இங்கு நான் அது சம்பந்தமாகக் குறிப்பிட விரும்பவில்லை. சம்பந்தப்பட்ட அமைச்சர்களிடம் இது சம்பந்தமாகத் தெரியப்படுத்தினாலும், குறித்த நிறுவனத்தினுடைய தலைவர் அமைச்சரினுடைய உறவினராக இருக்கின்றார் அல்லது அந்த நிறுவனத்தினது தலைவரால் தனக்குத் தேர்தலில் இவ்வளவு வாக்குக் கிடைக்கும் என்று சம்பந்தப்பட்ட அமைச்சர் நினைக்கின்றார். இப்படியான ஒரு சூழ்நிலையின் மத்தியில்தான் அரசாங்க நிர்வாகம் சென்று கொண்டிருக்கின்றது. அரசாங்கம் இதே நிலைப்பாட்டில் தொடர்ந்தும் செல்லுமாக இருந்தால், அரசாங்கத்தின் சிறிய பிழைகளைத் தட்டிக்கேட்காது போனால், அரசாங்கம் எதிர்காலத்தில் பாரிய பிழைகளைச் செய்து அதன்மூலம் ஆட்சி மாறுகின்ற நிலைமைகூட ஏற்படலாம். ஆகவே, அரசாங்கப் பணம் மக்களுக்குச் சென்றடையும் விதத்தில் கணக்காய்வாளர் திணைக்களம் சரியான முறையில் இயங்கவேண்டுமென்று கூறிக் கொள்ள விரும்புகின்றேன்.

நிதி அமைச்சர் அவர்கள் இரண்டு மாதங்களுக்கு முன்பு எங்களுடைய மன்னார், முல்லைத்தீவுப் பிரதேசங்களில் பஸ் நிலையங்களின் புனரமைப்பு தொடர்பில் அடிக்கல் நடுவதற்கு வந்திருந்தார்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have one more minute.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Okay.

அவர் அங்கு வந்தபோது ஒரு விடயத்தைக் கூறியிருந்தார். அதாவது அங்கு ஒவ்வொரு பிரதேசச் செயலாளரையும் அழைத்து, ஒரு நிகழ்வு ஏற்பாடு செய்யப்பட்டிருந்தது. அதில் "உங்களுடைய பிரதேசச் செயலகங்களுக்கு 200 மில்லியன் ரூபாய் வழங்கப்படுகின்றது; அந்த 200 மில்லியன் ரூபாய்க்கான வேலைத்திட்டங்களை ஆயத்தப்படுத்துங்கள் என்று" கூறப்பட்டது. அதேநேரம் ஒவ்வொரு பிரதேசச் செயலாளருக்கும் 200 மில்லியன் வழங்குவதாக மேடையில் வைத்துக் கூறி, குறித்த ஒரு படிவமும் வழங்கப்பட்டது. அந்த ஒவ்வொரு பிரதேசச் செயலாளரும் 200 மில்லியன் ரூபாய்க்கு ஏற்றவாறு தங்களுடைய கிராமங்கள் தொடர்பில் முன்மொழிவுகளைக் கொடுப்பதற்குத் திட்டம் வகுத்திருந்தார்கள். ஆனால், தற்பொழுது அது மாவட்டத்திற்கு 200 மில்லியனாக மாறியிருக்கின்றது. அதாவது நிதி அமைச்சர் அவர்கள் அங்கு வந்த மக்கள் மத்தியில் பேசிய விடயம் இரண்டு மாதங்களுக்குள் பொய்த்துப் போயிருக்கின்றது. ஆனால், அங்கு அவர் ஒவ்வொரு பிரதேசச் செயலாளருக்கும் 200 மில்லியன் கொடுப்பதாகக் கூறி படிவங்களும் வழங்கியிருந்தார். அதேநேரம் தற்பொழுது இங்கிருந்து கடிதம் வந்திருக்கின்றது, ஒரு பிரதேசச் செயலாளருக்கு 40 மில்லியன் ரூபாய்தான் 'கம்பெறலிய'மூலம் வழங்கப்படும் என்று. ஆகவே, நிதியமைச்சர் கூறியதுபோன்று எங்களுடைய பிரதேசத்தில் பிரதேச செயலாளர் பிரிவு ரீதியாகக் குறித்த நிதி வழங்கப்பட வேண்டும். அங்கு சம்பந்தப்பட்டவர்களை அழைத்து இது சம்பந்தமாகச் சொன்ன பிறகு, தற்பொழுது அது 'இல்லை' என்று கூறப்படுவதை நாங்கள் ஏற்க முடியாது. ஆகவே, நிதி அமைச்சர் அவர்கள் கூறியதுபோன்று எங்களுடைய பிரதேசத்தில் ஒவ்வொரு பிரதேச செயலகத்துக்கும் 200 மில்லியன் ரூபாய் வழங்க வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please, conclude now.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු මංගල ඇමතිතුමා ඇවිත් කිව්වා, "එක ප්‍රාදේශීය ලේකම්වරයකුට රුපියල් මිලියන 200ක් දෙනවා." කියා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් අමාත්‍යතුමා මුලදී කිව්වේ, "මැතිවරණ කොට්ඨාසයකට රුපියල් මිලියන 200ක් දෙනවා." කියායි. ඒක තමයි රජයේ ස්ථාවරය.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමා, මංගල ඇමතිතුමා ඇවිල්ලා, එක ප්‍රාදේශීය ලේකම්වරයකුට රුපියල් මිලියන 200ක් දෙනවා කියා කොළයක් print කර දුන්නා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ, මැතිවරණ කොට්ඨාසයකට -electorate එකකට- තමයි.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ඊට පසුවයි කොළඹින් තීරණය ගත්තේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ඒ ගැන කතා කර ගනිමු.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මා කියන්නේ, උතුර ප්‍රදේශයේ එක් ප්‍රදේශයකට රුපියල් මිලියන 40ක් නොව ඊට වඩා වුවටක් වැඩි කර දෙන්න කියායි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි කතා කරමු, ඒ ගැන.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා.

[අ.භා. 12.22]

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා, ඉතාම වැදගත් කාරණයක් ගැන, විගණකාධිපතිතුමාගේ වැටුප් වැඩි කිරීම සහ එතුමාගේ සේවය පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාද කරන්න යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙන මොහොතක ඒ ගැන කතා කරන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව. අද දවසේ සාකච්ඡා වන මේ මාතෘකාවේ වැදගත්කම, එහි අරමුණ පිළිබඳව හෝ සිතන්නේ නැතිව මේ උත්තරීතර සභාවේ යම් යම් ක්‍රියාකාරකම් සිදු කිරීම පිළිබඳව මන්ත්‍රීවරයකු විධියට මට කතාව ආරම්භයේදීම කනගාටුව සහ කනස්සල්ල ප්‍රකාශ කරන්න සිදු වනවා. මොකද, මා අද උදෑසනින් ඇවිල්ලා මේ වන තුරුම කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ රැස්වීමට සහභාගි වී සිටියා. මා ඇතුළුව ගරු මන්ත්‍රීවරු හතර දෙනෙක් එහි සිටියා. එම කමිටුවේ වැඩසටහන අවසන් කරන්නත් කලින් උත්තරීතර පාර්ලිමේන්තුවේ බෙදුම් සීනුව නාද වූ නිසා තමයි මෙතැනට දුවගෙන ආවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරුන් විධියට අප මේ රටේ උත්තරීතර ආයතනයේ විනය, ක්‍රියාකාරකම් පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරනවා නම් මීට වඩා වැදගත් වනවාය, හරවත් වනවාය කියන එක මා මගේ කතාව ආරම්භයේදීම ප්‍රකාශ කරනවා. ආයතනයක, ප්‍රදේශයක, රටක, එහෙම නැත්නම් යම්කිසි පද්ධතියක වර්ධනය, උන්නතිය සහ සාර්ථකත්වය වෙනුවෙන් ඒ තුළ සේවය කරන සේවකයන්, විගණන කටයුතු කරන පුද්ගලයන්, ඒ පිළිබඳ පරීක්ෂණ, සමීක්ෂණ කරන පුද්ගලයන් සතුටින් සිටිය යුතුයි. එම නිසා අද දවසේ ගරු අග්‍රාමාත්‍යතුමා විසින් එතුමාගේ අමාත්‍යාංශය හරහා මේ නව රජය යටතේ ඉදිරිපත් කරන ලද තීරණය අනුව විගණකාධිපතිතුමාට මාසිකව රුපියල් 50,000ක විශේෂ දීමනාවක් එකතු වෙනවා; ඒ වාගේම, අදාළ වැටුප් පරිමාණයට නිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සිදු වනවා. මේ ගත් තීරණය මා දකින්නේ ඉතාම වැදගත් සහ කාලෝචිත තීරණයක් ලෙසයි. වර්තමානයේ යහ පාලන රජය මඟින් දූෂණයට, වංචාවට, හොරකමට වැට බැඳගෙන යන මේ කාලය තුළ කළ යුතු වැදගත්ම කටයුත්තක් කර තිබෙනවා කියන එක මා කියන්න ඕනෑ. එයට හේතුව මොකක්ද? රටක් විධියට අප තවත් අවුරුදු ගණනාවක් ගිහින් අද කතා කරන්නේත් අතීතයේ කතා කළ දේ ගැන විතරක් නම්, මේ විධියට දෙකට තුනට බෙදිලා, ආණ්ඩුව ගන්න කියා කොළඹට ඇවිල්ලා, පෙළපාළි කර, එය පසුව පුස්සක් වුණාම ගෙදර යන්න පුළුවන්. හැබැයි අප මොන විධියට බෙදිලා දේශපාලනය කළත් අනාගතයේදී රටක් විධියට සතුටින් කතා කරන්න, දියුණු රාජ්‍යයක් බවට මේ රාජ්‍ය පත් කරන්න අපට පුළුවන් වන්නේ, මේ රාජ්‍ය ඉදිරියට ගෙන යන්න අප සූදානම් වෙලා ඉන්නවා නම්, රටේ වග කිව යුතු උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් සූදානමින් ඉන්නවා නම්, ගරු කථානායකතුමා, ගරු නියෝජ්‍ය කථානායකතුමා ඇතුළුව ඔබ අප පෙළ ගැහෙනවා නම් විතරයි. පන්දම් පත්තු කළාට එය කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. උඩ ඉඳලා පෙළ ගස්වා නිවැරැදි කළ යුතු දේවල් නිවැරැදි කරන්න ඕනෑ.

අහිංසක, අසරණ මිනිස්සු ගෙනැල්ලා, තැන් තැන්වල බොන්න දීලා කෑකෝ ගහලා, රටේම මිනිසුන්ගේ බදු මුදලින් නඩත්තු වන "සුවසැරිය" රථවලින් රෝහල්ගත කළාට බැහැ. ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ තමයි මේ යහ පාලන රජය ක්‍රමක්‍රමයෙන් ගොඩනඟමින් යන්නේ. මේ රජය භාර ගනිද්දී අපට හම්බ වුණු, දූෂණයෙන්, වංචාවෙන් පිරුණු ඒ යුගය අපි දැන් ක්‍රම ක්‍රමයෙන් අතුගාලා, පැත්තකට දාලා රටේ රාජ්‍ය නිලධාරියාට සතුටු විය හැකි තැනකට ගෙනැල්ලා තිබෙනවා. සමහර රාජ්‍ය නිලධාරීන් සතුටු නැතුව ඇති. ඒක අපි පිළිගන්නවා. කුණු රසට, පගාවට බර වුණු බොහෝ රාජ්‍ය නිලධාරීන්ට මේ පාලන ක්‍රමය යටතේ තමන්ගේ හොද්ද බොර නොවීම තමයි ඒකට හේතුව. නමුත්, අවංකව රාජකාරි කරන, රටේ සැබෑ උන්නතිය වෙනුවෙන් වැඩ කටයුතු කරන රාජ්‍ය නිලධාරීන් බහුතරයක් අද මේ ගෙන යන බොහෝ වැඩසටහන් සමඟ, ඒ වාගේම මේ රජයත් සමඟ අත් වැල් බැඳගෙන ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රටක් විධියට තව අවුරුදු ගණනක් ගිහිල්ලා ශ්‍රී ලංකාව පිළිබඳව අභිමානයෙන් කථා කරනවාද, නැත්නම් තට්ටු මාරු දේශපාලන ක්‍රමය තුළ ඉඳගෙන නැවත මේ රජය පෙරළලා තව කණ්ඩායම්වලට බලය ගන්න දෙනවාද, රට එක තැන තබනවාද කියන ප්‍රශ්නය තමයි මගේ කථාව ආරම්භයේදීම මම ඔබතුමාගෙන් ඇහුවේ. අපි ඒ පිළිබඳව යළි යළිත් හිතන්නට ඕනෑ. එම නිසා අපි කණ්ඩායමක් විධියට එකතු වෙලා රටේ වැදගත් තීන්දු තීරණ ගනිද්දී එකට අත් වැල් බැඳගන්නට ඕනෑ; ඒ තීන්දු තීරණ ගනිද්දී ඒවාට උදව් කරන්නට ඕනෑ; ඒ තීන්දු තීරණත් එක්ක හිට ගන්නට ඕනෑ. අපි මේ පාර්ලිමේන්තුවට එද්දී, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට පත් වෙන්න අපේක්ෂකයෙක් ලෙස ඉදිරිපත් වෙන්න ගමට යද්දී අපි ජනතාවට කියනවා, හරි දේ ඉදිරියේ අපි හිට ගන්නවා කියලා. අපි ජනතාවට පොරොන්දු වෙනවා, "රටේ අවශ්‍ය කාරණා වෙනුවෙන් ඔබ නියෝජනය කරනවා" කියලා. ගරු මන්ත්‍රීවරුනි, පුත්තලම දිස්ත්‍රික්කයෙන් අශෝක ප්‍රියන්ත පාර්ලිමේන්තුවට එවන්නේ එක්සත් ජාතික පක්ෂයේ කාර්ය භාරය කරන්න විතරක්ම නොවෙයි. ඒ, දිස්ත්‍රික්කයේ සිටින ලක්ෂ ගණනක් වන ජනතාවගේ හදවතේ තිබෙන සැබෑ වුවමනා ඉටු කරන්න සහ පාට පක්ෂ කණ්ණාඩි අත් හැරලා විටෙක පාර්ලිමේන්තුව තුළ හඬක් නඟන්න පුළුවන් නම් ඒ හඬ නංවන්නයි. එතැනට ආපු අපි හැම මොහොතකම පැති කණ්ණාඩියෙන් බලනවාට වඩා රටේ උත්තරීතර ආයතනයේ වගකීම්, ඒ ආයතනයේ ගෞරවය, ඒ වාගේම ඒ ආයතනයට අනුබද්ධ ආයතනවල ගෞරවය රකිමින් මේ රටේ රාජ්‍ය පාලනයට සහයෝගය දෙන්න ඕනෑ.

රටේ සෑම ආයතනයක්ම විගණනය කළ යුතුයි. ඒක මගේ අදහස. ඒ වාගේම රටේ ආයතන විගණනය කරලා, අනතුරුව පසු විපරම් කරලා, දූෂණ වංචා සහ අයථා ගසා කෑම්වලින් සිදු වුණු පාඩු වෙනුවෙන් ඒ වැරැදි කරන අයට දඬුවම් දිය යුතුයි කියලා මේ

රටේ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට මම කියනවා. එහෙම නැති නම් දිගින් දිගට පරීක්ෂණ කරමින්, පරීක්ෂණ විතරක් තිබෙනවා නම් රටේ ජනතාව අනාගතයේ දවසක ඒ වෙනුවෙන් පෙනී සිටියි කියලා මම ඔබතුමාට කියා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලැබුණු කාලය සීමිතයි. මම කියන්නේ, රටක් විධියට අපි ගොඩනැඟිය යුතු බවයි. එහෙම නම් රටේ සියලු මූල්‍ය ආයතන, රාජ්‍ය දේපළ, රාජ්‍ය මුදල්, ඒ සියල්ල විගණනය කරලා, ජනතාවට වග කියන විධියට වියදම් කරලා, එයින් ලැබෙන ප්‍රතිඵලය සමස්ත රටේම ජනතාවට භුක්ති විඳිය හැකි ඉතාමත් ගුණාත්මක සේවාවක් සැපයෙන රාජ්‍යයක් ගොඩනඟන්න අපි හැමෝටම එකතු වෙන්න පුළුවන්. එහෙම එකතු වෙන්න අවස්ථාව තිබියදී තමයි බොරුවට රටේ සිටින ජනතාව පෙළ ගස්වලා, ඒ මිනිසුන්ව අවුස්සලා කුපිත කරලා ආණ්ඩුව පෙරළලා ගෙදර යන්න කොළඹට එන්නේ. "නැවත කොළඹ එන්න එපා, කොළඹ මිනිස්සු කුපිත වුණොත් ගෙදර යන්න ලැබෙන්නේ නැහැ" කියන එක මම රටේ ජනතාවට ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පස් වරු1.30 දක්වා සභාවේ වැඩ කටයුතු තාවකාලිකව අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා]ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

I call upon the Hon. Leader of the House to move Item Nos. 33 and 34.

## වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත
## மருத்துவம் (திருத்தம்) சட்டமூலம்
## MEDICAL (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Health, Nutrition and Indigenous Medicine, I move,

"That the Bill be now read a Second time."

Sir, on behalf of the Minister, I also move Item No. 34.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*විනා එடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා. 1.31]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින වෛද්‍ය ආඥා පනත සංශෝධනය කිරීමටත්, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග ගෙන ඒමටත් තමයි බලාපොරොත්තු වෙන්නේ. මා එකින් එක පැහැදිලි කරන්නම්, මේ කුමක්ද කියන එක ගැන. පළමුවැනි කාරණය විධියට වෛද්‍ය ආඥා පනත සංශෝධනය කිරීම සඳහා අද හේතු පාදක වෙලා තිබෙන්නේ වෛද්‍ය ආඥා පනත අනුව වෛද්‍යවරු සහ විශේෂඥ වෛද්‍යවරු - දෙගොල්ලන්ම- එකම කාණ්ඩයක ලැයිස්තු ගත කරලා තිබීමයි; එකම වෙළුමේ තිබීමයි. සුදුසුකම් අනුව විතරක් ඔවුන්ව වෙන් කරලා තිබෙනවා. නමුත් දියුණු රටවල් හැම එකකම විශේෂඥ වෛද්‍යවරුන්ට ඒ වෛද්‍ය සභාව යටතේ වෙනමම රෙජිස්ටරයක් තිබෙනවා. ඒක ලෝකයේ පිළිගත් ක්‍රමවේදයක්. බ්‍රිතාන්‍ය වෛද්‍ය සභාව මෙම විශේෂඥ වෛද්‍යවරුන්ගේ රෙජිස්ටර් එක -Specialists' Registry එක- වෙනමම රෙජිස්ටරයක් බවට පත් කරලා දැනට අවුරුදු 20කට වඩා වැඩියි. නමුත් අපට මේක දිගටම කරන්න සිදු වුණේ නැහැ. ඒක නිසා අද අපි කරන්නේ මෙන්න මේ Consultants' Registry -Specialists' Registry- කියන එක වෙනම රෙජිස්ටරයක් බවට පත් කිරීමට කටයුතු කිරීමයි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව 2006දී මෙය සංශෝධනය කිරීමට තීන්දුවක් ගත්තා. ඒ තීන්දුව ගත්තාට ඒ තීන්දුව ක්‍රියාත්මක වුණේ නැහැ. මේක ඇතුළේ යම් බියක් තිබෙනවා, සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ අයිතිය පිළිබඳව සහ paramedics ඇතුළු අනෙකුත් කණ්ඩායම්වලට තමන්ගේ වෘත්තීය ක්‍රියාත්මක කිරීමට ප්‍රශ්න ඇති වෙයි කියලා. නමුත් එහෙම දෙයක් නැහැ. ඒ පිළිබඳව එක් කණ්ඩායමක් සුප්‍රීම් උසාවියටත් පෙත්සම් ගොනු කරලා මේ පිළිබඳව විරෝධය ප්‍රකාශ කළා. නමුත් සුප්‍රීම් උසාවිය පවා තීන්දු කළා, අපි ඉදිරිපත් කරලා තිබෙන සංශෝධන අනුව එවැනි දෙයක් සිදු වන්නේ නැහැ කියලා. ඇත්තටම යම් කිසි කෙනෙක් චේතනාන්විතව විශේෂඥ වෛද්‍යවරයෙක් විධියට ක්‍රියා කරනවා නම් හෝ තමන් විශේෂඥ වෛද්‍යවරයෙකු ලෙස පෙන්වමින් නොයෙකුත් ක්‍රියාමාර්ග ගන්නවා නම් ඒ ක්‍රම දෙක තමයි අද ඉදිරිපත් කරන සංශෝධන යටතේ සීමා කරන්නේ. ඒ නිසා කාටවත් බියක් වෙන්න ඕනෑ නැහැ.

ඉදිරියේදී මේකටත් වඩා වෙනස් බ්‍රිතාන්‍ය වෛද්‍ය සභාව වාගේ ස්වාධීන වෛද්‍ය සභාවක් ඇති කරන්න අපි පනතක් ගෙනෙනවා. අපි ගෙනෙන්නේ වෛද්‍යවරුන්ගේ වෛද්‍ය සභාවක් නොවෙයි, රටේ සෞඛ්‍යය ආරක්ෂා කරන, ජනතාවගේ අයිතීන් ආරක්ෂා කරන වෛද්‍ය සභාවක්. වෛද්‍ය සභාවක මූලික පරමාර්ථය වන්නේ වෛද්‍යවරුන්ගේ අයිතිය ආරක්ෂා කිරීම නොවෙයි, වෛද්‍ය සේවයේ අයිතිය ආරක්ෂා කිරීමයි. ජනතාවට ලබා දෙන සේවය ආරක්ෂා කිරීම තමයි වෛද්‍ය සභාවක යුතුකම. නමුත් අද මේ රටේ වෛද්‍ය සභාවෙන් සිදු වන්නේ වෛද්‍යවරුන් එකතු වෙලා වෛද්‍යවරුන්ගේ ප්‍රශ්න නිරාකරණය කර ගැනීම පමණයි. ඒ නිසා වෛද්‍යවරුන් කරන නීති විරෝධී වාගේ ක්‍රියා

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

එකක්වත් ගැන හරි පරිපාලනයක් සිදු වන්නේ නැහැ, මේ වෛද්‍ය සභාවෙන්. මොකද, ඒ නඩු අහන්නේත් වෛද්‍යවරු; විත්තිකරුවෝත් වෛද්‍යවරු. නමුත් බ්‍රිතාන්‍ය වැනි යුරෝපා රටවල කුඩා වෛද්‍ය කවුන්සල තිබෙන්නේ. ඒකේ නීතිඥවරු ඉන්නවා; නොයෙකුත් වෘත්තීයවේදීන් ඉන්නවා; සමාජ ක්‍රියාධරයන් ඉන්නවා. ඒ එක්කම තමයි වෛද්‍යවරුනුත් ඉන්නේ. නමුත් බහුතරය ඉන්නේ පිට අය.

ඒ නිසා එතැනින් විශාල සාධාරණත්වයක් ජනතාවට සිදුවෙනවා. අන්න එවැනි වෛද්‍ය සභාවක් ඇති කිරීම සඳහා වෛද්‍ය සභාවෙන්ම යෝජනා කරපු අයගේ නම් මම ඉල්ලා ගත්තා. ඒ නම්වලින් තෝරා ගත් අයගෙන් අපි ඊයේ කමිටුවක් පිහිටෙව්වා. ඒ කමිටුවට මම මාස දෙකක කාලපරිච්ඡේදයක් දුන්නා, අපි දිගටම සාකච්ඡා කරලා තිබෙන වෛද්‍ය ආඥා පනත කෙටුම්පත් කරලා ගේන්න කියලා. ඒ පනත් කෙටුම්පත ගෙනාවාම ඉතුරු බොහෝ දේවල් අපට විසඳාගත හැකියි. The Association of Medical Specialists විසින් ඉදිරිපත් කළ ලේඛනයක Specialists' Registry එකක වාසි පිළිබඳව මෙසේ සඳහන් වනවා, I quote:

"* Patients have every right to differentiate a specialist from a non -specialist as the register would be accessible to everyone.

* This enables the Certifying Authority to define the required criteria one should fulfill to be included in the Register.

* The Appointing Authority will be compelled to appoint specialists based on standards prescribed by the Certifying Authority.

* This will enable other organizations such as the private health sector to follow and conform to the above standards in enrolling specialists.

* This prohibits unqualified and part qualified individuals engaging in specialist practice.

* Such register would help insurance providers, legal authorities and agents issuing medical certificates for foreign employment to authenticate specialist practitioners."

ඒ නිසා ඇත්තටම මම මෙහිදී පෙන්වා දෙන්න ඕනෑ, සුප්‍රිම් උසාවියේ නඩු තීන්දුව ගැන. එහි පැහැදිලිවම කියනවා, මෙවැනි රෙගුලාසියක් මෙතෙක් නොතිබීම ගැන ඔවුන් මවිතයට පත් වෙනවා කියලා. සුප්‍රිම් උසාවියේ නඩු තීන්දුවෙන් කොටසක් මම කියවන්නම්. එහි මෙසේ සඳහන් වනවා:

"The intention of this registry is quite well seen to be to protect and preserve the standards in health service sector in line with the practice in other countries. We ourselves find it quite difficult to understand why there was no specialists' registry in our country all this time. The names of specialists in any subject should be available to be recognized and given prominence to since they are specialized on that subject."

මෙන්න මේ සුප්‍රිම් උසාවි නඩු තීන්දුව තමයි අර පෙත්සම් ඉවත ලා මේක ඉදිරියට ගෙන යන්නට අපට අවසරය දුන්නේ. ඒ වාගේම ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ ඖෂධ ලියා පදිංචි කිරීමේ ගාස්තු සම්බන්ධයෙන් සංශෝධනයක් කිරීමටයි. අපි ගිය වතාවේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ ගාස්තු සංශෝධනය කළා. ඒක කළාම විශේෂයෙන්ම ඔසුසල් හිමියන්ගෙන් අපට පැමිණිලි ආවා. ඔවුන් කුඩා ව්‍යාපාරිකයින්. ඔවුන්ට නියම කළ බදු මුදල් වැඩියි කියලා කිව්වා. ඔවුන් කිව්වා, බදු මුදල් රුපියල් 10,000 සිට 6,000කට විතර අඩු කරන්න කියලා. මම ඒක 5,000ටම අඩු කළා. ඒවා තමයි අපි ගෙන ආ සංශෝධන. ඔසුසල් හිමියන්ටත්, අපේ රටේ ඖෂධ නිෂ්පාදනය කරන්නන්ටත් නියම කර තිබෙන බදු ප්‍රමාණයන් අඩු කර මේ කොටියාස දෙකට සහන ලබාදීමට තමයි ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග ඉදිරිපත් කරන්නේ. [බාධා කිරීමක්] නැහැ, ගාස්තු සංශෝධනය. එච්චරයි.

අද ජාතික ඖෂධ නියාමන අධිකාරිය ස්වාධීන ආයතනයක් වශයෙන් ක්‍රියා කරමින් මේ රටේ ඖෂධ සහ අනෙකුත් වෛද්‍ය උපකරණවල මිල පාලනය කිරීම සඳහා ඉතා විශාල කාර්යභාරයක් කරනවා. එයින් මේ රටේ ජනතාවට විශාල වාසියක් ලැබිලා තිබෙනවා. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපති ධුරයට මහාචාර්ය අසිත ද සිල්වා මැතිතුමා පත් කර තිබෙනවා. එතුමා ආචාර්ය උපාධියක් සහිත මේ රටේ ඉන්න එකම සායනික ඖෂධවේදියා වනවා. එතුමාගේ ප්‍රධානත්වයෙන් අපි පසුගිය කාලයේ මුල් වටයට අත්‍යවශ්‍ය ඖෂධ 48ක් හඳුනාගෙන ඒවායේ මිල පාලනය කළා. ඒ ඖෂධ 48ක මිල පාලනය කළාම මේ තත්ත්වය යටතේ ඇත්තටම වෙළඳ නාමයෙන් යුක්ත ඖෂධ 272ක මිල පාලනය වුණා. මේ වෙනකොට රෝහල්වල medical survey එකක් කරලා තිබෙනවා; විගණනයකුත් කරලා තිබෙනවා. ඒකෙන් අපි සොයාගෙන තිබෙනවා, මේ ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන වෙනස ගැන. පළමුවැනි එක තමයි ඖෂධ පරිභෝජනය විශාල වශයෙන් වැඩිවෙලා තිබෙනවා.

ඒ විධියට ඖෂධ භාවිතය වැඩි වෙලා තිබෙන්නේ, වෙනදා මුදල් නැතිකම නිසා ඖෂධ නොගෙන සිටි අයත් ඖෂධ භාවිත කරන්න පටන් ගත්ත නිසායි. ස්ථිර වැටුපක්, ස්ථිර ආදායමක් තිබෙන රජයේ සේවකයන්, පුද්ගලික අංශයේ සේවකයන්, විශ්‍රාමිකයන් වැනි අයට ඖෂධ වෙනුවෙන් යන වියදම දරාගන්න බැරි හින්දා ඔවුන් ක්‍රමවත්ව ඖෂධ ලබා ගත්තේ නැහැ. සමහර වෙලාවට ඔවුන් දවසක් ඇර දවසක් තමයි ඖෂධ ලබා ගත්තේ. ඔසුසල් හිමියන් කියනවා, රෝගීන් ඇවිල්ලා එක දවසකට විතරයි බෙහෙත් ගන්නේ කියලා. ඒ ගොල්ලන්ට ඊට වඩා ඖෂධ මිලදී ගන්න මුදල් නැහැ. නමුත්, අද ඒ සියලු අය නියම විධියට තමන්ට අවශ්‍ය ඖෂධ ලබා ගන්නවා. සමහර ප්‍රතිජීවක වරින් වර ගත්තාම resistance strains තත්ත්වයට ඇවිල්ලා, ඒ රෝගින්ට තවත් නරක එලවිපාක ඇති වෙනවා. අද ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි මේ විගණනයෙන් පළමුවෙන්ම පෙන්වා දී තිබෙන්නේ, ඖෂධ භාවිතය සියයට 600කින් වැඩි වෙලා තිබෙන බව. ඖෂධ මිල නියාමනය කිරීම නිසා ඖෂධ භාවිතය 6 ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. අපි ඒ මිල නියාමනය කළේ සාමාන්‍ය මිලඅඩු කිරීම් ලෙස නොවෙයි. අපි ඖෂධ මිල ඉතා දැවැන්ත ලෙස අඩු කළා. ඒ බව මම මීට කලිනුත් පෙන්වා දීලා තිබෙනවා. රුපියල් 215ට තිබුණු Atorvastatin එක අපි රුපියල් 17.60 වෙනකම් අඩු කළා. Cozaar පෙත්ත රුපියල් 81 සිට රුපියල් 10.30 දක්වා අඩු කළා. රුපියල් 150ට තිබුණු Crestor කියන එක රුපියල් 37 දක්වා අඩු කළා. රුපියල් 40ට තිබුණු Voltaren එක රුපියල් 13 දක්වා අඩු කළා. රුපියල් 101ට තිබුණු Nexium එක රුපියල් 20 දක්වා අඩු කළා. මේ විධියට මිල අඩු කළ නිසා ඖෂධ භාවිතය 6 ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. ඖෂධ මිල නියාමනයෙන් සිදු වූ දෙවැනි වාසිය තමයි, එදාටත් වඩා ගුණාත්මකභාවයෙන් වැඩියි කියලා හිතෙන ඖෂධ භාවිතය වැඩි වෙලා තිබෙන එක. ඒක ඉතාම ඉහළ තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. ඉතා හොඳ ඖෂධ වෙළෙඳ නාමවලින් තිබෙන Augmentin වාගේ ඖෂධයක් ගත්තොත්, ඒ වෙළෙඳාම මිලියන 40 සිට මිලියන 211 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව, දැන් සාමාන්‍ය මිනිස්සුත් පරිභෝජනය කරන්නේ හොඳම බෙහෙත්.

විශේෂඥ වෛද්‍ය ගෝඨාභය රණසිංහ මහත්මයා මට කිව්වා, "Doctor අපට හොඳම බෙහෙත් ලියන්න" කියලා රෝගීන් එතුමාට කියනවා කියලා. ඔවුන් එදා බොහොම අසරණව හිටපු

අය. Dr. LakKumar Fernando මට කිව්වා, "දැන් තමයි අපි අපේ channel practice එක ආසාවෙන් කරන්නේ. එදා අපි ලෙඩා දිහා බලලා තමයි බෙහෙත් නියම කළේ. ඒ ලෙඩාගේ ආර්ථිකයට දරාගන්න පුළුවන් විධියටයි බෙහෙත් නියම කළේ. අද එහෙම නොවෙයි, අපි හොඳම බෙහෙත ඔවුන්ට ලියා දෙනවා. ඒ නිසා අද අපට අපේ වෛද්‍ය වෘත්තිය ගැන සතුටක් තිබෙනවා" කියලා. එදා Zithrin වාගේ ඖෂධ පෙති 184,000ක් විතර තමයි විකිණුනේ. නමුත්, අද Zithrin ඖෂධ පෙති 389,000ක් විතර විකිණෙනවා. සියයට 200කටත් වඩා වැඩි ප්‍රමාණයකින් භාවිතය වැඩි වෙලා තිබුණා. එදා Herbesser කියන විශේෂ ඖෂධය 232,000ක් විතර විකිණුනේ. දැන් ඒ ඖෂධය 505,000ක් විතර විකිණෙනවා. ඒ ඖෂධයේ භාවිතයත් දෙගුණයකටත් වඩා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, Losartanවල Losacar කියන ඖෂධය එදා ලක්ෂ 55ක් විතර විකිණුනා. අද ඒවා විකිණීම ලක්ෂ 115ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. නමුත් එදා මොකක්ද කිව්වේ? මේ ඖෂධ මිල නියාමනය හොඳ වර්ගයේ ඖෂධ ඔක්කෝම වෙළෙඳ පොළෙන් ඉවත් වෙනවාය කිව්වා. නමුත් එහෙම වුණේ නැහැ.

සති අන්ත ප්‍රසිද්ධ ඉංග්‍රීසි පුවත් පතක් මේ ගැන කර්තෘ වාක්‍යයකුත් ලිව්වා. ඔවුන් කිව්වා, "මේකෙන් වෙන්නේ ගුණාත්මකභාවයෙන් ඉහළ මට්ටමක තිබෙන ඖෂධ සමාගම් ලංකාවෙන් ඉවත් වෙලා යන එකයි." කියලා. නමුත් ඒ එක සමාගමක්වත් ඉවත් වෙලා ගියේ නැහැ. ඔවුන් අපට බලපෑම් ඇති කළා. ඒ බලපෑම්වලට අපි මුහුණ දුන්නා. ඒවාට අවශ්‍ය දේවල් අපි කරන කොට ඒ ගොල්ලන් රැඳී සිටියා.

එදා Voltaren කියන ඖෂධයේ වෙළඳාම තිබුණේ 475,000යි. දැන් 1,380,000ක විතර වෙළඳාමක් තිබෙනවා. ඒ වාගේම, Cataflam කියන ඖෂධයේ වෙළඳාම එදා තිබුණේ 709,000යි. අද ඒ ඖෂධයේ වෙළඳාම 1,674,000 දක්වා වැඩි වෙලා තිබෙනවා. එදා Crestor කියන ඖෂධය 181,000ක් විතර විකුණුනේ. දැන් 532,000ක් විතර විකිණෙනවා. ඒ වාගේම, Nexium 20mg ඖෂධය එදා විකුණුනේ 148,000යි. අද 1,024,000ක් විතර විකිණෙනවා. ඒ වාගේම, Nexium 40mg එදා 127,000යි විකුණුනේ. දැන් එම ඖෂධයේ වෙළඳාම 828,000ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, එදා Astrix කියන ඖෂධය 1,394,000යි විකුණුනේ. දැන් එම ඖෂධයේ වෙළඳාම 4,953,000 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඖෂධ ගැන මට මේ විධියට දිගටම කියන්න පුළුවන්. මේකෙන් පෙනෙනවා, ගුණාත්මක ඖෂධ භාවිතය කිරීමේ රටාවකට අද ජනතාව ඇවිල්ලා තිබෙන බව. මේක තමයි දියුණු ලෝකයේ රටවල්වල ඖෂධ භාවිතය කිරීමේ රටාව. අද ලංකාවත් ඒ තත්ත්වය කරා ගමන් කරමින් තිබෙනවා.

තුන්වැනි කරුණ තමයි මෙයින් ජනතාවට ඇති වුණු ආර්ථික ප්‍රතිලාභය කොපමණද කියන එක. ඖෂධ මිල අඩු වීමෙන් පසුගිය වසරේ ජනතාවට ලැබුණු ආර්ථික ප්‍රතිලාභය -මිල අඩු වීමේ වාසිය - රුපියල් බිලියන 4.4ක්. ඖෂධ පාවිච්චියේදී ජනතාවට රුපියල් කෝටි 440ක වාසියක් ගිය අවුරුද්දේ ලැබී තිබෙනවා. අපි නැවතත් දෙවැනි වතාවට ඖෂධ වර්ග 25ක මිල නියාමනය කළා. එහිදී අපි තෝරා ගත් එක් ඖෂධ වර්ගයක් තමයි මිල ඉතාම අධික පිළිකා ඖෂධ. පිළිකා ඖෂධවලින් සියයට 95ක්ම සපයන්නේ රජයට. පෞද්ගලික රෝහල්වලට පිළිකා ඖෂධ ගන්නේ සියයට පහයි. පිළිකා ඖෂධ මිල අධික නිසා හැමකෙනාම රජයේ රෝහල්වලට තමයි එන්නේ. මම අමාත්‍ය ධුරය භාර ගන්නකොට Trastuzumab injection එකේ මිල රුපියල් 280,000යි. මම ඒ වෙනුවට දෙවැනි ඖෂධයක් ඉදිරිපත් කළා. මම ආනයනකරුවන්ට කිව්වා දෙවැනි ඖෂධයක් ඉදිරිපත් කරන්න කියලා. ඔවුන් දෙවැනි ඖෂධයක් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී බාල ඖෂධ ගෙනෙනවා කියලා නොයෙක් කටිටිය මාධ්‍ය හරහා මට විශාල වශයෙන් පහර දුන්නා. මේ වන විට එම ඖෂධය අවුරුදු තුනක් පාවිච්චි කරලා තිබෙනවා. නමුත් ඒ ඖෂධයේ කිසිම වැරැද්දක් වාර්තා වෙලා නැහැ. කිසිම වරදක්, adverse effect එකක් අද වන තෙක් වාර්තා කරලා නැහැ. එම නිසා අද වන විට ඒ විධියේ තවත් ඖෂධ වර්ග දෙකක් ඇවිත් තිබෙනවා. ඇමෙරිකානු FDA එක පවා පිළිගත් මිල අඩු ඖෂධ වර්ග දෙකක් අද වන විට ඇවිත් තිබෙනවා. ඒ අනුව අපි ඒ තිබුණු අධිකාරය කැඩුවා. එදා ප්‍රබල බහුජාතික සමාගම් මොකක්ද කළේ? ඔවුන් ඖෂධ වර්ග කිහිපයක් තියාගෙන එක ඖෂධයයි ඉදිරිපත් කළේ. ඒකට එක වෙළෙඳ නාමයයි තිබුණේ. දෙවැනි එකකට එන්න ඉඩ දුන්නේ නැහැ. දෙවැනි ඖෂධය ආපු හැටියේ ඒ ගොල්ලන් මොකක්ද කළේ? දෙවැනි ඖෂධය ආපු හැටියේ රුපියල් 280,000 ඖෂධය රුපියල් 165,000 දක්වා අඩු කළා. ඒකෙන්ම තේරෙනවා ඒ ගොල්ලන්ගේ ගසා කෑම කොච්චරද කියලා. දෙවැනි පුද්ගලයා රුපියල් 148,000කට ඒ ඖෂධය ඉදිරිපත් කළා. Trastuzumab vial 440mg තිබුණේ රුපියල් 148,340.44ට. අපි ඒ ගණන රුපියල් 95,000ට අඩු කර තිබෙනවා. ඒකේම මිලිග්‍රෑම් 150 රුපියල් 94,854.96ට තිබුණේ. අපි ඒක රුපියල් 32,390ට අඩු කළා. ඒ වාගේම, Rituximab vial එක රුපියල් 118,000ට වාගේ තිබුණේ. අද වන විට එය රුපියල් 55,000ට අඩු කරලා තිබෙනවා. ඒකේම 100mg තිබුණේ රුපියල් 23,000ට. ඒක අපි රුපියල් 11,000 දක්වා අඩු කරනවා. ඒ වාගේමයි Peg-asparaginase vial IU එක. ඒක රුපියල් 248,750ට තිබුණේ. ඒක රුපියල් 140,000ට අඩු කර තිබෙනවා. ඒ වාගේම ඒ 500 mg රුපියල් 68,470ටයි තිබුණේ. ඒක රුපියල් 15,600ට අඩු කර තිබෙනවා. රුපියල් 15,548 තිබුණු 100mg එක රුපියල් 3,120ට අඩු කර තිබෙනවා. Abiraterone Acetate 250 mg රුපියල් 1,080ට තිබුණේ. ඒක රුපියල් 275 දක්වා අඩු කර තිබෙනවා. Filgrastim vial එක රුපියල් 40,000ට තිබුණේ. ඒක රුපියල් 22,000ට අඩු කර තිබෙනවා. මේ වාගේ දැවැන්ත විධියට අපි ඖෂධ මිල අඩු කර තිබෙනවා. ඇත්තටම රජය ඖෂධ වෙනුවෙන් වසරකට රුපියල් මිලියන 7,077කට වැඩි මුදලක් වියදම් කරනවා. එයින් රුපියල් මිලියන 4,066කට වැඩි ප්‍රමාණයක් වියදම් කරන්නේ පිළිකා ඖෂධ සඳහායි. සියයට 57ක් වැය වන්නේ පිළිකා ඖෂධ සඳහායි. අද වන විට ඒ රුපියල් මිලියන 4,066, රුපියල් මිලියන 2,281 දක්වා අඩු වෙලා තිබෙනවා. එසේ අඩු වූ විට රජයට රුපියල් මිලියන 1,780ක ලාභයක් තිබෙනවා. රුපියල් බිලියන 1.8ක විතර ලාභයක් රජයට තිබෙනවා. මේ පිළිකා ඖෂධ සම්බන්ධවයි.

ඒ වාගේම, දියවැඩියා රෝගීන්ට අවශ්‍ය Glucose monitor strips අඩු කරන්න කියලා ජනතාව අපෙන් ඉල්ලුවා. දියවැඩියා රෝගීන් විශාල සංඛ්‍යාවක් සිටින නිසා අපි ඒවායේ මිලත් අඩු කළා. අලුත් ලැයිස්තුවේ තිබෙන Cefotaxime කියන බෙහෙත රුපියල් 693 සිට රුපියල් 375 දක්වා අඩු කළා. Fluconazole කියන බෙහෙත රුපියල් 74ට තිබුණේ. එය රුපියල් 45 දක්වා අඩු කළා. එහි 50 mg එක රුපියල් පනස්නවයයි ගණනකට තිබුණේ. අපි ඒක රුපියල් 25ට අඩු කළා. රුපියල් 1,760 insulin එක රුපියල් 1,200 වෙනකම් අඩු කළා. ඒ වාගේම Glucose monitor strip එකක් රුපියල් 90ට තිබුණේ. එය රුපියල් 50 දක්වා අඩු කළා. ඊට අවශ්‍ය උපකරණය තිබුණේ රුපියල් 5, 260ටයි. අපි එය රුපියල් 2,750ට අඩු කළා. මේ වාගේ ජනතාවට අත්‍යාවශ්‍ය තවත් ඖෂධ වර්ග 15ක මිල අපි අඩු කළා.

එම ඖෂධ 15ත්, පිළිකා ඖෂධ 10ක් ඇතුළුව ඖෂධ වර්ග 25ක මිල අඩු කළා. ඒ අනුව අපි මේ වන විට වෙළෙඳ පොළේ ඖෂධ වර්ග 73ක මිල අඩු කරලා තිබෙනවා. ඒ වාගේම අපි stentවල මිල අඩු කළා. රුපියල් ලක්ෂ තුනහමාරකට තිබුණු stent එක මිල අපි රුපියල් 105,000කට අඩු කර, තුනෙන් එකකට ගත්තා. ඒ වාගේම ඇමෙරිකාවෙන් ගෙන්වන අක්ෂි කාවයක මිල තිබුණේ රුපියල් 60,000කට, අද අපි ඒක රුපියල් 8,000කට අඩු කරලා තිබෙනවා. ඒ අනුව අද ශල්‍යකර්ම ගාස්තු ආදී බොහෝ දේවල ගාස්තු අඩු කරලා තිබෙනවා.

මහාචාර්ය සේනක බිබිලේ මහතාගේ අනෙක් ප්‍රතිපත්තිය තමයි, ලංකාවේ මේ ඖෂධ නිෂ්පාදනය කිරීම. ඒ සඳහා අපි ඉස්සෙල්ලාම කළේ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ නිෂ්පාදනය වැඩි කිරීම. අපි දැනට එහි නිෂ්පාදනය කරන්නේ අවුරුද්දකට කරල් සහ පෙති බිලියන 2යි. ඔක්තෝබර් 15වෙනි දා ගරු ජනාධිපතිතුමා ඇවිල්ලා එහි දෙවෙනි කර්මාන්තශාලාව විවෘත කරනවා. එම කර්මාන්තශාලාවත් විවෘත කළාට පසුව අවුරුද්දක නිෂ්පාදන ධාරිතාව බිලියන 2 සිට බිලියන 4 දක්වා වැඩි වෙනවා. ඒ කියන්නේ අපේ ඖෂධ නිෂ්පාදනය දැන් වාගේ දෙගුණයකින් වැඩි වෙනවා. ඒ අනුව දැනට වඩා දෙගුණයකින් වෙළෙඳ පොළට ඖෂධ ලබා දීමට රජයට පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපි තවත් දේශීය සහ විදේශීය ඖෂධ සමාගම් 46ක් සමඟ ගිවිසුම් අත්සන් කළා. ඒ අය රජයත් සමඟ ඒකාබද්ධ ව්‍යාපාරයක් කරනවා නම් අපි අවුරුදු 15ක buy-back guarantee එකක් දෙනවා, ඒ අය ස්වාධීනව ව්‍යාපාරය කරනවා නම් අපි අවුරුදු 10ක buy-back guarantee එකක් දෙනවා. මේ අනුව අද වන විට 46 දෙනෙකු ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා, ඒ අයගෙන් තුන් දෙනෙකු මේ වන විටත් නිෂ්පාදනය ආරම්භ කරලා තිබෙනවා. තවත් සමාගම් දෙකක් මේ අවුරුද්ද අවසන් වන විට නිෂ්පාදනය ආරම්භ කරනවා. ඒවා යුරෝපීය තත්ත්වයට සමාන ඖෂධ සමාගම්. ඒ අයගේ දෙවෙනි අදියරේදී ඒ අය බලාපොරොත්තු වෙන්නේ, මේ රටේ වෙළෙඳ පොළ අවශ්‍යතා අවසන් වුණාම ඒ අයගේ ඖෂධ යුරෝපයට අපනයනය කිරීමටයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මා අවසන් කරන්නම්. තව පොඩි කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මෙහිදී තමුන්නාන්සේලාට බලාගන්නට පුළුවන් මේ අලුත් නිෂ්පාදන නිසා රටේ ඖෂධවල මිල කොපමණ ප්‍රමාණයකින් අඩු වෙනවාද කියලා. Diclofenac Sodium tablet එකේ අපි නියම කරපු මිල රුපියල් 13යි. නමුත් අලුත් නිෂ්පාදකයින් අපට ඒක ශත 57කට ලබා දෙනවා. මේ ආකාරයට බොහෝ ඖෂධ ප්‍රමාණයක මිල අඩු වෙනවා. Salbutamol inhaler එකේ කලින් පාලන මිල රුපියල් 310යි, නමුත් ඒගොල්ල ඒක ලංකාවට දෙනවා රුපියල් 195කට. ඒ වාගේම Omeprazoleවල පාලන මිල රුපියල් 4.50යි, අපේ නිෂ්පාදකයෝ ඒක අපිට රුපියල් 1.40කට දෙනවා. මිනිසුන් හුහාක්ම පාවිච්චි කරන ඖෂධයක් වන Domperidoneවල පාලන මිල රුපියල් 5.40යි, නමුත් අලුත් මිල අනුව අපි දැන් ඒක ගන්නේ ශත 54කට. එනම් දහයෙන් එකකට. ඒකෙන් තේරෙනවා, ඖෂධ වෙළෙඳාමේ මෙතෙක් කල් තිබුණු ගසා කෑම. ඇත්තටම නිදහස් සෞඛ්‍ය සේවය කියලා රජය මුදල් වියදම් කළේ, ජනතාවට නොවෙයි. මේ ඖෂධ සමාගම්වලටයි. මේ අනුව මේ අලුත් නිෂ්පාදන සමාගම්වලින් ඖෂධ මිලදී ගැනීම නිසා එන ලාභය ගැන මම කියන්නම්. උදාහරණයක් විධියට Atorvastatin tablet එක අපි ගන්නේ රුපියල් 11.05ක පාලන මිලකට, ඒක ශත 93කට අඩු වෙනවා. ආණ්ඩුව අවුරුද්දකට මේ Atorvastatin කියන tablets මිලියන 136ක් ගන්නවා. මේ අලුත් නිෂ්පාදකයින්ගෙන් මිලදී ගැනීම නිසා එතැනින් ආණ්ඩුවට එන ලාභය රුපියල් මිලියන 1,390ක් වෙනවා. මේ අනුව අපි අවසානයේදී එන ලාභය ගණනය කළා. මේ නව නිෂ්පාදන සමාගම්වලින් ඖෂධ මිලදී ගැනීම නිසා ආණ්ඩුවට රුපියල් මිලියන 6,292ක් ලාභ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපි අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් මිලියන 900ක් වියදම් කරනවා ඖෂධ සහ උපකරණ සඳහා. ඒ යන වියදමින් විශාල මුදලක් මේ රටේ රඳවා ගැනීම තමයි අපේ බලාපොරොත්තුව.

ඒ විතරක් නොවෙයි, අපි ගියවර ඖෂධ මිල අඩු කළාම ඖෂධ ආනයනකරුවෝ ඒගොල්ලන්ගේ නිෂ්පාදකයන්ට කිව්වා, මේගොල්ලන්ගේ තෙරපීම වැඩියි, ලාභ ප්‍රමාණයන් අඩුයි, එම නිසා ඔයගොල්ලන්ගේ නිෂ්පාදන මිලත් අඩු කරන්න කියලා. ඒ අනුව දැන් හුහාක් ඖෂධවල ගහලා තිබෙනවා, "Only for sale in Sri Lanka." කියලා. ඒ අනුව, ඒ අය මිල අඩු කරලා තිබෙනවා. ඒකෙන් රජයට වාසියක් ඇති වුණා, CIF මිල අඩු වීම තුළ පමණක් රුපියල් බිලියන 9කට වැඩි මුදලක් ගිය අවුරුද්දේදී ආණ්ඩුවට ලාභ වුණා. අපි අද මේ සියලුම දේවල් පාලනය කරලා තිබෙන්නේ කා එක්කවත් තරහකට නොවෙයි.

නමුත් අපේ බලාපොරොත්තුව වන්නේ මේ වියදම් කරන මුළු මුදලේ ප්‍රතිලාභය ජනතාවට ලබා දීමයි. ඒකයි අපේ බලාපොරොත්තුව. ඒක තමයි (මහාචාර්ය) සේනක බිබිලේ ප්‍රතිපත්තියේ තිබෙන්නේත්. අද අපේ වෛද්‍ය වාර්තාවල නොතිබුණත් British Medical Journal එක අපි අත්පොත වාගේ කියවන්නේ. අපි වෛද්‍ය වෘත්තියේ හිටපු කාලයේ අලුත් ඖෂධයක් ගැන බලන්න වුණත් කියෙව්වේ British Medical Journal එකයි. BMJ එකේ මාර්තු මාසයේ කර්තෘ වාක්‍යයේ තිබෙන්නේ, ''Tackling acute coronary syndrome in low-income and middle-income countries'' ගැනයි. කර්තෘ වාක්‍යයේ සම්පූර්ණයෙන්ම තිබෙන්නේ ශ්‍රී ලංකාව ගැන වාගේම අප මේ ගෙන යන ප්‍රතිපත්තිය ගැනයි. ඔවුන් කියනවා, ''Thus, we should applaud the decision of the Sri Lanka Ministry of Health, taken after the survey, to provide cardiac stents to hospitals with PCI facilities and to include troponin testing as a routine examination in state sector hospitals.'' කියලා.

ඒ කියන්නේ, පසු ගිය කාලයේ Troponinවල හොඳම ඖෂධය නිෂ්පාදනය කළා, Tenecteplase කියලා. Cardiologistsලා ඇවිල්ලා දවසක් මගෙන් ඉල්ලීමක් කළා, "මේ ඖෂධය ලංකාවට ගෙනැල්ලා දෙන්න පුළුවන්ද?" කියලා. මේක inject කළොත් පැය දෙකක් ඇතුළතදී ඕනෑම myocardial infarction (MI) එකක් හැදිලා එන රෝගියෙකු නිරෝගීව ගෙදර යවන්න පුළුවන්. ඒ නිසා අපි ඒ ඖෂධය ගෙන්නුවා. මා එම සමාගමේ නිලධාරීන් ගෙන්වලා ඇහුවා, මෙම ඖෂධය ලබා දිය හැකි මිල කීයද කියලා. ඒගොල්ලන් කිව්වා, vial එකක් රුපියල් එක්ලක්ෂ විසිපන්දාහයි කියලා. මා කිව්වා, "මාත් එක්ක ඔය ගණන් කථා කරන්න එපා. අනෙක් සමාගම් එක්ක කථා කරලා ඒගොල්ලන්ට මම මිල නියම කරලා තිබෙනවා. මම ඔයගොල්ලන්ගේ මිල නියම කරන්න ඉස්සෙල්ලා ඔයගොල්ලන් මට සාධාරණ මිලක් ගෙනැවිත් දෙන්න. ලංකාවේ තිබෙන සියලුම hospitalsවලට මම එක වතාවට vials 10,000ක් order කරනවා" කියලා. මොකද, අද myocardial infarction රෝගීන් විශාල ප්‍රමාණයක් hospitalsවලදී මැරෙනවා. ඒ අනුව ඔවුන් අන්තිමට මට මිල දුන්නා, vial එකක මිල රුපියල් 55,000යි කියලා. එක vial එකකින් රුපියල් 70,000ක් අඩු කළා. අපි vials 10,000ක් ගත්තා. ඊයේ - පෙරේදා කැබිනට් මණ්ඩලයේදී මම තව 13,000ක් ඉල්ලුවා. ECG recorder එකක් තිබෙන හැම hospital එකකටම මම එම ඖෂධය දුන්නා. මොකද, ECG recorder එකත් බලාගෙන තමයි මේක inject කරන්න ඕනෑ. එක රෝගියෙකුට එකයි. සමහර වෙලාවට එක හමාරක්, දෙකක් දුන්නාම ඒ රෝගියා සම්පූර්ණයෙන්ම සුව වෙනවා. දැන් medical survey එකක් කරලා තිබෙනවා, Dr. Gotabhaya Ranasinghe ඇතුළු Cardiologistsලා. එදා

myocardial infarction රෝගීන් හය දෙනෙකු රෝහලකට ආවාම, ඒ හය දෙනාගෙන් පස් දෙනෙකු මිය ගියා කියලා ඒගොල්ලන් කියනවා. අද වැඩිම වුණොත් මිය යන්නේ එක් කෙනායි. මම මේ කාරණය කල්මුණේ රෝහලේදී ප්‍රකාශ කළාම කල්මුණේ රෝහලේ ඉන්න Cardiologist කිව්වා, "සර්, tenecteplase දුන්නාට පස්සේ, stent එක නිකම් දුන්නාට පස්සේ කල්මුණේ රෝහලට ගෙනාපු කිසිම රෝගියෙකු අද වනතුරු මැරිලා නැහැ"යි කියලා. අද අපේ රටේ මාධ්‍යවල හෝ අපේ රටේ වෛද්‍ය සභරාවල මේ ගැන පළ නොවුණාට, මේ කාරණා දන්නා අය ඒ සම්බන්ධයෙන් බොහොම ගුණ කථනයන් කරනවා. ලෝක බැංකුව පවා අද මෙය පිළිගෙන තිබෙනවා. ඔවුන්ගේ වාර්තාවක සඳහන් වෙනවා, "Sri Lanka is achieving pro-poor universal health coverage without health financing reforms.", දුප්පතුන්ට හිතවාදී සෞඛ්‍ය ප්‍රතිපත්තියක් අද මේ රටේ තිබෙනවා කියලා. එහි කියනවා, **"**Health financing indicators also indicate that the health system is both pro-poor and efficient**."** - කාර්යක්ෂමයි; දුප්පතුන්ට හිතවාදියි. - "There are few if any other low or middle-income countries that have public health service like in Sri lanka, simultaneously achieved strong health outcomes, good financial protection, and low cost. Many countries are lauded for achieving two out of three, but a few can claim to have done as well as Sri Lanka on all fronts especially considering that it is still classified as a lower- middle income country ." ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා 70 වන සංවත්සරය සමරන්න ලංකාවට ආපු වෙලාවේදී අපේ මාධ්‍යවේදීන් ඔහුට ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. මාධ්‍යවේදීන් ඔහුගෙන් ඇහුවා, "අග්නිදිග ආසියාවේ හොඳම සෞඛ්‍ය සේවය තිබෙන්නේ ලංකාවේ කියලා කථාවක් තිබෙනවා, ඒක සත්‍යයක්ද?" කියලා.

මම හිතන විධියට ඒ මාධ්‍යවේදියා එම ප්‍රශ්නය ඇහුවෙත්, "ඒක එහෙම නොවෙයි" යනුවෙන් කියාවි කියලා හිතාගෙනයි. නමුත් ඔහු දුන් පිළිතුර තමයි මේ තිබෙන්නේ. ඔහු කියනවා,

"Sri Lanka's health service is one of the best not only in Asia but in the world, WHO Director-General Dr. Tedros Adhanom Ghebreyesus said.

Dr. Grebreyesus had stated that the reason behind the high quality of Sri Lanka's health service is because it is freely available. Sri Lanka's political leadership gives a clear guidance to the Sri Lankan Health Service."

ඒ වාගේම, "WHO Regional Director for South-East Asia Dr. Poonam Khetrapal Singh said that the Health Ministry will have enemies everywhere because it has reduced the prices of drugs which is very admirable. Measures taken by the Sri Lankan Government to control tobacco are very admirable." යනුවෙන්ද එහි සඳහන් කර තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඇන්ගෝලාව නිදහස් කළ විමුක්තිකාමී නායකයා වන Samora Machel ගැන ඔබතුමාත් දන්නවා නේ. එතුමාගේ බිරිඳ වන Graca Machel -පසු කලෙක නෙල්සන් මැන්ඩෙලාගේ භාර්යාව - මැතිනිය ලෝක සෞඛ්‍ය සංවිධානයේ පසුගිය World Health Assembly එකේදී විශේෂ දේශනයක් කළා. "The Elders " කියන සංවිධානයේ සභාපතිනිය වශයෙන් එතුමිය අපේ රටේ සෞඛ්‍ය සේවය ගැන පැහැදිලිව, තුන් වතාවක්ම කියා තිබෙනවා. එහිදී එතුමිය අපේ රටේ සෞඛ්‍ය සේවාව ගැන කියා තිබෙන්නේ මොනවාද? එතුමිය කියනවා,

"…Sri Lanka has famously provided universal free, publicly financed health care to its entire population since 1951 and as a result has achieved stunning successes in improving health outcomes. Its maternal mortality rate, for example, is lower than some States in the United States which we all know has yet to achieve Universal Health Coverage despite it being 15 times richer than Sri Lanka.

If Sri Lanka can provide publicly financed health care to their people why cannot their wealthier neighbours?"

ඒ විධියට තමයි එතුමිය අපට ප්‍රශංසා කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉදිරි සති කිහිපය තුළදී අපි පෞද්ගලික රෝහල්වල සියලුම ගාස්තු නියාමනය කරනවා. එම රෝහල්වලින් ලබාදෙන services විතරක් නොවෙයි, ඒවායේ ඖෂධවල මිලත් නියාමනය කරනවා. අප පසුගිය වතාවේ මිල නියාමනය කළේ බොහොම විද්‍යාත්මක විධියටයි. IMS කියන සංවිධානය සම්බන්ධ කරගෙන, ඔවුන් ලබාදුන් සංඛ්‍යා, දත්ත උපයෝගී කරගෙන තමයි අපි ඒ කටයුතු කළේ.

රෝහල් නියාමනය කරන්න අප යොදා ගත්තේ KPMG කියන ජාත්‍යන්තර සංවිධානයයි. එම සංවිධානය මඟින් survey එකක් කළා. ඒ ගොල්ලෝ මාස ගණනක් ගත කරලා, ලංකාවේ තිබෙන සියලුම රෝහල්වල මිල ගණන් අරගෙන, ඒ විස්තර අපට ලබා දුන්නා. ඒ අනුව, සියයට 50ක් කොහේද තිබෙන්නේ, සියයට 75ක් කොහේද තිබෙන්නේ, සියයට 25ක් කොහේද තිබෙන්නේ යන්න සොයා බලා, කොයි විධියටද එය කරන්නේ කියා තීන්දු කරන්න කියලා ඒ අය අපට කිව්වා. අපි ඒවායේ මිලත් එකකට එකකින් අඩු කරනවා. එහෙම කරන එකටත් අපට විශාල බලපෑම් තිබෙනවා. ඒ මොන බලපෑම ආවත් අප එය කරනවා. සමහර රෝහල් අසාධාරණ විධියට මිල වැඩි කරනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කරන මේ දේවල් තනිකරම ව්‍යාපාරයක්; නරකම අන්දමේ ව්‍යාපාරයක් බවට පත් කර තිබෙන අවස්ථාවක, සෞඛ්‍ය සේවාවේ ඒ ව්‍යාපාරික තත්ත්වයත් තියාගෙන, නමුත් සේවයක් ඉෂ්ට කිරීම සඳහා ඉදිරි සති කීපයේදී මම ඒ ක්‍රියා මාර්ගයත් ගන්නවා.

මේ විධියට අපේ සෞඛ්‍ය සේවාවට ජාත්‍යන්තර වශයෙන් ප්‍රසාදය ලබාගැනීම සඳහා විශාල වැඩ කොටසක් කිරීමට පසුගිය අවුරුදු තුන තුළ අපට උදව් කළ පිරිසක් සිටිනවා. අපේ ලේකම්තුමියට, සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාට, නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ට සහ අනිකුත් සියලුමදෙනාට මම ස්තුතිවන්ත වනවා. ඔවුන් ඉතා මහන්සියෙන් වැඩ කළා. සමහර වෙලාවට දවසේ පැය 24න් පැය 15ක්, 18ක්, 20ක් -රාත්‍රී කාලයේ පවා - මා සමඟ වැඩ කරමින්, අමාත්‍යාංශයේ රැඳී සිටිමින් පසුගිය කාලයේ මට උදව් කළ ඒ සියලුදෙනාට මම ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම මගේ නියෝජ්‍ය අමාත්‍යවරයාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා සෙවනැල්ලක් මෙන් මා පිටුපස හිඳිමින් සෑම දෙයකදීම මට විශාල වශයෙන් උදව් උපකාර කළා. එතුමාටත් මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඔබතුමන්ලා සියලුදෙනාටම ස්තුතියි.

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොඩි කාරණයක් ඉදිරිපත් කරන්න මට අවස්ථාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. (Dr.) Jayampathy Wickramaratne.

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහජන සෞඛ්‍යය වෙනුවෙන් කරන ලද අතිවිශාල සේවය පිළිබඳව ගරු සෞඛ්‍ය ඇමතිතුමාට මා ප්‍රශංසා කරනවා.

ගරු ඇමතිතුමනි, ඖෂධවේදීන්, අතුරු වෛද්‍ය සහකාරවරු, පරිපූරක වෛද්‍ය සේවාවල සිටින අය සහ පෝෂණවේදීන් ප්‍රශ්නයක් මතු කර තිබෙනවා. මම අද පෞද්ගලිකව ඔබතුමා හමුවී ඒ ගැන කථා කළා. තුන්වන වගන්තියේ ඔවුන් පිළිබඳ විශේෂයෙන් ව්‍යතිරේකයක් නැති නිසා, ඔවුන්ට අගතියක් වෙයිද කියා ඔවුන් අතර පොඩි සැකයක් තිබෙනවා. එහෙම දෙයක් වන්නේ නැහැය කියා ඔබතුමා කිව්වා. "ප්‍රධාන ප්‍රඥප්තියේ xiii, xiii (අ) සහ (ආ) යන කොටස්වලට අදාළ නොවන පරිදි" කියා ඔවුන් විශේෂයෙන් සඳහන් කර තිබෙනවා. ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, සුප්‍රීම් උසාවියේදී ඔවුන් ඔය විරෝධයම ඉදිරිපත් කළා. නමුත්, "එහෙම කිසිම අසාධාරණයක් සිදු වන්නේ නැහැ" කියා සුප්‍රීම් උසාවිය පැහැදිලිවම කියා තිබෙනවා.

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

[பி.ப. 2.04]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இடம்பெறுகின்ற மருத்துவம் (திருத்தம்) சட்டமூலம் பற்றிய விவாதத்தில் கலந்து கொண்டு சுகாதார அமைச்சுக்குக் கீழ் வருகின்ற சில விடயங்களைத் தொட்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றிகள்! கடந்த 2018, ஓகஸ்ட் மாதம் 31ஆம் திகதி, வெள்ளிக்கிழமை வெளியிடப்பட்ட 2087ஆம் இலக்க வர்த்தமானி அறிவித்தலினூடாகச் சுகாதாரத்துறை சார்ந்த உத்தியோகத்தர்களுக்கான பயிற்சி நெறிகளுக்குப் பயிலுநர்களை ஆட்சேர்ப்புச் செய்வதற்கான விண்ணப்பங்கள் கோரப்பட்டிருக்கின்றன. தாதியர் சேவையுடன் தொடர்புடைய தாதி உத்தியோகத்தர் பயிற்சிநெறிக்கும் விண்ணப்பங்கள் கோரப்பட்டிருப்பதன் மூலம், நாட்டின் பல்வேறு பகுதிகளிலும் காணப்படுகின்ற தாதியர் வெற்றிடங்களைப் பூர்த்தி செய்வதற்கு அரசாங்கம் முயற்சிக்கிறது; அமைச்சரவை முயற்சிக்கிறது என்பதைத் தெளிவாகப் புரிந்துகொள்ள முடிகின்றது. ஆனால், வடக்கு, கிழக்குப் பகுதிகளில் வாழுகின்றவர்கள் தாதியர் சேவை நியமனங்களுக்கு விண்ணப்பிப்பதில் தொடர்ந்தும் பல பாதிப்புக்களைச் சந்தித்து வருகின்றார்கள்.

குறிப்பாக, வடக்கு மாகாணத்திலே தாதி சேவையிலுள்ள தாதி உத்தியோகத்தர்களுக்கான ஆளணித் தேவை 1,119. ஆனால், அங்கு இப்பொழுதும் 327 தாதியர் வெற்றிடங்கள் காணப்படுகின்றன. இது கிளிநொச்சி மாவட்டத்திலே 58ஆக இருக்கின்றது. இதனைவிட, நிறைவுகாண் தொழில்வல்லுநர் சேவை என்கின்ற அடிப்படையிலான மருத்துவ ஆய்வுகூடத் தொழில்நுட்ப உதவியாளர், மருந்தாளர், தொழில்வழி சிகிச்சையாளர், கதிரியலாளர் போன்ற பதவிகளுக்கான வெற்றிடங்களை நிரப்புவதற்கு ஆட்சேர்க்கும் முகமாக இன்று குறித்த பயிற்சிநெறிகளுக்கு விண்ணப்பங்கள் கோரப் பட்டுள்ளது. வடக்கு மாகாணத்தில் இந்த வெற்றிடங்கள் 56, 92, 13, 30 என்ற அடிப்படையில் காணப்படுகின்றபோதிலும், குறித்த அலுவலர்கள் 14, 43, 12, 15 என்ற அடிப்படையில் காணப்படுகின்றார்கள். துணை மருத்துவ சேவை என்ற அடிப்படையில், பாடசாலை பற்சிகிச்சையாளர், சுகாதார பூச்சியியல் அலுவலர், கண் தொழில்நுட்பவியலாளர், செயற்கை அவயவத் தொழில்நுட்பவியலாளர், பொது சுகாதாரப் பரிசோதகர், இதயத்துடிப்புப் பதிவாளர், மூளை மின் இயக்கப் பதிவாளர் ஆகிய பயிற்சிநெறிகளுக்கும் விண்ணப்பங்கள் கோரப்பட்டிருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்கள் இந்தச் சபையிலே இருக்கிறபொழுது, நான் ஒரு விடயத்தை முன்வைக்க விரும்புகிறேன். அதாவது இதற்குரிய விண்ணப்பதாரிகள் 18 வயதுக்கும் 28 வயதுக்கும் இடைப்பட்டவர்களாக இருக்கவேண்டுமெனக் கேட்கப் பட்டுள்ளது. ஆனால், சம்பந்தப்பட்டவர் 2016ஆம் 2017ஆம் ஆண்டுகளில் க.பொ.த. உயர்தரப் பரீட்சைக்குத் தோற்றியிருந்தால், அவருடைய வயது 21ஐத் தாண்டாத நிலையில் காணப்படும். ஆகவே, இந்தக் கோரிக்கை வடக்கு மாகாணத்தில் இருக்கின்ற தாதியர் பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்குப் பொருத்தமாக அமையாது. குறித்த அரச இதழில் 12 தொழில்களுக்குரிய பயிலுநர்களைச் சேர்ப்பதற்கான விண்ணப்பங்கள் கோரப்பட்டுள்ளது. ஆனால், இத்தொழில் களுக்குத் தமிழ் இளைஞர்கள் தெரிவுசெய்யப்படுவது பல வருடங்களாகக் குறைந்து வருகின்றமை கவனத்தில் கொள்ளப்படவில்லை என்பது தெளிவாகின்றது. நாங்கள் இது பற்றிப் பல தடவைகள் அமைச்சருடன் பேசியபோது, குறித்த ஆட்சேர்ப்பில் வேறு சில முறைகளைக் கையாள்வதாக அவர் குறிப்பிட்டிருந்தார். குறிப்பாக கணித, விஞ்ஞானத் துறைகள் தவிர்ந்த கலை, வர்த்தகப் பிரிவுகளில் கல்வி கற்றுக் கொண்டவர்களுக்கும் தாதியர் சேவைக்கு விண்ணப்பிக்கும் தகுதியை ஏற்படுத்துவதாகும்.

தாதியருக்கான தமிழ் மொழி மூலப் பாடசாலைகள் வடக்கில் யாழ்ப்பாணம், வவுனியா ஆகிய மாவட்டங்களிலும் கிழக்கு மாகாணத்தில் மட்டக்களப்பிலும் உள்ளன. கடந்த சில வருடங்களாக வடக்கிலிருந்து இப்பாடசாலைக்குத் தமிழ் மாணவர்கள் தகுதி பெறாமையால், பல சிங்கள, முஸ்லிம் மாணவர்கள் அங்கு உள்வாங்கப்பட்டுள்ளனர். இதனால் கடந்த பல வருடங்களாக எமது வைத்தியசாலைகளில் மேற்படி பதவிகளுக்குச் சிங்கள அலுவலர்கள் நியமிக்கப்பட்டு வருகின்றனர். அதேநேரம் இரண்டு அல்லது மூன்று வருட முடிவில் இவர்களுக்கு விசேட இடமாற்றம் வழங்கப்பட்டு வருவதுடன், இவர்களுக்குப் பதிலாகப் புதிய ஆட்சேர்ப்பிலிருந்து மாற்றீடும் வழங்கப்படுகின்றது. இரண்டு அல்லது மூன்று வருட சேவையை முடித்தவர்களுக்குப் பதிலான மாற்றீட்டுக்கு ஒவ்வொரு புதிய ஆட்சேர்ப்பி லிருந்தும், மிகச் சிலரே நியமிக்கப்பட்டு வருகின்றனர். ஆனால், மொத்தத் தொகையைக் காட்டி, வடக்கிற்குப் பெருமளவில் ஆளணி நியமிக்கப்பட்டுள்ளதாகக் கூறப்படு கின்றது. உதாரணமாக, கடைசியாக நடைபெற்ற தாதியர் நியமனத்தில் 22 பேரே மேலதிகமாக நியமனம் பெற்றவர்கள். ஏனைய 76 பேரும் விசேட இடமாற்றத் திட்டத்தின்படி வெளி மாகாணங்களுக்குப் போக இருந்தவர்களுக்குப் பதிலாக வந்தவர்கள். ஆனால், வடக்கிற்கு 98 தாதிய உத்தியோகத் தர்கள் நியமிக்கப்பட்டதாகக் கூறப்பட்டது. ஆகவே, இங்கிருந்து விசேட இடமாற்றம் பெற்றுச் சென்றவர்கள் கடமையாற்றும் தென் பகுதிகளில்தான் இந்த நியமனத்தின் பயன் கிடைத்து வருகின்றது. இதனால், இப்பதவிகளுக்கு

எமது பகுதி வைத்தியசாலைகளில் வெற்றிடங்கள் தொடர்ந்தும் நிலவுகின்றன. தற்போது வடக்கில் 350 தாதியர்களுக்கான வெற்றிடங்கள் நிலவுகின்றன.

எமது இளைஞர்களுக்குக் குறித்த நியமனம் கிடைக்காமைக்குப் பல காரணங்கள் உண்டு. அதாவது தகைமையைப் பொறுத்த வரையில், விண்ணப்ப முடிவுத் திகதிக்கு முன்னதாக உள்ள இரண்டு வருடங்களில் நடைபெற்ற க.பொ.த உயர்தரப் பரீட்சைப் பெறுபேறுகள் கருத்தில் கொள்ளப்படுகின்றது. உதாரணமாக, 2016 அல்லது 2017ஆம் ஆண்டுகளில் நடைபெற்ற க.பொ.த. உயர்தரப் பரீட்சைக்குரிய பெறுபேறுகள் மட்டுமே இம்முறை விண்ணப்பங்கள் கோரப்பட்ட போது கருத்தில் எடுக்கப்பட்டுள்ளன. அதேநேரம் உயிரியல் மற்றும் பௌதிகவியல் பாடங்களைப் பயின்றவர்களே விண்ணப்பிக்க முடியும். ஆனால், எமது பிரதேசத்தில் இந்தப் பாடங்களைப் பயில்பவர்களின் விகிதாசாரம் குறைவு. இந்தப் பாடங்களைப் பயின்று, பல்கலைக்கழகக் கல்வியையோ வேறு உயர் கல்வியையோ தொடராதவர்களின் எண்ணிக்கை குறைவு. 18 வயதிலிருந்து 35 வயது வரையிலானவர்கள் விண்ணப்பிக்க முடியும் எனக் குறிப்பிடப்பட்டிருந்தாலும், க.பொ.த உயர்தரப் பரீட்சைக்கு 2016 அல்லது 2017 ஆண்டு மட்டுமே தோற்றியிருக்க வேண்டும். ஆனால், எமது பகுதியில் மாணவர்கள் அடுத்தடுத்துக் க.பொ.த உயர்தரப் பரீட்சையை எழுதுவார்கள். பின்னர் வேறு துறைகளை நாடிச் சரிவராத நிலையிலேயே தாதியர் துறைக்கு வருவர். விண்ணப்பிக்கக் கூடிய வயதுத் தகுதி இருந்தாலும், க.பொ.த உயர்தரப் பரீட்சை எடுத்த ஆண்டு அவர்களுக்குத் தடையாக அமைந்து விடுகிறது. விண்ணப்பம் கோருகின்ற ஒவ்வொரு முறையும் இப்படியான பலர் ஏமாற்றத்துடன் எம்முடன் தொடர்பு கொண்டு இது பற்றிக் கூறுகின்றார்கள்.

இம்முறை மாவட்ட 'கோட்டா' வழங்கப்படும் எனக் கூறுகின்றார்கள். இதற்கான சூத்திரத்தில் விண்ணப்பங்களின் எண்ணிக்கையும் பங்கு வகிக்குமானால், எமது மாணவர்கள் பாதிக்கப்படுவார்கள். அதாவது எமது மாவட்டத்தில் தகுதியான விண்ணப்பங்கள் குறைவாயின் எமது மாவட்டத்துக்கான 'கோட்டா' வின் மிகுதி ஏனைய மாவட்டங்களுக்குப் பகிர்ந்தளிக்கப்படும். இதற்கு நாம் தொடர்ச்சியாகச் சில மாற்றுத் திட்டங்களை முன்வைத்தோம். அதாவது, க.பொ.த. உயர் தரத்தில் உயிரியல் மற்றும் பௌதிகவியல் மட்டுமல்லாமல், கலை, வர்த்தகம் மற்றும் தொழில் நுட்பத் துறைகளில் பயின்றவர்களையும் இந்தப் பயிற்சிநெறிக்கு அனுமதித்தல், க.பொ.த. உயர்தரப் பரீட்சைக்கான ஆண்டு வரையறையை, வயது வரையறைக்கு ஈடாக மாற்றுதல் போன்ற திட்டங்களை முன்வைத்தோம். எமக்கு ஆதரவாகச் செயற்பட்டு இதற்காகத் தொடர்ந்து வாதாடிய அமைச்சர் ராஜித சேனாரத்ன அவர்களின் முயற்சியினால் அமைச்சரவையினால் இதற்கான அனுமதி வழங்கப்பட்டது. ஆனால், தாதியர் சங்கத்தின் எதிர்ப்பால், இந்தத் தடவையும் பழைய முறையே தொடர்கின்றது. எனவே, இதற்கு நான் வேறு மாற்றுத் திட்டத்தை முன்வைக்கின்றேன். அதாவது, க.பொ.த. உயர்தரப் பரீட்சைத் தகைமை சம்பந்தப்பட்ட ஆண்டுக் கட்டுப்பாட்டை நீக்குதல், மாவட்ட 'கோட்டா'வுக்குப் போதுமான விண்ணப்பதாரிகள் இல்லாவிட்டால், அதே மாவட்டத்தில் ஏனைய ஆண்டுகளில் க.பொ.த. உயர்தரத்தில் சித்தியடைந்தவர்களுக்கு வாய்ப்புக் கொடுத்தல், குறித்த பயிற்சிநெறிக்குப் பௌதிகத் துறையில் கற்றவர்களை அனுமதிக்க முடியுமாயின் ஏனைய துறைகளைப் பயின்றவர்களையும் அனுமதித்தல், எந்த மாகாணத்தைச் சேர்ந்தவர்களாயினும் வடக்கில் நியமிக்கப்பட்டதற்காக அவர்களுக்குச் சிறப்பு இடமாற்றம் வழங்குதல் மற்றும் புதிய நியமனங்களிலிருந்து பதிலாள் வழங்குதல் நிறுத்தப்படுதல். அதாவது, இங்கு நியமிக்கப்படுகின்றவர்களுக்கும் நான்கு அல்லது ஐந்து வருடங்களின் பின் ஏனைய மாகாணங்களைப்போல வருடாந்த இடமாற்ற நடைமுறையின் கீழேயே இடமாற்றம் வழங்குதல், குறித்த இடமாற்றங்களைப் பதிலாளுடன் மட்டும்தான் அமுல்செய்தல் என்பனவாகும். இவ்வாறான விடயங்களை மேற்கொள்கின்றபோதுதான் வடக்கு மாகாணத்திலும் கிழக்கு மாகாணத்திலும் தாதியர் பற்றாக்குறையை ஈடுசெய்ய முடியும்.

கௌரவ அமைச்சர் அவர்களே! நீங்கள் சபையில் இருக்கின்றபொழுது நான் ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, தாதியர் பயிற்சிக்காக விண்ணப்பிக்கின்றவர்கள் க.பொ.த. சாதாரண தரப் பரீட்சையில் கணிதம், விஞ்ஞானம், அத்துடன் தாய் மொழி, அதாவது தமிழ் அல்லது சிங்களம் அத்தோடு ஆங்கில மொழியிலும் திறமைச் சித்தியைப் பெற்றிருக்க வேண்டும் என்பதும் கட்டாயமாகும். 4 திறமைச் சித்திகளோடும் 2 சாதாரண சித்திகளோடும், 6 பாடங்களில் சித்தி பெற்றிருக்க வேண்டும் என்பது அடிப்படைத் தகைமையாகும். ஆனால், ஆங்கில பாடத்தைச் சிறு வயதிலிருந்து கற்பிக்கக்கூடிய வகையில் ஆசிரியர் வளமில்லாத, ஆங்கில ஆசிரியர்களுக்கு மிகக்கூடிய பற்றாக்குறை நிலவுகின்ற கிளிநொச்சி, முல்லைத்தீவு, வவுனியா, மன்னார் ஆகிய மாவட்டங்களைச் சேர்ந்தவர்கள் எவ்வாறு ஆங்கில பாடத்திலே திறமைச் சித்தி எடுத்து, தாதியர் பயிற்சிக்கு விண்ணப்பிக்க முடியும்? இந்த விடயம் குறித்த விண்ணப்பதாரிகளுக்குப் பெரிய தடையாக இருக்கின்றது. ஆகவே, அரசாங்கம் இதற்கு இன்னொரு முறையைக் கடைப்பிடிக்க வேண்டும். அதேநேரம் ஏதாவது ஓர் ஆண்டில், கணித, விஞ்ஞானத் துறைகளில், தாங்கள் விரும்பிய காலத்தில் க.பொ.த. உயர்தரப் பரீட்சையில் தோற்றிய பெறுபேற்றின் அடிப்படையில் விண்ணப்பிப்பதற்குச் சம்பந்தப்பட்டவர்களுக்கு அனுமதி வழங்க வேண்டும். குறித்த 12 பயிற்சி நெறிகளுக்கும் கணித, விஞ்ஞானத் துறைகளில் படித்தவர்களைத் மாத்திரம் தேர்ந்தெடுக்கின்றபோது, வடக்கு மாகாணத்தின் பல மாவட்டங்கள் பாரிய பின்னடைவைச் சந்திக்கும் என்பதை நான் இந்த இடத்திலே குறிப்பிட விரும்புகின்றேன்.

அடுத்து, மிக முக்கியமாக, கிளிநொச்சி மாவட்டப் பொது வைத்தியசாலைக்கு ஒரு CT Scanner ஐ வழங்குவதற்கென கௌரவ அமைச்சர் ராஜித சேனாரத்ன அவர்கள் தன்னுடைய திணைக்களத்திற்கு ஏற்கனவே அறிவுறுத்தல் வழங்கியிருந்தார். ஆனால், தற்போது 4 வருடங்கள் கடந்த பின்னரும்கூட, நெதர்லாந்து நாட்டின் அபிவிருத்தித் திட்டத்திலே இது உள்ளடக்கப்பட்டுள்ளதாகக் கூறி, அதாவது இன்னும் 4 வருடங்களுக்குப் பிறகு நடைபெற்று முடியவிருக்கின்ற நெதர்லாந்துத் திட்டத்தைக் கூறி, இந்த CT Scanner ஐ தென் பகுதியிலுள்ள வேறு வைத்தியசாலைக்குக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுகின்றது. இது துரதிஷ்டவசமானது. அதாவது பல ஆண்டுகளாக மிகக் கூடியளவில் வைத்திய தேவைக்காக எதிர்பார்த்திருக்கின்ற இந்த மக்களுக்கு CT Scanner ஐ வழங்குவதற்கான அமைச்சருடைய அறிவுறுத்தலையும் மீறி, இதற்கு மாற்றீடு நடைபெறுகின்றது என்பதை ஒரு துரதிருஷ்டவசமான விடயமாக நான் இந்த இடத்திலே பதிவுசெய்ய விரும்புகின்றேன்.

இலங்கையிலே தெல்லிப்பளை புற்றுநோய் வைத்திய சாலை மஹரகம புற்றுநோய் வைத்தியசாலைக்கு அடுத்ததாக விளங்குகின்றது. இன்று வடக்கிலும் கிழக்கிலும் மற்றும்

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

நாட்டின் ஏனைய சில பகுதிகளிலும் புற்றுநோயால் பாதிக்கப்பட்டவர்கள் பலர் அந்த வைத்தியசாலையிலே சிகிச்சைபெற்று வருகின்றார்கள். இந்தப் புற்றுநோய் வைத்தியசாலைக்கென முதன்முதல் கதிர்வீச்சு சிகிச்சைக்குரிய CT simulator ஒன்றை வழங்குவதற்கு அமைச்சர் கௌரவ ராஜித சேனாரத்ன அவர்கள் ஏற்கனவே அறிவுறுத்தல் வழங்கியிருந்தார்; அதற்கான செயற்பாடுகளும் முன்னெடுக்கப்பட்டிருந்தன. புற்றுநோயால் பாதிக்கப்பட்ட நோயாளர்கள் கதிர்வீச்சு சிகிச்சையைப் பெறுவதற்கு முன்னர் அவர்களுடைய உடலில் பாதிக்கப்பட்ட இடத்தை அடையாளப்படுத்தவும், ஏனைய அவயவங்களுக்குப் பாதிப்பில்லாத வகையிலும் வைத்தியர்கள் தங்களுடைய ஆய்வுப் பணியை இந்த CT simulator மூலமாக மேற்கொள்கிறார்கள். புற்றுநோயால் பாதிக்கப்பட்ட இழையங்களுக்கு மாத்திரம் கதிர்வீச்சை இலக்காக்கி மேற்கொள்கின்ற CT simulator இனால் எடுக்கப்படுகின்ற முப்பரிமாணமான நிழற்படமும் இதற்கான உதவியை வழங்குகின்றது. இவ்வாறான CT simulator ஐ அந்த வைத்தியசாலைக்கு வழங்காமல், ஏற்கனவே மஹரகம வைத்தியசாயில் ஒன்று இருக்கக்கூடியதாக, அதற்கு மேலதிகமாக இதனையும் அங்கு வழங்குவதற்கான நடவடிக்கையைக் குறித்த திணைக்களம் மேற்கொள்கின்றது என்றால், மாற்றான்தாய் மனப்பான்மையோடுதான் தெல்லிப் பளை வைத்தியசாலை பார்க்கப்படுகின்றதா? என்ற ஒரு கேள்வி எழுகின்றது. பெருமளவான நோயாளர்கள் பாதிப்படைந்த நிலையில், அங்கேயிருக்கின்ற நோயாளர் களின் பலநாள் கோரிக்கைகள் கௌரவ அமைச்சர் அவர்களால் ஏற்றுக்கொள்ளப்பட்டு, அதற்கான அறிவுறுத் தல்கள் வழங்கப்பட்ட சூழலிலும்கூட, இது வேறோர் இடத்திற்கு மாற்றப்படுவதை ஏற்றுக்கொள்ள முடியாது. எனவே, இதற்கான மாற்றீடு ஒன்றைக் கடைப்பிடிக்க வேண்டுமென்று இந்த இடத்திலே அமைச்சர் அவர்களைக் கௌரவமாகக் கேட்டுக் கொள்கின்றேன்.

வவுனியா, ஓமந்தைப் பகுதியிலே வைத்தியசாலைக் கழிவுகளை எரிப்பதற்கென இயந்திரத் தொகுதியொன்று - incinerator அவுஸ்ரேலியா அரசாங்கத்தின் 60 வீத நன்கொடையோடும் 40 வீத இலகு கடன் மூலமும் 80 மில்லியன் ரூபாய் செலவிலே பொருத்தப்பட்டிருந்தது. அது தற்போது பாவனையிலுள்ளது. அதனைத் தென்பகுதி வைத்தியசாலையொன்றுக்கு வழங்குமாறு மத்திய சுகாதார அமைச்சினால் இப்போது அறிவுறுத்தல் வழங்கப் பட்டிருக்கின்றது. வவுனியா மாவட்ட வைத்தியசாலை மற்றும் சிறிய வைத்தியசாலைகளுடைய கழிவுப் பொருட்களை அழிப்பதற்காக ஓமந்தைப் பகுதியில் பொருத்தப்பட்டிருக்கின்ற அந்த மிக முக்கியமான இயந்திரத் தொகுதி அவுஸ்திரேலியா நாட்டினது உதவியோடும் கௌரவ அமைச்சர் அவர்களுடைய அனுசரணையோடும் வழங்கப்பட்டிருந்தது. அவ்வாறான ஓர் இயந்திரத் தொகுதியை அங்கிருந்து மாற்றுவதற்கு எடுக்கப்படும் முயற்சியைத் தடுக்கவேண்டும் என இந்த இடத்திலே நான் விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

இந்த நாட்டிலே சில நோய்களுக்குரிய மருந்துகளை அரசாங்கத்தினால் மட்டுமே இறக்குமதி செய்ய முடிகின்றது. அந்த மருந்துகளைத் தனியார் துறை நாட்டுக்குள் கொண்டுவர முடியாது. அந்த வகையில் புற்றுநோயாளர்கள் பாவிக்கின்ற மிக முக்கிய மருந்தான Hydroxyurea 500 mg capsules இனை இந்த நாட்டிலுள்ள தனியார் வைத்தியசாலைகளில் அல்லது தனியார் மருந்து நிறுவனங்களில் பெற்றுக்கொள்ள முடியாதுள்ளது. இதனை அரசாங்க வைத்தியசாலைகளில்தான் பெற்றுக்கொள்ள முடியும். ஆனால், இன்று இந்நோயினால் பாதிக்கப்பட்ட பல நோயாளர்கள் இந்த மருந்து வகைகளைப் பெறமுடியாது திணறுகின்றார்கள். இது பாரிய அளவிலே அவர்களைப் பாதிக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே! நீங்கள் இந்த விடயங்களிலே அதிகம் கவனம் கொண்டவர். அதனால்தான் இந்தக் கோரிக்கைகளை நான் உங்களிடம் முன்வைக்கின்றேன். ஓர் எதிரிக்குக்கூட வரக்கூடாத புற்றுநோயால் பாதிக்கப்பட்டிருக்கின்ற நோயாளர்களுடைய மனக் கவலையைப் புரிந்துகொண்டு அவர்களுக்குச் சிகிச்சை அளிக்க வேண்டும். ஆகவே, இந்த மருந்து வகைகளைப் பெற்று வழங்குகின்ற நடவடிக்கையை அரசாங்கம் அதிகரிக்க வேண்டும் என்பதையும் நான் இந்த இடத்திலே குறிப்பிட விரும்புகின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மிக முக்கியமாக யாழ்ப்பாண மாவட்டத்திலே இருக்கின்ற பல வைத்தியசாலைகள் மற்றும் தரைவழிப் போக்குவரத்து வசதிகள் உள்ள உள்ளூர் வைத்தியசாலைகள் என்பன இன்று ஓரளவுக்காவது வைத்திய சேவைகளை வழங்குகின்றது. அதேநேரம் நயினாதீவு, எழுவைதீவு, அனலைதீவு, நெடுந்தீவு போன்ற வைத்தியசாலைகளிலே பணிபுரிகின்ற வைத்தியர்கள் போக்குவரத்தில் இடைஞ்சல்களை எதிர்நோக்குகின்றார்கள். அவர்கள் தங்கள் குடும்பங்களைவிட்டு அங்கே சென்று சேவையாற்றுவதும் அவர்களை மிகக் கூடியளவிலே பாதித்திருக்கின்றது. குறிப்பாக, நெடுந்தீவு வைத்தியசாலை 2010ஆம் ஆண்டு வரைக்கும் ஒரு மாவட்ட வைத்திய சாலையினுடைய தரத்தோடு இயங்கியது. இப்பொழுது அதனுடைய தரம் குறைக்கப்பட்டிருக்கிறது. அதாவது 2010ஆம் ஆண்டுக்குப் பின்னர், நெடுந்தீவு வைத்திய சாலைக்கான ஒரு நிரந்தர வைத்தியரை நியமிக்கச் சுகாதாரத் திணைக்களத்தினால் முடியாதுள்ளது. இந்த வகையில் அங்கு பிரச்சினைகள் அதிகமாகக் காணப்படுகின்றன. இதனால், வயதுபோன அல்லது இயலாத, ஓய்வுபெற்றிருக்கின்றவர் களை ஒப்பந்த அடிப்படையில் இந்த நெடுந்தீவு வைத்திய சாலைக்கு நியமிக்கின்றார்கள். ஒவ்வொரு வருடமும் பல நூற்றுக்கணக்கானவர்கள் இந்த நாட்டிலே வைத்தியர்களாகப் பட்டம்பெற்று வெளியேறுகிறார்கள். ஆனால், ஒரு வைத்தியர் தானும் நெடுந்தீவு வைத்தியசாலைக்குச் சென்று கடமை புரிவதற்குத் தயாரில்லாத ஒரு சூழலையே எங்களால் பார்க்க முடிகிறது.

இலங்கையிலே தனித் தீவாக இருக்கின்ற எட்டுக் கிராம அலுவலர் பிரிவுகளைக் கொண்ட நெடுந்தீவு பிரதேச செயலாளர் பிரிவிலே சரியான போக்குவரத்து வசதிகள் இல்லை; அங்குள்ள வைத்தியசாலைக்கு நோயாளர் காவு வண்டி இல்லை; வைத்தியர் இல்லை; தாதியர் இல்லை. இதனால் அங்கிருக்கின்ற ஆறாயிரத்திற்கும் மேற்பட்ட மக்கள் வைத்தியத் தேவையைப் பூர்த்திசெய்ய முடியாமல் திணறுகின்றார்கள். அங்கு நோய்வாய்ப்படுகின்றவர்களை யாழ்ப்பாணம் வைத்தியசாலைகளுக்குக் கொண்டுசெல்வ தென்றால், அவர்கள் பாரிய வள்ளங்களூடாகக் குறிகட்டு வானுக்குக் கொண்டுசெல்லப்பட்டு, அங்கிருந்து தரைமார்க்க மாக 20 கிலோ மீற்றர்களைத் தாண்டி யாழ்ப்பாண வைத்தியசாலைக்குச் செல்ல வேண்டும். இன்று மிகக் கூடியளவிலே பாதிப்படைந்துள்ள நெடுந்தீவு வைத்திய சாலையின் நிலைமையைப் பார்வையிடுவதற்கு ஒருமுறை கௌரவ அமைச்சர் அவர்கள் அங்கு நேரடியாகவே வருவதற்கு இருந்தார். ஆனால், பல காரணங்களால் அந்தப் பயணம் பிற்போடப்பட்டது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே! நீங்கள் ஒருமுறை நெடுந்தீவு வைத்தியசாலைக்கு நேரடியாக விஜயஞ்செய்யுங்கள். இன்று நெடுந்தீவு, நயினாதீவு, அனலைதீவு, எழுவைதீவு போன்ற தனித்தீவுகளிலே

வாழ்கின்ற மக்கள் சுகாதார சேவையை இழந்தவர்களாக இருக்கின்றார்கள்; இந்த நாட்டிலே சுகாதாரத் துறையிலே புறக்கணிக்கப்பட்ட மக்களாக இருக்கின்றார்கள் என்பதையும் இந்த இடத்திலே நான் குறிப்பிட விரும்புகின்றேன்.

கிளிநொச்சி மாவட்ட வைத்தியசாலையில் இருந்த மகப் பேற்று வைத்தியர் சரவணபவன் அவர்கள் ஏற்கனவே தெல்லிப்பளை வைத்தியசாலைக்கு இடமாற்றம் செய்யப்பட் டிருந்தார். பின்னர் இரண்டு மகப்பேற்று மருத்துவர்கள் அங்கு நியமிக்கப்பட்டார்கள். அங்கு அவர்கள் மாறிமாறிக் கடமையில் ஈடுபட்டார்கள். திடீரென்று அந்த மகப்பேற்று மருத்துவர்களில் ஒருவர் வெளிநாடு சென்றுவிட்டார். மற்றவருக்கு யாருக்குமே தெரியாமல் தங்களுடைய அமைச்சின் ஊடாக இடமாற்றம் வழங்கப்பட்டுள்ளது. அதன் பிறகு அங்கு மருத்துவத்துக்காகச் செல்கின்ற கர்ப்பிணித் தாய்மார் போராட்டம் செய்யவேண்டிய நிலைமைக்குத் தள்ளப்பட்டார்கள். கிளிநொச்சி மாவட்ட வைத்தியசாலையின் நோயாளர் நலன்புரிச் சங்கத் தலைவரான முன்னாள் பிரதிக் கல்விப் பணிப்பாளர் சின்னராசா அவர்கள் இது சம்பந்தமாக வருத்தம் தெரிவித்திருக்கின்றார்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, இன்னும் இரண்டு நிமிடங்கள் இருக்கின்றன.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
அந்த வைத்தியசாலைக்கு நெதர்லாந்து நாட்டின் உதவி கிடைக்கவிருப்பதாகக் கூறப்படுகின்றது. கௌரவ அமைச்சர் அவர்களுடைய முயற்சியினாலும் வடக்கு மாகாண சபையின் முயற்சியினாலும் அந்த உதவி கிடைக்கின்றது. நல்ல விடயம்! அதை நாங்கள் வரவேற்கின்றோம். ஆனால், அங்கு தேவையான கட்டிடங்கள் கட்டப்பட்டு, அந்த வேலைத் திட்டங்கள் முடிவடைவதற்கு இன்னும் நான்கு ஆண்டுகள் எடுக்கும். அதேநேரம் அந்த வைத்தியசாலையிலே CT Scanner இல்லை; நிரந்தர மகப்பேற்று மருத்துவர் இல்லை. அங்கு சலரோக நோயினால் பாதிக்கப்பட்டவர்களின் இரத்தத்தைச் சுத்திகரிக்கின்ற Dialysis இயந்திரங்களை இப்பொழுதுதான் இயக்க ஆரம்பித்திருக்கிறார்கள். அந்த இயந்திரங்கள் இவ்வளவு காலமும் அந்த வைத்தியசாலைலே இயங்காமல் காத்திருந்தது. இவ்வாறான சூழ்நிலைகள்தான் இந்த மாவட்ட வைத்தியாலையில் காணப்படுகின்றன.

வவுனியா வடக்குப் பகுதியிலிருக்கின்ற பெரும்பாலான மக்கள் சிகிச்சைக்காகக் கிளிநொச்சி வைத்தியசாலையையே நாடி வருகின்றார்கள். புதுக்குடியிருப்பு, முல்லைத்தீவு நோயாளர்களும் மன்னார் மாவட்ட நோயாளர்களும் மற்றும் மல்லாவி, துணுக்காய், முழங்காவில், பூநகரி நோயாளர்களும் கிளிநொச்சி வைத்தியசாலையை நம்பி இருக்கின்றார்கள். இந்த வகையில் வன்னிப் பிரதேசத்திலே ஒரு மத்திய வைத்திய சாலையாக, பாரிய அளவிலான நோயாளர்களை உள்வாங்குகின்ற ஒரு வைத்தியசாலையாக கிளிநொச்சி வைத்தியசாலை காணப்படுகின்றது. அங்கு சராசரியாக ஒரு நாளைக்கு 1,130 நோயாளர்கள் Out Patients Department - OPD இலே சிகிச்சை பெற்றுவருகின்றார்கள். இந்த எண்ணிக்கை வவுனியா, யாழ்ப்பாணம் மற்றும் ஏனைய வைத்தியசாலைகளுக்கு வருகின்றவர்களுடைய எண்ணிக் கையைவிடவும் அதிகமாகும். யாழ்ப்பாண வைத்தியசாலை OPD இல் கிட்டத்தட்ட 18 வைத்தியர்கள் கடமையாற் றுகின்றார்கள். ஆனால், கிளிநொச்சியிலே இந்த 1,130 நோயாளரையும் கவனிப்பதற்கு ஆறு வைத்தியர்கள் மட்டுந்தான் கடமையில் இருக்கின்றார்கள். இவ்வாறுதான் அங்கு அதிகம் வைத்தியத் துறையில் பற்றாக்குறைகள் காணப்படுகின்றன.

அங்குள்ள ஆளணியை Management Board தீர்மானிக் கின்றது. கிளிநொச்சி வைத்தியசாலைக்கான ஆளணி இம்முறையும் சரியான முறையில் தீர்மானிக்கப்படவில்லை. இந்த வைத்தியசாலை சீராக இயங்குவதற்கு இதுவும் இடைஞ்சலாக இருக்கின்றது என்று நான் கருதுகின்றேன். ஆகவே, அங்கே செல்கின்ற நோயாளர்களுடைய எண்ணிக்கையைக் கருத்திலேகொண்டு செயற்பட வேண்டும். கிளிநொச்சி வைத்தியசாலை மட்டுமல்ல, தீவகங்களில் இருக்கின்ற வைத்தியசாலைகள் மற்றும் அங்கு பாதிப் படைந்துள்ள ஏனைய வைத்தியசாலைகள் கவனிக்கப்பட வேண்டும். குறிப்பாக, தெல்லிப்பளை புற்றுநோய் வைத்திய சாலையின் பிரச்சினைகளை விசேடமாகக் கருத்தில் கொள்ளுமாறு கௌரவ அமைச்சர் அவர்களிடம் வேண்டுகோள் விடுக்கின்றேன்.

இறுதியாக, கலை, வர்த்தகப் பிரிவுகளில் கற்றுக்கொண்ட வர்களும் மற்றும் ICT துறையிலே கற்றுக்கொண்டவர்களும் தாதியர் உத்தியோகத்தர்களுக்கு விண்ணப்பிக்கக்கூடிய வகையில் குறித்த ஆட்சேர்ப்பு முறையில் மாற்றம் வர வேண்டும். அத்துடன் குறித்த விண்ணப்பதாரிகளின் வயதெல்லை விடயத்திலும் க.பொ.த. உயர்தரப் பரீட்சைக்குத் தோற்றுகின்ற ஆண்டுகள் விடயத்திலும் மாற்றம் கொண்டு வர வேண்டும் என்றும் மீண்டும் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களது உரையை முடித்துக்கொள்ள வேண்டும்.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
அதாவது குறித்த விண்ணப்பதாரி 18 வயதுக்கும் 35 வயதுக்கும் இடைப்பட்ட காலத்தில் ஏதாவது ஓராண்டிலே க.பொ.த. உயர் தரத்தில் தோற்றியிருத்தல் வேண்டும் என்ற அடிப்படையில் அந்த விண்ணப்பங்கள் கோரப்பட்டால், எமது பிரதேசத்தில் அதிகம் பேரை குறித்த தொழில்வாய்ப்புகளுக்கு உள்வாங்க முடியும். ஆகவே, கடந்த ஆகஸ்ட் மாதம், 31ஆம் திகதி வெளிவந்த குறித்த வர்த்தமானி அறிவித்தலைக் கவனத்தில் எடுக்குமாறு கோரி, என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
நன்றி! அடுத்து கௌரவ வேலு குமார் அவர்கள். உங்களுக்கு ஆறு நிமிடங்கள்!

[பி.ப. 2.26]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மருத்துவம் (திருத்தம்) சட்டமூலம் தொடர்பான இந்த விவாதத்தில் கலந்துகொண்டு எனது அபிப்பிராயத்தையும்

[ගරු වේලු කුමාර් මහතා]

தெரிவிப்பதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன். இந்தச் சட்டமூலத்தின் முக்கியத்துவம் பற்றி அமைச்சர் அவர்களது ஆரம்ப உரையில் விளக்கம் அளிக்கப்பட்டது. இந்த நல்லாட்சி இலங்கையினுடைய சுகாதாரத் துறைமீது மிகுந்த கரிசனை காட்டப்படுவதை இன்று நாங்கள் காண்கின்றோம். இதற்கான வேலைத்திட்டங்கள் இடம்பெறுகின்றன. அரசாங்கத்தினுடைய பங்காளிகளாக இருக்கின்ற நாங்கள் இதனையிட்டு மகிழ்ச்சியடைகின்றோம். குறிப்பாக, மக்கள் அன்றாடம் பயன்படுத்துகின்ற மருந்து வகைகள் சார்ந்து ஏற்படுத்தப்பட்டிருக்கின்ற விலைக் குறைப்பும் மருந்து வகைகளின் தரத்தை உயர்த்தி, தரமான மருந்துப் பொருட்களைப் பெறுவதற்குரிய வசதியை ஏற்படுத்திக் கொடுத்துள்ளமையும் வரவேற்கத்தக்க விடயங்களாகும். ஆகவே, இந்தச் சந்தர்ப்பத்திலே அமைச்சர் அவர்களுக்கு எங்களுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம்.

கடந்த காலங்களிலே வைத்திய சபையின்மூலம் வைத்தியர்களைப் பாதுகாப்பதற்கான முன்னெடுப்புக்கள் மேற்கொள்ளப் பட்டதேயொழிய, பொதுமக்களுக்கு அசாதாரணங்கள் நிகழ்கின்றபோது அந்தப் பொதுமக்களைப் பாதுகாப்பதற்கான, அவர்களுக்கு நீதியினைப் பெற்றுக்கொடுப்பதற்கான சரியான வழிமுறைகள் அவர்களால் கையாளப்படவில்லை. ஆனால், குறித்த நடவடிக்கைகளில் மாற்றத்தை ஏற்படுத்துவதன்மூலம் எதிர்காலத்தில் பொதுமக்களின் நலனை நோக்கிச் செல்ல முடியும். இந்த இடத்தில் நான் ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். அதாவது, கடந்த மாதம் 28ம் திகதி கண்டி மாவட்டத்தினுடைய கலகா பிரதேச வைத்தியசாலையில் இடம்பெற்ற ஒரு கவனக்குறைவு காரணமாக அந்தப் பகுதியைச் சேர்ந்த செல்லத்துரை சங்கர், புவனராணி சங்கர் ஆகியோருடைய ஒன்றரை வயதான துசியந்தன் சஜு என்ற குழந்தை மரணத்தைத் தழுவியது. அதுகுறித்து நாங்கள் எங்களுடைய ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்துக் கொள்கின்றோம். இந்த நிகழ்வு காரணமாக அண்மையில் அந்தப் பிரதேசத்திலே பாரிய மக்கள் ஆர்ப்பாட்டம் ஒன்று இடம்பெற்றது. இந்தப் பிரதேச வைத்தியசாலைகளிலுள்ள வைத்தியர்கள், அங்கிருக்கின்ற தாதிமார் மற்றும் சிற்றாழியர்கள் அங்குள்ள தோட்டங்களில், கிராமங்களில் இருக்கின்ற மக்களை இரண்டாம்பட்சமானவர்களாக, தரம் குறைந்தவர்களாகக் கருதி, அவர்களுடைய சுயமரியாதைக்குப் பாதிப்பை ஏற்படுத்தக்கூடிய வகையில் தொடர்ச்சியாக நடந்து கொண்டதன் காரணமாக, குறித்த நிகழ்வு தொடர்பில் அந்த மக்கள் கோபமடைந்து, மக்கள் போராட்டம் வெடித்தது. அந்த மக்கள் போராட்டத்தின் பின்னர் அந்த வைத்தியசாலையானது இன்றுவரை மூடப்பட்டுக் காணப்படுகின்றது. நான் குறித்த விடயத்தைக் கௌரவ அமைச்சர் அவர்களிடம் கடிதமூலம் தெரிவித்திருக்கின்றேன். இந்த உயரிய அவையிலும் கூறிக்கொள்கின்றேன். இத்தகைய மக்கள் போராட்டங்கள், மக்கள் எழுச்சிகள் இன்று பல்வேறு துறைகளிலும் இடம்பெறுகின்றன. அவ்வாறு நடைபெறுவதற்கான காரணத்தை இன்று அரசு தேடிக் கொண்டிருக்கிறது.

குறித்த கலகா பிரதேச வைத்தியசாலை உடனடியாகத் திறக்கப்படுவதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும்; அங்கு பொருத்தமான வைத்தியர்கள் மற்றும் பொருத்தமான உத்தியோகத்தர்கள் நியமிக்கப்பட வேண்டும். மறுபக்கம் அந்தக் குழந்தையினுடைய இறப்புத் தொடர்பில் மற்றும் அந்த வைத்தியர்களினுடைய கடந்தகால செயற்பாடுகள் தொடர்பாக ஆராய்ந்து சட்டரீதியான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். அத்துடன் அந்த மக்கள் போராட்டத்தின்போது பொதுச் சொத்துக்களுக்கு ஏதேனும் நஷ்டம் விளைவிக்கப் பட்டிருக்குமாக இருந்தால், அதனுடன் சம்பந்தப்பட்டவர் களைச் சட்டத்தின்முன் கொண்டுவர வேண்டும். ஆனால், அங்கு ஜனநாயக ரீதியாகத் தங்களுடைய கோபத்தை வெளிப்படுத்திய, ஜனநாயக ரீதியாகத் தங்களுடைய கருத்துக்களை வெளிப்படுத்தியவர்களின் குறித்த செயற் பாட்டை முடக்கக்கூடிய வகையில், ஒடுக்கக்கூடிய வகையில் பொலிஸ் தரப்பினர் மற்றும் உயர்மட்ட பொலிஸ் உத்தியோகத்தர்கள் குறித்த தோட்டத்தில் இருக்கின்ற சகல இளைஞர்களினதும் பெயர்ப் பட்டியலை வைத்துக்கொண்டு முறையற்ற ரீதியில் சட்டத்தைப் பிரயோகிக்க முனைவது உடனடியாக நிறுத்தப்பட வேண்டும். இதில் சம்பந்தப்பட்டவர்கள் தோட்டத் தொழிலாளர்கள் என்பதனாலா இவ்வாறான இரண்டாம்பட்ச செயற்பாட்டை நீங்கள் முன்னெடுக்கின்றீர்கள்? என்று நான் கேட்க விரும்புகிறேன். ஆகவே, இந்த விடயத்தில் சுகாதார அமைச்சர் அவர்கள் உடனடியாகத் தலையீடு செய்வது அவசியமாகும். கௌரவ பிரதமருடைய மற்றும் பொலிஸ் மா அதிபருடைய தலையீடுகளும் அவசியம். ஆகவே, சகல தரப்பினரும் தலையிட்டு அந்த மக்களின் கோரிக்கைக்கு நியாயமான தீர்வொன்றைப் பெற்றுக்கொடுக்க வேண்டுமென்று இந்த இடத்திலே நான் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

அங்கு இருக்கின்ற தேசிய வைத்தியசாலைகள் மிகச் சிறப்பாக இயங்குகின்றன. ஆனால், கலகா பிரதேச வைத்தியசாலை, பன்வில பிரதேச வைத்தியசாலை, தொலஸ்பாக பிரதேச வைத்தியசாலை, புசல்லாவ பிரதேச வைத்தியசாலை போன்ற தோட்டங்களுக்கு அண்டிய இடத்தில் இருக்கின்ற வைத்தியசாலைகள் அனைத்துமே பல்வேறு விதமான குறைபாடுகளுடன் இயங்குகின்றன. குறித்த பிரதேச வைத்தியசாலைகள் குறிப்பாக மாகாண சபையின் நிர்வாகத்தின்கீழ் இயங்குகின்றன. அன்றாட தேவைக்கான மருந்துப் பொருட்களில்கூட அங்கு குறைபாடுகள் காணப்படுகின்றன. ஆகவே, மாகாண சபையின்கீழ் இயங்குகின்ற வைத்தியசாலைகளிலே இத்தகைய நிலைமைகள் இருப்பதற்கான காரணம் என்ன என்பதனைக் கௌரவ அமைச்சர் அவர்கள் தேடிக் கண்டறிந்து உடனடியாக அதற்கான நிவாரணத்தைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்று கேட்டுக் கொண்டு, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[අ.භා. 2.33]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලේඛනයක් සකස් කිරීම ඇතුළත්ව ඉදිරිපත් කර තිබෙන වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලේඛනයක් සකස් කිරීම පිළිබඳ කාරණය පරක්කු වෙලා හෝ ඉදිරිපත් කිරීම ගැන ඉස්සෙල්ලාම අගය කරන්න ඕනෑ. මගේ මතකයේ හැටියට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් 2006 අවුරුද්දේ මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. එහෙම තිබියදීත් අවුරුදු 12කට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා මේ සංශෝධනය ඉදිරිපත් කරන්න. ඒ විතරක් නොවෙයි. මේ සංශෝධනය පිළිබඳව සමහර පාර්ශ්වයන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණය කියා තිබුණේත්, "මේ වන තෙක් අප රටේ

විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලේඛනයක් නොපැවතීම තේරුම් ගැනීමට අපහසු කරුණක් බව අප විසින් නිරීක්ෂණය කරමු" කියලායි. ඒ අනුව ගත්තොත්, මේක ඇත්තටම වැදගත් අවශ්‍යතාවක්. මොකද, මේ මහින් ඒ ඒ ක්ෂේත්‍රවල ඉන්න විශේෂඥ වෛද්‍යවරුන් හඳුනා ගැනීම සඳහා ජනතාවට අවස්ථාව ලැබෙනවා වාගේම තමන්ට හොඳම වෛද්‍යවරුන් තෝරා ගෙන ප්‍රතිකාර ලබා ගැනීමේ අවස්ථාව ජනතාවට හිමි වෙනවා. ඒ නිසා ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් පවත්වා ගෙන යාමේදී එවැනි විධිමත් ලේඛනයක් පවත්වාගෙන යාම අප අගය කරන්න ඕනෑ කරුණක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සංශෝධනය ගෙන එන කොට මුලින්ම සමහර වෛද්‍ය නිලධාරීන් අතර, සාමාන්‍ය වෛද්‍යවරුන් අතර වෙනස් වෙනස් මත වාද තිබුණා. සමහර අය හිතුවා, ඔවුන්ගේ පෞද්ගලික channeling සේවාවන්වලට මේකෙන් බාධාවක් ඇති වේවි; සමහර ඖෂධ නිර්දේශ කිරීමේදී එය විශේෂඥ වෛද්‍යවරුන්ට පමණක් සීමා වේවි කියලා. නමුත්, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයත් එවැනි විරෝධතාවක් නොදැක්වූ නිසා, සාමාන්‍ය වෛද්‍යවරුන්ට එහෙම ප්‍රශ්නයක් මතු නොවනු ඇතැයි මා හිතනවා. කොහොම වුණත් ගරු ඇමතිතුමනි, විශේෂ කාරණා කිහිපයක් කෙරෙහි මා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. එකක් තමයි, අපේ රටේ විශේෂඥ වෛද්‍යවරුන් තුන්දහසක් පමණ සිටින නමුත්, සමහර ක්ෂේත්‍රවල ඉන්න විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම. උදාහරණයක් හැටියට කොළඹ ජාතික රෝහලේ එක් අවස්ථාවක ඩයි වර්ගයක් විෂ වීමෙන් රෝගීන් කිහිප දෙනකු මරණයට පත් වුණාට පසුත් දැඩි සත්කාර ඒකක - ICU - සඳහාම ප්‍රවීණයන් වුණු විශේෂඥයන් පත් කරන්න සාකච්ඡාවක් පැමිණියා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් ඒ මතයේ ඉන්නවා කියා මා දන්නවා. කෙසේ නමුත්, අපි විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලේඛනයක් සකස් කරන්න කටයුතු කරන මේ වේලාවේ, ICU සඳහාම විශේෂඥ වෛද්‍යවරු ප්‍රමාණයක් වැඩි කර ගන්න ඒ ක්ෂේත්‍රයෙන්ම ඉල්ලීමක් පැමිණියොත් හොඳයි. මොකද, එහෙම වුණොත් තමයි ඒ රෝගීන්ට විශේෂ අවධානයක් යොමු කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

ඊළඟට, විශේෂඥ වෛද්‍යවරුන් අපේ රෝහල්වලට යොමු කළාට පස්සේ ඔවුන් මුහුණ දෙන බරපතළම ප්‍රශ්නයක් තමයි ඒ විශේෂඥ වෛද්‍ය සේවාව පවත්වාගෙන යාම සඳහා ඒ රෝහල්වල අවශ්‍ය කරන සාමාන්‍ය වෛද්‍යවරුන් නොමැති වීම. ඒ කියන්නේ, විශේෂඥ වෛද්‍යවරයකු අනුයුක්ත කළාට වැඩක් නැහැ, ඔහුට හෝ ඇයට සහය ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට සාමාන්‍ය වෛද්‍යවරුන් නැත්නම්. මේක මෑත කාලයේ මූලික රෝහල් බවට පත් කරපු බොහෝ රෝහල්වල තිබෙන ප්‍රශ්නයක්. ඇත්තටම සමහර රෝහල් මූලික රෝහල් බවට පත් කළේ, ඒ රෝහලේ තිබෙන සංවර්ධනයේ අවධිය සලකා බලා නොවෙයි; සමහර දේශපාලන අවශ්‍යතාවන් මතයි. කෙසේ නමුත්, රෝහලකට විශේෂඥ වෛද්‍යවරයකු අනුයුක්ත කිරීම හොඳයි. ඒ අනුයුක්ත කළාට පස්සේ ඒ වෛද්‍යවරයාගේ සේවය නිසි පරිදි ලබා ගන්න නම් ඔහුට සහය වන්න සාමාන්‍ය වෛද්‍යවරු කණ්ඩායමක් වුවමනා කරනවා. ඒ වාගේම රෝගවලට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය කරන මූලික පහසුකම් සැපයීමත් ප්‍රධාන කාරණයක්. රෝහලක ශල්‍ය වෛද්‍යවරයකුට අවශ්‍ය කරන තියටර් එක, මූලික පරීක්ෂණ සඳහා අවශ්‍ය පහසුකම් ආදී දේවල් ප්‍රමාණවත් නොවෙනවා නම් විශේෂඥ වෛද්‍යවරයකු අනුයුක්ත කිරීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ.

ඊළඟට, මම තවත් කාරණයක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. විශේෂයෙන් විදේශීය පුහුණුව අවසන් වෙලා ලංකාවට පැමිණෙන තරුණ විශේෂඥ වෛද්‍යවරුන්ට පත්වීම් ලැබෙන්නේ බොහෝ දුර බැහැර දිස්ත්‍රික්කවලටයි. එවිට ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි ඔවුන්ගේ දරුවන් පාසලට ඇතුළත් කර ගැනීමේ ප්‍රශ්නය. ඒ බොහෝ අය අපේ රටේ මධ්‍ය විද්‍යාල, මහා විද්‍යාලවලින් ආපු සාමාන්‍ය පවුල්වල අය. ඔවුන් කැමැතියි, තමන්ගේ දරුවා රජයේ පාසලකට ඇතුළත් කර උගන්වන්න. නමුත්, ඔවුන් සේවය කරන ස්ථානය අනුව ඒ පහසුකම ලැබෙන්නේ නැහැ. මෙන්න මේ ප්‍රශ්නයෙන් සමහර අය බරපතළ පීඩාවකට පත් වෙලා ඉන්නවා. එවැනි තරුණ විශේෂඥ වෛද්‍යවරුන් මේ ප්‍රශ්නය නිසාම සමහර වෙලාවට රට අතහැර යනවා. ඒක අපට සැලකිය යුතු මට්ටමේ පාඩුවක්. මොකද, ඔවුන්ගේ අධ්‍යාපනයට, ඔවුන් විශේෂඥ වෛද්‍යවරුන් බවට පත් කිරීමට මේ රටේ ජනතාවගේ බදු මුදල් විශාල ප්‍රමාණයක් වැය කර තිබෙනවා.

නමුත්, දරුවා පාසලට ඇතුළත් කර ගැනීම කියන ප්‍රශ්නය මත එවැනි කෙනෙකුගේ සේවය අපට අහිමි වනවා නම්, ඒක අපේ රටේ ජනතාවට වන පාඩුවක්. එම නිසා විශේෂඥ වෛද්‍යවරු ප්‍රමාණය වැඩි කර ගන්නා අතරේම, දැන් සිටින අය මේ රටේ රඳවා ගන්න ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම සම්බන්ධයෙනුත් මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි.

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී ඖෂධවේදීන්ගේ පැත්තෙන්, පෝෂණවේදීන්ගේ පැත්තෙන් විවිධාකාරයේ සංශෝධන ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. ඔබතුමාට මීට කලිනුත් මේ ප්‍රශ්නය ඉදිරිපත් වුණා. ඔබතුමා ඒ ප්‍රශ්නයට උත්තරයකුත් ලබා දුන්නා. ඒ ප්‍රශ්නය එන්නේ මේ පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් නොවෙයි. නමුත්, පෝෂණවේදීන්ගේ ප්‍රශ්නය පිළිබඳව මම නැවත වතාවක් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු ඇමතිතුමනි, අපේ රටේ සෞඛ්‍ය දර්ශක සම්බන්ධයෙන් ඔබතුමාගේ කථාවේදී සඳහන් කළා. ඒ කරුණු ඇත්ත. දකුණු සහ අග්නිදිග ආසියානු කලාපවල පමණක් නොවෙයි, සමහර සෞඛ්‍ය දර්ශක අතින් අපි ලෝකයෙන්ම ඉදිරියෙන් ඉන්නවා. ආර්ථික මට්ටමින් ඉහළ සිටින සමහර රටවලට සාපේක්ෂව අපි ඒ අයට ආසන්න මට්ටමක ඉදිරියෙන් ඉන්නවා. විශේෂයෙන් මාතෘ මරණ අනුපාතිකය, ළදරු මරණ අනුපාතිකය, වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ මරණ අනුපාතිකය වාගේ දේවල්වලින් අපි ඉදිරියෙන් ඉන්නවා. නමුත්, අපේ රටේ දැන් පෝෂණ ප්‍රශ්නයක් පැන නැඟෙමින් තිබෙන බව ඔබතුමා දන්නවා. එය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයත් පිළිගන්නවා, ලෝක සෞඛ්‍ය සංවිධානයත් පිළිගන්නවා. ඒ අනුව අධිපෝෂණය සහ මන්ද පෝෂණය කියන දුෂ්පෝෂණයේ අවස්ථා දෙකම අපේ රටේ දැන් දක්නට ලැබෙනවා. විශේෂයෙන් ගත්තොත් අවුරුදු 5ට වඩා අඩු දරුවන්ගෙන් සියයට 16කට, 17කට ආසන්න ප්‍රමාණයක් එක්තරා ආකාරයක මන්ද පෝෂණයෙන් පෙළෙනවා. ඒක උග්‍ර මන්ද පෝෂණය නොවෙයි. නමුත්, ඔවුන්ට වයසට සරිලන බර නැහැ; වයසට සරිලන උස නැහැ; උසට සරිලන බර නැහැ. මේ ආදී සෞඛ්‍ය දර්ශකවලට අනුව අපි යම් කිසි ආකාරයක යම් අවදානම්සහගත තත්ත්වයක ඉන්නවා. අපේ රටේ ගැබිනි මව්වරුන් ගත්තොත් සියයට 31කට රක්ත හීනතාව තිබෙනවා; යකඩ අඩුයි. මෙවැනි සෞඛ්‍ය ප්‍රශ්න ගණනාවක් දැන් බරපතළ ලෙස පැන නැඟෙමින් තිබෙනවා. ඒ වාගේම, සියයට 6කට ආසන්න ප්‍රමාණයකට දියවැඩියාව තිබෙනවා. සියයට 24කට අධික ප්‍රමාණයකට අධි රුධිර පීඩනය තිබෙනවා. තවත් සියයට 26කට පමණ කොලෙස්ට්‍රෝල් වැඩි වෙලා තිබෙනවා. ඒ පැතිවලිනුත් අපේ සෞඛ්‍ය දර්ශක යම් ප්‍රමාණයකින් අවදානම්සහගත තත්ත්වයකට ලක් වෙලායි තිබෙන්නේ. එම නිසා පෝෂණය කියන එක දැන් අපට වැදගත් මාතෘකාවක් වාගේම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේදී විශේෂ අවධානය යොමු කළ යුතු

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

පැත්තක් වෙලා තිබෙනවා. පශ්චාත් උපාධි හදාරා ඇති අපේ රටේ වෛද්‍යවරුන්ට පෝෂණ ක්ෂේත්‍රයේ විශේෂඥ වෛද්‍යවරු වන්නට අවස්ථාව ලබා දෙන අතරේම, ඒ අයත් එක්ක වැඩ කිරීම සඳහා පෝෂණවේදීන් විශාල පිරිසක් වුවමනා කරනවා. මේ අවශ්‍යතාව දැන හෝ නොදැන තමයි, වයඹ විශ්වවිද්‍යාලය 1996දී මෙවැනි පාඨමාලාවක් ආරම්භ කළේ. නමුත්, එම විශ්වවිද්‍යාලයේ අවුරුදු හතර සම්පූර්ණ කරලා එළියට එන ඒ විශේෂවේදී උපාධිධාරීන් අපේ රටේ රජයේ රෝහල්වලට අනුයුක්ත කර ගන්නට තවමත් වැඩ පිළිවෙළක් නැහැ. ඔවුන්ගේ සායනික පුහුණුවේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒක ඒ දරුවන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. ඒ සායනික පුහුණුව ලබා දීම අපේ වගකීමක්. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවත් එක්ක සාකච්ඡා කරලා, ඔවුන්ගේ අනුමැතියට යටත්ව, ඒ අයට සායනික පුහුණුවක් ලබා දෙමින් පෝෂණ ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්නය විසඳන්නට ඒ අයගේ දායකත්වය ලබා ගත යුතුයි. මා මීට කලිනුත් මේ කරුණ ඇමතිතුමාගේ අවධානයට යොමු කළා. නමුත්, ඒ පෝෂණවේදීන්ගේ සේවය ලබා ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක් තවමත් අපට නැහැ. එහිදී යම් යම් ප්‍රායෝගික දුෂ්කරතා තිබෙනවා. දේශපාලන ක්ෂේත්‍රයේ ඉන්න අයට මේ ප්‍රශ්නය දිහා ඉතා පුළුල් ආකාරයෙන් බලන්න පුළුවන් නම්, මේ ප්‍රශ්නය දෙස පුළුල් අවධානය යොමු කරලා ඒ විශේෂවේදී උපාධිධාරීන්ටත් අපේ සෞඛ්‍ය සේවයට ඇතුළු වන්න අවස්ථාව ලබා දීලා, ඔවුන්ගේ සේවයත් අපි ලබා ගනිමු කියලා මා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අයටත් ආරාධනා කරනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය පුළුල් වීමේදී අපට විවිධ ක්ෂේත්‍රවල උපාධිධාරීන්, පශ්චාත් උපාධිධාරීන් වුවමනා කරනවා. නමුත්, විවිධ ශ්‍රේණි ප්‍රශ්න පදනම් කර ගෙන ඒ අය බඳවා ගැනීමේ කටයුතුවලට අකුල් හෙළීම එතරම් සුදුසු වන්නේ නැහැ. මොකද, ඒකෙන් පීඩාවට පත් වන්නේ බදු ගෙවන අපේ රටේ සාමාන්‍ය ජනතාව වන නිසා. ඒ ජනතාවට ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් ලබා දෙන්න නම්, විවිධ ක්ෂේත්‍රවල විශේෂඥභාවය සහිත, දැනුමත්භාවය සහිත විශාල කණ්ඩායමක් අපට වුවමනා කරනවා.

ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේදී මා ඔබතුමාගේ අවධානය තවත් කරුණකට යොමු කරනවා. දැන් ඖෂධ ගණනාවක මිල අඩු කරලා තිබෙනවා. ඒක හොඳයි. ඒ තුළින් ජනතාවට විශාල සේවයක් වෙනවා; සහනයක් අත් පත් වනවා. විශේෂයෙන් බෝ නොවන රෝගවලින් සෑහෙන කාලයක් පීඩා විඳින, මාසයකට සැරයක් ක්ලිනික් එකට ගිහිල්ලා බෙහෙත් ගන්නා රෝගීන්ට ඒක විශාල වශයෙන් සහනයක්.

ගරු ඇමතිතුමනි, පසුගිය කාලයේ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ යම් අලුත්වැඩියා කිරීම් ප්‍රමාණයක් සිද්ධ කළා. ඒ නිසාම සමහර ඖෂධ ඉන්දියාවෙන් ගෙන්වන්න සිද්ධ වුණා. ඉන්දියාවෙන් ගෙනැල්ලා SPMC එකේ ලේබල් එක යටතේ අපේ රෝහල්වලට හෝ වෙළඳපොළට නිකුත්වන ඖෂධ පිළිබඳ වගකීම තිබෙන්නේ කෙසේද? ඒවා අපේ රසායනාගාරවලදී පරීක්ෂා වෙනවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මා ඒ ගැන පැහැදිලි කරන්නම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
හොඳයි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අපේ SPMC එකේ ඉන්න සේවකයෝ ඉන්දියාවට ගිහින් තමයි ඒ ඖෂධ ඔක්කොම නිෂ්පාදනය කරලා ගෙනෙන්නේ. අපි ඒකට ලංකාවේ තිබෙන කර්මාන්තශාලාවක් ගත්තේ නැත්තේ මේවායේ තිබෙන formulas වෙන සමාගම් අරගනියි කියන හේතුව නිසා යි. ඒ නිසා තමයි SPMC එක ඒ තීන්දුව ගත්තේ. අපේම සේවකයෝ, අපේම pharmacist ලා ඉන්දියාවට ගිහිල්ලා එහිදී බෙහෙත් හදලා මේ රටට ගෙනෙනවා. කුලියට අරගෙන තිබෙන්නේ ඒ රටේ කර්මාන්තශාලාවක් විතරයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඒ බෙහෙත් පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය තිබෙන විධියටමයි?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
එහෙම තියෙනවා නම් හොඳයි. නැත්නම් අපි රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විධියට කාලයක් තිස්සේ අත්පත් කර ගත්ත කීර්තිනාමය පාවිච්චි කරලා වෙනත් සමාගමකට ඒ ඖෂධ නිෂ්පාදනය කරන්න අවස්ථාවක් ලබා දීම සුදුසු වන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, ඊළඟට මම අවධානය යොමු කරනවා-

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ළඟදීම මේ රටේ ඒ නිෂ්පාදන ආරම්භ කරනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
හොඳයි. තව පොඩි කාලයයි එහෙනම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟ කාරණය මෙකයි. පසුගිය කාලය පුරා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඕනෑම ප්‍රශ්නයක් සාකච්ඡා කරනකොට අපි SAITM එකේ ප්‍රශ්නයත් සාකච්ඡා කළා. ගරු ඇමතිතුමාටත් මේක අහලා අහලා, අපිත් කියලා කියලා එපාවෙන තත්ත්වයකට ඇවිල්ලා තිබුණා. කෙසේ වුණත්, අපේ රාජ්‍ය වෛද්‍ය පීඨවල ඉගෙන ගත්ත ශිෂ්‍යයන්ටත් නැවත දේශනවලට යන්න පුළුවන් ආකාරයටත්, SAITM එකේ රැවටීමකට ලක්වෙලා හෝ හිටපු ශිෂ්‍ය කණ්ඩායමටත් සාධාරණයක් වන විධියටත් ඒ ප්‍රශ්නයට යම් විසඳුමක් ලබා දෙන්න අපට හැකියාව ලැබුණා. එහිදී පාර්ලිමේන්තුවත් යම් දායකත්වයක් දැක්වූවා. දැන් ගරු ඇමතිතුමනි, මෙන්න මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා. මේ ළමයි 900කට ආසන්න පිරිස අතරේ පූර්ණ සහ අර්ධ ශිෂ්‍යත්ව ලැබුණු අය ඉන්නවා. සාමාන්‍යයෙන් ශිෂ්‍යත්වධාරීන් 200ක් විතර ඉන්නවා. පූර්ණ ශිෂ්‍යත්වධාරීන් 35ක් 40ක් විතර ඉන්නවා. ඇත්තටම ගත්තොත්, ඔවුන්ගෙන් බොහෝ අයට ශිෂ්‍යත්වයක් නොලැබුණා නම් රුපියල් ලක්ෂ හැටපහක්, හැත්තෑපහක්, අනූවක් වියදම් කරලා SAITM වාගේ ආයතනකට යන්න බැහැ. ඔවුන්ට අවශ්‍ය සුදුසුකම්ද තිබෙනවා. මේ බොහෝ අය රජයේ විශ්වවිද්‍යාලයක පශු වෛද්‍ය, දන්ත වෛද්‍ය එසේ නැත්නම් කෘෂි

විද්‍යාපීඨයකට ඇතුළත් වෙන්න සුදුසුකම් තිබුණු අය. නමුත් මේ ශිෂ්‍යත්වය ලැබීම නිසාම ඔවුන් වෛද්‍ය උපාධිය හැදෑරීම සඳහා SAITM වාගේ ආයතනයකට ගියා. දැන් ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. ඔවුන් SAITM එකේ ශිෂ්‍යත්වධාරීන් විධියට නොමිලේ ඉගෙන ගත්තාට, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට යනකොට ඔවුන් බඳවා ගන්නේ මුදලට. දැන් ඔවුන්ගෙන් එක අවුරුද්දකට රුපියල් දහතුන් ලක්ෂ හැටදෙදාහක මුදලක් ඉල්ලනවා. මෙය කිසිසේත් සාධාරණ නැහැ. ඒ නිසා අපි ප්‍රථම වශයෙන්ම අවධානය යොමු කරන්න වෙලා තිබෙනවා මේ ශිෂ්‍යත්වධාරීන් වෙත. KDU එකේ මේ මුදල් ප්‍රශ්නය නිසා මේ අයට මේ පාඨමාලාව අත්හරින්නට සිද්ධ වුණොත්, ඇත්තටම ඔවුන්ගේ ජීවිතවලට අපි බරපතළ අසාධාරණයක් කරන්නේ. මොකද, ඔවුන්ට රජයේ විශ්වවිද්‍යාලයක වෙනත් පඨමාලාවක් හදාරන්නට තිබෙන අවස්ථාවත් නැතිවෙලා තිබෙන නිසා ඔවුන් අධ්‍යාපනයෙන් සහ ජීවිතයෙන් පිටමං කරන තැනකටයි පත් වෙන්නේ. පසුගිය 5වැනි දා කොළඹ "කෝලාහලය" තිබුණ වෙලාවේ, ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ විවේක සුවයෙන් ගත කරපු වෙලාවේත් මේ ගැන මම එතුමාගේ අවධානය යොමු කළා. එතුමාත් මේ ප්‍රශ්නය දැනුවත්වයි සිටියේ; විසඳුමක් දෙනවා කියලාත් කිව්වා. සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට ඔබතුමාටත් මේ ශිෂ්‍යත්වධාරීන් පිළිබඳව අවධානය යොමු කරන්න වගකීමක් තිබෙනවා.

ඒ වාගේම, SAITM ආයතනයට වසර පහක් හෝ හයක් මුදල් ගෙවපු දරුවන් ඉන්නවා. ඔවුන් එතැනට අවුරුද්දකට රුපියල් ලක්ෂ පහළොවක්, දහසයක්, විස්සක් ගෙවා තිබෙනවා. හැබැයි, අවුරුදු පහක් එතැනට ගාස්තු ගෙවපු අයගේ සුදුසුකම් සලකා බලා, ඔවුන්ගේ සායනික පුහුණුව පිළිබඳව සලකා බලා කොතලාවල විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගන්නේ සමහරවිට අවුරුදු තුනකට. ඒ දරුවන්ට නැවත වතාවක් අවුරුදු දෙකකට KDU එකට මුදල් ගෙවන්න කියලා තිබෙනවා. ඇත්තටම ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය ගැන පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන වෙලාවේ කිසිසේත්ම අපි කවුරුවත් හිතුවේ නැහැ, මේ දරුවන් KDU එකට ගන්නකොට මුදල් අයකරයි කියලා. KDU එක ඉදි කිරීම සඳහා මේ පාර්ලිමේන්තුව රටේ ජනතාවගේ බදු මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, KDU එකට බඳවාගත් SAITM එකේ ශිෂ්‍යයන්ට සායනික පුහුණුව ලබා දෙන්නේ රජයේ රෝහල්වල. අවිස්සාවේල්ල රෝහලේ, මුල්ලේරියාව රෝහලේ සහ දැන් ආණ්ඩුව විසින් සියයට සියයක් පවරා ගත්ත, ඔබතුමා උදෑසන කියපු SAITM රෝහල ඇතුළු රෝහල් හතරක තමයි ඒ ශිෂ්‍යයන්ට සායනික පුහුණුව ලබාදෙන්නේ. ඒ අයට නේවාසිකාගාර දෙන්නේත් නැහැ.

මෙහෙම තත්ත්වයක් තිබියදී SAITM එකේ මුදලාලිත් මුදල් අරගෙන තිබෙන කොට, නැවත වතාවක් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් මුදල් අය කිරීම කිසිසේත්ම සාධාරණ නැහැ. මොකද, අපට වුවමනාව තිබෙන්නේ මෙම ප්‍රශ්නය විසඳා ගන්නයි. ඒ නිසා රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මඟින් මේ දරුවන්ට වෛද්‍ය උපාධිය ලබා දීලා ඒ අය පිටමන් කරලා සෞඛ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන්න ඕනෑ. එහිදී ඒ අයගේ සුදුසුකම්, ඒ අයගේ සායනික පුහුණුව බැලීම සඳහා තමයි ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යටතේ යම් කමිටුවක් පත් කරන්නේ. ඒ නිසා අප මේ ප්‍රශ්නයේ දී ඉතාම සාධාරණව බැලිය යුතුයි. අපි මෙම ප්‍රශ්නයට මැදිහත් වුණේ වෛද්‍ය උපාධිය මුදලට විකිණීමට එරෙහිවයි. දැන් ඒක නෙවිල් ප්‍රනාන්දු මහත්මයාගෙන් අරගෙන කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ දීත් ඒ මුදල් ඒ ප්‍රමාණයම අය කරනවා නම්, SAITM එකෙන් මුදල් අය කරපු දරුවන්ගෙන් නැවත වරක් මුදල් අයකරනවා නම් එය කිසිසේත්ම සාධාරණ නැහැ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඔබතුමාට තේරෙනවා නේ, SAITM මුදලාලිට වඩා KDU මුදලාලි අමාරුයි කියලා. අඩුම ගණනේ SAITM මුදලාලි ශිෂ්‍යත්ව 200 ගණනක් දීලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මම හිතන්නේ, ඒ පිළිබඳ අපි සතුටු වෙන්න ඕනෑ නැහැ කියලායි. KDU එක කියලා කියන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාලයක්. එම විශ්වවිද්‍යාලය මේ රටේ ජනතාවගේ බදු මුදලින් නඩත්තු වෙන ආයතනයක්. රටේ ජනතාව රුපියල රුපියල බදු ගෙවලා තමයි එම විශ්වවිද්‍යාල නඩත්තු කරන්නේ ඒ සියලුම දේවල් ජනතාව විසින් නඩත්තු කරමින් තිබියදී එතැනට ආපු අයට නැවත නැවත කසයෙන් තලන එක සාධාරණ වෙන්නේ නැහැ.

ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමනි, ඔබතුමා දැන් SAITM එක වෙනුවෙන් කථා කළා වාගේම; ඒ වෙනුවෙන් මැදිහත් වුණා වාගේම KDU එකේ ඉගෙනුම ලබන ළමයින් සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා.

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, මම නැවත වතාවක් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන්. මේ ගැනත් අපි විටින් විට සාකච්ඡා කළා. ඔබතුමා ඒ වෙලාවේ කිව්වා, ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් 900කට පත්වීම් ලබා දෙනවා කියලා. දැන් ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

පත්වීම් ලබා දීලා අවසන්. විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍යයන් 650ක් පිට වුණා. ඉතිරි අයටත් පත්වීම් ලබා දෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

පත්වීම් 900ක් දෙනවා කිව්වාට එතරම් ප්‍රමාණයක් හිටියේ නැහැ නේද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

නැහැ. හිටියේ නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

Batches කිහිපයක් pass out වෙන්න ඉන්නවා. ගරු අමාත්‍යතුමනි, මම එක් කාරණය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. අපේ රටේ සංචාරක ව්‍යාපාරයත් එක්ක ආයුර්වේදය ගැටගැහිලා තිබෙනවා. සංචාරක හොටල්වලට ආයුර්වේද වෛද්‍යවරු බඳවා ගන්නවා. නමුත්, ඒ අයගේ ප්‍රමිතිය සම්බන්ධයෙන් කොහේවත් පරීක්ෂා වෙන්නේ නැහැ. මොකද,

ඒවායෙන් ප්‍රතිකාර ලබා ගන්න එන, එහෙම නැත්නම් විවේකය ගත කරන ගමන් යම් ආයුර්වේද ප්‍රතිකාරයක් ලබා ගන්නට එන පුද්ගලයෙකුට වඩා ඔවුන් අරගෙන යන්නේ අපේ රටේ කීර්ති නාමයයි. අවුරුද්දෙන් අවුරුද්ද ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් 100ක්, 150කට ආසන්න ප්‍රමාණයක් විශ්වවිද්‍යාලවලින් පිටවනවා. රජය මැදිහත් වෙලා, එම වෛද්‍ය උපාධිධාරීන්ට මේ සංචාරක ක්ෂේත්‍රයත් ඉලක්ක කරගෙන, පත්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරන්න පුළුවන්ද කියන එක ගැන අවධානය යොමු කරන්න කියලා මම කියනවා. විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලේඛනය හැදුවා වාගේම, අදාළ රෝහල් සඳහා යොමු කරන්න පුළුවන් වෛද්‍යවරු ප්‍රමාණයක් ඉන්නවා නම් ඒ වගකීම රජයෙන් -සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්- ගන්න ඕනෑ. හෝටල් වගකීම අරගෙන හරියන්නේ නැහැ. මොකද ඔවුන් කරන සේවය නිකම්ම නිකම් ලාංකිකයෙකුට කරන සේවයට වඩා ලෝකයටම අරගෙන යන පණිවුඩයක්. ඉතින් මෙම ආයුර්වේද ක්ෂේත්‍රය සම්බන්ධයෙනුත් අපි අවධානයක් යොමු කරමු. මොකද, ආයුර්වේද ක්ෂේත්‍රය හරහා විවිධාකාර ඩිජ්ලෝමා සහ වෙනත් ආකාරයට පත්වීම් ලබා ගෙන මෙම ක්ෂේත්‍රයට නොගැළපෙන අය ඇතුළත් වෙලා තිබෙනවා. එම සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය රැක ගැනීමට ඕනෑකම තිබෙන අතරේම, මේ උපාධිධාරීන්ගේ සේවය ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නිසි ක්‍රමවේදයක් වුවමනා කරනවා. ගරු අමාත්‍යතුමනි, මෙම කරුණු පිළිබඳ ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා වේලාව අවසන් බවත් කිව්වා. එම නිසා ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මාගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මීළඟට, ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා.

[අ.භා. 2.52]

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තුවේ සාකච්ඡා වෙන මේ මොහොතේදී මමත් අදහස් කිහිපයක් මෙම සභාව හමුවේ ඉදිරිපත් කරන්න කැමතියි. මම හිතන්නේ වෛද්‍යවරු, විශේෂඥ වෛද්‍යවරු ඇතුළු වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ සෑම කෙනෙක්ම බලාපොරොත්තුවෙන් හිටපු කාරණයක් තමයි -ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවෙනුත් සඳහන් කළ ආකාරයට- දීර්ඝ කාලයක් තිස්සේ මේ රටට අවශ්‍ය වෙලා තිබුණු විශේෂඥ වෛද්‍යවරුන් හදුනා ගැනීම වෙනුවෙන් විශේෂ ලේඛනයක් ඉදිරිපත් කිරීම. වෛද්‍ය සභාව හරහා මෙය ප්‍රකාශයට පත් කරලා, මේ රටේ රෝගී ජනතාවට තමන් ප්‍රතිකාර ලබා ගන්නා වෛද්‍යවරයාගේ සුදුසුකම් මොනවාද කියලා පැහැදිලිව, නිශ්චිතව දැන ගැනීමේ ක්‍රමවේදයක් සැකසීම තමයි මෙම පනත් කෙටුම්පත හරහා සිදු වන්නේ.

එය යුගයේ අවශ්‍යතාවක්. විශේෂයෙන්ම දියුණු රටවල දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන සහ ඉතාම යථාවත් වන ක්‍රමවේදයක් හැටියට විශේෂඥ වෛද්‍යවරුන් හඳුනාගැනීමේ ක්‍රමවේදය සහ ඔවුන් ලියා පදිංචි කිරීමේ ක්‍රමවේදය ඇතුළත් කරන්න ගරු ඇමතිතුමා මෙම පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙනවා. එය හොඳ කාරණයක් බව අප විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි. මේ කාල වකවානුව වන විට ලංකාවේ වෛද්‍යවරු 20,000කට වඩා වැඩි ප්‍රමාණයක් ඉන්නවා. විශේෂඥ වෛද්‍යවරුන් 2,500ක් - 3,000ක් අතර ප්‍රමාණයක් මේ රටේ සේවය කරනවා කියා අපි විශ්වාස කරනවා. වෛද්‍යවරුන් හැටියට පෙනී සිටීමින් වෛද්‍ය සේවාවේ යෙදෙන වෛද්‍යවරුන් නොවන විශාල පිරිසක් සිටිනවා. MBBS හෝ පිළිගත් වෙනත් වෛද්‍ය උපාධියක් නොමැති, වෛද්‍යවරුන් හැටියට පෙනී සිටීමින් ඖෂධ නිකුත් කරන විශාල පිරිසක් මේ රටේ ඉන්නවා. රෝගීන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ඔවුන් හඳුනා ගැනීම අවශ්‍යයි. ඒ වාගේම තමයි, නිශ්චිත සුදුසුකම් නොමැති කවර හෝ පුද්ගලයන් විශේෂඥ වෛද්‍යවරුන් හැටියට පෙනී සිටිනවා නම්, ඔවුන් හඳුනා ගැනීමත් අවශ්‍යයි. මොකද, රෝගියාට බොහොම පැහැදිලි අයිතිවාසිකමක් තිබෙනවා, මේ රටේ තමන් බෙහෙත් ගන්නට යන පුද්ගලයාගේ නිශ්චිත සුදුසුකම් -ඔහුගේ උපාධිය හෝ පශ්චාත් උපාධිය- පිළිබඳව දැන සිටීමට. රෝගියා ඒ ගැන පැහැදිලිව දැනගෙන සිටීම අවශ්‍යයි. ඒ නිසා මෙය හොඳ කාරණයක්. ගරු අමාත්‍යතුමනි, මේ කාරණයත් එක්ක සමහර වෛද්‍යවරුන් අතර පොඩි ගැටලුවක් මතු වෙලා තිබෙනවා, දීර්ඝ කාලයක් තිස්සේ වෛද්‍ය සේවාවේ නිරත වෙලා සිටි සමහර වෛද්‍යවරුන්ට, ඔවුන් කරන කටයුතුවලට යම්කිසි බාධාවක් ඇති වේද කියලා. ඔවුන් තුළ එවන් කුකුසක් ඇති වෙලා තිබෙනවා. මා හිතන විධියට එහෙම ගැටලුවක් මතු වන්නේ නැහැ. හැබැයි ඒ එක්කම ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා, ඖෂධවේදීන් සහ අනෙකුත් පෝෂණවේදීන් ඇතුළු කණ්ඩායම්වලට මේ හරහා ගැටලුවක් මතු වේද කියලා. අපි විශ්වාස කරන විධියට මේ හරහා ඒ අයට ගැටලුවක් මතු වන එකක් නැහැ. මෙය යුගයේ අවශ්‍යතාවක්. ඒ වෙනුවෙන් කටයුතු කිරීම පිළිබඳව අපි සතුට පළ කරනවා.

මේ හා සමහම ඖෂධ නියාමනය පිළිබඳව, මිල ඉදිරිපත් කිරීම පිළිබඳව, ලියා පදිංචිය ඇතුළු කරුණු කාරණා කිහිපයක් පිළිබඳව ගරු ඇමතිතුමා සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. අපේ ආණ්ඩුව පැවැති පසු ගිය කාලයේත්, ඒ වාගේම වර්තමානයේත් ලංකාවේ ඖෂධ නිෂ්පාදනය පිළිබඳව කතිකාවක් ඇති වෙලා තිබෙන බව අපි දන්නවා. ලංකාවට පිට රටින් ගෙන්වන ඖෂධ විශාල ප්‍රමාණය සීමා කරලා මේ රටේ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම පිළිබඳව කථා බහක් ඇතිවෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් ගත් විවිධ ක්‍රියා මාර්ග තිබෙනවා. අද අප විශ්වාස කරන විධියට, International Medical Statistics - IMS- දත්ත අනුව ලංකාවේ ඖෂධ වෙළෙඳ පොළ රුපියල් බිලියන 90ක් පමණ වෙනවා. එයින් ලංකාවේ නිෂ්පාදනය කරන ඖෂධවල වටිනාකම රුපියල් බිලියන 16ක් පමණ වනවා. ලංකාවේ නිෂ්පාදනය කරන ඖෂධවලින් ලංකාවේ වෙළෙඳ පොළට අද සැපයෙන්නේ සියයට 20කට වඩා අඩු ප්‍රමාණයක්. ඒ නිසා විශාල රික්තයක් තිබෙනවා. ඉදිරි කාලයේදී ලංකාවේ නිෂ්පාදන සමාගම්වලට හැකියාවක් ලැබෙනවා, මේ රටේ නිෂ්පාදන ධාරිතාව වැඩි කරන්න. ඒ සඳහා සුදුසු සමාගම් තිබෙනවා. ආයෝජන වෙනුවෙන් අවස්ථාව විවර වෙලා තිබෙනවා. ලංකාවෙන් අතිවිශාල මුදල් ප්‍රමාණයක් ඖෂධ වෙනුවෙන් පිටරටවලට ඇදී යනවා. එම නිසා ලංකාවේ ඖෂධ නිෂ්පාදනය හැකි උපරිමයෙන් වැඩි කරන්න, දියුණු කරන්න අත හිත දෙන්න අප සෑම කෙනකුටම යුතුකමක් තිබෙනවා. එය ජාතික වගකීමක්. ගරු අමාත්‍යතුමනි, දැනට තිබෙන තත්ත්වයන් යටතේ ලංකාවේ සමාගමක් වුණත් ඖෂධ ලියා පදිංචිය සඳහා, formulation approval සඳහා ඉල්ලුම් කළාට පසුව ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ විශාල ප්‍රමාදයක් තවමත් තිබෙනවා. අඩුම ගණනේ මාස 6ක් විතර යනවා, formulation approval එකට. Dossier එක submit කළාට පසුව අඩු ගණනේ අවුරුද්දක්, අවුරුදු එකහමාරක් විතර ගතවනවා, ඖෂධයට මූලික අනුමැතිය ලබා ගන්න. ලංකාවේ නිෂ්පාදකයකුට වුණත් වසර එකහමාරක්, දෙකක් ගතවනවා ඖෂධයක් සඳහා තම ලියා පදිංචිය ලබා ගන්න. මෙය ක්‍රමවත් කරලා, වේගවත් කරලා ඉක්මනින් ලියා පදිංචිය ලබා දෙන්න පුළුවන් ක්‍රමවේදයක් සකස් කරනවා නම් ඒක වටිනවා කියා මම හිතනවා. එවැනි ක්‍රමවේදයක් සකස් කළ යුතුය කියලා අපි යෝජනා කරනවා. මොකද, දැනටමත් ඖෂධවේදීන්ගේ හිඟයක් පවතිනවා. ජාතික ඖෂධ නියාමන

අධිකාරියේ දීර්ඝ කාලයක් තිස්සේ තිබෙන ගැටලුවක් තමයි, ලිය කියවිලි පරීක්ෂා කර අනුමැතිය ලබා දීම සඳහා දීර්ඝ කාලයක් ගත වීම. පිට රටින් ගෙනෙන, දැනටමත් ලංකාවේ ලියා පදිංචි ඖෂධ ප්‍රමාණය කාණ්ඩ වශයෙන් 1,000කට වඩා තිබෙනවා. වෙළඳ නාම සමඟ ගත්තොත්, 20,000කට වඩා වැඩි ඖෂධ ප්‍රමාණයක් මේ රටේ ලියා පදිංචි වෙලා තිබෙනවා. දැනට ලියා පදිංචි වී තිබෙන ඖෂධ කාණ්ඩ හරහා අලුතින් තවත් ඒවා එකතු කළ යුතුද කියන සාකච්ඡාව කරන්න අපට සිදු වනවා. හැබැයි ඒ සාකච්ඡාව කරන අතරතුරේ දීම අප කතා කළ යුතු කාරණය තමයි පිට රටින් ගෙන්වන ඖෂධ වෙනුවට ලංකාවේ ඖෂධ නිෂ්පාදනය කරන සමාගම්වලට, දේශීය නිෂ්පාදකයාට අත හිත දෙන්න, registration process එක expedite කරන්න ක්‍රමවේදයක් සකස් කළ යුතුය කියන කාරණය. එහෙම කළොත් තමයි ලංකාවේ නිෂ්පාදකයා දිරිමත් වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ එක්කම තව කාරණයක් පිළිබඳව මා ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවනවා. ලංකාවට ගෙනෙන ඖෂධ සියල්ලටම Cess, PAL, VAT ආදි බදු ගහන්නේ නැහැ. ඒ කිසිම බද්දක් නැතිව තමයි ලංකාවට ඖෂධ එන්නේ. ඒක හොඳයි. එතකොට පාරිභෝගිකයාට; රෝගියාට පුළුවන් තරම් අඩු මිලට ඖෂධ ගන්න පුළුවන් වනවා.

හැබැයි, ලංකාවේ ඖෂධ නිෂ්පාදනය සඳහා මේ ගෙන එන අමුද්‍රව්‍ය - raw materials, excipients - සහ උපකරණ ඇතුළු සියලු දේවල්වලට cess, PAL, VAT යනාදී බදු ගහනවා. ගරු ඇමතිතුමනි, duty waiver එකක් පස්සේ හම්බ වෙනවා. හැබැයි, Cesss සහ වරාය බදු - PAL, Ports and Airports Development Levy - ඇතුළු සහන නිෂ්පාදකයාට ලැබෙන්නේ නැහැ. ඒ නිසා, Cess, PAL, VAT යනාදි බදු නැතිව අවසාන නිෂ්පාදනය - end product එක - හැටියට මේ රටට ඖෂධ අරගෙන එනවා නම්, empty capsules ඇතුළු අමුද්‍රව්‍ය සහ excipients සඳහා කරුණාකර මේ රටේ නිෂ්පාදකයා වෙනුවෙනුත් සම්පූර්ණ බදු නිදහස ලබාදෙන්න කියා අපි ඔබතුමාට යෝජනා කරනවා. එහෙම වුණොත් තමයි ඔවුන්ට පිට රටින් එන නිෂ්පාදකයා සමඟ මේ රටේ තරග කරන්න පුළුවන් වෙන්නේ.

ගරු ඇමතිතුමනි, ඊළඟ කාරණය තමයි, දැන් duty waiver එක ලබාගැනීමට කල්ගත වීම. ඔබතුමා දන්නවා ජාතික ඖෂධ නියාමන අධිකාරිය ඇති වෙන්න කලින් ඉස්සර CDDA - Cosmetics, Devices and Drugs Authority - එකේ letter එක අරගෙන ගියාම කෙළින්ම duty waiver එකක් ලබා ගන්න පුළුවන් වුණු බව. CDDA එකේ ලියුම අරගෙන ගියාම, මේ සමාගම ලංකාවේ ඖෂධ නිෂ්පාදනය කරන සමාගමක් කියා ඒ ගොල්ලෝ දන්නවා. ඒ ඖෂධවේදීන් ඉතාම කෙටි කාලයක් තුළ duty waiver එක ලබා ගන්න ඒ ලියුම ලබා දුන්නා. හැබැයි ගරු ඇමතිතුමනි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත ගෙනාවාට පස්සේ, මේ duty waiver එක ලබා ගන්න නිෂ්පාදකයාට සෞඛ්‍ය අමාත්‍යාංශයට යන්න වෙලා තිබෙන බව ඔබතුමා දන්නවා. සෞඛ්‍ය අමාත්‍යාංශයට ගිහිල්ලා ඒ ලියුම එතැනට ඉදිරිපත් කළාට පස්සේ, එතැන නිශ්චිත ඖෂධවේදියෙක් නැති නිසා නැවත වතාවක් ජාතික ඖෂධ නියාමන අධිකාරියට ඒක යොමු කරලා එතැනින් පැහැදිලි කිරීම සහ අනුමැතිය ලබා ගත්තාට පසුව නැවත සෞඛ්‍ය අමාත්‍යාංශයට ඇවිල්ලා තමයි මේ duty waiver එක ලැබෙන්නේ. ඒ නිසා කල්ගත වීමක් සිදු වෙනවා. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාට යෝජනා කරනවා, මේ කාරණය සඳහා පුළුවන් නම් සෞඛ්‍ය අමාත්‍යාංශයට ඖෂධවේදියෙක් යොමු කරන්න කියා. ලංකාවේ ලියා පදිංචි ඖෂධ නිෂ්පාදනය කරන සමාගම් සහ ඖෂධ පිළිබඳ තොරතුරු ටික ළඟ තියාගෙන ඉඳලා, ලියුම ඉදිරිපත් කළ සැණෙකින්ම duty waiver එක ලබා දෙන්න කියා ඔහුට කියන්න. නැත්නම් මේ ප්‍රමාදය නිසා, දේශීය නිෂ්පාදකයාට තමන්ගේ මුදල් නැවත ලබාගෙන ඒ නිෂ්පාදනය තරගකාරී මිලකට ලබාදීමේ ගැටලුවක් මතු වෙනවා.

ගරු ඇමතිතුමනි, ඊළඟට තවත් කරුණක් කෙරෙහි මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පිළිබඳව අද මෙතැන කථා කළා. ඔක්තෝබර් මාසයේ 15වන දා සිට නැවත වතාවක් ලංකාවේ ඒ කටයුතු ආරම්භ කරනවාය කියා ඔබතුමා සඳහන් කළා. ඒක හොඳයි. පසුගිය කාලයේදී මතු වුණු තවත් කාරණයක් තිබෙනවා. ලංකාවේ ඖෂධ නිෂ්පාදනය හා ප්‍රවර්ධනය සඳහා විවිධ ආයෝජකයන්ට එන්න කියලා ඔබතුමන්ලා කිව්වා. අපේ ආණ්ඩු කාලයේත් ඒක කිව්වා. පසුගිය කාලයේ ඉන්දියානු සමාගම් ඇවිල්ලා ලංකාවේ අයත් එක්ක joint ventures පටන් අරගෙන තිබෙනවා. ඉන් එක සමාගමක් තමයි, ඉන්දියාවේ "සෙලෝජන්" කියන සමාගම. එහි කොටස් ප්‍රමාණය සියයට 51යි; ලංකාවේ කොටස් ප්‍රමාණය සියයට 49යි. ලංකාවට ආයෝජනය එන්න ඕනෑ. ඔවුන් ලංකාවේ ආයෝජනය කරනවා; නිෂ්පාදනය කරනවා. හැබැයි, ලංකාවේ ආයෝජනය කරලා ඒ අය තමන්ගේ ලාභය පිට රටට අරගෙන යනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා කථා කරන්නේ නැහැ. එතුමාගේ වෙලාවෙන් විනාඩි 4ක් මට ලබාදෙන්න කියා ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
හොඳයි.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
Thank you very much.

ගරු ඇමතිතුමනි, පුළුවන් නම් දැනට ලංකාවේ නිෂ්පාදනය නොකරන ඖෂධ නිෂ්පාදනය කරන්න පිට රටින් එන මේ සමාගම් දිරිමත් කරන්න කියා අපි යෝජනා කරනවා. දැනට ලංකාවේ අපහසුවෙන් නිෂ්පාදනය කරලා, ඉතාම තරගකාරී මට්ටමෙන් ඖෂධ සපයන සමාගම්වලට වැඩි ඉඩක් ලැබෙන්නේ, ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාව තරගකාරී මට්ටමක පවත්වා ගෙනයන්න පුළුවන් වෙන්නේ, ඔවුන් අලුත් ඖෂධ නිෂ්පාදන - products - ඉදිරිපත් කළොත් තමයි කියා මා හිතනවා. ඒ නිසා, පුළුවන් නම් ඒ කාරණය ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. එහෙම වුණොත් තමයි, දේශීය නිෂ්පාදකයා වඩාත් දිරිමත් කරන්න පුළුවන් වෙන්නේ.

ගරු ඇමතිතුමනි, "ඇමොක්ස්ලින්", "පැරසිටමෝල්", "පිරිටන්" වාගේ ඖෂධ විශාල ප්‍රමාණයක් දැනට ලංකාවේ නිෂ්පාදනය වෙනවා. මම ඔබතුමාට යෝජනා කරනවා, පුළුවන් නම් මේ ඖෂධ පිට රටින් ගෙන්වීම සම්පූර්ණයෙන්ම නතර කරන්න කටයුතු කරන්න කියා. මොකද, මූලික ඖෂධ ටික

නිෂ්පාදනය සඳහා මේ රටේ ඉතාම ශක්තිමත් පදනමක් වැටිලා තිබෙනවා. ඒ ඖෂධ ටික නිෂ්පාදනය කරන ලංකාවේ ආයෝජකයා, ලංකාවේ නිෂ්පාදකයා දිරිමත් කරන්න නම්, ඒවා පිට රටින් ගෙනෙන එක සම්පූර්ණයෙන්ම නතර කළ යුතුයි. එහෙම වුණොත් ලංකාවේ නිෂ්පාදකයාට හොඳ තත්ත්වයක් ඇති වෙයි කියා මා විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, එම කරුණු දෙකට අමතරව මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ කරාපිටිය රෝහල පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න ඕනෑ. අපේ ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන, අපි ගරු කරන ඇමතිවරයෙක්. ගරු ඇමතිතුමනි, පසුගිය කාලයේ ගාල්ල කරාපිටිය රෝහලේ අතිවිශාල තදබදයක් තිබුණා. එය අදටත් එහෙමමයි. ශල්‍ය වෛද්‍ය අංශයේ, Cancer Unit එකේ, Neurosurgical Unit එකේ, ඒ වාගේම හෘද රෝග ඒකකයේ - Cardiology Unit එකේ - අතිවිශාල තදබදයක් තිබෙනවා. මීට වසර දෙකකට කලින් - ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවාට පස්සේ- පිළිකා රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා තට්ටු 10කින් සමන්විත Oncology Unit එක හදන්න යෝජනා කළා.

හැබැයි, මුදල් වෙන් කළාට අද වනතුරු එම කටයුත්ත ආරම්භ වෙලා නැහැ, ගරු ඇමතිතුමනි. අපේ ආණ්ඩුව තිබෙන කාලයේ, තට්ටු 8කින් සමන්විත වකුගඩු ඒකකයේ ඉදිකිරීම් කටයුතු අප ආරම්භ කළා. එවකට සෞඛ්‍ය ඇමතිවරයා හැටියට ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමයි ඒ සඳහා මුදල් වෙන් කළේ. අපි ගිහින් මුල්ගල තබා එහි වැඩ ආරම්භ කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Bimal Rathnayake to the Chair?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
Sir, I propose that the Hon. Bimal Rathnayake do now take the Chair.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ඒකකයේ වැඩ කටයුතුවලින් සියයට 75ක් දැනට අවසන් වෙලා තිබෙන්නේ. එය තට්ටු අටකින් සමන්විත ඒකකයක්. වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී අද විශාල තදබදයක් ඇති වී තිබෙනවා. වකුගඩු රෝගයට ප්‍රතිකාර ගැනීම සඳහා දකුණු පළාතේ ඇතම දිස්ත්‍රික්කය වන හම්බන්තොට්න්, ඒ වාගේම ඌව පළාතට අයත් මොණරාගල දිස්ත්‍රික්කයෙන් රෝගීන් එනවා. ගරු ඇමතිතුමනි, එම ඒකකයේ වැඩ කටයුතු අවසන් කිරීම කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ඊළඟට, කරාපිටිය රෝහලට ගෙන්වා තිබෙන linear accelerator එක ගැනත් මම කියන්න ඕනෑ. පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කිරීමටයි එම linear accelerator එක යොදා ගන්නේ. අපේ රජය පැවති කාලයේ සෞඛ්‍ය ඇමතිතුමා වශයෙන් සිටි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් සමඟ ගිහින් අපි ආරම්භ කළ එම කටයුත්තට කෝටි 400ක් පමණ වටිනා උපකරණ ගෙනැවිත් තිබෙනවා. මේ linear accelerator එක ගෙනැත් දැන් අවුරුදු දෙකක්, දෙකහමාරක් පමණ වෙනවා. හැබැයි එම ගොඩනැඟිල්ලේ වැඩ කටයුතු අවසන් වෙලා නැති නිසා, ඒකෙන් ප්‍රතිකාර ලබාගැනීමට රෝගීන්ට විශාල බාධාවක් ඇති වෙලා තිබෙනවා. Radioiodine treatment සම්බන්ධයෙනුත් ඒ වාගේම තත්ත්වයක් තමයි තිබෙන්නේ. අද වනවිට ඒ සඳහා waiting list එකේ අවුරුදු දෙකක් තිස්සේ ඉන්නා අයත් ඉන්නවා. ඒ නිසා විශාල ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. රෝගීන්ට පිට ස්ථානවලට ගිහින් මේ ප්‍රතිකාරය ලබා ගැනීමේ අපහසුතාවක් තිබෙනවා. මේ විධියට අද මේ සෑම අංශයකම විශාල තදබදයක් ඇති වෙලා තිබෙනවා. එම කාරණය කෙරෙහිත් මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා.

Cardiology Unit එකටත්, ඒ වාගේම ස්නායු ශල්‍ය ඒකකයටත් - Neurosurgical Unit එකටත්- මුදල් වෙන් කර තිබෙනවා. නමුත් ඒවායේ වැඩ ආරම්භ කර නැහැ. ගරු ඇමතිතුමනි, කරාපිටිය රෝහලේ තත්ත්වය පිළිබඳව ඔබතුමාට ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාගෙන් දැන ගන්න පුළුවන්. ඒ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. මේ කාරණා නිසා රෝගීන් විශාල පීඩාවකට පත් වී සිටිනවා. මේ සියලුම කාරණා පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවමින්, විශේෂඥ වෛද්‍යවරුන් හඳුනා ගැනීම සම්බන්ධයෙන් මේ ලේඛනය සකස් කරන්න වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා ඒ අවශ්‍ය කටයුතු කිරීම පිළිබඳවත් අපේ ස්තූතිය ඔබතුමාට පුද කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.05]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දොස්තර මහත්මයෙක් සෞඛ්‍ය ඇමති වෙලා සිටියදී, දොස්තර මහත්වරු දෙදෙනෙකුගේ කථාවලින් පසුව මේ වැදගත් විවාදයේදී අදහස් ස්වල්පයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි නිදහස ලබා දශක හතකට පසුව රටක් හැටියට බොහෝ දේවලින් ඉස්සරහටත් ඇවිත් තිබෙනවා; පසුබෑමවලටත් ලක් වී තිබෙනවා. ඒ අතර සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව කථා කරනකොට, අපි ලෝකයේ බොහෝ රටවල් අතර කැපී පෙනෙන තැනක, ප්‍රමුඛ තැනක සිටීම ගැන අප සතුටු වෙනවා. විශේෂයෙන්ම ඉතිහාසයේ කිසිම දවසක සිදු වී

නැති තරමට වර්තමානයේ අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය විශිෂ්ට ජයග්‍රහණ ලබා තිබෙන අවස්ථාවකයි, අපි අද මේ විවාදයට සම්බන්ධ වන්නේ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන විශේෂත්වයක් තමයි, කොයි තරම් දැවැන්ත ආයෝජනයක් සිදු කළත්, ඒවායේ ප්‍රතිඵල බැලූ බැල්මට, එකවර දකින්න නොලැබීම. එම ආයෝජනවල ප්‍රතිඵල සමහර විට දශක ගණනාවකට පසුව තමයි මිනිසුන් දකින්නේ. එය හරියට අධ්‍යාපන ක්ෂේත්‍රය වාගේයි. පාන් ගෙඩියක මිල රුපියල් පහකින් විතර වැඩි වුණු ගමන්, තෙල් මිල අඩු-වැඩි වුණු ගමන්, මහ විශාල කුලුනක් හැදුවාය; ගුවන් තොටුපොළවල් හැදුවාය කියා, ඒවා ආශ්චර්ය දේවල් හැටියට මිනිසුන්ට පෙන්වන බව අපි දන්නවා. නමුත් මේ ක්ෂේත්‍රයේ වෙනස මොකක්ද? කලක් ගියවිට තමයි මේ ක්ෂේත්‍රයේ බොහෝ ප්‍රතිඵල ගැන මිනිසුන් කථා කරන්නේ; දකින්නේ; භුක්ති විඳින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිරෝගී සිරුරක් ඇතුළේ තමයි, සමබර, නිරෝගී මනසක් තිබෙන්නේ. එහෙම සමබර මනසක් තිබෙන මිනිසුන් තමයි සමබර, සංහිඳියාව පිරුණු, ශක්තිමත්, සමෘද්ධිමත් රටක් බිහි කරන්නේ. ඒ නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් දුරදිග බලා කරන ආයෝජනවලින් බලාපොරොත්තු වන්නේ ක්ෂණික සහනවලටත් වඩා ජාතියට අවශ්‍ය ශක්තිමත්, සමෘද්ධිමත් පදනමක් දැමීමයි.

මෑත කාලයට අදාළව මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය දිහා බැලුවාම, වෘත්තියෙන් වෛද්‍යවරයෙක් නොවුණත් අපේ වර්තමාන ජනාධිපති, අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හිටපු සෞඛ්‍ය ඇමතිවරයා හැටියට විවිධ බාධක මැද්දේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල වැඩ කොටසක් කර තිබුණා. එතුමාට කොයි තරම් බාධක තිබුණාද කියා අපි දන්නවා; යමක් කරන්න යනකොට කකුලෙන් කොයි තරම් ඇද්දාද කියා අපි දන්නවා. ඒ සියල්ල මැද්දේ, එතුමා සෞඛ්‍ය ඇමතිවරයා හැටියට මෙම ක්ෂේත්‍රය දියුණු කරන්න ලොකු පදනමක් දමපු බව අපි දන්නවා. ඒ වාගේම තමයි, අපේ වර්තමාන සෞඛ්‍ය ඇමතිතුමා වෘත්තියෙන් වෛද්‍යවරයකු හැටියට මේ ක්ෂේත්‍රය ගැන හොඳ දැනුමක් ඇතිව, අත් දැකීම් ඇතිව විශාල වැඩ කොටසක් අද කර තිබෙනවාය කියන කාරණය යහ පාලන ආණ්ඩුවේ පුද්ගලයෝ හැටියට අපට බය නැතිව ප්‍රකාශ කරලා, පෙන්වා දෙන්න පුළුවන්කම තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ බොහෝ තීන්දු-තීරණ නිසා අපේ ගම්වල අහිංසක මිනිසුන් බොහෝ ප්‍රතිඵල ගන්නා හැටි අපි දැක තිබෙනවා. ඉස්සර ගමක මනුස්සයෙකුට "හදවතේ block එකක් තිබෙනවා. ඒ නිසා හදවත් සැත්කමක් කරන්න ඕනෑ." කිව්වාම, ඒ පුද්ගලයාට විතරක් නොව මුළු පවුලටම ඒක ලොකු කම්පනයක් වෙනවා. ඒ සඳහා වැය වන මුදල සොයා ගන්නේ කොහොමද කියන ප්‍රශ්නය එතැන ඉඳලාම ඔහුගේ ඇහ පුරා ගමන් කරනවා. මුදල් තිබෙන සමහර අය එහෙම එකක් කිව්වාම කිසි ප්‍රශ්නයක් නැතුව පෞද්ගලික රෝහලකට යනවා, එක්කෝ විදේශ රටකට යනවා, වැඩේ කරගන්නවා. ගම්වල දුප්පත් මිනිස්සු ඒ කාලයේ කළේ, එම මුදල සොයාගන්න සම්මාදමේ යන එකයි. පාරේ යනකොට අපි අනන්තවත් දැක තිබෙනවා, -ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාටත් මේවා අලුත් දේවල් නොවෙයි.- ආධාර පත්‍ර ගහගෙන, ටිකට් ගහගෙන, loudspeaker බැඳගෙන පාරක් පාරක් ගානේ, හන්දියක් හන්දියක් ගානේ, පොළවල්වල, පන්සල්වල, හැම තැනම ඒවා විකුණලා සල්ලි එකතු කරනවා. සමහර විට සල්ලි ටික එකතුවෙගන එනකොට ලෙඩා නැහැ; ලෙඩා මැරිලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කරපු මේ පරිවර්තනය නිසා ඒ විධියට සල්ලි එකතු කරගෙන හදවත් සැත්කම් කරන්න ගිය මිනිසුන්ට අද පහසුවෙන් සැත්කම කරගන්න අවස්ථාව ලැබී තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඩෙංගු රෝගය හැදිලා දිනකට කීප වතාවක් ලේ පරීක්ෂා කරන්න සිදු වුණු අයට ලේ සාම්පල් අරගෙන පෞද්ගලික රෝහල් ගානේ යන්න සිදු වුණා. ඔබතුමා ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න කටයුතු කළා. රුපියල් කෝටි ගණනක් වැය කර ඒ පහසුකම් රජයේ රෝහල්වලින් කරන්නත්, පෞද්ගලික රෝහල්වලින් කරන එක නතර කරගන්නත් ඔබතුමාට පුළුවන්කමක් ලැබුණා. මේවා පිළිබඳව බොහෝ දෙනෙක් කථා නොකළාට, මේවා මේ රජයෙන් කළ සුවිශේෂී වැඩ හැටියට අපි දකිනවා.

ගරු ඇමතිතුමනි, ඇසේ සුද ආවාම කාව දෙකක් ගන්න වත්කමක් නැතුව වයෝවෘද්ධ දෙමව්පියෝ කොච්චර පසු බෑමකට ලක් වුණාද කියා අපි ඒ කාලයේ දැක්කා. දවසින් දවස තමන්ගේ ලෝකය අඳුරු වන හැටි දැක දැක, දිනපතාම අන්ධභාවයට පත් වෙමින් තිබෙන හැටි බලමින් ළතැවෙන්න තමයි ඒ අයට සිද්ධ වුණේ. ඔබතුමා අක්ෂි කාව නොමිලයේ ලබාදෙන වැඩ පිළිවෙළ ඇති කළා. එම ශල්‍යකර්ම රජයේ රෝහල්වල සිදු කරන්න ඔබතුමා කටයුතු කළා. ඒ අක්ෂි කාව බාල වර්ගයේ ඒවා නොවෙයි. ලෝකයේ තිබෙන හොඳම ඒවායින් තමයි රජයේ රෝහල්වල ඒ කටයුතු කරන්න ඔබතුමා ක්‍රියා කර තිබෙන්නේ. ඒ වාගේම සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය අවුරුදු ගණනක් තිස්සේ අපේ ජාතියට සිහිනයක් වෙලා තිබුණා. ඔබතුමා වගේ හොඳ කශේරුකාවක් තිබෙන ඇමතිවරයෙක් නිසා ඒවා යථාර්ථයක් බවට පත් කරගන්න අපට පුළුවන් වෙලා තිබෙනවාය කියන එක අද කාටත් තේරෙනවා.

බෙහෙත් වර්ග ගණනාවක මිල අඩු වුණා. ඒවායේ මිල භාගෙට භාගෙටත් වැඩිය අඩුවෙලා තිබෙනවා. විශ්‍රාමික උදවිය හම්බවුණාම බොහෝ වෙලාවට මට කියනවා, ඒ කාලයේ බෙහෙත් ගන්න අපේ pension එක මදි කියා. රාජිත ඇමතිතුමා දැන් බෙහෙත් මිල අඩු කර තිබෙනවා, මාසික බෙහෙත් බිල ගන්නකොට භාගෙට භාගයක් ඉතුරු වන හැටි කියා පින් දීලා කථා කරන හැටි අපි දැක තිබෙනවා.

සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන කථා කරනකොට 1990 "සුවසැරිය" ගිලන් රථ සේවය ගැනත් කථා නොකර බැහැ. මේවා සුළුපටු දේවල් නොවෙයි. ඒ සේවය නිසා අද ජීවිත ගණනාවක් බේරාගන්න පුළුවන්කම ලැබී තිබෙනවා. අපි දන්නවා, ඉස්සර මහ මඟ අනතුරුක් වුණාම රෝහලට ගෙන යන්න ප්‍රමාද වීම නිසයි බොහෝ වෙලාවට රෝගියා නැති වුණේ. එම ගිලන් රථ සේවය ඇති කරනකොට තමුන්නාන්සේලා බිල්ලෝ මැව්වා. එක එක බිල්ලෝ මවලා ඉන්දියාවේ රියදුරන් එන්න හදනවා කිව්වා, ඉන්දියාව ගැන කියා වෙන වෙන කතන්දර කිව්වා. නමුත්, එහි ප්‍රතිඵල අද අපට පැහැදිලිව පෙනෙනවා. දකුණට, බස්නාහිරට පමණක් නොවෙයි, 1990 "සුවසැරිය" ගිලන් රථ සේවය අද මුළු රටටම ප්‍රයෝජනවත් වෙලා තිබෙනවා. රෝගියා විනාඩි කිහිපයක් ඇතුළත නොමිලයේම ආසන්න රෝහලට ගෙනයන්න පුළුවන්. මේවා අපේ රටේ සාමාන්‍ය මිනිසුන්ට, අපේ ගම්වල මිනිසුන්ට විශාල සේවාවක් කියන එක අපට නොකියාම බැහැ. අපි ජීවිත බේරාගන්නා හැටි දැක්කා. ආණ්ඩුව අරගන්න කොළඹට එන්න කියා තමුන්නාන්සේලා පෙරේදා ගම්වල මිනිසුන්ට කිව්වා, "ආණ්ඩුව අරගෙන තමයි ආපසු යන්න ඕනෑ." කියා. එසේ ආපු මිනිස්සු එක එක දෙවල් පානය කර ඇදගෙන වැටුණාම ක්ෂණිකව රෝහල්වලට ගෙනයන්න 1990 ගිලන් රථ බොහොම ප්‍රයෝජනවත් වුණා. එම නිසා මම කියන්න කැමැතියි, වර්තමාන රජයේ සෞඛ්‍ය ඇමතිතුමා හැටියට රාජිත සේනාරත්න මැතිතුමා අපේ සෞඛ්‍ය සේවය දියුණු කරන්න ඉතිහාසගත වැඩ කොටසක් මේ කාලය තුළත් කර තිබෙනවා කියා. ඔබතුමා කරපු සේවාවන් ගැන විස්තර කරන්න ගියොත් සෑහෙන කාලයක් අවශ්‍යයි. ඇත්ත වශයෙන්ම හදිසි හෘදයාබාධයක් හැදුණු කෙනෙක් රෝහලට ගිය විගස මිල අධික එන්නතක් අද රජයේ රෝහල්වලින් ලබා දෙනවා. ඒ නිසා පැය කිහිපයක් ඇතුළත සුවය ලබා ජීවිතය බේරාගෙන ආපහු ගෙදරට යන්න ඔහුට පුළුවන්කම ලැබී තිබෙනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

මේවා පොඩි දේවල් හැටියට නම් මම දකින්නේ නැහැ. මේවා ගැන කථා කරන්නේ නැහැ. මේවා මාධ්‍යවල යන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඕනෑ තරම් අඩු පාඩුකම් තිබෙනවා. සියයට 100ක් ඔක්කෝම හරි නැහැ. මොනවා හෝ අඩු පාඩුවක් වුණාම ඒවා පොල් ගෙඩි අකුරෙන් පත්තරවල වැටෙනවා, මාධ්‍යවල පෙන්වනවා. හැබැයි, මේ වාගේ සුවිශේෂ වැඩ ඒවායේ කථා වෙන්නේ නැහැ. පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ මුදල් ප්‍රමාණයේ එක්තරා සීමාවක් තිබුණා. අද කොන්දේසි විරහිතව අවශ්‍ය ප්‍රතිකාර ලබා දෙන්න ඔබතුමාගේ නායකත්වය යටතේ ක්‍රියා කරනවා. කොළඹ ජාතික රෝහලට පමණක් සීමා වෙලා තිබුණු හදිසි අනතුරු සේවය දිවයින පුරා දැන් ක්‍රියාත්මක කරන්න කටයුතු කර තිබෙනවා. ඒ වාගේම කොළඹට සීමා වෙලා තිබුණු මාතෘ හා ළමා රෝහල් කළුතර, උතුරු කොළඹ, පොළොන්නරුව, ගාල්ල, යාපනය වාගේ තැන්වලත් අද ඇති කර ප්‍රධාන රෝහල් 24ක ඒ සේවය ලබා දෙන්න ඔබතුමා කටයුතු කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
විනාඩි දෙකක් දෙන්න, මගේ කථාව අවසන් කරන්න. මේ සේවාව ගැන කථා කළොත් විනාඩි නොව පැය ගණනක් කථා කරන්න පුළුවන්. වෛද්‍ය පීඨ තුනක් විතර අලුතෙන් ඇති කරන හැටි ඔබතුමා කිව්වා. ඒ වාගේම අපේ කරාපිටිය වෛද්‍ය ශිෂ්‍යයෝ 150දෙනා, 350ක් දක්වා වැඩි කරන්න ඔබතුමා තීරණය කර තිබෙනවා. ඒ වාගේම විශේෂඥ වෛද්‍යවරුන්ට සහ වෛද්‍යවරුන්ට නිල නිවාස 5,000ක් ඉදි කරන්න ඔබතුමා කටයුතු කරනවා. ඔබතුමා හැම දාම කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කරන හැටි අපි දකිනවා. ඒවා කැබිනට් මණ්ඩලය අනුමත කරන හැටිත් දකිනවා. ඒ වාගේම පිළිකා රෝගීන් සඳහා ඇට මිදුලු බද්ධ කිරීමේ සැත්කම මහරගම අපේක්ෂා රෝහලේ ආරම්භ කර දැන් සැත්කම් 39කට වැඩිය කර තිබෙන බව අපි අහලා තිබෙනවා.

කොළඹ ජාතික රෝහල තුළ වකුගඩු බද්ධ කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කළා. මහනුවර මහ රෝහලේ ප්‍රථම හදවත් බද්ධ කිරීමේ සැත්කම සාර්ථකව සිදු කළ බව අපි මාධ්‍යවලින් දැක්කා. අනුරාධපුර මහ රෝහලේ ප්‍රථම පාද බද්ධය සිදු කළා. අපේ රටේ වෛද්‍ය ක්ෂේත්‍රය ලබා ගත් සුවිශේෂ ජයග්‍රහණ ඔබතුමා මේ කාල සීමාව තුළ අපට ලබා දීලා තිබෙනවා. තවත් රාශියක් කරන්න හිතේ තිබෙන බව අපි දන්නවා. මම අවසාන විනාඩියේ මේ කාරණය කියන්න ඕනෑ. ඔබතුමා කරාපිටිය රෝහලට කරන සේවය ගැන අපි දැක්කා. ඒ වාගේම රමේෂ් පතිරණ මැතිතුමා ඒකේ කළ යුතු දේවල් ගැන කිව්ව නිසාත්, කාලය නැති නිසාත් මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. ඇල්පිටිය රෝහල තමයි මම නියෝජනය කරන ආසනයේ තිබෙන ප්‍රධානම රෝහල වන්නේ. ඒකට ඔබතුමා ගිහිල්ලා පරීක්ෂා කර තට්ටු අටක ගොඩනැඟිල්ලක් ලබා දීලා ඒකට මුල්ගල තිබ්බා. බලපිටිය රෝහලේ තට්ටු දහයක ගොඩනැඟිල්ලකට ඔබතුමා ප්‍රතිපාදන වෙන් කර මුල්ගල තිබ්බා. ඒ වාගේම ඇල්පිටිය රෝහලට ගිලන් රථයක් ලබා දෙන්න පසු ගිය දවස්වල කටයුතු කළා. මේවා ඉතාමත් ප්‍රයෝජනවත් දේවල්.

ඇල්පිටිය සහ බලපිටිය රෝහල්වලට ලබා දුන් ගොඩනැඟිලි දෙක කඩිනම් කර ඒ වැඩ කටයුතු ආරම්භ කර ඒවායේ වැඩ පටන් ගන්නටත් ඔබතුමාගේ උපදෙස් අදාළ නිලධාරීන් වෙත ලබා දෙන්න කියා යළි යළිත් ඉල්ලා සිටිනවා. ඔබතුමා කරපු මේ මහා වැඩ කොටස සමහරුන් දැකලා තිබෙනවා. සමහරුන් දැකලත් නොදැක්කා වාගේ සිටිනවා. දැනුණත් නොදැනුණා වාගේ සිටිනවා. හැබැයි, අපි කාට නොපෙනුණත් ලෝකය මේක හොඳට දැකලා තිබෙනවා. ඒක නිසා ඔබතුමා පසු ගිය දවසක ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපසභාපති තනතුරෙන් පිදුම් ලැබුවා. ඒක ඔබතුමා පෞද්ගලිකව ලබපු ජයග්‍රහණයක් හැටියට විතරක් නොවෙයි, මුළු ශ්‍රී ලංකාවේ අපටම ලැබුණු විශාල ගෞරවයක් හැටියටත් අපි මේ වෙලාවේ දකිනවා.

මීට වඩා කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමා මේ වාගේ විශාල වැඩ කොටසක් කර තිබෙනවා. අවුරුදු තුනකට පස්සේ ආණ්ඩුව මොනවාද කළේ කියා අහන අයට අමුතුවෙන් දෙයක් කියන්න ඕනෑ නැහැ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මේ ඇමතිතුමා කරපු සේවය තුළින් රට පුරා ලක්ෂ සංඛ්‍යාත පිරිසකට ඒක භුක්ති විඳින්න අවස්ථාව ලබා දීම ලොකු ජයග්‍රහණයක් හැටියට මම පෙන්වා දෙන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, "සුවපති" හැටියට අපේ අභිංසක මිනිසුන්ට සේවය කරන්න ඔබතුමාට තව තවත් ශක්තිය, ධෛර්ය ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. I. Charles Nirmalanathan. You have 13 minutes.

[பி.ப. 3.18]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி! இன்று இங்கு சுகாதார அமைச்சினால் முன்வைக்கப்பட்டிருக்கின்ற மருத்துவம் (திருத்தம்) சட்டமூலம் தொடர்பாகவும் மற்றும் மருத்துவத் துறையுடன் சம்பந்தப்பட்ட ஏனைய விடயங்கள் குறித்தும் கௌரவ அமைச்சர் அவர்களின் கவனத்திற்குக் கொண்டுவர விரும்புகிறேன். கௌரவ அமைச்சர் அவர்களிடம் ஒரு விடயம் குறித்து நான் முதலில் மன்னிப்புக் கேட்க வேண்டும். அதாவது நேற்று முன்தினம் மன்னார் பொது வைத்தியசாலையிலுள்ள மருத்துவர் ஒருவர் அங்குள்ள ஒரு நோயாளியின் கணவரால் தாக்கப்பட்டிருக்கின்றார். அந்த வைத்தியர் சிங்கள மொழி பேசுகின்றவர்; அவரைத் தாக்கியவர் முஸ்லிம் சகோதரர். இந்தத் தாக்குதல் விடயம் குறித்து மன்னார் மாவட்ட மக்கள் சார்பாக நான் கௌரவ அமைச்சர் அவர்களிடம் மன்னிப்புக் கேட்கிறேன். சம்பந்தப்பட்டவர் என்ன மனநிலையில் வைத்தியரைத் தாக்கினார் என்று தெரியாது. ஆனால், சரியோ, பிழையோ, வைத்தியர்மீது தாக்குதல் நடத்துவது மிகப்பெரிய குற்றமாகும். எங்களுடைய பிரதேசத்தைச் சேர்ந்த வைத்தியர்கள் சிலர் அங்கு சேவை செய்ய வருவதற்கு மறுக்கின்ற அதேநேரம், அங்குள்ள பல வைத்தியசாலைகளில் தற்போது சிங்கள மொழி பேசுகின்ற வைத்தியர்கள் சேவை செய்கிறார்கள். இந்த நிலையில் சிங்கள மொழி பேசுகின்ற மருத்துவர் ஒருவர் அங்கு தாக்கப்பட்டமை மிகுந்த துன்பியல் விடயமாகும். அந்த மருத்துவர் இது குறித்து சம்பந்தப்பட்ட பணிப்பாளரிடம் முறைப்பாடு செய்திருக்கின்றார். மன்னாரில் தனக்குப் பாதுகாப்பு இல்லை என்றும் அங்கு சேவை செய்யத்

தனக்கு முடியாதென்றும் தனது முறைப்பாட்டில் அவர் தெரிவித்துள்ளார். ஆனால், அங்கு உண்மையில் அப்படியான ஒரு நிலைமை இல்லை. ஆனால், நபர் ஒருவர் குறித்த வைத்தியரைத் தாக்கியது பிழையான விடயம் என்பதை நான் ஏற்றுக் கொள்கின்றேன். ஆகவேதான் நான் அமைச்சர் அவர்களிடமும் மருத்துவரிடமும் அந்த மக்கள் சார்பாக பகிரங்கமாக மன்னிப்புக் கேட்கின்றேன். இப்படியான ஒரு சம்பவம் இனிமேலும் அங்கு இடம்பெறுவதற்கு நாங்கள் இடமளிக்கமாட்டோம் என்றும் சம்பந்தப்பட்ட வைத்தியர்கள் அங்கு வழமைபோல் மக்களுக்குச் சேவை செய்ய முடியும் என்றும் கூறிக் கொள்வதுடன், கௌரவ அமைச்சர் அவர்களும் இது குறித்து உரியவர்களுக்கு ஆலோசனை வழங்க வேண்டும் என்றும் நான் இந்த நேரத்தில் கோரிக்கை விடுக்கின்றேன்.

கடந்த 2 மாதங்களுக்கு முன்பு கௌரவ அமைச்சர் அவர்களை நேரடியாகச் சந்தித்து மன்னார் வைத்தியசாலை மற்றும் வவுனியா, முல்லைத்தீவு வைத்தியசாலைகளில் இருக்கின்ற வைத்தியர் பற்றாக்குறை தொடர்பில் நான் பல விடயங்களை எடுத்துக் கூறியிருந்தேன். அவற்றில் ஒன்றிரண்டு கோரிக்கைகள் உடனடியாக நடைமுறைக்கு வந்திருக்கின்றன. அதற்காக அமைச்சர் அவர்களுக்கு நான் நன்றி சொல்ல வேண்டும். அதாவது அங்கு Surgeons மற்றும் Anaesthetis நியமிக்கப்பட்டிருக்கின்றார்கள். அங்கு அந்த வைத்தியர்கள் நியமிக்கப்பட்டமை உண்மையில் அந்த மக்களுக்கு மிகப்பெரிய வரப்பிரசாதமாகும். ஏனெனில் கொழும்பு, யாழ்ப்பாணம், அநுராதபுரம், கண்டி போன்ற இடங்களில்போன்று அங்கு தனியார் மருத்துவமனைகள் இல்லை. அங்குள்ள பாராளுமன்ற உறுப்பினராக இருக்கலாம் அல்லது ஏனைய வசதி படைத்தவர்களாக இருக்கலாம், எவராக இருந்தாலும் அங்கு அரச வைத்தியசாலையில் மட்டும்தான் சிகிச்சை பெற வேண்டியுள்ளது. ஏனெனில் அங்கிருந்து தனியார் வைத்தியசாலைக்குச் செல்ல வேண்டும் என்றால் சுமார் 80 கிலோ மீற்றர் மற்றும் 115 கிலோ மீற்றர் தூரம் செல்ல வேண்டியுள்ளது. இன்று இப்படியான சூழ்நிலைதான் எங்களுடைய மாவட்டத்தில் இருக்கின்றது. இன்று நாடு தழுவிய ரீதியில் வைத்தியர் பற்றாக்குறை இருக்கின்றது. அதேநேரம் பொதுவாக எல்லா வைத் தியசாலைகளிலும் குறைபாடுகள் இருக்கின்றன. ஆனால், சில வைத்தியசாலைகளில் உள்ள வைத்தியர் பற்றாக்குறை பெரிதாகத் தெரிவதில்லை. எங்களுடைய பிரதேசங்களில் வைத்தியர்கள் இல்லாவிட்டால், மக்கள் மிகவும் பாதிக்கப் படுகின்றார்கள்.

குறிப்பாக, மன்னார் வைத்தியசாலையில் அண்மைக் காலமாக VOG இல்லாத ஒரு நிலைமை இருந்தது. அங்குள்ள கர்ப்பிணிப் பெண்கள் அதற்காக வீதி மறித்து, எதிர்ப்புத் தெரிவித்திருந்தார்கள். அது சம்பந்தமாக கௌரவ அமைச்சர் அவர்களுடனும் Director அவர்களுடனும் நான் உடனடியாகத் தொடர்புகொண்டேன். குறித்த வைத்தியர்கள் கிளிநொச்சியி லிருந்தும் வவுனியாவிலிருந்தும் தற்காலிகமாக இடமாற்றலாகி அங்கு உடனடியாக வருவார்கள் என்று தெரிவிக்கப்பட்டது. தற்பொழுது அவர்கள் அங்கு நியமிக்கப்பட்டிருக்கிறார்கள். [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, ඔබතුමාටබොහොම ස්තුතියි කියලා මම කියන්නේ. මාස තුනකට ඉස්සෙල්ලා තිබුණු තත්ත්වය තමයි දැන් කියන්නේ.

அதேநேரம், மருந்துகளுடைய விலைக் குறைப்பு விடயத்தில் நான் அமைச்சர் அவர்களுக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன். நானும் அதில் ஒரு பயனாளி. முன்னர் நான் பாவிக்கும் tablets 10 வாங்குவதற்கு 295 ரூபாய் தேவையாக இருந்தது. இப்போது அதே tablets 20 ஐ 95 ரூபாய்க்கு வாங்க முடிகின்றது. இன்று மருந்துகளின் விலைகள் குறைக் கப்பட்டதால் மக்கள் மிகப்பெரிய சந்தோஷத்தில் இருக்கிறார்கள்.

கடந்த 2 மாதங்களுக்கு முன்பு அங்கும் 'அம்பியுலன்ஸ்' சேவை விஸ்தரிக்கப்பட்டிருப்பது நல்ல விடயம். ஆனால், அது போதுமானதாக இல்லை. குறிப்பாக மன்னார் மாவட்டத்தைப் பொறுத்தவரையில் அங்குள்ள 5 பிரதேசச் செயலகப் பிரிவுகளில் 3க்கு குறித்த 'அம்பியுலன்ஸ்' வண்டிகள் வழங்கப்பட்டுள்ளன. மற்றைய 2 பிரதேச செயலகப் பிரிவுகளுக்கும் வழங்கப்படாத காரணத்தால், தாங்கள் ஒதுக்கப்பட்டுவிட்டதான மனநிலையில் அந்த மக்கள் மிகவும் கவலையில் இருக்கிறார்கள். ஆகவே, அங்கு 'அம்பியுலன்ஸ்' வண்டிகள் அதிகரிக்கப்பட வேண்டும் என்பதையும் இந்த நேரத்தில் சொல்லிக் கொள்ள விரும்புகின்றேன்.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හැම රෝහලකටම ගිලන් රථයක් දෙනවා.

**ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim - Deputy Minister of Health, Nutrition and Indigenous Medicine)
எல்லா வைத்தியசாலைகளுக்கும் 'அம்பியுலன்ஸ்' வண்டிகள் வழங்கப்படும்.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
நன்றி. சகல வைத்தியசாலைகளுக்கும் 'அம்பியுலன்ஸ்' வண்டிகள் வழங்கப்படவிருப்பது குறித்து கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று குறிப்பாக மன்னார் வைத்தியசாலையில் பல குறைபாடுகள் காணப்படுகின்றன. இந்த நிலையில் கௌரவ அமைச்சர் அவர்களுடைய அமைச்சு நிதியில் இருந்து சிலாவத்துறை வைத்தியசாலைக்கு maintenance work க்கு கிட்டத்தட்ட 30 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது. நல்ல விடயம். ஆனால் அந்த வைத்தியசாலையில் 15 மில்லியனுக்குரிய வேலைதான் இருக்கின்றது. அதனால் மிகுதிப் பணம் அமைச்சுக்குத் திரும்பிப் போகும் என்று நினைக்கின்றேன். அதேநேரத்தில் மன்னார் பொது வைத்திய சாலைக்குக்கீழ் வருகின்ற முருங்கன், அடம்பன், நானாட்டான், பெரியமடு, பள்ளமடு போன்ற வைத்தியசாலைகளிலும் சிலாவத்துறை வைத்தியசாலையில் இருப்பது போன்று பல குறைபாடுகள் இருக்கின்றன. குறித்த குறைபாடுகள் தொடர்பான தரவுகளை மன்னார் RDHS இலிருந்து பெற்றுக் கொண்டேன். இந்தத் தரவுகளின்படி சம்பந்தப்பட்ட எல்லா வைத்தியசாலைகளுக்குமான maintenance செலவுகளுக்கு 34 மில்லியன் ரூபாய் தேவைப்படுகின்றது.

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
வடக்கு மாகாண சபைக்கு 30 மில்லியன் ரூபாய்ப் பணம் ஒதுக்கப்பட்டிருக்கின்றது. ஆனால், அதற்கான எந்த வேலையும் இன்னும் அங்கு செய்யப்படவில்லை.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
நான் கதைத்தது மன்னார், சிலாவத்துறை பற்றி.

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
இதுவரை மன்னாருக்கு ஒதுக்கப்பட்ட பணத்தின்மூலமும் எந்தவேலையும் நடக்கவில்லை.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
அதனைச் செய்ய வேண்டியது உங்களுடைய நிர்வாகம் தானே?

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
எங்களுடைய நிர்வாகம் இல்லை!

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
நான் சொல்வது என்னவென்றால் -

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
நான் இந்த மாதக் கடைசியில் மன்னாருக்கு விஜயம் செய்வேன். போவதுபற்றி உங்களுக்கும் தெரிவிப்பேன். அப்பொழுது நாங்கள் எல்லாரும் அங்குள்ள hospital க்கும் போய் பிரச்சினைகளை அறிந்து, அவற்றுக்கு ஒரு முடிவு காண்போம்.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ அமைச்சர் அவர்களே, மன்னார், முருங்கன், அடம்பன், பெரியமடு, வங்காலை, நானாட்டான் போன்ற வைத்தியசாலைகளிலுள்ள இதர தேவைகளை நிறைவேற்று வதற்கு 34 மில்லியன் ரூபாய் தேவைப்படுவதாகக் குறிப்பிடப் பட்டுள்ளது. எனவே, இந்த விடயத்தையும் தங்களுடைய கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன்.

இன்னுமொரு விடயத்தையும் கூறிக்கொள்கின்றேன். அதாவது ஏற்கனவே மன்னாரில் கடமை புரிந்த ஒரு வைத்தியர் தற்போது Eastern Province இல் கடமையாற்றுகின்றார். அவர் எமது பிரதேசத்தில் கடமை புரிவதையே எமது மக்கள் விரும்புகின்றார்கள் என்பதை அவர்கள் என்னிடம் வந்து சொன்னார்கள். அந்த வைத்தியர் முன்பு முருங்கன் வைத்தியசாலையில்தான் பணிபுரிந்தார். நான் அவருடன் தொலைபேசி ஊடாகத் தொடர்புகொண்டு இது சம்பந்தமாகக் கூறியபோது, "என்னை முருங்கன் வைத்தியசாலையில் DMO பதவியில் permanentஆக நியமிக்கின்றபட்சத்தில் நான் மீண்டும் மன்னார் மாவட்டத்துக்கு வந்து சேவையாற்றுவேன்" என்று கூறினார். எனவே, இது தொடர்பாகவும் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்தவேண்டுமெனக் கேட்டு நிற்கிறேன்.

மேலுமொரு விடயம் தொடர்பாகவும் அமைச்சர் அவர்களுடைய கவனத்தை ஈர்க்க விரும்புகின்றேன். அதாவது முல்லைத்தீவு மாவட்டத்தில் இருக்கின்ற வைத்தியசாலையின் நிர்வாகத்தில் பல குழப்பங்கள் ஏற்படுகின்றன. அதாவது வைத்தியர்களுக்கும் ஏனைய நிர்வாகிகளுக்கும் இடையில் குழப்பம் ஏற்பட்டுள்ளது. கடந்த 2 - 3 மாதங்களாக அங்கு வைத்தியத்துறையில் நிர்வாக ரீதியான குழப்பங்கள் ஏற்பட்டுக் கொண்டிருக்கின்றன. அதேநேரம் அங்கிருக்கின்ற pharmacyகள் மீது நடவடிக்கை எடுக்கப்படுகின்றது. சம்பந்தப் பட்ட விடயங்கள் ஒவ்வொன்றிலும் இவ்வாறு தொடர்ச்சியாகக் குழப்பநிலை காணப்படுகின்றது. அதே நேரத்தில், மன்னாரில் குறித்த இடத்தில் Admin Block அமைப்பது சம்பந்தமாகவும் உங்களுடன் நான் கதைத்திருந்தேன். இது தொடர்பாகக் கவனமெடுக்கும்படி செயலாளரிடம் தாங்கள் கூறியிருந்தீர்கள். ஆகவே, இது சம்பந்தமாக மேலும் கவனம் செலுத்துமாறு கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அமைச்சரவைப் பேச்சாளராகவும் இருக்கின்றீர்கள். அமைச்சரவைப் பேச்சாளர் என்ற அடிப்படையில் நீங்கள் தெரிவிக்கின்ற கருத்துக்களை நான் அவதானிப்பது உண்டு. அந்த வகையில் நீங்கள் தெரிவித்த ஒரு கருத்துப்பற்றி இப்பொழுது நான் குறிப்பிட விரும்புகின்றேன். பல விடயங்களில் யாருக்கும் பயப்படாமல் துணிவாகக் கதைப்பது உங்களுடைய வழமை. அது நல்ல விடயமும்கூட. இந்த நிலையில் நீங்கள் கூறுகின்ற விடயங்களில் விமர்சனங்கள் எழுந்தாலும், நீங்கள் கூறியது நல்ல விடயம் என்பது காலப்போக்கில் எல்லோருக்கும் தெரியவருகின்றது. அண்மையில் நீங்கள் "2015ஆம் ஆண்டில் ஆட்சி மாற்றம் ஏற்பட்டதன் பின்பு முல்லைத்தீவு, வவுனியா மாவட்டங்களில் சிங்களக் குடியேற்றங்கள் எதுவும் இடம்பெற வில்லை" என்று கூறியிருந்தீர்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one more minute.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා, මට විනාඩි දෙකක් දෙන්න.

நீங்கள் குறித்த விடயம் பற்றிய உண்மை நிலையை அறியாமல் இதனைக் கூறியிருக்கின்றீர்கள் என்றே நான் நினைக்கின்றேன். அதேநேரம் அந்தக் கருத்தை நான் ஏற்றுக்கொள்ளவில்லை. அரசாங்கத்துக்குச் சார்பானவர்கள் விட்ட பிழைகளையும் அமைச்சரவைப் பேச்சாளர் என்ற அடிப்படையில் நீங்கள் சிலவேளைகளில் துணிவாக எடுத்துக் கூறியிருக்கின்றீர்கள். இந்த வருடம் மகாவலி அதிகார சபையானது, எமது பிரதேசத்தைச் சாராத ஆயிரம்பேருக்கு நிலங்களை வழங்குவதற்காகக் காணிக் கச்சேரி நடத்தியிருக் கின்றது. நான் இது தொடர்பில் சனாதிபதியிடம் முறைப்பாடு செய்திருக்கிறேன். சனாதிபதி அந்தச் செயற்பாட்டைத் தற்காலிகமாக நிறுத்தியிருக்கிறார்; நேரடியாக வந்து அப்பிரச்சினையைத் தீர்ப்பதாகக் கூறியிருக்கிறார். கௌரவ அமைச்சர் அவர்களே! நீங்கள்தான் இந்த அரசாங்கத்தை அமைப்பதில் முதலில் துணிச்சலுடன் செயற்பட்டவர். மற்றவர்கள் பெரும்பாலும் பின்னர் யோசித்துப் பார்த்து வந்தவர்கள். அதாவது எந்தக் கட்சி வெல்லும் என்று பார்த்து, பார்த்து இருந்துவிட்டு வந்தவர்கள்தான் இந்த அரசாங்கத்தில் அதிகமாக இருக்கிறார்கள். ஆனால், அந்த நிமிடத்தில் "வாருங்கள்!" என்று சம்பந்தப்பட்டவர்கள் எல்லோரையும் இழுத்துக்கொண்டு வந்தவர் நீங்கள். அந்த வகையில்

උංකළෙ නාන් මතික්කිරේන්. ආකවේ, නීංකළ් ඉන්දක් කාණි සම්බන්දමාන විදයත්තිල් කවනම් සෙලුත්ත වේන්ඩුම් එන්රු කේට්ටුක් කොළ්කින්රේන්.

ඉන්රු එමදු පිරදේසංකළෛච් චේර්න්ද ඔර් ඉලට්සත්තිර්කුම් මේර්පට්ට මක්කළ් ඉන්දියාවිල් ඉරුක්කිරාර්කළ්. යුත්තම් කාරණමාකප් පලර් පුලම්පෙයර්න්දු වේරු නාටුකළිල් වසික්කින්රාර්කළ්. අවර්කළ් මීන්ඩුම් ඉංකු වරුවදර්කාන වාය්ප්පුකළ් ඉරුක්කින්රන. මීන්ඩුම් වරුවදර්කේර්ර සූල්නිලෛ අමෛන්දාල් නිච්චයමාක අවර්කළ් වරුවාර්කළ්. ඉන්දියාවිලුළ්ළ එමදු මක්කළුම් ඉංකු වරුවදර්කු මුයර්චි සෙය්කිරාර්කළ්. ඉන්ද නිලෛයිල් එංකළුටෛය නිලංකළිල් ආට්කළ් ඉල්ලෛ එන්පදර්කාක අංකු සිංකළ මක්කළෛක් කුටියේර්රුවදු එන්පදු එමදු මක්කළෛ මිකවුම් වේදනෛප් පටුත්තුකිර විටයමාක ඉරුක්කිරදු. නීංකළ් නල්ල පල විටයංකළෛච් චෙය්තුවිට්ටු, මක්කළ් ඒර්රුක් කොළ්ළාද ඕරිරු විටයංකළෛච් චෙය්කින්රපෝදු, නීංකළ් චෙය්ද නල්ල විටයංකළ් අමිළ්න්දුපෝකින්ර නිලෛමෛ ඒර්පටුම්.

නාන් ඉංකු වරුවදර්කු මුන්පු, පිරදමර් අලුවලකත්තිල් පිරදමරෛච් චන්දිත්තුක් කුරිත්ද විටයම් පර්රික් කූරියිරුක් කින්රේන්. අදාවදු, ඉන්රු තොල්පොරුළ් ආරාය්චිත් තිණෛක්කළත්තිනර් ඉරාණුවත්තිනුටෛය Survey Unitඉක් කොන්ඩුවන්දු, මුල්ලෛත්දීවු මාවට්ටත්තිලුළ්ළ චෙම්මලෛ කිළක්කුප් පිරදේසච් චෙයලකප් පිරිවිලුළ්ළ නායාර්රුප් පකුදියිල් නිල අළවෛ චෙය්තිරුක්කිරාර්කළ්. මුල්ලෛත්දීවු මාවට්ටත්තිල් නිල අළවෛත් තිණෛක්කළම් ඉරුක්කින්රදු. එනිනුම්, ඉවර්කළ් ඉරාණුවත්තිනුටෛය Survey Unitඉක් කොන්ඩුවන්දු අප්පකුදියිල් නිල අළවෛ චෙය්තිරුක් කිරාර්කළ්. ඒර්කනවේ අප්පකුදියිල් ඉරුක්කින්ර ඔරු පිල්ලෛයාර් කෝවිලෛ අංකිරුන්දු අකර්රිවිට්ටු අව්විටත්තිල් ඔරු පෞත්ත විකාරෛ අමෛප්පදර්කු මුයර්චි සෙය්තිරුක්කින්රාර්කළ්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛදාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, please now wind up.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(මාණ්පුමිකු ඉ. චාර්ස් නිර්මලනාතන්)
(The Hon. I. Charles Nirmalanathan)
වවුනියා වටක්කිල් නෙටුංකේණියිලුළ්ළ වෙටුක්කුනාරි මලෛ, තණ්ණිමුරිප්පිල් ඉරුක්කින්ර කුරුන්දූර් මලෛ පෝන්ර පිරදේසංකළිල් තොල්පොරුළ් ආරාය්චිත් තිණෛක්කළම් මේර්කොළ්කින්ර නටවටික්කෛකළ් අරසාංකත්තුක්කු මිකප් පෙරිය ඉළප්පෛක් කොන්ඩුවරුම් එන්රු නාන් නිනෛක්කින්රේන්. තොල්පොරුළ් ආරාය්චිත් තිණෛක් කළත්තින් ඉන්ද නටවටික්කෛ කාරණමාක එංකළුටෛය මක්කළ් මිකුන්ද වේදනෛයුටනුම් එතිර්ප්පුටනුම් ඉරුක්කිරාර්කළ්. නාන් ඉන්ද විටයත්තෛප් පිරදමරින් කවනත්තුක්කුක් කොන්ඩු වන්දිරුක්කිරේන්. ඉදු තොටර්පිල් පිරදමර් නටවටික්කෛ එටුප්පදාකක් කූරියිරුක්කිරාර්. කෞරව අමෛච්චර් අවර්කළේ! පොරුප්පුවාය්න්ද අමෛච්චරාක ඉරුක්කින්ර නීංකළ් ඉන්ද විටයංකළ් තොටර්පිලුම් කූටිය කවනම් එටුක්කවේන්ඩු මෙන්රු කේට්ටු, එනදු උරෛයෛ නිරෛවුචෙය්කින්රේන්. නන්රි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛදාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මන්නාරමේ වෛද්‍යතුමාට යම්කිසි පුද්ගලයෙකු විසින් පහරදීම පිළිබඳව දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයා වශයෙන් ඔබතුමා කනගාටුව ප්‍රකාශ කිරීම මූලාසනය වශයෙන් මා ප්‍රථමයෙන්ම අගය කරනවා.

මීළඟට, ගරු මහාචාර්ය ආශු මාරසිංහ මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආසු මාරසිංක)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 8ක කාලයක් තිබුණා. ඒ ප්‍රමාණය අඩු වෙලාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛදාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔව්. අඩු වෙලා.

[අ.භා.3.33]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආසු මාරසිංක)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලැබී ඇති සුළු කාලය තුළ කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා. වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කිරීමට ලැබීම ගැන සන්තෝෂයට පත් වෙනවා. වෛද්‍ය ආඥාපනතෙන් යම් යම් දේවල් පිළිබඳව, විශේෂයෙන් ඖෂධවේදීන්, අතුරු වෛද්‍ය සහකාර සේවයේ වෘත්තිකයන්, පරිපූරක වෛද්‍ය සේවයේ වෘත්තිකයන් සහ පෝෂණවේදීන් අතර ප්‍රශ්න ප්‍රමාණයක් තිබුණා. මේ පනත් කෙටුම්පත මඟින් ඒ කිසිම කෙනෙකුට හානියක් වෙන්නේ නැහැ කියලා සෞඛ්‍ය ඇමතිතුමා අපට සහතිකයක් දුන්නා. සෞඛ්‍ය ඇමතිතුමනි, වෛද්‍ය සභාවට අනාගතයේදී විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනෙක්, දන්ත වෛද්‍යවරයෙක් වාගේම ඖෂධවේදීන්, පරිපූරක වෛද්‍ය වෘත්තිකයෙක් සහ අනෙකුත් අතුරු වෛද්‍ය වෘත්තිකයින් යම් ප්‍රමාණයක් ඇතුළත් කිරීමට හැකියාවක් ලැබුණොත්, එදාට මේ වෛද්‍ය සභාව මීට වඩා ස්වාධීන වෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අනාගතයේදීවත් ඔබතුමාගේ අවධානය ඒ ගැන යොමු කරන්න කියා ඉල්ලනවා.

ඊළඟට මේ පනත් කෙටුම්පතේ ප්‍රධාන ප්‍රඥප්තියේ කරන සංශෝධන ප්‍රධාන ප්‍රඥප්තියේම තිබෙන viii, viii (අ), viii (අඅ) යන වගන්තිවලට අදාළ නොවන සංශෝධන බවට ඔබතුමා ලබාදුන් සහතිකය නිසා මම හිතනවා, ඖෂධවේදීන්ට වාගේම පෝෂණවේදීන්ට මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් යම් යම් අඩුපාඩු ඇති නොවෙයි කියා.

මේ අවස්ථාවේදී සෞඛ්‍ය සේවය ගැන කථා කරනකොට ලෝකයේ විවිධ අය කරපු ප්‍රකාශ මම උපුටා ගන්න කැමැතියි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ Regional Director's Desk එකෙන් කියන මෙන්න මේ කොටස මම උපුටා ගන්න කැමැතියි:

> "The country's achievements are a testament to robust leadership, unwavering political commitment and strong partnerships dedicated to ensuring healthy lives and positive well-being for all."

ඒ වාගේම, Seventy-first World Health Assembly එකේදී Director-General of the World Health Organization, Dr. Tedros Adhanom Ghebreyesus, මෙන්න මේ විධියට කියනවා:

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

"Many of the other countries I have visited, including China, Cuba, Denmark, Oman, Saudi Arabia, Sri Lanka, Thailand, the United Arab Emirates and the United Kingdom are living proof that universal health coverage is not a pipedream; it's a reality for countries all over the world, at all income levels."

ඒ වාගේම බිල් ගේට්ස් මහත්මයා, මයික්‍රොසොෆ්ට් ආයතනයේ අධිපති, founder, මෙන්න මෙහෙම කියා සිටි බවට පුවත් පළ වී තිබුණා: "Microsoft Corporation Founder Bill Gates asked the Commonwealth to look to Sri Lanka to know what 'high quality' primary healthcare meant."

ඒ වාගේම, Rt. Hon. Patricia Scotland, Commonwealth Secretary-General මෙන්න මෙහෙම කියූ බවට පුවත් වාර්තා පළ වී තිබුණා: "The Commonwealth Secretary General highlighted Sri Lanka as a shining example in health coverage for its population, which, she said, was extending the service delivery to near universal levels. She also appreciated Sri Lanka for the innovative and forward looking approach aimed to promote affordable health care for all its people, ……"

මේ ප්‍රකාශ කිහිපයෙන්ම අපට ආඩම්බර විය හැකි සෞඛ්‍ය සේවයක් තිබෙනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, අපේ රටේ සෞඛ්‍ය සේවය නහා සිටුවීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, British Medical Journal - BMJ - එකේ මෙන්න මෙහෙම කියනවා:

"Also laudable is the recent introduction of state operated ambulance services in some parts of Sri Lanka, which would lead to the reduction of the total ischaemic time, with further reduction of STEMI in-hospital mortality."

මේ ambulance service එක ගැන කථා කරන කොට අපට ඊයේ-පෙරේදාත් දකින්න ලැබුණා, මේ සේවය ආවොත් ඉන්දීය රහස් ඔත්තු සේවය අපේ රටට එනවා කියලා කෑ ගහපු අය අසරණ වුණු වෙලාවේ, කොළඹ නගරය වටලන්න කියලා ඇවිල්ලා කෑ ගහපු කට්ටිය බීලා වැටිලා ඉන්න කොට ඒ වෙලාවේත් පිහිට වුණේ මෙන්න මේ ambulance service එක බව. මේ ambulance service එක ඒ ආකාරයෙන් ලබා දීමට හැකිවීම ගැන අපි සන්තෝෂ වෙනවා. අපට හැකියාවක් ලැබුණා, සෑම අවස්ථාවකම 1990 ambulance service එක හරහා ඒ අවශ්‍යතාවන් ඉටු කරන්න. 1990 ambulance service එක සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාව මා ළඟ තිබෙනවා. පළමුවැනි අදියරේදී අපට ambulances 88ක් ලැබුණා. දෙවැනි අදියරේදී අපට තවත් ambulances 297ක් ලැබුණා. දෙවැනි අදියර හරහා අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 15ක ප්‍රදානයක්, ඒ වාගේම තවත් ඇමෙරිකානු ඩොලර් මිලියන 4ක ප්‍රදානයක් control and training research facility එක හදන්න ලැබෙනවා. Research එකක් විධියට මේ ඔක්කෝම data අරගෙන තිබෙනවා. අද වන විට cases 90,983කට support කරලා තිබෙනවා. Minimum response time එක විනාඩි 12ක් ඇතුළත,-[බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. Minimum response time එක විනාඩි 12ක් ඇතුළත වාගේම call-to-wheeled time එක විනාඩි දෙකක් වාගේ කාලයක් තුළ සිද්ධ කරන්න හැකියාව ලැබිලා තිබෙනවා. මීට වඩා විවාදයක් අපට අවශ්‍ය වෙනවා, මේ ambulance service එක ගැන කථා කරන්න. අවසාන වශයෙන් තව වැදගත් විශේෂ කාරණයක් කෙරෙහි ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න මම කෙටි කාලයක් ගන්නම්. අපි යාපනයේදී මහජන මුදල් කාරක සභාවේ,-[බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ ගරු මන්ත්‍රීවරයකුගේ කාලයෙන් අඩු කරන්නේ නැතිව ඔබතුමාට වැඩිපුර කාලය ලබා දෙන්න බැහැ.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් වැදගත් කාරණයක් වන තෙලිප්පලෙයි රෝහල ගැනයි මේ කථා කරන්න හදන්නේ. මට ඒකට අවස්ථාවක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කමක් නැහැ, ඔබතුමා කථා කරන්න.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි යාපනයට ගිය වෙලාවේ Dr. Thivarhar, Medical Superintendent of the Tellippalai Base Hospital, අපට යෝජනා ඉදිරිපත් කළා, ඔබතුමාට ඉදිරිපත් කරන්න කියලා. තෙලිප්පලෙයි රෝහල විශේෂයෙන් cancer hospital එකක් විධියට සංවර්ධනය කරන්න තව රුපියල් මිලියන 1,000ක විතර අඩු පාඩුවක් තිබෙනවා. ඊළඟ Budget එකට ඇතුළත් කරලා තෙලිප්පලෙයි රෝහල තවදුරටත් සංවර්ධනය කරන්න ඒ අවශ්‍ය යෝජනා අපට ලැබී තිබෙනවා. මම ඒක ඔබතුමාට පසුව ඉදිරිපත් කරන්නම්. ඒ කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Douglas Devananda, please. You have ten minutes.

[பி.ப. 3.39]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி! இன்றைய தினம் மருத்துவம் (திருத்தம்) சட்டமூலம் மற்றும் தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் தொடர்பிலான விவாதத்தில் கலந்து கொண்டு எனது கருத்துக்களையும் பதிவு செய்வதற்கு வாய்ப்பு வழங்கியமை தொடர்பில் முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இப்பொழுது சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சு தொடர்பில் சில கருத்துக்களை முன்வைக்க விரும்புகின்றேன்.

வடக்கு, கிழக்கு மாகாணங்களில் தாதியர்களுக்கான பற்றாக்குறையானது மிக நெடுங்காலமாக நிகழ்ந்து வருகின்ற நிலையில், இந்தப் பற்றாக்குறையினை நிவர்த்தி செய்வதற்கு ஏதுவாக, கல்விப் பொதுத் தராதர சாதாரண தரப் பரீட்சையில் விஞ்ஞான பாடமும் முக்கியமாகும் என்பதால், கல்விப் பொதுத் தராதர உயர் தரப் பரீட்சையில் எந்தப் பாடங்களில் சித்தியடைந்திருப்பினும் அவர்களைத் தாதியர்களாக உள்வாங்குவதற்கும், அதேநேரம், ஆண் தாதியர்களை உள்வாங்கும் விகிதத்தை அதிகரிப்பதற்கும் ஒரு விஷேட ஏற்பாட்டினை மேற்கொள்ள வேண்டும் என்கின்ற விடயத்தை நான் பல முறை இந்தச் சபையிலே கௌரவ சுகாதார அமைச்சர் அவர்களது அவதானத்திற்குக் கொண்டு வந்துள்ளேன். அந்த வகையில் இந்த இரு விடயங்களையும் முன்னெடுப்பதற்கு கௌரவ சுகாதார அமைச்சர் ராஜித சேனாரத்ன அவர்கள் முன்வந்திருப்பதாக ஊடகங்களின் மூலமாகத் தெரிய வந்திருக்கும் நிலையில், முதலில் எமது மக்கள் சார்பாக எனது நன்றியை அமைச்சர் அவர்களுக்கு தெரிவித்துக் கொள்கின்றேன். அதேநேரம் அண்மையில் மருந்து வகைகள் சிலவற்றின் விலைக்குறைப்புகளும் இடம்பெற்றுள்ளன. இந்த விடயமும் வரவேற்கத்தக்க விடயமாகும்.

வடக்கு, கிழக்கு மாகாணங்களில் 2015, 2016 மற்றும் 2017ஆம் ஆண்டுகளில் கல்விப் பொதுத் தராதர உயர் தரப் பரீட்சையில் எந்தப் பாடங்களில் சித்தியடைந்திருப்பினும், சம்பந்தப்பட்டவர்கள் தாதியர் சேவைக்கு உள்வாங்கப்பட நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதாகத் தெரியவருகின்றது. கடந்த 30 வருடகால யுத்தம் காரணமாக எமது பகுதிகளில் கல்வித் தரம் பின்னடைவிற்கு உட்பட்டுள்ள நிலையில், இத்தகையதொரு ஏற்பாட்டினை மேற்கொள்கின்றபோது, ஏதேனும் தடைகள் வருமாயின், குறிப்பாக தாதியர் சேவையின் தரங்கள் குறையும் என்றவாறான தடைகள் வருமாயின், இவ்வாறு விஷேட ஏற்பாட்டின்மூலமாக இணைத்துக் கொள்ளப்படுவோருக்கு விசேட பயிற்சிகளை வழங்க முடியும் என நான் நம்புகின்றேன்.

அதேநேரம் வடக்கு மாகாணச் சுகாதாரத் தொண்டர்கள் 454 பேரினது நியமனங்கள் தொடர்பில் நான் பல தடவைகள் பல்வேறு முயற்சிகளை மேற்கொண்டிருந்தேன். இந்தச் சுகாதாரத் தொண்டர்களுக்கு நியமனம் வழங்குவது தொடர்பில் கௌரவ அமைச்சர் ராஜித சேனாரத்ன அவர்கள் அனுமதி அளித்து, அந்தச் செயற்பாட்டை வடக்கு மாகாண சபைக்கு கொடுத்துள்ளதாகத் தெரிய வருகின்றது. இருப்பினும், வடக்கு மாகாணத்தில் பல வருட காலமாக, மிகுந்த சிரமங்களுக்கு மத்தியில், எவ்விதமான கொடுப்பனவுகளையும் பெறாமல் 820 சுகாதாரத் தொண்டர்கள் தங்களுக்கான நிரந்தர நியமனங்களுக்காகக் காத்திருக்கின்றனர். இதனை கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் அவதானத்தில் கொண்டு, ஏனைய அனைவரையும் நிரந்தரப் பணிக்கு உள்ளீர்க்கக்கூடிய வகையில் ஒரு விஷேட ஏற்பாட்டை முன்னெடுக்க வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

வடக்கு மாகாணத்தைப் பொறுத்தமட்டில் சுகாதாரத்துறையானது மிகவும் பின்தங்கிய நிலையிலேயே காணப்படுகின்றது. இந்தச் சுகாதாரத் தொண்டர்கள் தொடர்பாக குறித்த அமைப்பினர் பிரதமர் அவர்களிடமும் ஜனாதிபதி அவர்களிடமும் பல தடவைகள் எடுத்துக் கூறியிருக்கின்றனர். அந்தவகையில் எதிர்வரும் வரவு செலவுத் திட்டத்தில் அந்த விடயத்தை உள்ளடக்கி அவர்களுக்கு நியமனங்கள் வழங்குவதாகப் பிரதமர் அவர்களும் ஜனாதிபதி அவர்களும் தெரிவித்திருக்கிறார்கள். ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் அதைக் கவனத்திற்கொள்ள வேண்டும்.

வடக்கு மாகாண சபையைப் பொறுத்தமட்டில், சுகாதாரத் துறையானது மிகவும் பின்தங்கிய நிலையிலேயே காணப்படுகின்றது. தற்போது எந்த வகையிலும் அது செயலூக்க முள்ளதாக இல்லை. இருப்பதை அழிப்பது அல்லது கிடைப்பதை இல்லாமற்செய்வதுதான் அதனுடைய நோக்கமாக இருக்கின்றது. தெல்லிப்பளை புற்றுநோய் மருத்துவமனையை எடுத்துக்கொண்டால், அது வெகு விரைவில் மூடப்பட்டுவிடுமோவென்ற அச்சம் எமது மக்களிடத்தே தற்போது எழுந்துள்ளது. மருத்துவர்கள் பற்றாக்குறை மற்றும் போதிய வசதிகளின்மை காரணமாகவே அந்த மருத்துவமனைக்கு இந்த நிலை ஏற்பட்டுள்ளதாகத் தெரியவருகின்றது. அந்த மருத்துவமனையினை மத்திய சுகாதார அமைச்சின்கீழ் கொண்டுவருவதற்கு நடவடிக்கை யெடுக்க முடியுமானால், அது மிகவும் உகந்த செயற்பாடாக இருக்கும்.

கிளிநொச்சி மாவட்டப் பொது மருத்துவமனையில் மகப்பேற்று மருத்துவ நிபுணர் மற்றும் பெண் நோயியல் சிறப்பு மருத்துவ நிபுணர் இல்லாததால் பொதுமக்கள் அங்கு போராட்டம் நடத்துகின்ற நிலைமை அண்மையில் உருவாகி யிருக்கிறது. கிளிநொச்சி மாவட்ட மருத்துவமனையானது, கிளிநொச்சி மற்றும் முல்லைத்தீவு மாவட்டத்தின் 2 இலட்சத்திற்கும் அதிகமான மக்களுக்கு மருத்துவப் பயன்களை அளித்துவருகின்ற நிலையில், இடவசதிப் பற்றாக்குறையுடன் இயங்குகின்றது. இந்த மருத்துவ மனைக்கான இரண்டாம் கட்டக் கட்டடப் பணிகள் இதுவரையில் மேற்கொள்ளப்படாத நிலை காணப்படுகின்றது. இதன் காரணமாக அங்கு பொது மருத்துவம், சத்திரசிகிச்சை, பெண் நோயியல், உளநலம், கண் மற்றும் தோல் சிகிச்சைப் பிரிவு போன்றவற்றிக்கான விடுதி வசதிகள் இன்றிய நிலை காணப்படுகின்றது. வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில், பின்தங்கிய பகுதிகளில் உள்ள மருத்துவமனைகள் அனைத்துமே மிகுந்த குறைபாடுகளுடனேயே செயற்பட்டுவருகின்றன. நான் ஏற்கெனவே கூறியதுபோல, மக்கள் தொடர்பிலோ அல்லது தாங்கள் மக்களுக்குக் கொடுத்த வாக்குறுதிகளைக் கொண்டு பெற்ற மாகாண சபையிலோ சம்பந்தப்பட்டவர்களுக்கு அக்கறை இருப்பதாகத் தெரியவில்லை. கௌரவ அமைச்சர் அவர்கள் மனிதநேயம் மிக்கவர்! தமிழ் மக்கள்பால் மிகவும் பாசமுள்ளவர்! அந்த வகையில், நீங்கள் குறித்த விடயங்களைப் பொறுப்பேற்று நடவடிக்கை மேற்கொள்ள வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

I have no power to appoint anybody to the provincial hospitals. Volunteers have been appointed to all the Central Government hospitals by now. After taking over the Ministry in 2015, in two weeks' time, I appointed and made everybody permanent. But, I have no power to appoint anybody to the provincial hospitals.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

I can understand that. But, the problem is -

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

It is the Chief Minister and the other people who had created a cooperative society and brought in new people rather than appointing those who have worked during the difficult times.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Yes, I know. But, in one-and-a-half months' time, it will come under the Governor. Then, we can take that matter up at the Presidential Secretariat and I ask you to do the needful.

பொதுமக்களின் நலன்சார்ந்த எந்தத் துறையையும் கவனிக்காத வடக்கு மாகாண சபை, சுகாதாரத் துறையினையும் கவனிக்காத நிலையில், வடக்கில் சுகாதாரத் தேவைகளுக்காக அல்லல்படுகின்ற மக்களின் நிலைமைகளைப் பற்றி யாரிடம் போய்ச் சொல்வதென்ற நிலை இன்று உருவாகியுள்ளது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
யாழ் மாவட்டத்தைப் பொறுத்தவரையில், தீவுப் பகுதிகளில் குறிப்பாக, நெடுந்தீவு மருத்துவமனையில் மருத்துவர் இல்லாத குறையானது அடிக்கடி தொடர்ந்து நிலவி வருகின்றது. இன்னும் பல்வேறு தேவைகள் - குறைபாடுகள் மலிந்த துறையாகச் சுகாதாரத்துறை வடக்கு மாகாணத்திலே காணப்படுவது மிகவும் வேதனைக்குரிய விடயமாகவே தொடர்கின்றது என்பதையே நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். இதற்கொரு மாற்று ஏற்பாடு மிக அவசியம் என நினைக்கின்றேன்.

வடக்கு மாகாண சபையின் உத்தியோகபூர்வக் காலம் முடிவடைவதற்கு இன்னும் சில தினங்களே இருக்கின்றன. இந்த நிலையில், வடக்கு மாகாண சபையின் அமைச்சர்கள் யாவரென்ற குழப்பத்தில் வடக்கு மாகாண சபையின் ஆட்சியாளர்கள் இருக்கின்றார்கள். ஆகவே, செயற்றிறன் கொண்ட ஒரு மாகாண சபை வடக்கில் அமைகின்றவரை கௌரவ அமைச்சர் ராஜித சேனாரத்ன அவர்கள் சுகாதாரத் துறை வளர்ச்சி தொடர்பில் அங்கு தேவையான வழிகாட்டல்களையும் ஆலோசனைகளையும் வழங்கினால், அது எமது மக்களுக்குப் பேருதவியாக இருக்குமென நான் நினைக்கின்றேன்.

யாழ். மாவட்டத்தைப் பொறுத்தவரையில், நெடுந்தீவு பிரதேசமானது மிகவும் பின்னடைவுக்குட்பட்ட பிரதேசமாகவே காணப்படுகின்றது. கடந்த காலங்களில் இப்பிரதேசத்தினை பல வழிகளிலும் கட்டியெழுப்பும் நோக்கில் நாம் பல்வேறு பணிகளை முன்னெடுத்திருந்தபோதிலும், பின்னரான காலப் பகுதியில் எமக்கான அரசியல் பலமின்மை காரணமாகவும், போதுமானளவு அரசியல் அதிகாரங்கள் வெறும் வாய்ச் சவடால்காரர்கள் வசம் சென்றதாலும், யாழ். மாவட்டத்தைப் போன்றே இப்பகுதியும் மிகுந்த பின்னடைவுக்குட்படலாயிற்று. அந்த வகையில், நெடுந்தீவுப் பகுதியில் ஏராளமான பிரச்சினைகள் தலையெடுத்துள்ளன. அந்த வகையில், இன்றைய தின விவாதத்திற்கு உட்பட்ட அமைச்சுக்குரியதான ஒரு விடயத்தை இங்கு நான் முன்வைக்க விரும்புகின்றேன்.

நெடுந்தீவில் நூற்றுக்கணக்கான சிறார்கள் போசாக்கின்மை காரணமாக மிகவும் பாதிக்கப்பட்டு வருகின்றனர். குறிப்பாக, நெடுந்தீவிலே தோட்டச் செய்கைகள் மற்றும் இலைக்கறி வகை உற்பத்திகள், தானிய வகை உற்பத்திகள் போன்றவை மேற்கொள்ளப்படாத காரணத்தினால், இத்தகைய பொருட்களை நெடுந்தீவிற்கு வெளியிலிருந்தே பெற்றுக்கொள்ள வேண்டிய நிலை உள்ளது. எனினும், அங்குள்ள மக்களின் பொருளாதார நிலை காரணமாக அவர்களால் இவற்றை அவ்வாறு பெறுவதில் சிரமங்கள் காணப்படுகின்றன. தவிர, பல்வேறு சிரமங்களுக்கு மத்தியில் அங்கு பிடிக்கப்படுகின்ற கடலுணவுகள் உடனடியாகவே வெளிமாவட்டங்களுக்குக் கொண்டு செல்லப்படுகின்றன. இத்தகைய நிலையில் இங்குள்ள சிறார்களின் போசாக்கின்மையானது ஒரு பிரச்சினையாக உருவெடுத்துள்ளது. எனவே, இதனை அவதானத்தில் எடுத்து கௌரவ அமைச்சர் ராஜித சேனாரத்ன அவர்கள், தரைப் போக்குவரத்து அற்ற வகையில், கடலால் சூழப்பட்டுள்ள தீவகப் பகுதி மக்களின் நலன் கருதி விசேட ஏற்பாடாகச் சத்துணவு வகைகளைச் சிறார்களுக்கு இலவசமாக வழங்கக்கூடிய ஒரு நடவடிக்கையினை மேற்கொண்டு உதவ வேண்டும் எனவும் கேட்டுக்கொள்கின்றேன்.

நான் ஏற்கெனவே சொன்னதுபோல, வடக்கு மாகாண சபையின் ஆட்சிக் காலம் முடிவடைவதற்கு இன்னும் ஒன்றரை மாதங்களே இருக்கின்றன. அதன் பின்னர், அது ஆளுநருக்குக்கீழ் வந்துவிடும். ஆனபடியினால், அந்தப் பிரச்சினைகளைச் சனாதிபதியினுடைய விசேட செயலணியின் முன் கொண்டுவந்து, விரைவில் தீர்க்கலாமென்று நான் நம்புகின்றேன் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 15ක් වෙන් කර තිබෙනවා.

[අ.භා.3.50]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කථා කිරීමට බලාපොරොත්තු වන්නේ වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවයි. මේ සම්බන්ධයෙන් කාරණා කිහිපයක්ම අපි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කළා. එහි තිබෙන ප්‍රශ්න කිහිපයක් ගැන අපේ යම් අදහස් තිබුණා. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාත්, මමත් ඒ සම්බන්ධව සංශෝධන කිහිපයකුත් ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ පනත් කෙටුම්පත පිළිබඳව අපට ගැටලුවක් නැහැ. නමුත් මෙතැනදී වෛද්‍ය වෘත්තිකයන්ට අමතරව අතුරු වෛද්‍ය වෘත්තිකයන් සම්බන්ධයෙන් ප්‍රශ්නගත කාරණා ගණනාවක් මතුවෙලා තිබෙනවා. මේක තමයි අපි මතු කරන ප්‍රධානම ප්‍රශ්නය.

මෙහිදී ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරන හැම තැනකදීම, ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වගන්තිය, 8 (අ) වගන්තිය සහ 8 (ආ) කියන වගන්ති සම්පූර්ණයෙන්ම අත්හැරලා තිබෙනවා. මම කියන්නේ නැහැ, ඇමතිතුමා මේක කළා කියලා. නමුත් කිසියම් විධියකට මේකට කොටස් රිංගවලා තිබෙනවා, අතුරු වෛද්‍ය සේවාවල සිටින අයට විශාල අගතියක් සිදු වන විධියට. මේ ක්‍රියාදාමය ගැන ඔබතුමා සමඟ සාකච්ඡා කළ වේලාවේ මට ඔබතුමා කිව්වා, මීට

වඩා පුළුල් ප්‍රතිපත්ති මාලාවක් සහිත බ්‍රිතාන්‍ය ක්‍රමයට සම්පාදනය කරන නව වැඩ පිළිවෙළක් ඉතාම ඉක්මනින් ගෙනෙනවා කියලා. මම ඒකට ස්තුතිවන්ත වෙනවා, ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග ගැන අපේ ලොකු ගෞරවයක් තිබෙනවා. හැබැයි, ඒ වාගේම මේ ක්‍රියාදාමය තුළ අතුරු වෛද්‍ය වෘත්තිකයන්ට යම් අසාධාරණයක් සිදු වෙනවා නම් එය විශාල ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා තමයි මම මේ සම්බන්ධව කථා කළ යුතුයි කියලා කල්පනා කළේ.

විශේෂයෙන්ම පරිපූරක වෛද්‍ය සේවය, අතුරු වෛද්‍ය සේවය, උපාධිධාරී ඖෂධවේදීන් සහ පෝෂණවේදීන් - nutritionistsලා - සම්බන්ධයෙන් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඔවුන්ට අසාධාරණයක් නොවන විධියට මේ සංශෝධනය කළා නම් හොඳයි කියලා මම හිතනවා. මොකක්ද, හේතුව? අපි දන්නවා, පෝෂණවේදය සඳහා වෙනම උපාධියක් ගන්න අවුරුදු හතර හමාරක් විතර මහන්සි වෙන්න ඕනෑ. නමුත් සාමාන්‍ය වෛද්‍යවරයෙකුට ඒ සුදුසුකම ලබා ගැනීමට මාස හයක පොඩි course එකක් කළාම ඇති. අද සිදුවෙලා තිබෙන දේ තමයි, වෛද්‍ය සංගමයේ සිටින සමහර ප්‍රධානීන් පවා මේ course එක කරලා ඒ අය hospitalsවල පෝෂණවේදීන්ගේ වැඩේ පටන් ගෙන තිබීම. මේ විධියට අනුන්ගේ වැඩ කරන්න යන්නේ ඇයි? වෛද්‍යවරු, වෛද්‍යවරුන්ගේ වැඩේ කරන්නට ඕනෑ. ඒගොල්ලන් වෛද්‍ය වෘත්තියේ සිටින ගමන් පෝෂණවේදී සුදුසුකමත් හදාගෙන පෝෂණවේදීන්ට මේ ක්ෂේත්‍රය තුළ ඉන්න බැරි තත්ත්වයක් ඇති කරනවා. මම මේ කාරණය සම්බන්ධයෙන් විශාල විරෝධයක් දක්වනවා.

වෛද්‍ය සංගමය සමඟ අපට කිසිම විරෝධයක් නැහැ, ඔවුන්ට අසාධාරණයක් සිද්ධ වෙනවා නම් අපි ඕනෑම වෙලාවක කෙළින් සිටගන්න සූදානම්. GMOA එකත් සමඟ අපේ ගනුදෙනුව ඒ ආකාරයට බේරා ගත්තත්, ඒ හේතුව නිසාම ඔවුන්ට ඒකාධිකාරයක් ඇති කර ගන්නට ඉඩ දෙන්නත් බැහැ. ඔවුන් දිගින් දිගටම කරන්නේ තමන්ගේ වෘත්තිය ආරක්ෂා කිරීම සඳහා අනෙකුත් වෘත්තින් සම්පූර්ණයෙන්ම කෙළෙසා දැමීමයි. අපි මේකට විරුද්ධයි. නීතීඥවරුන් ලෙස අපිත් අපේ ක්ෂේත්‍රය ආරක්ෂා කර ගැනීමට මහන්සි වෙනවා. හැබැයි, එහෙමයි කියලා වෙනත් ක්ෂේත්‍රයක සිටින පිරිසක්ව අපේ බලය පාවිච්චි කරලා, අපේ වෘත්තිය අයිතිවාසිකම් පාවිච්චි කරලා විනාශ කරන්න හදනවා නම් ඒක සාධාරණ ක්‍රියාවලියක් වෙන්නේ නැහැ. ඔබතුමා ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරන විශාල ක්‍රියාවලිය ගෙනෙන්න; වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීමේ සමස්ත ක්‍රියාවලිය ගේන්න. හැබැයි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා ඊට කලින් අතුරු වෛද්‍ය සේවාවේ සිටින කට්ටියට සිදු වන අසාධාරණය පොඩි වගන්ති කිහිපයකින් ඉවත් කරලා දෙන්න කියලා. ඒ අයට විශාල භයක් තිබෙනවා.

අද වයඹ විශ්වවිද්‍යාලයේ වෙනම course එකක් තිබෙනවා පෝෂණවේදය සම්බන්ධව. මම ඒ සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මීට කලින් පෝෂණවේදය සම්බන්ධයෙන් කිසිදු වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. හැබැයි, ඔබතුමා ආවාට පසුව පෝෂණවේදී පාඨමාලාව සඳහා 500ක් බඳවා ගැනීමට විශාල ප්‍රයත්නයක් දැරුවා. දැන් ඒක සාර්ථක වෙලා තිබෙනවා.

හැබැයි, දැන් සිදු වෙලා තිබෙන දේ තමයි, මේ එළියට එන අයත් ලංකාවේ ඉන්නේ නැහැ, ඒ ගොල්ලෝ ලංකාවෙන් පිට යනවා. ලංකාවෙන් පිට ගිහිල්ලා ඒ ගොල්ලෝ පඩියක් ගන්නවා. ලංකාවට ආපුවාම ඒ ගොල්ලන්ගේ පඩිය රුපියල් 35,000යි. වෘත්තිමය වෛද්‍යවරයා වෛද්‍ය වෘත්තියත් කරමින් පෝෂණවේදයත් කරනවා. එහෙම කරන්න බැහැ; ඒක සම්පූර්ණ වැරදියි. මොකද, පෝෂණවේදය කියන්නේ කෑම බීම ගැන, කෑම වට්ටෝරු හදන ඒවා සියල්ල ගැන ඔවුන්ට දැනුමක් තිබෙන්න ඕනෑ. මම හිටපු ක්‍රීඩා අමාත්‍යවරයා විධියට දන්නවා, පෝෂණවේදය කියන්නේ වෙනම කාරණයක් කියලා. ඒ නිසා මේක වෛද්‍ය වෘත්තියත් එක්ක පටලවා ගන්න එපාය කියන කාරණය මම විශේෂයෙන් කියනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය ඉතාම සාර්ථක ක්‍රියා මාර්ගයක්. නමුත්, වෛද්‍ය සභාව වෘත්තීය සමිතිවල නෝතැන්නක් බවට පත් කරන්න හදන වැඩ පිළිවෙළට ඔබතුමා අත ගහන්න දෙන්න එපා. ඔබතුමා කෙළින් වැඩ කරන කෙනෙක්. ඔබතුමා මේවාට විරුද්ධයි. ඒ නිසා අපිත් ඔබතුමාට මේ වෙනුවෙන් දෙන්න පුළුවන් සහයෝගය ලබා දෙන්නම්. වෛද්‍ය වෘත්තිය, වෛද්‍ය වෘත්තිය විධියට ක්‍රියාත්මක වෙන්න ඉඩ දෙන්න. වෛද්‍ය සභාවට වෘත්තීය සමිතිවලට එන්න දෙන අයිතිවාසිකම නම් ඇති කරන්න එපා. වෛද්‍ය සභාව කියන්නේ ලංකාවේ සියලුම වෛද්‍යවරුන් යම් කිසි විධියකට නියාමනය කරන ක්‍රමවේදයක් ඇති කරන ස්ථානයක්. නමුත්, අද වෘත්තීය සමිති මෙය තුළට රිංගලා මේ ආයතනය විශාල අර්බුදයක් බවට පත් වෙමින් තිබෙනවා. ඒ නිසා දැන්වත් මේ වෙනුවෙන් නිවැරදි ක්‍රමවේදයක් සකස් කරන්න කියලා අපි ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. බ්‍රිතාන්‍යයේ තිබෙනවා වාගේ අඩුම තරමින් නීතිඥවරුන්ටත් මෙයට එන්න දෙන්න; අනෙක් අයටත් කැමැති විධියකට එන්න දෙන්න. සාමාන්‍ය මහ ජනතාවගෙන් නියෝජනය වන තැනක් බවට මේ ආයතනය පත් වෙන්න ඕනෑ. වෛද්‍ය සභාව කිසිම වෛද්‍ය නියාමනයක් කරන්න බැරි තැනට දැන් අද පත් වෙලා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් ඔබතුමා විශාල වැඩ කොටසක් කර තිබෙන බව මම කියන්න කැමැතියි. ඒ විතරක් නොවෙයි, පසුගිය ආණ්ඩු ගණනාවකිනුත් සෞඛ්‍ය ක්ෂේත්‍රයට සිදු කළ සේවාව ගැන මම ස්තුතිවන්ත වනවා.

ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන තිබෙන විශ්වසනීයත්වය ගැන බැලුවාම, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින්ගේ ඉඳලා, වෛද්‍යවරුන්ගේ ඉඳලා, සෞඛ්‍ය සේවයේ සිටින අනෙකුත් සියලුදෙනාගේ කැපවීමත්, ආණ්ඩුවල කැපවීමත්, ඔබතුමන්ලාගේ කැපවීමත් මෙහිදී මම ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි. මේ තුළ තමයි රටට, අපට අද ගෞරවයක් ඇති වෙලා තිබෙන්නේ.

අද වෛද්‍යවරයෙක් විධියට පත්වෙලා ආවාට පසුව, අවුරුදු පහක්, හයක්, හතක්, අටක්, දහයක්, දොළහක් ගියාම ඔහු ගැන නියාමනයක් කරන්න කිසිම වැඩ පිළිවෙළක් ලංකාවේ නැහැ. ඒ, වෛද්‍යවරයා මොනවාද කරන්නේ, ඔහු අලුත් journals බලනවාද, ඔහුගේ දැනුම යාවත්කාලීන කර ගන්නවාද, මේ සම්බන්ධයෙන් තිබෙන ක්‍රියාදාමය මොකක්ද? මේ ගැන කිසිම ක්‍රියාදාමයක් ලංකාවේ නැහැ. ඒ නිසා තමයි මේ ක්ෂේත්‍රය තුළ වෛද්‍යවරුන්ගේ දැනුම පිළිබඳ නියාමනය ඇති කරන වැඩ පිළිවෙළක් අනිවාර්යයෙන්ම ලංකාවේ ඇති වෙන්න ඕනෑ වන්නේ. එහෙම ඇති වෙන්නේ නැතිව මේ ක්‍රියාදාමය ඉස්සරහට ගෙන යන්න බැහැ.

2015 වෙන කොට මැලේරියා වසංගතයෙන් බේරුණු රටක් බවට පත් වෙන්න අපට පුළුවන් වුණා; 2016 සරම්පවලින් බේරුණු රටක් බවට පත් වුණා; 2017 ෆයිලේරියාවලින් බේරුණු රටක් බවට පත් වුණා. 2018, මේ වර්ෂයේ රුබෙල්ලාවලින් ගැළවුණු - Rubella free country - රටක් බවට පත් වුණා. ඒ නිසා තමයි අද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල ගෞරවයක් ලංකාව වෙනුවෙන් ඇති වෙලා තිබෙන්නේ.

මෙය තවදුරටත් ශක්තිමත් කරන්න නම්, මේ ක්‍රියාදාමය තුළින් හැම ක්ෂේත්‍රයකටම යම් ගෞරවයක් ඇති කරන්න ඕනෑ. වෛද්‍යවරු වාගේම අනෙකුත් අයත් මේ ක්ෂේත්‍රයේ වටිනා ක්‍රියාදාමයක් සිද්ධ කරන අය විධියට හඳුනා ගන්න ඕනෑය කියලා මම විශේෂයෙන් මතක් කරන්නට කැමැතියි.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

මේ සේවාවේ විවිධ ක්ෂේත්‍රවල සිටින අයට වෛද්‍ය සංගමය තුළ ප්‍රශ්න තිබෙනවා. අද හෙද සේවය සඳහා පිට රටවල විශාල ඉල්ලීමක් තිබෙනවා. හෙද සේවයේ අය කියන්නේ degree එක දෙන්න කියලායි. Degree එක ගන්න අවස්ථාව දුන්නාම ඒ අයට ලංකාවේදී තමන්ගේ ක්ෂේත්‍රය තුළ ඉහළට යන්න අවස්ථාව තිබෙනවා. හෙද සේවයේ අයට උපාධියක් ගන්න අයිතිවාසිකමක් තිබෙනවා. ඒක කාටවත් නවත්වන්න බැහැ. මේක පුදුම ප්‍රශ්නයක්! ඒ කියන්නේ, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ - GMOA එකේ - තිබෙන ප්‍රශ්නයත් එක්ක අද හෙද සේවයේ අයට degree එක ගන්න දෙන්නේ නැති නිසා විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා.

අද පිට රටවලින් - කටාර් ආදී හැම රටකින්ම - ඉල්ලනවා, "අපට පුළුවන් තරම් හෙද සේවයේ අය එවන්න. අපට විශාල පඩියකට ඒ ගොල්ලෝ ගන්න පුළුවන්" කියලා. මා කටාර්වලට ගිය අවස්ථාවේ මට කිව්වා, හෙද සේවය සඳහා ඩිනාර් 800ක, 1,000ක විතර පඩියක් දෙන්න ඔවුන්ට පුළුවන් කියලා. ඒක විශාල මුදලක්. ඒක ලංකාවට විශාල ආදායමක් උපයන්න පුළුවන් ක්‍රමවේදයක් බවට පත් වෙනවා. අපේ skilled labour හැටියටයි ඒ අය යවන්නේ. නමුත්, ඔවුන්ට degree එක ගන්න දෙන්නේ නැහැ. ඔබතුමා ඒ සම්බන්ධව දැඩි තීන්දුවක් ගනිවි කියලා මම හිතනවා. ඔබතුමාට එම ශක්තිය තිබෙනවා. පාර්ලිමේන්තුවේ සිටින අප සියලුදෙනා මේ වෙනුවෙන් ඔබතුමාට අපට හැකි උපරිම සහයෝගය ලබා දෙන්න සූදානම් කියන කාරණය මේ වෙලාවේ මම කියන්න කැමැතියි.

අද ප්‍රාථමික වෛද්‍ය සේවයේත් යම් යම් ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා. අපි පොඩි කාලයේ, පවුලේ වෛද්‍යවරයෙක් - family doctor කෙනෙක්- අපට හිටියා. පවුලේ වෛද්‍යවරයා තමයි අපේ උණට, හෙම්බිරිස්සාවට, එහෙම නැත්නම් ඊට වඩා ලොකු රෝගයකට දෙන බෙහෙතක් නිර්දේශ කරන්නේ. එදා අපට පැනඩෝල් හෝ ඇස්ප්‍රින් දෙක, තුනක්, එහෙමත් නැත්නම් පොඩි බෙහෙතක් පැණියකුත් එක්ක දෙනවා, ඒක බිව්වාම වැඩේ ඉවරයි.

අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ප්‍රාථමික වෛද්‍ය සේවය කොයි තරම් කඩා වැටිලාද කියනවා නම්, ලංකාවේ තිබුණු "පවුලේ වෛද්‍යවරයා" කියන සංකල්පය දැන් අපෙන් සම්පූර්ණයෙන් ඈත් වෙලා තිබෙන්නේ. දැන් වෙන මොකක්වත් නොවෙයි කරන්නේ? දවස් දෙකක් උණ තිබුණා නම්, පවුලේ වෛද්‍යවරයාගෙන් බෙහෙත් අරගෙන බැලුවා, හරි ගියේ නැත්නම් specialist ළඟට යනවා. දැන් specialist ළඟට ගිහිල්ලා තමයි උණටත් බෙහෙත් ලියා ගන්නේ. Specialist ළඟට ගියාම ගණන කීයද? අද විශේෂඥ වෛද්‍යවරයකු channel කරන්නම රුපියල් 2,000ක් හෝ 2,500ක් පමණ යනවා. ඒ වෛද්‍යවරයා බෙහෙත් දෙනවා. අපේ අයටත් ඕනෑ ඒකයි. බෙහෙත් පෙති තොගයක් බොන්න දුන්නොත් තමයි අපේ අය හිතන්නේ, "වෛද්‍යවරයා හොඳට බැලුවා, හොඳ කෙනෙක්, ගොඩක් බෙහෙත් බොන්න දුන්නා" කියා. හැබැයි, අපේ primary care එක, නැත්නම් අපේ ප්‍රාථමික ක්‍රියා පිළිවෙත තිබුණා නම් මෙහෙම වෙන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. එංගලන්තය වාගේ රටවල පවුලේ වෛද්‍යවරයාගේ නිර්දේශයක් නැතිව විශේෂඥ වෛද්‍යවරයකු ළඟට යන්න බැහැ. හැබැයි, අපට මොකක්ද වෙලා තිබෙන්නේ? අපට එහෙම කිසිම ප්‍රශ්නයක් නැහැ. අපට හිතුණාම අපි විශේෂඥ වෛද්‍යවරයා ළඟට ගිහින් බෙහෙත් ගන්නවා. ඒක හොඳයි. ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. විශේෂඥ වෛද්‍යවරයා ළඟට යන්න කලින් අපට මේ රෝගය සුව කර ගන්න පුළුවන්. නමුත්, ලංකාවේ ජනතාව පුරුදු වෙලා ඉන්නේ කොහොමද? කහටගස්දිගිලිය වැනි ගම්වල සිටින දුප්පත්, අහිංසක මිනිහාත් පොඩි උණක්, හෙම්බිරිස්සාවක් හැදුණාත් කෙළින්ම consultant කෙනෙක් ළඟට ගිහිල්ලා බෙහෙත් ගන්නවා. ඇත්ත වශයෙන්ම අද විශේෂඥ වෛද්‍යවරුන්ටත් සාමාන්‍ය රෝගීන් බලන්න සිද්ධ වෙලා තිබෙනවා. කුරුණෑගල hospital එකේ රෝගීන් වැඩි ඇයි කියලා ඔබතුමා හොයා බලන්න. ගමේ hospital එකෙන් බෙහෙත් ගන්න ඉන්න මිනිහා කුරුණෑගල hospital එකට යනවා. ඇයි, වෛද්‍යවරු ඔක්කෝම එතැන පිරිලා ඉන්න නිසා. විශේෂඥ වෛද්‍යවරයාට වෙන වැඩක් නැහැ. එතුමාගේ විශේෂඥ සේවය පැත්තකින් තියලා සාමාන්‍ය රෝගියාට බෙහෙත් කරන්න තමයි එතුමාට දැන් සිද්ධ වෙලා තිබෙන්නේ. පවුලේ වෛද්‍යවරයාගේ නිර්දේශයකින් තොරව විශේෂඥ වෛද්‍යවරයකු ළඟට යන්න තිබෙන අයිතිවාසිකම නැති කරන වැඩ පිළිවෙළක් රට ඇතුළේ හැදුවේ නැත්නම් ඉදිරියේදී මෙය විශාල ප්‍රශ්නයක් බවට පත්වනවා, ගරු ඇමතිතුමනි.

සමහරු දැන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට බණින්නේ කොහොමද? රජයේ රෝහලේ ඇඳක රෝගීන් හතරදෙනෙක් ඉන්නවා කියලා බණිනවා. ඒ විධියට එක ඇඳක රෝගීන් හතරදෙනෙක් ඉන්න ඕනෑ නැහැ. සමහර වෙලාවට ගෙදර ඉන්න ඕනෑ අය තමයි රෝහල ඇතුළේ ඉන්නේ. ඒ ඇයි? මිනිසුන්ගේ මානසිකත්වය දැන් වෙනස් වෙලා තිබෙනවා. ගමේ hospital එකෙන් ගන්න තිබෙන බෙහෙත් ටික වෙනුවට, අර හොඳ රෝහල්වලට ගිහිල්ලා එතැන හතරදෙනෙකු සිටින ඇඳක වුණත් හිටියොත් අපිට හොඳයි කියා තමයි ඔවුන් කල්පනා කරන්නේ. මේ සම්බන්ධයෙන් යම්කිසි වැඩ පිළිවෙළක් හදන්න කියා ඔබතුමාගෙන් මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

තව සුළු කලකින් අපි family physician කියන concept එක ඉදිරිපත් කරනවා. අපි ඒකට 10,000ක් ලියා පදිංචි කරනවා. ජනගහනයෙන් 10,000කට වෛද්‍යවරයකු හෝ දෙදෙනෙකු ප්‍රදේශ අනුව වෙන් කරලා එතැන සිට අපි එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක හොඳයි, ගරු ඇමතිතුමනි. නැත්නම් අද මේක විශාල අර්බුදයක් බවට පත් වී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි කීපයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, වැඩිපුර වෙලාව ගතවෙලා තිබෙන නිසා විනාඩි දෙකෙන් අවසන් කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි. දැන් තවත් විනාඩියක් ගතවෙනවා.

අනික් කරුණ තමයි, බෝ නොවන රෝග. ගරු ඇමතිතුමනි, බෝ වන රෝග අපි දැන් සෑහෙන දුරට පාලනය කර තිබෙනවා. හැබැයි, අද බෝ නොවන රෝගවල තත්ත්වය මොකක්ද? අද අපේ ගම්වල ජීවත් වන ජනතාවට තිබෙන විශාලම සෞඛ්‍ය ප්‍රශ්න මොනවාද? දණ හිස් ආබාධ, උකුලේ ආබාධ, වාත රෝග, හන්දි රෝග හා සම්බන්ධ සායනවලදී අද දණ හිසක් දමන්න රුපියල් 100,000ක් හෝ රුපියල් 85,000ක් පමණ ගන්නවා. අද සාමාන්‍ය අහිංසක මිනිහාට වෙන ලෙඩක් නැහැ. ඔවුන්ට heart ප්‍රශ්න මොකුත් නැහැ; සරම්ප වාගේ වෙන රෝගයක් හැදෙන්නේත් නැහැ; මැලේරියාව හැදෙන්නෙත් නැහැ; වෙන මොකක්වත් නැහැ. දැන් අපේ ආයු අපේක්ෂාව අවුරුදු 79යි. හැබැයි දැන් බොහෝ අයට තිබෙන විශාලම ප්‍රශ්නයක් තමයි, මේ හන්දිපත් රුදාව. අද බොහෝ අයට සන්ධි බද්ධ කිරීමක් කරන්න, එහෙම නැත්නම් උකුල් ඇටයක් දමන්න සිදු වෙලා තිබෙනවා. එවැනි ශල්‍යකර්ම සිදු කරන ස්ථානවල අද රෝගීන් විශාල වශයෙන් පිරිලා ඉන්නවා. ඒකයි, විශේෂයෙන් මේ ගැන බලන්න කියලා මම ඔබතුමාට කිව්වේ. බෝ නොවන රෝග සම්බන්ධව ඇති ක්‍රියාදාමය අපි වහාම වේගවත් කරන්න ඕනෑ. මම එහෙම කියන්න හේතුව මෙකයි. බෝ නොවන රෝග සම්බන්ධයෙන් ගත්තොත්, දැන් හදිසි අනතුරුවලින් පාරෙදීම මැරෙන සංඛ්‍යාව දවසකට 6ක් පමණ වනවා. ඊළඟට සියදිවි හානි කර ගැනීම් අවුරුද්දකට සාමාන්‍යයෙන් 1,500ත්, 2,000ත් අතර සංඛ්‍යාවක් වාර්තා වනවා. අවුරුද්දකට 2,000ක් විතර පාරෙදි මැරෙනවා. මේ දෙකෙන් පමණක් දවසකට 12දෙනකු පමණ ලංකාවේ මැරෙනවා. සියදිවි හානි කර ගැනීම් සම්බන්ධව ගත්තොත්, මානසික ආතතිය වැනි කාරණා අවම කර ගන්න පුළුවන් වුණොත්, අපිට ශක්තිමත් සෞඛ්‍ය සේවයක් හදා ගන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා. එම නිසා ඒ සම්බන්ධයෙනුත් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. බෝ නොවන රෝග සම්බන්ධයෙනුත් අපි විශාල වැඩ කොටසක් කළා.

ගරු අමාත්‍යතුමනි, බෝ නොවන රෝග ගැන කටයුතු කිරීම සම්බන්ධයෙනුත් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. වයසට ගියාම බොහෝ අයට හන්දිපත් රුදාව -හන්දි සම්බන්ධයෙන් වන ආබාධ- ඇති වනවා. ඒ සම්බන්ධයෙන් තිබෙන බෙහෙත් වර්ග හා ශල්‍යකර්ම පිළිබඳව අවධානය යොමු කොට, ලබන අවුරුද්දේ ඔබතුමා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ තුළින් ඒ අයට යම් අනුග්‍රහයක්, ශක්තියක් ලබා දෙන්න කියන ඉල්ලීම මම කරනවා. නැත්නම් මෙය විශාල අර්බුදයක් බවට පත් වෙනවා. හැබැයි, අපි "ඩෙංගු", "ඩෙංගු" කියලා කෑ ගැහුවාට, ඩෙංගු රෝගයෙන් මිය යන්නේ බොහොම පොඩි සංඛ්‍යාවක්. පාරෙදි මැරෙන මිනිසුන් සංඛ්‍යාවයි, සියදිවි හානිකර ගන්නා මිනිසුන් සංඛ්‍යාවයි ගත්තාම, ඒ අයගෙනුත් 2,000ක්, 3,000ක් පමණ බේරා ගන්න - ඒවාට හේතු වන කාරණා සඳහා පිළියම් යොදන්න -පුළුවන් නම් හොඳයි.

වයඹ පළාත -මම නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කය- වෙනුවෙනුත් මම ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරන්න කැමතියි. අපේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට cabs 20ක් පමණ අවශ්‍ය වෙලා තිබෙනවා. මොකද, සෞඛ්‍ය නිලධාරි කාර්යාල 30ක් පමණ තිබෙනවා. නමුත් අවශ්‍යතාවට cabs නැහැ. මම වයඹ පළාතේ මහ ඇමතිවරයා ලෙස කටයුතු කළ කාලයේ ඔබතුමා මට ගොඩක් උදව් කළා. ඒ වාගේම අපට ambulance 20ක් විතර අවශ්‍ය වනවා. ඒ සඳහාත් කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා. [බාධා කිරීමක්]

මදක් නිහඬ වෙන්න. ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා පැහැදිලි කිරීමක් කරනවා.

**ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim )
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් bone grafts ගැන කිව්වා. ඇත්ත වශයෙන්ම ඒ රෝගීන්ට consultant හරහා MSD එකෙන් ඒවා ඉල්ලන්න පුළුවන්. ඉල්ලුවොත් අපි ඉස්පිරිතාලයට නිකම් දෙනවා. ඒක කරගන්න පුළුවන්. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමියනි, දැන් ඔබතුමියගේ කථාව ආරම්භ කරන්න.

[අ.භා. 4.07]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ඉතාම වැදගත් වන, අද ඉදිරිපත් කර තිබෙන වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍යවරුන් ලියා පදිංචි කිරීම සඳහා වෙනම ලේඛනයක් හඳුන්වා දීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම් හා ඒ සඳහා අදාළ විධි විධාන සැලැස්වීමේ සංශෝධනයක් අද ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒක ඉතාම අත්‍යවශ්‍යයි කියා මම හිතනවා. මෙතෙක් කල් වෛද්‍ය සභාවේ තමයි අදාළ සුදුසුකම් ලැබූ වෛද්‍යවරු, MBBS වෛද්‍යවරු සහ විශේෂඥ වෛද්‍යවරු ලියා පදිංචි වුණේ. නමුත්, දියුණු රටවල නම් මේ අය වෙනම ලියා පදිංචි වීමක් සිදු වුණා. විශේෂඥ වෛද්‍යවරු ලියා පදිංචි කිරීමට වෙනම වෛද්‍ය ලේඛනයක් හඳුන්වා දීම ගැන වත්මන් සෞඛ්‍ය ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වනවා; ඒ ගැන අපි සතුටු වනවා. මේ තුළින් වෛද්‍ය සේවාවේ ගුණාත්මකභාවය ආරක්ෂා කරගන්න හැකියාව ලැබෙනවා. සුදුසුකම් නැති අය විශේෂඥ වෛද්‍ය සේවයේ යෙදීම, චැනල් සේවයේ යෙදීම අවම කර ගන්නත් මෙමගින් හැකියාව ලැබෙනවා. ඒ නිසා මේ තුළින් රෝගීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත් යම්තාක් දුරට හැකිවන බව මම විශ්වාස කරනවා. ඒ අතරම මේකට තවත් සංශෝධනයක් එකතු කර තිබෙනවා. ඒක තමයි, වෛද්‍ය සභාවට අතිරේකව විශේෂඥ වෛද්‍යවරු සහ විශේෂඥ දන්ත වෛද්‍යවරයෙක් පත් කිරීම සඳහා වූ යෝජනාව. සමස්තයක් හැටියට වෛද්‍ය ආඥාපනතම සංශෝධනය වුණා නම් හොඳයි කියා මම හිතනවා.

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

අද අපි දකිනවා, බොහෝ දියුණු රටවල නම් රෝගියාගේ රෝගය කළමනාකරණය කරන්නේ වෛද්‍ය මණ්ඩලයක් විසින් බව. එය multi-disciplinary approach එකක්. සමහර විට සංකීර්ණ රෝගී තත්ත්වයක් තිබෙන කොට එක විශේෂඥ වෛද්‍යවරයෙක් නොවෙයි, වෛද්‍යවරු ගණනාවක් එකට වාඩි වෙලා එම රෝගියාගේ කළමනාකරණය ගැන කථා කරනවා. මම හිතන විධියට එම ක්‍රමවේදයත් ලංකාවට හඳුන්වා දෙනවා නම් හොඳයි. ඒක තවම අලුත්. ලංකාවටත් එවැනි වෛද්‍ය මණ්ඩලයක් හඳුන්වා දී, අදාළ ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු කිහිප දෙනෙක් එකතු වෙලා තීන්දු ගන්නවා නම්, ගුණාත්මක සේවාවක් අපට ලබා දෙන්න පුළුවන් කියායි මට හිතෙන්නේ.

මේ විශේෂඥ වෛද්‍ය ලේඛනය හඳුන්වා දෙනකොට තව ප්‍රශ්නයක් මතු වෙනවා. විදෙස් රටවලින් ලංකාවට ඇවිත් ශල්‍යකර්ම කරන වෛද්‍යවරු ඉන්නවා. ඔවුන් ලියා පදිංචි කිරීම පිළිබඳවත් යම්කිසි විධියක පැහැදිලි කිරීමක් තිබෙනවා නම් හොඳයි. මොකද, සමහර අය ලංකාවට ඇවිල්ලා, ශල්‍යකර්ම කරලා රෝගියාගේ වගකීම වෙනත් අංශවලට භාරදීලා ආපසු යනවා. එතකොට අපට රෝගියාගේ වගකීම ලබාදීමේදී මෙම ලියා පදිංචිය ඉතාම වැදගත් වෙනවා. මේ පිළිබඳ පැහැදිලි තත්ත්වයක් මෙම සංශෝධන තුළ හඳුන්වා දී නැහැ. ගරු ඇමතිතුමා ඒ පිළිබඳ අවධානය යොමු කර අවශ්‍ය කටයුතු කරයි කියා මම හිතනවා.

අද මෙතුමන්ලා නොයෙක් ගිවිසුම් ගැන විවිධ කථා කියනවා. සිංගප්පූරු ගිවිසුම ගැන කියනවා; "එටකා" ගිවිසුම ගැන කියනවා. විශේෂඥ වෛද්‍යවරුන්ට ලංකාවට ඇවිත් ප්‍රතිකාර ලබාදීමට මේ ගිවිසුම් හරහා හැකියාව ලැබෙන බව පැවසෙනවා. එම නිසා මේ කටයුතු විධිමත් කිරීම තුළින් අපේ රෝගීන්ගේ ආරක්ෂාව සහතික කරන්න පුළුවන් වෙයි කියා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ සෞඛ්‍ය සේවාව හොඳින් පවත්වාගෙන යාම සඳහා විශේෂඥ වෛද්‍යවරු, සාමාන්‍ය වෛද්‍යවරු වාගේම අතුරු වෛද්‍ය සේවාවේ විවිධ තලවල සිටින නිලධාරීන් විශාල පිරිසකුත් සහයෝගය ලබාදෙනවා. එම නිසා ඔවුන්ටත් continuous professional development එකකට අවස්ථාව ලබා දෙනවා නම් ඉතා හොඳයි කියායි මම හිතන්නේ. මොකද, අද පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් හැටියට පත් වුණු නිලධාරිනියකට අධීක්ෂණ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් හැටියට තමයි විශ්‍රාම ගන්න වෙන්නේ. නමුත් ඔවුන්ටත් තමන්ගේ අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන ගිහින් විවිධ ඩිප්ලෝමා පාඨමාලා හදාරා, හැකි නම් උපාධිය ලබාගෙන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉහළ තනතුරුවලට යාමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙනවා නම් එය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුවට විශාල පිටිවහලක් වෙනවා ඇතැයි කියා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග හඳුන්වා දීමත් සිදු කරනවා. ඖෂධ මිල පාලනය කිරීම සඳහා වත්මන් සෞඛ්‍ය ඇමතිතුමා පියවර ගෙන තිබීම සම්බන්ධයෙන් ඇත්තටම අපි සන්තෝෂ වෙනවා. අද වන විට ඖෂධ පරිභෝජනය වැඩි වෙලා තිබෙනවා කියා එතුමා කිව්වා. හැබැයි, ඖෂධ මිල පාලනය කරන ගමන් ඖෂධවල ගුණාත්මකභාවය රඳවා ගැනීමත් ඉතා වැදගත් වෙනවා. ඖෂධ පරිභෝජනය වැඩි වී තිබෙන්නේ එක බෙහෙත් පෙත්තක් බීලා රෝගී තත්ත්වය පහව නොයෑම නිසා බෙහෙත් පෙති දෙක, තුන බොන නිසාද කියන සැකය මතු වෙනවා. එම නිසා ඖෂධවල ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන්නය කියා අපි ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපි අසල්වැසි රටවලින් තමයි ඖෂධ වර්ග ආනයනය කරන්නේ. ඉන්දියාව, බංග්ලාදේශය, පාකිස්තානය වැනි රටවලින්. පසුගිය කාලයේ ඖෂධ වර්ග පිළිබඳ විශාල අර්බුද තිබුණු බව අපි දැක්කා. දකුණු ප්‍රදේශයේ ඉන්ෆ්ලුවන්සා රෝගය පැතිරුණු වෙලාවේ "Ipratropium" කියන සාන්ද්‍රණයේ තිබූ "Klebsiella" කියන බැක්ටීරියාව ආසාදනය වීම නිසා දරුවන් මිය ගිය බව අපි දන්නවා. ඉන්ෆ්ලුවන්සා රෝගය වැලඳුණු දරුවන්ට ප්‍රතිකාර කිරීම නිසා ඒ දරුවෝ ඉක්මනට මිය ගියා. එම නිසා ඖෂධවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම ඉතා වැදගත් වන බව මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම Cloxacillin Sodiumවල ගුණාත්මකභාවයේ ප්‍රශ්න නිසා ඒවා ඉවත් කළ බව පුවත් පත්වල පළ වී තිබුණා. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියා පදිංචි ආයතනවලින් ඖෂධ ගෙන්වනකොට ගුණාත්මකභාවය පිළිබඳ වගකීම ඉතා වැදගත් බව අපි මතක් කරන්න ඕනෑ.

අද වන විට වයස්ගත රෝගීන් ගොඩක් සිටිනවා. මේ රටේ ජනගහනයෙන් සියයට 14ක්, අවුරුදු 60ට වැඩි අය. ඒ වයස්ගත ජනගහනයේ ලොකුම අවශ්‍යතාව තමයි ඇසේ සුදු ඉවත් කර කාව බද්ධ කර ගැනීම. පිටින් කාව ගෙනෙන්න එපා කියා හැමෝටම රජය මඟින් කාව ලබා දීමට පියවර ගෙන තිබීම ගැන අපි සතුටු වෙනවා. මේ නිසා අද රෝහල්වල ලොකු තදබදයක් ඇති වී තිබෙනවා. අවශ්‍යතාව කාව 500ක් වන තැනට ලැබෙන්නේ කාව 200යි. අපි මේ පිළිබඳ ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. ඉස්සර සමහර අම්මලා, තාත්තලා දානපතීන් ළඟට ගිහින් කාව ඉල්ලාගෙන රෝහල්වලට ඇවිත් ශල්‍යකර්ම කර ගත්තා. එම නිසා ලොකු තදබදයක් තිබුණේ නැහැ. හැබැයි, අද වන විට රෝහල්වල කාව හිඟයක් සහ ලොකු තදබදයක් තිබෙන බව අපි දකිනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ නිසා නොවෙයි. එදා වාර්ෂික අක්ෂි කාව ඉල්ලුම 89,000යි. අද ලක්ෂ තුනක් විතර වෙනවා. එම නිසා තමයි තදබදය තිබෙන්නේ. ඔක්කොම රෝගීන් ඇවිත් ශල්‍යකර්ම කර ගන්නවා. මම ඒ වෛද්‍යවරුන්ගෙන් ඉල්ලීමක් කර තිබෙනවා, "සවස 4.00න් පසුව සේවය කරන්න. මම ඒ සඳහා ගෙවීම් කරනවා." කියා. ඒ අය තවම ඒකට එකඟ නැහැ.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ගරු ඇමතිතුමනි, ලක්ෂ තුනේ කාව ගන්න ඇත්තේ ධනපති පන්තියේ අය. නමුත් පිටින් අරගෙන දමන්න රුපියල් 6,500ට කාව තිබුණා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

එදා ධනපති පන්තිය දුන්න කාවය මොකක්ද? රුපියල් 4,000, රුපියල් 5,000 කාව දුන්නේ. මමත් අරගෙන දුන්නා නේ. අද එහෙම නොවෙයි. අද ඇමෙරිකාවෙන් තමයි ගෙන්වන්නේ. මම සමාගම්වල නම් කියන්නේ නැහැ.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ඔබතුමා ඒ ගැන සොයා බලන්නකෝ. අද රෝහල්වල තදබදයක් තිබෙනවා. රෝගීන් waiting list එකේ සිටිනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
තදබදය තිබෙන්නේ ඒකයි. අද ඉල්ලුම වැඩි වී තිබෙනවා.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
අද අක්ෂි කාච සීමාසහිත ප්‍රමාණයක් ලැබෙන නිසා surgery කර ගන්න බැරුවත් සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන සෞඛ්‍ය පිළිබඳව මම අද විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මට කලින් කථා කරපු අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ලබා තිබෙන ප්‍රගතිය -මැලේරියාව මර්දනය කිරීම, සරම්ප රෝගය මර්දනය කිරීම, පෝලියෝ රෝගය මර්දනය කිරීම.- ගැන කිව්වා. හැබැයි, අද මහජන සෞඛ්‍ය වෙනුවෙන් වෙන් කරන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කරන මුදලින් සියයට 5ක් වාගේ ප්‍රමාණයක්. එම නිසා අද බෝ නොවන රෝග විශාල ගැටලුවක් බවට පත් වී තිබෙනවා. අද වන විට මේ රටේ ජනගහනයෙන් සියයට 7ක් දියවැඩියා රෝගයෙන් පෙළෙනවා. අපේ රටේ ජනගහනයෙන් සියයට 7ක් දියවැඩියා රෝගයෙන් පෙළෙනකොට, දියවැඩියා රෝගීන් 87,895ක් ඉන්නකොට එයින් වෛද්‍ය ප්‍රතිකාර ගන්නේ සියයට 21ක් වාගේ ප්‍රමාණයක් පමණයි. ඒ වාගේම අපේ රටේ ජනගහනයෙන් සියයට 26ක් අධි රුධිර පීඩනයෙන් පෙළෙනවා. ඒ වාගේම කාන්තාවන් 100ක් ගත්තොත් එයින් 34දෙනෙක් තරබාරුකමින් පෙළෙනවා. පිරිමි අයගෙන් සියයට 25ක් තරබාරුකමින් පෙළෙනවා. ඒ වාගේම කොලෙස්ට්රෝල් ප්‍රතිශතය වැඩි හුඟදෙනෙක් සිටිනවා.

රෝග වැළැක්වීම සඳහා නිවැරදි සෞඛ්‍ය හුරුපුරුදු ප්‍රවර්ධනය කරන්න, අවදානම් තත්ත්ව හඳුනා ගන්න, රෝගීන්ව කල්තියා හඳුනා ගන්න අවශ්‍ය කටයුතු කරන්න මහජන සෞඛ්‍ය අංශයට වැය කරන මුදල ඉතාම අඩු බව අපි මතක් කරන්න ඕනෑ. ඊළඟට, වත්මන් රජයේ අධ්‍යාපනය තුළ අද පාසල්වල 10,11 පන්තිවලට සෞඛ්‍ය විෂයය අනිවාර්ය කර නැහැ. අවශ්‍ය නම් පමණක් ඉගෙන ගන්න පුළුවන්. ඒක කනගාටුවට කාරණාවක්. මේ නිසා අපි අනාගතය ගැන බොහොම භය වෙනවා. මොකද, පාසල් අධ්‍යාපනය හරහා තමයි දරුවන් මූලික වශයෙන් නීරෝගී ජීවිතයක් ගත කරන්න අවශ්‍ය කරන නිවැරදි, යහපත් සෞඛ්‍ය හුරුපුරුදු ඇති කර ගන්නේ. හැබැයි, අද 10, 11 පන්තිවලට සෞඛ්‍ය විෂයය උගන්වන්න සතියට periods දෙකයි තිබෙන්නේ. එයිනුත් එකක් ශාරීරික ක්‍රියාකාරකම්වලට වෙන් කර තිබෙනවා. Period එකක් විතරයි සෞඛ්‍ය අධ්‍යාපනය වෙනුවෙන් වෙන් වෙන්නේ. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. එහෙම නොවුණොත්, ලංකාවේ මානව සම්පත අනාගතයේ රෝගී පිරිසක් බවට පත් වේවි. ඔවුන්ගේ කාර්යක්ෂමතාව බින්දුවට බහීවි, රටේ ඵලදායීතාව ලොකු අවදානමකට ලක් වේවි. ඒ නිසා පාසල් අධ්‍යාපනය තුළ සෞඛ්‍ය විෂයය අනිවාර්ය විෂයක් කර අඩුම ගානේ සතියකට periods හතරක්වත් සෞඛ්‍ය විෂයය උගන්වන්න කාලය වෙන් කර දීම සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටින ගමන්, රෝහල් හදලා රෝගීන්ට ප්‍රතිකාර කරනවා වාගේම, බෝ නොවන රෝග ඇතුළු අනෙකුත් රෝග වළක්වා ගැනීම, අවදානම් තත්ත්වයන් වළක්වා ගැනීම වෙනුවෙන් මහජන සෞඛ්‍ය අංශය සඳහා වැඩිපුර ප්‍රතිපාදන වෙන් කිරීම අවශ්‍ය බව මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 4.17]

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් අද දින ඉදිරිපත් කරනු ලැබූ වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත සඳහා මාගේ සහයෝගය පළ කරනවා. සමස්තයක් විධියට ගත්තාම අද රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුවක් සිද්ධ වෙමින් පවතිනවා. අද රෝහල්වලට අවශ්‍ය කරන ගොඩනැඟිලි, උපකරණ, කාර්ය මණ්ඩල පහසුකම් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම අවශ්‍ය කරන බෙහෙත් ද්‍රව්‍යවල මිල ගණන් අඩු වෙමින් පවතිනවා. විශේෂයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කය ගැනයි මා අද වැඩිපුර කථා කරන්න බලාපොරොත්තු වන්නේ. මා ගරු සෞඛ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මා නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව, කහටගස්දිගිලිය, කැකිරාව යන ප්‍රදේශවල රෝහල් මූලික රෝහල් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු සැලැස්වීම වෙනුවෙන්. ඒ වාගේම අනුරාධපුර මහ රෝහලට හදිසි අනතුරු ඒකකයක් ලබාදීම ඇතුළුව විශාල වැඩ කොටසක් අනුරාධපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් සිදු කිරීම වෙනුවෙන් එතුමාට මගේ කෘතඥතාව පුද කරනවා.

අද අපේ රටේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලොකු හිඟයක් තිබෙනවා. අද රෝහල්වල විශේෂඥ වෛද්‍යවරුන් සිටියත් බොහෝ වෙලාවට දුෂ්කර පළාත්වලට යන්න එතුමන්ලා අකැමැත්තක් පළ කරනවා. පසුගිය දවස්වලත් දළ වශයෙන් 164ක පුරප්පාඩු තිබුණා. මට මතක විධියට රෝහල්වලට යොමු කරන්න විශේෂඥ වෛද්‍යවරුන් හිටියේ 120ක් පමණ. පුරප්පාඩු 164ක් තිබෙන බවට website එක හරහා දැන්වීම් පළ කළාම බොහෝ විශේෂඥ වෛද්‍යවරුන් තමන්ට කැමැති, පහසුකම් සහිත රෝහල්වලට යන්න වැඩි නැඹුරුතාවක් දැක්වුවා. ඒ නිසා ඉදිරියේදී විශේෂඥ වෛද්‍යවරුන් ඉන්න ප්‍රමාණයට, දුෂ්කර පළාත්වලට ප්‍රමුඛතාව දෙමින් පුරප්පාඩු රෝහල් ප්‍රමාණය website එක හරහා ප්‍රසිද්ධ කළා නම් අනිවාර්යයෙන්ම ඒ සෑම දුෂ්කර රෝහලකටම එක විශේෂඥ වෛද්‍යවරයකුට යන්න වෙනවා. ඒ නිසා ඒ ක්‍රමවේදය ඉදිරියේදී ක්‍රියාත්මක වේවි කියා මා විශ්වාස කරනවා.

ඊළඟට, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය රෝහලේ scanning යන්ත්‍රයක් සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. අවුරුදු එකහමාරක සිට මේ තත්ත්වය තිබෙනවා. මම ඇහුවා, "මේක සෞඛ්‍ය ඇමතිතුමාට දැන්වුවේ නැත්තේ ඇයි?" කියා. ඒ රෝහල්වල වෛද්‍යවරුන් එතුමාගෙන් බලාපොරොත්තු වන්නේ ඊට වඩා ලොකු දේවල්. "Scanning යන්ත්‍රය පළාත් සභාවෙන් ගන්න පුළුවන්. සෞඛ්‍ය

[ගරු වන්දිම ගමගේ මහතා]

ඇමතිතුමාගෙන් ඒක ගන්න එක පාඩුයි. එතුමාගෙන් ඊට වඩා ලොකු දෙයක් ගන්න ඕනෑ." කියායි ඒ අය විශ්වාස කරන්නේ. ඒ නිසා මේ scanning යන්ත්‍රයේ ප්‍රශ්නය මා ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. අද පදවිය රෝහල අද වැසී යන තත්ත්වයකට මුහුණ පාලා තිබෙනවා. විශේෂයෙන් මූලතිව්, ත්‍රිකුණාමලය, වව්නියාව, අනුරාධපුරය කියන දිස්ත්‍රික්කවල මායිම්වල ඉන්න ජනතාව වැඩිපුරම පරිහරණය කරන්න පුරුදු වෙලා තිබෙන්නේ පදවිය රෝහලයි. ඒ නිසා මේ රෝහලට විශේෂඥ වෛද්‍යවරුන්, අවශ්‍ය කාර්ය මණ්ඩල ලබා දීලා පහසුකම් වැඩි දියුණු කළොත් දවසකට රෝගීන් දාහක් විතර යොමු කර ගන්න හැකියාව තිබෙනවා. එහෙම නැති වුණොත් අද වන විට තිබෙන scanning යන්ත්‍රය පිළිබඳ ප්‍රශ්නයත් සමඟ ගැබ්බර මාතාවන්ට අර මා කලින් කියපු දිස්ත්‍රික්කවල මායිම්වල ඉඳලා අනුරාධපුරය දක්වා යන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා පදවිය රෝහල හැකි නම් මධ්‍යම ආණ්ඩුවේ රෝහලක් වශයෙන් ප්‍රකාශයට පත් කර වැඩිදියුණු කරන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලීමක් කරනවා.

අනුරාධපුර රෝහලේ සේවය කළ ස්නායු පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයා මෑතකදී ජේරාදෙනිය විශ්වවිද්‍යාල භූමියේදී සරසවි මැරයන්ගේ ප්‍රහාරයකට ලක් වුණා. අපි ඒ සිදුවීම හෙළා දකිනවා. බරපතළ තුවාල ලැබූ ඒ වෛද්‍යවරයා රෝහල්ගත කළා. හැබැයි, අනුරාධපුර ජනතාව මේ සම්බන්ධයෙන් විශාල මැසිවිල්ලක් නඟනවා. මොකද, ඒ වෛද්‍යවරයා හොඳ වෛද්‍යවරයෙකු වශයෙන් තමයි නම් දරලා තිබෙන්නේ. හැබැයි, හැම දාම තමන්ගේ ඉල්ලීම්, අවශ්‍යතා වෙනුවෙන් ආණ්ඩුවට තර්ජනය කරන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විශ්වවිද්‍යාල සිසුන් වෛද්‍යවරයාට පහර දීම ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ. ඒ කාරණය සම්බන්ධයෙන් කථා කරන්නේ නැත්තේ ඇයි කියලා මම ඔවුන්ගෙන් අහන්න කැමැතියි. අද මේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ක්‍රියාකාරකම් සිදු වෙන්නේ එක් පාර්ශ්වයක් සඳහා පමණයි.

එදා ඉඳලා අපේ රටේ ජනතාව වෛද්‍යවරුන්ට දෙවියන් සේ සැලකුවා. නමුත් අද වනකොට ජනතාව තුළ වෛද්‍යවරුන් කෙරෙහි එක්තරා විධියක වෛරයක් ඇති වෙලා තිබෙනවා. මොකද, ඒ කාලයේ වෛද්‍යවරයෙකු අතින් රෝගීන් මැරුණා කියලා ඔවුන්ට ප්‍රහාර එල්ල කිරීමට ජනතාව පෙළඹුණේ නැහැ. අද මේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විවිධ වැරදි මතවලට වෛද්‍යවරුන්ව නැඹුරු කරලා තිබෙනවා; එමෙන්ම විශ්වවිද්‍යාලවල වාගේම පාසල්වල ගුරුවරුන් දක්වාම වැරදි මතයන්ට නැඹුරු කරලා තිබෙනවා. strike කරලා, ජනතාවට ලබා දී ඇති පීඩනය තුළින් අද ජනතාව තුළ මේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සම්බන්ධයෙන් වෛරයක් ගොඩ නැඟිලා තිබෙනවා. ඒ නිසා මේ කාරණය සම්බන්ධයෙන් මේ උදව්යගේ අවධානය යොමු වෙයි කියලා අපි විශ්වාස කරනවා. තමන්ගේ සංගමයේ හෙට දවස ගොඩ නහා ගන්න බැරි උදව්ය රටේ වෙනත් වෘත්තීන් -සේවයන්- සම්බන්ධයෙන් උපදෙස් දෙන්න උත්සාහ කිරීමේ තේරුම මොකක්ද කියලා මම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයෙන් අහන්න කැමැතියි.

එමෙන්ම අමතක කරන්න බැරි සිද්ධියක් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ඉතිහාසයේ අසාර්ථකම උද්ඝෝෂණය පෙරේදා තිබුණා. මේ උද්ඝෝෂණය පටන් ගන්න ඉස්සෙල්ලා මහා වීරත්වයෙන් විශාල මාධ්‍ය සන්දර්ශනයක් පැවැත්වුවා. හැබැයි, මේ උද්ඝෝෂණයේ අරමුණ වුණේ ආණ්ඩුව පලවා හැරලා, මහින්ද රාජපක්ෂ මහත්තයා අගමැති කරලා, ගෙවල්වලට යෑමයි. එහෙම කියපු උදව්ය එදා ය. 7.00, 8.00 වනකොට ගෙවල්වලට ගියා. හැම දාම තමන්ව අන්දලා, බොරු කියලා, ගොනාට අන්දන මේ පාර්ශ්වයන් කරන බොරුව තේරුම් අරගෙන තමයි ඔවුන් එදා මේ උද්ඝෝෂණයෙන් ඉවත් වෙලා ගියේ. ආබාධිත රණවිරුවන්ගේ සංගමයේ තරුණයෙක් කළ ප්‍රකාශයක් අපි මාධ්‍ය හරහා දැක්කා. එදා ඡන්ද ලක්ෂ 58ක් ගත්ත මහින්ද රාජපක්ෂ මහත්තයාට පසුගිය මැතිවරණයේදී ලැබුණේ ඡන්ද ලක්ෂ 49යි. මේ වාගේ කටයුතු කළොත් ඉදිරියේදී මේ ඡන්ද ප්‍රමාණය ලක්ෂ 30කට විතර අඩු වෙනවා කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා. ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ස්තූතියි, ගරු මන්ත්‍රීතුමා.

ඊළඟට ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා, ඔබතුමාට විනාඩි 11ක් තිබෙනවා.

[අ.භා. 4.26]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තූතියි.

අද ඉදිරිපත් කරන වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත විශේෂයෙන් යම් යම් අරමුණු ඇතිව ඉදිරිපත් කරන පනත් කෙටුම්පතක්. විශේෂඥ වෛද්‍යවරුන් හා අනෙකුත් වෛද්‍යවරුන් ඔවුන්ගේ සුදුසුකම් අනුව ලියා පදිංචි කර ලේඛනගත කොට, ඒ අනුව ඔවුන් නිශ්චිතව හඳුනාගැනීමට හැකි වීමේ තත්ත්වය ඇති කරන බවට, ඔවුන් අනිවාර්ය ලෙස ලියා පදිංචි විය යුතු බවට වන ප්‍රතිපාදනත් මෙමඟින් ගෙන එනවා. ඊට අමතරව, අර්ථ නිරූපණ, ප්‍රතිපාදන කීපයක්ම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛද්‍ය සභාවට සාමාජිකයන් පත් කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. "වෛද්‍ය සභාවට විශේෂඥ වෛද්‍යවරුන් තුන්දෙනකුත්, විශේෂඥ දන්ත වෛද්‍යවරුන් එක්කෙනකුත් ඇතුළත් කළ යුතුය" කියන කොටම අපේ පැත්තෙන් ඉල්ලීමක් තිබෙනවා, "එක් උපාධිධාරී ඖෂධවේදියෙකු, එක් උපාධිධාරී පරිපූරක වෛද්‍ය වෘත්තිකයෙකු, එක් උපාධිධාරී අතුරු වෛද්‍ය වෘත්තිකයෙකු එයට ඇතුළත් කළ යුතුය" කියා. අපි මේ ගැන ඇමතිතුමා සමඟ කතා කළා. ඇමතිතුමා කිව්වා, "මේ සියල්ලන්ම නියෝජනය වන විධියේ වෛද්‍ය සභාවක් අනාගතයේ ඇති කිරීමට වුවමනා සංශෝධන ගෙන එනවා" කියා. එය එසේ වනවා නම් හොඳයි. මම අද බලාපොරොත්තු වනවා, යම් යම් සංශෝධන ඉදිරිපත් කරන්න. ඒ සංශෝධනවල සඳහන් වන්නේත් ඒවායි. ගරු අමාත්‍යතුමනි, ඉදිරිපත් කරන එම සංශෝධන ඔබතුමා බලාපොරොත්තු වන, වඩාත් දුර දිග යන සංශෝධනය ගෙන එන්නට දිරි ගැන්වීමක් වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ අතර තවත් අදහසක් තිබෙනවා, 'ජනමාධ්‍යවේදියකුත් මේ සභාවට ඇතුළත් විය යුතුය' කියා. ඒ වාගේම, 'මහ ජනයා අතරින් තෝරා ගත් පුද්ගලයකුත් මෙම වෛද්‍ය සභාවට ඇතුළත් විය යුතුය' කියන අදහසත් තිබෙනවා.

අපේ ඖෂධවේදීන්, පරිපූරක වෛද්‍ය සේවයේ වෘත්තිකයන්, අතුරු වෛද්‍ය සේවයේ වෘත්තිකයන් ඉතා වුවමනාවෙන් ඉල්ලා සිටිනවා, අද මෙම පනත් කෙටුම්පත මඟින් සිදු කරන සංශෝධන ප්‍රධාන ප්‍රඥප්තියේ VIII, VIII (අ), VIII (අඅ) යන කොටස්වලට අදාළ නොවන බව සඳහන් විය යුතුය කියා. මෙම කෙටුම්පත තුළ එසේ ලිවීමට -ලේඛනගත කිරීමට- නොහැකි වනවා නම්, ගරු ඇමතිතුමා එතුමාගේ පිළිතුරු කතාවේදී ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළොත්, ඔවුන්ට සෑහීමට පත් වන්නට එයත් හේතුවක් වේවි. මම නැවතත් එය කියන්නම්. ප්‍රධාන ප්‍රඥප්තියට කරන මේ සංශෝධන ප්‍රධාන ප්‍රඥප්තියේ තිබෙන VIII, VIII (අ), VIII (අඅ) යන කොටස්වලට අදාළ නොවන සංශෝධන බවට සහතිකයක් ලැබේවි කියා ඒ අය බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන් පෝෂණවේදීන් වෙනුවෙන් වචනයක් කිව යුතුයි. මගේ ලේකම්වරයා යම් අමාරුවක් සැදී රෝගි බවට පත් වුණා. ඊට පසුව ඔහු ඉතාම හොඳ විශේෂඥ වෛද්‍යවරුන් අතරට ගියා. එසේ ගිහින් ඔහු විසින් අවශ්‍ය ප්‍රතිකාර සියල්ල ගනු ලැබුවා. ඒ ප්‍රතිකාර ගන්නා අතරතුර එක් වෛද්‍යවරයෙක් කිව්වා, "කෝකටත් ඔබ ගිහින් පෝෂණවේදියෙකු හම්බ වෙන්න" කියා. ඔහු ගිහින් පෝෂණවේදියෙකු හමු වුණා. ගත යුතු ආහාර පිළිබඳව ඒ පෝෂණවේදියා ඔහුට දුන්නා වූ උපදේශනයන් අනුව ඔහු කටයුතු කිරීම නිසා ඔහුගේ රෝගය යම් දුරකට -මුළුමනින්ම කියා මම කියන්නේ නැහැ.- යහපත් අතකට හැරෙන්න පටන් ගත්තා. ඒ බව වෛද්‍යවරයාටත් දැනුම් දුන්නා. වෛද්‍යවරයාත් සතුටු වුණා. පෝෂණවේදීන්ට ඉටු කරන්න විශේෂ කාර්යයක් තිබෙනවා. ඔහු Medical Nutritionist කෙනෙක් නොවෙයි. ඔහු නිකම්ම Nutritionist කෙනෙක්.

පෝෂණවේදියාගේ ඒ සේවය කොච්චර උදව්වක් වුණාද මගේ ලේකම්වරයාට? එය ඉතාම බරපතළ රෝගයක්. මම ඒ ගැන විස්තර කියන්න යන්නේ නැහැ. ඒ රෝගය යහපත් අතට පත් වීමට පෝෂණවේදියා හේතු වීම නිසා අපට ලොකු සැනසීමක් ඇති වුණ බව මම මේ වෙලාවේ කියන්න ඕනෑ. පෝෂණවේදී උපාධිධාරීන්, ඒ වාගේම අනෙකුත් අතුරු වෛද්‍ය, පරිපූරක වෛද්‍ය කියන වෛද්‍ය සේවාවට අදාළ සහ අවශ්‍ය මේ සියලුම කොටස් එකතු වුණාම තමයි, වෛද්‍ය සේවයක් හැදෙන්නේ. වෛද්‍ය සේවයේ විවිධ හා විශේෂ අංශවල කාර්ය භාර ඉටු කරන මේ කවුරුවත් අයින් කරලා, නැත්නම් දෙවැනි තැනට දමා මේක කරන්න බැහැ. හෙද සේවයද ඇතුළත්ව සෞඛ්‍ය සේවයේ ඔක්කෝම උපාධිධාරි මට්ටමට ගැනීමට ඇමතිතුමා කරගෙන යන්නා වූ උත්සාහය, 'ප්‍රශංසනීයයි' කියලා අපි කියනවා.

මේ ඇමතිතුමා, අපේ ඉතාමත්ම තදබල දේශපාලන විරුද්ධවාදියා. ඒ නිසා, එතුමාට විරුද්ධව දේශපාලන වශයෙන් එල්ල කළ හැකි තියුණුම පහරවල් එල්ල කරන්නට මා පසුබට වෙන්නේ නැහැ. නමුත්, ඔහු සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් කරන මෙහෙවර අගය නොකර මට ඉන්නත් බැහැ. මම ඒ බව කියන්නේ, ඇත්තටම ලොකු සතුටකින්. මොකද, අපේ රටේ මහා අසිරිමත් බව රැඳී තිබුණේ ප්‍රධාන කුලුනු තුනක් මතයි. ඒ තමයි නිදහස් සෞඛ්‍යය, නිදහස් අධ්‍යාපනය හා සුභසාධනය. මේවාට හේතු වුණේ වාමාංශික ව්‍යාපාරයත්, වෘත්තීය සමිති ව්‍යාපාරයත්. මෙම ව්‍යාපාරවල මැදිහත් වීම් තුළ ප්‍රතිසංස්කරණ ඇති වීම තුළින් මේ රටේ මේ හැම දෙයක්ම දියුණුවකට ගියා. මට දුකක් තිබෙන්නේ, ඔබතුමා සෞඛ්‍ය සේවයට ඉටු කරන සේවය අද ඒ ආකාරයෙන්ම නිදහස් අධ්‍යාපන සේවයට ඉටු නොවන නිසායි.

දැන් බලන්න, ඕනෑම දුප්පත් මිනිහෙකුට ඕනෑම විධියක ව්‍යාධියක් ඇති වුණොත් යන්න තැනක් තිබෙනවා; රෝහලක් තිබෙනවා. රජයේ රෝහල්වල, හොඳම පරීක්ෂණ සිද්ධ වෙනවා; ප්‍රතිකාර ලැබෙනවා; දෙන්න පුළුවන් ඉහළම සත්කාර ලැබෙනවා. නමුත්, අධ්‍යාපනයේ එහෙම නොවෙයි. සුදුසුකම ඉහළින්ම ලැබූ අයටත් මුදල් නැත්නම් උපාධියකට යන්නට බැහැ. ඒකයි ඇත්ත තත්ත්වය. බාහිර උපාධියකට යන්නත් බැහැ. විවෘත විශ්වවිද්‍යාලයට ගියත් එතැනත් දිනපතා ගාස්තු වැඩි කරනවා. මෙවැනි තත්ත්වයක් තුළ අධ්‍යාපනයේ නැහැ, එදා අපි ගෙනාපු ඒ උරුමය. ගරු ඇමතිතුමනි, සෞඛ්‍යයේ උරුමය ඔබතුමා ඉදිරියට ගෙන යනවා. ඒ ගැන තමයි මගේ ප්‍රශංසාව. නමුත්, අධ්‍යාපනයේ "සුදුසුකම් ලබන දරුවන්ට සල්ලි -මුදල්- නැත්නම් උපාධිය කරා යන්නට බැහැ" කියන මහ කරුමක්කාර අපරාධය මේ රටේ සිද්ධ වෙන්න ඉඩ දුන්නොත්, මේ රටේ නොනවතින අරගළයක් ඇති වනවා. මොකද මේ රට පුරුදු වෙලා තිබෙන්නේ, නිදහස් අධ්‍යාපනයේ තිබෙන්නා වූ උරුමය ඇතුව ඉගෙන ගන්න. එය කප්පාදු කරන්නට, එය වෙනස් කරන්නට, එය විකෘති කරන්නට, එය විලම්බනය කරන්නට ගන්නා වූ විවිධ පියවර නිසා අද දිගින් දිගට යන විශාල අරගළයක් ඇති වෙලා තිබෙනවා. අපේ සෞඛ්‍ය ඇමතිතුමාත් නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් ගෙන ගිය අරගළයේ හිටපු කෙනෙක්. ඒ ලබාගත් උරුමය රැක ගන්න, අදත් නිදහස් අධ්‍යාපන අරගළය ඉදිරියට යනවා. ඒ නිසා අපි එක දෙයයි ස්ථිර කරන්න ඕනෑ. ඒ මෙයයි. ඕනෑම රෝගියෙකුට යන්න රෝහලක් තිබෙනවා වාගේ, රෝගයකට ප්‍රතිකාරයක් ලැබෙනවා වාගේ, හැකියාව තිබෙනවා නම්, ඕනෑම දරුවෙකුට ඔවුන්ගේ සුදුසුකම් අනුව උපාධියක් හෝ ඊටත් ඉහළ පශ්චාත් උපාධියකට යන්න අවස්ථාව තිබෙන රටක් බවට පත් කර, ලංකාව ලබා ගත් ඒ අසිරිමත් කීර්තිය අපි රැක ගන්න ඕනෑ කියන එකයි මේ වෙලාවේ මම විශේෂයෙන් මතක් කරන්නේ. මෙසේ කියන ගමන්ම මම කැමැතියි තවත් කරුණු එකක්, දෙකක් ඔබතුමාගේ අවධානයට යොමු කරවන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි.

ගරු ඇමතිතුමනි, වෛද්‍යවරුන්ගේ අයිතිය ආරක්ෂා වීම ගැන ඔබතුමා කිව්වා. ඒ වාගේම වෛද්‍ය සේවය ආරක්ෂා කරන්න ඕනෑ කියලාත් ඔබතුමා කිව්වා. මේ දෙකේ පරස්පරයක් නැහැ. වෛද්‍යවරුන්ගේ අයිතියත්, වෛද්‍ය සේවයට අයිති සියලු දෙනාගේම අයිතියත් ආරක්ෂා කිරීම තුළ තමයි වෛද්‍ය සේවය ආරක්ෂා වෙන්නේ කියා මා හිතනවා.ඒ වාගේම ඔබතුමා ගෙන එන අලුත් වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පතේ ඔබතුමා කියන ලද ඒ කරුණු ඇතුළත් වෙන ආකාරයට කටයුතු වෙන අතර, අපේ ඖෂධ වර්ගවල මිල අඩු කිරීම නිසා ලැබුණු වාසිය ඔබතුමා පෙන්වා දුන්නා. ඒ වාගේම විරුද්ධ වුණු ඖෂධ සමාගම් දැන් අපූරුවට ගැළපිලා ඉන්නවා. මොකද, දැන් එදාට වඩා ඒ ගොල්ලන්ගේ වෙළෙඳාම වැඩියි. ඇයි ඒ? ඖෂධවල මිල අඩු වුණා. මිල අඩු වෙනකොට ලාභය අඩු වෙයි කියලා ඔවුන් හිතුවා. නමුත් මිල අඩු වුණාට පසුව වෙළෙඳාම වැඩි වුණා. වෙළෙඳාම වැඩිවීම නිසා ඔවුන්ගේ ආදායම වැඩි වුණාය කියලා මම හිතනවා. ඒ නිසා මේ ව්‍යාපාරිකයින් එක්ක ගනුදෙනු කිරීමේදී ජාවාරම්කාර මානසිකත්වයෙන් මිදිලා වෙළෙඳාමක සාධාරණ ලාභය අය කර ගන්නා වූ පදනමකට අනුව කටයුතු කිරීමට අපට ඔවුන් නම්මවා ගන්න පුළුවන් නම්, මම හිතන විධියට ඔවුන්ටත් මේකෙන් ප්‍රයෝජනයක් ලබා දීලා, අපටත් ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසාන කරන්නම්. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ඖෂධ ප්‍රතිපත්තිය තුළින් බෙරාගත් මුදල් ප්‍රමාණය අපේ රටේ සෞඛ්‍ය සේවය දියුණු කර පවත්වා ගෙන යෑමට, දළ දේශීය නිෂ්පාදිතයේ ඊට වුවමනා කරන ප්‍රතිශතයකින් අපේ සෞඛ්‍ය වියදම් වැඩි කර ලබා ගන්න ඕනෑය කියා මතක් කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මැතිනිය. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට විනාඩි හයක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 4.35]

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අවස්ථාවේදී අපේ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගේ විෂය යටතේ විශේෂඥ වෛද්‍යවරුන් සහ අනෙක් වෛද්‍යවරුන් ලේඛනගත කිරීම සම්බන්ධව වාගේම ඖෂධ නියාමන අධිකාරිය පිළිබඳව කථා කිරීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව මා ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, විශේෂඥ වෛද්‍යවරුන් සහ විශේෂඥ නොවන වෛද්‍යවරුන් වෙනම ලේඛනගත කිරීම පිළිබඳව කථා කරන මේ මොහොතේ මා කියන්න කැමැතියි, අපි රටක් විධියට ගත්තාම සමහර වේලාවට වෙනත් සහතික තිබෙන අය, ආයුර්වේද එහෙම නැත්නම් හෝමියෝපති practise කරන අය මේ වනවිටත් බටහිර වෛද්‍ය වෘත්තියේ යෙදී සිටිනවා කියන කාරණය. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මෙතැනදී මම දකින දෙයක් තමයි වෛද්‍යවරුන් විධියට MBBS සහ විශේෂඥ වෛද්‍යවරුන් විධියට උපාධි සුදුසුකම් ලබා ගෙන එම වෘත්තියේ නියැළෙන වෛද්‍යවරුන්ට පමණක් බටහිර -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. BIMAL RATHNAYAKE *left the Chair and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමිය, කථා කරන්න.

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියමින් සිටියේ මෙයයි. MBBS සහ විශේෂඥ වෛද්‍යවරුන් විධියට උපාධි සුදුසුකම් ලබා ගෙන එම වෘත්තියේ නියැළෙන වෛද්‍යවරුන්ට පමණක් බටහිර ඖෂධ නියම කරන්න අවසරය දීලා තිබියදී, බටහිර ඖෂධ නියම කරන්න වෛද්‍ය වෘත්තීය සුදුසුකම් නැති පුද්ගලයෝත් ක්‍රියාත්මක වෙනවා.

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනියක් විධියට ඉන්නා කාලයේදී මා ලද අත් දැකීමක් අනුව මේ අවස්ථාවේදී මට කාරණයක් ඉදිරිපත් කරන්න තිබෙනවා. අපිට බටහිර ඖෂධ නියම කරන ඒ "හොර වෛද්‍යවරුන්" කියන කොට්ඨාසය අල්ලන්න නීතියේ ප්‍රතිපාදනයක් නැහැ. සමහර වේලාවට අපි ඒ අය නීතියට හසු කර ගන්න උත්සාහ කළත්, මේ තිබෙන දුර්වලතා එක්ක අපට ඔවුන්ව නීතිය ඉදිරියට ගෙන ගොස් උසාවියට ඉදිරිපත් කිරීමේදී ලොකු ගැටලුවක් ඇති වුණා. මෙතැනදී ඖෂධ පිළිබඳ වැටලීමේ කටයුත්ත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයාට නැතුව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට ලැබෙන කොට, එතැන නීතියේ පොඩි ලිහිල්බවක් ඇති වෙනවා. එම තත්ත්වයත් එක්ක මේ වනවිටත් අපේ ලංකාව තුළ සුදුසුකම් නොලත් වෛද්‍යවරු විධියට පෙනී සිටින අය බටහිර වෛද්‍ය ඖෂධ නියම කිරීම සිදු කරනවා.

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, ඖෂධ නියාමන අධිකාරිය ගැන කථා කරන කොට, ඔබතුමා අද මේ රටේ ඖෂධ මිල ගොඩක් අඩු කරලා ජනතාවට ලොකු සහනයක් ලබා දී තිබීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, අද රට ඇතුළට එන සමහර ඖෂධවල ප්‍රමිතිකරණය - quality එක - ගැන අපිට සමහර වේලාවට ගැටලුවක් ඇති වෙනවා. අපි මේ සම්බන්ධව අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් කථා කළා. මේ රට ඇතුළට එන ඖෂධවලට අදාළව regulatory mechanism එකක් නැති එක නිසා, ප්‍රමිතිගතකරණයේදී අපි ලොකු ගැටලුවකට හසු වෙලා තිබෙනවා. ඔබතුමාගේ උත්සාහයෙන් ඖෂධ මිල අඩු කරලා ජනතාවට ශුභ සිද්ධිය ලබා දෙනවා වාගේම ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මේ රට ඇතුළට එන ඖෂධවල ප්‍රමිතියත් සමඟ monitoring system එකක් සකස් කරන ලෙස මම ඔබතුමාට යෝජනා කරනවා. එහෙම වුණොත්, ඔබතුමාගේ ඉලක්කය අනුව එම ශුභසාධනය වඩාත් ඵලදායී ලෙස ජනතාවට ලැබේවි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ප්‍රශ්නය මෙකයි. අපට laboratory එකක් නැහැ. දැන් අපි ඒ laboratory එක හදන්න ආරම්භ කරනවා. මීට ඉස්සෙල්ලා චීනය කිව්වා, අපට ඒක හදලා දෙනවා කියලා. ඒක නිසායි ප්‍රමාද වුණේ. දැන් අපේ NMRA එකේ රුපියල් බිලියන දෙකක විතර මුදලක් තිබෙනවා. ඒ මුදල් යොදලා තව නොබෝ දිනකින් අපි ඒ කටයුතු ආරම්භ කරනවා.

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)
බොහොම ස්තුතියි ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි.

ගරු ඇමතිතුමනි, රෝග නිවාරණය සහ ප්‍රතිකාර ගැන කථා කරන කොට විශේෂයෙන්ම ඔබතුමා ප්‍රතිකාර සඳහා ලොකු මුදලක් වැය කරනවා. රෝග නිවාරණය කටයුතු පිළිබඳ අවධානයත් අපි ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. පවුල් සෞඛ්‍ය නිලධාරී කාර්යාලවල නිලධාරීන් කරනු ලබන කාර්යභාරය සහ සේවය මා අගය කරන අතර, ඒ කටයුතුවලදී අපි ලොකු ගැටලුවකට මුහුණ දී තිබෙන බවත් කියන්න ඕනෑ. බොහෝ පවුල් සෞඛ්‍ය නිලධාරී කාර්යාලවල කොට්ඨාස මට්ටමින් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ ලොකු නිහයක් තිබෙනවා. මේ වෙනකොට ඒ බහුතර නිලධාරීන් විශ්‍රාම ගිහින් තිබෙනවා. මම සතුටුයි කියන්න, අලුතින් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් බඳවා ගැනීමට ඔබතුමා ක්‍රියා කරලා තිබීම ගැන. හැබැයි, ඒ කටයුතු සඳහා අවුරුදු කිහිපයක් ගත වෙනවා. එම නිසා මම ඔබතුමාට යෝජනාවක් කරනවා. ගරු අමාත්‍යතුමනි, විශ්‍රාම ගිය පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් නැවත සේවයට බැඳෙන්න කැමැතියි. ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා, ඒ පුරප්පාඩු සඳහා විශ්‍රාම ගිය පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට කොට්ඨාස මට්ටමින් පත්වීම ලබා දෙනවා නම් වඩා හොඳයි කියන කාරණය මම කියන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ අයට නැවත පත්වීම් ලබා ගන්න පුළුවන්. ඒ අය අවසන් වරට ලබාගත් පඩිය අපි ඔවුන්ට ලබා දෙනවා.

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

ගරු අමාත්‍යතුමනි, නැවත සේවයට බැඳෙන්න කැමැති පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් ඉන්නවා.

ඒ වාගේම, මේ අවස්ථාවේ මම ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කළ යුතු කරුණක් තිබෙනවා. අද ඔබතුමා මහ රෝහල්, ශික්ෂණ රෝහල් වාගේ හැම රෝහලක්ම දියුණු කරලා හොඳ මට්ටමක තිබෙනවා. හැබැයි, අපේ කෑගල්ල දිස්ත්‍රික්කයට මායිම්ව බස්නාහිර පළාතේ තිබෙන අවිස්සාවේල්ල රෝහල පිළිබඳව මම මේ අවස්ථාවේ ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. එම රෝහල පළාත් සභා රෝහලක් විධියටයි තිබෙන්නේ. මේ වෙන කොටත් යම් යම් සුබසාධන කටයුතු කරලා ඒ රෝහලේ තිබෙන අඩු පාඩු සකස් කර දෙන්න සැබැවින්ම ඔබතුමා උත්සාහ කර තිබෙනවා. ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, එම රෝහල වැඩියෙන්ම ප්‍රයෝජනයට ගන්නේ සබරගමුවේ ජනතාව. කෑගල්ල දිස්ත්‍රික්කයේත්, රත්නපුර දිස්ත්‍රික්කයේත් ජනතාව අවිස්සාවේල්ල මූලික රෝහලෙන් සේවය ලබා ගන්නකොට, එම රෝහලට කුඩම්මාගේ සැලකිල්ලක් දක්වන්නේ බස්නාහිර පළාත් සභාවේ මායිමක තිබෙන රෝහලක් නිසාදෝ කියා මා දන්නේ නැහැ. එම නිසා අවිස්සාවේල්ල මූලික රෝහලට ගිහිල්ලා නිරීක්ෂණ චාරිකාවක් කරන ලෙස මා මේ අවස්ථාවේ ඔබතුමාට යෝජනා කරනවා. එහෙම කළොත් පළාත් සභාව මාර්ගයෙන් හෝ එම අඩු පාඩු සම්පූර්ණ කරන්න ඔබතුමාට හැකියාව ලැබෙයි. කරවනැල්ල රෝහල වාගේ පළාත් සභා රෝහල්වල CT Scan යන්ත්‍රයක් තිබුණත්, අවිස්සාවේල්ල මූලික රෝහලේ CT Scan යන්ත්‍රයක් නැති නිසා ඒ රෝගීන් කොළඹට සහ කලුබෝවිලට මාරු කර යවන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, මම ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යවරයා විධියට ඔබතුමා අද මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට කරන මෙහෙයත් අපි අගය කරන්න ඕනෑ. වෘත්තියෙන් වෛද්‍යවරයකු විධියට සැමටම සහනයක් දෙන්න ඔබතුමා ලොකු කාර්යභාරයක් කරනවා. රෝගීන්ට පහසුකම් ලබා දෙනවා වාගේම, ඖෂධ නොමිලේ ලබා දෙනවා වාගේම, අක්ෂි කාච සහ ස්ටෙන්ට් නොමිලේ ලබා දීමත් ඔබතුමා කරන ලොකු සත්කාරයක්. ඒ කටයුතු අගය කරන අතර, මට කථා කිරීමට කාලය ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය කථානායකතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.43]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් අවස්ථාවක් මට උදාකර දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ රජයටත්, සෞඛ්‍ය අමාත්‍යවරයා වන රාජිත සේනාරත්න මැතිතුමාටත් මම මේ අවස්ථාවේ මගේ ගෞරවය පුද කරන්න ඕනෑ.

එතුමාට කරන්න තිබෙන දේවල් ගැන මම කියන්න යන්නේ නැහැ. එතුමා කරපු දේවල් ගැන කථා කළොත්, ඉතිහාසයේ පළමුවැනි වතාවට සෞඛ්‍ය අමාත්‍යවරයකු හැටියට ගන්න පුළුවන් සෘජු තීන්දු අරගෙන මේ රටේ ඖෂධ මිල අඩු කරලා, අභිංසක, දුක්විඳින, පීඩාවට පත්වෙච්ච, එදා වේල බොහොම අමාරුවෙන් හම්බ කරගෙන හිටපු ජනතාවට ලොකු සහනයක් එතුමා සලසා දීලා තිබෙනවා. මේ රටේ දෙකෝටි දසලක්ෂයකට වැඩි ජනතාව වෙනුවෙන් ඒ කරන ලද සේවය මා අගය කරන්න ඕනෑ.

එතුමා අද මේ සභාවට ඉදිරිපත් කරන වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත හා ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග සම්බන්ධයෙන් වූ විවාදයේදී ගරු වෛද්‍ය තුසිතා විජේමාන්න මැතිනිය ප්‍රකාශ කළ විධියට මේ රටේ වෛද්‍යවරුන් සම්බන්ධයෙන් යම් නියාමනයක් තිබෙන්න ඕනෑ. අද හතු පිපෙනවා වාගේ හැම හන්දියකම වෛද්‍ය මධ්‍යස්ථාන තිබෙනවා. එතුමිය කිව්වා වාගේ ආයුර්වේද වෛද්‍යවරුන්, වෙනත් හෝමියෝපති වෛද්‍යවරුන් සායනත් එක්කම වෛද්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යනවා.

මම මේ කාරණය මේ පාර්ලිමේන්තුවේදී කියන්න ඕනෑ. සමහර ආයුර්වේද වෛද්‍යවරුන් කරන ගබඩා නිසා අද ජීවිත විශාල ගණනාවක් අපට අහිමි වෙලා තිබෙනවා. ඒ ශාස්ත්‍රය වෛද්‍ය විද්‍යානුකූලව හදාරන්නේ නැතුව, ගමේ තිබෙන කෙම් ක්‍රම මඟින් හෝ නොයෙකුත් විධියේ ක්‍රම මඟින් ගබඩා කරන්න ගිහිල්ලා ජීවිත ගණනාවක් අනතුරට පත් වෙලා තිබෙනවා; ජීවිත විනාශ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම නොදන්නාකම නිසා මේ තත්ත්වයට ඇතිවෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද වෘත්තීය වෛද්‍යවරයෙක් වෙන්නේ නැතුවත් වෛද්‍යවරු විධියට බොහෝ ආයතනවල සේවය කරනවා. මම දන්නේ නැහැ, ඒක කොතෙක් දුරට සාධාරණද කියලා. සමහර වෛද්‍ය ශිෂ්‍යයන් උපාධිය ලබා ගන්න කලින් යම් යම් ස්ථානවල වෛද්‍යවරු විධියට කටයුතු කරනවා. වෛද්‍යවරයෙක් ළඟ එහෙම සේවයක් කරන එක ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් සමහර තැන්වල පෞද්ගලිකවම ඒ කටයුත්ත කෙරෙනවා. ගරු ඇමතිතුමනි,

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ඕනෑම කඩයක වෙළෙඳ බලපත්‍රය ප්‍රදර්ශනය කරනවා. ඒ විධියට මේ ස්ථානවලත් තමන්ගේ තනතුර, උපාධිය සඳහන් කරලා යම් කිසි බලපත්‍රයක් නැත්නම් සහතිකයක් ප්‍රදර්ශනය කරන්න පුළුවන්කමක් තිබෙනවා. එතකොට මේ වෛද්‍යවරයා විශේෂඥ වෛද්‍යවරයෙක්ද, MBBS සාමාන්‍ය වෛද්‍යවරයෙක්ද කියන එක පිළිබඳව යම් අවබෝධයක් ඕනෑම කෙනෙකුට ලබා ගන්න පුළුවන්. ඒක ඉතාම වැදගත්. ගාල්ල ප්‍රදේශයේ මම දන්නා වෛද්‍යවරුන් ඉන්නවා. ඒ අය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ නිෂ්පාදනය කරන බෙහෙතුයි, බටහිර රටවල නිෂ්පාදනය කරන බෙහෙතුයි සංසන්දනය කරනවා. "මේ බෙහෙත මට 'ෂුවර්' කරන්න බැහැ. මට මේකට guarantee එකක් දෙන්න පුළුවන්කමක් නැහැ" කියනවා. සමහර වෙලාවට, "කෙටි කාලයකින් මැරෙයි" කියන එකත් කියනවා. "මේ බෙහෙත බිව්වොත් ඉක්මනින් ප්‍රතිචාර දක්වලා මේ රෝගය නිවාරණය වෙනවා" කියනවා. මේ තත්ත්වය අහිංසක මිනිසුන්ට බරපතළ ප්‍රශ්නයක්. කවුරුවත් මැරෙන්න කැමති නැහැ. ඖෂධීය ගුණය ගැන හිතන්නේ නැතුව විශාල ව්‍යාපාරිකයන් ගෙන්වන ඒ ඖෂධ වර්ග, කොම්පැනි නම්වලින් ගෙනෙන විවිධ වූ ඖෂධ වර්ග ඒ විධියට රෝගීන්ට දෙනවා. ඒ ගැනත් සොයා බලන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කරපු විප්ලවීය වෙනස අපි අගය කරන්න ඕනෑ. ගාල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු හැටියට මම සතුටු වෙනවා, ගාල්ල - කරාපිටිය ශික්ෂණ රෝහලට ඉතිහාසයේ වැඩිම මුදලක් ඔබතුමා ලබා දීම සම්බන්ධව. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ - 1980 දශකයේ- ආරම්භ කළාට පස්සේ, ඔබතුමා තමයි ඒ රෝහලට ලක්ෂ එක්ලක්ෂ පනස්දාහක වැඩ කරලා ඉතිහාස ගත වෙන්නේ. එහේ අලුතින් ඉදිවෙනවා මාතෘ රෝහලක්. ඒ රෝහල අවුරුදු නවයක් තිස්සේ හැදුණේ නැහැ. "හෙල්මුට් කෝල්" පදනමින් ඒකට දීපු මිලියන 3,000ක් විනාශ කරලායි තිබුණේ. හැබැයි, රාජිත සේනාරත්න මැතිතුමා පාර්ලිමේන්තු මැතිවරණයට කලින් මුල්ගල් තැබූ ඒ ගොඩනැඟිල්ල ලබන මාර්තු වෙන කොට විවෘත කරන්න පුළුවන්. අවුරුදු දෙකහමාරක්, තුනක් ඇතුළත ඒ කටයුතු අවසන් කරලා තිබෙනවා.

වකුගඩු රෝහල් සංකීර්ණයකුත් හදලා තිබෙනවා. වර්තමාන ජනාධිපතිතුමා සෞඛ්‍ය ඇමතිවරයා විධියට සිටියදීයි එයට මුල්ගල් තිබ්බේ. එහි ඉදිරි කටයුතු කිරීමට මුදල්වල යම් අඩු පාඩු තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, 2019 මාර්තු මාසය වෙන කොට එහි වැඩ කටයුතුත් අවසන් කරන්න කියලා. ඔබතුමාට ඒ කටයුතු කරන්න පුළුවන් හැකියාව තිබෙනවා. ඒ එක්කම මහාචාර්ය ඒකකයක් තිබෙනවා. ඒකටත් ඔබතුමා විශාල මුදලක් දීලා තිබෙනවා. ඒ වාගේම, ළමා ඒකකයක් සඳහා අවශ්‍ය තට්ටු 10ක ගොඩනැඟිල්ලක් ලබා දීලා තිබෙනවා. දන්ත වෛද්‍ය ඒකකයක් සඳහා තවත් තට්ටු දහයක ගොඩනැඟිල්ලක් ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. බදුල්ල, මොනරාගල විතරක් නොවෙයි, හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාගේ බලප්‍රදේශයේ ඉඳලාත් විශාල පිරිසක් එන්නේ, ගාල්ල රෝහලට. මා හිතන හැටියට කොළඹ රෝහලට, මහනුවර රෝහලටත් වඩා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් කරාපිටිය රෝහලට ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, පසු ගිය දවස්වල "ඉන්ෆ්ලුවන්සා" උණ රෝගය පැතිරුණු වෙලාවේ කරාපිටිය රෝහලේ ඇඳන් ඉතාම සීමිත ප්‍රමාණයක් තමයි තිබුණේ. අද එහි ඇඳන් 13ක් තිබෙනවා. රිජ්වේ ආර්යා ළමා රෝහලේ තිබෙන්නේ ඇඳන් 11යි. මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, අපි අද ඇඳන් 13ක් දක්වා වැඩි කරගෙන තිබෙනවා. ගරු අමාත්‍යතුමා එතකොට විදේශගත වෙලායි හිටියේ. එතුමා පිටරට හිටියත් ඒ මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න කටයුතු කරලා එක්කෝටි පනස් ලක්ෂයක මැෂින් එකක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා, ඒ ඇඳත් එක්ක. අද "ඉන්ෆ්ලුන්සා" වාගේ බෝවෙන රෝගයක් ආවොත් කිසිම බයක් වෙන්න දෙයක් නැහැ. ගාල්ලේ ශික්ෂණ රෝහලට ඇතුළත් කළාම ඒ ජීවිතවලට රැකවරණය ලබා දෙන්න ළමා දැඩි සත්කාර ඒකකය කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න. ඔබතුමාටවත් ප්‍රයෝජනවත් වන දෙයක් සඳහන් කිරීමට අවශ්‍යයි.

මේ කටයුත්තේ දී මා විශේෂයෙන්ම කියනවා,-[බාධා කිරීමක්] මට බාධා කරන්න එපා, මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඒක ඇමතිතුමාගෙන් ඉල්ලා ගන්න. අවශ්‍ය නම් මැද කොළඹ ප්‍රදේශයෙත් රෝහලක් හදන්න කියලා අපි කියනවා.

ගරු අමාත්‍යතුමාට මා විශේෂ ගෞරවය පුද කරනවා. ඉතිහාසයේ පළමුවෙනි වතාවට මෙවන් වූ සංවර්ධන ක්‍රියාදාමයක් තුළින් මේ රටේ දුක්විඳින අහිංසක මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කරන්න එතුමා කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම වකුගඩු රෝගීන්, ඒ වාගේම පිළිකා රෝගීන් සඳහා දෙන්න පුළුවන් ඉහළම අනුග්‍රාහකත්වය, දායකත්වය එතුමා ලබා දීලා තිබෙනවා. ඒ පිළිබඳව මගේ ප්‍රසාදය පළ කරනවා.

කඩිනමින් අපි මේ රෝහල විවෘත කරනවා, ඇඳන් 600ක් සහ ශල්‍යාගාර 6ක් එක්ක. අලුත් රෝහලට අවශ්‍ය උපකරණ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීමට අමාත්‍යාංශය මඟින් කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ කටයුතු ඉක්මනින් කරන්න කියලා ඉල්ලන ගමන් මම තව ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ ඉදිවෙන ගොඩනැගිලි ඉතාම කඩිනමින් ඉදි කරලා ඉදිරි අවුරුද්ද ඇතුළත මේ කටයුතු අවසන් කරන්න කියලා. එතකොට අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අග්‍රාමාත්‍යතුමාගේත් මහ පෙන්වීම යටතේ මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාලම ප්‍රාතිහාර්ය ඉෂ්ට කරපු නායකයා හැටියට රාජිත සේනාරත්න මැතිතුමා ඉතිහාසගත වෙනවා. මම හිතන්නේ එතුමාට වෙන කිසිම දෙයක් අවශ්‍ය නැහැ, ඒ පිනෙන්ම එතුමාට දීර්ඝායුෂ ලැබෙනවා; එතුමාට ඉදිරියට යන්න ශක්තිය ලැබෙනවා කියන එක මම විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු ජේ.සී. අලවතුවල රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 5ක් තිබෙනවා.

[අ.භා.4.51]

**ගරු ජේ. සී. අලවතුවල මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. J.C. Alawathuwala - State Minister of Home Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මටත් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වනවා. සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමා සෞඛ්‍ය අමාත්‍යාංශය භාරගත්තාට පසුව එහි වෙනස්කම් ගණනාවක් කරන්න, ඉතිහාසයේ කවදාවත් නොකරපු කාර්යයන් ගණනාවක් කරන්න එතුමාට අවස්ථාව උදා වුණා කියන එක විශේෂයෙන්ම මෙහිදී මම මතක් කරන්නට ඕනෑ. යහ පාලන රජය යටතේ විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත් මහ පෙන්වීම යටතේ සෞඛ්‍ය අමාත්‍යතුමාට පුළුවන් වෙලා තිබෙනවා, මේ රටේ තිබුණු බෙහෙත් මිල විශාල ප්‍රමාණයකින් අඩු කරලා රටේ ජනතාවට විශාල සහනයක් ලබා දෙන්න. එදිනෙදා පාවිච්චි කරන සමහර බෙහෙත් වර්ග සියයට 60කින්, 70කින් පමණ මිල අඩුකරන්න එතුමාට පුළුවන් වුණා. මේක මේ රටේ දීර්ඝ කාලයක් මාෆියාවක් වශයෙන් තිබුණු කාරණාවක්. නමුත් එතුමාට පුළුවන් වුණා මෙහි වාසිය ජනතාවට ලබා දෙන්න. ඒ නිසා අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, විශාල පිරිසකට මේ වාසිය අත් වුණා. සියලුම දෙනා තමන්ට අවශ්‍ය කරන බෙහෙත් රජයේ රෝහල්වලට ගිහිල්ලා ගන්නේ නැහැ. ගොඩක් දෙනෙක් පෞද්ගලිකව ෆාමසිවලින් ගන්නා බෙහෙත්වල මිල විශාල ප්‍රමාණයකින් අඩු කළා. උදාහරණයක් හැටියට ගත්තොත්, සමහර අය මාසයකට ගන්නා බෙහෙත්වලට රුපියල් 5,000ක් වියදම් වුණා නම්, අද රුපියල් 2,000ක් දක්වා ඒ වියදම අඩු කරන්න සෞඛ්‍ය ඇමතිතුමාට පුළුවන් වෙලා තිබෙනවා. මේක හැම රෝගයකටම අදාළයි. දියවැඩියා රෝගය වෙන්න පුළුවන්; blood pressure වැනි රෝග වෙන්න පුළුවන්. දීර්ඝ කාලීනව පවතින රෝග ගණනාවකට අදාළව ජනතාව එදිනෙදා පාවිච්චි කරන බෙහෙත්වල මිල අඩු කිරීමෙන් ජනතාවට විශාල සහනයක් ලබා දෙන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම බෙහෙත් විතරක් නොවෙයි, හෘදයාබාධ වැනි රෝග තත්ත්වයන් ඇති වූ අයට stent දැමීම විශාල වශයෙන් සිදු වෙනවා. අද ඒවායේ මිලත් තිබුණු ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයකින් අඩුකරලා ලබා දෙනවා. ඒ වාගේම රජයේ රෝහල්වලත් මේ කටයුතු කරන්න අවශ්‍ය පහසුකම් එතුමා ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අද අපේ රටේ විශාල පිරිසක් පිළිකා රෝගයට ගොදුරු වෙලා සිටින බව අපි දන්නවා. පසුගිය කාලයේ සිදුවුණේ පිළිකා රෝගය සඳහා ප්‍රතිකාර ගන්නා විශාල පිරිසකට යම් ප්‍රමාණයකට අවශ්‍ය ප්‍රතිකාර කරලා, ඒ රෝගියා වෙනුවෙන් රුපියල් ලක්ෂ 15ක විතර මුදල් ප්‍රමාණයක් වැය වුණාට පසුව ඒ පුද්ගලයා තරුණ වයසේ කෙනෙක් වුණත්, වැඩිමහල් වයසේ වුණත්, කොහොම කෙනෙක් වුණත් ඒ අයට එතැනින් එහාට ප්‍රතිකාර කරන එක නැවැත්වීමයි. නමුත් අපි ඉතාම අගය කළ යුතුයි, අද පිළිකා රෝගියෙකුට ඒ, වැය වන මුදල් ප්‍රමාණය සීමා නොකර රෝගියාට අවශ්‍ය ප්‍රතිකාර ඒ ආකාරයෙන් දිගටම සිදු කරන්න අවශ්‍ය පහසුකම් අපේ සෞඛ්‍ය ඇමතිතුමා ලබා දීලා තිබෙනවා. ඒක යහ පාලන රජය ගත්ත ඉතාම වැදගත් තීන්දුවක්. එහි ගෞරවය සෞඛ්‍ය ඇමතිතුමාටත්, ඒ කටයුතු කරන්න සහයෝගය ලබා දුන් සියලු දෙනාටමත් අපි ලබා දෙන්න ඕනෑ.

අද මධ්‍යම රජයට අයත් රෝහල් ගණනාවක් තිබෙනවා. කුරුණෑගල රෝහල ගැනත් මම මතක් කරන්න ඕනෑ. කුරුණෑගල මහ රෝහලට අද මිලියන ගණනක් වියදම් කරලා, එම රෝහල නවීන රෝහලක් බවට පත් කරන්න අවශ්‍ය අංගෝපාංග සියල්ලම ලබා දෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කොට තිබෙනවා. මේ වන විට ඒවා ඉදිවෙමින් පවතිනවා. වයඹ පළාතේ තිබෙන ප්‍රධානම රෝහල කුරුණෑගල මහ රෝහලයි. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මේ කාලසීමාව තුළ කුරුණෑගල මහ රෝහල වෙනුවෙන් දැවැන්ත මුදලක් වෙන් කරලා ඒ ලබා දෙන සහයෝගය වෙනුවෙනුත් අපේ ස්තුතිය ඔබතුමාට පුද කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව එක කාරණයක් ගැන සඳහන් කරලා මම විනාඩියකින් මගේ කථාව අවසන් කරන්නම්. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, තැලසීමියා රෝගය කුරුණෑගල දිස්ත්‍රික්කයේ නුවරට ආසන්නව විශාල වශයෙන් ව්‍යාප්ත වෙලා තිබෙන නිසා ඒ අය වෙනුවෙන් නිතරම ලේ ලබාදීමේ අවශ්‍යතාවක් තිබෙනවා. එම නිසා තැලසීමියා රෝගය සම්බන්ධයෙන් නුවර ප්‍රදේශයේ ඒකකයක් පිහිටුවලා, ඇටමිදුලු බද්ද කිරීම වාගේ කටයුතුවලට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරලා දීලා තිබෙනවා. ඒ පිළිබඳවත් අපේ ගෞරවය හා ස්තුතිය ගරු අමාත්‍යතුමාට පුද කරන්න ඕනෑ. විශේෂයෙන්ම එතුමා ක්‍රියාත්මක කරන්න යන මේ සංශෝධන සම්බන්ධයෙන් අපේ සහයෝගය පළ කරන අතර, එතුමාට සෞඛ්‍ය ක්ෂේත්‍රය හරහා ජනතාවට අවශ්‍ය සහයෝගය තව තවත් ලබා දෙමින්, මේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කිරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Faizal Cassim. You have ten minutes.

[பி.ப. 4.56]

**ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim - Deputy Minister of Health, Nutrition and Indigenous Medicine)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று நடைபெறுகின்ற சுகாதார அமைச்சின் மீதான விவாதத்தில் கலந்து கொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். நாட்டு மக்களில் கூடுதலானவர்கள் middle income - மத்திய வருமானமுள்ளவர்களாகக் காணப்படுகின்றனர். அதேநேரம் இன்று நாட்டு மக்கள் சுகாதார சேவை, நீர்வழங்கல், மின்சாரம் போன்ற விடயங்களிலே மிகவும் ஊக்கம் செலுத்துவதை நாங்கள் காண்கின்றோம். அந்த வகையில் அரசாங்கம் வரவு செலவுத் திட்டத்திலே கூடுதலான பணத்தை சுகாதாரத்துக்கும் கல்விக்கும் செலவழிக்கின்றது. இங்கு உரையாற்றிய எல்லாப் பாராளுமன்ற உறுப்பினர்களும் பெரும்பாலும் கடந்த 3 வருடங்களாக, அதாவது இந்த ஆட்சி அமைக்கப்பட்டதன் பின்னர் சுகாதார சேவையில் ஏற்பட்ட அபிவிருத்தி பற்றிப் பேசினார்கள். இந்த அபிவிருத்திக்குக் காரணமாக இருப்பவர் அமைச்சர் டாக்டர் ராஜித சேனாரத்ன அவர்கள். அவர் இந்த அமைச்சைப் பொறுப்பேற்றதிலிருந்து இன்றுவரை சுகாதாரச் சேவையை மேம்படுத்த வேண்டும் என்பதில் காட்டிய அக்கறை குறித்து அவரை நாங்கள் வாழ்த்துகின்றோம். எவ்வாறாவது மக்களுக்கு நல்ல சுகாதார சேவைகளை வழங்க வேண்டும் என்ற வகையில் இன்று அவர் எல்லா முயற்சிகளையும் மேற்கொண்டு வருகின்றார்.

இங்கு உரையாற்றிய பாராளுமன்ற உறுப்பினர்கள் மருந்துப் பொருட்களின் விலைகுறைப்புப் பற்றிப் பேசினார்கள்; நோயாளிகளுக்கு stents பொருத்துவது பற்றிப் பேசினார்கள்; கண் வில்லைகள் பற்றிப் பேசினார்கள். இவை எல்லாவற்றையும்விட, அமைச்சர் அவர்களின் அடுத்த நடவடிக்கை பற்றியும் இங்கு நாம் பேச வேண்டும். இன்று

[ගරු ෆයිසාල් කාසිම් මහතා]

இலங்கையிலே சுமார் 40,000 பேர் kidney நோயினால் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அதைத் தடுப்பதற்காக நாங்கள் நிறைய வேலைத்திட்டங்களை மேற்கொண்டு வருகின்றோம். இன்று நாங்கள் CKD எனப்படும் kidney disease என்ன காரணத்தினால் ஏற்படுகின்றதென்பதை மிக முக்கியமாக அறிய வேண்டியிருக்கின்றது. அதேநேரம் இன்று அமைச்சர் அவர்கள் kidney வியாதியால் பாதிக்கப்பட்ட மக்களைக் கவனிப்பதற்கான இரண்டு வேலைத்திட்டங்களை அறிமுகப் படுத்தியிருக்கின்றார். இப்போது அந்த விடயம் Cabinet இலும் சமர்ப்பிக்கப்படவுள்ளது. முதலாவது peritoneal dialysis பற்றிய விடயம். அதாவது, வீடுகளுக்குச் சென்று குறித்த நோயாளர்களுக்கு dialysis செய்வதாகும். இரண்டாவது, சிறுநீரக நோயாளர்களுக்கு அண்மையிலுள்ள வைத்திய சாலைகளில் dialysis செய்கின்ற விடயம். கௌரவ அமைச்சர் அவர்கள் இன்று காலையில்கூட இது சம்பந்தமாகக் குறிப்பிட்டிருந்தார். இந்த வகையில் அமைச்சர் அவர்கள் இந்த வேலைத்திட்டங்களை மிக விரைவில் செயற்படுத்தவிருக் கின்றார்.

இந்த வருடத்திற்குரிய அடுத்த திட்டம் digital health system ஆகும். அதாவது, சுகாதாரத் துறையை IT உடன் சம்பந்தப்படுத்துவதாகும். அந்த வகையில் நாட்டிலுள்ள 22 மில்லியன் மக்களுக்கும் சுகாதார card கொடுப்பதற்குரிய வேலைத் திட்டத்தை அமைச்சர் அவர்கள் ஆரம்பித்திருக் கின்றார். அந்த வேலைத்திட்டம் இப்பொழுது இடம்பெற்றுக் கொண்டிருக்கின்றது. இந்த digital health system இனை நாட்டிலுள்ள எல்லா வைத்தியசாலைகளிலும் அறிமுகப் படுத்துவதன்மூலம் எந்தவொரு வைத்தியசாலைக்கு வருகின்ற நோயாளிகளும் அங்கு பதிவுசெய்யப்படுவார்கள். எந்த நோயால் சம்பந்தப்பட்டவர்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள், அவர்கள் பாவிக்கும் மாத்திரைகள் போன்ற விபரங்களும் அங்கு computer மூலம் பதிவு செய்யப்படும். உதாரணமாக, இன்று கொழும்பு தேசிய வைத்தியசாலையில் சிகிச்சை பெறுகின்ற ஒரு நோயாளி நாளை மாத்தறைக்குப் போகின்றபோது மீண்டும் நோய்வாய்ப்பட்டால் குறித்த சுகாதார card ஐ அங்குள்ள வைத்தியசாலையில் காட்டிச் சிகிச்சை பெறுகின்ற நிலைமை தொடரப்போகின்றது. அடுத்த திட்டம் என்னவென்றால், குறித்த இயந்திர உபகரணத்தை வீடு வீடாகக் கொண்டுசென்று, வீட்டிலுள்ளவர்களின் இரத்தத்தைப் பரிசோதனை செய்வதாகும். இதன்மூலம் கிடைக்கும் தரவுகள் குறித்த பிரதேசத்திலுள்ள வைத்தியசாலையினூடாக அல்லது MOH Office ஊடாக கணனி மயப்படுத்தப்படும். இதன்மூலம் மக்கள் மத்தியிலுள்ள நோய்கள் இலகுவாகக் கண்டறியப்படும். ஆரம்பத்திலேயே நோய்களைக் கண்டறிவதன்மூலம் அதன் பாதிப்புக்களிலிருந்து மக்களைப் பாதுகாக்க முடியும்.

கௌரவ அமைச்சர் அவர்கள் கூறியதுபோன்று public health system உலக வங்கியின் நிதி உதவியுடன் கிட்டத்தட்ட 200 மில்லியன் ரூபாய் செலவில் நடைமுறைப்படுத்தப்படும். இந்தத் திட்டம் 10,000 பேருக்கு ஒரு வைத்தியர் என்ற அடிப்படையில் அமுல் செய்யப்படும். Public health ஐப் பொறுத்த வரையில் Primary Care Hospitalகளை அமைப்பதன்மூலம் மக்களுக்கு எல்லா சுகாதார வசதிகளும் செய்து கொடுக்கப்படும். இதன்மூலம் மக்கள் தங்களுக்குத் தேவையான மருத்துவ உதவிகளைப் பெற்று, ஆரம்ப சிகிச்சையைப் பெறலாம். எனக்கு முன்பு பேசிய பாராளுமன்ற உறுப்பினர் ஒருவர் "மக்கள் தங்களுக்கு ஏதாவது நோய் வந்தால் முதலில் மருத்துவத்துக்கான Consultantஐ நாடிச் செல்கின்றார்கள்" என்று கூறினார். ஆனால், இந்த முறை பிழையானது. ஆகவே, ஆரம்ப கட்டமாக Primary Care வைத்தியசாலைகளில் சிகிச்சை பெற்று பின்னர்தான், அடுத்த கட்டச் சிகிச்சைக்குச் செல்ல வேண்டும். இது சம்பந்தமான ஒரு வேலைத்திட்டமும் மக்கள் மத்தியில் மிக முக்கியமாக மேற்கொள்ளப்படும்.

இன்று நாங்கள் ஒரு சவாலை எதிர்கொள்கின்றோம். அதாவது வைத்தியத் துறைக்குத் தேவையான எல்லா இயந்திர உபகரணங்களும் சுகாதார அமைச்சினால் சம்பந்தப்பட்ட வைத்தியசாலைகளுக்கு வழங்கப்படுகின்றன. ஆனால், அவை எல்லாம் மக்களுக்குப் பயன்படுத்தக்கூடிய வகையில் பராமரிக்கப்படுகின்றதா? இல்லையா? என்பது கேள்விக்குறி! அவை இயங்கக்கூடிய நிலையில் இருந்தாலும், சம்பந்தப்பட்ட அதிகாரிகளின் கவனக்குறைவினாலும் அவர்கள் வேண்டா வெறுப்புடன் செயற்படுவதனாலும் சிலவேளைகளில் குறித்த இயந்திர உபகரணங்கள் முழுமையாகப் பாவிக்க முடியாமல் போய்விடுகின்றன. இதனால், மக்களுக்கு முழுமையான சேவையை வழங்க முடியாதிருக்கின்றது.

இன்று எமது வைத்தியசாலைகளில் கிட்டத்தட்ட MRI இயந்திரங்கள் 7 இருக்கின்றன. இந்த MRI இயந்திரங்கள் இன்று மக்களுக்குப் பயன்படுகின்றவா, இல்லையா? என்ற கேள்வியை இந்தச் சபையில் கேட்க விரும்புகிறேன். அமைச்சர் அவர்களும் பிரதி அமைச்சரும் மற்றும் பணிப்பாளர்களும் பிரதிப் பணிப்பாளர்களும் செயற்படுவதன்மூலம் மாத்திரம் சுகாதாரத் துறையை மேம்படுத்த முடியாது. சுகாதார அமைச்சின் எல்லா ஊழியர்களதும் ஒத்துழைப்பு வழங்கப்பட வேண்டும். ஒவ்வோர் சுகாதார ஊழியரும் தங்கள் மனச்சாட்சிக்கேற்பச் சேவை செய்யவேண்டும். இன்று அரசாங்கம் குறித்த வேலைத்திட்டங்களை மேற்கொண்டு வருகின்றபோதிலும் சிலவேளைகளில் இந்தச் சேவைகள் மக்களைச் சென்றடைவதில்லை. உதாரணமாக CT scan பற்றிய சேவையைக் குறிப்பிடலாம்.

இங்கு பேசிய சில உறுப்பினர்கள் வைத்தியசாலை களுக்குக் கூடுதலான மக்கள் வருகின்றபோதிலும், அங்கு சேவைகளைப் பெற்றுக்கொள்வதில் அவர்கள் மிகுந்த கஷ்டங்களை எதிர்நோக்குகின்றார்கள் என்று கூறினார்கள். இதனை நாங்கள் ஏற்றுக்கொள்கின்றோம். இன்று நோயாளர் களுக்கு Cardiothoracic சம்பந்தப்பட்ட Stent free ஆகப் பொருத்தப்படுவதனால் சம்பந்தப்பட்ட நோயாளிகள் அரசாங்க வைத்தியசாலைகளையே நாடிவருகின்றனர். ஆகவே, இவர்களுக்கு ஈடுகொடுக்கக்கூடிய வகையில் இப்பொழுது நாங்கள் குறித்த வேலைத்திட்டங்களை மேற்கொண்டு வருகின்றோம். அதேநேரம் இந்த வேலைத் திட்டங்களை அமுல்படுத்துவதில் doctors, Consultants, Paramedics முதலிய எல்லோரும் ஒத்துழைப்பு வழங்க வேண்டும். அவ்வாறு ஒத்துழைப்பு வழங்கினால் மட்டுமே குறித்த திட்டங்களில் வெற்றிபெற முடியும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Deputy Minister, you have only one minute more.

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

இப்பொழுது நாட்டில் ஒரு புதிய கலாசாரம் காணப்படுகின்றது. அதாவது, doctors தாக்கப்படுகின்றார்கள். இந்த விடயம் தொடர்பில் நான் மிகவும்

கவலையடைகின்றேன். இன்று நாடு பூராகவும் மூளை நரம்பு பற்றிய Consultants 13 பேர் இருக்கின்ற நிலையில், அநுராதபுரத்திலுள்ள Neurological Consultant பேராதனை மாணவர்களால் தாக்கப்பட்டுள்ளார். அவருடைய நிலைமையையிட்டு நான் கவலையடைகின்றேன். இன்று நாட்டில் மருத்துவத் துறையில் consultants தேவையென்று கவலைப்படும்போது, இவ்வாறு டாக்டர்கள் தாக்கப்படுவது கவலைக்குரிய விடயமாகும். இவ்வாறு தொடர்ந்தும் வைத்தியர்கள் தாக்குதலுக்குள்ளானால் எவ்வாறு மக்களுக்கு மருத்துவ சேவையை வழங்க முடியும்? என்று நான் இந்தச் சபையில் கேட்க விரும்புகிறேன்.

தாதிமாருக்கான degree தொடர்பிலும் இங்கு சொல்லப் பட்டது. அமைச்சர் அவர்கள், முன்னாள் நிதியமைச்சர் ரவி கருணாநாயக்க அவர்களுடன் பேசித் தாதிமாருக்கான degree awarding Institute இனை மிகவும் கஷ்டத்துக்கு மத்தியில் ஆரம்பித்திருக்கின்றார். இந்த விடயம் தொடர்பில் அமைச்சர் அவர்களுக்கு நான் நன்றி கூறவேண்டும். இவ்வாறான வேலைத்திட்டங்களின்மூலம் நாட்டில் தகைமையுள்ள குறித்த உத்தியோகத்தர்களை உருவாக்க முடியும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, you have to conclude your speech now.

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
பிரதி அமைச்சராகிய நானோ அமைச்சர் அவர்களோ மற்றும் அதிகாரிகளோ செயற்படுவதன்மூலம் மாத்திரம் சுகாதாரச் சேவையைத் திறம்பட மேற்கொள்ள முடியாது. நாட்டு மக்களினது ஒத்துழைப்பும் அவசியமாகும். இன்று நாட்டில் சிறுசிறு விடயங்களுக்கு எல்லாம் சம்பந்தப் பட்டவர்கள் strikes மேற்கொள்வதை நாங்கள் காண்கின்றோம். இவ்வாறான நிலையில் நாட்டில் சிறந்த சேவைகளை மேற்கொள்ள முடியாது. எனவே, இந்தச் சுகாதார சேவையை மேம்படுத்துவதற்கு நாட்டு மக்கள் ஒத்துழைக்க வேண்டும் என்று கோரி எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
மீළහට, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.07]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට නැවත අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කළ කරුණු කිහිපයක් ගැන පැහැදිලි කිරීම් කරන්න මම මේ අවස්ථාව යොදා ගන්නවා.

ඕමන්තෙයි ප්‍රදේශයේ තිබෙන incinerator එක එතැනින් ඉවත් කරලා දකුණේ රෝහලකට දෙන්න යනවාය කියා ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා. නමුත් ඒක එහෙම නොවෙයි. මොකද, පළාත් සභාවෙනුත් incinerator යන්ත්‍ර 5ක් අරගෙන තිබෙනවා. ඒ වුණත්, ඒක එහෙම දකුණේ රෝහලකට ගෙන යන්නේ නැහැය කියා අපි තීන්දු කර තිබෙනවා.

ඊළඟට, ගලහ රෝහල ගැන කිව්වා. ගලහ රෝහලේ වුණු ඒ සිද්ධිය ගැන මධ්‍යම රජයෙන්ම සියලු පරීක්ෂණ කටයුතු ආරම්භ කරලා, ඒ කටයුතු කරගෙන යනවා. ඒ වාගේම paramedics ඇතුළු අනෙකුත් පිරිස් බඳවා ගැනීමට දීර්ඝ කාලයක් ගියා. ඒ අයගේ සහතික පත්‍රවල නිවැරැදිතාව තහවුරු කර ගැනීම සඳහා විශාල කාලයක් ගත වුණා. නමුත් අපි අද විභාග දෙපාර්තමේන්තුවත් සම්බන්ධ කරගෙන අන්තර්ජාලය ඔස්සේ ඒ සඳහා වැඩසටහනක් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව අපේක්ෂකයාගේ National Identity Card Number එක සහ Index Number එක ඇතුළත් කළාම ඔහුගේ සියලුම සහතික පත්‍ර පරීක්ෂා කළ හැකි වෙනවා. ඒ නිසා මෙතෙක් කල් බඳවා ගැනීම සඳහා ගත වුණු මාස 18ක කාල පරිච්ඡේදය මාස 2කට අඩු කර ගන්න අපට පුළුවන් වෙනවා. ඒ අනුව මීට පසුව ඒ අය බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය ඉතාම වේගවත් වෙනවා.

කරාපිටිය රෝහලේ ඉදිකිරීම් ගැන කථා කළා. දැන් ඒ linear accelerator එකේ bunker එක හැදීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා පොළව යට විශේෂිත bunker එකක් හදන්න ඕනෑ. දැන් ඒ කටයුත්ත කරගෙන යනවා. ඒ වාගේම මහල් 8කින් යුතු වකුගඩු රෝගී සංකීර්ණය දැන් හදලා අවසානයි. ඒ වාගේම ළමා රෝහල් සංකීර්ණයේ සහ දන්ත රෝහල් සංකීර්ණයේ piling කර තිබෙනවා. තට්ටු 10කින් යුතු ශල්‍ය ඒකකය සඳහා බිම සකස් කර තිබෙනවා. Stroke Unit එකේ ඉදිකිරීම් දැන් සම්පූර්ණයෙන්ම නිම කර තිබෙනවා. ඖෂධයක වැරැද්දක් නිසා කරාපිටිය රෝහලේ දරුවන් මිය ගියාය කියාත් සඳහන් කළා. ඒ ප්‍රකාශය වැරැදියි. ඒ ඖෂධය නිසා නොවෙයි ඒ මරණ සිදු වුණේ. ඒ ඖෂධය ඉවත් කළාටත් පසුව තමයි ඒ දරුවන්ගේ මරණ සිදු වුණේ. ඒ මරණවලට ඖෂධවල කිසිම විධියක සම්බන්ධයක් නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා intensivistsලා පත් කිරීම ගැන කිව්වා. අපි මේ වන විටත් ජාතික රෝහලට intensivists ලා දෙදෙනෙකු බඳවාගෙන තිබෙනවා. ඒ වාගේම ළමා රෝග විශේෂඥයන් 15දෙනාගෙන් 3දෙනකු හැම්විටම intensivistsලා විධියට බඳවාගෙන පුහුණු කිරීමට පශ්චාත් වෛද්‍ය ආයතනය තීන්දු කර තිබෙනවා; අපි ඒ අනුව ක්‍රියා කරනවා. ඒ වාගේම CT simulators ගැනත් සඳහන් කළා. තෙලිප්පලේ, මඩකලපුව සහ නුවරට CT simulators යන්ත්‍ර තුනක් ලබාදීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය කරගෙන යනවා. තෙලිප්පලේ තිබෙන යන්ත්‍රය මහරගමට ගෙන යනවාය කියන කථාවේ කිසිම සත්‍යතාවක් නැහැ. ඒ වාගේම කිලිනොච්චියේ තිබෙන CT Scan machine එක ඉවත් කරනවාය කියන කාරණයේත් කිසිම සත්‍යතාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි stents නිකම් ලබාදීමේ වැඩ පිළිවෙළ ආරම්භ කළා. කොළඹ වෛද්‍ය පීඨයේ මහාචාර්ය ප්‍රියදර්ශනී ගලප්පත්ති මහත්මිය ඒ සම්බන්ධයෙන් medical audit එකක් කර තිබෙනවා. එම විගණනයට අනුව, අපි stents නිකම් දෙන්න ආරම්භ කිරීමට පෙර ලංකාවේ රජයේ රෝහල්වලට පැමිණි පිරිසෙන් සියයට 3ක් පමණයි stents දමාගෙන තිබෙන්නේ. අනෙක් සියයට 97ම මුදල් නැතිකම නිසා - stents එක ගන්න සල්ලි නැති නිසා- stents දමාගෙන නැහැ. එහෙම stents දමා නොගත් අයගේ ඉදිරි තත්ත්වය මොකක්ද කියා අපි දන්නවා; ඒ සියලුදෙනාම මරණයට පත් වෙනවා.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

මේක කල්ගියාම සමහර උදවියට thoracic surgeriesවලට යන්න වෙනවා.

අපි අක්ෂි කාව නිකම් දෙන්න කලින් අවුරුද්දකට ලක්ෂ 12ක් විතර අන්ධභාවයට පත් වුණා. ඒක තමයි ඇත්ත තත්ත්වය. අද ඒ සියලුම අය මේ නිදහස් සෞඛ්‍ය සේවය උඩ මේ වැඩ කටයුතු කර ගන්නවා. එතකොට තදබදය වැඩියි. කාල පරිච්ඡේදය වැඩියෙන් ගන්නවා. මොකද, මේ කටයුතු නිකම් කිරීම නිසා විශාල තදබදයක් ඇවිල්ලා තිබෙනවා.

අද දින මේ විවාදයට සහභාගී වුණු සියලුම දෙනාට ඉතාමත් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මේ කෙටුම්පතේ තිබෙන ප්‍රශ්න පිළිබඳව මා සමඟ දීර්ඝව කථා කළා. ඔවුන් සමඟත් සංවාදයක් ඇති වුණා. මම ඒ සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.*
*විනා විවාදයකින් තොරව, ඒ අනුව දෙවන වර කියවන ලදී.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' --[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]***
*තීරණය කරන ලදී.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon.(Dr.) Rajitha Senaratne.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*කුලුවිල් ආරාය්පට්ටදු.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
දෙවන වගන්තිය සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු අමාත්‍යතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු සභාපතිතුමනි, මට ඉදිරිපත් කිරීමට සංශෝධන තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමාගේ සංශෝධන මුලින් ඉදිරිපත් කරන්න.

## 2වන වගන්තිය. - (105 වන අධිකාරයේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.)
## வாசகம் 2.- (105ஆம் அத்தியாயத்தின் 12ஆம் பிரிவினைத் திருத்துதல்.)
CLAUSE 2.- (*Amendment of section 12 of Chapter 105.*)

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ඇඇ) 39අ වන වගන්තියේ (1) වන, (3) වන සහ (4) වන' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාගේ සංශෝධන ඉදිරිපත් කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"ඇඇඇ 39(අ)වන වගන්තියේ (2)වන උප වගන්තියේ සඳහන් විශේෂඥ දන්ත වෛද්‍යවරුන් විසින් තෝරා පත් කරගනු ලබන එක් සාමාජිකයෙක් යන තැනට පහත උපවගන්ති එකතු කළ යුතුය:-

'ඉඉ 56 වන වගන්තියේ සඳහන් ලියාපදිංචි ඖෂධවේදීන් විසින් තෝරා පත් කරගනු ලබන එක් උපාධිධාරී ඖෂධවේදී සාමාජිකයෙක්ද;

ඉඉඉ 60 ආ වැනි වගන්තියේ සඳහන් ලියාපදිංචි අතුරු වෛද්‍ය වෘත්තිකයන් අතරින් තෝරා පත් කරගනු ලබන එක් උපාධිධාරී අතුරු වෛද්‍ය වෘත්තිකයෙක්ද;

ඉඉඉඉ (60)(ඒ) වගන්තියේ සඳහන් ලියාපදිංචි පරිපූරක වෛද්‍ය වෘත්තිකයන් විසින් තෝරා පත් කරගනු ලබන උපාධිධාරී පරිපූරක වෛද්‍ය වෘත්තිකයෙක්;

ඊ සහ ඊඊ අමාත්‍යතුමා විසින් සාමාජිකයන් දෙදෙනෙකු නම් කරන අතර, එක් සාමාජිකයෙකු මාධ්‍යවේදියෙකු විය යුතු අතර, අනෙක් සාමාජිකයා මහ ජනතාව අතරින් තෝරා පත්කර ගත් අයෙකු විය යුතු ය."

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමනි, එම සංශෝධනය පිළිගන්නවාද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු ඇමතිතුමා එම සංශෝධනය භාරගන්නවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මේ ඉදිරිපත් කළ කරුණු පිළිබඳව නීන්දුවක් ලබා දී තිබෙනවා. මෙය කිසිම සම්බන්ධයක් නැහැ. මොකද, විශේෂඥවරු Specialist Registry එකේ නිසා ඒක වෙනත් අවස්ථාවක ගන්න කියායි සුප්‍රීම් උසාවිය නියෝගයක් ලබා දී තිබෙන්නේ. ඉදිරියේදී අපි සම්පූර්ණයෙන්ම ඒ සියල්ල ක්‍රියාත්මක කිරීමට අදහස් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ සංශෝධන ඉදිරිපත් කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(ඇඇ) 39 වන වගන්තියේ (1) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් විශේෂඥ වෛද්‍යවරුන් විසින් තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන් තිදෙනෙක්ද;

(ඇඇඇ) 39අ වන වගන්තියේ (2) උපවගන්තියේ සඳහන් විශේෂඥ දන්ත වෛද්‍යවරුන් විසින් තෝරා පත්කර ගනු ලබන එක් සාමාජිකයෙක්;

ඉඉ 56 වන වගන්තියේ සඳහන් ලියා පදිංචි ඖෂධවේදීන් විසින් තෝරා පත්කර ගනු ලබන එක් උපාධිධාරී ඖෂධවේදී සාමාජිකයෙක්;

ඉඉඉ 60 ආ වන වගන්තියේ සඳහන් ලියා පදිංචි අතුරු වෛද්‍ය වෘත්තිකයන් අතුරින් තෝරා පත්කර ගනු ලබන එක් උපාධිධාරී අතුරු වෛද්‍ය වෘත්තිකයෙකු;

ඉඉඉඉ 60 එ වන වගන්තියේ සඳහන් ලියා පදිංචි පරිපූරක වෛද්‍ය වෘත්තිකයන් විසින් තෝරා පත්කර ගනු ලබන උපාධිධාරී පරිපූරක වෛද්‍ය වෘත්තිකයෙකු;

ඊ සහ ඊඊ අමාත්‍යතුමා විසින් සාමාජිකයන් දෙදෙනෙකු නම් කරනු ලබන අතර, එක් සාමාජිකයෙකු මාධ්‍යවේදියෙකු විය යුතු අතර, අනෙක් සාමාජිකයා මහ ජනතාව අතරින් තෝරා පත්කර ගත් අයෙකු විය යුතුයි".

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳ තමයි සුප්‍රීම් උසාවියේ තීන්දුව දීලා තිබෙන්නේ, මේක Specialist Registry එක නිසා මේ ඉදිරිපත් කළ පැමිණිල්ල වෙනත් අවස්ථාවක ගන්න කියා. අපි ප්‍රධාන පනත් කෙටුම්පත ගෙනෙනකොට මේ සියල්ලම ඉදිරිපත් කරමු. ඒ වාගේම, අපි පනත් කෙටුම්පත උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරනවා. ඒ අවස්ථාවේදී කථා කරමු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, මේ සියල්ලම කියවාගෙන යන්න මට අවශ්‍යතාවක් නැහැ. අපි ඒ සියල්ල, "සංශෝධන ලෙස ඉදිරිපත් කරනවා"ය කියා ඉදිරිපත් කරන්නම්. ගරු ඇමතිතුමනි, ඒවා උපදේශක කාරක සභාවට ඉදිරිපත් කර ඊළඟ පියවරේදී ඒ ගැන සලකා බලමු. මේ කාරණය ඉක්මනින් ගෙනාවොත් හොඳයි. අදාළ නොවන පරිදි ඇතුළත් කරන්නය කියායි ඒ අයගේ ඉල්ලීම තිබෙන්නේ. මේ සිද්ධ වෙලා තිබෙන කාරණයත් සමඟ ඒ අය මෙතැනින් ඉවත් වෙයි කියා ඒ අයට බයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නමුත්, ඒ අය ඒ කරුණම සුප්‍රීම් උසාවියට ඉදිරිපත් කළා. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළා, එවැනි දෙයක් ඒ අයට සිදු වෙන්නේ නැහැ කියා. ඊට පසුව වෛද්‍යවරු මා සමඟ පැවසුවේ, ඒ ගොල්ලන්ට ඒක දුන්නේ නැති වුණාට තමන්ට ඒක වෙනවාය කියා. මම දන්නේත් නැහැ ඒ කාරණය. ඒ ගැන ප්‍රසිද්ධ නීතිඥවරුන්ගෙන් මම ඇහුවා, අපේ නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරුන්ගෙනුත් ඇහුවා. ඒ අය කිව්වා, "මේකේ තිබුණාට එහෙම වෙන්නේ නැහැ. තමන් "ඇඟවීම" විතරයි මේකේ වරදක් විධියට තිබෙන්නේ." කියා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි. එහෙම නම් යෝජනා කිරීමේදී අපි ඒක ඇතුළත් කර ගනිමු.

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ආ වාසකම් திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*3ආ වාසකම් சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3 ordered to stand part of the Bill.*

## 4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 39අ, 39ආ සහ 39ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.)

### வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தில் 39அ, 39ஆ மற்றும் 39இ என்னும் புதிய பிரிவுகளை உட்புகுத்துதல்.)

CLAUSE 4. - (*Insertion of new sections 39A, 39B and 39C in the principal enactment.*)

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

(1) "2 වන පිටුවේ, 1 වන පේළියේ සිට 4 වන පේළිය දක්වා පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ප්‍රධාන ප්‍රඥප්තියට 39ඇ, 39ආ, 'ප්‍රධාන ප්‍රඥප්තියට 39ඇ, 39ආ, 39ඇ සහ 39ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 39ඇ, 39ආ, 39ඇ සහ 39 ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය.' " ;

(2) "5 වන පිටුවේ, 7 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

"ලියාපදිංචි විශේෂඥ වෛද්‍යවරුන් හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරුන්ට අදාළ විශේෂඥයකු ලෙස වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති බව.

'39ඇ. 39ආ වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ විශේෂඥ වෛද්‍යවරුන්ට හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරුන්ට ශ්‍රී ලංකාව තුළ අදාළ විශේෂඥයකු ලෙස වෘත්තියේ යෙදීමටත්, ඒ වෘත්තියේ යෙදීමේ දී සපයනු ලබන ඖෂධ සහ ශල්‍ය උපාංගවල හෝ ලබාදෙන වෙනත් සේවාවල පිරිවැය ඇතුළත් වන සාධාරණ වෘත්තීමය ගාස්තුවක් ඉල්ලා සිටීමට සහ අයකර ගැනීමටත් හිමිකම තිබිය යුතු ය.'; "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டன.*
*Amendments put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු සභාපතිතුමනි, 4වන වගන්තියට පහත සඳහන් සංශෝධන මා ඉදිරිපත් කරනවා:

(1) "(අ) ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ යන ස්ථානයට පහත සඳහන් වාක්‍යය එකතු විය යුතු ය:

'ප්‍රධාන ප්‍රඥප්තියේ VIII,VIII (අ), VIII(අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි' "

(2) "(ආ) නිශ්චිතව දක්වන සුදුසුකම් ඇති යන ස්ථානයට පහත සඳහන් වාක්‍යය එකතු විය යුතු ය:

'ප්‍රධාන ප්‍රඥප්තියේ VIII,VIII (අ), VIII(අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි'

(3) " '39අ. (1) වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති පරිදි...' යන ස්ථානයට පහත සඳහන් වාක්‍ය එකතු කළ යුතු ය:

'ප්‍රධාන ප්‍රඥප්තියේ VIII,VIII (අ), VIII(අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි' "

(4) " '39අ. (2) වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති පරිදි...' යන ස්ථානයට පහත සඳහන් වාක්‍ය එකතු කළ යුතු ය:

'ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ VIII,VIII (අ), VIII(අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි'

(5) "39අ. (3) ස්ථානයටද එලෙසම, පහත සඳහන් කොටස එකතු කළ යුතු ය:

'ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ VIII,VIII (අ), VIII(අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි' "

(6) "39අ. (3)හි '... උපාධි ආයතනයේ යෝග්‍යතා මිනුම් දණ්ඩ සපුරාලන යම් තැනැත්තකුට ...' යන ස්ථානයට පහත සඳහන් කොටස එකතු විය යුතු ය:

'ප්‍රධාන ප්‍රඥප්තියේ VIII,VIII (අ), VIII(අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි'

(7) "39(ආ) උපවගන්තියේ (ඇ) හි '... ප්‍රතිතන සභතිකයක් ඉදිරිපත් කරන්නේ නම්, ...' යන ස්ථානයට පහත සඳහන් කොටස එකතු කළ යුතු ය:

'ප්‍රධාන ප්‍රඥප්තියේ VIII,VIII (අ), VIII(අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි'

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අමාත්‍යතුමා එම සංශෝධන පිළිගන්නවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නැහැ. මේ ගෙනෙන යෝජනාව වෛද්‍ය ආඥා පනතේ Section 13 ට විරුද්ධ වනවා. අනෙක් කාරණය, Board එක පිළිබඳව සම්පූර්ණයෙන්ම කරුණු ප්‍රධාන පනතේ ඉදිරිපත් කර තිබෙනවා. මේ කියන යෝජනාව ඒවාත් සමඟ ගැළපෙන්නේ නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ප්‍රධාන ප්‍රඥප්තියේ VIII,VIII (අ), VIII(අඅ) යන කොටස්වලට මේ ගෙන එන සංශෝධනවල බලපෑමක් හෝ අදාළ වීමක් නැහැයි කියනවා නම්, එය ප්‍රමාණවත්.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒක වෛද්‍ය ආඥා පනතේ Section 13ට අදාළ වන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ නේද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඉදිරිපත් කරනවා. මේ කාරණාම තමයි තියෙන්නේ. මමත්, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් ඉදිරිපත් කර තිබෙන කාරණා එකයි. මේ හැම එකකටම VIII,VIII (අ), VIII(අඅ) කොටස් බලපානවා කියලා තමයි ඒ අය කියන්නේ. අනික් ඒවා පැත්තකින් තියමු කෝ. නමුත්, මේ කාරණාව දිහා ඔබතුමා පොඩ්ඩක් බැලුවොත් හොඳයි කියලා තමයි මම යෝජනා කළේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
Those are inconsistent with Section 13 of the Medical Ordinance.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හරි, බොහොම ස්තුතියි.

***4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.*
*Clause 4, as amended, ordered to stand part of the Bill.*

## 5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම.)
## வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்தின் 74ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 5. - (*Amendment of section 74 of the principal enactment*.)

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මා ඉදිරිපත් කරනවා:

" 5 වන පිටුවේ, 24 වන පේළියේ සිට 28 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය යන්නෙන්, 2014 ඔක්තෝබර් මස 11 වන දින සහ අංක 1883/17 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය මඟින් අවසන් වරට සංශෝධනය කරන ලද සහ කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි වන, 1991 මැයි මස 17 වන දින සහ අංක 662/11 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය අදහස් වේ;' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*තිරුත්තම් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.*
*Amendment put, and agreed to.*

***5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*5ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.*
*Clause 5, as amended, ordered to stand part of the Bill.*

***6 සහ 7 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*6ආම්, 7ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.*
*Clauses 6 and 7 ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නව වගන්තිය ඉදිරිපත් කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු සභාපතිතුමනි, පහත සඳහන් පරිදි නව වගන්තිය ඇතුළත් විය යුතුය.

"වෛද්‍ය සභාවේ සියලුම සාමාජිකයන් - ඉ සහ ඊ යන කොටස් හැර ඉතිරි සියලුම සාමාජිකයන්- ප්‍රධාන ප්‍රඥප්තියේ 20, 41,56, 60B සහ 60G යන වගන්ති යටතේ ලියා පදිංචි සාමාජිකයන් විය යුතුය."

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා එම සංශෝධනය පිළිගන්නවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මම හිතන්නේ මෙම යෝජනාවත් මේ සංශෝධනවලට සම්බන්ධ වෙන්නේ නැහැ. මොකද, මෙම කරුණු සියල්ලම සුපිරීම් උසාවියට ඉදිරිපත් කළා, මෙම කරුණු වෙනමම ගන්න කියලා තමයි කිව්වේ. එම නිසා මෙම ඉදිරිපත් කිරීමට එකඟ වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා සංශෝධන ඉදිරිපත් කරන්නේ නැද්ද? අපට කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, අවශ්‍ය නැහැ. එම සංශෝධන ටික මම ඉදිරිපත් කරන්නම්, ඉදිරියේදී.

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*චට්ටමාකු වාසකමුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.*
*චට්ටමූලම් තිරුත්තංකළුටන් අර්පික්කෙ චෙය්‌යප්පට්ටදු.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මම යෝජනා කරනවා.

පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*විනා විටුක්කප්පට්ටු, ඒර්රුක්කොළ්ළප්පට්ටදු.*
*අතන්පඩි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්‍රාම්මුරෙයාක මතිප්පිටප්පට්ටු නිරෙවේර්‍රප්පට්ටදු.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත: නියෝග
## தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டம்: ஒழுங்குவிதிகள்
## NATIONAL MEDICINES REGULATORY AUTHORITY ACT: REGULATIONS

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු, 142(2) වගන්තියේ (ද) ඡේදය යටතේ 2017 අංක 2 දරන ඖෂධ ලියාපදිංචි කිරීම (ගාස්තු) නියෝග සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 05 දිනැති අංක 2052/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.04.03 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල්තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තැබීමේ යෝජනාව, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

## විදේශ අමාත්‍යාංශය රාජතාන්ත්‍රික සංචාර සංවිධානය කිරීමේදී මහජන මුදල් අවභාවිතය
## வெளிநாட்டு அலுவல்கள் அமைச்சு ஒழுங்கு செய்கின்ற இராஜதந்திர விஜயங்களில் அரச நிதி தவறாகக் கையாளப்படுதல்
## MISUSE OF PUBLIC FUNDS BY FOREIGN MINISTRY IN ORGANIZING DIPLOMATIC VISITS

[අ.භා. 5.29]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරනු ලබන යෝජනාව මෙයයි.

"විදේශ අමාත්‍යාංශය විසින් විවිධ රාජතාන්ත්‍රිකයන් සඳහා (විදේශ හා දේශීය) සංචාර හා උත්සව සංවිධානය කිරීමේදී,

1. නිසි හා පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම.

2. එම සංචාර හා උත්සවවල ප්‍රතිඵල පිළිබඳ නිසි ඇගයීමක් නැතිව විශාල වියදම් සිදු කිරීම.

3. මෙම සංචාර හා උත්සවවලදී රාජ්‍ය මුදල් අවභාවිතාවන් පිළිබඳ නිසියාකාර පරීක්ෂණ සිදු නොකිරීම.

ආදිය විසින් ජනතා මුදල් විශාල අවභාවිතාවන්වලට ලක්වීමත්, ඉදිරියේදී එසේ නොවීමට අවශ්‍ය විධිමත් පියවර ගැනීමත්, ක්‍රමවේද සැකසීමත්, මූල්‍ය අවභාවිතාවන් පිළිබඳ පරීක්ෂණ සිදුකිරීමත් කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම කරුණු ඉදිරිපත් කරන්නේ ජාතික වැදගත්කමකින් යුතු සහ ජාත්‍යන්තර වශයෙනුත් යම් අවධානයකට ලක්වී තිබෙන ප්‍රශ්න කිහිපයක් පිළිබඳව මේ රටේ ජනතාවගේත්, මේ සභාවේත්, විදේශ කටයුතු අමාත්‍යතුමාගේත් අවධානය යොමු කරන්නයි. මා මේ කියන කරුණු සම්බන්ධව ඉතා කුප්‍රකට, ඉතා කළු පැල්ලමක් ඇති කරපු සිදුවීම් පසුගිය අවුරුදු 7, 8 ඇතුළත අපේ රටේ සිදු වී තිබෙන බව ඔබතුමා දන්නවා. මේ රටේ විදේශ අමාත්‍යාංශය කියලා කියන්නේ මේ රට ආරක්ෂා කර ගැනීමට තිබෙන එක්තරා වළල්ලක් වාගේයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි නිකම්ම නිකම් ගොඩබිමක් නොවෙයි; ස්වෛරී රටක්. ඒ ස්වෛරී රටේ අනෙක් රාජ්‍යයන්ගෙන් එල්ල විය හැකි විවිධාකාර තර්ජනයන්ගෙන් අපව ආරක්ෂා කරගන්න කටයුතු කරන්නේ විදේශ අමාත්‍යාංශයයි. ඒ නිසා විදේශ සම්බන්ධතා අතිශය වැදගත්. අපි ඒවාට විශාල මුදලක් වියදම් කරනවා. එවැනි විශාල මුදලක් වියදම් කරද්දි ඒ වියදමට සරිලන වටිනාකමක් අපි ඒවායෙන් උපයා ගත යුතු වෙනවා, දේශපාලන වශයෙන්.

අනෙක් කරුණ තමයි විදේශ අමාත්‍යාංශය තුළින් සිදු විය හැකි වැරැද්දක ප්‍රතිඵලය බිල්ඩිමක පරණ යකඩ දැම්මා වාගේ වෙන්නේ නැහැ. නැත්නම්, බාල සිමෙන්ති දාලා ගොඩනැඟිල්ලක් හැදුවා වාගේ වෙන්නේ නැහැ. ඒවා රාජ තාන්ත්‍රික අවුල් නැත්නම් diplomatic blunders බවට පත් වෙනවා. ඒ නිසා මේක වැදගත් දෙයක්. ඒ නිසා විදේශ අමාත්‍යාංශයේ පෙනුම, හැසිරීම, පුද්ගලයන්ගේ හැසිරීම අතිශය වැදගත් වෙනවා. නමුත්, අපි කවුරුත් දන්නවා, විදේශ අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳ පොදු ජනතාව තුළ ලොකු අවබෝධයක් නැහැ කියලා.

මම කියන්නේ නැහැ, විදේශ ඇමතිවරු හැම කෙනාම එහෙමයි; ජනාධිපතිවරු, අගමැතිවරු හැම කෙනාම එහෙමයි; සියලුම තානාපතිවරු එහෙමයි කියලා. නමුත්, බිලියන ගණනක්, රුපියල් කෝටි දහස් ගණනක් විදේශ කටයුතුවලට මේ රටේ ජනතාවගේ බදු මුදල් වෙන් කරනවා. ඒවාට අදාළ කරන වගකීම්සම්පන්න ක්‍රමයකට මේ විදේශ කටයුතු අමාත්‍යාංශය පසුගිය අවුරුදු 7, 8 ඇතුළතදී -මේ අවුරුද්දත් ඇතුළුව- කටයුතු නොකිරීම පිළිබඳ ඉතාම නරක උදාහරණ කිහිපයක් මම ඉස්සෙල්ලාම මතක් කරගෙන යන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා හිටපු විදේශ කටයුතු අමාත්‍යවරයකු වන රෝහිත බෝගොල්ලාගම මහතාට එක්තරා අවස්ථාවකදී චෝදනාවක් ඉදිරිපත් වුණා එතුමාගේ දියණියගේ උපන් දින සාදය සඳහා ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ අතිවිශාල මුදලක් වැය කළා කියලා. ඒ කාලයේ පුවත් පත් වාර්තා කළා රුපියල් ලක්ෂ 25ක් කියලා. ඒ කියන්නේ, birthday cake එකේ වටිනාකම විතරක් රුපියල් ලක්ෂ 25යි කියලායි කිව්වේ. කෙසේ වුණත්, රුපියල් ලක්ෂයක් වුණත් වියදම් කළා නම් වැරදියි. ඇත්තටම රුපියල් ලක්ෂ 25ක කේක් එකක්

මොන වාගේද කියලා අපට බලා ගන්න පුළුවන් වුණා නම් හොඳයි කියලාත් හිතෙනවා. ලක්ෂ ගණන කෙසේ වෙතත් එහෙම වෝදනාවක් තිබුණා.

ඊළඟට, අද මේ රටේ ප්‍රධාන දේශපාලනඥයකුගේ සෙවණේ සැඟවී සිටින සජින් ද වාස් ගුණවර්ධන කියන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ කෑම බිල් පිළිබඳව පසුගිය කාලයේ අන්තර්ජාලයේ විවිධ කථා හුවමාරු වුණා. ඒ වාගේම ඒ පිළිබඳ පරීක්ෂණ සිද්ධ වුණු බව ඔබතුමා දන්නවා. එක කෑම වේලකට රුපියල් ලක්ෂ දෙකකට ආසන්න මුදලක් වියදම් කර තිබුණා. ඒවා ගෙවා තිබුණේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ මුදලින්.

ඊළඟට, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ බිරිඳ ශිරන්ති රාජපක්ෂ මහත්මිය ප්‍රංශයේ වෙසක් බලන්න ගිහිල්ලා නතර වුණු හෝටලයේ ගාස්තුව ගැන අපි කවුරුත් අසා තිබෙනවා. එක දිනක හෝටල් ගාස්තුව රුපියල් ලක්ෂ 25ක් වෙලා තිබෙනවා. එයට අදාළ නිශ්චිත ලිපිලේඛන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිද්ධ වුණාද කියා මම දන්නේ නැහැ. ඊළඟට, - මේක එතරම් හෙළිදරවු වෙලා නැහැ- වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පළමු බ්‍රිතාන්‍ය සංචාරයේදී එතුමාට පූර්ණ කාලීනව butler කෙනකු -ඒ කියන්නේ, helper කෙනකු නොවෙයි, butler කෙනකු. සිංහලෙන් ඒ සඳහා භාවිත කරන වචනය මම දන්නේ නැහැ- විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් බ්‍රිතාන්‍යයේදී අනුයුක්ත කළා. මගේ අවබෝධයේ හැටියට ඒ butler සඳහා දින 5ක වියදම වශයෙන් පවුම් 6,000කට වැඩි මුදලක් ගෙවිවා. මොකද, බිල්වල breakdown එක එන්නේ නැහැ. පරීක්ෂණයක් කළොත් ඒක ඔප්පු වේවි. කෙසේ හෝ ජනාධිපතිවරයාගේ butler සඳහා දවස් 5ට රුපියල් ලක්ෂ 12කට වැඩි මුදලක් ගෙවිවා.

ඊළඟට, මෑතකදී හෙළිදරවු වුණු කරුණ තමයි, බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ලංකාවේ සංචාරය සඳහා අවස්ථා දෙකකදී විදේශ කටයුතු අමාත්‍යාංශය අතිවිශාල මුදලක් වියදම් කිරීම පිළිබඳ සිද්ධිය. ඒකට ලංකාවෙන් නොවෙයි ඇත්තටම ප්‍රශ්නය ඇති වුණේ; බ්‍රිතාන්‍යයෙනුයි ප්‍රශ්නය ඇති වුණේ. ඉයන් පේස්ලි කියන මන්ත්‍රීවරයාට පාර්ලිමේන්තු සභාවාර 30ක් තහනම් කර තිබෙනවා, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව. ඔහු ලක්ෂ 130කට ආසන්න මුදලක් ශ්‍රී ලංකා රජයේ බදු මුදල්වලින් ලබා ගැනීම ගැන බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ආචාර ධර්ම පිළිබඳ කමිටුවට වාර්තා නොකිරීම නිසායි ඔහුට පාර්ලිමේන්තුවේ සභාවාර 30ක් තහනම් වුණේ. මා දන්නා හැටියට දැනට ඔහුට විරුද්ධව පෙත්සමක් අත්සන් කෙරෙනවා, අයර්ලන්තයේ ඔහුගේ ආසනය තුළ. ඒ පෙත්සම හරියාකාරව ක්‍රියාත්මක වුණොත්, ඒ කියන්නේ, ඒ පෙත්සමට සියයට 10කට වැඩි ප්‍රමාණයක් අත්සන් කරලා ඉල්ලීම කළොත්, -දැනට ස්ථාන ගණනාවක ඒ පෙත්සම අත්සන් කෙරෙනවා- ඔහුට මන්ත්‍රී ධුරය අහිමි වෙලා, අලුතින් මැතිවරණයකට ඉදිරිපත් වෙන්න වෙනවා.

කෙසේ වුවත් ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, අර කලින් - පැරණි- සිද්ධිවලින් සමහර ඒවාට පරීක්ෂණ සිද්ධ වෙලා තිබෙනවා. ජනාධිපතිවරයාට අදාළ සිද්ධිය තරමක් අලුත් එකක් වුණත් ඒකටත් අවුරුදු ගණනක් වෙනවා. ඒකත් ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් පරීක්ෂණයක් කළ යුතු එකක්. කෙසේ හෝ, ලංකාවේ බදු මුදල් ලක්ෂ 130ක් වියදම් කිරීම පිළිබඳ කාරණයට බ්‍රිතාන්‍ය රජය, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ඉයන් පේස්ලි මන්ත්‍රීවරයාගේ සභා වාර තහනම් කරලා තිබෙනවා. හැබැයි, ඒ සල්ලි ගෙවිවේ මේ දුප්පත්, පුංචි රටේ මිනිසුන්ගේ බදු සල්ලිවලිනුයි. එතකොට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව; ආණ්ඩුව ඒ වෙනුවෙන් මොකක්ද කරන්නේ කියන එක පිළිබඳවයි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නේ. BBC එක, "The Guardian" එක ඇතුළු ජාත්‍යන්තර මාධ්‍ය සියල්ල මෙය වාර්තා කළා. මම ඒ අනුව, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආංශික අධීක්ෂණ කාරක සභාවට මේ සම්බන්ධයෙන් පැමිණිලි කළා.

විදේශ අමාත්‍යාංශයේ නිලධාරී මහත්වරු සම්පූර්ණයෙන්ම නොවුණත් -තවත් කළ යුතු දේවල් තිබෙනවා- ඒ පිළිබඳව යම් ප්‍රමාණයකට සෑහීමකට පත් විය හැකි වාර්තා ප්‍රමාණයක් අප වෙත ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මම එතුමන්ලාට ස්තුතිවන්ත වනවා. ඒ වාර්තාත් පදනම් කරගෙන තමයි මා මේ රටේ ජනතාවට මේ කරුණ කියන්න යන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප වියදම් කරන්නේ බදු මුදල් බව ඔබතුමා දන්නවා. ගරු නීතිපතිවරයකුව සිටි අපේ විදේශ අමාත්‍යතුමා දන්නවා, බදු මුදල් වියදම් කරද්දී ලෝකයේ ප්‍රධාන මූලධර්මයක් විධියට value for money කියන එක පිළිගන්නා බව. අප මුදල් වියදම් කරනවා නම්, අප ඒවායෙන් මොන දේ කළත්, ඒ යොදවන මුදලට ගැළපෙන ප්‍රතිඵලයක් ලැබිය යුතුය කියන එක කුමන චක්‍රලේඛනයකින් හෝ නතර වන්නේ නැහැ. එයයි වැදගත්ම දෙය. විදේශ කටයුතු අමාත්‍යාංශය උත්සව සංවිධානයේදී, විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයන්ට ආරාධනා කරද්දී, දේශීය රාජ්‍ය තාන්ත්‍රිකයන් විදේශගත වෙද්දී value for money කියන එක justify වන ආකාරයේ ක්‍රියා පිළිවෙළක් විදේශ කටයුතු අමාත්‍යාංශය සතුව භාවිතාවේ නැහැ. Value for money කියන එක ප්‍රතිපත්තියක් පමණක් නොවෙයි, science එකක්. කුඩා නිලධාරීන් සම්බන්ධව නම් එය යම් මට්ටමකින් තිබෙනවා කියා අපි දන්නවා. නමුත් ප්‍රධාන පෙළට - VIP, VVIP මට්ටමට - ගියාට පසුව එවැන්නක් නොමැති බව තමයි පෙනෙන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දැනගන්න කැමැතියි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ බිරිඳට දවසකට ලක්ෂ 25ක කාමර කුලියක් සහිත හෝටලයක් book කරන්න විදේශ අමාත්‍යාංශයට තිබෙන මහ පෙන්වීම කුමක්ද කියා. රුපියල් ලක්ෂ 50ක එකක් වුණත් book කරන්න පුළුවන්ද, එවැනි ඒවා ප්‍රංශයේ තිබෙනවා නම්? මා ඒ ගැන දැනගන්න කැමැතියි. ලක්ෂ 100ක එකක් වුණත් book කරන්න පුළුවන්ද, ගරු අමාත්‍යතුමනි? මොකද, මට මතකයි, මා පුංචි කාලයේ එතුමිය මොන්ටිසෝරියක් කළා. ඒ මොන්ටිසෝරිය කරගෙන ගිය ගෙදර මට තවම මතක් වෙනවා. ඒ එතුමිය ජීවත් වූ පරිසරය ගත්තොත්, මා හිතන්නේ නැහැ, ඒ ගෙවල් රුපියල් ලක්ෂ 4ක්, 5ක් හෝ වටින ඒවාය කියා. එතුමියගේ ප්‍රශ්නය ගැනම නොවෙයි මා අහන්නේ. මා අහන්නේ, ඒ ආකාරයට වෙන් කිරීම් කරන්න මාර්ගෝපදේශනයක් තිබෙනවාද කියායි. දෙවන කාරණය මේකයි. මේවා තුළ අපේක්ෂා අතර ගැටුමක් - a conflict of interest - තිබෙනවා. සමහර විට විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරියකුට පුළුවන්කම තිබෙනවා, තමන්ගේ තනතුර ඉහළ දමා ගැනීම සඳහා ඊළඟ promotion එක ගන්නම තමන්ට සලකන්න හම්බ වෙන VIPට හෝ VVIPට වැඩිපුර සලකන්න. එහෙම වෙන්න පුළුවන්. ඒ වාගේ දේවල් පාලනය කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය අපි ඔබතුමාගෙන් අහනවා, ගරු අමාත්‍යතුමනි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපට පෙනෙනවා මුදල් මෙහෙයවීමේ බලය තිබෙන නිසා, තීන්දු ගැනීමේ බලය තිබෙන නිසා සමහර අය කරන දේවල්. කියමනක් තිබෙනවා නේ, "හැන්ද අතේ තිබෙන නිසා අපිම බෙදා ගන්නවා" -administrating ourselves- කියා. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සමහර දේවල් සම්බන්ධයෙන් එවැනි තත්ත්වයකුත් අපි දැක තිබෙනවා. විදේශීය සංචාර සම්බන්ධව, ආරාධනා සම්බන්ධව හරියාකාර මහ පෙන්වීමක් නැති නිසා රාජ්‍ය තාන්ත්‍රික අවුල් නිර්මාණය වෙලා තිබෙනවා. මගේ නිශ්චිත යෝජනාව සම්බන්ධයෙන් මා ඊළඟට මේ පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරනවා. මා ඇමතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ මේ බරපතළ ගැටලුව

[ගරු බිමල් රත්නායක මහතා]

විසඳන්න කියායි. රෝහිත බෝගොල්ලාගම මැතිතුමාගේ දියණියගේ උපන් දින සාදය පැවැත්වීම ගැන අපට ප්‍රශ්නයක් නැහැ. එතුමා ඒක හදේ පැවැත්වුවත් කමක් නැහැ. දැන් private spacecraft තිබෙනවා. ගිහින් ඒවායේ සාද පවත්වන්න පුළුවන්. නමුත් රාජ්‍ය බදු මුදල් යොදවා එතුමා කරපු ඒ කටයුත්තට වියදම් කරන්න වොෂිංටන්වල තිබුණු තානාපති කාර්යාලයට බලය ලැබුණේ කොහෙන්ද? ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. මා මතු කරන්නේ එයයි. පළමුවන කාරණය මේකයි. අදට ගැළපෙන, ලෝකයේ තිබෙන best practicesවලට ගැළපෙන නිසි චක්‍රලේඛයක්, guidelines මාලාවක් හදලා ඔබතුමා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියන ඉල්ලීම අපි ඉස්සර වෙලාම කරනවා, ගරු අමාත්‍යතුමනි. අපි කියන්නේ නැහැ, අපේ රාජ්‍ය තාන්ත්‍රිකයන් ගිහින් නිකම් කඩවල් ගානේ ඉන්න, එහෙම නැත්නම් පුංචි hotel එකක ඉන්න, යහළුවන්ගේ ගෙවල්වල ඉන්න කියා. අපි එහෙම කියන්නේ නැහැ. අපි කියන්නේ, value for money කියන ප්‍රතිපත්තියට අනුව, ජාත්‍යන්තරයේ පිළිගත් ක්‍රමවේදවලට අනුව ඔබතුමා සුදුසු චක්‍රලේඛනයක්, සුදුසු guidelines හදන්න කියායි. ඒවා කැඩුවාම ලැබෙන දඬුවම් ද එහි සඳහන් කරන්න.

දෙවන කාරණය මේකයි. මා නිශ්චිත වශයෙන් අද ඉදිරිපත් කරන්නා වූ කරුණ මීට කලිනුත් ඉදිරිපත් වෙලා යට ගිහින් තිබෙනවා. ශිරන්ති මැතිනියගේ කාරණය, රෝහිත බෝගොල්ලාගම මහතාගේ ගැටලුව වාගේ දේවල්, සජීන් ද වාස් මහතාගේ වියදම් ආදිය පිළිබඳව වහාම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ එහෙම නැත්නම්, අපරාධ පරීක්ෂණ කටයුතු සිදු කරන ආණ්ඩුවේ පිළිගත් ආයතනයකට -පොලීසිය හෝ එවැනි ආයතනයකට- හෝ භාර දීලා අවශ්‍ය කටයුතු කරන්න. ගරු අමාත්‍යතුමනි, නීතිපතිවරයකු හැටියට හිටපු ඔබතුමා පැහැදිලිවම දන්නවා, ඒවා ඉදිරිපත් කළ යුතු තැන ගැන. ඒ නිසා, අදාළ ආයතනයට යොමු කරලා මාසයක් හෝ දෙකක් ඇතුළත - අඩු ගණනේ මාස තුනක් ඇතුළත- මේ කාරණා පිළිබඳව වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියන ඉල්ලීම තමයි මම කරන්නේ. හොරුන්ට, දූෂිතයන්ට, බොරුකාරයන්ට මේ රටේ මහජන මුදල් ඇති පදම් ගසා කන්න ඉඩ දුන්නා ඇති. මේවා අහලා, අහලා අද මේ රට ලෙඩවෙලා - sick - තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේ ෆයිල් එක අධ්‍යයනය කළා. මේවා බලද්දී අපේ ඔළු නාස්ති වෙනවා.

අපි පෙරේදා දැක්කා මේ පුංචි රටේ පෙළපාළියක් තිබුණා. මොන තරම් අහිංසක දුප්පත් මිනිස්සුද ඒ පෙළපාළිවලට ගෙනෙන්නේ. මම මේ පෙළපාළි ගැන වෙන දෙයක් කියනවා නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ පෙළපාළි යන මනුස්සයාගෙයි, පෙළපාළි සංවිධානය කරන මනුස්සයාගෙයි ශරීර දැක්කාම, ඒ අය නිකම් ජන වර්ග දෙකක මිනිස්සු වාගෙයි පෙනෙන්නේ. පෙළපාළියේ ගිය නායකයෝ ටික වාත්තු කළ අය වාගේ ඉතාම ප්‍රියාමනාප අය. ඒත් බලන්න, ඒ වැටිලා හිටපු, පෙළපාළියේ කෑ ගසමින් නටපු දුප්පත් මිනිස්සු දිහා. එහෙම පෙළපාළි කරන්නේ පොහොට්ටු පක්ෂයෙන් විතරයි කියලා මම කියන්නේ නැහැ. ඒක එක්සත් ජාතික පක්ෂයෙන් කළත් වෙන පක්ෂයකින් කළත් එකයි. අපේ රටේ පහළ පන්තියේ ජනයාගේ සාමාන්‍ය ස්වරූපය කුමක්ද? දිනකට ලක්ෂ 25ක කාමරයක ඉන්නවා තියා ඔවුන්ට ගෙයක් හදා ගන්නම දෙන්නේ රුපියල් ලක්ෂ පහයි! "යා දෙන්නේ නැහැ" කියලා මිනිස්සු කියන කථාවක් තිබෙනවා නේ. මමත් මේවාට කියන්නේ, එහෙමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන් එන්නම් මාතෘකාවට. ඔබතුමා දන්නවා,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු තිලක් මාරපන මහතා (සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலக் மாரபன - அபிவிருத்திப் பணிப் பொறுப்புகள் அமைச்சரும் வெளிநாட்டலுவல்கள் அமைச் சரும்)
(The Hon. Tilak Marapana - Minister of Development Assignments and Minister of Foreign Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "විජේපාල හෙට්ටිආරච්චි මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிரா சனத்திலிருந்து அகலவே, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලින් කෙරුණු පරීක්ෂණවලට අමතරව අද මම මතු කරන මේ නිශ්චිත ප්‍රශ්නයට විදේශ කටයුතු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඒ තමයි, ඉයන් පේස්ලි කියන බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ ශ්‍රී ලංකා සංචාරය. ඒ විස්තර සාරාංශ කරලා කිව්වොත් ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, 2013 මාර්තු 30 සිට අප්‍රේල් 05 දක්වා කාලයේ ඉයන් පේස්ලි කියන බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා එතුමාගේ බිරිඳ, දරුවෝ හතර දෙනා සමඟ -හය දෙනෙක්- ලංකාවට එනවා, සංචාරයකට. ඔවුන්ගේ ගුවන් ගමන් සඳහා Business Class වෙන් කරන්නේ. ඒ ටිකට් එකක් සඳහා වියදම 585,000යි. ඒ ගුවන් ගමන් සඳහා අපි ලක්ෂ 35ක් වෙන් කරනවා. විදේශ කටයුතු අමාත්‍යාංශය ඒ සඳහා quotation එකක් අරගෙන තිබෙනවා. ඒ වෙලාවේ Economy Class ටිකට් එකක් 109,000යි. නමුත්, ටිකට් එකකට 585,000ක් වියදම් කරලා Business Class වෙන් කරලා තමයි ඒ පවුල ගෙන්වන්නේ. ආහාර සඳහා ලක්ෂ 10කුත්, හෝටල් බිල සඳහා ලක්ෂ 6කුත්, ලංකාව තුළ ගමනාගමනය වෙනුවෙන් හෙලිකොප්ටර් සඳහා ලක්ෂ 12කුත් ඇතුළුව මේ පවුල සඳහා දින පහකට ලක්ෂ 70ක් වියදම් කරනවා. 2013 මාර්තු 30 සිට අප්‍රේල් 05 දක්වා කාලය තුළ තමයි එතුමාගේ පළමුවැනි සංචාරය සිදු වෙන්නේ.

ඊට පස්සේ ගරු ඇමතිතුමනි, මේ ඉයන් පේස්ලි මහතා ඔහුගේ දරුවන් සමඟ දෙවැනි සංචාරයට එනවා. එවර එන්නේ දරුවන් දෙදෙනෙක් සහ බිරිඳ සහ එතුමා; හතර දෙනෙක්. ඒ එන්නේ 2013 ජූලි 01 සිට ජූලි 11 දක්වා දින 12ක සංචාරයකට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා ගුවන් ටිකට් පත් වෙනුවෙන් ලක්ෂ 18කුත්, හෝටල් කාමර සඳහා ලක්ෂ 13කුත්, ආහාර සඳහා 270,000කුත්, ලංකාව තුළ හෙලිකොප්ටර්වලින්

යෑම සඳහා 1,571,000කුත් ඇතුළුව ලක්ෂ 60ක් වෙන් කර තිබෙනවා. ඒ පිළිබඳ විදේශ අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලද මේ ලේඛනය මම හැන්සාඩ්ගත කරන්න බලාපොරොත්තු වනවා. එතුමාගේ පළමු සංචාරයේ වියදම ලක්ෂ 70යි; දෙවැනි සංචාරයේ වියදම ලක්ෂ 60යි. ලක්ෂ 130ක් රාජ්‍ය බදු මුදල් ඒ සඳහා වියදම් කරලා තිබෙනවා. ඒක තමයි මේ කථාවේ සාරාංශය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ සංචාරය ගැන තවත් කියන්නම්. එතුමා ගෙන්වා ගෙන තිබෙන්නේ ලංකාවේ ප්‍රතිරූපය වර්ධනය කිරීම සඳහායි. 2013 කාලයේ ලංකාවට ඇති වෙච්ච යම් යම් ජාත්‍යන්තර බලපෑම් අවම කිරීම සඳහා ඒ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා යොදා ගත්තා කියන එක තමයි ඒ කාලයේ ආණ්ඩුවේ හිටපු පාලකයන් ඉදිරිපත් කරපු සීමිත අදහස විධියට තිබෙන්නේ. එය ප්‍රබල විධියට පළ කරපු අදහසක් නොවෙයි. දැන් මම කියන්නම් එතුමාගේ පළමුවැනි සංචාරයෙන් එතුමා අපේ රටේ ප්‍රතිරූපය නංවන්න කරපු දේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයෙක් එවැනි අරමුණක් සඳහා අපේ රටට එනවා නම්, ඒ සඳහා අපේ රට වියදම් කරනවා නම්, ඒ එන රාජ්‍ය තාන්ත්‍රිකයා මේ රටේ සාමාන්‍ය පිළිවෙත අනුව, මුණ ගැසෙන, මුණ ගැසිය යුතු සහ යා යුතු යම්කිසි ආයතන ප්‍රමාණයක්, දේශපාලන අධිකාරියක් තිබෙන බව ඔබතුමා දන්නවා. මා පසුව ඒ කරුණු ඉදිරිපත් කරනවා.

එතුමා මාර්තු මාසයේ ආවා. එතුමා ඒ සංචාරයේදී ජනාධිපතිවරයා හම්බ වුණේ නැහැ; අගමැති හම්බ වුණේ නැහැ; විදේශ ඇමති හම්බ වුණේ නැහැ; විපක්ෂ නායක හම්බ වුණේ නැහැ; කථානායක හම්බ වුණේ නැහැ; බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් තියා, අඩු ගණනේ බ්‍රිතාන්‍යයෙන් පැමිණි සංචාරකයෙකුවත් හම්බ වුණේ නැහැ. එතුමා මොකක්ද, කළේ? එතුමා ඇතුළු පවුලේ අය හෙලිකොප්ටර් එකෙන් ගිහින් පාසිකුඩාවල nights තුනක්, හිලටන් එකේ night එකක්, මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමාගේ දිස්ත්‍රික්කයේ, ගාල්ලේ The Fortress Resort and Spa එකේ night එකක් ගත කරලා, අලි බලලා ආපසු බ්‍රිතාන්‍යයට යනවා. එතුමා අලි හම්බ වෙන්න පින්නවලට ගිහින් තිබෙනවා. ඒවාට ගිය වියදම කීයද? ලක්ෂ 70යි. එතුමා ආවේ ලංකාව ජාත්‍යන්තර වශයෙන් මුහුණ දී තිබෙන ප්‍රශ්නය ගැන දැන ගන්න නම්, අඩු ගණනේ එක්කෝ ආණ්ඩුවට පක්ෂ කෙනෙක් හෝ එහෙම නැත්නම් ආණ්ඩුවට විරුද්ධ කෙනෙක් හෝ හම්බ වෙන්න ඕනෑ. නමුත් එහෙම කිසිවක් නොකර එතුමා ආපසු යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඇතුළු පවුලේ අය ජූලි මාසයේ නැවත ලංකාවට එනවා. මොකටද එන්නේ? එන්නේ ලංකාවේ image buildingවලට; ලංකාව පිළිබඳව කථා කරන්න. මම පසුව ඒ විස්තර ඉදිරිපත් කරන්නම්. දෙවැනි සංචාරයේ තත්ත්වය මොකක්ද? එවකට මහින්ද රාජපක්ෂ මහත්මයා තමයි ජනාධිපති වශයෙන් සිටියේ. දෙවැනි සංචාරයේදීත් එතුමා ජනාධිපතිතුමා හම්බ වෙන්නේ නැහැ; අගමැතිවරයා හම්බ වෙන්නේ නැහැ; විදේශ ඇමති හම්බ වෙන්නේ නැහැ; විපක්ෂ නායක හම්බ වෙන්නේ නැහැ; කථානායක හම්බ වෙන්නේ නැහැ; බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්වරයා හම්බ වෙන්නේ නැහැ. ඒ කවුරුවත් හම්බ වෙලා නැහැ. හැබැයි, ඒ වතාවේත් එතුමා අලි හම්බ වෙන්න පින්නවල ගිහින් තිබෙනවා. හෙලිකොප්ටරයෙන් මේ තැන්වල සංචාරය කරලා තිබෙනවා. එම සංචාරයේදී, කන්ඩලමේ nights දෙකක්, Earl's Regency එකේ night එකක්, Heritance Ahungalla හෝටලයේ nights පහක් ගත කරලා ගියා. ඒ වියදම ලක්ෂ 60යි. එතකොට අපට පැහැදිලිව පෙනෙන්නේ එතුමා ලංකාව පිළිබඳව තොරතුරක් ලබා ගන්න ලංකාවට ආවාට, සාමාන්‍යයෙන් රාජ්‍ය තාන්ත්‍රිකයෙක් කරන වැදගත් කිසිම දෙයක් කරලා නැහැ කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විදේශ අමාත්‍යාංශයට සම්බන්ධ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මේ ගැන ප්‍රශ්න කළා. ප්‍රශ්න කරලා මම ඇසුවා, විදේශ අමාත්‍යාංශය විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයෙකුට ආරාධනා කරන ක්‍රමවේදය මොකක්ද කියලා. මට ඒ විස්තරය ඉදිරිපත් කරන්න වැඩි වේලාවක් ගන්න බැහැ. ඒ සම්බන්ධව එතුමන්ලා යම් විස්තරයක් එවා තිබෙනවා. ඒක හොඳම, comprehensive report එකක් කියලා මම කියන්නේ නැහැ. නමුත් කමිටුවක වාර්තාවක් ලෙස මා එය භාර ගන්නවා. මූලිකව එහි general outline එකක් තිබෙනවා; general model එකක් එතුමන්ලා ඉදිරිපත් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයෙක් ලංකාවට එන්නේ, එක්කෝ ජනාධිපතිවරයා ආරාධනා කිරීම නිසා, අගමැතිවරයා ආරාධනා කිරීම නිසා, විදේශ ඇමතිවරයා ආරාධනා කිරීම නිසා, නැත්නම් කැබිනට් ඇමතිවරයෙක් ආරාධනා කිරීම නිසා. එම ආරාධනාව ලැබුණාට පසුව මොකද වෙන්නේ? ඒ රටවල තිබෙන ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙන් සංචාරයට අදාළ කරන කටයුතු පටන් ගන්නවා. විදේශ අමාත්‍යාංශයේ "Desk" කියලා එකක් තිබෙනවා. එහි මුළු ලෝකයම එක එක අංශවලට බෙදලා තිබෙනවා. ඒ දේශපාලන අංශයෙන් මේ ක්‍රියාවලිය පටන් ගන්නවා. ඊට පස්සේ එන පුද්ගලයාගෙන්, ගෙන්වන කණ්ඩායමෙන්, ලංකාවේ දේශපාලන ප්‍රතිපත්තිය, විදේශ ප්‍රතිපත්තිය සමඟ මේ සංචාරයේ තිබෙන ප්‍රයෝජනය ගැන යම්කිසි නිරීක්ෂණයක් ඉදිරිපත් වෙනවා. ඊටත් පසුව අදාළ රටේ තිබෙන තානාපති කාර්යාලයෙන් ආරාධනාව යනවා. නැත්නම් විදේශ අමාත්‍යාංශයේ දේශපාලන අංශයෙන් ආරාධනාව යනවා. ඊටත් පස්සේ දේශපාලන අධිකාරියෙන් -විදේශ ඇමතිවරයාගෙන් - උපදෙස් ලැබුණාම තමයි ඔවුන් මේ රටට ඇවිල්ලා ඉන්නේ අහුන්ගල්ලේද, කන්ඩලමේද, අලි බලනවාද, තල්මසුන් බලනවාද, කවුද හම්බ වෙන්නේ කියලා තීන්දු කරලා programme එක හැදෙන්නේ. එතකොට, මේ දේශපාලන අධිකාරිය කියන්නේ ඇමතිවරයා. අමාත්‍යාංශයේ ලේකම්වරයා තමයි ඇමතිවරයාගේ උපදෙස් මත මේ සංචාරවලට අවශ්‍ය අවසරය ලබා දෙන්නේ. ඒකට යම්කිසි පිළිවෙළක් තිබෙනවා. යම්කිසි නිරීක්ෂණ ප්‍රමාණයක් සිදු කර, අඩුම ගණනේ අදාළ රටේ තානාපති කාර්යාලයෙන් විමසන්න ඕනෑ, මේ සංචාරයෙන් ප්‍රයෝජනයක් තිබෙනවාද කියලා.

ඉයන් පේස්ලිගේ ගමන ගත්තාම, ඒකට කියන්න පුළුවන් මොකක්ද? විදේශ අමාත්‍යාංශයේ තිබෙන general model එක අනුව නොවෙයි ඉයන් පේස්ලි ලංකාවට එන්නේ. මේ සංචාර සැලසුමට එක්කෝ "Ian Paisley model" කියන්න පුළුවන්. නැත්නම් "G.L. Peiris model" කියලා කියන්න පුළුවන්. මොකද, ඒ කාලයේ විදේශ ඇමති වුණේ එතුමා නිසා. එහෙමත් නැත්නම් "Rajapaksa model" කියන්නත් පුළුවන්. ඒ විධියේ කැමැති නමක් දමා ගන්න පුළුවන්. ඉයන් පේස්ලිට කළ ආරාධනා ගත්තාම, ඔහුගේ සංචාරයට අදාළ ලිපි ගොනුවේ එංගලන්තයේ තිබෙන ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයෙන් එවපු එකදු ලියුමක්වත් අපට -කාරක සභාවට- ඉදිරිපත් කරලා නැහැ. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පවුලක් ලංකාවට එනවා කියලා අපේ මහ කොමසාරිස් කාර්යාලයෙන් එවපු එක ලියුමක්, එක memo එකක් ඒ ලිපිගොනුවේ නැහැ. ඒ වාගේම, බටහිර ප්‍රදේශයේ කටයුතු සොයා බලන අමාත්‍යාංශයේ දේශපාලන අංශයට - Political Affairs (West) Division - අදාළ එකම ලියවිල්ලක්වත් ඒ ගොනුවේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට ඉයන් පේස්ලිට මේ ආරාධනාව කවුද කරලා තිබෙන්නේ? එතුමාට මේ වියදම කරලා තිබෙන්නේ කොහොමද?

ඔන්න, ඉයන් පේස්ලිට යවපු පළමුවැනි ලිපිය ලැබෙනවා. ඊළඟට, ඉයන් පේස්ලි පෙබරවාරි මාසයේ 1වැනිදා ලිපියක්

[ගරු බිමල් රත්නායක මහතා]

එවනවා. ඒවා ඔක්කෝම කියවන්න ගියොත් කාලය ගතවෙනවා. ඉයන් පේස්ලි එවපු email පණිවුඩය මගේ ළඟ තිබෙනවා. 2013 පෙබරවාරි 1වැනිදා ඔහු email එකක් එවනවා. කාටද එවන්නේ?

"Dear Sajin" කියලා අමතලා, "Many thanks for your hospitality on Wednesday evening. I had a wonderful time and my colleague Peter appreciated your hospitality…" කියලා කියනවා. එතුමාට කරපු ආරාධනාව බොහොම අගය කරනවා. එතුමා මෙහේ එන්න කැමැතියි කියලා එතැනදී කියනවා. "I wanted to follow up your kind offer of a visit for myself and my family given family commitments and school holidays would it be possible to visit between 13th March.." කියලා එහි සඳහන් වෙනවා. මේක තමයි initiation එක. 2013 පෙබරවාරි 1වැනිදා ඉයන් පේස්ලි එවපු email එක තමයි අපට තිබෙන එකම සාධකය, ඔහු සජින් කියන පුද්ගලයෙක් එක්ක කර තිබූ සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවට ආවේ කියන එක පෙන්වන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ පෙබරවාරි මාසයේ 16වැනිදා එතුමාට ලිපියක් යවනවා. එතකොට සජින් කියන නම වෙනස් වෙලා තිබෙනවා. සජින් වෙනුවට ඒ ලිපිය යවන්නේ මජින්ත කියලා කෙනෙක්. මජින්ත කියන අමාත්‍යාංශ නිලධාරියා තමයි මේ සම්බන්ධයෙන් වන ඊළඟ ලිපිය යවන්නේ. අමාත්‍යාංශ ලේකම්ගෙන් ලැබුණු උපදෙසක් හෝ ඒ කාලයේ හිටපු වෙනත් ඉහළ නිලධාරියෙකුගෙන් ලැබුණු කිසිම උපදෙසක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉයන් පේස්ලි ඊළඟ ලිපියත් එවනවා, මජින්ත කියන පුද්ගලයාට. මට මතක විධියට පෙබරවාරි මාසයේ 23වැනිදා. "මෙන්න මගේ passport සහ අනෙකු දේවල්" කියලා තමයි ඒ ලිපිය එවන්නේ. මේ වෙලාවේ ඒ වෙනුවෙන් ලොකු කාලයක් ගන්න අවශ්‍යතාවක් නැහැ. ඒ පිළිබඳ සාක්ෂි සටහන් තිබෙනවා.

දැන් මම විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අහන පළමුවැනි ප්‍රශ්නය මෙකයි. Sectoral Oversight Committee එකට දීලා තිබෙන විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයකුට ආරාධනා කිරීමේ දී කළ යුතු proceduresවලට අදාළව බැලුවොත්, ඉයන් පේස්ලිගේ සංචාරයට අදාළව තිබෙන්නේ මොනවාද? මොකුත් නැහැ. ගරු ඇමතිතුමනි, practices, procedures and guidelines කිසිවක් අනුගමනය කරලා නැහැ. එහෙම ලේඛන අපට හම්බවෙලා නැහැ. සජින් කවුද කියන එක අපි කවුරුත් දන්නවා. මජින්ත කියන්නේ කවුද කියලා සොයන්න ඕනෑ. ඔහු තානාපති නිලධාරියෙක් කියලා ආරංචියක් තිබෙනවා. එම නිසා සජින්ට මෙහෙම කරන්න බලය හම්බ වුණේ කොහෙන්ද? මජින්ත මහතාට මේ ආකාරයට කටයුතු කරන්න උපදෙස් දුන්නේ කවුද, ඒවා ලිඛිතව තිබෙනවාද කියන කරුණ බරපතළ ප්‍රශ්නයක් විධියට තිබෙනවා. ඒ නිසා අපට මතු වන පළමුවැනි ප්‍රශ්නය තමයි, තානාපති කාර්යාලයේ හෝ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආරාධනාවක් නැතුව ලක්ෂ 70ක් වියදම් කරලා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට මෙහි ඡොලි කරලා යන්න සල්ලි දුන්නේ ඇයි කියන එක. ඒ තමයි පළමුවැනි ප්‍රශ්නය. ඒ සඳහා සජින් ද වාස් ගුණවර්ධන Sectoral Oversight Committee එකට දීපු ලිපියේ තොරතුරු තිබෙනවා. අමාත්‍යාංශය පිළිගෙන තිබෙනවා, සජින් කියන්නේ සජින් වාස් ද ගුණවර්ධන මන්ත්‍රීවරයා විය යුතුයි කියලා.

ගරු අමාත්‍යතුමනි, සජින් ද වාස් ගුණවර්ධන මහතාට විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒ යුගයේ තිබුණු තනතුර මොකක්ද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. තනතුරු මොකක්ද, එම තනතුර සඳහා එතුමා පත් කරපු ලියවිල්ල මොකක්ද? අපි ඒක Sectoral Oversight Committee එකෙන් ඉල්ලුවා. නමුත්, ඒක අපට ලබා දීලා නැහැ. ඒක ඔබතුමාට සොයාගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. ඒක තමයි ඊළඟ කාරණය.

මම අහන තුන්වැනි ප්‍රශ්නය තමයි, මජින්ත කියන විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරියාට මේ ආකාරයට කටයුතු කරන්න උපදෙස් දුන්නේ කවුද කියන එක. එසේ උපදෙස් දුන් බවට විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගෙන් හෝ ඔහුට ඉහළ නිලධාරියෙකුගෙන් ලැබුණු කුමන හෝ ලේඛනයක්, කුමන හෝ සහතිකයක්, email එකක් හෝ SMS එකක් තිබෙනවාද? මේ ලේඛනයේ ඒ, කිසිවක් නැහැ. අපි මජින්ත කියන නිලධාරියාගෙන් මේ පිළිබඳව අහන්න කියලා කිව්වාම, ඔහු රට පටලවනවා. ඔහු කොළ එකහමාරක වාර්තාවක් එවලා තිබෙනවා. අපි ඒක භාර ගන්නේ නැහැ. අපි නිශ්චිත වශයෙන් විස්තර ඇහුවාම, විදේශ කටයුතු අමාත්‍යාංශයේ වර්තමාන ලේකම්තුමා මජින්ත කියන නිලධාරියාට ලිපියක් යවලා තිබෙනවා, "ඔබට මේ සඳහා උපදෙස් දුන් අය පැහැදිලි නැති නිසා, නිශ්චිත උපදෙස් දුන්නේ කවුද කියන එක ලියලා එවන්න" කියලා. එතකොට එතුමා, විදේශ කටයුතු අමාත්‍යාංශය කොහොමද රාජතාන්ත්‍රික නිලධාරීන්ට ආරාධනා කරන්නේ කියන එක පිළිබඳ පාඩම් මාලාවක් එවලා තිබෙනවා. එතුමා ඒ පාඩම කියවා ගන්නවා නම් හොඳයි. ඊට වඩා නිශ්චිත ප්‍රශ්නයක් තිබෙනවා. කවුද උපදෙස් දුන්නේ, මොකක්ද ආපු ලියවිල්ල, කොහොමද ඒක ලැබුණේ කියන එක කරුණාකරලා කියන්න. ඔහු එහි ඉටු කරපු කාර්ය භාරය අපට ඒ තරම්ම වැදගත් නැහැ. නමුත්, ඔහුත් යම් කිසි භූමිකාවක් කළ බව පැහැදිලියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම වෙලා ඊට පස්සේ මොකක්ද වෙන්නේ?

පෙබරවාරි මාසයේ පටන් ගන්න මේ ව්‍යාපෘතිය 2013 මාර්තු මාසයේ 21 වැනි දා ජී.එල්. පීරිස් මහතා ළඟට එනවා. ඔහු විදේශ කටයුතු ඇමතිවරයා. මෙතැන තිබෙනවා, ඔහුගේ අත්සන. ඔහු අනුමත කරනවා, ඉයන් පේස්ලිගේ සංචාරය. ඒක නිසා පහළ නිලධාරීන්ට බේරෙන්න පුළුවන් කියලා ඒ ගොල්ලන් හිතනවා වෙන්න පුළුවන්. එහෙම බේරුණත් මට විශේෂ ප්‍රශ්නයක් නැහැ. අපි අහන දේ තමයි, මේ පුද්ගලයාට ලක්ෂ 70ක් රටේ සල්ලි වියදම් කරන්න ඉඩ දෙන්න ජී.එල්. පීරිස් මහතා තීන්දු ගත්තේ කුමන ක්‍රියා පිළිවෙළ මත විශ්වාසය තබලාද කියලා. මොකක් දැන ගෙනද? මොනවා අධ්‍යයනය කරලාද? එතුමාගේ අත්සන මෙහි යොදලා තිබෙනවා. මේක කන අත්සනක් නොවේ නම්, වංචාවට හවුල් වීමක් නොවේ නම්, මේ වියදම සාධාරණයි කියලා කියන්න එතුමා අනුගමනය කරපු ක්‍රියාමාර්ගය මොකක්ද කියලා එතුමා කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම මේ ලේඛන සභාගත* කරනවා.

මම තවත් එකක් කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉයන් පේස්ලිට කොළඹ යන්න, ගාල්ලේ යන්න, පාසිකුඩා යන්න ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් හෙලිටුවර්ස් එකෙන් හෙලිකොප්ටර් එකක් දෙනවා. මා ළඟ තිබෙනවා, ඒකේ බිල කීයක්ද කියලා. ඇමෙරිකානු ඩොලර් 8,866ක්. මේ හෙලිකොප්ටරය දින හතරක් ඔහු සහ ඔහුගේ පවුලේ අයගේ පාවිච්චිය සඳහා තියාගෙන ඉන්නවා. ඒක නිසා අමතරව ඩොලර් දාහකුත් ගෙවලා තිබෙනවා. මොකටද? එහි සඳහන් කර තිබෙනවා, "Including the 1000 US$ for four day night stop charges." කියලා. ඇත්තටම ඉයන් පේස්ලි 1948ට කලින් ආවා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නම් අපි පුදුම වෙන්නේ නැහැ. මේ මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අපි බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකුගේ පවුලක් ගෙනැල්ලා, කන්න බොන්නත් දීලා, full-time හෙලිකොප්ටරයක් දෙනවා, දින හතරක් ඕනෑ එකක් කරලා යන්න කියලා. ඊට අදාළ ලේඛනයත් මා සභාගත කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට එතුමාගේ ජූලි සංචාරය. මම ඉතා ඉක්මනින් එතැනට එන්නම්. ඒකත් අර විධියමයි. එක නිසා මට ලේසියි, ගොඩක් කියන්න දෙයක් නැහැ. මහකොමසාරිස් කාර්යාලයේ ලිපියක් නැහැ. අමාත්‍යාංශයේ බටහිර දේශපාලන අංශයෙන් ඉල්ලීමක් මොනවාත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ ඊළඟ වෙනස තමයි ජූලි visit එකේ invitation එක. ඒක නියමයි. ඉයන් පේස්ලිට තේරෙනවා, මේ රටේ මහජන මුදල් ඕනෑ හැටියට ඔහුට පාවිච්චි කරන්න පුළුවන් කියලා. ඒක නිසා මේ සැරේ invitation එක ඔහුම එවනවා. මම එයත් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කරන්නම්. මේක අපූරු එකක්. ඇත්තටම මේ රටේ ජනතාව; මාධ්‍ය මේක බලන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔහුම එවනවා, සම්පූර්ණ programme එක. "මම අහුංගල්ල හෙරිටන්ස් එකේ අහවල් දවසේ ඉන්නම්, කන්ඩලමේ අහවල් දවසේ ඉන්නම්" කියලා. මේ යනාදී වශයෙන් දින 11ක programme එක ඔහුම එවනවා. දින 11කට ඔහු එනවා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම සංචාරය වෙනුවෙන් ඉයන් පේස්ලි ඉල්ලපු නැති ඒවාත් අපේ ඒ යුගයේ හිටපු Chief of Protocol ඔහු යටතේ හිටපු ඒ, නිලධාරිවරුන්ට යෝජනා කර තිබෙනවා. ඒ මොනවාද? ඔහු පහළ නිලධාරීන්ට මෙසේ සඳහන් කරමින් email එකක් යවනවා, "The programme is acceptable. Please, get Rt. Hon. Ian Paisley's concurrence. On the rooms - please, get upgrades for a suite." ඉයන් පේස්ලි suite එකක් ඉල්ලාත් නැහැ, මේ අය දෙනවා. මෙම ලේඛනයත් මා සභාගත* කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට එන විදේශ අමුත්තන්ට නිසි ක්‍රියාමාර්ග ඇතුළේ දේශපාලන - political - අවශ්‍යතාව, වුවමනාව, වටිනාකම - value for money - බලලා අපි සංග්‍රහ කරනවා. ඒ අදාළ වියදම්වලින් රටට වටිනාකමක් ලැබෙනවා නම්, අපි කිසිම ප්‍රශ්නයක් සලකන්නේ නැහැ. ඒක ප්‍රශ්නයක් නැහැ. රාජ්‍ය තාන්ත්‍රිකයන්ට බුහාරි එකෙන් කන්න දීලා, මරදාන motel එකක නිදා ගන්න දෙන්න බැහැ. අපි ඒක පිළිගන්නවා. හැබැයි, "අපි ශ්‍රී ලංකාවේ ජනතාවගේ මුදල් වියදම් කරනවා, ඒකෙන් අපට ප්‍රයෝජනයක් වෙනවා" කියන අවබෝධය මත තමයි මේ හැම දෙයක්ම කරන්න ඕනෑ. ඔහුට බෙන්ස් එකක් වෙන් කරන්න කියනවා. නමුත් Deputy Chief of Protocol කරන්නේ මොකක්ද? ඔහු ඊ මේල් එකක් යවනවා, "Please, arrange the following in addition to the "E" Class Benz for the above visit." කියලා.

"E" Class කියන්නේ, Executive Class. Executive Class Benz එකක් වෙන් කරන්න කියලා යවනවා. ඒ තරමටම උනන්දු වෙනවා. ලංකාවට ළඟදී ඇමෙරිකානු කොන්ග්‍රස් සභිකයෙක් ආවා. ඔහුට වෙන් කරලා තිබුණේ, නිසාන් වර්ගයේ වාහනයක්. නිසාන් වර්ගයේ සාමාන්‍ය මිනිස්සු පාවිච්චි කරන වාහනයක් නොවෙයි තමයි. හැබැයි, ඉයන් පේස්ලි ඉල්ලන්නේත් නැතුව, ඔහුට මෙහෙන් වෙන් කරනවා, "E" Class Benz එකක්.

"E" Class ද, "S" Class ද කියන එක ගැන මට ප්‍රශ්නයක් නැහැ. මම මතු කරන්නේ මේවා වුණේ කොහොමද කියන කාරණයයි. මම ඒ පිළිබඳව අවසානයේදී ඔබතුමාට කියනවා, ගරු ඇමතිතුමනි. මා ළඟ තිබෙන මේ ලේඛනය මම සභාගත* කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉයන් පේස්ලි ලංකාවට එනවා. ඇවිත්, දින 11ක් ඉඳලා එතුමා යනවා. මම මුලින් කිව්වා වාගේ, එතුමා කිසිම ආකාරයකින්, කිසිදු දේශපාලන නායකයෙක් හෝ ජනමාධ්‍යවත් හම්බවෙන්නේ නැතිව යන්න යනවා. එතුමා අහුන්ගල්ලේ සිටි දවස් පහේදී වජිර අබේවර්ධන ඇමතිතුමා එහෙම මුණ ගැහුණාද කියා මම දන්නේ නැහැ. මොකද, ගාල්ල පැත්තේ නිසා. ගරු වජිර අබේවර්ධන ඇමතිතුමනි, ඔබතුමාට එතුමා හම්බ වුණේ නැහැ නේ. [බාධා කිරීමක්] හොඳයි. මම හිතන විධියට රටේ සල්ලි හොඳට වියදම් කරලා එතුමා ගිහිල්ලා තිබෙනවා.

හැමදෙනාගේම අවබෝධය සඳහායි මම මේ කාරණය කියන්නේ. මේ පිළිබඳව අපි විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ප්‍රශ්න කළ වෙලාවේ, සාමාන්‍යයෙන් සංචාරයක් සැලසුම් කරනකොට එය සකස් කරන ආකාරය ගැන අපි ඇහුවා. අපි දන්නවා, රාජ්‍ය තාන්ත්‍රික අමුත්තන්ගේ විවිධ අවශ්‍යතා තිබෙන බව; වෙනස්කම් තිබෙන බව. ඒ එක එක්කෙනාගේ අවශ්‍යතා ගැනත් අපි හිතන්න ඕනෑ. මොකද, ඔවුන් දේශපාලන වැඩ කටයුතු විතරක් කරලා යන්න එන්නේ නැහැ. රටේ සංචාරය කරන්නත් එක්ක තමයි ඒ ගොල්ලන් එන්නේ. ඒක අපි පිළිගන්නවා; අපි දන්නවා. ඒක අමුත්තක් නොවෙයි. ඔවුන් දේශපාලන කටයුතුවලට ඇවිල්ලා, සීගිරිය නරඹන්න යන්න පුළුවන්; පින්නවල යන්න පුළුවන්. ඒ කාරණා අපට තේරෙනවා. මම දැක්කා, US Congressman ඉල්ලා තිබෙනවා, ඔහුට ඉරිදාට worship කරන්න ඕනෑය කියා. මොකද, ඔහු Catholic කෙනෙක්. අපට ඒ කාරණා තේරෙනවා. අපි ඒවා සම්පාදනය කරන්න ඕනෑ. හැබැයි, සාමාන්‍ය සංචාර ගැන අපට තිබෙන අත්දැකීම මොකක්ද? මම ඒ ගැන දැන් කියන්නම්.

මෑතකදී රනිල් ජයවර්ධන ලංකාවට ආවා. ඔහු ලංකාවේ ඉපදුණු කෙනෙක්. දැන් ඔහු බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක්. ඔහු ඇතුළුව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමක් ලංකාවට ආවා. ඒ පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන මා ළඟ තිබෙනවා. ඒ සංචාරය පටන් අරගෙන තිබෙන්නේ කොහොමද? ඒවා පටන්ගෙන තිබෙන්නේ හොර e-mailවලින් නොවෙයි; "ජින් බෑන්" කල්ලියෙන් නොවෙයි; සජින් - මජින්ලාගෙන් නොවෙයි. ඉස්සර, "ජින් බෑන්" කල්ලිය කියා එකක් තිබුණා නේ. මේ ඉයන් පේස්ලිගේ සියලුම කටයුතු කරලා තිබෙන්නේ "ජින් බෑන්"කල්ලියෙන්. සජින්ලා - මජින්ලා තමයි ඒකේ ඉන්නේ. හැබැයි, ළඟදී ආවා, UK delegation එකක්. ඒක initiate වෙන්නේම, බ්‍රිතාන්‍යයේ තිබෙන ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයෙන්. ඒක පිළිවෙළට වෙනවා. ඒකේ High Commissioner කියනවා, "මේ ගොල්ලන් එන එක රටට වැදගත්; මෙන්න මේ මේ අයයි එන්නේ" කියා. ඊට පස්සේ විදේශ අමාත්‍යාංශයෙන් ඒක යම් ආකාරයකට analyze කරනවා. Analyze කරලා සතියකින් දෙකකින් නොවෙයි, මාසයකට පස්සේ තව වාර්තා යවලා, තවත් මාස කිහිපයකට පස්සේ තමයි ඔවුන් එන්නේ. ඔවුන් වෙනුවෙනුත් ලක්ෂ 76ක් වියදම් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, හැබැයි, ඉයන් පේස්ලිගේ පළමුවෙනි

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

visit එක ගැන ඔබතුමා බලන්න. ජී.එල්. පීරිස් මහත්මයා මාසයකට වඩා අඩු කාලයකදී අත්සන් කරනවා; අනුමත කරනවා. ඉයන් පේස්ලිගේ ජූලි visit එක බලන්න. දින 12යි. ජී.එල්. පීරිස් මහත්මයා විදේශ කටයුතු ඇමතිවරයා වශයෙන් එය අනුමත කරන ලිපිය මම සභාගත* කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දින 12කදී ජී.එල්. පීරිස් මහත්මයා දෙවන visit එකට ලක්ෂ 60ක් අනුමත කරනවා, ව්‍යාපෘතියත් එක්ක. අපි පැහැදිලිවම දකින දේ තමයි, එක්කෝ විදේශ කටයුතු අමාත්‍යාංශය තුළ නීති රීති තිබුණේ නැහැ; චක්‍රලේඛයක් නැහැ; guideline එකක් නැහැ කියන එක. එහෙම නැත්නම්, guideline එකක් තිබෙනවා, ඒක නොසලකා වැඩ කරන්න නිලධාරීන්ට බලයක් දීලා තිබෙනවා. ඒ නිසා දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? ලක්ෂ 130ක් වියදම් කර තිබෙනවා; නාස්ති කර තිබෙනවා. ඒකෙන් රටට අත් වුණු ප්‍රතිඵලය මොකක්ද?

මෙන්න මේ කාරණයත් ප්‍රකාශ කරලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ පිළිබඳව ප්‍රශ්න කරද්දී කෙනෙක් කියන්න පුළුවන්, කොටි සංවිධානයට විරුද්ධව මේ මන්ත්‍රීතුමා වැඩක් කළාය කියා. නමුත් කිසිම දෙයක් කර නැහැ. මම හිතන විධියට මේ සල්ලි දුන්නාට පස්සේ එතුමා ඒ කාලයේ බ්‍රිතාන්‍යයේ අගමැතිට ලිපියක් ලියා තිබෙනවා. එහෙම නම් අපට කියන්න වන්නේ, එතුමාගේ ලිපියේ වටිනාකම ලක්ෂ 130ක් බවයි. මේ සංචාරයට වියදම් කිරීම ගැන අපට එක එක හේතු පෙන්වනවා. නමුත් ඇත්ත කුමක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉයන් පේස්ලි කියන බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සහ ඔහුගේ පවුල මාස තුනක් ඇතුළත දෙවතාවක් ගෙන්වලා, රටේ මුදලින් ලක්ෂ 130ක් හෝ ඊට වැඩි මුදලක් නාස්ති කළේ කුමක් වෙනුවෙන්ද කියා මම දැන් ඔබතුමාට හෙළිදරව් කරන්නම්. මේ ලංකාවේ image building process එකටද? නැහැ. එතුමා 2013 පෙබරවාරි මාසයේ පළමුවැනි දා Dear Sajinට එවන e-mail එකේ මාතෘකා දෙකක් යොදා තිබෙනවා. පළමුවන මාතෘකාව වන්නේ - Visit, දෙවන මාතෘකාව වන්නේ - Oil. එම e-mail එකත් මම **සභාගත*** කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම e-mail එකේ සඳහන් වන පණිවුඩය මම දැන් කියවන්නම්. ඒ සඳහා විනාඩියක් ගත වෙයි. ඒ සඳහා මට අවස්ථාව දෙන්න.

එහි මෙසේ සඳහන් වනවා:

"At dinner we discussed a potential oil purchase. I have two significant arrangements with national oil suppliers in either Oman or Nigeria. I understand from our conversation you require a regular supply and are currently changing your filters on the refinery to take other than Iran oil. If you can let me know quantity and quality specifications of oil requirements, I can certainly make this happen very quickly. Peter and I have a meeting in Africa in a week or so with the individual we discussed and we could progress this immediately. Let me know your requirements,..."

විදේශ කටයුතු ඇමතිතුමනි, මෙන්න මේක අහන්න. ඔහු කියනවා, "...as you know this is the most lucrative project you could be involved in and government to government ....." කවුද මෙහි අත්සන් කර තිබෙන්නේ? ඉයන් පේස්ලි. දැන් මේ මොකක්ද කියන්නේ? "Lucrative business" කියන්නේ, අධික ලාභ ලැබිය හැකි ව්‍යාපාරයි. සජින් වාස් මොකක්ද කරලා තිබෙන්නේ?

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
කාටද ලියා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, "Dear Sajin" කියා තමයි ලියා තිබෙන්නේ. විදේශ කටයුතු අමාත්‍යාංශයට අදාළ Sectoral Oversight Committee එක කියනවා, "මේ සජින් ද වාස් ගුණවර්ධන හිටපු මන්ත්‍රීවරයා විය යුතුයි" කියා. එතකොට මේ oil business එකට දෙන්න යන්නේ මොකක්ද? Lucrative project, ඒ කියන්නේ වැඩි ලාභ ගන්න පුළුවන් ව්‍යාපෘතියක් තමයි මේකේ මූලික කථාව. "මම ලංකාවේ image buildingsවලට එනවා" කියා ඉයන් පේස්ලි කොතැනකදීවත් කියා නැහැ. ඒ, පෙබරවාරි මස පළමුවැනි දායි. මේක "ජින් බෑන්" කල්ලියක්ය කියා මම කිව්වා. දැන් මේක සජින්ගෙන් මජින්ට මාරු වෙනවා. ඊට පස්සේ මජින් 2013 පෙබරවාරි මස 16වැනි දා ඉයන් පේස්ලිට ඊ-මේල් එකක් යවනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"Dear Ian,

The dates are fine and we can go ahead with those dates.

As for Nigeria please kindly propose 2 sets of dates in order to coordinate the travel accordingly."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අහන්නේ මේකයි. මජින් කියන්නේ නිලධාරියෙක් නම්, ලංකාවට තෙල් ගෙනෙන business එකක් කරන බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකුට නයිජීරියාවේ රවුම් ගහන්න මෙහෙන් ටිකට් සහ අනෙකුත් වියදම් දෙන්න කියා ඔහුට උපදෙස් දීලා තිබෙන්නේ කවුද? අද නොවෙයි, ඒවායේ තොරතුරු අපි පසුව කථා කරමු. Nigerian Oil Business එක පිළිබඳව අපි වෙනම කථා කරමු. කෙසේ වෙතත්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරියෙක් ලියනවා, "නයිජීරියාවේ oil වැඩෙට ඔයාගේ දින එවන්න" කියා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේකයි. මේ අදාළ නිලධාරියා ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ඉන්නවා නම්, ලංකාවට තෙල් අදින business එක කරන්න විදේශ කටයුතු අමාත්‍යාංශයට භාර දුන්නේ කවදාද කියා ඔහුගෙන් අහන්න ඕනෑ; ඔහුට මේ ඊ-මේල් එක ලියන්න උපදෙස් ලැබුණේ කොහෙන්ද කියලා අහන්න ඕනෑ. අඩුම ගණනේ මේක insist කළේ ඉයන් පේස්ලි නම් කමක් නැහැ.

අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් කියනවා, "නයිජීරියාවට යන්න ඔයාගේ දින ඉක්මනට එවන්න" කියා. ඊට පස්සේ ඉයන් පේස්ලි 2013 පෙබරවාරි 23වන දා තමන්ගේ 3වැනි ඊ-මේල් එකෙන් දන්වා එවනවා, "Oil - I will forward some dates to you at the beginning of the week to coordinate travel plans to Africa" කියා. අප ඒ සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීම අවශ්‍යයි. සමහර තොරතුරු අප ළඟ තිබෙනවා. මේ කොටස පිළිබඳව බ්‍රිතාන්‍යයත් උනන්දුයි. ඒ කියන්නේ, සජින් ද වාස් ගුණවර්ධන හිටපු මන්ත්‍රීවරයා ඉයන් පේස්ලි මන්ත්‍රීවරයාත්,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

විදේශ අමාත්‍යාංශයේ "ජින් බෑන්" කල්ලියේ කට්ටියත් එකතු කරගෙන, ලංකාවේ අරමුදල් යොදාගෙන, සජින් වාස්ගේ business එකකට බැස්සාය කියන එක පැහැදිලියි. මේකේ අතරමැදියා වශයෙන් කටයුතු කරන ඉයන් පේස්ලිට හොඳට කන්න බොන්න දීලා, රටේ සල්ලිවලින් සැප දීලා, ඔහු negotiator විධියට නයිජීරියාවට යවනවා. ඔය කියන විධියට සමහර විට ඉයන් පේස්ලිට Nigerian oil companies එක්ක සම්බන්ධතා තිබෙන්න පුළුවන්. නයිජීරියාව කියන්නේ, one of the most corrupt countries බව ඔබතුමා දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නයිජීරියාව කියන්නේ දළ ජාතික නිෂ්පාදිතය භාගයකින් අඩු වුණු රටක්; තෙල් සොයා ගත්තාට පස්සේ, ඒ රටේ දළ ජාතික නිෂ්පාදිතය තිබුණාට වඩා භාගයකින් පහළ බැස්සා. ලෝකයේ වැඩිම දුප්පතුන් සංඛ්‍යාව; අන්ත දුප්පතුන් සංඛ්‍යාව ඊයේ-පෙරේදා වෙනතුරු වාර්තා වී තිබුණේ ඉන්දියාවෙන්. දැන් ඒ තත්ත්වය තිබෙන්නේ නයිජීරියාවේ. ලෝකයේ තෙල් තිබෙන ලොකුම රටක් අන්ත දුෂිතයි; එය දුෂිතභාවයේ පතුළෙනුත් පතුළේ ඉන්න රටක්. ඒ රටත් එක්ක තමයි ඉයන් පේස්ලිලා ගනුදෙනු කරන්නේ. සජින් වාස් මහත්මයාගේ නමයි, නයිජීරියාවයි එකට එනකොට ඒක දුෂිතභාවයේ black hole එකක් කියලා අපට තේරුම් ගන්න පුළුවන්.

ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, මේ කරුණු සියල්ලම සැලකිල්ලට අරගෙන අපි ඔබතුමාගෙන් අහන පළමුවැනි කරුණ මෙයයි. සජින් වාස් මහතාට විදේශ අමාත්‍යාංශයේ තිබුණු තනතුර කුමක්ද? ඔහු පත් කරපු ලිපිය හෝ ඔහුට තිබුණු බලය කුමක්ද? මේ ඉයන් පේස්ලි සිද්ධියේදී මේ ආකාරයෙන් කටයුතු කරන්න විදේශ අමාත්‍යාංශයේ "ජින් බෑන්" කල්ලියට හෝ වෙනත් අයට උපදෙස් ලැබුණේ කෙසේද? විදේශ කටයුතු අමාත්‍යාංශය තුළ සිටින පහළ තනතුරු දරන අවංක නිලධාරීන්ට කිසිම ආකාරයක හිංසනයක් සිදුකිරීමේ බලාපොරොත්තුවෙන් නොවෙයි මා මේ කාරණය කියන්නේ. මම ඉතාම වගකීමෙන් යුතුව එය ප්‍රකාශ කරනවා.

දේශපාලන අධිකාරිත්වයට භයවෙලා කරපු දේවල් තිබෙන්නට පුළුවන්. එහෙම නම් ඔවුන් ඒ ගැන කට උත්තර ලබා දිය යුතුයි. මම හිතන විධියට ඒක සජින් ද වාස්ගෙනුත් දැනගන්නට පුළුවන්. සජින් ද වාස්ගෙනුත් දැන ගන්නට පුළුවන්, මොකද සජින් ද වාස් කළෙත් ඒකයි. සජින් ද වාස් තමන් හිරේ ගියාට පසුව රාජපක්ෂලා ගැන සියලුම තොරතුරු ටික දුන්නා. ඒක තමයි වුණේ. ඒ නිසා මේ ඉන්න "ජින් බෑන්" කල්ලියේ උදවියටත් පුළුවන් තමන්ට වුණු ඇත්ත බලපෑම කියන්නට. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින දේ තමයි, ඔබතුමා best practices අනුව වහාම නිවැරදි චක්‍රලේඛ සහ guidelines මාලාවක් හදන්න කියන එක විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයන්ට ලංකාවේ ආගන්තුක සත්කාරය නිසි ආකාරයට ලබා දීලා, -අපේ රටේ ගරුත්වයත්, ඔවුන්ගේ ගරුත්වයත් ආරක්ෂා වෙන විධියට- value for money කියන එක ආරක්ෂා වන විධියට. ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මාස තුනක් ඇතුළත ඒක මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න කියා.

ඊළඟ කාරණය තමයි, ඉයන් පේස්ලිගේ සිද්ධිය සම්බන්ධයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශ මට්ටමේ පරීක්ෂණයකින් එහාට ගිහිල්ලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ සුදුසු පරීක්ෂණ ආයතනයක් ලවිවා මාස තුනක් ඇතුළත පරීක්ෂණයක් සිදු කර, -අමුතුවෙන් සොයන්නට දෙයක් නැති තරම් ඔක්කොම දේවල් මේකේ තිබෙනවා.- අදාළ පුද්ගලයන් කැඳවලා දඬුවම් දෙන්න කියන ඉල්ලීම. අද සජින් ද වාස් රටේ රාජ්‍ය නායකයන්ගේ, දේශපාලන තුරුල්ලේ සිටිනවා කියන එක තමයි අපි දන්නේ. එතැන සිටිනවා වෙන්නත් පුළුවන්, නැති වෙන්නත් පුළුවන්. නමුත්, ඔප්පු කර තිබෙනවා ඔහුගේ තෙල් ව්‍යාපාරයක් වෙනුවෙන් විදේශ අමාත්‍යාංශයේ කිසිදු අවසරයකින් තොරව, සාමාන්‍ය practices ඔක්කොම කඩලා ලක්ෂ 130ක මුදලක් නාස්ති කළා කියා. එම නිසා මීට අදාළ කරන සජින් ද වාස් ඇතුළු පුද්ගලයන් සම්බන්ධව වහාම පරීක්ෂණයක් කරන්න. විශේෂයෙන් අදාළ පුද්ගලයා සජින් ද වාස් නොවෙයි නම් මේ සමස්තයේ වගකීම කා සතුවද තිබෙන්නේ? සජින් ද වාස්ට පත්වීම් ලිපියක් නැතිනම්, සජින් ද වාස්ට නිල වශයෙන් නිශ්චිත වගකීමක් නොතිබුණා නම් මේ සමස්ත දූෂණයේ වගකීම ජී.එල්. පීරිස් මහතා අතටයි එන්නේ. ඔහු තමයි විදේශ ඇමතිවරයා, ඔහුට තමයි රටේ ජනතාව බලය දීලා තිබුණේ. ඔහු ඔහුගේ අමාත්‍යාංශය මේ වාගේ දූෂිත ලෙස පාවිච්චි කරන්නට දැනුවත්ව ඉඩ දුන්නා නම්, -ඔහු තමයි මෙවාට අත්සන් කර තිබෙන්නේ.- පැහැදිලිවම ඔහුත් මෙහි වග උත්තරකරුවෙක්.

කරුණාකර මේ සඳහා මැදිහත්වෙලා ක්‍රියා කරන්න කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. හරියාකාරව මෙවාට ඇහුම් කන් දීලා, ඔබතුමාගේ නීති දැනුමත්, විදේශ දැනුමත් පාවිච්චි කර ඔබතුමා මෙවැනි කාරණයක් ඉටු කරන්න පුළුවන් පුද්ගලයෙක් කියා ඔප්පු කරන්නත් මේක අවස්ථාවක් වෙනවා ගරු ඇමතිතුමනි. ඒ කාරණා සිහිපත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා, බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.13]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජපක්ෂ පාලන සමයේ ඔහුත්, ඔහුගේ ළඟම ඥාතීනුත්, ගෝල බාලයනුත් එකතුවෙලා මහජන මුදල් අව භාවිත කරමින් කළ මහා අපරාධවලින් අංශුවක් පමණක් හෙළිදරවු කරමින් ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් වැදගත් වූ මෙම යෝජනාව මම දැඩි වගකීමකින් යුතුව ස්ථිර කරනවා.

[අ.භා. 6.14]

**ගරු තිලක් මාරපන මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலக் மாரபன - (வெளிநாட்டலுவல்கள் அமைச்சர்) )
(The Hon. Tilak Marapana - Minister of Foreign Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ප්‍රථමයෙන්ම ඉතාමත්ම ස්තුතිවන්ත වනවා මේ කල් තැබීමේ යෝජනාව මඟින් මා සහ රටේ ජනතාව මේ සිද්ධීන් පිළිබඳව දැනුවත් කිරීමට ගත් වෙහෙස සම්බන්ධයෙන්. ගරු මන්ත්‍රීතුමා කියපු කරුණු මම ඉතාමත්ම ඕනෑකමින් ඇහුම් කන් දුන්නා. ප්‍රධාන කාරණයට එන්නට කලින් මම මෙන්න මේ කාරණා ගැන සුළු වශයෙන් ඔබතුමා දැනුවත් කරන්නට කැමැතියි.

විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා සිදු වන විදේශ සංචාර සහ විදේශවල පවත්වන උත්සවවලට සල්ලි යොදවන්නේ කොහොමද, ඒ සඳහා කාගේ අනුමැතියද ලැබෙන්නේ සහ ඒ

[ගරු තිලක් මාරපන මහතා]

සම්බන්ධව පවතින guidelines මොනවාද කියන කාරණා ගැන මම සඳහන් කරන්නට කැමැතියි. ඇත්ත වශයෙන්ම පහළ මට්ටමේ නිලධාරියෙක් විදේශීය සම්මන්ත්‍රණයක් වැනි දෙයකට යනවා නම් එතුමා -පිට රට යන හැම කෙනාම- අමාත්‍යාංශ ලේකම්ගෙන් අවසර ගන්නට ඕනෑ, ඇමතිතුමාගෙන් අවසර ගන්නට ඕනෑ, ඒ වාගේම අගමැතිතුමාගෙන් අවසරය ලබා ගන්නට ඕනෑ.

ඒ ගොල්ලන්ට ඒ ගමනට ලැබෙන ප්‍රතිපාදන යනාදී සියල්ලම සම්බන්ධයෙන් 2015 මැයි මාසයේ 15 වැනිදා භාණ්ඩාගාර ලේකම්තුමාගේ MF/6/1/1/2015 කියන චක්‍රලේඛයේ, "ඒ අයට ගන්න පුළුවන් දීමනා මෙපමණයි." යනුවෙන් සියලු විස්තර සඳහන් වෙනවා. ඒ ආකාරයට තමයි මුදල් ලබා ගෙන යන්න ඕනෑ.

අමාත්‍යාංශයෙන් වැය කරන සෑම වියදමක්ම අභ්‍යන්තර විගණනයකට ලක් වෙනවා. ඊට පසුව විගණකාධිපතිතුමාගේ ආයතනයෙන් ඒක විගණනයට ලක් කරනවා. ඒ ආකාරයෙන් මේ මුදල් හරියාකාරව වියදම් වෙලා තිබෙනවාද කියා දැනගන්න නොයෙක් checks and balances තිබෙනවා.

ඊට අමතරව, විශාල වශයෙන් මොකක් හෝ උත්සවයක් පිට රට පවත්වනවා නම්, ඒ වෙනුවෙන් වැය කරන මුදල සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම කැබිනට් අනුමැතියක් ලබා ගන්නම ඕනෑ. කැබිනට් අනුමැතියක් නැතිව විදේශ උත්සව සම්බන්ධයෙන් අපේ රටේ මුදල් පාවිච්චි කරන්න අවසර දෙන්නේ නැහැ. අවසර නැතිව ඒ මුදල් පාවිච්චි කළොත් ඒක විගණනයට භාජනය වෙලා, ඒ ආකාරයට මුදල් වැය කළ පුද්ගලයන්ට ඒ පිළිබඳව කරුණු දක්වන්න සිද්ධ වෙනවාමයි.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කිව්ව විධියට අපේ ආණ්ඩුව කාලයේ නම් විදේශ ආගන්තුකයෙකුට මේ රටට පැමිණීමට එක්කෝ ජනාධිපතිතුමාම ඒ ආගන්තුකයාට ආරාධනා කරන්න ඕනෑ. එහෙම නැත්නම් අගමැතිතුමා ආරාධනාවක් කරන්න ඕනෑ. විදේශ ඇමති හැටියට මම ආරාධනාවක් කරනවා නම්, හැම වෙලාවේම අගමැතිතුමාගෙන් හෝ ජනාධිපතිතුමාගෙන් අවසර ලබා ගෙන තමයි මම ඒ ආරාධනාව කරන්නේ. ඒ ආරාධනාව කළාට පස්සේ ඒ තැනැත්තාගේ status එක අනුව, ඒ කියන්නේ ජනාධිපතිවරයෙක්ද, අගමැතිවරයෙක්ද, විදේශ ඇමතිවරයෙක්ද, වෙනත් ඇමති කෙනෙක්ද කියා සොයා බලා එතුමාට සුදුසු වන ආකාරයට තමයි අපි සංග්‍රහ යනාදිය ලබා ගන්නේ. ඒ සියලු දේ විධිමත්වයි සිදු කෙරෙන්නේ. ඔබතුමා කලින් සඳහන් කළා වාගේ ආරාධනාවක් කරන්න පෙර, "මේක අවශ්‍ය ආරාධනාවක්ද, මෙයින් ලැබෙන ප්‍රතිලාභය මොකක්ද, මෙය කොපමණ දවසකට සීමා කළ යුතුද?" යන සියලු විස්තර සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශයේ තිබෙන desk එකෙන් අධ්‍යයනයක් කරනවා. ඒ ආකාරයට සියලු විස්තර ලබා ගෙන තමයි අපි ඒවා සියල්ලම කරන්නේ.

මම වග කීමකින් ඔබතුමාට දැනුම් දෙනවා, අපේ ආණ්ඩුව බලයට පත් වුණු දා ඉඳලා පසුගිය කාලයේ කළා වාගේ ආවාට ගියාට එවැනි ආරාධනාවන් කරලාත් නැහැ; කරන්න බලාපොරොත්තුවකුත් නැහැ; මුදල් අවභාවිත කරන්න සිද්ධ වෙලාත් නැහැ; සිදු කිරීමට බලාපොරොත්තුවකුත් නැහැ කියා. ඒවා සියල්ලම හරියාකාරව අධීක්ෂණය කරන්න අපේ අමාත්‍යාංශය ඇතුළේ විගණන කමිටුවක් තිබෙනවා. ඒ වාගේම, විගණකාධිපතිවරයා යටතේ විගණකාධිපති දෙපාර්තමේන්තුව තිබෙනවා. මේ සියලු දේ ඒවායේ විගණනයට භාජනය වෙනවා.

ඔබතුමා කිව්වා, සජින් ද වාස් ගුණවර්ධන, මජින්ත ද කවුද කියා අපේ අමාත්‍යාංශයේ පසුගිය කාලයේ සිටි දෙදෙනෙක් ගැන. මේවා ඔක්කෝම පසුගිය ආණ්ඩුව පවත්වා ගෙන ගිය කාලයේ තමයි වෙලා තිබෙන්නේ. මම පුවත් පත්වල කියවා තිබෙනවා ඒ කාලයේ සිදු වුණු අවභාවිත ගැන. සජින් ද වාස් ගුණවර්ධන කියන මහත්මයාට විරුද්ධව තිබෙන නොයෙක් නොයෙක් පැමිණිලි සම්බන්ධව FCID එකෙන් සහ CID එකෙන් දැනටත් විමර්ශන කර ගෙන යනවා.

අපේ පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී මේ ප්‍රශ්නය මතු කර මේ පිළිබඳව ප්‍රශ්න කළාය කියා මම දන්නවා. ඊට පසුව අපේ ලේකම්තුමා මේ පිළිබඳව තවත් කරුණු සොයමින් සිටින බව තමයි මට දැනගන්න ලැබී තිබෙන්නේ.

මම හිතන්නේ මේක ඉතාමත් බරපතළ චෝදනාවක්; බරපතළ සිද්ධියක්. මොකද, මේ සිද්ධියේදී අපේ රටේ මුදල්වලින් රුපියල් මිලියන 13ක් නාස්ති කෙරුවා විතරක් නොවෙයි; ඊට වඩා ගැඹුරු වංචාවක්. රුපියල් මිලියන 13ක් නාස්ති කරලා ඉයන් පේස්ලි කියන මහත්මයාව යොමු කර තිබෙන්නේ ඊට වඩා ලොකු වංචාවක් සිදු කරගන්න. ඒ, තෙල් business එකක් කරන්න. එම නිසා ඔබතුමා යෝජනා කළ පරිදි, මේ සිද්ධිය සම්බන්ධයෙන් CID එකට හෝ FCID එකට භාර දීලා, හරියාකාර විමර්ශනයක් කිරීම අනිවාර්යයෙන්ම කළ යුතු දෙයක්.

ගරු මන්ත්‍රීතුමනි, නයිජීරියාව සම්බන්ධව ඔබතුමා කියපු ඉතිරි කරුණු ටික මම දැනගෙන හිටියේ නැහැ. ඒ නයිජීරියා සම්බන්ධකමත් එක්ක මේ චෝදනාව වෙනත් ස්වරූපයක් ගන්නවා. ඒ අනුව කලින් තිබුණු තත්ත්වයට වඩා දැන් තත්ත්වය ටිකක් බරපතළ වනවා. මේ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා මම අපේ ලේකම්තුමා දැනුවත් කරන්නම්. ආංශික අධීක්ෂණ කාරක සභාවට ඔබතුමා ගොනු කර තිබෙන මීට අදාළ ලේඛන ටික මමත් පරීක්ෂා කර, මේ පිළිබඳව නිවැරදි අධ්‍යයනයක් කර, යම් කිසි ක්‍රියා මාර්ගයක් ගෙන ඔබතුමා දැනුවත් කරන්න මම පොරොන්දු වනවා කියා මම ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිලක් මාරපන අමාත්‍යතුමනි, ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.22ට, 2018 සැප්තැම්බර් 18 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***


*அதன்படி பி. ப. 6.22 மணிக்கு பாராளுமன்றம், 2018 செப்ரெம்பர் 18, செவ்வாய்க்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 6.22 p.m. until 1.00 p.m. on Tuesday, 18th September, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 263 - இல. 5
Volume 263 - No. 5

2018 සැප්තැම්බර් 18වන අඟහරුවාදා
2018 செப்ரெம்பர் 18, செவ்வாய்க்கிழமை
Tuesday, 18th September, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා

පාර්ලිමේන්තුවේ ගණපූරණය පවත්වාගෙන යෑම

ප්‍රශ්නවලට වාචික පිළිතුරු සැපයීම

ආංශික අධීක්ෂණ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව : සාමාජිකයන් නම් කිරීම සහ ආදේශ කිරීම

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ප්‍රභූ ඝාතන කුමන්ත්‍රණය

**ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත :**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි.

**සිවිල් ගුවන් සේවා පනත:**
නියෝග


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புக்கள்:**

அரசியலமைப்புக்கான இருபதாவது திருத்தம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்

அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்

பாராளுமன்றில் கூட்ட நடப்பெண்ணைப் பேணல்

வினாக்களுக்கு வாய்மூலம் விடையளித்தல்

துறைசார் மேற்பார்வைக் குழுக்கள், அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள், சட்டவாக்க நிலையியற் குழு, நிலையியற் கட்டளைகள் பற்றிய குழு, அரசாங்க நிதி பற்றிய குழு, பின்வரிசைக் குழு: அங்கத்தவர்களைப் பெயரிடல் மற்றும் பதிலீடு செய்தல்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

பிரமுகர்களைப் படுகொலை செய்வதற்கான சதித்திட்டம்

**வானூர்தி மூலம் ஏற்றிச் செல்லல் சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

**குடியியல் வான்செலவுச் சட்டம்:**

ஒழுங்குவிதிகள்


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Twentieth Amendment to the Constitution Bill: Petitions to the Supreme Court

Ministerial Consultative Committees

Maintenance of Quorum in Parliament

Oral Answers to Questions

Sectoral Oversight Committees, Ministerial Consultative Committees, Legislative Standing Committee, Committee on Standing Orders, Committee on Public Finance and Backbencher Committee : Nomination and Substitution of Members

AUDITOR-GENERAL'S REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Conspiracy to Assassinate VIPs

CARRIAGE BY AIR BILL:
Read a Second, and the Third time and passed

CIVIL AVIATION ACT:
Regulations

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2018 සැප්තැම්බර් 18වන අඟහරුවාදා*
*2018 செப்ரெம்பர் 18, செவ்வாய்க்கிழமை*
*Tuesday, 18th September, 2018*

**අ. භා.1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### அரசியலமைப்புக்கான இருபதாவது திருத்தம் சட்டமூலம்: உயர்நீதிமன்றுக்கு மனுக்கள்
### TWENTIETH AMENDMENT TO THE CONSTITUTION BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව **"විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය"** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් දහයක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

### II

### අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා
### அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்
### MINISTERIAL CONSULTATIVE COMMITTEES

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, මේ වන විට අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා 43ක් ස්ථාපිත කර ඇති බැවින් මෙම අගනා අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව කටයුතු කර අවම වශයෙන් සෑම මාසයකට වරක්වත් සියලුම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීම් කැඳවීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් එම කාරක සභාවල සභාපතිවරයන් වන විෂය භාර අමාත්‍යවරයන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටින අතර පොදු ජනතාවගේ යහපත වෙනුවෙන් අවශ්‍ය කටයුතු කිරීමට සක්‍රිය දායකත්වය ලබාදෙන මෙන් දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි.

### III

### පාර්ලිමේන්තුවේ ගණපූරණය පවත්වාගෙන යෑම
### பாராளுமன்றில் கூட்ட நடப்பெண்ணைப் பேணல்
### MAINTENANCE OF QUORUM IN PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, පාර්ලිමේන්තුවේ ගණපූරණය නොමැතිවීම හේතුවෙන් අදාළ දිනයන්ට නියමිතව තිබූ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු පවත්වාගෙන යාමට නොහැකිව පාර්ලිමේන්තුව කල් තැබීමට සිදු වූ මෑත කාලීන අවස්ථා කිහිපයක් සම්බන්ධයෙන් සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දැඩි අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

පාර්ලිමේන්තුවේ දෛනික ප්‍රධාන වැඩ කටයුතු අතර රජයේ අමාත්‍යාංශයන්හි විවිධ කාරණයන්ට අදාළව පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත්, නොයෙක් අණ පනත් යටතේ වූ නියෝග, නියමයන්, රෙගුලාසි, ගිවිසුම් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනා සම්මතයන් වැනි වැදගත් සහ නිශ්චිත කාල රාමුවක් තුළදී පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලබන ව්‍යවස්ථාදායක කටයුතු ඇතුළත් වන බවත්, එසේම එවැනි ව්‍යවස්ථාදායක කාර්යයන් පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම සඳහා පාර්ලිමේන්තු රැස්වීම් වෙනුවෙන් දෛනිකව විශාල මහජන මුදල් ප්‍රමාණයක් වැය කරනු ලබන බවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස ඔබ සැම ඉතා හොඳින් දන්නා කරුණකි.

එබැවින්, මෙලෙස ඉතා විශාල මහජන මුදලක් දෛනිකව වැය කරමින් රටේ අයවැය හා මූල්‍ය ප්‍රතිපත්තිය සහ රටේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමෙහිලා අත්‍යවශ්‍ය වන්නා වූ පාර්ලිමේන්තු ක්‍රියාවලිය පාර්ලිමේන්තුවේ ගණපූරණය නොමැති වීම නිසා අක්‍රිය වීමට ඉඩ දීම ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයක් බව සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

එබැවින්, පාර්ලිමේන්තුව තුළ ගණපූරණය පවත්වා ගැනීම ආණ්ඩු පාර්ශ්වයේ මෙන්ම විරුද්ධ පාර්ශ්වයේ සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ව්‍යවස්ථාදායක වගකීමක් බව අවධාරණය කරන අතර, ඉදිරියේදී පාර්ලිමේන්තුවට පැමිණ එවැනි කනගාටුදායක තත්ත්වයන් මතු නොවන ආකාරයෙන් කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

### IV

### ප්‍රශ්නවලට වාචික පිළිතුරු සැපයීම
### வினாக்களுக்கு வாய்மூலம் விடையளித்தல்
### ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සම්බන්ධයෙන් කරුණු කිහිපයක් පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් සියලුදෙනාගේ කාරුණික අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

[ගරු කථානායකතුමා මහතා]

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව අවම වශයෙන් තුන්වැනි අවස්ථාවේදීවත් පිළිතුරු සැපයිය යුතු බැවින්, පිළිතුරු ලබාදීම සඳහා එම ප්‍රශ්න යොමුවන විෂය භාර අමාත්‍යවරු නියමිත දිනයේදී පාර්ලිමේන්තුවට පැමිණ එම ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දීමටත්, අමාත්‍යවරයා නොසිටින අවස්ථාවක කැබිනට් නොවන අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් අදාළ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමටත් කටයුතු කරන ලෙස කාරුණිකව මෙයින් දන්වා සිටිමි.

ප්‍රශ්න පිළිබඳව කලින් දැනුම්දීම, පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය මඟින් සිදු කරනු ලබන බැවින් අදාළ මන්ත්‍රීවරයන් නියමිත දිනයේදී පාර්ලිමේන්තුවේ ප්‍රශ්න සඳහා නියමිත වේලාවේදී එම ප්‍රශ්න ඇසීමට කටයුතු කරන ලෙසත් සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත දැනුම් දීමට කැමැත්තෙමි.

V

## ආංශික අධීක්ෂණ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව : සාමාජිකයන් නම් කිරීම සහ ආදේශ කිරීම

## துறைசார் மேற்பார்வைக் குழுக்கள், அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள், சட்டவாக்க நிலையியற் குழு, நிலையியற் கட்டளைகள் பற்றிய குழு, அரசாங்க நிதி பற்றிய குழு, பின்வரிசைக் குழு: அங்கத்தவர்களைப் பெயரிடல் மற்றும் பதிலீடு செய்தல்

## SECTORAL OVERSIGHT COMMITTEES, MINISTERIAL CONSULTATIVE COMMITTEES, LEGISLATIVE STANDING COMMITTEE, COMMITTEE ON STANDING ORDERS, COMMITTEE ON PUBLIC FINANCE AND BACKBENCHER COMMITTEE: NOMINATION AND SUBSTITUTION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් ඇතැම් ආංශික අධීක්ෂණ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව යනාදී කාරක සභාවල සේවය කිරීම සඳහා නම් කරන ලද සහ ඇතැම් කාරක සභාවල සංශෝධනය කරන ලද සභික මන්ත්‍රීවරයන්ගේ නම් ඇතුළත් E සිට R දක්වා වෙන් වෙන් වශයෙන් වූ නිවේදන 14ක් හැන්සාඩ් වාර්තාවේ භාෂාත්‍රයෙන් පළ කිරීමට හැකි වන පරිදි **සභාගත*** කරන බව දන්වනු කැමැත්තෙමි.

**සභාමේසය මත තබන ලද නිවේදන:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட அறிவிப்புக்கள் :*
*Announcements tabled:*

**E**

**ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව : අතිරේක සාමාජික**
நிலையியற் கட்டளைகள் பற்றிய குழு: மேலதிக உறுப்பினர்
COMMITTEE ON STANDING ORDERS: ADDITIONAL MEMBER

පාර්ලිමේන්තුවේ අංක 127(3) ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලකී ජයවර්ධන මහතා ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

பாராளுமன்றத்தின் 127(3) ஆம் இலக்க நிலையியற் கட்டளையின் ஏற்பாடுகளின் பிரகாரம் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் நிலையியற் கட்டளைகள் பற்றிய குழுவில் கடமையாற்றுவதற்கு பெயர் குறிப்பிடப்பட்டுள்ளார் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

I wish to inform that the Hon. Lucky Jayawardana, Member of Parliament, has been nominated by the Committee of Selection on the 06th of September, 2018 to serve in the Committee on Standing Orders in terms of the provisions of Standing Order No. 127 (3) of Parliament.

**F**

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාව : අතිරේක සාමාජිකයන්**
அரசாங்க நிதி பற்றிய குழு: மேலதிக உறுப்பினர்கள்
COMMITTEE ON PUBLIC FINANCE: ADDITIONAL MEMBERS

පාර්ලිමේන්තුවේ අංක 127(3) ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා සහ ගරු (ආචාර්ය) එස්.එම්. මොහමඩ් ඉස්මායිල් මහතා යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

பாராளுமன்றத்தின் 127(3) ஆம் இலக்க நிலையியற் கட்டளையின் ஏற்பாடுகளின் பிரகாரம் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா மற்றும் மாண்புமிகு (கலாநிதி) சீ.மு. முகம்மட் இஸ்மாயில் ஆகிய பாராளுமன்ற உறுப்பினர்கள் அரசாங்க நிதி பற்றிய குழுவில் கடமையாற்றுவதற்கு பெயர் குறிப்பிடப்பட்டுள்ளனர் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

I wish to inform that the Hon. (Dr.) Harsha De Silva and the Hon. (Dr.) S.M. Mohamed Ismail, Members of Parliament, have been nominated by the Committee of Selection on the 06th of September, 2018 to serve in the Committee on Public Finance in terms of the provisions of Standing Order No. 127 (3) of Parliament.

**G**

**ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : අතිරේක සාමාජිකයන්**
பொருளாதார அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: மேலதிக உறுப்பினர்கள்
SECTORAL OVERSIGHT COMMITTEE ON ECONOMIC DEVELOPMENT: ADDITIONAL MEMBERS

පාර්ලිමේන්තුවේ අංක 111(21) සහ (22)(අ) ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් ගරු සන්දිත් සමරසිංහ මහතා සහ ගරු (ආචාර්ය) එස්.එම්. මොහමඩ් ඉස්මායිල් මහතා යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

பாராளுமன்றத்தின் 111(21) ஆம் மற்றும் (22)(அ) ஆம் இலக்க நிலையியற் கட்டளைகளின் ஏற்பாடுகளின் பிரகாரம் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் மாண்புமிகு சந்தித் சமரசிங்க மற்றும் மாண்புமிகு (கலாநிதி) சீ.மு. முகம்மட்

இஸ்மாயில் ஆகிய பாராளுமன்ற உறுப்பினர்கள் பொருளாதார அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவில் கடமையாற்றுவதற்கு பெயர் குறிப்பிடப்பட்டுள்ளனர் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

I wish to inform that the Hon. Sandith Samarasinghe and the Hon. (Dr.) S.M. Mohamed Ismail, Members of Parliament, have been nominated by the Committee of Selection on the 06th of September, 2018 to serve in the Sectoral Oversight Committee on Economic Development in terms of the provisions of Standing Order Nos. 111 (21) and (22) (a) of Parliament.

**H**

**ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : සාමාජිකයකු ආදේශ කිරීම**

போக்குவரத்து மற்றும் தொலைத்தொடர்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினரைப் பதிலீடு செய்தல்

SECTORAL OVERSIGHT COMMITTEE ON TRANSPORT AND COMMUNICATION: SUBSTITUTION OF MEMBER

පාර්ලිමේන්තුවේ අංක 111(21) සහ (22)(අ) ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සිසිර ජයකොඩි මහතා ඉවත් කොට, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කනක හේරත් මහතා එකී කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

பாராளுமன்றத்தின் 111(21) ஆம் மற்றும் (22)(அ) ஆம் இலக்க நிலையியற் கட்டளைகளின் ஏற்பாடுகளின் பிரகாரம் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் போக்குவரத்து மற்றும் தொலைத்தொடர்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் உறுப்பாண்மையிலிருந்து பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு சிசிர ஜயகொடி அவர்கள் நீக்கப்பட்டு, பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு கனக ஹேரத் அவர்கள் அக்குழுவில் கடமையாற்றுவதற்கு நியமிக்கப்பட்டுள்ளார் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

I wish to inform that the Hon. Sisira Jayakody, Member of Parliament, has been discharged from the membership of the Sectoral Oversight Committee on Transport and Communication and the Hon. Kanaka Herath, Member of Parliament, has been nominated by the Committee of Selection to serve in the said Committee, in terms of the provisions of Standing Order Nos. 111 (21) and (22) (a) of Parliament.

**I**

**කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : අතිරේක සාමාජික**

கமத்தொழில் மற்றும் காணி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: மேலதிக உறுப்பினர்

SECTORAL OVERSIGHT COMMITTEE ON AGRICULTURE AND LANDS: ADDITIONAL MEMBER

පාර්ලිමේන්තුවේ අංක 111(21) සහ (22)(අ) ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) එස්.එම්. මොහමඩ් ඉස්මායිල් මහතා කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

பாராளுமன்றத்தின் 111(21) மற்றும் (22)(அ) ஆம் இலக்க நிலையியற் கட்டளைகளின் ஏற்பாடுகளின் பிரகாரம் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு (கலாநிதி) சீ.மு. முகம்மட் இஸ்மாயில் அவர்கள் கமத்தொழில் மற்றும் காணி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவில் கடமையாற்றுவதற்கு பெயர் குறிப்பிடப்பட்டுள்ளார் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

I wish to inform that the Hon. (Dr.) S.M. Mohamed Ismail, Member of Parliament, has been nominated by the Committee of Selection on the 06th of September, 2018 to serve in the Sectoral Oversight Committee on Agriculture and Lands, in terms of the provisions of Standing Order Nos. 111 (21) and (22) (a) of Parliament.

**J**

**තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : අතිරේක සාමාජික**

இளைஞர், விளையாட்டுத்துறை, கலை மற்றும் மரபுரிமைகள் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: மேலதிக உறுப்பினர்

SECTORAL OVERSIGHT COMMITTEE ON YOUTH, SPORTS, ARTS AND HERITAGE : ADDITIONAL MEMBER

පාර්ලිමේන්තුවේ අංක 111(21) සහ (22)(අ) ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු වේලු කුමාර් මහතා තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

பாராளுமன்றத்தின் 111(21) மற்றும் (22)(அ) ஆம் இலக்க நிலையியற் கட்டளைகளின் ஏற்பாடுகளின் பிரகாரம் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு வேலு குமார் அவர்கள் இளைஞர், விளையாட்டுத்துறை, கலை மற்றும் மரபுரிமைகள் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவில் கடமையாற்றுவதற்கு பெயர் குறிப்பிடப்பட்டுள்ளார் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

I wish to inform that the Hon. Velu Kumar, Member of Parliament, has been nominated by the Committee of Selection on the 06th of September, 2018 to serve in the Sectoral Oversight Committee on Youth, Sports, Arts and Heritage, in terms of the provisions of Standing Order Nos. 111 (21) and (22) (a) of Parliament.

**K**

**කාන්තා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : අතිරේක සාමාජික**

பெண்கள் மற்றும் பால்நிலை பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: மேலதிக உறுப்பினர்

SECTORAL OVERSIGHT COMMITTEE ON WOMEN AND GENDER : ADDITIONAL MEMBER

පාර්ලිමේන්තුවේ අංක 111(21) සහ (22) (අ) ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු අරවින්ද් කුමාර් මහතා කාන්තා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

பாராளுமன்றத்தின் 111(21) மற்றும் (22)(அ) ஆம் இலக்க நிலையியற் கட்டளைகளின் ஏற்பாடுகளின் பிரகாரம் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் மாண்புமிகு அ. அரவிந்த் குமார் அவர்கள் பெண்கள் மற்றும் பால்நிலை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவில் கடமையாற்றுவதற்கு பெயர் குறிப்பிடப்பட்டுள்ளார் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

I wish to inform that the Hon. A. Aravindh Kumar, Member of Parliament, has been nominated by the Committee of Selection on the 06th of September, 2018 to serve in the Sectoral Oversight Committee on Women and Gender, in terms of the provisions of Standing Order Nos. 111 (21) and (22) (a) of Parliament.

[ගරු කථානායකතුමා මහතා]

**L**

**කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : සාමාජිකයකු ආදේශ කිරීම**
*කමත්තොழිල් மற்றும் காணி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினரைப் பதிலீடு செய்தல்*
SECTORAL OVERSIGHT COMMITTEE ON AGRICULTURE AND LANDS: SUBSTITUTION OF MEMBER

පාර්ලිමේන්තුවේ අංක 111(20) ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දුනේෂ් ගන්කන්ද මහතා ඉවත් කොට, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රංජිත් අලුවිහාරේ මහතා එකී කාරක සභාවේ සේවය කිරීම පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

பாராளுமன்றத்தின் 111(20) ஆம் இலக்க நிலையியற் கட்டளையின் ஏற்பாடுகளின் பிரகாரம் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு துனேஷ் கங்கந்த அவர்கள் கமத்தொழில் மற்றும் காணி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் உறுப்பினர் பதவியிலிருந்து நீக்கப்பட்டு, பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே அவர்கள் அக்குழுவில் சேவையாற்றுவதற்கு நியமிக்கப்பட்டுள்ளார் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

I wish to inform that the Hon. Dunesh Gankanda, Member of Parliament, has been discharged from the membership of the Sectoral Oversight Committee on Agriculture and Lands and the Hon. Ranjith Aluvihare, Member of Parliament, has been nominated by the Committee of Selection to serve in the said Committee, in terms of the provisions of Standing Orders No. 111 (20) of Parliament.

**M**

**ප්‍රතිසන්ධානය හා උතුර හා නැඟෙනහිර නැවත ගොඩ නැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : සාමාජිකයන් ආදේශ කිරීම**
*நல்லிணக்கம் மற்றும் வடக்கையும் கிழக்கையும் மீளக் கட்டியெழுப்புதல் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர்களைப் பதிலீடு செய்தல்*
SECTORAL OVERSIGHT COMMITTEE ON RECONCILIATION AND NORTH AND EAST RECONSTRUCTION: SUBSTITUTION OF MEMBERS

පාර්ලිමේන්තුවේ අංක 111(20) ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් ප්‍රතිසන්ධානය හා උතුර හා නැඟෙනහිර නැවත ගොඩ නැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු කේ. කාදර් මස්තාන් මහතා සහ ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා ඉවත් කොට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු දුනේෂ් ගන්කන්ද මහතා සහ ගරු රංජිත් අලුවිහාරේ මහතා එකී කාරක සභාවේ සේවය කිරීම පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

பாராளுமன்றத்தின் 111(20) ஆம் இலக்க நிலையியற் கட்டளையின் ஏற்பாடுகளின் பிரகாரம் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் பாராளுமன்ற உறுப்பினர்களான மாண்புமிகு கா. காதர் மஸ்தான் அவர்கள் மற்றும் மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா அவர்கள் நல்லிணக்கம் மற்றும் வடக்கையும் கிழக்கையும் மீளக் கட்டியெழுப்புதல் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் உறுப்பாண்மையிலிருந்து நீக்கப்பட்டு, பாராளுமன்ற உறுப்பினர்களான மாண்புமிகு துனேஷ் கங்கந்த அவர்கள் மற்றும் மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே அவர்கள் அக்குழுவில் சேவையாற்றுவதற்கு நியமிக்கப்பட்டுள்ளனர் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

I wish to inform that the Hon. Kader Masthan and the Hon. Seyed Ali Zahir Moulana, Members of Parliament, have been discharged from the membership of the Sectoral Oversight Committee on Reconciliation and North and East Reconstruction and the Hon. Dunesh Gankanda and the Hon. Ranjith Aluvihare, Members of Parliament, have been nominated by the Committee of Selection on the 06th of September, 2018 to serve in the said Committee in terms of the provisions of Standing Order No. 111 (20) of Parliament.

**N**

**ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : සාමාජිකයකු ආදේශ කිරීම**
*சர்வதேச தொடர்புகள் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினரைப் பதிலீடு செய்தல்*
SECTORAL OVERSIGHT COMMITTEE ON INTERNATIONAL RELATIONS : SUBSTITUTION OF MEMBER

පාර්ලිමේන්තුවේ අංක 111(20) ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රංජිත් අලුවිහාරේ මහතා ඉවත් කොට, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා එකී කාරක සභාවේ සේවය කිරීම පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

பாராளுமன்றத்தின் 111(20) ஆம் இலக்க நிலையியற் கட்டளையின் ஏற்பாடுகளின் பிரகாரம் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு ரஞ்சித் அலுவிஹரே அவர்கள் சர்வதேச தொடர்புகள் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் உறுப்பாண்மையிலிருந்து நீக்கப்பட்டு, மாண்புமிகு புத்திக பதிரண அவர்கள் அக்குழுவில் சேவையாற்றுவதற்கு நியமிக்கப்பட்டுள்ளார் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

I wish to inform that the Hon. Ranjith Aluvihare, Member of Parliament, has been discharged from the membership of the Sectoral Oversight Committee on International Relations and the Hon. Buddhika Pathirana, Member of Parliament, has been nominated by the Committee of Selection on the 06th of September, 2018 to serve in the said Committee in terms of the provisions of Standing Order No. 111 (20) of Parliament.

**O**

**නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශගත උපදේශක කාරක සභාව : අතිරේක සාමාජික**
*நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினரைப் பதிலீடு செய்தல்*
MINISTERIAL CONSULTATIVE COMMITTEE ON CITY PLANNING AND WATER SUPPLY: ADDITIONAL MEMBER

පාර්ලිමේන්තුවේ අංක 112(1) (ආ) ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලකී ජයවර්ධන මහතා කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශගත උපදේශක කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉවත් කොට, නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශගත උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

பாராளுமன்றத்தின் 112(1)(ஆ) ஆம் இலக்க நிலையியற் கட்டளையின் ஏற்பாடுகளின் பிரகாரம் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுவின் உறுப்பாண்மையிலிருந்து நீக்கப்பட்டு, நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுவில் சேவையாற்றுவதற்கு நியமிக்கப் பட்டுள்ளார் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

I wish to inform that the Hon. Lucky Jayawardana, Member of Parliament, has been discharged from the membership of the Ministerial Consultative Committee on Hill Country New Villages, Infrastructure and Community Development and has been nominated by the Committee of Selection on the 06th of September, 2018 to serve in the Ministerial Consultative Committee on City Planning and Water Supply in terms of the provisions of the Standing Order No. 112 (1) (b) of Parliament.

**P**

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා : අතිරේක සාමාජිකයන්
## அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: மேலதிக உறுப்பினர்கள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEES: ADDITIONAL MEMBERS

පාර්ලිමේන්තුවේ අංක 112 ස්ථාවර නියෝගයේ විධිවිධානවල, 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාවේ තීරණය, 2018 ජූලි මස 17වැනි දින සහ සැප්තැම්බර් මස 07වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව මතු සඳහන් මන්ත්‍රීවරුන්, ඒ ඒ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

1. ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

   ගරු විමල් වීරවංශ මහතා

2. මහවැලි සංවර්ධන හා පරිසර පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

   ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

3. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කරක සභාව

   ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

4. සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කරක සභාව

   ගරු ගාමිණී ලොකුගේ මහතා

5. ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

   ගරු තාරානාත් බස්නායක මහතා

6. විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

   ගරු අනුරාධ ජයරත්න මහතා

7. රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

   ගරු එස්.බී. දිසානායක මහතා

8. විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

   ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා

9. වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

   ගරු දයාසිරි ජයසේකර මහතා

10. ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා

11. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

12. අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු ටී.බී. ඒකනායක මහතා

13. කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු. එස්.එම්. චන්ද්‍රසේන මහතා

14. වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා

15. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

16. වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

17. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

18. නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

19. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු චන්දිම වීරක්කොඩි මහතා

20. කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු සී.බී. රත්නායක මහතා

21. ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

22. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

23. අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු ඩලස් අලහප්පෙරුම මහතා

24. විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් සහ විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු ඩිලාන් පෙරේරා මහතා

25. සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

26. පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

27. සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු තිලංග සුමතිපාල මහතා

28. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

    ගරු වාසුදේව නානායක්කාර මහතා

பாராளுமன்றத்தின் 112 ஆம் இலக்க நிலையியற் கட்டளையின் ஏற்பாடுகள், 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக் குழுவினால் மேற்கொள்ளப்பட்ட தீர்மானம், 2018 யூலை மாதம் 17 மற்றும் செப்ரெம்பர் மாதம் 07 ஆம் திகதிகளில் பாராளுமன்றத்தினால் ஏற்றுக்கொள்ளப்பட்ட பிரேரணைகளின் பிரகாரம் உரிய அமைச்சுசார் ஆலோசனைக் குழுக்களில் கடமையாற்றுவதற்கு பின்வரும் உறுப்பினர்கள் பெயர் குறிப்பிடப்பட்டுள்ளனர் என்பதை அறிவித்துக் கொள்ள விரும்புகின்றேன்.

1. பாதுகாப்பு பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

   மாண்புமிகு விமல் வீரவங்ச

2. மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

   மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில

3. தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

   மாண்புமிகு தினேஷ் குணவர்தன

4. சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

   மாண்புமிகு காமினி லொக்குகே

[ගරු කථානායකතුමා මහතා]

5. போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க

6. விஞ்ஞான, தொழில்நுட்ப, ஆராய்ச்சி, திறன்கள் அபிவிருத்தி, தொழிற்பயிற்சி மற்றும் கண்டி மரபுரிமைகள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு அநுராத ஜயரத்ன

7. அரச தொழில்முயற்சி மற்றும் கண்டி நகர அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க

8. வெளிநாட்டலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன

9. துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு தயாசிறி ஜயசேகர

10. உள்நாட்டலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன

11. சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே

12. உள்ளக அலுவல்கள் மற்றும் வடமேல் அபிவிருத்தி பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு ரி.பி. ஏக்கநாயக்க

13. கமத்தொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு எஸ்.எம். சந்திரசேன

14. பெருந்தோட்டக் கைத்தொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்

15. மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த

16. நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா

17. அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே

18. வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு லக்ஷமன் வசந்த பெரேரா

19. பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு சந்திம வீரக்கொடி

20. மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு சீ.பி. ரத்நாயக்க

21. காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன

22. நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு சந்திரசிறி கஜதீர

23. கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு டக்ளஸ் தேவானந்தா

24. தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புக்கள் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு டிலான் பெரேரா

25. சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி

26. மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்

27. அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தகம் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு திலங்க சுமதிபால

28. தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு

மாண்புமிகு வாசுதேவ நாணாயக்கார

I wish to inform that the following Members have been nominated by the Committee of Selection on the 6th of September, 2018 to serve on the respective Ministerial Consultative Committees as per the decision of the Committee of Selection in terms of the provisions of Standing Order No. 112 of Parliament and the Motions agreed to by Parliament on the 17th of July and the 07th of September, 2018.

1. Ministerial Consultative Committee on Defence

Hon. Wimal Weerawansa

2. Ministerial Consultative Committee on Mahaweli Development and Environment

Hon. Udaya Prabhath Gammanpila

3. Ministerial Consultative Committee on National Policies and Economic Affairs

Hon. Dinesh Gunawardena

4. Ministerial Consultative Committee on Tourism Development and Christian Religious Affairs

Hon. Gamini Lokuge

5. Ministerial Consultative Committee on Transport and Civil Aviation

Hon. Tharanath Basnayaka

6. Ministerial Consultative Committee on Science, Technology, Research, Skills Development and Vocational Training and Kandyan Heritage

Hon. Anuradha Jayaratne

7. Ministerial Consultative Committee on Public Enterprise and Kandy City Development

   Hon. S.B. Dissanayake

8. Ministerial Consultative Committee on Foreign Affairs

   Hon. Lakshman Yapa Abeywardena

9. Ministerial Consultative Committee on Ports and Shipping

   Hon. Dayasiri Jayasekara

10. Ministerial Consultative Committee on Home Affairs

    Hon. W.D.J. Senewiratne

11. Ministerial Consultative Committee on Health, Nutrition and Indigenous Medicine

    Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle

12. Ministerial Consultative Committee on Internal Affairs and Wayamba Development

    Hon. T.B. Ekanayake

13. Ministerial Consultative Committee on Agriculture

    Hon. S.M. Chandrasena

14. Ministerial Consultative Committee on Plantation Industries

    Hon. Arumugan Thondaman

15. Ministerial Consultative Committee on Power and Renewable Energy

    Hon. A.D. Susil Premajayantha

16. Ministerial Consultative Committee on Irrigation and Water Resources and Disaster Management

    Hon. Anura Priyadharshana Yapa

17. Ministerial Consultative Committee on Public Administration and Management and Law and Order

    Hon. Susantha Punchinilame

18. Ministerial Consultative Committee on Housing and Construction

    Hon. Lakshman Wasantha Perera

19. Ministerial Consultative Committee on Petroleum Resources Development

    Hon. Chandima Weerakkody

20. Ministerial Consultative Committee on Hill Country New Villages, Infrastructure and Community Development

    Hon. C.B. Rathnayake

21. Ministerial Consultative Committee on Lands and Parliamentary Reforms

    Hon. (Mrs.) Sumedha G. Jayasena

22. Ministerial Consultative Committee on Justice and Prison Reforms

    Hon. Chandrasiri Gajadeera

23. Ministerial Consultative Committee on Education

    Hon. Dullas Alahapperuma

24. Ministerial Consultative Committee on Telecommunication, Digital Infrastructure and Foreign Employment

    Hon. Dilan Perera

25. Ministerial Consultative Committee on Social Welfare and Primary Industries

    Hon. (Mrs.) Pavithradevi Wanniarachchi

26. Ministerial Consultative Committee on Provincial Councils, Local Government and Sports

    Hon. Janaka Bandara Tennakoon

27. Ministerial Consultative Committee on Development Strategies and International Trade

    Hon. Thilanga Sumathipala

28. Ministerial Consultative Committee on Labour and Trade Union Relations

    Hon. Vasudeva Nanayakkara

**Q**

**ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව : සාමාජිකයන් නම් කිරීම**
சட்டவாக்க நிலையியற் குழு: உறுப்பினர்களைப் பெயரிடல்
LEGISLATIVE STANDING COMMITTEE: NOMINATION OF MEMBERS

පාර්ලිමේන්තුවේ අංක 113 ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව නියෝජ්‍ය කථානායකවරයාගේ සභාපතිත්වයෙන් නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ද ඇතුළුව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු ඩග්ලස් දේවානන්දා මහතා

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

பாராளுமன்றத்தின் 113 ஆம் இலக்க நிலையியற் கட்டளையின் ஏற்பாடுகளின் பிரகாரம் பிரதிச் சபாநாயகரைத் தவிசாளராகக் கொண்ட சட்டவாக்க நிலையியற் குழுவில் கடமையாற்றுவதற்கு குழுக்களின் பிரதித் தவிசாளர் உள்ளிட்ட பின்வரும் உறுப்பினர்கள் 2018 செப்ரெம்பர் மாதம் 06 ஆம் திகதி தெரிவுக்குழுவினால் பெயர் குறிப்பிடப்பட்டுள்ளனர் என்பதை அறிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

மாண்புமிகு எட்வட் குணசேகர

மாண்புமிகு டக்ளஸ் தேவானந்தா

மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்

மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்

மாண்புமிகு அசோக்க பிரியந்த

மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ

I wish to inform that the following Members of Parliament have been nominated by the Committee of Selection on the 06th of September, 2018 to serve in the Legislative Standing Committee in addition to the Deputy Speaker as the Chair and the Deputy Chairman of Committees in terms of the provisions of Standing Order No. 113 of Parliament:

Hon. Edward Gunasekara

Hon. Douglas Devananda

Hon. (Mrs.) Vijayakala Maheswaran

Hon. M.A. Sumanthiran

Hon. Ashoka Priyantha

Hon. (Dr.) Nalinda Jayathissa

**R**

**පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ කාරක සභාව : සාමාජිකයන් නම් කිරීම**
பின்வரிசைக் குழு: உறுப்பினர்களைப் பெயரிடல்
BACKBENCHER COMMITTEE: NOMINATION OF MEMBERS

පාර්ලිමේන්තුවේ අංක 126 ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයාගේ සභාපතිත්වයෙන් විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ද ඇතුළුව 2018 සැප්තැම්බර් මස 06වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

[ගරු කථානායකතුමා මහතා]

පාරාලුමන්ත්‍රණයේ 126 ආම් ඉලක්ක නිලෙයියත් කට්ටළෙයින් ඒත්පාටුකළින් පිරකාරම් අරසාංක්ක් කට්චියින් මුතත්කෝලාසාන් අවර්කළෙත් තවිසාළරාකක් කොණ්ට පින්වරිසෙක් කුලුවිල් කටමෙයාත්රුවතත්කු එතිර්ක්කට්චියින් මුතත්කෝලාසාන් උළ්ළිට්ට පින්වරුම් උරුප්පිනර්කළ් 2018 සෙප්රෙම්පර් මාතම් 06 ආම් තිකති තෙරිවුක්කුලුවිනාල් පෙයර් කුරිප්පිටප්පට්ටුළ්ළනර් එන්පතෙ අරිවිත්තුක්කොළ්ළ විරුම්පුකින්රේන්.

මාණ්පුමිකු (වෛත්තිය කලානිති) නළින්ත ජයතිස්ස

මාණ්පුමිකු ඉ. චාල්ස් නිර්මලනාතන්

මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා පිරේමච්චන්ත්‍රිර

මාණ්පුමිකු චමින්ත විජේසිරි

මාණ්පුමිකු (තිරුමති) චාන්ති ශ්‍රීස්කන්තරාසා

I wish to inform that the following Members of Parliament have been nominated by the Committee of Selection on the 06th of September, 2018 to serve in the Backbencher Committee in addition to the Chief Government Whip as the Chair and the Chief Opposition Whip in terms of the provisions of the Standing Order No. 126 of Parliament:-

Hon. (Dr.) Nalinda Jayathissa

Hon. I. Charles Nirmalanathan

Hon. (Mrs.) Hirunika Premachandra

Hon. Chaminda Wijesiri

Hon. (Mrs.) Shanthi Sriskandarasa

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු චපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව

2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ VIII කොටස; සහ

2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXI කොටස, තෙවැනි කාණ්ඩයේ IX කොටස සහ නවවැනි කාණ්ඩයේ VI කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල - අරස තොළිල්මුයට්චිකළ් මට්රුම් කණ්ඩි නකර අපිවිරුත්ති අමෙච්චරුම් පාරාලුමන්රච් චපෙ මුතල්වරුම්)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක - කාණි මට්රුම් පාරාලුමන්ර මරුසීරමෙප්පු අමෙච්චරුම් අරසාංක්ක් කට්චියින් මුතත්කෝලාසානුම්)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2015 වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2016 වර්ෂයේ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

2016 වර්ෂයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2016 වර්ෂයේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් වාර්තා මම ඉදිරිපත් කරමි.

(i) 2013 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2016 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් වාර්තා මම ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(ii) 2016 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(iv) 2016 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව;

(v) 2016 වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ දොළොස් වැනි වාර්ෂික වාර්තාව;

(vi) 2016 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් වාර්තාව;

(vii) 2016 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(viii) 2016 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන්, 2016 වර්ෂයේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ, අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ, නීතිපති දෙපාර්තමේන්තුවේ, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ, ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ, මහා භාරකාර දෙපාර්තමේන්තුවේ, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ සහ ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන්, 2017 වර්ෂය සඳහා විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන්, 2017 වර්ෂය සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) වගන්තිය සහ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ ආනයන හා අපනයන (පාලන) නියෝග සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 10 දිනැති අංක 2083/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

එම නියෝග ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)

ගරු කථානායකතුමනි, ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත;
(ii) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග;
(iii) 2017 වර්ෂය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව; සහ
(iv) 2016 වර්ෂය සඳහා ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Education and Human Resources Development on, "Institute of Personnel Management, Sri Lanka (Amendment) Bill" which was referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා (අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எட்வட் குணசேகர - உள்ளக அலுவல்கள் மற்றும் வடமேல் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Edward Gunasekara - Deputy Minister of Internal Affairs and Wayamba Development)

ගරු කථානායකතුමනි, බත්තරමුල්ල, "සුහුරුපාය", ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක (තොරතුරු තාක්ෂණ) වශයෙන් සේවය කරන එස්.එන්.බී.ඒ.කේ.එම්.එන්.ඩී. නාමරත්න මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු කථානායකතුමනි, නෑගම්පහ, ඉදිගොල්ලෑගම, සියඹලංගමුව දකුණ, අංක 2 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්. ප්‍රසිලා බිසෝකුමාරිහාමි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) සේරුවිල, කාවන්තිස්සපුර, අංක 218 දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ. රූපලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ
(2) සේරුනුවර, නව තිස්සපුර, අංක 165 දරන ස්ථානයෙහි පදිංචි මෙරගල්ගේ ජයරත්න මහතා ඇතුළු පවුල් 1,500ක් වෙනුවෙන් ලැබුණු පෙත්සම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්දිම ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් පහ මම පිළිගන්වමි.

(1) තලංගම උතුර, පයිප්ප පාර, කොස්වත්ත, අංක 382/1ඩී, "මධුෂානි" යන ලිපිනයෙහි පදිංචි ඩී.ඒ.ජේ.එම්. දයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම;
(2) කළුතර දකුණ, වැලිතුඩුව වත්ත, ගමගොඩ පාර, අංක 113 දරන ස්ථානයෙහි පදිංචි එල්.පී.යූ. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;
(3) අනුරාධපුරය, සාලියපුර, ගල්වල හන්දිය, අංක 48 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. චන්දන කැලුම් මහතාගෙන් ලැබුණු පෙත්සම;
(4) ගාල්ල, වලහන්දුව, මානවිල, "අජන්තා" යන ලිපිනයෙහි පදිංචි එම්.එල්.අයි. ප්‍රියංගනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ
(5) පිළිමතලාව, ඉලුක්වත්ත, හොන්දෙණියවත්ත, අංක 134/1/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. ඉනෝකා නිලන්ති පීරිස් මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු කථානායකතුමනි, මහනුවර, අරුප්පල තාක්ෂණ විද්‍යාලයේ සේවය කරන එස්. චමලි ගුණතිලක මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, රාගම, පහළ කරගහමුණ,

අංක 290/2/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ජේ. චන්දන පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගත්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කරුණාකර කාලය සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නය කියා මම දෙපාර්ශ්වයටම කියනවා.

## "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ ව්‍යාපෘති : විස්තර
## "அண்மையிலுள்ள பாடசாலை மிகச் சிறந்த பாடசாலை" வேலைத்திட்டத்தின் கீழான கருத்திட்டம்: விபரம்
## PROJECTS UNDER "NEAREST SCHOOL IS THE BEST SCHOOL" PROGRAMME: DETAILS

11/'18

**1. ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ අවම පහසුකම් යටතේ පවත්වාගෙන යනු ලබන තවදුරටත් සංවර්ධනය කළ යුතු පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් සංවර්ධනය කිරීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් මේ වනවිට අවසන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට අවසන් නොකළ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iv) එම ව්‍යාපෘතීන් අවසන් නොකිරීමට හේතු කවරේද;

(v) ඉහත සියලු ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන්නේද;

(vi) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் ஆகக் குறைந்த வசதிகளுடன் இயங்கி வருகின்ற மேலும் அபிவிருத்தி செய்ய வேண்டியுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளை அபிவிருத்தி செய்ய அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) "அண்மையிலுள்ள பாடசாலை மிகச்சிறந்த பாடசாலை" எனும் வேலைத் திட்டத்தின் கீழ் ஆரம்பிக்கப்பட்டுள்ள கருத்திட்டங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) அவற்றில் தற்போது நிறைவு செய்யப்பட்டுள்ள கருத்திட்டங்களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(iii) இதுவரை நிறைவுசெய்யப்படாத கருத்திட்டங் களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) அக்கருத்திட்டங்கள் நிறைவு செய்யப்படாமைக் கான காரணங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி அனைத்துக் கருத்திட்டங்களையும் துரிதமாக நிறைவுசெய்ய நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(vi) அதற்காக எவ்வளவு காலம் தேவைப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of schools maintained with minimum facilities in Sri Lanka which are in need of further development; and

(ii) the measures taken by the Government to develop such schools?

(b) Will he also inform this House-

(i) the number of projects commenced under the "Nearest school is the best school" project;

(ii) the number of projects completed as of now;

(iii) the number of projects not completed as of now;

(iv) the reasons for non-completion of them;

(v) whether action will be taken to complete all above projects forthwith; and

(vi) the time to be taken for it?

(c ) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

(අ) (i) පාසල් ක්‍රමවත්ව පවත්වාගෙන යෑමටත්, සිසුන්ගේ ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව පවත්වාගෙන යෑම සඳහාත් අවශ්‍ය සියලුම පහසුකම් පාසල් 10,194 සඳහාම සැපයීමට රජය බැඳී සිටී. එහිලා පිළිගත් ජාතික ප්‍රතිමාන හා නිර්ණායකවලට අනුව පාසල් සඳහා අවශ්‍ය පහසුකම් සපයනු ලැබේ. එසේ වුවද තවදුරටත් පහසුකම් සංවර්ධනය විය යුතු ක්ෂේත්‍රයන් පවතී. සමස්තයක් වශයෙන් ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යෑමට අවශ්‍ය පහසුකම් සියලුම පාසල්වලට සපයා ඇත.

(ii) ඔව්.

සමස්ත අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය උදෙසා අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන බලධාරීන් විසින් කඩිනම් ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ගෙන ඇත. ඒ අතරින් පහත සඳහන් ක්‍රියා මාර්ග ප්‍රධාන වේ.

* 2015 දී සැලසුම් කළ පරිදි 2016 ජූනි 15 දින සිට "ළඟම පාසල හොඳම පාසල" ජාතික වැඩසටහන යටතේ සියලුම පාසල්වල සනීපාරක්ෂක පහසුකම්, ජල පහසුකම්, විදුලිබල පහසුකම් හා පන්ති කාමර ඉගෙනුම් පහසුකම් මෙම වසර අවසානය වන විට සම්පූර්ණ කිරීම.

* උක්ත ව්‍යාපෘතිය සඳහා තෝරාගත් පාසල්වල මූලික අවශ්‍යතා සැපිරීම යන තේමාව යටතේ පාසල් 1,137ක ජල පහසුකම්, පාසල් 3,982ක වැසිකිළි පහසුකම්, පාසල් 3,935ක විදුලි පහසුකම් ලබා දීම හා 5,948ක ගොඩනැගිලි හා වෙනත් ඉදි කිරීම්වල අලුත්වැඩියාවන් සිදු කිරීමට කටයුතු කිරීම.

* "සනීපාරක්ෂාව පෙරට" යන වැඩසටහන යටතේ තෝරාගත් පාසල් 1,633ක් සඳහා රුපියල් මිලියන 2.00ක් වටිනා වැසිකිළි පද්ධතියක් ලබාදීමට කටයුතු කිරීම.

* මෙම ව්‍යාපෘතිය යටතේම මෑතකදී කිසිදු සංවර්ධන වැඩසටහනකට අයත් නොවූ අ.පොස. (උසස් පෙළ) පන්ති පැවැත්වෙන පාසල් 1,360ක් සංවර්ධනය කිරීමට පියවර ගැනීම.

* මේ යටතේ තෝරාගත් වතු පාසල් 25ක් සංවර්ධනය කිරීමට පියවර ගැනීම.

මානව සම්පත් සංවර්ධනය

* ප්‍රමාණවත් පරිදි මානව සම්පත් පාසල්වලට ලබා දීමේ අරමුණින් පාසල් සඳහා නවක ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරන ලදී. විශේෂයෙන් ගුරු හිඟයක් පවතින වතු පාසල් සඳහා ගුරු සහායකයින් 2015 වසරේ සිට මේ දක්වා 2,896ක ප්‍රමාණයක් බඳවා ගැනීමට කටයුතු කිරීම.

* ගුරු හිඟය පියවා ගැනීම සඳහා අතිරික්ත ගුරුවරුන් මාරු කිරීම, ගුරු තුලනය, විශේෂයෙන්ම ගුරු හිඟයක් පවතින විෂයයන් වන ආගමික විෂයයන් සඳහා ගුරුවරුන් 2,705ක් ශිෂ්‍ය උපදේශනය සඳහා ගුරුවරුන් 1,165ක් හා 3,800ක් ක්‍රීඩා පුහුණුකරුවන් බඳවා ගැනීමට කටයුතු කිරීම.

* උතුරු නැගෙනහිර පළාත්වල ස්වේච්ඡා හා කොන්ත්‍රාත් පදනම මත ගුරුවරුන් සේවයේ යෙදී සිටිය දී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණියට බඳවා ගැනීමට කටයුතු කිරීම හා මෙම වසරේ දී ස්වේච්ඡා ගුරුවරුන් 639ක් ද කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් ගුරුවරුන් 142ක් ද උතුරු පළාත තුළ ස්ථිර කිරීම.

* 2016 හා 2017 වර්ෂ සඳහා විදුහල්පතිවරුන් 3,901ක ප්‍රමාණයක් බඳවා ගැනීම.

(ආ) (i) ව්‍යාපෘති 13,087කි. (දහතුන් දහස් අසූ හතකි.)

(ii) 9,101ක වැඩ අවසන් කර ඇත. (නවදහස් එකසිය එකකි.)

(iii) 3,986කි. (තුන්දහස් නවසිය අසූ හයකි.)

(iv) දැනට මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතුවලින් 70%ක් පමණ නිම කර ඇත. ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් අවසන් කිරීමට නියමිතව ඇත්තේ 2020 වර්ෂයේ අවසානයේදී බැවින් ඉතිරි වැඩ යථා කාලයේදී අවසන් වනු ඇත.

(v) ඔව්.

(vi) ඔව්.

2020 දෙසැම්බර් 31දින වන විට අවසන් කිරීමට නියමිතය.

(ඇ) අදාළ නොවේ.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මුළු රටේම නොවෙයි, කෑගල්ල දිස්ත්‍රික්කය තුළ මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කර තිබෙන ප්‍රමාණයේ ප්‍රගති වාර්තාවක් අපට ගන්න පුළුවන් වෙයිද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔව්. ප්‍රගති වාර්තාවක් වෙනම දෙන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
එම ප්‍රගති වාර්තාව අපට ලැබෙන්න සලස්වන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ සමහර ගොඩනැඟිලිවල වහල ගලවා තිබෙනවා. 2016 වසර අවසන් වනවිට, 2017 වසර අවසන් වනවිට සහ මේ වර්ෂය වනවිටත් ඒවායේ වැඩ කටයුතු අවසන් කරන්න බැරි වෙලා එම කටයුතු නතරවී තිබෙනවා. ඇත්තටම මෙහිදී ගොඩක් ගැටලු මතු වන්නේ ඒ නිසායි. මම මේ ප්‍රශ්නය විශේෂයෙන්ම ඇහුවෙත් ඒ නිසායි. පාසල්වල පවතින එම ගැටලුව පිළිබඳව කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඇසුවාම ඒ ගොල්ලන් කියන්නේ, "මේකට මුදල් ලැබී නැහැ, මුදල් ලබා දෙන්නේ නැති නිසා ඒවා සංවර්ධනය කරන්නේ නැතිව වැඩ නවත්වා තිබෙනවා"

කියායි. මෙම වැඩසටහන කඩිනමින් කිරීමට මුදල් ප්‍රතිපාදන ලබාදීම සඳහා තමුන්නාන්සේ කුමක් හෝ පියවරක් ගන්නවාද? විශේෂයෙන්ම සමහර කුඩා පාසල්වල තිබෙන ගොඩනැගිලි දෙක තුනේත් වහලවල් නැහැ. ඒ නිසා ඒවායේ තිබුණු ඉඩත් දැන් නැති වෙලා. ඒ පිළිබඳව සලකා බලා ඉතාම කඩිනමින් -මේ වර්ෂය ඇතුළතදී- ඒ සඳහා මුදල් ලබාදෙන්න හැකියාවක් තිබෙනවාද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(මාණ්පුමිකු අක්කිල විරාජ් කාරියවසම්)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, "ළහම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වුණා. එසේ ක්‍රියාත්මක වෙද්දී, සමහර අවස්ථාවලදී යම් යම් අඩු පාඩු නිසා මුදල් ලබාදීම ප්‍රමාද වුණා.

හැබැයි, මෙතරම් විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙද්දීත් සමස්තයක් වශයෙන් මේ වන විට සියයට 70ක පමණ වැඩ අවසන් වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ ව්‍යාපෘතිවලට අදාළ බිල් පළාත් සභාවෙන් අපට එවන්නත් ඕනෑ. ඊට පසුව තමයි ගෙවීම් කටයුතු සිද්ධ වෙන්නේ. [බාධා කිරීමක්] සමස්තයක් විධියට අපි ඒ මුදල් ගෙවන්න කටයුතු කර තිබෙනවා. ඉතිරි මුදලක් තිබෙනවා නම් ඉදිරි කාලයේදී ගෙවන්න බලන්නම්.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -17/'18- (2), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු ආනන්ද අලුත්කමකේ)
(The Hon. Ananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -59/'18- (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මේ සඳහා ත්‍රිකුණාමලය, හම්බන්තොට වැනි දිස්ත්‍රික්කවල ලේකම්වරුන්ගෙන් තොරතුරු රාශියක් ලබාගන්න තිබෙනවා. ඒ නිසා, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මම මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මාතලේ දිස්ත්‍රික්කයේ හොකී ක්‍රීඩාව දියුණු කිරීම : අමාත්‍යාංශය ගනු ලබන පියවර

## மாத்தளை மாவட்டத்தில் ஹொக்கி விளையாட்டை முன்னேற்றுதல்: அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள்

## DEVELOPMENT OF HOCKEY IN MATALE DISTRICT: ACTION BY MINISTRY

143/'18

**4. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ හොකී ක්‍රීඩාවේ නිජබිම ලෙස මාතලේ දිස්ත්‍රික්කය හැඳින්වෙන බව දන්නේද;

(ii) මාතලේ හොකී ක්‍රීඩකයන්ට ක්‍රීඩා කිරීමට ඇති නන්දිමිත්‍ර ඒකනායක ක්‍රීඩාංගණය වසර කිපයක සිට කිසිදු සංවර්ධනයකට ලක් වී නොමැති බව පිළිගන්නේද;

(iii) මාතලේ දිස්ත්‍රික්කය සතුව තිබූ හොකී ක්‍රීඩාවේ අභිමානය යළි ලබා ගැනීමට හා මාතලේ දිස්ත්‍රික්කයේ හොකී ක්‍රීඩාව දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் ஹொக்கி விளையாட்டின் பிறப்பிடமாக மாத்தளை மாவட்டம் அழைக்கப்படுகின்றதென்பதை அறிவாரா;

(ii) மாத்தளையின் ஹொக்கி விளையாட்டு வீரர்களுக்கு விளையாடுவதற்குள்ள நந்திமித்ர ஏக்கநாயக்க விளையாட்டரங்கு பல வருடங்களாக எவ்வித அபிவிருத்திக்கும் உள்ளாக்கப்படவில்லை என்பதை ஏற்றுக்கொள்வாரா;

(iii) மாத்தளை மாவட்டத்துக்கு உரித்தாகக் காணப்பட்ட ஹொக்கி விளையாட்டின் பெருமையை மீண்டும் பெற்றுக்கொள்வதற்கும் மாத்தளை மாவட்டத்தில் ஹொக்கி விளையாட்டை முன்னேற்றுவதற்கும் அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House -

(i) whether he is aware that Matale District is known as the birthplace of Hockey in Sri Lanka;

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

(ii) whether he admits that the Nandimithra Ekanayaka Ground which is used by Hockey players of Matale has not received any assistance for development in the past few years; and

(iii) the steps that will be taken by the Ministry to develop Hockey in Matale so that the Matale District can once again claim the pride in the game of Hockey?

(b) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

නන්දිමිත්‍ර ඒකනායක ක්‍රීඩාංගණය මාතලේ විද්‍යා විද්‍යාලය සතුව පවතින අතර, එහි පාලන හා නඩත්තු කටයුතු මාතලේ මහ නගර සභාව විසින් කරනු ලැබේ.

(iii) 2018 වර්ෂයේදී කෘත්‍රිම තණ තිල්ලක් ඇතිරීම සඳහා රුපියල් මිලියන 100ක ප්‍රතිපාදන ලැබී ඇති අතර, ප්‍රසම්පාදන පරිපාටියට අනුව කටයුතු ආරම්භ කර ඇති අතර, ඉදිරි මාස කිහිපය තුළ කොන්ත්‍රාත් ප්‍රදානය කර ඉදිකිරීම් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

(ආ) පැන නොනඟී.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඉදිරි මාස කිපය ඇතුළත ක්‍රීඩාංගණයේ සංවර්ධන කටයුතු සිදු වෙනවාය කියා ඔබතුමිය කියනවා නම්, අපි ඒ ගැන සතුටු වෙනවා. මා නියෝජනය කරන මාතලේ දිස්ත්‍රික්කයේ තමයි ලංකාවේ හොඳම හොකී ක්‍රීඩකයන් හිටියේ. අද ඒ තත්ත්වය නැති වෙලා ගිහින් තිබෙනවා. මොකද, පසුගිය යුගය පුරාවට එම ක්‍රීඩාවට අදාළ සංවර්ධන කටයුතු සිදු නොවුණු නිසා. දැන්වත් ඒ කටයුතු සිදුවෙනවා නම් අප සතුටු වෙනවා. මම ඔබතුමියගෙන් අහන අතුරු ප්‍රශ්නය මෙයයි.

අපේ ගම්වල තරුණ-තරුණියෝ රූපවාහිනිය හෝ දුරකථනය වැනි දේවලට යොමු වීම තුළ අද ඔවුන් ක්‍රීඩා පිටියට එන එක අඩු වෙලා තිබෙනවා. ඒ අය ක්‍රීඩා පිටියට ගෙන්වා ගැනීම සඳහා මේ වෙනකොට ඔබතුමියගේ අමාත්‍යාංශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු කථානායකතුමනි, ගම්බදව පවතින ක්‍රීඩා සමාජවලට උදවු උපකාර කිරීම වැනි කාරණා විශේෂයෙන්ම අප කරනවා. ඒ වාගේම ජාතික වශයෙන් මුළු ශ්‍රී ලංකාව තුළම ක්‍රීඩාව දියුණු කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කරනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

අපේ කාන්තාවන් ක්‍රීඩාවෙන් දැන් බොහොම ඉදිරියට ඇවිත් තිබෙනවා. ඒ අය ක්‍රිකට් ක්‍රීඩාවෙනුත් ඉදිරියට ඇවිත් තිබෙනවා. මේක ප්‍රශ්නයක් විධියට නොවෙයි මම අහන්නේ. මම යෝජනාවකුයි මේ කරන්නේ, ගරු රාජ්‍ය ඇමතිතුමියනි. පාසල් මට්ටමින් බොහොම දක්ෂ දැල් පන්දු ක්‍රීඩිකාවන් ඉන්නවා. ඒ අයට ඉදිරියට එන්න ක්‍රීඩා අමාත්‍යාංශය මැදිහත් වෙලා විශේෂ ක්‍රමවේදයක් හදා දෙන්න කියා මම ඉල්ලීමක් කරනවා.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ඒක බොහොම හොඳ යෝජනාවක්, ගරු මන්ත්‍රීතුමියනි.

ඇත්තටම අද අපට සතුටු වෙන්න පුළුවන්. මොකද, දීර්ඝ කාලයකට පස්සේ මේ වසරේ තමයි අපේ රටේ netball ක්‍රීඩාව සම්බන්ධයෙන් ආසියානු දැල්පන්දු ශූරතාව දිනා ගනු ලැබුවේ. ඒ අයටත් සුබ පතන ගමන් අපි netball ක්‍රීඩාව ප්‍රචලිත කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරනවා.

## බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව: ලැබුණු පැමිණිලි

## பாரிய மோசடி, ஊழல், அதிகார துஷ்பிரயோகம், அரச சொத்துக்கள் மற்றும் சிறப்புரிமைகளை துஷ்பிரயோகம் செய்தல் தொடர்பாக விசாரணை செய்தல் பற்றிய சனாதிபதி விசாரணை ஆணைக்குழு: கிடைக்கப்பெற்ற முறைப்பாடுகள்

## PRESIDENTIAL COMMISSION OF INQUIRY INTO SERIOUS ACTS OF FRAUD, CORRUPTION AND ABUSE OF POWER, STATE RESOURCES AND PRIVILEGES: COMPLAINTS RECEIVED

176/'18

**5. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පිහිටුවූ දිනය කවරේද;

(ii) 2017.09.01 දින වනවිට එයට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට එම කොමිෂන් සභාව විසින් පරීක්ෂණ අවසන් කර භාරදී ඇති විමර්ශන කවරේද;

(iv) එම කොමිෂන් සභාවේ නිර්දේශ අනුව මේ වනවිට ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**පිරතම අමෙච්චරුම් තේසිය කොල්කෙකළ් මර්රුම් පොරුළාතාර අලුවල්කළ් අමෙච්චරුමානවරෙක් කේට්ට විනා:**

(அ) (i) பாரிய மோசடி, ஊழல், அதிகார துஷ்பிரயோகம், அரச சொத்துக்கள் மற்றும் சிறப்புரிமைகளை

துஷ்பிரயோகம் செய்தல் தொடர்பாக விசாரணை செய்தல் பற்றிய சனாதிபதி விசாரணை ஆணைக்குழு தாபிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) 2017.09.01ஆம் திகதியளவில் அதற்குக் கிடைத் திருந்த முறைப்பாடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) குறித்த ஆணைக்குழு இன்றளவில் விசாரணை களை நிறைவுசெய்து ஒப்படைத்துள்ள புலனாய்வுகள் யாவை என்பதையும்;

(iv) மேற்படி ஆணைக்குழுவின் சிபாரிசின்படி இதுவரை எடுத்துள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the date on which the Presidential Commission of Inquiry to Investigate and Inquire into Serious Acts of Fraud, Corruption and Abuse of Power, State Resources and Privileges was established;

(ii) the number of complaints received by it as at 01.09.2017;

(iii) the allegations against which the said Commission has concluded its investigations and reports handed over; and

(iv) the measures taken in respect of the recommendations made by that Commission so far?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2015 මාර්තු මස 03වැනිදා.

(ii) 1,599යි.

(iii) 401යි.

(iv) ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு:*
*Annexure tabled:*

එම කොමිෂන් සභාවේ නිර්දේශය අනුව,

| | | |
|---|---|---|
| 1. | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හා නීතිපතිතුමන් වෙත සුදුසු පරිදි නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කළ පැමිණිලි/ පෙත්සම් සංඛ්‍යාව | 59 |
| 2. | ඉදිරි සුදුසු කටයුතු සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කළ පැමිණිලි/පෙත්සම් සංඛ්‍යාව | 70 |
| 3. | ඉදිරි සුදුසු කටයුතු සඳහා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය (FCID) වෙත යොමු කළ පැමිණිලි/ පෙත්සම් සංඛ්‍යාව | 42 |
| 4. | ඉදිරි සුදුසු කටයුතු සඳහා අපරාධ විමර්ශන කොට්ඨාසය (CID) වෙත යොමු කළ පැමිණිලි/ පෙත්සම් සංඛ්‍යාව | 21 |
| 5. | ඉදිරි සුදුසු කටයුතු වෙනත් විමර්ශන ආයතන වෙත යොමු කළ පැමිණිලි/ පෙත්සම් සංඛ්‍යාව | 07 |
| 6. | විමර්ශන සිදුකර විධි නියෝගයට අනුකූල නොවීම මත අවසන් කළ පැමිණිලි/පෙත්සම් සංඛ්‍යාව | 202 |
| | ඒ අනුව විභාග කර අවසන් කර ඇති පැමිණිලි/ පෙත්සම් සංඛ්‍යාව | 401 |
| | විමර්ශන සිදු කිරීමට පෙර විධි නියෝගයට අනුකූල නොවීම මත ප්‍රතික්ෂේප කළ පැමිණිලි/පෙත්සම් සංඛ්‍යාව | 1198 |
| | ලැබුණු මුළු පැමිණිලි/පෙත්සම් සංඛ්‍යාව | 1599 |

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පිහිටුවලා අවුරුදු තුනහමාරකට ආසන්න කාලයක් ගත වෙනවා. මෙම පැමිණිලි හා පෙත්සම් 1,599 දැනට විවිධ ආයතනවලට යොමු කළා කියා ඔබතුමා කිව්වාට, මම දන්නා හැටියට තවම ඒ ආයතන මඟින් එක පැමිණිල්ලකටවත් නඩු පවරා නැහැ. පැමිණිලි විමර්ශනය කර තිබෙනවා, ඒ ආයතනවලට යොමු කර තිබෙනවා, ඒ වාගේම රටට මේ වාර්තා එළිදරවු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ මුදල් පාවිච්චි කර මීගමුව කළපු ව්‍යාපෘතිය කරපු අවභාවිත සම්බන්ධයෙන් නම් ගම් ඇතිව තොරතුරු එළිදරවු වුණා. මම අහන්න කැමැතියි, මේවාට නඩු පැවරීම් කර ජනතාවගේ මුදල් අවභාවිත කිරීම සම්බන්ධයෙන් ඒ අයට එරෙහිව ගනු ලබන ක්‍රියා මාර්ග මොනවාද කියා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, ඒ අවශ්‍ය කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට බොහෝ දේ යොමු කර තිබෙනවා. නමුත්, මට දැනගන්න තිබෙන විධියට ඔබතුමා කියපු ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ චෝදනාව සම්බන්ධයෙනුත් මහාධිකරණයේ අධිචෝදනා ගොනු කර තිබෙනවා.

මම ඊයේ-පෙරේදා දැක්කා, මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වාර්තා 34ක් ඉදිරිපත් කර තිබුණු බව. ඒවා අපි බොහෝ දුරට පාර්ලිමේන්තුවේ විවාදයට ගත්තෙත් නැති තරම්. ඒ වාගේම, ඇවන්ට්ගාඩ් ගනුදෙනුවේ දූෂණ, වංචා සම්බන්ධයෙනුත්

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

අධිචෝදනා ගොනු කළාය කියා මේ දවස්වල පුවත් පත්වල තිබුණා අපි දැක්කා.

මම දන්නා තරමින් නීතිපති දෙපාර්තමේන්තුව ක්‍රම ක්‍රමයෙන් මහාධිකරණයේ අධි චෝදනා ගොනු කරමින් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පැමිණිලි විභාග කර, 2015 සැප්තැම්බර් සිට චූදිතයන් නම් කර, චූදිතයන්ට අදාළ චෝදනා ගොනු කර, චෝදනාවට අදාළ වැරැද්ද සඳහන් කර අපට පෙනෙන හැටියට ඉතාමත්ම සවිස්තරව වාර්තා ඉදිරිපත් කළා. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා මතු කළ කරුණුවලට අමතරව එහි ඇවන්ට්ගාඩ් ගනුදෙනුවේ දූෂිතයන් 13දෙනා නම් කර, ඒ අයගේ වැරැද්ද මොකක්ද, ඒ අයට දිය යුතු දඬුවම මොකක්ද කියා යෝජනා කර තිබෙනවා. ඒවාට නඩු පවරා තිබෙනවාද?

ඊට අමතරව නිවාස සංවර්ධන අධිකාරියේ දූෂිතයන් ගණනාවක් -පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළුව- නම් කර තිබෙනවා, වැරැද්ද සඳහන් කර තිබෙනවා, චෝදනාව සඳහන් කර තිබෙනවා. පසුගිය කාලයේ පොල් සංවර්ධන මණ්ඩලය භාරව සිටි ඇමතිවරයා -වර්තමාන ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ තනතුරක් දරනවා.- එම වාර්තා 34න් 2ක වැරදිකරු කර තිබෙනවා. ඒවාට අදාළව නඩු පවරා තිබෙනවාද? මම මේ පිළිබඳව නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයාගෙනුත් ඇහුවා. බරපතළ ගණයේ මූල්‍ය අවභාවිත පිළිබඳව, ITN එකේ මුදල් වංචා පිළිබඳව කෙළින්ම චෝදනා කර, චූදිතයන් නම් කර -හිටපු රාජ්‍ය නායකයන්ගේ නම් සමඟ- තිබෙනවා. ඔබතුමන්ලා ඒවා දේශපාලන වශයෙන් පාවිච්චි කර ගන්නවාද, එහෙම නැතිනම් සාධාරණ ක්‍රමවේදයකට අනුව නඩු අහන්න දෙනවාද කියා අපි දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු කථානායකතුමනි, මේ රටට ඉතාමත්ම පැහැදිලිව පෙනෙනවා, නීතිපතිවරයා ඒ අවශ්‍ය චෝදනා සම්බන්ධව අධිකරණයේ නඩු ගොනු කර තිබෙන බව. දැනට අපේ පක්ෂයේ ඉහළ නිලයක් දරන හිටපු ඇමතිවරයෙක් සම්බන්ධයෙනුත් මෙවැනි සිද්ධියක් වාර්තා වුණා. අපේ දේශපාලන අවශ්‍යතාවකට, "එහෙම කරන්න, මෙහෙම කරන්න" කියා නීතිපතිවරයාට කියනවාය කියා මම විශ්වාස කරන්නේ නැහැ. මම විශ්වාස කරන්නේ, නීතිපතිවරයා තම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හරහා ඒ චෝදනා ගොනු කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බවයි.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කියපු කාරණය මමත් පිළිගන්නවා. ITN නාලිකාවේ රුපියල් මිලියන 110ක advertisements දමලා ඒවාට ගෙවන්නේ නැතිව ඒ සම්බන්ධයෙන් හිටපු රාජ්‍ය නායකයාගේ නම පවා සඳහන් වෙනවා. මම හිතන විධියට ඒ වැරැද්දට දිය යුතු දඬුවමත් ඒ කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. එතුමා පමණක් නොවෙයි, ඉදිරියේදී ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්න ඕනෑය කියන පුද්ගලයන්ගේ නම් පවා මෙහි සඳහන් වෙලා තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපිත් බලාපොරොත්තු වනවා, ඒ සම්බන්ධයෙන් නිසි පියවර නීතිපතිවරයා වහාම ගනීවි කියලා. මොකද, කවුරු හෝ වරදක් කළා නම්, දේශපාලන පක්ෂ භේදයකින් තොරව සියලුම දෙනාට ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක විය යුතුයි කියන එකයි අපේ මතය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6-210/'18-(1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Public Enterprise and Kandy City Development, I ask for two weeks' time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර:රත්නපුර දිස්ත්‍රික්කය
## எரிபொருள் நிரப்பு நிலைய உரிமப்பத்திரங்கள்: இரத்தினபுரி மாவட்டம்
## FILLING STATION LICENCES: RATNAPURA DISTRICT

258/'18

**7. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2010 වර්ෂයේ සිට රත්නපුර දිස්ත්‍රික්කය සඳහා ලබා දී ඇති ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍ර ලබාගත් පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම බලපත්‍ර ලබාදීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் வருடம் முதல் இரத்தினபுரி மாவட்டத்துக்கு வழங்கப்பட்டுள்ள எரிபொருள் நிரப்பும் நிலையங்களுக்கான உரிமப் பத்திரங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி உரிமம்பத்திரங்களைப் பெற்றுக் கொண்ட ஆட்களது பெயர் மற்றும் முகவரி யாது;

(iii) மேற்படி உரிமப்பத்திரங்களை வழங்கும் போது பின்பற்றப்பட்ட முறையியல் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Petroleum Resources Development:

(a) Will he inform this House -

(i) the total number of filling station licences that have been issued to the Ratnapura District since 2010;

(ii) the names and addresses of the persons to whom those licences have been issued; and

(iii) the methodology that has been adopted in issuing those licences?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය (ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (டாக்டர்) (திருமதி) அனோமா கமகே - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Anoma Gamage - Deputy Minister of Petroleum Resources Development)

ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) බලපත්‍ර සංඛ්‍යාව 16යි.

(ii) අදාළ විස්තර ඇමුණුමෙහි දක්වා ඇත. එය **සභාගත*** කරමි.

(iii) මේ සම්බන්ධයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රමවේදයක් තිබෙනවා. Filling stations 2ක් අතර දුර කිලෝමීටර් 6ක් තිබෙන්න ඕනෑ. නමුත්, ඒක නාගරික ප්‍රදේශවලට බලපවත්වන්නේ නැහැ. පාරට මුහුණලා අඩි 125ක දුරක් තිබෙන්න ඕනෑ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 30ත්, 40ත් අතර වන්න ඕනෑ.

සංස්ථාවේ නිර්ණායකයන් සම්පූර්ණ කරනු ලැබුවද ඉන්ධන පිරවුම්හලක් පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදීමට ප්‍රථම පහත සඳහන් ආයතනවල නිර්දේශයන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අනිවාර්යය ලෙස සලකා බලනු ලබයි.

1. ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය
2. මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය
3. අදාළ ප්‍රාදේශීය සභා/නගර සභාවල නිර්දේශය
4. මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්දේශය
5. අදාළ භූමිය පිහිටි ප්‍රදේශය අනුව අත්‍යවශ්‍ය වන අනෙකුත් ආයතනවල නිර්දේශයන්.

(ආ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

***NEW DEALERSHIP PROJECT - MKT***

| | | NAME OF DEALER | ADDRESS | LOCATION | DISTRICT |
|---|---|---|---|---|---|
| | DA | Mr K D N T K Upasena | Pansala Rd,Palmadulla, | Kuruwita | Ratnapura |
| 2 | DA | Mr R Ranaweeraarachchi | Aluth Walawwa,Thunkama | Thunkuma | Ratnapura |
| 3 | DA | Mr P H R D Daya Pathirana | Dambegoda,Wijeriya Ratnapura | Hidellana Junction | Ratnapura |
| 4 | DA | M/s D S S N Auto Eng Ltd | No 278, Colombo Road, Ratnapura | Rathnapura | Ratnapura |
| 5 | DA | R A Premadasa | Prasanga Garment Alpitiya, Godakawela | Rideewita jun. | Ratnapura |
| 6 | DA | P D Wanniarachchi | Pavithragara, Rilhena, Pelmadulla | Ganegama | Ratnapura |
| 7 | DA | Mr U L Chandana Methsen | No 01, Srimaha vihara Rd, Pamankada, Dehiwala | Thoranagoda | Ratnapura |
| 8 | DA | Lionel Gunatilaka | No.512, Getahetta, Huladduwa | Divurumpitiya | Ratnapura |
| 9 | DA | G A B Pilapitiya | Vitanakanda Watta,Delwala, Ratnapura | Kalawana | Ratnapura |
| 10 | DA | Belihuloya Travels | Belihuloya Travel,Belihuloya Pambahinna | Belihuloya | Ratnapura |
| | CON | Kiriella MPCS | Idangoda Kiriella | Idangoda | Ratnapura |
| 12 | CON | Otora pvt Ltd | 122 B-1, Thalawa,Haltota, Bandaragama | 99 Junction | Ratnapura |
| 13 | CON | C S Ranaweeraarachchi | Aluth walawwa,Thunkuma, Embilipitiya. | Embilipitiya | Ratnapura |
| 14 | CON | B K J S Amaradasa | 181,Haputale rd,Kiringala | Balangoda | Ratnapura |
| 15 | CON | S A P H Subasingha | Tanjantenna,Balangoda | Pambahinna | Ratnapura |
| 16 | CON | W K P L DeAlwis | Weligepola,Balangoda | Weligepola | Ratnapura |

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් මම ගරු නියෝජ්‍ය ඇමතිතුමියට ස්තුතිය පළ කරනවා. ගරු කථානායකතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු කථානායකතුමනි, ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් මිල උච්චාවචනයත් එක්ක ඇතිවන තෙල් මිල වැඩිවීම පාලනය කිරීම කිසිම රජයකට පහසු වන්නේ නැහැ. පසුගිය රජයත් ඒ ගැටලුවට මුහුණ දුන්නා. ඒ වාගේම මේ රජයටත් ඒ ගැටලුවට මුහුණ දෙන්න සිදුවනවා. නමුත් ගරු නියෝජ්‍ය ඇමතිතුමියනි, ඉතිහාසයේ සමහර අවස්ථාවල ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ශීඝ්‍රයෙන් අඩු වුණු වෙලාවට ඒ වාසිය මේ රටේ ජනතාවට ලැබුණේ නැති බව අපි දන්නවා. එවැනි අවස්ථාවලදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දු පවා නොතකා සමහර රජයන් තමන්ට හිතැඟි පරිදි කටයුතු කළා.

අද වනකොට තිබෙන සැබෑ තත්ත්වය මේ රටේ ජනතාවට දැන ගන්න තිබෙන අයිතිය අහිමි කරලා, ව්‍යාජ ආර්ථික විශේෂඥයෝ වෙනස් වෙනස් අංක ගණිත ක්‍රමවලින් රටේ ජනතාව මුළා කරන මහා ලොකු මාධ්‍යකරණයක නිරත වෙනවා. මේ සැබෑ තත්ත්වය මේ රටේ ජනතාවට අවබෝධ කරලා දෙන්න, බොරු බේගල්වලින් ජනතාවගේ මනස විකෘති කරන ප්‍රකාශවලට පිළිතුරක් දෙන්න ආයතනය විසින්, අමාත්‍යාංශය විසින් යම්කිසි ක්‍රියා මාර්ගයක් ගැනීම අවශ්‍යයි. මා ඔබතුමියගෙන් දැන ගන්න කැමැතියි, මේ චෝදනා සම්බන්ධව ඉදිරිපත් කරන අසත්‍ය ප්‍රචාරවලට මුහුණ දෙන්න පාරිභෝගිකයා වෙනුවෙන් අමාත්‍යාංශය විසින් කරනු ලබන යම් වැඩසටහනක් තිබෙනවාද කියලා.

**ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (டாக்டர்) ((திருமதி) அனோமா கமகே)
(The Hon. (Dr) (Mrs.) Anoma Gamage)
ගරු මන්ත්‍රීතුමනි, අද ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ඉහළ ගිහින් තිබෙනවා. අගෝස්තු 01වන දා වනකොට ඔක්ටේන් 92 ඉන්ධන බැරලයක මිල ඩොලර් 81.31ක් වශයෙන් තමයි තිබුණේ. සැප්තැම්බර් 03වන දා වනකොට ඉන්ධන බැරලයක මිල ඩොලර් 86.55ක් වෙලා තිබෙනවා. සමහර විට ලබන වතාවේ මිල වැඩි වෙන්නත් පුළුවන්. නමුත් මිල සූත්‍රය හඳුන්වා දීමත් එක්ක ලෝක වෙළෙඳ පොළේ ස්වභාවය බැලුවොත්, සාමාන්‍යයෙන් ශීත කාලය කිට්ටු වනකොට වෙළෙඳ පොළේ මිල වැඩිවෙලා තිබෙනවා. නමුත් ඉදිරියේදී පෙබරවාරි, මාර්තු මාස වනකොට වෙළෙඳ පොළේ ඉන්ධන මිල අඩු වනකොට, මිල සූත්‍රයත් එක්ක අපට ඉන්ධන මිල පාලනය කරන්න පුළුවන් වෙනවා. නමුත් ඇත්තටම දැන් මිනිසුන්ට ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, ඉන්ධන මිල වැඩි කළාම බඩු මිල වැඩි කිරීමත්, ඉන්ධන මිල අඩු කළාම බඩු මිල අඩු නොකිරීමත් තමයි. ඉන්ධන මිල වැඩි කිරීමට සාපේක්ෂව නොවෙයි බඩුවල මිල වැඩි කරන්නේ. අද උදේ කැබිනට් මණ්ඩලයේදීත් මේ සම්බන්ධයෙන් කථා කළා. ඩීසල් මිල රුපියලකින් වැඩි කළොත් පාන් ගෙඩියක මිල රුපියල් 5කින් වැඩි කරනවා. අනික් දේවල්වල කිසිම මිල පාලනයක් නැහැ. ඩීසල් මිල වැඩි වුණාය කියන කාරණය උපයෝගී කරගෙන හැම භාණ්ඩයකම මිල වැඩි කරනවා. නමුත් අපි ඉන්ධන මිල අඩු කළ වෙලාවේ කවුරුවත් බඩු මිල අඩු කළේ නැහැ. ඒ නිසා මේ ගැන දැනුවත් කිරීමේ වැඩසටහනක් අමාත්‍යාංශයෙන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. වෙන රටවල් හැම දාම ඉන්ධන මිල වෙනස් කරනවා. ඉන්දියාවේ හැම දාම ඉන්ධන මිල වෙනස් කරනවා. කාටවත් ඒක තේරෙන්නේ නැහැ. ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල අඩු වීමත් එක්ක අපි අනිවාර්යයෙන්ම මිල අඩු කරනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, point of Order එකක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද? [බාධා කිරීම්] Hon. Hesha Withanage, first finish asking the Supplementary Questions. තව අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අතුරු ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්නේ නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න අවසන් වුණාම ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්නය අහලා අවසන් වුණාම, ඔබතුමාට point of Order එක ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්නම්.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ප්‍රශ්නය අහලා ඉවර වුණාම අවස්ථාව දෙන්නම්. ඔබතුමා පාර්ලිමේන්තුවට disturb කරනවා නේ. මන්ත්‍රීවරයෙකුට ප්‍රශ්නයක් අහන්න දෙන්නේත් නැහැ, disturb කරනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමියනි, මම ඔබතුමියට කිව්වේ මෙයයි. මේක තමයි ඇත්ත තත්ත්වය. මේ රටේ මිනිසුන්ගේ මනස විකෘති කරන්න බොරු බේගල් කියමින් ඉන්නකොට ඔබතුමිය සැබෑ තත්ත්වය -ඇත්ත- කියනකොට අහගෙන ඉන්න බැරි තත්ත්වයක් ඇති. මම ඔබතුමියට කියනවා, මේකට විශේෂයෙන්ම -[බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දැන් ඩොලර් එක කීයද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මන්ත්‍රීතුමා වාඩි වෙන්න. ඔබතුමා දැන් කොච්චර කථා කළාද? ඔබතුමා දැන් හතර-පස් දෙනෙකුට disturb කළා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ඩොලර් එක ඒ දවස්වල තිබුණු ගණනයි, දැන් තිබෙන ගණනයි බැලුවාම පැහැදිලි කරගන්න පුළුවන්. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමියනි, මම ඔබතුමියට කියනවා, මේ "පව කණ්ඩායම" පවත්වන මාධ්‍ය සාකච්ඡාවලට පිළිතුරු දෙන්න පුළුවන් වැඩසටහනක් හදන්න කියලා. මොකද, මේ රටේ මිනිසුන්ට සංවේදී ප්‍රශ්නයක් වන තෙල් මිල පිළිබඳව දැන ගන්න ඕනෑ; මේ වෙන සිද්ධිය මොකක්ද කියන එක දැන ගන්න ඕනෑ. අවුරුදු ගණනක් තිස්සේ තෙල් මිල මහා විශාල ප්‍රමාණයකින් වැඩි වුණා. මේ ආණ්ඩුව බලයට පත් වුණු ගමන් තෙල් මිල අඩු කළා. ඒ අඩු කරපු කාලයේ කටවල් වැඟිලා තිබුණා. දැන් ලෝක වෙළෙඳ පොළේ බොරතෙල් මිල වැඩිවීමත් සමඟ රජයක් විධියට යම් යම් ක්‍රියාමාර්ග ගන්න සිද්ධ වෙනවා. දෙවන අතුරු ප්‍රශ්නය විධියට ගරු නියෝජ්‍ය ඇමතිතුමියගෙන් මම මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. මේ රටේ සංස්කෘතියේ කොටසක් වෙලා තිබුණා, සම්ප්‍රදායයක් තිබුණා, filling station එකක් ගන්න දේශපාලනඥයෙක් වෙන්න ඕනෑ කියලා. මේ රටේ බහුතරයක් -සියයට 90ක්ම- filling stationsවල අයිතිය තිබෙන්නේ මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට. හැබැයි, අපි පසුගිය අවුරුදු තුනේ කොහේවත් එහෙම දෙයක් වෙනවා දැක්කේ නැහැ. ඒ නිසා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමියගෙන් අහනවා, මේ සංස්කෘතිය නිර්මාණය වෙලා තිබෙන්නේ කොහොමද, නියෝජ්‍ය අමාත්‍යවරිය විධියට ඔබතුමියට ඒ ඉතිහාසය ගැන අවබෝධයක් තිබෙනවාද කියලා.

**ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (டாக்டர்) ((திருமதி) அனோமா கமகே)
(The Hon. (Dr) (Mrs.) Anoma Gamage)
ඇත්තටම මම පත් වුණාට පසුව ඒ සඳහා අවශ්‍ය නිර්ණායක බොහොම පැහැදිලිව දමලා තිබෙනවා, මෙන්න මේ නිර්ණායක ඇතුළේ තමයි අපි filling station එකක් දෙන්නේ කියලා. මොකද, වෙනදාට මිනිස්සු මහන්සි වෙලා filling station එකට අවශ්‍ය දේවල් ඔක්කෝම කළාට පසුව දෙන්න බැහැ කියලා reject කරනවා. ඔබතුමා කියපු විධියට ඒ අතරේ හැම තැනම මුදල් ගනුදෙනුත් සිද්ධ වුණු බව මම දන්නවා. දැන් අපි ඒක නවත්වලා තිබෙනවා. ඔබතුමන්ලාට අහන්න පුළුවන්, කවදාද අපි filling stationsවලට සල්ලි අරගෙන තිබෙන්නේ කියලා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමියට පිළිතුරු දෙන්න අවස්ථාව දෙන්න.

**ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (டாக்டர்) ((திருமதி) அனோமா கமகே)
(The Hon. (Dr) (Mrs.) Anoma Gamage)
මම දන්නවා, filling station එකක් සල්ලි දීලා ගන්නවා කියන එක, ඇත්තටම ඒක නිකම් නියමයක් වෙලා තිබුණා කියා. නමුත් අපි දැන් ඒ තත්ත්වයෙන් මිදිලා තිබෙනවා. මට ඒ ගැන බය නැතුව කියන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ආචාර්යතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මම ගරු නියෝජ්‍ය ඇමතිතුමියගෙන් පැහැදිලි කිරීමක් කර ගන්නයි හදන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමිය සඳහන් කළා, ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වෙලා තිබෙනවා කියලා. නමුත් ඔබතුමියට පිළිගන්න සිද්ධ වෙනවා, අද වන විට ඩොලර් එකක ලංකා බැංකුවේ විකුණුම් මිල රුපියල් එකසිය හැටහතයි සත පහළොවක් බව. එවිට, රුපියල බාල්දුවීමත් සමඟ ආනයනය කරන තෙල් සඳහා ඔබතුමියට ගෙවන්න සිද්ධ වන මිල අනිවාර්යයෙන්ම දිගින් දිගටම වැඩි වෙනවා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ සම්බන්ධයෙන් වෙනම විවාදයකට යමු. මේක මෙතැනින් ඉවරයි. මේක පැහැදිලි කර ගැනීමක්.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
එදා මහින්ද රාජපක්ෂ යුගයේ ලෝක වෙළෙඳ පොළේ බොරතෙල් බැරලයක් රුපියල් අසූවට තිබෙනකොට අපි ඛනිජ තෙල් ලීටර් එකක් අළෙවි කළේ රුපියල් එකසිය පහළොවට. අද අළෙවි කරන්නේ රුපියල් එකසිය හතළිස්නවයට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is not a point of Order.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒ නිසා, මහින්ද රාජපක්ෂ යුගයට වඩා අද තෙල් මිල වැඩියි කියන එක අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is the point of Order, Hon. Leader of the House? - [*Interruption*.]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That Question is over now. Let us move on to the next Question.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මෙහෙම ප්‍රශ්න අහන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අහන්න බැහැ. That is right. We will move on to the next Question.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Prime Minister?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඇහුවේ තෙල් මිල ගැන ප්‍රශ්නයක්. ඒ පිළිබඳව දැනුවත් කරන්න අමාත්‍යාංශය කරන්නේ මොකක්ද කියලා තමයි එතුමා ඇහුවේ. ලෝකයේම ඩොලර් එක ශක්තිමත් වෙලා අනෙක් සියලුම මුදල් බාල්දුවෙලා තිබෙනවා. ඉන්දියාවට මෙය වෙලා තිබෙනවා; පාකිස්තානයට වෙලා තිබෙනවා. ලෝකයේ මුදල් අතර ඩොලරයේ අගය වැඩිවෙලා අනෙක් ඒවා අඩුවෙලා තිබෙනවා. ඒ නිසා බඩු මිල පිළිබඳ ප්‍රශ්නය හැම රටකටම තිබෙනවා. ඒ පිළිබඳව ඕනෑ නම් වෙනම විවාදයක් ගන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වෙනම විවාදයක් ගන්න පුළුවන්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒ වාගේම සමහරවිට රුපියල් 2,000කින් අපට ජීවත් වෙන්න පුළුවන් යුගයක් එයි. ඒ වන තෙක් අපි ලෝකයේ තිබෙන මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ. එච්චරයි තිබෙන්නේ. එදා ලංකාවේ තෙල් විකුණන කොට ගත්ත ලාභය බලන්න. විශාල ලාභයක් ගත්තා නේ. අද ඒක අඩු කරලා, ලෝකයේ තිබෙන තත්ත්වයට මුහුණ දෙනවා. අපි කිව්වේ ලෝක වෙළෙඳපොළේ මිල වැඩි වුණොත් අවාසිය ගන්න වෙයි; මිල අඩු වුණොත් වාසිය දෙනවා කියලායි. මෙතෙක් කල් වාසිය දුන්නා.

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට මිලදී ගත් ඉන්ධන පොම්ප : විස්තර
## இலங்கை மீன்பிடித் துறைமுகக் கூட்டுத்தாபனத்திற்கு கொள்வனவு செய்யப்பட்ட எரிபொருள் பம்பிகள்: விபரம்
## FUEL PUMPS PURCHASED FOR CEYLON FISHERY HARBOURS CORPORATION: DETAILS

401/'18

**8. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2013, 2014 හෝ ඊට ආසන්න වර්ෂයකදී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට ඉන්ධන පොම්ප (මනු කඩන) තොගයක් මිලදී ගත්තේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඉන්ධන පොම්පවල නිෂ්පාදිත රට, නිෂ්පාදිත වර්ෂය හා වර්ගය කවරේද;

(iv) එක් ඉන්ධන පොම්පයක මිල කොපමණද;

(v) ඒ සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම ඉන්ධන පොම්ප වර්ගය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රමිති පරීක්ෂණයෙන් අනුමත වූ ඒවාද;

(ii) එම පොම්ප මේ වනවිට භාවිතයේ පවතීද; නැතහොත්, භාවිතයෙන් ඉවත් කර තිබේද;

(iii) භාවිතයෙන් ඉවත්කර තිබේ නම්, එයට හේතුව කවරේද;

(iv) භාවිතයෙන් ඉවත් කර තිබේ නම්, එම පොම්ප මිලදී ගත් නිලධාරීන්ට එරෙහිව ගන්නා පියවර කවරේද;

(v) මෙම මිලදී ගැනීම හේතුවෙන් රජයට සිදු වූ මූල්‍ය පාඩුව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2013, 2014 அல்லது அதனை அண்மித்த வருடங்களில் இலங்கை மீன்பிடித் துறைமுகக் கூட்டுத்தாபனத்திற்கு ஒரு தொகை எரிபொருள் பம்பிகள் (மானி இடப்பட்ட) கொள்வனவு செய்யப்பட்டதா;

(ii) ஆமெனின், அதன் எண்ணிக்கை எவ்வளவு;

(iii) மேற்படி எரிபொருள் பம்பிகளை உற்பத்தி செய்த நாடு, உற்பத்தி வருடம் மற்றும் வகை யாது;

(iv) மேற்படி எரிபொருள் பம்பியொன்றின் விலை எவ்வளவு;

(v) அதற்காகச் செலவு செய்யப்பட்ட மொத்த நிதித் தொகை எவ்வளவு;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி எரிபொருள் பம்பி வகையானது இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்தின் தரப் பரிசோதனையின்மூலம் அங்கீகரிக்கப் பட்டவையா;

(ii) மேற்படி பம்பிகள் தற்போது பாவனையில் உள்ளனவா, பாவனையிலிருந்து நீக்கப் பட்டுள்ளனவா;

(iii) பாவனையிலிருந்து நீக்கப்பட்டிருப்பின், அதற் கான காரணம் யாது;

(iv) பாவனையிலிருந்து நீக்கப்பட்டிருப்பின் அந்த பம்பிகளைக் கொள்வனவு செய்த உத்தியோ கத்தர்களுக்கு எதிராக எடுக்கப்படும் நடவடிக்கை யாது?

(v) இந்தக் கொள்வனவு காரணமாக அரசுக்கு ஏற்பட்ட நிதிசார் நட்டம் எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs:

(a) Will he inform this House-

(i) whether a consignment of fuel pumps (meter readable) were purchased for the Ceylon Fishery Harbours Corporation in the years 2013, 2014 or a year close to those;

(ii) if so, how many;

(iii) the country of manufacture, the year of manufacture and the brand of the fuel pumps;

(iv) the price of a pump; and

(v) how much was spent in total?

(b) Will he also inform this House-

(i) whether the brand of fuel pumps concerned are those approved by the standard test of the Ceylon Petroleum Corporation;

(ii) whether those pumps are still in use or removed from use;

(iii) if they have been removed from use, what the reason was;

(iv) if they have been removed from use, what action will be taken against the officers who purchased the pumps concerned; and

(v) the financial loss caused to the Government by this purchase?

(c) If not, why?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඉන්ධන පොම්ප ඒකක 06යි.

(iii) නිෂ්පාදිත රට - චීනය

නිෂ්පාදිත වර්ෂය - 1995

වර්ගය - Fuel Dispenser - LANFEND - JDK 90C 1111 (single nozzle)

(iv) රු. 1,038,240.00 (ප්‍රවාහනය හා සවි කිරීම සහිතව)

(රුපියල් දසලක්ෂ තිස්අටදහස් දෙසිය හතලිහක් පමණි.)

(v) රු. 6,229,440.00 (ප්‍රවාහනය හා සවිකිරීම් සහිතව)

(රුපියල් හැටදෙලක්ෂ විසිනවදහස් හාරසිය හතලිහක් පමණි.)

(ආ) (i) ඔව්.

(ii) භාවිතයේ පවතී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(v) මූල්‍ය පාඩුවක් සිදු වී නොමැත.

(ඇ) පැන නොනඟී.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. 2013, 2014 වර්ෂවලදී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට මේ කියන මනු යන්ත්‍ර -තෙල් පොම්ප- මිලදී අරගෙන තිබෙනවා. හැබැයි, ඒ මිලදී ගත් පොම්ප මේ වනකොට භාවිතයේ තිබෙනවාය කියලා ගරු ඇමතිතුමා කිව්වාට එතුමා කිව්ව කාරණය සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් තොරයි. ඒ සියලු පොම්ප මේ වනවිට භාවිතයෙන් ඉවත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වූ සියලු තොරතුරු සහ ඡායාරූප මා ළඟ තිබෙනවා. ගරු ඇමතිතුමාට අදාළ නිලධාරීන් විසින් වැරැදි තොරතුරක් සපයලා වෙන්න ඇති කියලා මම හිතනවා.

මම නැවතත් මේ කාරණය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. 2002 වර්ෂයේ හෝ 2003 වර්ෂයේ -ගරු කථානායකතුමා විදුලි බල සහ බලශක්ති ඇමතිවරයා ලෙස හිටපු වකවානුව තුළ- මිලදී ගත් චීනයේ නිෂ්පාදිත තෙල් පොම්ප ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කෙරෙනවා. 2014 අවුරුද්දේ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට මිලදී ගත් පොම්ප ටික තමයි මේ කැඩිලා තිබෙන්නේ. මේ දෙකම එකම වර්ගයේ; එකම මිල. දෙවැනි වතාවට -2014 වර්ෂයේ- මිලදී ගත් පොම්පවල ප්‍රමිතියේ කිසි ගැටලුවක් නැතිව භාවිතයේ පවතිනවා කියන කාරණය සත්‍යයක්ද කියලා නැවතත් මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

2013, 2014 වර්ෂවල ගෙනාපු පොම්ප පාවිච්චි කරනවා. ඒවා පිළිබඳව ප්‍රශ්නයක් නැහැනේ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

නැහැ, ගරු ඇමතිතුමා. ඒ සියල්ල භාවිතයෙන් ඉවත් කරලා තිබෙනවා. ඒ පිළිබඳ වූ සියලු තොරතුරු මම ළඟ තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමාට ඒ තොරතුරු සියල්ල ලබා දෙන්න. එතකොට ඇමතිතුමාට ඒ සම්බන්ධයෙන් හොයා බලන්න පුළුවන්නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
2013, 2014 වර්ෂ කියන්නේ රාජපක්ෂ ආණ්ඩුව තිබුණු කාලයේ. පරණ බඩු වෙන්න ඇති ගෙන්වලා තිබෙන්නේ. මම ඒ ගැන හොයා බලා තොරතුරු කියන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන හොයලා බලන්න.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
රාජපක්ෂ ආණ්ඩුව,-

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ධීවර ඇමතිතුමා කවුරු වුණත් රාජපක්ෂ ආණ්ඩුව කාලයේ - 2013, 2014- තමයි ගෙන්වුවේ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විස්තර ලබා දෙන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමනි, මේ ආකාරයට පොම්ප ගෙන ඒම තුළින් මූල්‍ය පාඩුවක් සිද්ධ වී නැත කියා පිළිතුරේ ප්‍රකාශ කරනවා. ඒ පිළිතුර පිළිනොගන්නා අතරම මම ඔබතුමාගේ අවධානයට නැවතත් මේ කාරණය යොමු කරවනවා. ඒ පොම්ප ගෙනාපු කාලයේ -2014 වන විට- ඇමෙරිකන් ඩොලරයක් රුපියල් 131යි. හැබැයි, අද ඇමෙරිකන් ඩොලරයක් රුපියල් 167.15යි. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට හෝ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට මේ ආකාරයෙන් පොම්ප මිලදී ගැනීමට වැඩි මුදලක් ගෙවන්නට සිදු වීම තුළින් ඒ බරත් ජනතාවට දරන්න සිදු වීම තුළින් බනිජ තෙල් මිල ඉහළ යාම නතර කළ නොහැකි සාධකයක් බවට පත් වෙලා තිබෙනවා නේද?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
බනිජ තෙල් මිල ඉහළ යාම නතර කළ නොහැකි සාධකයක් බවට පත් වෙලා නැහැ. ලෝක වෙළෙඳ පොළේ මිල සූත්‍රය අනුව බනිජ තෙල් ලබා දෙන්න අපි අද වනකොට කටයුතු කරලා තිබෙනවා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මිල පිළිබඳව නොවෙයි මම අහන්නේ, ගරු ඇමතිතුමා. වැඩිපුර මුදලක් නැවත ගෙවන්න පාරිභෝගිකයාට සිද්ධ වන එක ගැනයි මම අහන්නේ.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
පාරිභෝගිකයාට නොවෙයි. ඩොලරය වැඩි වනකොට ඒ වැඩි වන ප්‍රමාණය ගෙවන්න ඕනෑ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
බොහොම ස්තුතියි.

## පානීය ජල සැපයුම: යාපනය දිස්ත්‍රික්කය
## குடிநீர் விநியோகம்: யாழ்ப்பாண மாவட்டம்
## SUPPLY OF DRINKING WATER: JAFFNA DISTRICT

412/'18

**9. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 1983 වර්ෂය වනවිට යාපනය දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුද්මය තත්ත්වය නිමවන තුරු පානීය ජලය ලබාදීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුද්මය තත්ත්වය නිමවීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983ஆம் ஆண்டளவில் யாழ்ப்பாண மாவட்டத்தில் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையினால் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங்கப்பட்டிருந்த வீடுகளின் எண்ணிக்கை யாது;

(ii) இன்றளவில் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங்கப்படுகின்ற வீடுகளின் எண்ணிக்கை யாது;

(iii) 1983ஆம் ஆண்டின் பின்னர் யுத்த நிலைமை முடிவடையும் வரை குடிநீர் வழங்குவதற்காக ஒவ்வோர் ஆண்டிற்கும் அரசாங்கம் ஒதுக்கிய மொத்தப் பணத்தொகை யாது;

(iv) யுத்த நிலைமை முடிவடைந்த பின்னர், 2015ஆம் ஆண்டுவரை குடிநீர் வழங்கல் கருத்திட்டங் களுக்காக அரசாங்கம் ஒதுக்கிய மொத்தப் பணத்தொகை ஆண்டு வாரியாகத் தனித் தனியாக எவ்வளவு;

(v) மேற்படி அனைத்தினதும் முன்னேற்ற அறிக்கையைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply:

(a) Will he inform this House-

(i) how many households within the Jaffna District had been connected to the supply of cleaned drinking water by the National Water Supply and Drainage Board by 1983;

(ii) how many households are provided with cleaned drinking water at present;

(iii) what amount in full was allocated by the Government in each year for providing drinking water until the end of the war situation after 1983;

(iv) what amount in full was allocated by the Government for projects implemented for the supply of drinking water, separately in respect of each of the years following the war situation until the year 2015; and

(v) whether he will table a progress report on all above?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) යුද්මය වාතාවරණය පැවැති කාලය තුළ සියලු ලියකියවිලි විනාශ වී ඇති හෙයින් මේ සම්බන්ධයෙන් කිසිදු දත්තයක් නොමැත.

(ii) 2018.03.31 දිනට ගෘහස්ථ ජල සම්බන්ධන සංඛ්‍යාව 4,978කි.

(iii) යුධමය වාතාවරණය පැවැති කාලය තුළ සියලු ලියකියවිලි විනාශ වී ඇති හෙයින් මේ සම්බන්ධයෙන් කිසිදු දත්තයක් නොමැත.

(iv)

| අංකය | ජල සම්පාදන ව්‍යාපෘතිය | | රුපියල් මිලියන | | | | | සටහන |
|---|---|---|---|---|---|---|---|---|
| | | 2011 | 2012 | 2013 | 2014 | 2015 | එකතුව | |
| 1 | මරුදන්කර්නි | - | 8.9 | 23 | 7.3 | - | 39.2 | උතුරු හදිසි ප්‍රතිසාධන ව්‍යාපෘතිය |
| 2 | වැල්වෙටිතුරෛයි | 53.3 | 147.3 | 49.3 | 54.6 | 18.5 | 323 | |
| 3 | පේදුරු තුඩුව | 39.7 | 109.8 | 164.2 | 187.6 | - | 501.3 | |
| 4 | ඩෙල්ෆට් | - | - | 8.9 | 23.7 | 75.4 | 108 | යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - මුහුදු ජලය ප්‍රති ආශ්‍රැතිකරණය |
| සම්පූර්ණ එකතුව | | 93 | 266 | 245.4 | 273.2 | 93.9 | 971.5 | |
| 2011 සිට 2015 දක්වා වෙන් කරන ලද මුදල: රු.මි. 971.5කි. | | | | | | | | |
| 5 | යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | මෙම ව්‍යාපෘතිය 2009 ආරම්භ කරන ලද අතර, පැවැති යුද්මය වාතාවරණය මත මෙම ව්‍යාපෘතිය මන්දගාමී ලෙස ක්‍රියාත්මක වන ලදී. නමුත් යුද්මය වාතාවරණය අවසන් වූ පසුව මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන ලදී.<br><br>මෙම ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 266කි. ව්‍යාපෘතිය 2020 වන විට අවසන් වීමටද නියමිතය. | | | | | |

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

| අංකය | ජල සම්පාදන ව්‍යාපෘතිය | වෙන් කරන ලද මුදල | ජල සම්බන්ධන ගණන | සටහන |
|---|---|---|---|---|
| 1 | මරුදන්කර්නි | 39,182,068.20 | පේදුරු තුඩුව ප්‍රාදේශීය සභාව වෙත භාර දෙන ලදී. | උතුරු හදිසි ප්‍රතිසාධන ව්‍යාපෘතිය |
| 2 | වැල්වෙට්තුරෙයි | 323,045,691.42 | ජල සම්බන්ධන 636 | |
| 3 | පේදුරු තුඩුව | 501,322,142.40 | ජල සම්බන්ධන 1185 | |
| 4 | ඩෙල්ෆ්ට් | 107,614.308.13 | ජල සම්බන්ධන 299 | යාපනය කිලිනොච්චි ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - මුහුදු ජලය ප්‍රති ආශ්‍රැතිකරණය |
| මුළු මුදල රුපියල් | | 971,164,210.15 | | |

(v) ඔව්.

(ආ) අදාළ නොවේ.

ඔබතුමාට අතුරු ප්‍රශ්න තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. එම අතුරු ප්‍රශ්න ගරු අමාත්‍යතුමාට යොමු කරන්න පුළුවන්.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මේ වන විට ලංකාවේ දිස්ත්‍රික්ක ගණනාවක් දැඩි වියළි කාලගුණයකට මුහුණ දෙමින් සිටින බව ඔබතුමාත් දන්නවා; මේ රටත් දන්නවා. දිස්ත්‍රික්ක 11කට ආසන්න ප්‍රමාණයක ලක්ෂ භයකට වැඩි ජනතාවක් පානීය ජල අර්බුදයකට මුහුණ පා සිටින බව මාධ්‍යවලින් වාර්තා කර තිබුණා. ගරු කථානායකතුමනි, මේ වන විට විශේෂයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කය, පොළොන්නරුව දිස්ත්‍රික්කය උග්‍ර ජල භීතියකට මුහුණ දෙමින් සිටිනවා. නේවාසිකව අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් 4,000කට ආසන්න පිරිසක් සිටින රජරට විශ්වවිද්‍යාලය තාවකාලිකව වසා දමන තැනට මේ අර්බුදය බලපා තිබෙනවා. ඒ විශ්වවිද්‍යාල දරුවෝ උග්‍ර පානීය ජල භීතියකට මුහුණ දෙමින් සිටිනවා. රජරට විශ්වවිද්‍යාලය යථා තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා පානීය ජල අර්බුදය විසඳීමට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ගනු ලබන පියවර කුමක්ද කියන ප්‍රශ්නය තමයි මම අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය. ඒ සඳහා කඩිනම් පියවරක් ගත යුතුව තිබෙනවා. මට මේ ප්‍රශ්නයට පිළිතුරක් අවශ්‍යයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ ප්‍රශ්නය කලින් අහලා තිබුණා නම් උත්තරය ගෙන්වා ගන්න තිබුණා. විෂයභාර ඇමතිතුමා නැති නිසා ඔබතුමාට ආවාට ගියාට උත්තරයක් දෙන්න මට බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එම ප්‍රශ්නය ඇමතිතුමාගේ හදිසි අවධානයට යොමු කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

අපි මේ ප්‍රශ්නය ඇමතිතුමාට යොමු කරලා ඔබතුමා දැනුවත් කරන්නම්.

කොහොමටත් අපේ රජය නියඟයටත්, ගංවතුරටත් දෙකටම ඔරොත්තු දෙන රජයක්.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැනට පානීය ජලය සම්බන්ධයෙන් විශාල අර්බුදයක් පවතිනවා. 2025 වර්ෂය විතර වනවිට ලෝකයේ සෑම රටකම ජලය ආශ්‍රිත රෝග සියයට 50කට ආසන්න ප්‍රමාණයක් හැදෙන තත්ත්වයක් නිර්මාණය වෙනවාය කියලා සමහර සමීක්ෂකයන් කියනවා. අපේ රටේ ජල පෝෂක ප්‍රදේශවලින් ලැබෙන ජලයෙන් තමයි අපේ රටේ වාරි මාර්ග, වැව් අමුණු ඇතුළු ජල ව්‍යාපෘති නිර්මාණය වෙලා තිබෙන්නේ. අපේ සමහර ග්‍රාමීය ජල ව්‍යාපෘති ජලසම්පාදන මණ්ඩලයෙන් - Water Board එකෙන් - ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒවා ප්‍රජා ජල ව්‍යාපෘති හැටියට ක්‍රියාත්මක වෙනවා. ඒවා ජනතාව විසින් තමයි නඩත්තු කරන්නේ.

ගරු කථානායකතුමනි, මට දැන ගන්න ඕනෑ මෙයයි. මේ ජල ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශවල ජල පෝෂක ප්‍රදේශ රැක ගැනීම සඳහා ජල සම්පාදන මණ්ඩලයේ අවධානය යොමු වෙන ප්‍රමාණය අඩුයි කියන එකයි මගේ නිගමනය. ඇතිවන ජල භීතය අවම කිරීමට සැලසුම් සකස් කරනවා මිස, ඒ ජල පෝෂක ප්‍රදේශ හා ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ජලය රැඳෙන තැන් රැක ගැනීමට වැඩ පිළිවෙළක් නැහැ. ඒ සඳහා දීර්ඝ කාලීන වැඩපිළිවෙළක් අත්‍යවශ්‍යයි. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් ගෙන ඇති පියවර මොනවාද? ගරු කථානායකතුමනි, රංජිත් මද්දුමබණ්ඩාර ඇමතිතුමාත් මේ සභාවේ ඉන්න නිසා, උදාහරණයක් හැටියට මොනරාගල ජීලෝන් වතුයායේ තිබෙන ජල යෝජනා ක්‍රමය ගැන සඳහන් කරන්න කැමැතියි. ඔබතුමාත් දන්නවා, 1991 වර්ෂයේ ලංකාවේ හොඳම ජල යෝජනා ක්‍රමයට ලැබුණු සම්මානය ලැබුණේ එම යෝජනා ක්‍රමයට බව. නමුත් අද ජීලෝන් ව්‍යාපෘතියෙන් ලැබෙන ජලය අපද්‍රව්‍ය සහිත ජලය බවට පත් වී තිබෙනවා. එහෙම වුණේ කාලයක් තිස්සේ ඒ ජල පෝෂක ප්‍රදේශවල ජනගහන ව්‍යාප්තිය හා අනවසර පදිංචිවීම් නිසායි. ඒක අපට විසඳා ගැනීමට නොහැකි වූ ප්‍රශ්නයක්. ඒ නිසා ඒ රක්ෂිත රැක ගන්න ඕනෑ. ජීලෝන් රක්ෂිතය ආරක්ෂා කරන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය මොකක්ද ගරු මන්ත්‍රීතුමා?

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මගේ අතුරු ප්‍රශ්නය මේකයි. ඇයි ඒවාට පිළියම් යොදන්නේ නැත්තේ? ජල සම්පාදන මණ්ඩලය ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය මොකක්ද? පරිසර අමාත්‍යාංශයත් මේකට සම්බන්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමාගේ අවධානයට ඒ ප්‍රශ්නය යොමු කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විස්තරාත්මක පිළිතුරක් එවන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ප්‍රශ්න අංක 10 - 442/'18-(2), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා : කාර්යාල සහ පෞද්ගලික කාර්ය මණ්ඩලය

## மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சர்: அலுவலகங்கள் மற்றும் பிரத்தியேகப் பதவியணி

## STATE MINISTER OF MAHAWELI DEVELOPMENT: OFFICES AND PERSONAL STAFF

464/'18

**11. ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) 2015 සිට 2017 වර්ෂය දක්වා ගෙවා ඇති මුළු කුලී/ බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රාජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) රාජ්‍ය අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரின் அமைச்சு அலுவலகங்களின் முகவரிகள் யாவை என்பதையும்;

(ii) அந்த அலுவலகங்களுக்காக வாடகை குத்தகை செலுத்தப்படின் அந்த மாதாந்த வாடகை/ குத்தகை தொகை எவ்வளவென்பதையும்;

(iii) 2015 - 2017ஆம் ஆண்டுவரை செலுத்தப் பட்டுள்ள மொத்த வாடகை/ குத்தகைத் தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இராஜாங்க அமைச்சரின் பிரத்தியேக பதவி யணியின் உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அந்த பிரத்தியேக பதவியணிக்கு ஒதுக்கப்பட்ட வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) இராஜாங்க அமைச்சருக்காக ஒதுக்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-
  (i) the addresses of ministerial offices of the State Minister of Mahaweli Development;
  (ii) if rent or lease is paid for the said offices, the monthly rental/lease; and
  (iii) the total rent/lease paid from the year 2015 up to the year 2017?

(b) Will he also inform this House-
  (i) the number of officials in the personal staff of the State Minister;
  (ii) the number of vehicles allocated for the said personal staff; and
  (iii) the number of vehicles allocated to the State Minister?

(c) If not, why?

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට අදාළ පිළිතුර සභාගත කරන්න කියා ඉල්ලා සිටිනවා. ඒ ඉතිරි වන වේලාව තුළ ඔබතුමාගේ අවසරය ඇතිව මට ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ප්‍රශ්නයට අදාළවමද? මේ ප්‍රශ්නයට අදාළ නැත්නම් අවසර දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේ ප්‍රශ්නයටම අදාළ නොවුණත්, අගමැතිතුමාටම අදාළ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්නයට ඔබතුමා පිළිතුර දෙනවාද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ඒකට අදාළ කරුණු මා ළඟ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, එතුමා ළඟ අවශ්‍ය කරුණු නැහැ කියනවා.

රාජ්‍ය ඇමතිතුමනි, පිළිතුර ලෑස්තිද?

**ගරු වීරකුමාර දිසානායක මහතා (මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க - மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Weerakumara Dissanayake - State Minister of Mahaweli Development)
ගරු කථානායකතුමනි, පිළිතුර ලෑස්තියි. මහවැලි සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරී ගොඩනැඟිල්ල, 11 වන මහල, නො. 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

(ii) කුලී හෝ බදු ගෙවන්නේ නැත.

(iii) ඉහත (අ) (ii) අනුව අදාළ නොවේ.

(ආ) (i) රාජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පෞද්ගලික ලේකම් | 01 |
| 02 | සම්බන්ධීකරණ ලේකම් | 02 |
| 03 | මාධ්‍ය ලේකම් | 01 |
| 04 | මහජන සම්බන්ධතා නිලධාරී | 01 |
| 05 | කළමනාකරණ සහකාර | 04 |
| 06 | රියදුරු | 02 |
| 07 | කාර්යාල කාර්ය සහායක | 02 |

(ii) රාජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | වෙන්කර ඇති වාහන සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පෞද්ගලික ලේකම් | 01 |
| 02 | සම්බන්ධීකරණ ලේකම් | 01 |
| 03 | මාධ්‍ය ලේකම් | 01 |

(iii) රාජ්‍ය අමාත්‍යවරයා සඳහා වාහන තුනක් (03) වෙන්කර ඇත.

(ඇ) පැන නොනඟී.

## පෞද්ගලික විදුලි ජනන සමාගම්වල විදුලි සැපයුම: විස්තර
## தனியார் மின்னுற்பத்திக் கம்பனிகளின்மூலமான மின்சார விநியோகம்: விபரம்
## ELECTRICITY SUPPLY BY PRIVATE ELECTRICITY GENERATING COMPANIES: DETAILS

470/'18

**12.ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ලංකාව තුළ ක්‍රියාත්මක වන පෞද්ගලික විදුලි ජනන සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම්වල නම්, ලිපිනයන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට එම එක් එක් සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දුන් විදුලි ඒකක සංඛ්‍යාව සහ එම එක් සමාගමකට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යහපාලන රජය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය මඟින් සිදු කරනු ලබන විදුලි ජනනය වැඩි කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை இலங்கையில் இயங்கும் தனியார் மின் உற்பத்திக் கம்பனிகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி கம்பனிகளின் பெயர்கள், முகவரிகள் மற்றும் பணிப்பாளர் சபை உறுப்பினர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) 2010ஆம் ஆண்டு தொடக்கம் மேற்படி ஒவ்வொரு கம்பனியினாலும் இலங்கை மின்சார சபைக்குப் பெற்றுக்கொடுக்கப்பட்ட மின்சார அலகுகளின் எண்ணிக்கை மற்றும் மேற்படி ஒவ்வொரு நிறுவனத்திற்கும் இலங்கை மின்சார சபையினால் செலுத்தப்பட்ட பணத்தொகை, ஒவ்வொரு ஆண்டு அடிப்படையில் தனித் தனியே யாவை என்பதையும்;

(iv) நல்லாட்சி அரசாங்கத்தின்கீழ் இலங்கை மின்சார சபையினூடாக மேற்கொள்ளப்படும் மின்னுற் பத்தியை அதிகரிக்கச் செய்வதற்கு மேற்கொள் ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the of Power and Renewable Energy:

(a) Will he inform this House-

(i) the number of private electricity generating companies functioning in Sri Lanka from the year 2010;

(ii) the names and addresses of the aforesaid companies and names of Director Board Members;

(iii) the number of electricity units provided to Ceylon Electricity Board by each company from year 2010 and the amount paid to each company by the Ceylon Electricity Board in each year separately; and

(iv) the measures that will be taken by the Ceylon Electricity Board to increase the electricity generation under the Good Governance Government?

(b) If not, why?

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පෞද්ගලික විදුලි බලාගාර සංඛ්‍යාව 233කි. ඉන් 13ක් තාප විදුලි බලාගාර. ඉතිරි ඒවා පුනර්ජනනීය බලශක්තිය හා සම්බන්ධ සුළං, සූර්ය, ජලවිදුලි සහ biomass බලාගාර.

(ii) එම සමාගම්වල නම්, ලිපිනයන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ විස්තර ඇමුණුම් අංක 01හි සහ 02හි සඳහන් කර තිබෙනවා.

(iii) 2010 වර්ෂයේ සිට එම එක් එක් සමාගම විසින් ලබා දෙන ලද විදුලිය ප්‍රමාණය, ගෙවන ලද මුදල් ප්‍රමාණය සම්බන්ධ සියලු විස්තර ඇමුණුම් අංක 3,4,5 සහ 6හි වෙන් වෙන්ව දක්වා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාට ඒ තොරතුරු ලබා ගන්න පුළුවන්.

(iv) වර්තමාන යහපාලන රජය යටතේ, විදුලිබල මණ්ඩලය මඟින් විදුලිය ජනනය වැඩි කිරීමට ගනු ලැබූ පියවර වශයෙන් කාරණා කිහිපයක් තිබෙනවා.

විදුලිබල මණ්ඩලය විසින් පිළියෙළ කරන 2018-2037 දිගුකාලීන ජනන සැලැස්ම අනුව, ඉදිරි වසර 20ක කාලය ඇතුළත විදුලිබල ධාරිතා ඉල්ලුම - Peak Demand - මෙගාවොට් 2525 සිට 6040 දක්වාද, වාර්ෂික බලශක්ති ඉල්ලුම ගිගා වොට් පැය 14600 සිට 36600 දක්වාද වැඩි වන බවට පුරෝකථනය කර තිබෙනවා.

මේ සඳහා පද්ධතියේ සමස්ත ධාරිතාව මොගාවොට් 4000ක සිට 11200ක් දක්වා වැඩි කරනවා. මේ සඳහා මූලිකව පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් මොගාවොට් 3000ක බලාගාර ද, ගල් අඟුරු හා ස්වාභාවික වායු මඟින් මෙගාවොට් 4200ක තාප විදුලි බලාගාරද, මෙගාවොට් 600ක ජල පොම්ප බලාගාර ද - pumped-storage - ඉදි කිරීමට නියමිතයි.

එම 2018-2037 දිගු කාලීන ජනන සැලැස්මට අනුකූලව 2025 වන විට සූර්ය බලාගාර ධාරිතාව මෙගාවොට් 685 දක්වා ද, සුළං විදුලි බලාගාර ධාරිතාව මෙගාවොට් 729 දක්වා ද ඇතුළුව සංයුක්ත පුනර්ජනනීය විදුලිබල ධාරිතාව මෙගාවොට් 1912 දක්වා වැඩි කිරීමට බලාපොරොත්තු වේ.

මීට අමතරව එම කාලය තුළ දී මොරගොල්ල, බ්‍රෝඩ්ලන්ඩ්ස්, උමා ඔය, සීතාවක, තල්පිටිගල හා ගිංගඟ ආශ්‍රිතව මෙගාවොට් 240ක සංයුක්ත ධාරිතාවෙන් යුතු ජල විදුලි බලාගාර ඉදි කිරීමට නියමිතය. ඒවායෙන් කොටසක දැන් වැඩ ආරම්භ කර තිබෙනවා. තවත් ඒවා ඉදිරියේදී සැලසුම් කර තිබෙනවා.

ලංකා විදුලිබල මණ්ඩලයේ දිගු කාලීන ජනන සැලසුම අනුව බස්නාහිර පළාත තුළ ද්විත්ව ඉන්ධන ප්‍රභව මඟින් ධාවනය වන ද්විත්ව චක්‍රීය විදුලි බලාගාර යෝජනා කර ඇත. මේවා ආරම්භයේ දී ඩීසල් මඟින් ධාවනය වන අතර පාරිසරික බලපෑම් අවම කිරීමට ස්වාභාවික වායු ආදේශනය කිරීමට යෝජනා කර ඇත. අපට දැනට ස්වාභාවික වායු ආදේශනයක් නැහැ. Terminal එකක් ඉදි කිරීමෙන් පසුව අපි ඒ සඳහා පියවර ගන්නවා.

මේ අනුව 2025 වන විට මෙගාවොට් 300ක ද්විත්ව චක්‍රීය බලාගාර 02ක් අලුතින් ඉදි කිරීමට නියමිත අතර පොසිල ඉන්ධන මඟින් දැනට ක්‍රියාත්මක මෙගාවොට් 630ක ධාරිතාවකින් යුතු විදුලි බලාගාර ස්වාභාවික වායු මඟින් ක්‍රියාත්මක කිරීමට පරිවර්තනය කිරීමට සැලසුම් සකසා ඇත. දැනට ඩීසල් මඟින් සහ HFO මඟින් ක්‍රියාත්මක වන ඒවාත් ස්වාභාවික වායුවලට පරිවර්තනය කරනවා.

මීට අමතරව ඉහළ කාර්යක්ෂමතාවකින් යුතු අවම පාරිසරික බලපෑමක් ඇති කරන අවම පිරිවැයෙන් යුතු ගල් අඟුරු තාප විදුලි බලාගාර ඉදි කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයේ සැලැස්මක් ඇත. මෙය යටතේ ඉදිවන ප්‍රථම මෙගාවොට් 300ක ගල් අඟුරු තාප විදුලි බලාගාරය 2023 වන විට ඉදි කර නිම කිරීමට සැලසුම් කර ඇත. වැඩි විස්තර සඳහා ඇමුණුම 07 බලන්න.

ඇමුණුම් **සභාගත*** කරමි.

කෙටි කාලීන විදුලි අර්බුදය මහ හැරවීම සඳහා මෙගාවොට් 320ක ඩීසල් තාප විදුලිබලාගාර ද ඇණවුම් කිරීමට සැලසුම් කර ඇත.

අපේ රටේ කාලගුණ තත්ත්වයන්හි ඇති වන විෂමතා අප නිරීක්ෂණය කර තිබෙනවා. ප්‍රධාන විදුලි බලාගාර ඉදි කර අවසන් වනතුරු, ඒ අතරතුර කාලයේ දී ඇති වන තත්ත්වයන්ට මුහුණ දීමට අදාළ ප්‍රතිකර්ම යොදා තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

විස්තරාත්මකව පිළිතුරක් සැපයීමට හැකි ආකාරයට මේ ප්‍රශ්නය ඇහුවාට බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මට පැහැදිලි කරගැනීමක් අවශ්‍යයි. මා එම ප්‍රශ්නය අහන්නද, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
එක් එක් බලාගාරවලින් විදුලිය මිලදී ගන්නා විට ඒවායේ මිල එකිනෙකට වෙනස්ද? සෑම බලාගාරයකින්ම ගන්නා විදුලිය ඒකකයක මිල සමානද? එය මගේ අතුරු ප්‍රශ්නය නොවෙයි. අතුරු ප්‍රශ්නය ඇසීම සඳහා දැනුවත් වෙන්නයි එය ඇසුවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)
සුළං විදුලිය හා සූර්ය විදුලිය පිළිබඳව සැලකුවොත්, දැනට ක්‍රියාත්මක වන සෑම බලාගාරයකම සම්මත මිල ගණන් අනුව මිල දී ගැනීම් කර තිබෙනවා. නමුත් තාප විදුලිය සම්බන්ධව කිව්වොත්, අපි දීර්ඝ කාලයක් තිස්සේ පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගන්නවා.

එම එක් එක් බලාගාරයේ විදුලි ඒකකයක මිල වෙනස්. එම බලාගාර ආරම්භ කරන අවස්ථාවේ ඇති වූ ගිවිසුම් අනුවයි එය සිදු වන්නේ. ඒ සඳහා මිල සූත්‍රයක් තිබෙනවා. ඉන්ධනයේ මිල අනුව - ඒ කියන්නේ, ඩීසල් හෝ HFO මිල අනුව- එම ඒකකය වෙනස් වෙනවා. ඒ වාගේම භාවිත කරන ප්‍රමාණය අනුව, මිල වෙනස් වනවා. ඒ කියන්නේ, ප්‍රමාණය අඩු වනකොට ඒකකයක මිල වැඩි වනවා; ප්‍රමාණය වැඩි වනකොට ඒකකයක මිල අඩු වනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, දීර්ඝ හා සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම ගැන ඔබතුමාට විශේෂයෙන්ම ස්තුති කරනවා. ඒ වාගේම ඔබතුමා විදුලිබල හා පුනර්ජනීය බලශක්ති අමාත්‍යාංශය තුළ විශාල කාර්ය භාරයක් ඉටු කරන රාජ්‍ය ඇමතිවරයා හැටියට, ගරු ඇමතිතුමා නොපැමිණියත් ඔබතුමා පැමිණ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන ආකාරය අපි දකිනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, විදුලිබල හා පුනර්ජනීය බලශක්ති අමාත්‍යාංශයේ මේ තිබෙන ප්‍රශ්න විසඳා ගැනීම සඳහා ඔබතුමන්ලා විශාල දායකත්වයක් සහ විශාල පිරිවැයක් දරමින් කටයුතු කරනවා. ඔබතුමන්ලාගේ එම යෝජනා සහ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වීම තුළ මේ රටේ පාරිභෝගිකයාට අවශ්‍ය පරිදි විදුලිය ලබා දෙන්න හැකියාව ලැබී තිබෙන බව අපි විශ්වාස කරනවා. මම අහන්න යන ප්‍රශ්නය සම්බන්ධව හා ඊට අදාළ සංඛ්‍යා ලේඛන පිළිබඳව සමහර විට ඔබතුමා දැනුවත්ව ඇති කියා මා විශ්වාස කරනවා. එසේ නොවේ නම් ඒ පිළිබඳව ඔබතුමා දැනුවත් කිරීම සඳහා මෙම ප්‍රශ්නය මා අහනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, පසුගිය දා මාධ්‍යයක පළ වෙලා තිබෙනවා මා දැක්කා, "අපේ රටේ පාසල් 300කට මේ වනකොට විදුලිය ලබා දී නැහැ" කියන කාරණය. අපේ කොතෙක් යෝජනා සාර්ථකභාවයේ තිබුණත් අපට යම් තැනක් අතපසු වී හෝ මහ හැරී තිබෙනවා නම්, විශේෂයෙන්ම ඔබතුමා මෙම අමාත්‍යාංශයේ වග කීමෙන් යුතුව කටයුතු කරන රාජ්‍ය අමාත්‍යතුමා විධියට ඒ පිළිබඳව ඔබතුමාට දන්වන එක මගේ යුතුකමක් විධියට මා සලකනවා. මේ කාරණය සත්‍යයද, අසත්‍යද? එය සත්‍යයක් නම්, ඒ සඳහා ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය ගන්නා වූ කඩිනම් වැඩ පිළිවෙළ කුමක්ද කියන එක මෙම ගරු සභාවට දන්වන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමනි, මමත් එම පුවත දැක්කා. මා එක දෙයක් කියන්න ඕනෑ. මේ රටේ සෑම ගමකටම, සෑම පාරකටම, සෑම නිවසකටම අපි විදුලිය ලබා දී තිබෙනවා. නිවාස 5ක් හෝ 6ක් තිබෙන පාරකට කවුරු හෝ කෙනෙක් විදුලිය ඉල්ලනවා නම්, අලුතෙන් නිවාස හැදුවත් අපි කැමැතියි මාස තුනක් ඇතුළත එම නිවාසවලට විදුලිය දෙන්න. ජනතාවට විදුලිය සැපයීම සඳහා විදුලිය හිඟයක් නැහැ. ඒ වාගේම අපි විශේෂයෙන්ම "සැමට විදුලිය" ව්‍යාපෘතිය යටතේ රුපියල් බිලියන 7ක් වියදම් කරලා, දුෂ්කර ප්‍රදේශවල නිවාස ඒකක 262,000කට -දුප්පත්ම අතිංසක මිනිස්සුන්ට- විදුලිය දීලා ඉවර කළා. අද අපේ විදුලිය සැපයීම - සම්පූර්ණ සබඳතා ප්‍රමාණය- සියයට සියයයි කියලා අපි කියනවා. අලුතෙන් හදන ගෙවල්වලට විතරයි විදුලිය නැත්තේ. යම් ගමක ගෙවල්වලට විදුලිය තිබිලා, පාසලකට විදුලිය අරගෙන නැත්නම් ඒ පිළිබඳව අප දැනුවත් වෙලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි. නමුත් යම් ගමක පාසලකට විදුලිය නැහැ; තවම විදුලිය සබඳතාව නැහැ කියලා කවුරු හෝ කියනවා නම්; අයදුම්පතක් ඉදිරිපත් කරනවා නම්, ඒ ඕනෑම පාසලකට අපි විදුලි සබඳතාව ලබා දෙනවා. හැබැයි, ඒකට අයදුම්පතක් ඉදිරිපත් කරන්න ඕනෑ. එහෙම නැතිව සොයාගෙන ගිහිල්ලා ගොඩනැගිල්ලකට විදුලිය ලබා දෙන එක විදුලිබල මණ්ඩලයේ රාජකාරියට අයත් වන්නේ නැහැ. ඒ පිළිබඳව කවුරු හෝ ඉල්ලීමක් කරනවා නම්, අපි විදුලිය ලබා දෙන්න සූදානම්.

ඒ සඳහා අයදුම් පතක් ඉදිරිපත් කරන්න. එවැනි දුෂ්කරතාවක් තිබෙනවා කියලා විදුලිබල මණ්ඩලයට දැනට ඉල්ලීමක් ලැබී නැහැ. රටේ සෑම ගමකටම අපි විදුලිය ලබා දී තිබෙනවා. ඒක ස්ථිරයි. ඒ වාගේම මීට අවුරුදු දෙකකට කලින් එම ව්‍යාපෘතිය අවසන් කරනකොට අපි සෑම නිවසකටම විදුලිය ලබා දී අවසන් කළා.

ඕනෑම පාසලකට විදුලිය ලබා දෙන්න අපට පුළුවන්. ඉල්ලීම ඉදිරිපත් කළොත්, විදුලිය ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් අසා ඉවරයි. දැන් අපිට වේලාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. දැනටමත් පස් වරු 2.00 පසු වී තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මම එක අතුරු ප්‍රශ්නයයි ඇසුවේ. මුලින්ම කළේ පැහැදිලි කර ගැනීමක්. දැන් මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අසන අතරම, විදුලිය නැති පාසල්වලට විදුලිය ලබා ගැනීම සඳහා මේ වේලාවේ දීම මාර්ගෝපදේශය ලබා දීම පිළිබඳව ගරු රාජ්‍ය ඇමතිතුමාට මගේ ගෞරවය සහ ප්‍රණාමය පුද කරනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා විදුලිය නිෂ්පාදනය කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය අනුව විදුලි ඒකකයක මිල වැඩි වෙනවාය කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ ඒකක මිල නිර්මාණය කරන්නේ එසේ විදුලිය නිෂ්පාදනය කරන ආයතනය තුළ සිටින ඉංජිනේරුවන්ය කියලා මෙහිදී චෝදනාවක් තිබෙනවා. පිළිගත් මිල සූත්‍රයක් තිබෙනවාය කියන කාරණය ඔබතුමා කිව්වත්, ජල විදුලිය නිෂ්පාදනය කරන විවිධ බලාගාර ගත්තොත්, ඒ එක එක බලාගාරවල ඒකක මිල ගණන් වෙනස් කියන කාරණය අපි සමහර වේලාවට දැක තිබෙනවා. එකම ද්‍රව්‍ය -ජලය- පාවිච්චි කරමින් තමයි මේ විදුලිය නිෂ්පාදනය වෙන්නේ. හැබැයි, අපි එක ගමක තිබෙන ජලයෙන් ක්‍රියාත්මක වන විදුලි බලාගාරයක් හා වෙනත් ගමක තිබෙන ජල විදුලි බලාගාරයක් ගත්තොත්, ඒ එකකට වඩා අනෙක් බලාගාරයේ ඒකක මිල වැඩියි කියන කාරණය අපට පෙනී යනවා. එතකොට එතැන තිබෙන මිල සූත්‍රය පිළිබඳ කාරණය අපට පිළිගන්න බැහැ නේද, ගරු රාජ්‍ය ඇමතිතුමනි? ඒ නිසා ජලයෙන් නිෂ්පාදනය කරන හැම විදුලි ඒකකයකම මිල එක හා සමානව ගත යුතු නැද්ද, අමාත්‍යාංශයක් හැටියට ඒ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවාද කියා මා අහන්න කැමැතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමනි, කුඩා ජල විදුලි බලාගාර ගැනයි ඔබතුමා සඳහන් කරන්නේ. මේ රටේ කුඩා ජල විදුලි බලාගාරවලින් අපේ පද්ධතියට විශාල සේවයක් කරනවා. මෙගාවොට් 300කට වැඩි විදුලිය ප්‍රමාණයක් අපි ඒවායෙන් නිතිපතා -දිනපතා- ලබා ගන්නවා. ආරම්භක අවස්ථාවේ ඉඳලා ගත්තාම කුඩා ජල විදුලි බලාගාරවල කාලයෙන් කාලයට ඒවායේ විදුලි ඒකකයක මිල වෙනස් වෙනවා. හැබැයි, සියලුම කුඩා ජල විදුලි බලාගාරවලට මිල නියම කිරීමේ සූත්‍රය සමානයි. එම බලාගාරයේ වයස අනුව තමයි අදාළ කාලයේ ඒකකයක මිල කීයද කියලා තීරණය වෙන්නේ. කාලය ගත වෙත්ම, විදුලිබල මණ්ඩලය බලාගාරයට ගෙවන මිල අඩු වෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එය ක්ෂයවීමේ ක්‍රමවේදයක් තිබෙනවාද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එය ක්ෂයවීමේ ක්‍රමවේදයක් තිබෙනවා. ඒ කියන්නේ අවුරුදු 7ක් විතර යනකොට, ආයෝජකයා බලාගාරයට කළ ආයෝජනය ලබා ගන්නවා. ඉන් පසුව ඔහුට සියයට 100ක්ම ලාභය තමයි එන්නේ. අපි කවුරුත් එකඟ වී හදපු මිල සූත්‍රයක් තිබෙනවා. බලාගාරයේ වයස වැඩි වෙන්න, වැඩි වෙන්න රජය බලාගාරයේ හිමිකරුට ගෙවන මුදල අඩු කරලා තිබෙනවා.

එය රටේ පුරවැසියා වෙනුවෙන් කරන දෙයක්. මොකද, ඒ සඳහා පාවිච්චි කරන්නේ ජනතාවගේ ජලයයි. ජලය කියන්නේ ජනතාවගේ සම්පතක්. අපි royalty එකක් කියා වෙනම අය කිරීමක් කරන්නේ නැහැ. Royalty එකක් වෙනුවට අඩු මිලකට අපි ලබා ගන්නවා. එම නිසා එය ආයෝජකයාටත් ලාභයි. විදුලිබල මණ්ඩලයට සහ පොදුවේ රජයටත් ලාභ සූත්‍රයක් තමයි අපි අනුගමනය කරන්නේ. එම සූත්‍රය සෑම කුඩා ජල විදුලි බලාගාරයකටම එක හා සමානයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

තව ප්‍රශ්න තුනක් අහන්න තිබෙනවා. දැනටමත් කාල වේලාව ඉක්මවා ගිහින් තිබෙනවා.

ප්‍රශ්න අංක 13 -540/'18- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 -565/'18- (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

## වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව : තනතුරු සහ සුදුසුකම්

வடமேல் மாகாண ஆயுர்வேதத் திணைக்களம்: பதவிகள் மற்றும் தகைமைகள்

AYURVEDIC DEPARTMENT OF NORTH-WESTERN PROVINCE: POSITIONS AND QUALIFICATIONS

585/'18

**15. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වයඹ පළාත් ආයුර්වේද කොමසාරිස්වරයාගේ නම කවරේද;

(ii) ඔහුගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව තුළ වෘත්තීය හා වෙනත් සුදුසුකම් නොසලකමින් වැඩබැලීමේ පදනම මත ලබාදී ඇති තනතුරු කවරේද;

(iv) වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව තුළ සුදුසුකම් අනුව උසස් වීම් ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාරම், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடமேல் மாகாண ஆயுர்வேத ஆணையாளரின் பெயர் யாதென்பதையும்;

(ii) இவரது கல்வி மற்றும் தொழிற் தகைமைகள் யாவை என்பதையும்;

(iii) வடமேல் மாகாண ஆயுர்வேதத் திணைக் களத்தில் தொழில் மற்றும் வேறு தகைமைகளைப் பொருட்படுத்தாது பதில் கடமை அடிப்படையில் வழங்கப்பட்டுள்ள பதவிகள் யாவை என்பதையும்;

(iv) வடமேல் மாகாண ஆயுர்வேதத் திணைக் களத்தினுள் தகைமைகளின்படி பதவி உயர்வு களை வழங்குவதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine :

(a) Will he inform this House-

(i) the name of the Ayurvedic Commissioner of the North-Western Province;

(ii) his educational and professional qualifications;

(iii) the positions that have been given in the Ayurvedic Department of the North-Western Province on acting basis without considering professional and other qualifications; and

(iv) the steps that are taken by the Ministry to award promotions on qualifications in the Ayurvedic Department of the North-Western Province?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සෙනවිරත්න මුදියන්සේලාගේ අනුර රුක්මන් සෙනවිරත්න

(ii) කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය

රෝහල් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය - 2010

ආහාර හා පෝෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

පළමු ශ්‍රේණියේ වෛද්‍යවරයෙකි.

(iii) වැඩ බැලීමේ තනතුරු ලෙස පත්කර ඇත්තේ වයඹ පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර පමණි. මෙම තනතුර වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් තෝරා පත්කර ඇත.

(iv) තනතුරුවලට අදාළව බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් නිර්ණායකයන්ට අනුව සුදුසුකම් පරීක්ෂා කර සම්මුඛ පරීක්ෂණ මඟින් වැඩිම ලකුණු ලබාගන්නා අයට උසස්වීම් ලබාදෙනු ලැබේ.

(ආ) පැන නොනඟී.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු ඇමතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. එම නිලධාරීන් අතර මේ පිළිබඳව විශාල ව්‍යාකූලතාවක් තිබුණා. ඔබතුමාගේ පිළිතුර නිවැරැදියි කියා මම විශ්වාස කරනවා. ඔබතුමා දැන් මෙම ස්ථානයේ සිටින නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයටම අදාළ වූ, නිරවුල් කරගත යුතු තවත් ප්‍රශ්නයක් මම අහනවා.

පසුගිය කාලයේ ගලහ රෝහලේ විශාල උද්ඝෝෂණයක් ඇතිවෙලා එම රෝහල වසා දමන්න තරම් තත්ත්වයක් ඇති වුණා. නමුත්, ගලහ රෝහල නැවත විවෘත කරන ලෙස දැන් ප්‍රදේශවාසීන් විශාල ඉල්ලීමක් කරනවා. මේ පිළිබඳව ඔබතුමා ගන්නා පියවර මොකක්ද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, එම කලබලකාරී අවස්ථාවේ ගලහ රෝහලට විශාල වශයෙන් අලාභ හානි සිදුවී තිබෙනවා. ඒ සියලු දේවල් අලුත්වැඩියා කරලා තමයි රෝහල ආරම්භ කරන්න වෙන්නේ. ඒ කටයුතු මේ දිනවල කරගෙන යනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හිටපු සභාපති, මහාචාර්ය කොල්වින් ගුණරත්න මැතිතුමා පසුගිය දිනක එම තනතුරින් ඉල්ලා අස්වුණා. ඔහු ඉල්ලා අස්වුණේ නිකම්ම නොවෙයි, පොඩි පැහැදිලි කිරීමකුත් කරමිනුයි.

"වෛද්‍ය සභාව තුළ සිටින නිලධාරීන් හුදෙක් වෛද්‍යවරුන්ගේ කටයුතු වෙනුවෙන් මැදිහත් වෙනවා පමණක්ය, රෝගීන් සහ මහ ජනතාවගේ පාර්ශ්වයෙන් මේ සඳහා මැදිහත් වීමක් දක්වන්නේ ඉතාම අඩුවෙන්ය" කියන චෝදනාවත් කරමින් තමයි කොල්වින් ගුණරත්න මැතිතුමා ඒ තනතුරෙන් ඉල්ලා අස්වුණේ. "ඔබතුමා මේක දේශපාලනීකරණය කරන්න හදනවා, මෙහි සංයුතීන් වෙනස් කරන්න හදනවා" කියා වෛද්‍ය සභාවේ යම් යම් අය එතුමාට චෝදනා කරනවා. හැබැයි කොල්වින් ගුණරත්න මැතිතුමා අර වාගේ දෙයක් කියනවා. ඔබතුමා මේ ගැන පැහැදිලි කිරීමක් කරයි කියා මම බලාපොරොත්තු වෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, එතුමා ඉවත් වුණේ මේ කාරණය නිසායි. වෛද්‍ය සභාව වෙනස් කළ යුතුයි කියන එකයි එතුමා දිගටම දරපු මතය වන්නේ. මේ ආඥා පනතට බ්‍රිතාන්‍ය වෛද්‍ය සභා පනත වාගේ වෙනත් පනතක් ගෙන ආ යුතුයි කියන ස්ථාවරයේයි එතුමා හිටියේ. මගේ ස්ථාවරයත් ඒකමයි. නමුත් එතුමා අයින් වුණේ, මේ පිළිබඳව කාලය දිගට ගෙවී යනවා කියායි. එවැනි පනත් කෙටුම්පතක් ගෙනෙන්න ඕනෑය කියා මේ වන විට වෛද්‍ය සභාවත් තීන්දු කර තිබෙනවා. ඒ අනුව ඔවුන් මට නම් වගයක් ඉදිරිපත් කළා. මේ අලුත් පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන්න ඒ අයගේ සාමාජිකත්වයෙන් යුතුව මම කමිටුවක් පත් කර තිබෙනවා.

ලංකාවේ තිබෙන පැරණිම සංගමය වන ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයත් ඒ මතයට එකඟ වෙලා තිබෙනවා. දැන් තිබෙන පනත නොවෙයි, අලුතින් පනත් කෙටුම්පත් සකස් කරලා වෛද්‍යවරු පමණක් නොවෙයි, අනෙකුත් සාමාජිකයන්ද අඩංගුව බ්‍රිතාන්‍ය වෛද්‍ය පනත වාගේ එකක් ගෙනෙන්න ඕනෑය කියා ඒ ගොල්ලනුත් යෝජනාවක් සම්මත කරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, medical colleges තිබෙනවා නේ. Medical colleges 46ක් රැස් වෙලා, ඒ ගොල්ලනුත් ඉල්ලා සිටියා මේක කරන්න ඕනෑය කියා. ඒ අනුව වෛද්‍ය සංගමය තනි වුණා. ඒ නිසා දැන් අපි අලුත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට කටයුතු කරගෙන යනවා. මාස දෙකක් ඇතුළත ඒ කෙටුම්පත ඉදිරිපත් කරන්න කියලා මම කියා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 10 -442/'18- (2), ගරු ජයන්ත සමරවීර මහතා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 -565/'18- (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

**ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ප්‍රභූ ඝාතන කුමන්ත්‍රණය
### பிரமுகர்களைப் படுகொலை செய்வதற்கான சதித்திட்டம்
### CONSPIRACY TO ASSASSINATE VIPS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා අසන මෙම ප්‍රශ්නය යොමු කරන්නේ ගරු අග්‍රාමාත්‍යතුමා වෙතයි. මම මේ ප්‍රශ්නය අසන්නේ මුළු රටම අද බලාගෙන සිටින බරපතළම අර්බුදයක් පිළිබඳ තොරතුරු මෙම පාර්ලිමේන්තුව හමුවේ තැබීම සඳහායි.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඝාතනය

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

කරවීමේ සැලසුමක් පිළිබඳව පුරවැසියකු විසින් වගකීම් සහගතව සිදුකරනු ලැබූ හෙළිදරව්වක් හේතුවෙන් සමාජය දැඩි කම්පනයකට පත්වී තිබෙනවා. පසුගිය සති අන්තයේ සියලු ජනමාධ්‍ය විසින් මේ සම්බන්ධ පුවත් ප්‍රධාන සිරස්තල යටතේ හෙළිදරව් කොට තිබුණි.

දැනට ප්‍රකාශයට පත් වී ඇති ආකාරයට පාතාල සාමාජිකයන් හරහා ක්‍රියාත්මක කිරීමට සැලසුම්කොට ඇති බව පවසන මෙම කුමන්ත්‍රණයට අණ දී ඇත්තේ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකි. එකී නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ හඬපට ද ජනමාධ්‍ය වෙත මුදාහැර තිබුණා. මේ වන විට රහස් පොලීසිය හරහා පරීක්ෂණ ආරම්භකොට තිබුණ ද, මෙය රාජ්‍ය නායක ඝාතන සැලැස්මක් ලෙස සලකා බලන විට ආරක්ෂක අංශයන්හි ක්‍රියාකාරිත්වය පවතිනුයේ ඉතා පහළ මට්ටමකය. මේ නිසා ප්‍රභූ ඝාතන කුමන්ත්‍රණය සැලසුම් කරනු ලබන්නේ ශ්‍රී ලංකා පොලීසිය සහ පාතාලය ඒකාබද්ධවය යන සැකය නිසාවෙන් සාමය ආරක්ෂා කරනු ලබන පොලීසිය පිළිබඳව මිලියන සංඛ්‍යාත පුරවැසියන් හා විදේශ රටවල්ද බරපතළ විශ්ෂිප්තභාවයකට පත්ව සිටීම ද අප විසින් තේරුම්ගත යුතු කරුණකි. එහෙයින්,

1. ගරු කථානායකතුමනි, මෙකී පසුබිම යටතේ රට තුළ නීතිය හා සාමය බිඳ වැටී රට අරාජික බවට පත්විය හැකි බැවින්, නොපමාව සමාජ ස්ථාවරභාවය වෙනුවෙන් කඩිනම් පියවර ගතයුතු බව ඒකාබද්ධ විපක්ෂය ආණ්ඩුවට හා පාර්ලිමේන්තුවට ප්‍රකාශ කර සිටිනවා. මේ සම්බන්ධව මෙතෙක් ගෙන ඇති පියවර කුමක්ද යන්න පැහැදිලි කරනවාද?
2. මේ සම්බන්ධ අදාළ පොලිස් නිලධාරීන් ගැන ගෙන ඇති පියවර කුමක්ද? පියවර ගන්නේද?

ගරු කථානායකතුමනි, රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් ලෙස සැලකිය හැකි මෙම බරපතළ පැමිණිල්ල නාමල් කුමාරගේ මහතා ප්‍රසිද්ධියට පත් කළා. ඒ වාගේම පොලිස්පතිතුමා ඒ පිළිබඳව කටයුතු කරන බව රහස් පොලීසිය හරහා ප්‍රකාශ කළා. ඒ පිළිබඳව පසුගිය දවස්වල පුවත්පත් සියල්ලම - " දිවයින", "ලංකාදීප " සහ අනෙකුත් පුවත්පත්- ප්‍රවෘත්ති සිරස්තල ලෙස වාර්තා කළා. 2018.09.17 වන සඳුදා, "දිවයින" පුවත්පතේ සිරස්තලය යටතේද ඒ ගැන මෙන්න මෙහෙම පළ වුණා:

"ජනපති මෛත්‍රී ගෝඨා ඝාතන කුමන්ත්‍රණය. නාමල්ගේ නිවසට ගොස් සීඅයිඩීය පැය 06ක් ප්‍රශ්න කරයි. වැඩිදුර ප්‍රකාශ ගන්න සීඅයිඩීයට අද කැඳවයි."

ඒ අනුව ඊයේ පැය 10ක් පමණ මේ පුද්ගලයා රහස් පොලීසියට කටඋත්තරයක් දුන් බව ප්‍රසිද්ධ වුණා. ජනමාධ්‍යවේදීන්, ප්‍රධාන කර්තෘවරුන් ජනාධිපතිතුමා හමු වූ අවස්ථාවේදී ජනාධිපතිතුමා -2018.09.15 වන දා "දිවයින" පුවත්පත- මෙහෙම ප්‍රකාශ කර තිබෙනවා:

"ඝාතන කුමන්ත්‍රණය ගැන පරීක්ෂණ පැවැත්වෙනවා."

මෙය ඇති වී තිබෙන බරපතළ තත්ත්වයක් හැටියට සලකා කුමන දේශපාලන කරුණු, මතභේද තිබුණද රටේ ජනාධිපතිවරයා ඝාතනය කිරීමට මෙලෙස කුමන්ත්‍රණයක්, සැලසුමක්, වැඩ පිළිවෙළක් පවතින බව ප්‍රකාශ කරන්නට පැමිණිල්ලක් කරන්නට පුළුවන්කම මත තිබෙන තොරතුර අති බරපතළයි. ජනාධිපතිවරයා ඝාතනය කළොත් ගරු කථානායකතුමනි, ඔබතුමා නොවෙයි ජනාධිපති වෙන්නේ. අලුත් ජනාධිපතිවරයෙක් පත්කරනතුරු අගමැතිතුමා වැඩබලනවා. මෙය දේශපාලන බල පෙරළියක්ද? මේ කුමන්ත්‍රණය හරියට සොයා බලන්න. මේ කුමන්ත්‍රණයට සම්බන්ධ, විවිධ වැඩ පිළිවෙළවල්වලට සම්බන්ධ සියලුදෙනා ගැන ගන්නා ක්‍රියා මාර්ගය පුංචි ළමයි කළ පැමිණිල්ලක් අනුව ගන්නා ක්‍රියාමාර්ගයක් බවට පත් වෙලා තිබෙනවා. එයයි මෙහි තිබෙන බරපතළකම. මේ තරම් බරපතළ කුමන්ත්‍රණ පැමිණිල්ලක් තිබෙද්දී, එය පුංචි ළමයින්ගෙන් අහන කරුණක් බවට පරිවර්තනය කර - තමුන්නාන්සේලාගේ සැලැස්මක් තිබෙනවාද කියා මම දන්නේ නැහැ, මේ පැමිණිලිකරු උස්සාගෙන යන්න. - උස්සාගෙන ගියොත් පැමිණිල්ලත් ඉවරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් ඉදිරි වැඩ කටයුතුවලට අවස්ථාව දෙමු නේද? ඔබතුමාට ප්‍රශ්න අහන්නත් හුහක් වෙලාව දුන්නා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මෙහි බරපතළකම ලංකාවේ කථානායකට දැනෙන්නේ නැත්නම් පාර්ලිමේන්තුවේ තත්ත්වය මොකක්ද? පොඩ්ඩක් ඉවසීමෙන් අහගෙන ඉන්න. එහෙම නම් මගේ ප්‍රශ්නය කථානායකතුමා හැටියට ඔබතුමාට ප්‍රතික්ෂේප කරන්නට තිබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. ඔබතුමා ප්‍රශ්නය ඇහුවා. මේ ප්‍රශ්නයට විනාඩි 15ක් ගියා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා නිකම් හිතුවක්කාර ප්‍රකාශ කිරීම නවත්වා පාර්ලිමේන්තුවේ- [බාධා කිරීමක්] 1962 ඔය පුටුවේ හිටපු කථානායක ඔහොම කථා කළේ නැහැ. බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පෙරළා දැමීමේ කුමන්ත්‍රණයක් හදන වෙලාවේ එදා හිටපු කථානායකතුමා පිලිප් ගුණවර්ධනට, ආචාර්ය ඇන්.ඇම්. පෙරේරාට කථා කර කිව්වා, පැමිණිල්ල ගැන. ඔබතුමා අහගෙන ඉන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග අනුව ප්‍රශ්නය අහන්න අවස්ථාව දුන්නා. ඊට පස්සේ පත්තර කියවන්නටත් අවස්ථාව දුන්නා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම පැමිණිල්ල ගැනයි අගමැතිතුමාට ප්‍රකාශ කරන්න හදන්නේ. ඇයි ඔබතුමා මේක වහන්න හදන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වහන්න හදන්නේ නැහැ. මම ඔබතුමාට අවස්ථාව දුන්නා. මෙහි තිබෙන විධියට ඔක්කොම අවස්ථාව දුන්නා. [බාධා කිරීමක්] ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මෙතුමාගේ ප්‍රකාශය පරීක්ෂණවලට බාධාවක්. [ඝෝෂා කිරීම්] ඒක තමයි කරන්නේ. මෙතුමා පරීක්ෂණවලට පොලු දමන්නයි හදන්නේ. [බාධා කිරීමක්] මමත් නීතිඥයෙක්. ප්‍රශ්නය අහනකොට මට ඒ බව තේරෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

I am not asking the Question from the Leader of the House. I am asking from the Hon. Prime Minister. I hope the Hon. Prime Minister would reply my Question because the problem that has arisen is very serious.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Law and Order)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. 2018.09.12 වන දින දූෂණ විරෝධී බලකායේ මෙහෙයුම් අධ්‍යක්ෂ ලෙස හඳුන්වා ගනිමින් මහනුවර ඩෙවෝන් ශාලාවේදී මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් අංක: ඒ/54/1, කරඳතුල්හිරිය ලිපිනයේ පදිංචි ඒ.එම්. නාමල් කුමාර යන අය විසින් ඔහුගේ ජංගම දුරකථනයේ පටිගත කරන ලද සංවාද කිපයක් ප්‍රතිවාදනය කරමින්, එම සංවාද තමන් හා ත්‍රස්තවාදී විමර්ශන දිසාවේ නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහතා සමඟ පැවැති බවට ප්‍රථම හෙළිදරව්ව කරන ලදී. මෙම හෙළිදරව්වෙන් අනාවරණය වන කරුණු පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් 2018.09.14 වන දින විමර්ශනයක් ආරම්භ කර එහි ඉදිරි විමර්ශන පවත්වා ගෙන යනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ බී/10744/18 යටතේ 2018.09.17 වන දින කරුණු වාර්තා කර ඇත. වැඩිදුර විමර්ශනය සඳහා අදාළ කර ගැනීමට 2018.09.12 වන දින ඩෙවෝන් ශාලාවේදී පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවේ සංස්කරණය නොකළ හඬ රූප පටි එම මාධ්‍ය සාකච්ඡාව ආවරණය කරන ලද මාධ්‍ය ආයතනවලින් ද, නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහතාගෙන් ඒ පිළිබඳ මාධ්‍ය ආයතනවලින් කරන ලද විමසීම්වලට අදාළ හඬ පටිවල පිටපත් එකී මාධ්‍ය ආයතනවලින්ද ලබා ගැනීමට අධිකරණයේ නියෝග ලබාගෙන, එම අධිකරණ නියෝග අදාළ මාධ්‍ය ආයතනවලට බාර දීමට කටයුතු කර ඇත. මෙතෙක් එම හඬ රූප පටි සහ හඬ පටි ලැබී නොමැත.

2. එම විමර්ශන කටයුතු සඳහා නාමල් කුමාර මහතා සංවාද පටිගත කිරීමට යොදා ගත් ජංගම දුරකථනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබාගෙන ඇත. මේ විමර්ශන කටයුතු අපක්ෂපාතීව සහ විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් කරන ලද ඉල්ලීමක් ප්‍රකාරව නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහතා ත්‍රස්තවාදී විමර්ශන දිසාවේ සිට පොලිස් මූලස්ථානයේ තොරතුරු තාක්ෂණ දිසාව වෙත ස්ථාන මාරුකර යවා ඇත. ඒ අනුව නාමල් කුමාර මහතා විසින් කරන ලද හෙළිදරවුවෙන් අනාවරණය වන කරුණුවල සත්‍යතාව පිළිබඳව අපක්ෂපාතීව විමර්ශනයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සිදු කරගෙන යනු ලබයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ගැන විවාදයක් කරන්නට බැහැ, අවශ්‍ය නම් ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කිරීමක් කර ගන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි, ගරු කථානායකතුමනි. ගරු රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමනි, ඔය නාමල් කියන පුද්ගලයා තවත් බරපතළ කරුණු ටිකක් අනාවරණය කරනවා. මහනුවර, දිගන ප්‍රදේශයේ ඇති වුණු සිංහල - මුස්ලිම් ගැටුමේදී මුස්ලිම් ජනතාවට එරෙහිව ප්‍රහාර යොමු කරන්නට නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ උපදෙස් අනුව තමන් ක්‍රියා කළා කියනවා. ඒ ගැටුම ඇති කළේ ඔවුන් හරහාය කියනවා. ඒ වාගේ ඉතාම සංවේදී, බරපතළ කරුණු ප්‍රමාණයක් කියනවා. පාතාලයත් සමඟ තිබෙන ගනුදෙනු ගැන කියනවා, නියෝජ්‍ය පොලිස්පතිවරයා පාතාලයේ ඇතැමුන් ගැන දන්නා සහතික ගැන කියනවා. බැලූ බැල්මට බරපතළ කාරණා ගණනාවක්.

මම හිතන්නේ නැහැ, කෙනෙක් කිසිම වගකීමකින් තොරව මේ විධියේ බරපතළ ප්‍රකාශයක් කරයි කියා. ඔහු කියනවා, තමන් සතුව හඬ පටි පවා තිබෙන බව. මේ නියෝජ්‍ය පොලිස්පතිවරයාට තිබෙන චෝදනා ඇත්තවශයෙන්ම අත් අඩංගුවට අරගෙන පරීක්ෂණ කරන්නට තරම් බරපතළයි. ඔබතුමන්ලා ඒක කළේ නැහැ. ඒ වාගේම වර්තමාන පොලිස්පතිතුමා ගැනත් කියනවා. ඊයේ පෙරේදා පාසලකට ගිහිල්ලා හාමුදුරුවන්ට "බඩ්ඩ" කියලා කිව්වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදාළ කාරණය ගැන අහන්නකෝ ගරු මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
"ආතල්" කියලත් කිව්වේ. ලංකා ඉතිහාසයේ පහළ වුණු ජෝකර්ම පොලිස්පති.

ගරු ඇමතිතුමනි, එම නිසා අපි ඔබතුමාගෙන් අහන්නේ ඒ අදාළ නියෝජ්‍ය පොලිස්පතිවරයා අත් අඩංගුවට අරගෙන පරීක්ෂණ කරනවා වෙනුවට ඔහුට මේ පරීක්ෂණවලට තවදුරටත් බලපෑම් කිරීමට ඉඩ ලැබෙන ආකාරයට කටයුතු කර තිබෙන විට මේ පරීක්ෂණය ස්වාධීනව කෙරෙයි කියා අපි කොහොමද විශ්වාස කරන්නේ කියලායි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
පොලීසිය ගැන විනය කටයුතු කළ හැක්කේ පොලිස් කොමිසමටයි. අපි මූලික විමර්ශන කටයුතු කර ඒ පිළිබඳව

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

පොලිස් කොමිසමට වාර්තා කරනවා. [බාධා කිරීමක්] අපි අදාළ පරීක්ෂණය කරනවා. ඒවා ගැන තිබෙන සාක්ෂි බලලා,- [බාධා කිරීමක්] නැහැ, නැහැ. මූලික පරීක්ෂණය කර අපි අවශ්‍ය පියවර ගන්නවා. ඉතා ඉක්මනින් ඒ සම්බන්ධයෙන් පියවර ගන්නවා, භය වෙන්න එපා.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, මේක ගැන දිග විවාදයකට යන්නට බැහැ. [බාධා කිරීමක්]

ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(මාණ්පුමිකු ටලස් අළහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, පැහැදිලි කිරීම් ලබා ගන්න අපට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පැහැදිලි කිරීම් ලබා ගන්න. ඔය උත්තරයත් දීලා, මෙතැනින් එහාට, We have to get back to the Business of the Day. [බාධා කිරීමක්] Wait, just calm down, Hon. Members. කියන්න ඉස්සර කලබල වෙනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(මාණ්පුමිකු ටලස් අළහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් මතු කරනු ලැබූ ප්‍රශ්නයට ගරු ඇමතිතුමා ලබා දුන් උත්තරය අනුව මෙහි බර, පරිමාව, ගැඹුර පිළිබඳව මට දැනෙන්නේ නැහැ. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මෙතැන ප්‍රධාන කාරණා හතරක් තිබෙනවා. පළමුවැනි කාරණය,- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, පළමුවැනි කාරණය තමයි, මේ කුමන්ත්‍රණය,-[බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Let the Hon. Minister reply. ගරු ඇමතිතුමා. [බාධා කිරීමක්]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(මාණ්පුමිකු ටලස් අළහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමාගේ ආරක්ෂාව එතුමා සහතික කරනවාය කියනවා. හැබැයි ඝාතන කුමන්ත්‍රණයේ අනික් පැත්තේ ඉන්නේ හිටපු ආරක්ෂක ලේකම්තුමා; ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. එතුමාට කිසිම ආරක්ෂාවක් නැහැ. [බාධා කිරීමක්] ඒක නොවෙයි ප්‍රශ්නය.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ප්‍රශ්නය අහන්න. Then, let the Hon. Minister reply.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(මාණ්පුමිකු ටලස් අළහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, පළමු කාරණය,-

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, ප්‍රශ්නය- [බාධා කිරීමක්]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(මාණ්පුමිකු ටලස් අළහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු ඇමතිතුමනි, මේ රටේ පුරවැසියෙක් බරපතළ හෙළිදරව් කිරීමක් කරනවා. ඒ වාගේම, ඔබතුමාගේ පොලීසියට ඇවිල්ලා එතුමා ඒ සම්බන්ධ පැමිණිල්ල භාර දෙනවා. [බාධා කිරීමක්] සමාවෙන්න. මොහොතක් ඇහුම් කන් දෙන්න.

ගරු කථානායකතුමනි, පළමුවැනි කාරණය, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වා වාගේ මේ කුමන්ත්‍රණය කරනු ලබන්නේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා. දෙවැනි කාරණය, ඔහු මේක ක්‍රියාත්මක කරන්න උත්සාහ ගන්නේ පාතාලය හරහා. තුන්වැනි කාරණය, මේ පාතාලය සහ පොලීසිය සම්බන්ධීකරණය කරන්නේ පොලිස්පතිවරයා. පොලිස්පතිවරයා! ඒ නිසා මේක සැහැල්ලුවෙන් ගන්න පුළුවන් කාරණාවක් නොවෙයි. හතරවැනි වැදගත් කාරණය, කිසිදු රාජ්‍ය මාධ්‍යයක් මේ කුමන්ත්‍රණය පිළිබඳ පුවත ගන්නේ නැහැ. ඇයි ඒ? මොකක්ද ප්‍රශ්නය? මෙහි තිබෙන්නේ රටේ පළමුවැනි පුරවැසියා ඝාතනය කිරීමේ කුමන්ත්‍රණයක්.

ගරු කථානායකතුමනි, අවුරුදු 152ක් පැරණි පොලිස් දෙපාර්තමේන්තු ඉතිහාසයේ පොලිස් දෙපාර්තමේන්තුවට එල්ල වෙච්ච බරපතළම චෝදනාව මේක.

ගරු කථානායකතුමනි, රටේ පළමුවැනි පුරවැසියා විධියට ජනාධිපතිතුමා මේක කොයිතරම් සැහැල්ලුවෙන් ගන්නවාද කියලා මම දන්නේ නැහැ. ඒක මට තේරෙන්නේ නැහැ. ඒක මට අදාළත් නැහැ. නමුත්, ජනාධිපතිවරයාත් මේ කාරණය දිහා මෙහෙම උපේක්ෂාවෙන් බලාගෙන හිටියොත්, -පොලිස්පතිවරයා අර කොටපොලදී කිව්වා වාගේ,- පොලිස්පතිතුමා ඇවිල්ලා ජනාධිපතිතුමා දිහා බලලා කියාවි, "අම්මට හුඩු! මූ තවම ඉන්නවා නේ?" කියලා. එතකල්ද, මේ බලා ගෙන ඉන්නේ? එතකල්ද, මේ බලාගෙන ඉන්නේ!!

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, ගරු ඇමතිතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව අපක්ෂපාතී පරීක්ෂණයක් පොලීසියෙන් කරනවා. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. අතිගරු ජනාධිපතිතුමා අපේ රටේ පළමුවැනි පුරවැසියා. එතුමාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂක අංශත්,

පොලීසියත් ඒ කටයුතු කරනවා. අනික් පුද්ගලයා ලංකාවේ පුරවැසියෙකු නොවුණත්, ඔහුට අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන්නත් අපි කටයුතු කරනවා. මට කියන්න තිබෙන්නේ එපමණයි.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

මේ සම්බන්ධයෙන් වාද විවාදයකට යන්න අමාරුයි. අපට මේ කටයුත්ත මෙතැනින් නවත්වන්න වෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
We have a lot of work today. We have gone beyond the allotted time. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාට මම අවස්ථාව දෙන්නම්. අනික් මන්ත්‍රීතුමන්ලා කියපු දේවල් නැවත කියන්න අවශ්‍ය නැහැ. අලුත් දෙයක් තිබෙනවා නම් කියන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මම කියන්නේ අලුත් දෙයක්. ගරු කථානායකතුමනි, සමා වෙලා ඔබතුමා ඉවසීමෙන් අහගෙන ඉන්න.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම ඉවසීමෙන් අහගෙන ඉන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මම මගේ වගකීම දන්නවා. මම මේ කාලය නාස්ති කරන්න හදනවා නොවෙයි. ඔබතුමාට කිව යුතුයි, මේ පොලිස්පතිතුමා තබා ගෙන මේ පරීක්ෂණය කරන්න බැහැ කියන එක.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Yes, that is a point.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
හේතුව මම කියන්නම්. මේ චෝදනාවට ලක් වී සිටින නාලක ද සිල්වා කියන නියෝජ්‍ය පොලිස්පතිවරයාව මීට ටික වෙලාවකට ඉස්සෙල්ලා පොලිස්පතිතුමා විසින් කැලණිය පන්සලට එක්කර ගෙන ගිහිල්ලා තිබෙනවා, බෝධි පූජාවකට. මම මේක කියන්නේ ඉතා වගකීමෙන්. අපේ පොලීසිය හාර ඇමතිතුමාගෙන් මම මේ කාරණය අහනවා. මේ අපරාධය; මේ මහා ඝාතන සැලසුම ගැන දැනට චෝදනාවට ලක් වී සිටින මේ මනුස්සයාව පොලිස්පතිතුමා විසින් බෝධි පූජාවලට එක්කර ගෙන යනවා නම්, ඒ දෙදෙනා අතර තිබෙන සම්බන්ධය ඉතා ප්‍රබල සම්බන්ධයක්.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඇමතිතුමා ඒ ගැන අවධානය යොමු කරන්න. මේ කරුණ මීට වඩා දිගට ගෙන යන්න දෙන්න බැහැ. Do not repeat the same thing.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
අන්න, websitesවල ප්‍රචාරය වනවා. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
You have finished it. So, you do not have to repeat that.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, බෝධි පූජා ගැන බුද්ධ ශාසන ඇමතිතුමාගෙන් අහගන්න කියන්න. මම දන්නේ නැහැ, ඒවා ගැන.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා කියන්න. But, do not repeat the same thing. එක ප්‍රශ්නයම නැවත අහන්න එපා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
No, it is not the same thing.

ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දැන් track එකේ යනවා පෙනෙනවා. [බාධා කිරීම්] I cannot allow anymore.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, දැන් මේ නියෝජ්‍ය පොලිස්පතිතුමා ස්ථාන මාරු කරන්නේ තොරතුරු තාක්ෂණ අංශයට. මේ ඇති වෙලා තිබෙන බරපතළ තත්ත්වය තුළ තොරතුරු තාක්ෂණ අංශය ඉතාම වැදගත් අංශයක් බවට පත්වනවා. ගරු කථානායකතුමනි, එතකොට මේ පරීක්ෂණ කිසිසේත්ම ස්වාධීනව කරන්න බැහැ. ගරු ඇමතිතුමනි, එතුමා තොරතුරු තාක්ෂණ අංශයට මාරු කිරීම එතුමාට, එතුමන්ලාගේ කණ්ඩායමට, පොලිස්පතිතුමාට තවදුරටත්

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

මේ පරීක්ෂණ කරන්න වාසියක් බවට පත්වනවා. ඒ හින්දා ඔබතුමන්ලා මේ ස්ථාන මාරුව කරලා තිබෙන්නේ කිසිසේත්ම සුදුසු තැනකට නොවෙයි.

**ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මට වැදගත් කාරණාවක් කියන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එක් මන්ත්‍රීවරයෙකු කථා කරන්න.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මට වැදගත් කාරණාවක් කියන්න තිබෙනවා. මා මේ කාරණය කියන්නේ වගකීමෙන් යුතුවයි. මේ වනවිට "නෙත් නිවුස්"හි වාර්තා වෙනවා, "දැඩි කථා බහට ලක් වුණු ත්‍රස්ත විමර්ශන ඒකකයේ නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා තවත් ජ්‍යෙෂ්ඨතම පොලිස් නිලධාරියකු සමඟ කැලණිය රජ මහා විහාරස්ථානයේ බෝධි පූජා පින්කමකට සහභාගි වුණා"ය කියලා.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ ගැන අපි කථා කළා. Let us finish that matter.

**ගරු කනක හේරත් මහතා**
(මාණ්පුමිකු කනක හේරත්)
(The Hon. Kanaka Herath)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු කනක හේරත් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
නාලක සිල්වාට ආශීර්වාද ලබා ගැනීමට -

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එක වතාවක් කියපු දෙයක් නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, point of Order එකක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු කනක හේරත් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු කනක හේරත් මහතා**
(මාණ්පුමිකු කනක හේරත්)
(The Hon. Kanaka Herath)
ගරු ඇමතිතුමනි, පසුගිය සතියේ ත්‍රස්ත විමර්ශන ඒකකයේ "ස්නයිපර්" වර්ගයේ තුවක්කුවක් නැතිවෙලා තිබෙනවා. එය ඇත්තද, නැද්ද කියා දැන ගන්න අවශ්‍යයි. ඒ තුවක්කුව කොහාටද ගෙන ගිහින් තිබෙන්නේ, කවුද එය හොරකම් කළේ, ඒ පිළිබඳව පරීක්ෂණයක්, විමර්ශනයක් කරනවාද කියලා දැනගන්න කැමැතියි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔබතුමා ඒ සම්බන්ධව ලිඛිතව කරුණු ඉදිරිපත් කරන්න. අපි ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්නම්. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඊළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. කරුණු repeat කරන්න බැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
I will not repeat, Sir.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාට මා අවස්ථාව දුන්නා. ඔබතුමාට මිනිත්තු 10ක් දුන්නා. නැවතත් වේලාව දෙන්න බැහැ. ඔබතුමා ඉතාමත් අසාධාරණයි. ඔබතුමාට ඉඩ දුන්නා. ඔබතුමා බෝධි පූජා ගැන කිව්වා. ඒ ඔක්කොම කියලා ඉවරයි. ආයෙත් ඔබතුමාට වේලාව දෙන්න මට බැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා මා නැවැත්වූවා.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, මොකක්ද කියන්නේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මා මේ කාරණය පොලීසිය භාර ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. මේ පැමිණිල්ල

කිරීමෙන් පසු පළමුවන දවසේ පොලිස්පතිවරයා ඒ පිළිබඳව මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වූවා. මේ පරීක්ෂණය පවත්වන්න කලින්, මේ පැමිණිල්ල කළ නාමල් කියන පුද්ගලයාගෙන් CID එක කටඋත්තරය ගන්න කලින්, පොලිස්පතිවරයා කියනවා, "මේ හඬ පටය ගැන සැකයි" කියලා. පරීක්ෂණය පවත්වන්න කලින් පොලිස්පතිතුමා එහෙම කියන්නේ කොහොමද? පරීක්ෂණය පවත්වන්න කලින්, කටඋත්තරය ගන්න කලින්, හඬ පටය අහන්න කලින් පොලිස්පති මාධ්‍යයට කියනවා, හඬ පටය ගැන සැකයි කියලා. එයින්ම තේරෙනවා නේ, පොලිස්පති කොහේද ඉන්නේ කියලා. එය පළමුවන කාරණයයි.

දෙවන කාරණය මෙයයි. ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඊයේ පැය 10ක් නාමල් කියන පුද්ගලයාගෙන් කටඋත්තර ගත්තා. ඔහු මහනුවර ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙක්. මේ වනකොට ඔහු විදේශ රටකට පන්නන්න උත්සාහයක් තිබෙනවා; හංගන්න උත්සාහයක් තිබෙනවා; විදේශ රටකට පිට මං කරන්න උත්සාහයක් තිබෙනවා. කරුණාකරලා ඔහුට පොලිස් ආරක්ෂාව දෙන්න. ඊයේ සිට ඔහුගේ පොලිස් ආරක්ෂාව ඉවත් කළා. ඔහු විදේශ රටකට ගෙන ගියොත් මේ නඩුව සම්පූර්ණයෙන් අවසන් වෙනවා. ඒ නිසා ඉතාම අවදානම් තත්ත්වයක් තිබෙනවා. ඔහු විදේශ රටකට ගෙන යන්න මේ වනකොට සියලු සැලසුම් සකස් කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඒ පුද්ගලයා කියනවා නම් පැමිණිල්ල කිරීම සම්බන්ධයෙන් ඔහුට ආරක්ෂාව ඕනෑය කියලා, එවැනි පුද්ගලයකුට ආරක්ෂාව දෙන්න අපි ලෑස්තියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ඒ කාරණය දැන් ඉවරයි. [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, point of Order එකක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ප්‍රශ්න නැහැ. ඔබතුමා පැහැදිලි කළා. ඔබතුමා සාධාරණ වෙන්න. පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු රාශියක් තිබෙනවා. මේ කාරණයේ තිබෙන වැදගත්කම නිසා තමයි මා සෑම මන්ත්‍රීවරයකුටම කථා කරන්න අවස්ථාව දුන්නේ. මේ, පැල් බැඳගෙන කථා කරන්න අවස්ථාවක් නොවෙයි. එහෙම දෙයක් මට කරන්න බැහැ. එක වතාවක් අවස්ථාවක් දුන්නාම දෙවන වතාවේත් බලාපොරොත්තු වෙන්න එපා. ඒක අසාධාරණයි. මේ පාර්ලිමේන්තුවේ 225දෙනෙක් ඉන්නවා. [බාධා කිරීමක්] මට බැන්නාට කමක් නැහැ. ඔව්, කියන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
රටේ ජනාධිපතිවරයාට එරෙහි කුමන්ත්‍රණයක් ගැනයි මේ කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලාට වාගේ මටත් ඒ ගැන හැඟීමක් තිබෙනවා. ඒ ගැන මමත් කථා කරන්නම්.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාටත් අවස්ථාව දුන්නා. ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந්த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාව අගමැති කරන්න -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, මට ඕනෑකමක් නැහැ. මට ඕනෑකම තිබෙන්නේ ඔබතුමා වාඩි වෙන එකයි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, මා මේ කාරණය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ අවස්ථාවේ නියෝජ්‍ය පොලිස්පතිවරයකුට විරුද්ධව බරපතළ චෝදනාවක් එල්ලවෙලා තිබෙනවා. මීට පෙර මේ වාගේම චෝදනාවක් එල්ල වුණා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාට විරුද්ධව. හැබැයි එතුමාට විරුද්ධව චෝදනාවක් එල්ල වුණත්, මේ රටේ අධිකරණයෙන් අඩුම තරමේ එතුමාගේ ගුවන් ගමන් බලපත්‍රයවත් තහනම් කළේ නැහැ. ඒ පරීක්ෂණය පටන් ගන්න කලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා රටින් පැනලා ගියා. දැන් මේ නියෝජ්‍ය පොලිස්පතිවරයා පිට රට යන්න උත්සාහයක් ගන්නවාය කියලා අපට ආරංචියක් තිබෙනවා. ඔබතුමන්ලා විශේෂයෙන් එතුමා වෙනත් ස්ථානයකට ස්ථාන මාරු කිරීමක් කරනවාට වඩා අධිකරණයට කරුණු වාර්තා කරලා, අඩු තරමේ එතුමාගේ ගුවන් ගමන් බලපත්‍රයවත් තහනම් කරලා එතුමා පිළිබඳව යම්කිසි පරීක්ෂණයක් කරන්නය කියන ඉල්ලීම මේ අවස්ථාවේදී කරනවා. එහෙම නැත්නම් අර්ජුන මහේන්ද්‍රන් වගේ -

**ගරු කථානායකතුමා**
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. අවසන් කරන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්ඩුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඒ සම්බන්ධව අපි අවශ්‍ය අයට දැනුම් දෙනවා, භය වෙන්න එපා.

**ගරු තාරක බාලසූරිය මහතා**
(මාණ්ඩුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)

*නැඟී සිටියේය.*
*එழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. තාරක බාලසූරිය මන්ත්‍රීතුමා කථා කරන්න. එතුමාගේ කථාවෙන් පස්සේ මේ කාරණය ගැන කථා කිරීම අවසාන කරනවා.

**ගරු තාරක බාලසූරිය මහතා**
(මාණ්ඩුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
ගරු කථානායකතුමනි, රාජ්‍ය ද්‍රෝහී ක්‍රියාවක් පිළිබඳවයි අපි කථා කරන්නේ. මේ පිළිබඳව කථා කිරීම අසාධාරණයි කියා කියන්න එපා. මන්ත්‍රීවරුන්ට කථා කරන්න වෙලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාට කථා කරන්න අවස්ථාව දුන්නා නේ. ඉතින් කථා කරන්න.

**ගරු තාරක බාලසූරිය මහතා**
(මාණ්ඩුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
ඒක තමයි. අසාධාරණයි කියන්න එපා, මන්ත්‍රීවරුන්ට කථා කරන්න වෙලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
වෙලාව දුන්නා. එක් කෙනෙකුට පැල් බැඳගෙන කථා කරන්න අවස්ථාවක් නැහැ නේ. ඔබතුමා කථා කරනවාද, නැද්ද?

**ගරු තාරක බාලසූරිය මහතා**
(මාණ්ඩුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
This is reasoned.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා කථා කරනවාද, නැද්ද?

**ගරු තාරක බාලසූරිය මහතා**
(මාණ්ඩුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
ඒ ගැන තමයි මා කියන්නේ.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඉතින් කථා කරන්න අවස්ථාව දුන්නා නේ. බණ කියන්නේ නැතුව කථා කරන්න.

**ගරු තාරක බාලසූරිය මහතා**
(මාණ්ඩුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
ඔබතුමා අසාධාරණයි කියනවා නේ. ඒක අසාධාරණ නැහැ.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා කථා කරනවාද, නැද්ද? ඉතින් කථා කරන්න.

**ගරු තාරක බාලසූරිය මහතා**
(මාණ්ඩුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
"මයික්" එක දීලා නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
"මයික්" එක දීලා තිබෙන්නේ.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(මාණ්ඩුමිකු சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

*නැඟී සිටියේය.*
*එழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(මාණ්ඩුමිකු சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ ප්‍රශ්නය යොමු කළේ ගරු අගමැතිතුමාටයි. ගරු අගමැතිතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා. වෙන ප්‍රශ්නවලදී නම් හැමදාම උඩ පැනලා ගරු අගමැතිතුමා විහිළු සපයනවා, පොලිස්පතිතුමා වාගේම. දැන් මේ වෙලාවේ ගරු අගමැතිතුමාට මේ ගැන උත්තරයක් දෙන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, ඉඳ ගන්න. ඒක අවසානයි.
ගරු අගමැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(මාණ්ඩුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මේ ගැන අපේ නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමා කිව්වා, එතුමා ඒ කරුණු ටික ඔක්කෝම ලබා දෙන්නම් කියලා. ගරු කථානායකතුමනි, අනෙක් කාරණය, සම්ප්‍රදායයක් හැටියට විභාගයක් පවත්වනකොට සියලුම කරුණු හෙළි කරන්නේ නැහැ. එතුමා පොලීසියට ගිහිල්ලා ඒ සම්පූර්ණ

කරුණු සොයා ගත්තා. එතුමාත් මට කිව්වේ, මේ ඔක්කෝම දැනට කියන්න උවමනා නැහැ, සාක්ෂි තිබුණාම, සාක්ෂි අනුව අපි ක්‍රියා කරන්නම් කියලා. එතුමා නීතිය කියලා තිබෙනවා. මෙතුමන්ලා අපේ ජනාධිපතිතුමා ගැන දක්වා තිබෙන උනන්දුව ගැන මම ස්තුති කරනවා. එහෙත් එතුමා ජනාධිපති අපේක්ෂක හැටියට ඉන්නකොට එතුමාගේ ආරක්ෂාව ඉවත් කරනකොට මෙතැන කවුද කථා කළේ? [බාධා කිරීම්] කවුද මෙතැන කථා කළේ? [බාධා කිරීම්] මේ කැක්කුම ඒ වෙලාවේ තිබුණාද? [බාධා කිරීම්] දැන් මම කථා කරන්නේ නැත්තේ ඇයි කියලා ඇහුවා. මේ පිළිබඳව විභාග කරන්න කියලා ලංකාවට ආපු ගමන් මම පොලිස්පතිතුමාට කිව්වා. ඒ වාගේම ජනාධිපතිතුමාත් කියා තිබෙනවා. ඒ විභාගයෙන් පස්සේ ගත යුතු පියවර කුමක්ද කියලා අපට වාර්තා කරන්නම් කිව්වා. [බාධා කිරීම්] ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ජීවිත තර්ජනයක් තිබෙනවා කියලා එතුමා හිතුවොත්, එතුමාට ඇවිල්ලා අපෙන් ආරක්ෂාව ඉල්ලන්න පුළුවන්. මම දන්නා හැටියට මේ දවස්වල එතැන යන අර්බුදය අනුව සමහර වෙලාවට අපට ඒ සඳහාත් ආරක්ෂාව ලබා දෙන්න පුළුවන්. [බාධා කිරීම්] ඒ ගැනත් කිසිම සැකයක් තියා ගන්න එපා. මේකෙන් නිකම් දේශපාලන වාසි ගන්න හදන්න එපා. මේ සම්බන්ධයෙන් ඇමතිතුමාට කිව්වා, ඕනෑම කරුණක් කියන්න කියලා. මේ ප්‍රශ්නය ආරම්භ කළේ ජනාධිපතිතුමා ගැන කියලා; අන්තිමට අවසන් කළේ, පොලිස්පතිතුමා ගැන කියලා. ජනාධිපතිතුමා ඝාතනය කරන්න සූදානමක් තිබෙනවා කියලා දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ප්‍රශ්නයක් නැඟුවා. ඒ ප්‍රශ්නය අවසන් වෙලා තිබෙන්නේ පොලිස්පතිතුමාගෙන්. [බාධා කිරීම්] ප්‍රශ්නය තිබෙන්නේ පොලිස්පතිතුමා එක්ක වෙන්න ඇති. [බාධා කිරීම්] පොලිස්පතිතුමාගේ අඩුපාඩුකම් තිබෙනවා නම් ඒවාත් හෙළි වෙයි. පොලීසිය විභාග කරනකොට පොලීසිය ඇතුළෙන්ම මේවා එයි, අඩුවක් තිබෙනවාද, හොඳද, නරකද මොකක්ද කියලා. ඒ විභාගය කර ගෙන යන්න ඉඩ දෙන්න. ජනාධිපතිතුමා කියපු හැටියට CID එකට භාර දීලා,- [බාධා කිරීමක්] ඔව්. පොලිස් කොමිසමෙනුත් කිව්වා. දැන් මේ හැම එක්කෙනාම කියා තිබෙනවා. පොලිස්පතිතුමා කියා තිබෙනවා; ජනාධිපතිතුමා කියා තිබෙනවා; පොලිස් කොමිසම කියා තිබෙනවා; මම කියා තිබෙනවා. දැන් වාර්තාව එනකල් ඉන්න. [බාධා කිරීම්]

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමිය, මේ ගැනමද කථා කරන්නේ?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ඔව්. කාරණා දෙකක් කියන්න තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ කාරණය ඉතාම බරපතළ කාරණයක් ගරු කථානායකතුමනි. මේ රටේ රාජ්‍ය නායකයාත්, ඒ වාගේම ගෝඨාභය රාජපක්ෂ හිටපු ආරක්ෂක ලේකම්තුමාත් ඝාතනය කිරීම සම්බන්ධයෙන් මේ සිද්ධියට අදාළ නියෝජ්‍ය පොලිස්පතිවරයා වහාම වැඩ තහනමට ලක් කරලා අත් අඩංගුවට ගත යුතුයි, ගරු කථානායකතුමනි. සාමාන්‍යයෙන් අපරාධයකට සම්බන්ධ කාරණයක් තිබෙනකොට ඉස්සෙල්ලාම ඒකයි කරන්නේ. ඒ වාගේම මේ පොලිස්පතිතුමාගේ කාර්ය භාරය ගැන ආණ්ඩුවේ ඉන්න මන්ත්‍රීවරු විධියට අපටත් සෑහීමකට පත් විය නොහැකියි, ගරු කථානායකතුමනි. ඒ නිසා කරුණාකරලා මේ පොලිස්පතිවරයා මේ කාරණයෙන් ඉවත් කරලා, නව පොලිස්පතිවරයෙක් පත් කරලා, පරීක්ෂණ කටයුතු ආරම්භ කරන්න කියලා ඉල්ලනවා. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අවසාන අවස්ථාව, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීම්]

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මයික් එක දුන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න. මයික් එක දීලා තිබෙන්නේ.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ගරු කථානායකතුමනි, අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. මට අගමැතිතුමාගෙන් අහන්න තිබෙන්නේ ඉතාම සරල ප්‍රශ්නයක්. ඔබතුමා අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා පිළිබඳ වගකීම ගත්තා වාගේම-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මේ කාරණයට අදාළ එකක් නොවෙයි; that is not relevant.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, අද මේ මතු වන කාරණය පිළිබඳව යම් වැදගත්කමක් තිබෙනවා තමයි. ඒ එක්කම අපි ඒකාබද්ධ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා, අපේ ජනාධිපතිතුමාගේ ආරක්ෂාව පිළිබඳව උනන්දු වීම පිළිබඳව. හැබැයි වර්තමාන ජනාධිපතිතුමාම අවස්ථා ගණනාවකදීම ප්‍රකාශ කරලා තිබෙනවා, එතුමා 2015 ජනවාරි 08වන දා ජනාධිපතිවරණයෙන් දිනුවේ නැත්නම්, බඹ ගණනක් යට වළලලා ඉවරයි කියලා. එතකොට ජනාධිපතිතුමාට ඒ කාලයේ- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එම කරුණත් අදාළ නැහැ. බොහොම ස්තුතියි. [බාධා කිරීම්]

[ගරු කථානායකතුමා මහතා]

මම දැන් අවස්ථාව ලබා දුන්නා නේ. ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා එක වතාවක් කථා කළා නේද? එක වතාවක් අවස්ථාව දුන්නා නේ. [බාධා කිරීම්] එක් වතාවක් අවස්ථාව දුන්නා. දැන් අද දවසේ වැඩ කටයුතු ආරම්භ කරන අවස්ථාව. දැන් වාඩි වෙන්න. [බාධා කිරීම්] ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමාට මම අවස්ථාව ලබා දුන්නා. නැවත අවස්ථාව ලබා දෙන්න බැහැ. මම ඔය දෙන්නාටම අවස්ථාව දුන්නා. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාටත්, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාටත් අවස්ථාව දුන්නා. විනාඩි පහ, පහ ලබා දුන්නා. අද දිනට නියමිත වැඩ කටයුතු තිබෙනවා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, what is the point of Order?

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. මම කලින් කථා කළේ නැහැ, ගරු කථානායකතුමනි. මම කලින් කථා කළා නම් ඔබතුමාගෙන් නැවත අවස්ථාව ඉල්ලන්නේ නැහැ. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමේදී එතුමා කිව්වා, "මේ සිදුවීම හෙළිදරව් කරපු නාමල් කුමාර නැමැති පුද්ගලයාට පොලිස් ආරක්ෂාව දෙන්න" කියලා. නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමා කිව්වා, ඒ පුද්ගලයා ආරක්ෂාව ඉල්ලුවොත් ලබා දෙනවා කියලා. ආරක්ෂාව ඉල්ලුවොත් ලබා දෙනවා නොවෙයි, ගරු කථානායකතුමනි. ඊයේ වෙනකම් ඒ පුද්ගලයාට ලබා දී තිබුණු ආරක්ෂාව ඊයේ සවස ඉවත් කරලා තිබෙනවා. පරීක්ෂණය හරියට කෙරෙනවා නම් ඒ පුද්ගලයා පොලිස් ආරක්ෂාව ඉල්ලන්න ඕනෑද? ආරක්ෂාව ඉල්ලන්න කලින් ආරක්ෂාව ලබා දී හරියට පරීක්ෂණ කරන එක ආණ්ඩුවේ යුතුකම නොවෙයිද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඊයේ CID එක පැය 10කට ආසන්න කාලයක් පරීක්ෂණ පවත්වා එම නිලධාරීන් විසින්ම පොලිස් ජීප් රථයක නංවා නාමල් කුමාරව ඔහුගේ නිවසට ඇරලුවා. මේ කියන්නේ සම්පූර්ණ බොරුවක්. අපි අවශ්‍ය ආරක්ෂාව ලබා දී තිබෙනවා. ඊයේ CID එක බොහොම ගෞරවයෙන් ඒ පුද්ගලයා නිවසට ඇරලුවා. එම නිසා ඒ පුද්ගලයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි පැමිණිලිකරුවනුත් ආරක්ෂා කරනවා; චිත්තිකරුවනුත් ආරක්ෂා කරනවා. ඔබතුමන්ලාගේ කාලයේ පැමිණිලිකරුවන් ආරක්ෂා වුණේත් නැහැ; චිත්තිකරුවන් ආරක්ෂා වුණේත් නැහැ. අපි නාමල් කුමාර විතරක් නොවෙයි, සියලුදෙනා ආරක්ෂා කරනවා කියන එක වගකීමෙන් ප්‍රකාශ කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ වන විට පැයකට ආසන්න කාලයක් ප්‍රමාද වී තිබෙනවා. [බාධා කිරීමක්] ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාට අවස්ථාව දුන්නා. බොහොම ස්තුතියි. කරුණාකර වාඩි වෙන්න. [බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
වෙන ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද වෙන ප්‍රශ්න අහන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එක මොකක්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු විජයකලා මහේස්වරන් මන්ත්‍රීතුමිය විසින් කරන ලද LTTE එකට පක්ෂපාති, බෙදුම්වාදය ප්‍රවර්ධනය වන බරපතළ ප්‍රකාශය ගැන නීතිපතිවරයාගෙන් උපදෙස් ඉල්ලා සිටි බව ඔබතුමා මීට පෙර වතාවක මේ ගරු සභාවට කියා සිටියා. දැන් සති ගණනක් ගෙවී ගිහින් තිබෙන්නේ. නීතිපතිවරයා ඔබතුමාට අදාළ උපදෙස් ලබා දුන්නාද, ලබා දුන්නා නම් ඒ උපදෙස් මොනවාද, උපදෙස් ලබා නොදුන්නේ නම් ඒවා ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ කවදාද කියා මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නීතිපතිතුමා අවශ්‍ය පියවර ගන්නවා කියා මා දැනුවත් කර තිබෙනවා. එතුමා අවශ්‍ය නීතිමය පියවර ගන්නවා. [බාධා කිරීමක්] එතුමා දැනටමත් නඩු පැවරීමට පියවර අරගෙන තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඒක නොවෙයි ප්‍රශ්නය.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මෙය රීති ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා මේ ගරු සභාවේ කථානායකතුමා හැටියට ඒ අවස්ථාවේ පොරොන්දු වුණා, මෙමඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වී තිබෙනවාද නැද්ද කියා නීතිපතිවරයාගෙන් විමසා දැන ගැනීමෙන් අනතුරුව එම මන්ත්‍රීවරියට තවදුරටත් මන්ත්‍රී ධුරයේ රැඳී සිටීමට පුළුවන්ද, බැරිද කියන කරුණ පිළිබඳ පියවර ගන්නවා කියා. පොලිසිය පරීක්ෂණයක් කර, බොරුවට උසාවියක නඩුවක් පවරලා, තව විරාන් කාලයක් තිස්සේ නඩුව අහලා, නඩු file කැළේ ගිහින්, ඒ ප්‍රෝඩාව ගැන නොවෙයි මම අහන්නේ. අපි මේ ගරු සභාවේ ව්‍යවස්ථාව රකින්න, බෙදුම්වාදය ප්‍රවර්ධනය නොකරන්න දිවුරුම් දුන්නා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
උසාවියේ තීරණය ලැබෙන තෙක් මට කිසිවක් කරන්න බලයක් නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ මන්ත්‍රීවරිය මේ දිවුරුම කඩ කරලා තිබෙන්නේ. එතකොට ඔබතුමා මොකද කරන්නේ? අපි ඔක්කොම ඒ දිවුරුම කඩ කළොත්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම කරන්නේ උසාවියේ තීරණය අනුව ක්‍රියා කිරීමයි. නීතිපතිවරයාගේ ක්‍රියාදාමය අනුව මම ක්‍රියා කරනවා. එතුමා උසාවියේ නඩු පවරලා තිබෙන්නේ. එතැනින් එහාට කරන්න දෙයක් නැහැ. කරුණාකර වාඩි වෙන්න.

දැන් ප්‍රධාන කටයුතුවලට යාමේ අවස්ථාව. මම මේ අවස්ථාවේ පැහැදිලි කිරීමක් කළ යුතුයි. මේ ප්‍රශ්නයේ වැදගත්කම තේරුම් අරගෙන තමයි මම අවස්ථාව ලබා දුන්නේ. එහෙම නැත්නම් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඇහුවා; පිළිතුරු දුන්නා. එතැනින් ඉවරයි. මම අද ස්ථාවර නියෝගවලින් පිට ගිහින් මන්ත්‍රීවරු බොහෝ දෙනෙකුට කථා කරන්න අවස්ථාව ලබා දුන්නා. එහෙම අවස්ථාව ලබා දුන්නේ මෙහි තිබෙන වැදගත්කම නිසායි. එක් වරකට වඩා අවස්ථාව ඉල්ලුවාම මම කිව්වා, "අසාධාරණ වෙන්න එපා" කියලා. ඒකට ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමාත් පොඩ්ඩක් කලබල වුණා. මම කථානායකවරයා වශයෙන් මේ කරුණ ආරංචි වුණු හැටියේම පොලිස්පතිවරයාට කථා කළා; පොලිස් කොමිසමේ සභාපතිට කථා කළා: ඇමතිතුමාට කථා කළා. ඊයේ පොලිස්පතිවරයා මගේ කාර්යාලයට කැඳවලා පැයකට වැඩි කාලයක් මේ ගැන සාකච්ඡා කළා. අපටත් මේ ගැන වගකීමක් තිබෙනවා. එම නිසා අවශ්‍ය පියවර ගත්තා. ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා එක පිටුවක ප්‍රශ්නයක් තමයි දුන්නේ. මම ඒක කියවන්න අවස්ථාව දුන්නා. ඒකට තව අමතර කොටස් එකතු කර එතුමා කථා කළා. ඊට පසුව පත්තර හයක කැලිත් කිව්වා. ඊට පසුව තමයි මම කිව්වේ දැන් අවසාන කරන්න කියලා. ඒකටත් කලබල වුණා.

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයකු හැටියට හිටපු එතුමා මේ ස්ථාවර නියෝග දැන ගන්න ඕනෑ. ඉතාම සාධාරණයි මම කටයුතු කළේ. ඒ නිසා අසාධාරණ චෝදනා නහන්න එපා. ඔබතුමන්ලාට වාගේම මටත් යුතුකමක් තිබෙනවා, ජනාධිපතිතුමා, ගෞරවනීය රාජපක්ෂ මහත්මයා -ඒ ඕනෑම කෙනකු- ආරක්ෂා කරන්න. ඒ කාට හෝ ජීවිත තර්ජනයක් තිබෙනවා නම් ඒ අය ආරක්ෂා කිරීම අපේ යුතුකමක්. ඒ නිසායි මම ඊයේ පොලිස්පතිවරයා කැඳෙව්වේ. ඒ අවශ්‍ය පියවර ගන්නවා. ඒ නිසා කරුණාකර, මේ කාරණය අනවශ්‍ය ප්‍රචාරයක් ගැනීම සඳහා පාවිච්චි කරන්න එපා. මම කනගාටු වෙනවා, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා වැනි කෙනකු ඒ විධියට කථා කිරීම ගැන. [බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඉවරයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්න හැදුවේ මෙතැන රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් තිබෙන බවයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ඔබතුමාට ඒ වෙලාවේ කියන්න තිබුණා. විනාඩි 6ක් කථා කළා. ඒ වෙලාවේ ඔබතුමා වෙනත් කාරණා මතු කළා. [බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපි කියන්න හැදුවේ- [බාධා කිරීම්] එහෙම වුණොත් ඔබතුමාත් ඔතැන නැහැ; අපිත් මෙතැන නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට කමක් නැහැ. මම නැති වුණාට කමක් නැහැ.

මීළඟට, ප්‍රධාන වැඩ කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම. විෂය අංක 2, ගුවන් සේවා පනත යටතේ නියෝග අනුමත කිරීම.

න්‍යාය පත්‍රයේ අද දින සලකා බැලීමට නියමිත විෂය අංක 1 යටතේ සඳහන් ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත සහ අංක 2 යටතේ සඳහන් ගුවන් සේවා පනත යටතේ නියෝග පිළිවෙළින් 2018 අගෝස්තු 24 සහ 2018 අගෝස්තු 23 යන දිනවලදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, 2018 සැප්තැම්බර් 2 වැනි දින ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සලකා බලා, ඒ සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව 2018 සැප්තැම්බර් 18 එනම්, අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද බවත්, මෙම ගරු සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

## ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත
## வானூர்தி மூலம் ஏற்றிச் செல்லல் சட்டமூலம்
## CARRIAGE BY AIR BILL

[අ.භා. 2.47]

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)
ගරු කථානායකතුමනි, "ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත දැන් දෙවනවර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පතත්, සිවිල් ගුවන් සේවා පනත යටතේ ගෙනෙන නියෝගත් මෙම ගරු සභාවට මා ඉදිරිපත් කර සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා පළමුවෙන්ම ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත පිළිබඳව මූලික කරුණු පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි.

අද දින ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පත සමඟ 1999 මොන්ට්‍රියල් සම්මුතිය පූර්ණ වශයෙන්ම ඇතුළත් කර තිබෙනවා. ඒ, ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැන ගැනීම සඳහා. වාර්ෂිකව බිලියන 4කට වැඩි මගීන් සංඛ්‍යාවක් සහ ටොන් මිලියන 50කට අධික භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන ගුවන් ගමනාගමනය ලෝකයේ ආරක්ෂිතම ප්‍රවාහන මාධ්‍ය බවට පත් වෙලා තිබුණත්, අනතුරු හා විවිධ සිදුවීම් ඇති වීමේ හැකියාවක් හා සම්භාවිතාවක් තවමත් පවතිනවා.

ගුවන් මගීන් මරණයට පත්වීම, මගීන් හට තුවාල සිදුවීම, මගීන් ගුවන් ගමනා ගමනයේදී ප්‍රමාදයට ලක්වීම හා ඔවුන්ගේ ගමන් මලු, භාණ්ඩ ප්‍රමාදයට ලක්වීම, හානියට පත්වීම හෝ නැතිවීම සිදු වුවහොත් එවැනි අවස්ථාවලදී සහන සැලසීමට අදාළව ගුවන් සමාගම් විසින් දැරිය යුතු වගකීම් පද්ධතියක් සඳහා වන ප්‍රතිපාදන ලබා දීමට 1999 මොන්ට්‍රියල් සම්මුතිය මඟින් ඉඩ සලසා තිබෙනවා. මීට පෙර, ගුවන් සමාගම්වල වගකීම්වලට අදාළව විවිධ ජාත්‍යන්තර සම්මුති ඇති කරගනු ලැබුවත්, ඒ සියල්ල සංශෝධනය කොට මෙවැනි වගකීම් පද්ධති නවීකරණයට ලක් කිරීම හා ඒකාබද්ධ කිරීම මෙම සම්මුතිය මඟින් ඉටු කර තිබෙනවා. වෙනත් අයුරකින් කියනවා නම්, සමස්ත ලෝකයටම අදාළ වන ලෙස ගුවන් සමාගම්වල වගකීම පාලනය කරනු ලබන තනි විශ්වීය සම්මුතියක් වශයෙන් ක්‍රියාත්මක වනු පිණිස මොන්ට්‍රියල් සම්මුතිය නිර්මාණය කර තිබෙනවා. මේ දක්වා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානවලට අයත් සාමාජික රාජ්‍යයන් 192න්, 131ක් මෙම සම්මුතියෙහි ප්‍රතිපාදනවලට අදාළව තම රාජ්‍යයන්හි නීති පද්ධති තුළ නීති පනවනු ලබමින් සම්මුතියේ පාර්ශ්වකරුවන් බවට පත් වෙලා තිබෙනවා. කෙසේ වෙතත්, මොන්ට්‍රියල් සම්මුතිය මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ සාමාන්‍ය ගුවන් මගීන් වෙත අත්කර දීමට නම් සාමාජික රාජ්‍යයන්ගෙන් බහුතරය අප්‍රමාදව එය අපරානුමත කළ යුතු වෙනවා.

එසේ නම්, විවිධ සංදර්භයන්ට අදාළ වගකීම් පද්ධතිවල අඩු පාඩු මහ හරවාලමින් ඒ කටයුතු කිරීම අවශ්‍ය වනවා. ඒ නිසා තමයි ශ්‍රී ලංකාවත් 1999 මොන්ට්‍රියල් සම්මුතිය පිළිගෙන ඒ සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට ඇතුළත් වෙලා, අපේ සිවිල් ගුවන් සේවා අංශයට ජාත්‍යන්තර වශයෙන් ලබාගත හැකි පහසුකම් හා නීතිමය රාමුව ලබා ගැනීම සඳහා කටයුතු කර තිබෙන්නේ.

ප්‍රවාහනය කරන භාණ්ඩ තොගවලට අදාළව කාර්යක්ෂමතාව ඉහළ නංවන හා අඩු වියදම් විද්‍යුත් ලිපිගොනුකරණය භාවිත කිරීමට අවශ්‍ය නෛතික රාමුව ස්ථාපිත කිරීම මෙම සම්මුතිය මඟින් සිදු කෙරෙනවා. විශේෂයෙන්ම මෙම පනත් කෙටුම්පතට මොන්ට්‍රියල් සම්මුතියේ සඳහන් කරුණු සියල්ල පූර්ණ වශයෙන්ම ඇතුළත් කර, ගරු මන්ත්‍රීතුමන්ලාට දැන ගැනීම සඳහා මොන්ට්‍රියල් සම්මුතියේ පිටපතක්ද අමුණා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තුළින් ලැබෙන වාසි මොනවාද කියා කෙනෙක් අහන්න පුළුවන්. ගුවන් යානා අනතුරකින් යම් කෙනෙක් මිය ගියා නම් මීට පෙර තිබුණු සම්මුති අනුව ඒ මරණය වෙනුවෙන් ලබාගත හැකිව තිබුණේ, එක්සත් ජනපද ඩොලර් 24,000ක මුදලක් පමණයි. නමුත් මේ සම්මුතියට ඇතුළත් වීම නිසා, යම් ආකාරයකින් ගුවන් අනතුරකින් කෙනෙකු මිය ගියා නම් ඒ මරණය වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් 160,000ක් නිතැතින්ම ලැබෙනවා. නමුත්, ඒ අනතුර සිදු වෙලා තිබෙන්නේ නොසැලකිලිමත්කම නිසා නම්, ඒ වගකීම පිළිබඳව උසාවියකින් නියම කරන ඕනෑම ඉහළ මුදලක් - unlimited liability - ලබා ගැනීමේ අයිතිවාසිකම තිබෙනවා. ඒ වාගේම, ගමන් මලු ප්‍රමාදයක් නිසා ගුවන් මගියකුගේ පැමිණීම ප්‍රමාද වුණා නම්, ඒ සඳහා එක්සත් ජනපද ඩොලර් 6,000ක් ලැබෙනවා. තමන්ගේ බඩු බාහිරාදිය ප්‍රමාද වුණා නම් ඉස්සර හැකියාව තිබුණේ එක්සත් ජනපද ඩොලර් 20ක් අය කර ගන්නයි. නමුත් දැන් 1,600ක් අය කර ගන්න පුළුවන්.

එපමණක් නොවෙයි. නඩු පැවරිය හැකි අධිකරණ බලය පිළිබඳව මෙම පනත් කෙටුම්පත මඟින් වෙනසක් කර තිබෙනවා. මුලින් තිබූ සම්මුති අනුව, නඩු පැවරිය හැකි අධිකරණ බලය පිළිබඳව ස්ථාන - principal place of business - වෙනස් කර තිබෙනවා. යම් රටක airline එකේ මූලික කාර්යාලය - airline office - තිබෙන ස්ථානය හෝ ටිකට් විකුණුපු ස්ථානය - place of sale - හෝ ඒ airline එකේ ගමනාන්තය - place of destination - කුමක් වුවත් මගියෙකුට තමන්ගේ රටේදීම නඩු පැවැරිය හැකියි. ශ්‍රී ලාංකිකයෙක් නම් ඔහුට වෙන රටවලට ගිහිල්ලා නඩු පැවරීමේ අවශ්‍යතාවක් නැහැ. ඒ තුවාලය පිළිබඳව, ඒ සිදු වුණු අනතුර පිළිබඳව හෝ මරණය පිළිබඳව වන්දි ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකාවේදීම කර ගැනීමට අවශ්‍ය ඉඩ පහසුකම් මේ මොන්ට්‍රියල් සම්මුතියට ඇතුළු වීම තුළින් අපි ලබා දී තිබෙනවා. මේ නිසා දැන් අපේ ගුවන් සේවාව ඉතා පුළුල් වේයැයි මා හිතනවා. දැන් ගුවන් ගමන්වල යෙදෙන ශ්‍රී ලාංකිකයන්ගේ සංඛ්‍යාව ඉතාම වැඩියි. ඒ නිසා අපට මෙයින් විශාල වාසි ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන්. මෙය අත්‍යවශ්‍ය නීතියක් බවට පත් වෙලා තිබෙනවාය කියා මා ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ සමඟම අද ඉදිරිපත් කරන Civil Aviation Safety Management Regulations ගැනත් කිව යුතුයි. අමාත්‍යවරයා වශයෙන් මම 2018 අප්‍රේල් 05 දිනැති මෙම ගැසට් පත්‍රයේ සිවිල් ගුවන් සේවා නිරුපද්‍රවතා කළමනාකරණ නියෝග දාලා තිබෙනවා. යම් ගුවන් සේවාවක් ක්‍රියාත්මක කිරීමේදී හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටතට යන ගුවන් ගමන් පිළිබඳව, ඒ ක්‍රියාත්මක කරන ගුවන් සේවා පිළිබඳව නීතිරීති සමුදායක් අපි මෙම නියෝග මඟින් ඉදිරිපත් කර තිබෙනවා.

නිරතුරුව එම එන්ජින් සහ ගුවන් යානා නිසි ලෙස නඩත්තු කිරීම, පරිපාලනය කිරීම, ඒ වාගේම එහි සේවය කරන සේවකයින්ගේ කාර්යක්ෂමතාව, තාක්ෂණික දැනුම, විශේෂයෙන්ම ගුවන් නියමුවන් - pilotsලා - පිළිබඳව තිබෙන නියෝග, ඔවුන්ගේ සෞඛ්‍ය පිළිබඳව, ඔවුන්ගේ දෘශ්‍ය පද්ධතිය පිළිබඳව යනාදි කරුණු ජාත්‍යන්තර මට්ටමින් තබා ගැනීමේ වැදගත්කම සහ ඒ අනුව ආරක්ෂිත ගුවන් සේවාවක් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීම තමයි අපි මේ තුළින් බලාපොරොත්තු වෙන්නේ. මේ සඳහා පාර්ලිමේන්තුවේ අනුමතිය ලැබුණායින් පසුව සිවිල් ගුවන් සේවා අධිකාරිය - Civil Aviation Authority - විසින් මේ සඳහා අවශ්‍ය වෙනත් කරුණු කාරණා පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීමට බැඳී සිටිනවා. එම කටයුතු සිදු කිරීමට අපි පියවර ගන්නා බවත් මා ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ගුවන් සේවාව වඩාත් සුරක්ෂිත කිරීම සඳහාත්, ගුවන් සේවාව වඩාත් ප්‍රවලිත කිරීම සඳහාත්, ගුවන් සේවාවේ ආරක්ෂාව සඳහාත් අපි ගුවන් යානා පමණක් නොවෙයි, ගුවන් යානා ගොඩ බැස්සවීමට ඇති ගුවන් තොටුපොළවල ප්‍රමිතිය නියම මට්ටමට ගෙන ඒමත් ඉතාම අවශ්‍ය වෙනවා. අවුරුදු 21ක් තිස්සේ අපි ගුවන් යානා ගොඩ බැස්සවීමේ කටයුතු සිදු කළත්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ගුවන් පථය අනාරක්ෂිත බව ICAO සංවිධානය මඟින් අප වෙත පෙන්වා දීමෙන් පසුව අපට එය නැවතත් ජාත්‍යන්තර මට්ටමට ප්‍රතිසංස්කරණය කිරීමේ අවස්ථාව ලැබුණා. එම කාර්ය භාරය අප විසින් ඉටු කළ බවත් මම ප්‍රකාශ කරන්නට කැමැතියි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු ඇමතිතුමනි, යම් කාරණයක් ගැන දැන ගැනීමට පුළුවන් ද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ඔව්, කියන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු ඇමතිතුමනි, ඔබතුමා අද ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත භරහා ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නේ නිදහස් ගුවන් අවකාශය ගැනද, එහෙම නැත්නම් ගුවන් යානා සම්බන්ධ ප්‍රමිතිය ගැනද? මොකද, ඔබතුමාගේ පැහැදිලි කිරීමේ දී නිදහස් ගුවන් අවකාශය ගැනත් කථා කළා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
නැහැ, නැහැ. නිදහස් ගුවන් අවකාශය ගැන නොවෙයි. ඒ කියන්නේ, open skies policy ගැන නොවෙයි කථා කරන්නේ.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ඒ ගැන කථා කළේ නැද්ද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
නැහැ. ඒක මේකට අයිති වෙන්නේ නැහැ. මෙතැනදී කථා කරන්නේ ගුවන් යානාවල ගමන් ගන්නා මගීන්ගේ ආරක්ෂාව, බඩු මුට්ටුවල ආරක්ෂාව යනාදිය සම්බන්ධවයි. ගුවන් ගමනකදී මගියෙකුට යම් අනතුරක් වුණා නම්, එහිදී කලින් තිබුණු සම්මුතිවලට වැඩිය මොන්ට්‍රියල් සම්මුතියෙන් තමයි ගුවන් මගියාට වැඩි වාසි ලැබෙන්නේ. එම සම්මුතිය තමයි අපි අත්සන් කරලා තිබෙන්නේ. ඒ සම්මුතිය අනුව තමයි මේ පනත් කෙටුම්පත අපි සකස් කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම සිවිල් ගුවන් සේවා අධිකාරිය වඩාත් ශක්තිමත් කරන්න අපට පුළුවන් වුණා. සිවිල් ගුවන් සේවා අධිකාරිය තමයි මේ රටේ ඊට අදාළ සියලු නීති රීති, රෙගුලාසි ක්‍රියාත්මක කරන සහ ඒවා නිසි ලෙස ක්‍රියාත්මක වෙනවාද කියලා බලන මධ්‍යස්ථානය වන්නේ. අපි රුපියල් මිලියන 825ක් පමණ වියදම් කරලා කටුනායක ඉතා හොඳ ගොඩනැඟිල්ලක් ඉදිකර, ඒ සඳහා අවශ්‍ය නවීන තාක්ෂණ උපකරණ සියල්ල සවි කළා. හුණුපිටිය ගංගාරාමයට විශාල කුලී මුදලක් ගෙවපු එක නතර කරගෙන හොඳ -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමාගෙන් මෙම කාරණය පිළිබඳව මා දැන ගන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, පලාලි ගුවන් තොටුපොළ ජාත්‍යන්තර මට්ටමේ සිවිල් ගුවන් තොටුපොළක් බවට පරිවර්තනය කරලා ඉන්දියානු සිවිල් ගුවන් සේවා අධිකාරියට භාර දෙන්න තමුන්නාන්සේලා කටයුතු කරගෙන යනවාය කියලා මේ වනවිට වාර්තා වෙලා තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු මුල් කාරණා ටික හරි. දෙවනුව කියපු ටික වැරදියි. ඒක ඔබතුමා අතින් දමපු එකක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමනි, දෙවනුව කියපු කාරණය වැරැදියි කියන්න බැහැ. මොකද, මම ඉතා වගකීමෙන් කියනවා මේ වනවිට විදේශ -

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
මමයි ගුවන් සේවා ඇමති විධියට කටයුතු කරන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමනි, මේ වනවිට විදේශ කටයුතු අමාත්‍යාංශය ඉන්දියානු සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ එකඟතාවක් ඇති කරගෙන, මූලික ගිවිසුමක් පවා අත්සන් කරලා තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala De Silva)
අමූලික බොරුවක්. අමූලික බොරුවක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
නැහැ. මම වගකීමකින් කියන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
හොඳයි. ගරු ඇමතිතුමා කථාව කරගෙන යන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala De Silva)
ගරු මන්ත්‍රීතුමනි, මම ඇමතිතුමා වශයෙන් කියන දේ ඔබතුමා පිළිගන්න එපායැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා ඇමතිතුමා වශයෙන් කියනවා, "ඒක බොරුවක්" කියලා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala De Silva)
බොරුවක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමන්ලාගේ මේ තිබෙන ආණ්ඩුවේ ආයු කාලය ගෙවී යාමට ප්‍රථම අනාගතයේ කිසියම් දිනක පලාලි ගුවන් තොටුපොළ ඉන්දියානු සිවිල් ගුවන් සේවා අධිකාරියට දුන්නොත්, ඔබතුමා එතකොට ඔය තනතුරින් ඉල්ලා අස් වෙනවාද කියා මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala De Silva)
මෙය දේශපාලන වශයෙන් යම් යම් වාසි ලබා ගැනීමට ඔබතුමා කරන උපකල්පනයක්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
මම අහන්නේ ඔබතුමා ඔය තනතුරින් ඉල්ලා අස් වෙනවාද කියලායි. එහෙම වුණොත් ඔබතුමා ඉල්ලා අස් වෙනවාද කියලායි මම අහන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala De Silva)
උපකල්පනය කරන්න එපා. එහෙම දෙයක් වෙන්නේ නැහැ.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(මාණ්පුමිකු ආර්. එම්. පත්ම උදයසාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
එහෙම වුණොත්?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala De Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලාට ඕනෑ නැති ගිනි අවුළුවන්නයි. ඒක වැරැදියි. [බාධා කිරීම්] මෙතුමන්ලාට ඕනෑ නැති ගිනි අවුළුවන්න. [බාධා කිරීම්] පලාලි ගුවන් තොටුපොළ දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නවා. නමුත් ඉන්දියාවට හෝ වෙන කෙනෙකුට හෝ දෙන්න කිසිම අදහසක් නැත.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(මාණ්පුමිකු ආර්. එම්. පත්ම උදයසාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
දුන්නොත්?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala De Silva)
දුන්නොත් ඔබතුමා ඒ වෙලාවට බලා ගන්න. එහෙම දෙන්නේ නැහැ, එහෙම දෙන්නේ නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාත් එතකොට පූජිත වාගේ කියයි, "අම්මට හුඩු දිලා නේ", කියලා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala De Silva)
තමුන්නාන්සේ කට තිබුණු පළියට කථා කරන්න එපා. වැදගත් විධියට කථා කරන්න ඉගෙන ගන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(මාණ්පුමිකු නිමල් සිරිපාල ද සිල්වා)
(The Hon. Nimal Siripala De Silva)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, හැම තිස්සේම points of Order raise කරන්න එපා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
නිකම් කොකු දාලා මාධ්‍යයට කථා කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, what is your point of Order?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට වැදගත් විධියට කථා කරන්න කියන එක, අමාත්‍යාංශයක ශීලාචාර විධියට හැසිරිච්ච කෙනෙකු මට එහෙම කිව්වා නම් මම ඒක බාර ගන්න ලෑස්තියි. නමුත්,- [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Minister, you continue with your speech.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පලාලි ගුවන් තොටුපොළ කිසිම විදේශ රටකට -ඉන්දියාවට- ලබා දීමට කිසිදු අදහසක් මේ රජයට නැත. නමුත් ජෝන් අමරතුංග ඇමතිතුමාගේ Tourism Development Fund එකෙනුත්, අපේ තිබෙන මුදලුත් යොදලා අපි දැන් පලාලි ගුවන් තොටුපොළ වැඩිදියුණු කිරීමට කටයුතු කරනවා. පලාලි ගුවන් තොටුපොළ විතරක් නොවෙයි. හිඟුරක්ගොඩ, මඩකලපුව දැනටමත් අපි දියුණු කරලා අවසානයි. ඒ වාගේම කොග්ගල, දිගන, ත්‍රිකුණාමලය කියන මේ domestic airports සියල්ලම අපි වැඩිදියුණු කළ යුතුයි. මොකද, අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා ඒවා නිසි ප්‍රමිතියට අපි ගෙන ආ යුතුයි. මේ ගුවන් තොටුපොළ භදන්නේ කාටවත් දෙන්න නොවෙයි, අපිට තියා ගන්න. අභ්‍යන්තර ගුවන් ගමන් සේවාව වැඩිදියුණු කරන්න තමයි අපි මේ ගුවන් තොටුපොළ භදන්නේ. මොකද, ඒකේ වැරැද්දක් නැහැනේ. විශේෂයෙන්ම රත්මලාන ගුවන් තොටුපොළ පරිශ්‍රය තුළ විශාල කොටසක් ගුවන් හමුදාව විසින් අත් කරගෙන තිබුණු නිසා රත්මලාන ගුවන් තොටුපළින් සම්පූර්ණ ඵල ප්‍රයෝජන ගන්න අපිට බැරි වුණා. අපි දැන් ගුවන් හමුදාවත් එක්ක මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා, අපට තිබෙන අරමුදල්වලින් රුපියල් මිලියන 750ක් ඒ අයට ගෙවලා, ඒ අයගේ තිබෙන ගොඩනැඟිලි එක පැත්තකට ගෙනියලා, එතැනින් අක්කර 25ක ඉඩම් ප්‍රමාණයක් මුදවාගෙන එහි වඩාත් ඉඩකඩ සහිත ගුවන් තොටුපොළක් ඇති කිරීම සඳහා අපි අවශ්‍ය කටයුතු කරනවා. විශේෂයෙන්ම පෞද්ගලික ජෙට් යානා ලංකාවට පැමිණියාම ඒ පෞද්ගලික ජෙට් යානා නතර කිරීමට තැනක් අවශ්‍යයි. ඒ සඳහා විශාල ඉල්ලුමක් ඇති වී තිබෙනවා. ඒක විශාල ආදායම් මාර්ගයක්. ඒකට අපේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ඉඩකඩ නැති නිසා අපි දැන් එය දියුණු කිරීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරනවා.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ දෙවැනි මගී පර්යන්තය -second terminal- සෑදීම සඳහා අපිට JICA ආයතනයෙන් ණය මුදලක් ලැබුණා. හැබැයි, ජයිකා ආයතනයෙන් ණය මුදල ලැබෙන විට ඒ ණය කොන්දේසි අනුව ජපන් කොන්ත්‍රාත්කරුවන් පමණක් ඒ සඳහා තේරා ගන්න අපට සිදු වුණා. ඒ අවස්ථාවේදී අපි කොන්ත්‍රාත්කරුවන් තේරා ගන්නට ගියාම, ජපන් කොන්ත්‍රාත්කරුවන්ගේ කොන්ත්‍රාත් මුදල ඉංජිනේරු ඇස්තමේන්තුවලට වඩා සියයට 47ක් වැඩියි. ඒ නිසා අපට ඒක දෙන්න ලැබුණේ නැහැ. ඒක අපට දෙන්න පුළුවන්කමක් නැහැ කියලා මම කිව්වා. ඒ නිසා අපි දැන් නැවත ඒක ටෙන්ඩර් කරන්න කටයුතු කරගෙන යනවා.

එම නිසා එහි ප්‍රමාදයක් ඇතිවෙලා තිබෙනවා. එසේ ප්‍රමාදයක් ඇති වුණත්, දැනට පැමිණෙන මගී ධාරිතාව දිනෙන් දින වැඩි වන නිසා තාවකාලික පිළියමක් වශයෙන් අපට පෙරසව් ගුවන් පර්යන්තයක - prefabricated terminal - අවශ්‍යතාව මතු වී තිබෙනවා. එවැනි terminals ලෝකයේ ගුවන් තොටුපළවල් ගණනාවක තිබෙනවා. එම ගුවන් තොටුපළවලින් ඒ පිළිබඳ අත්දැකීම් ලබාගෙන, ටෙන්ඩර් පටිපාටිය අනුව එම කාර්යය ප්‍රදානය කිරීමට අපි කටයුතු කර තිබෙනවා. දැන් එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙන්නේ. එම පර්යන්තය මාස 9ක් තුළදී ගොඩ නැංවීම සඳහා ඒ කටයුතු තව සුමානයකින් දෙකකින් පමණ ආරම්භ කරන්න අපට පුළුවන් වෙයි. විශේෂයෙන්ම සංචාරකයන්ගේ පැමිණීම වැඩිවීමත් සමඟ අපට ඒ අවශ්‍යතාව ඉතාම ඉහළින් දැනෙනවා. අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

විශේෂයෙන්ම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ලෝකයේ ඉහළම තත්ත්වයේ ගුවන් තොටුපළක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය රේඩාර් සහ අනෙකුත් තාක්ෂණික පහසුකම් සියල්ල අපි දැන් ලබා දී තිබෙනවා. එම නිසා අපේ ගුවන් තොටුපොළ ඉතාම ආරක්ෂිතයි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඒ මට්ටමට ගෙන ඒමට පුළුවන් වීම අපට ආඩම්බරයක්.

මේ රජය යටතේ අපි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙන් විශාල ආදායමක් ලබාගෙන එම ආදායම මහා භාණ්ඩාගාරයට ලබාදී තිබෙනවා. මීට කලින් duty-free shopsවලින් අපට ලැබුණේ සියයට 23යි. නමුත්, මම පාරදෘෂ්‍යභාවයකින් යුතුව ඒ කටයුතු කළ නිසා සියයට 43ක ප්‍රමාණයක් ලබාගෙන මහා භාණ්ඩාගාරයට මුදල් විශාල ප්‍රමාණයක් ලබාදීමට පුළුවන් වුණා. ගුවන් ක්ෂේත්‍රය තුළ මෙන්න මේ කියන වැඩිදියුණු කිරීම් කිරීමට අපේ ගුවන් සේවා අධිකාරිය කටයුතු කර තිබෙන බව ප්‍රකාශ කරමින්, අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත සහ නියෝග සම්මත කර ගැනීම සඳහා මෙම ගරු සභාවේ අනුමැතිය ලබාදෙන ලෙසත් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මීළඟට, ගරු බිමල් රත්නායක මහතා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කොපමණ කාලයක් වෙන් කර තිබෙනවාද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Twenty one minutes.

[අ.භා. 3.09]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගුවන් සේවයට සම්බන්ධ නියෝගයක් සහ පනත් කෙටුම්පතක් අනුමැතිය සඳහා අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම, ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට අයත් නොවන, වෙනත් අමාත්‍යාංශයකට අදාළ ආයතනයක් පිහිටුවීම සම්බන්ධයෙනුත් අද සාකච්ඡා වෙනවා. මෙහිදී මගේ අවධානය ප්‍රධාන වශයෙන්ම යොමු කරන්නේ ගුවන් සේවා සම්බන්ධවයි. මූලික වශයෙන් ගත්තොත්, අද දින ඉදිරිපත් කර තිබෙන, ගුවන් මගීන්ගේ සහ ගමන් බඩුවල ආරක්ෂාව වැඩිදියුණු කිරීම වෙනුවෙන් ප්‍රමිති සකස් කිරීම පිළිබඳ කාරණා ගැන විරෝධතාවක් තිබෙනවාය කියා මම හිතන්නේ නැහැ. මොකද, ඒවා පරිපාලන සහ සාමාන්‍ය තාක්ෂණික කරුණුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද පාර්ලිමේන්තුව පටන් ගන්නකොට මම ගරු අග්‍රාමාත්‍යවරයාගේ අවධානයට යොමු කරන්න හැදූ කාරණයක් ගැන කියලා මගේ කථාව ආරම්භ කරන්න මම හිතුවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, ශ්‍රී ලංකා පරිපාලන සේවා විභාගය - SLAS - පිළිබඳව මේ වන විට රටේ යම් ආන්දෝලනයක් ඇති වී තිබෙන බව. එම විභාගය පවත්වලා වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගෙන් 59දෙනකු තෝරාගෙන තිබෙනවාය කියා තමයි අප දැනුවත් කර තිබෙන්නේ. එම අයදුම්කරුවන්ට අදාළ කරන පෞද්ගලික ලිපිගොනු පවා මේ වන විට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට ගෙන්වා තිබෙනවා. එසේ තිබියදී, මෙම විභාගය තුළ යම් ආකාරයක වංචාවක් වුණාය කියමින් විභාග ප්‍රතිඵල අත් හිටුවීමට ආණ්ඩුව කටයුතු කරනවාය කියන බරපතළ ගැටලුව විශේෂයෙන්ම මෙම විභාගයෙන් සමත් වූ අය අතර දැන් ඇති වී තිබෙනවා; ඒ පිළිබඳව විශාල සාකච්ඡාවක්, සැකයක් ගොඩනැහෙමින් තිබෙනවා.

විභාග වංචා සාමාන්‍යයෙන් සිදු වෙනවා. මීට අවුරුදු කිහිපයකට කලින් මේ පරිපාලන සේවා විභාගයේ යම් වංචාවක් සිදු වුණු බව අපි දන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වංචාව සිදු වුණු ගමන්ම -විභාගය පවත්වපු ආසන්න කාලයේම- ඒ පිළිබඳව විවේචන ගොඩනැඟුණා. මීට කලින් අවස්ථාවේ නම් ප්‍රතිඵල ලකුණු කරලා, ඒ ප්‍රතිඵල නිකුත් කරලා, ඒ අයගේ පෞද්ගලික ලිපිගොනු පවා ගෙන්වා ගත්තාට පස්සේ විභාගය අවලංගු වුණා නොවෙයි. නමුත් මේ අවස්ථාවේ වෙලා තිබෙන්නේ මොකක්ද? විභාගය ලියලා, ඒ ප්‍රශ්න පත්‍ර බලලා, ලකුණු දීලා, ඒ ලකුණුවලින් 59දෙනෙක් තෝරාගෙන, ඒ 59දෙනාට අදාළ පෞද්ගලික ලිපිගොනුත් අමාත්‍යාංශයට ගෙන්වා ගත්තාට පස්සේ ඒ ප්‍රතිඵල අත් හිටුවන්න යනවාය කියන කාරණය පිළිබඳව දැනට අමාත්‍යාංශ මට්ටමින් යම් මැදිහත් වීමක් වෙලා තිබෙන බව අපි දන්නවා.

මේ පිළිබඳව වග කිව යුතුව තිබෙන රාජ්‍ය පරිපාලන ඇමතිවරයා, ඒ වාගේම විභාග දෙපාර්තමේන්තුව භාර අධ්‍යාපන ඇමතිවරයා මේ ගැන රටට වහාම පැහැදිලි කිරීම අවශ්‍යයි. මොකද, මේ විභාගය අවලංගු කිරීමට යනවාය කියන හේතුව ගත්තාට පස්සේ, පැහැදිලිවම ආණ්ඩුවට දේශපාලන සහ වෙනත් කරුණු මත චෝදනා රාශියක් එල්ල වෙනවා. එම නිසා මෙවැනි විභාගයක් අවලංගු කරනවා නම්, එහි තිබෙන බරපතළ ප්‍රශ්නයක් ආණ්ඩුව ඉදිරිපත් කළ යුතුයි. එහෙම නම් විභාග දෙපාර්තමේන්තුව පැහැදිලිවම ඒ වග කීම, තමන්ගේ වැරැද්ද භාරගෙන වැරැදි කළ පුද්ගලයන් හෙළිදරව් කරන්න ඕනෑ. මේ විභාගය අවලංගු කළොත්, ඒ නිසා මෙවර සමත් වුණු පිරිසකට ඊළඟ අවස්ථාව නැති වෙන්න පුළුවන්ය කියන කාරණයත් අපට පෙනෙන්න තිබෙනවා. දෙවරක් මෙම විභාගය ලියපු අයට කොහොමත් නැවත විභාගයට ඉදිරිපත් වෙන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවේ සිටින ප්‍රධාන ඇමතිවරයෙක් වශයෙන් අපේ ගරු ඇමතිතුමා මේ පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරාවි කියා මම හිතනවා. මොකද, මේ අය ඉදිරියේදී අමාත්‍යාංශවල ප්‍රධාන පරිපාලකයන් බවට පත් වෙන්න සිටින අයයි.

ගුවන් සේවා පනත යටතේ වූ නියෝග සම්බන්ධ විවාදයට මම නැවත එකතු වෙන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි අපේ කටුනායක ගුවන් තොටුපොළෙහි ඉඩ පහසුකම් මදිය කියන කාරණය ගරු ඇමතිතුමා පිළිගත්තා; එතුමා එය ප්‍රකාශ කළා. මගේ දැනීමේ හැටියට එය සකස් කර තිබෙන්නේ අවුරුද්දකට මගීන් ලක්ෂ 65ක වාගේ ප්‍රමාණයක් හසුරුවන්නයි. නමුත් නිසි කාලයේදී ඒවායේ අදාළ පුළුල් කිරීම් කර නැහැ. මගීන් ලක්ෂ 90ක්, 95ක් වැනි ප්‍රමාණයක් වාර්ෂිකව කටුනායක ගුවන් තොටුපළ හරහා එනවා. තාක්ෂණික පහසුකම් වැඩි වීමත්, අන්තර්ජාතික වෙළෙඳාම, සංචාරක කටයුතු වැඩිදියුණු කිරීම වැනි කාරණා නිසා ලෝකය පුරා ගුවන් ගමන් සිදුවන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා දැනට විශාල ගැටලුවක් ඇති වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ ඉඩකඩ නොමැති වීම නිසා ගුවන් මගීන්ට සැලකිය යුතු පීඩාවකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. එක ප්‍රශ්නයක් තමයි, ඔවුන්ට ඉන්න තැන්, වාඩි වෙන්න තැන් නැති එක. හැම දේටම ඔවුන්ට සැලකිය යුතු කාලයක් පෝලිමේ ඉන්න වෙලා තිබෙනවා. ලෝකයේ තිබෙන හැම ගුවන් තොටුපොළකදීම මගීන්ට පෝලිමේ ඉන්න වෙන බව අපි දන්නවා. එය සිදු වන්නේ ලංකාවේ විතරක් නොවෙයි. නමුත් ලංකාවේ එහෙම ඉන්න වෙලා තිබෙන කාලය වැඩි වී තිබෙනවා. මම සරල උදාහරණයක් කියන්නම්. සාමාන්‍ය ජනතාව අවුරුද්දකට හත් අට වතාවක් ගුවන්ගත වෙන්නේ නැහැ. අවුරුද්දකට එක වතාවක්, දෙකක් නැත්නම් අවුරුදු කිහිපයකට වතාවක් තමයි මිනිස්සු එහෙම කරන්නේ. අපේ රටෙත් එහෙමයි. ලෝකය ගත්තත් එහෙමයි. ඒ නිසා බෙහෝ අයට මේ ගුවන් ගමන් හුරුපුරුදු නැහැ.

ගරු ඇමතිතුමනි, කටුනායක ගුවන් තොටුපොළේ තිබෙන සරල ප්‍රශ්නයක් ගැන ගිය සැරේත් මම ඔබතුමාට කිව්වා. ඒක තමයි, Wi-Fi කලාප පිළිබඳ ප්‍රශ්නය. එය විසඳනවාය කියා ඔබතුමා එදා පොරොන්දු වුණා. එය විසඳුවාද කියා මම දන්නේ නැහැ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
එය විසඳලායි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

විසඳලා නම් හොඳයි. හැබැයි, මම හිතනවා ඒක ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ ඉන්න විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ Wi-Fi වාගේ නොවෙනවා ඇති කියා. ඒ වාගේ Wi-Fi නම් වැඩක් නැහැ.

ඊළඟ කාරණය මෙකයි, ගරු ඇමතිතුමනි. විවිධ කාර්ය බහුල තත්ත්වයන් නිසා, සමහර අවශ්‍යතා නිසා බොහෝ ගුවන් ගමන්වලදී ගුවන් යානයට ඇතුළු වන දොරටුව වෙනස් කරනවාය කියා ඔබතුමාත් දන්නවා. ගුවන් යානයට ඇතුළු වන දොරටුව සමහර අවශ්‍යතා මත වෙනස් කරනවා. ඒක වෙනස් කළාට පස්සේ, public hearing system එකක් හරහා මගීන්ට දැනුම් දෙනවා ඒක වෙනස් කළාය කියා. නමුත් කටුනායක ගුවන් තොටුපලේ තිබෙන public hearing system එක මගීන්ට ඇහෙන්නේම නැහැ. කොයි තරම් පහසුකම් තිබුණත්, එහෙම වෙනස් වුණාම යම්කිසි පිරිසක් අපහසුතාවට පත් වෙනවා. මෙය සාමාන්‍ය ජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් විධියට අප දකිනවා. ඒ public hearing system එක මුළු ආයතනයටම හරියන විධියට නොවෙයි තිබෙන්නේ. ඒ වාගේම ලංකාවට එනකොට අපට වැඩියෙන්ම දැනෙන කාරණයක් තිබෙනවා. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හරහා මගීන් ඇතුළත් කරගනිද්දී සමහර ආගමන හා විගමන නිලධාරීන් ඉතාම දුෂ්කර -වෙහෙසකර - කාර්ය භාරයක් ඉටු කරන ආකාරය අපට පෙනෙනවා. ඔවුන්ට එක දිගටම මගීන්ගේ වීසා බලමින් මේ කටයුතු කරන්න වෙලා තිබෙනවා. අපට පෙනෙනවා, counters විශාල ප්‍රමාණයක් තිබෙනවා කියා. නමුත් ඒවායේ සේවයට අවශ්‍ය කරන නිලධාරීන් නැහැ. මම දන්නවා, මේක ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් කටයුත්තක් නොවන බව ඔබතුමා කියයි කියා. නමුත් ඔබතුමාට තමයි ගුවන් තොටුපොළ භාරව තිබෙන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ඇත්ත වශයෙන්ම ඒ ගැටලුව දීර්ඝ කාලයක් තිස්සේ තිබුණා. මොකද, අවශ්‍ය ප්‍රමාණයට ආගමන හා විගමන නිලධාරීන් නැහැ. නමුත් ලෝකයේ අනිකුත් airportවල තිබෙන ක්‍රම පිළිබඳව මම සොයා බැලුවා. අද දින කැබිනට් මණ්ඩලය මට අනුමැතිය දුන්නා, e-Gate ක්‍රමයට. ඒ කියන්නේ යම් මගියෙක් ලංකාවෙන් පිටවෙලා ගියා නම් එයාගේ passport එකට අදාළ විස්තර තිබෙනවා. e-Gate සවි කළාට පස්සේ passport එක මේ යන්ත්‍රය මත තැබුවාම නිකම්ම දොරටුව ඇරෙනවා. ඒ නිසා ඒ කටයුත්තට ආගමන හා විගමන නිලධාරීන් අවශ්‍ය වන්නේ නැහැ. ඒ වාගේම අපේ රටට එන විදේශිකයන් ඉන්නවා නේ. ඒ පැමිණි අයගේ records තිබෙනවා නේ. ඒ නිසා රටින් පිටවනකොට ඒ අයටත් අවශ්‍ය නැහැ. මේ නිසා අපට තදබදය සියයට 65කින් පමණ නැති කර ගන්න පුළුවන්. තව මාස පහක් ගත වෙන්න ඉස්සර වෙලා අපි ඒ යන්ත්‍ර සවි කර, නවීන තාක්ෂණය අනුව ඒ වැඩ කටයුත්ත කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, මේ පිළිබඳව ආගමන හා විගමන නිලධාරීන්ගේ පැත්තෙන් ගත්තාම වසර ගණනාවක් තිස්සේ ඔවුන් තමන්ගේ දුක්ගැනවිලි රජයට ඉදිරිපත් කළා කියන කාරණය. ඔබතුමාට එය සෘජුව අදාළ නැහැ. නමුත් ජනතාවට අදාළයි. ගුවන් තොටුපොළට එන මිනිසුන් දන්නේ නැහැ, මොන නිලධාරියා මොන ඇමතිටද අයත් වන්නේ කියා. අපට පෙනෙන දේ තමයි ආගමන හා විගමන නිලධාරීන් ඉදිරිපත් කර තිබෙන්නේ සාධාරණ යෝජනා කියන එක. ඔවුන් ඉදිරිපත් කරන සාධාරණ යෝජනා රාශියක් තිබෙනවා. නමුත් ඒවාට ඇහුම්කන් දෙන්නේ නැහැ. ඒ නිසා ඔවුන් මීට මාස කිහිපයකට කලින් එක් දිනක් වැඩ වර්ජනය කළා. ඔවුන් වැඩ වර්ජනය කළ ඒ පැය කිහිපය ඇතුළේ ගුවන් තොටුපොළේ මගීන්ගේ ගමනාගමන කටයුතු සම්පූර්ණයෙන්ම අර්බුදයකට ලක් වුණා. ඒ නිසා ගුවන් තොටුපොළ සමස්තයක් ලෙස සලකා අවශ්‍ය මැදිහත්වීම් කරන්න කියන ඉල්ලීම අපි කරනවා. ආගමන හා විගමන නිලධාරීන් වෙනුවට තාක්ෂණය පාවිච්චි කළා කියා මම නම් හිතන්නේ නැහැ, ඉන් සම්පූර්ණ විසඳුමක් ලැබෙයි කියා. ඒ නිසා ඒ කාරණය පිළිබඳවත් මේ අවස්ථාවේදී අවධාරණය කරන්න කැමැතියි.

මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, සී/ස ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ මතු වූ මහා පරිමාණ දූෂණ වංචා පිළිබඳව. මගේ දැනීමේ හැටියට අද දිනයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඒ ගැන ප්‍රශ්නයක් අහලා තිබුණා. නමුත් ආණ්ඩුව උත්තර දුන්නේ නැහැ. ඒ, වැලිඅමුණ වාර්තාව ගැන. වැලිඅමුණ මහතා මුල්වෙලා වාර්තාවක් සකස් කළා. [බාධා කිරීමක්] මම දන්නවා. මගේ දැනීමේ හැටියට ඒ වාර්තාවට රජයේ මුදල් ලක්ෂ 40කට වැඩිය ගෙව්වා, පරීක්ෂණ කොමිටියටත් ලක්ෂ 40ට වඩා ගෙව්වා. 2015 අවුරුද්ද අවසාන වෙනකොට ඒ වාර්තාව නිකුත් කළා. හැබැයි, වාර්තාවට අදාළ නිර්දේශවලින් මොනවාද ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ කියන එක අපි දැන ගන්න කැමැතියි. අපි දන්නා තරමින් නම්, ආණ්ඩුව කිසිවක් ක්‍රියාත්මක කළේ නැහැ. SriLankan Airlines එක පාර්ලිමේන්තුවේ COPE එකට ගෙන්වපු අවස්ථාවේදී ඇති තරම් පෙන්නුම් කර තිබෙනවා, ඒ ආයතනය ගොඩගන්න බැරි තරමට බිඳ වැටිලා තිබෙන බව. චරිත රත්වත්තේ මහතා කියන්නේ රනිල් වික්‍රමසිංහ මහතාගේ බොහොම ළඟ හිතවතෙක්. රනිල් වික්‍රමසිංහ මහත්තයා ආණ්ඩුවක් හැදුවොත් රත්වත්තේලාගෙන් ඒ ආණ්ඩුව පුරවා ගන්නවා. ඒ ඥාතියෙකුට සී/ස ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ ප්‍රධාන විධායක තනතුර ලබා දුන්නා. මගේ දැනීමේ හැටියට ලක්ෂ 66කට ආසන්න වැටුපක් ඔහු ලබා ගත්තා. හැබැයි, ලක්ෂ 66කට අදාළ සේවයක් ලබා දුන්නාද කියන ප්‍රශ්නය ඇහුවොත්, පිළිතුර බින්දුවයි. මොකද, හැම වෙලාවේම කියන දෙයක් තමයි සමහර පුද්ගලයන් විශාල මුදලක් නොදී අපට ගන්න බැහැ කියන කාරණය. මාසයකට ලක්ෂ 66ක වැටුපක් දීලා ගත්ත පුද්ගලයා මොනවාද ගුවන් සමාගමට කළේ කියා ඇහුවොත්, කියන්න උත්තරයක් නැහැ. ගරු ඇමතිතුමනි, ගුවන් සේවය සහ ගුවන් තොටුපොළේ තිබෙන ගැටලු ප්‍රමාණයක් තමයි මම ඒ මතු කළේ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, විශේෂයෙන්ම ශ්‍රීලන්කන් ගුවන් සේවය සහ ගුවන් තොටුපොළ සම්බන්ධයෙන් පසුගිය කාලය තුළ ඇති වී තිබෙන වංචා දූෂණ පිළිබඳව අමාත්‍යාංශය පැත්තෙන් -FCID අරවා මේවා ගැන නොවෙයි.- ගෙන තිබෙන පියවර ගැන. ඒ සමඟම ගරු ඇමතිතුමනි, මට පැහැදිලි වූ ආකාරයට දෙවැනි රෙගුලාසියට අනුව, ඔබතුමා යම්කිසි ආකාරයක වෙනස්කමක් කරනවා, පෞද්ගලික ගුවන් සේවා සමාගම් සඳහා බලපත්‍ර ලබාදීම සම්බන්ධව. මම හිතන්නේ helicoptersවලට, private jetsවලට land කරන්න විතරක් නොව commercial විධියට operate කරන්නත් බලපත්‍ර ලබාදීමට බලයක් තිබෙනවා. ඒක වෙනස් කරන්න යනවා.

මේකෙන් බලය තිබුණාට ඒ බලය ක්‍රියාත්මක කරද්දී, විශේෂයෙන්ම පෞද්ගලික ගුවන් සේවා සමාගම්වලට බලපත්‍ර ලබා දීමේදී, ඒ සම්බන්ධව ඔබතුමා සකස් කරන නිර්ණායක

[ගරු බිමල් රත්නායක මහතා]

සම්මත කිරීමට පෙර පාර්ලිමේන්තුවට හෝ අඩුම ගණනේ ආංශික අධීක්ෂණ කාරක සභාවට හෝ ඉදිරිපත් කරන ලෙස අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි. මේ බලපත්‍ර ලබා දෙන එකට අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත්, බලපත්‍ර ලබා දීමේදී ඒ බලපත්‍ර ලබා ගන්නා සමහර ආයතන සහ ලබා ගන්න ඉන්න සමහර ආයතන දෙස බැලුවාම අපට පෙනෙනවා, ගුවන් සේවයක් පවත්වාගෙන යාමට වඩා වෙනත් අරමුණු ඔවුන්ට තිබෙන බව. සමහර උනන්දු සහගත පාර්ශ්වයන් පිළිබඳව අපට අවබෝධයක් තිබෙනවා. එම නිසා දැනට මේ කරුණු ප්‍රමාණය මතු කරමින් මම ඊළඟ කාරණාවට යන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සහභාගී වූ ගුවන් ගමනකදී ඇතිවූ සිදුවීමක් සම්බන්ධයෙන් පසුව එතුමා කරපු විශාල ගෝරනාඩුවක් පිළිබඳව දැන් ලෝකය පුරාම සාකච්ඡා වෙන බව ඔබතුමා දන්නවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා SriLankan Airlines ගුවන් යානයකින් ලංකාවට එද්දී, එතුමාට ප්‍රමිතියෙන් බාල කපු ලබා දුන්නා කියා එතුමා රැස්වීමකදී කියනවා. ඒ කපු ප්‍රශ්නය නිසා දිගු කාලීනව කපු ලබා දුන්න ඒ සමාගම්කරුවා ඉවත් කර වෙනත් කෙනෙක් ගත්තා කියා මම ළඟදී දැක්කා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිට විතරක් නොව ඕනෑම මගියෙකුට හරියාකාරව ඒ සේවා ලබා දෙන්න ගුවන් සේවා සමාගමට වගකීමක් තිබෙන බව අපි පිළිගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍ය වැදගත් මනුස්සයෙක් වුණත් තමන්ට මොනවා හෝ කෑමක අඩුවක් වුණා කියා ඒ ගැන රට වටේ කෑ ගහමින් යන්න ඕනෑ කියා අපි හිතන්නේ නැහැ. ජනාධිපතිවරයා කාට බැන්නත් මට පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. මේ ගැන බැලුවොත් ඔබතුමාට පෙනේවි, මේ පිළිබඳව ලෝකයේ සියලුම අන්තර්ජාතික මාධ්‍යවල පළ වෙලා තිබෙන අදහස් මොනවාද කියා. ඇමෙරිකාවේ ප්‍රධානම ධාරාවේ ජනමාධ්‍යවල සිට දකුණු කොරියාවේ ජනමාධ්‍ය දක්වාත්, ඉන්දියාවේ NDTV වැනි නාලිකා දක්වාත් මේ හැම එකකින්ම පෙන්වා තිබෙනවා, ශ්‍රීලන්කන් ගුවන් සේවය අපේ රටේ ජනාධිපතිට දීලා තිබෙන්නේත් ජරා කපු කියා. ජනාධිපතිවරයා ලංකාවට ඇවිල්ලා ගුවන් සේවාවේ සභාපතිවරයා හෝ ඇමතිවරයා කැඳවා මේ පිළිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කර, විනය පරීක්ෂණයක් කර අදාළ පුද්ගලයන්ට දඬුවම් දුන්නා නම් අපට ප්‍රශ්නයක් නැහැ. එහෙම නොකර, එතුමා දැන් මේක රටට කියනවා; ලෝකයට කියනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් අන්තර්ජාතික වශයෙන් ශ්‍රීලන්කන් ගුවන් සමාගමට එල්ල වෙලා තිබෙන දරුණු කැළල ඩොලර් බිලියනයක් වියදම් කර හදාගන්න පුළුවන් කියා මම නම් හිතන්නේ නැහැ. අපි ඒකයි මේ ගැන අහන්නේ. සාමාන්‍යයෙන් වැදගත් මනුස්සයෙක් තමන්ට කෑමක ප්‍රශ්නයක් වුණා කියා ඒක තැන් තැන්වල කිය කියා ඇවිදිනවා ද? අනික මේ විධියට කියන්නේ කවුද? මෙහෙම කියන්නේ, මේ රටේ ජනාධිපති. ප්‍රායෝගික වශයෙන් ගත්තාම එතුමා යටතේ තමයි මේ හැම එකක්ම තිබෙන්නේ. මේ එතුමාගේ ගුවන් සේවය. ඒකේ වැරැද්දක් තිබෙනවා නම්, ඒකේ අවසාන වගකීම එතුමාට තිබෙනවා. ඒ නිසා මේ වාගේ බාල වර්ගයේ ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් මේ රටේ පුරවැසියන් විධියට අපි ඇත්තටම කනගාටු වෙනවා. මොකද, මේ සිදු වුණු damage එක ඉතාම විශාලයි. ඔබතුමන්ලා ඒ video clips ප්‍රමාණය එකතු කර බලන්න.

මම දැක්කා, South Korean Airlines එකෙන් ඉදිරිපත් කර තිබෙන එක video එකක්. දකුණු කොරියාවේත් ඔය විධියේම කපු ප්‍රශ්නයක් ඇති වුණා. ඒ රටේ ගුවන් සමාගමේ හිටපු සභාපතිගේ දියණිය දකුණු කොරියානු ගුවන් සමාගමේ උපසභාපතිනිය වශයෙන් කටයුතු කළා. එතුමිය ගුවන් ගමනක් යද්දී එතුමියටත් මේ වාගේ කපු ප්‍රශ්නයක් තමයි ඇති වුණේ. එතුමියටත් කපු පැකට් එකක් දීලා තිබෙනවා. අපේ රටේ ජනාධිපතිතුමාට කොහොම දුන්නා ද කියා මම දන්නේ නැහැ. සාමාන්‍යයෙන් serve කරන විධිය තමයි dish එකක දාලා කපු ලබා දෙන එක. කපු පැකට් එක දුන්නා කියා දකුණු කොරියානු ගුවන් සමාගමේ උපසභාපතිනිය මොකක්ද කරන්නේ? ඒක විසි කර, ඒක දුන්නු සේවිකාවට බැණලා විශාල ජංජාලයක් කරනවා. ඔබතුමා බලන්න, දකුණු කොරියාවේ සහ අන්තර්ජාතික ප්‍රවෘත්තිවල මේ ගැන යන්නේ කොහොමද කියා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ photo එකයි, දකුණු කොරියාවේ මේ වැඩේ කරපු උපසභාපතිනියගේ photo එකයි එකට පළ වෙලා තිබෙනවා. මේ ක්‍රියාවලිය හරහා ජනාධිපතිවරයා අපේ රටටත් ජාත්‍යන්තර කීර්තියක් අත්පත් කරදීලා තිබෙනවා, අපේ ගුවන් සමාගමටත් අත්පත් කරදීලා තිබෙනවා. මම හිතුවා මේකත් මේ වෙලාවේ මතු කරන්න ඕනෑ කියා. මොකද, තමන් යටතේ තිබෙන මේ ආයතනයට මෙහෙම කළාම මොනවාද වෙන්නේ කියා රට පාලනය කරන කෙනාට අමතක වෙලා තිබෙනවා. මම හිතනවා, ඒවා ඉතාමත් දුර්වල තත්ත්වයක් බව. රටක නායකයෙක් වශයෙන් මෙය ඉතාමත් දුර්වල තත්ත්වයක් කියන එකත් ප්‍රකාශ කරමින් මගේ මූලික අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තුතියි.

[පි.ප. 3.27]

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ் - அரச தொழில் முயற்சி மற்றும் கண்டி நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.M.M. Harees - Deputy Minister of Public Enterprise and Kandy City Development)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்!*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, வானூர்தி மூலம் ஏற்றிச் செல்லல் சட்டமூலம் பற்றிய இன்றைய விவாதத்தில் கலந்து கொண்டு பேசுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். இன்று இந்த நாட்டில் குறிப்பாக, விமான நிலையங்கள் சிறந்த முறையில் ஒழுங்படுத்தப்படுவது மிகவும் அவசியமான ஒரு தேவையாகும்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Shehan Semasinghe to the Chair?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
Sir, I propose that the Hon. Shehan Semasinghe do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SHEHAN SEMASINGHE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, කථා කරන්න.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)

இன்று வெளிநாட்டு விமான நிலையங்களில் மிகச் சிறந்த பல ஏற்பாடுகள் மேற்கொள்ளப்பட்டிருக்கின்றன. குறிப்பாக, அங்கு வெளிநாட்டவர்கள் மற்றும் உள்நாட்டவர்களுடைய குடிவரவு, குடியகல்வுச் செயற்பாடுகள் நவீனமயப்படுத்தப் பட்டுள்ள அதேநேரம், Electronic Passport ஊடாகக் குடிவரவு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றன. இப்பொழுது உரையாற்றிய கௌரவ அமைச்சர் அவர்கள் இலங்கையிலும் இன்னும் 5 மாதங்களுக்குள் அவ்வாறானதொரு நிலைமை ஏற்படுமென்று குறிப்பிட்டார். அவ்வாறு செய்கின்றபொழுது, எமது நாட்டின் விமான நிலையங்களினுடைய சேவை மேலும் விஸ்தரிக்கப்படுமென்பது எங்களுடைய நம்பிக்கையாகும்.

இன்று கிழக்கு மாகாணத்தில் அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை ஆகிய இடங்களிலுள்ள உள்ளூர் விமான நிலையங்கள் நவீனமயப்படுத்தப்பட்டு வருகின்றன. அண்மையில்கூட கௌரவ அமைச்சர் நிமல் சிறிபால த சில்வா அவர்கள் மட்டக்களப்புக்கான விமான நிலையத்தைத் திறந்து வைத்தார். ஆனால், உள்ளூர் விமான சேவைகள் துரித கதியில் இடம்பெறுவதில் சில இடையூறுகள் இருந்து கொண்டிருக் கின்றன. அதாவது இன்று எங்களுடைய நாட்டின் உள்ளூர் விமான சேவைகள் மந்தகதியில் செயற்பட்டுக் கொண்டிருப்பதை எங்களால் அவதானிக்க முடிகின்றது. ஆனால், இந்த 3 பிரதேசங்களும் சுற்றுலாத்தலங்களைக் கொண்டவையாகும். மட்டக்களப்பை எடுத்துக்கொண்டால், பாசிக்குடா சுற்றுலாத்துறையில் மிகப் பிரசித்தமானதொரு பிரதேசமாகும். அதேபோன்று, அம்பாறையில் அறுகம்பைப் பிரதேசமும் திருகோணமலையில் நிலாவெளிப் பிரதேசமும் சுற்றுலாத் துறையில் பிரசித்தமானவைகளாகும். இருந்த போதிலும் இன்று அம்பாறை விமான நிலையத்திலிருந்து பொத்துவில் பிரதேசத்திற்குச் செல்வதற்கு கிட்டத்தட்ட 100 கிலோ மீற்றர் பயணிக்க வேண்டியிருக்கின்றது. இந்த நிலைமையில் பொத்துவிலிலுள்ள பெரிய களப்பில் நீரில் செல்கின்ற விமானங்களைத் தரையிறக்கி குறித்த பயணத்தை இலகுவாக்க முடியும். கௌரவ சிவில் விமானச் சேவைகள் அமைச்சர் அவர்கள் அங்கு சுற்றுலாத்துறையை ஊக்குவிப் பதற்கான infrastructure - உட்கட்டமைப்பினை அபிவிருத்தி செய்து, அறுகம்பையில் உள்ளூர் விமானங்களைத் தரையிறக் குவதன்மூலம் அந்தத் தொழிற்றுறையை இலாபகரமானதாக மேற்கொள்ள முடியும். இன்று நான் பிரதிநிதித்துவப் படுத்துகின்ற கல்முனைப் பிரதேசம் commercial hub ஆக - பாரிய வர்த்தக மையகமாக இருந்து கொண்டிருக்கின்றது. அங்குள்ள lagoon இலும் நீரில் செல்கின்ற விமானங்களைத் தரையிறக்கி, குறித்த விமானப் போக்குவரத்து உட்கட்டமைப்பு வசதிகளை ஏற்படுத்தி, குறித்த பிரதேசத்தையும் அபிவிருத்தி செய்ய முடியும். இன்று அம்பாறை விமான நிலையம் புனரமைக்கப்பட்டிருக்கின்றது. ஆனால், இன்னும் அங்கு உள்ளூர் விமானச் சேவைகள் ஆரம்பிக்கப்படவில்லை. கௌரவ அமைச்சர் அவர்கள் இதனைக் கவனத்திற்கொண்டு நடவடிக்கை எடுக்க வேண்டும் என்றும் இந்த உயரிய சபையில் கேட்டுக் கொள்கின்றேன்.

இந்தச் சபையில் இன்னுமொரு முக்கிய விடயத்தையும் குறிப்பிட விரும்புகின்றேன். எங்களுடைய ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியின் ஸ்தாபகத் தலைவர் கௌரவ எம்.எச்.எம். அஷ்ரஃப் அவர்கள் மரணித்து இம்மாதம் 16ஆம் திகதியுடன் அதாவது நேற்று முன்தினத்துடன் 18 வருடங்கள் பூர்த்தியாகின்றன. அவர் இந்த நாட்டில் யுத்தம் மிகக் கொடூரமாக இருந்த ஒரு காலகட்டத்தில், ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் என்ற அரசியல் கட்சியை உருவாக்கி, முஸ்லிம் இளைஞர்களை ஜனநாயகப் பாதைக்குள் கொண்டு வந்தார். ஆகவே, அவர் இந்த நாட்டில் ஐக்கியத்தையும் சமாதானத்தையும் ஏற்படுத்துவதற்காகப் பெரும் பாடுபட்ட ஒரு தலைவராக விளங்குகின்றார். அதுமட்டுமல்லாமல், 1989 - 1994ஆம் ஆண்டுவரை பாராளுமன்றத்தில் பெரும்பாலான விவாதங்களில் பங்குகொண்டு இந்த நாட்டின் தேசிய நலனுக்காகப் பெரும் பங்காற்றினார்; 1994 ஆம் ஆண்டு இந்த நாட்டில் புதியதோர் ஆட்சி மலர்வதற்குக் காரணமாக இருந்தார். அதாவது kingmaker ஆகச் செயற்பட்ட அவர் முன்னாள் ஜனாதிபதி சந்திரிகா பண்டாரநாயக்க அவர்களுடைய ஆட்சி மலர்வதற்கு உறுதுணையாக இருந்தார். கௌரவ எம்.எச்.எம். அஷ்ரஃப் அவர்கள் 2000ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 16ஆம் திகதி மரணிக்கும்வரை அமைச்சராகச் செயற்பட்டு நாட்டின் தேசிய பாதுகாப்புக்கும் தேசிய நலனுக்கும் மற்றும் நாட்டில் சமாதானத்தைக் கொண்டுவருவதற்கும் பாடுபட்டார். அதேநேரம் கௌரவ அமைச்சர் நிமல் சிறிபால த சில்வா அவர்களுடைய நெருங்கிய நண்பனாக இருந்தார். இந்த உயரிய பாராளுமன்றத்தில் அவர் ஆற்றிய சேவை எல்லோருக்கும் தெரியும். பெரும் தலைவர் அஷ்ரஃப் அவர்கள் மரணித்து இன்று 18 வருடங்களாகின்றன. இந்த நிலையில் இந்தச் சபை அவரைக் கௌரவப் படுத்துவதற்குக் கடமைப்பட்டிருக்கின்றது. கௌரவ எம்.எச்.எம். அஷ்ரஃப் அவர்கள், 2000ஆம் ஆண்டு புதிய அரசியலமைப்பைக் கொண்டுவருவதற்காக இந்தப் பாராளு மன்றத்தில் இடம்பெற்ற விவாதத்தில் கலந்துகொண்டு தொடர்ச்சியாக 3 மணித்தியாலங்கள் பேசிச் சாதனை படைத்திருக்கிறார். அப்படிப்பட்ட ஒருவருடைய portrait - உருவப்படத்தினை இந்தப் பாராளுமன்றக் கட்டிடத்தில் திரைநீக்கம் செய்வதற்குச் சபாநாயகர் அவர்கள் முன்வர வேண்டுமென்று கௌரவ எம்.எச்.எம். அஷ்ரஃப் அவர்கள் பிரதிநிதித்துவப்படுத்திய கல்முனைத் தொகுதியின் பாராளு மன்ற உறுப்பினர் என்ற அடிப்படையில் நான் இந்த சபையிலே கோரிக்கை விடுக்க விரும்புகின்றேன். இந்தப் பாராளுமன்றக் கட்டிடத்தில் அவருடைய portrait ஐக் கூடிய விரையில் திரைநீக்கம் செய்வதை அவருக்குக் கொடுக்கின்ற கௌரவமாக, மரியாதையாக நாங்கள் பார்க்க முடியும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Deputy Minister, you have only two more minutes.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
Okay.

இப்பொழுது இந்த நாட்டில் மிகப் பெரியளவில் விவாதத்திற்கு உட்பட்டிருக்கின்ற விடயமாக மாகாண சபைத் தேர்தல்கள் (திருத்தச்) சட்டம் காணப்படுகின்றது. அண்மை யில், மாகாண சபைத்தேர்தல் தொகுதிகளின் எல்லை நிர்ணயம் தொடர்பான குழுவின் அறிக்கையை இந்தச் சபையிலுள்ள ஒட்டுமொத்த உறுப்பினர்களும் தோற்கடித்தார்கள். பாராளுமன்றம் இந்த அறிக்கையை முழுமையாக நிராகரித்த நிலையில், அடுத்து என்ன நடக்கப்போகின்றதென்று

[ගරු එච්.එම්.එම්. හරීස් මහතා]

නාට්ඨලුල්ල මක්කල් ඉන්රු කේට්කින්රනර්. ඉන්රු පිරතමර් අවර්කල් තලෛමෛයිලාන කුළු, ඉතුතොටර්පිල් ඉරණ්ටු මාතඞ්කළුක්කුල් අරික්කෛ සමර්ප්පික්ක වේණ්ටුමෙන්රු කේට්කප්පට්ටුල්ළතු. පිරතමරුක්කු ඉතිල් පාරිය පොරුප්පු ඉරුක්කින්රතු. ආකවේ, පළෛය තේර්තල් මුරෛමෛයෛ මීණ්ටුම් කොණ්ටු වරුවතර්කාන නටවටික්කෛයිනෛ මේර්කොළ්ළ වේණ්ටුමෙන්රු ඉන්තච් සපෛයිනූටාකච් කේට්ටුක් කොළ්කින්රේන්. ඉරණ්ටු මාතඞ්කළුක්කුල් අමෛච්චරවෛප් පත්තිරත්තෛච් චමර්ප්පිත්තු, ඉන්තප් පාරාළුමන්රම් නිරෛවේර්රිය මාකාණ සපෛ තේර්තල්කළ් (තිරුත්තච්) චට්ටත්තෛ නිරාකරිත්තු, පළෛය තේර්තල් මුරෛමෛක්කුප් පෝකප් පෝකින්රෝමෙන්ර වකෛයිලාන අරචාඞ්කත්තින් උත්තියෝක පූර්ව අරිවිප්පෛ කෞරව පිරතමර් අවර්කල් විටුක්ක වේණ්ටුම්. මාකාණ චපෛත් තේර්තල්කළ් නටක්කුමා? අප්පටි යෙන්රාල්, එන්ත මුරෛයිල් නටක්කුම්? එන්රු පට්ටිතොට්ටි කළිලුල්ළ මක්කළ් එල්ලාම් පාරාළුමන්ර උරුප්පිනර්කළෛප් පාර්ත්තුක් කේට්කින්රාර්කළ්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්ඩලිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Please wind up now.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(මාණ්ඩලිකු එච්.එම්.එම්. හරීස්)
(The Hon. H.M.M. Harees)
Sir, give me one more minute.

එනවේ, පොරුප්පුල්ළ කෞරව පිරතමර් අවර්කළ් පළෛය තේර්තල් මුරෛමෛයෛ මීණ්ටුම් කොණ්ටු වරුවතර්කුරිය නටවටික්කෛකළෛ එටුක්කවේණ්ටුමෙන්රු නාන් ඉන්තච් සපෛයිල් කේට්ටුක්කොළ්ළ විරුම්පුකින්රේන්. නන්රි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්ඩලිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළහට, ගරු කනක හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි එකොළහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.36]

**ගරු කනක හේරත් මහතා**
(මාණ්ඩලිකු කනක හේරත්)
(The Hon. Kanaka Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග සහ දෙවන වර කියැවීම සඳහා ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන සතුටට පත් වෙනවා. මෙය ඉතාමත් වැදගත් පනත් කෙටුම්පතක් සහ නියෝග හැටියටයි මා දකින්නේ. අපේ ගරු අමාත්‍යතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන අපි සතුටට පත් වෙනවා. මොකද, හැම දාම අපි පාර්ලිමේන්තුවේ මෙතුමා එක්ක වාද විවාද කර ගන්නවා; විරුද්ධයි කථා කරන්නේ. නමුත්, අද මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත සහ නියෝග වෙනුවෙන් අපේ සතුට ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම, අපි ඒ සඳහා සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරනවා.

මෙහි විශේෂ වැදගත් වන කාරණය තමයි, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධාන ප්‍රඥප්තිය යටතේ තිබුණු ඇණවුම් 18ට එකක් වැඩි වෙලා අද ඒක 19ක් බවට පත් වෙලා තිබීම. ඒක නිසා තමයි අද මේ නියෝග මඟින්, රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන - State Safety Programme- කියන එක මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නේ. ඒ ඇණවුම් 18ට වඩා එකක් වැඩි වෙලා, අද නිරුපද්‍රිතතා වැඩසටහන -Safety Management System- විශේෂයෙන්ම ඉදිරිපත් වෙලා තිබෙනවා. ඇණවුම් 1, ඇණවුම් 8, ඇණවුම් 13 වැනි ඇණවුම් තුළදීත් මේ පිළිබඳව කථා කරලා තිබෙනවා. නමුත්, ඒක එකලස් කරලා, විශේෂයෙන්ම ඇණවුම් 19 මඟින් ලබා දෙන බලතල මඟින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට තවදුරටත් වැඩි බලතල ඇතිව, වපසරියක් ඇතිව වැඩ කරගෙන යන්න, එහෙමත් නැත්නම් නීති පනවන්න, නීති ක්‍රියාත්මක කරන්න හැකියාවක් තිබෙනවා.

අද මේ වැඩසටහන ඉදිරිපත් කිරීමත් සමඟ රාජ්‍ය නිරුපද්‍රිතතා ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරන්න, අවදානම් කළමනාකරණය, ඒ වාගේම නිරුපද්‍රිතතාව පිළිබඳ රාජ්‍ය සහතිකවීම, ප්‍රවර්ධනයවීම යනාදී කටයුතු හතරක් ක්‍රියාත්මක කරන්න තිබෙනවා. ප්‍රතිපත්ති සකස් කිරීම යටතේ බැලුවාම මේ සේවා සැලසුම්කරුවා, සේවාදායකයා -airline එක- ඒ නිරුපද්‍රිතතා කළමනාකරණය කරන ක්‍රමයක් හඳුන්වා දිය යුතුයි; ගුවන් සමාගම මඟින් හඳුන්වා දිය යුතුයි. ඒ වාගේම ඒකේ දත්ත රැස් කිරීමේ වග කීමත් සිවිල් ගුවන් සේවා අධිකාරියට පැවරී තිබෙනවා.

ඊළඟට අපි අවදානම් කළමනාකරණය දිහා බැලුවාම, බලපත්‍ර නිකුත් කිරීම, සහතික නිකුත් කිරීම, බලය පැවතීම සහ අනුමත කිරීම යන මේ සියල්ලක් පසුගිය ඇමුණුම් 18 තුළදීත් තිබුණා.

මේකේ ක්‍රමවේදයකුත් තිබුණා. ඉස්සෙල්ලා කථා කළ මන්ත්‍රීතුමෙකු ඇහුවා, මේකේ ක්‍රමවේදයක් වෙනස් කරනවාද කියලා. ඇත්ත වශයෙන්ම මේකේ ක්‍රමවේදයක් තිබුණා. මේ සියල්ල ඒක රාශි කරලා විශේෂයෙන්ම නිරුපද්‍රිතතාවට -safety සඳහා- මේ ක්‍රියාවලිය සකස් කරලා තිබෙනවා කියන එක තමයි මට හැඟෙන්නේ.

ඊළඟ කාරණය තමයි, රජයේ සහතික වීම. මේ පිළිබඳව කථා කළාම සෝදිසි කිරීම, ඒ වාගේම රාජ්‍ය නිරුපද්‍රිතතාව, කාර්ය සාධනය, සමාලෝචනය හා ඇගැයීම වැනි දේවල් ඉෂ්ට කරන්න සිදුවනවා. ඒ වාගේම ප්‍රවර්ධනය කිරීමත් ඉතාමත් වැදගත් වනවා. විශේෂයෙන්ම මෙහි තිබෙන සිද්ධීන් පිළිබඳව අභ්‍යන්තර සන්නිවේදන ක්‍රමයක් සහ බාහිර සන්නිවේදන ක්‍රමයක් සකස් කර ගත යුතුයි.

මේකේ ඉතාමත් වැදගත් කාරණය තමයි, මේ රටේ යම් කිසි සිද්ධියක්, එහෙමත් නැත්නම් මේ රට ඇතුළේ accident එකක් සිදු වුණොත් ඒ දත්ත සියල්ල රැස් කරලා, ඒ සියලුම දත්ත වෙනත් රාජ්‍යයන්ට ලබා දෙන්න හැකියාවක් ලැබීම. ඒක තමයි වැදගත් වන්නේ. උදාහරණයක් හැටියට අපේ රටට, අපේ රටේ තිබෙන රාජ්‍ය ගුවන් සමාගමකට එහෙම නැත්නම් පෞද්ගලික ගුවන් සමාගමකට වේවා වෙනත් රටකින් ගුවන් යානයක් මීලදී ගැනීමේදී නොයෙකුත් ගැටලු ඇතිවනවා. එහිදී නඩත්තුව ආදී නොයෙකුත් ගැටලු පිළිබඳව හොයා බලන්න ඕනෑ. මෙවැනි ආකාරයේ දත්ත ඒක රාශි කරලා සියලුදෙනා අතර බෙදා හැරීම තුළින් වෙනත් රාජ්‍යයකට -වෙනත් රටකට- ඒ පිළිබඳව දැනුම ලබා ගන්න හැකියාව තිබෙනවා. මේක රාජ්‍ය ආරක්ෂාවට කිසිම බාධාවක් නොවන ආකාරයෙන් කළොත් ඒක ඉතාමත් වැදගත්ය කියන එක තමයි මේ අවස්ථාවේදී මට කියන්න තිබෙන්නේ.

ඊළඟට, දෙවෙනි කාරණය මෙයයි. 1999 මොන්ට්‍රියල් සම්මුතිය තුළින් MC99 කියන සම්මුතිය ඉදිරිපත් කරලා තිබුණා. ඒ සම්මුතිය මඟින් විශේෂයෙන්ම ගුවන් මගියාට තිබෙන ගැටලු

රාශියක් විසඳෙනවා කියන එක මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ. සමහර අවස්ථාවලදී පෞද්ගලිකව අපිත් මේ වාගේ අකරතැබ්බවලට මුහුණ දීලා තිබෙනවා. 1929 වෝසෝ සම්මුතියටත්, ඒ වාගේම 1953 හේග් සම්මුතියටත් පසුව තමයි, මේ MC99 සම්මත කර ගන්න යන්නේ. මෙය සම්මත කර ගන්න ආසියාවෙන් ඉතිරි වෙලා තිබෙන්නේ තව රටවල් දෙකක් පමණයි. ඒ රටවල් දෙක අතර ශ්‍රී ලංකාවත් තිබෙනවාය කියන එක අපිට කනගාටුවට කාරණයක්. ඒ කෙසේ වෙතත් අද ඒ කාරණය ඉෂ්ට වනවා. මේ තුළින් මේ හා සම්බන්ධ මරණයකදී කිසිම නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්නේ නැතිව ඇමෙරිකානු ඩොලර් 160,000ක් පමණ ලබා ගන්න හැකියාවක් ලැබෙනවා.

ඊළඟ කාරණය මෙයයි. සමහර වෙලාවට මේ රටෙන් ගුවන් ටිකට් පත අරගෙන වෙනත් රටකට පියාසර කළාට පස්සේ -ගුවන් යානයකින් ගියාට පස්සේ- අපිට මේ අකරතැබ්බවලට මුහුණ දෙන්න සිදුවනවා. සමහර වෙලාවට අපේ flight එක delay වෙන්න පුළුවන්. එහෙමත් නැත්නම් අපේ බඩු බාහිරාදිය නැති වන්න පුළුවන්. ඒ කාරණාවලදී ඇත්තටම අපි නීති මාර්ගයට යද්දි ඒ රටට ගිහිල්ලා තමයි ඉස්සර ඒ කටයුතු කරන්න තිබුණේ. නමුත්, අද වනකොට ඒ ගුවන් ටිකට් පත මිලදී ගන්න රට, ඒ වාගේම පියාසර කරන රට, ගුවන් සමාගම register කරලා තිබෙන රට ඇතුළු රටවල් පහක් ඇතුළතදී මෙය ක්‍රියාත්මක කරන්න හැකියාව තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
මෙය ඉතාම වැදගත් කාරණයක්. ඒ පිළිබඳව අපේ සතුට ප්‍රකාශ කරන අතර ගරු අමාත්‍යතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. ගමන් මලු භාර ගැනීමට සාමාන්‍යයෙන් පැය 6ක හෝ පැය 8ක කාලයක් මඟියා ප්‍රමාද වුණොත් ඒ සඳහා යම්කිසි ගෙවීමක් කරනවා. එහිදී කොපමණ මුදලක් ගෙවනවාද කියන එක ගැන කිසිම තැනක සඳහන් කරලා නැහැ. ඒ පිළිබඳව ඔබතුමාට පසුව හෝ උත්තර දෙන්න පුළුවන් නම් මා සතුටට පත් වෙනවා.

ඊළඟ කාරණය මෙයයි. අපේ මත්තල ගුවන් තොටුපොළ විකිණීම පිළිබඳව, එහෙමත් නැත්නම් ඉන්දියානු සමාගමක් සමඟ සම්බන්ධතාවක් ඇති කර ගැනීම පිළිබඳව සහ සියයට 50කට වඩා වැඩි ප්‍රමාණයක් ඉන්දියානු සමාගමට ලබා දීම පිළිබඳව පසුගිය කාලයේ අපි ඔබතුමාත් එක්ක තර්ක කළා, වාද කළා. ඒ පිළිබඳව දැන් පවතින තත්ත්වය මොකක්ද කියා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කලින් ප්‍රකාශ කළා, Airports Authority of India සමඟ ගිවිසුමක් අත්සන් කළේ නැහැ කියලා. මෙය අත්සන් කර තිබෙන්නේ Ministry of Foreign Affairs සමඟයි. ඒ කියන්නේ, Airports Authority of India සහ අපේ Ministry of Foreign Affairs තමයි ගිවිසුම අත්සන් කර තිබෙන්නේ. අද "ඩෙලිමිරර්" පුවත් පත්තේ සඳහන් වෙනවා, සංවර්ධනය සඳහා පලාලි ගුවන් තොටුපොළ -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ඒ පිළිබඳව උත්තරයක් දෙන්න ගරු ඇමතිතුමාට පුළුවන් නම් හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි 5ක් ගන්න කියා එතුමා කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, විමල් වීරවංශ මන්ත්‍රීතුමාට අද දින වෙලාවක් වෙන් කරලා නැහැ.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
තව විනාඩි දෙකකින් මගේ කථාව අවසන් කරන්නම්. ඇමතිතුමාගෙන් දැන ගන්න කරුණු කිහිපයක් තිබෙනවා. ඊට පස්සේ මගේ කථාව අවසන් කරන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට අමතර විනාඩි දෙකක් දෙන්නම්.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
විනාඩි 2ක් හෝ විනාඩි 3ක් දෙන්න.

ඊළඟ කාරණය තමයි, බිමල් රත්නායක මන්ත්‍රීතුමාත් කියපු "කජු" සිද්ධිය. මා හිතන හැටියට ජනාධිපතිතුමා හොඳ චේතනාවකින් තමයි ඒ දේශනය කරන්න ඇත්තේ. නමුත් ඒ තුළින් අද මේ ආණ්ඩුව විකුණන්න බලාගෙන ඉන්න අපේ ශ්‍රීලන්කන් ගුවන් සමාගමට තිබෙන කීර්තියත් නැතිවෙලා තිබෙනවා. අද ඒ ගුවන් සමාගම අපකීර්තියට ලක්වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ජාත්‍යන්තර මාධ්‍ය මඟින් අද ලෝකයේ හැම තැනම මේ පිළිබඳව ප්‍රචාරය වෙලා තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී අපි ඒ පිළිබඳවත් කනගාටුව ප්‍රකාශ කරනවා.

ගරු ඇමතිතුමනි, අපේ ජනාධිපතිතුමා වාගේම, ඔබතුමාත් මේ ආණ්ඩුව නියෝජනය කරන අමාත්‍යවරයකු වුණත් ඔබතුමන්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි නියෝජනය කරන්නේ. එදා ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සුද්දාගෙන් ගත්ත නායකයා තමයි ඔබතුමා නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා වූ බණ්ඩාරනායක මැතිතුමා. ඒ නිසා අපි විශේෂයෙන්ම ඔබතුමාගෙන් මේ අවස්ථාවේදී පුන-පුනා ඉල්ලා සිටින්නේ, මත්තල ගුවන් තොටුපොළ වේවා, පලාලි ගුවන් තොටුපොළ වේවා, වෙන රටකට -ඉන්දියාවටද කියන එකවත්, චීනයටද කියන එකවත් නොවෙයි- විකුණන්නේ නැතුව සංවර්ධනය කිරීමට කටයුතු කරන්න කියලායි. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට පුළුවන් නම් මා අහපු ප්‍රශ්න දෙකට උත්තරයක් දෙන්න. විශේෂයෙන් පලාලි ගුවන් තොටුපොළ පිළිබඳව උත්තරයක් දෙන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ඔබතුමා නහපු ප්‍රශ්න දෙකෙන් ප්‍රමාද වීම පිළිබඳ කාල සීමාව ඒ ඒ රටවල් විසින් තීරණය කළ යුතු අතර, ශ්‍රී ලංකාවට අදාළ ප්‍රමාද කාල සීමාව ඉදිරියේදී අපි සාකච්ඡා කරලා නියම කරනවා.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

දෙවන ප්‍රශ්නයට පිළිතුර මෙයයි. පලාලි ගුවන් තොටුපොළ ඉන්දියාවට හෝ වෙනත් කිසිම රටකට දීමට -

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
සංවර්ධනය කිරීමට?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
පලාලි ගුවන් තොටුපොළ ඉන්දියාවට හෝ වෙනත් කිසිම රටකට සංවර්ධනය කිරීමට දීමටවත් කිසිම අදහසක් නැහැ. ඒ පිළිබඳව කැබිනට් සංදේශයක් ඉදිරිපත් කළා. මමත්, ජෝන් -

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
"ඩෙලිමිරර්" පත්‍රයේ තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
"ඩෙලිමිරර්" පත්‍රය කියන එක ඇත්තද? එය අසත්‍ය පළ කරන පත්‍රයක් නේ.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
එහෙම නම් නඩු දාන්න පුළුවන්නේ?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
නඩු දාන්න තිබුණා criminal defamation එකක් නම්. Criminal defamation එකක් නැහැනේ. පත්තරවල තිබෙන ඒවාට නඩු දදා ඉන්න ගියොත් අපි තමුන්නාන්සේලා සියලුදෙනාටම නඩු දදා ඉන්නවා මිස වෙන කරන්න දෙයක් නැහැ.

අගමැතිතුමාත්, මමත්, ජෝන් අමරතුංග මැතිතුමාත් ඒකාබද්ධ කැබිනට් සංදේශයක් ඉදිරිපත් කළා, පලාලි ගුවන් තොටුපොළ අපේ ගුවන් හමුදාව මඟින් දියුණු කරන්න ඕනෑ කියලා. ඒ සඳහා අවශ්‍ය මුදල්වලින් රුපියල් මිලියන 750ක් මම Civil Aviation Authority Fund එකෙන් දුන්නා, ඉතිරි රුපියල් මිලියන 1,000 ජෝන් අමරතුංග මැතිතුමා Tourism Development Fund එකෙන් දෙන්න එකඟ වුණා. ගුවන් හමුදාව මඟින් තමයි ඒ සියලු දියුණු කිරීමේ වැඩ කටයුතු කරන්නේ. වෙනත් කිසිම විදේශීය රාජ්‍යයක හෝ වෙනත් විදේශීය සමාගමක සම්බන්ධතාවක් ඒකට නැහැයි කියන එක විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මම ප්‍රකාශ කරන්න කැමැතියි. [බාධා කිරීමක්]

දැනට ඒ ගුවන් තොටුපොළේ runway එක බොහොම අබලන් වෙලා තිබෙන්නේ. ඒ runway එකේ දිග මීටර් 650යි තිබෙන්නේ. ඒක අපි දීර්ඝ කරන්නට ඕනෑ, 320 යානයක් ගොඩ බස්සවන්න පුළුවන් විධියට. අපි ඒ කටයුත්තත් කරනවා, ඒ ගොඩනැඟිලිත් හදනවා. අපි Batticaloa ගුවන් තොටුපොළ දියුණු කළා වාගේම මේකත් දියුණු කරනවා. Batticaloa ගුවන් තොටුපොළ දියුණු කිරීමේ ඒ කොන්ත්‍රාත් එක අපි භාර දුන්නේත් Air Force එකට. මේකත් අපි භාර දුන්නේ Air Force එකට. ඊයේ මම Air Force එක ඇතුළු සියලු stakeholdersලා ගෙන්වලා ඒ පිළිබඳව විශේෂ සාකච්ඡාවකුත් පැවැත්වුවා. මේ කටයුතු Air Force එකට භාර දුන්නාය කියන එක පත්තරවලට news එකක් නොවෙයිනේ. මේ කටයුතු ඉන්දියාවට දුන්නාය කිව්වොත් තමයි ඒක පත්තරවලට news එකක් වෙන්නේ. ඒ නිසා මේවා plant කරන news.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු ඇමතිතුමනි, ඇත්තටම ඒ තොරතුරු බොරු වෙන්න පුළුවන්. ඔබතුමන්ලා ඉන්දියාවෙන් ඒ විධියේ ඉල්ලීමක්වත් කරලා නැද්ද? ඉන්දියාවේ ගුවන් යානා සහ ගුවන් සමාගම්වලට පමණක් යානා ගොඩ බාන්න පුළුවන් ආකාරයට කටයුතු කරනවා කියලා තමයි ඒ news එක websitesවල ගියේ. ඒ කථාව පිළිබඳව පැහැදිලි කර ගැනීමක් තමයි ඔබතුමාගෙන් බලාපොරොත්තු වුණේ. ඔබතුමන්ලා ඒ විධියේ ඉල්ලීමක්වත් ඉන්දියාවෙන් කරලා නැද්ද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
එහෙම කිසිම ඉල්ලීමක් කරලා නැහැ. එහෙම ඉල්ලීමකට ඉඩ දීලාත් නැහැ. අපි දැන් ඒ වැඩේ පටන් අරගෙන ඉවරයි.

ගරු මන්ත්‍රීතුමනි, පත්තරවල තිබෙන ඒ news ඔක්කොම ඇත්තයි කියන පදනමේ ඉඳගෙන කථා කරන්න එපා. මම විෂය භාර අමාත්‍යවරයා. ඒකයි මම පැහැදිලිව කරුණු කිව්වේ. දැන් අපි මේ කටයුතු Air Force එකට භාරදීලා තිබෙනවා, Air Force එකත් සමඟ තමයි අපි මේ කටයුත්ත කරන්නේ, Air Force එකටයි අපි සල්ලි ගෙවන්නේ. විශේෂයෙන්ම මේ කටයුතු Air Force එකට භාර දුන්නේ ජාතික ආරක්ෂාව පිළිබඳ හැඟීමක් මට තිබෙන නිසා; මේ ආණ්ඩුවට තිබෙන නිසා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ආණ්ඩුවට නම් නැහැ, ඔබතුමාට තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
"The Times of India" එකේ හෝ මොකක හෝ තිබුණත්, රටේ ඉන්න, ලෝකයේ ඉන්න පත්තරකාරයෝ, මාධ්‍යකාරයෝ මේවා අවුළුවන්න බලනවා මිස නිවන්න බලන්නේ නැහැනේ. ඉතින් ඒවාට අහුවෙන්නට එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා, ඔබතුමාට මිනිත්තු 10ක් තිබෙනවා.

[අ.භා.3.54]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටට කීර්තියක් ඇති වෙන කාරණයක් පිළිබඳව වචනයක් කථා කරන්නට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. ලෝකයෙන් හුදකලාවෙලා ඉන්න රටක් වුවත්, අපේ ශ්‍රීලන්කන් ගුවන් සේවයට මේ නියෝග හරහා යම් කීර්තියක් ඇති වෙනවා නම් ඒක ඉතාම වැදගත් දෙයක්. විශේෂයෙන් ප්‍රමාදවීම්, ගමන් මලුවල ආරක්ෂාව ඇතුළු ඒ කාරණා පිළිබඳව

ලැබෙන පහසුකම් සහ වන්දි කියන කාරණා ඉතාම වැදගත් වෙනවා. ලෝකයේ තාක්ෂණය දියුණු වෙන්න දියුණු වෙන්න, ජාත්‍යන්තර වෙළෙඳාම දියුණු වෙන්න දියුණු වෙන්න, සංචාරක ව්‍යාපාර දියුණු වෙන්න දියුණු වෙන්න, -විශේෂයෙන් අපි වාගේ පුංචි රටකට සංචාරක ආකර්ෂණය වැඩි වැඩියෙන් ලබා ගත හැකි රටකට- ඒ විදේශීය සංචාරකයන්, ගුවන් මඟින් වෙනුවෙන් මේ වාගේ නීති රීති ගෙනැල්ලා යම් පහසුකම් ලබා දෙන්නට පුළුවන් නම් ඉතාම හොඳයි. ඉතිහාසයේ ඉඳලා ශ්‍රීලන්කන් ගුවන් සේවය ගැන බොහොම ඉහළ පුරාජේරුවක් තිබුණා, එහි සේවය බොහොම කාරුණිකයි කියලා.

හැබැයි ඒ මට්ටම අපට දිගින් දිගටම පවත්වා ගෙන යන්නට පුළුවන් නම්, ඒ සඳහා අවශ්‍ය වන කරුණු කාරණා ගොඩ නහන්නට පුළුවන් නම්, එය ඉතාමත්ම හොඳයි. පසුගිය කාල පරිච්ඡේදය තුළ බණ්ඩාරනායක ගුවන් තොටුපොළ විශාල වශයෙන් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවක් තිබුණා. විශාල වශයෙන් මගී ගුවන් යානා එම ජාත්‍යන්තර ගුවන්තොටුපොළට පැමිණෙමින් තිබියදී, එම ගුවන්තොටුපොළ සංවර්ධනය කරනවා වෙනුවට, විශේෂයෙන් අපේ ගුවන් සේවය තුළ තිබෙන අවුරුදු දහය පහළොව පැනපු අබලන් වූ ගුවන් යානා සඳහා අලුත් ගුවන් යානා මිල දී ගැනීම වෙනුවට, බණ්ඩාරනායක ගුවන් තොටුපොළේ තිබුණු එම ධාවන පථයන් ඇතුළු අනෙකුත් අවශේෂ පහසුකම් දියුණු කරනවා වෙනුවට කළේ මොකක්ද? වෙනත් ගුවන් තොටුපොළවල් ඇති කරමින් නිකම් ඉන්න අලි, සුදු අලි බවට පත් කිරීමයි. ඒ සඳහා විශාල වියදමක් දරමින් අපේ ධනය විනාශ කර ගත්තා. ඒ විතරක් නොවෙයි, අපි ණයකාරයන් බවටත් පත් වුණා. හදන්නට ඕනෑ ඒවා, වැඩි දියුණු කරන්නට ඕනෑ ඒවා කරන්නේ නැතිව වෙනත් අවශ්‍ය නැති දේවල් ඇති කරන්නට යාමෙන් අපේ ගුවන් සේවයට විශාල වශයෙන් පාඩු සිදු කර ගත්තා. බණ්ඩාරනායක ගුවන් තොටුපොළට අවශ්‍ය පහසුකම් මේ වෙනකොට දීලා තිබුණා නම්, එම අවශ්‍ය පුළුල් කිරීම් සියල්ල සිදු කර තිබුණා නම්, අපේ ගුවන් සේවය මීට වඩා ජාත්‍යන්තරයට අරගෙන යන්න පුළුවන් හැකියාවක් අපට තිබුණා. පරණ ගුවන් යානා වෙනුවට අලුත් ගුවන් යානා ගත්තා නම්, ගුවන් යානාවල විශාල වශයෙන් පැවැති එම ඉන්ධන දහනයන් අවම කර ගන්නට අපට හැකියාව තිබුණා. සුදු අලි ඇති කරන්න කලින් සිටින අලියාව බේරා ගත යුතුව තිබුණා. සිටින අලියාව බේරා ගන්නේ නැතිව සුදු අලින් වෙනුවෙන් අපේ රටේ විශාල මුදලක් අපි නැති නාස්ති කළා. ඒ පිළිබඳවත් අපි මේ අවස්ථාවේ දී සිහිපත් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්තල ගුවන් තොටුපොළ විකුණනවා; මෙය ඉන්දියාවට විකුණනවා, බදු දෙනවා, කියලා ලොකු ගාලගෝට්ටියක් පසුගිය කාලපරිච්ඡේදය පුරාම මේ රට තුළ ඇති වුණා. මෙය ඇති කළ කණ්ඩායමේ නායකතුමා, අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පසුගිය අවස්ථාවක ඉන්දියාවට ගියා. ගිහින් නරේන්ද්‍ර මෝදිතුමා ඇතුළු යම් යම් අය හමු වී කථා කළා. එක් අවස්ථාවක හින්දු පුවත්පතේ මාධ්‍යවේදියෙක් එතුමාගෙන් ප්‍රශ්න අහනවා; සම්මුඛ පරීක්ෂණයක් කරනවා. [බාධා කිරීම්] කරුණාකර මට කථා කරන්න ඉඩ දෙන්නකෝ. [බාධා කිරීම්] මම බැලුවේ "ලංකාදීප" පත්තරය.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
පත්තරේ ගෙනෙන්න. [බාධා කිරීම්]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
පත්තරේ ගෙනෙන්න දෙයක් නැහැ. මම බැලුවේ "ලංකාදීප" පත්තරේ. තමන්ගේ පත්තර සූත්තරය හැම දාම මෙතැන දාන්න එපා. පාර්ලිමේන්තුවට එනකොට පත්තරේ ගෙනෙන්න නීතියක් නැහැ. පත්තරයක් අල්ලාගෙන. එක දවසක් පත්තරයක් අල්ලාගෙන දිනුවා වුණාට පාර්ලිමේන්තුවට එනකොට පත්තරේ ගෙනෙන්න කියලා නීතියක් නැහැ. "ලංකාදීප" පත්තරය ගන්න. මහින්ද රාජපක්ෂ මහත්මයාගෙන් අහනවා, [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු මන්ත්‍රීතුමාගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
එම මාධ්‍යවේදියා මහින්ද රාජපක්ෂ මහත්මයාගෙන් අහනවා, "මත්තල ගුවන් තොටුපොළ පෞද්ගලීකරණය කිරීම සම්බන්ධයෙන් ඔබතුමාගේ අදහස මොකක්ද?" කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ පිළිබඳව කෙලින් උත්තරයක් දෙන්නේ නැහැ. එතුමා කියනවා, "මත්තල ගුවන් තොටුපොළ පෞද්ගලීකරණය කිරීම සම්බන්ධයෙන් නොවෙයි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ පෞද්ගලීකරණ වැඩ පිළිවෙළට තමයි මම කැමති නැත්තේ" කියලා. මත්තල ගැන කිසිම වචනයක් එතුමා කථා කළේ නැහැ. එතුමා එතැනින් ලිස්සා යනවා. මම ඒකයි කියන්නේ. ලංකාවට එක කථාවක්; හම්බන්තොටට එක කථාවක්; තමුන්නාන්සේලාට එක කථාවක්; ඉන්දියාවට ගියාම තව කථාවක්. මේ හතර බිහිරි කථා, දෙබිඩි කථා ගැනත් විශේෂයෙන්ම අපි කනගාටු වෙන්නට ඕනෑ. ඒකෙන් මත්තල කථාව දැන් ඉවරයි.

අපේ ප්‍රවාහන ඇමතිතුමාත් ගරු සභාවේ සිටින වෙලාවකයි මම මේ ගැන කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ අලි තුන් දෙනෙක් දුම්රියක හැපී මැරී සිටිනවා අපි දැක්කා. දුම්රිය අනතුරුවලින් අපේ වන සතුන් විශාල වශයෙන් ඝාතනය වෙනවා. ඒ එක්කම දැන් බස් වර්ජනයක් ගැන කථා කරනවා. [බාධා කිරීම්] කරුණාකර මගේ කථාවට බාධා කරන්නේ නැතිව ඉන්න කෝ ගරු මන්ත්‍රීතුමා. දැන් බස් වර්ජනයක් ගැන කථා කරනවා. නැවතත් ලබන 24 වැනිදා බස් වර්ජනයක් ඇති කර අපේ රටේ කම්කරුවන්, ශ්‍රමිකයන්, ශිෂ්‍යයන් ඇතුළු සමස්ත ජනතාවට විශාල වශයෙන් පීඩනයක් ඇති කරන්න දැන් කථා කරනවා. ඩීසල් මිල වැඩි වෙනවා තමයි. ඊට සාපේක්ෂව කලින් කලට මෙහෙම බස් ගාස්තු වැඩි වුණොත් ඩීසල් මිල අඩු වෙනකොට ආපසු බස් ගාස්තු අඩු කිරීමේ ප්‍රවණතාවක් නැද්ද?

දැන් ඩීසල් ලීටරයක මිල රුපියලකින් වැඩි වනකොට ආප්පයක මිල රුපියල් පහකින් වැඩි වනවා. එතකොට පෙට්‍රල් ලීටරයක මිල රුපියල් පහකින් වැඩි වනකොට plain tea එකක මිල රුපියල් පහකින් වැඩි වනවා. එතකොට, තෙල් මිල අඩු වනකොට ඒ සූත්‍රයට අනුව අනෙක් ඒවායේ මිල අඩු කරදීමේ ක්‍රියාවලියක් අපට අනුගමනය කරන්න බැරිද කියන කාරණය ගැනත් මම මේ අවස්ථාවේදී විශේෂයෙන් අහන්න ඕනෑ. මොකද, මේ බස් වර්ජන නිසා ඇත්තටම හානියට පත් වන්නේ; පීඩාවට පත් වන්නේ අපේ රටේ අභිංසක මහජනතාව; එදිනෙදා වැඩට යන ශ්‍රමිකයන්, කම්කරුවන් ඇතුළු සියලුදෙනා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

හොඳයි. අද විශාල උද්ඝෝෂණයක් ඇතිවෙලා තිබෙනවා, අපේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාව ඝාතනය කරන්න අපේ රටේ යම් පොලිස් නිලධාරිනුත් සම්බන්ධ වෙලා මහා ඝාතන කුමන්ත්‍රණයක් තිබෙනවාය කියලා. පොඩි ඉඟියකින් කියැවුණා, ඒකට ආණ්ඩුවෙත් සහයෝගයක් තිබෙනවාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාතෘකාවක් නැතුව ඉන්නකොට ඒකාබද්ධ විපක්ෂයට කලින් කලට මාතෘකා හම්බ වෙනවා. මාතෘකා කියන ඒවා පැළ කරනවා; වගා කරනවා. එහෙම වගා කරලා මාතෘකාවක් අරගෙන යනවා. මම ඔබතුමාට කියන්න කැමැතියි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එතුමාගේ කටින්ම කියා තිබෙනවා, 2015 ජනවාරි 08 වනදා එතුමා ජයග්‍රහණය කළේ නැත්නම්, එතුමා දැන් මැරිලා පොළොවේ බඹ ගණනක් යට තමයි එතුමාගේ මිනිය තිබෙන්නේ කියලා. එතුමාගේ මිනිය විතරක් නොවෙයි, එතුමාගේ පවුලේ අයගේත් මිනී ටික මේ මහ පොළවේ බඹ ගණනක් යට තිබෙන්නේ කියලා තමයි එතුමා කියන්නේ. එතකොට අපේ රටේ ජනාධිපතිතුමා එතුමාට තිබුණු මරණ තර්ජන, එතුමාට තිබුණු ජීවිත අවදානම පිළිබඳව අනියමින් - නොකියා කියමින්- කියා තිබෙනවා. එතුමා ජනාධිපතිවරයා වුණාට පසුව කියා තිබෙනවා, එතුමාගේ ජීවිතය පිළිබඳව තිබුණු අවදානම ගැන. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා සහ එතුමාගේ පවුලේ සියලුදෙනා බඹ ගණනක් මහ පොළොව යට වැළලෙන්න තිබුණු එකෙන් අපි තමයි එතුමාව ගලවා ගත්තේ කියන එක එතුමා කියා තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී කියනවා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාව -අපි හඳපු ජනාධිපතිතුමාව, අපි ගොඩ නහපු ජනාධිපතිතුමාව- එහෙම ඝාතනය කිරීමේ කටයුත්තකට උදව් කරන්න අපට කිසිම අවශ්‍යතාවක් නැති බව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

හැබැයි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අනියමින් කියන ආකාරයට එතුමා පැරදුණා නම් 2015 ජනවාරි 08 වැනිදාට පසුවදා එතුමාව ඝාතනය කරන්න හිටපු සැබෑ ඝාතකයින් කවුද කියන එක සොයන්න කියලා මේ අවස්ථාවේ දී ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 13ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.03]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, TNA එකේ මන්ත්‍රීතුමා කථා කරන්නේ නැති නිසා එතුමාගේ වෙලාවෙන් විනාඩි 5ක් ගන්න කියා කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී ගරු අමාත්‍යතුමා මේ සභාවේ නැහැ. නමුත් ඇමතිතුමා මේ සභාවේ සිටියා නම් මම කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ අවධානය යොමු වන්නේ එතුමාගේ විෂයය වන සිවිල් ගුවන් සේවා සම්බන්ධයෙන් නොවුණත්, සාමාන්‍යයෙන් මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ තමයි ජාතික ගුවන් සේවාව තිබුණේ. ඉතිහාසයේ පැවැති හැම ආණ්ඩුවක් යටතේම සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා යටතේ තමයි ජාතික ගුවන් සේවය තිබුණේ. හැබයි, විකුණන්න ඕනෑ දේවල් ඔක්කෝම බෙලෙක් කඩේට දමනවා වාගේ මේ යහපාලන ආණ්ඩුව පළමු වතාවට රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශය කියලා එකක් හදලා, මේ රටේ පෞද්ගලීකරණය කරන්න ඕනෑ සියලු ආයතන ටික එක අමාත්‍යාංශයක් යටතට දමපු නිසා තමයි ශ්‍රී ලංකන් ගුවන් සමාගමත් එම අමාත්‍යාංශය යටතට වැටුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපේ රටේ ජාතික ගුවන් සේවාව පිළිබඳව කවදාවත් අපට මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න අවස්ථාවක් නැහැ. මේ රටේ ජාතික ගුවන් සේවාව දවසින් දවස පාඩු ලබමින් තිබෙද්දී, රුපියල් මිලියන ගණනක් වංචා කරමින්, කෝටි ගණනක් මුදල් කොමිස් ගසමින් මේ ආණ්ඩුව මේ රටේ ජාතික ගුවන් සේවාව බොරැල්ලේ කනත්තට ගෙන යමින් සිටින වෙලාවක මේ පාර්ලිමේන්තුවේ ඒ පිළිබඳව කථා කරන්න අපට අවස්ථාවක් නැහැ. මොකද, මේ විෂයය සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ කවදාවත් කථා කරන්නේ නැති නිසා.

සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ තමයි ගුවන් තොටුපොළ දෙක තිබෙන්නේ. හැබැයි මේ ගුවන් තොටුපොළ දෙකටත් ගුවන් යානා එන්න එපායැ. එසේ ගුවන් යානා එන්න, අපට ගුවන් යානයක් තිබෙන්න එපායැ. ඒ නිසා අපේ ගුවන් සේවාවට වන විනාශය පිළිබඳව මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අමාත්‍යවරයෙක් නිසා එතුමාගේ අමාත්‍යාංශයට සම්බන්ධ නොවුණත්, එතුමාගේ අමාත්‍යාංශයට සම්බන්ධ වෙන්න තිබුණු, ඒ වාගේම මේ රටේ ජාතික වැදගත්කමක් තිබෙන මේ විෂයය පිළිබඳව කැබිනට් මණ්ඩලයේ දී කථා කරලා ඒ පිළිබඳව අවධානය යොමු කරවයි කියලා හිතාගෙන තමයි මම එතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ප්‍රධානම ගුවන් සේවා ආයතනය ශ්‍රීලන්කන් ගුවන් සමාගමයි. අපේ රටේ ජාතික ගුවන් සේවය එම සමාගමේ ගුවන් සේවයයි. මුලින්ම මේ ගුවන් සමාගම ලාභ ලබන ආයතනයක් බවට පත් වී තිබුණත්, අවසාන කාලය වනවිට පාඩු ලබන තත්ත්වයකට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 8වන දා බලයට පත් වුණු මේ ආණ්ඩුව දිගින් දිගටම අපට එල්ල කළ චෝදනා අතර තිබුණු එක් චෝදනාවක් තමයි, මේ ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ සිදුවුණු පාඩුව. අපට කියපු දෙය තමයි, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ මහා පරිමාණයෙන් හොරකම් සිදුවුණු නිසා මේ ගුවන් සමාගම බිලියන ගණනක් පාඩු ලැබුවාය කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ තිබෙන අනෙක් ගුවන් සේවා පිළිබඳවත් මම ඔබතුමාට කියන්න ඕනෑ. ලෝකයේ ගුවන් සමාගම් අතර Qatar Airways ගත්තත්, Emirates එක ගත්තත්, Singapore Airlines ගත්තත් -ලෝකයේ වෙනත් ප්‍රබලම ගුවන් සේවා වුණත්- ලාභ ලබන්නේ බොහොම සුළු ප්‍රමාණයක්. එම සේවාවලට වැඩිපුර ලාභ ලබන්න බැහැ. එයට හේතුව මේකයි. මේ සේවාවේදී වැඩිම වියදමක් යන්නේ තෙල් සඳහායි. අනෙකුත් වියදම් ගියාම මේ ගුවන් සේවාවල ලාභ තිබෙන්නේ බොහොම සුළු ප්‍රමාණයක්. මේවා මහජනයාට පහසුකම් සලසන සේවා නිසා මහ ලොකුවට ලාභ ලබන්න අමාරුයි. අපේ පාලන කාලය තුළ

ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල දිගින් දිගටම ඉහළ ගිය නිසා ශ්‍රීලන්කන් ගුවන් සමාගම යම් පාඩුවක් ලබමින් තිබුණා. මේ පාඩුව ලැබුවාට පස්සේ, ශ්‍රීලන්කන් ගුවන් සමාගම ලාභ ලබන ආයතනයක් බවට පත් කරන්න, කාර්යක්ෂම ආයතනයක් බවට පත් කරන්න ඕනෑය කියා 2015 වර්ෂයේ බලයට පත් වුණු මේ ආණ්ඩුව එම සමාගමට අලුත් සභාපතිවරයෙක්, අලුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කළා. එහෙම කරලා, මේක ලාභ ලබන සමාගමක්, කාර්යක්ෂම සමාගමක් බවට පත් කරන්න වැඩ පිළිවෙළක් හැදුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යහපාලන ආණ්ඩුව කියපු දෙය අහලා, "ශ්‍රීලන්කන් ගුවන් සමාගම මේ රටේ ලාභ ලබන ආයතනයක්, අනෙකුත් ගුවන් සමාගම්වලට තරගකාරිත්වයක් ඇතිකරන ගුවන් සමාගමක් බවට පත් කරන්න වර්තමාන පාලන අධිකාරියට හැකිවෙයි" කියා අපි හිතුවා. හැබැයි, අවුරුදු දෙකහමාරක් ගතවන විට ආණ්ඩුව ඇතුළෙන්ම ආ විරෝධතාව නිසා, අධ්‍යක්ෂ මණ්ඩලයට ඉල්ලා අස්වෙන්න කටයුතු කළ නිසා, මේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පසුගිය දා ඉල්ලා අස් වුණා. දැන් අලුතෙන් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර තිබෙනවා. ඒ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳවත් මම කථා කරන්නේ නැහැ. මේ අධ්‍යක්ෂ මණ්ඩලය දිහා බැලුවාම, කලින් සිටි අයත්, දැන් සිටින අයත් දෙගොල්ලන්ම එක වාගෙයි කියා අපට පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ විධායක නිලධාරියා හැටියට කටයුතු කළේ සුරේන් රත්වත්තේ කියා පුද්ගලයෙක්. මේ සුරේන් රත්වත්තේ කියන පුද්ගලයා වර්තමාන අග්‍රාමාත්‍යවරයාගේ උපදේශක හැටියට කටයුතු කරන චරිත රත්වත්තේ මහත්මයාගේ සහෝදරයායි. එතුමා තමයි සුරේන් රත්වත්තේ කියන්නේ. එතුමා ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ pilot කෙනෙකු හැටියටයි හිටියේ. එතුමාට තිබෙන ඒ අත් දැකීම් එක්ක මේ ගුවන් සේවාව හොඳින් කර ගෙන යන්න පුළුවන් වෙයි කියා තමයි මේ තනතුරට ඔහු පත් කළේ. හැබැයි එතුමා විධායක නිලධාරියා හැටියට පත් වුණාම සභාපතිවරයා හෝ අධ්‍යක්ෂවරයා හෝ එසේත් නැත්නම් විෂයය භාර අමාත්‍යවරයා හෝ කිසි කෙනෙක් ගණන් ගන්නේ නැතිව ඔහුට ඕනෑ විධියට ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ කළමනාකරණය හසුරුවාගෙන යන ආකාරය අපි දුටුවා. මේ ගැන දිගින් දිගටම අපි කථා කළා. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ සිදුවන හොරකම්, සමාගම ලබන පාඩු පිළිබඳව කථා කරන්න වෘත්තීය සමිති විටින් විට ජනාධිපතිවරයා හමු වුණා; ඇමතිවරයා හමු වුණා; අදාළ සියලුදෙනා හමු වුණා. නමුත් මේ ගුවන් සේවාවේ විධායක නිලධාරියාට අවශ්‍ය පරිදි, නැත්නම් අරලියගහ මන්දිරයට අවශ්‍ය පරිදියි මේ ගුවන් සේවාව පාලනය කළේ.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පාලන සමයේ ශ්‍රීලන්කන් ගුවන් සමාගම යම් යම් පාඩු ලබමින් තිබුණා. පාඩු ලබන මේ ගුවන් සේවාව ලාභ ලබන තත්ත්වයට පත් කිරීම සඳහා ශ්‍රීලන්කන් ගුවන් සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැබිනට් මණ්ඩලයට මූල්‍ය වාර්තාවක් ඉදිරිපත් කර තිබුණා. ඔවුන් කියා තිබුණේ මෙයයි. එදා අපට තිබුණු fleet එකේ ගුවන් යානා 22 කට ආසන්න ප්‍රමාණයක් තිබුණා. මේ ගුවන් යානා 22ම අවුරුදු 15කට 20කට වඩා පරණයි. අවුරුදු පහළොවක් විස්සක් පරණ මේ ගුවන් යානා ඉවත් කර, අලුත් ගුවන් යානා අරගෙන මේ ආයතනය ලාභ ලබන තත්ත්වයකට පත් කරන්න පුළුවන් ආකාරයේ මූල්‍ය වාර්තාවක් ඔවුන් ඉදිරිපත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට තිබෙන ගුවන් යානා සියල්ලම වසර ගණනක් පරණයි; කාර්යක්ෂම නැහැ; ඒවාට යන තෙල් ප්‍රමාණය වැඩියි; දුර ගමන් යන්න බැහැ. අපි කටාර් ගුවන් සේවය, නැත්නම් එමිරේට්ස් ගුවන් සේවය වැනි ගුවන් සමාගම් සමඟ තරගකාරීව කටයුතු කළ යුතු නිසා නව ගුවන් යානා ගැනීමේ අවශ්‍යතාවක් තිබුණා. මේ එකඟතාව මත තමයි, පරණ fleet එක අයින් කර අලුතෙන් ගුවන් යානා ගෙන ඒම කැබිනට් මණ්ඩලයෙන් අනුමත කර මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන ගියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වැඩ පිළිවෙළ අනුව පළමුවැනි ගුවන් යානා ආවා; දෙවැනි ගුවන් යානාත් ආවා. A 350 සහ 900 කියන අවසාන ගුවන් යානා - Airbus - එන්න තිබුණේ 2015 අවුරුද්දේයි. 2015දී මේ ගුවන් යානා ලංකාවට එනවාත් එක්කම යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණා. යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණාට පසුව ඒ අය මේ ගුවන් යානා මිලදී ගැනීම අවලංගු කරන්න කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් ලෝකයේ රටවල් දෙකක් අතර ජාත්‍යන්තර ගිවිසුමක් අත්සන් කරන කොට රටේ නීතියක් තිබෙනවා. පළමුවෙන්ම ශ්‍රීලන්කන් ගුවන් සමාගම එය තමන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන්න ඕනෑ; අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළාට පසුව ඒක විෂයය භාර ඇමතිතුමාට යන්න ඕනෑ; ඊට පසුව විෂයය භාර ඇමතිතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න ඕනෑ; කැබිනට් මණ්ඩලය එය අනුමත කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ සඳහා නීතිපතිවරයාගෙන් උපදෙස් ගන්න ඕනෑ. මේ ගුවන් යානා ගෙන ඒම අවලංගු කිරීම සඳහා ශ්‍රීලන්කන් ගුවන් සමාගම ඒ කිසිම ක්‍රමවේදයක් අනුගමනය කළේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවකට මේ විෂයය භාරව සිටි ගරු කබීර් හාෂිම් ඇමතිතුමා 2017.02.08 දින කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව මම **සභාගත*** කරනවා.

"මේ ගුවන් යානා ගෙන්වීම අවලංගු කිරීම ගැන මම දන්නේ නැහැ, මේ පිළිබඳව කිසිදු සාකච්ඡාවක් කර නැහැ, ඒ නිසා මේ පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කරන්නේ නැතිව, අමාත්‍යාංශයේ නියෝජිතයකුගෙන් සැදුම්ලත් කමිටුවකින් හැරෙන්න කිසිම කටයුත්තක් කරන්න එපා" කියා එතුමා එහි පැහැදිලිව සඳහන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා විසින් දිගින් දිගටම කැබිනට් පත්‍රිකා තුනක් ඉදිරිපත් කර තිබෙනවා. කැබිනට් පත්‍රිකා තුනක් ඉදිරිපත් කරලා එතුමා කියනවා, "ශ්‍රීලන්කන් ගුවන් සමාගම කැබිනට් මණ්ඩලයේ අනුමැතියකින් තොරව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව, නීතිපතිවරයාගේ උපදෙස් අහන්නේ නැතිව කරන මේ කටයුතු වහාම නවත්වන්න" කියා. එක්සත් ජාතික පක්ෂයේ හිටපු මහ ලේකම් සහ මේ විෂයය භාරව සිටි කබීර් හාෂිම් ඇමතිතුමා තමයි මේ කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කර තිබෙන්නේ. "මේක ඉතාම භයානක තත්ත්වයක්, මේ පිළිබඳව නැවත සිතා බලන්න" කියා එතුමා කියනවා. හැබැයි, මේ කිසිවක් ශ්‍රීලන්කන් ගුවන් සමාගම අහන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා අහන්නේ නැතිව මේ ගුවන් යානා ගෙන ඒම අවලංගු කරන්න කටයුතු කරනවා. අපි ශ්‍රීලන්කන් ගුවන් සමාගම පාර්ලිමේන්තුවේ COPE එකට කැඳෙව්වා. කැඳවලා මේ පිළිබඳව ඇහුවා. " ඔව්, අපි නීතිපතිවරයාගෙන් මේ පිළිබඳව ඇහුවේ නැහැ" කියා ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ සභාපති අජිත් ඩයස් මහත්මයා පිළිගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසානයේ මොකක්ද වෙලා තිබෙන්නේ? මේවා අවලංගු කිරීමේ වන්දිය වශයෙන් අද වන විට රුපියල් බිලියන 18ක් මේ ආණ්ඩුව ගෙවා තිබෙනවා. ඒ වාගේම තව රුපියල් බිලියන 50ක් ඉල්ලා තිබෙනවා. ඒ ගැන arbitration එකට ගිහින් තිබෙනවා. ආණ්ඩුව ගනු ලබන තීරණය නිසා, මේ සියල්ල එකතු වුණොත් රුපියල් බිලියන 68ක් ආණ්ඩුවට ගෙවන්න සිද්ධ වෙනවා. මේ තීන්දුව ගත්තේ කවුද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඔහු පාර්ලිමේන්තුවේ COPE එකට කැඳවලා ඇහුවා, "විෂයය භාර ඇමතිවරයාගෙන් අහන්නේ නැතිව,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්නේ නැතිව, අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අහන්නේ නැතිව මේ තීන්දුව ගත්තේ කවුද?" කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අවස්ථාවේ අපට email පණිවිඩයක් ඉදිරිපත් කළා. ඒ email පණිවිඩය දැන් මා ළඟ තිබෙනවා. චරිත රත්වත්තේ මහත්මයා එතුමාගේ "බ්ලැක්බෙරි" ෆෝන් එකෙන් මේ email පණිවිඩය තමන්ගේ සහෝදරයා වන සුරේන් රත්වත්තේ මහත්තයාට එවනවා. එතුමාගේ පණිවිඩයෙන් එතුමා කියන්නේ, "PM has given me instructions." කියායි. ඒ කියන්නේ, මේ ගිවිසුම අවලංගු කරන්න අගමැතිවරයා උපදෙස් දුන්නාය කියායි. බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ අගමැතිවරයාගේ උපදෙස් පරිදි ඔහුගේ උපදේශකයා වන චරිත රත්වත්තේ විසින් ඔහුගේ "බ්ලැක්බෙරි" ජංගම දුරකථනයෙන් එවන email පණිවිඩය නිසා ගත්ත තීන්දුව. ඒ තීන්දුව නිසා රටට අහිමි වුණු මුදල දෙවැනි වාරිකයත් එක්ක රුපියල් බිලියන 68කට වැඩියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුද මේවාට උත්තර දෙන්නේ? මේ මුදල් අගමැතිතුමා ගෙදරින් ගෙනැල්ලාද? පස්වැනි පටුමගෙන් ගෙනැල්ලාද? නැහැ. මේවා රටේ ජනතාවගේ සල්ලි. රුවන් විජයවර්ධන රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ ඥාතියා. මේ සල්ලි ගෙවන්නේ කවුද? මේවා මහ ජනතාවගේ සල්ලි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුවන් විජයවර්ධන මහත්මයාට නම් ප්‍රශ්නයක් නැහැ, අඩු ගණනේ දේපොළ හෝ තිබෙනවා, විකුණලා ගෙවන්න. දෙමව්පියෝ හම්බ කළ ඒවා. මේවාට වග කියන්නේ කවුද? ගරු රුවන් විජයවර්ධන රාජ්‍ය ඇමතිතුමනි, චරිත රත්වත්තේ මහත්මයා තමන්ගේ "බ්ලැක්බෙරි" ෆෝන් එකෙන් යවන පණිවිඩය අනුව තමයි මේ ගුවන් යානා මිලදී ගැනීම අවලංගු කරන්නේ. එම email පණිවිඩය මම **සභාගත*** කරනවා.

මේ රුපියල් බිලියන 68 නිබුණා නම් අධිවේගී මාර්ග කීයක් හදන්න තිබුණාද? අපට ගුවන් තොටුපොළවල් හදන්න තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලයෙන් තව මිනිත්තු දෙකක් ඉතිරිව තිබෙනවා. ඊට අමතරව ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් ලබා දෙන්න පුළුවන්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මුලින් අපේ ගරු විපක්ෂ නායකතුමා කිව්වා, එතුමන්ලාගේ කථිකයන් තුන් දෙනාම එන්නේ නැහැ, ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමාගේ වෙලාව ගත්තාට කමක් නැහැය කියා. [බාධා කිරීමක්] හරි, හරි. ඔබතුමා කථා කරන්න. මම විපක්ෂ නායකතුමාගෙන් ඇහුවාම කිව්වා කථිකයන් දෙදෙනායි කථා කරන්නේ කියා. ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරනවා නම් මට ප්‍රශ්නයක් නැහැ. මම ඔබතුමාගෙන් ඇහුවේ නැහැ. එතුමා කිව්ව නිසායි මම ඒ කාරණය කිව්වේ.

යාපනයේ මොන ගුවන් තොටුපොළවල්ද? මේ නිකම් වැඩකට නැති දේවල් ගැන කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියාගෙන ආවේ මේකයි. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ උපදේශකවරු ගත් තීරණ නිසා Grand Hyatt Hotel Project එකේ contract එකක් හිටපු මුදල් ඇමතිවරයා විසින් අවලංගු කරන ලද බව රුවන් විජයවර්ධන රාජ්‍ය ඇමතිතුමාත් දන්නවා. අන්තිමට මොකද වුණේ? ඒ ගොල්ලන් arbitration එකට ගියා. ඇමෙරිකානු ඩොලර් මිලියන 5ක් වන්දි වශයෙන් ආණ්ඩුවට ගෙවන්න සිදු වුණා. මේවා කාගේ සල්ලිද? Grand Hyatt Hotel Project එකේ contract එකක් අවලංගු කරන්න ගිහිල්ලා -මේ අත්සන් කරපු ගිවිසුම් අවලංගු කරන්න ගිහිල්ලා- ඇමෙරිකානු ඩොලර් මිලියන ගණනක් ගෙවන්න වෙලා. ඒ විතරක් නොවෙයි, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ විධායක නිලධාරියා විසින් පාකිස්තානයට අපේ ගුවන් යානා තුනක් lease කර දෙන ලද බව ඔබතුමන්ලා දන්නවා. ගුවන් යානා lease කරනකොට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය දුන්නේ, ගුවන් යානා තුනක් lease කරනවා නම් පමණක් පාකිස්තානයට මේක දෙන්න පුළුවන් කියායි. හැබැයි, එක් ගුවන් යානයයි දුන්නේ. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ආර්.සී. ද සිල්වා, ජේ.එම්.එස්. බ්‍රිටෝ, ආර්.එස්. ජයවර්ධන, එච්.කේ. බාලපටබැඳි කියන අධ්‍යක්ෂවරු හතර දෙනෙකු අත්සන් කර ලියුමක් දෙනවා. ඒ ලියුම මා ළඟ තිබෙනවා. විධායක නිලධාරියා අපෙන් අහන්නේ නැතිවයි මේ තීන්දුව ගන්නේ. විධායක නිලධාරියාට කාගේ භයියද තිබුණේ? සුරේන් රත්වත්තේට බලය ඇවිල්ලා තිබෙන්නේ කාගෙන්ද? අධ්‍යක්ෂ මණ්ඩලයේ හතර දෙනාගේ නම් ඇතුළත් ලිපිය මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් හතර දෙනෙකු සභාපතිවරයාට කියනවා, "මේ ගැන පරීක්ෂණයක් පවත්වන්න." කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තීන්දු ගන්නේ කවුද? විධායක නිලධාරියා ගෙදර යැව්වා. දැන් මාස හයක පඩියක් ඔහුට ගෙවන්න හදනවා. මේ රටට මහා විනාශයක් කරපු සුරේන් රත්වත්තේ මහත්තයාට විදේශ රටවලට යන්න ටිකට් වෙනුවෙන් රුපියල් ලක්ෂ එකසිය ගණනක package එකක් ගෙවන්න ශ්‍රීලන්කන් ගුවන් සමාගම තීන්දු කරනවා. කොහාටද, මේ යන්නේ? ගරු ඇමතිතුමා, මම ඔබතුමාට කියාගෙන ආවේ මේකයි. ඒ විතරක් නොවෙයි.

ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගමේ පාඩු ගැන කිව්වා. 2014 අපි ආණ්ඩුව බාර දෙනකොට ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ පාඩුව රුපියල් බිලියනයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 පාඩුව රුපියල් බිලියන 14යි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ පාඩුව රුපියල් බිලියන 14යි. මේ වනකොට පාඩුව රුපියල් බිලියන 4යි. මේ ආකාරයට දවසින් දවස ශ්‍රීලන්කන් ගුවන් සමාගම පාඩු ලබන තත්ත්වයට පත් වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කැබිනට් අවසරයක් නැතිව, නීතිපතිවරයාගේ උපදෙස් නැතිව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් නැතිව මෙවැනි දේවල් ගත්ත මේ නිලධාරීන්ට විරුද්ධව ආණ්ඩුව මොනවාද කරන්නේ කියායි අපි දැන් අහන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්. ආණ්ඩුව මේ අයට විරුද්ධව කටයුතු කරන්නේ කොහොමද? අපි COPE එකේ තීන්දු දුන්නා. ඒ සියල්ල ක්‍රියාත්මක කරන්නේ නැහැ. මේ සියලු දේ කර ශ්‍රීලන්කන් ගුවන් සමාගම විකුණන්න හදනවා. හොඳ ආයතනයකට විකුණනවා කියා අපි හිතමු. හැබැයි, අගමැතිතුමා හිතූ මතයට ගත් තීරණ නිසා රටේ ජනතාවට රුපියල් බිලියන 68ක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවාට තමුන්නාන්සේලාට ඉදිරියේදී වග කියන්න වේවි. ඒ නිසා මේ වාගේ මහා අපරාධ සිදු වන එක නවත්වන්න.

නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා, මම ඔබතුමාට කියාගෙන ආවේ මේකයි. ඔබතුමා සිවිල් ගුවන් සේවා ඇමතිතුමා. ගුවන් යානා බස්සන්න ගුවන් තොටුපොළක් තිබෙන්න ඕනෑ. හැබැයි, මෙහෙම ගියොත් අපිට ගුවන් යානා බස්සන්න ගුවන් තොටුපොළක් නැති වේවි. ඒ නිසා ගරු ඇමතිතුමනි, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ සිදු වෙලා තිබෙන මේ ගැටලුව පිළිබඳව ඔබතුමාගේ අවධානය කැබිනට් මණ්ඩලයේදී යොමු කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ශ්‍රීලන්කන් ගුවන් සේවය ඒ කාලයේ කරපු වැරැදි වාගේම මේ කාලයේ කරපු වැරැදි ඔක්කොම හොයන්න කොමිෂන් සභා පත් කර තිබෙනවා. එහිදී ඔය ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලැබේවි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ඇමතිතුමා, කොමිෂන් සභා ගොඩක් පත් වුණා. බැඳුම්කර කොමිසමත් පත් වුණා. හැබැයි, ලොකු හොරු ටික තවම එළියේ. ඒ නිසා මේ කොමිසමත් වැඩක් නැහැ. ඒ කාලයේ කරපු වැරැදි හෙව්වාට වැඩක් නැහැ. මේ වනතුරු ඒ පිළිබඳව හොයන්න තවම එක් කොමිසමක්වත් පටන් අරගෙන නැහැ, ගරු ඇමතිතුමා. ඒ නිසා බැඳුම්කර ගනුදෙනුව වාගේ නැතිව මේ පිළිබඳවත් සාධාරණව පරීක්ෂණයක් පවත්වන්න කියා එතුමාට කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු නවයක කාලයක් තිබෙනවා. ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු කනක හේරත් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී "ගරු කනක හේරත් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SHEHAN SEMASINGHE *left the Chair, and* THE HON. KANAKA HERATH *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා.4.19]

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිවිල් ගුවන් සේවා ඇමතිතුමාත් මේ ගරු සභාවේ සිටියදී, විවිධ මැති-ඇමතිවරුන් ගේ කථා අතරතුර විශේෂිත වූ මේ කාරණය පිළිබඳව කථා කරන්න මටත් අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම මේ වසරේ ලෝකයේ දැඩි අවධානයකට පාත්‍ර වුණු ශ්‍රී ලංකාවේ ගුවන් සේවා සමාගම් තව ටිකක් සංවර්ධනය කිරීමට මේ රජය කටයුතු කළ යුතුයි කියන ස්ථාවරයේ මමත් සිටිනවා.

විශේෂයෙන් මම නියෝජනය කරන පුත්තලම දිස්ත්‍රික්කයේ තිබෙන ගුවන් තොටුපළ domestic ගුවන් තොටුපළක්. අපි වර්තමාන ඇමතිතුමාත් සමඟ එම ප්‍රදේශයේ සංචාරයක යෙදුණු අවස්ථාවේදී ගුවන් යානා ගොඩ බැස්සවිය හැකි, එම ප්‍රදේශයට සංචාරකයන් ගෙන යා හැකි, ආකර්ෂණීය ගුවන් තොටුපළක් බවට පත් කළ හැකි ස්ථානයක් බවට එම ගුවන් තොටුපළ අපට හඳුනා ගැනීමට පුළුවන්කම ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවාසනාවට පුත්තලම දිස්ත්‍රික්කයෙන් ජනාධිපතිවරයෙක් පත් වුණේ නැහැ. එම නිසා අපි පුංචි කාලයේ සිට අහපු, ගුවන් යානාවක් බැස්සවීමට නොහැකි මට්ටමේ, නොදියුණු තත්ත්වයේ ගුවන් තොටුපළක් තමයි තවම එහි තිබෙන්නේ. මේ වෙද්දී කල්පිටිය ප්‍රදේශය සංචාරක කර්මාන්තය වෙනුවෙන් නම් වෙලා තිබෙනවා; යෝජනා වෙලා තිබෙනවා. සංචාරක කර්මාන්තයෙන් අපේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලැබෙනවා. එම නිසා ඔබතුමන්ලා මැදිහත් වී මේ රජය ගෙන යන වැඩසටහන්වලදී සමස්ත රටම ආවරණය වන පරිදි ගුවන් තොටුපළ සංවර්ධනය කරන ලෙසත්, අලුතින් ගුවන් තොටුපළ ස්ථාපිත කරන ලෙසත්, රට තුළ අභ්‍යන්තර ගුවන් සේවා ඇති කිරීම තුළින් සංචාරකයන්ගෙන් අපේ ආර්ථිකයට යමක් උත්පාදනය කර ගැනීමේ වැඩ පිළිවෙළක් දියත් කරන ලෙසත් මම ඔබතුමාට යෝජනා කරනවා.

ශ්‍රීලන්කන් ගුවන් සමාගම විනාශ වී තිබෙන්නේ මේ අවුරුදු තුන ඇතුළත කියන එක තමයි අද අපේ ඒකාබද්ධ විපක්ෂයේ සහෝදර මන්ත්‍රීවරු කියන්න උත්සාහ කළේ. මේ ප්‍රකාශ අහන අය අපේ රටේ සිටිනවා. උගත්, බුද්ධිමත් ජනතාව සිටිනවා. එම නිසා විහිළුවට පාත්‍ර වෙන්න එපා. අපි මේ ආණ්ඩුව 2015 ජනවාරි මාසයේ ලබා ගනිද්දී විකුණන්නවත්, ආරක්ෂා කරන්නවත්, රකින්නවත් ශ්‍රීලන්කන් ගුවන් සමාගමක් තිබුණේ නැහැ. මම නම් වශයෙන් කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් හපේටම සුප්පු කරලා, විනාශ කරලා, ගහන්න තිබෙන සියලු ගැහිලි ගහලා අපට ඒ ගුවන් සේවා සමාගම් ගැන කථා කරන්නවත් හිඩැසක් තියලා තිබුණේ නැහැ. මේ අවුරුදු තුන තුළ

[ගරු අශෝක ප්‍රියන්ත මහතා]

යම් කිසි වැරැද්දක් සිදු වෙලා තිබෙනවා නම් ඒ පිළිබඳ සොයා බලනවාට, ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වනවාට, ඒ සම්බන්ධ වැරැදිකරුවන් නීතියේ රැහැනට හසු කර ගන්නවාට අපේ විරුද්ධත්වයක් නැහැ.

යහ පාලන රජය පිහිටුවීමට ජනතාව පෙළ ගැසුණු මුඛ්‍ය පරමාර්ථය තමයි හොරු අල්ලන එක, වංචනිකයන්ට දූෂකයන්ට විරුද්ධව ක්‍රියා කරන එක. එදා එසේ පෙළ ගැසුණු ජනතාවගේ ප්‍රධාන මානෘකාවක් තමයි ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ, මිහින් ලංකා ගුවන් සමාගමේ සිදු වුණු දැවැන්ත වංචා, ගසාකෑම්, හොරකම් සොයන්න කියන එක. අද වෙද්දී අතිගරු ජනාධිපතිතුමා මැදිහත් වෙලා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කර තිබෙනවා. අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ පසුගිය දවසක බැදුම්කර කොමිෂන් සභාවේ වාර්තා එළියට ඇවිත් තිබුණා. එම වාර්තාවලට ජනතාව අතර ලැබුණු ප්‍රසිද්ධිය වාගේම ශ්‍රීලන්කන් ගුවන් සමාගම සම්බන්ධ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවත් සාක්ෂි කැඳවන විධියට පෞද්ගලික මාධ්‍ය හරහා දවසින් දවස පළ වෙනවා නම් හොඳයි. ඒ තුළ සිදු වුණු මහා පරිමාණ වංචා, දූෂණ පිළිබඳව මාධ්‍යයෙන් ප්‍රසිද්ධ කරන්න සූදානමක් නැහැ. මේ න්‍යාය පත්‍රය කොහෙන් ක්‍රියාත්මක වෙනවාද දන්නේ නැහැ. වර්තමානයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන කථා කළා. හැබැයි, එදා මේ ගුවන් සේවා සමාගම්වලට සභාපතිවරු පත් කරපු හැටි, ජනාධිපතිවරුන්ගේ ඥාතීන් ඒ තුළට ගෙන ගිය හැටි, ඒ අය මේ ගුවන් සමාගමේ තිබුණු catering කරන ආයතනය අරගෙන දේශපාලනීකරණය කරපු හැටි විපක්ෂයේ සමහර මැති ඇමතිවරුන්ට අමතක වෙලා තිබෙනවා. ඒ අය කළත්, මේ අය කළත් වැරැද්ද වැරැද්ද ලෙස පිළිගැනීමට අපට පුළුවන්කමක් තිබෙනවා නම්, ඒක තමයි ඉදිරියේදී -ගරු ඇමතිතුමාත් මේ අවස්ථාවේ මේ ගරු සභා ගර්භයේ සිටිනවා.- මෙම ආයතන රැක ගැනීමට අපට පාර්ලිමේන්තුව විධියට ගත හැකි ක්‍රියාමාර්ගය කියන එක සඳහන් කරන්න ඕනෑ.

මට නම් මේ ප්‍රශ්නයෙන් නිදොස් වෙන්න, නිදහස් වෙන්න පුළුවන්, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි. - ඒ මන්ත්‍රීතුමා අහගෙන නැතිව ඇති.- මොකද, මම එදාත් හිටියේ එක්සත් ජාතික පක්ෂය විධියටයි. එදා ගුවන් සේවා සමාගම ක්‍රියාත්මක කළේත් ඔබේ පක්ෂයේ නායකවරු මැදිහත් වෙලායි. නමුත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරයෙක් වන නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා තමයි අදත් මේ කටයුත්ත කරන්නේ. ඒ නිසා මම හිතන්නේ ඔබටත් එතුමාත් එක්ක සහයෝගයෙන් කටයුතු කරලා, එදා වුණු වැරදිත්, අද එක්සත් ජාතික පක්ෂයෙන් වැරදි සිදු වෙනවා නම් ඒවා පිළිබඳවත් පරීක්ෂණ පවත්වන්න පුළුවන්. මේ ගුවන්සේවා සමාගම්වල සිදුවන හානි, වංචා, දූෂණ සහ අකටයුතුකම් පිළිබඳ සොයා බලන්න කටයුතු කිරීම් පිළිබඳව, එක්සත් ජාතික පාක්ෂිකයෙක් විධියට මට ඉතාමත් ආඩම්බරයෙන් කථා කරන්න පුළුවන්. කිසිදු විධියක අපට ප්‍රශ්නයක් නැහැ. නමුත්, පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නම අල්ලා ගෙන, ද්වේශ සහගත විධියට මේ පාර්ලිමේන්තුවේ කථා කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ, නැත්නම් එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය විවේචනය කරන ආකාරයටයි. මම ඒ පිළිබඳව කථා නොකළත්, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් විධියට මම එය දැඩි සේ හෙළා දකිනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් එකතු වෙලායි මේ ආණ්ඩුව කරන්නේ. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, මේ සම්මුතිවාදී ආණ්ඩුව තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් ඇමතිකම් කරද්දි ඔබ දැඩිසේ දෝෂදර්ශනයට, විවේචනයට ලක් කරන මේ අමාත්‍යාංශයේ, ඔබත් එක්ක එකට තරග කරපු ගරු ඇමතිවරයෙක් ඇමතිකම උසුලනවා. ඒ නිසා මේ පිළිබඳ ද්වේශ සහගතව හිතන්න එපා; වෛරීව හිතන්න එපා. එදා වැරැද්දක් සිදු වෙලා තිබෙනවා නම් ඒවාත්, අද වැරැද්දක් සිදු වෙනවා නම් ඒකත් නිවැරදි කරගත යුතු වනවා. අපේ රටේ අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් තුළ පහසුකම් හදලා, ඒ හරහා සංචාරකයන්ට ඉතාමත් පහසුවෙන් එහෙට මෙහෙට යන්න පුළුවන් අවස්ථාව හදා දීලා, රට තුළ ආකර්ෂණීය සංචාරක කර්මාන්තයක් ස්ථාපිත කළ යුතු වනවා. ඒ අනුව ඒ කාර්ය භාර්ය මැනවින් ඉටු කරන්නට මෙම අමාත්‍යාංශයට ශක්තිය දිය යුතු වනවා. මොකද, මේ, ඒ සඳහා අපට හැකියාව තිබෙන වකවානුවක්; එවැනි විනිවිදභාවයක් පෙනෙන ක්‍රමවේදයක් ස්ථාපිත වෙලා තිබෙන මොහොතක්; එදා සහ අද සිදුවෙන වංචනික දූෂණ ක්‍රමවේදයන් පිළිබඳ නිතර නිතර ජනාධිපති කොමිෂන් සභා සහ මාධ්‍ය හරහා දැවැන්ත ආකාරයෙන් ජනතාව දැනුවත් කිරීම් සහ ජනතාවට අවශ්‍ය තොරතුරු සොයා ගන්න පුළුවන් ආකාරයක අපි රැඳිලා සිටින මොහොතක්. අප සියලු දෙනාටම මෙවැනි යුගයක් ආයේ කවදාවත් එන්නේ නැහැ කියලා මම හිතනවා. ඒ නිසා උදා වුණු මේ යුගය තුළ තමන්ගේ අඩුපාඩු වැරදි මකා ගන්න උත්සාහ කරනවා මිස, නැති ප්‍රශ්න ඇති කරලා එහෙමත් නැත්නම් අපේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගෙන යන මෙම නිවැරදි ක්‍රියාදාමය මඩ ප්‍රහාරවලින් යට කරලා එය පැත්තකට දමන්න උත්සාහ කරන්න එපා. ගරු අගමැතිතුමාට කිසිසේත් පවුල් පාලනයක්, පවුල්වාදයක් නැහැ. පුතාලා, අයියලා, මල්ලිලා, ඥාතීන් මෙතැනින් එහාට මේ රටේ නායකත්වයට ගෙනෙන්න වුවමනාවක්වත්, කැමැත්තක්වත්, ආශාවක්වත් එහෙම නැත්නම් එවැනි ක්‍රමවේදයක්වත් නැහැයි කියන එක මේ සභාවට මම කියන්න කැමැතියි. ඒ නිසා පවුල් පාලනය කොතැනද තිබුණේ, මේ රටේ තිබෙන ප්‍රධාන ආයතනවල බලය කවුද ඉල්ලා ගෙන ගියේ, අදටත් බලය නැතිව ඒ බලය ගන්න පසුගිය කාලවකවානුවේදී සිදු වුණ ඒ අපරාධ සිදු කරමින් තවත් ඉදිරියට ගෙන යන්නේ කවුද කියන එක අපි දැන ගන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසන් කරන්නම්. මම කියන්නට බලාපොරොත්තු වන්නේ මහලොකුවට ඒකාබද්ධ විපක්ෂයේ අය කෑ ගැහුවාට, ඒ ගුවන් සමාගම් සහ මෙම සිවිල් ගුවන් සේවයට අයිති ආයතන අපි විකුණනවා යැයි කිව්වාට, 2015 ජනවාරි මාසයේ 08 වෙනිදා අපි මේ රටේ බලය ගනිද්දි විකුණන්න කිසිදු දේපොළක් මේ රටේ ඉතිරි කරලා තිබුණේ නැහැ; ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායම ගියේ හපේටම ලොට්ට කරලායි කියන එක මතක් කරමින් ඔබතුමා මට කථා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. Next, the Hon. S. Shritharan. You have 11 minutes.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
No, Sir, I have been given 15 minutes.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
No, you have been given only 11 minutes.

[பி.ப. 4.29]

**ගරු එස්. ශ්‍රිතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் வானூர்தி மூலம் ஏற்றிச் செல்லல் சட்டமூலம் சம்பந்தமான விவாதம் நடைபெறுகின்ற இந்த வேளையில், இன்று நாட்டிலே ஏற்பட்டிருக்கின்ற ஓர் அனர்த்தம் பற்றிய விடயத்தையும் இந்த இடத்திலே குறிப்பிடுவதற்கு அனுமதிக்கு மாறு தங்களைத் தயவாகக் கேட்டுக்கொள்கின்றேன். மிக முக்கியமாக இப்பொழுது இந்த நாட்டிலே வரட்சி தாண்டவமாடிக் கொண்டிருக்கிறது. மக்கள் குடிப்பதற்குத் தண்ணீர் இல்லாமல் அங்கலாய்த்துக் கொண்டிருக்கிறார்கள். அவர்கள் நீருக்காக பல மைல்கள் அலைந்து திரிகின்ற சூழல் காணப்படுகின்றது. பல்வேறுபட்ட இடங்களிலே மக்களுடைய குடிநீர்த் தேவைகள் பூர்த்தி செய்யப்படாமலும் அவர்களுக்கு வரட்சி நிவாரணங்கள் கிடைக்காமலும் இருக்கின்றன. இதனால், அவர்கள் பாரிய பொருளாதார நெருக்கடிகளையும் தங்களுடைய அன்றாட வாழ்வாதரப் பிரச்சினைகளைத் தீர்ப்பதில் பாரிய சவால்களையும் சந்தித்து வருகின்றார்கள்.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற யாழ்ப்பாணத் தேர்தல் மாவட்டத்திலுள்ள கிளிநொச்சி மாவட்டத்தினுடைய பல்வேறு இடங்களிலே குடிநீர்ப் பிரச்சினையானது, பாரியளவில் அந்த மக்களை வாட்டி வதைத்துக் கொண்டிருக்கின்றது. கிளிநொச்சி மாவட்டத்தில் இருக்கின்ற உள்ளூர் நீர்நிலைகள் பெரு மளவிலே வற்றிவிட்டன. குறிப்பாக, அக்கராயன் குளம் தண்ணீரே இல்லாமல் வரண்டு போயிருக்கிறது. இரணைமடுக் குளத்தில் இருக்கின்ற குடிநீர் கால்நடைகளுக்கு மட்டும் திறந்துவிடுகின்ற அளவிலேதான் இருக்கின்றது. அதாவது, தண்ணீர் முழுமையாக வற்றிய நிலையிலே காணப்படுகின்றது. கல்மடுக் குளத்திலே இருக்கிற தண்ணீர், அங்கே இருக்கின்ற மக்களுக்குப் பயன்படக்கூடிய நிலையில் இல்லாமல் குளத்தின் அடிப்பகுதியில் இருக்கின்றது. வன்னேரிக் குளம், கரியாலை நாகபடுவான் குளம், சின்ன பல்லவராயன் கட்டுக் குளம், ஆனைவிழுந்தான் குளம் போன்ற குளங்களில் தண்ணீர் வற்றிய நிலை காணப்படுவதால், அந்த மக்கள் குடிநீருக்காக அலைகின்ற சூழல் அதிகமாகக் காணப்படுகின்றது. இதனை நாங்கள் சொல்லுவதற்கான சந்தர்ப்பங்களும் இந்த மன்றில் இல்லாத ஒரு சூழலில்தான், இன்றைய தினம் இந்த இடத்திலே இந்த விடயத்தைச் சொல்லவேண்டிய சூழ்நிலை ஏற்பட்டது.

அண்மையிலே நான் கிளிநொச்சி மாவட்டத்தினுடைய கண்டாவளைப் பிரதேச செயலகப் பிரிவுக்குட்பட்ட, கல்மடுநகர் கிராம அலுவலர் பிரிவிலுள்ள ரங்கன் குடியிருப்பு என்ற கிராமத்துக்குச் சென்றபொழுது, அங்கே இருக்கின்ற மக்களுடைய வாழ்க்கை காட்டுவாசிகளின் வாழ்க்கைபோல் இருப்பதைக் கண்டேன். அவர்களுக்குக் குடிப்பதற்கு நீர் இல்லை; குளிப்பதற்கு நீர் இல்லை; மின்சார வசதி இல்லை. அவர்கள் நாளாந்தம் தங்களுடைய வாழ்க்கைக்காகப் போராடுகின்ற ஒரு சூழலை அவதானிக்கக்கூடியதாக இருந்தது. பல தடவைகள் இதற்கான முயற்சிகள் மேற்கொள்ளப்பட்டிருக்கின்றன. பிறந்திருக்கின்ற இந்த வருட சித்திரை மாதத்திலிருந்து வரட்சியினுடைய கொடூரத்தை அந்த மக்கள் அனுபவித்தும்கூட, அவர்களுக்கு இதுவரை வரட்சி நிவாரணம் வழங்கப்படவில்லை. இது தொடர்பாக மாவட்ட அரசாங்க அதிபரால் அனர்த்த முகாமைத்துவ அமைச்சுக்கு அறிவிக்கப்பட்டிருக்கிறது; கடிதங்கள் அனுப்பப்பட்டிருக் கின்றன. அப்படியிருந்தும், இந்த மாவட்டத்தைச் சேர்ந்த பாதிக்கப்பட்ட மக்களுக்கு வரட்சி நிவாரணம் வழங்கப் படாதது ஒரு பாரிய குறைபாடாகும். இதனால், அந்த மக்கள் தங்களுடைய அன்றாட சீவியத்திற்கே அல்லற்படுகின்றார்கள்.

நான் அண்மையிலே பாரதிபுரம், மலையாளபுரம், விநாயகபுரம், கிருஷ்ணபுரம் போன்ற இடங்களிலே வாழ்கின்ற மக்களோடு பேசுகின்றபோது, அங்குள்ள மக்கள் எல்லோரு டைய கிணறுகளிலும் தண்ணீர் வற்றியிருக்கின்றது என்ற விடயம் தெரிய வந்தது. அத்துடன், அந்த மக்கள் குடிதண்ணீர் இல்லாமல் இருக்கின்ற நிலையிலே, அவர்களிருக்கின்ற காணிகளின் அயற்காணிகளிலே குளாய்க் கிணறுகளை அமைக்கின்றார்கள். அவ்வாறு குளாய்க் கிணறுகளை அமைக்கின்றபோது, அங்கிருக்கின்ற கிணறுகளி லேயிருக்கின்ற தண்ணீரும் கீழிறங்கிவிடுகின்றது. இதனால், அந்த மக்கள் இன்னுமின்னும் பாரியளவிலே குடிநீர்ப் பிரச்சினையை எதிர்கொள்கின்றார்கள். அங்கே போகின்ற இடங்களிலெல்லாம் குடிநீருக்காக அலைகின்ற மக்களைத் தான் அவதானிக்க முடிகின்றது. மிக முக்கியமாக கிளிநொச்சி மாவட்டத்தினுடைய பூநகரிப் பிரதேச செயலாளர் பிரிவு நீண்டகாலமாக அதிவரண்ட பிரதேசமாகக் காணப்படு கின்றது. இங்கு பூநகரி மற்றும் முழங்காவில் பிரதேசங்களுக் குட்பட்ட பல்வேறுபட்ட இடங்களிலும் மற்றும் வலைப்பாடு, பள்ளிக்குடா போன்ற இடங்களிலும் மக்கள் நீண்ட நாட்களாகக் குடிதண்ணீருக்காக அலைந்து திரிந்து, சொல்லொணாத் துன்பங்களை அனுபவிப்பதை அவதானிக்க முடிகின்றது. ஆனால், அரசாங்கம் இன்னும் அந்த மக்களுக்கு வரட்சி நிவாரணங்களை வழங்குவது தொடர்பில் ஓர் உறுதிமொழியைக் கூறவில்லை.

மேலும், அங்குள்ள இரணைமடுக் குளம் என்கின்ற பெரிய குளத்தில் கிட்டத்தட்ட 240 குடும்பங்களைச் சேர்ந்தவர்கள் நன்னீர் மீன்பிடித் தொழிலில் ஈடுபட்டு வந்தார்கள். ஆனால், இன்று அந்தக் குளத்திலே தண்ணீர் இல்லை. இதனால் அங்கு மீன்கள் இறந்து, மீன் இனப்பெருக்கமும் இடம்பெறுவதில்லை. இந்த நிலையில் இரணைமடுக் குளத்தில் நன்னீர் மீன்பிடியை நம்பியிருந்த சாந்தபுரம் பகுதியிலே வாழ்கின்ற பெரும்பாலான நன்னீர் மீன்பிடிக் குடும்பங்கள் பொருளாதார ரீதியாகப் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். ஆனால், இன்னும் அந்த மக்களுக்கு வரட்சி நிவாரணம் வழங்கப்படவில்லை. சுமார் நான்கு வருடங்கள் அங்கு தொடர்ந்து மழையில்லை; 2013 ஆம் ஆண்டிலிருந்து இயற்கை பொய்த்திருக்கின்றது. அதாவது கிளிநொச்சி மாவட்டத்தில் 2013 ஆம் ஆண்டு பெய்த மழைக்குப் பிற்பாடு 2014 - 2017 ஆம் ஆண்டு வரையுள்ள நான்கு ஆண்டுகளில் இயற்கையின் தாண்டவத்தினால் மழை கிடைக்காத காரணத்தினால், அங்குள்ள பல்வேறுபட்ட இடங்களிலும் மக்கள் குடிநீரில்லாமல் அலைகின்ற நிலைமையைப் பார்க்க முடிகின்றது.

நேற்றைய தினம் முல்லைத்தீவு மாவட்டத்தினுடைய அரசாங்க அதிபர் அவர்கள் பத்திரிகையாளர்களைச் சந்தித்த போது, அங்கு 8,000 இற்கும் மேற்பட்ட குடும்பங்கள் வரட்சியால் பாதிக்கப்பட்டிருக்கின்றன எனக் குறிப்பிட்டிருக் கின்றார். கிளிநொச்சி மாவட்டத்திலே 33,185 குடும்பங்களைச் சேர்ந்த 109,794 பேர் வரட்சியினால் கடுமையாகப் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். இவ்வாறு பாதிக்கப்பட்ட வர்களுக்கு நிவாரணம் வழங்குவதற்காக 80 மில்லியன் ரூபாய்க்கு மேல் நிதி வேண்டுமென்ற கடிதங்கள் சம்பந்தப்பட்ட அமைச்சுக்களுக்கு அனுப்பப்பட்டும்கூட, இன்றுவரை அந்த மக்களுக்கு எந்தவித நிவாரண உதவிகளும் கிடைக்கவில்லை; இந்த வரட்சியிலிருந்து மீள்வதற்கான வாய்ப்புக்கள் கிடைக்கவில்லை.

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

இயக்கச்சியிலேயிருக்கின்ற ஒரு நல்ல தண்ணீர்க் கிணற்றை இப்பொழுதும் இராணுவம் வைத்திருக்கின்றது. அதிலே அந்த ஊரைச் சார்ந்தவர்களோ அல்லது தண்ணீருக்காக அலைகின்ற வேறு மக்களோ குடிதண்ணீர் பெற முடியாது. ஆனால், அதிலேயிருந்து இராணுவம் தன்னுடைய தேவைக்காக ஒரு நாளைக்கு ஓரிலட்சம் லீற்றருக்கும் மேற்பட்ட தண்ணீரை வெளியிலே எடுத்துச் செல்கின்றது. இராணுவம் குடிதண்ணீர்க் கிணறுகளைத் தன்வசம் வைத்திருப்பதனால், அந்த மக்கள் தங்களுக்குரிய குடிதண்ணீர்க் கிணறுகளைப் பாவிக்க முடியாத நிலையிலே, அங்கு மக்கள் குடிதண்ணீருக்கு அலைகின்ற நிலைமை காணப்படுவதாகப் பச்சிலைப்பள்ளிப் பிரதேச சபைத் தவிசாளர் கௌரவ சுரேன் அவர்கள் வெளிப்படையாகவே குறிப்பிட்டிருக்கின்றார்.

அதேபோல், பூநகரிப் பிரதேச சபைக்குட்பட்ட பிரதேசத்தில் அரசபுரம் என்கின்ற ஒரு சிறிய கிராமம் இருக்கின்றது. அங்கே 32 குடும்பங்கள் வாழ்கின்றன. அவர்களுடைய காணிகளை மற்றும் தென்னந்தோட்டங்களை இராணுவம் இப்பொழுதும் தன்வசம் வைத்திருக்கின்றது. அந்த மக்களுடைய கண்களுக்கு முன்னாலேயே அவர்களுடைய சொந்தக் காணிகளிலிருக்கின்ற தென்னம் பிள்ளைகளிலுள்ள தேங்காய்களை இராணுவம் பறிக்கின்றது. அந்தத் தென்னந்தோட்டத்தையும் மற்றும் அங்கேயிருக்கின்ற குளம், நல்ல தண்ணீர்க் கிணறு போன்றவற்றையும் இராணுவம் தன்வசம் வைத்திருப்பதனால் மற்றும் இத்தகைய இராணுவப் பிரசன்னங்களால் அந்தக் கிராமத்திலே வாழ்கின்ற மக்கள் குடிப்பதற்குத் தண்ணீர் இல்லாமல் அலைகின்ற, அன்றாட சீவியத்திற்குக்கூட அல்லற்படுகின்ற சூழல் ஏற்பட்டிருக்கின்றது. இதனைப் பல தடவைகள் நாங்கள் குறிப்பிட்டுள்ள நிலையில், இந்த நாட்டிலே நல்லிணக்கம், தேசிய ஒற்றுமை பற்றிப் பேசப்பட்டுக் கொண்டிருக்கின்ற சூழலில், முழுமையான இராணுவத் தேவைகளுக்கான இராணுவ ஆக்கிரமிப்புக்களுக்கு மத்தியில், அந்த மக்கள் அங்கு குடிதண்ணீர் இல்லாமலும் தங்களுடைய உணவுக்காகவும் நாளாந்தம் அல்லற்படுகின்ற, வாழ முடியாமல் கஷ்டப்படுகின்ற நிலைமையை நாங்கள் பாரியளவிலே காணமுடிகின்றது.

தென்பகுதியிலே இயற்கை அழிவு வருகின்றபொழுது, அங்கு உடனடியாக அமைச்சர்கள் செல்கிறார்கள்; ஜனாதிபதி செல்கிறார்; பிரதமர் செல்கிறார். அந்த மக்களுக்கு நிவாரணம் வழங்கப்படுகின்றது. ஆனால், கடந்த நான்கு ஆண்டுகள் எமது பிரதேசத்தில் தொடர்ச்சியாக மழையில்லை. அதற்குப் பிற்பாடு அங்குள்ள மக்கள் கடந்த நான்கு மாதங்களாகக் கடும் வரட்சிக்கு மத்தியில் வாழ்கின்றார்கள். அங்கு குடிப்பதற்குக் கூடத் தண்ணீர் இல்லை. கிளிநொச்சி மாவட்ட அரசாங்க அதிபர் அனர்த்த முகாமைத்துவ அமைச்சிடம் கடந்த 7ஆம் மாதமே 200 தண்ணீர்த் தாங்கிகளைக் கேட்டிருக்கிறார். அவ்வாறு 200 தண்ணீர்த் தாங்கிகள் வேண்டுமென்று கேட்டபோது, 50 தண்ணீர்த் தாங்கிகள் மட்டுமே வழங்கப்பட்டிருக்கின்றன. அப்படியாயின், பெருமளவு பிரதேசத்தைக் கொண்ட இந்த மாவட்டத்திலே இருக்கின்ற குடிதண்ணீர்ப் பிரச்சினையை எவ்வாறு தீர்க்க முடியும்? அதேபோல, அங்கே இருக்கிற மக்களுக்கு உடனடி வரட்சி நிவாரணமாக 80 மில்லியன் ரூபாய்கு மேலான நிதி வேண்டுமென்று குறிப்பிட்டுக் கடிதம் அனுப்பியும்கூட, இன்றுவரை அவர்களுக்கான வரட்சி நிவாரணம் மற்றும் dry rations வழங்குவதற்கான எந்த நடவடிக்கைகளும் மேற்கொள்ளப்படவில்லை. அந்த மாவட்டத்திலே இருக்கின்ற 33,000 க்கும் மேற்பட்ட குடும்பங்களினது 109,000 க்கும் மேற்பட்ட மக்கள் வரட்சியினால் பாதிக்கப்பட்ட நிலையில் இன்று தெருவுக்கு வருகின்ற சூழலுக்கு தள்ளப்பட்டிருக்கின்றார்கள். குறிப்பாக, அந்த இடங்களிலே இருக்கின்ற ஒவ்வொரு கிராமத்து மக்களுடைய நிலைமையையும் உரிய அமைச்சு கவனத்திலே எடுக்க வேண்டுமென்று நான் இந்த உயரிய சபையினூடாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். வரட்சியென்பது வெறுமனே ஒரு பேசு பொருளாக இருக்கலாம். ஆனால், அதனால் பாதிக்கப்பட்டு அன்றாடம் குடிநீருக்காக அலைகின்ற, தங்களுடைய நாளாந்தச் சீவியத்திற்காகக் கஷ்டப்படுகின்ற மக்களுடைய நிலைமை மிக மோசமானது. அதேநேரம் இதனால் தோற்று நோய்கள் ஏற்படுகின்ற வாய்ப்புக்கள் அதிகரித்திருக்கின்றன.

அண்மையிலே பிரபந்தனாறு, புன்னை நீராவி, கண்ணகிநகர் ஆகிய கிராமங்களுக்குச் சென்று அந்த மக்களை நான் சந்தித்தபொழுது, ஏற்கனவே குடிநீருக்காக அலைந்திராத அந்த மக்கள், இப்பொழுது குடிப்பதற்குத் தண்ணீர் இல்லாமல், குளிப்பதற்குத் தண்ணீர் இல்லாமல் நாளாந்தம் மிகக் கூடியளவான நெருக்கடியைச் சந்திப்பதை அவதானித்தேன். கண்ணகிநகர் கிராமத்திலே உள்ள தண்ணீர் அழுக்கடைந்த நிலையில் காணப்படுகின்றது. அந்த நீரில் உவர்த்தன்மை, சவர்த்தன்மை காணப்படுவதால் மக்கள் தங்களுடைய அன்றாடக் குடிநீர்த் தேவைக்காகக் கஷ்டப்படுகின்றார்கள்; அந்த நீரைக் குடிக்க முடியாத ஒரு சூழலுக்குள் தள்ளப்படுகின்றார்கள். ஆகவே, பாரியளவான இந்தத் தண்ணீர்ப் பிரச்சினைக்குத் தீர்வு காணுவதற்கு அனர்த்த முகாமைத்துவ அமைச்சு உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டும். வெறுமனே கைவிடப்பட்ட ஒரு பிரதேசமாக அல்லது கேட்பார் இல்லாத ஓர் இடமாக அந்த இடம் மாறியிருப்பதை வேதனையோடு நான் இந்த இடத்திலே பதிவு செய்ய விரும்புகிறேன். இன்று இந்த நாட்டிலே மிக முக்கிய பிரச்சினையாக இருக்கின்ற வரட்சியின் காரணமாக விவசாயிகள், நன்னீர் மீன்பிடிப்பாளர்களென்று பலரும் பாதிக்கப்பட்டிருக்கிறார்கள்; கால்நடைகளும் பாதிக்கப் பட்டிருக்கின்றன. இந்தப் பாதிப்புக்களுக்கு அரசாங்கம் உடனடி நிவாரணம் வழங்கவேண்டும் என்பதையும் நான் இந்த இடத்திலே குறிப்பிடுகின்றேன்.

இந்த நாட்டிலே இருக்கின்ற தமிழ் அரசியல் கைதிகள் அனுராதபுர சிறைச்சாலையிலே 4 நாட்களாக உண்ணாவிரதப் போராட்டத்தை மேற்கொண்டிருக்கின்றார்கள். நான் இன்றைய ஒரு பத்திரிகையிலே கௌரவ அமைச்சர் சம்பிக ரணவக்க அவர்கள் குறிப்பிட்டிருந்த ஒரு செய்தியைப் படித்தேன். அதாவது 12,000 விடுதலைப் புலிகளை புனர்வாழ்வளித்து விடுவித்த அரசாங்கம், 60 தமிழ் அரசியல் கைதிகளுக்கு நிபந்தனையற்ற முறையில் பொதுமன்னிப்பு வழங்கி ஏன் அவர்களை விடுவிக்கக்கூடாதென்ற சிந்தனையில் அவர் பேசியிருக்கிறார். அவருக்கு ஏற்பட்டிருக்கின்ற சிந்தனைபோல, ஜனாதிபதிக்கும் பிரதமருக்கும் ஏன் சிந்தனை வரவில்லை? இந்த நாட்டிலே நீங்கள் விடுதலைப் புலிகளென்று 12,000 பேரைப் புனர்வாழ்வளித்து விடுவித்திருக்கிறீர்கள். ஒன்றில் தங்களுக்குப் புனர்வாழ்வளித்து தங்களை விடுதலை செய்யுங்கள் அல்லது பொதுமன்னிப்பின் அடிப்படையில் தங்களை விடுதலை செய்யுங்களென்று அந்த அரசியல் கைதிகள் கேட்கிறார்கள். குற்றம் செய்தவர்கள் யாரோ இருக்க, குற்றமற்றவர்களாக இருக்கும் இவர்கள் ஒவ்வொரு வழக்குக்காகவும் கொண்டு செல்லப்பட்டு வருடக்கணக்கிலே சிறையிலே அடைக்கப்பட்டிருக்கிறார்கள். இந்த அரசியல் கைதிகளுடைய விடுதலையை அரசாங்கம் துரிதப்படுத்த வேண்டும். இவர்களைச் சிறையிலடைப்பது நியாயமற்ற

செயலாகவே நீண்டு கொண்டிருக்கிறது. அறுபதுக்கும் மேற்பட்ட இந்த தமிழ் அரசியல் கைதிகளுடைய விடயமானது அரசாங்கத்தினுடைய கண்களுக்குத் தெரியாத ஒரு விடயமல்ல. ஆனால், இவர்களைத் தொடர்ந்தும் வதைக்க வேண்டுமென்று அரசாங்கம் வேண்டுமென்றே செயற்படுவதாக எமக்குத் தோன்றுகிறது. இந்த நாட்டிலே இவ்வாறு அந்த அரசியல் கைதிகள் சிறையிலிருந்துகொண்டு தொடர்ந்தும் போராட்டம் நடத்துகின்ற சூழலை உருவாக்கிவிட்டு, நல்லிணக்கம் பேசுவதிலும் தேசிய ஒருமைப்பாடு பற்றி பேசுவதிலும் எந்தவிதமான பயனும் ஏற்படப் போவதில்லை. ஆகவே, இந்தத் தமிழ் அரசியல் கைதிகளுடைய விடுதலையை அரசாங்கம் துரிதப்படுத்த வேண்டும். இவர்கள் தொடர்ந்தும் இவ்வாறு உண்ணாவிரதம் இருப்பதும், அரசாங்கம் பொய் வாக்குறுதி களை வழங்குவதும், அவர்கள் உண்ணாவிரதங்களை நிறுத்துவதுமாக இல்லாமல் அந்த அரசியல் கைதிகளுடைய விடுதலையில் அவசரமானதும் தீர்க்கமானதுமான ஒரு முடிவை அரசாங்கம் உடனடியாக எடுக்கவேண்டும். அது நீதியானதாக, நியாயமானதாக இருக்க வேண்டும்; பாதிக்கப்பட்டவர் களுடைய குடும்பங்கள் நிம்மதி பெற வேண்டும். ஆகவே, இந்த அரசாங்கம் அரசியல் கைதிகள்மீதான இந்தப் பிரச்சினைக்கு ஓர் உடனடித் தீர்வைக் காண வேண்டுமென்பதை இந்த இடத்திலே நான் வலியுறுத்துகிறேன்.

இந்த நாட்டிலே தொடர்ந்தும் பிரச்சினைகள் ஏற்பட்டுக் கொண்டுதான் இருக்கின்றன; பிரச்சினைகள் தீர்ந்தபாடில்லை. இந்த நிலையில் யுத்தத்தை முடித்தவர்கள் வெற்றிக் கொண்டாட்டங்களை நடாத்துகின்றார்கள்; நினைவுச் சின்னங்களை அமைத்து வைத்திருக்கிறார்கள். அதனை வைத்துக்கொண்டு அவர்கள் வீரம் பேசுகின்றார்களே தவிர, இந்த நாட்டிலே தீரவேண்டிய பிரச்சினையைத் தீர்ப்பதற்கான எந்த நடவடிக்கைகளிலும் இன்னும் சரியான முன்னேற் றத்தைக் காணவில்லை. போகவேண்டிய தூரம் இன்னும் அதிகமாகவே இருக்கின்றது. அந்தத் தூரத்தை அளவிட முடியாமல் இருக்கிறது. இந்த நிலையில் அரசியல் கைதி களுடைய போராட்டம், வலிந்து காணாமல் ஆக்கப்பட்டவர்களுடைய உறவினர்களின் போராட்டம், காணி களுக்கு போகவேண்டிய மக்களுடைய போராட்டமென்று இந்த நாட்டிலே இன்னுமின்னும் போராட்டங்கள் அதிகரித்துக் கொண்டே செல்கின்றன. ஆகவே, இதிலொரு மாற்றம் வேண்டும். இந்த மாற்றத்தை ஏற்படுத்துவதற்கு அரசாங்கம் முதற்கட்டமாக நல்லிணக்கத்தை வெளிப்படுத்த வேண்டும். வெறுமனே வார்த்தைகளால் மட்டும் நல்லிணக்கம் பேசுவது அல்லது தேசிய ஒருமைப்பாடு பற்றிப் பேசுவதிலே எந்த நியாயங்களும் இந்த நாட்டிலே ஏற்படப் போவதில்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்களிலே உண்ணாவிரதம் இருக்கின்ற அந்த அரசில் கைதி களுடைய மனவேதனைகளையும், அவர்களுடைய குடும்பத் தினர்கள் படுகின்ற வேதனைகளையும் கருத்திலே கொண்டு அந்த அரசியல் கைதிகளின் விடுதலையை பொதுமன்னிப்பின் அடிப்படையிலோ அல்லது புனர்வாழ்வின் அடிப்படையிலோ உடனடியாக மேற்கொள்வதற்கு அரசாங்கம் முனைய வேண்டுமென்று அந்தக் குடும்பத்தினர்கள் சார்பாகவும் அரசியல் போராட்டம் நடத்துகின்ற அந்தத் தமிழ் அரசியல் கைதிகள் சார்பாகவும் நான் விநயமாகக் கேட்கிறேன். இல்லையென்றால், இந்த அரசாங்கம் மாற்றாந்தாய் மனப்பான்மையுடன் தமிழர்களை நடாத்தி, அவர்களை ஏதோ ஓர் இன ரீதியான குரோதத்திற்குள் வைத்திருக்கின்றது என்ற நிலையைத்தான் அது உணர்த்துகின்றது. அந்த உணர்வுகள் தொடர்ந்தும் தமிழர்களிடம் வளராமல் இருக்கவேண்டு மானால், இனக்குரோதங்கள் வளர்ந்து செல்லக் கூடாதென்றால், இன ரீதியான வேறுபாடுகள் இருக்கக் கூடாதென்றால், இந்த அரசியல் கைதிகளை விடுதலை செய்வதில் அரசாங்கம் உடனடியாகச் செயற்பட வேண்டுமென்று வலியுறுத்தி என்னுடைய உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කනක හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. KANAKA HERATH *left the Chair, and* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *took the Chair.*

[අ.භා. 4.43]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙන, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය සඳහා වන ඇතැම් රීති එක් කිරීම සඳහා වන සම්මුතිය බලාත්මක කිරීම පිණිස වූ මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඔබතුමිය මූලාසනයේ ඉන්න වෙලාවේ කථා කිරීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. ඒ වාගේම අපේ දිස්ත්‍රික්කයේ විශාල වැඩ කොටසක් කරන, වර්තමාන යහපාලන ආණ්ඩුව තුළ ඉන්න අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැනත් මා සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම අමාත්‍යාංශය විශාල අභියෝගයකට ලක් වුණු අමාත්‍යාංශයක්. අද වන විට කළු ඇටයේ ඉඳන් හදන්න වෙලා තිබෙන අමාත්‍යාංශයක්. මම දන්නවා, විශාල වැඩ කොටසක් කළ අපේ ගරු ඇමතිතුමාට ඒ අභියෝගය ලෙහෙසි, පහසු අභියෝගයක් බව.

අද මේ ගුවන් සේවයේ දෙන ආහාර පාන පවා පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත් වුණේ ඇයි කියන කාරණය අපටත් ප්‍රශ්නයක්. රටේ නායකයා මේ පිළිබඳව දන්වනතුරු කිසි කෙනෙක් ඒ ගැන දැනුම් දුන්නේ නැහැ. ඒ අදාළ කටයුතු කරන නිලධාරීන් පිළිබඳව වග කිව යුතු තීන්දු තීරණ ගත යුතුයි. මොකද, ගරු ඇමතිතුමනි, ඔබතුමා සහ අපි අද ගෙනයන මේ වැඩ පිළිවෙළ අපටම විවේචනය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ, අපේ තිබෙන

[ගරු චමින්ද විජේසිරි මහතා]

සමහර දුර්වලතාවන් නිසායි. අපි මේවා ගැන කථා කරමු, මේවාට විසඳුම් සොයමු. ඒ විසඳුම් තුළින් රටක් හැටියට අපේ රටේ කීර්ති නාමය ආරක්ෂා කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපි නිර්මාණය කරන්න ඕනෑ.

මා සතුටු වෙනවා, මේ යහපාලන ආණ්ඩුව තුළ හොඳ, නරක සියල්ල කථා කරන්න පුළුවන් වටපිටාවක් ගොඩ නඟා තිබීම පිළිබඳව. එදා එහෙම තිබුණේ නැහැ. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේත් එදා පැවැති ආණ්ඩුව තුළ හිටියා. නමුත්, එදා තීන්දු, තීරණ ගන්න විට ඔබතුමාටවත් "ඒක වැරදියි", "ඒක කරන්න එපා" කියන කාරණය කියන්න පුළුවන් තත්ත්වයක් තිබුණේ නැහැ. ඔබතුමාම ඒකට සාක්ෂි දරාවි; උදාහරණ සපයාවි. මා මේ වෙලාවේ ඒකට අවස්ථාවක් ගන්නේ නැහැ. නමුත්, එවන් යුගයක එවන් අමිහිරි අත්දැකීම් එක්ක ඒවා නිවැරදි කරමින් යන ගමනක අද අපි ඉන්නවා. ගුවන් සේවය කියන්නේ, ජාත්‍යන්තර වශයෙන් රටවල් තුළ සංවර්ධනය මනින මිනුම් දණ්ඩක්. ගරු ඇමතිතුමනි, මේ ගුවන් සේවය වැටෙන්න, අඩපණ වෙන්න, කඩා වට්ටන්න කටයුතු කරනවායි කියන කාරණය පිළිබඳව අපට ඇහිල්ල දිගු කරන උදවියට පෙන්වා දෙන්න ඕනෑ ඔබතුමා මොනවාද කළේ කියන එක. තිබුණු සම්පත රැක ගන්න, සංවර්ධනය කරන්න බැරිව රටට ලෝකයට සංවර්ධනය පෙන්වන්න කටයුතු කිරීම තුළ, තමන්ගේ ආණ්ඩුව, නායකත්වය ආරක්ෂා කරන්න, ඒ වාගේම ඒ දේශපාලන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න කටයුතු කිරීම තුළ එදා මේ රටේ සමස්ත ජනතාව අසරණ කළා. ඒකේ ප්‍රතිවිපාක තමයි අද අපි මේ විඳින්නේ. මේ ගුවන් සේවය තුළ තිබුණු ඒ අඩු පාඩු ගොඩ නඟමින් යනවාට එහා ගිය වැඩ පිළිවෙළක් අද වන විට නිර්මාණය කර තිබෙනවා.

අපි අද දකිනවා, මත්තල ගුවන් තොටුපොළ සම්බන්ධයෙන් තිබෙන වැඩ පිළිවෙළ. ගරු ඇමතිතුමා රාජ්‍යයන් කිහිපයක් එක්කම කථා කරලා, ඉන්දියාවත් එක්ක එය සම්බන්ධ කරලා රටට ඵලදායී වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා. රටේ අනාගතයට මෙය යොදවා ගන්නේ කෙසේද කියන කාරණය ගැන අවධානය යොමු කර තිබෙනවා. එය ගරු ඇමතිතුමා ගත්ත හොඳ ප්‍රවේශයක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා හැමදාම කියනවා, කවුරු මොනවා කිව්වත් මේ ගුවන් තොටු පොළ කාටවත් සින්නක්කර අයිතියට දෙන්න කටයුතු කරන්නේ නැහැ කියන එක. ඒක ඔබතුමාගේ අභිමානවත් ප්‍රකාශයක් කියන එක අපි මේ වෙලාවේ මතක් කරනවා. ඔබේ දේශපාලන ඉතිහාසය තුළ ඔබතුමා එවැනි කටයුතුවලට පෙලඹුණේ නැහැ. නමුත්, මා කලිනුත් සඳහන් කළා වාගේ ඔබතුමාට බාධා තිබුණා. අදත් ඔබතුමාට බාධා තිබෙනවා නම් ඒවා සියල්ල හෙළි කරමින් රටට සහ රටේ ජනතාවට වග කිව යුතු ඇමතිවරයකු හැටියට මේ කටයුතු ඉදිරියට ගෙන යන්නය කියා අපි ඉල්ලීමක් කරනවා.

පසුගිය කාලය තුළ ඉදිරිපත් කළ අය වැය වාර්තා තුළ, ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කය ඇතුළු ඌව පළාතට අභ්‍යන්තර ගුවන් තොටුපොළක තිබෙන අවශ්‍යතාව ගැන අන්තර්ගත වුණා.

හැබැයි, මේ කටයුත්ත සිද්ධ වෙන්නේ මන්දගාමීව. මෙය ඉටු වෙයිද, නැද්ද කියන කාරණය අපට පැහැදිලි නැහැ, ගරු ඇමතිතුමනි. ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයටත්, රටටත් ඵලදායී ආයෝජනයක් වන අභ්‍යන්තර ගුවන් තොටුපොළක අවශ්‍යතාව තිබෙනවා. විශේෂයෙන්ම මෙම අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා හැටියට ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙනුත්, රට වෙනුවෙනුත් එම අභ්‍යන්තර ගුවන් තොටුපොළේ කටයුතු ඉතා ඉක්මනින් නිම කර දෙයි කියා අපි බලාපොරොත්තු වනවා. අපේ ප්‍රදේශයේ ජනතාවගේත්, රටේ ජනතාවගේත් ඒ බලාපොරොත්තුව සඵල කරන්න ඔබතුමාට ශක්තිය හා ධෛර්ය ලැබෙවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු ඇමතිතුමනි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිවරු විධියට ඔබතුමාත් මාත් කටයුතු කරනවා. එහිදී මේ ව්‍යාපෘති ගැන සාකච්ඡා කරද්දී සමහර වෙලාවට කරුණු නැහැ; මේ කටයුතු සිද්ධ වෙනවාද නැද්ද කියන්න කරුණු නැහැ. හැබැයි, අපි පසුගිය කාලයේ දැක්කා, මේ කටයුත්ත සඳහා අපේ ප්‍රදේශයේ භූමි භාග පරීක්ෂා කළ බව හා නිරීක්ෂණය කළ බව. ඒ පරීක්ෂණ හා නිරීක්ෂණය කිරීම් අනුව මෙය යථාර්ථයක් බවට පරිවර්තනය වෙන්නේ කවදාද කියලා අපි දකින්නට ආසයි. මොකද, අපි ඒ පළාත නියෝජනය කරන මන්ත්‍රීවරු මෙන්ම, පුරවැසියන් නිසා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(*மாண்புமிகு நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala De Silva)

ගරු මන්ත්‍රීතුමනි, බණ්ඩාරවෙල ගුවන් තොටුපොළ පිළිබඳව කැබිනට් සංදේශය ඉදිරිපත් කරලා ඒකට අවසර ගන්න අවස්ථාවේ භාණ්ඩාගාරයෙන් මට නියෝග කළා, මේ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් කරන්න කියලා. දැනට සිවිල් ගුවන් සේවා අධිකාරිය මඟින් ඒ ශක්‍යතා අධ්‍යයනය කරගෙන යනවා. ඒ ශක්‍යතා අධ්‍යයනයෙන් ඒ කටයුතු යහපත් යැයි හැඟුණොත් අපට ඒ ගුවන් තොටුපොළ හදන්න පුළුවන්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

ස්තුතියි, ගරු ඇමතිතුමනි. විශේෂයෙන්ම අය වැය ලේඛනයකට මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරන්නට ඇත්තේ අවශ්‍යතාව, ප්‍රමුඛතාව සහ රටට ඵලදායී කියන කාරණයත් එක්කයි. ගරු ඇමතිතුමනි, එය කඳුකර ප්‍රදේශයක්. ඒ වාගේම මීදුමෙන් පිරිච්ච ප්‍රදේශයක්. ඒ නිසා ඒ කටයුතුවලදී වැඩි පිරිවැයක් වැය වෙන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. නමුත්, ඒ පිරිවැය ගැන බලන්නට එපා. මොකද, විශේෂයෙන්ම නුවරඑළිය, බදුල්ල හා ඇල්ල කියන ප්‍රදේශවලට දෙස් - විදෙස් සංචාරකයන් වැඩි ප්‍රමාණයක් එන නිසා. අපේ රටට එන ඒ විදෙස් සංචාරකයන්ට එක් දිනකදී අපේ රටේ සංචාරය කරන්න පුළුවන් වැඩ පිළිවෙළක අවශ්‍යතාව තමයි මම හිතන හැටියට මේ අභ්‍යන්තර ගුවන් තොටුපොළ කියන කාරණයෙන් මතු වුණේ. එහෙම නැතුව ඔබතුමාට හෝ මට කොළඹට එන්න හෝ ඔබතුමාට හෝ මට විදේශ රටවලට යන්න පහසුව සපයාගන්න නොවෙයි. ඒ නිසා මේ සඳහා වන පිරිවැය පිළිබඳව කල්පනා කරන්නේ නැතුව රටේ අනාගතය වෙනුවෙන්, රටේ සංවර්ධනය කළ යුතු ප්‍රදේශ හඳුනාගෙන ඒවාට මූලිකත්වය දිය යුතුයි කියන යෝජනාව මා මේ වෙලාවේ කරනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා රට වෙනුවෙන් අපේ ප්‍රදේශයට ඒ අවස්ථාව ලබා ගන්න කියන කාරණය මා මතක් කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අලුත් වැඩ පිළිවෙළකට යන්න අවශ්‍ය කරන රීති මාලාව දැන් හදලා තිබෙනවා. ඒ රීති මාලාව තුළ ගුවන් මගියා හා ගුවනින් ප්‍රවාහනය කරන භාණ්ඩ සුරක්ෂිතව ප්‍රවාහනය කරනවා වාගේම, ඒවාට තිබෙන වගකීම සහ ඒ පාර්ශ්ව ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් වැඩ පිළිවෙළක් ගෙන තිබීම ගැනත් මගේ ප්‍රශංසාව මේ වෙලාවේ පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ රාජ්‍ය දේපළ, මහ ජනතාවගේ දේපළ අයථා විධියට පාවිච්චි කරමින් හා ඒවා මේ රටේ ජනතාවට අහිමි කරන්නට උත්සාහ දරපු කණ්ඩායමේ බොහෝ දෙනෙකු අද අපට ඇහිල්ල දික් කරනවා. ඒ ගැන අපේ

මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් අද කථා කළා. මටත් ඒ ප්‍රශ්නය තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය කාලයේ මේ ගුවන් තොටුපොළ වෙනුවෙන් ආයෝජනය කර, එය ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ හදනකොට සමහර කණ්ඩායම් කළු කොඩි දාලා මේ රටේ ජනතාවගේ හදවතට කාවද්දන්න ගත්ත, මවන්න ගත්ත බොහෝ දේවල් පුස්සක් බව අද අපට පෙනෙනවා. අපි දැක්කා හිටපු ජනාධිපතිතුමා ප්‍රමුඛ එතුමාගේ කණ්ඩායම ඊයේ-පෙරේදා ඉන්දියාවට ගිහිල්ලා එතුමන්ලා විසින් කරන සියලු දේවල් හොඳයි, ඒවා යහපත් කියන කාරණය සමාජයට පෙන්වන්න උත්සාහ ගත් බව. එවැනි විහිළු සපයන්න එපා කියලා අපි ඔවුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඔවුන් පසුගිය දවස්වල බැලුවා විශාල බලවේගයක් ගෙනැල්ලා ආණ්ඩුව පෙරළන්න. දැන් අපි දකිනවා, ජාත්‍යන්තරයෙන් උදවු අරගෙන, ජාත්‍යන්තර වශයෙන් කුමන්ත්‍රණ කරලා, මේ ආණ්ඩුව පෙරළන්න උත්සාහ දරන බව.

අපි අද දැක්කා, අපේ ගුවන් සේවය යහපත් මහක ගෙන යන්න පුළුවන් වැඩ පිළිවෙළක අවශ්‍යතාව හා ඒ අවශ්‍ය වැඩ පිළිවෙළ නිර්මාණය වෙලා තිබෙන බව. ඒ වාගේම ගරු ඇමතිතුමනි, අපේ කටුනායක ගුවන් තොටුපළේ ධාවන පථය පුළුල් කිරීම හරහා විශාල ගුවන් යානාවලට සහ ගුවන් යානා රැසකට එන්න පුළුවන් අවකාශය සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ ඔබතුමා නිර්මාණය කළා. ඒ වාගේම, මත්තල ගුවන් තොටුපොළත් ඉතා ඉක්මනින් මේ රටේ එලදායී ව්‍යාපෘතියක් බවට පත් කර, අනාගත පරපුරට එහි එල ප්‍රයෝජනය ලබා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න ඔබතුමාට ශක්තිය හා ධෛර්ය ලැබෙවායි කියා ප්‍රාර්ථනා කරමින්, මට කථා කරන්න මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි. මීළඟට, ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.53]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා ගරු අමාත්‍යතුමා දෙවැනිවර කියවීම සඳහා ඉදිරිපත් කරපු ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත වාගේම අද දින ඉදිරිපත් කළ නියෝග ඉතා වටිනවාය කියන කාරණය මා මුලින්ම කියන්නට ඕනෑ. මෙය, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය යාවත්කාලීන කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක්. විපක්ෂය හැටියට -ඒකාබද්ධ විපක්ෂය හැටියට- ඒ සම්බන්ධයෙන් අපේ කිසිම ප්‍රශ්නයක් නැහැ.

ගරු අමාත්‍යතුමනි, මට තමුන්නාන්සේගෙන් අහන්න ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. එකක් තමයි, විශේෂයෙන්ම මේ රටේ මේ ක්ෂේත්‍රය හා සම්බන්ධ Flight Information Region එක ඉන්දියාවට දෙනවාය කියන කාරණය. මේ ක්ෂේත්‍රයේ සිටින අය තුළ ඒ සම්බන්ධව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, එහෙම තත්ත්වයක් තිබෙනවාද කියලා තමුන්නාන්සේගේ පිළිතුරු කථාවේදී දැන ගන්න මා කැමැතියි.

ගුවන් තොටුපොළ ආරක්ෂක සේවය ගැනත් මට දැන ගන්න අවශ්‍යයි. ගුවන් තොටුපොළ ආරක්ෂක සේවය පෞද්ගලිකකරණය කරනවාද කියන කාරණයටත්, කටුනායක ගුවන් තොටුපොළ පුළුල් කරන්න බලාපොරොත්තු වෙනවා නම් ඒ සඳහා ඉඩ සොයා ගන්නේ කොහොමද කියන කාරණයටත් මම ඔබතුමාගෙන් පැහැදිලි පිළිතුරක් අපේක්ෂා කරනවා.

ගරු අමාත්‍යතුමනි, ඊළඟට මම තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්නේ වෙනත් ප්‍රධාන කාරණාවකට. ඒ තමයි, මේ රටේ බිහි වන ගුවන් නියමුවන් පිළිබඳ කාරණාව. අතීතයේ නම් සල්ලිකාර -ධනවත්- පවුල්වල අය පිට රටවලට ගිහිල්ලා private pilot licence එක, commercial pilot licence එක, එහෙම නැත්නම් ATPL එක අරගෙන pilotsලා වුණා. ඒ කාලයේ එහෙම තමයි pilotsලා බිහි වුණේ. හැබැයි, පසුගිය කාලයේ විශේෂයෙන්ම අපේ රටේ සාමාන්‍ය පවුල්වල දෙමව්පියන් පවා තමන්ගේ ආදරණීය දරුවන්ගේ ඉල්ලීම අනුව -මේ ක්ෂේත්‍රය තුළින් ඉහළට යන්න පුළුවන් කියන කාරණය හිතේ තබා ගෙන- සමහර වේලාවට ගෙවල් දොරවල් උකස් තබා හෝ තමන් ඉතුරු කරගත් මිල මුදලක් යොදවා හෝ ඒ දරුවන් මේ ක්ෂේත්‍රයට යොමු කළා. සමහර අය පිට රටවලට ගිහිල්ලා දෙමව්පියන්ගේ ඒ මුදල්වලින් ඉගෙන ගෙන ආවා. සමහර අය මෙහේ තිබෙන ආයතනවලින් ඉගෙන ගත්තා. ගරු ඇමතිතුමනි, එහෙම ඉගෙන ගත්ත අයට, ඒ වාගේ licences ගත්ත අයට, ගුවන් නියමුවන් හැටියට පුහුණු වුණු අයට, ප්‍රායෝගික පුහුණුව ලැබූ අයට ඊළඟට තිබෙන අභියෝගය තමයි රස්සාවක් සොයා ගන්නා එක. ගරු අමාත්‍යතුමනි, මම හිතන විධියට අද වනවිට ගුවන් නියමුවන්ට රස්සාවක් සොයා ගන්නවාය කියන එක ඉතාම අමාරු කාර්යයක් වෙලා තිබෙනවා. මොකද, අද වනවිට ශ්‍රී ලන්කන් ගුවන් සේවය විතරයි මේ රටේ ජාතික ගුවන් සේවය විධියට තිබෙන්නේ. එයට සාමාන්‍යයෙන් අවුරුද්දකට 10 දෙනෙකු විතර වාගේ තමයි බඳවා ගන්නේ. ගරු අමාත්‍යතුමනි, මේ වේලාවේදී මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, අද ශ්‍රී ලන්කන් ගුවන් සේවයත් එහි රක්ෂාවලට විදේශිකයන් බඳවා ගන්නවාය කියන කාරණයත්. අපේ රටේ අත්දැකීම් තිබෙන, අපේ රටේ මේ සම්බන්ධයෙන් පළපුරුද්ද තිබෙන ගුවන් නියමුවන් සිටියදීත්, එහෙම නැත්නම් අලුත් -තරුණ- අය කැඩෙට් නිලධාරීන් හැටියට බඳවා ගෙන පුහුණු කරලා ඒ අය ගුවන් නියමුවන් හැටියට බඳවා ගැනීමට අවස්ථාව තිබියදීත් ඒ අයට අවස්ථාව දෙන්නේ නැතුව අද මේ ආණ්ඩුව විදේශිකයන් ගුවන් නියමුවන් හැටියට ශ්‍රී ලන්කන් ගුවන් සේවයට බඳවා ගෙන කටයුතු කිරීම ගැන මට පුදුම හිතෙනවා.

ඊළඟට, මේ ක්ෂේත්‍රයට ආයෝජකයන් සොයන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, ඒ කටයුතු විවෘත කරන්න. ශ්‍රීලන්කන් ගුවන් සේවයට මේ ඒකාධිකාරිය පවත්වා ගෙන යන්න දෙන්න එපා. මාත් අවුරුදු 20කට වැඩි කාලයක් ශ්‍රීලන්කන් ගුවන් සේවයේ වැඩ කරපු කෙනෙක්. නමුත් මේ ඒකාධිකාරිය විසින් වෙනත් ගුවන් සේවාවලට තරගකාරිත්වයක් තුළින් මේ රටේ මේ ක්ෂේත්‍රයට එන්න ඉඩ දෙන්නේ නැහැ. එහෙම එන්නේ නැති වුණාම, තරගකාරිත්වයක් ඇති වෙන්නේ නැහැ. අඩුම ගණනේ budget airlinesවලට හෝ එන්න ඉඩ දෙන්න. අපි දන්නවා, තිබුණු budget airline එක -මිහින් ලංකා ගුවන් සමාගම- පවා වසා දැමූ බව. අපේ රට තුළ ගුවන් සේවා අලුතින් ඇති වෙන්නේ නැතිනම්, අලුත් අයට එන්න දෙන්නේත් නැතිනම් අඩු ගණනේ මේ අයට රක්ෂාවක් දෙන්න අවස්ථාවක් ඇති වෙන්නේත් නැහැ. ඒ නිසා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය හා සිවිල් ගුවන් සේවා අධිකාරිය මේ සම්බන්ධයෙන් වැඩ කටයුතු කරන්න ඕනෑ. ඒ අයට -අලුත් ගුවන් සේවාවලට- එන්න දෙන්න. අඩුම ගණනේ budget airlinesවලට හෝ ඇවිල්ලා මේ තරගකාරිත්වය ඇති කරන්න ඉඩ දෙන්න. මේ ඒකාධිකාරය පවත්වා ගෙන යන්න දෙන්න එපා. එහෙම වුණොත් තමයි අලුතින් එන අයට රක්ෂා දෙන්න හෝ පුළුවන් වන්නේ. මේක අද අදෝනාවක් වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම හිතන විධියට අද වනවිට මේ රටේ ගුවන් නියමුවන් හැටියට පුහුණු වුණු අය දෙතුන්දහසක් පමණ ඉන්නවා, රක්ෂාවක් නැතුව.

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

සමහර අය දෙමව්පියන්ගේ මුදල් ලක්ෂ ගණන් වියදම් කරලා අද ගෙවල්වලට වෙලා ඉන්නවා. සමහර අයට රැකියා නැහැ. සමහර අය කුඩා රැකියාවක් කරනවා. මොනවා හරි රැකියාවක් කරනවා. මේ සියලු දෙනා සම්බන්ධ කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ.

ගරු අමාත්‍යතුමනි, අපි අවුරුදු තිහක යුද්ධයක් කරපු ජාතියක්. අපි දන්නවා, මේ රටේ ගුවන් හමුදාව යුද්ධය කරන්න දැවැන්ත ශක්තියක් දුන් බව. අපේ ගුවන් හමුදාව තුළ ගුවන් නියමුවන් ඉන්නවා. ගුවන් පැයවලට අපි සාමාන්‍යයෙන් කියනවා, flying hours කියලා. යුද සමයේ ගුවන් පැය 2,500ක්, 3,000ක්, 4,000ක් වැඩ කරපු අය ඉන්නවා. ඒ අය අද ශ්‍රීලන්කන් ගුවන් සේවයට බඳවා ගන්නකොට සම්පූර්ණයෙන් දක්වන්නේ කුඩම්මාගේ සැලකිලි. අද ඒ ගුවන් නියමුවන්ට සාමාන්‍ය කැඩෙට් නිලධාරීන් විධියට තමයි එන්න වෙලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් ගුවන් පැය 100ක්, 200ක් පමණ තිබෙන කැඩෙට් නිලධාරීන් එක්ක තමයි ඒ අයවත් බඳවා ගන්නේ. ඉන්දියාව ගත්තොත්, සාමාන්‍යයෙන් ඉන්දියාවේ ගුවන් හමුදා නිලධාරියෙක් සිවිල් ගුවන් සේවාවට එකතු වෙනකොට, නැත්නම් ඉන්දියාවේ තිබෙන ජාතික ගුවන් සේවාවට එකතු වෙනකොට ඒ අයට ගුවන් පැය 400ක්, 500ක් තිබෙනවා නම්, ඒ අය captain කෙනෙක් වෙනවා. හැබැයි, ගුවන් පැය තුන්හාරදහසක් තිබෙන අපේ ගුවන් හමුදා නිලධාරියෙක් ශ්‍රීලන්කන් ගුවන් සේවාවට ඇවිල්ලා captain කෙනෙක් වෙන්න නම්, අඩුම ගණනේ තව අවුරුදු හයක්, හතක් බලාගෙන ඉන්න ඕනෑ, සාමාන්‍ය කැඩෙට් නිලධාරීන් එක්ක ඒ විධියේ ගමනක් යන්න. මම හිතන විධියට විශේෂයෙන් ගුවන් නියමුවන් බඳවා ගැනීමේ දී ජාතික ගුවන් සේවයේ තිබෙන ඒකාධිකාරය ඉතාම ඛේදජනක තත්ත්වයක්. ගුවන් හමුදාවේ ගුවන් නියමුවන්ට දක්වන්නා වූ මේ අඩු සැලකිල්ල පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, අඩු ගණනේ මේ Act එක වෙනස් කරලා හරි ඒ සම්බන්ධයෙන් යම් පියවරක් ගන්න ඕනෑ.

ගරු අමාත්‍යතුමනි, අපට ආරංචියක් ලැබිලා තිබෙනවා, හෙට අනිද්දා ඉඳලා ගුවන් තොටුපොළින් ඇතුළට එන සියලු මඟීන්ගෙන් ඩොලර් 5ක් අය කරන්න යනවා කියලා සීටා කියන ආයතනයකට. මොනවාටද, මේ ඩොලර් පහක් ගන්න යන්නේ? මේ රටට පැමිණෙන අයගේ රහස් තොරතුරු දැන ගැනීම සඳහා අපේ බුද්ධි අංශ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවත් එක්ක සම්බන්ධ වෙලා වෙන්න පුළුවන් මෙය කරන්නේ. ඩොලර් පහක් අය කරන්න යනවා කියලා අපට දැන ගන්නට ලැබී තිබෙනවා. අපි දන්නවා, මේක යට ලොකු ගැහිල්ලක් තිබෙන බව. මේ යෝජනාව මුලින්ම ආවේ හිටපු මුදල් ඇමති රවි කරුණානායක මැතිතුමා එම ධුරයේ වැඩ කටයුතු කරපු කාලයේයි. මේ රටට ඇතුළු වෙන මිනිසුන්ගෙන් ඩොලර් පහක් අරගෙන ඒ අයගේම තොරතුරු අපේ රට දැන ගන්න හදනවා නම්, මම හිතන්නේ ඒක විහිළුවක්. මිනිසුන් මේ කාරණය දැන ගත්තොත් විශාල ප්‍රශ්නයක් ඇති වෙයි. මේ ආයතනයට අදාළව අපට ඒ සම්බන්ධයෙන් එම ආයතනවල අයගෙන්ම තොරතුරු ඇවිල්ලා තිබෙනවා. සාමාන්‍යයෙන් එම තොරතුරු ලබා ගැනීමේ කටයුතුවලට වැය වන්නේ ඉතාම සුළු මුදලක්. නමුත් ඩොලර් පහ ගණනේ ගන්න ලැහැස්ති වෙනවා කියන කාරණාව අපට දැන ගන්න ලැබී තිබෙනවා.

දිගින් දිගටම ශ්‍රීලන්කන් ගුවන් සේවය ගැන කථා කළා. ගරු ඇමතිතුමනි, ශ්‍රීලන්කන් ගුවන් සේවය ඔබතුමාට සම්බන්ධ නැති වුණත් ඒ පිළිබඳව එක කාරණයක් කියන්න ඕනෑ. අද ශ්‍රීලන්කන් ගුවන් සේවය ගැන මෙතුමන්ලා කථා වුණා. අපේ කාලයේ ශ්‍රීලන්කන් ගුවන් සේවයේ වැරැදි තිබුණා. ඒක ඇත්ත. අපේ කාලයේ ප්‍රශ්නයක් තිබුණා. දැවැන්ත ඉන්ධන මිලක් එක්ක තමයි ශ්‍රීලන්කන් ගුවන් සේවාව පවත්වාගෙන ගියේ. හුහක් අය කියනවා, ශ්‍රීලන්කන් ගුවන් සේවය එමිරේට්ස් ආයතනයට තිබුණු කාලයේ ලාභ ලැබුවා කියලා. ගරු ඇමතිතුමනි, එහෙම එකක් නැහැ. එමිරේට්ස් ආයතනය අපේ තිබුණු වත්කම් විකුණා තමයි ලාභ පෙන්නුවේ. තාක්ෂණික වශයෙන් යම් යම් දියුණු තත්ත්වයන් ඇති කළා. නමුත් එමිරේට්ස් ආයතනය අපේ දියුණුව වැඩි කර ගන්න දුන්නේ නැහැ. ගුවන් ගමන් සඳහා සමහර රටවල් සමඟ අපට තිබුණු rights ඒ අය අරගෙන පාවිච්චි කළා. ගරු ඇමතිතුමනි, මේ ශ්‍රීලන්කන් ගුවන් සේවය ගැන මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා මතු කළා, cancellation එකක් ගැන. Cancellation fee එකෙන් මේ ගහලා තිබෙන්නේ. ගුවන් යානා ඇණවුම cancel කරනකොට අය කරන cancellation fee එකෙන් මේ ගහලා තිබෙන්නේ. මේක ජාතික අපරාධයක්. මේක ඕනෑම කෙනෙකුට තේරෙනවා. Cancellation fee එක ගැන මේ ක්ෂේත්‍රයේ සිටින සියලු දෙනා දන්නවා.

ඊළඟට, ඊයේ පෙරේදා ජනාධිපතිතුමා කජු ගැන කතා කළා. ශ්‍රීලන්කන් ගුවන් සේවය ලබාදුන් කජු ගැන. ගරු ඇමතිතුමනි, මේ ගැන සොයලා බලන්න. තමුන්නාන්සේලා කැබිනට් මණ්ඩලයට සාමූහිකව වග කියන නිසාත්, මේ ක්ෂේත්‍රයට සම්බන්ධ නිසාත්. මේ කජු order එක දෙන්නේ ඩුබායිවලින්. මේ රටේ මෙච්චර කජු තිබෙන කොට මේවා ලබාගන්නේ ඩුබායිවලින්. කවුද මේ ඩුබායිවලින් කජු දෙන්නේ? සුරේන් රත්වත්ත මහත්මයා තමයි ඒක පිටිපස්සෙන් ඉන්නේ. එක අතකට ජනාධිපතිතුමා මේ කාරණය මතු කරන්න ඕනෑ තැන ඔතැන නොවෙයි. ජනාධිපතිතුමා මාධ්‍ය ඉදිරියේ මේ කාරණය මතු කිරීම නිසා ජාත්‍යන්තර වශයෙන් ගුවන් සේවයට ලොකු කැළලක්, අපකීර්තියක් ඇති වුණා. ඒක ගැන අපි කනගාටු වෙනවා. හැබැයි, ජනාධිපතිතුමා කුමන හෝ තැනකදී මේ කාරණය මතු කිරීම හොඳයි. මේ කාරණය මාධ්‍යයට දෙන්නේ නැතිව එම නිලධාරීන් ගෙන්වා මේ ගැන විමසුවා නම් මීට වඩා සුදුසුයි කියලා මම හිතනවා.

ගරු අමාත්‍යතුමනි, මම සංචාරක විෂය භාර නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ කාලයේ අපි විශේෂයෙන් බලාපොරොත්තු වුණු දෙයක් තමයි අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් වැඩි දියුණු කිරීම සහ අලුත් ගුවන් තොටුපොළවල් ආරම්භ කිරීම. මීට පෙර කථා කළ බදුල්ල දිස්ත්‍රික්කයේ අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒ හැම තැනම සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න නම් අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් ඇති වෙන්නට ඕනෑ, අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් දියුණු වෙන්නට ඕනෑ. ඒ වාගේම ආරක්ෂාව සම්බන්ධයෙනුත් සැලකිලිමත් වෙන්නට ඕනෑ ගරු ඇමතිතුමනි. ඔබතුමා මඩකළපුව ගුවන් තොටුපොළ සම්බන්ධයෙන් අද ඉතාමත්ම හොඳ පියවරක් ගෙන තිබෙනවා. මම හිතන විධියට දැන් එහි සිවිල් ගුවන් සේවා කටයුතු පවත්වාගෙන යනවා. කටුනායක ගුවන් තොටුපොළින් ගොඩ බහින සංචාරකයකුට ත්‍රිකුණාමලයට, මඩකළපුවට යන්න අද සාමාන්‍යයෙන් පැය හයක්, හතක් ගත වනවා. ශ්‍රීලන්කන් ගුවන් සේවයේ sea planes තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට එක විනාඩියක් දෙන්න.

මිනිස්සු sea plane එකේ යනකොට ඒ මිනිස්සුන්ගේ බෑග් ටික වෑන් එකේ එන්න තව දවස් එකහමාරක් විතර යනවා. එම නිසා අද අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් දියුණු කිරීම ඉතාමත් වටිනවා කියලා මම හිතනවා. මා මීට පෙර මතු කළ කාරණා සම්බන්ධයෙනුත් ගරු අමාත්‍යතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 19ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.05]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින සාකච්ඡාවට භාජන වන ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත සහ ගුවන් සේවා පනත යටතේ නියෝග සම්බන්ධයෙන් කථා කිරීමට ලැබීම ගැන මම සන්තෝෂ වනවා. ලෝකයේ වාර්ෂිකව බිලියන 4කට වැඩි මහීන් සංඛ්‍යාවක් සහ ටොන් මිලියන 50කට අධික භාණ්ඩ ප්‍රමාණයක් ප්‍රවාහනය කරන ගුවන් ගමනාගමනය සම්බන්ධයෙන් තමයි මේ ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ දක්වා ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයට අයත් සාමාජික රාජ්‍යයන් 192න් 131ක්ම සම්මුතිගතව, එම සම්මුතියේ ප්‍රතිපාදනයන්ට අදාළව තම තමන්ගේ රාජ්‍යයන් හි නීති පද්ධති තුළ පවත්වාගෙන යනවා. අපිත් ඒ රාමුව තුළ සිටින සිවිල් ගුවන් සේවා නියාමනයන් කරන රාජ්‍යයක් හැටියටයි අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ.

මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරනවා වාගේම, ඒ හා සමාන වැදගත්කමක් දරන අපේ ගුවන් සේවය ගැන කථා කරන්නත් මම බලාපොරොත්තු වෙනවා. මොකද, මේ ගුවන් සේවය සම්බන්ධයෙන් විවිධ කාරණා අද මේ සාකච්ඡාවට භාජන වුණා. ඒ හරහා සත්‍ය විකෘති වුණු අවස්ථාත් තිබුණා. එම සත්‍යයත් මතක් කර දෙමින් කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හැටියට අපි දැනට ශ්‍රීලන්කන් ගුවන් සේවය restructure කරන්නේ කොහොමද කියලා අනු කාරක සභාවක් යටතේ අධ්‍යයනය කරමින් ඉන්නවා. ඒ සම්බන්ධයෙන් අපි ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වෙනවා.

ශ්‍රීලන්කන් ගුවන් සේවයට සිදුවී තිබෙන මේ පාඩුව වුණේ කොහොමද කියා මේ පාර්ලිමේන්තුවේදී විවිධ අවස්ථාවල අපි කථා කර තිබෙනවා. මට කලින් කථා කළ ඒකාබද්ධ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වේ, "මෑත කාලයේ තමයි සියලුම පාඩු සිදු වුණේ" කියායි. මේක තමයි ජනතාව නොමඟ යවන ක්‍රමවේදය වෙලා තිබෙන්නේ.

2015 වසරට කලින් ශ්‍රීලන්කන් ගුවන් සේවයේ සභාපතිවරයා ලෙස හිටියේ කවුද? සියලුදෙනාටම දැන් ඒක අමතක වෙලා තිබෙනවා. නිශාන්ත වික්‍රමසිංහ තමයි 2015ට කලින් ශ්‍රීලන්කන් ගුවන් සේවයේ සභාපතිවරයා ලෙස හිටියේ. මේ නිශාන්ත වික්‍රමසිංහ කියන්නේ කවුද? ඒකත් දැන් සියලුදෙනාටම අමතක වෙලා තිබෙනවා. නිශාන්ත වික්‍රමසිංහගේ සුදුසුකම් මොනවාද? අපි දන්නා තරමින් එතුමා O/Level fail. එතුමාගෙන් ප්‍රශ්න කරනකොට, "O/Level fail" කියා ප්‍රකාශ කර තිබුණා. එතුමා වතු අධිකාරිවරයෙක් හැටියට හෝ වතුවල වැඩ කළාය කියා තමයි අපිත් අහලා තිබුණේ. නිශාන්ත වික්‍රමසිංහ මේ සමාගමේ සභාපති හැටියට පත් කළේ කවුද? නිශාන්ත වික්‍රමසිංහ කියන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ බිරින්දෑගේ අයියාද, මල්ලිද? මම ඒක දන්නෙත් නැහැ. [බාධා කිරීමක්] සහෝදරයෙක්. එතුමියගේ සහෝදරයා තමයි ශ්‍රීලන්කන් ගුවන් සේවයේ සභාපතිවරයා හැටියට පත් වුණේ.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)
ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසාද ගාමන්ටිකාරයෙක් ඊළඟට සභාපති විධියට පත් කළේ?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
නැහැ. මම කියන්නේ මේ සිදු වුණු හානිය ගැන අමතක කරන්න බැහැය කියන කාරණයයි. ඒ නිසා තමයි ඒ ගැන සොයා බැලීමට ජනාධිපති කොමිෂන් සභාවක් පත් කළේ. ඒ විතරක් නොවෙයි, අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදීත් දැන් මේ ගැන හොයනවා; ඒ කාලයේ සිදු වුණු වැරැදි සියල්ලක්ම අපි හොයනවා. ඒ සිදු වුණු වැරැදි වහන්න බැහැ; නිශාන්ත වික්‍රමසිංහ කළ දේවලුත් වහන්න බැහැ.

නිශාන්ත වික්‍රමසිංහ මහත්මයා, නැත්නම් මහින්ද රාජපක්ෂ මහත්මයාගේ මස්සිනා ශ්‍රීලන්කන් ගුවන් සේවයට මොකද කළේ? ඔහු තමන්ගේ හිතුමතයට ගුවන් යානා පාලනය කළ විධිය අපි දැක්කා. ඒ ගැන විවිධ කථා තිබෙනවා. අපට දවසක් වුණත් ඒ ගැන කථා කරන්න පුළුවන්. මැලේසියාවට ගිය flight එකක් ඔහුට ඕනෑ වෙලාවට "ටක්" ගාලා අනික් පැත්තට හරවලා ගෙනාවා; ඒක මැලේසියාවේ ඉඳලා සිංගප්පූරුවට ගෙනාවා. "ඒක අමුණුගම ඇමතිතුමාට අවශ්‍ය නිසා ගෙනාවා" කියා එතුමා ඒ සම්බන්ධයෙන් එදා අසත්‍යයක් ප්‍රකාශ කර තිබුණා. ඒක නොවෙයි නේ, ඇත්ත කථාව. එහෙම එකක් නැහැ. නිශාන්ත වික්‍රමසිංහගේ හිතවතියට අවශ්‍ය වෙලාවට ගුවන් යානා වෙනස් කළා.

මේ ගුවන් සේවයට කරන ලද හානිය බලන්න ඕනෑ නම්, මෙන්න මේ කාරණය කෙරෙහි අවධානය යොමු කරන්න කියා මම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මේ ගුවන් සේවය තුළ තිබෙනවා, නිලධාරීන් සමඟ එකතුවෙලා හදපු Collective Agreement එකක්. ගුවන් යානා කාර්ය මණ්ඩලය; ගුවන් නියමුවන් නොවන කාර්ය මණ්ඩලය, -ඒ කියන්නේ ගුවන් සේවක සේවිකාවන්- සඳහා වන Collective Agreement එක අත්සන් කරන්න හදනකොට, නිශාන්ත වික්‍රමසිංහ මහත්මයා ඒක නිර්මාණය කළේ තමාගේ හිතවතියට අවශ්‍ය විධියටයි. ඒක කොහොම නිර්මාණය කළාද කියනවා නම්, "වහාම මේ Collective Agreement එක අත්සන් කරන්න, නැත්නම් මම ගුවන් සේවිකාවෝත් එක්ක ඇවිත් strike කරනවා" කියා අවසානයේ එවකට සිටි ප්‍රධාන නිලධාරීන්ට ඔහු බලපෑම් කළා. ඒ විධියට තමයි නිශාන්ත වික්‍රමසිංහ කියන හිටපු සභාපතිවරයා එදා වැඩ කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගුවන් සේවක සේවිකාවන් සඳහා වන block hour එකකට ලබාදෙන ඇමෙරිකානු ඩොලර් ප්‍රමාණය මේ Collective Agreement එකේ තිබෙනවා. ගුවන් යානාවේ නියමුවාට වඩා, ගුවන් යානාවේ cabin manager, නැත්නම් purserට block hour එකකට ගෙවන ඩොලර් ප්‍රමාණය වැඩියි. කොහොමද මේක වුණේ? සම්පූර්ණ ගුවන් යානාව සම්බන්ධයෙන් සිටින ප්‍රධාන නිලධාරියා -ගුවන් නියමුවාට- වඩා

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

ගුවන් සේවක සේවිකාවන්ට පැයකට ගෙවන මුදල වැඩියි. මේ Collective Agreement එක අත්සන් කළේ ඇයි? නිශාන්ත වික්‍රමසිංහ මහත්මයාට අවශ්‍ය වුණා, තමන්ගේ හිතවතිය සන්තෝෂ කරන්න.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(මාණ්පුමිකු මුජීපුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
Girlfriend.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආශු මාරසිංහ)
(The Hon. (Prof.) Ashu Marasinghe)
අපේ මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියනවා "girlfriend" කියා. මම නම් ඒක දන්නේ නැහැ, හිතවතිය.

නිශාන්ත වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ Collective Agreement අත්සන් කරනකොට එවකට Collective Agreement අත්සන් කළ, දැනට පිරිස් කළමනාකරණ අංශයේ ප්‍රධානියා - HHR-, -

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(මාණ්පුමිකු අරුන්දික්ක පර්නාන්දු)
(The Hon. Arundika Fernando)
තවමත් ඉන්නවා නේ.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආශු මාරසිංහ)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඔව්, තවමත් ඉන්නවා. ඒක තමයි අපටත් තිබෙන ප්‍රශ්නය. දැන්වත් අපි ඒ අය අයින් කරන්න ඕනෑ.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(මාණ්පුමිකු අරුන්දික්ක පර්නාන්දු)
(The Hon. Arundika Fernando)
ප්‍රදීප් කැකුලාවල.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආශු මාරසිංහ)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඔබතුමා ඔහුගේ නම දන්නවා. ඔහු ප්‍රදීප් කැකුලාවල. පාර්ලිමේන්තුවේ කමිටුවට ගෙන්වලා එතුමාගෙන් ප්‍රශ්න කරන වෙලාවේ එතුමාට උත්තර නැති වුණා. ඇයි මේක අත්සන් කළේ කියන එකට හේතුව කියන්න එතුමාට බැරි වුණා. "බලපෑම් නිසා" කියා එතුමා කියනවා. බලපෑම් නිසා අත්සන් කළත්, ගුවන් නියමුවන්ට වඩා ගුවන් සේවක-සේවිකාවන්ගේ පඩිය වැඩිවෙන්න Collective Agreement එක අත්සන් කරන්නේ කොහොමද? විශේෂයෙන් ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ සභාපතිතුමාගෙන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් මා ඉල්ලා සිටිනවා, රාජපක්ෂ යුගයේ සිට නිශාන්ත වික්‍රමසිංහ මහත්මයාට ඕනෑ විධියට වැඩ කළ අය දැන්වත් අයින් කරන්න කියා. මේ අය අයින් කරන්න හේතු කාරණා ඕනෑ තරම් තිබෙනවා. 2015 ජනාධිපතිවරණය සහ මහ මැතිවරණය වෙලාවේ ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ සේවය කළ අයට එක් එක් ප්‍රදේශ භාර දීලා තිබුණු හැටි අපි දැක්කා. ඒවා දැනටමත් එළිවෙලා තිබෙනවා. මේ පිරිස් කළමනාකරණ මහත්වරු ඡන්ද ව්‍යාපාරයේදී කොළොන්නාව, රත්නපුර ප්‍රදේශවල වැඩ කළා. ශ්‍රීලන්කන් ගුවන් සමාගම සම්පූර්ණයෙන් බලය අයුතු ලෙස පාවිච්චි කළා. ශ්‍රීලන්කන් ගුවන් සේවයේ කළමනාකාර level එකේ 400කට අධික පිරිසක් ඉන්නවා.

මට කලින් කථා කළ අපේ හිටපු නියෝජ්‍ය ඇමතිතුමාත් මේ කජු ප්‍රශ්නය ගැන කිව්වා. ගරු ඇමතිතුමනි, අපි මෙහෙම හිතමු. ජනාධිපතිතුමාට ඒ කජු කන්න ලැබෙන්නේ, එතුමා flight එකේ යන ගමන් සාමාන්‍ය අය කන කෑම කන නිසා නේ. හැබැයි, මහින්ද රාජපක්ෂ මහත්මයා යන කාලයේ සුපිරි කෑමයි දුන්නේ. එතුමාට විතරක් special catering service එකක් තිබුණා. එතුමාට විතරක් සුවිශේෂ ගුවන් යානයක් තිබුණා. එතුමාට විතරයි, ඒ ගුවන් යානය තිබුණේ. ඒ ගුවන් යානය තුළ තිබුණු සුවිශේෂ කෑම වර්ග ගැන ඒ ගුවන් සේවයේ අයම කියනවා. ඒ catering service එක කළේ කොහොමද කියන එක ගුවන් සේවයේ අයමයි කියන්නේ.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(මාණ්පුමිකු අරුන්දික්ක පර්නාන්දු)
(The Hon. Arundika Fernando)
කජු ලබාදීම හරියට කරන්න බැරි නම් ඒවා නොදී ඉන්න ඕනෑ. Business class එකේ ගියත්, economy class එකේ ගියත් හැමදෙනාටම දෙන්නේ මේ කජු. මේ කජු දුන්න අය ගැන හොයන්න කෝ.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආශු මාරසිංහ)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මහින්ද රාජපක්ෂ මහත්මයාට ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ තිබෙන ඒ වාගේ කජු තියා එහෙම කෑමක් කාලාවත් පුරුද්දක් තිබුණේ නැහැ. මොකද, එතුමාට සුපිරි කෑම දුන්නේ. ඒක නිසා තමයි එතුමා සුපිරි කෑමවලට අමතරව සුපිරි ගුවන් යානයකුත් order කළේ. ඒ සුපිරි ගුවන් යානයේ හැටි අපි දැක්කා නේ. ඒක එතුමාට නිදාගෙන යන්න, නාන්න, සියලුම දේවල් කරන්න අවශ්‍ය සැප පහසුකම් සහිත ගුවන් යානයක්. ඒ ගුවන් යානය ලැහැස්ති කර තිබුණේ, ගුවන්ගත වෙන්න දවස් දෙකකට කලින් එහි seats ටික ගලවලා අලුතෙන් ඒක set up කරන විධියටයි. එවැනි වැඩසටහන් හරහා තමයි මේ ගුවන් සේවය කාබාසිනියා කර තිබුණේ.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(මාණ්පුමිකු අරුන්දික්ක පර්නාන්දු)
(The Hon. Arundika Fernando)
ඔබතුමා මට වඩා හොඳට මහින්ද රාජපක්ෂ මහත්මයා ගැන දන්නවා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා සාමාන්‍ය විධියට ඉන්න කෙනෙක්.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආශු මාරසිංහ)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඒ හින්දාම තමයි එතුමා එය අරගෙන ගියේ. ජපානයේ සිට එනකොට ගුවන් යානයක් ගෙන්වාගෙන තමයි එතුමා ආපහු ආවේ. අපේ වර්තමාන ජනාධිපතිතුමාවත්, අගමැතිතුමාවත් කිසිම වෙලාවක ගුවන් යානයක් තමන්ටම කියලා වෙන් කරගෙන යන්නේ නැහැ. ඇත්තටම "එමිරේට්ස්" ආයතනයත් එක්ක තිබුණු ගිවිසුම අවලංගු කරන්න හේතුව වුණේත් ඕක නේ. එතුමාට යන්න ඕනෑ වුණා. දුන්නේ නැහැ. ජනාධිපතිවරයාට සහ අදාළ කණ්ඩායමට seats ප්‍රමාණය දුන්නා. එතැනින් එහාට එතුමාගේ පරිවාර සේනාවටම දුන්නේ නැහැ කියා ගිවිසුම අවලංගු කළා. මේක තමයි ශ්‍රීලන්කන් ගුවන් සමාගම පරිහානියට පත්වෙන්න හේතුව. අපි කියන්නේ ශ්‍රීලන්කන් ගුවන් සේවය ආරක්ෂා කළ යුතුයි කියායි. ඒකේ කථා දෙකක් නැහැ. It is our national pride. So, we must protect it. There is no argument about it. අපි ඉන්නෙත් ශ්‍රීලන්කන් ගුවන් සමාගම ආරක්ෂා කළ යුතුයි කියන පැහැදිලි ස්ථාවරයේයි. හේතුව මොකක්ද? ශ්‍රීලන්කන් ගුවන්

සේවය හරහා තමයි සංචාරකයෝ වැඩියෙන්ම එන්න කැමති. ඒ ගුවන් සේවය හරහා, ඒ රටේ ගුවන් යානයක එන්න තමයි සංචාරක ආකර්ෂණය තිබෙන්නේ.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

ගරු මන්ත්‍රීතුමනි, යුරෝපයට යන ගුවන් ගමන් නැවැත්වූයේ ඒ නිසාද?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ඒකේ ප්‍රශ්න තිබෙනවා. අපිත් පැහැදිලිව ඒ ගැන කථා කරනවා. "නයිරාස්" ආයතනයේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විශ්ලේෂණයක් කළ යුතුයි; ඒ ගැන වාද-විවාද කළ යුතුයි. ප්‍රාදේශීය ගුවන් සේවාවක් විධියට අපි කිසිම වෙලාවක එය අනුමත කරන්නේ නැහැ. ඒක පවත්වාගත යුතුයි.

අපට තිබෙන ශ්‍රීලන්කන් ගුවන් සේවය ජාත්‍යන්තර ගුවන් සේවයක්. නිසි කළමනාකාරිත්වයෙන් ඉදිරි වැඩසටහනක් හරහා මේක ප්‍රතිව්‍යුහගත කිරීම තුළ අපට හැකියාවක් ලැබෙනවා මේ ගුවන් සේවය දිගටම පවත්වාගෙන යන්න. මේවා වුණේ අපේ රටේ විතරක් නොවෙයි. 2010දී JAL -Japan Airlines එක- වැටුණා. ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක පාඩුවක් සිද්ධ වුණා. එම ගුවන් සේවයේ ඉතාමත් දක්ෂ කළමනාකාරිත්වය හරහා මේ බිලියන 7ක පාඩුව එතුමන්ලා ජය ගත්තා. එම කළමනාකාරිත්වයට පත් වෙච්ච අවුරුදු 80ක් වයසැති එවකට එම ගුවන් සේවයේ සභාපතිවරයා සුවිශේෂී කළමනාකාරිත්ව ව්‍යුහයක් ආරම්භ කළා. ඒකට කිව්වේ, Amoeba Management කියායි. Amoeba කෙනෙක් තමන්ගේ කණ්ඩායම manage කරනවා වාගේ, එතුමා නායකත්වය හදලා ඒ ඒ හැම කොටසක්ම බාර දීලා නායකත්වය හරහා කොහොමද profitable වෙන්නේ කියන scenario එකක් හරහා තමයි Japan Airlines එක නැවත අවුරුදු 3ක් ඇතුළත ලාභ ලබන තත්ත්වයට පත් කළේ. මේකේ තිබෙන්නේ, rocket science නොවෙයි. ගුවන් සේවයේ පරිපාලනය තමයි මේ තිබෙන්නේ. Rocket science නොවෙයි මේ තිබෙන්නේ. අපට යම් යම් කාර්යයන් ටිකක් කළ යුතු වෙනවා. එකක් තමයි, ශ්‍රීලන්කන් ගුවන් සේවයට සමහරු දීලා තිබෙන loansවලින් ප්‍රධාන බැංකු දෙකක් වන ලංකා බැංකුව හා මහජන බැංකුව ලබා ගන්නා පොලී ප්‍රමාණය අති විශාල වීම. ඒ වාගේම, Ceylon Petroleum Corporation එක තමන් ලබා දෙන ගුවන් යානා ඉන්ධන සඳහා වන මිල නැවත මිල සූත්‍රය හරහා සංශෝධනය කළ යුතුයි කියා අපි විශ්වාස කරනවා. ඒ මිල සූත්‍රයත් සංශෝධනය වුණාම ශ්‍රීලන්කන් ගුවන් සේවයටත් තමන්ට අවශ්‍ය වන මුදල් ප්‍රමාණය ගණනය කර ගත හැකි වෙනවා. ඒ විතරක් නොවෙයි, අපට මේ පිහිටීමෙන් ලැබී තිබෙන වාසියත් අපි ප්‍රයෝජනයට ගත යුතුයි. අපි ඉන්නේ airline hub එකක. ඒ නිසා ශ්‍රීලන්කන් ගුවන් සේවය හරියට නිර්මාණශීලීව ඉදිරියට අරගෙන ගියොත් මේ airline hub එක හරහා අපට හැකියාවක් ලැබෙනවා, අපට තිබෙන අවස්ථා වැඩි කරගන්න. උදාහරණයකට චීනය වාගේ රටක නගර රාශියකට අපේ ගුවන් සේවය ව්‍යාප්ත කරන්න පුළුවන් නම් හොඳයි. මොකද, අද චීන සංචාරකයෝ විශාල සංඛ්‍යාවක් ලංකාවට ඇදී එනවා. මේ හරහා අපේ ගුවන් සේවාව පුළුල් කරන්න අපට හැකියාව ලැබෙනවා.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡාවලට භාජනය වෙනකොට අපි දැකපු දෙයක් තමයි, අපේ දේශීය ගුවන් නියමුවන්ට සහ විදේශීය ගුවන් නියමුවන්ට සලකන්නේ ක්‍රම දෙකකට බව. මේක නිවැරැදි විය යුතුයි කියා අපි විශ්වාස කරනවා. දේශීය ගුවන් නියමුවෝ සියලුම දෙනා අදාළ රජයේ බදු -tax එක- මුදල් සියල්ලම ගෙවනවා. නමුත්, විදේශීය ගුවන් නියමුවෝ ඒ බදු ගෙවන්නේ නැහැ, ඔවුන් බද්දෙන් නිදහස්. ඒ නිසා මේ සම්බන්ධයෙන් දේශීය ගුවන් නියමුවන්ගේ කලකිරීමක් තිබෙනවා. ඒ නිසා මේ ගැන අවධානය යොමු කර විදේශීය ගුවන් නියමුවන්ගෙනුත් ඒ බදු අය කරන ක්‍රමවේදය හදා ගත්තේ නැත්නම්, දේශීය ගුවන් නියමුවෝ අපේ රට දාලා යන තත්ත්වයට පත් වෙනවා. ඒ නිසා මේ ගැන අපි දැඩි අවධානය යොමු කළ යුතු වෙනවා. එහෙම වුණොත්, දේශීය ගුවන් නියමුවෝ මේ රට දාලා යන එක අපට නවත්වා ගන්න පුළුවන්. මොකද, මේ දේශීය ගුවන් නියමුවෝ තමයි අපේ ශ්‍රීලන්කන් ගුවන් සේවය ඉතාමත් කීර්තිමත් විධියට ඉදිරියට අරගෙන යන්නේ. ඒ වාගේම තමයි, ශ්‍රීලන්කන් ගුවන් සමාගමට අනුබද්ධව SriLankan Aviation College එකක් තිබෙනවා.

මේක ගුවන් සේවය සම්බන්ධ විවිධ පුහුණු පාඨමාලා කරන තැනක්. අපි මේ පුහුණු පාඨමාලා කරන තැන ගැන අධ්‍යයනයක් කළා. එතකොට අපි දැක්කා, ලෝකයේ තිබෙන අනාගත අවශ්‍යතාවන් සමඟ යනකොට මේ SriLankan Aviation College එකට ඉදිරියේදී විශ්වවිද්‍යාලයක් දක්වා ප්‍රවර්ධනය වෙන්න හැකියාව තිබෙන බව. මේ අංශයෙන් අනාගතයේ 2025 වන විට 250,000ක පමණ රැකියා අවස්ථා උත්පාදනය වෙනවා. ගුවන් යානා ඉංජිනේරු පාඨමාලා වැඩි කිරීම තුළ, ගුවන් යානා කාර්ය මණ්ඩලය නිර්මාණශීලීව ඒ පාඨමාලාවලට යොමු කිරීම තුළින් 2025 වන විට අපට හැකියාවක් ලැබෙනවා, ආසියාවේ විතරක් උත්පාදනය වන රැකියා අවස්ථා 250,000කට පමණ අපේ තරුණ තරුණියන් යොමු කරන්න. ඒ නිසා අපි අනාගතය ගැන හිතලා knowledge economy එකක් හැටියට ඉදිරියට යනකොට ඉතාමත් වැදගත් තව තැනක් තමයි, මේ ගුවන් නියමු සහ ගුවන් ඉංජිනේරුවරුන් පුහුණු කිරීමේ පාසල. ඒ පාසලට අපි අවස්ථාව ලබා දිය යුතුයි, පාඨමාලා වැඩිදියුණු කර වැඩි වැඩියෙන් අපේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න. ලංකාවේ විතරක් නොව ලෝකයේ ගුවන් යානා සමාගම් සමඟ ඇති වන ඉල්ලුමත් සමඟ ඒ ගොල්ලන්ට අවශ්‍ය කරන ඒ නිම් වළලු පුළුල් කර දෙන්නත් අපි අවස්ථාව ලබා දිය යුතුයි.

එම පාසල හරහා අපිට හැකියාවක් ලැබෙනවා, ශ්‍රීලන්කන් ගුවන් සේවයට අදාළ අනිකුත් ආයතන කාර්යක්ෂම කර ගුවන් සේවයට අදාළ ආදායම වැඩි කර ගන්න. ඒ විතරක් නොව ඒ තුළින් අපේ කීර්තියත් වැඩිවනවා. මොකද, ඒ ආයතනය ආසියාවේම තිබෙන ගුවන් යානා සමාගමක් සමඟ බද්ධ වුණු ප්‍රධාන පෙළේ ආයතනයක්. ආසියාවේ අපේ රට ආසන්නයේ රටවල මෙහෙම පාසලක් නැහැ. එම නිසා මේ මඟින් SriLankan Aviation College එක විශ්වවිද්‍යාල මට්ටමට දියුණු කරන්න අපට හැකියාව ලැබෙනවා. දැනටත් SriLankan Aviation College එක ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයත් සමඟ අවුරුදු 4ක පාඨමාලාවක් කරනවා. මේ පාඨමාලාවට අමතරව SriLankan Aviation College එක හරහා වෙනම උපාධි පාඨමාලා ආරම්භ කිරීම තුළින් Aeronautical Engineering පැත්තේ එහෙම නැත්නම්, ගුවන් යානා ඉංජිනේරු විද්‍යාව පැත්තේ පාඨමාලා තව තවත් වැඩි කර අපිට එම ක්ෂේත්‍රය පුළුල් කර ගන්න හැකියාව ලැබෙනවා. [බාධා කිරීමක්] මේ අවස්ථාවේදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මගේ වෙලාව අවසන් බවට සංඥා කරනවා. අද විවාදයට ගන්නා ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත සහ ගුවන් සේවා පනත යටතේ නියෝග මඟින් ශ්‍රීලන්කන් ගුවන් සේවය නිර්මාණශීලීව නැවත ප්‍රතිව්‍යුහගත කළ හැකි වන බව අපි විශ්වාස කරනවා. ඒ හරහා අපිට වටිනා අපේම ගුවන් සේවය වන ශ්‍රීලන්කන් ගුවන් සේවය රැක ගන්න අපි කටයුතු කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. මේ ගුවන් සේවය regional ගුවන් සේවයක් විධියට හිතන්නේ නැතිව ජාත්‍යන්තර ගුවන් සේවයක් - international airline එකක්- හැටියට සිතා සංචාරක

[ගරු (මහාචාර්ය) ආෂු මාරසිංහ මහතා]

කර්මාන්තයට අවශ්‍ය ගුවන් යානා ටික වැඩිදියුණු කර ගෙන මෙහි තිබෙන අඩු පාඩු ටික හදා ගෙන නිර්මාණශීලීව මේ ගුවන් සේවය අපි ගොඩ නැඟිය යුතුයි.

මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මම මේ කරුණ කියන්න ඕනෑ. මේ ගුවන් සේවයේ කළමනාකරණ ක්ෂේත්‍රයේ -managerial level එකේ- සිටින 380කට අදාළ පිරිස අතරින් මේ සමාගමට ද්‍රෝහී වෙලා සමාගම විනාශ කරන කණ්ඩායමේ 30ක්, 40ක් සිටිනවා. මේ කණ්ඩායම මේ සමාගමෙන් ඉවත් කර සමාගම නිසි තැනකට ගත්තොත් අපිට ඉක්මනටම නැවත ශ්‍රීලන්කන් ගුවන් සේවය යථා පරිදි ගෙන යන්න පුළුවන්ය කියා අපි විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you. Next, Hon. I. Charles Nirmalanathan. You have eleven minutes.

[பி.ப. 5.25]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி. கௌரவ போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சரினால் வானூர்திமூலம் ஏற்றிச் செல்லல் சட்டமூலம் இங்கு முன்வைக்கப்பட்டுள்ளது. பலாலி விமான நிலையமானது சர்வதேச விமான நிலையமாக மாறவேண்டு மென்ற எனது கருத்தை கௌரவ அமைச்சருக்கும் இந்த அரசாங்கத்திற்கும் இந்த சந்தர்ப்பத்தில் வலியுறுத்திக் கூற விரும்புகின்றேன். பலாலி விமான நிலையமானது ஒரு சர்வதேச விமான நிலையமாக மாறவேண்டுமென்று வடக்கிலிருக்கின்ற மக்கள் மிகவும் விரும்புகிறார்கள். பலாலி விமான நிலையம் ஒரு சர்வதேச விமான நிலையமாக மாறினால், வடக்கிலிருக்கின்ற மக்கள் மாத்திரமல்ல, வடக்கு மாகாணத்தை அண்மித்துள்ள மாவட்டங்களில் இருக்கின்ற மக்களுக்கும் நன்மையடைவர்; அவர்களுடைய போக்கு வரத்துக்கள் இலகுவாக்கப்படும்; எங்களுடைய பிரதேசம் அபிவிருத்தியில் மேன்மையடைந்த பிரதேசமாக மாறுவதற்கு வாய்ப்பாக அமையும். பலாலி விமான நிலையத்தைப் புனரமைப்பது தொடர்பாகக் கடந்த காலங்களில் பலவிதமான பத்திரிகைச் செய்திகள் வெளிவந்தாலும்கூட, சம்பந்தப் பட்டவர்கள் ஓர் ஆக்கபூர்வமான தீர்மானத்தை எடுத்ததாக இன்றுவரை நான் அறியவில்லை.

கௌரவ அமைச்சர் அவர்களே, பலாலி விமான நிலையத்தை இந்தியாவைச் சேர்ந்த ஒரு குழு ஆய்வு செய்திருப்பதாக நான் ஒரு பத்திரிகை மூலம் அறிந்தேன். தங்களுடைய நாட்டின் நிதியால் அதனைப் புனரமைப்புச் செய்வதில் அவர்கள் மிகவும் ஆர்வமாக இருக்கின்றார்கள். ஆகவே, இந்த பலாலி விமான நிலையம் சர்வதேச விமான நிலையமாக மாறுவதற்கு நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும். ஏற்கனவே இந்திய அரசாங்கத்தினால் அதற்குரிய ஆலோசனைகள் வழங்கப்பட்டிருக்கின்றன. ஆனால், தற்பொழுது சர்வதேசப் பயணிகள் போக்குவரத்துக் கட்டுப்பாட்டு அதிகார சபை இந்திய அரசாங்கம் அதைச் செய்வதைத் தடுப்பதாக பரவலாகச் செய்தி வெளியாகியுள்ளது. அதனை நேரடியாகத் தடுக்காவிட்டாலும் அதனைச் சம்பந்தப்பட்டவர்கள் விரும்பவில்லை என்று நான் அறிந்திருக்கின்றேன். ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, நான் தங்களிடம் பலாலி விமான நிலையம் தொடர்பான ஒரு பதிலை எதிர்பார்க்கின்றேன். ஏனென்றால், பலாலி விமான நிலையம் ஒரு சர்வதேச விமான நிலையமாக மாறுகின்ற பட்சத்தில் வடக்கில் மிகப் பாரிய மாற்றத்தைக் கொண்டு வரக்கூடிய ஒரு சூழ்நிலை இருக்கிறது. ஆனால், தெற்கில் மாத்திரம் விமான நிலையங்களையும் துறைமுகங்களையும் அமைப்பது மக்கள் மத்தியில் ஒருவிதமான அபிவிருத்தியாகத் தெரிகின்றது. இந்த நிலையில் எங்களுடைய அயல் நாடாகிய - தமிழர்களுடைய தாய் நாடாகிய இந்தியா முன்வந்து அதை அபிவிருத்தி செய்வதாகச் சொல்கின்றபோது ஏன் அதற்கு அனுமதி வழங்குவதற்குக் காலதாமதங்கள் ஏற்பட்டுக் கொண்டிருக்கின்றனவென்பதை கௌரவ அமைச்சர் அவர்கள் தெளிவுபடுத்த வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இந்த விமான நிலையத்தை அரசாங்க நிதியில் புனரமைப்புச் செய்யப்போவதாகவும் ஒரு கதை கூறப்படுகின்றது. அரசாங்க நிதியில் அதனைப் புனரமைப்புச் செய்வதென்றால் பாரிய தொகை வேண்டும். குளங்கள், வீதிகள், வைத்தியசாலைகள் என ஏற்கனவே வடக்கில் பலவிதமான அபிவிருத்திப் பணிகள் மேற்கொள்ளப்பட வேண்டியிருக்கின்றன. ஆனால், அவற்றுக்கு நிதி செலவிடமுடியாத ஒரு சூழ்நிலை அரசாங்கத்திற்கு இருக்கின்றது. இந்த நிலையில் பலாலி விமான நிலையத்தை அரசாங்கம் புனரமைப்புச் செய்வதாகக் கூறிக் கொண்டு காலத்தைக் கடத்தாது, இந்தியா அரசாங்கத்துடன் ஆக்கபூர்வமான பேச்சுவார்த்தை நடத்தி அதனைப் புனரமைப்புச் செய்ய வேண்டும் என்று சிவில் விமான சேவைகள் அமைச்சரையும் இந்த அரசாங்கத்தையும் எங்களுடைய மக்கள் சார்பாகவும் வடக்கு மாகாண சபை சார்பாகவும் அங்கிருக்கின்ற ஏனைய அனைத்துத் தரப்பினர் சார்பாகவும் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, தங்களுடைய அமைச்சுக்குக்கீழ் இயங்குகின்ற இலங்கைப் போக்குவரத்துச் சபை தொடர்பான ஒரு விடயத்தையும் இச்சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, 2011 ஆம் ஆண்டு டிசம்பர் முதல் 2015 ஆம் ஆண்டு வரை வடக்கு மாகாண இலங்கை போக்குவரத்துச் சபை ஊழியர்களுடைய EPF பணம் இன்னும் அவர்களுக்குக் கிடைக்கவில்லை. அது தொடர்பாக நான் கடந்த வரவு செலவுத்திட்ட விவாதத்தில் கலந்து கொண்டு கூறியபோது, மிக விரைவில் அந்தக் கொடுப்பனவுகள் வழங்கப்படுமென்று பிரதி அமைச்சர் அவர்கள் உறுதியளித்திருந்தார். கௌரவ அமைச்சர் அவர்களே, வடக்கு மாகாண இலங்கைப் போக்குவரத்துச் சபைமீது நீங்கள் நன்மதிப்பு வைத்திருக்கின்றீர்கள். அண்மையில் உங்களுடன் உரையாடியபோதுகூட, அங்கிருக்கின்ற ஊழியர்கள் திறமையான முறையில் பணிபுரிகிறார்களென்று கூறினீர்கள். உண்மையில் நான் பெருமையடைந்தேன். இந்த நிலையில் இந்த EPF நிதியில் கிட்டத்தட்ட 322 மில்லியன் ரூபாய் இலங்கைப் போக்குவரத்துச் சபையால் எங்களுடைய வடக்கு மாகாணத்திற்கு வழங்கப்பட வேண்டியிருக்கிறது. தற்பொழுது மற்றைய மாகாணங்களுக்கு அந்தப் பணத்தை வழங்க ஆரம்பித்திருக்கிறீர்கள். ஆனால், அது இன்னும் வடக்கு மாகாணத்திற்குக் கிடைக்கவில்லை. இலங்கைப் போக்குவரத்து சபை ஊழியர்கள் மிக வேதனையோடு என்னிடம் வந்து ஒரு விடயத்தைக் கூறினார்கள். அதாவது, மற்றைய மாகாணங்களுக்குப் படிப்படியாக அந்தப் பணம் வழங்கப்பட்டுக் கொண்டிருப்பதாகவும், ஏற்கனவே இந்த

EPF பணம் தொடர்பாகக் கடந்த வரவு செலவுத் திட்ட விவாதத்தில் தெரிவிக்கப்பட்டபோது குறித்த சில மாதங்களுக்குள் அதை வழங்குவதாக பிரதி அமைச்சர் அவர்கள் குறிப்பிட்டிருந்தமை பற்றியும் இன்றுவரை தங்களுடைய மாகாணத்திற்கு அந்த 322 மில்லியன் ரூபாய் கிடைக்கவில்லையென்றும் கூறினார்கள். இதனால் அவர்கள் மிகவும் கவலையடைந்த நிலையில் இருக்கின்றார்கள். ஆகவே, இலங்கைப் போக்குவரத்துச் சபையின் வட மாகாண ஊழியர்களுக்குச் சேர வேண்டிய 322.8 மில்லியன் ரூபாயை மிக விரைவில் அவர்களுக்கு வழங்குவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, அங்குள்ள இலங்கை போக்குவரத்துச் சபைக்குச் சொந்தமான பஸ்கள் மிகவும் பழுதடைந்த நிலையிலேயே காணப்படுகின்றன. குறிப்பாக, மாவட்டங்களுக்கு இடையில் சேவையில் ஈடுபடுகின்ற பஸ்கள் ஓரளவு ஓடக்கூடிய நிலையில் இருந்தாலும், மாவட்டத்திலுள்ள கிராமங்களுக்கிடையில் சேவையில் ஈடுபடுகின்ற பஸ்கள் பல்வேறு விதமான குறைபாடுகள் நிறைந்த பஸ்களாகவே காணப்படுகின்றன. இலங்கைப் போக்குவரத்துச் சபைக்கு மிக விரைவில் பஸ்கள் கிடைக்கவிருப்பதாகவும், அப்போது அவை சகல டிப்போக்களுக்கும் பகிர்ந்தளிக்கப்படுமென்றும் நீங்கள் ஏற்கனவே ஓர் உரையின்போது கூறியிருந்தீர்கள். வடக்கு மாகாணத்தில் 7 பஸ் டிப்போக்கள் இருக்கின்றன. அங்கு ஒவ்வொரு கிராமமும் பல மைல்களுக்கு அப்பால்தான் இருக்கின்றன. அந்தக் கிராமங்களில் இருக்கின்ற பெரும்பாலான பாடசாலை மாணவர்கள் இலங்கைப் போக்குவரத்துச் சபை பஸ்களினூடாகத்தான் பாடசாலைக்குச் செல்கின்றார்கள். குறிப்பாக, முல்லைத்தீவிலிருந்து கொழும்புக்கு சேவையிலீடுபடுத்தப்படுகின்ற இலங்கைப் போக்குவரத்துச் சபைக்குச் சொந்தமான பஸ்கள் ஓடக்கூடிய நிலையில் இருந்தாலும், அங்கு முல்லைத்தீவு நகரத்திலிருந்து கிராமங்களுக்குச் சேவையிலீடுபடுத்தப்படுகின்ற பஸ்கள் மிகவும் பழுதடைந்த நிலையில் காணப்படுகின்றன. அந்த பஸ்களில் பாடசாலை மாணவர்களும் பயணிக்கின்றார்கள். சிலவேளைகளில் அவை இடை நடுவில் பழுதாகி விடுகின்றன. எனவே, அங்குள்ள இலங்கைப் போக்குவரத்துச் சபைக்குத் தரமான பஸ்கள் வழங்கப்பட வேண்டும்.

அடுத்து, பலாலி விமான நிலையத்தை ஒரு சர்வதேச விமான நிலையமாக மாறுவதற்குத் தங்களுடைய காலத்திலேயே ஆக்கபூர்வமான முயற்சிகளை எடுக்கவேண்டுமென்று நான் உங்களை மீண்டும் கேட்டுக் கொள்கின்றேன். அதேநேரத்தில், அதன் புனரமைப்புக்குத் தேவையான நிதியை இந்திய அரசாங்கம் வழங்குவதை நாங்கள் விரும்புகின்றோம் என்ற கருத்தையும் மீண்டும் நான் சொல்ல விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த அரசாங்கத்தில் மிக முக்கியமான ஓர் அமைச்சராக இருக்கின்றீர்கள். இந்த நிலையில் எங்களுடைய மக்களை உளவியல் ரீதியாகப் பாதிப்புக்கு உள்ளாக்கும் வகையில் அண்மையில் நடந்த ஒரு சம்பவம் பற்றி உங்களிடம் நான் கூற விரும்புகின்றேன். கடந்த 9 ஆம் திகதி, ஞாயிற்றுக்கிழமை வவுனியா மாவட்டத்தில் கனகராயன் குளம் பொலிஸ் பிரிவுக்கு உட்பட்ட கனகராயன் குளத்தில் உள்ள hotel உரிமையாளர் ஒருவர் மற்றும் தனி நபரொருவருக்கு இடையில் ஒரு காணிப் பிணக்கு ஏற்பட்டிருக்கின்றது. ஏனெனில் அந்தக் காணியில் வாடகைக்கு இருந்தவர்கள் அங்கிருந்து செல்ல மறுத்தமையாகும். இந்த நிலையில் கனகராயன் குளம் பொலிஸ் நிலையப் பொறுப்பதிகாரி அந்தக் காணியை வாடகைக்கு வழங்கியிருந்த செல்வகுமார் என்ற நபருக்கும் அவருடைய மனைவி மற்றும் பிள்ளைகளுக்கும் தனது கரங்களால் அடித்திருக்கிறார். பொலிஸ் அதிகாரி ஒருவர் இப்படியாக நடந்துகொள்வது மிகவும் மோசமான, ஏற்றுக்கொள்ள முடியாத ஒரு செயலாகும். சட்டத்துக்கும் ஒழுங்குக்கும் பொறுப்பான அமைச்சரை இன்று நான் நேரடியாகச் சந்தித்து இச்சம்பவம் தொடர்பாக விளங்கப்படுத்தியிருக்கிறேன். அவர் தொலைபேசியினூடாக வட மாகாணப் பிரதிப் பொலிஸ் மா அதிபரிடம் இவ்விடயம் பற்றி வினவினார். நான் இது தொடர்பாக அவருக்குக் கடிதமும் அனுப்பியிருந்தேன். வெளிநாட்டில் தான் இருந்தபடியால் தனக்கு அந்தக் கடிதம் கிடைக்கவில்லை யென்று அவர் கூறியிருந்தார். நான் இந்த விடயத்தை ஏன் இங்கு கூறுகின்றேன் என்றால், இப்படியான பல சம்பவங்கள் தொடர்ந்தும் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. இதை ஏற்றுக்கொள்ள முடியாது. ஒரு பொலிஸ் அதிகாரி சட்ட ரீதியான நடவடிக்கையினூடாகத்தான் குறித்த விடயத்தை அணுகியிருக்க வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මට තව විනාඩියක් ලබා දෙන්න.

அதைவிடுத்து, சிவில் உடையில் வந்து அந்த நபருக்கும் அவரது மனைவி மற்றும் 14 வயது மகளுக்கும் அவர் அடித்திருக்கிறார். உண்மையில் இது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும். தொடர்ச்சியாக இப்படியான சம்பவங்கள் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. இவ்வாறான சம்பவங் களை ஏற்றுக்கொள்ள முடியாது. இதற்குரிய நடவடிக்கை எடுப்பதாக அவர் கூறியிருக்கிறார். நடவடிக்கை எடுக்கத் தவறும் பட்சத்தில், வேறுவிதமான பிரச்சினைகள் ஏற்படுவதற்கும் வாய்ப்புக்கள் இருக்கின்றன.

அதேநேரத்தில், இந்த நாட்டில் 2017ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 17 ஆம், 23ஆம், 24ஆம் திகதிகளில் SLAS Class II க்குரிய பரீட்சை நடைபெற்றது. அந்த SLAS பரீட்சை நடைபெற்று ஒரு வருடமாகியும் இன்னும் பெறுபேறுகள் வெளிவராமலிருப்பதால் பலவிதமான சந்தேகங்கள் எழுகின்றன. அதாவது இந்தப் பரீட்சையில் குறித்த ஒரு சமூகத்தினர் கூடுதலான புள்ளிகளைப் பெற்றுவிட்டார்களோ என்ற சந்தேகத்தின் அடிப்படையில், அந்தப் பரீட்சைப் பெறுபேற்றில் ஏதேனும் மாற்றங்களைச் செய்வதற்காக, சம்பந்தப்பட்டவர்கள் அந்தப் பெறுபேறுகள் வெளியிடப் படுவதைத் தாமதிக்கின்றார்களோ அல்லது அந்தப் பரீட்சையை இரத்துச் செய்வதற்கு முயற்சிக்கிறார்களோ எனப் பலவிதமான சந்தேகங்கள் எழுகின்றன. ஆகவே, இப்படியான சந்தேகங்கள் எழுவதைத் தவிர்த்து, இதற்குரிய தீர்வை மிக விரைவில் வழங்க வேண்டுமென்று கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டு, வாய்ப்புக்கு நன்றி கூறி, என்னுடைய உரையை முடிக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.40]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ගුවන් සේවයට ඉතාමත් වැදගත් වන පනත් කෙටුම්පතක් ගරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් මේ සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී ඒ සඳහා වචන කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමියට මගේ ස්තුතිය පුද කරනවා.

ශ්‍රී ලංකාවේ ගුවන් සේවය ආරම්භ කරලා, 1911දී පමණ කාලයේදී තමයි පළමුවෙන්ම ශ්‍රී ලංකාවට ගුවන් යානයක් ගෙනැවිත් තිබෙන්නේ. ප්‍රංශයේ නිෂ්පාදිත අශ්වබල 25කින් යුත් "අත්සානි" නමැති ගුවන් යානය නැවක් මඟින් මේ රටට ප්‍රවාහනය කරලා, කොළඹ වරායට ගොඩබැස්වූවා. ඒ අනුව 1911 සැප්තැම්බර් මාසයේ 12වන දා තමයි පළමුවන ගුවන් යානය ගෙනාවේ. ඊට අමතරව 1911 දෙසැම්බර් මාසයේ ජර්මානු ජාතික ගුවන් නියමුවකු වුණු ෆ්‍රාන්ස් ඔස්ටර් මහතා ඔස්ට්‍රියාවේ නිෂ්පාදිත "එට්‍රිච්" කියන ගුවන් යානය ශ්‍රී ලංකාවට රැගෙනවිත්, ඔස්ටර් විසින් කොළඹ දී සිය ගුවන් යානය ගුවන් ගත කිරීමට ගත් උත්සාහය ව්‍යර්ථ වුණා. ගුවන් යානය කඩා වැටීමෙන් ඔස්ටර් තුවාල ලබා තිබෙනවා.

ඉන් අනතුරුව 1912 දෙසැම්බර් මාසයේ 07වන දා ප්‍රංශ ජාතික ගුවන් නියමුවන් දෙදෙනකු වන වර්මින්ක් සහ පොප්රේ කොළඹ තුරහ තරග පිටියේදී ආරම්භ කළ සාර්ථක ගුවන් ගමන ශ්‍රී ලංකාවේ පළමුවන ගුවන් ගමන ලෙස ඉතිහාසගත වෙනවා. 1934දී රජය විසින් රත්මලානේ අක්කර 224ක පොල් ඉඩමක් පවරාගෙන ගුවන් තොටුපොළක් ඉදි කරලා, 1935දී එය විවෘත කර තිබෙනවා.

එවකට ප්‍රවාහන සහ වැඩ ඇමතිවරයා වශයෙන් සිටි ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා 1930 ගණන්වල ලංකාවේ සිවිල් ගුවන් සේවය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරමින් එතුමා ප්‍රධාන වැඩ කොටසක් ඉෂ්ට කරලා තිබෙනවා. ඒ වාගේම 1940 ගණන්වල දෙවන ලෝක යුද්ධයත් එක්ක ශ්‍රී ලංකාවේ ගුවන් ගමන් ඉතාමත් වැදගත් වුණා. එදා කටුනායක, වවුනියාව, පුත්තලම, ත්‍රිකුණාමලය සහ පලාලි යන ප්‍රදේශවල ගුවන් තොටුපොළවල් කිහිපයක් ආරම්භ කළා.

1947 සිට 1978 දක්වා කාලය තුළ එයාර් සිලෝන් ගුවන් සේවය ආරම්භ කරලා, 1979දී එයාර් ලංකා ගුවන් සේවය ආරම්භ කරලා, 1998දී ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් නමින් ආරම්භ කරලා ඒ තුළින් ශ්‍රී ලංකාවේ ගුවන් සේවය ඉතාමත් ශක්තිමත් කරලා, ජාත්‍යන්තර මට්ටමට ගෙන එන්නට පුළුවන්කමක් ලැබුණා. එම්රේට්ස් ගුවන් සමාගම එදා ඇමෙරිකානු ඩොලර් මිලියන 70ක් වටිනා කොටස් සියයට 40ක් මිල දී ගෙන ආයෝජන සහ කළමනාකරණ තීරණ සඳහා සම්පූර්ණ පාලනය එම්රේට්ස් වෙත ලබා දී තිබෙනවා. 2008 මාර්තු 31වන දා එම්රේට්ස් සහ ශ්‍රී ලංකා රජය අතර පැවති ගිවිසුම අවසන් වුණා. ඉන් පස්සේ එම්රේට්ස් සතුව තිබූ කොටස් ඇමෙරිකානු ඩොලර් මිලියන 53කට 2010දී ශ්‍රී ලංකා රජයට විකුණා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2006 ඔක්තෝබර් 24වන දා මිහින් ලංකා නමින් තවත් ගුවන් සේවයක් ආරම්භ කරලා, ඉන් පසුව මිහින් ලංකා ගුවන් සේවයත් ශ්‍රීලන්කන් ගුවන් සේවය යටතට ගෙන කටයුතු කළා. ඒ වනවිට බිලියන 17ක අලාභයක් තිබුණා. 2017 ජනවාරි 13වන දා එය අහෝසි කර තිබෙනවා. මේ වනකොට මිලියන 28,829ක අලාභයක් තිබෙනවා. මේ ඉතිහාසය ගැන කථා කරනකොට අපට පැහැදිලිව පෙනෙනවා, ශ්‍රී ලංකා ඉතිහාසය තුළ විශේෂයෙන්ම ලංකාවට ආවේණික වුණු, ඒ වාගේම සාම්ප්‍රදායික වුණු ගුවන් සේවයක්, අනන්‍යතාවක් අපට තිබුණු බව.

මේ සම්බන්ධයෙන් කටයුතු කරන කොට ජාත්‍යන්තර මට්ටමින් ගුවන් සේවා සමාගම් එක්ක කටයුතු කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. අද විවාදයට ගන්නා ගුවන් ප්‍රවාහන පනත් කෙටුම්පත තුළින් අපේ ගරු අමාත්‍යතුමා ගෙන එන්නේ කැනඩාවේ මොන්ට්‍රියල් නගරයේ පැවතුණු 1999 වසරේ අත්සන් කරන ලද සම්මුතියට අනුව MC99 ලෙස හැඳින්වෙන සම්මුතියයි. මේ වනකොට රටවල් රැසක් මෙම සම්මුතිය අනුගමනය කරලා තිබෙනවා. ගුවන් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වඩාත් වේගවත්ව හා කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය පිටුබලය මේ සම්මුතියෙන් සැලසෙනවා. මේ සේවා සම්බන්ධයෙන් ජාත්‍යන්තරය සමඟ කටයුතු කරන රටක් හැටියට අපට මේ සම්මුතියෙන් ලොකු වාසියක් ලැබෙනවා.

MC99 මඟින් සැලසෙන ප්‍රධානතම වාසියක් මම සඳහන් කරන්නම්. ගුවන් මගීන් මරණයට පත් වෙලා, තුවාල ඇති වෙලා, ඒ වාගේම භාණ්ඩ ප්‍රවාහනයේදී නැති වීම තුළින් වන අලාභයන් පිළිබඳව කෙටි කාලයක් තුළ ඉතාමත් ඉක්මනින් අධිකරණ ක්‍රියාමාර්ග අරගෙන ඒ තුළින් ප්‍රවාහකයින්ට එහෙම නැත්නම් ගුවන් මගීන්ට තිබෙන සම්බන්ධතාව ශක්තිමත් කරලා ඒ තුළින් අන්‍යෝන්‍ය විශ්වාසය ඇති කරලා, තමන්ට අලාභයක් වනවා නම් මේ සම්මුතිය මඟින් කටයුතු කිරීමේ හැකියාවක් අපට තිබෙනවා.

මගීන් ප්‍රවාහනයේදී ගමනාරම්භක ස්ථානයේ සිට ගමනාන්තය පිළිබඳව සඳහන් වන ඉතා පැහැදිලි වැඩ පිළිවෙළක් අනුගමනය කිරීමේ හැකියාව මේ අලුත් තාක්ෂණික ක්‍රමය අනුව ලැබෙනවා. ඒ විතරක් නොවෙයි. අද බොහෝ විට ගුවන් ගමන් යනකොට නොයෙක් අතවරවලට මුහුණ දෙන්න සිදුවන බව අපි දන්නවා. එහිදී භාණ්ඩ නැතිවන අවස්ථා තිබෙනවා.

සමහර භාණ්ඩ විනාශ වන අවස්ථා තිබෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ තුළින් ඉතාම ආරක්ෂිතව, රක්ෂණයක් ඇතිව එවැනි කටයුතු කිරීමේ හැකියාවන් වඩාත් බලගන්වන බව සඳහන් කරන්න ඕනෑ. ජාත්‍යන්තරයත් එක්ක බලන කොට පසු ගිය කාල පරිච්ඡේදය තුළ අපේ ගුවන් සේවය තුළින් ඉතාම හොඳ සේවාවක් සිද්ධ වුණා. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ගුවන් යානයකින් ගමනක් යනකොට බොහොම සතුටින්, බොහොම සෙනෙහසින්, බොහොම ලෙන්ගතුකමින් කටයුතු කරන්න අපට පුළුවන්කම ලැබුණා. නමුත් ගරු අමාත්‍යතුමනි, ඒවායේත් යම් අඩු පාඩුකම් තිබෙනවා. වර්තමාන රජය බලයට පත් වුණාට පසු ඔබතුමා ගුවන් තොටුපොළ පර්යන්ත සුවිශාල කරලා, ගුවන් යානා බැස්සවීම සහ නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් ඇති කළා. නමුත් අපේ ගුවන් තොටුපොළවල තත්ත්වය පිළිබඳව අපි කනගාටු වෙන්න ඕනෑ. අපි ලෝකයේ වෙනත් රටවලට ගියාම, විශේෂයෙන් චීනය, රුසියාව, අපේ ආශ්‍රිත රටවල් වන දකුණු කොරියාව, ඉන්දියාව, සිංගප්පූරුව වැනි රටවල්වලට ගියාම ඒ ගුවන් සේවාවල විශාල දියුණුවක් තිබෙන බව දකිනවා. සිංගප්පූරුවේ ගුවන් ප්‍රවාහනයේ විශාල දියුණුවක් තිබෙනවා. ඒ සමඟර ගුවන් තොටුපොළවලට ගියාම අපට ඒ තිබෙන තත්ත්වය හිතා ගන්නවත් බැහැ. ඒ නිසා අපේ ගුවන් තොටුපොළවල් ගැන අපි කනගාටු වෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමාට විශාල වගකීමක් තිබෙනවා. මේ අවුරුදු දෙක තුන ඇතුළත මේවා ඔක්කොම කරන්න පුළුවන්කමක් නැහැ. මේ ගුවන් තොටුපොළවලට අවශ්‍ය පහසුකම් ඇති කිරීම සඳහා ඔබතුමාට විශාල වගකීමක් තිබෙනවා. ඕනෑම ගුවන්

තොටුපොළක වැසිකිළියකට ගියාම ඒ ගුවන් තොටුපොළේ තත්ත්වය පිළිබඳව අපට පෙනෙනවා. වෙනත් රටකට ගිහිල්ලා ඒ ගුවන් තොටුපොළේ සනීපාරක්ෂක පහසුකම් භුක්ති විඳින අපට ලංකාවට ආවාම අපේ ගුවන් තොටුපොළක තිබෙන තත්ත්වය ඉතාම කනගාටුදායකයි. ඒ නිසා මීට වඩා විධිමත්, ක්‍රමානුකූල, පිරිසිදු සහ නවීන අංගෝපාංගවලින් සමන්විත ඒ පහසුකම් අපට ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක් එක් පර්යන්ත - terminals- පිළිබඳව කථා කරන කොට, පසු ගිය දවස්වල කොරියාවට ගියාම අපි දැක්කා ලෝකයේ තිබෙන විශාලතම-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක් දෙකක් දෙන ලෙස ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා. ඒ කාලය ඇතිවෙයි කියලා මම හිතනවා.

Terminals නිර්මාණය කිරීම, ඉදි කිරීම සම්බන්ධයෙන් අපි සැලකිලිමත් වෙන්න ඕනෑ. සංවර්ධනය වෙමින් පවතින රටක් වන අපි පසු ගිය කාලයේ මිහින් එයාර් ගුවන් සමාගම ඇති කරලා, ඒ තුළින් සිදු වුණු පාඩුව නිසා ඉතාම දරුණු ඛේදවාචකයක් ඇති වුණා. ශ්‍රීලන්කන් ගුවන් සමාගම පාඩු ලබන තත්ත්වයේ තිබියදී කිසිම ඉවක් බවක් නැතිව හිතුමතේ, හිතුවක්කාර විධියට තමන්ගේ නම්වලින් සඳහන් කරමින් තවත් සමාගම් ඇති කිරීමෙන් ඊට වඩා පාඩු ලබන තත්ත්වයට පත් වුණා. 2017දී පමණක් අපේ ශ්‍රීලන්කන් ගුවන් සේවයට රුපියල් මිලියන 28,929ක අලාභයක් සිදුවීම බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා අපට සිද්ධ වෙනවා, කවුරු මොන විධියට කථා කළත් මේ සේවාව සුදු අලියකු බවට පත් වෙන්න ඉඩ හරින්නේ නැතිව ඒ භූමිය තුළින්, ඒ ගුවන් සේවාව තුළින් යම් කිසි ආදායමක් ලබා ගන්න කටයුතු කරන්න. ඒ විතරක් නොවෙයි, ලංකාව ලෝකයේම සංචාරක මධ්‍යස්ථානයක් වන විට අපි තව තවත් ගුවන් සේවා ආරම්භ කරන්න ඕනෑ.

අවසාන වශයෙන් ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ශ්‍රී ලංකාවේ කටුනායක ගුවන් තොටුපොළ ගුවන් යානා හුවමාරු වන මධ්‍යස්ථානයක් හැටියට පත් කරන්න කටයුතු කරන්නය කියලා. ඒ තුළින් අපට විශාල ආදායමක් ලබා ගන්න පුළුවන් කියලා අපි දන්නවා. ඒ කාලයේ ඕස්ට්‍රේලියාවට ගුවන් යානා ගිය ආකාරය අපි දන්නවා. සමහර රටවලට ලංකාවේ ඉඳලා එකම ගමන් වාරයකින් යන්න පුළුවන්කම තිබුණා. ඒ නිසා ඔබතුමාගේ කාල පරිච්ඡේදය තුළ ගුවන් යානා හුවමාරු වන මධ්‍යස්ථානයක් හැටියට කටුනායක ගුවන් තොටුපොළ පත් කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් එය ඉතාම වටිනවා. ලංකාව සතුව ගුවන් යානා කීයක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. ඒවායින් කීයක් ආදායම් ලැබෙනවාද කියලා මම දන්නේ නැහැ. අපට තවමත් තිබෙන්නේ බද්දට ගත්ත ඒවා. ඒ නිසා අපට කියලා හරියට ආදායමක් ලබන්න පුළුවන් එක ගුවන් යානයක් හෝ අප ලබා ගත යුතු වෙනවා. අප සතුව තිබෙන්නේ ගුවන් යානා 25ක් 26ක් වාගේ පුංචි ප්‍රමාණයක්. ජාත්‍යන්තර ගුවන් සමාගම් එක්ක ගත්තාම ඒක ඉතා සුළු ප්‍රමාණයක්. ඒක අපට ලොකු ප්‍රශ්නයක්. අපි ජය ගත යුතු අභියෝගයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම පනත් කෙටුම්පත සහ අද දින ඉදිරිපත් කර තිබෙන නියෝග තුළින් ලෝකයේ අනෙකුත් රටවල ගුවන් සමාගම් එක්ක ළඟැදියාවෙන් කටයුතු කරමින්, ඒ තුළින් මේ රටේ ගුවන් සේවය විධිමත් කරන්න පුළුවන් ශක්තියක් ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.51]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින මේ විවාදයේදී අගනා අදහස් ඉදිරිපත් කළ ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ සියලු මැති ඇමතිතුමන්ලාට මගේ ස්තුතිය පළමුවෙන්ම ප්‍රකාශ කරන්න කැමැතියි. මම බොහෝ ප්‍රශ්නවලට ඒ අවස්ථාවේදීම උත්තර ලබා දුන්නා.

අරුගම්බේ සහ කල්මුණේ තිබෙන ජලාශ මත ගුවන් යානා ගොඩ බැස්සවීම පිළිබඳව කල්පනා කරන්න කියලා නියෝජ්‍ය ඇමති හරිස් මැතිතුමා ඉල්ලීමක් කළා. ඇත්ත වශයෙන්ම ඒ පිළිබඳව ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරිය විසින් සොයා බලා, තාක්ෂණික වශයෙන් එය කිරීමට හැකියාවක් තිබෙනවා නම් අපි එයට අවස්ථාවක් සලසා දෙන බව ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම, පුත්තලම ගුවන් තොටුපොළ පිළිබඳව ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ මෙකයි. අපි මේ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් - feasibility study - කළා. Holcim Cement Factory එකේ විමිනියක් airport එකේ ඉඳලා කිලෝමීටරයක දුරින් තිබෙන නිසා එය සංවර්ධනය කිරීමට අපහසු වන විධියේ තාක්ෂණික ගැටලුවක් මතුවෙලා තිබුණා. ඒ වාගේම, Sri Lanka Air Force එකේ defence radar එක එහි සවි කරලා තිබෙන නිසා එය ඉවත් කිරීමේදී ඇති වන ගැටලු පිළිබඳව කල්පනා කර බලා -ඒ තාක්ෂණික හේතු මත- ඒ ස්ථානයේ ගුවන් තොටුපොළක් ඉදිකිරීමේ අදහස අපට අත්හැර දාන්න වුණා.

අපේ ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා Flight Information Region එක අපි පෞද්ගලිකකරණය කරන්න යනවා කියා මතයක් ප්‍රකාශ කළා. නමුත් ඒවා පෞද්ගලීකරණය කිරීමේ කිසිම අදහසක් අපට නැහැ.

ඊළඟට, කටුනායක ගුවන් තොටුපොළේ දෙවැනි runway එක හදන්නේ කොයි පැත්තෙන්ද කියන කාරණය පිළිබඳ විවිධ මත තිබෙනවා. ජනතාවට අවම හානියක් සිදු වන ආකාරයෙන් second runway එක හදන්න බලන්න ඕනෑ. අඩු පිරිසක් ඉවත් කරලා මේ runway එක හදන්නේ කොහොමද, කොයි පැත්තෙන්ද හදන්නේ කියන කාරණය පිළිබඳව අපි අධ්‍යයනයක් කරගෙන යනවා. හැබැයි, එය හදන පැත්ත පිළිබඳව තීන්දු කිරීමේදී ඒ සම්බන්ධයෙන් තිබෙන නිර්ණායකත් සලකා බලා තමයි අපට තීන්දුවක් ගන්න වෙන්නේ. ඒ නිසා කොයි ස්ථානයේ එය හදනවාද කියන එක පිළිබඳව තවම අවසාන තීරණයක් අපි අරගෙන නැහැ.

ඒ වාගේම, මේ රටට පැමිණෙන ගුවන් මගීන්ගෙන් තවත් ඩොලර් පහක මුදලක් අය කරන්නට යන බවත්, අපේ ගිනි නිවන සේවාව හා ආරක්ෂක සේවාව පෞද්ගලික අංශයට දෙන්න යන බවත් අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා. නමුත් එවැනි කිසිම

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

අදහසක් නැහැ. මෙලෙස අය කරනු ලබන ඩොලර් පහේ මුදල භාණ්ඩාගාරය විසින් දැරීමට එකඟ වෙලා තිබෙනවා. ඒ නිසා ගුවන් මගීන්ට ඒ සම්බන්ධයෙන් කිසිම අමතර වැය බරක් දැරීමට සිදු වෙන්නේ නැහැ.

එමෙන්ම, උතුර පළාත නියෝජනය කරන මන්ත්‍රීතුමා පලාලි airport එක පිළිබඳව කථා කළා. අපි වැඩක් කරන්න ගියාම ඒ හැම අවස්ථාවකදීම වෙන රටවල් දිහා බලන බව මා විශේෂයෙන්ම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ඇයි අපි එහෙම බලන්නේ? අපි කථානායකතුමා එක්ක ඉන්දියානු සංචාරයක නිරත වුණා. අපි ඉන්දියානු සංචාරයට ගිය අවස්ථාවේ ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ විශාල ජල ගැල්මක් ඇති වුණා. ඒ ජල ගැල්ම නිසා ජීවිත හා දේපළ හුඟක් විනාශ වුණා. ඒ අවස්ථාවේ රටවල් ගණනාවක් ඉන්දියාවට ආධාර දෙන්න ඉදිරිපත් වුණා. නමුත්, "අපට ඔයගොල්ලන්ගේ ආධාර ඕනෑ නැහැ. අපට මේවා manage කර ගන්න පුළුවන්. අපට ඒ කටයුතු කරන්න පුළුවන්" කියලා ඉන්දියාව කිව්වා. අන්න එහෙමයි ඉන්දියාව කටයුතු කළේ.

එම නිසා අපි හැම දේකටම විදේශ රටවලින් මුදල් සොයාගෙන කටයුතු කළ යුතු නැහැ. මොන රටක්වත් අපට නොමිලේ මේවා කරලා දෙන්නේ නැහැ. ණය ආධාර වශයෙන් තමයි දෙන්නේ. අපි ඒවා ආපහු ගෙවන්න ඕනෑ. Palali Airport එක සම්බන්ධව තීක්ෂණ බුද්ධියෙන් යුතුව කල්පනා කරලා තමයි අපි තීරණ ගෙන තිබෙන්නේ. එම නිසා මමත්, ගරු අගමැතිතුමාත්, ගරු ජෝන් අමරතුංග ඇමතිතුමාත් ඒකාබද්ධ කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කර ශ්‍රී ලංකා ගුවන් හමුදාව මඟින් මෙහි අලුත්වැඩියා කටයුතු සියල්ල ඉටු කර මෙම ගුවන් තොටුපොළ A320 ගුවන් යානා ගොඩ බැස්සවිය හැකි තත්ත්වයට ගෙන ඒමට මුදල් සොයා ගෙන තිබෙනවා. සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් රුපියල් මිලියන 750කුත්, සංචාරක අරමුදලෙන් රුපියල් මිලියන 1,000කුත් ලබාදීලා, ඒ තුළින් මේ වැඩ කටයුතු කිරීමට සැලසුම් කර තිබෙනවා. එම කටයුතු කළාට පසුව අපට පළමුවෙන්ම රට ඇතුළත ගුවන් සේවාවන් ක්‍රියාත්මක කිරීමත්, ඉන් පසුව රටින් පිට යන ගුවන් සේවාවන් ක්‍රියාත්මක කිරීමත් යන මේ හැම දෙයක්ම පටන් ගන්න පුළුවන් වෙයි. හැබැයි, බෙදන්න ඉස්සෙල්ලා හොද්ද හදා ගන්න ඕනෑ. එම නිසා මේ ගුවන් තොටුපළ ප්‍රමිතියෙන් යුතුව සකස් කිරීමේ කාර්ය අප විසින් කරනවා. ජාතික සංහිඳියාව සඳහා, උතුරත් දකුණත් යා කිරීමේ ක්‍රියාවලිය සඳහා අපි මෙවැනි සංවර්ධන කටයුතු කරන්න ඕනෑ කියා මම කල්පනා කරනවා. ඒවා කොන් කරන්න හොඳ නැහැ. අපි Mattala Airport එක දියුණු කරනවා වාගේම Palali Airport එකත් දියුණු කරන්න ඕනෑ; සීගිරියත් දියුණු කරන්න ඕනෑ; ත්‍රිකුණාමලයත් දියුණු කරන්න ඕනෑ. ඒක තමයි අපේ රජයේ ප්‍රතිපත්තිය. ඒ නිසා අපි එම කටයුතු කරනවා. අපට ඒ තැන්වලින් ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ කරන්න පුළුවන් වෙයි කියා මම හිතනවා. එහෙම නැතිව අපි මේ ගුවන් තොටුපොළ දියුණු කරන්නේ කාට හරි විකුණන්න හෝ, කාට හරි දෙන්න හෝ, විදේශිකයන් ගෙන්වීමට හෝ නොවෙයි. දේශීය වශයෙන් මෙම ගුවන් තොටුපොළ දියුණු කර අපේ රට තුළ ගුවන් සේවා පහසුකම් වැඩි දියුණු කිරීමයි අපි බලාපොරොත්තු වන්නේ. ඒ තුළින් සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීම ඇතුළු කරුණු රාශියක් පිළිබඳව අපි ඉතා අවධානයෙන් කටයුතු කරනවා.

මෙතැනදී විෂයට පරිබාහිර ප්‍රශ්නයකුත් ඇහුවා. අපි EPF ගෙවලා නැහැ කියලා කිව්වා. අපි EPF ඔක්කොම ගෙවලා තිබෙන්නේ. නමුත් සේවකයින්ට සමහර මුදල් ගෙවීමට තිබෙනවා. අපි දැනට විශාල මුදල් ප්‍රමාණයක් ගෙවා තිබෙනවා. ඉතිරි මුදල් ටිකත් අපි ඉතා ඉක්මනින් ගෙවනවා.

ඒ වාගේම ලංකා ගමනාගමන මණ්ඩලය ලාභ ලබන ආයතනයක් බවට පත් කිරීමට මට හැකියාව ලැබී තිබෙනවා. ලංගා ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ට රුපියල් 10,000ක් බෝනස් වශයෙන් ගෙවනවා. මෙතෙක් කල් ලබා නොදුන් පඩි වැඩි කිරීම් දෙකක් ලබන මාසයේ සිට ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ට ලබා දෙනවා. අපි මේ රජයට එකතු වී අපේ අමාත්‍යාංශ තුළින් කඩා වැටුණු ආයතන තව දුරටත් කඩා වටිටන්නේ නැතිව දියුණු කර ඉහළ තත්ත්වයකට ගෙන ඒමට අපට පුළුවන් වුණා. ඒ ගැන අපි ඉතාම සන්තෝෂ වෙනවා.

මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. විශේෂයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපති ආනන්ද විමලසිරි මැතිතුමා මෙයට නායකත්වය ලබා දුන්නා. ලංකාවේ එවැනි ප්‍රවීණයන් සොයා ගන්න අමාරුයි. එම ක්ෂේත්‍රයේ විදේශිකයෙක් ගෙනාවොත් අපට ඩොලර් 10,000ක්, 15,000ක් ගෙවන්න වෙනවා. මේ සියලු නීති-රීති, රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවීණ, එම ක්ෂේත්‍රය තුළ ගැඹුරු අධ්‍යයනයක් කර අත්දැකීම් තිබෙන කණ්ඩායමක් බිහි කිරීමේ අභියෝගය අපට තිබෙනවා. අපි එම අභියෝගයට මුහුණ දීමට කටයුතු කරනවා. ඒකට ටික කාලයක් ගත වෙයි. නමුත් ඒකත් අනිවාර්යයෙන්ම අප විසින් කළ යුතුයි. ඒ බවත් ප්‍රකාශ කරමින් මෙම විවාදයට සහභාගි වූ සියලුදෙනාට මගේ ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත රීට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*විනා විවාදයකට, ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය." - [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]***
*තීරණය කරන ලදී.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon.Nimal Siripala De Silva.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
[THE HON. PRESIDING MEMBER *in the Chair.]*

***1සිට 9තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 9ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 9 ordered to stand part of the Bill.*

***උප ලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*அட்டவணை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Schedule, ordered to stand part of the Bill.*

***පූර්විකාව, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*முன்னுரை, சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Preamble, ordered to stand part of the Bill.*
***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, accordingly read the Third time, and passed.*

## සිවිල් ගුවන් සේවා පනත: නියෝග
## குடியியல் வான்செலவுச் சட்டம்: ஒழுங்குவிதிகள்
## CIVIL AVIATION ACT: REGULATIONS

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා.

"2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 11(1)(ආ), 17(2) සහ 31 (ඇ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 117(2)(එ) වගන්තිය යටතේ සිවිල් ගුවන් සේවා නිරූපදිතා කළමනාකරණ නියෝග සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 05 දිනැති අංක 2065/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.08.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.03 ට, 2018 සැප්තැම්බර් 19 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***


*அதன்படி பி. ப. 6.03 மணிக்கு பாராளுமன்றம், 2018 செப்ரெம்பர் 19, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 6.03 p.m. until 1.00 p.m. on Wednesday, 19th September, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 263 - இல. 6
Volume 263 - No. 6

2018 සැප්තැම්බර් 19වන බදාදා
2018 செப்ரெம்பர் 19, புதன்கிழமை
Wednesday, 19th September, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි.

**ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි.

**ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි.


---

# பிரதான உள்ளடக்கம்


**அரசாங்க சேவை ஆணைக்குழுவின் அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபைச் சட்டமூலம்**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

**பிரதேச சபைகள் (திருத்தம்) சட்டமூலம்** :
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது.

**இலங்கை ஆளணி முகாமை நிறுவகம் (திருத்தம்) சட்டமூலம்** :
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.


---

# PRINCIPAL CONTENTS


REPORT OF PUBLIC SERVICE COMMISSION

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

NEW VILLAGES DEVELOPMENT ATHORITY FOR PLANTATION REGION BILL:
Read a Second, and the Third time, and passed

PRADESHIYA SABHAS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

INSTITUTE OF PERSONNEL MANAGEMENT, SRI LANKA (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2018 සැප්තැම්බර් 19වන බදාදා*
*2018 செப்ரெம்பர் 19, புதன்கிழமை*
*Wednesday, 19th September, 2018*

---

**අ.භා.1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்) தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] in the Chair.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්තාව
## அரசாங்க சேவை ஆணைக்குழுவின் அறிக்கை
## REPORT OF PUBLIC SERVICE COMMISSION

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

I present the Progress Report of the Public Service Commission for the First quarter of 2018 (01.01.2018 - 31.03.2018) in terms of Articles 41B (6) and 55(5) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා විගණන සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2016 වර්ෂය සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2016 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන සහ ගිණුම් වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව ව්‍යාපාර සහ වාණිජ කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා පොල් පර්යේෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2016 වර්ෂය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තාව
## நிலைக்கட்டளை இல. 52 (6)இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கை
## REPORT PRESENTED UNDER STANDING ORDER NO. 52(6)

### වෛද්‍ය එස්. එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### டாக்டர் எஸ்.எஸ். குணவர்தன சுதேச ஆயுர்வேத அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### DR. S.S. GUNAWARDANA INDIGENOUS AYURVEDA DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

"Report on the Bill titled 'Dr. S. S. Gunawardana Indigenous Ayurveda Development Foundation (Incorporation) Bill' ". - [The Hon. Lakshman Kiriella on behalf of the Minister of Health, Nutrition and Indigenous Medicine]

*පනත් කෙටුම්පත 2018 සැප්තැම්බර් මස 20 වන බුහස්පතින්දා දෙ වන වර කියවීය යුතුයයි නියෝග කරන ලදී.*
*சட்டமூலம் 2018 செப்ரெம்பர் 20, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Bill ordered to be read a Second time upon Thursday, 20th September, 2018.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ව්‍යාපාර හා වාණිජ කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් ව්‍යාපාර හා වාණිජ කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2014/2015 සහ 2015/2016 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(ii) 2012 වර්ෂය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iii) 2016 වර්ෂය සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iv) 2017 වර්ෂය සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, உள்ளக நிருவாகம் மற்றும் அரச முகாமைத்துவம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் தவிசாளர் சார்பாக உள்ளக நிருவாகம் மற்றும் அரச முகாமைத்துவம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவிற்கு ஆற்றுப்படுத்தப்பட்ட, "பிரதேச சபைகள் (திருத்தச்) சட்டமூலம்" தொடர்பிலான அக்குழுவின் அறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 41 වගන්තිය යටතේ නියෝගය;

(ii) 2017 වර්ෂය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iv) 2013 සහ 2014 වර්ෂ සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික පාලන වාර්තා; සහ

(v) 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(ii) 2016/17 වර්ෂය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2014, 2016 හා 2017 යන වර්ෂ සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(v) 2013 සහ 2014 යන වර්ෂ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා; සහ

(vi) 2017 වර්ෂය සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු හා වෘත්තීය සම්බන්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரவீந்திர சமரவீர - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர்)
(The Hon. Ravindra Samaraweera - Minister of Labour and Trade Union Relations)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දෙල්ගොඩ, පූගොඩ පාර, අංක 316/සී දරන ස්ථානයෙහි පදිංචි ආර්.එම්. ධර්මදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Ajith P. Perera - *[Not in the Chamber.]*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) සුල්තානාගොඩ, අකුරුගොඩ, මාවිදෙණිය "මනෝජ්" යන ලිපිනයෙහි පදිංචි එච්.එන්. මනෝජ් ප්‍රියන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාතර, තිහගොඩ, අරලිය මාවත, "සඳරු" යන ලිපිනයෙහි පදිංචි එන්. හිමාලි ප්‍රදීපා දිසානායක මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම සුල්තානාගොඩ, අකුරුගොඩ, පරණවත්ත හේන, අංක 50/2/1 යන ලිපිනයෙහි පදිංචි කේ.ජේ. විතාරණ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පදවිය, "ඒ" යාය, අංක 74 යන ලිපිනයෙහි පදිංචි එච්.ආර්. පොඩිමැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම නාකියාදෙණිය, තෙල්ලඹුර ඉහළ, හෙරලියගස්ගොඩැල්ල යන ලිපිනයෙහි පදිංචි ඩී.ජී. කරුණාදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Question No. 1 - 18/'18 - (2), the Hon. Ananda Aluthgamage.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Question No. 2 - 60/'18 - (1), the Hon. (Dr.) Bandula Gunawardane.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Gunawardane, what is your point of Order?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ ප්‍රශ්නය යොමු කළේ, ගරු කෘෂිකර්ම ඇමතිතුමාට. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානයත් මේ සඳහා යොමු කරනවා. විශේෂයෙන් කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ උක් වගා කරන ගොවීන් සම්බන්ධයෙන් සහ සීනි පාරිභෝගිකයන් සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් අද මතු වෙලා තිබෙනවා.

පසුගිය දා මධ්‍යම රාත්‍රී දොළහේ සිට සීනි, විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ඉවත් කරලා ඒ සඳහා අතිරේක විශේෂ බද්දක් පැනවීම කරණකොටගෙන වෙළෙඳ පොළේ සීනි කිලෝ එකක මිල රුපියල් 18 - 20 අතර ප්‍රමාණයකින් ඉහළ නඟින බවයි පැවසෙන්නේ. විටෙක සත 25ට බදු අඩු කරලා තිබෙනවා. තව වෙලාවක රුපියල් 46ක් වෙන කල් බද්ද වැඩි කරනවා. මේ වාගේ ප්‍රතිපත්තියක් නැති වුණාම අපේ රටේ කෘෂි කාර්මික ක්ෂේත්‍රයට වන බලපෑම ගැන -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## දඹුල්ල දිසා රෝහලේ පහසුකම් ඉහළ නැංවීම : ගනු ලබන පියවර
## தம்புள்ள மாட்ட வைத்தியசாலையின் வசதிகளை மேம்படுத்தல்: மேற்கொண்ட நடவடிக்கைகள்
## UPGRADE FACILITIES AT DAMBULLA DISTRICT HOSPITAL: STEPS TAKEN

144/'18

**3. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දඹුල්ල දිසා රෝහලේ බාහිර ප්‍රතිකාර අංශයට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා දිනපතා විශාල රෝගීන් පිරිසක් පැමිණෙන බවත්;

(ii) එම රෝගීන්ට ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් මෙම රෝහලේ නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, දඹුල්ල රෝහලේ පහසුකම් ඉහළ නැංවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போஷணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தம்புள்ள மாட்ட வைத்தியசாலையின் வெளி நோயாளர் பிரிவுக்கு சிகிச்சை பெறுவதற்காக நாளாந்தம் பெருந்தொகையானோர் வருகை தருகின்றனர் என்பதையும்;

(ii) இவர்களுக்குப் போதிய மலசலகூட வசதிகள் இவ்வைத்தியசாலையில் காணப்படுவதில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், தம்புள்ள வைத்தியசாலையின் வசதிகளை மேம்படுத்த அமைச்சு மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Is he aware that-

(i) a large number of patients arrive at the Out Patient Department of Dambulla District Hospital every day to get medical treatment; and

(ii) this hospital does not have sufficient toilet facilities for those patients?

(b) If so, will he inform this House of the nature of the steps that will be taken by the Ministry to improve facilities at Dambulla District Hospital?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා ඇත.

(ආ) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මට අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පුළුවන්.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, මෙහි සායන සඳහා පැමිණෙන රෝගීන්ට හවස 4.00ට ඇවිල්ලා පසුදා උදෑසන 4.00 වෙන කල් රෝහලේ නවතින්න සිදු වෙලා තිබෙනවා. ඇත්තටම කිව්වොත් ඒ අයට යටිතල පහසුකම් නැහැ. සමහර අය තැන් තැන්වල නිදාගෙන ඉන්නකොට යාචකයෝ කියලා හිතලා සල්ලි දීලා යන අවස්ථාත් තිබෙනවා.

ගොවි පවුල්වල මිනිස්සු තමයි එතැනට එන්නේ. ගරු ඇමතිතුමනි, දඹුල්ල රෝහලේ යටිතල පහසුකම් වාගේම වෛද්‍යවරුන්ගේ හා සේවකයන්ගේත් හිඟයක් තිබෙනවා. එම හිඟය පියවන්නට කටයුතු කරනවාද? එහෙම නම් ඒ කවදාද කියා දැන ගන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. දඹුල්ල රෝහලට උතුරු මැද පළාතෙන්, වයඹ පළාතෙන් සහ මධ්‍යම පළාතෙන් ඒ කියන්නේ අනුරාධපුර, පොලොන්නරුව දිස්ත්‍රික්කවල රෝගීන්, ඒ වාගේම කුරුණෑගල දිස්ත්‍රික්කයේ රෝගීන්, මාතලේ දිස්ත්‍රික්කයේ රෝගීන් පැමිණෙනවා. ගරු ඇමතිතුමනි, මේ වෙනකොට නව රෝහලක් ඉදි කිරීමට කියලා බිලියන 7ක් වෙන් කරලා තිබෙනවා. ඒ නව රෝහල අලුතින් ඉඩමක් අරගෙන එතැන ඉදිකරන්නටයි කටයුතු යොදා තිබෙන්නේ. නමුත් මධ්‍යම පළාත් සභාවට මේ රෝහල පාලනය කර ගන්නට හැකියාවක් නැහැ. මොකද, රෝගීන් විශාල පිරිසක් එන නිසා. ඒ නිසා මේ රෝහල රේඛීය අමාත්‍යාංශය යටතට අරගෙන රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහලක් විධියට පවත්වාගෙන යන්න කටයුතු කරනවාද කියන එක දැන ගන්න කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රෝහලට දවසකට රෝගීන් 600ක් පමණ ප්‍රතිකාර ගැනීමට එනවා. වැසිකිළි පහසුකම් සලසා තිබෙනවා. ඒවා ගැහැනු, පිරිමි, ආබාධිත වශයෙන් වෙන් කර සපයා දී තිබෙන බව තමයි දැනුම් දීලා තිබෙන්නේ. ඒවායේ පවිත්‍රතාව පිළිබඳවත් ප්‍රශ්නයක් නැහැ කියලා දන්වා තිබෙනවා. මොකද, පෞද්ගලික අංශයට එම පවිත්‍රතා කටයුතු භාර දීලා තිබෙනවා. ඒ වාගේම රෝහලේ පහසුකම් ඉහළ නංවන්න දැනටමත් අමාත්‍යාංශය රුපියල් මිලියන 7,500ක් වැය කරලා අංග සම්පූර්ණ රෝහලක් බවට පත් කිරීමේ සංවර්ධන කටයුතු ආරම්භ කරලා තිබෙන බව තමයි අමාත්‍යතුමා දැනුම් දීලා තිබෙන්නේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමා, මගේ පෞද්ගලික අත්දැකීමක් ප්‍රකාශ කරන්නම්. මට පසුවේ අමාරුවක් හැදිලා රෝහලේ දෙකේ වාට්ටුවට ගියා. ඒ ගිය වෙලාවේ රෝහලේ ECG machine එකත් වැඩ කළේ නැහැ. -[බාධා කිරීමක්]- ඒවා පසුගිය අවුරුදු තුන ඇතුළත සිද්ධ වෙච්ච දේවල් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. මම කියන්නේ, කාලයක් තිස්සේ පවතින අඩු පාඩු ගැනයි. අංක 5 සහ 11 කියන ළමා වාට්ටුවලත් අඩු පාඩු තිබෙනවා. ඒ වාගේම, ප්‍රසව හා නාරිවේද වාට්ටුවේත් අඩු පාඩු තිබෙනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ රෝහලේ සංචාරයකට ගිහිල්ලා තිබෙනවා. ඒ අවස්ථාවේ දී මේ අඩු පාඩු සියල්ල වහලා තමයි පෙන්වලා තිබෙන්නේ. එම නිසා ඒ කෙරෙහි අවධානය යොමු කරන්න කියාත් ඉල්ලා සිටිනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමියනි, මිලියන 7,500ක සංවර්ධන වැඩ කටයුතු කරන කොට ඔබතුමිය කියපු බොහෝ අඩු පාඩුකම් ඉෂ්ට වෙයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Question No. 4-177/'18-(1), The Hon. (Dr.) Nalinda Jayathissa-*[Not in the Chamber.]*

## රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කිරීම : විස්තර
## இராஜதந்திர கடவுச்சீட்டுக்கள் வழங்குதல்: விபரம்
## ISSUANCE OF DIPLOMATIC PASSPORTS: DETAILS

211/'18

**5. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යම් පුද්ගලයෙකු රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයකට හිමිකම් ලබන්නේ දැයි තීරණය කරනු ලබන තොරතුරු අඩංගු චක්‍රලේඛයක්, රෙගුලාසියක් හෝ අමාත්‍ය මණ්ඩල තීරණයක් තිබේ නම්, ඒ කවරක්ද;

(ii) ජනාධිපතිවරයා, ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන්, ව්‍යවස්ථාදායක සභාව විසින් පත් කරනු ලබන කොමිෂන් සභා සාමාජිකයන්, ආණ්ඩුකාරවරයන්, ප්‍රධාන අමාත්‍යවරයන්, විනිසුරුවරයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්, පළාත් අමාත්‍යවරයන්, අමාත්‍යාංශ ලේකම්වරයන් සහ එම තනතුරට සමාන තනතුරු දරන්නන් හෝ රාජ්‍ය තාන්ත්‍රික සේවයේ යෙදී සිටින නිලධාරීන් හැර රාජ්‍ය තාන්ත්‍රික ගමන්

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකම් ඇති වෙනත් තනතුරු කවරේද;

(iii) ඉහත තනතුරුවලට අයත් නොවන පුද්ගලයන්ට රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කර තිබේද;

(iv) එසේ නම්, ඊට බලපෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக அலுவல்கள் மற்றும் வடமேல் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) எவரேனும் ஆள் ஒருவர் இராஜதந்திர கடவுச்சீட்டொன்றைப் பெறுவதற்கு உரித்துடையவர் எனத் தீர்மானிப்பதற்கான தகவல்கள் உள்ளடங்கிய சுற்றுநிருபம், ஒழுங்குவிதி அல்லது அமைச்சரவை தீர்மானம் ஏதும் இருப்பின் அவை யாவை என்பதையும்;

(ii) சனாதிபதி சட்டவாக்கச் சபை உறுப்பினர்கள், சட்டவாக்கசபையால் நியமிக்கப்படும் ஆணைக் குழு உறுப்பினர்கள், ஆளுனர்கள், முதலமைச்சர்கள், நீதிபதிகள், பாராளுமன்ற உறுப்பினர்கள், மாகாண அமைச்சர்கள், அமைச்சு செயலாளர்கள் மற்றும் அந்தப் பதவிகளுக்கு சமனான பதவிகளை வகிப்பவர்கள் அல்லது இராஜதந்திர சேவையில் ஈடுபட்டுள்ளவர்கள் தவிர்ந்த இராஜதந்திர கடவுச் சீட்டுக்களைப் பெறுவதற்கு உரித்துடைய வேறு பதவிகள் யாவை என்பதையும்;

(iii) மேற்குறித்த பதவிகளில் உள்ளடங்காத ஆட்களுக்கு இராஜதந்திரக் கடவுச்சீட்டுக்கள் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) அவ்வாறெனின், அதற்கு ஏதுவான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal Affairs & Wayamba Development:

(a) Will he inform this House-

(i) if there is a circular, a regulation or a cabinet decision containing information that determines whether any person is entitled to a diplomatic passport, what it is;

(ii) other than the President, the members of the Constitutional Council, the members of the commissions appointed by the Constitutional Council, the Governors, the Chief Ministers, the Judges, the Members of Parliament, the Ministers of the Provincial Councils, the Secretaries to the Ministries or those holding similar posts and the officers of the diplomatic service, the other posts with entitlement for a diplomatic passport;

(iii) whether diplomatic passports have been issued to persons who do not belong to the above posts; and

if so, the reasons for same?

(b ) If not, why?

**ගරු එස්.බී. නාවින්න මහතා (අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு எஸ்.பி. நாவின்ன - உள்ளக அலுவல்கள் மற்றும் வடமேல் அபிவிருத்தி அமைச்சர்)

(The Hon. S.B. Nawinne - Minister of Internal Affairs and Wayamba Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත් නිකුත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති අංක සීඑස්ඒ/1/38 හා 2016.10.04 දිනැති ලිපිය. එකී ලිපියේ පිටපතක් සභාගත* කරමි.

රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කිරීමට හිමිකම් ලබන පුද්ගලයන්/ තනතුරු නම්කොට අමප/16/1012/722/005-1 හා 2016.07.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත.

(ii) වෙනත් තනතුරු නැත.

(iii) ඔව්.

ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කිරීමට යෝජිත පුද්ගලයන්ගේ ලැයිස්තුව මම කියවන්නම්.

01. ජනාධිපතිවරයා, කලත්‍රයා හා ඔවුන්ගේ පුත්‍රයන් හා දියණියන්.

02. අග්‍රාමාත්‍යවරයා, කලත්‍රයා හා ඔවුන්ගේ පුත්‍රයන් හා දියණියන්.

03. හිටපු ජනාධිපතිවරුන්, හිටපු අග්‍රාමාත්‍යවරුන්, කලත්‍රයන් හා ඔවුන්ගේ අවිවාහක පුත්‍රයන් හා දියණියන්.

04. කථානායකවරයා, අගවිනිසුරුවරයා, අමාත්‍යවරු, විපක්ෂ නායකවරයා, කලත්‍රයන් හා ඔවුන්ගේ අවිවාහක පුත්‍රයන් හා දියණියන්.

05. හිටපු ජනාධිපතිවරුන්ගේ හා අග්‍රාමාත්‍යවරුන්ගේ වැන්දඹුවන්.

06. ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් හා ඔවුන්ගේ කලත්‍රයන්, වයස අවුරුදු 21 දක්වා වූ ඔවුන්ගේ අවිවාහක පුත්‍රයන්, අවිවාහක දියණියන්, වයස නොතකා නිලධරයාගෙන් යැපෙන කායිකව හෝ මානසිකව ආබාධිත වූ දරුවන් ඇතුළුව පවුලේ සාමාජිකයන්.

07. විදේශ දූත මණ්ඩල සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයටතේ පත් කරනු ලැබූ නිලධාරීන්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, වාණිජ දෙපාර්තමේන්තුවේ, ආරක්ෂක අමාත්‍යාංශයේ, කම්කරු දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

හා වෙනත් ඕනෑම රාජ්‍ය ආයතනයක නිලධාරීන් හා ඔවුන්ගේ කලත්‍රයන්, අවුරුදු 21ක් දක්වා වූ අවිවාහක පුත්‍රයන්, අවිවාහක දියණියන්, වයස නොතකා නිලධරයාගෙන් යැපෙන කායිකව හෝ මානසිකව ආබාධිත වූ දරුවන්ද ඇතුළුව එකී නිලධරයන් ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සේවයේ රාජ්‍ය තාන්ත්‍රික තනතුරක් දරන තුරු පමණක් ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සේවයේ රාජ්‍ය තාන්ත්‍රික තනතුර දරන වෙනත් රටවල රජයන් සඳහා නිල වශයෙන් පිළිගනු ලැබූ ශ්‍රී ලංකා රජයේ නියෝජිතයන්.

08. පළාත් ආණ්ඩුකාරවරුන්, ඔවුන්ගේ කලත්‍රයන්, අවිවාහක පුත්‍රයන් හා දියණියන්.

09. පළාත් ප්‍රධාන අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, ඔවුන්ගේ කලත්‍රයන්, අවිවාහක පුත්‍රයන් හා දියණියන්.

10. නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය අමාත්‍යවරුන්, ව්‍යාපෘති අමාත්‍යවරුන්, කැබිනට් නොවන අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු කමිටුවල නියෝජ්‍ය සභාපතිවරුන්, පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, ඔවුන්ගේ කලත්‍රයන්, අවිවාහක පුත්‍රයන් හා දියණියන්.

11. ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාවල සාමාජිකයන්.

12. නීතිපති.

13. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්.

14. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්.

15. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා ඔවුන්ගේ කලත්‍රයන්.

16. පළාත් සභාවල සභාපතිවරුන්, පළාත් අමාත්‍යවරුන් හා ඔවුන්ගේ කලත්‍රයන්.

17. ජනාධිපති ලේකම්.

18. අග්‍රාමාත්‍ය ලේකම්.

19. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

20. මහබැංකු අධිපති.

21. කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරු.

පාර්ලිමේන්තු මහ ලේකම්.

ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී.

අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී.

ජනාධිපති උපදේශකවරු.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් - (ඔම්බුඩ්ස්මන්)

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්.

විගණකාධිපති.

මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල්.

අග්‍රාමාත්‍ය උපදේශකවරු.

22. පාර්ලිමේන්තු සභානායකගේ ලේකම්.

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකගේ ලේකම්.

23. කැබිනට් නොවන අමාත්‍යාංශ ලේකම්වරු.

ජනාධිපති අතිරේක ලේකම්වරු.

ප්‍රධාන ලේකම්වරු.

24. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී.

යුද හමුදාපති/නාවික හමුදාපති/ගුවන් හමුදාපති/ පොලිස්පති.

25. මල්වතු, අස්ගිරි, රාමඤ්ඤ, අමරපුර නිකායවල මහානායක ස්වාමීන් වහන්සේලා.

රෝමානු කතෝලික පල්ලියේ අගරදගුරුතුමා.

අනෙකුත් ආගම්වල ප්‍රධාන පූජකවරුන්.

26. ජාතික බුද්ධි අංශ ප්‍රධානී.

27. විදේශ කටයුතු ලේකම්වරයාගේ නිර්දේශය මත තේ ප්‍රවර්ධන කටයුතු (විදේශ) පිළිබඳ විෂයය භාර කොමසාරිස්වරයා.

28. කොළඹ, මහනුවර මහ නගර සභාවල නගරාධිපතිවරුන්.

29. පාලක ජනරාල්, ආගමන හා විගමන,

අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,

අධ්‍යක්ෂ ජනරාල්, රේගු,

අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත්.

විශේෂ සටහන් :

* මෙම අනුමත ලැයිස්තුවෙහි සඳහන් නාමයන් වෙනස් කිරීම ජනාධිපතිතුමාගේ එකඟත්වය මත ජනාධිපති ලේකම්ගේ අත්සනින් නිකුත් කරනු ලබන ලිපියක් මඟින් පමණක් විය යුතුය.

* සියලු අමාත්‍යාංශ ලේකම්වරු/ආයතන ප්‍රධානීන් විසින් රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කිරීම් ලේඛනගත කර අදාළ තනතුර/ධුරය අවසන් වූ වහාම ආගමන විගමන පාලක ජනරාල් වෙත දැනුම් දිය යුතුය.

* ආගමන විගමන පාලක ජනරාල්වරයා විසින්ද රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කිරීම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය.

* 2015 ජනවාරි 08 දිනට පෙර සිට රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර පාවිච්චි කරන ලද අයවලුන් දැනට මෙකී ගමන් බලපත්‍ර ලැබීමට සුදුසු යම් තනතුරක් නොදරන්නේ නම්, කලින් නිකුත් කර තිබූ රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර භාවිතය වැළැක්වීම සඳහා ආගමන විගමන පාලකවරයා වහාම පියවර ගත යුතුය.

(iv) රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රියා පටිපාටිය සඳහන්ව 2016 ඔක්තෝබර් 04 දාතමින් ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති උපදෙස් ලිපිය මඟින් අතිගරු ජනාධිපතිතුමා තීරණය කරනු ලබන ඉහත (i) හි සඳහන් ලැයිස්තුවේ සඳහන් නොවන වෙනත් පාර්ශ්වයන් සඳහා ද රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කිරීමට විධිවිධාන සලසා ඇත. කෙසේ නමුත් එවැනි ගමන් බලපත්‍ර නිකුත් කිරීම් ඉතාම අල්ප තත්ත්වයක පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු ඇමතිතුමනි, මෙම ප්‍රශ්නයේ (අ) (ii) කොටසින් මම අසා තිබෙන්නේ, "...හිමිකම් ඇති වෙනත් තනතුරු කවරේද?" කියායි. ඒ ප්‍රශ්නයට පිළිතුර ඔබතුමා දැන් කිව්වා. ප්‍රශ්නයේ (අ) (iii) කොටසෙන් මම අසා තිබෙන්නේ "ඉහත තනතුරුවලට අයත් නොවන පුද්ගලයන්ට රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කර තිබේද" කියායි. මේ ප්‍රශ්නයේ තිබෙන වැදගත්ම කොටස ඒකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මගේ ප්‍රශ්නයේ එම කොටසට පිළිතුරක් දුන්නේ නැහැ.

**ගරු එස්.බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

ඉහත තනතුරුවලට අයත් නොවන පුද්ගලයන්ට රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කර තිබේද යන ප්‍රශ්නයට පිළිතුර "ඔව්" කියන එකයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

එසේ නම්, ඊට බලපෑ හේතු කවරේද, ගරු ඇමතිතුමනි?

**ගරු එස්.බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

(අ) (iv) ප්‍රශ්නය විධියට ඔබතුමා අසා තිබෙනවා, "එසේ නම්, ඊට බලපෑ හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද" කියා. මේ ලැයිස්තුවේ සිටින සියලුදෙනා අතර අනිවාර්යයෙන් ඒ නම් ටික තිබෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු අමාත්‍යතුමනි, ප්‍රශ්නයේ (අ) (ii) කොටසෙන් මම අසා තිබෙන්නේ, මෙම ගමන් බලපත්‍ර ලබාගැනීම සඳහා නීත්‍යානුකූලව හිමිකම් ඇති තනතුරු හැර හිමිකම් ඇති වෙනත් තනතුරු කවරේද කියායි. ඔබතුමා ඒ ප්‍රශ්නයට දීර්ඝ පිළිතුරක් ලබා දුන්නා. ප්‍රශ්නයේ ඊළඟ කොටසින් මම ඇහුවේ, චක්‍රලේඛ අනුව සහ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව - ඒ අදාළ චක්‍රලේඛ සහ අමාත්‍ය මණ්ඩල තීරණය ඔබතුමා සභාගත කරයි කියා මම බලාපොරොත්තු වෙනවා.- ඒවාට අදාළ නොවන අයට රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කර තිබේද කියන එකයි. ඊට ඔබතුමාගේ පිළිතුර වුණේ "ඔව්" යන්නයි.

මා ඒ අයගේ නම් අහන්න ගියේ නැහැ. පෞද්ගලිකත්වය ගැන ප්‍රශ්න කරන්න කිසිම හේතුවක් නැහැ. ප්‍රශ්නයේ (iv) කොටසින් මා ඔබතුමාගෙන් ඇහුවේ, "එසේ නම්, ඊට බලපෑ හේතු කවරේද;" කියායි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

එහෙම නමක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න පුළුවන්ද? ඔබතුමා කියන විධියට නුසුදුසු අයට දීලා තිබෙනවා නම් එහෙම නමක් ඉදිරිපත් කරන්න පුළුවන්ද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ඔබතුමා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා. මට උත්තර දෙන්න ඉඩ දෙන්න. ඒ ප්‍රශ්නයට උත්තරය මා දන්නවා නම්, මා එය ඇමතිතුමාගෙන් අහන්නේ නැහැ. මා අහලා තිබෙන ප්‍රශ්නයේ (iii) වන කොටසට එතුමා උත්තර දෙනවා, "ඔව්" කියා. මා නමක් දන්නේ නැහැ. මා නොදන්නා නිසායි ඇමතිතුමාගෙන් ඇහුවේ. ඇමතිතුමායි කියන්නේ, "ඔව්" කියා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා එහෙම ප්‍රශ්නයක් අහන්න ඔබතුමා ළඟ තොරතුරක් තිබෙන්න ඕනෑ. You should have some information.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මා කියන්නේ නැහැ. ඇමතිතුමායි කියන්නේ. ඔබතුමා පටලවාගෙන. මා ප්‍රශ්නයක් ඇහුවා විතරයි. ඇමතිතුමා කියනවා, එහෙම අය ඉන්නවාය කියා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

You are trying to confuse.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

එහෙම අයට දෙන්න හේතුව මොකක්ද කියා මා ගරු අමාත්‍යතුමාගෙන් අහනවා. මා අද නොවෙයි ඇහුවේ. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්නයක් අහලා තිබෙනවා. ඒ ප්‍රශ්නයට උත්තර ලැබුණේ නැහැ කියායි කිව්වේ.

**ගරු එස්.බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ඔබතුමාට මේ ප්‍රශ්නයට උත්තර දෙන්න අනාගතයේදී වාසනාව ලැබේවා!යි කියා මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු එස්.බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

ගරු මන්ත්‍රීතුමනි, මේ උත්තරයේ තිබෙනවා නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මොකක්ද, උත්තරයේ තිබෙන්නේ?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඔබතුමා ප්‍රශ්නයේ (iv) වන කොටසින් අහලා තිබෙනවා, එසේ නම් ඊට බලපෑ හේතු කවරේද කියා. එයට පිළිතුර මෙසේ සඳහන්

වෙනවා, "රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රියා පටිපාටිය සඳහන්ව 2016 ඔක්තෝබර් 04 දාතමින් ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති උපදෙස් ලිපිය මඟින් අතිගරු ජනාධිපතිතුමා තීරණය කරනු ලබන ඉහත (I)හි සඳහන් කළ ලැයිස්තුවේ සඳහන් නොවන වෙනත් පාර්ශ්වයන් සඳහාද රාජ්‍ය තාන්තික ගමන් බලපත්‍ර නිකුත් කිරීමට විධිවිධාන සලසා ඇත. කෙසේ නමුත් එවැනි ගමන් බලපත්‍ර නිකුත් කිරීම් ඉතා අල්ප තත්ත්වයකින් පවතී." කියා. ඉදලා හිටලා දෙන්න පුළුවන්කම තිබෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ඒ අනුව තමයි ඒ අයට දී තිබෙන්නේ. ඒකයි මට දැන ගන්න ඕනෑකම තිබුණේ. බොහොම ස්තුතියි, ඇමතිතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Then, Question No. 6 - 228/'18 -(1) to be asked by the Hon. Douglas Devananda.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
කෞරව ගුරුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළේ, නාන් අන්තක් කේල්වියෙක් කේට්කින්රේන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. The Hon. Minister needs two weeks' time to answer that Question.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
This Question was given eight months ago.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කුරුවිට, හිග්ගස්වත්ත ප්‍රාථමික විද්‍යාලය: නායයෑමේ තර්ජනය
## குருவிட்ட, ஹிக்கஸ்வத்த ஆரம்பப் பாடசாலை: மண்சரிவு அபாயம்
## HIGGASWATTA PRIMARY COLLEGE, KURUWITA: THREAT OF LANDSLIDE

259/'18

**7. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කුරුවිට, හිග්ගස්වත්ත ප්‍රාථමික විද්‍යාලය නමින් විද්‍යාලයක් තිබෙන බව දන්නේද;

(ii) දැනට එම විද්‍යාලයේ ඉගෙනුම් ලබන ශිෂ්‍ය සංඛ්‍යාව හා සේවය කරන ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iii) එම විද්‍යාල භූමියේ මායිමක එක් කොටසක දැඩි නායයෑමේ තර්ජනයකට ලක් වී තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருவிட்ட, ஹிக்கஸ்வத்த ஆரம்பப் பாடசாலை என்ற பெயரில் பாடசாலை ஒன்று உள்ள தென்பதை அறிவாரா என்பதையும்;

(ii) அப்பாடசாலையில் இன்றளவில் கல்வி பயிலும் மாணவர் எண்ணிக்கை மற்றும் பணியாற்றும் ஆசிரியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி பாடசாலை வளாகத்தின் ஓரத்தில் ஒருபகுதியில் கடுமையான மண்சரிவு அபாயம் நிலவுகிறது என்பதை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனின், இது தொடர்பில் அமைச்சு எடுக்க விருக்கும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) whether he is aware that there is a school named Higgaswatta Primary College in Kuruwita;

(ii) the number of students that are studying in the aforesaid school along with the number of teachers that are serving there at present ;

(iii) one portion of the embankment of the school land is prone to landslide; and

(iv) if so, the steps that will be taken by the Ministry in this regard ?

(b) If not , why ?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ශිෂ්‍ය සංඛ්‍යාව - 1134යි
ගුරුවරුන් සංඛ්‍යාව - 32යි

(iii) ඔව්.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

(iv) ඔව්.

"ගංවතුර හා නායයාම් හේතුවෙන් හානියට පත් පාසල් ගොඩනැඟිලි පුනරුත්ථාපනය සහ ඉදිකිරීම - 2017" ව්‍යාපෘතිය යටතේ රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල අධීක්ෂණය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ඉහත නම් සඳහන් කුරුවිට, හිග්ගස්වත්ත ප්‍රාථමික විද්‍යාලයේ නායයාම් සිදු වූ ප්‍රදේශය ආවරණය කරමින් පැනි බැම්මක් ඉදිකර දැනට එහි කටයුතු අවසන් කර ඇති බව සබරගමුව පළාත් අධ්‍යාපන ලේකම් විසින් මා වෙත වාර්තා කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(*මාණ්පුමිකු හේසා විතානගේ*)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

රත්නපුර දිස්ත්‍රික්කය සාමාන්‍යයෙන් බොහෝ කාලයක සිට වසරකට වතාවක් ගංවතුර උවදුරට ලක් වනවා. ඒ හේතුවෙන් විශාල පාසල් සංඛ්‍යාවක් ගංවතුරට යට වනවා; ඒ වාගේම ජනතාව අපහසුතාවට පත් වෙනවා. "හොඳම පාසල - ළඟම පාසල" කියන වැඩසටහන යටතේ විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර, "පළාත් පාසල්" හා "ජාතික පාසල්" කියා වෙන් කරන්නේ නැතිව, රත්නපුර දිස්ත්‍රික්කයේ විතරක් නොව මුළු රටේ සියලුම පාසල්වලට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ඔබතුමා ලබා දීලා තිබෙනවා. දේශපාලනික ව්‍යාපාරයක් නොවන ආකාරයට කටයුතු කිරීම නිසා ඔබතුමා කරපු ඒ වැඩසටහන යම් යම් තැන්වලදී අද විවේචනයට ලක් වනවා.

අපි දැක්කා, ඊයේ පාර්ලිමේන්තුවේදී කනක හේරත් මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහනවා, "වැඩ කර තිබෙනවා. මුදල් ගෙවන්නේ නැද්ද?" කියා. හැබැයි, මම ඊට පස්සේ ඒ ගැන හොයා බැලුවා. එලෙස 'මුදල් ගෙවන්නේ නැද්ද?' කියා අහන මන්ත්‍රීතුමාගේ තාත්තා තමයි ප්‍රධාන අමාත්‍යවරයා. එතුමා තමයි මේ වැඩසටහන කරගෙන යන්නේ. 'මුදල් ගෙවන්නේ නැද්ද?' කියා එතුමා ඉස්සෙල්ලාම අහන්න ඕනෑ, ප්‍රධාන ඇමතිතුමාගෙනුයි. මම ඒ සම්බන්ධයෙන් හොයා බැලුවා. සියලුම පාසල් සඳහා කොන්ත්‍රාත් ටික දීලා තිබෙන්නේ පසුගිය කාලයේ එකට එකතුවෙලා හිටපු කල්ලියකට. ඒ කල්ලිය කොන්ත්‍රාත් ටික කර තිබෙනවා, ගරු ඇමතිතුමා. නිලධාරීන් හොයලා බලන නිසා මුදල් අනුමත කරන්න බැරි සමහර ව්‍යාපෘති අද තිබෙනවා. රටට දැනෙන ව්‍යාපෘතියක් වන "හොඳම පාසල - ළඟම පාසල" කියන ව්‍යාපෘතිය අසාර්ථක කරන්න, මේකට වැරැදි -කුණු- නාමයක් එකතු කරන්න සමහර නිලධාරීන් කටයුතු කරනවා. මම හිතන්නේ අපේ කනක හේරත් මන්ත්‍රීතුමා කරුණු දැනගෙන හෝ නොදැන එම ප්‍රශ්නය ඉදිරිපත් කළා. රත්නපුර දිස්ත්‍රික්කයේ -සබරගමුව පළාතේ- පවතින ප්‍රශ්නය සම්බන්ධයෙන් නිලධාරීන් ගෙන්වලා, පරීක්ෂණයක් කරන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙතුමා ඒ ප්‍රශ්නය ඇහුවේ උත්තරය දැනගෙනයි. මම දන්නා තරමින් මුදල් ගෙවිය නොහැකි තත්ත්වයේ පවතින සමහර ව්‍යාපෘති තිබෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(*මාණ්පුමිකු අක්කිල විරාජ් කාරියවසම්*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙම ව්‍යාපෘතිය සඳහා විශේෂයෙන් ගොඩනැඟිලිවලට ඉංජිනේරුවරයාගේ නිර්දේශය ලබා නොදෙන්නේ නම් ගෙවීම් කටයුතු කරන්නේ නැහැ. එහෙම ප්‍රමාද වුණු ඒවා සෑහෙන්න තිබෙනවා. ඒ වාගේම කොන්ත්‍රාත් කරනු ලැබුවේ පළාත් සභාව විසින්. කොන්ත්‍රාත් ටික තමයි විශේෂයෙන් පළාත් සභාවට අපි දුන්නේ. මෙම ව්‍යාපෘතිය මුළු රටේම කළ යුතු නිසා අපි යම් යම් නිර්ණායක මත පාසල් තෝරාගෙන තමයි මේ කටයුත්ත කරන්නේ. මේ රටේ පාසල් 10,194න් පාසල් 5,900කට එක්කෝ අලුතින් ගොඩනැඟිලි ලබා දී තිබෙනවා; එහෙම නැත්නම් ඒවා පූර්ණ වශයෙන් නැවත ගොඩ නඟා තිබෙනවා; විශේෂයෙන්ම අලුත්වැඩියා කර තිබෙනවා. මෙම ව්‍යාපෘතිය විවිධ පුද්ගලයන් විවිධ ආකාරයෙන් අර්ථකථනය කළත් මෙය රටට දැනෙන, බැලූ බැල්මට පෙනෙන, දෙමව්පියන්ට දැනෙන දැවැන්ත ව්‍යාපෘතියක්. ඒක කාටවත් යට ගහන්න බැහැ. මීට අවුරුදු 3 1/2කට කලින් අපේ රජය බලයට පත් වෙනකොට මේ රටේ පාසල් 10,194න් සියයට 60කට පමණයි විදුලිය තිබුණේ. අද පාසල්වලින් සියයට 98කට විදුලිය තිබෙනවා. ඒ වාගේම එදා පාසල් 3,000කට පමණ විද්‍යාගාර තිබුණේ නැහැ. අද විද්‍යාගාර හෝ ජංගම විද්‍යාගාර ඒ පාසල් 3,000ටම ලබා දී තිබෙනවා. රුපියල් මිලියන 700ක් ලබා දී පාසල් පුස්තකාලවලට පොත් ලබා දී තිබෙනවා. මේක දැවැන්ත ව්‍යාපෘතියක්. මාධ්‍යයෙන් මේ ගැන වැඩිය ප්‍රචාරය වෙන්නේ නැති වෙන්න පුළුවන්. ඉඳලා හිටලා තැනක බෝඩ් ගැහුවාට, කෝටි ගණන්වල බෝඩ් ගහන්නේ නැති වෙන්න පුළුවන්. මේ ව්‍යාපෘතිය යටපත් කරන්න බැහැ. මේ රටේ ලක්ෂ 42කට වැඩි පාසල් ළමයින් සහ ඒ අයගේ දෙමව්පියන් මේක දකිනවා. මේ, උදේ සවස දකින සහ දැනෙන වැඩ පිළිවෙළක්.

**ගරු හේෂා විතානගේ මහතා**
(*මාණ්පුමිකු හේසා විතානගේ*)
(The Hon. Hesha Withanage)

ගරු ඇමතිතුමනි, මම මේ කරුණ කියන එක සාධාරණයි. මට විතරක් නොවෙයි, තව මන්ත්‍රීවරුන්ටත් මේ ප්‍රශ්නය ඇති. ගරු කනක හේරත් මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයත් එක්කයි මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අමුණන්නේ. ගරු ඇමතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා, පළාත් ලේකම්තුමා මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත් ලබා දීමට රජයේ ක්‍රමවේදය අනුගමනය කළාද කියා මම දන්නේ නැහැ.

මම සාක්ෂි සහිතව ඉදිරිපත් කරන්නම්. මහ ඇමතිතුමා දන්නවාද දන්නේ නැහැ, මහ ඇමතිතුමාගේ නිලධාරීන් මේ ව්‍යාපෘති දෙන්නේ මුදල් ලබා ගෙනයි. මම හිතනවා, මහ ඇමතිතුමා -මහීපාල හේරත් ඇමතිතුමා,- ඒ ගැන නොදැන ඉන්න විධියක් නැහැ කියලා. මුදල් ලබා ගෙන, කිහිප දෙනෙක් අතර මේ කොන්ත්‍රාත් ටික හුවමාරු වුණා. දැන් මේ වැඩය සමහර තැන්වල වෙන්නේ නැහැ. මොකද, ඔවුන් ගත්ත ව්‍යාපෘති ප්‍රමාණය වැඩියි. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ තරම් සාර්ථක වැඩසටහනක්, අහිංසක පාසල් දරුවන් වෙනුවෙන් මේ රජය ගෙනා හොඳ වැඩසටහනක්, ආපස්සට හරවන්න කටයුතු කිරීම පිළිබඳ වෙනමම පරීක්ෂණයක් පවත්වන්න කියලා. මොකද, දේශපාලනය කිරීමේ වුවමනාවට මේ වැඩසටහන අසාර්ථක වැඩ සටහන් බවට පෙන්වන්න කටයුතු කරනවා කියලා මම විශ්වාස කරනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(*මාණ්පුමිකු අක්කිල විරාජ් කාරියවසම්*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිසි ක්‍රමවේද අනුගමනය කර නැත්නම් ඒ මුදල් මුදා හරින්න - release කරන්න

- අපි කිසිවිටෙකත් කටයුතු කරන්නේ නැහැ. රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වශයෙන් මට සාක්ෂි නැතිව ඒ ගැන කිසිවක් කියන්න බැහැ. හැබැයි, සමහර පළාත් සභාවල ලැබුණු පැමිණිලි මත, මේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රශ්න තිබුණු තැන්වල අපි ඒවා නැවත හදන්නත්, ඒවා සම්බන්ධයෙන් නැවත ක්‍රියා කරන ලෙසත් දැනුවත් කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය නැවතත් අලුතෙන් ආරම්භ කළ අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. අපට ඕනෑ වුණේ ජාතික පාසල්වලට පමණක් සීමා නොවී රටට බොහෝ දේවල් අත්පත් කර දී මේ දැවැන්ත ව්‍යාපෘතිය රටේ ව්‍යාප්ත කරන්නයි. විශේෂයෙන් ගරු අගමැතිතුමාගේ උපදෙස් මත සියලුම පළාත් සභා එකතු කරගෙනයි, අපි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේ.

## ඌව පළාත් සභාවේ අක්‍රමිකතා සම්බන්ධ විමර්ශන වාර්තාව : විස්තර

**ஊவா மாகாண சபையின் முறைகேடுகள் பற்றிய புலனாய்வு அறிக்கை: விபரம்**

INVESTIGATION REPORT ON MALPRACTICES IN UVA PROVINCIAL COUNCIL: DETAILS

473/'18

**8. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධයෙන් විගණකාධිපති වරයා විසින් අංක SIN/B/AG/KI/2017/02 හා 2017.04.20 දිනැති විමර්ශන වාර්තාවක් ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති අතර එම වාර්තාවේ පෙර පාසල් සඳහා බෑග් ලබාදීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා ගැනීම සම්බන්ධයෙන් අනාවරණය කර ඇති ඡේද අංක 5 (අ) (i) සිට (v) දක්වා කරුණු ඉදිරිපත් කරන්නේද;

(ii) එම අනාවරණයන්ට අදාළව (ආ) (i) සිට (iii) දක්වා සිදු කර ඇති නිරීක්ෂණ ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

මාගාණ සපෙකළ, උළුෙරාට්සි මත්‍රුම් විළෙයාට්ටුත් තුරෙ අමෙච්සරෙරක් කේට්ට විනා:

(அ) (i) ஊவா மாகாண சபையில் நடைபெற்றுள்ள மற்றும் நடைபெற்றுக்கொண்டிருக்கும் முறைகேடுகள் தொடர்பான கணக்காய்வாளர் தலைமையதிபதியின் SIN/B/AG/KI/2017/02 ஆம் இலக்க மற்றும் 2017.04.20ஆம் திகதிய புலனாய்வு அறிக்கை ஊவா மாகாண பிரதான செயலாள ருக்கு அனுப்பப்பட்டுள்ளதுடன், இவ்வறிக் கையில் பாலர் பாடசாலைகளுக்குப் புத்தகப் பைகளைப் பெற்றுக்கொடுப்பதற்கு நிதி அனுசரணை பெற்றுக்கொண்டமை தொடர் பாக வெளிப்படுத்தப்பட்டுள்ள 5 (அ) (i) தொடக்கம் (v) வரையான பந்திகளில் எடுத்துக் காட்டப்பட்டுள்ள விடயங்களை இச்சபையில் சமர்ப்பிப்பாரா;

(ii) இந்த வெளிப்படுத்தல்கள் தொடர்பில் (ஆ) (i ) தொடக்கம் (iii ) வரை மேற்கொள்ளப்பட்டுள்ள அவதானிப்புகளை சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House-

(i) whether facts given under paragraph number 05 (a) (i) to (v) of the investigation report bearing number SIN/B/AG/KI/2017/02 and dated 2017.04.20 sent to the Chief Secretary of Uva Province by the Auditor-General with pertinence to the malpractices that have taken place and are taking place in the Uva Provincial Council, which has disclosed about obtaining financial sponsorship for the distribution of bags for pre-schools, will be submitted to this House; and

(ii) whether the observations made from (b) (i) to (iii) pertaining to the aforesaid disclosures will be presented?

(b) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්.

ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදු වෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් අංක SIN/B/AG/KI/2017/02 හා 2017.04.20 දිනැති විමර්ශන වාර්තාවක් ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති අතර, එම වාර්තාවේ පෙර පාසල් සඳහා බෑග් ලබාදීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම සම්බන්ධයෙන් අනාවරණය කර ඇති ඡේද අංක 5 (අ) (i) සිට (v) දක්වා කරුණු ඇමුණුම් 01 මඟින් දක්වා ඇත. ඇමුණුම 01 සභාගත කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඇමුණුම කියවන්න.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු මන්ත්‍රීතුමා, දීර්ඝ ඇමුණුමක් තිබෙන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ලියා පදිංචි තැපෑලෙන් එවිවනේ. ඒකනේ අද මේ කියවන්නේ. මේ ඇමුණුම කියවන්න ගොඩාක් කාලය යන්නේ නැහැ. මොකද, ප්‍රශ්න තුනයි තිබෙන්නේ. කියවන එක තමයි වැදගත් වන්නේ, අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(*மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம*)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
කාලය ප්‍රශ්නයක් නැත්නම් ඇමුණුම කියවන්නම්.

ඇමුණුම 01හි මෙසේ දැක්වෙනවා:

"<u>පෙර පාසල් සඳහා බෑග් ලබාදීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා ගැනීම.</u>

(අ) මේ සම්බන්ධයෙන් පහත සඳහන් අනාවරණයන් කරනු ලැබේ.

(i) උක්ත කරුණට අදාළව පළාත් සභාව වෙත වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් පෙර පාසල් සිසුන් සඳහා සෞඛ්‍ය ආරක්ෂිත පාසල් බෑගයක් ලබා දීම සඳහා අනුග්‍රාහක දායකත්වය ලබාදෙන ලෙස ඌව පළාත් අමාත්‍ය කාර්යාලය ලිපි ශීර්ෂ යොදාගෙන ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ලෙස දක්වා අත්සන් කර 2015 නොවැම්බර් 10 දිනැති අංක ඌව/ප්‍ර/අමා/01 දරන ලිපිය මඟින් ලංකා බැංකුව, මහජන බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන ආයතනවලින් ඉල්ලීමක් කර තිබුණි. මෙයට ප්‍රතිචාර වශයෙන් ලංකා බැංකුව හා මහජන බැංකුව විසින් රුපියල් ලක්ෂ 35ක මුදලක් ලබා දී තිබුණි. විස්තර පහත දැක්වේ.

| බැංකුව | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|
| ලංකා බැංකුව | 833861 | 1,000,000 |
| මහජන බැංකුව | 109034 | 2,500,000 |
| | | 3,500,000 |

(ii) අංක ජේ.කළ/බදු/ආර්එස් හා 2015 දෙසැම්බර් 09 දිනැති ලංකා බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුගේ ලිපිය මඟින් ඉහත කාර්යයට සත්කාරයක් වශයෙන් අංක 833861 දරන චෙක්පත මඟින් රුපියල් මිලියන 01ක් එවන බවත්, ලංකා බැංකුවේ "රන් කැකුළු" ගිණුම ප්‍රවර්ධනය කිරීම සඳහා පාසල් පොත් බෑගයට "රන් කැකුළු" ගිණුම් ලාංඡනය යෙදවීමටත් යෝජනා කර තිබුණි.

(iii) මෙම බැංකු දෙකෙන්ම අදාළ චෙක්පත් "ප්‍රධාන අමාත්‍ය ඌව පළාත්" නමින් "ආදායකයාගේ ගිණුමට පමණයි" යන්න රේඛනය කර ලබා දී තිබූ අතර, එම චෙක්පත් කිසිවක් ප්‍රධාන ලේකම් යටතේ ඇති පළාත් අරමුදලේ ක්‍රියාත්මක වන බදුල්ල මහජන බැංකුවේ මුතියංගන ශාඛාවේ අංක 269-100178440329 දරන ගිණුමට හෝ ලංකා බැංකුවේ බදුල්ල ශාඛාවේ අංක 8473604 දරන ගිණුමට හෝ ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පවතින මහජන බැංකුවේ බදුල්ල ශාඛාවේ අංක 269-1-001-2-8440483 දරන ගිණුමට හෝ ප්‍රධාන අමාත්‍ය අරමුදලේ මහජන බැංකුවේ බදුල්ල ශාඛාවේ අංක 269-1-001-1-8440662 දරන ගිණුමට හෝ බැරවී නොතිබුණු බව එම ගිණුම් භාර ගණකාධිකාරිවරුන් විසින් තහවුරු කර ඇත.

(iv) පළාත් මුදල් රීති 170.2.1 ප්‍රකාරව යම් නිශ්චිත කටයුත්තකට යෙදවීමට ඉල්ලුම් කරමින් ලැබෙන මුදල් තාවකාලික තැන්පත් ගිණුමක තැන්පත් කරවා ඒ සඳහා වියදම් දැරීමට අනුමැතිය ලබාගත යුතුය. පළාත් මුදල් රීති 170.2.2 ප්‍රකාරව තෑගි මුදල් ලැබුණේ යම් විශේෂ යෝජනා සඳහා නම් පළාත් සභාවේ අනුමැතියට යටත්ව එම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලස්වා ගැනීමට පියවර ගත යුතුය. එසේ අනුමැතිය ලද පසු තැන්පත් ගිණුමේ රඳවා ඇති ත්‍යාග මුදල් පළාත් ආදායමට බැර කර ඉදිරි කටයුතු කළ යුතුය. යම් ලෙසකින් පළාත් සභා අනුමැතිය නොලදහොත් අදාළ ත්‍යාග මුදල පරිත්‍යාග දායකයින්ට නොපමාව ආපසු ගෙවිය යුතුය.

(v) 2015 හා 2016 වර්ෂවලදී ඌව පළාතේ පළාත් පාලන ආයතන 23ක් හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පෙර පාසල් සිසුන් සඳහා බෑග් මිලදීගෙන බෙදා හැරීම සඳහා රු.4,665,425ක මුදලක් පහත පරිදි වැය කර තිබූ අතර, එම සම්පූර්ණ මුදලම එක් එක් පළාත් පාලන ආයතනවල අරමුදල් මඟින්ද පළාත් සභා අරමුදලින්ද ගෙවා ඇති බව අනාවරණය වේ. "

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, ප්‍රශ්නයේ (ii) කොටසට පිළිතුර ඉදිරිපත් කළේ නැහැ.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(*மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம*)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
(අ) (ii) ඔව්.
එම අනාවරණයන්ට අදාළව (ආ) (i) සිට (iii) දක්වා සිදු කර ඇති නිරීක්ෂණ ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ඇමුණුම 02හි ඇතුළත් එම නිරීක්ෂණ තුන කියවන්න, ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(*மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம*)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිරීක්ෂණ තුනක් ඇමුණුම 02හි සඳහන් වෙනවා. ඒවා මෙසේය:

"I. ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඌව පළාත් අමාත්‍ය කාර්යාල ලිපි ශීර්ෂ හා ප්‍රධාන අමාත්‍ය නිල නාමය යොදාගෙන ලංකා බැංකුවෙන් හා මහජන බැංකුවෙන් නිශ්චිත කාර්යයක් සඳහා ලබාගත් රු. 3,500,000ක මුදල ඌව පළාත් අරමුදලට හෝ තැන්පත් ගිණුමට බැර වී නොමැති බවටත් එම සම්පූර්ණ මුදලම චාමර සම්පත් දසනායක පදනම නමැති පෞද්ගලික ගිණුමකට බැරවී ඇති බවටත් නිරීක්ෂණය කරනු ලැබේ.

II. ලංකා බැංකුවෙන් මුදල් දීමේදී ඉදිරිපත් කර තිබූ කොන්දේසිය වූයේ බෙදා දෙනු ලබන බෑග්වල රන් කැකුළු ගිණුම් ලාංඡනය ඇතුළත් කරන ලෙසය. එහෙත් 2015 හා 2016 වර්ෂවල පළාත් පාලන ආයතන මඟින් බෙදා හරින ලද පාසල් බෑග්වල එම ලාංඡනය ඇතුළත් කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

III. ඉහත I හා II නිරීක්ෂණවලට අනුව තම තනතුර හා තනතුරට අදාළ රාජකාරි කරන ස්ථානයේ ලිපි ශීර්ෂ යොදා ගෙන රාජ්‍ය බැංකුවලින් ආධාර මුදල් ලබාගෙන (මහජන මුදල්) අවභාවිතයක් සිදුකර නොමැති බවට විගණනයේදී බැහැර කළ නොහැක."

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*මාණ්පුමිකු சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නට ප්‍රථම ගරු කථානායකතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න ඕනෑ, මේ අවස්ථාවේ එතුමා මේ ගරු සභාවේ නොසිටියත්. මොකද, ගරු රාජ්‍ය ඇමතිතුමිය විසින් අද ඉදිරිපත් කළ පිළිතුර තුළ මගේ නිර්දෝෂීභාවය ඔප්පු වුණා. මම දිගින් දිගටම මේ කාරණය සම්බන්ධයෙන් ප්‍රශ්න කරමිනුයි සිටියේ. මම මේ පිළිතුර රෙජිස්ට්ර් තැපෑලෙන් අමාත්‍යාංශයට යැව්වා. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, අද එම පිළිතුර ඔබතුමිය විසින් කියවීම පිළිබඳව ඔබතුමියට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. මට වාගේම මෙතැන ඉන්න මේ උගත් බුද්ධිමත් සියලුම දෙනාටම පැහැදිලි වන ආකාරයට නීති කඩ කිරීම සහ මුදල් අවභාවිතාව කියන කාරණා පිළිබඳව විගණනය විසින් පැහැදිලි කර තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, මෙම විගණන විමසුමට උඟව පළාත් ප්‍රධාන ලේකම් විසින් යවන පිළිතුරෙත් සඳහන් වන කාරණාවක් මා කියවන්නම්. එහි පහත පරිදි සඳහන් වෙනවා.

"පෙර පාසල් සඳහා බෑග් ලබා දීම සඳහා මුල්‍ය අනුග්‍රහය ලබා ගැනීම.

මේ සම්බන්ධව උඟව පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා දැනුවත් කර ඇති අතර, එතුමා විසින් පිළිතුරු ලබා දීමෙන් අනතුරුව එම පිළිතුර ඔබ වෙත වාර්තා කරමි.....

තවද, කෙසේ වෙතත් විගණන නිරීක්ෂණයෙහි සඳහන් ගිණුම් නිල ගිණුමක් නොවන හෙයින්, ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේ හැකියාවක් මා වෙත නොමැත."

විගණන දෙපාර්තමේන්තුවෙන් එවන ලද ලියුමට උඟව පළාත් ප්‍රධාන ලේකම්තුමා විසින් යවන ලද පිළිතුර ඒකයි. මුදල් අවභාවිතාව කියන කාරණය වාගේම මේ ගිණුම නිල නොවන ගිණුමක් කියලා එහි සඳහන් වෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, දැන් ඔබතුමිය කිව්වා, පළාත් මුදල් රීති අනුව කටයුතු කළ යුත්තේ කෙසේද කියන එක. මේකෙදී මුදල් රීති කඩ කිරීම සහ මුදල් අවභාවිතාව කියන කාරණා දෙකම සිදු වී තිබෙනවා.

අද වාමර සම්පත් දසනායක මහතා එතුමාගේ තුන්වන සංවත්සරය සමරනවා. මේ මගේ අතේ තිබෙන්නේ ඒ සම්බන්ධ "පෝස්ටර්" එකක්. මේකේ සඳහන් වෙනවා, "උඟවේ අරුණෝදයේ තෙවසරක අභිමානය - වාමර සම්පත් දසනායක. අපගේ සුබපැතුම්." යනුවෙන්. එතුමා අද තුන්වන සංවත්සරය සමරනවා. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමියගේ දැනුම සහ නීතිඥවරියක් වශයෙන් ලබා තිබෙන පළපුරුද්ද එක්ක ඔබතුමියට හිතෙන්නේ නැද්ද, අපේ මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළත් එක්ක මේ කියන කාරණයේදී එතුමා ඉන්න ඕනෑ කොතැනද කියන එක. මට දුකකට තිබෙන්නේ මේ "පෝස්ටර්" එකේ උඩින්ම ජනාධිපතිතුමාගේ "ෆොටෝ" එක තිබෙන එක ගැනයි.

ඒ අපි එකතු වෙලා පත් කර ගත් ජනාධිපතිතුමා. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, නීති කඩ කිරීම සහ මුදල් අවභාවිතය කියන කාරණා නිසා වාමර සම්පත් දසනායක ඉන්න ඕනෑ කොහේද කියලා ඔබතුමියට හිතෙන්නේ නැද්ද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(*மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம*)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමනි. මේ අනාවරණ සහ නිරීක්ෂණ සම්බන්ධයෙන් මම පැහැදිලි උත්තරයක් දුන්නා. ඒ නිසා, මගේ මතය ප්‍රකාශ කිරීමෙන් මා වළකිනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමියනි, වග කිවයුතු ඇමතිවරියක වන ඔබතුමිය එම ප්‍රශ්නයට පිළිතුරු දීමෙන් බැහැර වීම පිළිබඳව මම කනගාටු වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, ඉක්මනින් ප්‍රශ්නය අහලා ඉවර කරන්න ඕනෑ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

හැබැයි, දේශපාලන අධිකාරිය හැටියට මෙවැනි කාරණාවලදී මම නීතිමය වශයෙන් ගත යුතු ක්‍රියා මාර්ග ගත් දේශපාලන නායකයෙක්. මුදල් අවභාවිතයක් සිද්ධ වෙලා තිබෙනවාය කියන කාරණයේදී විශේෂයෙන්ම අපට දැන ගන්නට ඕනෑ, ඒ සම්බන්ධව නීතිමය ක්‍රියා මාර්ගය ගන්න පුළුවන් ප්‍රධාන ඇමතිවරයාටද, අමාත්‍යාංශයටද, ආණ්ඩුකාරයාටද, එහෙම නැත්නම් වෙනත් කෙනෙකුටද කියලා. ඒ පිළිබඳව මේ ගරු සභාවට පහදා දෙන්න පුළුවන්ද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(*மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம*)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මෙය පළාත් සභාවට අයත් විෂයයක් සහ පළාත් සභාවේ සිද්ධ වෙච්ච දෙයක් ගරු මන්ත්‍රීතුමා. මට තේරෙන, මම දන්න නීතිය අනුව නම් අපරාධයක් සම්බන්ධයෙන් ඕනෑම කෙනෙකුට පැමිණිල්ලක් කරන්න අයිතියක් තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, අපි පැමිණිල්ල කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඉක්මනින් ඉවර කරන්න. [බාධා කිරීම්] වෙලාව නැහැ නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

දැන් ගරු රාජ්‍ය ඇමතිතුමිය කියන හැටියට මේ කරුණු අනාවරණය වෙලා. නමුත්, දඬුවම් දීම කියන කාරණය පිළිබඳව පැහැදිලි කරන්න බැහැයි කියලා ඔබතුමිය සඳහන් කරනවා. ගරු ඇමතිතුමියනි, ඇත්තටම අපි පැමිණිලි ඉදිරිපත් කළා. නමුත්, අපි ඉදිරිපත් කරපු පැමිණිල්ල සම්බන්ධව හොයන්න තවම කටයුතු කරලා නැහැ. අපි ඒ ගැන කනගාටු වෙනවා. බණ්ඩාරවෙල මහනගර සභාවේ හිටපු නගරාධිපති මම. හැබැයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් ඇවිල්ලා මම නගරාධිපතිවරයා ලෙස හිටපු කාලය තුළ කරපු වැඩ පිළිවෙළ ගැන අද හොයනවා. අද මේ මොහොතේ ඒ කටයුතු කෙරෙනවා කියන ආරංචිය දැන් ලැබුණේ. මේ පිළිබඳව හොයලා, බලලා වාර්තා කරන්න කියලා මා ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
හොඳයි, සොයා බලා වාර්තා කරන්නම්.

## වයඹ පළාත් සභාව යටතේ පාලනය වන පාසල්: ගුරු පුරප්පාඩු

வடமேல் மாகாண சபையின்கீழ் நிர்வகிக்கப்படும் பாடசாலைகள்: ஆசிரியர் வெற்றிடங்கள்

SCHOOLS ADMINISTERED BY NORTH WESTERN PROVINCIAL COUNCIL: TEACHER VACANCIES

566/'18

**9. ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ පාලනය වන පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරු පුරප්පාඩු පිරවීමට පළාත් සභාව ගෙන ඇති පියවර කවරේද;

(iii) අද වනවිට වයඹ පළාතේ ගුරුවරුන් බඳවා ගැනීම සඳහා විභාගයක් පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අතර මතභේදයක් මතු වී තිබෙන බව දන්නේද;

(iv) එම මතභේදය විසඳා පළාතේ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා අදාළ විභාගය පැවැත්වීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடமேல் மாகாண சபையின்கீழ் நிர்வகிக்கப்படுகின்ற மாகாணப் பாடசாலைகளில் நிலவும் ஆசிரியர் வெற்றிடங்களின் எண்ணிக்கை எவ்வளவு;

(ii) அந்த ஆசிரியர் வெற்றிடங்களை நிரப்ப மாகாண சபை எடுத்துள்ள நடவடிக்கைகள் யாவை;

(iii) இன்றளவில் வடமேல் மாகாணத்தில் ஆசிரியர்களை ஆட்சேர்ப்பதற்காகப் பரீட்சையொன்றை நடத்துதல் தொடர்பில் மாகாணக் கல்வி அமைச்சருக்கும் மாகாண பகிரங்க சேவைகள் ஆணைக்குழுவுக்கும் இடையே கருத்து வேறுபாடு ஏற்பட்டுள்ளதை அறிவாரா;

(iv) அக்கருத்து வேறுபாட்டைத் தீர்த்து மாகாணத்தில் ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்காக குறித்த பரீட்சையை நடத்த அமைச்சு மேற் கொள்ளும் நடவடிக்கை யாது;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of vacancies for teachers in the schools administered by the North Western Provincial Council;

(ii) the measures taken by the Provincial Council to fill those vacancies;

(iii) whether he is aware that there is a disagreement between the Provincial Minister of Education and the Provincial Public Service Commission over the conduct of examination for the recruitment of teachers in the North Western Province; and

(iv) the measures to be taken by the Ministry to resolve this disagreement by conducting the aforesaid examination and fill vacancies for teachers in the Province?

(b) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2018.07.23 දිනට ගුරු පුරප්පාඩු 2,226කි.

(වයඹ පළාත් ලේකම් විසින් දන්වා එවා ඇති පරිදි)

(ii) පළාත් ගුරු සේවයට උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ කෙටුම්පත් සකස් කරමින් සිටින බව වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දී ඇත.

(iii) එවැනි මත භේදයක් නොමැති බව වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දී ඇත.

(iv) අදාළ නොවේ.

(ආ) පළාත් සභා විෂය යටතට වැටෙන ගුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අදාළ පළාත් සභාවේ වගකීම වේ.

2,226ක් වන පුරප්පාඩු සඳහා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා විභාග පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග වයඹ පළාත් සභාව විසින් ගනිමින් පවතින බව වයඹ පළාත් ප්‍රධාන ලේකම් විසින් දන්වා ඇත.

ඒ හේතුවෙන් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඒ සඳහා පියවර ගැනීමේ අවශ්‍යතාවක් පැන නැඟී නොමැත.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු ඇමතිතුමනි, වයඹ පළාත කිව්වාම, එයට පුත්තලම දිස්ත්‍රික්කය හා කුරුණෑගල දිස්ත්‍රික්කය කියන දිස්ත්‍රික්ක දෙකම අයිති වෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයට තමයි වැඩිපුරම ගුරුවරුන් බඳවා ගැනීම කරන්නේ. ඒ වාගේම, පුත්තලම දිස්ත්‍රික්කයට බඳවා ගන්නා ගුරුවරුන් අවුරුද්දක්, එකහමාරක් විතර කාලයක් ඉඳලා ඇමතිතුමාගේ නිර්දේශය අරගෙන පුත්තලම දිස්ත්‍රික්කයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයට නැවත එනවා. අවසානයට පසුගිය කාලයේ පුත්තලමේ හිටපු පළාත් අධ්‍යාපන ඇමතිවරයා කළේ, ගුරුවරුන් වෙනුවට කම්කරුවන් බඳවා ගැනීමයි. කම්කරුවන් 850දෙනෙක් බඳවා ගත්තා; ගුරුවරුන් 100ක් විතර බඳවා ගත්තා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අතුරු ප්‍රශ්න අහන්නේ නැහැ, මෙය පළාත් සභාවට අයත් විෂයක් නිසා. මේ පළාත් සභාවත් ළඟදී විසිරුවා හරින නිසා, ලංකාවේ අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් කටයුතු කරන කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රීවරයකු වන ඔබතුමා පුත්තලමත්, කුරුණෑගලත් අතර මේ ගුරු පුරප්පාඩු තුලනය වන ආකාරයේ, සමනය වෙන ආකාරයේ ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින්, පළාත් සභාවේ ගුරුවරුන් බඳවා ගැනීමට තිබෙන සල්ලිවලින් කම්කරුවන් බඳවා ගැනීම නවත්වන්න කියන ඉල්ලීමත් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Question No. 10 - 586/'18 - (1), Hon. Thushara Indunil Amarasena.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*විනාඩි මත්තොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළైයිටප්පට්ටදු.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Question No. 11 - 595/'18 - (2), Hon. Susantha Punchinilame. - *[Not in the Chamber.]*

Question No. 12 - 968/'18 - (1), Hon. Ishak Rahuman. - [Not in the Chamber.]

Question No. 13 - 993/'18 - (1), Hon. Padma Udhayashantha Gunasekera. - [Not in the Chamber.]

## 1998 වසරේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ උසස්වීම් : අසාධාරණයට ලක්වූවන්ට සාධාරණය
## 1998 ஆம் ஆண்டு இலங்கை நிருவாக சேவையில் இடம்பெற்ற பதவியுயர்வு: பாதிக்கப்பட்டவர்களுக்கு நீதி வழங்கல்
## PROMOTIONS TO SRI LANKA ADMINISTRATIVE SERVICE IN 1998: JUSTICE TO AFFECTED PERSONS

1108/'18

**14. ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1998 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, දෙවන පංතියේ, II වැනි ශ්‍රේණියට කුසලතා පදනම මත උසස් කර පුරප්පාඩු පිරවීමේදී නිලධාරීන් දසදෙනෙකුට පමණ අසාධාරණයක් සිදුවී ඇති බවත්;

(ii) ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ නොසලකා හරිමින් සේවා ව්‍යවස්ථාවේ උසස්වීම් ක්‍රමවේදයට සම්පූර්ණයෙන්ම පරිබාහිරව ද්විත්ව උසස්වීම් ලෙස තනතුරු පුරප්පාඩු ඇතිවීමෙන් වසර හතක් පමණ ප්‍රමාද කර විභාගයක් පවත්වා උසස්වීම් ලබාදීම හේතුවෙන් ඔවුන්ට අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නේ ද?

(ආ) (i) කිසියම් නිලධාරියකුගේ සේවයේ අවසන් කාලය වනවිට හෝ විශ්‍රාම ගිය පසු මෙම උසස්වීම ලබා දෙන බැවින් අදාළ නිලධාරීන් ඒ සඳහා යොමු නොකළේ මන්ද;

(ii) එසේ අසාධාරණයට ලක් වූ නිලධාරීන්ට සාධාරණය ඉටු කිරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේ ද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

අරස නිරුවාක, මුකාමෙත්තුව මට්රුම් සට්ටමුම් ඔළුංකුම් අමෙච්සරෛක් කේට්ට විනා:

(අ) (i) 1998 ආම් ආණ්ටිල් ඉලංකෛ නිරුවාක සේවෛ, වකුප්පු ඉරණ්ටින් IIආම් තරත්තිර්කු තිරමෛ අටිප්පටෛයිල් පතවි උයර්වු වළංකි වෙට්රිටංකළෛප් පූර්ත්ති සෙය්තපෝතු සුමාර් පත්තු අලුවලර්කළුක්කු අනීති නේර්න්තුළ්ළතු එන්පතෛයුම්;

(ii) තාපන විතික් කෝවෛයින් ඒර්පාටුකළ් මට්රුම් පොතු නිරුවාක සුට්රට්රික්කෛකළෛප් කවනත්තිර් කොළ්ළාතු, සේවෛ පිරමාණක් කුරිප්පින් පතවි උයර්වු විතිමුරෛක්කු මුට්රිලුම් මාරුපට්ටතාක ඉරට්ටෛ පතවි උයර්වාකක් කරුති පරීට්සෛයොන්රෛ නටත්තුවතර්කාක, වෙට්රිටම් ඒර්පට්ටු සුමාර් ඒළු ආණ්ටුකළ් තාමතිත්තු පතවි උයර්වු වළංකප්පට්ටුළ්ළතාල් ඉවර්කළුක්කු අනීති නේර්න්තුළ්ළතු එන්පතෛයුම්;

අවර් අරිවාරා?

(ආ) (i) එවරේනුම් අලුවලර් ඔරුවරින් සේවෛක් කාලම් මුටිවුක්කු වරුම්පෝතු අල්ලතු ඔය්වු පෙට්ර පින්නර් ඉන්ත පතවි උයර්වු වළංකප්පටුවතාල් සම්පන්තප්පට්ට අලුවලර්කළ් අතිල් ඒන් සේර්ක්කප්පටවිල්ලෛ එන්පතෛයුම්;

(ii) ඉව්වාරු අනීති නේර්න්තුළ්ළ නපර්කළුක්කු නීති වළංක එටුක්කප්පටුම් නටවටික්කෛකළ් යාවෛ එන්පතෛයුම්;

අවර් ඉච්සපෛයිල් අරිවිප්පාරා?

(ඉ) ඉන්රේල් ඒන්?

asked the Minister of Public Administration & Management and Law & Order:

(a) Is he aware that-

(i) an injustice has been caused to around ten officers when promotions were granted on

[ගරු විජිත හේරත් මහතා]

merit basis in 1998 to fill the vacancies in Grade 11, Class 2 of Sri Lanka Administrative Service; and

(ii) an injustice has been caused to them as a result of granting promotions by way of double promotions, in total disregard of the provisions of the Establishment Code and Public Administration Circulars by holding an examination with a delay of seven years from the time that vacancies occurred?

(b) Will he inform this House -

(i) the reasons for not referring the relevant officers for promotions as those promotions are granted by the end of the service period or after the retirement of an officer; and

(ii) the measures that will be taken to deliver justice to the individuals who have been subjected to injustice in that manner?

(c) If not, why?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் பிரதி அமைச்சர்)

(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Public Administration and Management and Law and Order)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) අසාධාරණයක් සිදු වී නොමැත.

(ii) 1994 වසරට අදාළ විභාගයේ බඳවා ගැනීම් සම්බන්ධව වෘත්තීය සමිති එරෙහිවීම මත 1998 වසරේ බඳවා ගැනීමද ප්‍රමාද වී ඇත.

(ආ) (i) බඳවා ගැනීම්, උසස්වීම් ලබා දෙන දිනට පෙර විශ්‍රාම ගිය නිලධාරීන්ට පත්වීම්, උසස්වීම් ලබා නොදෙන බැවින් අදාළ නොවේ.

(ii) ඉහත (අ) අනුව අදාළ නොවේ.

(ඇ) ඉහත (අ), (ආ) අනුව පැන නොනඟී.

**ගරු බිමල් රත්නායක මහතා**

(மாண்புமிகு பிமல் ரத்நாயக்க)

(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය ඇමතිතුමාගෙන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙයටම ආසන්න ප්‍රශ්නයක් වර්තමානයට අදාළව මා ඊයේත් මේ සභාවට යොමු කරනු ලැබුවා. රාජ්‍ය පරිපාලන සේවා විභාගය නැත්නම් SLAS විභාගය පවත්වලා, එයින් වැඩිම ලකුණු ලබා ගත් 59දෙනෙක් තෝරාගෙන ඔවුන්ගේ පුද්ගලික ලිපිගොනු පවා ඔබතුමාගේ අමාත්‍යාංශයට කැඳවා තිබෙනවා. නමුත් දැනට අපට දැන ගැනීමට ලැබී තිබෙනවා එම විභාග ප්‍රතිඵල අත්හිටුවීමට යම් කිසි ආකාරයක කටයුතු සිදු වෙමින් තිබෙන බවට. එමඟින් මේ විභාගය සමත් වෙච්ච අයට විශාල අසාධාරණයක් වෙන බව එම පිරිස්වල හැඟීමයි. ඒ නිසා මම දැන ගන්න කැමැතියි, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් මේ විභාගයේ ප්‍රතිඵල අවලංගු කරන්න තීරණයක් අරගෙන තිබෙනවාද කියලා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**

(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)

(The Hon. Nalin Bandara Jayamaha)

දැනට එහෙම තීන්දුවක් අරගෙන නැහැ, ගරු මන්ත්‍රීතුමනි. නමුත් යම් යම් ගැටලු කිහිපයක් ගැන මේ අවස්ථාවේදී සාකච්ඡා වෙමින් යනවා. ඔබතුමාට ඕනෑ නම් වැඩිදුර විස්තර ලබා දෙන්න පුළුවන්.

**ගරු බිමල් රත්නායක මහතා**

(மாண்புமிகு பிமல் ரத்நாயக்க)

(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් මේක විශාල ප්‍රශ්නයක් වෙලා. මා දන්නා තරමින් ඒ විභාග සමතුන් අද කොළඹ පැවැත්වෙන විශේෂ රැස්වීමකටත් එනවා. දැන් මේ ගරු සභාවට ඇමතිතුමාත් එනවා. ඒ නිසා මම දැන ගන්න කැමැතියි, ඒ විශේෂ ගැටලු මොනවාද කියලා. ඒවා රටට කියන්න. මේක එක්කෙනෙකුගේ, දෙන්නෙකුගේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක නිසා මෙම ගැටලු පිළිබඳව රටට කියන්න. එතකොට මේ ප්‍රශ්න නිරවුල්. ඇමතිතුමා ඒකට උත්තර දෙන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சர்)

(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Law and Order)

ගරු මන්ත්‍රීතුමනි, දැනට ඒ විභාගය සම්බන්ධව පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සම්බන්ධව පරීක්ෂණයක් කරගෙන යනවා. ඒ පරීක්ෂණයෙන් පස්සේ කාරණය මොකක්ද කියලා අපි කියන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**

(மாண்புமிகு பிமல் ரத்நாயக்க)

(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් දැන ගන්න කැමතියි, ඒ පරීක්ෂණය සිදු කෙරෙන්නේ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයෙන්ද, නැත්නම් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති විභාග දෙපාර්තමේන්තුවෙන්ද, එහෙමත් නැත්නම් ඒ දෙකෙන්මද කියලා?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**

(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)

(The Hon. R.M. Ranjith Madduma Bandara)

අධ්‍යාපන අමාත්‍යාංශය සහ විභාග දෙපාර්තමේන්තුවෙන්.

## තේ අපනයනය : ගුණාත්මකභාවය පිළිබඳ වගකීම

தேயிலை ஏற்றுமதி: தரம் பற்றிய பொறுப்பு

TEA EXPORTS: RESPONSIBILITY OF QUALITY

1115/'18

**15. ගරු දයාසිරි ජයසේකර මහතා**

(மாண்புமிகு தயாசிறி ஜயசேகர)

(The Hon. Dayasiri Jayasekara)

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව වාර්ෂිකව අපනයන කරනු ලබන තේ මෙට්‍රික්ටොන් ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවෙන් තේ මිලදී ගන්නා රටවල් කවරේද;

(iii) තේ අපනයනය කිරීමේදී තේ තොග ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් විධිමත් පරීක්ෂණයකට යටත් කර නිසි අධීක්ෂණයක් යටතේ අපනයනය කරනු ලබන්නේද;

(iv) නොඑසේ නම්, අපනයනය කරනු ලබන තේවල ගුණාත්මකභාවය පිළිබඳව වගකීම දරනු ලබන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) තේ දළු වියලීමේදී හෝ තේ බවට පත් කිරීමේ ක්‍රියාවලියේදී කර්මාන්තශාලා තුළ දී සීනි හෝ වෙනත් රසකාරක, වර්ණ කාරක එක් කිරීම පසුගිය කාලසීමාවේදී සිදු කර තිබේද;

(ii) ඒ පිළිබඳව පරීක්ෂණ මඟින් තහවුරු කරගෙන තිබේද;

(iii) තේවල සීනි සාන්ද්‍රණය මැනීමේ මිනුම් ඒකකයක් පවතීද;

(iv) තේවල ගුණාත්මකභාවයට හානිකර අන්දමින් කටයුතු කරන්නන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පෙරුන්තෝට්ට කෛත්තොෂිල් අමෛච්චරෛක් කේට්ට විනා:

(අ) (i) இலங்கை வருடாந்தம் ஏற்றுமதி செய்யும் தேயிலையின் அளவு மெட்ரிக் தொன்களில் எவ்வளவு;

(ii) இலங்கைத் தேயிலையைக் கொள்வனவு செய்யும் நாடுகள் யாவை;

(iii) ஏற்றுமதி செய்யப்படும் தேயிலையானது இலங்கைத் தேயிலைச் சபையினால் முறையான பரிசீலனைகளுக்கு உட்படுத்தப்பட்டு உரிய மேற்பார்வையின்கீழ் ஏற்றுமதி செய்யப்படு கின்றதா;

(iv) இன்றேல், ஏற்றுமதி செய்யப்படும் தேயிலையின் தரம் பற்றிய பொறுப்பினை ஏற்பவர்கள் யார்;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தேயிலைக் கொழுந்துகளை உலரவிடுகையில் அல்லது தேயிலையாக மாற்றும் தொழிற் பாட்டின்போது கைத்தொழிற்சாலையினுள் சீனி அல்லது வேறு சுவையூட்டிகள் அல்லது நிற மூட்டிகள் கடந்த காலப்பகுதியில் சேர்க்கப்பட் டுள்ளனவா;

(ii) இதுகுறித்து பரிசீலனைகள்மூலம் ஊர்ஜிதப் படுத்தப்பட்டுள்ளதா;

(iii) தேயிலையில் சீனியின் அடர்த்தியை அளவீடு செய்வதற்கானதொரு அலகு முறை உள்ளதா;

(iv) தேயிலையின் தரத்தினைப் பாதிக்கும் வகையில் தொழிற்படுவோருக்கு எதிராக மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Will he inform this House -

(i) the quantity of tea annually exported by Sri Lanka in Metric tons;

(ii) the countries that purchase tea from Sri Lanka;

(iii) whether tea in bulk is subjected to proper tests and exported under a standard monitoring mechanism, when tea is exported by the Sri Lanka Tea Board; and

(iv) if not, the authority that holds the responsibility of the quality of tea exported?

(b) Will he also inform this House-

(i) whether sugar or other flavours and colourings were added during the process of drying and processing tea in the factories during the past period;

(ii) whether it has been confirmed through testing;

(iii) whether a measuring unit is available to measure up the sugar concentration of tea; and

(iv) the measures that will be taken against those who engage in activities that are harmful to the proper quality of tea?

(c) If not, why ?

**ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ.டி. பிரேமதாச - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)

(The Hon. A.D. Premadasa - State Minister of Plantation Industries)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2017 වසරේ තේ මෙට්‍රික්ටොන් මිලියන 288.9ක් (දෙසිය අසූඅටයි දශම නවය) අපනයනය කර ඇත.

(ii)

ii.

| | | | |
|---|---|---|---|
| 1. ඉරාකය | 34. ප්‍රංශය | 67. පිලිපීන් දූපත් | 100. බෙලිසී |
| 2. තුර්කිය | 35. නවසීලන්තය | 68. ඕමානය | 101. ආමේනියාව |
| 3. රුසියාව | 36. උස්බකිස්ථානය | 69. ඩෙන්මාර්කය | 102. මාලි |
| 4. ඉරානය | 37. අයිව්ර්කොස්ට් | 70. සියරා ලියෝන් | 103. පකිස්ථානය |
| 5. එක්සත් අරාබි එමීර් රාජ්‍ය | 38. සෙනගල් | 71. උරුගුවේ | 104. බෙනින් |
| 6. චීනය | 39. ජෝර්ජියා | 72. බහරේන් | 105. කැමරූන් |
| 7. සිරියාව | 40. ග්‍රීසිය | 73. ඇල්ජීරියාව | 106. පැසුවානිව ගිනියා |
| 8. අසර්බයිජානය | 41. සෘතාව | 74. නෙව්වේ | 107. ගිනියාබිසව් |
| 9. ලිබියාව | 42. කසකස්ථානය | 75. කාලිදන්තය | 108. හංගේරියාව |
| 10. වියට්නාමය | 43. ගිනියාව | 76. ටජිකිස්ථානය | 109. බොස්නියාව |
| 11. ජපානය | 44. නයිජීරියාව | 77. ලැජ්පියා | 110. පැරගුවේ |
| 12. සවදි අරාබිය | 45. කැනඩාව | 78. බූර්කිනාෆාසෝ | 111. ඇෆ්ගනිස්ථානය |
| 13. ඇමරිකා එක්සත් ජනපදය | 46. සිංගප්පූරුව | 79. ඔස්මානය | 112. කොස්ටරිකාව |
| 14. ජර්මනිය | 47. ලිතුවේනියා | 80. මැසිඩෝනියාව | 113. වියුනීසියාව |
| 15. ජෝර්දානය | 48. ස්විඩනය | 81. ටෝර්ගෝ | 114. මුරුසිය |
| 16. හොංකොං | 49. කොන්ගෝව | 82. මොරොක්කෝ | 115. රුමේනියාව |
| 17. තායිවානය | 50. වියට්නාමය | 83. ලයිබීරියාව | 116. කිරිබටි |
| 18. ලෙබනානය | 51. බෙලාරුස් | 84. එස්ටෝනියාව | 117. සැමෝවාව |
| 19. යුක්රේනය | 52. ජීජී දූපත් | 85. මෙක්ෂතරජය | 118. ට්‍රිනිඩෑඩ් ටොබැගෝ |
| 20. බෙල්ජියම | 53. ඉන්දියාව | 86. මෝල්ඩෝව | 119. බාබඩෝස් |
| 21. නෙදර්ලන්තය (හොල්නඩ්) | 54. මැලේසියාව | 87. ටර්ක්මෙන්ස්ථාන් | 120. බුරුනායි |
| 22. කුවේටය | 55. ඇන්ගෝලාව | 88. සීසෙල්ස් | 121. පේරු |
| 23. ඕස්ට්‍රේලියාව | 56. ඛල්ගේරියාව | 89. ආර්ජන්ටිනාව | 122. නේපාලය |
| 24. පෝලන්තය | 57. කටාර් රාජ්‍යය | 90. මෙක්සිකෝව | 123. මෝල්ටාව |
| 25. අයර්ලන්තය | 58. ගැම්බියාව | 91. ස්පාඤ්ඤය | 124. බංග්ලාදේශය |
| 26. ඊජිප්තුව | 59. ස්විස්ටර්ලන්තය | 92. කෙන්යාව | 125. කාම්බෝජය |
| 27. දකුණු අප්‍රිකාව | 60. මාලදිවයින | 93. ඉක්වදෝරය | 126. ස්ලෝවේනියාව |
| 28. ඊශ්‍රායලය | 61. ඉන්දුනීසියාව | 94. බොලිවියාව | 127. පැනමාව |
| 29. ඇල්බේනියා | 62. ඔස්ට්‍රියාව | 95. සුරිනාම් | 128. බහමාස් |
| 30. ඉතාලිය | 63. දකුණු කොරියාව | 96. සයිප්‍රසය | 129. කොලොම්බියාව |
| 31. එක්සත් රාජධානිය | 64. මොරිටේනියාව | 97. වැඩි ජනරජය | 130. උතුරු කොරියාව |
| 32. කිරිකිස්ථානය | 65. මොංගෝලියාව | 98. සුඩානය | 131. උගන්ඩාව |
| 33. ෆින්ලන්තය | 66. මැක්ඩඩ් | 99. සර්බියාව | |

[ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා]

(iii) ඔව්, සියලු තේ අපනයන තොග අන්තර්ජාතික ප්‍රමිතිකරණය වන ISO 3720 ප්‍රමිතියට අනුකූල බව තහවුරු කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- සතිපතා කොළඹ තේ වෙන්දේසියට ඉදිරිපත් කරන තේ තොග (Lots) 12,000 (දොළොස්දහස)න් තේ සාම්පල් 4,000ක් පමණ තේ රස බලන්නන් වෙත යොමු කිරීමෙන් අනතුරුව ඌන ප්‍රමිති තේ වෙන්දේසියෙන් ඉවත් කෙරේ. මීට අමතරව එම ඌන ප්‍රමිති තේ රසායනාගාර පරීක්ෂාව සඳහා යොමු කර තත්ත්වය තහවුරු කර ගැනේ.
- අපනයන අවස්ථාවේදී නැවත වතාවක් අපනයනකරුවන්ගේ තේ ගබඩාවලින් ලබා ගන්නා සාම්පල, තේ රස බලන්නන් වෙත ඉදිරිපත් කර තේ ගුණාත්මකභාවය පිළිබඳ තහවුරුවක් ලබා ගැනේ.
- ශ්‍රී ලංකා රේගු පරිශ්‍රයේ පවත්වාගෙන යන ශ්‍රී ලංකා තේ මණ්ඩල කාර්යාලය මඟින් වරාය වෙත ගෙන යන තේ බහාලුම්වලින් සම්මත ක්‍රම අනුව සාම්පල් පරීක්ෂා කරමින් ගුණාත්මකභාවය පිළිබඳ තහවුරු කෙරේ.
- අපනයනකරුවන්ගේ ගබඩාවන් යහපත් නිෂ්පාදන ක්‍රමවේදයන් - GMP - අනුගමනය කරන්නේ ද යන්න පරීක්ෂාවකට ලක් කෙරේ.

(iv) අපනයනය කරනු ලබන තේවල ගුණාත්මකභාවය පිළිබඳව අපනයනකරුවන් විසින් වගකීම දරන අතර එය අධීක්ෂණය හා නියාමනය ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් සිදු කරනු ලබයි.

(ආ) (i) කම්හල් කිහිපයක මෙම තත්ත්වය හඳුනාගෙන ඇත.

(ii) ෆෙරස් සල්ෆේට් වැනි තේවලට කෘත්‍රිමව එකතු කරන රසායන ද්‍රව්‍ය හඳුනාගෙන ඇත. සීනි වැනි ද්‍රව්‍ය ද කෘත්‍රිමව තේවලට එකතු කරන අවස්ථා හඳුනාගෙන ඇත.

(iii) තේ පර්යේෂණ ආයතනය මේ සඳහා මිනුම් ඒකකය සකසා ඇති අතර, එහි නිර්දේශ ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ලැබීමට නියමිතය.

(iv)
- තේ කම්හලේ ලියා පදිංචිය තාවකාලිකව අත්හිටුවීම.
- වරද සමථයකට පත් කිරීමේ ගාස්තු අය කර ගැනීම.
- කර්මාන්තශාලා ලියා පදිංචිය අවලංගු කිරීම හා තේ කොමසාරිස් වෙත පැවරී ඇති බලතල අනුව අධිකරණ ක්‍රියා මාර්ගයක් සඳහා ඉදිරිපත් කිරීම.

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, (ආ) (i)හි අසා තිබෙන, "තේ දළු වියලීමේදී හෝ තේ බවට පත් කිරීමේ ක්‍රියාවලියේදී...." කියන ප්‍රශ්නයට උත්තරය දුන්නා ද?

**ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා**
(*மாண்புமிகு ஏ.டி. பிரேமதாச*)
(The Hon. A.D. Premadasa)

ගරු මන්ත්‍රීතුමනි, එහි දීර්ඝ පිළිතුරක් තිබෙන්නේ. ඒ පිළිතුර සභාගත කරන්නයි වෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඇත්තටම මට අවශ්‍ය පිළිතුරු ටික තිබෙන්නේ අසා තිබෙන ප්‍රශ්නයේ (ආ) කොටස යටතේයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(*மாண்புமிகு கயந்த கருணாதிலக்க*)
(The Hon. Gayantha Karunatileka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අසා තිබෙන්නේ, "තේ දළු වියලීමේදී හෝ තේ බවට පත් කිරීමේ ක්‍රියාවලියේදී කර්මාන්තශාලා තුළදී සීනි හෝ වෙනත් රසකාරක, වර්ණ කාරක එක් කිරීම පසුගිය කාලසීමාවේදී සිදු කර තිබේ ද?" කියලා නේ. එසේ කටයුතු කරපු කර්මාන්තශාලා කීපයක් මේ වන විට අපි හඳුනාගෙන තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා තේවලට සම්බන්ධ නැති වුණත්, බීඩිවලට සම්බන්ධ වුණත්- [බාධා කිරීමක්] ඒක බොනවා, අනෙක් එක ඔතනවා, දෙකම. [බාධා කිරීමක්] තේ අදාළ නැති වුණාට තේ ගැන ප්‍රශ්න මට අහන්න පුළුවන්. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ හිටපු සභාපතිතුමා නිසා මම එතුමාගෙන් අතුරු ප්‍රශ්න ටික අහන්නද?

**ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා**
(*மாண்புமிகு ஏ.டி. பிரேமதாச*)
(The Hon. A.D. Premadasa)

හොඳයි, එතුමාගෙන් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)

දැන් ලංකාවේ තේවලට සීනි කලවම් කරලා අපනයනය කිරීම සම්බන්ධව විශාල ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. අද තේ කිලෝවක් රුපියල් 550කට පමණ ගිහින් තිබෙනවා. සීනි කිලෝ එකක් රුපියල් 100ක් පමණ වෙනවා. මේ විධියට තේවලට සීනි කලවම් කරන කම්හල් 53ක් දැන් හඳුනාගෙන තිබෙනවා. මේක විශාල අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා. මේ නිසා ලංකාවේ තේවලට ජාත්‍යන්තරයේ තිබෙන පිළිගැනීම පිළිබඳව විශාල අර්බුදයක් ඇවිල්ලා තිබෙනවා. රොහාන් පෙතියාගොඩ මහත්මයා තේ මණ්ඩලයේ සභාපතිවරයා විධියට සිටි කාලයේ එතුමා සීනි කලවම් කරන තේ කම්හල් 53ක් හඳුනා ගත්තා. හැබැයි, මේ වනතුරු ඒ සම්බන්ධයෙන් පියවරක් අරගෙන නැහැ. ඒකයි මේ සම්බන්ධව තිබෙන තත්ත්වය.

හැබැයි, ජාත්‍යන්තරයේ "Ceylon Tea" නාමයට විශාල ගෞරවයක් තිබෙනවා. මේ ක්‍රියාව නිසා එම ගෞරවයට විශාල හානියක් සිදුවෙලා තිබෙනවා. ඔබතුමාත් දන්නවා ඇති, මේ කම්හල් 53 සම්බන්ධයෙන් ඇතිවෙලා තිබෙන ප්‍රශ්නයට වඩා බරපතළ ප්‍රශ්නය තමයි මේ තුළින් ලංකාවේ සිටින ලක්ෂ 20ක් පමණ වන කුඩා තේ වතු හිමියන්ගේ කර්මාන්තය තමයි කඩා වැටෙන්නේ කියන එක.

සීනි උණු කරලා තේවලට කලවම් කරලා තේවල පාට වැඩි කිරීමෙන් එහි ගුණාත්මක භාවය විනාශ කරන නිෂ්පාදකයන්ට විරුද්ධව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම දැනගන්නට කැමැතියි. වරද සමථයට පත් කිරීම තමයි දැනට කරන්නේ. ඔබතුමන්ලා වෙනත් ක්‍රමවේදයක් අනුගමනය කරන්නේ නැද්ද? අපේ රටේ තේවලට ඇතිවෙලා තිබෙන- [බාධා කිරීමක්] ඔබතුමන්ලා දැනට අනුගමනය කරන වැඩ පිළිවෙළ මොකක්ද, ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(*மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன*)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මටත් පොඩි පැහැදිලි කර ගැනීමක් තිබෙනවා. [බාධා කිරීමක්] ඒ අයට නීතිමය වශයෙන් දඬුවම් දෙන ක්‍රමයක් නැද්ද, ඒකට දඬුවම් දෙන්න ක්‍රමයක් රටේ නැහැ කියන එක තමයි කියන්නේ. ඒකට රටේ නීතියක් නැහැ, එහෙම නම් අපි නීතියක් හදන්නට ඕනෑ, මේ අයට දඬුවම් දෙන්න. ඔබතුමා දන්නවා තේවලට සීනි කලවම් කරන්නේ කළු කරන්න බව. එක පැත්තකින් තේවලට ෆෙරස් සල්ෆේට් ගහනවා, අනෙක් පැත්තෙන් සීනි ගහනවා. මේ ආකාරයේ කම්හල් 53ක් හදුනා ගත්තා. මම වැවිලි කර්මාන්ත ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, වාහන එකසිය ගණනක් යොදලා දවසකින් වැටලීම් කිරීම සම්බන්ධව.

එහෙම වැටලීම් කළාට මේ වරදට දඬුවම් දෙන්න ක්‍රමයක් නැහැ. කර්මාන්තශාලා තිබෙන නිසා ඔබතුමාත් දන්නවා ඇති, මාසයකට රුපියල් මිලියන 4ක්, 5ක් එයින් ලාභ ලබලා, පෙරකදෝරුවන්ට -නීතිඥවරුන්ට - ගෙවලා මේවායින් බේරෙන බව. අපි පාර්ලිමේන්තුවේ සියලු දෙනාගේම එකඟත්වය ඇතිව මේ වෙනුවෙන් නීතියක් සම්මත කරලා, මේ ගොල්ලන්ට දඬුවම් දෙන ක්‍රමයක් හදන්න ඕනෑ. එහෙම නැති වුණොත් ලංකාවේ තේ කර්මාන්තය ඉවරයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)

ඒක හරි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(*மாண்புமிகு கயந்த கருணாதிலக்க*)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමාගේ අවසරය ඇතිව මම මේ කාරණයට එකතු වෙන්නම්. මම විරුද්ධ පක්ෂයේ සිටි කාලයේත් පැවැති ආණ්ඩුවට බලපෑම් කළා, මේක කරන්න කියලා. ඒ කාලයේත් වුණේ නැහැ. පසුගිය දවස්වල කර්මාන්තශාලා පනස් ගණනක් විතර මේකට අහු වුණා. [බාධා කිරීමක්] ඔව්. ඇත්ත වශයෙන්ම මේ ක්‍රමය නිසා අද අවංකව කර්මාන්තශාලා කරන මිනිසුන්ට ඒවා කරගෙන යන්න බැරි වෙලා තිබෙනවා. ඒක විශාල අර්බුදයක්. ගරු ඇමතිතුමා දැන් ඒ ගැන කටයුතු කරනවා. ඒකට අවශ්‍ය මිනුම් ඒකක සකස් කිරීමට තේ පර්යේෂණ ආයතනය මඟින් තේ මණ්ඩලයට දැන් නිර්දේශ ලැබිලා තිබෙනවා.

දැනට තිබෙන විධියට මේ වරදට අහු වුණාම තේ කම්හල් ලියා පදිංචිය තාවකාලිකව අත් හිටුවනවා; වරද සමථයකට පත් කිරීමේ ගාස්තු අය කරගන්නවා. කර්මාන්තශාලා ලියා පදිංචිය අවලංගු කිරීම හා තේ කොමසාරිස් වෙත පැවරී ඇති බලතල අනුව අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම තමයි තිබෙන්නේ. නමුත්, ඔබතුමන්ලා කියන ප්‍රශ්න තිබෙනවා. ඒ ගැන දැඩි ක්‍රියා මාර්ගයක් ගන්න අමාත්‍යාංශයේ අවධානය දැන් යොමු වෙලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)

මේක සිද්ධ වුණේ පසුගිය පෙබරවාරි මාසයේ, ගරු ඇමතිතුමනි. ලංකාවේ තේ කම්හල් 600ක් විතර තිබෙනවා. හැබැයි කම්හල්,- [බාධා කිරීමක්] ඒක තමයි. කර්මාන්තකරුවෝ 600ක් විතර මේ ක්‍රියාවලියේ යෙදෙනවා. නමුත්, මෙයින් 53ක් එම වරදට හසුවුණා. පසුගිය පෙබරවාරි මාසයේ තමයි මේක සිද්ධ වුණේ. ඒ කාලයේ නවින් දිසානායක මන්ත්‍රීතුමා බොහොම පැහැදිලිව කිව්වා, "වහාම මේ සම්බන්ධව දැඩි දඬුවම් දෙනවා"යි කියලා. හැබැයි, මේ වනතුරු මේ කම්හල් 53 සම්බන්ධයෙන් කිසිම පියවරක් ගෙන නැහැ. ඒ විතරක් නොවෙයි, එම ආයතනයේ සේවය කළ රොහාන් පෙතියාගොඩ මහත්මයාත් අයින් කරලා වෙනත් කෙනෙක් ගෙනැල්ලා දැම්මා. දැන් මේකට වෙච්ච දෙයක් නැහැ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමන්ලාගෙන් මේ කාරණය පිළිබඳව අහන්න කැමැතියි. ආණ්ඩුව විධියට ලංකාවේ "Ceylon Tea" නාමය ආරක්ෂා කිරීම සඳහා ඔබතුමන්ලා මේ කර්මාන්තකරුවන්ට විරුද්ධව පියවර ගන්නේ කවදාද, ඒ වෙනුවෙන් ගෙනෙන යෝජනාවලිය හා ක්‍රමවේදය මොකක්ද කියලා කරුණාකර මේ පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න ඔබතුමාට පුළුවන්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(*மாண்புமிகு கயந்த கருணாதிலக்க*)
(The Hon. Gayantha Karunatileka)

දැනටමත් එහි බරපතළකම තේරුම් ගෙන තිබෙනවා. දැනට තිබෙන නීති ප්‍රමාණවත් නොමැති නිසා අලුත් ක්‍රම ගැන දැන් කල්පනා කරගෙන යනවා. [බාධා කිරීමක්] ඒක ඇමතිතුමාට තමයි කියන්න ඕනෑ. [බාධා කිරීමක්]

**ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා**
(*மாண்புமிகு ஏ.டி. பிரேமதாச*)
(The Hon. A.D. Premadasa)

ගරු ඇමතිතුමා මේ ගරු සභාවේ නැහැ. නමුත්, මේ සම්බන්ධයෙන් නඩු විභාගයකට යනවාය කියා මෙම පිළිතුරේ සඳහන් කර තිබෙනවා. [බාධා කිරීමක්] ඒක මට කියන්න බැහැ, අමාත්‍යාංශයෙන් අහලා බලන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairman of Committees)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, පිළිතුරක් තිබෙනවා නම් table කරන්න.

**ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා**
(*மாண்புமிகு ஏ.டி. பிரேமதாச*)
(The Hon. A.D. Premadasa)

මේ සම්බන්ධව ඇමතිතුමා දැනුවත් කරලා පසුව පිළිතුරක් ලබාදෙන්නම්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(*மாண்புமிகு கயந்த கருணாதிலக்க*)
(The Hon. Gayantha Karunatileka)

ගරු මන්ත්‍රීතුමනි, එතුමා විශේෂයෙන් රබර් අංශය ගැන අවධානය යොමු කර තිබෙනවා වාගේම, නවින් දිසානායක ඇමතිතුමා මෙහි බරපතළකම තේරුම් ගෙන දැන් ඊට අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairman of Committees)

බොහොම ස්තුතියි. Now, the second round.

**කොළඹ ෂැන්ග්‍රි-ලා හෝටල් ව්‍යාපෘතිය : ගිවිසුම**
கொழும்பு ஷங்கிரிலா ஹோட்டல் கருத்திட்டம்: உடன்படிக்கை
SHANGRI-LA, COLOMBO HOTEL PROJECT AGREEMENT

177/'18

**4. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා වෙනුවට)**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. (Dr.) Nalinda Jayathissa)

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) කොළඹ, ෂැන්ග්‍රි-ලා හෝටල් ව්‍යාපෘතිය සඳහා චීන රජය, ශ්‍රී ලංකා රජය සමඟ ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) ඒ අනුව චීනය හා ශ්‍රී ලංකාව යන පාර්ශ්වවලින් ගිවිසුමට අත්සන් කර ඇත්තේ කවුරුන්ද;

(iii) ගිවිසුම අත්සන් කර ඇති දිනය කවරේද;

(iv) එම ගිවිසුම සභාගත කරන්නේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති ඉඩමේ ප්‍රමාණය කොපමණද;

(vi) එම ඉඩම ලබාදී ඇති පදනම කවරේද;

(vii) සින්නක්කර පදනමින් ලබා දී ඇත්නම්, එම සින්නක්කර ඔප්පුවේ අංකය එහි මුද්‍රා තබා ඇති දිනය හා ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு ஷங்கிரிலா ஹோட்டல் கருத் திட்டத்திற்காகச் சீன அரசாங்கம் இலங்கை அரசாங்கத்துடன் உடன்படிக்கையொன்றில் கைச்சாத்திட்டுள்ளதா என்பதையும்;

(ii) அதன்படி, சீனா மற்றும் இலங்கை சார்பாக உடன்படிக்கையில் கைச்சாத்திட்டுள்ளவர்கள் யாவர் என்பதையும்;

(iii) உடன்படிக்கை கைச்சாத்திடப்பட்ட திகதி யாது என்பதையும்;

(iv) அந்த உடன்படிக்கையை சபையில் சமர்ப்பிப் பாரா என்பதையும்;

(v) மேற்படி கருத்திட்டத்திற்காக வழங்கப்பட்டுள்ள காணியின் அளவு யாது என்பதையும்;

(vi) குறித்த காணி எந்த அடிப்படையில் வழங்கப் பட்டுள்ளது என்பதையும்;

(vii) இறையிலி அடிப்படையில் வழங்கப்பட்டிருப் பின், குறித்த இறையிலி உறுதியின் இலக்கம், அதில் இலச்சினையிடப்பட்ட திகதி மற்றும் இடம் யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Development Strategies and International Trade:

(a) Will he inform this House-
(i) whether the Government of China has signed an agreement with the Government of Sri Lanka for the Shangri-La Hotel project in Colombo;
(ii) accordingly, the parties who have signed the agreement on behalf of China and Sri Lanka;
(iii) the date on which the agreement was signed;
(iv) whether that agreement will be tabled in this House;
(v) the land area that has been given for that project;
(vi) the basis on which the aforesaid land has been given; and
(vii) if it has been given on freehold basis, the number of the freehold title along with the date and the place of the seal affixed to it?

(b) If not, why?

**ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)
Sir, I will **table*** the Answer.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) No. The Agreement has been entered into between the Board of Investment of Sri Lanka and Shangri-La Hotel Lanka (Private) Limited.

(ii) Agreement No-228
1. Mr. Jayampathi Bandaranayake, Director General, Board of Investment of Sri Lanka
2. Mr. Madhu Rama Chandra Rao, Director, Shangri-La Hotel Lanka (Private) Limited (SHLPL)
Mr. Mohamed Fazal Mohamed Rifdhy, Director, Shangri-La Hotel Lanka (Private) Limited (SHLPL)

Agreement No-24
1. Mr. Upul Jayasuriya, Chairman, Board of Investment of Sri Lanka.
2. Mr. Woo Wilfred Shan Chen, Director, Shangri-La Hotel Lanka (Private) Limited (SHLPL)
Mr. Mohomad Sajjad Mawzoon, Director, Shangri-La Hotel Lanka (Private) Limited (SHLPL)

(iii) 07th February, 2011 (Agreement No. 228) and;
01st April, 2015 (Supplementary Agreement No. 24).

(iv) Copies of the Agreements as mentioned below are attached herewith**.

---

*** පුස්තකාලයේ තබා ඇත.*
**** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

(a). No. 228 dated 07.02.2011 attested by F.S. Ismail of Colombo, Notary Public

(b). No. 24 dated 01.04.2015 attested by S.D.I. Seneviratne of Colombo, Notary Public

(v) 4.0469 hectares (Agreement No. 228 and No. 24)

(vi) By virtue of State Grant under Section 23(2) of the Crown Lands Ordinance.

(vii) Not applicable since it is a State Grant as mentioned in (vi) above.

(b) Not relevant.

## උතුරු මැද හා නැඟෙනහිර පළාත්වල ව්‍යාප්තව ඇති වකුගඩු රෝගය : පර්යේෂණ

## வட மத்திய மற்றும் கிழக்கு மாகாணங்களில் பரவியுள்ள சிறுநீரக நோய்: ஆய்வுகள்

## KIDNEY DISEASE PREVALENT IN NORTH-CENTRAL AND EASTERN PROVINCES: RESEARCHES

595/'18

**11. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු සුසන්ත පුංචිනිලමේ මහතා වෙනුවට)**

(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே சார்பாக)

(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Susantha Punchinilame)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) උතුරු මැද, නැඟෙනහිර පළාත්වල ව්‍යාප්තව පවතින වකුගඩු රෝගී තත්ත්වය හඳුනාගැනීම සම්බන්ධයෙන් මේ වන විට සිදු කෙරෙමින් පවතින පර්යේෂණ සංඛ්‍යාව කොපමණද;

(ii) එම පර්යේෂණ සිදු කරනු ලබන ආයතන සහ පර්යේෂකයන්ගේ නම් කවරේද;

(iii) එම පර්යේෂණවල නිගමන ලැබීමට නියමිතව ඇති දිනය කවරේද;

(iv) එම පර්යේෂණ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වකුගඩු රෝගයට ගොදුරුවූවන්ට ලබා දෙන ප්‍රතිකාරවලට අමතරව එම රෝගී තත්ත්වයට පත්වීම වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) ආස්‍රැත ජලය නිෂ්පාදනය කරනු ලබන Reverse Osmosis Plantsවලට අමතරව බ්‍රිතාන්‍යයේ IOCN LIFE SAVER නමැති ආයතනයේ නිෂ්පාදනයක් බව කියන LIFE SAVER නමැති ජල පෙරණයක් මෙරටට හඳුන්වාදී තිබේද;

(iii) එය වකුගඩු රෝග ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා යොදා ගත නොහැක්කේ මන්ද යන්න පැහැදිලි කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வட மத்திய மற்றும் கிழக்கு மாகாணங்களில் பரவியுள்ள சிறுநீரக நோய் நிலைமையை இனங்கண்டுகொள்வதற்காகத் தற்போது இடம் பெற்றுவருகின்ற ஆய்வுகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அவ்வாய்வுகளை மேற்கொண்டுவருகின்ற நிறுவனங்களினதும் ஆய்வாளர்களினதும் பெயர்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி ஆய்வுகளின் முடிவுகள் கிடைக்கப் படவுள்ள திகதி யாதென்பதையும்;

(iv) குறிப்பிட்ட ஆய்வுகளுக்காக ஒதுக்கப்பட்டுள்ள நிதித் தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சிறுநீரக நோயினால் பாதிக்கப்பட்டோருக்கு வழங்கப்படுகின்ற சிகிச்சைகளுக்கு மேலதிகமாக இந்நோய் ஏற்படுவதைத் தடுப்பதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாதென்பதையும்;

(ii) வடித்த நீரை உற்பத்தி செய்கின்ற Reverse Osmosis Plant களுக்கு மேலதிகமாக பிரித்தானியாவில் அமைந்துள்ள ICON LIFE SAVER எனும் நிறுவனத்தின் ஒரு உற்பத்தியாகக் கூறப்படுகின்ற LIFE SAVER எனும் நீர் வடியொன்று இந்நாட்டுக்கு அறிமுகப்படுத்தப் பட்டுள்ளதா என்பதையும்;

(iii) சிறுநீரக நோய் பரவுவதைக் கட்டுப்படுத் துவதற்கு அதனை ஏன் பயன்படுத்த முடியாது என்பது பற்றித் தெளிவுபடுத்தப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine :

(a) Will he inform this House-

(i) the number of researches underway on the kidney disease prevalent in the North-Central and Eastern Provinces, of which a cause has not been specifically identified by now;

(ii) the names of the researchers and institutions that conduct those researches;

(iii) the dates on which the conclusions of those researches are due; and

(iv) the amount of money allocated for those researches?

(b) Will he also inform this House-

(i) the steps that have been taken to prevent the people from afflicting with this disease, in addition to treatment given to patients with the disease;

(ii) whether a water filter known as LIFE SAVER, which is said to be a product of IOCN LIFE SAVER in Britain has been introduced to this country in addition to Reverse Osmosis Plant that produce distilled water; and

(iii) whether he will explain why it cannot be used to control the spread of the kidney disease?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) එකකි.

(ii) එම පර්යේෂණ මෙම අමාත්‍යාංශයෙහි වසංගත රෝග ඒකකයෙහි පර්යේෂණ කණ්ඩායම විසින් සිදු කරනු ලබයි.

(iii) එම පර්යේෂණවල පළමුවන පියවර වන මූලික තක්සේරුව දැනට අවසන් වී ඇත. දෙවන පියවරේදී කාණ්ඩ දෙකක් වසර 4ක් පුරා පර්යේෂණයට ලක්වේ.

(iv) 2018 වර්ෂය සඳහා රුපියල් මිලියන 22ක් වෙන් කර ඇත.

(ආ) (i) වකුගඩු රෝගය පිළිබඳ වැඩි අවදානම් ප්‍රදේශවල පූර්ව පර්යේෂණ මඟින් පුද්ගලයන් පරීක්ෂා කිරීම.

වැඩි අවදානම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අවුරුදු 20ට වැඩි පුද්ගලයන් රුධිර හා මූත්‍රා පරීක්ෂාවට ලක් කිරීම.

පරීක්ෂාවෙන් හඳුනාගත් පුද්ගලයන් වකුගඩු රෝග පිළිබඳ විශේෂඥවරයකු වෙත යොමු කිරීම.

වකුගඩු රෝග විශේෂඥවරයා විසින් රෝගය තිබේ යැයි නිගමනය කරනු ලබන පුද්ගලයන් ප්‍රදේශයේ සිටින කායික රෝග විශේෂඥ වෛද්‍යවරයා වෙත යොමු කිරීම.

අවදානම් ප්‍රදේශවල පුද්ගලයන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මඟින් රෝගය පිළිබඳවත්, එය සෑදීමට හේතු යැයි උපකල්පනය කරන හේතු පිළිබඳවත්, රෝගීන් විසින් අනුගමනය කළ යුතු ජීවන රටාව පිළිබඳවත් දැනුවත් කිරීම.

ජලය මෙම රෝගය සෑදීමට හේතුවන බව සනාථ වී නැතත්, වෙනත් ආයතන මඟින් ප්‍රති ආස්‍රැති යන්ත්‍ර (Reverse Osmosis Plant) හරහා ජලය සැපයීම හා ජල ප්‍රවාහන මණ්ඩලය හරහා නල ජලය සැපයීම.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එවැනි යන්ත්‍ර මිලදී ගැනීම හෝ බෙදා හැරීම හෝ නඩත්තු කිරීමක් සිදු නොකරයි.

(iii) වකුගඩු රෝගී තත්ත්වයට හේතු කාරක සොයා ගෙන නොමැති බැවින් ප්‍රති ආස්‍රැති යන්ත්‍ර මඟින් සපයන ජලය නිසා රෝගය පාලනය කළ හැකි බව කිව නොහැක. රෝග කාරකය ජලය, ආහාර, ශ්වසන පද්ධතිය හරහා ඇතුළු වීමට ඉඩ ඇත.

(ඇ) පැන නොනඟී.

## කලාවැව ධාතුසේන වත්ත : ප්‍රතිසංස්කරණය
## கலாவெவ தாதுசேனவத்த: புனரமைப்பு
## DHATHUSENA WATTA IN KALAWEWA: RECONSTRUCTION

968/'18

**12. ගරු ආනන්ද අලුත්ගමගේ මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே - மாண்புமிகு இஷாக் ரஹ்மான் சார்பாக)
(The Hon. Ananda Aluthgamage on behalf of Hon. Ishak Rahuman)

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මැල්සිරිපුර වතු සමාගමක් යටතේ පවතින අක්කර 1000ක් පමණ වූ කලාවැව, ධාතුසේන වත්ත මේ වන විට වල් බිහිවී ප්‍රයෝජනයට ගත නොහැකි මුඩු ඉඩමක් බවට පත්වී ඇති බවත්;

(ii) එය නවීකරණය කර රජයට ආදායමක් ලබා ගත හැකි අයුරින් ප්‍රතිසංස්කරණය කළ හැකි බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, එම කාර්යය ආරම්භ කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச தொழில்முயற்சி மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மெல்சிறிபுர பெருந்தோட்டக் கம்பனியின் கீழுள்ள அண்ணளவாக 1000 ஏக்கர் பரப் பளவான கலாவெவ, தாதுசேனவத்த தற்சமயம் காடடர்ந்து பயன்படுத்த முடியாத தரிசு நிலமாக மாறியுள்ளதென்பதையும்;

(ii) இதனை நவீனமயமாக்கி அரசாங்கத்திற்கு வருமானமொன்றைப் பெறக்கூடிய வகையில் புனரமைக்க முடியுமென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனின், மேற்படி செயற்பாட்டை ஆரம்பிக்கும் திகதி யாதென்பதை அவர் இச்சபையில் அறிவிப் பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise and Kandy City Development :

(a) Is he aware that-

(i) the Dhathusena Watta of Kalawewa with an extent of approximately 1,000 acres which comes under the ownership of a Melsiripura Plantation Company has become a barren land gone in to wilderness at present;

(ii) this land can be renovated and reconstructed enabling the Government to earn an income out of it; and

(b) If so, will he inform this House of the date on which the aforesaid task would be initiated?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) නැත.

(ආ) නැත.

(ඇ) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින වැවිලි ආයතන කිසිවක් මගින් අක්කර 1,000ක් පමණ වූ කලාවැව, ධාතුසේන වත්ත පාලනය නොවේ.

## සෙවනගල සීනි කර්මාන්තශාලාව : උක් වගාව සඳහා වෙන් කළ ඉඩම්

## செவனகல சீனித் தொழிற்சாலை: கரும்புச் செய்கைக்காக ஒதுக்கப்பட்ட காணிகள்

## SEVENAGALA SUGAR FACTORY: LAND ALLOCATED FOR SUGAR CANE CULTIVATION

993/'18

**13. ගරු විජිත බේරුගොඩ මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**

(மாண்புமிகு விஜித பேருகொட - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)

(The Hon. Vijitha Berugoda on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) සෙවනගල සීනි කර්මාන්තශාලාව ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම කර්මාන්තශාලාව සඳහා වෙන් කරන ලද ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) එම කර්මාන්තශාලාව සඳහා උක් වැවීමට වෙන් කළ ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) පසුගිය වර්ෂ 5ක කාලය තුළ,

(i) උක් වගාව සඳහා වෙන් කළ ඉඩම් ප්‍රමාණයෙන්, උක් වගා කරන ලද ඉඩම් ප්‍රමාණය;

(ii) වගා කරන ලද මුළු ඉඩම් ප්‍රමාණයෙන්, ලබා ගත් මුළු උක් ටොන් ප්‍රමාණය;

(iii) අඹරන ලද උක් ටොන් ප්‍රමාණය;

(iv) නිෂ්පාදනය කළ මුළු සීනි ප්‍රමාණය;

(v) සීනි අලෙවියෙන් ලබන ලද ලාභය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச தொழில்முயற்சி மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) செவனகல சீனித் தொழிற்சாலை ஆரம்பிக்கப் பட்ட வருடம் யாது;

(ii) மேற்படி தொழிற்சாலைக்காக ஒதுக்கப்பட்ட காணிகளின் எக்கரளவு யாது;

(iii) மேற்படி தொழிற்சாலைக்கான கரும்புச் செய்கைக்காக ஒதுக்கப்பட்ட காணிகளின் ஏக்கரளவு யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) கடந்த 5 வருட காலப்பகுதிக்குள்,

(i) கரும்புச் செய்கைக்காக ஒதுக்கப்பட்ட காணி களின் அளவில் கரும்புச் செய்கை மேற்கொள்ளப் பட்ட காணிகளின் அளவு;

(ii) பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்ட காணிகளி லிருந்து பெற்றுக்கொண்ட மொத்த கரும்பு தொன்களின் அளவு ;

(iii) பிழியப்பட்ட கரும்பு தொன்களின் அளவு;

(iv) உற்பத்தி செய்யப்பட்ட மொத்த சீனியின் அளவு;

(v) சீனி விற்பனையின் மூலம் கிடைத்த இலாபம்;

ஒவ்வொரு வருடத்திற்கிணங்கவும் வெவ்வேறாக எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise and Kandy City Development :

(a) Will he inform this House -

(i) the year in which the Sevenagala Sugar Factory was started;

(ii) the acreage of land allocated for that factory;

(iii) the acreage of land allocated for cultivation of sugar cane for that factory?

(b) Will he also inform this House with relevance to each year, separately-

(i) the area cultivated with sugar cane out of the land allocated for sugar cane cultivation;

(ii) the total quantity of sugar cane obtained from the total area cultivated;

(iii) the quantity of sugar cane ground;

(iv) the total quantity of sugar produced; and

(v) the profit earned through the sale of sugar;

within the last five years?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) 1986

(ii) අක්කර 18,795

(iii) අක්කර 10,415

(ආ) පසුගිය වර්ෂ 05ක කාලය තුළ අංක (i) සිට (v) දක්වා අදාළ පිළිතුරු පහත වගුව මඟින් දක්වා ඇත.

| | | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|
| I | උක් වගා කරන ලද ඉඩම් ප්‍රමාණය (අක්කර) | 6,054 | 8,181 | 9,014 | 9,241 | 8,643 |
| II | ලබා ගත් මුළු උක් ටොන් ප්‍රමාණය (මෙ.ටො) | 192,568 | 193,812 | 200,180 | 283,202 | 209,566 |
| III | අඹරන ලද උක් ටොන් ප්‍රමාණය (මෙ.ටො) | 177,468 | 180,941 | 193,624 | 234,707 | 198,151 |
| IV | නිෂ්පාදනය කළ මුළු සීනි ප්‍රමාණය - (මෙ.ටො) | 14,190 | 14,417 | 14,376 | 17,233 | 15,198 |
| V | සීනි අලෙවියෙන් ලද ලාභය (රුපියල්) | 56,472,776 | 515,556 | 253,113,951 | 21,527,238 | 66,394,092 |

(ඇ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Now, Public Business: Item Nos. 1 to 3 in today's Order Paper.

Item No. 1 - New Villages Development Authority for Plantation Region Bill; Item No. 2 - Pradeshiya Sabhas (Amendment) Bill and Item No. 3- Institute of Personnel Management, Sri Lanka (Amendment) Bill.

Item No. 1 - New Villages Development Authority for Plantation Region Bill - to be moved by the Hon. Palany Thigambaram.

## වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත
## பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபைச் சட்டமூலம்
## NEW VILLAGES DEVELOPMENT AUTHORITY FOR PLANTATION REGION BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[பி.ப. 2.08]

**ගරු පලනි දිගම්බරම් මහතා (කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பழனி திகம்பரம் - மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சர்)
(The Hon. PalanyThigambaram - Minister of Hill Country New Villages, Infrastructure and Community Development)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, "பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபைச் சட்டமூலம் இப்பொழுது இரண்டாம் முறை மதிப்பிடப்படுமாக" என நான் முன்மொழிகின்றேன்.

இன்றைய தினம் மலையக மக்களின் வரலாற்றிலே முக்கியமானதொரு தினமாகும். இந்த அதிகாரசபையின் உருவாக்கத்தின் மூலமாக மலையக மக்களின் நீண்டகாலக் கனவொன்று இன்று நிறைவேறுகிறது. இந்த அதிகாரசபை எதற்காக உருவாக்கப்பட்டதென்பதை இதற்குப் பொறுப்பான அமைச்சர் என்ற வகையில் விளக்க வேண்டியது எனது கடமையாகும். தற்போது எனக்கு வழங்கப்பட்டிருக்கும் மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சுக்கான பௌதிக வளங்கள் மற்றும் மனித வளங்கள் போதுமானதாக இல்லை. இதனால், இந்த அமைச்சினால் உருவாக்கப்பட்ட செயற்திட்டங்களை நடைமுறைப்படுத்துவதில் பல்வேறு சிக்கல்களை எதிர்நோக்க வேண்டியுள்ளன. அத்துடன் சில தாமதங்கள் ஏற்பட்டு வருவதையும் நான் அவதானித்து வருகிறேன்.

1997ஆம் ஆண்டு அன்றைய ஜனாதிபதியாக இருந்த சந்திரிகா அம்மையார் அவர்கள் பெருந்தோட்ட மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்காக ஒரு தனியான அமைச்சை உருவாக்கினார். 2010ஆம் ஆண்டு வரைக்கும் இந்த அமைச்சு பல்வேறு அமைச்சுக்களின்கீழ் எல்லா வளங்களையும் கொண்ட பலம்மிக்க ஓர் அமைச்சாக வளர்ச்சி பெற்று வந்தது. 2006ஆம் ஆண்டு இந்த அமைச்சு தேசிய நிர்மாண அமைச்சோடு சேர்க்கப்பட்டு அதனுடைய ஒரு பிரிவாகவே செயற்பட்டது. பின்னர் 2010ஆம் ஆண்டு இந்த அமைச்சு இல்லாமல் ஆக்கப்பட்டது. 2015ஆம் ஆண்டு ஜனவரியில் புதிய அரசாங்கம் உருவாக்கப்பட்ட பின்னரே மீண்டும் தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அபிவிருத்தி அமைச்சு உருவாக்கப்பட்டது. 2015ஆம் ஆண்டு, ஆகஸ்ட் மாதம் நடைபெற்ற பொதுத் தேர்தலின் பின்னர் இந்த அமைச்சானது மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு எனப் பெயர் மாற்றம் பெற்றது. இது புதிய அமைச்சாக இருந்த காரணத்தினால் இந்த அமைச்சினைக் கொண்டு நடத்துவதற்கான வளங்கள் குறைந்த அளவாகவே இருந்தன. இதனை முழுமைப்படுத்தி வலுவான ஒரு நிருவாகக் கட்டமைப்பை உருவாக்குவதே இந்த அமைச்சின் சவாலாகும். இந்தச் சவாலை நிறைவேற்றுவதே இந்த அதிகாரசபையின் முக்கிய பணியாகும்.

பெருந்தோட்டப் பகுதிகளில் முறையான அபிவிருத்திப் பணிகளை முன்னெடுக்க 2015 முதல் 2020 வரையான ஆண்டுகளை உள்ளடக்கிய ஒரு திட்டம் தயாரிக்கப்பட்டு அமைச்சரவைக்கும் சமர்ப்பிக்கப்பட்டது. இந்தத் திட்டத்தை நடைமுறைப்படுத்துவதற்கு ஒரு முழுமையான நிருவாகக் கட்டமைப்பு அமைச்சிடம் இருக்கவில்லை. இதன் காரணமாகவே ஓர் அதிகாரசபையின் தேவை உணரப்பட்டது. 2005ஆம் ஆண்டு வெளியிடப்பட்ட 'மஹிந்த சிந்தனை'யில் "பெருந்தோட்டப் பகுதிகளின் உட்கட்டமைப்பு அபிவிருத்தி மற்றும் மனிதவள அபிவிருத்திக்காக ஓர் உயர் சக்திமிக்க அதிகாரசபையொன்று நிறுவப்படும்" எனக் கூறப்பட்டது. ஆனால், 2005ஆம் ஆண்டு நிறுவப்பட்ட அரசாங்கம் இந்த அதிகாரசபையை உருவாக்க எந்தவிதமான நடவடிக்கை களையும் எடுக்கவில்லை.

குறித்த ஐந்தாண்டுத் திட்டத்தை நடைமுறைப்படுத்து வதற்கு அதிகாரசபை தேவையென என்னால் அமைச்சரவை யின் அங்கீகாரத்துக்காகப் பத்திரமொன்று சமர்ப்பிக்கப் பட்டது. இதன்படி இந்த முன்மொழிவுக்கான ஆரம்ப வரைவு அமைச்சரவையின் அங்கீகாரத்துடன் நிறுவப்பட்ட பணிக் குழுவினால் தயாரிக்கப்பட்டது. அப்போது இதனோடு சம்பந்தப்பட்ட எல்லாத் தரப்பினர்களோடும் கலந்தாலோசனை செய்யப்பட்டது. இக்குழுவின் தலைவராக தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சின் செயலாளர் செயற்பட்டார். இக்குழுவில் எனது அமைச்சின் செயலாளர் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில், காணி, வீடமைப்பு, பொதுமுயற்சிகள் அபிவிருத்தி, துறைமுகம், கப்பற் போக்குவரத்து விடயங்கள் சம்பந்தப்பட்ட பிரதிநிதிகளும் சட்ட வரைஞர் திணைக்களம், பெருந்தோட்டக் கம்பனிகள், சமூக அமைப்புகள் ஆகியவற்றின் பிரதிநிதிகளும் இடம்பெற்றனர். இக்குழுவின் இணைப்பாளராக எனது அமைச்சின் ஆலோசகர் திரு. வாமதேவன் அவர்கள் செயற்பட்டார். இந்தக் குழுவின் ஆரம்ப வரைவு 2016ஆம் ஆண்டு ஜூலை மாதம் அமைச்சரவையினால் அங்கீகரிக்கப் பட்டது. இதனுடன் தொடர்புடைய தரப்பினர்களின் கருத்துக்கள், அவதானங்கள் பெறப்பட்டு, சரி செய்யப்பட்டு, சட்ட மா அதிபரின் அங்கீகாரத்துடன் 2018ஆம் ஆண்டு, ஜூன் மாதம், 25ஆம் திகதி சம்பந்தப்பட்ட வர்த்தமானி அறிவித்தலும் வெளியிடப்பட்டது. இன்று இது இந்த உயரிய சபையின் அங்கீகாரத்திற்காகச் சமர்ப்பிக்கப்பட்டுள்ளது.

இந்த அதிகாரசபைக்கு இரண்டு முக்கிய குறிக்கோள்கள் உள்ளன. முதலாவது, பெருந்தோட்டச் சமுதாயத்தினரை சமூக, பொருளாதார, கலாசார உட்கட்டமைப்பு அபிவிருத்திமூலம் அரச கட்டமைப்புக்குள் சேர்ப்பதை உறுதிப்படுத்தலாகும். இரண்டாவது, தேசிய அபிவிருத்திச் செயன்முறைக்குப் பங்களிப்பதற்காகச் சமூக ரீதியிலும் பொருளாதார ரீதியிலும் வலுப்படுத்தலாகும். இந்த நோக்கங்களை அடைவதற்காக இந்த அதிகாரசபையினுடைய பணிகள் இம்மசோதாவிலே எடுத்துக் கூறப்பட்டுள்ளன. அரசாங்கத்தினால் வழங்கப்படும் பொதுச் சேவைகள் இம்மக்களை முழுமையாகப் போய்ச் சேருமாக இருந்தால் மட்டுமே இச்சமூகம் வலுப்பெற்றதாக மாறும். இந்த அதிகாரசபை பல்வேறு அமைச்சுக்களோடு தொடர்புகளை ஏற்படுத்தி அரச சேவைகள் இச்சமூகத்தை முழுமையாகச் சென்றடைவதை உறுதிப்படுத்தும். இதற்காக இந்த அதிகாரசபை தேசிய, மாகாண மற்றும் மாவட்ட மட்டங்களிலுள்ள நிறுவனங்களோடு ஒருங்கிணைந்து செயற்படும். அத்தோடு சமுதாயம் சார்ந்த அமைப்புக்களில் பங்குபற்றுதலையும் உறுதிப்படுத்தும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று அரசாங்கத்தின் கொள்கையாக இருப்பது, இந்த மக்களுக்கான வீட்டுரிமையினை வழங்குதலாகும். இந்த உரிமையை உறுதிப்படுத்துவதற்காகத் தோட்டங்களில் வாழும் மக்களுக்குத் தெளிவான காணி உறுதி வழங்கலை இந்த அதிகாரசபை வசதிப்படுத்தும். அத்தோடு தோட்டத்துறையினுடைய இளைஞர்களுக்குக் கல்வி முன்னேற்றத்திற்காக மூன்றாம்நிலை உயர்கல்வி நிறுவனங்களுக்கான அனுமதியை அதிகரிப்பதற்கான உதவிகளை வழங்கும். தோட்டச் சமுதாயத்தினருக்கு மாற்று வாழ்வாதார வாய்ப்புகளை மேம்படுத்துவதிலும் அது தொடர்பான வழிகாட்டுதல்களை வழங்குவதிலும் இந்த அதிகாரசபை கவனம் செலுத்தும். அத்தோடு பெண்கள், சிறுவர்கள், முதியோர் மற்றும் மாற்றுத் திறனாளிகளை வலுப்படுத்தி அவர்களுக்கான வாழ்வாதார வசதிகளை வழங்குவதற்கும் நடவடிக்கை எடுக்கும். தற்போது அமைச்சானது வீடமைப்புத் திட்டங்களை நிறைவேற்றி வருகின்றது. இதனை புதிய கிராமங்களில் அபிவிருத்தி செய்வதற்காக அரசாங்கத்தின் நிகழ்ச்சித்திட்டங்களையும் கருத்திட்டங்களையும் அமுலாக்குதலே இவ்வதிகாரசபையின் பிரதான பொறுப்பாகும். செயற்பாட்டு ரீதியாக நோக்குகையில், அமைச்சின்கீழ் புதிய வீடுகள் நிர்மாணிக்கப்பட்டு வருகின்றன. இவற்றைப் புதிய கிராமங்களாக மாற்றவேண்டிய தேவை இந்த அதிகாரசபைக்கு இருக்கின்றது. இதற்காக இந்த அதிகாரசபை பல்வேறு நடவடிக்கைகளையும் மேற்கொள்ள வேண்டும். இந்த அதிகாரசபையின் செயற்பாடுகளின் மூலமாக, இச்சமுதாயம் ஏனைய சமுதாயங்களோடு ஒப்பிடுகையில், எல்லா அபிவிருத்தி அம்சங்களிலும் சமமான நிலையை அடைய முயற்சிகள் மேற்கொள்ளப்படும்.

இந்த அதிகாரசபையினை உருவாக்குவதற்கு முழுமூச்சாக நின்று செயற்பட்ட அமைச்சின் ஆலோசகர் எம்.வாமதேவன், அமைச்சின் செயலாளர் ரஞ்சினி நடராஜபிள்ளை உள்ளிட்ட அமைச்சின் அதிகாரிகள் அனைவருக்கும் எனது நன்றிகளைத் தெரிவித்துக்கொள்கின்றேன். அதேபோல இவ்வதிகார சபையைத் தோற்றுவிக்க வேண்டும் என்பதில் அக்கறையுடன் குரல் கொடுத்த பெ. முத்துலிங்கம், சந்திரபோஸ், சந்திரா சாப்டர், சந்திரசேகரன், விஜேந்திரன் போன்ற சிவில் சமூக செயற்பாட்டாளர்களுக்கும் மலையக மக்கள் முன்னணியின் செயலாளர் லோரன்ஸ்க்கும் எனது நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். மேலும், இந்த அதிகாரசபையினை உருவாக்க வேண்டும் என்பதற்காக என்னோடு ஒத்துழைத்த தமிழ் முற்போக்குக் கூட்டணியின் தலைவர் கௌரவ மனோ கணேசன் அவர்களுக்கும் பிரதித் தலைவர் கௌரவ இராதாகிருஷ்ணன் அவர்களுக்கும் மற்றும் கூட்டணியின் பாராளுமன்ற உறுப்பினர்களான மாண்புமிகு வேலு குமார், மாண்புமிகு திலகராஜா, மாண்புமிகு அரவிந்த் குமார் ஆகியோருக்கும் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின் றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2020 වනකොට අපේ වතු ජනතාව ඉන්දියාවේ ඉඳලා මේ රටට ඇවිල්ලා අවුරුදු 200ක් වෙනවා. අපේ ජනතාව කවදාවත් මේ රටේ තනි ඊළමක් හෝ වෙනම රටක් ඉල්ලුවේ නැහැ. ඒ ජනතාවත් අනික් ජනතාව වාගේ ගෞරවයෙන් ජීවත් වෙන්න ඕනෑ. හැබැයි, මෙපමණ කල් බලයේ සිටි ආණ්ඩු අපේ ජනතාවට සැලකුවේ නැහැ. 2015දී බලයට පැමිණි මේ ආණ්ඩුවේ අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් අපේ වැඩ ටික පටන් ගෙන තිබෙනවා.

මේ අවස්ථාවේදී අපේ දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට ස්තුති කරන්න ඕනෑ. එතුමා හැම දාම අපට කරදර කරනවා, "මොකක්ද කරන්නේ? මේ පනත් කෙටුම්පත් දෙකම කෝ? ඔබලා බොරු කරන්නේ." කියා. වතුකරයේ ජනතාව වෙනුවෙන් අපි එතුමාට ස්තුති කරනවා. ඒ විධියටම වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාටත් අපි ස්තුති කරන්න ඕනෑ. එතුමා අපේ වතු ජනතාව වෙනුවෙන් හැම දාම කථා කළා. ඒ වාගේම අපේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාටත් ස්තුති කරන්න ඕනෑ. මා එතුමාට telephone එකෙන් කථා කර කිව්වා, මේ කටයුත්ත කරන්න අනිවාර්යයෙන්ම උදවු කරන්න කරන්න ඕනෑය කියා. එතුමා කිව්වා, "හය වෙන්න එපා. අපි උදවු කරන්නම්." කියා.

අපේ ජනතාවට ගෙවල් 1,60,000ක් ඕනෑ. දැනට සුළු ප්‍රමාණයක් හදාගෙන යනවා. ඒ ජනතාවටත්, අනික් ජනතාව වාගේ ජීවත් වෙන්න ඕනෑ. මේ ආණ්ඩුවටත්, අගමැතිතුමාටත්, අපේ ජනාධිපතිතුමාටත් ස්තුති කරමින් මා නිහඬ වෙනවා. Thank you.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඊළඟට ෆයිසර් මුස්තාපා ඇමතිතුමා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils, Local Government and Sports)

The Hon. State Minister will speak first and thereafter, I will do my speech closing up the Debate.

[අ.භා. 2.18]

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කාරණා ඉදිරිපත් කරන්නට පළමුවෙන්ම මට අවස්ථාව ලබා දීම ගැන ප්‍රථමයෙන්ම අපේ ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

[ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය]

විශේෂයෙන්ම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මඟින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ශුභසාධනය ඇති කිරීමට මෙම ආයතන පිහිටුවනු ලැබුවා. කෙසේ වෙතත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම පනත පැනවීමේදී වතුකරයේ ජනතාවගේ ශුභසාධනය ආවරණය කරන්න ඉඩකඩ ඇති වුණේ නැහැ. ඊට හේතු වුණේ මේ ප්‍රදේශවල රජයට අයත් වතු, එහෙම නැත්නම් සමාගම්වලට අයත් වතු තිබීම නිසා පළාත් පාලන ආයතන හැටියට, ඒවායේ සමාජ ශුභසාධන කටයුතු කරන්න -පාරවල් හදන්න, ළිං හදන්න, පෙර පාසල් හදන්න- ඒ ආයතනවලට බලයක් ලැබෙන්නේ නැහැ. ඒ සඳහා අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

මීට කලින් පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් වතුකරය නියෝජනය කරන ගරු පලනි දිගම්බරම් ඇමතිතුමා කථා කළා. විශේෂයෙන්ම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආණ්ඩුව වතුකරයේ ජනතාවගේ අයිතිවාසිකම් ලබා දෙන්න කටයුතු කිරීම ඉතාමත් අගය කළ යුතු කාරණයක්. විශේෂයෙන්ම ඒක මේ ආණ්ඩුව ලැබූ ජයග්‍රහණයක් විධියටයි මා සලකන්නේ. මට මතකයි පසුගිය ආණ්ඩුව තිබෙද්දී අපි උපදේශක කාරක සභාවලට ගිහිල්ලා වතුකරයේ ජනතාවට ගෙවල් හදන එක ගැන කථා කළ බව. නමුත් ඒක කරන්න බැරි වුණා. අද ඒ ජනතාව සඳහා ගෙවල් හැදෙනවා. පෞද්ගලික නිවාස හැදෙනකොට ඒ හා සමානව ඒ අයගේ යටිතල පහසුකම් නැංවීම රජයක වගකීමක් බවට පත් වෙනවා. ඒ වගකීම ඉෂ්ට කරන්නට තමයි ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තියත්, 33 වන වගන්තියත් සංශෝධනය කර, අවශ්‍ය පවරා ගැනීම් කර පළාත් පාලන ආයතනවලට; ප්‍රාදේශීය සභාවලට සංවර්ධන වැඩ කටයුතු කරන්නට ඉඩකඩ සලසා තිබෙන්නේ.

ප්‍රාදේශීය සභා පනත මඟින් වතුකරයේ ජනතාවගේ ජීවිතවලට විශේෂ වැදගත්කමක් ලැබෙනවා. වතුකරයේ ජනතාව දීර්ඝ කාලයක් අපේ රටට සේවය කළා. නමුත් ඒ අයගේ ජීවිත මේ දක්වා ඉතාමත් දුක්ඛිත තත්ත්වයකයි තිබුණේ. ඒ ජනතාවගේ ජීවිත නහා සිටුවන්නට මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නවා වාගේම, මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නා අවස්ථාවේදී විශේෂයෙන්ම යෝජනා කරනවා, ඒ සංවර්ධන කටයුතුවලටත් ඉතා ඉක්මනින් මුදල් ප්‍රතිපාදන ලබා දෙන්නටත් අවශ්‍යයි කියන කාරණය. විශේෂයෙන් ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත අනුව ඒ ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට සුබසාධනය සැලසීම ඒ ප්‍රාදේශීය සභාවක වගකීමක් වෙනවා. පාරක්, ළිඳක්, පුස්තකාලයක්, පාසලක්, පෙර පාසලක්, වෛද්‍ය මධ්‍යස්ථානයක් සඳහා අවශ්‍ය මූලික පහසුකම් ටික ලබා දෙන්නට ඕනෑ. පසුගිය කාලයේ මේ ජනතාව වතු යටතේ ජීවත් වෙද්දී ඔවුන්ට අඩු අයිතිවාසිකම් ප්‍රමාණයක් තමයි තිබුණේ. හැබැයි, මේ පනත් කෙටුම්පත-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Velu Kumar to the Chair?

**ගරු එස්.බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

I propose that the Hon. Velu Kumar do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංශෝධන පනත් කෙටුම්පත මඟින් ඒ වතුකරයේ ජනතාවගේ අයිතිවාසිකම් ලබා දෙන්නට අපට පුළුවන්කම ලැබෙනවා. ඒ තුළින් එම ජනතාවගේ දියුණුව සැලසීමට හැකියාව ලැබෙනවාය කියන එක මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. [බාධා කිරීමක්]

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සඳහා වතු අධිකාරියේ එකඟත්වය තිබෙන්නට ඕනෑ. ගැටුමක් ඇති වෙනකොට ඒ ගැටුම නිරාකරණය කර ගැනීම සඳහා වෙන තැනකට යන්නට සිදු වෙනවා. ඒ අවශ්‍යතාවය ඉටු කිරීමේ බලය ප්‍රාදේශීය සභා සංශෝධන පනත් කෙටුම්පතට ඇතුළත් වෙන්නට ඕනෑ. නැත්නම් ප්‍රශ්නයක් ඇති වෙනවා.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු මන්ත්‍රීතුමා මොකක් ගැනද මේ කියන්නේ?

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

මේ පනත් කෙටුම්පතේ 2 වන පිටුවේ මෙහෙම සඳහන් වෙනවා:

> " (2) වැවිලි ප්‍රදේශ සම්බන්ධයෙන් වන විට, ප්‍රාදේශීය සභාව විසින්, විශේෂ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසුව සහ අදාළ වත්තෙහි පාලනාධිකාරියේ එකඟත්වය ඇතිව,..."

ගහක් කපන්නට බැහැ- [බාධා කිරීම්]

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු ඇමතිතුමා, ඒ සම්බන්ධයෙන් වෙනසක් වෙනවාද? [බාධා කිරීමක්]මේ පනත් කෙටුම්පතේ අඩුපාඩුවක් තිබෙනවා නම් එය සංශෝධනය කර ගැනීමේ හැකියාවක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. විශේෂයෙන්ම පළාත් පාලන ආයතනයට, ප්‍රාදේශීය සභාවට ඒ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් කළ යුතු වැඩ කොටස ඉෂ්ට කරන්නට අවස්ථාව ලබා දීම තමයි මේ සංශෝධන පනත් කෙටුම්පත මඟින් කරන්නේ. මේ ඉදිරිපත් කර තිබෙන පනත කෙටුපතේ අඩු පාඩු සම්බන්ධයෙන් ඔබතුමන්ලාට කාරක සභා අවස්ථාවේදී කාරණා ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධනයන් එකතු කරන්නට අවස්ථාව තිබෙනවා. එම නිසා මේ වතුවල පදිංචිකරුවන්ගේ සුබසාධනය ඇති කිරීමත්, පොදු පහසුකම් නංවාලීමත් -[බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මේ පාරවල් ටික ප්‍රාදේශීය සභාවට පවරා ගන්නට පුළුවන් ආකාරයට ඇතුළත් කරන්න. නැත්නම් කවදාවත් මේ වතුවල වැඩ කරන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ. සමාගම් යටතේ තිබෙනකොට මේ සමාගම් වැඩ කරන්නට දෙන්නේ නැති නිසා ඒ පාරවල් ටික ප්‍රාදේශීය සභාවට ගැසට් කරන්නට පුළුවන් විධියට ඇතුළත් කරන්න.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ඔව්. ඒ සම්බන්ධව මම මගේ කථාවේදීත් කිව්වා. අවශ්‍ය දේවල් පවරා ගැනීම් කරන්න අයිතිය ඇතිව තමයි මේ පනත් කෙටුම්පත සංශෝධනය කරන්නේ. එම නිසා ඉදිරියේදී මේ ප්‍රදේශවලත් අනෙක් පළාත්වල වාගේම සංවර්ධනයක් සිද්ධ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය අමාත්‍යතුමියට තව විනාඩියක කාලයයි තිබෙන්නේ.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ජනතාවට අයිතිවාසිකම් ලබා දීමට කටයුතු කිරීම ගැන අපේ ආණ්ඩුවේ සියලුම දෙනාට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

අපේ අමාත්‍යාංශය මේ වෙනුවෙන් අවශ්‍ය සියලුම පියවර ගන්නා බවත්, ඉදිරි කටයුතු ඉෂ්ට කරන්න අපේ ගරු අමාත්‍යතුමාත්, රාජ්‍ය අමාත්‍යවරිය විධියට මමත් කටයුතු කරන්නට සූදානමින් ඉන්න බවත් සඳහන් කරමින් මම මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Then, Item No. 3 of today's Order Paper to be moved by the Hon. Ravindra Samaraweera.

[අ.භා. 2.27]

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரவீந்திர சமரவீர - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர்)
(The Hon. Ravindra Samaraweera - Minister of Labour and Trade Union Relations)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය පනත සංශෝධනය කරමින් ගෙන එන, "ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමේ විවාදයට ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට මම සලකනවා. "ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය", "වරලත් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" ලෙස නාමකරණය කිරීම තමයි මේ පනත් කෙටුම්පත තුළින් සිදු වෙන්නේ. එවකට ජාතික රාජ්‍ය සභාවේ යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සී.එක්ස්. මාටින් මැතිතුමන් විසින් 1976 මැයි මාසයේ 05 වැනි දින පෞද්ගලික කෙටුම්පතක් ලෙස එම පනත් කෙටුම්පත ඉදිරිපත් කර ඉන් අනතුරුව, රේඛීය අමාත්‍යාංශය ලෙස එවකට කම්කරු අමාත්‍යාංශය හරහා මෙම ආයතනය සංස්ථාපිත කරනු ලැබ, පුරා වර්ෂ 40කට වැඩි කාලයකින් පසුව "වරලත් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" ලෙස එය නාමකරණය කිරීම සඳහා ඉදිරිපත් කරන මෙම පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය අද දිනට යෙදී ඇති බැව් දන්වනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායට අවශ්‍ය දැනුම මෙන්ම මානව සම්පත් කළමනාකරණය යන පෘථුල විෂයය ඉගැන්වීමටත්, ඒ සඳහා වඩා ඵලදායී ක්‍රමෝපායයන් හඳුන්වා දීමටත් ඇති එකම සහ ප්‍රථම ආයතනය ලෙස ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය හඳුන්වා දිය හැකියි. ශ්‍රී ලංකාව තුළ වඩා ප්‍රචලිත වෛද්‍ය, ඉංජිනේරු, නීතිඥ, ගණකාධිකාරී ආදී වෘත්තීන් හා සමානව මානව සම්පත් විෂයය පථයට අදාළ සුවිශේෂී අවශ්‍යතාවන් මෙන්ම දැනුම හා නිපුණතා හඳුනා ගැනීමත්, එම අවශ්‍යතාවන්ට සරිලන පරිදි විෂයානුබද්ධ ක්‍රියාකාරකම් හරහා "මානව සම්පත් කළමනාකරණය", "මානව සම්පත් සංවර්ධනය" වැනි විෂයයන් ජාතික මෙන්ම ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට හැකි වීමත් පසුගිය දශක කීපය තුළ ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය ලද සුවිශේෂී ජයග්‍රහණ කිහිපයකි.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කුඩා, මධ්‍ය හා මහා පරිමාණ සංවිධානවල මානව සම්පත් ප්‍රාග්ධනය ජාතික වශයෙන් ඉහළ දැමීමට මෙන්ම ඵලදායී මට්ටමකට ගෙන ඒමට සහ සංවර්ධනය කිරීමටත්, මෙම IPM ආයතනය විසින් විවිධ වූ මංපෙත් විවර කරමින්, විවිධ වෘත්තීය සහ අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් වෘත්තිකයන්ට ඇවැසි පෘථුල දැනුමක් ලබා දීම ඉතා සාර්ථකව ඉටු කරමින් පවතින බව මට හැඟී යයි. එය ඉතා විශිෂ්ට ක්‍රියාවලියක් බැව් කිව යුතුමය. මානව සම්පත් කළමනාකරණය රාජ්‍ය අංශයේ ආයතනවලද නිසි ලෙස ක්‍රියාත්මක කිරීම අප සතු වගකීමක් ලෙස මම සලකමි. එමෙන්ම උසස් පෙළ අධ්‍යාපනය හැදෑරීමෙන් අනතුරුව සරසවි වරම් ලැබූ දරුවන් මෙන්ම සරසවි වරම් නොලැබූ දරුවන්ගේ අනාගතය සාර්ථක කර ගැනීමට අත්‍යවශ්‍යම සාධකයක් වූ උසස් අධ්‍යාපනය ක්‍රමවත්ව ලබා දීමද, IPM ආයතනයේ කාර්ය භාරයන් අතර ඉතා සුවිශේෂී වේ.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය එක් අතකින් තරුණ පරපුරේ මානව විභව හැකියාවන් ඉස්මතුකොට තරගකාරී ශ්‍රම වෙළෙඳ පොළට අවශ්‍ය ප්‍රශස්ත වෘත්තිකයන් දායාද කරයි. අනෙක් අතින් රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි විවිධ මට්ටම්වල මානව සම්පත් හා පරිපාලන කළමනාකරුවන්ගේ දැනුම ගෝලීය ප්‍රමිති - global standards- දක්වා වර්ධනය කර ආයතනික ඵලදායිතාව වැඩි කිරීම සඳහා විශාල දායකත්වයක් සපයයි. මෙම ආයතනය ශ්‍රී ලංකාවේ මානව සම්පත් වෘත්තිකයන් බිහි කරන පුරෝගාමී ආයතනයක් බව පැහැදිලිය. එමෙන්ම මෙම ආයතනය මානව සම්පත් කළමනාකරණ පිළිබඳ ගෝලීය හා ජාත්‍යන්තර වශයෙන් ස්ථාපිතව ඇති මානව සම්පත් කළමනාකරණ පිළිබඳ ආසියානු සම්මේලනයේද - Asia Pacific Federation of Human Resource Management -, මානව සම්පත් කළමනාකරණ පිළිබඳ ජගත් සම්මේලනයේද - World Federation of People Management Association - WFPMA - සාමාජිකත්වය ලබා ඇති අතර, එමඟින් සුවිශේෂ වූ කාර්ය භාරයක් ඉටු කරන වෘත්තීය ආයතනයකි. ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය ශ්‍රී ලංකා විද්වත් වෘත්තිකයන්ගේ සංගම් සංවිධානයේ - OPA - පූර්ණකාලීන සාමාජිකත්වය දරමින් විශාල මෙහෙයක් ඉටු කරයි.

[ගරු රවීන්ද්‍ර සමරවීර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 60කට ආසන්න කාලයක් මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය බවට පත්ව වෘත්තීය සුදුසුකම් සපුරන ලද පූර්ණකාලීන සාමාජිකයන් 1,500කට වඩා වැඩියෙන් නියෝජනය කරන මානව සම්පත් කළමනාකරණ විෂය ක්ෂේත්‍රය සඳහා පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත එකම ආයතනය වන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනයේ පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය "වරලත් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" ලෙසට නාමකරණය කිරීම සඳහා, 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතන පනත පහත කරුණු පදනම් කරගෙන සංශෝධනය කිරීමට යෝජනා කර, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අද දිනයේදී, මෙම "ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත" දෙ වන වර කියවීම සඳහා යෝජනා කර ඇත. මෙම නාමකරණයේ ප්‍රධාන අභිප්‍රායන් අතර පහත සඳහන් කරුණු ප්‍රමුඛ වේ.

1. පාර්ලිමේන්තු පනතකින් සංස්ථාපිත වූ මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ විෂයානුබද්ධ ක්‍රියාකාරකම් වර්තමාන වැඩ පරිසරයට ගැළපෙන සේ ක්‍රියාත්මක කිරීම.
2. මානව සම්පත් ප්‍රාග්ධනය - human capital - වැඩි දියුණු කිරීම හරහා වර්තමාන වැඩ පරිසරය සඳහා සුදුසු දැනුමින් පිරි ශ්‍රමික පිරිසක් බිහි කිරීම.
3. මානව සම්පත් වෘත්තිකයන් සඳහා රැකියා වෙළෙඳ පොළෙහි ගෞරවනීය ස්ථානයක් ලබා දීම.
4. මානව සම්පත් වෘත්තිකයන් සඳහා පිළිගත හැකි වෘත්තීය සාර්ථකත්ව ක්‍රමෝපායන් හඳුන්වා දීම සහ නියාමනය කිරීම.

ගෝලීය වශයෙන් ප්‍රමුඛ ස්ථානයේ පවතින මහා බ්‍රිතාන්‍යයේ වරලත් පිරිස් හා සංවර්ධන ආයතනය - Chartered Institute of Personnel and Development - CIPD - මට්ටමට ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය ප්‍රමිතියෙන් උසස් කිරීම මේ තුළින් අපේක්ෂා කෙරේ.

පනතේ මූලික ඉලක්ක, අරමුණු සහ අභිලාෂයන්ට කිසිදු ව්‍යුහාත්මක වෙනසක් නොකොට හුදු නාමකරණ සංශෝධනයක් පමණක් මෙම අවස්ථාවේ අපේක්ෂා කරන බැවින් මෙය බැරෑරුම් නොවූද, සංකීර්ණ නොවූද කටයුත්තක් වන අතර, මෙම නාමකරණ සංශෝධනය තුළින් අදාළ ආයතනයේ වෘත්තීය භාවයද, ආයතනයේ පිළිගැනීමද, ගෞරවය හා කීර්තිනාමයද ඉහළ නැංවීමට සමත් වනු ඇත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම නාමකරණයත් සමඟ ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය හා සම්බන්ධව සිටින හා ඉදිරියේදී සාමාජිකත්වය ලබා ගැනීමට නියමිත මානව සම්පත් වෘත්තිකයින් "වරලත් මානව සම්පත් වෘත්තිකයන්" ලෙස නම් කරනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ ආයතනය මෙතෙක් අදාළ නීති රීති මෙන්ම ක්‍රමවේදයන්ද දැනටමත් සකස් කර ඇති බැව් දන්වනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය ජාත්‍යන්තර වශයෙන් ලබාගෙන ඇති පිළිගැනීම මත 2020 වසරේදී පැවැත්වීමට නියමිත ගෝලීය මානව සම්පත් මහා සම්මේලනය - World HR Congress 2020 - ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට දැනටමත් අනුමැතිය ලැබී ඇත. ඒ සඳහා ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය සත්කාරක ආයතනය ලෙස කටයුතු කරනු ලැබේ. මෙම සමුළුව ශ්‍රී ලංකාවට ලබා ගැනීමට හැකිවීම ආසියාතික රටක් ලෙස අප ලැබූ සුවිශාල ජයග්‍රහණයකි. මෙම සම්මේලනය ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය ඉටු කරනු ලැබූ කාර්යය මා වෙසෙසින් පැසසුමට ලක් කළ යුතුය. ඒ සඳහා රජයක් වශයෙන් අවශ්‍ය පහසුකම් සැපයීම මාගේ අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධව විශේෂ වැඩ පිළිවෙළක් ඉදිරියේදී සකස් කරනු ඇත.

මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උනන්දුවක් දක්වන පාසල් හැරයන දූ දරුවන් සඳහා ආරම්භයක් ලෙස මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පදනම් පාඨමාලාව - Foundation Course in Human Resource Management -, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව -Certificate Course in Human Resource Management -, පුහුණු හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - National Diploma in Training & Human Resource Development - හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඉහළම වෘත්තීය පාඨමාලාව - Professional Qualification in Human Resource Management - වැනි පාඨමාලා පවත්වමින් ක්‍රමිකව විශිෂ්ට මානව සම්පත් වෘත්තිකයන් බිහි කිරීමේ ක්‍රියාවලියක් විධිමත්ව පවත්වාගෙන යනු ලැබේ. සිසුන් සහ රැකියාවල නියුක්ත පුද්ගලයින් 10,000 පමණ IPM ආයතනයේ පාඨමාලාවේ නිරතව සිටියි. මෙම ආයතනයේ ප්‍රධාන කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාරික පාසල නාරාහේන්පිට, පොල්හේන්ගොඩ ස්ථානගත වී ඇති අතර, එහි ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන ව්‍යාපාරික පාසල් නාරාහේන්පිට, පොල්හේන්ගොඩ ස්ථානගත වී ඇති අතර, එහි ප්‍රාදේශීය කාර්යාල මහනුවර, කුරුණෑගල, ගාල්ල යනාදී දිස්ත්‍රික්කවලද, අධ්‍යාපන මධ්‍යස්ථාන ගම්පහ, මීගමුව යන නගරවලද ස්ථාපනය කර ඇත. ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය නවීන ලෝකයට ගැළපෙන ලෙස "වරලත් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" ලෙස නාමකරණය සංශෝධනය කිරීම කාලෝචිත බව ද මම යෝජනා කරමි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉහත කරුණු සලකා බලා ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය "වරලත් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" ලෙසට නාමකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා මෙම ගරු පාර්ලිමේන්තුවේ අනුමැතිය අපේක්ෂා කරමින් මම නිහඬ වෙමි. ස්තුතියි.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකුවේ කාර්ය මණ්ඩලය දැනට දවස් දෙකක් උද්ඝෝෂණයක් නැත්නම් වැඩ වර්ජනයක් කරලා තිබෙනවා. රටේ ආර්ථිකය කඩාගෙන වැටෙන

වෙලාවේ මහ බැංකුවේ සේවකයන්ගේ අයිතීන් වෙනුවෙන් හෝ ඉල්ලීම් වෙනුවෙන් ආණ්ඩුවේ ගරු විෂයභාර අමාත්‍යවරයා මැදිහත් වුණොත් හොඳයි කියලා ඔබතුමාට මා යෝජනා කරනවා. ඒ පිළිබඳ ගරු කථානායකතුමා දැනුවත් කරලා, මුදල් ඇමතිවරයා සහ ගරු අගමැතිතුමා දැනුවත් කරලා මහ බැංකුවේ තිබෙන ප්‍රශ්නවලට මැදිහත් වෙන්න මේ වෙලාවේ ඉදිරිපත් වුණොත් හොඳයි කියලා මම යෝජනා කරනවා.

[பி.ப. 2.38]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று கௌரவ அமைச்சர் திகாம்பரம் அவர்களால் முன்வைக்கப் பட்டிருக்கின்ற பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபைச் சட்டமூலமானது மிக முக்கியமானதாகும். இந்த அதிகாரசபையினூடாக மலையகப் பகுதிகளிலே இருக்கின்ற மக்களுக்கு வீட்டுத் திட்டங்கள் கொண்டு வரப்படும். அத்துடன் அந்த மக்களுடைய செயற்பாடு களிலே மாற்றங்கள் ஏற்படும்.

கடந்த 30 ஆண்டுகளுக்கும் மேலாக இந்த அமைச் சினூடாகப் பல்வேறுபட்ட செயற்பாடுகள் மேற்கொள்ளப் பட்டாலும், அந்த அமைச்சின்கீழ் ஓர் அதிகாரசபை இல்லாமல், தனியார் நிறுவனங்களுக்கூடாக அல்லது வெளி நிறுவனங்களுடைய முகாமைத்துவத்தின்கீழ் அந்த அமைச்சு தனது செயற்பாடுகளைக் கொண்டு செல்லவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைமை இருந்தது. அந்தத் துர்ப்பாக்கிய நிலைமையை மாற்றியமைத்து, அந்த அமைச்சுக்கான தனிப்பட்ட ஓர் அதிகாரசபையை உருவாக்கி, அதனூடாக அந்த மக்களுடைய தேவைகளை உடனுக்குடன் பூர்த்தி செய்யக்கூடிய வகையிலே, இன்று இந்தப் பாராளுமன்றத்திலே இந்தச் சட்டமூலம் கொண்டு வரப்பட்டிருக்கின்றது. இது மிக வரவேற்கத்தக்கதும் கால மாற்றத்தில் ஏற்பட்ட நல்லதொரு முன்னேற்றகரமான விடயமுமாகும். இந்த முயற்சிக்காக உழைத்த அனைத்து அமைச்சர்களையும் பாராளுமன்ற உறுப்பினர்களையும் நாங்கள் இந்த இடத்திலே பாராட்டுகிறோம். இதனோடு இணைந்ததாகப் பிரதேச சபைகள் (திருத்தம்) சட்டமூலமும் இன்றைய தினம் கொண்டு வரப்பட்டிருக்கின்றது. 1987ஆம் ஆண்டிலே மலையகப் பகுதிகளில் பிரதேச சபைகள் உருவாக்கப்பட்டன. அந்தப் பிரதேச சபைகள் அங்கிருக்கின்ற மக்களிடம் வரிகளை வசூல் செய்து வருமானங்களைப் பெற்றிருக்கின்றன. ஆனால், தங்களுடைய பிரதேசங்களிலே அந்தப் பிரதேச சபைகளினூடான பணிகளைப் பெற்றுக்கொள்வதற்கான சந்தர்ப்பங்கள் அங்கு வரி செலுத்திய அந்த மக்களுக்கு வழங்கப்படவில்லை. 30 ஆண்டுகளுக்குப் பிறகு ஏற்பட்டிருக்கின்ற இந்த மாற்றத்தை ஒரு வரலாற்றின் மாற்றமாகவே நாங்கள் பார்க்கின்றோம். ஆகவே, அந்த மக்களுக்குக் கிடைத்திருக்கிற இந்த இரண்டு நன்மையான சட்டமூலங்களும் அவர்களது வாழ்க்கையிலே மாற்றங்களைக் கொண்டுவர வேண்டும்.

கௌரவ அமைச்சர் திகாம்பரம் அவர்கள் குறிப்பிட்டதுபோல, அந்த மக்களுக்கு 7 பேர்ச்சஸ் காணிகளை வழங்க வேண்டும். ஏனெனில் இன்று அவர்களுக்கு வழங்கப்படுகின்ற வீடுகூட சிறியதாக இருந்தது. ஆனால், இன்று அவர்களுக்கு வீட்டுத்திட்டம் கிடைக்கவிருக்கின்றது. நீண்டகால வரலாற்றிலே, 200 வருடங்களுக்குப் பிறகு அமைச்சர் திகாம்பரம் மற்றும் அவரோடு சேர்ந்த கூட்டணியினுடைய கடும் முயற்சியினால் அந்த மக்களுக்கு வீடு கிடைக்கின்றதென்பது அந்த மக்களுக்கு ஒரு வரப்பிரசாதமாகும். ஆனால், இன்று அவர்களுக்குக் கிடைக்கின்ற வீட்டுத் திட்டங்கள் நில வசதியுடையதாக அமையவில்லையென்பது பெரும் குறையாக இருக்கின்றது. இந்த அடிப்படைகளை மையமாக வைத்துப் பார்க்கின்ற பொழுது, அந்த மக்களுடைய எண்ணங்களிலே சில மாற்றங்கள் ஏற்பட்டிருப்பதும் முன்னேற்றங்கள் ஏற்பட்டிருப் பதும் வரவேற்கத்தக்க ஒன்றாகும். அவர்களுக்கு மத்தியில் தொடர்ச்சியாக முன்னேற்றங்களைக் கொண்டுவர வேண்டும். ஏனென்றால், அவர்களுடைய எதிர்பார்ப்புகள் அதிகமாகும். ஆனால், இப்பொழுதுகூட அந்த மக்களுடைய வாழ்க்கை லயன்களிலேயே கழிகின்றது. அதாவது அவர்கள் இன்னும் லயன்களை விட்டுச் சொந்த வீடுகளுக்கு செல்ல முடியவில்லை. அந்த மக்களுக்கு 140,000 இற்கும் மேற்பட்ட வீடுகள் இன்னும் தேவையென்று கௌரவ அமைச்சர் அவர்கள் தன்னுடைய உரையிலே குறிப்பிட்டிருந்தார். ஆகவே, இந்த நவீன உலகத்திலே 500 ரூபாய் அடிப்படைச் சம்பளத்தோடு, இருப்பதற்கு வீடு இல்லாமல், 'லயன்'களிலே வாழுகின்ற ஏழைகளைக் கொண்ட ஒரு நாடாக இந்த நாடு இருக்கின்றது. இந்த நாட்டிலே இன்னும் அந்த மனித வர்க்கம் மனித இனமாகக் கணிக்கப்படாமல், அடிமைகள்போல், வேலைகாரர்கள்போல் நடத்தப்படுவது ஏற்றுக்கொள்ள முடியாதது.

கௌரவ அமைச்சர் திகாம்பரம் அவர்களும் அவரோடு இணைந்த மலையக அமைச்சர்கள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களும் அந்த மக்களுடைய முன்னேற்றத்திற்காகவும் வாழ்க்கை மாற்றத்துக்காகவும் எடுத்திருக்கின்ற இந்த முயற்சிகளுக்கு அவர்களை எங்களுடைய சொந்தச் சகோதரர்களாகக் கருதி நாங்கள் முழு ஆதரவையும் வழங்குகின்றோம். எந்த இடர்கள் வந்தபோதிலும் எங்களுடைய கரங்கள் அவர்களுடன் இணைந்திருக்கும் என்பதையும் இந்த இடத்திலே பதிவு செய்து கொள்ள விரும்புகின்றேன். மிக முக்கியமாக, அவர்களுக்கு ஒரு சொந்த நிலம் வேண்டும்; தோட்ட முதலாளிகளுக்காக இருக்கிற நிலங்கள் அந்த மக்களுக்குப் பகிர்ந்தளிக்கப்பட வேண்டும். ஆனால், பல்லாண்டு காலமாக அந்த மண்ணிலே உயிர்வாழ்ந்த மக்கள் இன்றும் தொழிலாளர்களாகவே இருக்கின்றார்கள். அவர்கள் தங்களுடைய தொழிலைச் சுயமாக மேற்கொள்ளக்கூடிய வகையிலே அவர்களுடைய வாழ்க்கை மாற்றியமைக்கப்பட வேண்டும். மேலும் அவர்களுக்கு வீடு, சொந்த நிலம் வழங்கப்பட வேண்டும் என்பதையும் இந்த இடத்திலே மிக விநயமாகப் பதிவுசெய்து கொள்ள விரும்புகின்றேன்.

அதேபோல இந்த பிரதேச சபைகள் திருத்தச் சட்டமூலம் அவர்களுடைய வாழ்வில் ஒரு மாற்றத்தை ஏற்படுத்துமென்று கருதுகின்றேன். அந்த மக்கள் இவ்வளவு காலமும் வரிகளைச் செலுத்தி வந்தபோதிலும் இப்பொழுதுதான் தங்கள் வாழ்க்கையில் ஒரு மாற்றத்தைக் காண்கின்றார்கள். அதாவது, இந்தச் சபைகளுக்கூடாகத் தங்களுடைய பாடசாலைகளை, சிறுவர் பாடசாலைகளை - முன்பள்ளிகளை மற்றும் கிராமங்களை, கிராம வீதிகளைப் புனரமைக்கக்கூடிய ஓர் அரிய சந்தர்ப்பம் அந்த மக்களுக்குக் கிடைத்திருக்கிறது. அங்கு மலையகத்தில் இருக்கின்ற ஒவ்வொரு பிரதேச சபையையும் நகர சபையையும் கையாள்கின்ற தமிழ்ப் பிரதிநிதிகளுக்கு இன்று இந்தச் செயற்பாடுகளை மேற்கொள்வதற்கான வாய்ப்புக் கிடைத்திருக்கின்றது. 30 வருடங்களுக்குப் பிறகு கிடைத்திருக்கின்ற இந்த நல்ல வாய்ப்பைச் சரியாகப் பயன்படுத்திக் கொள்ள வேண்டும்.

இன்று இங்கு முன்வைக்கப்பட்டிருக்கின்ற மூன்றாவது விடயம் இலங்கை ஆளணி முகாமை நிறுவகம் சம்பந்தமானது. இலங்கைத் தமிழரசுக் கட்சியினுடைய யாழ்ப்பாண மாவட்டப்

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

பாராளுமன்ற உறுப்பினராக இருந்த சி.எக்ஸ். மார்ட்டின் அவர்களால் 40 வருடங்களுக்கு முன்பு இந்த இலங்கை ஆளணி முகாமை நிறுவகம் சம்பந்தமான ஒரு தனிநபர் பிரேரணை இந்தப் பாராளுமன்றத்திலே முன்வைக்கப்பட்டது. இப்பொழுது இந்தத் திருத்தச் சட்டமூலத்தினூடாக இந்த நிறுவகம் "இலங்கை பட்டயம்பெற்ற ஆளணி முகாமை நிறுவகம்" என்று பெயர் மாற்றம் பெறுகின்றது. இந்த மாற்றம் இந்த நாட்டிலே தொழில் வாய்ப்புக்களுக்காகப் போராடுகின்ற மக்களுடைய தேவைகளை, அவர்கள் தொடர்பான விடயங்களை இனங்காணக்கூடிய வகையிலே அமையுமென்று நாங்கள் கருதுகின்றோம். ஆனால், இது ஓர் இன ரீதியானதாக, இனவாத முலாம் பூசப்பட்டதாக இருக்கக்கூடாது.

மிக முக்கியமாக, மட்டுப்படுத்தப்பட்ட இலங்கை நிர்வாக சேவைக்கான பரீட்சை - limited exam எழுதிய பரீட்சார்த்திகளுக்குக் கடந்த யூலை மாதம் நேர்முகப் பரீட்சை நடத்தப்பட வேண்டியிருந்தது. அவர்களிலே 59 பேர் தெரிவு செய்யப்பட்டிருக்கின்றார்கள். அதிலே 21 பேர் தமிழர்களென்ற காரணத்தினால், சில காரணங்கள் சொல்லப்பட்டு, அந்தப் பரீட்சையினுடைய பெறுபேறுகள் வெளியிடப்படாது நிறுத்தி வைக்கப்பட்டிருக்கின்றன; குறித்த நேர்முகப் பரீட்சைக்கு அவர்கள் அழைக்கப்படாமல் தடுக்கப்பட்டிருக்கின்றது. இதில் 21 தமிழர்கள் சித்திபெற்ற காரணத்தால் அந்த நேர்முகப்பரீட்சைக்கு அவர்கள் அழைக்கப்படுவது இனவாத அடிப்படையில் தடுக்கப்பட்டிருக்கின்றது. இதேபோன்ற ஒரு சம்பவம் கடந்த 6 மாதங்களுக்கு முன்பும் இந்த நாட்டிலே நடைபெற்றது. அதாவது, இலங்கையினுடைய பட்டயக் கணக்காளர் பரீட்சையிலே அதிகமாகத் தமிழ் மாணவர்கள் சித்தி பெற்றார்களென்ற காரணத்திற்காக, அதிலே ஏதோ ஊழல் நடந்ததாகக் கூறி, அந்தப் பரீட்சையிலே சித்திபெற்ற மாணவர்களுக்கான நேர்முகப்பரீட்சை நடாத்தப்படாமல் நிறுத்தப்பட்டுள்ளது.

இன்று நல்லிணக்கம், தேசிய ஒருமைப்பாடு, மொழிகளுக்குச் சம அந்தஸ்து, சம உரிமை என்றெல்லாம் இந்த நாட்டிலே பேசப்படுகின்றது. ஆனால், இன்று குறித்த மக்கள் ஓர் அதிகாரசபை இல்லாததனால் தங்களுக்குரிய வசதிகளைப் பெற்றுக் கொள்ள முடியாமல் இருக்கின்றார்கள். அதேநேரம் பிரதேச சபைகளுக்கு வரியைச் செலுத்துகின்ற மக்கள் அந்த வரிப்பணத்தின்மூலம் வழங்கப்படுகின்ற வசதிகளை அனுபவிக்க முடியாமலிருக்கின்றார்கள். மேலும் குறித்த போட்டிப் பரீட்சையிலே திறமையைக் காட்டிப் பரீட்சையிலே சித்திபெற்ற பின்னரும் சம்பந்தப்பட்டவர்கள் நேர்முகப் பரீட்சைக்குத் தோற்ற முடியாமல் தடுக்கப்படுகின்றார்கள். இவ்வாறு நடப்பதென்றால், இந்த நாட்டிலே எவ்வாறு இன நல்லிணக்கம் ஏற்பட முடியும்? எவ்வாறு தேசிய ஒருமைப்பாடு ஏற்பட முடியும்?

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முதலில் இந்த நாட்டிலேயுள்ள மக்களின் மனங்களில் மாற்றம் ஏற்பட வேண்டும். அதேநேரம் சிங்கள மக்கள், சிங்களத் தலைவர்கள் போட்டி மனப்பான்மைக்கப்பால், குரோத உணர்வுகளுக் கப்பால், இனவாத சிந்தனைகளுக்கப்பால் செயற்பட வேண்டும். அவர்கள் முதலிலே மகாவம்ச சிந்தனைகளிலிருந்து விடுபட்டு வெளியிலே வந்து, பௌத்த மேலாதிக்கச் சிந்தனைகளைத் தூக்கியெறிந்துவிட்டு, மனித குலத்தை மதிக்கின்ற எண்ணங்களோடு செயற்பட வேண்டும். அவ்வாறிருக்கின்றபொழுதுதான் இந்த நாட்டிலே மாற்றங்களைக் கொண்டுவர முடியும். அவ்வாறில்லாத வரைக்கும் வெறும் உதட்டளவிலே பேசுகின்றனவாகத்தான் குறித்த விடயங்கள் அமைந்திருக்குமே தவிர நியாயமான, நீதியான, மக்களுக்கான நல்ல பணிகளை ஆற்றக் கூடியவையாக அமையாது.

Sri Lanka Administrative Service - இலங்கை நிர்வாக சேவைப் பரீட்சை, இலங்கைப் பட்டயக் கணக்காளர் பரீட்சை ஆகிய இரண்டிலும் அதிகமாகத் தமிழர்கள் சித்திபெற்று விட்டார்கள் என்ற காரணத்தினால், இன்று குறித்த பரீட்சை வினாத்தாள் முன்கூட்டியே வெளியிடப்பட்டதாகச் சொல்கின்றார்கள், அங்கே சில குழறுபடிகள் நடந்திருப்பதாகச் சொல்கின்றார்கள். இந்தப் பரீட்சை கொழும்பிலே நடைபெறவில்லை, யாழ்ப்பாணத்திலே நடைபெற்றதென்று முதலிலே ஓர் உண்மைக்குப் புறம்பான விடயத்தைச் சொன்னார்கள். ஆனால், குறித்த பரீட்சை கொழும்பிலேதான் நடந்தது. இவ்வாறெல்லாம் பல பொய்கள் சொல்லப்பட்டு, இப்பொழுது நேர்முகப்பரீட்சை நடாத்தப்படாமல் தடுக்கப்பட்டிருப்பது மிக அபாண்டமானது. இந்த நாட்டிலே நேர்மைக்கும் சத்தியத்திற்கும் பங்கம் விளைவிக்கக்கூடிய வகையில்தான் இவ்வாறான சம்பவங்கள் தொடர்ந்தும் நடைபெறுகின்றன. கல்வியில் ஏற்படுத்தப்பட்ட தரப்படுத்தல்தான் இந்த நாட்டிலே யுத்தம் நடைபெறுவதற்கு, இளைஞர்கள் துப்பாக்கி தூக்குவதற்கு மிக முக்கியமான காரணமாக அமைந்தது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
மதிப்பார்ந்த தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ அமைச்சர் திகாம்பரம் அவர்கள் பேசும்போது, "நாங்கள் மலையகத்திலே தனியீழம் கேட்கவில்லை; மக்களுடைய வாழ்வுரிமையைத்தான் கேட்கின்றோம்" என்று கூறினார். ஆனால், நாங்கள் தனியீழம் கேட்டவர்கள்! இப்பொழுதும் அந்தக் கருத்துக்களை நாங்கள் தூக்கியெறியவில்லை. இந்த நாடு சரியான முறையில், நீதியான வகையில், தமிழர்களுக்கு நீதி வழங்கக்கூடிய வகையில் நடக்கத் தவறினால், சம்பந்தப்பட்டவர்களுக்கு அந்தச் சிந்தனையைத் தவிர, வேறு வழியிருக்க முடியாது. இந்த நாட்டிலே அந்தச் சிந்தனை வரக்கூடாதென்றால் - தனியீழம் பற்றிய எண்ணங்கள் வரக்கூடாதென்றால் அந்த மக்களுடைய உரித்துக்கள் வழங்கப்பட வேண்டும். நேர்மையான வழியிலே, அவர்களுடைய எண்ணங்களைப் பிரதிபலிக்கக் கூடிய வகையிலே, அவர்களுடைய மனம் ஆறுதலடையக்கூடிய வகையிலே, இவ்வளவு காலமும் அவர்கள் வாழ்ந்த மண்ணிலே அவர்களடைந்த துன்பங்களை, அவர்களுக்கு ஏற்பட்ட அழிவுகளை அவர்கள் தாங்கிக்கொண்டு வாழக்கூடிய வகையிலே அவர்களுக்கு இந்த நாட்டிலே நீதியான தீர்வு முன்வைக்கப்பட வேண்டும். தவறினால், இந்த அரசாங்கம், தனியீழம் பற்றிச் சிந்திக்கின்றவர்களுக்குத் தீனி போடுகின்ற வாய்ப்பைத் தானாகவே உருவாக்கும் என்றுதான் நான் நினைக்கின்றேன் என்று கூறி, என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன்.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සහෝදර ද්‍රවිඩ මන්ත්‍රීතුමා කළ ප්‍රකාශය ඔහුවාදී හැඟීම් ඇති වන ප්‍රකාශයක්. මේ අවස්ථාවේ

ආණ්ඩුවේ වගකිව යුතු කවුරු හෝ කෙනෙක් මෙතුමාගේ කථාව සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්නට ඕනෑ. මෙතුමාගේ කථාවෙන් කියන්නේ, ඔවුන් ද්‍රවිඩ ජාතීන් නිසා ඔවුන්ට සැලකුවේ නැහැ කියන එකයි. කවුරු හෝ ආණ්ඩුවේ වගකිව යුතු මන්ත්‍රීවරයෙක් මෙතුමාගේ කථාව සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න ඕනෑ.

[අ.භා. 2.48]

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

මෙම කාරණය පසු ගිය අය වැය ලේඛන කිහිපයකදීම පළාත් සභා සහ පළාත් පාලන ආයතන පිළිබඳ සාකච්ඡාවේදී මම සඳහන් කළ කාරණයක්. වතුකරය තුළ සංවර්ධන කටයුතු කරන්න ප්‍රාදේශීය සභාවලට මේවිවර කාලයක් බලයක් තිබුණේ නැහැ. මෙය, අවුරුදු තුනක් පිට පිටම අය වැය ලේඛන පිළිබඳ සාකච්ඡාවලදී මම මතු කළ කාරණයක්. ඒ නිසා ප්‍රමාද වී හෝ මෙම සංශෝධනය ගෙන ඒම ගැන අපි ඉතාම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, ඔබතුමා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පළාත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සහ ඒ මුළු සභික පිරිසටම තමන්ගේ ආසන නැති වුණා. වතුකරයේ සංවර්ධන කටයුතු කළාය කියලා ඔවුන් නෙරපා දැම්මා. ඔවුන්ට අධිභාරයක් - surcharge - ගෙවන්න සිද්ධ වුණා. වතු කම්කරු ප්‍රජාව ඓතිහාසික වශයෙන් නොසැලකිල්ලට භාජන වුණු ජන කොට්ඨාසයක් - discriminated community. 1949දී ඔවුන්ගේ ඡන්ද බලය අහිමි කළා. ඒ වෙලාවේ වතුකරයේ ජනතාව නියෝජනය කළ මන්ත්‍රීවරු හත්දෙනා සමඟ ඒ යෝජනාවට විරුද්ධව ඡන්දය දුන්නේ වාමාංශික මන්ත්‍රීවරු පමණයි. ඒ කාලයේ වතු මැදින් යන එක නවත්වන්නට, වතු මැදින් ඇති පාරවල් වහන්නට වතු අධිකාරිවරුන්ට - superintendents - බලය තිබුණා. ඊට පස්සේ 1970 ගණන්වල සමඟි පෙරමුණ ආණ්ඩුව කාලයේ, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් හිටපු කාලයේ Trade Union Representatives (Entry into Estates) කියන පනත ගෙනැල්ලා ඒකට ඉඩ දුන්නා. එහෙත්, එම ප්‍රාදේශීය සභා සීමා තුළ තිබෙන වතුවල සංවර්ධන කටයුතු කරන්න ප්‍රාදේශීය සභාවලට ඉඩ ලැබුණේ නැහැ. එම නිසා ප්‍රමාද වී හෝ මෙම සංශෝධනය ගෙනාපු එක ගැන සතුටු වෙනවා.

ඒ වාගේම, මීට කලින් ගරු මන්ත්‍රීවරයෙක් සඳහන් කළා වාගේ, මේ කටයුතුවලට අදාළ වැවිලි ප්‍රදේශවල වතුවල පාලනාධිකාරියේ එකඟත්වය ගැනීම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු වෙන්නට ඕනෑ. සමහර අවස්ථාවල මෙම පාලනාධිකාරීන් පදනමක් නොමැතිව - arbitrarily - මේ කටයුතුවලට විරුද්ධ වෙන්නට ඉඩ තිබෙනවා. එම නිසා ඒවා පිළිබඳවද ආණ්ඩුවේ අවධානය යොමු කරලා අවශ්‍ය නම් සංශෝධන ඉදිරිපත් කරයි කියා බලාපොරොත්තු වෙනවා.

මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මෙම සංශෝධනය ගෙන ඒම පිළිබඳව ආණ්ඩුවට සහ ගරු අමාත්‍යවරයාට නැවතත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආර්ථිකයේ විශාල පංගුවකට දායක වෙන්නේ වතුකරයේ ජනතාවයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු පලනි දිගම්බරම් මහතා**
(மாண்புமிகு பழனி திகம்பரம்)
(The Hon. PalanyThigambaram)

"ගරු හේෂා විතානගේ මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. HESHA WITHANAGE *took the Chair.*

[අ.භා.2.52]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආර්ථිකයේ විශාල පංගුවකට දායක වෙන්නේ වතුකරයේ වැඩ කරන ජනතාව බව අපි කවුරුත් දන්නවා. නමුත්, වතුකරයේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ලබා දීමට මෙතෙක් කිසිදු ආණ්ඩුවක් සමත්වෙලා නැහැ. අදත් ඔවුන්ට දැවෙන ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

අපේ රටේ දුප්පත්කම ගත්තොත්, විශේෂයෙන්ම නගරයේ දුප්පත්කම සියයට 2.1යි. ගමේ දුප්පත්කම සියයට 7.6යි. නමුත්, වතුකරයේ දුප්පත්කම සියයට 10.9යි. එතකොට අපේ රටේ දුප්පත්කමින් වැඩිම දුප්පත්කම තිබෙන්නේ වතුකරයේ ජනතාව තුළයි.

මන්ද පෝෂණය ගත්තොත්, නගරයේ මන්ද පෝෂණය සියයට 5.6යි. ගමේ මන්ද පෝෂණය සියයට 9.1යි. වතුකරයේ ජනතාවගේ මන්ද පෝෂණය සියයට 22යි. මන්ද පෝෂණය පැත්තෙන් ආසියාවේ දෙවැනි තැනට පත් වෙලා තිබෙනවා ලංකාව. ඒ කියන්නේ, වැඩිම මන්ද පෝෂණයකින් පෙළෙන රටක් බවට අපේ රට පත් වෙලා තිබෙනවා. එය මනින ප්‍රධාන සාධකය වෙලා තිබෙන්නේ වතුකරයේ මන්ද පෝෂණ ප්‍රතිශතයයි. සියයට 22ක් වූ වතුකරයේ මන්ද පෝෂණ ප්‍රතිශතය නිසා අපේ රට ආසියාවේ මන්ද පෝෂණයෙන් දෙවැනි තැනට පත් වෙලා තිබෙනවා.

[ගරු විජිත හේරත් මහතා]

ඊළඟට, අඩු මාස දරු උපත් ඇති වීමේ ප්‍රතිශතය නගරයේ 12.7යි. ගමේ 15.7යි. වතුකරයේ 27.6යි. ඒකෙන් පෙනෙනවා වතුකරයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය කොහොමද කියන එක. ඉතාම අඩු සෞඛ්‍ය පහසුකම් යටතේ ජීවත් වන ජනතාවක් තමයි වතුකරයේ ඉන්නේ. නමුත්, මෙතෙක් ඔවුන්ගේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් නිවැරදි ක්‍රියාමාර්ග අරගෙන නැහැ. අද ඔබතුමන්ලා ගන්නේත් ප්‍රාදේශීය සභා හරහා වතුවල පාරවල් සෑදීම සඳහා වන නීතිමය අවසරය පමණයි. නමුත්, මාතලේ, බදුල්ල, බණ්ඩාරවෙල මහ නගර සභා ගත්තොත් ඒ ආශ්‍රිතව වතු තියෙනවා. එතකොට ඒ වතුවල පාරවල් හැදීම, ජල ළිං සැකසීම ඇතුළු යටිතල පහසුකම් සැපයීම මේ පනතින් ආවරණය වන්නේ නැහැ. ඒ නිසා ප්‍රාදේශීය සභා පනත පමණක් නොවෙයි, නගර සභා පනතත්, මහ නගර සභා ආඥා පනතත් මෙලෙසම වෙනස් විය යුතුයි කියා යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1992දී තමයි මේ වතු සමාගම්වලට පැවරුවේ. ඒ පවරද්දී අත්සන් කරපු ගිවිසුම්වල තිබුණු බරපතළ අඩුවක් තමයි අද අපට මේ සම්පූර්ණ කරන්න වෙලා තිබෙන්නේ. එදා වතු ටික පෞද්ගලික අංශයේ සමාගම්වලට පැවරුවා, අවුරුදු 55කට. ඒ පවරද්දී ගිවිසුම් අත්සන් කළා. එහිදී ඒ වතුවලට අයිති පාරවල් ටික, ළිං ටික භදන්න ඒ සමාගම්වලට වගකීමක් පැවරෙන විධියට ඒ ගිවිසුම්වලට වගන්තියක් ඇතුළු කරන්න එදා පැවති ආණ්ඩුවට බැරි වුණා. එදා බලයේ හිටියේත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක්. ඒ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවකටම තමයි ඉතිහාසයේ සරදමක් විධියට අවුරුදු හතළිස් ගණනකට පස්සේ දැන් ඒ ගිවිසුම්වලට ඌන පූරණ ගෙනෙන්න මේ පාරවල් හදා දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එදා ගිවිසුම් අත්සන් කරන කොට කළ යුතුව තිබුණු දෙයක් නොකරපු නිසා තමයි අවුරුදු ගණනක් තිස්සේ ඒ වතුකරයේ ජනතාව යන්න පාරක් නැතිව, නාන්න, බොන්න වතුර ටිකක් ගන්න ළිං ටික හදා ගන්න බැරිව මේ තරම් දුක්ඛිත තත්ත්වයකට පත් වුණේ.

අපේ රටේ වැවිලි කර්මාන්තය ඇති වුණේ 1828දී කෝපි වගාව ආරම්භ වීමත් එක්කයි. නමුත්, ඒ කෝපි වගාව පසුකාලීනව අභාවයට ගියා. 1865න් පස්සේ කෝපි වගාව සම්පූර්ණයෙන් නතර වුණා. ඊට පස්සේ 1867දී තේ වගාව තමයි ආරම්භ වුණේ ජේම්ස් ටේලර්ගේ මූලිකත්වයෙන්. එදා ලුල්කඳුර වත්තේ තේ පැළයක් හිටුවා ආරම්භ කළ තේ වගාවත් එක්ක 1867 සිට 2018 අද අපි මේ කථා කරන මොහොත දක්වා අවුරුදු 151ක් වතුකරයේ ජනතාව ලැබුවේ ඇත්තටම කියනවා නම් දෛනික වැටුපක්. ඒ කියන්නේ දවසේ කුලියක්. අවුරුදු 151ක් තිස්සේ දවසේ කුලිය ලබා ගනිමින් තමයි වතුකරයේ ජනතාව ජීවත් වෙන්නේ. 1867 සිට 1948 දක්වා ඔවුන් දවසේ කුලීකාරයන් විධියට හිටියා. 1948දී නිදහස ලබා ගත්තාට පස්සේ ආණ්ඩුව ලංකාවේ කළු සුද්දන්ගේ අතට පත් වුණා. ලංකාවේ අය ආණ්ඩු පාලනය කරන්න පටන් ගත්තා. නමුත්, මේ වතු ආණ්ඩුවට පැවරුණේ නැහැ. 1948 සිට 1972 වනතුරුම මේ වතු තිබුණේ සුද්දා යටතේ; සුද්දාගේ පාලනය යටතේ. 1972දී ජනරජ ව්‍යාවස්ථාව ගෙනැල්ලා ඒ ඇති කරපු වෙනස්කම්වලින් පස්සේ තමයි සුද්දාගෙන් මේ වතු ටික ආණ්ඩුවට පවරා ගන්න පුළුවන් වුණේ. 1972 සිට 1992 දක්වා මේ වතු රජය සතු වතු විධියට තිබුණා. ඒ කියන්නේ, වතු ආණ්ඩුවට පවරා ගත්තා. වත්ත ආණ්ඩුවේ. හැබැයි, ඒ සේවකයා ආණ්ඩුවේ සේවකයකු විධියට, රජයේ සේවකයකු විධියට සැලකුවේ නැහැ. වතු ටික රජයට පවරා ගත්තා. හැබැයි, ඒ වත්තේ වැඩ කරන කම්කරුවා, සේවකයා රජයේ සේවකයකු විධියට සැලකුවේ නැහැ.

එහෙම සැලකුවා නම්, 1972 මේ වතු ටික රජයට පවරා ගත්තාට පස්සේ වතු කම්කරුවන්ව රජයේ සේවකයන් ලෙස සලකා ඔවුන්ට වැටුප් ලබා දිය යුතුව තිබුණා. නමුත් කනගාටුවට කරුණ, අවාසනාවක තරම, එවැනි සැලකීමක් ඔවුන්ට ලබා නොදීමයි. වතු ටික රජයේ වුණාට, සේවකයෝ රජයට අයිති වුණේ නැහැ. 1992දී තමයි මේ වතු ටික තුට්ටු දෙකට විකුණා දැම්මේ. එම වතු 449 සමාගම් 22කට වික්කා, අපට මතකයි. අද වුණත් බලන්න පුළුවන්. අවුරුදු 55කට බදු දුන්නා. ඒ කියන්නේ 2047 දක්වා, තවත් අවුරුදු ගණනක් මේ සමාගම්වලට වතුවල අයිතිය තිබෙනවා. ඒ වතු 449ම -මුළු ඉඩම් ටික- වික්කේ රුපියල් මිලියන 606කට. සමහර වතු විකුණා තිබෙන්නේ, අක්කරය රුපියල් 2ටයි. බණ්ඩාරවෙල ලියන්ගහවල වත්ත ගත්තොත් විකුණා තිබෙන්නේ, අක්කරය රුපියල් 3ටයි. මේ 1992දී. අපේ රටේ ජාතික සම්පතක් වන මේ වතු අක්කරයක් රුපියල් දෙකට, තුනට, වතු 449ම රුපියල් මිලියන 606කට තමයි සමාගම්වලට විකුණා දැම්මේ. එතැනදී, වතුවල පාරවල් ටික හා ළිං ටික ඒ වතු සමාගම් මඟින්ම හදන්න කියලා ඔවුන්ට කියන්න අපට බැරි වුණා. එහෙම කිව්වා නම්; ලිඛිතව ඒ ගිවිසුම්වල අත්සන් කර තිබුණා නම්, අද මේ ප්‍රශ්නය පැන නඟින්නේ නැහැ. නමුත්, කෙසේ හෝ දැන් අපි ඒ සඳහා නීති සකස් කරමින් තිබෙනවා.

නීති සකස් කළාට ඇත්තටම තවමත් තිබෙන්නේ ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔවුන්ගේ ජීවන තත්ත්වය ගත්තොත්, ඔවුන්ගේ යටිතල පහසුකම් ගත්තොත් ඉතාම පහළ මට්ටමක තිබෙන්නේ. සාමාන්‍යයෙන් අද රජයේ සේවකයකුගේ අවම වැටුප රුපියල් 32,040ක් වනවා. මේ වතු කම්කරුවනුත් සාමාන්‍ය රජයේ සේවකයන්ට ලැබෙන වැටුපට සමාන වැටුපක් හිමි විය යුතු සේවකයන්. අවම වශයෙන් දවස් 25ක් වැඩ කරන්න ඕනෑ කියලා ඔවුන්ට නීතියක් තිබෙනවා. දවස් 25ක් වැඩ කළොත් දවසකට රුපියල් 1,281ක් ලැබිය යුතුයි; සාමාන්‍ය රජයේ සේවකයාට ලැබෙන වැටුප ගත්තොත් ඔවුන්ට දෛනික වැටුප ලෙස රුපියල් 1,281ක් ලැබිය යුතුව තිබෙනවා. නමුත් කනගාටුවට කරුණ තමයි, අද හම්බ වෙන්නේ රුපියල් 500යි. රුපියල් 500ක් කියන්නේ, අවුරුදු ගණනකට පස්සේ විවිධ සාමූහික ගිවිසුම්, විවිධ සටන් හරහා ලබා ගත් දෙයක්. අද අවුරුදු දෙකෙන් දෙකට සාමූහික ගිවිසුම් අත්සන් කරනවා. පළමු සාමූහික ගිවිසුම අත්සන් කළේ 1999දී; පදනම් වර්ෂය. එදා දෛනික වැටුප රුපියල් 101යි. 2002දී ඒක, රුපියල් 231ක් වුණා. අද වනකොට රුපියල් 500ක් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1999 ඉඳලා 2018 දක්වා මේ අවුරුදු 19ටම වතු කම්කරුවන්ගේ වැටුප වැඩි වුණේ රුපියල් 399කින් පමණයි. ඒ කියන්නේ, අවුරුද්දකට වැඩි වුණේ රුපියල් 21යි. මේ අවුරුදු 19ට වැඩි වෙලා තිබෙන්නේ, රුපියල් 399යි. අවුරුදු 21ක් ගෙවිලා තිබෙනවා. ඒ කියන්නේ, අවුරුද්දකට රුපියල් 21යි වතු කම්කරුවන්ගේ වැටුප වැඩි වෙලා තිබෙන්නේ.

වතු කම්කරුවන්ගේ අයිතිවාසිකම් ගැන අපි කථා කරනවා. වතු කම්කරුවන් වෙනුවෙන් ඇමතිවරු පත් කරනවා. ඒ ඇමතිවරුන්ට විවිධ වරදාන හා වරප්‍රසාද දෙනවා. අපි දන්නවා ආණ්ඩු හදද්දී හැම අවුරුද්දකම ඒ පත් වන ඇමතිවරුන්ට වර දාන හා වරප්‍රසාද දෙන බව. සමහරුන් පෞද්ගලිකව නොයෙක් නම්වලින් පදනම් හැදුවා. අදත් වතුකරයේ තොණ්ඩමන් පදනම් තිබෙනවා. ඒක තොණ්ඩමන් පවුලේ සාමාජිකයන්ට මැරෙනකම් ඔප්පුවකින් ලියා දීලා තිබෙන්නේ. කැබිනට් තීරණයක් අරගෙනයි දීලා තිබෙන්නේ. මේ රටේ මහජනතාවගේ, වතුකරයේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකමක් වෙනුවෙන් ඇමතිවරුන්ට වරදාන දීලා, වරප්‍රසාද දීලා තමන්ගේ ආණ්ඩු බලය, දේශපාලන බලය පවත්වාගෙන යන්න පදනම් හදලා, ඒ පදනම් සින්නක්කර ඔප්පුවලින් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ලියලා දීලා තිබෙනවා. යාවජීව සාමාජිකත්වය තොණ්ඩමන් පවුලේ සාමාජිකයන්ට පැවරෙනවා. පසුගිය කාලයේ පැවැති ආණ්ඩු එවැනි වැරැදි, එවැනි නීත්‍යානුකූල නොවන සදාචාර විරෝධී ක්‍රියා

මාර්ග ගෙන තිබෙනවා. එවැනි කටුක යථාර්ථයක් ඇතුළේ තමයි අපට වතු කම්කරුවන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරන්න වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අද මේ තිබෙන තත්ත්වය අනුව, ඇත්තටම වතුකරයේ පාරවල් හදන එක ප්‍රාදේශීය සභාවට පවරා ගන්න එක හොඳයි. වතුකරයේ පාරවල් සෑදීම ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමේ සංශෝධනය මෙම පනත් කෙටුම්පත මඟින් ඉදිරිපත් කර තිබෙනවා. එසේ කර හෝ වතු කම්කරුවන්ගේ පාරවල් ටික හදා දීලා, පොදු පහසුකම් ටික සංවර්ධනය කරන්න මැදිහත් වෙනවා නම් හොඳයි. ඒ චිතරක් මදි. ඔවුන්ගේ දෛනික ජීවිතය සාර්ථක කර ගන්න අවශ්‍ය කරන වැටුප් වැඩි කිරීමත් වහාම කළ යුතුව තිබෙනවා.

ඊළඟට, වතු කම්කරුවන්ගේ නිවාස. පර්චස් 7ක ඉඩම් කෑල්ලක නිවාස ලබා දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන බව අපි දැක්කා. හැබැයි එතැන තිබෙන ප්‍රශ්නය, නිවසට ඔප්පුවක් දෙන්නේ නැහැ. පසුගිය කාලයේ කිරිඇල්ල ඇමතිතුමා "කිරිඇල්ල ඔප්පුව" කියලා නිකම් කොළ කෑල්ලක් දුන්නා අපි දැක්කා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කරන්නේ බොරුවක්. ජනතාව නොමඟ යවනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
නිකම් කොළ කෑල්ලක් තිබෙන්නේ. දැන් දිගම්බරම් ඇමතිතුමාගේ කොළ කෑල්ලක් දෙනවා. ඒක "දිගම්බරම් කොළ කෑල්ල". දිගම්බරම් ඔප්පුවයි, කිරිඇල්ල ඔප්පුවයි වාගේ නිකම් කොළ කැලි වැඩක් නැහැ. ස්ථිර සහතික ඔප්පුවක්, එහෙම නැත්නම් අඩුම ගණනේ -

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි, ඉඩම් ලබා දීමේ ආරම්භක වැඩසටහනක් හැටියට තමයි අර පත්‍රිකාව ලබා දෙන්නේ. දැන් ඒවාට ස්ථිර ඔප්පු ලබා ගැනීමේ ඉතිරි වැඩ කටයුතු ටික කරගෙන යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. බොහොම ස්තුතියි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
දැන් අවුරුදු තුනහමාරක් ගෙවී තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු ආකාරයට වතුකරයේ ජනතාවට ඉඩම් දෙන්න ඕනෑ. අපිත් ඒ මතයේ ඉන්නවා. හැබැයි, සිදුවෙලා තිබෙන්නේ "ජනවසම" සභාපතිතුමා අත්සන් කරලා කාඩ්බෝඩ් කෑල්ලක් දීලා තිබෙන එකයි. ඒක තනිකර බොරුවක්. මැනලා නැහැ; පෙන්වා නැහැ; පාරවල් නැහැ; විදුලිය නැහැ. තනිකර බොරුවක් කරන්නේ. ඇත්තටම වතුකරයේ ජනතාවට ඉඩම් දෙන්න ඕනෑ. අපිත් ඒ මතයේ ඉන්නවා. ඒ නිසා නිකම් -

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
මැනලා නීත්‍යානුකූලව තමයි ලබා දෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා පිළිගත්තා, දැනට ලබා දෙන්නේ තාවකාලික ලියවිල්ලක් බව. ඒකම තමයි මම අවධාරණය කළේ. තාවකාලික කොළ කෑල්ල ප්‍රමාණවත් නැහැ. මොකද, වතු කම්කරුවන්ට මීට කලින් මේ වාගේ කොළ කෑලි ගොඩාක් ලැබිලා තිබෙනවා. කදුරට ජනතා පෙරමුණේ එදා හිටපු නායකයා මේ විධියටම "ඔප්පුවක්" කියලා කොළ කෑල්ලක් ලබා දුන්නා අපට මතකයි. නමුත් අදත් කොටගල වතු යායේ ජනතාව උසාවි ගණනේ රස්තියාදු වෙනවා. උසාවිය පිළිගන්නේ නැහැ, ඒක ඔප්පුවක් කියලා. අඩුම ගණනේ බලපත්‍රයක් කියලා පිළිගන්නේත් නැහැ. එක්කෝ "ජය භූමි" වාගේ වෙන මොකක් හරි නමකින් හෝ නීත්‍යානුකූල බලපත්‍රයක් හෝ ලබා දිය යුතුව තිබෙනවා.

ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමනි, ඉදිරියේදී ස්ථිර ඔප්පු ලබා දෙනවා කියලා ඔබතුමා පොරොන්දු වෙනවා. ඒ නිසා අපි බලා ගෙන ඉඳිමු. දැන් වනවිට අවුරුදු තුනහමාරක් ගත වී තිබෙනවා. තවම ලබා දුන්නේ නැහැ. තවම තිබෙන්නේ අර කොළ කෑල්ල විතරයි. මම හිතන විධියට මේක ඒ තරම් අමාරු වැඩක් නොවෙයි. පර්චස් හත වෙන් කරලා නිවාසය හදලා දෙනවා නම්, ඒ වේලාවේම ඔප්පුවේ කටයුත්තත් අවසන් කරලා දෙන්න. එතකොට ඒ අයට හිත සන්තෝෂයෙන් තමන්ගේ කියන නිවසක පදිංචි වෙන්න පුළුවන්. නමුත් අත් දැකීම් අනුව බලන කොට, "කොළ කෑල්ල" කියන එක සම්බන්ධව ඉතිහාසයේ තිබෙන්නේ නරක අත් දැකීමක්. [බාධා කිරීම්] ඒ නිසා මේ කොළ කෑල්ලෙන් ඔවුන්ට අයිතියක් ලැබෙනවා කියන එක පිළිගන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, බාධා කරන්න එපා. එතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් කරුණක් ගැන අවධාරණය කරන්න කැමැතියි. එම වතු සමාගම් තවත් සමාගම්වලට උපකොන්ත්‍රාත් -subcontracts- දෙනවා. එසේ උපකොන්ත්‍රාත් දීපු සමාගම් ගණනාවක් දැන් තිබෙනවා. මෑතක සිට බොහෝ වතු කැලි-කැලිවලට කැඩෙමින් පවතිනවා. ඒවායේ වතුකර ජනතාව සිටියදීම ඒවා තවත් සමාගම්වලට පැවරීමක් සිද්ධ වෙනවා. අපි මේ කරුණ අවස්ථා කිහිපයකදීම මතු කළා. මීට කලින් ගරු කබීර් හාෂිම් ඇමතිතුමා සිටි කාලයේත් මේ ආකාරයට සිද්ධ වෙලා තිබුණා. පසුගිය කාලයේ කිරිඇල්ල ඇමතිතුමා මැදිහත් වෙලාත් ආපසු මේ ආකාරයටම කටයුතු සිදු වෙමින් පවතිනවා. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, වතුකරයේ ජනතාව ජීවත් වෙන, ආදායම් ලබන මේ වතු subcontracts දීලා, විවිධ පෞද්ගලික සමාගම්වලට පවරා ඉතිහාසයේ වුණු වැරැද්ද නැවත සිද්ධ කරන්න එපා කියලා. අනාගතයට ඒ ප්‍රශ්නය ඉතුරු කරන්න එපා කියලා. මම ඒ ගැනත් අවධාරණය කරනවා.

විශේෂයෙන්ම අපේ රටේ ආර්ථිකයේ විශාල පංගුවකට දායකත්වය ලබා දෙන මේ වතුකරයේ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ආණ්ඩුවක් විධියට අද මේ ඉදිරිපත් කළ පනත් කෙටුම්පත සාධනීය පියවරක් හැටියට අපි දකිනවා. මෙය, ප්‍රාදේශීය සභාවලට පමණයි සීමා වෙලා තිබෙන්නේ. නමුත් නගර සභා, මහ නගර සභාවලට අයත් පාරවල් ප්‍රතිසංස්කරණය කිරීමට ඒ පනත් අනිවාර්යයෙන්ම සංශෝධනය විය යුතුයි. නමුත් පනත සංශෝධනය වුණාට වැඩක් නැහැ. ආණ්ඩුවේම පළාත් සභා, පළාත් පාලන ගරු රාජ්‍ය ඇමතිතුමිය කිව්වා, "පනත වෙනස් කළාට වැඩක් නැහැ, අපිට පාරවල් හදන්න සල්ලි ඕනෑ"යි කියලා. එම ප්‍රශ්නයට උත්තරයක් නැති වුණොත්, මෙතැන නීතිය හැදුවාට වැඩක් නැහැ. ආණ්ඩුවේ ගරු රාජ්‍ය ඇමතිතුමියම කියනවා, "අපි නීතිය වෙනස් කරන එක හොඳයි. හැබැයි, නීතිය වෙනස් කළාට මදි. සල්ලි නැතුව පාරවල් හදන්න බැහැ" කියලා. ඒ නිසා මේ පාරවල් ටික හදන්න වහාම සල්ලි වෙන් කරලා, කඩිනමින් මේ යටිතල පහසුකම් ටික නඟාසිටුවන්න මැදිහත් වෙන්න කියා ඉල්ලා සිටිමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැම කන අවස්ථාවේ දී තමයි අපේ විජිත හේරත් මන්ත්‍රීතුමාගේ කථාවට සවන් දුන්නේ. වතු කම්කරුවන්ට පර්චස් හතක් දෙන්න කියලා මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළේ ගරු අගමැතිතුමාගේත්, අතිගරු ජනාධිපතිතුමාගේත් උපදෙස් අනුවයි.

යහ පාලන රජයේ, දින සියයේ ආණ්ඩුවේ වැවිලි කර්මාන්ත ඇමතිවරයා හැටියට කටයුතු කරනකොට මම ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළා. සෑම වත්තකම පර්චස් 7ක් මැනලා, ඔප්පුවක් විතරක් නොවෙයි, ලියවිල්ලක් එක්ක අපි වතු කම්කරුවන්ට එහි භුක්තිය භාර දෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා කියන දෙය වැරැදියි, ගරු ඇමතිතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
You can explain. අපි භුක්තිය භාර දීලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නේ නැතිව ඇති, භුක්තිය කියන්නේ අයිතියෙන් සියයට 99ක් බව - Possession is 99 per cent of the law. මීට කලින් කිසිම වතු කම්කරුවෙකුට භුක්තිය - possession - තිබුණේ නැහැ. ඔබතුමන්ලා අවුරුදු 10ක් රට පාලනය කළා නේ. ඇයි, මේවා කළේ නැත්තේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපි කළා. අපි තමයි ඒක පටන් ගත්තේ. ඔබතුමා දන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තරහා ගන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ අයට පර්චස් හත ගණනේ දුන්නා. ඒවායේ භුක්තියත් භාර දීලා තිබෙනවා. භුක්තිය විතරක් නොවෙයි, ඒ අයගේ අයිතිය ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කරන්නත් පුළුවන්. දැන් සමහර පළාත්වල ඒ බිම් කොටස්වල ගෙවල් හදන එක ආරම්භ කරලාත් තිබෙනවා. අපි ඒ කාර්යය කළා. මහින්ද රාජපක්ෂ මැතිතුමා අවුරුදු 10ක් මේ රටේ පාලන බලයේ හිටියා. ඊට කලින් අවුරුදු 10ක් ඔබතුමන්ලාගේ ආණ්ඩුව තිබුණා. අවුරුදු 20ක් තිස්සේ මේ කටයුත්ත සිදුවුණේ නැහැ. මේක මහා විප්ලවයක්. මම විපක්ෂයට කියන්නේ, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපට සහයෝගය දෙන්න කියායි.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. මම පශු සම්පත් හා වතු යටිතල පහසුකම් සංවර්ධන ඇමතිවරයා වශයෙන් කටයුතු කළා නේ. අපි අවුරුදු 20ක් ආණ්ඩු කරපු කාලයේ මම අවුරුදු 4ක් එම අමාත්‍ය ධුරයේ කටයුතු කළා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
වතු කම්කරුවන්ට ඉඩම් දෙන්න කියා මේ යහ පාලන ආණ්ඩුව එන්න කලින් කිසිම දවසක කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණේ නැහැ,

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
රජයේ ප්‍රතිපත්තියක් හැටියට ඉස්සර වෙලාම ඒක පිළිගත්තේ අපේ ආණ්ඩුවයි.

**ගරු සී.බී. රත්නායක මහතා**
(මාණ්පුමිකු சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මොකක්ද ඇහුවේ?

**ගරු සී.බී. රත්නායක මහතා**
(මාණ්පුමිකු சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට තිබෙන්නේ මගේ කථාවද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ. ඔබතුමා කථා කරන වෙලාවේදී මේ ගැන අදහස් දක්වනවාද?

**ගරු සී.බී. රත්නායක මහතා**
(මාණ්පුමිකු சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මම පශු සම්පත් හා වතු යටිතල පහසුකම් සංවර්ධන ඇමතිවරයා හැටියට කටයුතු කළ කාලයේ නිවාස 4,260ක් හදා තිබෙනවා. ඒ නිවාස 4,260 පර්චස් හතේ ඉඩම් කොටස්වල තමයි හදා තිබෙන්නේ. පාරවල් ටික, මින්සාර වසති, ෆ්‍රෝට්ටු වසති එල්ලාම් කොටුත්තිරුක්කු. එව්වළවු පොය්සොල්ලුරදු. ඒමාත්‍ර වේණ්ඩාම්!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කථා කරන්න අවස්ථාව එනවා. ඒ අවස්ථාවේදී කථා කරමු.

දැන් ගරු කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.11]

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා (විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - விஞ்ஞான, தொழில்நுட்ப, ஆராய்ச்சி, திறன்கள் அபிவிருத்தி, தொழில் பயிற்சி மற்றும் கண்டி மரபுரிமைகள் பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Science, Technology, Research, Skills Development and Vocational Training and Kandyan Heritage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි සම්මත කරගන්න බලාපොරොත්තු වන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත ඉතාම ඓතිහාසික පනතක්. මෙය සම්මත වීමෙන් වතුකරයේ තිබෙන සියලු අඩු පාඩු සම්පූර්ණ වෙන්නේ නැති බව අපට පැහැදිලි වුණත්, මෙය ඉතාම වැදගත් පනතක්. වතුකරයේ ජනතාවට ප්‍රාදේශීය සභාවලට නියෝජිතයන් පත් කරන්න පුළුවන්, නමුත් ඒ ප්‍රාදේශීය සභාවේ සේවය ලබා ගන්න බැහැ. ඒක තමයි මේ වනතුරු තිබුණු නීතිය වුණේ. මේක අපේ ප්‍රාදේශීය ආණ්ඩුකරණයේ තිබෙන හිඳැසක්; ලොකු අඩු පාඩුවක්. ඒක සෑහෙන කාලයක් තිස්සේ තිබුණා. අපි මේ ගැන කථා කර කර හිටියාට, එය අඩු පාඩුවක් කියා අපි සියලුදෙනා පිළිගත්තාට, මේ අඩු පාඩුව පවා නිවැරැදි කර ගන්න අපි සෑහෙන ප්‍රමාද වුණා.

අපට මතකයි, මේ ආණ්ඩුව පත් වෙලා පාර්ලිමේන්තුව රැස්වුණු මුල්ම දවස්වල මේ සම්බන්ධයෙන් ඉතාම වැදගත්, සභාව කල් තබන අවස්ථාවේ විවාදයක් පැවති ආකාරය. අපේ හිතවත් ගරු තිලකරාජා මන්ත්‍රීතුමා එම යෝජනාව ඉදිරිපත් කළා. ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා එම යෝජනාව ස්ථීර කළා. එදා අපි ඒ යෝජනාව ගැන සාකච්ඡා කළා. හැම දාම කථා කරමින් තිබුණත්, ක්‍රියාත්මක නොකළ මේ කාරණය නීතියක් විධියට සම්මත කරලා ඉක්මනින් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන යෝජනාව ඒ විවාදයේදී මතු වුණා. ඒ කාලයේදී මමත් පළාත් සභා හා පළාත් පාලන නියෝජ්‍ය ඇමතිවරයා ලෙස කටයුතු කළ නිසා මට ඒ කාරණය හොඳට මතකයි. අපි ඒ විවාදයට සහභාගි වුණා. මේ පනත් සංශෝධනය ඉක්මනින්ම පාර්ලිමේන්තුවට ගෙනෙනවාය කියා එදා අපි තීන්දුවක් ගත්තා. එම නිසා මේ අවස්ථාව ඉතාම වැදගත්, ඓතිහාසික අවස්ථාවක් හැටියට අපි සලකනවා. වතු පෞද්ගලික අංශයට දෙන වෙලාවේ, "වතුවල තිබෙන යටිතල පහසුකම් සපුරා ලීම ඒ සමාගම්වල වග කීමක් හැටියට තිබිය යුතුයි" කියා ඕනෑ නම් කොන්දේසියක් දමන්න තිබුණාය කියා කලින් කථා කළ මන්ත්‍රීවරු සඳහන් කළා.

ඒක ඉතාම වැදගත් තර්කයක්; හොඳ කාරණයක්. එහෙම තිබුණා වුණත් -වතු සමාගම්වලට සම්පූර්ණයෙන්ම මේ කටයුතු පැවරිලා තිබුණත්- ප්‍රාදේශීය සභාවටත් ඒ අයිතිය තිබෙන්න අවශ්‍යයි කියන එකයි මම කියන්නේ. මොකද, වතුකරයේ ජනතාව ඒ මන්ත්‍රීවරු පත් කර ගන්න ඡන්දය දෙනවා. නමුත් ප්‍රතිලාභ නැහැ. මේක එක්තරා විධියක අසමාන ආකාරයකට සැලකීමක් වනවා. එක්තරා ආකාරයක වර්ගවාදී නීතියක් හැටියටයි එය තිබිලා තිබෙන්නේ. ඒ නරක තත්ත්වය වෙනස් කරලා, ප්‍රාදේශීය සභාවලට වතුකරයේ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා මැදිහත්වීමේ අයිතිය අද අපි ලබාදෙනවා.

ප්‍රාදේශීය සභාවලට සල්ලි නැත්නම් මේ දෙය කරලා වැඩක් නැහැය කියා මෙතැනදී කියැවුණා. ඒක ඊළඟට විසඳා ගන්න ඕනෑ ප්‍රශ්නයක් තමයි. නමුත් මෙවැනි නීතියක් තිබෙනවා නම් සල්ලි තිබුණත් ඒ කටයුතු කරන්න බැරි වෙනවා. එම නිසා ඉස්සර වෙලා නීතිය හදලා ඉන්න ඕනෑ. මොකද සල්ලි තිබුණත් ඒ කටයුතු කරන්න බැහැ, මේ වාගේ නීති ඒවාට බාධා කරන නිසා. එම නිසා අද මේ විධියට නීතිය සකස් කිරීම අනාගතයේදී ප්‍රාදේශීය සභාවලට ඉතාම වැදගත් වෙනවා.

වතුකරය ආශ්‍රිතව තිබෙන ප්‍රාදේශීය සභා මහා ධනයක් තිබෙන ඒවා නොවන බව අපි හොඳටම දන්නවා. වතුකර ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට අපි ඒ ගැන දන්නවා. විජිත හේරත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ, වතුකරයේ ජනතාව තමයි හැම අතින්ම අඩු වරප්‍රසාද භුක්ති විඳින්නේ. මේ ප්‍රදේශවල දුප්පත්කම වැඩියි; අධ්‍යාපනය අඩුයි; සෞඛ්‍ය පහසුකම් අඩුයි; පෝෂණය අඩුයි. ඒ සියල්ල ගත්තාම වතුකරයේ ජනතාව තවම ඉන්නේ දෙකේ පන්තියේ පුරවැසියන් හැටියටයි. මේ නරක තත්ත්වය අපි තේරුම් ගන්න ඕනෑ; පිළිගන්න ඕනෑ; ඒවා වෙනස් කරන්න අපි ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේ විධියට නීතියේ අඩු පාඩුකම් තිබෙන තව ක්ෂේත්‍ර ගණනාවක් අපේ නීති ආකෘතින් ඇතුළේ හැංගිලා ඇති. මේ කාරණය තිබුණා වාගේම, අපේ අණපනත් ඇතුළේ, අපේ සංවර්ධන වැඩසටහන් ඇතුළේ වතුකරයට මේ ආකාරයටම සැහවූ, වෙනස්කම් කළ යුතු නීති රීති, රෙගුලාසි සැලසිලා ඇති කියා අපි විශ්වාස කරනවා. එම නිසා

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

වතුකරයේ ජනතාවගේ නියෝජිතයන් වශයෙන්, ඒ වාගේම ප්‍රතිපත්ති සම්පාදකයන් වශයෙන් අපි සියලුදෙනාම එකතුවෙලා මේ දේවල් නැවත වතාවක් පුනරීක්ෂණය කරන්න දැන් කාලය උදාවෙලා තිබෙනවා. මේ රීති, අඩු පාඩු අපි වෙනස් කළා වාගේම, තවත් එවැනි දේ තිබෙනවා නම්, ඒවා ගැන නැවත සොයා බලා, ඒ නීති රීතිත් ඉක්මනින්ම පාර්ලිමේන්තුවට ගෙනැත් මේ හැමදෙනාටම සමානව සලකන ආකාරයට රටේ තත්ත්වය ඇති කරන්න අපි වැඩ කරන්න ඕනෑය කියන කාරණය මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය පළාත් පාලන ඡන්ද කාලයේදී වතුකරයේ ඡන්ද රැස්වීම් පවත්වනකොට ඒ නියෝජිතයෝ මේ ප්‍රශ්නය මතු කළා; ඒ ජනතාව මතු කළා. "ඉක්මනින්ම මේ තත්ත්වය වෙනස් කරලා, ඔබ පත් කරන මන්ත්‍රීවරයා කවුරු හෝ වේවා, ඔවුන් ලවා වතුකරයේ පහසුකම් සලසා ගැනීමට නීතිමය ඉඩකඩ සලසා දෙනවා" කියා අපි ඒ අයට ප්‍රකාශ කළා. ඒ නීති සංශෝධනය පාර්ලිමේන්තුවට මේ ආකාරයට ගෙන ඒමට අවස්ථාව ලැබීම පිළිබඳව අද අපි සතුටු වෙනවා. අපේ පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමාටත් මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ කාරණය මතු කළ ගරු නිලකරාජා මන්ත්‍රීතුමා, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා ඇතුළු වතුකරයේ අපේ ජනතා නියෝජිතයන්ටත් මා ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද අපි කථා කරන මේ කාරණාවලට ඉතිහාසයෙන් උප්පැන්න දෙමින්, ඒ ගැන විවිධාකාරයේ කථා කියන්න බොහෝ අය සූදානම් වෙනවා. නමුත් වතුකරයේ ජනතාව -නුවරඑළිය දිස්ත්‍රික්කය- නියෝජනය කරමින් පුරා වසර විසි ගණනක් මම මහජන නියෝජිතයකු හැටියට කටයුතු කරමින් ඔවුන්ගේ මරණයට, මඟුලට, මුත්තෙට්ටුවට සහභාගි වුණා. ඔවුන් හා අත්වැල් බැඳගෙන යන මේ ගමනේදී ඔවුන්ගේ අඩු පාඩු මට හොඳාකාරව දැනුණා; පෙනුණා. පශු සම්පත් හා වතු යටිතල පහසුකම් සංවර්ධන ඇමතිවරයා හැටියට මම වසර ගණනාවක් ඔවුන් වෙනුවෙන් කටයුතු කළ ආකාරයත් මෙතැනදී කියන්න ඕනෑ. වතුකරයේ ආදරණීය ජනතාවගේ නිවාස ප්‍රශ්නය ගැන මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ඔවුන්ගේ නිවාස ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් ගන්නා වූ සෑම ක්‍රියා මාර්ගයකදීම මගේ සහයෝගය ලබා දුන්නා. ඔවුන්ට නිවසක් උරුම විය යුතුයි කියන කාරණයේදී කිසිම වාද විවාදයක් නැතුව අත්දෙකම ඔසවා මා ඒකට එකඟ වුණා; ඒ වෙනුවෙන් කටයුතු කරන්න සූදානම් වුණා.

ඒ ජනතාව ගැන කථා කරනකොට අද දෙවන වර කියැවීම සඳහා පනත් කෙටුම්පත් 3ක් ඉදිරිපත් කර තිබෙන ආකාරය මම දැක්කා. එයින් පළමුවැන්න, වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත. දෙවැන්න, ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත. තුන්වැන්න, ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත. ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරමින් සහෝදර ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කිව්වා, "දැමිළ ජනතාව විභාග සමත් වුණු නිසා ඒ ප්‍රශ්නය පිළිබඳව කල් දමමින්, කල් මරමින් ඉන්නවා." කියා. ඒක ඔවුන්ගේ ආණ්ඩුවේ ප්‍රශ්නයක් විය හැකියි. නමුත්, වැරැදි අර්ථකථන දිය යුතු නැතැයි කියන එක මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. වතුක්ෂේත්‍රයේ ජීවත් වෙන ආදරණීය උගත්, බුද්ධිමත් ජනතාව වෙනුවෙන් අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර, ඔවුන්ට ගුරු පත්වීම් ලබාදීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර, ගුරු පත්වීම් 3,145ක් ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. ඒ සඳහා දායකත්වය ලබා දෙන්න හැකිවීම පිළිබඳව මම සතුටු වෙනවා. වෛද්‍ය විද්‍යා පීඨය වාගේම ඉංජිනේරු පීඨය වෙන්න පුළුවන්. මෙන්න මේ පීඨවල ඉඳලා අද වතුකරයේ අභිංසක කම්කරුවන්ගේ දරුවෝ හෙට දවසේ රටට සම්පත් දායකත්වය ලබා දෙනවා. මේ සියලු දේ ක්‍රියාත්මක වෙනකොට ඔවුන්ට නිවසක් අවශ්‍යයි. ඔවුන්ට නිවසක් ලබාදීම සහ ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයා දිය යුතු වෙනවා.

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත නීත්‍යානුකූල කරන්න ඉස්සෙල්ලා ඒ ජනතාව මඩ ගොඩේ එරී එරී ගිය මාර්ගයන් පිළිසකර කර, විදුලිය නැතිව තිබුණු ප්‍රදේශවලට විදුලිය ලබාදීලා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපනය ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් සියල්ල සපයමින් කටයුතු කරපු ආකාරය මම මෙතැනදී මතක් කරන්න ඕනෑ. එහෙම නොවුණොත්, අවුරුදු 20ක් අපි කිසිම දෙයක් නොකරපු මිනිස්සු හැටියටයි කථා කරන්නේ. අද මහින්දෝදය විද්‍යාගාර කීයක් ඒ පාසල් තුළ තිබෙනවා ද? විද්‍යා පීඨ කීයක් තිබෙනවා ද? ඒ වාගේම, හැම වත්තකටම විදුලිය සහ සෞඛ්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවා. වතු ආශ්‍රිත රෝහල් ටික සකස් කර, සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කර තිබෙනවා. ඉන්දියානු රජයේ ආධාර උපකාර මත දික්ඔය රෝහල වැඩිදියුණු කර ඒ ප්‍රදේශයේ ජනතාවට ලබා දෙන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ වෙනුවෙන් දායකත්වය දැරූ අපේ සහෝදර මන්ත්‍රීවරු සියලුම දෙනා පිළිබඳව මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. එතැනදී අපට පක්ෂයක් නැහැ, පාටක් නැහැ. අපට අවශ්‍ය වුණේ ජනතාව වෙනුවෙන්, ජනතාවගේ නාමයෙන් ඒ සේවය කරන්නයි. අපි ඒ සේවය කිරීම සඳහා කටයුතු කරන්න සූදානම් වුණා. හැබැයි, නිවාස ප්‍රශ්නය හා යටිතල පහසුකම් සැපයීම ආදී සේවා සියල්ල සිද්ධ කරනවා වාගේම අපි තේ ආර්ථිකය ගැනත් බලන්න ඕනෑ. අද වතු ක්ෂේත්‍රයේ වැවිලි භෝගවලින් ආදායම් ලබනවා වාගේම තේ, පොල්, රබර් අපනයනය කිරීමෙනුත් අපට ආදායමක් ලැබෙනවා. තේ කර්මාන්තය ගැන කථා කරනකොට "Ceylon Tea" කියන නාමය අද ලෝකයේ ප්‍රසිද්ධ වෙලා තිබෙනවා. ඒ තත්ත්වය ක්‍රියාත්මක කරගෙන යනකොට අපේ රටේ තේ වතු ටික අද බහු ජාතික සමාගම් එළවලු වගා කිරීම සඳහා පාවිච්චි කරගෙන යනවා.

සමහර තේ ඉඩම් සෝදා පාළුවීම්වලට ලක් වෙනවා. සමහර තේ ඉඩම්වල නෙත්ති කානු ඇත්තේ නැහැ. ඒ වාගේම, වැටි ටික ඇත්තේ නැහැ. මේ ඉඩම් බදු දීලා ඔවුන් ලාභයක් ලබන්න සූදානම් වෙනකොට, දෛනික වැටුපක් ලබපු කම්කරුවාට තේ ගස් 500ක් ලබා දෙනවා. තේ ගස් 500 ලබා දීලා තේ දලු ටික නෙළලා සමාගමට දෙන්න අවස්ථාව සලසා දීලා තිබෙනවා. ඔවුන්ගේ ආර්ථිකය පවත්වාගෙන යෑම සඳහා කටයුතු කරනවා විනා තේ ආර්ථිකය, තේ ගස රැක ගන්නා වැඩ පිළිවෙළ මන්දගාමී තත්ත්වයෙන් තමයි යන්නේ. මන්දගාමී තත්ත්වයෙන් යන නිසාම අද ස්ථිරසාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ගරු

පලනි දිගම්බරම් සහෝදර ඇමතිතුමා මේ වෙනුවෙන් විශාල උත්සාහයක් ගත්තා බව මම දන්නවා. ඒ වාගේම, සෞම්‍යමූර්ති තොණ්ඩමන් මැතිතුමා, ආරුමුගන් තොණ්ඩමන් මැතිතුමා සහ පී. චන්ද්‍රසේකරන් මැතිතුමා මේ සඳහා විශාල දායකත්වයක් ලබා දෙමින් නිවාස හදන්න දායක වූ ආකාරය පිළිබඳව මම මේ වෙලාවේදී විශේෂයෙන්ම මතක් කළ යුතුමයි. එසේ නොවන්නේ නම්, එය එතුමන්ලාට කරන අකටයුත්තක්, අසාධාරණයක් කියන එකත් මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. පාට පක්ෂ දේශපාලනය ගැන වෙනම විධියකට කථා කරන්න. ප්‍රදේශයේ ඉන්න මිනිසුන් හැටියට අපේ මිනිසුන් ජීවත් වෙන්න ඕනෑ. "ඉරේ මක්කළ්, ඉරේ නාටු" යන තේමාවත් සමඟ අපි යන්න අවශ්‍ය වෙනවා.

අපි ඔවුන්ට රාජ්‍ය සේවයේ රැකියා ලබා දීම ආරම්භ කළා. රාජ්‍ය සේවයේ රැකියා ලබා දීම තුළින් ඔවුන්ට මේ රටේ පුරවැසියන් හැටියට ගමන යන්න අවශ්‍ය පසුබිම සකස් කළා. දකුණු අප්‍රිකාවේ කළු ජාතිකයින් විඳින පීඩාව වතුකරයේ ජනතාව විඳිනවා කියන කථාව නිසා සමහරවිට උතුරුකරයේ මන්ත්‍රීවරුන් මේවා අළෙවි කරන්න සූදානම් වෙන්න පුළුවන්. නමුත්, අපි යම් යම් දේවල් කරන්න සූදානම් වෙනවා. මේ කාරණා සංකලනය කරමින් ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්නට මා මිත්‍ර මනෝ ගනේසන් රාජ්‍ය ඇමතිතුමා විශාල මහන්සියක් දරනවා. මම ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

සිංහල සහ දෙමළ කියන භාෂා දෙකම කථා කිරීමට හැකියාව ලබා ගන්නට ඕනෑ. ගරු මනෝ ගනේසන් රාජ්‍ය ඇමතිතුමනි, මම විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. ප්‍රජා සන්නිවේදන සහකාර තනතුර සඳහා 501 දෙනෙකු මගේ කාලයේදී බඳවා ගත්තා. වතුකරයේ ආදරණීය දරුවෙක් පොලීසියකට පැමිණිල්ලක් කරන්න ගියාම සිංහල භාෂාව දන්නේ නැහැ, අධ්‍යාපන කාර්යාලයට ගියාම සිංහල භාෂාව දන්නේ නැහැ. එම නිසා ඒ ආයතනවලට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සන්නිවේදන පහසුකම් සලස්වන්නන් -ප්‍රජා සන්නිවේදන සහකාරවරුන්- භාෂා පරිවර්තකයින් හැටියට ස්ථානගත කළා. ඔවුන් භාෂා පරිවර්තකයින් හැටියට පත් කළේ වතුකරයේ බොහොමයක් ආදරණීය ජනතාව සිංහල භාෂාව නොදන්නා නිසායි. දැන් හැම ආයතනයකම මේ කටයුත්ත ක්‍රියාත්මක වෙමින් යන නිසා පහසුකම් තිබෙනවා. අපි ඒ පහසුකම් සලස්වන්නට ඕනෑ. මම ඒ සඳහා 501 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කළා. 3,145ක් සඳහා ගුරු පත්වීම් ලබා දෙන්නට පුළුවන්කම ලැබුණා. මේ තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රය ඉහළට ගෙනෙන්න හැකි වුණා.

හැමදාම අපි කොළඹ ඉඳලා නුවරඑළිය දිස්ත්‍රික්කයට - තමුන්නාන්සේලාගේ ප්‍රදේශයට- ගියාම නුවරඑළියේ සුන්දර මල් නැද්ද, තේ නැද්ද කියා අහනවා. ඊළඟට අහන්නේ "වැඩට කවුරුහරි නැද්ද?" කියායි. මෙන්න මේ සංකල්පය බිඳින්න, නැති කරන්න තමයි අපි උත්සාහ ගත්තේ. එම නිසා අද ලයින් කාමරය කියන කථාව නැතුව නිවාසයක ඉන්න වතුකරයේ දරුවා වෛද්‍ය පීඨයට ගිහින් වෛද්‍යවරයෙක් හැටියට රෝහල්වල ස්ථානගත වෙලා සිටිනවා. ඒ වාගේම අද වතුකරයේ දරුවන්ට ඉංජිනේරු පීඨවල ඉගෙන ගන්න අවස්ථා සලසා දෙමින් කටයුතු කරගෙන යනවා. මෙන්න මේ අවස්ථා සලසා දෙනවා වාගේම ඔවුන්ගේ දෛනික වැටුප පිළිබඳවත් අපි කථා කළ යුතුයි. මෙන්න මේ අරගළයේදී වඩිවේල් සුරේෂ් මැතිතුමා, පලනි දිගම්බරම් ඇමතිතුමා ඇතුළු අපි සියලු දෙනාම ඔවුන්ට නිශ්චිත දෛනික වැටුපක් ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ගන්න ඕනෑ. එම වැඩ පිළිවෙළ සකස් කිරීම සඳහා ඔබට අපෙන් යම් උදව්වක් උපකාරයක් අවශ්‍ය නම් අපි ඒ සඳහා නිරන්තරයෙන්ම සූදානමින් සිටිනවා. කාලානුරූපව ඉස්සරහට යනවිට ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලබා දී තිබූ කාලය අවසානයි ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මට තව විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ තත්ත්වය අවබෝධ කරගෙන ප්‍රාදේශීය සභාවට, පළාත් පාලන අමාත්‍යාංශයට මුදල් ප්‍රතිපාදන ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න කියන කාරණය මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, ගරු පලනි දිගම්බරම් ඇමතිතුමනි.

මින්සාර වසති, ෆොට්ටු වසති, වේලෙ වසති එල්ලාම් කොටුක්ක වේණුම්. කොටුක්කාම ඉන්ත මාතිරි සෙය්තිට්ටුප් පෝනාල් young crowd ඉක්කු පිරච්සින වර ඉයලුම්.

අවසාන වශයෙන් මම ඔබතුමාට කියන්නට කැමැතියි, මේ නිවාස සෑදීම පිළිබඳව මාගේ ස්තුතිය පුද කරන බව. මම විශේෂයෙන්ම කියන්නට කැමැතියි තේ ආර්ථිකය රැක ගැනීම සඳහා ස්ථිරසාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියා. තේ ආර්ථිකයෙන් තමයි භාණ්ඩාගාරයට විශාල දායකත්වයක් ලබා දෙන්නේ. තේ කර්මාන්තය රැක ගැනීම සඳහා අපි වැඩ පිළිවෙළක් සකස් කර ගත යුතුයි කියන එක විශේෂයෙන් සඳහන් කළ යුතුයි. වතු සමාගම් තේ වතුවල තිබෙන වටිනා ගස් කපා විකුණලා සේවකයන්ගේ පඩි ගෙවන්නට කටයුතු කිරීම පිළිබඳවත්, තේ ගස් ගලවලා ඒ වතුවල එළවලු වගා කිරීම නිසා ඒ ප්‍රදේශවල පාංශු ඛාදනය සිදු වීම පිළිබඳවත් කෘෂිකර්ම අමාත්‍යාංශයත් සමඟ බද්ධ වෙලා වැඩ පිළිවෙළක් සකස් කරන්න කියන කාරණයත් මම විශේෂයෙන් සඳහන් කරනවා.

අද ජල පෝෂක ප්‍රදේශවල කෘෂි රසායන භාවිත කිරීමෙන් ජල උල්පත් දූෂණය වෙලා තිබෙන නිසා දරුවන්ට රෝගී තත්ත්වයන් ඇති වෙන්නට පුළුවන්. එම නිසා මේ පිළිබඳවත් විශේෂයෙන් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා මම ඉල්ලීමක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[பி.ப. 3.28]

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனது நண்பரான கௌரவ அமைச்சர் திகாம்பரம் அவர்களினால் முன்மொழியப்பட்டுள்ள பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபைச் சட்டமூலம் தொடர்பாகவும், அந்த அதிகாரசபையிலே இருக்கின்ற விடயங்களை நிறைவேற்றுவதிலே பிரதேச சபைகளினூடாக ஏற்படக்கூடிய தடைகளை நிவர்த்திப்பதற்காகவும் கொண்டு வரப்படுகின்ற பிரதேச சபைகள் (திருத்தம்) சட்டமூலம் தொடர்பாகவும் இன்று நடக்கின்ற இந்த விவாதத்திலே கலந்து கொண்டு சுருக்கமாக ஒருசில கருத்துக்களைப் பகிர்ந்துகொள்ள விரும்புகின்றேன். உண்மையிலேயே பெருந்தோட்டப் பகுதி மக்களுடைய வாழ்வாதாரப் பிரச்சினைகளிலும்

[ගරු රවුල් හකීම් මහතා]

உட்கட்டமைப்பு மேம்பாட்டு வசதிகளிலும் ஏற்படுகின்ற மிகமோசமான பாதிப்புக்கள் குறித்துக் கவனஞ்செலுத்துகின்றபோது, அவற்றை இயலச் செய்வதிலேயிருக்கின்ற தடைகளை நீக்குவதற்கு இவ்வாறான ஓர் அதிகாரசபையின் அவசியம் மிக முக்கியமானது என்பதை அமைச்சர் அவர்கள் உணர்ந்து, புரட்சிகரமான ஒரு திட்டத்தை முன்வைத்திருக்கின்றார். இந்த நாட்டிலே தோட்டப்புறப் பகுதிகளிலே வாழ்கின்ற இந்திய வம்சாவளி மக்கள் காலங்காலமாக அனுபவித்து வருகின்ற இன்னல்களிலிருந்து வருங்காலத்திலே அவர்களை விடுவிப்பதற்காக எடுக்கப்படுகின்ற இந்த நடவடிக்கையை நாங்கள் வரவேற்கின்றோம்.

உண்மையிலேயே 1948ஆம் ஆண்டு எங்களுடைய நாட்டுக்குச் சுதந்திரம் கிடைத்த உடனேயே இந்திய வம்சாவளி மக்களுடைய குடியுரிமை பறிக்கப்பட்டது மிகவும் கவலைக்குரிய விஷயமாகும். அந்த வகையில் மிகவும் கறைபடிந்த ஒரு வரலாற்றைக் கொண்ட இந்த நாட்டிலே அந்த மக்களுக்கு மீண்டும் அந்தக் குடியுரிமை முழுமையாகக் கிடைத்திருந்தபோதிலும்கூட அவர்களுடைய வாழ்வியலிலே சிறந்த மாற்றங்கள் செய்யப்படவில்லை. அரசாங்கம் செய்கின்ற எந்த நன்மையை எடுத்தாலும் அது அந்த மக்களின் கீழ் மட்டத்துக்குச் சென்றடையாத ஒரு நிலவரத்தையே நாங்கள் அந்த மக்கள் வாழ்கின்ற பல இடங்களிலே பார்க்கின்றோம். அதாவது கல்வி மற்றும் சுகாதார ஏற்பாடுகளிலே அவர்களுக்கு ஏற்பட்ட பின்னடைவை இல்லாமலாக்குவதற்குப் படிப்படியாக மாற்று நடவடிக்கைகள் எடுக்கப்பட்டு வந்தாலும், முழுமையாக அவர்களை முன்னேற்றுவதிலே இருந்த பல தடைகளை அடிக்கடி மலையகப் பகுதித் தலைமைகள் சுட்டிக்காட்டி அவற்றுக்கான நிவாரணங்களைப் பெற்றுக் கொடுப்பதிலே பல முயற்சிகளை மேற்கொண்டிருந்தாலும், குறிப்பாக உட்கட்டமைப்பு ஏற்பாடுகளை அந்த மக்களுக்குச் சரிவரக் கொண்டு சேர்ப்பதிலே பலவிதமான தடைகளைச் சந்திக்க வேண்டி ஏற்பட்டிருந்தது. இதன் விளைவாகத்தான் இன்று இந்த அதிகாரசபை தோற்றுவிக்கப்பட்டுள்ளது. பாராளுமன்றத்தின் நிதியொதுக்கீட்டினூடாக எந்தத் தங்குதடையும் இல்லாமல் நேரடியாக நிதியைப் பெற்றுத் தோட்டப் புறங்களிலே உட்கட்டமைப்பு ஏற்பாடுகளைச் செய்வதற்கான ஓர் ஆரம்ப முயற்சியாக இந்த அதிகாரசபையின் உருவாக்கம் இருக்கிறது என்பதையும் நாங்கள் இங்கு சொல்லியாக வேண்டும்.

மலையகத் தலைமைகள் மலையக மக்களின் அபிவிருத்திக்கு என்று உருவாக்கிய எந்த அமைப்புக்களும் அதனுடைய இலக்குகளைப் போதியளவு அடையவில்லை என்கின்ற ஒரு துர்ப்பாக்கிய நிலைக்கு மத்தியிலேதான் இந்த முயற்சியிலே அமைச்சர் அவர்கள் ஈடுபட்டிருக்கிறார் என்று நான் நினைக்கின்றேன். அந்த அடிப்படையில், அமைச்சருடைய அந்த முயற்சியை நாங்கள் பாராட்டுகின்றோம். அதேநேரம், என்னுடைய அமைச்சினூடாக குறிப்பாக, குடிநீர் வசதிகளை ஏற்படுத்திக் கொடுக்கின்ற விவகாரத்திலும் நாங்கள் பாரிய யுக மாற்றமொன்றை மலையகப் பிரதேசங்களிலே செய்து வருகின்றோம். அதாவது நுவரெலியா மாவட்டத்திலேயிருக்கின்ற மலையக மக்கள் வாழுகின்ற கிராமங்களுக்கு குழாய்மூலம் குடிநீரைப் பெறுவதற்கான வசதிகளைச் செய்து வருகின்றோம். அதேநேரம் அவர்களுக்குச் சுத்தமான குடிநீரைப் பெற்றுக் கொள்வதற்கான ஏற்பாடுகளைச் செய்வதற்கென்று உலக வங்கியின் நிதியொதுக்கீடுகளோடு நாங்கள் ஒரு செயற்றிட்டத்தை ஆரம்பித்திருக்கின்றோம். இந்தத் திட்டத்தைப் படிப்படியாக நிறைவேற்றுகின்றபோது, எவ்வாறு மலையகப் பகுதிகளுக்கு வெளியிலே இருக்கின்ற நகர்ப்புறப் பிரதேசங்களுக்கு குழாய்மூலம் குடிநீர் கிடைக்கிறதோ அதேபோல, மலையகப் பிரதேசங்களில் அமைக்கப்பட்டு வருகின்ற இந்தப் புதிய கிராமங்களுக்கும் சுத்தமான குடிநீரை நிரந்தரமாக வழங்குவதற்கும் இந்த உலக வங்கிச் செயற்றிட்டத்தில் இவ்வாறான கிராமங்களை உள்ளடக்கி அதற்கான ஏற்பாடுகளையும் நாங்கள் செய்து வருகின்றோம். அதேநேரம் இதற்கான ஒத்துழைப்பைத் தருகின்ற விவகாரத்திலே ஒருசில அரச நிறுவனங்களின் உதவி எங்களுக்கு நிச்சயமாகத் தேவைப்படுகின்றது. குறிப்பாக, நீர்ப்பாசனத் திணைக்களத்தினூடாகத் தேவையான இடங்களில் நீர்மூலங்களைப் பெற்றுக் குடிநீர் வசதிகளைப் பெற்றுக்கொடுப்பதற்கான உதவிகள் தேவைப்படுகின்றன.

இன்று தோட்டப்புறப் பாடசாலைகளிலே நிலவுகின்ற மிக மோசமான ஆசிரியர் பற்றாக்குறையைத் தீர்ப்பதற்கான நடவடிக்கை எடுக்கப்பட்டபோதிலும்கூட, பல இடங்களிலே பிரச்சினைகள் இன்னும் முழுமையாகத் தீர்க்கப்படாத நிலவரங்களை நாங்கள் காண்கிறோம். அடிக்கடி பல இடங்களில் தோட்டப்புறப் பாடசாலைகள் மூடப்பட வேண்டிய துர்ப்பாக்கிய நிலைக்குத் தள்ளப்படுகின்ற அளவுக்கு அங்கு ஆசிரியர் பற்றாக்குறை என்கின்ற பிரச்சினை மிகப் பூதாகரமான பிரச்சினையாக உருவெடுத்திருக்கின்றது. இந்த நிலையில், அதற்கென்று என்ன நடவடிக்கைகளை எடுத்தாலும், ஏனைய பிரதேசங்களில் இருக்கிற பாடசாலைகளிலுள்ள குறைபாடுகளைப்போல அந்தப் பிரதேசங்களில் இருக்கின்ற பாடசாலைகளிலுள்ள குறைபாடுகளும் இன்னும் முழுமையாகத் தீர்க்கப்படாத சூழ்நிலையே காணப்படுகின்றது.

உயர் கல்வி நிறுவனங்களுக்கு மாணவர்களை உள்வாங்குகின்ற விடயத்தில், வெட்டுப் புள்ளிகளைக் குறைத்து, தோட்டப்புற மாணவர்கள் உள்நுழைவதற்கான ஏற்பாடுகளைச் செய்து கொடுக்க வேண்டும் என்பது குறித்தும் நாங்கள் கவனம் செலுத்தவேண்டும். அதாவது இன்று வெறுமனே பல்கலைக்கழக நுழைவுக்கு மாத்திரம் உருவாக்கப்பட்டிருக்கின்ற district quota system மூலம் பின்தங்கிய தோட்டப்புற பாடசாலை மாணவர்களுக்குச் சற்று நன்மைகள் கிடைத்தாலும்கூட, இதைவிடவும் கூடுதலான எண்ணிக்கையில் இருக்கிற ஏனைய உயர் கல்வி நிறுவனங்களிலும் இந்த வெட்டுப்புள்ளி என்ற விவகாரத்திலே சில வித்தியாசமான நடவடிக்கைகளை மேற்கொள்வதன்மூலம் அப்பாடசாலை மாணவர்களின் உள்நுழைவு சம்பந்தமான விடயங்களிலே இருக்கிற இயலாமை சரிசெய்யப்பட வேண்டும். அதேபோல, SLOS என்கின்ற இலங்கை வெளிநாட்டுச் சேவையிலும் தோட்டப்புற இளைஞர்கள் சரிவர உள்வாங்கப்பட வேண்டும். அவ்வாறே, இந்த நாட்டின் நீதித்துறையிலும் சரியான அடிப்படையில் வாய்ப்புக்கள் பெற்றுக் கொடுக்கப்பட வேண்டும். அதாவது, பல துறைகளிலும் பின்தங்கிய நிலையிலே இருக்கின்ற மலையக மக்களுக்கு உரிய quota வசதிகளைப் பெற்றுக்கொடுப் பதற்கான ஏற்பாடுகள் செய்யப்பட வேண்டும்.

இடம்பெயர்ந்த மக்கள் தமிழர்களாக இருக்கலாம், முஸ்லிம்களாக இருக்கலாம். அவர்களுக்கும் இதேவிதமான பிரச்சனைகள் பல இடங்களிலும் இருந்துகொண்டிருக்கின்றன. எனவே, பல்கலைக்கழகம் மற்றும் உயர் கல்வி நிறுவனங்களுக்கான நுழைவு விடயத்திலே அவர்களுக்கு இருக்கின்ற குறைபாடுகளைக் களைவதற்கான விசேட ஏற்பாடுகள் செய்து கொடுக்கப்பட வேண்டும். இந்தியாவிலே இருக்கின்ற இடம்பெயர்ந்த தமிழர்கள் இலங்கைக்கு மீண்டும் வருகின்றபொழுது, அவர்களுடைய இயல்பு வாழ்க்கையைச்

சரிவர அமைத்துக் கொள்வதற்கு நீண்ட காலம் எடுக்கும். இன்று இந்தியாவிலே கல்வி கற்ற அகதிகள் இங்கு வந்து குடியேறுவதற்கோ தொழில்களில் ஈடுபடுவதற்கோ தயக்கம் காட்டுகின்ற நிலவரம் காணப்படுவதற்குக் காரணம் இருக்கின்றது. அதாவது இங்கு உயர் கல்வி ஏற்பாடுகளிலும் வேலைவாய்ப்புக்களிலும் நியாயமான இடங்களைப் பெற்றுக்கொள்வதில் அவர்களுக்கு இருக்கிற சிரமங்களை அடிப்படையாக வைத்துத்தான் அவர்கள் இவ்வாறு தயக்கம் காட்டுகின்றார்கள். அந்த வகையில், இலங்கையில் அவர்களுடைய இயல்பு வாழ்க்கை சாத்தியமில்லாத விடயங்களாக மாறிக் கொண்டு வருகின்றன என்பதையும் நாங்கள் கவனத்தில் கொள்ள வேண்டும். இருந்தபோதிலும் இந்த சட்டமூலங்களின்மூலம், மலையக மக்களுக்கு மத்தியில் இயல்பு வாழ்க்கை ஏற்படுவதுடன் அவர்களுடைய பிரதேசங்களிலே உட்கட்டுமான ஏற்பாடுகளிலே இருக்கின்ற தடைகள் விரைவாக நீங்கும் என்ற நம்பிக்கையோடு உங்கள் மத்தியிலிருந்து விடைபெற்றுக் கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
*ස්තුතියි, ගරු ඇමතිතුමනි.*

*මීළඟට, ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.*

[பி.ப. 3.36]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்குகின்ற உறுப்பினர் அவர்களே, நன்றி. இன்று இங்கு முன்வைக்கப்பட்டுள்ள சட்டமூலங்களானது பெருந்தோட்ட மக்களுக்கு மிகவும் பயனுள்ளவையாகும். பெருந்தோட்ட மக்களைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற அமைச்சர்கள் இங்கிருக்கின்றார்கள். குறிப்பாக, கௌரவ மனோ அண்ணன் இருக்கின்றார்; கௌரவ திகாம்பரம் அவர்கள் இருக்கின்றார். அதேபோன்று, எனது நண்பர்களான பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கின்றார்கள். சம்பந்தப்பட்ட அமைச்சர்கள் தங்களுடைய அமைச்சு ரீதியாகவோ அல்லது வேறு அமைச்சுக்கள் மூலமாகவே தங்களுடைய பிரதேங்களுக்கு அபிவிருத்தியைக் கொண்டு போகின்றபோதிலும், அங்கு தனியார் கம்பனிகள் நிர்வாகம் இருக்கின்ற காரணத்தினால், குறித்த அமைச்சர்கள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்கள் தங்களுடைய மக்களுக்கு நேரடியாகச் சேவை செய்ய முடியாத ஒரு சூழ்நிலை காணப்படுகின்றது. அதை நிவர்த்தி செய்வதற்காக கௌரவ அமைச்சர் திகாம்பரம் அவர்கள் இன்று பாராளுமன்றத்தில் இந்தப் பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபைச் சட்டமூலத்தை முன்மொழிந்திருக்கிறார். உண்மையில், இது வரவேற்கத்தக்க விடயமாகும்.

மலையகக் கிராமங்களின் அபிவிருத்தி வேலைகளைப் பிரதேச சபைகளூடாகச் செய்ய வேண்டுமென்ற இதுபோன்ற விடயமொன்றைச் சில காலங்களுக்கு முன்பு எனது நண்பரும் பாராளுமன்ற உறுப்பினருமான திலகராஜா அவர்கள் முன்மொழிந்திருந்தார். அதேநேரம் இந்த இரண்டு சட்டமூலங்களும் எதிர்காலத்தில் மலையக மக்களுக்கு நல்லதொரு வாய்ப்பாக அமையப் போகின்றது. அங்கு நல்ல முறையில் அபிவிருத்தியை மேற்கொண்டு அவர்களுக்குக் கௌரவமான வாழ்க்கையை அமைத்துக் கொடுக்கக்கூடிய வகையில் குறித்த சட்டமூலங்கள் அமைந்திருக்கின்றன. அந்த வகையில், இந்தச் சட்டமூலங்களைத் தமிழ்த் தேசியக் கூட்டமைப்பு வரவேற்கிறது. ஆனால், இந்தச் சட்டமூலங்கள் எப்போதோ நிறைவேறியிருக்க வேண்டும். இருந்தபோதிலும் இப்போதாவது இந்த விடயங்கள் சம்பந்தப்பட்ட அமைச்சர்கள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களுடைய முயற்சியால் நடைமுறைக்கு வரவிருப்பது குறிப்பிடத்தக்கது.

மேலும், அந்த மக்களுடைய சம்பள விடயமானது நீண்ட காலமாகவே கேள்விக்குறியான விடயமாகப் பார்க்கப்படுகின்றது. பல பேச்சுவார்த்தைகள் நடைபெற்றும்கூட அந்த மக்கள் ஏற்றுக்கொள்ளக்ககூடிய வகையில் முன்னேற்றகரமாக அவை அமையவில்லை. தற்பொழுது எங்களுடைய பாராளுமன்ற உறுப்பினர்கள் அந்த விடயத்தில் முன்னேற்றத்தை ஏற்படுத்துவதற்கு முயற்சி செய்து கொண்டிருக்கிறார்கள் என்று நான் நினைக்கிறேன். தற்பொழுது ஐந்நூறு ரூபாயாக இருக்கின்ற இந்த அடிப்படைச் சம்பளத்தை ஆகக்குறைந்தது 800 ரூபாயாகவாவது உயர்த்துவற்கு அவர்கள் முயற்சி செய்கின்றார்கள். அவர்களுடைய முயற்சி வெற்றியளிக்க வேண்டும். அந்த மக்களுக்கு வழங்கப்பட்டுக் கொண்டிருக்கின்ற காணி, வீடுகள் அங்கிருக்கின்ற எல்லா மக்களுக்கும் கிடைக்கக்கூடிய வகையில் அரசாங்கம் குறித்த முன்மொழிவுகளை நடைமுறைப்படுத்த வேண்டுமென்று நான் இந்த சபையில் கேட்டுக் கொள்கின்றேன்.

இன்று அங்குள்ள மாணவர்கள் தங்களுடைய படிப்பை முடித்துவிட்டு, அரச நிறுவனங்களாக இருந்தாலும் சரி, தனியார் நிறுவனங்களாக இருந்தாலும் சரி, வேறு மாவட்டங்களில் வந்து பணிபுரிய வேண்டிய ஒரு சூழ்நிலை இருக்கின்றது. எனவே, இந்த அதிகாரசபையினூடாகக் கௌரவ அமைச்சர்கள் அந்தப் பிரதேசத்திலுள்ள கல்வி கற்ற இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்பை வழங்கக்கூடிய திணைக்களங்களை உருவாக்க வேண்டும். அதேநேரம் அந்தப் பிரதேசத்திலிருக்கின்ற மக்களுக்கு நன்மை பயக்கக்கூடிய வகையில் இந்த அதிகாரசபை செயற்பட வேண்டும். அதற்குத் தற்போது அமைச்சர்களாக இருக்கின்றவர்கள் முழு முயற்சி எடுப்பார்களென்று நான் நம்புகின்றேன். அவர்களுடைய முயற்சியால்தான் இன்று இந்தச் சட்டமூலம் பாராளுமன்றத்திற்கு வந்திருக்கின்றது.

මේ අවස්ථාවේදී තවත් වැදගත් කරුණක් මම මතක් කරනවා. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලබා දුන් උදාරතර පොරොන්දුවක් අනුව කටයුතු කරමින්, මේ රටේ ජීවත් වන සෑම දමිළ සහෝදරයෙකු වෙනුවෙන්ම මෙච්චර කල් නොදීපු; මෙච්චර කල් ඔවුන්ට අහිමි වුණු අයිතිය වෙනුවෙන් මේ පර්වස් හතක ඉඩම් කැබැල්ලක් පමණක් නොවෙයි, ලැයිම් කාමර සංස්කෘතියෙන් එහාට ගිහිල්ලා ඒ හැම කෙනෙකුටම තනි නිවසක පදිංචි වන්න අවස්ථාව අපි ලබා දෙනවා. එම නිසා අද මේ දේවල් විපක්ෂයේ සමහරුන්ට බලාගෙන ඉන්න බැහැ. අද දමිළ ජනතාව අතර ජාතිවාදයක් ඇති කරලා තිබෙනවා; මුස්ලිම් ජනතාව අතර ජාතිවාදයක් නිර්මාණය කරලා තිබෙනවා. මේ ඇතිවන විපර්යාසය තුළින් තමන්ට ඇතිවන අවාසිය වහගන්න විපක්ෂයේ සමහර අය උත්සාහ කරනවා. මේවා දැන් ටික ටික එළියට එනවා. මේ අයට දැන් දෙමළ ජනතාවගේ ඡන්ද ගන්න, මුස්ලිම් ජනතාවගේ ඡන්ද ගන්න තියා තමන්ගේ ළඟ සිටින මිනිසුන් ටිකවත් රැක ගන්න බැහැ. දැන් මේ කණ්ඩායම හතරකට පහකට කැඩිලා සිටින වෙලාවේ විකාරයෙන් කෑ ගහන ඒවා අපට අදාළ වන්නේ නැහැ. එම නිසා අපි දිගම්බරම් අමාත්‍යතුමාට කියනවා, මේ රටේ දමිළ ජනතාව වෙනුවෙන් සහන සලසන්න කියා.

තමන් වෙනුවෙන් දෙමළ ජනතාව කඩේ අරගෙන යන්න කටයුතු කරපු නායකයෝ තමයි පසුගිය කාලයේ බිහි වුණේ. සැබෑවට ඒ මිනිසුන් ආරක්ෂා කර ගන්න පුළුවන් නායකයෝ ඒ යුගයේ මේ රටේ හිටියේ නැහැ. ඔවුන්ට ඕනෑ වෙලා තිබුණේ union එකක් හදා ගෙන, "මේ ඉන්නේ මගේ union එකේ ඉන්න දෙමළ ජනතාව" කියලා පොඩි සද්දයක් දාලා ආණ්ඩුවකට සෙට් වෙලා වාසියක් ගන්නයි. එතැනින් එහාට ගිහිල්ලා ඒ ජනතාවගේ සැබෑ අයිතිය වෙනුවෙන් හඬක් නඟා ඔවුන්ටත් මේ රටේ අයිතියක් තිබෙනවාය කියන එක, මේ රටේ ජන කොට්ඨාසයක් විධියට සිංහල හා මුස්ලිම් ජනතාවට තිබෙන ඒ සැබෑ අයිතිය ඔවුන්ටත් තිබෙනවාය කියන එක අද පෙන්නුම් කරලා තිබෙනවා. එහෙම නැතිව දමිළ ජනතාව කියන්නේ වත්තේ වැඩ කරන්න ඉන්න මිනිසුන් නොවෙයි. ඒ සම්බන්ධයෙන් මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා.

ගරු ඇමතිතුමනි, මේ වතු සමාගම් තව වැඩක් කරනවා. දෙමව්පියන් වත්තේ වැඩ කළා නම්, ඒ පවුලේ දරුවකු හොඳින් ඉගෙන ගෙන ඒ දරුවා වත්තේ වැඩ කරන්නේ නැත්නම්, එම පවුල වත්තෙන් එළියට දමන්න සමහර වතු සමාගම් කටයුතු කරනවා. එහෙම සංස්කෘතියක් මේ රටේ තිබෙන්න බැහැ. අම්මා තාත්තා වත්තේ වැඩ කළ පළියට, ඒ පවුලේ දරුවන් වත්තේ වැඩ කරන්නේ නැහැයි කියලා වතු ඉඩමක පදිංචි වෙලා සිටින ඒ පවුල වත්තෙන් එළියට දමන වතු සමාගම් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා සොයා බලන්න. මොකද, ඒ මිනිසුන්ට වෙන විකල්පයක් නැහැ. ඔවුන්ගේ දරුවන් ඉගෙන ගෙන තිබෙනවා නම්, වෙන රැකියාවකට යන්න ඕනෑ. යම් කිසි දරුවෙකු විශ්වවිද්‍යාලයකට ගිහිල්ලා අධ්‍යාපනය ලබා තිබෙනවා නම්, මේ රටේ අනික් දරුවන්ට තිබෙන අවස්ථාව ඒ දරුවාටත් තිබෙන්න ඕනෑ. හැබැයි, අද ඒ අවස්ථාව ඔවුන්ට නැහැ. අම්මා තාත්තා වත්තේ වැඩ කළා, ඒ පවුලේ ළමයින් හෝ තවත් සාමාජිකයෙක් වත්තේ වැඩ කරන්නේ නැත්නම් ඒ පවුල වත්තෙන් එළියට දමන්න වතුහිමියන් කටයුතු කරනවා. ඒක අපට දිනපතා එන චෝදනාවක්; දිනපතාම වාගේ ඒ ජනතාව අපට මතක් කර දෙන දෙයක්. එම නිසා දමිළ නායකයෝ විධියට ඔබතුමන්ලා මේ වෙනුවෙන් නැඟී සිටින්න ඕනෑය කියන එක මම මතක් කරනවා. මේ රටේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන් කටයුතු කරන මේ පොදු නීතිය හැම කෙනෙකුටම සමාන වන විධියට සංශෝධනය කරන්න කටයුතු කිරීම තුළින් මේ රජය ඉතාමත්ම වැදගත් කාර්යයක් ඉටු කරනවා කියලා අපි විශ්වාස කරනවා.

දමිළ ජනතාව වෙනුවෙන් වෙන්න පුළුවන්; මුස්ලිම් ජනතාව වෙනුවෙන් වෙන්න පුළුවන්; සිංහල ජනතාව වෙනුවෙන් වෙන්න

පුළුවන්; තව මාස දෙක තුනක් යනකොට මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු යහ පාලනයේ සැබෑ අර්ථය ඉටු කරන්න පුළුවන් ආකාරයට මේ රජය කටයුතු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් මේ කරුණ කියනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ගෙන යන මේ වැඩසටහන පිටුපසට අදින්න සද්ද දමන බොරු මාධ්‍ය සන්දර්ශනවලට රැවටෙන්නේ නැතිව ශක්තිමත්ව, කෙළින් හින්දු අරගෙන ඒ අවශ්‍ය ගමන යන්න ඔබතුමන්ට හැකියාව ලැබේවා! කියා මා ප්‍රාර්ථනය කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
දැන් අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

පළාත් සභා, පළාත් පාලන ඇමතිතුමනි, මේ ඇවිල්ලා තිබෙන ගම්පෙරළිය වැඩසටහනේ මුදල් ටික ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්ට හා මන්ත්‍රීවරුන්ට අවශ්‍ය යෝජනාවලට යොදවන්න දෙන්නේ නැත්නම් මෙවා කරන්න දෙන්නේ නැහැයි කියලා මේ දවස්වල ලොකු කථාවක් යනවා. අපිත් ප්‍රාදේශීය සභාවල සිටියා තමයි. ප්‍රාදේශීය සභාවල පාරක් මට හදන්න බැරි නම්, ඔබතුමන්ලාට හදන්න බැරි නම්, මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවෙන් හෝ කොහෙන් හෝ එන මුදල් ටිකෙනුත් ඒවා හදන්න නොදී මහ හරින්න ලෑස්ති වෙනවා නම් අපි ඒක බලාගන්නම්.

අපිත් ලැහැස්ති වෙලා ඉන්නේ. මේ රටේ ජනතාවට වැඩ කරන්නට දෙන අයිතිය කවුරු හෝ අහුරන්න ලැහැස්ති වෙනවා නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට අපිත් ඒ වෙනුවෙන් ගන්නට පුළුවන් ඕනෑම ක්‍රියාමාර්ගයක් ගන්න සූදානම්ය කියන එකත් ඔය මහත්වරුන්ට මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා.6.37]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඓතිහාසික වැඩ පිළිවෙළක්, අපේ වතුකරයේ දමිළ ජනතාවගේ සිහිනයක්, ඒ වාගේම "සංහිඳියාව" කියන වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම සමාජයට රටට ප්‍රායෝගික කරන වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්නට කටයුතු කළ තරුණ අමාත්‍යවරයෙකුට ප්‍රශංසා කරන්න, එතුමාගේ ක්‍රියාව අගය කරන්න අවස්ථාව සැලසීම පිළිබඳව ඉහළ ඌව නියෝජනය කරමින්, ඒ වාගේම දමිළ, සිංහල, මුස්ලිම් ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට සම්බන්ධ වුණු මන්ත්‍රීවරයෙක් හැටියට මා ඔබතුමාට පළමුවෙන්ම ස්තුතිය ප්‍රකාශ කරනවා.

ගරු පලනි දිගම්බරම් අමාත්‍යතුමනි, ඔබතුමා හදවතින්ම මේ ජනතාවගේ දුක දකින නායකයෙක්. සමහරු චේවිටිය ඇන්දාට, පොට්ටුව තිබ්බාට, සුම්බරය බැන්දාට ඒ ජනතාව වෙනුවෙන් පෙනී නොසිටින ජනතා නායකයෝ. සමහර කණ්ඩායම් අද මෙතැන ඇවිත් ඒ ජනතාවගේ හදවතට කථා කරන විලාශයක් පෙන්නුවා අපි දැක්කා. හැබැයි, ඔවුන් හදවතින්ම ඒ කී කාරණා කියන බවක් මේ පාර්ලිමේන්තුව තුළ, මේ සමාජය තුළ පෙන්නුවත් ඔවුන්ගෙන් ඒ කාරණා මහ හැරුණු බව අද ඔවුන් අමතක කරමින් කටයුතු කළා.

ගරු ඇමතිතුමනි, අපි ජනතා නියෝජිතයෝ හැටියට අපේ ප්‍රදේශයේ දේශපාලන කටයුතු කරනකොට, අපි ජනතාව අතරට යනකොට ඔවුන් කළ ඉල්ලීම්, අපට කළ යෝජනා අපි ඔවුන්ට ලබා දෙනවාය කියන පොරොන්දුව මතයි අපි පාර්ලිමේන්තුවට ආවේ. විශේෂයෙන් ගරු වඩිවේල් සුරේෂ්, ගරු අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමන්ලා දන්නවා ඇති, ඒ පොරොන්දු, පොරොන්දු හැටියට තියන්නේ නැතිව ඒවා සමාජයේ යථාර්ථයක් බවට පරිවර්තනය කිරීමේ ගෞරවය ඔබතුමා අපට ලබා දුන් බව. ඔබතුමා නැත්නම් මේ කටයුත්ත සිද්ධ වෙන්නේ නැහැ. ඉතිහාසය ගත්තොත් බොහෝ දේශපාලන නායකයෝ නිර්මාණය වුණාට වතුකරයේ ජනතාවගේ හදවතට කථා කරන, ඔවුන්ගේ දුක හඳුනන, ඔවුන්ගේ සැබෑ අවශ්‍යතාවය ඉෂ්ට කරන නායකයෙක් හැටියට කටයුතු කළේ ඔබතුමායි. ඒ නිසා අපි දුන් පොරොන්දු ඉෂ්ට සිද්ධ කරන්නට පුළුවන්, ඒවා සඵල වෙච්ච අවස්ථාවක් සැලසීම පිළිබඳව ඔබතුමාට මගේ ගෞරවය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා ගරු ඇමතිතුමනි. මේ වැඩ පිළිවෙළ තුළ ක්‍රියාත්මක වීමේදී මේ අධිකාරිය තුළ රජයක් හැටියට ප්‍රතිපාදන වෙන් කර, භය නැතිව ඒ අදාළ ජනතාවට අවශ්‍ය කරන තැනට, අවශ්‍ය කරන දෙය, අවශ්‍ය වෙලාවට ලබා දීමේ හැකියාවයි ඔබතුමා මේ නිර්මාණය කරන්නේ. මේ සඳහා විශාල බාධාවන් තිබුණා. සමහර වෙලාවට රජයක් හැටියට යෝජනා කර, සම්මත කර එන ඒ ප්‍රතිපාදන අපේ රටේ දැවැන්ත කාර්ය භාරයක් ඉටු කරන ඒ ජනතාව වෙනුවෙන් ලබා දෙන්න වතු අධිකාරිවරු ක්‍රියා කරන්නේ නැහැ. සුදු අධිරාජ්‍යවාදීන්ගේ යටත් විජිතයක් හැටියට අපි හිටියා. අපට නිදහස ලැබුණා. නමුත් අදටත් සමාජය තුළ සමහර තැන්වල නිර්මාණය වෙලා තිබෙන්නේ එවන් වූ යටත් විජිත ස්වරූපයක්. එයින් ජනතාව මුදා ගන්නට ඔබතුමා කටයුතු කළා. ඔබතුමා නිසා ඉතිහාසගත වන වැඩ පිළිවෙළක් නිර්මාණය වෙන්නේ. එම නිසා මම හිතනවා, දමිළ ජනතාවගේ හදවත තුළ ලියවිය යුත්තේ වෙන දේශපාලන නායකත්වයක් නොවේය කියන කාරණය. මොකද, ඔබතුමායි මේ කටයුත්ත කරන්නේ. සමහරු චෝදනා කරනවා," මුදල් නැහැ. මුදල් දෙන්නේ නැහැ" කියා. ඒ අයට මම යෝජනා කරනවා, මේ කරන උතුම් වූ වැඩ පිළිවෙළ වෙනුවෙන් අපට ලැබෙන පාර්ලිමේන්තු මුදලක් තිබෙනවා නම් මේ සඳහා යොදවන්නට කටයුතු කරන්නටය කියා. මගේ අත් දෙකම මම ඒ සඳහා ඔසවනවා. ඒ කියන අය මේ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ යෝජනා කරන්නේත් නැහැ. මෙහි ඇති අකාර්යක්ෂමභාවය, මෙයින් වැඩක් වෙන්නේ නැහැ කියන කාරණය කියා, ඔවුන් සමාජයට පෙන්වා දෙන්නට යන්නේ මොකක්ද? ඔවුන්ගේ අකාර්යක්ෂමභාවයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා හදපු මේ වැඩ පිළිවෙළ ඉතාම සාර්ථක වැඩ පිළිවෙළක්. එම නිසා ඔබතුමා හදපු මේ පුංචි වැඩ පිළිවෙළ තුළ කුඩු හදනකොට ඒ කුඩු තුළ වෙන වෙන කට්ටිය බිත්තර දාන්න එයි. හැබැයි අපි ඉතා වගකීමෙන් කියනවා, ඔබතුමා තමයි මේ ඉතිහාසගත වැඩ පිළිවෙළ නිර්මාණය කළේ කියන එක. අපි එය මතක් කරන්නේ විශේෂයෙන් වතුකරයේ ජනතාව-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. අපේ පළාත් සභා, පළාත් පාලන ගරු ඇමතිතුමා සිටින නිසා මේ අවස්ථාවේදී මම මේ කාරණය කියන්න ඕනෑ. හිටපු පළාත් පාලන නියෝජිතයෙක් හැටියට මම මතක් කරනවා, සම්මත අතුරු ව්‍යවස්ථාව තුළයි මේ පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වෙන්නේ කියන කාරණය. මේවා යල්පැන ගිය අතුරු ව්‍යවස්ථා. සියලුම අය කිරීම් නීති විරෝධී විධියටයි පළාත් පාලන ආයතන අය කර ගන්නේ. නමුත් කරන්නට දෙයක් නැහැ. පුංචි ආණ්ඩුවක්. පුංචි ආදායමක් තිබෙන පළාත් පාලන ආයතනයක සම්මත අතුරු ව්‍යවස්ථාවලින් ඔබ්බට යන්න ඕනෑ. මේවා සමහර පළාත් පාලන ආයතන පිළිගෙන නැහැ. නොපිළිගත් අතුරු ව්‍යවස්ථාවක් තුළ ක්‍රියාත්මක වීම නීත්‍යානුකූල වෙන්නේ නැහැ ගරු අමාත්‍යතුමනි. ඒ නිසා සමහර වෙලාවට පළාත් පාලන ආයතන නියෝජිතයින් යම් අකරතැබ්බයන්ට මුහුණ දෙනවා. ඒවායින් ඔවුන් මුදා ගැනීම සඳහා අලුත් පනත් කෙටුම්පතක් ගෙනැවිත් අලුත් අතුරු ව්‍යවස්ථා සම්මත කරන වැඩ පිළිවෙළක් නිර්මාණය කර දෙන්න. එවිට මේ පළාත් පාලන අයතන සක්‍රීය කර, පුංචි ආණ්ඩුවේ භාණ්ඩාගාරය ශක්තිමත් කර, පුංචි ආණ්ඩුව තුළ ඒ කටයුතු ශක්තිමත්ව කර ගෙන යන්නට පුළුවන්. මොකද, අපි ඒ පුංචි ආණ්ඩුව නියෝජනය කර තමයි මේ පාර්ලිමේන්තුවට ආවේ. මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමන්ට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ස්තුතියි.

[6.42p.m.]

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)

Hon. Presiding Member, I take pride in bringing these Amendments to the Pradeshiya Sabhas (Amendment) Bill. As you know, the workers in the estate sector of this country are underprivileged. I started my politics from a Party representing the plantation sector. So, I realize the difficulties they have.

When we talk about equality, if you look at health, education, sanitation and housing, you would see that we have a lot to do to the plantation sector. Their contribution towards the national economy should be appreciated. Continuously, the governments have tried to improve their lives, but if you look at the condition of the line room, you would see that it is appalling. Basically, we need to give the opportunity to the plantation worker to live with dignity. So, I believe that these Amendments will help them to live with dignity.

As you know, the local government bodies - Pradeshiya Sabhas - have tried to develop the road network and various infrastructure facilities within the plantation sector. In doing so, as common areas do not come under local governments, some chairmen of those institutions have been sent home for violating the law.

So, Sir, I see this as a very progressive step of this Government and I think this will be a paradigm shift with regard to infrastructure development in the plantation sector. As you know, so far, only public roads have been developed by local governments, but these Amendments would be a milestone in improving the living conditions of the plantation workers. These Amendments give the opportunity for infrastructure development to take place with regard to title, which was vested with the plantation companies. Now, there is a mechanism to vest the said areas developed back with the local government bodies.

I would be thankful to my Cabinet Colleagues who continuously agitated that I should bring this Bill. So, I think we have collectively brought dignity to the plantation sector. The Hon. Lakshman Yapa Abeywardena wanted a certain amendment made to expand the scope and I will concede to that amendment because plantation workers do not mean only those who are working in tea, coconut and rubber plantations. So, wherever there are planation workers in this country, we should see that they live with dignity. Therefore, here, we are following a very inclusive approach. I am also proud to say that during my tenure, I brought in amendments with regard to Pradeshiya Sabhas in the upcountry, which had been agitated for a long time. So, I believe this Government has been very progressive. Since I started my politics from a Party which represents the plantation sector - today, I am here because of the start I had from that Party - I was able to bring that amendment during my tenure. I see some Members of Parliament representing the plantation sector from both sides present here. Therefore, I would like to say that this is a very progressive step and a collective approach. So, we would see that these amendments would give dividends to the plantation sector. Thank you.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය.:*
*"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." --[ගරු පලනි දිගම්බරම් මහතා]*

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு பழனி திகம்பரம்]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Palany Thigambaram.]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
*[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]*
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
[THE HON. PRESIDING MEMBER *in the Chair.]*

***1 සිට 38 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 38ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 38 ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු පලනි දිගම්බරම් මහතා**
(மாண்புமிகு பழனி திகம்பரம்)
(The Hon. PalanyThigambaram)
Sir, I move,

"That the Bill be now read the Third time."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත
## பிரதேச சபைகள் (திருத்தம்) சட்டமூலம்
## PRADESHIYA SABHAS (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils, Local Government and Sports)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය.:*
*''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' --[ගරු ෆයිසර් මුස්තාපා මහතා]*
*தீர்மானிக்கப்பட்டது.*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு பைசர் முஸ்தபா]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Faiszer Musthapha.]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
*[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]*
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සහ 2 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம், 2ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 and 2 ordered to stand part of the Bill.*

### 3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.)
### வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 33ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 3.-*(Amendment of section 33 of the principal enactment.)*

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් සංශෝධන මා ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 19 වන සහ 20 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(1) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන් සහ එම නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ 'නඩත්තු කිරීම සඳහා, එකී ඉදි කිරීම' යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

'නඩත්තු කිරීම සඳහා, එකී අයිතිකරු හෝ අයිතිකරුවන් සමඟ ගිවිසුමකට බැඳිය හැකිය.' ; "

(2) "2 වන පිටුවේ, 3 වන සහ 4 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'පසුව සහ අදාළ වත්තෙහි පාලනාධිකාරිය විමසා, අදාළ වැවිලි ප්‍රදේශවල පදිංචිකරුවන්ට අවශ්‍ය' "

(3) " 2වන පිටුවේ, 7 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

"(3) (අ) (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ ඉදිකරන ලද, නඩත්තු කරන ලද හෝ සලස්වන ලද පාරවල්, ළිං සහ පොදු පහසුකම්, සුදුසු සාධන පත්‍රයක් මඟින් ප්‍රාදේශීය සභාව සතු කර දෙනු ලැබිය යුතු අතර ප්‍රසිද්ධ පාරවල්, ළිං සහ පොදු පහසුකම් ලෙස සංස්ථාපනය කරනු ලැබිය යුතු ය.

(ආ) ප්‍රාදේශීය සභාව විසින්, එකී පාරවල්, ළිං සහ පොදු පහසුකම් ඉදි කිරීම, නඩත්තු කිරීම හෝ සැලැස්වීම පිළිබඳව වන ව්‍යදම් වෙනුවෙන්, අවස්ථාවෝචිත පරිදි, එම වතුවල හෝ කර්මාන්තවල අයිතිකරුවන්, අදාළ වතුවල පාලනාධිකාරීන් හෝ එම වැවිලි ප්‍රදේශවල පදිංචිකරුවන් විසින් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි වන දායක මුදලක් ගෙවිය යුතු බව නියම කරනු ලැබිය යුතුය. තවද, එකී සියලුම දායක මුදල්, එසේ ප්‍රයෝජනය ලත් ඉඩම් සහ වැවිලි ප්‍රදේශ සඳහා නියම කරන ලද විශේෂ වරිපනම් බද්දක් ලෙස සැලකිය යුතු අතර, ඒවා මේ පනතේ විධිවිධාන යටතේ පනවනු ලැබ ඇති වරිපනම් බද්දක් වශයෙන් අය කර ගනු ලැබිය යුතුය.";

(4) " 2වන පිටුවේ, "8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(4) මේ වගන්තියේ කාර්යය සඳහා "වැවිලි ප්‍රදේශ" "

[ගරු ෆයිසර් මුස්තාපා මහතා]

(5) " 2වන පිටුවේ, 9 සිට 13 දක්වා වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යන්නෙන් මධ්‍යම, ඌව, සබරගමුව, දකුණ, බස්නාහිර, උතුරු මැද සහ වයඹ පළාත් තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස යටතේ පවතින නේවාසික කම්කරුවන් වාසය කරන සහ තේ, රබර්, පොල් සහ ඔයිල් පාම් වගා කරනු ලබන වතු අදහස් වේ.' "

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාගේ සංශෝධන ඉදිරිපත් කරන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් යාප්පා අපේවර්තන)
(The Hon. Lakshman Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"(4) 9 සිට 13 දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යන්නෙන් මධ්‍යම, ඌව, සබරගමුව, දකුණ, බස්නාහිර, උතුරු මැද සහ වයඹ පළාත්වල පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස යටතේ පවතින නේවාසික කම්කරුවන් වාසය කරන සහ තේ, රබර්, පොල්, කුරුඳු, ගම්මිරිස්, කරාබුනැට් සහ ඔයිල් පාම් වගා කරනු ලබන වතු අදහස් වේ.' "

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(මාණ්පුමිකු පයිසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
I accept that.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාගේ සංශෝධනයටත්, ගරු ලක්ෂ්මන් යාපා මන්ත්‍රීතුමාගේ සංශෝධනයටත් සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(මාණ්පුමිකු අ. අරවින්ත් කුමාර්)
(The Hon. A. Aravindh Kumar)
Hon. Minister, I need a small clarification from you. Originally, it was stated that the Pradeshiya Sabha undertakes the development of an estate with the consent of its management. That has to be removed.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(මාණ්පුමිකු පයිසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
That has now been changed.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(මාණ්පුමිකු අ. අරවින්ත් කුමාර්)
(The Hon. A. Aravindh Kumar)
Thank you, Sir.

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டன.*

*Amendments put, and agreed to.*

***3වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

***4 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 4 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(මාණ්පුමිකු පයිසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මම යෝජනා කරනවා.

පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා සහ මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරැදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත
## இலங்கை ஆளணி முகாமை நிறுவகம் (திருத்தம்) சட்டமூலம்
## INSTITUTE OF PERSONNEL MANAGEMENT, SRI LANKA (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*විනා විවාදයකින් තොරව, ඒ ආකාරයට ම පිළිගනු ලැබිණි.*
*එබැවින්, පනත් කෙටුම්පත දෙවන වර කියවන ලදී.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]***

*තීරණය කරන ලදී.*
*"පනත් කෙටුම්පත මුළු පාර්ලිමේන්තුවේ කාරක සභාවකට යොමු කිරීමට" [මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Lakshman Kiriella.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*කුමුවිල් ආරායප්පට්ටු.*
*[මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.]*

*Considered in Committee.*
[THE HON. PRESIDING MEMBER *in the Chair.]*

***1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ආම් වාසගත්තිලිරුන්දු 4ආම් වාසගම් වරෙ සට්ටමූලත්තින් පකුදියාග ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.*
*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

***පූර්විකාව පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*මුන්නුරෙ සට්ටමූලත්තින් පකුදියාග ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.*
*Preamble ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*සට්ටමාකු වාසකමුම් තලෛප්පුම් සට්ටමූලත්තින් පකුදියාග ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.*
*සට්ටමූලම් තිරුත්තමින්ර් අරික්කෛ සෙය්යප්පට්ටදු.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the Bill be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*විනා විවාදයකින් තොරව, ඒ ආකාරයට ම පිළිගනු ලැබිණි.*
*එබැවින්, පනත් කෙටුම්පත තුන් වන වර කියවා සම්මත කරන ලදී.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.


***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් තොරව, ඒ ආකාරයට ම පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.57ට, 2018 සැප්තැම්බර් මස 20වන බ්‍රහස්පතින්දා පු. භා. 10.00 වන තෙක් කල් තියේය.***
*අදන්පිඩි පි. ප. 6.57මණික්කු පාරාළුමන්රම්, 2018 සෙප්රෙම්බර් 20, වියාළක්කිළමෛ මු. ප.10.00 මණිවරෙ ඔත්තිවෛක්කප්පට්ටදු.*
*Parliament adjourned accordingly at 6.57 p.m. until 10.00 a.m. on Thursday, 20th September, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 263 - இல. 7
Volume 263- No. 7

2018 සැප්තැම්බර් 20 වන බ්‍රහස්පතින්දා
2018 செப்ரெம்பர் 20, வியாழக்கிழமை
Thursday, 20th September, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන :**
කථානායකතුමාගේ සහතිකය

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :**
කාන්තා පොලිස් නිලධාරිනියන්ගේ උසස්වීම්
තෙල් මිල ඉහළ දැමීම නිසා ධීවර ප්‍රජාව මුහුණ පා ඇති ගැටලු

**වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත :**
නියෝගය

**සුරාබදු ආඥාපනත :**
නිවේදන

**ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත :**
දෙවන වර හා තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

**එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත :**
නියෝගය

**කල්තැබීමේ යෝජනාව :**
කිරි ගවයන් ආනයනය කිරීමේ ව්‍යාපෘතියේ අක්‍රමිකතා


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புக்கள்:**
சபாநாயகரது சான்றுரை

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா :**
பெண் பொலிஸ் உத்தியோகத்தர்களின் பதவி உயர்வு
எரிபொருள் விலை உயர்வினால் கடற்றொழிலாளர் சமூகம் முகங்கொடுக்கும் நெருக்கடி நிலைமை

**துறைமுக மற்றும் விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் சட்டம் :**
கட்டளை

**மதுவரிக் கட்டளைச் சட்டம்:**
அறிவித்தல்கள்

**பொருளாதாரச் சேவை விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது.

**சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டம் :**
ஒழுங்குவிதி

**ஒத்திவைப்புப் பிரேரணை:**
பசுக்களை இறக்குமதி செய்யும் கருத்திட்டத்தில் முறைகேடுகள்


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Speaker's Certificate

PUBLIC FINANCE COMMITTEE REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Promotions of Women Police Officers
Issues Faced by Fishing Community due to Fuel Price Hike

PORTS AND AIRPORTS DEVELOPMENT LEVY ACT:
Order

EXCISE ORDINANCE:
Notifications

ECONOMIC SERVICE CHARGE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

VALUE ADDED TAX (AMENDMENT) ACT:
Regulation

ADJOURNMENT MOTION:
Irregularities in Import of Dairy Cattle Project

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2018** සැප්තැම්බර් **20** වන බ්‍රහස්පතින්දා*
*2018 செப்ரெம்பர் 20, வியாழக்கிழமை*
*Thursday, 20th September, 2018*

---

**පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

# නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 සැප්තැම්බර් 19 දින "වෛද්‍ය (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි ම'විසින් සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 සැප්තැම්බර් මස 20වන බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 3.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, එම රැස්වීමට පැමිණ සහභාගි වන ලෙස සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.



# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, அரசாங்க நிதி பற்றிய குழுவின் தவிசாளர் சார்பாக அக்குழுவிற்கு ஆற்றுப்படுத்தப் பட்ட நிதிச் சட்டமூலம், துறைமுக மற்றும் விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் சட்டத்தின் கீழான கட்டளைகள் மற்றும் மதுவரிக் கட்டளைச் சட்டத்தின் கீழான அறிவித்தல்கள் தொடர்பிலான அக்குழுவின் அறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன். நன்றி.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මාතලේ, උකුවෙල, බාබර්වත්ත, අංක 246/ඩී 1 දරන ස්ථානයේ පදිංචි සුබ්‍රමනියම් ශිව කුමාර් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු රවී කරුණානායක මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව, තල්පොත, බී.ඕ.පී. 317, අංක 63 දරන ස්ථානයේ පදිංචි කේ.පී.එන්.එස්. වික්‍රමසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කිරීම***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 - 32/'18 (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***

*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.*

*Question ordered to stand down.*

## වෙළඳ භාණ්ඩ අපනයනය හා ආනයනය : ආදායම හා වියදම
## வர்த்தகப் பொருட்களின் ஏற்றுமதி மற்றும் இறக்குமதி : வருமானம் மற்றும் செலவினம்
## EXPORT AND IMPORT OF GOODS : INCOME AND EXPENDITURE

61/'18

**2. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2016 වර්ෂයේ අයවැය යෝජනා මඟින්, වර්ෂ 2000දී 33.3% ක්ව පැවති ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය, වර්ෂ 2014දී 14% දක්වා පහත වැටුණ බව ඉතා වගකීමෙන් අවධාරණය කොට ඇති බැවින්, වර්ෂ 2000 - 2016 දක්වා එක් එක් වර්ෂය අවසානයේදී වාර්තා වූ,

(i) ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයන ප්‍රමාණය හා ආදායම;

(ii) ශ්‍රී ලංකාවේ භාණ්ඩ ආනයන ප්‍රමාණය හා වියදම;

(iii) වෙළඳ ශේෂය;

රුපියල්වලින් සහ ඇ.එ.ජ ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත (අ) (i), (ii) සහ (iii) හි අඟයන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් කවරේද;

(ii) වර්ෂ 2000 සිට 2017 දක්වා ගෝලීය අපනයන වෙළෙඳ පොළෙහි ශ්‍රී ලංකාවේ දායකත්වය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**නිති මත්‍රීතුමා වෙකුසන ඌටක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):**

(අ) 2016 ආම් ආණ්ඩුක්කාන වරවු සෙලවුත් තිට්ටම්මූලම් 2000ආම් ආණ්ඩිල් 33.3% ආකක් කාණප්පට්ට ඉලංකෙයින් වර්ත්තකප් පොරුළ් ඒර්‍රුමති 2014ආම් ආණ්ඩිල් 17% ආක වීழ්ච්සියටෙන්දුළ්ළතාක මිකවුම් වලියුරුත්තික් කූරප්පට්ටුළ්ළතනාල් 2000 - 2016ආම් ආණ්ඩුවරෙ ඔව්වොරු වරුට ඉරුතියිලුම් පතිවු සෙය්යප්පට්ටුළ්ළ,

(i) ඉලංකෙයින් පණ්ටංකළින් ඒර්‍රුමති අළවු මර්‍රුම් වරුමානම්;

(ii) ඉලංකෙයින් පණ්ටංකළින් ඉරක්කුමති අළවු මර්‍රුම් සෙලවිනම්;

(iii) වර්ත්තක නිලුවෙ;

ආකියවර්‍රෙ රූපා මර්‍රුම් ටොලර්කළිල් වෙව් වේරාකක් කුරිප්පිටුවාරවා එන්පතෙයුම්;

(ආ) (i) මේලේ (අ)විල් (i), (ii) මර්‍රුම් (iii) පොරුමානංකළෙ මොත්ත උළ්නාට්ටු උර්පත්තියින් සත වීතංකළාක කුරිප්පිටුවාරා එන්පතෙයුම්;

(ii) 2000 – 2007 වරෙ උලකළාවිය ඒර්‍රුමතිච් සන්තෙයිල් ඉලංකෙයින් පංකළිප්පු ඔව්වොරු වරුටත්තුක්කමෙය වෙව්වේරාක යාතු එන්පතෙ යුම්

අවර් ඉච්සපෙයිල් අරිවිප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

(a) asked the Minister of Finance and Mass Media:

(i) Will he inform this House separately in Rupees and in US Dollars-

(ii) the amount of export goods of Sri Lanka and the income received;

(iii) the amount of import goods of Sri Lanka and the expenditure borne; the trade balance;

reported at the end of each year from the year 2000 to 2016, since it has been emphasized with great responsibility by the Budget Proposals of year 2016 that the exports of trade goods in Sri Lanka, which was at the 33.3 per cent in 2000, declined to 14 per cent in the year 2014;

(b) Will he also inform this House-

(i) whether the values related to (i), (ii), and (iii) above will be given as a percentage of the Gross Domestic Production; and

(ii) of the Sri Lanka's contribution in the global export market from the year 2000 to 2017, separately as per each year?

(c) If not, why?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) විවිධ නිෂ්පාදන විවිධ මිනුම්වලින් වාර්තා කරනු ලබන බැවින් සමස්ත භාණ්ඩ අපනයන පරිමාව ගණනය කරනු නොලැබේ. (උදා: තේ කිලෝග්‍රෑම්වලින් මනිනු ලබන අතර, ඇතැම් ඇඟලුම් අයිතම ගණන ලෙස වාර්තා කරයි.)

ශ්‍රී ලංකාවේ 2000 - 2016 කාලපරිච්ඡේදයේදී වෙළෙඳ භාණ්ඩ අපනයනයෙන් ලද ආදායම සංඛ්‍යා සටහන 1 මඟින් දැක්වේ.

මම රුපියල්වලින් කියවන්නේ නැතිව ඩොලර්වලින් විතරක් කියවන්නද? එතැන හුහක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මම මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ 2016 අය වැය ලේඛනයේ 85වැනි අය වැය යෝජනාව අනුවයි. එහි සඳහන් කර තිබෙන්නේ, වර්ෂ 2000දී සියයට 33.3ක්ව පැවැති ශ්‍රී ලංකාවේ වෙළෙඳ භාණ්ඩ අපනයන 2014 වර්ෂයේදී සියයට 14 දක්වා පහත වැටී තිබෙන බවයි. එතකොට ඒ calculation එකේ දක්වා තිබෙනවා නේ, සියයට 33.3 ආපු ක්‍රමය සහ සියයට 14 ආපු ක්‍රමය. ඒ ක්‍රමවේදයට අනුව උත්තරය සපයන්න.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

අය වැයේ තිබුණු ක්‍රමවේදය ගැන මට කියන්න බැහැ. සංඛ්‍යා ලේඛන සියල්ල ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

අපනයන වර්ධන වේගයයි අහන්නේ. මේ වර්ෂයේ අපනයන ඉකුත් වර්ෂයේ අපනයන සමඟ සැසඳීමේදී කවර ප්‍රතිශතයකින් අපනයන වර්ධනය වුණාද කියන එක ඉදිරිපත් කළා නම් හරි. ඒ කියන්නේ, සියයට ගණන.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු මන්ත්‍රීතුමනි, මම ඒ අදාළ ලේඛන ඉදිරිපත් කරන්නම්.

සංඛ්‍යා සටහන 1 : ශ්‍රී ලංකාවේ අපනයන ආදායම (2000 - 2016 )

| | අපනයන ආදායම (එ.ඇ. ඩොලර් මිලියන) | අපනයන ආදායම (රු. මිලියන) |
|---|---|---|
| 2000 | 5,522.3 | 420,114.0 |
| 2001 | 4,816.9 | 430,373.0 |
| 2002 | 4,699.0 | 449,850.0 |
| 2003 | 5,133.3 | 495,426.0 |
| 2004 | 5,757.2 | 583,967.0 |
| 2005 | 6,346.7 | 638,276.0 |
| 2006 | 6,882.7 | 716,579.0 |
| 2007 | 7,640.0 | 845,682.7 |
| 2008 | 8,110.6 | 878,498.5 |
| 2009 | 7,084.5 | 813,911.0 |
| 2010 | 8,625.8 | 974,387.4 |
| 2011 | 10,558.8 | 1,167,587.9 |
| 2012 | 9,773.5 | 1,245,530.8 |
| 2013 | 10,394.3 | 1,344,054.3 |
| 2014 | 11,130.1 | 1,453,175.7 |
| 2015 | 10,546.5 | 1,431,431.5 |
| 2016 | 10,309.7 | 1,500,765.7 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(ii) ශ්‍රී ලංකාවේ ආනයන ප්‍රමාණය හා වියදම;

විවිධ ආනයන භාණ්ඩ මිනුම්වලින් වාර්තා කරනු ලබන බැවින් සමස්ත භාණ්ඩ ආනයන පරිමාව ගණනය කරනු නොලැබේ. (උදා: සහල් කිලෝග්‍රෑම්වලින් මනිනු ලබන අතර, වාහන අයිතම ගණන මඟින් මනිනු ලැබේ.)

2000 - 2016 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ආනයන වියදම සංඛ්‍යා සටහන 2 මඟින් දැක්වේ.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

සංඛ්‍යා සටහන 2: ශ්‍රී ලංකාවේ ආනයන වියදම (2000 - 2016)

| | ආනයන වියදම (එ.ජ. ඩොලර් මිලියන) | ආනයන වියදම (රු. මිලියන) |
|---|---|---|
| 2000 | 7,319.8 | 554,290.0 |
| 2001 | 5,974.4 | 532,946.0 |
| 2002 | 6,105.6 | 584,491.0 |
| 2003 | 6,671.9 | 643,749.0 |
| 2004 | 7,999.8 | 811,138.0 |
| 2005 | 8,863.2 | 891,359.0 |
| 2006 | 10,253.0 | 1,066,689.0 |
| 2007 | 11,296.5 | 1,250,386.2 |
| 2008 | 14,091.2 | 1,525,705.1 |
| 2009 | 10,206.6 | 1,172,618.0 |
| 2010 | 13,450.9 | 1,519,737.1 |
| 2011 | 20,268.8 | 2,241,488.1 |
| 2012 | 19,190.2 | 2,440,899.0 |
| 2013 | 18,002.8 | 2,323,128.3 |
| 2014 | 19,416.8 | 2,535,163.1 |
| 2015 | 18,934.6 | 2,572,466.5 |
| 2016 | 19,182.8 | 2,794,393.0 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

*එ. ජ. ඩොලර් මඟින් ගණනය කරන ලද දත්ත මත පදනම් වේ.

(iii) 2000 - 2016 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලාංකාවේ වෙළඳ හිඟය සංඛ්‍යා සටහන 3 මඟින් දැක්වේ.

සංඛ්‍යා සටහන 3 : ශ්‍රී ලංකාවේ වෙළඳ හිඟය (2000 - 2016)

| | වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන) | වෙළඳ හිඟය (රු. මිලියන) |
|---|---|---|
| 2000 | -1,797.5 | -136,209.5 |
| 2001 | -1,157.5 | -103,437.4 |
| 2002 | - 1,406.6 | -134,557.9 |
| 2003 | -1,538.6 | -148,507.1 |
| 2004 | - 2,242.6 | -226,925.1 |
| 2005 | - 2,516.5 | - 252,905.7 |
| 2006 | - 3,370.3 | - 350,384.1 |
| 2007 | - 3,656.5 | - 404,493.7 |
| 2008 | - 5,980.6 | - 647,899.0 |
| 2009 | - 3,122.1 | - 358,866.7 |
| 2010 | - 4,825.1 | - 545,549.7 |
| 2011 | - 9,710.0 | -1,073,586.1 |
| 2012 | - 9,416.7 | -1,201,599.6 |
| 2013 | - 7,608.5 | - 982,333.1 |
| 2014 | - 8,286.7 | -1,081,916.0 |
| 2015 | -8,388.1 | -1,140,259.5 |
| 2016 | -8,873.1 | - 1,291,938.0 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) (i) 2000-2016 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ අපනයන ආදායම, ආනයන වියදම සහ වෙළෙඳ හිඟය සංඛ්‍යා සටහන 4 මඟින් දැක්වේ.

සංඛ්‍යා සටහන 4: ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකාවේ අපනයන ආදායම, ආනයන වියදම සහ වෙළෙඳ ශේෂය (2000-2016)*

| | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අපනයන | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආනයන | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළෙඳ හිඟය |
|---|---|---|---|
| 2000 | 33.3 | 44.1 | -10.8 |
| 2001 | 30.6 | 37.9 | -7.3 |
| 2002 | 28.4 | 36.9 | -8.5 |
| 2003 | 27.2 | 35.3 | -8.1 |
| 2004 | 27.9 | 38.7 | -10.9 |
| 2005 | 26.0 | 36.3 | -10.3 |
| 2006 | 24.3 | 36.3 | -11.9 |
| 2007 | 23.6 | 34.9 | -11.3 |
| 2008 | 19.9 | 34.6 | -14.7 |
| 2009 | 16.8 | 24.3 | -7.4 |
| 2010 | 15.2 | 23.7 | -8.5 |
| 2011 | 16.2 | 31.0 | -14.9 |
| 2012 | 14.3 | 28.0 | -13.8 |
| 2013 | 14.0 | 24.2 | -10.2 |
| 2014 | 14.0 | 24.5 | -10.4 |
| 2015 | 13.1 | 23.5 | -10.4 |
| 2016 | 12.6 | 23.5 | -10.9 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(ii) 2000-2017 කාලපරිච්ඡේදය තුළ ගෝලීය අපනයන වෙළෙඳ පොළ සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය සංඛ්‍යා සටහන 5 මඟින් දැක්වේ.

සංඛ්‍යා සටහන 5: ගෝලීය අපනයන වෙළෙඳ පොළේ ශ්‍රී ලංකාවේ දායකත්වය (2000-2017)

| | ශ්‍රී ලංකාවේ අපනයන ගෝලීය අපනයනවල ප්‍රතිශතයක් ලෙස |
|---|---|
| 2000 | 0.086 |
| 2001 | 0.078 |
| 2002 | 0.072 |
| 2003 | 0.068 |
| 2004 | 0.062 |

| | ශ්‍රී ලංකාවේ අපනයන ගෝලීය අපනයනවල ප්‍රතිශතයක් ලෙස |
|---|---|
| 2005 | 0.060 |
| 2006 | 0.057 |
| 2007 | 0.054 |
| 2008 | 0.050 |
| 2009 | 0.056 |
| 2010 | 0.056 |
| 2011 | 0.058 |
| 2012 | 0.053 |
| 2013 | 0.055 |
| 2014 | 0.059 |
| 2015 | 0.064 |
| 2016 | 0.064 |
| 2017 | 0.064 |

මූලය: ලෝක වෙළෙඳ සංවිධානය, ශ්‍රී ලංකා මහ බැංකුව

(ඇ) පැන නොනඟී.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය ජාතික වශයෙන් ඔබතුමාටත් ඉතා වැදගත්. මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් ලියලා දෙන පිළිතුර තමයි එතුමා මේ ගරු සභාවට ඇවිල්ලා කියවන්නේ. නිලධාරීන් විසින් රජයට, පාර්ලිමේන්තුවට, ඇමතිවරුන්ට කොච්චර ලණු දෙනවාද කියන එක පිළිබඳ,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මේක පාර්ලිමේන්තුව. මුදල් පිළිබඳව බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, දැන් තමුන්නාන්සේ කිව්වා, පරිමාව පිළිබඳව කිසි සඳහනක් කරන්න බැහැ කියලා. ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2017 වාර්තාවේ 63 වැනි සංඛ්‍යා සටහන මම පෙන්වන්නම්. "මහ බැංකුවේ වෙළඳ දර්ශක - වටිනාකම (අ)". එහි කාර්මික අපනයන යටතේ "රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජ තෙල් නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත සහ එකතුව" දක්වා තිබෙනවා. කෘෂි කාර්මික අපනයන යටතේ "තේ, රබර්, පොල් නිෂ්පාදිත, සුළු කෘෂි කාර්මික නිෂ්පාදිත සහ එකතුව" දක්වා තිබෙනවා. ඒ වාගේම ඛනිජමය අපනයන සමඟ මුළු අපනයන ප්‍රමාණයත් දක්වා තිබෙනවා. ඊළඟට, මහ බැංකුවේ වෙළෙඳ දර්ශක වාගේම, වෙළෙඳ වටිනාකම වාගේම පරිමා දර්ශකත් වෙනම සකස් කරලා තිබෙනවා. මහ බැංකුවේ 64 වැනි සංඛ්‍යා සටහන මම **සභාගත*** කරනවා.

කාර්මික අපනයන යටතේ "රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජ තෙල් නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත සහ එකතුව" දක්වා තිබෙනවා. කෘෂි කාර්මික අපනයන යටතේ "තේ, රබර්, පොල් නිෂ්පාදිත, සුළු කෘෂි කාර්මික නිෂ්පාදිත සහ ඒවායේ එකතුව" දක්වා තිබෙනවා. ඒ වාගේම ඛනිජමය අපනයන සහ මුළු අපනයන ප්‍රමාණයත් දක්වා තිබෙනවා. මේවා ඔක්කෝම වෙන වෙනම ගණනය කරලා මුදල් නීති පනතේ විධිවිධානවලට අනුව වර්ෂයකට සැරයක් මෙම කෘතිය පාර්ලිමේන්තුවට පිළිගන්වනවා. ඇමෙරිකානු ඩොලර් එකක් අද මේ රටේ විකිණෙන්නේ රුපියල් 169යි ශත 5කටයි. 2014දී මහින්ද රාජපක්ෂ යුගය අවසන් වන විට ඇමෙරිකානු ඩොලර් එකක් රුපියල් 131යි.

අද ඇමෙරිකානු ඩොලර් එකක් රුපියල් 169යි ශත 5යි. ගරු කථානායකතුමනි, මෙය ගොවීන් හා කම්කරුවන් ඇතුළු මේ රටේ ජීවත් වන සමස්ත මිනිසුන්ට දැවැන්ත ලෙස බලපාන බරපතළ අර්බුදයක්. ඊයේ කොටස් වෙළෙඳ පොළ සම්පූර්ණයෙන් කඩා වැටිලා. මේ ගරු සභාව පනතක් සම්මත කරගෙන තිබුණා. ඒ තමයි, විදේශ විනිමය පනත - Foreign Exchange Bill. එදා එම පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කළාම, මම ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ උගත් විනිසුරුවරුන්ට කිව්වා, "මේ විධියට-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු සභානායකතුමනි, මේක පාර්ලිමේන්තුව. මුදල් පිළිබඳ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. මේ රටේ බඩු මිල දවස ගණනේ ඉහළ යනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එතුමාට ඕනෑ නම් මේ ගැන විවාදයක් ඉල්ලන්න පුළුවන්. උදේ පාන්දර මේ වාගේ- [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මම අහලා තිබෙන ප්‍රශ්නය මොකක්ද? මම අහලා තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා ඔබතුමාට තේරෙනවාද? ප්‍රශ්නයට බොරු උත්තර ලියා දුන්නාම- [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ වෙලාවේ ඔය වාගේ සංකීර්ණ ප්‍රශ්න කථා කරන්න බැහැ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
එහෙම නම් මේ ප්‍රශ්නය න්‍යාය පත්‍රයට දැම්මේ මොකටද? ඇයි, මේ වගේ සංකීර්ණ ප්‍රශ්න- [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා මේ කරන්නේ විවාදයක් නේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය කෙටියෙන් අහන්න. නැත්නම්, අපි ඒ ගැන විවාදයක් දෙන්නම්. ගරු සභානායකතුමා විවාදයක් දෙන්න ලෑස්තියි නේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මම කෙටියෙන් අතුරු ප්‍රශ්නය අහන්නම්.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ලංකා ඉතිහාසයේ ඇති වෙච්ච දැවැන්තම මුල්‍ය කඩා වැටීම දැන් මේ රටේ සිද්ධ වෙමින් පවතිනවා. ඇමෙරිකානු ඩොලරයට හෙට රුපියල් 170ක් ගෙවන්න ඕනෑ. සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ඇතුළු අනෙක් ගිවිසුම් ක්‍රියාත්මක වනකොට, ඩොලරයට රුපියල් 200ක් ගෙවන්න සිද්ධ වනකොට, මේ රටේ මිනිසුන්ට ජීවත් වීමේදී ඇති අර්බුදය විසඳන්න ගන්න ක්‍රියා මාර්ගය මොකක්ද කියලා තමුන්නාන්සේ කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආචාර්යතුමා ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න. ඔබතුමා ගොඩක් දුර ගියා වැඩියි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු කථානායකතුමනි, එතුමා ඒ ප්‍රශ්නය ඇහුවාට බොහොම ස්තුතියි.

අද පවතින අර්බුදය, ලංකාවේ තිබෙන අර්බුදයක් නොවෙයි.

ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහපු නිසා මම ඒ ගැන පැහැදිලි කරන්නම්. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ජනවාරි මාසයේ ඉඳලා සැප්තැම්බර් මාසයේ 06 වැනි දා වනතෙක් සියයට 5.29කින් තමයි අඩු වෙලා තිබෙන්නේ. තව විධියකට කිව්වොත්, ලෝකයේ සෑම currency එකක් එක්කම සැසඳුවාම ඩොලර් එකේ අගය ඉහළ ගිහින් තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, ඊයේ වෙනකොට ඉන්දියාවේ රුපියල හා සැසඳුවොත් සියයට 13.12කින් ඩොලර් එකේ වටිනාකම ඉහළ ගිහින් තිබෙනවා. ඩොලරයට සාපේක්ෂව සියයට 5.2ට තිබුණු ලංකාවේ රුපියලේ පහත වැටීම සියයට 8ක් දක්වා ඇවිත් තිබෙනවා. පාකිස්තානයේ සියයට 11.22කින් හා ඉන්දුනීසියාවේ සියයට 9.61කින් ඩොලරය ඉහළ ගිහින් තිබෙනවා. ආසියාවේ රටවල් අතරින් තායි බාට් එකයි, සිංගප්පූරුවේ ඩොලර් එකයි හැරුණාම, පාකිස්තානය, ඉන්දියාව, ඉන්දුනීසියාව කියන මේ සියලු රටවල්වල මුදල්වලට වඩා ලංකාවේ රුපියල විශාල ලෙස ශක්තිමත්.

"මිල" කියන එක සැසඳිය යුතු කරුණක්. ඔබතුමා කියන විධියට "මිල" එක මට්ටමේ තිබෙනවා නම් අපි සියලු දෙනාම කැමැතියි. නමුත්, චීනයයි, ඇමෙරිකාවයි අතර තිබෙන අර්බුදය නිසා තමයි සංවර්ධිත රටවල්වලින් ඩොලර් ඇමෙරිකාවට ගලා ගෙන යන්නේ. නමුත් අපේ ආර්ථිකය ශක්තිමත් නිසා තමයි අපේ රුපියල ආසියාවේ අනෙක් රටවල්වලට වඩා ශක්තිමත්ව තිබෙන්නේ.


පසුගිය අවුරුද්ද අරගෙන බැලුවොත්, අපේ අය වැය හිඟය අඩු වෙලා තිබෙන බව පෙනී යනවා. අපි රට භාර ගන්න කොට, අය වැය හිඟය සියයට 7.7යි. ඒක සියයට 5.5ක් දක්වා අඩු කරලා තිබෙනවා. මේ අවුරුද්දේ එය සියයට 5ක් දක්වා අඩු කරගෙන යනවා. අපේ විදේශීය සංචිත ගැන බැලුවොත්, ඉතිහාසයේ වැඩිම විදේශ සංචිත තිබුණේ ජූනි මාසයේ. එය, ඩොලර් බිලියන නවයකට වැඩිය තිබුණා. අපේ අපනයනයන් පිළිබඳව බැලුවොත්, වැඩිම අපනයනය තිබුණේ මේ අවුරුද්දේ බව පෙනී යනවා. සෘජු විදේශීය ආයෝජනයන් ගත්තොත්, වැඩිම සෘජු විදේශීය ආයෝජනය තිබුණේ මේ අවුරුද්දේ.

එතකොට ඔබතුමා කියන එක හරි. ඩොලර් එකත් එක්ක රුපියලේ අගය පොඩ්ඩකින් හරි අඩු වුණෙත්, සමහර අයට ගැටලුවක් තිබෙනවා. විශේෂයෙන්ම ආනයනය කරන අයට ගැටලුවක් තිබෙනවා. තෙල්වල මිල, වාහන ගන්නවා නම් වාහනවල මිල, සුඛෝපභෝගී ජීවන රටාවක් තිබෙනවා නම් ඒ අයගේ ජීවන වියදම ඉහළ යනවා. නමුත්, මම මේ කාරණය අහන්න කැමැතියි. තේ අපනයනය කරන අය ඇවිල්ලා කෙඳිරි ගානවද? රබර් අපනයනය කරන අය ඇවිල්ලා කෙඳිරි ගානවද? පොල් අපනයනය කරන අය කෙඳිරි ගානවද? මෘදුකාංග අපනයනය කරන අය කෙඳිරි ගානවද? සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින අය කෙඳිරි ගානවද? ඇඟලුම් කර්මාන්තයේ යෙදී සිටින අය කෙඳිරි ගානවද? මට ඇත්තටම මෙවාට පිළිතුරු දෙන්න. මිල අඩු වෙන කොට ආනයනය කරනවා නම් ගැටලුවක් තිබෙනවා කියලා මම පිළිගන්නවා. නමුත් අපනයනය කරන අයට ගැටලුවක් නැහැ. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මුදල් අමාත්‍යාංශය භාර නියෝජ්‍ය ඇමතිවරයා විධියට හිටියා. අපේ අම්මලා, අක්කලා, නංගිලා මැද පෙරදිග වැඩ කරනවා. ඒ අයට ඩොලර් 100ට ලැබෙන වාසිය කොච්චරද කියලා බලන්න. සමහර අයට අවාසියක් තිබෙන අතරේදී සමහර අයට ආර්ථිකය තුළ වාසියක් තිබෙනවා කියන එකත් කියන්න අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ගරු ඇමතිතුමා ඉතාම නරක ලෙස මේ ගරු සභාව නොමඟ යැව්වා. ඒක නිසා මම ඉන්දියානු රුපියලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අඩුවීම පිළිබඳව "Annual depreciation of LKR & INR against USD" යනුවෙන් තිබෙන මේ සංඛ්‍යා සටහනේ විස්තරය ඉදිරිපත් කරනවා. 2002, 2008 වාගේ වර්ෂවල ඉන්දියානු රුපියල අතිවිශාල ලෙස කඩා වැටෙන කොට, 2011 අතිවිශාල ලෙස ඉන්දියානු රුපියල කඩා වැටෙන කොට, 2013 අතිවිශාල ලෙස ඉන්දියානු රුපියල කඩා වැටෙන කොට ලංකාවේ රුපියල කඩා වැටුණේ නැහැ කියන එක පිළිබඳව පෙන්වා දෙන්නට මේ ප්‍රස්ථාර සටහන මගේ උත්තරයේ කොටසක් හැටියට මා **සභාගත*** කරනවා. මොකද මෙතුමා මේ ගරු සභාව නොමඟ යවපු නිසා.

**** සභාමේසය මත තබන ලද ප්‍රස්ථාරය:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட வரைபு :*
**Graph tabled:*



**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමාගේ දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිදි) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය,-

**ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම - අපිවිරුත්දි උපාය මුරෙකළ් මර්රුම් සර්වදේස වර්ත්තක අමෙච්චර්)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)
ගරු කථානායකතුමනි, මෙතුමා කිව්වා රුපියල කඩා වැටුණේ නැහැ කියලා. 2012 වර්ෂයේ රුපියල සියයට 10.43කින් කඩා වැටිලා තිබෙනවා. මෙවරත් මෙපමණ ප්‍රශ්න තිබිලාත් එච්චර අඩු වෙලා නැහැ. සියයට 06යි දශම ගණනකින් තමයි අඩු වෙලා තිබෙන්නේ. නමුත්, 2012දී සියයට 10.43කින් රුපියල කඩා වැටිලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිදි) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රකාශයට මා පිළිතුරක් දෙන්නට ඕනෑ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මුදල් රාජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිදි) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ප්‍රශ්න දෙකක්. එතුමන්ලාට දෙන වෙලාව මටත් දෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාට වේලාව දෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිදි) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මේ කාරණය පාර්ලිමේන්තුවට ඉතා වැදගත්. මොකද, රටේ මුදල් පිළිබඳ සම්පූර්ණ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ඒ නිසා මා ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එසේ ප්‍රකාශ කිරීම ගැන. ගරු ඇමතිතුමා, මෙහිදී සාමාන්‍යයෙන් බලන්නේ අවුරුදු ගණනාවක් තිස්සේ මිසක් එක දවසක ඇතිවන සිද්ධියක් ගැන නොවෙයි. ඔබතුමා තේරුම් ගන්න. අපි 2005දී මේ රට භාර ගන්නකොට ඩොලරයට ගෙවන්නේ රුපියල් 105යි. එතකොට ලෝක බනිජ තෙල් අර්බුදය, ලෝක ආහාර අර්බුදය, ලෝක මූල්‍ය අර්බුදය වැනි බාහිර කම්පනයන් සියල්ල තිබෙද්දී, අවුරුදු 10කට පසුව ආණ්ඩුව භාර දෙනකොට ඩොලරය රුපියල් 131යි. එතකොට අවුරුදු 10කට ඩොලරයේ මිල වැඩි වෙලා තිබෙන්නේ රුපියල් 26යි. ඔබතුමන්ලා ආණ්ඩුව අරගෙන තවම අවුරුදු 4ක් ගතවෙලා නැහැ. රුපියල් 131ට තිබුණු ඩොලරය රුපියල් 169යි. ඩොලරය රුපියල් 170ක් දක්වා ඉහළ ගිහිල්ලා, රුපියල් තිස් හතළිස් ගණනින් වැඩිවෙනකොට මේ කම්පනය මේ රටට ඔරොත්තු දෙන්නේ නැහැ. මේ රට ගිනි ගන්නවා; ආර්ථිකය කඩා වැටෙනවා; සුන්නද්දුලි වෙනවා. ඉතින් මේ තත්ත්වය පිළිබඳව පාර්ලිමේන්තුව,-

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මුදල් රාජ්‍ය ඇමතිතුමා දැන් පිළිතුරු දෙන්න. [බාධා කිරීමක්] සභානායකතුමා කිව්වා, ඕනෑ නම් වෙනම විවාදයක් දෙන්නම් කියලා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා 2011 වර්ෂය ගැන කථා කළා; 2012 වර්ෂය ගැන කථා කළා. 2011 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළඳ හිඟය සියයට 14.9යි. [බාධා කිරීමක්]

ඔබතුමා අහපු ප්‍රශ්නවලටම පිළිතුරු දෙන්න මම කැමැතියි. 2012දී එය සියයට 13.8ක් වුණා. නමුත්, 2010දී වෙළෙඳ හිඟය සියයට 8.5යි. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, බාධා කරන්න එපා. ගරු රාජ්‍ය ඇමතිතුමාට පිළිතුරු දෙන්න ඉඩ දෙන්න. [බාධා කිරීමක්] මේ සම්බන්ධයෙන් ඔබතුමාටත් මතයක් තිබෙනවා, රාජ්‍ය ඇමතිතුමාටත් මතයක් තිබෙනවා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
අපි මේ ප්‍රමාණ ඩොලර් මිලියනවලින් අරගෙන බලමු. එතකොට ඩොලර් මිලියන 4,825ක්ව තිබුණු වෙළෙඳ හිඟය ඩොලර් මිලියන 9,710ක් දක්වා වැඩි වුණා. ඔබතුමා සඳහන් කළ අවුරුදු දෙකේදී වෙළෙඳ හිඟය එක අවුරුද්දකින් සියයට 1.2කින් අඩු වුණා. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මම කියන්න හදන්නේ මේ කාරණයයි. රටකට පාලනය කරන්න පුළුවන් සමහර දේවල් තිබෙනවා. ආර්ථික විද්‍යාඥයන් හැටියට අපි එය පිළිගන්න ඕනෑ.

එදා ගෝලීය අර්බුදයක් තිබුණාය කියා ඔබතුමා කිව්වා. අද ලෝකයේ තිබෙන අර්බුදය මොකක්ද? අද තිබෙන අර්බුදය තමයි, ඇමෙරිකාව සහ චීනය අතර තිබෙන වෙළෙඳ සටිටනය. ලෝකයේ හැමෝම ඒක දන්නවා. එතකොට මොනවාද වෙන්නේ? Emerging රටවලින්, ඒ කියන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවලින් ඩොලර් එක ඇමෙරිකාවට යනකොට, ඇමෙරිකාවේ ඩොලර් එක ඉහළ යනවා. එහෙම නැතිව අනෙක් රටවල currency එක පහළට යනවා නොවෙයි. ඔබතුමා ඒක දැන දැන නේ, ඔය ප්‍රශ්නය අහන්නේ. හැබැයි සාපේක්ෂව ගත්තාම, අපි තවමත් ආසියාවේ ශක්තිමත්ම ආර්ථිකය තිබෙන රටක්ය කියන කාරණයත් මම කියන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, මම දෙපාර්ශ්වයටම අවශ්‍ය වෙලාව දුන්නා. ඕනෑ නම් අපට වෙනත් දිනයකදී මේ සම්බන්ධයෙන් දීර්ඝ විවාදයක් කරන්න පුළුවන්. ඒකට ගරු සභානායකතුමා එකඟ වුණා.

**"HOUSE OF JUSTICES" ව්‍යාපෘතිය : ඇස්තමේන්තුගත වියදම**

"House of Justices" கருத்திட்டம்: மதிப்பீட்டுச் செலவு

"HOUSE OF JUSTICES" PROJECT: ESTIMATED COST

178/'18

**3. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "House of Justices" ව්‍යාපෘතිය යටතේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සඳහා ගොඩනැඟිලි සංකීර්ණයක්, විනිශ්චයකාරවරුන් පුහුණු කිරීමේ ආයතනයක් හා අධිකරණ කටයුතු සඳහා ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීමට යෝජනා වී තිබේද;

(ii) එම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(iii) ඉදිකිරීම් සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(iv) ඒ සඳහා ඉදිරිපත් වූ සමාගම් හා ඔවුන් ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(v) එම ඉදිකිරීම් සිදු කරන කොන්ත්‍රාත් සමාගම කවරේද;

(vi) එම ඉදිකිරීම් අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "House of Justices" கருத்திட்டத்தின்கீழ் நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சுக்குக் கட்டடத் தொகுதியொன்றையும், நீதிபதிகளைப் பயிற்றுவிக்கும் நிறுவனமொன்றையும் மற்றும் நீதிமன்ற அலுவல்களுக்கான கட்டடத்தொகுதியொன்றையும் நிர்மாணிப்பதற்கு முன்மொழியப்பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்தின் மதிப்பீட்டுச் செலவு எவ்வளவென்பதையும்;

(iii) நிர்மாணப்பணிகளுக்கு கேள்விப்பத்திரம் கோரப் பட்டுள்ளதா என்பதையும்;

(iv) அதன் பொருட்டு முன்வந்த கம்பனிகளும் அவை சமர்ப்பித்த விலைகளும் யாவை என்பதையும்;

(v) மேற்படி நிர்மாணப் பணிகளை மேற்கொள்கின்ற ஒப்பந்தக் கம்பனி யாதென்பதையும்;

(vi) அதன் நிர்மாணப் பணிகளை நிறைவுசெய்வதற்கு எதிர்பார்த்துள்ள திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and Prison Reforms:

(a) Will she inform this House-

(i) whether it has been proposed to construct a building complex for the Ministry of Justice and Prison Reforms, a training institute for Judges and a building complex for judicial affairs under the project of "House of Justices'';

(ii) the estimated cost of the aforesaid project;

(iii) whether tenders have been called for the aforesaid constructions;

(iv) the companies which submitted tenders and the bids offered by them;

(v) the construction company which carry out the aforesaid construction work;

(vi) the date on which it is expected to complete the aforesaid construction work?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඇමෙරිකානු ඩොලර් මිලියන 94.55යි.

(iii) ඉදිකිරීම් සඳහා මූල්‍ය හා ව්‍යුහාත්මක යෝජනා කැඳවා ඇත.

(iv) ලංසු ලේඛන මිලදී ගැනීමට ඉදිරිපත් වූ සමාගම් 13ක් ඇති අතර, මිල ගණන් ඉදිරිපත් කිරීමක් මේ දක්වා සිදු වී නොමැත.

ගරු කථානායකතුමනි, එම සමාගම්වල නම් ලැයිස්තුව මම **සභාගත*** කරනවා.

යෝජනා කැඳවීම සඳහා දී ඇති කාලය මෙතෙක් අවසන් වී නොමැති බැවින්, මිල ගණන් ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැත.

(v) මෙතෙක් තීරණය කර නොමැත.

(vi) 2022 මැයි 28වන දින ඉදිකිරීම් අවසන් කිරීමට අපේක්ෂිතයි.

(ආ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ලැයිස්තුව:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் :*
*List tabled:*

ලංසු ලේඛන මිලට ගෙන ඇති සමාගම් :-

- China State Construction Engineering Corporation Ltd.
- Olympus Construction Ltd.
- China Harbour Engineering Company Ltd.
- Access Engineering PLC
- International Construction Consortium (Pvt.) Ltd.
- Yanjian Group Co. Ltd.
- Zhone Tian Ding Hui (Pvt.) Ltd.
- Sanken Construction (Pvt.) Ltd.
- Maga Engineering (Pvt.) Ltd.
- CML-MTD Construction Ltd.
- Chelcey Holdings (Pvt.) Ltd.
- Beijing Uni-Construction Group Co. Ltd.
- KNK Lanka (Pvt.) Ltd.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, සමාගම් 13ක නම් ඔබතුමා සභාගත කළා. කරුණාකර ඒ නම් ටික කියන්න පුළුවන්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ලංසු ලේඛන මිලදී ගත් සමාගම් 13ක් පමණයි තිබෙන්නේ. මිල ගණන් තවම කැඳවා නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මිල ගණන් ඕනෑ නැහැ. සමාගම්වල නම් කියන්න, ගරු ඇමතිතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
දීර්ඝ ලැයිස්තුවක් තිබෙන්නේ. මම එය ඔබතුමාට දැන් ලබා දෙන්නම්. එතකොට ඔබතුමාට අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඒ ලංකාවේ සමාගම්ද, පිට රට ඒවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
වැඩිපුර තිබෙන්නේ පිට රට සමාගම්. KNK Lanka (Pvt.) Ltd., Beijing Uni-Construction Group Co. Ltd., Chelcey Holdings (Pvt.) Ltd., Olympus Construction Ltd., වාගේ ඒවා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නවලට පිළිතුරු දෙනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මීට එහා කාරණා ගැන අහනවා නම් ඒවා ගරු ඇමතිතුමියට යොමු කරන්න වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්න ඇසුවාම එතුමා ගරු ඇමතිතුමියට ඒවා යොමු කරාවි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නවලට නම් උත්තර මේකේ තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මීට කලින් අපි ප්‍රශ්න යොමු කළාට එහෙම උත්තර හම්බ වුණේ නැහැ නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, අපි විෂයය භාර ඇමතිවරයා නොවන කෙනෙකුට අතුරු ප්‍රශ්න ඉදිරිපත් කළාට පසුව ඒවාට උත්තර හම්බ වෙන ක්‍රමවේදය මොකක්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඒ ප්‍රශ්න විෂයය භාර අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරියට යොමු කරනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
අදාළ ඇමතිවරයා හෝ ඇමතිවරියට ඒ ප්‍රශ්න යොමු කරලා උත්තර සපයනවාය කියා ඔබතුමා කිව්වාට, මෙච්චර කාලයකට එහෙම සිදු වෙලා නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමා ප්‍රශ්න ටික මට ලිඛිතව දෙන්න. මම ඒ වගකීම භාරගෙන පිළිතුර අරගෙන දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා ඒ වගකීම භාර ගන්නවා, ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මොකක්ද කියන්නේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අපි අතුරු ප්‍රශ්න ඇහුවාට පස්සේ, ගරු අමාත්‍යවරයා නැති වෙලාවට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අවස්ථා ගණනාවකදීම දුන් උත්තරය තමයි, අදාළ අමාත්‍යවරයාට ඒවා යොමු කොට පිළිතුරු ලබා දෙනවාය කියන එක.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අදාළ අමාත්‍යතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා කියන දෙදෙනාම නැත්නම් විතරයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, අදාළ අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා නැතිව, ඔබතුමා පිළිතුරු දෙන වෙලාවට.

[ගරු අනුර දිසානායක මහතා]

ගරු කථානායකතුමනි, මම අහන ප්‍රශ්නය මේකයි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඒ ප්‍රශ්න අදාළ අමාත්‍යවරයාට යොමු කරන්නේ කොහොමද? මෙතුමා ඒ හැන්සාඩ් වාර්තාව යවනවාද, නැත්නම් මෙහි පිටපත් යවනවාද? එහෙමත් නැත්නම් අපි අහන ප්‍රශ්න ඔබතුමා ලිපියක ලියා ඒ අදාළ ඇමතිතුමාට යොමු කරනවාද? ඒ කිසිවක් නොවෙයි නම්, ඔබතුමා ඇමතිතුමාට ඒ ප්‍රශ්න යොමු කොට පිළිතුරක් ලබා දෙනවාය කියා මෙතැනින් ගැලවීම සඳහා කියනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
එහෙම ගැලවෙන්න අවශ්‍යතාවක් මට නම් නැහැ. මම මේ ප්‍රශ්න අදාළ අමාත්‍යාංශයට CD එකකින් යවනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
CD එකකින්, නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ඔව්. ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගන්න ඔබතුමන්ලාත් පොඩ්ඩක් උනන්දු වන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඒ සම්බන්ධයෙන් අපට උනන්දු වන්න දෙයක් නැහැ. අපේ උනන්දුව තමයි පාර්ලිමේන්තුවේ ප්‍රශ්න විමසන එක. ඒ අමාත්‍යවරු නිසි පරිදි පිළිතුරු ලබා දෙන එක ගැන හොයා බලන්න ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා උනන්දු වන්න ඕනෑ. අපි උනන්දු වෙලා ප්‍රශ්න ඉදිරිපත් කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
මම ඒ ගැන උනන්දු වෙලා කටයුතු කරන්නම්. මේ ප්‍රශ්නයෙන් පසුව නැවත ඒක පටන් ගන්නම්.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නවලට පිළිතුරු දීමට ගරු අමාත්‍යවරුන්ගේ සහභාගිත්වය අවශ්‍ය බව මම මීට කලිනුත් ප්‍රකාශ කර තිබෙනවා. ඒ බව ස්ථාවර නියෝගවලත් සඳහන් කර තිබෙනවා. ඒ ගැනත් මම ගරු සභානායකතුමාගේ අවධානය යොමු කරවනවා.

ප්‍රශ්න අංක 4 -212/'18- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## මෑත කාලීනව ආපදාවට ලක් වූ කුඩා තේවතු හිමියන් : රත්නපුර දිස්ත්‍රික්කය
## அண்மைய அனர்த்தத்தால் பாதிக்கப்பட்ட சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்கள்: இரத்தினபுரி மாவட்டம்
## TEA SMALLHOLDERS AFFECTED BY RECENT DISASTER: RATNAPURA DISTRICT

260/'18

**5. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ සිටින කුඩා තේ වතු හිමියන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) පසුගියදා ඇති වූ ආපදා තත්ත්වයේ බලපෑමට ලක් වූ කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම කුඩා තේ වතු හිමියන් යළි නහා සිටුවීමට අමාත්‍යාංශය විසින් මෙතෙක් ගෙන ඇති සහ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்திலுள்ள சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களின் எண்ணிக்கையையும்;

(ii) அவர்களின் பெயர் மற்றும் முகவரிகள் யாவையென்பதையும்;

(iii) அண்மையில் ஏற்பட்ட அனர்த்த நிலைமையின் காரணமாகப் பாதிக்கப்பட்ட சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களின் எண்ணிக்கையையும்;

(iv) மேற்படி சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களைக் கட்டியெழுப்புவதற்காக அமைச்சினால் இதுவரை மேற்கொள்ளப்பட்டுள்ள மற்றும் எதிர்காலத்தில் மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries :

(a) Will he inform this House-

(i) the number of tea smallholders in Ratnapura district;

(ii) the names and the addresses of the aforesaid tea smallholders;

(iii) the number of tea smallholders affected by recent disaster situations; and

(iv) the measures taken and will be taken by the Ministry in order to revive the aforesaid tea smallholders?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2018 සංගණනය අනුව 109,164 (එක්ලක්ෂ නවදහස් එකසිය හැටහතර)ක් පමණ.

(ii) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහනාධාර ක්‍රම යටතේ ලියා පදිංචි වී ඇති රත්නපුර දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන්ගේ නම් සහ ලිපිනයන් සංයුක්ත තැටියක් (CD) මඟින් ඉදිරිපත් කරමි. සංයුක්ත තැටිය **සභාගත*** කරමි.

(iii) කුඩා තේ වතු හිමියන් 2,952ක් (දෙදහස් නවසිය පනස්දෙකක්) පමණ සිටිනවා.

(iv) පූර්ණ වශයෙන් හානි වූ තේ ඉඩම් අක්කරයක් සඳහා රුපියල් 250,000.00ක් (රුපියල් දෙලක්ෂ පනස්දහසක්) සහ අර්ධ වශයෙන් හානි වූ තේ ඉඩම් අක්කරයක් සඳහා රුපියල් 10,000.00ක් (රුපියල් දහදාහක්) බැගින් හෙක්ටෙයාර 498.3268ක් (හාරසිය අනූඅටයි දශම තුනයි දෙකයි හයයි අටක්) සඳහා රුපියල් මිලියන 74.649ක (රුපියල් මිලියන හැත්තෑහතරයි දශම හයයි හතරයි නවයක) මුදලක් ගංවතුර සහනාධාර වශයෙන් ගෙවා අවසන් කර ඇත.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තේ නැවත වගා, අලුත් වගා හා වගා පුනරුත්ථාපන දිරි දීමනා ක්‍රම යටතේ සහනාධාර ලබා දෙමින් ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් තාක්ෂණික උපදෙස් ලබා දීමේ කටයුතු ක්‍රියාත්මකව පවතී.

පාංශු සංරක්ෂණ ක්‍රමවේද අනුගමනය කර හානි වූ තේ වගාවන් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම.

රත්නපුර හා කලුතර දිස්ත්‍රික්කයන්හි කුඩා තේ වතු හිමියන්ට ගංවතුරින් ඇති වන බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව ඇති කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් ගරු ඇමතිතුමා පිළිතුරක් ලබා දුන්නා. මා හිතන හැටියට කුඩා තේ වතු හිමියන්ගේ ප්‍රශ්න, ගැටලු දන්නා, කුඩා තේ වතු හිමියන් සිටින ප්‍රදේශයක ජීවත් වන අමාත්‍යවරයකු හැටියට මෙතුමාට මගේ අතුරු ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙන්න පුළුවන් වෙයි.

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. සාමාන්‍යයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව වසරකට වරක් ගංවතුරට යට වීමෙන් ආපදාවට ලක් වෙනවා.

ඒ අනුව තේ ඉඩම් විශාල ප්‍රමාණයක් හානියට පත් වනවා. ඔය කියන විධියට ජනතාවට ආධාර, සහයෝගය වාගේම සහනාධාර ලබා දීම අපි රජයක් විධියට සිදු කර තිබෙනවා. පසුගිය රජය ඒ කටයුතු කඩිනමින් සිදු කළා.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට මම යොමු කරන්නේ මෙකයි. කුඩා තේ වතු හිමියන්ට ආධාර හා සහන -ගංවතුර ආධාර නොවෙයි.- ලබා දීමේදී පසුගිය කාල සීමාව පුරාවට වාගේම අදටත් -ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියටයි කියන්නේ.- යම් යම් නිලධාරීන්ගේ අවශ්‍යතාවන්ට අනුව හැම දෙනාටම ඒවා සමානව බෙදී යන්නේ නැති තත්ත්වයක - විෂමතාවක්- දක්නට තිබෙනවා. එක් ප්‍රදේශයකට දෙනවා, තවත් ප්‍රදේශයකට දෙන්නේ නැහැ. මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ රක්වාන, ගොඩකවෙල වාගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට පසුගිය කාලයේ මේ සහනාධාරය ලබා දුන්නේ නැහැ. මේක නිලධාරීන්ගේ හයියක් හෝ දේශපාලනික හයියක් වෙන්නත් පුළුවන්. මේ කටයුත්ත මම භිතන්නේ යහ පාලන ආණ්ඩුවට එච්චර හොඳ නැහැ. ඔබතුමාගෙන් මේ ප්‍රශ්නයට පිළිතුරක් දැනගන්න පුළුවන් නම් හොඳයි. මේ සම්බන්ධයෙන් අපිට ගන්න පුළුවන් විකල්ප ක්‍රියා මාර්ගය කුමක්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඔබතුමා කියන විධියට රත්නපුරයේ ගංවතුර තිබුණු ප්‍රදේශවල කුඩා තේ වතු හිමියන්ට ආධාර නොලැබී තිබෙනවාද? ගංවතුරක් තිබිලා, ඒ ආධාර නොලැබුණු පිරිසක් රත්නපුරයේ සිටිනවාද?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගංවතුර වෙනුවෙන් සියලුම දෙනාට ආධාර ලබා දුන්නා. ඊට අමතරව නැවත තේ වගාව කිරීමට ආධාර සහ පොහොර සහනාධාරය හැම ගොවියෙකු අතරේම බෙදිලා යන්නේ නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඔබතුමා ප්‍රශ්නයෙන් අහලා තිබුණේ ගංවතුර ආධාර ගැනයි. එතකොට ඒ ප්‍රශ්නයට පිළිතුර හරි නේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

හරි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඔබතුමා දැන් අහන්නේ නැවත වගාව සහ පොහොර සහනාධාරය සම්බන්ධයෙනුයි. වැවිලි කර්මාන්ත ඇමතිතුමා තේ තිබෙන පළාත්වල සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එන්න කියා වෙනම විස්තර කිරීමක් කළා. වැඩිම හෙක්ටෙයාර ප්‍රමාණයක් තිබෙන රත්නපුර දිස්ත්‍රික්කයට තමයි නැවත වගාව සඳහා ආධාර දෙන්න සූදානම් තිබෙන්නේ කියන කාරණය එතුමා පැහැදිලි කළා. ඊට අමතරව කුඩා තේ වතු සමිති හරහා කුඩා තේ වතු හිමියන්ගේ පාරවල් සකස් කිරීමටත් විශාල මුදලක් යොදවන්න වැවිලි කර්මාන්ත ඇමතිතුමා සැලසුම් කර තිබෙන හැටි ඊයේ විස්තර කළා.ඒ සම්බන්ධ වාර්තාව ගත්තා නම්, ඔබතුමාට ඔක්කෝම පැහැදිලි වෙයි.

---

** ප්‍රශ්නකාලයේ නබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 - 402/'18 - (1), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පෙර පාසල් සඳහා පාසල් බෑග් ලබා දීමේ ව්‍යාපෘතිය: වැය වූ මුදල්
## முன்பள்ளிகளுக்குப் பாடசாலைப் புத்தகப் பைகள் வழங்கும் கருத்திட்டம்: செலவிட்ட பணம்
## PROJECT TO PROVIDE SCHOOL BAGS FOR PRESCHOOLS: EXPENDITURE INCURRED

503/'18

**7. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පෙර පාසලේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් පෙර පාසල් සඳහා පාසල් බෑග් ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ මේ දක්වා එම ප්‍රතිලාභය ලබාගෙන ඇති පෙර පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් කවරේද;

(iv) මේ සඳහා වැය වූ මුදල් ප්‍රමාණය හා මුදල් සපයාගත් මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

මාකාණ සභෙකළ්, උළ්ළූරාට්සි මර්‍රුම් විළෙයාට්ටුත්තුරෙ අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) பதுளை மாவட்டத்தில் இயங்கும் முன்பள்ளி களின் எண்ணிக்கையையும்;

(ii) மேற்படி முன்பள்ளி ஒவ்வொன்றினதும் பெயர் மற்றும் முகவரிகளைத் தனித்தனியாகவும்;

(iii) ஊவா மாகாணத்தின் தற்போதைய முதலமைச் சரால் முன்பள்ளி மாணவர்களுக்கு பாடசாலைப் புத்தக பைகள் வழங்கப்படும் கருத்திட்டத்தின் கீழ் இற்றைவரை, அந்த அனுகூலங்களைப் பெற்றுள்ள முன்பள்ளி மாணவர்களின் எண்ணிக்கை மற்றும் இவர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iv) இதற்கெனச் செலவான பணத்தொகை மற்றும் பணம் பெற்றுக்கொள்ளப்பட்ட மூலங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House-

(i) the number of preschools functioning in the District of Badulla;

(ii) separately the name and the address of each of the aforesaid preschool;

(iii) the number and the names of the preschool children who have hitherto obtained the benefits under the project to provide school bags for preschools by the present Chief Minister of Uva Province; and

(iv) the expenditure incurred for this purpose and the sources through which funds were secured for the purpose?

(b) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)
ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පෙර පාසල් සංඛ්‍යාව 943කි.

(ii) එම එක් එක් පෙර පාසලේ නම් හා ලිපිනයන් ඇමුණුම් 01* -I සිට xxv- මගින් ඉදිරිපත් කර ඇත.

(iii) වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් පෙර පාසල් සඳහා පාසල් බෑග් ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ මේ දක්වා එම ප්‍රතිලාභ ලබාගෙන ඇති පෙර පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව 2015 වසරේදී 12,907ක්ද, 2016 වසරේදී 13,090ක්ද වේ. එම ප්‍රතිලාභ ලැබූ පෙර පාසල් ශිෂ්‍යයන්ගේ නම් මේ සමඟ ඇති සංයුක්ත තැටිය මඟින් දක්වා ඇත. සංයුක්ත තැටිය **සභාගත*** කරමි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(iv) පෙර පාසල් බෑග් ලබා දීම සඳහා වැය වූ මුදල් ප්‍රමාණය හා ඒ සඳහා මුදල් සපයා ගත් මූලාශ්‍ර ඇමුණුම් 02* මඟින් දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවශ්‍ය නම් එම සංයුක්ත තැටිය ලබා දෙන්න පුළුවන්. මොකද, 25,000කට ආසන්න නම් ප්‍රමාණයක් එහි තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
එය ලබා දෙන්න, ගරු රාජ්‍ය ඇමතිතුමියනි.

**ගරු කථානායකතුමා**
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
එතුමාට එම සංයුක්ත තැටිය ලබා දෙන්න.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(*மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம*)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
හොඳයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඔබතුමා ඊයේ දිනයේ මේ ගරු සභාවේ නොසිටියත්, දීර්ඝ කාලයක් තිස්සේ අහපු ප්‍රශ්නයකට ඔබතුමාගේ මැදිහත්වීම තුළ විධිමත් පිළිතුරක් ලැබුණා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, මාගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහන්නම්. පෙර පාසල් දරුවන්ට ප්‍රතිලාභ ලැබුණා වාගේම මේ තුළින් විශාල වශයෙන් ප්‍රතිලාභ ලබා ගත්තේ කවුරුන්ද කියන කාරණය මම ඊයේ දිනයේ හෙළි කළා. මෙම විෂය පළාත් සභා විෂයයක් වාගේම පළාත් පාලන ආයතනවල විෂයයක් හැටියට අදාළ අණ පනත්වල සඳහන් වෙනවා. මේ, "මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන". එම වචන සැලකිල්ලට ගත්තාම පෙනෙනවා, එය විශාල වැඩ කොටසක් සම්බන්ධ වෙන ආයතනයක් බව. ඔබතුමියත් පෙර පාසල් ගිහින්, පෙර පාසල් අධ්‍යාපනය තුළින් නිවැරැදි මාවතට ඇවිත් අද මෙම ස්ථානයේ ඉන්නවා. ඒ වාගේම අධ්‍යාපනය ආරම්භයේදී පෙර පාසල තුළින් ඔබතුමියට ලොකු ශක්තියක් ලබා දුන්නා. නමුත්, පෙර පාසල් තුළ නිශ්චිත වැඩ පිළිවෙළක් නැහැ කියා මම දකිනවා. මේ පෙර පාසල් නවසිය ගණන ගත්තත්, ඒ තුළ සිටින සමහර ගුරුවරු ස්වේච්ඡාවෙන් තම දැනුම පාවිච්චි කරලා තමයි දරුවන්ගේ ආරම්භක මනස සකසන වැඩ පිළිවෙළ නිර්මාණය කරන්නේ. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමු වී තිබෙනවාද කියා මම දන්නේ නැහැ. මේ, මෙම ප්‍රශ්නය අහන පළමුවෙනි වතාව නොවෙයි. මන්ත්‍රීවරු වර්ෂ ගණනාවක මේ ප්‍රශ්නය අහලා ඇති. හැබැයි, ඒක හැන්සාඩ් වාර්තාවලට සීමා වෙලා, යෝජනාවලට සීමාවෙලා තිබෙන්න ඇති. හැන්සාඩ් වාර්තාවලට සීමා නොවී, යෝජනාවලට සීමා නොවී අමාත්‍යාංශය වශයෙන් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන තුළ විධිමත් අධ්‍යාපනික ක්‍රමයක් හදන්න ශක්තිමත් වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද, ඒ කවදාද කියන කාරණය මම දැන ගන්න කැමැතියි.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(*மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம*)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව ලොකු ඉතිහාසයක් මම දන්නේ නැහැ. මේ සම්බන්ධව පසුගිය දවසක ගරු රෝහිණි කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය යෝජනාවක් ඉදිරිපත් කරලා අපි පාර්ලිමේන්තුවේ විවාදයකුත් කළා. ඇත්තටම පෙර පාසල් ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය සහ ඒ අයගේ සුදුසුකම් යම් කිසි මට්ටමකට ගෙන ඒමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ වාගේම පෙර පාසල් අධ්‍යාපනය ඒ අයගේ හැකියාවන් මත පමණක් නොවෙයි, යම් කිසි ප්‍රමිතියකට ලක් කරන්න ඕනෑ කියන කාරණය මමත් පිළිගන්නා කාරණයක්. මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති සකස් කර ලංකාව පුරාම දියත් කළ යුතුයි. මෙය ලොකු වැඩසටහනක්. මේ සඳහා මුදල් සොයා ගැනීමට ක්‍රමයක් තිබෙනවා නම් කරන්න පුළුවන්. ඒකයි තිබෙන තත්ත්වය.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, "මුදල් සොයා ගන්න පුළුවන් නම් කරන්න පුළුවන්" කියන රාජ්‍ය අමාත්‍යතුමියගේ පිළිතුර පිළිබඳව මම සෑහීමකට පත් වන්නේ නැහැ.

මම මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. පනතෙන් පෙර පාසල්වල අයිතිය පළාත් සභාවලට ලබා දී තිබුණත් සමහර පෙර පාසල් තිබෙන්නේ පෞද්ගලික ගෙවල්වල. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශය හරහා විෂය නිර්දේශයක් සකස් කරගෙන, පළාත් පාලන ආයතන බලප්‍රදේශ තුළ එහෙම නැත්නම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ එක් පෙර පාසලක් බැගින් හෝ ගොඩ නහන්න අපට පුළුවන් නම් ඉතා වැදගත් වෙනවා. මම ඒක යෝජනා කරනවා. මොකද, ඒ පෙර පාසල තුළ අපි බලාපොරොත්තු වන ගුණාත්මක මූලික අධ්‍යාපන ක්‍රමවේදය නිර්මාණය කරන්න පුළුවන්. සමහර වෙලාවට තමන්ගේ ගෘහය තුළ ස්වයං රැකියාවක් විධියටත් මේ පෙර පාසල් පවත්වා ගෙන යනවා. ඔවුනුත් උගත්, බුද්ධිමත් අය තමයි. නමුත්, ක්‍රමවේදයක් නැහැ; විෂය නිර්දේශයක් නැහැ.

මුල් ළමා විය සංවර්ධනය කියන කාරණය ඉතා අත්‍යවශ්‍ය කාරණයක්. දියුණු රටවල දරු පරපුර නිර්මාණය වන්නේ රටට වැඩදායී සහ රටේ අනාගතයට ඔබින බුද්ධිමත් පරපුරක් විධියටයි. අපේ රට තුළ නිර්මාණය වන සමහර කණ්ඩායම් ඒ ආකාරයට නිර්මාණය නොවන්නේ මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන තුළ තිබෙන ප්‍රමිතීන් පිළිබඳ ප්‍රශ්නය නිසායි. ඒ නිසා ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමියගේ අමාත්‍යාංශය වෙනත් නොයෙකුත් කාරණාවලට යොදවන මුදලින් කොටසක් හෝ මේ ඉතා වටිනා, වැදගත් කාරණය සඳහා යොදවන්න. ලබන අවුරුද්දේවත් ඔබ අමාත්‍යාංශයේ තිබෙන යම් කිසි මුදලක් මේ වෙනුවෙන් යොදවා එක දිස්ත්‍රික්කයක හෝ එහෙම නැත්නම් උඟව පළාත තුළ පෙර පාසල් පටන් ගන්න බැරිද කියා මා අහනවා. මොකද, අපේ පළාතේ පෙර පාසල්වත් ගියේ නැති සමහර කණ්ඩායම් කරන දේවල් දැක්කාම ඉතාම ශෝචනීය තත්ත්වයක් තිබෙන්නේ.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(*மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம*)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් පළමුවෙන්ම අපි පාර්ලිමේන්තුව විධියට මැදිහත් වෙලා ඒ විෂය නිර්දේශය සකස් කරන්න වෙනවා. අමාත්‍යාංශයට ඒ අනුව මැදිහත් වෙලා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඒක වැදගත් යෝජනාවක් නිසා ඒ ගැන අවධානය යොමු කරන්න.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
හොඳයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 - 542/'18 - (1), ගරු වාසුදේව නානායක්කාර මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 - 567/'18 - (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා. [සභා ගර්භය තුළ නැත.]

## කැබිතිගොල්ලෑව නගරයේ ක්‍රීඩාංගණය : අලුත්වැඩියා කිරීම
## கெபிதிகொல்லாவ நகரத்தில் அமைந்துள்ள விளையாட்டு மைதானம்: நவீனமயப்படுத்தல்
## STADIUM IN KEBITHIGOLLEWA CITY: RENOVATION

969/'18

**10. ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැබිතිගොල්ලෑව නගරයේ පිහිටා ඇති ක්‍රීඩාංගණය ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බව දන්නේද;

(ii) ප්‍රදේශයේ පාසල්වල දරුවන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය මෙම ක්‍රීඩාංගණය නවීකරණය කිරීමට අදහස් කරන්නේද;

(iii) එසේ නම්, එම ක්‍රීඩාංගණයේ නවීකරණ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

මාකාණ සභාවන්, උප්පාරාට්සි මට්රුම් විලයාට්ටුත් තුරෙ අමෛච්සරෙක් කේට්ට විනා:

(அ) (i) කෙපිත්තිකොල්ලාව පිරතේස සෙයලාළර් පිරිවිල්, කෙපිතිකොල්ලාව නකරත්තිල් අමෛන්තුළ්ළ විලෙයාට්ටු මෛතානම් මිකවුම් සීර් කුලෛන්ත නිලෙයිල් කාණප්පටුවතෙ අරිවාරා එන්පතෙයුම්;

(ii) පිරතේසත්තිලුළ්ළ පාටසාලෙ මාණවර්කළින් විලෙයාට්ටුත් තිරමෛකළෙ මේම්පටුත්තික් කොළ්ළත් තේවෛයාන ඉන්ත විලෙයාට්ටු මෛතානත්තෙ නවීනමයප්පටුත්තක් කරුතප් පට්ටුළ්ළතා එන්පතෙයුම්;

(iii) ආමෙනිල්, මේර්පටි මෛතානත්තිනෙ නවීනමයප්පටුත්තුම් නටවටික්කෛකළ් ආරම්පික් කප්පටුම් තිකති යාතු එන්පතෙයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ஆ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House-

(i) whether he is aware that the stadium situated in the Kebithigollewa City of the Kebithigollewa Divisional Secretary's Division is in a badly dilapidated state;

(ii) whether it is intended to renovate this stadium, which is required to enhance the sports capabilities of the children of the schools of the area; and

(iii) if so, of the date on which the renovation activities of the said stadium will be commenced?

(b) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ක්‍රීඩා පිටිය අබලන් තත්ත්වයේ නොපවතින අතර, සිදු කළ යුතු අලුත්වැඩියාවන් පවතින බව උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව වාර්තා කර ඇත.

(ii) ඔව්. අදාළ ප්‍රාදේශීය සභාව ව්‍යාපෘති යෝජනාවක් මෙතෙක් ඉදිරිපත් කර නොමැත.

(iii) එබැවින්, ව්‍යාපෘති යෝජනාවක් අදාළ ප්‍රාදේශීය සභාව මඟින් ඉදිරිපත් කළ පසු අලුත්වැඩියා කටයුතු මේ වසරේ පවත්නා මුදල් ප්‍රතිපාදන මඟින් ලබා දීමට හැකි අතර, ආරම්භ කරන දිනය නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක.

(ආ) අදාළ නොවේ.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු රාජ්‍ය ඇමතිතුමියනි, දිවංගත මෛත්‍රීපාල සේනානායක ඇමතිතුමා තමයි අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ආසනයේ ඒ ක්‍රීඩා පිටිය හැදුවේ. ඔබතුමිය කිව්වා, ප්‍රාදේශීය සභාව estimate කරලා දුන්නොත් එම මුදල් ලබා දෙනවා කියලා. මම ඒකට ඔබතුමියටත්, ඔබතුමියගේ අමාත්‍යවරයාටත් ස්තුති කරනවා. මම estimate එක ලබා දෙන්නම්. මේ අවුරුද්දේ එහි වැඩ පටන් ගන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන්ද කියලා තමයි මට දැන ගන්න අවශ්‍ය වන්නේ.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ඒ අවස්ථාව ලබා දෙන්න පුළුවන් කියලා තමයි අමාත්‍යාංශයෙන් උත්තරය සපයලා තිබෙන්නේ. එය ලබා දෙන්න කටයුතු කරන්නම්.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මේ යහ පාලන ආණ්ඩුවේ අපි ටෙන්ඩර් කරලා සුදුස්සෙකුට ලබා දෙනවා. ඒක ආවාට ගියාට පන්දම්කාරයන්ට,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දේශපාලන ඉත්තන්ට අපි දෙන්නේ -[බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, සුදුසු වචන භාවිත කරන්න. [බාධා කිරීමක්]

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, ඒ, දෙමළ වචනයක් මම පාවිච්චි කළේ. මම ඒ වචනය ඉල්ලා අස් කර ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ඒ සියලුම ඒවා ටෙන්ඩර් කරලා තමයි ලබා දෙන්නේ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් දරුවෝ සමස්ත ලංකා තරගවලින් පවා දස්කම් පෙන්වනවා. ඔවුන්ට ඇඳුම්, සපත්තු යනාදී දේවල් ගැනීමේ ලොකු ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා. ජාත්‍යන්තර මට්ටමේ තරගවලට පවා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන් ඉදිරිපත් වෙනවා. මම නිටපු ඇමතිතුමාගෙනුත් ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කළා. එතුමා මේ කනින් අහලා අනෙක් කනෙන් පිට කළා. ඔබතුමියගේ අමාත්‍යාංශය භාර ඇමතිතුමා ක්‍රීඩාවට මුල් තැන දෙන බව මම දන්නවා. මා එතුමාටත් කියන්නේ, පාසල්වලින් සමස්ත ලංකා තරගවලට යන ක්‍රීඩකයන් වාගේම ජාත්‍යන්තර මට්ටමේ තරගවලට යන ක්‍රීඩකයන්ගේ නාම ලේඛනයක් අපි දුන්නොත් ඒ අයට අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියලායි. ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, ඔබතුමියත් එතුමාට කියන්න. ඒ සම්බන්ධව යම් නීතියක් පාර්ලිමේන්තුවේදී සම්මත කරලා දුප්පත් අයට සහනයක් ලබා දෙන්න පුළුවන් ක්‍රමයක් හදා දෙන්න කියලා මම ගෞරවනීය ඉල්ලීමක් කරනවා.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
හොඳයි. ගරු මන්ත්‍රීතුමා, පසුගිය දවස්වල දිවීමේ තරගවලිනුත් අනුරාධපුරයේ එක පවුලේ දරුවන් දෙදෙනෙකු ජයග්‍රහණය කළා අපි දැක්කා. ඇත්තටම සමස්තයක් හැටියට මම මේ කෙටි කාලය තුළ දැකපු දේවල් ගැන කල්පනා කරනකොට මුළු රටටම ලොකු ශක්තියක් දෙන්න අවශ්‍යයි මෙම අමාත්‍යාංශය හරහා. අපට කරන්න පුළුවන් උපරිමය කරලා දෙන්න බලන්නම්. අනුරාධපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් අවශ්‍ය ඉල්ලීම ඔබතුමා ක්‍රීඩා අමාත්‍යාංශයට ඉදිරිපත් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ගරු රාජ්‍ය අමාත්‍යතුමිය, දැන් ඔබතුමියට පෙනෙනවා ඇති පළාත් පාලන ආයතන සම්බන්ධව මහජන නියෝජිතයින්ට කොයි තරම් උද්‍යෝගයක් තිබෙනවාද කියා. දැන් අපට මාසයකට සැරයක් Ministerial Consultative Committees තියන්න පුළුවන්.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
එහෙමයි, ගරු කථානායකතුමනි. උපදේශක කාරක සභා ක්‍රමය නැවත ආරම්භ කිරීම ගැන මම බොහොම සතුටු වනවා. මොකද, එය අපි ඉල්ලපු දෙයක්. එය නැවත ලැබීම ජනතා නියෝජිතයන්ට ලොකු පහසුවක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න හුඟක් තිබෙන නිසා ප්‍රධාන ඇමතිවරු ඇතුළු අදාළ කට්ටිය ගෙන්වලා, ඇමතිතුමාගේ සහභාගිත්වයෙන් රැස් වෙන්න. මට හිතෙන විධියට හුඟක් ප්‍රශ්න විසඳා ගන්න පුළුවන් වෙයි. එතකොට ඔබතුමියලාට ලේසියි. ඉතා ඉක්මනින් එම කටයුත්ත ආරම්භ කරන්න.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
හොඳයි.

## පැල්වත්ත සීනි කර්මාන්තශාලාව : විස්තර
## பெல்வத்தை சீனித் தொழிற்சாலை: விபரம்
## PELWATTA SUGAR FACTORY : DETAILS

994/'18

**11. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පැල්වත්ත සීනි කර්මාන්තශාලාව ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම කර්මාන්තශාලාව සඳහා වෙන් කරන ලද ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) එම කර්මාන්තශාලාව සඳහා උක් වැවීමට වෙන් කළ ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) පසුගිය වර්ෂ 5ක කාලය තුළ,

(i) උක් වගාව සඳහා වෙන් කළ ඉඩම් ප්‍රමාණයෙන්, උක් වගා කරන ලද ඉඩම් ප්‍රමාණය;

(ii) වගා කරන ලද මුළු ඉඩම් ප්‍රමාණයෙන් ලබා ගත් මුළු උක් ටොන් ප්‍රමාණය;

(iii) අඹරන ලද උක් ටොන් ප්‍රමාණය;

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

(iv) නිෂ්පාදනය කළ මුළු සීනි ප්‍රමාණය;

(v) සීනි අලෙවියෙන් ලබන ලද ලාභය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

අරස තොෂිල්මුයර්ච්චි මර්රුම් කණ්ඩි නගර අපිවිරුත්ති අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) පෙල්වත්තෙ සීනිත් තොෂිර්චාලෙ ආරම්පික්කප් පට්ට වරුටම් යාදු;

(ii) මේර්පඩි තොෂිර්චාලෙක්කාක ඔදුක්කප්පට්ට කාණිකළින් එක්කරළවු යාදු;

(iii) මේර්පඩි තොෂිර්චාලෙක්කාන කරුම්පුච් චෙය්කෙක්කාක ඔදුක්කප්පට්ට කාණිකළින් ඒක්කරළවු යාදු;

එන්පතෙ අවර් ඉච්චපෙක්කු අර්විවිප්පාරා?

(ආ) කටන්ත 5 වරුට කාලප්පකුතික්කුළ්,

(i) කරුම්පුච් චෙය්කෙක්කාක ඔදුක්කප්පට්ට කාණි කළින් අළවිල් කරුම්පුච් චෙය්කෙ මේර් කොළ්ළප්පට්ට කාණිකළින් අළවු;

(ii) පයිර්ච් චෙය්කෙ මේර්කොළ්ළප්පට්ට මොත්ත කාණිකළිලිරුන්තු පෙර්රුක්කොණ්ට මොත්ත කරුම්පු තොන්කළින් අළවු ;

(iii) පිලියප්පට්ට කරුම්පු තොන්කළින් අළවු;

(iv) උර්පත්ති චෙය්යප්පට්ට මොත්ත චීනියින් අළවු;

(v) චීනි විර්පනෙයින් මූලම් කිටෙත්ත ඉලාපම්;

ඔව්වොරු වරුටත්තිර්කිණංකවුම් වෙව්වේරාක එව්වළවු එන්පතෙ අවර් ඉච්චපෙක්කු අර්විවිප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Public Enterprise and Kandy City Development:

(a) Will he inform this House of-

(i) the year in which Pelwatta Sugar Factory was started;

(ii) the acreage of land allocated for that factory; and

(iii) the acreage of land allocated for cultivation of sugar cane for that factory?

(b) Will he also inform this House with relevance to each year, separately-

(i) the area cultivated with sugar cane out of the land allocated for sugar cane cultivation;

(ii) the total quantity of sugar cane obtained from the total area cultivated;

(iii) the quantity of sugar cane ground;

(iv) the total quantity of sugar produced; and

(v) the profit earned through the sale of sugar;

within the last five years?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 1986.

(ii) අක්කර 26,096.80යි.

(iii) අක්කර 24,026.00යි.

(ආ) (i), (ii), (iii) හා (iv) ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **සභාගත*** කරනවා. ගරු මන්ත්‍රීතුමනි, (ආ) කොටස යටතේ අසා ඇති ප්‍රශ්නවලට තිබෙන පිළිතුරේ හුඟක් තිබෙන්නේ tables.

(v)

| වසර | ලාභය/ අලාභය (රු.) | ලාභය / අලාභය |
|---|---|---|
| 2013 | 538,097,046 | ලාභ |
| 2014 | -220,831,292 | අලාභ |
| 2015 | -818,059,808 | අලාභ |
| 2016 | 483,954,754 | ලාභ |
| 2017 | -141,251,481 | අලාභ |

(ඇ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி :*
** Rest of the Answer tabled:*

(ආ) (i)

| වසර | වෙන් කළ ඉඩම් ප්‍රමාණය (අක්කර) | වගා කරන ලද ඉඩම් ප්‍රමාණය (අක්කර) |
|---|---|---|
| 2013 | 25,598.28 | 22,708.65 |
| 2014 | 26,151.14 | 22,751.88 |
| 2015 | 26,329.17 | 23,419.71 |
| 2016 | 26,626.63 | 22,914.82 |
| 2017 | 25,696.13 | 22,539.60 |

(ii)

| වසර | උක් සැපයුම (මෙ.ටො) |
|---|---|
| 2013 | 332,634.94 |
| 2014 | 229,582.34 |
| 2015 | 364,122.86 |
| 2016 | 416,385.87 |
| 2017 | 379,571.76 |

(iii)

| වසර | අඹරන ලද උක් ප්‍රමාණය (මෙ.ටොං) |
|---|---|
| 2013 | 332,634.94 |
| 2014 | 229,183.34 |
| 2015 | 364,122.86 |
| 2016 | 416,339.67 |
| 2017 | 378,516.95 |

(iv)

| වසර | සීනි නිෂ්පාදනය (මෙ.ටොං) |
|---|---|
| 2013 | 28,358.20 |
| 2014 | 17,964.30 |
| 2015 | 27,611.60 |
| 2016 | 34,187.95 |
| 2017 | 27,642.60 |

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මේ වනකොට පැල්වත්ත හා සෙවනගල යන සීනි කර්මාන්තශාලා දෙකේම අර්බුද විශාල ප්‍රමාණයක් මතු වෙලා තිබෙනවා. මා ඔබතුමාගේ අවධානය විශේෂයෙන්ම ඒ කෙරෙහි යොමු කරවනවා. මොකද, පසුගිය දවස්වල වෘත්තීය සමිති සාමාජිකයින් පාර්ලිමේන්තුවට පවා ඇවිල්ලා තමුන්නාන්සේත් මුණ ගැහුණා.

ගරු කථානායකතුමනි, පැල්වත්ත සීනි කර්මාන්ත ආයතනය තුළ පසුගිය දවස්වල අර්බුදයක් මතු වුණා. එය මාධ්‍යවලින් වාර්තා වුණා. පැල්වත්ත සීනි කර්මාන්තශාලාව විසින් අස්වනු මිලට ගැනීම ප්‍රමාද කිරීම නිසා උක් පැටවූ රථ 400ක පමණ ප්‍රමාණයකට එම ආයතනය ඉදිරි පිට පෝළිමේ ඉන්න සිද්ධ වුණා. පැල්වත්ත සීනි කර්මාන්තශාලාවට උක් අස්වැන්න භාර ගැනීමේ ප්‍රමාදය නිසා පසුගිය කාලයේ අස්වනු කපා පටවා දින 5ක් විතර කාලයක් load කරගෙන ඉන්න සිද්ධ වුණා. එම නිසා ගොවීන් -වගාකරුවන්- විශාල ප්‍රමාණයක් දැඩි අසහනයකට පත් වුණා. ඒ සම්බන්ධයෙන් විශාල ගැටලුවක් තිබෙනවා.

දෙවැනි කාරණය මෙයයි. සෙවනගල සීනි කර්මාන්ත ආයතනය පිළිබඳවත් අපට වාර්තා වෙලා තිබෙනවා. ඔබතුමාට පුළුවන් නම් ඒකටත් පිළිතුරක් දෙන්න. ඒක වෘත්තීය සමිති හරහාත් මතු වන කාරණයක්. දැනට සීනි කර්මාන්තශාලාව තුළ තිබෙන සීනි තොග - stocks - ඉතාම අඩු මුදලකට, ඒ කියන්නේ ඒ සමාගමට පාඩු වන ආකාරයේ අඩු මුදලකට වෙළෙඳ පොළට බෙදාහැරීම සඳහා අභ්‍යන්තර සැලසුමක් තිබෙනවා. 2018 අය වැයේදී පෞද්ගලීකරණය සඳහා ලැයිස්තුගත වුණු ලේඛනයේ පැල්වත්ත සහ සෙවනගල ආයතන තිබුණා. ඔබතුමා වෘත්තීය සමිති සාකච්ඡාවේදී කිව්වා, ඒ ක්‍රියාවලිය සිද්ධ වෙන්නේ නැහැ කියලා. ඒක හරි. නමුත්, ආයතනයේ සේවකයන්ට සැකයක් තිබෙනවා, සීනි තොග දහස් ගණන් මේ විධියට වෙළෙඳ පොළට දෙන්න යන්නේ ඒ සැලසුමේ එක් පියවරක් වශයෙන්ද කියලා. ඒ සීනි වෙළෙඳ පොළට දෙනවාද, සමාගම හෝ රජය විසින් කිසියම් මිලක් තීන්දු කරලා තිබෙනවාද, රටට දෙන්නේ කීයටද කියලා ඔබතුමාට වග කිව යුතු පිළිතුරක් දිය හැකිද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඇත්ත වශයෙන්ම එතුමාගේ මුල් ප්‍රශ්නයෙන් මේ ප්‍රශ්න දෙක ගැන අහලා නැහැ. එතුමා අහලා තිබෙන්නේ, වගා කරපු අක්කර ප්‍රමාණයයි, පසුගිය අවුරුදු පහේ ලාභයයි පමණයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පුළුවන් නම් පැහැදිලි කිරීමක් වශයෙන් උත්තරයක් දෙන්න ගරු අමාත්‍යතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

හැබැයි, මම මෙතුමාට උත්තරයක් දෙන්නම්. එම සමාගම පෞද්ගලික සමාගමකට දෙන්නවත්, කිසිම පුද්ගලයෙකුට දෙන්නවත් කිසිම බලාපොරොත්තුවක් නැහැ. මම ඒක කලිනුත් කියලා තිබෙනවා; අදත් කියනවා. සෙවනගල සමාගම රජයේ අයිතිය යටතේ තබා ගන්නා බව මම පැහැදිලිව කියනවා.

ඔබතුමා අහපු අනික් කාරණය පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. දැන් ඒක මහ හැරිලා තිබෙන්නේ. ප්‍රමාදය මහ හැරිලා තිබෙන්නේ. අනික් එක, වෙළෙඳ පොළේ මිල - market price එක - අනුව තමයි සීනි විකුණන්නේ. ලෝක වෙළෙඳ පොළේ මිල අඩුවීම නිසා සමහර වර්ෂවල සීනි අපනයනය කරන කොට විශාල අලාභ සිද්ධ වෙලා තිබෙනවා. අපට ඊට වඩා වැඩි මුදලකට දෙන්න බැහැ. Market එක අනුව මිල වෙනස් වෙනවා.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

පැල්වත්ත සහ සෙවනගල සීනි සමාගම් මේ වෙලාවේ වෙළෙඳ පොළට සීනි ලබා දෙන මිල කීයද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා දීර්ඝ ප්‍රශ්නයක් ඇහුවොත් මම සොයා බලා කියන්නම්. වෙළෙඳ පොළ මිල වෙනස් වෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, 2015 වර්ෂයේ විශාල අලාභයක් සිද්ධ වුණා. ඒකට හේතුව තමයි -

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු ඇමතිතුමනි, යම් කරුණක් ගැන දැන ගැනීමට මට පොඩි අවස්ථාවක් දෙන්න. ඔබතුමන්ලාගේ රජයෙන් ඊයේ-පෙරේදා සීනිවලට පනවපු බද්ද පාරිභෝගිකයාගෙන් අය වෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැහැ, නැහැ. එහෙම නැහැ.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඔබතුමා වග කීමෙන්ද කියන්නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔව්, වග කීමෙන් කියන්නේ.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු මුදල් ඇමතිතුමාගෙන් ඒ ගැන දැන ගන්න කැමැතියි.

**ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
ඒක සම්පූර්ණයෙන්ම වැරදි ප්‍රවෘත්තියක්. අපි ඒ බද්ද වැඩි කළත්, ඒ බද්ද පාරිභෝගියාට පාස් කරන්න එපා කියන පණිවුඩය අපි දුන්නා. ඒ ගොල්ලන් ඒක පිළිගත්තා. එහෙම නැත්නම්, MRP එකක් දමනවා කියලා අපි කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් හරි නේද, ගරු මන්ත්‍රීතුමනි? අපට දැන් COPE එකත් තිබෙනවා නේ. ඒ නිසා දැන් ඉස්සර වාගේ එක එක්කෙනාට ඕනෑ මිල ගණන්වලට විකුණන්න බැහැ. ඒවා හසු වෙනවා.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
දැන් ඇමතිතුමා කිව්වා නේ, සීනි market price එකට දෙනවා කියලා. දැන් තිබෙන market price එක මොකක්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා stock එක ගැන අහලා නැහැ. මම ඒ ගැන සොයා බලා උත්තරයක් දෙන්නම්. ඔබතුමා සවිස්තරාත්මක ප්‍රශ්නයක් අහන්න, stock එක ගැනයි, වෙළෙඳ පොළ මිල වෙනස් වෙන ආකාරය ගැනයි. එතකොට මම උත්තරයක් දෙන්නම්.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 - 1109/'18 - (1), ගරු විජිත හේරත් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 13 - 1116/'18 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

## ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යතුමා : පෞද්ගලික කාර්ය මණ්ඩලයට වෙන්කළ වාහන

தேசிய ஒருமைப்பாடு, நல்லிணக்கம் மற்றும் அரசகரும மொழிகள் அமைச்சர்: பிரத்தியேகப் பதவியணிக்கு ஒதுக்கப்பட்ட வாகனங்கள்

MINISTER OF NATIONAL INTEGRATION, RECONCILIATION AND OFFICIAL LANGUAGES :VEHICLES ALLOCATED TO PERSONAL STAFF

1179/'18

**14. ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියා පදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தேசிய ஒருமைப்பாடு, நல்லிணக்கம் மற்றும் அரசகரும மொழிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) தேசிய ஒருமைப்பாடு, நல்லிணக்கம் மற்றும் அரசகரும மொழிகள் அமைச்சரின் பிரத்தியேக பதவியணிக்கு இணைக்கப்பட்டுள்ள உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஒவ்வோர் உத்தியோத்தரதும் பெயர், பதவி, ஒதுக்கப்பட்டுள்ள வாகனத்தின் வகை, பதிவிலக்கம் மற்றும் அவ்விதம் ஒதுக்குவதற்கு அங்கீகாரம் வழங்கியது யார் என்பதை வெவ்வேறாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of National Integration, Reconciliation and Official Languages:

(a) Will he inform this House separately the name and designation of each officer who is attached to the personal staff of the Minister of National Integration, Reconciliation and Official Languages and has been allocated a vehicle, along with details on the type of vehicle allocated to them, registration number and the name of the officer who authorized such allocation of a vehicle?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා ඇමතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සිටින අයගේ තනතුර සහ ඔවුන්ට වෙන් කර තිබෙන වාහනවල වර්ගය කිව්වා නම්, මට ප්‍රමාණවත්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
හොඳයි.

(අ) ඔව්.

Annex – 01

| Se. No. | Name | Designation | Type of Vehicle | Model | Vehicle No |
|---|---|---|---|---|---|
| 1 | Mrs. Priyani Gunaratne | Private Secretary | Car | Sunny | CAE-5311 |
| 2 | Mr. Sakshin Dileep Ganesan | Media Secretary | Jeep | Nissan X-Trail | KV-9407 |
| 3 | Mrs. Maheshwari Ganesan | Coordinating Secretary | Car | Corolla ZRE141R | KX-7806 |
| 4 | Mr. S Kuhawardan | Coordinating Secretary | Double Cab | KB4TGJNXZR | PG-0671 |
| 5 | Mr. S Rajendran | PRO | Jeep | X-Trail | HS-5545 |

- In terms of the Circular No CA/1/17/1 dated 14th May 2010 by the Secretary to the President, the official vehicles mentioned above have been allocated for the aforesaid officers by the Secretary, Ministry of National Integration, Reconciliation and Official Languages.

එක්කෙනෙක් ඉන්නවා, Private Secretary විධියට. ඇයට Sunny වර්ගයේ කාර් එකක් දීලා තිබෙනෙවා. Media Secretary ඉන්නවා. ඔහුට Nissan X-Trail වර්ගයේ ජීප් එකක් ලබා දීලා තිබෙනවා. Coordinating Secretary කෙනෙක් ඉන්නවා. ඇයට Corolla වර්ගයේ කාර් එකක් ලබා දීලා තිබෙනවා. ඊළඟට, තවත් Coordinating Secretary කෙනෙක් ඉන්නවා. ඔහුට Double Cab එකක් ලබා දීලා තිබෙනවා. ඊළඟට, මහජන සම්බන්ධතා නිලධාරියෙක් -PRO- සිටිනවා. ඔහුට ජීප් එකක් ලබා දීලා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, එම ජීප් රථයේ වර්ගය මොකක්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒක X-Trail එකක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒකේ අංකය මොකක්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Vehicle number එක, HS-5545. එම වාහන පහ, ඉහත තනතුරු පහ දරන පස්දෙනාට අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමතිය ඇතුව ලබා දීලා තිබෙනවා. ඊට අමතරව ගරු ඇමතිතුමාගේ උපදේශක වශයෙන් කාලිංග චන්දන අරුණදේව සිල්වා කියන මහත්මයා කටයුතු කරනවා. එතුමාටත් Nissan Sunny වර්ගයේ කාර් එකක් ලබා දීලා තිබෙනවා. කැබිනට් අනුමතියකින් තමයි එය ලබා දී තිබෙන්නේ.

(ආ) පැන නොනඟී.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේක ප්‍රශ්නයකටත් වඩා ආණ්ඩුවේ අවධානයට යොමු කළ යුතු කාරණයක්. මා මේ ප්‍රශ්නය සෑම අමාත්‍යවරයෙකුගෙන්ම විමසලා තිබෙනවා. අමාත්‍ය කාර්ය මණ්ඩලවලට පෞද්ගලික ඥාතීන් - බිරිඳ, පුතා, දුව- පත් කර ගැනීමේ දරුණු, කැත සම්ප්‍රදායයක් තිබෙනවා. ඇමතිවරු පමණක් නොවෙයි, ජනාධිපතිවරුත් විවිධ තනතුරුවලට තමන්ගේ ළඟම ඥාතීන් පත් කර ගැනීමේ සම්ප්‍රදායයක් තිබෙනවා. එහෙම පත් වුණාට පස්සේ, ඒ නියෝජ්‍ය ඇමතිවරයා පාවිච්චි කරන වාහනයට වඩා මිල අධික වාහන සම්බන්ධීකරණ ලේකම්ට, පෞද්ගලික ලේකම්ට දෙනවා. මේ ප්‍රශ්නයට අදාළ ඇමතිවරයාගේ අමාත්‍යාංශයේ නම් බැලූ බැල්මට එහෙම දෙයක් පෙනෙන්නේ නැහැ. ආණ්ඩුවෙන් පෙට්‍රල් සීමා, ඩීසල් සීමා හදලා තිබෙනවා. වාහනයක් import කරනකොටත් ඔබතුමන්ලා ඒ permit එකට යම් කිසි සීමාවක් දාලා තිබෙනවා. නමුත්, පෞද්ගලික කාර්ය මණ්ඩලවලට වාහන ලබා දීමේදී, එක්කෙනෙකුට Mercedes-Benz එකක් දෙන කොට, අනෙක් කෙනාට Double Cab එකක් දෙන ක්‍රමය සුදුසු නැහැ. අපි කියන්නේ නැහැ ඒ අයට කරත්ත දෙන්න කියලා. නමුත් මේ වාහන අතර මහා විශාල වෙනසක් තිබෙනවා. අවසානයේ වෙන දේ මෙයයි. නියෝජ්‍ය ඇමතිවරු පත්වුණාම, රාජ්‍ය ඇමතිවරු පත්වුණාම රටේ බදු මුදල්වලින් ඔවුන්ට අලුතින් වාහන ගෙන්වන්න වෙනවා. සභානායකවරයා තමයි මෙතැන ඉන්න ජ්‍යෙෂ්ඨතම ඇමතිවරයා. ඒ නිසා ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, කරුණාකරලා අමාත්‍යාංශවලට වාහන වෙන් කිරීම සම්බන්ධව චක්‍රලේඛයක් හදන්න කියලා. සමහර නියෝජ්‍ය ඇමතිවරු ඉන්නවා, ඔවුන් පාවිච්චි කරන වාහනවලට වඩා මිල අධික නැත්නම් වටිනාකමින් වැඩි වාහන පාවිච්චි කරන පෞද්ගලික ලේකම්වරු ඉන්න. ඕනෑනම් මට නම්වලින් සඳහන් කරලා කියන්නත් පුළුවන්. එහෙම ඇමතිවරු ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලයේ ඉන්නවා. මට ඒක තමයි කියන්න තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි එවැනි ක්‍රමයක් හදන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එවැනි ක්‍රමයක් හදන්න. එතකොට රටේ බදු මුදල් ඉතුරු වෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි චක්‍රලේඛයක් හදන්නම්. ඔබතුමා කියන කථාවේ සත්‍යතාවක් තිබෙනවා. අපි රාජ්‍ය පරිපාලන ඇමතිවරයාත් එක්ක සාකච්ඡා කරලා ඒ කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක සාධාරණයි. අතුරු ප්‍රශ්න ඉවරද ගරු මන්ත්‍රීතුමනි?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විෂය භාර ඇමතිවරයා මේ සභාවේ නැති වුණත්, අදාළ ප්‍රශ්නයක් නිසායි මම අහන්නේ. මා මේ සභාවේදී ඊයේත් මේ කරුණ මතු කරනු ලැබුවා. ශ්‍රී ලංකා පරිපාලන සේවා විභාගය ජාතික සමඟියට බලපාන ප්‍රශ්නයක් ලෙස දැන් මතු වෙමින් එන බවක් පෙනෙනවා. ඊයේ ගරු ඇමතිතුමා ඒ සම්බන්ධව ප්‍රකාශයක් කළා. අපි ස්තුතිවන්ත වෙනවා, එතුමා ඒ සත්‍ය තත්ත්වය හෙළිදරව් කිරීම පිළිබඳව. විභාග දෙපාර්තමේන්තුව පැවැත්වූ එම විභාගයේදී අක්‍රමිකතා සිදුවෙලා තිබෙනවා. එම නිසා ඒ විභාගය අත්හිටුවීමට දැනට පරීක්ෂණ සිදු කරනවා කියලා තමයි එතුමා ප්‍රකාශ කළේ. අත්හිටුවනවා කියලාම කිව්වේ නැහැ. නමුත්, ඒ පැත්තට තමයි යමින් තිබෙන්නේ. දැන් මෙහි තිබෙන තත්ත්වය මෙයයි.

ගරු කථානායකතුමනි, ඔබතුමා ඊයේ නොසිටි නිසා මට තව තත්පර 10ක් දෙන්න, මේ කරුණ පැහැදිලි කරන්න. ඒ විභාගයෙන් වැඩිම ලකුණු තිබෙන 59දෙනෙක් තෝරාගෙන තිබෙනවා.

ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු පවා අමාත්‍යාංශයට කැඳවා ගත්තාට පස්සේ තමයි දැන් මේ පරීක්ෂණය ගෙනැල්ලා විභාගය තහනම් කරන්න හදන්නේ. ගරු කථානායකතුමනි, ඒ සඳහා යොදා ගන්නා එක තර්කයක් වෙලා තිබෙනවා, මේ සමත්වූවන් අතර, සිංහල නොවන -මම එහෙම කියන්නම්- අපේක්ෂකයන් සැලකිය යුතු ප්‍රමාණයක් ඉන්නවාය කියන එක. ඒ නිසා මේක ඉතා සංවේදී ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. විභාගය පවත්වපු ගමන් මෙවැනි ප්‍රශ්නයක් මතුවෙලා නැහැ. නමුත් විභාගය කරලා, ඒ ඔක්කෝම කටයුතු අවසන් වුණාට පස්සේ තමයි විභාගය තහනම් කරන්න යන්නේ. විභාගයේදී වංචා කරලා තිබෙනවා නම්, සිංහල දෙමළ කියලා ප්‍රශ්නයක් නැහැ, ඒ විභාග ප්‍රතිඵල වැරදියි. එහෙම නම්, ඒ විභාගය තහනම් කරනවා හා සමානවම ඒ වැරැද්ද කරපු විභාග දෙපාර්තමේන්තුවේ හෝ අදාළ අමාත්‍යාංශයේ අදාළ අයට දඬුවම් දෙන ගමන් තමයි මේ කටයුත්ත කරන්න ඕනෑ. එසේ නැතිව, වැරැද්ද කරපු මිනිහා පැත්තක සිටිද්දී මේ විධියට කටයුතු කිරීමෙන් විශාල පිරිසක් පීඩාවට පත් වෙනවා. මේ සමහර අයගේ වයස ඉක්මවා යනවා. ඒ අයට නැවත විභාග ලියන්නත් බැරි වෙනවා. ඒ වාගේම, ඊළඟට තියන්න තිබෙන SLAS Exam එකත් කල් යනවා. මෙහිදී විශාල අසාධාරණයක් හා ජාතිවාදී ප්‍රශ්නයක් මතුවෙන නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, වහාම පරීක්ෂණ කරලා, ඔප්පු කරලා, දඬුවම් දීලා, මේ විභාගය තහනම් කරනවා නම් සාධක සහිතව තහනම් කරන්න කියලා. ස්තුතියි.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, may I add one word?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, go ahead.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Hon. Speaker. I wish to bring to the notice of the Government that it is a very serious issue that has arisen for the reason that out of the 59 candidates who were called for the interview, 21 were Tamil-speaking persons. It is because of that, one year after the Exam was concluded, this action is being taken to cancel the Exam. This happened about three years ago also for the Sri Lanka Accountants' Service exam and that became a big issue. So, I am appealing to the Government not to take this step. If there was any irregularity in the Exam, that should have been known at the time the Exam was held. All the exam centres were in Colombo and it is a very, very serious issue if this Exam is cancelled. It is not merely a suspicion but perception and it will be proved that there is a rank discrimination on the basis of language.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the House, you can give your attention to that matter.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ ඇමතිවරයාගේ අවධානයට මම ඒ කාරණය යොමු කරන්නම්. සුමන්තිරන් මන්ත්‍රීතුමා කියපු කාරණය ඇත්ත. විභාගය පවත්වා අවුරුද්දකට පස්සේ කියන්න බැහැ, විභාගය වැරදියට පැවැත්වුවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, that is true.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මේ කාරණය සම්බන්ධයෙන් අධිකරණයට ගියොත් අනවශ්‍ය ප්‍රශ්න ඇති වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 4 - 212/'18 - (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## බ්ලූමැන්ඩල් වරාය පිවිසුම දෙපස භූමිය : වරාය අධිකාරියට පවරා ගැනීම

## புளுமெண்டல் துறைமுகப் பிரவேச வழியின் இருமருங்கிலுமுள்ள நிலப்பகுதி: துறைமுக அதிகாரசபைக்குக் கையேற்றல்

## LAND ON EITHER SIDE OF BLUEMANDEL ENTRANCE TO PORT: ACQUISITION BY PORTS AUTHORITY

542/'18

**8. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා (ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට)**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா - மாண்புமிகு வாசுதேவ நாணாயக்கார சார்பாக )
(The Hon. T. Ranjith De Zoysa on behalf of the Hon. Vasudeva Nanayakkara)

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බ්ලූමැන්ඩල් වරාය පිවිසුම දෙපස භූමිය ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරාගෙන බහලුම් පරීක්ෂා කිරීමට භාවිත කරන්නේ නම්, දැනට බහලුම් පරීක්ෂා කරන අංශ පිහිටා ඇති නුගේ පාර යන ස්ථානය වෙත ගමන් කිරීමේදී ඇතිවන පැය 6 - 10 අතර විශාල ප්‍රමාදය වළක්වා ගත හැකි බව පිළිගන්නේද;

(ii) සමහර ආනයනකරුවන් ඔවුන්ගේ ගබඩා හිස්වනතුරු ආනයනය කර ඇති භාණ්ඩ නිදහස් කර ගැනීම ප්‍රමාද කරමින් ප්‍රමාද ගාස්තු ගෙවීමට කටයුතු කිරීම ඔවුන්ට ලාභයක් බව දන්නේද;

(iii) එසේ නම්, ඉහත (i) සහ (ii) සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புளுமெண்டல் துறைமுகப் பிரவேச வழியின் இருமருங்கிலுமுள்ள நிலப்பகுதியை இலங்கைத் துறைமுக அதிகாரசபைக்குக் கையேற்று கொள்கலன்களைப் பரிசோதனை செய்யப் பயன்படுத்துவதாயிருப்பின், தற்போது கொள் கலன்களைப் பரிசோதனை செய்வதற்கான பிரிவு அமைந்துள்ள நுகே வீதி நிலையத்தை நோக்கிச் செல்கையில் தோன்றுகின்ற 6-10 மணித்தியாலங்களுக்கிடைப்பட்ட பாரிய தாமதத் தைத் தவிர்த்துக்கொள்ள இயலுமென்பதை ஏற்றுக்கொள்கிறாரா;

(ii) ஒருசில இறக்குமதியாளர்கள் அவர்களின் களஞ்சியங்கள் வெறுமையாகும்வரை இறக்குமதி செய்துள்ள பண்டங்களை விடுவித்துக் கொள் வதைத் தாமதம்செய்து, தாமதக் கட்டணங்களைச் செலுத்த நடவடிக்கை மேற்கொள்வது அவர் களுக்கு இலாபமானதென்பதை அறிவாரா;

(iii) ஆமெனில், மேலே (i) மற்றும் (ii) சம்பந்தமாக மேற்கொள்ளப்படும் எதிர்கால நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Shipping:

(a) Will he inform this House-

(i) whether it is admitted that a significant delay of 06 to 10 hours resulted when traveling to the Nuge Road Container Inspection Division where containers are currently inspected can be avoided if the land on either side of the Bluemandel entrance to the port is acquired by the port and utilized for the inspection of containers;

(ii) whether he is aware that the payment of demurrage is profitable for certain importers who purposely delay the clearance of goods that they have imported until their warehouses get emptied; and

(iii) if so, the future measures taken with pertinence to (i) and (ii) above?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ප්‍රශ්නයේ දක්වා ඇති පරිදි නුගේ පාරේ පිහිටි පහසුකම් බහලුම් පරීක්ෂණ මධ්‍යස්ථානයක් නොවේ. මෙය අර්ධ පූර්ණ බහලුම්වල ආනයනික නැව් භාණ්ඩ මෙහෙයුම් කිරීම සඳහා යොදා ගනු ලැබේ. (එක් ප්‍රේෂණලාභියෙකුට වඩා වැඩි ගණනක් සඳහා ආනයනික බහලුම්) වරාය තුළ/නගරය තුළ රථ වාහන තදබදය අවම කිරීම සහ ප්‍රේෂණලාභීන් හට වඩාත් හොඳ සේවාවක් සැපයීම සඳහා මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2000 වසරේදී ස්ථාපනය කරන ලදී. පහසුවෙන් ළඟා විය හැකි හෙයින් ප්‍රේෂණලාභීන් මෙම පහසුකමට වැඩි කැමැත්තක් දක්වනු ලැබේ.

කෙසේ නමුත්, පෞද්ගලික පර්යන්ත මෙහෙයුම්කරුවන් දෙදෙනකු මඟින් මෙහෙයවන රේගු ආනයන බහලුම් පරීක්ෂණ මධ්‍යස්ථාන 3ක් කොළඹ නගරය තුළ පිහිටා තිබේ. මේ අතුරින් මධ්‍යස්ථාන 2 (ශ්‍රේලයින් i සහ RCT) ඔරුගොඩවත්තේ පිහිටා ඇති අතර එකක් (ශ්‍රේලයින් ii) කොටළඟ පිහිටා ඇත. ආනයනය කරන ලද බහලුම්ගත භාණ්ඩයන්හි රේගු විමර්ශන කටයුතු මෙම පහසුකම් තුළදී සිදු වේ.

ආනයනික භාණ්ඩ වරාය මඟින් නිෂ්කාශනය කිරීමෙන් පසුව මෙම රේගු විමර්ශනයන් සිදුවන බැවින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මේ ක්‍රියාවලිය සඳහා දායක නොවේ.

නගරය තුළ රථ වාහන තදබදය හේතුවෙන් මෙම පරීක්ෂණ මධ්‍යස්ථාන වෙත දිවා කාලය තුළදී ළඟා වීමට අපහසු වේ. නගරයේ රථවාහන පොලිසිය මඟින් මාර්ගයන්හි බහලුම් රැගෙන යාම කාර්යබහුල කාලය තුළදී විශේෂයෙන්ම ඉහුරුකඩේ මං සංදිය අසලදී පාලනය කෙරෙන අතර එහිදී සාමාන්‍ය රථවාහන සඳහා ප්‍රමුඛත්වය ලබා දේ. එම නිසා, දක්වා ඇති පරිදි ආනයනය කරන ලද පූර්ණ බහලුම් පැටවුම් රැහෙන යන ට්‍රක් රථ ප්‍රමාදයන්ට ලක්වේ.

ශ්‍රී ලංකා රේගුව විසින් මෙය හඳුනාගෙන ඇති අතර, කසල එක්රැස් කිරීමේ ස්ථානය පිහිටා ඇති බ්ලූමැන්ඩල් පෙදෙසේ වරාය ප්‍රවේශ මාර්ගයට ආසන්නව බහලුම් නිෂ්කාශන පහසුකමක් ස්ථාපිත කිරීමට රේගු දෙපාර්තමේන්තුව සහ මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය එක්ව පියවර ගනිමින් පවතී. මීට අමතරව, මෙම කාර්යය නගරයේ සිට නගරයෙන් බැහැරට ගෙන යෑම සඳහා නගරයෙන් පිටත විශාල නිෂ්කාශන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ආසියානු සංවර්ධන බැංකුව අපේක්ෂා කරයි.

(ii) කොළඹ නගරය තුළ ගබඩා පහසුකම් හිඟවීම හේතුවෙන් සහ වරාය ගබඩා ගාස්තු ගෙවීම අතිරේක ගබඩා පහසුකම් සකස් කිරීමට වඩා වියදම අඩු බැවින් සමහර අපනයනකරුවන් ඔවුන්ගේ භාණ්ඩ සඳහා ගබඩා ප්‍රදේශයක් ලෙස වරාය භාවිත කරන බවට චෝදනාවක් ඇත.

බොහෝ අමුද්‍රව්‍ය ආනයනකරුවන් ඔවුන්ගේ භාණ්ඩ (අමුද්‍රව්‍ය) අවසන් මොහොතේදී ආනයනය කරනු ලැබේ. එම නිසා ඔවුන් ගැන සැලකීමේදී සිතාමතා ප්‍රමාදයන් සිදු නොවේ.

කෙසේ නමුත්, කොළඹ නගරයේ සිට මෙහෙයුම් සිදුකරන පුද්ගලයින් (ගබඩා පහසුකම් සීමිත හෙයින්) විසින් ඔවුන්ගේ දැනට ඇති තොග ප්‍රමාණයන් අවසන් වනතුරු පැමිණ ඇති නැව් බඩු නිෂ්කාශනය කිරීම ප්‍රමාද කිරීමට පෙළඹීය හැක.

වර්තමාන ගබඩා කුලී ගාස්තුවලට අනුකූලව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ පෞද්ගලික පර්යන්ත මෙහෙයුම්කරුවන් විසින් වැඩ කරන දින 3ක (නිවාඩු දින අත්හැර) කාල සීමාවක් සඳහා වරාය තුළ ආනයනික බහලුම් සඳහා නොමිලේ ගබඩා පහසුකම් ලබා දෙනු ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස සතිය මධ්‍යයේදී නැව්බඩු ලැබෙන ආනයනකරුවෙකු හට ඒ සමගම නිවාඩු දිනයන්ද ඇති විට, දින 5-7 දක්වා කාල සීමාවක් සඳහා නොමිලයේ ගබඩා පහසුකම් හිමිවේ. වරාය සහ රේගු ලිපි ලේඛන දිවා කාලයට පමණක් සීමා කළ කාලයේදී මෙම සහනය ලබා දෙන ලදී. කෙසේ නමුත්, 2016 වසරේ සිට ගෙවීම් සහ ලිපි ලේඛන කටයුතු පහසු කිරීම සඳහා පැය 24 පුරා පාර්ශ්වයන් ද්විත්වය විසින් සේවය සැපයීම ආරම්භකොට ඇති හෙයින් මෙම නොමිලයේ ලබා දෙන ගබඩා පහසුකම් දින 3කට (නොමිලයේ ලබා දෙන ගබඩා පහසුකම් කාල සීමාව සඳහා නිවාඩු දිනයන් ඇතුළු වේ) පමණක් සීමා කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය යෝජනා කරන ලදී. මෙමඟින් ආනයනකරුවන් නිෂ්කාශනය ප්‍රමාද කිරීම අධෛර්යමත් කෙරෙනු ඇත. මෙම වෙනස ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

(iii) (i) විශාල නිෂ්කාසන මධ්‍යස්ථානයක් සඳහා බලපෑමැත්ඩල් ප්‍රදේශයන් ඉඩමක් ලබා ගැනීමට ශ්‍රී ලංකා රේගුව සහ මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය (නාගරික සංවර්ධන අධිකාරිය) විසින් පියවර ගනිමින් පවතී.

(ii) මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය හිමි වූ පසු නැව් බඩු නිෂ්කාශනය සඳහා දින 3 පමණක් ආනයනකරුවෙකුට හිමි වන ලෙස තිරුබදු සංශෝධනය කරන අතර එම කාලය තුළ නිෂ්කාශනය නොකළ හොත් නිකුත් කරන දිනයේ සිට ගබඩා තුළ ගාස්තු අය කරනු ඇත.

(ආ) පැන නොනඟී.

## ශ්‍රී ලංකාවේ ධීවර වරායන්: විස්තර
## இலங்கையிலுள்ள கடற்றொழில் துறைமுகங்கள்: விபரம்
## FISHERY HARBOURS IN SRI LANKA: DETAILS

567/'18

**9. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු අශෝක ප්‍රියන්ත මහතා වෙනුවට)**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு அசோக்க பிரியந்த சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. Ashoka Priyantha)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ධීවර වරායන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව, මෙම එක් එක් ධීවර වරාය සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள கடற்றொழில் துறைமுகங்களின் எண்ணிக்கையையும்;

(ii) அவற்றின் பெயர்களையும்;

(iii) நல்லாட்சி அரசாங்கம் ஆட்சியேற்றதன் பின்னர், மேற்படி ஒவ்வொரு கடற்றொழில் துறைமுகத்தையும் அபிவிருத்தி செய்வதற்கு அமைச்சு எடுத்துள்ள நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries & Aquatic Resources Development and Rural Economic Affairs:

(a) Will he inform this House-

(i) the number of fishery harbours in Sri Lanka;

(ii) the names of those harbours; and

(iii) the steps taken by the Ministry to develop each of those fishery harbours, after the "Good Governance" Government came into power?

(b) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 20කි. මීට අමතරව අලුතින් වරායන් 03ක වැඩ නිමවෙමින් පවතී.

(ii) 1. පානදුර ධීවර වරාය
2. බේරුවල ධීවර වරාය
3. අම්බලන්ගොඩ ධීවර වරාය

4. හික්කඩුව ධීවර වරාය
5. දොඩන්දුව ධීවර වරාය
6. ගාල්ල ධීවර වරාය
7. මිරිස්ස ධීවර වරාය
8. පුරාණවැල්ල ධීවර වරාය
9. සුදුවැල්ල ධීවර වරාය
10. නිල්වැල්ල ධීවර වරාය
11. කුඩාවැල්ල ධීවර වරාය
12. තංගල්ල ධීවර වරාය
13. හම්බන්තොට ධීවර වරාය
14. කිරින්ද ධීවර වරාය
15. වාලවේචේන ධීවර වරාය
16. කොඩ්ඩේ ධීවර වරාය
17. කල්පිටිය ධීවර වරාය
18. හලාවත ධීවර වරාය
19. මීගමුව ධීවර වරාය
20. දික්ඔවිට ධීවර වරාය
21. කලමැටිය ධීවර වරාය - 97%ක් වැඩ නිමකොට ඇත.
22. මයිලඩි ධීවර වරාය - ධීවර වරාය සඳහා මුල් ගල තබා ඇත.
23. වෙල්ලමන්කර ධීවර වරාය - 7%ක් වැඩ නිමකොට ඇත.

(iii) ගාල්ල ධීවර වරාය -

ධීවර වරායේ වේදිකා බැම්ම සංවර්ධනය කිරීම

ගාල්ල ධීවර වරායේ මීටර් 58ක් දිග නව සේවා ජැටි ඉදිකිරීම

එම වරාය සඳහා ටොන් 55ක ජංගම දොඹකරයක් මිලදී ගැනීම

මිරිස්ස ධීවර වරාය -

මීටර් 82ක් දිග සේවා ජැටි ඉදි කිරීම

මීටර් 56ක් දිග වේදිකා බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම

මීටර් 100ක් දිග නව වේදිකා බැම්ම ඉදි කිරීම

දැල් සැකසුම් මධ්‍යස්ථානය ඉදි කිරීම

වරායේ ජල අපහරණ පද්ධතිය සැකසීම හා පියරය කොන්ක්‍රීට් කර කාණු පද්ධතිය සැකසීම

කුඩාවැල්ල ධීවර වරාය -

මීටර් 100ක් දිග නව සේවා ජැටි ඉදි කිරීම

ධීවර වරායේ වේදිකා බැම් සංවර්ධනය කිරීම

දියකඩන බැම් අලුත්වැඩියා කිරීම

වරායේ අප ජල ප්‍රවාහන පද්ධතිය සැකසීම

පානීය ජල පද්ධතිය සැකසීම

වරායේ පාලම් තරාදි සවි කිරීම

කිරින්ද ධීවර වරාය -

මීටර් 50ක් දිග නව වේදිකා බැම්ම ඉදි කිරීම

ධීවර වරායේ වේදිකා බැම් සංවර්ධනය කිරීම

දියකඩන බැම් අලුත්වැඩියා කිරීම

පුරාණවැල්ල ධීවර වරාය -

ධීවර වරායේ බෙසමේ ඇති ගල් ඉවත් කර බෙසම ගැඹුරු කිරීම

සුදුවැල්ල ධීවර වරාය -

ධීවර වරායේ බෙසමේ ඇති ගල් ඉවත් කර බෙසම ගැඹුරු කිරීම

මීටර් 260ක දිගකින් යුතු දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීම

හම්බන්තොට ධීවර වරාය -

වරායේ පිටත බෙසමේ වැලි ඉවත් කර බෙසම ගැඹුරු කිරීම

ධීවර වරායේ නව ඉන්ධන ටැංකිය සවි කිරීම

හලාවත ධීවර වරාය -

ධීවර වරායේ මත්ස්‍ය වෙන්දේසි ශාලාව (වපසරිය - 1360 වර්ග මීටර්)

ආරක්ෂක කුටි ඉදි කිරීම

එම වරාය සඳහා පාලම් තරාදි සවි කිරීම

දික්ඔවිට ධීවර වරාය -

ධීවර වරායේ මීටර් 440ක දිගකින් යුතු වරාය ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

වෙල්ලමන්කර ධීවර වරාය -

ධීවර වරාය ඉදි කිරීම

කලමැටිය ධීවර වරාය -

ධීවර වරායේ වැඩ කටයුතු 2018 අගෝස්තු වන විට 97% කින් පමණ නිමකර ඇති අතර මෙම වර්ෂයේ විවෘත කිරීමට යෝජිතය

මයිලඩි ධීවර වරාය -

ධීවර වරාය සඳහා මුල් ගල තැබීම

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 - 1109/'18 - (1), ගරු විජිත හේරත් මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය අහලා තිබෙන්නේ ස්වදේශ කටයුතු අමාත්‍යාතුමාගෙන්. එතුමා මාසයක් කල් ඉල්ලා තිබෙනවා. නමුත් ස්වදේශ කටයුතු ඇමතිතුමා මට දැනුම් දුන්නා, එම ප්‍රශ්නය එතුමාගේ අමාත්‍යාංශයට නොවෙයි අදාළ වෙන්නේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් මොන අමාත්‍යාංශයටද අදාළ වන්නේ?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට විය යුතුයි කියලා තමයි එතුමා කිව්වේ.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, එහෙම නම් අදාළ අමාත්‍යාංශයට යොමු කරන්නය කියා ඉල්ලා සිටිනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය අදාළ අමාත්‍යාංශයට යොමු කළ යුතු වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් පාලනය වන පුරාවිද්‍යා ස්ථාන : විස්තර
## மத்திய கலாசார நிதியத்தினால் நிருவகிக்கப்படும் தொல்பொருளியல் நிலையங்கள்: விபரம்
## ARCHEOLOGICAL SITES COMING UNDER CENTRAL CULTURAL FUND: DETAILS

1116/'18

**13. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. T. Ranjith De Zoysa on behalf of the Hon. Dayasiri Jayasekara)

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් පාලනය වන පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් එක් එක් දිස්ත්‍රික්කය අනුව සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම ස්ථාන සඳහා 2015 වර්ෂයේ සිට බඳවා ගත්,

(i) ස්ථිර සේවකයන් සංඛ්‍යාව;

(ii) අනියම් සේවකයන් සංඛ්‍යාව;

(iii) කොන්ත්‍රාත් පදනමට අයත් සේවකයන් සංඛ්‍යාව;

(iv) අනියම් සේවකයන්ගෙන් ස්ථිර සේවයට ඇතුළත් කරගන්නා ලද සේවකයන් සංඛ්‍යාව;

(v) කොන්ත්‍රාත් පදනමට අයත් සේවකයන්ගෙන් ස්ථිර සේවයට ඇතුළත් කර ගන්නා ලද සේවකයන් සංඛ්‍යාව;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) මෙම බඳවා ගැනීම් රජය විසින් පිළිගත් ක්‍රමවේදයන්ට අනුව සිදු කර තිබේද;

(ii) මේ වනවිට පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மத்திய கலாசார நிதியத்தினால் நிருவகிக் கப்படும் தொல்பொருளியல் நிலையங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி நிலையங்களின் பெயர்களை ஒவ் வொரு மாவட்டத்துக்கும் ஏற்ப குறிப்பிடுவாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி நிலையங்களுக்கு 2015ஆம் ஆண்டு முதல் ஆட்சேர்ப்பு செய்யப்பட்ட,

(i) நிரந்தர ஊழியர்களின் எண்ணிக்கை;

(ii) அமைய ஊழியர்களின் எண்ணிக்கை;

(iii) ஒப்பந்த அடிப்படையிலான ஊழியர்களின் எண்ணிக்கை;

(iv) அமைய ஊழியர்களில் நிரந்தர சேவையில் இணைக்கப்பட்ட ஊழியர்களின் எண்ணிக்கை;

(v) ஒப்பந்த அடிப்படையிலான ஊழியர்களில் நிரந்தர சேவையில் இணைக்கப்பட்ட ஊழியர் களின் எண்ணிக்கை;

ஒவ்வொரு மாவட்டத்துக்கும் ஏற்ப வெவ்வேறாக யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி ஆட்சேர்ப்புகள் அரசாங்கத்தினால் அங்கீகரிக்கப்பட்ட நடைமுறைக்கு ஏற்ப மேற் கொள்ளப்பட்டுள்ளனவா;

(ii) தற்போது காணப்படும் ஊழியர்களின் வெற்றி டங்கள் ஒவ்வொரு மாவட்டத்துக்கும் ஏற்ப வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education & Cultural Affairs:

(a) Will he inform this House-

(i) the number of archeological sites coming under the purview of the Central Cultural Fund;

(ii) the names of the aforesaid sites as per each district?

(b) Will he also inform this House separately for each district-

(i) the number of permanent employees;

(ii) the number of casual employees;

(iii) the number of employees serving under the contract basis;

(iv) the number of employees absorbed to the permanent service out of the casual workers; and

(v) the number of employees absorbed to the permanent service out of the contract basis employees;

recruited for the aforesaid sites from the year 2015?

(c) Will he further inform this House-

(i) whether these recruitments have been made as per the methodologies accepted by the Government; and

(ii) the number of staff vacancies currently existing as per each district?

(d) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පුරාවිද්‍යා ස්ථාන 29යි.

(ii) ඔව්.

**ඇමුණුම් අංක 01* බලන්න.**

(ආ) (i) 838යි.

**ඇමුණුම් අංක 02* බලන්න.**

(ii) 08යි.

**ඇමුණුම් අංක 03*** බලන්න.

(iii) 259යි.( මධ්‍යම සංස්කෘතික අරමුදල)

**ඇමුණුම් අංක 04*** බලන්න.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත් සේවක සංඛ්‍යාව 1373යි**. ඇමුණුම් අංක 05*** බලන්න.

(මේ සඳහා අනුමත සේවක සංඛ්‍යාව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීම් පටිපාටිය අනුමත කර ගන්නා තෙක් මධ්‍යම සංස්කෘතික අරමුදලින් වැටුප් ගෙවනු ඇත.)

(iv) 462යි.

**ඇමුණුම් අංක 06*** බලන්න.

(v) කොන්ත්‍රාත් පදනම මත කිසිදු සේවකයෙකුට ස්ථිර පත්වීම් ලබා දී නොමැත.

ඉහත පිළිතුර අනුව අදාළ නැත.

(ඇ) (i) මෙම බඳවා ගැනීම් රජය පිළිගත් ක්‍රමවේදයන්ට අනුව සිදු කර ඇත.

(ii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ අනුමත වී ඇති බඳවා ගැනීම් පටිපාටියේ දිස්ත්‍රික් අනුව සේවක පුරප්පාඩුවලට බඳවා ගැනීම සම්බන්ධව අනුමැතිය ලබා දී නොමැත.

(ඈ) දැනට සකස් කරමින් පවතින බඳවා ගැනීම් පටිපාටියේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති කාර්යාලයන්ට අදාළව පුරප්පාඩු පිරවීම සඳහා සකස් කර ඇත.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### I

## කාන්තා පොලිස් නිලධාරිනියන්ගේ උසස් වීම්
## பெண் பொலிஸ் உத்தியோகத்தர்களின் பதவி உயர்வு
## PROMOTIONS OF WOMEN POLICE OFFICERS

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும், ஒழுங்கும் அமைச்சரான கௌரவ ரஞ்ஜித் மத்தும பண்டார அவர்களிடம் கேட்க அனுமதித்ததற்கு நன்றி,

இலங்கைப் பொலிஸ் சேவையானது, கடந்த 03 ஆம் திகதி தனது 152ஆவது வருடத்தினைப் பூர்த்தி செய்துள்ளது. இந்த நிலையில், இலங்கைப் பொலிஸ் சேவையில் பெண் பரிசோதகர்கள் பதவி உயர்வுகளிலிருந்து தடுக்கப்பட்டு வருகின்றனர் என்ற குற்றச்சாட்டு முன்வைக்கப்பட்டு வருகின்றது. 1997ஆம் ஆண்டு இலங்கைப் பொலிஸ் சேவையில் 120 பெண்கள் உதவி பரிசோதகர்களாகப் பதவியில் இணைந்துகொண்டனர் என்றும், இவர்களில் சிலர் 2003 மற்றும் 2006ஆம்ஆண்டுகளில் சிரேஷ்ட பரிசோதகர் களாகப் பதவி உயர்த்தப்பட்டனர் என்றும் ஏனையோர் பதவி உயர்த்தப்படவில்லை என்றும் சிரேஷ்ட பொலிஸ் பரிசோதகர் நிலைக்கான பெண்கள் தரப்பு வெற்றிடங்கள் இன்மையே இதற்குக் காரணம் என்றும் தெரிவிக்கப்படுகின்றது. இந்த நிலைமை காரணமாக இலங்கைப் பொலிஸ் சேவையில் இணைந்துகொள்கின்ற பெண்கள் உதவிப் பொலிஸ் மா அதிபராகவோ, சிரேஷ்ட பொலிஸ் மா அதிபராகவோ, பொலிஸ் மா அதிபராகவோ வர இயலாத சூழ்நிலை இருப்ப தாகத் தெரிவிக்கப்படுகின்றது. தற்போதைய நிலையில், அரசியலில் பெண்களுக்கு 25 சதவீதமான ஒதுக்கீடுகளை வழங்குவதற்கு முன்வந்துள்ள நாட்டில் பொலிஸ் சேவையில் பெண்கள் தொடர்பில் காணக்கூடியதான மேற்படி நிலைப் பாடானது, பெண்களின் உரிமையினை மறுதலிப்பதாக உள்ளதாகத் தெரியவருகின்றது.

மேற்படி, விடயம் தொடர்பில் எனது பின்வரும் கேள்வி களுக்கான பதில்களையும் எடுக்கப்படக்கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ அமைச்சர் ரஞ்ஜித் மத்தும பண்டார அவர்கள் வழங்குவார் என எதிர்பார் கின்றேன்.

01. இலங்கைப் பொலிஸ் சேவையில் இதுவரையில் பதவி உயர்வு பெற்றுள்ள பெண் பரிசோதகர்கள் எத்தனை பேர்? உயர்த்தப்பட்ட பதவி நிலைகள் என்ன?

02. இலங்கைப் பொலிஸ் சேவையில் பதவி உயர்வு பெறக்கூடிய நிலையில் தற்போது எத்தனை பெண் பரிசோதகர்கள் சேவையில் இருக்கின்றனர்?

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

03. මේ‍ප්‍රකාර පෙණ් පරිසෝතකර්කලුක්කාන පතවි උයර්විර්කාන වෙට්‍රිඩංකළ් ඉල්ලෙ එනක් කූරප්පඩුකින්‍ර නිලෙයිල්, වෙට්‍රිඩංකළෙ එර්පඩුත්තුවතර්කු නඩවඩික්කෙ එඩුක්කප්පට්ටුල්ළතා?

04. මේ‍ප්‍රකාර පෙණ් පරිසෝතකර්කළුක්කු පතවි උයර්වුකළ් වළංකප්පඩ ඉයලුම් එනිල්, එප්පෝතු අතනෙ වළංක මුඩියුම් එන්පතෙ අරියත්තර මුඩියුමා?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Public Administration and Management and Law and Order)
ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. මේ වන විට කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුරේ සිට කාන්තා පොලිස් පරීක්ෂක තනතුරට නිලධාරිනියන් 229ක් උසස්වීම් ලබා ඇති අතර, කාන්තා පොලිස් පරීක්ෂක තනතුරේ සිට කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට නිලධාරිනියන් 15 දෙනෙක් උසස්වීම් ලබා ඇත.

02. කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති කාන්තා පොලිස් පරීක්ෂකවරියන්ගේ සංඛ්‍යාව 178කි.

03. 2015 වර්ෂයට පෙර කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ අනුමත තනතුරු සංඛ්‍යාව වූයේ තනතුරු 15කි. වත්මන් රජය යටතේ කාන්තා නිලධාරිනියන් වැඩිපුර සංඛ්‍යාවකට උසස්වීම් ලබා ගැනීමට අවස්ථාව සලසමින් එම තනතුරු සංඛ්‍යාව තනතුරු 66 දක්වා වැඩි කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගෙන ඇත.

04. කාන්තා පොලිස් පරීක්ෂක නිලධාරිනියන් කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සුදුසුකම් පරීක්ෂා කර බලා ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලනගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කර ක්‍රියාත්මක වෙමින් පවතින අතර, එම කාර්ය අවසන් වීමෙන් පසු ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පැවැත්වීමට ක්‍රියා කළ හැක.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැනගත යුතු කරුණක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, එතුමාට උත්තර දෙන්න කැමැතිද? මොකද, මේ සම්බන්ධයෙන් දැන් විවාදයකට යන්න බැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ කැමැත්තක් තිබෙනවා නම් අවසර ලබා දෙන්නම්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් දෙදෙනාම පොලිස්පතිතුමාට සති දෙකක් ඇතුළත ඉල්ලා අස්වෙන්න කියලා ඉල්ලීමක් කරලා තිබෙනවාද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
එහෙම කිසිදු ඉල්ලීමක් කරලා නැහැ. අපි දැක්කා උදේ මාධ්‍යවල එවැනි ප්‍රවාරයන් යනවා. නමුත්, එවැනි කිසිදු ඉල්ලීමක් කරලා නැහැ. ගරු රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමාත්, මමත් උදේ අමාත්‍යාංශයේ ඉන්න වෙලාවේ ඒ ගැන පොඩ්ඩක් විපරම් කරලා බැලුවා. අපි දැනුවත්ව නම් එහෙම කිසිදු ඉල්ලීමක් කරලා නැහැ, මාධ්‍යවලින් තමයි මේ ඉල්ලීම කරලා තිබෙන්නේ. [බාධා කිරීමක්] නැහැ, කිසිදු වාර්තාවක් ගැන මේ දක්වා පොලිස් කොමිසම හෝ අපේ අමාත්‍යාංශය දැනුවත් කිරීමක් කරලා නැහැ.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ජනාධිපතිවරයා ඔහුට දුරකථනයෙන් කථා කර, අයින් වෙන්න කිව්වා කියලා තමයි මාධ්‍යවල පළවන්නේ. දුරකථනයෙක් කථා කළ බව.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
දුරකථන සංවාදවලට නම් අපි සවන් දෙන්නේ නැහැ. අපි දැනුවත්ව නම් එහෙම දෙයක් සිදුවෙලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඊළඟට ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාගේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය අහන්නට කලින් මේ මතු වුණු ප්‍රශ්නයත් වැදගත් කියලා මා හිතනවා. පසුගිය කාලය පුරාවටම පොලිස්පතිවරයාගේ හැසිරීම ගැන ප්‍රශ්න තිබුණා. මම හිතන විධියට ඔබතුමාත් එතුමාව කැඳවලා උපදෙස් ලබා දීලා තිබෙනවා. නමුත්, එතුමා වෙනස් වෙලා නැහැ. එතුමාගේ තනතුරටත්, එතුමා දරන වග කීමටත් උචිත නොවන ආකාරයටයි එතුමා හැසිරෙන්නේ. ගරු නලින් බණ්ඩාර ජයමහ නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පොලීසිය භාර නියෝජ්‍ය අමාත්‍යවරයා

හැටියට එතුමාගේ හැසිරීම පිළිබඳව ඔබතුමන්ලාට තිබෙන අදහස මොකක්ද? තීන්දු, තීරණ කවරක් වුණත්. ඔබතුමන්ලා එය අනුමත කරනවාද? එවැනි පොලිස්පතිවරයෙක් මෙහෙයවන පොලිස් දෙපාර්තමේන්තුවක් විසින් රටේ නීතිය සහ සාමය නිසි පරිදි ස්ථාපිත කරන්න පුළුවන් වෙයි කියලා ඔබතුමා විශ්වාස කරනවාද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු මන්ත්‍රීතුමනි, පොලිස්පතිතුමා පත් කළේ ව්‍යවස්ථාදායක සභාවෙන්. එතුමා ගැන යම්කිසි ගැටලුවක් තිබෙනවා නම් කටයුතු කළ යුතු ආකාරයක් තිබෙනවා. දැනට එතුමා සම්බන්ධව අපේ අමාත්‍යාංශයට ලැබී තිබෙන යම් යම් චෝදනා සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් කටයුතු කරමින් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒ කියන්නේ පොලිස්පතිවරයාට විරුද්ධව අමාත්‍යාංශයට ලැබී තිබෙන යම් චෝදනා පිළිබඳව ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් මේ වන විට යම් පරීක්ෂණ කටයුත්තක් ආරම්භ කරලා තිබෙනවාද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු ඇමතිතුමා විසින් එසේ පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට නියම කරලා තිබෙනවා. ඒ සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණ පවත්වන්න කියලා අමාත්‍යාංශ ලේකම්තුමා දැනුවත් කරලා තිබෙනවා.

## II

## තෙල් මිල ඉහළ දැමීම නිසා ධීවර ප්‍රජාව මුහුණ පා ඇති ගැටලු

### எரிபொருள் விலை உயர்வினால் கடற்றொழிலாளர் சமூகம் முகம்கொடுக்கும் நெருக்கடி நிலைமை

### ISSUES FACED BY FISHING COMMUNITY DUE TO FUEL PRICE HIKE

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, 27 (2) ස්ථාවර නියෝගය යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

තෙල් මිල ඉහළ දැමීම නිසා ධීවර කර්මාන්තයේ නිරතවූවන් මුහුණ පා ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි. ගරු මුදල් අමාත්‍යතුමාත් සභාවේ සිටින නිසා වඩාත් හොඳයි.

පසුගිය මැයි මාසයේ 10වන දින ආණ්ඩුව නැවත වතාවක් ඉන්ධන මිල ඉහළ දැමීම හේතුවෙන් මේ රටේ සමස්ත ජනතාව ඉමහත් පීඩාවකට පත්ව සිටිනවා. ධීවර ප්‍රජාව ඒ අතර බරපතළ ලෙස පීඩාවට පත් වූ ක්ෂේත්‍රයක් ලෙස හැඳින්විය හැකියි. 2018 මැයි 10වන දා භූමිතෙල් ලීටරයක මිල රුපියල් 44 සිට රුපියල් 101 දක්වාද, ඩීසල් ලීටරයක මිල රුපියල් 95 සිට රුපියල් 109 දක්වාද ඉහළ දැමීම නිසා මේ රටේ ධීවර කාර්මිකයාට බලවත් පීඩාවකට මුහුණ දෙන්න සිදු වුණා. එයට එරෙහිව මේ රටේ ධීවර ප්‍රජාව රට වටා උද්ඝෝෂණ හා විරෝධතා ක්‍රියාවලියක නිරත වූ අතර, ඊට ප්‍රතිචාරයක් ලෙස ආණ්ඩුව භූමිතෙල් පමණක් රුපියල් 70ක් දක්වා පහත හෙලනු ලැබුවා.

එතකොට භූමිතෙල් පාවිච්චි කරන බෝට්ටුවලට මේ ප්‍රශ්නය පැන නඟින්නේ නැහැ, ගරු කථානායකතුමනි.

පෙට්‍රල් සහ ඩීසල් සඳහා මේ අඩු කිරීම බලපෑවේ නැහැ. ඉන්පසු ආණ්ඩුව නැවත වරක් මිල සූත්‍ර පෙන්වමින් ඉන්ධන මිල අවස්ථා දෙකකදී ඉහළ දැමුවා.

ඇත්තටම ගරු මුදල් ඇමතිතුමා අද පාර්ලිමේන්තුවට ඒ මිල සූත්‍ර සභාගත කරාවිය කියාත් මම බලාපොරොත්තු වෙනවා. දැන්, "බී" බෙදීම; "බී" එකතු කිරීම; "වී" එකතු කිරීම; "ඩබ්ලිව්" වැනි එක එක සූත්‍ර ගැන කියනවා. "බී" කියන්නේ, බැඳුම්කරය; "වී" කියන්නේ, "වැට්" එක; ඩබ්ලිව්" කියන්නේ, "වික්‍රමසිංහ" කියා සමහර අය කියනවා. ඒ වාගේ මිල සූත්‍රත් දැන් යනවා. එම නිසා නිසි මිල සූත්‍රය කුමක්ද කියා දැන ගන්නත් අපි කැමැතියි.

මේ වනවිට ඩීසල් ලීටරයක් රුපියල් 123ක් වෙනවා. මාස 4ක කාලයක් තුළදී වැඩිවීම රුපියල් 28ක් වන අතර, එය සියයට 30ක වැඩිවීමක්. මෙම මිල ඉහළයාම මේ රටේ ධීවර කර්මාන්තයේ නියුතු බහුදින ධීවර යාත්‍රා හා ඇතැම් එක්දින යාත්‍රා සඳහා සෘජුවම බලපාන කාරණයක් වන අතර, විශේෂයෙන්ම බහුදින ධීවර යාත්‍රාවකට එක් මුහුදු ගමන් වාරයක් සඳහා ඩීසල් ලීටර් 3,000 සිට 20,000 දක්වා වැය වෙනවා. මේ මිල වැඩි වීම නිසා බහුදින ධීවර යාත්‍රාවකට එක් ගමන් වාරයක් සඳහා රුපියල් 84,000 සිට රුපියල් 560,000 දක්වා මුදලක් ඩීසල් සඳහා පමණක් අතිරේකව වැය කිරීමට සිදු වෙනවා. මෙය රටේ ධීවර කර්මාන්තයට හිතකර නොවන තත්ත්වයක් වන අතර, බහුදින ධීවර යාත්‍රා ධීවර කර්මාන්තයෙන් ඉවත් කිරීමට ලබා දෙන අනුබලයක් ලෙස සඳහන් කළ හැකියි.

ගරු කථානායකතුමනි, මම පසුගිය දා බහුදින යාත්‍රා හිමිකරුවන්ගේ සංගමය මුණ ගැසුණා. ඔවුන් පෙන්වා දෙන්නේ, තෙල් මිල වැඩිවීම -එහි අහිතකර බලපෑම- නිසා විතරක් විශාල වියදමක් දරන්න සිදු වන නිසා ඔවුන්ට ධීවර කර්මාන්තය භාර ගන්න නොහැකි බවයි. එම නිසා ඔවුන් යෝජනා කරනවා, මේ බහුදින යාත්‍රා අමාත්‍යාංශයට භාරගෙන අමාත්‍යාංශයෙන් යම් මුදලක් ඒ අයට දෙනවා නම් ඒක මුහුදු යාමට වඩා හොඳයි කියා. හලාවත ප්‍රදේශයේ බොහෝ අය ඉතාලියට ගිහින් යම් මුදල් ප්‍රමාණයක් සොයා ගෙන ඇවිත්, ආයෝජනයක් හැටියට බෝට්ටුවක් අරගෙන මේ රක්ෂාව පටන් ගත්තා. නමුත් දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද? ඔවුන්ට ණය ගෙවා ගන්න විධියකුත් නැහැ, මුහුදු යන්න විධියකුත් නැහැ, බෝට්ටු විශාල ප්‍රමාණයක් අද මුහුදු යන්නේ නැතිව නැංගුරම් පොළවල නතර කර තිබෙනවා. එම නිසා ඒ අය කියන්නේ, මුහුදු යන්න එපා නම් යාත්‍රාව ධීවර අමාත්‍යාංශය භාරගෙන යම් මුදලක් ඒ අයට දෙන්න; ඒක වුණත් ප්‍රමාණවත් කියායි.

මේ රටේ සමස්ත ධීවර ප්‍රජාවට වරාය හා තොටුපළවල ප්‍රමාණවත් පහසුකම් ලබානොදී වරාය ගාස්තු ඉහළ දමා ඇති මොහොතක, ධීවර ආම්පන්නවල මිල ඉහළ යාම, අයිස් මිල අධික වීම - අද අයිස් රුපියල් 200 සිට 250 දක්වා වැඩි කර තිබෙනවා- VMS උපකරණ සඳහා බදු ගෙවීම, අවිධිමත් පන්න ක්‍රමවේද ඇතුළු සාධක රැසක් මඟින් ධීවරයා පීඩාවට පත් කර ඇති මොහොතක, මෙලෙස ඉන්ධන මිලද ඉහළ දැමීම ඔවුන්ට දැරිය නොහැකි කරුණක් වී තිබෙනවා. ආණ්ඩුව එතැනින් නොනැවතී, ධීවර ප්‍රජාවට ආදායම් බදු ලිපිගොනුවක් විවෘත කරන්නය කියා මේ වන විට දන්වා එවා තිබෙනවා. ඔවුන් දැන් මුහුදු රක්ෂාවට යන්නෙත් නැහැ; බෝට්ටුව බැඳලා නැංගුරම් පොළේ. හැබැයි ආදායම් බදු ලිපිගොනුවක් ආරම්භ කරන්න කියා මුදල් අමාත්‍යාංශයෙන් දන්වා එවා තිබෙනවා.

[ගරු අනුර දිසානායක මහතා]

රටේ ජාතික මත්ස්‍ය අස්වැන්නට වැඩි පංගුවක දායකත්වයක් දක්වන බහුදින ධීවර යාත්‍රා සඳහා මෙම තත්ත්වය තවදුරටත් පැවතියහොත්, ඔවුන්ට මෙම කර්මාන්තයෙන් ඉවත්වීම හැර වෙනත් විකල්පයක් නොමැති වෙනවා. රට වටා මහ මුහුදක් පවතින බවටත්, එය රට මෙන් අට ගුණයක්, එනම් වර්ග කිලෝ මීටර් 517,000ක් වන බවටත් පුරසාරම් දෙඩවීම තුළින් රටේ ධීවර කර්මාන්තය සංවිධානය කළ නොහැකියි. එබැවින් මේ වන විට ක්‍රියාත්මක වන මේ රටේ බහුදින ධීවර යාත්‍රා 4,600ක් හා ඩීසල් භාවිත කරන එක් දින යාත්‍රා 900ක පමණ සංඛ්‍යාවක් වෙනුවෙන් ඉන්ධන සහන සැලසීමට කටයුතු කළ යුතු වෙනවා. එම නිසා මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්න කිහිපය අහනවා, ගරු ඇමතිතුමනි.

(1) බහුදින ධීවර යාත්‍රා හා ඩීසල් භාවිත කරන එක්දින ධීවර යාත්‍රා සඳහා පෙර පැවති මිලට ඉන්ධන ලබා දීමට කටයුතු කරන්නේද?

ධීවර වරාය ඇතුළේ තිබෙන පෙට්‍රල් ෂෙඩ් එකෙන් ඒ මිලට තෙල් ලබා දෙන්නය කියා ඔවුන්ගේ යෝජනාවක් තිබෙනවා. එතකොට ධීවර වරාය ඇතුළෙන් බස්වලට තෙල් ගහන්න බැහැ; එළියේ අනික් වාහනවලට තෙල් ගහන්නත් බැහැ. ඔබතුමාගේ නිලධාරියෙක් යවා ඒ සඳහා යම් ක්‍රමවේදයක් හැදුවොත් හොඳයි. ධීවර වරාය ඇතුළේ තිබෙන ෂෙඩ් එකෙන් ඔවුන්ගේ බෝට්ටුවලට පමණක් තෙල් ලබා දෙන්න කටයුතු කරන්න.

(2) එසේ නොවන්නේ නම් ඒ වෙනුවෙන් වෙනත් සහනයක් එම යාත්‍රා සඳහා ලබා දෙන්නේද?

ඒ කියන්නේ, එම සහනය ලබා දෙන්න නොහැකි නම් වෙනත් ක්‍රමයකට සහනය ලබා දෙන්න ලැහැස්තිද කියන එකයි.

(3) ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කුමක්ද? ගතවන කාලය කොපමණද?

(4) මෙවැනි මිල වැඩිවීම්වලදී ධීවර ක්ෂේත්‍රයට සිදුවන බලපෑම අවම කර ගැනීම සඳහා වන ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය තීරණය කුමක්ද?

ගරු කථානායකතුමනි, බහුදින ධීවර යාත්‍රාවලට මුහුදු යන්න බැරි තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. ඒ යාත්‍රාවලින් සියයට 30ක් පමණ නැංගුරම් පොළවල නතර කර තිබෙනවා. ඩීසල් ලීටර 10,000ක් ගහලා මුහුදු යන යාත්‍රා එක්කෙනා දැන් ලීටර 8,000ක් ගහගෙන මහට ගිහිල්ලා එන තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. එම නිසා බහුදින ධීවර යාත්‍රාවල ධීවරයින් මුහුණ දෙන මේ ගැටලුව පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමුකොට ඔවුන්ට සහන මිලකට ඉන්ධන ලබා දීම සඳහා කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - கடற் றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)

ගරු කථානායකතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක අනුර දිසානායක මහතා මේ ප්‍රශ්න යොමු කිරීම පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, ඉන්ධන මිල පළමුව වැඩි වූ අවස්ථාවේදී බහුදින ධීවර යාත්‍රා, එක්දින ධීවර යාත්‍රා, ඒ වාගේම පිටස්තර එන්ජිම සවි කරන ලද සාම්ප්‍රදායික ධීවර යාත්‍රා සහ ෆයිබර්ග්ලාස් ධීවර යාත්‍රා කියන මේ සියල්ලටම මිලියන 5,000ක සහනාධාරයක් ලබා දෙන්න කියා අපේ අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කළා. ඒ අවස්ථාවේදී අපට ලාම්පු තෙල් සඳහා සහනාධාරය ලැබුණා. ඒක අපට වෙනම ලැබුණු සහනාධාරයක් නොවෙයි. ඒ අවස්ථාවේදී සමස්ත මිල අඩු වීමක් වුණා. ඒ සමස්ත මිල අඩු වීම තුළ අපට ලබා දෙන සහනාධාරය සමහර විට වෙන කර්තව්‍යයන්වලටත් පාවිච්චි කරන්න අවස්ථාව ලැබුණා. අපි කල්පනා කරනවා, මේකටත් යම් කිසි ක්‍රමවේදයක් ආරම්භ විය යුතුයි කියා. ඒ අවස්ථාවේදී අපට ඒ මිලියන 5,000න් මිලියන 4,000ක් ලැබුණා. තවත් මිලියන 1,000ක් පමණ තමයි බහුදින ධීවර යාත්‍රාවලට අවශ්‍ය වුණේ. ඒක අපට ලැබුණේ නැහැ. ඒක දෙන්න බැහැයි කිව්වා.

ධීවර කර්මාන්තය දියුණු කිරීම සම්බන්ධයෙන් අනුර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් මතු කළා. අපි දැන් නැංගුරම් පොළවල්, තොටුපොළවල්, ඒ වාගේම වරායන් 23ක් සංවර්ධනය කරන්න කටයුතු කර ගෙන යනවා. ගරු කථානායකතුමනි, මේ රජය යටතේ ගරු මුදල් අමාත්‍යතුමා ඒ සඳහා අපට ආධාර මුදල් ලබා දීලා තිබෙනවා. අපි දැනට වරායන් 3ක වැඩ අවසන් කර තිබෙනවා. එකක් තමයි, කලමැටිය ධීවර වරාය. මේ වනකොට එහි වැඩ කටයුතු සියයට 97ක් නිමකොට තිබෙනවා. ඒ වාගේම මයිලෙඩ්ඩි ධීවර වරාය සඳහා අපි මුල්ගල තැබුවා. වෙල්ලමංකරේ ධීවර වරායේ වැඩ අපි ආරම්භ කර තිබෙනවා. මේ වනකොට එහි වැඩ කටයුතු සියයට 7ක් නිම කර ඉතිරි කටයුතු අපි දැන් කර ගෙන යනවා. ගාල්ල ධීවර වරාය, මිරිස්ස ධීවර වරාය, කුඩාවැල්ල ධීවර වරාය, කිරින්ද ධීවර වරාය, පුරාණවැල්ල ධීවර වරාය, සුදුවැල්ල ධීවර වරාය, හම්බන්තොට ධීවර වරාය, හලාවත ධීවර වරාය, දික්ඔවිට ධිවර වරාය, වෙල්ලමංකරේ ධීවර වරාය, කලමැටිය ධීවර වරාය ආදී ධීවර වරායන් රාශියක අඩු පාඩු සකස් කිරීම සඳහා මුදල් වෙන් කර මේ වනකොට ඒ කටයුතු කර ගෙන යනවා.

ඊට අමතරව, මම මේ අමාත්‍යාංශයට එන අවස්ථාවේදී, අඩි 55න් ඉහළ ධීවර යාත්‍රා පමණක් ලබා දිය යුතුයි කියා නීතියක් තිබුණා. ඒ වාගේම අංක ලබා ගැනීමේදී විශාල දුෂ්කරතාවක් තිබුණා. මා එය සම්පූර්ණයෙන් ඉවත් කළා. යාත්‍රා නිෂ්පාදකයකුට ඕනෑම ප්‍රමාණයේ යාත්‍රාවක් නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒ සඳහා අපි අංක ලබා දිය යුතුයි. සමහර තැන්වලට අපි ගිහින් බැලුවා. නැහෙනහිර පළාතේ මුත්තුඅරමේ ධීවරයන් යන්නේ බහුදින යාත්‍රාවෙන් තමයි. හැබැයි කෙටි ගමන් වාරයකින් ඒ ගොල්ලන් අස්වැන්න නෙළාගෙන එනවා. ඒ මුහුදේ තිබෙන නොගැඹුරුතාව නිසා ඒ ගොල්ලන් ඉල්ලන්නේ කුඩා යාත්‍රා. ඒ සම්බන්ධයෙන් ප්‍රායෝගිකව බලා අපි එයට අවසර දෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ, සමහර තැන්වල වරායවල වැලි පිරිලා තිබෙනවා. සමහර විට වරාය පෙනී-පෙනී, තමන්ගේ ගම පෙනී-පෙනී, ගෙය පෙනී-පෙනී ධීවර යාත්‍රාව පෙරළිලා ධීවරයා මියැදෙනවා. එවැනි තත්ත්වයන් නැති කිරීම සඳහා අපි dredges ආනයනය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ dredges දමලා පිරිසිදු කරන්න අපි කටයුතු කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, අපි දැන් නැව් 5ක් මිල දී ගෙන තිබෙනවා. මුහුදේදී ධීවරයන් අසනීප වුණොත්, ඒ ධීවරයන්ට යම්කිසි කරදරයක් වුණොත්, ගින්නක් ඇති වුණොත්, යාත්‍රාව අනතුරකට භාජන වුණොත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඒ නැව් 5 ගිනි නිවන සහ ප්‍රථමාධාර දෙන නාවුක යාත්‍රා බවට පත් කරලා ඒ වැඩ කටයුතු අපි ආරම්භ කර තිබෙනවා.

ඊළඟට, ධීවරයාට රක්ෂණ ක්‍රමයක් ඇති කරන්න කටයුතු කරනවා. ධීවරයා අතුරුදහන් වුණොත් ඒ රක්ෂණය ලැබෙන්නේ නැහැ. අපි ඒ පිළිබඳව රක්ෂණ සමාගම් සමඟ සාකච්ඡා කරනවා. ඒ පිළිබඳව මම ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. ගරු මුදල් ඇමතිතුමනි, මේ අවුරුද්දේ ධීවර රක්ෂණයක් ආරම්භ කරන්න අපි ඒ සියලුම රක්ෂණ සමාගම් සමඟ සාකච්ඡා කළා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, ඒ රක්ෂණයෙන්, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාගේ පිළිතුර අවසන් කරන්න ඉඩ දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු මන්ත්‍රීතුමනි, මට අවසන් කරන්න ඉඩ දෙන්න. මගේ flow එක නැති වෙනවා. පොඩ්ඩක් ඉන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, කියන්න. ඔබතුමා flow එක තියාගෙන යන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මම එතුමාගේ ඔය කාරණයට එනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. කියන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු කථානායකතුමනි, ධීවරයා අතර මං වෙනවා නම්, ධීවරයාට අසාධාරණයක් වෙනවා නම් ඒ සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය අපි කියන්න ඕනෑ. රජයේ ප්‍රතිපත්තිය වන්නේ ධීවරයාගේ සියලු වගකීම් භාර ගන්නා ප්‍රතිපත්තියක්. මේ ආණ්ඩුව අද මේ රටේ සෑම නිවසක්ම රක්ෂණය කර තිබෙනවා. පාසල් දරුවාට රක්ෂණය ලබා දී තිබෙනවා. එහෙම නම් ධීවරයාටත් රක්ෂණය ලබා දිය යුතුයි. ධීවරයකු අතුරුදහන් වුණොත්, ඒ ධීවරයාට පාසල් යන වයසේ දරුවන් ඉන්නවා නම්, ඒ ධීවරයා අතුරුදහන් වූ දවසේ සිට ඒ දරුවන්ට අවශ්‍ය මිල මුදල් ලබා දීමේ ක්‍රමවේදයක් හදන්න අපි ඒ රක්ෂණ සමාගම් සමඟ සාකච්ඡා කළා. ඒ වාගේම ඒ ධීවරයා වෙනුවෙන් යම්කිසි මූලික මුදලක් -අඩු ගණනේ රුපියල් මිලියනයක්වත්- ලබා දෙන්නත් සාකච්ඡා කළා. රුපියල් මිලියන 25 දක්වා වූ රක්ෂණ අරමුදලක් ලබා දෙන්න අපි සාකච්ඡා කළා, ගරු කථානායකතුමනි. මගේ අමාත්‍යාංශයේ ගොඩනැඟිල්ලක් හදන්න තිබුණා. මම ඒ ගොඩනැඟිල්ල හදන එක නවත්වලා, ධීවරයා වෙනුවෙන් රක්ෂණ අරමුදලක් පිහිටුවන්න ඒ රක්ෂණ සමාගම්වලට පළමුවැනි අවුරුද්ද මොඩලයක් හැටියට කරන්න මේ සඳහා අපිට අවසර දෙන්න කියාත් මම ඔබතුමාගෙන් ඉල්ලනවා. මේ විධියට අපි ධීවර වරායන්, තොටුපොළවල්, නැංගුරම් පොළවල් විතරක් නොව කළපු ටිකත් සංවර්ධනය කරන්න අවශ්‍ය කටයුතු කරගෙන යනවා. ධීවරයන්ගේ භාර්යාවන්ට වාරකන් කාලයේදී ජීවත් වෙන්න වාගේම ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරන්න, cage ක්‍රමයට සහ විවිධ ක්‍රමවලට මිරිදිය ධීවර කර්මාන්තය, කිවුල්දිය ධීවර කර්මාන්තය වාගේම කරදිය ධීවර කර්මාන්තය කියන මේ සියල්ල සංවර්ධනය කරන්න අවශ්‍ය මූලික වැඩ පිළිවෙළ අපි දැන් ආරම්භ කර තිබෙනවා. මම මේ කොළයේ සඳහන් දේවල් සියල්ලම කියවන්නේ නැතිව කෙටියෙනුයි අදහස් දක්වන්නේ.

ගරු කථානායකතුමනි, අයිස් නිෂ්පාදකයන් ගෙන්වලා, බහුදින යාත්‍රාකරුවන්ගේ අයිස් මිල ගැන ඊයේ මම සාකච්ඡාවක් පැවැත්වුවා. ඒ සාකච්ඡාවේදී මම ඔවුන්ට කිව්වා, "රුපියල් 220ට වැඩිය අයිස් විකුණන්න බැහැ." කියා. අපේ ධීවර වරායන්වල නිෂ්පාදනය කරන අයිස් අපි ඒ මිලටම දෙනවා. [බාධා කිරීමක්] රුපියල් 250 කරන්න බැහැ කියා කිව්වා. අයිස් නිෂ්පාදකයන් සමඟ මම ඊයේ මේ ගැන සාකච්ඡා කළා. ඒ විධියට අපි කළමනාකරණය කරනවා. අපි අපේ වරායන්වල නිෂ්පාදනය කරන අයිස් රුපියල් 220 ගණනේ ධීවරයන්ට ලබා දෙනවා. සෑම ධීවර වරායකම, නැංගුරම් පොළකම petrol shed එකක් -ඩීසල් හා භූමිතෙල් ලබා දෙන shed එකක්-, බහුදින යාත්‍රාවලට තමන්ගේ කෑම ද්‍රව්‍ය ටික ගන්න supermarket එකක්, ශීතාගාරයක්, අයිස් නිපදවන කර්මාන්තශාලාවක් -මේ සියල්ල- සම්බන්ධයෙනුත් අපි පෞද්ගලික අංශයත් සමඟ සාකච්ඡා කර ඒ වැඩ කටයුතු කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, ඉන්ධන මිල සම්බන්ධයෙන් ඔබතුමාත් යෝජනා ඉදිරිපත් කළා. අපි ඒ සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. බහුදින ධීවර යාත්‍රාකරුවන්ට සහනාධාර ලබා දිය යුතුය කියන ස්ථාවරයේ ඉඳගෙන මම ධීවර ඇමතිවරයා හැටියට නැවත කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා.

ඇම සඳහා මාළු ගෙනෙනවා. ඇම සඳහා මාළු ගෙනැවිත් මාළු අල්ලන එකයි කරන්නේ. එහෙම අල්ලන මාළු ගරු කථානායකතුමනි, ශරීරයට විෂ සහිතයි. ඒ මාළු ආහාරයට ගන්න බැහැ. ඒ කටයුත්ත නවත්වන්න දැනට අපි කටයුතු කරගෙන යනවා. ඉතාලියේ සිටින අපේ සහෝදරයෙකු ඒ ඇම නිෂ්පාදනය කර තිබෙනවා. අපි නාරා ආයතනයත් සමඟ එකතු වෙලා, ඒ සුවඳ තිබෙන, ඒ ඇස් තිබෙන කෘත්‍රිම ඇමක් නිෂ්පාදනය කරන්න කටයුතු කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, මේ සියලු දේ කරන අතරේ, ආර්ථිකමය වශයෙන් රටේ යම් අර්බුදකාරී තත්ත්වයක් තිබෙන බව අපට පෙනෙනවා. ඉන්ධන මිල සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. එතකොට, ධීවරයාට මාළු සඳහා හොඳ මිලක් ලැබෙන්නේ කොහොමද? අද මාළු මිල හොඳටම අඩු වෙලා තිබෙනවා. ඒක ගැටලුවක්. ඒකට හේතුව, මාළු ප්‍රතිඅපනයනය කිරීම. ගරු කථානායකතුමනි, අපේ මාළු පිට රට යවනවා මිසක් මාළු ප්‍රතිඅපනයනය කිරීමෙන්, අනවශ්‍ය විධියට වෙළෙඳ පොළට මාළු සංක්‍රමණය වීම මඟින් මිල පහළ වැටෙනවා. ඒ නිසා අපේ මාළු ප්‍රවාහන ගාස්තු සහ නොයෙකුත් අමතර ගාස්තු අඩු කර ගැනීම සඳහා ඒ වරායන් තුළම මාළු අපනයනය සඳහා සකස් කිරීමට සැකසුම් කර්මාන්තශාලා ඇති කිරීම පිළිබඳව අපි පෞද්ගලික අංශයත් සමඟ සාකච්ඡා කළා. ඒ ආදී වශයෙන් විශාල වැඩ පිළිවෙළක් අපි ආරම්භ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි ධීවරයාට අවශ්‍ය අයිස් තමන්ගේ යාත්‍රාවලම -ශීතාගාරවල- නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ආධාර ලබා දෙනවා. ඒ වාගේම රිටි පන්නය, දැල් පාඩුව ආදී සියලු පන්න ක්‍රම

[ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා]

පිළිබඳව නව නීති සම්පාදනය කරන්න අපි ක්‍රියා කරගෙන යනවා. අපට මූලනිව් එක ප්‍රශ්නයක්, යාපනයේ තව ප්‍රශ්නයක්, දකුණේ තව ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ. මේ සියලු ප්‍රශ්න එකතු කර පන්න ක්‍රම සම්බන්ධයෙන් නව නීති සම්පාදනය කරන්න යනවා.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමා පිළිතුර දීලා අවසන් නම් ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්නම්. එතුමා ඇහුවේ ඩීසල් ගැන. ඒකට බොහොම දිග පිළිතුරක් දුන්නා නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(මාණ්පුමිකු කාමිණි විජිත් විජයමුණි සොය්සා)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඔව්. මම ඒ සම්බන්ධයෙන් Cabinet Paper එකක් ඉදිරිපත් කරනවා කිව්වා.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
තව හුඟක් වැඩ කටයුතු තිබෙන නිසා ගරු අනුර දිසානායක මැතිතුමා ප්‍රශ්නය අහන්න. ඊට පසුව අපි ප්‍රධාන කටයුතුවලට යමු.

**ගරු අනුර දිසානායක මහතා**
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
එතුමා විටෙක මැණික් කර්මාන්තකරුවෙක්. තවත් විටෙක කෘෂි කර්මාන්තයේ යෙදෙනවා. මම දැක්කා සත්ව ගොවිපොළකුත් දමලා තිබෙන බව. ආණ්ඩුවේ හරක් අරගෙනද දන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මැතිතුමා ප්‍රශ්නය අහන්න. අපට අද හුඟක් වැඩ කටයුතු තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ආණ්ඩුවේ හරක් නැත්නම් කමක් නැහැ. එච්චරයි මට කියන්න තිබෙන්නේ. ගොවිපොළවල් දැම්මාට කමක් නැහැ. ආණ්ඩුවෙන් හරක් අරගෙන දමන්න එපා කියායි කියන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(මාණ්පුමිකු කාමිණි විජිත් විජයමුණි සොය්සා)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
නැහැ, නැහැ. ආණ්ඩුවේ හරක් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
හරි, හරි. කමක් නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(මාණ්පුමිකු කාමිණි විජිත් විජයමුණි සොය්සා)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
එහෙම නම් කෘෂි කර්මාන්තයට දෙන සහනාධාරත් නවත්වන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි පොඩ්ඩක් track එකෙන් පිට ගියා. ආපසු ප්‍රධාන කටයුතුවලට යමු. [බාධා කිරීමක්] අනුර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා ඇමතිතුමාගේ හරක්වත් සහනාධාර දීලා. ඒක වෙනම එකක්. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දැන් මෙතුමා කිව්වා, "බිලියන හතරක් වෙන් කර තිබෙනවා. තව බිලියනයක් දුන්නොත් මේ මිලට ඩීසල් දෙන්න පුළුවන්." කියා. එතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න අපේක්ෂා කරනවා කිව්වා. හැබැයි, මෙහෙම සිදු වෙනවා. සමහර බහුදින යාත්‍රා මාස දෙක, තුන වැනි අධික කාලයක් මුහුදේ සිටිනවා. එතකොට සමහර යාත්‍රා පිටත් වෙලා ඉවරයි. තමුන්නාන්සේලා තව සතියකින් තීන්දුව ගත්තත්, මාස තුනකට විතර පසුව තමයි මේක හම්බ වෙන්නේ. මොකද, ඒ ගොල්ලන් මුහුදු රස්සාව කරලා ආයෙත් එන්න ඕනෑ. ගහපු ඒවාට තමුන්නාන්සේලා කොහොමත් ගෙවන්නේ නැහැ නේ. ගරු මුදල් ඇමතිතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය ගැන අවධානය යොමු කරන්න ඕනෑ. බහුදින යාත්‍රා 4,600ක් තිබෙනවා. ඩීසල් භාවිත කරන එක් දින යාත්‍රා 900ක් විතර තිබෙනවා. ඒවාට පෙට්‍රල් ෂෙඩ් ටික ධීවර වරාය ඇතුළත තිබෙනවා. ඒ වරායේ ෂෙඩ් එකෙන් ඩීසල් මේ ගණනට දෙන්න. වරායේ ෂෙඩ් එකෙන් වෙන ඒවාට දෙන්න බැරි වෙන්න තමුන්නාන්සේලා ක්‍රමවේදයක් හදන්න. ඒක අමාත්‍යාංශයට භාර ගන්න වෙනවා. ගරු කථානායකතුමනි, ඒ ගොල්ලන්ගේ යාත්‍රා නැංගුරම්පොළේ ගැට ගහලා තිබෙනවා. හැබැයි, මාස්පතා බැංකු වාරිකය එනවා. ඒ ගොල්ලන්ට වාරිකය ගෙවා ගන්න විධියකුත් නැහැ. තෙල් ගණන් නිසා මුහුදු යන්න විධියකුත් නැහැ. මුහුදු ගිහින් මාළු අල්ලලා ඒ ගණනට විකිණුවාට ලාභයකුත් නැහැ. සමහර වෙලාවට රුපියල් ලක්ෂ හත-අට එක වාරයකට පාඩු වෙලා තිබෙනවා. තොටුපොළේ නතර කර තිබෙනවාට නැංගුරම් ගාස්තු ගෙවන්නත් ඕනෑ. ඒ ගොල්ලන් විශාල නිරවීමකයි ඉන්නේ. යාත්‍රාව මුහුදට ගෙන යන්නේ නැතුව කර්මාන්තය පවත්වාගෙන යන්න බැහැ. මුහුදට ගෙන යන්න නම් බහුදින යාත්‍රා සඳහා අඩු මිලට තෙල් ලබා දීමේ වැඩ පිළිවෙළ ඉක්මනින්ම ක්‍රියාත්මක කරන්න ඕනෑ. එහෙම නැත්නම් නැංගුරම් තොටුපොළවල තමයි බහුදින යාත්‍රා තිබෙන්නේ. ඒ සඳහා මොකක්ද කරන්නේ කියා ගරු මුදල් ඇමතිතුමාගෙන් මම දැන ගන්න කැමැතියි.

**ගරු මංගල සමරවීර මහතා**
(මාණ්පුමිකු මංගල සමරවීර)
(The Hon. Mangala Samaraweera )
කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළාම අපි බලමු.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමනි, මෙය ස්ථාවර නියෝග 27 (2) යටතේ අහපු ප්‍රශ්නයක් නිසා අපට විවාදයකට යන්න බැහැ. අද අපට හුඟක් වැඩ කටයුතු තිබෙනවා. නමුත් ධීවර ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා පැහැදිලි කිරීමට කැමති නම් -

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු කථානායකතුමනි, මම විනාඩියෙන් කථාව අවසන් කරනවා.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු මන්ත්‍රීතුමනි, කියන්න.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, බහුදින ධීවරයන් වාගේම එක්දින ධීවරයන් විශාල අපහසුතාවකට පත් වී සිටිනවා. විශේෂයෙන්ම ගාල්ලේ, රත්ගම වැල්ලේ සිටින එක්දින ධීවරයන්, ඔබතුමාගේ ඥාතීන්. ඒ අයගේ ප්‍රශ්නය පිළිබඳ මැදිහත් වෙන්න කියා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ අයට පහසුකම් නැහැ. ඒ අයට ජීවත් වීමේ ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා ගාල්ලේ නොසිටියාට, ගාල්ල ප්‍රදේශයෙන් බිහි වුණු ඇමතිවරයෙක් හැටියට රත්ගම වැල්ලේ, ගාල්ල කොටුව අයිනේ සිටින ධීවරයන්ගේ ප්‍රශ්නය විසඳීමට අදම මැදිහත් වෙලා නිලධාරීන් යවා කටයුතු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු කථානායකතුමනි, හිටපු ඇමතිතුමා සඳහන් කළ කාරණය පිළිබඳ මම අවධානය යොමු කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා කැබිනට් පත්‍රිකාව ලබන සතියේ දමනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
දමනවා, දමනවා.

ගරු කථානායකතුමනි, ධීවර ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමට ඕස්ට්‍රේලියාවේ තානාපතිතුමා සමඟ සාකච්ඡා කර ඕස්ට්‍රේලියාවෙන් ආධාර ලබාගෙන නොමිලේ, දෛනික වියදමත් සියයට 50ක් ගෙවන විධියට, හොඳ යාත්‍රා නිරීක්ෂණ ක්‍රමවේදයක් - Vessel Monitoring System - අපි ආරම්භ කරනවා.

"හරකා නැති ගෙදර රෑ වෙනවා නොදැනේ - බල්ලා නැති ගෙදර හොරු එනවා නොදැනේ

(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු රාජ්‍ය ඇමතිතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට පැහැදිලි කර ගැනීමක් කරගන්න ඔබතුමා අවසර දෙනවාද?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
හොඳයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පානීය වතුර බෝතල් සම්බන්ධයෙන් කථා කළා. මට ඔබතුමාගේ කෙටි අවධානය යොමු කරන්න අවශ්‍ය වන්නේ මේ පානීය වතුර බෝතල්වල මිල ගණනය කරන විධිය සම්බන්ධයෙනුයි.

මිලී ලීටර් 500ක වතුර බෝතලයක් වෙළෙඳ පොළේ රුපියල් 50ට විකුණද්දී, ලීටරයේ වතුර බෝතලය රුපියල් 70ට විකුණනවා. ලීටර් එකහමාරේ වතුර බෝතලය රුපියල් 80ට විකුණනවා. ලීටර් 5 වතුර බෝතලය රුපියල් 170ට විකුණනවා. සාමාන්‍යයෙන් හුඟ දෙනෙක් පාවිච්චි කරන මිලි ලීටර් 500 වතුර බෝතලය රුපියල් 50යි. එහෙම නම් ලීටරයේ වතුර බෝතලය රුපියල් 100ක් වෙන්න ඕනෑ නේ. නමුත් ලීටර් 5ම රුපියල් 200ට දෙනවා. මෙතැන හරිම පැහැදිලියි, මේ පානීය ජල බෝතල් නිෂ්පාදනය කරන සමාගම් ජනතාවට අතිවිශාල මංකොල්ලයක් කරන බව. මොකද, මිලක මොකක් හෝ සාධාරණ අනුපාතයක් තිබෙන්න ඕනෑ නේ. මම කියන්නේ නැහැ, මිලි ලීටර් 500 වතුර බෝතලය දෙන ගණන අනුවම ලීටර් 5 වතුර බෝතලයත් දෙන්නය කියා. ඔබතුමා මුදල් රාජ්‍ය අමාත්‍යවරයා නිසා මේ මිල ගණනය කිරීම තර්කානුකූල කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. මේ කරන්නේ මංකොල්ලයක්.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
වතුරවල මිල, වතුරවල භාවිතය පිළිබඳව ගැටලුවක් තිබෙනවා. මේ රටේ සමහර ප්‍රදේශවල ඕනෑවට වඩා වතුර පාවිච්චි කරනවා; නාස්ති කරනවා. අපි නාන්න ගියාම, දත් මදින්න ගියාම වතුර පයිප්පය ඇරගෙන ඉන්නවා. නමුත් මොනරාගල වාගේ දිස්ත්‍රික්කවලට ගියාම විශාල වතුර හිඟයක් තිබෙනවා කියා අපිට පෙනෙනවා. ඒ නිසා මේ ගැන අපට අවධානය යොමු කරන්න සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව ඉක්මනට අවසාන කරන්නට තිබෙන නිසා මා නැවතත් මගේ මාතෘකාවට යනවා. මම කියන්නේ, මේ සනීපාරක්ෂක තුවාවල මිල තවත් පහළට ගෙනෙන්න අපි ක්‍රියා කළ යුතුයි කියායි. මෙහි සෞඛ්‍ය අවදානමකුත් තිබෙනවා. මොකද, මේ tampons භාවිත නොකරනවා නම් bacterial ප්‍රශ්න ඒ වාගේම urinary tract infections ඇති වෙන්න ඉඩ තිබෙනවාය කියා researchesවලින් පෙන්වනවා; වෛද්‍යවරු පෙන්වා දෙනවා. සමහරවිට මේවා වකුගඩු රෝගවලට සම්බන්ධයි කියා තිබෙනවා; ඒ වාගේම දරු උපතට සම්බන්ධයි කියා කියනවා; ඒ වාගේම Cancerවලට සම්බන්ධයි කියලාත් කියනවා. අමීතා අරුද්ප්‍රගාසම් කියන researcherගේ සොයා ගැනීම්වලින් තමයි මම මේ හුඟක් කරුණු ඉදිරිපත් කළේ. මෙහි තව බලපෑමක් තිබෙනවා. 2006දී ශ්‍රම බළකායට කාන්තා දායකත්වය කාන්තාවන්ගෙන් සියයට 46යි; පිරිමින් සියයට 80ක් විතර වුණා. නමුත් වසර දහයක් තුළදී -2016 වර්ෂයේදී- කාන්තාවන්ගෙන් ශ්‍රම බලකායට ලැබුණු දායකත්වය සියයට 36යි; පිරිමි අයත් සියයට 75ක් විතර වුණා. වසර දහයක් තුළදී කාන්තා දායකත්වය සියයට 46 සිට සියයට 36ට අඩු වුණා. නමුත් අධ්‍යාපනය පැත්තෙන් බැලුවාම කාන්තාවන් ඉදිරියෙන් ඉන්නවා. අපොස (සාමාන්‍ය පෙළ) සමත්වීම, අපොස (උසස් පෙළ) සමත්වීම, විශ්ව විද්‍යාල අධ්‍යාපනය වාගේ කරුණුවලින් බැලුවාම කාන්තාවන් ඉදිරියෙන් ඉන්නවා. නමුත් ආර්ථිකයට සම්බන්ධ වීම පිළිබඳව සලකා බලන විට කාන්තා දායකත්වයේ සම්පූර්ණ වාසිය රටට ලැබෙන්නේ නැහැ.

කාන්තාවන්ගේ පැත්තෙන් බලනවිට කාන්තාවන් වෙනුවෙන් තව බොහෝ දේ කරන්නට තිබෙනවා. කර්යාලවල, factoriesවල සේවය කරන කාන්තාවන්ගේ දරුවන් බලා ගන්න අවශ්‍ය පරිසරය හදන්න ඕනෑ. අප ළඟදී කුඩා දරුවන් සිටින අම්මලාට නීතිමය රැකවරණයක් ලබා දුන්නා, ඒ දරුවන් බලා ගැනීම හා කිරි දීම සම්බන්ධයෙන්. කාන්තාවන් වෙනුවෙන් ඒ වාගේ කටයුතු රාශියක් කරන්නට තිබෙනවා. කාන්තාවන් පාවිච්චි කරන tamponsවල මිල පහළටම ගෙන ඒම අත්‍යවශ්‍ය දෙයක් හැටියට සලකා ක්‍රියා කළ යුතු වෙනවාය කියන කාරණය නැවතත් සඳහන් කරමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්තුතියි. ඊළඟට ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 28ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.42]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ආර්ථිකය පිළිබඳව බදු කිහිපයක් ගැන සහ ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන නිසාම මේ මොහොතේ පාර්ලිමේන්තුවෙන් එළියේ තිබෙන සාකච්ඡාව මොකක්ද කියා අපි බැලුවොත් සාමාන්‍යයෙන් අද දිනයේ පත්තර වාර්තා කර තිබෙන්නේත්, ඊයේ මාධ්‍යවල වාර්තා කළේත් එකවර සමස්ත ආර්ථිකයම විශාල කඩා වැටීමකට "ගමන් කරමින් "නොවෙයි, "ගමන් කර තිබෙනවාය" කියන එකයි. තවම එය ප්‍රසාරණය වෙමින් තිබෙන්නේ. විශේෂයෙන් බස් ගාස්තු සියයට 4කින් වැඩි කරන්නට තීරණය කර තිබෙනවා.

බස් ගාස්තු වැඩි කිරීමේ ප්‍රතිශතය සියයට 4 වුණාට, බස් එක ඇතුළේදී තර්කානුකූලව ඒ ප්‍රතිශත අනුව ගණන් හැදෙන්නේ නැහැ. මණීන්ට මාරු කාසි දෙන්නේත් නැහැ, රුපියල් පහේ බස් ගාස්තුව රුපියල් හයෙන්, රුපියල් හතෙන් තමයි ඉහළ යන්නේ කියන එක අපි දන්නවා. ඒවා නියාමනය කරන්න ක්‍රමවේදයකුත් නැහැ. දැන් ගෑස් මිල රුපියල් 195කින් වැඩි වෙනවාය කියනවා. ඒ වාගේම, ඩොලරය කඩා වැටීම නිසා බඩු මිල ඉහළ යනවා. මුදල් ඇමතිතුමා පාර්ලිමේන්තුවට කියනවා, සීනිවල තොග මිල වැඩි කරන්න දෙන්නේ නැහැයි කියලා. නමුත් සීනි තොග වෙළෙන්දෝ මාධ්‍ය ප්‍රකාශන තුළින් කියනවා, සීනි කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 15කින් වැඩි කරනවා කියලා. එතකොට මේ ක්‍රියාවලිය ඇතුළේ වැඩි නොවෙන්නේ මොනවාද? වැඩි නොවෙන්නේ ජනතාවගේ එදිනෙදා ආදායම; රජයේ සේවකයාගේ වැටුප; පෞද්ගලික අංශයේ සේවකයාගේ වැටුප. මේ මිල වැඩි කිරීම කළාට, මිල පාලනය පිළිබඳව තිබෙන ආණ්ඩුවේ ආයතන, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය නිහඬයි; නියාමනය නිහඬයි. නමුත්, ජනතාවගේ ආදායම වැඩි වෙන්නේ නැහැ. අද පත්තරවල වාර්තා කරනවා, කන්න 6ක් පාළු වුණු නිසා පවුලක දෙදෙනෙක් මුරුංගා කොළ තම්බාගෙන කාලා ජීවත් වෙනවා කියලා. අද මිනිසුන්ට කන්න විධියක් නැහැ; ජීවත් වෙන්න විධියක් නැහැ.

ඔබතුමන්ලා ආර්ථික විද්‍යාත්මක තර්ක ඉදිරිපත් කරනවා, රුපියලේ අගය අවප්‍රමාණ වුණාම අපනයන ආදායමට වාසිදායකයි කියලා. දැන් ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමාත් ඉදිරිපත් කළේ ඒ කරුණ තමයි. අපි සමාජ අධ්‍යයනය, ආර්ථික විද්‍යාව ඉගෙන ගෙන තිබෙනවා. ආර්ථික විද්‍යාවේ සංකල්පයක් හැටියට අපි ඉගෙන ගන්නවා, රුපියල බාල්දු වුණාම අපනයන ආදායම ලබන්නන්ට හොඳයි කියලා. හැබැයි යථාර්ථය මොකක්ද? අපනයන ආදායම ලබන අය මේ ආර්ථිකයට ගෙනෙන දේවල් වියදම් කරන්න වෙන්නේ මොනවාටද? ඒවා වියදම් කරන්න වෙන්නේ, අපේ පරිභෝජන රටාව අනුවත්, ආර්ථික ප්‍රතිපත්තිය අනුවත් හිරකර තිබෙන, අපට පාලනය කරන්න බැරි අධිපරිභෝජන සංස්කෘතියකට අවශ්‍ය වන අත්‍යවශ්‍ය ආනයනවලටයි. අපේ අපනයන ආදායම ගෙනැවිත් අපේම රටේ ගොවීන්ට වියදම් කරනවා නම්, අපේම රටේ කර්මාන්තවලට වියදම් කරනවා නම්, අපේම රටේ කර්මාන්තවල පරිභෝජනයට වියදම් කරනවා නම් අපනයන ආදායම රට ඇතුළේමයි කැරකෙන්නේ. ඇමතිතුමා කියපු, විදේශගත ශ්‍රමිකයන් උපයා ගෙනෙන ආදායම අපි යොදවන්නේ මොනවාටද? තෙල්වලට, බෙහෙත්වලට, යන්ත්‍ර සූත්‍රවලට, වාහනවලට වාගේම, සරුංගල්වලට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය නිවාඩු කාලයේ සරුංගල් යවන අපේ දරුවන් සරුංගල් 10ක් යැව්වා නම්, එයින් 8ක්ම චීන සරුංගල්. අපේ ආර්ථිකය අද මුළුමනින්ම චීන, ඉන්දියානු, එහෙම නැත්නම් වෙනත් රටවල පරිභෝජන සංස්කෘතියක් එක්කයි ගමන් කරන්නේ. රුපියල කඩා වැටීම නිසා සිද්ධ වන පාඩුව, ආනයන වියදමට දරන කොටස අපට පාලනය කරන්න පුළුවන්ද?

දැන් ආණ්ඩුවේ ඉන්න අය කථා කරනවා, අපනයන ආදායම ගැන. විපක්ෂයේ සිටින නිසා අපි කථා කරනවා, ආනයන වියදම ගැන. එහෙම කථා කරලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්ද? දැන් අපි යථාර්ථය පිළිගන්න ඕනෑ. 2017 අවුරුද්දේ ඇමෙරිකානු ඩොලර් මිලියන 11,154ක් අපේ අපනයන ආදායම වශයෙන් ලැබෙනකොට, ඇමෙරිකානු ඩොලර් මිලියන 29,000ක් අපි ආනයන වියදම වශයෙන් දරනවා. අපේ ආර්ථිකය සියයට 100ක - දෙගුණයක- ආනයන අපනයන පරතරයක් තිබෙන ආර්ථිකයක්. ඩොලරය කඩාගෙන වැටීම අපට පාලනය කරන්න බැරි නම්, මේ වෙළෙඳ ශේෂ පරතරයට, මේ ගෙවුම් ශේෂ පරතරයට, මේ දෙගුණයක ආනයන අපනයන පරතරයට මෙය බලපාන්නේ කොහොමද කියා අපි බලන්න ඕනෑ.

සරල ආර්ථික විද්‍යාවට අනුව සෑම විකුණුම්කරුවකුම ගැනුම්කරුවකු වෙනවා. අපි යම්කිසි භාණ්ඩයක් විකුණා ලබා ගන්නා ආදායම, ගැනුම්කරුවකු හැටියට නැවත වියදම් කරනවා. ඒ නිසා මේ ආර්ථිකය ඇතුළේ රුපියල කඩා වැටීමේ වාසියක් තිබෙනවාය කියන්නේ කාටද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? දැන් මෙතුමන්ලා කියනවා, තේ ආර්ථිකයට, රබර් ආර්ථිකයට, සුළු අපනයන භෝග ආර්ථිකයට, මැණික්වලට, සංචාරක කර්මාන්තයට වාසියක් ලැබෙනවා කියලා. මේ සියලු කරුණු ගත්තොත් අපට තිබෙන්නේ නිෂ්පාදන ආර්ථිකයක් දෙසට ගිය ආර්ථිකයක් නොවෙයි, අමුද්‍රව්‍ය ආර්ථිකයක්. අපේ කුරුඳුවලට ලෝක වෙළෙඳ පොළේ තැනක් තිබෙන බව ඇත්ත. හැබැයි, අපි තවම කුරුඳු මිටි බැඳලා පිට රට පටවනවා. ඒ ක්‍රමය නිෂ්පාදන ආර්ථිකයක ලෝක වෙළෙඳ පොළේ විශාල පංගුවක් අපට අත් පත් වුණු ක්‍රමයක් නොවෙයි. අපි තවම අමු මැණික් ගල් පිට රට යවනවා. අපේ තේ ගත්තත්, අපි තවම කළු තේ හැටියට තමයි වැඩියෙන් පිටරටට යවන්නේ. රුපියල කඩා වැටෙන එක හොඳයි, ඒ නිසා අපේ අපනයන ආදායම වැඩි වෙයි කියලා හීන බලාගෙන ඉන්නවා නම්, අපට අනිවාර්යයෙන් දරන්න වෙලා තිබෙන ආනයන වියදමට මෙය කොහොම බලපායිද කියලා ඔබතුමන්ලා බලන්නේ නැත්තේ ඇයි?

ඩොලරයට ඩොලරයකින් ණය ගෙව්වාට, ඩොලරයක් ඇතුළේ තිබෙන රුපියල්වලට මොකද වෙලා තිබෙන්නේ කියලා අපි බලන්නේ නැත්තේ ඇයි? ඩොලරයක් රුපියල් 100ක විටිනාකමට අපි ණය ගත්තා නම්, අද අපට ඒ ණය ගෙවන්න සිදු වෙන්නේ ඩොලරයේ රුපියල් 168 විටිනාකමට නම්, ඒ වැඩි වූ රුපියල් 68 හොයන්නේ කවුද? ඒ නිසා ඔබතුමන්ලා මේ ඉදිරිපත් කරන තර්කය කොච්චර අවිද්‍යාත්මකද කියලායි මම අහන්නේ. මේ ගත්ත ණය ගෙවන්න සිදු වනකොට ඒ පොලියටයි, වාරිකයටයි අමතරව මේ රටේ ජනතාවට තව රුපියල් ප්‍රමාණයක් උපයන්න වෙනවා. මොකද, මහ බැංකුව ණය ගෙවන්නේ ඩොලර්වලින් වුණාට, මහ බැංකුවට නැත්නම් භාණ්ඩාගාරයට ඩොලර් ගෙනයන්නේ රුපියල්වලින්නේ. මේකට හොඳම උදාහරණයක් තිබෙනවා. මම ඒ කාරණය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි චීනයෙන් ණය අරගෙන හම්බන්තොට වරාය හැදුවා. හම්බන්තොට වරාය හදන්න අපි චීනයෙන් ඩොලර් මිලියන 1,542ක් ණය අරගෙන තිබෙනවා. හැබැයි, ඩොලර් මිලියන 1,400ක් අරගෙන එතැන කොම්පැනි දෙකක් හැදුවා. ඩොලර් මිලියන 1,500ක ණයක් ගත්ත වරායේ ඉඩම් තක්සේරු නොකර, ඩොලර් මිලියන 1,400ක මිලක් නියම කරලා හම්බන්තොට වරාය චීනයට බදු දුන්නා. චීනය ඒ

වෙනුවෙන් ගෙව්වේ ඩොලර් මිලියන 973යි. ආණ්ඩුව ඒ ඩොලර් මිලියන 973 දැන් භාණ්ඩාගාරයේ තියාගෙන වරාය අධිකාරියට කියනවා, "ඔයගොල්ලන් ණය ගෙවන්න" කියලා. චීනයෙන් ගත්ත ණයවලට රුපියල් බිලියන 148ක් ගෙවන්න වෙලා තිබෙන්නේ වරායෙන්. නමුත් වරාය කියනවා, අපට ගෙවන්න බැහැ කියලා. මොකද, ගත්ත සල්ලි තිබෙන්නේ භාණ්ඩාගාරයේ. වරාය තව දෙයක් කියනවා. ඒ මොකක්ද? "මේවා ණය පොතේ තියාගෙන හිටියාට වැඩක් නැහැ. රුපියල බාල්දු වන එකේ පාඩුවත් අපට ගෙවන්න සිද්ධ වනවා" කියලා. අන්න එතැනදීයි මේ ප්‍රශ්නය එන්නේ. රුපියල බාල්දු වන එක හොඳ නම්, ඇමතිතුමා කියන විධියට එය අපනයන ආදායමටත් හොඳ නම් වරායටත් ඒක හොඳ වෙන්න එපායැ. නමුත් දැන් වරායට මොකද වෙලා තිබෙන්නේ? චීනයෙන් ගත්ත ණයත් ගෙවන්න සිද්ධ වනවා; රුපියල බාල්දු වන එකේ පාඩුව දරා ගන්නත් සිද්ධ වනවා.

ණය ගෙවන කොට රුපියල බාල්දු වීම නිසා විතරක් රුපියල් කෝටි 122ක් පාඩු වුණාය කියලා ගිය වතාවේ මහ බැංකු වාර්තාවෙන් කිව්වා මට පැහැදිලිව මතකයි. මට හරියටම - නිශ්චිතවම- ඉලක්කම මතක නැහැ. මේවා ගෙවන්නේ කවුද? රුපියල් කෝටි 122ක්, රුපියල් කෝටිය ගණනේ පාසල් 122කට දෙන්න පුළුවන්. අපේ ඉස්කෝලවලට අවශ්‍ය පහසුකම් ටික හදන්න රුපියල් කෝටි ගණන් ඉල්ලන්නේ නැහැ. ක්‍රීඩාගාරයක්, පුස්තකාලයක් හදා ගන්න රුපියල් ලක්ෂ 5ක්, 10ක් දෙන්න කියලායි විදුහල්පතිවරයා ඉල්ලන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වැසිකිළි පහසුකම් නැති පාසල් 1,630ක් තිබෙනවා. වැසිකිළියක් හදා ගන්න රුපියල් කෝටියක් යන්නේ නැහැ. හැබැයි, රුපියල බාල්දු වීමෙන් සිද්ධ වන පාඩුව විසින් රටේ ආර්ථිකයේ ඇති කරලා තිබෙන තත්ත්වය මේකයි. මේ ණය ගිවිසුම් අත්සන් කරන අයවත්, මහ බැංකුවේ අධිපතිතුමාවත්, මුදල් ඇමතිතුමාවත් ඒවා පෞද්ගලිකව ගෙවන්නේ නැහැ. හැබැයි, මේ රටේ වැඩ කරන ගොවි ජනතාව, දුප්පත් අහිංසක මිනිස්සු මේ පාඩුව දරා ගන්න ඕනෑ. බඩු මිල වැඩි වෙන්නේ ඇයි කියලා අහිංසක මිනිසුන්ට ආර්ථික විද්‍යාත්මකව තේරෙන්නේ නැහැ.

ඔබතුමන්ලා දැන් කියනවා, මේක "ගෝලීය අර්බුදයක්" කියලා. ඇත්ත, ගෝලීය අර්බුදයක් තිබෙනවා. ලෝක ධනවාදයම අර්බුදයට ගිහිල්ලා. ඒ නිසා ලෝකයට තමන්ගේ ක්‍රමය පවත්වාගෙන යන්න බැහැ. නමුත් ඔය ගෝලීය අර්බුදයට මුහුණ දීපු රටවල් තිබෙනවා. අපේ රටට ආසන්න ඉන්දියාව, වෙනිසියුලාව වාගේම අනිකුත් රටවල් ඒවාට මොනවා හෝ ප්‍රතිකර්මයක් හොයනවා; උත්තරයක් හොයනවා. මහ බැංකුව හෝ භාණ්ඩාගාරය දැන් කියන්න ඕනෑ, දවස ගණනේ කඩාගෙන වැටෙන -බාල්දු වන- රුපියලට මහ බැංකුවේ ප්‍රතිකර්මය මොකක්ද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සැප්තැම්බර් මාසයේ 03 වැනි දා ඩොලරයේ වටිනාකම රුපියල් 161යි. අද වටිනාකම රුපියල් 168යි. හෙට වටිනාකම රුපියල් 169 වෙයි. අනිද්දා වටිනාකම රුපියල් 170 වෙයි. මේ ප්‍රමාණයට රුපියල කඩාගෙන වැටෙනවානේ. මේකට හේතුව මොකක්ද? එක්කෝ මහ බැංකුව සතුව තිබෙන ඩොලර් සංචිත නිකුත් කරන්න ඕනෑ. නැත්නම් මහ බැංකුව වාණිජ බැංකුවලට නියෝගයක් නිකුත් කරන්න ඕනෑ, දැන් බැංකුවල තිබෙන ඩොලර් සංචිතවලින් යම් ප්‍රමාණයක් වෙළෙඳ පොළට මුදා හරින්න කියලා. ඒ සංචිත නිදහස් කරන්නේ නැත්තේ ඇයි? ඇයි මහ බැංකුව කට පියා ගෙන ඉන්නේ? අපනයන ආදායම් වැඩි වෙන්න ඕනෑ, ආනයන වියදම් අඩු වෙන්න ඕනෑ, නාස්තිකාර ආනයන ආදායම් අඩු වෙන්න ඕනෑ, තෙල් ප්‍රශ්නයට උත්තරයක් හොයන්න ඕනෑ, "සරුංගල්වලට" උත්තරයක් හොයන්න ඕනෑ කියන කාරණය අපි දීර්ඝ කාලීනව දන්නවා. ඒවා සාර්ව ආර්ථික විද්‍යාත්මක සංකල්ප. ඒවා දීර්ඝ කාලීන සැලැසුම්. මේ විධියට රුපියලේ අගය කඩාගෙන වැටෙන එකට දෙන උත්තරය මොකක්ද කියලා ඔබතුමන්ලා කොටස් වෙළෙඳ පොළට, වාණිජ බැංකුවලට, හෙට ආර්ථිකයට, ආර්ථිකයේ ඉන්න දේශීය නිෂ්පාදකයන්ට වාගේම ව්‍යාවසායකයන්ට කියන්න ඕනෑ.

මොකද, ආර්ථිකය කළමනාකරණයේදී දීර්ඝ කාලීන සැලසුම් වාගේම කෙටි කාලීන උත්තරත් තිබෙන්න ඕනෑ. මහ බැංකුව, භාණ්ඩාගාරය කියන්න ඕනෑ, දැන් අපට කරන්න දෙයක් නැහැ, අපේ පාලනයෙන් තොරයි කියලා. දැන් මේක හරියට ගත්තොත් එහෙම නාවිකයෙක් නැතුව යාත්‍රාවක් පදවනවා වාගේ නේ. රියදුරා නැති වාහනයක් වාගේ නේ මේ ආර්ථිකය යන්නේ. හැමදාම රෑ දොළහ වනකොට message එකක් එනවා කියලා බලාපොරොත්තු වෙන්න ඕනෑ, හෙට කඩා වැටෙනවා කියලා. ඉතින් එතකොට කොටස් වෙළෙඳ පොළට කවුද එන්නේ? කවුද, මේ රටට ආයෝජන ගෙනෙන්නේ? මොන දේශීය කර්මාන්තකරුවාද, තමන්ගේ අතේ තිබෙන මුදලක් ආයෝජනය කරන්නේ? ආර්ථිකය කඩාගෙන වැටෙනවා නේ. මොකද, මේක නියමුවෙක් නැති වාහනයක් නේ; රියදුරෙක් නැති වාහනයක්. අද මේ මුදල් මාතෘකාව ගැන කථා කරන නිසා මම කියන්නේ, මේ වාගේ වෙලාවකදී මුදල් අමාත්‍යාංශයට වගකීමක් තිබෙනවා, මහා භාණ්ඩාගාරයට වගකීමක් තිබෙනවා, මේ රුපියල බාල්දු වීමේ යන්ත්‍රණය, මේ මහ බැංකුව හසුරුවන යන්ත්‍රණය, තමන්ට හසුරුවන්න පුළුවන්ද, බැරිද කියන එක කියන්න. කවුරුවත් මොකුත් කියන්නේ නැහැ නේ. මුදල් ඇමතිතුමාවත් ඒ ගැන ස්ථාවරයක් දරනවාද කියලා මම දන්නේ නැහැ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා මොකක්ද කියන්නේ?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඔබතුමා අහපු නිසයි මම මේ කියන්නේ. බාධාවක් නොවෙයි, පිළිතුරු දීමක්. ඔබතුමා දන්නවා, දැන් පවතින ආර්ථික තත්ත්වය ගැන. ලංකාවේ රුපියල එක්ක බලනකොට ඩොලර් එක සියයට 8කින් ශක්තිමත් වෙලා තිබෙනවා. නමුත් ආසියාවේ අනෙක් හැම රටක්ම බැලුවොත්, ඉන්දියාවේ සියයට 13කින්, පාකිස්තානයේ සියයට 11කින්, චීනයේ සියයට 5ක් ඩොලරය ශක්තිමත් වෙලා තිබෙනවා. ඉන්දුනීසියාවේ සියයට 9.61කින් ශක්තිමත් වෙලා තිබෙනවා. නමුත් යුරෝපයේ රටවල් බැලුවත්, රුසියාවේ බැලුවත්, රූබල් එක හරහාත් සියයට 18කින් ශක්තිමත් වෙලා තිබෙනවා. බ්‍රසීලයේ සියයට 24කින් ශක්තිමත් වෙලා තිබෙනවා. ආර්ජන්ටිනාව හා තුර්කිය ගත්තොත්, එම රටවල් සියයට 70ක් හා සියයට 100කට වඩා කඩා වැටිලා තිබෙනවා. ආර්ජන්ටිනාවේ සියයට 112කින් ශක්තිමත් වෙලා තිබෙනවා. ඉතින් මේක ලංකාවේ තිබෙන ගැටලුවක් -ප්‍රශ්නයක්- නොවෙයි. ඔබතුමා කිව්වා වාගේ තිබෙන සංචිතය භාවිත කරන්න පුළුවන්. නමුත්, එහෙම කරන්නේ නැහැ. ඒක මහ බැංකුවේ තීරණය. මුදල් අමාත්‍යාංශයේ තීරණය නොවෙයි, මහ බැංකුවෙන් තීරණයක් ගෙන තිබෙනවා. එම සංචිතය භාවිත නොකර, LC එකක් අරිනවා

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

නම් සියයට 100ක තැන්පතුවක් තිබෙන්න ඕනෑ කියලා අද මහ බැංකුවෙන් කියා තිබෙනවා. එතකොට මොනවාද කරන්න ඕනෑ? අනවශ්‍ය luxury items ආනයනය කරන එක තමයි මෙතැන දී ඒ අය සීමා කරන්නේ. එතකොට අත්‍යවශ්‍ය ඒවා පමණයි ගෙනෙන්නේ. ඒ වාගේම අපනයනය ඉහළට යනවා. මම මේ ගැනත් කියලා අවසන් කරන්නම්. ඔබතුමා කිව්වා, විද්‍යාත්මකව තර්කානුකූල නැහැ කියලා. ඔව්, රුපියල්වලින් ණයක් ගත්තාම රුපියල්වලින් ගෙවන්න ඕනෑ. විදේශ ණයක් ගත්තාම ඒක ඩොලර්වලින් ගෙවන්න ඕනෑ. ඒ නිසා තමයි මේ ක්‍රමවේදයෙන් අපනයන ඉහළ යන්නේ. අපනයන ඉහළ ගියොත් තමයි ඒක ගෙවා ගන්න පුළුවන් වන්නේ. එතකොට, රුපියලේ අගය සියයට 8කින් අඩු වුණා කියමු. අපනයනයත් සියයට 8කින් ඉහළ යයි කියලා අපි බලාපොරොත්තු වනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

දැන් බලන්න, මේකත් පය බරවායට පිටිකර බෙහෙත් බඳිනවා වාගේ වැඩක් නේ. ලෙඩේ වෙන පැත්තක, බෙහෙත් බඳින්නේ වෙත තැනකට. අනෙක් කාරණය, අන්තිම හුස්ම වැටිලා මිනිහා මැරෙන්න යනකොටද උත්තර හොයන්නේ? දවස් හතරක්-පහක් යනකොට රුපියල කඩා වැටෙනවා. ඩොලරය ශක්තිමත් වෙනවා කියන්නේ, රුපියල කඩා වැටෙනවා කියන එක නේ. රුපියල කඩා වැටෙනකොට තමයි කියන්නේ, LC එකක් අරිනවා නම් සියයට 100ක තැන්පතුවක් තියන්න ඕනෑ කියලා. එතකොට තමයි හදිසියේම LC තැන්පතුව තියන එක මතක් වෙන්නේ. ඒකෙන් ආයෙත් අර්බුදයට යන්නේ කවුද? දැනටමත් වාහන ගෙන්වන්න ඇණවුම් කරලා තිබෙන අය; වාහන කර්මාන්තයේ ඉන්න අය; ඒවායේ රැකියාවල ඉන්න මිනිස්සු. ඇයි ඒකට සැලැස්මක් ගැන කලින් හිතන්න බැරි? මේ අයට මේ අර්බුදය පෙනෙන්නේ දැන්ද? මම කියන්නේ ඒකයි. දැන් මේ මොහොතේ පෙනෙන උත්තර නේ මේ හොයන්නේ. දැන් තමයි උත්තර හොයන්නේ. දැනුත් උත්තර හොයන්න ඕනෑ බව අපි පිළිගන්නවා.

අපනයන ආර්ථිකය දියුණු කරනවා කියලා මෙතුමන්ලා කියනවා. ඔබතුමාත් දන්නවා ඇති, ඔබතුමාගේ පළාතේත් තිබෙන ගම්මිරිස් කිලෝව රුපියල් එක්දහස් දෙසියයට තිබුණු එක දැන් රුපියල් හාරසිය පනහට, පන්සියයටවත් විකුණා ගන්න බැරිවෙලා තිබෙනවා. එතකොට අපනයන වෙළෙඳ පොළේ ගම්මිරිස්වලට මොකද වුණේ කියලා පෙනුණේ නැද්ද? දැන් මෙතුමන්ලා කියන්නේ, "කමක් නැහැ, ඩොලරය කඩාගෙන වැටුණාම ගම්මිරිස්වලට හොඳ වෙයි" කියලා. එතකොට ගම්මිරිස් ගොවියාට බලාපොරොත්තුවක් හදනවා, ඩොලරය කඩා වැටෙනකල් ඉඳපල්ලා කියලා. ඩොලරය ශක්තිමත් වෙනවා, රුපියල කඩාගෙන වැටුණාම ගම්මිරිස් මිල හොඳ වෙනවා. එහෙම වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම සංකල්පවල ඉඳලා අමාරුවේ වැටෙනවා. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. දැන්වත් මේ රටට තිරසාර, ස්ථීර සැලැස්මක්, වැඩ පිළිවෙළක් ඕනෑ.

ආනයන අපනයන පරතරයේ වෙනස ඇති කර ගැනීමට රටට ගෙනෙන්න ඕනෑ දේවල් මොනවාද, ඒවා මොන ප්‍රමාණයකින් ඕනෑද, පාරිභෝජන අවශ්‍යතාව තිබෙන්නේ කොයි මට්ටමින්ද කියන එම දේවල් හරියට ගණනය කරන්නේ කවුද? අප දන්නා තරමට තවම එහෙම ගණනය කරන තැනක් නැහැ. ඒ වාගේම අපනයන දිරිගැන්වීම් සිදු වන්නේ මොන ඉලක්කයක් මතද කියන එක සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒකේ ප්‍රතිඵලය විතරක් නොවෙයි. ලබා ගත් ණයවල වාරික, පොලි ගෙවීමට අපි කොච්චර වැය කරනවාද? අද රටේ ආර්ථිකයේ සියයට 89ක් ආදායම යොදවන්නේ ගත්ත ණයවල වාරිකයයි, පොලියයි ගෙවන්නයි. දැන් අපි මොනවා කථා කළත් අගෝස්තු මාසය, සැප්තැම්බර් මාසය වන විට ගත්ත ණයවල වාරිකය සහ පොලිය ගෙවීමට මුදල් සොයා ගන්න බැරිව මහ බැංකුවේ භාණ්ඩාගාරයේ ලේකම්තුමන්ලා ගිනි අරගෙන ඉන්නේ කියලා ඔබතුමන්ලා හොඳටම දන්නවා. ඔය ණය වාරිකය ගෙවන්න ඩොලර් නැති නිසා තමයි දැන් මේ සංචිත මුදා හරින්න බැරි. ඇත්ත කාරණය ඒකයි. සංචිත මුදා හරින්න සංචිත තිබෙන්න එපායැ. දැන් ඔබතුමන්ලාම පිළිගත්තා, අය වැය ඉදිරිපත් කරනකොට කිව්වා 2018, 2019 තමයි අපි ණය වාරිකවල උච්චතම අවස්ථාවට යන්නේ කියලා. අපට අතීතයට දොස් කියන්න පුළුවන්. අතීතයට දොස් කියන්න පුළුවන්, ඒක වෙනම කථාවක්. මෙතුමන්ලාට පුළුවන් කියන්න, ඔයගොල්ලන් ගත්ත ණය, මේ ගොල්ලන් ගත්ත ණය, ඉතිහාසයේ ගත්ත ණය, අපි ගත්ත ණය නොවෙයි කියලා. අපි, ඔබතුමන්ලා ආර්ථිකයක් හැටියට, රටක් හැටියට යථාර්ථයට මුහුණ දෙන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණෙන් අපි කියන්නේ නැහැ, ඔයගොල්ලන් ගත්ත ණය කියලා. මේවා රටක ණය. ගත්ත ණයවල කොන්දේසි වෙනස් වෙන්න පුළුවන්; පදනම වැරැදි වෙන්න පුළුවන්, නාස්තිකාර වියදම් වෙන්න පුළුවන්. හැබැයි, ගෙවන්න වෙනවා නේ. ගෙවන්න වෙනවා. ගෙවන්න වෙන අර්බුදයේ දී උත්තර හොයනකොට ඔබතුමන්ලා තවම උත්තර හොයන්නේ මේ රටේ තිබෙන මොකක් හරි කාට හරි විකුණන්නයි. දැන් ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික නැවත ඉන්දියාවට දෙන්න තීරණය කර තිබෙනවා. තෙල් ටැංකි 15ක් දුන්නා. මා දන්නා තරමට අගෝස්තු මාසයේ හත්වැනි දින කැබිනට් මණ්ඩලය තීරණය කර තිබෙනවා ඉන්දියාවයි, ලංකාවයි හවුල් සමාගමක් හදලා ඉතිරි තෙල් ටැංකි 85ත් දෙන්න. එතකොට මොකද වෙන්නේ? තෙල් ටැංකි කියන්නේ අපට ධන නිධානයක්; ඩොලර් සම්පතක්. ලංකාව ඔය තෙල් ටැංකි ටික හරියට පුරවා ගත්තොත් ලංකාවට විතරක් නොවෙයි, මේ කලාපයේ මාලදිවයින ඇතුළු අනෙකුත් රටවලටත් තෙල් විකුණන්න අපට පුළුවන්. ලෝක වෙළඳ පොළේ තෙල් මිල අඩු වෙන කාලයට අපට තෙල් ටැංකි ටික පුරවලා තියාගන්න බැරිද? අපි දැන් ඒක ඉන්දියාවට විකුණලා ඉන්දියාවෙන් තෙල් ගන්න තමයි යන්නේ. ඊළඟට අපට ඉන්දියාවෙන් තමයි තෙල් ගන්න වෙන්නේ. ඒක තමයි ඇත්ත කථාව. ඔබතුමන්ලා දැන් ආර්ථික අර්බුදයට උත්තර හොයන්න තෙල් ටැංකි ටික විකුණනවා. අනුනව අවුරුද්දකට වරාය විකුණනවා. වරායේ කොළඹ නැගෙනහිර ජැටිය දෙන්න කථා කරනවා. පුල්මුඩේ බනිජ වැලි එක දෙන්න කථා කරනවා. එතකොට අපට ඉතිරි වෙන්නේ මොකක්ද? ඊට පස්සේ කල්පනා කරලා කියනවා, රුපියල බාල්දු වෙනකොට අපේ අපනයන ආදායමට හොඳයි කියලා. අපනයන ආදායමක් ලබන්න මොනවාද අපනයනය කරන්න ඉතිරි වෙලා තිබෙන්නේ. මොනවාද අපනයනය කරන්නේ? අපනයන ආදායම ජනිත කර ගැනීමට තිබෙන ආර්ථික මූලයන් ටික, සම්පත් ටික විකුණලා, අපි හැමදාම අනිවාර්යයෙන් ගෙන්වන තෙල් ටික, බෙහෙත් ටික, යන්ත්‍ර සූත්‍ර ටික, වාහන ටික ගෙනෙන්න ඕනෑ නම් අපට ඉතිරි වෙන්න දෙයක් නැහැ.

2018 සැප්තැම්බර් මස 3වැනි දින සිට 20වැනි දින දක්වා රුපියල කඩා වැටුණු ආකාරය දැක්වෙන මෙම ලේඛනය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලමින් මා **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1986 වර්ෂයේ අපි ඩොලරයකට ගෙව්වේ රුපියල් 28යි. 2000 වර්ෂයේ රුපියල් 75යි. 2010 වර්ෂයේදී රුපියල් 113යි. මේ ආණ්ඩුව බලයට එනකොට ඩොලරය රුපියල් 130යි. මේ ආණ්ඩුව බලයට ඇවිත් මේ අවුරුදු 3ක කාලය තුළ රුපියල් 38කින්, අවුරුද්දට රුපියල් 10 ගණනේ රුපියල කඩා වැටී තිබෙනවා. රුපියලකට ඩොලර් හුවමාරු කරන වටිනාකම කඩා වැටී තිබෙනවා. ඒ කියන්නේ 2015 වර්ෂයේදී රුපියල් 130ට ගත්ත ඩොලරයක් අවුරුදු තුනකට පසුව අද රුපියල් 168යි, අනිද්දා වනකොට රුපියල් 170යි. මේක කොහොම සාධාරණීකරණය කරන්නද? ඒකට අපට ඉතිහාස ණය, ඉතිහාස කථා කියන්න පුළුවන්.

ඊයේ රාජිත සේනාරත්න ඇමතිතුමා කියනවා මම දැක්කා, "2019 අය වැයෙන් හොඳින් හුස්ම ගන්න පුළුවන් සහන ලබා දෙනවා" කියලා. ඒ කියන්නේ 2019 අය වැය එනකම් අපි හුස්ම හිරකර ගෙන ඉන්න ඕනෑ. රටේ ජනතාව නොවැම්බර් මාසයේ 5වැනි දින වෙනකම් දැන් බෙල්ල හිරකර ගෙන ඉන්න ඕනෑ කියලා නේ මේ කියන්නේ. "එතෙක් නුඹලා හුස්ම ගන්න එපා, 2019 අය වැයෙන් හුස්ම ගන්න දෙනවා." මේ බලාපොරොත්තු, මේ හීන, මේ බෝල පිම්බිල්ල කවදාද ඉවර කරන්නේ? අපට රටේ ජනතාවට ඊට වැඩිය කියන්න දෙයක් නැද්ද? රටේ ජනතාවට කියනවා නම්, රටේ ජනතාවට ඇත්තටම මීට වඩා පිළිගනී. "අපි අර්බුදයක ඉන්නේ, අපි හිර වෙලා ඉන්නේ, බෙල්ල හිරවෙලා ඉන්නේ, ජනතාවට වාගේම අපටත් හුස්ම ගන්න විධියක් නැහැ" කියලා දැන් කියන්න බැහැ නේ.

මොකද, එතුමන්ලාට හුස්ම ගන්න බැරි ප්‍රශ්නයක් නැහැ. එතුමා කොන්දේ අමාරුව හැදුණත් බෙහෙත් ගන්න යන්නේ සිංගප්පූරුවේ මවුන්ට් එළිසබෙත් රෝහලටයි. එතුමාගේ පුතාගේ wedding එක තිබුණේ අරලියගහ මන්දිරයේයි. එතුමන්ලාට හුස්ම ගන්න බැරි ප්‍රශ්න නැහැ. "අපි හොඳට හුස්ම ගන්නවා, ඔය ගොල්ලන් හුස්ම හිර කරගෙන ඉන්න, 2019 අය වැයෙන් තමයි හොඳට හුස්ම ගන්න පුළුවන්කම ලැබෙන්නේ" කියා එතුමන්ලා ජනතාවට කියනවා. එතුමා හිතාගෙන ඉන්නේ මාස 9ක්, 10ක් හුස්ම හිර කරගෙන ඉඳලා අත හැරියාම ආයෙත් හුස්ම ගන්න පුළුවන් කියායි. ඒ නිසා නේ, එවැනි තර්ක ගෙනෙන්නේ. ඉතින් මෙවැනි තත්ත්වයක් තුළ, අද රටේ ජනතාව පාරට බහින එක වළක්වන්න බැහැ කියන එකයි අපට ඉතා පැහැදිලිව කියන්න තිබෙන්නේ.

අද ගොවි ජනතාව අසරණ වෙලා ඉන්නවා; ඔවුන්ගේ කන්න ගණනාවක් පාඩු වෙලා තිබෙනවා; රට පුරාම නියඟයක් තිබෙනවා. මිනිසුන්ට බොන්න වතුර නැහැ; වගා කරන්න වතුර නැහැ. ඔවුන්ට ආදායම් මාර්ගයක් නැහැ. සාමාන්‍ය ජනතාවගේ තත්ත්වය ඒකයි. බස් ගාස්තු වැඩි වෙනවා; ගෑස්, කිරි පිටි, කෑම බීමවල මිල වැඩි වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෑස් සිලින්ඩරය රුපියල් 195කින් වැඩි වෙනකොට පාන් ගෙඩියේ, බනිස් ගෙඩියේ මිල වැඩි වෙන්නෙත් ඒ ගණනට අනුපාතිකව රුපියල් පහෙන්, දහයෙන්. හැබැයි, මේ සියල්ලටම මිල සූත්‍ර තිබෙනවා. තෙල් සඳහාත් මිල සූත්‍රයක් තිබෙනවා. මිල සූත්‍රයක් නැත්තේ මොනවාටද? වැටුප් සඳහා මිල සූත්‍රයක් නැහැ. ජනතාවට ජීවත් වෙන්න ආදායම වැඩි වන මිල සූත්‍රයක් නැහැ. ඔබතුමන්ලා මේ යථාර්ථය පිළි ගන්න. ගම්වල ඉන්න ඇමතිතුමන්ලා දන්නවා, ජනගහනයෙන් සියයට 74ක් ජීවත් වන්නේ ගම්වල බව. ඒ වාගේම ජනගහනයෙන් සියයට 43කට දවසකට රුපියල් 320ක ආදායමක්වත් නැහැ. මෙවැනි බරපතළ විෂමතාවක් තිබෙන රටක ජනතාවගේ කොන්ද මතට තමයි ඔබතුමන්ලා මේ බදු බර පටවන්නේ. මේකෙදී, "ලෝකයේ යථාර්ථය මේකයි" කියලා හරි යන්නේ නැහැ. අද මේ කරන බදු නිදහස් කිරීම ඉන්දියාව කර නැහැ. අර්බුදයක් තිබෙන බව ඇත්තයි. නමුත්, ඉන්දියාවේ ජනගහනය, ඒ රටේ ප්‍රමාණය, ආර්ථිකය අපේ රටත් එක්ක සංසන්දනය කරන්න බැහැ; "ඉන්දියාවෙත් මෙහෙම තමයි, චීනයෙත් මෙහෙම තමයි" කියලා හරි යන්නේ නැහැ. අපේ දෙකෝටි දහනවලක්ෂයක ජනතාවගේ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න ආණ්ඩුවට පුළුවන්ද, බැරිද? ආණ්ඩුව ඒකෙදී මේ මොහොතේ තිබෙන අර්බුදයට උත්තර හොයන්නේ කොහොමද? අද ආර්ථිකය සම්පූර්ණයෙන් කඩා වැටිලා තිබෙන්නේ. ව්‍යාපාර, කර්මාන්ත එක තැන ඇන හිටලා තිබෙන්නේ. ආණ්ඩුව නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කළොත්, ඒ තත්ත්වය තව දුරටත් වර්ධනය වන එක වළක්වන්න බැහැ. ඒ නිසා මේ බදු වැඩි කිරීම වෙනුවට ජනතාවට බදු සහන දීලා, මේ මොහොතේ ඇති වෙලා තිබෙන තත්ත්වයට -රුපියලට සාපේක්ෂව ඩොලරය ශක්තිමත් වෙමින් රුපියල බාල්දු වන මේ අර්බුදයට- ආණ්ඩුව පිළිතුරු සෙවිය යුතුයි කියන එකයි අපේ යෝජනාව වන්නේ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.05]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මුදල් අමාත්‍යාංශය පිළිබඳව ජාතික වැදගත්කමකින් යුත් විශාල ප්‍රශ්න මතු වෙද්දී, අපේ මුදල් රාජ්‍ය අමාත්‍ය, ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා ඒ ප්‍රශ්නවලට මේ පාර්ලිමේන්තුවේදී යම් යම් පිළිතුරු ප්‍රකාශයට පත් කරනවා. මේ රජය පටන් ගත්ත දවසේ ඉඳන් අද වනතුරු දිගින් දිගටම නහන චෝදනාවක් තමයි, "හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ සඳහා මහින්ද රාජපක්ෂගේ කාලයේ අරගෙන තිබෙන නාස්තිකාරී ණය කන්ද නිසා තමයි මේ රටට ගොඩ යන්න බැරි, ඒ නිසායි බදු වැඩි කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ, කිසිම මැතිවරණ පොරොන්දුවක් ඉෂ්ට කරන්න බැරි වෙලා තිබෙන්නේ" කියන එක. ඒක සම්පූර්ණයෙන්ම සාවද්‍යයි. අඩු ගණනේ අදවත් මේක නිවැරැදි කරන්න ඕනෑ. අඩුම තරමින් එක්සත් ජාතික පක්ෂයේ පසු පෙළ ඉන්න මන්ත්‍රීතුමන්ලාවත් තේරුම් ගත යුතු දෙයක් තිබෙනවා. මේ රටේ ණය පිළිබඳ දැවැන්ත අර්බුදය ඇති වුණේ මහින්ද රාජපක්ෂ යුගයේදී නොවෙයි. රාජ්‍ය අය වැය තුළ දීර්ඝ කාලයක් තිස්සේ නොපියවූ යම් හිඟයක් පියවා ගැනීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් ණය ගැනීම නිසා, 2001 වර්ෂය වන විට දැවැන්ත ණය කන්දක් උරුම කර දී තිබුණා. 2001 වර්ෂයේදී රාජ්‍ය ණය අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්තොත්, 103.3යි; 2002දී 105.6යි; 2003දී 102.3යි; 2004දී 102.3යි. මහින්ද රාජපක්ෂ මැතිතුමා රට භාර ගත්තේ ලංකාවේ ජාතික නිෂ්පාදනයට වඩා ණය බර ප්‍රමාණය වැඩි තත්ත්වයක තිබියදීයි. මේක තමයි පරම සත්‍යය වන්නේ. මේ සම්බන්ධ සංඛ්‍යා, දත්ත පැහැදිලිව සටහන් වන ප්‍රස්තාර සටහන මා **සභාගත*** කරනවා. එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියා මා ඉල්ලා සිටිනවා. මොකද, මේ කරගෙන යන බොරුව මෙතැනින් නතර විය යුතුයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

ඒ අවස්ථාවේදී රටේ අග්‍රාමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2002 ජූලි 4වන දා මෙහෙම කිව්වා.

"ලංකා ඉතිහාසයේ පළමු වතාවට ප්‍රධාන තත්ත්වයන් තුනක් අද රටේ ආර්ථික ක්ෂේත්‍රය තුළ දකින්න තිබෙනවා, දළ දේශීය නිෂ්පාදනයට වඩා රාජ්‍ය ණය ප්‍රමාණය ඉහළ යාම පළමු තත්ත්වයයි, දෙවන විශේෂ තත්ත්වය රජයේ ආදායමට වඩා ලබා ගත් ණයවල වාරික හා පොලිය වැඩි වී තිබීමයි, මෙම සිද්ධීන් දෙකම එකම අවස්ථාවක දී ඇතිවීම තෙවන සුවිශේෂ තත්ත්වයයි"

වර්තමාන අග්‍රාමාත්‍ය -එදාත් අග්‍රාමාත්‍ය- ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පළමුවැනි වතාවට ඉතා පැහැදිලිව කියනවා, "මේ ණය කන්දේ ප්‍රමාණය රටේ ආදායමට වඩා වැඩියි" කියා. මහින්ද රාජපක්ෂ යුගයේදී සිදු වුණේ ඒ තිබුණු ණය ප්‍රමාණය සියයට 71.3ක් දක්වා අඩු කිරීමයි. ඒ නිසා මේ ණය පිළිබඳ කතන්දරය අසත්‍යයක්; මිථ්‍යාවක්. ඒ මිථ්‍යාව වපුරලා, වපුරලා දැන් ඇත්ත වශයෙන් තිබෙන තත්ත්වය තමුන්නාන්සේලා තේරුම් ගන්නේ නැහැ. ලංකාව වැනි අඩු ආදායම් ලබන රටක්; දියුණු වෙමින් පවතින රටක්; මැදි ආදායම් ලබන රටක් ගෙවුම් ශේෂයේ ප්‍රාග්ධන ගිණුම විවෘත කිරීම වැරැදියි කියමින් බොහොම සරල කතන්දර කියන්නේ නැතිව, මෙම අණ පනත් වෙනස් කරනකොට ඊට මැදිහත් වෙන්න ව්‍යවස්ථාදායකයට හැකියාව තිබුණා. විනිමය පාලන පනතේ මේ වෙනස් කිරීම කරන්න එපාය, එහෙම කළොත් රට අර්බුදයට යනවාය කියා ශ්‍රේෂ්ඨාධිකරණයට ගියේ ඒකාබද්ධ විපක්ෂයේ අපි විතරයි. මම ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් ඉල්ලා සිටියා, "විනිමය පාලන පනත වෙනස් කරන්න එපා, exchange control එක ඕනෑ" කියා. "එය ශ්‍රී ලංකා මහ බැංකුවට තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් සෝරෝස්ලා නායිලන්තයේ ආර්ථිකය කඩා වැටිටුවා වාගේ මේ ටිකත් අරගෙන යාවි. වක්කඩ කැඩුවා වාගේ අපේ මුදල් යන්න පටන් ගනියි. බාහිර කම්පනයක් ඇති වුණොත් මේ දේවල් රටට ඔරොත්තු දෙන්නේ නැහැ. ඒ නිසා මේ වෙනස් කිරීම කරන්න එපා" කියා අපි කිව්වා. එහෙම කියලාත් අහන්නේ නැති නිසා මම ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළා. "මේ රට ඇතුළට මුදල් එනවාට විපක්ෂය විරුද්ධ ඇයි?" කියා ශ්‍රේෂ්ඨාධිකරණයේ උගත් විනිසුරුතුමන්ලා අපෙන් ඇහුවා. "රට ඇතුළට මුදල් එන එකේ කිසි ප්‍රශ්නයක් නැහැ; රටින් පිටට මුදල් ගලාගෙන යනකොට ඒක නතර කරන්න ක්‍රමයක් නැති වෙන එක තමයි ප්‍රශ්නය" කියලා අපි කිව්වා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් සමහර කරුණු වෙනස් වුණා. තිලක් මාරපන ඇමතිතුමාගේ කමිටුවේදී වාසුදේව නානායක්කාර මැතිතුමායි, මමයි මේ ගැන කිව්වා. "විනිමය පාලනය" කියන කොටස මහ බැංකුව යටතේ තියා ගන්න බැහැ කිව්වා. "විනිමය කළමනාකරණය" කියන වචන ඇතුළත් කරන්න කියා එහිදී අපි කිව්වා. ඒක කරන්න බැහැ කිව්වා. අඩුම තරමින්, "කළමනාකරණය" කියන වචනයවත් දමන්න බැහැ කියලා සොච්චම් ප්‍රමාණයක් තියාගෙන හිටියා. ඒ නිසා අද "නූල කැඩුණු සරුංගලය වාගේ" ඩොලරයේ මිල දවස ගණනේ වැඩි වෙනවා. ඒ වැඩිවීමත් එක්ක සසඳනකොට තමුන්නාන්සේලා පිළිගත යුතු සත්‍යයක් තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ ප්‍රධානම වගකීම වුණේ මොකක්ද? සාර්ව ආර්ථික ස්ථායීකරණයයි. සාර්ව ආර්ථික ස්ථායීකරණයක් ඇති කරන්න මුදලේ අභ්‍යන්තර සහ බාහිර අගය ආරක්ෂා කරන්න ඕනෑ. එය කළ නොහැකි රජයක් ඉන්නවා නම් ඒ රජයට රටේ ආණ්ඩු කරන්න බැහැ.

2005දී මහින්ද රාජපක්ෂ මැතිතුමා රට භාර ගන්නා විට ඩොලරයක මිල රුපියල් 105යි. ඒ කියන්නේ, අපි ඩොලර් එකකට රුපියල් 105ක් ගෙව්වා. ඒක තමයි එදා තිබුණු මිල. අද මේ කියන ඇමෙරිකාවේ ප්‍රශ්නය වාගේ නොවෙයි, මුළු ලෝකයම තෙලෙන් බැඳෙන, ජාත්‍යන්තර මට්ටමේ විශාල ඛනිජ තෙල් අර්බුදයක් එදා තිබුණා. තෙල් බැරලයක මිල රුපියල් 127ක් වුණා. ඒ මිල ලංකාවට, ඉන්දියාවට, පාකිස්තානයට, බංග්ලාදේශයට විතරක් නොවෙයි, ලෝකයේ හැම රටකටම පොදුයි. දෙවැනි ප්‍රශ්නය මේකයි, අවුරුදු 30කට පසු ලෝකයේ දැවැන්තම ආහාර අර්බුදයක් ඇති වුණා. මිනිසුන්ට කන්න නැති වුණා; රොකට් එකක් යන වේගයෙන් ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ ගියා. එතකොට ආහාර ගෙන්වන්න යන සල්ලි රටින් පිටට යන එක වැඩි වුණා. ලෝක මූල්‍ය අර්බුදයක් ඇති වුණා. Mutual Bank බංකොලොත් වුණා; Lehman Brothers කඩාගෙන වැටුණා. කාඩ් කූටිටම පෙරළෙනවා වාගේ, බැංකු 450ක් විතර කඩාගෙන වැටෙනකොට සෙලාන් බැංකුවත් හෙල්ලෙන්න පටන් ගත්තා. ඒ බැංකුව බේරා ගත්තේ රජයට පවරාගෙනයි. ඒ, එක අර්බුදයක්.

අනෙක් දැවැන්තම අර්බුදය තමයි යුද්ධය. අවුරුදු 30ක් තිස්සේ මේ රටේ තිබුණු යුද්ධය විසඳන්න කාටවත් නොහැකි වුණා. ඒ වෙනුවෙන් මෝටාර් ගෙනෙන්න ඕනෑ; Multi-barrel rocket launchers ගෙනෙන්න ඕනෑ; යුද්ධයට අවශ්‍ය කරන ආයුධ සියල්ලම ගෙනෙන්න ඕනෑ. ඒ සඳහා විදේශ විනිමය ඕනෑ වෙනවා. මේ සඳහා විදේශ විනිමය විශාල ප්‍රමාණයක් රටින් පිටට ගියා.

මේවා දැවැන්ත අර්බුද. ඇමෙරිකාවේ පොලිය වැඩි කිරීම වාගේ නොවෙයි. ලෝක ඛනිජ තෙල් අර්බුදය, ලෝක ආහාර අර්බුදය, ලෝක මූල්‍ය අර්බුදය, ලංකාව ඇතුළේ තිබෙන යුද්ධය, ණය කන්ද පිළිබඳ අර්බුදය, මේ සියලු අර්බුද මැද්දේ මහින්ද රාජපක්ෂ අවුරුදු 10ක් මේ රටේ ආණ්ඩු කරනකොට ඇමෙරිකානු ඩොලරය රුපියල් 131යි. රුපියල් 105 සිට 131 දක්වා වැඩි වීම රුපියල් 26යි. එතකොට රුපියල පිරිහීමේ වාර්ෂික සාමාන්‍ය අගය ගත්තොත් එය සියයට 2යි. ඒ විධියට මහින්ද රාජපක්ෂ යුගයේ තමයි ලංකා ඉතිහාසයේ පාවෙන විනිමය අනුපාත ක්‍රමය යටතේ වඩාත්ම ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබෙන්නේ.

ලංකා ඉතිහාසයේ කිසිම රජයකට නොලැබුණු ආකාරයේ ඉතා විශාල වාසියක් තමුන්නාන්සේලාට ලැබුණා. මොකද, ලෝකයේ ඛනිජ තෙල් මිල අඩු වුණා. 2011දී ඛනිජ තෙල් බැරලයක් ඇමෙරිකානු ඩොලර් 108යි ශත 59යි. 2012දී ඇමෙරිකානු ඩොලර් 114යි. 2013දී ඇමෙරිකානු ඩොලර් 109යි. 2016දී ඛනිජ තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 46යි ශත 30 දක්වා අඩු වුණා. මතක තියාගන්න, එහෙම වාසියක් ලංකාවේ කිසිම ආණ්ඩුවකට ලැබිලා නැහැ. 2015දී බොර තෙල් බැරලයක් ඇමෙරිකානු ඩොලර් 54.80යි. 2016දී ඇමෙරිකානු ඩොලර් 46යි ශත 30යි. 2017දී ඇමෙරිකානු ඩොලර් 57යි ශත 79යි. ලංකාවේ ප්‍රධානම වියදම තමයි ඛනිජ තෙල් ආනයනය කරන්න යන වියදම. එම වියදම එකට එකක් තමුන්නාන්සේලාගේ,- මම මේ මිල ගණන් සඳහන් ලේඛන **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද රාජපක්ෂ යුගයේදී ඛනිජ තෙල් ආනයන වියදම බැලුවොත්, 2012දී ඇමෙරිකානු ඩොලර් මිලියන 5,045යි. 2013දී ඇමෙරිකානු ඩොලර් මිලියන 4,308යි. 2014දී ඇමෙරිකානු ඩොලර් මිලියන 4,597යි. ඛනිජ තෙල් ගෙනෙන්න හැමදාම ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක්, 5ක් මේ රටින් පිටට යනවා. තමුන්නාන්සේලාට මොකද වුණේ?

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

2015දී වාසනාව ලැබුණා. 2015දී බනිජ තෙල් ආනයනය කරන්න වැය වුණේ ඇමෙරිකානු ඩොලර් මිලියන 2,700යි. 2016දී ඇමෙරිකානු ඩොලර් මිලියන 2,481යි. 2017දී ඇමෙරිකානු ඩොලර් මිලියන 3,427යි. සල්ලි දැවැන්ත තොගයක් රට ඇතුළේ ඉතුරු වුණා. ආණ්ඩුවකට මෙලෙසින් මහා පරිමාණ විදේශ විනිමය වස්තුවක් ඉතුරු වුණු අවුරුදු තුනක් ලංකා ඉතිහාසයේම නැහැ. ණය වාරික හා පොලිය ගෙවීම සඳහා යන වියදම සහ බනිජ තෙල් ගෙන්වීම සඳහා යන වියදම තමයි රටේ තිබෙන ප්‍රධානම වියදම් දෙක වන්නේ. ඒ දෙක සඳහා තමයි රටින් පිටට සල්ලි යන්නේ. අනිත් සියල්ලම, ඒ කියන්නේ ආනයනය කරන පොඩි පොඩි භාණ්ඩ ගත්තොත් ඒවා සුළු -සිල්ලර- දේවල්. රටින් පිටට සල්ලි යන විශාලම මූලයන් දෙක තමයි විදේශ ණයවලට වාරිකය හා පොලිය ගෙවන එක සහ බනිජ තෙල් බිල ගෙවන එක. මහින්ද රාජපක්ෂ පාලන කාලයට වඩා තමුන්නාන්සේලාගේ රජය පැවැති අවුරුදු තුනේ ඒ දෙකේම වියදම අඩුයි. ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය අමාත්‍යතුමාට මම මේ පිළිබඳ සංඛ්‍යා දත්ත ඉදිරිපත් කරනවා. මම වැරදි නම් කරුණාකරලා ඔබතුමා නිවැරදි කරන්න. මොකද, මේක අපේ රට. දැන් නොවෙයි, ඔබතුමා කථාවක් කරන වෙලාවේදී නිවැරදි කරන්න.

2012දී විදේශ ණය වාරික සහ පොලිය ගෙවන්නයි, බනිජ තෙල් ගෙන්වන්නයි ගිය වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 7,720යි. 2013දී ඇමෙරිකානු ඩොලර් මිලියන 8,352යි. 2014දී ඇමෙරිකානු ඩොලර් මිලියන 8,332යි. එතකොට මහින්ද රාජපක්ෂ යුගයේදී විදේශ ණය හා වාරික ගෙවන්නයි, බනිජ තෙල් බිල ගෙවන්නයි අවුරුද්දකට සාමාන්‍යයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 8,500ක් විතර ගියා. තමුන්නාන්සේලාගේ කාලයේදී කොහොමද? 2015දී ඇමෙරිකානු ඩොලර් මිලියන 7,472යි. 2016දී ඇමෙරිකානු ඩොලර් මිලියන 6,942යි. 2017දී ඇමෙරිකානු ඩොලර් මිලියන 7,987යි. මේ කියන අසත්‍ය මොකක්ද? ඇයි, මේ ණය ගෙවා ගන්න බැහැ කියන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
නමුත්, අද වෙලා තිබෙන්නේ මොකක්ද? අපේ කාලයට වඩා අද තෙල්වල මිල වැඩියි. 2005දී බොර තෙල් බැරලයක් ඇමෙරිකානු ඩොලර් 52.14ට තිබෙනකොට මේ රටේ පෙට්‍රල් ලීටරයක් වික්කේ රුපියල් 80ට. බොර තෙල් බැරලය ඇමෙරිකානු ඩොලර් 46ට තිබියදීත් තමුන්නාන්සේලා පෙට්‍රල් ලීටරය විකුණුවේ රුපියල් 117ට. අද තිබෙන මිලට බොර තෙල් තිබෙනකොට අපි පෙට්‍රල් ලීටරය වික්කේ රුපියල් 115ට. තමුන්නාන්සේලා විකුණන්නේ රුපියල් 149ට. ඒ නිසා පෙට්‍රල් මිල වැඩියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ජාතියේ අවධානය යොමු විය යුතු ප්‍රධානම ප්‍රශ්නයක් තිබෙනවා. රුපියල මස්තබාල්දූ වීම කරණ කොට ගෙන 2015දී රටේ ණය බර රුපියල් බිලියන 285කින් වැඩි වුණා. ඊළඟට 2016දී ණය බර රුපියල් බිලියන 187කින් වැඩි වුණා. 2017දී ණය බර රුපියල් බිලියන 225කින් වැඩි වුණා.

මම ඉදිරිපත් කරන සංඛ්‍යා ලේඛන වැරදි නම්, ඕනෑම කෙනෙකුට නිවැරදි කරන්න අයිතිය ඇතුවයි කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2018 -මේ වර්ෂයේදී- රුපියල බාල්දූ වීම නිසා, බිලියන 300කට වඩා වැඩි ප්‍රමාණයකින් ණය බර වැඩි වෙනවා කියා පුරෝකථනය කර තිබෙනවා. එවිට අවුරුදු 4දී රුපියල මස්තබාල්දූ වීම කරණකොට ගෙන රටේ ණය බර බිලියන 1,000කින් වැඩි වෙලා තිබෙනවා. ලංකාවේ කිසිම ආණ්ඩුවක් යටතේ කවදාකවත් මෙලෙසින් රුපියලක් බාල්දූ වෙලා, විදේශ ණය බර වැඩි වෙලා නැහැ. එහෙම සිදු වෙලා තිබෙනවා නම් කියන්න. "මෙන්න මේ ආණ්ඩුව කාලයේ මෙහෙම වුණා." කියා කියන්න. එහෙම වෙලා නැහැ. ඒ වැඩිපුර ගෙවන සල්ලිවලින් හම්බන්තොට වරාය වාගේ වරායන් හයක් හදන්න පුළුවන්. හම්බන්තොට වරාය වාගේ වරායන් හයක් හදන්න පුළුවන් සල්ලි! මත්තල ගුවන් තොටුපොළ වාගේ ගුවන් තොටුපොළවල් හදන්න පුළුවන්.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Irrigation and Water Resources and Disaster Management)
මාළු අල්ලන්න යන්නද?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මාළු නොවෙයි. ඒ සල්ලිවලට මොකද කළේ? ඒ සල්ලි කොහේ ගියාද කියා හොයා ගන්න බැහැ. රටට කිසිම වත්කමක් නැතුව ඩොලර් බිලියන 1,000ක් කොහෙටද ඇද්දේ? ලෝකයේ බනිජ තෙල් මිල අඩු වෙලා, පොහොර මිල අඩු වෙලා, රසායනික ද්‍රව්‍යවල මිල අඩු වෙලා. පොලීසියට තේරෙනවාද ආර්ථික විද්‍යාව? මෙය රටක තිබෙන ප්‍රශ්නයක්, රටක තිබෙන ගැඹුරු ප්‍රශ්නයක්. ඒ නිසා තමයි මම ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය අමාත්‍යතුමාට කිව්වේ, මේ ණය බරේ ප්‍රශ්නය නොවන බව අඩු ගානේ තේරුම් ගන්න කියා. ඩොලර් ටික පිච්චුවා. පුච්චනකම් බලාගෙන හිටියා. මම අභියෝග කරනවා. මම තමුන්නාන්සේලාට අභියෝග කරනවා, පුළුවන් නම් ගම්වලට යන්න. අද ඩොලරයේ රුපියලේ අගය 170යි. තමුන්නාන්සේලා වක්කඩ කැඩුවා වාගේ liberalize කළා. ඩොලරයේ අගය රුපියල් 200 වුණාම මොකද වෙන්නේ? මේ ගැන "සීල්" විපක්ෂය කථා කළෙත් නැහැ, "හීලෑ" විපක්ෂය කථා කළෙත් නැහැ. තමුන්නාන්සේලා විනිමය පාලන පනත අයින් කර, ශ්‍රී ලංකා මහ බැංකුවට තිබුණු පාලන බලය නැති කර, දැන් කටයුතු කරගෙන යනවා. කවුද මේ රටේ ඉන්නේ? ව්‍යවස්ථාදායකය ඇතුළේ ඉන්නේ මේ වාගේ අය නම්, රටේ ආර්ථිකය කඩා වැටෙනකොට තිබෙන සංවාදය මේක නම්, උකුණෙක් තරම් මොළයක් තිබෙන මිනිහෙක් මේ රටේ ආයෝජනය කරන්න එයිද? කොටස් වෙළෙඳ පොළ කඩාගෙන වැටෙනවා. විනිමය අනුපාතය කඩාගෙන වැටෙනවා. පොලී අනුපාතය අහස උසට ඉහළ යනවා. ගත්ත ණය වාරික, පොලී ගෙවා ගන්න බැරිව මිනිස්සු වස බීලා මැරෙනවා. රටේ දවස ගානේ බදු වැඩි කරනවා. මේ වාගේ තත්ත්වයක් තුළදී, ව්‍යවස්ථාදායකයේ මේ වාගේ ප්‍රබුද්ධ මන්ත්‍රීවරු කට්ටියක් ඉන්න රටකට ආයෝජකයෙක් නියා පිස්සෙක්වත් එයිද? පිස්සෙක්වත් එන්නේ නැහැ. හොඳටම පිස්සු නැති මිනිහෙක් මේ රටේ ආයෝජනය කරන්නේ නැහැ, තිබෙන සල්ලි ටිකත් අරගෙන යනවා. මොකද, ව්‍යවස්ථාදායකයේ ඉන්න අයට මේ රටේ තිබෙන අර්බුදය ගැන අඹ මල් රේණුවක තරම්වත් අවබෝධයක් නැහැ. ඒ නිසා තමයි අද රට මේ තත්ත්වයට කඩාගෙන වැටිලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් කියන්න කැමැතියි ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය කඩා වැටෙනකොට තේ නිෂ්පාදකයන් හා අනෙක් අය මොකද කියන්නේ කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

පුරවැසියෙක් විසින් මා වෙත එවන ලද ලිපියක් ගරු සභාවට ඉදිරිපත් කරන්න මම කැමැතියි. එම ලිපියේ මෙසේ සඳහන් වනවා:

"..... ඩොලරය නොනැවතී ඉහළ යන අතර, රිට සාපේක්ෂව දළු මිල ද ඉහළ යා යුතු නමුත්, සිදුව ඇත්තේ රිට ප්‍රතිවිරුද්ධ දෙයකි. පසුගිය මාස කීපය තුළ මගේ මධ්‍යම ප්‍රමාණයේ (අක්කර 8ක) තේ වත්තෙන් සැපයෙන දළු සඳහා ලැබුණු මිල ගණන් පහත පරිදි වේ.

දළු සපයනු ලබන්නේ "උඩපුස්සැල්ලාව වැවිලි සමාගමට" අයිති රංගල "ඩක්වාරි" තේ කර්මාන්තශාලාවටය.

| මාසය | මිල (කිලෝවකට) |
|---|---|
| 2017 දෙසැම්බර් | රු. 80.03 |
| 2018 ජනවාරි | රු. 78.83 |
| 2018 පෙබරවාරි | රු. 77.13 |
| 2018 මාර්තු | රු. 70.49 |
| 2018 අප්‍රේල් | රු. 71.20 |
| 2018 මැයි | රු. 69.48 |
| 2018 ජුනි | රු. 60.39 |
| 2018 ජූලි | රු. 60.87 |

මෙම පුදුම සහගත තත්ත්වයට රජය වහකිව යුතු වේ. කරුණාකර මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ හඬක් නගන්නේ නම් ඉතා කෘතඥ වෙමි....."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක තමයි රටේ ජනතාව කියන්නේ. දැන් ඇමතිවරු කියනවා, ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අඩුවනකොට තේවලට හොඳයි, රබර්වලට හොඳයි, පොල්වලට හොඳයි, මිල වැඩි වෙනවා කියා. මිනිස්සු කියනවා, "අපට වෙලා තිබෙන දේ බලන්න කියා මේ පාර්ලිමේන්තුවේ හඬක් නගන්න." කියා. රුපියල තවදුරටත් පාවෙන්න ඉඩ දුන්නොත්, අද රුපියල් 170ට ගිය ඩොලරය නියත වශයෙන් රුපියල් 200 දක්වා යෑම නතර කර ගැනීමට බැරි වනවා. එය නතර කර ගැනීමට ප්‍රබුද්ධ සංවාදයක් ඇති කර ගන්න පාර්ලිමේන්තුව මැදිහත් වෙන්න කියා ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා.2.22]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Irrigation and Water Resources and Disaster Management)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, tuition පන්තියක් ඉවර වුණාට පස්සේ කථා කරන්න ලැබීම ගැන බොහොම සන්තෝෂයි. පොඩි ළමයින්ට දේශනා දුන්නාට රටේ නීතිය පිළිබඳව දන්නේ නැහැ. පොලිසියේ ඉන්න මිනිස්සුත්, හිටපු මිනිස්සුත් රටේ නීතිය ගැන දන්නවා. ඒ නිසා අනවශ්‍ය දේවල්වලට පැටලෙන්නේ නැතුව වැඩකටයුතු කරන්න පුළුවන්. නීතිය දන්නේ නැති මිනිස්සු හම්බ කරන්න, ජරාව කන්න ගිහිල්ලා අමාරුවේ වැටිලා හැම දාම උසාවි ගානේ ඉන්නවා. ඒක තමයි රටට අත්වෙලා තිබෙන ඉරණම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ විවාදයේදී අනෙක් කාරණා සියල්ලම පැත්තක තබා, රුපියල අවප්‍රමාණය වීම පිළිබඳව තමයි විපක්ෂය නියෝජනය කළ හැම මන්ත්‍රීවරයෙක්ම පාහේ කථා කරනවා අපට දක්නට ලැබුණේ. අද දවසේ පවතින මේ තත්ත්වය ශ්‍රී ලංකාවට පමණක් බලපෑ සිද්ධියක් නොවෙයි. හැබැයි, අපේ ආණ්ඩුවට ඉස්සෙල්ලා ආණ්ඩුව -මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව,- පැවැති යුගයේ මේ තත්ත්වය ශ්‍රී ලංකාවට විතරක් බලපෑ යුගයක් බවට පත් වී තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද මුදල් අවප්‍රමාණය වීම ගැන කථා කරන කොට, එක් එක් රටවල භාවිත වන මුදල් වර්ග අවප්‍රමාණය වී ඇති ආකාරය බලමු. ඉන්දියාවේ රුපියල සියයට 11කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා, ඉන්දුනීසියාවේ සියයට 9කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඕස්ට්‍රේලියාවේ සියයට 8.2කින්, Philippine Peso එක සියයට 7.7කින්, ශ්‍රී ලංකාවේ සියයට 7කින්, ඒ වාගේම තුර්කියේ සියයට 41.7කින්, කොරියාවේ සියයට 5.2කින් යනාදි වශයෙන් ඒ ඒ රටවල භාවිත වන මුදල් වර්ග ඩොලර් එකට සාපේක්ෂව අවපාතයකට එහෙම නැත්නම් අවප්‍රමාණවීමකට ලක් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අන්න, අපේ "සූරින්" යනවා. සූරින් මේ ගරු සභාවේ හිටියා නම් තමයි මම කැමැති. අපරාදේ! කරන්න දෙයක් නැහැ, එතුමා මෙතැන නැති වුණත් කථා කරන්න වෙනවා නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2011-2012 කාලයේදී අපේ රුපියල ඩොලර් එකට සාපේක්ෂව සියයට 8.9 සිට සියයට 12 දක්වා අවප්‍රමාණය වෙලා තිබෙනවා. මේ සූරින්ලා ආණ්ඩු කරපු කාලය තමයි 2011-2012 කාලය කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මහින්ද රාජපක්ෂ මහත්මයා ජනාධිපති ධුරය දරපු කාලයේ තමයි මෙසේ සියයට 8.9ත්, සියයට 12ත් අතර ප්‍රමාණයකින් රුපියල අවප්‍රමාණය වෙලා තිබෙන්නේ. ඒ වාගේම 2015 අවුරුද්දේත් සියයට නවයක ප්‍රමාණයකින් රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා, ඩොලර් එකට සාපේක්ෂව. මේක සිද්ධ වෙලා තිබෙන්නේ එක යුගයක නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2011-2012 හා 2015 යුගවල ඩොලර් එකට සාපේක්ෂව අවප්‍රමාණය වෙලා තිබෙන්නේ ලංකාවේ රුපියල විතරයි; අනෙක් රාජ්‍යවල මුදල් වර්ග නොවෙයි. අද මේ ප්‍රශ්නයට මම ඉහතින් කියපු රාජ්‍යයන් සියල්ලටම ජාත්‍යන්තර වශයෙන් මුහුණ දෙන්න වෙලා තිබෙනවා. නමුත් එදා -2011, 2012 සහ 2015දී- මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදී; ඒ ආශ්චර්ය ගෙනා මැතිතුමාගේ කාලයේදී; අර හම්බන්තොට වරාය වාගේ තව වරායවල් අටක් හදන්න හිටපු මහත්මයාගේ පාලන කාලයේදී තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවට විතරක් බලපාන විධියට රුපියල අවප්‍රමාණය වෙලා තිබෙන්නේ. එතකොට ඒ යුගයේදී මේ ගොල්ලන් සංචිතයේ තිබුණු මුදල් යොදමින් මේ තත්ත්වය කෘත්‍රිමව පාලනය කරන්න උත්සාහ ගත්තා. එසේ කෘත්‍රිමව පාලනය කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵල අද අපට භුක්ති විඳින්න වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එසේ අවප්‍රමාණය වීම වළක්වා ගැනීමට 2011 අවුරුද්දේ විතරක් සංචිතයේ මුදල්වලින්

ඩොලර් මිලියන 3,184ක් නිකුත් කරන්නට වෙලා තිබෙනවා. එසේ වුණත් අවප්‍රමාණය වීම වළක්වා ගන්න බැරි වුණා. ඒ වාගේම 2012 අවුරුද්දේ මුල් කාර්තුවේදී විතරක් ඩොලර් මිලියන 977ක් මහා භාණ්ඩාගාරය වෙළෙඳ පොළට නිකුත් කරලා තිබෙනවා, රුපියල අවප්‍රමාණය වීම වළක්වා ගැනීම සඳහා. ඒ වාගේම 2015 අවුරුද්දේ සංචිතයේ තිබුණු මුදල්වලින් ඩොලර් මිලියන 1,900ක් වෙළෙඳ පොළට නිකුත් කරලා තිබෙනවා, රුපියල අවප්‍රමාණය වීම වළක්වා ගැනීම සඳහා. 2011, 2012 සහ 2015 අවුරුදුවල ආශ්වර්යයේ පියාණන් තමයි මේ රට පාලනය කළේ. මේ බන්දුල ගුණවර්ධන මැතිතුමා ඇතුළු කණ්ඩායම තමයි ඒ Cabinet එකේ එහෙම නැත්නම් අමාත්‍ය මණ්ඩලයේ සිටියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්] මොකක්ද? [බාධා කිරීමක්] ඔබතුමා අහගෙන ඉන්න කෝ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2010 ඉඳලා 2015 දක්වා කාල පරිච්ඡේදය තුළ ඩොලර් මිලියන 3,121ක් මහා භාණ්ඩාගාරයේ සංචිතයෙන් වෙළෙඳ පොළට මුදා හැරලා තිබෙනවා. ඒ යුගයේදී ඒ වෙනකොට ඩොලර් එකක් තිබුණේ රුපියල් 114.42ට, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ යුගයේදී මහා ආශ්චර්යක් තිබුණා කියනවා; බඩු මිල වැඩි කළේ නැහැ කියනවා; මිනිසුන්ට සහන දුන්නා කියනවා; mortars ගෙනාවා කියනවා; rockets ගෙනාවා කියනවා. නමුත් මිල පාලනය කළා, රට පාලනය කළා, මුදල පාලනය කළා, ඩොලර් එක පාලනය කළා කියන ඒ යුගයේ ඩොලර් එකේ අගය රුපියල් 114.42 සිට 131.25 දක්වා වැඩි වෙලා තිබෙනවා. රුපියල් 17කින් එදා ඩොලර් එකේ වටිනාකම ඉහළ ගිහිල්ලා තිබෙනවා. එතකොට මොනවාද, මේ tuition mastersලා කියන්නේ? කවුරු රවටන්නද, මේවා කියන්නේ? ඉස්කෝලේ යන පොඩි ළමයින් කිසිවක් දන්නේ නැති නිසා යමක් කිව්වාම ඒක අහගෙන ඉන්නවා ඇති. නමුත් පාර්ලිමේන්තුව එහෙම නොවෙයි කියන එක තේරුම් ගන්නවා නම්, වඩාත් හොඳයි කියන එක මම කියන්නට කැමැතියි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පාර්ලිමේන්තුවට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇවිල්ලා ඉන්නවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇවිල්ලා ඉන්නවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තමුන්නාන්සේලාගේ පැත්තේ වාඩි වෙලා ඉන්නවා. ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉන්න එකේ ප්‍රතිඵලය නිසා තමයි තමුන්නාන්සේලා හැම දාම උසාවියට යන්නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තමුන්නාන්සේලා එක්ක ඉඳගෙන ඉන්නවා. ඒක නිසා තමයි තමුන්නාන්සේලාට හැම දාම උසාවි යන්න වෙලා තිබෙන්නේ. මහජන දේපළෙන් තමන්ගේ අම්මාගේ-තාත්තාගේ පිළිරුව හදපු කට්ටිය, සොහොන් පිටිය හදපු කට්ටිය ඉන්නවා. එහෙම මුදල් අවභාවිත කරපු නිසා තමයි තමුන්නාන්සේලාට උසාවි යන්න වෙලා තිබෙන්නේ. මිනිසුන් සිල් ගන්වන්න කියලා මහජන මුදලින් සිල් රෙදි බෙදලා ඡන්ද දිනන්න ගුණ්ඩු දුන්නා. ඒක නිසා තමයි තමුන්නාන්සේලාට උසාවි යන්න වෙලා තිබෙන්නේ. බන්දුල ගුණවර්ධන මැතිතුමා ඒක දැනගෙන ඉන්න එක වඩාත් හොඳයි. දන්නේ නැත්නම් දැන ගන්න.

ඒ කාලයේ සහන දුන්නා කියලා කිව්වා; මිනිසුන්ට සාධාරණය ඉෂ්ට කළා කියලා කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි 2015 ආණ්ඩුව ගන්න කොට පෙට්‍රල් ලීටරයක් තිබුණේ රුපියල් 158කටයි. එදා පායලී චම්පික ඇමතිතුමායි, මමයි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය භාර ඇමතිතුමා සහ රාජ්‍ය ඇමතිතුමා හැටියටයි හිටියේ. එදා විදුලිබල මණ්ඩලයත් ඒ වාගේම පෙට්‍රෝලියම් එකත් තිබුණේ අපේ අමාත්‍යාංශය යටතේ. එදා අපි රුපියල් 158 ඉඳලා රුපියල් 128 දක්වා පෙට්‍රල් ලීටරයක මිල අඩු කරලා, රටේ ජනතාවට ඒ සහනය දුන්නා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩු වුණා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ලෝක වෙළෙඳ පොළේ මිල කඩා වැටුණා නම්, එදා මහින්ද රාජපක්ෂගේ කාලයේ මිල කඩා වැටුණේ නැද්ද? එහෙම නම් එදා මහින්දටත් දෙන්න තිබුණා නේ, ඒ මිලට. අපි මහින්ද රාජපක්ෂගෙන් නේ ආණ්ඩුව භාර ගත්තේ. එදා තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. එදා තමුන්නාන්සේ ඇමතිවරයෙක් හැටියට ඒ ආණ්ඩුවේ හිටියා නේ. ශ්‍රේෂ්ඨාධිකරණය ලෝක වෙළෙඳ පොළේ මිලට සාපේක්ෂව තීන්දුවක් දුන්නා. අධිකරණයටත් ගරු නොකරපු උදවිය මොනවාද මේ කතන්දර කියන්නේ? එදා ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් දීලාත් මිල අඩු කර ගන්න බැරි වුණා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
පාර්ලිමේන්තුවේ බහුතරය තීරණය කළේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පාර්ලිමේන්තුවේ බහුතරය? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් 111ට ඩීසල් ලීටරයක් තිබුණේ. අපි ගත්තු ගමන් රුපියල් 95ට ඩීසල් ලීටරයක් දුන්නා. වැරදි තීන්දුව නම් අපි දුන්නේ කොහොමද?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
පාර්ලිමේන්තුව තමයි උත්තරීතර.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පාර්ලිමේන්තුව උත්තරීතර තමයි. පාර්ලිමේන්තුවෙන් කෙරෙන්නේ නැති වෙන කොට රටේ ජනතාව පිහිට පතා ගෙන අධිකරණයට යනවා, අධිකරණයෙන් හරි නියෝගයක් ගන්න. පාර්ලිමේන්තුව උත්තරීතර නම් අධිකරණයට නියෝග දෙන්න ඉස්සෙල්ලා නතර කර ගන්න තිබුණා නේ. ලෝක වෙළෙඳ පොළේ මිලට සාපේක්ෂව දුන්නා නම්, මහින්ද රාජපක්ෂ යුගයේ, තමුන්නාන්සේලා ඇමතිකම් කරපු යුගයේ, ලෝක වෙළෙඳ පොළේ මිල අඩු වීමට සාපේක්ෂව මිල අඩු කළේ නැත්තේ ඇයි?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
අඩු කළා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
කොහේද අඩු කළේ? අඩු කළා නම් ඇයි රුපියල් 158ට පෙට්‍රල් ලීටරය දුන්නේ? අඩු කළානම් ඇයි ඩීසල් ලීටරය රුපියල් 111ට දුන්නේ? අඩු කළා නම් ඇයි භූමිතෙල් ලීටරය රුපියල් 81ට දුන්නේ? තමුන්නාන්සේලා මොනවාද අඩු කළේ? තමුන්නාන්සේලා කළේ හලාවත වැල්ලේදී වෙඩි තියලා ඇන්ටනී ප්‍රනාන්දුව මැරුවා; තව පස්දෙනෙකුට තුවාල කළා. ඔන්න, තෙල් මිල අඩු කරපු හැටි. රතුපස්වලදී වතුර ටික දෙන්න කියද්දී වෙඩි තියලා මරලා දැම්මා. EPF, ETF දෙන්න කියද්දී කටුනායකදී වෙඩි තියලා රොෂේන් වානක මැරුවා. මිනීමරු ආණ්ඩුව තමුන්නාන්සේලා නේ. වෙන කාටවත් ඇඟිල්ල දික් කරනවා, මිනීමරුවෝ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩීසල් ලීටරයක් රුපියල් 111යි රාජපක්ෂ ආණ්ඩු කරන කාලයේ. අපි ආණ්ඩුව ගත්තු ගමන්ම ඩීසල් ලීටරය රුපියල් 95ටයි දුන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම භූමිතෙල් ලීටරය රුපියල් 81ට තිබුණේ. ඒක අපි රුපියල් 65ට අඩු කරලා නැවත අපි රුපියල් 49 දක්වා අඩු කළා. එදා යුගයේ ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩු වෙලා තිබුණා ලු. එහෙම නම් රාජපක්ෂගෙන් ආණ්ඩුව භාර ගන්න කාලයේ බොර තෙල් මිල අඩු වෙලා නේ තිබුණේ. ඒ අඩුවීම ඇයි රාජපක්ෂ ජනතාවට දීලා තිබුණේ නැත්තේ? දුන්නේ නැති හින්දා තමයි අවුරුදු දෙකකට කලින්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගෙන යන්න වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකයි තත්ත්වය. බොරු ටියුෂන් දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා අපි ආණ්ඩුව භාර ගන්න කොට ගෑස් සිලින්ඩරයක් රුපියල් 2,650යි. අදටත් ගෑස් සිලින්ඩරය රුපියල් 1,768යි; රාජපක්ෂගේ මිල ගණනට ඇවිල්ලා නැහැ. ඩොලර් එකේ අගය වැඩි වෙලා කියනවා, රුපියල කඩාගෙන වැටිලා කියනවා, බඩු මිල වැඩි වෙලා කියලා කියනවා. කොහේද බඩු මිල වැඩි වෙලා තිබෙන්නේ? මොකෙන්ද බඩු මිල වැඩි වෙලා තිබෙන්නේ? පෙට්‍රල් ලීටරයක් අදටත් රුපියල් 149යි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඉඩ දෙන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
තමුන්නාන්සේගේ වෙලාවේදී කථා කරන්න. මට වෙලාව නැහැ. අදටත් පෙට්‍රල් ලීටරයක් රුපියල් 149යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රෑම් 400 කිරිපිටි පැකට් එකක් රුපියල් 425යි. කිරි බිව්වා නම් මතක තියා ගන්න. කිරි බිව්වාද? තමුන්නාන්සේගේ ආශ්චර්යයේ නායකයාගේ කාලපරිච්ඡේදය තුළ ග්‍රෑම් 400 කිරි පැකට් එකක් රුපියල් 425යි. ඒ කිරි පැකට් එකක් අදටත් රුපියල් 345යි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රුපියල කඩාගෙන වැටිලා, ඩොලර් එක නැඟලා, බඩු මිල වැඩි වෙලා, රටේ ආර්ථිකය කඩාගෙන වැටිලා කියලා මේ tuition master මොනවාද, මෙච්චර වෙලා කිව්වේ? කොහේද කඩාගෙන වැටිලා තිබෙන්නේ? වෙන මොනව හරි ඔහුගේ කඩාගෙන වැටිලා ඇති. ඒකයි වෙලා තිබෙන්නේ. ඔවුන්ගේ කඩාගෙන වැටිච්ච දේවල් ගැන බලාගෙන ඉන්නේ නැතුව. ඔවුන්ගේ ආර්ථිකය කඩාගෙන වැටිලා. අපි දන්නවා. රටේ ආර්ථිකය කඩාගෙන වැටිලා නොවෙයි, ඒ ගොල්ලන්ගේ ආර්ථිකය කඩාගෙන වැටිලා තිබෙනවා. ඒකයි මේ වේදනාව. මේ, බහුභූත දේශනා දෙනවා.

**ගරු ලොහාන් රත්වත්තේ මහතා**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පුත්තලමේ බූරුවෝ ඉන්නවා. ඊට වඩා හරක් ඉන්නවා, තමුන්නාන්සේලාගේ පැතිවල; මී හරක් ටිකක් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ සියලු කාරණා ගැන කථා කරනවාට අමතරව, සුරාබදු ආඥාපනත පිළිබඳව කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. එය කවුරුවත් කථා නොකරපු දෙයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දිස්ත්‍රික්කයේ තමයි පොල්වතු වැඩිපුර තිබෙන්නේ. [බාධා කිරීම්] අපේ පැත්තේ බූරුවෝත් ඉන්නවා. [බාධා කිරීම්] අර කෑ ගහන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නම් නැහැ. අපේ පැත්තේ ඉන්න බූරුවන්ගේ විනයක් තිබෙනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විනයක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ කල්පිටියේ, පුත්තලමේ ඉන්න බූරුවන් ළඟට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ටික අරගෙන ගිහිල්ලා දාන්න ඕනෑ, විනයක් ඇතිව ඉන්නේ කොහොමද කියන එක පිළිබඳව ඉගෙන ගන්න. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ප්‍රදේශයේ නිෂ්පාදනය කරන රා -බෝතල් රා- අරගෙන මහනුවරට, යාපනයට, නුවරඑළියට සහ රට පුරා හැම තැනටම දිනපතා එළිය වැටෙනකොට ලොරි පිටත් වෙනවා. මේ බෝතල් රා වශයෙන් ගෙනියන රා ප්‍රමාණය පුත්තලම දිස්ත්‍රික්කයේ තිබෙන පොල්ගස් සියල්ලම මැද්දත්, ඒ වාගේ තව දහ ගුණයක් මැද්දත්, විසි ගුණයක් මැද්දත් එවැනි රා ප්‍රමාණයක් නම් පුත්තලම් දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය කරන්න පුළුවන්කමක් නැහැ. රා ජාවාරමේ යෙදෙන කිහිප දෙනෙක් ජල ටැංකි හදලා, ඒ ටැංකියට වතුර පුරවලා, ඇමෝනියා දාලා, යූරියා දාලා, එක එක විෂකාරක දාලා හදන ලද කෘත්‍රිම රා තමයි මේ විධියට රට පුරාම ගෙනියන්නේ. මම මේ කාරණය මේ පාර්ලිමේන්තුවේ අවස්ථා ගණනාවකදී කිව්වා. අද ඒ කෘත්‍රිම රා අරගෙන යනකම් කඳුරට මිනිසුන් වෙවුල වෙවුලා බලාගෙන ඉන්නවා. මොකද, ඒ ගොල්ලන්ට මේවා බීලා පුරුදු වෙලා දැන් නොබී ඉන්න පුළුවන්කමක් නැහැ. මේ කෘත්‍රිම රා ගැනීමෙන් සිද්ධ වෙන්නේ එහි තිබෙන විෂ දවසින් දවස ශරීර ගතවෙලා දවසින් දවස ලෙඩ්ඩු බෝවීම පමණයි. මේක ඉතාම නරක තත්ත්වයක්. ඒ නිසා තවදුරටත් මේ කෘත්‍රිම රා නිෂ්පාදනය කිරීම පිළිබඳව මුදල් අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය අවධානය යොමු කරලා කටයුතු කරන්නට ඕනෑ කියන කාරණය මම සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අද පොලීසිය පිළිබඳවත් අපි පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. මොකද, පොලීසියටත් බලතල පැවරෙන පනතක් තමයි සුරාබදු ආඥාපනත. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසිය ගැන කථා කරනකොට රාහුල සිල්වා මැතිතුමා, ගාමිණි සිල්වා මැතිතුමා, නලින් දෙල්ගොඩලා, ලයනල් ගුණතිලකලා, නිමල් ගුණතිලකලා, ටෙරන්ස් පෙරේරලා, එඩිසන් ගුණතිලකලා වාගේ පොලිස් නිලධාරීන් පිළිබඳව මිනිසුන් කථා කළේ ඉමහත් ප්‍රසාදයෙන්. සමස්ත රට පුරාම විහිදී ඇති පොලිස් ස්ථාන තුළ සිටි ඒ ගොල්ලන් රටේ ජනතාව එදා දැක්කේ හින්දි චිත්‍රපටවල ඉන්නා පොලිස් චරිත විධියටයි. ඒ ගොල්ලන් නිල ඇඳුම ඇන්දත් අභිමානවත් විධියට රාජකාරිය ඉෂ්ට කළා. රටේ තව නිල ඇඳුම් අඳින හමුදා සේවය සහ වෙන වෙන අංශ ගණනාවක් තිබුණත් එදා රටේ තරුණ පරපුර දැවැන්ත උනන්දුවක්, ආසාවක් ඇතුව පොලිස් දෙපාර්තමේන්තුවට එහෙම නැත්නම් පොලීසියට ඇතුළත් වුණා. එදා පොලිස් දෙපාර්තමේන්තුවට බැඳීම සඳහා ලොකු තරගයක් තිබුණා. පොලීසියේ උප පොලිස් පරීක්ෂක, සහකාර පොලිස් අධිකාරි වාගේ තනතුරුවලට පමණක් නොවෙයි, පොලිස් කොන්ස්තාපල් තනතුරට බැඳීම සඳහාත් එදා තරුණ අය ගියේ ලොකු උනන්දුවකින් සහ ආසාවකින්. හැබැයි, අද මේ වෙනකොට ඒ තත්ත්වය ක්‍රමානුකූලව වෙනස් වෙලා තිබෙනවා. ඒ වාගේම එදා හිටපු ගාමිණි සිල්වා වාගේ පොලිස් නිලධාරීන් විදේශගත වෙලා හිටපු අපරාධකාරයන් පවා අල්ලාගෙන ආවා. ඔහු ජපානයට ගියා. ජපානයට ගිහිල්ලා අපරාධකාරයන් -අර ඔස්මන් වාගේ අපරාධකරුවන්- අල්ලාගෙන ආවා. එහෙම ඉතිහාසයක් තිබෙනවා. අද මාකඳුරේ මදුෂ්ලා වාගේ අපරාධකාරයන් විදේශගත වෙලා ඉන්නවා. ඒ වාගේම උදයංග වීරතුංගලා වාගේ මේ ගොල්ලන් එක්ක ඉඳලා හොඳ ජාවාරම් කරලා මේ ආර්ථිකය කඩා වැටිවූ කට්ටිය; ඒ කාලයේ හම්බ කරලා කරලා රට බංකොලොත් කරපු කට්ටිය අද විදේශවල ඉඳගෙන මේ රටට කොකා පෙන්නමින් ඉන්නවා. අද පොලීසිය ඒ අය ගැන ක්‍රියාත්මක වෙන්නට ශක්තිමත් වෙලා නැහැ. පොලීසිය දුර්වල තැනකට ගිහිල්ලා තිබෙනවා. පොලීසිය මෙහෙයවන ප්‍රධානීන් මේවා පිළිබඳව වග කියන්න ඕනෑ කියන කාරණය මා සිහිපත් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හොඳයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පසුගිය කාලපරිච්ඡේදයේ මාර්තු මාසයේ මේ රටේ ප්‍රශ්නයක් ඇති වුණා. මුස්ලිම් ජනතාවත්, සිංහල ජනතාවත් අතර මහනුවර ඇති වූ සිද්ධියක් මුල්කරගෙන රටේ තැනින් තැන ප්‍රශ්න ඇති වුණා. ඒ ප්‍රශ්න ඇති වුණු වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ ඉන්නා ගමන් මම පුත්තලම් දිස්ත්‍රික්කයේ දිසාපතිතුමාට කථා කරලා සියලු දෙනා කැඳෙව්වා. දේශපාලන නායකයන්, ආගමික නායකයන්, ඒ වාගේම ආරක්ෂක අංශවල නායකයන්, පොලීසියේ ස්ථානාධිපතිවරයාගේ ඉඳලා කැඳවලා, අපි ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව පුත්තලමේ සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයෝ එකට ඒකරාශී වෙලා සහෝදරත්වයෙන් එදා වැඩ කළා; ආගමික නායකයෝ වැඩ කළා. ඒ නිසා සිදුවීම් ඇති වුණේ නැහැ. ඒ වාගේ සිදුවීම් ඇතිවීම පාලනය කර ගන්නට පුළුවන් වුණා. අපි කථා කර ගත්තා, එදා වතුර බවුසරයේ ඉඳලා ලැහැස්ති කරලා තබාගන්නා අන්දම.

අපරාධයක් ඇති වුණොත්, ඒ අපරාධය වළක්වා ගන්නේ කොහොමද? රිය අනතුරක් සිදු වුණොත්, අපි කොහොමද එතැනට මැදිහත් වෙන්නේ? ජන වර්ග දෙකක දෙගොල්ලක් අතර ගැටුමක් ඇති වුණොත්, අපි කොහොමද එතැනට මැදිහත් වෙලා බේරා ගන්නේ කියලාත් අපි කථා කර ගත්තා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, ඒ ගැන කථා කරලා දවස් 4යි ගත වුණේ. අපි කියපු උපදෙස් එකක්වත් තැකීමට ලක් කළේ නැහැ, ආණමඩුවේ පොලිස් ස්ථානාධිපතිවරයා. ආණමඩුව නගරයටම එක මුස්ලිම් හෝටලයයි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ තමයි, මදීනා හෝටලය. මේ මදීනා හෝටලය 2018.03.12වැනි දා රාත්‍රී ගිනි තිබ්බා. ආණමඩුව නගරයටම එක මුස්ලිම් හෝටලයයි තිබෙන්නේ. ඒ වෙළෙඳ සැල ආරක්ෂා කරගන්න අසමත් වුණා. පසුව වතුර බවුසරයක් හොයා ගන්න බැරිව පොලිස් අධිකාරිතුමා මට කථා කරලා අපේ ගෙදර තිබුණු වතුර බවුසරය එවන්න කියලා කිව්වා. මෙවැනි තත්ත්වයක් ඇති වුණොත් ක්‍රියා කරන්නේ කෙසේද කියා කිසිම සූදානමක් තිබුණේ නැහැ. මේ තත්ත්වය උඩ අපි කොහොම නමුත් මේ ලජ්ජාව වසා ගන්න ආණ්ඩුවක් වශයෙන් වැඩ කටයුතු කරලා, මේ වෙළෙඳ සැලේ ගින්න නිවා දැම්මා. ඉන් පසුව අපි හීන්දු කළා, එදා දවසේ හැන්දෑ වෙනකොට කොහොම හරි මේ වෙළෙඳ සැල යළිත් හදනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රාත්‍රී 7.00 වන විට වඩු බාස්ලා 26ක් එකතු කරගෙන, වෙළෙඳ සංගමයත් එක්ක එකතු වෙලා මේ වෙළෙඳ සැල හැදුවා. අපි රාත්‍රී 7.30 වන විට මේ වෙළඳ සැල නැවත ආරම්භ කළා. ඒ හේතුව නිසා රටේ කොතැනකවත් නැවත මුස්ලිම්, සිංහල ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැතිව අපට බේරා ගන්න පුළුවන් වුණා.

මේ සිද්ධියේදී එක වෙළෙඳ සැලක් ආරක්ෂා කරගන්න බැරි ආණමඩුවේ පොලිස් ස්ථානාධිපතිවරයා පිළිබඳව මම පොලිස්පතිවරයාටත්, පොලීසිය බාර ගරු ඇමතිතුමාටත් ලිපියක් යැව්වා. මේ සිදුවීම සම්බන්ධව විශේෂ විමර්ශන ඒකකයෙන් - SIU එකෙන්- විමර්ශනය කරන්න කියලා මම දන්වා සිටියා. මේ එක ගොඩනැඟිල්ලක්, එක වෙළෙඳ සැලක් ආරක්ෂා කරන්න බැරි මිනිහෙක් ග්‍රාම සේවා වසම් 35කින් සමන්විත පොලිස් වසමක්

[ගරු ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

ආරක්ෂා කරන්නේ කොහොමද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඒ පිළිබඳවත් ලිපියේ සඳහන් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පල්ලම පොලිසියේත් ස්ථානාධිපතිවරයෙක් ඉන්නවා. එතුමා උදේ සවස විල්පත ප්‍රදේශයේ ගෙදරකට යනවා. මේ මෑතකදී ඒ ගෙදරට නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ කණ්ඩායමක් ගිහිල්ලා කසිප්පු පෙරීමට ගන්නා ගෝඩා බැරල් 45ක්, ගෝඩා ග්‍රෑම් 97,200ක්, නීති විරෝධී මත්පැන් ග්‍රෑම් 12,000ක්, පෙරන උපකරණ ආදී මේ සියල්ල අත් අඩංගුවට ගත්තා. ඒකට අධිකරණයේදී රුපියල් 360,000ක් දඩ ගැහුවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු පාලිත රංකේ පණ්ඩාර)
(The Hon. Palitha Range Bandara)
මම විනාඩියෙන් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ගෙදරම තිබිලා සුඛෝපභෝගී රථයකින් ගෙනියන්න ලැහැස්ති කරලා තිබුණු කසිප්පු හා නීති විරෝධී මත්පැන් ග්‍රෑම් 40,000ක් නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ කණ්ඩායම අත් අඩංගුවට ගත්තා. ඒවා අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රුපියල් 120,000ක් දඩ ගැහුවා. මෙන්න! පල්ලම පොලිසියේ ස්ථානාධිපතිවරයා උදේ සවස යන ගෙදර තත්ත්වය. මේ තරම් කසිප්පු ප්‍රමාණයක් ඒ ගෙදරදී පොලිසිය විසින් අත් අඩංගුවට ගත්තා. ගරු නලින් බණ්ඩාර ජයමහ නියෝජ්‍ය ඇමතිතුමනි, පොලිස් ස්ථානාධිපතිවරයා උදේ සවස යන ගෙදර කසිප්පු පෙරන්න ගන්නා ගෝඩා බැරල් 45ක් තිබුණා. මම මේ පිළිබඳව ඔබතුමාගේ අමාත්‍යාංශයටත් දැනුම් දුන්නා; ඔබතුමාටත් දැනුම් දුන්නා. ඔබතුමාත් ඉන්න තැන මම මේ ගැන කිව්වා. අද ඇමතිතුමා ඉන්න තැනත් මම මේ ගැන කිව්වා. මේ ගැන මම පොලිස්පතිතුමාටත් කිව්වා. පොලිස්පතිතුමා criterion එකක් තියනවා කිව්වා. මම ඇහුවා, criterion එක මේ වාගේ අපරාධකාරයන්ට සහාය දෙන criterion එකක් ද කියලා. අන්න, සාලියවැව පොලීසියට දැන් ස්ථානාධිපතිවරයෙක් ඇවිල්ලා ඉන්නවා. මම එතුමා ගැන අහලා බැලුවාම, එතුමා උදේ පටන් ගත්තාම හැන්දෑ වෙනකම් අරක්කු බොනවා ලු. මහ ජනතාවගෙන් ලැබෙන තොරතුරුයි මේ. මෙන්න මේකයි අද පොලීසියේ තත්ත්වය. මේකට පොලිස් ප්‍රධානීන් වග කියන්නට ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු පාලිත රංකේ පණ්ඩාර)
(The Hon. Palitha Range Bandara)
පොලිස් කොමිසම පත් කළාට පස්සේ අද පොලිස් ප්‍රධානීන් ඇමතිවරයා ද, නියෝජ්‍ය ඇමතිවරයා ද කියා ඒ මොකුත් සලකන්නේ නැහැ. පොලිස් කොමිසමට තමන්ට ඕනෑ මිනිහෙක් දානවා; "my man" කෙනෙක් දානවා. එහෙම කෙනෙක් දාලා පොලීසිය පවත්වාගෙන යන්න හදනවා. බලපුවාම ඒ අය කරන්නේ කුපාඩි වැඩ. මෙන්න මේ තත්ත්වයත් එක්ක අද පොලීසිය ඉතාමත් කනගාටුදායක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය වෙනස් කිරීමට අවධානය යොමු කරන්නට ඕනෑ. රටේ පොලීසිය මෙවැනි තත්ත්වයකට යන්න දෙන්නේ නැතිව ගාමිණී සිල්වා මහත්මයාලා, ලයනල් ගුණතිලක මහත්මයාලා හිටපු යුගයේ වාගේ නම්බුකාර පොලීසියක් බවට, ආඩම්බර පොලීසියක් බවට පරිවර්තනය කිරීමට පොලිස් ප්‍රධානීන් කටයුතු කළ යුතුයි කියන කාරණය සිහිපත් කරමින්, ඔබතුමාට ස්තුති කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. Next, the Hon. Douglas Devananda. You have 10 minutes.

[පි.ප. 2.41]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் துறைமுக மற்றும் விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் சட்டத்தின் கீழ் கட்டளை, மதுவரிக் கட்டளைச் சட்டத்தின்கீழ் அறிவித்தல்கள், பொருளாதாரச் சேவை விதிப்பனவு திருத்தச் சட்டமூலம் மற்றும் சேர்பெறுமதி வரி திருத்தச் சட்டத்தின் கீழான ஒழுங்குவிதி ஆகிய விடயங்கள் தொடர்பில் இடம்பெறுகின்ற இந்த விவாதத்தில் கலந்துகொண்டு, எனது கருத்துக்களையும் பதிவுசெய்வதற்கு வாய்ப்பு வழங்கியமை குறித்து எனது நன்றியை முதலில் தெரிவித்துக்கொள்கின்றேன்.

"ஆடத் தெரியாதவனுக்கு மேடை கோணல்" எனச் சொல்வார்கள். அந்த வகையில்தான் இந்த நாட்டின் வரி விதிப்புகள் இருக்கின்றன என்றே கருதவேண்டிய நிலைக்கு மக்கள் தள்ளப்பட்டுள்ளனர். அதாவது, முறையான பொருளாதாரக் கொள்கை இல்லாததன் காரணமாக, கண்ட, நின்ற அனைத்திற்கும் வரி விதிப்புகள் எனத் தொடர்வதையே இங்கு சுட்டிக்காட்ட வேண்டியிருக்கின்றது. வரி அறவீடுகள் தொடர்பான சட்டமூலங்களை நீங்கள் கொண்டுவருவதும், அவை தொடர்பில் இங்கே விவாதிக்கப்படுவதும், பின்னர் அவை நிறைவேற்றப்பட்டுவிடுவதும் இங்கே வாடிக்கையான நிகழ்வுகளாகத் தொடர்ந்தாலும், இந்த வரிகளின் சுமைகளால் எமது மக்கள் அனுபவித்து வருகின்ற துன்ப துயரங்கள் பற்றி எவரும் அலட்டிக் கொள்வதாக இல்லை. அண்மையில் மாவின் விலை கிலோவுக்கு 5 ரூபாயால் அதிகரிக்கப்பட்டு, மறுநாளே 450 கிராம் பாணின் விலையும் 5 ரூபாயினால் அதிகரிக்கப் பட்டது. தற்போது, ஏனைய பேக்கரி உற்பத்திப் பொருட்களின் விலைகளும் 5 ரூபாயினால் அதிகரிக்கப்பட்டுள்ளதாகவும் தெரிய வருகின்றது.

இந்த நாட்டில் முறையான திட்டம் இல்லாததால் மேற்படி உற்பத்திப் பொருட்களின் நிறை தொடர்பில் பாரிய பிரச்சினைகள் இருப்பதாக பேக்கரி உரிமையாளர்கள் தெரிவித்துள்ளனர். நுகர்வோரைப் பாதுகாப்பதற்காக அமைக்கப் பட்டுள்ள நுகர்வோர் பாதுகாப்பு அதிகாரசபை முறையாகச் செயற்பட்டு, தேவையான நடவடிக்கைகளை மேற்கொள்ளாத தாலேயே இந்த நிலை உருவாகியுள்ளதாகவும் பேக்கரி உரிமையாளர்கள் மேலும் தெரிவிக்கின்றனர். இதனைப் பார்க்கின்றபோது, அதிகாரசபைகள் உருவாக்கப்பட்டு, அவற்றில் பணியாற்றுகின்றவர்களுக்கு ஊதியங்கள், ஏனைய கொடுப்பனவுகள் உள்ளிட்ட அனைத்துச் செலவினங்களையும் மக்களது பணத்திலிருந்து வழங்கப்பட்டு வந்தாலும், அவை மக்களது நலனில் அக்கறை கொண்டு செயற்பாடாத நிலையே காணப்படுகின்றது. இதனால், அதற்கும் நட்டஈடு செலுத்துகின்ற நிலை எமது மக்களுக்கே ஏற்பட்டுள்ளது.

இந்த நிலையில், சீனியின் இறக்குமதி வரியும் 12 ரூபாயால் அதிகரிக்கப்படவுள்ளதாகத் தெரியவருகின்றது. இதனால், சில்லறை விலையில் மாற்றங்கள் ஏற்படாது என்று நிதி அமைச்சு அறிவித்துள்ளதாகவும் தெரியவருகின்றது. இவற்றை யெல்லாம் நம்புகின்ற நிலையில் இந்த நாட்டு மக்கள் இருக்கின்றார்களா? என்பது ஒருபுறமிருக்க, எரிவாயுவின் விலையையும் 190 ரூபாயினால் அதிகரிக்க அமைச்சரவை அங்கீகாரம் வழங்கியுள்ளதாகவும் தெரியவருகின்றது. வாழ்க்கைச் செலவுக்குழு இதற்கான பரிந்துரையைச் செய்திருப் பதாகத் தெரியவருகின்றது. உண்மையில் இப்படியொரு குழு செயற்படுவதுகுறித்து எமது மக்கள் உணர்ந்திருப்பதற்கு வாய்ப்புகள் இருக்காது என்றே, நாளுக்கு நாள் அதிகரிக்கின்ற பொதுமக்களின் வாழ்க்கைச் செலவினங்கள் தொடர்பில் ஆராய்கின்றபோது தெரியவருகின்றது.

இந்த நாட்டில், பொருளாதாரத் துறையினை மேம்படுத்து வதற்கு ஏற்றவாறான தேசிய பொருளாதாரக் கொள்கை இன்மையும், ஏற்படுத்தப்படுகின்ற பொருளாதாரக் கொள்கை களில்கூட தொடர்ச்சியின்மைகள் ஏற்படுகின்றமையும் காரண மாக இந்த நாட்டின் பொருளாதாரமானது, இன்று மிகவும் அபாயமானதொரு காலகட்டத்தை எட்டியுள்ளது. இந்தக் கட்டமைப்பினைச் சீர் செய்யாமல், வெறுமனே எடுத்ததற் கெல்லாம் வரிகளை அதிகரித்தும், பொருட்களின் விலைகளை அதிகரித்தும், அதன் மூலமாகப் பொருளாதாரத்தினை சரிசெய்து கொள்ளலாம் என எதிர்பார்ப்பதானது, எமது மக்களை உயிரோடு படுகுழிக்குள் தள்ளிவிட்டு, மண் அள்ளி மூடுவதை ஒத்த செயலாகும் என்பதையே இங்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். 2015 - 2016ஆம் ஆண்டு காலகட்டத்தின்போது, சர்வதேசப் பொருளாதாரப் போட்டித் தன்மையில் 140 நாடுகளுக்கிடையிலே, 64ஆவது இடத்தில் இந்த நாடு இருந்தது. பின்னர், 2016 - 2017ஆம் ஆண்டு காலப்பகுதியில் 138 நாடுகளுக்கிடையில் 71 ஆவது இடத்திற்குப் பின்தள்ளப்பட்டு, 2017 - 2018ஆம் ஆண்டு காலப்பகுதிக்குள் இன்னும் பின்தள்ளப்பட்டு 85ஆவது இடத்திற்கு வந்துவிட்டது.

இலங்கையின் பொருளாதார வளர்ச்சியை எடுத்துக் கொண்டால், அது 2015ஆம் ஆண்டு 5.0 சதவீதமாக இருந்துள்ளது. 2016ஆம் ஆண்டில் அது 4.0 சதவீதமாக வீழ்ச்சி கண்டிருந்தது. 2017ஆம் ஆண்டில் அது 3.1 சதவீதமாக மேலும் வீழ்ச்சி நிலையைக் கண்டுள்ளது. ஆனால், மத்திய வங்கியானது தனது 2016ஆம் ஆண்டுக்கான ஆண்டறிக்கை யில், 2017ஆம் ஆண்டுக்கான நாட்டின் பொருளாதார வளர்ச்சி 5 சதவீதமாக இருக்குமென்றும், பின்னர் அது படிப்படியாக அதிகரித்து 2020ஆம் ஆண்டில் 7 சதவீதமாக உயரும் எனவும் தெரிவித்திருந்தது. அந்த வகையில், 2017ஆம் ஆண்டு எதுவுமே நடக்கவில்லை. மாறாக, அது மேலும் வீழ்ச்சி நிலையினையே காட்டுகின்றது. ஆகவே, "முதற் கோணல், முற்றிலும் கோணல்" ஆகிவிடும் நிலையே தென்படுகின்றது. இந்த ஆண்டைவிட அடுத்த ஆண்டில் மீளச் செலுத்தவேண்டிய மூலதனக் கடன் தொகையானது இரண்டு மடங்கு அதிகமாகும் எனத் தெரிய வருகின்றது. அந்தவகையில், இந்த ஆண்டானது 2019ஆம் ஆண்டில் செலுத்தப்படவுள்ள கடனுக்கான தயார் நிலை ஆண்டாகும். இதனை நீங்கள் முறையாகப் பயன்படுத்தியிருக் கின்றீர்களா? என்றால், இல்லை என்றே தெரியவருகின்றது.

நிலையற்ற பொருளாதாரத் தன்மை, நாணயப் பெறுமதி யின் வீழ்ச்சி, தொடர்ச்சியான பணிப் பகிஷ்கரிப்புகள், போராட்டங்கள் காரணமாக 2018ஆம் ஆண்டில் மீளச் செலுத்தப்பட வேண்டிய கடனின் அளவினை முழுமையாகச் செலுத்தக்கூடிய வலுவினை நீங்கள் இழந்துநிற்கின்றீர்கள். இத்தகைய நிலையில், அடுத்த ஆண்டு மிகப் பாரிய தொரு தொகைக் கடனைச் செலுத்துவதற்கு உங்களுக்கு என்னென்ன வழிகள் இருக்கின்றன? எனக் கேட்க விரும்புகின்றேன். உங்களுக்கிருக்கின்ற ஒரே வழி, மக்களது வருமானங்களைக் குறைக்கின்றதும், செலவினங்களை அதிகரிக்கின்றதுமான வரிகளை விதிப்பது மட்டும்தானா? அல்லது வேறேதும் வழிகள் உண்டா? எனக் கேட்க விரும்புகின்றேன்.

இன்று இந்த நாட்டின் வறுமை அதிகம் கொண்ட மாகாணமாக வடக்கு மாகாணமும், இரண்டாவது நிலையில் கிழக்கு மாகாணமும் காணப்படுகின்றது. அந்தவகையில், வடக்கு மாகாணம் வறுமை நிலையில் 7.7 சதவீதமாகவும், கிழக்கு மாகாணம் 7.3 சதவீதமாகவும் காணப்படுகின்றன. மாவட்ட ரீதியாகப் பார்க்கின்றபோது, கிளிநொச்சி மாவட்டமே 18.2 சதவீதத்தில் அதியுச்ச நிலை வறுமை கொண்ட மாவட்டமாக இருக்கின்றது. அதேநேரம், வரட்சி காரணமாக மிக அதிகமான குடும்பங்கள் அதாவது, சுமார் 33,165 குடும்பங்கள் பாதிக்கப்பட்ட மாவட்டமாகவும் கிளிநொச்சி மாவட்டமே காணப்படுகின்றது. வறுமையிலும் முதன்மை, வரட்சியிலும் முதன்மை என்ற வகையில் கிளிநொச்சி மாவட்டம் தத்தளித்துக் கொண்டிருக்கும் நிலையில், நீங்களும் அடிக்கடி வரிகளை அதிகரித்துக் கொண்டுவரும் நிலையில், அங்குள்ள எமது மக்கள் தங்களது வாழ்க்கையை முன்னெடுப்பது எப்படி என நீங்கள் சிந்தித்துப் பார்த்ததுண்டா? எனக் கேட்க விரும்புகின்றேன்.

வறுமை நிலையில் இந்த நாட்டில் முதலாம் இடம் கிளிநொச்சி மாவட்டத்திற்கு என்றால், இரண்டாம் இடம் முல்லைத்தீவிற்கு. மூன்றாம் இடம் மட்டக்களப்பிற்கு. நான்காம் இடம் திருகோணமலைக்கு. ஐந்தாம் இடம் யாழ்ப் பாணத்திற்கு. வடக்கு மகாணம் இந்த நிலைக்குத் தள்ளப்பட்டிருப்பதற்கு மிக முக்கிய காரணகர்த்தாக்கள் சுயலாபத் தமிழ் அரசியல்வாதிகள் என்பதில் சற்றேனும் சந்தேகமில்லை. இதனை நீங்களும் அறிவீர்கள். அதனால் எவ்விதமான தயக்கமுமின்றி வடக்கு மாகாண சபைக்கென நிதி ஒதுக்கீடுகளை மேற்கொள்கின்றீர்கள். அந்த நிதி ஒதுக்கீடுகள் உங்களுக்கே திரும்பி வருமென்று உங்களுக்குத் தெரியும். பல்வேறு அபிவிருத்தித் திட்டங்கள் பற்றிச் சொல்கின்றீர்கள். அவை யாவும் வடக்கு மகாண சபையால் நிராகரிக்கப்படுமென்று உங்களுக்குத் தெரியும். பின்னர் அவற்றை அப்படியே வேறுபக்கமாகத் திருப்பிக் கொள்கிறீர்கள்.

எமது மக்கள் வடக்கு மாகாணத்தில் இருவேறு தரப்புகளினால் ஆக்கிரமிப்பிற்கு உட்படுத்தப்பட்டுள்ளனர். ஒரு புறத்தில் படைகள் உள்ளிட்ட அரச திணைக்களங்களால் ஆக்கிரமிக்கப்பட்டுள்ளனர். மறுபுறத்தில், வடக்கு மாகாண சபையின் ஆட்சியினை ஏற்றிருக்கின்ற தரப்பினரால் ஆக்கிரமிக்கப்பட்டுள்ளனர். படைகளின் ஆக்கிரமிப்பு என்கின்றபோது, எமது மக்களின் சொந்தக் காணி, நிலங்கள், பொருளாதாரக் கேந்திர இடங்கள், பொருளாதார முயற்சி களுக்கான வாய்ப்புகள் என்பன அவற்றில் அடங்குகின்றன. அரச திணைக்களங்கள் என்கின்றபோது, வனப் பாதுகாப்புத் திணைக்களம், வன ஜீவராசிகள் திணைக்களம், தொல்பொருள் திணைக்களம், மகாவலி அபிவிருத்தி அதிகாரசபை என்பன எமது மக்களின் காணி, நிலங்கள் மற்றும் வணக்க வழிபாட்டுத்தலங்கள் உள்ளிட்ட பொருளாதார முயற்சி களுக்கான வளப் பகுதிகளையும் ஆக்கிரமித்துக் கொண்டிருக் கின்றன.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have only one more minute.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

தொல்பொருள் திணைக்களம் என்பது வடக்கு, கிழக்கு மக்களுக்கு இன்று தொல்லை தரும் திணைக்களமாக மாறிவிட்டது. இந்தத் திணைக்களத்தினர் கூறுவதைப் பார்க்கப்போனால், இந்த நாட்டில் இன்னும் குறுகிய காலத்திற்குள் மக்கள் எவருமே வாழ முடியாத நிலை ஏற்பட்டு, வெறும் தொல்பொருட்கள் மட்டுமே அடங்கிய நாடாக இது மாறிவிட்டாலும், ஆச்சரியப்படுவதற்கு ஒன்றுமில்லை என்றே தோன்றுகின்றது. வடக்கு மாகாண சபை ஆட்சியாளர்களது ஆக்கிரமிப்பு என்பது, எமது மக்களுக்குக் கிடைக்கவேண்டிய அனைத்தையும் கிடைக்கவிடாமல், தடுத்து வருவதும், எமது மக்களின் நிதி வளங்களைத் தாங்கள் மட்டும் அனுபவித்தும், கொள்ளையடித்தும் வருவதாகும். வடக்கு மாகாணத்தின் வறுமை நிலைக்கு முக்கிய காரணங்கள் இவைதான் என்றே கருதுகின்றேன். அரசியல் என்பது பொய்யான வாக்குறுதி களை மக்களுக்கு வழங்குவதும், மக்களிடம் வாக்குகளைப் பெற்றுக் கொண்டு, தாங்கள் மட்டும் அனைத்துச் சுகபோகங்களையும் அனுபவிப்பதும் மட்டும்தான் என்றே இந்தச் சுயலாபத் தமிழ் அரசியல்வாதிகள் நினைத்துக் கொண்டிருக்கிறார்கள். அரசியல் என்பது இந்த அரசியல் வாதிகள் கூறுவதுதான் என்றே எமது மக்களும் கடந்த காலங்களில் நினைத்துக் கொண்டிருந்தார்கள். ஆனால், இப்போது அப்படி இல்லை. அதாவது, இந்த அரசியல்வாதிகள் கூறுவது அவர்களது சுயலாபங்களுக்கு மட்டுமே உரித்தானவை; அதனால் தங்களுக்கு எவ்விதமான பயன்களும் ஏற்படப்போவதில்லை என எமது மக்கள் உணர்ந்து கொண்டுள்ளனர். இதன் காரணமாகத் தற்போதைய வடக்கு மாகாண சபையின் உத்தியோகப்பூர்வக் காலம் முடிவடை கின்ற தினத்தை, துன்ப துயரங்களிலிருந்து விடுபட்ட தங்களது பொன்னான நாளாகக் கருதி, பட்டாசு கொளுத்திக் கொண்டாடுவதற்கு எமது மக்கள் தயாராகி வருகின்றனர் எனத் தெரிய வந்துள்ளது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please conclude your speech now.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, please give me one more minute.

நான்கு வருடங்களாக வடக்கு மாகாண சபையின் மூலமாக எமது மக்களுக்கு எதையுமே செய்யாத ஒருவர், மீண்டும் அதே பதவிக்கு வரத் துடித்துக் கொண்டிருப்பதும், அந்தப் பதவியில் அவர் ஒன்றுமே செய்யவில்லை, நானும் அதே பதவிக்கு வந்து ஒன்றுமே செய்யாமல் இருப்பதற்கு எனக்கும் ஒரு சந்தர்ப்பத்தைத் தாருங்கள் என எமது மக்களிடம் கேட்கின்ற வர்களும் வடக்கின் அரசியலில் குளிர்காய நினைக்கின்ற போது, வடக்கு மாகாணமானது வறுமை மாகாணமாக மாறுவதில் ஆச்சரியப்படுவதற்கு எதுமில்லை என்றே கூறிவைக்க விரும்புகின்றேன். எனவே, தொடர்ந்தும் எமது மக்கள் இந்த நிலையில் இருந்தால் எதிர்வரும் காலங்கள் மிகவும் அபாயகரமானதாகவே இருக்கும் என்பதில் சந்தேகமில்லை. யுத்தம் இடம்பெற்றிருந்த காலகட்டங்களில் கூட தென்பகுதியிலிருந்து வடக்கு, கிழக்கு மக்களுக்குப் போதியளவில் எங்களால் உணவுப் பொருட்கள் உட்பட அத்தியாவசியத் தேவைகள் அடங்கலாக சுகாதாரம், கல்வி போன்ற நடவடிக்கைகளுக்காகவும் பொருட்கள் அனுப்பக் கூடியதாகவும், ஏற்பாடுகள் செய்யக்கூடியதாகவும் இருந்தது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனக்கு ஒதுக்கப்பட்ட நேரம் போதாமையால் எனது எஞ்சிய உரையை சபாபீடத்தில் சமர்ப்பிக்கின்றேன்*. நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.54]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා, එතුමාගේ කථාවේ දී ප්‍රධාන වශයෙන් සඳහන් කළේ මේ ආණ්ඩුව කාන්තාවන් වෙනුවෙන් ඉටු කර තිබෙන යුතුකම් පිළිබඳවයි. කාන්තාවන්ගේ සනීපාරක්ෂක තුවා වෙනුවෙන් පනවා තිබුණු සෙස් බද්ද ඉවත් කළාය කියලා එතුමා කිව්වා. ඒ අතරම එතුමා සඳහන් කළා, "තවත් වෙන බදු තිබෙන්නට පුළුවන්, මුදල් අමාත්‍යාංශය හැටියට ඒවා සම්බන්ධයෙන් අපට කරන්න දෙයක් නැහැ" කියලා. පාර්ලිමේන්තුවෙන් තමයි ඒ බදු නියම කරලා තිබෙන්නේ. පාර්ලිමේන්තුවට ඒ බදු ගෙනාවේ මුදල් අමාත්‍යාංශය. මුදල් අමාත්‍යාංශයට ඕනෑ නම් ඒ බදුත් ඉවත් කරන්නට පුළුවන්. මේ විධියේ ප්‍රයෝගකාරී ප්‍රකාශවලින් කිසිවකුත් රවටන්නට බැහැ. නමුත්, එතුමා ගණන් ඉලක්කම් ඇතිව ඒ ගැන හුහාක් උදම් ඇණුවා. "මේ බලන්න, මෙපමණ පිරිසක් සනීපාරක්ෂක තුවා පාවිච්චි කරනවා, මෙපමණ පිරිසක් පාවිච්චි කරන්නේ නැහැ" කියලා කිව්වා. සනීපාරක්ෂක තුවා නිෂ්පාදනය කරන සහ විකුණන උදවියගේ කර්මාන්තය දියුණු කර දීම වෙනුවෙන් එතුමා මේ සභාවේදී කථා කළ බවයි මට පෙනී ගියේ. කෙසේ නමුත් වේවා, එතුමාට කාන්තාවන් විසින් කිව යුතු දෙයක් තිබෙනවා. කාන්තාවන් විසින් එතුමාට කියාවි, "අද කාන්තාවන්ට වුවමනා කරන අනෙකුත් සියලුම දේවල මිල වැඩි වෙමින් තිබෙනවා. ඒ වැඩි වෙන මිල ගණන්වල සන්දර්භය තුළ මේ සඳහා වන සෙස් බද්ද ඉවත් කිරීමෙන් ලැබෙන ලාභය අපට සතයකටවත් ගණන් ගන්න බැහැ"යි කියලා. ඇයි? ගෑස් මිල වැඩි වෙනවා, ප්‍රවාහන ගාස්තු මිල වැඩි වෙනවා. ඒවායේ එකතුව අරගෙන බලනකොට, එයින් ඇති වෙන පීඩනයයි, ඔය සෙස් බද්ද ඉවත් කිරීමෙන් ඇති වන සහනයයි දෙක අතරේ තිබෙන්නේ අහසයි පොළොවයි අතර තිබෙනවා වාගේ පරතරයක්.

ඊළඟට, ගරු රංගෙ බණ්ඩාර මැතිතුමා ඇහුවා, "මේ මිල වැඩිවෙලා කියන්නේ මොනවාද? මොකකවත් මිල වැඩි වෙලා නැහැ" කියලා. මම හිතන්නේ එතුමා දේශපාලන වශයෙන් ජාති අන්ධයෙක්. ජාති අන්ධයා කියන්නේ පෙනෙන්නේම නැති කෙනාට. ඔහු දකින දේත්, බැලීම ප්‍රතික්ෂේප කරනවා. "There is none so blind as those who will not see" ඒ කියන්නේ,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

තමන්ට පෙනෙන දේත් දැකීම ප්‍රතික්ෂේප කරන තරමේ දේශපාලන අන්ධකමක් රංගෙ බණ්ඩාර මහතාට තිබෙන බව පේනවා. ඇයි? අපට බලන්නට තිබෙන්නේ ඉලක්කම් දෙක තුනක් ගැන විතරයි. උද්ධමනයේ ඉලක්කම. එදා 2015දී උද්ධමනය සියයට 3.7යි, අද 2018 වන විට එය සියයට 5.9ක් වෙලා තිබෙනවා. උද්ධමනය කියන්නේ මොකක්ද කියලා එතුමා දන්නවා. උද්ධමනය කියන්නේ මිල වැඩි වීමේ වේගය. ඒ විධියේ මිල වැඩි වීමේ වේගයක් තිබෙනවාය කියන කොට, මිල වැඩි වීමේ වේගය අතින් මේ කාල පරිච්ඡේද දෙක තුළ තිබෙන්නා වූ මහා පරතරය එතැනින්ම පෙනෙනවා .

ඊළඟට, අපි පොලී රේට්ටු ගැන බලමු. එදා, 2015දී සියයට 11ක් පමණ තිබුණු පොලී රේට්ටුව දැන් සියයට 17යි. රටේ හැම භාණ්ඩයකම මිල ගණන්වලට, හැම සේවාවකම මිල ගණන්වලට පොලී රේට්ටුව බලපානවා. එහෙම නම් පොලී රේට්ටුවල වැඩි වීම් මේ රටේ මිල ගණන්වලට කෙළින්ම බලපා තිබෙන බව මේ මැති ඇමතිවරුන් හංගන්නට හදනවාද කියන එක මම දැන ගන්නට කැමැතියි.

අපේ ගරු රවි කරුණානායක මැතිතුමා සභාවට එනකොටම මට මතක් වුණේ, මන්දිර බද්ද වාගේ ඒවා ගැන. එතුමා මේ ආණ්ඩුවේ දින සියයේ වැඩසටහන සඳහා ගෙනාපු යෝජනා අතර මන්දිර බද්ද ඇතුළු ඉහළ පන්තියට ගහපු තවත් නොයෙකුත් බදු තිබුණා. අන්තිමට ඒ බදු ඔක්කොම කරකැවිලා එන්නෙත් මහජනයාගේ කර පිටට. අන්තිමට මන්දිර බද්ද ක්‍රියාත්මක වුණෙත් නැහැ. තමුන්නාන්සේ දන්නවා, මන්දිර බද්ද ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික හේතු මත පැත්තකට දමපු බව. ඕනෑම හේතුවක් මත අන්තිමට එවැනි බදු තමයි ඉවත් වෙන්නේ. අනෙක් අතට, මේ පනවන බදු හෙමින් හෙමින් කැරකි කැරකී ඇවිල්ලා බර ගොඩක් හැටියට එකතු වෙන්නේ මේ රටේ සාමාන්‍ය මහ ජනයාගේ ඔළුව උඩටමයි.

මේ තත්ත්වය අපි දන්නා නිසා මේ වැඩි වන මිල ගණන් අනුව ඇති වෙන ජීවන වියදමේ අංකය අපි පෙන්නුම් කරන්නට කැමැතියි. 2015දී ජීවන වියදම් අංකය 107යි. 2018 වනකොට එය 128යි. පසුගිය අවුරුදු තුන සමඟ සංසන්දනය කර බලන විට අපට පෙනෙනවා, උද්ධමනය වැඩි වූ ප්‍රමාණයෙන් ජීවන වියදම් අංකයත් වැඩි වූ බව. මේ ගැන වැඩිය ලොකුවට බලන්න ඕනෑ නැහැ. මෙන්න මේ කාරණය අරගෙන බලන්න. මේ වනකොට බත් පැකට් එකක මිල රුපියල් 10කින් පමණ වැඩියි. හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා ගියා, බත් පැකට්වල මිල ගණන් බලන්න. හැබැයි, එතුමා ගියේ වැරදි කඩවලටයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට යන්න තිබුණේ විනයාලංකාර මාවතේ තිබෙන කඩවලටයි. ඔබතුමා ගියේ යූඑන්පී කඩයකට නේ. ඔබතුමා ඒ කඩවලට ගිහින් ඒ අය කිව්ව දේ අහගෙන ආවා. ඔබතුමාට පිළිගන්න වෙයි, අද වනවිට බත් පැකට් එකේ මිල රුපියල් 10කින් පමණ වැඩි වෙලා තිබෙන බව. බත් පැකට් එකේ මිල වැඩි වෙනවාය කියන එකේ තේරුම මොකක්ද? ඒ සඳහා යොදවන යෙදවුම්වල මිල, මිනිසුන්ගේ කුලිය වැඩි වෙලාය කියන එකයි. මේවා එකතු වුණාම තමයි බත් පැකට් එකේ මිල වැඩි වන්නේ. එහෙම නම්, ඒ බත් පැකට් මිලදී ගන්නා මිනිසුන්ගේ ජීවන වියදම වැඩි වීම ආදිය තමයි අපි මිල වැඩි වීම් හැටියට කථා කරන්නේ. හැබැයි, දැන් තමුන්නාන්සේලා නියත වශයෙන්ම යම් යම් දේවල්වල මිල ගණන් නියම කරගෙන ඉන්නවා. ඉන් එකක් තමයි, තෙල් මිල. තමුන්නාන්සේලා තෙල් මිල වැඩි කරනවා. ඊළඟට තමුන්නාන්සේලා, "ගෑස්වල මිල මේකයි" කියා කියනවා. ඊට පසුව ගෑස්වල මිලත් වැඩි කරනවා. තමුන්නාන්සේලා නියම කර තිබෙන ඒ මිල ගණන් තමුන්නාන්සේලා විසින්ම වැඩි කරනවා. ඒ මඟින් මේ රටේ මිනිසුන්ගේ ජීවන වියදම වැඩි වනවා.

මිල ගණන් නියම කළ භාණ්ඩ තිබෙනවා වාගේම, මිල ගණන් නියම කර නැති බඩු භාණ්ඩ තමයි මේ රටේ වැඩි හරියක් තිබෙන්නේ. සබන් කැල්ලේ සිට සෙරෙප්පු දෙක දක්වා වූ භාණ්ඩවලට මිල නියමයක් නැහැ. මිල නියමයක් නැති මේ භාණ්ඩවල මිල හැම මාසයකටම, මාස එකහමාරකටම වතාවක් වැඩි වනවා. ඒක මේ රටේ මිනිසුන් දන්නවා. සෙස් බද්ද ඉවත් කිරීමෙන් කාන්තාවන්ගේ සනීපාරක්ෂක තුවාවල මිල අඩු කළා. ඒ වාගේ තමයි, කථාවලින් වහ ගන්න බැරි, විශාල මිල වැඩි වීමක් අනික් සියලු භාණ්ඩවල තිබෙනවා. තමුන්නාන්සේලා ඒවායේ මිල පාලනය කරනවාද? දැන් මම තමුන්නාන්සේලාගෙන් තව දෙයක් අහනවා. තමුන්නාන්සේලා telecommunication towersවලිනුත් බද්දක් ගන්න යනවා. ඒ කියන්නේ, විදුලි සන්දේශ කුලුනුවලින්. තමුන්නාන්සේලා එක පැත්තකින් ඒ කුලුනුවලින් ගන්නා බද්ද අනික් පැත්තෙන් ඒ සමාගම් විසින් පාරිභෝගිකයාගෙන් අය කර ගන්නවා. තමුන්නාන්සේලා ටෙලිෆෝන් ගාස්තු පාලනය කරනවාද? නැහැ. එහෙම නම්, ටෙලිකොම් සමාගම් කුලුනුවලට ගෙවන මුදල එකතු කර ගන්නේ මේ රටේ සාමාන්‍ය පාරිභෝගිකයාගෙන්. තමුන්නාන්සේලා මේක නොදන්නවා නොවෙයි. "ජීවිතය ගිනි ගන්නවා" කියා මිනිසුන් මේ පැත්තෙන් කෑ ගහද්දි, ඔය ප්‍රධාන මූල්‍ය සමාගම්වල, බැංකුවල, කොම්පැනිවල ලාභය පිළිබඳව තොරතුරු අපි පුවත් පත්වලින් දකිනවා. ඒ අයගේ ලාභ රුපියල් බිලියන ගණන්වලින් වැඩි වනවා. මේ තත්ත්වය යටතේ මිල පාලනය පවා විහිළුවක් වෙලා තිබෙනවා. ඒ, ඇයි? තමුන්නාන්සේලා කියනවා, "මෙන්න හාල් මැස්සන්, මේ මිලටයි විකුණන්න ඕනෑ" කියා. නමුත්, කඩයකට ගියාම හාල් මැස්සෝ වර්ග තුනක් තිබෙනවා. පාලන මිලට තිබෙන හාල් මැස්සෝ ඉතාම බාල වර්ගයක්. දුප්පත්ම මිනිහා ඒක අරගෙන යනවා. ඊළඟ වර්ගය ගන්න යනකොට පාලන මිලක් නැහැ. ඇයි? ඒකේ වර්ගය ඉහළයි. එතකොට වර්ගය ඉහළ ඒවා මිලදී ගන්න පුළුවන් අය වර්ගය ඉහළ ඒවා මිලදී ගන්නවා. මොකුත්ම කර ගන්න බැරි අය බාලම දේ අරගෙන යනවා. අන්තිමට ක්‍රියාත්මක වන්නේ වෙළෙඳ පොළ නීතියයි. ඒකයි මම මේ කියන්න හදන්නේ. මිල පාලනයක් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ මිල පාලනය ඒවායේ තිබෙන වර්ගය අනුව වෙනස් වී තිබෙනවා. කන්න පුළුවන් විධියේ පරිප්පුවක් ගන්න ගියොත්, ඒ මිනිසුන්ට ඒ සඳහා වැඩිපුර ගෙවන්න සිදුවනවා. නියමිත මිලට තිබෙන පරිප්පුව ගත්තාම, ඒ පරිප්පුව කාලා වැඩක් නැහැය කියා මිනිසුන්ට දැනෙනවා. ඒ නිසා ආණ්ඩුව මිනිසුන්ට කවාපු ඔක්කොම පරිප්පු තමන්ට කන්න සිද්ධවන කාලයක් ඉදිරියේදී ළඟාවන බවට අපට සැකයක් නැහැ.

රුපියලේ බාල්දුව ගැන ඊළඟට මම කියන්න කැමැතියි. රුපියල බාල්දු වීම එක්තරා විධියකට යහපත් දෙයක්ය කියා අපට කිව්වා. සිහි කල්පනාව තිබෙන කෙනකුට එහෙම කියන්න පුළුවන් කියා මා හිතන්නේ නැහැ. "රුපියල බාල්දු වීම අපට වළක්වා ගන්න බැහැ" කියා කියනවා නම් එය වෙනම කාරණයක්. "එය යහපත් දෙයක්" යැයි කීම මොන තරම් අසාධාරණ කථාවක්ද කියා මා අහන්න කැමැතියි. මෙහි සමස්තය අරගෙන බැලුවාම, අපේ අපනයනයෙන් ලැබෙන්නා වූ ප්‍රයෝජනයත්, ආනයනයෙන් අපට ලැබෙන බරත් යන දෙකයි සංසන්දනය කරන්න ඕනෑ. ආනයනය කිරීම්වලට අපේ trade deficit එක කීයද? වෙළෙඳ ශේෂයේ පරතරය බැලුවාම, අපේ අපනයන ආදායමත්, ආනයන වියදමත් අතර දෙගුණයක පරතරයක් තිබෙනවා. රුපියලේ වටිනාකම පහළ වැටෙනකොට, ආනයනය කරන හැම භාණ්ඩයකටම ඒකෙන් වදින පහර අපට වැදෙනකොට, ඒකේ නරක පැත්තෙන් දෙගුණයක බලපෑමක් අපට තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

රුපියල බාල්දු වීමට හේතුව ඩොලර්වලට තිබෙන ඉල්ලුම වැඩි වීමයි. ඩොලර්වලට ඉල්ලුම වැඩි වෙන්නේ ඇයි? ඩොලර්වලට ඉල්ලුම වැඩි වෙන්නේ, මේ රටේ සල්ලිකාර මිනිසුන්ටයි -සල්ලි තිබෙන මිනිසුන්ටයි- ආණ්ඩුවටයි වුවමනා කරන දේවල් ආනයනය කරන නිසායි; තමන්ට හිතුණු හැටියට තමන්ගේ වර්තන ගිණුමේ මුදල් අරගෙන මේ රටින් පිට වී යන නිසායි; මේ රටේ තිබෙන කාඩ් පත් අරගෙන පිට රට ගිහින් තමන් කැමැති හැටියට වියදම් කරන නිසායි. මේ ඔක්කොම එකතු වෙන්නේ අර ඩොලර්වල ඉල්ලුමටයි.

ඩොලර්වල ඉල්ලුම වැඩි වීමට පළමුවෙන් වග කියන්න ඕනෑ, මේ ආණ්ඩුවේ තිබෙන වැරැදි ආනයන ප්‍රතිපත්තියයි. ඊළඟට ලිබරල්කරණ ප්‍රතිපත්තියයි. විදේශ විනිමය ලිබරල්කරණය කළාම අපට වැඩිපුර ආදායම ලැබෙනවාය කිව්වා. නමුත් සිද්ධවෙලා තිබෙන්නේ, අද අපේ රටේ විනිමය වැඩිපුර සෝදා පාලුවකට භාජන වෙලා තිබෙන එකයි.

රුපියලේ වටිනාකම පහත වැටීමට හේතු වෙලා තිබෙන්නේ, එක පැත්තකින්, අපි කවුරුත් දන්නා පරිදි මේ රටින් විශාල මුදලක් පිට වී යෑම හා අනික් පැත්තෙන්, මේ රටේ Treasury Billsවල, එහෙම නැත්නම් Treasury Bondsවල විදේශිකයන් ආයෝජනය කළ මුදල් ආපසු අරගෙන යෑමයි. ඇමෙරිකාවේ පොලී මිල -පොලී වටිනාකම- ඉහළ යන එක ඇත්ත තමයි. ඒ නිසා මේ රටින් ඒ මුදල් අරගෙන ගිහින් ඒ රටේ තැන්පත් කරනවා. ඒකත් ඇත්ත තමයි. නමුත්, අපේ රටේ අපේ රුපියල පුළුවන් තරම් දුරකට රැක ගන්න ඕනෑ බව අපි දැන ගත යුතුයි. මොකද, අපේ ආනයන වියදම අපි අපනයනයෙන් ලබන ආදායමට වඩා දෙගුණයකින් වැඩියි; දෙගුණයකට වඩා වැඩියි.

අපේ රටේ මේ රුපියලේ වටිනාකම පාලනය කිරීමේ ප්‍රශ්නය ගැන අපි කල්පනා කරමු. අපේ රට ඕනෑ තරම් ඉන්ධන ආනයනය කරන්නේ නැහැ. ඉන්ධන ආනයනය සීමා කරන්න කියා මා යෝජනා කළා. අපට ඉන්ධන ආනයනය සීමා කරන්න බැරි ඇයි? අපේ ආනයනයන්ගෙන් වැඩි පංගුවක් යන්නේ ඉන්ධන ආනයනයටයි. අපට ඉන්ධන පාවිච්චිය සීමා කරන්න බැරි ඇයි? මේ රටේ සීමාසහිත ප්‍රමාණයකට ඉන්ධන නිකුත් කිරීම කරන්න බැරි ඇයි? අපේ රටේ ආදායම පිළිබඳ ප්‍රශ්නයත් එක්කයි මේවා බැඳිලා තිබෙන්නේ.

අපේ රජයට ආදායම තිබුණාය කියා අපි දන්නවා. බදු ගන්න ඕනෑ. ජනතාවගෙන් බදු ගැනීම අඩු කරලා, ආණ්ඩුවට ආදායම ගන්න තිබුණු රජයේ ව්‍යවසායයන් එකින් එක විකුණුවා. රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව විකුණුවා. ඇල් වතුරවලින් අපට රුපියල් කෝටි දහස් ගණනක් ගෙනැවිත් දුන්නා. ඒවා හැරි ජයවර්ධනට විකුණුවා.

ඉන්ෂුවරන්ස් එක දුන්නා. ඒවා බේරා ගත්තා. එක් අවුරුද්දක ලාභය බිලියන 126යි. වරායේ කොටස් පවරලා දීලාත්, ඉතුරු ඒවායේ ආදායම බිලියන 11යි. මේවා ව්‍යවසායන්ගෙන් එන ආදායම. බංකරින්වලින් අපිට කොච්චර ආදායමක් තිබුණාද? බංකරින්වලින් තිබුණු ආදායම කොම්පැනිකාරයන්ට දුන්නා. ඒ නිසා අපිට බිලියන කීයක් නැති වුණාද? එක්සත් ජාතික පක්ෂය තිබුණු කාලයේදීත්, චන්ද්‍රිකාගේ පාලනය තිබුණු කාලයේදීත් -මේ කාල පරිච්ඡේද දෙකම- මේ රටේ ආණ්ඩුවේ ආදායම් පුද්ගලයන්ගේ ලාභ බවට හරවලා දුන්නා. මේ රටේ අද අර්බුදයක් තිබෙනවා නම්, ඒ අර්බුදයට වග කිව යුතු ප්‍රධානම ආණ්ඩු පාලන දෙකක් තමයි මේ ආණ්ඩු පාලන දෙක. මක් නිසාද, මේ රටේ රජයට එන ආදායම් මාර්ග රාජ්‍ය ව්‍යවසාය මඟින් රජයට අහිමි කරපු කාලයක් තිබුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එක් පැත්තකින් මේ රටේ ඉහළ පන්තියේ අයගේ වුවමනාකම් අනුව ඔවුන්ගේ පරිභෝජන භාණ්ඩ සීමා විරහිතව මේ රටට ගෙන්වූවා. මේ රටේ මුදල් -සල්ලි- තිබෙන උදවිය සීමා විරහිතව මේ රටින් අරගෙන යන ලිබරල් පාලනයකට ඉඩ දීම තුළිනුත්, රාජ්‍ය ව්‍යවසායන්ගේ ආදායම් ධනපති පන්තියට පාවා දීම තුළින් වාගේම විදේශිකයන්ට පාවා දීම තුළින් වෙච්ච අගතිය අද -මේ ආණ්ඩුව යටතේ- මේ රටට ශාපයක් වී තිබෙනවා. ඒ ශාපයෙන් මේ රටේ ජනයා ගැලවීමට ඉදිරි කාලයේදී ජනතාව සූදානම් වෙමින් ඉන්න බව කියමින් මා නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා. ඊට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී "ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. MAYANTHA DISSANAYAKE *took the Chair.*

[අ.භා. 3.11]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "තෙල් විකිණීම සීමා කරන්න අපිට බැරිද?" කියා අපේ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා යෝජනාවක් ගෙනාවා. ඒ කියන්නේ, ration එකක්, පොතක් වාගේ ක්‍රමයකට යන්න පුළුවන්ද කියායි. එවැනි ඉතිහාසයක් තිබුණා. පෙට්‍රල්, ඩීසල් විතරක් නොව හාල් ටික ගන්නත් කාලයක් එහෙම හාල් පොතක් තිබුණ බව අපිට මතකයි. මම පුංචි දවස්වල සීබල් ඇවිනියු එකේ සමූපකාරයේ පෝලිමේ ඉඳලා තිබෙනවා. නමුත් එවැනි තත්ත්වයක අද මිනිසුන්ට ජීවත් වෙන්න ඕනෑ නැහැ කියන පදනම යටතේ තමයි වෙළෙඳ පොළ ආර්ථිකයකට රටේ ජනතාව දිගින් දිගටම ඡන්දය දීලා තිබෙන්නේ. "අද මෙච්චරයි හාල් ගන්න පුළුවන්. මෙච්චරයි සීනි ගන්න පුළුවන්. මෙච්චරයි පෙට්‍රල් ගන්න පුළුවන්." කියා ඔබතුමා හිටපු ආණ්ඩුවලදීවත් කිසිම දවසක මම හිතන්නේ සීමාවක් දැම්මේ නැහැ.

ඒක අද උතුරු කොරියාවේ හැරුණාම ලෝකයේ වෙනත් කිසිම රටක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. හැබැයි, ඔබතුමා ගොඩක් අගය කරපු වෙනිසියුලාවේ අද වනකොට මදුරෝ ජනාධිපතිතුමා යටතේ මොකක්ද තිබෙන තත්ත්වය කියා ඔබතුමා දන්නවා. ඒ රටේ ඕනෑ තරම් තෙල් තිබෙනවා. නමුත්, ඒ රටේ මිනිසුන්ට shed එකට ගිහිල්ලා කාර් එකට පෙට්‍රල් ගහන්න හැකියාවක් නැහැ. සම්පූර්ණයෙන්ම වෙනිසියුලාවේ මුදල් ඒකකය කඩා වැටිලා, hyperinflation දසදහස් ගණනට ගිහිල්ලා තිබෙනවා. හැබැයි, අපිට මේක පාලනය කර ගන්න තව යම් ක්‍රමයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ තමයි, මිල සූත්‍රය. මිල සූත්‍රය අපි පාවිච්චි කරන්නේ ලෝකයේ තෙල් මිල ඉහළ යනකොටයි. අමතක කරන්න එපා, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට රුපියල් බිලියන 280ක් - මම නිවැරැදි නම්- ණය ගෙවන්න තිබෙනවා. ඔබතුමා කිව්වා නිවැරැදියි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා. ලෝකයේ තෙල් මිල වැඩි වනකොට පරිභෝජනය යම්කිසි විධියකට සීමා විය යුතු නම් වෙළෙඳ පොළ ආර්ථිකයක් තුළ අපිට කළ හැකි දේ තමයි ඒ මිල සූත්‍රය පවත්වා ගැනීම.

ඒ අවස්ථාවේදී අනවශ්‍ය ලෙස ඉන්ධන භාවිතය අඩු වනවා. ඒක වෙළෙඳ පොළ හරහාම අපට කළ හැකි දෙයක්. [බාධා කිරීමක්] හරි. ඔබතුමා කියන කථාවට මම සියයට සියයක් එකඟයි. සල්ලිකාරයින්ට අපි අඩුවට දිය යුතුද? සල්ලි අඩු උදවියට අඩුවට දිය යුතුද? දේශපාලන පක්ෂ, පාට භේදයකින් තොරව අපි ඔන්න ඔය වැදගත්ම ප්‍රශ්නයට උත්තරයක් හොයන්න ඕනෑ. අපි හැමෝටම -බෙන්ස් කාර් එකේ යන පුද්ගලයාටත්, ත්‍රී වීලර් එකේ යන පුද්ගලයාටත්- එක මිලට තෙල් විකිණිය යුතුද? බෙන්ස් කාර් එකේ එන පුද්ගලයාටත්, බස් එකේ එන දරුවාටත් එක මිලට අධ්‍යාපනය ලබා දිය යුතුද? මොන පක්ෂය ආණ්ඩු කළත් අපි මෙවැනි සමාජයීය ප්‍රශ්න විසඳුවේ නැත්නම්, මේ රට ඉදිරියට අරගෙන යන්න අපට අපහසු වෙනවා. ඒ නිසා මම ඔබතුමා සමඟ එක විධියකට එකඟ වන ගමන්, ඒ කියන්නේ යම් කිසි පාලනයක් විය යුතුයි කියා එකඟ වන ගමන්, එය සමාජ, ආර්ථික වෙළෙඳ පොළ ව්‍යුහයක් තුළ විය යුතුයි කියන මතය දරනවා, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි.

අනෙක් කාරණය මෙකයි. මහ බැංකුවෙන් L/C අරිනකොට සියයට 100ක margin එකක් අවශ්‍යයි කියා දමලා තිබෙනවා. එහෙම කර තිබෙන්නේත් වෙළෙඳ පොළ ව්‍යුහය තුළ ඩොලර් ගලාගෙන යාම අවම කිරීම සඳහායි. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, මේ දවස්වල මේ ලෝකයේම තිබෙන්නේ ඉතාම අර්බුදකාරී තත්ත්වයක් බව අපි පිළිගන්න ඕනෑ. ඇමෙරිකාවේ ඩොලරය ශක්තිමත් වීම හරහා ඔබතුමා කිව්වා සේම ලෝකයේ සංවර්ධනය වන බොහෝ රටවල emerging marketsවලින් ඔවුන්ගේ බැඳුම්කරවල තිබෙන මුදල් නැවතත් ඇමෙරිකාවට අරගෙන යනවා. ලෝකයේ බොහෝ රටවල කොටස් වෙළෙඳ පොළවලිනුත් ඒවා නැවතත් ඇමෙරිකාවට සංක්‍රමණය වෙනවා. මොකද, ඇමෙරිකාවේ ඩොලරය ශක්තිමත් වීම සිදු වන්නේ, ඔබතුමා කිව්වා වාගේ පොලී අනුපාතය වැඩි වීම සමඟ. පොලී අනුපාතය වැඩි වන කොට ඩොලර් නැවතත් ඇමෙරිකාවට ගලාගෙන යනවා. එහෙම නම් අපට කරන්න පුළුවන් මොකක්ද? අපි ඒ විවේචනය භාර ගන්නවා. අපට අපහසු වෙලා තිබෙනවා මේ රුපියලේ අගය ජනතාවට අවශ්‍ය වන තැන රඳා පවත්වා ගන්න. මම ඒක පිළිගන්නවා. සද්භාවයෙන් පිළිගන්නවා. අපට කථා කරලා, කෑ කෝ ගහලා, මඩ ගහලා විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි මේ අද තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි මේ ප්‍රශ්නය තේරුම් ගන්න ඕනෑ. අපේ මේ සංචිත මුදා හැරලා මේ ප්‍රශ්නයෙන් ගොඩ එන්න අපට පුළුවන්ද, ලංකාවට හැකියාවක් තිබෙනවාද? ඒ හැකියාව නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක අපට ලජ්ජා සහගත දෙයක්. මම කියන්නේ මේ අද තිබෙන පාලනය, අද තිබෙන රජය ගැන නොවෙයි. මම කියන්නේ, එවැනි සංචිත ප්‍රමාණයක් හදා ගන්න කාලයක් තිස්සේ අපට බැරි වෙලා තිබෙනවා කියන එක. හැබැයි, ඉන්දියාව වාගේ රටක් ගන්න. මම හිතන විධියට ඉන්දියාව ගිය මාසය තුළ සංචිත ඩොලර් බිලියන හතළිහක් විතර මුදා හැරියා. නමුත්, ඉන්දියාව තමයි වැඩිම විධියට ඔවුන්ගේ අවප්‍රමාණයක් දැක්කේ. 2018 ජනවාරි මාසයේ ඉඳලා ඊයේ වන විට සියයට 12කින් ඉන්දියානු රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා. හැබැයි තුර්කිය, වෙනිසියුලාව, ආජන්ටිනාව වාගේ රටවල් සමඟ සංසන්දනය කළේ නැති වුණත්, මේ කලාපයේ Philippine Peso එක සියයට හතහමාරකින්, Indonesian Rupee එක සියයට නවයහයමාරකින්, Chinese Renminbi එක පවා සියයට පහකින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. අපි කථා කරන සංවර්ධිත රටක් වන ඔස්ට්‍රේලියාවේ පවා ඩොලරය සියයට හතහමාරකින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. මම වැදගත් කථාවක් කියන්න කැමැතියි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි. කොහොමද, මේ රටවල් සංචිත මුදා හැරීමෙන් තොරව මේ අවප්‍රමාණය වීම වළක්වා ගන්නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

අවප්‍රමාණය අඩු කර ගන්න තිබුණා, ආනයන සීමා කිරීමෙන් හා විනිමය පාලනය කිරීමෙන්. නමුත් තමුන්නාන්සේලා සීමා කිරීමේ ප්‍රතිපත්තිය පිළි ගන්නේ නැහැ නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඒක එකක්. වෙළෙඳ පොළ තුළ අපට සීමා කරන්න පුළුවන්. ඒක තමයි L/C margin එක වැඩි කර තිබෙන්නේ. ලෝක වෙළෙඳපොළේ තෙල් මිල ඉහළ යාමට සාපේක්ෂව ඉල්ලුම යම්කිසි විධියකට පාලනය කර ගන්න තමයි තෙල් මිල යම්කිසි ප්‍රමාණයකට වැඩි කරන්නේ. එහෙම තමයි ලෝකයේ මේ තත්ත්වය පාලනය කරන්නේ. හැබැයි මූලික දෙය තමයි පොලී අනුපාතය වැඩි වෙන්න ඕනෑ කියන එක. දැන් බලන්න, ඉන්දුනීසියාවේ ඊයේ පෙරේදා දෙ වරක් මේ පොලී අනුපාතය වැඩි කර තිබෙනවා; ඉන්දියාවේ පොලී අනුපාතය දෙවරක් වැඩි කර තිබෙනවා. තුර්කිය, පිලිපීනය මේ සියලුම රටවලත් එහෙමයි. අපේ පොලී අනුපාතය මම සංසන්දනය කර බැලුවා. Standing Deposit Facility Rate සහ Standing Lending Facility Rate තමයි ප්‍රතිපත්ති අනුපාතය. දැනට තිබෙන Standing Deposit

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

Facility Rate එක සියයට 7.25 යි; Standing Lending Facility Rate එක 8. 5යි. ඒක 2000 වර්ෂයේ සිට මම සංසන්දනය කර බැලුවා. දැනට ඒක තිබෙන්නේ බොහොම අඩු තැනක. මම මේ ප්‍රශ්නය ගැන මහ බැංකුවෙනුත් ඊයේ ඇහැව්වා. යම් කිසි විධියකට කෙටි කාලීනව මේ පොලී අනුපාතය ඉහළ දැමීම හරහා ඔබ කියන්නා වූ මේ ගලාගෙන එළියට යාම අඩු කර ගැනීමට අවස්ථාවක් සලසා දෙන්න අපට හැකියාවක් තිබෙනවාද? මම ඒක තාර්කිකව ඉදිරිපත් කරනවා. මොකද, හැමදාටම අපි මේක කරන්න නොවෙයි; ටික කාලයකට හෝ ඒ හරහා එළියට ගලාගෙන යන ප්‍රමාණය අවම කර ගන්න අපට පුළුවන් වෙයි ද? මේ කථාව වැදගත් වෙන්නේ මෙහෙමයි. ඔබතුමා කිව්වා වාගේම, Government Securitiesවලින් පිටරට ආයෝජකයෝ ආයෝජනය කර තිබෙන ප්‍රමාණය, මේ අවුරුද්දේ දැන් වෙනකොට ඩොලර් මිලියන 400ක වාගේ ප්‍රමාණයක් එළියට ගිහින් තිබෙනවා. ඒකට සාපේක්ෂව 2017 වර්ෂයේ ඩොලර් මිලියන 450ක පමණ ප්‍රමාණයක් ඇතුළට ඇවිත් තිබෙනවා. එසේ නම් මෙතැන තිබෙන වැදගත්ම ප්‍රශ්නය තමයි, - අපි එය අමතක කරන්න නරකයි,- අපට ලබන අවුරුද්දේ ඇමරිකන් ඩොලර් බිලියන 04ක ණය වාරික සහ පොලිය ගෙවන්නට තිබෙනවාය කියන එක. ඩොලර් බිලියන 04ක්! මේ රටේ ආර්ථිකයට උහුලා ගන්න පුළුවන් වෙන්නේ අපට සාමාන්‍ය වශයෙන් ඩොලර් බිලියන 2 1/2ක් වැනි ප්‍රමාණයක්. ඩොලර් බිලියන 2 1/2ක් වැනි ප්‍රමාණයක් තමයි අපි දිගටම ගෙවාගෙන ආවේ. නමුත් එන අවුරුද්දේ ගෙවන්න තිබෙන්නේ ඔබතුමන්ලාගේ රාජ්‍ය පාලන කාලය තුළ ඉහළ පොලියක් මත ලබා ගත්තා වූ International Sovereign Bondsවලට bullet payments. ඒ එකපාරට එන bullet payments- [බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඇයි, තමුන්නාන්සේලාගේ කාලේ ආපු Bond scam එක? ඒකෙන් ආපු පොලී බරත් එකතු කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

එදා ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කියනවා මම අහගෙන හිටියා, "දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ණය බර අඩු වුණා" කියා. ඇත්තවශයෙන්ම එතැන එතුමාට නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. ණය ප්‍රතිශතයක් හැටියට අඩු වුණාට අපි කල්පනා කරන්න ඕනෑ, කොයි වර්ගයේ ණයද අපි ගන්නේ; composition එක මොකක්ද කියා. 2008 වර්ෂයේ තමයි ඉස්සෙල්ලාම International Sovereign Bonds ගත්තේ. ඒ වෙනතුරු අපේ ණය තිබුණේ අවුරුදු විසපහයි; තිහයි; හතළිහයි; පණහයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පියා මහවැලිය එහෙම හදන කාලයේ අපි ණය ගත්තේ සියයට 0.1ක පොලියකට නැත්නම් සියයට 0.25යි වාගේ පොලියකටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල කැලණි පාලම අලුතෙන් හදනවා. කාටත් ඒක පේනවා. ඒ සඳහා ජපානයෙන් ණය අරගෙන තිබෙන්නේ, සියයට 0.1 ක පොලියකට. නමුත් International Sovereign Bonds අපි අරගෙන තිබෙන්නේ සියයට 8ට, සියයට 8.5ට. සියයට 9ට ගත් ණයත් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, සියයට 9.8 ක පොලියට ගත් ඩොලර් මිලියන 50ක ණය මුදලකුත් තිබෙනවා. අපට මේවා එකපාරට ගෙවන්න වෙනවා; පොඩ්ඩ පොඩ්ඩ අවුරුදු තිහ හතළිහ ගෙවන්න නොවෙයි. එසේ නම් අපි වගකිව යුතු - responsible - රජයක් හැටියට අපේ තිබෙන සංචිත ඩොලර් බිලියන අටහමාර, නවය මුදාහරින්න අපට පුළුවන්කමක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, අපට මුදා හරින්න පුළුවන්; බැරි කමක් නැහැ. ඩොලර් ටික තියෙනවා, ඒ ඩොලර් ටික මුදා හරින්න පුළුවන්. මුදා හැර අපිට කියන්න පුළුවන්, "ඔන්න! අපි රුපියල යම් කිසි ස්ථාවරභාවයක තියා ගන්නවා" කියා. මට හොඳට මතකයි, අපි විපක්ෂයේ ඉන්නකොට ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එදා මුදල් ඇමති හැටියට අය වැය යෝජනා කියවාගෙන යන කොට එකපාරට අතරමගදී කිව්වා, "දැන් සිට රුපියල සියයට 2කින් අවප්‍රමාණය කරනවා" කියා. කිසිම දවසක මුදල් ඇමතිවරයෙක් එහෙම දෙයක් කියා නැහැ. නමුත් ඒක ඒ විධියට සිද්ධ වුණා, 2011 නොවැම්බර් මාසයේ.

ඒකට හේතුව තමයි, ඩොලරයේ අගය රුපියල් 109ට සඳාකාලිකව අපට තියාගන්න පුළුවන් කියලා හිතලා එවකට මහ බැංකුව ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තිය. මම ඔබතුමාට දත්ත ටික දෙන්නම්. එහෙම කරන්න ගිහින් 2011 ඩොලර් මිලියන 2,840ක් සහ 2012 මුල මාස දෙකේ ඩොලර් මිලියන 1,166ක්, ඒ කියන්නේ ඩොලර් මිලියන 4,000ක් විතර -ඩොලර් බිලියන 4ක් විතර- අපට තිබුණු සංචිතවලින් භාගයකට පොඩ්ඩක් වැඩි වන ප්‍රමාණයක් අපි මුදා හැරියා. එහෙම මුදා හැරලා අවසානයේ මොකද වුණේ? සියයට 13කින් රුපියල අවප්‍රමාණය වුණා. සියයට 13කින්! මේ, ඔබතුමන්ලාගේ රජය කාලයේ. මම ඔබතුමාට සද්භාවයෙන් කියන්න උත්සාහ කරන්නේ, අවසානයේදී මොකද වුණේ කියන එක. අවසානයේදී අපට තිබුණු සංචිතත් නැති වුණා; රුපියලත් සියයට 13කින් අවප්‍රමාණය වුණා. එහෙම නම් වගකිව යුතු රජයක් හැටියට අපට ජනතාවට කියන්න පුළුවන් වෙන්න ඕනෑ, "ඔව්, අපට අභියෝගයක් තිබෙනවා. එම අභියෝගය අපි විසින්ම නිර්මාණය කරපු ගැටලුවක් නොවෙයි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Minister, you have two minutes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි පහක කාලයක් ලබා දෙන්න.

මන්ත්‍රීතුමා කිව්වා හරි. අපි ආනයනය කරන්න ඕනෑ. ආනයන සීමා කිරීමට අපි වෙළෙඳ පොළ හරහා යම්කිසි ක්‍රමවේද යොදලා තිබෙනවා. නමුත්, අපනයනය අඩුකම තමයි ඔබතුමා කිව්වේ. ඔබතුමාට දෙයක් කියන්න අමතක වුණා. ඔබතුමා කිව්වේ භාණ්ඩ අපනයනය ගැන විතරයි. නමුත්, මේ වන විට සේවා අපනයනය ශීඝ්‍රයෙන් ඉදිරියට යනවා. IT සේවාව, logistics සේවාව, port සේවාව යනාදී සේවා සහ සංචාරක සේවා හරහා අපට සෑහෙන මුදල් ප්‍රමාණයක් ලැබෙනවා. අපි අපනයනය බලන්නේ භාණ්ඩ හා සේවා. එහෙම බැලුවොත් මේ අවුරුද්දේ ඇමෙරිකානු ඩොලර් බිලියන 18ක විතර ප්‍රමාණයක භාණ්ඩ හා සේවා අපනයනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එතකොට අර 11 කියන ප්‍රමාණයට වඩා වැඩි වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ගැටලුව මෙන්න මෙකයි. 2000 වසරේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපේ ජාත්‍යන්තර වෙළෙඳාම සියයට 88යි. නමුත්, 2017 වර්ෂය වන විට මේ ප්‍රමාණය සියයට 53ට අඩු වෙලා තිබෙනවා. 2000 වර්ෂයේදී අපේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 35ක් අපනයනයට වැය කළා. නමුත් මේ ආණ්ඩුව මාරු වෙනකොට ඒක සියයට 12ට අඩු වෙලා තිබුණා.

එහෙම නම් අපි කල්පනා කරන්න ඕනෑ, අපි රටක් හැටියට දියුණු වෙනකොට ආනයනය කරනවා. එසේ ආනයනය කළාට කමක් නැහැ. නමුත්, ආනයන සඳහා ගෙවීමට අපි අපනයනය තුළින් ඩොලර් ලබා ගන්න ඕනෑ.

අපි වියට්නාමය ගැන කථා කරනවා. ඊයේ අපි සාකච්ඡාවක සිටින විට ගරු අගමැතිතුමා කිව්වා, 2001 වර්ෂයේ විතර එතුමා අගමැති වශයෙන් සිටි කාලයේ, වියට්නාමයේ ඇමති කෙනෙක් ආපු අවස්ථාවක, ඔවුන්ගේ රෙදිපිළි අපනයනය තිබුණේ ඩොලර් බිලියන දෙකක විතර ප්‍රමාණයක් කියා සඳහන් කළ බවත්, අපෙත් අපනයනය තිබුණේ ඩොලර් බිලියන දෙකක විතර ප්‍රමාණයක් බවත්. අද අපේ රෙදිපිළි අපනයනය ඩොලර් බිලියන පහට විතර ගිහින් තිබෙනවා. සමස්ත භාණ්ඩ අපනයනය ඩොලර් බිලියන 11ට විතර ගෙනැත් තිබෙනවා. භාණ්ඩ හා සේවා අපනයන ඩොලර් බිලියන 17ක් විතර වෙනවා. නමුත් අද වන විට වියට්නාමයේ කීයද? අපනයනය ඩොලර් බිලියන 260යි! ඔවුන්ගේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපනයනය -මේක කියන්න අපි ලජ්ජා වෙන්න ඕනෑ- සියයට 100 ඉක්මවා තිබෙනවා. සියයට 100 ඉක්මවා තිබෙනවා! ඒ කියන්නේ ඔවුන්ගේ ආනයනයට සාපේක්ෂව ඒවාට ගෙවීමට අපනයන ශීඝ්‍රයෙන් වැඩි වෙලා තිබෙනවා. අපි සියයට 35 සිට සියයට 11ට, 12ට වැටිලා. දැන් GSP එක හරහා යුරෝපීය කලාපයට යවන අපනයන මත, සෑහෙන වර්ධනයක් පෙන්වන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. එය සියයට 13ට වැඩි වෙලා තිබෙනවා. එම නිසා අපි බැණගෙන වැඩක් නැහැ; නම් කියාගෙන වැඩක් නැහැ; මඩ ගහගෙන වැඩක් නැහැ. අපි රජයක් හැටියට, පාර්ලිමේන්තුව හැටියට, මේ රටේ ජනතාව වෙනුවෙන් පත් වී සිටින නියෝජිතයන් හැටියට තේරුම් ගන්න ඕනෑ, අපට අපනයනය වර්ධනය කර ගැනීමට බැරි නම් අපේ රට අගාධයකට යනවා කියන එක. අපනයන වර්ධනය කර ගැනීම මත තමයි මේ ප්‍රශ්නයට දීර්ඝකාලීන පිළිතුර තිබෙන්නේ.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. ඔබතුමා දැන් වියට්නාමය ගැන කිව්වා. හැබැයි, දැන් වියට්නාමයේ ඒකපුද්ගල ආදායම ලංකාවට වඩා අඩුයි. අපි ඩොලර් බිලියන ගණනක් import, export කරලා අපේ ඒකපුද්ගල ආදායම වැඩි වෙන්නේ නැත්නම් තේරුමක් නැහැ. අනික, අවුරුදු 05ක වාගේ කාලයක් තුළ regional currencies එක්ක අපේ රුපියල සංසන්දනය කළොත්, අපේ රුපියලේ අගය අඩු වෙලා තිබෙනවා. ඒ, ඩොලර් එකට සාපේක්ෂව විතරක් නොවෙයි; බාට් එකට, රිගිට් එකට, ඉන්දියානු රුපියලට -මේ සියල්ලටම- සාපේක්ෂව රුපියලේ අගය අඩු වෙලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය පැහැදිලියි. ඔබතුමා දෙවනුව ඉදිරිපත් කළ ප්‍රශ්නයට මා මුලින් පිළිතුරු දෙන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අතේ තිබෙන මේ වාර්තාව **හැන්සාඩ්*** වාර්තාවට ඇතුළත් කරන්නය කියා මා ඉල්ලනවා. බාට් එක සම්බන්ධයෙන් එහෙම එතුමා අහපු ප්‍රශ්නයට උත්තරය මේ තුළ තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේකේ සඳහන් වන විධියට 2000 සිට අද වනතුරු ඉන්දියානු රුපියලට සාපේක්ෂව අපේ රුපියලේ අවප්‍රමාණය වීම සමානව සිදු වෙලා තිබෙනවා. පාකිස්තානු රුපියල අපේ රුපියලට වඩා වැඩිපුර අවප්‍රමාණ වෙලා තිබෙනවා. බංග්ලාදේශය එක්ක බැලුවොත්, ඔවුන්ගේ මුදල් ඒකකයට වඩා අපේ රුපියල යන්තමින් අවප්‍රමාණය වෙලා තිබෙනවා, 2000 සිට 2010 වනතුරු. ඊළඟට, මැලේසියාවෙත් එහෙමයි. අවප්‍රමාණ වෙලා තිබෙන්නේ ලංකාවේ විතරයි කියලා ඔබතුමා කිව්වාට, එහෙම නැහැ.

වියට්නාමය ගැනත් ඔබතුමා කථා කළා. වියට්නාමය ඔවුන්ගේ මූල්‍ය ඒකකයේ අගය ස්ථාවරව තියාගෙන ඉන්නේ කොහොමද කියලා බලන්න. ඔබතුමා දන්නවාද, අද වියට්නාමයේ තිබෙනවා, trade surplus එකක්. ඔවුන් ඇමෙරිකන් ඩොලර් බිලියන 260ක අපනයනය කරනවා; නමුත්, ඇමෙරිකන් ඩොලර් බිලියන දෙසිය ගණනක ආනයනය කරනවා. එතකොට අවසානයේදී ඔවුන්ගේ trade surplus එකක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, you have one minute.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඒ නිසා වියට්නාමය- [බාධා කිරීමක්] දැන් වේලාව නැහැ. පස්සේ කියන්න. මට විනාඩියයි තිබෙන්නේ.

වියට්නාමයේ අපේ තරම් ආදායමක් නැහැ. ඒක අපි පිළිගන්නවා. අපේ ඒකපුද්ගල ආදායම සෑහෙන්න ඉහළ ගිහිල්ලා තිබෙනවා. අද වන කොට nominal per capita income එක, -GDP per capita එක- ඩොලර් 4,000ක් විතර වෙනවා. නමුත්, purchasing power parity අරගෙන බැලුවාම, කොළඹ ප්‍රදේශයේ per capita income එක purchasing power parity එකට adjust කළාම ඇමෙරිකන් ඩොලර් 14,000ක්, 15,000ක් විතර වෙනවා. එතකොට ඒ purchasing power parity එකත් එක්ක අපි ආර්ථික වර්ධන වේගය අතින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. යම්කිසි වේගයකට මේ ආර්ථිකය වර්ධනය වෙනවා. ඒක රඳා පවත්වා ගෙන යන්න, තව දුරටත් ඉහළ ගෙනයන්න අපේ අපනයන වැඩි විය යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන කාලවේලාව ඉවර නිසා මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු ඊ. සරවනපවන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 05ක් තිබෙනවා.

[3.31p.m.]

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

Mr. Presiding Member, at present, both the President and the Hon. Prime Minister have started developing the North and the East. They have set up special committees

[ගරු ඊ. සරවනපවන් මහතා]

in connection with that and the work has already been commenced. We also attended the President's meeting. We are very happy that they have selected a few industries such as Paranthan Chemicals Company and the Elephant Pass Saltern - also, they spoke about the cement factory. It is going to be converted into an industrial zone to be developed.

If these start to function, we will definitely have economic development and employment creation. But, it is very sad to say, the North and the East are 30 years behind the other Provinces in terms of development. In addition to that, though the war ended in 2009, none of the politicians or the Government have considered, up to now, the war-torn areas for development. That is the sad story. But anyhow, now the President and the Hon. Prime Minister have started the development work. Therefore, I presume that we will reach the target and our Provinces will also become more or less equal to the other Provinces in development.

The backbone of economic development is the Pradeshiya Sabhas. We have 34 Pradeshiya Sabhas in the North. Unfortunately, the Pradeshiya Sabhas are not fully-fledged and therefore, they are not in a position to function properly because of the lack of equipment.
I am, now, going to give the details in Tamil.

வட மாகாணம் கடந்த மூன்று தசாப்த காலப் போர் நடவடிக்கையின் பின் மீள் கட்டியெழுப்பப்படுகின்றது. இதன்மூலம் வடக்கில் உள்ள 34 உள்ளூராட்சிச் சபைகள் தற்போது படிப்படியாக மீழெழுச்சி பெறுகின்றன. எனினும், மத்திய அரசும் உலக வங்கியும் இணைந்த வகையில் தேசியக் கருத்திட்டமொன்றினை முன்மொழிந்த வகையில், NELSIP என்ற 'புறநெகும' திட்டத்தினூடாக வடக்கிலுள்ள 34 உள்ளூராட்சிச் சபைகளுக்கும் தலா 100 முதல் 110 மில்லியன் ரூபாய் வரை நிதி கிடைக்கப்பெற்று, 5 முதல் 10 வரையான வீதிகள், சந்தைகள் எனச் சில அபிவிருத்திகள் கண்டன. எனினும், வடக்கில் ஒவ்வோர் உள்ளூராட்சிச் சபைகளும் இதுவரை எதிர்பார்த்த அபிவிருத்தி அடையாமல் உள்ளன. அவை 350 முதல் 600 வரையிலான வீதிகளைத் தன்னகத்தே கொண்டுள்ளதுடன், இதில் 65 சதவீதமான வீதிகள் இதுவரை செப்பனிடப்படாத நிலையிலுள்ளன. இதில் நல்லூர், சுன்னாகம் மற்றும் யாழ். மாநகர சபை போன்ற வளர்ச்சியடைந்த சபைகளை விட, வடக்கிலுள்ள ஏனைய 31 சபைகளும் பெரியளவிலான வருமானமின்றி நலிவுற்ற சபைகளாகவே உள்ளன.

இன்று வடக்கிலுள்ள உள்ளூராட்சிச் சபைகளில் பெரும் பாலான சபைகள் திண்மக் கழிவு முகாமைத்துவப் பரிகரிப்புச் செயற்றிட்டத்திற்கு ஏற்ற பொறிமுறைத் தொகுதிகளைப் பெற்றுக்கொள்ள முடியாத சூழலில், அதற்கான ஆளணிகள் குறிப்பாக, பொதுச் சுகாதாரப் பரிசோதகர்கள், சுகாதார மேற்பார்வையாளர்கள், சுகாதாரத் தொழிலாளர்கள், காவலாளிகள், களஞ்சியக் காப்பாளர்கள் எனத் திண்மக் கழிவு முகாமைத்துவப் பரிகரிப்புச் செயற்றிட்டத்திற்கு ஒவ்வொரு பிரதேச சபைகளுக்கும் நகர சபைகளுக்கும் மாநகர சபைகளுக்கும் பிரத்தியேகமான ஆளணிகள் அங்கீகரித்து வழங்கப்பட வேண்டும். இத்தேவைப்பாடுகள் முகாமைத்துவச் சேவைகள் திணைக்களத்தினால் முன்னெடுக்கப்பட வேண்டியுள்ளன. இதற்கான அனுமதியைத் திறைசேரிச் செயலாளர் வழங்கி உதவினால் மட்டுமே எதிர்காலத்தில் வடக்கில் உள்ளூராட்சிச் சபைகளின் திண்மக் கழிவு முகாமைத்துவம் வலுப்பெறும் திட்டமாகிச் சிறந்த சுகாதாரச் சூழல் பேணப்படுவதுடன், உக்கும் கழிவுகள் பசளையாவதுடன் ஏனைய 'பிளாஸ்டிக்', தகரம், கண்ணாடி போன்ற கழிவுகள் மீள் பயன்பாட்டுக்கு உள்ளடக்கப்படும் ஏதுநிலை உருவாகும்.

கடந்த 01.01.2013 அன்று முகாமைத்துவச் சேவைகள் திணைக்களத்தினால் வடக்கிற்கு அனுமதிக்கப்பட்ட ஆளணியினைக் கொண்டு உள்ளூராட்சிச் சபைகளை மீளக் கொண்டு செல்ல முடியாத நிலை காணப்படுகின்றது. தற்போது வடக்கில் வட மாகாணப் பிரதம செயலாளர், வட மாகாண உள்ளூராட்சிச் சபைகளின் தவிசாளர்கள், உள்ளூராட்சி ஆணையாளர்கள் ஆகியோர் இணைந்த வகையில் புதிய ஆளணி அங்கீகாரத்திற்கான நடவடிக்கை களைப் பூர்த்தி செய்துள்ளனர். எனினும், மேற்படி ஆளணி அங்கீகாரத்திற்கான அனுமதிகள் தடைப்பட்டு இடை நடுவில் நிற்பது வருத்தமளிக்கிறது. எனவே, பொருத்தமான நடவடிக்கைகளுக்கு வழி விட்டுக்கொடுத்து வடக்கின் சபைகளை மீளக் கட்டியெழுப்ப உதவ வேண்டும்.

இதனைவிட, உள்ளூராட்சிச் சபைகளின் தரமுயர்த்தல் தொடர்பாக வடக்கின் யாழ். மாவட்டத்தில் கடந்த 13.09.2009இல் முன்னாள் மறைந்த யாழ். மாவட்ட அரசாங்க அதிபர் உயர்திரு. கணேஷ் அவர்களது காலத்தில் இடம்பெற்ற மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் பிரதேச சபைகள் சிலவற்றை நகரசபைகளாகத் தரமுயர்த்துவது தொடர்பில் தீர்மானம் நிறைவேற்றப்பட்டது. இவற்றில் நல்லூர் பிரதேச சபை, மானிப்பாய் பிரதேச சபை, சுன்னாகம் பிரதேச சபை, சுழிபுரம் பிரதேச சபை, கரவெட்டி பிரதேச சபை உள்ளிட்ட பிரதேச சபைகளை நகர சபைகளாகத் தரமுயர்த்துவது தொடர்பில் தீர்மானம் நிறைவேறியது. எனினும், கடந்த 9 ஆண்டுகள் கழிந்த நிலையிலும் வடக்கில் எந்தவொரு வளர்ச்சியடைந்த பிரதேச சபைகளும் நகர சபைகளாகத் தரமுயர்த்தப்படவில்லை. இதற்கான உரிய நடவடிக்கைகளை சம்பந்தப்பட்ட வட மாகாண உள்ளூராட்சி அமைச்சோ அன்றி மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிக்கான மத்திய அமைச்சோ இதுவரை எடுக்கவில்லை. எனவே, வடக்கிலுள்ள வளர்ச்சி மற்றும் அபிவிருத்தியடைந்த உள்ளூராட்சிச் சபைகளை அவற்றின் வருமானம், சனத்தொகை மற்றும் தகுதி வழிகளை முறையாக ஆய்வு செய்து, பிரதேச சபைகளின் ஒரு பகுதியை நகர சபையாகத் தரமுயர்த்துகின்ற அதேவேளை, மற்றைய பிரதேசத்தை பிரதேச சபையாக தரமுயர்த்தும் நடவடிக்கையை இந்த உயரிய சபையில் எதிர்காலத்தில் முன்னெடுக்க வேண்டும்.

மேலும், கடந்த காலங்களின் உள்ளூராட்சி மன்றங்களின் செயலாளர்களாக, அதாவது பிரதேச சபை, நகர சபைகளின் செயலாளர்களாக இலங்கை நிர்வாக சேவை தரத்தின் III ஆம் வகுப்பு ஆளணியினர் கடமை புரிந்தனர். தற்போது முகாமைத்துவ உதவியாளர் சேவையில் உள்ளவர்களே உள்ளூராட்சி மன்றங்களின் செயலாளர்களாக உள்ளனர். இதனை உள்ளூராட்சி மறுசீரமைப்புக் கொள்கையின்கீழ் வலுவடையச் செய்ய வேண்டுமாயின், மீளவும் இலங்கை நிர்வாக சேவைத் தரத்திலுள்ளவர்களை நியமனம் செய்ய வேண்டும். இல்லாவிடில், பட்டதாரித் தரத்துடன் பட்டப்பின் கல்வித் தகைமைகளையுடைய பிரத்தியேகமான ஆளணியினராக வடக்கு உள்ளூராட்சிச் சபைகளில் கடமையாற்றும் உள்ளூராட்சி அலுவலர்களை அல்லது உள்ளூராட்சி

உதவியாளர்களை, அங்கு செயலாளர்களாக நியமிப்பதற்கான நடவடிக்கையையெடுத்தால் மட்டுமே உண்மையான அபிவிருத்தியை வடக்கிலுள்ள பிரதேச சபைகள், நகர சபைகள் எய்தும் என்பது எனது ஆய்வின் மூலமான முடிவாகும். வடக்கு மாகாண உள்ளூராட்சி அமைச்சின் முடிவும் இதுவாகும்.

வடக்கில் 10.02.2018இல் உள்ளூராட்சித் தேர்தல் முடிவுற்று 6 மாதங்கள் முடிவுற்ற நிலையிலும் சபையின் தவிசாளர் மக்களுக்கு முழுப் பணியாற்றுவதற்குத் தேவையான வாகனமின்றியுள்ளமை பெரும் வருத்தத்திற்குரிய விடயமாகும். இந்தத் தவிசாளர்கள் மக்களுக்கான சேவையாற்றுவதற்காக வாகனங்கள் வழங்கப்படாமை உள்ளூராட்சி மறுசீரமைப்புக் கொள்கை வலுவிழந்துள்ளமையைச் சுட்டிக் காட்டுகின்றது.

வடக்கில் 34 உள்ளூராட்சிச் சபைகள் உள்ளபோதும் அங்குள்ள சபைகள்மூலம் மக்களுக்கான குடிநீர் வழங்குவதற்குப் போதுமான நீர் மூலாதார வளங்கள் இன்மையானது பெரும் குறையாகும். இதனாலேயே யாழ்ப்பாணம் - கிளிநொச்சி குடிநீர்த் திட்டம் மற்றும் மருதங்கேணி கடல் நீரைச் சுத்திகரித்துக் குழாய்மூலம் வழங்கப்படும் திட்டம் ஆகிய இரு திட்டங்களும் முன்னெடுக்கப்பட்டும் நிறைவேறாத தன்மை காணப்படுகின்றது. இதற்கு மாற்றீடாக, கிடைக்கின்ற நீர் மூலாதாரங்களைக்கொண்டு குடிதண்ணீரை வழங்குவதற்கு வடக்கிலுள்ள 34 உள்ளூராட்சிச் சபைகளில் சில பிரதேச சபைகளை விலக்கி, ஏனைய 23 பிரதேச சபைகளுக்கும் ஒவ்வொன்றும் 8,000 லீற்றர் கொள்ளவுடைய tractors, லொறி, bowsers, போன்ற வாகனங்கள் வழங்கப்பட வேண்டும். திண்மக்கழிவு முகாமைத்துவத்தினூடாகக் குப்பையகற்றும் திட்டத்தை முன்னெடுத்து, 'டெங்கு' அற்ற பிரதேசங்களை உருவாக்குவதற்காகப் பெட்டியுடன்கூடிய tractors, computers, மலக்கழிவுகளை உறிஞ்சும் bowsers, அதனைச் சுத்திகரிக்கும் இயந்திரங்கள் என்பன முதற்கட்டமாக வழங்கப்படுதல் வேண்டுமென்பதனை இவ்வுயரிய சபையில் சுட்டிக்காட்ட விரும்புகிறேன். மேலும், ஆளணிகள் உள்ள சபைகள் வீதி மீள்புனரமைப்பில் ஈடுபட வேண்டுமாயின், அதற்கான motor machine, tractor என்பன ஆய்வுசெய்து வழங்கப்படல் வேண்டும். இவ்வாறான உள்ளூராட்சிச் சபைகள் வலுவுள்ள தாக மாற்றம்பெற வாகனங்கள், சுத்திகரிப்பு இயந்திரங்கள், பொறித்தொகுதிகள் என்பன முக்கியமானதாகும்.

மேலும், இன்று வடக்கில் கட்டாக்காலி நாய்களின் பெருக்கம் வகைதொகையின்றி அதிகரித்துள்ளது. தினமும் வடக்கில் பலர் விசர் நாய்க் கடிக்கு இலக்காகி, அரசினர் வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டு வருகின்றனர், சிலர் விசர் நாய்க்கடியினால் இறந்தும் வருகின்றனர். இந்த விபரங்களைப் புள்ளிவிபர ரீதியாக வழங்க முடியும். எனவே, கட்டாக்காலி நாய்களை இல்லாதொழிப்பதற்கு அல்லது கட்டாக்காலி நாய்களைப் பிடித்துப் பொதுவான சரணாலயங் களில் பாதுகாப்பதற்கு மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சு உடனடியாக நடவடிக்கை எடுக்கவேண்டுமென்று தயவுடன் கேட்டுக்கொள்கின்றேன்.

Apart from this, I would like to mention that it was in 1974 that the last valuation was done by these Pradeshiya Sabhas. So, you can see how many years we are behind. Even today they are collecting the same amount of money from the public. The answer given by the Centre is that they do not have sufficient officers to do valuations. But in the case of the South, it is not so. There, they have done a valuation three years back. All these Pradeshiya Sabhas are losing three crores per year averagely. Therefore, the Government should find a way to enable these Pradeshiya Sabhas to collect the income by doing valuations as quickly as possible without giving any reasons. They must send valuation officers and get all these things updated.

You can see, valuations have not been done after the war. It is more than 35 years. Therefore, we request the Government to act very quickly and allow the Pradeshiya Sabhas to function independently with their own money.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Saravanapavan, you have more time left. You have been allotted 15 minutes. If you want to speak more, you can do so. You have a few more minutes left.

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)
No, Sir, I have finished. Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Okay. The next speaker is the Hon. Shehan Semasinghe. You have ten minutes.

[අ.භා. 3.43]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෙම විවාදයට සම්බන්ධවීමට ලැබීම ගැන මගේ සතුට ප්‍රකාශ කරනවා. අද පෙරවරුවේ සිට ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් කථා කරපු මැති ඇමතිවරු අපනයන සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ගැටලුවක් ගැන දිගින් දිගටම කථා කළා. හැබැයි, මංගල සමරවීර මුදල් ඇමතිතුමා එතුමාගේ කථාවේදී අපනයන වටිනාකම ගැන ඉතා පැහැදිලිව කථා කළා. 2014 අවුරුද්දේ අපේ රටේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 11.1යි. 2017 වෙද්දී ඒ අපනයන ආදායම වැඩි වෙලා තිබෙනවාය කිව්වාට, ඒ වැඩි වෙලා තිබෙන්නේ දශම ගණනකින්. ඒ ගණන ඇමෙරිකානු ඩොලර් බිලියන 11.3යි. 2014 අපනයන ආදායමත් 2017 අපනයන ආදායමත් එක හා සමාන ප්‍රමාණයක තිබෙද්දී මලික් සමරවික්‍රම ඇමතිතුමා ප්‍රකාශ කළා, අපේ රටේ අපනයන ආදායම සියයට 50කින් වැඩි වෙලා තිබෙනවා කියලා. හැබැයි, එහෙම වෙලා නැහැ. සංඛ්‍යාලේඛන කිසිවක ඒ ආකාරයේ වැඩි වීමක් ගැන සඳහන් කරන්නේ නැහැ. මම මේ කරුණ කියලා කියන්න උත්සාහ කළේ, මේ ආකාරයටම හැම කරුණක් සම්බන්ධයෙන්ම රජය ජනතාව නොමඟ යවලා තිබෙන බව කියන්නයි. එක පැත්තකින් රජය පොරොන්දු ගණනාවක් දීලා තිබෙනවා. අනෙක් පැත්තෙන් ඒ පොරොන්දු ඉටු කර ගන්න බැරි වුණාම, වෙනත් සංඛ්‍යාලේඛන පෙන්වලා ආණ්ඩුවේ නොහැකියාව වහ ගන්න උත්සාහ කරනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ ප්‍රකාශ කිරීම යුක්ති සහගතත් නැහැ, සදාචාරාත්මක ආණ්ඩුවක් නම් එසේ කළ යුතුත් නැහැ.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට -අද දවල් 12 පහු වෙද්දී- ඇමෙරිකානු ඩොලරය රුපියල් 168.6කට ඉහළ යනවා. ආණ්ඩුවේ මුදල් අමාත්‍යතුමා, මුදල් රාජ්‍ය අමාත්‍යතුමා, ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල කඩා වැටීම හොඳයි කියපු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා -ඒ සියලු දෙනා- කථාවලදී කියන්න උත්සාහ කළේ, මේ වන විට අනෙකුත් රටවලට සාපේක්ෂව ඇමෙරිකානු ඩොලරය ශක්තිමත් වෙලා තිබෙනවා, ඒ නිසා රුපියල කඩා වැටීම ප්‍රශ්නයක් නොවෙයි කියන එකයි. එහෙම නැත්නම්, ඒක පාලනය කර ගන්න බැහැ කියන කාරණාව කියන්නයි උත්සාහ කළේ. හැබැයි, එතුමන්ලා උදාහරණයට ගන්නවා ඉන්දියාව. ඉන්දියාව උදාහරණයට ගත්තාට, 2015 ඉඳලා 2018 මේ දක්වා වර්ෂ තුනහමාරක කාලය තුළ ඉන්දියානු රුපියල අවප්‍රමාණ වෙන්නේ සියයට 8කින්. නමුත්, ලංකාවේ රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 28කින් අවප්‍රමාණ වනවා. එතකොට, ලංකාවේ රුපියල අවප්‍රමාණ වීම ඉන්දියාවත් එක්ක සන්සන්දනය කරන්නේ කොහොමද? ඒක මේ ආකාරයට වෙන්නේ සමස්ත ආර්ථිකයේම සිදුවෙන දුර්වල කළමනාකරණය නිසායි.

හිටපු මුදල් ඇමති රවි කරුණානායක මැතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා දින 100 ආණ්ඩුව යටතේ සිටියදී "දිනමිණ" පත්‍රයට කියලා තිබෙනවා, "සතියක් ඇතුළත ඇමෙරිකානු ඩොලරයේ මිල 130 මට්ටමට ස්ථාවර කරනවා" කියලා. මේ විධියට තමයි මේ ආණ්ඩුව පටන් ගත්තේ. රවි කරුණානායක මන්ත්‍රීතුමනි, සමහර විට ඔබතුමාගේ ප්‍රතිපත්තිය ඉස්සරහට ගියා නම් ඒ ආකාරයට වෙන්න තිබුණා. නමුත්, මේ ආණ්ඩුව එවැනි ජනතාවාදී තීන්දු-තීරණ ගන්නා ආණ්ඩුවක් නොවෙයි. දැන් බලන්නකෝ, තෙල් මිල සම්බන්ධයෙන් කියන අමූලික පට්ටපල් බොරු ටික. දැන් මිල සූත්‍රයක් ගැන ආණ්ඩුව කථා කරනවා. අඩුම ගණනේ මේ ආණ්ඩුවේ ඉන්න එක ඇමතිවරයෙක් හෝ මේ මිල සූත්‍රය ගැන දන්නවාද? මොකක්ද මේ මිල සූත්‍රය? මොකක් පදනම් කරගෙනද මේ මිල සූත්‍රය සකස් කරලා තිබෙන්නේ? ඒ ගැන එකම එකයි අපි දන්නේ. ඒ තමයි, හැම මාසයකම 10 වෙනි දා වෙද්දී ඉන්ධන මිල වැඩි වෙන බව. ඒ කාරණාව විතරයි අපි දන්නේ. එහෙම නැතිව ආණ්ඩුවේ කිසිම කෙනෙක් මේ මිල සූත්‍රය ගැන සාකච්ඡාවක් කරලාත් නැහැ, දන්නේත් නැහැ. 10වෙනි දාට තෙල් මිල වැඩිවීම ගැන විතරයි දන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපේ රටේ- [බාධා කිරීමක්] ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඒ තිබෙන මිල සූත්‍රය මේ රටේ මිල සූත්‍ර නොවෙයි. ඒ රටේ මිල සූත්‍රය කාටත් කියවන්න පුළුවන්. මෙහේ තිබෙන්නේ මිල සූත්‍රයක් නොවෙයි. ඒකත් මේ ආණ්ඩුව වාගේ තමයි. ඒ සටහනත් අච්චාරු වූ සටහනක්. ඒ වාගේ අච්චාරු මිල සූත්‍රයක් තමයි මෙහේ තිබෙන්නේ. ඒ නිසා අද වෙනකොට රුපියල අවප්‍රමාණ වෙලා මේ ආර්ථිකයට වන හානිය මේ රටේ ආණ්ඩුවට පාලනය කරගන්න බැරිවෙලා තිබෙනවා. ඒ නිසා තමයි සමස්ත ජනතාවගේ ජීවන වියදම ඉහළ යන්නේ; සෑම අත්‍යවශ්‍ය භාණ්ඩයකම මිල ඉහළ යන්නේ.

අපේ රටේ ආනයනවල ප්‍රමාණය දිගින් දිගටම වැඩි වෙනවා. දැන් වෙළෙඳ ශේෂය ගැන කථා කළා; වෙළෙඳ ශේෂයේ පරතරය ගැන කථා කළා. දැන් මේ රටේ වෙළෙඳ ශේෂයේ පරතරය දිගින් දිගටම පුළුල් වීගෙනයි යන්නේ. විශේෂයෙන්ම 2017 ජූනි මාසය වෙනකොට -පළමුවැනි කාර්තු දෙකේ- වෙළෙඳ ශේෂය ඇමෙරිකානු ඩොලර් මිලියන 554යි. 2018 අවුරුද්දට යද්දී ඒ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 795ක් වෙනවා. ඒ අනුව, වෙළෙඳ ශේෂයේ පරතරය සියයට 43.5කින් වැඩි වෙනවා. එසේ වැඩි වෙන්නේ, අපේ රටේ ආනයනය වැඩි වෙලා, නිෂ්පාදන අපනයන ප්‍රමාණය දිගින් දිගටම අඩු වීම නිසායි. 2017 අවුරුද්ද 2018 අවුරුද්ද සමඟ සන්සන්දනය කරද්දී, 2017 අවුරුද්දේ ඇමෙරිකානු ඩොලර් මිලියන 4,800ක් වූ වෙළෙඳ ශේෂය, 2018 අවුරුද්ද වෙනකොට ඇමෙරිකානු ඩොලර් මිලියන 5,700 දක්වා වැඩි වෙනවා. 2017 සහ 2018 වර්ෂවල පළමුවැනි කාර්තු දෙකේ පමණක් සියයට 43.5කින් වෙළෙඳ ශේෂ පරතරය පුළුල් වෙනවා. සමස්ත අවුරුද්දටම ඇස්තමේන්තුගත වෙළෙඳ ශේෂ පරතරය සියයට 18.75කින් වැඩි වෙනවා. අද මේ විධියට වෙළෙඳ ශේෂ පරතරය වැඩි වෙද්දී, ආනයන ප්‍රමාණය දිගින් දිගටම වැඩි වෙද්දී, අපනයනය කඩාගෙන වැටෙද්දී, ආණ්ඩුවට රුපියලේ අගය පාලනය කර ගන්න බැරි වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව දිගින් දිගටම ප්‍රකාශ කළා, "රුපියල ශක්තිමත් කරගෙන පවත්වාගෙන යන්න පසු ගිය ආණ්ඩුව ඇමෙරිකානු ඩොලර් සංචිත නිකුත් කළා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අද වන විට ඩොලරය රුපියල් 168.6ට ගිහිල්ලා තිබෙනවා. නමුත්, ඩොලරය රුපියල් 160ට තිබියදී තවත් ඉහළ යෑම පාලනය කර ගැනීම සඳහා රජය ඇමෙරිකානු ඩොලර් මිලියන 357ක් සංචිතවලින් නිකුත් කළා. 2018 ජූනි මාසයේ විතරක් ඇමෙරිකානු ඩොලර් මිලියන 137ක් වියදම් කළා; විනාශ කළා. 2018 අගෝස්තු මාසයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 220ක් වෙළෙඳ පොළට නිකුත් කළා; විනාශ කළා. වර්තමාන ආණ්ඩුව අද සමස්ත සංචිත ප්‍රමාණයම ඒ සඳහා පාවිච්චි කරමින් යනවා. ඒත් ආණ්ඩුවට මේ ආර්ථිකය කළමනාකරණය කරගන්න බැරි වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ට අවශ්‍ය විධියට පෞද්ගලික වාසි ලබා දිය යුතු කණ්ඩායම්වලට වාසි ලබා දෙන්න තනි තීන්දු ගන්න ආණ්ඩුවක් නිසා තමයි අද මේ රටේ ආර්ථිකය දවසින් දවස කඩා වැටෙන්නේ.

පුරෝකථනය කරලා තිබෙන ආර්ථික වර්ධන වේගය සියයට 1.5යි. 2014 අවුරුද්දෙන් පසු මහින්ද රාජපක්ෂ ආණ්ඩුව වර්තමාන පාලකයන්ට රට භාර දෙනකොට සියයට 7.7ට තිබුණු ආර්ථික වර්ධන වේගය යහ පාලනයේ නාමයෙන් සියයට 1.5 දක්වා අඩු කරලා තිබෙනවා. කොහොමද ආර්ථිකය ඉස්සරහට යන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල පවත්වාගෙන යෑම සඳහා ආණ්ඩුව මේ විධියට සංචිත නිකුත් කළත්, රටේ මහා භාණ්ඩාගාරය ඒ සඳහා අවශ්‍ය කටයුතු කළත්, ඒත් රුපියල ශක්තිමත් කර ගන්න බැරි නම්, වර්තමාන ආණ්ඩුවට කවදාවත් අපේ රටේ ජීවන වියදම වැඩි වීම නවත්වාගන්න බැහැ. මේ වෙනකොට රුපියල අවප්‍රමාණ වීම හරහා පමණක් රුපියල් බිලියන 1,000කින් අපේ රටේ ණය බර වැඩිවෙලා තිබෙනවා. වර්තමාන ආණ්ඩුව මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරලා කියනවා, ණය ගත්තා කියලා. මේ ආණ්ඩුව කිසිම දෙයක් නොකර නිකම්ම ඉඳලා, ආණ්ඩුවේ වැරදි සහ දුර්වල කළමනාකරණය නිසා එසේ ගත් ණය ප්‍රමාණය වාගේ පහෙන් එකකින් -රුපියල් බිලියන 1,000කින්- මේ රටේ ණය බර වැඩි වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා තමයි අද අපේ රටේ තිබෙන දැවෙන ප්‍රශ්න. මේවා තමයි තිබෙන ප්‍රශ්න.

හැබැයි, රටේ ආර්ථිකය මේ විධියට යන්න ගියොත්, කොතැන නවතීද කියලා අපි දන්නේ නැහැ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය කොතැන නවතීද කියලා අපි දන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමාගෙන් මිනිත්තු 4ක කාලයක් මට ලබා දීලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එම කාලයත් එක්කයි මිනිත්තු 10 ලබා දීලා තිබෙන්නේ.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
නැහැ. එම කාලය නැතුව මට මිනිත්තු 10ක් වෙන් කර තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊට අමතරව මට තව මිනිත්තු 4ක කාලයක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විධියට රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ප්‍රමුඛ එතුමාගේ සමීප මිත්‍රයන් ගන්න තීන්දු තීරණ නිසා තමයි අද මේ රටේ ජනතාවට වන්දි ගෙවන්න සිදු වෙලා තිබෙන්නේ. මහ බැංකුවේ මහා මංකොල්ලයේ ඇස්තමේන්තුගත පාඩුව, ආර්ථිකයට කරපු හානිය රුපියල් ට්‍රිලියනයක් බව මුදල් අමාත්‍යාංශයේ නිටපු ඇමතිතුමාම කිව්වා. මහ බැංකුවෙන් කරපු පාඩුව රුපියල් ට්‍රිලියනයක්. ඊට අමතරව පසුගිය දා ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයෙන් කර තිබුණු ගුවන් යානා ඇණවුම නවත්වන්න ආණ්ඩුව විසින් කටයුතු කළා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ පෞද්ගලික අවශ්‍යතාව මත, එතුමාගේ හිත මිත්‍රයන්ගේ අවශ්‍යතාව මත, ඒ ගත් තනි තීන්දුව නිසා සිදු වෙච්ච මූලික පාඩුව රුපියල් බිලියන 18යි. ඊට අමතරව තව රුපියල් බිලියන 50ක් ගෙවන්න වෙලා තිබෙනවා, සිංගප්පූරුවේ සිදු වන බෙරුම්කරණ - arbitration - ක්‍රියාවලියට. මේ වනකොට ඒ බෙරුම්කරණ ක්‍රියාවලිය සිංගප්පූරුවේ සිදු වෙනවා. හයට හෝටලයේ interior design එක මාරු කරන්න ගිහිල්ලා ඇමෙරිකානු ඩොලර් මිලියන 5ක පාඩුවක් අපේ රටේ සමස්ත ආර්ථිකයට සිදු කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විධියට ගත්තාම ආර්ථිකය කඩා වැටෙන්නේ ලෝක ආර්ථිකයේ තිබෙන ප්‍රවණතාවක් නිසා නොවෙයි. මේ ආර්ථිකය කඩා වැටෙන්නේ, වර්තමාන ආණ්ඩුව හිතුමතේ තමන්ට අවශ්‍ය තීන්දු තීරණ ගන්න නිසා. අහිංසක ජනතාව ගැන හිතන්නේ නැතුව තීන්දු තීරණ ගන්න නිසා.

දැන් හම්බන්තොට වරායා වික්කා; චීනයට දුන්නා. එය විකිණීමේදී නිසි තක්සේරුවක් කරලා නැහැ. 2014 අවුරුද්දේ කරපු තක්සේරුව ගත්තෙත් නැහැ. අලුත් තක්සේරුවක් 2017 අවුරුද්දේ කරලාත් නැහැ. නිවැරදි තක්සේරුවක් කළා නම්, හම්බන්තොට වරායේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 57.1ක් බවට පත් වනවා. කොළඹ වරායේ ඉඩම් බදු දීමේදී ලාෆ් ගෑස් සමාගමත් එක්ක ඇති වෙච්ච ගිවිසුම තිබෙනවා. ඒ අවුරුද්දකට හෙක්ටෙයාර් එකකට ඇමෙරිකානු ඩොලර් 50,000ක්. හැබැයි, හම්බන්තොට වරායේ හෙක්ටෙයාර් 1,143ම නියමිත වටිනාකමට තක්සේරු කළා නම්, ලැබිය යුතු මුදල වෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 57.1යි. හැබැයි, කීයටද වරාය දුන්නේ? වරායේ ණයවලින් තුනෙන් එකක් ගෙවලා තිබෙද්දිත් වරාය ලබා දෙනවා ඇමෙරිකානු ඩොලර් මිලියන 947කට. බිලියන 57.1කට තක්සේරු වන වරායක් ලබා දෙනවා, බිලියන 1කට. පොඩ්ඩක් කල්පනා කරන්න. ආර්ථිකය කඩා වැටෙන්නේ නැද්ද? ආර්ථිකය ඉදිරි ගමනක් යයිද? මේ කිසිම දෙයක් සිදු වෙන්නේ, නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා එකම විකල්පය මේ ආණ්ඩුව මාරු වෙලා අලුත් ආණ්ඩුවක් නිර්මාණය වීම විතරයි. ඒ සඳහා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් මැතිවරණයක් ලබා දෙන්න ඕනෑ. මැතිවරණයක් ලබා දෙන්නේ නැතුව, තමන්ගේ ආණ්ඩුව පවත්වාගෙන යන්න බැරි ලෙස තමන්ට අභියෝගයක් වන කණ්ඩායම් ඝාතනය කරන්න කුමන්ත්‍රණය කරලා හරියන්නේ නැහැ.

පොලිස්පතිතුමා සම්බන්ධයෙන් තිබෙන චෝදනාව අපි දැක්කා. පොලිස්පතිතුමාට අයින් වෙන්න කියලා ජනාධිපතිතුමායි, අගමැතිතුමායි උපදෙස් ලබා දී තිබෙනවා කියලා මාධ්‍යවල වාර්තා වෙනවා. හැබැයි, නලින් බණ්ඩාර ජයමහ නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, "නැහැ. අගමැතිතුමා නම් එහෙම උපදෙසක් ලබා දීලා නැහැ" කියලා. එතකොට මේ අගමැතිතුමා මොකක්ද කරන්නේ? එතුමා අගමැතිතුමාව පුම්බන්න, ඒ සැලැස්ම හදපු පූජිත ජයසුන්දර පොලිස්පතිතුමාව ආරක්ෂා කරනවා. දැන් ඔබතුමන්ලා කල්පනා කරන්න, රටේ ආරක්ෂාවට ඇති වන තත්ත්වය. ඔය විධියටම මහ බැංකුවේ නිටපු අධිපතිතුමාව ආරක්ෂා කළා. අද සිදු වෙලා තිබෙන පාඩුව බලන්න. කුමන්ත්‍රණ කරලා, ජනතාව පීඩාවට පත් කරලා, ජනතාවට ඡන්ද අයිතිය ලබා දෙන්නේ නැතිව කටයුතු කළාම මේ වාගේ ව්‍යසනයක් රටකට ඇති වීම නවත්වන්න කාටවත් හැකියාවක් නැහැ. ඒ නිසා ආර්ථික වශයෙන් අපි ඉතාම බරපතළ, අවදානම් තත්ත්වයකයි ඉන්නේ.

මූඩීස් ආයතනය කියනවා, ලෝකයේ වැඩිම අවදානම් සහගත මුදල් ඒකකය ලංකාවේ මුදල් ඒකකයයි කියලා. අපි තවදුරටත් ණය මත රැඳීම නිසා අපේ රටේ ආර්ථිකය කඩා වැටෙනවා කියලා ඔවුන් කියනවා. අපේ රටට ආයෝජකයෝ එන්නේ නැහැ. අද වනතුරුත්, යහ පාලන ආණ්ඩුව ලැයිස්තු පිටින් පෙන්වන්නේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යටතේ පැමිණි ආයෝජන. අලුත් එක ආයෝජනයක් ගෙනෙන්න වර්තමාන ආණ්ඩුවට පුළුවන් වෙලා නැහැ. මොකද, ආයෝජකයෝ එන්නේ නැහැ. මේ රටේ ආර්ථිකය අවදානම්. අපේ රට අවදානම් සහගත ආර්ථිකයක් සහිත රටවල් 12 තුළට ඇතුළත් වෙලා තිබෙනවා. දේශපාලන වශයෙන් අපේ රට අස්ථාවරයි; පාර්ලිමේන්තුව අස්ථාවරයි; ජනාධිපතිතුමා, අගමැතිතුමා අතර ගැටුම්; පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර 15ක් දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි තත්ත්වයක් තුළ කිසිසේත්ම රටක් ඉදිරියට යන්නේ නැහැ. රට කඩා වැටීම පමණයි සිදු වෙන්නේ. ඒ නිසා මේ වාගේ අවදානම් සහගත තැනකට මේ රට තල්ලු කරගෙන ගිහිල්ලා ආණ්ඩුවේ වගකිව යුත්තන් නිහඬව බලා සිටීම ගැන අපි කනගාටු වෙනවා. ඒ වාගේම තමන්ට දේශපාලන අභියෝගයක් වෙන විරුද්ධවාදීන් දඩයම් කරලා මේ රටේ ආර්ථිකය හදන්න බැහැ කියන කාරණයත් ආණ්ඩුවට මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.59]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ආර්ථිකය තිබෙන තත්ත්වය ගැන වචනයක් කථා කරන්න මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා. මීට පෙර ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණු අනුවම මගේ කථාව පටන් ගන්න මම කැමැතියි.

2015 ජනවාරි මාසයේ 08 වැනි දා ඔබතුමන්ලා අපට දුන්නේ සුන්දර ආර්ථිකයක් නම් නොවෙයි කියන එක අපට මතකයි. දණ ගස්වපු, වට්ටපු, අමාරු ආර්ථිකයක් අපට භාර දුන්නේ. නමුත් ඔබතුමා කිව්වා වාගේ දින සියයේ වැඩසටහන තුළින් අපට පෙන්වා දෙන්න පුළුවන් වුණා, ලෝකයේ කොතරම් ආර්ථික අර්බුද තිබුණත්, කොතරම් ආර්ථික අර්බුදවල අපව පටලා දැමුවත්, අවශ්‍යතාව තිබෙනවා නම්, එම වැඩ කටයුතු ස්ථිරව කරන්න හැකියාව තිබෙනවා කියන එක. ඒක තමයි සේමසිංහ මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය තුළින් උපුටා දැක්වූයේ. එතුමා කළ අභියෝගය අනුව අද එවැනි තත්ත්වයක් ඇති නොවේවා කියලා කියන ගමන්ම, මම ඒ අවස්ථාවේ සිටියා නම් අවශ්‍ය ආකාරයෙන් ක්‍රියා කරනවා කියන එකත් මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

අපට භාර දුන්නේ සම්පූර්ණයෙන්ම කඩා වැටුණු ආර්ථිකයක් පමණක් නොවෙයි, ණයබර ආර්ථිකයක් තමයි අපට භාර දුන්නේ. ඒ ගැන මෙතැනදී තර්ක-විතර්ක කරලා මෙහි තිබෙන වටිනාකම නැති කරන එක නොවෙයි අවශ්‍ය වන්නේ. අද ලංකාවට ප්‍රශ්නයක් තිබෙනවා. මේ, අපේ ආර්ථිකය. මේක නිල් පාට, රතු පාට, කොළ පාට ආර්ථිකයක් නොවෙයි. මේක ශ්‍රී ලංකා ජනතාවගේ ආර්ථිකය. යුද්ධයකින් අපේ රට බැට කෑවා. ඒක ඉවර වුණාට පසුව අපේ රටේ ආර්ථිකය හදන්න පටන් ගැනීමේ අවශ්‍යතාවයි තිබුණේ. ඒ සඳහා තමයි 2015 ජනවාරි මාසයේ 08 වැනි දා අපේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනටත්, අපේ අගමැති රනිල් වික්‍රමසිංහටත් මේ රට භාර දුන්නේ. අලුත් රටක්; අලුත් ආර්ථියක් හදන්න ඕනෑය කියලා, ඒ හදන ආර්ථිකය මේක නොවෙයි කියන එකත් අපි මතක් කරන්න අවශ්‍යයි.

මම හිතන විධියට මේ ආර්ථිකය හදන්න බැරි කමක් නැහැ. ආර්ථිකය හදන්න ඕනෑ කොයි ආකාරයෙන්ද කියන එකයි තිබෙන ගැටලුව. අද ලෝක ආර්ථිකයේත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒක හංගන්න බැහැ. ලෝක ආර්ථිකයේත් ප්‍රශ්න තිබෙනවා නම්, රටක ආණ්ඩුවක් තුළින් ඒ රටේ ආර්ථිකය පිළිසකර කරන්න අවශ්‍ය වන්නේ කොයි ආකාරයකින්ද, ඒකට පිළිතුරු දෙන්න අවශ්‍ය වන්නේ කොහොමද කියා සොයා බලන්න ඕනෑ. එහෙම නැතිව ලෝක ආර්ථිකයේ ප්‍රශ්න තිබෙනවා කියලා රටක ආර්ථිකය ඒ විධියටම යන්න දෙනවා නම් අපට ආණ්ඩුවක් අවශ්‍ය නැහැ; අපට මහ බැංකුවක් අවශ්‍ය නැහැ. මෙන්න මේක තමයි තිබෙන ප්‍රශ්නය.

අද මුදල් අමාත්‍යාංශයට මූලිකව තිබෙන ප්‍රශ්නය තමයි, 2000 වසරේ දීත් රටේ ආර්ථිකය ඍණ අගයකට ගෙන ගිය එම ආර්ථික ඔස්තාර්ලා තමයි දැන් දුවන්න පටන් ගෙන තිබෙන්නේ. වෙන කවුරුත් නොවෙයි, චන්ද්‍රිකා කුමාරතුංගගේ කාලයේ ඉඳලා මේ ආර්ථිකය ඍණ ආර්ථිකයක් කරපු කට්ටිය තමයි අද ආර්ථිකය ග්‍රහණයට ලක් කරලා තිබෙන්නේ. මේක තමයි තිබෙන ප්‍රශ්නය. 2017දී අපි යම් තීන්දුවකට ආවා. කමක් නැහැ, ජනාධිපති සහ අගමැති කියන දෙයට අනුව අපි ස්වකැමැත්තෙන් වෙනස් වුණා. නමුත් ඉන් පසුව එක දවසක් හෝ අපි ආර්ථිකය සම්බන්ධයෙන් කොයි ආකාරයෙන්ද කටයුතු කළේ කියන එක ගැන මුදල් අමාත්‍යාංශය සාකච්ඡා කර තිබෙනවාද? නැහැ. අද මේක වෙනත් ආකාරයකට ගෙන ගොස් තිබෙනවා. අපි හදපු ආණ්ඩුවක, අපි එහි ත්‍රස්තවාදියෝ වාගේ සලකන යුගයකට ගෙන ගොස් තිබෙනවා. අද මේ කටයුතු කරගෙන යන කොට, මේ වැටිච්ච ආර්ථිකය අපි කොයි ආකාරයෙන්ද හදන්නේ කියන එක තමයි මෙතැන කථා කරන්න අවශ්‍ය වන්නේ. අපි මෙතැනදී විපක්ෂයට බණින එක හෝ විපක්ෂයෙන් ආණ්ඩුවට බණින එක නොවෙයි කළ යුත්තේ. මේක මතක තබා ගන්න. අපි වේදිකා ගණනේ ගිහිල්ලා ජනතාව වෙනුවෙන් කථා කරන්නේ, "ඔබට අදට වඩා හොඳ ආර්ථිකයක් හෙට හදනවා"යි කියලායි. අන්න ඒක තමයි මෙතැන තිබෙන්නේ.

දැන් බලන්න සීනි මිල. ලෝකයේ සීනි මිල මාර්තු මාසය වෙන කොට මෙට්‍රික් ටොන් එකක් ඩොලර් 350යි. අද මෙට්‍රික් ටොන් එකක් ඩොලර් 320යි. නමුත්, මෙහේ සීනි කිලෝවක් රුපියල් 15කින් මිල වැඩි වෙනවා. ඇයි, ඒ? අපි එදා 2015 ජනවාරි මාසයේ දී මේ රට භාර ගත් අවස්ථාවේ තිබුණු ආර්ථිකය අපට මතකයි. අපි පෙට්‍රල් මිල, ඩීසල් මිල, ගෑස් මිල, සීනි මිල, කිරිපිටි මිල අඩු කළා. එවකට තිබුණු විශ්‍රාමිකයන්ගේ ප්‍රශ්න විසඳුවා; අභිංසක රජයේ සේවකයන්ට රුපියල් 10,000ක වැටුප් වැඩි කිරීමක් කළා. මේ ඔක්කෝම කළේ, දින සියයේ වැඩසටහන යටතේ.

මේ විධියට ඒ දේවල් වැඩි කරලා වැය බරක් ඇති කරන එක නොවෙයි අපි කළේ. වැයත් වැඩි කළා. ඒකෙන් ලැබෙන අය අගයත් අපි එකතු කර ගත්තා. මේක තමයි තිබෙන වෙනස. ඒ විධියට සීනි මිල පිළිබඳ ප්‍රශ්නයටත් අද අපි උත්තර හොයන්න ඕනෑ.

ඊළඟ කාරණය තමයි, අපේ රුපියල අවප්‍රමාණය වීම. මහ බැංකුව රුපියලේ අගය පාවෙන්න ඉඩ හැර තිබෙනවා. මේ කථා කරන මොහොත වන විට ඩොලරයක් රුපියල් 168.87යි. නමුත් HNB එක ඩොලරයට රුපියල් 172.72ක් ගෙවනවා. ලංකා බැංකුව ඩොලරයට රුපියල් 171.28ක් ගෙවනවා. මේක තමයි speculation කියන්නේ. ඒක තමයි මහ බංකුවෙන් කරන්න ඕනෑ. මම එදා මේ සම්බන්ධයෙන් මතක් කළා. අපි ජනතාවගේ ඡන්දයෙන් පත් වෙලා එන පුද්ගලයන්. ඒ අයට තිබෙන ප්‍රශ්නය මොකක්ද කියා අපි දන්නවා. මහ බැංකුවට මූල්‍ය ප්‍රතිපත්තිය භාර දීලා, ඒ තුළින් ඒ අය රට පාලනය කරන්න හදනවා. අභිංසක ජනාධිපතිතුමාටත්, අපේ අගමැතිතුමාටත් නොදැනුවත්ව ක්‍රියා කරන එක තමයි මහ බැංකුව කරන්නේ. මේක තමයි තිබෙන ප්‍රශ්නය. එහෙම නම්, කවුද මේ ග්‍රහණයට ලක් කර තිබෙන්නේ? 2000 වර්ෂයේ මේ රට ඍණ ආර්ථිකයට අරගෙන ගිය කට්ටිය තමයි මේක පාලනය කරන්නේ කියන එකයි මට දැකෙන් වුණත් කියන්න තිබෙන්නේ.

හිටපු මුදල් ඇමතිවරයා වශයෙන් මගෙන් එක දවසක්වත් මුදල් අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් අහලා තිබෙනවාද? මම මේ කථා කරන්නේ යම් විධියකින් හිතේ බරක් නියාගෙනයි. මේ ආණ්ඩුව හදපු අපට, මේ ආණ්ඩුවම අසත්‍ය චෝදනා එල්ල කරලා නඩු දමන්න හදනවා. මොන වාගේ ආණ්ඩුවක්ද මේ? මේකද යහ පාලනය කියන්නේ? මේ කියන වචනයක්, වචනයක් පාසා අපට

ඔප්පු කරන්න පුළුවන් නිසා තමයි මේ ගැන කථා කරන්නේ. මට තිබෙන දුක, අපි අමාරුවෙන් හදපු ආර්ථිකය මහ බැංකුවේ ඉන්න ඔස්තාර්ලා ටිකකට ලෙහෙසියෙන් නැති කරන්න ඉඩ දෙන එකයි. පෞද්ගලික කොම්පැනිවලට එදා දෙන්න බැහැය කියපු අය, ආණ්ඩු වෙනස් වුණාට පස්සේ ඒ ගොල්ලන්ටම ඒවා බෙදා ගන්න හදනවා. මෙන්න මේක තමයි තිබෙන ප්‍රශ්නය.

මහ බැංකුවේ සිටින නන්දලාල් වීරසිංහලා වැනි අය අද රුපියල් 350,000ක් දක්වා මාසික පඩිය වැඩි කරගෙන තිබෙනවා. රජයේ අභිංසක සේවකයන් තමන්ගේ පඩිය රුපියල් 5,000කින් වැඩි කරන්න කිව්වාම බැහැය කියන අය, අද මහ බැංකුවේ වැඩ කරන්නේ නැති තත්ත්වයට පත් වෙලා ඉන්නවා. දෙන්නෙක්, තුන්දෙනෙක්, දහදෙනෙක්, පහළොස් දෙනෙක්, විසිදෙනෙක් තමන්ගේ පඩි වැඩි කර ගනිද්දි, සාමාන්‍ය රජයේ සේවකයන්ට සාධාරණය ඉෂ්ට නොවෙනවා නම්, එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඉහළ අයගේ පඩි වැඩි කරලා, "Yes, Sir." කියාගෙන ඉන්න එක නොවෙයි, මහ බැංකුවෙන් වෙන්න ඕනෑ.

අපේ රුපියල ශක්තිමත් කරන්නේ කොහොමද කියන එකයි අපි බලන්න ඕනෑ. මේක ලෙහෙසි කාර්ය භාරයක් නොවෙයි. එතැන පුද්ගලයන් වෙනස් කළාට මේක කරන්න පුළුවන්ය කියා හිතන්න එපා. අපිට ලැහැස්ති වෙන්න තිබුණා. 2018දී, 2019දී ඇමෙරිකාවේ ආර්ථිකය කොහොමද කියලා ට්‍රම්ප් කථා කරන්න පටන් ගත්තා. එතුමා ඒ වෙනුවෙන් ආර්ථිකය ශක්තිමත් කිරීම තමයි කරන්න පටන් ගත්තේ. ඇමෙරිකාවේ ආර්ථිකය ශක්තිමත් වෙනකොට ලංකාවේ ආර්ථිකයට ඉබේම ප්‍රශ්නයක් ඇති වෙනවා. 2017දී අපට ණය ගැනීමේ හැකියාව තිබුණා, US Dollars-

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු මන්ත්‍රීතුමනි, කාරණයක් කියන්න මට අවස්ථාවක් දෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කියන්න, ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමනි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
හිටපු මුදල් ඇමතිතුමනි, අසත්‍ය චෝදනා යටතේ ඔබතුමාට නඩු ගොනු කරන්න උත්සාහ කරනවාය කියා ඔබතුමා කියනවා. එතකොට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ඉරණම මොකක්ද කියා ඔබතුමා කල්පනා කරන්න. ඔබතුමා කියන කාරණාවත්, අපි කියන කාරණාවත් දෙකම අද එකම කාරණාවක් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබේ පවිත් මම කරගහන්නම්. ඒකයි වෙලා තිබෙන්නේ. අවුරුදු තුනක් ගිහිල්ලාත් ඔබතුමන්ලාට case මොකුත් නැහැ නේ. අපට විතරයි නඩු දමන්න හදන්නේ. ඒකට කමක් නැහැ. අපේ ළඟ බොරු නැති නිසා තමයි බය නැතුව මෙහෙම කථා කරන්න පුළුවන් හැකියාව තිබෙන්නේ. එවැනි දේවල් කළ අය තමයි මේවාට වන්දි ගෙවිය යුත්තේ.

මේ දේවල් සඳහා සූදානම් විය යුතුයි කියා අපි මහ බැංකුවට කිව්වා. ගිය අවුරුද්දේ අපට LIBOR plus 1.23කට විතර ණය ගන්න තිබුණා. නමුත් ඒ අවස්ථාව ගිලිහී ගිහින් අද එය සියයට 2.8ත්, සියයට 3ත් අතර ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. මෙවැනි ඉහළ මට්ටමකින් ණය ගන්න තිබෙන එක තමයි අද තිබෙන ප්‍රශ්නය. එදා අපි liability management කියලා කථා කළා. නොදැනුවත්කම නිසා දැනුවත් කට්ටිය අමාරුවෙන් පිට රටින් ගෙන්වා ගෙන ඒ සම්බන්ධයෙන් කටයුතු කළා. නමුත් ඒකෙන් සත පහක් ගත්තේ නැහැ. අද ට්‍රම්ප්ට බැණලා වැඩක් නැහැ. ට්‍රම්ප් පත් වෙලා ඉන්නේ ඇමෙරිකාවේ ආර්ථිකය හදන්නයි. ඔහු ලංකාව ගැන හිතනවා යැ? ඒ අවස්ථාවේදී අපිට සූදානම් වෙන්න තිබුණා. ඒ ගත් ණය ගෙවන්නයි අපට තිබුණේ. අපි ණය ගත්තේ නැහැ. ඔබතුමන්ලා තමයි ඒ ණය ගත්තේ. නමුත්, දැන් බැණලා වැඩක් නැහැ. 1994දී එක්සත් ජාතික පක්ෂය රට භාරදෙන කොට සම්පූර්ණ ණය ප්‍රමාණය මිලියන 784යි. නමුත්, 2005 වසර වන විට එය මිලියන 1,784 දක්වා වැඩි වුණා.

අපි ආණ්ඩුව භාර ගන්නකොට ඒ ප්‍රමාණය 10,800ක් දක්වා වැඩි වෙලා තිබුණා. මේ ණය ප්‍රමාණය ඔබතුමන්ලා ගත්තාද, අපි ගත්තාද කියන එක නොවෙයි බලන්න ඕනෑ. ජනතාව වෙනුවෙන් සටන් කරලා අපේ රුපියල ශක්තිමත් කිරීමයි අප කළ යුත්තේ. මහ බැංකුව ඊයේ එක පාරට කියනවා, අනවශ්‍ය ආනයනවලට සියයට සියයක් බදු පනවනවාය කියා. මීට ඉස්සර වෙලා ඒක නොකළේ ඇයි? ඒක තමයි කරන්න තිබුණේ. මම මුදල් ඇමතිවරයා වශයෙන් කටයුතු කරනකොට යම් දේවල් සම්බන්ධයෙන් Loan-To-Value - LTV - ratio එක සියයට 80 දක්වා වැඩි කළා. නමුත්, අලුතින් වෙන කෙනෙක් පත්වුණු ගමන් අපි කරපු ඒ දේවල් වෙනස් කරන්න පටන් ගත්තා. එහි ප්‍රතිවිපාකය තමයි දැන් පෙනෙන්න තිබෙන්නේ. රටේ ආර්ථිකය මේ විධියට තල්ලු කරලා, ඊට පස්සේ ලෝක ආර්ථිකයට බණින්න පටන් ගන්නවා. එම නිසා මම මේ අවස්ථාවේදී කියන්නේ, අපි සියලුදෙනාම එකතු වෙලා අපේ ආර්ථිකය හදන්න ඕනෑය කියන එකයි. ඒක තමයි අත්‍යවශ්‍යම දෙය වන්නේ. මේ කටයුත්ත ලෙහෙසි කාර්ය භාරයක් නොවෙයි. නමුත්, එය කරන්න අවශ්‍යයි.

අපි එදා ගෑස් මිල අඩු කළේ කොහොමද? ඩීසල් මිල අඩු කළේ කොහොමද? Pension එක වැඩි කළේ කොහොමද? අපි එදා රජයේ සේවකයන්ට රුපියල් 10,000ක දීමනාවක් ගෙවීම නිසා රාජ්‍ය වියදම බිලියන 173කට වැඩි වුණා. අපි ඒවා ගෙව්වේ ආදායම එකතු කරලායි. මෙන්න මේ ප්‍රතිපත්තිය තමයි අපි ඉදිරියට ගෙනියන්න අවශ්‍ය වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප මේ අවස්ථාවේදී උපයෝගි කර ගන්න අවශ්‍ය වන්නේ අලුත්, නිර්මාණශීලි වැඩ පිළිවෙළක්. ඒ වැඩ පිළිවෙළ තුළින් තමයි අපි කටයුතු කළ යුත්තේ. අභිංසක ජනතාව බලාගෙන සිටින්නේ ලෝකයේ මිල ගණන් වැඩි වෙන ආකාරය දෙස නොවෙයි. ලංකාවේ භාණ්ඩවල මිල අඩු කරන්නේ, මිල පාලනය කරන්නේ කොහොමද කියන එක ගැනයි ඔවුන් බලාගෙන ඉන්නේ. අපට හැම දවසේම මේ සඳහා කටයුතු කරන්න බැරි වෙනවා. නමුත්, තෙල් මිල දෙස බලන්න. මම මුදල් අමාත්‍යාංශයේ කටයුතු කරනකොට මිල සූත්‍රය අනුව තෙල් මිල වැඩි කරන්නේ නැතිව අවුරුදු එකහමාරක් තිස්සේ එය රැකගෙන හිටියා. ඇයි ඒ? මේක ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දෙන එකක්. "මිල සූත්‍රය අනුව මාස හයකට වතාවක් සංශෝධන කරන්නම්" කියා අපි කිව්වේ නැහැ. තෙල් මිල වැඩි වෙන මාසයේ වැඩි වුණු ප්‍රමාණය suspense account එකට දමනවා, මිල අඩු වෙනකොටත් එහෙම කරලා මාස හයකට පස්සේ ප්‍රශ්නයක් ඇති වෙනවා නම්, එය උපයෝගි කර ගෙන මිල වැඩි කිරීමක් තමයි කරන්න අවශ්‍ය වන්නේ කියන එක එදා අපි කිව්වා.

ඒ විධියට කළා නම් මේ වාගේ බලපෑමක් ඇති වෙන්නේ නැහැයි කියා මම විශ්වාස කරනවා. එම නිසා අපි දැන් වුණත් ඉදිරියට ඒ ආකාරයට කටයුතු කරන්න අවශ්‍යයි. මේ

[ගරු රවි කරුණානායක මහතා]

සම්බන්ධයෙන් කොහොමද අපි පොලී අනුපාතය අඩු කරන්නේ? දැන් උද්ධමනය අඩු වෙනවා කියා සද්ද කළාට, සියයට 5.9ක උද්ධමනයක් තිබෙනවා. උද්ධමනය අඩු වෙනවා නම්, පොලී අනුපාතය අඩු කරන්න පුළුවන්. හැම රුපියලක්ම අවප්‍රමාණය වීම නිසා අපේ අය වැයට රුපියල් බිලියන 40ක වෙනසක් ඇති කරනවා. රුපියල් බිලියන 40ක් කියන්නේ, කෝටි 4,000ක්. මෙන්න මේක තමයි තිබෙන ප්‍රශ්නය වන්නේ. මේ වැඩි වෙලා තිබෙන රුපියල් 10 තුළින් අද අය වැයට වියදම් කරන්න පුළුවන් හැකියාව රුපියල් මිලියන 1,000කින් අඩු වෙනවා. මෙන්න මේ වෙනස තමයි අපි නැති කරන්න ඕනෑ. ඒ නිසා මම හිතන විධියට අපට රුපියල ශක්තිමත් කරන්න පුළුවන් වන්නේ,- දැන් බලන්න, මැලේසියාවේ මහතීර් මොහොමඩ් අගමැතිතුමා ආණ්ඩුවට එන විට මැලේසියාවේ ආර්ථිකය යම් ප්‍රශ්නයකයි තිබුණේ. නමුත්, එය හදන්න බැරි ආර්ථික ප්‍රශ්නයක් නොවෙයි. එතුමා මැලේසියාවේ ආර්ථිකය පුළුවන් තරම් යහපත් අතට ගන්න කටයුතු කළා. ඒකෙන් අද අවප්‍රමාණය වෙලා තිබෙන්නේ සියයට 2යි. මෙන්න මේක තමයි තිබෙන වෙනස වන්නේ. ඒ නිසා අපට අවශ්‍ය වන්නේ ජනතාවට ඔබින මට්ටමකට, අලුතින් හිතන්න පුළුවන් විධියකට ඉදිරියට ගෙන යන්නයි. ඒ තුළින් වැඩ ගණනාවක් වෙනවා. නමුත්, රජයේ නිලධාරීන් ක්‍රියා කරන ආකාර දෙකක් තිබෙනවා. එක්කෝ, දේශපාලන තීන්දුවක් ගන්න ඕනෑ. නැත්නම්, රජයේ නිලධාරීන්ට බාර දෙන්න ඕනෑ. රජයේ නිලධාරීන්ට බාර දෙනවා නම්, ඔවුන් යම් කාල වකවානුවක් තුළ මෙන්න මේකයි මෙහි සාර්ථකත්වය කියා ඔප්පු කර පෙන්වන්න අවශ්‍යයි. නැත්නම් වෙන්නේ, සාර්ථකත්වය වෙනුවට ඒ ගොල්ලන් හැමදේම දේශපාලනඥයන්ගේ ගොඩට දමන එකයි. ඔන්න ඔතැනින් තමයි ප්‍රශ්නය ඇති වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය ගත්ත එක ගැන දැන් කථා කරනවා. හුඟාක් ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ විපක්ෂය කරපු දේවල්වලිනුයි. යම් විධියකින් ආදායමක් උපයන්න බැරි ණයවලට වියදම් කර, ඒ ණය තමයි අපේ ඇහට දමන්න පටන් අරගෙන තිබෙන්නේ. නමුත්, රජයක් වශයෙන් අපට කියන්න බැහැ, ඒකෙන් ආදායමක් ලැබෙන්නේ නැහැයි කියා. ඒ ආදායමත් වියදමත් අතර සරිලන විධියකට ඒක වාණිජකරණය කරන එක තමයි අවශ්‍ය වන්නේ. නැත්නම් අපට කිසිසේත්ම අවශ්‍යතාවක් නැහැ තිබෙන වත්කම් ටික විකුණන්න. වරායකට මිලියන 100ක් අවුරුද්දකට ලැබෙනවා නම්, අපි ඒකට පොලී අනුපාතය වශයෙන් බිලියන 12.5ක් අවුරුද්දකට ගෙවනවා නම්, එවැනි වත්කම් ටිකක් ඉදිරියට ගෙනියන එකේ කිසිම වටිනාකමක් නැහැ. හැබැයි, අද මේ කර තිබෙන වාණිජකරණය තුළින් හම්බන්තොට වරාය ආදායම් උපයන්න පටන් අරගෙන තිබෙනවා. ඒ බර දැන් තිබෙන්නේ වෙනත් පෞද්ගලික කොම්පැනියකටයි. හැබැයි, අයිතිය තිබෙන්නේ අපටයි. මෙන්න මේ වාගේ දේවල් තමයි ගුවන් තොටුපොළවල්වලිනුත් කරන්න අවශ්‍ය වන්නේ. නිකරුණේ සල්ලි හැදෙන ඒවා නොවෙයි දෙන්න අවශ්‍ය වන්නේ. ණය ගෙවන්න බැරි ආයතන ආදායමක් උපයන්න පුළුවන් මාර්ගයට වෙනස් කරන්න පුළුවන් නම්, අන්න ඒක තමයි තිබෙන සාර්ථකත්වය කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

රුපියල පාවෙන නිසා ප්‍රශ්නයක් ඇති වෙනවා කියා විපක්ෂය කිසිසේත්ම තාවකාලික තෘප්තියක් ලබා ගන්න අවශ්‍ය නැහැ. නමුත්, මේ ප්‍රශ්නය තුළින් අපට අවශ්‍ය වෙන්නේ පුංචි ලංකාවේ අපනයනය කරන්න පුළුවන් ස්වරූපය ඇති කරන එකයි. මේ අපනයනය කරන ස්වරූපය තමයි අපේ රටේ වෙනසක් ඇති කරන්නේ. නමුත්, රටක සියයට 69ක් ආනයනය කරනකොට, ඒකෙන් සියයට 35ක් අපනයනය කරන එක තුළින් රුපියල නිකරුණේ අවප්‍රමාණය කිරීමෙන් කිසිම වාසියක් ලැබෙන්නේ නැති එක තමයි තිබෙන ප්‍රශ්නය වන්නේ. නමුත්, මහ බැංකුව මේක පිළිගන්නේ නැති විධියට තමයි කටයුතු කර තිබෙන්නේ. ඒ නිසා අපි නැවත අලුතින් හිතන්න පුළුවන් විධියකට ප්‍රතිපත්ති වෙනස් කරන්න අවශ්‍යයි. අපනයනය තමයි අත්‍යවශ්‍ය දේ. මගේ දේශපාලනයේ ගුරුවරයා වන ගරු ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා කියපු දෙයක් තමයි, "export or perish" කියන එක. අපනයනය කිරීම තුළින් තමයි සාර්ථකත්වය ඇති වන්නේ. මේකෙන් තමයි ඉදිරියට යන්න පුළුවන් ද, බැරි ද කියන එක තීරණය වෙන්නේ. අපනයනය වැඩි වෙනකොට නිෂ්පාදනය වැඩි වෙනවා. නිෂ්පාදනය වැඩි වෙනකොට රැකීරක්ෂා ඇති වෙනවා. රැකීරක්ෂා ඇති වෙනකොට මේ රටේ අපනයනය වැඩි වෙලා, ඒ තුළින් ගෙවුම් ශේෂයට බර අඩු වෙනවා. මේ තුළින් තමයි අපේ ආර්ථිකය ඉදිරියට ගෙනියන්න පුළුවන් වන්නේ. එම නිසා අපේ තිබෙන දේශපාලන භේද හින්න පැත්තකින් තියලා, රටේ ආර්ථිකය හදන්න පුළුවන් මාර්ගයක් ඇති කරන එක තමයි කළ යුතුව තිබෙන්නේ. අද ජනතාව බලාගෙන සිටියදීම සියලුම දේශපාලන පක්ෂ එක වාගේ බොරු කරන පක්ෂ බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මේකයි සැබෑ තත්ත්වය වන්නේ. ඒ දේශපාලන පක්ෂය නිල් වෙන්න පුළුවන්, කොළ වෙන්න පුළුවන්, රතු වෙන්න පුළුවන්, වෙනින් පක්ෂ දෙකක් මිශ්‍ර වෙලා එකතු වෙච්ච පක්ෂයක් වෙන්න පුළුවන්. නමුත්, ඒක නොවෙයි කළ යුතුව තිබෙන්නේ. ඉන්දියාව ඉදිරියට යනවා නම්, පුංචි මාලදිවයින ඉදිරියට යනවා නම්, බංග්ලාදේශය ඉදිරියට යනවා නම්, අසල්වැසි ඉන්දුනීසියාව, මැලේසියාව ඉදිරියට යනවා නම්, දේශපාලනීකරණයෙන් ලංකාවට විතරක් මේ ප්‍රශ්නය ඇති වන්නේ ඇයි කියන එක ගැන තමයි කල්පනා කළ යුතු වන්නේ. අපි දේශපාලනය කළා ඇති. දැන් අපට අවශ්‍ය වන්නේ ජනතාව මුල් කොටගෙන ඒ ප්‍රතිපත්ති ඇති කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඉදිරියට ගෙන යන්නයි.

මේ මොහොතේ මහ බැංකුවට පුළුවන් HNB බැංකුවට කියන්න, අද ඩොලර් එක රුපියල් 168.75යි නම්, එහෙම නම් ඔබතුමන්ලා රුපියලයි සත පනහක් තියාගෙන කටයුතු කරන්න කියා. HNB එක ඉදිරිපත් කරලා තිබෙන පත්‍රිකාවේ තිබෙනවා, forward contract එක ඩොලරයට රුපියල් 172.73ක් බව. ලංකා බැංකුවේ තිබෙන්නේ ඩොලරයට රුපියල් 171.73යි. මෙන්න මේක තමයි තිබෙන වෙනස. අපේ රජයේ බැංකු එහෙම අනුගමනය කරනවා නම්, පෞද්ගලික බැංකු ඊටත් වඩා ඉදිරියෙන් කටයුතු කරන්න අවශ්‍යතාව තිබෙන්නේ කොහොමද? මහ බැංකුවේ ඉදිරි දැක්මක් නැති වැඩ පිළිවෙළක් ගෙන යන එක තමයි මෙයින් පෙන්වන්නේ. මම දැක්කා, ලෝක ආර්ථිකයේ ඇති වෙලා තිබෙන දේ නිසා අපිත් සුළි සුළඟට එකතු වෙලා තිබෙන කොළ කැල්ලක් වාගේ පා වෙනවා කියා ප්‍රකාශයක් කරලා තිබෙන ආකාරය. එහෙම වෙනවා නම් අපට ආණ්ඩුවක් අවශ්‍ය නැහැ, අපට මහ බැංකුවක් අවශ්‍ය නැහැ. මෙන්න මේක තමයි තිබෙන වෙනස. එදා මේක වුණේ නැහැ. හැබැයි, ඒක වෙන්න ඒ ගොල්ලන් ඉඩ දුන්නා. ඒක අපි තරණය කර, යම් විධියකින් සටන් කර ඒ තත්ත්වයට ගෙනෙන්න පුළුවන් වුණා. යම් විධියකින් ඉදිරි දැක්මක් සහිතව ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් අත්වැල් බැඳගෙන ඒ ප්‍රශ්නයට සටන් කරන්න පුළුවන් හැකියාව ඇති කරලා දෙන එකයි කළ යුතු වන්නේ. අපි සියලු දෙනාම අලුතින් හිතලා කටයුතු කළ යුතු අවස්ථාව තමයි දැන් ඇවිල්ලා තිබෙන්නේ. නැත්නම්, නිකරුණේ අපේ මුදල් ඇමතිතුමාට බැණලා වැඩක් නැහැ. එතැන දැන් රාජ්‍ය ඇමති කෙනෙක් ඉන්නවා. නියෝජ්‍ය ඇමති කෙනෙක් ඉන්නවා. පිටස්තර ඇමතිවරුත් ඉන්නවා. දැන් ඔක්කෝම එකතු වෙලා. නමුත්, කරන්න බැරි එක තමයි අද තිබෙන ප්‍රශ්නය වන්නේ.

ඒ රජයේ නිලධාරීන් කරන කටයුත්ත නිසයි, මෙන්න මේක අපි මෙතැනදී හංගන්නේ නැතිව කථා කරන්නටයි අවශ්‍යතාවය තිබෙන්නේ. අද රටේ ජන ජීවිතය ගෙන යාම ලේසි කාර්ය

භාරයක් නොවෙයි. මතක තියා ගන්න 2015 ජනවාරි මාසයේ 08 වන දා අපට භාර දුන්නේ මීට වඩා අන්ත ආර්ථිකයක්, නැති වෙච්ච ආර්ථිකයක්. ඒක හදලා ඉදිරියට ගෙනෙනකොටම, ඒ ළමයා දුවන්න පටන් ගන්න ඔන්න මෙන්න කියා තිබියදී තමයි යම් යම් ප්‍රශ්න ඇති වෙන්න පටන් ගත්තේ. එම නිසා අපි මේ අවස්ථාවේදී රැකී රක්ෂා ඇති කළ හැකි මාර්ග සොයන්නට අවශ්‍යයි.

අපේ පොලී අනුපාතය කොහොමද කියලා බලමු. අපේ අපනයනකරුවෙක්, Brandix, MAS Holdings වාගේ ආයතනවලත් ඉන්දියාවේ වෛෂාග් නගරයකට ගිහින් ආයෝජනය කරනවා. එහෙන් සියයට 7ක, 8ක පොලියකට ණයක් ගන්න පුළුවන් අවස්ථාව තිබෙන විට මෙහේ ඇවිල්ලා සියයට 17ක, 18ක පොලියකට ණය ගන්න අවශ්‍ය නැහැ. මොකද, එතැනින්ම සියයට 10ක අලාභයක් ඇති වෙනවා. මේක තමයි තිබෙන වෙනස. අපි තරග කරන්නට පුළුවන් තත්ත්වයක් ඇති කරන්නට අවශ්‍යයි. අපේ අපනයනකරුවන්ට ලෝකයේ ඕනෑම කෙනෙකු සමඟ තරග කරන්නට පුළුවන්. නමුත් even playing field එකක්, සම මට්ටමක් අපි ඒ අයට දෙන්නට අවශ්‍යයි. ඒ වාගේම ප්‍රශ්නයක් ඇති වුණාම විසඳා ගන්න මාර්ගයක් ඇති කරන්න අවශ්‍යයි. ප්‍රශ්නයක් ගැන රජයේ නිලධාරීන් සමඟ කථා කළාම උත්තරය ලැබෙන්නේ අවුරුද්දකට පස්සේ නම්, ආයෝජනය කරන්නට එන්නේ ලංකාවට නොවෙයි.

එම නිසා සියලුදෙනාම හැඟීම්බරව මේ රට ගැන හිතන්නට අවශ්‍යයි. මේක තමයි වෙනසක් ඇති කරන්නට පුළුවන් අවස්ථාව. අද තිබෙනවා වාගේ, හිසරදයට කොට්ටය මාරු කරනවා වාගේ වෙනසක් නොවෙයි අවශ්‍ය වන්නේ. අවුරුදු 30ක් මේ පුංචි ලංකාව යුද්ධයෙන් බැටකාලා නැති වුණා. ඒ කාලයේ ආර්ථික වර්ධන වේගය සියයට 8ට, 9ට තමයි තිබුණේ. අද ඒක සියයට 3.4යි, සියයට 3.5යි වෙන්නේ කොහොමද? මේවා තමයි හිතන්න අවශ්‍ය වන්නේ.

ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මේ රටේ සුවිශේෂී වෙනසක් කළා. ඒ විවෘත ආර්ථිකය ඇති කිරීම තුළින් පුංචි ලංකාව ලෝකයට එකතු කරලා ලෝකයත් සමඟ තරග කරන්නට පුළුවන් තත්ත්වයක් ඇති කළා. අද අපේ වරාය ලෝකයේ හොඳම වරායක්, most progressive වරායක් බවට පත් වෙලා තිබෙනවා. එම වරාය ඒ තත්ත්වයට ගෙනෙන්නට කටයුතු කළ හැම දෙනාටම අපි ශුභාශිංසන පතන්නට ඕනෑ. එදා ලලිත් ඇතුලත්මුදලි මහත්මයා ජපන් ආධාරවලින් ඉදිරි දැක්මක් ඇතිව ගත් පියවරවල ප්‍රතිඵල අද පෙනෙන්නට තිබෙනවා. East Container Terminal වෙන්න පුළුවන්, හම්බන්තොට වරාය වෙන්න පුළුවන්. අනෙක් ඒවා දිහා බලලා කේන්ද්‍රස්ථානයක් වෙලා තිබෙන පුංචි ලංකාව මීට වඩා හොඳ මට්ටමකට ගෙනෙන්නට අවශ්‍යයි. ඒ වාගේම ගුවන් තොටුපොළවල් ඒ ආකාරයට දියුණු කරන්නට අවශ්‍යයි. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කටුනායක ගුවන් තොටුපොළේ විශාල වෙනසක් කරන්නට කටයුතු කර තිබෙනවා. ඒවා උපයෝගී කරගෙන අපේ සංචාරක කර්මාන්තය දියුණු කළ යුතුයි. ජෝන් අමරතුංග ඇමතිතුමා සුවිශේෂී වෙනසක් කරමින් මේ අවුරුද්දේ ලක්ෂ 30ක සංචාරකයන් පිරිසක් මේ රටට ගෙනෙන්නට හදනවා. මේ තමයි තිබෙන වෙනස වන්නේ. මේ කටයුතු ඉදිරියට ගෙන යන්නට අවශ්‍යයි. මේ තුළින් තමයි රැකී රක්ෂා ඇති වන්නේ.

අද බංග්ලාදේශයේ, නේපාලයේ සේවකයන් රුපියල් 30,000 පඩියකට මේ රටට වැඩ කරන්නට එනවා. එහෙම ගෙනෙන්නට අවශ්‍ය නැහැ. අපේ ශ්‍රමය රටේ සංවර්ධනයට පාවිච්චි කරන්නට අවශ්‍යයි. ලංකාවේ කොල්ලෝ, කෙල්ලෝ මැද පෙරදිග රැකියාවලට යනවා. ඒ අයට ඊට වඩා හම්බකරගෙන එන්න පුළුවන් හැකියාව තිබෙනවා. මෙවැනි අවස්ථා පුළුල් කිරීම අවශ්‍යයි. අපි හරි දේවල් වහලා වැරදි දේවල් විවෘත කර තිබෙන එක ප්‍රශ්නයක්. අපි සැබෑ ආර්ථික වෙනසක් ඇති කරන්නට පුළුවන් ගමනක් යා යුතුයි. අනිවාර්යයෙන්ම අපේ ආර්ථිකය හදන්නට පුළුවන් හැකියාව තිබෙනවා. අපට මේ පොලී අනුපාතය අඩු කරන්නට පුළුවන්. රුපියල ශක්තිමත් කරන්නට අපට පුළුවන්. අප කළ යුත්තේ නිවැරදි ප්‍රතිපත්තිය හරියාකාරව ඉදිරියට ගෙන යාමයි. අද ප්‍රතිපත්තියක් හදලා හෙට ඒක වෙනස් නොකොට, සෘජු ප්‍රතිපත්තියක් අනුව ක්‍රියාත්මක වීම අවශ්‍ය වෙනවා. එම නිසා අලුතෙන් හිතන්නට පුළුවන් ගමනක් ආරම්භ කර ඒ තුළින් අපේ ආර්ථිකය අද ඉඳන් හදන්න ඕනෑ කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්නට අවශ්‍යයි. එහිදී දේශපාලනය පැත්තකට දමන්න, වර්ගීකරණය පැත්තකට දමන්න. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ කියන සියලුදෙනාම එක්සත්ව වැඩ කරන්නට පුළුවන් ආර්ථිකයක් ඇති කරන්නට ඕනෑ කියන එක මම මතක් කළ යුතුයි. ඩොනල්ඩ් ට්‍රම්ප් ඇමෙරිකාවේ ආර්ථිකය හදනවා වාගේම, මැලේසියාවේ ආර්ථිකය මහතිර් මොහොමඩ් හදනවා වාගේම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ලංකාවේ ආර්ථිකය හදන්නට 2015 ජනවාරි මාසයේ 08වෙනි දා පටන් ගත්ත ඒ ගමන නැවත සවි ශක්තිමත් කිරීම අවශ්‍ය බව මම මතක් කර සිටිනවා. මගේ කථාවට කාලය හරස් වෙලා තිබෙන නිසා මූලාසනයට ස්තුතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා. ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය (කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Chandrani Bandara - Minister of Women and Child Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශෙහාන් සේමසිංහ මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු මයන්ත දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் அக்கிராசத்தினின்று அகலவே, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MAYANTHA DISSANAYAKE *left the Chair and* THE HON. SHEHAN SEMASINGHE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 4.21]

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දවසේ විශේෂයෙන්ම මුදල් ඇමතිතුමා විසින් ගෙන එන ලද පනත් කෙටුම්පත සම්බන්ධයෙනුත්, සුරාබදු ආඥාපනත යටතේ වූ නිවේදන දෙකක් සම්බන්ධයෙනුත් කථා කරන්න ලැබීම පිළිබඳව මම සන්තෝෂ වනවා.

[ගරු කංචන විජේසේකර මහතා]

මට පෙර කථා කළ අපේ හිටපු මුදල් ඇමතිතුමා වන රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, එතුමන්ලා බලයට පත් වෙලා දින කීපයක් තුළදී මේ රටේ අත්‍යවශ්‍ය භාණ්ඩ ගණනාවක මිල අඩු කරන්නත්, මේ රටේ රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි කරන්නත්, විවිධ වරප්‍රසාද දෙන්නත් හැකියාව ලැබුණා කියලා. මේ රටේ පඩි වැඩි කරන්න, වරප්‍රසාද දෙන්න, භාණ්ඩ මිල අඩු කරන්න එතුමන්ලාට දින 100ක් තුළ එවැනි වාතාවරණයක් නිර්මාණය වුණේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා 2015 ජනවාරි 8වැනි දා මේ රටේ ආර්ථිකය භාර දීලා තිබුණු ආකාරය මතයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවනවා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට වඩා හොඳින් මේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්න මේ රට පාලනය කරනවා කියපු ආර්ථික ඔස්තාර්ලාට පුළුවන්කම තිබුණා නම්, ඊළඟ අය වැය වනකොට රුපියල් 10,000කින් නොවෙයි, රුපියල් 20,000කින් පඩි වැඩි කරන්න එතුමන්ලාට පුළුවන්කම ලැබෙන්න ඕනෑය කියලා මම හිතනවා. එතුමන්ලාට පඩි වැඩි කරන්නත්, සමෘද්ධි දීමනාව වැඩි කරන්නත්, භාණ්ඩවල මිල අඩු කරන්නත් ආදී ඒ සියලු කටයුතු කරන්න ලැබුණේ වෙන මොනවත් නිසා නොවෙයි, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් කර ගෙන ආ වැඩ පිළිවෙළ නිසාය කියන එක අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

අද වනකොට කොටස් වෙළඳ පොළ මිල දර්ශකය බලන්න. පළමුවැනි වතාවට මේ රටේ කොටස් වෙළඳ පොළේ මිල දර්ශකය 6,000ට එහාට ගියේ 2010 සැප්තැම්බර් මාසයේදීයි. 2018 සැප්තැම්බර් මාසය වනකොට නැවත වතාවක් එම දර්ශකය 5,000ට ගිහිල්ලා තිබෙනවා. 6,000න්, අපි 5,000ට ගිහිල්ලා තිබෙනවා. 2010දී 6,000ට එහාට යනවා; ඒ අනුව අපි එහි වර්ධනයක් ලබනවා. අවුරුදු 8කට පස්සේ කොටස් වෙළඳ පොළ නැවත 6,000න් පහළට ඇවිල්ලා, මේ රට අවුරුදු 8ක් ආපස්සට ගිහින් තිබෙනවා.

මේ රටේ ආර්ථිකය පිළිබඳව වෙන මොනවත් පෙන්වන්න ඕනෑ නැහැ. මේ රටේ කොටස් වෙළඳ පොළ තිබෙනවා, මේ රටේ මහ බැංකු වාර්තා ටික තිබෙනවා. මේ රටේ පසුගිය කාලය පුරාම පුවත් පත්වල වාර්තා කරපු දේවල් ආදී සියලු දේවල්වලිනුත්, දර්ශකවලිනුත් පෙන්වන්නේ වෙන මොනවත් නොවෙයි; මේ රටේ ආර්ථිකය අවුරුදු තුන හමාරක් තිස්සේ මුදල් ඇමතිවරු, රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලුදෙනා විසින් විනාශයට පත් කරලා තිබෙනවාය කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව මේ ආණ්ඩුවට රට භාර දෙන වෙලාවේ 2014 කොටස් වෙළඳ පොළේ ආයෝජනයේ ප්‍රතිලාභය තිබුණේ සියයට 24කට. ඒ අනුව අපි රුපියල් 100ක් ආයෝජනය කරනවා නම්, රුපියල් 124ක් අපට ලැබෙනවා. සියයට 24ක්ව තිබුණු ඒ ප්‍රතිලාභය 2018 අවුරුද්ද වනකොට සෘණ 4ක් දක්වා පහළ ගිහිල්ලා තිබෙනවා. කොටස් වෙළඳ පොළේ රුපියල් 100ක් ආයෝජනය කරන කොට අපට ආපස්සට ලැබෙන්නේ රුපියල් 96ක් පමණයි. රුපියල් 100ට රුපියල් 124ක් ලැබුණු එක අද රුපියල් 96ක් බවට පත් වෙලා තිබෙනවා. ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න, මෙහෙම තිබෙන කොටස් වෙළඳ පොළක මොන ආයෝජකයෝද ඇවිල්ලා ආයෝජනය කරන්නේ කියලා. 2014දී මේ රටේ ඩොලර් මිලියන 1,500කට වැඩි විදේශ ආයෝජන ප්‍රමාණයක් තිබුණා. ඒක අද ඩොලර් මිලියන 20කට අඩු ප්‍රමාණයකට පහත වැටිලා තිබෙනවා.

මුදල් ඇමතිතුමා අද උදේ වරුවේ දිගින් දිගටම කිව්වා, මේ රට ණය උගුලක හිර කළේ රාජපක්ෂ ආණ්ඩුවයි කියන එක. පසුගිය මැතිවරණ කාලයේත්, පසුගිය අවුරුදු තුන හමාරේත් මේක තමයි කිව්වේ. මේ ණය උගුල ගැන කියන කොට කිව්වා, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව මේ රට චීන ණය උගුලක හිර කරලා තිබෙනවා කියලා. චීනයෙන් වැඩි පොලියට ණය අරගෙන තිබෙනවා, ඒ නිසා තමයි මේ රටේ වරාය විකුණන්න වුණේ, මත්තල ගුවන් තොටුපොළ විකුණනන්න වෙන්නේ, නොරොච්චෝලේ බලාගාරය දෙන්න වෙන්නේ, අධිවේගී මාර්ග ටික දෙන්න වෙන්නේ කියලා එතුමන්ලා කිව්වා.

හැබැයි, එහෙම කියපු අගමැතිතුමා පසුගිය දවසක රට නියෝජනය කරමින් ආසියානු සම්මේලනයට සහභාගි වෙලා කිව්ව දේ සැප්තැම්බර් 12 වන දා "Daily Mirror" පුවත් පතේ මෙසේ සඳහන්ව තිබෙනවා:

"Sri Lanka is not falling into a Chinese debt trap."

මේක තමයි ආසියානු සම්මේලනයට ගිහිල්ලා අගමැතිවරයාට එතුමාගේ කටින්ම කියන්න සිද්ධ වුණේ.

මේ රටේ ණය බර ගැන කථා කරනවා නම්, 2005 මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මේ රටේ ආර්ථිකය භාර ගන්න කොට මේ රටේ තිබුණු සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 2,222යි. 2005 සිට 2009 වනකොට රුපියල් බිලියන 2,222 සිට යුද්ධය අවසාන වන තෙක් සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 4,160යි. Multi-barrel rocket launcher ගෙනැල්ලා, ගුවන් යානා ගෙනැල්ලා යුද හමුදාවට අවශ්‍ය පහසුකම් ටික දීලා මේ රටේ පැවැති යුද්ධය අවසන් කරන්න මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට වැය වූ මුදල තිබෙන්නේත් ඒ රුපියල් බිලියන 4,160 ඇතුළේයි. ඒ, මේ රටේ සමස්ත ණය ප්‍රමාණය. ඒ රුපියල් බිලියන 4,160 සිට මේ රට භාර දුන් 2015 ජනවාරි මාසයේ 8 වැනි දා වනකොට මේ රටේ තිබුණු සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 7,391යි.

මේ රුපියල් බිලියන 7,391 ගත්තාම, එයින් රුපියල් බිලියන 2,222ක් චන්ද්‍රිකා කුමාරතුංග රජයෙන් ගත් ණය සඳහා පිටරටවලට දෙන්න තිබෙන මුදල. ඉතිරි රුපියල් බිලියන පන්දාහ ඇතුළේ තමයි යුද්ධය අවසන් කර, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය, කොළඹ-ගාල්ල අධිවේගී මාර්ගය, ගාල්ල-මාතර අධිවේගී මාර්ගය යන අධිවේගී මාර්ග තුනත් හදා, නොරොච්චෝලේ විදුලිබලාගාරය, හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපළ ඉදි කර, මේ සියලු කටයුතු කරලා තිබුණේ. රුපියල් බිලියන 5,000යි මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ණය බරට එකතු කර තිබුණේ. රුපියල් බිලියන 7,391 සිට අද වෙනකොට මේ රටේ ණය බර රුපියල් බිලියන 11,000න් එහාට ගෙනැවිත් තිබෙනවා. මහින්ද රාජපක්ෂ ආණ්ඩු කාලයේ අවුරුදු 9කදී ණය බර තිබුණේ රුපියල් බිලියන පන්දාහයි. අවුරුදු තුනහමාරකදී යහ පාලන ආණ්ඩුවේ මේ රටේ ණය බර රුපියල් බිලියන හාරදාහයි. මේක තමයි ඇත්ත කථාව. දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ප්‍රතිශතයක් හැටියට ගත්තාම, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව භාර දෙනකොට මේ රටේ ණය බර තිබුණේ සියයට 70.7යි. එය සියයට 85 දක්වා ගෙන ගියා. අද වෙනකොට එය නැවත වතාවක් සියයට 81 දක්වා ඇවිත් තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Ravi Karunanayake, what is your point of Order?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බාධා කළාට කමක් නැද්ද? මම නිවැරදි කිරීමක් කරන්නේ. මතක තියා ගන්න, 2005 අවුරුද්දේ ආණ්ඩුව ගන්නකොට රටේ සම්පූර්ණ ණය බර රුපියල් බිලියන 1,784යි. 2015 ජනවාරි 8 වැනි දා වෙනකොට මෙය රුපියල් බිලියන 10,850යි. එකතු වුණේ රුපියල් බිලියන 5,000ක් නොවෙයි; රුපියල් බිලියන 8,200ක්. එයයි සැබෑ තත්ත්වය. අවශ්‍ය වන්නේ භේද භින්න කිරීම නොවෙයි; සැබෑ තත්ත්වය පෙන්වන එක විතරයි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ එළි දක්වන සියලු සංඛ්‍යාලේඛන මෙතුමා විවේචනය කරන මහ බැංකු වාර්තාවල තිබෙන දේවල්. 2015 , 2016, 2017 මහ බැංකු වාර්තාවල තමයි මේ විස්තර තිබෙන්නේ. 2015 , 2016, 2017 මහ බැංකු වාර්තා නිකුත් කරන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන්. මෙහි ප්‍රශ්නයක් තිබෙනවා නම් මහ බැංකුවත් එක්ක විසඳා ගත යුතු කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙන්වෙලා තිබෙන කාලයේ අවසාන විනාඩියයි ගත වෙන්නේ. මම අවසාන වශයෙන් මේ කාරණය කියන්නට ඕනෑ. මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 7 සිට සියයට 3.1ට අඩු වී තිබෙනවා. අද කියනවා, ඩොලරය පාලනය කර ගැනීම වෙනුවෙන් විශාල මුදලක් අපේ ආණ්ඩුව කාලය තුළ යට කළාය කියා. අපේ ආණ්ඩුව භාර ගන්නාවිට ඩොලරයක අගය රුපියල් 133යි. රුපියල් 133 සිට රුපියල් 168 දක්වා ඩොලරය ඉහළ ගොස් තිබෙනවා. අපේ ආණ්ඩුව කාලයේ 2005 සිට 2014 දක්වා අවුරුද්දක් පාසා සාමාන්‍ය වශයෙන් රුපියලේ අවප්‍රමාණය වෙච්ච අගය සියයට 2.9යි. නමුත් 2015 සිට 2018 දක්වා සෑම අවුරුද්දකම සමාන්‍ය වශයෙන් ඩොලරයට සාපේක්ෂව සියයට 8.2කින් රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා. අපේ ආණ්ඩුවේ අවුරුදු නවයක කාලය තුළ ඩොලරය පාලනය කර ගන්න රුපියල් බිලියන 4.9ක් වැය කර තිබෙනවා. නමුත්, ඔබතුමන්ලාගේ යහ පාලන ආණ්ඩුව ඩොලර් බිලියන 6.5ක මුදලක් පුච්චලා තිබෙනවා කියන එකත් අපි මේ වෙලාවේදී මතක් කරනවා.

මොන සංඛ්‍යාලේඛන ගත්තත්, මේ රටේ ආර්ථිකය පිළිබඳව ඔබතුමන්ලා කියන මොන විශ්ලේෂණය කළත් අද මේ රටේ ආර්ථිකය පරිහානියට පත් කර තිබෙන්නේ මේ යහ පාලන ආණ්ඩුවය කියන එක අපි පැහැදිලිව මතක් කරන කරුණක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට නලීන් බණ්ඩාර ජයමහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.29]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Public Administration and Management and Law and Order)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. 2015 ජනවාරි 8 වැනි දා වෙනසත් එක්ක මේ රටේ දැවැන්ත ආර්ථිකමය හා සාමාජීය වෙනසක් සිදු වුණා. වර්තමානයේ ඩොලරයේ මිල ඉහළ යාමත් එක්ක ඩොලරය ශක්තිමත් වීම පිළිබඳ කාරණය අද විශාල මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. මෙහි පසුබිම ගැන සොයා බලද්දී ඇමෙරිකා එක්සත් ජනපදයේ වර්තමාන නායක ඩොනල්ඩ් ට්‍රම්ප් බලයට පත් වුණාට පස්සේ ඒ රටේ දේශීය ආර්ථිකය ශක්තිමත් කර ගෙන යන නිසා ඒ රටේ දැවැන්ත අර්ථිකමය වෙනසක් සිදුවෙමින් පවතිනවා. ඇමෙරිකානු ආර්ථිකය ශක්තිමත් වීමට සමගාමීව අපේ රටේ විතරක් නොවෙයි ආසියාවේ, යුරෝපයේ පවා රටවල මුදල් ඒකක අවප්‍රමාණය වීම දකින්න පුළුවන්.

උදාහරණයක් විධියට කියනවා නම්, ආසියානු රටක් වන ඉන්දුනීසියාවේ සියයට 8.9කින් හා තවත් ආසියානු රටක් වන කොරියාවේ සියයට 5.2කින් මුදල් ඒකක අවප්‍රමාණය වී තිබෙනවා. කොරියාව කියන්නේ බොහොම දියුණු රටක්. පිලිපීනයේ සියයට 7.7කින් මුදල් ඒකක අවප්‍රමාණය වී තිබෙනවා. බොහොම ශක්තිමත් ආර්ථිකයක් තිබෙන ඉන්දියාවේ සියයට 10.9කින් සහ යුරෝපා රටක් වන තුර්කියේ සියයට 41කින් මුදල් ඒකක අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඊට සාපේක්ෂව, දියුණු රටක් වන ඕස්ට්‍රේලියාවේත් සියයට 5කට ආසන්න ප්‍රමාණයකින් අවප්‍රමාණය වෙලා තිබෙනවා.

අනික් පැත්තෙන් රුසියාව ගත්තොත්, ඇමෙරිකාවේ බල කඳවුරේ අනික් පැත්තේ හිටගෙන ඉන්න රුසියාවටත් අත්වෙලා තිබෙන්නේ මේ ඉරණමම තමයි. එහෙම නම්, මේ ලෝක තත්ත්වයත් එක්ක අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කර ගන්නේ කොහොමද කියන කාරණයේදී, පසුගිය කාලයේදී සිදු වුණු දේවල් අපට වැදගත් වෙනවා.

විශේෂයෙන්ම 2015දී අපි බලයට පත්වනකොට අපට විශාල වශයෙන් විදේශ විනිමය ලැබුණු GSP Plus සහනය නැති වෙලා තිබුණු බව අපට මතකයි. ඒ වාගේම අපට විශාල වශයෙන් විදේශ විනිමය ලැබුණු යුරෝපා මත්ස්‍ය අපනයනය තහනම් කරලා තිබුණා. අවුරුදු තුනක් වැනි කෙටි කාලයක් ඇතුළත GSP Plus සහනය ලබා ගැනීමටත්, යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කර ගැනීමටත් අපට පුළුවන් වුණා. මෙවැනි තත්ත්වයක් ඇති කර ගන්න අපට පුළුවන් වුණේ, අපි යහ පාලන ආණ්ඩුවක් ඇති කළ නිසායි. උදාහරණයක් විධියට, 2016 අපනයන වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 3,346යි, 2017 අපනයන වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 3,851යි. අපනයන වටිනාකම වසරක් ඇතුළත සියයට 15.1කින් වැඩි වෙලා තිබෙනවා. 2018 වසරේ දත්ත මට ලැබුණේ නැහැ. අපේ අපනයන වටිනාකම, විශේෂයෙන් ඩොලර් රටට ගලා ඒම වැඩි කර ගන්න පුළුවන් වුණේ, රජයක් විධියට අපි ගත් ක්‍රියා මාර්ග නිසා GSP Plus සහනය ලබා ගැනීමට හැකි වීමත්, යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කර ගැනීමට හැකි වීමත් කියන ඒ ජයග්‍රහණ නිසාය කියලා එයින් පැහැදිලිවම පෙනෙනවා. එහෙම නම්, 2015දී මෛත්‍රීපාල සිරිසේන මහත්මයා බලයට ආවේ නැත්නම්, අමතරව ලබුණු මේ ආර්ථිකමය ශක්තීන් අපේ රටට ලැබෙන්නේ නැහැ. දැන් මේ ගොල්ලෝ මොනවා කිව්වත්, මහා ලොකුවට පුරසාරම් දෙඩුවත්, රාජපක්ෂ මහත්මයා 2015 ජනවාරි 08වන දා දිනුවා නම්, අපට තවමත් GSP Plus සහනය ලැබෙන්නේ නැහැ; අපට තවමත් යුරෝපා මත්ස්‍ය තහනම පැනවිලා තිබෙනවා. එහෙම නම්, මේ අවුරුදු තුනේ තවදුරටත් රාජපක්ෂ පාලනයක් තිබුණා නම්, අද තිබෙනවාටත් වඩා භයානක තත්ත්වයක් තමයි ඇති වෙන්නේ. මෙය සත්‍ය කාරණයක්.

අපේ රට ලෝක ආර්ථිකයත් එක්ක ගැටෙන කුඩා රටක්; විශේෂයෙන් ආනයනයන්, අපනයනයන් අතර විශාල වෙනසක් තිබෙන රටක්. එහෙම නම්, අපි රටක් විධියට අපේ ආනයනයන් පුළුවන් තරම් අවම කර ගන්නේ කොහොමද කියලා ප්‍රතිපත්තිමය කාරණාවලට එළඹෙන්න වෙනවා. ගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, මුදල් අමාත්‍යාංශයේ අපේ ඇමතිතුමා ඇතුළු

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

නිලධාරිනුත් එකතු වෙලා, අනවශ්‍ය ආනයනයන් පුළුවන් තරම් අඩු කර ගන්න ඕනෑ. අනවශ්‍ය ආනයනයන් විශාල ප්‍රමාණයක් අපේ රට තුළට එන බව අපි දන්නවා. අපේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් දේවල් පවා පිට රටින් ගෙන්වන බව අපි දැකලා තිබෙනවා. චීනය වැනි රටවල්වලින් කුඩා සෙල්ලම් බඩු ගෙන්වනවා; සරුංගලය පවා ගෙන්වනවා. මේ සම්බන්ධව දැඩි තීන්දු ගත්තොත්, විශාල වශයෙන් සිදු කරන අනවශ්‍ය ආනයනයන් නතර කරන්න පුළුවන්.

අනික් රටවලට සාපේක්ෂව බලනකොට අපට පැහැදිලිව පෙනෙනවා, රුපියලේ වටිනාකම අපි යම් මට්ටමකින් රඳවාගෙන තබාගෙන ඉන්නවාය කියලා. මහින්ද රාජපක්ෂ පාලනය රුපියල අවප්‍රමාණය වීම කෘත්‍රිමව පාලනය කරගෙන සිටියා. රටේ තිබුණු ඩොලර් සංචිත විශාල වශයෙන් මුදා හැරලා රුපියල කෘත්‍රිමව පාලනය කරගෙන ඉඳලා, එක්තරා අවස්ථාවක මේක අල්ලාගෙන ඉන්න බැරිම තැන එක දවසකට, දෙකකට එකවර රුපියල් 15කට ආසන්න ප්‍රමාණයකින් රුපියල අවප්‍රමාණය වෙනවා අප දුටුවා. ඉතිහාසයේ ලොකුම ප්‍රමාණයකින්, ඉතාම කෙටි දින ගණනකින් රුපියල අවප්‍රමාණය වුණේ රාජපක්ෂ පාලන සමයේදීය කියන එක මතක් කරන්න ඕනෑ. ඒකයි ඇත්ත තත්ත්වය.

ඊට අමතරව මට දැන් තව තොරතුරක් ලැබුණා. යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කිරීම නිසා ඇමෙරිකානු ඩොලර් මිලියන 340ක අමතර ආදායමක් අපට ලැබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එය සියයට 38කින් පමණ වැඩි වීමක් විධියට හඳුන්වන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මා අවසන් කරන්නම්.

යහ පාලන ආණ්ඩුව බලයට පැමිණියේ නැත්නම් මේ මුදල් අපේ රටට එන්නේ නැහැ. රාජපක්ෂ මහත්මයාගේ පාලන සමය තිබුණා නම්, මේ කපේට යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කර ගන්න ලැබෙන්නේ නැහැ; මේ ආත්මයට GSP Plus සහනය ලබා ගන්න වෙන්නේ නැහැ. ඒකයි ඇත්ත තත්ත්වය. අපි ඇත්ත තත්ත්වය අවබෝධ කරගෙන, තිබෙන තත්ත්වයෙන් ඉදිරියට යන්නේ කොහොමද කියන එක ගැන සාකච්ඡා කරන්න ඕනෑය, ඒ වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑය කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

අද ඒකාබද්ධ විපක්ෂය නොයෙක් සටන් පාඨ කියමින් මේ ආණ්ඩුව විවේචනය කරන්න උත්සාහ කරනවා. හැබැයි මේ ගොල්ලෝ මීට දවස් කිහිපයකට කලින් සැප්තැම්බර් 05වන දා අලුත් ආණ්ඩුවක් හදන්න කැස පට ගහපු අයයි.

ඔවුන්ගේ බලාපොරොත්තුව අනුව නම් දැන් තිබෙන්න ඕනෑ රාජපක්ෂ පාලනයක්. හැබැයි, මේ ආණ්ඩුව වෙනස් කරන්න සූදානම් නැහැ කියන එක රටේ ජනතාව පසුගිය සැප්තැම්බර් 05වැනි දා පෙන්නුවා. සැප්තැම්බර් 05වැනි දා කොළඹ වට කරලා -කොළඹ ආක්‍රමණය කරලා-, ආර්ථික මර්මස්ථාන සහ පරිපාලන මර්මස්ථාන වට කරලා, බලය අල්ලන්න ආපු කට්ටිය පැය 12ක්වත් ඉන්නේ නැතිව දාලා ගියා. ඒ පරාජය වහගන්න අද ආණ්ඩුවට නොයෙක් අවලාද නහන්න මේගොල්ලන් උත්සාහ කරනවා.

ඊයේ - පෙරේදා පොලිස් දෙපාර්තමේන්තුවටත්, ශ්‍රී ලංකා පොලිසියටත් නොයෙක් චෝදනා කරනවා අපි දැක්කා. හැබැයි, අමාත්‍යාංශයක් විධියට වාගේම රජයක් විධියට මේ සම්බන්ධයෙන් තිබෙන හැම දෙයකටම විරුද්ධව අපි කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහත්මයා හා සම්බන්ධ කාරණයේදී අපි ඉතාම කෙටි කාලයක් ඇතුළත -කෙටි හෝරාවන් ගණනාවක් ඇතුළත- විනිවිදභාවයකින් යුතුව වැඩ කරලා තිබෙනවා. අද ඒ සම්බන්ධයෙන් CID එකේ පරීක්ෂණ පවත්වනවා. ඊට අමතරව අමාත්‍යාංශයෙන් තීන්දු කරලා, කොමිසම මඟිනුත් කටයුතු කරලා DIG නාලක ද සිල්වා මහත්මයා අනිවාර්ය නිවාඩු යවලා තිබෙනවා. ඊට අමතරව පොලිස්පතිතුමා සම්බන්ධව තිබෙන කාරණාවලට අමාත්‍යාංශයෙන් වෙනම පරීක්ෂණයක් කරනවා. මේ විධියට අපි විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරනවා. කිසිම අවස්ථාවක අපි රජයක් විධියට වගකීම් විරහිතව වැඩ කරලා නැහැ. ගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් එක්ක එකතු වෙලා රංජිත් මද්දුමබණ්ඩාර ඇමතිතුමාත්, අපිත් බොහොම වගකීම් සහගතව කටයුතු කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසාන කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කාරණයේදී අපි වගකීම් සහගතව කටයුතු කළා කියන එක මේ පාර්ලිමේන්තුවට බොහොම ගෞරවයෙන් ප්‍රකාශ කරනමින් මගේ කථාව අවසන් කරනවා. කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා.

[අ.භා. 4.37]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව ඉතා වගකීම් සහගතව කටයුතු කරන බව තමයි අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියන්නේ. වැදගත් මුදල් පනතක් විවාදයට ලක් කරන වෙලාවේ මේ ආණ්ඩුවේ වග කිව යුතු ඇමතිවරු -මුදල් ඇමතිතුමා හෝ ආර්ථිකය සම්බන්ධ ගරු ඇමතිවරු- මේ පාර්ලිමේන්තුවේ නැහැ. ඒ නිසා ඩොලර් එක විතරක් නොවෙයි, අද මේ ආණ්ඩුවම බාල්දු වෙලා තිබෙන්නේ. ඩොලරය මස්තබාල්දු වෙලා, ආණ්ඩුව මස්තබාල්දු වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ ගරු සභාව අද

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

භූමියක් බවට පත් වෙලා තිබෙනවා. ඒ කාලයේ ආස්වාදයෙන් "පාර්ලිමේන්තුව" කියලා කිව්වාට අද මිනිසුන් කියන්නේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]*
*[Expunged on the order of the Chair.]*

කියලායි. 2015 ජනවාරි 08වැනි දා ඉඳලා ඒ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]*
*[Expunged on the order of the Chair.]*

භාවය තමයි රට පුරාම තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන උතුරු මැද පළාත ඇතුළු මුළු රටේම ජනතාව අද නියහයෙන් සහ සාගතයෙන් බැට කනවා. අද මේ ආණ්ඩුව නිහඬ වෙලා ඉන්නේ. අගමැතිතුමා විහිළු කරනවා. මුදල් ඇමතිතුමා වෛරයෙන්, -

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-[බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Point of Order එකක් තිබෙනවා. ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව 'මස්තබාල්දු වෙලා' කියන වචනය ඉල්ලා අස් කරගන්න කියලා අපි යෝජනා කරනවා. ඒ වාගේ වචන මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පාර්ලිමේන්තුවට නුසුදුසු කිසියම් ප්‍රකාශයක් තිබුණොත් ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මස්තබාල්දු නියෝජිතයෝත් ඉන්නවා. ඒ නිසා අලුතින් මේවා ගැන ජනතාවට කියන්න දෙයක් නැහැ. මේ ගරු සභාවේ වග කිව යුතු ඇමතිවරු නැහැ කියන එකයි අපි කියන්නේ. මේ සභාව බාල්දු වෙලා තිබෙනවා කියන කාරණයේ තර්කය ඒකයි. රට පුරාම නියහයක් තිබෙනවා. සාගතයෙන් මිනිසුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ. අගමැතිතුමා විහිළු සපයනවා; මුදල් ඇමතිතුමා වෛරය සපයනවා; ජනාධිපතිතුමා හිනා වෙවී ය 10.00ට නිදා ගන්නවා.

අද "ලංකාදීප" පුවත් පතේ මෙසේ සඳහන් වනවා:

"කන්න හයක්ම පාළුයි. වේල් ගණනක් බත් නැතිව අඹුසැමී යුවළක් මුරුංගා කොළ තම්බාගෙන කාලා."

කන්න හයක් කුඹුරු ටික වගා කර ගන්න බැහැ. වේල් ගණනක් කන්න නැහැ. මේවා මුදල් අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාරයේ නිලධාරිතුමන්ලාට පෙනෙන්නේ නැතිව ඇති; ආණ්ඩුවේ වග කිව යුත්තන්ට පෙනෙන්නේ නැතිව ඇති. මෙන්න රටේ ඇත්ත ආර්ථික තත්ත්වය. මම සංඛ්‍යා ලේඛනවලට යන්නේ නැහැ. නමුත් සංඛ්‍යා ලේඛන කියන්න මම සූදානම්. ගරු මන්ත්‍රීතුමන්ලා ආණ්ඩුව ඉදිරිපත් කරපු සියලු තර්ක සංඛ්‍යා ලේඛනවලින් බිඳ වට්ටලා තිබෙන්නේ. මේ මහ පොළොවේ තත්ත්වය ඒකයි.

අද "ලංකාදීප" පුවත් පතේ මෙසේ සඳහන් වනවා:

"වතුර මෝටරය උකස්කර දරුවන්ට කෑම අරන් එද්දී සිවුදරු පියාට වල්අලි ප්‍රහාරයක්".

වතුර නැතිව අද උතුරත්, නැඟෙනහිරත්, උතුරු මැදත්, අනිකුත් දිස්ත්‍රික්කවල ජනතාවත් පීඩාවට පත්වෙලා සිටිනවා. වතුර ටික නැතිව සිටියදී වතුර මෝටරය විකුණලා දරුවන්ට කන්න දෙන්න හදනවා. මේකයි රටේ තත්ත්වය. මේකයි ආර්ථිකයේ පසුබෑම. මේ රටේ කන්න හයක් පාළු වුණු බව අපි දන්නවා. අද එක පන්සලකවත් වැසි වහින්න කියලා සෙත් පතලා, පිරිත් ටිකක් කියන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. 'දෙවියනේ! මුන් ටික මකබෑවිලා යනකම්ම ඉන්නවා.' කියලා තමයි රට පෙළ ගැහිලා ඉන්නේ.

නැන්නම්, වැහි වහින්න කියලා වැහි පිරිත් කියනවා. අන්‍යාගමික පූජකවරු පින්කම්, පූජා පවත්වනවා. අද එහෙම දෙයක්වත් වෙන්නේ නැහැ. ඒ නිසා මේ රටේ-

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)
ගරු මන්ත්‍රීතුමනි, ලබන විසිතුන්වන දා -පෝය දවසට කලින් දවසේ- පහන් වනතුරු රුවන්වැලි මහා සෑය පූජා භූමියේදී මහා සමය සූත්‍රය ඇතුළු පිරිත් දේශනාවක් පවත්වනවා. එයට සහභාගි වන ලෙස අපි ඔබතුමන්ලාටත් ආරාධනා කරනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
හරි සතුටුයි, ඔබතුමන්ලා එහෙම දෙයක් සංවිධානය කිරීම ගැන.

මම ඔබතුමාගෙන් අහනවා, අද ගෞරවනීය ස්වාමීන් වහන්සේලා කී දෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවාද, වධ බන්ධනයට ලක් කරනවාද කියලා. මේ මහ පොළොව වෙනුවෙන් මියැදුණු- බුද්ධි අංශ නිලධාරින් අතුළු මේ රට ආරක්ෂා කරපු රණවිරුවෝ කී දාහක් අද අත්අඩංගුවට අරගෙන වධ දෙනවාද? ඒ පාපයේ ශාපයට මේ ආණ්ඩුව නියෝජනය කරන බොහෝ පිරිසකට අද මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. අද රටේ සාගතයක්, නියහයක්, ආර්ථික වශයෙන් පීඩාවක්, ජීවත් වෙන්න බැරි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අද නියං ආධාර දෙනවාද කියලා අපි නිලධාරින්ගෙන් අහනවා. අද සාර්ථක නියං ආධාර ක්‍රමයක් නැහැ. ජනතාවට ඒ ආධාර හම්බ වෙන්නේ නැහැ. පීඩාවට පත් වන මිනිසුන්ට ආධාර හම්බ වෙන්නේ නැහැ. රජයේ නිලධාරින් ආධාර දෙන්න යන්නේ නැහැ. ඇයි යන්නේ නැත්තේ? ඉතිහාසය මතක් කරන්න. මේ ආණ්ඩුව ආපු ගමන් කළේ මොකක්ද? මේ රටේ අතීත රණවිරුවා, හිටපු යුද හමුදාපති මේජර් ජනරාල් දයා රත්නායක මහත්මයා නියං ආධාර බෙදුවාය කියලා ජනාධිපති කොමිසමට එක්කගෙන ගියා. නියං ආධාර බෙදුවා කියලායි එක්කගෙන ගියේ. අද නියං ආධාර දෙන්නේත්

[ගරු සිසිර ජයකොඩි මහතා]

නැහැ; නිලධාරීන් නියං ආධාර බෙදන්නේත් නැහැ. මිනිසුන්ට කර කියා ගන්න දෙයක් නැතුව අහසට අත් දිගු කරගෙන අඬා වැලපෙන, එක තැන පල් වන, රටක් බවට මේ රට පරිවර්තනය කරලා තව කයිය ගහන්නත් එනවා; පුරාජේරු කියන්නත් එනවා; ආර්ථිකයේ ශක්තිය ගැන කියන්නත් එනවා. මිනිසුන්ට එදිනෙදා ජීවත් වෙන්න බැරිව පීඩාවට පත් වෙලා තිබෙනවා. රටේ කෘෂිකාර්මික ආර්ථිකය කඩා වැටිටුවා. කෘෂිකාර්මික, ස්වයංපෝෂිත ආර්ථිකයක් අපේ රටේ තිබුණා. 2014 වසරේදී අපේ රටේ මිනිසුන්ට කන්න අවශ්‍ය වී ටික තිබුණා. තමුන්නාන්සේලා කෘෂිකර්මාන්තය සෘණ අගයක් දක්වා පහළට බැස්සුවා. අපේ රටේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ යම් අපනයනයක් වුණා නම්, පොහොර සහනාධාරය නවත්වලා ඒ සියල්ලත් කඩා වැටිටුවා.

ඩොලර් එකේ ප්‍රශ්නය, ඩොලරය කඩා වැටීම ගැන අපි දන්නවා. මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. හැබැයි, තමුන්නාන්සේලා ඒකට උදාහරණ වශයෙන් ගන්නේ ඉන්දියාව. ඉන්දියාවේත් රුපියල වැටෙනවා ලු. ට්‍රම්ප් මහත්මයා ඇමෙරිකාවේ ඩොලරය ශක්තිමත් කළා ලු. දැන් අපේ රටේ ප්‍රශ්නයට උත්තර දෙන්නේ, ට්‍රම්ප්ගේ ආර්ථික ප්‍රතිපත්තිය සහ ඩොලර් එක වැඩි වීම ගැන කියලා. ඇයි අපට කියලා ප්‍රතිපත්තියක් නැද්ද? අපට වැඩ පිළිවෙළක් නැද්ද? මේ ආණ්ඩුව ඩොලර් එක පාලනය කරන්න උපයෝගි කර ගත්ත මූලධර්ම මොනවාද? ඒ මූලිකාංග කෝ? මේවා පාලනය කර ගන්න බැරි නම් ගෙදර යන එකයි ඇත්තේ, මේ සියලුදෙනා. හෙට අනිද්දා වන විට, මේ අවුරුද්ද අවසන් වෙන්න ඉස්සර වෙලා ඩොලර් එක රුපියල් දෙසියය දක්වා ඉහළ යනවා. අපි දන්නවා, අපේ රට ආනයන මත රඳා පවතින රටක් බව. හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා කියනවා, ඩොලරය වැඩි වීම අපනයනවලට හොඳයි ලු. දෙයියනේ, අපනයනය කරනවා නම් නේ හොඳ. මොනවාද අපි අපනයනය කරන්නේ? කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ තේවලින් අපි අපනයන ආදායම් ඉපැයුවා. එහෙමනම් ඩොලර් එක වැඩි වීමේ වාසිය තේ ගොවියාට ගිහිල්ලා තිබෙනවාද? තේ ගොවියාට ඒ වාසිය ගිහිල්ලා නැහැ. තේ දලු මිල අඩු වෙලායි තිබෙන්නේ, වැඩි වෙලා නැහැ. ඒ නිසා අපනයන ආර්ථිකය ශක්තිමත් වෙන්නේ නැහැ. අද ඉන්දියාව ගැන කථා කරනවා. ඉන්දියාවනේ තමුන්නාන්සේලාගේ දර්ශකය. ඉන්දියාවේ සෑම අපනයනයක් වෙනුවෙන්ම සියයට නවයක සහනයක් ලබා දෙනවා, අපනයනකරුවාට. අපේ? Turnover එකට 0.5ක tax එකක් අය කරනවා. නිලධාරීන් මේවා දන්නවා. අපේ රටේ අපනයනකරුවන්ගෙන් මුළු වෙළෙඳ අගයට බද්දක් අය කරනවා. ආනයනකරුවන්ගෙන් නොවෙයි, අපනයනකරුවන්ගෙන් බද්දක් අය කරනවා. එතකොට අපේ රටේ අපනයන වර්ධනයක් තිබෙනවාද? අපේ රටට ආනයනය කරන්නේ මොනවාද? ගිනි පෙට්ටියේ ඉඳලා මීනි පෙට්ටිය දක්වාම ආනයනය කරනවා.

ළඟදී අපේ හිතවතෙකුගේ අවමංගල්‍යයක් සිදු වෙලා අපි මල්ශාලාවකට ගියා. ගිහින් මීනි පෙට්ටියක් හෙව්වා. ලස්සන මීනි පෙට්ටියක් තිබුණා. ඒකේ මිල කීයද කියලා ඇහුවා. ඒකේ මිල රුපියල් 1,75,000යි. අපි අල්ලලා බැලුවා. ඇතුළේ සිනිදු වෙල්වට් දමලා තිබෙන්නේ. ඒක ඇතුළේ මැරෙන්න හිතුණා. මැරිච්ච මනුස්සයාට ඒ තරම් සැපයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
අද අපේ රටට වැල නොකැඩී ආනයන ගලනවා. ඒ නිසා අපේ රටේ දේශීය නිෂ්පාදනයක් කිරීමට අවශ්‍ය පසුබිම තිබෙනවාද? අද ආණ්ඩුව "Enterprise Sri Lanka" කියලා වැඩසටහනක් ගැන කියනවා; සංවර්ධනයට ණය දෙනවාය කියනවා. අපේ රටේ ව්‍යාපාර කඩා වැටුණු ව්‍යාපාරිකයෝ කී දාහක් ඉන්නවාද? එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ හෘදය සාක්ෂිය ඒ ගැන කථා කරයි. ඒ ව්‍යාපාරිකයන්ට බිස්නස් නැහැ; පොලිය ගෙවා ගන්න බැහැ; ණය වාරික ගෙවා ගන්න බැහැ; ෆිනෑන්ස් වාරිකය ගෙවා ගන්න බැහැ. ඒ මිනිස්සු අතරමං වෙලා ඉන්නේ. එහෙම නම් "Enterprise Sri Lanka" වලින් පළමුවෙන්ම කරන්න ඕනෑ දැනට සිටින ශක්තිමත් ව්‍යාපාරිකයන්ගේ ණය සහ ණය පොලී කපා හරින එකයි. දැනට සිටින ව්‍යාපාරිකයන්ගේ ණය සහ ණය පොලී කපා හරින්න. අද ව්‍යාපාරිකයෙක් ණය මුදලක් ගත්තොත් පොලිය කීයද? අද ව්‍යාපාරිකයාට මේක ඔරොත්තු දෙනවාද? ඔරොත්තු දෙන්නේ නැහැ. අද වන විට ආණ්ඩුව නාස්තිකාර වියදම් උගුලක පැටලිලා ජනතාව පීඩාවට පත් කරමින් ඉන්නේ. දවසින් දවස අධික බදු අය කරනවා. මේ තුළිනුත් එන්නේ තවත් අධික බදු. ඩොලර් එක වැඩි වෙනකොට ආනයන වියදම වැඩි වෙනවා. අවසානයේ එය පාරිභෝගිකයා පිටට දමනවා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි, ඇමතිවරුන්ට විතරක් නොවෙයි, ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයාට ඇඟිල්ල දිගු කර කිව්වා නිල්වලා සහ ගිං හග ව්‍යාපෘතිවල ඩොලර් මිලියන 35ක වංචාවක් සිදු වෙලා තිබෙනවා කියලා. ඒ ගැන "මව්බිම" පුවත්පතේ වාර්තා වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
වංචාව, ඩොලර් මිලියන 35ක්. මේ හොරකම නවත්වලාද, වංචාව නවත්වලාද, දූෂණය නවත්වලාද? නැහැ. ඒ නිසා මේ ආණ්ඩුවට වැඩ පිළිවෙළක් නැහැ. මේ ආණ්ඩුව අයාලේ යන්නේ. රට මෙහෙයවා ගන්න බැහැ. රට බාල්දු වෙලා. නූල කඩා ගත්ත සරුංගලය වාගේ ඔහේ උඩ පාවෙන ආර්ථිකයක් රටේ තිබෙන්නේ. එම නිසා තවත් පව් නොදී ආණ්ඩුව ගෙදර යන එක තමයි කරන්න තිබෙන්නේ. වෙන පැලැස්තර විසඳුම්වලින් කිසිදාක මේ රටේ ජනතාවට සහනයක් ලැබෙන්නේ නැහැ කියා මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

[අ.භා.4.48]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන් මට කලින් කථා කළ මන්ත්‍රීතුමා "මස්තබාල්දුවක්" ගැන කථා කළා. එතුමා කිව්වා නියඟය එන එක, ගංවතුර ගලන එක මස්තබාල්දුයි කියලා. 2005 වර්ෂයේ මේ රටට සුනාමි ආවේ මේ රටේ මස්තබාල්දු නායකයෝ ඉන්නකොට තමයි. ඇවිත් රටම විනාශ වුණා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
2004 සුනාමිය ආවේ.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, 2004දී. එතකොට තමුන්නාන්සේලාගේ මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි අගමැති වෙලා හිටියේ. සුනාමිය එනකොට එතුමා තමයි අගමැති වෙලා හිටියේ. එතකොට එතුමාත් මස්තබාල්දු නායකයෙක්ද කියලා අපට අහන්න වෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාත් මස්තබාල්දු නායකයෙක්ද කියලා අපට අහන්න වෙනවා. ඒ නිසා මස්තබාල්දු කථා, කථා කරලා වැඩක් නැහැ. "ලංකාදීප" පුවත් පතේ පළ කර තිබෙන ප්‍රවෘත්තියක් ගැන එතුමා අද කිව්වා. "මෝටරයක් උකස් තියලා ඇවිත් කෑම අරගෙන යනකොට අලියෙක් ගහලා මැරුණා." කියලා සඳහන් වෙනවා කිව්වා. ඔබතුමාට මතක නැතිව ඇති ඔබතුමන්ලාගේ කාලයේ මිනිස්සු කන්නේරු ඇට කාලා මැරුණා කියලා. දඹුල්ලේ ගොවියෝ වස බිව්වා. අම්මලා ළමයි අරගෙන මාතර නිල්වලා ගඟට පැන්නා, කන්න දෙන්න බැරුව. තමුන්නාන්සේලාට දැන් ඒ ඔක්කොම අමතක වෙලා තිබෙනවා. ඒ කාලයේ මිනිසුන් කන්නේරු ඇට කාලා මැරුණු ඒවා ආදී ඒ හැම එකක්ම අමතක වෙලා තමුන්නාන්සේලාගේ කාලයේ හරියට සුරපුරයක් තිබුණා වාගේයි දැන් කථා කරන්නේ. නමුත්, එහෙම සුරපුරයක් තිබුණේ නැහැ. සුරපුරයක් තිබුණේ නැහැ නේ.

දැන් finance companies ගැන කථා කරනවා. ලලිත් කොතලාවල හිරේ දමලා Ceylinco සමාගම වැස්සුවා. ඒ විතරක් නොවෙයි, Golden Key සමාගමත් වහලා දැම්මා. Golden Key සමාගමේ මුදල් තැන්පත්කරුවෝ මුදල් නැතිව පාරවල් ගණනේ තවම රස්තියාදු වෙනවා. එහෙමයි තමුන්නාන්සේලා finance companiesවල අයිතිකරුවන්ට සැලකුවේ. ලලිත් කොතලාවල මහත්මයා හිරේ දමලා ඉඩම ලියා ගත්තා. ඒ ඉඩම අරගෙන ඒක වික්කා. කොල්ලුපිටියේ එතැන දැන් apartment complex එකක් හදනවා. ඒකටත් නඩු තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා දන්න දේකුත් නැහැ. මේ ආණ්ඩුව යටතේ තමයි මේ ඔක්කොම වුණේ කියලා බොරුවට කෑගහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා අවුරුදු දෙකකට කලින් ජනාධිපතිවරණය තිබ්බා. මේ රටේ අවුරුදු දෙකකට පසුව ආර්ථික අර්බුදයක් එන බව පී.බී. ජයසුන්දර මහත්මයා කලින් දැක්කා. ඒ ආර්ථික අර්බුදයට මුහුණ දෙන්න නම් 2017 තියන්න ඕනෑ ජනාධිපතිවරණය 2015 තියන්න කියලා පී.බී. ජයසුන්දර මහත්මයා කිව්වා.

ඒ නිසා තමයි ඡන්දය තිබ්බේ. එහෙම නැතිව පේන බලන කෙනෙකු කියපු නිසා ඡන්දය තිබ්බේ නැහැ. සුමනදාස කියපු නිසා ඡන්දය තිබ්බේ නැහැ. සුමනදාස කියන විධියට ඡන්දය තියන්න මහින්ද රාජපක්ෂ මහත්මයාට පිස්සු නැහැ. පී.බී. ජයසුන්දර කියපු නිසායි ඡන්දය තිබ්බේ. "2017 වන කොට ලෝකයේ ආර්ථික අර්බුදයක් එනවා; වෙළෙඳ ගැටුම් එනවා; චීනයයි, ඇමෙරිකාවයි අතර වෙළෙඳ ගැටුම නිර්මාණය වෙනවා. එවිට එය ලෝකයේ කලාපවල තිබෙන කුඩා රටවලට බලපානවා. මෙහෙම ගියොත්, 2017 වන කොට මීට වඩා අමාරු තත්ත්වයකට මේ රටේ ආර්ථිකය ගමන් කරනවා. ඒ නිසා 2015 වන කොට ඡන්දය තියමු. අපි දිනලා 2017ට මුහුණ දෙමු" කියලා පී.බී. ජයසුන්දර මහත්මයා තමයි මහින්ද රාජපක්ෂ මහත්මයාට කිව්වේ. එතුමා ඒක අහලා ඡන්දය තිබ්බා, නමුත් ඡන්දයෙන් පැරදුණා. දැන් තමුන්නාන්සේලාගේ ඒ, පව් ඔක්කෝම අපට කර ගහන්න වෙලා තිබෙනවා. දැන් අපට ඒකට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. එම යථාර්ථයේ ඉඳගෙනයි අපි කථා කරන්න ඕනෑ. එහෙම නැතිව අපේ ආණ්ඩුව ඇවිල්ලා අවුරුදු තුනකින් මේ රටේ ආර්ථිකය වළ පල්ලට ගියා; ආර්ථිකය කඩාගෙන වැටුණා, ඩොලර් එකේ අගය වැඩි වුණා, එහෙම එකක් නොවෙයි. මේ තත්ත්වය දීර්ඝ කාලීනව ඇවිල්ලා තිබෙනවා. අද මුළු ලෝකයම පාලනය කරන්නේ IMF එකයි, World Bank එකයි, WTO එකයි. ඒක අපි සියලුදෙනාම දන්නා දෙයක්. අද ලෝක වෙළෙඳ සංවිධානය - WTO - අත හැරලා කාටවත් වෙළඳාම් කරන්න බැහැ; ඒ පැත්තෙන් අඩියක්වත් ඉස්සරහට යන්න බැහැ. එහෙම ගිය රටවල් මීට වඩා දරුණු විධියට අද කඩා වැටිලා තිබෙනවා. අද ඉරානයට සිදු වෙලා තිබෙන දේ අපි දන්නවා; කියුබාවට සිදුවෙලා තිබෙන දේ අපි දන්නවා. මේ තිබෙන වෙළෙඳ ආධිපත්‍යයට මුහුණ දෙන්න බැරිව ලෝකයේ හුඟක් රටවල් අද දරුණු විධියට කඩා වැටිලා තිබෙනවා. අපි යම්කිසි ආකාරයකට ඒකෙන් බේරිලා තිබෙනවා. එම ආර්ථික අර්බුදයෙන් යම් ප්‍රමාණයකට මේ රට ගලවා ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ ගැන අපි සන්තෝෂ වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා කිව්වා, අද ට්‍රම්ප්ගේ ආර්ථික ප්‍රතිපත්තිය මේකට බලපාන්නේ නැහැ කියලා. ඒකෙන්ම තේරෙනවා, තමුන්නාන්සේලාගේ දේශපාලන දැනුම ගැන. ට්‍රම්ප්ගේ ආර්ථික ප්‍රතිපත්ති ලෝක ආර්ථිකයට බලපාන්නේ නැහැ කියලා තමුන්නාන්සේලා කියනවා නම්, තමුන්නාන්සේලා ඉගෙන ගත්ත දේශපාලනය මොකක්ද කියලා මම දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගෝලීයකරණ ආර්ථිකයක් තිබෙන්නේ. අද මුළු ලෝකයම එක ගමක් වාගෙයි. එතකොට ඒ ගමෙන් පිට කාටවත් යන්න බැහැ. අපි එකිනෙකාට සම්බන්ධ වෙලා තිබෙනවා. ඉන්දියාව ගන්න තීන්දුවක් අපට බලපානවා; ඇමෙරිකාව ගන්න තීන්දුවක් අපට බලපානවා. මැදපෙරදිග තෙල් ටික වැඩි වෙන කොට අපේ ආර්ථිකයට ඒක බලපානවා. ඒක බලපාන්නේ නැහැ කියලා කාටද කියන්න පුළුවන්. සෞදිඅරාබිය තෙල් මිල වැඩි කරන කොට අපේ රටේ තෙල්වලට, භාණ්ඩවලට, ආනයනවලට, ජන ජීවිතයේ හැම එකකටම එම තෙල් මිල බලපානවා. එහෙම වෙන්නේ නැහැ කියලා කාටවත් කියන්න බැහැ. ට්‍රම්ප්ගේ ආර්ථික ප්‍රතිපත්ති අපට බලපාන්නේ නැත්නම්, සෞදිඅරාබිය තෙල් මිල වැඩි කළත් අපට බලපාන්නේ නැහැ කියලා අපට කියන්න පුළුවන්. එහෙම නම් සෞදිඅරාබියේ තෙල් මිල වැඩි කළාම අපට මොකද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද ලෝක ආර්ථිකය කියන්නේ, එය තුළ මුළු ලෝකයම එකිනෙකට සම්බන්ධ වෙලා තිබෙනවා. ඒවායින් කාටවත් වියෝ වෙලා යන්න බැහැ. ඒක

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

තමයි ඇත්ත යථාර්ථය. තමුන්නාන්සේලාත් ආණ්ඩු කරපු උදවිය. තමුන්නාන්සේලාගේ (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහත්මයාගෙන් මේ ගැන ඇහුවා නම් එතුමා හොඳට විග්‍රහ කර දේවි. එතුමා දන්නවා, ගෝලීයකරණය ගැන, ලෝක ආර්ථිකය ගැන. නමුත්, එතුමාත් මේ වෙලාවේ තමුන්නාන්සේලාව අන්දවනවා. අන්දවලා මෙහෙට එවනවා. තමුන්නාන්සේලා ඇවිල්ලා කෑ ගහනවා. ඒකයි වෙන්නේ. (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහත්මයා මේවා නොදන්නවා නොවෙයි. එතුමා දන්නවා. එතුමා තමුන්නාන්සේලාව අන්දවන්න එක එක දේවල් ඔළුවට දාපු ගමන් තමුන්නාන්සේලා ඇවිල්ලා කෑ ගහනවා. අද තිබෙන ලෝක ආර්ථික තත්ත්වයත් එක්ක අපට ඉදිරියට යන්න වෙනවා. අපට ඒක අතහැරලා යන්න බැහැ. ලෝකයේ තිබෙන යථාර්ථයට අපට මුහුණ දෙන්න සිදු වෙනවා. 2007, 2008 කාලයේදීත් මුළු ලෝකයේම මේ විධියේ ආර්ථික අර්බුදයක් ඇවිල්ලා හුඟක් රටවල් විනාශ වෙලා ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි තත්ත්වයක් තිබියදී පවා මේ රටේ ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දෙන්න අපට හැකි වෙලා තිබෙනවා. අධ්‍යාපනය වෙන්න පුළුවන්; සෞඛ්‍ය වෙන්න පුළුවන්; මහජොළ, සමෘද්ධිය ඇතුළු සහනාධාර, අනෙකුත් දීමනා වෙන්න පුළුවන්, ඒ හැම එකක්ම එලෙසින්ම ලබා දෙන්න පුළුවන් විධියේ ශක්තිමත් අඩිතාලමක් මේ ආණ්ඩුව දමා තිබෙනවාය කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
විනාඩි කියක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මිනිත්තු 11ක් තිබුණා නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය කළමනාකරණය කරන්න සිදු වෙලා තිබෙනවා.

[අ.භා. 4.55]

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට විනාඩි අටක කාලයක් හෝ ලබා දීපු එක ගැන මා මුලින්ම සතුටු වෙනවා. අද දින වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය පිළිබඳවත්, සුරාබදු ආඥාපනත යටතේ නිවේදන දෙකක් පිළිබඳවත්, ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවත්, එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යටතේ නියෝගය පිළිබඳවත් අපි මේ ගරු සභාවේ කථා කරනවා. සුරාබදු සම්බන්ධයෙන් වන කාරණා මාස දෙක, තුනකට වතාවක් අපේ ගරු මුදල් ඇමතිතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා. ඇත්ත වශයෙන්ම අපේ ගරු මුදල් ඇමතිතුමා ආර්ථික වශයෙන් සහනයක් දීලා තිබෙන්නේ සුරාබදු සම්බන්ධයෙන් විතරයි. මීට මාස කිහිපයකට ඉස්සෙල්ලාත් මේ ආකාරයෙන්ම සුරාබදු ආඥාපනත යටතේ මෙවැනිම කාරණාවක් ඉදිරිපත් කළා. ඒකෙන් මොකක්ද කළේ? Licence fee එක අඩු කළා. සුරාබදු ආඥාපනත යටතේ අද ඉදිරිපත් කර තිබෙන නිවේදන මඟින් රා නිෂ්පාදනය කරන අය වෙනුවෙන් සමූපකාර - cooperatives - වැඩිපුර වේලාවක් විවෘතව තියන්න අවසර දෙනවා.

ඇත්ත වශයෙන්ම මේකේ අවශ්‍යතාව මොකක්ද කියන එක මට තේරුම් ගන්න බැහැ. මොකක් හරි level playing field එකක් නැත්නම්, සාධාරණ වෙළෙඳ පොළක් නිර්මාණය කරනවා නම්, එක කට්ටියකට වැඩියෙන් ඇරලා තියන්නයි, අනෙක් අයට ඒ වෙලාව දෙන්නේ නැත්නම් ඒක සාර්ථක ප්‍රතිපත්තියක් නොවෙයි. අපේ මුදල් ඇමතිතුමා රටේ ජනතාවට බොන්න පුරුදු කරලා ඒ තුළින් ආණ්ඩුවට බදු හොයා ගන්න ක්‍රමයක් හදනවා කියන එකයි අපි නම් දකින්නේ.

අද මෙහිදී කථා කළ කථිකයන් කිහිප දෙනෙකුම රුපියල අවප්‍රමාණය වීම ගැන කථා කළා. බොහෝ වෙලාවට ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් මෙතැනදී පැහැදිලි කරලා පෙන්වන්න හැදුවා, frontier markets නැත්නම් emerging marketsවල අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ, ඇමෙරිකාවේ interest rates එහෙම නැත්නම්, පොලී අනුපාතය 0.25 per cent - 25 basis pointsවලින් වැඩි කරපු නිසා කියලා. මෙම ප්‍රාග්ධන වෙළෙඳ පොළේ තත්ත්වය හේතුවෙන් ලංකාව වාගේ රටවල මුදල් ඇමෙරිකාවට ගලා ගෙන යනවා කියන එක තමයි මෙතැනදී පැහැදිලි කරන්න බැලුවේ. හැබැයි, ලංකාවේ අපට කොච්චර මුදල් තිබෙනවාද කියලා බැලුවොත් ප්‍රාග්ධන වෙළෙඳ පොළේ -Bond market- දැනට තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.7ක් වාගේ ප්‍රමාණයක්. පසුගිය ජනවාරියේ ඉඳන් රුපියල් බිලියන 300ක්, 400ක් වාගේ ප්‍රමාණයක් ගිහිල්ලා තිබෙනවා. අපට මෙතැනදී තර්ක කරන්න පුළුවන්, මේ සම්බන්ධව අනෙක් රටවල් සමඟ සංසන්දනය කළොත් අපට තිබෙන exposure එක යම්කිසි විධියකට අඩුයි කියලා. දැනටම රුපියල් බිලියන 50ක් වාගේ ප්‍රමාණයක් මෙම මාස 8, 9 ඇතුළත ගලා ගෙන ගිහිල්ලා තිබෙනවා. හැබැයි, ඇත්ත වශයෙන්ම මෙතැනදී අපි තේරුම් ගන්නට ඕනෑ, මේක නොවෙයි මූලික කාරණාව කියන එක. අපේ හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා කථා කරන අවස්ථාවේ අපි එතුමාගෙනුත් මේ පිළිබඳව ප්‍රශ්න කළා. අවුරුදු 5ක, අවුරුදු 10ක කාලය තුළ අපේ කලාපීය මුදල් - regional currencies - දිහා බැලුවොත්, සියලුම මුදල් එක්ක අපේ රුපියල අවභාවිතාවක් වෙලා තිබෙනවා. අවුරුදු 5ක කාලය ගත්තොත්, ඇමෙරිකානු ඩොලර් එකත් එක්ක සියයට 21.8කින් අඩු වෙලා තිබෙනවා. චීනයේ යුවාන් එකත් එක්ක සියයට 18.5කින් අඩු වෙලා තිබෙනවා. සිංගප්පූරු ඩොලර් එකත් එක්ක සියයට 12.5කින් අඩු වෙලා තිබෙනවා. ඉන්දියානු රුපියලත් එක්ක සියයට 6.7කින් අඩු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ඇති ඔබතුමා බැංකොක් වාගේ රටකට අවුරුදු 5කට, 10කට ඉස්සෙල්ලා යනකොට අපට ගෙවන්න තිබුණේ බාට් එකකට **රුපියල්** 2.25ක් වාගේ ප්‍රමාණයක්. අද බාට් එකක් කීයක් වෙනවාද? රුපියල් 5ක් වාගේ ගණනක් ගෙවන්න වෙනවා. මැලේසියාවේ රින්ගිට් එක දිහා බැලුවොත් ඒකටත් දැන් අපට

ගෙවන්න තිබෙනවා. මම හිතන්නේ මෙම ප්‍රශ්නය ඇමෙරිකාවට දාලා; ට්‍රම්ප් පිටින් දාලා බේරෙන්න බැහැ. මම හිතන්නේ මෙහි මූලික ප්‍රශ්නය වෙලා තිබෙන්නේ අද අපේ අපනයනයි, ආනයනයි අතර තිබෙන පරතරයයි. එය එන්න එන්නම වැඩි වෙලා තිබෙනවා. අපේ ආණ්ඩු පක්ෂයේ ඉන්න සමහර මන්ත්‍රීවරු -අපේ හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමාත්, ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමාත්- කියනවා, අපනයනයට මේක හොඳයි කියලා. යම් කිසි විධියකට මේ තර්කයේ ඇත්තක් තිබෙනවා. අපි අපනයනය කරන රටවල් පිළිබඳව පොඩ්ඩක් කල්පනා කරලා බලන්න කෝ. ලෝකයේ තුන්වැනි අපනයනය කරන රට තමයි ජර්මනිය. ජර්මනිය ට්‍රිලියන 1.45ක් අපනයනය කරනවා. ඒ කියන්නේ බිලියන 1,450ක් හැම අවුරුද්දකම ඒ අය අපනයනය කරනවා. මේ අපනයනය කරන්නේ යුරෝ එක බාල්දු කරලා නොවෙයි. එහෙම නැත්නම් මීට ඉස්සෙල්ලා ඩොයිෂ් මාක් එක භාවිත කරන කොට, එය බාල්දු කරලා නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු තාරක බාලසූරිය මහතා**
(මාණ්පුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
අද යුරෝ එක ශක්තිමත් මුදලක් හැටියට සියලු දෙනාම ගණන් ගන්නවා. ඒ වාගේම තමයි සිංගප්පූරුව වාගේ රටවලින් අපට යම් කිසි විධියකට ආදර්ශයක් ගන්න පුළුවන් වෙනවා. මම හිතන්නේ 1967 "Bretton Woods" ක්‍රමවේදය නැත්නම්, රත්තරන් එක්ක තිබුණු සම්බන්ධතාව කඩා වැටෙනකොට එංගලන්තයේ පවුම විශාල ලෙස -සියයට 14කින් වාගේ ප්‍රමාණයකින්- අවප්‍රමාණය වුණා. හැබැයි, එංගලන්තයේ පවුම සියයට 14ක් වාගේ ප්‍රමාණයකින් අවප්‍රමණය වුණා කියලා, සිංගප්පූරු ඩොලරය අවප්‍රමාණය කළේ නැහැ. 1971දී ඇමෙරිකානු ඩොලර් එක අවප්‍රමාණය වන විට, සිංගප්පූරු ඩොලරය අවප්‍රමාණය කළේ නැහැ. 1967 දී පමණ සිංගප්පූරු ඩොලර් එක තිබුණේ ඇමෙරිකානු ඩොලර් එකට සාපේක්ෂව සියයට 0.36කට. දැන් කීයද තිබෙන්නේ? දැන් සියයට 1.2ක් වාගේ ගණනකට තමයි තිබෙන්නේ. මොකද, මේ සිංගප්පූරු ඩොලර් එක ශක්තිමත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ අයගේ අපනයනය ශක්තිමත් වෙලා තිබෙනවා.

නිවැරැදි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොකරන නිසා තමයි අද අපේ රට මෙවැනි තත්ත්වයකට පත්වෙලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු තාරක බාලසූරිය මහතා**
(මාණ්පුමිකු තාරක්ක පාලසූරිය)
(The Hon. Tharaka Balasuriya)
ඒ කාලයේ සිංගප්පූරුවේ සිටි මුදල් ඇමති, Dr. Goh Keng Swee මැතිතුමා කිව්වා, "වෙනත් රටක් තමන්ගේ මුදල් අවප්‍රමාණය කළාට, අපි එහෙම කරන්න වුවමනාවක් නැහැ" කියා. එසේ අවප්‍රමාණය කළොත්, සමහර වෙලාවට අපනයනවලින් කෙටිකාලීන වාසියක් ගන්න පුළුවන් වුණත්, එහෙම කෙටිකාලීන වාසියක් ගත්තාට, ඒ තුළින් ආනයනය කිරීම සඳහා යන මුදල - import cost- වැඩි වන බවත්, ජීවන වියදම වැඩි වන බවත්, අපේ පඩිය - real wages - එන්න එන්න අඩුවන බවත් එතුමා කිව්වා. පඩිය අඩු වුණාම මොකක්ද වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? Social unrest. මිනිසුන් පාරට බැහැලා, පඩි වැඩි කරන්න කියා strike කරනවා.

ඉතා කෙටිකාලීන විසඳුමක් ලබා දෙන්නයි මේ ආණ්ඩුව බලන්නේ. අපේ අපනයන ශක්තිමත් කරන්න මේ අවුරුදු තුනහමාර තුළ ක්‍රියාත්මක ප්‍රතිපත්ති මොනවාද කියන එකයි අපි මේ ආණ්ඩුවෙන් අහන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ කාලයෙන් විනාඩි තුනක් අඩු කළ නිසා මම මීට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා.

ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.***

*අතන්පිරකු, මාණ්පුමිකු සෙහ්‍රාන් සේමසිංහ අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු මුජිපුර් රහ්‍රූමාන් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.*

*Whereupon* THE HON. SHEHAN SEMASINGHE *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

[අ.භා. 5.03]

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මුදල් අමාත්‍යාංශයට අදාළව, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගයක්, සුරාබදු ආඥාපනත යටතේ නිවේදන දෙකක්, එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යටතේ නියෝගයක් හා ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත අද දින මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කළා. ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුත් කථා කළා. සමහර අය විශාල විවේචන ඉදිරිපත් කළා. හැබැයි, අපි මේ රටේ ආර්ථිකය ගැන කථා කරනකොට ඉතිහාසය දෙසත් පොඩ්ඩක් බැලිය යුතුයි. ඉතිහාසයේ තිබුණු ආණ්ඩු -පසුගිය ආණ්ඩු- විසින්

[ගරු සන්දිත් සමරසිංහ මහතා]

කළ ඒ ව්‍යාපෘති පිළිබඳව නිවැරැදි ඇගැයීමක් කර, එම ව්‍යාපෘති මේ රටටත්, ජනතාවටත් අවශ්‍යද කියා බලා ඒ දේවල් කළා නම් අද මේ රට මෙවැනි තත්ත්වයකට පත් වෙන්නේ නැහැ. එදා එතුමන්ලා විශාල ව්‍යාපෘති කළා. ගුවන් යානා එන්නේ නැති ගුවන් තොටුපළවල් හැදුවා. වරායවල් හැදුවා. ක්‍රිකට් ගහන්න බැරි පිටවනි හැදුවා. ඒවා හදලා රටේ ජනතාවට විශාල ණය බරක් ගෙනාවා. ඒ එකක්වත් මේ රටේ තිබුණු මුදල්වලින් නොවෙයි කළේ. විදේශ රටවලින් විශාල මුදලක් අරගෙන තමයි ඒ දේවල් කළේ.

2015 ජනවාරි 8වන දා අපි මේ රටේ වෙනසක් කරලා, ඒ අවුරුද්දේම අගෝස්තු 18වන දා ආණ්ඩුව භාර ගත්තා. හැබැයි, නිකම්ම නොවෙයි, ලොකු දැවැද්දකුත් එක්කයි අපි ආණ්ඩුව භාර ගත්තේ. තමුන්නාන්සේලා දුන් ණය බරත් එක්ක තමයි අපි මේ රට භාරගෙන කටයුතු කරගෙන ගියේ. ඒ ණය බරත් දරාගෙන, ඒවා ගෙවාගෙන යන ගමන් මේ රටේ ජනතාවට අවශ්‍ය සහන ලබා දෙන්න අපට හැකි වුණා. එසේ සහන ලබා දෙන අතරතුර, අපේ ආණ්ඩුව පවතින කාලය තුළදී මේ රටට ව්‍යසනවලටත් මුහුණ දෙන්න සිදු වුණා; නාය යාම්වලට, නියඟවලට මුහුණ දෙන්න සිදු වුණා. හැබැයි, එම ව්‍යසනවලට මුහුණ දුන් මේ රටේ සියලුම ජනතාවට සහන ලබා දෙන්න රටක් හැටියට, ආණ්ඩුවක් හැටියට අපට හැකි වුණා. ඒ සඳහා හොඳම උදාහරණය තමයි, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අපේ අරනායක ප්‍රදේශයේ ඇති වුණු නාය යාම. ඒ අයට අවශ්‍ය නිවාස තනා දෙන්න මේ රජයට හැකි වුණා; ඒ නිවාස ලබා දෙන්න මේ රජය කටයුතු කළා. අලාභ සිදු වුණත්, රටේ ජනතාවට සහන ලබා දීලා අපි ඉදිරි කටයුතු කරගෙන ගියා.

මේ රට දිහා බලනකොට අපි තේරුම් ගන්න ඕනෑ, රජයන් ඇවිල්ලා සෑම විටම කටයුතු කර තිබෙන්නේ ඒ අයගේ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සහ බලයේ සිටීම සඳහා පමණක් බව. මේ රටට සරිලන ජාතික ප්‍රතිපත්තියක් හදලා, රට ඉදිරියට ගෙන යන්නේ කොහොමද, රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියන වැඩ පිළිවෙළට ඒ අය කවදාවත් ගිහින් නැහැ. 2030 වෙනකොට අනෙක් රටවල් එක්කම අපිත් තිරසර සංවර්ධන ඉලක්ක සපුරන්න ඕනෑ. වර්තමාන ආණ්ඩුව විශේෂයෙන්ම ප්‍රතිපත්තියක් එක්ක, රටේ ජනතාවත්, පරිසරයත් ආරක්ෂා කරගෙන ඒ සියලු කටයුතු කරමින් අද ඉදිරියට යනවා.

රටේ ජනතාව මත අද විශාල බරක් පටවලා තිබෙනවාය කියා විපක්ෂය කියනවා. නමුත්, මේ රජය ජනතාවට සහන විශාල ප්‍රමාණයක් දී තිබෙන බව අපි දන්නවා. රෝගීන්ට අවශ්‍ය බෙහෙත් හේත්වල මිල අඩු කරන්න අද අපට හැකි වෙලා තිබෙනවා. එපමණක් නොවෙයි, පාසල් දරුවන් වෙනුවෙන් "සුරක්ෂා" රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කරන්නත් අද අප කටයුතු කර තිබෙනවා. ඒ වාගේම "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ පාසල් සංවර්ධනය කරලා, අධ්‍යාපනික වශයෙන් මේ රට ඉදිරියට ගෙන යන්න කටයුතු කර තිබෙනවා. අපි මේ සියලු දෙයක්ම කරන්නේ, අපේ රට ගෙවිය යුතු ණය ගෙවා ගෙන යන අතරේයි.

"ජනතාව බලාගෙන හිටියා, ඒ මිනිසුන්ට කිසිම දෙයක් දීලා නැහැ, අපේ අභිංසක ජනතාව නොමඟ යැව්වා" කියා විපක්ෂය අද කියනවා. අපි රජයක් හැටියට කවදාවත් කවුරුවත් නොමඟ යවා නැහැ. අපි සෑම විටම උත්සාහ කරන්නේ මේ රටේ ජනතාවට හරියාකාරව සේවය කරන්නයි. විශේෂයෙන්ම රජයක් හැටියට ඉස්සර වෙලාම අපි කර තිබෙන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීමයි; ආර්ථික දියුණුව ඇති කිරීමයි. විනිවිදභාවය කියන දේ අද මේ රට තුළ තිබෙනවා. අද රටේ ක්‍රියාත්මක කරන ඕනෑම ව්‍යාපෘතියක් ගැන, "මේ දේ වනවාද, කරනවාද, හරියාකාරව ක්‍රියාත්මක වනවාද?" කියා ඕනෑම කෙනෙකුට කථා කර අහන්න පුළුවන්; අද ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් කථා කරලා ඒ දේවල් අහන්න පුළුවන්.

අද ලෝක වෙළෙඳ පොළේ සිදුවන වෙනස්වීම් දිහා බැලුවාම, ඩොලරයට ගෙවිය යුතු රුපියලේ අගය වැඩි වුණත් රටේ ජනතාවට සහන ලබා දෙන එක අපි අඩු කර නැහැ. ඇතැම් භාණ්ඩවල මිල වැඩි වෙලා තිබෙන බව අපි දන්නවා. එම මිල ගණන් අඩු කරලා, ඉදිරියේදී තවත් සහන ලබා දෙන්න රජයක් හැටියට අපි කටයුතු කරගෙන යනවා. මේ දේවල් විවේචනය කර කර ඉන්නේ නැතිව, පක්ෂ, විපක්ෂ සියලුදෙනාම එකතු වෙලා මේ රට ඉදිරියට ගෙන යන වැඩ පිළිවෙළකට යමුය කියන යෝජනාව කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක් තිබෙනවා.

[අ.භා.5.09]

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මුදල් අමාත්‍යාංශයට අදාළව අද ඉදිරිපත් කර තිබෙන මෙම නියෝග, නිවේදන හා පනත් කෙටුම්පත පිළිබඳව මේ පාර්ලිමේන්තුව තුළ කෙරුණු කථාවලදී මට ආණ්ඩු පක්ෂය හා විපක්ෂය වෙන් කර හඳුනා ගන්න බැරි වුණා. මොකද, අද ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු දිගටම හැසිරුණේ විපක්ෂයේ මන්ත්‍රීවරු විධියටයි. අවුරුදු තුනක් තිස්සේම මෙතුමන්ලාගේ යෝජනා නම් තිබෙනවා. හැබැයි, ඒවා බිම් මට්ටමෙන් ක්‍රියාත්මක වන විධිය අපි මේ අවුරුදු තුනේදීම දැක්කේ නැහැ. ලෝක බැංකුවේ, IMF එකේ තිබෙන ගැටලු නිසා තමයි අද මේ ආර්ථිකය හසුරුවා ගන්න බැරි වෙලා තිබෙන්නේ කියා ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියනවා අපි අහගෙන හිටියා. හැබැයි මම එතුමාට මතක් කර දෙන්න කැමැතියි, ඕනෑම රටක රජයක් අලුතින් පත් වුණාම අභියෝග එන බව. ඒවාට මුහුණ දෙන්න ඒ ආණ්ඩුව දැන ගන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ මැතිතුමා භාර ගත්ත රටේ අවුරුදු 30ක කුරිරු යුද්ධයක් තිබුණා. මේ ත්‍රස්තවාදය කියන එක මැඩ පවත්වන්න අද මුළු ලෝකයම අපොහොසත් වෙලා තිබෙනවා. ISIS මැඩ පවත්වන්න අද ලෝකයම අසමත් වෙලා තිබෙනවා. "මේ ත්‍රස්තවාදය අවසන් කරන්න ලෝකයටම බැරි නිසා මටත් එය කරන්න බැහැ" කියා එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාත් හිතුවා නම්, අදත් මේ රටේ ත්‍රස්තවාදීන් ඉන්නවා; අදත් මේ රටේ ජනවාර්ගික ගැටලුව තිබෙනවා. එතුමා එදා ලෝකය ගැන හිතන්නේ නැතිව, "රට තුළ තිබෙන ත්‍රස්තවාදය කෙසේ හෝ නැති කරනවා" කියා හිතලා ක්‍රියා කළ නිසා තමයි, එය විසඳන්න පුළුවන් වුණේ.

"අද රටේ ආර්ථිකයේ ප්‍රශ්නයක් නැහැ, එය දැන් හොඳට හැදිලා තිබෙන්නේ, දැන් ගැටලු නැහැ, අපි දැන් සියලුම ප්‍රශ්න විසඳාගෙන තිබෙන්නේ" කියා ගරු අගමැතිතුමා කියනවා. හැබැයි අපි එතුමාට මතක් කර දෙන්න කැමැතියි, එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට භාර දෙනකොට රටේ ආර්ථික සංවර්ධන වේගය සියයට 7.2ක් බව. ඉතාම ශීඝ්‍රයෙන් වර්ධනය වන රටක් තමයි

එතුමා භාර දුන්නේ. හැබැයි, ස්ථාවර වුණාය කියා ඔබතුමන්ලා කියන මේ ආර්ථිකයේ සංවර්ධන වේගය සියයට 2.8 දක්වා පහත වැටී තිබෙන බව තමයි අපි දකින්නේ. ඉතින් මේ ආර්ථිකය ස්ථාවරයි කියා ඔබතුමන්ලා කොහොමද කියන්නේ? මහින්ද රාජපක්ෂ මැතිතුමා ඔබතුමන්ලාට මේ රට භාර දෙද්දී කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්ධන වේගය සියයට 4.8යි. එතකොට කෘෂිකර්ම ක්ෂේත්‍රය ඉතාම ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් තිබුණා. හැබැයි එය දැන් ඍණ දශම අට දක්වා කඩා වැටී තිබෙනවා; එය ඍණ පැත්තටත් ගිහින් තිබෙනවා. නමුත්, "ආර්ථිකය දැන් ස්ථාවර වෙලා තිබෙන්නේ" කියා ඔබතුමන්ලා කියනවා.

මම මතක් කරන්න කැමැතියි ඔබතුමන්ලාගේ මේ ආණ්ඩුව බලයට පත් වෙන්නේ "තරුණ-තරුණියන්ට රැකියා දසලක්ෂයක් දෙනවා." කියා බව. රැකියා දසලක්ෂයක්! හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව පත් වුණාට පසුව 2014 වර්ෂයේ 4වැනි කාර්තුවේ තිබුණු රැකියා සංඛ්‍යාවත් සමඟ, 2018 වර්ෂයේ 1වැනි කාර්තුවේ තිබුණු රැකියා සංඛ්‍යාව සංසන්දනය කරනකොට, රැකියා භාරලක්ෂඅසූදෙදහසක් අහිමි වෙලා කියන කාරණය පෙනී යනවා. දැන් ආර්ථිකය ස්ථාවරද? එහෙම නම් කොහොමද, භාරලක්ෂඅසූදෙදහසකට රැකියා අහිමි වුණේ?

අපි දැක්කා, "දැන් රටේ අපනයනය වැඩි වෙලා. GSP Plus ලැබුණා." කියා ඔබතුමන්ලා කියපු ආකාරය. හැබැයි, අපිට ඒකේ ප්‍රතිඵල පෙනෙන්නේ නැහැ. මොකද, අද වනවිට පවතින වෙළෙඳ ශේෂය බලන්න. එදා තිබුණේ ඍණ 8,287යි. අද වනවිට ඒ ප්‍රමාණය ඊටත් එහා ගිහිල්ලා, ඍණ 9,619ට ඇවිත් තිබෙනවා. වෙළෙඳ ශේෂය වැඩි වෙලා තිබෙනවා. කොහොමද, එහෙම වුණේ? ඒ නිසා මේ කියන ස්ථාවරත්වය අපට නම් පෙනෙන්නේ නැහැ. ඒ වාගේම මෙතුමන්ලා "ඩොලරයේ අගය වැඩි වීමට, ඇමෙරිකාවේ පොලී අනුපාත වැඩි වීම බලපා තිබෙනවා." යනාදී විවිධ හේතු දිගින් දිගටම දක්වන ආකාරය අපි දැක්කා. හැබැයි, ඩොලර් එකේ අගය වැඩි වෙන්න පටන් ගත්තේ මාස දෙකක් තිස්සේ නොවෙයි, කියන කාරණය අපි ඔබතුමන්ලාට මතක් කරන්න කැමැතියි. රුපියල කඩා වැටෙන්න ගත්තේ 2015 ජනවාරි 08 වැනි දා ඔබතුමන්ලා රට භාර ගත්ත දවසේ ඉඳලායි. එදා සිට රුපියල ක්‍රමානුකූලව කඩා ගෙන වැටුණා. රුපියලේ සියයට 29ක කඩා වැටීමක් තිබෙනවා, මෙතුමන්ලා රට භාර ගත් දවසේ ඉඳලා. ඔබතුමන්ලා කියනවා ඉන්දියානු රුපියලේ විශාල කඩා වැටීමක් තිබෙනවා කියා. හැබැයි, 2014 ඉඳලා 2018 දක්වා ගත්තාම ඉන්දියානු රුපියලේ කඩා වැටීම සියයට 8යි. ලංකා රුපියලේ සියයට 29ක කඩා වැටීමක් තිබෙනවා. ඔබතුමන්ලා මේවාට වග කියන්න ඕනෑ. ඔබතුමන්ලාගේ මේ ආර්ථික වැඩ පිළිවෙළේ අසාර්ථකත්වය තමයි මේකෙන් පෙනී යන්නේ.

ඊළඟට, අපි ඔබතුමන්ලාට මතක් කරන්න කැමැතියි, අද ලංකාවේ සියලුම ක්ෂේත්‍රවල ඉහළ සිට පහළ දක්වා වන සියලුම ආයතන කඩා වැටීමට පත් වෙලා තිබෙන බව. ලංකාවේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරික ආයතනයක් වන හේලීස් සමාගමේ චිතරක් මේ වර්ෂයේ පාඩුව මිලියන 342යි. ඒ වාගේම රිච්ඩ් පීරිස් සමාගමේ ආදායමේ සියයට 29ක අඩු වීමක් තිබෙනවා. ඒ වාගේම හේමාස් සමාගමේ සියයට 20ක අඩු වීමක් තිබෙනවා. ඒ, ඉහළම මට්ටමේ තිබෙන ආයතන. හැබැයි, ඉහළ සිට පහළ දක්වා වන සියලුම ආයතනවලට මේ ආර්ථික පරිහානිය මේ වනවිට බලපා තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලා ඕනෑ කෙනෙකුට කියන්න පුළුවන් රටේ ප්‍රශ්න තිබෙනවා කියා. ඔබතුමන්ලාට හැම දාම මේ චෝදනා එල්ල කරන්න පුළුවන්. එක්කෝ ණය බර ගැන කථා කරන්න පුළුවන්. හැබැයි, ඔබතුමන්ලා ආණ්ඩුවක් වශයෙන් මේ රටේ ආර්ථිකයට වග කියන්න ඕනෑ. මේ ආර්ථිකය හදන්න බැරි නම්, ඔබතුමන්ලා මැතිවරණයකට ගිහින් හෝ ආර්ථිකය හදන්න පුළුවන් කෙනෙකුට රට භාර දෙන්න කියා ඉල්ලීමක් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි හයක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 5.15]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කිරීමට මේ කාලය ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මගේ මිත්‍ර ඩී.වී. චානක මන්ත්‍රීතුමා කථා කළාට පසුව මට කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳවත් මා සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ රටේ ආර්ථිකය එකවරම කඩා ගෙන වැටුණේ නැහැ. මේ රටේ ආර්ථිකය ක්‍රම-ක්‍රමයෙන් තමයි කඩාගෙන වැටුණේ. විශේෂයෙන්ම අපේ රටේ ඉතිහාසය ගත්තාම, අපේ රටේ අපනයන ආර්ථිකයක් තිබුණු බව අපි දන්නවා. අපි කුරුඳු අපනයනය කළා. තේ, පොල් සහ රබර් අපනයනය කරන ආර්ථිකයක් අපට තිබුණා. ඒ වාගේම රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේදී, වත්මන් අගමැතිතුමා වන ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා තරුණ කටයුතු ඇමතිතුමා විධියට කටයුතු කළ කාලයේදී බියගම නිදහස් වෙළෙඳ කලාපය, කටුනායක නිදහස් වෙළෙඳ කලාපය ඇතුළු වෙළෙඳ කලාප ඇති කර, මේ රටේ අපනයන ආර්ථිකයක් ඇති කළා; මේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කළා. ඒ හරහා මේ රටට දැවැන්ත ඩොලර් ප්‍රමාණයක්, ඒ වාගේම පිට රට මුදල් ප්‍රමාණයක් ලැබුණා. ඒ වාගේම මේ රටේ සිටින අහිංසක තරුණ-තරුණියන්ට රැකීරක්ෂා සොයා ගන්න පුළුවන් පරිසරයක් අපි නිර්මාණය කළා. නමුත් 1994දී මොවුන් මේ රට භාර ගත්තාට පසුව, දිනෙන් දින මේ රට ආර්ථික වශයෙන් අගාධයට අරගෙන ගියා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි මේ රට ඍණ ආර්ථිකයක් සහිත රටක් බවට පත් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2002දී ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා මේ රට භාර ගන්නකොට, පැවැතියේ ඍණ ආර්ථිකයක්. නමුත් අපි එය ධන ආර්ථිකයක් බවට පත් කළා. ඊට පසුව පැවැති ආණ්ඩුව 2005 වර්ෂයේ මේ රට භාර ගෙන ඔවුන් මොකද, කළේ? අපි ධන ආර්ථිකයක් බවට පත් කර තිබුණු මේ රටේ ආර්ථිකය දිනෙන් දින අගාධයට අරගෙන ගියා.

එදා එක පුද්ගලයෙක් ලෝකයට ණය වෙලා තිබුණේ ලක්ෂ තුනකට වැඩි ප්‍රමාණයක්. නමුත්, 2015 අවසන් වෙනකොට -අපට ආණ්ඩුව ලබා දෙන කොට- එක පුද්ගලයෙක් ලෝකයට ලක්ෂ පහක් ණය වෙනවා. මිලියන 20ක් ණය වෙනවා. මේ ණය වුණේ කොහොමද? අපේ රටේ මිනිසුන්ට කන්න දීලාද? අපේ රටේ මිනිසුන්ට බොන්න දීලාද? අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න මොනවාද කළේ? අපි දන්නවා, අපි මාධ්‍ය ඔස්සේ දැකලා තිබෙනවා, පොත පතේ කියවලා තිබෙනවා, චීනය කියන්නේ ලෝකය හඳුනා ගත්තු රටවලට යටිතල පහසුකම් සංවර්ධනය කරගන්න ණය දෙන රටක් කියා. චීනය කරන්නේ ඒකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ණය අර ගත්තු රටවල් ඒ ව්‍යාපෘති කර, ඒ ව්‍යාපෘතිවලින් ලාභයක් නැතුව දිනෙන් දින පොලියයි, ණයයි ගෙවා ගන්න බැරුව චීනයට ණය වෙනවා කියන එක හැමෝම දන්නා රහසක්. ඒකත් සමඟ මොකද

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

වෙන්නේ? අපේ තිබෙන සම්පත් ඔවුන් කඩා වඩා ගන්න උත්සාහ ගන්නවා. ඒ වාගේ ව්‍යාපෘති ගණනාවක් අපේ රටේ ක්‍රියාත්මක වුණා.

හම්බන්තොට ගුවන් තොටුපොළ, Hambantota Convention Centre එක, ක්‍රිකට් ක්‍රීඩාංගණය මේ සියල්ලක්ම හැදුවත්, මේවායින් ප්‍රතිලාභයක් රටේ ජනතාවට, ආර්ථික වශයෙන් රටට ලැබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම දිනෙන් දින මේ රට ණය උගුලක හිර කළේ පසු ගිය ආණ්ඩුවයි. අපටත් පුළුවන්, බොහොම උජාරුවට ලෝකයෙන් ණය ගන්න. ණය අරගෙන මේ රට ණය කරන්න. නමුත් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා වේදිකාවක්, වේදිකාවක් ගණනේ හැම දාම කියන්නේ මොකක්ද? අපේ රට ණය වෙලා තිබෙන මේ ණය බර අපි විසින් විඳවලා, අපි විසින් ගෙවලා මේ රටේ ණය නැවත වතාවක් අපේ රටේ අභිංසක උපන්-නූපන් දරුවන්ට ගෙවන්න ඉඩ තියන්නේ නැහැ කියන එක ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියනවා. එහෙම කියන්නේ මේ රටේ අනාගතය ගැන කැක්කුමක් තිබෙන නිසා. මේ රටේ උපන්-නූපන් දරුවන්ට ආදරයක් තිබෙන නිසා. මොකද, මේ රටේ තවදුරටත් අද දිනයේ ජීවත් වෙන්න බැරි සමාජයක් නිර්මාණය කරන්න බැහැ.

සමහර රටවල් වාගේ හම්බ කරන සල්ලි නැත්නම් ණය වෙලා අද විතරක් චූන් එකේ, එහෙම නැත්නම් ජොලියේ ඉඳලා, ඒ සල්ලි ටික නැති කරලා, අනාගතය උදෙසා වැඩ කටයුතු නොකර ඉන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒක ලේසියි. චීනයෙන්, අරෙහෙන්-මෙහෙන් ණය අරගෙන හැමෝටම හම්බ කර ගන්න පුළුවන්; කොමිස් ගහගන්න පුළුවන්. එවැනි පරිසරයක් නිර්මාණය කරන්න ලේසියි. නමුත්, මේ රටේ ශක්තිමත් ආර්ථිකයක් නිර්මාණය කරන්න අමාරුයි. ඒක කරන්න අවශ්‍ය නම් අපි මොකක්ද කරන්න ඕනෑ. මේ රටට ඩොලර් එන්න ඕනෑ නම් මොකක්ද කරන්න ඕනෑ. අපට නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කරන්න වෙනවා. අපනයන ආර්ථිකයක් නිර්මාණය කරන්න වෙනවා. ඒ වාගේම අපේ රටට එන විදේශිකයෝ - touristsලා - වැඩි කරන්න වෙනවා. ඒකට තමයි අපි මේ කටයුතු කරන්නේ. ඒ උදෙසා තමයි ගම සංවර්ධනය කරන, ගමේ ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නේ. අද එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන හරහා මොකක්ද කරන්නේ? NVQ කරලා තිබෙන හැම තරුණ-තරුණියෙකුටම මිලියන 1.5ක ණයක් දෙනවා.

Home tourism කරන කෙනෙකුට සියයට 6.75ක පොලියට මිලියන 5ක ණයක් දෙනවා. ඒ අයට තමුන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න පුළුවන්. මේ පොලියෙන් සියයට 50ක් ආණ්ඩුව දරන්නේ ඒකයි. ඒකෙන් තමුන්ට අවශ්‍ය කරන ආර්ථිකමය දැක්ම, ආර්ථිකමය ශක්තිය ලබා ගන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් කල්පනා කර බලන්න. එදා තිබුණු අපේ කර්මාන්තශාලා ටික වැහෙන්න ගත්තා. ඒකත් සමඟ අපේ රටේ තරුණ-තරුණියන්ට රැකී-රක්ෂා නැති වුණා. ඒකට හේතුව මොකක්ද? GSP Plus එක නැති වෙච්ච එක. GSP Plus එක නැවත වතාවක් අපි ලබා ගත්තා. හැබැයි, ලබා ගත්තු ගමන් එළිවෙන ජාමෙට ඇවිල්ලා කර්මාන්තශාලා දමන්නේ නැහැ. ඒකට අවශ්‍ය කරන යටිතල පහසුකම් දෙන්න ඕනෑ. බැංකුවලින් ණය දෙන්න ඕනෑ. ඒකට අවශ්‍ය කරන පරිසර වාර්තා ගන්න ඕනෑ. ඒකට අවශ්‍ය කරන orders ටික පිට රටින් ලැබෙන්න ඕනෑ. මේ සියල්ලක්ම වෙන්න ඕනෑ. [බාධා කිරීමක්] ඒක තමයි ආණ්ඩුවක් හැටියට අපි ඒ ගොල්ලන්ට ලබා දීලා තිබෙන අවස්ථාව. මම තව දෙයක් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පෞද්ගලික රෝහල්වල outpatientsලාගෙන් අය කරන වැට් එක අයින් කර තිබෙනවා. වෛද්‍ය ක්ෂේත්‍රයට මේ ආණ්ඩුව කරපු තරම් සේවයක් කවදාවත් කර නැහැ. රෝගීන්ටත් ලැබිලා නැහැ. විශේෂයෙන්ම ඖෂධ මිල අඩු කළා. අත්‍යවශ්‍ය ඖෂධ 48ක මිල අඩු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇස්වලට දමන කාව ටික නිකම් ලබා දෙනවා. හෘදය වස්තුවට දමන stent එක නිකම් ලබා දෙනවා. ඒ වාගේම පිළිකා රෝගීන්ට අවශ්‍ය කරන ඖෂධ ටික සීමාවකින් තොරව ලබා දෙන්න අපට පුළුවන්කම ලැබුණා.

ඒ කියන්නේ මේ රටට අවශ්‍ය කරන සම්පත් ටික මේ යහ පාලන ආණ්ඩුව රටට ලබා දීලා තිබෙනවා. අද ඊටත් ඔබ්බට ගිහිල්ලා පෞද්ගලික රෝහල්වලට අවශ්‍ය කරන සහන ටික ලබා දෙන්නත් කටයුතු කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආණ්ඩුව දිහා කුහකත්වයෙන් බලන, ද්වේශයෙන් බලන ඒකාබද්ධ විපක්ෂයට අපි කියනවා, ඒ ගොල්ලන්ට ආණ්ඩුවක් තිබුණා නම්, මේ වෙනකොට මේ රට චීනයට ණය වෙච්ච රටක් බවට පත්වෙලා අවසන් කියලා. බොහොම ස්තුතියි.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩී.වී. චානක මන්ත්‍රීතුමා කථා කරපු අවස්ථාවේ කරපු වැරැදි ප්‍රකාශයක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් කරන්න ඕනෑ.

එතුමා කිව්වා, සමහර ආයතන සම්පූර්ණයෙන් වැටිලා තිබෙනවා කියලා. ඒක වැරැදියි. උදාහරණයක් වශයෙන් අබාන්ස් ආයතනයේ profit එක සියයට 147කින් වැඩි වෙලා තිබෙනවා. එතුමා සඳහන් කළ Hayleys PLC එකේ ලාභය සියයට 32.3කින් වැඩි වෙලා තිබෙනවා. ඊට අමතරව, NDB PLC එකේ සියයට 69කින් වැඩි වෙලා තිබෙනවා; Dialog ආයතනයේ ලාභය සියයට 48කින් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුවේ අසත්‍ය කියන එක නවත්වන්න ඕනෑ. ඇත්ත දත්ත මා ළඟ තිබෙනවා. මේ රටේ ආයතන බොහොමයක් තවමත් ලාබ ලබනවා. ඒ නිසා මේ සභාවේ අසත්‍ය කියන එක නවත්වන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා ඒ ප්‍රශ්නය හෙට දිනයේ මතු කරන්න.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## සුරාබදු ආඥාපනත: නිවේදනය
## மதுவரிக் கட்டளைச் சட்டம் : அறிவித்தல்
## EXCISE ORDINANCE: NOTIFICATION

## I

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජූනි 13 දිනැති අංක

2075/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.04 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 10/2018 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*විනා විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

## II

**ගරු මංගල සමරවීර මහතා**
(මාණ්ඩලික කටයුතු සඳහා කැබිනට් අමාත්‍ය)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජූනි 13 දිනැති අංක 2075/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.04 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 11/2018/ දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දක්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*විනා විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

# ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත
# பொருளாதாரச் சேவை விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்
# ECONOMIC SERVICE CHARGE (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.*
*විනා විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි, අතන්බඳි, සභා මූලික මතිපිරිට්පත්ත් මුරෙයාක මතිප්පිටප්පට්ටතු.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය.:*

*'පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු මංගල සමරවීර මහතා]*

*තීරණය කරන ලදී.*
*சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு மங்கள சமரவீர]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Mangala Samaraweera.]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
*[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

*1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.)
## வாசகம் 2.- (2006ஆம் ஆண்டின் 13ஆம் இலக்க, பொருளாதாரச் சேவை விதிப்பனவுச் சட்டத்தின் 2ஆம் பிரிவினைத் திருத்துதல்.)
CLAUSE 2.- (*Amendment of section 2 of Act, No. 13 of 2006.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 7 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-
'වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින්' ";

(2) "1 වන පිටුවේ, 9 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-
'(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ-
(අ) (අ) වන ඡේදයේ අදාළ පිරිවැටුමේ සෑම' ";

(3) "1 වන පිටුවේ, 13 වන සහ 14 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-
'(ආ) (ආ) වන ඡේදයේ-
(i) (ii) වන උපඡේදයේ "ලෝහ තොග ආනයනය" ';

(4) "1 වන පිටුවේ, 18 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-
'(ii) (iii) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත' ";

[ගරු මංගල සමරවීර මහතා]

(5) "1 වන පිටුවේ, 24 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ඇ) (iii) වන උපඡේදයට ඉක්බිතිව ම පහත අලුත් උපඡේදය' ";

(6) "2 වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ඇ) (ආ) වන ඡේදයට ඉක්බිතිව ම පහත අලුත් ඡේදය එකතු' ";

(7) "2 වන පිටුවේ, 9 වන පේළියට ඉක්බිතිව ම පහත කොටස ආදේශ කරන්න:-

'(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඇති ව්‍යාතිරේකය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කෙරේ:-

'(අ) (අ) වන ඡේදයේ " සලකනු ලැබිය යුතු ය; තව ද" යන වචන වෙනුවට "සලකනු ලැබිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) වන ඡේදයේ "පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට "පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) (ආ) වන ඡේදයට ඉක්බිතිව ම පහත අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්

'(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධයෙන් වන විට උපලබ්ධි නොවූ, මිල ප්‍රත්‍යාගණන වාසි සහ උපලබ්ධි නොවූ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසි, ශ්‍රී ලංකා මහ බැංකුවේ පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතුය." "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.***

*තිරුත්තංකල් විධුක්කප්පට්ටු ඏත්රුක්කොළ්ළප්පට්ටන.*
*Amendments put, and agreed to.*

***2වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*2ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 සහ 4 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*3ආම්, 4ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clauses 3 and 4 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*චට්ටමාකු වාසකමුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*
*චට්ටමූලම් තිරුත්තංකළුටන් අරික්කෛ චෙය්යප්පට්ටතු.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පතේ සෝදුපත්වල භාෂා සහ මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරැදි කර ගැනීම හා ආනුෂාංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***

*විනා විටුක්කප්පට්ටු, ඒත්රුක්කොළ්ළප්පට්ටතු.*
*අතන්පටි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්රාම්මුරෛයාක මතිප්පිටප්පට්ටු නිරෛවේට්රප්පට්ටතු.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත : නියෝගය
## சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டம் : ஒழுங்குவிதி
## VALUE ADDED TAX (AMENDMENT) ACT: REGULATION

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පහත සඳහන් නියෝගය ඉදිරිපත් කරනවා.

"2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් අවසන් වරට සංශෝධනය කරන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 5(15) වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජූලි 02 දිනැති 2078/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.08.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටතු.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*විනා එටුත්තියම්පප්පෙට්රතු.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

## කිරි ගවයන් ආනයනය කිරීමේ ව්‍යාපෘතියේ අක්‍රමිකතා
## பசுக்களை இறக்குமதி செய்யும் கருத்திட்டத்தில் முறைகேடுகள்
## IRREGULARITIES IN IMPORT OF DAIRY CATTLE PROJECT

[අ.භා.5.29]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාවට කිරි ගවයන් 20,000ක් ආනයනය කිරීමේ ව්‍යාපෘතියේ සැක කටයුතු ස්වභාවය හා ඒ හේතුවෙන් කිරි ගොවීන්ට මුහුණ පෑමට සිදුව ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු විය යුතුව ඇතැයි සිතමි.

පසුගිය රජය යටතේ ඕස්ට්‍රේලියාවේ සීමාසහිත වෙලාර්ඩ් රූරල් එක්ස්පෝට් පෞද්ගලික සමාගම සමඟ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ගිවිසුම්ගතව 2011 වර්ෂයේ කිරි ගවයන් 500ක් ද, 2013 වර්ෂයේ කිරි ගවයන් 1,500ක් ද මිලදී ගෙන තිබුණි. ඉන් අනතුරුව දේශගුණික අතින් නුසුදුසු හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි රිදියගම ගොවිපොළට, කිසිදු ශක්‍යතා අධ්‍යයනයකින් තොරව, 2015 වර්ෂයේදී කිරි ගවයන් 2,495ක් මිලදී ගෙන තිබුණි.

කිරි ගවයකුගෙන් දිනකට අපේක්ෂිත කිරි ප්‍රමාණය ලීටර් 20ක් ලෙස සලකා ශක්‍යතා අධ්‍යයන වාර්තාව මඟින් ප්‍රකාශයට පත් කර තිබුණ ද, සැබෑ ප්‍රමාණය ඊට වඩා බෙහෙවින් අඩු බව සංඛ්‍යාලේඛන මඟින් තහවුරු කර තිබුණි. උෂ්ණාධික පරිසරයක් වන රිදියගම ගොවිපොළේ සතුන් රඳවා ගැනීම සඳහා ජලය සහ විදුලි පංකා යොදා කෘත්‍රිම පාරිසරික තත්ත්වයක් ඇති කිරීම සඳහා විදුලි බිල වෙනුවෙන් රුපියල් මිලියන ගණනක් වැය කර තිබුණි.

පසු ඇගයීමකින් තොරව මෙම ව්‍යාපෘතිය ඉන් පසුව නැවතත් 2017 වර්ෂයේදී ක්‍රියාවට නංවා ඇත. ඒ යටතේ පළමු අදියර ලෙස කිරි ගවයන් 2,000ක් ආනයනය කර ඇත. කෙසේ වුවද, මෙම කිරි ගවයන් ලබා ගත් බොහෝ දෙනෙකුට දෛනිකව එක් ගවයකුගෙන් කිරි ලීටර් 20ක ප්‍රමාණය ලබා ගැනීමට නොහැකි වී ඇති අතර, අදාළ ගොවීන්ට කර්මාන්තය නඩත්තු කර ගැනීමට නොහැකිව තිබියදී, 2017 දෙසැම්බර් මස 21 දින තවත් කිරි ගවයන් 3,024ක් ආනයනය කර තිබේ.

2017 වර්ෂයේ ආනයනය කළ කිරි ගවයන් 3,024ක් පිළිබඳව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පශු පර්යේෂණ) විසින් නිකුත් කර ඇති වාර්තාව මඟින් අදාළ සමාගම විසින් බරපතළ ලෙස සෞඛ්‍ය ප්‍රමිතීන් (Health Protocols) උල්ලංඝනය කර ඇති බව සඳහන් කර තිබේ. එසේ තිබිය දී ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2018 අප්‍රේල් 17 දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට උපදෙස් ලබාදී ඇත්තේ ඉතිරි කිරි ගවයන් 15,000 මිලදී ගැනීම සඳහා අත්තිකාරම් මුදල් ගෙවන ලෙසයි. ඉන් අනතුරුව 2018 මැයි මස 08 දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුව කිරි ගවයන් 15,000ක් ආනයනය කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස වෙලාර්ඩ් රූරල් එක්ස්පෝට් ආයතනයට ඩොලර් මිලියන 8.31ක් (රුපියල් කෝටි 131) නිදහස් කර, පසුව තවත් ඩොලර් මිලියන 2.7ක් (රුපියල් කෝටි 43) නිදහස් කර ඇති බව වාර්තා වේ. මේ තත්ත්වය තුළ කිරි ගොවීන්ට මුහුණ පෑමට සිදුව ඇති ගැටලුකාරී තත්ත්වයට විසඳුම් ලබා දෙන ලෙසත්, ව්‍යාපෘතිය තුළ සිදුව ඇති අක්‍රමිකතා පිළිබඳව විමර්ශනයක් සිදු කරන ලෙසත්, රජයට සිදුවූ පාඩුව ඊට වගකිව යුත්තන්ගෙන් අය කර ගැනීමට පියවර ගන්නා ලෙසත් මෙම සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2016 අපේ රටේ ජාතික කිරි අවශ්‍යතාව වෙලා තිබුණේ ලීටර් මිලියන 1,166.5ක්. නමුත්, මේ ප්‍රමාණයෙන් තුනෙන් එකක ප්‍රමාණයක් විතරයි අපට නිෂ්පාදනය කරන්න හැකියාව තිබුණේ. ඒ අනුව 2016දී අපි දේශීය වශයෙන් නිෂ්පාදනය කරලා තිබෙන්නේ කිරි ලීටර් මිලියන 384යි.

ඒ නිසාම අවුරුද්දකට දළ වශයෙන් රුපියල් කෝටි 3,000කට ආසන්න ප්‍රමාණයක් අපි කිරි පිටි ආනයනය කිරීම සඳහා වියදම් කරනවා. 2016 අවුරුද්දේ අපි කිරි සහ කිරි නිෂ්පාදන මෙට්‍රික්ටොන් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් ආනයනය කරලා තිබෙනවා. සාමාන්‍ය වශයෙන් ගත්තොත් අපේ රටේ කිරි ගොවීන් ලක්ෂ දෙකහමාරක් පමණ ඉන්නවා. දේශීය කිරි අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීමේ අඩු පාඩුව පසුගිය රජයන් විටින් විට සාකච්ඡා කරලා තිබුණා. ඒ අනුව 2005 මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආණ්ඩුවත් කිරි ගවයන් ආනයනය කිරීම සඳහා තීන්දුවක් ගත්තා.

පසුගිය ආණ්ඩුව මඟින් කිරි ගවයන් ආනයනය කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් අධ්‍යයනය කර ඒ වන විට ආනයනය කළ කිරි ගවයන්ගේ ආයුෂ අඩු වීම, පැටවුන් ලැබීමේ හැකියාව අඩු වීම මෙන්ම රෝගවලට භාජනය වීමේ වැඩි ප්‍රවණතාවක් ඇති වීම මත මෙය වැඩි අවදානමක් සහිත ව්‍යාපෘතියක් බව හඳුනාගෙන, ඒ ණය මුදල් රජයට දරා ගැනීමට අපහසු බව හඳුනාගෙන තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේදී පසුගිය කාලයේ මේ රටට ආනයනය කරන ලද කිරි ගවයන් පිළිබඳව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව **සභාගත*** කරනවා.

ඒ වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා:

"2008 අගොස්තු 13 වන දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ඔවුන් වෙත ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාව සඳහා ඉදිරිපත් කළ වාර්තාව (ඇමුණුම 17) මඟින්ද මෙතෙක් ආනයනය කළ කිරි ගවයන්ගේ ආයු කාලය කෙටි බවත්, පැටවු ලැබීම් හැකියාව අඩු බවත්, රෝගවලට භාජනය වීම වැඩි ප්‍රවණතාවයක් ඇති බවත් ඒ අනුව මෙය වැඩි අවදානමක් සහිත ව්‍යාපෘතියක් බවත් දක්වා ඇත. ව්‍යාපෘති යෝජනාව අනුව වර්ෂ 4 ක් ඉකුත් වූ පසු පමණක් ධන මුදල් ප්‍රවාහයක් ලැබෙන බවත් මෙම ණය මුදල රජයට දරා ගැනීම අපහසු තත්ත්වයක් බවත් දක්වා තිබුණි."

එසේ වුවත් ඕස්ට්‍රේලියාවේ සීමා සහිත වෙලාර්ඩ් රූරල් එක්ස්පෝට් (පෞද්ගලික) සමාගම සමඟ ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය ගිවිසුම්ගතව 2011 වර්ෂයේදී ගවයන් 500කුත්, 2013 වර්ෂයේ ගවයන් 1,500කුත්, පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මිලදී ගෙන තිබුණා.

ඉන් පසුව දේශගුණික වශයෙන් නුසුදුසු හම්බන්තොට දිස්ත්‍රික්කයේ රිදියගම ගොවිපොළට කිසිදු ශක්‍යතා අධ්‍යයන වාර්තාවකින් තොරව 2015 වර්ෂයේ කිරි ගවයන් 2,495ක් මිලදී ගෙන තිබුණා. මෙම කිරි ගවයන් ආනයනය කිරීම සඳහා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

අනුගමනය කරලා තිබුණු ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගය මුළුමනින්ම දූෂිතයි කියලා විගණකාධිපති විසින් තහවුරු කරලා තිබෙනවා. කිරි ගවයකුගෙන් දිනකට අපේක්ෂිත කිරි ප්‍රමාණය ලීටර් 20ක් ලෙස ශක්‍යතා අධ්‍යයන වාර්තාව මඟින් ප්‍රකාශයට පත් කරලා තිබුණත්, ලැබුණු ප්‍රමාණය ඊට වඩා බෙහෙවින් අඩු බව සංඛ්‍යා ලේඛන මඟින් තහවුරු වෙනවා.

උෂ්ණාධික පරිසරයක් සහිත රිදියගම ගොවිපොළේ සතුන් රඳවා ගැනීම සඳහා ජලය සහ විදුලි පංකා යොදාගෙන කෘත්‍රිම පාරිසරික තත්ත්වයක් ඇති කිරීම සඳහා විදුලි බිල වෙනුවෙන් 2015 වර්ෂයේ රුපියල් ලක්ෂ 57කුත්, 2016 වර්ෂයේ රුපියල් ලක්ෂ 399කුත් වැය කරලා තිබෙනවා. මේ එක් කිරි ගවයෙක් සඳහා ඇමෙරිකානු ඩොලර් 3,036.50ක් වැය කර තිබූ අතර, එහි රුපියල් වටිනාකම රුපියල් 443,420ක් වෙනවා. 2015 හා 2016 වර්ෂවල කෘත්‍රිම පාරිසරික තත්ත්වයක් ඇති කරන්නට, -කිරි ගවයන්ට අවශ්‍ය කරන ඕස්ට්‍රේලියාවේ තිබුණු පාරිසරික තත්ත්වය ජලය සහ විදුලි පංකා යොදාගෙන කෘත්‍රිමව ඇති කරලා දෙන්න- දරපු මුළු පිරිවැය රුපියල් ලක්ෂ 456ක් වනවා. විගණකාධිපතිවරයා වාර්තා කරනවා ඒ රුපියල් ලක්ෂ 456න් තවත් කිරි ගවයන් 102ක් මිලදී ගන්නට තිබුණාය කියලා.

2014 පෙබරවාරි 17වෙනි දා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලද එවකට ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහත්මයා කිරි ගවයන් 20,000ක් ආනයනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව සීමාසහිත වෙලාර්ඩ් රූරල් එක්ස්පෝට් (පෞද්ගලික) සමාගම විසින් ඉදිරිපත් කරන ලද ඇමෙරිකානු ඩොලර් මිලියන 73.95ක ව්‍යාපෘතියකට අනුමැතිය ඉල්ලා තිබෙනවා. අවශ්‍ය නම් මට ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන්නට පුළුවන්. ඒ කැබිනට් පත්‍රිකාවට නිරීක්ෂණ ඉදිරිපත් කරලා තිබෙන එවකට මුදල් ඇමති මඟින්ද රාජපක්ෂ මහත්මයා, ඇමෙරිකානු ඩොලර් මිලියන 73.95 එම ආයතනයට පැවරීමට එකඟ බවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දීලා තිබෙනවා. මෙතරම් මුදල් ප්‍රමාණයක්, ඇමෙරිකානු ඩොලර් මිලියන 73.95ක් වියදම් කරන්නට බැසිල් රාජපක්ෂ මහත්මයාගේ අමාත්‍යාංශයෙන් ඉල්ලා තිබියදී මුදල් අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් කිසිදු බාධාවක්, අවහිරයක් කරන්නේ නැහැ, ඒකට සම්පූර්ණ අනුමැතිය ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි අවධානය යොමු කළ යුතු කාරණය මෙයයි. මෙහෙම 2014 පෙබරවාරි 17වන දා බැසිල් රාජපක්ෂ හිටපු ඇමතිවරයා කැබිනට් පත්‍රිකාවකින් මේ මුදල ඉල්ලන කොට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ඊට කලින් කියා තිබෙනවා, ඊට කලින් මේ පුද්ගලික සමාගමෙන් ගෙනා කිරි ගවයන් අපේ රටට ගැළපෙන්නේ නැහැ; මේ මුදල අමාත්‍යාංශයට දරා ගන්න බැහැ කියලා.

මෙම ව්‍යාපෘතිය ඉන් පසුව පශු සම්පත් විෂය භාර ගත් පී. හැරිසන් අමාත්‍යවරයා යටතේ 2017 වර්ෂයේදී ක්‍රියාවට නංවා ඇත. ඒ යටතේ පළමු අදියර ලෙස කිරි ගවයන් 2,000ක් ආනයනය කර ඇත. එක් කිරි ගවයකු රුපියල් 521,551.10ක මුදලකට මිලදී ගත් මෙම ගවයන්, කිරි ගොවීන් වෙත රුපියල් 200,000කට නිකුත් කළ අතර, ඉතිරි රුපියල් 321,551.10 සහනාධාරයක් විය.

එක් කිරි ගවයකුගේ මිල රුපියල් 521,551.10ක මුදලක් වුණාට කිරි ගොවියාට දුන්නේ රුපියල් 200,000කට. ඒ අනුව ආණ්ඩුව සහනාධාරයක් හැටියට රුපියල් 321,551.10ක් දීලා තිබෙනවා.

කිරි ගවයන් 400ක් එක්තරා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ලබාදී තිබුණු අතර, -මධ්‍යම පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. එතුමාට කිරි ගවයන් 400ක් ලබා දීලා තිබෙනවා.- එම මන්ත්‍රීවරයාට මහජන මුදලින් ලැබුණු සහනාධාරය රුපියල් කෝටි 12.8ක්.

ඒක හරි නේ, ඇමතිතුමනි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
හරි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මෙම කිරි ගවයන් ලබා ගත් බොහෝ දෙනෙකුට දෛනිකව එක් කිරි ගවයකුගෙන් කිරි ලීටර් 20ක ප්‍රමාණයක්වත් ලබා ගැනීමට නොහැකි වූ අතර, එම ගොවීන්ට කර්මාන්තය නඩත්තු කර ගැනීමට නොහැකිව ගවයන් විකුණා තිබේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මෙහිදී එක් කිරි ගවයකු සඳහා රජයෙන් රුපියල් 200,000ක සහනාධාරයක් දීලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
සතාගේ මුදල සඳහන් කර තිබෙන්නේ රුපියල් 521,551.10යි කියලා. ඒ රුපියල් 200,000ක සහනාධාරය අඩු කර තමයි.

2017 දෙසැම්බර් මස තවත් කිරි ගවයන් 3,024ක් ආනයනය කර තිබේ. 2017 වර්ෂයේ ආනයනය කළ කිරි ගවයන් 3,024 පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පශු පර්යේෂණ) ආචාර්ය එස්.එස්.පී. සිල්වා මහතා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කර ඇති වාර්තාව මඟින් අදාළ සමාගම විසින් බරපතළ ලෙස සෞඛ්‍ය ප්‍රමිතීන් උල්ලංඝනය කර ඇති බව සඳහන් කර ඇති අතර Bovine Viral Diarrhoea - BVD - නම් වෛරස් රෝගය සතුන්ට වැලඳී ඇති බවත්, මෙය ආර්ථිකයටද බලපාන රෝග විශේෂයක් බැවින් ඉතා කඩිනමින් පියවර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත. ආනයනය කළ සතුන්ගේ එන්නත් පිළිබඳව පූර්ව වාර්තා ලබා ගැනීම, BVD නම් වෛරසය සක්‍රිය සතුන් පිළිබඳව එම සමාගම ගෙන ඇති පියවර සහ එම සතුන් නැවිගත කිරීමට පෙර රෝග බෝවී ඇති සතුන් වෙන් කරනු ලැබුවේද යන්න පරීක්ෂා කිරීම සහ සියලුම සතුන් BVD නම් වෛරසය සම්බන්ධ පරීක්ෂණවලට යොමු කර කර්මාන්තයේ ආරක්ෂාවට පියවර ගත යුතු බවද නිර්දේශ කොට තිබුණි. මීට අමතරව, සතුන් සහ මනුෂ්‍යයින්ගේ අක්මා ආසාදනය ඇති කරන Fasciola hepatica වෛරසය -මෙය වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ දකින්නට නොලැබෙන වෛරසයක්- සඳහා ද කඩිනමින් ක්‍රියා මාර්ග ගැනීම පිළිබඳව නිර්දේශ කොට තිබුණි. BVD වෛරසය හඳුනා ගැනීම සන්නිවේදනය කිරීම ප්‍රමාද කිරීම මඟින් ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තයට පිරිමැසිය නොහැකි හානියක් සිදු විය හැකි බව අවධාරණය කර ඇති අධ්‍යක්ෂවරයා, ඒ පිළිබඳව අදාළ විශේෂඥ නිලධාරීන් සමඟ සාකච්ඡා ආරම්භ කර, මහජන සෞඛ්‍යයට හා කිරි කර්මාන්තයට ඇති විය හැකි හානිය වැළැක්වීමට කටයුතු කරන ලෙස සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා ඇත. තවදුරටත් කරුණු සඳහන් කර ඇති අධ්‍යක්ෂවරයා, සුදුසු පියවර ගැනීම සඳහා මෙම සතුන් ආනයනකරු වන ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් හැකි ඉක්මනින් දැනුවත් කරන ලෙසද ඉල්ලා ඇත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018 පෙබරවාරි 14වන දා මම කියන මේ අධ්‍යක්ෂ ආචාර්ය එස්.එස්.පී. සිල්වා මහතා මේ සම්බන්ධයෙන් බොහොම පැහැදිලිව පශු සම්පත් හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියා යවනවා, මේ Bovine Viral Diarrhoea එක සම්බන්ධයෙන් සහ ඒ වාගේම ලංකාවට එන Fasciola hepatica කියන වෛරසය පිළිබඳව. එම ලිපිය මම **සභාගත*** කරනවා.

එම වාර්තාව මත පදනම්ව 2018 පෙබරවාරි 22වන දින ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් අමතා ඇති සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉහත වාර්තාවේ නිර්දේශ ලේකම්ගේ අවධානයට යොමු කර කඩිනමින් ප්‍රතිචාර සඳහා යොමු කර තිබෙනවා. පාර්ලිමේන්තුවේ දැනගැනීම සඳහා එම ලිපියත් මම **සභාගත*** කරනවා.

මොකද, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් දක්වා තිබෙන උනන්දුව, මේ කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා ඔවුන් ගෙන ඇති කඩිනම් පියවර මේ සභාව දැනගත යුතු නිසා.

මේ අතර, එංගලන්තයේ OIE Reference Laboratory නමැති සත්ව සෞඛ්‍ය පිළිබඳ ආයතනයට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව රෝග වැළඳුණු කිරි ගවයන්ගේ සාම්පල් යවා තිබෙනවා. එම සාම්පල් පරීක්ෂා කළ එම ආයතනය මෙරට කිරි ගවයන්ට BVD රෝගය වැළඳී ඇති බව තහවුරු කර තිබෙනවා. අමාත්‍යාංශය ඕස්ට්‍රේලියාවේ සීමාසහිත වෙලාර්ඩ් රෑරල් එක්ස්පෝට් පෞද්ගලික සමාගම සමඟ ගිවිසුම් ගතව ඇත්තේ කිරි ගවයන් 5000ක් ආනයනය කිරීමේ පියවරේ සාර්ථකභාවය මත ඉතිරි කිරි ගවයන් 15,000 ආනයනය කිරීම සඳහා පමණයි. ඒක බොහොම පැහැදිලිව සඳහන් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

The Addendum dated 14th of October, 2014 states, I quote:

"……The Stage II of 15000 cattle will be implemented on the success of the Stage I."

ඒ ගවයන් 5000 ගෙනැල්ලා, ඒ කටයුතු සාර්ථක වුණොත් විතරයි ඉතිරි ගවයන් 15,000 ගේන්න ඕනෑ කියලා තමයි අමාත්‍යාංශය වාර්තා කරන්නේ.

ඉහත ගැටලුවලට කිසිදු අවධානයක් යොමු කර නොමැති අමාත්‍යාංශය ඉතිරි කිරි ගවයන් 15,000 ආනයනය කිරීම සඳහා පියවර ගෙන තිබෙනවා.

2017 මැයි මාසයේ රජය විසින් අමාත්‍ය මණ්ඩල සංශෝධනයක් සිදු කළා. එම අමාත්‍ය මණ්ඩල සංශෝධනය මැයි මාසයේ 1 වන දා සිට ක්‍රියාත්මක වුණා. ඒ යටතේ ග්‍රාමීය කටයුතු පිළිබඳ අමාත්‍ය පී.හැරිසන් මහතාගේ අමාත්‍ය ධුරය වෙනස් වුණා. කිරි ගවයන් 15,000 ගනුදෙනුව ආරම්භ වෙන්නේ මේ අමාත්‍යවරයාගේ අමාත්‍ය ධුර සංශෝධනය ආසන්න කාලයේයි.

2018 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදන සලසා නැහැ; ඊට අදාළ පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා නැහැ. ඒ වුණත්, ව්‍යාපෘති අධ්‍යක්ෂ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මේ සම්බන්ධයෙන් තොරතුරු විමසුවාට පස්සේ, සාවද්‍ය තොරතුරු සපයා 2018 වර්ෂයට ඩොලර් මිලියන 8.1ක් වෙන් කර තිබෙන බව දක්වා තිබෙනවා. එසේ තිබියදී ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා 2018 අප්‍රේල් 17 දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දී තිබෙන්නේ ඉතිරි කිරි ගවයන් 15,000 මිලදී ගැනීම සඳහා අත්තිකාරම් මුදල් ගෙවන ලෙසය. 2018 මැයි 2 වැනි දින ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් කිරි ගවයන් ආනයනය කිරීමට අදාළව පුවත්පත් දැන්වීමක් නිකුත් කර තිබෙනවා. ගරු හැරිසන් ඇමතිවරයා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයෙන් ඉවත් වන්නේ 2018 මැයි 2 වැනි දා. අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියට 2018 මැයි 09 වැනි දින පිළිතුරු සපයන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කියනවා, 2018 වර්ෂයට මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැති බව. මේ තිබෙන්නේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ඩබ්ලිව්.ඩී.එස්.සී වැලිවත්ත කියන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරයා, 2018 මැයි 09 වැනි දින නිකුත් කළ ලිපිය. එහි මෙසේ සඳහන් වෙනවා:

"Meanwhile, we observed that budgetary provision for this project has not been allocated for the fiscal year of 2018."

මම එය **සභාගත*** කරනවා.

තොරතුරු දැනගැනීමේ පනත යටත් ඉල්ලූ තොරතුරට, ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ඉදිරිපත් කර තිබෙන්නේ සාවද්‍ය තොරතුරු.

2018 මැයි 8වැනි දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුව කිරි ගවයන් 15,000ක් ආනයනය කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස වෙලාර්ඩ් රෑරල් එක්ස්පෝට් ආයතනයට ඩොලර් මිලියන 8.31 ක් -රුපියල් මිලියන 1312ක්- නිදහස් කරලා, තවත් ඩොලර් මිලියන 2.7ක් -මිලියන 437ක්- නිදහස් කරලා තිබෙනවා.

ඒ අනුව, ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ විෂයය භාර පී.හැරිසන් ඇමතිවරයාගේ කාලයේදී ලේකම් විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව පාර්ලිමේන්තුවේ මූල්‍ය බලතල ඉක්මවා අත්තනෝමතික ලෙස ක්‍රියාකොට රුපියල් කෝටි 174ක් වියදම් දරා තිබෙනවාය කියා මා මේ අවස්ථාවේදී කියනවා.

මේ සම්බන්ධයෙන් ලංකා කිරි නිෂ්පාදකයන්ගේ සංගමය විසින් නිකුත් කර තිබෙන නිවේදනයක සඳහන් ආකාරයට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආනයනික සතුන් මිලදී ගත් කිරි නිෂ්පාදකයන් පහත සඳහන් ගැටලුවලට මුහුණ දී තිබෙනවා.

1. ආනයනය කරන ලද කිරි ගවයන්ගේ ප්‍රමිතිය සහ සෞඛ්‍ය තත්ත්වය යහපත් නොවීම.
2. දෙනුන්ගෙන් කිරි ලබා ගැනීමේ හැකියාව අමාත්‍යාංශය සහ වෙලාර්ඩ් රෑරල් එක්ස්පෝට් පෞද්ගලික සමාගම විසින් ප්‍රචාරය කරන ලද ප්‍රමාණයට වඩා බෙහෙවින් අඩු වීම.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

3. දිනකට එක් කිරි ගවයෙකුගෙන් කිරි ලීටර් 18ක හා ලීටර් 20 ක ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන් යයි සඳහන් වුණාට ලබා ගත හැකි සාමාන්‍ය ප්‍රමාණය කිරි ලීටර් 10ක් පමණ වීම.
4. නඩත්තුව සඳහා අධික පිරිවැයක් දරන්නට සිදු වී තිබීම.
5. බෙහෙත් සඳහා වර්ෂයකට රුපියල් 5,000ක් ඇස්තමේන්තු කර තිබුණත්, ඇත්තවශයෙන් මේ ගවයන් සඳහා ලක්ෂයක වියදමක් දරා තිබීම.
6. කිරි ගවයන් අධික මිලකට මිලදී ගැනීම.

ඔස්ට්‍රේලියාවෙන්,රුපියල් එක්ලක්ෂ විසිපන්දහසක පමණ මුදලකට මිලදී ගතහැකි කිරි ගවයෙක් රුපියල් පන්ලක්ෂ විසි දාහක මුදලකට මිලදී ගෙන ගොවීන්ට ලක්ෂ දෙක ගණනේ විකිණීම.

මිල්කෝ සමාගම මිලදී ගනු ලබන කිරි සඳහා මුදල් ගෙවීම ප්‍රමාද වීම මත කර්මාන්තය පවත්වාගෙන යෑමට අපහසු වී තිබීම.

මෙය බරපතළ ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමාත් ඒ ගැන දන්නවා. කලින් මිල්කෝ සමාගම විසින් කිරි මිලදී ගෙන දින 15කට වරක් තමයි මුදල් ගෙවීම කළේ. හැබැයි, මා දන්නා හැටියට දින 15න්, දින15ට මුදල් ගෙවීම වෙනුවට දැන් දින 45න් දින 45ට තමයි මුදල් ගෙවන්නේ.

**ගරු ගාමිණි විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අපි බලයට පත්වනකොට මාස තුනක කිරිවලට සල්ලි දීලා තිබුණේ නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
අන්න හරි. කිරිවලට සල්ලි වෙලාවට දුන්නේ නැහැ.

අමාත්‍යාංශය සහ සමාගම විසින් කිරි ලීටරයක් සඳහා රුපියල් 85 - 95 අතර මුදලක් ලබා ගත හැකි බවට සඳහන් කළ ද, ගොවීන්ට ලීටරයකට ලැබෙන මුදල රුපියල් 65 - 73 අතර පරාසයක විය. නඩත්තු වියදම් අධික වීම සහ කිරි නිෂ්පාදනය අඩු වීම, මිල ගණන් අඩු වීම මත ණය ආපසු ගෙවා ගැනීමට නොහැකි වීම නිසා කර්මාන්තය කඩා වැටුණි.

කිරි නිෂ්පාදකයන්ගේ සංගම් විසින් පෙන්වා දෙන කාරණා කීපයකට තමයි මා අවධානය යොමු කළේ. මේ තත්ත්වය යටතේ ඒ කිරි නිෂ්පාදකයන් පහත දැක්වෙන ඉල්ලීම් ඉදිරිපත් කරනවා.

1. ලෙඩ රෝග සහිත අස්වැන්න අඩු කිරි ගවයන් සඳහා අය කළ මුදල මුළුමනින්ම ගොවීන්ට ආපසු ගෙවීමට කටයුතු කිරීම.
2. ගොවිපොළවලින් සිදුවී ඇති අලාභය ප්‍රතිපූරණය කිරීම.
3. කිරි නිෂ්පාදකයක් තවදුරටත් මෙවැනි විපතකට නොවැටීම සඳහා ආනයනය නතර කර දැමීම.
4. ණය ආපසු ගෙවීමේ කාලය වසර 10 දක්වා දීර්ඝ කොට වසර 3ක සහන කාලයක් ලබා දීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ඇමතිවරුන් කීපදෙනකු යටතේම ඉදිරියට ආපු ප්‍රශ්නයක්. 2014න් පටන් ගෙන, බැසිල් රාජපක්ෂ ඇමතිවරයාගේ කාලයේ ඉඳලා ඉදිරියට ආපු ප්‍රශ්නයක්. දේශීය කිරි අවශ්‍යතාව සම්පූර්ණ කර ගන්න අපට බැරි වෙනකොට, අපේ රටට ගැළපෙන, සුදුසු තත්ත්වයේ කිරි හරක් ආනයනය කිරීම කියන කාරණය ඉස්සරහට දමලා, දිගින්-දිගටම ශක්‍යතා අධ්‍යයන වාර්තාවලින් අසමත්වෙලා තිබියදීත්, රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් මේ සම්බන්ධයෙන් වන අවදානම කියලා තිබියදීත් මේ ක්‍රියා පිළිවෙත ඉදිරියට ගෙන ගිහින් තිබෙනවා. මා කලින් සඳහන් කළා වාගේ මෙයට අනුමැතිය දීලා තිබෙන්නේත්, පළමුවන කිරි ගවයන් 5000 ව්‍යාපෘතිය සාර්ථක වුණොත් තමයි ඉතිරි 15,000 ගෙන්වන්නේ කියන පදනම මත. හැබැයි, එසේ නොවී තිබියදී මේ කාරණයට අත තියලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ලෝකයේ පිළිගත් රසායනාගාර විසින් සහතික නිකුත් කර තිබියදීත්, මේ හරහා ලංකාවට පැමිණෙන වෛරස, මිනිසුන්ට සහ ගවයන්ට බලපාන රෝග පිළිබඳව පශු සම්පත් දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමු කරවා තිබියදීත්, ඒවා පිළිබඳව තඹ දොයිතුවක අවධානයක් යොමු කරන්නේ නැතිව මෙවැනි කටයුතු කිරීම සම්බන්ධයෙන් බරපතළ සැකයක් තිබෙනවා.

දැන් මේ කිරි නිෂ්පාදකයන් අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම, මේ තුළින් රජයේ භාණ්ඩාගාරයේ තිබෙන ජනතාවගේ බදු මුදල් හානිවෙලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා මේ සිදු වී තිබෙන හානිය ගොවීන්ට ප්‍රතිපූරණය කරන්නත්, ඒ වාගේම, මේ සිදු වී තිබෙන ක්‍රියාවලිය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරලා, එයින් රටට සිදු වී තිබෙන පාඩුව හෙළිදරවු කරලා, එයට සෘජුවම සම්බන්ධ අයට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරයි කියා මා බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.50]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද කල් තැබීමේ යෝජනාව මා ඉතා කැමැත්තෙන්ම ස්ථිර කරනවා.

ඇත්තෙන්ම පසුගිය මහින්ද රාජපක්ෂ ආණ්ඩුවත්, ඒ වාගේම මෛත්‍රීපාල සිරිසේන-රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවත් කියන මේ දෙගොල්ලන්ම එකයි. එහි කිසිදු වෙනසක් නැහැ. නායකත්වයෙනුත්, ප්‍රතිපත්තිවලිනුත්, වැඩ පිළිවෙළිනුත් එක සමානයි. මේ ගජ මිතුරන් ඔක්කොම එකතුවෙලා මහජන මුදල් රුපියල් කෝටි ප්‍රකෝටි ගණනක් වියදම් කරලා තමයි මේ කිරි හරක් මේ රටට අරගෙන ඇවිත් තිබෙන්නේ. එක්තරා කිකිළියකගේ බිජු රත්තරන් කිව්වා වාගේ මේ හරක්ගෙන් ලැබෙන කිරිත් රත්තරන්ද කියලා මා අහන්න කැමැතියි. ඒ ගවයන්ගේ බුරුලුවලින් දොවන්නේ රත්තරන් කිරිද කියලා මා අහන්න කැමැතියි. ඒ තරම් මහා දැවැන්ත විනාශයක් තමයි සිද්ධ වෙලා තිබෙන්නේ.

2011 - 2013 දක්වා කිරි හරක් 2,000ක් ගෙනැල්ලා තිබෙනවා. ඊට පසුව 2015 වසරේ හම්බන්තොට රිදියගම ගොවිපොළටත් කිරි හරක් 2,495ක් ගෙනැල්ලා තිබෙනවා. 2017 වසරේ නැවත වතාවක් මේ රජය පළමුවැනි අදියර වශයෙන් කිරි හරක් 2,000කුත්, දෙවැනි අදියරේදී 3,024කුත් ලෙස කිරි හරක් 5,024ක් ගෙනැල්ලා තිබෙනවා. අපේ නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා

කිව්වා වාගේම පසුව තවත් කිරි හරක් 15,000ක් ගෙන්වන්න අදාළ මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඇත්තටම මෙහිදී අපි තේරුම් ගන්නට ඕනෑ දෙයක් තිබෙනවා. අපට මේ සතුන් ලබා දීලා තිබෙන්නේ මොන රටින්ද, ඒ රට මොන වාගේ රටක්ද? ඕස්ට්‍රේලියාව කිරිවලින් ස්වයංපෝෂිත රටක් බව අපි දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දියර කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන මිලදී ගන්න ඔවුන්ගේ හොඳම වෙළෙඳ පොළක් බවට අපේ රට -ශ්‍රී ලංකාව- පත්වෙලා තිබෙන බව අපි විශ්වාස කරනවා. අපේ රටේ කිරි නිෂ්පාදන කර්මාන්තය දියුණු කරලා, දියර කිරි සහ කිරි නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන අපේ වෙළෙඳ පොළින් ජනතාවට මිලදී ගන්න පුළුවන් වන විධියේ ක්‍රමයක් සද්භාවයෙන් ක්‍රියාත්මක කරන්න ඔවුන්ට තිබෙන හැකීම මොකක්ද කියන එක සම්බන්ධයෙන් අපිට ගැටලුවක් තිබෙනවා. ඒ අය මොනම ආකාරයකින්වත් පැනලා දීලා, වණ කර ගන්න අය නොවෙයි කියලා අපි විශ්වාස කරනවා. මෙතැන කුමන ආකාරයක හෝ යටින් දිවෙන කුමන්ත්‍රණයක් තිබෙනවාය කියන එකයි මගේ අදහස. අපේ රට කිරිවලින් ස්වයංපෝෂිත කළාට පස්සේ ඒගොල්ලන්ගේ වෙළෙඳ පොළ අපිට නැති වන බව ඒගොල්ලන් දන්නවා. අපේ වෙළෙඳ පොළ පරිහරණය කරලා, අපේ මුදල් ඒ රටට ගෙනයන එක නවත්වන්න ඒගොල්ලන් කවදාවත් කැමති වෙනවාද? එහෙම කැමති වෙන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් සද්භාවයෙන් ක්‍රියාත්මක වීමක් නොවෙයි මේ ඕස්ට්‍රේලියානු රජය කරලා තිබෙන්නේ කියලා මම පැහැදිලිවම කියනවා. අපි තලියේ කිඹුල්ලු රකිනවා නොවෙයි. අපේ රටට අවශ්‍ය කිරි සහ කිරි නිෂ්පාදන ඕස්ට්‍රේලියාවෙන් ගෙනැල්ලා ඉෂ්ට කර ගන්න හදන උත්සාහයට අව කැපීමක් හෝ අකුල් හෙළීමක් නොවෙයි අපි මේ කරන්නේ. ගොනා හැරෙන්නේ පොල් පැලේ කන්නද, එහෙම නැත්නම් වෙනත් වැඩකටද කියලා අපට තේරෙනවා. ඒ නිසා මේ කාරණය ඇතුලේ බරපතළ විධියේ වුවමනාවක් තිබෙනවා කියන එක අපට පැහැදිලි වනවා. අපේ රටේ ඉන්න පාලකයෝත්, නිලධාරි පෙළැන්තියේ යම් යම් අයත් මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා, උඩ ගෙඩි දීමක් තිබෙනවාය කියලා අපි විශ්වාස කරනවා.

අපේ රටේ දේශගුණයට සහ පරිසරයට ඔරොත්තු නොදෙන කිරි හරක් ඔවුන් අපට ලබා දෙන්නේ ඇයි කියන කාරණය සම්බන්ධයෙන් අපට ගැටලුවක් තිබෙනවා. ඕස්ට්‍රේලියාව කියලා කියන්නේ ශීත දේශගුණය තිබෙන රටක්. ඒ වාගේ රටක කිරි හරක් මෙහාට ආනයනය කළාට පස්සේ මොකද වෙන්නේ කියලා ඒගොල්ලන් දන්නවා. අපේ රටේ විවිධ පළාත් තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(*மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா*)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඕස්ට්‍රේලියාවේ කාන්තාරත් තිබෙනවා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(*மாண்புமிகு நிஹால் கலப்பத்தி*)
(The Hon. Nihal Galappaththi)
ඕස්ට්‍රේලියාවේ කාන්තාරත් තිබෙනවා. අපේ රටේත් ශුෂ්ක, වියළි, සමශීතෝෂ්ණ, තෙත් ප්‍රදේශ තිබෙනවා. ඒ නිසා අපි ඒගොල්ලන්ගෙන් හරක් ගෙනෙන්න ඕනෑ, අන්න ඒ වාගේ පරිසරයට ඔරොත්තු දෙන දේශගුණික ලක්ෂණ තිබෙන ප්‍රදේශවලටයි. තමුන්නාන්සේලා රිදියගමට මේ කිරි හරක් අරගෙන ගියාට හරි යන්නේ නැහැනේ. ඒ ප්‍රදේශය උෂ්ණ අධික ප්‍රදේශයක්. මේ කිරි හරක් තෙත් ප්‍රදේශවලට ගෙනැල්ලා ව්‍යාප්ත කළා නම් තමුන්නාන්සේලාගේ අරමුණු යම් තාක් ප්‍රමාණයකට හෝ සාර්ථක වෙයි කියා අපි විශ්වාස කරනවා. මේ වාගේ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු නොදෙන ප්‍රදේශවලට මේ කිරි හරක් ගෙනැල්ලා දැම්මාට පස්සේ ඒ සතුන් අනිවාර්යයෙන්ම ලෙඩ වන බව ඒගොල්ලන් දන්නවා.

ඒ වාගේම ඒ අයට පෝෂණ ඌනතා ඇති වනවා. ඒ වාගේම ඒ අයගෙන් ලබා ගන්නා කිරි ප්‍රමාණය අඩු වනවාය කියන එක ඔවුන් අනිවාර්යයෙන්ම දන්නවා. ඒ වාගේම ඒ හරක් ලෙඩ වුණාට පසුව මිය යනවාය කියන ඒකත් ඒ ගොල්ලන්ට හොඳටම තේරෙනවා. එහෙම තේරිලා තිබියදී තමයි ඒ අය මේ කටයුත්තට අත ගහලා තිබෙන්නේ. අපේ අයත් ඒක දන්නවා. නමුත්, නොදන්නවා වාගේ තමයි අපේ අයත් කටයුතු කරන්නේ කියන එකයි මගේ විශ්වාසය. මෙන්න මේ අවිධිමත් වැඩ කටයුතුවලින් සිදු වන්නේ මොකක්ද? තමුන්නාන්සේලා බලාපොරොත්තු වන - අපේක්ෂිත- අරමුණු විනාශ වීම. ඒ වාගේම ඕස්ට්‍රේලියානු රජයේ බහු ජාතික සමාගම්වල අවශ්‍යතාව ඉෂ්ට කිරීමක් තමයි අපේ පැත්තෙන් අපි කරනු ලබන්නේ කියන එකයි අපේ විශ්වාසය. අපේ රටේ මේ තිබෙන වෙළෙඳ පොළට වඩා පුළුල් වෙළෙඳ පොළක් ඔවුන් අපේ රටේ නිර්මාණය කරන්න උත්සාහ කරන්නේ නැහැ නේ. ඒ නිසා මේක අනිවාර්යයෙන්ම හිතා මතාම කුමන්ත්‍රණකාරී විධියට සකස් කළ උප්පරවැට්ටියක්ද කියලා අපට සැකයක් ඇති වනවා. මේක හරියට අර බිබිලේ දොඩම්වලට ඊශ්‍රායල්කාරයෝ කරපු විනාශය වාගේ වැඩක්. ඔබතුමාත් දන්නවා නේ. අපේ රටේ ප්‍රසිද්ධියක් තිබෙනවා, පිහන් කර්මාන්තයට නම් පිළියන්දල; රසායන කර්මාන්තයට නම් පරන්තන්; සිමෙන්ති කර්මාන්තයට නම් කන්කසන්තුරේ සහ ගාල්ල; රුහුණේ මී කිරි; රත්නපුරේ මැණික්. එහෙම තමයි අපි ඉගෙන ගෙන තිබුණේ; ඒ වාගේම බිබිලේ දොඩම්. අපේ දේශීය දොඩම් වගාව මුළුමනින්ම විනාශ කළා. මේ විධියටම ඊශ්‍රායලයෙන් දොඩම් අරගෙන ඇවිල්ලා මෙහේ පැළ කළා. මොකක්ද වුණේ? අපේ දේශීය දොඩම් වගාව මුළුමනින්ම විනාශ වුණා; මහ පොළොවෙන් අතු ගෑවිලා ගියා. බිබිල ප්‍රදේශය අදත් තිබෙනවා. නමුත්, බිබිලේ දොඩම් ගහක්වත් අද අපට දකින්න හම්බ වෙන්නේ නැහැ. අන්න ඊට සමාන වැඩක් තමයි මේ කරගෙන යන්නේ කියන එකයි අපි විශ්වාස කරන්නේ. මේ කථා කරන්නේ සද්භාවයෙන්. එහෙම නැතිව ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් නොවෙයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(*மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா*)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඒකත් හොඳ දෙයක්. ඔබතුමාත්, මමත් දෙදෙනාම බිබිලේ දොඩම් මිරිකපු දෙන්නා නේ.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(*மாண்புமிகு நிஹால் கலப்பத்தி*)
(The Hon. Nihal Galappaththi)
ඔව්, අනිවාර්යයෙන්ම. දැනුත් මිරිකනවා නේද? ඊළඟට, විදේශ රටවලින් දියුණු කළ සතුන් -කිරි හරක්- ගෙනැල්ලා අපේ රටේ කිරි කර්මාන්තය දියුණු කරන්න එපා කියලා මොනම ආකාරයකින්වත් අපි කියන්නේ නැහැ. අපි ඒ විධියේ නරුම වැඩ කරන මිනිස්සු නොවෙයි. නමුත් අපි ඒ සත්තු ගෙනැල්ලා; ඒ හරක් අරගෙන ඇවිල්ලා, ඒ හරකුන්ට ගැළපෙන දේශගුණයක් තිබෙන ප්‍රදේශවල විද්‍යාත්මකව ස්ථාපිත කරලා මේ කටයුත්ත කරනවා නම්, අඩුම ගණනේ අපේක්ෂිත අරමුණුවලින් යම් ප්‍රමාණයක් හරි ඉෂ්ට කර ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. එහෙම නොකිරීම නිසා තමයි මේ තිබෙන ගැටලුවලට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙන්නේ කියන එක තමයි මම කියන්නේ.

අපි තමුන්නාන්සේලාට කියන්න ඕනෑ, මේ රටේ දියර කිරි සහ මුදවපු කිරි අවශ්‍යතාව සහ පිටිකිරි අවශ්‍යතාව මේ වනකොටත් අපේ දේශීය කිරි කර්මාන්තකරුවන් විසින් ඉෂ්ට කරමින් යන බව. ගරු ඇමතිතුමනි, මහා විශාල දෙයක් නොවෙයි. නමුත් තමුන්නාන්සේ අමාත්‍යවරයා වශයෙන් සිටියදීත්, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා අමාත්‍යවරයා වශයෙන් සිටියදීත්,

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

ගරු පී. හැරිසන් මහත්මයාගෙනුත් -ඒ හැම කෙනාගෙන්ම- අපි දිගින් දිගටම ඉල්ලීමක් කළා, මෙන්න මේ දේශීය අවශ්‍යතාව ඉෂ්ට කරන අපේ දෙමුහුන් ගවයන්, කිරි ගවයන් ආරක්ෂා කරලා, ඒ අයට තණබිම් දීලා, මේ කර්මාන්තය නහා සිටුවලා, අපේ රටේ අවශ්‍යතාව ඉෂ්ට කරන්න මැදිහත් වෙන්නය කියලා. නමුත් ඒවාට මේ වනතුරු කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. ඒ නිසා වෙලා තිබෙන්නේ මොකක්ද? දැන් අපි ඒක දියුණු කරන්නේත් නැහැ. ඒක විනාශ වෙන්න හරිනවා. ඒ තුළින්, රටේ ජනතාවට අවශ්‍ය දියර කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදනවල යම් හරි අවශ්‍යතාවක් ඉෂ්ට වෙනවා නම් , ඒකත් ක්‍රමානුකූලව නැති වෙනවා.

තමුන්නාන්සේලා මහජන මුදල් කෝටි ගණනින් වියදම් කර, ප්‍රතිනියෙන් තොර, රෝගාබාධවලින් පෙළෙන මේ විධියේ විදේශීය සතුන් ගේනවා. ඊට පස්සේ, ලෙඩ රෝග සහිත ඒ සතුන් මිය යනවා. ඒ නිසා වෙන්නේ මොකක්ද? අපි අපේක්ෂා කරන අරමුණු ඉටු වන්නේ නැහැ. මේ කාරණා දෙකම නිසා සිදු වන්නේ මොකක්ද? විදේශ රටවලින් අරගෙන ඇවිත් දේශීය අවශ්‍යතාව ඉෂ්ට කරන්න හදන අපේ බලාපොරොත්තුවත් අහෝසි වෙනවා. ඒ වාගේම දේශීය කිරි ගව හිමියන්ට ආධාර උපකාර නොදීම නිසා එම කර්මාන්තයත් විනාශ වී යනවා. ඒ කාරණා දෙකෙන්ම සිදු වන්නේ අපේ අවශ්‍යතාව මුළුමනින්ම අහෝසි වීමයි. ඊට පසුව නැවත වතාවක් ඕස්ට්‍රේලියාවට අත පාලා අපේ සියලු අවශ්‍යතා ඕස්ට්‍රේලියාවෙන් ඉෂ්ට කරගන්න අපට සිදු වෙනවා. අන්න ඒ කාරණයද මේ සිදුවන්නේ කියන එක සම්බන්ධයෙන් අපට පොඩි සැකයක් තිබෙනවා. ඒක තමයි අපට ඇති වෙලා තිබෙන ගැටලුව වන්නේ. එම නිසා මේ තත්ත්වය තේරුම් ගෙන, කරන දෙය අනිවාර්යයෙන්ම ඵලදායී වන විධියට, රටට සේවයක් වන විධියට, ජනතාවට සේවයක් වන විධියට, රටේ සම්පත් ආරක්ෂා වන විධියට කරන්න කියන ඉල්ලීම තමයි මේ මොහොතේ අපි කරන්නේ.

[අ.භා. 6.03]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳ විවාදයට මම ඉතා කැමැත්තෙන් තමයි සහභාගි වෙන්නේ. එතුමා ඉදිරිපත් කළ කාරණා ආණ්ඩුව ඉතා බරපතළ ලෙස අවධානයට ගන්න ඕනෑ. මේ ආණ්ඩුව මතුරන ලද තේමා පාඨයක් තිබෙනවා. ඒක තමයි, "යහ පාලනය" කියන එක. පසුගිය ආණ්ඩුව කළ බරපතළ වරදක් විවේචනයට ලක් වෙලා, ඒ කාලයේ බැසිල් රාජපක්ෂ මැතිතුමා ගැන පුවත් පත් විශාල සංඛ්‍යාවක විවේචන පළ වෙලා තිබුණා. රෝගාබාධවලට ලක් වීම, ආර්ථික වශයෙන් වටිනාකමක් නැති වීම, ගවයන් මිය යාම වැනි ප්‍රශ්න තිබියදී එම ව්‍යාපෘතියම ආපහු ඉදිරියට ගෙන යමින් රුපියල් කෝටි 174ක් වැනි විශාල මුදලක් ඒ සඳහා වැය කිරීම අපේ රටට බලවත් පාඩුවක්. ඩොලර් මිලියනවලින් ගත්තාම, රුපියල් කෝටි 174ක් කියන්නේ මුදල් අමාත්‍යාංශයට පොඩි මුදලක් වෙන්න පුළුවන්. නමුත් ලංකාවේ කිරි නිෂ්පාදනය පැත්තෙන් ගත්තොත්, ඩොලර් බිලියනයක් කියන්නේ රටේ ගොවි ජනතාවට විශාල විප්ලවයක් කළ හැකි මුදලක්.

ලංකාවේ ආර්ථිකය දියුණු කරන්නේ කොහොමද කියන එක ගැන බලනකොට මම අවධානය යොමු කළ ප්‍රධාන පැති දෙකක් තිබෙනවා. ලෝකයේ අද දියුණු වෙලා තිබෙන විද්‍යාව හා තාක්ෂණය අපට වාසිදායක විධියට යොදා ගන්න පුළුවන්. හැබැයි, නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ එක් අදහසකට මම එකඟ වෙන්නේ නැහැ. ඒක තමයි, අපි දියුණු හරකුන් පිටරටින් ගෙනෙන එක විද්‍යාත්මකයි, ඒකෙන් ආර්ථිකමය වශයෙන් ප්‍රතිලාභ තිබෙනවාය කියන අදහස. එහෙම ගෙන්වන එක වැරැදියි කියන එකයි මගේ අදහස වන්නේ. මොකද, ආර්ථිකමය වශයෙන් ප්‍රතිලාභ සහිත ගවයන් විද්‍යාත්මකව සෑදීමට අවශ්‍ය තාක්ෂණය ලංකාවේ ඕනෑ තරම් තිබෙනවා. අද අපේ ගොවීන් ඇති කරන ගවයකුගෙන් අපි සාමාන්‍යයෙන් ගන්නේ කිරි ලීටර් තුනක්, හතරක් වැනි ප්‍රමාණයක්. රජයේ ගොවිපළක ගවයකුගෙන් අපි සාමාන්‍යයෙන් ගන්නේ කිරි ලීටර් 7ක් වැනි ප්‍රමාණයක්. අපේ ගොවීන්ට දැන් ඉන්න ගවයන්ගෙන් ලබා ගන්නා සාමාන්‍ය කිරි ප්‍රමාණය ලීටර් තුනේ සිට හත දක්වා වර්ධනය කරගන්න පුළුවන් නම් ලංකාවේ කිරි අවශ්‍යතාව සම්පූර්ණ කරන්න පුළුවන් කියා මම හිතනවා. ඒ සඳහා කළමනාකරණ හා තාක්ෂණික උපදේශයක් පමණයි අපි දෙන්න ඕනෑ. උදාහරණයක් ගත්තොත්, අපේ නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා කිව්ව විධියට හම්බන්තොට අනන්‍යතාව මී කිරි හට්ටියයි. අපි රුහුණේ සිට කොළඹට එනකොට, හම්බන්තොට සිට කොළඹට එනකොට, නෑදෑ ගමන් යනකොට කිරි හට්ටි දෙකක් බැඳගෙන එන සම්ප්‍රදායක් තිබුණා. එම නිසා, "රුහුණේ අනන්‍යතාව මී කිරි" කියා කථාවක් තිබෙනවා. නමුත්, අපි මොකක්ද කළේ? හම්බන්තොට ක්‍රිකට් පිටිටනි හදන්න එහේ හිටපු ගම්බාරලා ටික එළවලා දැම්මා. ඒ මිනිසුන් ගිරාඳුරුකෝට්ටේ වැනි ප්‍රදේශවලට ගිහින්, වැස්සේ තෙමී -තෙමී වනජීවී එකට අයිති කැලෑවලට හරකුන් ටික දක්කලා අද අන්ත දුක් විඳිනවා. චීන්නුන්ට ඉඩම් දෙන්නයි, ක්‍රිකට් පිටිටනි හදන්නයි ඒ ප්‍රදේශවල ඉඩම් ටික අරගෙන, හම්බන්තොට ගොවියෝ හතර පැත්තට දැක්කුවා. [බාධා කිරීමක්] ඔව්, ඒ අය අභය භූමිවලටත් තල්ලු කළා.

වනජීවී එකේ ඉඩම් පාවිච්චි කරනවාය කියා අද වනජීවී එකෙන් හම්බන්තොට ගොවීන්ට දඩ ගහනවා. දේශ ප්‍රේමීත්වය ගැන ලොකු කථා කියපු, ජාතික ආර්ථිකයක් ගැන හිතුවාය කියන පසුගිය ආණ්ඩුවේ තත්ත්වය ඒකයි. ඒ නිසා අපි එදා ඒ ආණ්ඩුව විවේචනය කළා. මේක ඕස්ට්‍රේලියානු රජයේ කුමන්ත්‍රණයක් හෝ බහුජාතික සමාගම්වල ප්‍රශ්නයක්ය කියා මා හිතන්නේ නැහැ. අපේ අය මොළය පාවිච්චි කරන තරම සහ මුදල් ගසා කෑමට තිබෙන වංචාකාරී මානසිකත්වය නිසා මේ දේ සිද්ධ වුණාය කියා මට වුණත් අද කියන්න සිද්ධ වෙනවා. මේක ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් නොවෙයි. සාක්කුවට මුදලක් දමා ගන්න අපේ අයගේ තිබෙන බලවත් කෑදරකම නිසා, වැරැදි උපදේශකයන් කිහිපදෙනකු දෙන උපදෙස් මත කළ බරපතළ වරදක් මෙක. ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද අපි හැම දේටම කොමිෂන් සභා පත් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුදල පුංචි මුදලක් නොවෙයි. අද කිසිම අවශ්‍යතාවක් නැහැ, රෝගී ගවයන් ගෙනෙන්න. බටහිර රටවල ගවයන්ට පසුගිය කාලයේ කුර රෝගයක් ඇති වුණු බව අපි දන්නවා. ඕස්ට්‍රේලියාවත් ඒ ප්‍රශ්නයට වරින් වර මුහුණ දුන්නා. ඒකට හේතුව, බටහිර යුරෝපීය රටවල කිරි ගවයන් හදන ක්‍රමයේ බරපතළ ප්‍රශ්නයක් තිබීමයි. ගවයන්ගේ මස් ගවයන්ටම කන්න දෙන විධියට ඒ ගොල්ලන් තාක්ෂණය දියුණු කර තිබෙනවා. හැබැයි, ඒක මානුෂීය තාක්ෂණයක් නොවයි. අපට ගවයන් හැදීමට මානුෂීය තාක්ෂණයක් අවශ්‍යයි. ඉන්දියාව කිරිවලින් ස්වයංපෝෂිත රටක්. ඉන්දියාවේ විශාල ගව ගාල් බොහොම සුළු

ප්‍රමාණයකුයි තිබෙන්නේ. ඉන්දියාවේ ගවයන් හදන්නේ ගෘහස්ථ මට්ටමින්. අද බිහාර්වලට, උත්තර් ප්‍රාන්තයට ගියාම, ඒ හැම ගෙදරකම ගවයකු ඇති කරනවා දකින්න පුළුවන්. අද ලෝකයේ ලොකුම කිරි නිෂ්පාදකයා ඉන්දියාවයි. ඒ ගොල්ලන් ඒ තැනට ඇවිත් තිබෙන්නේ කොහොමද? ඒ අයගේ සුළු පරිමාණ කිරි නිෂ්පාදනය තමයි රටේ කිරි ස්වයංපෝෂිතභාවයක් ඇති කිරීම දක්වා ගමන් කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කිසිම ගවයකු ලංකාවට ගෙන්වන්න ඕනෑ නැහැ. විශේෂයෙන් යුරෝපීය වර්ගයේ හරක් ගෙන්වීම ඉතාම වැරැදියි. එහෙම ගෙන්වනවා නම් අපිට ගැළපෙන ගව වර්ග අපි ගෙන්වන්න ඕනෑ. දැනට ලංකාවේ ගොවි පොළවල්වල Friesian, Jersey, Sahiwal වර්ගයේ ගවයන් ඉන්නවා. මෙයින් සාමාන්‍යයෙන් Friesian වර්ගයේ ගවයන් ගොඩක් ගැළපෙන්නේ තෙත් කලාපයටයි; නැත්නම් සීත දේශගුණයක් සහිත ප්‍රදේශවලටයි. Sahiwal වර්ගයේ ගවයනුත් අපේ ගොවි පොළවල්වල ඉන්නවා. අපට කිරි ලීටර් 10ක්, 12ක් වාගේ ප්‍රමාණයක් ඒ ගවයන්ගෙන් ගන්න පුළුවන්. ඒ ගව වර්ගය පාකිස්තානු, ඉන්දියානු කලාපයේ සිටින ප්‍රසිද්ධ ගව වර්ගයක්. දැනට ලංකාවේ සත්ව ගොවිපොළවල් සෑහෙන ප්‍රමාණයක් තිබෙනවා. අපට ගවයන් බෝ කර ගැනීමට එම ගොවිපොළවල් හොඳටම ප්‍රමාණවත්. නමුත්, නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව, නිසි කළමනාකරණයක් නොමැතිවීම, දේශපාලන හෙංචයියන් පත් කිරීම, වැරැදි උපදේශකයන් පත් කිරීම වැනි හේතු නිසා අද අපේ කිරි ගව මධ්‍යස්ථාන කඩා වැටිලා තිබෙනවා. ඒ නිසා මා විශේෂ කාරණයක් මේ ගරු සභාවේ අවධානයට යොමු කරනවා. මේ සියලුම කිරි ගව මධ්‍යස්ථාන රජයට තියා ගන්නත් එපා; විකුණන්නත් එපා; ඒවා ජනතාවට දෙන්න. සමුපකාර ක්‍රමයක් හදලා, ඒ යටතේ නිසි කළමනාකාරිත්වයකින් ඒවා භාර දුන්නා නම්, ලංකාවේ කිරි නිෂ්පාදනය සඳහා අපට තිබෙන ගොවි පොළවල් ටික හොඳටම ප්‍රමාණවත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගව පැටවුන් ලබා ගැනීමේදී ස්ත්‍රී පැටවුන් පමණක් ලබා ගැනීමට හැකි වන පරිද්දෙන් ලෝකයේ තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් ගව පැටවුන් බිහි වෙනකොට ගැහැනු පැටවකු ලැබුණොත්, පිරිමි පැටවෙකුත් ලැබෙනවා. එතකොට පිරිමි පැටවා මරන්න සිද්ධ වෙනවා. මොකද, ගොවිපොළක පිරිමි සතෙකු තියා ගැනීමේ ප්‍රශ්නයක් තිබෙන නිසා. නමුත්, ස්ත්‍රී පැටවුන් පමණක් ලබා ගැනීමට හැකි වන ආකාරයට අද තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා. ජාන අධ්‍යයනය කරලා, නිරීක්ෂණය කරලා ස්ත්‍රී ජීවාණු විතරක් තෝරා ගැනීමේ හැකියාව අද තිබෙනවා. ඒ අනුව, ස්ත්‍රී ජීවාණු තැන්පත් කරලා අඛණ්ඩව ගැහැනු සතුන් පමණක් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. ගවයකු අවුරුදු 15ක් පමණ ජීවත් වෙනවා. එයින් අවුරුදු 12ක් විතර ඒ සතාගේ සශ්‍රීකත්වය තිබෙනවා. අපි අද ගවයන් ලක්ෂයක් දුන්නොත්, ඊළඟ අවුරුද්ද වනකොට ඒක ලක්ෂ දෙකක් වෙනවා. තුන්වන අවුරුද්ද වනකොට ඒ ලක්ෂ දෙක, ලක්ෂ හතරක් බවට පරිවර්තනය වෙනවා. ඒ අනුව, බැලුවොත්, දැනට ලංකාවේ සත්ව ගොවිපොළවල්වල ඉන්න සතුන් ප්‍රමාණය හොඳටම ඇති. අපට ගැළපෙන ජීවාණු තිබෙනවා නම් ඒවා පිට රටින් ගෙන්වන්න පුළුවන්. ජීවාණු ගෙන්වන ක්‍රම තිබෙනවා. අපි දැනටමත් ඒ වාගේ ජීවාණු වරින් වර ගෙන්වා තිබෙනවා. ඇති තරම් ජීවාණු ලංකාවේ දියුණු කර ගන්න හැකියාව තිබෙනවා. ජීවාණු කියන්නේ බැරල් ගණනින් ගෙනෙන ඒවා නොවෙයි. ජීවාණුවක් කියන්නේ ඇසට නොපෙනෙන අංශු මාත්‍රයක් වැනි දෙයක්. විද්‍යාත්මකව අපේ කලාපයට සුදුසු, ගැළපෙන ජීවාණු පිට රටකින් ලංකාවට ගෙන්වා ගන්න අපට පුළුවන්. අපි ආර්ථික සංවර්ධනය ගැන හිතනවා නම්, මේ වියදම් කළ රුපියල් කෝටි 174න් දුප්පත් ගම්මාන සියයක, කිරි ගම්මාන සියයක් ඇති කරන්න පුළුවන්කම තිබුණා. මේ කිරි ගොවිපොළවල් භාරව ඇත්තේ අපේ ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමාටයි. මම පසුගිය දවස්වල ඒ හැම ගොවි පොළකම ගවයන් කොපමණ ඉන්නවාද කියා හොයා බැලුවා.

කිරි ගම්මාන සියයක් ස්වාධීනව ඇති කිරීමේ වැඩ පිළිවෙළක් බහුජන ව්‍යාපාරත් සමඟ මම පෞද්ගලිකවම ආරම්භ කර තිබෙනවා. ඒ වාගේ ගම්මාන තුනක් අපි ස්ථාපිත කර තිබෙනවා. ලංකාවේ හොඳම කිරි ගොවියා ඒකනායක මහත්මයායි. එක දිගටම අවුරුදු තුන හතරක් ලංකාවේ හොඳම කිරි ගොවියා බවට පත් වුණේ ඔහුයි. සාමාන්‍යයෙන් දිනකට එක එළදෙනකගෙන් කිරි ලීටර් 20ක් විතර ගන්නවා. මේ ඔක්කෝම හරක් වර්ග දැනට ලංකාවේ ප්‍රචලිතව ඉන්නා හරක් වර්ගයි. බහුල වශයෙන් Jersey වර්ගයේ හරක් ඉන්නවා. ජාන මිශ්‍ර කරලා හදපු Friesian වර්ගයේ හරක් ඉන්නවා. වැලිමඩ ඒකනායක මහත්තයා මේ කර්මාන්තය ලෙහෙසියෙන්ම දියුණු කර තිබෙන්නේ කොහොමද කියා ඔහුගෙන්ම අහගන්න පුළුවන්. අද, කිසිම කරදරයක් නැතිව ලීටර 20ක් ගන්න පුළුවන්. පර්චස් 20ක භූමියක හරක් 20ක් විතර ඉන්නවා. මේ ගව ගාල බොහොම ලෙහෙසියෙන් පවත්වා ගෙන යනවා. ලංකාවේ හොඳම කිරි ගොවියාට හිමි සම්මානය ඔහු වර්ෂ කිහිපයක්ම ලබා ගත්තා. ලංකාවේ පසුගිය අවුරුදු 2ක, 3ක කාලයක් ඇතුළත රුපියල් බිලියන 30ක, 40ක මුදල් වැයකරමින් පිටරටින් කිරි ගෙන්වනවා. අපි දේශීය ආර්ථිකය, අපේ දේශීය කර්මාන්ත දියුණු කරන්න කියා කථා කරනවා. මේ කථා කරන කිසිම කෙනෙක් අපේ රටේ කිරි පිටි ආනයනය අඩු කරන්න කියා කිසිම වැඩ පිළිවෙළක් හැදුවේ නැහැ. පසු ගිය ආණ්ඩුව කාලයේ හැදුවෙත් නැහැ. මේ ආණ්ඩුව කාලයේ හදලත් නැහැ. පසු ගිය ආණ්ඩුව කාලයේ හරක් ගෙන්වන්න කියා, ඒකෙනුත් අතට කීයක් හෝ ලබා ගන්නා ව්‍යාපෘතියක් තමයි හැදුවේ. ඒ ව්‍යාපෘතිම මේ ආණ්ඩුව කරන එක තමයි කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ මේ ප්‍රශ්නය විසඳන්න කාර්යක්ෂම ඇමතිවරයෙක් සිටිනවා. දැන් මේ ගරු සභාවේ ඒ ඇමතිවරයා සිටිනවා. ඇත්තවශයෙන්ම මගේ දැනුම අනුව අවුරුදු දෙකක් තුළ ලංකාවට අවශ්‍ය කිරි ස්වයංපෝෂිතභාවය නිසි නායකත්වයකින්, නිසි කළමනාකරණයකින් අවුරුදු දෙකක් තුළ සම්පූර්ණයෙන් ලබා ගන්න පුළුවන්. ගරු ඇමතිතුමාට මම කියන්න කැමතියි, එක කිරි ගොවිපොළක් සමුපකාර ක්‍රමයට ජනතාවට භාර දීලා බලන්න කියා. එහෙම කරන්නේ නැතුව ඒවා විකුණන්න තමයි කථා කරන්නේ. සමාගම්වලට විදේශිකයන්ට ජාවාරම්කරුවන්ට විකුණන්න නොවෙයි, ආණ්ඩුවේ දේශපාලන හෙංචයියන්ට කීයක් හෝ හම්බ කර ගන්නත් නොවෙයි, නිලධාරීන්ට ගසා කන්නත් නොවෙයි. මේ ගොවිපොළවලින් එක් ගොවිපොළක් එතැන සිටින දක්ෂ නිලධාරීන්ට, කම්කරුවන්ට භාර දෙන්න. ඒ සඳහා අපිත් එකතු වෙන්න කැමතියි. ඒ ගොවිපොළ තුළින් අවුරුද්දක් ඇතුළත විශාල ජයග්‍රහණයක් ලබා ගන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා අද මෙම කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා ලංකාවෙන් පිට රටවලට යන රුපියල් බිලියන 30ක මුදල අපට ඉතිරි කර ගන්න පුළුවන් වනවා. අපට තරම් තණකොළ ඉන්දියාවේ නැහැ. නවසීලන්තයේ ජනගහනය මිලියන 5කට අඩුයි. නමුත්, රටේ ජනගහනය වාගේ දෙගුණයක් විතර හරක් -ලක්ෂ 90කට වඩා- සිටිනවා. අවුරුද්දෙන් භාගයයි තණකොළ තිබෙන්නේ. මාස හයක් තණකොළ නැහැ. ඉන්දියාවේ උතුරු ප්‍රදේශයේ මාස 4ක් ගිනි අව්වෙන් පිව්වෙනවා. සීතල මාස 5ක විතර කාලයක් හරියට තණකොළ නැහැ. නමුත්, ඉන්දියාව කිසිම කිරි පිටි පැකට් එකක් ගෙන්වන්නේ නැහැ.

[ගරු (ප්‍රජා) අතුරලියේ රතන හිමි ]

බංග්ලාදේශය කිසිම කිරි පැකට් එකක් ගෙන්වන්නේ නැහැ. පාකිස්තානය කිසිම කිරි පැකට් එකක් ගෙන්වන්නේ නැහැ. නවසීලන්තයේ කිරි විකුණන එකම රට ශ්‍රී ලංකාව පමණයි. මේ ආණ්ඩුව නවසීලන්තයට ඕනෑ විධියට කිරිවල බදු ඉවත් කර තිබෙනවා. අද ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුමක් ඇති කර තිබෙනවා. මෙම ගිවිසුම යටතේ ඕනෑම ආහාර නිෂ්පාදනයක් සිංගප්පූරුව හරහා ලංකාවට එන්න පුළුවන්. ඒ අනුව ක්‍රමානුකූලව කිරි පිටිවල බද්ද අප ඉවත් කර තිබෙනවා. එතකොට වෙන්නේ මිනිස්සු පිටරටින් එවන කිරි පිටි බොනවා මිසක්, ගමේ ගොවි ජනතාවගෙන් කිරි ලීටරයක් අරගෙන නැවුම් කිරි ටිකක් බොන්න කවදාවත් කිසිම උනන්දුවක් ඇති වෙන්නේ නැහැ. අද මේ ආණ්ඩුවට අවශ්‍ය වෙලා තිබෙන්නේ, අපේ රටේ කිරි ගොවියාත්, දේශීය කර්මාන්තකරුවන්ත් නැත්තටම නැති කර මුළු රටම නව ලිබරල්වාදී ජාත්‍යන්තර සමාගම්වල කෙළිබිම බවට පත් කරන්නයි. මේක ජාතික ආණ්ඩුවක් නොවෙයි, මේක ලිබරල් ආණ්ඩුවක්. බහුජාතික සමාගම්කාරයන් තුන් හතර දෙනෙක්ගේ පදයට නටන ආණ්ඩුවක්. මේක නතර කර මේ පිළිබඳ නිසි අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා. හරිහැටි තණකොළ නැති නවසීලන්තයට කිරි හදන්න පුළුවන් නම්, අපට බැරි ඇයි? ශ්‍රී ලංකාව අවුරුද්ද පුරාම කොළ පාටින් දිළිසෙන රටක්. අපේ රට කවදාවත් සම්පූර්ණයෙන් තණකොළ නැතිවෙන රටක් නොවෙයි. අඩුම තරමේ හම්බන්තොට තණකොළ නැත්නම්, බදුල්ලේ තණකොළ තිබෙනවා. ඒ වාගේම $CO_3$ සහ $CO_4$ වාගේ තණකොළ වර්ග ලංකාවේ ඉතා හොඳින් සකස් කර ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම ගවයන්ට අවශ්‍ය මූලික කෑම ලංකාව තුළම සකස් කර ගන්න පුළුවන්කම තිබෙනවා. පිටරටින් ගවයන්ට අවශ්‍ය ආහාර ගෙන්වන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

සාමාන්‍යයෙන් ගවයෙක් දවසකට කිලෝ 30ක්, 40ක් අතර ප්‍රමාණයක් ආහාරයට ගන්නවා. ඉන්පසු, එයින් හතරෙන් එකක් ගොම බවට පත් වෙනවා. දවසකට හරකෙක් ගව මූත්‍ර ලීටර 150ක් පිට කරනවා. ඒ ගව මූත්‍ර සම්පූර්ණයෙන්ම අපේ පොහොර නිෂ්පාදනයට යොදා ගන්න පුළුවන්. ඒ තාක්ෂණය ලෝකයේ රටවල -ඉන්දියාව, චීනය, ස්විට්සර්ලන්තය- ඉතාම හොඳින් දියුණු කර තිබෙනවා.

ක්ෂුද්‍ර ජීවී තාක්ෂණයත්, ගොමත්, ඒ වාගේම ගව මූත්‍රාත් යොදා ගන්නේ කොහොමද කියන එක. අද එළදෙනගෙන් කිරි විතරක් නොවෙයි ගන්නේ. ගොමවලින් අපට විදුලිය නිෂ්පාදනය කරන්නත් පුළුවන්කම තිබෙනවා, ඒවායින් අපට ගෑස් නිෂ්පාදනය කරන්නත් පුළුවන්කම තිබෙනවා, ඒවායින් අපට පොහොර විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නත් පුළුවන්කම තිබෙනවා. වර්ෂයකට කොපමණ යූරියා ප්‍රමාණයක් අපේ රටට පිට රටින් ගෙන්වනවාද? අපි පොහොර ගෙන්වන්න වැය කරන මුදලින්, ඒ කියන්නේ පොහොර ගෙන්වන්න වැය කරන රුපියල් බිලියන 50ක් පමණ මුදලින් බිලියන 35ක් විතර වැය වෙන්නේ යූරියා ගෙන්වීම සඳහායි. ගවයන්ගේ ගොමවල අධික ලෙස නයිට්‍රජන් තිබෙනවා. ගවයන්ගේ ගොම ටික තිබෙනවා නම් අපට යූරියා ගෙන්වීමේ අවශ්‍යතාවක් ඇති වෙන්නේ නැහැ. ලංකාවට පිට රටින් ගෙන්වන රුපියල් බිලියන 50ක් පමණ වන පොහොර ප්‍රමාණය වෙනුවට ලංකාවට අවශ්‍ය මුළු පොහොර ප්‍රමාණය ලංකාව තුළ රුපියල් බිලියන 20කින් නිෂ්පාදනය කරන්න පුළුවන්කම තිබෙනවා. යහ පාලන ආණ්ඩුව යටතේ පසුගිය වකවානුව තුළ මේ මතවාදය අපි ජනතාව අතරට ගෙන ගියා. ගොවියන්ගේ ගොවිපළවල්වල තිබෙන ගොම ටික එකතු කරලා පොහොර හදන මධ්‍යස්ථාන ඇති කළා. හැබැයි, මේ ආණ්ඩුවට ඒවා කිසි දෙයක අවශ්‍යතාවක් නැහැ. කිසිම ධෛර්ය දීමක් කරන්නේ නැහැ. ඒවාට තල්ලු කිරීමක් නැහැ. ඒ වැඩසටහන් සම්පූර්ණයෙන් අඩාල කරන වැඩසටහනක තමයි අද මේ මුළු ආණ්ඩුවම ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කනගාටුයි කියන්න. අද මේ රට දියුණු කරන්න මේ ආණ්ඩුවට කිසිම අවශ්‍යතාවක් නැහැ. අද ඔවුන්ට අවශ්‍ය කර තිබෙන්නේ කියක් හෝ සාක්කුවට ලැබෙන ක්‍රමයක් මිසක්, ගොවි ජනතාව නගා සිටුවන්න නොවෙයි. මුළු ලෝකයෙන්ම ලස්සන රටක් වුණු අපේ රටේ ආර්ථික වටිනාකම කොන්ක්‍රීට් ගොඩනැඟිලි නොවෙයි. මේ රටේ තිබෙන වටිනාකම සදාහරිත වනාන්තර සහ ඇහැට පෙනෙන කොළ පාටයි. ඒවා විනාශ කරන්න, ඒ කියන්නේ අපේ ඉඩම් ටික විකුණන්න, අපේ ගම් බිම් විකුණන්න, ජාත්‍යන්තර යෝධ කර්මාන්තකරුවන්ට අපේ සම්පත් දෙන්න අද මේ ආණ්ඩුව නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියක සැලසුම් හදලා තිබෙනවා. කලින් කිව්වා වාගේ, අපේ දේශීය දොඩම් වගාව 1980 ගණන්වල "මෙටා ඉන්ටර්නැෂනල්" වාගේ යෝධ ජාත්‍යන්තර සමාගම්වලට දුන්නා. 1818දී, ඒ කියන්නේ අදට අවුරුදු 200කට කලින් මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවගේ සම්පූර්ණ ඉඩම් ටික මංකොල්ල කෑවා. ඒ වාගේම 1980 ගණන්වල ඒ මිනිසුන්ගේ ඉඩම් මංකොල්ල කාලා ඒ මිනිස්සු ඒ ඉඩම්වල වහල්ලු බවට පත් කළා. ඒක තමයි මේ ආණ්ඩුව යටතේ ජනතාවට අත් වුණු ඉරණම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එළදෙනගෙන් කරන්නේ කිරි නිෂ්පාදනයක් පමණක් නොවෙයි. කිරි නිෂ්පාදනයත් සමඟ අපේ රටේ අපට ගොඩ නඟන්න පුළුවන් ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් තිබෙනවා. කිරි නිෂ්පාදනය හා සමාන්තරව අපි සමුපකාර සමිති හරහා කිරි නිෂ්පාදනය සකස් කරන වැඩ පිළිවෙළක් හදන එක එහිදී ඉතාම වැදගත් වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ පිළිබඳව අවධානය යොමු කරන්න. අද රටවලට වෙනත් රටවලින් හරක් ගෙන්වන්නේ නැහැ. එහෙම හරක් ගෙන්වනවා නම්, ඒ ගෙන්වන ඇමතියාත් හරකෙක්, නිලධාරියාත් හරකෙක්. මොකද, හරක් වෙනුවට අපේ රටට දියුණුම තත්ත්වයේ ජාන ගෙනැල්ලා ඒ හරක් ඇති කරන්න පුළුවන්. ශීත රටවල සිටින Friesian වර්ගයේ හරක් ලංකාවේ ගොවිපළවල්වල සිටිනවා. ඒ හරක්ට ඕනෑම වර්ගයක semen ඇතුළු කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ විධියට ජීවානු ඇතුළු කරන්න පුළුවන්කම තිබෙනවා. එහෙම තිබියදී හොරකම් කරන්න පුළුවන්, නිලධාරින් කිහිප දෙනෙකුට උපදේශකයෝ කිහිප දෙනෙකුට සාක්කුවට සල්ලි දමා ගන්න පුළුවන් ව්‍යාපෘතියක් තමයි අලුත් හරක් ගෙනෙනවාය කියන්නේ. එම නිසා කිසිම අර්ථ ක්‍රමයක් යටතේ පිට රටකින් ලංකාවට කිසිම හරකෙක් ගෙන්වන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අපේ රටේ තාක්ෂණික දැනුම තිබෙනවා, විද්‍යාඥයෝ සිටිනවා. අපේ රටට අවශ්‍ය කිරි ලීටර් ප්‍රමාණය ගත්තොත්, අපේ රට තුළ ඕනෑවටත් වැඩිය කිරි නිෂ්පාදනය කරන්න පුළුවන්කම තිබෙනවා. දැනට සිටින හරක් කාර්යක්ෂම කර, කළමනාකරණය කළත් ඒකට උත්තරයක් හම්බ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවට ඉදිරිපත් කළ මෙම කල් තැබීමේ යෝජනාව පිළිබඳව ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, මේ පිළිබඳව රජයේ සම්පූර්ණ අවධානය යොමු කරන්න කියා මම ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා.

[பி.ப. 6.21]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இச்சந்தர்ப்பத்தைத் தந்தமைக்கு நன்றி. இன்றைய கால கட்டத்தில் நடைபெறுகின்ற பசுமாடுகளினது இறக்குமதி தொடர்பாகவும் அது தொடர்பில் ஏற்படுகின்ற பிரச்சினைகள் தொடர்பாகவும் இன்று கௌரவ பாராளுமன்ற உறுப்பினர் நளிந்த ஜயதிஸ்ஸ அவர்களினால் முன்வைக்கப்பட்டிருக்கின்ற சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையானது அவசிய மானதும் முக்கியத்துவமானதுமாகும்.

நாட்டில் காலாகாலமாகப் பேசப்பட்டு வருகின்ற ஒரு முக்கிய விடயம் என்னவென்றால், இலங்கைக்குத் தேவை யான பாற்பொருட்களை - அவை பாலாக இருக்கலாம்; பால்சார்ந்த பொருட்களாக இருக்கலாம் - இந்த நாட்டிற் குள்ளேயே உற்பத்தி செய்யக்கூடிய எல்லா வாய்ப்புக்களு மிருந்தும், அவை நழுவவிடப்பட்டு, மில்லியன் கணக்கான தொகை அத்தகைய இறக்குமதிக்காகச் செலவிடப்படுகின்ற தென்பதாகும். கண்டி மாவட்டத்தைப் பிரதிநிதித்துவம் செய்கின்ற பாராளுமன்ற உறுப்பினர் என்றவகையிலே, பால் உற்பத்தியிலே பெரும்பகுதியை உற்பத்தி செய்கின்ற மாகாணத்தில் ஒரு மாவட்டமாக எங்களுடைய மாவட்டம் அமைந்திருக்கின்றது என்பதை இங்கு நான் தெரிவிக்க விரும்புகின்றேன்.

அதேநேரம் இந்த மாவட்டத்திற்குள் பெருமளவான நிலங்கள் பயிர் செய்யப்படாத நிலங்களாக இருக்கின்றன. குறிப்பாக மக்கள் தோட்ட அபிவிருத்திச் சபை, அரச பெருந்தோட்ட யாக்கம், Elkaduwa Plantations போன்ற அரசிற்குச் சொந்தமான பெருந்தோட்டங்களில் பெருமளவான நிலங்கள் கடந்த இரு தசாப்தங்களாகப் பயிரிடப்படாது கைவிடப்பட்டு, ஒதுக்கப்பட்ட நிலங்களாக இருக்கின்றன. இப்போது இங்கு உரையாற்றிய வணக்கத்துக்குரிய அத்துரலியே ரதன தேரர் அவர்கள் குறிப்பிட்டதுபோல, இந்தத் தோட்டத் துறையிலிருக்கின்ற பிரதான பிரச்சினையாக, அந்தத் தோட்ட மக்களுடைய பொருளாதார நிலைமை காணப்படுகின்றது. அந்தப் பொருளாதாரத்தைச் சீர்படுத்து வதற்கு இரண்டு ஆண்டுகளுக்கொரு தடவை அவர்களுடைய சம்பளம் தொடர்பாகப் பேச்சுவார்த்தை நடத்தப்படுகின்றது. அத்தோடு, அவர்களுக்குச் சுயதொழிலை மேற்கொள்வதற் குரிய அடிப்படை வசதியும் ஏற்படுத்திக் கொடுக்கப்படுமாக இருந்தால், தோட்டத்துறையைப் பாதுகாப்பதுடன் எங்களு டைய பொருளாதாரத்திலிருந்து அந்நியச் செலாவணி வெளியேறுவதைத் தடுத்து, அந்த மக்களுடைய வாழ்வாதாரத்தையும் மேம்படுத்த முடியும். ஆனால், சுயதொழில் நடவடிக்கைகளை மேற்கொள்வதற்குத் தேவையான காணிகள் அங்கு தாராளமாகக் காணப்பட்டும், அந்த நடவடிக்கையை முன்னெடுப்பதற்குரிய வாய்ப்புக்கள் அரசுக்கிருந்தும், அதற்கான திட்டங்களை நாங்கள் கோரிநின்றும், அவ்வாறான செயற்பாடுகள் முன்னெடுக்கப் படுவதாக இல்லை.

தோட்டப் புறத்திலிருக்கின்ற மக்களுக்குப் பாற்பண்ணை தொடர்பாக, பசுக்களை வளர்ப்பது தொடர்பாகக் காலாகாலமாக அனுபவமிருக்கின்றது. ஆனால், அந்த நடவடிக்கைகளை மேற்கொள்வதற்குத் தேவையான நிதி உதவிகளை வழங்கும் விடயத்தில் அல்லது பசுக்களைப் பெற்றுக் கொடுத்தல், அவர்களுக்கான காணிகளை ஒதுக்கிக் கொடுத்தல் போன்ற விடயங்களில் அரசாங்கம் தலையிட்டு நடவடிக்கையெதுவும் மேற்கொண்டதாகத் தெரியவில்லை.

இங்கே குறிப்பிடப்பட்டதுபோல, ஒரு கூட்டுறவு முறையை உருவாக்கி, அங்கேயிருக்கின்ற நிலங்களை அவர்களுக்குப் பகிர்ந்து கொடுத்து, அதிலே குறித்த செயற்பாடுகளை முன்னெடுக்கின்றபோது அந்தச் சாதகத்தை, நாடும் அந்தச் சமூக மக்களும் பெற்றுக்கொள்ள முடியும். அதனை விடுத்து, வெளிநாட்டவர்களுக்கு அல்லது வெளிநாட்டு நிறுவனங் களுக்கு, தனவந்தர்களுக்கு இந்தக் காணிகளைப் பகிர்வதற்குரிய ஏற்பாடுகளைச் செய்வதிலும் யோசனைகளில் ஈடுபடுவதிலுமே அதிகாரிகளும் சம்பந்தப்பட்ட சபைகளின் தலைவர்களும் அக்கறை காட்டுகின்றார்களென்பது கண்கூடு. அங்கு நிலம் இருக்கின்றது; அனுபவங்கொண்ட தொழிலாளிகள் இருக்கின்றார்கள்; தோட்டத்துறையில் இருக்கின்றவர்கள் அந்தச் செயற்பாட்டைச் செய்வதற்குத் தயாராக இருக்கின்றார்கள். அப்படியிருந்தும் ஏன் இந்த நிலைமை? அவற்றையெல்லாம் புறந்தள்ளிவிட்டு பாரிய கம்பனிகள், முதலாளி வர்க்கத்தினர் சார்ந்தோர்களை இந்தத் திட்டத்துக்குள் புகுத்தி அவர்களுக்கு இந்தக் காணிகளைக் கொடுப்பதிலேயே கூடிய அக்கறை காட்டுகின்றவர்களாக சம்பந்தப்பட்ட சபைகளிலுள்ளவர்கள் காணப்படுகின்றார்கள். இந்த நிலைமை மாற்றப்பட வேண்டும்.

தற்போது இருக்கின்ற திட்டத்தின்கீழ் குறைந்தபட்சம் 10 பசுக்கள் கொள்வனவு செய்யப்பட வேண்டும். அவ்வாறு கொள்வனவு செய்கின்றபோது, அதில் 50 சதவீதமான தொகையை அவர்கள் செலுத்த வேண்டும். நான் அறிந்த வகையிலே, ஒரு பசுவுக்கு ஏறக்குறைய 200,000 ரூபாய் செலுத்தப்பட வேண்டும். அத்தொகைப்படி 10 பசுக்களையும் பெற்றுக்கொள்ள ஏறக்குறைய 2,000,000 ரூபாய் தேவை. இதனால் சாதாரணமாக இந்தத் தொழிற்துறையை வளர்த்தெடுக்கக்கூடியவர்களுக்கு இதில் தங்களுடைய பங்குபற்றலைச் செய்ய முடியாது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களை நான் வேண்டிக்கொள்வது என்னவென்றால், தோட்டத்துறையை மையமாகக்கொண்டு குறித்த ஒரு வேலைத்திட்டத்தை ஆரம்பியுங்கள் என்றுதான். அந்த வேலைத்திட்டத்தைச் சரியாக முன்னெடுத்தால், இந்தப் பால் உற்பத்தியிலே தன்னிறைவு பெற்ற ஒரு தேசமாக எங்களுடைய தேசத்தை மாற்ற முடியும். அதேநேரம், இந்தத் தோட்டத்துறையில் இருக்கக்கூடிய மக்களின் வாழ்க்கைத் தரத்தையும் உயர்த்திக் கொள்ளக் கூடியதாகவிருக்கும்.

இந்த அமைச்சுக்கு உரித்தான பாற்பண்ணை கண்டி மாபெரிதென்ன பிரதேசத்திலே காணப்படுகின்றது. அந்தப் பாற்பண்ணைத் தொழிலாளர்கள் நீண்ட காலமாக அங்கு சேவை புரிகின்றார்கள். கடந்த அரசாங்கத்திலே உத்தியோகப் பற்றற்ற வகையிலே அவர்களுக்கு வீடுகளைக் கட்ட நிலங்கள் வழங்கப்பட்டிருந்தன. ஆனால், அது அமைச்சரவை அங்கீகாரம் பெற்று முறையாக வழங்கப்படவில்லை. ஆகவே, கடந்த காலத்தில் அந்த நிலங்கள் மீள சுவீகரிக்கப்பட்டன. அந்த மக்களுக்குக் காணிகளைப் பெற்றுக்கொடுப்பதற்கு தற்போதைய அரசு அமைச்சரவை அங்கீகாரமொன்றை வழங்கியிருக்கிறது. அந்த அமைச்சரவைப் பத்திரத்திற்கமைய அந்த மக்களுக்கு வீடுகளை அமைத்துக் கொள்வதற்குத் தேவையான காணிகளைப் பெற்றுக்கொடுப்பதற்கான நடவடிக்கையைத் தாங்கள் மேற்கொள்ள வேண்டுமெனவும், அந்தப் பாற்பண்ணையை அபிவிருத்தி செய்வதற்கும் நடவடிக்கை எடுக்கவேண்டுனவும் கேட்டு, விடை பெறுகின்றேன்.

[பி.ப. 6.27]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கால்நடை அபிவிருத்தி தொடர்பான இன்றைய இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையைக் கொண்டுவந்த எமது சக உறுப்பினரும், வைத்தியருமான நளிந்த ஜயதிஸ்ஸ அவர்களுக்கும் சந்தர்ப்பத்தைத் தந்த உங்களுக்கும் எனது நன்றியைக் கூறிக் கொள்கின்றேன். எமது நாட்டிலுள்ள வளங்கள் பற்றி இங்கே பேசிய பலரும் சொன்னார்கள். எமது நாட்டைப் பொறுத்தளவிலே உண்மையிலே, இந்த நாட்டிலே இல்லாத வளங்கள் கிடையா. விவசாயமாக இருக்கலாம், கால்நடை அபிவிருத்தியாக இருக்கலாம். அவை அனைத்தையும் மேற்கொள்வதற்கான அனைத்து வளங்களும் இந்த நாட்டில் இருக்கின்றன.

எமது பாற்பொருட்கள் தொடர்பான விடயங்களிலே, நாங்கள் வெளிநாட்டை எதிர்பார்த்திருக்க வேண்டிய அவசியம் கிடையாது. இது ஒரு விவசாய நாடாக இருந்தாலும்கூட, துரதிருஷ்டவசமாகத் தொடர்ந்தும் வெளிநாடுகளிலே தங்கியிருக்கும் ஓர் அவலகரமான நிலைமையையே இங்கு நாங்கள் பார்க்கின்றோம். எமது நாட்டைப் பொறுத்தளவிலே, வருடந்தோறும் மழை பெய்கின்றது; சுவாத்தியமான நிலங்கள் இருக்கின்றன; புற்றரைகள் இருக்கின்றன. இவ்வாறு, எமது நாடு அனைத்து வளங்களும் கொண்டதாக இருக்க, நாங்கள் எதற்காக வெளிநாடுகளிலே தங்கியிருக்கவேண்டுமென்ற ஒரு கேள்வி எழும்புகின்றது. விசேடமாக நான் பிரதிநிதித்துவப் படுத்தும் மலையகத்தைப் பொறுத்தளவிலே, அங்குள்ளவர்கள் பாற்பண்ணை உற்பத்திகளிலே அல்லது மாடு வளர்ப்பிலே மிக அதிகளவில் ஈடுபாடு கொண்டவர்களாகத் தொடர்ந்தும் இருந்து வருகின்றார்கள். துரதிருஷ்டவசமாக அவர்களுக்கு உரிய வளங்கள் சரியாக வழங்கப்படவில்லை; அவர்களின் உழைப்பினை நாங்கள் சரியான முறையிலே பயன்படுத்திக் கொள்ளவில்லை. அதன் காரணமாக இந்த நாட்டுக்கு மலையக மக்களூடாகக் கிடைக்க வேண்டிய சேவைகள் இழக்கப் படுகின்றன என்பதுதான் யதார்த்தமாகும் - உண்மையாகும்.

கடந்த காலங்களிலே, மலையகத்தைச் சேர்ந்த ஒருவர் கால்நடை அபிவிருத்தி அமைச்சராகத் தொடர்ச்சியாக இருந்து வந்திருக்கிறார். அந்தக் காலகட்டத்தில் அந்த அமைச்சு சரியாகச் செயற்பட்டிருந்தால், சரியாக இயங்கியிருந்தால், திட்டமிட்டுச் செயற்பட்டிருந்தால் இன்று மலையகத்திலே ஒவ்வொரு வீட்டிலும் ஒரு பண்ணையாளர் உருவாகியிருக்கக் கூடிய ஒரு நிலைமை ஏற்பட்டிருக்கும். அவ்வாறு, சரியாகத் திட்டமிட்டுச் செயற்பட்டிருந்தால், இன்று மலையத்திலே வீடு தோறும் ஒரு பண்ணையாளர் இருந்திருப்பார். இப்பொழுது காலம் கடந்துவிட்டது. கடந்தவற்றைப் பற்றிப் பேசுவதில் எவ்வித அர்த்தமும் இருப்பதாக நான் எண்ணவில்லை. அந்த வகையில், நாங்கள் இந்த விடயத்திலே சரியாகச் செயற்பட வேண்டும். அவ்வாறு சரியாகச் செயற்பட்டால், இந்த நாட்டிற்குத் தேவையான பால் உற்பத்தியில் 40 சதவீதத்திற்கும் அதிகமான உற்பத்திகளை மலையகத்திலே இருந்து மாத்திரம் பெற்றுக்கொள்ள முடியும். அவ்வாறு நாங்கள் பெற்றுக் கொண்டால், பாற்பொருட்களை இறக்குமதி செய்யவேண்டிய அவசியம் கிடையாது. வெளிநாட்டுச் செலாவணியை வீணாகச் செலவழிக்கவேண்டிய அவசியம் கிடையாது. இந்த நாட்டிலே எங்களது பால் உற்பத்திகளைப் பெருக்கிக் கொள்ளக்கூடிய நல்ல நிலைமை அப்போது ஏற்படும்.

கௌரவ விஜயமுனி சொய்சா அவர்கள் இந்த அமைச்சுக்குப் புதிதாக நியமிக்கப்பட்டிருக்கின்றார். மலைய கத்தைப் பற்றி மிக நன்றாக அவருக்குத் தெரியும். அவர் மொனராகலை மாவட்டத்தைப் பிரதிநிதித்துவம் செய்கிறார். மொனராகலை என்பது பதுளையைப் போன்று ஊவா மாகாணத்திலே உள்ள இன்னுமொரு மாவட்டமாகும். அந்த வகையில், அந்த மாவட்டத்திலும் பாற்பண்ணைகளைச் சிறந்த முறையில் செய்ய முடியும். இப்பொழுது நாங்கள் வெளிநாடுகளிலிருந்து மாடுகளை இறக்குமதி செய்கின்றோம். ஆனால், அவற்றை இறக்குமதி செய்வதில் நான் எவ்வித பிழையும் காணவில்லை. எமது நாட்டிலே போதியளவு கால்நடைகள் இல்லாத காரணத்தினால் நல்ல கறவை மாடுகளை, தரமான மாடுகளை வெளிநாட்டில் இருந்து நாங்கள் கொண்டுவரத்தான் வேண்டும். அதிலே மாற்றுக் கருத்துக்கு இடமில்லை. ஆனால், நாங்கள் திட்டமிட்டுச் செயற்பட வேண்டும். இந்தத் திட்டமிடல் இல்லாத காரணத்தினால்தான், எமது பால் உற்பத்திகளிலே நாங்கள் பின்னடைவுகளைச் சந்தித்து வருகின்றோம்.

அவுஸ்திரேலியா போன்ற நாடுகளிலிருந்து தருவிக்கப் பட்ட மாடுகளுக்காக மின்விசிறிகள் பூட்டப்பட்டிருக்கின்ற தென்று சொல்லப்படுகிறது. குளிர்காற்று செயற்கையாக ஏற்படுத்தப்பட்டு அவற்றுக்கு அந்தச் சுவாத்தியம் ஏற்படுத்தப் படுவதாக இங்கே குற்றம் சுமத்தப்பட்டது. அவ்வாறு நாங்கள் செய்யவேண்டிய அவசியம் இல்லை. இந்த மாடுகளை நீங்கள் மலையத்திற்குக் கொண்டுவாருங்கள்! இந்த அனைத்துக் கால நிலையும் மலையத்திலே இருக்கின்றது. அங்கே குளிரான காற்று, நீர் வளங்கள் முதலியன இருக்கின்றன. ஆகவே, அங்கு அந்தக் கால்நடைகளுக்கு மின்சார வசதி அவசியமில்லை. ஏனெனில், காலநிலை அங்கே சிறப்பாக இருக்கின்றது. அவ்வாறு அங்கே அந்தச் சூழல் அமைந்திருப் பதன் காரணமாக, மலையகத்தை மையப்படுத்தி இந்த விடயத்திலே திட்டமிட்டுச் செயற்பட்டால் அதிகளவான பால் பொருள் உற்பத்திகளை எங்களால் மேற்கொள்ள முடியும். வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்யும் அந்தப் பாற்பொருட்களின் அளவைக் கணிசமானளவு குறைக்க முடியும். அது மாத்திரமல்ல, பால் உற்பத்தியில் எங்களால் தன்னிறைவு அடைய முடியும் என்ற விடயத்தையும் இந்த இடத்திலே பதிவுசெய்துகொள்ள விரும்புகிறேன்.

எனவே, இந்தப் பால் உற்பத்தி விடயத்திலே மலையக மக்களுக்கு முன்னுரிமை கொடுங்கள்! மலையகத்திலே அதிகளவான மாட்டுப் பண்ணைகளை ஏற்படுத்துவதற்கான வசதி வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுங்கள்! அப்போது எங்களால் பாலுற்பத்தியில் உச்சக் கட்டத்திற்குச் செல்ல முடியுமென்று கூறி, வாய்ப்பளித்த அவைத் தலைவர் அவர்களுக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

[අ.භා. 6.33]

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වැදගත් කරුණක් පිළිබඳව ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් වන විවාදයේදී කථා කරන්න ලැබීම සතුටක්. රටට වැඩි ඵලදායිතාවක් සහිත

සතුන් ගෙන එන්න අවශ්‍ය නම්, එහෙම අරන් එන්න ඕනෑ කියලා විශේෂඥ මතයක් තිබෙනවා නම්, නිවැරදි ලෙස තෝරාගෙන, නිවැරදි ක්‍රමවේදයට එම වසු පැටවුන් රටට අරගෙන එන්නත්, එම සතුන් බෙදා හරින්නත් එහි ඵලදායිතාව පිළිබඳව අඛණ්ඩව පරීක්ෂා කිරීමත් කළ යුතුව තිබෙනවා. ඒ ක්‍රියාදාමයේදී නොසැලකිලිමත් භාවයක්, දූෂණයක් සිද්ධ වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳව වග කිව යුතු තැනැත්තන්ට එරෙහිව කටයුතු කිරීම කළ යුතුයි කියන කාරණය මම පිළිගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ප්‍රශ්නය ඊට වඩා වෙනස් එකක්. "අපි කිරි බොන්න ඕනෑ" කියලා ලංකාවේ අපට අදහසක් තිබෙනවා. කුඩා දරුවන්ට අපි කිරි දෙනවා. වැඩිහිටියෝත් කිරි බොනවා. නමුත් කිරි බොනවා කියලා අපි බොන්නේ, පිටි කිරි. ඒ කියන්නේ, පිටි බවට පත් කරනලද බව කියන ද්‍රව්‍යයකට වතුර දමා බොනවා. සංඛ්‍යා ලේඛන පිළිබඳව අධ්‍යයනය කරන විට මුළු ලෝකයේම නොමැති විධියේ අසාමාන්‍ය තත්ත්වයක් අපේ රටේ කිරි පාරිභෝජනයේ තිබෙනවා. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාටත් මේ කාරණය පිළිබඳව අවබෝධයක් ඇති. මීට කලින් නවසීලන්තයෙන් ගෙන එන කිරිවලට යම් රසායනික ද්‍රව්‍යයක් මුසු වී තිබේ යැයි කියන සැකය මත, ලංකාවට ගෙන ඒම නතර කළා. එවිට නවසීලන්තයේ අගමැතිවරයා ලංකාවට පැමිණ රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් කථාකොට එම ප්‍රශ්නය විසඳා ගැනීම දක්වා එය බරපතළ තත්ත්වයක් බව අපට පෙනුණා. ඇත්තම කථා කළොත්, නවසීලන්තයේ ආර්ථිකය පවත්වාගෙන යාමට ලංකාවේ අපි විශාල හයියක් දෙන බව තමයි අපට ඒ අවස්ථාවේ පෙනී ගිය කාරණය.

අපේ රටට අවශ්‍ය කිරි ප්‍රමාණය, මේ රටේ දියර කිරි වශයෙන් නිෂ්පාදනය කර ගැනීමට අවශ්‍ය භූමිය අපට තිබෙනවා. අපේ රටට ප්‍රමාණවත් තරම් දියර කිරි නිෂ්පාදනය කර ගන්න පුළුවන්. එහෙම කරන්න අවශ්‍ය සම්ප්‍රදායක්, එහෙම කරන්න අවශ්‍ය හැකියාවක් අපේ ගොවීන්ට තිබෙනවා. නිසි මිලදී ගැනීමේ ක්‍රමවේදයක් සහ බෙදා හැරීමේ ක්‍රමවේදයක් අපි සකස් කර ගන්නවා නම්, මේ පුංචි රටේ හැම ගෙදරටම උදැසන දියර කිරි බෝතලයක් ලබා දීමට හැකියාවක් තිබෙනවා. නමුත්, එසේ තිබියදී අපි දිගින් දිගටම පිටි කිරි භාවිතයට ඇබ්බැහි වෙලා තිබෙනවා. මේ පිළිබඳව මත ප්‍රකාශ කරන විශේෂඥයින් කියන්නේ, මේ රටට අරන් එන පිටි කිරි -පිටි කරන ලද කිරි- තුළ ඇත්ත වශයෙන්ම තිබිය යුතු වටිනා ප්‍රෝටීන නොමැති බවයි. ඒ කියන්නේ, ගවයන්ගේ කිරි තුළ ස්වභාවිකව තිබෙන ඒ වටිනා ප්‍රෝටීන ඉවත් කර ඒ වෙනුවට සත්ත්ව හෝ ශාක ප්‍රෝටීන එකතු කර, කිරි ලෙස පෙනෙන ද්‍රව්‍යක් තමයි අපි මේ සකස් කර ගන්නේ. පුරුද්දට බොනවා.

නවසීලන්තයේ සත්‍ය කිරි නිෂ්පාදනයයි, නවසීලන්තයෙන් එළියට එන පිටි කිරි ප්‍රමාණයයි අතර විශාල නොගැළපීමක් තිබෙන බව මේ පිළිබඳව විෂය දන්නා විශේෂඥයන් ප්‍රකාශ කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එයට එක හේතුවයි තිබෙන්න පුළුවන්. පිටි කිරි ලෙස අපට සහ තවත් රටවලට යවන මේ ද්‍රව්‍ය, ස්වාභාවික කිරිවලින් උකහා ගන්නා කොටසකට තවත් කෘත්‍රිම දේ එකතු කොට නිෂ්පාදනය කරන ලද යම් ආකාරයක කෘත්‍රිම ද්‍රව්‍යයක් බවයි මගේ නම් හැඟීම. අපි විවිධාකාර පාන වර්ග පාවිච්චි කරනවා. ජාත්‍යන්තර නාම සහිත පාන වර්ග පාවිච්චි කරනවා. නවසීලන්තයෙන් හෝ ඕස්ට්‍රේලියාවෙන් හෝ එන මේ පිටි කිරිවල අන්තර්ගතය පිළිබඳව පරීක්ෂණ කරන්නට ඕනෑ. මේක ලෙහෙසි නැහැ. මෙහෙම සැක සංකා උපදවන්න, මෙහෙම ප්‍රශ්න මතු කරන්න උත්සාහ කරන බොහෝ දෙනෙක්ව මේ පිටි කිරි ජාවාරම කරන අය විසින් යම් ආකාරයක පාලනයකට හසු කර ගන්නවා. මේ පිළිබඳව උනන්දු වන, මේ ප්‍රශ්නය පිළිබඳව කථා කරන අයට මේ පිටි කිරි සමාගම් විසින් නොයෙක් බලපෑම් එල්ල කරනවා. මේ රටට නවසීලන්තයෙන් ලැබෙන්නේ සත්‍ය වශයෙන්ම ස්වාභාවික පිටි බවට පත් කරන ලද කිරිද කියන ප්‍රශ්නය මතු කරන සෑම විටම ඒ ප්‍රශ්නය මතු කරන පුවත් පතට, ඒ ප්‍රශ්නය මතු කරන ගුවන් විදුලි නාළිකාවට, ඒ ප්‍රශ්නය මතු කරන රූපවාහිනී නාළිකාවට මේ පිටි කිරි සමාගම් විසින් විශාල බලපෑමක් එල්ල කරනවා, "ඔබලා මේ ප්‍රශ්නය මතු කරනවා නම්, ඔබලාට අපි දැන්වීම් දෙන්නේ නැහැ" කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ප්‍රතිචාරයෙන් පෙනී යන්නේ මේ කාරණය පිළිබඳව ඔබතුමාත් දන්නවා කියන එකයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
හරියට හරි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මේක තමයි යථාර්ථය. මේ යථාර්ථය දන්නා, ගමේ ජීවත් වෙන, මේ පිළිබඳව අවබෝධයක් තිබෙන ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක් වන ගරු සොයිසා ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මගේ ස්ථාවරය ගැන යම් සහායක් දැක්වීම ගැන. එක දෙයයි කරන්න තිබෙන්නේ. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ දැන් මේ ප්‍රශ්නය මතු වුණා. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළ ප්‍රශ්නය එකක්, මම කියන්නේ තවත් එකක්. ඒක ඇත්ත. හැබැයි, මේ ප්‍රශ්න දෙක එකට ගැට ගැසී තිබෙනවා. අපේ ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හාමුදුරුවෝ පවසා සිටියේ, එක් එක් ගොවියා තමන්ගේ ගෙදර හරක් කිහිප දෙනෙක් ඇති කරලා ආදායමක් ලබා ගන්නා ක්‍රමය ගැනයි. ඒ model එක ඉතාම හොඳයි. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපේ රටේ කර්මාන්තකරුවන් පෙන්වා දී තිබෙනවා, මහා පරිමාණ විධියට අපේ රටේ භූමිය පාවිච්චි කරලා, අලුතින් කැලෑ එළි කරන්නේ නැතුව, තිබෙන තෘණ භූමි පාවිච්චි කරලා මේ රටේ කිරි අවශ්‍යතාවෙන් විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්න පුළුවන් කියලා. ඒ කිරි නවීන තාක්ෂණයෙන් අපේ ගෙදරට එවන්න, supermarket එකට එවන්න, ගෙයින් ගෙට බෙදන්න පුළුවන් බව දැනටමත් ඔප්පු කරලා තිබෙනවා. දේශීය කිරි නිෂ්පාදනයට එරෙහිව කටයුතු කරන මේ කුමන්ත්‍රණකාරී බලවේගය මේ පිටි කිරි සමාගම් බවට සැක කරන්න අපට ගොඩක් හේතු තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඒ නිසා මගේ ඉල්ලීම වන්නේ, මේ රටට ගෙන එන "කිරි පිටි" යැයි සඳහන් මේ අමු ද්‍රව්‍ය නිසි විද්‍යාත්මක පරීක්ෂණයකට ලක් කළ යුතුයි කියන එකයි. මෙහි අන්තර්ගතය සත්‍ය වශයෙන්ම ස්වාභාවිකද, කෘත්‍රිමද, කෘත්‍රිම ප්‍රමාණයක් තිබෙනවා නම් ඒ කොපමණද කියන කාරණය ගැන නියම ස්වාධීන විද්‍යාත්මක පරීක්ෂණ අපි කළ යුතුව තිබෙනවා. එහෙම කරන්න අපි බැඳී සිටිනවා; එහෙම කළ යුතුව තිබෙනවා. මොකද, විවිධාකාර අලංකාර වචන යොදා "මේ කිරි පිටි බිව්වොත් මෙහෙම වෙනවා, ලස්සන වෙනවා, මේ කිරි පිටි බිව්වොත් මොළය වර්ධනය වෙනවා, දත් එනවා" කියලා මේ රටේ දරුවන්ට කියනවා. ඒ වාගේම, "මේ කිරි පිටි බිව්වාම බබා හොඳට හම්බ වෙනවා,මේ කිරි පිටි බිව්වාම පෞරුෂය වර්ධනය වෙනවා" කියලා විවිධ ලස්සන, ලස්සන කථා කියනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
Muscles එනවා කියනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔව්, muscles එනවා කියනවා. එක එක දේවල් කියනවා. හැබැයි, ලෝකයේ කිසිම තැනක නැති තරමට අපේ රටේ අය මේ පිටි කිරිවලට ඇබ්බැහි වෙලා තිබෙනවා. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබෙනවා වාගේ මේ පිටි කිරිවලටත් ඇබ්බැහි වෙලා තිබෙනවා. අපේ දුප්පත් අම්මලා, තාත්තලාගේ ඉඳලා, පොහොසත් මිනිස්සු දක්වා සියලුදෙනාම මේ ඇබ්බැහියට යටත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි ස්වාභාවික දියර කිරි දරුවන්ට, වැඩිහිටියන්ට ලබා දෙන්න පුළුවන් මට්ටමට පත් විය යුතුයි. ඒ කියන්නේ පිටි දිය කරලා දෙන ඒවාට නොවෙයි. ස්වාභාවික දියර කිරි එලෙසින්ම අපේ දරුවන්ට දෙන ජාතියක් බවට අපි පත් වෙන්න අවශ්‍යයි. එහෙම නම්, මේ පිටි කිරිවල ඇති අගුණ, පිටි කිරිවල ඇති නුගුණ, පිටි කිරි යැයි කියා අපට එවන්නා වූ එම ද්‍රව්‍ය සත්‍ය වශයෙන්ම මොනවාද කියන කාරණා ගැන හොයලා බලලා, පරීක්ෂණ කරලා ස්වාධීනව කටයුතු කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හැටියට මම මේ කාරණය යෝජනා කරනවා. නමුත්, ඒ කාරණය පිළිබඳව මට කිසිම විශ්වාසයක් නැහැ. මොකද, ඒ පාලනය තිබෙන බොහොමයක් අය -අද නොවෙයි නම්- මෙවැනි පරීක්ෂණයක් කරන්න යන පළමුවැනි මොහොතේම ඒ සමාගම්වල බලපෑමට යටත් වෙන නිසා.

මම අපේ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, විෂය භාර ඇමතිවරයා හැටියට ඔබතුමාත්, ඒ වාගේම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැටියට අපිත් අපේ රටේ දරුවන්ගේ අනාගතය ගැන හිතලා මේ තිබෙන පිටි කිරි ඇබ්බැහිය නතර කිරීමට කටයුතු කළ යුතුයි කියලා. පිටි කිරි ලෙස මේ රටට එන අමුද්‍රව්‍යවල සත්‍ය තත්ත්වය විද්‍යාත්මකව පරීක්ෂණයකට ලක් කළ යුතුයි. මේ අසාමාන්‍ය භාවිතය කුමක්ද කියන කාරණය ගැන පරීක්ෂණයක් කළ යුතුයි. මේ රටේ තිබෙන තත්ත්වය ලෝකේ කොහේවත් නැහැ. නවසීලන්තය ලෝකයටම යවන කිරිවලින් ලොකුම පංගුවක් එන්නේ අපට; මේ පුංචි රටට. ඒක වෙන්න බැහැ නේ. ඒක අසාමාන්‍යයි නේ. මෙතැන මොකක් හරි ප්‍රශ්නයක් තිබෙන්න එපායැ. මොකක්ද මේ ප්‍රශ්නය? ඒ නිසා මේ ගැටලුව විසඳන්න අපි එකතු වෙලා කටයුතු කරන්න ඕනෑ කියන කාරණය පක්ෂ, පාට භේදයක් නැතුව මා මතක් කරනවා. මේ ප්‍රශ්නය පිළිබඳ සොයා බලන්න යම් ආකාරයක කමිටුවක් පත් කරනවා නම්, ඒ කමිටුවේ පරාසය පුළුල් කළ යුතුයි. ලංකාවට පිට රටින් ගව පැටවුන් අරගෙන එන එක හොඳද නරකද කියන එකට විතරක් මේ කාරණය සීමා කරන්න එපා. පිටි කරන ලද කිරි ලෙස මේ රටට අරගෙන එන මේ අමුද්‍රව්‍ය පිළිබඳ යථාර්ථය සහ ඒ ඇබ්බැහියෙන් අපි මිදෙන්නේ කොහොමද කියලා අපි කටයුතු කරන්න අවශ්‍යයි කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු අමාත්‍ය විජිත් විජයමුණි සොයිසා මැතිතුමා.

ඊට ප්‍රථම, කවුරු හෝ මන්ත්‍රීවරයෙකු ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේ ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MUJIBUR RAHUMAN *left the Chair, and* THE HON.VELU KUMAR *took the Chair.*

[අ.භා. 6.45]

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ඉතා වැදගත් යෝජනාව මගේ හිතමිත්‍ර දොස්තර නලින්ද ජයතිස්ස මැතිතුමා ඉදිරිපත් කිරීම ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා. මාත් ඔබතුමාගේ යෝජනාව නැවත වරක් අනුමත කරනවා.

අපේ නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාත් -1989 ඉඳලා එතුමා මගේ මිත්‍රයා- මේ ගැන කථා කළා. ඒ වාගේම, අපේ අතුරලියේ රතන හිමියන් මේ ගැන කථා කළා. අපේ අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමා, වේලු කුමාර් මන්ත්‍රීතුමා, අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා මේ විවාදයේදී ඉතා වැදගත් අදහස් දැක්වූවා.

මේක හොඳ යෝජනාවක්. මේ යෝජනාව ගැන අපි මේ සභාවේ සාකච්ඡා කරනවා. ඒ සාකච්ඡා කිරීමේදී මගේ වග කීම තමයි විෂය භාර ඇමතිවරයා හැටියට මම දන්නා සත්‍ය තොරතුරු මේ සභාවට ප්‍රකාශ කරන එක. අපි කාටත් දුර්මත තිබෙන්න පුළුවන්. අපි මේ විවාදයෙන් බලාපොරොත්තු වෙන්නේ ඒ දුර්මත ඉවත් කරගෙන, අපි කොහොමද නිවැරැදි දේ දැන ගන්නේ කියන එකයි. හරියට හංසයා වතුරෙන් කිරි වෙන් කරලා පානය කරනවා වාගේ, අපි හරි දේ මතු කර ගනිමු කියන අදහස තමයි මගේ අදහස.

මට දැන් ප්‍රශ්නය තිබෙන්නේ, මේ ප්‍රශ්නයට ඉතා පැහැදිලි විද්‍යාත්මක උත්තරයක් ලබා දෙන එකයි. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා වෛද්‍යවරයෙක්; උගතෙක්. මේ සිටින හැම දෙනාම බුද්ධිමතුන්; උගතුන්; බහුශ්‍රැත අය; දැනුම එකතු කර ගත්තු අය. එහෙම නම් අපට මේ ගැන ලොකු වග කීමක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා ඉතාම විද්‍යාත්මකව තමයි මේ ප්‍රශ්න ටික ඇහුවේ. මගේ වගකීම තමයි, විද්‍යාත්මකව ඔබතුමා අහපු ප්‍රශ්නවලට ඒ සම්බන්ධයෙන් මගේ තිබෙන අල්ප දැනුමත් එක්ක ඒ පිළිතුරු

ටික විද්‍යාත්මක පදනමක් මත සපයන එක. ඒ පිළිතුරු සපයන්න කලින් මම කල්පනා කළා, මෙතැනදී මතු වෙච්ච කාරණා ගැන ටිකක් කථා කරන්න.

පළමුවෙන්ම මම කියන්න ඕනෑ මේ කාරණය. නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා මතක් කළා මිල්කෝ ආයතනය ගැන; කිරිවල ආදායම ගැන. මම ඒ ආයතනය භාරගන්නකොට දෛනික ආදායම මිලියන 27යි. අද අපි බිලියනයකට වැඩි දෛනික ආදායමක් ගන්නවා. අපේ business plan එක හරියට ක්‍රියාත්මක කරලා විශාල මුදලක් අපි ආදායම් වශයෙන් ගන්නවා. මම ඔබතුමාගෙන් ඉල්ලනවා, මේ වාගේම, මිල්කෝ සමාගම, NLDB එක ගැන අපි වෙනම සාකච්ඡා කරමු කියලා. ඒ නිසා මම ඒ ගැන ඊට වඩා කථා කරන්න යන්නේ නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, මිල්කෝ එකේ ගබඩා කිරීමේ පහසුකම්වල ප්‍රශ්නයක් තිබුණා නේද? ලීටර් ලක්ෂ දෙකකට වැඩියෙන් කිරි ගත්තොත් ඒවා ගබඩා කර ගැනීමේ අපහසුතාව නිසා සමහර කාලවල කිරි අහක දමන තත්ත්වයක් තිබුණා. ඔබතුමා ඒකට පිළියමක් යොදලාද තිබෙන්නේ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අනිවාර්යයෙන්ම.

ඔබතුමා ඉතා වැදගත් ප්‍රශ්නයක් ඇහුවේ. කිරි ගබඩා කර ගැනීමේ අපහසුවට වඩා අපට වුණු දේ මේකයි. ඒ කිරි යාපනයෙන්, මුලතිව්වලින්, නැඟෙනහිර පළාත්වලින් ගෙනෙන්නේ අඹේවෙලට. එතකොට සමහර වෙලාවට ඒ කිරි නරක් වෙනවා. ඒ නරක් වුණු කිරි වෙනම ටැංකියක් හදලා ඒකට දාලා මුදාහැරීම නිසා වැලිමඩ ගොවීන්ගේ කුඹුරුවලට වාගේම ජලාශවලටත් ගිහිල්ලා මහා විශාල වින්නැඟියක් වුණා. අපි දැන් ඒකට ක්‍රමානුකූලව ක්‍රමවේද ආරම්භ කරලා තිබෙනවා. අපි බඩල්ගමුව ෆැක්ටරිය විවෘත කළාම ඒ ප්‍රශ්නයට විසඳුම් ලැබෙනවා. ඒ වාගේම, තවත් කිරි ෆැක්ටරි හයක් විවෘත කරන්න කැබිනට් පත්‍රිකාව අනුමත කරලා, අපට ඒ සඳහා ප්‍රංශ රජයෙන් මුදල් ආධාරත් ලැබිලා තිබෙනවා. රිදියගම තව ෆැක්ටරියක් විවෘත කිරීම සඳහා කැබිනට් පත්‍රිකාව අත්සන් කරලා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා තව කථාවක් කිව්වා, විදුලි බිල ගැන. අපි දන්නවා, මේ වාගේ ඇති කරන සතුන් අරාබි රටවල ඉන්නවා. අපේ රටේ වවුනියාවේ ඉන්නවා. මම හිතන හැටියට කිරි ගවයන් 1,000ක් විතර ඉන්නවා. රිදියගම ගොවිපොළේ අපේ දෛනික කිරි ආදායම මිලියන 30ක් 40ක් වෙලා තිබෙනවා. ඒ නිසා දේශගුණික ප්‍රශ්නයට අදාළව මගේ පිළිතුරේදී පිළිතුර සපයනවා.

ඊළඟට, කිරි ගවයෙකුගේ මිල ඔබතුමා කිව්වා, රුපියල් පන්ලක්ෂ ගණනක් කියලා. ඒක වැරැදියි. කිරි ගවයෙකුගේ මිල රුපියල් 467,000යි. එතකොට ප්‍රමිතිය, සෞඛ්‍ය තත්ත්වය ගැන, මුදල් ගෙවීම් ප්‍රමාද වීම ගැන අපි කථා කළා. ඔබතුමාගේ කථාවේදී සමහර අභූත චෝදනාත්, වැරැදි මතත් ගොඩක් තිබුණා. ඒවාට මම පිළිතුරු දෙන්න බලාපොරොත්තු වෙනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ යහ පාලන රජය යටතේ සෑම දරුවෙකුටම කිරි වීදුරුවක් දෙන්න අපි සූදානම් කරලා තිබෙනවා. ඒ නිසා අපට කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීමේ අවශ්‍යතාවකුත් තිබෙනවා. අපි ඕස්ට්‍රේලියාව ගැනත්, නෝර්වේ රජය ගැනත් කථා වුණා. අපි මේ හැම එකක් දිහාම සැකෙන් බියෙන් බලන්න අවශ්‍යත් නැහැ. නමුත්, අපි සැක හිතෙන තැන්වල තිබෙන සැක දුරුකර ගත යුතුයි. ඒ ගැන ඇමතිවරයා හැටියට මගේ කිසිම වාදයක් නැහැ.

ඊළඟට, අපේ ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා ඉතා හොඳ සාකච්ඡාවක් මෙතැනදී මතු කළා, කිරිපිටි ආනයනය ගැන. කිරිපිටි ආනයනයේදී ප්‍රධාන සමාගම් දෙකක් තිබෙනවා. ඒ සමාගම් දෙකේම විධායක ශ්‍රේණියේ නිලධාරීන් මා හමු වෙන්න ආවා. ඇවිල්ලා මට කිව්වා, "ඔබතුමාගේ අඩු පාඩු, ප්‍රශ්න අපි බලන්නම්" කියලා. " අපි ඇමතිතුමා බලාගන්නම්" කියලා. "අපි ඇමතිතුමාගේ දිස්ත්‍රික්කය පුරා, රටපුරා අවුරුදු උත්සව තියන්නම්" කියලා. එහෙම කථා කළා. එහෙම කථා කළාම මම ඒ අයට නිසි පිළිතුර දුන්නා. ඔවුන් ගියා ගියාමයි නැවත ආවේ නැහැ. පසුගිය දවසක මා හමුවෙන්න ආවා, නවසීලන්ත තානාපති කාර්යාලයේ නිලධාරීන්. ඇවිල්ලා මා ඉදිරිපිට වාඩි වුණා. මම ඒ ගොල්ලන්ට කන්න අපේ හයිලන්ඩ් චීස් කෑල්ලක් දුන්නා, මේවා අපේ චීස් කියලා. ඉන්දියානු කොමසාරිස්තුමාටත් මම එහෙම දීලා තිබෙනවා. ඒ වාගේ අය මා මුණගැහෙන්න ආවාම මම එහෙම ඒවා දෙනවා, අපේ productsවල තත්ත්වය පෙන්වන්න. ඔවුන් කිව්වා, ක්‍රාෆ්ට් චීස් වාගේයි කියලා. මේ තානාපති නිලධාරීන් ප්‍රස්තුත කාරණාවට එන්න කලින් මම ප්‍රශ්නයට ආවා. එදා සාකච්ඡාවට සහභාගි වුණු අපේ අධ්‍යක්ෂතුමා අද මේ Public Officials' Box එකේ ඉන්නවා. මම ඒ ගොල්ලන්ට කිව්වා, කරුණාකරලා මට වටින්නේ ෆොන්ටෙරා සමාගම නොවෙයි කියලා. මම සමාගමේ නම කියනවා. මට වටින්නේ අපේ රටේ අම්මලා සහ දරුවෝ. "මල්ලී ඔහොම නොකරන් අපෙ අම්මාට - දෙනනේ කිරි දුන්නෙත් අපි දෙදෙනාට" තේරුණාද? කිරෙන් ඇරිච්ච පුංචි දරුවන්ට දෙන කිරි පිටි ටික, කිරි වරණ, කිරි එරෙන මව්වරුන්ට දෙන කිරි පිටි ටික, අපි ලෙඩ්ඩුන්ට දෙන කිරි පිටි ටික, අපේ අහිංසක ගැමියා බොහොම අමාරුවෙන් සල්ලි හොයාගෙන අමුඩ ලේන්සුවේ ඔතාගෙන, නැත්නම් කරේ දාපු තුවායෙන් ඔතාගෙන ගෙදරට ගේන කිරි පිටි පැකට් එකේ මොනවාද තිබෙන්නේ? ඒ කිරි පිටිවල තිබෙන්නේ ඌරු තෙල්, හරක් තෙල්. එපමණක් නොවෙයි, බෙකරල් 200ක විකිරණශීලී ද්‍රව්‍ය වගේම මේකේ මෙලමයිනුත් තිබෙනවා කියලා සෞඛ්‍ය ලේකම් කිව්වා. හත්තිලව්වේ! මේ ලේකම් එහෙම කියලා ටික කලක් ගිහිල්ලා නැවත වාර්තාවක් දෙනවා, එහෙම එකක් නැහැ කියලා. ඒ සාම්පලයේ එහෙම එකක් නැහැ කියලා කියපු එතුමා ඊට පස්සේ නැවතුණේ කොහේද? එතුමා නැවතුණා, ෆොන්ටෙරා සමාගමේ උපදේශකවරයා හැටියට. මෙන්න කථාව.

මගේ ඉදිරි කාලය තුළ මට ජීවත් වෙන්න අවශ්‍ය දේවල් මම හොයා ගෙන තිබෙනවා. මට එහෙම හැකියාවක් තිබෙනවා. මම කවුරුවත් පස්සේ ගිහිල්ලා දේශපාලනය කරපු කෙනෙක් නොවෙයි. මගේ නායකතුමිය ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය. මම කාගේවත් ගෝලයෙක් නොවෙයි. අපට බණ්ඩාරනායක ප්‍රතිපත්තිවල උගන්වපු -ethics- තිබෙනවා. අපට ප්‍රතිපත්ති තිබෙනවා. ඒවා තුළ ඉඳගෙන තමයි අපි මේ දේශපාලනය කරන්නේ.

1989 දී ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා දොඩන්ගොල්ල මගේ ආසනයේ කිරි ගම්මානයක් හැදුවා. අපට දුන්නා ජර්සි වර්ගයේ හරක්. අපි මොනවාද කළේ? අපේ මිනිස්සු ඒ හරක්ට දෙන වද තිස්දෙක ඒ රටේ මිනිස්සු දැක්කා නම්, ඔවුන් අපට වෙඩි තියනවා. අපේ සිංහල මනුස්සයන්ට හරකෙක් දුන්නාම, හරකා බඳින්නේ නැහැ. හරකා ලිහලා දානවා. අනුන්ගේ කොටු පාළු

[ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා]

කරනවා. වනජීවී උද්‍යානවලට යනවා. නැත්නම්, කැලෑවල ඉඩම්වලට දාලා තමන් කිරි දොවා ගන්න කාලයට කිරි ටික දොවා ගන්නවා. මූලාසනය හොබවන ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමනි, නමුත් තමුන්නාන්සේලාගේ දමිළ ජාතිකයෝ හරකාගේ energy හොඳට රකින්න එයාට ඇවිදින්න දෙන්නේ නැතිව, එයා එක තැන තියාගෙන, එයාට හොඳට කන්න බොන්න දීලා, එයාට හොඳට සලකලා ඒ කිරි ටික ලබා ගන්නවා. වල් ටික කපාගෙන ඔලුවේ තියාගෙන ඇවිල්ලා ඒ සතාට කන්න දීලා හොඳට සලකනවා. ඇත්ත වශයෙන්ම මේ රටේ දේශීය කිරි කර්මාන්තය දියුණු කරනවා නම්, වතුකරයේ දෙමළ ජනතාවත් එක්ක තමයි මේ වැඩේ අපට කරන්න වෙන්නේ. එහෙම නැත්නම් අපේ මිනිස්සු මේවා කරන්නේ නැහැ. මේ ගැන කියන්න ගොඩාක් කථා තිබෙනවා. කොමිෂන් සභාවක් පත් කරන්න කියලා කිව්වා. ගරු අජිත් පී. පෙරේරා මැතිතුමනි, ඔබතුමාත් කිව්වා කමිටුවක් පත් කරන්න කියලා. කොමිෂන් සභා ගැන කියද්දී මට උපහාසාත්මක කවියකුත් මතක් වුණා. එම කවියේ මෙසේ සඳහන් වෙනවා.

"රෙද්ද ඉරිලා හාමිනේගේ දාසි සරදම් කළ හැටි
බැද්ද මාළුව හොරෙන් කෑවට කුස්සි අම්මා ලද ගුටි
හොද්ද ලුණු වැඩි නිසා අඹුවට ගෙහිමියා සැර වූ හැටි
නැද්ද කවුරුත් කිව්වේ තවමත් කොමිෂන් සභාවට වැඳ වැටී"

ඒක නිසා කොමිෂන් සභා පත් කර කර ඉන්නේ නැතිව, හරි දේ තෝරා බේරා ගෙන වැඩ කරන්න තමයි මේ උත්තරීතර පාර්ලිමේන්තුවට අපි තමුන්නාන්සේලා පත් කරලා තිබෙන්නේ. මම අපේ ගරු රතන හිමියන්ගේ සමහර කථාවලට එකඟයි. උන්වහන්සේගේ සමහර ආර්ථික ප්‍රතිපත්තිවලට මම එකඟයි. නමුත්, උන්වහන්සේගේ යම් යම් ප්‍රතිපත්තිවලට මට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. මම උන්වහන්සේට ගරු කරනවා, ඒක වෙනම දෙයක්. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, එහෙම නම් ඔබතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාවේ ප්‍රශ්නවලට අදාළ පිළිතුරු ටික මම කියවන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ පවතින දේශීය කිරි ගවයන් ප්‍රමාණය ලක්ෂ 12ක් (මී සහ එළ ගවයන්) වන අතර, එයින් කිරි ලබා ගන්නේ තුන්ලක්ෂ පනස්දහසකින් පමණි. ඒ නිසා මේ සියවසේ දී ඉබි ගමනින් ගොස් අපේ රට කිරිවලින් ස්වයංපෝෂිත රටක් බවට පරිවර්තනය කිරීමට අපට හැකියාවක් නොලැබෙනු ඇත. මේ සඳහා වාණිජ මට්ටමේ කිරි ගොවිපොළවල් ඇති කිරීමට රජයේ මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ. එය පදනම් කරගෙන ඕස්ට්‍රේලියාවේ සීමාසහිත වෙලාර්ඩ් රූරල් එක්ස්පෝට් පෞද්ගලික සමාගම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ගිවිසුම්ගතව 2011 වර්ෂයේ කිරි ගවයන් 500ක් ද, 2013 වර්ෂයේ කිරි ගවයන් 1,500ක් ද මිලදී ගැනීම හා ඉන් අනතුරුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි රිදියගම ගොවිපොළට කිරි ගවයන් 2,495ක් මිලදී ගැනීම පශු සම්පත් විෂය භාර අමාත්‍යාංශය යටතේ පවතින ජාතික පශු සම්පත් මණ්ඩලය වෙත න්‍යාෂ්ටික අභිජනන ගව රැළක් සැපයීම සඳහා ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක් වන අතර, 2017 වර්ෂයේදී ක්‍රියාවට නැංවූ කිරි ගවයන් 20,000ක් ආනයනය කිරීමේ ව්‍යාපෘතිය කිරි ගව ව්‍යාසායකයන් වෙත උසස් ආරයේ කිරි ගවයන් සැපයීම අරමුණු කර එවකට පැවැති ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් ආරම්භ කර පසුව පශු සම්පත් විෂය භාර අමාත්‍යාංශය වෙත පැවරූ නව ව්‍යාපෘතියකි. ආරුමුගන් තොන්ඩමන් මැතිතුමා ගැන, බැසිල් රාජපක්ෂ මැතිතුමා ගැන යම් විවේචන තිබෙනවා. නමුත්, එතුමන්ලා යම් උත්සාහයක් ගත්තා කියලා අපි හිතනවා. අපි හරි දේ හරියි කියන්නත්, වැරැදි දේ වැරැදියි කියන්නත් ඕනෑ.

පළමු සඳහන් ව්‍යාපෘතියේ පළමු අදියරේ දී 2012 වසරේ මාර්තු මස කිරි ගවයන් 500ක්ද, 2013 වසරේ ජනවාරි කිරි ගවයන් 1,500ක්ද ලෙස Friesian, Jersey Friesian දෙමුහුම් වර්ගයේ ගැබ්ගත් කිරි ගවයන් 2,000ක් ආනයනය කරන ලද අතර, බෝපත්තලාව, මැණික්පාලම, ඩයගම යන ගොවිපොළවල් තුනක එම සතුන් රඳවා පවත්වාගෙන යනු ලැබීය.

පළමු අදියරේ සාර්ථකත්වය මත දෙවන අදියරේ දී සතුන් 2,500ක් එම සමාගමෙන් ආනයනය කිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව තීරණය කළ අතර, ඒ සඳහා එවකට සිටි පශු සම්පත් සංවර්ධන විෂය භාර අමාත්‍ය ආරුමුගන් තොණ්ඩමන් මැතිතුමා විසින් 2012.12.12 වන දින "කිරි ගව ආනයනය කිරීම - අදියර II" යන මැයෙන් සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

එහිදී ගෙන්වීමට යෝජනා කරන ලද සතුන් වර්ගය රිදියගම වැනි වියළි කලාපය තුළ ඇති කිරීම සම්බන්ධව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, සත්ව අභිජනන විසින් ලබා දෙන ලද නිරීක්ෂණ වාර්තාව අනුව කෘතිමව පාලනය කරන ලද පරිසර තත්ත්වයන් යටතේ මෙම සතුන් ඇති දැඩි කළ යුතු බව සඳහන් කර ඇත.

අද වව්නියාව - ඕමන්තේ ගොවිපොළක කිරි ගවයන් 250ක් රඳවා තිබෙනවා. රිදියගම, සීගිරිය හා දඹුල්ල වැනි උෂ්ණාධික ප්‍රදේශවල ආනයනික ගවයින් යොදාගෙන සාර්ථකව කිරි ගව ගොවිපොළවල් පවත්වාගෙන යනු ලබනවා.

ඊට අමතරව සාර්ථක භාවය විමර්ශණාත්මකව බලා සිටි පෞද්ගලික සමාගමක් වන වටවල ප්ලාන්ටේෂන් දැනටමත් සතුන් 900කගෙන් යුතු ගොවිපොළක් පවත්වාගෙන යන අතර, ඊට අමතරව තවත් මෙම වර්ගයේ සතුන් 250ක් ගුවන් මඟින් ලබා ගෙන තිබෙනවා.

ගුවන් මඟින් ගෙන්වා ගන්නා සතුන්ටත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දීලා තිබෙනවා. ලෝකයේ කිරි නිෂ්පාදනය ඉහළ මට්ටමේ ඇති රටවල් වන මැද පෙරදිග සහ ඊශ්‍රායලය වැනි රටවල පාලිත තත්ත්වය යටතේ මෙවැනි උසස් ආරේ සතුන්ගෙන් ඉහළ නිෂ්පාදනයක් ලබා ගනී.

එවකට සිටි පශු සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු ආරුමුගන් තොණ්ඩමන් ඇමතිතුමා විසින් 2013.07.11 වන දින කිරි ගව ආනයනය කිරීම - අදියර II යන මැයෙන් සාකච්ඡා සම්මුති කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් ලබා දෙන ලද නිර්දේශ ඇතුළත් සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, කිරි ගවයන් 2,500ක් ආනයනයට හා ඒ සම්බන්ධ රිදීගම ගොවිපොළ සංවර්ධන කටයුතු සඳහා 2013.08.01 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

සතුන්ගෙන් ලැබෙන සාමාන්‍ය දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 16 - 20ත් අතර බව සඳහන් කර ඇත. නිසි කළමනාකරණය සහ අවශ්‍ය පරිදි ආහාර ලබා දෙන ගොවිපොළවල එම ප්‍රමාණය ලබාගෙන ඇති අතර, සමහර ගොවිපොළවල කිරි නිෂ්පාදය ලීටර 22 දක්වාද ලබාගෙන ඇත.

ඕස්ට්‍රේලියාවේ පාරිසරික තත්ත්වය අනුව මෙම ගවයින්ගේ දෛනික කිරි නිෂ්පාදනය දක්වා ඇති අතර, උපරිම දෛනික කිරි නිෂ්පාදනය වන ලීටර 31ක් මෙරටදීත් ලබාගෙන ඇත. මේ

රටෙදීත් කිරි ලීටර් 31ක් ලබාගෙන තිබෙනවා. සමහර අය දෛනික වාර්තා ගන්නවා. පැටවුන් ලැබුණාට පසුව සමහර ගවයින් කිරි වරනවා. සමහර අයගේ ගැබ්බර වන විට කිරි නැති වෙනවා. එම නිසා සමහරු සපයන වාර්තා නිවැරදි වාර්තා නොවෙයි. නමුත්, අපේ අමාත්‍යාංශය නිවැරදි වාර්තා ලබා ගැනීමේ ක්‍රමවේද සම්බන්ධව ඉතාම මැනවින් කටයුතු කරනවා.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතිය සහ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන ව්‍යාපාරික මට්ටමේ පෞද්ගලික කිරි ගොවිපොළ ඇති කිරීමේ ව්‍යාපෘතිය එකිනෙකට වෙනස් ව්‍යාපෘති දෙකකි. විගණකාධිපති වාර්තාවේ දී මෙම ව්‍යාපෘති දෙක එකට සම්බන්ධ කර නිවැරදි නොවන කරුණු දක්වා ඇත.

එමෙන්ම එම සතුන් නිසි ලෙස කළමනාකරණය කර සාර්ථකව පවත්වාගෙන යයි. මෙම ව්‍යාපෘතිය රටේ කිරි නිෂ්පාදනය කඩිනමින් ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන අතර, මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන ප්‍රථම අවස්ථාවද මෙය වේ. එබැවින් මෙහිදී ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් ඇත්නම් ඒවාට විසඳුම් ලබාදී ඉදිරියට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටින අතර, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විවිධ බාහිර පාර්ශ්වයන් ගෙන යන සත්‍යයෙන් තොර ප්‍රචාර නිසා රජයේ ප්‍රමුඛ වැඩසටහනක් කඩාකප්පල්වීමටද හැකියාවක් ඇත. වෘත්තිකයන් ඇතුළුව බොහෝ පාර්ශ්වයන් මෙම ප්‍රචාරයන්ට සම්බන්ධවීමෙන් ජාතික කිරි නිෂ්පාදනය වැඩි වනවා වෙනුවට තව තවත් පිටි කිරි ආනයනය ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වනු ඇති බව කණගාටුවෙන් සඳහන් කරමි.

2017 වර්ෂයේ ආනයනය කරන ලද ගවයින් සම්බන්ධව පශු පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ විසින් අත්සන් රහිත ලිය විල්ලක් මඟින් කර ඇත්තේ වග කීමෙන් තොර ප්‍රකාශයක් මෙන්ම එය නීත්‍යානුකූල ලිය විල්ලක්ද නොවේ. එමෙන්ම, එවැනි වාර්තාවක් අමාත්‍යාංශය වෙතද ලබා දී නොමැත. එතුමා සටහනක් ඉදිරිපත් කරලා තිබෙනවා, එය අත්සන් රහිත ලියවිල්ලක්.

එහිදී සෞඛ්‍ය ප්‍රමිතීන් -health protocol- (ඇමුණුම 1) උල්ලංඝනය කර ඇතැයි ප්‍රකාශ කිරීම සාවද්‍ය කරුණකි. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති සෞඛ්‍ය ප්‍රමිතීන්ට අදාළ සෞඛ්‍ය සහතිකයක් ඇමුණුම 2 වශයෙන් මා ඉදිරිපත් කරනවා.

ඕස්ට්‍රේලියාවේ නිරෝධායන කාල සීමාවෙන් පසුව ඕස්ට්‍රේලියානු සත්ව නිරෝධායන ඒකකය මඟින් ලබා දී ඇති සහතිකයත් අපට ඉදිරිපත් කරන්න පුළුවන්. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය මොකක්ද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ප්‍රතික්ෂේප කළ, පශු සම්පත් පර්යේෂණ අධ්‍යක්ෂවරයා ඉදිරිපත් කළ ලිපියේ දිනය කියන්න පුළුවන්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ප්‍රතික්ෂේප කිරීමක් කර නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
එම ලිපිය වගකීම් විරහිතව ඉදිරිපත් කළ එකක් කියලා ඔබතුමා කිව්වා නේ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
එතුමා අමාත්‍යාංශයට කිසිම ලියවිල්ලක් ඉදිරිපත් කර නැහැ. එතුමා පුවත් පත්වලට දීලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මා ළඟ ලිපියක් තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු මන්ත්‍රීතුමනි, විනාඩියක් ඉන්න. මම මේ පිළිතුර ඉදිරිපත් කර අවසන් වූ පසු අපි ඒ සම්බන්ධව කථා කරමු. අපි මේ ගැන සාකච්ඡා කරන්න ඕනෑ. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලා මේ සම්බන්ධව ප්‍රශ්න කරලා, හොඳට සාකච්ඡා කරලා මේ ප්‍රශ්නයට අවතීර්ණ වන්න. ඒක හොඳයි.

එමෙන්ම එම සතුන් මෙරටට ආනයනය කිරීමෙන් අනතුරුවද මාස 1යි, දින 14ක නිරෝධායන කාලයකින් පසුව -මැණික් ෆාම් එකේත්, විවිධ ෆාම්වලත් මේ සතුන් රඳවා ගෙන ඉඳලා- පරීක්ෂා කර නිරෝගී සතුන් බව තහවුරු කර ඇත. (ඇමුණුම 3/ඇමුණුම 4 මඟින් ආනයනික සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ වාර්තා ඉදිරිපත් කර තිබෙනවා.)

එසේම, අදාළ වාර්තාව නිකුත් කිරීමේ බලය ඇත්තේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හා ප්‍රධාන සත්ව නිරෝධායන නිලධාරිහට වන අතර, පශු පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා මේ සම්බන්ධයෙන් වාර්තා සැපයීමක් සිදු නොකරයි. එය ඔහුගේ කාර්ය භාරයක් ද නොවේ. එමෙන්ම මෙම සතුන් 2011 වසරේ සිටම මෙරටට ආනයනය කර ඇති අතර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් අදාළ සෞඛ්‍ය කටයුතු සිදු කර ඇත.

පිට රටින් ආනයනය කරන සතුන් සම්බන්ධයෙන් මෙවැනි මතයක් දරන්නේ නම් ගව ශුක්‍රාණු ගෙන්වීමටද නොහැක. එයින්ද ලෙඩ බෝවිය හැක. ඒ නිසා මෙය සාවද්‍ය මතයකි. අපේ රටේ පමණක් නොව, ලෝකයේ අනික් රටවල්ද සතුන් ආනයනය කිරීම සිදුකරයි. විශේෂයෙන්ම ඕස්ට්‍රේලියාව වැනි රටක් ඔවුන්ගේ කර්මාන්තයන්හි සුරක්ෂිතතාව ආරක්ෂා කර ගැනීම සඳහා උපරිම පියවර ගනු ලබයි.

මෙම ව්‍යාපෘතිය අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමට වර්ෂ 2016 නොවැම්බර් මස අප අමාත්‍යාංශය මඟින් කොන්ත්‍රාත් ගිවිසුමට අතිරේකව පරිශිෂ්ටයක් මඟින් තීරණය කර ඇත. එසේ

[ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා]

නොවූයේ නම් මෙම ව්‍යාපෘතිය සඳහා සියයට 20ක අත්තිකාරම මුලදී ගෙවිය යුතු වූයේ සතුන් 20,000ම සඳහා වේ. එබැවින් දෙවන අදියර වන සතුන් 15,000ක් ආනයනය කිරීමට 2018 මාර්තු මස විශේෂඥ කමිටු වාර්තාව අනුව තීරණය කළ අතර, ඒ අනුව දෙවන අදියර සඳහා සියයට 20ක අත්තිකාරම මහා භාණ්ඩාගාරය මඟින් ගෙවා ඇත.

කිරි නිෂ්පාදනය සඳහා පෞද්ගලික ගොවිපොළවල් පිහිටුවීම මඟින් දේශීය කිරි නිෂ්පාදනය කඩිනමින් ඉහළ නැංවීමට සහ රටට බිලියන 40ක විදේශ විනිමයක් වැය වන කිරි පිටි ආනයනය කිරීම නවතා දැමීමට හැකිවනු ඇත.

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, සමාවන්න. ඔබතුමාත් වෛද්‍යවරයෙක්. මම මේක ඔබතුමාට කියනවා නොවෙයි. සමහර වෛද්‍යවරු අද කථා කරනවා, පොළොවට දමන වස ගැන. අපේ අම්මලා දරුවන්ගේ බඩට දමන වස ගැන ඔවුන් කථා කරන්නේ නැහැ. ඒ වස පානය කිරීමට පමණක් බිලියන 40ක විදේශ විනිමයක් වාර්ෂිකව අපි වැය කරනවා. අපේ අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ, අපි කිරි පිටි කියලා හිතාගෙන බොන්නේ වස.

එමෙන්ම, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සියලුම ගොවීන්ට පවතින ප්‍රධානම ගැටලුව වනුයේ සත්ව ආහාර මිල අධික වීම, ණය ගෙවීමේ කාල සීමාව කෙටි වීම යන කරුණු වේ. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනිමින් ඇත. විෂය විශේෂඥයන්ගේ ගණනයන්ට අනුව, දිනකට කිරි ලීටර් 20ක් නිෂ්පාදනය කරනු ලබන කිරි දෙනුන් ලක්ෂයක් ආනයනය කිරීම මඟින් ලංකාවට කිරි පිටි ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නවතා දැමිය හැකි බවට පුරෝකථනය කරනු ලැබ ඇත.

එබැවින්, මෙම කිරි දෙනුන් ආනයනය කිරීමේ ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක කළ යුතු අතර, මෙම ව්‍යාපෘතියේ ඉතිරි කිරි දෙනුන් 15,000 කඩිනමින් ආනයනය කළ යුතු බවට යෝජනා කරමි.

මෙම ආනයනික කිරි දෙනුන්ගෙන් බිහිවන දෙවන පැටියා උසස් ආරයේ ජානමය හැකියාවකින් යුතු පැටියකු බවට පත් කර ගැනීමේ තාක්ෂණය අප සතුව පවතී. එබැවින්, දෙවන පැටියාගේ සිට ඉදිරියට ඉපදෙන පැටවුන් ඉහළ නිෂ්පාදන හැකියාවකින් යුතු පැටවුන් ලෙසින් ලබා ගැනීමේ හැකියාව පවතී. සෘජු හා වක්‍ර වශයෙන් නව රැකියා විශාල ප්‍රමාණයක් මෙම ගොවිපළ ආශ්‍රිතව බිහිවී ඇත.

පසුගිය කාල වකාවනුවකදී වයඹ විශ්වවිද්‍යාලය විසින් ශ්‍රී ලාංකික වෙළෙඳ පොළෙහි පවතින ආනයනික කිරි පිටි සාම්පල එක්සත් රාජධානියේ රසායනාගාරයකින් පරීක්ෂා කරවා තිබේ. එහි පරීක්ෂණ වාර්තා අනුව ආනයනික කිරි පිටිවල ශාක තෙල් අඩංගු කර ඇති බවට තහවුරු වී තිබේ. (ඇමුණුම 5)

කුමන කුමන්ත්‍රණකාරී බලවේග ක්‍රියාත්මක වුවද, ශ්‍රී ලාංකික ජනතාවට වස විසෙන් තොර ආහාර ලබා දීම හා වස විසෙන් තොර ආහාර සුරක්ෂිතතාවක් ඇති කිරීම උදෙසා මාගේ කැපවීම ඉදිරියටත් මේ අයුරින්ම හා වඩාත් ශක්තිමත් ලෙසින් ක්‍රියාත්මක කරනු ලබන බව මම ස්ථිරවම ප්‍රකාශ කරමි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කරවල ආනයනයට බදු පැනෙව්වා. අද ඉතාම හොඳ, දේශීය කරවල තිබෙනවා. කරවල නිෂ්පාදකයෝ තුන්දාහක් සිටියා. ඒ තුන්දාහම අතර මං වෙලා හිටියේ; අනාථවෙලා හිටියේ; රැකියා අහිමිවෙලා හිටියේ. අපි කරවල ගේනවා. ගේන්නේ කොහෙන්ද? ඩුබායිවලින්; කරච්චිවලින්; බංග්ලාදේශයෙන්; වෙනත් විවිධ රටවලින්. මේ කරවල වේළන්නේ කොහොමද? අව්වේ දමලාද? නැහැ. ඇසිඩ් දමලායි වේළන්නේ. මෝර කරවල කෑවාම කිරි එරෙනවාය කියා අපේ අම්මලාගේ මතයක් තිබෙනවා නේ. නමුත් ඒවා කෑමෙන්, තිබෙන කිරිත් වේළෙනවා. ඒවායේ වස තිබෙන්නේ. මේ කරවල ගෙන්වීමේදී quarantine කරන්නේ නැහැ. අද දේශීය කරවල මිල අඩු වෙලා තිබෙනවා. හාල් මැස්සන් කිලෝවක තොග මිල අද රුපියල් 350ක් දක්වා අඩු වෙලා තිබෙනවා.

බදු සම්බන්ධයෙන් උච්චාවචනය කිරීමේ ක්‍රමවේදය මිල කමිටුවේදී අපි ගරු මංගල සමරවීර ඇමතිතුමාට ඉදිරිපත් කළා. එතුමා එය අනුමත කළා. අද කට්ට කරවල, උම්බලකඩ මිල අඩු වෙලා තිබෙනවා. රුපියල් 2,000ට තිබුණු උම්බලකඩ කිලෝවක මිල රුපියල් 1,000ට අඩු වෙලා තිබෙනවා. කට්ට කරවල රුපියල් 600ට අඩුවෙලා තිබෙනවා. එම නිසා වස විසෙන් තොර ආහාර ලබාදීමේ වගකීමත් මගේ අමාත්‍යාංශයට පැවරෙනවා. අපි ඒ සඳහා අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පහත සඳහන් ඇමුණුම් අපි ඉදිරිපත් කරනවා.

ඇමුණුම අංක 1 - සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ගව දෙනුන් ආනයනය කිරීම සඳහා වන සෞඛ්‍ය ප්‍රමිතීන්- Health Protocol එක.

ඇමුණුම අංක 2 - ඕස්ට්‍රේලියානු පශු වෛද්‍ය බලධාරීන් විසින් නිකුත් කරනු ලැබූ සතුන්ගේ සෞඛ්‍ය පිළිබඳ සහතිකය.

ඇමුණුම අංක 3 - ලංකාවේ ප්‍රධාන සත්ව නිරෝධායන නිලධාරීගේ වාර්තාව

ඇමුණුම අංක 4 - ආනයනික සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය.

i. BVD රෝගය මීට පෙරද රට තුළ හඳුනාගත් පරීක්ෂණ වාර්තා.
ii. BVD රෝගය ශ්‍රී ලංකාව තුළ පැවැති බවට විද්‍යාත්මක පර්යේෂණ වාර්තාව.

ඇමුණුම අංක 5 - වයඹ විශ්ව විද්‍යාලය විසින් ශ්‍රී ලාංකික වෙළඳ පොළේ පවතින ආනයනික කිරි පිටි

සාම්පල් එක්සත් රාජධානියේ රසායනාගාරයෙන් පරීක්ෂා කර ලබාගත් ආනයනික කිරි පිටිවල ශාක තෙල් අඩංගු කර ඇති බවට තහවුරු කර ගත් වාර්තාව.

ඇමුණුම අංක 6 - කිරි ගව ආනයන ව්‍යාපෘතියේ අරමුණු සහ විකාශය.

එම ඇමුණුම් මම සභාගත* කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩි පැහැදිලි කිරීමක් කරන්න මට අවස්ථාවක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී මේ කාරණය තේරුම් ගියා. මම මතු කළ ප්‍රශ්නය, එනම් දරුවන්ට පිටි කිරි කියා මේ දෙන දෙය තුළ තිබෙන්නේ කෘත්‍රිම තෙල් සහ,-

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ලැක්ටෝස්, තෙල් සහ බෙකරල් 200ක විකිරණශීලි ද්‍රව්‍ය තිබෙනවා. ඒ බෙකරල් 200ක විකිරණශීලි ද්‍රව්‍ය ගෙන්වීමට අවසරය තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ ප්‍රශ්නය මෙයයි. අපි වස විස ප්‍රශ්නය පැත්තකට දමමු. ස්වාභාවික කිරි නැත්නම්, මේ තිබෙන්නේ වෙන කාබෝහයිඩ්‍රේට් සහ ප්‍රෝටීන් මිශ්‍රණයක් නම්, එහි පෝෂණ තත්ත්වය නැත්නම්, රටට අහිතකර මෙවැනි දේවල් -වස විස- මේ රටට ගෙන එන්න අවසර දෙනවාද කියන එක ගැන අපි තද ක්‍රියා මාර්ගයක් ගන්න අවශ්‍යයි. මේ කාරණය පිළිබඳව තීරණයක් ගන්න. බදු පැනවීමෙන් පෙන්නුම් කරන්නේ කිරි පිටි මිල වැඩි වෙලා තිබෙනවාය කියන එකයි. එයින් රජය අපකීර්තියට පත් වෙනවා. ගරු ඇමතිතුමනි, එහෙම නම් රජය හැටියට අපි කළ යුතු වන්නේ නවසීලන්තයෙන් අපේ රටට එන මේ ද්‍රව්‍ය කිරි නොවෙයි කියන කාරණය පිළිබඳව campaign එකක් කරන එකයි. ඒ වාගේම සියයට සියයක්ම ස්වාභාවික දෙය පමණක් මේ රටට අරගෙන එන වැඩ පිළිවෙළක් සකස් කරන එකයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, නවසීලන්ත තානාපති කාර්යාලයෙන් ඇවිත්, ඒ අය මට නවසීලන්තයට යන්න කථා කළා. "මම ඔය ගොල්ලන්ගේ cricket team එකට හරි කැමතියි; cricket captainට මම හරි ආදරෙයි, ඔය ගොල්ලන්ගේ රටේ rugger ගහනකොට දමන dance එකට මම හරි ආසයි, හැබැයි ඔය ගොල්ලන්ගේ 'ෆොන්ටේරා' සමාගමටත් මේ කිරි පිටිවලටත් වඩා මම මගේ රටේ අම්මලාටයි, දරුවන්ටයි ආදරෙයි, එම නිසා මම ඔය ගොල්ලන්ගේ රටට එන්නේ නැහැ" කියා මම කිව්වා. "මම විදේශ ආයෝජකයෝ මෙහාට එනවාට විරුද්ධ කෙනෙක් නොවෙයි, මම ඒකට කැමැතියි, ඔය ගොල්ලෝ කරුණාකර එන්න, අපේ ගොවිපොළවල් තිබෙනවා, අපට නඩත්තු කරන්න වාර්ෂිකව තඹ සතයක් දෙන්නේ නැහැ, අපි හරි අමාරුවෙන් ඉන්නේ, එම නිසා ඔය ගොල්ලෝ අපේ ගොවිපොළක් හෝ අරගෙන අපේ දියර කිරි ටික එකතු කර, ඔය ගොල්ලෝ කිරි දෙනුන් ගෙනැත් දියර කිරි නිෂ්පාදනය කරලා, කිරි පිටි කම්හලක් හදන්න, ඒකට සම්පූර්ණ සහයෝගය දෙන්නම්" කියාත් මම ඒ ගොල්ලන්ගේ මුහුණටම කිව්වා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
සවිස්තරාත්මක පිළිතුරක් ලබා දුන්නාට ගරු ඇමතිතුමාට බොහොම ස්තුතියි. අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා කියන කාරණය සම්බන්ධයෙන් අපට විවාදයක් නැහැ. පිටි කිරි නතර කරලා, අවම කරලා, දියර කිරි ප්‍රචලිත කරන්නේ කොහොමද කියන එක පිළිබඳව විධිමත් සහ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් වුවමනා කරනවා. මෙතැන මේ ගැටලුව මතු වුණේ කිරි හරක් ගෙන්වා රටේ දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීම කියන වැදගත් යෝජනාවට යටවෙලා යම්කිසි ආකාරයක සැක කටයුතු හරක් ප්‍රමාණයක් ගෙනැවිත් තිබෙන නිසායි. රිදියගම ගොවිපොළේ කෘත්‍රිමව මේ තත්ත්වය ඇති කරන්න ජලය සහ විදුලිය යොදා ගැනීම පිළිබඳව මා උපුටා දැක්වූයේ විගණකාධිපතිතුමාගේ වාර්තාවෙනුයි. ඇත්තෙන්ම ඒ වෙලාවේ යෝජනාවකුත් ඉදිරිපත්වෙලා තිබෙනවා. අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමාටත් මෙය වැදගත් වෙනවා. කලින් යෝජනාවක් ඉදිරිපත්වෙලා තිබෙනවා, විකල්ප ක්‍රමවේදයක් හැටියට සූර්ය බලශක්තිය උපයෝගී කර ගන්නය කියා. හැබැයි විගණකාධිපතිතුමා කියනවා, 2017 මාර්තු 14 වනතුරුම ඒ කටයුත්ත කළේ නැහැ, ඒ වැය වුණු මුදලට තවත් කිරි හරක් 102දෙනෙකු ගෙන්වා ගන්න තිබුණාය කියා. ඒ නිසා මා හිතනවා, විගණකාධිපති වාර්තාව පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑය කියා. ඊළඟ කාරණය, ඔබතුමා මා කියපු -

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මා එයට පොඩි උත්තරයක් දීලා අනික් ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්නම්. ඒකට ප්‍රශ්නයක් නැද්ද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
කියන්න, කියන්න. ප්‍රශ්නයක් නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
කිරි ගවයින් පාලනය කරන ලෝකයේ දියුණු රටවල්, ශුෂ්ක රටවල් මේ ක්‍රමය යොදා ගන්නවා, ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම අරාබිකරයේ රටවල් මේ ක්‍රමය යොදා ගන්නවා. මා හිතන හැටියට වවුනියාවේ මේ ක්‍රමය යොදාගෙන ඇති කරන හරක් 1,000ක් විතර ඉන්නවා. පෞද්ගලික අය මේ ක්‍රමය යොදාගෙන තිබෙනවා. ඇත්තම කියනවා නම් අපි බලශක්තිය පිළිබඳව වෙනත් විකල්පයකට යන්න ඕනෑ. මා ඔබතුමාගේ මතයට එකඟ වෙනවා. නමුත්, මේ ක්‍රමය ලෝකයේ ප්‍රචලිත ක්‍රමයක්. වාණිජ මට්ටමේ කිරි වගාව එක ක්‍රමයක්, කිරි හරක් එක් කෙනෙකු, දෙදෙනෙකු තබාගෙන කිරි නිෂ්පාදනය කරන එක තවත් ක්‍රමයක් කියන එක මතක තබා ගන්න. මෙතැන ක්‍රම දෙකක් තිබෙනවා. රිදියගම ගොවිපොළේ කිරිවලින් විතරක් දවසකට රුපියල් මිලියන තුනක, රුපියල් මිලියන හතරක වාගේ ආදායමක් ලබාගෙන තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මේ සම්බන්ධයෙන් මුලින්ම කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන්නේ 2014 පෙබරවාරි මාසයේදී බැසිල් රාජපක්ෂ ඇමතිතුමායි. එහි සඳහන් වෙනවා, කිරි ගවයන් 20,000ක්

[ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා]

ගෙන්වීම සඳහා ඩොලර් 73,954,054.83ක මුදලක් වියදම් වෙනවාය කියා. ඒ අනුව එක කිරි ගවයකු සඳහා ඩොලර් 3,697.07ක් වැය වෙනවා.

ඊළඟට වැදගත්ම කාරණය මෙයයි. පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳව මා දන්නේ නැහැ. මා පශු වෛද්‍යවරයෙක් නොවෙයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(*මාණ්පුමිකු කාමිණී විජිත් විජයමුණි සොය්සා*)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

ඔබතුමා සත්වයින්ට ප්‍රතිකාර කරන දොස්තරවරයකු නොවෙයි කියා මා දන්නවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(*මාණ්පුමිකු (වෛත්තිය කලානිති) නලින්ද ජයතිස්ස*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මා උපුටා දැක්වූවේ, 2018 පෙබරවාරි 14 වන දා අධ්‍යක්ෂ (පශු සම්පත් සැලසුම් හා ආර්ථික) ආචාර්ය එස්.එස්.පී. සිල්වා විසින් පේරාදෙනිය, ගැටඹේ, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවන ලද වාර්තාවයි. ගරු ඇමතිතුමනි, ඒ වාර්තාවේ බොහොම පැහැදිලිව මෙසේ සඳහන් වනවා:

> "Presence of Bovine Viral Diarrhoea (BVD) antibodies in serum samples of significant proportion of cows tested. Since BVD is a significant economic disease of cattle, following urgent action is suggested."

මෙහිදී එතුමා කාරණා කිහිපයක් යෝජනා කරනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(*මාණ්පුමිකු කාමිණී විජිත් විජයමුණි සොය්සා*)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

මේ ගැන සාකච්ඡා කරන නිසා මා ඒකටත් උත්තරයක් කියන්නම්. ඔබතුමාගේ යෝජනාව ගැන මා ඉතාම කැමැත්තෙන් තමයි ඉන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මේ ගෙන්වපු එළදෙනුන්ගෙන් කිසිම එළදෙනෙකුට මෙවැනි රෝග තිබිලා නැහැ. එතුමාගේ වාර්තාවෙන් එතුමා පෙන්වා තිබෙන්නේ අපේ රටේ BVD තිබුණාය කියායි. ඒ වාර්තාව අපි ළඟ තිබෙනවා. පැටවුන් 32දෙනෙකුට පමණක් BVD තත්ත්වය තිබිලා තිබෙනවා. මෙය අපේ රටේ ගවයන්ට තිබෙන ලෙඩක්. ඒක අපට පාලනය කර ගන්න පුළුවන්. එය diarrhoea රෝගයක්. එය පාලනය කර ගන්න පුළුවන්. මනුෂ්‍යයින්ට බෝ වන ලෙඩක් තිබෙනවාය කියා මහ ලොකුවට පත්‍රවල පළ වුණා. ඒක අමූලික බොරුවක්. මේ එක සතෙකුටවත් එවැනි රෝගයක් නැහැ.

අපේ වෛද්‍යවරුන් කියන කථාවේ එක පැත්තක් මා දකිනවා. මා ඒකත් කියන්න ඕනෑ. අපි විවිධ තනතුරුවලට ආවාම බලාධිකාරී ගොඩ නහා ගන්නවා. ඒ බලාධිකාරියට, අපේ කොටුවට කිසි කෙනෙකුට ඇතුළු වෙන්න දෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේකේ ආකර්ෂණය තිබුණේ ගැබ්බර වැස්සියන් ගෙන්වීමටයි.

නමුත් වෛද්‍යවරු කල්පනා කරනවා ඇති, ගැබ්බර වැස්සියන් ගෙන්වන්නේ නැතිව ඔබතුමා කිව්වා වාගේ කෘත්‍රිම සිංචනය මඟින් මේ සතුන් බෝ කර ගන්නේ කොහොමද කියා. ඉන්න සතුන්ටවත් කෘත්‍රිම සිංචනය කරන්න අපේ වෛද්‍යවරුන්ට යන්න වාහනයක් නැහැ, පහසුකම් නැහැ, ඉඩකඩ නැහැ, පශු වෛද්‍ය කාර්යාලයේ දුරකථනය නැහැ, දුරකථනයෙන් කථා කළාට පශු වෛද්‍යවරයා යනකොට සතාගේ අවශ්‍යතාව අවසන් වෙලා. ඒ කටයුත්ත කරන්න බැහැ. සතෙකුට නියම වෙලාවට කෘත්‍රිම සිංචනය කළේ නැත්නම් වාණිජ මට්ටමේ ගොවිපොළක ඉන්න සතුන්ට කන්න දෙන එක පාඩුවක්. ඒ අවස්ථාව ආපසු එන්නේ මම හිතන්නේ තව දවස් 30, 40ක් ගිහිල්ලා. මම හරියටම ඒ ගැන දන්නේ නැහැ. මම හිතන විධියට ඒකට දවස් 20කට වඩා ගත වනවා. එතකොට මේගොල්ලන්ගේ AI කරන එක නැති වෙනවා නේ. එතැන ගැටලුවක් තිබෙනවා. ඒක තමයි කියන්නේ. "මේ වැස්සියන් හොඳයි. මේගොල්ලන් ගෙන්වන්න. හැබැයි, AI කරන එක මෙහේදී කරමු." කියා.

එතකොට අපි ශුක්‍රාණු -sperms- ගෙනෙන්න ඕනෑ, වැස්සියෝත් ගෙනෙන්න ඕනෑ. ඒකට සමහර විට වෛද්‍ය සංගම්වලින් එහෙම පොඩි විරෝධතාවක් එන්න ඇති. වෛද්‍ය සංගම් කිව්වාම ඒවා හරි ප්‍රබලයි නේ. ඔබතුමන්ලාත් ඒවායේ ඉන්නවා නේද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(*මාණ්පුමිකු (වෛත්තිය කලානිති) නලින්ද ජයතිස්ස*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මේක ඒ වෛද්‍ය සංගම් වාගේ එකක් නොවෙයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(*මාණ්පුමිකු කාමිණී විජිත් විජයමුණි සොය්සා*)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

නැහැ, නැහැ. මම උපකල්පනයක් කරපු එකක් ගැනයි කිව්වේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(*මාණ්පුමිකු (වෛත්තිය කලානිති) නලින්ද ජයතිස්ස*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඇමතිතුමා මෙහෙමයි. ඔබතුමාගේ අමාත්‍යාංශ යටතේ තිබෙන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඔවුන්ගේ තිබෙන මොකක් හෝ වෙන ව්‍යාපෘතියක් අනුව කළා කියා මම හිතන්නේ නැහැ. ඒ අමාත්‍යාංශය විසින් එංගලන්තයේ OIE Reference Laboratory එකට යවලා, ලබා ගන්නා ලද වාර්තාවක් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ අපි ලබා ගෙන තිබෙනවා. ඒකේ බොහොම පැහැදිලිව තිබෙනවා, "positive for BVDVI/II nucleic acid..." කියා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(*මාණ්පුමිකු කාමිණී විජිත් විජයමුණි සොය්සා*)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

ගරු මන්ත්‍රීතුමා, ඒක ඇත්ත. එහෙම බැලුවොත් අපේ රටට විදේශිකයන් 25,000ක් විතර එනවා නේ. ඔවුන්ට ඒඩිස් වාගේ විවිධ ලෙඩ රෝග තිබෙනවා. එහෙනම් අපේ මනුෂ්‍ය වර්ගයා විනාශ වෙලා, වඳ වෙලා යන්න එපායැ. එහෙම බරපතළ රෝගයක් නොවෙයි මේක. සත්ව සෞඛ්‍ය නිරෝධන අංශයේ වාර්තාවන් තිබෙනවා. මම ඒ වාර්තාවන් ඔබතුමාගේ දැනගැනීම සඳහා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලින් ගත් වාර්තා ප්‍රතික්ෂේප කර, වෙන තැන්වලින් ගත් වාර්තා තමයි ඒක හරියි කියා කියන්න පාවිච්චි කරන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මෙතෙක් කල් නීත්‍යානුකූලව වාර්තා ලබා දෙන තැන්වලින් ගත් වාර්තා තමයි මම සභාගත කරන්නේ. නානත්තකායා - නානත්ත සඤ්ඤා. ගෙදරක් ගත්තත් කී දෙනෙකුගේ මත තිබෙනවාද? එහෙම නේ තිබෙන්නේ. ඒක එතුමාගේ අදහස වෙන්න පුළුවන්. නමුත්, මේ සියලු වාර්තා මම **සභාගත*** කරනවා. ඔබතුමා ඒ වාර්තා පරිශීලනය කරන්න. වාර්තා පරිශීලනය කර ඒවායේ මොනවා හෝ ගැටලුවක් තිබෙනවා නම් ඔබතුමාට ඒවා මට පෙන්වලා දෙන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම ඔබතුමා මගේ මිත්‍රයෙක්. වැරැදි තිබෙනවා නම් අපි ඒ වැරැදි හදා ගන්න කැමතියි. මෙම සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මම නැවත වරක් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ගරු මන්ත්‍රීතුමා, ඇත්තටම මමත් නොමඟ ගිහින් තිබෙනවා නම් මට ඔබතුමා ඒවා පෙන්වලා දෙන්න. ඔබතුමාත් සමඟ එතැනදී එකතු වෙන්න මමත් ලෑස්තියි. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මමත් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. බිබිලේ ඉඩම්වලට ගිය කල යන්නේ නැතිව අපේ දේශීය ගව සම්පතත් ආරක්ෂා කර ගෙන වැඩේ කරන එක තමයි වැදගත් වෙන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අපේ නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාට මම කියන්න ඕනෑ, ඒ කාලයේ අපි බිබිලේ පාරවල්වල යනකොට පැය ගණන් වාහන නවත්වාගෙන හිටපු බව. බිබිලේ ඒ තරම් හරක් හිටියා. තේරුණාද? අද නැහැ. අද ඒ සතුන් නැහැ. ඒ හරක් දොඩම් ගස්වල බැඳලා තිබුණා. ගව මුත්‍රා තිබුණා. ගව පොහොර තිබුණා. මේක චක්‍රීය කෘෂි කර්මාන්තයක්. මතක තබා ගන්න, හරකෙක් හෝ වැස්සියෙක් ගෙනෙනවා කියන්නේ අපි කොම්පෝස්ට් මැෂිමක් තමයි ගෙනෙන්නේ. ආදර්ශවත් ගොවියෙකු හැටියට මම ජවිපෙ අපේ සහෝදර මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා, මගේ වත්තට එන්න කියා. පූජ්‍ය අතුරලියේ රතන හාමුදුරුවන්ට මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වනවා. උන් වහන්සේ හොඳ ප්‍රකාශයක් කළා. ඒ, මොකක්ද දන්නවාද? මේ චක්‍රීය කෘෂි කර්මාන්තය ගැන උන් වහන්සේ කථා කළා. චක්‍රීය කෘෂි කර්මාන්තයේදී ගව පොහොර, ගව මුත්‍රා යොදා ගන්නා හැටි උන් වහන්සේ පෙන්වා දුන්නා. අද මගේ තේ වගාවට, කුරුඳු වගාවට -මේ සියල්ලටම- මම යොදන්නේ ගවයන්ගෙන් ලබා ගන්නා පොහොරයි. වල් ටික කපලා සතුන්ට කන්න දෙනවා. මගේ ගොවි පොළෙනුත් ලීටර් 20 පන්නලා කිරි ගත්තා. හැබැයි, මේ කාරණය මම අන්තිමට කියන්න ඕනෑ. මේක මෙහෙමයි. 'අප්පුහාමි ලංසි ගෑනියෙක් බැන්දා වාගේ' කන්න දෙන්න බැරි අය ගත්තාම මේ සතුන්ගේ කිරි එරෙන්නේ නැහැ. බුරුල්ලට තියලා ඉරුවත් කිරි එන්නේ නැහැ. ඕක තමයි ඇත්ත කථාව.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව රීට අනුකූලව අ. භා. 7.22ට, 2018 සැප්තැම්බර් මස 21 වන සිකුරාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***


*அதன்படி பி. ப. 7.22 மணிக்கு பாராளுமன்றம், 2018 செப்தெம்பர் 21, வெள்ளிக்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 7.22 p.m. until 10.00 a.m. on Friday, 21st September, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 263 - இல. 8
Volume 263 - No. 8

2018 සැප්තැම්බර් 21වන සිකුරාදා
2018 செப்ரெம்பர் 21, வெள்ளிக்கிழமை
Friday, 21st September, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම

කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: අතිරේක සාමාජික

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: අතිරේක සාමාජිකයන්

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්න:**

උතුරු ප්‍රදේශයේ බෞද්ධ පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීම

තෙලිප්පලේ පැවැති ජනපති ජංගම සේවය

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණ තෙල් ටැංකි ඉන්දියානු තෙල් සමාගමට පැවරීම

**පාර්ලිමේන්තු සේවය අත්හිටුවීම :**

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු විමල් වීරවංශ මහතා

**ශෝක ප්‍රකාශ:**

ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මහතා

ගරු එම්. තිලකරත්න මහතා

ගරු මංගල මුණසිංහ මහතා

**කල් තැබීමේ යෝජනාව:**

ක්‍රිකට් ක්‍රීඩාවේ අර්බුදකාරී තත්ත්වය


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புக்கள்:**

அரசாங்க நிதி பற்றிய குழு: உறுப்பினர் பதிலீடு

கமத்தொழில் மற்றும் காணி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: மேலதிக உறுப்பினர்

அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: மேலதிக உறுப்பினர்கள்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

வட பகுதியில் பௌத்த தொல்பொருளியல் அமைவிடங்களைப் பாதுகாத்தல்

தெல்லிப்பளையில் நடைபெற்ற ஜனாதிபதி நடமாடும் சேவை

திருகோணமலை எண்ணெய்க் குதத்திலுள்ள எண்ணெய்த் தாங்கிகளை இந்திய எரிபொருள் கம்பனியிடம் ஒப்படைத்தல்

**பாராளுமன்ற சேவையிலிருந்து இடைநிறுத்தல்:**

மாண்புமிகு பிரசன்ன ரணவீர

மாண்புமிகு விமல் வீரவங்ச

**அனுதாபத் தீர்மானம்:**

மாண்புமிகு எச். எம். உபதிஸ்ஸ சில்வா

மாண்புமிகு எம். திலகரத்ன

மாண்புமிகு மங்கள முனசிங்க

**ஒத்திவைப்புப் பிரேரணை:**

கிரிக்கட் விளையாட்டு எதிர்கொண்டுள்ள நெருக்கடி நிலைமை


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Committee on Public Finance: Substitution of Member

Sectoral Oversight Committee on Agriculture and Lands: Additional Member

Ministerial Consultative Committees: Additional Members

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Protection of Buddhist Archaeological Sites in the North

Presidential Mobile Service in Tellippallai

Handover of Oil Tanks at Trincomalee Oil Tank Farm to Indian Oil Company

SUSPENSION FROM SERVICE OF PARLIAMENT:

Hon. Prasanna Ranaweera

Hon. Wimal Weerawansa

VOTES OF CONDOLENCE:

Hon. H.M. Upathissa Silva

Hon. M. Tilakaratne

Hon. Mangala Moonesinghe

ADJOURNMENT MOTION:

Crisis Situation in Cricket

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2018 සැප්තැම්බර් 21වන සිකුරාදා*
*2018 செப்ரெம்பர் 21, வெள்ளிக்கிழமை*
*Friday, 21st September, 2018*

**පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA]
in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### රජයේ මුදල් පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
### அரசாங்க நிதி பற்றிய குழு: உறுப்பினர் பதிலீடு
### COMMITTEE ON PUBLIC FINANCE: SUBSTITUTION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ 127 (3) ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 20වැනි දින තේරීම් කාරක සභාව විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය ඉවත් කොට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මුජීබුර් රහුමාන් මහතා එකී කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

### II

### කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: අතිරේක සාමාජික
### கமத்தொழில் மற்றும் காணி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: மேலதிக உறுப்பினர்
### SECTORAL OVERSIGHT COMMITTEE ON AGRICULTURE AND LANDS: ADDITIONAL MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ 111 (21) සහ (22) (අ) වැනි ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව 2018 සැප්තැම්බර් මස 20වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉෂාක් රහුමාන් මහතා කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

### III

### අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: අතිරේක සාමාජිකයන්
### அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: மேலதிக உறுப்பினர்கள்
### MINISTERIAL CONSULTATIVE COMMITTEES: ADDITIONAL MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ 112 ස්ථාවර නියෝගයේ විධිවිධාන සහ 2018 සැප්තැම්බර් මස 20වැනි දින තේරීම් කාරක සභාවේ තීරණය, 2018 ජූලි මස 17වැනි දින සහ සැප්තැම්බර් මස 07වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනා ප්‍රකාරව මතු සඳහන් මන්ත්‍රීවරුන්, ඒ ඒ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

1. ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

   ගරු වජිර අබේවර්ධන මහතා

2. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

   ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

### IV

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 සැප්තැම්බර් මස 21වන සිකුරාදා එනම්, අද දින අපර භාග 3.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් නියමයන් මම ඉදිරිපත් කරමි.

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන්

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 31 දිනැති අංක 2073/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 08 දිනැති අංක 2074/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 14 දිනැති අංක 2075/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම නියමයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*ඛිනා විදුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සුමේධා ජී ජයසේන මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු රවි කරුණානායක මහතා**
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මීගොඩ, සිරි රතන මාවත අංක 256 බී දරන ස්ථානයේ පදිංචි ජේ.එච්. ගුණසීලී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු එස්. ශ්‍රේමරත්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු ප්‍රසන්න රණවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යැවිය යුතු යයි නියෝග කරන ලදී.***
*සමර්ප්පික්කප්පට්ට මනුක්කළෙප් පොදුමනුක් කුழුවුක්කුච් චාට්ටක් කට්ටළෙයිටප්පට්ටදු.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ඛිනාක්කළුක්කු වාය්මූල විටෙකළ්
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 - 33/'18- (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 - 62/'18 - (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance and Mass Media, I ask for two weeks' time to answer that Question.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම අසා තිබෙන්නේ කොටස් වෙළෙඳ පොළ පිළිබඳ ප්‍රශ්නයක්. කොටස් වෙළෙඳ පොළ ඊයේ දිනයේදී ඉතාම දරුණු ලෙස කඩා වැටුණා. මේ තිබෙන මුදල් තත්ත්වය පිළිබඳව මම ඔබතුමාගේ,-

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඊළඟ පාර්ලිමේන්තු සතියේදී පිළිතුරක් දෙන්න පුළුවන් නේද? The Answer will be given at the next Sitting week.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවෙන් සම්මත කරන අධික බදු මේ රටේ ජනතාවට බලපානවා. දැන් සීනිවල බද්ද මේ රටේ ජනතාවට බලපානවා. පරණ සීනි මෙට්‍රික් ටොන් 40,000ක්, 50,000ක් තියෙනවා. ඒ පරණ සීනි රුපියල් 100 අලුත් මිලට විකුණනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඊයේ මුදල් ඇමතිතුමා පැහැදිලිව උත්තරයක් දුන්නා, සීනිවලට බද්දක් අය කරන්නේ නැහැ කියා. ඊයේ උත්තරයක් දුන්නා. Hon. Speaker, you were not here when he said that.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
At the next Sitting week, the Question will be answered. පිළිතුර ලැබෙයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, the Hon. Minister of Finance and Mass Media gave an assurance that there would be no tax on sugar.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මුදල් පිළිබඳ බලය මේ පාර්ලිමේන්තුවට තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇත්ත. ඇත්ත. ඒක පිළිගන්නවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒ නිසා කරුණාකරලා මට විනාඩියක් දෙන්න. මොකද මේ, ගෙනාපු සීනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමාට විනාඩි දෙකක් දෙන්නම්. විනාඩි දෙකෙන් අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගෙනාපු සීනි තොග මෙට්‍රික් ටොන් 40,000ක්, 50,000ක් රට ඇතුළේ තිබෙනවා. ඊයේ පාරිභෝගික කටයුතු අධිකාරියේදී පිළිගත්තා. දැන් බද්ද වැඩි කළාම,- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ මුදල් කටයුතු ගැන මෙතුමා කථා කරනවා. පසුගිය රජය කාලයේ මුදල් ඇමතිතුමා - මහින්ද රාජපක්ෂ මැතිතුමා- එක දවසක්වත් මේ සභාවට ඇවිත් පැහැදිලි කළේ නැහැ. මුදල් ඇමති වශයෙන් එක දවසක්වත් මේ සභාවට ආවේ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ප්‍රශ්න අහන අවස්ථාවේ ප්‍රශ්න අහන්න පුළුවන්; අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්. එතැනින් එහාට දෙයක් අහන්න අවස්ථාවක් නැහැ. මේ තත්ත්වය මෙහෙම ඇති වුණොත් මේක සම්ප්‍රදායක් බවට පත් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ඇත්ත. ඒක මටත් හොඳ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු මේ ක්‍රමය අනුගමනය කරන කොට මේක සම්ප්‍රදායක් වෙනවා. මේකට ඉඩ දෙන්න එපා. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ප්‍රශ්නය විවාදයක් කර ගන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බැහැ. ඒක හරි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ස්ථාවර නියෝගවලින් කියන්නේ ඒකයි. ප්‍රශ්න අසන වෙලාවේ විවාදයක් කරන්න බැහැ. ප්‍රශ්නය විවාදයක් කරගන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, එහෙම නම් ඔබතුමා ලබන සතියේ පිළිතුර දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මහින්ද රාජපක්ෂ මැතිතුමා අවුරුදු 10ක් මුදල් ඇමති හැටියට හිටියා. ප්‍රශ්නවලට උත්තර දෙන්න එක දවසක්වත් පාර්ලිමේන්තුවට ආවේ නැහැ.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට එක දවසක්වත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රශ්නවලට උත්තර දුන්නේ නැහැ කියලා මෙතුමා කියනවා. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා සහ ආරක්ෂක ඇමතිවරයා විධියට මෛත්‍රීපාල සිරිසේන මහත්තයා එක දවසක් හෝ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රශ්නවලට උත්තර දුන්නාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් මේක විවාදයක් කරගන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මුදල් බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. කාටවත් බලයක් නැහැ පාර්ලිමේන්තුවට,-

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා ඔබතුමාට නියෝග දෙන්න උත්සාහ කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, මම කාගේවත් නියෝග භාරගන්නේ නැහැ. නියෝග මොනවාද කියලා මම දන්නවා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, ඇමතිවරු ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු දෙන්නේ නැති නිසා තමයි මේ විධියට පැහැදිලි කිරීම් අවශ්‍ය වෙලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, මට තේරෙනවා. ඒක තමයි මම අවස්ථාව දුන්නේ, ඊළඟ රැස්වීම් සතියේ පිළිතුරු ලබා දෙන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
අජිත් පී. පෙරේරා මැතිතුමාට අපි කියන්නේ, කථානායකතුමාගේ රාජකාරිය කථානායකතුමා කරයි, ඔබතුමා ඔබතුමාගේ රාජකාරිය කරන්න කියලායි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පසුගිය රජය කාලයේ මුදල් ඇමතිතුමා අවුරුදු 10ක් තුළ මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිසිම ප්‍රශ්නයකට උත්තර දුන්නේ නැහැ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*විනාඩි මත්තොරතු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -145/'18- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -179/'18- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 - 213/'18- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6- 229/'18- (1), ගරු ඩග්ලස් දේවානන්ද මහතා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
කෞරව සභානායකතුමනි, නාන් අන්තක් කේල්වියෙක් කේට්කින්රේන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා ඒම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*විනාඩි මත්තොරතු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

## වන අලි තර්ජනය: මාතලේ දිස්ත්‍රික්කය
## காட்டு யானைகளின் அச்சுறுத்தல்: மாத்தளை மாவட்டம்
## WILD ELEPHANT MENACE : MATALE DISTRICT

145/'18

**3. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල, ගලේවෙල, ලග්ගල, පල්ලේගම සහ විල්ගමුව ආදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස රැසක ජනතාව වන අලි තර්ජනයට මුහුණ පා සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම ජනතාව වන අලි තර්ජනයෙන් මුදා ගැනීම සඳහා අමාත්‍යාංශය සතු දැක්ම හා වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වලුවාතාර අපිවිරුත්ති, වනසීවරාසිකළ් මට්රුම් පිරදේස අපිවිරුත්ති අමෙච්චරෛක් කේට්ට විනා:

(அ) (i) මාත්තළෙ මාවට්ටත්තින් තම්පුල්ළෙ, කලේවෙල, ලක්කල, පල්ලේකම මට්රුම් විල්කමුව ආකිය පිරදේස සෙයලාළර් පිරිවුකළිල් මක්කළ් කාට්ටු යානෙකළින් අච්චුරුත්තලුක්කු මුකම් කොටුත්තුල්ළන එන්පතෙ අරිවාරා එන්පතෙයුම්;

(ii) ආමෙනින්, ඉම්මක්කළෙ කාට්ටු යානෙකළින් අච්චුරුත්තලිලිරුන්තු මීට්පතර්කු අමෙච්චු වසමුල්ළ තොලෛනෝක්කු මට්රුම් වේලෛත් තිට්ටම් යාතු එන්පතෙයුම්;

අවර් ඉච්චපෙයිල් අරිවිප්පාරා?

(ஆ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Sustainable Development,Wildlife and Regional Development:

(a) Will he inform this House-

(i) whether he is aware that people in many Divisional Secretaries' Divisions including Dambulla, Galewela, Laggala, Pallegama and Wilgamuwa Divisions in the Matale District are faced with wild elephant menace; and

(ii) if so, what vision and course of action the Ministry has for saving these people from the wild elephant menace?

(b) If not, why?

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා (තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා)**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா - வலுவாதார அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் பிரதேச அபிவிருத்தி அமைச்சர்)
(Field Marshal Hon. Sarath Fonseka - Minister of Sustainable Development, Wildlife and Regional Development)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) දැනට මාතලේ දිස්ත්‍රික්කය තුළ විදුලි වැට කිලෝමීටර් 370ක් ඉදි කර ඇත. ජාතික විදුලි වැට පද්ධතිය ක්‍රියාත්මකව පවත්වාගෙන යෑමේ වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කරගෙන යන අතර, ඒ පිළිබඳව ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සන්දේශය සඳහා අනුමැතිය ද ලැබී ඇත. ඒ යටතේ ජාතික විදුලි වැට පද්ධතිය ඉදිකර අවසන් කිරීමට නියමිතය. තවද එකී විදුලි වැට නඩත්තු කිරීම සඳහා සිවිල් ආරක්ෂක භටයන් සංඛ්‍යාත්මකව වැඩිකර ගැනීමටත්, විදුලි වැට නඩත්තු සහායකයන් අලුතින් බඳවා ගැනීමටත් කටයුතු කරන අතර, විදුලි වැට කිලෝමීටර් 1කට එක් අයෙකු බැගින් යෙදවීමටත්, එසේ යොදවා විදුලි වැට නඩත්තු කාර්ය මණ්ඩලය සංවිධානාත්මකව කළමනාකරණය කිරීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීමටත්, සමස්ත ක්‍රියාවලිය සඳහා අවශ්‍ය භෞතික සම්පත් ලබා ගැනීමටත් කටයුතු කරමින් පවතී. මාතලේ දිස්ත්‍රික්කයද ඉහත කී ජාතික වැඩසටහනට ඇතුළත් කර ඇත. ඒ තුළින් දැනට උද්ගතව ඇති වන අලි - මිනිස් ගැටුමට තිරසර විසඳුමක් ලබා ගැනීමට අපේක්ෂිතය.

මිනිමරු අලි අල්ලා හොරොව්පොතාන ප්‍රදේශයේ ඇති අක්කර 2,600ක ඇතුන් ආරක්ෂිත ප්‍රදේශයට ඇතුළු කිරීමට සැලසුම් කර ඇත. ඊට අමතරව, විදුලි වැට ගසා ජනතාව ජීවත්වන ප්‍රදේශවලින් ඉවතට ගෙන යන අලින් සඳහා අක්කර 15,000ක තෘණ භූමි වගා කිරීමේ සැලැස්මක්ද පවතී.

(ආ) ඉහත පිළිතුරු ලබා දී ඇත.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු ඇමතිතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමා විශාල වැඩ පිළිවෙළක් කරගෙන යන බව අපි දන්නවා. ඒ නව වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් ඔබතුමා අපේ දිස්ත්‍රික්කයට ඇවිල්ලා සාකච්ඡා කළා. එහිදී විශේෂයෙන් අලි වැට සංවර්ධනය කිරීම වාගේම, නිලධාරීන්ගේ අඩු පාඩුකම් සම්පූර්ණ කිරීම ගැනත් අප දැනුවත් කළා. ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත්, ගරු ඇමතිතුමනි, ඒ පළාත්වල ගොවිතැන් කටයුතුවල යෙදෙන ජනතාවගේ බෝග හානි වුණාම කෘෂි රක්ෂණ මණ්ඩලයෙන් වන්දි ලබා දෙන්නේ වී, කවුපි, අල, බඩඉරිගු ඇතුළු බෝග 6ක් සඳහා පමණයි. අනෙකුත් බෝගවලට වන්දියක් ලබා ගන්න නම් ඒ ගොල්ලන් ඊට කලින් ඒ බෝග සඳහා රක්ෂණ ආවරණයක් ලබා ගන්න ඕනෑ. ඒක ඒ ප්‍රදේශවල අයට දරාගන්න අමාරුයි. ඒ කාරණයේදී ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් එම ජනතාවට යම්කිසි සහනයක් ලබා දෙන්න පුළුවන්ද? ඒ වාගේම, ගෙදරකට හානියක් වුණත් ලබා දෙන වන්දිය පිළිබඳව ගැටලුවක් තිබෙනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු කථානායකතුමනි, ජීවිත හානි වුණාම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වන්දි ගෙවනවා. 2015 ජනවාරි 08වැනි දාට කලින් ජීවිත හානියකදී වන්දිය හැටියට ගෙව්වේ රුපියල් ලක්ෂයයි. අපි දැන් ඒක රුපියල් ලක්ෂ 5 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම, දේපොළ හානියකදී දිගටම ගෙවා ගෙන ආවේ උපරිම රුපියල් පණස්දහසයි. දැන් ඒ මුදල අපි රුපියල් ලක්ෂ දෙක දක්වා වැඩි කරන්න කටයුතු කරමින් පවතිනවා.

ගරු මන්ත්‍රීතුමියනි, කෘෂිකාර්මික කටයුතුවලදී වන්දි ගෙවීම් කරනු ලබන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින්. ඒ නිසා ඒ සම්බන්ධ යම් යම් ප්‍රශ්න තිබෙනවා නම් ඒවා කෘෂිකර්ම ඇමතිතුමාට යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු ඇමතිතුමනි, වන අලින් ගම් වදින්නේ ආහාර සොයාගෙන. අලින්ට වනයේ තිබෙන ආහාර ප්‍රමාණය අඩු වීම වැනි හේතු නිසායි ගමට එන්නේ.

අපට අලි වැට හදන්නට, අලි වැට නඩත්තු කරන්නට ලොකු වියදමක් -ලොකු පිරිවැයක්- දරන්නට සිදු වෙනවා. ඒ අයගේ පානීය ජල අවශ්‍යතාව සහ ආහාර අවශ්‍යතාව වනය ඇතුළේම ඇති කරන්නට යම් කිසි ක්‍රමවේදයක් තිබෙනවාද? ඒකට කුමන හෝ බාධාවක් තිබෙනවාද? මොකද, මම නියෝජනය කරන නාවුල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි ගොඩගමුව වැව ඉදි කරන්න නව රජය පත් වුණාට පසුව රුපියල් මිලියන 225ක මුදලක් වෙන් කරගෙන තිබෙනවා. නමුත්, ඒ වැව වනජීවී කලාපය ඇතුළේ තිබෙන නිසා මේ දවස්වල ඒ සඳහා අවසරය ලබා නොදීමේ කටයුත්තක් සිදු වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ විධියට ඒ අයගේ ආහාර අවශ්‍යතාව වනය ඇතුළේ සපුරා ගැනීමේ වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු මන්ත්‍රීතුමියනි, ඔය වැව ඉදි කිරීම කෘෂිකර්මයට අදාළව සිදු වෙන දෙයක් නම්, වනජීවී සංරක්ෂිත ප්‍රදේශයකට ගොවීන්ගේ ඇතුල්වීම හෝ ඒ ප්‍රදේශයන් තුළ ගොවිතැන් කිරීම වැනි ගැටලු

[ගරු ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

තිබෙනවා නම්, අනිවාර්යෙන්ම අපට වෙනම සාකච්ඡාවක් මගින් එම ගැටලු විසඳා ගන්න සිදු වෙනවා. විදුලි වැටෙන් ඔබ්බට මේ අලි තල්ලු කළාම, අලින්ට අවශ්‍ය ආහාර සැපයීම සඳහා අපි යම් සැලැස්මක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා. අපි දැනට ඒ අදාළ ප්‍රදේශ -වතුර තිබෙන ප්‍රදේශ, තණකොළ භූමි වර්ධනය කිරීමට හැකි ප්‍රදේශ- හඳුනා ගැනීමේ කටයුත්තක යෙදිලා ඉන්නවා. මම ඒ ගැන තමයි ඉස්සෙල්ලා කිව්වේ. අපි තෘණ භූමිය අක්කර 15,000ක් වගා කරන්න කටයුතු කරනවා. අපට එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ලැබුණු ආධාර මුදලත් තිබෙනවා. ඒ මුදල පාවිච්චි කරලා අලින්ට අවශ්‍ය ආහාර සැපයීමට අපි නිසි පියවර ගන්නවා.

ගම්වලට එන අලි 1,500කට අධික ප්‍රමාණයක් ඉන්නවා. ඒ අය කැලෑවට තල්ලු කළාම ඒ සංඛ්‍යාවට අවශ්‍ය ආහාර නිෂ්පාදනය කරන්න තමයි අපි ඒ කැලෑ භූමි ප්‍රදේශය වෙන් කරන්නේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ අනුමැතිය තවම නොලැබීම නිසා වැව හදා ගැනීමට අපට බැරි වෙලා තිබෙනවා. එම අනුමැතිය ඉක්මනින් ලබා දෙන්න. ඒ වැව හැදුවොත් එම වනාන්තරයේ ජීවත් වන අලීන් ඇතුළු වන සතුන්ගේ ජල අවශ්‍යතාවත් සම්පූර්ණ වෙනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය යම්කිසි නියෝජිතයකු අපගේ මහජන දිනයට සහභාගී කරවන්න. ඒ ගැන මගේ අදාළ නිලධාරීන් ඉදිරියේ දී අපට දිර්ඝ වශයෙන් සාකච්ඡා කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමියනි, ගරු ඇමතිතුමා යෝජනා කළ පරිදි යම්කිසි නියෝජිතයකු සහභාගී කරවන්න.

මීළඟට ප්‍රශ්න අංක 7, ගරු හේෂා විතානගේ මහතා.

## නැග්රක් වතු ගම්මානය : සංවර්ධනය කිරීමට ගනු ලබන පියවර
## நக்ரெக் தோட்ட கிராமம்: அபிவிருத்தி செய்வதற்கு மேற்கொள்ளும் நடவடிக்கைகள்
## NAGRAK ESTATE VILLAGE: STEPS TAKEN FOR DEVELOPMENT

304/'18

**7. ගරු හේෂා විතානගේ මහතා**
(මාණ්පුමිකු ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1)

(අ) (i) බලංගොඩ සිට කිලෝ මීටර් 43 ක් දුරින් නන්පේරියල් නැනැඩ්‍රැඩ් නමින් ගමක් තිබෙන බවත්;

(ii) එම ගමේ ජීවත් වන පවුල්වලට පොදු පහසුකම් නොමැතිව ඉතා දුෂ්කර ජීවිත ගත කරන බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, එම ගම සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

මාකාණ සපෙකළ්, උළ්ලූරාට්සි මර්රුම් විළෙයාට්ටුත්තුරෙ අමෙච්සරෛක් කේට්ට විනා:

(අ) (i) පලාංකොටෙයිලිරුන්තු 43 කි.මී. තූරත්තිල් නන්පේරියල් නෙනට්රට් එන්ර පෙයරිල් කිරාම මොන්රු උළ්ළතෙන්පතෙයුම්;

(ii) අක්කිරාමත්තිල් වසික්කුම් කුටුම්පංකළ් පොදු වසතිකළින්රි පෙරුම් සිරමංකළුටන් වාළ්න්තු වරුකින්රාර්කළ් එන්පතෙයුම්;

අවර් අරිවාරා?

(ආ) ආමෙනිල්, මේර්පටි කිරාමත්තෛ අපිවිරුත්ති සෙය්වතර්කු අමෛච්සු මේර්කොළ්ළුම් නටවටික්කෛකළ් යාවෙ එන්පතෛ අවර් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Is he aware that-

(i) there is a village named "Nonparial Nanadrad" located 43 km away from Balangoda; and

(ii) the families living in that village suffer severe hardships due to the lack of required facilities?

(b) If so, will he inform this House of the measures that will be taken by the Ministry to develop the aforesaid village?

(c) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැනැඩ්‍රැඩ් නමින් ගමක් හඳුනාගත නොහැකිය. එහෙත් බලංගොඩ නගරයේ සිට බදුල්ල දෙසට කි.මී. 15ක් පමණ ගිය විට පඔහින්න ආසන්නයේ නන්පේරියල් හන්දියෙන් හැරී තවත් කි.මී. 20ක් පමණ ගිය විට නැග්රක් නමින් වතු ගම්මානයක් පිහිටා ඇත. මෙය ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ය.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ගම ගැනද අහන්නේ?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ඔව්. ඒ ගම ගැන තමයි.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

(ii) නැග්රැක් නැමැති වතු ගම්මානයේ ඡන්ද නාම ලේඛනයේ ලියා පදිංචි පවුල් 24ක් සහ තාවකාලිකව පදිංචි තවත් පවුල් 10ක් පමණ ඇත. එම තාවකාලික පවුල්වල සාමාජිකයෝ බලංගොඩ වැවිලි සමාගම යටතේ පාලනය වන නන්පේරියල් වතු යායට අයත් පේළි නිවාසවල ජීවත් වන බැවින් වතු යාය ආශ්‍රිත රැකියාවල නිරත වෙති. ප්‍රදේශයේ ජල හා විදුලිය පහසුකම් ඇත. ගම්මානයට කිලෝමීටර් 08ක් පමණ පහළින් ර/බල/විවේකානන්ද විද්‍යාලය පිහිටා ඇති අතර දරුවන් වෙනුවෙන් සකස් කරන ලද සියලු පහසුකම්වලින් යුතු නේවාසිකාගාරයක් ද ඇත. පාසල දක්වා ගමන් කිරීම සඳහා බලංගොඩ ඩිපෝවෙන් බස් රථයක් ධාවනය වේ.

(ආ) සහ (ඇ) නන්පේරියල් හන්දියේ සිට සබරගමුව පළාත් සභාවට අයත් මාර්ගයේ දුර කිලෝමීටර් 10ක් පමණ වේ. පසුගිය කාලයේ සබරගමුව පළාත් සභාව මඟින් එම කොටසේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් යොදා සකස් කර ඇත. ඉන් ඔබ්බට ඇති ප්‍රදේශය බලංගොඩ වැවිලි සමාගම යටතේ පාලනය වන බැවින් පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් සංවර්ධන කටයුතු සිදු කිරීමට නීතිමය හැකියාවක් නොමැත.

මේ උත්තරයේ තිබෙනවා, "නීතිමය හැකියාවක් නැත" කියලා. නමුත් අපි පසුගිය බදාදා දිනයේ දී වතු යායවල්වල පාරවල් සෑදීමට ප්‍රාදේශීය සභාවලට අවශ්‍ය බලතල ලබා දුන්නා. ඒ නිසා දැන් ඒ සඳහා පුළුවන්කමක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මේ උත්තරය, ඊට කලින් හදපු එකක්.

මේ වනවිට පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය වතු ගම්මාන සංවර්ධනය කිරීම සඳහා රජයේ අරමුදල් යෙදවීම සඳහා නීතිමය බලතල ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව ප්‍රාදේශීය සභා පනතේ 33(1) සහ 19 වන වගන්තිය සංශෝධනය කර නීතිය හදලා තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී අපේ අමාත්‍යාංශය හරහා මෙම වැඩ කටයුතු කිරීමට පුළුවන්කමක් තිබෙනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

එම ප්‍රශ්නයට පිළිතුරු ලබාදීම සම්බන්ධව ගරු රාජ්‍ය ඇමතිතුමියට මා බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ගමේ නම පිළිබඳව අකුරක වෙනසක් තිබුණා. ඒක "ටයිප්" කරනවිට සිදුවුණු වෙනසක් වෙන්න ඇති. ඔබතුමිය දුන් පිළිතුර නිවැරැදියි. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමිය දුන් පිළිතුරේම තිබෙනවා, "කිලෝමීටර් අටක් දුරින් පාසලක් ඇත, ඒ පාසල දක්වා බස් රථයක් ගමන් කරයි" කියා. ඔබතුමියට ඔය පිළිතුර ලබාදීලා තිබෙන නිලධාරින්ගේ අරමුණ වෙලා තිබෙන්නේ ප්‍රශ්නයට කුමන හෝ පිළිතුරක් දීමයි. බලංගොඩ ප්‍රදේශයේ, ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉන්නේ කිසි සරණක් නැති, අහිංසක මිනිසුන් ටිකක්. කිලෝමීටර් අටකට එහායින් ඉස්කෝලයක් තිබෙනවාය කියා උත්තරයක් දෙනවා නම්, ඒකෙන්ම හිතාගන්න පුළුවන් මේ ගොල්ලන්ගේ අරමුණ මොකක්ද කියන එක.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, කිලෝමීටර් අටක් දුර තිබෙන පාසලකට දරුවකුට යන්න පුළුවන්ද කියලා ඔබතුමියටත් හිතෙනවා ඇති. වාහනයක් තියා පයින් යන්නවත් පාරක් නැහැ. ප්‍රාදේශීය සභා සභාපතිවරයකුට බලතල රාශියක් තිබෙනවා; ප්‍රාදේශීය සභාවලට ඔබතුමියලා ප්‍රතිපාදන ලබාදෙනවා. මේ ප්‍රාදේශීය සභාවේ නිලධාරින් අවුරුදු ගණනාවකින් මේ ගමට ගිහිල්ලාත් නැහැ. මම කියන්නේ බස් එකක් දෙන්න කියා නොවෙයි. මේ දරුවන්ට ඉගෙන ගන්න වෙන ක්‍රමවේදයක් හදා දෙන්න පුළුවන් වටපිටාවක් නිර්මාණය කිරීමේ අයිතිය පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයට තිබෙනවා. මොකද, මේ ගමේ පවුල් ප්‍රමාණය අඩුයි කියා අපට අපේම රටේ පුරවැසියන් කොටියාසයක් පැත්තකට දමලා ඉන්න බැහැ. ඒ ප්‍රදේශය ගැන ඔබතුමිය දන්නවා. එය "ලෝකාන්තය" කියන ප්‍රදේශයට පහළින්, බලංගොඩ තිබෙන තනි වුණු ප්‍රදේශයක්.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමනි, පසුගිය බදාදා දිනය වනතුරු ප්‍රාදේශීය සභාවට එම ප්‍රදේශයට ගිහින් පාරක් හදන්න අයිතියක් තිබුණේ නැහැ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

පාසල ගැන මම කියන්නේ, ගරු රාජ්‍ය ඇමතිතුමියනි.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ඇත්තටම රජයක් විධියට අපිට ඒ සංවර්ධන කටයුතු කරලා, එම ජනතාවට අවශ්‍ය පහසුකම් සපයන්න පුළුවන් බව මටත් තේරෙනවා.

අපේ අමාත්‍යාංශයෙන් කළ හැකි උදව් සියල්ලම අපි කරන්නම්. පාසලක් හදනවා නම්, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් තමයි ඒ කටයුතු කරන්න වෙන්නේ. රජයක් හැටියට අපට ඒ කටයුතු ඉෂ්ට කරන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ දවස්වල අපේ සමහර ප්‍රාදේශීය සභාවල -හැම තැනම නොවෙයි.- මතු වෙලා තිබෙන ප්‍රශ්නයක් ගැනයි මම මේ කියන්නේ. මධ්‍යම රජය වෙන් කරන මුදල් ප්‍රතිපාදනවලින් සිදුකරන ඒ මාර්ග සංවර්ධන ව්‍යාපෘති හෝ ප්‍රාදේශීය සභාවට අයිතියි කියන වෙනත් සංවර්ධන ව්‍යාපෘති කරන්න මේ ආයතන පොඩි මැදිහත්වීමක් වෙලා -තමන් ක්‍රියාකාරී ආයතනය නොවී- අද යම් යම් ගැටලු මතුවෙලා තිබෙනවා. ඔබතුමියත් ඒ ගැන දන්නවා ඇති. මේක මේ රටේ පුරවැසියන්ට ලැබෙන අවස්ථාවක්. එහෙම නැතිව, මේක දේශපාලනික වුවමනාවක් නොවෙයි. මේ ආයතන දෙක අතර ගැටලු ඇතිවීම රටක් විධියට අපට සුබ නැහැ කියායි මම හිතන්නේ. ඔබතුමිය මේ ගැන පැහැදිලි ප්‍රකාශයක් කරයි කියා මා විශ්වාස කරනවා. මේ ගැටලු විසඳීම සඳහා පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කුමක්ද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමනි, මේ වනවිට අමාත්‍යාංශය ඒ සම්බන්ධව පියවරක් අරගෙන තිබෙනවා. පළාත් පාලන කොමසාරිස්වරයා සමඟ සංවර්ධන කටයුතු කරන්න පළාත් පාලන ආයතනය ඉඩ දෙන්නේ නැත්නම්, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න කැබිනට් මණ්ඩලය තීරණයක් අරගෙන තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -448/'18- (2), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය : උපදේශකයන්

**மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சு: ஆலோசகர்கள்**
MINISTRY OF PROVINCIAL COUNCILS, LOCAL GOVERNMENT AND SPORTS: ADVISORS

504/'18

**9. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යහපාලන රජය බලයට පත්වීමෙන් පසු, මේ දක්වා පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයට බඳවා ගෙන ඇති උපදේශකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම උපදේශකයන්ගේ නම්, ලිපිනයන් හා අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) එම උපදේශකයන්ට ගෙවනු ලබන වැටුප්, දීමනා සහ වරප්‍රසාද කවරේද;

(iv) ඉහත (iii) හි සඳහන් කාරණය සඳහා මේ දක්වා වැය කර ඇති මුළු මුදල කොපමණද;

(v) පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් සේවා ලබා ගන්නා පොදු ජනතාවට මෙම උපදේශකයන් මඟින් අත්වන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத் துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நல்லாட்சி அரசாங்கம் அதிகாரத்திற்கு வந்த பின்னர், இதுவரை மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சுக்கு ஆட்சேர்ப்பு செய்யப்பட்ட ஆலோசகர்களின் எண்ணிக்கையையும்;

(ii) மேற்படி ஆலோசகர்களின் பெயர், முகவரிகள் மற்றும் கல்வித் தகைமைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஆலோசகர்களுக்குச் செலுத்தப் படுகின்ற சம்பளங்கள், படிகள் மற்றும் சிறப்புரிமைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி (iii) இல் குறிப்பிடப்பட்டுள்ள விடயத் திற்காக இதுவரை செலவிட்டுள்ள மொத்தப் பணத்தொகை யாது என்பதையும்;

(v) மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சிலிருந்து சேவைகளைப் பெற்றுக் கொள்ளும் பொதுமக்களுக்கு இந்த ஆலோசகர் களின்மூலம் கிடைக்கும் நன்மைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House-

(i) the number of advisors that have been hitherto recruited to the Ministry of Provincial Councils, Local Government and Sports after the good governance government came into power;

(ii) the names, addresses and educational qualifications of the aforesaid advisors;

(iii) the salaries, allowances and privileges provided to the aforesaid advisors;

(iv) the total amount of money that has been so far spent for the purpose mentioned in (iii) above; and

(v) the benefit of these advisors for the general public who obtain the services from the Ministry of Provincial Councils, Local Government and Sports?

(b) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) එක් අයෙකි.

(ii) නම්, ලිපිනයන් සහ අධ්‍යාපන සුදුසුකම් පහත දක්වා ඇත.

| නම | පත්වීමේ දිනය | ලිපිනය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| වී.කේ. නානායක්කාර | 2016.01.13 - 2016.10.31 | අංක 09 ටෙම්ප්ලර්ස් පාර ගල්කිස්ස | **රාජ්‍ය සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය Graduate School of Public and International Affairs, University of Pittsburg,** ඇමෙරිකා එක්සත් ජනපදය - 1980<br>**ජනගහන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා** ජනගහන පුහුණු සහ පර්යේෂණ ඒකකය කොළඹ විශ්වවිද්‍යාලය 1977<br>**භූගෝල විද්‍යා විශේෂවේදී උපාධිය** ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණිය - 1964 |
| පී. කොඩිතුවක්කු | 2016.11.01 - 2018.10.31 | අංක 444/18 සී දෙවෙනි පටුමග විහාර මාවත කොතලාවල කඩුවෙල | **වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය** පිලිපීන විශ්වවිද්‍යාලය ලොස් බැඤ්ඩ්ස් - 1989<br>**රාජ්‍ය කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව** ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - 1989<br>**ශාස්ත්‍රවේදී කලා උපාධිය,** ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණිය - 1972 |

ඒ අනුව, දැනට ඉන්නේ පී. කොඩිතුවක්කු කියන උපදේශකවරයායි.

(iii) වැටුප් - මාසිකව රුපියල් 100,000/-යි.
දීමනා - මාසිකව රුපියල් 8,000/-යි.
වරප්‍රසාද - අමාත්‍ය මණ්ඩල තීරණ අංක 16/0302/744/005, 16/2262/744/025 හා 17/2392/744/025 අනුව වරප්‍රසාද හිමිවේ.

(iv) රුපියල් 2,866,000/-යි.

(v) පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ප්‍රතිපත්ති සම්පාදනයේදී සහාය වීම. අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල ප්‍රගතිය ඇගයීම් කටයුතුවලදී උපදෙස් ලබා දීම හා සහාය වීම.

පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයේ පරිපාලන කටයුතුවලදී දීර්ඝ කාලීන අත් දැකීම් ඇති හිටපු අමාත්‍යාංශ ලේකම්වරයකු, ප්‍රධාන ලේකම්වරයකු උපදේශක වශයෙන් සේවය කිරීම නිසා ගරු ඇමතිතුමාගේ මහජන සේවා ඉටු කිරීමේදී හා වෘත්තීය සමීනි නියෝජිතයන්ගේ ගැටලු සාකච්ඡාවලදී ඔහුගෙන් ඵලදායී සේවාවක් ඉටු වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමියනි. විශේෂයෙන්ම ගරු ඇමතිතුමාට මේ පහසුකම ලබා දෙන්නේ අමාත්‍යාංශයේ කාර්ය භාරය සහ එතුමාගේ ඉදිරි වැඩ පිළිවෙළ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ හදා ගන්නයි. ඔහුගේ තනතුර සහ දැනුම අනුව ඔහුට මේ සඳහා විශාල සහයෝගයක් දෙන්න පුළුවන් බව අපි දන්නවා. ඒ සම්බන්ධයෙන් අපට විවාදයක් නැහැ. විශේෂයෙන්ම ක්‍රීඩා අමාත්‍යාංශයට මෙවන් වූ සහයෝගයක් ලැබිලාත්; මෙවන් උගත් කණ්ඩායම් සම්බන්ධ කර ගෙනත් අද ක්‍රිකට් ක්‍රීඩාව විශාල පසුබෑමකට ලක් වෙලා තිබෙනවා. පසුගිය දවස්වල ක්‍රීඩකයෝ හැඩූ කඳුළින් ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව කනගාටුව පළ කළ ආකාරය අපි දැක්කා. අමාත්‍යාංශය මෙවන් වූ වියදමක් දරා සමහර කණ්ඩායම් බඳවා ගත්තද, ජාත්‍යන්තරයට අපේ රට ගෙන ගිය ක්‍රිකට් ක්‍රීඩාව ඉක්මනින් නැතිවන තත්ත්වයක් දැන් තිබෙන්නේ. මීට හේතුව, කාගේ බලපෑමක්ද, කුමන මැදිහත්වීමක්ද යන්න මේ පාර්ලිමේන්තුවට ඉතා වගකීමෙන් පහදන්න; හෙළි කරන්න ඔබතුමියට පුළුවන්ද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මේ සඳහා කාගේවත් මැදිහත් වීමක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම මෙම අමාත්‍යාංශයට අපි පත් වුණාට පස්සේ හැම තරගයක්ම දිනුවා. අවසානයට තිබුණු ක්‍රිකට් තරගය තමයි පරාද වුණේ.

අපේ ක්‍රිකට් කණ්ඩායම සමඟ ගරු ඇමතිතුමාත්, මමත් එයට සහභාගි වුණා. ඇත්තටම ඒ අය මානසිකවත් වැටිලායි සිටියේ. ඒ අයගේ මනස ශක්තිමත් කරන්න ඒ අය සමඟ කථා බහ කරලා, ඊළඟ තරගවලට සූදානම් වෙන්න අවශ්‍ය උපදෙස් සහ ශක්තිය ලබා දෙන්නත් අපි කටයුතු කළා. කාගේ හෝ මැදිහත් වීමක් ගැන මොකක්ද මේ කියන්නේ කියා මා දන්නේ නැහැ. එහෙම මැදිහත් වීමක් වෙලා නැහැ. ඒ වෙලාවේ ක්‍රීඩකයින්ට සෙල්ලම් කරන්න බැරිවෙලා තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මා එක අතුරු ප්‍රශ්නයයි ඇසුවේ. දෙවන අතුරු ප්‍රශ්නය හේෂා විතානගේ මන්ත්‍රීතුමා අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ක්‍රිකට් ගැනද?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය අහන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මෙහිදී මතු වුණු කාරණාවක් නිසායි මා මේ ප්‍රශ්නය අහන්නේ. ඔබතුමිය කිව්වා, "අපි එක තරගයයි පරාජය වුණේ." කියා. එය වැරැදියි. අවසානයට මුහුණ දීපු ආසියානු කුසලාන තරග දෙකම අපි පරාජයට පත් වුණා. 1996දී ලෝක කුසලානය ලබා ගෙන ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජනප්‍රියත්වයට පත්වුණු රටක් විධියට ශ්‍රී ලංකාව ගැන ලෝකය දැන ගත්තා. අපි පසු ගිය සතියේ පරාජය වුණු එක සැහැල්ලුවට හිතන්න බැහැ, ගරු රාජ්‍ය ඇමතිතුමියනි. ඇල්ෂනිස්තානයටයි අපි පරාජය වුණේ. ඔවුන් තවම එක් දින ක්‍රිකට් තරගවලටවත් සුදුසුකම් ලබා ගෙන නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා යෝජනා කරන්නේ මොකක්ද?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මා ඔබතුමියට කියන්නේ, ශ්‍රී ලංකාවේ ක්‍රිකට් කැත විධියට මේ තැනට වැටීමට ක්‍රිකට් ක්‍රීඩකයින්ට වඩා ක්‍රිකට් පරිපාලනයත් වග කියන්න ඕනෑ. ඔබතුමිය කිව්වා, ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ මානසිකත්වය වැටිලා තිබුණාය කියා. ඔවුන්ගේ මානසිකත්වය වැටෙන්න හේතුවත් මේ පරිපාලනයයි කියා මා විශ්වාස කරනවා. අමාත්‍යාංශය විධියට මේ වෙනුවෙන් ගන්නා වූ ක්‍රියා මාර්ගය මොකක්ද, ක්‍රිකට් ක්‍රීඩාව මුදලාලිලා දෙතුන් දෙනෙකු අතට යන්න ඉදිරියටත් ඉඩ දෙනවාද කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

නීතියත් සමඟ සම්බන්ධ වුණු කාරණා රාශියක් මෙතැන තිබෙන්නේ. ඡන්ද පවත්වා, ඒ අනුව තමයි ක්‍රිකට් බලධාරින් පත්වෙන්නේ. ඡන්දයකින් බලධාරින් පත් වුණාම ඒ අය තමයි ඉතින් බලධාරින් බවට පත් වන්නේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ඡන්දය නොපවත්වන්න හේතුව මොකක්ද කියලා මම දැනගන්න කැමතියි.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ඡන්දයක් පැවැත්වීම කියන එක ඇත්තටම ඇමතිතුමාත්, ඒ පාලක මණ්ඩලයත් තීරණය කරන්න ඕනෑ කාරණයක්. ඒ සම්බන්ධයෙන් අපි ඉදිරියේදී කටයුතු කරන්නම්.

## හම්බන්තොට වරාය භූමියේ තක්සේරුව: විස්තර

## அம்பாந்தோட்டைத் துறைமுக வளவின் மதிப்பீடு: விபரம்

## ASSESSMENT OF HAMBANTOTA PORT PREMISES: DETAILS

543/'18

**10. ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010, 2012 හා 2016 වර්ෂවලදී හම්බන්තොට වරාය භූමියේ කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, එම අවස්ථාවලදී හෙක්ටෙයාරයක් සඳහා රජයේ වාර්ෂික තක්සේරු බදු මුදල කොපමණද;

(iii) 2010 හා 2012 වර්ෂවලදී එය හෙක්ටෙයාරයක් සඳහා ඇ.ඩොලර් 50,000ක් හා 2016 දී හෙක්ටෙයාරයක් සඳහා ඇ.ඩොලර් 56,000 ලෙස තක්සේරු කර තිබේද;

(iv) වර්තමානයේ එම තක්සේරු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) හම්බන්තොට වරායේ මෙම ඉඩම් චීන සමාගමට ලබා දීමේදී හෙක්ටෙයාරයක් සඳහා තක්සේරු කළ මිල කොපමණද;

(ii) වර්ෂ ගණනාවක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) සමඟ කටයුතු කර නිවැරදි ටෙන්ඩර් පටිපාටිය යටතේ අනුමතිය ලබා ගත් ආයෝජක සමාගම්වලට සුදුසු වෙනත් ස්ථානයක් ලබා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010, 2012 மற்றும் 2016ஆம் ஆண்டுகளில் அம்பாந்தோட்டை துறைமுக வளவில் கைத் தொழில்களுக்கான கேள்விப் பத்திரங்கள் கோரப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனின், அத்தகைய சந்தர்ப்பங்களில் ஹெக்டயர் ஒன்றுக்கான அரசாங்கத்தின் வருடாந்த மதிப்பீட்டுக் குத்தகைத் தொகை யாது என்பதையும்;

(iii) 2010 மற்றும் 2012ஆம் ஆண்டில் அத்தொகை யானது ஹெக்டயர் ஒன்றுக்கு அமெரிக்க டொலர் 50,000 ஆகவும், 2016ஆம் ஆண்டில் ஹெக்டயர் ஒன்றுக்கு அமெரிக்க டொலர் 56,000 ஆகவும் மதிப்பீடு செய்யப்பட்டிருந்ததா என்பதையும்;

(iv) தற்போது அந்த மதிப்பீட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) அம்பாந்தோட்டை துறைமுகத்தின் இந்தக் காணிகளைச் சீனக் கம்பனிக்கு வழங்கியபோது ஹெக்டயர் ஒன்றுக்கென மதிப்பீடு செய்யப்பட்ட விலை யாது என்பதையும்;

(ii) பல ஆண்டுகளாக இலங்கைத் துறைமுக அதிகார சபையுடன் (SLPA) இணைந்து பணியாற்றி, சரியான கேள்விப்பத்திர நடைமுறையின்கீழ் அங்கீகாரம்பெற்ற முதலீட்டுக் கம்பனிகளுக் குப் பொருத்தமான வேறு இடமொன்று வழங்கப் படுமா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Shipping:

(a) Will he inform this House-

(i) whether tenders have been called for industries in the premises of the Hambantota Port in the years 2010, 2012 and 2016;

(ii) if so, the annual assessment tax of the Government for a hectare of land as calculated during the above occasions ;

(iii) whether it has been assessed as US Dollars 50,000 for a hectare in the years 2010 and 2012 and as US Dollars 56,000 for a hectare in the year 2016; and

(iv) the above assessment as of today?

(b) Will he also inform this House-

(i) the amount assessed for a hectare when these lands of the Hambantota Port were handed over to the Chinese company; and

(ii) whether another appropriate location would be offered for the investment companies that obtained approval following the proper tender procedure, having dealt with the Sri Lanka Ports Authority for many years?

(c) If not, why?

**ගරු මහින්ද සමරසිංහ මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Ports and Shipping)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2010, 2012 හා 2016 යන වර්ෂවල හම්බන්තොට වරාය වෙළෙඳ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා යෝජනා කැඳවීම් සිදු කර ඇත.

(ii) එම අවස්ථාවල ඉඩම් බදු දීම සම්බන්ධයෙන් වාර්ෂික පදනම මත කිසිදු තක්සේරු වාර්තාවක් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන නොමැත. කෙසේ වෙතත් වෙළඳ ව්‍යාපාර ආරම්භ කිරීමට අදාළව යෝජනා කැඳවූ ලේඛනයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නිර්ණය කරන ලද (2010 සහ 2012 වර්ෂවල හෙක්ටෙයාරයක් සඳහා වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් 50,000ක් සහ 2016 වර්ෂයේදී හෙක්ටෙයාරයක් සඳහා වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් 56,000ක්) හෙක්ටෙයාරයක් සඳහා අවම වාර්ෂික බදු මුදල් ප්‍රමාණයක් පිළිබඳව සඳහන් කොට ඇති අතර, එම බදු මුදල් ප්‍රමාණය වෙනස් වීමට අදාළව බදු මුදල් ගණනය කිරීමේ සමීකරණයක් ද ඇතුළත් කොට ඇත.

(iii) ඉහත (අ) (ii) පරිදි වේ.

(iv) හම්බන්තොට වරාය සංවර්ධනය කිරීමට අදාළව ශ්‍රී ලංකා රජය සහ මහජන චීන ආණ්ඩුව අතර 2016.04.07 දින අත්සන් කොට ඇති අවබෝධතා ගිවිසුම පදනම් කරගෙන 2016.11.06 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුකූලව 2016.12.08 වන දින හම්බන්තොට වරාය සංවර්ධනය කිරීමට අදාළව රාමුගත ගිවිසුමක් - Framework Agreement - අත්සන් කොට ඇති අතර, එකී ගිවිසුමේ අදාළ ව්‍යාපෘතියේ පරිවර්තිත අගය ලෙස ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4ක මුදලක් සඳහන් වේ. පසුව 2017.07.25 සහ 2017.08.01 දිනවල පැවැත්වූ කැබිනට් මණ්ඩල තීරණවලට අනුකූලව හම්බන්තොට වරාය සංවර්ධනය කිරීම, වාණිජකරණය, කළමනාකරණය සහ මෙහෙයවීම යන අරමුණින් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව මොඩලයකට අනුගත වෙමින් පාර්ශ්වකරුවන් අතර 2017.07.29 වන දින අනුග්‍රාහක ගිවිසුමක් - Concession Agreement - අත්සන් කොට ඇත. එකී අනුග්‍රාහක ගිවිසුමේ කොන්දේසින් ප්‍රකාරව හම්බන්තොට වරාය කළමනාකරණය කිරීම සඳහා පෞද්ගලික සමාගම් දෙකක් පිහිටුවිය යුතු අතර, එම සමාගම් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4කින් ප්‍රාග්ධනය කළ යුතු බව සඳහන් වේ.

(ආ) (i) ඉහත (අ) (iv) හි සඳහන් කරුණු නැවත අවධාරණය කර සිටින අතර, හම්බන්තොට වරායේ ඉඩම් චීන සමාගමට ලබා දී ඇත යන කරුණ ප්‍රතික්ෂේප කර සිටිමි. අදාළ ඉඩම් හම්බන්තොට වරායේ කටයුතු කළමනාකරණය සහ මෙහෙයවීම සඳහා සමාගම් පනත යටතේ ලංකාවේ පිහිටුවා ඇති සී/ස හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් ගෲප් (පුද්ගලික) සමාගම සහ සී/ස හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් සර්විසස් (පුද්ගලික) සමාගම වෙත බදු පදනම මත ලබා දී ඇත. ඉහත (අ) (iv) හි සඳහන් පරිවර්තිත අගය මත හම්බන්තොට වරාය සඳහා වූ ගිවිසුම අත්සන් කිරීම.

(ii) ඉහත (අ) (i) හි සඳහන් කරුණු නැවත අවධාරණය කර සිටින අතර, එකී වෙළඳ ව්‍යාපාර ආරම්භ කොට ඇති සමාගම්වලට සුදුසු වෙනත් ස්ථානයක් ලබා දීම සම්බන්ධයෙන් කරුණු පැන නොනඟී. හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාළව පාර්ශ්වකරුවන් අතර අත්සන් කොට ඇති ගිවිසුම් ප්‍රකාරව එකී වෙළඳ ව්‍යාපාරිකයන් සමඟ අත්සන් කොට ඇති ගිවිසුම්වල සඳහන් සම්පූර්ණ කාල සීමාව නිම වන තෙක් හා එකී ගිවිසුම්වල සඳහන් කොන්දේසිවලට අනුකූලව එම ස්ථානයේ ඔවුන්ට අදාළ ව්‍යාපාරයන් පවත්වාගෙන යෑමට ඉඩ ප්‍රස්තා සලස්වා ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු අමාත්‍යතුමනි, පිළිතුරට ස්තුතියි. අපට පැහැදිලි කරවාගන්න ඕනෑ පළමුවන කරුණ මෙයයි. හම්බන්තොට වරාය සම්බන්ධයෙන් චීන සමාගම සමඟ ගිවිසුම් ඇති කර ගන්නට පෙර යම් යම් සමාගම් කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ඉල්ලුම් කළ අවස්ථාවේ හම්බන්තොට වරායට අයිති භූමිය තක්සේරු කිරීම් කළේ නැද්ද?

ඒ තක්සේරු කිරීමට අනුව; ඔය කියන ඩොලර් 56,000, ඩොලර් 50,000 තක්සේරු අනුව වරාය අධිකාරිය ඒ අවස්ථාවේදී කටයුතු කිරීමට තීන්දු කරගෙන සිටියාද? ඒක මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

ඔව්. මම ඒකට පිළිතුරු සැපයුවා. මම නැවත වරක් කියන්නම්. 2010, 2012 වර්ෂවල හෙක්ටෙයාරයක් සඳහා ඩොලර් 50,000ක තක්සේරුවක් තිබුණා. 2016 වර්ෂයේ ඩොලර් 56,000ක තක්සේරුවක් කළා. මූලිකව ස්ථාන දෙකක් තිබෙනවා. ඒකත් දැනගන්න ඕනෑද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

චීන සමාගම සමඟ මුලින් ඇති කර ගත් ගිවිසුමත්, ඉන් පසුව ඇති කර ගනු ලැබූ ගිවිසුමත් ඇති කර ගැනීමෙන් පසු මේ තක්සේරු වටිනාකම් අනුව ඒ භූමිය පිළිබඳව ගණනය කිරීමක් කරනු ලැබුවාද?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

නැහැ. එහෙම දෙයක් කෙරිලා නැහැ. මම ඒක තවදුරටත් පැහැදිලි කර දෙන්න ඕනෑ. ඔය ඩොලර් 50,000යි, ඩොලර් 56,000යි කියන තක්සේරුව කර තිබෙන්නේ සුවිශේෂ භූමි දෙකක් කොම්පැනි දෙකකට භාර දෙන්න. එකක් ලාෆ් ගෑස් සමාගම. අනෙක ලිත්‍රෝ ගෑස් සමාගම. පර්යන්තයේම කොටසක් තමයි දීලා තිබෙන්නේ. වරායේ පර්යන්තය ඇතුළේම. ඒ පර්යන්තය ඇතුළේ තිබෙන භූමි ප්‍රමාණය සන්සන්දනය කරන්න බැහැ, හෙක්ටෙයාර් 1,100ක භූමි ප්‍රමාණයක් එක්ක. මොකද, ඇත්ත වශයෙන්ම එහා කොනේ තිබෙන භූමියේ වටිනාකම අඩු වෙනවා නේ. පර්යන්තය ඇතුළේ තිබෙන භූමියේ වටිනාකම වැඩියි. මම කලින් කිව්වා වාගේ චීන සමූහාණ්ඩුව සමඟ සාකච්ඡා කරලා -දෙපාර්ශ්වය සමඟ සාකච්ඡා කරලා - ආපු එකඟතාව මත Framework Agreement එකක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, ඩොලර් බිලියන 1.4කට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ගත්තා. ඒ අනුව තමයි කටයුතු කළේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, තව පැහැදිලි කර ගැනීමක් කර ගන්න ඕනෑ. චීන සමාගම සමඟ මේ ගිවිසුම ඇති කර ගත් වෙලාවේ ඉඩම්වල ප්‍රමාණය අනුව භූමිය ගණනය කිරීමේ තක්සේරුවක් වෙන වෙනම කෙරුණේ නැතිව මේ සඳහා පළල්ම වටිනාකම කැබිනට් මණ්ඩලය තීන්දු කරලා මේ ගණනට නියම වුණා.

ඉන් පසුව, කලින් දුන්නා වූ සමාගම්වලට ඒ භූමි ප්‍රමාණය දැන් භාවිත කළ නොහැකි නම්, ඔවුන්ට විකල්ප තැනක් දිය යුතුයි නේ? ඒ සඳහා ආසන්නයෙන් විකල්ප තැනක් ලබා දීමට ඔබතුමා කටයුතු කරනවාද?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
එහෙම ප්‍රශ්නයක් පැන නඟින්නේ නැහැ. මොකද, ඒ ගොල්ලෝ අත්සන් කරපු ගිවිසුම අදටත් වලංගුයි. ඒ ගිවිසුමේ scope එක වෙනස් කළොත් පමණයි නැවත වරක් ශ්‍රී ලංකාවේ ලියා පදිංචි කර තිබෙන සමාගම් දෙකත් එක්ක සාකච්ඡා කරන්න වෙන්නේ. හැබැයි, කලින් අත්සන් කළ ගිවිසුම නීත්‍යානුකූලයි. ඒක එහෙමම ක්‍රියාත්මක වනවා. ඒක අවලංගු වෙන්නේ නැහැ. නැවත සාකච්ඡා කරන්න වෙන්නේ scope එක වෙනස් වුණොත් විතරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 11-568/'18-(1), ගරු අශෝක ප්‍රියන්ත මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 12-587/'18-(1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 13-970/'18-(1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 14-995/'18-(1),ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 15-1119/'18-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා. නමුත්, උත්තර දීමට ඇමතිවරයෙක් නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
උත්තර දෙයි. ගරු සභානායකතුමා ඉන්නවා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Industry and Commerce, I ask for two weeks' time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## ලංකා ධීවර සංස්ථාවේ අළෙවිසැල් : මහනුවර දිස්ත්‍රික්කය

## இலங்கைக் கடற்றொழில் கூட்டுத்தாபனத்தின் விற்பனை நிலையங்கள்: கண்டி மாவட்டம்

## SALES OUTLETS OF CEYLON FISHERIES CORPORATION: KANDY DISTRICT

33/'18

**1. ගරු කේ.කේ. පියදාස මහතා (ගරු ආනන්ද අලුත්ගමගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு கே.கே. பியதாஸ - மாண்புமிகு ஆனந்த அலுத்கமகே சார்பாக)
(The Hon. K.K. Piyadasa on behalf of the Hon. Ananda Aluthgamage)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ලංකා ධීවර සංස්ථාවේ අළෙවි සැල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට අද දක්වා එම එක් එක් අළෙවි සැලෙන් ඉපැයූ ආදායම හා නඩත්තු වියදම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මහනුවර දිස්ත්‍රික්කය තුළ ලංකා ධීවර සංස්ථාවේ ශාඛා ජාලය තවදුරටත් වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தில் உள்ள இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனத்தின் விற்பனை நிலையங்களின் எண்ணிக்கை எவ்வளவு;

(ii) அவை அமைந்துள்ள இடங்களின் முகவரிகள் யாவை;

(iii) 2010ஆம் ஆண்டு தொடக்கம் இன்று வரை அந்த ஒவ்வொரு விற்பனை நிலையங்களி லிருந்தும் ஈட்டிய வருமானம் மற்றும் பராமரிப்பு செலவுகள் வெவ்வேறாக யாவை;

(iv) கண்டி மாவட்டத்தில் இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனத்தின் கிளை வலையமைப்பினை மேலும் விருத்திசெய்வதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாது;

என்பதை அவர் இச் சபைக்கு அறிவிப்பாரா ?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs:

(a) Will he inform this House-

(i) the number of sales outlets belonging to the Ceylon Fisheries Corporation located in the District of Kandy;

(ii) the addresses of the said sales outlets;

(iii) separately, of the income earned and the cost of maintenance of each of the aforesaid sales outlets; and

(iv) the steps that would be taken by the Ministry to expand the branch network of the Ceylon Fisheries Corporation in the District of Kandy?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs, I **table*** the Answer.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) 04 sales points.

(ii)

| Sales point | Address |
|---|---|
| Menikhinna sales point | No. 14/1, Mediwala Road, Menikhinna |
| Gelioya Sales Point | Central Market Complex of Udunuwara Pradeshiya Sabha, Gelioya |
| Kandy - Sales Point No. 02 | Central Market Complex, Kandy |
| Kandy - Sales point No. 03 | Central Market Complex, Kandy |

(iii) Details from 2010 to 2015 could not be found and therefore, details from 2016 to 2018 are given in the Annex.

**ඇමුණුම 1**

2016 වසරේ සිට 2018 වසර දක්වා වෙළඳසැල්වල ආදායම/ වියදම් විස්තර

| වෙළඳසැල | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|
| | ආදායම (රු.) | වියදම් (රු.) | ආදායම (රු.) | වියදම් (රු.) | ආදායම (රු.) | වියදම් (රු.) |
| මැණික්හින්න වෙළඳසැල | | | 5,401,957.37 (මිලියන 5.4) | 592,200.42 (මිලියන 0.6) | 2,787,803.65 (මිලියන 2.8) | 499,150.00 (මිලියන 0.5) |
| ගෙලිඔය වෙළඳසැල | 4,776,472.60 (මිලියන 4.8) | 1,110,750.07 (මිලියන 1.1) | 4,576,150.31 (මිලියන 4.6) | 1,258,230.57 (මිලියන 1.3) | 1,485,513.89 (මිලියන 1.5) | 396,533.97 (මිලියන 0.4) |
| මහනුවර - අංක 02 වෙළඳසැල | 5,707,974.38 (මිලියන 5.7) | 654,862.70 (මිලියන 0.7) | 18,827,430.12 (මිලියන 18.8) | 1,301,835.79 (මිලියන 1.3) | 6,470,791.70 (මිලියන 6.5) | 499,527.83 (මිලියන 0.5) |
| මහනුවර - අංක 03 වෙළඳසැල | 7,563,695.90 (මිලියන 7.6) | 6,143,922.85 (මිලියන 6.1) | 4,152,438.85 (මිලියන 4.2) | 150,504.85 (මිලියන 0.2) | 3,972,608.82 (මිලියන 4.0) | 2,994,037.96 (මිලියන 3.0) |
| එකතුව | 18,048,142.88 (මිලියන 18.1) | 7,909,535.62 (මිලියන 7.9) | 32,957,976.65 (මිලියන 33.1) | 3,302,771.63 (මිලියන 3.3) | 14,716,718.06 (මිලියන 14.7) | 4,339,249.76 (මිලියන 4.3) |

(iv) A mega sales point has been formed by the combination of all the sales points operative in the Public Market Complex, Kandy and currently 02 main sales outlets are operating successfully in the said mega sales point.

Measures have been initiated to open a seafood restaurant in line with the fully-equipped mega sales point in the Public Market Complex and it is scheduled to be opened for the public before the end of this year.

It has been planned that modified sales points be established this year in Peradeniya, Pilimathalawa and Digana having conducted a field check and subsequently giving a wide publicity.

(b) Does not arise.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4-179/'18-(1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Justice and Prison Reforms, I ask for three weeks' time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5-213/'18-(1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I ask for three months' time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8-448/'18-(2), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I ask for six months' time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නියඟයෙන් පීඩාවට පත් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා බවුසර් ලබාදීම : පියවර
## வறட்சியால் பாதிக்கப்பட்ட பிரதேச செயலாளர் பிரிவுகளுக்கு பவுசர்கள் வழங்குதல்: நடவடிக்கைகள்
## PROVISION OF BOWSERS TO DS DIVISIONS AFFECTED BY DROUGHT: MEASURES TAKEN

568/'18

**11. ගරු කේ.කේ. පියදාස මහතා (ගරු අශෝක ප්‍රියන්ත මහතා වෙනුවට)**
(மாண்புமிகு கே.கே. பியதாஸ - மாண்புமிகு அசோக்க பிரியந்த சார்பாக)
(The Hon. K.K. Piyadasa on behalf of the Hon. Ashoka Priyantha)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නියඟයෙන් පීඩාවට පත් වූ ප්‍රදේශ සඳහා බවුසර් ලබාදීමේ වැඩසටහනක් දියත්කර තිබේද;

(ii) එසේ නම්, මේ දක්වා එසේ බවුසර් ලබාදී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iii) දැඩි නියඟයකට ලක් වූ පුත්තලම දිස්ත්‍රික්කයට ලබා දුන් බවුසර් සංඛ්‍යාව හා ඒවා ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සෙසු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා බවුසර් ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உள்நாட்டலுவல்கள் அமைச்சினால் வறட்சியால் பாதிக்கப்பட்ட பிரதேசங்களுக்கு பவுசர்களை வழங்கும் நிகழ்ச்சித்திட்டம் ஒன்று முன்னெடுக் கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனின், இதுவரை அவ்வாறு பவுசர்கள் வழங்கப்பட்டுள்ள பிரதேச செயலாளர் பிரிவுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) கடும் வறட்சியால் பாதிக்கப்பட்ட புத்தளம் மாவட்டத்திற்கு வழங்கப்பட்ட பவுசர்களின் எண்ணிக்கை மற்றும் அவை வழங்கப்பட்ட பிரதேச செயலாளர் பிரிவுகள் தனித்தனியாக யாவை என்பதையும்;

(iv) ஏனைய பிரதேச செயலாளர் பிரிவுகளுக்கு பவுசர்களை வழங்க அமைச்சு எடுக்கும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House-
(i) whether the Ministry of Home Affairs has launched a programme to provide bowsers to drought-ridden areas;
(ii) if so, of the number of Divisional Secretaries' Divisions for which aforesaid bowsers have been provided;
(iii) the number of bowser trucks provided for the Puttalam District, which was severely affected by the drought and separately, of the Divisional Secretaries' Divisions for which aforesaid bowsers have been provided; and
(iv) of the measures that the Ministry will take in order to provide bowsers for other Divisional Secretaries' Divisions?

(b) If not why ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) මේ වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 208ක් සඳහා බවුසර් ලබා දී ඇත. (ඇමුණුම** මඟින් ඉදිරිපත් කර ඇත.)

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

(iii) පුත්තලම දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දුන් ට්‍රැක්ටර් බවුසර් 39ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16ක් වෙත ලබා දී ඇත.

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | බවුසර් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මහකුඹුක්කඩවල | 02 |
| 02 | කරුවලගස්වැව | 03 |
| 03 | පල්ලම | 03 |
| 04 | නවගත්තේගම | 03 |
| 05 | කල්පිටිය | 01 |
| 06 | වෙන්නප්පුව | 03 |
| 07 | මුන්දලම | 02 |
| 08 | වනාතවිල්ලුව | 02 |
| 09 | දංකොටුව | 06 |
| 10 | හලාවත | 02 |
| 11 | ආණමඩුව | 02 |
| 12 | ආරච්චිකට්ටුව | 01 |
| 13 | පුත්තලම | 02 |
| 14 | නාත්තන්ඩිය | 02 |
| 15 | මාදම්පේ | 02 |
| 16 | මහවැව | 03 |
| | එකතුව | 39 |

(iv) ඔව්.

දැනටමත් ලබා දී ඇති ජල බවුසර් ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී පළාත් පාලන ආයතනවල ජල බවුසර් යොදා ගැනීමට හැකි වේ. අවශ්‍යතාවය පැන නැඟෙන පරිදි කුලී පදනම මත හෝ ජල බවුසර් යොදා ගැනීමටද අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12-587/'18-(1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
ගරු කථානායකතුමනි, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කලාවැව පානීය ජල ව්‍යාපෘතිය : දීර්ඝ කිරීම
## கலாவெவ குடிநீர் கருத்திட்டம்: விஸ்தரித்தல்
## KALA WEWA DRINKING WATER PROJECT: EXTENSION

970/'18

**13. ගරු කේ. කේ. පියදාස මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கே.கே. பியதாஸ - மாண்புமிகு இஷாக் றஹுமான் சார்பாக)
(The Hon. K. K. Piyadasa on behalf of the Hon. Ishak Rahuman)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කලාවැව රෝහල මේ වනවිට උග්‍ර පානීය ජල ගැටලුවකට මුහුණ පා ඇති බවත්;

(ii) දැනට ක්‍රියාත්මක කලාවැව පානීය ජල ව්‍යාපෘතිය, කලාවැව රෝහලට මීටර් 500ක් තිබියදී නතර වී ඇති බවත්;

(iii) මෙම මීටර් 500 දීර්ඝ කිරීමෙන් කලාවැව රෝහලට මෙන්ම, රෝහලෙන් එපිට ඇති බළලුවැව, දික්ඇදියාය, කරවිලගල සහ නෑගම යන ගම්මානවල ජීවත්වන ජනතාවටත් පානීය ජලය සැපයිය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මෙම ජල ව්‍යාපෘතිය දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) இப்பலோகம பிரதேசச் செயலாளர் பிரிவில் அமைந்துள்ள கலாவெவ வைத்தியசாலை தற்போது கடும் குடிநீர்ப் பிரச்சினையை எதிர் கொண்டுள்ளது என்பதையும்;

(ii) தற்போது செயற்படும் கலாவெவ குடிநீர் கருத்திட்டம் கலாவெவ வைத்தியசாலைக்கு 500 மீற்றர் தொலைவில் நிறுத்தப்பட்டுள்ளது என்ப தையும்;

(iii) இந்த 500 மீற்றரை நீடிப்பதன் மூலம் கலாவெவ வைத்தியசாலைக்கும் அதற்கு அப்பாலுள்ள பலலுவெவ, திக்அந்தியாய, கரவிலகல மற்றும் நேகம ஆகிய கிராமங்களில் வாழ்கின்ற மக்களுக்கு குடி நீர் வழங்க முடியும் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், இந்நீர்க் கருத்திட்டத்தை விஸ்தரிப்பதற் கான நடவடிக்கைகளை மேற்கொள்ளும் திகதி யாது என்பதை இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of City Planning and Water Supply:
Is he aware that-

(a) (i) the Kala Wewa Hospital situated in Ipalogama Divisional Secretary's Division has faced the problem of severe shortage of drinking water;

[ගරු කේ. කේ. පියදාස මහතා]

(ii) the Kala Wewa drinking water project in operation now has stopped 500 metres away from the hospital;

(iii) the Kala Wewa Hospital as well as the people living in the villages of Balaluwewa, Dikediyaya, Karawilagala and Negama situated beyond this hospital could be provided with drinking water through this 500-metre extension; and

(b) If so, will he inform this House of the date by which action would be taken to extend this water project?

(c) If not, why?

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) උග්‍ර ජල හිඟයකට මුහුණපා නොමැති අතර, අදාළ ළිඳෙහි ප්‍රමාණවත් තරම් ජලය පවතී. එහෙත් ළිඳෙහි ඇති ජල පොම්පයෙහි කලාතුරකින් ඇතිවන කාර්මික දෝෂයකදී ජලය ලබාදීමට නොහැකි තත්ත්වයක් උද්ගත වේ.

(ii) කලාවැව රෝහලට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ජලය ලබා දීමට නම්, මීටර් 500ක් නොව මීටර් 1,500ක් දුරට නළ මාර්ගය දීර්ඝ කළ යුතුය.

(iii) මීටර් 500ක් ජල නළ දීර්ඝ කිරීමෙන් රෝහලට මෙන්ම රෝහලෙන් එපිට පිහිටි ගම්මාන සඳහා කලාවැව ජල සම්පාදන ක්‍රමයෙන් පානීය ජලය සැපයීමේ තාක්ෂණික හැකියාවක් නොමැත.

(ආ) රෝහල සඳහා ජලය ලබා දීමට මීටර් 1,500ක් දුරට ජල නළ එළිය යුතු අතර, ඒ සඳහා රුපියල් මිලියන 05ක් පමණ ප්‍රතිපාදන අවශ්‍ය වේ. මේ පිළිබඳ රෝහල් බලධාරීන් ඉල්ලීමක් සිදු කර නොමැති බැවින්, 2018 වසරේ කිසිදු වැය ශීර්ෂයක් යටතේ මුදල් වෙන් කර නොමැත. සෙසු ගම්මාන සඳහා ජලය සැපයීම පිළිබඳව දැනට සැලසුම් කටයුතු සිදුවෙමින් පවතින අතර, ඒ සඳහා ගල්නෑව-පලාගල ජලසම්පාදන ව්‍යාපෘතිය මඟින් ජලය ලබා දීමට හැකියාව ඇත. මේ සඳහා වසර තුනක පමණ කාලයක් ගතවිය හැක.

(ඇ) කෙසේ වෙතත් පහත සඳහන් ගැටලු නිසා කලාවැව ජලසම්පාදන ක්‍රමයෙන් අනෙකුත් ගම්මාන සඳහා ජලය ලබා දීමට මේ අවස්ථාවේදී හැකියාවක් නොමැත.

* කලාවැව ජල පවිත්‍රාගාරයේ නිෂ්පාදනය කරනු ලබන ජලය ප්‍රමාණවත් නොවීම.

* සියලුම ගම්මාන කලාවැව වම් ඉවුරේ පිහිටා තිබීම හා ඒ සඳහා යොදන නළ මාර්ග කලා ඔය හරහා එළීමට සිදුවීම.

* කලාවැව ජල පවිත්‍රාගාරයේ සිට එම ගම්මාන සඳහා ඇති දුර වැඩිවීම.

## හිඟුරාන සීනි කර්මාන්තශාලාව : උක් වගාවට වෙන් කළ ඉඩම්

## ஹிங்குராணை சீனித் தொழிற்சாலை: கரும்புச் செய்கைக்காக ஒதுக்கப்பட்ட காணிகள்

## HINGURANA SUGAR FACTORY: LANDS ALLOCATED FOR SUGAR CANE CULTIVATION

995/'18

**14.ගරු ටී. රංජිත් ද සොයිසා මහතා (ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. T. Ranjith De Zoysa on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හිඟුරාන සීනි කර්මාන්තශාලාව ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම කර්මාන්තශාලාව සඳහා වෙන් කරන ලද ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) එම කර්මාන්තශාලාව සඳහා උක් වැවීමට වෙන් කළ ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 5ක කාලය තුළ,

(i) උක් වගාව සඳහා වෙන් කළ ඉඩම් ප්‍රමාණයෙන් උක් වගා කරන ලද ඉඩම් ප්‍රමාණය;

(ii) වගා කරන ලද මුළු ඉඩම් ප්‍රමාණයෙන් ලබා ගත් මුළු උක් ටොන් ප්‍රමාණය;

(iii) අඹරන ලද උක් ටොන් ප්‍රමාණය;

(iv) නිෂ්පාදනය කළ මුළු සීනි ප්‍රමාණය;

(v) සීනි අලෙවියෙන් ලබන ලද ලාභය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

අරස තොළිල්මුයර්චි මර්රුම් කණ්ඩි නගර අපිවිරුත්දි අමෙච්චරෛක් කේට්ට විනා:

(අ) (i) හිඟුරාන සීනි කර්මාන්තශාලාව ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම කර්මාන්තශාලාව සඳහා වෙන් කරන ලද ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) එම කර්මාන්තශාලාව සඳහා උක් වැවීමට වෙන් කළ ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 5ක කාලය තුළ,

(i) උක් වගාව සඳහා වෙන් කළ ඉඩම් ප්‍රමාණයෙන් උක් වගා කරන ලද ඉඩම් ප්‍රමාණය;

(ii) වගා කරන ලද මුළු ඉඩම් ප්‍රමාණයෙන් ලබා ගත් මුළු උක් ටොන් ප්‍රමාණය;

(iii) අඹරන ලද උක් ටොන් ප්‍රමාණය;

(iv) නිෂ්පාදනය කළ මුළු සීනි ප්‍රමාණය;

(v) සීනි අලෙවියෙන් ලබන ලද ලාභය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச தொழில்முயற்சி மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹிங்குராணை சீனித் தொழிற்சாலை ஆரம்பிக்கப்பட்ட வருடம் யாது;

(ii) மேற்படி தொழிற்சாலைக்காக ஒதுக்கப்பட்ட காணிகளின் ஏக்கரளவு யாது;

(iii) மேற்படி தொழிற்சாலைக்கான கரும்புச் செய்கைக்காக ஒதுக்கப்பட்ட காணிகளின் ஏக்கரளவு யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) கடந்த 5 வருட காலப்பகுதிக்குள்,

(i) கரும்புச் செய்கைக்காக ஒதுக்கப்பட்ட காணி களின் அளவில் கரும்புச் செய்கை மேற்கொள் ளப்பட்ட காணிகளின் அளவு;

(ii) பயிர்ச் செய்கை மேற்கொள்ளப்பட்ட மொத்த காணிகளிலிருந்து பெற்றுக்கொண்ட மொத்த கரும்பு தொன்களின் அளவு ;

(iii) பிழியப்பட்ட கரும்பு தொன்களின் அளவு;

(iv) உற்பத்தி செய்யப்பட்ட மொத்த சீனியின் அளவு;

(v) சீனி விற்பனையின் மூலம் கிடைத்த இலாபம்;

ஒவ்வொரு வருடத்திற்கிணங்கவும் வெவ்வேறாக எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise and Kandy City Development:

(a) Will he inform this House of-

(i) the year in which the Hingurana Sugar Factory was started;

(ii) the acreage of lands allocated for that factory;

(iii) the acreage of lands allocated for cultivation of sugar cane for that factory?

(b) Will he also inform this House with relevance to each year, separately-

(i) the area cultivated with sugar cane out of the land allocated for sugar cane cultivation;

(ii) the total amount of sugar cane obtained from the total area cultivated;

(iii) the amount of sugar cane ground;

(iv) the total amount of sugar produced; and

(v) the profit earned through the sale of sugar;

within the last five years?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I **table*** the Answer.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) 1963.

(ii) 18,441 acres.

(iii) 12,500 acres.

(b) The Galoya Plantations (Pvt.) Limited was established in 2007. The answers for (b) are given based on the information obtained from the Galoya Plantations (Pvt.) Limited.

(i)

| Year | Allocated Land (ha) | Cultivated Land (ha) |
|---|---|---|
| 2013/14 | 5,200 | 3,725 |
| 2014/15 | 5,200 | 4,214 |
| 2015/16 | 5,200 | 4,619 |
| 2016/17 | 5,200 | 4,859 |
| 2017/18 | 5,200 | 5,085 |

(ii)

| Year | Total Harvested (MT) |
|---|---|
| 2013/14 | 154,400.81 |
| 2014/15 | 259,289.06 |
| 2015/16 | 221,331.88 |
| 2016/17 | 163,147.50 |
| 2017/18 | 183,610.02 |

(iii)

| Year | Total Crushed (MT) |
|---|---|
| 2013/14 | 133,770 |
| 2014/15 | 246,349 |
| 2015/16 | 206,146 |
| 2016/17 | 146,740 |
| 2017/18 | 169,940 |

(iv)

| Year | Total Marketable Sugar Produced (MT) |
|---|---|
| 2013/14 | 10,521 |
| 2014/15 | 19,837 |
| 2015/16 | 14,528 |
| 2016/17 | 10,091 |
| 2017/18 | 12,541 |

(v)

| Year | Operating Profit/ (Loss) |
|---|---|
| 2013/14 | (58,666,833) |
| 2014/15 | 301,930,683 |
| 2015/16 | (363,956,043) |
| 2016/17 | (214,979,380) |
| 2017/18 | (149,448,780) |

(c) Not applicable.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## I

## උතුරු ප්‍රදේශයේ බෞද්ධ පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීම
## வட பகுதியில் பௌத்த தொல்பொருளியல் அமைவிடங்களைப் பாதுகாத்தல்
## PROTECTION OF BUDDHIST ARCHAEOLOGICAL SITES IN THE NORTH

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 27(2) යටතේ, ගරු උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් මා මෙම ප්‍රශ්නය අහනවා.

ශ්‍රී ලංකාවේ බෞද්ධ පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීම හා ඒවා සඳහා අවශ්‍ය සුරක්ෂිතභාවයක් ඇති කිරීමටත්, එම ස්ථාන ආරක්ෂා කිරීමට අවශ්‍ය වූ විට නීතිය මඟින් කටයුතු කිරීමත් දිගින් දිගටම පවත්වාගෙන එන සම්මත පිළිවෙතක් බව සැමදෙනා පිළිගන්නා කරුණක්.

අවුරුදු දහස් ගණනක් පැරණි වටිනා බෞද්ධ හා අනෙකුත් පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂ ආරක්ෂා කර දීමට රජය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන බැඳී සිටී.

මෙවැනි පසු බිමක් පැවතියද, 2018 සැප්තැම්බර් 17වන දින "ඩෙලි මිරර්" පුවත් පතෙහි ඡායාරූපයද සහිතව දක්වා ඇති ආකාරයට කිළිනොච්චි නගරයේ සියවස් ගණනක් පැරණි බෞද්ධ නටබුන් කරච්චි ප්‍රාදේශීය සභාව විසින් බැකෝ යන්ත්‍ර යොදා ගනිමින් විනාශයට පත් කර තිබේ. මා එම පුවත් පත් වාර්තාව **සභාගත*** කරනවා.

මේ ආකාරයට උතුරු ප්‍රදේශයේ ස්ථාන කිහිපයකම පුරාවස්තූන්, බෞද්ධ සිද්ධස්ථාන පිළිබඳ නටබුන් විනාශ කර ඇති බව පෙන්වා දී තිබෙනවා. නමුත්, මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට වග කිව යුතු බලධාරීන් ක්‍රියාකර නැහැ. උතුරු පළාත් සභාව මේ සම්බන්ධව කිසිදු ආරක්ෂාවක් හෝ නිලධාරීන්ට මග පෙන්වීමක් නොකිරීම ඉතා අනතුරුදායක තත්ත්වයක්.

ගරු ඇමතිතුමනි, එහෙයින්;

1. කරච්චි ප්‍රාදේශීය සභාව සිදු කළ මෙම විනාශකාරී ක්‍රියාව පිළිබඳව ඔබතුමා දැනුවත්ද?

   ඊට අතිරේකව කන්දරායකුලම් හන්දියේ චෛත්‍ය ගොඩැල්ල, මන්නාරම් කොටුව හා මාතොට කොටුව අවට ඉඩම්, මාළිගාපටිටි චෛත්‍ය ගොඩැල්ල, වවුනියාවේ නෙලුක්කුලම් චෛත්‍ය ගොඩැල්ල, වවුනියාවේ මාමඩුව, අග්බෝපුර මෙගලිතික් ප්‍රාග් ඓතිහාසික භූමිය සම්පූර්ණයෙන් විනාශ කර තිබෙනවා. සමලන්කුලම් චෛත්‍ය නටබුන්ද විනාශ කර තිබෙනවා. නෙලුම්කුලම් චෛත්‍යය නටඹුන්, පුරාවිද්‍යාව විසින් වෙන් කර තිබූ නෙලුම්කුලමේ අක්කර 5ක පුරාවිද්‍යා සංරක්ෂණ භූමිය සම්පූර්ණයෙන් අත්පත් කරගෙන තිබෙනවා. යාපනය පාරේ ඕමන්තේ පාසල ඉදිරියේ පුරාණ පන්සලේ නටබුන් තිබූ තැන ගල් කණු පවා දැන් ඉවත් කරමින් තිබෙනවා. ඔඩ්ඩුසුඩාන් චෛත්‍ය, නැදුන්කර්නි අවට බෞද්ධ විහාර, පුරාවිද්‍යා ස්ථාන අතුරුදහන් වෙමින් තිබෙනවා. මෙය එක් පැත්තකින් අපේ රටේ ඓතිහාසික වටිනාකමට කරන බලවත් තර්ජනයක්. අනෙක් අතින් මෙය ප්‍රකාශිත පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂ ඉවත් කිරීමේ නීති විරෝධී ක්‍රියාදාමයක්. ත්‍රස්තවාදීන් ඉන්න පුළුවන්. ත්‍රස්තවාදීන්ගේ ක්‍රියා කියලා අපට ඒ ස්ථාන විනාශ වීම සම්බන්ධයෙන් කටයුතු නොකර සිටීමට නොහැකියි.

2. මෙම සිදුවීම සම්බන්ධයෙන් ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග කවරේද?

3. උතුරු ප්‍රදේශයේ තිබෙන බෞද්ධ සිද්ධස්ථාන හා පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථාන ආරක්ෂා කර ගැනීමට ගෙන ඇති පියවර කුමක්ද? ඒ පියවර පැහැදිලි කරනවාද?

සිංහල හා දෙමළ ජනතාව අතර ඇති අන්‍යෝන්‍ය විශ්වාසය පමණක් නොව, අපේ ආගම් අතර ඇති අන්‍යෝන්‍ය හොඳ හිතද මේ නිසා අනවශ්‍ය ලෙස සැකයට හා පලුදුවීමට භාජන වන තත්ත්වයක් වර්ධනය වීමට ඉඩදී රජය හැටියට නිහඬව ක්‍රියා නොකර සිටීම උතුරේ පළාත් සභාව බලාපොරොත්තු වන අවුල් ජාලාව ඇති කිරීමට තමයි උදව් වෙන්නේ.

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education and Cultural Affairs)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ගරු උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුව ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

1. කරච්චි ප්‍රාදේශීය සභාව සිදුකළ මෙම විනාශකාරී ක්‍රියාව පිළිබඳව දැනුවත්ද යන්න ගරු මන්ත්‍රීතුමා අසා තිබෙනවා. පිළිතුර: දැනුවත්. හැබැයි, මෙය පුරාවස්තු විනාශයක් නොවෙයි.

2. මෙම සිදුවීම සම්බන්ධයෙන් ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග කවරේද යන්නට පිළිතුර මෙසේයි.

   ඇත්තටම මෙම සිද්ධිය ෆේස්බුක් වැනි සමාජ මාධ්‍ය ජාලවල පළ වුණු ගමන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උතුරු පළාතේ පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ නිලධාරී ක්‍රියාත්මක වුණා. මට ඒ අයගේ නම සඳහන් කරන්න පුළුවන්. පියතිලක බණ්ඩාර මහත්මයා එතැනට ගිහින් පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා.

   කිලිනොච්චි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කේ.එන්. 23, ඒ -9 මාර්ගය අසල, ඩිපෝ හන්දිය කියන ස්ථානයේ තමයි මේ සිදුවීම වෙලා තිබෙන්නේ. පියතිලක බණ්ඩාර මහත්මයා ඇතුළු නිලධාරීන් පස්දෙනකු එතැනට ගිහිල්ලා මේ පිළිබඳව හොයා බලන කොට, ඩෝසර් කළ බැම්මේ ගඩොල් සියල්ල එතැන තිබිලා තිබෙනවා, කැඩිලා, බිඳිලා. සමහර ගඩොල් ඒ ස්ථානයේ තිබුණු වළවල් වසා මට්ටම් කරන්න දමා තිබෙනවා. ඒ ගල්වල පින්තූර සියල්ල මා ළඟ තිබෙනවා. Websitesවල පළ වූ පින්තූරත් එක්කම මා මේවා භාර දෙන්නම්. ඒ ගල්වල සංස්කෘතික ත්‍රිකෝණයේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ලාංඡනය, ඒවා හදාපු බුද්ධ වර්ෂය සටහන් කර තිබෙන බව දැනගන්න ලැබුණා. බුද්ධ වර්ෂ දෙදහස් ගණන්වල මුල් කාලයටයි ඒවා අයත් වන්නේ. ඊට අමතරව, ඒවා හදපු කොන්ත්‍රාත්කරුගේ අංකයත් එහි සටහන් වෙනවා. මේ සම්බන්ධයෙන් හොයා බලනකොට පෙනී ගියා මේ ගල් හදා තිබෙන්නේ අභයගිරිය ස්ථූපයේ සංරක්ෂණ කටයුතු සඳහා වන බව. ඒ කියන්නේ, ඒ ස්ථූපයේ තිබෙන විධියේම ගල් හදන්න කොන්ත්‍රාත් දීලා තිබෙනවා. හැබැයි, ඒ ගල් පැරණි ගල්වලින් වෙන්කර ගැනීම සඳහා ඒවායෙහි සංස්කෘතික ත්‍රිකෝණයේ ත්‍රිකෝණ ලකුණත්, නිෂ්පාදකයාගේ -ඒ කොන්ත්‍රාත්කරුගේ- අංකයත්, ඒවා හදාපු බුද්ධ වර්ෂයත් ලකුණු කරන්න කියලා නීතියක් දාලා තිබෙනවා. ඒ හමු වුණු සියලු ගල්වල ඒ සාක්ෂි තිබෙනවා. එහිදී අපට හමු වුණා, උතුරු පළාත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ සහකාර අධ්‍යක්ෂ ජයන්ත රත්නායක මහත්මයා. අභයගිරිය ස්ථූපය ප්‍රතිසංස්කරණය කරනු ලැබුවේ, සංරක්ෂණය කරනු ලැබුවේ මධ්‍යම සංස්කෘතික අරමුදලින්. උතුරු පළාත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ සහකාර අධ්‍යක්ෂවරයා ඒ වෙලාවේ ඉදිරිපත් වෙලා කිව්වා, "මේ ගල් අභයගිරි ස්ථූපය සංරක්ෂණය කරන්න ඉදිරිපත් කරපු ගල්" කියලා. ඒවායින් ලෝඩ් එකක්, එහෙම නැත්නම් ලොරියක ගල් ප්‍රමාණයක් ප්‍රමිතිය නැති වීම හේතුවෙන් අයින් කරලා සංරක්ෂණ භූමියේ දමා තිබෙනවා. යුද්ධය ඉවර වුණාම හමුදාව විසින් ජයන්ත රත්නායක මහත්මයාගෙන් ඒ ගල් ටික ඉල්ලා තිබෙනවා. ඒ අනුව, ඒ ඉල්ලීම අනුමත කරලා, ඒ කොන්ත්‍රාත්කරුගේ අවසරයත් අරගෙන නොමිලේම ඒ ගල් ටික හමුදාවට දීලා තිබෙනවා.

කිලිනොච්චි නගරයේ කරච්චි ප්‍රාදේශීය සභාවට අයත් වන තැනක -එතැනම පාරෙන් අඩි 20ක, 30කට එහා අනෙක් පැත්තේ- කිලිනොච්චි රණවිරු ස්මාරකය පිහිටා තිබෙනවා. හමුදාව මෙම ගල් අරගෙන ඇවිල්ලා ඒ රණවිරු ස්මාරකය වටා පැරණි විධියටම -අතීතයේ විධියටම- අලුතින් හදපු ගල්වලින් බැම්මක් බැඳලා තිබෙනවා. ඒ බැම්මේ පින්තූර ඔක්කෝම මා ළඟ තිබෙනවා. ඒ ඉතිරි වුණු ගල්වලින් -හරියටම පාරෙන් අනෙක් පැත්තේ- මේ කියන බැම් කෑල්ල බැඳලා තිබෙනවා. හැබැයි, ඒක මොකට බැන්දා ද කියලා දන්නේ නැහැ. එම බැම්ම පෙනෙන විධියට, අඩි 20ක් පමණ දිග "ඉංග්‍රීසි හෝඩියේ එල්" හැඩයට තිබෙන බැම් කෑල්ලක්. හැබැයි, මේ බැම්මත් පරණ ක්‍රමයටම බැඳලා තිබෙනවා. හමුදා ස්මාරකය වටේ එම බැම්ම බැඳලා තිබෙන්නේත් අතීතයේ දී බැම්ම බැඳලා තිබෙන විධියටමයි. ඒ විධියට බැඳපු බැම් කෑල්ලක් මෙතැනත් තිබ්බා තිබෙනවා. කරච්චි ප්‍රාදේශීය සභාව විසින් අලුතින් හදන්න යන සති පොළ හා රථගාල සඳහා එළිපෙහෙළි කිරීමේදී, ඩෝසරයක් මඟින් කඩලා තිබෙන්නේ අලුත් ගල්වලින් හදපු අලුත් බැම්මයි. ඒ නිසා මේ කියන විධියේ පුරාවිද්‍යාත්මක විනාශයක් වෙලා නැහැ. ඒකට අදාළ සාක්ෂි සහිත සියලු පින්තූර මා ළඟ දැන් තිබෙනවා. මේ පින්තූරයේ තිබෙන්නේ ඒ කඩන තැනයි. මේ, ඒ කඩපු වෙලාවේ පත්තරවල වැටුණු පින්තූරයි. මේ තිබෙන්නේ ඒ ස්ථානයට නිලධාරීන් ගිය පින්තූර. මේ තිබෙන්නේ, ඒ ස්ථානයේ දැනටත් ඉතිරිවෙලා තිබෙන ගල්වල පින්තූර. මේ පින්තූරයත් ලොකු කරලා පෙන්වලා තිබෙනවා, සංස්කෘතික ත්‍රිකෝණයේ ලකුණ ආදී සලකුණු. ඒ වාගේම, ඒ ගල්වල තිබුණේ වත්මන් කාලයේ සිමෙන්ති බදාම. ඒ විතරක් නොවෙයි, පුරා විද්‍යා ඉදි කිරීමක් නම් අත්තිවාරම සෑහෙන්න ගැඹුරට තිබෙන්න ඕනෑ ලු. නමුත් මෙහි අත්තිවාරම තිබ්බා තිබෙන්නේ අඩියක පමණ ගැඹුරට. මේ සියල්ලෙන්ම සාක්ෂි සහිතව ඔප්පු වෙලා තිබෙනවා, මේක ඒ කියන විධියට සිදු වුණු පුරාවිද්‍යා වස්තු විනාශයක් නොවෙයි කියන එක.

ගරු කථානායකතුමනි, ඒ එක්කම ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, මීට අමතරව කිලිනොච්චි නගරය ආශ්‍රිතව කිසිදු පුරාවිද්‍යාත්මක සාධකයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණවලින් මේ දක්වා හොයාගෙන නැහැයි කියලා. ඒ කියන්නේ උතුරු පළාතේ නොවෙයි, කිලිනොච්චි නගරයේ පුරාවිද්‍යා ස්ථාන නොමැති බවයි.

3. යුධමය වාතාවරණය අවසන්වීමත් සමඟම උතුරු ප්‍රදේශයේ පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක හඳුනා ගැනීමේ මූලික ගවේෂණ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. පළමුවැන්න, සංරක්ෂණය කරන්න, ආරක්ෂා කරන්න නම් එම පුරාවිද්‍යාත්මක ස්ථාන හොයා ගන්න ඕනෑ. ඒ සියලු ස්ථාන ගවේෂණය කරලා, පුරාවිද්‍යාත්මක සාධක මේ විධියට හොයා ගෙන තිබෙනවා.

මූලතිව් දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක 176ක් හඳුනාගෙන තිබෙනවා. ඒවායින් 88ක් ගැසට් කර තිබෙනවා. මන්නාරම දිස්ත්‍රික්කයේ 64ක් හඳුනාගෙන තිබෙනවා. ඒවායින් 33ක් ගැසට් කර තිබෙනවා. වවුනියාව දිස්ත්‍රික්කයේ 50ක් හඳුනාගෙන තිබෙනවා. ඒවායින් 28ක් ගැසට් කර තිබෙනවා. යාපනය දිස්ත්‍රික්කයේ 79ක් හඳුනාගෙන තිබෙනවා. ඒවායින් 58ක් ගැසට් කර තිබෙනවා. කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ 18ක් හඳුනාගෙන තිබෙනවා. ඒවායින් 08ක් ගැසට් කර තිබෙනවා. ගවේෂණය තුළින් හඳුනාගත් ඉතුරු ස්ථාන හා ස්මාරක ගැසට් කරන්න යවා තිබෙනවා. ගැසට් කර නැති ස්ථාන හා ස්මාරක සියල්ල මේ වන විට ලේඛනගත කරලා ගැසට් කරන්න යවා තිබෙනවා.

උතුරු පළාතේ පුරාවිද්‍යා ඝනත්වය සැලකිල්ලට අරගෙන, පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක ආරක්ෂා කිරීම සඳහා මෙම පළාත කොටස් දෙකකට බෙදලා ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගේ නායකත්වයෙන් පුරාවිද්‍යා කාර්යාල දෙකක් මේ වන විට පිහිටුවා තිබෙනවා. ඒ අනුව යාපනය හා කිලිනොච්චිය කියන දිස්ත්‍රික්ක දෙක එකතු කරලා එක කාර්යාලයක් පිහිටුවා තිබෙනවා. මන්නාරම, මූලතිව් හා වවුනියා කියන දිස්ත්‍රික්ක තුන එකතු කරලා තවත් කාර්යාලයක් පිහිටුවා තිබෙනවා. මෙම කාර්යාල දෙක මඟින් තමයි පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක ආරක්ෂා කිරීම සහ පාලනය කිරීම් කරනු ලබන්නේ. මේ සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ සහයෝගය අරගෙන තිබෙනවා. උතුරු පළාත තුළ පසුගිය වසර තුන තුළ -මේ අවුරුද්දත් ඇතුළුව- පුරාවිද්‍යා වස්තු විනාශ පිළිබඳ වාර්තා වූ සිද්ධි මෙවායි.

2016දී, පුරාවස්තු විනාශ මන්නාරම දිස්ත්‍රික්කයේ 01ක් වෙලා තිබෙනවා; වෙනත් වැරදි 02ක් වෙලා තිබෙනවා. මේවා පොලීසියේ වාර්තා වෙලා තිබෙනවා. වෙනත් වැරදි කියන්නේ, පුරා වස්තු සොරකම් කරන්න ගිහින් අසු වීම්, අනවසර කැණීම් වාගේ දේවල්. උතුරු පළාතේ පුරාවස්තු විනාශ කිරීම්, 2016දී එකයි වාර්තා වෙලා තිබෙන්නේ. උතුරු පළාතේ අනෙක් එක දිස්ත්‍රික්කයකවත් පුරාවස්තු විනාශ කිරීම් වාර්තා වෙලා නැහැ. ඒ කියන්නේ, 2016 වර්ෂයේදී මුළු උතුරු පළාතෙන්ම පුරාවස්තු විනාශ වීම් වාර්තා වෙලා තිබෙන්නේ 01යි; වෙනත් වැරදි 12යි.

2017දී, පුරාවස්තු විනාශ වීම් 02ක් වාර්තා වෙලා තිබෙනවා. ඒ වවුනියාවෙන් 1ක් හා කිලිනොච්චියෙන් 1ක් වශයෙන්. ඒ අනුව 2017 වර්ෂයේ පුරාවස්තු විනාශ වීම් 02යි; වෙනත් වැරදි 08යි. 2018 වර්ෂයේ මේ දක්වා පුරාවස්තු විනාශ වීම් කිසිවක් වාර්තා වෙලා නැහැ. පුරාවස්තු සොරකම, අනවසර කැණීම් ආදී වශයෙන් වෙනත් වැරදි 08ක් වාර්තා වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, උතුරු පළාතේ විශාල වශයෙන් පුරාවස්තු විනාශයක් සිදු වනවාය කියලා අපේ ගරු මන්ත්‍රීතුමා

[ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා]

කිව්වාට, ඇත්ත වශයෙන්ම 2016, 2017 හා 2018 වසරේ මේ දක්වා සිදු වුණු වැරදි හා පුරාවස්තු විනාශ පිළිබඳව ගත්තාම, 2016 උතුරු පළාතෙන් වාර්තා වෙලා තිබෙන්නේ, 12යි. නමුත්, සමස්ත ලංකාවෙන්ම සිද්ධි 203ක් වාර්තා වෙලා තිබෙනවා. 2017 වර්ෂයේ උතුරු පළාතෙන් වාර්තා වෙලා තිබෙන්නේ, සිද්ධි 10යි. නමුත්, සමස්ත ලංකාවෙන්ම සිද්ධි 290ක් වාර්තා වෙලා තිබෙනවා.

ඊළඟට, 2018.07.31 වනවිට සමස්ත ලංකාවේ සිදු වී තිබෙන පුරාවස්තු විනාශයන් හා වෙනත් වැරැදිවලට අදාළ සිද්ධීන් ප්‍රමාණය 184ක් වනවිට, උතුරු පළාතේ සිදුවෙලා තිබෙන්නේ සිදුවීම් අටයි. ගරු මන්ත්‍රීතුමනි, මේ අනුව බැලුවාම අනෙක් පළාත්වලට සාපේක්ෂව උතුරු පළාතේ සිද්ධ වෙලා තිබෙන පුරාවස්තු විනාශයන් හා අනෙකුත් වැරැදිවලට අදාළ සිදුවීම් ප්‍රමාණයේ අඩුවක් දක්නට තිබෙනවා.

ඊට අමතරව පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. වැඩිම විනාශය සිදු වෙලා තිබෙන්නේ අනුරාධපුරයේ කියන එක අපට පෙනී යනවා. දෙවනුවට වැඩිම විනාශය සිදුවෙලා තිබෙන්නේ කුරුණෑගල. තුන්වනුව වැඩිම විනාශය සිදුවෙලා තිබෙන්නේ තංගල්ලේ. විශේෂයෙන්ම මම ඒ දිස්ත්‍රික්ක තුන ගැන සඳහන් කළේ අවබෝධය සඳහායි.

දැනට පිහිටුවා ඇති ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල දෙකෙන් යාපනය, කිලිනොච්චිය ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල සඳහා කලාප කාර්යාල හයක් සහ වවුනියාව, මුලතිව්, මන්නාරම ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල සඳහා කලාප කාර්යාල දහයක් වශයෙන් වෙන්කර පවත්වා ගෙන යනු ලබනවා. එම ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල සඳහා පිළිවෙළින් ක්ෂේත්‍ර නිලධාරීන් 20ක් හා 08ක් පමණ බැගින් ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු ඉටු කරනු ලබනවා. ඒ වාගේම මුරකරු සහ පුරාවිද්‍යා සහායක ඇතුළු ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින් පිළිවෙළින් 44ක් සහ 26ක පමණ ප්‍රමාණයක් රාජකාරි කටයුතුවල යොදවා තිබෙනවා. ඇත්තටම මේ වනවිට අලුතෙන් මුරකරුවන් බඳවා ගෙන තිබෙනවා.

මෙම කටයුතු වඩාත් පුළුල් කිරීම සඳහා ඉදිරියේදී ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල දිස්ත්‍රික්ක මට්ටමින් 25ක් පිහිටුවීමට යෝජනා කර ඇති අතර, ඊට අනුරූපීව කාර්ය මණ්ඩලය ප්‍රතිවයුහගත කිරීමට යෝජනා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබෙනවා. එම යෝජනාවලිය යටතේ මේ වනවිටත් මුරකරු සහ පුරාවිද්‍යා සහායක තනතුරු වැඩි කිරීමට අනුමැතිය ලබා දී තිබෙනවා. ඒ අනුව උතුරු ප්‍රදේශයේ කාර්යයන් සඳහා ද යෝජිත කාර්ය මණ්ඩලය යටතේ තනතුරු සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන බැවින්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති ස්මාරක ආරක්ෂා කර ගැනීම සඳහා පුළුල් වැඩ පිළිවෙළක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබෙනවා.

මේ අවස්ථාවේ දී මෙම පින්තූර සියල්ල මා **සභාගත*** කරනවා. ඒ තුළින් ගරු මන්ත්‍රීතුමාට යම් අවබෝධයක් ලබා ගන්න පුළුවන් වෙයි කියා මා හිතනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මෙම පිළිතුර ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයට පැමිණ මේ කාරණාව සම්බන්ධව තිබෙන තොරතුරු ඉදිරිපත් කිරීමට හා ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට අපට අවස්ථාවක් ලබා දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා**
(මාණ්පුමිකු මොහාන් ලාල් කිරේරු)
(The Hon. Mohan Lal Grero)
අනිවාර්යයෙන්ම අප හමු වී ඒ සම්බන්ධව කථා කරමු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මීළඟට, ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

## II

## තෙලිප්පලේ පැවැති ජනපති ජංගම සේවය
## தெல்லிப்பளையில் நடைபெற்ற ஜனாதிபதி நடமாடும் சேவை
## PRESIDENTIAL MOBILE SERVICE IN TELLIPPALLAI

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, உள்நாட்டலுவர்கள் அமைச்சர் கௌரவ வஜிர அபேவர்தன அவர்களிடம் இந்தக் கேள்வியைக் கேட்பதற்கு வாய்ப்பளித்ததற்கு நன்றி!

கடந்த 15ஆந் திகதி யாழ்ப்பாணம், தெல்லிப்பளைப் பிரதேசச் செயலாளர் பிரிவிற்கான ஜனாதிபதி உத்தியோகபூர்வப் பணித் தேசிய நிகழ்ச்சித் திட்டத்தின் கீழான நடமாடும் சேவை இடம்பெற்றிந்த நிலையில், அதற்கு முன்பதாக, பிரதேச செயலாளரினால் கிராம அபிவிருத்திச் சங்கங்களின் பிரதிநிதிகளுக்கு அனுப்பி வைக்கப்பட்டிருந்த கடிதமொன்றில், "எமது பிரதேசச் செயலாளர் பிரிவிற்கான மேற்படி நடமாடும் சேவை எதிர்வரும் 15ஆம் திகதி, சனிக்கிழமை தெல்லிப்பளை யூனியன் கல்லூரியில் நடைபெறவுள்ளமையாலும், இந்நிகழ்வில் 3,000 இற்கும் மேற்பட்ட மக்கள் கலந்து கொண்டு சேவைகளைப் பெறவுள்ளனர் என எதிர்பார்க்கப்படுவதனாலும், இச்சேவை பெறுதலில் எமக்கும் பொதுமக்களுக்கும் பல்வேறு வகையான செலவினங்கள் ஏற்படும் என மதிப்பிடப்பட்டுள்ளது. ஆகையால், தங்கள் பிரிவிலுள்ள நலன்விரும்பிகள், சமூக ஆர்வலர்கள்மூலம் இந்த நிகழ்விற்கு ஏற்படும் செலவினங்களுக்காக இயன்றளவு அன்பளிப்புத் தொகையைச் சேகரித்துத் தருமாறு கேட்டுக்கொள்கின்றேன்" எனக் குறிப்பிடப்பட்டிருந்ததாகத் தெரிய வருகின்றது.

அதுமட்டுமல்லாது, மேற்படி சேவையைப் பெற்றுக் கொள்கின்ற பிரதேசத்துக்கான கிராம சேவையாளர்கள் தலா 25,000 ரூபாவினைச் சேகரித்துத் தருமாறு பிரதேசச் செயலகத்தில் இடம்பெற்றிருந்த கிராம சேவையாளர்களுக்கான கூட்டத்தில் தெரிவிக்கப்பட்டிருந்ததாகவும், இந்த விடயத்தைக் கிராம சேவையாளர்கள் கிராம அபிவிருத்திச்

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සංඝ මත්‍රුම් මාතර් අපිවිරුත්තිච් සංඝ අංගත්තවර්කළිටම් තෙරිවිත්තිරුන්තතාකවුම් මේලුම් තෙරිය වරුකින්‍රතු.

අරසාංගත්තිනාල් වළංගප්පටුකින්‍ර සේවෛකළෛ උරිය කාලකට්ටංකළිල් පෙරත් තවරිය මක්කළින් නලන්කරුති, අම්මක්කළ් මේර්පටි සේවෛකළෛ මීළප් පෙර්රුක් කොළ්වතර්කු ඔරු සන්තර්ප්පම් වළංකුකින්‍ර වකෛයිල් අරසාංගත්තාල් මුන්නෙටුක්කප්පට්ටු වරුකින්‍ර මේර්පටි සේවෛක්කුරිය සෙලවිනංකළෛ අරසාංගමේ මේර්කොළ්ළ වේණ්ටුම්. ඉත්තකෛයතොරු නිලෛයිල් මේර්පටි නිති වසූලිප්පානතු, එමතු මක්කළිටෛයේ කටුමෛයාන විසනත්තෛ ඒර්පටුත්තියුළ්ළතු.

ඉන්ත විටයම් තොටර්පිල් පින්වරුම් එනතු කේල්විකළුක්කාන පතිල්කළෛයුම් එටුක්කප්පටක්කූටිය නටවටික්කෛකළ් තොටර්පිලාන විළක්කංකළෛයුම් කෙළරව අමෛච්චර් වජිර අපේවර්තන අවර්කළ් වළංකුවාර් එන එතිර්පාර්ක්කින්‍රේන්.

1. ජනාතිපති උත්තියෝකපූර්ව පණි, නාටළාවිය රීතියිල් නටත්තප්පට්ටු වරුකින්‍ර නිලෛයිල්, ඉතන් සෙලවිනංකළුක්කෙනප් පොතුමක්කළිටම් ඉරුන්තෝ පොතු අමෛප්පුක්කළිටම් ඉරුන්තෝ නිති අරවිටුකින්‍ර ඒර්පාටුකළ් තංකළතු අමෛච්චින් මේර්පටි තිට්ටම් චාර්න්තු උළ්ළනවා?
2. උළ්ළනවෙනිල්, එතර්කාක, එන්ත වකෛයිල් අතු අරවිටප්පටුකින්‍රතු එන්පතු තොටර්පිල් තෙළිවුපටුත්ත මුටියුමා?
3. ඉල්ලෛ එනිල්, ඉත්තකෛය නිති වසූලිප්පුක්කළ් ඉතුවරෛයිල් නාට්ටිල් එංකාවතු මේර්කොළ්ළප් පට්ටුළ්ළතාන තකවල්කළ් තංකළතු අමෛච්චුක්කුක් කිටෛත්තුළ්ළනවා?
4. යාළ්ප්පාණත්තිල්, මේර්පටි තෙල්ලිප්පළෛ පිරතේස සෙයලාළර් පිරිවිල් ඉන්ත නිති වසූලිප්පු එන්ත වකෛයිල් ඉටම්පෙර්රුළ්ළතු? එව්වළවු නිති වසූලික්කප්පට්ටුළ්ළතු? වසූලික්කප්පට්ට නිති එතර්කාකප් පයන්පටුත්තප්පට්ටුළ්ළතු? එන්පතු කුරිත්තු ආරාය්න්තු කූර මුටියුමා?

**ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**

(මාණ්පුමිකු වජිර අපේවර්තන - උළ්නාට්ටලුවල්කළ් අමෛච්චර්)

The Hon. Wajira Abeywardana - (Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරපු ප්‍රශ්නය සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන්න මා කැමැතියි.

"ජනපති ජනතා සේවා නිල මෙහෙවර" වැඩසටහන මේ වනවිට ගාල්ල දිස්ත්‍රික්කයේත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේත්, මුලතිව් දිස්ත්‍රික්කයේත්, කිලිනොච්චි දිස්ත්‍රික්කයේත්, වවුනියාව දිස්ත්‍රික්කයේත් ක්‍රියාත්මක කර එහි වැඩ කටයුතු අවසන් කර තිබෙනවා. ඒ වාගේම කුරුණෑගල දිස්ත්‍රික්කයේත් එම වැඩ කටයුතු අවසන් කර තිබෙනවා.

මේ මාස කිහිපය තුළ ජනපති ජනතා සේවා නිල මෙහෙවර ජාතික වැඩසටහන යාපනය දිස්ත්‍රික්කයේ පැවැත්වෙනවා. යාපනය දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස 11ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15ක හඳුනා ගත් ප්‍රශ්න 350,000කට ආසන්න ප්‍රමාණයක් දැනට අපට වාර්තා වෙලා තිබෙනවා. 350,000කට ආසන්න ප්‍රමාණයකින් හඳුනා ගත් එම ප්‍රශ්න ඒ ඒ අදාළ අමාත්‍යාංශ 53 වෙතම ඉදිරිපත් කර තිබෙනවා. එසේ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එකී අමාත්‍යාංශ 53න් විශේෂයෙන්ම යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ගොස් අදාළ ප්‍රශ්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විසඳමින් පවතිනවා. ඒ වාගේම මේ අවස්ථාවේදීත් රජයේ දායකත්වය, පෞද්ගලික අංශයේ දායකත්වය හා රාජ්‍ය නොවන ආයතනවල දායකත්වය කලින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ දිස්ත්‍රික්කවලදී ලබා ගත් ආකාරයටම යාපනය දිස්ත්‍රික්කයට අදාළවත් ලබා ගනිමින් එම කටයුතු සිදු කරමින් පවතිනවා. ඒ අනුව මේ දක්වා සෑම දිස්ත්‍රික්කයකම මේ වැඩසටහන ක්‍රියාත්මක වූ ආකාරයටම යාපනය දිස්ත්‍රික්කයේත් එය ක්‍රියාත්මක වෙමින් පවතින බව සඳහන් කරන්න මා කැමැතියි. විශේෂයෙන් එතුමා සඳහන් කළ 01, 02, 03, 04 ප්‍රශ්න කිහිපයම මුල් කරගෙන මා උත්තර දෙන්නම්.

ස්වකැමැත්තෙන් දායකත්වය ලබා දෙන ආයතන හෝ පුද්ගලයන් මිස අනිවාර්ය කිරීමක් හෝ වෙනත් කාරණයක් සිදු වී නොමැති බව මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. එසේ නොමැතිව වෙනත් ආකාරයක කටයුත්තක් සිදු නොවන අතර, අප ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින සැලසුම් අධ්‍යක්ෂවරුන්, ගණකාධිකාරිවරුන්, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු එම කණ්ඩායම විසින් එම කටයුතු මෙහෙයවන අතර, එය ගිණුම් සහගතව අවසානයේ දී අමාත්‍යාංශයද දැනුවත් කිරීමට අනෙක් දිස්ත්‍රික්ක මෙන්ම යාපනය දිස්ත්‍රික්කයේද කටයුතු කරමින් සිටිනවා. විශේෂයෙන් අපේ ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා මතු කරන ස්ථානය ගැන මා කියන්න ඕනෑ. උදාහරණයක් හැටියට තෙළිප්පළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගනිමු. "ප්‍රාදේශීය නිල මෙහෙවර" 2018.09.15වැනි දින යුනියන් විද්‍යාලයේ දී පැවැත්වූවා. අමාත්‍යාංශ 53ක නිලධාරීන් දින හතරක් යාපනයේ ගත කරලා තිබෙනවා. ඒ සඳහා යාපනය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමන්ලා වන මාවෙ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමා, ධර්මලිංගම් සිද්ධාර්ථන් මන්ත්‍රීතුමා, සරවනපවන් මන්ත්‍රීතුමා, සුමන්තිරන් මන්ත්‍රීතුමා, විජයකලා මහේස්වරන් මන්ත්‍රීතුමිය සහ බාලවන්දන් පළාත් සභා මන්ත්‍රීතුමා, සුන්දරලිංගම් පළාත් සභා මන්ත්‍රීතුමා, වේලුපිල්ලේ පළාත් සභා මන්ත්‍රීතුමා ඇතුළු පිරිස සහභාගී වෙලා තිබෙනවා. යුනියන් විද්‍යාලයේදී වාර්තා වූ ප්‍රශ්න 4,300කට ආසන්න ප්‍රමාණයකින් 2,374කට එදා දවස තුළ විසඳුම් ලබා දීලා තිබෙනවා.

ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. පසුව එම කටයුතු සඳහා පෞද්ගලික අංශයේත්, රාජ්‍ය අංශයේත් පුද්ගලයන් ලබා දී ඇති දායකත්වය පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් පසුව අප අමාත්‍යාංශයේ ලේකම් මහින් ඔබතුමා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා. යාපනය දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස 11න් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15ක පවුල් 196,000ක් ජීවත් වන අතර 624,000ක ජනතාවක් සිටිනවා. එම දිස්ත්‍රික්කයේ ප්‍රශ්න 340,000කට වැඩි ප්‍රමාණයක් අමාත්‍යාංශය වෙත වාර්තා වෙලා තිබෙනවා. තෙළිප්පළේ, "නිලසෙවණ" වැඩසටහන පැවති යුනියන් විද්‍යාලයටද එදින තුළ පැමිණිලි 4,600ක් වාර්තා වෙලා තිබෙනවා. එයින් පැමිණිලි 3,624කට එදිනම විසඳුම් ලබාදී තිබෙනවා. ඊට අමතරව, ඉදිරියේදී විසඳීම සඳහා පැමිණිලි 986ක් අපි සටහන් කරගෙන තිබෙනවා. විවිධ අංශ සඳහා සහන රාශියක් එදින ලබාදී තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකොළහෙන් කොට්ඨාස 8ක ඒ වැඩකටයුතු දැනට අවසන් කර තිබෙනවා. ඉතිරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඒ කටයුතු මේ මස අගදීත්, ලබන මස මුලත් අවසන් කිරීමට නියමිතව තිබෙනවා. නල්ලූර්, ඩෙල්ෆ්, පේදුරුතුඩුව යන කොට්ඨාසවල ජනපති ජනතා සේවා නිල මෙහෙවර ඉදිරි මාසය තුළ පවත්වා අදාළ සහන ලබාදීමට කටයුතු

[ගරු වජිර අබේවර්ධන මහතා]

කරගෙන යනවා. අවසාන වශයෙන් අපේ මන්ත්‍රීතුමාට මම මතක් කරන්න කැමැතියි, එම අවස්ථාවට සහභාගි වන පුද්ගලයන්ගේ දායකත්වය පිළිබඳව අප අමාත්‍යාංශය සොයා බලමින්, ක්‍රියා කරමින් සිටින බව. විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි, මේ කටයුතු සඳහා ජනාධිපති ලේකම්තුමා, අග්‍රාමාත්‍ය ලේකම්තුමා, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ සියලු අමාත්‍යාංශවල රාජ්‍ය නිලධාරීන් පෝය දිනය, සෙනසුරාදා, ඉරිදා දින සහ රජයේ නිවාඩු දිනවල විශාල කැපකිරීමකින් ඒ කටයුතු කරගෙන යන බව. මම මේ වෙලාවේ ඒ සමස්ත රාජ්‍ය නිලධාරීන්ට විශේෂ ස්තුතියක් පිරිනමනවා.

ගරු මන්ත්‍රීතුමාගේ කොටියාසයේ එතුමා සඳහන් කළ ඒ දැන්වීම සහ අනෙක් කරුණු ගැන මම යාපනය දිස්ත්‍රික් ලේකම්තුමාගෙන් මේ වන විට කරුණු විමසා තිබෙනවා. ඒ අදාළ ප්‍රාදේශීය ලේකම් කොටියාසයේ පැවති නිල මෙහෙවරේ අංග සම්පූර්ණ වාර්තාවක් මන්ත්‍රීතුමාට ලබාදීමට අපි කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, මම මතක් කරන්න කැමැතියි, යුද්ධයෙන් අත් පා අහිමි වුණු, ඒ වාගේම බෝම්බ පිපිරීම නිසා කන් ඇසීම නැතිවී ගිය අය 2,800ක පමණ පිරිසකගේ තොරතුරු දැනට නම් සහ ලිපිනයන් සමඟ යාපනය දිස්ත්‍රික්කයෙන් අපට වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම මුලතිව්, කිලිනොච්චි, වවුනියාව, මන්නාරම සහ ත්‍රිකුණාමලයේ යම් ප්‍රදේශ ගණනාවකින් 6,000කට ආසන්න පිරිසක් වාර්තා වෙනවා. ඒ ගැන අද සවස 2.00ට අපේ අමාත්‍යාංශයේ සාකච්ඡාවක් පැවැත්වෙනවා. ඒ කටයුතු නිරාකරණය කිරීමට විශේෂයෙන් අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා උපදෙස් දීලා තිබෙනවා. ඒ අනුව, අපේ මහජන නියෝජිතයනුත්, ඒ ප්‍රදේශවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනුත් මේ සඳහා සම්පූර්ණ දායකත්වය ලබාදෙමින්, ක්‍රියා කරමින් සිටිනවා.

එම නිසා, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා මතු කළ කාරණය සම්බන්ධයෙන් සොයා බලා, එයින් යම් අපහසුතාවකට පත් වෙලා තිබෙනවා නම් ඒ ගැන අංග සම්පූර්ණ වාර්තාවක් එතුමාට ලබාදීමට කටයුතු කරන්නම්.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(මාණ්පුමිකු ටක්ளස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Douglas Devananda, do you want a clarification?

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(මාණ්පුමිකු ටක්ளස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
Yes, Sir.

நீண்டகாலமாக யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களுடைய பிரச்சினைகளை இந்த நடமாடும் சேவைமூலம் தீர்க்க முன்வந்ததற்காக முதலில் நான் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அதேநேரத்தில் குறிப்பிட்ட அந்தத் தெல்லிப்பளைப் பிரதேசம் என்பது நூற்றுக்கு நூறு வீதம், அதாவது முழுக்க முழுக்க மீள்குடியேற்றப்பட்ட ஒரு பிரதேசம். அந்த வகையில் அங்குள்ள மக்கள் ஏற்கனவே 30 வருடங்களுக்கு மேலாக யுத்தத்தால் பாதிக்கப்பட்டு, மீள்குடியேற்றப் பட்டவர்கள். அந்த மக்களிடம் நிதி அறவிடுவதென்பது ரொம்பக் கஷ்டமான ஒரு விடயம். பத்திரிகையில் அந்தச் செய்தி பிரசுரிக்கப்பட்டிருந்தது. பாராளுமன்ற உறுப்பினர்கள் - மக்கள் பிரதிநிதிகள் எனப் பலரும் அந்தச் சந்திப்பில் கலந்துகொண்டதாகத் தெரிவிக்கப்பட்டிருந்தது. நல்லது. ஆனால், இப்படி நிதி வசூலிக்கப்படுவதால் அந்த மக்கள் ரொம்ப சிரமங்களுக்குள்ளாக்கப்பட்டிருக்கிறார்கள் என்பதைத் தான் உங்களுடைய கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன். நன்றி.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් අංග සම්පූර්ණ වාර්තාවක් මම එතුමාට ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

Order, please! ගරු මන්ත්‍රීවරුනි, මෙම වසරේ දකුණු කොරියාවේ පැවැති 5වන ලෝක කුසලාන කැරම් තරඟාවලියේදී එහි ශූරතාව හිමි කරගත් ශ්‍රී ලංකා කැරම් කණ්ඩායම පිරිමි සහ අනුශූරතාව හිමි කරගත් කාන්තා කණ්ඩායම මේ අවස්ථාවේ කථානායක ගැලරියේ අසුන් ගෙන සිටින බවත්, ඔවුන්ට මෙම ගරු සභාවේ සුබ පැතුම් පිරිනමන බවත් මම මේ අවස්ථාවේදී සඳහන් කිරීමට කැමැතියි.

මීළඟට, ස්ථාවර නියෝග 27 (2) යටතේ තුන්වැනි ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට, ගරු අනුර දිසානායක මැතිතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නේ කවුද, ගරු සභානායකතුමනි? [බාධා කිරීමක්] ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ඇමතිතුමාත් මේ අවස්ථාවේ මෙම ගරු සභාවේ නැහැ, නියෝජ්‍ය ඇමතිතුමාත් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, we will answer that Question tomorrow.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හෙට පාර්ලිමේන්තුව රැස් වන්නේ නැහැ, සෙනසුරාදා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
"Tomorrow" means, on the 09th of October - the Parliamentary jargon used is "tomorrow". පාර්ලිමේන්තුවේ භාෂාවෙන් "හෙට" කියා කියන්නේ, ඊළඟ රැස්වීම් දිනය වන ඔක්තෝබර් 9වන දායි.

## III

## ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ තෙල් ටැංකි ඉන්දියානු තෙල් සමාගමට පැවරීම

### திருகோணமலை எண்ணெய்க் குதத்திலுள்ள எண்ணெய்த் தாங்கிகளை இந்திய எரிபொருள் கம்பனியிடம் ஒப்படைத்தல்

### HANDOVER OF OIL TANKS AT TRINCOMALEE OIL TANK FARM TO INDIAN OIL COMPANY

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, දැන් මේ ප්‍රශ්නය අහන එකේ තේරුමක් නැද්ද කියාත් මට හිතෙනවා. කෙසේ වුවත්, මම ප්‍රශ්නය අහන්නම්. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව පිහිටා ඇති තෙල් ටැංකි තවත් ප්‍රමාණයක් වක්‍රාකාරයෙන් ඉන්දියානු තෙල් සමාගමට පැවරීම සඳහා වූ ආණ්ඩුවේ තීරණ සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි. ත්‍රිකුණාමලයේ චීන වරාය ආශ්‍රිතව ඇති තෙල් ටැංකි සංකීර්ණයේ ටැංකි 15කින් සමන්විත පහළ ටැංකි සංකීර්ණය සම්පූර්ණයෙන්ම ඉන්දියානු තෙල් සමාගමට ලබාදීමටත්, ටැංකි 85කින් සමන්විත ඉහළ ටැංකි සංකීර්ණය ලංකා ඛනිජ තෙල් සංස්ථාව හා ඉන්දියානු තෙල් සමාගම යටතේ වූ හවුල් සමාගමකට පැවරීමටත්, ආණ්ඩුව විසින් 2018.08.07 දින කැබිනට් තීරණයක් ගෙන ඇති බව වාර්තා වෙනවා. මේ අනුව මෙම නව හවුල් සමාගම මඟින් ටැංකි 16ක් පමණක් තෙල් සංස්ථාවට ලබාදීමට කටයුතු කරන්න තමයි මේ තීරණය අරගෙන තිබෙන්නේ. මෙතැන අමාත්‍යවරු ගණනාවක් ඉන්නවා. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය, ගරු අර්ජුන රණතුංග මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව මා ළඟ තිබෙනවා. ඒ වාගේම, මුදල් අමාත්‍යාංශයෙන් ඒ සඳහා ලබාදී ඇති නිර්දේශයත්, ජනාධිපතිතුමාගේ නිර්දේශ ඇතුළත් කැබිනට් තීරණයත් මා සතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ සියල්ලෙන්ම පෙන්නුම් කරන්නේ අපේ රටේ තිබෙන ඉතාම වැදගත් සම්පතක් වන තෙල් ටැංකි සංකීර්ණය මුළුමනින්ම ඉන්දියානු සමාගම් වෙත ලබාදීම සඳහා සැලැස්මක් තිබෙන බවයි. වර්තමාන ආණ්ඩුවේ ජාතික සම්පත් විකිණීමේ ක්‍රියාවලියේ ඉතාම භයානක සහ විනාශකාරී ක්‍රියාවකට තමයි පසුගිය අගෝස්තු මාසයේ 7වන දා මේ කැබිනට් මණ්ඩල තීරණය අරගෙන තිබෙන්නේ. ඛනිජ තෙල් සංස්ථාව පාර්ලිමේන්තුවේ COPE එක හමුවට කැඳවන ලද අවස්ථාවක, මෙතෙක් භාවිතයට ගෙන නැති, සුළු අලුත්වැඩියාවකින් භාවිතයට ගත හැකි ඉතිරි ටැංකි ප්‍රමාණය පාවිච්චි කිරීමේ හැකියාව සොයා බලන ලෙසට නිර්දේශයක්ද කරනු ලැබුවා. සංස්ථාවේ වෘත්තීය සමිති විසින්ද මෙම තෙල් ගබඩා සංකීර්ණය පාවිච්චියට ගැනීමේ අවශ්‍යතාව බලධාරීන්ට පෙන්වා දී තිබුණා. පාඩු ලබන ඛනිජ තෙල් සංස්ථාවට රට තුළ බෙදා හැරීම්වලින් ලාභ උපදවා ගැනීමට පමණක් නොව, ජාත්‍යන්තර තෙල් වෙළෙඳ පොළට ප්‍රවේශ වීමටද මෙමඟින් ඉඩ කඩ පාදාගත හැකිව තිබුණා.

ගරු කථානායකතුමනි, 2016.06.01වන දා එවකට තෙල් සංස්ථාව භාරව සිටි අමාත්‍යතුමා එහිදී කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. එහි සඳහන් වන්නේ මොකක්ද? මෙම ටැංකි සංකීර්ණයේ ටැංකි 16ක් අලුත්වැඩියා කිරීම, මුහුදේ සිට නල එළීම, තෙල් පිරවුම් පහසුකම් ඉදි කිරීම, පවතින දුම්රිය බෝගි පිරවීමේ පහසුකම් අලුත්වැඩියාව හා පරිපාලන ගොඩනැඟිල්ල සඳහා යන වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 10ක් බවත්, එම මුදල තෙල් සංස්ථාව සතු බවත්, එම මුදල් ත්‍රිකුණාමලය අවට ප්‍රදේශවලට චීන වරාය හරහා තෙල් බෙදීමෙන් ඉතිරි වන වියදමින් වසර 4ක් ඇතුළත ප්‍රතිපූරණය වන බවත් 2016.06.01වන දින අනුමත කළ කැබිනට් පත්‍රිකාව සාක්ෂි දරනවා. තවද, මෙය අන්තර්ජාතික ගබඩාවක් ලෙස භාවිත කිරීමෙන් ඩොලර් උල්පතක් බවට පත් කරගත හැකි බවද කැබිනට් මණ්ඩලයම පිළිගත්තා. මේ කැබිනට් මණ්ඩලයම, 2016.06.01වන දා මෙම තෙල් ටැංකි සංකීර්ණය තෙල් සංස්ථාව හරහා සංවර්ධනය කිරීමටත්, ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 10ක් වැය වන බවත්, එය වසර 4ක් ඇතුළත ප්‍රතිපූරණය කර ගත යුතු බවත් තීරණය කළා. අපි නොවෙයි, තමුන්නාන්සේලාමයි මේ කැබිනට් පත්‍රිකාවට අවසර ලබා දුන්නේ; අනුමැතිය ලබා දුන්නේ. මෙම තෙල් ටැංකි සංකීර්ණය තෙල් සංස්ථාව හරහා නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවසර ලබා දී තිබියදී තමයි, අගෝස්තු මාසයේ 7වන දා මේ කැබිනට් පත්‍රිකාව යළි ඉදිරිපත් කරන්නේ.

ඒ අනුව, 2016.06.01වන දා කැබිනට් පත්‍රිකාව අනුමත කරන්නත්, නැවත එය ප්‍රතික්ෂේප කරන්නත්, ඒ වෙනුවට තෙල් ටැංකි සංකීර්ණය ඉන්දියානු සමාගමක් වෙත ලබාදීමට වෙනත් කැබිනට් මණ්ඩල තීරණයක් ගැනීමටත් හේතුව කුමක්ද කියා අදාළ අමාත්‍යවරයා විසින් මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කළ යුතුව තිබෙනවා. කෙසේ වුවත්, සංස්ථාව විසින් මෙම ටැංකි පද්ධතියේ නවීකරණ කටයුතු ඇරඹීමට සූදානම් වෙමින් සිටියදී, කිසියම් අදිසි හස්තයක් නිසා එම කටයුතු නතර වූ බවද පසුගිය කාලයේ වාර්තා වුණා. මේ කැබිනට් පත්‍රිකාව අනුව තෙල් සංස්ථාව කටයුතු කරමින් තිබුණා. තමුන්නාන්සේලා දැන් ඒක නතර කර ඉන්දියානු සමාගමකට මෙම තෙල් ටැංකි සංකීර්ණය ලබා දීම සඳහා කටයුතු කරමින් සිටිනවා.

එසේම ආණ්ඩුවේ නව තීරණය මඟින් තෙල් සංස්ථාවට මෙම තෙල් ටැංකි සංකීර්ණය පැවරීම අත් හිටුවීමේ රහසිගත වුවමනාව පැහැදිලි වනවා. ඒ අනුව මෙම ජාතික සම්පත රටට අහිමි වීමේ අවදානමක් මේ වන විට මතුවී අවසන්. මොකද, තවදුරටත් ජාතික සම්පත් සංවර්ධනය කොට රටට ආර්ථික ප්‍රතිලාභ ලබා දෙන කැබිනට් මණ්ඩලයක් වෙනුවට ජාතික සම්පත් අළෙවි කරන බ්‍රෝකර්වරුන්ගේ සංගමයක් බවට මේ කැබිනට් මණ්ඩලය පත් වෙලා හමාරයි. තමුන්නාන්සේලා තීරණ ගන්නේ ජාතික සම්පත් විකුණන්න. මේක බ්‍රෝකර්වරුන්ගේ කැබිනට් මණ්ඩලයක්, බ්‍රෝකර්වරුන්ගේ අමාත්‍ය මණ්ඩලයක් බවට පත් වෙලා අවසන්. මේ කැබිනට් මණ්ඩලය හැම දාම රටේ ජාතික සම්පතක් විකිණීම පිළිබඳව, බදු දීම පිළිබඳව තමයි සාකච්ඡා කරන්නේ. එම නිසා මේ බ්‍රෝකර්වරුන්ගේ කැබිනට් මණ්ඩලය අපේ රටේ වැදගත්ම ජාතික සම්පත ඉන්දියානු සමාගමක් වෙත ලබා දීම වෙනුවෙන් පසුගිය අගෝස්තු මාසයේ 7වෙනි දා මේ කැබිනට් තීරණය අරගෙන තිබෙනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා ලබා දෙනු ඇතැයි කියා මා බලාපොරොත්තු වනවා. මා එසේ බලාපොරොත්තු වුණාට ගරු කථානායකතුමනි, මෙතැනට ඇවිල්ලා මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න බැරි බව ඇමතිවරයා දන්නවා. එම නිසා තමයි තෙල් සංස්ථාව භාර අර්ජුන රණතුංග අමාත්‍යවරයා, ඒ වාගේම අනෝමා ගමගේ නියෝජ්‍ය අමාත්‍යවරිය මේ අවස්ථාවට සහභාගි නොවන්නේ. මම ඊයේ මේ ප්‍රශ්න ටික ලබා දුන්නා. ඒ අනුව මෙහෙම ප්‍රශ්නයක් තිබෙන බව මම ඊයේ පෙන්නුම් කර තිබෙනවා. එසේ තිබියදී අමාත්‍යවරයා සහ නියෝජ්‍ය අමාත්‍යවරිය මීට පිළිතුරු ලබා නොදී පාර්ලිමේන්තුව

[ගරු අනුර දිසානායක මහතා]

මහ හැරීමෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද? මේ ඉතාමත් කැත කිලිටි ගනුදෙනුව පාර්ලිමේන්තුව හමුවේ සාධාරණීකරණය කරන්න හෝ අර්ජුන රණතුංග අමාත්‍යවරයාට පාර්ලිමේන්තුවේ පෙනී සිටින්න හෝ නොහැකියාව තමයි පෙන්නුම් කර තිබෙන්නේ.

1. ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සම්බන්ධයෙන් ආණ්ඩුව ගෙන ඇති නව තීරණ මොනවාද?

2. ඒ අනුව ඉහළ ටැංකි සංකීර්ණයේ වැඩි ටැංකි ප්‍රමාණයක් ලංකා ඉන්දියානු තෙල් සමාගමට පැවරීමට රජය තීරණයක් ගෙන තිබේද? මා ළඟ කැබිනට් පත්‍රිකාව තිබෙනවා. අද ආණ්ඩුව මේකට කියන්නේ මොකක්ද? එසේනම් ඒ කවර හේතු මතද? එය පාර්ලිමේන්තුවට පැහැදිලි කරන්න. තමුන්නාන්සේලා අවුරුදු පහකට බලය ගත්තාට මේ රටේ ජාතික සම්පත් හිතූ හිතූ පරිදි විකිණීම සඳහා තමුන්නාන්සේලාට අවසරයක් ලබා දීලා නැහැ. තමුන්නාන්සේලා අවුරුදු පහක භාරකරුවෝ පමණයි. ජාතික සම්පත් විකිණීම සඳහා කිසිදු අයිතියක් තමුන්නාන්සේලාගේ පාලනයට හෝ රාජ්‍යයට ලබා දීලා නැහැ.

3. එම ටැංකි පද්ධතියේ වැඩි අයිතිය ඉන්දියානු තෙල් සමාගම සතුවීම නිසා ලංකාවේ ඛනිජ තෙල් පාලනය ලංකාවට අහිමි වීමේ අවදානමක් ඇති බව පිළිගන්නේද? අවදානමක් පවතින බව මා පෙන්වා දෙන්න කැමැතියි, ගරු කථානායකතුමනි.

4. මෙම ජාතික සම්පත ඛනිජ තෙල් සංස්ථාවට පවරා ගැනීමට පියවර ගත නොහැක්කේ මන්ද?

ඉහත ගැටලු පිළිබඳව අදාළ අමාත්‍යවරු ආණ්ඩුව වෙනුවෙන් පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වනවා. ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
Sir, the reply will be given later.

**ගරු අනුර දිසානායක මහතා**
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
හැබැයි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා ඒ කැබිනට් මණ්ඩලයේ සිටියා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
එහෙම නම්, ඔබතුමා මේ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
අදාළ ඇමතිවරයා එන්න එපායැ. ඔබතුමා ප්‍රශ්නය මගෙන් ඇහුවේ නැහැ නේ? මගෙන් ඇහුවා නම්, මම උත්තර දෙනවා.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු සභානායකතුමනි, මී ළඟට ඔබතුමාගේ යෝජනාව.

## පාර්ලිමේන්තු සේවය අත්හිටුවීම : ගරු ප්‍රසන්න රණවීර මහතා
## பாராளுமன்ற சேவையிலிருந்து இடைநிறுத்தல்: மாண்புமிகு பிரசன்ன ரணவீர
## SUSPENSION FROM SERVICE OF PARLIAMENT: HON. PRASANNA RANAWEERA

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

" 2018 සැප්තැම්බර් මස 5 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාවේ සඳහන් නිර්දේශයන්ට අනුකූලව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 77(3) යටතේ, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ප්‍රසන්න රණවීර මහතාගේ පාර්ලිමේන්තු සේවය සති හතරක කාලයකට තාවකාලිකව අත්හිටුවීම සඳහා යෝජනාව මම ඉදිරිපත් කරමි." [සෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
If you want a Division, it is okay, we can have a Division. It is democracy. -[*Interruption.]* Who is asking for the Division?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Divide by name!

*බෙදුම් සීනුව නාද වෙද්දී -*
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*While the division bell is ringing-*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ප්‍රකාශයක් කරන්න අවසර දෙන්න. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රකාශ ඉදිරිපත් කරන්න බැහැ.

ස්ථාවර නියෝග 77 (1) හොඳට කියවා බලන්න. [බාධා කිරීම්] Division එකක් සඳහා සීනුව නාද වන අවස්ථාවේදී ප්‍රකාශ බැහැ. [බාධා කිරීම්] Sorry, Hon. Member, you cannot make a statement. [බාධා කිරීම්] ආපසු මේකට රණ්ඩු කර ගන්න එපා, හේතුවක් නැතිව.[බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කොහේද තියෙන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝගවල තිබෙන්නේ. කියවන්න. [බාධා කිරීම්] No point of Order can be raised when the Division bell is being rung. So, I cannot allow a point of Order to be raised. Hon. Members, please sit down! [*Interruption].* -All that is provided in the Standing Orders. Hon. Member, you must read the Standing Orders. [*Interruption.]* All that is provided in the Standing Orders.

*බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -*
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the division bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඡන්දය දීමේ අවස්ථාව.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වුණු ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර දැනුම් දෙන්න.

*ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -*
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේ පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்தின் டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 41: විරුද්ධව 21 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்கப் பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 41; எதிராக 21.*
*According to Electronic Voting, Parliament divided: Ayes 41: Noes 21.*

| | |
|---|---|
| G 002. Mangala Samaraweera | Yes |
| G 004. Gamini Jayawickrama Perera | Yes |
| G 006. Lakshman Kiriella | Yes |
| G 007. Ranil Wickremesinghe | Yes |
| G 010. Rauff Hakeem | Yes |
| G 018. Mahinda Samarasinghe | Yes |
| G 019. Wajira Abeywardana | Yes |
| G 021. Ananda Kumarasiri | Yes |
| G 022. S.B. Nawinne | Yes |
| G 031. R.M. Ranjith Madduma Bandara | Yes |
| G 036. Thalatha Atukorale | Yes |
| G 045. A.H.M. Fowzie | Yes |
| G 055. Mohan Lal Grero | Yes |
| G 061. Sriyani Wijewickrama | Yes |
| G 063. Ajith P. Perera | Yes |
| G 066. J.C. Alawathuwala | Yes |
| G 076. Ranjan Ramanayake | Yes |
| G 077. Ashok Abeysinghe | Yes |
| G 079. Karunarathna Paranawithana | Yes |
| G 085. Nalin Bandara Jayamaha | Yes |
| G 094. Anura Sidney Jayarathne | Yes |
| G 095. K.K. Piyadasa | Yes |
| G 098. Hector Appuhamy | Yes |
| G 101. A. Aravindh Kumar | Yes |
| G 104. Velu Kumar | Yes |
| G 107. Kavinda Heshan Jayawardana | Yes |
| G 108. Ravi Karunanayake | Yes |
| G 109. Mylvaganam Thilakarajah | Yes |
| G 110. Mayantha Dissanayake | Yes |
| G 113. Bandula Lal Bandarigoda | Yes |
| G 116. Imran Maharoof | Yes |
| O 006. Dharmalingam Sithadthan | Yes |
| O 009. Mahinda Rajapaksa | No |
| O 010. Chamal Rajapaksa | No |
| O 013. Dinesh Gunawardana | No |
| O 014. Bandula Gunawardana | No |
| O 017. Vasudeva Nanayakkara | No |
| O 021. Selvam Adaikkalanathan | Yes |
| O 036. Chandrasiri Gajadeera | No |
| O 037. Anura Priyadharshana Yapa | No |
| O 058. Chandima Weerakkody | No |
| O 059. Dayasiri Jayasekara | No |
| O 061. Ashu Marasinghe | Yes |
| O 063. Mujibur Rahuman | Yes |
| O 072. T. Ranjith De Zoysa | No |
| O 074. Vijitha Berugoda | No |
| O 081. Jayampathy Wickramaratne | Yes |
| O 083. Rohini Kumari Wijerathna | Yes |
| O 084. Chaminda Wijesiri | Yes |
| O 085. Namal Rajapaksa | No |
| O 087. Vidura Wickramanayaka | No |
| O 089. Shehan Semasinghe | No |

[ගරු කථානායකතුමා]

| | |
|---|---|
| O 090. Kanaka Herath | No |
| O 092. D.V. Chanaka | No |
| O 094. Malith Jayathilake | Yes |
| O 096. Sanath Nishantha Perera | No |
| O 101. Hesha Withanage | Yes |
| O 105. Mohamadu Nazeer | Yes |
| O 110. Tharaka Balasuriya | No |
| O 112. Prasanna Ranaweera | No |
| O 113. Kanchana Wijesekara | No |
| O 114. Indika Anuruddha Herath | No |

*Total Voting Results*

| | |
|---|---|
| Yes | 41 |
| No | 21 |
| Abstain | 00 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! Ayes 41; Noes 21. The Motion is carried.

ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමාට ඊළඟ යෝජනාව සඳහා වන ඡන්ද විමසීමට සහභාගි වෙන්නට බැහැ.

දෙවැනි යෝජනාව, ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තු සේවය අත්හිටුවීම : ගරු විමල් වීරවංශ මහතා
## பாராளுமன்ற சேவையிலிருந்து இடைநிறுத்தல்: மாண்புமிகு விமல் வீரவங்ச
## SUSPENSION FROM SERVICE OF PARLIAMENT: HON. WIMAL WEERAWANSA

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"2018 සැප්තැම්බර් මස 5 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාවේ සඳහන් නිර්දේශයන්ට අනුකූලව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 77(1) යටතේ, පාර්ලිමේන්තු මන්ත්‍රී විමල් වීරවංශ මහතාගේ පාර්ලිමේන්තු සේවය සති දෙකක කාලයකට තාවකාලිකව අත්හිටුවීම සඳහා යෝජනාව මම ඉදිරිපත් කරමි."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Does the House agree?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Divide!

*බෙදීම් සීනුව නාද වී අවසන් වුණාට පසු -*
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the division bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Voting is in progress now.

*මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.*
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)*
*(At this stage, the Voting commenced.)*

*ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -*
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීම අවසානයි. ඡන්දය ප්‍රකාශ කිරීමට බැරි වූ ගරු මන්ත්‍රීවරයෙක් ඉන්නවා නම් අත ඔසවන්න. All the Members have voted.

*මේ අවස්ථාවේ පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.*
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்தின் டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

*විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව **39:** විරුද්ධව **21** යනුවෙන් බෙදුණේය.*
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க, பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 39; எதிராக 21.*
*According to Electronic Voting, Parliament divided: Ayes 39: Noes 21.*

| | |
|---|---|
| G 002. Mangala Samaraweera | Yes |
| G 004. Gamini Jayawickrama Perera | Yes |
| G 006. Lakshman Kiriella | Yes |
| G 007. Ranil Wickremesinghe | Yes |
| G 010. Rauff Hakeem | Yes |
| G 018. Mahinda Samarasinghe | Yes |
| G 019. Wajira Abeywardana | Yes |
| G 021. Ananda Kumarasiri | Yes |
| G 022. S.B. Nawinne | Yes |
| G 031. R.M. Ranjith Madduma Bandara | Yes |
| G 036. Thalatha Atukorale | Yes |
| G 045. A.H.M. Fowzie | Yes |
| G 055. Mohan Lal Grero | Yes |
| G 063. Ajith P. Perera | Yes |
| G 066. J.C. Alawathuwala | Yes |
| G 076. Ranjan Ramanayake | Yes |

| | |
|---|---|
| G 077. Ashok Abeysinghe | Yes |
| G 079. Karunarathna Paranawithana | Yes |
| G 085. Nalin Bandara Jayamaha | Yes |
| G 094. Anura Sidney Jayarathne | Yes |
| G 095. K.K. Piyadasa | Yes |
| G 098. Hector Appuhamy | Yes |
| G 101. A. Aravindh Kumar | Yes |
| G 104. Velu Kumar | Yes |
| G 107. Kavinda Heshan Jayawardana | Yes |
| G 108. Ravi Karunanayake | Yes |
| G 109. Mylvaganam Thilakarajah | Yes |
| G 110. Mayantha Dissanayake | Yes |
| G 113. Bandula Lal Bandarigoda | Yes |
| G 116. Imran Maharoof | Yes |
| O 006. Dharmalingam Sithadthan | Yes |
| O 009. Mahinda Rajapaksa | No |
| O 010. Chamal Rajapaksa | No |
| O 013. Dinesh Gunawardana | No |
| O 014. Bandula Gunawardana | No |
| O 017. Vasudeva Nanayakkara | No |
| O 021. Selvam Adaikkalanathan | Yes |
| O 035. Johnston Fernando | No |
| O 036. Chandrasiri Gajadeera | No |
| O 037. Anura Priyadharshana Yapa | No |
| O 058. Chandima Weerakkody | No |
| O 059. Dayasiri Jayasekara | No |
| O 061. Ashu Marasinghe | Yes |
| O 063. Mujibur Rahuman | Yes |
| O 072. T. Ranjith De Zoysa | No |
| O 074. Vijitha Berugoda | No |
| O 081. Jayampathy Wickramaratne | Yes |
| O 083. Rohini Kumari Wijerathna | Yes |
| O 084. Chaminda Wijesiri | Yes |
| O 085. Namal Rajapaksa | No |
| O 087. Vidura Wickramanayaka | No |
| O 089. Shehan Semasinghe | No |
| O 090. Kanaka Herath | No |
| O 092. D.V. Chanaka | No |
| O 096. Sanath Nishantha Perera | No |
| O 101. Hesha Withanage | Yes |
| O 105. Mohamadu Nazeer | Yes |
| O 110. Tharaka Balasuriya | No |
| O 113. Kanchana Wijesekara | No |
| O 114. Indika Anuruddha Herath | No |

*Total Voting Results*

| | |
|---|---|
| Yes | 39 |
| No | 21 |
| Abstain | 00 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Ayes, 39; Noes 21. The Motion is carried.

අද දිනට නියමිතව තිබෙන්නේ, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමාගේ, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු එම්. තිලකරත්න මැතිතුමාගේ සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු මංගල මුණසිංහ මැතිතුමාගේ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කිරීමටයි. ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
The first Vote of Condolence is on Hon. H. M. Upathissa Silva.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I think it is easy if all three Votes of Condolence are taken together.

## ශෝක ප්‍රකාශ :
## ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මහතා,
## ගරු එම්. තිලකරත්න මහතා සහ
## ගරු මංගල මුණසිංහ මහතා
## அனுதாபத் தீர்மானம்:
## மாண்புமிகு எச். எம். உபதிஸ்ஸ சில்வா,
## மாண்புமிகு எம். திலகரத்ன மற்றும்
## மாண்புமிகு மங்கள முனசிங்க
## VOTES OF CONDOLENCE:
## HON. H.M. UPATHISSA SILVA,
## HON. M. TILAKARATNE AND
## HON. MANGALA MOONESINGHE

[පූ.භා. 11.37]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)
**රත්නපුර දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව.**

රත්නපුර දිස්ත්‍රික්කයේ පොදු මහ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කරන ලද ගරු උපතිස්ස සිල්වා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

හිරිපිටියගේ විලියම් සිල්වා මහතාට හා චූලවතී ආටිගල යන මව්පියන්ට දාව කොටිගංගොඩ, පාදුක්කේදී 1943 පෙබරවාරි මස 16 වැනි දා උපතිස්ස සිල්වා මහතා ඡන්ම ලාභය ලැබුවේය.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

කොළඹ නාලන්දා විද්‍යාලයෙන් සහ මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද මෙතුමා ශිෂ්‍යයෙකු වශයෙන් සිටියදී එක්සත් ජාතික පක්ෂයේ තරුණ සංවිධාන සමඟ සම්බන්ධ වී කටයුතු කළේය.

පසු කලෙකදී මනෝරාමා සුරංජනී මෙනවිය සමඟ අතිනත ගත් උපතිස්ස සිල්වා මැතිතුමා එම විවාහයෙන් ජනේෂ් සිල්වා සහ දුමින්ද සරෝජ් සිල්වා යන පුතුන් දෙදෙනා මෙලොවට දායාද කළේය.

1982 වසරේ සිට 1987 දක්වා පුරා වසර 05ක පමණ කාලයක් රත්නපුර දිස්ත්‍රික් සංවර්ධන සභාවේ සභාපති ලෙස කටයුතු කර ඇති මෙතුමා නගරයේ ඓතිහාසික වැදගත්කම සුරක්ෂිත වන අන්දමින් මාර්ග වැඩිදියුණු කරමින් යටිතල පහසුකම් නංවාලීමට ක්‍රියා කළේය. 1987 වසරේ රක්වාන ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස එක්සත් ජාතික පක්ෂයෙන් පත් වූ මෙතුමා 1988 දෙසැම්බර් මස දක්වා රක්වාන ආසනයේ පොදු ජනතාව වෙනුවෙන් ඉතා කැපවීමෙන් සේවය කළේය.

1990 වසරේ සිට 1992 දක්වා සබරගමු පළාත් සභාවේ පළාත් පාලන, ක්‍රීඩා සහ සුභසාධක ඇමති ලෙස එම ධුරයේ වගකීම් සියතට ගනිමින් සුවිශාල කාර්ය භාරයක් ඉටු කළ මෙතුමා 1991 දෙසැම්බර් මස 05වෙනි දින නැවතත් පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයට පත් විය. 1994 වර්ෂයේදී පැවති මහ මැතිවරණයට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් තරග කර ඉන් ජයගෙන රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීමේ භාග්‍යය නැවතත් උදා කර ගත් උපතිස්ස සිල්වා මැතිතුමා 2000 වසර තෙක් රත්නපුර ජනතාව වෙනුවෙන් කැප වෙමින් සේවය කළ මන්ත්‍රීවරයෙකු ලෙස මෙහිදී පෙන්වා දිය හැකිය.

පසුව 2004 සිට 2008 දක්වා සබරගමු පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙසද මෙතුමා සේවය කර ඇත. ඓතිහාසික කෝට්ටේ රජමහා විහාරයේ බස්නායක නිලමේ තනතුර හෙබ වූ මෙතුමා විහාරස්ථානයේ තත්ත්වය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යාමට කටයුතු කළ අතර, එම කාලයේදී එහි සියලු ප්‍රතිසංස්කරණ කටයුතු ද සිදු කළේය. බස්නායක නිලමේ තනතුරෙහි වත් පිළිවෙත් ආරක්ෂා කර ගනිමින් යුගයට ගැළපෙන අයුරින් ඒවා ප්‍රතිනිර්මාණය කිරීම මෙතුමා නියැලී සිටි සමාජ, සංස්කෘතික හා ආගමික කටයුතුවලට නිදසුන් ලෙස දැක්විය හැකිය.

කිසිදු අවස්ථාවක දේශපාලනය ආභරණයක් කර නොගත් උපතිස්ස සිල්වා මැතිතුමා හිතට එකඟව තීරණ ගත්තේය. පාකිස්තානය, තායිලන්තය, නෝර්වේ සහ සයිප්‍රස් යන රටවල විදේශ සංචාරයන්හි නියුක්ත වූ එතුමා ඒවායින් ලද අත්දැකීම් පොදු ජනතාව වෙත සේවය කිරීම පිණිස යොදා ගැනීමට අමතක නොකළේය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ද බස්නායක නිලමේ ආදී තනතුරු දරමින් ද ජනතාවට සේවය කළ එතුමා අවුරුදු 74ක් ආයු වළඳා 2016 මැයි මස 26වන දින අප අතරින් සදහටම සමු ගත්තේය.

ගරු කථානායකතුමනි, 1987 වර්ෂයේ සිට 1988 වර්ෂයේ දෙසැම්බර් දක්වාද නැවත 1991 දෙසැම්බර් සිට 2000 වසර දක්වාද අවුරුදු 10කට වැඩි කාලයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පාර්ලිමේන්තුව තුළ රැඳී සිටීමින් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ ගරු උපතිස්ස සිල්වා මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර බිරිඳ, දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරමි.

**ගරු කථානායකතුමනි, ඊළඟට, අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. තිලකරත්න මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව.**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පොදු මහ ජනතාව නියෝජනය කරමින් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ ගරු එම්. තිලකරත්න මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මෙම අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරමි.

කේ. මැණික්රාළ මහතාට සහ කේ. ඩිංගිරි මැණිකා මහත්මියට දාව 1946 පෙබරවාරි මස 07වන දින කහටගස්දිගිලිය හිදී එම්. තිලකරත්න මැතිතුමා ජන්ම ලාභය ලැබුවේය. කහටගස්දිගිලිය මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපන කටයුතු හැදෑරූ එතුමා වැඩිදුර අධ්‍යාපන කටයුතු කොළඹ සුනේත්‍රාදේවී පිරිවෙණෙන් සිදු කළේය.

දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වශයෙන් සේවය කළ එතුමා පසු කලෙක එම්. ඉන්ද්‍රාවතී මෙනෙවිය සමඟ යුග දිවියට පිවිසියේය. ඇය ගුරු වෘත්තියේ නියැළුණු අයෙකු වූ අතර, ඔවුන් දෙදෙනාට දාව බිහි වූ දරුවන් තිදෙනාගෙන් වම්ලා තිලකරත්න සහ අනුරාධ තිලකරත්න යන දරුවන් ගුරු වෘත්තියේ නියැළෙමින් සිටින අතර, නිරෝෂා තිලකරත්න දියණිය අනුරාධපුර ශික්ෂණ රෝහලේ හෙද නිලධාරිනියක වශයෙන් සේවය කරයි.

හොරොව්පතාන ප්‍රදේශයේ සමිති සමාගම් රැසක ලේකම්, සභාපති, අනුශාසක ලෙස නිලතල රාශියක් දැරූ තිලකරත්න මැතිතුමා 1981 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික් සංවර්ධන සභා ඡන්දයෙන් සංවර්ධන සභා මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වී එම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විශාල සේවාවක් සිදු කර ඇත. ප්‍රදේශයේ කෘෂි කර්මාන්තය නඟා සිටුවීම වෙනුවෙන් තම අවධානය යොමු කළ එතුමා වාහල්කඩ වැව යටතේ ඇති ඇළ වේලි ප්‍රතිසංස්කරණය කිරීම, හුරුළු වැව යටතේ ඇති ඇළ වේලි ප්‍රතිසංස්කරණය කිරීම සහ පාලම් බෝක්කු ඉදි කරවමින් මාවත් ගණනාවක් තැනීම ආදිය කළේ ය. එමෙන්ම මහා ශ්‍රමදාන පවත්වා ඒවාට දායක වෙමින් ජනතාව වෙනුවෙන් උරෙනුර ගැටී වැඩ කටයුතු කළ නායකයෙකු ලෙස එතුමා පෙන්වා දිය හැකිය.

ප්‍රදේශයේ බොහෝ දෙනෙකුගේ විරැකියාවට පිළියම් ලෙස රැකියා අවස්ථා ලබා දීමට අත හිත දෙමින් කටයුතු කළ එතුමා ප්‍රදේශයේ ජනතාවගේ ඉඩම් ප්‍රශ්නවලට විසඳුම් ලබා දීමට මහත් වෙහෙසක් දරමින් ක්‍රියා කළ තැනැත්තකු ලෙස ද අප මෙහිදී ඉතා කෘතවේදීව සිහිපත් කළ යුතුය.

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පන්සල් හා පල්ලිවල නොයෙකුත් ආගමික කටයුතුවලට සම්බන්ධ වෙමින් ඒවායේ අභිවෘද්ධිය වෙනුවෙන් සහයෝගය ලබා දී කටයුතු කිරීම තුළින් සමාජ, සංස්කෘතික හා ආගමික කටයුතුවලට එතුමා දායකත්වයක් දැක්වීය.

1988 සැප්තැම්බර් මස සිට හොරොව්පතාන මැතිවරණ කොට්ඨාසයේ මන්ත්‍රීවරයා ලෙස පත්වූ නිලකරත්න මැතිතුමාහට 1988.12.20 දක්වා පාර්ලිමේන්තුව විසුරුවා හරින තුරු කෙටි කාලයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් සේවය කිරීමට ඉඩ ලැබිණි. එතුමා එම කාලය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විශාල සේවාවක්

සිදු කළේය. මෙසේ ජනතා මෙහෙවර කළ එතුමා අවුරුදු 72ක් ආයු වළඳා 2017 වසරේ අප්‍රේල් මස 18වන දින මෙලොව හැර ගියේය.

ගරු කථානායකතුමනි, 1988 සැප්තැම්බර් මස 29 දින සිට 1988 දෙසැම්බර් මස 20වැනි දා දක්වා පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ එම්. තිලකරත්න මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර බිරිඳ, දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරමි.

ගරු කථානායකතුමනි, මීළඟට, කළුතර දිස්ත්‍රික්කයේ පොදු මහජනතාව නියෝජනය කරමින් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ ගරු මංගල මුණසිංහ මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මා මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

සනත් මුණසිංහ සහ ලක්ෂ්මි මුණසිංහ මහත්මියට දාව 1931 ජූනි මස 13 වැනි දින එතුමා උපත ලැබුවේය. කොළඹ රාජකීය විදුහලෙන් සිප් සතර හැදෑරූ එතුමා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මෙන්ම බස්නාහිර පළාත් සභාවේ මහ ඇමති තනතුරද දැරූ සුසිල් මුණසිංහ මැතිතුමාගේ ඥාති සොහොයුරෙකි.

මහත්මා දේශපාලනයේ යෙදුණ කෙනකු ලෙස නමක් දිනා සිටි මංගල මුණසිංහ මැතිතුමා බ්‍රිතාන්‍යයේදී අධිනීතිඥවරයකු ලෙස සුදුසුකම් ලැබූ අතර, අයිසන්හවර් ශිෂ්‍යත්වය ලබා ඇමෙරිකා එක්සත් ජනපදයට ගොස් කැලිෆෝනියාවේ වෙස්ටර්න් ස්ටේට් විශ්වවිද්‍යාලයේදී අභ්‍යාවකාශ නීතිය හැදෑරුවේය. 1960 සිට 1963 දක්වා කාලය තුළ ලංකා කාර්මික විද්‍යාලයේ සමාගම් නීතිය පිළිබඳ කථිකාචාර්යවරයකු ලෙස සේවය කළේය.

පසු කලෙක එතුමා නීතිඥවරයකු, දේශපාලනඥයකු හා රාජ්‍ය තාන්ත්‍රිකයකු ලෙස කටයුතු කළේය. ලංකා සමසමාජ පක්ෂයෙන් දේශපාලනයට පිවිසි එතුමා 1965 සිට 1977 දක්වා බුලත්සිංහල ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විය. එසේම, එතුමා ඉන්දියාවේ මහ කොමසාරිස් පදවිය දැරූ අවදියේ ශ්‍රී ලාංකික ජනතාවට සුවිසල් සේවයක් කළේය.

පසුව නැවතත්, 1989 සිට 1994 දක්වා කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත් වූ එතුමා එම පළාතේ ජනතාව වෙනුවෙන් ඉතා කැපවීමෙන් කටයුතු කළේය.

ජනවාර්ගික අර්බුදයට විසඳුමක් සෙවීමේ අරමුණින් හිටපු ජනාධිපති අතිගරු රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ පත් කළ "ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදයට විසඳුම් සෙවීම සඳහා වන කමිටුවේ" සභාපති ධුරය ඉසිලුවේ එතුමා වන අතර, එම කමිටුවේ වාර්තාව "මංගල මුණසිංහ කමිටු වාර්තාව" වශයෙන් ප්‍රසිද්ධ විය.

චෙකොස්ලොවැකියාවේ වෘත්තීය සමිති කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා ඇති එතුමා, රුසියාවේ හා උතුරු කොරියාවේ ද සංචාරය කර ඇත. ජපන් ආධාර මඟින් නවදිල්ලියේ වන්දනාකරුවන් හට නවාතැනක් ගොඩනැඟීමට කටයුතු කළ එතුමා ශ්‍රී ලංකා ජනතාවට ඉතා අගනා මෙහෙවරක් සිදු කළ අතර, අවුරුදු 84ක් ආයු වළඳා 2016 වර්ෂයේ ජූලි මස 22 වන දින අපගෙන් සමු ගත්තේය.

ගරු කථානායකතුමනි, 1965 වසරේ සිට 1974 වසර දක්වාද, 1989 වර්ෂයේ සිට 1994 වර්ෂය දක්වාද අවුරුදු 17කට වැඩි කාලයක් පාර්ලිමේන්තුවේ රැඳී සිටිමින් කටයුතු කළ ගරු මංගල මුණසිංහ මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ අභාවය වෙනුවෙන් මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර බිරිඳ, දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමනි, ඒ යෝජනා ස්ථිර කරමින් ඔබතුමාට කථා කරන්න පුළුවන්.

[පූ.භා. 11.48]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}
ගරු කථානායකතුමනි, මා ඒ යෝජනා ස්ථිර කරනවා.

ගරු කථානායකතුමනි, පළමුවෙන්ම මා ගරු එච්.එම්. උපතිස්ස ද සිල්වා මැතිතුමා ගැන කථා කරන්න කැමැතියි. මා උපතිස්ස ද සිල්වා මැතිතුමා දැන ගත්තේ, නියෝජ්‍ය ඇමති එච්. කුලරත්න මැතිතුමා සමඟ සිටියදීයි. එතුමා එච්. කුලරත්න මැතිතුමාගේ - හැරල්ඩ් කුලරත්න මැතිතුමාගේ - නෑදෑයෙක්. අපි ඒ කාලයේ කුලරත්න මැතිතුමා ළඟින් ආශ්‍රය කළා. නන්ද මැතිව් හිටපු ඇමතිතුමා, ගාමිණී අතුකෝරළ හිටපු ඇමතිතුමා, එච්. කුලරත්න නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු අපි ඔක්කොම එකට වැඩ කටයුතු කළා.

රක්වානට ගිය අවස්ථාවක මට උපතිස්ස ද සිල්වා මැතිතුමා මුණගැසුණා. රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ උපතිස්ස ද සිල්වා මැතිතුමා අපේ පක්ෂයේ ප්‍රධාන සාමාජිකයෙක්. ඒ වගේම, එතුමා රත්නපුර සංවර්ධන සභාවේ සභාපති හැටියටත් පත් වුණා. කුලරත්න මැතිතුමා ආරම්භ කළ රක්වාන ප්‍රදේශයේ සංවර්ධන වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න භාර ගත්තේ එතුමායි. එදා රක්වාන කියන්නේ ඉතා නොදියුණු ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයට විදුලිබලය ලබා දෙන්න, පාසල් ලබා දෙන්න, පාරවල් දියුණු කරන්න කුලරත්න මැතිතුමා එක්ක උපතිස්ස ද සිල්වා මැතිතුමා විශාල සේවයක් කළා. කුලරත්න මැතිතුමාගේ මරණයෙන් පස්සේ උපතිස්ස ද සිල්වා මැතිතුමා තමයි රක්වාන ආසනය නියෝජනය කරන්න සුදුසු කියලා හැම දෙනාම ඒකමතිකව තීරණය කරලා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් එතුමා පාර්ලිමේන්තුවට පත් කළා. එහෙත්, 1988 මැතිවරණයෙන් පස්සේ එතුමාට යළිත් දේශපාලනයට එන්න අවස්ථාව ලැබුණේ 1991දී. එතුමා 1991දී පාර්ලිමේන්තුවට පැමිණිලා කාලයක් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියටත්, පසුව විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියටත් 2000 වර්ෂය වන තෙක් ක්‍රියා කළා.

එතුමා 1994 මැතිවරණය ජයග්‍රහණය කරලා තමයි ඉදිරියට ගියේ. ඒ කාලයේ ඒ ප්‍රදේශයට නායකත්වයක් දෙන්න, ඉදිරියට ගෙන යන්න එතුමා හැම විටම කැප වුණා. අපේ 2001 ජයග්‍රහණයටත් එතුමා විශාල සේවයක් කළා. රක්වාන ආසනය අපි ජයග්‍රහණය කළත්, එතුමාට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණේ නැහැ. එහෙත්, 2004 එතුමා පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා, 2008 වෙනකල් පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට ක්‍රියා කළා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

එතුමා ප්‍රදේශයේ බෞද්ධ විහාරස්ථානවල වැඩ කටයුතුවලට සම්බන්ධ වුණා; සමාජ සේවා වැඩ කටයුතුවලට සම්බන්ධ වුණා. එතුමා ව්‍යාපාරිකයකු හැටියට, වැවිලිකරුවකු හැටියට ඒ වැඩ කටයුතුත් කළා. විශේෂයෙන්ම, රක්වාන ප්‍රදේශයේ ජනතාව උපනිස්ස සිල්වා මැතිතුමාට තවමත් ගරු කරනවා. එතුමා දැඩි ලෙස අප සමඟ දේශපාලනය කළා. අපට අමාරු කාලයේත් එතුමා අපි එක්ක හිටියා; දිනන කාලයේත් එතුමා අපි එක්ක හිටියා. එතුමා සමඟ තිබුණු ඒ සම්බන්ධකම මම මෙහිදී මතක් කරනවා. විශේෂයෙන්ම, අපේ උපනිස්ස සිල්වා මැතිතුමා විසින් අපට, රත්නපුර දිස්ත්‍රික්කයට කර තිබෙන සේවය මතක් කරමින්, ඒ සේවය වෙනුවෙන් එතුමාට ස්තුති කරමින්, එතුමාට නිවන් සැප ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අද දින මේ සභාවේ ශෝකය ප්‍රකාශ කරන එම්. තිලකරත්න මන්ත්‍රීතුමා මම දැනගත්තේ සංවර්ධන සභාවේ මන්ත්‍රීවරයකු හැටියටයි. අපේ හිටපු හූරුල්ලේ මැතිතුමා එතුමා ඒ සඳහා නම් කරලා තිබුණා. එතුමා සංවර්ධන සභාව ජයග්‍රහණය කළා. එසේ ක්‍රියා කරමින් සිටින විට ආණ්ඩුකාරවරයා හැටියට පත්වීමට හූරුල්ලේ ඇමතිතුමා 1988දී හොරොව්පොතාන ආසනයෙන් ඉල්ලා අස් වුණා. ඉන් පසුව කෙටි කාලයක් තිලකරත්න මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට ක්‍රියා කළා. තේමිය හූරුල්ලේ මැතිතුමා 1989දී යළිත් හොරොව්පොතාන ආසනයට ඉදිරිපත් වුණු නිසා එතුමා ඉවත් වුණා. ඒත් ඒ කාලය තුළ එතුමා සමාජ සේවයේ යෙදිලා කරපු වැඩ කටයුතු අපි මතක තබා ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් එතුමාට ස්තුතිය පුද කළ යුතු වෙනවා. එතුමාටත් නිවන් සැප ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට මංගල මුණසිංහ මැතිතුමා ගැන මා විශේෂයෙන් සඳහන් කළ යුතුයි.

මංගල මුණසිංහ මැතිතුමා මම දැනගත්තේ ප්‍රතිපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියටයි. මංගල මුණසිංහ මැතිතුමා 1965 සිට 1977 වනතුරු බුලත්සිංහල ආසනය නියෝජනය කළා. ඒ කාලයේ අනිල් මුණසිංහ මැතිතුමා අගලවත්ත ආසනය නියෝජනය කළා. "මුණසිංහවරු" නියෝජනය කරන ප්‍රදේශයක් හැටියට තමයි ඒ ප්‍රදේශය නමක් ගත්තේ. එතුමා ඒ කාලයේත් සමසමාජ පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් වුණා. එංගලන්තයේදී අධිනීතිඥවරයකු හැටියට දිවුරුම් දුන්නත්, මේ රටට පැමිණ දේශපාලන වැඩ කටයුතුවල යෙදුණා. එතුමා පාර්ලිමේන්තුවේ සිටි කාලය තුළ මම පාර්ලිමේන්තුවේ සිටියේ නැහැ කියලා මට මතකයි. එතුමා හොඳට පාර්ලිමේන්තුවේදී කරුණු ඉදිරිපත් කළා; හොඳට ඒ අදහස් ඉදිරිපත් කළා. මා හිතන විධියට ඒ කාලයේ සමසමාජ පක්ෂයෙන් ඉදිරියට එන්න පුළුවන් නායකයකු හැටියට තමයි එතුමාට සලකා තිබුණේ. එහෙත් 1977 මැතිවරණයේදී එතුමා පරාජය වුණා. නමුත් 1989දී යළිත් එතුමා පාර්ලිමේන්තුවට තේරුණා. මේ පාර්ලිමේන්තුව තුළදී තමයි මම එතුමා හොඳට ආශ්‍රය කරන්න පටන් ගත්තේ. එතුමා එක්ක අපි එකට වැඩ කටයුතු කළා. "මේ රටේ ජාතිවාදී ප්‍රශ්න විසඳන්න ඕනෑ, අපි යුද්ධයට විසඳුමක් හොයන්න ඕනෑ" යනුවෙන් හැම වෙලාවේම එතුමා කථා කළා. ඒ සඳහා අපි පක්ෂ සියල්ලම එකතු වුණා. මම එදා සභානායක හැටියටයි කටයුතු කළේ. ඒ පක්ෂ සියල්ලම එකතු වෙලා, "මේ ප්‍රශ්නවලට විසඳුමක් හොයන්නට පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කරලා ඒ විශේෂ කාරක සභාවට භාර දෙමු" කියලා කටයුතු කළා. "ඒ විශේෂ කාරක සභාවේ සභාපති විපක්ෂයේ මන්ත්‍රීවරයකු විය යුතුයි" කියලා ආර්. ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා තීරණය කරලා, අවසානයේ මංගල මුණසිංහ මැතිතුමා එහි සභාපති හැටියට පත් කළා. අපි ඒ කමිටුවේ රැස්වීම් ගණනාවක් පැවැත්වුවා. මම අගමැති වුණාට පසු ඒ රැස්වීම්වලට සහභාගි වුණේ නැහැ. ඊට පෙර සහභාගි වුණා. ඒ කමිටුවේ රැස්වීම් ගණනාවක් පවත්වලා ප්‍රථම වතාවට ප්‍රධාන පක්ෂ දෙකට විසඳුමක් ගැන එකඟත්වයකට එන්න අවස්ථාව ලැබුණා. අපේ ප්‍රධාන පක්ෂ දෙක එකඟත්වයකට ආවාට, ද්‍රවිඩ පක්ෂ -TULF පක්ෂය- ඒකට එකඟ වුණේ නැහැ. එදා ඒ විසඳුම්වලට එකඟ වුණා නම්, සමහර වෙලාවට අද වෙනස් ඉතිහාසයක් මේ රටේ පවතින්න තිබුණා. ඒ වෙනුවෙන් මංගල මුණසිංහ මන්ත්‍රීතුමා ගත්ත උත්සාහයට අපි සියලුදෙනාම එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ "මංගල මුණසිංහ වාර්තාව" ගැන අදත් කථා කරනවා. එදා පළමු වතාවටයි ජනවාර්ගික ගැටලුව විසඳන්න ප්‍රධාන පක්ෂ දෙක එකඟ වුණේ. එදා දීපු විසඳුම් අපි එදා පිළිගත්තා නම් අද මේ රටේ මේ තත්ත්වය ඇති වන්නේ නැහැ.

ඒ නිසා එතුමාව සිහිපත් කිරීම වෙනුවෙන් අපට කරන්නට තිබෙන්නේ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පක්ෂ සියල්ලම එකඟත්වයකට එන එක කියලයි මම හිතන්නේ. අපි ළඟදීම විශේෂඥයන්ගේ කෙටුම්පතත් ඉදිරිපත් කරන්නම්. එතැන ඉඳලා සාකච්ඡා කරද්දී මංගල මුණසිංහ මැතිතුමා වෙනුවෙන් කළ හැකි හොඳම උපහාරය තමයි අප සියලුදෙනා ඒ පිළිබඳ එකඟ වීම.

එතුමා ඉන්දියාවේ මහකොමසාරිස් වශයෙන් කටයුතු කළා. ඉන් පසුව එතුමා එංගලන්තයට ගියා. මම ඉන්දියාවට ගිය අවස්ථාවකත්, ඊට පසුව එංගලන්තයට ගිය අවස්ථාවේ දීත් එතුමාව මහ කොමසාරිස් හැටියට හමුවීමට මට අවස්ථාව ලැබුණා. මම අගමැති වශයෙන් පත්වී සාම ගිවිසුම අත්සන් කළ පසුව නවදිල්ලියේ අලුත් මහ කොමසාරිස්වරයෙක් පත් කරන්න අවශ්‍ය වුණා. මේ සම්බන්ධයෙන් විශේෂයෙන් වැඩ කටයුතු කළ හැකි පුද්ගලයෙක්, හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියටත්, මටත් යන දෙදෙනාටම විශ්වාස කළ හැකි පුද්ගලයෙක් තමයි අවශ්‍ය වුණේ. එහෙම පුද්ගලයෙක් සොයන එක ලෙහෙසි පහසු වැඩ කටයුත්තක් නොවෙයි. ඒත් මංගල මුණසිංහ මැතිතුමාව නැවත නවදිල්ලියට කැඳවීමට මා තීරණය කළා. එයට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිවරියත් එකඟ වුණා. එතුමා නවදිල්ලියට ඇවිත් එම කාලය තුළ එහි විශාල සේවයක් සිදු කළා. ඉන්දු-ලංකා සම්බන්ධකම් වැඩි දියුණු කරන්නත්, වජපායි අගමැතිතුමා සමඟ වැඩ කටයුතු කරමින් සටන් විරාම ගිවිසුම ඉදිරියට ගෙන යෑමටත් එතුමා විශාල සේවයක් සිදු කළා. මම විශේෂයෙන්ම ඒ ගැන සඳහන් කරන්න කැමතියි.

ඉන් පසුව එතුමා මාර්ග සංවර්ධන වැඩ කටයුතුවලත් යෙදුණා. මා විටින් විට එතුමා හමු වුණා. එතුමා මුණ ගැසුණු අවස්ථාවල දී මේ රටේ සාමය ඇති කරන්නේ කොහොමද, සංහිඳියාව ඇති කරන්නේ කොහොමද කියන එක ගැන හැම අවස්ථාවකම එතුමාගේ අදහස් ලබා දුන්නා. ඒක අපි අමතක කරන්න හොඳ නැහැ. එතුමාත්, එතුමාගේ බිරිඳ ඥානාත් බොහෝ අවස්ථාවල අප සමඟ එක් වෙලා වැඩ කටයුතු කර තිබෙනවා. එතුමා අසනීපව සිට අභාවප්‍රාප්ත වූ අතර, එතුමාගේ අභාවය අපට සිදු වූ විශාල පාඩුවක් බව කනගාටුවෙන් යුතුව මා කියන්න කැමැතියි. එතුමා අද සිටියා නම් මේ කරන වැඩ කටයුතුවලදී එතුමාගේ දැනුමෙන් හැම පක්ෂයටම කථා කිරීමට එතුමාට අවස්ථාව තිබුණා. කෙසේ හෝ අද එතුමා අපි අතර නැහැ. මේ අවස්ථාවේ එතුමාගේ සේවයට ස්තුති කරමින්, මම එතුමාට නිවන් සැප ප්‍රාර්ථනා කරනවා.

අද දින ඉදිරිපත් කර තිබෙන ශෝක යෝජනාවලට අදාළව අපෙන් සමුගත් අනෙකුත් හිටපු මන්ත්‍රීවරු දෙදෙනාගේ සේවය ගැනත් අද සිහිපත් කළා. ඒ අයට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, අපගේ ශෝක ප්‍රකාශ එම පවුල්වල අයට දන්වා යවන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා.

[පූ.භා. 11.57]

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
( மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
ගරු කථානායකතුමනි, මංගල මුණසිංහ මැතිතුමාගේ අභාවය පිළිබඳ ඒකාබද්ධ විපක්ෂයේ ශෝකය මේ අවස්ථාවේදී විශේෂයෙන් ප්‍රකාශ කරනවා. මංගල මුණසිංහ මැතිතුමා පෞද්ගලික මිත්‍රයෙක් වශයෙන් අපි ආශ්‍රය කළා. එතුමා මානව හිතවාදියෙක්. ඒ වාගේම නීතිඥයෙක්. එදා රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා එංගලන්තයට ගොස් බැරිස්ටර් කෙනෙක් වශයෙන් සුදුසුකම් ලබා ලංකාවට පැමිණ ලංකාවේ අධිනීතිඥයකු වශයෙන් සේවය කළා. ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔහුගෙන් විය යුතු යුතුකම රටට ඉටු කළා. සම සමාජ පක්ෂය තුළින් දේශපාලන ගමන ආරම්භ කර පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමඟ එකතු වී කටයුතු කළා. එතැනින් එහාට ගිහින් එතුමා නවදිල්ලියේ මහ කොමසාරිස්වරයා වශයෙනුත්, පසුව එංගලන්තයේ මහ කොමසාරිස්වරයා වශයෙනුත් සේවය කළා. ඔහුගෙන් සිදුවූ සේවය අපමණයි. ජාතික ප්‍රශ්නයේ දී ඔහු සෑම අවස්ථාවකදීම සංවේදීව මේ ප්‍රශ්නය විසඳීම සඳහා මැදිහත් වුණා. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදයට විසඳුම් සෙවීම සඳහා වන කමිටුව එතුමාගේ සභාපතිත්වයෙන් තමයි පත් වුණේ. ඒ පිළිබඳ වාර්තාව අදත් බොහොම පැහැදිලිව තිබෙනවා. ඇත්ත වශයෙන්ම මංගල මුණසිංහ මැතිතුමා සමඟ මා වඩාත් කිට්ටු වුණේ අප දෙදෙනාම පැරදි සිටින කාලයේ දීයි. ධර්මපාල මාවතේ පිහිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති කාර්යාලයේ දී අප දෙදෙනා හමු වුණා. වෘත්තීය සංගම් පිළිබඳ හැදෑරීමට අප දෙදෙනාටම චෙකෝස්ලෝවේකියාවේ ශිෂ්‍යත්වයක් ලැබුණා.

මාස තුනක් පමණ අප දෙදෙනාට චෙකොස්ලොවෙකියාවේ වෘත්තිකයන් පුහුණු කරන ආයතනයේ වෘත්තිය සමිති කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාව හදාරන්න අවස්ථාව ලැබුණා. අපි දෙදෙනා එක කාමරයේ හිටියේ. එහිදී අපි නොයෙක් දේ පිළිබඳව කථා කළා. දේශපාලනය, පෞද්ගලිකත්වය, රටේ ජාතික ප්‍රශ්නය, වෘත්තීය ප්‍රශ්න පිළිබඳව, වෘත්තීය සංගම් පිළිබඳව හා අනෙකුත් ප්‍රශ්න පිළිබඳව අපට කථා කරන්න අවස්ථාව ලැබුණා. ඒ තුළින් එතුමාට මමත්, මට එතුමාවත් හොඳින් හඳුනා ගන්න පුළුවන් වුණා. විශේෂයෙන් ධර්මපාලතුමාගේ ගුණ සමරන මේ සභයේ දී ගරු මංගල මුණසිංහ මැතිතුමාගේ ගුණ කියන්න අවස්ථාවක් ලැබීම වඩාත් කාලෝචිතයි කියලා මා සිතනවා. මොකද, එතුමාත් ධර්මපාලතුමාගේ ඥාති පරම්පරාවෙන් එන අයකු නිසා. එතුමා බුලත්සිංහලට විතරක් නොවෙයි, කළුතර දිස්ත්‍රික්කය ඇතුළු මුළු රටටම විශාල සේවයක් කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් විතරක් නොවෙයි, නානාපනිවරයකු වශයෙන් ජාත්‍යන්තර රටවල මිත්‍රත්වය පවත්වා ගෙන යන්නත්, යුද කාලයේදී පවා එකිනෙකා අතර අවබෝධය ඇති කරවමින් සහ ඒ ඒ රජයන්වල අගමැතිවරු, ඇමතිවරු එක්ක ඉතාම කිට්ටු සම්බන්ධකම් ඇති කරගෙන පෞද්ගලිකව ඔවුන් සමඟ කථා කරන්න එතුමාට ශක්තියක් තිබුණායි කියා මා විශ්වාස කරනවා. එතුමා පාර්ලිමේන්තුව තුළ අපත් සමඟ මිතුරකු -සගයකු- වශයෙන් කටයුතු කළා. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාත් ඒ යුගයේදී එතුමා එක්ක එකට පාර්ලිමේන්තුවේ හිටියා. ඒ නිසා මිතුරකු වශයෙනුත්, දේශපාලනඥයකු වශයෙනුත්, මානව හිතවාදියකු වශයෙනුත් මේ අවස්ථාවේදී එතුමාට අපේ ගෞරවය පුද කරනවා. ඒ වාගේම එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ ආදරණීය බිරිඳ ඥානා මුණසිංහ මැතිනියටත්, එතුමාගේ දරුවන් ඇතුළු පවුලේ අනෙකුත් සියලු දෙනා වෙත අපගේ ශෝකය ප්‍රකාශ කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

මීළඟට, ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කළ, ගරු එම්. තිලකරත්න මැතිතුමාගේ අභාවය පිළිබඳවත්, එතුමාගේ පවුලේ උදවිය වෙත අපගේ ශෝකය පුද කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමාගේ අභාවය පිළිබඳවත් අපගේ ශෝකය පුද කරනවා. විශේෂයෙන් එතුමා නාලන්දා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක්. අපි එතුමා එක්ක එකට අධ්‍යාපනය ලැබුවා. ඒ නිසා අපි එකිනෙකාව හොඳින් හඳුනනවා. දේශපාලනික වශයෙන් මොන විධියේ ප්‍රශ්න තිබුණත් අපි රත්නපුරය හරහා යන හැම දවසකම එතුමාගේ ගෙදරට එන්න කියලා අපට ආරාධනාව ලැබෙනවා. ඒ අනුව අපි ඒ ගෙදරට ගිහිල්ලා තේ බීලා, කථා කරලා එනවා. දේශපාලනමය වශයෙන් කුමන පැත්තක් නියෝජනය කළත් එතුමා පෞද්ගලිකව අප සමඟ බොහොම හිතවත්ව කටයුතු කළා. එතුමා ඒ පළාතට කළ සේවය අගය කරන ගමන් එතුමාගේ අභාවය සම්බන්ධයෙන් එතුමාගේ පවුලේ අයට අපේ ශෝකය ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.03]

**ගරු තලතා අතුකෝරල මහත්මිය (අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Justice and Prison Reforms)
ගරු කථානායකතුමනි, රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ ඉතාම වැදගත් දේශපාලනඥයකු හැටියට අප කාගේත් මතකයේ රැඳෙන ගරු උපතිස්ස සිල්වා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරන මේ මොහොතේ විශේෂයෙන්ම එතුමාගේ පවුලේ උදවිය සමඟ ඉතාම කිට්ටු සම්බන්ධතාවකින් කටයුතු කරන කෙනකු හැටියට මා, එතුමා ගැන මතක් කරන්නේ ඉතාමත් කෘතවේදීත්වයකිනුයි. ගරු උපතිස්ස සිල්වා මැතිතුමා සංවර්ධන සහා සභාපතිවරයකු හැටියටත්, පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියටත්, පළාත් සභාවේ ඇමතිවරයකු හැටියටත් සහ රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියටත් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ හදවතෙහි හැමදාමත් හොඳින් මතක තිබෙන චරිතයක් බව මේ අවස්ථාවේ දී මතක් කරන්නට ඕනෑ.

එක්දහස්නවසිය හැට ගණන්වල තමයි එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමා දේශපාලනයට ප්‍රවිෂ්ට වෙන්නේ. එතුමාගේ මාමණ්ඩිය වන, එවකට එක්සත් ජාතික පක්ෂයේ රත්නපුර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ දේශපාලන නායකයෙකුව සිටි හැරල්ඩ් කුලරත්න මැතිතුමාගේ ආභාෂයෙන් තමයි එතුමා දේශපාලනයට පිවිසෙන්නේ. උපතිස්ස සිල්වා මැතිතුමා, හැරල්ඩ් කුලරත්න මැතිතුමාගේ දේශපාලන කටයුතුවලදී ඉතාම ළඟින් ඉඳගෙන ඒ අවශ්‍ය සහයෝගය ලබාදුන්නා වාගේම, රක්වාන මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරමින් විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් එක්දහස්නවසිය හැට ගණන්වල ඉඳලාම තරුණ සංවිධානවලට ඒ අවශ්‍ය නායකත්වය ලබා දුන්නා. හැරල්ඩ් කුලරත්න මැතිතුමාගේ නායකත්වය, මහ පෙන්වීම අනුව යමින්, රක්වාන මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරමින් තමයි උපතිස්ස මැතිතුමා දේශපාලනයට පිවිසියේ. ඇත්තටම උපතිස්ස

[ගරු තලතා අතුකෝරල මහත්මිය ]

සිල්වා මැතිතුමා අද දේශපාලනයේ යෙදෙන බොහෝ අයට හොඳින් ආදර්ශයට ගන්න පුළුවන් දේශපාලනඥයෙක්. බොහොම නිහඬව, ඒ වාගේම තමන්ට අයිති කාර්යය ඉතාම මැනවින් ඉෂ්ට කරමින්, තමන්ගේ පාක්ෂිකයන්ට වාගේම තමන් නියෝජනය කළ රක්වාන ආසනයේ සියලු ජනතාවට පක්ෂ භේදයකින් තොරව සේවය කරමින් වැදගත් දේශපාලනයක යෙදුණු මහත්මයෙක් හැටියට අපට එතුමා හඳුන්වන්න පුළුවන්. මොනම හේතුවක් නිසාවත් වංචාව, දූෂණය, නාස්තිය පිළිබඳව එතුමාට කවදාවත් චෝදනා තිබුණේ නැහැ. ඒ වාගේම වැදගත් පරම්පරාවකින් පැමිණි කෙනකු හැටියට තමන්ගේ බාප්පාගේ අඩි පාරේ යමින්, එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා කරන්නත්, තනතුරුවල ගරුත්වය ආරක්ෂා කරන්නත් එතුමා බොහොම හොඳින් කටයුතු කළා.

උපතිස්ස සිල්වා මැතිතුමාගේ අභාවය, හදිසි අභාවයක්ය කියා අපට කියන්න බැහැ. මොකද, එතුමා ටික කාලයක් අසනීපයෙන් සිටියා. හැබැයි මට මතක් කරන්න පුළුවන්, මොන තරම් අමාරු තත්ත්වයෙන් සිටියත් එතුමා ඒ සෑම කාල වකවානුවකම එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් නිරන්තරයෙන්ම ඇප කැප වුණු බව. එතුමා හැම මැතිවරණයකදීම වාගේ පක්ෂය වෙනුවෙන් කෙරෙන්න තිබෙන, කරන්න තිබෙන කටයුතු ඉතාම මැනවින් සොයා බලා කළා. මැතිවරණවලට ඉදිරිපත් වෙනවාද, නැද්ද කියන එක නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති තුළ ඉඳගෙන ඒ අවශ්‍ය කටයුතු කිරීම තමයි එතුමාට වැදගත් වුණේ.

උපතිස්ස සිල්වා මැතිතුමාගේ පවුලේ තොරතුරු ගැනත් මම කෙටියෙන් කියන්නම්. එතුමාගේ පවුල ව්‍යාපාරික පවුලක්. එතුමා යමක් කමක් තියාගෙන දේශපාලනයට ප්‍රවිෂ්ට වුණු කෙනෙක්. ඒ කාලයේ දේශපාලනය කළ අය මුදල් පසු පස හඹාගෙන යන තත්ත්වයක් තිබුණේ නැහැ. ඒ වාගේ ඉතාම නිහතමානී, තමන්ගේ තනතුරේ ගරුත්වය, තමන්ගේ පවුල් පසු බිමේ ගරුත්වය ආරක්ෂා කරගෙන වැඩ කළ කෙනෙක් හැටියට තමයි මට එතුමා පෞද්ගලිකව මතක. මොකද, එතුමා මගේ සහෝදරයා වන අභාවප්‍රාප්ත ගාමිණී අතුකෝරල මැතිතුමා සමඟ ඉතාම ළඟින් කටයුතු කළා. ඇත්තටම අපි ඒ කාලයේ මොන තරම් සමීපව සිටියාද කිව්වොත්, සහෝදර බැම්මකින් බැඳිලා තමයි අපි හැම කෙනෙක්ම කටයුතු කළේ. එතුමාගේ පවුල් පසු බිම වාගේම, එතුමා කළ සමාජ සේවය ගැනත් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ. ඕනෑම ඇත පිටිසර ගම්මානයකට ගියොත්, අදත් එතුමාගේ නම මතක් කරලා කථා කරන අය ඕනෑ තරම් ඉන්නවා. එතුමාට තිබුණේ ඉතාම කෙටි පාර්ලිමේන්තු කාලයක්. ඒ කාලය තුළත් එතුමා වැඩි හරියක්ම නියෝජනය කළේ විපක්ෂයයි. විපක්ෂය නියෝජනය කරමින් වුණත් තමන්ගේ මැතිවරණ බල ප්‍රදේශයේ අවශ්‍යතා වෙනුවෙන් පක්ෂ භේදයකින් තොරව කටයුතු කරන්න එතුමා ඉදිරිපත් වුණා.

එතුමාගේ දයාබර බිරිඳ වන සුරංජනී ගුණවර්ධන මැතිනිය එතුමාට විශාල ශක්තියක් ලබා දුන්නා වාගේම, අද එතුමා ජීවතුන් අතර නැති වුණත්, තමන්ගේ දරුවන් යහපත්, වැදගත් දරුවන් හැටියට සමාජයට අවතීර්ණ කර තිබෙනවා. විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරියක් හැටියට, ඉතාම කිට්ටු සම්බන්ධතාවක් තිබෙන පවුලක කෙනෙක් හැටියට මම මේ අවස්ථාවේ ගරු උපතිස්ස සිල්වා මැතිතුමාට එතුමා ප්‍රාර්ථනය කරන බෝධියකින් නිවන් දකින්න හැකි වේවායි ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, ගරු මංගල මුණසිංහ මැතිතුමා ලංකා සම සමාජ පක්ෂය නියෝජනය කරමින් දේශපාලනය ප්‍රවිෂ්ට වෙලා රට වෙනුවෙන් ඉතාම හොඳ සේවයක් කළා. ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා වගේ, රාජ්‍ය තාන්ත්‍රිකයකු හැටියට, මන්ත්‍රීවරයකු හැටියට එතුමා තමන්ගේ ජීවිත කාලය තුළ මේ රට වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉෂ්ට කළා.

එතුමා ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා ලෙස කටයුතු කරද්දී, මේ රටවල් දෙක අතර සමීප සම්බන්ධතාවක් ඇති කරගෙන, රටවල් දෙකේ රාජ්‍ය තාන්ත්‍රිකභාවය හොඳින් ආරක්ෂා කරගනිමින් කටයුතු කළා. අනගාරික ධර්මපාලතුමාගේ පරම්පරාවෙන් පැවත එන උදවිය හැටියට මේ රටවල් දෙක අතර තිබුණු සම්බන්ධතාව වැඩිදියුණු කරගෙන, එය ආරක්ෂා කරන්න කටයුතු කළ මන්ත්‍රීවරයකු හැටියට ගරු මංගල මුණසිංහ මැතිතුමා මේ අවස්ථාවේ අපිට මතක් කරන්න පුළුවන්. එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ මැතිනිය ඇතුළු පවුලේ සියලුදෙනාටම අපේ ශෝකය මේ අවස්ථාවේ පළ කරනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හොරොව්පතාන ආසනය නියෝජනය කරමින් පැමිණි ගරු එම්. තිලකරත්න මන්ත්‍රීතුමා ඉතාම කෙටි කාලයක් තමයි මේ පාර්ලිමේන්තුවේ රැඳී සිටියේ. හොරොව්පතාන ප්‍රදේශය අද යම්කිසි මට්ටමක දියුණුවකට පත්වෙලා තිබුණත්, තිලකරත්න මහත්මයලා නියෝජනය කළ කාලයේ එය දුෂ්කර ප්‍රදේශයක්ව පැවතුණා. එම ග්‍රාමීය ආර්ථිකය තුළ ජීවත් වූ ගොවි ජනතාව ඇතුළු අනික් සියලුම ජනයා ඉතාම අමාරු තත්ත්වයකයි ජීවත් වුණේ. ගරු එම්. තිලකරත්න මහත්මයා අපේ හිටපු අමාත්‍ය, ගරු හුරුල්ලේ මැතිතුමාගේ ආභාසය ලබමින්, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් දේශපාලනය කළ කෙනෙක්. එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ පවුලේ උදවියට මේ අවස්ථාවේ අපේ ශෝකය පළ කරනවා. ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මන්ත්‍රීතුමාටත්, ගරු මංගල මුණසිංහ මන්ත්‍රීතුමාටත්, ගරු එම්. තිලකරත්න මන්ත්‍රීතුමාටත් එතුමන්ලා ප්‍රාර්ථනය කරන බෝධියකින් නිවන් දකින්නට වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

[12.12p.m.]

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**

(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Mr. Speaker, I would like to say a few words on the Condolence Motion pertaining to the Hon. Mangala Moonesinghe. The Hon. Mangala Moonesinghe was a lawyer; he was a politician; he was a diplomat; he was a civil society activist, and apart from that Sir, he was one of the finest of gentlemen.

Sir, I will start with my last description of him that he was one of the finest of gentleman. He was amiable, he was affable, self-effacing to a point of almost being shy, kind, refined, warm, to put it altogether and to put it briefly, he was one of the finest gentlemen you could ever meet.

My first contact with the late Hon. Mangala Moonesinghe Sir, was as a lawyer. We were both lawyers. We opposed each other as lawyers in many matters pertaining to trade union rivalry in the Trincomalee Port. The Hon. Mangala Moonesinghe represented the LSSP, the left trade union. I represented the trade union affiliated to the Federal Party or the Illankai Tamil Arasu Kachchi. They were both powerful

trade unions and there was a lot of litigation in court and we represented the different trade unions I mentioned earlier.

We came to know each other fairly closely and the closer that I came to know Hon. Mangala Moonesinghe, my respect for him grew. The Hon. Mangala Moonesinghe was a Member of Parliament. He represented both the Bulathsinhala and the Kalutara Electorates. He entered Parliament through the LSSP and later through the Sri Lanka Freedom Party. He is said to have had a very close association with the people, particularly the people of his Constituency and one can easily visualize the warmth and kindness with which he interacted with his constituents. He is said to have been engaged very much in development activity in his area.

The late Mangala Moonesinghe was a progressive and a liberal. He was not one who played the racial card or the communal card to continue to sustain his political career. He believed in all Sri Lankans being equal citizens. A significant role he played as a Member of Parliament was when he chaired the Select Committee on Constitutional Reform during His Excellency President Premadasa's term. It was in 1991. After the Indo-Sri Lanka Accord was signed in July, 1987 and the Thirteenth Amendment to the Constitution had been enacted, the Hon. Mangala Moonesinghe was appointed as the Chairman to a Select Committee appointed by President Premadasa to consider further Constitutional Reform. Despite the Hon. Managala Moonesinghe being a Member of Parliament of the Opposition, of the Sri Lanka Freedom Party, President Premadasa appointed him as the Chairman of the Select Committee on Constitutional Reform. That was indicative of the immense trust and respect that the Hon. Managala Moonesinghe commanded.

Through painstaking negotiations, he was able to achieve a substantial consensus which inter alia referred to: one - devolution on the Indian pattern which meant that while ensuring the territorial integrity of the country there would be genuine power-sharing arrangements.

The second is, substantially transferring subjects in the Concurrent List to the Provincial List or doing away completely with the Concurrent List.

And the third is, an Apex Council of the Northern and Eastern Provincial Councils enabling the Tamil speaking people of the North and the East to be real beneficiaries of power sharing arrangements. In a spirit of goodwill and cooperation amongst all the people who lived in the different provinces, regions in the country, the recommendations reflected a genuine desire to address the longstanding genuine concerns of the Tamil speaking people of the North and the East. The proposals were reflective of the depth of the late Hon. Mangala Moonesinghe's vision for Sri Lanka.

These proposals of the Hon. Mangala Moonesinghe provided the gateway and the momentum for the proposals later brought by Her Excellency Madam Chandrika Bandaranaike Kumaratunga in the mid-nineties culminating with the August, 2000 Constitutional Proposals and the Tissa Vitharana All Party Representative Committee proposals during His Excellency President Mahinda Rajapaksa's time. President Mahinda Rajapaksa had appointed an APRC - All Party Representative Committee- and with the aid of experts' reports that Committee was engaged in formulating further proposals. All these proposals are also indicative of progressive thinking particularly on the part of Sri Lanka Freedom Party over a considerable period of time starting with Mr. Mangala Moonesinghe during President Premadasa's time, President Chandrika Bandaranaike Kumaratunga's term, Mr. Mahinda Rajapaka's term when he appointed the APRC with Prof. Tissa Vitharana as its Chairman for almost twenty years. This provides the foundation on which we are now attempting to finalize reform on power sharing through constitutional changes. It must be accepted, Sir, that much respected Hon. Mangala Moonesinghe played a crucial role in these healthy developments. He did so in the interest of the country and all the people who lived in the country.

As I said before, Hon. Mangala Moonesinghe was a diplomat. He served in India during two terms; he served also as a High Commissioner in the United Kingdom. He was much respected in the countries where he served as High Commissioner. He had contacts with the most important people in those countries. He was able to discharge his obligations by Sri Lanka not merely to the best of his ability but in the best interest of the country.

In his later years, he played the role of civil society activist. He was much involved in the One Text Initiative through which he tried to take the constitutional process forward. Unfortunately, the environment was not conducive to his being successful.

In the loss of the late Managala Moonesinghe, we have lost a very dedicated, much respected, able citizen of Sri Lanka. We are all sad that we have lost such a worthwhile personality.

In all his endeavours he was very ably assisted by his wife, Gnana. We happened to know her well. She was a great assistance to Mr. Mangala Moonesinghe in the discharge of his duties. We respect her for the contribution she made.

We convey our very sincere condolences to the widow and the children of Mr. Mangala Moonesinghe and we shall be grateful, Sir, if a copy of today's Proceedings would be sent to the family.

Thank you.

[අ.භා.12.22]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன அமைச்சர்)

(The Hon. Gamini Jayawickrama Perera - Minister of of Buddhasasana)

ගරු කථානායකතුමනි, මේ මොහොත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තිදෙනෙකුගේ අභාවය ගැන අපේ ශෝකය පළ කරන අවස්ථාවක්.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

මම පළමුවෙන්ම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමා ගැන කථා කරන්න කැමැතියි. එතුමා මා සමඟ පමණක් නොව අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ එකට තමයි නාලන්දා බෝඩිමේ සිටියේ. එතුමා මගේ කල්‍යාණ මිත්‍රයෙක්. අපි එතුමාට "උපතිස්ස" කියායි කථා කරන්නේ. එතුමා බොහොම නිහතමානී, භාවනා කරනා උපාසක කෙනෙකු වාගේයි. එතුමා නාලන්දයේ සිටි කාලයේදීවත් කිසිම රණ්ඩු දබරයකටවත් ගියේ නැති, ශාන්ත ගති ඇති ඉතා ආදර්ශවත් කෙනෙක්. මට මතකයි, එතුමාගේ පියා රක්වාන, පැල්මඩුල්ල ප්‍රදේශයේ බොහොම වැදගත් ප්‍රභූ පවුලක කෙනෙක් බව. එසේ වැදගත් ප්‍රභූ පවුලකින් පැමිණි කෙනෙක් විධියට තමයි උපතිස්ස මැතිතුමා දේශපාලනයේ නිරත වූයේ. එතුමා නාලන්දයෙන් අයින් වුණාට පසුව එක්සත් ජාතික පක්ෂයේ තරුණ පෙරමුණේ ක්‍රියාශීලිව, නිශ්ශබ්දව කටයුතු කළා.

ගරු කථානායකතුමනි, එතුමාගේත්, මගේත් මිත්‍රත්වය ගැන කියන්න මා කැමැතියි. ඒ කාලයේ මම කතරගම යන හැම අවස්ථාවකම උපතිස්සලාගේ ගෙදරට ගිහින් තමයි යන්නේ. එතුමාගේ ආදරණීය බිරිඳ සහ දරුවන් ගෙදර සිටියා. ඒ කාලයේ ඔවුන් කුඩා දරුවන්. අද ඔවුන් සමාජයේ වැජඹෙනවා. ඒ තරම් මිත්‍රත්වයක් එතුමාත් මාත් අතර තිබුණා. එතුමා මන්ත්‍රීවරයෙක් විධියට පාර්ලිමේන්තුවට පැමිණෙන්න ප්‍රථම එතුමාගේ බාප්පා වන හැරල්ඩ් කුලරත්න මැතිතුමා පාර්ලිමේන්තුවට පැමිණියා. උපතිස්ස මැතිතුමා හැරල්ඩ් කුලරත්න මැතිතුමා සමඟ ඥාතියෙක් විධියට බොහොම නිහතමානිව වැඩ කළා. එතුමා සමඟ දේශපාලන කටයුතු කළා, සමාජ වැඩ කටයුතු කළා. එසේ සමාජ වැඩ කටයුතු කළ එතුමා සංවර්ධන සභාවේ සභාපති විධියටත් කටයුතු කළා. ඇත්තවශයෙන්ම එතුමා එතැන ඉඳලා පළාත් සභාවේත් එලෙසම සේවය කර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට පැමිණියා.

මම දකින විධියට හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී උපතිස්ස සිල්වා මැතිතුමාගේ ගණයේ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේ සිටිනවා නම් ඒ, බොහොම ස්වල්ප සංඛ්‍යාවක් තමයි. අනේ ඇඟිලි ප්‍රමාණයට තමයි ඉන්නේ. ඒ තරම් නිශ්ශබ්ද, අවංක, තැන්පත්කම තිබුණු, ඉතාම උසස් ගුණාංග තිබුණු කෙනෙක් තමයි උපතිස්ස සිල්වා මැතිතුමා. එතුමා හැම වේලාවේම ජනතාව ගැන හිතපු කෙනෙක්. මම මුලින් සඳහන් කළා වාගේ මම කතරගම හෝ වෙනත් ගමනක් යනකොට, එතුමාගේ ගෙදරට යනවා. එසේ යනකොට එතුමා ජනතාවත් සමඟ නිහතමානිව කටයුතු කරන ආකාරය මා දැක තිබෙනවා. එතුමා තමන්ගේ පැරණි ජීප් එකෙන්ම තමයි වැඩට ගියේ. ඒ කඳුකර ප්‍රදේශයට එතුමා එලෙස ලොකු සේවයක් කළා. එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට කටයුතු කළ කාලයේ ජනතාවටවත්, ඡන්දදායකයින්ටවත් චෝදනා කරන්න බැරි ලෙස කැටපතක් විධියට වැඩ කළා. ඒකයි මම එතුමා ගැන කථා කරන්නේ.

අපේ හිටපු ජනාධිපතිතුමා වන මහින්ද රාජපක්ෂ මැතිතුමාත් අපින් එකට නාලන්දේ සිටියා, සංවර්ධන සභාවල වැඩ කටයුතු කළා. මම හිතන විධියට අපේ විපක්ෂ නායකතුමා කථා කළ කාරණයත් ඒකයි. මමත් 1977දී පාර්ලිමේන්තුවට ආවා. එවකට පැවැති සංවර්ධන සභා ක්‍රමය ඒ තරම් සාර්ථක ක්‍රමයක් නොවෙයි කියා මා හිතනවා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා අවංකව බැලුවා බලය විමධ්‍යගත කරන්න. එසේ බලය විමධ්‍යගත කිරීම තුළ සංවර්ධන සභා ක්‍රමයේ ඒ තරම් සාර්ථකත්වයක් තිබුණේ නැහැ. ඊට පසුව තමයි පළාත් සභා ක්‍රමය ගෙනාවේ. 1988 කාලයේදී මමත් පාර්ලිමේන්තුවේ ඉඳලා අයින් වුණා. මට මගේ ජ්‍යෙෂ්ඨත්වය තබාගෙන, වරප්‍රසාද අරගෙන පාර්ලිමේන්තුවේ ඉන්න තිබුණා. නමුත් මම දුටුවා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විශාල බලයක් පළාත් සභාවලට දුන් බව. ඒ තුළ මූල්‍ය පාලනය තිබුණා. උපතිස්ස මැතිතුමා කළා වාගේ ඒ තුළින් විශාල සේවයක් කරන්න පුළුවන් නිසායි මම එසේ කළේ. ඒ වාගේම රටක් දියුණු වෙන්න නම් මේ රටේ පාලන බලය මධ්‍යගත ක්‍රමයෙන් එක්තරා මට්ටමකට විමධ්‍යගත කරන ක්‍රමයක් ඇති වෙන්න ඕනෑ. නමුත් සංවර්ධන සභාවේ අසාර්ථක වීම තුළ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ඊළඟට තමයි පළාත් සභා ක්‍රමයක් ඇති කර ඉන්දු-ලංකා ගිවිසුමෙන් එය ආරම්භ කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, පස් වරු 12.30ට දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු තාවකාලිකව අත් හිටුවන්න තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, මා ඉක්මනින් මගේ කථාව අවසන් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැවත පස් වරු 1.30ට සභාව රැස්විය යුතුයි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, මගේ කථාව විනාඩි තුනකින් අවසන් කරනවා.

උපතිස්ස සිල්වා මැතිතුමාගේ ආදරණීය බිරිඳ හා දරුවන් මේ ගරු සභාවට අද දින පැමිණ සිටිනවා. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් මගේ ශෝකය මෙම අවස්ථාවේදී ඒ පවුලේ සියලු දෙනාට පළ කරන අතර, එතුමාට අමාමහ නිවන් සුව අත්වේවා!යි ප්‍රාර්ථනා කරනවා.

මංගල මුණසිංහ මැතිතුමා කියන්නේ මහා ශ්‍රේෂ්ඨ ගුණාංග තිබුණු පුද්ගලයෙක්. එතුමා සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමා ඇතුළු සියලු දෙනාම කියපු කථා මමද සියයට 100ක්ම අනුමත කරනවා. එදා මංගල මුණසිංහ මැතිතුමාගේ සභාපතිත්වයෙන් පැවති, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදයට විසඳුම් සෙවීම සඳහා වන කමිටුවේ යෝජනා ක්‍රියාත්මක වුණා නම් මේ රටේ ත්‍රස්තවාදයක් ඇති වෙන්නේ නැහැ; ජාතිවාදී අරගළවල් අපට නවත්වන්න තිබුණා. එතුමා හරිම අවංක කෙනෙක්; මම ගරු කරපු බොහොම උතුම් දේශපාලකයෙක්. එතුමා මහ කොමසාරිස්වරයෙකු ලෙස එක්සත් ජාතික පක්ෂ රජයෙන් තානාපති සේවයට යැවිවේ, එතුමා තුළ තිබුණු අවංකකම හින්දායි. ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ කියලා වෙනසක් නැතුව මේ සභාවේ කවුරුත් එතුමාට ගරු කළා. එසේ ගරු කෙරුවේ එතුමා තුළ තිබුණු ඒ උතුම් ගුණාංග නිසායි. එවැනි දේශපාලනඥයන් අපේ පාර්ලිමේන්තුවට අවශ්‍යයි. එවැනි උතුම් පුද්ගලයන් මේ පාර්ලිමේන්තුවට පත් වෙලා එන්න ඕනෑ. හේවාවිතාරණ පවුල කියන්නේ උතුම් වැදගත් පවුලක්. -අපි අනගාරික ධර්මපාල මැතිතුමාගේ ගුණ නොබෝදා සැමරුවා.- මෙතුමා එවැනි උතුම් පවුලකින් පැවත එන කෙනෙක්. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් මාගේ ශෝකය එතුමාගේ පවුලේ සෑම දෙනාටම මෙම අවස්ථාවේදී ප්‍රකාශ කරන අතර, එතුමාට අමාමහ නිවන් සුව අත්වේවා!යි ප්‍රාර්ථනා කරනවා.

නිලකරත්න මැතිතුමා එක්ක මගේ එතරම්ම සම්බන්ධයක් තිබුණේ නැහැ. දේශපාලන වශයෙන් මම එතුමා දන්නවා. එතුමාටත් අමාමහ නිවන් සුව අත්වේවා!යි පතමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි. පස් වරු1.30 දක්වා සභාවේ වැඩ කටයුතු තාවකාලිකව අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.30ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

[අ.භා.1.31]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අප සමඟ පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් කටයුතු කළ මංගල මුණසිංහ මැතිතුමා පිළිබඳ ශෝක යෝජනාවට මා එක්වෙන්නේ ඉමහත් ගෞරවයකිනුයි. පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධයෙන් එකට කටයුතු කිරීමේදී සුහදතාවයෙන් පමණක් නොව, ගැඹුරු දැනුමකින් යුතුව එතුමා සිදු කළ කාර්ය භාර්ය ගැන මා සිහිපත් කරන්නේ එතුමාට ගෞරවය පුද කරමිනුයි. මංගල මුණසිංහ මැතිතුමා ලංකා සම සමාජ පක්ෂයෙන් පාර්ලිමේන්තුවට පිවිසියා. එතුමාත් අනිල් මුණසිංහ මැතිතුමාත් දීර්ඝ කාලයක් ලංකා සම සමාජ පක්ෂය සමඟ දේශපාලන ක්‍රියාදාමයට එක් වී කටයුතු කළ සහෝදරවරු දෙදෙනෙක්. ඒ වාගේම පාර්ලිමේන්තුවටත්, බස්නාහිර මහ ඇමතිතුමා හැටියටත් පත් වුණු සුසිල් මුණසිංහ මැතිතුමාද මේ මුණසිංහ පවුලේ ඥාතියෙක්. එතුමන්ලා එක්ව පරිත්‍යාගශීලීව දේශපාලන කටයුතුවලට නායකත්වය දීම සුවිශේෂීයි. විශේෂයෙන් ප්‍රගතිශීලී කඳවුරේ දේශපාලන ක්‍රියාදාමයට දායකත්වය ලබා දෙමින් මංගල මුණසිංහ මැතිතුමා දැක්වූ කැපවීම මේ අවස්ථාවේදී සිහිපත් කළ යුතුයි. වෘත්තීය සමිති ව්‍යාපාර නායකයෙක් ලෙස, නීතිඥවරයෙක් ලෙස එතුමා විශාල සේවාවක් ඉටු කළා. ඒ වාගේම වෘත්තිකයන්ගේ සංවිධානවලට නායකත්වය දෙමින් සමාජය පිළිබඳ, ආර්ථිකය පිළිබඳ, ජනතා අයිතිවාසිකම් පිළිබඳ අපේ රටේ ප්‍රධාන පර්යේෂණයන් රාශියක් එතුමාගේ නායකත්වය හා මගපෙන්වීම තුළින් ඉටු කරදීමේ ගෞරවය ද එතුමාට අත් වෙනවා. ඒ වාගේම තානාපතිවරයෙක් ලෙස ඉන්දියාව සමඟත් ඒ වාගේම මහා බ්‍රිතාන්‍ය සමඟත් කටයුතු කරන්න එතුමා ගත කළ කාලය අපි මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් සිටි, මා සභාපතිවරයා ලෙස සිටි පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සඳහා වූ කමිටුව කාලයේ මංගල මුණසිංහ මැතිතුමා පාර්ලිමේන්තුවේ නොසිටිය ද, අපත් සමඟ සාකච්ඡා වාර ගණනාවක් පවත්වා මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරලා මහජන නියෝජිතයන් ජනතාවට වඩා කිට්ටු නියෝජිතයන් බවට පත් වෙන නව සරල මැතිවරණ ක්‍රමයක් සකස් කිරීමට දක්වන ලද උනන්දුවත්, ඒ පිළිබඳ ලබා දුන් සහයෝගයත් මේ අවස්ථාවේදී මා සිහිපත් කරනවා. ඒ වාගේම අපේ රටේ ජාතික ව්‍යාපාරයේත් ජාතික නිදහස් සටනේත් සදාකාලික ගෞරවය හිමි වන අනගාරික ධර්මපාලතුමන්ගේ ඥාති පරම්පරාවේ කෙනෙකු හැටියට, එතුමා ඉන්දියාවේ තානාපතිවරයෙකු වශයෙන් සිටි කාලයේ ශ්‍රී ලංකා ජනතාවට අගනා මෙහෙවරක් කිරීමට දැක්වූ ක්‍රියාවලිය මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව ඇතුළෙත්, පාර්ලිමේන්තුවෙන් පිටතත් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කළ මහජන අරගලවලදී එකට කටයුතු කරන්න හවුල් වුණු ක්‍රියාකාරී දේශපාලන සගයෙක් හැටියට, ඒ වාගේම මිත්‍රයෙක් හැටියට හිටපු මන්ත්‍රී මංගල මුණසිංහ මැතිතුමාව අප සිහිපත් කරනවා. එතුමාගේ බිරිඳ වන ඥාණා මුණසිංහ මහත්මිය ඇතුළු ඒ පවුලේ සියලුදෙනා සමඟ මේ ශෝකය බෙදා ගන්නා බව මා සඳහන් කරන්න කැමැතියි.

අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමා අපිත් එක්ක මේ පාර්ලිමේන්තුවේ කටයුතු කළ කාල පරිච්ඡේදය මට සිහිපත් වෙනවා. මම හිතන විධියට එතුමාගේ මාමා තමයි, රක්වාන ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළ කුලරත්න මැතිතුමා. පාර්ලිමේන්තුවේදී එතුමාවත් අපට ටික කාලයක් ආශ්‍රය කරන්න ලැබුණා. ඔහු නිතර දෙවේලේ තමන්ගේ ගම් පළාත ගැන අපට කිව්වා. ඒ රක්වාන ගැන නොවෙයි, පාදුක්ක ප්‍රදේශය ගැන. පාදුක්ක ප්‍රදේශයේ ඉන්න එතුමාගේ ඥාති සම්බන්ධකම් ඇති විශාල පිරිස පිළිබඳ, ඒ සම්බන්ධතාව නිතර අප පාර්ලිමේන්තුවේ හමු වුණාම සඳහන් කළා. දුම්රිය දෙපාර්තමේන්තුවේ අර්බුද ඇති වූ අවස්ථා ගණනාවකදී අපට එතුමා සමඟ සාකච්ඡා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

ගරු උපතිස්ස සිල්වා මැතිතුමාවත් පාර්ලිමේන්තුවේ සිටි කාලයටත් වඩා පාර්ලිමේන්තුවේ සිටි කාලයෙන් බාහිරව අපට ඉතාම කිට්ටුවෙන් ආශ්‍රය කරන්න ලැබුණා. මොකද, ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර බෞද්ධ හා සංස්කෘතික කටයුතු පිළිබඳව සුවිශේෂී උනන්දුවක් හා දායකත්වයක් දැක්වූ කෙනෙක් තමයි උපතිස්ස සිල්වා මැතිතුමා. එතුමාගේ වියෝව පිළිබඳව ගෙනා ශෝක ප්‍රකාශ යෝජනාවට අප ද එකතු වෙනවා. ඒ පවුලට සම්බන්ධ සෑම දෙනාටම ඒ ශෝකය දැනුම් දෙන ලෙසද ඉල්ලා සිටිනවා.

අපේ රජරට උපන් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. නිලකරත්න මන්ත්‍රීතුමා ගැනත් යමක් ප්‍රකාශ කරන්න ඕනෑ. එතුමා ඇත එපිට පිටිසර ගොවි ජනතාව අතරින් මතු වුණු නායකයෙකු හැටියට අපේ රටේ ගොවි ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව ඉතාම හැඟීමකින් සාකච්ඡා කළ වාර රාශියක් පිළිබඳව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. එතුමා ගොවි ජනතාවගේම නියෝජිතයෙක් හැටියට මේ සභාවට ඇවිල්ලා, තමන්ගේ මහජන නියෝජිතත්වය තුළින් ගොවි ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට මැදිහත් වී දැක්වූ ඒ ආදර්ශය ඉතාම වටිනවා. එසේ සඳහන් කරමින් මේ ශෝක යෝජනාවට අපද එක් වෙමින් මගේ කථාව අවසන් කිරීමට ඔබතුමාගෙන් අවසර පතනවා.

[1.39 p.m.]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - State Minister of Finance)

Hon. Speaker, I am honoured to say a few words on the life of a distinguished Parliamentarian, the late Hon. Mangala Moonesinghe. My association with the Moonesinghe family goes back to the time I was five years old and entered school where Vinodh, the Hon. Anil Moonesighe's son, and I were classmates. So, the Hon. Mangala Moonesinghe to me was more in the category of uncle, in a sense, of respectfully belonging to a generation ahead of us. The Hon. Mangala Moonesinghe was also the first Member of Parliament who was made an Eisenhower Fellow. I am glad that I share proudly the distinction of being somebody who has followed in the same footsteps and was made an Eisenhower Fellow.

He was educated at Royal College and then went on to England where he became a barrister. He practised criminal law in the courts of this country and had a solid practice. As a criminal lawyer, he played his role very effectively as a constituent Member of Parliament in very turbulent times defending young people from the brutality of that time. He was a lawyer, a politician and a diplomat.

In his political career, Hon. Moonesinghe served Parliament from 1965 to 1977 representing the Bulathsinhala Electorate as a Member of the Lanka Sama Samaja Party and subsequently, from 1989 to 1994 representing the Kalutara District as a Member of the Sri Lanka Freedom Party. Mr. Moonesinghe, I would not call him a Marxist although he was in the LSSP, but he was, in my own reading and understanding, very much a social democrat. Mr. Moonesinghe was appointed as the Sri Lanka's High Commissioner to India and subsequently as the High Commissioner to the United Kingdom. Later in his life, he went on to be the Chairman of the Marga Institute where he continued to contribute to society even after he ceased to be a legislator.

There are a couple of anecdotes about Mr. Moonesinghe when we talk about his life. As a constituent MP, he took a keen interest in socio-economic development in his Electorate. He was instrumental in getting one of the bridges built over the *Kalu Ganga* in his constituency. When the bridge was completed and it was to be inaugurated, rather than him inaugurating it or getting a fellow politician to inaugurate it, he looked for the worker who had worked the longest in constructing the bridge and got that worker to inaugurate the bridge. That says something about his character and about his life.

Another anecdote is that he was instrumental in the expansion of passion fruit growing in his constituency. One illustration of this was there was a farm established for girls in the 1960s for growing passion fruit. Then, in the 1970s when land reforms came, he was concerned with making land reform of practical benefit to his constituents. Although he would have preferred if more State-owned plantations were actually transferred to people's ownership, in some small way though, he was able to reduce by the transfer of lands the landlessness in his Electorate. He believed that small-scale farming could be efficient or even more so as large-scale farming. He was a person with a social conscience.

As we have heard in this Assembly today, he will always be remembered because of his role as the Chairman of the Parliamentary Select Committee appointed to recommend ways and means of achieving peace and political stability in the country in 1991 by President R. Premadasa. The Committee concluded its sittings in September 1993, and submitted a comprehensive Report to Parliament. There was a mandate to go into the ethnic conflict and make its recommendations towards an early solution.

Proposals were made by the UNP, the SLFP and also all the other Parties including the Tamil Parties. If these recommendations were embraced, this country certainly would have been different. In these recommendations, the principles that Mr.Mangala Moonesinghe strongly stood for, was reconciliation. He stood for equality; he stood for justice. When Sri Lanka adopts the new Constitution, the principles and recommendations of the Mangala Moonesinghe Committee will, I am sure, stand to his honour as we have strived in that process.

I would like to say in conclusion that his widow, devoted wife Gnana, whom I used to observe after I became a Member of Parliament as Mr. Moonesinghe was engaged in a lot of civil society initiatives, including the One-Text Initiative, she always stood by supporting him, and not only supporting him but even in her own right in conversation often showing us the way.

May Mr. Moonesighe's widow Gnana and his children be comforted.

Thank you.

[අ.භා. 1.46]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, අද මේ ශෝක ප්‍රකාශ යෝජනා අතර, මංගල මුණසිංහ මැතිතුමා පිළිබඳ ශෝක යෝජනාවත් තිබෙනවා. එතුමා එදා බැරිස්ටර්වරයකු ලෙස සමත් වී එක පිම්මේම ලංකාවට දුවගෙන ආවේ සම සමාජ පක්ෂයට එකතු වෙන්නයි. ඒ වෙනකොට සම සමාජ පක්ෂයේ ප්‍රබල චරිතයක් වූ අනිල් මුණසිංහ ඥාති සහෝදරයාවීමත් සම සමාජයේ කටයුතුවලදී එතුමාට මහත් ආභාෂයක් වුණා. එදා අපි සම සමාජ ව්‍යාපාරයේ කනිෂ්ඨයන් හැටියට අනිල් සහෝදරයාගෙන් වාගේම, සුසිල් මුණසිංහ මැතිතුමාගෙන් ද ලොකු ආභාෂයක් ලැබුවා. ඉතාම දක්ෂ නීතිඥවරු හැටියට සමත්වෙච්ච මේ මුණසිංහවරු සම සමාජ ව්‍යාපාරයේ දේශපාලනය උදෙසා ජීවිතයේ වැඩි කොටසක් එකතු කළ අය. එතුමන්ලාගේ ව්‍යක්තිය දක්ෂකම් ජනතාවගේ හා සම සමාජය වෙනුවෙන් කැප කළා. අනික් අතට, දේපළ රැස් කිරීම, හම්බ කිරීම, මුදල් එකතු කිරීම කියන කාරණා විසි කරලා දමලා

තමන් ගේ ජීවිතය, තමන්ගේ කාලය, තමන්ගේ හැකියාව උතුම් පරමාර්ථ වෙනුවෙන්, උතුම් සමාජ පරමාර්ථ වෙනුවෙන් කැප කරන්නට පැමිණීම ඇත්තටම දෙවැනි පරම්පරාව සම සමාජයට දක්වපු ආදර්ශයක් හැටියට අපේ සිත්වලට කා වැදුණා. සම සමාජයේ පළමුවෙනි පරම්පරාව වුණේ එන්.එම්. පෙරේරා, කොල්වින් ආර්. ද සිල්වා, ලෙස්ලි ගුණවර්ධන ආදීන්. ඊළඟ පරම්පරාව ලෙස අනිල් මුණසිංහ, මංගල මුණසිංහ වැනි අය ඒ ආකාරයෙන්ම මේ රටේ සම සමාජ ව්‍යාපාරයට එකතු වුණා. එදා ඒ සියල්ලක්ම අපේ සිත්වලට ලොකු බලපෑමක් ඇති කළා, අපටත් ඒ ආකාරයෙන්ම අපේ ජීවිත අනුගමනය කරන ප්‍රතිපත්තියක් ගොඩනගා ගන්න. අද වෙනකොට ඒ සම්ප්‍රදාය ටිකෙන් ටික අඩුවේගන යන බව පෙනෙනවා. තමන්ගේ හැකියා සමාජ පරමාර්ථ සමඟ ගැටගහලා, තමන්ගේ හැකියා පෞද්ගලික ලාභ ප්‍රයෝජනය වෙනුවට, සමාජ ප්‍රයෝජනය සඳහා හැරවීමේ සම්ප්‍රදාය, ඒ ගුණාංගය අද බුද්ධිමතුන් අතර අඩුවේගන යන කාලයක අපි ජීවත් වෙන බව මේ වෙලාවේ පැවසීමත් උචිතයි කියා මා හිතනවා.

එතුමා ඥානා මුණසිංහ මැතිනිය ඔහුගේ ආදරණීය බිරිඳ හැටියට විවාහ කරගෙන, දරුවන් හදාගෙන ඒ ගත කරපු ජීවිතය ගැන කියන්න ඕනෑ. ඒ දෙපළ අතර සෑම කටයුත්තකදීම තිබුණා වූ මනා සහයෝගය අපි ඉතාම අගයකොට සලකනවා.

අපි කවුරුත් දන්නවා, අනිල් මුණසිංහ වාගේම මංගල මුණසිංහත් පසු කාලයක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එකතු වුණු බව. නමුත් අපට ඒ පියවරට යන්නට පුළුවන් වුණේ නැහැ. මෙන්න මෙතැනදී අපි අපෙන් ප්‍රශ්නයක් අහගෙන තිබෙනවා. විශේෂයෙන් මංගල මුණසිංහ සහෝදරයා සිහිපත් කරන අද වාගේ දවසක, අපි අපෙන් ප්‍රශ්නයක් අහගෙන තිබෙනවා මේ විධියට සිද්ධ වුණේ ඇයි කියලා. සම සමාජ ව්‍යාපාරයේ ඉඳලා පසු කලෙක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එකතුවීම ගැන අපි අපෙන් ප්‍රශ්නයක් අහගෙන තිබෙනවා. ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය අමාත්‍යතුමා කිව්වා, එතුමාගේ සැබෑ ලක්ෂණය වුණේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයයි කියලා. සැබැවින්ම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ අදහස මත තමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එතුමා එකතු වෙන්නේ මාක්ස්වාදයේ වාමාංශිකවාදයේ ඉඳලා. වාමාංශික වාදයේ එතුමා හිටපු අවධිය වඩාත් දීර්ඝයි. ඒ වෙනුවෙන් එතුමා කරපු කැපකිරීම් වඩාත් විශාලයි. ඒ පිළිබඳව ඔහු ඇති කර ගත් සාකච්ඡාවලින්, අපි අතර ඇති වුණු සංවාදයන්ගෙන් අපි තව තවත් වාමාංශිකවාදී අදහස් පෝෂණය කර ගත් කාලයත් අපට හොඳටම මතකයි. නමුත් මෙහෙම වුණේ, වාමාංශික පක්ෂ එක වැඩ පිළිවෙළක් ඇතිව, ලොකු බලයක් හැටියට එකතු වී මැද මාවතත් සමඟ එකට ගමන් කරන අවදියක් කරා ගිහින් ඇති වෙන ලෝක තත්ත්වයේ වෙනවස්වීම් එක්ක මේ රටේ මැද මාවතේ දේශපාලනයත්, වමේ දේශපාලනයත් නැවත වෙන් වෙන වෙලාවේ වමට ප්‍රබලත්වයක් ඉතුරු නොවීමේ හේතුවයි. ඒක තමයි අපට මේ කාරණාව ඇසුරෙන් තේරුම් ගත හැකි වන්නේ කියා මේ වෙලාවේ මා සිහිපත් කළ යුතුයි. කෙසේ නමුත් මංගල මුණසිංහ මහතා පිළිබඳව අපේ ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ ඇගයීම ඥානා මුණසිංහ මහත්මිය ඇතුළු එතුමාගේ දරුවන් වෙත මේ වෙලාවේ ප්‍රකාශ කර සිටිනවා. මංගල මුණසිංහ මහතාගේ චරිතය බුලත්සිංහල ජනතාව ඉතාම ආදරයෙන් වැළඳ ගත් චරිතයක්. ඒ වාගේම මංගල මුණසිංහ මහතා ඉතාමත්ම ප්‍රේමණීය ලෙස බුලත්සිංහල තමන්ගේ ජනතාව ඉතා සමීපව ඇසුරු කරමින් ජීවත් වුණු බව මේ වෙලාවේ අප සිහිපත් කළ යුතුයි. ඔවුන් දුන් ආදර්ශය මේ රටේ පරම්පරාවෙන්-පරම්පරාවට යම් ආකාරයකට පහළට ගලා යවන්නට හැකි වේවා! යි ප්‍රාර්ථනා කරමින් මංගල මුණසිංහ මහතාගේ නාමයට අපේ ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ ගෞරවය, ප්‍රණාමය පුද කරනවා.

මීළඟට, මම අපේ රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන ශෝක යෝජනාව සම්බන්ධයෙන් මගේ අදහස් බිඳක් එකතු කරන්න කැමැතියි. එතුමා ඉතාමත්ම උනන්දුවෙන් තමන්ගේ මිතුරන් ඇසුරු කරපු කෙනෙක්. ඒ වාගේම, තමන්ගේ මිතුරන් නොවූ අය සමඟ පවා ඉතා කුලුපගව කටයුතු කරන්නට පුරුදුවී සිටි කෙනෙක්. කුඩා කාලයේ එතුමාව "තිස්ස බේබි" නමින් හැඳින්වූවා. හැමෝම වාගේ "බේබි" කියා එතුමාට කථා කළා. නමුත්, පසු කාලයක එතුමා ලොකු මහත් වී උසින්, මහතින් වැඩි විශාල මිනිසෙකුව සිටි කාලයේත් එතුමාව ඒ නමින්ම මිනිසුන් හුරතලයට ඇමතුවා. මේ මනුෂ්‍යයා මේ විධියට එතුමාගේ ගුණගරුකත්වය පළ කළේ හුදෙක්ම මිනිසුන් දිනා ගැනීමට හෝ මහජන සම්බන්ධතාවල ශිල්පීය කටයුත්තක් හැටියට වඩා, එතුමාගේ නිසඟ ගුණාංගය හැටියට ඒ කුලුපගතාව තිබුණු නිසායි. ඒ නිසා මේ වෙලාවේදී එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමාගේ බිරිඳ ඇතුළු දරුවන්ට එතුමා පිළිබඳව අපගේ තිබෙන ගෞරවය ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ වෙනුවෙන් පළ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්තුතියි.

මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 1.54]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු කථානායකතුමනි, අද දවසේ මේ පාර්ලිමේන්තුවට ශෝක ප්‍රකාශ යෝජනා තුනක් ඉදිරිපත් වෙලා තිබෙනවා. එක යෝජනාව තුළ පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරු තිදෙනෙකුගේ ශෝක යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරපු ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමා වෙනුවෙනුත්, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරපු ගරු එම්. නිලකරත්න මැතිතුමා වෙනුවෙනුත්, අපේ පක්ෂයත් එක්ක ඉතා සමීපව ක්‍රියා කරපු ගරු මංගල මුණසිංහ මැතිතුමා වෙනුවෙනුත් තමයි අද දවසේ ශෝක යෝජනා ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මම මේ අවස්ථාවේදී මේ තිදෙනා වෙනුවෙන්ම අපේ පක්ෂයේ ශෝකය එක්තැන් කරන අතර, විශේෂ යමක් ගරු මංගල මුණසිංහ මැතිතුමා වෙනුවෙන් ප්‍රකාශ කිරීම මගේ යුතුකමක් වෙනවා. මංගල මුණසිංහ මැතිතුමා 1960-70 දශකයේ දේශපාලනයට ප්‍රවිෂ්ට වෙලා ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කළේ වාමාංශික පක්ෂයක් වන ලංකා සමසමාජ පක්ෂයේ තරුණ මන්ත්‍රීවරයකු විධියටයි. ඒ වාගේම කොමියුනිස්ට් පක්ෂය සමඟ ඉතා සමීප සබඳකම් තිබුණු වාමවාදී හැඟීම්වලින්, මානුෂිකවාදී හැඟීම්වලින් පෝෂණය වූ මන්ත්‍රීවරයකු විධියටයි.

විශේෂයෙන්ම අපට එතුමා සමඟ විශේෂ සම්බන්ධයකුත් තිබෙන බව මම මේ අවස්ථාවේ දී මතක් කරන්න කැමැතියි. මොකද, මාතරට සම්බන්ධ අනගාරික ධර්මපාල මැතිතුමාගේ පරපුර වන හේවාවිතාරණ පරපුරේ සාමාජිකයකු ලෙස මේ රටේ ජාතික දේශපාලනයට සම්බන්ධ වෙමින් තරුණ කාලයේ පැසුණු බුද්ධියකින්, උගත්කමකින්, සමාජ අත්දැකීම්වලින් අපේ රටේ ජනතා මෙහෙවර ඉටු කරන්න එතුමා අතිශය කැපවීමක් කරපු කෙනෙක්. මේ පාර්ලිමේන්තුව තුළ එතුමා හැසුරුණු ආකාරය පිළිබඳව, එතුමාගේ කෘතහස්තභාවය පිළිබඳව, එතුමාගේ සමාජ කටයුතු ගැන වාගේම, කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරමින් ඒ ප්‍රදේශවල ජනතාවට කරපු මහඟු මෙහෙවර සහ ජාතික වශයෙන් එතුමා දැක්වූ සමාජ දායකත්වය පිළිබඳවත් අපි කථා කළා. මම මේ වෙලාවේ විශේෂ වශයෙන් මතු නොවුණු කරුණක්, දෙකක් මතු කරන්නට කැමැතියි. ගරු කථානායකතුමනි, එතුමා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හැටියට ඉතාමත්ම වටිනා මෙහෙයක් ඉටු කළා වාගේම මහ කොමසාරිස්වරුන් විධියට එංගලන්තයේත්, ඉන්දියාවේත් කටයුතු කරපු කාලය තුළ අපේ රටේ කීර්තිය ඔසවන්න එතුමා විශාල දායකත්වයක් දුන්නා. මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ, ඉන්දියානු මහ කොමසාරිස්වරයා හැටියට එතුමා කටයුතු කළේ පසුගිය යුද සමයේ දී බව. ඒ අවස්ථාවේදී අපිට ඉන්දියාවත් සමඟ ඒ තරම් හොඳ හිතක් තිබුණේ නැහැ, ඉන්දියාව දිහා සැකයෙන් බැලුවේ. ඒ වෙලාවේදී මංගල මුණසිංහ මැතිතුමා ඉන්දියාවත්, අපේ රටත් අතර හොඳ හිත හදන්නට විශාල කැප වීමක් කළා. එම රාජ්‍ය නායකයන් සමඟ විතරක් නොවෙයි, ඉන්දියාවේ තිබුණු වමේ ව්‍යාපාර සමඟත් සමීප සබඳතා පවත්වමින් අපේ රටේ ජනවාර්ගික යුද්ධයට යම් විසඳුම් ගෙනෙන මානසිකත්වයක් සකස් කරන්නට එතුමා විශාල උත්සාහයක් ගත්තා. ඒ වාගේම මන්මෝහන් සිං මැතිතුමා ඉන්දියාවේ නායකයා වශයෙන් සිටි කාලයේ රාජ්‍ය තාන්ත්‍රික බැඳීම් හදන්නට සහ අපේ රටවල් දෙක අතර හිතේ යම් පලුදු වීමක්, දුරස්ථ වීමක් තිබුණා නම් ඒවා වෙනස් කරන්නට විවිධ උපක්‍රම පාවිච්චි කළා.

ගරු කථානායකතුමනි, මම ඉන් එක් අවස්ථාවක් පිළිබඳව මතක් කරන්නට කැමැතියි. ඒ අවධියේ අපේ රටේ විශිෂ්ට ආර්ථික විද්‍යාඥයකු වූ ලාල් ජයවර්ධන මැතිතුමා, - මහාචාර්ය කුමාරි ජයවර්ධන මැතිනියගේ සැමියා - මිය ගිය අවස්ථාව. අගමැති මන්මෝහන් සිං මැතිතුමා එතුමාගේ නිල නිවසේ විශේෂ උත්සවයක් පැවැත්වූවා. මම හිතන්නේ එය ඉතාම දුර්ලභ අවස්ථාවක්. ඒ අවස්ථාවේ දී මන්මෝහන් සිං මැතිතුමා වර්තමාන අගමැතිතුමාටත්, - මගේ මතකයේ හැටියට ඒ අවස්ථාවේ එතුමා සභානායකවරයා - චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියටත් ආරාධනා කළා. චන්ද්‍රිකා මැතිනිය වෙනුවෙන් ඒ අවස්ථාවට සහභාගි වුණේ අපේ පක්ෂයේ ප්‍රධාන ලේකම් ඩිව්. ගුණසේකර මැතිතුමා. ඒ අවස්ථාවේ දී එතුමා පක්ෂ, විපක්ෂ සියලු දෙනා සමඟම සම්බන්ධතා ගොඩනඟමින් එක පැත්තකින් ජාතික වශයෙන් අපේ රටේ තිබෙන දේශපාලන බලවේගවලට ඉන්දියාවත් සමඟ හොඳ හිත තියාගෙන සමීප සබඳතා තහවුරු කර ගන්නට අවස්ථාව ලබා දීමට උත්සාහයක් ගත්තා. එවැනි රාජ්‍ය තාන්ත්‍රික උපාය, උපක්‍රම පාවිච්චි කරමින් එම සබඳතා දියුණු කරමින් කටයුතු කරන්නට දක්ෂ වුණු එතුමා අපේ රටේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳන්නට විශාල උත්සාහයක් දැරුවා.

අපි කවුරුත් කථා කළා වාගේ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ මංගල මුණසිංහ කමිටුව පත් කරමින් එතුමාට විශාල වගකීමක් භාර දුන්නා, මේ ප්‍රශ්නය එතුමාගේ ප්‍රධානත්වයෙන් විසඳන්නට. එදා එම කමිටුව මඟින් එතුමා ඉදිරිපත් කළ නිර්දේශ හරියට ක්‍රියාවට නැඟුවා නම්, මේ රට මෙවැනි සෝචනීය තත්ත්වයකට අද මුහුණ දෙන්නේ නැහැ. ඒක එතුමාගේ වරදක් නොවෙයි. මේ රටේ ජාතිවාදය පාවිච්චි කරන බලවේග විසින් එතුමා ඉදිරිපත් කළ විසඳුම් ඉදිරියට ගෙන යන්නට තිබුණු අවස්ථා රටට අහිමි කළා. ඒ සියල්ල යටපත් වුණේ ජාතිවාදී හැඟීම් නිසායි. තමන්ගේ බලය තහවුරු කර ගන්නට ක්‍රියා කළ සමාජ බලවේග ඒ විසඳුම් ක්‍රියාවලිය හමස්පෙට්ටියට දැම්මා. එවැනි නායකයින්ගේ ප්‍රබුද්ධ හැඟීම්, අදහස් ප්‍රායෝගිකත්වයට ලක් කළා නම් අපි අද මුහුණ දෙන සෝචනීය සමාජ ඉරණමට මේ රට ගොදුරු වෙන්නේ නැහැ.

මම මෙයින් කියන්නට අදහස් කළේ, එතුමා හැම පැත්තකින්ම තමන් ලබාපු අධ්‍යාපනය, තමන් ලබාපු දැනුම, තමන්ගේ සමාජ සම්බන්ධතා සියල්ල පාවිච්චි කරමින් අපේ රට වෙනුවෙන් විශාල කැප වීමක් කළ ශ්‍රේෂ්ඨ පාර්ලිමේන්තුවාදියෙකු පමණක් නොවෙයි මානව හිතවාදී, වාමවාදී හැඟීම්වලින් පෝෂණය වුණු, එවැනි දෘෂ්ටියකින් සමාජ ප්‍රශ්න දෙස බලපු කෙනෙකු බවයි.

ඇත්ත වශයෙන්ම මේ අවධියේ මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපි කාටත් එතුමා ආදර්ශයක්. කවුරුත් ප්‍රකාශ කළා වාගේ, එතුමා හැම ප්‍රශ්නයකදීම සංවේදීව, ඉතාම ඉවසීමකින් යුතුව කටයුතු කළා. එතුමා මේ සමාජයට කළ මෙහෙවර තවදුරටත් ඉදිරියට ගෙන යන්න එතුමාගේ භාර්යාව වන ඥානා මුණසිංහ මැතිනිය දක්වන දායකත්වය අපි අඩුවෙන් තක්සේරු කරන්නේ නැහැ. මංගල මුණසිංහ මැතිතුමාත්, ඒ පවුලේ සියලුදෙනාත් මේ සමාජ කටයුතු ඉදිරියට ගෙන යෑම සඳහා අපේ සමාජයට ඉහළ මෙහෙවරක් කරන්න දෙන ලද දායකත්වය මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ. මංගල මුණසිංහ මැතිතුමා වැනි ප්‍රාඥයන්, එතුමා වැනි කැප වීමකින් යුක්ත ශ්‍රේෂ්ඨ මිනිසුන් අවශ්‍ය අවධියකදී එතුමා අපට අහිමි වීමේ පාඩුව සුළු පටු එකක් නොවෙයි. එය මේ ජන සමාජයටම බලපාන පාඩුවක්. මේ අවස්ථාවේදී එතුමාගේ අභාවය වෙනුවෙන් අපේ පක්ෂයේ සාතිශය සංවේගය එක් කරමින්, එතුමා ප්‍රාර්ථනා කළ යම් සුවයක් ඇද්ද, එය ලැබේවා!යි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

[අ.භා. 2.04]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, නිටපු ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තිදෙනකුගේ වියෝව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ශෝක යෝජනා ගෙනෙන මේ අවස්ථාවේදී, එක්සත් ජාතික පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරයකු විධියට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අදහස් දක්වන්න මටත් අවස්ථාවක් ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

රත්නපුරය දිස්ත්‍රික්කයේ හිටපු කෘතහස්ත දේශපාලනඥයකු වන, එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමා ගැන මගේ අදහස් එකතු කරන්න පළමුවෙන්ම මා කැමැතියි. රත්නපුර දිස්ත්‍රික්කයේ හිටපු දැවැන්ත දේශපාලන චරිත අතර ගාමිණී අතුකෝරල මැතිතුමාගේ සමකාලීනයකු ලෙස රත්නපුර දිස්ත්‍රික් දේශපාලන ගමන තුළ නොමැකෙන නාමයක් ඉතිරි කළ නායකයෙක් තමයි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අපේ ආදරණීය උපතිස්ස සිල්වා මැතිතුමා. එතුමා ගැන අද දින මේ පාර්ලිමේන්තුවේ අදහස් දක්වන්න අවස්ථාව හිමි කර ගැනීම මගේ වග කීමක් කියා මා විශ්වාස කරනවා. ගරු කථානායකතුමනි, එතුමා මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු වූවා විතරක් නොවෙයි, වර්තමානයේ රක්වාන මැතිවරණ කොට්ඨාසයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා වශයෙන් මා කටයුතු කරන අතර, මට පෙර රක්වාන මැතිවරණ කොට්ඨාසයේ අභිංසක ජනතාවගේ භාරකාරයා විධියට එතුමාට නොමැකෙන නාමයක් තිබුණු නිසායි මා එහෙම කියන්නේ.

එතුමා ගැන කථා කරන්න ආරම්භ කළොත්, හැරල්ඩ් කුලරත්න හිටපු නියෝජ්‍ය අමාත්‍යතුමා, ශ්‍රී ලාංකීය දේශපාලනය තුළ පක්ෂ, පාට භේදයකින් තොරව අදටත් කථා කරන, මහත්මා දේශපාලනයක් කළ නායකයෙක්. එතුමාගේ ඥාතිත්වයක් දරන උපතිස්ස සිල්වා මැතිතුමා හැරල්ඩ් කුලරත්න මැතිතුමාගේ වියෝවෙන් පසුව රක්වාන මැතිවරණ කොට්ඨාසයේ වගකීම භාර

ගත්තා. 1982 වර්ෂයේ රත්නපුර දිස්ත්‍රික්කයේ සංවර්ධන කමිටු සභාපතිවරයකු ලෙස දේශපාලනය ආරම්භ කළ උපතිස්ස සිල්වා මැතිතුමා 1960-1962 වාගේ කාලයේ සිට එක්සත් ජාතික පක්ෂයේ තරුණ පෙරමුණේ නායකත්වයක් දරා රත්නපුර දිස්ත්‍රික්කයට සහ අප පක්ෂයට ශක්තියක් දීපු නායකයෙක්. එතුමාගේ දේශපාලන ගමන් මඟේ වසර 10කට වැඩි කාලයක් මේ උත්තරීතර සභාව නියෝජනය කළා.

එතුමාගේ දේශපාලන පෞරුෂය තුළින් හැදුණු වැඩුණු නායකයෝ අද රත්නපුර දිස්ත්‍රික්කය පුරාවට දේශපාලනය කරනවා. අප අතරින් වෙන් වුණු හිටපු පළාත් සභා මන්ත්‍රී, ජගත් පල්ලියගුරු මැතිතුමා, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ අජිත් කුමාර මැද්දේගම මැතිතුමා වැනි අය ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමාගේ ආභාසය හා ශක්තිය එක්ක ගොඩ නැඟුණු නායකයෝයි. මෙහිදී අපි දකින දෙයක් තිබෙනවා. වර්තමාන දේශපාලනය තුළ නිලධාරිවාදයක් තුළින් පුරවැසියාගේ අයිතීන් වහගෙන තිබෙනවා. නමුත් මෙතුමන්ලා තමන්ගේ දේශපාලන පෞරුෂයත් එක්ක පුරවැසියාගේ බලාපොරොත්තුව වෙනුවෙන් කෙළින් හිට ගත් නායකයන්. මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට දිවුරුම් දීලා ගියාම, එතුමා මාව ගෙන්වලා උපදෙස් රාශියක් ලබාදුන් ආකාරය මට මේ අවස්ථාවේදී සිහිපත් වෙනවා.

ගරු කථානායකතුමනි, රටේ ජනතාවට පෙනෙන භෞතික සංවර්ධනය තුළින් ජනතා මතය උලුප්පන්න උත්සාහ කරන යුගයක, "ජනතාවාදී නායකයන්ගේ අදහස වෙන්න ඕනෑ මානව සම්පත දියුණු කිරීමයි" කියා එතුමා දවසක් මට කිව්වා. කාපට් පාරවල් හදනවා වාගේම, මේ කාපට් පාරවල්වල යන්නත් හොඳ ඔළු ගෙඩි තිබෙන මිනිස්සු ටිකක් හදන්න ඕනෑය කියන කාරණයයි එතුමා ඒ කිව්වේ. එතුමා දේශපාලනයේදී කවදත් පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව ජනතාවට වැඩ කළ නායකයෙක්. රක්වාන ආසනයේ වර්තමාන මන්ත්‍රීවරයා විධියට මට එතුමා විපක්ෂයේ ඉඳගෙන කළ කාර්ය භාරය අදටත් ඉටු කරන්න බැරිවෙලා තිබෙනවා. කිසිවෙකුට සම කරන්න බැරි විධියේ ජනතා මෙහෙවරක් එතුමා ඉටු කළා. අපේ වාසුදේව නානායක්කාර මැතිතුමා කිව්වා වාගේ, එතුමා ජනතාවගේ හදවත තුළ සිටි ළෙන්ගතු නායකයෙක්. එතුමාගේ වියෝව රත්නපුර දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි, මුළු රටටම පාඩුවක්; අපේ පක්ෂයට දැවැන්ත දේශපාලන පාඩුවක්.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. එතුමා දේශපාලන පරපුරක් හදන්න උත්සාහ කළේ නැහැ. දේශපාලනයට ගෙනෙන්න පුළුවන් තරුණ පුත්‍රයන් දෙදෙනෙකු එතුමාට හිටියා. නමුත් තමන්ගේ දරුවන් දේශපාලනයට අරගෙන ඇවිත්, තමන් ඉටු කළ වැඩ කොටස එතැනින් එහාට අරගෙන යන්න එතුමා කොයි වෙලාවකවත් උත්සාහ කළේ නැහැ. එතුමා සමාජයට පණිවුඩයක් දුන් නායකයෙක්. ඒ මැතිනියත් එහෙමයි. ඒ පවුල මම ඉතා ළඟින්ම ආශ්‍රය කරන, හොඳ දේශපාලන ගමනක නිරතවෙලා ඉන්න නිහතමානී පවුලක්. උපතිස්ස සිල්වා මැතිතුමා ලාංකීය දේශපාලනයට තියපු ඒ සලකුණ රත්නපුර දිස්ත්‍රික්කයේ අපිට ලොකු ආදර්ශයක්. අනාගතයේදී උපතිස්ස සිල්වලා දහස් ගණනක් මේ රටේ බිහි විය යුතුයි, මේ දේශපාලනය මේ රටේ නැවතත් පැවතෙන්න ඕනෑය කියන අදහස ඉදිරිපත් කරමින්, අපෙන් වියෝ වුණු උපතිස්ස සිල්වා ආදරණීය නායකයාට මම නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. අපි අහලා තිබෙන, මංගල මුණසිංහ ජොෂ්ඨ දේශපාලනඥයාගේත්, එම්. තිලකරත්න ජොෂ්ඨ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේත් අභාවයන් පිළිබඳවත් අද අපගේ ශෝකය පළ කරනවා. අපේ ඒ ආදරණීය නායකයන් සියලුදෙනාටම නිවන් සුව ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.2.11]

**ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**

(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)

(The Hon. J.M. Ananda Kumarasiri - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමාගේත්, එම්. තිලකරත්න මැතිතුමාගේත්, මංගල මුණසිංහ මැතිතුමාගේත් අභාවයන් පිළිබඳව ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ, එතුමන්ලා සම්බන්ධයෙන් වවන ස්වල්පයක් එකතු කරන්න අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට මම ස්තුතිවන්ත වනවා. උපතිස්ස සිල්වා මැතිතුමා අවුරුදු 10ක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමාට ඒ ආභාසය ලැබුණේ එතුමාගේ ඥාතිවරයකු වූ හැරල්ඩ් කුලරත්න නියෝජ්‍ය ඇමතිතුමාගෙනුයි. ඒ කාලයේ පැවතුණු සංවර්ධන සභා ක්‍රමය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයෙන් තේරී පත් වුණු පළමුවැනි සභාපතිවරයා එතුමායි. ඒ තුළින් එතුමා දේශපාලන අත්දැකීම් රැසක් එකතු කරගෙන තමයි පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට පත් වුණේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට එතුමා රක්වාන මැතිවරණ කොට්ඨාසයට අතිවිශාල සේවයක් කළා. ජනතාවගේ ආදරයට පාත්‍ර වුණු මන්ත්‍රීවරයකු හැටියට එතුමා තමන්ගේ රාජකාරී කාර්ය භාරය කරගෙන ගියා. හැම ගෙදරකටම ගිහින්, පක්ෂය වෙනුවෙන් තමන්ට කරන්න පුළුවන් යුතුකම් ඉෂ්ට කරලායි තිබෙන්නේ කියා එතුමා අපිත් සමඟ කථා කරන සමහර අවස්ථාවලදී කිව්වා. ඒ වාගේම හැම දාම ඒ මැතිවරණ කොට්ඨාසය -අපේ පක්ෂය හැටියට- ජයග්‍රහණය කරන්නත් එතුමාට හැකියාව ලැබුණා. සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශය භාරව සිටි වෙලාවේදීත්, ක්‍රීඩා අමාත්‍යාංශය භාරව සිටි වෙලාවේදීත්, පළාත් පාලන ක්ෂේත්‍රයේදී එතුමා දැකපු ඒ දේවල් තමයි එතුමා දේශපාලනය කරන්න උපයෝගි කර ගත්තේ.

රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා සිටි කාලයේ "මාර්ග සති" කියලා වැඩසටහනක් ක්‍රියාත්මක කළ ආකාරය අපිට මතකයි. ඒ වැඩසටහන යටතේ ගම්වලට යන්න මාර්ග හදන්න අවශ්‍ය දේවල් දෙනකොට ඒ සඳහා නිර්මිත කොන්ක්‍රීට් තිබුණේ නැහැ. ඒ වෙලාවේදී පළාත් සභාවේ අලුත් ඇමතිවරයකු හැටියට තමන්ගේ මැතිවරණ කොට්ඨාසයේ ඒ සඳහා වෙනම ව්‍යාපෘතියක් ආරම්භ කරන්න එතුමාට පුළුවන්කම ලැබුණා. ඒ ව්‍යාපෘතිය තවමත් පවත්වාගෙන යනවා. එතුමා බොහොම දීර්ඝකාලීනව හිතලා -ඈත බලලා- තමන්ගේ ප්‍රදේශයට යමක් කරන්න ඕනෑය කියන හැඟීමෙන් යුතුව කටයුතු කළා. පළාත් සභාවේ, සංවර්ධන සභාවේ, නැත්නම් පාර්ලිමේන්තුවේ කියලා වෙනසක් කරන්නේ නැතිව, තමන් නියෝජනය කරන රක්වාන මැතිවරණ කොට්ඨාසයේ ජනතාව වෙනුවෙන් තමන්ට කරන්න පුළුවන් උපරිම කාර්ය භාරය එතුමා ඉටු කළා. ජනතාවට සේවය කිරීමේදී එතුමා කොයි වෙලාවකදීවත් පක්ෂ භේදය කරේ තබා ගෙන කටයුතු කළේ නැහැ. කිසිවකු කෙරේ වෙනස්කමක් දක්වන්නේ නැතිව 'තමා ජනතාවගේ සේවකයෙක්' කියන කාරණය තේරුම් ගෙන එතුමා තමාට කරන්න පුළුවන් උපරිම සේවය තම මැතිවරණ කොට්ඨාසයේ ජනතාවටත්, පසු කාලීනව පළාත් සභාවේ සිටින විට -සබරගමුව පළාත් සභාවේ ඇමතිවරයකු හැටියට සිටින විට- පළාතේ ජනතාවටත් එතුමා කළා. මා විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට සිටියදීත් එතුමා සමඟ බොහොම කිට්ටුවෙන් ආශ්‍රය කළා. ඒ වාගේම, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියටත් මම එතුමා සමඟ බොහොම කිට්ටුවෙන් ආශ්‍රය කළා. ඒ ආශ්‍රය මන්ත්‍රීවරයකු සහ මන්ත්‍රීවරයකු අතර පැවැති සම්බන්ධයට වඩා එහා ගිහින් හිතවතකු, ඥාතිවරයකු කියන තත්ත්වයට පසු කාලීනව පත් වුණා.

[ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා]

මම බෙහෙවින් කනගාටු වෙනවා එතුමාගේ අභාවය පිළිබඳව. එතුමා වාගේ ශ්‍රේෂ්ඨ දේශපාලනඥයන් මේ රටේ ඉන්න ඕනෑ. එතුමන්ලා තමන්ගේ දෙයක් පරිත්‍යාග කළා මිසක කිසිම දවසක කිසිම දෙයක් තමන්ට හම්බ කර ගත්තේ නැති දේශපාලනඥයන්. ඒ කාලයේ සිටි දේශපාලනඥයන් වූ එතුමන්ලා ඉතාම ආදර්ශවත් දේශපාලනඥයන්. මම විශ්වාස කරනවා, එතුමා කළ සේවය රක්වාන මැතිවරණ කොට්ඨාසයේත්, රත්නපුරය දිස්ත්‍රික්කයේත්, ඒ වාගේම සබරගමුව පළාත් සභාවේත් මහ ජනතාවට කිසි දවසක අමතක වන්නේ නැති වේවි කියා. ගරු කථානායකතුමනි, මා මේ වෙලාවේ අපේ සුරංජනී ගුණවර්ධන මැතිනියටත්, ජනේෂ් සහ සරෝජ් කියන පුතුන් දෙපළටත්, එම පවුලේ අයටත් මගේ ගෞරවය සහ කනගාටුව ප්‍රකාශ කරනවා. එතුමාගේ අභාවය මුළු රටටම වූ බලවත් පාඩුවක්. ඒ පාඩුව මකාලන්න ඉදිරි කාලයේදී හෝ ඒ පවුලේ අයට පුළුවන්කම ලැබේවි කියා මම විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, ගරු මංගල මුණසිංහ මැතිතුමා පිළිබඳවත් කතා කරන්න ඕනෑ. අපේ රට අවුරුදු 30ක් පිටුපසට ඇදගෙන ගිය, අපේ රටේ පැවැති යුද්ධය අවසන් කරන්න එතුමාගේ කාලය තුළ එතුමා ලොකු කාර්ය භාරයක් කළා. මංගල මුණසිංහ කමිටුව පත් කළ වෙලාවේ තමන්ට කරන්න පුළුවන් සේවය, ශ්‍රී ලාංකිකයකු හැටියට තමන්ට කරන්න පුළුවන් උපරිම දේ එතුමා කළා. එතුමා කටයුතු කරද්දී එක්සත් ජාතික පක්ෂය ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද කියා බැලුවේ නැහැ. එතුමා තමන්ට ලබා දුන් වගකීම හැම වෙලාවේම හරියට ඉෂ්ට කළා. ගරු අග්‍රාමාත්‍යතුමාත් එතුමාගේ කතාවේදී ප්‍රකාශ කළා වාගේ, දේශපාලන හිතවත්කම් පැත්තක තබා මංගල මුණසිංහ මැතිතුමා ඉන්දියාවේ මහ කොමසාරිස්වරයා හැටියට පත් කළේ එතුමා තුළ තිබූ දුර දක්නා නුවණ සහ ඒ වගකීම භාරගෙන එය ඉෂ්ට කරන්න එතුමා තුළ තිබූ හැකියාව නිසායි.

ගරු කථානායකතුමනි, මේ වෙලාවේ අප කතා කරන්නේ, දුෂ්කර ප්‍රදේශයක් නියෝජනය කළ ගරු තිලකරත්න මැතිතුමා ඇතුළු හිටපු ගරු මන්ත්‍රීතුමන්ලා තිදෙනකු කළ කාර්ය භාරයන් ගැනයි. රත්නපුර දිස්ත්‍රික්කය, අනුරාධපුර දිස්ත්‍රික්කය, පොළොන්නරුව දිස්ත්‍රික්කය ආදි දිස්ත්‍රික්ක දියුණු කරන්න එතුමන්ලා කළ කාර්ය භාරය අප සියලුදෙනා අගය කරන්න ඕනෑ. මේ වෙලාවේ එම මන්ත්‍රීවරුන් තුන්දෙනාගේම පවුල්වලට අපගේ බලවත් වූ ශෝකය ප්‍රකාශ කරමින්, අභාවප්‍රාප්ත වූ ඒ ගරු මන්ත්‍රීතුමන්ලාට නිවන් සැප ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිය පළ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

The next speaker is the Hon. Dharmalingam Sithadthan. Before that, the Hon. Deputy Speaker will take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.***

*අතන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [මාණ්පුමිකු ජේ.එම්. ආනන්ද කුමාරසිරි] තලෙමෙ වකිත්තාර්කළ්.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

[பி.ப. 2.17]

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, காலஞ்சென்ற பாராளுமன்ற உறுப்பினர்களான திரு. எச்.எம் உபதிஸ்ஸ சில்வா, திரு. எம். திலகரத்ன, திருவாளர் மங்கள முனசிங்க ஆகியோருடைய அனுதாபத் தீர்மானம்மீது பேசிய கௌரவ அங்கத்தவர்களுடன் இணைந்து, நானும் காலஞ்சென்ற பாராளுமன்ற உறுப்பினர்களுடைய குடும்பத்தினருக்கு ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன். மங்கள முனசிங்க அவர்களுடன் மிக நீண்ட காலமாகத் தனிப்பட்ட முறையிலே பழகிய எனக்கு அவரைப்பற்றி அறியக்கூடிய சந்தர்ப்பங்களும் வாய்ப்புக்களும் நிறைவே கிடைத்திருக்கின்றன. மங்கள முனசிங்க அவர்கள் சிறந்த பண்புமிக்க ஒரு தலைவராக, மனிதாபிமானமிக்க ஒரு மனிதராக இருந்ததை நான் அறிவேன். அவர், தனது வாழ்நாளிலே மூன்று விதமாகச் சேவைகளை ஆற்றியிருக்கின்றார். அதாவது வழக்கறிஞராக, அரசியல் வாதியாகச் செயலாற்றிய அவர், இந்த நாட்டைப் பிரதிநிதித்துவப்படுத்தி மிக முக்கியமான நாடுகளான இந்தியா, பிரித்தானியா போன்ற நாடுகளின் தூதுவராகவும் இருந்துள்ளார். மிகவும் கஷ்டமான காலங்களிலேகூட, தான் தூதுவராக இருந்த அந்த நாடுகளிலே இருந்த அரசியற் தலைமைகளுடனும் நற்புறவைப் பேணிவந்தார். அரசாங்கக் கட்சியினருடன் மாத்திரமல்லாது, ஏனைய கட்சிகளின் தலைமைகளுடனும், பிரதிநிதிகளுடனும் நட்புறவைப் பலப்படுத்தி இந்த நாட்டின் நன்மதிப்பை உயர்த்துவதற்காகப் பல வகைகளிலே முயற்சியெடுத்தார்.

திரு. மங்கள முனசிங்க அவர்கள் சமசமாஜக் கட்சியினூடாகத் தனது அரசியல் பயணத்தை ஆரம்பித்து, பின்பு ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியிலே தன்னை இணைத்துக்கொண்டு, மிக நீண்ட காலமாகப் பாராளுமன்ற உறுப்பினராக இருந்தார். அவர், இந்த நாட்டின் மிகப் பெரிய பிரச்சினையாகக் கருதப்படுகின்ற இனப் பிரச்சினைக்கு ஒரு நியாயமான தீர்வு காணவேண்டும் என்பதற்காகப் பாராளுமன்றத்துக்கு உள்ளேயும் வெளியேயும் மிக அக்கறையாகச் செயற்பட்ட தலைவர்களுள் ஒருவர். அவர் மாற்றுக் கட்சியிலே இருந்தபோதும்கூட, காலஞ்சென்ற சனாதிபதி பிரேமதாஸ அவர்கள் நியமித்த பாராளுமன்றத் தெரிவுக்குழுவுக்கு அவரைத் தலைவராகத் தெரிவு செய்ய வேண்டிய ஒரு தேவை ஏற்பட்டது. அந்தளவுக்கு அவருடைய செயற்பாடுகள் அமைந்திருந்தன. மங்கள முனசிங்க அவர்கள் எந்தக் கட்சியில் இருந்தாலும், எந்த இனத்தைச் சேர்ந்தவராக இருந்தாலும், தமிழர்களாக இருக்கலாம், சிங்களவர்களாக இருக்கலாம், மாற்றுக் கட்சியினராக இருக்கலாம், எவராக இருந்தாலும், அவர்கள் எல்லோரும் அவரை மிகவும் மதித்து வந்திருக்கிறார்கள். அதற்குக் காரணம், அவர் தனது கொள்கைமீது வைத்திருந்த உண்மையான பற்றேயாகும். பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும் என்பதிலே அவர் மிகவும் ஆர்வமாக இருந்தார். பாராளுமன்றத் தெரிவுக் குழுவுக்கு அவர் தலைவராக்கப்பட்ட பின்பு, அந்தப் பாராளுமன்றத் தெரிவுக் குழுவானது, 'மங்கள முனசிங்க குழு' என்ற பெயரைப் பெற்றுக் கொண்டது. இன்றுகூட, இனப் பிரச்சினைக்கான தீர்வு சம்பந்தமாகப் பேசப்படுகின்ற எந்த இடத்திலும், எந்தச் சந்தர்ப்பத்திலும் மங்கள முனசிங்க குழுவால் முன்வைக்கப் பட்ட பிரேரணைகள் சிறந்த பிரேரணைகள் என்றே பேசப்படுகின்றன.

අවර් ඔරු සිරන්ත අරසියල්වාදියාක මාත්දිරමල්ලාමල්, ඉන්ත නාට්ටිලේ වාළක්කූටිය ඔව්වොරු කුටිමකනුම් සුය මරියාතෙයුටනුම්, සුතන්දිරත්තුටනුම් උරිමෙකළෙ මුළුමෙයාකප් පෙට්රු වාළවේන්ටුම් එන්පතිලේ අක්කරෙ උටෙයවරාකවුම් ඉරුන්තාර්. අවර් පාරාළුමන්ර අරසියලෙ, තූතරකච් චෙයර්පාටුකළෙ එල්ලාම් මුටිත්ත පින්පු, ඉන්ත නාට්ටින් ඉනප් පිරච්චිනෙත් තීර්වුක්කුච් චකල කට්චිකළුම් ඉණෙන්තු one text මූලම් පිරේරණෙයෙක් කොන්ටු වරුවතර්කාන මුයර්චියෙත් තොටර්න්තුම් එටුත්තු වන්තාර්. අතන් මූලමාවතු ඉන්තප් පිරච්චිනෙක්කු ඔරු තීර්වෙක් කාණ මුටියුමා? චකල කට්චිකළුම් පාරාළුමන්රත්තුක්කු වෙළියියිලේ ඔන්රුකූටි, ඔරු නියායමාන තීර්වෙ මුන්වෙක්ක මුටියුමා? එන්පතිලේ අවර් අක්කරෙයාකච් චෙයර්පට්ටාර්.

අතු මාත්දිරමල්ල, එංකළුටෙය වට ඉලංකෙප් පකුතිකළිලේ නලිවුර්ර මක්කළුක්කාන "වාළ්වකම්" එන්රොරු ස්තාපනම් ඉරුප්පතෙ නාන් අරිවේන්. කණ්පාර්වෙ ඉළන්ත කුළන්තෙකළුටෙය අන්ත ඉල්ලත්තුක්කු අවරුම් අවරුටෙය පාරියාරුම් වරුකෙතරුවාර්කළ්. ඔව්වෝර් ආණින් වෙර්රික්කුප් පින්නාලුම් ඔරු පෙණ් ඉරුප්පාළ් එන්රු පොතුවාකච් චොල්වාර්කළ්. ආනාල්, තිරු. මංකළ මුනචිංක අවර්කළුටෙය මනෙවියාන තිරුමති ඥානා මුනචිංක අවර්කළ් තනතු කණවරෙප් පින්නාල් ඉරුන්තු ඌක්කප්පටුත්තවිල්ලෙ. මාරාක, අවරුක්කුප් පක්කත්තිලේ නින්රු, අවරුටෙය කෙයෙප් පිටිත්තුක්කොන්ටු චෙන්රාර්; අවරතු ඔව්වෝර් චෙයර්පාට්ටිලුම් කෙකොටුත්තාර්. අතු මනිතනේයච් චෙයර්පාටාක ඉරුන්තාල් එන්න, අරසියල් චෙයර්පාටාක ඉරුන්තාල් එන්න, එන්තච් චෙයර්පාටානාලුම් අවරුක්කු මිකවුම් තුණෙයාක නින්රු, අවරෙ නේරාන පාතෙයිලේ චෙල්වතර්කු ঊක්කුවිත්තාර්. මංකළ මුනචිංක අවර්කළෙප් පෝන්ර නල්ල තලෙමෙකළ් එංකළතු නාට්ටිලේ ඉල්ලාමර්පෝනතමෙ පිරච්චිනෙකළ් නීණ්ටුකොන්ටු පෝවතර්කුක් කාරණමාක ඉරුක්කිරතු. අවරුටෙය ඉළප්පු අවරුටෙය කුටුම්පත්තුක්කු මාත්දිරමල්ල, මුළු නාට්ටුක්කුම් පාරිය ඉළප්පාකුම්. ඉන්ත නේරත්තිලේ, එන්නුටෙය අනුතාපත්තෙ විචේටමාක තිරුමති ඥානා මුනචිංක අවර්කළුක්කුම් අවරුටෙය කුළන්තෙකළුක්කුම් තෙරිත්තු, විටෙපෙරුකින්රේන්. නන්රි.

[අ.භා. 2.23]

**ගරු කනක හේරත් මහතා**
(මාණ්පුමිකු කනක හේරත්)
(The Hon. Kanaka Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභාවයට පත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන අද දිනයේ, විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උපතිස්ස සිල්වා මැතිතුමා පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වනවා. එතුමා මගේ ඥාතියකු වන නිසා මේ අවස්ථාවේ එතුමා පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන සතුටට පත් වෙනවා.

අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ සංවර්ධන සභාවේ සභාපතිවරයා හැටියට දේශපාලනය ආරම්භ කළ මෙතුමා පළාත් සභාව නියෝජනය කරමින් එහි මන්ත්‍රීවරයකු මෙන්ම පළාත් සභා අමාත්‍යවරයකු හැටියටත් කටයුතු කළා. දෙවතාවක් පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා නියෝජනය කළ රක්වාන ආසනයට පමණක් නොවෙයි; රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොවෙයි; මුළු රටටම විශාල සේවාවක් කළ දේශපාලනඥයකු හැටියට තමයි අපි දකින්නේ. විශේෂයෙන්ම එතුමා අවංක, නිහතමානී දේශපාලනඥයෙක්. අපට ආරංචි හැටියට එතුමා ජනතාව සමඟ සමීපව කටයුතු කරමින්, ඕනෑම ප්‍රශ්නයකදී, ගැටලුවකදී කොන්ද කෙළින් තියාගෙන ඒවාට මුහුණ දෙන්න පුළුවන් නායකයෙක් හැටියට දේශපාලන කටයුතු කළ කෙනෙක්. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කටයුතු කළ මෙතුමා වැනි දේශපාලන නායකයන් කළ සේවාවන් ගැන බලන විට එතුමාගේ අභාවය අද රත්නපුර දිස්ත්‍රික්කයට ලොකු පාඩුවක්. මේ අවස්ථාවේ එතුමා කළ සියලුම සේවාවන් අපි සිහිපත් කරන අතර, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. ශෝකයට පත් එම මැතිනිය සහ එතුමාගේ දරුවන් වන ජනේෂ් සිල්වා සහ දුමින්ද සරෝජ් සිල්වා සහෝදරවරුන් දෙදෙනාට එතුමාගේ අභාවය පිළිබඳ මගේ කනගාටුවත්, මගේ පවුලේ කනගාටුවත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

[අ.භා. 2.26]

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(මාණ්පුමිකු විතුර වික්කිරමනායක්ක)
(The Hon. Vidura Wickramanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුව තුළ හිටපු මන්ත්‍රීවරුන් තිදෙනකුගේ අභාවයන් පිළිබඳව ශෝක ප්‍රකාශ ඉදිරිපත් වන මේ අවස්ථාවේ විශේෂයෙන්ම ගරු මංගල මුණසිංහ මැතිතුමා වෙනුවෙන් මේ ගරු සභාවට අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමටයි මා බලාපොරොත්තු වන්නේ.

කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ආසනය 1965 එතුමා මන්ත්‍රී වන විට තිබුණේ අද තිබෙන තත්ත්වයෙන් නොවෙයි. එවිට එය බොහොම දුෂ්කර ආසනයක්. ඒ වාගේම එය විශාල ආසනයක්. ඒ ආසනයේ අතිමහත් බහුතරය දුප්පත් ජනතාව. ඒ අතර වතු කම්කරු ජනතා නියෝජනයකුත් තිබුණා. අන්න එවැනි ආසනයක ප්‍රගතිශීලී පිල නියෝජනය කරමින් එතුමා මන්ත්‍රීවරයා වුණා. මම එතුමාව දකින්නේ ප්‍රගතිශීලී නායකයෙක් වාගේම මානව හිතවාදියෙක්; සමානාත්මතාව බොහොම අගය කළ පුද්ගලයෙක් විධියටයි. 1977 දේශපාලන වේදිකාවේදී අපි මුණගැසුණා. එතුමා දේශපාලනඥයකු වුවත් බොහොම මෘදු ස්වරයකින් තමයි සියලු දෙනාටම ආමන්ත්‍රණය කළේ. දේශපාලන වේදිකාවේදී පවා එතුමා බොහොම මෘදු ස්වරයකින් තමයි ආමන්ත්‍රණය කළේ. ඒ තරම් මනුස්සකම කියන දේ එතුමා තුළ තිබුණා. අපි අද විවිධ පක්ෂ, විවිධ මතවාද නියෝජනය කරනවා. හැබැයි, අපි අතර -දේශපාලනඥයින්ගේ- අද මනුස්සකම තිබෙනවාද කියන එක ගැටලුවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රගතිශීලිත්වය තුළ මංගල මුණසිංහ මැතිතුමාගේ නිර්මාණශීලිත්වයක් අපි දැක්කා. ඒක අදටත් වලංගුයි; හෙටටත් වලංගුයි. ඒකට හොඳම උදාහරණයක් තමයි "කලවැල්ලාව පාලම". ඒ කලවැල්ලාව පාලම අදටත් ඔබතුමන්ලාට ගිහිල්ලා බලන්නට පුළුවන්. එහි සමරු ඵලක නැහැ, "මෙය මංගල මුණසිංහ මහතා විසින් අහවල් දවසේ මුල්ගල තැබුවා; අහවල් දවසේ විවෘත කළා" කියලා. "ජනතාවගේ මුදල්වලින් මේ පාලම සාදා, ජනතාව විසින් විවෘත කරන ලදී" කියලා එහි ගහලා තිබෙනවා. එතුමා ඒ තරම් නිහතමානී පුද්ගලයෙක්. ඒ නිසා, අපට ඔවුන්ගෙන් ඉගෙන ගන්න බොහොම පාඩම් තිබෙනවා.

දිවංගත ගරු මන්ත්‍රීවරුන් තිදෙනෙක් -එච්.එම්. උපතිස්ස සිල්වා ගරු මන්ත්‍රීතුමා, එම්. තිලකරත්න මන්ත්‍රීතුමා, මංගල මුණසිංහ මන්ත්‍රීතුමා- ගැන අද උදෑසන පටන් මේ සභා ගර්භයේ විවිධ අදහස් ප්‍රකාශ වුණා. මේ සෑම කෙනෙක් ගැනම කථා කරන විට අපිට හැඟී ගියේ ඔවුන් කොයිතරම් දුරට ජනතාවත් එක්ක

[ගරු විදුර වික්‍රමනායක මහතා]

බැඳිලා හිටියාද, ජනතාවට සමීප වෙලා හිටියාද, ජනතාවට කොයිතරම් ආදරය කළාද, ඒ වාගේම කොයිතරම් ප්‍රතිපත්තිගරුකව හිටියාද කියන එකයි. මේක තමයි අද සිටින දේශපාලනඥයින්ගේ සහ එදා සිටි දේශපාලනඥයින් අතර තිබෙන වෙනස; ප්‍රතිපත්තිගරුක බව. එතුමන්ලාගේ තිබුණු ප්‍රධාන ප්‍රතිපත්තිය මොකක්ද? දේශපාලනය ව්‍යාපාරයක් කර නොගැනීම; වෙළෙඳ ව්‍යාපාරයක් කර නොගැනීම. අන්න ඒ කුලකයට තමයි කුමන පක්ෂය නියෝජනය කළත් එදා හිටපු මන්ත්‍රීවරු සියලු දෙනා අයත් වුණේ. ඒ නිසා අපට ඔවුන්ගෙන් ඉගෙන ගන්න පාඩම් තිබෙනවා; ආදර්ශ තිබෙනවා. හැබැයි, ඒ පාඩම් -ආදර්ශ- මොනතරම් දුරට ඉගෙන ගන්නවාද කියන එක පිළිබඳව අද ගැටලුවක් තිබෙනවා. ඒ නිසා එන්න එන්නම අපේ රට පරිහානියට පත් වෙනවා; සමාජය පරිහානියට පත් වෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනා තමයි මේ රටේ නායකයෝ කියලා කියන්නේ. හැබැයි, එදාට වැඩිය අද ප්‍රශ්න වැඩියි; අදට වැඩිය හෙට ප්‍රශ්න වැඩියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්න ඒ නිසායි මෙතුමන්ලාගේ චරිත වඩාත් ඔපමට්ටම් වෙන්නේ; වඩාත් වටින්නේ.

ගරු මංගල මුණසිංහ මැතිතුමා, ගරු උපතිස්ස සිල්වා මැතිතුමා වාගේම ගරු තිලකරත්න මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ඒ පවුල්වල සියලුදෙනාට මාගේ ශෝකය ප්‍රකාශ කරන අතර, ඔවුන් තිදෙනාටම අප්‍රාමර නිවන් සුව අත්වේවායි! ප්‍රාර්ථනා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුම**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

[අ.භා.2.33]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුව නියෝජනය කළ ගරු මන්ත්‍රීවරුන් තිදෙනෙකුගේ අභාවයන් පිළිබඳව ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කෙරෙන මේ අවස්ථාවේදී මටත් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම මේ රටේ වාමාංශික ව්‍යාපාරයට විශාල ශක්තියක් වුණු, දීර්ඝ කාලයක් අත් දැකීම් සහිත මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ ගරු මංගල මුණසිංහ මැතිතුමාගේ අභාවය පිළිබඳව කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලා වාගේම පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් විශාල පිරිසක් අදහස් දැක්වූවා. අපි එතුමා දැක නැති වුණත්, ඇසුරු කර නැති වුණත්, මේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාරයට විශාල ශක්තියක්, දායකත්වයක් ලබා දෙමින්, ප්‍රගතිශීලී අණ පනත් සම්මත කිරීමේදී ජනතාව වෙනුවෙන් විශාල සේවාවක් සිදු කළ මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා පිළිබඳව රටේ ජනතාව සඳහන් කරනවා වාගේම, එතුමා පිළිබඳව රටේ ජනතාව අතර තිබෙන්නේ ඉතාම ගෞරවණීය හැඟීමක්.

විශේෂයෙන්ම ජන වාර්ගික ප්‍රශ්නයට විසඳුම් සෙවීමේදී, දිවංගත ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා විසින් පත් කරන ලද කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරමින්, ඒ වෙනුවෙන් කළ යුතු නිර්දේශ ගණනාවක් රට හමුවේ තබලා, ජන වාර්ගික ප්‍රශ්නයට සාමකාමී විසඳුමක් සෙවීමේ උත්සාහයට එතුමා විශාල වෙහෙසක්, මහන්සියක් ගත්තා කියන එක අපි මේ අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කළ යුතු වෙනවා. එතුමා පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ වෙලාවේ එතුමාගේ පවුලේ ඥාතීන් වෙත අපගේ ශෝකයත් දන්වා යවන ලෙස ඉල්ලා සිටිනවා.

මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමා පිළිබඳවත් අද ශෝකය ප්‍රකාශ කෙරෙනවා. මා නියෝජනය කරන රක්වාන ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස වසර 10ක පමණ කාලයක් සේවය කළ ගරු උපතිස්ස සිල්වා මැතිතුමා, පාර්ලිමේන්තුවට පැමිණීමට පෙර රත්නපුර දිස්ත්‍රික් සංවර්ධන සභාවේ ආරම්භක සභාපතිවරයා ලෙස කටයුතු කර, ඉන් අනතුරුව පළාත් සභාවේ අමාත්‍යවරයෙක් ලෙස කටයුතු කර තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස දෙවතාවක් සේවය කළ එතුමා, විශේෂයෙන්ම රක්වාන මැතිවරණ කොට්ඨාසයට විශාල ජනතා සේවාවන් රැසක් බලයේ පැවැති රජයයන් හරහා ඉටු කළ ජනහිතකාමී මහජන නියෝජිතයෙක් කියන එක අපි ඉතාම කෘතවේදීව සඳහන් කළ යුතු වෙනවා. එතුමා දේශපාලනයට පිවිසෙන කාල සීමාවේ අපි පාසල් ශිෂ්‍යයෝ හැටියට සිටියත්, පසු කාලයේ එතුමාත් සමඟ එකම පළාත් සභාව නියෝජනය කිරීමේ අවස්ථාව අපට ලැබුණා. අප දෙදෙනා පළාත් සභාවට පැමිණීමට පෙරාතුව ඒ තරම් ලොකු දැන හැඳුනුම්කමක් නොතිබුණත්, පළාත් සභාවට පැමිණි පසු අප අතර බොහොම ලෙන්ගතුකමක්, හිතවත්කමක්, මිත්‍රත්වයක් ඇති වුණා. විශේෂයෙන්ම විදේශ සංචාර වාගේ දේවල්වලදී වැඩිහිටියෙකු ලෙස එතුමා අප සමඟ බොහොම හොඳින් කටයුතු කළ නිසා අපි අතර ලොකු හිතවත්කමක් ඇති වුණා. පසු කාලීනව පළාත් සභා මැතිවරණයෙන් එතුමාට මහජන නියෝජිත තත්ත්වය නැති වුණත්, තමන්ගේ ව්‍යාපාරික කටයුතු සහ අනෙකුත් පොදු සමාජ සේවා කටයුතුවලදී, විශේෂයෙන්ම ගමේ පන්සලේ ආගමික උත්සව වැනි අවස්ථාවලදී අපි එතුමාත් සමඟ බොහොම හිතවත්ව, සමීපව කටයුතු කළා. ඒ වාගේම එක ගමේ එක නගරයේ ජීවත් වන උදවිය හැටියට අපි එතුමාගේ දයාබර මැනිනිය සහ දරුවන් දෙපළ සමඟ සමීප සම්බන්ධතා සහ හිතවත්කම් තිබෙනවා. එකම ප්‍රදේශයේ උදවිය හැටියට, මහජන නියෝජිතයෝ හැටියට එතුමාගේ අභාවය වෙලාවේත් අපි ඒ පවුලේ අයත් සමඟ දුක බෙදා හදාගෙන කටයුතු කරන්නට යෙදුණා. අවසාන කාලය වන විට එතුමා පක්ෂ දේශපාලනයෙන් බොහෝ දුරට ඈත් වෙලා නිදහස්ව කාලය ගත කළාය කියන එකත් මම සඳහන් කරන්නට ඕනෑ. එතුමා සමඟ කථා බහ කරන අවස්ථාවලදී එතුමා තුළ යම් ආකාරයක හිත් වේදනාවක් තිබුණා වාගේත් අපට දැනුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙසේ වෙතත් දේශපාලනය කරන උදවිය හැටියට අවසානයේ අපි කළ දේවල් ගැන සතුටු වෙනවා වාගේම අවසානයේ ඉතිරි වෙන්නේ හිත් වේදනාවක් පමණක් කියන එකත් අපි කවුරුත් සැලකිල්ලට ගත යුතුයි. ඒ කෙසේ නමුත්, ඉතාම හොඳ බෞද්ධයෙක් හැටියට එතුමා ගමේ පන්සලත් සමඟ, අහළ පහළ විහාරස්ථාන සමඟ හොඳ සමීප සම්බන්ධතාවක් තිබුණා වාගේම, අදත් ගරු උපතිස්ස සිල්වා කියන නමට ගරු කරන ජනතාවක් රක්වාන මැතිවරණ කොට්ඨාසයේ, රක්වාන ආසනය තුළ ඉන්නවා. මොකද, එතුමා නිහතමානී මහජන සේවකයෙක් නිසා.

එතුමාගේ වැඩිමහල් ඥාතියෙක් වුණු හිටපු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍ය කුලරත්න මැතිතුමාගේ ඇවෑමෙන් දේශපාලනයට ආපු කෙනෙක් හැටියට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එතුමාට බොහොම ගරු කරන පිරිසක් අදත් ඒ පළාත්වල ජීවත් වෙනවා. ඒ වාගේම එතුමා කළ සේවාවන්වලින් විශාල වශයෙන් එල ප්‍රයෝජනය ලබන ජනතාවක් ඒ පළාත්වල සිටින බවත් සඳහන්

කළ යුතුයි. බොහොම නිහතමානී, නිදහස්, හුදෙකලා ජීවිතයක් ගත කළ ගරු උපතිස්ස සිල්වා මැතිතුමා පිළිබඳව ශෝකය පළ කරන මේ අවස්ථාවේ එතුමාගේ දයාබර මැනිනිය සහ දරුවන් වෙත එම ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හැටියට මාගේ ශෝකයත් දන්වා යවන මෙන් ඉල්ලා සිටිමින්, දිවංගත ගරු උපතිස්ස සිල්වා මැතිතුමාට අපි අදහන ආගමේ හැටියට නිවන් සම්පත් ලැබෙවායි ප්‍රාර්ථනය කරනවා. ඒ වාගේම මට කථා කරන්න අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.38]

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ උත්තරීතර සභාව නියෝජනය කළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තිදෙනෙක් -ගරු එම්. තිලකරත්න මැතිතුමා, ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මැතිතුමා, ගරු මංගල මුණසිංහ මැතිතුමා- පිළිබඳව ශෝක ප්‍රකාශ යෝජනා සභාවට ඉදිරිපත් කර තිබෙන මොහොතේ එම මන්ත්‍රීවරුන්ගේ අභාවයන් පිළිබඳව මාගේ බලවත් සංවේගය මේ අවස්ථාවේ ඔවුන්ගේ පවුල්වල සියලුදෙනාටම පුද කර සිටිනවා.

විශේෂයෙන්ම දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලාංකීය වාමාංශික දේශපාලනයට විශිෂ්ඨ මෙහෙවරක් සිදු කළ ගරු මංගල මුණසිංහ මැතිතුමන් පිළිබඳව වචන කිහිපයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

එතුමාගේ දීර්ඝකාලීන, කීර්තිමත්, විශිෂ්ට සමාජ දේශපාලන ජීවිතය පිළිබඳව මේ සභාවේ කථා කළ ගරු මැති ඇමතිතුමන්ලා අදහස් රාශියක් ප්‍රකාශ කළා. එතුමාගේ ජීවිතය කොටස් තුනකට බෙදා ගත්තොත්, එතුමා නීතිඥවරයකු වශයෙන් ගත කළ වෘත්තීයමය ජීවිතය, දේශපාලනඥයකු විධියට, මහජන නියෝජිතයකු, පාර්ලිමේන්තුවාදියකු විධියට ගත කළ ජීවිතය සහ රාජ්‍ය තාන්ත්‍රිකයකු විධියට ලංකාව නියෝජනය කරමින් ගත කළ ජීවිතය ලෙස කොටස් තුනකින් සමන්විත වෙනවා. කැලිෆෝනියාවේ වෙස්ට්ර්ස් ස්ටේට් විශ්වවිද්‍යාලයේ අයිසන්හවර් ශිෂ්‍යත්වය දිනාගෙන විශිෂ්ට බුද්ධිමතකු, නීතිඥයකු හැටියට එතුමන් ගත කළ වෘත්තියමය ජීවිතය ලංකාවේ ජනතාව අතර එතරම් ප්‍රකට එකක් නොවුණාට, එතුමා ඉතා විශිෂ්ට බුද්ධිමතකු හැටියට වෘත්තීයමය ජීවිතය ආරම්භ කළ බව අපි සෑම කෙනෙක්ම දන්නවා. ඒ වාගේම, ඉතා තරුණ වයසේදී -අවුරුදු 34ක් වැනි තරුණ වයසේදී- කළුතර දිස්ත්‍රික්කයේ දුෂ්කර ප්‍රදේශවන පස්දුන් කෝරළය සහ රයිගම් කෝරළය නියෝජනය කරමින් දුක් විඳින මිනිසුන්ගේ මහජන නියෝජිතයා හැටියට 1965 වර්ෂයේ පාර්ලිමේන්තුවට පත් වූ එතුමා ඉතා විශිෂ්ට මහජන භූමිකාවක නිරත වුණු මහජන නියෝජිතයකු හැටියට අපි සෑම කෙනෙකුගේම ගෞරවයට පාත්‍ර වෙනවා. ලංකා සමසමාජ පක්ෂයෙන් ආරම්භ කරපු එතුමාගේ විශිෂ්ට දේශපාලන ගමන, මේ රටේ දුක් විඳින ජනතාවට සමාජ සාධාරණත්වය ඉෂ්ට කිරීමට, ජාති, කුල මල, ආගම් භේදවලින් තොර නව්‍ය ශ්‍රී ලාංකීය සමාජයක් ඇති කිරීමට පෙර ගමනක් හැටියට ගිය දේශපාලන ගමනක් හැටියට තමයි අපි දකින්නේ. එතුමා පසු කාලීනව 1995 වර්ෂයේ සිට 2000 වසර දක්වා ලංකාව නියෝජනය කරන මහ කොමසාරිස්වරයකු හැටියට ඉන්දියාවේත්, එංගලන්තයේත් සේවය කළා. 2010 වර්ෂයේදී නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ මම එතුමාගෙන් ඉගෙන ගත්ත පාඩම තමයි, එතුමාගේ සමස්ත සමාජ දේශපාලන ජීවිතයම කැප කර තිබෙන්නේ 21වැනි සියවසයට ගැළපෙන නව්‍ය ශ්‍රී ලාංකිකයෙකු තැනීම වෙනුවෙන්ය කියන කාරණය. ආවේණික කල්පිත මතවාද කර තියාගෙන, ජාති, කුල මල, ආගම් භේද පිළිබඳව තවමත් කථා කරන සමාජයක ජීවත් වන පුද්ගලයන් තමයි අපි. මේ රටේ සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ජනතාව ජාති, කුල මල, ආගම් භේදවලින් තොර, 21වැනි සියවසට ගැළපෙන මනුෂ්‍යයන් බවට පරිවර්තනය කිරීමේ අභිලාෂය, වුවමනාව එතුමාගේ මුළු ජීවිතය පුරාම ගැබ් වී තිබුණා. සමාජ සාධාරණත්වය, සමානාත්මතාව පතන එතුමා වැනි විශිෂ්ට මහජන නියෝජිතයන් නැතිවීම හේතුවෙන් මේ රටේ දේශපාලන ක්ෂේත්‍රයේ විශාල හිඩැසක් ඇති වී තිබෙනවාය කියන කාරණය අපට හැඟෙනවා. එතුමා දේශපාලනය ආරම්භ කරපු කාලයේ 1950 දශකයේ, 1960 දශකයේ, 1970 දශකයේ මේ රටේ බිහි වී සිටි විශිෂ්ට බුද්ධිමතුන්, විශේෂයෙන් නීතිඥ වෘත්තිය හරහා බිහි වුණු බුද්ධිමතුන් මේ උත්තරීතර සභාව නියෝජනය කරලා තිබෙනවා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා, ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා, ආචාර්ය කොල්විල් ආර්. සිල්වා මැතිතුමා, ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා වැනි විශිෂ්ට බුද්ධිමතුන්ගේ ගණයට වැටෙන, ඒ හා තරමටම සුවිශේෂී දැක්මක් තිබුණු මහජන නියෝජිතයෙක් තමයි මංගල මුණසිංහ මැතිතුමා. එතුමා වැනි විශිෂ්ට පරිණත දේශපාලනඥයෙකුගේ අභාවය සමස්ත ශ්‍රී ලාංකීය දේශපාලන ක්ෂේත්‍රයටම විශාල පාඩුවක්ය කියන කාරණය අපි සිහපත් කරනවා.

එතුමාගේ අභාවය පිළිබඳ අපේ බලවත් සංවේගය ඒ ආදරණීය මැනිනියට, දරුවන් ඇතුළු ඥාතීන්ට පුද කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම, එම්. තිලකරත්න මැතිතුමාගේ සහ උපතිස්ස සිල්වා මැතිතුමාගේ පවුලේ අයට අපගේ සාතිශය සංවේගය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ අවස්ථාවේදී තව විනාඩියක් ලබා ගන්නවා, පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලීන සේවයකින් පසුව විශ්‍රාම යන ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු සේවා සහායක කේ.එල්.ජී. ලයනල් මහතාට සුබ පැතීමට. එතුමා ගාල්ල ප්‍රදේශයේ පදිංචි මහත්මයෙක්. වසර 37ක් වැනි දීර්ඝ කාලයක් පැරණි පාර්ලිමේන්තුවේ සිට වර්තමාන පාර්ලිමේන්තුවේ අද දක්වාම මහජන නියෝජිතයන් සමඟ ඉතා සුහදශීලිව කටයුතු කළ, සෑම කටයුත්තකදීම අපට සහයෝගය ලබා දෙමින් කටයුතු කළ ලයනල් මැතිතුමාගේ දීර්ඝ සේවා කාලයෙන් පසුව විශ්‍රාම දිවියට පිය නඟනකොට මහජන නියෝජිතයන් හැටියට ඒ මහතාට අපගේ සුබ පැතුම් එක්කොට, එතුමාගේ සේවය වෙනුවෙන් ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අභාවප්‍රාප්ත ගරු එච්.එම්. උපතිස්ස සිල්වා මහතා, ගරු එම්. තිලකරත්න මහතා, සහ ගරු මංගල මුණසිංහ මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින් ගරු කථානායකතුමා සමඟ මාද ඒ හා එකතු වීමට කැමැත්තෙමි.

අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් එම පවුල්වල අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාට මම නියෝග කරමි.

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## ක්‍රිකට් ක්‍රීඩාවේ අර්බුදකාරී තත්ත්වය
## கிரிக்கட் விளையாட்டு எதிர்கொண்டுள்ள நெருக்கடி நிலைமை
## CRISIS SITUATION IN CRICKET

[අ.භා. 2.46]

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ක්‍රිකට් ක්‍රීඩාවට ශ්‍රී ලංකාවේ අතිබහුතරයක් ක්‍රීඩා ලෝලීන් අදරය කරන අතර, එය ශ්‍රී ලංකාවේ ජනප්‍රියම ක්‍රීඩාවයි. එමෙන්ම ක්‍රිකට් ක්‍රීඩාව තුළින් රටට ඉමහත් කීර්තියක් ලබාදී ඇති අතර, අප 1996 ලෝක කුසලානය ඇතුළු කුසලාන රාශියක් ජයග්‍රහණය කර තිබේ.

කෙසේ වෙතත්, අද වන විට ක්‍රිකට් ක්‍රීඩාවේ පරිපාලනයේ ඇති වී තිබෙන දුර්වලතා හේතුවෙන් දිනෙන් දින ක්‍රිකට් ක්‍රීඩාව බරපතළ අර්බුදයකට පත්වී ඇති බව ඉතා පැහැදිලිව දක්නට ලැබේ.

එම නිසා ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය හා වර්ධනය උදෙසා කටයුතු කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවස වන විට ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව ගැන කථා කරන්න වෙන්නේ ඉතාම කනගාටුවෙන්, කනස්සල්ලෙන්. අපි රටක් වශයෙන් විවිධ අර්බුදවලට මුහුණ දුන් අවස්ථාවලදී, උදාහරණ වශයෙන් යුද්ධයට මුහුණ දෙන කාල වකවානුවේ, සුනාමි වැනි ව්‍යසනවලට මේ රට මුහුණ දුන් අවස්ථාවලදී, ආර්ථිකය අතින් පරිහානියට පත් වූ අවස්ථාවලදී මේ රටේ ජනතාවට යම්කිසි ආකාරයක හෝ සතුටක් ගෙන දෙන කාරණයක් තිබුණා නම් ඒ ක්‍රිකට් ක්‍රීඩාවයි. එදා දවසේ මේ රටේ ජාතීන් අතර ප්‍රශ්න තිබෙන කොට, බෙදීම් තිබෙන කොට ඒ සියලුදෙනා එක තැනකට ගෙනෙන්න පුළුවන් වූ එකම ක්‍රීඩාව ක්‍රිකට් බවට පත් වෙලා තිබුණා. අපට මතකයි, 1996 ලෝක කුසලානය ජයග්‍රහණය කළ අවස්ථාව. අද දවසේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට, ක්‍රීඩා අමාත්‍යාංශයට හෝ ක්‍රීඩකයන්ට තිබුණු පහසුකම්වත් නොතිබුණු අවධියකයි ඒ ජයග්‍රහණය අපට ලබා ගන්න පුළුවන් වුණේ. ඒ ජයග්‍රාහී කණ්ඩායමේ නායකයා, ගරු අර්ජුන රණතුංග මැතිතුමා අද ආණ්ඩුවේ ඇමතිවරයකු වශයෙන් කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාල වකවානුව ගත්තොත්, ක්‍රිකට් ක්‍රීඩාව පමණක් නොවෙයි, ලංකාවේ සම්ස්ත ක්‍රීඩා ක්ෂේත්‍රයම කඩා වැටීමකට ලක් වෙලා තිබෙන බව අපට පෙනෙනවා. මේ ආණ්ඩුව බලයට පත් වෙලා පසු ගිය අවුරුදු තුනහමාරක කාලය තුළ ක්‍රීඩා විෂයය භාරව ඇමතිවරු තුන් දෙනකු කටයුතු කර තිබෙනවා. ගරු නවීන් දිසානායක මැතිතුමා දින සියයේ ආණ්ඩුව තුළත්, ඉන්පසුව ගරු දයාසිරි ජයසේකර මැතිතුමාත් කටයුතු කළා. වර්තමානයේ ගරු ෆයිසර් මුස්තාපා මැතිතුමා ක්‍රීඩා විෂයය භාරව කටයුතු කිරීමේ වගකීම අරගෙන තිබෙනවා. මේ ක්‍රිකට් ක්‍රීඩාවේ, ක්‍රිකට් පරිපාලනයේ, ඒ වාගේම ක්‍රීඩා ක්ෂේත්‍රයේ තිබෙන පරිහානිය නිසා අද ක්‍රීඩකයන්ටත් චෝදනා එල්ල වන තැනට පත් වෙලා තිබෙනවා. අපේ ක්‍රිකට් කණ්ඩායම තරගවලින් ජයග්‍රහණය කර තිබෙනවා; පරාජයට හිමිකම් කියා තිබෙනවා. නමුත්, පරාජය වන අවස්ථාවලදී ක්‍රීඩාලෝලීන් ක්‍රිකට් කණ්ඩායමට "හූ" කියපු තත්ත්වයක් ඉතිහාසයේ අපි දැකලා නැහැ. නමුත්, අද ඒ තැනට පත් වෙලා තිබෙනවා. ක්‍රීඩා විෂයභාර අමාත්‍යාවරයාත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයත් ඒ සියලුදේවලට අද වග කිව යුතුව තිබෙනවා. අද වන විට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වගකීමක් නැති ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. ඊයේත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හිටපු සභාපතිතුමා මාධ්‍යයට ප්‍රකාශ කළා, ක්‍රිකට් කණ්ඩායම ලබන මේ පරාජයේ වගකීම භාර ගන්නවත් අද ශ්‍රී ලංකා ක්‍රිකට් අයතනය තුළ පුද්ගලයකු නැහැ කියලා. ඒ වාගේම අනෙක් පාර්ශ්වයෙන් චෝදනාවක් එල්ල කළා, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මේ වගකීම දරන්නේ ක්‍රීඩා ඇමතිවරයා, ඒ නිසා මේ පරාජයේ වගකීමත් ඇමතිවරයා භාරගත යුතුයි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ ඇති වී තිබෙන තත්ත්වය කාලයක් පුරා හැදුණු දෙයක්. එහෙම නැතිව එක දවසකින් දෙකකින් ඇති වුණ දෙයක් නොවෙයි.

එදා පාසල් තුළ ක්‍රීඩා කරලා, ක්‍රිකට් සංගම් තුළ ක්‍රීඩා කරලා, ජාතික කණ්ඩායමට සුදුසුකම් ලබා ක්‍රීඩා කරපු බොහෝ දෙනෙක්, අද මේ රටින් සහ ක්‍රීඩාවෙන් ඈත් වෙලා ගිහින් තිබෙනවා; විදේශගත වෙලා තිබෙනවා. ඒ, ඔවුන්ට අවස්ථාව නොලැබෙන නිසා. අපි දන්නවා, ක්‍රීඩකයින්ට පසුගිය කාලයේ ක්‍රීඩා කණ්ඩායමට යන්න තිබුණු සුදුසුකම බවට පත් වුණේ තමන්ගේ දක්ෂතාව පමණක් නොවන බව. තේරීම් කමිටුවේ කළමනාකරුවන් සිටිනවා. කළමනාකරුවන් විසින් තෝරා ගනු ලබන අයට තමයි සමහර වෙලාවට ක්‍රීඩා කණ්ඩායමට ඇතුළත් වෙන්න පුළුවන්කම තිබෙන්නේ. එවැනි වට පිටාවක් තුළ අද ක්‍රිකට් ක්‍රීඩාව ඉතාමත්ම පරිහානියට පත් වෙලා තිබෙනවා. ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලියේදී එහි ප්‍රතිඵලය අපි දැක්කා. ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලියේදී අපි දකුණු ආසියාවේ සියලුම කණ්ඩායම්වලට පරාජයට පත් වුණා. බංග්ලාදේශයට අපි පරාජයට පත් වුණා; ඇෆ්ගනිස්ථානයට අපි පරාජයට පත් වුණා. අපට තිබෙන කනගාටුව පරදින එක නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි පරදින ආකාරය පිළිබඳවයි, අපි ක්‍රීඩා කරන පිළිවෙළ පිළිබඳවයි.

පසු ගිය කාලයේ අපේ ක්‍රිකට් කණ්ඩායම යම් ජයග්‍රහණයන් ලබා ගත්තා. ඒ වාගේම යම් පරාජයන් ලබා ගත්තා. පරාජයන් ලැබූ අවස්ථාවල ක්‍රීඩා ඇමතිවරයාගේ විවේචනයට ලක්වනවාත් අපි දැක්කා. මම කියන්නේ, ෆයිසර් මුස්තාපා ඇමතිතුමා ගැන නොවෙයි. ඔබතුමාට පෙර හිටපු ඇමතිතුමා. ක්‍රිකට් ක්‍රීඩකයන්ව ප්‍රසිද්ධ වේදිකාවල විවේචනයට ලක් කරනවා, අපි දැක්කා. ප්‍රසිද්ධියේ විවේචනයට ලක් කරනවා, අපි දැක්කා. යම් ක්‍රීඩකයන් ඉලක්ක කරගෙන විවේචනයට ලක් කරනවා අපි දැක්කා. යම් යම් ක්‍රීඩකයන් ඔවුන්ගේ මතය ප්‍රකාශ කරද්දී ඔවුන්ට දඩුවම් දෙන්න ක්‍රියා කළ ආකාරය අපි දැක්කා. සමහර ක්‍රීඩකයන්ව අවුරුදු එකහමාරක්, දෙකක් ක්‍රීඩාවෙන් ඈත් කරලා තිබුණා. ඒ ක්‍රීඩකයෝ අවුරුදු එකහමාරකට පස්සේ නැවත ඇවිල්ලා, ක්‍රීඩා පිටිය පාවිච්චි කර, ඒ ඇමතිවරුන්ට උත්තර දෙන්න තමයි ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලියේ දී එදා දිනයේ ක්‍රීඩා පිටිය පාවිච්චි කළේ. අද

දවස වනවිට ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ චිත්ත ධෛර්ය නැති කරලා, මානසිකව ඇද වැටිලා තිබෙනවා. අපි ඊළඟ ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියට යනකොට මේ තත්ත්වය කොතැනින් කෙළවර වෙයිද කියන සැකය අපට තිබෙනවා.

ක්‍රිකට් ලෝක කුසලානය ලංකාවට රැගෙන එනවා, ඊයේ දවසේ අපි දැක්කා. කුසලානය ලංකාවට රැගෙන ආ වෙලාවේ ලෝක කුසලානය භාර ගැනීමේ උත්සවයට අඩුම තරමේ ක්‍රිකට් කණ්ඩායම නැහැ. අපේ ක්‍රිකට් කණ්ඩායමට අද මුහුණ දෙන්න පුළුවන්කමක් නැහැ. ඔවුන්ගේ මානසිකත්වය බිඳ වැටිලා ඉවරයි. ක්‍රිකට් පාලන අධිකාරිය තුළ නිල බලයෙන් පත් වෙලා හිටපු කණ්ඩායම දැන් ඉවත් වෙලා ගිහිල්ලා. අද නිලවරණයක් නැහැ. ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමාගේ වෙලාවේ තිබෙන මොකක් හෝ අවුලක්ද කියලා මම දන්නේ නැහැ. එතුමා මොන විෂයය භාර ගත්තත් කටයුතු කල් යනවා. අඩුම තරමේ මැතිවරණයක්වත් තියා ගන්න බැහැ. පළාත් සභා, පළාත් පාලන විෂයය භාර ගත්තා, මැතිවරණ කල් යනවා. ක්‍රීඩා විෂයය භාර ගත්තා, නිලවරණ කල් යනවා. ඇත්තටම ඊයේ ඇමතිතුමා කථා කරලා මගෙන් ඇහුවා, මේ කල් තැබීමේ විවාදයත් කල් දමන්න පුළුවන්ද කියලා. ඒක කරන්න පුළුවන්ද කියලා එතුමා ඊයේ මගෙන් කථා කරලා ඇහුවා. මේ කල් තැබීමේ විවාදයත් කල් ගියා නම්, මේකත් ඔබතුමාගේ ඇහටම තමයි ගොඩ වෙන්නේ ගරු ඇමතිතුමනි. ඒ නිසා පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා විෂයය භාර ඇමතිවරයා හැටියට ඔබතුමාට මෙම අමාත්‍යාංශ දෙකේ කාර්ය භාරය කරන්න බැරි නම්, ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් මෙය කරන්න පුළුවන් සුදුසු පුද්ගලයකුට භාරදෙන්න ඔබතුමා කටයුතු කළ යුතුයි කියලා මම හිතනවා.

ක්‍රිකට් පාලන මණ්ඩලයට සුදුසු කණ්ඩායමක් අද පත් වෙන්න ඕනෑ බව අපි විශ්වාස කරනවා. මම පෞද්ගලිකව හිතනවා, තිලංග සුමතිපාල මැතිතුමා ඉතිහාසයේ යම්කිසි සේවාවක් ක්‍රිකට් පාලක මණ්ඩලය වෙනුවෙන් කර තිබෙන බව. එතුමා ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් යම්කිසි සේවයක් කර තිබෙනවා. නමුත්, පසුගිය කාල වකවානුවල සිදු වෙච්ච සිදුවීම් නිසා මේ වකවානුව තුළ එතුමාට චෝදනා ගණනාවක් එල්ල වෙලා තිබෙනවා. පසුගිය දවස්වලත් අපි දැක්කා, මූල්‍ය අක්‍රමිකතා පිළිබඳව ක්‍රිකට් පාලක මණ්ඩලයට විශාල වශයෙන් චෝදනා එල්ල වුණු බව. මෙලෙස චෝදනා එල්ල වෙලා තිබෙන අවධියක ක්‍රිකට් නිලවරණය පැවැත්වුවත් නිලවරණයෙන් පත් වෙන්නේ චෝදනා එල්ල වෙච්ච පිරිස නම්, ක්‍රිකට් ක්‍රීඩාවේ ඉදිරි අනාගතය පිළිබඳව අපට විශාල සැකයක් ඇතිවේවි. ඒ නිසා, එවැනි චෝදනා එල්ල වෙලා තිබෙන සියලුදෙනා අඩුම තරමේ තහනමකට ලක් කිරීමෙන් හෝ ක්‍රිකට් ක්‍රීඩාව සඳහා නව පාලන අධිකාරියක් පත් කර ගැනීමට නිලවරණයක් තියලා අවස්ථාව ලබා දිය යුතුයි.

පසුගිය කාලය පුරාවටම සිදු වෙච්ච දේවල් අපි දැක්කා. ඇමතිවරු වෙනස් වෙනකොට ක්‍රීඩා ක්ෂේත්‍රය වෙනුවෙන් ගන්න තීන්දු තීරණත් වෙනස් වුණා; ප්‍රතිපත්තියත් වෙනස් වුණා. ආණ්ඩු වෙනස් වනකොට ප්‍රතිපත්ති වෙනස් වන බව අපට පිළිගන්න පුළුවන්. නමුත් එකම ආණ්ඩුවේ ඇමතිවරු වෙනස් වනකොට, ඇමතිවරයාගෙන් ඇමතිවරයාට ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙනස් වෙනවා නම්, -මේ අවුරුදු තුනහමාර තුළ ඇමතිවරු තුන් දෙනෙකුගේ ප්‍රතිපත්ති මත ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙනස් වෙනවා නම්- අපට පෙනෙනවා එතැන ගැටලුවක් තිබෙන බව.

පාසල් ක්‍රිකට් කියන එක අද තරගයට පමණක් සීමා වෙලා තිබෙනවා. පාසල් ක්‍රිකට් කණ්ඩායම් තුළින් අද ජාතික කණ්ඩායමට එකතු වෙන්නේ කී දෙනාද? ක්‍රිකට් සමාජවලින්, domestic tournamentsවලින් අද ලංකාවේ කණ්ඩායම නියෝජනය කරන්න අවස්ථාව ලැබෙන්නේ කී දෙනෙකුටද? පාසල් තුළින් ආපු, ක්‍රිකට් සංගම් මට්ටමින් ආපු දක්ෂ ක්‍රීඩකයෝ හිටියා. මීට අවුරුදු 10කට ඉස්සෙල්ලා අපි දැකපු ඒ දක්ෂ ක්‍රීඩකයෝ සියලුදෙනා අද දවස වන විට ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව අත හැරලා, විදේශ රටවලට ගිහිල්ලා ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍ය පෙන්වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපට පුහුණුකරුවන් ආනයනය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. පසුගිය අවුරුදු තුනහමාරේදී විතරක් ප්‍රධාන පුහුණුකරුවෝ හතරදෙනෙක් යටතේ ලංකාවේ ක්‍රිකට් කණ්ඩායමට කටයුතු කරන්න සිදු වුණා. එම නිසා, අපි හිතනවා එතැන ගැටලුවක් තිබෙන බව. තරගාවලියෙන් තරගාවලියට, අවුරුද්දෙන් අවුරුද්දට පුහුණුකරුවෝ මාරු වනවා නම් එතැන ගැටලුවක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා අපි ඔබෙන් ඉල්ලීමක් කරනවා. මේක දේශපාලන භේදයක් නොවෙයි. අපි දේශපාලන භේදයකින් මේ පාර්ලිමේන්තුව ඇතුළේ දෙපැත්තක සිටියාට, කණ්ඩායම් දෙකක සිටියාට, ක්‍රීඩාව වෙනුවෙන් සියලු දෙනා එකට එක්කාසු වෙලා මෙවැනි යම් කිසි වැඩ පිළිවෙළක් හදන්න ඕනෑය කියලා මා හිතනවා.

පසුගිය කාලයේ ඔබතුමන්ලා හිටපු ක්‍රිකට් ක්‍රීඩකයන්ට මේ සඳහා අතහිත දෙන්න කියලා ආරාධනා කළ ආකාරය අපි දැක්කා. නමුත් ඒ ක්‍රිකට් ක්‍රීඩකයන්ටත් සැකයක් තිබෙනවා, අතහිත දෙන්න. මොකද, ඔවුන් යම් කිසි වගකීමක් ගන්නවා නම්, ඒ වගකීම අනුව ඔවුන් ඉදිරිපත් කරන යෝජනා, ඔවුන් දෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙයිද කියන සැකය ඔවුන් තුළ තිබෙනවා. ඒ නිසා හිටපු ක්‍රිකට් ක්‍රීඩකයන්, දැනුම තිබෙන, අත් දැකීම් තිබෙන බොහෝ දෙනෙක් අද ක්‍රිකට් පාලක මණ්ඩලයෙන් පවා ඉවත් වෙලා තිබෙනවා. රොෂාන් මහානාම, තිලකරත්න දිල්ශාන් වැනි ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධව ගොඩාක් අත් දැකීම් තිබෙන අය පවා, ලංකාවට කීර්තියක් ගෙන දුන් නායකයන් පවා, ක්‍රීඩකයන් පවා අද ක්‍රිකට් ක්‍රීඩාව දිහා බලන්නේ ඉතාම කනස්සල්ලෙන්ය කියන එක අපට කියන්න සිද්ධ වෙලා තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩකයන් පමණක් නොවෙයි, අද සියලු ජනතාවත් එහෙමයි. මේ රටේ තිබෙන ආර්ථික පීඩනය දරා ගන්න බැරි වේලාවට, රටේ ජනතාවට යම් කිසි හෝ සහනයක් ලැබෙන්නේ රූපවාහිනියේ විකාශනය වන ක්‍රිකට් තරගයක් බලනකොට විතරයි. නමුත් අද ක්‍රිකට් තරගයක් බලනකොට ඊටත් වඩා විශාල පීඩනයක් ඔවුන්ට එල්ල වෙනවා.

ඒ නිසා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ කරුණු පිළිබඳව ඔබේ අවධානය යොමු කරන්න කියලා. අවධානය යොමු කරලා මේ ක්‍රීඩාව ගොඩ ගන්න බලන්න. මේක, ගොඩ ගන්න බැරි දෙයක් නොවෙයි. දක්ෂ ක්‍රීඩකයෝ ගණනාවක් ඉන්නවා; සංචිතවල ක්‍රීඩකයෝ ගණනාවක් ඉන්නවා. හැබැයි, අපි දකින විධියට එකම වැරැද්දක් තිබෙනවා. ඒ තමයි ක්‍රිකට් කණ්ඩායම තෝරන කොට, සමහර වේලාවට කණ්ඩායමට 15 දෙනෙකු තෝරා ගන්නවා. ඊළඟ තරගාවලිය වෙන කොට ඒ 15 දෙනා වෙනස් වෙනවා. ඊළඟ තරගාවලිය වෙන කොට මුලින් තරගාවලියේ තරග කළ 15 දෙනා නැවත ගෙනෙනවා. මේ කණ්ඩායම ඇතුළේ පසුගිය අවුරුදු එකහමාර-දෙක තුළ විතරක් ක්‍රීඩකයෝ 100කට වැඩි පිරිසක් මාරු වෙලා තිබෙනවා. Test Matchවලදී, විස්සයි විස්ස තරගවලදී, එක්දින තරගවලදී ක්‍රීඩකයන් විශාල වශයෙන් වෙනස්වීමකට ලක් වෙනවා. අපි දකිනවා, match එකක් පරදින කොට ක්‍රිකට් තරගාවලියේ නායකයා වෙනස් වෙන බව, batting order එක වෙනස් කරන බව, ක්‍රිකට් ක්‍රීඩකයන් වෙනස් කරන බව. හැබැයි, මොනම අවස්ථාවකවත් ක්‍රිකට් පාලක මණ්ඩලයේ තිබෙන ඔළු ගෙඩි ටික වෙනස් කරන්න කවදාවත් කටයුතු කරලා නැහැ. මේ ඇතුළේ සිටින කණ්ඩායමම තමයි හැම දාමත් සිටින්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොන සභාපතිලා පත් වුණත් ඇතුළේ සිටින කණ්ඩායම තමයි පසුගිය දශකයට වැඩි කාලයක් තුළ මේ ක්‍රිකට්

[ගරු කංචන විජේසේකර මහතා]

පාලක මණ්ඩලයේ කටයුතු කරගෙන ඇවිල්ලා තිබෙන්නේ. ඔවුන්ට විරුද්ධව විශාල චෝදනා තිබෙනවා. ඔවුන්ට විරුද්ධව විශාල මූල්‍ය අක්‍රමිකතා චෝදනා තිබෙනවා. ඒ පිළිබඳව පරීක්ෂණ කටයුතු කරන්න නම්, ඒ පිළිබඳව පරීක්ෂණ කරලා ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය සඳහා කටයුතු කරන්න නම් අඩුම තරමේ එකී පරීක්ෂණ කටයුතු කරන තෙක් තාවකාලිකව ඔවුන්ගේ සේවය අත් හිටුවා හෝ මේ කටයුත්ත කරන්න සිද්ධ වෙනවා. එහෙම නොවුණොත් මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවට වෙන්නේ මොකක්ද?

අද වෙනකොට අපේ කණ්ඩායම ඇෆ්ගනිස්ථානයට පරාදයි. දැන් නේපාලයටත් ක්‍රිකට් කණ්ඩායමක් ඉන්නවා. ඔවුන් තවම ආසියානු කුලසානයට ඇතුළත් වෙලා නැහැ. අපි දන්නවා මාලදිවයිනත් ක්‍රිකට් කණ්ඩායමක් හදාගෙන එන බව. ඔවුන් තවම ආසියානු කුසලානයට ඇතුළු වෙලා නැහැ. හෙට අනිද්දා වෙන කොට සමහර වේලාවට අපි මාලදිවයිනට, නේපාලයට පරදින කණ්ඩායමක් බවට පත් වෙයි. ඒ තැනට අපේ රට ගෙන යන්න එපා කියලා අපි මේ වේලාවේ කාරුණිකව ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ක්‍රිකට් ආයතනය රජයෙන් යැපෙන ආයතනයක් නොවෙයි කියන එක අපි දන්නවා. මූල්‍යමය ශක්තියක් එයට තිබෙනවා. ඒ මූල්‍යමය ශක්තිය තුළ ක්‍රිකට් ආයතනයට ස්වාධීනව කටයුතු කරන්න පුළුවන් අවස්ථාවක් තිබෙනවා. අද වෙනකොට සමහර වේලාවට තේරීම් කමිටු පත් කරන බව අපි දන්නවා. මේ සඳහා අවශ්‍ය සුදුසු පුද්ගලයන් පත් කරනවා. නමුත් සමහර වේලාවට තේරීම් කමිටුවලට බලය තිබෙනවාද කියන සැකයත් අපට තිබෙනවා. තේරීම් කමිටුවල සාමාජිකයන් නිර්දේශ කරන ක්‍රීඩකයින් පිරිසද, කණ්ඩායමක් විධියට තරගවලට යන්නේ කියන සැකය අපට තිබෙනවා. ඒ නිසා ඔවුන්ට ස්වාධීනව කටයුතු කරන්න ඒ අවකාශය ලබා දිය යුතුව තිබෙනවා.

මේ රටේ බිහි වෙච්ච -පහළ වෙච්ච- ශ්‍රේෂ්ඨ ක්‍රිකට් ක්‍රීඩකයෝ ගණනාවක් ඉන්නවා. ඔවුන්ගේ අත් දැකීම්, ඔවුන් සතුව තිබෙන දැනුම අප ලබා ගත යුතුව තිබෙනවා. නමුත් අවාසනාව වන්නේ ඔවුන්ගේ දැනුම අපේ රටට ලබා ගන්නවා වෙනුවට අපි ඔවුන් විවේචනයට ලක් කරලා වෙනත් රටවලට අද යවා තිබෙන එකයි. අද කුමාර් සංගක්කාර, මහේල ජයවර්ධන, මුත්තයියා මුරලිදරන් සමහර වේලාවට IPL තරගවලදී වෙනත් කණ්ඩායම්වලට ඔවුන්ගේ දැනුම ලබා දෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපි ඔවුන් එකතු කර ගත යුතුයි. අර්ජුන රණතුංග වැනි ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව විශාල අත් දැකීම් තිබෙන මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන කිහිප දෙනෙකුත් සිටිනවා. ඒ සියලු දෙනාත් එකතු කරගෙන ක්‍රිකට් පාලක මණ්ඩලයේ කටයුතු වෙනුවෙන් ශක්තිය යෙදවිය යුතුයි.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේදී අපට චෝදනාවක් එල්ල කළා, "final එකට එනවා, final එක පාවා දෙනවා" කියලා. අද final නොවෙයි, අඩුම තරමින් පළමුවැනි වටයෙන් එළියට යන්නවත් පුළුවන්කමක් ලැබී නැහැ. එදා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තීන්දුවක් ගත්තා. එතුමාගේ ආණ්ඩුව පැවැති කාලයේත් මේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ නිලධාරීන් සිටියා. එදා දවසේ එතුමා තීන්දුවක් ගත්තා, "දේශපාලනය කරන කිසිම කෙනෙක් ක්‍රිකට් පාලක මණ්ඩලයට ඇතුළත් කරන්න ඉඩ තබන්නේ නැහැ" කියලා. ඒ ගත්ත තීන්දුව ඉතාම නිවැරදි තීන්දුවක් කියලා මා හිතනවා. අඩුම තරමේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ කටයුතු නිවැරදිව කරගෙන යන්න යම් කිසි අවස්ථාවක් ලැබුණා. ඒ නිසා ක්‍රිකට් පාලක මණ්ඩලයට ඇඟිලි ගැසීම් සිදු කළාය කියලා එදා දවසේ එහෙම ඇඟිල්ල දිගු කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ.

නමුත් අද දිනයේ ඒ චෝදනාව බරපතළ විධියට එල්ල වෙනවා. ක්‍රිකට් ක්‍රීඩා ලෝලියෙක් හැටියට, විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරන කෙනෙක් හැටියට මා ඉල්ලීමක් කරනවා. ක්‍රිකට් ක්‍රීඩාවට ආරක්ෂාව සපයන්න නම්, එය ඉදිරි අනාගතයට ශක්තිමත්ව ගෙන යන්න නම් අපි ඒ කටයුත්ත කළ යුතුයි. අද ඉඳලා පටන් ගත්තොත් ලෝක කුසලාන තරගාවලිය වෙන කොට අපට යම් කිසි ජයග්‍රහණ වෙනුවෙන් යන්න පුළුවන්කමක් ලැබෙයි. නමුත් අපි ලෝක කුසලානයට යන්නේ මේ තිබෙන තත්ත්වය උඩ නම්, අපට ලෝක කුසලානය පිළිබඳව සිහිනයක්ම පමණයි ඉතුරු වෙන්නේ. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. පසු ගිය කාලයේ සිදු වූ අකටයුතු පිළිබඳව පරීක්ෂණ පවත්වන තෙක් ඒ අය ඔවුන්ගේ ධුරවලින් අත්හිටුවා හෝ මේ කටයුතු නැවත වතාවක් සිදු කරන්න කියන ඉල්ලීම කරමින් මේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. යෝජනාව ස්ථිර කිරීම, ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.00]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද කල් තැබීමේ යෝජනාව මා ස්ථිර කරනවා. විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් අපේ රට ඉතාම කනගාටුදායක තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව නිතරම කථා කරන කාරණාවක් තමයි, සංහිඳියාව. ඉතිහාසයේ ඉඳලා අපේ රටේ සංහිඳියාව විශ්වාස කරපු, ඒ වාගේම සංහිඳියාව ප්‍රායෝගිකව අත්විඳපු, දැකපු තැන තමයි ක්‍රිකට් ක්‍රීඩාව. අපේ රට ලෝකය ඉදිරියේ ඉහළට ගෙන ගිය, අපේ රටෙන් ජාත්‍යන්තර ක්‍රීඩකයන් බිහි කළ ක්‍රීඩාවක් අද මේ ආකාරයට කඩා වැටීම සම්බන්ධයෙන් අප සියලු දෙනා තුළම කනගාටුවක් තිබෙනවා. හැබැයි, මේ කඩා වැටීමේ චෝදනාව සෘජුව ක්‍රීඩකයන්ට එල්ල කරන්නට බැහැ. පසු ගිය කාල පරිච්ඡේදය තුළ ක්‍රිකට් ක්‍රීඩාව විතරක් නොවෙයි, අනෙකුත් ක්‍රීඩා සියල්ලත් පරිහානියට පත් වෙනවා අපි දැක්කා.

අපට දේශීය වශයෙන් කිසිදු ක්‍රීඩාවකින් සාර්ථක තරගාවලියක් පවත්වන්න බැරි වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් අමාත්‍යාංශය කොතෙක් දුරට තමන්ගේ කාලය වැය කරනවාද කියන කාරණාව සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම සෑම තැනකම දේශපාලන ඇඟිලි ගැසීම් වැඩි වෙලා තිබෙනවා. පෞද්ගලිකව ක්‍රීඩකයන්ගෙන් පළිගන්නා තැනට පත්වෙලා තිබෙනවා. මේ කාරණාවලින් අපි මේ රජය විවේචනයට පත් කිරීමක් නොවෙයි කරන්නේ. ක්‍රිකට් පමණක් නොවෙයි, අපේ රටේ සමස්ත ක්‍රීඩා ක්ෂේත්‍රය ඉහළ නැංවීම අප සියලු දෙනාගේම වග කීමක් බවට පත් වෙලා තිබෙනවා. අවසාන වශයෙන් පවත්වපු ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලියේ දී අපේ ක්‍රිකට් කණ්ඩායමේ ඉරණම කුමක්ද කියන එක අපි දැක්කා. මේ ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලිය ආරම්භ වෙන්න ඉස්සර ඉඳන්ම ඔවුන්ගේ මානසිකත්වය බිඳ වැටිලා තමයි, එම ක්‍රීඩාවලියට ක්‍රීඩකයන් සම්බන්ධ කරවන්නේ. ආසියානු කුසලාන තරගාවලිය අභියස හිටපු ශ්‍රී ලංකා කණ්ඩායමට; එම තරගාවලිය සඳහා මුහුණ දෙන්න හිටපු ශ්‍රී ලංකා කණ්ඩායමට, තරගයට යන්න ඉස්සෙල්ලා ලැබෙන ප්‍රවෘත්තිය තමයි, "ශ්‍රී ලංකා ක්‍රිකට්

ආයතනයේ රුපියල් කෝටි 89ක වංචාවක්" කියන ප්‍රවෘත්තිය. රුපියල් කෝටි 89ක වංචාවක් ගැන කථා කරනවා. ඒ වංචාව තමයි, සෝනි ඉන්ටර්නැෂනල් ආයතනයට විකාශන අයිතිය ලබා දීම සම්බන්ධ කාරණය. ක්‍රිකට් තරගාවලියක් අභියස මේ ආකාරයේ දූෂණ, අක්‍රමිකතා, වංචා පිළිබඳව එළියට එනවා නම් කිසිම ක්‍රීඩකයෙකුට නිදහස්, ස්වාධීන මනසකින් ගිහිල්ලා ක්‍රීඩා කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ක්‍රිකට් පාලක මණ්ඩලයට චෝදනා රාශියක් මේ වර්ෂ දෙක, තුනක කාලය තුළ එල්ල වෙනවා. අර්ජුන රණතුංග ඇමතිතුමා - ලෝක කුසලානය අපේ රටට අරගෙන ආපු නායකතුමා- දිගින් දිගටම කරපු ප්‍රකාශය තමයි, අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව බුකීකාරයන්ගේ ග්‍රහණයට හසුවෙලා තිබෙනවාය කියන කාරණාව. එතුමා දිගින් දිගටම ප්‍රකාශ කළා, "මෙහෙම ගියොත් කිසිම දවසක ක්‍රිකට් ක්‍රීඩාවේ අනාගත දියුණුවක් ඇති වෙන එකක් නැහැ" කියන කාරණය. මොකද, තරග පාවාදීම්වලට අවශ්‍ය බුකීකරුවන්ගේ ග්‍රහණයට අපේ ක්‍රීඩාව හසුවෙලා තිබෙනවා කියලා එතුමා ප්‍රකාශ කළා. දැන් අපටත් ඒ ගැන සාධාරණ සැකයක් ඇති වෙලා තිබෙනවා, අර්ජුන රණතුංග නායකතුමා කියපු කාරණාව සත්‍යයි නේද කියලා. අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් කිසිදු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නැහැ.

අමාත්‍යාංශය තමන්ගේ පෞද්ගලික හිතවත්කම් මත තමයි ක්‍රිකට් පරිපාලනය පවත්වාගෙන ගියේ. ගරු ඇමතිතුමනි, ඒ නිසා අද ක්‍රිකට් ආයතනය තුළ නිලවරණයක් පැවැත්වීමේ අවශ්‍යතාවකුත් තිබෙනවා. ෆයිසර් මුස්තාපා ඇමතිතුමාට අපි විශේෂයෙන් මේ කාරණය මතක් කර දෙන්න ඕනෑ. පසුගිය කාලය තුළ ක්‍රිකට් ආයතනයට විතරක් නොවෙයි, අනිකුත් සංගම්වලටත් දේශපාලන අත පෙවීම් තිබුණා. දේශපාලන අත පෙවීම් මත පත්වන නිලධාරින් තමයි ක්‍රීඩා කළ යුතු ක්‍රීඩකයන්, ඒ වාගේම ඉදිරියේ තිබෙන කාරණා ගැන තීරණය කර ගත්තේ. ඒ නිසා අනවශ්‍ය ආකාරයේ දේශපාලන අත පෙවීම් ක්‍රීඩාවට යොමු වුණාම, ක්‍රීඩාවේ කඩා වැටීම සහ මේ වාගේ ඉරණමක් අපි සියලුදෙනාට අත්වීම පුදුම වෙන්න කාරණයක් නොවෙයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දක්ෂ නීතිඥවරයෙක්; අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධන කටයුතු කරද්දී, ඒ හිටපු හිටපු නායකයන්ගේ අවශ්‍යතා මත ඒ සංශෝධන කටයුතු කරන්න නීති උපදෙස් ලබා දුන් නීතිඥවරයෙක්. ඒ නිසා ඔබතුමාගේ ඒ නීති දැනුම, ප්‍රවීණත්වය භාවිත කර මේ කටයුතු කරන්න. දූෂණයට ලක්වුණු, දූෂිත චෝදනාවලට ලක්වුණු, ඒ වාගේම ක්‍රීඩා ප්‍රවීණයන්ය කියා දිගින් දිගටම කථා කරන මේ පුද්ගලයන්ට ක්‍රිකට් ක්‍රීඩාවට හෝ වෙනත් ක්‍රීඩාවලට ඇතුළත් වෙන්න මින් ඉදිරියටවත් ඉඩ තියන්න එපා. එහෙම වුණාම තමයි ක්‍රීඩාව දිගින් දිගටම පරිහානියට පත් වෙන්නේ.

ලංකා ඉතිහාසය දෙස බැලුවාම අපට පෙනෙනවා, අපි ජාත්‍යන්තරය ජයග්‍රහණය කළ, ජාත්‍යන්තර මට්ටමින් ඉහළින්ම පිළිගත් ක්‍රීඩකයන් රාශියක් බිහි කළ රටක් බව. හැබැයි ගරු ඇමතිතුමනි, බලන්න මේ එක ප්‍රවීණ ක්‍රීඩකයෙක්වත් තමන්ගේ ඒ දැනුම, තමන්ගේ ඒ දක්ෂතාව රට වෙනුවෙන් ලබාදෙන්න අද කැපවීමක් කරන්නේ නැහැ. එය මොන තරම් කනගාටුදායක තත්ත්වයක්ද? ඒකට හේතු විධියට ඔවුන් කියන්නේ මොනවාද? "යෝජනා ලබාගැනීම පමණයි කරන්නේ, කවදාවත් බිම් මට්ටමේ ඒ යෝජනා ක්‍රියාත්මක වෙන්නේ නැහැ, එහෙම නැත්නම් එතැන තිබෙන්නේ දේශපාලන අත පෙවීම්" කියා තමයි ඔවුන් කියන්නේ. ඒ නිසා අද මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව දෙස බලද්දී කළ යුතු වඩාත් සුදුසු දෙය වන්නේ, ජාත්‍යන්තරය ජයග්‍රහණය කළ ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයන්ගේ සහයෝගය ලබාගැනීමයි.

ඔබතුමා ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් පත්වුණාට පසුව ඔවුන්ගෙන් ඉල්ලීමක් කර තිබුණු ආකාරය අපි දැක්කා. හැබැයි, ඔවුන් ඔබතුමාගේ ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා. ඒ විධියට ප්‍රතික්ෂේප කළේ ඔවුන්ට තමන්ගේ දැනුම, දක්ෂතාව ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය සඳහා ලබාදෙන්න පුළුවන් වාතාවරණයක් ක්‍රිකට් ආයතනය තුළත්, ක්‍රීඩා අමාත්‍යාංශය තුළත් නොතිබීමයි. ඒ නිසා ඉතාම කනගාටුදායක තත්ත්වයක් තමයි අද තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, ක්‍රිකට් ක්‍රීඩාව විතරක් නොවෙයි, සමස්ත ක්‍රීඩාවම අපි ඉදිරියට ගෙන යා යුතුයි. අද පාසල් මට්ටමින් ක්‍රීඩකයෝ බිහි වෙන්නේ නැහැ; පළාත් මට්ටමින් ක්‍රීඩකයෝ බිහි වෙන්නේ නැහැ; සංගම්වල club cricket අපි දකින්නේ නැහැ; අනාගතයේදී අපේ රට වෙනුවෙන් ජාත්‍යන්තර වශයෙන් තරග කරන්න පුළුවන් ක්‍රීඩකයෙක් නිර්මාණය වන බවක් අපට පෙනෙන්නේ නැහැ. ඒ වෙනුවෙන් අමාත්‍යාංශය තුළ වැඩ පිළිවෙළක් තිබෙන බවක් අපි දකින්නේ නැහැ. සියලු නිලධාරින්; විශේෂයෙන්ම අමාත්‍යාංශය අද යොමු වෙලා තිබෙන්නේ දේශපාලන පසුබිමක් මත ක්‍රියා කරන්න පමණයි; දේශපාලන කටයුතුවල නියැලීම පමණයි. ඒ නිසාම අපි දකිනවා, ක්‍රීඩාව පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතු කාලයක් අද උදා වෙලා තිබෙන බව.

ක්‍රීඩාව ගැන අපි මේ ආකාරයට කනස්සල්ලෙන් කථා කරද්දී අපට පෙනෙනවා, අපේ රටේ හැම දෙයකම කඩා වැටීමක් සිදුවෙලා තිබෙන බව. හෙට දවසට රට ඉස්සරහට ගෙනියන්න බැරි ආණ්ඩුවක් තිබෙද්දී, ක්‍රීඩාව ගැන අවධානය යොමු කරන්න ඔබතුමන්ලාට කාලය තිබෙනවාද කියන කාරණයත් අද අපට ප්‍රශ්නාර්ථයක් බවට පත්වෙලා තිබෙනවා. ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමනි, අපි ඔබතුමාට කියන්නේ මෙපමණයි. ඔබතුමාට අද අභියෝග රාශියක් තිබෙනවා. පළාත් පාලන විෂයය ගැන ඔබතුමාගේ අවධානය යොමු කළත් ඔබතුමාට අභියෝග රාශියක් තිබෙනවා. ඔබතුමා ඊයේ පෙරේදා භාරගත් ක්‍රීඩා අමාත්‍යාංශය ගැන අවධානය යොමු කළත් ඔබතුමාට අභියෝගයක් තිබෙනවා. ඒ නිසා පසුගිය දේවල් ගැන කථා කර කර ඉන්න එක ඉදිරියට ඇති විසඳුම නොවෙයි. පසුගිය දේවල් ගැන කථා කර කර ඉන්නවාට වඩා, අනාගතය සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න; ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. එක පැත්තකින් අද නිලවරණ කල් ගිහින් තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීවරයකු කිව්වා වාගේ, අපේ රටේ මැතිවරණ කල් ගිහින් තිබෙනවා. ඒකේ අවමානය ඔබතුමාට එනවා. මොකද, ෆයිසර් මුස්තාපා ඇමතිතුමා නායකත්වය ලබා දෙන, මෙහෙයවීම කරන අමාත්‍යාංශය තුළ අපේ රටේ ජනතාව බලාපොරොත්තු වන ප්‍රගතිය නැහැය කියන කාරණය ඔබතුමාටත් පෞද්ගලිකව ඒ තරම් හොඳ දෙයක් වන්නේ නැහැ. ඔබතුමාට බලපෑම් එන්නේ කොතැනින්ද කියන කාරණාවත් අපි දන්නවා. ඔබතුමාට ඒ තීන්දු -තීරණ ගන්න බැරි වෙලා තිබෙන්නේ ඇයි කියන කාරණාවත් අපි දන්නවා. මේ දේ ඔබතුමාට අභියෝගයක් හැටියට අපි සලකන්නේ ඒ නිසායි. ඒ නිසා වහාම ක්‍රිකට් නිලවරණයක් පවත්වන්න. හැබැයි, දූෂිතයන් හැටියට හංවඩු ගැසුණු අය මේවාට පත් කරන්න එපා. ඒ වාගේම අර්ජුන රණතුංග ඇමතිතුමා දිගින් දිගටම ප්‍රකාශ කරන; බුකීකරුවන් හැටියට එතුමා හඳුන්වා දෙන, ක්‍රීඩාව ඉස්සරහට ගෙන යන්න බැහැය කියන කණ්ඩායම් ඉවත් කරලා, ක්‍රීඩාවට ආදරය කරන, ක්‍රීඩාව ඉදිරියට ගෙන යන්න පුළුවන් කණ්ඩායමක් පත් කර ගන්න අවශ්‍ය ඒ ස්වාධීන නිලවරණය පවත්වන්න. අනෙක් කණ්ඩායම එතැනින් මොහොතකට අමතක කර දමන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු අමාත්‍යතුමනි, international rankings දිහා බැලුවාම, ඉතාම කනගාටුදායක තත්ත්වයක් තිබෙනවාය කියන කාරණාව අපි නැවත නැවතත් කියන්න ඕනෑ නැහැ. අපට පහළින් ඉන්න රටවල් දිහා බැලුවොත්,

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

ඒ රටවල් ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් කොතැන තිබුණු රටවල්ද කියන කාරණාව ඉතාම පැහැදිලියි. එක්දින ශ්‍රේණිගත කිරීම බැලුවොත්, අපට පහළින් ඉන්නේ West Indies, Afghanistan, - අපි අද ඇෆ්ඝනිස්තානයටත් පරදිනවා.- Zimbabwe, Ireland, Scotland and UAE. මේ විධියට තව දවස් කිහිපයක් ගියොත් මේ ශ්‍රේණිගත කිරීම්වලිනුත් අපි ඉතාම පහළ මට්ටමේ කණ්ඩායමක් බවට පත් වෙයි. ඒ වාගේම T20 බැලුවොත්, අපට පහළින් ඉන්නේ Bangladesh, Scotland, Zimbabwe, UAE and Netherlands. අනෙක් පැත්තෙන්, test cricket ක්‍රීඩාව බැලුවත්, අපි පහළ මට්ටමට වැටී තිබෙනවා. ගරු ඇමතිතුමනි, එම නිසා මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඔබතුමා ඇමතිතුමා හැටියටත්, රජය හැටියටත් මේ කාරණා පිළිබඳව අවධානය යොමු කරන්න. මොකද, ක්‍රිකට් ක්‍රීඩාව කියන්නේ පාට, පක්ෂ, ජාති භේදයකින් තොරව අපේ රටේ සියලුදෙනා එක ධජයක් යටතට අරගෙන පැමිණි ක්‍රීඩාවයි. එම ක්‍රීඩාව විනාශ මුඛයට අරගෙන යන්න ඉඩ දෙන්න එපාය කියා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! I wish to announce that this House cordially welcomes the Parliamentary Delegation from the Czech Republic led by His Excellency Milan Stech, President of the Senate of Parliament of the Czech Republic now present at the Speaker's Gallery.

මීළඟට, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[පි.ප. 3.11]

**ගරු වේලු කුමාර් මහතා**
(මාණ්පුමිකු වේලු குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ பிரதிச් சபாநாயகர் அவர்களே, இன்று கௌரவ கஞ්சන විජේසේකර அவர்களால் முன்வைக்கப்பட்டிருக்கின்ற சபை ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்திலே கலந்து கொண்டு எனது கருத்துகளையும் கூறுவதற்கு வாய்ப்புத் தந்தமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். குறிப்பாக, கிரிக்கட் என்பது இலங்கையினுடைய ஓர் அடையாளமாகும். இருந்தபோதிலும் இன்று இலங்கை முழுவதும் இருக்கக்கூடிய, உலகம் பூராகவும் இருக்கின்ற கிரிக்கட் ரசிகர்கள் இலங்கை கிரிக்கட் அணியினது செயற்பாடுகளைக் கண்டு மனவேதனை அடைகின்றார்கள். இந்த நிலையிலேயே இந்த ஒத்திவைப்பு வேளைப் பிரேரணை முன்வைக்கப்பட்டிருக்கின்றது. இதனை முன்வைத்த கஞ්சන විජේසේකර அவர்களுக்கு என்னுடைய மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இலங்கை கிரிக்கட் விளையாட்டில் ஓரிரு நாட்களில் நெருக்கடி ஏற்படவில்லை. இலங்கையின் கிரிக்கட் கட்டுப்பாட்டுச் சபை தொடர்பாக, அதனுடைய தலைமைத்துவம் தொடர்பாக, தலைமைத்துவம் பற்றிய வாக்கெடுப்புக்கள் தொடர்பாகத் தொடர்ச்சியாக இடம்பெற்றிருக்கக்கூடிய பல்வேறு விதமான மோசடிகள் நீண்டகாலமாகவே பேசப்பட்டு வந்த விடயங்களாகும். குறிப்பாக, அதன் நிருவாகிகளைத் தெரிவுசெய்யும் வாக்கெடுப்பிலே நடைபெற்று வந்த பல்வேறுவிதமான மோசடிகள் தொடர்பாகத் தொடர்ந்தும் பேசப்பட்டு வருகின்றது. ஆனாலும் அது சார்ந்த அமைச்சர்களாக இருந்தவர்கள் அது சார்பாக என்ன கரிசனையைக் காட்டினார்கள் என்பது கேள்விக்குறியாகவே இருக்கின்றது. தற்போதைய அமைச்சர் கௌரவ பைசர் முஸ்தபா அவர்களாக இருக்கலாம், இதற்கு முன்பிருந்த அமைச்சர்களாக இருக்கலாம், சம்பந்தப்பட்டவர்கள் அனைவரும் தற்போதைய நிலைமைக்குப் பொறுப்புக் கூறவேண்டியவர்களாக இருக்கின்றார்கள். ஏனெனில் இந்த நெருக்கடி தொடர்ச்சியாக ஏற்பட்டுக்கொண்டு வந்திருக்கின்றது.

கடந்த அரசாங்கத்தின்போதும் இலங்கைக் கிரிக்கட் கட்டுப்பாட்டுச் சபையினுடைய குளறுபடிகளை நாங்கள் கண்டோம். அந்தக் குளறுபடிகள் காரணமாக இலங்கைக் கிரிக்கெட்டின் அத்திவாரம் இன்று சரிவடைகின்ற நிலைமை ஏற்பட்டிருக்கின்றது. இந்த இலங்கைத் தேசமானது பொதுவாக Ceylon Tea என்பதன்மூலம் அறியப்படுகிறது. 1996ஆம் ஆண்டு உலகக் கோப்பையை எமது கிரிக்கட் அணி பெற்றுக்கொண்டபோதும் உலகம் முழுவதும் எமது நாடு பற்றிப் பேசியது. கடந்த உலகக் கிண்ணக் காற்பந்தாட்டப் போட்டியிலே குரோஷியா அணி இறுதிப் போட்டிக்கு வந்ததன் மூலம் முழு உலகமும் அறியப்படுகின்ற ஒரு தேசமாக அந்தத் தேசம் விளங்கியது என்பது எங்களுக்குத் தெரியும். அதுபோல 1996ஆம் ஆண்டிலே இந்த இலங்கைத் தேசம் கிரிக்கட்மூலம் புகழ்பூத்த ஒரு தேசமாக அறியப்பட்டது. ஆனால், இன்று இந்த நாடு அந்தப் புகழை இழந்திருக்கின்றது. இலங்கையின் சிரேஷ்ட கிரிக்கட் அணி வீரர்கள், குறிப்பாக கண்டி மாவட்டத்தைப் பிரதிநிதித்துவம் செய்யும் சிரேஷ்ட வீரர்களான குமார் சங்கக்கார, முத்தையா முரளிதரன் போன்ற வீரர்களின் அனுபவங்கள், அறிவுகள் இந்தத் துறையில் உள்வாங்கப்படாமை, அவர்கள் மதிக்கப்படாமை, அவர்களுக்கான அங்கீகாரம் வழங்கப்படாமை இதற்கு முக்கியமான ஒரு காரணமாக இருக்கின்றது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, please wind up now.

**ගරු වේලු කුමාර් මහතා**
(මාණ්පුමිකු වේලු குமார்)
(The Hon. Velu Kumar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

குறிப்பாக, பல்லேகல சர்வதேச விளையாட்டரங்கு அமைக்கப்படுகின்றபோது உலக கிரிக்கட் சாதனையாளரான முத்தையா முரளிதரனுடைய பெயர் அதற்குச் சூட்டப்படுமெனக் கூறப்பட்டாலும், அது நடைபெறவில்லை. அது இன்றுவரை பல்லேகல சர்வதேச கிரிக்கட் விளையாட்டரங்காகவே இருக்கின்றது. ஆனால், எங்களுடைய இந்த வீரர்களை அங்கீகரிக்க வேண்டும். ஆகவே, அந்த அரங்கம் "முத்தையா முரளிதரன் சர்வதேச கிரிக்கெட் அரங்கம்" எனப் பெயரிடப்படவேண்டுமெனக்

கௌரவ அமைச்சரைக் கேட்டுக்கொள்கின்றேன். அதேநேரம் கிரிக்கட் அணிக்கான வீரர்களைத் தெரிவுசெய்வதில் தொடர்ச்சியாகப் பாராபட்சங்கள் காட்டப்படுகின்றன. பாரபட்சங்களினால்தான் இந்த நிலைமைக்குள் நாடு தள்ளப்பட்டிருக்கின்றது. கண்டி மாவட்டத்தில் இருக்கின்ற முஹம்மது டில்ஷான் என்ற ஒரு வீரனுடைய கிரிக்கட் விளையாட்டுத் தொடர்பான சராசரிகள் மிகச் சிறப்பாக இருந்தாலும், அவர் குறித்த கிரிக்கட் அணியில் உள்வாங்கப்படவில்லை என்ற குற்றச்சாட்டுத் தொடர்ச்சியாக முன்வைக்கப்படுகின்றது. அதனையும் அமைச்சர் அவர்களின் கவனத்திற்கு முன்வைத்து, இலங்கை கிரிக்கட் அணி தொடர்பாகக் கூடிய கவனம் செலுத்தப்படவேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.16]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මෙම සභාව කල් තබන අවස්ථාවේ මෙවැනි විවාදයක් පැවැත්වීම ගැන මා ඉතාම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම හිටපු ක්‍රීඩා අමාත්‍යවරයා විධියට යම් අදහසක් දැක්විය යුතුයි කියායි මම කල්පනා කළේ. පසුගිය අවුරුදු තුනක කාලය ඇතුළත මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව විතරක් නොව සමස්ත ක්‍රීඩාවම දැවැන්ත දේශපාලනීකරණයකට ලක්වෙලා තිබුණා. ඒ නිසා මට වුවමනා කළා අපේ ජාත්‍යන්තර සංගම් සමඟ එකතු වෙලා, විශේෂයෙන්ම අන්තර්ජාතික ඔලිම්පික් කමිටුවත් -IOC- සමඟ සාකච්ඡා කරන්න. හිටපු ක්‍රීඩා අමාත්‍යවරු සියලු දෙනාම අවුරුදු ගණනක් තිබුණු -අවුරුදු හතරහමාරක්, පහක් තිස්සේ- මෙම ක්‍රීඩා රෙගුලාසි වෙනස් කරනවා කියා අන්තර්ජාතික ඔලිම්පික් කමිටුවට පොරොන්දු වෙලා තිබුණා. ඒ වාගේම ක්‍රීඩා පනත වෙනස් කරනවා කියා තිබුණා. නමුත්, 1973 තිබුණු පනත තමයි තවම තිබෙන්නේ. අද වෙනකොට ක්‍රීඩා පනත වෙනස් නොකිරීම හේතුවෙන් ලංකාවට එරෙහිව අන්තර්ජාතික ඔලිම්පික් කමිටුවේ විශාල චෝදනා ගණනාවක් එල්ල වෙලා තිබුණා. මම ක්‍රීඩා අමාත්‍ය ධුරයට ආවාට පසුව රෙගුලාසි සම්පූර්ණ වශයෙන් වෙනස් කළා. ඒවායේ යම් යම් අඩු පාඩු තිබෙන්න පුළුවන්. තිබුණු ඒවා අපි නියෝග විධියට හැදුවා. ක්‍රීඩාව දේශපාලනීකරණය කිරීම අත්හිටෙව්වා කියා කිව්වොත් මම හිතන්නේ නිවැරදියි. අදට වඩා වෙනදා ඇමතිවරයාට බලය තිබුණා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා ඇමතිවරයාගෙන් අත්සනක් අරගෙන යනවා "මට මෙම සංගමයේ සභාපති වෙන්න ඉඩ දෙන්න." කියා. ඉස්සර තිබුණේ එහෙමයි. හැබැයි, සමහර වෙලාවට ඒක හොඳ ක්‍රියාවක් වෙන්නත් පුළුවන්. සමහර හොඳ සභාපතිවරු හිටියා. මම උදාහරණයක් විධියට ගත්තොත් ඩිලාන් පෙරේරා මැතිතුමා වොලිබෝල් ක්‍රීඩාවට කරපු සේවය අති විශිෂ්ටයි කියා මම විශ්වාස කරනවා. ඒ වාගේම ගාමිණී දිසානායක මැතිතුමා ක්‍රිකට් ක්‍රීඩාවට කරපු සේවය අතිවිශිෂ්ටයි කියා මම විශ්වාස කරනවා. මට ඒ කාරණා දෙක විතරයි දළ වශයෙන් කියන්න පුළුවන් වන්නේ. තවත් කාරණා තිබෙන්න පුළුවන්. දේශපාලනඥයන් ඇවිල්ලා එම ක්‍රියාදාමයට ශක්තිමත්භාවයක් දීලා ඔවුන්ට උදව් කර මේ සංගම් ගොඩ නහන්න ක්‍රියා කළා. නමුත් මේක අන්තර් ජාතික ඔලිම්පික් කමිටුව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළා. මම රෙගුලාසි වෙනස් කර නියෝගයක් විධියට කිව්වා, "ලංකාවේ ජාතික සංගමයක් විසින් සංවිධානය කරන ලද තරගාවලියකට සම්බන්ධ වෙලා තිබෙනවා නම් පමණක් ඕනෑම කෙනෙකුට ජාතික සංගමයක සභාපති, ලේකම්, උපසභාපති, උපලේකම්, භාණ්ඩාගාරික කියන තනතුරුවලට ඉදිරිපත් වෙන්න පුළුවන්." කියා. ඒ අනුව අද අපේ ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාට පුළුවන් වෙලා තිබෙනවා, එතුමා ජාතික වශයෙන් තිබෙන තරගාවලියකට සම්බන්ධ වෙලා තිබුණු නිසා, වොලිබෝල් සංගමයේ සභාපති වෙන්න. අර්ජුන රණතුංග මැතිතුමාට පුළුවන්, ඒ ක්‍රියාදාමයට යන්න. තිලංග සුමතිපාල මහත්මයාට පුළුවන්, ඒ ක්‍රියාවලියට යන්න. අනෙක් මන්ත්‍රීවරුන් ඒ වාගේ ජාතික වශයෙන් තිබුණු තරගවලට සම්බන්ධ වෙලා තිබෙනවා ද කියලා මම දන්නේ නැහැ. නමුත්, ජාතික තරගවලට සම්බන්ධ වෙලා තිබෙන ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ඒ ක්‍රීඩාවෙන් ඉදිරියට යන්න පුළුවන්කම තිබෙනවා. ඒ විධියට තමයි අපි මේ රටේ ක්‍රීඩාව දේශපාලනීකරණයෙන් සම්පූර්ණයෙන්ම ඉවත් කර ගත්තේ. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආණ්ඩුවේ හිටපු ක්‍රීඩා ඇමතිවරයා විධියට අපට ඒක කරන්න පුළුවන්කම ලැබුණා. ඒක සමහර අයට වෙන විධියකට දැනෙන්න පුළුවන්. නමුත්, ක්‍රීඩා අමාත්‍යවරයාට තිබුණු ඒ අත්තනෝමතික බලය අපි අයින් කරපු බව මම කියන්න කැමැතියි. එසේ අයින් කරලා අපි මේ ක්‍රියාදාමය ගෙනාවා. සමහර වෙලාවට ඒක හොඳ දෙයක් වෙන්න පුළුවන්; නරක දෙයක් වෙන්නත් පුළුවන්. අපි කිව්වේ ක්‍රීඩකයන්ට පැහැදිලි අනාගතයක් කරා ඉදිරියට යන්න පුළුවන් ශක්තිය, පරිපාලනයක් හරහා ලබා දෙන්න පුළුවන් ශක්තිය ලබා දෙන්න ඕනෑ කියලයි. ඒ වාගේම, අපට පරිපාලනයත් මේකට සම්බන්ධීකරණය කරන්න අවශ්‍ය නම් ඔවුන්ගෙනුත් ගන්න පුළුවන් ප්‍රයෝජන ගණනාවක් තිබෙනවා. මේ විධියට අපි මේක වෙනස් කළා. ඒ නිසා තමයි ඇමතිවරයාගේ බලපෑම මත ඇමතිවරයාගේ යාළුවෝ අර ක්‍රීඩාවේ සභාපති වෙන්නයි, මේ ක්‍රීඩාවේ සභාපති වෙන්නයි තිබ්බිච්ච අයිතිවාසිකම අද නැති වෙලා තිබෙන්නේ. ඒක හොඳයි කියලා මම විශ්වාස කරනවා.

විවිධ ක්‍රීඩා සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න ගණනාවක් අපට තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 10කින්, 15කින් කිසිම සංගමයක විගණනය සම්බන්ධ විමසුමක් ඉදිරිපත් කරලා තිබුණේ නැහැ. අපේ හැම ව්‍යවස්ථාවකම තිබෙනවා, හැම අවුරුද්දකම දෙසැම්බර් 31වැනි දාට පෙර තමන්ගේ විගණන විමසුම් විගණකාධිපතිවරයා වෙත ලබා දෙන්න ඕනෑ කියලා. නමුත්, ඒක සිද්ධ වෙලා තිබුණේ නැහැ. නමුත්, මම ක්‍රීඩා ඇමතිවරයා විධියට පත් වුණාට පස්සේ අපි ඒ ගොල්ලන්ට කාලයක් දුන්නා, විගණන විමසුම් ලබා දීමේ මේ ක්‍රියාදාමය වහාම ඉක්මන් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර ක්‍රීඩා සංගම් අවුරුදු ගණන් Interim Committees තිබුණා. සමහර අය මාස 6කින් Interim Committee එක තියනවා; අලුත් account එකක් අරිනවා, ඊට පස්සේ ඒ account එක වහනවා. ඒකට සල්ලි එන විධිය අපි දන්නෙත් නැහැ. සමහර වෙලාවට අමාත්‍යාංශයෙන් දුන්න සල්ලි ටිකට මොකක්ද වුණේ කියලා හොයන්නත් බැහැ. කරපු කට්ටියත් නැහැ, accounts පවා නැහැ, මිනිස්සුත් නැහැ. සියලු දෙනාම නැහැ. මේ විධියට තමයි මේක තිබුණේ. ඒ නිසා මේ සංගම්වල තිබුණු ප්‍රශ්න ගණනාවක් මම පෞද්ගලිකව ක්‍රමානුකූලව එකිනෙකා ගෙන්වලා කථා කරලා ඉවර කළා. වර්තමානයේත් ඒ ආකාරයේ තවත් සංගම් ගණනාවක් තිබෙනවා. මම හිතන්නේ අපේ ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් උත්තරයක් දෙයි. මම හිතන විධියට එතුමා සංගම් පනස් ගණනකට තවත් ඉඩ කඩ දුන්නා. මොකද, අපේ auditorsලා පත් කරන්න තව ටික කාලයක් යනවා, ඒ නිසා ඒ අයට තමන්ගේ ක්‍රියාදාමය ඉස්සරහට ගෙනියන්න

[ගරු දයාසිරි ජයසේකර මහතා]

කියලා. ඒ නිසා අද වන විට විගණකාධිපති දෙපාර්තමේන්තුව ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා සංගම් පිළිබඳව තිබෙන මතවාදය යම්කිසි විධියකට වෙනස් කරගෙන තිබෙනවා. ඒ නිසා දැන් විගණනය, නැත්නම් ඔවුන්ට ඇති වගවීම - accountability, සහ වගකීම සම්බන්ධව හැම ක්‍රීඩා සංගමයක්ම ශක්තිමත්ව ඉදිරියට ගෙනැල්ලා තිබෙනවා.

අවුරුදු 5ක සැලැස්මක් හදන්න කියලා අපි ඒ අයට කිව්වා. අපි ඒකට ක්‍රීඩා අමාත්‍යාංශයෙන් මුදල් දුන්නා. කිහිප දෙනෙක් ඒ මුදල් වැරදි විදියට පාවිච්චි කරලා තිබෙනවා. මම හිතන විධියට ඒක ඇමතිතුමාත් දන්නවා. ඒ අය සම්මත කොම්පැනි හදාගෙන සම්මත අයට මේක බාර දෙන විධියේ වැඩ පිළිවෙළකුත් සකස් කරලා තිබුණා. මම දිගින් දිගටම ඒ සම්බන්ධව සාකච්ඡා කරපු නිසා අපට පුළුවන්කම ලැබුණා, ඒ ක්‍රියාවලිය සාර්ථක කරගන්න. මම හිතන විධියට සංගම් ගණනාවක්ම මේ වන විටත් five-year plan එකක් හදලා ඉවරයි. ඒක තමයි ඊළඟට ක්‍රියාත්මක කරන්න තිබුණේ. ඊළඟට තිබුණු ප්‍රධාන ප්‍රශ්නය තමයි, අධ්‍යාපන අමාත්‍යාංශයත්, ක්‍රීඩා අමාත්‍යාංශයත් හැමදාම විශාල ගැටුමක හිටපු එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයයි, ක්‍රීඩා අමාත්‍යාංශයයි එකට තියන්න ඕනෑ කියලා තමයි මම නම් යෝජනා කරන්නේ. මොකද හේතුව, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් එන දරුවෝ ටික ඊළඟට බලාගන්න වෙන්නේ අපේ ක්‍රීඩා අමාත්‍යාංශයටයි. අපට ඉතිහාසයේ තිබුණා, PT period එක කියලා එකක්. දැන් ඒ PT period එක නැහැ. වෙනදා අපි ඒ bell එක ගහනකම් බලාගෙන හිටියේ PT period එකේදී එළියට ගිහිල්ලා මොකක් හරි ක්‍රීඩාවක් කරන්න. දැන් ඒක ක්‍රියාත්මක කරන්න විධියක් නැහැ. මොකද, PT period එකේදී අද පාසල ඇතුළේම පන්ති කාමරයක සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය කියලා මොකක්ද විෂයයක් උගන්වනවා. ඒකේ කිසිම දවසක ක්‍රීඩාවක් ප්‍රායෝගිකව සිද්ධ වෙන්නෙ නැහැ. මම ඒකයි කිව්වේ, ක්‍රීඩාව සහ අධ්‍යාපනය එක ඇමතිවරයෙක් යටතට ගියොත් මේ තත්ත්වයෙන් අපේ දරුවන් බේරා ගන්න පුළුවන් කියලා. එහෙම නැත්නම්, මේ රණ්ඩුව කවදාකවත් නතර වෙන්නේ නැහැ. මොකද, අධ්‍යාපන ඇමතිතුමා හිතනවා, පාසල් ක්‍රීඩාව එතුමාගේ කියලා. ඊට පස්සේ, වැටිලා අනාථ වෙලා එන කට්ටියව ක්‍රීඩා අමාත්‍යාංශය භාර ගන්න ඕනෑ. ඊට පස්සේ කවුරුත් ක්‍රීඩා ඇමතිට බණිනවා, "අද දක්ෂ ක්‍රීඩකයෝ එන්නේ නැහැ" කියලා. ඇයි, අද දක්ෂ ක්‍රීඩකයෝ එන්නේ නැත්තේ? ඔවුන්ට සිද්ධ වෙලා තිබෙනවා, ඉගෙනීම පළමුවැනි කාරණාව විධියට පත් කර ගන්න. ඒ නිසා මූලික වශයෙන් අපි "Talent Identification" කියලා programme එකක් පටන් ගත්තා. පාසල් හත් දහස් ගණනක ඒ පරීක්ෂණය කළා, මට මතක හැටියට. ඒ අතරින් අපි තුන්ලක්ෂ හැත්තෑපන්දාහක් තෝරා ගෙන, එයින් පාසල් 316ක, කොටියාස මට්ටමේ පාසලක් සොයා ගෙන අර ගමේ ඉන්න ළමයි ටික එහි train කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් සකස් කළා. අපි ඒ වැඩ පිළිවෙළත් ඉදිරියට ක්‍රියාත්මක කර ගෙන ගියා. ගරු ඇමතිතුමාට ඒ වැඩ පිළිවෙළ තවදුරටත් ඉදිරියට කර ගෙන යන්නට පුළුවන්. එහි යම් යම් දුර්වලතා ගණනාවක් තිබුණා. අපි මේක දවස ගණනේ තල්ලු කර ගෙන, තල්ලු කරගෙන තමයි අරගෙන ගියේ. ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න ගණනාවක් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා තවත් එක් කාරණයක් කියා මගේ කථාව අවසාන කරන්නම්. ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධව Interim Committees අවුරුදු තුනක් තිබුණා. මේවායේ හිටපු අයට විරුද්ධව විශාල චෝදනා තිබුණා. දැන් අද "අරයා හොඳ එක්කෙනා. මෙයා මෙහෙමයි" කියා මන්ත්‍රීවරු කියනවා. සම්මතවිට ඒ අයගේම අයියලා, මල්ලිලා තමයි මේවා විනාශ කළේ. ඒ ගොල්ලෝ දැන් කල්පනා කරනවා, තමන් සභාපති වුණා නම් හොඳයි කියා. මම නම් කියන්නේ ගරු අර්ජුන රණතුංග මැතිතුමා ඉන්නතුරු ක්‍රීඩා ඇමතිවරයෙකුට ක්‍රීඩා කටයුතු ජීවිතේට කරන්න ඉඩ දෙන්නේ නැහැ කියලා. එක්කෝ එතුමාව ක්‍රීඩා ඇමති කරන්න ඕනෑ; නැත්නම් එතුමාව ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති කරන්න ඕනෑ. හැම දාම උදේ සිට රෑ වෙනතුරු එතුමා කියන්නේ මොකක්ද? ක්‍රිකට් ක්‍රීඩාව දිනුවත් වැරදියි; පැරදුණත් වැරදියි. පැරදුණාම, හැම දාම කියනවා, "ක්‍රිකට් ක්‍රීඩාව කඩා වැටිලා" කියා. එතුමායි, තිලංග සුමතිපාල මැතිතුමායි අතර තිබෙන ප්‍රශ්නය අන්තිමට යන්නේ ක්‍රීඩා ඇමතිවරයාගේ කරපිටින්. එම නිසා හැම දාම ක්‍රීඩා ඇමතිතුමා බැට කනවා. අර්ජුන රණතුංග ඇමතිතුමා මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ හෝ මේකේ ඉන්නතුරු ඔය ප්‍රශ්නය නතර වෙන්නේ නැහැ. එම නිසා මා නම් ගෞරවයෙන් කියන්නේ, ක්‍රිකට් ක්‍රීඩාව හදන වැඩය එතුමාටම භාර දිලා එතුමාටම මේක කරන්නට දුන්නා නම් හොඳයි කියායි. මොකද නැත්නම් මේක කරන්න හම්බ වෙන්නේ නැහැ. එතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා යටතේත් ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති වෙලා හිටියා. මාස හයකින්, හතකින් එතුමාව එළියට දැම්මා. මම දන්නේ නැහැ, මොකක්ද හේතුව කියා. ඒවා හදපු නිසා වෙන්න ඇති. මම දන්නේ නැහැ. එම නිසා අපි මේ ප්‍රශ්නය විසඳා ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ක්‍රීඩකයන්ගේ fitness ගැන මම කථා කළා. ඇයි කථා කළේ? -මෙතැන ඉන්න අපේ ගරු සේමසිංහ මැතිතුමාත් උදේට හොඳට දුවන කෙනෙක්.- අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. Hamstring strain එකක් සිදු වුණොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකට පසුගිය කාලයේ මොකද කළේ? Injections ගැහුවා. ඔය අද ඉන්න ක්‍රීඩකයෝ ගණනාවක් එහෙම injection ගහලා දුවපු කට්ටිය. Injection එක ගැහුවාම රිදෙන්නේ නැහැ, ඊට පස්සේ තවදුරටත් මේ නහරය ඉරෙනවා. අපි කවදාවත් rehabilitate කරන කටයුත්තක් කළේ නැහැ. මේවා අපි වෙනම සාකච්ඡා කරලා, මේගොල්ලන්ට කථා කරලා කිව්වා," Rehabilitate කරන්න. Fitness බලන්න. Fitness test එකෙන් ෆේල් වුණොත් මේ ගොල්ලන්ව ඇතුළට ගේන්න එපා. ඒ ගොල්ලන්ට තව පොඩි කාලයක් විවේක ගන්න දෙන්න" කියා. මේ විධියට තමයි ක්‍රියාත්මක වුණේ. ක්‍රිකට් ක්‍රීඩකයනුත් series සියල්ලම සෙල්ලම් කරන්න ඕනෑ. ඉස්සර තිබුණේ test matches දහයයි, දොළහයි. අද එක series එකකට test matches තුනක්, හතරක් තියෙනවා. එතකොට සෙල්ලම් කරන්න බැහැ. මේ ගැන අපි කිව්වාම, අපිට විරුද්ධව කියන්න පටන් ගත්තා, "දයාසිරි fitness ගැන කථා කරනවා" කියා. Fitness ගැන කථා කරන්නේ අපිත් fitness ගැන හොඳට දන්නා නිසා. එම නිසා මම කියන්නට කැමතියි, ඒ තීන්දු තීරණ අපි බොහොම පැහැදිලිව ගත් බව. ඒ ගැන හතුරුසිංහ මැතිතුමාගෙන් අහන්න පුළුවන්. හතුරුසිංහ මැතිතුමාවත් ඒ කාලයේ එලෙව්වා. අපි එතුමාව ලංකාවට ගෙනැල්ලා එතුමාට අද ඒක භාර දී තිබෙනවා. මම කියන්නට කැමතියි, එතුමාට මේ වැඩය කරන්න දෙන්න කියා. මේකට අත ගහන්න එපා. මාධ්‍ය කිව්වාය කියා අර ක්‍රීඩකයාව ඇතුළට දාන්න කටයුතු කරන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්නම්, සම්මත ක්‍රීඩකයෝ ඉන්නවා, රුපියල් පණස්දාහ ගණනේ දීලා facebook ගිණුම් තුන හතර හදා ගෙන. ඒ facebook ගිණුම්වලින් දවස ගණනේ ගහනවා. ක්‍රීඩා ඇමතිවරයාට ගහනවා, selectorsලාට ගහනවා, හතුරුසිංහ මැතිතුමාට ගහනවා. මේ විධියට ගහලා බලහත්කාරයෙන් team එකට ඇවිල්ලා ගහපුවාම පළමුවන තරගයේදී දෙකයි, තුනයි; ඊළඟට හැත්තෑවක් ගහනවා. එතැනින් පස්සේ කවුරුවත් කථා කරන්නේ නැහැ.

මේක නතර කරන්න නම් කරන්න තිබෙන්නේ මෙයයි. පළමුවන කාරණය, කරුණාකර ක්‍රිකට් තරග selectorsලාට භාර දෙන්න. පුහුණුකරුවකු වන හතුරුසිංහ මැතිතුමා විශාල සේවයක් කරනවා. එතුමාට ඒ කටයුතු භාර දෙන්න. ඒ වාගේම මම කියන්නට කැමැතියි, අපි පසුගිය කාලයේ observersලා හැටියට පත් වුණු බව. ඒ, අවුරුදු අටක්. මම ඔබතුමාට මෙය ගෞරවයෙන් කියන්නට කැමතියි. මට ප්‍රශ්නයක් නැහැ, නිලංග සුමතිපාල මහත්මයාද, කවුද එන්නේ කියන එක. ඒක නොවෙයි ප්‍රශ්නය. නිවැරදි ඡන්දයක් තියලා, ඔබතුමා නිවැරදි පුද්ගලයාව මේක්ට පත් කරන්න ඉඩ දෙන්න. මේක තවදුරටත් අදින්න එපා. මේක දෙසැම්බර් මාසයේ නැත්නම් තව පසු වෙනතුරු ඇදපුවාම වෙන්නේ මොකක්ද? අපි ඔබතුමාට කියන්නම්; ක්‍රිකට් ක්‍රීඩාවේ අපි නැවතත් විමර්ශකයෝ - observers - විධියට පත් වෙනවා. එම නිසා, ඒ සම්බන්ධව කරුණාකර මැදිහත් වෙන්න. මැදිහත් වෙලා ඔවුන්ට ඔවුන්ගේ ක්‍රියාදාමය ඉස්සරහට ගෙන යන්නට ඉඩ දෙන්න. ඉතිහාසයේ හිටපු දක්ෂ ක්‍රීඩකයෝ අද තැන් තැන්වලට බෙදිලා ඉන්නේ නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, ඒ අයගේ විවිධ වැඩ පිළිවෙළවල් තිබෙනවා. කට්ටියක් එක්සත් ජාතික පක්ෂ සහෝදරයෝත් එක්ක එකතු වෙලා. ඒ අයට ඕනෑ වෙලා තිබෙනවා, එතැන team එකක් හදාගෙන Interim Committee එකක් දා ගන්න.

ඒ Interim Committee එකට කැමැති කට්ටිය Interim Committee එකට කථා කරනවා, තව කට්ටියක් තව team එකකට විරුද්ධයි, ඒ නිසා ඒගොල්ලන් තව කට්ටියක් ගැන කථා කරනවා. අද මේ ක්‍රිකට් ක්‍රීඩකයනුත් කණ්ඩායම්වලට බෙදිලා ඉන්නේ. බෙදිලා නැති ක්‍රීඩකයෝ ඉන්නේ බොහොම ස්වල්ප දෙනයි. මහේල ජයවර්ධන මැතිතුමා, සංගක්කාර මැතිතුමා, අනුර තෙන්නකෝන් මැතිතුමා, හේමක අමරසූරිය මැතිතුමා ඇතුළු විශේෂඥ කණ්ඩායමක් ගෙනැල්ලා අපි සාකච්ඡා කළා. මම ඒ විශේෂඥ කමිටුවට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ කමිටු වාර්තාව ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය කටයුතු සූදානම් කර ගන්න කියලා, ඊළඟට පත්වන සංගමයත් එක්ක. ඒ සඳහා මහන්සි වෙන්න කියන ඉල්ලීමත් කරනවා. ඔබතුමා ගොඩක් මහන්සි වෙන බව මම දන්නවා.

අනෙක් පැත්තෙන් ඔබතුමා මේ සංගම්වලට ඉදිරියට යන්න පුළුවන් ශක්තිය අරගෙන දෙන වැඩ පිළිවෙල සකස් කරන්න. ලංකාවේ පහළ මට්ටමේ ඉඳලාම මේ ක්‍රීඩාව හදන්නට පුළුවන්; බැරිකමක් නැහැ. තරග පැරදුණා කියලා අපේ ක්‍රීඩකයන්ව කණ්ඩායමෙන් එළියට තල්ලු කරන්නට බැහැ. මේ පරාජයට පෙර ශ්‍රී ලංකා කණ්ඩායම matches ගණනාවක් දිනලායි හිටියේ. නමුත් අද පරදිනකොට ඔවුන්ට ගහනවා. ආපහු දිනනකොට ඔවුන්ට හුරේ දානවා. මම බොහොම ආදරයෙන්, ගෞරවයෙන් කියන්නට කැමැතියි, "මේ වාගේ පරාජයන් අත් වෙන්නට පුළුවන්. මෙවැනි පරාජයන්වලදී ක්‍රීඩකයන්ව අමානුෂික විධියට තළන්න, පෙළන්න ලැහැස්ති වෙන්න එපා" කියා. මම දැක්කා Facebook එකේ දාලා තිබෙනවා සමහර ක්‍රීඩකයන් කරත්ත දක්කනවා; සමහරු ත්‍රීවීලර් එළවනවා; සමහරු එළවලු විකුණනවා. මේ විධියට තමයි ඒගොල්ලන්ට ගහලා තිබුණේ. කරුණාකර මෙතැනට මේ ක්‍රීඩාව වටිටන්න හදන්න එපා. ඔවුන්ටත් යම් ශක්තියක් දෙන්න ඉඩ දෙන්න කියන ඉල්ලීම කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.30]

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මෙම අවස්ථාව ලබාදීම පිළිබඳව මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ක්‍රීඩාවට ආදරය කරන, ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරන පුද්ගලයකු වන ගරු කංචන විජේසේකර මැතිතුමා විසින් මෙම යෝජනාව ගෙන ඒම පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වනවා. ක්‍රිකට් ක්‍රීඩාව ගැන කථා කරන විට අපි දන්නවා, ඉතිහාසයේ ඉඳන්ම එය අපේ රටට ගෞරවයක් ගෙනා බව. පටන් ගත්ත දවසේ ඉඳන්ම දිනෙන් දින, දිනෙන් දින අපේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු වුණා. දීර්ඝ කාලීනව රටට ගෞරවයක් ගෙනාව ක්‍රීඩාවක් තමයි ක්‍රිකට් ක්‍රීඩාව. පිට රටවල ඉන්න ශ්‍රී ලාංකිකයන්ට ලොකු ගෞරවයක් ලබා දුන්නේ මේ ක්‍රිකට් ක්‍රීඩාව බව අපි දන්නවා. ඕස්ට්‍රේලියාවට වේවා, එංගලන්තයට වේවා ශ්‍රී ලංකාව කියන්නේ මොන වාගේ රටක්ද කියලා පෙන්වූවේ මේ ක්‍රිකට් ක්‍රීඩාවයි.

හැබැයි, අද වන විට ක්‍රිකට් ක්‍රීඩාවට අත්වෙලා තිබෙන ඉරණම ගැන අපි කනගාටු වෙනවා. එක පැත්තකින් අනෙක් හැම දේම විනාශ වුණු රටක ක්‍රිකට් විතරක් ඉදිරියට යන්නේ කොහොමද කියලාත් අපට ගැටලුවක් පැන නඟිනවා. රටටම ඝාපයක් ලබලා තිබෙන්නේ. මේ ක්‍රීඩාව තවදුරටත් ක්‍රීඩාවක් නොවෙයි. අද ක්‍රිකට් ක්‍රීඩාව ව්‍යාපාරයක් කරගෙන තිබෙන්නේ; බිස්නස් එකක් කරගෙන තිබෙන්නේ. අද ක්‍රිකට් ක්‍රීඩාව රටට සල්ලි ගෙනෙන මාර්ගයක් මිසක් එහෙම නැතිව රටට ගෞරවය ගෙනෙන ක්‍රීඩාවක් බවට පත්වෙලා නැහැ.

මෑත අතීතයේ අපි ක්‍රිකට් ක්‍රීඩාවෙන් ලබා ගත්ත විශිෂ්ට ජයග්‍රහණ ගැන අප දන්නවා. පසුගිය ආණ්ඩුව කාලයේ මහින්ද රාජපක්ෂ මැතිතුමන්ලා, එවකට හිටි ක්‍රිකට් පාලක මණ්ඩලය ඇතුළුව විශේෂයෙන්ම ක්‍රීඩකයන් එකතු වෙලා අපට සුවිශේෂ ජයග්‍රහණ ලබා දුන්නා. රජයක් වශයෙන් ක්‍රීඩකයන්ට අවශ්‍ය පහසුකම් ලබා දුන්නා; grounds හදලා දුන්නා; අවශ්‍ය සියලුම පහසුකම් ලබා දුන්නා; ක්‍රීඩකයන් ධෛර්යවත් කළා. ඒ විධියට තමයි මේ ක්‍රීඩාව දියුණු කළේ. 2007 වර්ෂයේ අපි ලෝකයේ අනුශූරයන්. 2009දී අපි Twenty20 තරගාවලියේ අනුශූරයන්. 2011දී අනුශූරයන්. අන්තිමට 2014දී Twenty20 ශූරයන් විධියට තමයි ක්‍රිකට් ක්‍රීඩාව මෙතුමන්ලාට භාර දුන්නේ. Twenty20 තරගාවලි ආරම්භ වුණු දවසේ ඉඳන්ම, මේ ආණ්ඩුවට මේ ක්‍රීඩාව භාර දෙනකම්ම ලංකාව හිටියේ ශ්‍රේණිගත කිරීම්වල අංක 01ට. එහෙම හිටපු කණ්ඩායම තමයි අද සිම්බාබ්වෙන්, බංග්ලාදේශයෙන්, ඇෆ්ගනිස්ථානයෙන් කාලා ගෙදර එන තත්ත්වයට මේ ආණ්ඩුව ගෙනාවේ. අද ලෝකයේ ප්‍රධාන පෙළේ ක්‍රිකට් වාර්තා අතර වැඩිම වාර්තා ගණනකට හිමිකම් කියන්නේ-

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මෙතුමා ආණ්ඩුවට චෝදනා කරනවා, මේ ක්‍රිකට් ප්‍රශ්නය සම්බන්ධයෙන්. ඉස්සර අපි මහින්ද - [බාධා කිරීමක්]

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම චෝදනා කරන්න හේතු පැහැදිලිව කියන්නම්. හේතුව තමයි, අද ක්‍රීඩාවට දේශපාලනය ඇවිල්ලා තිබීම. අද ක්‍රිකට් සංගම්වල සභාපතිවරුන් විධියට පත් වෙන්නේ දේශපාලනඥයෝ. අද ඇමතිවරුන් සෘජුවම ක්‍රීඩකයන්ව විවේචනය කරන්නට පටන් අරගෙන නිබෙනවා. අපි දන්නවා, මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහයෝගය දුන්නා කියලා, තමන්ගේ දේශපාලන මතය කිව්වා කියලා සමහර ක්‍රීඩකයන්ට විශ්‍රාම ගන්න කියලා බල කළ බව. සුදුකම් තිබියදී, හොඳ average එකක් තිබියදී, හොඳට පන්දු යවද්දී ඒ ක්‍රීඩකයන්ව එළියට දැම්මා. ඒ නිසා තමයි අපි ආණ්ඩුවට චෝදනා කරන්නේ. ලසිත් මාලිංග කියන්නේ 2014දී ලංකාවට T20 ලෝක කුසලානය ගේන්න නායකත්වය ලබා දුන්නු කෙනා. ඔහුව අවුරුද්දක් එළියේ තිබ්බා.

දැන් matches දෙකක් ලබා දුන්නා. එහිදී ඔහු ඉතාමත් හොඳට perform කළා. හැබැයි, අවුරුද්දක කාලයක් ඔහු එළියට දැම්මේ මේ තුළ දේශපාලනය තිබුණු නිසායි.

ඒ විතරක් නොවෙයි. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ grounds දෙකක් හැදුවාය කියලා අපි දන්නවා. එක පැත්තකින් Sooriyawewa ground එක හැදුවා. මේ Sooriyawewa ground එක හදන්න විශේෂයෙන්ම හේතු වුණේ, අපේ ලංකාවේ ක්‍රීඩාංගණවල slow pitches තිබෙන නිසායි. දහ පන්දු යවන්නන්ට මුහුණ දෙන්න විතරයි ඒවායේ අපේ ක්‍රීඩකයින් පුහුණු වෙන්නේ. ඒ නිසා තමයි Sooriyawewa ground එකට fast pitch එකක් හැදුවේ. එතකොට අපේ ක්‍රීඩකයන්ට හොඳ පුහුණු වීමක් ලබා ගන්න පුළුවන්. යුරෝපයට ගියාම, ඕස්ට්‍රේලියාවට ගියාම, South Africa ගියාම තරගවලට හොඳට මුහුණ දෙන්න පුළුවන් වෙන්න තමයි Sooriyawewa ground එක හැදුවේ. හැබැයි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නම තිබෙනවාය කියලා Sooriyawewa ground එක වහලා දැම්මා; පුටු ටික ගලවාගෙන ආවා; matches දුන්නේ නැහැ. Sooriyawewa ground එකට අද වන කල් match එකක්වත් ලබා දුන්නේ නැහැ. මේ ක්‍රීඩාංගණයේ සියලුම පහසුකම් තිබෙනවා; ක්‍රීඩකයන්ට recovery පහසුකම් තිබෙනවා. වැඩිම පහසුකම් තිබෙන ක්‍රීඩාංගණය මෙයයි. හැබැයි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නම තිබෙනවාය කියලා මෙතුමන්ලා මේ ක්‍රීඩාංගණය වහලා දැම්මා. මේවායේ ප්‍රතිඵල තමයි අද ක්‍රිකට් ක්‍රීඩාවට අත්වෙලා තිබෙන්නේ. අපි දන්නවා, මේවා දියුණු කළොත් ගම්වල ඉන්න තරුණ-තරුණියන්ටත් අද ක්‍රිකට් ක්‍රීඩාවට එන්න පුළුවන්කම තිබෙනවාය කියලා. හැබැයි මේ ආණ්ඩුව අද ඒ අවස්ථාව නැති කරගෙන යනවා. ඒ ගැන කියන්න දුකයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

අපේ ඇමතිතුමා මේ අවස්ථාවේ මේ සභාවේ ඉන්නවා. මැතිවරණ කල් දමනවාය කියලා සුප්‍රසිද්ධ ඇමතිතුමා අද Cricket Board එකේ මැතිවරණයත් කල් දැම්මා. වාසනාවට තමයි එතුමා ICC එකේ සභාපතිවරයා නොවුණේ. එහෙම නැත්නම් එතුමා World Cup තරගයත් කල් දමනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.35]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ක්‍රිකට් ක්‍රීඩාවේ පැන නැඟී තිබෙන අර්බුදය, ශෝක ජනක තත්ත්වය පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කිරීම ගැන ප්‍රථමකොටම ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ඇතිවෙලා තිබෙන තත්ත්වය ගැන අප කාටත් කනගාටුවක් තමයි තිබෙන්නේ. මොකද, මේ පහතට ඇද වැටෙන්නේ අපේ ක්‍රිකට් කණ්ඩායම පමණක් නොවෙයි; මේ රටේ කීර්තියයි. එක්තරා යුගයකදී අපේ ක්‍රිකට්වලින් සහ තේවලින් අපව ලෝකයේ ඉහළ තැනකට ගෙන ගියා. එක්තරා අවස්ථාවකදී තේවලින් අපි ලබාගත් කීර්තිය අභිභවා අපි ක්‍රිකට් ක්‍රීඩාවෙන් විශාල කීර්තියක් අත් පත් කර ගත්තා. අද මුහුණ දී තිබෙන මේ තත්ත්වය පිළිබඳව ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරන කවුරුත් යම්කිසි ආකාරයක කනගාටුවකින්, කනස්සල්ලකින් තමයි ඉන්නේ. ඒ තත්ත්වය තුළ මේ සියලු දේවල් ෆයිසර් මුස්තාපා ඇමතිතුමා පිට පටවන්න මා කිසිසේත් බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, කෙටි කාලයක් ඇතුළතදී ඇමතිවරයකුට ජයග්‍රහණ පෙන්වන්න පුළුවන් තත්ත්වයක නොවෙයි තිබෙන්නේ.

විශේෂයෙන් දයාසිරි ජයසේකර හිටපු ඇමතිවරයා ක්‍රිකට් ක්‍රීඩාවේ යම් ප්‍රගතියක් ලබා ගැනීම සඳහා වුණු කැප වීම, මැදිහත් වීම සහ මහන්සිය මා මේ අවස්ථාවේදී අගය කරනවා. මා දකින හැටියට එතුමා ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් අවංකව යම් මැදිහත් වීමක් කරන්න උත්සාහ කළා. ක්‍රිකට් ඇතුළු සමස්ත ක්‍රීඩා ක්ෂේත්‍රය ගත්තොත්, මෙයින් ගොඩ එන්නට අප කරන්න ඕනෑ මොකක්ද? මා හිතන හැටියට යම් පරාජයක් ලැබුවාට පස්සේ එය ඇමතිවරයා පිට පටවන්න හෝ යම් ජයග්‍රහණයක් ලැබුවාට පස්සේ එය ඇමතිවරයා කරේ දමා ගන්න හෝ ගියොත් තමයි මේ අර්බුදයට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ. මේ ඇතිවෙලා තිබෙන තත්ත්වය පිළිබඳව සමාලෝචනයක් කරලා, දීර්ඝ කාලීන වැඩ පිළිවෙළකට අපි යා යුතුයි කියලා මා හිතනවා. අපි දැන් ළඟ සංක්‍රාන්තියක් ලබා ගන්නට වැඩ පිළිවෙළක් සකස් කරනවා වෙනුවට තව වසර දෙකකින් හෝ වසර තුනකින් විශේෂයෙන් ක්‍රිකට් ක්‍රීඩාව ස්ථාවරව ජයග්‍රාහී මාවතකට යොමු කර ගැනීම සඳහා වුණු අඛණ්ඩ වැඩ පිළිවෙළක් සකස් කිරීම වුවමනා කරනවා. මා හිතන හැටියට දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් යෝජනා කරපු ආකාරයට පාසල් පද්ධතිය තුළින්ම මෙය ආරම්භ කළ යුතුයි. හදුනාගත් දක්ෂ ක්‍රීඩකයින්ට අවශ්‍ය කරන ආර්ථික පහසුකම්, නඩත්තු පහසුකම් ආදිය ලබා දීමේ වග කීමක් අපට තිබෙනවා. මා හිතනවා, එයට වියදම් කරන්න බැරි තරම් ආර්ථික දුෂ්කරතාවක අපි නැහැයි කියලා. Sri Lanka Cricket එකෙන් අහන්නේවත්, Sri Lanka Cricket එකට කියන්නේවත් නැතුව රුපියල් මිලියන 5,500ක් වියදම් කරලා සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හදන්නට පුළුවන්කමක් තිබුණා. අපි COPE එකට කැඳවා ප්‍රශ්න කරනකොට Sri Lanka Cricket එක කියනවා, "අපි කිව්වේත් නැහැ"යි කියලා. වරාය අධිකාරියෙන් තමයි ඒ ක්‍රීඩාංගණය හදලා තිබෙන්නේ. එහෙම මුදල් වියදම් කරලා cricket ground එකක් හදන්න අපට පුළුවන්කම තිබෙනවා නම් හදුනාගත් ගම් මට්ටමේ ක්‍රිකට් ක්‍රීඩකයන් දියුණු කරන්න අපට බැරි ඇයි? ඔවුන්ගේ ජීවිත නහා සිටුවන්න, ඔවුන්ට අවශ්‍ය කරන

පහසුකම් ලබා දෙන්න, ඔවුන්ගේ පුහුණුවීම් සඳහා උදව් කරන්න, ඔවුන්ගේ පෝෂණය පිළිබඳව සලකා බලන්න, ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව අඛණ්ඩ අවධානය යොමු කරන්න මුදල් ප්‍රතිපාදනයක් වෙන් කිරීමේ අපහසුතාවක් අපට නැහැ. ඕනෑ නම් විදේශීය විශේෂඥයන්ගේ සහාය ඇතිව, බාධා නොකරනවා නම් අපේ පැරණි ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ ද සහාය ඇතිව එවැනි ආකාරයේ අඛණ්ඩ සුපරීක්ෂාකාරී වැඩ පිළිවෙළක් ඉදිරියට කරගෙන යන්න අපට පුළුවන්. එසේ නොකර කෙටි කාලීන වැඩ පිළිවෙළකට යන්න ගියොත් හැම දාම අපට අත් පත් කර ගන්න වෙන්නේ මෙවැනි දේවල් තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ අවස්ථාවේදී කියනවා, මේ තත්ත්වය පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කරන්න ඕනෑ කියා. මෙහි ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ක්‍රීඩාව තුළ පසු ගිය කාලයේ සිදු වූ දේශපාලනීකරණයක් ඉන් එකක්. අද අප භුක්ති විඳින්නේ අද ඊයේ කළ දේවල ප්‍රතිඵල නොවෙයි. අවුරුදු ගණනක් තිස්සේ මේවාට දේශපාලනය රිංගලා, මේවා ව්‍යාපාර බවට පත් වෙලා, මේවායෙන් මුදල් උපයන තැනට ආවාට පසුව අප උපයාගත් කීර්තිය මෙසේ හෑල්ලූ වන එක, බාල්දු වන එක අහන්න දෙයක් නොවෙයි. මේ සියලු තත්ත්වයන් පිළිබඳව සැලකිල්ල යොමු කර අපි රටක් හැටියට කටයුතු කරන්න ඕනෑ. එය, අමාත්‍යාංශයක චිතරක් කාර්ය භාරයක් කියා මම හිතන්නේ නැහැ. 'රටක් හැටියට අපි ඒ සම්බන්ධයෙන් පැහැදිලි වැඩ පිළිවෙළක් අඛණ්ඩව ඉදිරියට ගෙන යමු' කියන යෝජනාව කරමින්, මේ කාරණය ගැන සභාවේ අවධානය යොමු කිරීම සම්බන්ධයෙන් කංචන විජේසේකර මන්ත්‍රීතුමාට නැවත වතාවක් ස්තුතිවන්ත වෙමින් මම නතර වෙන්නම්. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර ඇති කාලය විනාඩි 5යි.

[අ.භා. 3.40]

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතියි. විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධව ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාව ගැන වචන කීපයක් කතා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ක්‍රිකට් කණ්ඩායම ඇෆ්ගනිස්ථානයට වූ පරාජයත් එක්ක විශාල කඩා වැටීමක් අපේ ක්‍රිකට් ක්‍රීඩාවේ තිබෙනවා කියන මතය මේ රට තුළ ඇති කරන්න හදනවා. මම පාසල් ගිය කාලයේ සහිරා විද්‍යාලයේ First X1 cricket team එකට ක්‍රීඩා කරපු ක්‍රීඩකයෙක්. අන්තර් සමාජීය තුන්වැනි පෙළේ ක්‍රීඩාවලදී ද්‍රවිඩ සංගමය, නොමැඩිස් වාගේ ක්‍රීඩා සමාජවලට මම ක්‍රීඩා කරලා තිබෙනවා. ඒ නිසා ක්‍රිකට් පිළිබඳව මට යම් දැනුමක් තිබෙනවා. විශේෂයෙන්ම, හතුරුසිංහ, භෂාන් තිලකරත්න, නිශාන්ත රණතුංග මම පාසල් යන කාලයේ ක්‍රිකට් ගහනකොට මාත් එක්ක සමකාලීනව ක්‍රිකට් ක්‍රීඩා කරපු අය. ඒ නිසා ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව මට යම් දැනුමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හිටපු ක්‍රිකට් සභාපතිතුමාත් මේ අවස්ථාවේ මේ ගරු සභාවට ඇවිල්ලා සිටිනවා. දැන් අපි හිතනවා, අපේ ක්‍රිකට් කණ්ඩායම ඇෆ්ගනිස්ථානයත් එක්ක කළ තරගයේදී ලබපු පරාජයත් සමඟ විශාල පසුබැසීමකට ලක්වෙලා තිබෙනවාය කියලා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ අවස්ථා අපි ලෝකයේ ඕනෑ තරම් දැකලා තිබෙනවා. විශේෂයෙන්ම බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම කියන්නේ, 1970 ගණන්වල ඉඳලා 1990 මුල් කාලය වනතුරුම -1980 අග කාලය වනතුරුම- ලෝකයේ හිටපු හොඳම කණ්ඩායම. ලෝකයේ දක්ෂම ක්‍රිකට් ක්‍රීඩකයන් බිහි කරපු රටක් තමයි, බටහිර ඉන්දීය කොදෙව් කියන්නේ. විවියන් රිචර්ඩ්සන්, රිවී රිචර්ඩ්සන්, මැල්කම් මාර්ෂල්, ජොයෙල් ගාර්නර්, ක්ලයිව් ලොයිඩ් වාගේ අය ඒ කාලයේ බටහිර ඉන්දීය කොදෙව් පිලේ හිටියා. බටහිර ඉන්දීය කොදෙව්වන් කියලා නම කිව්වාම, කවුරුවත් මැව් එකක් දිනන්නේ නැහැ. එහෙම කාලයක් ලෝකයේ තිබුණා. නමුත් අද වනකොට බටහිර ඉන්දීය කොදෙව් පිල බංග්ලාදේශයටත් පැරදිලා තිබෙනවා. එහෙම පල්ලම් බැහැලා තිබෙනවා. එහෙම හොඳ කාලයකුත් තිබුණා. නමුත් අද වනකොට පල්ලම් බැහැලා. අද බටහිර ඉන්දීය කොදෙව් පිලත් එක්ක මැව් එකක් දිනනවාය කියන එක සාමාන්‍ය දෙයක්. 1970 ගණන්වල, 1980 ගණන්වල බටහිර ඉන්දීය කොදෙව් පිලත් එක්ක මැව් එකක් දිනනවා කියලා කියන්නේ හීනෙකින්වත් හිතන්න බැරි දෙයක්. ඔස්ට්‍රේලියාවේ ග්‍රේග් චැපෙල්ලා සෙල්ලම් කරන කාලයේ ඔස්ට්‍රේලියාවටවත් බටහිර ඉන්දීය කොදෙව් පිලත් එක්ක දිනන්න බැරි වුණා. නමුත් අද වනකොට ඒ පිලත් සාමාන්‍ය තත්ත්වයට ඇවිල්ලා, බටහිර ඉන්දීය කොදෙව් දූපත්වලටත් මේ අර්බුදය ඇවිල්ලා තිබෙනවා. බටහිර ඉන්දීය කොදෙව් දූපත කියන්නේ ලෝක ප්‍රසිද්ධ ක්‍රිකට් ක්‍රීඩකයන් හිටපු රටක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ ක්‍රීඩාව ගැන අපි කථා කරනවා. මම දකින විධියට අපට තිබෙන පළමුවැනි ප්‍රශ්නය මෙයයි. අපේ රටේ ක්‍රිකට් කණ්ඩායම ඉතාම තරුණ කණ්ඩායමක්. ක්‍රීඩකයන් එක් කෙනෙකු දෙදෙනකු හැරුණාම අනික් ඔක්කෝම අය fresh ක්‍රිකට් ක්‍රීඩකයන්. ඒගොල්ලන් දැන් තමයි ජාතික කණ්ඩායමට එකතු වෙලා, අත් දැකීම් බහුල නැති වුණත් ක්‍රීඩා කරන්න පටන් අරගෙන තිබෙන්නේ. ඒ නිසා ඔවුන්ට ඉස්සරහට එන්න යම් කාලයක් යනවා. දක්ෂ, අත් දැකීම් තිබෙන ක්‍රීඩකයන් ගණනාවක් එක පාරටම අපෙන් අයින් වෙලා ගිය බව අපි දන්නවා. විශේෂයෙන් 1990 ගණන්වල ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට එකතු වෙච්ච අය දහදෙනෙකු විතර හිටියා. 1996 Cricket World Cup දිනපු කණ්ඩායමේ හිටපු හොඳ අත් දැකීම් තිබෙන දහ දෙනෙකු වාගේ අයින් වුණා. ඒ නිසා අද අලුත් ක්‍රීඩකයන් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට ඇතුළු වෙලා සිටිනවා. ඒ අතරින් මැතිව්ස් චිතරක් යම් අත් දැකීමක් තිබෙන ක්‍රීඩකයෙකු හැටියට අපට හඳුන්වන්න පුළුවන්. අනික් ක්‍රීඩකයන් ඔක්කොම අලුත් ක්‍රීඩකයන්. ඒ ක්‍රීඩකයන්ට තත්ත්වයට එන්න යම් කාලයක් ගත වනවා. 1996දී අපි Cricket World Cup එක දිනලා, ඊළඟ Cricket World Cup එකට ගිහිල්ලා සෙල්ලම් කළත් පළමුවැනි වටෙන්ම අපට ගෙදර යන්න සිද්ධ වුණ බව අපි මතක තියා ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 1996 Cricket World Cup එක ජයග්‍රහණය කරපු කණ්ඩායමම තමයි, 2000දී අර්ජුන රණතුංග නායකතුමා යටතේ Cricket World Cup එකට සෙල්ලම් කරන්නත් ගියේ. නමුත් 2000දී පැවති Cricket World Cup තරගයේ පළමුවැනි වටයෙන්ම අපි ඉවත් වුණා. එහෙම තමයි ක්‍රීඩාව. ක්‍රීඩාවේ ඒ පැති දෙකම තිබෙනවා. දිනන්න පුළුවන්, පරදින්න පුළුවන්. ඒ දෙකම භාර ගන්න අපට පුළුවන් වෙන්න ඕනෑ. එහෙම භාරගන්න බැරි අය තමයි, "අපි හැම දාම දිනන්න ඕනෑ" කියලා කියන්නේ. එහෙම වෙන්න බැහැ; එහෙම කරන්න බැහැ. ජය පැරදුම භාරගන්න බැරි වුණාම අපි හිතනවා, "අපි හැම දාම දිනන්න ඕනෑ" කියලා. එහෙම දිනන්න බැහැ. අපි දිනන්න පුළුවන්, පැරදෙන්න පුළුවන්. එහෙම තමයි ක්‍රීඩාව. ඒ දෙකම විඳ දරාගන්න අපට පුළුවන් වෙන්න ඕනෑ. දිනන්න බැරි විධියේ අඩු පාඩුකම් තිබෙනවා නම් ඒවා අපි හදාගන්න ඕනෑ.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල් ක්‍රිකට් ක්‍රීඩාවේ මම යම් අඩු පාඩුවක් දකිනවා. ක්‍රිකට් ක්‍රීඩාවෙන් අපේ ජාතික කණ්ඩායමට ඒ කාලයේ එකතු වෙච්ච හැම ක්‍රීඩකයෙක්ම ආවේ පාසල් ක්‍රීඩාවෙන්. අර්ජුන රණතුංග, රොෂාන් මහානාම, අසංක ගුරුසිංහ, රොමේෂ් රත්නායක, අරවින්ද ද සිල්වා, හෂාන් තිලකරත්න අපේ කණ්ඩායමට ඇතුළත් වෙච්ච ඒ හැම ක්‍රීඩකයෙක්ම ආවේ පාසල්,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜ்புர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ හැම ක්‍රීඩකයෙක්ම ආවේ පාසල් ක්‍රීඩාවෙන්. නමුත්, අද පාසල් තුළින් අපේ ජාතික කණ්ඩායමට ක්‍රිකට් ක්‍රීඩකයන් බිහි වෙන්නේ නැහැ. ඒකයි තිබෙන ප්‍රධානම ප්‍රශ්නය. ඒ නිසා පාසල් ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කරන්න ඕනෑ. අද පාසල් ක්‍රීඩාව යම් පසු බැසීමකට ලක්වෙලා තිබෙනවා; ඒක යම් කඩා වැටීමකට ලක්වෙලා තිබෙනවා. මොකක්ද මෙතැන තිබෙන වරද කියලා අපි හොයා ගන්න ඕනෑ. අන්න එතැනට අපට බෙහෙත් කරගන්න පුළුවන් නම්, පාසල් තුළින් හොඳ ජාතික මට්ටමේ ක්‍රීඩකයන් බිහි කරගන්න පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ආනන්ද විද්‍යාලයේ ඉගෙන ගත්තා. ඔබතුමා දන්නවා ආනන්ද විද්‍යාලයෙන් බිහි වෙච්ච හැම දක්ෂ පාසල් ක්‍රීඩකයෙක්ම අන්තිමට ගිහිල්ලා නැවතුනේ ජාතික කණ්ඩායමේ බව. ඒ අය clubsවලින් ආවේ නැහැ; ක්‍රීඩා සමාජවලින් ඒ විධියේ ලොකු ක්‍රීඩකයන් බිහි වුණේ නැහැ. ඒ හැම ක්‍රීඩකයෙක්ම ආවේ පාසල් තුළින්. නමුත්, දැන් පාසල් තුළ ක්‍රිකට් ක්‍රීඩාවේ යම් කඩා වැටීමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද හැම දෙයක්ම වාණිජකරණය වී තිබීම තමයි ඊළඟට මම දකින දේ. හැම දෙයක්ම මුදල් මත දුවන තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. ඒක අද ක්‍රීඩාව තුළටත් බෝ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම, අද ක්‍රීඩාව වෙනුවෙන් තිබෙන කැපකිරීම, ක්‍රීඩාව වෙනුවෙන් තිබෙන උනන්දුව අඩු වෙලා, මුදල් වෙනුවෙන් සෙල්ලම් කරන ක්‍රීඩකයන් බවට පත් වෙලා තිබෙනවා. ඒකටත් බෙහෙත් හොයා ගන්න වෙයි. මුදල් සහ ක්‍රීඩාව එකට බද්ධවීම තුළ අද සියලුදෙනාටම අවශ්‍ය වෙන්නේ තරග ජයග්‍රහණය කිරීම නොවෙයි, වැඩි වැඩියෙන් මුදල් හොයා ගන්න පුළුවන් කොහොමද, වැඩි වැඩියෙන් සල්ලි හම්බ කරන්නේ කොහොමද කියන එකයි. අද ඒ තත්ත්වයට ක්‍රීඩාව කඩා වැටිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒ ප්‍රශ්න දෙකට විසඳුම් හොයා ගන්න පුළුවන් නම්, ක්‍රිකට් ක්‍රීඩාව නැවත ඒ තිබුණු තත්ත්වයට ගෙනෙන එක මහා ලොකු කාර්යයක් නොවෙයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.47]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව කථා කරන මේ වෙලාවේ මට කථා කිරීමට විනාඩි පහක් හෝ ලැබීම සන්තෝෂයට කරුණක්. මේ පිළිබඳව සාකච්ඡා කරන බව මා දැනගත්තේ මීට ටික වේලාවකට කලින්. ඒ නිසා, ප්‍රධාන කරුණු ටිකක් විතරයි මට කථා කරන්න තිබෙන්නේ.

ප්‍රථමයෙන්ම මේ කරුණ කියන්නට ඕනෑ. 2015න් පස්සේ මම ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති ධුරයට තේරී පත් වෙන කොට, State Engineering Corporation එකට මිලියන 2,500ක් අපි ණයයි; ආණ්ඩුවේ ආයතනවලට විතරක් බිලියන 1.4ක් ණයයි. හම්බන්තොටදී කරපු විනාශය නිසා, සූරියවැව ක්‍රීඩාංගණය නිසා අවුරුදු ගණනාවකට අපි මූල්‍යමය වශයෙන් කඩාගෙන වැටුණා. බිලියන 6ක් සූරියවැව ක්‍රීඩාංගණය හදන්න වියදම් වුණා. ඒ ගැන පරීක්ෂණයක් කරන්න කිව්වා; ඒ ගැන සොයා බලන්න කිව්වා. නමුත් අන්තිමට ආණ්ඩුව භාර ගත්තා ඒ ණය ගෙවන්න. මේ හොරු ටික අදටත් අල්ලා ගන්න බැහැ. ආණ්ඩුව සූරියවැව ක්‍රීඩාංගණයේ වංචාව ගැන සොයපු නැති එක ගැන අපි කනගාටු වෙනවා. ඒ ගැන සොයා බලන්න මැදිහත් වෙන්න කියා ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ සියලු ණය අපි ගෙවලා, මාර්තු මාසයේ 31වෙනි දා වෙන කොට bank account එකේ බිලියන 2.8ක deposit එකක්, reserve එකක් තිබුණු ක්‍රිකට් පාලක මණ්ඩලයේ හිටපු ගෞරවණීය සභාපති කෙනෙක්, මම. කවදාවත් දේශපාලනමය වශයෙන් ක්‍රිකට් ක්‍රීඩාවට ඇඟිලි ගැසීමක්, ගරු දයාසිරි ජයසේකර මැතිතුමාවත්, ෆයිසර් මුස්තාපා මැතිතුමාවත් මට කළේ නැහැ. මේ වෙලාවේ ක්‍රිකට් තරගයක්, දෙකක් පැරදුණාම දේශපාලන වාසියක් ගන්න ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරනවා නම්, ඒක මොළේ නැති, අවබෝධයක් නැති එක එක කොන්ත්‍රාත් කරන මිනිසුන්ගේ වැඩක්.

නොයෙකුත් වකවානුවල අපේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ හිටිය සභාපතිවරු දෙස බැලුවාම, හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා ඉන්නවා. මේ ආයතනය එක්කෙනෙකුගේ, දෙදෙනෙකුගේ දායකත්වයෙන්, දවසෙන් දෙකෙන් ගොඩනැඟිච්ච ආයතනයක් නොවෙයි. මේ හැමදේම දේශපාලනයට හරවලා, "අරයාගේ කාලයේ, මෙයාගේ කාලයේ" කියලා මේ ආයතනය තව ටිකක් විනාශ කරන්නයි යන්නේ.

මේ විවාදයේ අරමුණම ක්‍රිකට් දියුණු කිරීම නොවෙයි, මඩ ගැසීමයි. මේ විවාදයේ අරමුණම මඩ සොයලා, මඩෙන් මඩට යෑමයි. එහෙම නැතිව, ක්‍රිකට් දියුණු කරලා, සංවර්ධනය කරලා, යම් තැනකට ගෙන යන අදහසක් මේ විවාදය ඉල්ලීමේ අරමුණ වශයෙන් මම දැක්කේ නැහැ. එහෙම නම් මීට වඩා ප්‍රබුද්ධ සාකච්ඡාවකට යන්න පුළුවන්. ක්‍රීඩා ඇමතිතුමා නිලවරණයක් පවත්වන්නේ නැති එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. ක්‍රිකට් නිලවරණය පැවැත්වීම පිළිබඳව නීතියක් තිබෙනවා; ව්‍යවස්ථාවක් තිබෙනවා. ව්‍යවස්ථානුකූලව අපේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ තඹ සතයක් වෙනත් bank account එකකට දමන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් දන්නවා, bank account එකක් විවෘත කරන්න ගියත් එම ආයතනයේ ව්‍යවස්ථාවට අනුව තමයි කටයුතු කරන්නේ. ඒකේ signatoriesලා

According to Article 3 of the Constitution, Sovereignty includes the powers of the Government. What are the powers of the Government? They are the legislative power of the People, the Executive Power of the People and the Judicial Power of the People. How are the said powers of the Government exercised? The powers of the Government are exercised by and through three organs. They are Legislature, Executive and the Judiciary. The legislative power of the People is exercised by the Parliament consisting of elected representatives of the People and by the People at a Referendum. (Vide Article 4(a) of the Constitution).The executive power of the People is exercised by the President of the Republic elected by the People. (Vide Article 4(b) of the Constitution). The judicial power of the People is exercised by Parliament through courts. (Vide Article 4(c) of the Constitution).According to Article 3 of the Constitution Sovereignty includes the powers of the Government. The way in which the Sovereignty is exercised is explained in Article 4 of the Constitution. When we consider Articles 3 and 4 of the Constitution, we feel that the Sovereignty is

1. the legislative power of the People,
2. the executive power of the People,
3. the judicial power of the People and
4. the franchise of the People

that would be exercised at Presidential Election, Parliamentary Election and Referendum. Therefore it is correct to say that the franchise of the People that would be exercised at Presidential Election, Parliamentary Election and Referendum is a **part of Sovereignty** and the executive power of the People

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

which would be exercised by the President of the Republic is also a **part of Sovereignty**.

For the above reasons, we hold that if a Bill violates executive power of the People [Article 4(b) of the Constitution] and franchise of the people that would be exercised at a Presidential Election, a Parliamentary and a Referendum, it would violate the Sovereignty of the People and thereby would violate Article 3 of the Constitution. We have pointed out earlier that the proposed the 20th Amendment Bill violates Article 4(b) of the Constitution. We have earlier held that the executive power of the People which would be exercised by the President of the Republic [Article 4(b)] is also a part of Sovereignty. Therefore it can be safely concluded that Clauses in the Bill relating to the removal or reduction of the executive power of the People which would be exercised by the President of the Republic would directly violate Article 3 of the Constitution and that therefore they should be approved by the People at a Referendum.

We have earlier pointed out that the franchise that would be exercised at a Presidential Election, a Parliamentary Election, a Referendum is a part of Sovereignty. The proposed Bill seeks to remove this franchise in so far as a Presidential Election is concerned. Therefore the Clauses of the Bill relating to the removal of this franchise would directly violate Sovereignty. Therefore these Clauses would directly violate Article 3 of the Constitution.

The above views are supported by the following judicial literature.

His Lordship Justice R.S. Wanasundera in his dissenting judgment in the case of In the Thirteenth Amendment to the Constitution [1987] 2 SLR page 312 at pages 338 and 339 made the following observation:

"The question as to the extent of the application of Article 4 however could be raised, still, in any particular matter. It is not only Article 4 that we have often linked with Article 3, but by the same token our rulings would cover any Article in the Constitution which the court considers as being linked with any of the entrenched Articles so as to constitute a basic feature, of the Constitution.

There are sufficient guidelines in the wording of the Constitution itself to assist a court in this task. The Preamble to the Constitution declares the representatives of the People were elected- "to constitute SRI LANKA into a DEMOCRATIC SOCIALIST REPUBLIC, whilst ratifying the immutable republican principles of REPRESENTATIVE DEMOCRACY, and assuring to all peoples FREEDOM, EQUALITY, JUSTICE, FUNDAMENTAL HUMAN RIGHTS and the INDEPENDENCE OF THE JUDICIARY as the intangible heritage that Qua tees the dignity and well being of succeeding generations of the People of SRI LANKA and of all the people of the World, who come to share with those generations the effort of working for the creation and preservation of a JUST AND FREE SOCIETY."

Again, I said earlier Article 4 spells out the concept in Article 3 the Sovereignty of the People is organised into the three great departments of Government-namely, the Legislature the Executive and the Judiciary. Fundamental Rights is again referred to in Article 4.(d). but its substantive provisions lie elsewhere. The franchise is also referred to in Article 4 (e), but there are numerous provisions elsewhere relating to the franchise."

His Lordship Chief Justice SN Silva in the case of In Re Nineteenth Amendment to the Constitution [2002] 3 SLR 85 at 96 to 98 made the following observation

"Sovereignty, which ordinarily means power or more specifically power of the State as proclaimed in Article 1 is given another dimension in Article 3 from the point of the People, to include -

(1) the powers of Government;

(2) the fundamental rights; and

(3) the franchise.

Fundamental rights and the franchise are exercised and enjoyed directly by the people and the organs of government are required to recognize, respect, secure and advance these rights.

The powers of government are separated as in most Constitutions, but unique to our Constitution is the elaboration in Articles 4 (a), (b) and (c) which specifies that each organ of government shall exercise the power of the People attributed to that organ. To make this point clearer, it should be noted that subparagraphs (a), (b) and (c) not only state that the legislative power is exercised by Parliament; executive power is exercised by the President and judicial power by Parliament through Courts, but also specifically state in each sub paragraph that the legislative power "of the People" shall be exercised by Parliament; the executive power "of the People" shall be exercised by the President and the judicial power "of the People" shall be exercised by Parliament through the Courts. This specific reference to the power of the People in each sub paragraph which relates to the three organs of government demonstrates that the power remains and continues to be reposed in the People who are sovereign, and its exercise by the particular organ of government being its custodian for the time being, is for the People.

Therefore, the statement in Article 3 that sovereignty is in the People and is "inalienable", being an essential element which pertains to the sovereignty of the People should necessarily be read into each of the sub paragraphs in Article 4. The relevant sub paragraphs would then read as follows :

(a) the legislative power of the People is inalienable and shall be exercised by Parliament;

(b) the executive power of the People is inalienable and shall be exercised by the President; and

(c) The judicial power of the People is inalienable and shall be exercised by Parliament through Courts.

The meaning of the word "alienate", as a legal term, is to transfer anything from one who has it for the time being to another, or to relinquish or remove anything from where it already lies. Inalienability of sovereignty, in relation to each organ of government means that power vested by the Constitution in one organ of government shall not be transferred to another organ of government, or relinquished or removed from that organ of government to which it is attributed by the Constitution. Therefore, shorn of all flourishes of Constitutional Law and of political theory, on a plain interpretation of the relevant Articles of the Constitution, it could be stated that any power that is attributed by the Constitution to one organ of government cannot be transferred to another organ of government or relinquished or removed from that organ of government; and any such transfer, relinquishment or removal would be an "alienation" of sovereignty which is inconsistent with Article 3 read together with Article 4 of the Constitution."

His Lordship Chief Justice SN Silva in the case of In Re Eighteenth Amendment to the Constitution [2002] 3 SLR 71 held as follows:

"Articles 3 and 4 must be read together and hence no organ of government shall alienate the sovereignty of the People in the exercise of its power entrusted to it. The Constitution does not attribute any unfettered discretion or authority to any organ or body established under the Constitution. That would be inconsistent with the Rule of Law."

When we consider the above judicial literature, we are unable to agree with the contention of Mr. Sumanthiran President's Counsel.

We would like to point out another aspect as to how the Bill would violate Sovereignty of the People.

Article 3 of the Constitution sets out a very important principle that is to say that Sovereignty is inalienable. We have earlier held that the franchise that would be exercised at a Presidential Election, a Parliamentary Election and a Referendum is a part of Sovereignty. The 'Sovereignty is inalienable'. Therefore if a Bill is enacted removing the franchise of the People which would be exercised at a Presidential election, the principle enshrined in Article 3 of the Constitution that the 'Sovereignty is inalienable' would be violated. If a Bill violates Article 3 of the Constitution it has to be approved by the People at a Referendum. The proposed 20th Amendment Bill removes the franchise of the People that would be exercised at a Presidential Election. Therefore it violates the principle enshrined in Article 3 of the Constitution that the 'Sovereignty is inalienable'. Thus, Clauses in the Bill relating to removal of the franchise of the People that would be exercised at a Presidential Election would directly violate Article 3 of the Constitution. If a Clause of a Bill directly violates Article 3 of the Constitution, it has to be approved

by the People at a Referendum. Therefore we hold that provisions relating to removal of the franchise of the People that would be exercised at a Presidential Election should be approved by the People at a Referendum.

Clauses No.2,3,5,6,8,9,11,12,13,14,15,16,19,20,21,22,23 and 36 of the Bill relate to the removal or reduction of executive power of the People that would be exercised by the President of the Republic elected by the People. We have earlier held that Clauses in the Bill relating to the removal or reduction of the executive power of the People which would be exercised by the President of the Republic would directly violate Article 3 of the Constitution and that therefore they should be approved by the People at a Referendum. We therefore hold that the above clauses would directly violate Article 3 of the Constitution. Therefore they will have to be passed by a special majority required under the provisions of Article 84(2) of the Constitution and approved by the People at a Referendum. We have examined the Bill. In our view, Clauses 2,3,4,7,10,26,27,28,29,30,32,34,35 and 37 of the Bill relate to the removal of the franchise of the People that would be exercised at a Presidential Election. We have earlier held that Clauses in the Bill relating to removal of the franchise of the People that would be exercised at a Presidential Election would directly violate Article 3 of the Constitution. We therefore hold that the above clauses would directly violate Article 3 of the Constitution. Therefore they will have to be passed by a special majority required under the provisions of Article 84(2) of the Constitution and approved by the People at a Referendum.

However Clauses 17,18,24,25,31 and 33 of the Bill would not violate Article 3 of the Constitution and would not come within the ambit of Article 83 of the Constitution. Therefore they need not be approved by the People at a Referendum and can be passed by a special majority specified in Article 82(5) of the Constitution.

Clauses 2,3,4,5,6,7,8,9,10,11,12,13,14,15,16,19,20,21,22,23,26,27,28,29,30,32,34, 35,36 and 37 of the 20th Amendment Bill will have to be passed by a special majority required under the provisions of Article 84(2) of the Constitution and approved by the People at a Referendum.

Clauses 17,18,24,25,31 and 33 of the Bill can be passed by a special majority specified in Article 82(5) of the Constitution.

Sisira J de Abrew
Judge of the Supreme Court.

Prasanna Jayawardena
Judge of the Supreme Court.

Murdu Fernando
Judge of the Supreme Court.

*[මෙම ලේඛනය පුස්තකාලයේ ද තබා ඇත.]*
*[இந்த ஆவணம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This document is also placed in the Library.]*

# II

## කථානායකතුමාගේ සහතිකය
## சபாநாயகரது சான்றுரை
## SPEAKER'S CERTIFICATE

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව,

2018 සැප්තැම්බර් 28 දින -

ගුවන් ප්‍රවාහන;

ප්‍රාදේශීය සභා (සංශෝධන); සහ

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන)

නමැති පනත් කෙටුම්පත්හි ද;

2018 ඔක්තෝබර් 04 දින -

වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය; සහ

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)

නමැති පනත් කෙටුම්පත්හි ද ගරු කථානායකතුමා විසින් සහතික සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව-

2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXVI කොටස;

2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XII කොටස;

2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXVI කොටස; සහ

2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ I කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT OF THE FINANCE COMMISSION

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2018 වර්ෂයේ දෙවැනි කාර්තුව (2018.04.01-2018.06.30) සඳහා මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව
## இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவின் அறிக்கை
## REPORT OF THE COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2017 වර්ෂයේ දෙවැනි කාර්තුව (2017.04.01-2017.06.30) සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂයේ මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) 2016 වර්ෂයේ මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ව්‍යාපාර හා වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් නියමයන් මම ඉදිරිපත් කරමි.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2018.01.24 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස මහාචාර්ය ප්‍රීතාන්ත ගුණවර්ධන මහතා පත් කිරීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජුනි 29 දිනැති අංක 2077/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2018.04.24 දින සිට 2018.06.30 දින දක්වා බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස මහාචාර්ය ප්‍රීතාන්ත ගුණවර්ධන මහතා පත් කිරීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජුනි 29 දිනැති අංක 2077/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය තුළ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2018 ජූලි 09 දිනැති අංක 2079/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය තුළ සම සෞඛ්‍ය අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2018 ජූලි 09 දිනැති අංක 2079/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨය තුළ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2018 ජූලි 09 දිනැති අංක 2079/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, රජරට විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨය තුළ අලෙවිකරණ කළමනාකරණ අධ්‍යයන අංශයක් හා මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශයක් සහ ව්‍යවහාරික විද්‍යා පීඨය තුළ සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යයන අංශයක් හා පරිගණක අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2018 ජූලි 09 දිනැති අංක 2079/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2018 අගෝස්තු 01 දිනැති අංක 2082/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මම, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 සැප්තැම්බර් 11 දිනැති අංක 2088/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරමි.

එම නියමය නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2017 වර්ෂය සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils, Local Government and Sports)

Hon. Deputy Speaker, I present the Report on the submission of observations and steps taken in terms of Standing Order No. 119(4) of the Parliament with regard to the Report presented to Parliament by the Committee on Public Accounts regarding the performance of the Ministry of Provincial Councils and Local Government in the year 2016.

I move that this Report be referred to the Committee on Public Accounts.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2016 වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Deputy Speaker, I present the Report of the Committee on Public Finance on,

(i) Note on the Supplementary Allocations given from the Budgetary Support Services and Contingent Liabilities provision made under the Department of National Budget as per the Introduction Note of the Annual Estimates; and

(ii) Financial Performance of the first quarter of the year 2018 which were referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "1977 අංක 8 දරන ජාතික රාජ්‍ය සභාවේ උදර්පණ පනත යටතේ 3 වගන්තිය යටතේ නියමය" සහ;

"1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනතේ 18 වගන්තිය යටතේ නියෝගය" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

# පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාවුල, උඩහාඩුව අංක 236 - ඩී දරන ස්ථානයේ පදිංචි බී.ජී. තරංගා ලක්මාලි පෙරේරා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිටකෝට්ටේ, පාගොඩ පාර, ආනන්ද බාලිකා මාවත, අංක 49/ඒ දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.ඒ. අමිත් කුමාර පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩිලාන් පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) සේරුවිල, සෝමපුර L B-02, අංක 99/1 දරන ස්ථානයෙහි පදිංචි ඩී.ඒ. වසන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අම්පාර, දඩයම්තලාව, රුහුණුගම, අංක 26/122 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. සැම්සන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සිරිනාල් ද මෙල් මහතා**
(மாண்புமிகு சிறினால் டி மெல்)
(The Hon. Sirinal de Mel

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගැටහැත්ත, වලවිට, කැටම්රිස්පිටිය, අංක 129/ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්. ඕපනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) ගාල්ල, බෝපේ, ගිංතොට පාර, මුත්තෙට්ටුගේවත්ත, අංක 158/1බී දරන ස්ථානයෙහි පදිංචි ඊ්.ජේ.පී. දිනේෂ් අංජුල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ගාල්ල, එලියට් පාර, අංක 180 බී දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්.ජී.ඒ.ජී.ඩබ්ලිව්. ඩයස් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) ගාල්ල, මාඉටිපේ, දෙවන පටුමඟ, උඩුමුල්ල වත්ත, අංක 245/19 දරන ස්ථානයෙහි පදිංචි මනෝජ් නුවන් කුමාර මාඉටිපේ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

## මහනුවර දිස්ත්‍රික්කයේ පළාත් පාසල්: ගුරු පුරප්පාඩු
## கண்டி மாவட்டத்திலுள்ள மாகாணப் பாடசாலைகள்: ஆசிரியர் வெற்றிடங்கள்
## PROVINCIAL SCHOOLS IN KANDY DISTRICT: TEACHER VACANCIES

22/'18

1. **ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම එක් එක් පාසලේ සේවයේ නියුතු ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) මහනුවර දිස්ත්‍රික්කයේ පවතින ඉහත (iv)හි සඳහන් ගුරු පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தில் உள்ள மாகாணப் பாடசாலைகளின் எண்ணிக்கையையும்;

(ii) அந்தப் பாடசாலைகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) அந்த ஒவ்வொரு பாடசாலையிலும் பணியாற்றும் ஆசிரியர்களின் எண்ணிக்கை யையும்;

(iv) அந்தப் பாடசாலைகளில் நிலவும் ஆசிரியர் வெற்றிடங்களின் எண்ணிக்கை யையும்;

(v) கண்டி மாவட்டத்தில் நிலவும் மேலே (iv) இல் குறிப்பிடப்பட்ட ஆசிரியர் வெற்றிடங்களை நிரப்ப அமைச்சு எடுக்கும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of provincial schools in the Kandy District;

(ii) the names of the above-mentioned schools;

(iii) the number of teachers employed in each of the above-mentioned schools;

(iv) the number of vacancies for teachers in each of the above-mentioned schools; and

(v) the steps that will be taken by the Ministry to fill the vacancies for teachers in the Kandy District mentioned in (iv) above?

(b) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 615කි.

(ii) ඇමුණුම 01හි දැක්වේ.

(iii) ඇමුණුම 02හි දැක්වේ.

(iv) ඇමුණුම 02හි දැක්වේ. (ඇමුණුම් 1 සහ 2 **සභාගත*** කරමි.)

(v) ඔව්.

වරින් වර ඇති වන ගුරු පුරප්පාඩු සඳහා ගුරු සේවා ව්‍යවස්ථාව අනුව සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් බඳවා ගැනීමට කටයුතු කෙරේ. ඒ අනුව, පළාත් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් පාසල් පාදක ක්‍රමය පදනම් කරගෙන පත්වීම් ලබා දීම සිදු කෙරේ. 2017 වසරේ මහනුවර දිස්ත්‍රික්කයේ පාසල්වල පුරප්පාඩු සඳහා පාසල් පාදක ක්‍රමය පදනම් කරගෙන 118 දෙනෙකුට උපාධිධාරී ගුරු පත්වීම් ලබා දී ඇත.

මීට අමතරව රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් තෝරා ගත් සුදුසු අයදුම්කරුවන් (ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, අධ්‍යාපනවේදී ඩිප්ලෝමා, උපාධිධාරී, ගුරු සහායක ආදී) පුරප්පාඩු පවතින පාසල් සඳහා අනුයුක්ත කිරීම් සිදු කරනු ලබයි.

අවස්ථානුකූලව ඇති වන පුරප්පාඩු සලකා බලා, ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව පළාත් පාසල් සඳහා බඳවා ගැනීම් සිදු කෙරේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් අවුරුද්දකට භාරදහසකට වැඩි පිරිසක් විද්‍යා පීඨවලින් එළියට එනවා. අවුරුද්දක් පාසා අපි පළාත් පාසල්වලට ඒ ගුරුවරුන් අනුයුක්ත කරනවා. ඊට අමතරව, 2015 වර්ෂයේ අපි විශේෂයෙන්ම වතු පාසල් සඳහා ගුරුවරුන් 2,886ක් බඳවාගෙන තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරපු බව කවුරුත් පිළිගත යුතු කාරණයක්. ඊළඟ වර්ෂය සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ පාසල් වැඩි දියුණුව සඳහා ගන්නා වූ ක්‍රියාමාර්ග මොනවාද කියලා අපි දැනගන්න කැමැතියි.

මා හිතන විධියට විශේෂයෙන්ම ගොඩනැගිලි ඉදිකිරීම සහ වැසිකිළි පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් මේ වෙනකොට විශාල ප්‍රගතියක් ලබා තිබෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට ඊළඟ වර්ෂයේ ඔබතුමාගේ වැඩ පිළිවෙළ පිළිබඳව මා දැන ගන්න කැමැතියි. විශේෂයෙන්ම ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධව.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා යොමු කළ ප්‍රශ්නයෙන් විශේෂයෙන්ම අසා තිබුණේ ගුරුවරු සම්බන්ධවයි. අපි මේ දවස්වල මේ රටේ සියලුම ජාතික පාසල්වල ගුරු හිඟය පියවන්න රාජ්‍ය සේවා කොමිසමේත් අනුමතිය අරගෙන කටයුතු කරනවා. ඒ අනුව හෙට-අනිද්දා වෙනකොට ගැසට් පත්‍රයේ පළ කර, මේ රටේ සියලුම ජාතික පාසල්වල ගුරු හිඟය පියවීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විද්‍යා පීඨ සඳහා ශික්ෂණලාභීන් බඳවා ගැනීමේ වසර දෙකක ප්‍රමාදයක් තිබෙනවා. ඒක කාලයක් තිස්සේ පවතින ගැටලුවක්. ඒ නිසා විද්‍යා පීඨවලට බඳවා ගැනීමේදී සිදුවන එම ප්‍රමාදය වළක්වා ගැනීමට අපි මෙවර කණ්ඩායම් -batches- දෙකක් එකවර බඳවා ගැනීමට තීරණය කළා. අපි 2015 ආණ්ඩුව භාර ගන්නකොට, විද්‍යා පීඨවලට බඳවා ගත්තේ 3,500ක් විතර ප්‍රමාණයක්. මේ වෙනකොට එම ප්‍රමාණය 4,500 දක්වා වැඩි කරලා තිබෙනවා. ලබන ජනවාරි මාසයේ ඉඳලා විද්‍යා පීඨවලට බඳවා ගන්නා ප්‍රමාණය කණ්ඩායම් දෙකක් විධියට බඳවා ගෙන වසර දෙකක පුහුණුවක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. කණ්ඩායම් දෙකක් බඳවා ගන්නවා කියන්නේ, 9,000කට ආසන්න ප්‍රමාණයක්. අපි ශික්ෂණලාභීන් වශයෙන් 9,000කට ආසන්න ප්‍රමාණයක් බඳවා ගෙන අවුරුදු දෙකක් පුහුණු කරලා ඊට පසුව ඔවුන් පාසල්වල පුහුණුවට යොදවනවා. එතකොට අවුරුදු තුන සම්පූර්ණ වෙනවා.

ඊට අමතරව දීර්ඝ කාලීන සහ කෙටි කාලීන පියවර කිහිපයක් ගෙන තිබෙනවා. කෙටි කාලීන පියවර විධියට සියලුම ජාතික පාසල්වල ගුරු හිඟය පියවීම සඳහා මේ වසර අවසාන වනවිට ගුරුවරුන් බඳවා ගෙන එම කටයුතු අවසන් කරනවා. දීර්ඝ කාලීන පියවර විධියට විද්‍යා පීඨවලට කණ්ඩායම් දෙකක් බඳවා ගෙන ගුරුවරුන් 9,000ක් විතර පද්ධතියට ඇතුළත් කරනවා, මේ ගුරු හිඟය පියවීම සඳහා. මේ වනකොටත් අපි රේඛීය අමාත්‍යාංශයෙන් පවා පළාත් සභාවලට රජයේ මුදල් ලබා දීලා ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගුරුවරු විශාල ප්‍රමාණයක් බඳවා ගෙන තිබෙනවා.

ඊට අමතරව, ඔබතුමා අහපු විධියට "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ පාසල් 10,194න් 5,900කට අපි එක්කෝ ගොඩනැඟිලි දීලා තිබෙනවා, එහෙම නැත්නම් ඒ පාසල් දැවැන්ත ප්‍රතිසංස්කරණයකට ලක් කර තිබෙනවා. ඊට අමතරව අපි වැසිකිළි, කැසිකිළි විතරක් 26,000ක් හදලා තිබෙනවා. ජංගම

විද්‍යාගාර සහිතව විද්‍යාගාර 3,000ක් දීලා තිබෙනවා. පුස්තකාලවලට රුපියල් මිලියන 700ක පොත් දීලා තිබෙනවා. ඒ වාගේම දේශපාලනය බින්දුවක්වත් දමන්නේ නැතිව විදුහල්පතිවරුන් 4,000ක් බඳවා ගත්තා. අධ්‍යාපන පරිපාලන සේවයේ 852ක් බඳවා ගත්තා. ගුරු අධ්‍යාපනඥ සේවයේ 1,190ක් බඳවා ගත්තා. ඊට අමතරව, තුන්වන ශ්‍රේණියේ විදුහල්පතිවරු හයසිය ගණනක් බඳවා ගැනීම සඳහා මේ වසරේ දෙසැම්බර් 31 වෙනිදා වනකොට නැවතත් ගැසට් කරනවා. ඒ වාගේම ගුරු අධ්‍යාපනඥ සේවයේ 1,190ක් බඳවා ගන්න කටයුතු කළත්, ඒ වේලාවේ අවුරුදු 30 කියන සීමාව දැමූ නිසා අදාළ ප්‍රමාණයට පශ්චාත් උපාධි කළ අය හිටියේ නැහැ. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිසමට ලියලා, ඒ සීමාව අවුරුදු 35 දක්වා වැඩි කර තිබෙනවා. ඒ සඳහා දහසකට වැඩි ප්‍රමාණයක් බඳවා ගැනීමට මේ දෙසැම්බර් 31 වෙනිදාට ප්‍රථම ගැසට් කරනවා. ඒ වාගේම, අධ්‍යාපන පරිපාලන සේවයේත් තුන්සිය ගණනක් ගන්න ගැසට් කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, මට විශ්වාසයක් තිබෙනවා ඉතාම කෙටි කාලයක් තුළ ප්‍රශ්න බොහොමයකට විසඳුම් ලැබෙයි කියා. මේක ලොකු පද්ධතියක්. පාසල් දහදහසක් තිබෙනවා කියන්නේ පොඩි වැඩක් නොවෙයි. නමුත්, අපට උපරිම තැනකට යන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ආසනයේ ගිරාඋල්ල මහා විද්‍යාලයට දැනට ගොඩනැඟිල්ලක් ඉදිකර තිබෙනවා. ඒ වාගේම, ගරු ඇමතිතුමා ලබා දී තිබෙන ප්‍රතිපාදන යටතේ උලපනේ විද්‍යාලයටත් ගොඩනැඟිලි ඉදිවෙමින් පවතිනවා. හැබැයි, කොන්ත්‍රාත්කරුවන් පවසන්නේ මුදල් ප්‍රමාද නිසා ඒ අයට ඉදිකිරීම් කටයුතු කරගන්න බැරි වෙයි කියන එකයි. එවැනි ප්‍රශ්නයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. මේ පිළිබඳව ඔබතුමා අපට කරුණු පැහැදිලි කරනවා නම් හොඳයි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, අපි "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතියට ගොඩනැඟිලි අනුමත කළේ යම් යම් නිර්ණායක මතයි. විශේෂයෙන්ම, අධ්‍යාපන කලාප 92ක් තිබෙනවා. මේ කලාප අනුදෙකේම සැලසුම් අධ්‍යක්ෂවරුන් මඟින් නිර්ණායක ලබා දීලා, ඒවා අනුමත කිරීමෙන් පසුව පාර්ලිමේන්තුවටත් ගෙනැල්ලා සම්මත කරගෙන, කැබිනට් මණ්ඩලයෙනුත් සම්මත කළාට පසුව තමයි එම ගොඩනැඟිලි ඉදිකිරීමට පටන් ගත්තේ. ඒකට අනුව තමයි අපි මුදල් ප්‍රතිපාදන යවන්නේ. පොඩි ප්‍රමාදයකුත් තිබෙනවා. මුදල් අමාත්‍යාංශයෙන් මුදල් එනකොට ඒවා මුදල් වශයෙන්ම එන ප්‍රමාණයේ පොඩි ප්‍රමාදයක් තිබෙනවා. ඒක නැතුව නොවෙයි, ඒක ඇත්ත. ඒ වාගේම තව ප්‍රශ්නයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ලබාදෙන ප්‍රතිපාදන සමඟ පළාත් සභා වෙනත් කටයුතු සඳහා යොදවා තිබෙනවා. අපි එම ව්‍යාපෘතිවලට සල්ලි යැවිවාම සමඟ අවස්ථාවල ඒවා එම ව්‍යාපෘතිවලට නොයොදා වෙනත් දේවල්වලට යොදාගෙන තිබුණා. ඒ ගැටලුවත් තිබෙනවා. නමුත්, අපි ඉක්මනටම ඒ ප්‍රශ්න විසඳන්න බලාපොරොත්තු වෙනවා. අපි ඊයේ පෙරේදාත් රුපියල් මිලියන 200ක් යැව්වා. ඒවායේ කෙරෙන වැඩ අනුව ඉතිරි මුදලුත් ඉතා ඉක්මනින් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි විගණන කටයුතු කරද්දී දැක්කා, සමඟර අය වේලාසනින් බිල්පත් ඉදිරිපත් කරලා තිබෙනවා. එහෙම එකකුත් තිබෙනවා. ඒවා කෙරෙන පිළිවෙළ අනුව අපි ඉක්මනින් මුදල් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 2 -48/'18- (2), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම ප්‍රශ්නය අහන්නේ දෙවැනි වතාවටයි. ඒ නිසා කරුණාකරලා මෙවර අය වැය ලේඛනය ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා පිළිතුරක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. මොකද, එහෙම නැත්නම් ඒ වනකොට ඇමෙරිකානු ඩොලරය රුපියල් 200ක් දක්වා ඉහළ යයි.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මාතලේ දිස්ත්‍රික්කයේ වාරිමාර්ග සංවර්ධන කටයුතු: වෙන් කළ මුදල

### மாத்தளை மாவட்ட நீர்ப்பாசன அபிவிருத்தி நடவடிக்கைகள்: ஒதுக்கப்பட்ட பணத்தொகை

### DEVELOPMENT OF IRRIGATION SYSTEMS IN MATALE DISTRICT: MONEY ALLOCATED

136/'18

**3. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2)

(අ) (i) මධ්‍යම පළාත් සභාවට අයත් මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි වාරිමාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාරිමාර්ගවල නම් කවරේද;

(iii) එම එක් එක් වාරිමාර්ග ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් වාරිමාර්ග ක්‍රම මඟින් වගා කරන ඉඩම් අක්කර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) 2010 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම පළාත් සභාව විසින් මාතලේ දිස්ත්‍රික්කයේ වාරිමාර්ග සංවර්ධන කටයුතු සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மத்திய மாகாண சபைக்குச் சொந்தமான மாத்தளை மாவட்டத்தில் அமைந்துள்ள நீர்ப்பாசன திட்டங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி நீர்ப்பாசன திட்டங்களின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு நீர்ப்பாசன திட்டத் திலிருந்தும் பயன்பெறுகின்ற குடும்பங்களின் எண்ணிக்கை தனித்தனியாக எவ்வளவென் பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு நீர்ப்பாசன திட்டத்தின் மூலமும் பயிர்செய்கை மேற்கொள்ளப்படுகின்ற காணிகளின் ஏக்கர் அளவு தனித்தனியாக எவ்வளவு என்பதையும்;

(v) 2010 ஆம் ஆண்டிலிருந்து இற்றைவரை மத்திய மாகாணசபையினால் மாத்தளை மாவட்டத்தில் நீர்ப்பாசன அபிவிருத்தி நடவடிக்கைகளுக்காக செலவிடப் பட்டுள்ள பணத்தொகை வருடவாரியாக தனித்தனியாக எவ்வளவென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House-

(i) the number of irrigation systems located in Matale District which comes under the Central Provincial Council;

(ii) the names of aforesaid irrigation systems;

(iii) separately, the number of families benefitted from each aforesaid irrigation systems;

(iv) separately, the number of acres of lands cultivated with the help of each irrigation system; and

(v) the amount of money allocated by the Central Provincial Council for the development of irrigation systems of Matale District, from year 2010 to date?

(b) If not, why?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි වාරිමාර්ග පද්ධති සංඛ්‍යාව 1,035කි.

(ii) මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි වාරිමාර්ගවල නම් ඇමුණුමෙහි (i-xxi) පිටු අංක iv මඟින් දක්වා ඇත.

(iii) එම එක් එක් වාරිමාර්ග ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව 29,150කි. එය ඇමුණුමෙහි (i-xxi) පිටු අංක viii මඟින් දක්වා ඇත.

(iv) එම එක් එක් වාරිමාර්ග ක්‍රම මඟින් වගා කරන ඉඩම් ප්‍රමාණය අක්කර 23,323කි. එය ඇමුණුමෙහි (i-xxi) පිටු අංක vii මඟින් වෙන් වෙන් වශයෙන් දක්වා ඇත.

(v) 2010 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම පළාත් සභාව විසින් මාතලේ දිස්ත්‍රික්කයේ වාරිමාර්ග සංවර්ධන කටයුතු සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වර්ෂය අනුව පහත දක්වා ඇත.

(2010-2017)

| වර්ෂය | වියදම (රු. මිලියන) |
|---|---|
| 2010 | 9.33 |
| 2011 | 5.69 |
| 2012 | 1.85 |
| 2013 | 4.02 |
| 2014 | 5.17 |
| 2015 | 4.92 |
| 2016 | 6.85 |
| 2017 | 4.95 |

(ආ) අදාළ නොවේ.

ඇමුණුම **සභාගත*** කරමි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, මාතලේ දිස්ත්‍රික්කය ගත්තොත්, එහි සියයට 85ක්ම ඉන්නේ ගොවි ජනතාවයි. ඒ අයගේ ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීමේ වගකීම පළාත් සභාව සතුයි. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ පවතින පළාත් සභාව තුළින් මේ කටයුතු හරියාකාරව කෙරෙන්න ඕනෑ. මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ආසනයෙන් හැම වෙලාවේම වතුර ටික පිටට ගෙන යනවා; එහා පැත්තෙන් වයඹ ඇළෙන්, මොරගහකන්ද සහ කළු ගඟ කියන ව්‍යාපෘති අතරේ. නමුත්, අපේ ප්‍රදේශයේ ජනතාවට මහ කන්නයට විතරයි වගා කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. එහෙම නොවුණා නම් ඔබතුමා ඔය එකතු කළ සංඛ්‍යා ලේඛන ඔයිට වඩා වෙනස් වෙනවා. මෙහිදී අපට පැහැදිලිව පෙනෙනවා, ජල කළමනාකරණයේ ගැටලුවක් තිබෙන බව. මාතලේ අතිරික්ත ජලය වයඹට ගෙන යනවාය කිව්වාට, මෙතැනින්ම පැහැදිලියි

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

"අතිරික්ත" කියන වචනයේ තේරුම මොකක්ද කියන එක. ඒ කියන්නේ, අපේ ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාව සම්පූර්ණ වෙලා තිබුණොත් තමයි ඉතිරි ජලය පිටට ගෙන යාමේ හැකියාව තිබෙන්නේ. නියහය පවතින බොහෝ රටවල් ජල කළමනාකරණය බොහොම හොඳින් කරගෙන යනවා. මා ඔබතුමාගෙන් අහන අතුරු ප්‍රශ්නය වන්නේ, මේක කොතැනින් වුණු වරදක්ද කියන එකයි. මධ්‍යම පළාත් සභාවේ වේවා, කුමන හෝ අමාත්‍යාංශයක වේවා, කොතැන, කුමන නිලධාරීන්ගේ මොන අඩු පාඩුවක් නිසා මේ ජල කළමනාකරණය සිදු නොවනවාද කියන එක ඔබතුමා හඳුනාගෙන තිබෙනවාද?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු මන්ත්‍රීතුමියනි, පළාත් සභාව කියන්නේ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ තිබෙන එකක් නොවෙයි. එය බලය විමධ්‍යගත කර තිබෙන එකක්. ඒ නිසා ඔබතුමියගේ ප්‍රශ්නය මම පළාත් සභාවට යොමු කරන්නම්. එයට විසඳුමක් සොයන්න කියාත් ඒ උදවියට මම කියන්නම්. මේ සම්බන්ධයෙන් සෘජු මැදිහත් වීම මට කරන්න බැහැ. ඔය කියන අවදානම් තත්ත්වය පිළිබඳ විස්තර පළාත් සභාවට යොමු කරන්න මට පුළුවන්.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ඊළඟට, ලෑලිඅමුණ වැව පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. එය පළාත් සභාව යටතේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේයි ප්‍රතිසංස්කරණය කළේ. එය ප්‍රමිතියට සිදු නොවුණාය කියා ගොවි ජනතාව අතර මතයක් තිබෙනවා. මේක ගැටලුවක් නොවෙයි. නමුත් ඒ සම්බන්ධවත් පළාත් සභාවට යොමු කර, විමර්ශනයක් කර, ඒ අදාළ කොන්ත්‍රාත් කළ අය සහ එයට අනුමැතිය ලබා දුන් අය සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ඒ සම්බන්ධව සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

මේක බොහොම කලකට ඉහතදී සිදු වුණු දෙයක්, ගරු ඇමතිතුමනි.

## විශේෂ ජනාධිපති සමාව යටතේ නිදහස් කළ සිරකරුවන් : විස්තර

## சனாதிபதியின் விஷேட மன்னிப்பின்கீழ் விடுதலை செய்யப்பட்ட சிறைக் கைதிகள்: விபரம்

PRISONERS RELEASED ON SPECIAL PRESIDENTIAL PARDON: DETAILS

165/'18

**4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වර්ෂ 2006 - 2015 කාල සීමාව තුළ විශේෂ ජනාධිපති සමාව යටතේ නිදහස් කළ සිරකරුවන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඔවුන්ගේ නාම ලේඛනය හා සිරගතවීමට අදාළ වූ චෝදනා සඳහන් කරන්නේද;

(iii) එසේ නිදහස ලැබූවන් අතර මිනීමැරුම් චෝදනාවලට, ස්ත්‍රී දූෂණ චෝදනාවලට හා ළමා අපචාර චෝදනාවලට ලක්වූවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

*நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:*

(அ) (i) 2006 - 2015 ஆண்டு காலப்பகுதியில் சனாதிபதியின் விஷேட மன்னிப்பின் கீழ் விடுதலை செய்யப்பட்ட சிறைக் கைதிகளின் எண்ணிக்கை ஒவ்வொரு வருடத்துக்கமைய வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(ii) இவர்களின் பெயர் பட்டியலையும் சிறையிலிடப்படுவதற்கு ஏதுவான குற்றங்களையும் குறிப்பிடுவாரா என்பதையும்;

(iii) அவ்வாறு விடுதலை பெற்றவர்களில் கொலைக் குற்றச்சாட்டுகளுக்கு, கற்பழிப்பு குற்றச்சாட்டுகளுக்கு மற்றும் சிறுவர் துஷ்பிரயோக குற்றச்சாட்டுகளுக்கு உள்ளானவர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and Prison Reforms:

(a) Will she inform this House-

(i) the number of prisoners released on special Presidential pardon during the period 2006-2015, each year separately;

(ii) whether the list of their names and the charges that led to the imprisonment be presented; and

(iii) those pardoned, the number of prisoners convicted of murder, rape and child abuse separately?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

අ. (i)

| වර්ෂය | ප්‍රදානය කරන ලද ජනාධිපති සමාව | නිදහස් කරන ලද සංඛ්‍යාව |
|---|---|---|
| 2006 | 2006.02.04 නිදහස් දින සමාව | 2,217 |
| | 2006.03.08 ජාත්‍යන්තර කාන්තා දිනය | 33 |
| | 2006.09.12 සිරකරු සුභ සාධක දිනය | 1,318 |
| 2007 | 2007.02.04 නිදහස් දින සමාව | 1,945 |
| 2008 | 2008.02.04 නිදහස් දින සමාව | 2,281 |
| 2009 | 2009.02.04 නිදහස් දින සමාව | 2,575 |
| | 2009.03.08 ජාත්‍යන්තර කාන්තා දිනය | 10 |
| | 2009.05.08 වෙසක් දින සමාව | 651 |
| | 2009.06.07 පොසොන් දින සමාව | 583 |
| | 2009.07.27 දළදා පෙරහැර වෙනුවෙන් සමාව | 1,900 |
| | 2009.09.12 සිරකරු සුභ සාධක දින සමාව | 1,618 |
| 2010 | 2010.02.04 නිදහස් දින සමාව | 1,583 |
| | 2010.03.08 ජාත්‍යන්තර කාන්තා දින සමාව | 30 |
| | 2010.09.12 සිරකරු සුභ සාධක දින සමාව | 1,365 |
| | 2011.02.04 නිදහස් දින සමාව | 1,690 |
| | 2011.05.17 වෙසක් දින සමාව | 956 |
| | 2009.09.12 සිරකරු සුභ සාධක දින සමාව | 1,040 |
| 2012 | 2012.02.04 නිදහස් දින සමාව | 1,385 |
| 2013 | 2013.02.04 නිදහස් දින සමාව | 1,270 |
| | 2013.09.12 සිරකරු සුභ සාධක දිනය | 938 |
| 2014 | 2014.02.04 නිදහස් දින සමාව | 1,233 |
| | 2014.05.14 වෙසක් පොහොය වෙනුවෙන් | 533 |
| 2015 | 2015.01.13 ශුද්ධෝත්තම පාජ්තුමන්ගේ ශ්‍රී ලංකා ගමනය වෙනුවෙන් | 619 |
| | 2015.02.04 නිදහස් දින සමාව වෙනුවෙන් | 554 |
| | 2015.05.03 වෙසක් පොහොය වෙනුවෙන් | 429 |
| | 2015.12.25 නත්තල් දින සමාව | 553 |

(ii) සාමාන්‍ය වශයෙන් වසරකට අවස්ථා හතරක හෝ පහක දී අතිගරු ජනාධිපතිතුමන් විසින් කොන්දේසිවලට යටත්ව සිරකරුවන් සඳහා සමාවන් ප්‍රදානය කරනු ලබයි. ඒ අනුව ඉහත සඳහන් සිරකරුවන් සංඛ්‍යාව බන්ධනාගාරයෙන් නිදහස ලබා පිටව ගොස් ඇති අතර, වසර කිහිපයකදී නිදහස්ව ගිය සිරකරුවන්ගේ විස්තර වාර්තා බන්ධනාගාර මූලස්ථාන මෙහෙයුම් අංශයේ ගොනුකර තැබීමක් සිදු නොවේ. නිදහස්ව ගිය සිරකරුවන්ගේ චෝදනා සම්බන්ධ විස්තර බන්ධනාගාර මඟින් ගෙන්වා ගැනීම සිදු කළ යුතු බැවින්, ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්නේ නම් අවශ්‍ය තොරතුරු ලබා දිය හැකි බව කාරුණිකව දන්වමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
කාලය? කොපමණ කාලයකින්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
කාලය ගැන නම් කියා නැහැ. හැකිතාක් ඉක්මනට මම අහලා කියන්නම්. ප්‍රශ්නයේ (iii)වන කොටසට පිළිතුර.

(iii) එසේ නිදහස ලැබූවන් අතර, මිනී මැරුම් චෝදනාවන්ට, ස්ත්‍රී දූෂණ චෝදනාවන්ට හා ළමා අපචාර චෝදනාවන්ට ලක් වූවන් පිළිබඳව 2006 ඉඳලා 2015 දක්වා විස්තර එවා තිබෙනවා.

| වර්ෂය | මිනී මැරුම් | ස්ත්‍රී දූෂණ | ළමා අපචාර |
|---|---|---|---|
| 2006 | නැත | නැත | නැත |
| 2007 | නැත | නැත | නැත |
| 2008 | නැත | නැත | නැත |
| 2009 | නැත | නැත | නැත |
| 2010 | 01 | නැත | නැත |
| 2011 | නැත | නැත | නැත |
| 2012 | නැත | නැත | නැත |
| 2013 | නැත | නැත | නැත |
| 2014 | නැත | නැත | නැත |
| 2015 | නැත | නැත | නැත |

ස්ත්‍රී දූෂණ හෝ ළමා අපචාරවලට සම්බන්ධ කිසි කෙනෙකුට නිදහසක් දීලා නැහැ. 2010දී මිනී මැරුම් චෝදනාවලට ලක් වූවන්ගෙන් එක් කෙනෙකුට නිදහස දීලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
නම්?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මේකේ නම සඳහන් කර නැහැ. ඒකත් අහලා තිබුණා නම්, පිළිතුරට ඇතුළත් වෙන්න තිබුණා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
කාන්තාවක්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒකත් සඳහන් කර නැහැ. ඒකත් අහලා තිබුණා නම්, කියන්න තිබුණා. ඇසූ අතුරු ප්‍රශ්නයක් හැටියට, අපි එයට පිළිතුරක් එවන්නම්.

(ආ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් අහන්න කලින් මම දැන ගන්න කැමැතියි, ප්‍රශ්නයේ (අ) (i) කොටසට අදාළ සංඛ්‍යාවල එකතුව කීයද කියා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

එකතුව සඳහන් කර නැහැ. එකතු කර තමයි කියන්න වෙන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

හොඳයි. ගරු ඇමතිතුමා උත්තර දෙනවා නම්, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති, ජාත්‍යන්තර කාන්තා දිනයක් දවසකදී -මාර්තු 08 වනදා- මා හිතන විධියට ඔය 2010 වසරේ සඳහන් වන්නේ ඒකයි. මිනී මැරුම් දෙකකට චෝදනාවට ලක් වුණු,- [බාධා කිරීමක්] ඒ කියන්නේ කාන්තාවන් දෙදෙනෙක් ඝාතනය කරන ලද කාන්තාවකට -මිනී මැරුම් චෝදනාවකට ලක් වූ කෙනෙකුට- ජනාධිපති සමාව ලබා දුන්නා, ඇය හිටපු ඇමතිවරයෙකුගේ බිරිඳක් නිසා. එතකොට මේකත් ජනාධිපති සමාව පාවිච්චි කර දීපු සමාවක්. විශේෂ ජනාධිපති සමාව තිබෙන්නේ, විශේෂ අවස්ථාවල, අධිකරණයෙන් යම් අසාධාරණයක් වුණාය කියන කෙනෙකුට ඒ අවස්ථාව පාවිච්චි කර යම් නිදහසක් ලබා දෙන්න. නමුත් මෙන්න මේ ආකාරයට දේශපාලන හිතවත්කම් හෝ පාක්ෂික හිතවත්කම්, ඥාති සම්බන්ධකම් පාවිච්චි කර මේ අවස්ථාව අවභාවිත කිරීම වැළැක්වීම සඳහා ආණ්ඩුව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඇමතිතුමිය මේ ගරු සභාවේ නැති වුණත්, හිටපු ඇමතිතුමා උත්තර දෙන්න ඉදිරිපත් වෙනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා විසින් සිරකරුවන්ට නිදහස ලබා දීමේ සුවිශේෂ අවස්ථාවේදී ඒ නිදහස ලබා දීම සිදු කරන්නේ, යම් කිසි නිර්ණායකයක් මත. සියලුම බරපතළ වැරදි සම්බන්ධයෙන් සිර දඬුවම් ලැබූ සිරකරුවන්ට එහෙම නිදහස ලබා දීමක් සිදු කරන්නේ නැහැ. බරපතළ නොවන ගණයේ වැරදි ලැයිස්තුවක් තිබෙනවා. ඒ ලැයිස්තුව තුළින් එසේ නිදහස ලබා දීමට සුදුසු යැයි කියා නිර්දේශ කරන්න, විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමෙක් ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් තිබෙනවා. ඒ කමිටුවෙන් නිර්දේශ කළාට පසුව ඒ අනුව මිසක් ඒ නිදහස් කිරීමේ ක්‍රියාදාමයට බලපෑම් කරන්න කිසිදු නිලධාරියෙකුට හෝ දේශපාලනඥයෙකුට ක්‍රමවේදයක් නැහැ. ඒක බොහොම පැහැදිලිව පසුගිය කාලය පුරාවටම තිබුණු ක්‍රමයක්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මිනී මැරුම් චෝදනාවකට ලක් වෙලා විශේෂ ජනාධිපති සමාවක් ලබා දීපු අය පිළිබඳව ඔබතුමා කියන ආකාරයට ඉදිරිපත් කරපු විශේෂඥ කමිටු වාර්තාව සභාගත කරන්න කියා දෙවන අතුරු ප්‍රශ්නය හැටියට මම ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒක ගරු අධිකරණ ඇමතිතුමියට දැනුම් දෙන්න අපට පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි. බොහොම ස්තුතියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, දේශපාලන මැදිහත් වීම් හෝ දේශපාලන අනුග්‍රහයන් මත මේ දේ සිදු නොවන බව ඔබතුමා නිශ්චිත ලෙස කිව්වා. හැබැයි, මිනී මැරුම් චෝදනාවක් මත අමාත්‍යවරයෙකුගේ බිරිඳකට ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් නියම වුණාට පසුව එම දඬුවමෙන් ඇය නිදහස් කළ බව ඔබතුමාත්, මාත් ඉතා හොඳින් දන්නවා. අපට ඉතා පැහැදිලියි, එතුමා ඇමතිවරයෙක්, ඇය ඇමතිවරයාගේ බිරිඳ බව.

මහනුවර දිස්ත්‍රික්කයේ නගරාධිපතිවරයෙකු මහජන මුදල් හොරකම් කිරීමේ වරදට ඔහුට බරපතළ වැඩ සහිත අවුරුදු පහක සිර දඬුවමක් නියම වුණා. හැබැයි, එතුමා දේශපාලනයේ පිල් මාරු කිරීම හේතුකොටගෙන එතුමාටත් නිදහස ලැබුණා.

ගරු ඇමතිතුමනි, සබරගමු දේවාලයේ බස්නායක නිලමේ හා සම්බන්ධ සිද්ධිය ගැනත් ඔබතුමා දන්නවා. එතුමාටත් මේ ආකාරයටම සමාව ලැබුණා.

ඒ දඬුවම් සහ දඬුවම්වලට භාජන වුණු පුද්ගලයන් දිහා බැලුවාම පෙනෙනවා, ඔබතුමා කියන ස්වාධීන මණ්ඩලයන් හරහා ඔවුන්ට මේ නිදහස නොලැබුණු බව. ඒ අනුව ඔබතුමා කියන කරුණ කිසිසේත්ම අපට පිළිගන්න බැහැ. එම නිසා මේවාට දේශපාලන මැදිහත් වීම් නැහැයි කියලා ඔබතුමා කොතෙක් කිව්වත්, මා ඉහතින් සඳහන් කළ සිදුවීම් තුනෙන් ඉතා හොඳින් පැහැදිලි කර තිබෙනවා, මේ නිදහස්වීම් ලබා දීම සඳහා දේශපාලන මැදිහත් වීම් තිබෙන බව. ඔබතුමා ඒක පිළිගන්නේ නැද්ද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 ජනවාරි 8 වැනි දාට පෙර ඒ තත්ත්වය තිබුණු බව පිළිගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්ව ඒ සියලු උදාහරණ 2015 ජනවාරි 8 වැනිදාට පෙර ඒවායි. නමුත්, නව රජය පත් වුණාට පස්සේ අපි ඒකට ප්‍රතිපත්තියක් හදා ඒ ක්‍රියාදාමය තුළ කටයුතු කළා. ඒ ක්‍රියාදාමයෙන් පිටත නිදහස ලබා දුන් අවස්ථා තුනක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පළමුවෙනි අවස්ථාව ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමාට නිදහස ලබා දුන් කාරණය.

දෙවෙනි අවස්ථාව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම සිද්ධිය ඔබතුමාටත් මතක ඇති. මඩකලපුව පැත්තෙන් ආ ගැහැනු දැරියක් සීගිරියේ තිබෙන රූප විකෘති කිරීමක් කරලා තිබුණා. ඒ සිද්ධියට එම දැරිය වැරදිකාරිය වෙලා අවුරුදු දෙකකට සිරගත වුණා. ඒ අවස්ථාවේදී අපි ජනාධිපතිතුමාට නිර්දේශ ඉදිරිපත් කරලා, එම දැරියට සමාව අරගෙන දුන්නා. මොකද, ඇයගේ නොදැනුවත්කම මත එය කරපු නිසා.

තුන්වෙනි අවස්ථාව තමයි, අතිගරු ජනාධිපතිතුමාව ඝාතනය කරන්න තැත් කළ සිද්ධියේ වැරදිකරුවන්ට එතුමා සමාව දීම.

2015 ජනවාරි 8 වැනිදායින් පස්සේ ඔය අවස්ථා තුන සඳහා පමණයි ජනාධිපති සමාව දීලා තිබෙන්නේ. ඒ හැරෙන්න අනික් සෑම නිදහස් කිරීමක්ම අර කියපු ක්‍රමවේදය ඇතුළත පමණයි සිද්ධ වුණේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

2006 සිට 2015 වර්ෂය දක්වා ජනාධිපති සමාව ලබා ගත් පිරිසේ සම්පූර්ණ එකතුව 29,309යි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හරි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 5 -202/'18- (2), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -236/'18- (2), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මේ ප්‍රශ්නයට පිළිතුර දීම එතුමිය දෙවන වතාවටත් කල් ඉල්ලන හින්දා මට ගරු සභානායකතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බැහැ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු සභානායකතුමනි, මට මේ පිළිබඳව ඔබතුමාගෙන් අහන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා මේ ප්‍රශ්නය අසා තිබෙන්නේ, ගරු පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ඒකට අදාළව තමයි මා ගරු සභානායකතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නේ, ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් රටේ නැති හින්දා. මේ දවස්වල මාධ්‍යවල පළවන වාර්තාව -මේ රජය මාරු කරන්න යනවා, රජය වෙනස් වෙන්න යනවා, කණ්ඩායම් දෙකක් එකතු වෙන්න යනවා කියන ප්‍රවෘත්තිය- සම්බන්ධව ආණ්ඩුවේ මතය මොකක්ද? ගරු සභානායකතුමනි, ඔබතුමාට ඒ ගැන උත්තර දෙන්න පුළුවන්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නම් විශ්වාස කරන්නේ නැහැ, එහෙම දෙයක් වේවි කියා. මොකද, මේ රටේ ජන වරම තිබෙන්නේ යහ පාලන ආණ්ඩුවටයි; එහෙම නැතිනම් එක්සත් ජාතික පෙරමුණටයි. ප්‍රතික්ෂේප වෙච්ච කණ්ඩායම් එක්ක ආණ්ඩු පිහිටුවන්න අපි සූදානම් නැහැ. [බාධා කිරීම්]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ අයට කලබලයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ප්‍රතික්ෂේප වෙච්ච කණ්ඩායම් එක්ක ආණ්ඩු පිහිටුවන්න ජන වරමකුත් නැහැ. [බාධා කිරීම්]

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වතුකරයේ අධ්‍යාපනය නඟා සිටුවීම: ගනු ලැබූ පියවර
## பெருந்தோட்டப் பகுதிகளில் கல்வியை மேம்படுத்துதல்: மேற்கொண்டுள்ள நடவடிக்கைகள்
## UPLIFTMENT OF EDUCATION IN PLANTATION SECTOR: MEASURES TAKEN

385/'18

**7. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ග්‍රාමීය පාසල්වල අධ්‍යාපනයේ සංවර්ධනයක් සිදුවී ඇතත්, වතුකරයේ ජීවත්වන කම්කරු ජනතාවගේ දරුවන්ගේ අධ්‍යාපනයේ කඩා වැටීමක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(ii) 2010 වර්ෂයේ සිට 2014 දක්වා වතුකරයේ පාසල් නඟා සිටුවීම සඳහා පසුගිය රජය විසින් ගනු ලැබූ පියවර කවරේද;

(iii) ඒ සඳහා කොපමණ මුදලක් වැය කර තිබේද;

(iv) ඒ සඳහා එම කාලය තුළ බඳවාගෙන ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) 2015 වර්ෂයේ ජනවාරි සිට මේ දක්වා වතුකරයේ පාසල් සඳහා රජය විසින් වැය කළ මුදල හා බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව මහනුවර, නුවරඑළිය, බදුල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிராமியப் பாடசாலைகளின் கல்வியில் வளர்ச்சி ஏற்பட்டுள்ள போதிலும், பெருந்தோட்டங்களில் வாழ்கின்ற மக்களின் பிள்ளைகளின் கல்வி வீழ்ச்சியடைந்துள்ளதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) 2010ஆம் ஆண்டிலிருந்து 2014ஆம் ஆண்டு வரை பெருந்தோட்டப் பாடசாலைகளை மேம்படுத்துவதற்காக கடந்த அரசாங்கம் மேற் கொண்டுள்ள நடவடிக்கைகள் யாவையென் பதையும்;

(iii) அதற்காக எவ்வளவு பணம் செலவிடப்பட்டுள்ள தென்பதையும்;

(iv) அதற்காக அக்காலப்பகுதியினுள் ஆட்சேர்க்கப் பட்டுள்ள ஆசிரியர்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(v) 2015 ஆம் ஆண்டின் சனவரி முதல் இற்றைவரை அரசாங்கம் பெருந்தோட்டப் பாடசாலைகளுக் காக செலவிட்டுள்ள பணத் தொகை மற்றும் ஆட்சேர்க்கப்பட்டுள்ள ஆசிரியர்களின் எண்ணிக்கை கண்டி, நுவரெலிய, பதுளை மற்றும் இரத்தினபுரி மாவட்டங்களுக்கமைய தனித்தனியாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) whether he acknowledges that there has been a collapse in the education of children of workers living in the plantation sector though there has been a development in the education of rural schools;

(ii) the measures taken during the previous regime from 2010 to 2014 to uplift the education of schools in the plantation sector;

(iii) the amount of money spent on that;

(iv) the number of teachers recruited during that period for that purpose; and

(v) separately, in respect of the Kandy, Nuwara Eliya, Badulla and Ratnapura Districts, the amount of money spent on plantation schools by the Government and the number of teachers recruited from January 2015 to date?

(b) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) * වතු පාසල් සඳහා ඉංග්‍රීසි හා තාක්ෂණික වැඩමුළු පැවැත්වීම.

* දෙමළ භාෂා තරග පැවැත්වීම සහ පොත් ලබා දීම.

* ප්‍රාථමික හා ද්විතීයික ගුරුවරුන් සඳහා බහුතල ඉගැන්වීම් පිළිබඳ වැඩමුළු පැවැත්වීම.

* මනෝ උපදේශන හා සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ වැඩමුළු පැවැත්වීම.

* සිසුන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා බහුතල ඉගෙනුම් උපකරණ සකස් කිරීමේ වැඩමුළු පැවැත්වීම.

* 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල ඉහළ නැංවීමේ වැඩමුළු පැවැත්වීම.

* ප්‍රාථමික හා ද්විතියික (ගණිතය, ඉංග්‍රීසි හා විද්‍යාව) අධ්‍යාපනය සංවර්ධන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

* අධ්‍යාපන නිලධාරීන්ගේ, විදුහල්පතිවරුන් සහ ගුරු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
* වතු පාසල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීම.
* පැරණි ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම හා නව ගොඩනැඟිලි ඉදි කිරීම.
* සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම.
* නව විදුලි සම්බන්ධතාවන් ලබා දීම හා පාසල් සඳහා උපකරණ ලබා දීම.

මේ ආදී වශයෙන් කරපු ඒවා බොහෝ තිබෙනවා.

(iii) මධ්‍යම පළාත

මධ්‍යම පළාතේ වතු පාසල් නහා සිටුවීමේ වැඩසටහන් සඳහා මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් රුපියල් මිලියන 2,323.425ක් වැය කර ඇත. එසේම 2010 වර්ෂයේ සිට 2013 ඔක්තෝබර් මාසය දක්වා මධ්‍යම පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා, ග්‍රාමීය සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 208.003ක් වැය කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉහත සඳහන් වැඩසටහන් සඳහා රුපියල් මිලියන 4.463ක් වැය කර ඇත.

**සබරගමුව පළාත**

සබරගමුව පළාතේ වතු පාසල් නහා සිටුවීමේ වැඩසටහන් සඳහා සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 593,970.00ක් වැය කර ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 364,547.00ක් වැය කර ඇත.

**ඌව පළාත**

ඌව පළාතේ වතු පාසල් නහා සිටුවීමේ වැඩසටහන් සඳහා ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 2.201ක් වැය කර ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 2.325ක් වැය කර ඇත.

ගරු මන්ත්‍රීතුමනි, මෙය 2010 සිට 2013 වර්ෂය සඳහායි.

(iv) **සබරගමුව පළාත (2010 - 2014 වර්ෂය දක්වා)**

සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ගුරුවරුන් 750ක් බඳවාගෙන ඇත.

**ඌව පළාත (2010 - 2014 වර්ෂය දක්වා)**

ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ගුරුවරුන් 3,385ක් බඳවාගෙන ඇත.

**මධ්‍යම පළාත (2010 - 2104 වර්ෂය දක්වා)**

මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ගුරුවරුන් 1,311ක් බඳවාගෙන ඇත.

(v) ඔව්.

**මධ්‍යම පළාත (මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්ක)**

2015 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 45ක් වැය කර ඇති අතර නව ගුරු පත්වීම් 1,706ක් ලබා දී ඇත.

2015 වර්ෂයේ සිට මේ දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 394.028ක් වැය කර ඇති අතර නව ගුරු පත්වීම් 1,114ක් ලබා දී ඇත.

**සබරගමුව පළාත (රත්නපුර දිස්ත්‍රික්කය)**

2015 වර්ෂයේ සිට මේ දක්වා සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 25.070ක් වැය කර ඇති අතර, නව ගුරුපත්වීම් 416ක් ලබා දී ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 15.6ක් වැය කර ඇති අතර ගුරු පත්වීම් 425ක් ලබා දී ඇත.

**ඌව පළාත**

ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නව ගුරු පත්වීම් 1,343ක් ලබා දී ඇත.

2015 වර්ෂයේ සිට මේ දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 75.716ක් වැය කර ඇති අතර නව ගුරු පත්වීම් 846ක් ලබා දී ඇත.

2015 ජනවාරි සිට මේ දක්වා වතුකරයේ පාසල් සඳහා බඳවා ගත් ගුරුවරුන් සංඛ්‍යාව මහනුවර, නුවරඑළිය, බදුල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

| | දිස්ත්‍රික්කය | බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් |
| 1 | රත්නපුර | 425 | 416 |
| 2 | බදුල්ල | 846 | 1,343 |
| 3 | මහනුවර | 205 | 1,706 |
| 4 | නුවරඑළිය | 909 | |
| | **එකතුව** | **2,385** | **3,465** |

(ආ) අදාළ නොවේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගේ අවධානය යොමු කරන්නේ මේ කාරණය කෙරෙහියි. "ග්‍රාමීය පාසල් අධ්‍යාපනයේ සංවර්ධනයක් සිදුවී ඇතත්, වතුකරයේ ජීවත්වන කම්කරු ජනතාවගේ දරුවන්ගේ අධ්‍යාපනයේ කඩා වැටීමක් සිදුවී ඇති බව පිළිගන්නේද?" කියලා අහපු ප්‍රශ්නයට ඔබතුමා උත්තරය හැටියට "නැත" කියලා කිව්වා. වතුකරය ආශ්‍රිතව ජීවත්වන පුද්ගලයන් විධියට මෙවැනි ප්‍රශ්නයක් තිබෙන බව අපි දකිනවා. ගරු ඇමතිතුමනි, පැහැදිලිවම වතුකරයේ අධ්‍යාපනයේ කඩා වැටීමක් තිබෙනවා.

උදාහරණයක් විධියට මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය ආසනයේ සිංහල පාසල්වල තිබෙන අධ්‍යාපන තත්ත්වයත්, වතුකරයේ පාසල්වල තිබෙන අධ්‍යාපන තත්ත්වයත් ගත්තාම එහි ලොකු වෙනසක් තිබෙනවා, ගරු ඇමතිතුමා. ශිෂ්‍යත්ව ප්‍රතිඵල ගත්තත්, සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල ගත්තත්, උසස් පෙළ

විභාගයේ ප්‍රතිඵල ගත්තත් විශාල පරතරයක් තිබෙනවා. ගරු ඇමතිතුමා, අපි 2014දී උපාධිධාරීන්ට රැකියා ලබාදෙද්දී, නාවලපිටිය ආසනයේ 400කට පත්වීම් දෙනකොට වතුකරයෙන් හිටියේ දෙන්නායි. ඒ කියන්නේ සිංහල 400කට පත්වීම් දෙනකොට වතුකරයේ හිටියේ දෙන්නායි. විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන දරුවන් ගත්තාමත් එහෙමයි. උසස් පෙළ, සාමාන්‍ය පෙළ සමත් වෙන දරුවන් ගත්තත් විශාල වෙනසක් තිබෙනවා. ගරු ඇමතිතුමාගේ අවධානයට මම මේ කාරණය යොමු කරන්නේ පළාත් සභාවෙන් මේ කාරණයට අවධානය යොමුවීම අඩු නිසායි. ගරු ඇමතිතුමා, වතුකරයේ අධ්‍යාපනය නගාසිටුවීම සඳහා යම් අධීක්ෂණ වැඩ පිළිවෙළක් ඔබතුමාට කරන්න පුළුවන්ද කියන කාරණය ගැනයි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන කාරණයේ සත්‍යයක් තිබෙනවා.

වතුකරය නියෝජනය කරමින් තමයි අපේ රාජ්‍ය ඇමතිතුමාත් ඇවිල්ලා ඉන්නේ. මේ පිළිබඳව අපි කරුණු සොයා බලා මේ වෙනකොට වතුකරයේ අලුතෙන් පාසල් දෙකක් ඉදිකරන්නත් බලාපොරොත්තු වනවා. ඔබතුමා දන්නවා, ගුරුවරුන්ගේ හිඟයට හේතුව තමයි ගුරු ව්‍යවස්ථාව අනුව ගුරුවරුන් බඳවා ගැනීමේදී ඒ ප්‍රදේශවලින් සුදුසුකම් ඇති අය නැතිවීම. ඒ නිසා තමයි අපි ගුරු සහායකයන් බඳවා ගත්තේ. අපි බලයට පැමිණි දවසේ ඉඳලාම ස්වේච්ඡා ගුරුවරුන් වශයෙන් හිටි අය සෑහෙන ප්‍රමාණයක් ගුරු සහායකයන් වශයෙන් බඳවා ගනු ලැබුවා. ඊට අමතරව මේ පාසල්වල තිබෙන ඉඩකඩ අඩුයි. ඒ නිසා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර වතුකරයේ සියලුම පාසල් සඳහා අඩුම ගණනේ වතුහිමියන්ගෙන් අක්කර දෙකක්වත් ගන්න බලාපොරොත්තු වනවා. දැන් ඒකටත් කැබිනට් අනුමැතිය ලැබිලා තිබෙන්නේ. දැන් ඒවා පවරා ගැනීම් කටයුතු කරනවා. මොකද, buildings හදන්න ඉඩ නැහැ. සමහර තැන්වල පොඩි ඉඩකඩක් තිබෙන්නේ. ඒ නිසා අක්කර දෙකක් බැගින් ලබාගැනීම සඳහා වූ කැබිනට් පත්‍රිකාව දැන් අනුමත වෙලා තිබෙන්නේ. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමා, විදේශීය ආධාර යටතේත්, ඒ වාගේම ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මඟිනුත් වතුකරයේ පාසල් නගාසිටුවීමට වැඩ පිළිවෙළ රාශියක් මේ වෙනකොට ක්‍රියාත්මක වෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(*மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே*)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ඇමතිතුමා, වතුකරයේ මේ ප්‍රශ්නය යටිතල පහසුකම්, ගුරුවරුන්ගේ හිඟය පිළිබඳ ප්‍රශ්නයක්ම නොවෙයි. උදාහරණයක් විධියට පාසලට දරුවා පැමිණීමේ ඉඳලාම බලන්න. ගරු ඇමතිතුමා, සතියේ දවස් පහෙන් ළමයා පාසලට එවන්නේ දවසයි නැත්නම් දෙකයි. ඒ නිසා මේ ප්‍රශ්නය දෙමව්පියන්ගේ ඉඳලාම ඔළුව හදන්න ඕනෑ ප්‍රශ්නයක්. ඒ වාගේම වතුකරයේ දරුවාගේ ඔළුවේ තිබෙන්නේ "අපි කොච්චර ඉගෙන ගත්තත් අපට ගෙදරක වැඩක් නැත්නම් කඩයක වැඩක් තමයි හම්බ වෙන්නේ; ආණ්ඩුවේ රස්සාවක් හම්බ වෙන්නේ නැහැ." කියන එකයි. එහෙම මානසික තත්ත්වයක් තමයි වතුකරයේ දරුවා තුළ තිබෙන්නේ. ඒ නිසා මේ දෙමව්පියන්ගේ, දරුවන්ගේ මානසිකත්වය වෙනස් කරලා, මේ ගැටලුවට වෙනම වැඩ පිළිවෙළක් හදන්න. පළාත් සභාවෙන් මේ කාරණය ඉටු වෙන්නේ නැහැ. මොකද, පළාත් සභාවට ප්‍රතිපාදන නැහැ; ශක්තියක් නැහැ.

ඔබතුමා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් හොඳ වැඩ කොටසක් කරන බව මම දැක්කා. ඒක මම අගය කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පාසල්වල ක්‍රීඩාව නහා සිටුවන්න ඔබතුමා ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. අපි ඒක බොහෝම අගය කරනවා. ඒක ඉතාම හොඳයි. ඒකට ප්‍රතිපාදන වෙන් කරගෙන තිබෙනවා. පාසලේ ක්‍රීඩාව හැදුවේ නැත්නම්, අපට රටේ ක්‍රීඩාව හදන්න බැහැ. ඒක හොඳ දෙයක්. මම ඒ වාගේම ඔබතුමාට කියන්නේ, වතුකරයේ ක්‍රීඩාව නහා සිටුවීම සඳහා වෙනම කමිටුවක් පත් කරලා මේ විෂය ගැන හොඳට හඳුනාගෙන ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලායි. කොම්පැනියකින් ඉඩම් කැල්ලක් අරගෙන, තව කට්ටියකගෙන් වෙන දෙයක් අරගෙන, එහෙම කරන්න කියනවා නොවෙයි ඇමතිතුමා. මේක ලොකු ප්‍රශ්නයක් ඇමතිතුමා. ඒ නිසා මේ ගැන හොයා බලන්න සුවිශේෂී කමිටුවක් පත් කරලා, මේ සඳහා ස්ථිරසාර වැඩ පිළිවෙළක් සකස් කරන්න කියන එක තමයි මගේ ඉල්ලීම, ගරු ඇමතිතුමා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ වෙලාවේ අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා ගරු සභාවේ හිටියා නම් අපි මේ ගැන මොන මොන ක්‍රියා මාර්ග ද ගත්තේ කියලා සවිස්තරාත්මකව කියාවි. වතුකරයේ අධ්‍යාපනය එක පැත්තකින් ගුණාත්මකව වර්ධනය කරන්න ඕනෑ; අනෙක් පැත්තෙන් භෞතික සම්පත්වලින් වර්ධනය කරන්න ඕනෑ. ඇත්තටම ගරු මන්ත්‍රීතුමනි, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ අපි විශාල භෞතික සම්පත් ප්‍රමාණයක් ඒ පාසල්වලට ලබා දුන්නු බව ඔබතුමා දන්නවා. ඔබතුමා කියනවා වාගේ විශේෂයෙන්ම සමහර පාසල්වලට විද්‍යාගාර තිබුණේ නැහැ. ඒවායේ විද්‍යාගාරයක් හදන්නත් ඉඩක් නැහැ. අපි ජංගම විද්‍යාගාර සෑහෙන්න ප්‍රමාණයක් දීලා තිබෙනවා. විද්‍යාගාරයක තිබිය යුතු සියලු උපකරණ සහිතවයි අපි ඒ ජංගම විද්‍යාගාර ලබා දුන්නේ. ඒ නිසා මේ වන විටත් සෑහෙන කොටසක් ආවරණය වෙලා තිබෙනවා. ගුරුවරුත් සෑහෙන ප්‍රමාණයක් බඳවාගෙන තිබෙනවා. ඔබතුමා කියනවා වාගේ අපි මේ ගැන මීටත් වඩා අවධානය යොමු කරන්නම්. ඔබතුමාට තවත් තොරතුරු ඕනෑ නම් පසුව ලබා දෙන්න පුළුවන්. අද මම උත්තර ගෙනාවේ මේ ප්‍රශ්නයට විතරයි. හැබැයි, අපි මේ වන විටත් වතුකරයේ පාසල් නහා සිටුවන්න විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. කලින් තිබුණාට සාපේක්ෂවයි මම මේ කියන්නේ. තව කටයුතු කරන්න තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(*மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே*)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ඇමතිතුමනි, මගේ තර්කය වතුකරයට වැඩියෙන් වැඩ කරලා තිබෙන්නේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ රජය ද, නැත්නම් ඔබතුමන්ලාගේ රජය ද කියන එක නොවෙයි, ගරු ඇමතිතුමා. මම කියන්නේ, කවුරු කළත්, මොන තරම් සල්ලි දුන්නත් ප්‍රශ්නයට තවම විසඳුමක් ලැබිලා නැහැ කියන එකයි. වතුකරයේ දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධ ප්‍රශ්නයට මේ ආණ්ඩු දෙකම විසඳුමක් ලබා දීලා නැහැ. අඩු ගණනේ ඔබතුමා මේ ඇමති ධුරය දරන කාලයේ හරි, එහෙම දෙයක් කළොත් ඔබතුමාගේ හොඳ කියන කොට තවත් ටිකක් අපට හොඳ කියන්න පුළුවන්. ඒ නිසා ඔබතුමාගේ කාලයේ හරි ඔබතුමාට පුළුවන් නම්, වතුකරයේ අධ්‍යාපනය සසම්බන්ධ ප්‍රශ්නයට විසඳුමක් ලබාදෙන්න. මම මේ පිළිබඳව අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා එක්කත් කථා කළා. එතුමා මේ දේවල් කරන්න උත්සාහ කරනවා. හැබැයි, ඒක එතුමාට ගෙනියන්න බැහැ කියන එක තමයි මට දැනුණේ. මම ඉස්සෙල්ලා එතුමා එක්ක කථා කරලා තමයි, මේ ප්‍රශ්නය ඔබතුමාට ඉදිරිපත් කළේ. එතුමාට ඒ විසඳුම නුවරඑළිය දිස්ත්‍රික්කයට දෙන්න පුළුවන් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මහනුවර දිස්ත්‍රික්කය ගත්තාම

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

වතුකරයේ ජනතාව විශාල ප්‍රමාණයක් ඉන්නවා. හැබැයි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතුකර පාසල් ගැන අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා බැලුවාට, මහනුවර දිස්ත්‍රික්කයේ වතුකර පාසල් ගැන බලන්න කෙනෙක් නැහැ. මාතලේ රත්තොට ප්‍රදේශය ගැන බලන්න කෙනෙක් නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා වතුකරයේ දරුවන්ට ලොකු අසාධාරණයක් සිද්ධ වෙනවා.

මගේ නම් ඉල්ලීම ගරු ඇමතිතුමනි, මේ පොඩි පොඩි දේ හදන්නේ නැතිව වතුකරයේ කම්කරුවාගේ ඔළුව හදන එකේ ඉඳලා, දරුවා ඉස්කෝලේ යවන එකේ ඉඳලා සියලු ප්‍රශ්න ගැන හොඳට හොයලා බලන්න කමිටුවක් පත් කරලා, ඒ සම්බන්ධයෙන් සුවිශේෂී වැඩසටහනක් සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර මෙය කරන්න කියන එකයි. ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය විශේෂ ප්‍රශ්නයක් නිසා අපේ සම්පූර්ණ සහයෝගය ඔබතුමාට දෙන්නම්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, මට පෙනෙන විධියට ඔබතුමාගේ විශේෂ අවධානය යොමු වුණේ පාසල් හැරයන දරුවන් ගැනයි. ඒක එක කාරණයක්. අනෙක් වැඩ ටික කෙරීගෙන යනවා. ඕනෑ නම් ඔබතුමා සොයලා බලන්න. සංඛ්‍යා ලේඛන අනුව ගත්තත් මේ අවුරුදු තුනහමාර ඇතුළත අපි අලුතෙන් toilets, විද්‍යාගාර, පුස්තකාල, පොත් ලබාදීම් වැනි විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ ළමයි පාසල තුළට ගෙන්වා ගැනීමේ වැඩ පිළිවෙළ මන්දගාමීව තිබෙන්නේ වතුකරයේයි. ඔබතුමාගෙනුත් මම ඉල්ලා සිටිනවා, තමුන්නාන්සේ සම්බන්ධ වන දිස්ත්‍රික් සංවර්ධන කමිටුවලදී, -මම අපේ ඇමතිතුමන්ලාට, මන්ත්‍රීතුමන්ලාටත් කියන්නම්- ප්‍රාදේශීය සංවර්ධන කමිටුවලදී ඒ ඒ ප්‍රදේශවලිනුත් පොඩි වැඩ පිළිවෙළක් හදන්නට කියලා. මොකද, ඒ කටයුත්ත අපට මෙහේ ඉඳලාම කරන්නට බැරි වෙයි. පළාත් සභා වෙන්න පුළුවන්, ප්‍රාදේශීය සභා වෙන්න පුළුවන්, -ඔබතුමන්ලාගේත් පළාත් පාලන ආයතන තිබෙනවානේ- ඒවායිනුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. එතැනින් තමයි ළමයින්ව පාසලට යොමු කරන්නට ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, අපි දුප්පත්ම ළමයින්ට දෙන ශිෂ්‍යත්ව මුදලත් වැඩි කළා. අපි රුපියල් 500 ශිෂ්‍යත්ව මුදල රුපියල් 750 දක්වා වැඩි කළා. අපි ඉදිරියේදී ශිෂ්‍යත්වය ලබා දෙන ප්‍රමාණය වැඩි කිරීමටත් බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා, අවසාන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ඇමතිතුමනි, මම නැවතත් ඔබතුමාගේ අවධානයට යොමු කරවන්නේ, මේ කාරණය යටිතල පහසුකම් සම්බන්ධයෙන් හෝ ඒ සඳහා සල්ලි වෙන් කිරීම ගැන නොවන බවයි. ගරු ඇමතිතුමනි, පොදුවේ, සමස්තයක් හැටියට වතුකරයේ අධ්‍යාපනය කඩාගෙන වැටිලා. ඒක ඔබතුමාත් පිළිගන්නවා; මමත් පිළිගන්නවා. ගරු ඇමතිතුමනි, එම නිසා මම කියන්නේ මේ සඳහා ජාතික වැඩ පිළිවෙළක් හදන්න කියන එකයි. ඔබතුමා labs දෙන බව පිළිගන්නවා. ඔබතුමා ගොඩනැඟිලි හදන බව පිළිගන්නවා. මොන තරම් භෞතික සම්පත් දුන්නත් වැඩක් නැහැ ගරු ඇමතිතුමනි, අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් නැත්නම්.

ගරු ඇමතිතුමනි, එම නිසා මම ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලන්නේ, මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරලා විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරලා, මේ පිළිබඳව සොයා බලා, මේ සඳහා වැඩ පිළිවෙළක් හදන්න කියන එකයි. ඒක අපේ රජය කාලයේ සිද්ධ වුණේත් නැහැ. ඒකයි මම ඔබතුමාට යෝජනා කළේ මේ ගැන විශේෂ අවධානයක් ඔබතුමා යොමු කරන්න කියලා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

වතුකරයේ පාසල් නහා සිටුවන්නට පුළුවන්. ඒ සඳහා එක පැත්තකින් ගුණාත්මකව වර්ධනය කරන්නට ඕනෑ. ඒ සඳහා අවශ්‍ය ගුරු පුහුණුව අපි ආරම්භ කරලා තිබෙනවා; ඒ ප්‍රදේශවල විදුහල්පති පුහුණුව අපි ආරම්භ කරලා තිබෙනවා; දේශීය නොවෙයි විදේශීය පුහුණුවත් අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම භෞතික සම්පත් ලබා දීම ආරම්භ කරලා තිබෙනවා. ගුණාත්මක වර්ධනය සහ භෞතික සම්පත් ලබා දීම තමයි ප්‍රධාන දේ. ඒ වාගේම අනෙක් වැදගත් කාරණය පාසල තුළට ළමයින් යොමු කරවීමයි. ඇත්ත වශයෙන්ම මේ පාසල් තුළට ළමයි එන්නේ නැත්නම් අපි සියලුදෙනාම එකතුවෙලා ඒ යොමු කිරීම කරන්නට ඕනෑ. ඒක අපට තනියම කරන්නට බැහැ.

ඒ සඳහා දැනටත් වැඩ පිළිවෙළක් හදලායි තිබෙන්නේ. ඔබතුමා කියනවා නම් අපි එය තවදුරටත් ශක්තිමත් කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 8 -395/'18- (2), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා දැනට අවුරුදු 2ක් පමණ වෙනවා. හැමදාම කල් ගන්නවා. අගමැතිතුමා පිළිතුරු දෙන්නේ නැත්නම් සභානායකතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමා මාස තුනක කාලයක් ඉල්ලා සිටියා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා : පෞද්ගලික කාර්ය මණ්ඩලයට වෙන්කළ නිල වාහන

தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புக்கள் அமைச்சர்: பிரத்தியேகப் பதவியணிக்கு ஒதுக்கப்பட்ட உத்தியோகபூர்வ வாகனங்கள்

MINISTER OF TELECOMMUNICATION, DIGITAL INFRASTRUCTURE AND FOREIGN EMPLOYMENT: OFFICIAL VEHICLES ALLOCATED TO PRIVATE STAFF

456/'18

**9. ගරු බිමල් රත්නායක මහතා**
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියා පදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புக்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புக்கள் அமைச்சரின் பிரத்தியேக பதவியணிக்கு இணைக்கப்பட்டுள்ள உத்தியோக பூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஒவ்வோர் உத்தியோத்தரதும் பெயர், பதவி, ஒதுக்கப் பட்டுள்ள வாகனத்தின் வகை, பதிவிலக்கம் மற்றும் அவ்விதம் ஒதுக்குவதற்கு அங்கீகாரம் வழங்கியது யார் என்பதை வெவ்வேறாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Telecommunication, Digital Infrastructure and Foreign Employment:

(a) Will he inform this House separately the name and designation of each officer who is attached to the private staff of the Minister of Telecommunication, Digital Infrastructure and Foreign Employment and has been allocated a vehicle, along with details on the type of vehicle allocated to them, registration number and the name of the officer who authorized such allocation of a vehicle?

(b) If not, why?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புகள் அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication, Digital Infrastructure and Foreign Employment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ)

| නිලධාරියාගේ නම | තනතුර | වෙන්කර ඇති වාහන වර්ගය | ලියාපදිංචි අංකය | වෙන්කිරීම සඳහා අනුමැතිය ලබාදුන් අය |
|---|---|---|---|---|
| අස්රා රියල්ඩීන් මිය | පෞද්ගලික ලේකම් | ටොයෝටා යාරිස් | KR - 1491 | වසන්ත දේශප්‍රිය මහතා හිටපු අමාත්‍යාංශ ලේකම් |
| ආර්.එම්.ඒ. ජයලත් මයා | මාධ්‍ය ලේකම් | මිට්සුබිෂි L 200 ඩබල් කැබ් | PG - 9570 | වසන්ත දේශප්‍රිය මහතා හිටපු අමාත්‍යාංශ ලේකම් |
| ජී.එස්.පී. පෙරේරා මයා | සම්බන්ධීකරණ ලේකම් | මිට්සුබිෂි L 200 ඩබල් කැබ් | PH - 1225 | වසන්ත දේශප්‍රිය මහතා හිටපු අමාත්‍යාංශ ලේකම් |
| ජී.කේ.ඩී.ඒ.අයි. සිරිසේන මයා | සම්බන්ධීකරණ ලේකම් | ටොයෝටා හයිලක්ස් ඩබල් කැබ් | PD - 8850 | වසන්ත දේශප්‍රිය මහතා හිටපු අමාත්‍යාංශ ලේකම් |
| එච්.ඩී.ජේ. සේනුල මයා | මහජන සම්බන්ධතා නිලධාරි | මිට්සුබිෂි L 200 ඩබල් කැබ් | PH - 1234 | වසන්ත දේශප්‍රිය මහතා හිටපු අමාත්‍යාංශ ලේකම් |

(ආ) පැන නොනඟී.

**ගරු බිමල් රත්නායක මහතා**
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා පිළිතුර සභාගත කළ නිසා මට මේ ප්‍රශ්නයට විතරක් පිළිතුර කිව්වා නම් ප්‍රමාණවත්. ඔබතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සිටින නිලධාරීන් ප්‍රමාණය කොපමණද?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ නම්, විස්තර සියල්ලම මා ළඟ තිබෙනවා. ඒවා මා දෙන්නම්. පෞද්ගලික ලේකම් එක්කෙනායි, මාධ්‍ය ලේකම් එක්කෙනායි, සම්බන්ධීකරණ ලේකම්වරු දෙදෙනායි, මහජන සම්බන්ධතා නිලධාරීන් එක්කෙනායි ඉන්නේ. ඒ 5දෙනා තමයි ඉන්නේ. ඔබතුමා එක වතාවක් මෙවැනිම ප්‍රශ්නයක් ඇහුවා. පවුලේ කිසිම කෙනෙක් කාර්ය මණ්ඩලයේ නැහැ. පවුලේ ඥාතියකුගේ නමක් සඳහන් කරලා නැහැ. නිලධාරීන් සියලුදෙනාම එහි සේවය කරන කාර්ය මණ්ඩලයේ නිලධාරීන්. ඒ නම් ටික ඔබතුමාට දෙන්න පුළුවන්. වාහන ප්‍රශ්නයක් මතු වුණු දවසක ඔබතුමා මෙවැනිම ප්‍රශ්නයක් ඇහුවා. ඇමතිවරයකුට වෙන්කර තිබෙන වාහනයක් කිසිම නිලධාරියකු පාවිච්චි කරන්නේත් නැහැ. ඔවුන් පාවිච්චි කරන්නේ ලේකම්තුමා අනුමත කරපු වාහනයි. ඒ බව වග කීමෙන් කියන්න පුළුවන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, ඔබතුමාගේ කාර්ය මණ්ඩලයේ 5දෙනායි ඉන්නේ කියලා. 5දෙනාද, 15දෙනකුද?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඔබතුමා වාහන ගැන නේ අහලා තිබෙන්නේ. අහලා තිබෙන ප්‍රශ්නයට අදාළ විස්තර නේ මා කියන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
වාහන භාවිත කරන අය 5දෙනායි ඉන්නේ කියලාද ඔබතුමා කියන්නේ?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඔව්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඇමතුමාගේ පැහැදිලි කිරීමේදී එතුමා කිව්වා, එතුමාගේ කාර්ය මණ්ඩලයේ ඥාතීන් නැහැයි කියලා. නමුත් 2018 ඔක්තෝබර් 02වන දා "ඩේලි මිරර්" පුවත් පත වාර්තා කරනවා, "Over 75% ministers' secretaries are family members..." කියලා. අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලවලින් හැදුණු සංගමයක් තිබෙනවා. ඒ සංගමයේ ඉන්න ප්‍රධානියෙක් තමයි මේ කාරණය කියන්නේ. දැනට පාර්ලිමේන්තුවේ සහ පළාත් සභා සියල්ලේම ඇමතිවරුන්ගෙන් සියයට 75කගේ පමණ පෞද්ගලික කාර්ය මණ්ඩලවල ඉන්නේ ඥාතීන් කියලායි සඳහන් කර තිබෙන්නේ.

එතුමා කියන විධියට එතුමා ඒ සියයට 25ට අයිති කෙනෙක්. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සියයට 75ක්ම කාර්ය මණ්ඩලවලට දාගෙන තිබෙන්නේ පෞද්ගලික ඥාතීන්. පෞද්ගලික හිතවතුන් සහ ඥාතීන් කාර්ය මණ්ඩලවලට පත්කර ගන්න එක සීමා කරන චක්‍රලේඛයක් ජනාධිපතිවරයා විසින් 1994දී නිකුත් කරලා තිබෙනවා. මොකද, එතකොට එහෙම අය පත්කර ගත්තාම ඒ අයට උපදෙස් දෙන්න වෙන්නේ නැති බව ඔබතුමා දන්නවා. සමහර වැදගත් අමාත්‍යාංශ තිබෙනවා, ඒ අමාත්‍යාංශ පාලනය කරන්නේ අම්මායි, පුතායි. තාත්තා වෙන දේවල් කරනවා. තාත්තා ඇමති; අම්මායි, පුතායි තමයි අමාත්‍යාංශය පාලනය කරන්නේ. ඒ වාගේ අමාත්‍යාංශ තිබෙනවා. ඒ නිසා අපි සභානායකතුමාගෙන් මේ ඉල්ලීම කරනවා. එතුමාගෙන් මේ ඉල්ලීම කරලා වැඩක් වෙයිද දන්නේ නැහැ. මම ඔබතුමාගේ තනතුරෙන් තමයි මේ ඉල්ලීම කරන්නේ, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි. මේ තත්ත්වය සැලකිල්ලට අරගෙන, අඩු ගණනේ පෞද්ගලික හිතවතුන් සහ ඥාතීන් කාර්ය මණ්ඩලවලට පුරවා ගන්නේ නැති වන විධියට, 1994 චක්‍රලේඛයවත් බලාත්මක කරන්න කියලා අපි ආණ්ඩුවෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ඒ ප්‍රශ්නය අදාළ වෙන්නේ නැහැ.

## මත්පැන් හා දුම් පානය කිරීමේ දර්ශන විකාශය: වැළැක්වීම

மதுபானம் மற்றும் புகை பிடித்தல் காட்சிகளை ஒளிபரப்புதல்: தவிர்த்தல்

TELECASTING VISUALS OF DRINKING ALCOHOL OR SMOKING: PROHIBITION

476/'18

**10. ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (3):

(අ) 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතට අනුව මත්පැන් හා දුම් පානය කිරීමේ දර්ශන ඇතුළත් ටෙලිනාට්‍ය, චිත්‍රපට හෝ දැන්වීම් ප්‍රචාරය තහනම් බව එතුමා දන්නේද?

(ආ) (i) එසේ නම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් පාලනය කෙරෙන ස්වාධීන රූපවාහිනී නාලිකාව 2017.02.11 වැනි දින ප.ව. 7.30ත් - 8.00ත් අතර විකාශය කළ "ස්වේත ගංතීර" ටෙලි නාට්‍යයේ ජවනිකාවක, නිළියක දුම් පානය කරන අයුරු ඉතා පැහැදිලි ලෙස ප්‍රදර්ශනය කළ බවත්;

(ii) විශේෂයෙන් කාන්තාවක් දුම් පානය කරන දර්ශන විකාශය කිරීම හේතුවෙන් දුම් පානය සඳහා උත්තේජනයක් ඇති විය හැකි බවත්;

(iii) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක විධිවිධාන රජයේ ජනමාධ්‍ය ආයතනයක් විසින්ම කඩ කර ඇති බවත්;

එතුමා පිළිගන්නේද?

(ඇ) එම විකාශය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර මින් ඉදිරියට එවැනි සිදුවීම් වැළැක්වීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2006 ஆம் ஆண்டின் 27 ஆம் இலக்க புகையிலை மற்றும் மதுசாரம் தொடர்பான தேசிய அதிகாரசபைச் சட்டத்தின்படி மதுபானம் மற்றும் புகை பிடித்தல் காட்சிகளைக்கொண்ட தொலைக்காட்சி நாடகங்கள், திரைப்படங்கள் அல்லது விளம்பரப் பிரசாரங்கள் தடைசெய்யப்பட்டுள்ளன என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) ஆமெனில், வெகுசன ஊடக அமைச்சினால் நிருவகிக்கப்படும் சுயாதீன தொலைக்காட்சி அலைவரிசையில் 2017.02.11 ஆம் திகதி பி.ப. 7.30க்கும் 8.00க்கும் இடையில் ஒளிபரப்பப்பட்ட "சுவேத்த கங்தீர" தொலைக்காட்சி நாடகத்தின் ஒரு காட்சியில் ஒரு நடிகை புகைபிடிப்பது தெளிவாகக் காட்சிப்படுத்தப்பட்டது என்பதையும்;

(ii) குறிப்பாக, ஒரு பெண் புகைப்பிடிக்கின்ற காட்சி ஒளிபரப்பப்படுவதன் காரணமாக இது புகை பிடித்தலுக்கு ஊக்குவிப்பாக அமையலாம் என்பதையும்;

(iii) பாராளுமன்றத்தினால் நிறைவேற்றப்பட்ட சட்ட ஏற்பாடுகள் அரச வெகுசன ஊடக நிறுவன மொன்றினால் மீறப்பட்டுள்ளது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) இந்த ஒளிபரப்பு தொடர்பாக முறைசார்ந்த விசாரணை யொன்றை நடாத்தி இனிமேல் இவ்வாறான சம்பவங்களைத் தவிர்க்க நடவடிக்கை மேற்கொள் வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

askd the Minister of Finance and Mass Media:

(a) Is he aware that telecasting teledramas, films or advertisements with visuals of drinking alcohol or smoking is prohibited in terms of National Authority on Tobacco and Alcohol Act, No. 27 of 2006?

(b) Will he admit that-

(i) if so, on episode of the "Swetha Gantheera" teledrama telecast on Independent Television Network controlled by the Ministry of Mass Media between 7.30 p.m. and 8.00 p.m. on 11.02.2017 showed very clearly an actress was smoking;

(ii) such scenes, specially scenes of women smoking might be a stimulation for smoking; and

(iii) government controlled media institution has violated the provisions of an Act passed by Parliament?

(c) Will he inform this House whether a formal investigation would be conducted on that episode of the teledrama and steps taken to prevent such things from happening in future?

(d) If not, why?

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)

The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) අදාළ නාට්‍යයේ තත්පර 28ක කාලයක් තුළ අවස්ථා දෙකකදී මානසික පීඩනයට පත් තරුණියක දුම් පානය කරන දර්ශනයක් පෙන්වීම මඟින් අදාළ චරිතයේ ස්වභාවය මූර්තිමත් කිරීමට අපේක්ෂා කර ඇත. එසේ වුවද, දුම් පානය කිරීමේ ආදීනව දැක්වෙන වගන්තිය ඒ සමඟ ප්‍රචාරය කර ඇත.

(ii) 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ උපදෙස් දී ඇති පරිදි, නාටා අධිකාරිය (NATA) විසින් සපයා ඇති වගන්තිය අදාළ දර්ශනය විකාශය වන කාලය තුළ තිරය මත ප්‍රදර්ශනය කරනු ලැබීය.

(iii) කඩකර නොමැත.

අදාළ දර්ශනය තුළ දුම්වැටි පානයේ අහිතකර බවට වූ වාක්‍ය ප්‍රදර්ශනය කර ඇත.

(ඇ) අදාළ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ විධිවිධානවලට අනුව ක්‍රියා කරනු ඇත.

(ඈ) අදාළ නොවේ.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**

(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)

(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යටතේ, මෙවැනි දර්ශනයක් රූපවාහිනියක හෝ වෙනත් ජනමාධ්‍යයක ප්‍රදර්ශනය කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මෙම පනතේ 35වැනි වගන්තියේ 4වැනි උපවගන්තියේ "ඉ" අනුවගන්තිය බලන්න. එහි පැහැදිලිවම ඒ කරුණ තිබෙනවා. එම පනතේ එහෙම තිබියදී, ආණ්ඩුවේ රූපවාහිනී නාළිකාවකින් මෙවැන්නක් ප්‍රදර්ශනය කිරීම සාධාරණද කියලායි මම ඇමතිතුමාගෙන් අහන්නේ.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**

(மாண்புமிகு லசந்த அலகியவன்ன)

(The Hon. Lasantha Alagiyawanna)

ගරු මන්ත්‍රීතුමනි, පනතේ තිබෙන්නේ එවැනි දේ ප්‍රදර්ශනය කරනවා නම්, එය ප්‍රදර්ශනය කරන අවස්ථාවේදීම ඒ තිරය මත එහි තිබෙන අහිතකරතාව පිළිබඳව දැන්වීමක් පළ කළ යුතුයි කියලායි. ඒ අනුව, ඒ දැන්වීම් පළ කර තිබෙනවා. ඔබතුමා කියන එක සත්‍යයක්. විශේෂයෙන්ම මෙවැනි දේ රාජ්‍ය නාළිකාවල ප්‍රදර්ශනය කිරීම අනිවාර්යයෙන්ම නතර කළ යුතුයි. මේ වනවිටත් රාජ්‍ය නාළිකාවල ආයතන ප්‍රධානීන් සහ නාටා ආයතනයේ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව කටයුතු කරන නිලධාරීන් සාකච්ඡාවට දෙකක් පවත්වා, මෙවැනි තත්ත්ව ජාතික නාළිකාවල අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. සාපේක්ෂව බලනකොට මත්ද්‍රව්‍ය පිළිබඳ ප්‍රචාරණයේ යම්කිසි ආකාරයක අඩුවීමක් තිබුණත්, අද සියලු නාළිකාවල විකාශනය වන නාට්‍යවලින් දුම්වැටි සහ මද්‍යසාරය පිළිබඳව යම් යම් දර්ශන ඉදිරිපත් වෙන බව අපි පිළිගන්නවා. එය අවම කළ යුතුයි. අපි ඒක පිළිගන්නවා.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**

(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)

(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඇත්තටම මේ දර්ශනයේ පෙනී සිටියේ සමනලියක්. ඊස්ට්මන් වර්ණ, දේදුනු වර්ණ, පාට පාට දේදුනු මැද්දෙන් පියඹා යන සමනලියක්. යහපත් සමාජයක් වෙනුවෙන් පෙනී සිටිනවාය කියලා, යහපත් සමාජ දර්ශන මේ රටේ ප්‍රදර්ශනය කරලා, කංසා උරන දර්ශනයකයි ඇය පෙනී සිටියේ. යහපත් සමාජයක් හදන්න එවැනි දර්ශනවලින් බැහැ කියලා ඔබතුමා පිළිගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**

(மாண்புமிகு லசந்த அலகியவன்ன)

(The Hon. Lasantha Alagiyawanna)

බොහොම පැහැදිලිව මත්ද්‍රව්‍ය සහ දුම් පානය පිළිබඳව පාලනයක් ඇති විය යුතුයි. විශේෂයෙන්ම රාජ්‍ය නාළිකා එයට ආදර්ශය ලබා දිය යුතුයි කියන එක පිළිගන්නවා.

## ඌව පළාත් සභාවේ ආයුර්වේද රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථාන: විස්තර

**ஊவா மாகாணத்திலுள்ள ஆயுர்வேத வைத்திய சாலைகள் மற்றும் மருத்துவ நிலையங்கள்: விபரம்**

AYURVEDA HOSPITALS AND MEDICAL CENTRES IN UVA PROVINCIAL COUNCIL: DETAILS

494/'18

**11. ගරු චමින්ද විජේසිරි මහතා**

(மாண்புமிகு சமிந்த விஜேசிறி)

(The Hon. Chaminda Wijesiri)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

[ගරු චමින්ද විජේසිරි මහතා]

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන ආයුර්වේද රෝහල් හා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල නම් කවරේද;

(iii) දැනට එම රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව පළාතේ ආයුර්වේද රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල රැකියා ලබාදී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) එසේ රැකියා ලබා දුන් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

මාකාණ සපෙකළ, උළුෙරාට්චි මට්රුම් විළෙයාට්ටුත් තුරෙ අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) ஊவா மாகாண சபையின் கீழ் நிர்வகிக்கப்படும் ஆயுர்வேத வைத்தியசாலைகள் மற்றும் ஆயுர் வேத மருத்துவ நிலையங்களின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனையென்பதையும்;

(ii) அந்த வைத்தியாசலைகள் மற்றும் மருத்துவ நிலையங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) தற்போது அந்த வைத்தியசாலைகள் மற்றும் மருத்துவ நிலையங்களில் பணிபுரியும் மொத்த ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iv) ஊவா மாகாணசபையின் தற்போதைய முதலமைச்சர் அந்தப் பதவிக்கு நியமனம் பெற்றதன் பின்னர் மாகாணத்திலுள்ள ஆயுர் வேத வைத்தியசாலைகள் மற்றும் மருத்துவ நிலையங்களுக்கு தொழில்வாய்ப்புக்கள் வழங்கப் பட்டவர்களின் எண்ணிக்கை எத்தனையென் பதையும்;

(v) அவ்வாறு தொழில் வாய்ப்புக்கள் வழங்கப் பட்டவர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் பதவிகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House -

(i) separately the number of Ayurveda Hospitals and Ayurveda Medical Centres which are run under the Uva Provincial Council;

(ii) the names of the aforementioned hospitals and medical centres;

(iii) separately the number of employees working in the aforementioned hospitals and medical centres at present;

(iv) the number of jobs given to people at Ayurveda hospitals and Medical Centres in the Province after the present Chief Minister of the Uva Province was appointed to the post of Chief Minister; and

(v) the names, addresses and designations of persons who were given jobs in the above manner?

(b) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන ආයුර්වේද රෝහල් සංඛ්‍යාව 07කි.

ඌව පළාත් සභාව යටතේ පාලනය වන ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව 42කි.

(ii) එම රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල නම් ඇමුණුම් අංක 01 මඟින් දක්වා ඇත.

(iii) දැනට එම රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් ඇමුණුම් අංක 02 i-xi මඟින් දක්වා ඇත. එහි පිටු 11ක් තිබෙනවා.

(iv) වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව පළාතේ ආයුර්වේද රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල රැකියා ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව 42කි.

(v) එසේ රැකියා ලබා දුන් පුද්ගලයන්ගේ නම් ඇමුණුම් අංක 03 හි (i) මඟින්ද, ලිපිනයන් ඇමුණුම් අංක 03හි (v) මඟින්ද, තනතුරු ඇමුණුම් අංක 03හි (ii ) මඟින්ද දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, අදාළ ප්‍රශ්නය දැන් අහන්නම්. බටහිර වෛද්‍ය ක්‍රමය එන්න කලින් අපේ රට තුළ පැවති පැරණි වෙද ක්‍රමයක් තමයි ආයුර්වේද වෙදකම. මේ වෙදකම කෙමෙන් කෙමෙන් -ටිකෙන් ටික- අපෙන් ඈත් වෙනවා. මේ ඇත්වීම පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. රටේ තිබෙන විවිධ රෝගවලට ප්‍රතිකාර දෙන්න පුළුවන් හොඳ ක්‍රම තමයි ආයුර්වේද වෙදකම තුළ තිබෙන්නේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

උදාහරණයක් ගත්තොත්, මෑතක සිට සෑදී තිබෙන "සභාග ආණ්ඩු" කියන අදහසත් එක්තරා රෝගයක්. අපි කියන විධියට ඒකත් සමහර අයට වයර් මාරු වුණාම හැදෙන මානසික රෝගයක්. ඒ මානසික රෝගවලට ආයුර්වේද වෛද්‍ය විද්‍යාව අනුව "ඉසකුඩිච්චි" තමයි සාම්ප්‍රදායිකව දාන්නේ. ඒවා තිබුණා නම්, සමහර කණ්ඩායම්වලට ඔය වාගේ සිහින පෙනෙන්නේ නැහැ වාගේම, ඔය වාගේ ලෙඩ හැදෙන්නේත් නැහැ කියලා මම හිතනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, මම අහන්නේ මේ වෛද්‍ය ක්‍රමය ඇත්වෙලා යෑම පිළිබඳ ප්‍රශ්නයයි. මම මේ වටිනා කියන ප්‍රශ්නය ඇහුවාට, ඔබතුමියට අමාත්‍යාංශය හැටියට උත්තරයක් දෙන්න බැහැ. "පළාත් පාලන අමාත්‍යාංශය රේඛීය අමාත්‍යාංශය හැටියට තිබුණාට, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාවට තිබෙන බලතලත් එක්ක සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේ ගැන තීන්දුවක් ගන්න ඕනෑ" කියන එක තමයි ඔබතුමිය දෙන උත්තරය. හැබැයි, අපි සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේ ප්‍රශ්නය ඇහුවත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් දෙන උත්තරය තමයි, මේක රේඛීය අමාත්‍යාංශයෙන් විමධ්‍යගත වුණු විෂයයක් කියන එක.

මගේ අසුන ළඟ සිටින රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියත් තවත් අපේ මන්ත්‍රීවරුත් මේ කරුණ කිව්වා.

අපි දිගින් දිගටම මේ පාර්ලිමේන්තුව තුළ වටිනා කියන දේවල් යෝජනා කළත්, ඔය කියන බැඳීමත් එක්ක මෙයටට නිශ්චිත පිළිතුරක් වාගේම ඒ සඳහා ගන්නා වැඩ පිළිවෙළක් නැහැ. ඔබතුමියත් මේක දකිනවා නම්, අමාත්‍යාංශයේ රාජ්‍ය ඇමතිවරිය හැටියට මේ කියන ක්‍රියාදාමය තුළ ඔබතුමිය ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද කියලා මා ඔබතුමියගෙන් අහන්න කැමැතියි. මොකද, අපේ කාලය, ඒ වාගේම අපේ රටේ ධනය තමයි මේ සඳහා වැය වෙන්නේ. ඒ වාගේම මේ කියන වැඩ පිළිවෙළ සක්‍රීයව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් සෘජු ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. එම නිසා මේක පළාත් සභාවට තල්ලු කරලා දමන්නේ නැතුව ඔබතුමිය සහ ඔබතුමියගේ අමාත්‍යාංශය මේ සඳහා අමාත්‍යාංශ මට්ටමින් ගන්නා වැඩ පිළිවෙළ මොකක්ද? වග කිව යුතු රජයක් හැටියට දැන්වත් අමාත්‍යාංශ මට්ටමින් මේක හදන්න යම් කිසි වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභාවේ රැකියා ලබා දීම ගැන තමයි ඔබතුමා කථා කළේ. තනි ආයතනයක් විධියට ඒක එම ආයතනය විසින් ගන්නා තීරණයක්. මගේ පෞද්ගලික මතය නම්, විශේෂයෙන්ම අපේ රට ඉතා කුඩා රටක්. ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවකින් පාලනය කරන්න පුළුවන් රටක්. එම නිසා පළාත් සභා ක්‍රමය අවශ්‍ය නැති රටක් විධියටයි මම නම් දකින්නේ. එම නිසා දහතුන්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන තෙක් එම ආයතනය තනි ආයතනයක් විධියට මේ විධියේ තීන්දු තීරණ ගන්නවා. ඒ සඳහා නීතියක් සම්මත කරලා තිබෙනවා. එම ආයතනය ඒ විධියට වැඩ කරනවා. එහෙම නම් අපි පළාත් සභා ක්‍රමය අවසන් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවාද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නයට ලබාදුන් පිළිතුර පිළිබඳව මම සෑහීමකට පත් වෙන්නේ නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමිය මගේ ප්‍රශ්නය හොඳින් කියවන්න. මම අහන්නේ උෂ්ණ පළාත තුළ තිබෙන ආයුර්වේද රෝහල් ගණන සහ එම රෝහල් පිළිබඳවයි. මම අහන්නට උත්සාහ කරන්නේ මෙයයි. විශේෂයෙන්ම ආයුර්වේද රෝහල් 7ක් තිබෙනවා කිව්වා. විශේෂයෙන්ම එම ආයුර්වේද රෝහල්වලින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න රට තුළ ජනතාව නැතත් විදේශීය සංචාරකයින් විශාල පිරිසක් එනවා. උදාහරණයක් විධියට ඇල්ල ප්‍රදේශය ගත්තොත්, විදේශීය සංචාරකයෝ විශාල වශයෙන් එනවා. හැබැයි, එම විදේශිකයන්ට ප්‍රමාණවත් සේවාවක් සපයන්න, එහෙම නැත්නම් ඔවුන්ට අවශ්‍ය සාත්තු සේවය සපයන්න කාර්ය මණ්ඩල පහසුකම්, වෛද්‍යවරුන් ප්‍රමාණවත් නැහැ. හැබැයි, මේ සම්බන්ධයෙන් ගන්නා වැඩ පිළිවෙළ මොකක්ද කියලා මම ඔබතුමියගෙන් ඇහුවොත්, ඒක අදාළ වෙන්නේ පළාත් සභාවට කියලා කියන නිසාම තමයි එම කාරණය පැහැදිලි කර ගැනීම සඳහා මා එම ප්‍රශ්නය ඇහුවේ.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, විශේෂයෙන්ම බල්ලකෙටුව ආයුර්වේද රෝහලට එන රෝගීන්ට අවශ්‍ය ජලය සැපයීම සඳහාවත් වැඩ පිළිවෙළක් නැහැ. එම රෝගීන්ට ඇති වී තිබෙන අපහසුතාව මහ හරවා ගැනීම සඳහා ඔබතුමියගේ අමාත්‍යාංශය විසින් පළාත් සභාවේ සෞඛ්‍ය ආමාත්‍යාංශයට කුමන ආකාරයේ යෝජනාවක් කරන්නටද සූදානම්?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමනි, ජල සැපයුම කියන එක මූලික අවශ්‍යතාවක් ඉටු කිරීමක්. පළාත් සභාවට අවශ්‍යතාවක් තිබෙනවා නම් එම රෝහලේ අලුත්වැඩියා කටයුතු, ජල සම්පාදන කටයුතු යන සියල්ලට අමාත්‍යාංශය විධියට උදව් කිරීමට අපට පුළුවන්කම තිබෙනවා. මේ සම්බන්ධයෙන් සොයා බලන්නය කියා අපි අමාත්‍යාංශයට උපදෙස් දෙන්නම්. ඒ වාගේම පළාත් සභාව විසින් එම අවශ්‍යතාව සඳහන් කර ඉල්ලීමක් කරන්න කියන එකයි මට දැනුම් දෙන්න තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි. බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 12 - 520/'18- (2), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 13 - 530/'18- (2), ගරු වාසුදේව නානායක්කාර මහතා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය අසන දෙවැනි වාරය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අවසාන වාරය.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පුත්තලම දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය පාසල් : ගුරු හිඟය
## புத்தளம் மாவட்டத் தமிழ் மொழிப் பாடசாலைகள்: ஆசிரியர் பற்றாக்குறை
## TAMIL MEDIUM SCHOOLS IN PUTTALAM DISTRICT: SHORTAGE OF TEACHERS

555/'18

**14. ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) දැනට එක් එක් පාසලේ සේවයේ නියුතු ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) පුත්තලම දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය පාසල්වල උග්‍ර ගුරු හිඟයක් පවතින බව පිළිගන්නේද;

(v) එසේ නම්, එම ගුරු හිඟය අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்திலுள்ள தமிழ் மொழிப் பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு;

(ii) மேற்படி பாடசாலைகளின் பெயர்கள் யாவை;

(iii) தற்போது ஒவ்வொரு பாடசாலையிலும் சேவை யாற்றி வரும் ஆசிரியர்களின் எண்ணிக்கை யாது;

(iv) புத்தளம் மாவட்டத்திலுள்ள தமிழ் மொழிப் பாடசாலைகளில் பாரிய ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்றது என்பதை ஏற்றுக்கொள்வாரா;

(v) ஆமெனில், மேற்படி ஆசிரியர் பற்றாக்குறை யைக் குறைப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of Tamil medium schools in Puttalam District;

(ii) the names of those schools;

(iii) the number of teachers serving in each school at present;

(iv) whether it is admitted that there is a severe shortage of teachers in Tamil medium schools in Puttalam District; and

(v) if so, the measures that will be taken by the ministry to minimize the teacher shortage ?

(b) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) පාසල් සංඛ්‍යාව 82කි.

(ii) ඇමුණුම 1 බලන්න.

(iii) ඇමුණුම 1 බලන්න. ඇමුණුම **සභාගත*** කරමි.

(iv) මේ වන විට පුත්තලම දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය ජාතික පාසල්වල ගුරු පුරප්පාඩු නොමැති අතර, පළාත් පාසල්වල පමණක් ගුරු පුරප්පාඩු ඇත.

(v) ඔව්.

වර්තමානයේ පළාත් පාසල්වල ඇති පුරප්පාඩු සඳහා ඉදිරියේදී ගුරුවරුන් බඳවා ගැනීමට වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

*සභාමේසය මත තබන ලද ඇමුණුම:
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
*Annex tabled:*

Tamil Medium Schools Details
Puttalam District

| National Schools | Provincial Schools |
|---|---|
| 02 | 80 |

| SNo | Name of National School | No of Teachers |
|---|---|---|
| 1 | Zahira National College | 97 |
| 2 | Al Aqsa NS | 104 |

| SNo | Name of Provincial School | No of Teachers |
|---|---|---|
| 1 | Fathima Balika MV | 93 |
| 2 | Hindu Tamil MV | 35 |
| 3 | Vettalai MV | 22 |
| 4 | Thillaiyadi MMV | 48 |
| 5 | St. Mary's Tamil MV | 24 |
| 6 | Wattakkandel MMV | 29 |
| 7 | Manalthivu RCTV | 18 |
| 8 | Eluvankulam MMV | 18 |
| 9 | Karathivu MMV | 40 |
| 10 | Manalkundru MMV | 43 |
| 11 | Veppamadu MMV | 53 |
| 12 | Zeinab MGPS | 28 |
| 13 | Zahira Primary | 56 |
| 14 | President's S.C. | 12 |
| 15 | Viruthodai MMV | 29 |
| 16 | Puluthivayal MMV | 28 |
| 17 | Kanamoolai MMV | 42 |
| 18 | Kottantivu MMV | 20 |
| 19 | Kadyamottai MMV | 37 |
| 20 | Sameeragama MV | 5 |
| 21 | Al Minhaj MMV | 14 |
| 22 | Palavi MV | 21 |
| 23 | Omer Farook MMV | 42 |
| 24 | Tharakudivillu MMV | 20 |
| 25 | Udappu TMV | 30 |
| 26 | Andimunai TMV | 29 |
| 27 | Kattaikadu RCTMV | 26 |
| 28 | Ottapanai RCTV | 8 |
| 29 | Mundel TV | 17 |
| 30 | Erukalampiddy MMV | 64 |
| 31 | Kajuwaththa GMV | 10 |
| 32 | Sirimapura MV | 5 |
| 33 | Hidayathnagar MMV | 27 |
| 34 | Nallandaluwa MPS | 19 |
| 35 | Sri Krishna PS | 4 |
| 36 | Mampuri RCSTV. | 45 |
| 37 | Mampuri P.S. | 17 |
| 38 | Periyasanthikiramam BLV | 11 |
| 39 | Kandalkuda MV | 10 |
| 40 | Mudalaippali MV | 16 |
| 41 | Musalpity MV | 17 |
| 42 | Palliwasalthurai MMV | 39 |
| 43 | Kurinchipitty MMV. | 19 |
| 44 | Kandakuli MMV | 28 |
| 45 | Kalpitiya RCTV | 15 |
| 46 | Thillaiyoor MV | 10 |
| 47 | Muhaththuwaram MV | 4 |
| 48 | Uchchamunai RCTV | 2 |
| 49 | Kappalady MV | 7 |
| 50 | Thigali MMV | 41 |
| 51 | Etalai RCTV | 17 |
| 52 | P Alankuda MMV | 47 |
| 53 | Nuraichcholai MMV | 55 |
| 54 | Panayadi RCTV | 5 |
| 55 | Narakkally RCTV | 17 |
| 56 | Navatkadu RCTV | 15 |
| 57 | Thethapolai RCTV | 12 |
| 58 | Nayakkarcheni TV | 12 |
| 59 | Poolachenai MMV | 23 |
| 60 | Ulukkapallam MMV | 71 |
| 61 | Koyyawadi MMV | 17 |
| 62 | Al Madeena MPS | 15 |
| 63 | Al Karam MPS | 16 |
| 64 | Al-Hira MPS | 7 |
| 65 | Karungalicholai TV | 13 |
| 66 | Madawakkulam MMV | 49 |
| 67 | Kammandaluwa BLV. | 34 |
| 68 | Ch/ Nasriya C.C | 44 |
| 69 | Ch/ Al- Hira M.M.V | 35 |
| 70 | Ch/ Al – Mishbah M.M.V | 30 |
| 71 | Ch/ St.Bernadette's T.M.V | 21 |
| 72 | Ch/ Sri Vadivambigai H.C | 21 |
| 73 | Ch/ Sawarana M.V | 15 |
| 74 | Ch/ Maningala M.V | 11 |
| 75 | Ch/ Karukkupanai T.V | 14 |
| 76 | Ch/ Kusalai T.V | 14 |
| 77 | Ch/ Zahira M.V | 14 |
| 78 | Ch/ Thummodara M.V | 7 |
| 79 | Ch/ Narawila M.V | 6 |
| 80 | Sangattikulam MV | 10 |

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. ජාතික පාසල්වල පුරප්පාඩු නැහැ, පළාත් පාසල්වල පුරප්පාඩු තිබෙනවා කියලා ඇමතිතුමාගේ පිළිතුරේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලදී ජාතික පාසලක්ද, පළාත් පාසලක්ද කියන එක අපට ප්‍රශ්නයක් කර ගන්න බැහැ. ඒ වාගේම සංහිඳියාව ගොඩ නැඟීමට නිර්මාණය කරපු අපේ ආණ්ඩුවේ ගරු අධ්‍යාපන ඇමතිතුමා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පෙරළිකාර සංවර්ධනයක් කරද්දී පළාත් පාසල්, ජාතික පාසල් කියලා වෙන් කරලා දෙමළ ජනතාවගේ දරුවන්ට අසාධාරණයක් සිදු වෙනවා නම්, සිංහල මන්ත්‍රීවරු විධියට එය අපි කරන වැරැද්දක්.

අද අපට සතුටු විය හැකි කාරණාවක් සිදු වෙනවා. ඒ තමයි අද වයඹ පළාත් සභාවේ කාලය අවසන් වෙනවා. මේ කාලසීමාව තුළ හෝ යම්කිසි ක්‍රමවේදයක් හදලා දෙමළ මාධ්‍ය පළාත් පාසල්වල ගුරු පුරප්පාඩු ටික පුරවන්න වැඩ පිළිවෙළක් දියත් කරන්න පුළුවන්ද කියලා මා අහන්න කැමැතියි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල්වල ගුරු පුරප්පාඩු පිරවීම සඳහා සමහර පළාත් සභාවලට අපි දැනුම් දීලා තිබෙනවා, පුරප්පාඩු ටික හඳුනා ගෙන එකඟතාව පළ කරලා එවන්න කියලා. සමහර අවස්ථාවල ඒක ලැබෙන්නේ නැහැ. උදාහරණයක් විධියට අපි දැන් ක්‍රීඩා පුහුණුකරුවන් 3,800ක් අරගෙන තිබෙනවා. ක්‍රීඩාවේ ජාතික මට්ටමේ 1,2,3 ශ්‍රේණි ගත්ත අය සහ පළාත් මට්ටමේ 1,2 ශ්‍රේණි ගත් අයට පමණක් සම්මුඛ පරීක්ෂණ තියලා, තෝරා ගැනීම් ඔක්කෝම කරලා ඉවරයි. නමුත්, පළාත් සභාව මුලින්ම ඒ අයගේ එකඟතාව පළ කරලා, පසුව කියනවා ඒ ගොල්ලන්ගේ cadre එකට ඇතුළත් කර ගන්න බැහැ කියලා. ඉතින් මේ වාගේ ප්‍රශ්න ටිකක් තිබෙනවා. පළාත් සභාවෙන් අපට දැනුම් දෙන්න ඕනෑ. නැත්නම් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා උපාධිධාරීන් හැරුණු කොට ඉතිරි ටික අපි ගන්න ඕනෑ. සමහර අවස්ථාවල ව්‍යවස්ථාවත් උල්ලංඝනය කරමින් පළාත් සභාවලින් බඳවා ගැනීම් කර තිබෙනවා. උදාහරණයක් වශයෙන් ඌව පළාතේ cadre එකටත් පිටින් ගුරුවරුන් බඳවා ගෙන තිබෙනවා. ඒ නිසා පළාත් සභාව එකඟත්වය පළ කළොත්, මුදල් ඇමතිතුමා - එතුමා දැන් මෙතැන ඉන්නවා - අපට සල්ලි දුන්නොත් මේ පුරප්පාඩු පුරවන්න පුළුවන්කම තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, පසුගිය දිනක ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල නිකුත් වුණා. දරුවන් ඉහළ දක්ෂතා පෙන්නුම් කර තිබෙනවා. නමුත්, මෙවර කඩඉම් ලකුණු ප්‍රමාණය 168ක් බව ඔබතුමා දන්නවා. ගිය වතාවට වඩා ලකුණු 4ක් වැඩියි. ඒ කියන්නේ, ප්‍රශ්න පත්‍ර දෙකටම ලකුණු 84 බැගින් ගත්තොත් තමයි දරුවකු සමත් වෙන්නේ. එක ප්‍රශ්න පත්‍රයකට ලකුණු 84යි, අනෙක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 83යි ගත්තත් ඒ දරුවා අසමත් හැටියටයි සමාජය භාර ගන්නේ. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් සාකච්ඡා කරන කොට ඔබතුමන්ලා මීට කලින් පොරොන්දු වුණා, ඒ වාගේම පාර්ලිමේන්තුවේ සමහර Committeesවලදීත් කිව්වා, ශිෂ්‍යාධාර ලබා දෙන ප්‍රමාණය 15,000 සිට 30,000 දක්වා වැඩි කරනවා කියලා. එසේ වැඩි කළා නම් මේ කඩඉම් ලකුණු ප්‍රමාණය යම්කිසි ප්‍රමාණයකින් අඩු කරන්නත් තිබුණා. දැන් මෙය දරුවන්ට අතිශය පීඩාවක් බවට පත් වෙලා තිබෙනවා. අවුරුදු තුනක විතර කාලයක් අම්මලාත් දරුවන් අරගෙන මහා තරගයක යන මේ ශිෂ්‍යත්ව විභාගය තුළින් දරුවන්ට එල්ල වන පීඩනය අවම කිරීම සඳහා ඔබතුමන්ලා රජයක් හැටියට ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ජීවිතයේ ගොඩ යන්න තිබෙන එකම මාර්ගය ශිෂ්‍යත්ව විභාගයයි කියලා රටේ මතයක් හදලා තිබෙනවා. අපි මේ වතාවේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්න පත්‍ර හදන ක්‍රමය වෙනස් කළා. දැන් ඒකට tuition ක්‍රමයකුත් බිහි වෙලා තිබෙනවා නේ. ඒ නිසා මේ ශිෂ්‍යත්ව විභාග ක්‍රමය අනාගතයේ දී තියා ගන්නවාද, නැද්ද කියන එක දැන් අපට තීරණය කරන්න සිදු වෙලා තිබෙනවා. අපට මේ ඔක්කෝම එකට කරන්න බැහැ නේ. තමුන්නාන්සේලා සමහර අවස්ථාවල සහයෝගයක් දෙන්නෙත් නැහැ නේ. ඔබතුමා නම් සහයෝගය දෙනවා.

අපි මේ දේවල් කරන්න යනකොට සමහර වෘත්තීය සමිති කකුලෙන් අදිනවා. ඒ නිසා මේ සියල්ලම එකට කරන්න බැහැ. එහෙම නොවුණා නම්, පාසල්වලට මේ දරුවන් ඇතුළත් කරගැනීමේ ක්‍රමවේදයක් හදලා, ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින පුංචි දරුවන්ට තිබෙන මේ මානසික පීඩාව නවත්වන්න අපි වෙන ක්‍රමයක් හදුනාගෙන තිබුණා. 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වන දරුවන්ට අපි දැනට ශිෂ්‍යත්ව 15,000ක් ලබාදෙනවා. එම ශිෂ්‍යත්ව 15,000ට රුපියල් 500 ගණනේ තමයි ලබාදෙන්නේ. ඒ මුදල දැන් රුපියල් 750 දක්වා වැඩි කර තිබෙනවා. ශිෂ්‍යත්ව ප්‍රමාණය වැඩි කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව නැවතත් කල් දමා තිබෙනවා. අපි ඉදිරියේදී ඒකට සාධාරණයක් ඉෂ්ට කරන්න බලන්නම්, ගරු මන්ත්‍රීතුමනි. එහෙම වුණොත්, අපට මේ ලකුණු මට්ටම අඩු කර ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම ඒ දරුවන්ගේ මානසික පීඩාව අවම කර ගන්නත් පුළුවන්කම ලැබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලි කිරීමක් කර ගන්න මට අවස්ථාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අමාත්‍යතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් කරගන්න අවශ්‍යයි කියනවා. ඒ සඳහා පිළිතුරු දෙන්න ඔබතුමා සූදානම්ද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඔව්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමාට ඒක අහන්න කියන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ශිෂ්‍යත්ව විභාගය සම්බන්ධයෙන්ම තමයි මම මේ කාරණය ඔබතුමාට යොමු කරන්නේ. මෙම විභාගයේ ලකුණු මට්ටම් ඉහළ යාමට බලපාන කාරණය ඔබතුමා දන්නවා ඇති. වසරකට 4 ගණනේ මෙම විභාගයේ ලකුණු ඉහළ යනවා. ගිය අවුරුද්දේ ශිෂ්‍යත්ව විභාගයේ සමත් ලකුණු මට්ටම 164යි; ඊට කලින් අවුරුද්දේ එම ලකුණු මට්ටම 161යි; මේ අවුරුද්දේ ලකුණු මට්ටම 168යි. ලකුණු ප්‍රමාණය ඒ විධියට වැඩි වෙවී යනකොට 2021 වසර වන විට එම ලකුණු මට්ටම 180ක් වෙනවා. මෙහෙම වෙනකොට එක විෂයකට ලකුණු 90ක් අරගෙනත් ඒ දරුවන්ට අසමත් වෙන්න වෙනවා. ඒ නිසා මේ සඳහා වූ ප්‍රතිසංස්කරණ වශයෙන් අපි ඔබතුමාට මෙන්න මේ කාරණා යෝජනා කරන්න කැමැතියි. අද ප්‍රධාන පාසල්වලට බඳවා ගන්නා ශිෂ්‍යත්වලාභීන් ප්‍රමාණය එන්න එන්නම අඩු වෙලා තිබෙනවා. සෑම පාසලකම 6 ශ්‍රේණියේ සිටින සිසුන් ප්‍රමාණයට සියයට 50කට වැඩියෙන් -අවම වශයෙන් සියයට 50ක්වත් - ශිෂ්‍යත්වලාභීන් ඇතුළත් විය යුතුය කියා ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් යම්කිසි නියෝගයක් දෙනවා නම් මේ ප්‍රශ්නයට යම් විසඳුමක් ලැබෙයි කියා අපි විශ්වාස කරනවා. ඕනෑ නම් අපිට එය සියයට 30කින් ආරම්භ කරන්න පුළුවන්. අවම වශයෙන් සිසුන්ගෙන් සියයට 30ක්වත් ශිෂ්‍යත්වලාභීන් විය යුතුයි. මොකද, මෙම ලකුණු මට්ටම් ඉහළ යන්නේ දක්ෂතාව නිසාම පමණක් නොවෙයි. ශිෂ්‍යත්වලාභීන්ට එන්න එන්නම ජාතික පාසල්වල දොර වැහෙනවා. ප්‍රාථමික අංශ පටන් ගෙන, ඒවායේ ළමයි ප්‍රමාණය වැඩි වන නිසායි එහෙම වන්නේ. එම නිසා, 6 ශ්‍රේණියේ සිසුන් ප්‍රමාණයෙන් සියයට 50ක් හෝ ඊට ආසන්න මට්ටමක් ශිෂ්‍යත්වලාභීන්ට වෙන් කරන්න කියා මම පළමුවෙන්ම යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා කෙටියෙන් මම මේ කාරණා කියන්නේ. ගරු අමාත්‍යතුමනි, මේ කඩඉම් ලකුණු නිකුත් කිරීමේ අවශ්‍යතාව කුමක්ද කියා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. අපොස උසස් පෙළ විභාගයේදී නම් මුලින්ම අපට දෙන්නේ ප්‍රතිඵල පමණයි කියා ඔබතුමා දන්නවා. ඊට මාස ගණනකට පසුව තමයි rank එක එන්නේ; cut-off point එක, ඒ කියන්නේ Z-score එක ගණනය කරන්නේ. අන්න ඒ විධියට, ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100ක් ගත්ත ළමයි හැමදෙනාටමත් තමන් සමත් කියා දැනුම් දුන්නා නම්, ඊට පසු පාසලක් තෝරා ගැනීම පිළිබඳ ප්‍රශ්නය ද්විතීය කාරණයක් වනවා. මොකද, ඒක හැම ළමයකුටම අදාළ වන කාරණයක් නොවෙයි. ඒක තමයි මගේ දෙවැනි යෝජනාව වන්නේ.

ඔබතුමා 30,000කට ශිෂ්‍යත්ව දුන්නාට කීදෙනාද පාසල වෙනස් කරන්නේ? බොහොම අඩු ප්‍රමාණයක් නේ. 30,000 ලබන්නේ, ශිෂ්‍යාධාරයි. නමුත්, ඉහළ යැයි සම්මත පාසලකට යන්නේ ඊට වඩා අඩු ප්‍රමාණයක්. ඒ නිසා මෙන්න මේ වාගේ හදිසි ප්‍රතිසංස්කරණවලට යන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ශිෂ්‍යත්ව විභාගය අහෝසි කිරීම පිළිබඳ සාකච්ඡාව වෙනම කර ගන්න ඕනෑ දෙයක්. මේ කරුණු ඇතුළුව අනික් කාරණා ගැන අවධානය යොමු කරන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(*මාණ්පුමිකු අක්කිල ඛිරාජ් කාරියවසම්*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියූ කාරණා ගැන මම පැහැදිලි කිරීමක් කරන්නම්.

කඩඉම් ලකුණ දෙන්නේ, එක පැත්තකින් ඒ ඒ ජනප්‍රිය පාසල්වලට තිබෙන ඉල්ලුම අනුවයි. ගරු මන්ත්‍රීතුමා කියපු විධියට 6 ශ්‍රේණියෙන් ඉහළට ශිෂ්‍යත්ව කඩඉම් ලකුණ අනුව ගන්න වෙලා තිබෙන්නේ, ප්‍රධාන පාසල්වලට ඇතුළත් කර ගන්නා ලකුණු මට්ටම ඉහළ යන්නේ, ඉල්ලුම වැඩි නිසායි. ඒ වාගේම තමයි, කාලයක් තිස්සේ එන සහෝදර පදනම්, ආදි ශිෂ්‍ය පදනම් සහ තව අරවා මේවාත් තිබෙනවා. ඒවා වෙනස් කරන්න ගියාමත් තව ප්‍රශ්න මතු වෙනවා. ඒ කාරණයේ අන්න එහෙම පැත්තක් තිබෙනවා. මේ ප්‍රශ්නයට තිබෙන දීර්ඝකාලීන විසඳුම තමයි, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය. දැන් මොකද වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අද සියලුදෙනාම බලන්නේ හොඳ, ජනප්‍රිය පාසල්වලට දරුවෝ ඇතුළත් කරන්නයි. ඒ නිසා තමයි අපි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පාසල් දෙකක් සියලුම පහසුකම් සහිතව සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කළේ. ඒ වැඩ පිළිවෙළ දැන් බොහෝ දුරට අවසන් වෙලා තිබෙනවා. ඊට අමතරව, පොදුවේ සියලු පාසල්වල අඩු පාඩු අපි සපුරනවා. විදුහල්පතිවරුන්ගේ පුරප්පාඩු 4,000ක් තිබුණා. අපි ඒ විදුහල්පතිවරු 4,000 බඳවා ගත්තා. අධ්‍යාපන පරිපාලන සේවයේ පුරප්පාඩු 852ක් තිබුණා. අපි ඒ අය බඳවා ගත්තා. ගුරු අධ්‍යාපනඥ සේවයේ පුරප්පාඩු තිබුණා. අපි ඒ අයත් බඳවා ගත්තා. ඒ වාගේම, ගුරුවරු විශාල ප්‍රමාණයක් බඳවා ගත්තා. හෙට අනිද්දා වනකොට ගැසට් නිවේදනය නිකුත් වනවා; ඒ හිඟ ගුරුවරු ගන්නවා. අපි පාසල්වලට අවශ්‍ය භෞතික සම්පත් දෙනවා. ඉස්සර පාසල්වල පුස්තකාලවලට පොත් තිබුණේ නැහැ; විද්‍යාගාර තිබුණේ නැහැ. දැන් අපි විද්‍යාගාර 3,000ක් හදා තිබෙනවා. නැත්නම්, ජංගම විද්‍යාගාර හෝ දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කියනවා වාගේ, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, දක්ෂ දරුවකු ඉන්නවා නම්, ඒ දරුවා හොඳ පාසලකට යවා ගන්න හැම දෙමව්පියෙකුම කැමැතියි. ඒ අවස්ථාව අහුරන්න හොඳ නැහැ. මේ ප්‍රශ්නයට විසඳුමක් ලෙස, ඇතුළත් වීමේ විභාගයක් පවත්වලා, ඉස්කෝල තුනක් විතර තෝරන්න දීමේ ක්‍රමයක් ගැන අපි හිතලා තිබෙනවා. නමුත්, ඒක අපි කරන්න බලාපොරොත්තු වෙන්නේ අනාගතයේයි. හැබැයි අයින් කරන්න තිබෙන එකක් නම්, ඕනෑවට වඩා ඒ වෙනුවෙන් පෙනී ඉඳලා වැඩක් නැහැ. නමුත් මේ සඳහා සියලුදෙනාටම පිළිගන්න පුළුවන් විධියේ ක්‍රමවේදයක් ඉදිරි කාලයේදී ඇති කරන්න අපි බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාවේ ස්ථාවර නියෝග යටතේ ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා. අද මට පාර්ලිමේන්තුවේදී වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න තිබුණා. මම දහවල් 12.00ට තමයි කොළඹින් එන්න පිටත් වුණේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ගරු ඇමතිතුමනි, ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට ඉදිරිපත් කරන්න. මොකද, අද තවත් වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(*මාණ්පුමිකු අක්කිල ඛිරාජ් කාරියවසම්*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විනාඩියයි ගන්නේ.

මම එන්න පිටත් වුණේ දහවල් 12.00ටයි. නමුත් එන්න බැරිව පාරේ පැයක් හිටියා. අන්තිමේදී මම රාජගිරියේදී වාහනයෙන් බැහැලා, පාරේ යන කෙනෙකුගේ මෝටර් සයිකලයකට අත දමලා ඒක නවත්වාගෙන, එහි නැඟලා තෙමී-තෙමී තමයි පාර්ලිමේන්තුවට ආවේ.

අපට වාහනය එහෙන් මෙහෙන් දමලා යන්නත් බැහැ. ඒ නිසා මේ සඳහා කුමක් හෝ ක්‍රමවේදයක් හදන්න. සමහර දවස්වලට මේ වාහන සෙලවෙන්නේවත් නැහැ. ඒ තරමටම මේ පාරේ එන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

හොඳයි, ගරු ඇමතිතුමනි.

ප්‍රශ්න අංක 15 -578/'18- (2), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 5 -202/'18- (2), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(මාණ්පුමිකු ජූයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*විනාඩෙ මත්තොරු තිනත්තිත් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 15 -578/'18- (2), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(මාණ්පුමිකු කේ.කේ. පියතාස)
(The Hon. K.K. Piyadasa

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු පුත්තික පතිරණ - කෛත්තොළිල් මට්‌රුම් වාණිප අලුවල්කළ් පිරති අමෙච්චර්)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*විනාඩෙ මත්තොරු තිනත්තිත් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## I

## විශ්‍රාමිකයන් මුහුණ පා ඇති ගැටලු
## ஓய்வூதியர் எதிர்நோக்கும் பிரச்சினைகள்
## PROBLEMS FACED BY PENSIONERS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ ගරු අග්‍රාමාත්‍යතුමා වෙතයි.

රාජ්‍ය සේවය වෙනුවෙන් ජීවිත කැප කර ඇති ලක්ෂ හයක් පමණ වන විශ්‍රාමිකයන් මේ වන විට රජය විසින් නොසලකා හැර තිබෙනවා. දැඩි අමාරුකම් මැද ඔවුන් අද දිවි ගෙවන්නේ අවිනිශ්චිත තත්ත්වයෙන්. අද ඇති වී තිබෙන ආර්ථික අර්බුදයෙන් වෙළෙඳ පොළේ ඇති සියලුම භාණ්ඩවල මිල, ඉන්ධන මිල, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල, ප්‍රවාහන ගාස්තු, වෛද්‍ය ගාස්තු වැඩිවීම වැනි බරපතළ ආර්ථික ගැටලුවලට එම විශ්‍රාමිකයන් මුහුණ දී සිටින බව ආණ්ඩුවත්, පාර්ලිමේන්තුවත් පිළිගත යුතුව ඇත.
එහෙයින්,

1. විශ්‍රාමිකයන්ගේ ඉල්ලීම් අනුව, ඔවුන් මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම පසුගිය වසරේ සැප්තැම්බර් මස නව විසඳුම් හා නිර්දේශ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇත. විශ්‍රාමිකයන් පවසන මෙම ගැටලුව සාධාරණ බව පිළිගන්නේද? එම වාර්තාව වහා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද?

2. වැඩි වන ජීවන වියදම හා වෙළෙඳ පොළ ආර්ථිකය මත රාජ්‍ය සේවක වැටුප් වැඩි කරන විට ඊට සමගාමීව රජයේ විශ්‍රාමිකයන්ගේ වැටුප් වැඩි කිරීමට අදාළ සංශෝධන ඉදිරිපත් කරනවාද?

3. මුළු මහත් විශ්‍රාමිකයන් මුහුණ දෙන මේ ගැටලුවට විසඳුමක් ඇති කිරීමට රජය එකඟ වී ඇත. එසේ නම්, "රාජ්‍ය සේවක වැටුප් වැඩි වීම හා නිර්මාණය වී ඇති දැවැන්ත විශ්‍රාමික වැටුප් විෂමතා කඩිනමින් විසඳීම" යන්න ඉටු කරන්නේද? ඒ කවදාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්ත ලංකා රජයේ විශ්‍රාමිකයන්ගේ ඒකාබද්ධ ජාතික සංවිධානය විසින් ඒ සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපියක් මේ අවස්ථාවේ මම **සභාගත*** කරනවා. ඒ ගැන කථා කරන්න මම වෙලාව ගන්නේ නැහැ. ඒ වාගේම, මඩකලපුවේ හමීඩ් එම්. සලීම් මහතා, ආර්.ඒ. රසාක් මහතා, විශ්වලිංගම් මහතා, එම්.එම්. අබ්දුල් මහතා ඇතුළු තවත් විශ්‍රාමිකයන් පිරිසක් විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් ඇතුළු තවත් ලේඛනද මා **සභාගත*** කරනවා. මොකද, මේ අය නියෝජනය කරනවාය කියන මන්ත්‍රීවරු මේ ගැන ප්‍රශ්න කරන්නේ නැහැ.

4. රජයේ සේවයේ සිටින, දැනට විශ්‍රාම අයිතිය නොමැති අයට; අලුතෙන් සේවයට බඳවා ගත්ත අයට විශ්‍රාම වැටුප් අයිතිය ලබා දෙනවාද කියා අපේ ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මම ඉතාම ඕනෑකමින් අහන්න කැමැතියි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාවේ මේ මූල්‍ය අර්බුදය විසඳීමට උපදෙස් දෙන ආකාරයට, රාජ්‍ය සේවය කප්පාදු කිරීමේ අනතුරට දැනට රජයේ සේවයේ සිටින සේවකයන් පත් නොකිරීම සඳහා කටයුතු කිරීමට ආණ්ඩුවට හැකියාවක් තිබෙනවාද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Law and Order)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

(01) ඔව්. රාජ්‍ය ප්‍රතිපත්ති හා තීරණ අනුව මහා භාණ්ඩාගාරය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත.

(02) වැටුප් වැඩිවීමේදී විශ්‍රාමිකයින් සම්බන්ධයෙන් පෙර පැවැති විශ්‍රාම වැටුප් විෂමතාවන් විසඳීමට කටයුතු කර ඇති අතර, ඉදිරියේ තිබෙන විෂමතාවන් විසඳීමටද වැටුප් කොමිෂන් සභාව මඟින් කටයුතු සිදු කරනු ඇත.

(03) වැටුප් කොමිසම ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණ දැනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත.

(04) රාජ්‍ය සේවයේ පත්වීම් ලබන නිලධාරීන් හා දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිය සුරැකීමට රජය කටයුතු කරනු ඇති අතර, ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්ති පිළිබඳව සාකච්ඡා කරමින් පවතී. ඒ වාගේම රජයේ සේවකයින් කප්පාදු කිරීමක් සිදු කරනු නොලැබේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හමුවෙන්න පාර්ලිමේන්තුවට පැමිණෙමින් සිටින විශ්‍රාමිකයින් කණ්ඩායමක් මේ වන විට පාර්ලිමේන්තු මංසන්ධියේදී පොලීසියෙන් වට කර ගෙන ඉන්නවා. මේ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් පාර්ලිමේන්තුවට ඒමට නොහැකි වන විධියට පාර්ලිමේන්තු පොලීසිය දැන් පාර්ලිමේන්තු පාරත් වසා තිබෙනවා. මා හිතන්නේ මීට පෙර කවදාවත් මෙවැනි දෙයක් වෙලා නැහැ. එසේ නොයෙක් කණ්ඩායම් පැමිණි අවස්ථාවලදී කථානායකතුමා ඒ සඳහා වහාම මැදිහත් වෙලා පාර විවෘත කළා. මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තුවට එන්න තිබෙන අයිතිය විශේෂ අයිතියක්. මම ඒ කාරණයත් විශේෂයෙන් මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

විශ්‍රාමිකයින් මෙසේ ඇවිල්ලා තිබෙන්නේ ඔවුන්ගේ ප්‍රශ්නය විසඳී නැති නිසායි. ගරු ඇමතිතුමනි, විශ්‍රාමිකයින්ගේ මේ ප්‍රශ්නය පියවරෙන් පියවර විසඳීමේ ක්‍රියාමාර්ගයේ දින වකවානු අගමැතිතුමා වෙනුවෙන් ඔබතුමාට ප්‍රකාශ කරන්න පුළුවන් නම්, එය මා අගය කරනවා. මේ අවස්ථාවේදී අගමැතිතුමා මේ ගරු සභාවේ නැහැ.

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මෙතැන තිබෙන පළමු ප්‍රශ්නය මෙයයි. විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතාවන් ගැන අපි සාකච්ඡා කර මාස ගණනාවක්, අවුරුදු ගණනාවක් ගත වෙලා තිබෙනවා. නමුත්, ඒ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන නිශ්චිත දිනයක් ගැන තවම ඔබතුමා හරියට උත්තරයක් දෙන්නේ නැහැ.

දෙවැනි ප්‍රශ්නය මෙයයි. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේදී මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයට වාර්තාවක් යැව්වා. මේ වන විට අපි ඉන්නේ ඔක්තෝබර් මාසයේ. ඒ වාර්තාව ක්‍රියාත්මක කිරීම ගැන ස්ථාවර පිළිතුරක් ඔබතුමාට ලබා දෙන්න බැරි නම්, මුදල් ඇමතිතුමා යටතේ මහා භාණ්ඩාගාරය තිබෙන නිසා අඩු ගණනේ මේ අවස්ථාවේදී මුදල් ඇමතිතුමාවත් මේ ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මේ හා සම්බන්ධ පසුබිම මම කියන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැටුප් වැඩිවීමේදී සාමාන්‍යයෙන් මේ වාගේ විශ්‍රාම වැටුප් විෂමතාවන් එනවා. ඒක 2006දීත් ආවා. මේ වාගේම පාරට බැහැලා 2015 වන තෙක් මේ රටේ විශ්‍රාමිකයෝ උද්ඝෝෂණය කළා, ඒ විෂමතාව ඉවත් කරන්න. එත්මන් රජය 2015 ජනවාරි 08 වැනි දා බලයට පත් වෙලා මාස තුනක් යන්න ඉස්සෙල්ලා තමුන්නාන්සේලා අවුරුදු 9ක් නොදුන් ඒ විෂමතාවට උත්තරයක් දුන්නා. 2006 අවුරුද්දේ සිට පැවැති විශ්‍රාම වැටුප් විෂමතාවට අපි උත්තරයක් දුන්නා. ඒ අනුව විශ්‍රාම වැටුප් විෂමතාවට අපි සාධාරණයක් ඉෂ්ට කළා. අද වනකොට රජය ඒ සම්බන්ධව සාකච්ඡා කරමින් ඒ වාර්තා හදා ගෙන කටයුතු කරමින් යනවා. මම හිතන්නේ මුදල් ලබා දීම සම්බන්ධව ගරු අගමැතිතුමාත්, මුදල් ඇමතිතුමාත් ප්‍රකාශයක් කරයි. කොහොම නමුත්, අපි විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතාව නැති කරන්න ඉදිරියේදී කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණය සම්බන්ධව මම සඳහන් කරන්නම්. මීට ටික වෙලාවකට පෙර පාර්ලිමේන්තු පාර විවෘත කළා. ගරු කථානායකතුමාට ලිපියක් භාර දෙන්න ආ කණ්ඩායමෙන් අපි ඒ ලිපිය භාර ගත්තා. දැන් අපි ඒ වැඩ කටයුතු ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කර තමයි තිබෙන්නේ.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(මාණ්පුමිකු සන්දිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

මේ කාරණා තුනෙන් පසුව ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්නම්.

# II

## යාපනය විශ්වවිද්‍යාලයෙන් පිරිනැමෙන හෙද උපාධි පාඨමාලාව පිළිගැනුම

## யாழ்ப்பாணப் பல்கலைக்கழகத் தாதியியல் பட்டக் கற்கைக்கான அங்கீகாரம்

## RECOGNITION OF NURSING DEGREE COURSE OFFERED BY UNIVERSITY OF JAFFNA

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2) இன் கீழ் உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் கௌரவ விஜயதாஸ ராஜபக்ஷ அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்தமைக்கு நன்றி கூறுகின்றேன்.

யாழ்ப்பாணப் பல்கலைக்கழக மருத்துவ பீடத்தில் ஓர் அலகாக உள்ள இணை மருத்துவப் பிரிவில் மருந்தகவியல், மருத்துவ ஆய்வுகூட விஞ்ஞானம், தாதியியல் ஆகிய மூன்று பிரிவுகள் செயற்பட்டு வருகின்ற நிலையில், தாதியியல் கற்கை நெறிக்கு இதுவரையில் பதிவும் அங்கீகாரமும் வழங்கப்படவில்லை எனத் தெரியவருகின்றது. இதன் காரணமாகச் சேவைகளில் பதவிப் பிரமாணம், வேலைவாய்ப்பு, பதவி உயர்வுகள், உயர் கல்வி கற்பதற்கான தடை போன்ற பிரச்சினைகளை மேற்படி மாணவர்கள் எதிர்கொள்ளவேண்டி இருப்பதாகத் தெரியவருகின்றது. அத்துடன், யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் மாணவர் களுக்கான விடுதி வசதிகள், விளையாட்டு மைதானம் போன்ற தேவைகளும் ஏற்பட்டுள்ளன. மேலும், யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் முழுமையான தேவைகள் பற்றிய விபரங்கள் அடங்கிய பட்டியல் ஒன்றினை கௌரவ அமைச்சர் அவர்களது பார்வைக்கு இணைத்துள்ளேன்.

மேற்படி நிலைமையினை அவதானத்தில் கொண்டு எனது பின்வரும் கேள்விகளுக்கான பதில்களையும், எடுக்கப் படக்கூடிய நடவடிக்கைகள் தொடர்பிலான விளக்கங்களையும் கௌரவ அமைச்சர் அவர்களிடமிருந்து எதிர்பார்க்கின்றேன்.

1. யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் தாதியியல் கற்கை நெறிக்கான பதிவினையும் அங்கீகாரத்தினையும் வழங்குவதில் தடைகள் ஏதும் காணப்படுகின்றனவா?

2. தடைகள் இருப்பின், அவற்றை நீக்குவதற்கும், தடைகள் இல்லை எனில், உடனடியாக மேற்படி பதிவினையும் அங்கீகாரத்தினையும் வழங்குவதற்கும் நடவடிக்கை எடுக்க முடியுமா?

3. பல்கலைக்கழக மாணவர்களின் வசதி கருதி மாணவர் விடுதிகள் மற்றும் விளையாட்டு மைதானம் போன்றவற்றை அமைப்பதற்கும், மேலும், இணைக்கப்பட்ட பட்டியலில் குறிப்பிடப்பட்டுள்ள தேவைகளை முன்னுரிமை அடிப்படையில் நிறைவேற்றுவதற்கும் நடவடிக்கையினை மேற் கொள்ள முடியுமா?

4. இல்லை எனில், அதற்கான காரணத்தையும், உண்டு எனில், அது எப்போது சாத்தியமாகும் என்பதனையும் கூற முடியுமா?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)

Hon. Deputy Speaker, the first question raised by the Hon. Douglas Devananda is whether there is any obstacle with regard to registration of students who have completed the Degree Courses in Nursing. There is no such obstacle. Registration is not a matter for the University. Earlier there was a different structure. All those who completed the Nursing Courses had to be registered in the Ceylon Medical College Council. A few years later, that system was changed and a new institution was established. That is the Sri Lanka Nurses Council.

Therefore, all the steps that have to be taken by the university had been taken. In fact, representation had been made to the Sri Lanka Nurses Council, with regard to registration of those students. But the Sri Lanka Nurses Council is not an entity which comes within the purview of the Minister of Higher Education. That comes under the Ministry of Health. According to the information I have so far obtained - I am not certain about the correctness of it- at the moment there is a delay in the work of Sri Lanka Nurses Council as a result of a tug-of-war by two trade unions claiming that the Council had not been properly constituted. It is a matter to be resolved by the Ministry of Health and we will certainly inform the Minister of Health to take immediate action. I think that covers the first and the second questions.

With regard to the third question, Hon. Deputy Speaker, during the last few years, we have spent so much of money for provision of infrastructure facilities. In the year 2014, for the Jaffna University, we have spent Rs. 1,140 million; in 2015, Rs. 843 million; in 2016, Rs. 2,040 million; in 2017, Rs. 2,482 million and in 2018, Rs. 2,019 million. Altogether within this five-year period, Hon. Deputy Speaker, we have spent, Rs. 8,524 million for the development of Jaffna University.

In addition to that, as the Hon. Member is aware during the last 70-year period, in the State Universities governed by the University Grants Commission, there were hostel facilities for 56,000 out of the student population of 90,000. In fact I must appreciate the services rendered by my predecessor Hon. Lakshman Kiriella. During the last two years, he had initiated a programme to put up 84 hostels all over the country. As a result, by the end of this year, we are adding facilities for another 33,600 students. For the last 70 years, it was only for 56,000 and during these two years we have been able to provide hostel facilities for 33,600 students. Our student population is 91,000 but with this programme there will be hostel facilities for 89,000 students. And in the Jaffna University, there are 10 hostel buildings and after completion of the new building, we will be able to accommodate 4,000 students.

There is no lapse or any deficiency on the part of the Minister of Higher Education or the University Grants Commission. We have taken all the measures with regard to registration of students. Not only the Jaffna University but there are other universities also which have faculties for Nursing and Allied Sciences. This problem may crop up in those universities also unless it is resolved by the Minister of Health.

Than you very much.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලබන ඊළඟ ප්‍රශ්නය. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමතිතුමා ගරු සභාවේ නැහැ. පිළිතුර ලබා දෙන්නේ කවුද, ගරු සභානායකතුමනි?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි, මම ප්‍රශ්නය අහන්නම්.

ඊට අමතරව, මම ගිය වතාවේ ඔබතුමාගෙන් ඇහුවා, තෙල් ටැංකි පිළිබඳ ප්‍රශ්නයක්. එදාත් ඔබතුමා එකඟතාවකට ඇවිත් මට කිව්වා, අමාත්‍යතුමා අද පිළිතුර ලබා දෙනවා කියා. නමුත් අමාත්‍යවරයා අද ගරු සභාවේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අමාත්‍යවරයා කවුද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය අර්ජුන රණතුංග අමාත්‍යතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම එතුමාට මතක් කළා. මම නැවතත් මතක් කරන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැවත මතක් කරන්න, ස්තුතියි.

# III

## කොළඹ වරායේ වෘත්තීය සමිති ක්‍රියාකාරීන් ස්ථාන මාරු කිරීම

கொழும்புத் துறைமுக தொழிற்சங்கச் செயற்பாட்டாளர்களின் இடமாற்றம்

TRANSFER OF TRADE UNION ACTIVISTS OF COLOMBO PORT

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා අසන ප්‍රශ්නය මෙසේයි.

වෘත්තීය සමිති මර්දනය කිරීමේ අරමුණින් වරාය වෘත්තීය සමිති නිලධාරීන්, සාමාජිකයන් හා ක්‍රියාකාරී සේවකයන් ස්ථාන මාරු කිරීම හේතුවෙන් කොළඹ වරායේ සේවකයන් අතර පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෑත තීරණය තුළ බරපතළ වැටුප් විෂමතාවක් නිර්මාණය වූ බවට වරාය සේවකයන් අතර නොසන්සුන්කාරී තත්ත්වයක් ඇතිව තිබෙනවා. මේ තත්ත්වය තුළ පාලන අධිකාරියට විරෝධය පළ කරමින් විශාල සේවක පිරිසක් සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමට ඉදිරිපත්ව සිටියා. මේ තත්ත්වය හමුවේ එම වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වය අඩ පණ කිරීමේ අරමුණින් වෘත්තීය සමිති නිලධාරීන්, සාමාජිකයන් හා ක්‍රියාකාරී සේවකයන් ගණනාවක් වහාම ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරු කොට තිබෙනවා.

කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය යන වරායන් සැලකූ විට වඩාම සක්‍රිය හා ක්‍රියාත්මක වරාය වන්නේ කොළඹ වරායයි. මෙහෙයුම් ක්‍රියාවලිය හා අනෙකුත් කටයුතු සැලකූ විට සේවකයන් අත්‍යවශ්‍ය කොළඹ වරායටයි. එහෙත් සේවා අවශ්‍යතාව මත යැයි සඳහන් කර ගාල්ල හා ත්‍රිකුණාමලය වරායන් වෙත මාරු කර යවන ලද සේවකයන්ට මේ වන තෙක් කිසිදු රාජකාරියක් භාර දී නොමැති බවද වාර්තා වනවා.

තමුන්නාන්සේලා ඒ අය කොළඹින් යවනවා, ගාල්ල, ත්‍රිකුණාමලය ආදි වරායන්ට. හැබැයි කිසිදු වගකීමක්, රාජකාරියක් ඒ අයට බාර දී නැහැ.

ඒ අනුව මෙය හුදෙක් වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වයෙන් පළිගැනීමේ අරමුණින්ම කරන ලද මාරුවීම් බව තමයි පෙනෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

වරාය අධිකාරියේ ප්‍රධාන සුභසාධන ආයතන තුනම පාලනය කරනුයේ සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ පත්වූ නියෝජිතයන් හා අධ්‍යක්ෂ මණ්ඩලය මඟිනුයි. මේ තත්ත්වය තුළ රුපියල් කෝටි 300කට වැඩි වත්කම් ඇති මෙම ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩලවල කටයුතු කරන වෘත්තීය සමිති නියෝජිතයන් ස්ථාන මාරු කර මෙම ආයතනවල කටයුතු බිඳ වැටීමේ සැලසුම්ක්ද පවතිනවා.

ඒ සමඟර අය ඒ බැංකුව, සමුපකාර සමිති ආදියේ අධ්‍යක්ෂ මණ්ඩලවල සිටින අයයි. ඒ අය තමයි තමුන්නාන්සේලා පළිගන්න ගාල්ල, ත්‍රිකුණාමලය වරායවලට මාරු කර තිබෙන්නේ.

පසුගිය ආණ්ඩු සමයේ වරාය පාලනය තුළ දේශපාලන පළිගැනීම්වලට ලක්වූ අයුරින්ම සේවකයන් පළිගැනීම්වලට ලක් වෙමින් ඇති බවටත්, වත්මන් ආණ්ඩුවේ ඉහළ නිලධාරීන්ද පෙර ආකාරයටම වෘත්තීය සමිති ක්‍රියාකාරීන්ගෙන් පළිගැනීමට කටයුතු කරමින් සිටින බවටත් බරපතළ චෝදනාවක් දැන් තමුන්නාන්සේලාගේ වරාය අධිකාරියට තිබෙනවා.

වරාය අධිකාරිය තුළ සේවකයන් මාරු කිරීමේදී කළමනාකරණ සහකාරවරුන් වර්ෂ 08කට වරක් ස්ථාන මාරු කරන අතර, අනෙකුත් සේවකයන්ගේ ඉල්ලීම පරිදි මාරුවීම් කමිටුවලට ඉදිරිපත් කර ඇබෑර්තු හා නිදහස් කිරීමේ හැකියාව සලකා බලා ස්ථාන මාරු කිරීම් කරනු ලබනවා. නමුත් වත්මන් ප්‍රශ්නගත මාරු කිරීම් ඉහත විධිමත් පටිපාටියට පටහැනියි.

තමුන්නාන්සේලාගේ වරාය අධිකාරියේ විධිමත් ක්‍රමයක් තිබෙනවා, සේවකයකු මාරු කිරීම සම්බන්ධව. විශේෂයෙන්ම කළමනාකරණ සහකාරවරුන් ස්ථාන මාරු කරනු ලබන්නේ අවුරුදු 8කට වරක්. හැබැයි ඒ අවශ්‍යතා සපුරන්නේ නැතිව තමුන්නාන්සේලා මේ මාරු කිරීම් කර තිබෙනවා. මෙහි ප්‍රධානම අරමුණ මොකක්ද? මේ වෘත්තීය සමිති නායකයන් මර්දනය කිරීම සඳහා තමයි වරාය අධිකාරිය මේ කටයුත්ත කරමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් ප්‍රශ්නවලට ගරු අමාත්‍යවරයා පිළිතුරු ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

01. වහාම ක්‍රියාත්මක වන පරිදි ගාල්ල, ත්‍රිකුණාමලය වරායන් සඳහා සේවකයන් ස්ථාන මාරු කිරීමට ඇති වූ විශේෂ තත්ත්වය කුමක්ද?

    මෙය, වෘත්තීය සමිති නායකයන්ගෙන් පළිගන්නා එක නොවෙයි නම්, ඔවුන් මර්දනය කිරීම සඳහා ගන්නා ක්‍රියා මාර්ගයක් නොවෙයි නම්, ත්‍රිකුණාමලය සහ ගාල්ල වරායන්වල ඇති වූ හදිසි තත්ත්වය මොකක්ද, මෙහේ සේවකයන් ඒ වරායන්ට යවන්න? ඒක මේ පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ.

02. සේවක මාරු කිරීම්වලදී විධිමත් පටිපාටියක් අනුගමනය කළාද?

    සේවකයන් මාරු කිරීමේ විධිමත් පටිපාටියක් වරාය අධිකාරිය සතුව තිබෙනවා. ඒ සේවකයන් මාරු කළේ ඒ පටිපාටියට අනුකූලවද කියා තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ.

03. කොළඹ හැරෙන්න අනෙකුත් වරායන් සඳහා පුරප්පාඩු නිර්මාණය වූයේ නම් අයදුම්පත් කැඳවා බඳවා ගැනීමට කටයුතු නොකළේ ඇයි?

    ඒවායේ පුරප්පාඩුවක් තිබුණා නම්, අයදුම් පත් කැඳවා අලුත් පත්වීමක් ලබා දීමට කටයුතු නොකළේ ඇයි?

04. පෙරදී දේශපාලන පළිගැනීම්වලට ලක්වූ වෘත්තීය සමිති නායකයන් -මීට පෙර ආණ්ඩුවලදීද මේ පළිගැනීමට ලක් වූ වෘත්තීය සමිති නායකයන්- තමයි, තමුන්නාන්සේලා නැවත වතාවක් අඩන්තේට්ටම්වලට ලක් කරලා තිබෙන්නේ. මේ පිළිබඳව තමුන්නාන්සේලා ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

05. මෙම අසාධාරණ මාරුකිරීම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන්නේද?

06. වරාය අධිකාරිය තුළ වෘත්තීය සමිති මර්දනය කිරීමේ පිළිවෙත ඉවත් කර ගැනීමට මැදිහත් වන්නේද?

07. වරාය සේවකයන් අතර ගැටලු නිර්මාණය කිරීමට මුල් වූ වරාය අධිකාරියේ වැටුප් විෂමතාව පිළිබඳව ආණ්ඩුව තීරණයක් ගන්නේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. මේ වරාය සේවකයන් වෘත්තීය සමිතියකට බැඳුණාට පස්සේ ඔවුන්ගේ වැටුපෙන් යම් ප්‍රමාණයක් අවකරණය වෙනවා. තමුන්නාන්සේලා ඒක කරන්නේත් නැහැ; සාමාජික ලැයිස්තුව වර්ධනය වෙන්න ඉඩ දෙන්නේත් නැහැ. ඒ නිසා තමුන්නාන්සේලාගේ මුළු ක්‍රියාදාමය තිබෙන්නේ එක් වෘත්තීය සමිතියක් ඉලක්ක කොටගෙනයි.

[ගරු අනුර දිසානායක මහතා]

මර්දනීය ක්‍රියාමාර්ගයක් තමුන්නාන්සේලා අනුගමනය කරලා තිබෙනවා. තමුන්නාන්නසේලා වරාය අධිකාරිය තුළ පාලනය කරන්න හදන්නේ සේවකයන් මර්දනය කරලා, වෘත්තීය සමිති නායකයන් මර්දනය කරලා නම්, ඒක ඉදිරියේදී බලා ගන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෘත්තීය සමිති නායකයන් මාරු කර පළිගැනීම වහාම අත්හිටුවීම සඳහා අමාත්‍යවරයා කටයුතු කළ යුතුයි. මම සභානායකවරයාගෙන් මේ ගැන දැන ගන්න කැමැතියි. මේ නියෝජ්‍ය අමාත්‍යවරයා මොනවා කියයිද දන්නේ නැහැ. සභානායකවරයා මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරන්න ඕනෑ. මේ විධියට වරාය අධිකාරියේ ඉන්න වෘත්තීය සමිති නායකයන්ගෙන් පළිගැනීම සඳහා තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කටයුතු කරනවාද? මේ අය මීට කලින් ආණ්ඩුවලිනුත් බැට කාපු අය. තමුන්නාන්සේලා මොනවාද මේ කරන්නේ? තමුන්නාන්සේලා -ඇමතිත්, නියෝජ්‍ය ඇමතිත් දෙන්නාම- ඒ ආණ්ඩුවේත් ඇමති; මේ ආණ්ඩුවේත් ඇමති. මහින්ද සමරසිංහ ගිය ආණ්ඩුවේ ඇමති; දැනුත් ඇමති. මුතුහෙට්ටිගමගේ ගිය ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමති; මේ ආණ්ඩුවේත් නියෝජ්‍ය ඇමති. ඒ සේවකයන්ට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ සේවකයන්ගෙන් හැම වෙලාවේදීම පළිගන්නවා. ඒ සේවකයන් ඒ ආණ්ඩුවෙනුත් බැට කන්න ඕනෑ; මේ ආණ්ඩුවෙනුත් බැට කන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පළිගැනීම වහාම අත්හිටුවලා ඒ සේවකයන්ගේ මාරු කිරීම වහාම අවලංගු කරන්න කියලා තමයි මම ඉල්ලා සිටින්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා (වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. Nishantha Muthuhettigamage - Deputy Minister of Ports and Shipping Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීතුමාට මගේ උත්තර දීම ප්‍රමාණවත් වේද කියන ප්‍රශ්නය තිබෙනවා. මොකද, එතුමා බලාපොරොත්තු වෙන්නේ සියලු ප්‍රශ්න කඩිනමින් විසඳා ගන්නයි. එතුමා කළේ ප්‍රශ්න ඇසීමක් නොවෙයි; චෝදනා ඉදිරිපත් කිරීමකුයි. මම ඒකට එකඟ වෙන්නේ නැහැ. වරාය අධිකාරියේ 9,990ක් සේවකයන් හොඳ කාර්මික සාමයකින් හා සියලු කාරණාවලදී වෘත්තීය සමිති වඩාත් එකඟතාවකින් කටයුතු කරනවා. 13දෙනෙකුගේ ස්ථාන මාරුවීමක් සම්බන්ධව තමයි මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙන්නේ. එතුමා අහපු කාරණාවලට මම පිළිතුරු ලබා දෙන්නම්.

01. ගාල්ල හා ත්‍රිකුණාමලය වරායන්වල නේවාසික කළමනාකරු විසින් එම වරායන්වල පුරප්පාඩු කඩිනමින් පුරවන ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානව සම්පත් කොට්ඨාසය වෙත ලිඛිතව ඉල්ලීමක් කර ඇත. ඒ අනුව, එම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු සකස් කරන අවස්ථාවේදී රාජ්‍ය භාණ්ඩාගාරය මඟින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 3/18 අනුව වරාය අධිකාරියේ බඳවා ගැනීම් පටිපාටිය එම දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොමැති බැවින්, එම ක්‍රියාදාමය තාවකාලිකව අත්හිටුවා බඳවා ගැනීම් පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශය යටතේ සකස් කරගෙන ඉදිරි කටයුතු මේ වන විට සිදු කරනු ලබමින් පවතිනවා.

    ඒ අනුව ගාල්ල, ත්‍රිකුණාමලය වරායන්වල සේවාවන් නිසි පරිදි කරගෙන යාම සඳහා දැනට කොළඹ වරායේ සිටින සේවකයන් තාවකාලිකව ස්ථාන මාරු කරන ලදී.

02. සේවකයන් ස්ථාන මාරු කරන විටදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විධිමත් පටිපාටියක් අනුගමනය කරනු ලබන්නේ සේවක අවශ්‍යතාවන් අනුවය.

03. කොළඹ පමණක් නොව අනෙකුත් වරායන් සඳහා සේවක අවශ්‍යතාවන් ඇතිවුණු අවස්ථාවලදී අභ්‍යන්තර අයදුම්පත් කැඳවා එම තනතුරු පුරප්පාඩු පුරවනු ලැබූ අතර, එම තනතුරු සඳහා අභ්‍යන්තර සේවකයන් නොමැති නම් බාහිරව එම තනතුරු පිරවීම සිදු කරනු ලබයි.

    එසේ වුවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 3/18 අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත නොවී ඇති බැවින්, විධිමත් ලෙස පුරප්පාඩු පුරවන තෙක් අදාළ වරායන් දෙකට කොළඹ වරායේ සිටින සේවකයන් ස්ථාන මාරු කරන ලදී.

04. වෘත්තීය සමිති නායකයින්ට වරාය අධිකාරිය තුළ විශේෂ පිළිගැනීමක් ලබා දී ඇති අතර කිසිදු විට ඔවුන් පළිගැනීමක් සිදු කරනු නොලබයි.

05. මෙසේ ස්ථාන මාරු කිරීම සඳහා කිසිදු අසාධාරණ පිළිවෙතක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කර නොමැත.

06. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සියලුම වාත්තීය සමිති සහයෝගයෙන් හා කාර්මික සාමය පවත්වාගෙන යාමට වර්තමානයේ කටයුතු කර ඇති අතර, වෘත්තීය සමිති මර්දනය කිරීමට කිසිදු අවශ්‍යතාවක් මෙම අවස්ථාවේ පැන නැඟී නොමැත.

07. වරාය අධිකාරියේ සේවකයින් අතර ගැටලු නිර්මාණය වන ආකාරයට වැටුප් වැඩි කිරීමක් සිදු කර නොමැති අතර වසර තුනකට වරක් සේවක වැටුප් වැඩි කරනු ලබන්නේ වෘත්තීය සමිති සහ පාලන අධිකාරිය සමඟ ඇති කර ගන්නා වූ සාමුහික ගිවිසුමක් මඟිනි. ඒ අනුව මෙවරද 2018 ජනවාරි මාසයේ සිට ලියා පදිංචි වෘත්තීය සමිති 23 සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඇති කරගත්තා වූ සාමුහික ගිවිසුම මාර්ගයෙන් වැටුප් වැඩි කිරීම සිදු කර ඇති බැවින්, කිසිදු වැටුප් විෂමතාවක් ඇතිවී නොමැත.

    මේ කාරණයට අදාළ තවත් ලියවිලි කිහිපයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාට බලාගන්නත් එක්ක මම ඒ ලියවිලි **සභාගත*** කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**

(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි.

ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## වරප්‍රසාද: 2018.10.09 දින පාර්ලිමේන්තුවට පැමිණීමේදී බාධා කිරීම

## சிறப்புரிமை: 2018.10.09 அன்று பாராளுமன்றத்துக்கு வருகையில் தடை ஏற்படுத்தியமை

## PRIVILEGE: OBSTRUCTION CAUSED ON THE WAY TO PARLIAMENT ON 09.10.2018

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

(மாண்புமிகு சந்திம வீரக்கொடி)

(The Hon. Chandima Weerakkody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට අද දින පාර්ලිමේන්තු සැසිවාරයට සහභාගිවීම සඳහා මා පාර්ලිමේන්තුවට පැමිණෙන අවස්ථාවේ පොල්දූව මංසන්ධියෙන් පාර්ලිමේන්තු පාරට අවතීර්ණ වෙන්න

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

උත්සාහ ගත් වෙලාවේ පොලිස් නිලධාරින් -එතැන හිටපු සියලු දෙනාම නොවෙයි- කිහිප දෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට මා හැඳිනගෙනත් මගේ වාහනය ඇතුළු කරන්න ඉඩ නොදී පාරේ යන වෙනත් වාහන දිගින් දිගටම ඇතුළත් කිරීමට අවස්ථාව ලබාදුන්නා. පාර්ලිමේන්තුවට ඇතුළුවීමට ඇති අවස්ථාව බාධාවට ලක් කිරීම තුළින් මා හට එතැන පවත්වන්නට යෙදුණු උද්ඝෝෂණයකට තල්ලු වෙන්නට සිද්ධ වුණා. ඒ උද්ඝෝෂණයට යොමුවීමට අවස්ථාව ලබාදීම ගැන මහජන නියෝජිතයෙක් හැටියට එක අතකින් සතුටු වුණත්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රී වරප්‍රසාද කඩවීමක් මේ තුළින් සිදුවී ඇති බව ගරු සභාවට කියන්න කැමැතියි.

උද්ඝෝෂණයට මැදිවීමෙන් උද්ඝෝෂණකරුවන් -අපේ අභිංසක විශ්‍රාමිකයන්- මන්ත්‍රීවරයෙක් හැටියට මා වටකරගෙන "ජීවන වියදම වැඩිවීම විශ්‍රාම ගියාම විශ්‍රාමිකයන්ට දැනෙන්නේ නැද්ද; ඒ ජීවන බර විශ්‍රාමිකයන්ට දැනෙන්නේ නැති නිසාද පඩි වැඩිවෙනකොට ඒ වැඩි වෙන පඩිය විශ්‍රාමිකයන්ට වැඩි වෙන්නේ නැත්තේ" කියා මගෙන් ප්‍රශ්න ඇහුවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
වරප්‍රසාද මුවාවෙන් දේශපාලනය කථා කරනවා.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
නැහැ, නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීමක්] මට කථා කරන්න දෙන්න, වෙච්ච දේ ගැන කියන්න දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙච්ච සිද්ධිය ගැන පැහැදිලි කිරීමක් කරනකොට, විශ්‍රාමිකයන්ගේ ප්‍රශ්න ගැන කියනකොට, [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරප්‍රසාද මුවාවෙන් මෙතුමා දේශපාලනය කථා කරනවා. මෙතුමාත් ආණ්ඩුවේ හිටියා. ඔබතුමා ආණ්ඩුවේ හිටියේ ඇයි?

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
හිටියා තමයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා ලජ්ජා නැතුව ආණ්ඩුවේ හිටියා. ඔබතුමාත් කොටස්කාරයෙක් -[බාධා කිරීමක්] ජීවන වියදම වැඩිවෙලා තිබෙනවා කියන කාරණය සම්බන්ධයෙන් ඔබතුමාත් කොටස්කාරයෙක්. අවුරුදු තුනක් මේ පැත්තේ ඉඳලා ලජ්ජා නැතුව විපක්ෂය පැත්තට ගිහිල්ලා කථා කරනවා. ඔබතුමා ගිය ආණ්ඩුවෙත් හිටියා; මේ ආණ්ඩුවෙත් හිටියා. [බාධා කිරීමක්] අවස්ථාවාදීන්; දේශපාලන අවස්ථාවාදීන්. ගිය ආණ්ඩුවෙත් හිටියා; මේ ආණ්ඩුවෙත් හිටියා. දැන් විපක්ෂය පැත්තට ගිහිල්ලා විරුද්ධව කථා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. කරුණාකරලා ඔබතුමාගේ කරුණු ඉදිරිපත් කිරීම වරප්‍රසාද කාරණයට පමණක් සීමා කරන්න.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා, ඔබතුමාත් අපේ පැත්තේ ඉඳලා ගියේ. ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ 2000 වසරේ ක්‍රීඩා ඇමති. අපේ පක්ෂය පාවා දීලා UNP එකට ගියා. ඔබතුමා හෙට මේ පැත්තට එයි ද දන්නෙත් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
මම එක්සත් ජාතික පක්ෂයට ඇවිල්ලා අවුරුදු 15කටත් වැඩියි.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ඔබතුමා අපි ළඟ ඉඳලා ගියේ. ඔබතුමා හෙට ආපසු එයිද දන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. කරුණාකරලා ඔබතුමාගේ කථාව, ඉදිරිපත් කරපු කරුණ සම්බන්ධව විතරක් සීමා කරන්න. කොහොමත් මම මේ කාරණය පිළිබඳව ගරු කථානායකතුමා දැනුවත් කර තිබෙනවා. හෙට මේ ගැන එතුමා කථා කරයි. ඊට අමතරව ඔබතුමා ලිඛිතව ඉදිරිපත් කරපු කාරණය අපි ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මගේ ප්‍රශ්නය වුණේ, පොලීසිය මේ ආකාරයෙන් හැසිරීම තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද

කඩවීමක් සිදු වෙලා තිබෙනවා කියන එකයි. මගේ පමණක් නොවෙයි, අද දින පාර්ලිමේන්තුවට පැමිණි බහුතරයක් මන්ත්‍රීවරුන්ගේ, විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීමක් සිදු වුණා. ඒ තත්ත්වය දිගින් දිගටම ඇතිවීම පාර්ලිමේන්තුවේ ගරුත්වයට හොඳ දෙයක් නොවෙයි. ඒ නිසා මේ සම්බන්ධව ඔබතුමන්ලාගේ කාරුණික අවධානය යොමු කරන්න. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, සභානායකතුමාත් එකතු වෙලා විශ්වාමිකයන්ගේ පඩි ප්‍රශ්නය විසඳන්න කටයුතු කරයි කියලා. ඒකට විරුද්ධ වෙන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(මාණ්පුමිකු ආර්. එම්. පත්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාගේ අවධානයට කරුණක් යොමු කරවන්න මට අවස්ථාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(මාණ්පුමිකු ආර්. එම්. පත්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
මේ, ඔබතුමාගේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක්ද?

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(මාණ්පුමිකු ආර්. එම්. පත්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාත්, ඔබතුමාත් ඉන්න නිසා මම මේ කාරණාව කිව යුතුයි. මීට කලින් පසුගිය පාර්ලිමේන්තු දිනයකදීත් උතුරු-නැඟෙනහිර ප්‍රදේශවල ඉතා වැදගත්, වටිනා පුරාවිද්‍යා උරුමයන් විනාශ කිරීම පිළිබඳව මම සඳහන් කළා. මේ බෞද්ධ උරුමය, [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
දැන් මේ කාරණය ගැන කථා කරන්න ඔබතුමාට අවස්ථාවක් නැහැ.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(මාණ්පුමිකු ආර්. එම්. පත්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
නැහැ, නැහැ. මට ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. ඒ වෙලාවේ ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ගරු ඇමතිතුමා දැන් ගරු සභාවේ ඉන්න නිසා මට මේ ගැන එතුමාගෙන් අහන්න පොඩි වෙලාවක් දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරවීමට අවස්ථාවක් දිය හැකි නම් ඉතා හොඳයි. මොකද, මේ රටේ මේ වන විට වැදගත් කාරණාවක්, [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැනටමත් අපේ කාලය හොඳටම ගෙවී ගොස් තිබෙනවා.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(මාණ්පුමිකු ආර්. එම්. පත්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විනාඩියෙන් අවසන් කරන්නම්. මට විනාඩියක් දෙන්න. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, මම ගිය සතියේ ත්‍රිකුණාමලය සහ මුලතිව් දිස්ත්‍රික්කවලට ගියා. ගරු ඇමතිතුමනි, යම් අන්තවාදී කණ්ඩායම් මැදිහත් වෙලා අපේ රටේ පුරාවිද්‍යා උරුමයන් යම් ආකාරයකින් සංහාරයකට ලක් කරලා තිබෙනවා කියලා මාධ්‍යවලින් පළ වූ රාවය පිළිබඳව ඔබතුමාත්, ගරු අගමැතිතුමාත්, ගරු ජනාධිපතිතුමාත්, මේ පාර්ලිමේන්තුවත්, ගරු කථානායකතුමා ඇතුළු සියලුම දෙනාත් දන්නා කාරණයක්. මෙය ඇත්ත ද, නැත්ත ද කියලා බලන්න මමත්, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජයන්ත සමරවීර මැතිතුමාත් මේ දිස්ත්‍රික්ක දෙකට ගියා. මෙහිදී සිදුව ඇති ඉතා වැදගත්ම ඛේදවාචකය තමයි, යාන්ඔය පුරාණ රජමහා විහාරස්ථානයට අදාළ යාන්ඔය කලාපයේ අක්කර 8ක විතර තිබෙන පුරාවිද්‍යා උරුමයන් සංහාරයට ලක් වෙලා තිබෙන එක, ගරු ඇමතිතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා කථාව අවසාන කරන්න.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(මාණ්පුමිකු ආර්. එම්. පත්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු ඇමතිතුමනි, ඒ කාරණය සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. අනෙක් කාරණය තමයි, මුලතිව් දිස්ත්‍රික්කයේ කුරුඳුමලේ පිහිටා තිබෙන ඓතිහාසික රාජමහා විහාරයේ ක්‍රි.පූ. දෙවැනි, තුන්වැනි සියවසට අදාළ භූමිය අද වන විට දෙමළ සන්ධානයේ රවිහරන් කියන පළාත් සභා මන්ත්‍රීවරයාගේ මැදිහත්වීමෙන් උතුරු පළාත් සභාවේ යෝජනාවක් සම්මත කරලා, පළාත් සභා ප්‍රතිපාදන අරගෙන එතැන පුරාවිද්‍යා උරුමය විනාශ කරන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ බව ඉතා වගකීමෙන් මේ පාර්ලිමේන්තුවේදී මම කියන්නේ. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා මේ සම්බන්ධව උත්තරයක් දෙනවාද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සියලු තොරතුරු ලබා ගැනීමකින් තොරව පැහැදිලි උත්තරයක් දීමට මට අපහසුයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම් දීම. ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා.

# පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

## විසර්ජන පනත් කෙටුම්පත, 2019
### ஒதுக்கீட்டுச் சட்டமூலம், 2019
### APPROPRIATION BILL, 2019

"2019 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු මංගල සමරවීර මහතා විසිනි.***

***2018 නොවැම්බර් 05වැනි සඳුදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர் மாண்புமிகு மங்கள சமரவீர அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2018 நவம்பர் 05, திங்கட்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்படவேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. Mangala Samaraweera, Minister of Finance and Mass Media; to be read a Second time upon Monday, 05th November, 2018 and to be printed and to be referred to the Committee on Public Finance.*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-[බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා අද විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. මම එතුමාගෙන් දැනගන්න කැමැතියි, එතුමා අය වැය කථාව ඉදිරිපත් කරන්නේ කවදාද කියලා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නොවැම්බර් 05වැනි දා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමට මාසයකට පෙරයි විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුව තිබෙන්නේ. විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ ඔක්තෝබර් 09වැනි දා නම්, නොවැම්බර් 05වැනි දා වන විට මාසයක් ගත වෙලා නැහැ. [බාධා කිරීමක්] ඔව්, දින කීපයක් අඩුයි. ඒ නිසා අද විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා නොවැම්බර් 05වෙනි දා අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. මොකද, පාර්ලිමේන්තුවේදී විසර්ජන පනත් කෙටුම්පත පළමුවර කියැවීමෙන් මාසයකට පසුව තමයි අය වැය ලේඛනය ඉදිරිපත් කළ යුතු වන්නේ. ඒ අනුව, ඔක්තෝබර් 09වෙනි දා විසර්ජන පනත් කෙටුම්පත පළමුවර කියවලා, නොවැම්බර් මාසයේ 05වෙනි දාට අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමට හැකියාවක් නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි කථා කරලා, දින ටික හරියට සකස් කර ගන්නම්. ඔබතුමන්ලා අය වැය ඉදිරිපත් කරනවාට විරුද්ධද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ. ඔබතුමා එන්නේ ඔහොමමනේ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමාට තිබෙනවානේ අමුතු උසාවි ගැට.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේක දවස් තුනක ප්‍රශ්නයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. Sir, it is just a matter of three days.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාගේ උසාවි ගැටවලට අපි අහුවෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Member, do not be so technical. ඔය තරමට තාක්ෂණය ගැන-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තමුන්නාන්සේම කියනවා පාර්ලිමේන්තු සම්ප්‍රදායයන්ට ගරු කරන්න, පාර්ලිමේන්තුව තමයි උත්තරීතර කියලා. මේක මාර තැනක් කියලා තමුන්නාන්සේලා කියනවානේ. තමුන්නාන්සේලානේ කියන්නේ. ඒ නිසා මාසයක කාලයක් ලබා දිය යුතු නම්, ඒ මාසයක කාලය ලබා දෙන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එකඟයි, එකඟයි.

## II

## ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පත

### பயங்கரவாத எதிர்ப்பு சட்டமூலம்
### COUNTER TERRORISM BILL

"ත්‍රස්තවාදයෙන් හා ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදිවලින් ශ්‍රී ලංකාව හා ශ්‍රී ලංකාවේ ජනතාව ආරක්ෂා කිරීම සඳහා ද; ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදුකරනු ලබන ත්‍රස්තවාදය හා ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදි වැළැක්වීම සඳහා ද; ශ්‍රී ලංකාවෙන් පිටත ත්‍රස්තවාදය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකාවේ භූමිය සහ එහි ජනතාව භාවිත කිරීම වැළැක්වීම සඳහා ද; ත්‍රස්තවාදී ක්‍රියා සහ ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදි අනාවරණය කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් යම් වරදක් සිදුකර ඇත්තා වූ යම් තැනැත්තකු හඳුනාගැනීම, ග්‍රහණය කර ගැනීම, සිරභාරයට ගැනීම, අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, පරීක්ෂණ පැවැත්වීම, නඩු පැවරීම සහ දඬුවම් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ඉවත්කිරීම පිණිස ද; ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මහතා විසිනි.***

***2018 ඔක්තෝබර් 23වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*වෙළිනාට්ටලුවල්කළ් අමෙච්චර් මාණ්පුමිකු තිලක් මාරපන අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.*

*2018 ඔක්රෝපර් 23, සෙව්වාය්ක්කිළමෙ ඉරණ්ටාම් මුරෙ මතිප්පිටප්පට වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් උරිය තුරෙසාර් මේර්පාර්වෛක් කුළුවුක්කු ආර්රුප්පටුත්තප්පට වේණ්ටු මෙනවුම් කට්ටළෛයිටප්පට්ටදු.*

*Presented by the Hon. Tilak Marapana; to be read a Second time upon Tuesday, 23rd October, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## III

## යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ පනත් කෙටුම්පත

### ஆளொருவரின் இறப்புக்கான சேதவீடுகளை அறவிடுதல் சட்டமூலம்
### RECOVERY OF DAMAGES FOR THE DEATH OF A PERSON BILL

"වෙනත් යම් තැනැත්තකුගේ අයුතු ක්‍රියාවක්, නොකර හැරීමක්, අතපසු කිරීමක් හෝ පැහැර හැරීමක් හේතුවෙන් යම් තැනැත්තකුගේ මරණය සිදුවීම සම්බන්ධයෙන් අලාභ අය කරගැනීම සඳහා සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.***

***2018 ඔක්තෝබර් 23වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*නීති මර්රුම් සිරෛච්චාලෛකළ් මරුසීරමෛප්පු අමෛච්චර් චාර්පාග මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක අවර්කළාල් සమర్ప్పిక్కప్పట్టదు.*

*2018 ඔක්රෝපර් 23, සෙව්වාය්ක්කිළමෙ ඉරණ්ටාම් මුරෙ මතිප්පිටප්පට වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් උරිය තුරෙසාර් මේර්පාර්වෛක් කුළුවුක්කු ආර්රුප්පටුත්තప්පට වේණ්ටු මෙනවුම් කට්ටළෛයිටප්පට්ටදු.*

*Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Justice and Prison Reforms; to be read a Second time upon Tuesday, 23rd October, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්

### பாராளுமன்ற அமர்வு
### SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of the Standing Order No. 8 of the Parliament, the hours of Sitting of Parliament on this day shall be 1.00 p.m. to 7.30 p.m.. At 2.00 p.m. Standing Order No. 8(5) of the Parliament shall operate. At 7.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම

### ஒத்திவைப்பு
### ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභීමුඛ කරන ලදී.***
*විනා எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

### அரையாண்டு அரசிறை நிலைமை பற்றிய அறிக்கை
### MID-YEAR FISCAL POSITION REPORT

[අ.භා. 3.02]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ විධිවිධානවලට අනුව මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබූ වසර මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව අනුව, මූල්‍ය කළමනාකරණය හා සම්බන්ධයෙන්,

(i) සමස්ථ ආර්ථිකයෙහි වර්ධන වේගය පහත වැටී ඇති බැවින්ද;

(ii) රටෙහි මූල්‍ය ඒකකයෙහි බාහිර අගය බරපතළ ලෙස බාදනය වෙමින් පවත්නා බැවින්ද;

(iii) අවිචාරවත් සහ අවිධිමත් බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමෙන් ජනතාව, ව්‍යාවසායකයන් ඇතුළු ආර්ථික ක්‍රියාකරුවන් පීඩාවට පත්ව ඇති බැවින්ද;

(iv) දිනපතා භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම කරනකොටගෙන ජීවන වියදම දැරිය නොහැකි මට්ටමකට ඉහළ ගොස් ඇති බැවින්ද;

(v) සමස්ථ බැංකු ක්‍රමය, ණය ක්‍රමය, මූල්‍ය ක්‍රමය කඩා වැටෙමින් පවත්නා බැවින්ද;

මෙම බරපතළ තත්ත්වය පිළිබඳව මෙකී ගරු සභාවේ පූර්ණ අවධානය යොමු කොට, ඵලදායී විසඳුම් ලබාදීමට ආණ්ඩුවට බල කර සිටිමු."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත අනුව ඉදිරිපත් කළ වසර මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවෙන් සහ අද ආර්ථිකයේ සත්‍ය වශයෙන් සිදුවන දේ අනුවයි. පවතින අනෙක් කරුණු පිළිබඳව ගරු පක්ෂ නායකතුමන්ලා සහ සහෝදර මන්ත්‍රීවරුන් කරුණු ඉදිරිපත් කරයි.

මෙහිදී මා එක කරුණක් කෙරෙහි පමණක් මේ ගරු සභාවේ අවධානය යොමු කරනවා. අපේ රටේ ඕනෑම රජයක ප්‍රධාන මූල්‍ය වගකීම වන්නේ, රටේ මුදලේ ස්ථාවරභාවය ආරක්ෂා කිරීමයි. රට සතු මුදල් ඒකකයේ අභ්‍යන්තර අගය හා බාහිර අගය ආරක්ෂා කිරීමේ පරම යුතුකම හා වගකීම ඉෂ්ට කිරීම තමයි ඕනෑම රජයක ප්‍රධාන වගකීම. ඒ වගකීම පසුගිය කාල පරිච්ඡේදය තුළදී දිගටම ඉෂ්ට කරන්න බැරිවෙලා තිබෙනවා.

ගරු මුදල් අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා මේ සභාවේ ඉන්නවා. මේ ප්‍රශ්නය එතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. අනුන්ගේ තොප්පියක් එතුමා විසින් දමාගෙන අනික් අයට, විපක්ෂයට බැණ-බැණ යනවා. මේ තිබෙන ඇත්ත තත්ත්වය පිළිබඳව ඔබතුමාට බොහොම පැහැදිලිව කිව්වොත්, එතුමා මේ සඳහා වගඋත්තරකරුවකු නොවෙයි කියන එක තමයි මගේ දැනීමේ හා අවබෝධයේ හැටියට සඳහන් කරන්න තිබෙන්නේ.

මක් නිසාද යත්, මේ රුපියලේ වැටීම ආරම්භ වුණේ 2015 වර්ෂයේදීයි. එනම්, මීට වර්ෂ තුනහමාරකට පෙර දින 100 විප්ලවය යටතේයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2012දී මහින්ද රාජපක්ෂ යුගයේදී ඩොලරයේ වටිනාකම රුපියල් 127යි කියලා සඳහන් කරන්න මා කැමැතියි. 2013දී ඩොලරයේ වටිනාකම රුපියල් 130යි. එතකොට වර්ෂයක් තුළදී ඩොලරයකට වැඩිපුර ගෙව්වේ රුපියල් 3යි. 2014දී ඩොලරයේ වටිනාකම රුපියල් 131යි. වර්ෂයක් ඇතුළතදී ඇත්තටම ඩොලරයට වැඩිපුර ගෙවා තිබෙන්නේ රුපියලයි ශත හැත්තෑපහයි. ඊළඟට, 2015දී තමුන්නාන්සේලා රජය භාරගෙන, දින 100 විප්ලවය යටතේ රුපියල් 131ට තිබුණු ඩොලරයට රුපියල් 144ක් ගෙවන්න සිද්ධ වුණා. රුපියල සියයට 9.3කින් ඉතා දැවැන්ත ලෙස කඩා වැටීම ආරම්භ වුණේ 2015දියි. 2015දී මේ තත්ත්වය ඇති වෙන්න කලින් වර්ෂ දෙකේදීම ලංකා මුදල අධිප්‍රමාණ වුණා. රුපියලේ වටිනාකම රුපියල් 127ක් වශයෙන් තිබෙනකොට ජාතියේ ණය බර වැඩි වුණා, රුපියල් බිලියන 204කින්. 2013දී රටේ තිබෙන සමස්ත ණය බර රුපියල් බිලියන 19කින් අඩු වුණා, රුපියල අධිප්‍රමාණ වීම නිසා. ඊළඟට, රුපියල අධිප්‍රමාණ වීම නිසා 2014දී රටේ ණය බර රුපියල් බිලියන 89කින් අඩු වුණා. සංඛ්‍යා දත්ත අනුව 2013දී හා 2014දී රුපියල කඩා වැටෙනවා වෙනුවට අධිප්‍රමාණ වීම නිසා ඉතා පැහැදිලි ලෙස රටේ ණය බර අඩුවෙලා තිබෙනවා. ඊට පසුව, 2015දී රුපියල කඩා වැටුණා; රටේ ණය බර රුපියල් බිලියන 285කින් වැඩි වුණා. 2016දී ඩොලරයේ වටිනාකම රුපියල් 150ක් වුණා; තව රුපියල් 6ක් වැඩිපුර ගෙවන්න වුණා. 2017දී ඩොලරයට රුපියල් 153ක් ගෙවන්න වුණා. අද ඩොලරයට රුපියල් 171ක් ගෙවන්න වෙලා තිබෙනවා. ඒ අනුව 2015 වර්ෂයේදී ජාතියේ ණය බර රුපියල් බිලියන 285කින්, 2016 වර්ෂයේදී රුපියල් බිලියන 187කින්, 2017දී රුපියල් බිලියන 225කින්, මේ වර්ෂයේ ඇස්තමේන්තු අනුව රුපියල් බිලියන 325කින් වැඩිවෙලා තිබෙනවා. රුපියල කඩා වැටීම කරණ කොටගෙන දැනට ණය බර පමණක් රුපියල් බිලියන 1,022කින් වැඩිවෙලා තිබෙනවා. මේක තමයි ඇත්ත තත්ත්වය.

**ගරු කබීර් හාෂිම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development)

ගරු මන්ත්‍රීතුමනි, රුපියල අවප්‍රමාණ වීම පිළිබඳවයි ඔබතුමා කථා කරන්නේ. ආර්ථික විශ්ලේෂකයකු හැටියට ඔබතුමා දන්නවා, මේවා ආර්ථික න්‍යායයන් අනුව පාවිච්චි කරන යාන්ත්‍රණ කියලා. 1994දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඉවත්වෙලා අලුත් ආණ්ඩුවක් බලයට පැමිණි වෙලාවේ ඩොලරයේ වටිනාකම රුපියල් 49.40යි. 2015දී ඔබතුමන්ලා අපට ආණ්ඩුව භාර දෙනකොට ඩොලරයේ වටිනාකම රුපියල් 138යි. එතකොට රුපියල අවප්‍රමාණ වුණේ රුපියල් 89කින්. ඒකට උත්තර දෙන්නේ කොහොමද? ඒ අනුව 1994 සිට 2014 වනකොට ණය ප්‍රමාණය කොපමණ වැඩිවෙලා ඇද්ද?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මගේ වෙලාවයි ගතවෙන්නේ.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඒ නිසා මේවා ප්‍රායෝගික ප්‍රශ්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ඒකට උත්තරය මෙකයි. ඒ මුළු කාල පරිච්ඡේදය තුළ තමන්ගේ ආණ්ඩු කාලයේ දී සමස්ත රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ ඇති වෙච්ච වෙනස මොකක්ද කියලා බලන්න ඕනෑ. 2015දී මේ රටේ විනිමය අනුපාතය අනුව ඩොලරයකට ගෙව්වේ රුපියල් 105යි. මහින්ද රාජපක්ෂ අවුරුදු 10ක් ආණ්ඩු කරද්දි දැවැන්ත අර්බුද රාශියක් තිබුණා. ඉන් එක් අර්බුදයක් තමයි, ලෝක වෙළෙඳ පොලේ අසාමාන්‍ය ලෙස බනිජ තෙල් මිල වැඩි වීම නිසා තෙල් ගෙන ඒම සඳහා වර්ෂයකට බිලියන 5කට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් ගෙවන්න සිදු වීම. ලෝක බනිජ තෙල් අර්බුදයක් තිබුණා; ලෝක ආහාර අර්බුදයක් තිබුණා. රොකට් වේගයෙන් ආහාරවල මිල ඉහළ ගියා. ලංකාවට ගෙන්වන ආහාරපාන සඳහා වැඩි විදේශ විනිමයක් ගෙවන්න සිදු වුණා. 2007 ඉඳලා ලෝකයේ මූල්‍ය වෙළෙඳ පොළ කඩා වැටිලා, මූල්‍ය අර්බුදයක් ඇති වුණා. ඇමෙරිකාවේ විතරක් බැංකු 450ක් බංකොලොත් වුණා. Lehman Brothers බංකොලොත් වුණා; Mutual Bank බංකොලොත් වුණා. ජාත්‍යන්තර අර්බුදයක් නිසා ලෝක මූල්‍ය වෙළෙඳ පොළ කඩාගෙන වැටුණා. යුද්ධය තිබුණා.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

මේ සියල්ල තිබියදී, මහින්ද රාජපක්ෂ අවුරුදු 10ක් ආණ්ඩු කරලා අවසාන වනකොට ඩොලරයට ගෙව්වේ රුපියල් 131යි. ඩොලරයක් රුපියල් 105ට ගත්තේ. ඩොලරයක් රුපියල් 131ට දුන්නේ. අවුරුදු 10ක් තුළ වැඩිපුර දීලා තිබෙන්නේ රුපියල් 26යි. ඒක තමයි ඇත්ත. මුලින්ම ඩොලරයට ගෙව්වේ රුපියල් 105යි. ඊට පස්සේ බාර දෙන කොට ඩොලරයේ වටිනාකම රුපියල් 131යි. දැන් ඩොලරයේ අගය රුපියල් 171 කිව්වාම, අවුරුදු 4ක් ගත වෙන්න කලින් රුපියල් 40ක් ඩොලරයට වැඩිපුර ගෙවන්න වෙලා තිබෙන එක තේරෙන්න එපායැ. මේක නේ ප්‍රශ්නය. දැවැන්ත අර්බුදයක් තිබුණත්, අවුරුදු 10ක් තුළදී ඩොලරයේ අගය ඉහළ ගියේ රුපියල් 105 සිට රුපියල් 131 දක්වා රුපියල් 26කින් පමණයි.

තමුන්නාන්සේලා 2015 මේ රට බාර ගන්න කොට ලෝක ඛනිජ තෙල් අර්බුදයක් තිබුණේ නැහැ; ලෝක ආහාර අර්බුදයක් තිබුණේ නැහැ; ලෝක මූල්‍ය අර්බුදයක් තිබුණේ නැහැ; යුද්ධය පිළිබඳ අර්බුදයක් තිබුණේ නැහැ. ඒ වනවිට තිබුණු අර්බුදය මොකක්ද? කිසිම අර්බුදයක් නැති රටක් බාර ගෙන, දින සියයේ විප්ලවය යටතේ පළමුවෙන්ම සිදු වුණේ මොකක්ද? ගරු අග්‍රාමාත්‍යතුමා මේ රටේ සමස්ත මුදල් ක්‍රමය, බැංකු ක්‍රමය, ණය ක්‍රමය පාලනය කිරීම සඳහා සිංගප්පූරු ජාතික අර්ජුන මහේන්ද්‍රන් මහතාව පත් කළා. එතුමා විසින් පෙබරවාරි මාසයේ 27 වැනිදා මහ දවල් මහ බැංකුවේ මහා මුදල් මංකොල්ලය සිදු කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් එදා භාණ්ඩාගාර බිල්පත්වල විදේශිකයන් ආයෝජනය කරලා තිබුණු සල්ලි -රුපියල් බිලියන 381.7ක්- ආපසු අරගෙන ගියා. භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කරලා තිබුණු රුපියල් බිලියන 711.8ක මුදලක් අරගෙන ගියා. මහ බැංකුවේ ඇති වෙච්ච විශ්වාසනීය බව පළුදු වීම කරණ කොටගෙන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරලා තිබුණු රුපියල් බිලියන 1,093.5ක මුදල වර්ෂයක් තුළදී අරගෙන ගියා. ඒකයි ඇත්ත කථාව. ඊළඟට, කොටස් වෙළෙඳ පොළේ විදේශිකයන් සතුව තිබුණු කොටස්වලින් රුපියල් බිලියන 90ක කොටස් විදේශිකයන් විකුණලා දැම්මා, ශ්‍රී ලංකාව පිළිබඳව තිබෙන විශ්වාසනීය බව කඩා වැටීම නිසා. ඒකට මංගල සමරවීර ඇමතිවරයාගේ කිසිම සම්බන්ධයක් නැහැ. ඒකට සම්බන්ධ වෙච්ච අය අද එතුමාට ඇඟිල්ල දිග් කරනවාට මම විරුද්ධයි. ඒකට හේතුව මොකක්ද? ඇත්ත කතන්දරය මේකයි. මහ දවල් මහ බැංකුව මංකොල්ල කාලා, සමස්ත බැංකු ක්‍රමය, ණය ක්‍රමය, මුදල් ක්‍රමය පිළිබඳව ලෝකයේ තිබෙන විශ්වාසනීය භාවය අඩු වීමේ අර්බුදයේ -චක්‍රීය ක්‍රියාවලියක- අවසාන ප්‍රතිඵලය ලෙස අද කළු කඩේ ඩොලරය රුපියල් 180ට ඉහළ ගිහිල්ලා තිබෙනවා.

මේ තත්ත්වය තුළ එදා කරපු විනාශය දිහා බලන්න. නිදහසින් පස්සේ අපේ රට වර්ෂයක් තුළදී ලබා ගත් වැඩිම ණය ප්‍රමාණය 2015 වර්ෂයේ දී ලබා ගත්තා. ඇමෙරිකානු ඩොලර් මිලියන 1,112ක් ණය ලබා ගත්තා. මම වැරැදි නම් නිවැරැදි කිරීම සඳහා මේ ගරු සභාවට සම්පූර්ණ අවස්ථාව ලබා දෙනවා. නිදහසින් පසුව ශ්‍රී ලංකා ඉතිහාසයේ කිසිම රජයක් වර්ෂයක් තුළදී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,112ක ණයක් ලබාගෙන නැහැ. 2014 වර්ෂයේදී මහින්ද රාජපක්ෂ ඒ වර්ෂයේ අය වැය හිඟය මූල්‍යකරණය සඳහා විදේශයන්ගෙන් ගත්තේ ඇමෙරිකානු ඩොලර් බිලියන 20යි. 2015 වර්ෂයේදී විදේශවලින් බිලියන 222ක් ගත්තා. එක වර්ෂයක් තුළදී සියයට 1,000කට වඩා වැඩිය විදේශ ණය ගෙවීමේ වාර්තාව තබා තිබෙන්නේත් 2015 වර්ෂයයි. ඒ විතරක් නොවෙයි, අපේ රට වෙනුවෙන් ජාත්‍යන්තර මුදල් වෙළෙඳ පොළට ගිහිල්ලා ණය ගන්න කොට ස්වෛරීත්ව බැඳුම්කර -Sovereign Bonds- issue කරනවා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට 2015දී සියයට 6.85ක -සියයට 7- ගිනි පොලියට තමයි මේ මුදල ගත්තේ.

අද වෙනකොට කරලා තිබෙන විනාශය බලන්න. Sovereign Bonds issue කරලා විතරක් 2015 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 2,150ක්; 2016 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක්; 2017 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක්; 2018 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 2,500ක් අරගෙන තිබෙනවා. දැනට විදේශ මුදල් වෙළෙඳ පොළට ගිහිල්ලා ගිනි පොලියට අරගෙන තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 6,650ක්. බිලියනවලින් 6.6ක් අරගෙන තිබෙනවා, මේ කෙටි කාල පරිච්ඡේදය තුළදී. මෙහෙම එකක් ඉතිහාසයේ වෙලා නැහැ. ඒ නිසා අද ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගිහිල්ලා Sovereign Bond එකක් issue කරන්න බැරිවීම කරණ කොටගෙන, ශ්‍රී ලංකා මහ බැංකුව -Central Bank එක- තීන්දුවක් අරගෙන තිබෙනවා, Panda Bond එකක් issue කරන්න. ඒ කියන්නේ අපේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගිහිල්ලා බැඳුම්කරය විකුණන්න බැරි තත්ත්වයක් ලංකා ආණ්ඩුවට ඇති වුණාට පසුව, -චීනයට එළව-එළවා ගහමින්, චීනය ණය උගුලකට හසු වෙලා තිබෙනවාය කියමින්, චීනය අපව කම්බස් කරලා තිබෙනවාය කියමින්- චීනයේ මධ්‍යම බැංකුවට කියනවා, Panda Bond එකක් issue කරන්න කියලා. Panda Bond එක කියන්නේ මොකක්ද? ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් චීන ආණ්ඩුව චීනයේ බැඳුම්කරයක් නිකුත් කරනවා. චීන ජාතිකයෝ ඒ බැඳුම්කරයට යුආන්වලින් ගෙවනවා. එතකොට චීනයේ තිබෙන මධ්‍යම බැංකුව ලංකා ආණ්ඩුවට ඩොලර්වලින් ණය දෙනවා. ලංකා ඉතිහාසයේ මෙහෙම වෙච්ච දවසක් තිබුණා කියලා කාට හරි කියන්න පුළුවන්ද? තමන්ගේ රටට අවශ්‍ය ණය තමන්ගේ රටේ මධ්‍යම බැංකුවට සපයා ගන්න බැරුව වෙන රටකට භාර දීලා තිබෙනවා. රජයේ බැංකුකරු, රජයේ මූල්‍ය නියෝජිතයා, රජයේ -

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම නොමඟ යවනවා. මම මීට වඩා වේලාව ගන්නේ නැහැ. මම පසුව පිළිතුරු දෙන්නම්.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
හොඳයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය නම් අවසානයි.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට විනාඩි 14යි ලබා දීලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කරන කෙනා වශයෙන් මම තව විනාඩි පහක කාලයක් ලබා ගන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කාගෙන්ද, ඒ වේලාව ලබා ගන්නේ?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
අපේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලබා දී තිබෙන වේලාවෙන් විනාඩි පහක් අඩු කරන්න.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
කාගෙන්ද? නම කියන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මෙම යෝජනාවෙන් - [බාධා කිරීම්] එහෙම කරන්න බැහැනේ. [බාධා කිරීම්] ඒකාබද්ධ විපක්ෂයෙන් - [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කිහිප දෙනෙකුගෙන් අඩු කර ගන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
කිහිප දෙනෙකුගෙන් අඩු කරන්න, විනාඩි පහක්. [බාධා කිරීම්] මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගෙන් අඩු කර ගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ඔබතුමා කථා කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ අපි. [බාධා කිරීම්]

ඊළඟට, රුපියල බෙරා ගැනීම සඳහා පමණක් තිබුණු ඇමෙරිකානු ඩොලර් මිලියන 3,249.3ක් -බිලියන තුනක්- තමුන්නාන්සේලා 2015 වර්ෂයේ දී -එක වර්ෂයක් තුළ - වෙළෙඳ පොළට දමා පිවිවුවා. එතකොට විදේශ ණය ගෙවීම පිළිබඳව කිසිම අර්බුදයක් තිබුණේ නැහැ. ඇයි? ලංකා ඉතිහාසයේ ඛනිජ තෙල් මිල අඩුවීමේ වැඩිම වාසිය ලැබුණේ තමුන්නාන්සේලාගේ රජයට. 2015 වර්ෂයේ දී පමණක් ඛනිජ තෙල් මිල අඩුවීම නිසා රට ඇතුළේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.9ක මුදලක් ඉතුරු වුණා. ඊට පසුව 2017 සහ 2018 වර්ෂවල තෙල් මිල අඩුවුණා. මංගල සමරවීර ඇමතිතුමාට මා කියනවා, මම වැරදි නම් නිවැරදි කරන්න කියලා. තෙල් ගෙන්වන්න රටින් පිටට ගිය සල්ලි ප්‍රමාණය මහින්ද රාජපක්ෂ යුගයේ දී තිබුණාට වඩා ඩොලර් බිලියන 5.3ක මුදලක් 2015, 2016 හා 2017 යන අවුරුදුවල දී රට තුළ ඉතුරු වෙලා තිබෙනවා. මේ මූල්‍ය අර්බුදය ඇතිවෙලා තිබෙන්නේ 2015 ඇති කරපු මහ බැංකු මහා මුදල් මංකොල්ලය සහ අසාමාන්‍ය ලෙස ගිනි පොලියට ණය ලබා ගැනීම නිසායි. මේ ණය උගුල පිළිබඳව සම්පූර්ණ වගකීම දැරිය යුත්තේ කවුද? 2015,2016, 2017 අවුරුදුවලදී සිදු වුණු හා 2018 අවුරුද්දේ සිදුවෙමින් පවතින මේ මහා විනාශය නිසා අද මේ රටේ කර්මාන්තයෙන් කර්මාන්තය කඩා වැටෙනවා. කර්මාන්තවල නිෂ්පාදන පිරිවැය වැඩි වෙනවා. අමු ද්‍රව්‍ය ගෙන්වන්න බැහැ. පරිභෝජන භාණ්ඩ ගත්තොත්, සීනි, පිටි ඇතුළු සියලුම පරිභෝජන භාණ්ඩ ගෙන්වීම සඳහා මහින්ද රාජපක්ෂ යුගයේ දී ගෙව්වාට වඩා වැඩිපුර රුපියල් 40ක් ඩොලර් එකක් වෙනුවෙන් ගෙවන්න සිද්ධ වෙනවා. එතකොට ඒ හැම පරිභෝජන භාණ්ඩයකම මිල වැඩි වෙනවා. පොහොර, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් වැනි අත්තර් භාණ්ඩ ගත්තාම ඒවා ගෙන්වීමේදී ඒ හැම එකකටම මහින්ද රාජපක්ෂ යුගයට වඩා වැඩිපුර රුපියල් 40ක් සෑම ඩොලර් එකක් වෙනුවෙන්ම ගෙවන්න සිදු වෙනවා. යන්ත්‍ර-සූත්‍ර, උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය, මෝටර් වාහන ගත්තොත් ඒවා ගෙන්වීමේදී මහින්ද රාජපක්ෂ යුගයේ දී ගෙව්වාට වඩා රුපියල් 40ක් වැඩිපුර ගෙවන්න සිදු වෙනවා, හැම ඩොලර් එකකටම. ඒ නිසා ඇතිවන ජීවන වියදමේ මේ අර්බුදය පාලනය කරගන්න බැරි වෙලා, නිල විනිමය වෙළෙඳ පොළ හා කොටස් වෙළෙඳ පොළ කඩා වැටිලා, ඒ වෙනුවට අද කළු කඩ වෙළෙඳ පොළ ඉතා විශාල ලෙස සක්‍රිය වෙලා තිබෙනවා.

අද පිටකොටුවේ විදේශ විනිමය කළු කඩයක් තිබෙන බව කවුරුත් දන්නවා. විදේශ රැකියාවකට ගිහින් එන කෙනෙක්, නැත්නම් වෙනත් රටකින් එන කෙනෙක් බැංකුවට ගිහින් ගන්නවාට වඩා වැඩි මුදලක් ගන්න යන්නේ පිටකොටුවටයි. එතැන ඩොලරයකට කීයක් ගෙවනවාද? රුපියල් 174ක්, 175ක් ගෙවනවා. අද උදේ පිටකොටුවේ රුපියල් 174ක්, 175ක් ගෙව්වා. ඒ අය උණ්ඩියල් ක්‍රමයට සහ වෙනත් විවිධ අයථා ක්‍රමවලිනුයි රටින් පිටට මුදල් යවන්නේ. අද රුපියල් 180ටයි ඩොලරය විකිණෙන්නේ. පිටකොටුවේ තිබෙන මේ කළු කඩය මහ බැංකුව ඉදිරිපිටයි තිබෙන්නේ. එය කවුරුත් දන්නා කළු කඩයක්. ඒ තුළින් තමයි විදේශ විනිමය විශාල ප්‍රමාණයක් පිටට යන්නේ. විනිමය පාලන පනත මේ විධියට ලිහිල් කරන්න එපාය කියා අපි මේ ආණ්ඩුවට කිව්වා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ විතරක් නොවෙයි, විනිමය පාලන පනත ලිහිල් කරනකොට අපි **ශ්‍රේෂ්ඨාධිකරණයටත්** ගිහින් මේ කාරණා කිව්වා. මේ විධියට මුදල් රටින් පිටට යන්න පටන් ගත්තාම, සෝරෝස්ලා නායිලන්තයේ ආර්ථිකය කඩා වැටිටුවා වාගේ, මේ රට කඩා වැටෙයි කියා අපි කිව්වා. තමුන්නාන්සේලා සෝරෝස්ලාට මේ රටට එන්න කියා ආරාධනා කරලා, ඒ ගොල්ලෝ ලංකාවට ඇවිත් දේශන පවත්වලා ගියා. දැන් වක්කඩ කැඩුවා වාගේ අපේ සල්ලි පිටට යන්න පටන්ගෙන තිබෙනවා. මේ නිදහස් වෙළෙඳ ගිවිසුම් අත්සන් කළොත්, අත්සන් කරලා තිබෙන ඒවා ක්‍රියාත්මක කළොත්, ඩොලරය රුපියල් 200ට යන එක කිසි කෙනෙකුට නතර කරන්න බැහැ. තමුන්නාන්සේලා සිංගප්පූරු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම, "එට්කා" ගිවිසුම, චීන ගිවිසුම, තායිලන්ත ගිවිසුම කියලා ඔක්කෝම ගහලා මේවා නිදහස් කරන්නකෝ. මේ නිදහස් කිරීමේ අවසාන ප්‍රතිඵලය වන්නේ මේ රටේ ජනතාවට දැරිය නොහැකි පීඩනයක් ඇති වෙලා, ස්වජාතිකයෝ වැනසිලා, විදේශිකයන් සනසන ප්‍රතිපත්තියක් ඇතිවීමයි. එය වෙනස් නොකරන තාක් කල් මේ මූල්‍ය අර්බුදයට තමුන්නාන්සේලාට විසඳුමක් හොයන්න නොහැකියි කියන කාරණය සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට යෝජනාව ස්ථිර කිරීමට, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.20]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ආර්ථිකය තුළ ඇතිවී තිබෙන අර්බුදය පිළිබඳව ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරන කරමින්, ඒ පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පෙර මා මෙම කරුණ සඳහන් කරන්න ඕනෑ. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දී තිබෙන තීන්දුව අද ඔබතුමා විසින් මෙම ගරු සභාවට දැනුම් දෙනු ලැබුවා. එම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන වගන්ති ගණනාවක්ම පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත වීම අවශ්‍ය බවට අමතරව, ජනමත විචාරණයක්ද අවශ්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරණය පාර්ලිමේන්තුවට දැනුම් දී තිබෙනවා.

අපේ රටේ මූලික නීතිය අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. ඒක අපි කවුරුත් යටත් නීතියයි. 1978දී ඉදිරිපත් කර තිබෙන මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවවත්, ජනමත විචාරණයකින් සම්මත වූවක් නොවෙයි. ඉන් අනතුරුව ඒකට සංශෝධන 19ක් ගෙනැත් තිබෙනවා. ඒ සංශෝධන දහනවයම ජනමත විචාරණයකට තුඩු දීලා නැහැ. ඒ අනුව, දැනට අපි කවුරුත් යටත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කිසිසේත්ම ජනතාවගේ අනුමැතියට ලක් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නොවෙයි. නමුත්, මේ ඉදිරිපත් කරන ලද විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ වගන්ති ගණනාවකට ජනමත විචාරණයක් අවශ්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරණය දැනුම් දී තිබෙනවා. මම හිතන විධියට ඒක හොඳයි. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කියන්නේ රටේ මූලික නීතිය නම්; රටේ ජනතාව සියලුදෙනා යටත් නීතිය නම් එය ජනමත විචාරණයකට ලක් කොට සම්මත කරගැනීම වඩාත් යෝග්‍යයි කියන එක අපත් විශ්වාස කරනවා.

දැන් මේ පාර්ලිමේන්තුවට කාර්ය භාරයක් පැවරී තිබෙනවා. ඒ කියන්නේ, ජනමත විචාරණයට යාමට පෙර යම් කඩුල්ලක් පන්නන්න තිබෙනවා. ඒ කඩුල්ල තමයි, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර ඡන්දයකින් එය සම්මත වීම අවශ්‍ය වීම. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක අනුමැතිය ලැබුණොත් විතරයි මෙය ජනමත විචාරණයට යොමු වන්නේ. ඒ නිසා පාර්ලිමේන්තුවේ කිසි කෙනෙකු මෙයට බාධා කරන්න එපාය කියා මම ඉල්ලා සිටිනවා. පාර්ලිමේන්තුවේ සිටින 225දෙනා මේක අතට අරගෙන බාධා කරනවා වෙනුවට, මෙය ජනතාව හමුවට දෙන්න ඕනෑ. ජනතාව හමුවට යන්න තිබෙන දොරටුව පාර්ලිමේන්තුවේ 225දෙනාගේ අභිමතය පරිදි වහන්න එපා. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත වීම ලබා දුන්නොත් මෙය ජනමත විචාරණයකට ලක් වෙනවා. කවුරු හෝ කෙනෙක් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්ද බලය ලබාදෙන්න සූදානම් නැත්නම්, එයින් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි. මේ යෝජනාව ජනතාව හමුවට ගෙන යන්න භයයි කියන කාරණයයි එයින් පෙන්නුම් කරන්නේ. මෙම යෝජනාව ජනතාව සමඟ සාකච්ඡා කරන්න අප සූදානම්.

අද මේ පාර්ලිමේන්තුවේ සිටින දේශපාලන කණ්ඩායම් දිහා බලන්න. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඒ එක කණ්ඩායමකට නායකත්වය දෙනවා; මහින්ද රාජපක්ෂ මහත්මයා තව කණ්ඩායමකට නායකත්වය දෙනවා; රනිල් වික්‍රමසිංහ මහත්මයා තව කණ්ඩායමකට නායකත්වය දෙනවා පාර්ලිමේන්තුවේ ප්‍රධාන කණ්ඩායම් තුනට නායකත්වය දෙන මේ තිදෙනාම විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා අවස්ථා ගණනාවකදීම ජන වරම් ලබාගත් අයයි.

ඒ නිසා අපි කියන්නේ, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්ද බලය හමුවේ මෙය block කරන්නේ නැතිව; පාර්ලිමේන්තුව ඒ දොරටුව වහන්නේ නැතිව පාර්ලිමේන්තුවෙන්ම ජනතාවට අවස්ථාවක් ලබා දෙන්න කියායි. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ජනතාව හමුවේ සම්මත කර ගත හැකි වෙයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා. එම නිසා මෙය විවාදයට ගන්නා අවස්ථාවේදී එයට කිසිසේත්ම බාධා නොකරන ලෙස පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225දෙනාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ආර්ථිකය පිළිබඳව අද දින ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාවේදී කරුණු දක්වලා, අවසානයේදී බන්දුල ගුණවර්ධන හිටපු අමාත්‍යතුමා පෙන්වා දෙනු ලැබුවා, වර්තමාන ආණ්ඩුව අනුගමනය කරමින් තිබෙන ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රතිවිපාකවලට අපි මුහුණ දෙමින් සිටින බව. ඒක ඇත්ත. හැබැයි, වර්තමාන ආණ්ඩුව පමණක් අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රතිවිපාකවලට අපි මුහුණ දී තිබෙනවාය කියා අපි කිසිසේත්ම විශ්වාස කරන්නේ නැහැ. වර්තමාන ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය, එහි අකාර්යක්ෂමතාව, ආර්ථිකය පිළිබඳ ඔවුන්ගේ දැක්ම, ආර්ථිකය මෙහෙයවීම සඳහා ආණ්ඩුවේ තිබෙන වුවමනාව යන සාධක මෙම අර්බුදය තීව්‍ර කිරීමට හේතු සාධක වී තිබෙන බව ඇත්තයි; මෙම අර්බුදය තීව්‍ර කිරීමට, වර්ධනය කිරීමට ඒ දේවල් හේතු වී තිබෙනවා. හැබැයි, මේ අර්බුදයේ මුළු හේතුවම මේ අවුරුදු තුනහමාරයි කියා අපි සැලකුවොත් එය වැරැදියි. මේ, තමුන්නාන්සේලා දිගු කාලයක් නිස්සේ අනුගමනය කරමින් තිබෙන ආර්ථික ප්‍රතිපත්තියේ වැරැද්දයි.

"රුපියලේ අගය කඩා වැටීම ආර්ථික අර්බුදයක් නොවෙයි" කියා මුදල් අමාත්‍යතුමා පසුගිය දා පුවත් පත්වලට කියා තිබුණු ආකාරය මම දැක්කා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මම කියන්නේ ඒක ආර්ථික අර්බුදයක් නොවෙයි, ආර්ථික අභියෝගයක් කියායි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
රුපියලේ අගය කඩා වැටීම ආර්ථික අර්බුදයක් නොවෙයි, ආර්ථික අභියෝගයක් කියා ගරු මුදල් ඇමතිතුමා කියනවා. අභියෝග එන්නේ අර්බුදවලටයි. අර්බුදයක් නැත්නම් අභියෝගයක් නැහැ. අභියෝග එන්නේ අර්බුදයක් තිබෙන නිසායි, ගරු ඇමතිතුමනි.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අභියෝගයට මුහුණ නොදුන්නොත් අර්බුදයක් ඇති වෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

රුපියලේ අගය කඩා වැටීම අපේ රටේ සමස්ත ආර්ථිකය මුහුණ දී තිබෙන අර්බුදයේ ප්‍රකාශනයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික අර්බුද, ආර්ථික තලයේම විසඳෙනවා නම් අපට හොඳයි. ධන-ඍණ ඇතුළේ; ආනයන-අපනයන ඇතුළේ; එහෙම ඒවා විසඳෙන්නේ නැහැ. ආර්ථික අර්බුද අනිවාර්යයෙන්ම පෙරළා ජනතාවගේ ජීවිතවලට බලපෑම් කරමින් තිබෙනවා. එම බලපෑම තමයි ආර්ථික අර්බුදයේ ප්‍රකාශනය. අද අපේ රටේ ඇතිවී තිබෙන ආර්ථික අර්බුදයේ ප්‍රකාශනය අපට පෙන්නුම් කරමින් තිබෙනවා. පසුගිය වසරේ 30,000ක් පමණ වූ විශාල රැකියා ප්‍රමාණයක් අපට අහිමි වී තිබෙනවාය කියා වාර්තාවක සඳහන් වී තිබෙනවා මා දැක්කා. ඒ කියන්නේ, factories වැහිලා තිබෙනවාය කියන එකයි. සමහර ඒවායේ සේවා කප්පාදුවට ලක් කර තිබෙනවා. ඒ, ආර්ථික අර්බුදයේ ප්‍රකාශන; ඒ අයගේ රැකියා අහිමි වීම. නව රැකියා උත්පාදනය ගත්තොත්, රාජ්‍ය අංශයේ කිසිදු වැදගත්කමක් නැති ආයතන පිරවීමේ දේශපාලන පත්වීම් හැරුණුකොට රටේ ආර්ථික වර්ධනයේ ප්‍රතිඵලයක් හැටියට රැකියා නිර්මාණය වීමක් සිදු වන්නේ නැහැ. එය ආර්ථික අර්බුදයේ ප්‍රකාශනයක්.

අද වන විට බහුදින ධීවර යාත්‍රා හිමියන් තමයි අපේ රටට විශාල මාළු අස්වැන්නක් ගෙනැත් දෙන්නේ. මම මීට කලිනුත් පාර්ලිමේන්තුවේදී මේ පිළිබඳව පෙන්වා දුන්නා. මේ ඩීසල් මිලට තෙල් ගහලා මුහුදු ගිහින් අල්ලන මාළු අස්වැන්න තමන්ගේ ජීවිකාව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් නැහැ කියමින් ඔවුන් පාරට බැස උද්ඝෝෂණ කර තිබෙනවා. අද බහුදින ධීවර යාත්‍රා විශාල ප්‍රමාණයක් තොටුපළවල නැංගුරම් ලා තිබෙනවා. අපේ දිලිප් වෙදආරච්චි රාජ්‍ය අමාත්‍යතුමා මම මේ කියන කාරණා සමඟ එකඟ වෙයි කියා මා හිතනවා. බහුදින ධීවර යාත්‍රා විශාල ප්‍රමාණයක් අද නැංගුරම් ලා තොටුපළවල නතර කරලායි තිබෙන්නේ. එය ආර්ථික අර්බුදයේ ප්‍රකාශනයක්. ඒක අර්බුදයක් නොවෙයි කියන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැයි මාසයේ සිට මේ දක්වා වූ මාස පහ ඇතුළත රුපියල් 95ට තිබුණු ඩීසල් ලීටරය රුපියල් 123 දක්වා, රුපියල් 28කින් -සියයට 30කින්; තුනෙන් එකකින්- වර්ධනය වී තිබෙනවා. එය ආර්ථික අර්බුදයේ ප්‍රකාශනයක්. ඈත ගම්වලට ගිහින් බැලුවාම අපට පෙනෙනවා, ඒ ජනතාවට එදිනෙදා තමන්ගේ ජීවිතය පවත්වා ගැනීමට තිබෙන ආදායම් මාර්ග පවා ඇහිරී තිබෙන බව. අද කුඩා ව්‍යාපාර කඩා වැටී තිබෙනවා. මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර තිබුණා නම්, එම ව්‍යාපාරවල ආදායම අහිමි වී තිබෙනවා. එම නිසා සමස්ත ආර්ථික අර්බුදයක් අපේ රටේ තිබෙනවා.

මේ ආර්ථික අර්බුදයට එක් හේතුවක් තමයි, අපේ නිෂ්පාදනය කඩා වැටීම. දෙවැනි කාරණය, අපේ ආනයන අපනයන වෙළෙඳ පොළේ ඇති වී තිබෙන අර්බුදයයි. තුන්වැනි කාරණය, ආදායම් බෙදී යාමේ විෂමතාවයි. හතරවැනි කාරණය, රාජ්‍ය ආදායම අඩුවීමයි. පස්වැනි කාරණය, අපේ රට ලෝකයේ වෙළෙඳ පොළෙන් පංගුවක් අත්පත් කර ගැනීමට අසමත් වීමයි. මම මේ එකින් එක ගැන විස්තර කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු පියංකර ජයරත්න මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු පියංකර ජයරත්න මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු පියංකර ජයරත්න මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பியங்கர ஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. PIYANKARA JAYARATNE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

වර්තමාන නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වී හිටපු නියෝජ්‍ය කථානායකතුමකු මූලාසනයට පැමිණියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියමින් හිටියේ රුපියල කඩා වැටීමේ අර්බුදය ගැනයි. දැන් රජය නිරන්තරයෙන් ඔප්පු කරන්න හදනවා, ජාත්‍යන්තර වෙළෙඳ පොළේ ඩොලරය ශක්තිමත් වීම හේතුකොටගෙනයි ලංකාවේ රුපියල කඩා වැටෙන්නේ කියා. ඒකේ යම් අර්ධ සත්‍යයක් තිබෙනවා. හැබැයි, ඒක මුළුමනින්ම සත්‍ය නොවෙයි. ඩොලරයට සාපේක්ෂව යූරෝ එක කඩා වැටෙනවා. හැබැයි, යූරෝ එකට සාපේක්ෂවත් රුපියල කඩා වැටෙනවා. ඩොලරයට සාපේක්ෂව පවුම කඩා වැටෙනවා. හැබැයි, පවුමට සාපේක්ෂවත් රුපියල කඩා වැටෙනවා. ඩොලරයට සාපේක්ෂව බංග්ලාදේශයේ ටකා මුදල් ඒකකය කඩා වැටෙනවා. හැබැයි, බංග්ලාදේශයේ මුදල් ඒකකයට සාපේක්ෂවත් රුපියල කඩා වැටෙනවා. ඒ කියන්නේ මොකක්ද? ඩොලරය ස්ථාවර වීම අපේ රුපියලට යම් බලපෑමක් ඇති කර තිබෙනවා කියන එකයි. හැබැයි, රුපියල කඩා වැටීමට හේතුව එය පමණක්ද? ඇමෙරිකා එක්සත් ජනපදය විසින් ගනු ලබන තීන්දු, තීරණවල ප්‍රතිඵලයක් ලෙස රුපියල කඩා වැටෙනවා කියා තමුන්නාන්සේලා රටට ඉදිරිපත් කරනවා නම්, ඒක අර්ධ සත්‍යයක් මිස සම්පූර්ණ සත්‍යය නොවෙයි. එහෙම නම් වැඩිම අර්බුදයකට මුහුණ දෙන්න ඕනෑ මේ වෙලාවේ යූරෝ මුදල් ඒකකය. මොකද, යුරෝපා සංගමය එංගලන්තයෙන් ඉවත් වීම හේතුකොටගෙන. ඒ වාගේම පවුම මේ වෙලාවේ විශාල අර්බුදයකට මුහුණ දෙන්න ඕනෑ. මොකද, යුරෝපා සංගමයෙන් එංගලන්තය ඉවත් වීම හේතුකොටගෙන. මේ ආදී සාධක නිසා වැඩිම බලපෑමක් ඇති කර තිබෙන්නේ පවුම සහ යූරෝ එකයි. හැබැයි, සිදු වී තිබෙන්නේ මොකක්ද? පවුම සහ යූරෝ එකට සාපේක්ෂවත් අපේ රුපියල කඩා වැටෙමින් තිබෙනවා. ඒකෙන් කියන්නේ මොකක්ද? ජාත්‍යන්තරයේ ඇති වී තිබෙන තත්ත්වය පමණක්ම නොව, අපේ රටට ආවේණික වූ සාධක විශාල ප්‍රමාණයක් රුපියල කඩා වැටීමට බලපෑම් ඇති කර තිබෙනවා කියන එකයි. මේකෙදී ප්‍රධාන සාධකය වන්නේ අපේ ආනයන, අපනයන වෙළෙඳ පොළේ ඇති වී තිබෙන අර්බුදයයි.

[ගරු අනුර දිසානායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1978දී අපට ආනයන අපනයන වෙළෙඳ පොළේ ධන වෙළෙඳ ශේෂයක් තිබුණා. අපේ අපනයන ආදායමෙන් අවශ්‍ය භාණ්ඩ ආනයනය කළාට පස්සේ ඩොලර් මිලියන 41ක අතිරික්තයක් -ඉතිරියක්- තිබුණා. අද මොකක්ද සිදු වී තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ ආනයන වියදම ආසන්න වශයෙන් ගත්තොත් ඩොලර් බිලියන 20යි. අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 10යි. 1978 ඉඳන් මේ අවුරුදු 40 ඇතුළත අපේ ආනයන අපනයන වෙළෙඳ පොළේ ප්‍රසාරණය, වෙනස සියයට සියයක් දක්වා වර්ධනය වී තිබෙනවා. වෙළෙඳ ශේෂය සියයට සියයයි. භාණ්ඩ පිට රටට විකුණලා අපට හම්බ වෙන්නේ ඩොලර් බිලියන 10යි. පිට රටින් භාණ්ඩ ආනයනය කිරීම සඳහා ඩොලර් බිලියන 20යි. වෙළෙඳ ශේෂයේ ඩොලර් බිලියන 10ක හිඟයක් අපට තිබෙනවා. වෙළෙඳ ශේෂයේ හිඟය වර්ධනය කරනවා හැරුණුකොට සමනය කරන්න තමුන්නාන්සේලාට හැකියාව ලැබී නැහැ. ඉතිරි වන බිලියන 10 හොයා ගන්නේ කොහොමද කියා තමුන්නාන්සේලා කල්පනා කර නැහැ. භාණ්ඩ ගෙන්වීම සඳහා විතරක් අපට ඩොලර් බිලියන 20ක් ඕනෑ. ආසන්න වශයෙන් ගත්තොත් මේ වසරේ විදේශීය ණය වෙනුවෙන් ඩොලර් බිලියන 4ක් අවශ්‍ය වී වෙනවා. ඉදිරි වසර තුනකටම මේක අවශ්‍ය වෙනවා. එතකොට අපට භාණ්ඩ ආනයනය කරන්න ඩොලර් බිලියන 20ක් ඕනෑ. විදේශීය ණය ගෙවීම සඳහා ඩොලර් බිලියන 4ක් ඕනෑ. අපට වර්ෂයකට භාණ්ඩ ගෙන්වීම සහ විදේශීය ණය ගෙවීම සඳහා පමණක් ඩොලර් බිලියන 24ක් ඕනෑ. හැබැයි, අපට භාණ්ඩ විකුණලා හම්බ වෙන්නේ ඩොලර් බිලියන 10යි. අපට විදෙස්ගත ශ්‍රමිකයන් හරහා ඩොලර් බිලියන 7.1යි හම්බ වෙලා තිබෙන්නේ. එතකොට එකතුව ඩොලර් බිලියන 17.1යි. නව ඩොලර් බිලියන 1.9ක් වාගේ සංචාරක ව්‍යාපාරයෙන් හම්බ වෙනවා. ඔක්කොම එකතු කළාම ඩොලර් බිලියන 19යි. සංචාරක ව්‍යාපාරයෙන්, විදෙස්ගත ශ්‍රමිකයින්ගෙන් සහ අපේ අපනයන ආදායම -මේ ඔක්කෝම- එකතු කළාම ඩොලර් බිලියන 19යි. හැබැයි, අපේ ඇස් ඉදිරිපිට රවුම් ඉලක්කමක් තිබෙනවා. භාණ්ඩ ගෙන්වීම සහ ණය ගෙවීම සඳහා පමණක් ඩොලර් බිලියන 24ක් ඕනෑ. ඒ නිසා අපි මේ වසර ආරම්භ කරන්නේම ඩොලර් බිලියන 5ක හිඟයකින්. ඩොලර් බිලියන 24ක අවශ්‍යතාවක් එනකොට අපට සපුරා ගන්න වෙලා තිබෙන්නේ ඩොලර් බිලියන 19යි. අපේ සැපයුම ඩොලර් බිලියන 19යි, අපේ ඉල්ලුම ඩොලර් බිලියන 24යි. සැපයුම අඩු වෙලා තිබෙනවා, ඉල්ලුම වැඩි වෙලා තිබෙනවා, ඩොලරයේ මිල ඉහළ යනවා. මේක සරල ආර්ථික විද්‍යාව. මේවා ට්‍රම්ප්ගේ හෝ ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රශ්නයක් නොවෙයි. අපට ඩොලර් බිලියන 24ක් අවශ්‍ය වනකොට, අපේ ඉපයීම් හැටියට තිබෙන්නේ ඩොලර් බිලියන 19යි නම්, අපේ ආර්ථිකය පටන් ගන්නේ ඩොලර් බිලියන 5ක හිඟයකින් නම් අනිවාර්යයෙන්ම ඩොලරය ඉහළ යන එක වළක්වන්න බැහැ.

දැනුත් මහ බැංකුව තමන් සතු විදෙස් සංචිත නිදහස් කර තමයි රුපියල මේ ප්‍රමාණයෙන් ආරක්ෂා කරගෙන තිබෙන්නේ. මේ වසරේ විතරක් රුපියල ස්ථාවර කර ගැනීම වෙනුවෙන් මේ වනකොට මහ බැංකුව ඩොලර් මිලියන 184ක විදෙස් සංචිත නිදහස් කර තිබෙනවා. තවදුරටත් තමුන්නාන්සේලා මේ ස්ථාවර කිරීම සඳහා සමත් වුණේ නැත්නම් අනිවාර්ය ලෙස දෙසැම්බර් මාසයේ අග වනකොට ඩොලරයක් වෙනුවෙන් ගෙවිය යුතු ප්‍රමාණය රුපියල් 200ට ආසන්න වීම වළක්වන්න බැහැ කියන එක මම අද කියනවා. මේක තමයි සිද්ධ වෙන්නේ. ඉතින් මේ කාරණය පතුලේ තිබෙන්නේ කුමක්ද? එක පැත්තකින් අපට අපේ ආනයන වියදම පාලනය කර ගන්න බැරි වුණා. අනික් අතට අපේ අපනයන ආදායම වර්ධනය කර ගන්න අපට බැරි වුණා.

1977දී අපේ ප්‍රධාන ආදායම් මාර්ගය වුණේ තේ, රබර් සහ පොල්. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක වෙළෙඳ පොළේ තත්ත්වය හැමදාමත් එක වාගේ තිබෙන්නේ නැහැ. ලෝකයේ වෙළෙඳ පොළ වෙනස් වෙනවා. ලෝක වෙළෙඳ පොළේ සිද්ධ වන ඒ වෙනස ගැන කල්පනා කර, ලෝක වෙළෙඳ පොළෙන් පංගුවක් අත්පත් කර ගන්න අපි සමත් වුණේ නැහැ. එදා අපේ තේ වෙළෙඳ පොළ වෙනුවට කෙන්යාව වැනි රටවල තේ නිෂ්පාදනය වෙන්න පටන් ගත්තා. ඒ වාගේම තේ වෙනුවට විකල්ප බීම වර්ග එන්න පටන් ගත්තා. ඒ නිසා ලෝකයේ තේ වෙළෙඳ පොළ හැකිළුණා. පොල් අපටත් මදි වුණා. රබර් වෙනුවට කෘත්‍රිම රබර් ආවා. සම්ප්‍රදායික අපනයන භෝග මත තමයි අපි රඳා පැවතුණේ. අපට බැරි වුණා ලෝකයේ සිද්ධ වන නව වෙනස්කම් මත කටයුතු කරන්න. ලෝකයේ වෙළෙඳ පොළවල් දෙකක් තිබෙනවා. එකක් තමයි භාණ්ඩ වෙළෙඳ පොළ. අනික, ශ්‍රම වෙළෙඳ පොළ. අපි ලෝකයේ භාණ්ඩ වෙළෙඳ පොළෙනුත් අයින් වෙලා තිබෙන්නේ, ශ්‍රම වෙළෙඳ පොළෙනුත් අයින් වෙලායි තිබෙන්නේ. 2020දී ලෝකයේ ඉල්ලන ශ්‍රමිකයා කවුද කියන එක සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් හදන්න තමුන්නාන්සේලාට බැරි වුණා. අදත් ලෝකයේ ශ්‍රම වෙළෙඳ පොළට ලංකාව ශ්‍රමිකයින් සපයන්නේ කොහොමද? එක්කෝ ගෙදරක උයන්න, වඩු වැඩ කරන්න, තීන්ත ගාන්න, ඩ්‍රයිවින් වැඩ කරන්න, එහෙම නැත්නම් මැදපෙරදිග කොන්ක්‍රීට් අනන්න. ඔන්න බලන්න තමුන්නාන්සේලා ලෝක වෙළෙඳ පොළේ අත්පත් කර ගත්ත පංගුව.

හැබැයි, ලෝකයේ ශ්‍රම වෙළෙඳ පොළ වෙනස් වෙනවා. නව ශ්‍රම වෙළෙඳ පොළවල් ඉල්ලනවා. ඒ සඳහා තමුන්නාන්සේලාට දැක්මක් තිබුණේ නැහැ. විශේෂයෙන්ම ගත්තොත් අද ලෝකයේ විශාල ශ්‍රම වෙළෙඳ පොළක් තොරතුරු තාක්ෂණයෙන් සම්පූර්ණ කළා. ලෝකයේ සියලුම මෘදුකාංග පද්ධති නිර්මාණය කරන සෑම ප්‍රධාන සමාගමකම -Google වේවා, HP වේවා- ඉහළම තනතුරුවල ඉන්නේ ඉන්දියානුවන්. එක යුගයකදී ලෝකයේ ශ්‍රම වෙළෙඳ පොළ වෙනස් වෙනවා කියලා ඔවුන් දැනගෙන හිටියා. හැබැයි, තමුන්නාන්සේලා සමත් වුණාද? ලෝකයේ සිදුවන නව ශ්‍රම වෙළෙඳ පොළට අවශ්‍යවන නිර්මාපකයක් හැදුවාද? තමුන්නාන්සේලා ලජ්ජා වෙන්න ඕනෑ. 1960 දශකයේදී තොරතුරු තාක්ෂණ විප්ලවයන් ගැන කථා කළා. නමුත්, තමුන්නාන්සේලා තොරතුරු තාක්ෂණය විෂයයක් හැටියට උසස් පෙළට ඇතුළත් කරන්නේ 2014 අවුරුද්දේදීයි. තමුන්නාන්සේලා යල් පැනපු නායකයෝ; ලෝකය ගැන අලුත් දැක්මක් නැති නායකයෝ. ලෝකයේ සිදු වෙන නව පරිවර්තනයන් ගැන කල්පනා කරලා ලෝකයේ ශ්‍රම වෙළෙඳ පොළේ වෙනස්කම්, ලෝකයේ භාණ්ඩ වෙළෙඳ පොළේ වෙනස්කම් ගැන කල්පනා කරලා නව භාණ්ඩයක් ලෝක වෙළෙඳ පොළට හඳුන්වා දෙන්න, නව ශ්‍රමයක් ලෝක වෙළෙඳ පොළෙන් අත්පත් කර ගන්න අසමත් වුණා. සිදු වුණේ මොකක්ද? ලෝක වෙළෙඳ පොළේ අපේ පංගුව හැකුළුණා. තමුන්නාන්සේලා එක පැත්තකින් කල්පනා කළේ හැම වෙලාවේම ලෝකයේ භාණ්ඩ ආනයනය කරමින් ජීවත් වෙන්න පුළුවන් කියලායි. ඒ නිසා ආනයන වියදම ඩොලර් බිලියන 20 දක්වා වර්ධනය වුණා.

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා අපේ රටේ නිෂ්පාදනය කඩා වැටිටුවා. තමුන්නාන්සේලා මේ ගැන කල්පනා කරලා බලන්න. මා ළඟ සංඛ්‍යා ලේඛන තිබෙනවා. 2017 වසරේ ඩොලර් මිලියන 36ක අල ගෙනැල්ලා තිබෙනවා; ඩොලර් මිලියන 52ක වියළි මිරිස් ගෙනැල්ලා තිබෙනවා; ඩොලර් මිලියන 79ක ලොකු ලූනු ගෙනැල්ලා තිබෙනවා; ඩොලර් මිලියන 8ක රතු ලූනු ගෙනැල්ලා තිබෙනවා; ඩොලර් මිලියන 53ක බඩ ඉරිඟු ගෙනැල්ලා තිබෙනවා; ඩොලර් මිලියන 15ක මුං ඇට ගෙනැල්ලා තිබෙනවා; ඩොලර් මිලියනයක කුරක්කන් ගෙනැල්ලා තිබෙනවා;

ඩොලර් මිලියන 4ක කවුපි ගෙනැත් තිබෙනවා; ඩොලර් මිලියන 0.2ක සියඹලා ගෙනැත් තිබෙනවා. ආසන්න වශයෙන් ගත්තොත් ඩොලර් මිලියන 248.2ක නිෂ්පාදන භාණ්ඩ ගෙනැල්ලා තිබෙනවා. බඩ ඉරිඟු, කවුපි, කුරක්කන් යනාදිය අපට නිෂ්පාදනය කිරීමට නොහැකි භාණ්ඩ ද? අපි පොඩි කාලයේ හිතුවේ කුරක්කන් තිබෙන්නේ ලංකාවේ විතරයි කියලා. බලනකොට කුරක්කන් පිටරටිනුත් ගෙනෙන ආර්ථිකයක් තමුන්නාන්සේලා හදලා තිබෙනවා. නිෂ්පාදනය කඩා වැටිටුවා. තමුන්නාන්සේලා, අඩුම තරමේ අත්‍යාවශ්‍ය භාණ්ඩ ටික නිෂ්පාදනය කරන්නවත් බැරි පාලකයන්ද? අවුරුදු 70ක් වන විට මොකක්ද වෙලා තිබෙන්නේ? කඩල ආනයනය කරනවා නම්, මුං ඇට ආනයනය කරනවා නම්, කවුපි ආනයනය කරනවා නම්, කුරක්කන් ආනයනය කරනවා නම්, බඩ ඉරිඟු ආනයනය කරනවා නම්, ලූනු ආනයනය කරනවා නම්, වියළි මිරිස් ආනයනය කරනවා නම් හදපු ආර්ථිකය මොකක්ද? නිෂ්පාදනය කඩා වැටිටුවා. තමුන්නාන්සේලා ලුණුත් පිටරටින් ගෙන්වනවා. රට වටේට මුහුද තිබෙනවා. තමුන්නාන්සේලා ලුණු පවා ආනයනය කරන රාජ්‍යයක් නිර්මාණය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ආනයන සඳහා ඩොලර් බිලියන 20ක් වැය වෙනකොට මෙම නිෂ්පාදනවලට පණ පොවලා අපේ ආනයන වියදම අඩුම තරමින් ඩොලර් බිලියන දෙකකින්වත් අඩු කර ගන්න අපට පුළුවන්කම තිබුණා. තමුන්නාන්සේලා පණ පෙව්වේ නැහැ. ඒ නිසා මොකක්ද වුණේ? අපේ සියලු නිෂ්පාදන කඩා වැටිටුවා. කඩදාසි නිෂ්පාදනය, රෙදි පිළි නිෂ්පාදනය, තුනී ලෑලි නිෂ්පාදනය, කිරිපිටි නිෂ්පාදනය මේ සියල්ල කඩා වට්ටලා තිබෙන්නේ. ඒ සියල්ල කඩා වට්ටලා, සියල්ල ආනයනය මත රඳා පවතින රාජ්‍යයක් නිර්මාණය කළා. තමුන්නාන්සේලා හිතුවේ ඇමෙරිකා එක්සත් ජනපදයේ යහළුවෝ, සුද්දෝ ඉතාමත් හොඳ මිත්‍රයන් කියලා. අපි අර්බුදයට පත් වුණාම ඔවුන් උදව් කරන්නේ නැහැ. ඒ ගොල්ලන්ට තිබුණේ වෙළෙඳ පොළ අවශ්‍යතාව විතරයි. අපේ රටේ මොන තරම් සම්පත් ප්‍රමාණයක් ඔවුන්ගේ අතට ගන්න පුළුවන්ද; මොන තරම් ප්‍රමාණයක් අපේ රටේ වෙළෙඳ පොළ අත්පත් කර ගන්න පුළුවන්ද; අපේ රටේ ඒ සඳහා අවශ්‍ය වන දේශපාලනය හසුරුවන්න පුළුවන්ද කියන එක විතරයි ඔවුන් බලන්නේ. තමුන්නාන්සේලාගේ මිතුරන් අපේ රටේ උදව්වට එන්නේ නැහැ. ඒක මතක තබා ගන්න. ඒ නිසා අපේ රටේ නිෂ්පාදනය වර්ධනය කරන්න තමුන්නාන්සේලාට දැක්මක් හැදිය යුතුව තිබුණා. ඒ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා දැක්මක් තිබුණේ නැහැ. ඒක තමයි මේ අර්බුදයේ යටින් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණාව මෙයයි. අපට ඉතාමත් වැදගත් වන ඩොලර් උත්පාදනය කරන මධ්‍යස්ථාන තිබුණා. ඒ ඩොලර් උත්පාදන කරන මධ්‍යස්ථානවලට මොකක්ද වුණේ? අපට තිබුණා සපුගස්කන්දේ තෙල් පිරිපහදුව සමඟ-විශේෂයෙන්ම එහි අතුරු නිෂ්පාදන හැටියට අපට යූරියා නිෂ්පාදනාගාරයක් තිබුණා. රනිල් වික්‍රමසිංහගේ බටලන්ද වධකාගාරය කියලා කිව්වේ මොකටද? බටලන්ද වධකාගාරය කියලා කිව්වේ පොහොර ෆැක්ටරියට. එතැන පොහොර කර්මාන්තශාලාවක් තිබුණේ. අපි 1981 වර්ෂයේදී පාකිස්තානයට මෙට්‍රික් ටොන් 50,000ක යූරියා යැව්වා. අපට මියන්මාරය සමඟ ද්විපාර්ශ්වික ගිවිසුමක් තිබුණා, අපි යූරියා මියන්මාරයට යවන්නට. අපි යූරියා අපනයනය කළ මිනිස්සු. හැබැයි, තමුන්නාන්සේලා කළේ මොකක්ද? පොහොර කර්මාන්තශාලා වහලා දැම්මා. අද යූරියා ඇටයක් නිෂ්පාදනය කරන්නේ නැති රාජ්‍යයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපේ ඩොලර් වැය වනවා.

ඒ විතරක් නොවෙයි අපට තව විශාල ඩොලර් උල්පතක් තිබුණා. කොතැනද? තෙල් සංස්ථාව සතුව නැව්වලට තෙල් ගහන්න අංශයක් තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැව්වලට තෙල් ගැහුවාම අපට ලබා දෙන්නේ ඩොලර්. තෙල් සංස්ථාවට වැඩිම ලාභය උපදවන්නේ නැව් තෙල් අංශයයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා 2001-2003 කාලයේදී නැව් තෙල් අංශයට කළේ මොකක්ද? නැව් තෙල් අංශය Lanka Marine Services කියලා සමාගමක් බවට පරිවර්තනය කරලා, ඒක ඉන්දියානු සමාගමකට විකුණුවා. එතැන තමයි තෙල් උත්පාදනය කළේ.

මට මතකයි, වාසුදේව නානායක්කාර මැතිතුමා ඇතුළු කණ්ඩායමක් නඩු දාලා මෙම Lanka Marine Services එක විකිණීම වැරදියි කියලා නැවත ශ්‍රී ලංකා රජයට පවරා ගත්තා. එය විකුණපු එක වැරදියි කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දුන්නා. ඒ නිසා නැවත නැව් තෙල් අංශය තෙල් සංස්ථාවට ලබා ගත යුතුව තිබුණා. එය බෙහෙවින් ඩොලර් උත්පාදනය කරන තැනක්. විකුණපු එක වැරදියි කියලා තෙල් සංස්ථාවට මෙය අත්පත් කර ගැනීමට අවස්ථාව නඩු තීන්දුවකින් ලැබුණා. හැබැයි, නඩු තීන්දුව දුන්නාට පසුව, ඔබතුමාට මතක ඇති, Lanka Marine Services ආයතනය John Keells Holdings එකට විකිණීම පිළිබඳ සිදු වුණු වංචාව පිළිබඳ කෝප් වාර්තාවෙත් ලියවුණා.

John Keells Holdings එක ගැන කියද්දි මතක් වෙන්නේ මිලින්ද මොරගොඩ. මිලින්ද මොරගොඩලා සහ John Keells Holdingsලා අතර අලුත් ඥාති සම්බන්ධකමක් ඇති වුණා. ඒකට දීපු දෑවැද්ද මේක. මිලින්ද මොරගොඩ තමයි, එවකට ආර්ථික ප්‍රතිසංස්කරණ ඇමති. ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩගෙ පවුලයි, John Keells Holdingsලාගෙ පවුලයි අතර ඥාති සබඳකමක් ඇති වුණා, විවාහයක් නිසා. අන්න ඒ විවාහයට දෑවැද්ද ලෙස තමයි Lanka Marine Services එක John Keells Holdingsලාට දුන්නේ. මේකයි ඇත්තට එදා සිද්ධ වුණේ. අන්න ඒ විකිණීමට එරෙහිව වාසුදේව නානායක්කාර මැතිතුමා ඇතුළු කණ්ඩායමක් ගිහිල්ලා COPE වාර්තාව පදනම් කරගෙන උසාවියෙන් නඩු තීන්දුවක් ගත්තා. ඒ නඩු තීන්දුව අනුව නැවත ගත්තාට පසුව මොකක්ද වුණේ? Lanka Marine Services එක ආණ්ඩුවේ තියා ගන්නවා වෙනුවට නැවත මොකක්ද කළේ? Caltexලාටයි, John Keells Holdingsඑකටයි, ඊට පස්සේ McLarens Group එකටයි නැවත දුන්නා ඒක. මෙතැන නේ, අපට ඩොලර් ආපු උල්පත. ඉතින්, අපට ඩොලර් උත්පාදනය කරපු තැන තමුන්නාන්සේලා විකුණුවා නම්, අද ඩොලර් නැහැ කියලා කෑ ගහන්නේ ඇයි? මේවා තමයි තමුන්නාන්සේලා ගත්ත වැරදි තීන්දු.

කොළඹ වරාය, අපට විශාල ලෙස ඩොලර් උත්පාදනය කරන තැනක්. අද කොළඹ වරායට විශාල නැව් එන්න පුළුවන් ගැඹුරුම තැන තමයි දකුණු කොළඹ සංවර්ධනය කරන තැන. දකුණු කොළඹ වරාය තමයි අද මීටර් 18ට වඩා ගැඹුරට ඇති නැව් ගේන්න පුළුවන් එකම වරාය; එකම ජැටිය තිබෙන්නේ එතැන. අපි මොකද කළේ? දකුණු කොළඹ ජැටිය CICT සමාගමට විකුණුවා. එතැන වරාය හැදුවා, චීනා. අපි හම්බන්තොටට ගිහිල්ලා නැව් එන්නේ නැති තැනක වරායක් හැදුවා. පසුගිය අවුරුද්දෙ විතරක් CICT සමාගම උත්පාදනය කරලා තිබෙනවා, බහලුම් හුවමාරුවෙන් ඩොලර් මිලියන 134ක්. මතක තබා ගන්න, ඩොලර් මිලියන 134ක් CICT සමාගම දකුණු කොළඹ ජැටියෙන් උපයනවා. අපේ ඩොලර් උත්පාදනය කරන තැන් තමුන්නාන්සේලා විකුණලා දැම්මා. අපට ඩොලර් ලබා ගන්න පුළුවන් තැන් තමුන්නාන්සේලා විකුණලා දැම්මා. ඒ අර්බුදය අද විශාල ඩොලර් හිඟයක් නිර්මාණය වෙන්න හේතු සාධක වෙලා තිබෙනවා.

[ගරු අනුර දිසානායක මහතා]

එක පැත්තකින් අපට ලෝක වෙළෙඳ පොළේ ඩොලර් ප්‍රමාණයක් අත්පත් කර ගන්න බැරි වුණා, වෙළෙඳ පොළ අත්පත් කරගෙන. දෙක, ලෝකයේ ශ්‍රම වෙළෙඳ පොළෙන් පංගුවක් අපට අත්පත් කර ගන්න බැරි වුණා. තුන, අපේ ඩොලර් පිට රටට ගලාගෙන යන එක වැළැක්වීම සඳහා නිෂ්පාදනය වර්ධනය කර ගන්න බැරි වුණා; නිෂ්පාදන කඩා වැටිටුවා. හතර, අපට ඩොලර් නිෂ්පාදනය කරපු තැන් ටික විකුණා දැම්මා. මෙන්න ප්‍රතිඵලය. එහි ප්‍රතිඵලය හැටියට තමයි අද ඩොලරයට සාපේක්ෂව රුපියල කඩා වැටීමට බලපා තිබෙන්නේ. එහෙම නැතුව, ට්‍රම්ප්ගේ ප්‍රතිපත්ති නිසා නොවෙයි. ආර්ථික වර්ධනය කියන්නේ මොකක්ද? ඔවා අපට අලුත් කථා නොවෙයි; පරණ කථා. අපි ඔවා දේශපාලන වේදිකාවල ඕනෑ තරම් කියලා ඇති. තමුන්නාන්සේලා හඳලා තිබෙන ආර්ථිකය මොකක්ද? ඇමෙරිකාවට හෙම්බිරිස්සාවක් හැදුණොත්, ලංකාවට නිව්මෝනියාව හැදෙන ආර්ථිකයක්. එහෙම ආර්ථිකයක් අපට හදලා වැඩක් නැහැ. අපි හදන්න ඕනෑ ආර්ථිකය මොකක්ද? ඒ, ඕනෑම තත්ත්වයකට ඔරොත්තු දිය හැකි ආර්ථිකයක්. තමුන්නාන්සේලා මොකක්ද කියන්නේ? ඉරානේ ප්‍රශ්නයක් ආපුවාම, අපට අර්බුදය. ඇමෙරිකාවේ ප්‍රශ්නයක් ආපුවාම, අපට අර්බුදය. අපි ආර්ථිකයක් හදන්න ඕනෑ කුමටද; පාලනය ඕනෑ මොකටද? ආණ්ඩුව ඕනෑ මොකටද? ආර්ථික දැක්මක් ඕනෑ කුමකටද? ලෝකයේ කවර තත්ත්වයක් නිර්මාණය වුණත්, ඒ ඕනෑම තත්ත්වයකට ඔරොත්තු දිය හැකි ආර්ථිකයක් ගොඩනැඟීම තමයි පාලකයන්ගේ වගකීම. එහෙම නැතුව, ඇමෙරිකාවේ ට්‍රම්ප්ට බැණ බැණ ඉන්න, ඉරානයට බැණ බැණ ඉන්න, ඉරාකයට බැණ බැණ ඉන්න අපට පාලකයෝ ඕනෑද? ලෝකයේ ඕනෑම රටක, ඕනෑ වෙලාවක ආර්ථික අර්බුද ඇති වෙන්න පුළුවන්. අපි ආර්ථිකයක් ගොඩනැඟිය යුතු වන්නේ කෙසේද? ඕනෑම තත්ත්වයක් යටතේ ඔරොත්තු දිය හැකි ආර්ථිකයකුයි අපි සැදිය යුතු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද ගොඩනැඟිලි නිර්මාණයේදී විශාල සාකච්ඡාවක් තිබෙනවා. අද ගොඩනැඟිලි නිර්මාණයේදී වැඩිපුරම අවධානය යොමු කරන්නේ, ඕනෑම තත්ත්වකයට මුහුණ දිය හැකි ගොඩනැඟිල්ලක් සෑදිය යුතුයි කියලා. එය, සුනාමියක් වෙන්න පුළුවන්, අධික රස්නය වෙන්න පුළුවන්, අධික සීතල වෙන්න පුළුවන්, භූමි කම්පාවක් වෙන්න පුළුවන්, ඒ ඕනෑම තත්ත්වයකට මුහුණ දිය හැකි ගොඩනැඟිල්ලක්. අන්න ඒ වාගේ තමයි අපි ආර්ථිකයක් ගොඩනැඟිය යුත්තේ. විය හැකි ඕනෑම තත්ත්වයකට මුහුණ දිය හැකි ආර්ථිකයක් අපි ගොඩනඟන්න ඕනෑ. එහෙම ආර්ථිකයක් ගොඩනැඟීමකින් තොරව මේ ප්‍රශ්නයට විසඳුම් හොයන්න බැහැ. තමුන්නාන්සේලා ඒකට අසමත්. දැන් ගරු මංගල සමරවීර මුදල් ඇමතිතුමා මොකක්ද කිව්වේ? සාමාන්‍ය ජනතාවගේ වාහන ආනයනය නතර කරන්න කිව්වා. තමුන්නාන්සේලා කෙටි කාලීන පියවරක් හැටියට ආනයනය සීමා කිරීම සඳහා යම් පියවර ගෙන තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලාට සාධාරණ අයිතියක් තිබෙනවාද, ආනයන සීමා කිරීම සඳහා තීන්දුවක් ගන්න? මේ හැම ඇමතිවරයෙක්ම තමන්ට ලැබුණු අමාත්‍යාංශයට ගිහිල්ලා ගත්ත හැම වාහනයකම වටිනාකම රුපියල් ලක්ෂ 440ට වඩා වැඩියි. එහෙම නොවෙයිද? පරිපූරක ඇස්තමේන්තු ඇති තරම් ඉදිරිපත් කළා, මේ පාර්ලිමේන්තුවට. අධිකරණ අමාත්‍යාංශය ඇතුළු හැම අමාත්‍යාංශයකටම වාහන ගන්නකොට තමුන්නාන්සේලා රුපියල් ලක්ෂ 440 ඉක්මවූ වාහන තමයි පරිපූරක ඇස්තමේන්තු හරහා ගත්තේ. ගත හැකි, මිල අධිකම, සුපිරිම වාහන අරගෙන සාමාන්‍ය මිනිසුන්ට කියනවා, "මරුටි එක ගෙන්වීම නතර කරපන්", "වැගන්-ආර් ගෙන්වීම නතර කරපන්" කියලා. මොකක්ද මේ කියන කථාව? එහෙම කියන්න තමුන්නාන්සේලාට සාධාරණ අයිතියක් නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්තයාට අයිතියක් තිබෙනවාද, ජනතාවට කියන්න, "සුඛෝපභෝගී වාහන ආනයනය කරන්න එපා" කියලා. රනිල් වික්‍රමසිංහ මහත්තයා කාර් දෙකක් ආනයනය කළා. මෙන්න තිබෙනවා, විස්තර. පරිපූරක ඇස්තමේන්තුවක් දැම්මා. එය කොච්චරක්ද? රුපියල් ලක්ෂ 5,993යි. ආසන්න වශයෙන් ගත්තොත් කාර් එකක් රුපියල් ලක්ෂ 3,000යි. රුපියල් ලක්ෂ තුන්දාහේ කාර්! සමහර දවස්වලට අරලියගහ මන්දිරයේ සිට පාර්ලිමේන්තුවටත් එන්නේ හෙලිකොප්ටරයෙන්. අරලියගහ මන්දිරයේ සිට පාර්ලිමේන්තුවට හෙලිකොප්ටරයේ ඇවිල්ලා, කාර් එකක් ගන්නවා, රුපියල් ලක්ෂ 3,000ක් දීලා. රුපියල් මිලියන 300ක්! තමුන්නාන්සේලා අනුමත කරනවාද, ඒවා? මෙහෙම නායකයන්, මෙහෙම ඇමතිවරුන් රටේ ජනතාවට කියන එක සාධාරණද, "ඔයගොල්ලෝ වාහන ආනයනය සීමා කරන්න. ඔයගොල්ලෝ සුඛෝපභෝගී වාහන අඩු කරන්න" කියලා? ඒක සාධාරණ නැහැ. හොයලා බලන්න, තමුන්නාන්සේලාගේ ඇමතිවරු විදෙස්ගත වුණු සංඛ්‍යාව. මම අගමැතිවරයාගෙන් ඉල්ලා සිටිනවා. එතුමා අද ලංකාවේ නැහැ. මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා, විදෙස්ගත වුණු ඇමතිවරු සංඛ්‍යාව, විදෙස්ගත වනකොට ගෙන ගිය සංඛ්‍යාව, ඒ විදෙස්ගතවීම සඳහා වුණු වියදමේ ප්‍රමාණය සහ ලැබුණු ප්‍රතිලාභ පිළිබඳව වාර්තාවක් පුළුවන් නම් මේ පාර්ලිමේන්තුවට දෙන්න කියලා.

ගොඩක් ඇමතිවරු මොකක්ද කරන්නේ? ඔබතුමා දන්නවා, ගොඩක් ඇමතිවරු පාර්ලිමේන්තුවේ නැත්තේ ඒ අය පිට රට ඉන්න නිසා බව. කැබිනට් මණ්ඩලයට එන්නේත් නැහැ; පිට රට ඉන්නේ. ඒකයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඇමතිවරු තමන්ට සුඛවිහරණය සහිත ජීවිත ගත කරන්න අද තමන්ගේ තනතුරු උපයෝගි කර ගෙන තිබෙනවා. ඇමතිවරු සතියක් පාර්ලිමේන්තුවේ; සතියක් පිට රට. ආයෙත් පිට රට; ආයෙත් පාර්ලිමේන්තුවේ. මෙහෙම තමයි බහුතරයක් ඇමතිවරු. ඒක නොවෙයිද, අද සිද්ධ වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලා සුඛවිහරණ සහිත ජීවිත ගත කරමින් ජනතාවට කියනවා, පටි තද කර ගන්න, ආනයන සීමා කරන්න කියලා. තමුන්නාන්සේලාට යුක්ති සහගත, සදාචාරාත්මක අයිතියක් නැහැ, ජනතාවගෙන් එහෙම ඉල්ලීමක් කරන්න. තමුන්නාන්සේලා ඉතාම කැත පන්නයේ, සුපිරි පන්නයේ, සුඛවිහරණයන් සහිත ජීවිත ගත කරමින් ජනතාවට කියන්නේ කොහොමද, ආනයන සීමා කරන්න කියලා?

ජනාධිපතිවරයා මේ ළඟදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මන්ත්‍රණය අමතන්න ගියා. කී දෙනෙක් අරගෙන ගියාද, මේ වාගේ අර්බුදයක් තිබෙන වෙලාවක? රටේ ඩොලර් නැහැ කියා කියනවා. ආසන්න වශයෙන් දැනට වාර්තා වී තිබෙන අන්දමට 63 දෙනෙක් අරගෙන ගිහින් තිබෙනවා. සමහර මාධ්‍යවේදීන්ට රුපියල් ලක්ෂ හතරක් ගෙවා තිබෙනවා, මුදලින්. ඒ කියන්නේ ගමන් වියදම්, ටිකට් වියදම්, හෝටල් ගාස්තු හැරෙන්න ලක්ෂ හතරක් අතට දීලා තිබෙනවා, pocket money ලෙස. මොකක්ද, මේ කරලා තිබෙන්නේ? ජනාධිපති මාධ්‍ය ඒකකයක් තිබෙනවා. මාධ්‍ය ඒකකය අරගෙන ගිහිල්ලා තිබෙනවා. මෙවැනි අවස්ථාවක මාධ්‍ය ඒකකයෙන් කරන්න ඕනෑ අවශ්‍ය ටික එවන එකයි. මාධ්‍යවේදීන් ගිහිල්ලාත් ඒක තමයි කරන්නේ. මාධ්‍ය ඒකකයෙන් එවන ටික තමයි ඒ අයත් දමන්නේ. ඒක දමන්න තව මාධ්‍යවේදීන් අරගෙන යන්න ඕනෑද, රටේ අර්බුදයක් තිබෙන වෙලාවක? මම දැක්කා, සමහර ස්වාමීන් වහන්සේලාත් එක්කගෙන ගිහිල්ලා තිබුණා. ස්වාමීන් වහන්සේලා පිළිබඳ හොඳ භක්තියක් අපට තිබෙනවා. ඒක වෙනම දෙයක්. උන්වහන්සේලාට වන්දනාමාන කර ගන්න යාම සඳහා අවස්ථාව හදලා දෙන්න. ඒක ආණ්ඩුවක වගකීමක්. හැබැයි, එක්සත් ජාතීන්ගේ සංවිධානයට ස්වාමීන් වහන්සේලා අරගෙන යන්නේ මොකටද? කවුද, මේවාට සල්ලි ගෙවන්නේ? ජපානයට අරගෙන ගියා, මොකටද? කොහෙන්ද

සල්ලි? තමුන්නාන්සේලාට සාධාරණ අයිතියක් තිබෙනවාද, මිනිසුන්ට සරල ජීවිතයක් ගත කරන්න කියලා කියන්න, ආනයන සීමා කරන්න කියලා ඉල්ලන්න? මම දැක්කා, ජපානයටත් සමහර ස්වාමීන් වහන්සේලා එක්කගෙන යනවා. සමහර වංචාවලට හසු වෙලා හිරේ ඉන්න ඕනෑ මිනිස්සු -පොල්ගම්පොළ- එක්කගෙන ගියා නේ. එක සතියක් ජනාධිපතිත් එක්ක ජපානයේ; ඊළඟ සතියේ රිමාන්ඩ් එකේ. මෙහෙම මිනිස්සුද තමුන්නාන්සේලා එක්ක යන්නේ? මේ, මහජනයාගේ සල්ලි නැති කරන, විනාශ කරන පාලකයන්. තමුන්නාන්සේලාට කිසිසේත්ම සාධාරණ, යුක්ති සහගත අයිතියක් නැහැ, කාර් ගෙන්වන එක අඩු කරන්න, මේවා ටික අඩු කරන්න, ණයවර ලිපිය ගන්නකොට සියයට 100ක් මුදල් බඳින්න කියලා ජනතාවට කියන්න. සාමාන්‍ය ජනතාවට සියලු barriers දමනවා; සියලු බාධා හදනවා. හැබැයි, තමුන්නාන්සේලා ඒ එකකටවත් සූදානම් නැහැ. අද තමුන්නාන්සේලා ගියත් යන්නේ ගුවන් යානයක යන්න පුළුවන් සුපිරිම පන්තියේ, වැඩිම ටිකට් එක අරගෙන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදත් හොයලා බලන්න Katunayake Airport එකෙන්, දැන් මේ වනකොට ඇමතිවරු කී දෙනෙක් පිටරට ඉන්නවාද කියලා. ඒ ගොල්ලන් එක්ක කී දෙනෙක් ගිහිල්ලා ඉන්නවාද කියලා දැන් හොයලා බලන්න. කොච්චර මුදල්ද මේ? තමුන්නාන්සේලා එහෙම රටක්ද හදන්නේ? ඒ නිසා තමුන්නාන්සේලාට කිසි සාධාරණ යුක්ති සහගත අයිතියක් නැහැ, ජනතාවට පටි තද කර ගන්න කියලා කියන්න.

තමුන්නාන්සේලාගේ ඊළඟ ආර්ථික උපාය මාර්ගය මොකක්ද? දැන් මේ අර්බුදය නිර්මාණය වුණේ තමුන්නාන්සේලා 1978 ඉඳලා පටන් ගන්නා ලද ලිහිල්කරණයෙන්. ලෝකයේ ලිහිල්කරණය කියලා එකක් නැහැ. ඒක බොරුවක්. ලෝකයේ කිසි එකක් ලිහිල්කරණය කරන්නේ නැහැ. ඉන්දියාව ලිහිල්කරණය කරලාද තිබෙන්නේ? ඉන්දියාවට පිට රටින් කිරි පිටි ආනයනය කරනවාට සියයට 100ක බද්දක් තිබෙනවා; බීජ ආනයනය කරනවාට විශාල බද්දක් තිබෙනවා. හැම රටක්ම ලිහිල්කරණය කරලා තිබෙන්නේ තමන්ගේ නිෂ්පාදන ආරක්ෂා කර ගන්න. තමන්ගේ නිෂ්පාදන ශක්තිමත් කර ගැනීම සඳහා තමයි ලිහිල්කරණය උපයෝගි කරගෙන තිබෙන්නේ. තමන්ට නැති තාක්ෂණය ගෙනෙන්න ලිහිල්කරණය උපයෝගි කරගෙන තිබෙනවා. තමන්ට නැති ප්‍රාග්ධනය ගෙනෙන්න ලිහිල්කරණය උපයෝගි කරගෙන තිබෙනවා. ඉන්දියාව ලිහිල්කරණය උපයෝගි කර ගත්තේ මොකටද? ඉන්දියාවට ලේලන්ඩ් කොම්පැනිය එනකොට ඒ ගොල්ලන් ලිහිල්කරණය කළා. හැබැයි අශෝක් කොම්පැනියත් එක්ක එකතු වෙලා "අශෝක් ලේලන්ඩ්" හදන්න කිව්වා. එහෙමයි ඒ ගොල්ලන් ලිහිල්කරණය කළේ. ඒ ගොල්ලන්ට අවශ්‍ය කරන තාක්ෂණය ගෙනෙන්න ඒ ගොල්ලන් යම් ප්‍රමාණයකට වෙළෙඳ පොළ ලිහිල්කරණයකට ලක් කළා. ජපානයෙන් හොන්ඩා කොම්පැනිය ඉන්දියාවට එනකොට, හීරෝ කොම්පැනියත් එක්ක එකතු වෙලා "හීරෝ හොන්ඩා" හදන්න කිව්වා. ලිහිල්කරණයක් කළා, හොන්ඩා තාක්ෂණය ඉන්දියාවට ගෙනෙන්න ඕනෑ කියලා. අපි මොකක්ද කළේ? තමුන්නාන්සේලා එක අලුත් තාක්ෂණයක් ගෙනාවාද? මට කියන්න, 1978 වසරෙන් පසුව නව තාක්ෂණ කර්මාන්තශාලාවක් ගෙනාවාද, ගෙනාවා නම් ඒ මොකක්ද කියලා. අලුත් තාක්ෂණයක් ගෙනාවාද, ඒ මොකක්ද? ලෝකයේ තාක්ෂණයේ විශාල පරිවර්තනයන් වුණා. ඒ කිසිවක් ගෙනෙන්න තමුන්නාන්සේලා ලිහිල්කරණය උපයෝගි කර ගත්තේ නැහැ. තමුන්නාන්සේලා ලිහිල්කරණය උපයෝගි කර ගත්තේ අපේ රටේ තිබුණු සමස්ත නිෂ්පාදන කඩා වට්ටන්නයි. ඒක නොවෙයිද සිද්ධ වුණේ? අපේ රටේ තිබුණු සීනි කර්මාන්තශාලා ටික කඩාගෙන වැටුණා. කිරිපිටි කර්මාන්තශාලා කඩා වැටුණා. තුල්හිරිය, මත්තෙගොඩ, පූගොඩ රෙදි කර්මාන්තශාලා ටික කඩා වැටුණා. ගිංතොට තුනී ලෑලි සංස්ථාව කඩා වැටුණා. ඇඹිලිපිටිය කඩදාසි කම්හල කඩා වැටුණා. කන්තලේ සීනි කර්මාන්තශාලාව කඩා වැටුණා. හිඟුරාන සීනි කර්මාන්තශාලාව කඩා වැටුණා. ඇලයාපත්තුව උළු කම්හල කඩා වැටුණා. දංකොටුව පිහන් සංස්ථාව කඩා වැටුණා. මාතලේ පිහන් කම්හල විකුණලා දැම්මා. පිළියන්දල පිහන් සංස්ථාව කඩා වැටුණා. මේකයි සිද්ධ වුණේ. තමුන්නාන්සේලා කිසි දෙයක් නිෂ්පාදනය කරන්නේ නැති පාලකයෝ. තමුන්නාන්සේලා නිකම් බිස්නස්කාරයෝ; agentsලා. එහෙන් මෙහෙන් අරගෙන විකුණන්න ආණ්ඩු ඕනෑ නැහැ.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
කර්මාන්තශාලා කොච්චර දැම්මාද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එකක් කියන්න. [බාධා කිරීමක්] එකක් කියන්න.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඇයි, කඹුරුපිටිය උළු කම්හල?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කඹුරුපිටිය උළු කම්හල පිළිබඳ ප්‍රශ්නයේදී ඔබතුමාට හොඳට මතක ඇති, ඒ බොහෝ පිරිස් ඔබතුමාගේ නිවසේ සිටි බව. මතකද?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒක මම දන්නේ නැහැ. හැබැයි මම ඔබතුමන්ලාගේ පක්ෂයේ අයට ආරක්ෂාව දුන්නා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැනුත් ඉන්නවා. තමුන්නාන්සේලාට තිබෙන්නේ අවුරුදු 25කට එහා පැත්තේ වුණු උළු කම්හලක ප්‍රශ්නය නම්, තමුන්නාන්සේලා ආර්ථික වශයෙන් මොන තරම් බංකොලොත්ද? [බාධා කිරීමක්] ඒ කියන්නේ මේ ආර්ථිකයේ සමස්තය අවුරුදු 30කට එහා සිද්ධ වුණු උළු කම්හලක් ගැන ප්‍රශ්නය නම්, තමුන්නාන්සේලාට-

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අපි වග කියන්න ඕනෑය කියලා කියනවා වාගේම, ඔබතුමන්ලාත් විපක්ෂයේ සිටියා, -[බාධා කිරීමක්] මේ ආර්ථික අර්බුදයට ඔබතුමන්ලා පාවිච්චි කරන වචනය-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ. මීට අවුරුදු 40කට පෙර තිබුණේ සිවිල් යුද්ධයක්. ඔබතුමා ඒක හොඳට දන්නවා. ඒ සිවිල් යුද්ධයේදී ඔබතුමා නියෝජනය කළ පාර්ශ්වයන් පිළිබඳවත් අපට අවබෝධයක් තිබෙනවා. යුද්ධය කියලා කියන්නේ අපි කවුරුවත් කැමැති දෙයක් නොවෙයි. යුද්ධවලදී අපි අකැමැති දේවල් සිද්ධ වනවා. සිවිල් යුද්ධයක් තිබුණා. ඒක වෙනම දෙයක්. හැබැයි, ඒ සිවිල් යුද්ධය 1989දී අවසන් වුණා නම්, මේ වනකොට අවුරුදු 29ක් ගත

[ගරු අනුර දිසානායක මහතා]

වෙලා. අවුරුදු 29ක් ගිහිල්ලාත් තමුන්නාන්සේලාට උළු කම්හලක ප්‍රශ්නය විසඳාගන්න බැහැයි කියන්නේ තමුන්නාන්සේලාගේ බංකොලොත්කම නේ? තමුන්නාන්සේලා අතිශයින් බංකොලොත්. තමුන්නාන්සේලා agentsලා; බ්‍රෝකර්ලා. ඔය බ්‍රෝකර් වැඩය ධම්මික පෙරේරා වාගේ මහත්තයෙකුට දුන්නොත් ඔයිට වඩා හොඳට කරනවා. බඩු ගෙනාවා; වික්කා. එතුමා කර්මාන්තශාලා ටිකක්වත් හදනවා. ඔබතුමන්ලාට ඒකවත් බැහැ. ඔබතුමන්ලා agentsලා. ඔබතුමන්ලාගේ ප්‍රධාන වැඩය එහෙන් ගෙනැල්ලා මෙහේ විකුණන කොට එහේට මෙහේට ගෙනෙනවාට බදු ගන්න එකයි. තමුන්නාන්සේලාට තිබෙනවා, ජනතාවගෙන් සල්ලි ගන්න දිගු අතක්. ඒ දිගු අතෙන් තමුන්නාන්සේලා ජනතාවගෙන් සල්ලි එකතු කරනවා. තමුන්නාන්සේලා ජනතාවට බෙදන්නේ කොට අතකින්. නමුත්, තමුන්නාන්සේලාට බෙදා ගන්න ලොකු හැන්දක් තිබෙනවා. තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ ඒකයි. ඒක නිසා තමුන්නාන්සේලා අනුගමනය කරමින් තිබෙන ආර්ථික ප්‍රතිපත්තිය මුළුමනින්ම පරිවර්තනයකට ලක් කරන්නේ නැතිව මේ ආර්ථික ගමන ඉස්සරහට යන්න බැහැ. තමුන්නාන්සේලා සිංගප්පූරු සිහින මවනවා; මැලේසියා සිහින මවනවා; ඉන්දියාවත් එක්ක ඉස්සරහට යන්න කල්පනා කරනවා; චීනයත් එක්ක ඉස්සරහට යන්න කල්පනා කරනවා; ඇමෙරිකාවත් එක්ක ඉස්සරහට යන්න කල්පනා කරනවා. හැබැයි, තමුන්නාන්සේලාගේ කල්පනා සියල්ල අද තමුන්නාන්සේලාගේ ඇස් ඉදිරිපිට විනාශ වී තිබෙනවා. එම නිසා තමුන්නාන්සේලාගේ ආර්ථික ප්‍රතිපත්තිය වැරදියි. අඩුම තරමින් තමුන්නාන්සේලා අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව හොඳ සමාලෝචනයක් කරලා මින් ඉදිරියටවත් එතැනින් එහා ගමනක් සඳහා උත්සාහ දරනවා නම්, යම් ප්‍රතිඵලයක් ගැන අපේක්ෂා කරන්න පුළුවන්. හැබැයි, තමුන්නාන්සේලා අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්ති මුළුමනින්ම ආරක්ෂා කර ගනිමින්, ඒ දිශාවටම නම් ගමන් කරන්නේ, මේ අර්බුදය තවත් තීව්‍ර වනවා හැරුණු කොට සමනය වන්නේ නැති බව සහතිකයි.

මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. ඊළඟට ගරු මංගල සමරවීර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 25ක් තිබෙනවා.

**[අ.භා. 3.52]**

**ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකාබද්ධ විපක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ ඒකාබද්ධව අද ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් මටත් වචන කීපයක් කථා කරන්න ලැබීම ගැන මා ඉතාමත්ම සතුටුවනවා. ඇත්ත වශයෙන්ම මෙම යෝජනාව ඉදිරිපත් කළ ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා එතුමාගේ කථාව පටන් ගත්තේ, වෙනත් අයගේ තොප්පියක් මට භාර දීලා තිබෙනවා, මට ඒ ගැන වග කීමක් පවරන්නේ නැහැයි කියලායි. නමුත්, වග කිව යුතු ඇමතිවරයෙකු හැටියට කාගේ තොප්පිය වුණත්, වග කීමෙන් භාර ගෙන ඒ අර්බුදයෙන් ඉදිරියට යන්න කටයුතු කරන බව මම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපි 2015දී භාර ගත්තේ තොප්පියක් නොවෙයි; රාජ්‍ය මූල්‍ය කාල බෝම්බයක්. In fact, Sir, in 2015, we inherited a virtual fiscal time bomb from the earlier regime. මොකද, බන්දුල ගුණවර්ධන මැතිතුමා එතුමාගේ කථාව කළේ අතීතය අමතක කරපු අද ඊයේ උපන් දරුවකු හැටියටයි. ඒ වාගේම එතුමා රාජපක්ෂ සමය අපගේ ආර්ථිකයේ රන්වන් යුගයක් හැටියට පෙන්වන්න උත්සාහ කළා. නමුත් ඇත්ත කථාව තමයි, අපි භාර ගත්තේ කඩා වැටුණු, විනාශ වුණු, විශාල අර්බුදයකට රට ගෙන යමින් තිබුණු ආර්ථිකයක් කියන එක. මම මේ වෙලාවේ අතීතය ගැන කථා කරන්නට අකැමැති වුණත්, ඒ අතීතයේ අර්බුදවලට වග කිව යුත්තෝ සිහි කල්පනාවෙන් තොරව කථා කරන කොට මටත් අතීතයෙන් බිඳක් හෝ මතක් නොකර ඉන්න බැරිවනවා. උදාහරණයක් හැටියට ඒ යුගයේදී රටේ ආදායම දිගින් දිගටම පහත වැටුණා.

රටේ ආදායමට සාපේක්ෂව රජයේ ආදායම 1990 වර්ෂයේදී සියයට 21ක් ලෙසයි තිබුණේ. නමුත් ඒ ආදායම 2015 වර්ෂයේදී අපි රට බාර ගන්නකොට සියයට 11.4 දක්වා කඩා වැටිලා තිබුණා. ඒ වාගේම, එදා රාජ්‍ය ආදායම රුපියල් වශයෙන් ගත් කල මෙසේයි. එහි වාර්ෂික වැඩි වීම 2006 වර්ෂයේදී සියයට 25.8යි. 2014 වර්ෂයේදී එය සියයට 5.1 දක්වා කඩා වැටිලා තිබුණා. ඇත්ත වශයෙන්ම, 2014 වර්ෂයේදී ශ්‍රී ලංකාව අපේ කලාපයේ රටවල් අතරින් අඩුම රාජ්‍ය ආදායම ලබන රට හැටියට පත් වී තිබුණා. උදාහරණයක් ලෙස, මාලදිවයින, චීනය, මොංගෝලියාව, මියන්මාරය, මැලේසියාව, තායිලන්තය, වියට්නාමය, කාම්බෝජියාව, ඉන්දියාව, පිලිපීනය, ඉන්දුනීසියාව, බංග්ලාදේශය කියන රටවල් ගත්තොත්, ඒ රටවලටත් වඩා අඩු රාජ්‍ය ආදායමක් තමයි අපට තිබුණේ. 2000 වර්ෂයේදී රාජ්‍ය ආදයම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 14.5ට තිබුණේ. නමුත් 2015 වර්ෂයේදී අප රට බාර ගන්නා විට එය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 10.1 දක්වා අඩු වෙලා තිබුණා. බංග්ලාදේශයේත් එය සියයට 10.9ක්ව තිබුණා. ඉන්දුනීසියාවේ සියයට 16.6යි. ඉන්දියාවේ සියයට 19.4යි. මාලදිවයිනේ සියයට 32.3යි. නමුත් ඔබතුමන්ලා -විශේෂයෙන්ම බන්දුල ගුණවර්ධන හිටපු අමාත්‍යතුමා- නියෝජනය කරපු රජය, රාජ්‍ය ආදායම මේ තත්ත්වයට ගෙනාවා.

ඒ විතරක් නොවෙයි. රජයේ වියදම් රාජ්‍ය ආදායමට වඩා ඉහළ අගයක් ගත්තා. අපි ලැබෙනවාට වඩා වියදම් කළා. 2014 වර්ෂයේදී ආදායම සහ වියදම අතර තිබුණු පරතරය රුපියල් බිලියන 601 දක්වා වැඩි වෙලායි තිබුණේ. ඒ වාගේම, රාජ්‍ය ආදායම මුළුමනින්ම පාහේ ණය ආපසු ගෙවීම සඳහා වැය වුණා. 2014 වර්ෂයේදී රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,195යි. ආපසු ගෙවන්න අපට මුළු ණය තිබුණා, රුපියල් බිලියන 1,069ක්. ඇත්ත වශයෙන්ම 2013 වර්ෂයේ රාජ්‍ය ආදායමට වඩා ණය ආපසු ගෙවන ණය ප්‍රමාණය වැඩි වුණා. 2013 වර්ෂයේදී රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,137යි. අපේ ණය වශයෙන් ගෙවන්න තිබුණා රුපියල් බිලියන 1,144ක්. මෙන්න මේ විධියට පුනරාවර්තන වියදම් අඛණ්ඩව ඉහළ ගිය නිසා ප්‍රශ්න ඇති වුණා. මේ කාලය තුළදී විශ්‍රාම වැටුප් ගෙවීම් භයගුණයකින් වැඩි වුණා. ඒ වාගේම, ප්‍රාග්ධන ආයෝජන විශාල වශයෙන් අඩාළ වුණා. රාජ්‍ය ණය ඉතා ශීඝ්‍රයෙන් ඉහළ යෑම දැඩි අභියෝගයක් වුණා. අපේ බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා රුපියල අවප්‍රමාණය ගැන කතා කරලා කිව්වා, මේ අවප්‍රමාණය නිසා දැන් ණය වැඩි වෙලා කියලා. ඇත්ත වශයෙන්ම එතුමා වාගේ ආර්ථික විශේෂඥයකු ඒ ආකාරයට මේ පාර්ලිමේන්තුවත්, රටත් නොමහ යැවීමට කටයුතු කිරීම ගැන මා කනගාටු වෙනවා. හැබැයි කනගාටු වෙන්න ඕනෑත් නැහැ. මොකද, එතුමාම තමයි -ඒ කතා කරන කටින්ම තමයි- 2011 වර්ෂයේදී හෝ 2012 වර්ෂයේදී රටට කිව්වේ, 4දෙනකු සිටින

පවුලකට රුපියල් 2,500කින් ජීවත් වන්න පුළුවන් කියලා. නමුත් මා මෙතැනදී ඔබතුමන්ලාට කියන්න කැමැතියි, රුපියල අවප්‍රමාණ වුණාය කියා අපේ ණය වැඩි නොවන්නේ, ඒ ණය ලැබෙන්නේත් US Dollarsවලින් වීම නිසා සහ ඒ ණය ගෙවන්නේත් US Dollarsවලින් වීම නිසා බව.

රුපියල අවප්‍රමාණ වීම හේතුවෙන් ණය වැඩි වුණාය කියනවා නම්, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගෙන් මම මේ කාරණය අහනවා. 2012දී මීට වඩා අවප්‍රමාණ වීමේ අර්බුදයකට ආණ්ඩුව මුහුණ දුන්නා. 2012දී මාස කිහිපයක් ඇතුළත රුපියල සියයට 15කින් අවප්‍රමාණ වුණා. ඒ අවප්‍රමාණ වීම වැළැක්වීම සඳහා අපේ විදේශ සංචිතවලින් ඩොලර් බිලියන 4.1ක් එළියට දැම්මා. ඒ විධියට ඩොලර් බිලියන 4.1කුත් එළියට දැම්මත් සියයට 15කින් රුපියල අවප්‍රමාණ වුණා. එහෙම නම්, එතුමාගේ තර්කය අනුව එදා තිබුණු ණය ප්‍රමාණයත් රුපියල්වලින් බැලුවොත් සියයට 15කින් වැඩි වෙනවා. නමුත් එහෙම දෙයක් වුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් අද ලෝක ආර්ථිකයේ දැවැන්ත අර්බුදයක් තිබෙන මොහොතක වුණත්, ඒ අපකීර්තිමත් වැඩ බැරි අතීතය අමතක කරලා, අවට තිබෙන රටවලට වඩා ඒ අභියෝගයට අපි මේ දක්වා මුහුණ දීලා තිබෙනවා. ඊයේ වෙන කොට ඩොලරයේ average එක තිබුණේ රුපියල් 170.69යි. පසුගිය මාස හය තුළදී රුපියල අවප්‍රමාණ වෙලා තිබෙනවා, සියයට 10කින් විතර. නමුත් අපි ඒ අවප්‍රමාණ වීම නවත්වන්නට වියදම් කරලා තිබෙන්නේ, ඩොලර් මිලියන 250යි. එදා තමුන්නාන්සේලා ඩොලර් බිලියන 4.1ක් වියදම් කරලාත් සියයට 15කින් රුපියලේ කඩා වැටීම සිද්ධ වුණා. අපි ඒ සඳහා වියදම් කළේ ඩොලර් මිලියන 250යි. ඊට අමතරව තවත් විවිධ ආකාරයේ යම් යම් තීන්දු-තීරණ අරගෙන දැන් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා. මේ හේතුව නිසා රට මහා අර්බුදයකට යනවා කියලා කවුරු හරි කිව්වොත්, මම ඒක පිළිගන්නේ නැහැ. නමුත්, මේක අභියෝගයක් තමයි.

මම අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමාට කිව්වා වාගේ, මේ අභියෝගය ජය ගන්නට අපේ වටිනා foreign reserves පාවිච්චි කළොත්, එහෙම නම් අපට අර්බුදයකට යන්න වෙනවා. අපේ foreign reserves අපි තියා ගන්න ඕනෑ, ණය ගෙවන්න. මේ අවුරුද්දේ අපි රුපියල් ට්‍රිලියන 1.9කට, එහෙම නැත්නම් රුපියල් බිලියන 1,900කට වඩා වැඩි මුදලක් ණය වශයෙන් ගෙවනවා. මේ තමයි නිදහස් ලංකාවේ වැඩිම ණය ගෙවන ප්‍රමාණය. එන අවුරුද්දේ සහ 2020දී -ඒ අවුරුදු දෙකේ- අපි රුපියල් බිලියන 4,000ක් ණය ගෙවනවා. කවදාවත් මේ තරම් ණය කන්දරාවක් ගෙවලා නැහැ. අපේ බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා සංඛ්‍යාලේඛන කියාගෙන, කියාගෙන ගියා. නමුත් මම පැහැදිලිවම අභියෝග කරනවා, ඒක වැරදියි කියලා. මේ අවුරුද්දේ අපේ ණයවලින් සියයට 83ක්ම අපි ගෙවන්නේ රාජපක්ෂ යුගයේ ණයයි කියන එක මම වගකීමෙන් කියනවා. [බාධා කිරීමක්] ඔව්. ඇත්ත වශයෙන්ම මේ යෝජනාව ගෙනාපු මනුස්සයා මේ සභාවේ ඉන්න ඕනෑ. නමුත් ඒ මනුස්සයාත් මෙතැන නැහැ. මෙන්න මේ විධියට අපි බොහොම වගකීමෙන් -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
"මනුස්සයා" නොවෙයි, "මන්ත්‍රීතුමා".

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
සමාවෙන්න. වැරැදීමකින් කියැවුණේ. ගරු මන්ත්‍රීතුමා. හැබැයි, එතුමාත් මනුස්සයෙක්ය කියලා මම හිතනවා. [බාධා කිරීමක්] ඒක ඔබතුමාගේ කටින් ආපු එක ගොඩක් වටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මහා ආර්ථික විනාශයක් තමයි කරගහ ගත්තේ. මේ වාගේ ණය කන්දක් තිබුණා. මම පෙන්වපු විධියට රටේ ආදායම කඩාගෙන වැටිලා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොයිතරම් විනාශයක්ද කිව්වොත්, - හිටපු මහ බැංකු අධිපති TV එකට ඇවිල්ලා හැමදාම මහලොකුවට කයිවාරු ගහනවා මම දකිනවා. එතුමා භාරදීලා ගියේ අපට අලාභ ලබන මහ බැංකුවක්. කවදාවත් අහලා තිබෙනවාද, අලාභ ලබන මහ බැංකුවක් ගැන. මෙන්න අහගන්න, 2013දී මහ බැංකුවේ අලාභය මිලියන 24,264යි. 2014දී මහ බැංකුවේ අලාභය 32,309යි. මෙන්න මේ වාගේ සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටුණු, අලාභ ලබන මහ බැංකුවක් භාර අරගෙන තමයි අපි මේ ගමන ආරම්භ කළේ. ඇත්ත වශයෙන්ම මේ වෙනකොට අභියෝග රාශියක් මැද්දේ, ජාත්‍යන්තර අභියෝග මැද්දේ තමයි අපි මේ ගමන යන්නේ. මෙතුමා කිව්වා වාගේ 2008 එතුමා කථා කළා. හැබැයි, එතුමා කොළේ වහලා ගැහුවේ. මොකද, එතුමා කිව්වා, එදා ලෝකයේ මොන තරම් ආර්ථික අර්බුදයක් තිබුණා ද කියලා. ඔව්. හැබැයි, එදා තිබුණු ඒ ආර්ථික අර්බුදයේ වාසිය ආවේ අපට. මොකද, 2008දී ඇමෙරිකාවේ Lehman Brothers කඩා වැටීම තුළින් බැංකු ක්ෂේත්‍රය තුළ විශාල අර්බුදයක් -banking crisis- ඇති වුණා. ඒ තුළින් ඇමෙරිකාවේ තිබුණු පොලී අනුපාතය ගොඩක් පහතට ආවා. එතකොට මොකක්ද කළේ? ඇමෙරිකාව වාගේ රටවල හිටපු US investors ලා ලංකාව වාගේ emerging marketsවලට, ගොඩනැහෙමින් තිබුණු marketsවලට ඒ අයගේ සල්ලි අරගෙන ආවා. ලංකාවට විතරක් නොවෙයි, ඉන්දුනීසියාව, පිලිපීනය, ඉන්දියාව වාගේ රටවලට ඒ අය ගිහිල්ලා එහි ඩොලර් තැන්පත් කළා. මොකද, අපි ඊට වඩා හොඳ පොලියක් ලබාදෙන නිසා. නමුත් මේ වසර ආරම්භයත් එක්කම යළි වතාවක් ඇමෙරිකන් ඩොලරය ශක්තිමත් වුණා. මේ වසර ආරම්භවීමත් සමඟම ඇමෙරිකාවේ පොලී අනුපාතය වැඩි වුණා. ඒ වැඩිවීමත් සමඟ මේ රටවල්වල තිබුණු ඒ මුදල් යළි වතාවක් ඇමෙරිකාවට ගෙන ගියා. මොකද, ඒ අයට ඊට වඩා හොඳ පොලියක් ඇමෙරිකාවේ ලැබෙන නිසා. මේක අපට විතරක් වුණු දෙයක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බලන්න. උදාහරණයක් හැටියට ගත්තොත්, මේ වාගේම ඉන්දියානු පාර්ලිමේන්තුවෙත් කෑ ගහනවා. පෙරේදා පළ වූ පත්තරයක තිබෙනවා, "Indian rupee hits record low" කියලා. අපටත් වඩා මහ බරපතළ වශයෙන් ඉන්දියන් රුපියල අවප්‍රමාණය වුණා. "Pakistan's rupee under pressure amid regional currency turmoil". පාකිස්තානය, ඕස්ට්‍රේලියාව, රුසියාව වාගේ හැම රටකම මේ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. මොකද, තිබෙන මුදල් පිටරටවල්වලට ගෙන යන නිසා. ඒ නිසා තමයි අපි වාගේම ඉන්දියාවත් පසුගිය සතියේ පිටරටින් එන යම් යම් luxury goodsවලට, - television, refrigerator - ඇඳුම් වාගේ දේවල්වලට පවා තාවකාලිකව යම් තහංචි ඇති කළා. 1970 ආර්ථිකයට යළි වතාවක් අපි මේ රට ගෙනියන්නේ නැහැ. අපි පිටරටින් මේ රටට භාණ්ඩ එනවාට විරුද්ධ නැහැ. නමුත් මේ ගත්ත තීරණය මේ වෙලාවේ තිබෙන තත්ත්වයට මුහුණ දීම සඳහා ගත් තාවකාලික පියවරක්. හැබැයි, ඇත්ත වශයෙන්ම මේ අර්බුදය තුළිනුත් යළි වතාවක් අපි කියන්නේ අපේ ආර්ථිකය තවත් ලිහිල්කරණය කරන්න ඕනෑ බවයි. ඒ වාගේම liberalization process එක තව ශක්තිමත් කරන්න ඕනෑ. මම මෙතුමා කියපු කාරණයට එකඟ වෙන්නේ නැත්තේ ඒකයි. මේකට විසඳුම නැවතත් වැහිච්ච ආර්ථිකයට යන එක නොවෙයි. ආර්ථිකය වඩාත් විවෘත කරන ගමන් අපි export-oriented ආර්ථිකයක් වෙත මේ රට ගෙනියන්න ඕනෑ. "Vision 2025" කියන අපේ රජයේ ප්‍රතිපත්ති මාලාවේ මුල ඉඳන්ම කිව්වේ ඕකයි. අපට export-oriented liberalized economy එකක් තිබෙන්න ඕනෑ කියලා.

සමහර වෙලාවට ඔබතුමන්ලා මේවා ගැන දැනගෙන නොදන්නා විධියට ඉන්නවා ද කියලා මම දන්නේ නැහැ. නමුත්

[ගරු මංගල සමරවීර මහතා]

දැන් බලන්න, ඔබතුමන්ලාගේ පක්ෂයේ න්‍යායාචාර්ය, ඇත්තටම ඔබතුමන්ලාගේ පක්ෂයේ නිර්මාතෘ වන බැසිල් රාජපක්ෂ මහත්මයා කියා තිබෙන දේ. එතුමා හොඳ මොළයක් තිබෙන මහත්මයෙක්. මම කියන්නේ, එතුමා හොඳ දේශපාලනඥයෙක්. අපි කොයි පැත්තේ හිටියත් කියන්න ඕනෑ, එතුමා ඉතාමත්ම දක්ෂ දේශපාලනඥයෙක් බව. ඇත්ත වශයෙන්ම ඕනෑම ආණ්ඩුවක හිටියත්, ඒ ආණ්ඩුවට ශක්තියක් දෙන්න පුළුවන් කෙනෙක්. එතුමා මොකක්ද කියන්නේ? එතුමා 2018 ඔක්තෝබර් 07වැනි ඉරිදා "ලංකාදීප" පුවත් පතට මෙසේ කියා තිබෙනවා:

"මම කියන්නේ නෑ දැන් මේ තියෙන අර්බුදය නිකම්ම ආවා කියලා. තෙල් බෑරලය වැඩි වෙලා තියෙනවා. ඒවා ආණ්ඩුවකට පාලනය කළ නොහැකි දේවල්."

මේ අපි නොවෙයි කියන්නේ. බැසිල් රාජපක්ෂ මැතිතුමා කියන්නේ. එදා අපි දැක්කා, තෙල් මිල පාලනය කරන්න ඔබතුමන්ලාට නම් කිසිම වුවමනාවක් තිබුණේ නැති බව. තෙල් බෑරලය කොයි තරම් අඩු වුණත්, තමුන්නාන්සේලා ඒ වාසිය ජනතාවට දුන්නේ නැහැ. මට මතකයි, අන්තිමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝගයක් දුන්නා, තෙල් මිල අඩු කරන්න කියලා. එහෙම කියලත් තමුන්නාන්සේලා තෙල් මිල අඩු කළේ නැහැ. අන්න ඒ නිසා තමයි අපි මේ වෙනකොට මිල සූත්‍රයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ, මිල සූත්‍රය හරහා තෙල් මිල වැඩි වෙනකොට වැඩි වෙනවා. අඩු වෙනකොට ඒ වාසියත් මේ රටේ ජනතාවට ලැබෙනවා. ඒකේ දෙකක් නැහැ. හැබැයි, අවාසනාවකට වාගේ අපි ඒ තෙල් මිල සූත්‍රය හඳුන්වා දීපු දවසේ ඉඳන් තෙල් මිල වැඩි වෙනවා. ඉන්දියාවේ හැමදාම තෙල් මිල වෙනස් කරනවා. අපි මාසයකට සැරයක් තෙල් මිල වෙනස් කරන්න තීන්දු කළත්, ඉන්දියාවේ දිනපතාම වෙනස් කරනවා. ඉන්දියාව වාගේ තෙල් මිල දිනපතා වෙනස් කරන්න අපට ඒ තාක්ෂණය නැහැ. මොකද, ඉන්දියාවේ හැමදාම රාත්‍රී 12.00ට එක තැනෙකින් ඒ වෙනස් වෙන තෙල් මිල දැම්මාම, petrol sheds ඔක්කෝටම ඒ මිල වැටෙනවා. අපට ඒ තාක්ෂණය නැති නිසා අපි හිතුවා, මාසයකට සැරයක් මේක කරන්න ඕනෑ කියලා. ඒ අනුව දැන් මාස තුනක් කළා. දෙවැනි මාසයේ අපි තෙල් මිල වැඩි කළෙත් නැහැ. එක ගාණට තියාගෙන ආවා. ආයෙමත් වැඩි වෙන්න පටන් ගත්තා. පසුගිය මාසයේත්, -[බාධා කිරීමක්]-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හෙටත් එනවා නේද?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
හෙටත් එනවා. හැබැයි, ඇත්ත වශයෙන්ම කියන්න ඕනෑ අපේ, -[බාධා කිරීමක්]-

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු ඇමතිතුමනි, හෙට කියකින්ද තෙල් මිල වැඩි කරන්නේ?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒ ගැන හෙට බලන්න. අපි සංවේදී ආණ්ඩුවක්. සමහර වෙලාවට මේ දවස්වල අපි හිතනවාටත් වඩා ඉක්මනට තෙල් මිල වැඩි වෙනවා. තාමත් වැඩි වෙනවා. ඇත්ත වශයෙන්ම forecast අනුව නම් කියන්නේ, පෙබරවාරි විතර වෙනකම් වැඩි වෙයි; ඊට පස්සේ තමයි අඩු වෙන්න පටන් ගන්නේ කියලා. නමුත්, අඩු වෙනකොට අඩු වෙනවා. හැබැයි, සීමාවට වඩා මිල වැඩි වෙන්න පටන් ගත්තොත් සංවේදී ආණ්ඩුවක් හැටියට ඒවායින් කොටසක් අපි කර ගහනවා. මොන සූත්‍රය තිබුණත් අපි ඒකටත් කර ගහනවා. ඒ නිසා ඒ ගැන භය වෙන්න එපා. කොටසක් තමුන්නාන්සේලාත් භාර ගන්න. නමුත්, එදා බොර තෙල් බැරලය ලෝක වෙළෙඳ පොළේ අඩු වෙන වෙලාවේ දී එවකට බනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයා විධියට කටයුතු කළේ ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා. තෙල් මිල අඩු වුණු කාලයක් තිබුණා. මා ළඟ දැන් ඒ සංඛ්‍යා ලේඛන නැහැ. මට මතකයි, බොර තෙල් බැරලය US Dollars 45ටත් ගිය කාලයක් තිබුණා. ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා තමයි එවකට බනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයා විධියට කටයුතු කළේ. එතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්න නිසා මම ඒ ගැන කියනවා නොවෙයි. එදා බොර තෙල් බැරල් එකක මිල ඇමෙරිකානු ඩොරල් 45 දක්වා අඩු වුණාම ඒ වාසිය ජනතාවට දුන්නේ නැහැ. නමුත්, අපේ ආණ්ඩුව බොර තෙල් මිල අඩු වෙන්න පටන් ගත්ත මොහොතේ ඉඳලා හැම මාසෙම 10වැනි දා ඒ වාසිය ජනතාවට දෙනවා. මම මීට වඩා තවත් දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව කාලය තිබෙනවා ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩියක් තිබෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මට මීට වඩා කථා කරන්න ඕනෑ නැහැ. මම කියාගෙන ආවේ මේ ආර්ථිකය කඩාගෙන වැටෙන්නෙත් නැහැ; කඩාගෙන වැටෙන ප්‍රවණතාවකුත් නැහැ කියන එකයි. ඩොලරයට pressure එකක් තිබෙනවා. ඩොලරය තව ටිකක් වැඩි වෙන්න පුළුවන්. නමුත්, එසේ වැඩි වුණා කියලා ඒකෙන් රටේ ආර්ථිකය විනාශ වුණා කියලා කියන්න බැහැ. ඩොලරය තව ටිකක් වැඩි වෙන්න බැරි නැහැ. මම කියන්නේ නැහැ, මේ වැඩිවීම මෙතැනින් ඉවරයි කියලා.

නමුත්, ඒ වැඩි වීම අපේ වාසියකට හරවා ගනිමු. මේ තිබෙන තත්ත්වය යටතේ මේ රටේ ආර්ථිකය මම කලින් කියපු විධියට export පැත්තට හරවන්න ඕනෑ. අපි වැඩි වැඩියෙන් ඩොලර් හම්බ කර ගන්න ඕනෑ; tourism වැඩි කර ගන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, පිට රට යන අයටත් දැන් වැඩිපුර සල්ලි ලැබෙනවා. ඒ අය දැන් ගෙවල්වලට වැඩිපුර සල්ලි එවනවා. ඇත්තටම ඩොලරය වැඩිවීම නිසා ප්‍රශ්න ඇති වෙන්නේ ඉහළ පන්තියේ සහ මධ්‍යම පන්තියේ අයටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නම්. අපේ ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, ඩොලරය ඉහළ යාම නිසා දැන් බඩු මිලත් අහස උසට නැඟලා කියා. නමුත් ඔය කියන තරම් දෙයක් වෙලා නැහැ. උදාහරණයක් හැටියට අපි තම්බන ලද රතු සහල් ගනිමු. මම කන්නේ රතු සහල් බත් නිසායි එය උදාහරණයකට ගත්තේ. 2014 වසරේ දෙසැම්බර් මාසයේ -තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ අන්තිම මාසයේ- රතු සහල් කිලෝග්‍රෑම් එකක් රුපියල් 78යි. 2018 සැප්තැම්බර් මාසය වන විට එය රුපියල් 80යි. එදා මැලිබන් පිටි කිලෝග්‍රෑම් එකේ පැකැට්ටුවක් රුපියල් 900යි. අද වන විට එය රුපියල් 860යි. ඒක අඩු වෙලා. එදා සීනි කිලෝග්‍රෑම් එක රුපියල් 95යි. අද වන විට එය රුපියල් 97.50යි. එකම ගණන

වාගෙයි, රුපියල් 2.50ක් තමයි වැඩි වෙලා තිබෙන්නේ. එදා බී ලූනු කිලෝග්‍රෑම් එක රුපියල් 110යි. අද එය රුපියල් 115යි. මෙන්න බලන්න, හරි නම් රතු පරිප්පුවල මිල වැඩි වෙන්න ඕනෑ. ඒ කාලයේ රතු පරිප්පු කිලෝග්‍රෑම් එකක් රුපියල් 165යි. දැන් එය රුපියල් 120යි. [බාධා කිරීමක්] ඔව්, පරිප්පුත් පිට රටින් නේ, ගේන්නේ. පරිප්පු අපිටත් හම්බ වෙනවා, ඔය ගොල්ලන්ටත් හම්බ වෙනවා. අපි දෙගොල්ලන්ම පරිප්පු නම් කනවා! මේ දේවල් දිහා බැලුවාම, ඇත්ත වශයෙන්ම බඩු මිලෙහි ඔය කියන තරම් ලොකු ප්‍රශ්නයක් මේ වෙලාවේ නැහැ කියා පෙනෙනවා නේ. නමුත් පසුගිය අවුරුද්දේ එහෙම තිබුණා. දැන් අපි එය පාලනය කර තිබෙනවා. එම නිසා, ආර්ථිකය කඩාගෙන වැටිලාය කියා කවුරුන් හෝ කියනවා නම් ඒකත් අසත්‍යයක්.

ආර්ථිකය කඩාගෙන වැටිලාය කියන අයට අවසාන වශයෙන් මම තව එක කාරණයක් කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආර්ථිකය කඩාගෙන වැටුණා නම් මේ තරම් සංවර්ධන ක්‍රියාවලියක් සිදු වෙන්නේ කොහොමද? ඒ පිළිබඳ තොරතුරු, දත්ත සහිත "ෆයිල්" එකක් මම සකස් කරගෙන ආවා. නමුත්, මේ වෙලාවේදී මේ ලියකියවිලි අස්සේ එය සොයා ගන්න අපහසුයි. කෙසේ වෙතත්, "ගම්පෙරළිය" වැඩසටහන යටතේ මේ මොහොතේදීත් ලංකාව පුරාම ව්‍යාපෘති 39,666ක් ක්‍රියාත්මක වෙනවා. ඒ ක්‍රියාත්මක වෙන්නේ මාස හතරේ ව්‍යාපෘති. නොවැම්බර් 30වන දා වන විට ඒවා සියල්ලම අවසන් කරන්න ඕනෑ බව කියා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු මංගල සමරවීර මහතා**
(මාණ්පුමිකු මංකළ චමරවීර)
(The Hon. Mangala Samaraweera)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

"ගම්පෙරළිය" වැඩසටහන තවත් ශක්තිමත්ව අපි ඊළඟ අවුරුද්දේත් කරගෙන යනවා. අද කවදාවත් නැති තරමට, ගමක් ගමක් ගණනේ මුදල් ගිහිල්ලා තිබෙනවා. "ගම්පෙරළිය" වැඩසටහන හරහා මේ වන විට රුපියල් බිලියන 20කට ආසන්න මුදල් ප්‍රමාණයක් ගමට ගිහින් තිබෙනවා. තවත් මුදල් ගම්වලට යන්න තිබෙනවා. සමහර ව්‍යාපෘතිවල වැඩත් ඉවරයි. නොවැම්බර් මාසය වන විට අනික් ඒවායේත් සියලු වැඩ අවසන් වෙනවා.

"Enterprise Sri Lanka" කියන්නේ, තරුණ ව්‍යවසායකයන්, තරුණ businessmenලා නහා සිටුවන වැඩ පිළිවෙළක්. පරණ ඒවා නොවෙයි, මේ මාස තුන ඇතුළත පමණක් අපි විසිහතරදහස් ගණනකට අලුත් loans දීලා තිබෙනවා. අපි ඒ සඳහා රුපියල් බිලියන 54ක් වියදම් කර තිබෙනවා. කඩා වැටෙන ආර්ථිකයකට මේවා කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය කුමක්ද?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු ඇමතිතුමනි, "Enterprise Sri Lanka" යටතේ ණය දීමේදී දේශපාලන හිතවතුන්ට පමණක් ණය දෙනවාය කියා මතයක් තිබෙනවා. ඒකේ සත්‍යතාවක් තිබෙනවාද?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු මන්ත්‍රීතුමනි, එය සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. මම උදාහරණයක් කියන්නම්. ඔබතුමායි, මමයි දෙන්නාම දන්නා කෙනෙකු ඉන්නවා. ඒ, මාතර ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමා. දැන් එතුමා පොහොට්ටුවේ ක්‍රියාකාරිකයෙක්. එතුමාටත් මේ හරහා ළඟදී ණයක් ලබාදී තිබුණා. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. S. Shritharan. You have 20 minutes.

[பி.ப. 4.19]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அரையாண்டு அரசிறை நிலைமை அறிக்கை முன்வைக்கப் பட்டிருகின்ற இந்த நேரத்திலே நாட்டினுடைய அபிவிருத்தி தொடர்பாகவும், பொருளாதாரத்தை மேம்படுத்துதல் தொடர்பாகவும், எதிர்கால இறுப்புத் தொடர்பாகவும் வரவு செலவுத் திட்டத்தினுடைய குறைநிரப்பை அடிப்படையாக வைத்துப் பல்வேறுபட்ட விடயங்கள் இங்கு பேசப்பட்டுக் கொண்டிருக்கின்றன. இந்த நாட்டிலே எவ்வாறுதான் பொருளாதாரம் விருத்தி செய்யப்பட்டாலும், தங்கத்தினால் தார் ஊற்றினாலும்கூட, நாட்டிலே புரையோடிப் போயிருக்கின்ற தமிழ் மக்களுடைய பிரச்சினைகளும் தங்களுடைய விடுதலைக்காகப் போராடுகின்ற சிறைக் கைதிகளுடைய பிரச்சினைகளும் வலிந்து காணாமல் ஆக்கப்பட்டவர்களின் உறவினர்களுடைய பிரச்சினைகளும் தீர்க்கப்பட வேண்டிய இனப்பிரச்சினையும் நீறுபூத்த நெருப்பாகவே இப்பொழுதும் காணப்படுகின்றன. அரையாண்டு அரசிறை நிலைமை அறிக்கை பற்றி நாங்கள் இங்கே பேசிக்கொண்டிருக்கின்றவேளை, இந்த நாட்டுக்குரிய மக்கள் தங்களுடைய விடுதலைக்காகச் சிறையிலே போராடிக் கொண்டிருக்கின்றார்கள். இது இந்த நாட்டில் காணப்படும் ஒரு கொடுமையான நிலைமையாகும். நிதி அலகின் பெறுமதி வீழ்ச்சிகண்டுவருவது தொடர்பாக இன்று இங்கு கூட்டு எதிர்கட்சியினால் கூருணர்வுடன்கூடிய ஓர் ஒத்திவைப்பு வேளைப் பிரேரணை கொண்டு வரப்பட்டிருக்கின்றது. இங்கே இருக்கின்ற சிங்களத் தலைவர்கள் கட்சி சார்பைத் தவிர்த்து, சிறையிலே வாடுகின்ற இளைஞர்களுடைய எதிர்காலம் பற்றிய எண்ணங்களை ஏன் கூருணர்வோடு கருத்திலே எடுக்காது இருக்கின்றார்கள்? இந்த நாட்டிலே கல்வி ரீதியாகத்தான் பிரச்சினை ஆரம்பித்தது. நாட்டிலே இருக்கின்ற ஒரு பகுதி மக்கள் புறக்கணிக்கப்பட்டதனால்தான் நாட்டினுடைய பொருளாதாரம் பாதிக்கப்பட்டது. இந்த நாட்டிலே இருக்கின்ற பிரச்சினை தீர்க்கப்படாதவரை, மக்களின் எண்ணங்களைச் சரியாகப் பிரதிபலிக்க அரசாங்கம் தவறும்வரை பொருளாதார விருத்தி பற்றிச் சிந்திப்பதில் எந்த நியாயங்களும் இருப்பதாக எனக்குத் தெரியவில்லை.

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

நான் நேற்றைய தினம் அனுராதபுரம் சிறைச்சாலையிலே தங்களுடைய விடுதலைக்காகப் போராடுகின்ற தமிழ் அரசியல் கைதிகளைச் சென்று பார்வையிட்டிருந்தேன். இன்று 26 நாட்களாக அங்கே தங்களுடைய விடுதலைக்காக அவர்கள் போராடிக் கொண்டிருக்கிறார்கள். அவர்களுடைய உடல் நிலை கடுமையாகப் பாதிக்கப்பட்டிருக்கிறது. 26 நாட்களாக நீராகாரம் மட்டும் அருந்தி உண்ணாவிரதம் இருத்தல் என்பது, மனிதர்களுடைய உடற்பாகங்களை எவ்வளவுதூரம் பாதிக்கும் என்பதை இந்த நாட்டிலே இருக்கின்ற தலைவர்களும் மக்களால் தெரிவு செய்யப்பட்ட பிரதிநிதிகளும் புரிந்து கொள்ளாதிருப்பது மிகவும் வேதனைக்குரிய விடயமாகும். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இந்த இடத்திலே சம்பந்தப்பட்டவர்களுடைய பெயர்களைப் பதிவுசெய்ய விரும்புகிறேன். அதாவது, நல்லான் சிவலிங்கம் (வயது 41) 9 வருடங்கள் கடந்த நிலையிலும், புருசோத்தமன் அரவிந்தன் (வயது 40) 9 வருடங்கள், 3 மாதங்கள் கடந்த நிலையிலும், ராசவல்லவராசா தபோரூபன் (வயது 36) 9 வருடங்கள், 3 மாதங்கள் கடந்த நிலையிலும், மதியரசன் சுலக்ஷன் (வயது 30) 9 வருடங்கள், 4 மாதங்கள் கடந்த நிலையிலும் ராசதுரை ஜெகன் (வயது 42) 9 வருடங்கள், 5 மாதங்கள் கடந்த நிலையிலும், ராசதுரை திருவருள் (வயது 41) 6 வருடங்கள் 8 மாதங்கள் கடந்த நிலையிலும், நடராசா சபேஸ்வரன் (வயது 34) 2 வருடங்கள் கடந்த நிலையிலும், கணேஷன் தர்ஷன் (வயது 28) 8 ½ வருடங்கள் கடந்த நிலையிலும், சூரியகாந்தி ஜெயச்சந்திரன் (வயது 43) 9 வருடங்கள், 4 மாதங்கள் கடந்த நிலையிலும், சிவசுப்பிரமணியம் தில்லைராஜ் (வயது 40) 7½ வருடங்கள் கடந்த நிலையிலும், சிவப்பிரகாசம் சிவசீலன் (வயது 32) 9 வருடங்கள், 4 மாதங்கள் கடந்த நிலையிலும் தங்களுடைய உண்ணாவிரதத்தை - நோன்பை அனுராதபுரம் சிறைச்சாலையிலே மேற்கொண்டு வருகின்றார்கள். தங்களுக்குப் பொதுமன்னிப்பு வழங்குங்கள் அல்லது புனர்வாழ்வு அளித்து விடுதலை செய்யுங்கள் என்று அவர்கள் கேட்கிறார்கள். இந்த நாட்டிலே யுத்தம் முடிவடைந்திருக்கிறது; நல்லிணக்கம் பற்றிப் பேசப்படுகிறது. ஆனால், சரணடைந்த போராளிகள் காணாமல் ஆக்கப்பட்டிருக்கிறார்கள்; கொல்லப்பட்டிருக்கிறார்கள்; யுத்தத்தில் ஈடுபட்டார்கள் என்ற காரணத்திற்காகக் கைது செய்யப்பட்டுச் சிறையிலே அடைக்கப்பட்டிருக்கிறார்கள். சிறையிலே அடைக்கப்பட்டிருக்கின்ற இந்தத் தமிழ் அரசியல் கைதிகளை விடுதலை செய்வதற்கு அல்லது புனர்வாழ்வு அளிப்பதற்கு ஏன் அரசாங்கம் பின்னிற்கிறது? இது ஒரு மிக முக்கியமான விடயம். இவர்களுக்கு ஆதரவு தெரிவித்து, இப்பொழுது மெகசின் சிறைச்சாலையிலே 45 தமிழ் அரசியல் கைதிகள் உண்ணாவிரதம் இருக்கிறார்கள். இந்த நாட்டிலே உள்ள சம்பந்தப்பட்ட யாருக்கும் இந்த விடயம் தெரியாமலிருப்பதுதான் மிகவும் விநோதமானதும் வேதனைக் குரியதுமான விடயமாகும்.

இந்த நாடு எல்லோரையும் அணைத்துச் செல்கின்ற தென்றால், இந்த நாட்டிலே வாழ்கின்ற மக்கள் எல்லோருக்கும் சரியான பாதை காட்டப்படுகின்றதென்றால், இன ரீதியான வன்முறைகள் இந்த நாட்டிலே இல்லையென்றால், இவர்களை விடுதலை செய்வதற்கு ஏன் தயங்குகின்றார்கள்? இன்று நானும் சக பாராளுமன்ற உறுப்பினர் சார்ள்ஸ் நிர்மலநாதன் அவர்களும் மகசின் சிறைச்சாலைக்குச் சென்று அவர்களைப் பார்த்தபோது, 45 பேர் மிகவும் களைத்த நிலையிலே இருந்ததைக் கண்டோம். 26 நாட்கள் போராடிய அநுராதபுரம் சிறைக் கைதிகள் பேசமுடியாத நிலையிலே இருக்கின்றார்கள். அவர்களுடைய உடல்நிலை மிகவும் பாதிக்கப்பட்டிருக் கின்றது. மகசின் சிறைச்சாலையிலே இருக்கின்றவர்களுடைய உடல்நிலையும் பாதிக்கப்பட்டிருக்கின்றது. ஏதோவொரு வகையிலே தங்களை விடுதலை செய்யுங்களென்று அவர்கள் தொடர்ந்து கேட்கின்றார்கள். ஆனால், அரசாங்கமோ, அரசாங்கத்தினுடைய பிரதிநிதிகளோ, ஏன் அவர்களைக் கருத்திலே கொள்ளமுடியாதவர்களாக இருக்கின்றார்கள்?

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மிகக் கூடியளவான ஓர் இன ரீதியான வன்முறைக்கு உள்ளாக்கப் பட்ட இனமாகத் தமிழினம் இருக்கின்றது. அவர்களுடைய விடுதலை மிக முக்கியமானது. அதிலும், யுத்தத்தால் பாதிக்கப்பட்ட அந்த இளைஞர், யுவதிகள் விடுதலை செய்யப்பட்டுத் தங்களுடைய குடும்பங்களோடு சேர்ந்து வாழவேண்டும். 1993ஆம் ஆண்டு தன்னுடைய 19ஆவது வயதிலே கைது செய்யப்பட்ட மட்டக்களப்பு மாவட்டத்தின் மொறக்கொட்டாஞ்சேனையைச் சேர்ந்த செல்லப்பிள்ளை மகேந்திரன் என்பவர் இன்று சுமார் 26 வருடங்கள் கடந்தும் சிறையிலிருக்கின்றார். இன்று அவருடைய வயது 45 ஆகும். யோசித்துப் பாருங்கள்! ஓர் இளைஞன் 19 வயதிலே சிறைக்குச் சென்றிருக்கிறான். அவன் 19 வயதிலே சிறைக்குச் சென்று, இன்று 45 வயது வரையும் அவனுடைய காலம் சிறையிலே கழிந்திருக்கின்றது. நெல்சன் மண்டேலாகூட 27 ஆண்டுகள் சிறையிலே இருந்தாக நாங்கள் படித்திருக்கிறோம். தென்னாபிரிக்காவினுடைய முன்மாதிரிகளைப் பின்பற்று கின்றோம்; தென்னாபிரிக்காவினுடைய மாதிரிகளின் அடிப்படையில்தான் நல்லிணக்கம் ஏற்படுத்தப்படுகின்ற தென்றெல்லாம் இந்த நாட்டிலே தலைவர்கள் பேசிக் கொள்கின்றார்கள். ஆனால், தென்னாபிரிக்கா வினுடைய தலைவர் சொன்ன சொற்களுக்கப்பால், அங்கேயிருக்கின்ற அந்த நல்லிணக்கத்தைக்கூட இந்த நாட்டிலே வெளிக் காட்டுவதற்கு யாரும் இல்லாத ஒரு நிலைமை காணப் படுகின்றது. இந்தத் தமிழ் அரசியல் கைதிகளினுடைய விடுதலை மிக மிக முக்கியமானது. இவர்கள் தொடர்ந்தும் இவ்வாறு சிறையிலே வாடிக்கொண்டிருக்க, வெறுமனே நல்லிணக்கம் பேசுவதிலும் ஏதோ அபிவிருத்தி நடந்து விட்டதாக எண்ணுவதிலும் எதுவும் நடந்துவிடக்கூடிய வாய்ப்புக்கள் இல்லை.

மிக மிக முக்கியமாக நான் ஒரு விடயத்தை இந்த இடத்திலே குறிப்பிட வேண்டும். அதாவது, கோத்தாபய ராஜபக்ஷ தொடர்பான வழக்குத் தொடர்பாகவும், சரத் பொன்சேகா தொடர்பான வழக்குத் தொடர்பாகவும், சந்திரிகா தொடர்பான வழக்குத் தொடர்பாகவும், ஐ.பி. ஜெயரட்ணம் தொடர்பான வழக்குத் தொடர்பாகவும், பாகிஸ்தான் தூதுவர் தொடர்பான வழக்குத் தொடர்பாகவும், ஜெயராஜ் பெர்னான்டோபுள்ளே தொடர்பான வழக்குத் தொடர்பாகவும் -

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, there is a point of Order being raised by the Hon. Namal Rajapaksa.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Hon. Member, can I have one minute to ask you a question?

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வழக்குகள் எல்லாம் இருக்கின்றபோது, நான் கேட்பது என்னவென்றால், எது இருந்தாலும் ஏதோவொரு வகையில் நாட்டினுடைய பொருளாதாரம் சரியாக அமைய வேண்டுமென்றால் -

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, there is a point of Order being raised by the Hon. Namal Rajapaksa.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Hon. Member, you were talking about the prisoners in the Magazine Prison. Now, what steps have you have taken with regard to them? Yesterday, we saw a former State Minister getting bail within half-an-hour. But, what have you done with regard to the release of these prisoners so far? We remember, during the last Presidential Election, you went to the North promising to get bail for those people. But, what have you all done so far, for the last four-and-a-half years, to help them? You only complain, but you have not done anything.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் நாமல் ராஜபக்ஷ அவர்கள் இந்தக் கேள்வியை அரசாங்கத்திடந்தானே கேட்க வேண்டும்! நான் ஒரு பாராளுமன்ற உறுப்பினர். பாதிக்கப்பட்ட இனம் சார்பாக, வஞ்சிக்கப்பட்ட மக்கள் சார்பாக, சிறையில் போராடுகின்ற இளைஞர்கள் சார்பாக என்னுடைய கருத்துக்களை நான் முன்வைக்கின்றேன். கௌரவ நாமல் ராஜபக்ஷ அவர்கள் கேட்பது பற்றி இந்த அரசாங்கம் என்ன செய்யப்போகின்றது? ஏற்கனவே, சுமார் 12,000 போராளிகள் புனர்வாழ்வளிக்கப் பட்டு விடுதலை செய்யப்பட்டிருக்கின்றார்கள். நான் அதை ஏற்றுக்கொள்கின்றேன். ஆனால், அதேபோல ஏன் இந்த -

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, there is a point of Order being raised by the Hon. Namal Rajapaksa.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Hon. Member, we are happy that you are blaming the Government for this. You all communicate with the Government regarding the rest of the problems, but have you spoken about this matter? We know that you go and meet those people, talk about this problem. But when you come back and meet the Government officials you say something else. So, what have you done? I know it personally because I was in the remand prison with them.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவருடைய தந்தை இந்த நாட்டின் சனாதிபதியாக இருக்கும் பொழுதுதான், இந்த இளைஞர்கள் கைது செய்யப்பட்டு, சிறையிலே அடைக்கப்பட்டார்கள். அப்பொழுது, இவரும் பாராளுமன்ற உறுப்பினராக இருந்தார். இவர் சிறைக்குச் சென்று வந்த பிறகுதான், இவருக்கு சிறையினுடைய கொடுமை விளங்கியது. இவர்கள் நினைத்திருந்தால்கூட, அந்த நேரத்தில் அவர்களை விடுதலை செய்திருக்க முடியும். ஆனாலும் "அவர் நல்லவர் அல்லது இவர் கூடாதவர்" என்று யார் மீதும் இப்பொழுது நான் குற்றம் சொல்ல வரவில்லை.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Hon. Member, I do not want to argue with you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
That is not a point of Order, Hon. Member.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Sir, just a clarification. The Hon. Member is talking about rehabilitation. We have rehabilitated 12,500 ex-LTTE cadres and 3,500 of them were employed in the Sri Lanka Civil Security Force. But, what have you all done? You all changed our Government for this. That is my question. I am not going to argue with you, but I want an answer from you.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ நாமல் ராஜபக்ஷ அவர்கள் இந்தக் கேள்வியை என்னிடம் கேட்க முடியாது. அன்று அவருடைய தந்தை இந்த நாட்டின் சனாதிபதியாக இருந்தபொழுதும் நாங்கள் இதைத்தான் கேட்டோம்; இப்பொழுதும் இந்த அரசாங்கத்திடம் இதைத்தான் கேட்கிறோம். எங்களுடைய பிரச்சினையைத் தீர்த்துவையுங்கள்! எங்களுடைய இளைஞர்களை, யுவதிகளை விடுதலை செய்யுங்கள்! எங்களுடைய காணிகளை விடுவியுங்கள்! எங்களுடைய மக்களுக்கான ஓர் அரசியல் தீர்வை முன்வையுங்கள்! என்றுதான் நாங்கள் கேட்கிறோம். இப்பொழுது நான் கௌரவ உறுப்பினர் அவர்களிடம் ஒரு விடயத்தைக் கேட்கிறேன். அதாவது நீங்கள் வடக்கு-கிழக்கு இணைந்த மண்ணில் ஓர் அரசியல் தீர்வை இப்பொழுது வெளிப்படையாகச் சொல்லுவதற்குத் தயாரா? அல்லது ஆட்சியைப் பிடித்தால், எல்லா அரசியல் கைதிகளையும் விடுவிக்கிறேன்; வலிந்து

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

காணாமல் ஆக்கப்பட்டவர்களைத் தேடித் தருகிறேன் என்று சொல்லத் தயாரா? நடேசன், புலித்தேவன் ஆகியோர் சரணடைந்தபொழுது, அவர்களைச் சுட்டுக்கொன்றதும்

*[இலாஸனையே අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ஆகவே, இப்பொழுது நல்லவர்கள்போல் பேச முடியாது. இந்த நாட்டிலுள்ள ஒட்டுமொத்த சிங்களத் தலைவர்களிடமும் உங்களுடைய இதயத்தின் ஈராமான பகுதியால் எங்களுடைய மக்களின் பிரச்சினைகளைப் பற்றிச் சிந்தியுங்கள்! எங்களுடைய மக்களின் பிரச்சினைக்குத் தீர்வைத் தாருங்கள்! என்றுதான் நாங்கள் கேட்கிறோம்.

*[இலாஸனையே අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

நேரடியாக சுட்டு, வெட்டி தலையைக் கொண்டுபோனார்கள். ஆனால், இப்பொழுதிருக்கின்ற அரசாங்கமும் எங்களுடைய மக்களை இன்னும் வதைத்துக்கொண்டுதான் இருக்கிறது. அதைத்தான் நாங்கள் குறிப்பிடுகின்றோம். அதாவது, எங்களுடைய பிள்ளைகளை விடுதலை செய்யுங்கள்! சிறையிலேயிருக்கின்ற அரசியல் கைதிகளை விடுதலை செய்யுங்கள்! வலிந்து காணாமல் ஆக்கப்பட்டவர்களுக்கான விடுதலையை உறுதிப்படுத்துங்கள்! அதற்கான நீதியைப் பெற்றுத்தாருங்கள்! இவற்றைத்தான் நாங்கள் கேட்கின்றோம். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தச் சபையிலே இதனை விவாதப் பொருளாக வைத்துக்கொண்டு அவர் நல்லவர், இவர் கெட்டவர் என்று பேசுவதற்கு நாங்கள் வரவில்லை. இந்த நாட்டிலே நீதி இருக்கிறது, ஜனநாயகம் இருக்கிறது, மக்கள் மதிக்கப்படுகிறார்களென்றால், இங்கேயிருக்கின்ற தமிழ் மக்களை இந்த நாட்டினுடைய பிரஜைகளாக நீங்கள் ஏற்றுக்கொள்கிறீர்களென்றால் தமிழ் அரசியல் கைதிகளுடைய விடுதலையை முதலில் உறுதிப்படுத்துங்கள். கூட்டு எதிர்க்கட்சியினராகிய நீங்கள் இன்றைக்குக் கொண்டுவந்திருக்கின்ற இந்த ஒத்திவைப்பு வேளைப் பிரேரணையைப்போல, ஒரு பிரேரணையைக் கொண்டு வந்து நாங்கள் கதைப்பதுபோல, அந்த அரசியல் கைதிகளின் விடுதலைக்காகக் குரல் கொடுக்கலாமே! உங்களாலும் அதைச் செய்ய முடியுமே! ஏன், அப்படிச் செய்ய முடியாமல் இருக்கின்றது? எவரும் ஆட்சிக்கு வரும்வரைக்கும் கதைப்பார்கள். ஆட்சிக்கு வந்தபின்னர் இதைத்தான் கடைப்பிடிப்பார்கள். இந்த நாட்டினுடைய பொருளாதாரம் என்பது இந்த விடயங்களிலும்தான் தங்கியிருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் மஸ்கெலியாவில், நுவரெலியாவில், தலவாக்கலையில் மக்கள் போராடுகிறார்கள். அங்கு போராடுகின்ற ஒவ்வொரு தொழிலாளியுடைய நாட்சம்பளம் 2 அல்லது 3 டொலர்கள்தான்! அப்படியென்றால், 60 - 70 டொலர் வரையில்தான் அவர்களுடைய மாதச் சம்பளம் அமைகின்றது. சாதாரணமாக ஓர் அமைச்சருடைய செயலாளர் மாதமொன்றுக்கு இரண்டு இலட்சம் ரூபாய்வரை - கிட்டத்தட்ட 1,000 டொலர்கள் வரை - சம்பளம் பெறுகின்றார். ஆனால், அந்தத் தோட்டத் தொழிலாளர்கள் தொடர்ந்தும் தங்களுடைய நாளாந்த வயிற்றுப் பிழைப்புக்காக, சம்பள உயர்வுக்காகப் போராடுகிறார்கள். இந்த நாட்டிலே அவர்களைக் கவனிக்க யாருமில்லை. இந்த நாட்டின் தலைவர் எவரும் அவர்களுக்காக இதுவரை குரல் கொடுக்கவில்லை; இந்த நாட்டின் பொருளாதாரத்தின் முதுகெலும்பாக இருக்கின்ற தோட்டத் தொழிலாளர்களுடைய சம்பளம் பற்றி இந்தச் சபையிலே அவர்களால் இன்னும் ஒரு செய்தியைத் தானும் சொல்ல முடியவில்லை. இதுதான் இந்த நாட்டில் நடக்கின்றது.

எதிர்வரும் ஆண்டுக்கான வரவு செலவுத்திட்டம் வர விருக்கிறது; அதற்கான விவாதம் நடக்கவிருக்கிறது. நாட்டினுடைய பொருளாதாரம் விருத்தி செய்யப்பட வேண்டுமென்றால் நாட்டிலே புரையோடிப் போயிருக்கின்ற பிரச்சினைகளைத் தீர்ப்பதற்கு நல்லெண்ணங்களையும், இதயசுத்தியான சிந்தனைகளையும் முதலில் நீங்கள் ஏற்படுத்த வேண்டும். அதனை நீங்கள் செய்யத் தவறினால், இந்த நாடு எந்த ஒரு காலத்திலும் முன்னேற முடியாது. 1940களில் யப்பானுடைய பொருளாதாரம், சிங்கப்பூரினுடைய பொருளாதாரம் என்பன இலங்கையைவிட எவ்வளவோ குறைவாக இருந்தது. ஆனால், இன்று அந்த நாடுகளுடன் ஒப்பிடும்போது இலங்கையினுடைய பொருளாதாரம் மிகவும் கீழ்நிலையில் இருக்கின்றது. காரணம், இந்த நாட்டிலே ஓர் இனம் வஞ்சிக்கப்பட்டது; ஓர் இனம் அழிக்கப்பட்டது. ஓர் இன அழிப்பு இந்த மண்ணிலே நடைபெற்றது; 140,000 இற்கும் மேற்பட்ட மக்கள் கொல்லப்பட்டார்கள். அதனை கௌரவ நாமல் ராஜபக்ஷவுடைய

*[இலாஸனையே අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

செய்தார். ஆகவே, அவர்களுக்குப் பங்கிருக்கின்றது. இந்த நாட்டிலே அவர்கள் செய்ததை மறைக்க முடியாது. அது இந்த நாட்டிலேயே நடைபெற்றது. இனப்படுகொலையைச் செய்தவர்கள் இப்பொழுது தங்களை வெள்ளையடித்துக் கொள்ள முடியாது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த மண்ணிலேயிருக்கின்ற மக்கள் வஞ்சிக்கப்படாமல் நீதியின் அடிப்படையில் நடாத்தப்பட வேண்டும். 1987ஆம் ஆண்டு இலங்கை - இந்திய ஒப்பந்தம் கொண்டுவரப்பட்டபொழுது அரசியல் கைதிகள் விடுதலை செய்யப்பட்டார்கள். அதேபோல் 2001ஆம் ஆண்டு ரணில் விக்கிரமசிங்க அவர்களுக்கும் தேசியத் தலைவர் பிரபாகரனுக்குமிடையில் ஒப்பந்தம் எழுதப்பட்டபொழுது அரசியல் கைதிகளாக இருந்தவர்கள் விடுதலை செய்யப்பட்டர்கள். 2009ஆம் ஆண்டிலே யுத்தம் முடிந்துவிட்டது. வெடிச் சத்தங்களும் கேட்கவில்லை. யுத்தத்துக்கான எந்த அறிகுறிகளும் இல்லையென்றால். இப்போதிருக்கின்ற அரசியல் கைதிகளை ஏன் விடுதலை செய்ய முடியாது? இந்த நாட்டிலே அது செய்ய முடியாத ஒன்றா? இந்த நாட்டின் பொருளாதாரம் வளரவேண்டுமானால், இந்த நாட்டினுடைய பொருளாதாரத்தைக் கட்டியெழுப்ப வேண்டுமானால், புலம்பெயர்ந்து வெளிநாடுகளில் உள்ளவர்களும் சரி, வெளிநாடுகளும் சரி அதற்காகத் தங்களுடைய பங்கை காத்திரமாகச் செய்ய வேண்டுமென்றால், நீங்கள் முதலிலே இந்த நாட்டில் புரையோடிப் போயிருக்கின்ற பிரச்சினையைத் தீர்த்து, தமிழ் அரசியல் கைதிகளை விடுதலை செய்யுங்கள்! இந்த நாட்டிலே வலிந்து காணாமல் ஆக்கப்பட்ட மக்களுக்கான நீதியை வழங்குங்கள்!

முன்பு வெளிநாட்டலுவல்கள் அமைச்சராக இருந்த கௌரவ மங்கள சமரவீர அவர்கள், 2015ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையிலே, இந்தப் பிரச்சினைக்குத் தீர்வு காண்பதாகவும்,

பிரச்சினைகளை ஆய்வு செய்வதாகவும் குறிப்பிட்டிருந்தார். வழங்கப்பட்ட கால அவகாசங்கள் முடிந்தும் இன்றுவரை எங்களுடைய மக்களுக்கு நீதி கிடைக்கவில்லை. அதனால் நீதியின் அடிப்படையில், ஒரு நியாயாதிக்கத்தின் அடிப்படையில் இந்த நாட்டில் வாழுகின்ற இந்த மக்களுக்கான நீதியை வழங்குவதற்கு முயற்சியுங்களென்று கூறி, எனது பேச்சை நிறைவு செய்கிறேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. ඊළඟට, ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා. ඊට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකු ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු පියංකර ජයරත්න මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பியங்கர ஜயரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. PIYANKARA JAYARATNE *left the Chair, and* THE HON. SHEHAN SEMASINGHE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා.

[අ.භා. 4.37]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ඉතාම වැදගත් කාරණයක් පිළිබඳවයි සාකච්ඡා කිරීමට නියමිතව තිබෙන්නේ. "වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2018" පදනම් කරගෙන මේ රටේ ආර්ථිකය පිළිබඳව ගැඹුරු කතිකාවතක් ආරම්භ කරන්නටයි (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා අද මේ සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළේ. මට පෙර ගරු මන්ත්‍රීවරුන් ගණනාවක් කථා කළා. මම එතුමන්ලාගේ කථා අසාගෙන හිටියා. හැබැයි, මේ මූල්‍ය වාර්තාවේ තත්ත්වය පිළිබඳව හෝ එහි තිබෙන අන්තර්ගතය පිළිබඳව එක වචනයක්වත් අපි කාටවත් අහන්න ලැබුණේ නැහැ. මේ වාර්තාව පදනම් කරගෙන අපේ රටේ ආර්ථිකය ගැන විග්‍රහයක් කර ගන්න ඕනෑ කොහොමද කියන කාරණය පිළිබඳව ගරු සභාවේ අවධානය යොමු කරවන්න මම කල්පනා කළා.

විශේෂයෙන්ම මේ වාර්තාව අනුව 2017 වසර සමඟ සංසන්දනය කර බලන විට 2018 වසරේ අපි ඒ ඒ ක්ෂේත්‍රයන් තුළින් ලබාගෙන තිබෙන වර්ධනයන් මොනවාද, පිරිහීමක් පවතින්නේ මොන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන්ද කියන කාරණය ඉතාම වැදගත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මේ වාර්තාවේ තිබෙන සංඛ්‍යා ලේඛන අනුව කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්ධනය වුණු ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. ඒ ක්ෂේත්‍ර අතර ප්‍රධාන වශයෙන් වී වගාව සලකන්න පුළුවන්. 2017 වසරේ පළමු කාර්තුව හා සංසන්දනාත්මකව බැලූ විට 2018 වසරේ පළමු කාර්තුවේ අපේ රටේ වී වගාවෙන් ලද අස්වැන්න 56.6ක ප්‍රතිශතයකින් වර්ධනය වෙලා තිබෙනවා; ධාන්‍ය වගාව (වී හැර) සියයට 40.2ක වර්ධනයක් පෙන්නුම් කරනවා; එළවලු වගාවේ සියයට 22.3ක වර්ධනයක් තිබෙනවා; මිරිදිය ධීවර කර්මාන්තයේ සියයට 37.4ක වර්ධනයක් පෙන්නුම් කරනවා; තේ ආර්ථිකයේ වර්ධනය සියයට 10.6යි; පලතුරු වගාවේ වර්ධනය සියයට 6යි.

කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ කැපී පෙනෙන පසුබෑම්වලට ලක් වුණු ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. ප්‍රධාන වශයෙන්ම රබර් නිෂ්පාදනයේ සියයට 13.9ක අඩු වීමක් සිදුවෙලා තිබෙන බව අපි දකිනවා. පොල්, තැඹිලි, පාම් ඔයිල් කර්මාන්තයේ සියයට 13.5ක අඩුවක් තිබෙනවා. උක් වගාව, දුම්කොළ වගාව යනාදී බහුවිධ වගාවන්වල සියයට 9.2ක අඩුවක් තිබෙනවා. ඒ අනුව කෘෂිකර්ම ක්ෂේත්‍රයේ බොහෝ අංශවල වර්ධනයක් පවතින අතර, අංශ කීපයක පසුබෑමක් අපට දකින්න ලැබෙනවා.

අපේ රටේ ආර්ථිකයේ දෙවැනි ක්ෂේත්‍රය කර්මාන්ත ක්ෂේත්‍රයයි. මේ වාර්තාවට අනුව කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනය වුණු අංශ විධියට දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදනය -ගෘහ භාණ්ඩ හැර- පෙන්නුම් කරලා තිබෙනවා. එහි වර්ධනය සියයට 11.9යි. විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම යනාදියෙහි වර්ධනය සියයට 10.2යි; කසළ කළමනාකරණය වර්ධනය සියයට 9.8යි; ලෝහ කර්මාන්තය වර්ධනය සියයට 9.1යි; රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්තයන්හි වර්ධනය සියයට 7.9යි; රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ වර්ධනය සියයට 6.1යි.

කර්මාන්ත ක්ෂේත්‍රයේ පිරිහීම් අංශ විධියට පෙන්නුම් කරලා තිබෙනවා, අහුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදනය. එය 38.8ක ප්‍රතිශතයකින් අඩුවෙලා තිබෙනවා. කර්මාන්ත ක්ෂේත්‍රයේ විශාලම පිරිහීමක් තිබෙන ක්ෂේත්‍රය විධියට එම ක්ෂේත්‍රය හඳුනාගෙන තිබෙනවා. යන්ත්‍රෝපකරණ නිෂ්පාදන සියයට 5.5කින් අඩු වෙලා තිබෙනවා, ඉදිකිරීම් කර්මාන්තය සියයට 4.9ක පසුබෑමකට ලක් වෙලා තිබෙනවා. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සියයට 2ක පසු බෑමකට ලක්වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආර්ථිකය සමන්විත වන තුන්වන ක්ෂේත්‍රය තමයි සේවා අංශය. සේවා අංශයේ වර්ධනය වීම් පෙන්වන අංශ විධියට අපට පැහැදිලිව පෙනෙන්න තිබෙන්නේ මේ අංශයි. මූල්‍ය සේවා අංශයේ සියයට 12.2ක වර්ධනයක්, විදුලි සංදේශ අංශයේ සියයට 11.1ක වර්ධනයක්, රක්ෂණ ක්ෂේත්‍රයේ සියයට 9.3ක වර්ධනයක්, නවාතැන් සහ ආහාර පාන සැපයීම් අංශයේ සියයට 7.6ක වර්ධනයක්, නිවාස අයිතිය සහ දේපොළ වෙළෙඳාම් අංශයේ සියයට 4.9ක වර්ධනයක්, තැපැල් සහ කුරියර් සේවා අංශයේ සියයට 6.5ක වර්ධනයක්, තොග හා සිල්ලර වෙළෙඳාම් අංශයේ සියයට 5.4ක වර්ධනයක්, තොරතුරු තාක්ෂණ සේවා අංශයේ සියයට 4.3ක වර්ධනයක් පෙන්නුම් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සේවා අංශය ගත්තාම පිරිහීම් දකින්නට තිබෙන්නේ අංශ තුනක පමණයි. ඒ අංශ තුනෙන් කැපී පෙනෙන ප්‍රධානම අංශය තමයි, ගුවන් විදුලිය සහ රූපවාහිනී විකාශන සේවා අංශය. ගුවන් විදුලිය සහ රූපවාහිනී විකාශන සේවාවන්හි පිරිහීම, බිඳ වැටීම සියයට 18.3යි. මා හිතන හැටියට

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

මේ ක්ෂේත්‍රය පිළිබඳව මාධ්‍ය ආයතන, මාධ්‍යවේදීන් අවධානය යොමු කළ යුතුයි. අපේ රටේ විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය බොහෝ විට සිය තරගය තුළ නොයෙකුත් ක්‍රමවේද උපයෝගි කර ගත්තත්, පසුගිය අවුරුද්දේ මුල් කාර්තුව සමඟ සංසන්දනාත්මකව බැලුවාම මේ අවුරුද්දේ මුල් කාර්තුවේ පැහැදිලි ලෙසම සියයට 18.3ක බිඳ වැටීමක් දකින්න ලැබෙනවා; පිරිහීමක් දකින්න ලැබෙනවා. එය දළ වශයෙන් 1/5ක ප්‍රමාණයක්. මාධ්‍ය ආයතන බොහෝ විට දකුණු ඉන්දියානු ටෙලි නාට්‍ය විකාශනය කරමින් ඉන්නවා; superstarsලා නිර්මාණය කරමින් ඉන්නවා. ඒ අතර තුර ගුවන් විදුලිය සහ රූපවාහිනී විකාශන සේවා ජනතාව අතරින් එන්න-එන්න ප්‍රතික්ෂේප වෙමින් පවතින බවට හොඳ දත්තයක් මේ වාර්තාවේ සඳහන්වෙලා තිබෙනවා. සේවා අංශයෙන් පිරිහීමට ලක් වුණු අංශ තුනෙන් ගුවන් විදුලිය සහ රූපවාහිනී විකාශන සේවාවලට අමතරව අධ්‍යාපන සේවාවන්හි සියයට 1.7ක පිරිහීමක් සහ රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂාව අංශයේ සියයට 0.4ක පිරිහීමක් පෙන්නුම් කරලා තිබෙනවා.

අපේ රටේ දළ දේශීය නිෂ්පාදනය පිළිබඳව, උද්ධමනය පිළිබඳව, ජනතාවට මුහුණ දෙන්න තිබෙන ප්‍රශ්න පිළිබඳව සහ විරැකියාව පිළිබඳව අද දින බොහෝ ගරු මන්ත්‍රීතුමන්ලා සාකච්ඡාවට භාජන කළා. ඒ සම්බන්ධවත් මේ වාර්තාවෙන් අපට ඉතා වටිනා දත්ත සපයා තිබෙනවා. 2017 ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයේ වැඩිවීමේ වේගය සියයට 3.1ක් වශයෙනුත්, උද්ධමන වේගය සියයට 7.1ක් වශයෙනුත්, විරැකියාවේ ප්‍රතිශතය සියයට 4.2ක් වශයෙනුත් පෙන්නුම් කර තිබෙනවා. මේ සම්බන්ධව සංසන්දනාත්මකව බලනකොට ඉන්දියාවේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය සියයට 6.7යි; උද්ධමන වේගය සියයට 3.6යි. තායිලන්තයේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය සියයට 3.9යි; උද්ධමන වේගය සියයට 0.7යි; විරැකියාවේ ප්‍රතිශතය සියයට 0.7යි. මේ සංඛ්‍යා ලේඛන අනුව අපේ කලාපයේ රටවල් බොහොමයක දළ දේශීය නිෂ්පාදනය වැඩි කර ගැනීමේ වේගය බොහෝ සෙයින් සමාන මට්ටමකින් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ එක්කම විරැකියාවේ ප්‍රතිශතය ගත්තත් බොහෝ සෙයින් සමාන මට්ටමක පවතිනවා. එය මේ කලාපයේම පවතින ආර්ථික තත්ත්වය පෙන්නුම් කරන කාරණයක්.

මේ වාර්තාව මඟින් 2017 මුල් මාස හතර ඇතුළත රාජ්‍ය ආදායම් පිළිබඳ සංඛ්‍යා ලේඛන අපට ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව 2017 මුල් මාස හතර ඇතුළත රාජ්‍ය ආදායම රුපියල් බිලියන 590ක් වශයෙන් තිබුණු අතර, 2018 මුල් මාස හතර ඇතුළත රාජ්‍ය ආදායම රුපියල් බිලියන 622ක් බවට පත්වෙලා තිබෙනවා. ඒ අනුව 2017 මුල් කාර්තුවේ රාජ්‍ය ආදායම හා 2018 මුල් කාර්තුවේ රාජ්‍ය ආදායම සැසඳීමේදී මේ වසරේ රාජ්‍ය මූල්‍ය ආදායම් වර්ධනය සියයට 5.6කින් වැඩිවෙලා තිබෙනවා.

2017 එම කාර්තුවේ බදු ආදායම රුපියල් බිලියන 554යි. මේ වසරේ රුපියල් බිලියන 570යි. සියයට 2.8ක වැඩි වීමක් දකින්නට ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උසස් අධ්‍යාපනය ගත්තොත්, උසස් අධ්‍යාපනය වෙනුවෙන් වැය කරන මුදල් ප්‍රමාණයත් ඉතා ශීඝ්‍රයෙන් ඉහළ ගිහින් තිබෙනවා. 2017 මුල් කාර්තුවේ උසස් අධ්‍යාපන පුනරාවර්තන වියදම් විධියට රුපියල් මිලියන 8,004ක් වියදම් කර තිබුණා වුණත්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
නැහැ, මට චිනාඩි 20ක් වෙන් කරන්න. අපි කාලය adjust කරන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ඔබතුමා කථා කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
2017 වසරේ මුල් කාර්තුවේ උසස් අධ්‍යාපනය සඳහා රුපියල් මිලියන 8,004ක් වියදම් කළත්, මේ වසරේ පළමුවැනි කාර්තුව වන විට අපි රුපියල් මිලියන 8,400ක් වියදම් කර තිබෙනවා. මහපොළ ආධාර ලබා දීම සඳහා ගිය වසරේ මුල් කාර්තුවේ රුපියල් මිලියන 199ක් වියදම් කර තිබෙනවා. එය මේ වසරේ රුපියල් මිලියන 402ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව වැඩි වීමේ ප්‍රතිශතය 102යි. ඒ වාගේම 2017 මුල් කාර්තුවේ විශ්වවිද්‍යාල සංවර්ධනය සඳහා රුපියල් මිලියන 1,180ක් වියදම් කළත්, 2018 මුල් කාර්තුවේ එය රුපියල් මිලියන 2,387ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව වැඩි වීමේ ප්‍රතිශතය 102ක් බවට පත් වෙලා තිබෙනවා. ඉතිහාසයේ කිසිම දිනක මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ සංවර්ධන කටයුතු සඳහා වියදම් කිරීම මේ වාගේ වේගයකින් වැඩි වෙලා නැහැ.

මම කලිනුත් සඳහන් කළ විධියට විශ්වවිද්‍යාල නේවාසිකාගාර ගත්තොත්, පසුගිය වසර 70ක කාලය තුළ නේවාසිකාගාර පහසුකම් දුන්නේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 56,000කට පමණයි. නමුත්, මේ වසර දෙක ඇතුළත ශිෂ්‍ය ශිෂ්‍යාවන් 33,600ක් සඳහා අවශ්‍ය නේවාසිකාර අපි අලුතින් එකතු කරලා තිබෙනවා. විශ්වවිද්‍යාල ප්‍රජාව 91,000ක් වෙනකොට එයින් 89,000ක් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. විශ්වවිද්‍යාල තාක්ෂණ පීඨ ඉදිකිරීම සඳහා ගිය වසරේ පළමුවැනි කාර්තුවේ රුපියල් මිලියන 255ක් වියදම් කර තිබුණා. අපි මේ වසරේ ඒ වාගේ පස්ගුණයකට සමාන මුදලක්, ඒ කියන්නේ රුපියල් මිලියන 1,253ක් වැය කරලා තිබෙනවා. නැනෝ තාක්ෂණය සඳහා පසුගිය වසරේ මුල් කාර්තුවේ රුපියල් මිලියන 32යි වියදම් කරලා තිබෙන්නේ. අපි 2018 වසරේ මුල් කාර්තුව තුළ පමණක් එම ක්ෂේත්‍රය වෙනුවෙන් ඒ වාගේ දහස් ගුණයකටත් වැඩි මුදලක් -රුපියල් මිලියන 515ක්- වියදම් කරලා තිබෙනවා. ඒ අනුව බැලුවාම, අපේ රටේ ආර්ථිකයේ අංශ කිහිපයක යම් යම් පහත වැටීම් තිබෙනවා වාගේම, බහුතරයක් ක්ෂේත්‍ර සංවර්ධනය වෙලා තිබෙනවා; වැඩි වීමක් සිද්ධ වෙලා තිබෙනවා.

රුපියලේ අවප්‍රමාණය පිළිබඳව ආණ්ඩුවට අද දිනයේ දැඩි ලෙස විවේචන එල්ල වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඇමෙරිකානු ඩොලරය ශක්තිමත් වීම සහ ඩොලරයට සාපේක්ෂව වෙනත් රටවල මුදල් ඒකක අවප්‍රමාණය වීම ක්ෂණිකව ඇති වුණු දෙයක් නොවෙයි. ඒක පසුගිය අවුරුදු 10ක, 15ක කාලය තුළ ලෝක ආර්ථිකයේ තිබුණු විචලනයන් එක්ක සිදු වුණු දෙයක්. විශේෂයෙන්ම 2001දී ඇමෙරිකාවේ ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන ගොඩනැඟිලිවලට එල්ල වුණු ප්‍රහාරයත් එක්ක ඇමෙරිකාවේ ආයෝජනවල ලොකු අඩුවක් අපි දැක්කා. ඇමෙරිකාවේ ආයෝජනය කර තිබුණු මුදල් විශාල වශයෙන් මැද පෙරදිග රටවල ආයෝජනයට ගෙනගියා. ඊට අමතරව ඒවායේ මුදල් කොටස් ලංකාව, ඉන්දියාව වාගේ රටවල්වලටත් ඇදීගෙන ආවා. මොකද, ඒ වන විට ඇමෙරිකාවේ පොලී අනුපාතය ඉතා

ශීඝ්‍රයෙන් පහළ බැස්ස නිසා. ඊට වඩා ඉහළ පොලී අනුපාතයක් ලබාදුන් රටවලට ගෙන ගිය මුදල්, නැවතත් ඇමෙරිකාවේ ඩොලරය ශක්තිමත් වෙන්න පටන් ගත්තාට පස්සේ නැවත ඇමෙරිකාව වෙතට ඇදී ඒම තුළ ලෝකය තුළ මේ වාගේ ආර්ථික විපර්යාසයක් සිදු වෙමින් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට මූලික හේතුවක් තමයි, ඇමෙරිකාව තමන්ගේ රටට චීනයෙන් ගේන භාණ්ඩ සඳහා වන බදු මුදල විශාල වශයෙන් වැඩි කිරීම. එසේ බදු මුදල වැඩි කිරීම තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන ගණනාවක් ඇමෙරිකාව තුළ ඉතිරි වීම නිසා ඇමෙරිකාවේ මුදල් ඒකකයේ ශක්තිමත්භාවය ඇති වුණා.

එම පොලී අනුපාතය ඉහළ යාම නිසා අපේ රටේ -[බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකාව චීනයෙන් එන්න තිබෙන ඩොලර් බිලියන 34ක් වටිනා භාණ්ඩ සම්බන්ධව සියයට 25ක රේගු බදු වැඩි කිරීමක් - tariff increase එකක් - සිද්ධ කරලා තිබෙනවා. ඒක නිසා අද ඇමෙරිකාවට ඩොලර් විශාල ප්‍රමාණයක් රඳවා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. පසුගිය වසරේ ඇමෙරිකාව චීනයෙන් ඩොලර් බිලියන 506ක භාණ්ඩ ආනයනය කරන කොට, ඇමෙරිකාව චීනයට අපනයනය කරලා තිබෙන්නේ ඩොලර් බිලියන 130ක -පහෙන් එකක- වාගේ ප්‍රමාණයක්. මේ තමයි, ලෝක වෙළෙඳ පොළේ හැසිරීම. මේ තුළ විදේශ ආයෝජකයන් අපේ රටේ රාජ්‍ය බැඳුම්කරවල, අපේ ආණ්ඩුවේ බැඳුම්කරවල ආයෝජනය කර තිබුණු ඩොලර් මිලියන 449ක් පසුගිය කාල සීමාව තුළ -2018 සැප්තැම්බර් මාසය වෙනකොට- අපේ වෙළෙඳ පොළෙන් ඉවත් කරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම අපේ රටේ කොටස් වෙළෙඳ පොළේ - stock exchange එකේ - ආයෝජනය කරපු ඩොලර් මිලියන 34ක් අපේ වෙළෙඳ පොළෙන් ඉවත් කර ගෙන ගිහින් තිබෙනවා. ඒ අනුව ඩොලර් මිලියන 483ක් රපේ රටින්, අපේ ආර්ථිකයෙන් එළියට යනකොට, අපට ඩොලර් පිළිබඳව ගැටලුවක් මතු වෙනවා.

ඒ එක්කම රුපියල අවප්‍රමාණය වෙන්න බලපා තිබෙන තවත් ප්‍රධාන කාරණයක් තමයි කාර් සහ රත්තරන් ආනයනය කිරීමේ ප්‍රමාණය ඉතා ශීඝ්‍රයෙන් ඉහළ ගිහින් තිබීම. 2017 වසරේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4ක ප්‍රමාණයක් කාර් සහ රත්තරන් ආනයනය වෙනුවෙන් යෙදෙව්වා. එය සමස්ත ආනයනයේ කොටසක් විධියට ගත්තාම, සියයට 6.7යි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වසරේ මුල් මාස හය තුළ කාර් ආනයනය කරන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 812ක් වියදම් කරලා තිබෙනවා. ඒ වාගේම රත්තරන් ආනයනය කරන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 437ක් වියදම් කරලා තිබෙනවා. මෙහි සමස්තය ගත්තාම ඩොලර් මිලියන 1,249යි. ප්‍රතිශතයක් විධියට ගත්තාම 10.9යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට බොහොම පැහැදිලිව පෙනෙනවා, ගිය අවුරුද්දේ තිබුණු component එක, ප්‍රතිශතය 6.7ක් වුණාට, මේ අවුරුද්දේ පළමුවැනි මාස හය ඇතුළතම එය සියයට 10.9 දක්වා වැඩිවීමක් වෙලා තිබෙනවා කියලා. අපි දකිනවා, වරින් වර එන වෙළෙඳ පොළ හැසිරීම අනුව ඩොලරය ශක්තිමත් කර ගන්න ඒ ඒ වකවානුවල පැවති රාජ්‍යයන් නොයෙක් ක්‍රමවේද අනුගමනය කරලා තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011 වසරේදී අපේ රුපියල ස්ථාවර කර ගන්න අපේ ඩොලර් සංචිතයෙන් ඩොලර් මිලියන 3,184ක් වෙළෙඳ පොළට මුදා හැර තිබෙන බව සංඛ්‍යා ලේඛන අනුව ඔප්පු වෙනවා. 2012 වසරේ ඩොලර් මිලියන 977ක් ඒ ආකාරයෙන්ම වෙළෙඳ පොළට මුදා හැර තිබෙනවා. ඒ අනුව ඒ වසර දෙකේදී අපේ ආර්ථිකයට ඩොලර් මිලියන 4,161ක් -ඇමෙරිකානු ඩොලර් බිලියන 4.16ක්- අහිමි වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තමයි ඉතුරු වී තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

හොඳමයි. ඩොලර් බිලියන 4.16යි කියන්නේ රුපියල්වලින් ගත්තොත් බිලියන 715ක්. නමුත් ගරු මුදල් ඇමතිතුමා සඳහන් කළා වාගේ මේ වකවානුව තුළ ඒ වෙනුවෙන් අපි වැය කරලා තිබෙන්නේ ඩොලර් මිලියන 250ක් -රුපියල් බිලියන 43ක්- වාගේ සුළු ප්‍රමාණයක්. එදා රුපියල් බිලියන 715ක් ඒ විධියට අපට අහිමි කරගෙනත් -ඩොලර් සංචිතය ශක්තිමත් කර ගන්න බැරුව-සියයට 11ක, 12ක ප්‍රමාණයකින් රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා. මේ තත්ත්වය යටතේ අපි දකිනවා, අපේ ආර්ථිකයට යම් යම් ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍යයි කියන කාරණය.

අපේ රටට ආනයනය කළ යම් යම් භාණ්ඩ පිළිබඳව ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා සඳහන් කළා. ඒ අතින් බැලුවාම අපේ රටේ වගා කළ හැකි, අත්‍යවශ්‍ය නොවන ද්‍රව්‍ය බොහොමයක් අපේ රටට ආනයනය කිරීම තුළ ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම අපට නතර කර ගන්න අසීරුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව අවසාන කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අපි අපනයනයේ ප්‍රමාණය වර්ධනය කරගත යුතුයි කියලා තර්ක කරන ගමන්ම, ඊටත් වැඩිය අවධානය යොමු කරගත යුත්තේ අපේ රටේ ආනයන ප්‍රමාණය අඩු කර ගැනීමටයි. එහෙම කළොත් තමයි අපේ ආර්ථිකය ශක්තිමත් කරගන්න හැකි වෙන්නේ. බොහොම ස්තුතියි, ඔබතුමාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.57]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි විවාද කරන්නේ 2018 වසර මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව පිළිබඳවයි. ඒ සම්බන්ධයෙන් ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව තමයි අපි මේ විවාදයට භාජන කරන්නේ.

මේ වාර්තාවේ සඳහන් කරුණු අනුවම ගත්තත්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට 2017 පළමුවැනි මාස හයේ - අර්ධ වාර්ෂික වාර්තාව අනුව- ආර්ථික වර්ධන වේගය සියයට 3.8යි, 2018 වෙනකොට ඒක සියයට 3.2යි. මේ රජය යටතේම 2017 ඉඳලා 2018 වෙන කොට, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ආර්ථික වර්ධනය සියයට 3.8 ඉඳලා සියයට 3.2 දක්වා අඩු වෙලා තිබෙනවා.

කෘෂිකර්මය ගත්තොත්, 2017 ඍණ සියයට 3.2යි. ඒකට හේතු වශයෙන් කියයි, "නියඟය තිබුණා, වැස්ස ආවා" කියලා. දැන් ඒක සියයට 4.8ක් කියලා වාර්තාවේ සඳහන් වෙනවා. නමුත්, 2017 වර්ෂයේ කෘෂිකර්මය තිබුණේ ඍණ සියයට 3.2ක් වශයෙන්.

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

කර්මාන්ත වර්ධනය ගත්තොත්, සියයට 6.3 ඉඳලා සියයට 1 දක්වා අඩු වෙලා තිබෙනවා. සියයට 1යි, කර්මාන්තවල වර්ධන වේගය. සේවා අංශයේ වර්ධනය ගත්තොත්, සියයට 3.5 ඉඳලා සියයට 4.4ක් දක්වා, දශම 9කින් තමයි වැඩි වෙලා තිබෙන්නේ.

ඊළඟට අපි රාජ්‍ය ණය ගත්තොත්, 2017 ඉඳලා 2018 පළමුවැනි කාර්තුවේ බිලියන 341කින් වැඩි වෙලා තිබෙනවා. රාජ්‍ය ආයෝජන ගත්තොත්, බිලියන 19කින් අඩු වෙලා තිබෙනවා. වෙළෙඳ ශේෂය වැඩි වෙලා තිබෙනවා. මේ කරුණු ටික ගත්තත්, ආර්ථිකයට වෙලා තිබෙන දේ රජයේ මේ ප්‍රකාශනය තුළින් ඉතා හොඳින් පැහැදිලි වෙනවා. ඒකට හේතුව මොකක්ද? මේ ආණ්ඩුවට මුල ඉඳලාම දැක්මක් තිබුණේ නැහැ. රටේ ආර්ථිකය මෙහෙයවීම, රාජ්‍ය කළමනාකරණය පිළිබඳව දැක්මක් තිබුණේ නැහැ. මේ ගැන අපි කිව්වා. අපි වරින්වර කිව්වා, දැක්මක් හදාගන්නයි කියලා. නමුත් ඒක හදාගත්තේ නැහැ.

දැන් මුදල් ඇමතිතුමා කිව්වා, "Vision 2025" කියලා. ඒක දැම්මේ ආණ්ඩුවේ ආයු කාලයෙන් භාගයක් ගියාට පසුවයි. අවුරුදු දෙකහමාරකට පස්සේ තමයි එතුමා කිව්වේ, "Vision 2025" කියලා. එතකොට ආණ්ඩුවට අවුරුදු දෙකහමාරක් ගිහිල්ලා ඉවරයි. අවුරුදු දෙකහමාරක් යනකල් ආණ්ඩුවට දැක්මක් තිබුණේ නැහැ. දැන් හදන්නේ 2025දී ඒ දැක්මට යන්නයි.

මම ඉතා පැහැදිලිව කියනවා, සාම්ප්‍රදායික අපනයන තුළින් මේ රටේ මේ වෙළෙඳ ශේෂ පරතරය පියවන්න බැහැ කියලා. එක වර්ෂයකදී සියලු ආනයනවල එකතුව ඩොලර් බිලියන 21.5ක්, ණය ගෙවීම් හැර. සියලු අපනයන සහ සේවාවලින් ලැබෙන ආදායම ඩොලර් බිලියන 10.5යි. එතැනම තිබෙනවා පරතරයක් ඩොලර් බිලියන 10කට වැඩිය. ඒ නිසා විද්‍යාව පදනම් කරගත් නව තාක්ෂණයට, අද ලෝකයේ ප්‍රචලිතව තිබෙන ඖෂධ නිෂ්පාදනය වැනි ට්‍රිලියන ගණනින් ආදායම් උපයන්න පුළුවන් ක්ෂේත්‍රවලට අප යා යුතුයි. අපේ රටේ ඛනිජ ද්‍රව්‍යවලට අගය එකතු කරලා ඒ තුළින් මේ ප්‍රශ්නය විසඳන්න ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද? එවැනි යෝජනා ඉදිරිපත් කළත් ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ.

ඊළඟට මම පිළිතුරු කිහිපයක් දෙනවා. ගරු මුදල් ඇමතිතුමා කිව්වා, "මහ බැංකුවේ 2014 වෙනකොට අලාභයක් තිබුණා. ඒකත් එක්කයි එතුමන්ලා භාරගත්තේ" කියලා. මෙතැන ප්‍රශ්නය ඒක නොවෙයි. අලාභයක් එක්ක භාරගත්තාය කියලා මුදල් ඇමතිතුමා කියනවා නම්, අර කොමිෂන් වාර්තාව අනුව, ඒ අලාභය වෙච්ච මහ බැංකුවේම බිලියන 11ක් තමයි බලයට ඇවිල්ලා මාස දෙකක් ඇතුළත කොල්ලකෑවේ. ඉතිරි කාල සීමාවට තව කොමිෂන් එකක් දැම්මා නම්, ඒ වාගේ තුන්ගුණයකට වඩා වැඩියි. ඒ තුළින් ආයෝජකයන්ගේ විශ්වාසය බිඳ දැම්මා; ජනතාවගේ විශ්වාසය බිඳ වැටුණා. ලෝකයේ රටවල්වල විශ්වාසය බිඳ දැම්මේ අපි නොවෙයි. ඒක කළේ මහ බැංකුව කොල්ලකාපු අයයි. ඒ කොමිෂන් වාර්තාවට අනුව නඩු දැමිය යුතු අයට තවම නඩු දමලාත් නැහැ.

ඊළඟට කිව්වා, 2008 වෙනකොට ඇමෙරිකාවේ ඉඳලා ලංකාවට ආයෝජකයෝ ආවේ emerging market එකක් තිබුණු නිසායි කියලා. එහෙනම් එතුමාම ඒ කරුණු පිළිගන්නවා. යුද්ධය අවසන් කළේ 2009දී.

යුද්ධයක් කර කර සිටියදීත්, ලෝක ආර්ථිකය පසුබෑමකට ලක් වෙලා තිබියදීත්, එදා රාජපක්ෂ ආණ්ඩුවේ කළමනාකරණ ප්‍රතිපත්තිය නිසා නැඟී එන වෙළෙඳ පොළක් - emerging market - තිබෙන රටක් විධියට ලෝකය අපේ රට හඳුනාගත් බව මුදල් ඇමතිතුමා පිළිගත්තා. මෙන්න මේක තමයි පාලන දෙකක් අතර වෙනස. බැරිවෙලා හෝ මංගල සමරවීර ඇමතිතුමාට ඒක මතක් වීම ගැන මම සතුටු වෙනවා. එතුමා කියනවා, රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් ගෙවීම වැඩි වුණාලු. ඔව්, රාජ්‍ය සේවය මිලියන 1.4ක්. එදා රාජ්‍ය සේවය හැකුළුවේ නැහැ. මම අහනවා, මේ ආණ්ඩුව මේ අවුරුදු තුනහමාර ඇතුළත කී දෙනෙකුට රජයේ සේවයේ රැකියා ලබා දීලා තිබෙනවාද කියලා. මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න නම්, රුපියල ශක්තිමත් කරන්න නම් ආනයන සීමා කරන්න වෙනවා. රට තුළ ආදේශිත භාණ්ඩ නිෂ්පාදය කරන්න ඕනෑ. අද එකිනෙකට ගැටෙන ප්‍රතිපත්ති දෙකක් තිබෙන්නේ. අද නිදහස් වෙළඳ ගිවිසුම් අත්සන් කරනවා; ලිබරල් ආර්ථිකයක් ගැන කථා කරනවා. ඒ අතර වාහන ආනයනයට සියයට දෙසියක margin එකක් දමනවා. Electrical goods ගෙන්වීමේදී සියයට සියයක margin එකක් දමනවා. එතකොට ප්‍රතිපත්ති දෙකක් ගැටෙනවා. රාජපක්ෂ ආණ්ඩුව 2009 වර්ෂය දක්වා යුද්ධයක් එක්කයි-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඒ වේලාවේ ගත්ත ණය යටිතල පහසුකම් සංවර්ධනයට යොදවන්න වුණා. උතුරු දුම්රිය මාර්ගය, උතුරු නැගෙනහිර ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය, පුපුරවපු මහ බැංකුව වැනි දේවල්වලට එදා ගත්ත මුදල් ආයෝජනය කළා, ප්‍රාග්ධන ආයෝජන හැටියට. දැන් ඒ වාගේ දේවල් කෝ? දැන් ඒ කිසිවක් නැහැ. එදා ආරම්භ කළ ව්‍යාපෘති අද නැවතිලා. කොළඹ නගරයේ ඉදිකිරීම් ආරම්භ කර තිබුණු හෝටල්වල, ගොඩනැඟිලිවල cranes අද නැවතිලා. කොපමණ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළත් එක දෙයක් පැහැදිලියි. එක දෙයක් පැහැදිලියි. ඒ මොකක්ද? අද ජනතාවට ජීවත් වෙන්න බැහැ. ජනතාව අත මුදල් නැහැ. සුළු ව්‍යාපාරිකයාගේ සිට මහා පරිමාණ ව්‍යාපාරිකයා දක්වා අද මේ මැසිවිල්ල නහනවා. තව මාස කිහිපයක් යනකොට මොකක්ද වෙන්නේ? හෙට වෙනකොට තෙල් මිල නැවත වැඩි වෙනවා. එදා රාජපක්ෂ ආණ්ඩුව තිබෙන කාලයේ තෙල් බැරල් එක ඩොලර් 114ට ගියා. මේ ආණ්ඩුව ඇවිල්ල 2016 වෙනකොට තෙල් බැරල් එක ඩොලර් 45ට බැස්සා. දැන් තමයි තෙල් බැරල් එක ඩොලර් 82ට ආවේ. තෙල් බැරලයේ මිල වැඩි වීම සහ රුපියල අවප්‍රමාණ වීම යන මේ ප්‍රධාන සාධක දෙක මිල සූත්‍රයට ගැළපුවාම, හැම මාසයකම තෙල් මිල වැඩි වෙන ගණනට, රුපියල අවප්‍රමාණ වෙන ගණනට තෙල් මිල වැඩි වෙනවා. තෙල් මිල වැඩි වීම නිසා ප්‍රවාහන ගාස්තු එක්ක භාණ්ඩ හා සේවා මිල වැඩි වෙනවා. ඒ නිසා අද තිබෙන්නේ ජනතාවට ජීවත් වෙන්න බැරි ප්‍රශ්නයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
එදා යුද්ධයක් කරමින්, රට සංවර්ධනය කරමින්, ජනතාවට ජීවත් විය හැකි පරිසරයක් හැදුවා නම් එහෙම කරපු අයට කරුණාකර මේ රට භාර දෙන්න. මේ රට ආර්ථික වශයෙන් තවත්

දුබල තැනකට ගෙනෙන්න එපා, හදන්න බැරි තැනකට ගෙනෙන්න එපා කියන පණිවුඩය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.05]

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා පිරේමච්චන්දිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට මේ අවස්ථාව ලබා දීම ගැන ගරු සභානායකතුමාට ස්තුතිවන්න වෙන්න ඕනෑ. අද දින විවාදයට ගන්නා මාතෘකාව සම්බන්ධයෙන් කථා කිරීමට පෙර , ඊයේ දින මට සිදු වූ අසාධාරණයක් ගැන සඳහන් කරන්න අවශ්‍යයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක විධියට මගේ වරප්‍රසාද කඩවීමක් සිද්ධ වෙලා තිබෙනවා. එයින් මගේ කීර්තිනාමයට කැළලක් ඇති වෙලා තිබෙනවා. ඊයේ "දෙරණ" රාත්‍රී ප්‍රවෘත්ති විකාශයේදී වැරුදි ප්‍රකාශයක් පළ වුණා. ඒ පිළිබඳව මම මුලින් කියන්න ඕනෑ. ඊයේ ඒ ප්‍රවෘත්තිය ප්‍රචාරය වූ වේලාවේ සිට මේ වන තෙක් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මන්ත්‍රීවරුන්, ජනතාව, එදිනෙදා හමුවන හැමකෙනාම මගෙන් අහනවා, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා. ඊයේ මගේ නමත් එක්ක සම්බන්ධ වුණු නඩු කටයුත්තක් තිබුණා. මාත්, මගේ නීතිඥවරුත් trial එකට සූදානම් වෙලායි ගියේ. අපි නඩුව පටන් ගන්න සූදානම් වෙලායි ගියේ. ඒ අවස්ථාවේ අධිකරණයේ ගරු විනිශ්චයකාරතුමාගේ අවසරය මත රජයේ නීතිඥතුමා දෙපාර්ශ්වයටම කථා කරලා මෙම නඩුව කෙටි ක්‍රමයකින් ඉක්මනින් අවසන් කර ගැනීමට දෙපැත්ත සමථ වෙන්න කැමතිද කියා අසා සිටියා.

ඉන් පසු ගරු විනිශ්චයකාරතුමා ප්‍රකාශ කර සිටියේ, ගරු නීතිපතිතුමාගේ යම්කිසි අවසරයක් තිබෙනවා නම්, දෙපාර්ශ්වය සමථයකට පත් වෙන්න කැමැති නම් ඒක කරන එක ප්‍රශ්නයක් නැහැ, කථා කරගෙන ඒක කරන්න කියලායි. එතැනින් එහාට මේ පිළිබඳව වෙන කිසිම දෙයක් කථා කළේ නැහැ. මම ඊයේ දවසේවත්, අතීතයේ කිසිම අවස්ථාවකදීවත් මේ සම්බන්ධයෙන් වරද භාර ගෙන නැහැ. මම වරද භාර ගන්නවා නම්, මගේ නම යොදා ගෙන ඒ කාරණය කරපු මගේ ආධාරකරුවන් ඒ වැරැද්ද කළා කියලා භාර ගත්ත වෙලාවේ මට ඒක කරන්න තිබුණා. නමුත්, මම ඒක කළේ නැහැ, මම වැරැද්දක් කරලා නැති නිසා. ඒ නිසයි නඩු මාර්ගයට යන්න මම කැමැති වුණේ. එතකොට දෙපාර්ශ්වයේම සාක්ෂි කැඳවා සාමාන්‍ය නඩු විභාගයක් විධියට මේක කරගෙන යන්න පුළුවන් නිසා. ඇත්තටම එහෙම ලැහැස්ති වෙලා තමයි අපි ඊයේ ගියේ. මම, මගේ නීතිඥතුමන්ලා, ගරු විනිශ්චයකාරතුමා, රජයේ නීතිඥතුමා හෝ මේ කිසිම කෙනෙකු නොකළ ප්‍රකාශයක් ඊයේ දෙරණ නාළිකාවේ news මඟින් ප්‍රචාරය වෙලා තිබෙනවා. ඒ සමඟම අද සෑම ජාතික පුවත් පතකම කියා තිබෙනවා, "හිරුණිකා ප්‍රේමචන්ද්‍ර නඩුවේ වැරැද්ද පිළිගනී" කියලා. ඒක ඉතාමත් බරපතළ ප්‍රකාශයක්. ඒ විතරක් නොවෙයි, ඒක ගරු අධිකරණයට විශාල ලෙස පහර ගැසීමක්. විශේෂයෙන් අධිකරණය අපහසුතාවට පත් කිරීමේ කාරණාවක්. මා විතරක් නොවෙයි, අධිකරණයත් ඒකෙන් අපහසුතාවට පත් වෙනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවෙන්, ගරු කථානායකතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් මගේ අයිතිවාසිකම් ආරක්ෂා වීම සඳහාත්, අනාගතයේ තවත් මන්ත්‍රීවරයකුට, මන්ත්‍රීවරියකට මේ වාගේ දෙයක් සිදු නොවීම සඳහාත් මේ කියන මාධ්‍ය ආයතනයට පමණක් නොවෙයි, සියලුම මාධ්‍ය ආයතනවලට අදාළ වන විධියට පාර්ලිමේන්තුවට තිබෙන බලතල අනුව යම්කිසි දෙයක් කරන්න කියා. ප්‍රවෘත්තියක් ජනතාවට ඉදිරිපත් කිරීමේදී අපේ අයිතිවාසිකම්වලට, කීර්ති නාමයට හානියක් නොවන ආකාරයට කටයුතු කිරීම සම්බන්ධයෙන් යම් දෙයක් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. මට මේ සිදු වුණු දේ, තව දවසක තවත් කෙනකුට වෙන්න පුළුවන්. මේ නාළිකාව පෞද්ගලික නාළිකාවක්. රටේ මිනිස්සු විශාල වශයෙන් ප්‍රවෘත්ති බලන රූපවාහිනී නාළිකාවක්. එවන් අවස්ථාවක මේ වාගේ කටයුතු කිරීම ඉතාම වැරදියි. මේක මෙතැන කිව්වේ නැත්නම් මට වෙන අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. සමහර වෙලාවට මාධ්‍යවලින් කළ වැරදි ප්‍රකාශයක් අපි නිවැරදි කරන්න කිව්වාම, පත්තරේක නම් ඒක නිවැරදි කරලා කුඩාවට කොටසක් පළ කරනවා. අර ලොකු අකුරුවලින් headline එක දාලා වැරදියට දාපු ප්‍රවෘත්තියේ වැරැද්ද හදලා කුඩාවට පළ කරනවා. ඒකෙන් කිසිම තේරුමක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා පිරේමච්චන්දිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
හොඳයි. ඒ වාගේම තමයි රූපවාහිනී නාළිකාවක වුණත් ප්‍රවෘත්ති ප්‍රකාශයකදී සිදු වූ වැරැද්දක් නිවැරදි කරන්නේ ඒ විධියටයි. ඒ නිසා පුළුවන් නම් මට මේකට සාධාරණයක් ඉෂ්ට කර දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන් අද දවසේ මාතෘකාවට යොමු වෙන්නම්. මම වැඩිපුර කථා කරන්න යන්නේ නැහැ. කියන්න අවශ්‍ය දේ ඉතා ඉක්මනින් කියන්නම්. මට වඩා ආර්ථිකය පිළිබඳව ගොඩාක් දන්නා උදවිය මෙතැන සිටිනවා. ආර්ථිකය පිළිබඳව; ආර්ථික තත්ත්වය පිළිබඳව අවුරුදු ගණනාවක් තිස්සේ විශ්ලේෂණය කරලා හොඳ දැනුමක් තිබෙන උදවියත් එක්ක කථා කරන්න තරම් මට හැකියාවක් නැහැ. හැබැයි, මම දැන් දැකපු විධියට විපක්ෂයේ සියලු දෙනාම වාගේ "මේවා වැරැදියි, මේවා වැරැදියි" කියමින් ආණ්ඩුවට පහර ගැසුවා මිසක, කිසිම කෙනෙකුගෙන් හරියාකාර පිළිතුරක් ලැබුණේ නැහැ. අපට මඩ ගැහුවා හැරෙන්න, "දැන් රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා, අපි ආර්ථික යුද්ධයක ඉන්නේ, මේකෙන් ගොඩ එන්න අපි කරන්න ඕනෑ මොකක්ද?" කියන කාරණා සම්බන්ධයෙන් ආණ්ඩුවට කිසිම යෝජනාවක් කරනවා මට නම් අහන්න ලැබුණේ නැහැ.

හැබැයි, මට ගැටලුවක් තිබෙනවා. මහ බැංකු නියෝජ්‍ය අධිපති නන්දලාල් වීරසිංහ මහත්මයා කළ ප්‍රකාශයක් පිළිබඳව මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මේ මම නොවෙයි කියන්නේ, රාජ්‍ය සේවකයෙක් කියන්නේ. ඔහුගේම වචනවලින් කියනවා නම්, "රුපියල අවප්‍රමාණය වුණේ 2011, 2012 මහ බැංකුව තමන් සතු ඩොලර් බිලියන 8ත්, 9ත් අතර මිලියන 4ක් වියදම් කරලා තමයි රුපියල සියයට 12කින් අවප්‍රමාණය වීම රැක ගත්තේ."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ කථාව අවසන් කරන්න.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
පොඩ්ඩක් ඉන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රුපියල අවප්‍රමාණය වුණේ ලංකාවේ පමණයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට නියමිත කාලය අවසානයි.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
ජාත්‍යන්තර ප්‍රශ්නයක් නිසා නොවෙයි, දේශීය ප්‍රශ්න නිසා. රටේ ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රශ්නයක් නිසා තමයි 2012 වර්ෂයේ රුපියල අවප්‍රමාණය වුණේ කියලා තමයි මෙතුමා කියන්නේ. හැබැයි, 2018 වර්ෂයේ දී විදේශ රටවල තිබෙන ප්‍රශ්නයක් නිසා මේ විධියට රුපියල අවප්‍රමාණය වුණා කියලා තමයි එතුමා කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මම මේ කථාව විතරක් කියන්නම්. මේ ළඟ දිනයකදී විගණකාධිපතිතුමා කියනවා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියගේ කථාව අවසන් කරන්න.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මට මේක විතරක් කියන්න අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසානයි. අද අපට කාලය පිළිබඳව ගැටලුවක් තිබෙනවා.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න. පසුගිය ආණ්ඩුව කාලයේ -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු மහින්දානන්ද அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මගෙන් විනාඩි දෙකක් දෙන්නම්.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ஹிருணிகா பிரேමච්සන්දිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
එතුමාගෙන් විනාඩි දෙකක කාලයක් දෙන්න. පසුගිය කාලයේ ණය ප්‍රමාණය-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමිය කථාව අවසන් කරන්න.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ஹிருணிகா பிரேමච්සන්දිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට එතුමාගේ විනාඩි දෙක ලබා දෙන්න. මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කියනවා විනාඩි දෙකක් දෙනවා කියලා. මට මේ කථාව කියන්න පොඩ්ඩක් ඉඩ දෙන්න. පසුගිය කාලයේ ගත්ත ණය ප්‍රමාණයත් එක්ක අපේ ලංකාවේ කරපු වත්කම් හඳුනා ගන්න බැහැ කියලා විගණකාධිපතිතුමා කියනවා. ඒ කියන්නේ ගත්ත ණයට වත්කම් සම කරන්න බැහැ කියලා. එහෙම නම්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය කථාව අවසන් කරන්න.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ஹிருணிகா பிரேමච්සන්දිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා දුන්න විනාඩි දෙක මට ලබා දෙන්නේ නැද්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමිය කාලය ගත යුත්තේ ආණ්ඩු පාර්ශ්වයෙන්.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ஹிருணிகா பிரேමච්සන්දිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
අනේ! ඉතින් එතුමා කැමැත්තෙන් දෙනවා නම් ඒක දෙන්න කෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමිය කාලය ලබා ගත යුත්තේ ආණ්ඩු පාර්ශ්වයෙන්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු மහින්දානන්ද அலුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මම කැමැත්තෙන් දෙනවා. ඔබතුමියට ගන්න බැහැ නේ.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (திருமதி) ஹிருணிகா பிரேමච්සන්දිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කැමැත්තෙන් දෙනවා නම් ඉතින් දෙන්න කෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමිය අවසන් කරන්න.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා පිරේමච්චන්තිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
ඔබතුමා මට කාලය දෙන්නේ නැද්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්තානන්ත අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මම පුදන්න කැමතියි. ඔබතුමිය ගන්නේ නැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ කථාව අවසන් කරන්න.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා පිරේමච්චන්තිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසාන කරන්න කලින්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඒක නේ. ඔබතුමිය වෙනත් කථාවල පැටලෙන්නේ නැතිව ඔබතුමියගේ කථාව කරලා අවසන් කළා නම් හරි.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා පිරේමච්චන්තිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
ඉතින් මට අවශ්‍ය දේ කථා කරන්න ලැබුණේ නැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමියට වෙන්වෙලා තිබෙන කාලය තුළ ඔබතුමිය ඒක කළමනාකරණය කර ගන්න ඕනෑ.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා පිරේමච්චන්තිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
අනේ! මට කවුරු හරි මිනිත්තුවක්, දෙකක් දෙන්න කෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
හොඳයි. මම මිනිත්තුවක කාලයක් දෙන්නම්. ඔබතුමියගේ කථාව අවසාන කරන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු පුත්තික පතිරණ - කෛත්තොළිල් මර්රුම් වාණිප අලුවල්කළ් පිරති අමෛච්සර්)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)
මම විනාඩි පහක් දෙන්නම්.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා පිරේමච්චන්තිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
විනාඩි පහක කාලයක් බුද්ධික පතිරණ මැතිතුමා දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු බුද්ධික පතිරණ නියෝජ්‍ය ඇමතිතුමාට අද දවසේ කාලය වෙන් කරලා නැහැ. දැන් ඔබතුමියගේ මිනිත්තුවක කාලයත් අවසන් වනවා.

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා පිරේමච්චන්තිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මට මේ වෙලාවේ ප්‍රකාශ කරන්න දෙයක් තිබෙනවා. අපට මෙච්චර පහර ගසන නිසා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. ඇත්තටම දැන් රටේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා ඔබතුමන්ලා කියනවා නේ. එහෙම නම් මේ ප්‍රශ්නය විසඳීම සඳහා ඔබතුමන්ලාගේ අදහස් මංගල සමරවීර ඇමතිතුමාට ලබා දෙන්න. එතුමා කිසිම ලෝභකමක් නැතිව එම අදහස් ක්‍රියාත්මක කරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
හොඳයි. දැන් කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමිය.

මීළඟට, ගරු ඩග්ලස් දේවානන්ද ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[ප.ව. 5.15]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(මාණ්පුමිකු ටග්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉන්ත ආණ්ඩුම් මුඩිවුරප්පෝකින්ර නිලෛයිල්, අරසිතිර නිලෛමෛයානතු මිකවුම් මෝසමඩෛන්තු වරුම් නිලෛයිල්, ඉන්රෛය තිනම් අරෛයාණ්ඩු අරසිතිර නිලෛමෛ තොටර්පිල් ඉඩම්පෙරුකින්ර විවාතත්තිල් කලන්තුකොණ්ඩු, එනතු කරුත්තුක්කළෛයුම් පතිවුසෙය්තු කොළ්වතර්කු වාය්ප්පුක් කිටෛත්තමෛ තොටර්පිල් මුතලිල් එනතු නන්රිෛයෛත් තෙරිවිත්තුක් කොළ්කින්රේන්.

'මුතර් කෝණල් මුර්රිලුම් කෝණල්' එන්පතුපෝල්, ඉන්ත නාට්ටින් පොරුළාතාර නිලෛමෛ ආකියිරුප්පතු වේතනෛයෛයෛත් තරුකින්රතු. ඉන්ත නාට්ටුක්කුත් තේසිය පොරුළාතාරක් කොළ්කෛයින්මෛයේ මුතර් කෝණලාකුම්. ඉන්ත නාටු ඔරු තේසිය පොරුළාතාරක් කොළ්කෛයිනෛ වකුත්තු, සෙයර්පටුවතර්කු මුන්වර වේණ්ටිය අවසියම් ඉප්පෝතු උණර්ත්තප්පට්ටු වරුකින්රතු එන්රේ නාන් කරුතුකින්රේන්. ඉන්ත නාටු ඉන්රු මික මුක්කියමාන පිරච්සිනෛකළුක්කු මුකංකොටුත්තුළ්ළතු. ඉන්ත නාට්ටින් මොත්තත් තේසිය උර්පත්තික්කුච් සමාන්තරමාන වකෛයිල් අරස වරුමානමානතු විරෛවාන කුරෛපාට්ටිනෛක් කණ්ටිරුක්කින්රතු. ඉතු අරසින් පොතුච් සේවෛකළෛ මුන්නෙටුප්පතිල් තටෛයාකවුළ්ළතු. ඉත්තටෛයානතු එමතු මක්කළෛයේ පෙරිතුම් පාතික්කින්රතු. කුරිප්පාක වටක්කු, කිළක්කු පෝන්ර කටන්තකාල යුත්තප් පාතිප්පුකළුක්කු නේරටියාක මුකංකොටුත්තු, පාරිය පින්නටෛවුකළෛක් කොණ්ටුළ්ළ පකුතිවාළ් මක්කළ් පෙරිතුම් පාතිප්පුකළුක්කු උළ්ළාකින්රනර්.

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

இது ஒட்டுமொத்த நாட்டு மக்களையும் பாதிக்கின்றபோது, ஏற்கனவே பாதிப்புகள் அனைத்தும் நிவர்த்தி செய்யப்படாது நிலுவையில் இருக்கின்ற வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு மேலும் அரச சேவைகளின் தேவைகள் அதிகரிக்கின்ற நிலையில், இது மீள் செலவிடப்பட வேண்டிய மிகைத் தொகையாக அமைந்துவிடுகின்றது. இந்த நிலைமையில், அரச முதலீடுகளை நாம் எதிர்பார்ப்பதைவிட, அதற்கான வலியுறுத்தல்களை மேற்கொள்வதைவிட, அரச வருமானத்தை எவ்வாறு அதிகரிப்பது என்பது குறித்தே மிக முக்கிய அவதானங்களைச் செலுத்த வேண்டியிருக்கின்றது. இதனைச் செய்தால்தான் அரச செலவினங்களை மேற்கொள்ள முடியும் என்பது பொதுவாக பொருளாதார நிபுணர்கள் முன்வைக்கின்ற விடயமாக இருக்கின்றது.

இங்கு, அரச செலவினங்களைக் குறைத்தல் அல்லது கட்டுப்படுத்தல் என்கின்ற நிலை குறித்துப் பேசப்படுகின்றது. வீண் விரயங்கள், வீண் செலவினங்களால் இந்த நாட்டில் பொருளாதார நெருக்கடி நிலைமை ஏற்பட்டிருக்கின்றது என்று கூறப்படுகின்றது. இப்போதும்கூட இந்த வீண் விரயங்கள், வீண் செலவினங்கள் மட்டுப்படுத்தப்பட்டுள்ளனவா? என்ற கேள்வி எழாமல் இல்லை. அதேநேரம், மக்களுக்கான அரச சேவைகளைக் கட்டுப்படுத்துவதோ, குறைப்பதோ ஏற்றுக் கொள்ளத்தக்கதொரு விடயமல்ல. அதற்காகப் பொருட்களின் விலைகளை, நேரடி மற்றும் மறைமுக வரி விதிப்புக்களை மட்டும் அதிகரித்து அரச வருமானம் ஈட்ட வேண்டும் என்கின்ற நிலைமையில் தங்கியிருக்கக்கூடாது. இவ்வாறான செயற்பாடுகளால் மக்களை பட்டினி போட்டு, அதன் மூலம் சுரண்டப்படுகின்ற வருமானத்தால் அம்மக்களுக்குச் சேவை செய்வதென்பது ஏற்புடைய செயலாகாது. இன்று இந்த நாடு வருமானம் ஈட்டுகின்ற பிரதான துறையாக உல்லாசப் பிரயாணத்துறை காணப்படுகின்றது. அந்தவகையில், இந்த நாடு இந்த வருடத்தில் மாத்திரம் 2 மில்லியன் உல்லாசப் பிரயாணிகளை எதிர்பார்த்திருந்தாலும், உல்லாசப் பயணிகளை ஈர்ப்பதற்கான உட்கட்டமைப்பு வசதிகள் இந்நாட்டில் எந்தளவிற்கு முன்னேற்றம் கண்டிருக்கின்றனவென்பது தொடர்பில் நிலவுகின்ற கேள்விக்குறி இன்னமும் அகன்றுள்ளதாகத் தெரியவில்லை. அதேநேரம், நாட்டில் அடிக்கடி ஏற்படுகின்ற பணி நிறுத்தப் போராட்டங்களும் இத்துறையினைப் பாதிப்பதாகவே அமைகின்றன. மேலும், உல்லாசப் பிரயாணத்துறை சார்ந்த உட்கட்டமைப்பு வசதிகளை ஏற்படுத்துகின்ற நிலையில், இருந்துவரக்கூடிய பொருளாதார வளங்களும் அழிக்கப்பட்டு வருகின்றன அல்லது அவற்றின் மூலமான பொருளாதார ஈட்டல்களுக்குத் தடை ஏற்படுத்தப்படுகின்றன. குறிப்பாக, கடற்றொழிலை இதற்கு உதாரணமாகக் காட்ட முடியும். ஒரு தொழிற்றுறை இலாபகரமானதாக இயங்கிக் கொண்டிருக்கும் நிலையில், அதனது வளம் சார்ந்த இடத்தில் இன்னொரு இலாபகரமான தொழில்கொண்டு அதனை மூடிவிடுவதென்பதும் இங்கு மேற்கொள்ளப்பட்டு வருகின்ற அபிவிருத்திச் செயற்பாடுகளாகக் கொள்ளப்படுகின்றது. அந்த வகையில், இந்நாட்டின் கடற்றொழிற் துறையானது பாரியளவிலான நவீனத்துவத்தினையும், விரிவாக்கலையும் கோரி நிற்பதுடன், தடைகளைத் தகர்த்தெறியவும், கோருகின்ற நிலைமையினைக் காண முடிகின்றது. அவை உள்நாட்டுத் தடைகளாகட்டும், வெளிநாட்டுத் தடைகளாகட்டும். அவை கடல் வளப் பாதிப்புக்களையும், அந்தந்த மாவட்ட கடற்றொழிலாளர்களது தொழிலுக்கான சுதந்திரமான உறுதிப்பாட்டையும் பாதிப்பதாக, அழிப்பதாக அமைந்து வருகின்றன.

இந்நாட்டு விவசாயத் துறையினை எடுத்துக் கொண்டாலும், அதனது முன்னேற்றத்தன்மை வெகுவாக வீழ்ச்சியடைந்துகொண்டே வருகின்றது. விவசாயத்துறை தொடர்பில், இதுவரையில் இந்நாட்டில் ஒரு தேசியக் கொள்கை இல்லாத நிலையில், நாட்டு மக்கள் மரக்கறி வகைகளுக்கு அதிக விலையினைக் கொடுத்துவருகின்ற நிலை ஒரு புறத்தில் காணப்படுகின்ற அதேநேரம், இன்னொரு புறத்தில் மரக்கறி உற்பத்திகள் ஆயிரக்கணக்கான 'தொன்கள்' அளவில் காட்டு யானைகளுக்குக் கொட்டப்படும் நிலைமை ஏற்பட்டு வருகின்றது. இதன்காரணமாக, ஒரு புறத்தில் நுகர்வோரும் மறுபுறத்தில் விவசாய உற்பத்தியாளர்களுமே பாதிப்புக்களை எதிர்நோக்குகின்றனர். தற்போது இந்த நாட்டில் விவசாயத்துறையில் ஈடுபடுகின்ற மக்கள் பெருமளவில் குறைந்து, 20 வீதமான மக்களே அதில் ஈடுபடுகின்ற நிலை ஏற்பட்டுள்ளது. இந்த மக்களின் மனங்களிலும் இன்று விவசாயத்துறை தொடர்பில் விரக்தி நிலையே ஏற்பட்டு வருகின்றது. இந்த நாட்டில் மிகவும் குறைந்த வருமானம் ஈட்டுகின்றவர்களாகவும் விவசாயத் துறைத் தொழிலாளர்களே காணப்படுகின்றனர். அமெரிக்க டொலருக்கு நிகரான இலங்கை ரூபாவின் பெறுமதியிழப்பு அதிர்ச்சிக்கு எதிராக வெங்காயம், உருழைக்கிழங்கு, அரிசி போன்ற உள்ளூர் உற்பத்திகள் மக்களுக்கு உதவியாக அமையுமென மத்திய வங்கி ஆளுநர் தெரிவிப்பதாக அண்மையில் ஊடகங்களில் செய்திகள் வெளிவந்திருந்தன. இவை மட்டுமல்ல, தற்போதைய இந்நாட்டுப் பொருளாதார நெருக்கடி நிலைமையிலிருந்து மீள்வதற்கு, பல்வேறு உள்ளூர் உற்பத்திப் பொருட்களின் உதவிகளைப் பெறமுடியும். இதையே நானும் தொடர்ந்து சுட்டிக்காட்டி வந்துள்ளேன். ஆனால், இதுவரையில் அதற்கான ஏற்பாடுகள் மேற்கொள்ளப்பட்டதாகத் தெரியவில்லை.

தற்போது இறக்குமதிகளைக் கட்டுப்படுத்துவது தொடர்பில் பேசப்படுகின்றது. இது எந்தளவுக்குச் சாத்தியமாகும் என உங்களால் கூறமுடியாது. அதற்குரிய அடிப்படை ஏற்பாடுகள் எமது நாட்டில் அத்திவாரமாகக்கூட இன்னும் உருப்பெறாத நிலையே காணப்படுகின்றது. ஆனால், 1970இல் இது இந்த நாட்டில் நடைமுறைப்படுத்தப்பட்டது. இருந்தும், பிற்காலத்தில் அது நிராகரிக்கப்பட்டது. அந்தப் பயணத்தைத் தொடராதிருந்ததால் அதனது பயன்பாடு இந்த நாட்டுக்குப் போதியளவில் கிட்டவில்லை என்றே கருத வேண்டியுள்ளது. எனினும், 1997இல் இது மலேசியாவில் சாத்தியமானது. அமெரிக்கப் பொருளாதார நெருக்கடிக்கு முகங்கொடுத்து, பொருளாதார ரீதியில் முன்னேறி, இன்று அந்த நாட்டுப் பொருட்களை உலக நாடுகள் கொள்வனவு செய்யக்கூடிய வகையிலான வழிவகைகளை இத்திட்டம் ஏற்படுத்திக் கொடுத்தது. சுமார் 6 வருட காலம் இறக்குமதிகள் நிறுத்தப்பட்டு, தேசிய உற்பத்திகள் வலுப்படுத்தப்பட்டன. மலேசியா அன்று முன்னெடுத்திருந்த இந்தத் திட்டம் அந்த நாட்டு மக்களின் அங்கீகாரத்துடன், அர்ப்பணிப்புகளுடன் மேற்கொள்ளப்பட்டதால் அது வெகுவாகவே சாத்தியமடைந் திருந்தது. ஆனால், இந்த நாட்டில், உள்ளூர் உற்பத்தியாளர்கள் நடுத்தெருவுக்கு வந்து போராடிக் கொண்டிருக்கின்றார்கள்; உற்பத்திகள் உறங்கிக் கொண்டிருக்கின்றன; இறக்குமதிகள் நிறைந்து கொண்டிருக் கின்றன. நாட்டிலே ஏற்றுமதி உற்பத்தி வலயங்கள் தொடர்பில் அதிகளவு அக்கறையில்லாத நிலைமையே காணப்படுகின்றது. தீப்பெட்டித் தொழிற்சாலைகளைக்கூட மூடுமளவுக்கு நிலைமை காணப்படுகின்றது. அடுத்து அரச உள்நாட்டு, வெளிநாட்டுக் கடன்களும், அதனது தவணை முறைச் செலுத்துகைகளும் இன்னொரு சுமையாக இருக்கின்றது. அதாவது, மொத்தத் தேசிய உற்பத்திக்குச் சமாந்தரமாக

එදුත්තුක් කොණ්ඩාල්, සුමාර් 80 සතවීතමාන කදන්පලු ඉරුන්තු වරුකින්රතු. සුමාර් 5 පිල්ලියන් ටොලර්කල් ඉන්ත වකෙයිල් අදුත්ත වරුදම් මුතල් සෙලුත්තුකෙ මේර්කොල්ල වේණ්ටියුල්ලන. ඉන්ත වරුදම් අතර්කාන තයාර් නිලෙ වරුදමාකක් කොණ්ටිරුක්ක වේණ්ටුම්. ආනාල්, අතු නදෙපෙරවිල්ලෙ. අතාවතු, "විටිය, විටිය ඉරාමායණම්; විටින්තාල් ඉරාමන් සීතෙක්කු එන්න මුරෙ?" එනක් කේට්පතුපෝල්, පොරුලාතාර නෙරුක්කටි නිලෙමෙ තොටර්පිල් නීංකල් නාල්තෝරුම් කතෙත්තුම්, විවාතිත්තුම්, ඉරුතියිල් ඉප්පෝතු එන්න සෙය්වතු? එනත් තිණ්ටාට වේණ්ටිය නිලෙ එර්පට්ටිරුක්කින්රතු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කල්)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Do you want more time?

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(මාණ්පුමිකු ටක්ළස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
Please give me just two more minutes.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කල්)
(The Hon. Presiding Member)
Okay.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(මාණ්පුමිකු ටක්ළස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
Thank you.

සර්වතේස නාණය නිතියම්, ඉලංකෙයුටන් කොණ්ටුල්ල නීටිත්ත නිති වසතියොන්රුක්කාන ආතරවලික්කුම් තිට්ටත්තින් මූලමාක මේර්පටි කටන්කල් මුකාමෙත්තුවප්පටුත්තප්පට්ටු වන්තාලුම්, ඉතු ඔරු විටුතලෙක්කාන වලියන්රි, නෙරුක්කටි මිකුන්ත නිලෙ එන්පතු කාලප්පෝක්කිල් තෙරියවරුම් එන්රේ එණ්ණ වේණ්ටියුල්ලතු. අතේනේරම්, ඉන්තච් සර්වතේස නාණය නිතියම්කූට මේර්පටි තිට්ටත්තිනූටාන තනතු 5වතු කලන්තුරෙයාටලිල්කූට පොරුලාතාර මරුසීරමෙප්පෙයේ ඉලංකෙක්කු වලියුරුත්තියුල්ලතු එන්පතුම් කුරිප්පිටත්තක්කතු. අරස මීණ්ටෙළුම් සෙලවිනම් තොටර්පිල් පාර්ක්කින්රපෝතු, අතුවුම් කටන්ත ආණ්ටින් අරෙයාණ්ටුටන් ඔප්පිටුම්පෝතු, සුමාර් 59,497 මිල්ලියන් රූපාය් අතිකරිප්පිනෙයේ ඉන්ත වරුටක් කාලාණ්ටිල් කාට්ටුකින්රතු. අතේපෝන්රු ඌතියංකල්, ඔය්වූතියංකල් එන එල්ලාමේ අතිකරිත්තු, අරසාංකත්තිනාල් ඉන්තච් සෙලවිනංකලෙත් තාංක ඉයලාත නිලෙයේර්පට්ටු, අතුවුම් උල්නාට්ටු මර්රුම් වෙලිනාට්ටුක් කටන්කලිල් තංකියිරුක්කවේණ්ටිය නිලෙ එර්පට්ටුල්ලතු. ඉත්තකෙය සෙලවිනංකල් තොටර්පිලාන මුකාමෙත්තුව මින්මෙ කාණප්පටුකින්රතු. මේලුම්, නට්ටත්තිල් ඉයංකුකින්ර අරස නිරුවනංකල් අතික පණියාලර්කලෙයුම්, කුරෙන්ත පයන්කලෙයුම් කොණ්ටතාකච් සෙයර්පට්ටු වරුකින්රන. මරුපුරත්තිල් වරි අරවීටුකල් එන්කින්රපෝතු, සාතාරණ මක්කලිටමිරුන්තු පෙරප්පටුකින්ර වරිකල් සෙල්වන්තර්කලිට මිරුන්තු, නීංකල් කුරිප්පිටුකින්ර වකෙයිල් අනෙත්තු වලිකලිලුම්, ඔලුංකුර අරවිටප්පටුකින්රතා? එන්පතු තොටර්පිල් ඉන්නුම් තෙලිවර්ර තන්මෙයේ කාණප්පටුකින්රතු.

එනවේ, ඉන්ත නාට්ටින් පොරුලාතාර නෙරුක්කටි නිලෙමෙක්කු මුකංකොටුක්ක වේණ්ටුමෙනිල්, උටනටි නටෙමුරෙච් චාත්තියමානතොරු වලිමුරෙක්කු වන්තේ ආක වේණ්ටිය නිලෙ එර්පට්ටිරුක්කින්රතු. තොටර්න්තුම් ඉතේ වකෙයිල් මන්ත නිලෙයිල් සෙල්වෝමේයානාල්, ඉරුණ්ට යුකමානතු මික අරුකාමෙයිලේයේ ඉරුක්කින්රතු එන්පතෙ මරන්තුවිටක්කූටාතු එන්පතෙ නිනෙවුරුත්ති, විටෙපෙරුකින්රේන්. නන්රි. වණක්කම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කල්)
(The Hon. Presiding Member)
පොහොම ස්තුතියි. මීළහට, ගරු ජේ.සී. අලවතුවල රාජ්‍ය අමාත්‍යතුමා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු වේලු කුමාර් මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු අසෝක් අපේසිංක - පෝක්කුවරත්තු මර්රුම් සිවිල් විමානච් සේවෙකල් පිරති අමෙච්චර්)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්තානන්ත අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

***එසින් ස්ථිර කරන ලදී.***
*ආමෝතිත්තාර්.*
*Seconded.*

***අනතුරුව ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***

*අතන්පිරකු, මාණ්පුමිකු සෙහාන් සේමසිංක අවර්කල් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු වේලු කුමාර් අවර්කල් තලෙමෙ වකිත්තාර්කල්.*

*Whereupon THE HON. SHEHAN SEMASINGHE left the Chair, and THE HON. VELU KUMAR took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කල්)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා කථාව කරන්න.

[අ.භා. 5.25]

**ගරු ජේ. සී. අලවතුවල මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල - උල්නාට්ටලුවල්කල් ඉරාජාංක අමෙච්චර්)
(The Hon. J.C. Alawathuwala - State Minister of Home Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාල වේලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව සම්බන්ධයෙන් සහ ආර්ථිකය කඩා වැටිලා කියන මාතෘකා යටතේ තමයි ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා අද කල්

[ගරු ජේ. සී. අලවතුවල මහතා]

තැබීමේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. මා මුලින්ම මතක් කරන්න ඕනෑ, ගරු මුදල් අමාත්‍යතුමා කිව්වා, "අපට අභියෝග තිබෙනවා. ඒ අභියෝගවලට අපි මුහුණ දීලා, අපි කළමනාකාරීත්වයක් තුළ ආර්ථිකය ඉස්සරහට අරගෙන යනවා." කියලා. හැබැයි, අද කරුණු ඉදිරිපත් කරපු සමහර ගරු මන්ත්‍රීතුමන්ලා සහ පසුගිය මාස තුන වනතෙක් මේ ආණ්ඩුවේ ඇමතිකම් දරපු හිටපු ඇමතිතුමන්ලා හරියට කථා කළේ, මේ ආණ්ඩුව යටතේ කිසි දෙයක් සිදු වුණේ නැති ආකාරයෙනුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව කියන්න ඕනෑ, අපි මේ ආණ්ඩුව භාර ගනිද්දී හොඳ ආර්ථිකයක් තිබුණු, එහෙම නැත්නම් භාණ්ඩාගාරයේ මුදල් හුඟක් එකතු කර තිබුණු රටක් නොවෙයි අපට හම්බ වුණේ. මේ රට භාර ගන්නකොට මුහුණ දෙන්න අපේ යහ පාලන රජයට අභියෝග ගණනාවක් තිබුණා. අපි අද ඒ අභියෝග එකින් එක ජයග්‍රහණය කරගෙන ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. එක වෙලාවක අපි දැක්කා, අපේ රටේ ආදායම මදි බව ණය සහ පොලිය ගෙවන්න. එහෙම තත්ත්වයක තමයි මේ රට තිබුණේ. ඒ විතරක් නොවෙයි. ගොඩගන්න බැරි, ඉතාමත් අපහසු තැනක මේ රට තිබුණේ. විශේෂයෙන්ම 2014 වර්ෂයේ රාජ්‍ය ආදායම අඩු වෙලා, දළ දේශීය නිෂ්පාදනය සියයට 11ක් වැනි අඩු මට්ටමකට තිබුණේ. නමුත් 2015, 2016 හා 2017 වනකොට දළ දේශීය නිෂ්පාදනය ක්‍රමයෙන් වර්ධනය කරගෙන අද අපට පුළුවන් වෙලා තිබෙනවා, එය සියයට 15 දක්වා ගෙන එන්න. ඒ වාගේම අපි පැහැදිලිව කියන්න ඕනෑ, විශාල ණය තොගයක් එක්ක අපි මේ රජය භාර ගත්තත්, එම ණය ගෙවීම් අපි පැහැර හැරලා හෝ, එහෙම නැත්නම් අපේ රාජ්‍ය අසාධු ලේඛනයට ලක් වෙන්නට අපි ඉඩ හැරලා නැති බව. අපේ ණය තොගය අධිකව ඉහළ ගියා වාගේම, ණය සේවාකරණයේ අවශ්‍යතාව හඳුනාගෙන ඒකට හරියන්න ආදායම් වැඩි කරගෙන තිබෙනවා. අපි ආදායම වැඩි කරගෙන, පසුගිය වර්ෂ තුන තුළම නිසියාකාරව ණය වාරික ගෙවා තිබෙනවා. ඒ ගෙවපු ණයවලින් සියයට 84ක්ම,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේ ගණපූරණය නැහැ. ඒ පිළිබඳව ඔබතුමා අවධානය යොමු කරන්න වෙයි.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***

***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*පාරාළුමන්ත්‍රම් කණක්කිටප්පට්ටු, කූට්ට නටප්පෙණ් ඉල්ලෙ යෙනක් කණ්ටතනාල්, පිරිවු මණි අටික්කප්පට වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*පිරකු, කූට්ට නටප්පෙණ් ඉරුන්තතනාල් -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present-*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී. අලවතුවල රාජ්‍ය ඇමතිතුමා කථා කරන්න. [සෝෂා කිරීම්] ගරු රාජ්‍ය ඇමතිතුමා කථා කරන්න. [සෝෂා කිරීම්] ගරු රාජ්‍ය ඇමතිතුමා කථා කරන්න. [සෝෂා කිරීම්]

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
කෝ, දැන් මේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමාත් මේ ගරු සභාවේ නැහැ නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි- [බාධා කිරීම්] ඔබතුමන්ලා කෑ ගහන්නේ නැතුව දැන් පොඩ්ඩක් කථා කරන්න දෙන්න කෝ. යෝජනා ඉදිරිපත් කළාට කට්ටිය තියා ගන්නත් බැහැ.

**ගරු මන්ත්‍රීවරු**
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
ලජ්ජයි. ලජ්ජයි.

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
පොඩ්ඩක් කෑ ගහන්නේ නැතුව ඉන්න කෝ. කථා කරන්න දෙන්න කෝ.

**ගරු මන්ත්‍රීවරු**
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
ලජ්ජයි. ලජ්ජයි.

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
ලජ්ජා වෙන්න ඕනෑ ඔබතුමන්ලා නේ. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාත් මේ ගරු සභාවේ නැහැ; ගිහිල්ලා. [සෝෂා කිරීම්] බෙදුම් සීනු නාද කර බොහොම අමාරුවෙන් තමයි ගෙන්වා ගත්තේ. [බාධා කිරීම්] ඉතින්, දැන් සද්ද කරන්න එපා. පොඩ්ඩක් ඉන්න කෝ. කොහොම හරි දැන් අමාරුවෙන් කට්ටිය ගෙන්වා ගත්තා නේ. [බාධා කිරීම්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය බර ගැන මතක් කරන්න ඕනෑ. ණය තොගයක් එක්ක තමයි මේ ආණ්ඩුව අපට භාර දුන්නේ. එහෙම භාර දුන්නාට අපි මේක මේ අයගේ ණය ගෙවන්න තිබෙනවා කියා පැහැර හැරලා නැහැ. මේ අයගේ ණය තමයි සියයට 84ක් තිබෙන්නේ. අපි 2016 වසරේ රුපියල් බිලියන 1,352ක්, ඒ වාගේම 2017 වසරේ රුපියල් බිලියන 1,603ක් ගෙවලා තිබෙනවා. 2018 වසරේ රුපියල් බිලියන 3,000කට ආසන්න ප්‍රමාණයක් අපට ගෙවන්න තිබෙනවා. මේ තත්ත්වයට මුහුණ දීලා, මේ අභියෝගයට මුහුණ දීලා අපේ රටේ කඩා වැටිලා තිබුණු ආර්ථිකය නැවත වතාවක් යථා තත්ත්වයට ගෙනෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අද අපේ රජයට පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම අද ඩොලරය යම් ප්‍රමාණයකට - සියයට 9ක වාගේ ප්‍රමාණයකින්- ක්ෂය වෙමින් යන බව අපි දන්නවා. ලෝකයේ අනෙකුත් අසල්වැසි රටවල් සමඟ බැලුවත් අද ඒ තත්ත්වය උදා වෙලා තිබෙනවා. නමුත් අපට මේක මෙහෙම කියා මඟ හරින්න බැහැ. එහෙම නම් අපි අපනයන ආර්ථිකයක් හරහා අපේ රටේ අපනයනය වැඩි කර ගන්න අවශ්‍ය නිෂ්පාදන ඇති කර ගන්න ඕනෑ. මේ රජය මේ කෙටි කාලය -අවුරුදු තුන-

තුළ ඒ සඳහා අවශ්‍ය වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර තිබෙනවා. මේ වන විට අපි "Enterprise Sri Lanka" වැඩසටහන යටතේ අලුතෙන් ව්‍යවසායකයන් ඇති කරන්න කටයුතු කර තිබෙනවා. මේ වන විට 25,000කට ආසන්න ප්‍රමාණයක් - විශේෂයෙන්ම තරුණයන්- නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගැනීම සඳහා ඔවුන්ට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම මේ "Enterprise Sri Lanka" ණය වැඩසටහන යටතේ ණය ගොඩක් ඒවාට පොලිය ගෙවන්නේ රජය. විශේෂයෙන්ම සියයට 100ක් පොලිය ගෙවනවා, විශ්වවිද්‍යාල උපාධිධාරීන් ඉදිරිපත් කරන ව්‍යාපෘති සඳහා, රුපියල් ලක්ෂ 15ක ණය ලබා දීමේදී. ඒ වාගේම තවත් අංශ ගණනාවක් තිබෙනවා. ඒවාට සියයට 50ක පොලිය භාණ්ඩාගාරයෙන් ගෙවනවා. ඒ නිසා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මෙවැනි වැඩසටහන් තුළින් අපි බලාපොරොත්තු වන්නේ,-

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ලබා දෙන මේ සංඛ්‍යා ලේඛන ඔබතුමා කොහෙන්ද ගන්නේ කියන කාරණාව අපට පැහැදිලි කරන්න. මොකද, රාජ්‍ය ආදායම සහ ණය සේවාකරණ ගෙවීම් සම්බන්ධයෙන් ඔබතුමා කියන සංඛ්‍යා ලේඛන කොහේවත් පොත්වල නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
ඒක ඔබතුමා වෙනම බලා ගන්න. ඒක point of Order එකක් නොවෙයි.

මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, "Enterprise Sri Lanka" වැඩසටහන යටතේ අපි 25,000කට ආසන්න තරුණයින් සංඛ්‍යාවකට ණය ලබා දීලා තිබෙන බව. මීට ඉස්සර වෙලා මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළා, කොච්චර සංඛ්‍යාවකට ණය දීලා තිබෙනවාද කියා. මම පැහැදිලිව කියන්න ඕනෑ,- [බාධා කිරීමක්] පාක්ෂිකයින්ට නොවෙයි. රටේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වන ඕනෑම කෙනෙකුට මේ ණය ලබා දෙනවා. පාක්ෂිකයින්ට ලබා දෙන ණයක් නොවෙයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු மහින්தානන්ත அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු மහින්தානන්ත அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කුරුණෑගල දිස්ත්‍රික්කයේ දක්ෂ මන්ත්‍රීවරයෙක් සහ රාජ්‍ය ඇමතිවරයෙක් නිසා මම ඔබතුමාගෙන් අහනවා, මාවතගම ඔබතුමාගේ ආසනයේ කී දෙනෙකුට මේ ණය දීලා තිබෙනවාද කියා.

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
මාවතගම විශාල සංඛ්‍යාවකට අපි ණය දීලා තිබෙනවා. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීම්] මම පැහැදිලිවම කියන්න ඕනෑ,-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු மහින්தානන්ත அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කීයක්ද? දීපු එක් කෙනෙකුගේ නමක් කියන්න.

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
දීපු අය බොහෝ දෙනෙක් ඉන්නවා. නම් එකක් නොවෙයි, කියනවා නම්, ණය දුන් අයගේ නම් ගණනාවක් කියන්න තිබෙනවා. [බාධා කිරීම්] පොඩ්ඩක් අහගන්න. මාවතගම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන්, ඒ වාගේම මහජන බැංකුවෙන්, ඒ වාගේම ලංකා බැංකුවෙන් සියයකට වැඩි ප්‍රමාණයකට අපි ණය දීලා තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු மහින්தානන්ත அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දීපු අයගේ නම් කියන්න.

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
ඒ නම් පාර්ලිමේන්තුවේ කියන්න අවශ්‍ය නැහැ. ලැයිස්තුව ඕනෑ නම් ගෙනැල්ලා දෙන්නම්, ඔබතුමාට බලාගන්න. [බාධා කිරීම්] සියයකට වැඩි ප්‍රමාණයකට ණය දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපි පැහැදිලිව කියන්න ඕනෑ, අද මේ යෝජනා ගෙනැල්ලා මේ අය කල්පනා කරනවා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
මට බාධා කිරීම් ගණනාවක් කළා. ඒ වෙලාව මට දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ වෙලාවත් එකතු කර තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
අද මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන යෝජනාකරු ගැන අපි කථා කරන්න ඕනෑ නැහැ. ඔවුන්ගේ ආණ්ඩුව තිබෙන කාලයේ එක වෙලාවක ඒ යෝජනාකරු කිව්වා, හතරදෙනෙකු සිටින පවුලකට මාසයක් කෑම කන්න රුපියල් 2,500ක් ඇති කියලා. එහෙම කෙනෙක් තමයි අද මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. අද ඒ සියල්ල අමතක කරලා මේ අය කථා කරනවා. අද අපට ගෙවන්න වෙලා තිබෙන්නේ මේ අය ගත් ණය. අද ණයවලින් සියයට 84ක් ගෙවන්නේ ඒ ණයයි. මොනවා කථා කළත්, රජයක් හැටියට මේ වනකොටත් අපට ඒ ණය ගෙවීමේ හැකියාව තිබෙනවා. අපට මේ වනකොට විදේශ සංචිත වශයෙන් ඩොලර් මිලියන 8,000ක් මහ බැංකුවේ තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව කෙටියෙන් අවසන් කරන්න. කාලය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ඉදිරි කාලයේදී රටක් හැටියට ඉස්සරහට යන්න අපි විශාල වැඩසටහන් ගණනාවක් ආරම්භ කර තිබෙනවා. ඒත් සමහර අපි සංවර්ධනය වෙනුවෙන් 'ගම්පෙරළිය' වාගේ වැඩසටහන්, කුරුණෑගල අධිවේගී මාර්ගය වැනි ව්‍යාපෘති සියල්ල අවසන් කරන්න කටයුතු කරනවා. එදා තිබුණු අමාරු තත්ත්වයෙන් රට ගොඩ ගෙන, ප්‍රශ්න ගණනාවක් තිබුණත් රටේ ජනතාවට සහනත් ලබා දෙමින් අපේ රජය කටයුතු කරනවාය කියන එක මේ අවස්ථාවේදී මම මතක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ඊළඟට ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

[අ.භා. 5.41]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම, ගරු මංගල සමරවීර ඇමතිතුමා කියාගෙන ගිය කරුණුවලට කිව යුතු යම් පිළිතුරක් තිබෙනවා. එතුමා අපේ දළ දේශීය නිෂ්පාදිතය කොපමණ පහළ මට්ටමක තිබෙනවාද කියලා පෙන්වුවා, අවට කලාපීය රටවල් ගණනාවක් සමඟ සංසන්දනය කරලා. නමුත්, එතුමා එක දෙයක් පෙන්වුයේ නැහැ. ඒ තමයි, අවට රටවල් සමඟ සංසන්දනය කළාම අපේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය කීයද කියන එක. අවට රටවල් සමඟ සංසන්දනය කළාම ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයෙන් ඉහළ තැනකයි අපි ඉන්නේ. ඒ කුමක් නිසාද? දළ දේශීය නිෂ්පාදිතය කියන එක තීරණය වන්නේ ජනගහනය අනුවයි. අපේ ජනගහනයයි, අපේ දළ දේශීය නිෂ්පාදිතයයි අතර අන්තර් සම්බන්ධයක් තිබෙනවා. මේවා නොසලකා විශාල ජනගහන සිටින රටවල් ගැන කථා කළාට වැඩක් නැහැ.

මම ඊ ළඟට කියන්න කැමැතියි, අපේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය අපේ කාලය අවසන් වනකොට ඩොලර් 3,800කට ගෙනෙන්න අපට පුළුවන් වුණු බව. එසේ කරන්න පුළුවන් වීම අප ලද ලොකු ජයග්‍රහණයක්. ඒ අනුව අපි එක්තරා විධියක පහළ මැදි ආදායම් ලබන රටක් බවට පත් වන්නේ අපේ රජය කාලයේදියි.

ඊ ළඟට, ණය සහ වත්කම් ගැන කථා කරන්න මම කැමැතියි. අපි ණය ගැන කථා කරන්න යන්නේ වත්කම් ගැන කථා නොකර නේ. අපේ ගෙදර ගැන බලද්දී අපි කොපමණ ණය ද කියලා බැලුවොත් ඒ ණය වෙලා තිබෙන්නේ මොන වත්කම් ඇති කර ගන්න ගිහිල්ලාද කියලා අපි කියනවා. එතකොට වත්කම් සහ ණය අපි එකිනෙක සම්බන්ධ කරමින් කථා කරන්නේ. අන්තර් සම්බන්ධය කියන එක නම් මේ ආණ්ඩුව දන්නේම නැහැ. අපේ රජය කාලයේ ගත් ණය, වත්කම්වලට සම්බන්ධයි. නමුත්, මේ ආණ්ඩුව කාලයේ ගත් ණය, මොන වත්කම්වලටද සම්බන්ධ කියලා අපි ඇහුවොත් මේ ආණ්ඩුව දෙන පිළිතුර මොකක්ද? මුදල් ඇමතිතුමා දෙන උත්තර අනුව එතුමා කිව්වා, "ඩොලර්වලින් තමයි අපි ණය ගෙන තිබෙන්නේ, ඩොලර්වලින් තමයි අපි ණය ගෙවන්නේ. එම නිසා රුපියලේ වටිනාකම පහළ වැටුණා කියලා අපේ ණය වැඩිවන්නේ නැහැ"යි කියලා. එතුමා මේ අය වැය ඉදිරිපත් කරන්නේ ඩොලර්වලින්ද, රුපියල්වලින්ද? රුපියල්වලින්. එතකොට අපේ ණය අපි ගණන් බලන්නේ රුපියල්වලින්; ණය ගෙවන ගණන බලන්නේත් රුපියල්වලින්. එහෙම බලන කොට තමයි, ඩොලර් එකට සාපේක්ෂව අඩු වුණු රුපියලේ වටිනාකමට අනුව ඒ ප්‍රමාණය වැඩිවන්නේ. ඔය සාමාන්‍ය තර්කනය තේරුම් ගන්න බැරිව මුදල් ඇමතිකම කරන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ. එය නොතේරුණාද, එතුමා එය සැහෙව්වාද කියන එක මම දන්නේ නැහැ.

ඊළඟට එතුමා කිව්වා, "රාජපක්ෂලාගේ ණය සියයට 83ක් අපි ගෙවනවා" කියා. ගෙවන්න පුළුවන් නේ. මොකක්ද, ගෙවන්න තිබෙන අමාරුව? හම්බන්තොට වරාය විකුණුවා. ඒකෙන් ලොකු ගණනක් ගත්තා. ඒකෙන් ගෙවනවා. ඊළඟට හදපු තවත් එකක් වන Mattala Rajapaksa International Airport එක විකුණනවා. ඒකෙන් ණය ගෙවනවා. ඉතින් මොකක්ද, තමුන්නාන්සේලාට ණය ගෙවන්න තිබෙන අමාරුව? අපි හදපු දේවල් විකුණ විකුණා, මේ රටේ තිබෙන සම්පත් විකුණ විකුණා ඒවායෙන් අතට එන මුදල්වලින් ඒ ණය ගෙවනවා. ඉතින් මොකක්ද, අමාරුවෙන් ගෙවනවා කියන්නේ? ඒ නිසා "අමාරුවෙන් ණය ගෙවනවා" කියන කතා බොරු කතා. අපේ ණය ගෙව්වොත්, ඒ ගෙවන්නේ මේ රටේ අප ඇති කළ වත්කම්වල ණයයි. අද අපේ වත්කම් විකුණමින් තමයි ණය ගෙවන්නේ.

ඊළඟට එතුමා කිව්වා, ඉන්දියාවේත්, පාකිස්තානයේත් රුපියලේ අගය අඩු වෙලා තිබෙනවා කියා. අපේ රුපියලේ අගයත් අඩු වෙලා තිබෙනවා. පසුගිය කාලයේ අපට වඩා අඩු වෙලා ලු, ඉන්දියාවේත්, පාකිස්තානයේත් රුපියල. නමුත් මා අහන්න කැමැතියි, "ඉතියෝපියාව, සිම්බාබ්වේ කියන රටවලට වඩා අපි පහළට වැටුණේ කොහොමද?" කියා. ඒ රටවල මුදලේ වටිනාකම අඩු වුණේ නැහැ නේ. එහෙම නම්, අප කොහොමද ඊට වඩා පහළට වැටුණේ? ඉන්දියාව ගත්තොත්, ඉන්දියාවේ රුපියල නිබුණේ ශක්තිමත් තැනකයි. එතැන ඉඳලායි ඒ අය වැටුණේ. අපේ රුපියල නිබුණේ ඉතාම දුබල තැනකයි. අපි ඒ දුබල තැනේ ඉඳලායි මේ තවත් පහළට වැටී තිබෙන්නේ. ඩොලර් එකකට අදාළ රුපියල් ගණන බලන කොට, අපේ රුපියල වැටීමේ වේගය,

වැටීමේ තියුණු බව ඉතා හොඳින් පෙනෙනවා. ඒ නිසා ඉන්දියාව එක්ක මේ කාරණය පටලවා, මෙකෙන් ගැලවෙන්න පුළුවන්කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්තිම වශයෙන් -අන්තිම වශයෙන්, කියා කිව්වේ නැහු තර්කවලට දෙන අවසන් පිළිතුර මෙය වන නිසායි.- මේ කාරණය කියන්න ඕනෑ. අර්ජුන මහේන්ද්‍රන්ගෙන් වූ අලාභය කොච්චරද කියා එතුමා පිළිගත්තේත් නැහැ; කිව්වේත් නැහැ. ඒ අලාභය නිසා අපේ පොලී රේට්ටු වැඩි වනවා. එම නිසා අපේ ණය ගැනීම්වල පොලී රේට්ටු ඒ අනුව වැඩි වීමෙන් කාලයක් තිස්සේ යන කොට අපට වැඩි වන පොලී බර, ණය බර කොච්චරද කියන එකත් එතුමා කිව්වේ නැහැ. අර්ජුන මහේන්ද්‍රන් මේ රටට අල්ලා ගෙන ඒමට ගත් පියවරක් ගැන අපි දන්නේත් නැහැ. අගමැතිතුමා දැන් එයා සමඟ තිබෙන යාළුකම අත් හැරලා ලු. යාළුකම අත් හැරලා නම්, Interpol එක හරහා එයා මෙහේට ගෙන්වන්න දරන උත්සාහයේ ප්‍රගතිය මොකක්ද? ඒ ගැන වාර්තාවක් දෙන්න එපායැ? ඒ දවස්වල -ඒ හොරකම වෙච්ච කාලයේ- වාර්තාවක් දුන්නා, සුමාන දෙකකට සැරයක්. දැන් කිසිම වාර්තාවක් නැහැ, අර්ජුන මහේන්ද්‍රන් මෙහේට ගෙන්වීම වෙනුවෙන් ගන්නා වූ ප්‍රයත්නයේ ප්‍රගතිය කුමක්ද කියන එක ගැන. මෙන්න මේවාත් මතක් කරගෙන අපි ඉදිරියට යමු.

ඊළඟ කාරණය, export-oriented economy. අයියෝ, මේක කියන්න පුළුවන් සිය වාරයක්! "අපි අපනයනයට යොමු වූ ආර්ථිකයක් හදමු" කියා කියන්න පුළුවන්. නමුත් අද ඇත්ත කතාව මොකක්ද? ලෝකයේ හැම රටක්ම උත්සාහ කරන්නේ, තරගකාරීව අපනයනයට යොමු වූ ආර්ථිකය හදන්නයි. එතකොට මොකද වෙන්නේ? ගැනුම්කාරයන් ටික දෙනායි, විකුණුම්කරුවන් වැඩි දෙනායි. එතකොට මොකද වෙන්නේ? එතකොට අපේ මිල ගණන් වැටෙනවා. ඇයි ඒ? රටවල් විශාල ප්‍රමාණයක් තරග කරනවා, කාර්මික භාණ්ඩ, කෘෂි කාර්මික භාණ්ඩ ආදිය අපනයනය කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩියක කාලයකුයි තිබෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
කතාව විනාඩියෙන් අවසන් කරන්න නම් මට බැරි වෙනවා. නමුත් මම මේ කාරණය කියා කතාව අවසන් කරන්නම්.

මේ ඉලක්කම් සියල්ලම දැන් පැත්තකින් තබන්න. ලෝකයේ අපනයනය සඳහා මේ කරන තරගයත් එක්ක අද විශාල වාසියක් ගන්නවා, බහු ජාතික සමාගම්. මොකද, ගැනුම්කරුවන් හැටියට ඒ අය ඉන්නේ ටික දෙනායි. ඒ නිසා අපේ මිල ගණන් පහළ වැටෙනවා. ඒ නිසා අන්තිමට අපනයනයත් පිළිතුරක් නොවෙයි. We are all racing to the bottom.

ඊළඟට, සමාජ කරුණු දිහා බලන්න. සමාජ කරුණු දිහා බැලුවාම ඔබතුමාට පෙනේවි, කොතරම් විශාල විපතක් මේ රටේ ජන ජීවිතයට වෙලා තිබෙනවාද කියා. මන්ද පෝෂණය ගෙන බලන්න. මම ඉලක්කම්වලට යන්නේ නැහැ. මේ කවුරුත් දන්නවා, FAO report එක ගැන. මූර්ත වැටුප පහළ වැටිලා කියා මහ බැංකු වාර්තාව අනුව මම පිළිගන්නවා. ඒ අනුව අපේ ජීවන මට්ටම පහළ වැටිලා. 1 වසරේ ඉඳලා 11 වසරට යන කොට දරුවෝ 50,000ක් විතර පාසලෙන් බැහැරට වැටෙනවා. ඒ දරුවන් බැහැරට වැටෙන්න හේතුව, මූලික වශයෙන්ම ආර්ථික හේතු කියා අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙක් අපට කියනවා. ඉතින්, දෙවන හේතුව, පවුල්වල ආරාවුල්. පවුල්වල ආරාවුල්වලට හේතුවත් ආදායම පිළිබඳ ප්‍රශ්නයි.

ඊළඟට, ජීවන වියදම් දර්ශකය 2005 ඉඳලා 2015 දක්වා අවුරුදු 10ට points 52කින් වැඩි වුණා.

2015 සිට 2018 දක්වා වන අවුරුදු තුනට points 78කින් වැඩි වුණා. මේවා පොඩ්ඩක් සසඳා බලනකොට මිනිසුන්ගේ ජීවන මට්ටමට මොකක්ද වෙලා තිබෙන්නේ? 2015 දක්වා උද්ධමනය සියයට 3.7යි. ඊළඟට 2015 සිට 2018 දක්වා අවුරුදු තුනයි ගියේ, උද්ධමනය සියයට 5.9යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්‍රාමිකයන්ගේ විලාපය අද ඔබතුමාටත් අපටත් ඇහුණා. විශ්‍රාමිකයන්ට අද බෙහෙත් ටික ගන්නවත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප ප්‍රමාණවත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව කෙටි කරලා අවසන් කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ අතර විශ්‍රාම වැටුපත් කප්පාදු කරලා. මගේ අවසාන වාක්‍යය කියන්නම්. කප්පාදු කිරීමේ වැලක් තිබෙනවා. රජයේ සේවයට බැඳෙන සේවකයින්ගේ විශ්‍රාම වැටුප අද රජය විසින් කප්පාදු කර තිබෙනවා. මේ ඔක්කෝම එකට ගත්තාම මේ ආණ්ඩුව මේ රට විශාල විනාශයකට ගෙන ගොස් තිබෙනවා. ඒක තමයි වසර මැද වාර්තාව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 5.49]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තැබීමේ විවාදය වන "වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2018" විවාදයට එක් වීමට අවස්ථාව සැලසීම ගැන සියලුදෙනාටම ස්තුතිවන්ත වෙනවා.

පාර්ලිමේන්තුවට ඇති මූල්‍යමය වගකීම සහ රජයේ වගකීම ප්‍රධාන කොට ගෙන යාවත්කාලීන තොරතුරු සැපයීම යටතේ මෙම වාර්තාව සපයා තිබෙනවා. අපි ආර්ථිකය ගැන කථා කරන කොට මේ රටේ සමස්ත ජනතාව උදෙසා ආර්ථිකමය ප්‍රතිලාභ ලබා දීම තමයි අපේ යුතුකම විය යුත්තේ. 1977දී අපි මේ රටට විවෘත ආර්ථිකය හඳුන්වා දීලා, එම විවෘත ආර්ථිකය තුළින් මේ රට අපනයනය පදනම් කොට ගත් දියුණු රටක් බවට පත් කරන්නට මූලික අඩිතාලම දැම්මා. 1977දී අපි ආර්ථිකය විවෘත කරන කොට අද ලෝකයේ දියුණු වෙලා තිබෙන සමහර රටවල් එම ප්‍රතිපත්තියේ සිටියේ නැහැ. ඒ අය පසුව තමයි ඒ ප්‍රතිපත්තියට

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

ඇතුළු වුණේ. අපි ඒ අඩිතාලම දැම්මත්, වසර ගණනාවක් තිස්සේ අපේ රටේ තිබුණු යුද්ධය නිසා එය හරියට ක්‍රියාත්මක කිරීමට නොහැකි වුණා. 1990 දශකය වන විට අපි අපනයනය අතින් ඉතාම තරගකාරී ලෙස ප්‍රතිපත්ති සාදමින් ආසියාවේ ඉදිරියට ගියත්, 2015 වන විට අපි එම අපනයන ආර්ථිකයෙන් බැහැර වෙලා ගමනක් යන්න පටන් අරගෙන තිබුණා. අප දුටු පරිදි විශාල ණය කන්දකට හිර වෙලා එම ණය ගෙවාගන්න බැරි තත්ත්වයකට පත් වෙන්න සිද්ධ වුණා. පසුගිය අවුරුදු කිහිපය තුළ අපි එම ණය කලමනාකරණය කරලා, නැවතත් අපනයන ආර්ථිකය ශක්තිමත් කරන්න තමයි ක්‍රියා කළේ. එදා අපට යුරෝපා සංගමයේ GSP Plus සහනය නැති වුණා; මත්ස්‍ය අපනයනය වැනි දේවල් නැති වුණා. අපි 1990 ගණන්වල හඳුන්වා දුන් ඇහලුම් කර්මාන්තය වාගේ ඒවා දියුණු වෙලා තිබුණේ නැහැ. අපි ආරම්භ කළ ක්‍රියාවලිය තුළින් අපේ අපනයන ප්‍රමාණය ඉතිහාසයේ වැඩිම අගයකට නැවතත් ගෙනැල්ලා තිබෙනවා. නමුත්, අපට මේකෙන් සෑහීමකට පත් වෙන්න බැහැ. ලෝකයේ ඇති වන කාලගුණික වෙනස්වීම් තුළින් අපේ කෘෂි කර්මාන්තයට විටින් විට බාධා ඇති වෙනවා. එක අතකින් ඇති වන ගංවතුර, තවත් අතකින් ඇති වන නියඟය තුළින් අපේ කෘෂි කර්මාන්තයට ඉතාම දරුණු පහරවල් වැදෙනවා කියලා අපි සියලුදෙනාම දන්නවා. ඒ වාගේම අපනයනය මත පදනම් වුණු ආර්ථිකයක් හදනවා කියලා අපි කොච්චර කිව්වත්, අද වන විට අපට තරග කරන්නට තිබෙන රටවල් ගණන අතිවිශාලයි. අද හුගක් රටවල් අපට ඉස්සෙල්ලා ඇවිල්ලා වෙළෙඳ පොළවල් අල්ලාගෙන, ඒ වාගේම ඒ අයගේ ශ්‍රම බලකාය පුහුණු කරලා ස්ථාවර වෙලා සිටින අවස්ථාවක තමයි අපි නැවතත් එක්වරම අපනයනය මත පදනම් වූ ආර්ථිකයක් ඉදිරියට ගෙනයන්න හදන්නේ. නමුත්, අපනයනය ගැන කියන කොට, මේ රටේ සිටින ජනතාවටත් නිෂ්පාදනයක් අවශ්‍යයි. අපි නිෂ්පාදනය කළොත් විතරයි අපට ආර්ථිකයක් ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ. ඒ වාගේම නිෂ්පාදනය කිරීමේදී කාර්යක්ෂමතාව, ඒ වාගේම තාක්ෂණය හඳුන්වා දීම, ඒ වාගේම දැනුම වර්ධනය කිරීම වාගේ දේවල් ඇති කළ යුතුයි.

මේ දේවල් තුළින් නිෂ්පාදන වියදම අඩු කරගෙන ඉතාම තරගකාරී මිලකට, තරගකාරිත්වයෙන් ඉස්සරහට යන්න පුළුවන් වාතාවරණයක් අපි හදන්න ඕනෑ. ඒ නිසා තමයි අපි නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය කෙරෙහි අවධානය යොමු කරලා නිරෝගි ඒ වාගේම අධ්‍යාපනයෙන් උසස් ශ්‍රම බලකායක් හදන්නට ආයෝජනය කළේ. නමුත් ඒ ආයෝජනයේ යම්කිසි දුරක් ගියාට පස්සේ අපට ඒක හරිහැටි කර ගන්න බැරුව ගියා. භාණ්ඩ නිපදවීම සහ සේවාවන් සැපයීම සම්බන්ධ කරගෙන අපේ අධ්‍යාපනය දියුණු කර ගන්න අපට බැරිවෙලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපේ ශ්‍රම බලකායට අද මැදපෙරදිග වාගේ රටවලට ගිහිල්ලා නුපුහුණු ශ්‍රම සපයන්නන් හැටියට වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි අපේ ශ්‍රම බලකාය පුහුණු ශ්‍රම බලකායක් බවට පරිවර්තනය කරලා මීට වඩා කාර්යක්ෂමව මේ රටේ නිෂ්පාදනයට හවුල් කර ගන්න විධියක් ගැන හිතන්න ඕනෑ. අද අපි ඒ මානෘකාවට ඇවිල්ලා තිබෙනවා, ව්‍යාත්තීය පුහුණුව හරහා. ව්‍යාත්තීය පුහුණුව යාවත්කාලීන කිරීම තුළින් ඒ වාගේම යොවුන් සේනාංක, තරුණ සේවා සභාව වැනි දේවල් තුළින් අපට අපේ තරුණ ජවය, ඒ තරුණ ශක්තිය අපේ නිෂ්පාදන ක්‍රියාවලියට ඉතාම බුද්ධිමත් ආකාරයට හසුරුවාගන්න පුළුවන් නම් අපට මීට වඩා ඉදිරියට යන්න පුළුවන්. නිෂ්පාදනයට දායකත්වයක් දක්වන විදුලි බලය, ඒ වාගේම ප්‍රවාහන ක්ෂේත්‍රය වැනි දේවල් දශක ගණනාවක ඉඳන් අපි කාර්යක්ෂම කරලා නැහැ. අපි හැම වෙලාවේම තර්ක විතර්ක කරනවා. මේ පාර්ලිමේන්තුවේ ලොකු කථා පවත්වනවා. නමුත් අනික් රටවල් නවීන තාක්ෂණය පාවිච්චි කරලා, දැනුම පාවිච්චි කරලා විදුලි බලය අද අපට වඩා අඩු මිලට නිෂ්පාදනය කරනවා. ඒ ගොල්ලන්ගේ ප්‍රවාහන සේවය අපට වඩා කාර්යක්ෂම වෙලා තිබෙනවා. ඒ ගොල්ලන්ගේ අනික් දේවල් පවා අපට වඩා ඉතාම කාර්යක්ෂම වෙලා තිබෙනවා. ඒ නිසා අනික් රටවල් එක්ක තරගකාරීව භාණ්ඩ හෝ සේවාවන් නිපදවන්න අපට බැරි වෙලා තිබෙනවා. අපේ ශ්‍රමය ඉතාම මිල අධික වෙලා තිබෙනවා. නමුත් අපේ කාර්යක්ෂමතාව වැඩිවෙලා නැහැ. ඒ නිසා ඒවා ගැන සලකා බලා, ඒ අඩුපාඩු හඳාගෙන ඉස්සරහට ගිහිල්ලා ශක්තිමත් ආර්ථිකයක් හදන්නට අපි සියලු දෙනාම එක්වෙමුයි කියමින් මට අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට නැවතත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ மஹிந்தானந்த அலுத்கமகே அவர்கள்! உங்களுக்கு 13 நிமிடங்கள் இருக்கின்றன.

[අ.භා.5.56]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ දැවැන්තම මූල්‍ය අර්බුදයක් ඉදිරියේ තමයි අපි අද මේ විවාදය පවත්වන්නේ. ගමේ භාෂාවෙන් කිව්වොත්, ගිනිකන්දක් අසල ඉන්නවා වාගේ තමයි අපි අද ඉන්නේ. ආර්ථිකය පිළිබඳව, ආර්ථිකයේ කඩා වැටීම පිළිබඳව පාර්ලිමේන්තුවේ කථා කරන මේ මොහොතේ මේ රටේ ආර්ථිකය පාලනය කරන කිසිම කෙනෙක් පාර්ලිමේන්තුවේ නැහැ. අපි කවුරුත් දන්නවා, මේ රටේ ආර්ථිකය මෙහෙය වන්නේ අගමැතිවරයා බව. එතුමාට උපදෙස් දෙන්නේ සහ ඒ සියලු සාකච්ඡා කරන්නේ පාස්කරලිංගම් මහත්තයා. පාස්කරලිංගම් මහත්තයා තමයි මේ රටේ ආර්ථිකය තීරණය කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ඊයේ පෙරේදා ආණ්ඩුවේ ඇමතිවරයෙක් සමඟ පාර්ලිමේන්තුවේ ඉන්නකොට ඒ ඇමතිතුමා පාස්කරලිංගම් මහත්තයාට call එකක් අරගෙන කිව්වා, එතුමාගේ අමාත්‍යාංශයට සල්ලි එන්නේ නැහැ කියලා. ඒ ඇමතිතුමා පාස්කරලිංගම් මහත්තයාට කථා කරන්නේ "සර්" කියලා. "සර්, මගේ අමාත්‍යාංශයට සල්ලි ඇවිල්ලා නැහැ." කියා කිව්වා. බලන්න, ආණ්ඩුවට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. කැබිනට් ඇමතිවරයා පාස්කරලිංගම් මහත්තයාට කථා කරන්නේ "සර්" කියලා. "සර්, මගේ අමාත්‍යාංශයට සල්ලි ඇවිල්ලා නැහැ; සර්, මට සල්ලි දෙන්න" කියලා කිව්වා. මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරන කැබිනට් ඇමතිවරු විශ්‍රාම ගිය, මීටරයවත් හරියට වැඩ කරන්නේ නැති පාස්කරලිංගම් මහත්තයාට කථා කරන්නේ "සර්" කියලා. ඒ ආර්ථික තීන්දු ගන්න මිනිසුන් අද මේ පාර්ලිමේන්තුවේ නැහැ. මුදල් ඇමති මංගල සමරවීර මැතිතුමා ඉන්නවා. හැබැයි, එතුමා මුදල් ඇමතිතුමා වුණාට භාණ්ඩාගාරයේ මොනවාද සිද්ධ වෙන්නේ කියලා එතුමා දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේ අපි මොන දේ කථා කළත් ඒවා අහන්න කවුරුවත් පාර්ලිමේන්තුවේ නැහැ. බලන්න, රාජ්‍ය නිලධාරීන්ගේ කුටිය දිහා. වෙනදාට මුදල් අමාත්‍යාංශය ගැන කථා කරනකොට භාණ්ඩාගාරයේ සියලු නිලධාරීන් මේ පාර්ලිමේන්තුවට ගෙන්වලා භාණ්ඩාගාර නිලධාරීන් අහගෙන ඉන්නවා; භාණ්ඩාගාර ලේකම් අහගෙන ඉන්නවා. අද බලන්න, රාජ්‍ය නිලධාරීන්ගේ කුටිය හිස්.

අද එතැන එක නිලධාරියෙක්වත් නැහැ. මෙවැනි මූල්‍ය අර්බුදයක් ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කරන වෙලාවේ

අහගෙන ඉන්න අද එක නිලධාරියෙක් නැහැ. මම හිතන විධියට ඒ කට්ටිය මිල සූත්‍රය හදනවා ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අර්බුදය ඇතිවීමට මූලිකම හේතුව හැටියට අපි දකින්නේ රටේ වර්තමානයේ තිබෙන දේශපාලන අර්බුදයයි. ඒ වාගේම, අගමැතිවරයා සහ ජනාධිපතිවරයා අතර තිබෙන ගැටුමයි. මේ රටේ අගමැතිතුමා කරන වැඩේ ජනාධිපතිතුමා දන්නේ නැහැ. ජනාධිපතිතුමා කරන වැඩේ අගමැතිතුමා දන්නේ නැහැ. මෙහෙම කොහොමද ආණ්ඩුවක් කරගෙන යන්නේ? ආණ්ඩුව ඇතුළේ බරපතළ දේශපාලන අර්බුදයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් දේශපාලන වශයෙන් අස්ථාවර වුණොත් ඉදිරියට යන්න බැහැ. රටට ආයෝජකයෝ එන්නේ නැහැ. කොටස් වෙළෙඳපොළ කඩා ගෙන වැටෙනවා. විදේශ සංචිත අරගෙන යනවා. ඉන්න ආයෝජකයෝ ව්‍යාපාර වහනවා. ඒක තමයි අද වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ ආර්ථිකය උස්සන්න මේ ආණ්ඩුවට බැහැ. අගමැතිතුමා විදේශගත වෙන්න දවස් දෙක තුනකට කලින් කිව්වා, "තව ඉදිරියට මීට වැඩිය අර්බුදයකට අපට මුහුණ දෙන්න සිද්ධ වෙයි." කියලා. එහෙම නම් මොකටද ආණ්ඩුවක්? මෙවැනි අර්බුදයකට විසඳුම් දෙන්න බැරි නම්, මොකටද ආණ්ඩුවක්? ඒ නිසා මේ ආණ්ඩුව මේ ප්‍රශ්නයට විසඳුම් දෙන්න බැරි ආණ්ඩුවක්. ජනාධිපතිවරයා හා අගමැතිවරයා අතර එකඟතාවකට එන්න බැරි ආණ්ඩුවක්. කැබිනට් මණ්ඩලයේ පොදු එකඟතාවකට එන්න බැරි ආණ්ඩුවක් එක්ක මේ ගමන යන්න බැහැ. ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, තව තවත් මේ රට ආර්ථික වශයෙන් කඩා දාන්න එපා, තව තවත් මේ රට විනාශ කරන්න එපා කියලා. ආණ්ඩුවට බැරි නම් වහාම ඉල්ලා අස්වෙන්න කියලා අපි ආණ්ඩුවට කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ ජනතාවට ජීවත් වෙන්න තිබෙන අමාරුව දිහා බලන්න. 2015 ජනවාරි මාසයේ 08වැනි දා යහ පාලන ආණ්ඩුව බලයට පත් කරන්න එදා චම්පික රණවක මැතිතුමන්ලා වේදිකාවේ කිව්වේ මොනවාද කියලා අපට මතකයි. එතුමන්ලා වේදිකාවේ කිව්වා, "මහින්ද රාජපක්ෂ මහත්මයාලා කරපු වැරැදි, කරපු දූෂණ චෝදනා වහගන්න තමයි බදු ගැහුවේ. ඒ නිසා අපේ ආණ්ඩුවක් ආපු ගමන් ජනතාවගේ බදු බර සියල්ල අයින් කරනවා." කියලා. මම දන්නේ නැහැ, දැන් චම්පික රණවක මහත්මයා කැබිනට් මණ්ඩලයේ ඉන්නේ රෙදි ඇඳගෙන ද කියලා. රාජ්‍ය බදු ආදායම ට්‍රිලියන එකක් තිබුණා. ඒ රාජ්‍ය බදු ආදායම ට්‍රිලියන දෙක දක්වා සියයට සියයකින් වැඩි කළා. "බදු අඩු කරනවා, ජීවන බර අඩු කරනවා" කියලා ඡන්දය ගත්ත තමුන්නාන්සේලා මිනිසුන්ට බදු පිට බදු ගැහුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බලන්න මේ රටේ බදු ගහපු නැති දෙයක් තිබෙනවාද කියලා. අද සියලු භාණ්ඩවලට බදු ගහලා. මිල සූත්‍රයට අනුව හෙට උදේ වෙනකොට ආපහු තෙල් මිල ඉහළ යනවා. පසුගිය දවස්වලත් තෙල් මිල ඉහළ ගියා. ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමනි, හෙට උදේ ආයෙත් තෙල් මිල ඉහළ යනවා. මේ නිසා පෞද්ගලික බස් රථ හිමිකරුවන් ඔබතුමාගෙන් ඉල්ලයි, තෙල් මිල වැඩි නිසා බස් ගාස්තුත් වැඩි කරන්න කියලා. දුප්පත් මිනිහාට යන්න තිබුණු කෝච්චියේ ගාස්තුත් වැඩි වුණා. SLTB බස් ගාස්තුත් වැඩි වුණා. දරුවන් පාසල් යන පාසල් වෑන් ගාස්තුවත් වැඩි කරනවා. බයිසිකලේට ගහන තෙල් මිල වැඩි වෙනවා. ප්ලේන් ටී එකක මිල වැඩි වෙනවා. බනිස් ගෙඩියේ මිල වැඩි වෙනවා. එහෙම නම්, මොකටද ආණ්ඩුවක්? ජනාධිපතිවරයා පිට රට ඉඳලා කිව්වා, "මම ආපු ගමන් මිල සූත්‍රය අයින් කරනවා." කියලා. තාම මිල සූත්‍රය අයින් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුද මේවායේ වගකීම බාර ගන්නේ? දවසින් දවස මිනිසුන්ට ජීවත් වෙන්න බැහැ. මිනිසුන්ට එදා වේල කන්න බැහැ. මිනිසුන්ට ජීවත් වෙන්න තිබෙන අමාරුව දවසින් දවස දැනෙනවා. රුපියල් 10,000න් ජීවත් වෙච්ච මිනිහාට අද රුපියල් 15,000ක් ඕනෑ. රුපියල් 20,000න් ජීවත් වෙච්ච මිනිහාට අද රුපියල් 27,000ක් ඕනෑ. අද ජීවන මිල දවසින් දවස ඉහළ යනවා. ඒකට මේ ආණ්ඩුවට විසඳුම් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි, රුපියල් 131ට තිබුණු ඩොලරය අද රුපියල් 172ක් බව ඔබතුමා දන්නවා. රුපියල් 42කින් ඩොලරය වැඩි වෙලා. ඒක පාලනය කරගන්න මේ ආණ්ඩුවට ශක්තියක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩොලරයේ ඉහළ යෑම නිසා පමණක් අපට ගෙවන්න තිබෙන ණය ප්‍රමාණයට වඩා වැඩිපුර රුපියල් බිලියන 1,204ක් අපේ ණය බරට එකතු වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාට රුපියල අවප්‍රමාණ වීම නවත්වා ගන්න බැහැ. තමුන්නාන්සේලාගේ දේශපාලන තීන්දු දිහා බලන්න. තමුන්නාන්සේලා 2015 ජනවාරි මාසේ 08වැනි දා බලයට ඇවිල්ලා මුලින්ම කරපු මැටි වැඩේ මොකක්ද? ආණ්ඩුව දිනපු ගමන් දින සියයේ වැඩ සටහන යටතේ තෙල් මිල අඩු කළා. මිනිස්සු ඉල්ලුවා දතෙල් මිල අඩු කරන්න කියලා? තමුන්නාන්සේලා 2015 ජනවාරි 08වැනි දා බලයට ඇවිල්ලා ඉස්සෙල්ලාම කළේ තෙල් මිල අඩු කරපු එක. ඒකෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රුපියල් බිලියන 300ක් පාඩුයි. මිනිස්සු තෙල් මිල අඩු කරන්න කිව්වේ නැහැ. ඇයි, තෙල් මිල අඩු කළේ? රටේ හොඳ ආර්ථික කළමනාකරණයක් තිබෙනවා කියලා පෙන්වන්න ඕනෑ නිසා, රටේ මිනිසුන්ගේ ඡන්ද ටික අරගෙන 2015 අගෝස්තු 17වැනි දා රනිල් වික්‍රමසිංහ මහත්මයාට අගමැති වෙන්න ඕනෑ නිසා තෙල් මිල අඩු කළා. ඊළඟට, මැතිවරණයට වියදම් කරන්න සල්ලි නැති නිසා බැඳුම්කර කොල්ලය කළා. රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති කරන්න, මැතිවරණ ව්‍යාපාරයට එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයන්ට, මන්ත්‍රීවරුන්ට සල්ලි දෙන්න බැඳුම්කර කොල්ලය කළා. ඒ පාඩුව රුපියල් බිලියන 1,000යි. මේ දෙකම කළේ රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති කරන්නයි. තෙල් මිල අඩු කරපු නිසා සිදු වූ පාඩුව රුපියල් බිලියන 300යි. බැඳුම්කරය කොල්ලය හරහා කරපු පාඩුව රුපියල් බිලියන 1,000යි.

අපි අහනවා, රුපියල් බිලියන 1,300ක් වියදම් කරලා තමුන්නාන්සේලාට 113ක් පාර්ලිමේන්තුවට ගන්න පුළුවන් වුණාද? මේ රටේ මිනිස්සු ආසන 113ක් දුන්නාද? එහෙම නම් ඒ ආයෝජන අපතේ ගිය එකයි සිදු වුණේ. ඒ, තමුන්නාන්සේලාගේ ආර්ථික කළමනාකරණයේ තිබෙන අඩු පාඩු නිසා.

ඒ විතරක් නොවෙයි, කොටස් වෙළෙඳ පොළේ කඩා වැටීම පිළිබඳව ඔබතුමන්ලා දන්නවා. ආසියාවේ හොඳම කොටස් වෙළෙඳ පොළ වෙලා තිබුණේ ලංකාව. අද කොටස් වෙළෙඳ පොළට ආයෝජකයෝ එන්නේ නැහැ. කොටස් වෙළෙඳ පොළ කඩාගෙන වැටිලා, කොටස් වෙළෙඳ පොළ ගැන තිබුණු විශ්වාසය නැති වෙලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සම්පූර්ණයෙන්ම කොටස් වෙළෙඳ පොළ කඩාගෙන වැටිලා.

මේ දේශපාලන අස්ථාවර භාවය නිසා විදේශිකයෝ සංචිත අරගෙන යනවා, ඩොලරය ඉහළ යන නිසා ඔවුන්ගේ මුදල් අරගෙන යනවා. අපි පසුගිය දවස්වල පත්තරවලින් දැක්කා, මිලියන 800 ගණනක් විදේශිකයෝ සංචිතවලින් මුදල් ඇදලා තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් ආවාම හැමදාම ආර්ථිකය ශක්තිමත් වෙනවා කියලා අපි අහලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා දන්නවා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවාම මිනිස්සුන්ගේ සාක්කුවට සල්ලි එනවා කියලා මතයක් ඒ කාලයේ -ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ තාත්තා, ඒ වාගේම ගරු

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමාගේ තාත්තා ෆෙස්ටස් පෙරේරා මැතිතුමා වැනි අය හිටපු කාලයේ- තිබුණා. ව්‍යාපාරිකයෝ වුණත් කියනවා, "යූඑන්පී" ආණ්ඩුවක් ආවාම සල්ලි එනවා කියලා. තමුන්නාන්සේලා ඒක වෙනස් කරලා "යූඑන්පී" ආණ්ඩුවක් ආවාම ව්‍යාපාරිකයා පාරට වැටෙන, බිම වැටෙන යුගයක් එනවා කියන එක ඔප්පු කළා.

අද එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ විදේශ ආයෝජන සම්බන්ධයෙන් කටයුතු කරන්නේ ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා. මට කියන්න ඔබතුමන්ලා, ආපු විදේශ ආයෝජන ගැන. මලික් සමරවික්‍රම ඇමතිතුමා දිගින් දිගටම කියනවා අපි දැක්කා, ආසියාවේ ලොකුම tower එක ගහනවා කියලා. ඇමෙරිකානු ඩොලර් බිලියන 2.2යි. හැමදාම මලික් සමරවික්‍රම ඇමතිතුමා කිව්වා පළමුවෙනි ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක් එනවා, අපි හෙට ඒ ව්‍යාපෘතිය පටන් ගන්නවා කියලා. මගේ ළඟ තිබෙනවා, BOI එකේ සභාපති මංගල යාපා මහත්මයාගේ ප්‍රකාශයක්. එතුමා කියනවා, ඒ කොන්ත්‍රාත්තුව අවසන් කළා කියලා. ඒ ගිවිසුම අවලංගු කළා කියලා කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආසියාවේ ලොකුම tower එක ගහන ආයෝජනය; අමෙරිකානු ඩොලර් බිලියන 2.2ක ආයෝජනය, ආයෝජන මණ්ඩලය විසින් අවලංගු කරනවා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ සභාව පවත්වාගෙන යාම සඳහා ගණපූර්ණය නොමැති බව කාරුණිකව දන්වනවා.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present-*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය දැන් අවසන්. ඒ නිසා කථාව කෙටියෙන් අවසන් කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියමින් සිටියේ විදේශ ආයෝජන ගැන. ඉන්දියාවේ ටාටා සමාගම ලංකාවේ විශාල ආයෝජනයක් කිරීම සඳහා, -නිවාස සංකීර්ණ ඉදි කිරීම සඳහා- වැඩ පිළිවෙළක් ආරම්භ කළා. දැන් ටාටා සමාගම ඒ ගිවිසුමත් අවලංගු කරලා මුදල් ටික ඔක්කොම අරගෙන ආපහු ගියා. ඒ වාගේම, අපි දැක්කා ඉතාලියේ සමාගමක් දුම්රිය ව්‍යාපෘතියක් ගෙන ඒම සඳහා BOI එකෙන් අවසර ඉල්ලා තිබුණා. එම විෂය භාර ඇමතිවරයායි, නියෝජ්‍ය ඇමතිවරයායි, ඒ සමාගමෙන් කොමිස් ඉල්ලනවා. ඒ සමාගම ජනාධිපතිවරයාට පැමිණිල්ලක් කර තිබෙනවා, "ඇමතිතුමායි, නියෝජ්‍ය ඇමතිතුමායි අපෙන් කොමිස් ඉල්ලනවා" කියලා. එක පැත්තකින් ආර්ථිකය කඩාගෙන වැටිලා කියලා ආයෝජකයන් රට දාලා යනවා. තව පැත්තකින් රටට එන ආයෝජකයන්ගෙන් කොමිස් ඉල්ලනවා. එම නිසා විදේශ ආයෝජන සියල්ල කඩාගෙන වැටිලා තිබෙනවා, ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි.

ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා දන්නවා, රාජ්‍ය ණය ප්‍රමාණය ට්‍රිලියන 7 ඉඳලා ට්‍රිලියන 12 දක්වා වැඩි වෙලා තිබෙන බව. ඒ කියන්නේ තමුන්නාන්සේලා රාජ්‍ය ණය ට්‍රිලියන 5ක් අරගෙන තිබෙනවා.

මේ අවුරුදු හතරක කාලය තුළ තමුන්නාන්සේලා ගත් රාජ්‍ය ණයවලින් තමුන්නාන්සේලා මොනවාද කළේ කියලා අපි අහනවා. දවසින්-දවස රාජ්‍ය ණය වැඩිවෙලා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මූල්‍ය ආයතනවල, බැංකුවල බොල් ණය වැඩිවෙලා. මේ නිසා බැංකු, මූල්‍ය ආයතන, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සියල්ල විශාල අර්බුදකාරී තත්ත්වයකට පත්වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. රාජ්‍ය සම්පත් විකුණන්න පටන්ගෙන තිබෙනවා. හම්බන්තොට වරාය දුන්නා. ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, තමුන්නාන්සේලා හම්බන්තොට වරාය දුන්නේ කීයටද? තමුන්නාන්සේලා හෙක්ටයාර් 1,142ක් දුන්නා. අපට ඒ වරාය හදන්න වැය වුණේ යූඑස් ඩොලර් මිලියන 1,300යි. යූඑස් ඩොලර් මිලියන 1,300ක් වියදම් කරලා වරාය හැදුවත් ලැබුණේ යූඑස් ඩොලර් මිලියන 900යි. අපේ ආණ්ඩුව කාලයේ ලාෆ්ස් ගෑස් සමාගමට හෙක්ටයාර් 1ක් දුන්නේ ඩොලර් 50,000කටයි. ඉඩමේ විතරක් වටිනාකම රුපියල් බිලියන 50යි. තමුන්නාන්සේලා දුන්නේ යූඑස් ඩොලර් මිලියන 947කටයි. කෝච්චි පෙට්ටි ඇමතිතුමාගේ හොංකොං ගිණුමට ඒකෙන් ඩොලර් 100ක් ගියා. ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, තමුන්නාන්සේලා පෝස්ටර් ගහලා ආණ්ඩු හදනවා. අන්තිමට වෙන කවුරුත් හම්බ කර ගන්නවා, හොඳ හොඳ ඇමති තනතුරු අරගෙන. ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, තමුන්නාන්සේ ගාල්ලේ ඉන්න වජිර අබේවර්ධන ඇමතිතුමා වාගේ නොවෙයි.

**ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Home Affairs)
මාව අල්ලාගන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
"මාව අල්ලා ගන්න එපා"යි කියලා එතුමා කියනවා. ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, තමුන්නාන්සේ ජනතාවගේ ඇමති

නේ. වජිර ඇමතිතුමා නම් 'ටග්' ගාලා කෙළින්ම අගමැතිතුමා අල්ලා ගත්තා, ඩීල් එක දමා ගත්තා, වැඩේ කර ගත්තා. අපේ කාලයේ දීත් එතුමා ගොඩ; මේ කාලයේ දීත් එතුමා ගොඩ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව විනාඩියකින් අවසන් කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි, ආයෝජන ගිල්ල ආර්ථිකය කඩාගෙන වැටිලා තිබෙන නිසා මේ වනකොට සමාගම් වසාගෙන යන බව ඔබතුමාට කියන්න ඕනෑ. අද වනකොට විරැකියාවේ ප්‍රතිශතය සියයට 5යි. මේ යන විධියට සමාගම් වැහුවොත් ලබන අවුරුද්ද මැද වනකොට විරැකියාවේ ප්‍රතිශතය සියයට 25 දක්වා ඉහළ යයි. එතකොට මිනිසුන්ට රැකියා නැතිවෙනවා, මිනිසුන්ට ජීවත් වෙන්න බැරිවෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමන්ලාට මතක ඇති, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව තිබෙන කාලයේ තමුන්නාන්සේලා යූඑන්පී එකේ මැයි පෙළපාළියට ගියා, "සිරිමාවෝගේ මිරිස් පොල්ල, සිරිමාවෝගේ හාල් පොල්ල" කියලා. අද මැයි පෙළපාළි යන්න වෙනවා, "රනිල් මහත්තයාගේ වෑන් පොල්ල, රනිල් මහත්තයාගේ ටීවී පොල්ල, රනිල් මහත්තයාගේ ෆෑන් පොල්ල" කියලා. අද පොලු දමලා ඒ සියලු අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා මිල වැඩිවෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ආනයනය කරන සියලුම භාණ්ඩවල මිල ඉහළ ගිහිල්ලා. ඔබතුමා දන්නවා, එදා ඩොලර් 10,000ක වාහනයක් ගෙනෙන්න එල්සී එක අරින්න ශත 5ක් ගියේ නැහැ. අද සියයට 200ක් වැඩිවෙලා. අද රුපියල් ලක්ෂ 35ක් මුදල් ගෙවන්න ඕනෑ, වාහනයක් ගෙනෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රට බරපතළ ආර්ථික අර්බුදයකට වැටිලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙහෙම යන්න ගියොත් ව්‍යාපාර කඩාගෙන වැටෙනවා, රජයේ ආදායම අඩු වෙනවා, ආයෝජකයෝ රට අතහැරලා යනවා, ණය බරතාව වැඩිවෙනවා, රුපියල තව තවත් ඉහළට යනවා, පොලී අනුපාතය වැඩිවෙනවා. මෙය අපි කාටත් නවත්වන්න බැහැ, ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි. අපි ඔබතුමන්ලාට මේ කාරණය කියනවා. මේ ආණ්ඩුව ගෙන යන්න ඔබතුමන්ලා අවුරුදු 4ක් උත්සාහ කළා. නමුත් තමුන්නාන්සේලා අසාර්ථකයි. මේක පැහෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට මේ ගමන යන්න බැහැ. මේ රට විනාශය කරා ගෙන යන්න එපා. ඒ නිසා කරුණාකරලා ආර්ථිකය විනාශවෙලා තිබෙන මේ රට ගොඩ ගන්න තමුන්නාන්සේලා වැඩ පිළිවෙළක් හදන්න. එහෙම වැඩ පිළිවෙළක් හදන්න බැරි නම් තමුන්නාන්සේලා මේ ආණ්ඩුවවෙන් ඉවත් වෙලා, කරන්න පුළුවන් කෙනකුට මේ රට භාර දෙන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තූතියි. මීළඟට, ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා.6.14]

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු අසෝක් අපේසිංක - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය විසින් ගෙන එන ලද 2018 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන මේ අවස්ථාවේ දී, සභාව තුළ ගණ පූරණය පිළිබඳවත් කථා කරද්දී, අවසාන මොහොතේ හෝ මේ විවාදයට සහභාගි වෙන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සන්තෝෂ වෙනවා. 2015 ජනවාරි 08 වැනි දා එවකට පැවති රජය වෙනස් කිරීම සඳහා මේ රටේ ජනතාවට මූලික අවශ්‍යතා කිහිපයක් තිබුණා. එයින් එක අවශ්‍යතාවක් තමයි, පැවැති රජයේ තිබුණු දූෂණය සහ වංචාව. අනෙක් අවශ්‍යතාව තමයි ආර්ථික කළමනාකරණයේ නොහැකියාව.

මේ දේවල් පිළිබඳව කථා කරන්න කලින් මම මේ කාරණය කියන්න කැමැතියි. "අපි බිලියනයක් ණයට අරගෙන බිලියනයක් වියදම් කරන 'එදා වේල ටුවර්ස්' රටක්ය කියන එක අපි ජනතාවට කියන්න ඕනෑ නැද්ද?" කියා 2013 වසරේ, එවකට පැවති රජයේ ඇමතිවරයකුව සිටි විමල් වීරවංශ මැතිතුමා කළ ප්‍රකාශය මට මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් වනවා. "මේ රටේ ආර්ථිකය හසුරුවන්න මේ ආණ්ඩුවට බැහැ, කවදා හෝ මේ ආණ්ඩුව ඉවත් වෙලා වෙනත් ආණ්ඩුවක් ආවාම, ඒ එන රජයට මේ ආර්ථිකය ඉදිරියට ගෙන යාමට නොහැකි තත්ත්වයට පත් කරලා තමයි මේ ආණ්ඩුව ගෙදර යන්නේ" කියාත් එතුමා ඒ අවස්ථාවේදී ප්‍රකාශ කර තිබුණා. "මම මේ කියන එක 'ටේප්' කර තියා ගන්න, තව වසර දෙකකට පස්සේ මෙය නැවත අහන්න" කියා එතුමා වැඩිදුරටත් කියා තිබුණා. මම වගකීමෙන් මේ කාරණය කියන්නේ. එතුමා 2013 වසරේ තමයි එහෙම කියා තිබුණේ. දැන් ඒක ඔප්පු වෙලා තිබෙනවා. නමුත් මේ රටේ ජනතාව 2015 ජනවාරි මාසයේ 8වන දා මේ රටේ වෙනසක් ඇති කළ නිසා අපිට යම් තත්ත්වයකට මේ ආර්ථිකය පාලනය කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා.

2005 වසරේදී අපි මේ රට පසුගිය රජයට භාර දෙනකොට රටේ ආදායම, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 16.8යි. 2015 වසරේ අපිට නැවත රට භාර දෙද්දි ඒ ප්‍රමාණය සියයට 11.5 දක්වා අඩුවෙලා තිබුණා. 2005 වසරේ අපේ රටේ ණය බර රුපියල් කෝටි 222,000ක් -රුපියල් බිලියන 2,220ක්- වෙලා තිබුණා. ඒ අය අපිට නැවත මේ රට භාර දෙනකොට ඒ වාගේ තුන් ගුණයකට වැඩියෙන් ණය බර වැඩිවෙලා තිබුණා. එය රුපියල් කෝටි 750,000ක් -රුපියල් බිලියන 7,500ක්- බවට පත්වෙලා තිබුණා. ඒ වාගේම, ඩොලරයට සාපේක්ෂව රුපියලේ අවප්‍රමාණය 2005 වසරේ සියයට දශම හයයි අටයි. නමුත් ඉතිහාසයේ රුපියලේ සිදුවුණු වැඩිම අවප්‍රමාණය වීම 2012 වසරේ සිදු වුණා. 2012 වසරේ ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 15.41කින් අවප්‍රමාණය වුණා. 2005 අවුරුද්දේ අපි රට භාර දෙන අවස්ථාවේ අපේ රටේ විදේශ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 11.3යි. නමුත් අපි රට භාර ගන්නා අවස්ථාව වන විට ඒ ප්‍රමාණය ඩොලර් බිලියන 44.7 දක්වා වැඩිවෙලා තිබුණා.

[ගරු අශෝක් අබේසිංහ මහතා]

2005දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 44.3ක් ලෙස තිබුණු විදේශ ණය ප්‍රමාණය, අපි රට භාර ගන්නා අවස්ථාව වනවිට සියයට 55.7 දක්වා වැඩිවෙලා තිබුණා. රුපියල මේ විධියට ශීඝ්‍ර ලෙස අවප්‍රමාණය වනවිට එවකට සිටි මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් අය වැයේදී තීන්දුවක් ගත්තා. ඒ අනුව, ඒ අවස්ථාවේදී රුපියල රැක ගැනීම සඳහා ඩොලර් බිලියන 4ක පමණ සංචිත ප්‍රමාණයක් මුදා හැරියා. එයත් රැක ගැනීමට නොහැකි වූ අවස්ථාවේදී ලංකාවේ ඕනෑම බැංකුවකට පිට රටින් ඩොලර් ණයට ගැනීමේ හැකියාව එදා අය වැය තුළින් ඇති කළා. ලංකාවේ වාණිජ බැංකු 13ක් පමණ තිබෙනවා. එහි ප්‍රතිඵලයක් ලෙස ඒ සියලුම වාණිජ බැංකු ඩොලර් ණයට ගත්තා. එලෙස ණයට ගන්නා ඩොලර් මහ බැංකුවේ සුරැකුම්පත්වල - Bonds - හා Billsවල ආයෝජනය කරන්න පුළුවන් කියා එතුමා 2012 අය වැයේදී ප්‍රකාශ කළා. බැදුම්කරය හෝ බිල්පත කල් පිරෙන අවස්ථාවේදී ඩොලරයේ යම්කිසි වෙනසක් තිබෙනවා නම් එහි පාඩුව මහ බැංකුව විසින් දැරිය යුතුයි කියාත් එතුමා කිව්වා.

2012 වසරේ සිටි මුදල් ඇමතිවරයා ගත් ඒ තීන්දුව නිසා -අපේ මුදල් ඇමතිවරයා අද සඳහන් කළ පරිදි- ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට මහ බැංකුව පාඩු ලැබුවා. 2012 වසරේ ගත් ඒ තීන්දුව නිසා 2013 වසරේ මහ බැංකුවේ පාඩුව රුපියල් කෝටි 2,224යි -රුපියල් බිලියන 22.2යි.- 2014 වසරේ මහ බැංකුවේ පාඩුව රුපියල් කෝටි 3,154යි -රුපියල් බිලියන 31.5යි.- 2015දී මහ බැංකුවේ පාඩුව රුපියල් කෝටි 1,783යි -රුපියල් බිලියන 17.8යි.- මේ සියල්ලේම එකතුව රුපියල් කෝටි 7,160යි -බිලියන 71.6යි.- එදා සිටි මුදල් ඇමතිවරයා රුපියල අවප්‍රමාණය වීම වළක්වා ගැනීම සඳහා ගත් තීන්දුව නිසා ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට මහ බැංකුවට වසර තුනක් ඇතුළත රුපියල් කෝටි 7,161ක් -රුපියල් බිලියන 71.61ක්- පාඩු වුණා. එවකට හිටපු මහ බැංකු අධිපතිවරයා මේ පිළිබඳව හොයන්න විශේෂඥ සහාය පැතුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් නැතිව, ඒ සඳහා එංගලන්තයෙන් විශේෂඥයන් තුන්දෙනකු ගෙන්වුවා. කැබිනට් අනුමැතියක් නැතිව ගෙන්වපු ඒ විශේෂඥයන් තුන්දෙනාට දීමනා වශයෙන් ඒ වසරේ රුපියල් බිලියන 1.39ක් -රුපියල් කෝටි 139ක්- ගෙවා තිබුණා.

මම නිකම් ගණන් හදලා බැලුවා. ඒ එක්කෙනෙකුගේ මාසික දීමනාව රුපියල් ලක්ෂ 385කට වැඩියි. එදා, රුපියල අවප්‍රමාණය වීම වළක්වා ගැනීම සඳහා ඒ විශේෂඥයන්ගේ සහාය ගැනීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් නැතිව ගත්ත ඒ තීන්දුව නිසා, අපේ රටේ මහ ජනතාවගේ මුදල් එක මාසයකට ලක්ෂ 385 ගණනේ එංගලන්තයේ උපදේශකයන් තුන් දෙනෙකුට ගෙවන්න සිද්ධ වුණා. මේවා කිසිම කෙනෙකුට මතක නැහැ. ඒවා අමතක වුණු තත්ත්වයක ඉදිමින් තමයි දැන් මේ කථා කරන්නේ. ඒවා ගැන දැන් කවුරුවත් කථා කරන්නෙත් නැහැ. මෙන්න මේ ප්‍රවෘත්තිය බලන්න.

"ශ්‍රීලන්කන් ගුවන් සමාගම ඇතුළු සමාගම් පහක් EPF සල්ලි ගිලියි."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කෙටියෙන් කරුණු කියලා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඒ දේවල් ගැන මම දැන් කථා කරන්නේ නැහැ. පසුගිය රජය කාලයේ ශ්‍රීලන්කන් ගුවන් සමාගම ආයෝජනය කළ EPF සල්ලි ගැන කවුද දැන් කථා කරන්නේ? මේ EPF කියන්නේ මොකක්ද? මේ රටේ අසූපන්ලක්ෂයක් වන ශ්‍රම බලකායේ මුදල් තිබෙන්නේ එතැනයි. පසුගිය රජය කාලයේ ඒ මුදල් පාවිච්චි කළ විධිය බලන්න.

"සමාගම් පහක් ආයෝජනය කළ කෝටි 683.5ක EPF මුදල්වලට ප්‍රතිලාභ ලැබී නැහැ."

මේ පුවත් පත්වල පළ වී තිබෙන දේවල්. පසුගිය රජය කාලයේ මේ සියලුම දේවල් කළා.

ඊළඟට, ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා අපේ ශ්‍රම බලකාය ගැන කිව්වා. 2014 වෙනකොට අපේ ශ්‍රම බලකාය මිලියන අටයි. එදා අසූලක්ෂ හතළිස්හතරදහසක් වුණු ශ්‍රම බලකාය අද වනවිට අසූපන්ලක්ෂ හැටහත්දහස දක්වා වැඩි වෙලා තිබෙනවා. රජයේ සේවකයෝ ගැන කිව්වා. 2009දී යුද්ධය අවසන් වෙනකොට මේ රටේ රජයේ සේවකයෝ දොළොස්ලක්ෂ එකොළොස්දහසයි සිටියේ. අපි ආණ්ඩුව ගන්නා කාලය වනවිට එම ප්‍රමාණය දහතුන්ලක්ෂ දෙදහසක් වෙලා තිබුණා. ඒ කාලයේ - අවුරුදු පහක් තුළ- රජයේ රැකියා දීලා තිබුණේ අනූඑක්දහසකටයි. අද වෙනකොට එම ප්‍රමාණය දහහතරලක්ෂ විසිදහස දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ අවුරුදු තුන ඇතුළත අපි එක්ලක්ෂ දහඅටදහසකට රජයේ රැකියා දීලා තිබෙනවා. එතුමා මේ අවස්ථාවේ සභා ගර්භය තුළ නොමැතිවීම ගැන මම කනගාටු වෙනවා. අවුරුදු පහක් තුළ ලබා දී තිබුණු රජයේ රැකියා අනූඑක්දහස වෙනුවට, අපි එක්ලක්ෂ දහඅටදහසකට මේ අවුරුදු තුන තුළදී රජයේ රැකියා ලබා දීලා තිබෙනවා. ශ්‍රම බලකාය අසූලක්ෂයේ සිට අසූපන්ලක්ෂ හැටහත්දහස දක්වා වැඩි වෙලා තිබෙනවා. මහ බැංකු වාර්තාව අනුවයි මම මේ කථා කරන්නේ. ඒ නිසා මේ ආර්ථිකය කොහොමත් කඩා වැටිලා නැහැ. අපි බලාපොරොත්තු වන්නේ, ඩොලර් 3,800ක් වුණු ඒක පුද්ගල ආදායම ඩොලර් 4,200 දක්වා වැඩි කරලා, 2025 වනවිට එය දෙගුණයක් කරලා, මේ රට ස්වයංපෝෂිත රටක් බවට පත් කරන්නයි. "Vision 2025" වැඩසටහන ඔස්සේ අපි එය අනිවාර්යයෙන්ම කරනවා. ඒ නිසා 2020දී මේ ආණ්ඩුව පෙරළන සිහිනය, සිහිනයක්ම පමණක් බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*
***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.***

*අතන්පිறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

[අ.භා.6.23]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ආර්ථිකය කඩා වැටිලා නැහැ කියා ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. එහෙම නම් ඉතින් මිනිසුන්ට දැන් හොඳ ඇති; ප්‍රශ්න නැතිව ඇති; ඔවුන් සතුටින් ජීවත් වෙනවා ඇති; ජීවන වියදම අඩු ඇති. මිනිසුන්ට ප්‍රශ්න නැත්නම් තමුන්නාන්සේලාට පළාත් සභා මැතිවරණයත් ඉක්මනටම පවත්වන්න පුළුවන්.

ණය ගැනීම පිළිබඳව මෙතුමන්ලා කථා කළා. පසුගිය වකවානුවේ ණය ගත්තාය කියා මොන තරම් සඳහන් කළත්, අද වෙනකොට මුළු රාජ්‍ය ණය ප්‍රමාණය කොපමණද කියා බලන්න. දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව 2015දී එම ප්‍රමාණය සියයට 70.1යි. අද වෙනකොට එම ප්‍රමාණය සියයට 88ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, රාජ්‍ය ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවාය කියන එකයි. රාජ්‍ය ණය ප්‍රමාණය වැඩි වන තරමට රටේ ආදායම වැඩි වෙලාද, අනෙක් අංශ තුළ යම්කිසි ප්‍රගතියක් ඇති වෙලාද කියන එකයි අපි බලන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ හිටපු රාජ්‍ය නායිකාව ආර්ථිකයේ මේ තත්ත්වය පිළිබඳව පසුගිය දිනවල රූපවාහිනියට, මාධ්‍යයට ප්‍රකාශ කළා; ඇමෙරිකානු ජනාධිපති, ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ගොන් වැඩ නිසා ආර්ථිකය තුළ ඩොලරයේ අගය ඉහළ ගිහින් තිබෙනවාය කිව්වා. ඇමෙරිකාවේ ජනාධිපති වැඩ කරන්නේ ඇමෙරිකාවේ සුබසිද්ධිය සඳහායි. සැප්තැම්බර් මාසයේ 28වන දා ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව නිවේදනයක් නිකුත් කර තිබෙනවා.

ඒ නිවේදනයේ සඳහන් වෙනවා, "The US economic outlook is healthy according to the key economic indicators. The most critical indicator is the Gross Domestic Product, which measures the nation's production output." කියා.

ඇමෙරිකාව වැඩ කරන්නේ ඇමෙරිකාවේ දේශීය නිෂ්පාදනය වැඩි කරගන්න. ඇමෙරිකාව ඒ පැත්තට පරිවර්තනය වෙලා තිබෙනවා. අර්බුද තිබෙන අවස්ථාවේදී පවා, ඩොනල්ඩ් ට්‍රම්ප් බලයට පත් වුණාට පසුව ඇමෙරිකාවේ ආර්ථිකය ශක්තිමත් වෙලා තිබෙනවා. ලෝකයේ අනෙක් රටවලට අර්බුද තිබෙනවා නම් ඒ අර්බුදවලට මුහුණ දීමට සූදානම් විය යුතුයි.

1975 මේ රටේ ආර්ථික අර්බුදයක් ආවා. 1982 මේ රටේ ආර්ථික අර්බුදයක් ආවා. 1991 මේ රටේ ආර්ථික අර්බුදයක් ආවා. ඒ වාගේම, ලෝකයේ ආර්ථික අර්බුද ආවා. 2009 ලෝක ආර්ථිකයේ අර්බුදයක් තිබුණා. 2007, 2008, 2009දී යුද්ධයක් තිබුණා. 2007ලෝකයේ ආර්ථික අර්බුදයක් තිබියදීත්, ඒ ආර්ථික අර්බුදයට මුහුණ දෙන්න පසුගිය ආණ්ඩුවට පුළුවන්කමක් ලැබුණා. ඒ ආර්ථික අර්බුදයට මුහුණ දුන්නේ, එක පැත්තකින් මහ බැංකුව, එක පැත්තකින් මහා භාණ්ඩාගාරය, ඒ වෙලාවේ රටේ ඇතිවන තත්ත්වයන් පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ නිසායි. එක වෙලාවක ලෝකයේ ආහාර අර්බුදයත් සමඟ අනිකුත් අර්බුද සියල්ලම ආවා. ආර්ථික අර්බුදයයි, ආහාර අර්බුදයයි කියන දෙකම 2007, 2008 වර්ෂවල එක වෙලාවට යුද්ධයත් සමඟම ආවා.

2009 වර්ෂයේ යුද්ධය අවසන් වුණාට පසුව අපේ මූලික පරමාර්ථය වුණේ, මේ රටේ යටිතල පහසුකම් ශක්තිමත් කිරීමයි. ඒ නිසා තමයි යටිතල පහසුකම්වලට පූර්ණ වශයෙන් දායකත්වයක් දුන්නේ, යටිතල පහසුකම්වලට මුදල් විශාල ප්‍රමාණයක් වැය කළේ. ඒ විධියට යටිතල පහසුකම්වලට මුදල් වැය කර, ඊට පසුව මේ රටට ආයෝජකයෝ ගෙනෙන්න පටන් ගත්තා.

මේ ආණ්ඩුව යටතේ පවතින ආයෝජන මණ්ඩලය නිකුත් කර තිබෙන වාර්තාවට අනුව, ඇමෙරිකන් ඩොලර් බිලියන 1.8ක ආයෝජන මේ අවුරුද්දේ තිබෙනවාය කියනවා. නමුත්, මම කියනවා, 2015 වන තුරු අත්සන් කළ ගිවිසුම් හැර ගිවිසුම් 17යි අත්සන් කර තිබෙන්නේ කියා. ඒවාත් කුඩා ආයෝජන. මුළු ආයෝජන ප්‍රමාණය ගත්තාම, ඒ ඩොලර් බිලියන 1.8න් ඩොලර් මිලියන 458ක් හැරුණාම අනෙක් සියලුම ආයෝජන ඇවිල්ලා තිබෙන්නේ 2015ට කලින් අත්සන් කළ ගිවිසුම්වල ප්‍රතිඵලයක් හැටියටයි. ඒ සියලුම විස්තර මා ළඟ තිබෙනවා. පසුගිය වකවානුව ඇතුළත මේ හැම සමාගමක්ම අත්සන් කළ ගිවිසුම්වල විස්තර ඉතාමත්ම පැහැදිලිව තිබෙනවා. පසුගිය කාලයේ අත්සන් කර තිබෙන්නේ ගිවිසුම් 17යි. තවත් ගිවිසුම් 22ක් අත්සන් කර තිබෙනවා. නමුත්, ආයෝජන ඇවිල්ලා නැහැ.

මෙන්න මේ තත්ත්වය උඩ රටට ආයෝජනය ගෙනෙන්නේ නැත්නම්, රටේ නිෂ්පාදන ක්ෂේත්‍රය දියුණු වෙන්නේ නැත්නම්, අපනයන ආදායමක් ඇති වෙන්නේ නැත්නම්, විදේශ ආයෝජන - FDIs- ගෙනෙන්නේ නැත්නම්, මේ තත්ත්වය පාලනය කරන්නේ කොහොමද? අපනයනය සහ ආනයනය අතර පරතරය ඩොලර් මිලියන 11ක් තිබෙනවා. මේ ඩොලර් මිලියන 11ක ප්‍රමාණය අඩු කරන්න නම් අපනයන ආදායම වැඩි කරන්න ඕනෑ, විදේශ ආයෝජන වැඩි කරන්න ඕනෑ. මේ දෙකම නැත්නම් ක්‍රියා කරන්න බැහැ. මේ කාරණය මේ ආණ්ඩුව බලයට පැමිණි අවස්ථාවේදිම අපි කිව්වා.

Port City එක අවුරුද්දක් නැවැත්තුවා. ඒ නිසා විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය නැති වුණා. බදු ක්‍රම කීපයක් අනුගමනය කළා. ඒ බදු තුළ ආයෝජනය කළ හැකි වෙනත් රටවල් තිබෙනවා. වියට්නාමයට යන්න පුළුවන්, බංග්ලාදේශයට යන්න පුළුවන්. ඒ වාගේම, අනෙකුත් රටවලට ගිහිල්ලා ආයෝජකයන්ට ආයෝජනය කරන්න පුළුවන්. අපේ

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

නීතිරීතිවලට යටත් වෙලා ආයෝජනය කරන්න ඒ අය ලැහැස්ති වෙලා නැහැ. ඒ විධියට ආයෝජනය කළ හැකි රටවල් ලෝකයේ තිබෙනවා. විශාල ආයෝජන කරන්නට ගිය මේ රටේ ආයෝජකයින්ට මැලේසියාවේ ඉඩම් නොමිලයේ දුන්නා. ඒ අනුව, ඒ අය එම රටේ ආයෝජනය කළා. නමුත්, මේ කාලය ඇතුළත ගත් දේශපාලන තීන්දු නිසා එවැනි දේ විශාල ප්‍රමාණයක් අහිමි වෙලා ගිහින් තිබෙනවා. පසුගිය වකවානු අරගෙන බලන්න.

දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව 2014 වන විට පැවති රාජ්‍ය ණය සියයට 70.1 ඉඳලා, 2018 වන විට සියයට 87 දක්වා වැඩි වෙලා තිබෙනවා. 2014 ඉඳලා 2016 දක්වා ඩොලරය සියයට 28කින් බාල්දු වෙලා තිබෙනවා. එහෙම කියන ගමන්ම කියනවා, "ඉන්දියාවේ ඩොලරය වැඩි වෙලා තිබෙනවා." කියා. ඒ කථාව ඇත්ත. හැබැයි, ඉන්දියාවේ ඩොලරය වැඩි වෙලා තිබුණත්, ඒ ගොල්ලන්ගේ ජාතික ආදායම ට්‍රිලියන 2.2යි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 වර්ෂයේ ඉතියෝපියාවේ ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක ආයෝජන තිබෙනවා. අපි ඉතියෝපියාව ගැන කථා කරන්නේ, ජීවත් වෙන්න බැරි රටක් හැටියටයි. නමුත්, අපේ රටට ආපු ආයෝජනවලින් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.8ක් 2015ට කලින් අත්සන් කරපු ගිවිසුම්වලින් ආපු ඒවා. 2017 ජනවාරි මාසයේ ඉඳලා දෙසැම්බර් මාසය වෙනකොට ඉතියෝපියාවට ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක ආයෝජන ගෙනෙන්න පුළුවන්කම ලැබී තිබෙනවා. රටවල අර්බුද තිබෙනවා. ඒ අර්බුදවලට මුහුණ දෙන්න ඒ රටවල් ලැහැස්ති වෙලා සිටිනවා. නමුත්, මේ ආණ්ඩුව ඒකට ලැහැස්ති වෙලා නැහැ. මේ අර්බුදවලට මුහුණ දෙන්න මොන ආකාරයකින්වත් ලැහැස්ති වුණු බවක් අපට පෙනෙන්නත් නැහැ. ජනතාවගේ පැත්තෙන් බැලුවාම ජනතාව පීඩාවට පත් වෙලා තිබෙනවා. ජනතාවගේ පැත්තෙන් බැලුවාම ඔවුන්ගේ හැම ආදායමක්ම වැටිලා තිබෙනවා. තේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම වැටිලා තිබෙනවා. තේ කර්මාන්තශාලා 25කට වැඩිය,- මූලාසනයේ සිටින ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා දන්නවා, තේ කර්මාන්තයට සිදුවෙලා තිබෙන තත්ත්වය මොකක්ද කියා. තේවලට සීනි ගහලා තේවල quality එක අඩුවෙලා තේ විකුණා ගන්න බැරිවෙලා තිබෙනවා. අනික් පැත්තෙන් නිෂ්පාදන වියදම වැඩිවෙලා තිබෙනවා. තවත් පැත්තකින් ආධාර ක්‍රම අඩුවෙලා තිබෙනවා. රජය දායකත්වයක් දෙන්නේ නැති තත්ත්වයට පත්වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි ඉතිරි වෙලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් යාප්පා අපේවර්තන)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඊළඟට, ආර්ථික සේවා බද්ද කියා එකක් තිබෙනවා. ආර්ථික සේවා බද්ද සියයට 2.5 සිට සියයට 5 දක්වා වැඩි කර තිබෙනවා. තේ දළු කිලෝ එකක නිෂ්පාදන වියදමින් සියයට 38ක් නිෂ්පාදකයාට දෙන්න ඕනෑ. ඒ වාගේම නඩත්තුව සඳහා දෙන්න ඕනෑ. ඒ අනුව අද තේ කර්මාන්තය ගෙනයන්න බැරි තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. එතකොට කොහොමද අපනයනය වැඩි කරන්නේ? ඒ වාගේම ගම්මිරිස් මිල සම්පූර්ණයෙන්ම අඩුවෙලා තිබෙනවා. එතකොට කොහොමද අපනයනයෙන් ආදායමක් ලැබෙන්නේ. පසුගිය කාල පරිච්ඡේදය දෙස බලන්න, කෘෂි කාර්මික අංශයේ අපනයනය කොච්චර දුරට වැටිලා තිබෙනවාද කියා. අපි ලිබරල් ආර්ථිකයක් ගැන කථා කර දැන් භාණ්ඩ ආනයනය කරන්න එපා කියනවා. භාණ්ඩ ආනයනය කරන්න එපා කිව්වාට, ඒ සඳහා නිදහස් වෙළෙඳ ගිවිසුම් කියක් තිබෙනවාද? ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම අත්සන් කළා. ඒවායින් ආනයනය කරන එක නවත්වන්න පුළුවන්ද? ආනයනය නවත්වන්න පුළුවන් එකම දේ මොකක්ද? සිංගර් සමාගම, අබාන්ස් සමාගම, සොෆ්ට්ලොජික් සමාගම වාගේ සමාගම්වලින් ගෙනාපු භාණ්ඩ වාරික වශයෙන් ගෙවීමේ ක්‍රමයට මිනිසුන්ට ලබා දුන්නා. අනාගතයේදී එක මනුස්සයෙකුටවත් වාරික වශයෙන් ගෙවන්න කිසිම දෙයක් ගන්න බැරි වෙනවා. මොකද, ඒ අය ණයවර ලිපි විවෘත කරනකොට ආයෝජකයන්ට, එහෙම නැත්නම් භාණ්ඩ ගෙන්වන මිනිස්සුන්ට වාරික වශයෙන් ගෙවීම් කරන්න බැහැ. එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක මධ්‍ය කාලීන වශයෙන් ආර්ථිකයේ ඇති වී තිබෙන කඩා වැටීමක්. ඉදිරි මාස කිහිපය මේක මීටත් වඩා වැඩි වෙනවා. මේකට මුහුණ දෙන්න බැරි තත්ත්වයකට පත් වෙනවා.

[බාධා කිරීමක්] මේකේ කිසිම පිළිවෙළක් අපට පෙනෙන්නේ නැහැ. මේ ආර්ථික අර්බුදය කියන්නේ ආණ්ඩුවේ නොහැකියාව. එම නොහැකියාවට උත්තරයක් හොයනවා හැර, හැකියාව ලබාගන්න ක්‍රමවේදයක් හදනවා හැර වෙනත් කිසිම ක්‍රමවේදයක් නැහැ. එම නිසා කඩා වැටුණු ආර්ථිකය තවත් කඩාගෙන වැටෙනවා. ඒ සඳහා ආණ්ඩුවට තාවකාලිකව හෝ වෙනත් කිසිම විසඳුමක් ලබා දෙන්න නොහැකි බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[පි.ප. 6.34]

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(මාණ්පුමිකු වඩිවේල් සුරේෂ්)
(The Hon. Vadivel Suresh)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விசேடமாக இன்று இந்த நாட்டின் பொருளாதாரம் சம்பந்தப்பட்ட விடயம் இந்தப் பாராளுமன்றத்திலே பேசப்பட்டுக் கொண்டிருக்கின்றது. இந்தச் சூழ்நிலையிலே, மலையக மக்களுடைய பிரதிநிதி என்ற வகையிலே அவர்களுடைய இன்றைய பொருளாதார நிலைமை சம்பந்தமாகச் சில விடயங்களை இந்த உயரிய சபையிலே பதிவுசெய்ய விரும்புகின்றேன். இன்று மலையக மக்களுடைய பொருளாதார நிலைமை மிகவும் மோசமடைந்துள்ளது. பெருந்தோட்டக் கம்பனிகளுடைய நிருவாகச் சீர்கேடு, தேயிலைத் தொழிற்சாலைகள் மூடப்பட்டமை மற்றும் முதலாளிமார் சம்மேளனத்தோடு நடாத்தப்படுகின்ற தொழிலாளர்களுடைய சம்பள உயர்வு சம்பந்தமான பேச்சுவார்த்தையின்போது சம்பந்தப்பட்டவர்கள் அதை இழுத்தடிப்புச் செய்கின்ற நிலைமை போன்றன இதற்குக் காரணங்களாகும் என்பதை இந்தச் சபையிலே கூறிக்கொள்ள விரும்புகின்றேன். அவர்கள் சம்பந்தமாக அனைவரும் பேசுகின்றார்கள்; அறிக்கைகள் விடுக்கின்றார்கள். ஆனால், பெருந்தோட்டத்துறைத் தொழிலாளர்களுடைய சம்பளப் பிரச்சினை இன்று பாரியதொரு பிரச்சினையாக எழுந்துள்ளது. தற்போதுகூட முதலாளிமார் சம்மேளனத்தோடு தொழிற்சங்கத் தினராகிய நாங்கள் அவர்களின் சம்பள உயர்வு சம்பந்தமாகப் பேச்சுவார்த்தை நடாத்தினோம். கூட்டு ஒப்பந்தத்தின் முதலாவது கட்டப் பேச்சுவார்த்தையிலே, நிர்ணயிக்கப்பட்ட 500 ரூபாய் அடிப்படைச் சம்பளத்தோடு 50 ரூபாவினை

அதிகரிப்பதாகக் கூறினார்கள்; அதற்கு நாங்கள் உடன் படவில்லை. இன்று இரண்டாவது கட்டப் பேச்சுவார்த்தை நடைபெற்றது. இதில் 15% அதிகரிக்கிறோம் என்று கூறி, 575 ரூபா அடிப்படைச் சம்பளம் எனக் கூறுகின்றார்கள். இந்த அடிப்படைச் சம்பளத்தை வைத்து இந்தப் பெருந்தோட்டத் தொழிலாளர்கள் எப்படி வாழ்க்கை நடத்துவது? அவர்களுடைய பிள்ளைகளை எப்படி பாடசாலைக்கு அனுப்புவது? எப்படி அவர்களுடைய சுகாதாரப் பிரச்சினைகளைத் தீர்ப்பது?

இன்று பேசிய பலர் அரச உத்தியோகத்தர்களுடைய சம்பள உயர்வு சம்பந்தமாகவும், ஏனைய தொழிற்துறை சார்ந்தவர் களின் சம்பள உயர்வு சம்பந்தமாகவும் அவர்கள் பெற்றுக்கொள்கின்ற தொகை சம்பந்தமாகவும் பேசினார்கள். ஆனால், இந்த நாட்டிலே உழைப்புக்கேற்ற ஊதியம் இல்லாது, கூடுதலாக வேலைசெய்து துன்பப்பட்டு, நான்காவது, ஐந்தாவது பரம்பரையாகத் தங்களுடைய வாழ்க்கையை முழுமையாகத் தியாகம்செய்து, இந்த நாட்டினுடைய பொருளாதாரத்தினைத் தங்களுடைய தலையிலே சுமந்து கொண்டு, பொருளாதாரத்தின் முதுகெழும்பாகச் செயற்பட்டுக் கொண்டிருக்கின்ற பெருந்தோட்டத் தொழிலாளர்களுடைய பொருளாதாரம் கேள்விக்குறியாக இருக்கின்றது. ஆகவே, தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வு வழங்குவதற்கு அரசாங்கம் அழுத்தம் கொடுக்க வேண்டும். அதாவது மேதகு ஜனாதிபதி அவர்களும் கௌரவ பிரதம மந்திரி அவர்களும் பெருந்தோட்டக் கம்பனிகளுடைய உரிமையாளர்களை அழைத்துப் பேசி, இந்த நாட்டிலே இருக்கின்ற அப்பாவித் தோட்டத் தொழிலாளர்களுடைய சம்பளத்தை இன்றைய வாழ்க்கைச் செலவுக்கேற்ற வகையிலே உயர்த்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்; பாராளுமன்றத்திலே குரல் கொடுப்பவர்கள், முதலைக்கண்ணீர் வடிப்பவர்கள் மற்றும் தோட்டத் தொழிலாளர்கள்மீது அக்கறை உள்ள சம்பந்தப்பட்ட அனைவரும் ஒன்று சேர்ந்து இந்தத் தோட்டத் தொழிலாளர் களுடைய சம்பள உயர்வு சம்பந்தமாக முதலாளிமார் சம்மேளனத்துக்குத் தங்களுடைய முழுமையான அழுத்தத்தைப் பிரயோகிக்க வேண்டுமென மலையக மக்களுடைய பிரதிநிதி என்ற வகையிலே இந்தப் பாராளுமன்றத்திலே மிகவும் வேதனையுடன் அழைப்பு விடுக்கின்றேன்.

பெருந்தோட்டத் தொழிலாளர்களால் தேயிலைச் செடிகள் பயிரிடப்பட்டு, தேயிலைத் தூள் உற்பத்தி செய்யப்பட்டு வருகின்றது. காலையிலே bed-tea என்று தேநீரை அருந்து பவர்கள் அந்தத் தொழிலாளர்களுடைய மன உளைச்சலைப் புரிந்துகொள்ள வேண்டும். எதிர்வரும் வரவு செலவுத் திட்டத்திற்கு முன்பதாகத் தோட்டத் தொழிலாளர்களுடைய நிரந்தர அடிப்படைச் சம்பளத்தை நிர்ணயிப்பதற்காக இந்தச் சபையிலுள்ள அனைவரையும் நான் அழைக்கின்றேன். இந்த அப்பாவித் தோட்டத் தொழிலாளர்கள் சார்பாக அனைவரும் குரல் கொடுக்க வேண்டும். இந்த நாட்டிலே இருக்கின்ற ஏனைய துறைகளோடு ஒப்பிட்டுப் பார்க்கும்போது, தோட்டத் தொழிலாளர்களுடைய சம்பளம் மிகக் குறைவாகும். தோட்டத் தொழிலாளர்கள் அட்டைக் கடிக்கு உள்ளாகி, மிருகங்களால் தாக்கப்பட்டு, குளவிக்கொட்டுக்கு இலக்காகி, மழையில் நனைந்து, வெயிலில் காய்ந்து பெருந்தோட்டக் காடுமே டெல்லாம் சென்று மிகவும் வேதனைக்கு மத்தியிலே தொழில் புரிகின்றார்கள். அதற்கப்பால், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீங்கள் பிரதிநித்துவப்படுத்துகின்ற தென் பிரதேசத்திலே - காலி, மாத்தறை பகுதிகளிலே இன்று கටු පොල් அறிமுகப்படுத்தப்பட்டு, அந்த கටු පොල් தோட்டத்திலேயும் அந்தப் பெருந்தோட்டத் தொழிலாளர்கள் மிகவும் வேதனைப்பட்டுக் கொண்டிருக்கின்றார்கள். இன்று தோட்டத் தொழிலாளர்களுடைய நாள் சம்பளம் 500 ரூபாயாக இருக்கின்றது. ஆனால், அவர்களுக்கு இந்தச் சம்பளம் போதாது. அவர்களுக்குச் சுகாதார ரீதியான பாதுகாப்புக் கிடையாது. இந்த நிலையில் அவர்களுடைய சம்பளம் நிச்சயமாக அதிகரிக்கப்படவேண்டும்.

இரத்தினபுரி, கேகாலைப் பிரதேசங்களில் இறப்பர் தோட்டங்களிலே வேலைசெய்கின்ற தோட்டத் தொழிலா ளர்கள் மிகுந்த இன்னல்களுக்கு முகம்கொடுத்து வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். அத்துடன் மலையகத்திலே பதுளை, நுவரெலியா, கண்டி, மாத்தளை போன்ற பிரதேசங்களிலே உள்ள தோட்டத் தொழிலாளர்களும் இன்னோரன்ன பிரச்சினைகளுக்கு முகம்கொடுத்துக் கொண்டிருக்கிறார்கள். ஆனால், இந்தப் பெருந்தோட்டத் தொழிலாளர்கள் என்றுமே ஆயுதம் ஏந்தியது கிடையாது; தனி நாடு கேட்டது கிடையாது. அவர்கள் தங்களது உழைப்புக்கு ஏற்ற ஊதியத்தை மட்டுமே கேட்டுக்கொண்டிருக்கிறார்கள். ஆகவே, அவர்களுடைய தேவையை நிச்சயமாக நிறைவேற்றவேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

ආර්ථිකය සම්බන්ධව කථා කරනකොට වතුකරය නියෝජනය කරන නියෝජිතයෙකු හැටියට වතුකරයේ ජනතාව, විශේෂයෙන් තේ, රබර් සහ කටු පොල් කර්මාන්ත ආශ්‍රිතව සේවය කරන සියලු ජාතීන්වල කම්කරුවන් ඉතා අපහසු තත්ත්වයන්ට මුහුණ දී සිටින බව මම කියනවා. ඒ අයගේ මූලික පඩිය වැඩි කිරීමට වතු හිමිපුතුන්ගේ සංගමය සමඟ අපි සාකච්ඡා කරනවා. මීට ස්වල්ප වේලාවකට කලින් අපි ඒ පිළිබඳ සාකච්ඡා කරලායි ආවේ. රුපියල් 500ක් වන වතු කම්කරුවෙකුගේ මූලික පඩිය රුපියල් 575ක් කරනවා කියලා කියනවා. අද ජීවන වියදම එක්ක බැලුවාම රුපියල් 575ත් මදි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රදේශයේ කටු පොල් වගාවට සම්බන්ධ කම්කරුවන් විදින දුක ඔබතුමා දන්නවා. ඒ වාගේම කෑගල්ල, රත්නපුර පැත්තේ රබර් වතුවලින්, බදුල්ල සහ නුවරඑළිය පැත්තේ තේ වතුවලින් මේ කම්කරුවන්ට ලැබෙන මුදල ගැන අපි දන්නවා. මම එක කරුණක් මේ ගරු සභාවට සඳහන් කරන්න කැමැතියි. වතුකරයේ ජනතාව කවදාවත් ආයුධ අතට ගත්තේ නැහැ; කවදාවත් ඊළමක් ඉල්ලුවේ නැහැ; තනි රටක් ඉල්ලුවේ නැහැ. ඒ අහිංසක වතු කම්කරුවන් ඉල්ලන්නේ දුක් මහන්සි වී වැඩ කරන විධියට පඩි ගෙවන්න කියලා විතරයි. ඒ මිනිසුන් මේ රටට ආදරෙයි. මේ රටේ ආර්ථිකය ඒ වතු කම්කරුවන්ගේ ඔළුවෙන් උස්සාගෙන යන්නේ. අම්මා කෙනෙක්, කාන්තාවක් තේ දලු කිලෝ 20ක් ඔළුව උඩ තියාගෙන යන්නේ මොන තරම් අමාරුවෙන්ද කියලා අපට හිතා ගන්න පුළුවන්. ඒ අහිංසක වතු කම්කරුවන් තම හිස මත ඒ බර තියාගෙන ගිහින් තමයි මේ ආර්ථිකය ශක්තිමත් කරන්නේ. එම නිසා මේ වතු කම්කරු ජනතාවගේ පඩි වැඩි කිරීමට අපි සියලුදෙනාට වගකීමක් සහ යුතුකමක් තිබෙනවා. එම නිසා භේද පැත්තකට දමා අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා එකතු වී ලබන අය වැයට කලින් රජයේ සේවකයන්ගේ පඩි වැඩි කරනවා වාගේ වතු

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

කම්කරුවන්ගේ මූලික පඩියත් වැඩි කිරීමට කටයුතු කරන්න කියා ආණ්ඩු පක්ෂයෙන් මෙන්ම විපක්ෂයෙන්ද මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුකරය කියන්නේ වෙනම රටක් නොවෙයි; වතුකරයේ ඉන්නේ වෙනම ජනතාවක් නොවෙයි; රොබෝලා නොවෙයි; මිනිසුන් ඉන්නේ. ඒ මිනිසුන් හරි අමාරුවෙන් ජීවත් වෙන්නේ. එම නිසා ඒ කම්කරු ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට මේ ගරු සභාවේ කථා කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමු කියා මම මගේ මිත්‍ර ගරු මන්ත්‍රීවරුන්ට, මැති ඇමතිවරුන්ට යෝජනා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් වචනයට සීමා වෙන්නේ නැතිව, පාර්ලිමේන්තුවේ කථා කළා, හැන්සාඩ් එකට ආවා, පත්තරේ දැම්මා, TV එකේ පෙන්නුවා කියලා නිකම් ඉන්නේ නැතිව සියලුදෙනා මේ අය ගැන බලන්න ඕනෑ. මේ වතු කම්කරුවන් කූඩැල්ලෝ කාගෙන වැඩ කරන්නේ. බඹරු විදලා කිහිපදෙනෙක් මැරුණා. ගිය අවුරුද්දේ විතරක් 14දෙනෙක් බඹරු විදලා මැරිලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
இந்தச் சபையில் மிகவும் மன வேதனையுடன் இந்த விசேட உரையை நான் நிகழ்த்துகிறேன். பெருந்தோட்ட மக்களுடைய வாக்குகளைப் பெற்று வந்தவர்கள் என்ற வகையிலே, செஞ்சோற்றுக் கடன் தீர்க்கவேண்டிய கடமை எங்களுக்கு இருக்கின்றது. எங்களுடைய சமூகம் சார்ந்த மக்களுடைய பொருளாதாரத்தை வளர்த்துக்கொள்வதற்காக இந்தப் பாராளுமன்றத்திலே அனைவரும் ஒன்றுசேர்ந்து அவர்களுடைய அடிப்படைச் சம்பளத்தை 1,000 ரூபாவிற்கு மேலாக அதிகரிக்கவேண்டுமென்று கேட்டுக்கொண்டு விடை பெறுகிறேன். நன்றி. வணக்கம். බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.42]

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව 2015 වර්ෂයේ "තිබෙන ආණ්ඩුව මේ රටේ සම්පත් විනාශ කරලා, මේ රටේ සම්පත් හොරකම් කරලා මේ රට විනාශ කෙරුවා. ඒ විනාශ කරපු රට ගොඩ ගන්න අපට පුළුවන්" කියලා බොරුවෙන් මේ රටේ ජනතාව මුළා කර බලය ලබා ගෙන මේ අවුරුදු තුන ඇතුළත මේ රටේ ආර්ථිකය විශාල ප්‍රපාතයකට ඇද දැම්මා. මේ ආණ්ඩුව ආපු ගමන් කිව්වේ දින සියයෙන් මේ රට ස්වයංපෝෂිත කරනවා කියලායි. දින සියයෙන් මේ රට ස්වයංපෝෂිත කරනවා කියලා මේ රටේ ජනතාව මුළා කළා. තමුන්නාන්සේට මතක ඇති, කුළුබඩු වර්ග 10ක මිල අඩු කරලා විශාල බෝඩ් ගැහුවා. මේ රටේ ආර්ථිකය දියුණු කරන්න පුළුවන් හොඳම ආණ්ඩුව මේ ආණ්ඩුව කියලා පෙන්වන්න උත්සාහ කළා. එදා මොකද කිව්වේ? මේ රටේ ජනතාවට රැකියා ලක්ෂ 10ක් දෙනවා කිව්වා; මේ රටේ ජනතාව වෙනුවෙන් කර්මාන්තශාලා ඇති කරනවා කිව්වා; මේ රට කර්මාන්තවලින් ස්වයංපෝෂිත කරනවා කිව්වා. එදා අගමැතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිත් හැම වේලාවේම කිව්වේ 'වොක්ස්වැගන්' කර්මාන්තශාලාව ගැනයි; 'වොක්ස්වැගන්' ගැනයි. අපට වේලාවකට හිතුණා, මෙතුමාගේ කටින් වොක්ස්වැගන් කාර් එළියට පනීද කියලා. මොකද කළේ? ගිහින් මුල්ගල තිබ්බා. කුරුණෑගල ප්‍රදේශයේ මුල්ගල තිබ්බා. එතැනින් එහාට ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණාද? ඒක ක්‍රියාත්මක වෙන්නේ නැති බව මේ රටේ නායකයා දන්නේ නැද්ද? එහෙම නම් අපට පෙනෙනවා, මේ ආර්ථිකය හැසිරවීමට මේ ආණ්ඩුවට කිසිම පුළුවන්කමක් - හැකියාවක්- නැහැ කියලා. දැන් මොකද වෙලා තිබෙන්නේ? මහින්ද රාජපක්ෂට "හොරා, හොරා" කියලා, මහින්ද රාජපක්ෂ මේ රටේ සම්පත් හොරකම් කළා කියලා මේ රටේ මුදල් ඇමතිවරයා මේ පාර්ලිමේන්තුව තුළ කී පාරක් හඬ නැඟුවාද? ඩුබායි බැංකුවල ට්‍රිලියන ගණන් මුදල් තිබෙනවා කිව්වා. දැන් අවුරුදු හතරකට කිට්ටු වෙනවා. ඒ පිළිබඳ හෙව්වාද? තමුන්නාන්සේලා මහ පොළොව හාරලා හෙව්වා. මහ පොළොව හාරලා හෙව්වා! සෞඛ්‍ය ඇමතිතුමායි, මුදල් ඇමතිතුමායි මේ රටේ ජනතාව මුළා කළා. හැබැයි, මේ රටේ ජනතාව ඒවා විශ්වාස කළේ නැහැ. පසුගිය පෙබරවාරි 10වැනි දින මේ ජනතාව "ඔබලා කියන්නේ බොරු, ඔබලා මේ පාලනයෙන් අයින් වෙයල්ලා" කියලා තමුන්නාන්සේලාගේ කන හරහා ගැහුවා. "ආණ්ඩුවක් පිහිටුවන්න අපට බලය දෙන්න" කියලා ඉල්ලුවා. මේ රටේ ජනතාව 2015 වර්ෂයේ ජනවාරි මාසයේ 08වැනි දින තමුන්නාන්සේලාට බලය දුන්නා.

ඒ බලය මේ රටේ ජනතාව පසුගිය පෙබරවාරි 10වැනි දා ආපසු ගත්තා. තමුන්නාන්සේලා ජනතා මතයට ගරු කරනවා නම් නම්බුකාර විධියට කළ යුතුව තිබෙන්නේ පවත්වන්න තිබෙන පළාත් සභා ඡන්ද පවත්වා ජනතා මතයට ඉඩ දෙන එකයි. මෙතෙක් එහෙම නොකර බොරුවට 2020 සංකල්පය ගැන කියෙව්වා. නමුත්, දැන් 2020 සංකල්පය සාර්ථක කර ගන්න බැරි බව දන්නවා. ඒ නිසා දැන් මොකක්ද කියන්නේ? "අපි 2025ට යනවා" කියනවා. මේ ආණ්ඩුවට මේ ක්‍රමය යටතේ 2025ට නොවෙයි, 2050ට ගියත් මේ රට ගොඩ ගන්න බැහැ කියන එක අපි පැහැදිලිව කියනවා.

දැන් ආණ්ඩුව කියන්නේ මොනවාද? "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා", "ගම්පෙරළිය" වැඩසටහන් ගැන කියනවා. මේවා හරහා මුදල් ගලලා, ගමේ දෝරේ යනවා. හැබැයි, ගමේ මිනිහාට උදේට, දවල්ට බත් එකට කන්න මාළුවක් නැතිව මුරුංගා කොළ කනවා. මේ පුවත පත්තරේ පළ වී තිබෙනවා දැකලා මැති ඇමතිවරු ගිහිල්ලා කියනවා, "මුරුංගා කොළ හොඳ ගුණ කෑමක්." කියලා. රටේ නායකයෝ වැඩ කටයුතු කරන්නේ එහෙමද? අද රටේ ගම්වල මුදල් නැහැ; මුදල් සංසරණය වෙන්නේ නැහැ; වැඩ නැහැ. වැඩබිමක් වෙලා තිබුණු මේ රට අද නිකම් සොහොන් බිමක් වාගේ වෙලා. මේ පාර්ලිමේන්තුව උත්තරීතර තැනක්. මෙතැන ප්‍රකාශ කරන හැම වචනයක්ම, මේ රට පාලනය කරන නායකයෝ කියන හැම දෙයක්ම සත්‍යය වෙන්න ඕනෑ. හැබැයි, කියන්නේ තනිකර පව; බොරු. අද පාර්ලිමේන්තුව බොරු ගුහාවක් බවට පත් වෙලා තිබෙනවා. ලිච්ඡවි රජ දරුවෝ වාගේ ආදර්ශයක් ඇතිව මේ රට පාලනය කිරීමට නම් කියන දේ කරන, සත්‍යය ප්‍රකාශ කරන ආණ්ඩුවක්, නායකයින් මේ රටේ බිහි වෙන්න ඕනෑ. මොකක්ද දැන් කරලා තිබෙන්නේ? මට පෙර කථා කරපු මන්ත්‍රීවරයකු කිව්වා, තමන්ගේ ආසනයේ 2500කට

"එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ණය යෝජනා ක්‍රමය යටතේ ණය දුන්නායි කියලා. මම දන්නා ආකාරයට නම් අපේ ප්‍රදේශයේ කිසි පුද්ගලයකුට "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලැබී නැහැ. හැබැයි, ගමක් ගමක් ගානේ ගිහිල්ලා දේශපාලන නියෝජිතයින් forms නම් පුරවාගෙන ගිහිල්ලා තිබෙනවා. මේ රට දිනෙන් දින අගාධයට යනවා. ඒ නිසා මේ රටේ ජනතා මතයට ඇහුම්කන් දීලා, ඉල්ලා අස්වෙලා මේ රට කරන්න පුළුවන් කෙනකුට භාර දෙන්නය කියලා අපි මේ ආණ්ඩුවට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිනපතා පළවන පුවත් පතක තිබුණා, "වතුකරයේ කම්කරුවන්ට අවශ්‍ය කරන පඩි දුන්නොත් වතු ගෙනියන්න බැහැ" කියලා ප්‍රකාශයක්. ඇත්ත වශයෙන්ම වතුකරයේ ජනතාව ඉතාම දුක්ඛිත ජීවිත ගත කරන්නේ. එහෙම නම් වතුකරයේ ජනතාවගේ ශ්‍රමයෙන්ද ඒ කොම්පැනිකාරයින් ලාභ ලබන්නේ කියන ගැටලුවක් එනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා වතුකරයේ ජනතාව ගැන මේ ආණ්ඩුව මීට වඩා අවධානය යොමු කරන්න කියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක පමණ කාලයක් තිබෙනවා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම "පොලීසියට මේ තරම් නිදහස දුන්නු ආණ්ඩුවක් නැහැ" කියලා පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිතුමා කළ ප්‍රකාශයක් පත්තරේ තිබුණා. පුවත් පත් බලන පුද්ගලයින්ට පැහැදිලිව පෙනෙනවා, ආණ්ඩුවේ පොලීසියම රටේ නායකයින් මරන්න ක්‍රමන්ත්‍රණය කරනවා කියලා. පොලිස් බැරැක්කයේ තිබුණු ආයුධ දෙක කිසිම සටහනක් නැතිව අරගෙන ගිහිල්ලා දවස් දෙකකට පස්සේ ආපසු ගෙනැවිත් දමනවා කිව්වාම ඒක ගැන පරීක්ෂණ කරන්න මාස ගණන්, අවුරුදු ගණන් යනවාද? නැහැ. එහෙම නම් මේ ආණ්ඩුවේම අවශ්‍යතාව ඉෂ්ට කර ගැනීම සඳහා ඉදිරියේදී පොලීසිය යොදා ගන්නවා කියන එක මේ ක්‍රියාවලිය තුළ අපට පෙනෙනවා. ඒ නිසා "හොරාගේ අම්මාගෙන් ජේන අහනවා" වාගේ වැඩක් තමයි මේ ආණ්ඩුව කරන්නේ. මේ ආණ්ඩුව නැවත වරක් අලුත් අලුත් වචන දාලා මේ රටේ ජනතාව මුළා කරන්න උත්සාහ කළාට ජනතාව මුළා වෙන්නේ නැහැයි කියන එක ප්‍රකාශ කරන ගමන්, තමුන්නාන්සේලා කියන තරම් මේ රට ස්වයංපෝෂිත කර තිබෙනවා නම් පළාත් සභා මැතිවරණය පවත්වා තමුන්නාන්සේලාගේ සංවර්ධනයේ හයිය පෙන්වන්නය කියා ඉල්ලමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.50]

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න අවස්ථාවේදී අද මෙම විවාදයට එකතු වෙලා අදහස් කිහිපයක් එකතු කරන්න ලැබීම පිළිබඳව මගේ සතුට පළ කරන්න කැමතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෙම විවාදයට සම්පූර්ණ අවධානය යොමු කළාම අපට පැහැදිලිව පෙනෙන්න තිබෙන එක කාරණයක් තමයි, අද ඩොලර් එක ඉහළ ගිහිල්ලා රුපියල අවප්‍රමාණය වෙන්න සම්පූර්ණයෙන්ම වර්තමාන රජයේ ක්‍රියා කලාපය, කළමනාකාරිත්වය හේතු වෙලා තිබෙනවා කියන එක ඒත්තු ගන්වන්න ඒකාබද්ධයේ කණ්ඩායම -විපක්ෂය යැයි කියා ගන්නා කණ්ඩායම- උත්සාහ ගන්නවා කියන එක. ඒ වාගේම අනෙක් පැත්තෙන් පුන පුනා කියනවා, "දැන් මිනිසුන්ට ජීවත් වෙන්න බැහැ, ජීවන වියදම ඉහළ ගිහිල්ලා, මිනිස්සු බොහොම අමාරුවෙන් ජීවත් වෙන්නේ" කියලා. මට කලින් කථා කළ එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා පෙන්වන්න උත්සාහ කළා, මුරුංගා කොළ කාලා මිනිස්සු ජීවත් වෙන තැනක තමයි රට තිබෙන්නේ කියන එක. අපි එතුමන්ලාට ආරාධනා කරන්න කැමතියි, කරුණාකරලා ඔබතුමන්ලාගේ පාලන සමයේ අවසාන වකවානුවේ මේ රටේ තිබුණු බඩු මිලයි; තෙල් මිලයි, අද තිබෙන බඩු මිලයි; තෙල් මිලයි සංසන්දනය කරලා වෙළෙඳ පොළට ගිහිල්ලා බලන්න කියලා.

අද අපේ කලාපයේ අනෙකුත් රටවල් වාගේම දියුණු ආර්ථිකයක් තිබෙන බොහෝ රටවලත් තමන්ගේ මුදල් ඒකකය ඩොලරයට සාපේක්ෂව පහළ ගියා. මේ අවස්ථාවේ අපිත් ඒ අර්බුදයට මුහුණ දී තිබෙනවා වුවත්, රටේ කිසිදු සුභසාධන වියදමක් මේ රජය අඩු කරලා නැහැ. ඒ වාගේම රජයක් හැටියට කරගෙන යන සංවර්ධන කටයුතුවලත් අඩුවක් කරලා නැහැ. මේ අවස්ථාවේදී මම එක කාරණයක් ගැන එකඟ වනවා. අපි රජයක් හැටියට, රටක් හැටියට උත්සාහ කළ යුත්තේ නිෂ්පාදන ආර්ථිකයකට යන්නයි. නිෂ්පාදන ආර්ථිකයකට යන්න, නිෂ්පාදන ආර්ථිකයක් ශක්තිමත් කරන්න අපි උත්සාහ කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රජය භාර ගන්න කොට අපට විදේශ විනිමය ලැබෙන පළමුවෙනි ආදායම් මාර්ගය බවට පත් වෙලා තිබුණේ විදේශගත ශ්‍රමිකයන් අපට එවන මුදල් ටිකයි. මේක තමයි ආඩම්බරකාර අප්පච්චිලා, ආඩම්බරකාර රජවරු, ආඩම්බරකාර සිටුවරු, ඔය කියන මේ රටේ මහා කළමනාකාරිත්වය, මහා ආර්ථික විශේෂඥයෝ රට පාලනය කරන කාලයේ අපට උරුම කරලා දීලා ගියේ. අපේ රටේ එක්තරා යුගයක තේ, පොල්, රබර් තමයි අපට විදේශ විනිමය ලැබෙන පළමුවෙනි ආදායම් මාර්ගය බවට පත් වෙලා තිබුණේ. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ පාලන කාලය අවසාන වනකොට, මේ රටේ ඇඟලුම් අපට විදේශ විනිමය ලැබෙන පළමුවෙනි මාර්ගය බවට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, අද කර්මාන්ත ගැන කථා කරන, ආයෝජන ගැන කථා කරන, ආයෝජකයෝ නැහැ කියලා කෑ මොර දෙන සමහර දේශපාලනඥයන්ට අමතක වෙලා තිබෙනවා, 2005 ඉඳලා 2015වන තුරු ඇඟලුම් කර්මාන්තශාලා විතරක් 187ක් අපේ රටේ වැහිලා ගිහිල්ලා තිබෙනවා කියන එක; අටලක්ෂ විසිහත්දාහකට ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියා අහිමි වෙලා තිබෙනවා කියන එක. මහ බැංකු වාර්තා අනුව, අපේ පර්යේෂණ ඒකකයෙන් ගත් දත්ත අනුවයි මා මේ කාරණා කියන්නේ. අපට මේ විධියේ තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඇත්තවශයෙන්ම විදේශයට යවන ශ්‍රමිකයන් වෘත්තිකයන් බවට පත් කරලා යවන්න, හුදෙක්ම යම් යම් සුළු සේවාවන්වල නිරත වන ශ්‍රමිකයන් පමණක් නොවෙයි, විදෙස්ගත ශ්‍රමිකයන් වෘත්තිකයන් බවට පත් කරන්න අපි මීට අවුරුදු 5කට, 7කට කලින් සිතුවා නම් මීට වඩා හොඳ තැනකට අපේ රටේ ආර්ථිකය ගෙන එන්න ඒක හේතුවක් කර ගන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රජය ඒ ඉලක්කයට ගමන් කරමින් ඉන්නවා. අද අපේ අධ්‍යාපන ඇමතිවරයා ක්‍රියා

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

කරලා තිබෙන ආකාරය ගැන එතුමාට ස්තුතිකරන්න ඕනෑ. එතුමා අලුත් විෂයමාලා 24ක් හඳුන්වා දීලා තිබෙනවා. සාමාන්‍ය පෙළින් දරුවෙක් අසමත් කරලා ගෙදර යවන්නේ නැතිව උසස් පෙළ අධ්‍යාපනය දක්වා අඛණ්ඩව අධ්‍යාපනයක් දෙන ගමන් පාසල් අධ්‍යාපනයෙන් බැහැර වෙනකොට වෘත්තියකට යොමු කරන්න පුළුවන් විධියේ පුද්ගලයෙක් නිර්මාණය කරන්න ඒ තුළින් හැකියාව ලැබෙනවා. අපට ලෝකයේ ශ්‍රම ඉල්ලුමට, සුළු සුළු රැකියාවලට පමණක් නොවෙයි, වෘත්තීමය රැකියා, කාර්මික අංශයේ රැකියාවලට ශ්‍රමිකයන් යවන්න පුළුවන් නම් අප බලාපොරොත්තු වන ඉලක්කය අපට සපුරා ගන්න පුළුවන් වනවා. අපේ විරුද්ධ පක්ෂයේ උදවිය "Enterprise Sri Lanka" වැඩසටහනට අවමන් කරනවා. නමුත්, මේ වැඩ පිළිවෙළ මීට අවුරුදු 7, 8කට කලින් පටන් ගන්න පුළුවන්කම ලැබුණා නම් කුඩා ව්‍යවසායකයන් නිර්මාණය කර ගන්න පුළුවන් වුණා නම්, නිෂ්පාදන දිරි ගන්වන්න පුළුවන්කම ලැබුණා නම්, ආනයන අඩු කරගන්න තැනකට රට යොමු කර ගන්න පුළුවන්කම ලැබුණා නම් ට්‍රම්ප් මහත්මයා මෙම ආර්ථික තීන්දු-තීරණ ගනිද්දි රටක් හැටියට මීට වඩා ශක්තිමත්ව අපට ඒවාට මුහුණ දෙන්න පුළුවන්කම තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාල පරිච්ඡේදයේදී විශාල වශයෙන් ස්වාභාවික ව්‍යසනවලට, විපත්වලට, යම් යම් අර්බුදවලට රටක් හැටියට මුහුණ දෙමින් මේ රට ඉස්සරහට ගමන් කරද්දී ලෝකයේ තිබෙන කුණාටුවට හසුවෙමින් යම් පමණකින් හෝ එයට මුහුණ දෙන්න මෙම ආණ්ඩුවට හැකියාව ලැබිලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයක පළමුවෙනි ඉලක්කය වන 'ඊළඟ වතාවේ බලය ගන්න ඕනෑ' ය කියන එක ගැන මම පුදුම වෙන්නේ නැහැ.

හැබැයි, බලය ගන්න උත්සාහ කරද්දී හැම දේම දේශපාලන මාතෘකාවක් බවට පත් කරගෙන, හැම දාම උද්ඝෝෂණ කරන එක, විරෝධතා ව්‍යාපාර කරන එක, සටන් පාඨ කියන එක විතරක් එකම ක්‍රියාමාර්ගය බවට පත් කරගන්න එක කනගාටුදායකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මේ විපක්ෂය එක වෙලාවකදී ප්‍රකාශ කළා, "අපි කොළඹ එන්නේ ආණ්ඩුව ගන්න; කොළඹ ඇවිල්ලා ආණ්ඩුව අරගෙන මිසක් ආපහු යන්නේ නැහැ" කියලා. ඒ වාගේම කිව්වා, "අපි පහුවෙනි දා එළිවෙනකල් ඉඳලා ආණ්ඩුව අරගෙන යන්නේ" කියලා. හැබැයි, එහෙම සූදානම් වුණු ජනතාවක් මේ අයත් එක්ක කොළඹ ආවේ නැහැ. ඊට පස්සේ මොකක්ද කිව්වේ? ඊට පස්සේ කිව්වා, කිරි පැකට් දීලා අපේ ගමන අඩාළ කළා කියලා. කිරි පැකට්වලට විස දැම්මා කියලා කිව්වා. මුළු රට ඉදිරියේ ප්‍රවෘත්ති සාකච්ඡා පවත්වමින් සතියක් දෙකක් යනකල් "කිරි පැකට්" මාතෘකාව හැර වෙනත් කිසිම මාතෘකාවක් ඒකාබද්ධ කල්ලියේ මේ කණ්ඩායමට තිබුණේ නැහැ.

නමුත්, අද රජයේ රස පරීක්ෂකවරයා මොකක්ද කියලා තිබෙන්නේ? එය සම්පූර්ණයෙන් මුසාවක් කියන එක රජයේ රස පරීක්ෂකවරයාගේ වාර්තාවෙන් අද පැහැදිලි කර දීලා තිබෙනවා. අද මේ අයට තිබෙන්නේ, මෙවැනි පුහු දේශපාලන සටන් පාඨ පමණයි.

දැන් කියනවා, "භාරකාර ආණ්ඩුවක් හදනවා" කියලා. අපේ ආණ්ඩුව විසුරුවනතෙක් එහෙම භාරකාර ආණ්ඩුවක් හදන්න පුළුවන් තත්ත්වයක් අපේ ව්‍යවස්ථාව අනුව තිබේද කියන්න මා දන්නේ නැහැ. ඒ සියල්ලෙන් මේ උදවිය බලාපොරොත්තු වන්නේ එක දෙයයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
ඔබතුමාත් මාත් එකම දිස්ත්‍රික්කයේ නිසා මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උදවියට පුහු සටන් පාඨ නිර්මාණය කරනවා හැර වැඩ පිළිවෙළක් නැහැ. මහ ලොකු ආර්ථික විශේෂඥයන්ගෙන් අපි අහන්න කැමැතියි, ඔබතුමන්ලාට ආණ්ඩු බලය තිබුණා නම්, මේ ප්‍රශ්නයට මොකක්ද දෙන උත්තරය කියලා. මොකක්ද දෙන පිළියම? මොකක්ද ඔබතුමන්ලාගේ විසඳුම? ඒ ගැන කියන්න කිසි දෙයක් නැහැ. මෙතුමන්ලාගේ නායකයා වන මහින්ද රාජපක්ෂ මහත්තයාටත් මාධ්‍ය ඉස්සරහ ඒ ප්‍රශ්නයට දෙන්න උත්තරයක් නැහැ. එතකොට එතුමා පිටුපස හැරිලා වීරවංශ මහත්තයා දිහා බලනවා; අනෙක් පැත්ත හැරිලා කබ්රාල් මහත්තයා දිහා බලනවා. උත්තරයක් දෙන්න බැරිව තක්කු මුක්කු ගැහිලා ඉන්නවා. ඒ නිසා මේ අය අද හුදු සටන් පාඨ පමණයි කියන්නේ. අපි කියන්න කැමැතියි, මුදල් ඇමතිවරයාත්, අගමැතිවරයාත් විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ මාර්ගෝපදේශකත්වය මැද මේ පවතින කුනාටුවෙන් මිදෙන්න යම්කිසි ක්‍රියා මාර්ගයක් ගෙන යන බව. අපි මේ ප්‍රශ්නයට ශක්තිමත්ව මුහුණ දෙනවා විතරක් නොවෙයි, රටේ ආර්ථිකය ශක්තිමත් කරලා, ඊළඟ මහ මැතිවරණයේදීත් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගන්නවාය කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 08ක් තිබෙනවා.

[අ.භා.6.59]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කිරීමට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මුදල් ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්න නිසා විශේෂයෙන්ම මා මේ කාරණය අහන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඉන්ධන මිල සූත්‍රය අපේ රටේ අද ගොඩක් කථා බහට ලක් වෙනවා. කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුත් ඉන්ධන මිල සූත්‍රය ගැන දන්නේ නැහැ කියලා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරලා තිබෙනවා වාගේම, විවිධ කථා කියමින් ඔවුන් ඒ ප්‍රශ්නය මහ හරිමින් සිටිනවා. ගරු ඇමතිතුමනි, මිල සූත්‍රය සම්බන්ධයෙන් එක කාරණයක් අපට පැහැදිලියි. ඒ තමයි, "10වැනි දාට තෙල් මිල වැඩි වනවා" කියන එක. ඔබතුමාගේ තර්කය තමයි, ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වෙද්දි මෙහේ මිලත් වැඩි

වෙනවා; අඩු වෙද්දි අඩු වෙනවා කියන එක. හැබැයි, පසුගිය මාස කීපය තුළම අපි දැක්කේ තෙල් මිලේ වැඩිවීමක් විතරයි. ගරු ඇමතිතුමනි, රාජකීය විද්‍යාලයේ පැවැති උත්සවයකදී මීට සතියකට හෝ දවස් 10කට කලින් ඔබතුමාම කිව්වා, "ඒ සඳහා සූදානම් වෙන්න" කියලා. ඔබතුමා කිව්වා, "Be ready for that." කියලා. ගරු ඇමතිතුමනි, මේ මිල සූත්‍රය සම්බන්ධයෙන් අපි දරන මතය මේකයි. මෙය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ -IMF- උපදෙස් සහ ඔවුන්ගේ ඉල්ලීම මත ඇති කරපු සූත්‍රයක්. හැබැයි අපි විශ්වාස කරනවා, "මිල සූත්‍රය" සම්බන්ධයෙන් සූත්‍රයක් නැහැ කියලා. ඔබතුමන්ලා තෙල් මිල වැඩි කිරීම සඳහා උපයෝගි කර ගන්නා යාන්ත්‍රණය බවට දැන් මිල සූත්‍රය පත් වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඉන්දියාවේ තෙල් මිල ගැන ඔබතුමා කථා කළා. හැබැයි, ඉන්දියාව යම් ප්‍රමාණයකින් බද්ද අඩු කරලා, රුපියල් 5කින් ඉන්ධන මිල අඩු කරලා ජනතාවට යම් සහනයක් දෙන්න කටයුතු කළා. ඒ නිසා අපි නැවතත් යෝජනා කරනවා, ඔබතුමන්ලා බලයට එද්දී ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති මත කටයුතු කරන්න කියලා. ඒ ප්‍රතිපත්තිවල ඉතා පැහැදිලිව සඳහන් වුණා, "ඉන්ධනවලින් අධික බදු අය කිරීමක් සිදු වනවා. ඒ විධියට අධික බදු අය කරන්නේ නැතුව පහසු මිලට ඉන්ධන ලබා දෙන්න කටයුතු කරනවා" කියලා. ඒක ජනප්‍රිය ප්‍රකාශයක්. නමුත්, ඒක ඉතාම අත්‍යාවශ්‍ය ප්‍රකාශයක්; මහ පොළව මත ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න බැරි ප්‍රකාශයක්. අපි ඔබතුමාට කියන්නේ නැහැ, ඒ පොරොන්දු වුණු විධියට සම්පූර්ණ බදු මුදලම අඩු කරන්න කියලා. අද ජනතාවට තිබෙන ආර්ථික ගැටලු ගැන සලකා බලා රජය විසින් ඉන්ධනවලට අය කරන බදු ප්‍රමාණය අඩු කරන්න. අඩු කරලා, තවදුරටත් තෙල් මිල වැඩි කරන්න එපා කියන ඉල්ලීම අපි ඔබතුමාට කරනවා. මොකද, අද ජනතාව ජීවත් වෙන්න අපහසු තත්ත්වයකයි ඉන්නේ.

ගරු මුතුකුමාරණ මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගස්දිගිලිය ප්‍රදේශයේ මුරුංගා කොළ කාලා ජීවත් වෙච්ච පවුලක් ගැන. ඒ ගැන මාධ්‍ය තුළින් ප්‍රසිද්ධ වුණා. ජනාධිපතිතුමා ඒ සම්බන්ධයෙන් එතුමාගේ අදහස් ප්‍රකාශ කළා. හැබැයි මම දැක්කා, ආපදා කළමනාකරණ අමාත්‍ය දුමින්ද දිසානායක මහතා ගිහිල්ලා දේශනයක් කරනවා, මුරුංගා කොළවල වටිනාකම ගැන. නමුත්, අපි තේරුම් ගත යුත්තේ එහි යථාර්ථයයි. බතුයි, මුරුංගා කොළයි කාලා ජීවත් වන තැනට අද අපේ රට තල්ලු වෙලා කියන කාරණයයි අපි තේරුම්ගත යුත්තේ. එය එතරම් ශුභවාදී දෙයක් නොවෙයි, ගරු ඇමතිතුමනි. ජනතාව කෙහොමද ඒ තැනට තල්ලු වුණේ කියන කාරණාව දැන් සලකා බලන්න ඕනෑ.

මැතිවරණ පවත්වන්නේ නැතුව කල් දමන එකෙන්, ජනතාව මුරුංගා කොළ කාලා ජීවත් වන තැනට රට තල්ලු වෙලා තිබෙනවාය කියන සහනිකයද, ඒක තමයි මහ පොළොවේ සිදු වෙන්නේ කියන පණිවුඩයද මේ ආණ්ඩුව දෙන්නේ කියන ප්‍රශ්නය අපි අහනවා.

ගරු ඇමතිතුමනි, ඊළඟ කාරණය තමයි දුම්රිය ගාස්තු වැඩි වීම. දුම්රිය ගාස්තු සියයට 15කින් වැඩි වුණා කියලා කියනවා. මම ඉතාම පැහැදිලිව ඔබතුමාට මතක් කරන්න කැමැතියි, සියයට 15කට වඩා වැඩි ප්‍රමාණයකින් දුම්රිය ගාස්තු වැඩි වුණු බව. දුම්රිය ගාස්තු වැඩි වීම සියයට 15කට සීමා වුණේ නැහැ. සමහර තැන්වල වාර ප්‍රවේශපත්‍ර ගාස්තු සියයට 72කින් වැඩි වුණා. සමහර නගරාන්තර දුම්රිය ගාස්තු සියයට 36කින් වැඩි වුණා. ඒ අනුව, සියයට 15කින් දුම්රිය ගාස්තු වැඩිවීමක් වෙනුවට -ආණ්ඩුව සඳහන් කළ වැඩි වීම වෙනුවට- සියයට 35-40ක ප්‍රමාණයකින් දුම්රිය ගාස්තු වැඩි කරලා තිබෙනවා. අපි ප්‍රවාහන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා, මේ ගණනය කරන ක්‍රමවේදය වෙනස් කරලා, මේ තිබෙන ආර්ථික පීඩනය සලකා බලා, අඩුම තරමින් දුම්රිය ගාස්තු වැඩිවීම සියයට 15කට සීමා කරන්න කියලා. එහෙම නැත්නම් මේ තිබෙන ආර්ථික අවපාතය ගැන සලකා බලා තව අවුරුද්දක කාලයක් යනකල් දුම්රිය ගාස්තු වැඩි කරන්නේ නැතුව ඉන්න කියනවා.

දැන් දහවනදා රෑ -එකොළොස්වනදා උදේ- වෙද්දී නැවත තෙල් මිල වැඩි වෙනවා, ගරු ඇමතිතුමනි. එහෙම වැඩි වුණාම නැවත ප්‍රවාහන ගාස්තු වැඩියෙන් ඉල්ලනවා. ඒ බරත් ජනතාවට විඳ දරා ගන්න සිදු වනවා. ආණ්ඩුව නිර්මාණය කරන්න හදපු අපනයන ආර්ථිකය පැය 24ක් තුළ නිර්මාණය කිරීමේ හැකියාවක් ආණ්ඩුවට නැහැ. මේ වනකොට අවුරුදු තුනහමාරක් ඉවරයි, මේ ආණ්ඩුවට. ඒ කාලය තුළ අපනයනය වැඩි කරන්න බැරි වුණු, අපනයන ආර්ථිකයක් ගොඩ නඟන්න බැරි වුණු ආණ්ඩුවකට කිසිසේත්ම මේ ඉදිරි මාස කිහිපය තුළදී අපනයන ආර්ථිකයක් හදන්න බැහැ. අපනයන ප්‍රමාණය, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේත්, වර්තමාන යහපාලන ආණ්ඩුවේත් එකම තැනක තමයි තිබෙන්නේ. ඒ බිලියන 11.4යි, බිලියන 11.2යි වශයෙන්. ඉතින් ඒ නිසා අපනයනවල වර්ධනයක් සිදු කිරීම සඳහා වාතාවරණයක් වර්තමාන ආණ්ඩුව අපේ රට තුළ ඇති කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය තමයි අපේ රටේ තිබෙන ණය ගැටලුව. අගමැතිතුමා මේ ආණ්ඩුව භාර ගනිද්දී කිව්වා, අපි චීනයත් එක්ක ණය උගුලක හිර වෙලා ඉන්නේ කියලා. හැබැයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉන්දියාවට ගිහිල්ලා ඉන්දියාවේ අගමැතිතුමාත් එක්ක සාකච්ඡා කරද්දී, අගමැතිතුමා නැවත ප්‍රකාශයක් කරනවා, චීනය ශ්‍රී ලංකාව ණය උගුලක හිර කළේ නැහැ කියලා. ඒ නිසා මේ "ණය උගුල" කියන කාරණාවේදී අපි ඒ ණය උගුලේ හිර වුණේ, මේ ආණ්ඩුවේ තිබුණු වැරදි කළමනාකරණය නිසායි. මේ වනකොට වර්තමාන ආණ්ඩුව මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ලබා ගත්ත රුපියල් බිලියන 5ක ප්‍රමාණයම ණය හැටියට අරගෙන තිබෙනවා. අද රුපියල් බිලියන 7,391 ඉඳලා රුපියල් බිලියන 12,000 දක්වා මේ රටේ ණය බර වැඩි කරලා තිබෙනවා. හැබැයි අපට තිබෙන ප්‍රශ්නය මේකයි. එක පැත්තකින් අද ඒ ණය ගෙවිලාත් නැහැ, අනෙක් පැත්තෙන් ඒ ණය අරගෙන කරපු දෙයක් ජනතාවට දැනෙන්නත් නැහැ, පෙනෙන්නත් නැහැ. මොකද, එහෙම ණය ගෙවිවා නම් ණය ප්‍රමාණය අඩු වෙන්න ඕනෑ. එහෙම නැත්නම් රටේ ප්‍රාග්ධන ආයෝජනය වැඩි වෙන්න ඕනෑ. මේ රටේ ප්‍රාග්ධන ආයෝජනය වැඩි වෙලා නැහැ. ඒ නිසා ඉතාම අසීරු තැනක තමයි අපේ ආර්ථිකය තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

රුපියලේ අගය බාල්දු වීම අපේ රටේ ආර්ථිකයට අද බරපතළ විධියට බලපා තිබෙනවා. රුපියල් බිලියන 26ක් දක්වා අපේ ආනයන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ආනයනය කරන අල්පෙනෙත්තේ ඉඳලා අපි කන බොන හැම පාරිභෝගික භාණ්ඩයක් දක්වාම මේ රුපියලේ අගය බාල්දු වීම බලපානවා. අද වනකොට ඩොලරයේ වටිනාකම රුපියල් 172.40යි. හැබැයි black market එකේ ඩොලරය යනවා, රුපියල් 178ට, 180ට. ඉතින් මේ විධියේ ආර්ථිකයේ කඩා වැටීමට රුපියල අවප්‍රමාණ වීම බලපාන්නේ නැහැ කියලා ආණ්ඩුව හිතාගෙන ඉන්නවා නම් අපි

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

ආණ්ඩුවට කියනවා, මේ රටේ රුපියලේ අගය බාල්දු වීම හරහා පමණක් ණය, විදේශීය රටවලින් ගත්ත ණය සඳහා රුපියල් බිලියන දහසක් අපට වැඩිපුර ගෙවන්න වෙලා තිබෙනවා කියලා. ඒ අනුව රුපියල බාල්දු වීමේ බලපෑම තිබෙනවා. සමහර විට අපනයන වැඩි වෙලා තිබුණා නම්, ආණ්ඩුව ඔය කියන තර්කය අපට පිළිගන්න තිබුණා. මේ ආණ්ඩුව වැරදි විධියටයි ආර්ථිකය කළමනාකරණය කළේ. 2012 අවුරුද්දේ ඉඳලා 2017 අවුරුද්ද දක්වා රාජ්‍ය ආදායම ප්‍රමාණවත් වුණා, ණය සේවාකරණ ගෙවීම්වලට.

2017 අවුරුද්දේ රජයේ මුළු ආදායම රුපියල් බිලියන 1,831යි. දේශීය හා විදේශීය ණය වාරිකත්, ණය පොලියත් ඇතුළුව ණය සේවා සඳහා ගෙවන්න තිබුණා, රුපියල් බිලියන 1,603ක්. ඒ අනුව රුපියල් බිලියන 228ක අතිරික්තයක් තිබුණා. ඒ හින්දා මේ ණය ගෙවන්නවත් ආදායමක් නැහැයි කියන කාරණාව බොරු කථාවක්. මහ බැංකුවේ සංඛ්‍යා ලේඛනවලින්ම ඒ තත්ත්වය තහවුරු කරලා තිබෙනවා. මේ ආර්ථිකය කඩා වැටීමට බලපෑවේ අර්ජුන මහේන්ද්‍රන් ඇතුළු කණ්ඩායම ඒක රාශි කර ගෙන මේ රටේ මහ බැංකුව කොල්ලකමින් මේ ආණ්ඩුව කරපු ඒ මහා හොරකමයි. ඒ බරපතළම හොරකමේ ප්‍රතිවිපාකවලට තමයි අද මේ රටේ ජනතාව වන්දි ගෙවමින් ඉන්නේ. හැබැයි, ආණ්ඩුවට අද ඒ ප්‍රශ්න නැහැ. මොකද, අද අගමැතිතුමා සුපිරි තත්ත්වයෙන් ආණ්ඩුවේ ඇමතිවරු ටික බලා ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තත්පර 15න් මගේ කථාව අවසන් කරන්නම්. අගමැතිතුමා, මන්ත්‍රීවරු ටික සුපිරි තත්ත්වයෙන් බලා ගන්නවා. අගමැතිතුමා සියලු පහසුකම් ටික දීලා ඇමතිවරු ටික බලා ගන්නවා. මේ රටේ උපයන හැම ධනස්කන්ධයම වැය කරන්නේ මේ මහා විශාල ආණ්ඩුවේ මන්ත්‍රීවරු 160දෙනෙක් එකට තබා ගැනීම සඳහායි. ඒ සඳහා රටේ ජනතාව සූරාකමින්, බදු ගහමින් අද ආණ්ඩුව කරගෙන යනවා. ඒ නිසා අපි ආණ්ඩුවට කියන්නේ, එක්කෝ මැතිවරණයක් පවත්වන්න කියලායි. එතකොට ආණ්ඩුව ගෙන යන මේ ක්‍රමවේදය වැරදියි කියලා දැනෙයි. එහෙම නැත්නම් ඉල්ලා අස් වෙලා මේක කරන්න පුළුවන් කණ්ඩායමකට භාර දෙන්න කියන කාරණාව කියමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[ප.ව. 7.09]

**ගරු වේලු කුමාර් මහතා**
(මාණ්පුමිකු වේලු කුමාර්)
(The Hon. Velu Kumar)
කෞරව තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළේ, නාට්ඩිනදු පොරුළාතාර නිලෛමෛ තොටර්පාක ඉන්රු මුන්වෛක්කප්පට්ඩිරුක්කින්ර සභෛ ඔත්තිවෛප්පුවේළෛප් පිරේරණෛ මීතාන විවාතත්තිලේ එන්නුටෛය කරුත්තුක් කළෛයුම් කූරුවතර්කු වාය්ප්පුත් තන්තමෛක්කු නන්රි කූරුකින්රේන්. කුරිප්පාක, ඉන්ත නල්ලාට්සි අරසාංකම් ආට්සියෛප් පොරුප්පේර්කින්රපෝතු නාට්ඩින් පොරුළා තාරම් මිකච් චික්කලාන ඔරු නිලෛක්කුත් තළ්ළප්පට්ඩිරුන්තතු. නාඩු පාරිය කටන් සුමෛක්කුළ් චික්කුණ්ට නිලෛයිල් අතනෛප් පොරුප්පේර්ර ඉන්ත අරසාංකමානතු, පල්වේරු උත්තිකළෛක් කෛයාණ්ඩු, පඩිප්පඩියාකප් පොරුළාතාරත්තෛක් කට්ඩියෙළුප්පුවතර්කුරිය නටවඩික්කෛකළෛ මේර්කොණ්ඩු වරුකින්රතු. ආනාල්, ඉන්ත නාට්ඩිනදු පොරුළාතාර නිලෛමෛයෛයුම් නිති නිලෛමෛයෛයුම් කටන් සුමෛයෛයුම් කරුත්තිර්කොළ්ළාතු, ඉන්රෛය පොරුළාතාර නිලෛමෛයෛ මේලුම් කුළුප්ප නිලෛක්කුත් තළ්ළි, මක්කළෛ වීතික්කුක් කොණ්ඩුවරක්කූඩිය, අවර්කළෛප් පීතියිලාෆ්ත්තුකින්ර චෙයර්පාඩුකළෛයේ තොටර්ච්චියාක එතිරණියිනර් චෙය්තු කොණ්ඩිරුක්කින්රනර්. කටන්ත ඉරණ්ටරෛ - මූන්රු වරුට කාලමාක කාලනිලෛ මාර්රත්තිනාල් ඉන්ත නාට්ඩිලේ තොටර්ච්චියාන පාතිප්පුක්කළ් ඒර්පට්ටන. ඔරු පක්කත්තිල් වරට්සියින් පාතිප්පුකළ්! මරුපක්කත්තිල් මළෛ අතිකරිප්පිනාල් වෙළ්ළප්පෙරුක්කින් පාතිප්පුක්කළ්! අතේපෝල, පූකෝළ චූළලිලුම් මාර්රන්කළ් ඒර්පට්ටන. ඉවෛ එල්ලාවර්රෛයුම් ඔප්පුනෝක්කුකින්රපෝතු, ඉන්ත නිලෛමෛකළෛ මිකච් චිරන්ත මුරෛයිල් මුකාමෛ චෙය්තුකොණ්ඩු, එමතු අරසු මුන්නෝක්කිප් පයණික්කින්රතෙන්රු එංකළාල් කූර මුටියුම්.

නාන් පෙරුන්තෝට්ටත්තුරෛයෛප් පිරතිනිතිත්තුවම් චෙය්කින්ර පාරාළුමන්ර උරුප්පිනර් එන්ර වකෛයිල්, තර් පෝතෛය චූළලිල් පෙරුන්තෝට්ටත්තුරෛයෛ මෛයප්පඩුත්තිය චිල විටයංකළෛ ඉංකු මුන්වෛක්ක විරුම්පුකින්රේන්. පෙරුන්තෝට්ටත්තුරෛයිලේ ඉරුක්කින්ර තෝට්ටත් තොළිලාළර්කළුටෛය චම්පළ විවකාරම් තොටර්පාකත් තර්පෝතු පේචප්පට්ටු වරුකින්රතු. ඉලංකෛයිල් ඉරුක්කින්ර චමූකංකළිලේ මිකවුම් වරුමෛ නිලෛයිල් ඉරුක්කින්ර, පින්තළ්ළප්පට්ටිරුක්කින්ර, එල්ලා විතමාන කුරිකාට්ටි කළිලුමේ කීෆ් නිලෛයිල් කාණප්පඩුකින්ර ඔරු චමූකමාක එංකළුටෛය මලෛයකච් චමූකම් කාණප්පඩුවතු උංකළුක්කුත් තෙරියුම්. ඉන්තච් චපෛයිලුම් චරි, ඒනෛය පොරුළාතාර කුරිකාට්ටිකළ් තොටර්පාන විටයංකළිලුම් චරි, ඉච්චමූකම් තොටර්පිල් තොටර්ච්චියාකප් පේචප්පට්ටු වරුකින්රතු. ආනාල්, අච්චමූකත්තෛ වරුමෛ නිලෛයිලිරුන්තු මීට්ටෙටුක්ක, අන්තප් පින්නටෛවිලිරුන්තු අවර්කළෛ මීට්ටෙටුක්ක ඔරු තිට්ටමිට්ට වේලෛත්තිට්ටත්තෛ එන්ත අරසුම් මුන්වෛත්තතාක ඉල්ලෛ. ඉන්තත් තෝට්ටත් තොළිලාළර්කළ් මුළු නේරම් තංකළුටෛය තොළිලිල් ඊටුපටුපවර්කළාක ඉරුන්තාලුම්, ඉන්තප් පෙරුන්තෝට්ටක් කම්පනිකළ් අවර්කළුටෛය උළෛප්පෛච් චුරණ්ටික්කොණ්ඩු, මිකක් කුරෛන්තපච්චක් කොටුප්පනවෛයේ අවර්කළුක්කු වළංකුකින්රන. ඉන්රෛක්කු ඕර් අරස ඌළියර් පෙරුකින්ර අටිප්පටෛච් චම්පළත්තෛ මෛයප්පඩුත්තිප් පාර්ක්කින්රපෝතු, අවර්කළුටෛය ඔරු නාළ් චම්පළමානතු කුරෛන්තපච්චම් 1,200 රූපාය්ක්කුක් කිට්ටිය ඔරු තොකෛයාකක් කාණප්පට වේණ්ටුම්. ආනාල්, ඉන්රු අවර්කළුටෛය අටිප්පටෛච් චම්පළම් වෙරුම් 500 රූපායාකක් කාණප්පඩුකින්රතු.

තර්පෝතු කූට්ටු ඔප්පන්තම් තොටර්පාකප් පේචප්පඩුකින්රතු; 10 චතවීත අතිකරිප්පු, 15 චතවීත අතිකරිප්පු එන්රෙල්ලාම් පේචප්පට්ටුක්කොණ්ඩිරුක්කින්රතු. අතිමේතකු ජනාතිපති අවර්කළ් ඉන්රු අප්පතවියිල් අමර්න්තිරුප්පතු පෙරුන්තෝට්ටත් තොළිලාළර්කළුටෛය වාක්කුකළිනාලේ යාකුම්. අතේපෝල්, කෞරව පිරතමර් අවර්කළ් පතවියිල් ඉරුප්පතුම් පෙරුන්තෝට්ටත්තුරෛයිලේ ඉරුක්කින්ර අන්තත්

තොළිලාළර්කළතු වාක්කුකළිනාලේයාකුම්. ආයිනුම්, අවර්කළ් තොටර්පාකවෝ, අවර්කළුටෙය සම්පළ උයර්වු තොටර්පිලෝ අරසු පරාමුකමාක ඉරුක්කින්ර ඔරු නිලෙමෙ කාණප්පටුකින්රතු. කෙළරව නිති අමෙච්චර් අවර්කළුම් ඉංකිරුක්කින්රපෝතු ඔරු විටයත්තෙ මුන්වෛක්කලාමෙන නිනෛක්කින්රේන්. අතාවතු, ඉන්තච් චම්පළ අතිකරිප්පුටන් චේර්ත්තු අන්තච් චම්පළත්තිලේ ඒර්පටක්කූටිය කුරෛවෛ අල්ලතු අවර්කළිනුටෙය වාළ්ක්කෛත් තරත්තෛ මේම්පටුත්තික්කොළ්වතර්කු නාට්චම්පළත්තිලේ ඒර්පටක්කූටිය අන්තක් කුරෛවෛ නිවර්ත්তි චෙය්වතර්කු චමුර්ත්ති පෝන්ර ඔරු විචේට කොටුප්පනවුත් තිට්ටමොන්රු අන්ත මලෛයක මක්කළුක්කාක - පෙරුන්තෝට්ටත් තොළිලාළර්කළුක්කාක උරුවාක්කප්පට වේණ්ටුම්. අන්ත වකෛයිල්, අටිප්පටෛච් චම්පළමානතු ඕර් අරස ඌළියර් පෙරුකින්ර මාත අටිප්පටෛච් චම්පළත්තිල් ඔරු නාළුක්කුරිය චම්පළත්තින් විකිත චමමාක අමෛය වේණ්ටුම්. අතිලේ එන්තළවු කුරෛවු ඉරුක්කින්රතෝ අන්තත් තොකෛයෛ මානියමාකප් පෙට්රුක්කොටුප්පතර්කුරිය ඒර්පාටුකළෛ එතිර්වරුම් වරවු චෙලවුත් තිට්ටත්තිලේ අරචාංකම් මේර්කොළ්ළ වේණ්ටුම්. අව්වාරින්රි ඉන්තත් තෝට්ටත් තොළිලාළර්කළතු පොරුළාතාර නිලෛයෛ මේම්පටුත්තුවතර්කාන චම්පළප් පිරච්චිනෛයෛ ඉව්වාරු ඉළුත්තටිප්පුච් චෙය්වීර්කළාකවිරුන්තාල් ඉන්තත් තුරෛ මුර්රුමුළුතාක ඉන්ත නාට්ටිලිරුන්තු තුටෛත්තෙරියප්පටුකින්ර ඔරු නිලෛමෛ උරුවාකුම්.

අතුමට්টුමල්ලාතු, JEDB, SPC, Elkaduwa Plantations පෝන්ර අරස පෙරුන්තෝට්ටංකළෛ එටුත්තුක්කොණ්ටාල් අංකේ ඉරුක්කින්ර මුකාමෛ මට්ටත්තිලාන ඌළියර්කළ් අරස, කූට්ටුත්තාපන ඌළියර්කළාකක් කරුතප්පට්ටු අවර්කළුක්කුරිය කොටුප්පනවුකළ් වළංකප්පටුකින්රන. ආනාල්, අංකේ ඉරුක්කින්ර පෙරුන්තෝට්ටත් තොළිලාළර්කළ් චාතාරණ කූලිත්තොළිලාළර්කළාක, වෙළිත්තොළිලාළර්කළාකවේ කණික්කප්පටුකින්රාර්කළ්. අරස තුරෛචාර්න්ත නිරුවනඞ් කළිලේ පණියාට්රුකින්ර චිර්රාළියර්කළුක්කු අරස නියමනඞ්කළුක්කමෛයක් කොටුප්පනවුකළ් වළංකප් පටුකින්රන. ආනාල්, අරස පෙරුන්තෝට්ටත්තුරෛයිලේ පණිපුරිකින්ර ඉන්තත් තොළිලාළර්කළුක්කු ඉන්රුවරෛ මුළුමෛයාන පාරපට්චම් කාට්ටප්පට්ටුක් කොණ්ටිරුක්කින්රතු. ඉන්ත අරචාංකත්තෛක් කට්ටියෙළුප්පුවතර්කුම් කට්ටික් කාප්පතර්කුම් මුන්කොණ්ටු චෙල්වතර්කුම් නාංකළ් එංකළුටෙය මුළු ඔත්තුළෛප්පෛයුම් පංකළිප්පෛයුම් වළංකික්කොණ්ටිරුක්කින්රෝම්. ඉරුප්පිනුම්, ඉන්තත් තෝට්ටත් තොළිලාළර්කළ් එතිර්නෝක්කුකින්ර පොරුළාතාරච් චික්කල් මට්රුම් වරුමෛ නිලෛ තොටර්පාකච් අරචාංකම් කවනම් චෙලුත්තුකින්ර තන්මෛ මිකමිකච් කුරෛන්ත මට්ටත්තිල් ඉරුප්පතු එංකළුක්කු වරුත්තමළිප්පතාක ඉරුක්කින්රතු. ආකවේ, එතිර්වරුම් ආණ්ටුක්කාන වරවු චෙලවුත් තිට්ටත්තිලේ පෙරුන්තෝට්ටත්තුරෛ චාර්න්ත තොළිලාළර්කළුක්කු මානිය අටිප්පටෛයිලාන විචේට කොටුප්පනවුත් තිට්ටමොන්රු මුන්වෛක්කප්පට වේණ්ටුමෙන නාන් වලියුරුත්තික් කූර විරුම්පුකින්රේන්. මේලුම්, අවර්කළුටෙය ඉතර වරුමාන අතිකරිප්පුක්කාන නටවටික්කෛයොන්රුම් එටුක්කප්පට වේණ්ටුම් එන්පතෛයුම් ඉන්ත ඉටත්තිලේ ඥාපකප්පටුත්ති, ඕර් අරචාක නාංකළ් මුන්නෙටුත්තුච් චෙල්ලුකින්ර ඉන්තප් පයණම් වළමාකවුම් වෙට්රිකරමාකවුම් අමෛය වේණ්ටුම් එනක් කේට්ටු, විටෛපෙරුකින්රේන්. නන්රි

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 7.16]

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මට විනාඩි 8ක් තිබුණා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප සාකච්ඡා කරන, "වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව" ගැන මගේ අදහස් ඉදිරිපත් කරන්න විනාඩි 7ක කාලයක් ලබාදීම ගැන මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

Fiscal Management (Responsibility) Act No. 3 of 2003 කියන පනතින් තමයි, මෙම වාර්තාව හැම අවුරුද්දේම ජූනි 30වන දාට ඉස්සර වෙලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑය කියන කාරණය නීතිගත කර තිබෙන්නේ. මගේ කෙටි පාර්ලිමේන්තු ජීවිතයේ පළමුවන වතාවටයි මේ වාර්තාව පිළිබඳ විවාදයකට මේ සභාගි වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මම යෝජනා කර සිටිනවා, මෙම වාර්තාව ඉදිරිපත් කළාම ඒ ගැන පාර්ලිමේන්තුවේදී විවාදයක් පවත්වන්න ඕනෑ බව. මේ වාර්තාවේ මූලිකව ඉදිරිපත් කර තිබෙන්නේ, පළමුවන මාස හතරේ දත්තයි. හැබැයි, මේ 10වන මාසයයි අප ගෙවමින් සිටින්නේ. දැන් 10වන මාසයේත් භාගයක් ගෙවී ගිහින් තිබෙනවා. ඇත්තටම අප මේ පළමුවන මාස හතරේ දත්ත ගැන කථා කරන එක කොයි තරම් දුරට තේරුමක් තිබෙන දෙයක්ද කියන එක මම දන්නේ නැහැ. ඒ වාගේම අප සියලුදෙනා දන්නවා, දෙවන මාස හයේ ආර්ථික තත්ත්වය මේ අවුරුද්දේ පළමුවන මාස හයේ තත්ත්වයට වඩා විශාල ලෙස පසු බෑමකට ලක්ව තිබෙන බව.

අපේ මුදල් අමාත්‍යතුමාත් මේ ගරු සභාවේ ඉඳලා දැන් පිටවී ගියා. කෙසේ වෙතත්, එතුමාට අද ජනමාධ්‍ය ඇමතිකමත් තිබෙන නිසාද කොහේද මුදල් අමාත්‍යාංශයේ කටයුතුවලට එතුමා මැදිහත් වනවා මදියි කියන එක තමයි මගේ නම් අදහස වෙලා තිබෙන්නේ. එතුමා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දේවල් නම් නියමෙටම කරනවා. ජාතික රූපවාහිනිය, ITN එක දැන් ආපසු සාම්ප්‍රදායික විධියට අපට මඩ ගහන්න පටන් ගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෑතකදී ITN එකේ ප්‍රවෘත්ති තුළින් දැක්කා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා හිටිලර් කෙනකු හැටියට පෙන්වන්න හදන ආකාරය; මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා රූප 10කින් විතර හිටලර් කෙනකු බවට පරිවර්තනය කර පෙන්වනවා. මේ රට, ජාතිය නිදහස් කර ගත්ත කෙනෙකුට ඒ වාගේ අපහාසයක් කරනවා නම්, ඒ අයගේ සදාචාරය ගැන අප යම්කිසි විධියකින් ප්‍රශ්න කරන්න ඕනෑය කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජාතික රූපවාහිනියේත්, ITN එකේත් ratings දිහා බැලුවාම, ඒවාත් අපේ රටේ ratings වාගේම තමයි කියලා අපට පෙනෙනවා. සියල්ලම පසු බෑමකට ලක් වෙලායි තිබෙන්නේ. ඇත්තටම ආර්ථික විද්‍යාව ගැන දන්නා ඇමති කෙනකු මේ සඳහා පත් කළොත් මීට වඩා හොඳයි කියන එකයි මගේ විශ්වාසය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාව දිහා බැලුවාම, මූලිකව මතු වන ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ආදායම් ඇස්තමේන්තුව අප ලබා ගන්නා ආදායමට වඩා වැඩි ප්‍රමාණයක තමයි කොයි වෙලාවේත් තබාගෙන තිබෙන්නේ. මංගල සමරවීර අමාත්‍යතුමා මේ ගරු සභාවේ සිටින විට දවසක් මම එතුමාගෙන් ඒ ගැන ප්‍රශ්න කළා මට මතකයි. එතුමා අය වැයෙන් පසුව VAT සංශෝධනයක්ද කොහේද ගෙනාවාට පසු මම ඇහුවා, "මේක කළොත් තමුන්නාන්සේ බලාපොරොත්තු වන ආදායම ලැබෙන්නේ නැහැ නේද?" කියා. එතකොට එතුමා මොකක්දෝ කුණුහරුපයක් ගැන -සුදු වැන් ගැනද කොහේද- කථා කරලා වාඩි වුණා. හැබැයි අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? මේ වාර්තාව දිහා බැලුවොත් එය පෙනෙනවා. රුපියල් බිලියන 690ක

[ගරු තාරක බාලසූරිය මහතා]

ආදායමක් අප බලාපොරොත්තු වෙලා තිබෙනවා. ඇත්තටම අප ලබාගෙන තිබෙන ආදායම කීයද? රුපියල් බිලියන 622යි. රුපියල් බිලියන 66ක පමණ ආදායමක් අප ලබාගෙන නැහැ. අපි ගිය අවුරුද්දේ වාර්තාව අරගෙන බලමු. අප බලාපොරොත්තු වෙලා තිබුණු ආදායම -ඇස්තමේන්තු කළ ආදායම- රුපියල් බිලියන 654යි. හැබැයි ඇත්තටම අප ලබා ගත්තේ රුපියල් බිලියන 589යි. ගිය අවුරුද්දේත් රුපියල් බිලියන 65ක අඩු පාඩුවක් තිබෙනවා. අපේ පුනරාවර්තන වියදම් දිහා බැලුවාම, ඒ වියදම් ඒ විධියටම කරගෙන යනවාය කියා පෙනෙනවා. නමුත් අපේ ප්‍රාග්ධන වියදම -Capital Expenditure- තමයි බොහෝ දුරට අඩු වන්නේ. ප්‍රාග්ධන වියදම් අඩු වුණොත්, අප අනාගතයට යම්කිසි විධියක ආයෝජනයක් කරනවා නම් ඒ ආයෝජන අඩු වෙනවා.

මෙම වාර්තාව අනුව මේ අවුරුද්දේ අපේ පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 15කින් පමණ වැඩි වෙලා තිබෙනවා. හැබැයි ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 42කින් පමණ අඩු වෙලා තිබෙනවා. ගිය අවුරුද්ද දිහා බැලුවත් ඒ තත්ත්වයමයි තිබෙන්නේ. පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 26කින් වැඩි වී තිබෙනවා. ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 23කින් අඩු වී තිබෙනවා. අනෙක් සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම අපට මේ තත්ත්වය පෙනෙනවා. ඉස්පිරිතාලවලට වියදම් කරන්න පුළුවන් මුදල්, ඉස්කෝලවලට වියදම් කරන්න පුළුවන් මුදල්, නැත්නම් පාරවල් හදන්න වියදම් කරන්න පුළුවන් මුදල්, වරායවල් හදන්න වියදම් කරන්න පුළුවන් මුදල් -කුමක් හෝ ආයෝජනයක් හැටියට වෙන් කරන්න පුළුවන් මුදල්- අපට වෙන් කරන්න බැහැ.

ඊට පස්සේ අපේ සැලසුම් මුල සිට නැවත පටන් ගන්න වෙනවා. 2017 වසරේ මේ වාර්තාව අනුව ලංකාවේ තිබුණු විදුලිය ප්‍රමාණය ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන් ගත්තොත්, 99යි. හැබැයි, 2016දී ඒ ප්‍රමාණය සියයට 99.3යි. ඒ කියන්නේ මොකක්ද? සියයට දශම 3කින් එය අඩු වෙලා තිබෙනවා. ජනගහනය වැඩි වුණාට විදුලිය දෙන්න පුළුවන් වුණු ප්‍රමාණය වැඩි වෙලා නැහැ. පිරිසිදු වතුර ලබාදීම සම්බන්ධයෙන් බැලුවත්, 2017දී පිරිසිදු වතුර ලබා දුන් ප්‍රමාණය ලංකාවේ ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන් ගත්තොත්, මේ වාර්තාව අනුව 89.3යි. 2016දී ඒ ප්‍රමාණය සියයට 89.7යි. ඒකත් අඩු වෙලා තිබෙනවා. මේක සංවර්ධනයක්ද කියන එක තමයි අපි අහන්නේ. මෙයින් පෙනෙන්නේ අපි පසුබෑමකට යන බවයි. මෙලෙස පසුබෑමකට යන්නේ අපි ප්‍රාග්ධන වියදම් -Capital Expenditure- වැඩි කරන්නේ නැති නිසායි.

අපි කෙසේ හෝ අපේ ආදායම් ඇස්තමේන්තු සපුරා ගැනීමේ goal එකට; ඒ target එකට යන්න ඕනෑය කියා මම විශ්වාස කරනවා. අපි අපේ ආදායම් ඇස්තමේන්තු සපුරා ගත්තේ නැත්නම් ඉදිරි අවුරුදුවලදීත් අපට මේ ප්‍රශ්නයට මුහුණපාන්න සිදුවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අධ්‍යාපනය දිහා බලමු. අපට සිටින ගුරුවරු ප්‍රමාණය යම්කිසි විධියකට වැඩි වෙලා තිබුණත්, පාසල් සංඛ්‍යාව වැඩි වෙලා නැති නිසා, Primary Net Enrolment Ratio එක 2017දී සියයට 93.9යි. 2016දී එය සියයට 95.9යි. ඒකත් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම විශ්වවිද්‍යාල දිහා බැලුවත්, Age Specific Enrolment Ratio එක, එහෙම නැත්නම් අවුරුදු 19-23 වයසේ සිටින තරුණයන් කීදෙනකු විශ්වවිද්‍යාලවලට ඇතුළු වනවාද කියන එක ප්‍රතිශතයක් ලෙස ගෙන බැලුවොත්, 2016දී ඒ ප්‍රමාණය 6.9යි. හැබැයි, 2017 වර්ෂය වෙනකොට ඒ ප්‍රමාණය සියයට 6.8 දක්වා අඩු වෙලා තිබෙනවා. අපි ප්‍රාග්ධන වියදම් යම්කිසි විධියකට වැඩි කරන්න වුවමනාය කියන එකයි එහි මූලික අර්ථය වන්නේ.

අපේ රටේ රුපියල විතරක් නොවෙයි, අනික් රටවලත් -ජාත්‍යන්තරයෙත්- මුදල් වර්ගවලට එහෙම වෙනවාය, මේ තත්ත්වය ලංකාවට පමණක් විශේෂ වූ ප්‍රශ්නයක් නොවේය කියා පෙන්වන්න අපේ මුදල් ඇමතිතුමා උත්සාහ කළා. හැබැයි අවුරුදු පහක, නැත්නම් අවුරුදු දහයක කාල සීමාවක් අරගෙන බැලුවොත්, රුපියල බාල්දුවෙලා තිබෙන්නේ ඩොලර් එක එක්ක විතරක් නොවෙයි කියා අපට පැහැදිලිව පෙනෙනවා. අනික් සියලුම රටවල මුදල් ඒකක සමඟ බැලුවත්, අපේ රුපියල බාල්දු වෙලා තිබෙන බව පෙනෙනවා.

මේ කාරණය ඇමෙරිකාවේ ට්‍රම්ප් පිට දමන්නේ නැතිව, අපේ ආර්ථිකය අපි හරියට කළමනාකරණය කරගන්න ඕනෑ. ඒ වාගේම, අපේ ණයබරතාව කොපමණ ප්‍රමාණයකින් වැඩිවෙනවාද කියන එක අපේ මුදල් ඇමතිතුමාත් යම්කිසි විධියකට සැලකිල්ලට ගන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ රුපියල defend කරන්න ගිහින් Central Bank එක බිලියන 70ක පමණ අලාභයක් ලැබුවාය කියා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා. හැබැයි, ගිය අවුරුද්ද අවසන් වෙනකොට තිබුණු සම්පූර්ණ විදේශ ණය ප්‍රමාණය බිලියන 4,719යි. අඩුම ගණනේ රුපියල සියයට 10කින් අවප්‍රමාණය වුණොත්, එන අවුරුද්දේ අපට තව බිලියන 472ක් ගෙවන්න වෙනවා. ඊට අමතරව, මේ අවුරුද්දේ ඇමෙරිකානු ඩොලර් බිලියන 3.2ක ණය අරගෙන තිබෙනවා. ඊළඟට, එන සුමානයේ Panda Bond එකක් ගේන්න හදනවා. ඒක ආවාම ණය ප්‍රමාණය තවත් වැඩි වෙනවා. ඒ කියන්නේ, තව බිලියන 35ක් වාගේ ප්‍රමාණයක් අපට ගෙවන්න වෙනවා. මෙහෙම බැලුවොත්, බිලියන 505ක්, 510ක් වැනි ප්‍රමාණයක් අපට වැඩිපුර ගෙවන්න වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බිලියන 505ක් කියන්නේ විශාල මුදලක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

Colombo-Katunayake Expressway එක හදන්න ගියේත් බිලියන 48යි. කොළඹ සිට ගාල්ල දක්වා highway එක හදන්න ගියේ බිලියන 95යි; එහි ඉතිරි කොටස වන ගාල්ල සිට මාතර දක්වා හදන්න ගියේ බිලියන 19යි; නොරොච්චෝලේ විදුලි බලාගාරය හදන්න ගියේ බිලියන 103යි; හම්බන්තොට වරාය හදන්න ගියේ බිලියන 137යි; මත්තල ගුවන් තොටුපළ හදන්න ගියේ බිලියන 30යි. රුපියල අවප්‍රමාණය වීම නිසා වැඩිපුර ගෙවන්න වන ප්‍රමාණයට වඩා අඩු මුදලකින් මේ හැම දෙයක්ම හදන්න පුළුවන්. නිසි ආර්ථික කළමනාකරණයක් නැති නිසා තමයි මේ ප්‍රශ්නය උග්‍ර වෙලා තිබෙන්නේ. මේ ප්‍රශ්නය විසඳන්න නම්, පුළුවන් තරම් ඉක්මනින් මේ රටේ ආර්ථික තත්ත්වය පිළිබඳව විශ්වාසයක් ඇති කරන්න ඕනෑ. ඒක කරන්න නම්, පුළුවන් තරම් ඉක්මනින් මේ ආණ්ඩුව ගෙදර යවන්න ඕනෑය කියන කාරණය සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 7.26ට, 2018 ඔක්තෝබර් 10වන බදාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 7.26 மணிக்கு பாராளுமன்றம், 2018 ஒக்ரோபர் 10, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Parliament adjourned accordingly at 7.26 p.m. until 1.00 p.m. on Wednesday, 10th October, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 263 - இல. 10
Volume 263 - No. 10

2018 ඔක්තෝබර් 10 වන බදාදා
2018 ஒக்ரோபர் 10, புதன்கிழமை
Wednesday, 10th October, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

මුලතිව් සෙම්මලෙයි ප්‍රදේශයේ ඉඩම් නැවත ජනතාවට ලබා දීම

ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවට එරෙහි දූෂණ චෝදනා

**පුරාවිද්‍යාත්මක ස්ථාන විනාශ වන බවට පළ වන අසත්‍ය මාධ්‍ය වාර්තා:**

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**අපහාසාත්මක මාධ්‍ය වාර්තා:**

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත:**

දෙවන වර හා තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**කල්තැබීමේ යෝජනාව:**

හෝමාගම තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම


---

# பிரதான உள்ளடக்கம்


**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா :**

முல்லைத்தீவு, செம்மலைப் பகுதி மக்களின் காணிகளை மீள ஒப்படைத்தல்

இலங்கை கிரிக்கெட்டுக்கு எதிரான ஊழல்குற்றச்சாட்டுகள்

**தொல்பொருள் இடங்கள் அழிவதாக வெளியான உண்மையற்ற ஊடக அறிக்கைகள்**::

உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரினது கூற்று

**அவதூறான ஊடக அறிக்கைகள்:**

அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சரினது கூற்று

**இழப்புக்கான எதிரீடுகள் பற்றிய அலுவலகம் சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப் பட்டவாறு நிறைவேற்றப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**

ஹோமகம தொழில்நுட்ப நகர அபிவிருத்திக் கருத் திட்டத்துக்கான காணிச் சுவீகரிப்பு


---

# PRINCIPAL CONTENTS


SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

QUESTIONS POSED TO HON. PRIME MINISTER

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Handover of Lands Belonging to People in Semmalai, Mullaitivu

Corruption Charges Against Cricket in Sri Lanka

FALSE MEDIA REPORTS ON DESTRUCTION OF ARCHEOLOGICAL SITES:

Statement by Minister of Higher Education and Cultural Affairs

DEFAMATORY MEDIA REPORTS:

Statement by Minister of Development Strategies and International Trade

OFFICE FOR REPARATONS BILL:

Read a Second, and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:

Acquisition of Land for Tech City Development Project in Homagama

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2018 ඔක්තෝබර් 10 වන බදාදා***
*2018 ஒக்ரோபர் 10, புதன்கிழமை*
*Wednesday, 10th October, 2018*

**අ.භා.1.00ට පාර්ලිමේන්තුව රැස්විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப 1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

# නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2018 ඔක්තෝබර් මස 10 වන බදාදා, එනම් අද දින අපර භාග 3.00ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලුදෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රේගුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2016 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2015 වර්ෂය සඳහා ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රතිසන්ධානය හා උතුර හා නැඟෙනහිර නැවත ගොඩ නැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

Hon. Deputy Speaker, I present the Report of the Sectoral Oversight Committee on Economic Development on,

(i) Regulations under Section 20 of the Imports and Exports (Control) Act, No. 1 of 1969;

(ii) Annual Performance Report of the Galle Heritage Foundation for the year 2015;

(iii) Annual Report of the Public Utilities Commission of Sri Lanka for the year 2016; and

(iv) Performance Report of the Ministry of Special Assignments for the year 2017 which were referred to the said Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය (කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Chandrani Bandara - Minister of Women and Child Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුරාධපුරය, කල්ලංචිය, ගෝනෑව යන ලිපිනයෙහි පදිංචි සුසන්ත කුමාර පියසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා (තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித தெவரப்பெரும - வலுவாதார அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் பிரதேச அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Palitha Tewarapperuma - Deputy Minister of Sustainable Development, Wildlife and Regional Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මහරච්චිමුල්ල, නුගවෙල, "ප්‍රදීප් සෙවන" යන ලිපිනයෙහි පදිංචි එච්.එම් කුසුමාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) මෝල්කාව, කපුගෙදර, කරව්ව යන ලිපිනයෙහි පදිංචි පී.ජී. ජනක පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) අගලවත්ත, කෙලින්කන්ද යන ලිපිනයෙහි පදිංචි පියසිරි රණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රනාල, නවගමුව දකුණ, අංක 533/2 දරන ස්ථානයේ පදිංචි අයි.එම්. රෝහිත ගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පේරාදෙණිය, උඩරියගම, ප්‍රගති මාවත, අංක 35 බී/2 දරන ස්ථානයේ පදිංචි එම්.කේ.බී. හේරත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මා අසනු ලබන ප්‍රශ්නය මෙයයි:

(අ) මේ වන විට සමස්ත දිවයින තුළ අලි - මිනිස් ගැටුම හේතුවෙන් මියගොස් තිබෙන මිනිස් ජීවිත සංඛ්‍යාව විශාල ප්‍රමාණයකි. එමෙන්ම මියගිය වන අලි සහ ඇතුන් ප්‍රමාණයද බොහෝ ඉහළ ගොස් තිබෙනවා. ඒ සඳහා ඔබතුමාගේ ආණ්ඩුව ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

(ආ) වන අලි ගම් වැදුණු විට එම වන අලින් වනජීවී කලාප වෙත නැවත පන්නා දමන ලෙස වනජීවී දෙපාර්තමේන්තුවට පැමිණිලි කළ විට ඔවුන් පහත දුෂ්කරතා දන්වා සිටිනවා. ඒ සඳහා ඔබතුමාගේ රජයට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

(i) ප්‍රමාණවත් සේවක පිරිසක් නොමැති වීම.

ඊළඟ එක අවශ්‍ය රථ වාහන, ඉන්ධන නොමැතිකමයි. ඒ වාගේම මිනිස් ජීවිත 4ක් හෝ 5ක් නැති කළාට පස්සේ තමයි මේ වන අලි රැගෙන යෑමේ ක්‍රියාදාමය සිද්ධ වෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම මේ පිළිබඳව ඔබතුමාගේ රජය ගෙන තිබෙන විසඳුම් මොනවාද කියන එක මා දැන ගන්න කැමැතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට යොමු කර තිබෙන ප්‍රශ්න දෙස බැලුවාම ඇත්ත වශයෙන්ම සමහර ප්‍රශ්න ඇමතිවරුන්ගෙන් අහන්න වුවමනා ප්‍රශ්නයි. මොකද, ඒ කරුණු ඒ අමාත්‍යාංශයට අදාළ ඒවා නිසායි. සාමාන්‍යයෙන් ජාතික ප්‍රතිපත්තියක් හැටියට මට ප්‍රකාශ කරන්න පුළුවන්. නමුත් සමහර කාරණා සම්බන්ධයෙන් ප්‍රශ්න අදාළ ඇමතිවරුන්ටම යොමු කරලා ඒ ඇමතිවරුන්ගෙන්ම පිළිතුරු ලබා ගන්න තිබෙනවා. දැන් මේ මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නයත් මා හිතන හැටියට ඒ ක්‍රමවේදයටයි යටත් වෙන්නේ. කෙසේ හෝ මා කියන්න කැමැතියි, 2018 ඔක්තෝබර් මස 05 දින වනවිට වන අලි 218කුත්, මිනිස් ජීවිත 80කුත් අහිමිවෙලා තිබෙනවාය කියලා. වන අලින්ගේ පැමිණීම වැළැක්වීම සඳහා දිස්ත්‍රික්ක 17ක් තුළ කිලෝමීටර් 4,349ක දිගින් යුතු විදුලි වැට පද්ධතියක් ඉදි කරලා තිබෙනවා. දැනට කිලෝමීටර් 7,000ක විදුලි වැට පද්ධතියක් අමාත්‍යාංශයෙන් ඉදි කරගෙන යන්න ක්‍රියා කරගෙන යනවා. ඒ එක්කම ජන ජීවිතයට පීඩාවන ආකාරයට හැසිරෙන වන අලින් පුනරුත්ථාපනය කිරීම සඳහා රැඳවුම් මධ්‍යස්ථාන ඉදි කිරීමට රජය කටයුතු කරගෙන යනවා. දැනටම හොරොව්පතානේ රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදි කරලා තිබෙනවා. තව මධ්‍යස්ථානයක් ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ ඉදි කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම 2018 අගෝස්තු මස සිට නිකුත් කරන අලි වෙඩි ප්‍රමාණය සියයට 50කින් වැඩි කර තිබෙනවා. මේ එක්කම දැනට පවතින මිනිස් බල හිඟය නිසා සිවිල් ආරක්ෂක භටයින් 1,675ක් අනුයුක්ත කරලා තිබෙනවා. ඒ ප්‍රමාණය වැඩි කරන්නත් බලාපොරොත්තු වනවා. ඊට අමතරව සිවිල් ආරක්ෂක භටයින් අලුතින් බඳවා ගන්නත් ඇමතිතුමා විසින් ක්‍රියා කරගෙන යනවා. ඉන්ධන නොමැතිකම යනාදී වනජීවී දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න පිළිබඳව ඇමතිතුමා එක්ක සාකච්ඡා කරන්න. ජාතික ප්‍රතිපත්ති අනුව අපි මෙහෙමයි ක්‍රියාත්මක කරන්නේ.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

මට අතුරු ප්‍රශ්න දෙකක් අහන්න තිබෙනවා. මේ ප්‍රශ්න දෙක පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඔබතුමා විශාල මුදලක් වියදම් කරලා දිගු කරන්න බලාපොරොත්තු වන අලි වැට පිළිබඳව අවුරුදු 30ක් තිස්සේ භාවිතා කරන්නේ එකම energizer එකක්. ඇත්තටම මීට වඩා හොඳ තාක්ෂණික ක්‍රම තිබෙනවා. එක තාක්ෂණික ක්‍රමයක් තමයි, Wi-Fi zones.

ඔබතුමා Wi-Fi පැත්ත දිරිමත් කිරීම එක්ක මේක ඉතාම වැදගත් වනවා. එතැනදී එහෙම දෙයක් සිද්ධ වන්නේ නැහැ.

අනික් කාරණය, අලි වැටේ කණුව අඩි අට හමාරක් තිබුණා. පොළොවට යට කරන්නේ අඩි එක හමාරයි. මේ අඩි අට හමාරේ කණුවත් ටෙන්ඩර් කමිටුව විසින් අඩි හත හමාර කරලා තිබෙනවා. මේක අසාර්ථකයි. මේ කාරණය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මා කරනවා. මේ ටෙන්ඩර් කමිටුව පිටු පස්සේ ලොකු දූෂණයක් සිද්ධ වනවා. ඒ වාගේම මේ සම්බන්ධයෙන් කිසිම තාක්ෂණික දැනීමක්, විශ්වවිද්‍යාලයක උපදේශයක් ලබා ගන්නේ නැහැ. ටෙන්ඩර් කමිටුව මඟින් සිදු කරන දූෂණය තුළ මේ අලි වැට කඩා වැටෙනවාය කියන එකයි මම විශේෂයෙන්ම කියන්නේ. ඔබතුමා බලන්න, පෞද්ගලික අලි වැටවල් කඩාගෙන අලි එන්නේ නැහැ.

හැබැයි, මේ අලි වැට කැඩෙන ක්‍රමයටමයි ගහලා තිබෙන්නේ. එක කම්බියක් ගහනවා, එක දුරකින්. Earth wire එක දමනවා, ඊට පිටුපසින්. අඩි එකහමාරක් පොළොව යටට වැළලීමත්, ඒ වාගේම අලි වැටේ කණුව කොට කිරීමත්, ඒ වාගේම මේ කම්බි දෙකෙහි පිහිටීමත් මත මේ අලි වැට අසාර්ථක වෙලා තිබෙනවා. මේ සඳහා ඔබතුමන්ලාගේ රජය යම් මුදලක් වියදම් කරන්න යනවා නම්, ඒක අසාර්ථක කාරණයක්ය කියන එක විශේෂයෙන්ම මා සිහිපත් කරනවා. ඒ නිසා මේ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද කියන එක මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කරුණු ගැන දැන ගෙන ඉන්නේ ඇමතිතුමායි. ඒ නිසා මම මේ කාරණය ඇමතිතුමාට යොමු කරන්නම්. මම හිතන විධියට මෙම කරුණු ගැන ඇමතිතුමා එක්ක තමයි සාකච්ඡා කළ යුත්තේ. ඒ වාගේම පාර්ලිමේන්තුවේ කාරක සභා තිබෙනවා. ඒ කාරක සභා තුළ මේ කරුණු ගැන සාකච්ඡා කරන්න කියන එකයි මම යෝජනා කරන්නේ, මන්ත්‍රීතුමනි. මොකද, ඇත්තවශයෙන්ම මේ සම්බන්ධ කරුණු මා ළඟ නැහැ. ඇමතිතුමාගෙන් තමයි මේ ගැන විස්තර ලබා ගන්න තිබෙන්නේ. මම මේ ප්‍රශ්නය ඇමතිතුමාට යොමු කරන්නම්, මන්ත්‍රීතුමනි.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

ගරු අගමැතිතුමනි, මෙතැන මාෆියාවක් සිද්ධ වෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් විශේෂයෙන් ඔබතුමා අවධානය යොමු කරන්න. ඒ වාගේම මේ වනවිට අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ මිනිස් මරණ 20ක් සිද්ධ වෙලා තිබෙනවා. මේ මාසය ඇතුළත මරණ පහක් සිද්ධ වෙලා තිබෙනවා. සිදු වී තිබෙන දේපළ හානි සංඛ්‍යාව 200කට වැඩියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! ගරු මන්ත්‍රීතුමනි, මේක තාක්ෂණය පිළිබඳ ගැටලුවක් නිසාත්, ගරු අග්‍රාමාත්‍යතුමාට මේ සම්බන්ධව උත්තරයක් දෙන්න බැරි නිසාත් කරුණාකර මෙම ප්‍රශ්නය ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කරන්න. ඊට අමතරව Sectoral Oversight Committee එක තිබෙනවා. එහිදී මේ ගැන කථා කරන්න.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා මට කථා කරන්න පොඩ්ඩක් ඉඩ දෙන්නකෝ.

ගරු අගමැතිතුමනි, පසුගිය වසර ගණනාව දිහා බැලුවාම මිනිස් ජීවිතවලට සිදු වුණු හානිය වේගයෙන් වැඩි වී තිබෙන බව පෙනී යනවා. මෙයින් අංක එකට තිබෙන්නේ පොළොන්නරුව. ඒ, ජනාධිපතිතුමාගේ දිස්ත්‍රික්කය. මේ වෙනකොට මිනිස් මරණ විස්සක් සිදුවෙලා තිබෙනවා. අලි නිසා සිදුවන හානියේ වැඩිවීමක් දිගින් දිගටම සිද්ධ වෙනවා. ඒ නිසායි, අපි මේ ගැන ඔබතුමාට කියන්නේ. මේක සුළුපටු කාරණයක් නොවෙයි. මේ මාසය තුළ පමණක් පොළොන්නරුවේ මිනිස් ජීවිත 5ක් බිලිගත්තා. ඒ නිසා ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න.

මේ වන විට දිස්ත්‍රික්ක 25න් වැඩි වශයෙන් මිනිස් ජීවිතවලට හානි වෙලා තිබෙන්නේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ. සංඛ්‍යාත්මකව ගත්තාම, සමස්ත දිවයිනේම අලින්ගෙන් සිදුවන හානි නිසා අහිමි වන මිනිස් ජීවිත ප්‍රමාණයත්, අහිමි වන අලින්ගේ ප්‍රමාණයත් මේ වන විට වේගයෙන් වැඩි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම අගමැතිතුමාට මේ ප්‍රශ්නය යොමු කළේ, මෙයට රජයක් විධියට ක්‍රියාත්මක වීම, මැදිහත්වීම ඉතා වැදගත් වන නිසායි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමනි, තාක්ෂණ ප්‍රශ්න ඇමතිතුමාට යොමු කරන්න.

ගරු මන්ත්‍රීතුමනි, වැඩිම අලි ගහනය තිබෙන්නේ පොළොන්නරුව, අම්පාර, මොනරාගල, හම්බන්තොට වැනි ප්‍රදේශවලයි. විශේෂයෙන්ම කැලෑ ඉඩම් ගොවිතැනට යොදා ගත් නිසා අලින්ට ගමන් කරන්න තිබෙන මාර්ගයේ අවහිර තිබෙනවා. එම නිසා, මේ ප්‍රශ්නය කොහොමද විසඳන්නේ කියන කාරණය ගැන තමයි අපේ අවධානය යොමු වෙලා තිබෙන්නේ. ඒ ගැන තමයි ඇමතිතුමා ක්‍රියා කරගෙන යන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 2, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පහත ප්‍රශ්නය අසනවා.

(i) 2015 අතුරු අය වැය යෝජනාවට අනුව රාජ්‍ය සේවකයන් සඳහා රුපියල් 10,000/-ක මූලික වැටුප් වැඩිවීමක් ලබා දුන් බවත්, විශ්‍රාමිකයන් සඳහා රුපියල් 1,000/-ක වැටුප් වැඩිවීමක් ලබා දුන් බවත් ඔබතුමා දන්නේ ද?

(ii) ඉහත යෝජනාව අනුව 2015න් පසුව විශ්‍රාම ගන්නා විශ්‍රාම වැටුප් හිමි රජයේ සේවකයන් වැඩි විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් කියන අතර, 2015 වසරට පෙර විශ්‍රාම ලැබූවන් ලබා ගන්නේ ඊට සාපේක්ෂව අඩු විශ්‍රාම වැටුපක් බැවින්, මෙම දෙපිරිසම සමාන විශ්‍රාම වැටුප් තලයකට ගෙන ඒම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග කවරේද?

(iii) නො එසේනම් ඒ මන්ද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 අතුරු අය වැය යෝජනා අනුව රාජ්‍ය අංශයේ සේවය කරන නිලධාරීන්ට නව වැටුප් වැඩිවීමක් ලබා දීමට තීරණය කළා.

එයට සමගාමීව විශ්‍රාමිකයන් සඳහාත් රුපියල් දහසක වැටුප් වැඩිවීමක් ලබා දුන්නා.

2016 ජනවාරි මස 01වැනි දින සිට රාජ්‍ය සේවය සඳහා නව වැටුප් පරිමාණයක් ලබා දුන්නා. ඒ අනුව රුපියල් 10,000කින් සියලු රජයේ සේවකයන්ගේ මූලික වැටුප වැඩි කළා.

ඒ වාගේම, 2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් රුපියල් 1,000කින් වැඩි කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 වර්ෂයට කලින් විශ්‍රාම ගත් විශ්‍රාමිකයන්ට මෙම වැටුප් වැඩිවීම සම්බන්ධයෙන් ඇති වුණු ගැටලුවට සහන සලසන්න ඇති හැකියාව පිළිබඳව මේ වන විට රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ සඳහා විවිධ යෝජනා ඉදිරිපත් වී තිබුණත් මේ දක්වා අවසන් තීරණයකට එළඹී නැහැ.

රජයේ සේවකයන්ට වැටුප් ගෙවීම සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 750ක් පමණ වැය කරනවා. විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 200කට අධික මුදලක් වැය කරනවා.

විශ්‍රාමිකයන්ට රාජ්‍ය හා පෞද්ගලික බැංකු මඟින් ණය ලබා ගැනීමටත් පහසුකම් සලසා දී තිබෙනවා. ඒ අනුව, විශ්‍රාමිකයන් 145,000කට පමණ රුපියල් බිලියන 75කට අධික ණය මුදල් ප්‍රමාණයක් ලබා දී තිබෙනවා.

මීට අමතරව විශ්‍රාමිකයන්ට හිමි නොවූ අග්‍රහාර රක්ෂණ ක්‍රමයද ඔවුන්ට දැන් ලබා දී තිබෙනවා. ඒ අනුව 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලැබූ රජයේ සේවකයන්ට මෙම රක්ෂණ හිමිකම් ලබා ගන්න පුළුවන්. ඊට පෙර විශ්‍රාම ලැබූ අයටත් අග්‍රහාර රක්ෂණය ලබා දීමට දැන් සාකච්ඡා කරගෙන යනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

රජයේ සේවකයන් ලක්ෂ 14කට පමණ එකවර රුපියල් 10,000ක් වැඩි කිරීමෙන් අවුරුද්දකට රුපියල් බිලියන 168ක පමණ මුදලක් එකවර වැය කිරීමට රජය තීරණය කර තිබුණා. සාමාන්‍යයෙන් එම මුදල වැය වෙනවා.

වර්තමාන අර්බුදයටත් ඒ විධියට එකවර පඩි වැඩි කිරීම බලපා තිබෙනවා කියලා හිතෙන්න පුළුවන්. 2015න් පසු විශ්‍රාම යන අයට රුපියල් 1,000ක් -රුපියල් බිලියන 168ක්- වැඩිපුර ලබා දෙන කොට, ඊට කලින් විශ්‍රාම යන අයටත් රුපියල් 1,000ක් වැඩි කිරීමෙන් ආර්ථිකයට ලොකු පාඩුවක් වුණත්, එය දරාගන්න පුළුවන් කියන එක තමයි අපි විශ්වාස කරන්නේ.

ඒ විශ්‍රාමිකයන්ටත් සහනයක් දෙන්න ඉදිරි අය වැයෙන්වත් ක්‍රියාමාර්ග ගන්න අපට පුළුවන්ද කියන එක තමයි මගේ අතුරු ප්‍රශ්නය.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මම ඒ ප්‍රශ්නය අදාළ අංශවලට යොමු කරන්නම්. සාකච්ඡා කර බලා මොකක්ද ගන්න පුළුවන් පියවර කියලා පසුව දැනුම් දෙන්නම්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මුල් ප්‍රශ්නයටම කෙළින්ම සම්බන්ධ නොවුණත් ටිකක් සම්බන්ධයි. රජයේ සේවකයන්ට ලබාදෙන vehicle permit එක රටේ තිබෙන වර්තමාන තත්ත්වය හමුවේ නතර කරලා තිබෙනවා. කාලානුරූපීව ඒ වාගේ තීන්දුවක් ගැනීම පිළිබඳව ගැටලුවක් නැහැ. නමුත්, සමහර රජයේ සේවකයන් ඉන්නවා, ඔවුන්ට ලැබෙන vehicle permit එක විකුණලා තමයි ඔවුන්ගේ දරුවන් උසස් අධ්‍යාපන කටයුතු වලට යොමු කරන්නේ. එහෙම නැත්නම් ඒ vehicle permit එක විකුණලා ලැබෙන මුදලින් ස්ථිර තැන්පතුවක් දමාගෙන ඒ ආදායමින් ඒ කටයුතු කරනවා. එම නිසා පළමුවැනි වතාවට vehicle permit එක ලබා ගන්නා රජයේ සේවකයන්ට විතරක් එයින් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් විධියට යම් කිසි සහනයක් සලසන්න පුළුවන්ද? දෙවැනි, තුන්වැනි වතාවට vehicle permit එක ලබාගන්නා අයට සහනයක් නොදුන්නත්, පළමුවැනි වතාවට ලබාගන්නා අයටවත් සහනයක් දෙන්න පුළුවන්ද කියන එක තමයි මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

දැන් ලංකාවේ විතරක් නොවෙයි, රටවල් ගණනාවක විනිමය පිට රටවලට ගලාගෙන යෑම සීමා කරගන්න පියවර අරගෙන තිබෙනවා. මේ ප්‍රශ්න විසඳුණාට පස්සේ තමයි අපට මේවා ගැන සලකා බලන්න වෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 3 ගරු චාල්ස් නිර්මලනාදන් මහතා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ பிரதம அமைச்சர் அவர்களிடம் இந்தக் கேள்வியைக் கேட்க அனுமதித்ததற்கு நன்றி. அகில இலங்கை ரீதியில் இலங்கை நிர்வாக சேவை தரம் III போட்டிப் பரீட்சை 2017ஆம் ஆண்டு செப்ரம்பர் மாதம் 17, 24, 25 ஆகிய திகதிகளில் நடைபெற்றது. அப்பரீட்சை நடைபெற்று ஒரு வருடம் முடிவடைந்த நிலையில், அப்பரீட்சைக்குரிய பெறுபேறுகள் வெளியிடப்பட்டும் இதுவரையில் நேர்முகத்தேர்வு இடம்பெறவில்லை. நான் அறிந்த வகையில் இலங்கை வாழ் தமிழ் மக்களின் இன விகிதாசாரத்திற்கு அதிகமாகத் தமிழர்கள் இந்தப் பரீட்சசையில் சித்தியடைந்த காரணத்தினால் இந்தப் போட்டிப் பரீட்சையை இரத்துச் செய்வதற்கு பொதுநிர்வாக அமைச்சு முயற்சியெடுத்து வருவதாக அறிகின்றேன். இதேபோன்று 2017ஆம் ஆண்டு இலங்கைக் கணக்காளர் சேவைக்கான போட்டிப் பரீட்சை நடைபெற்றிருந்த நிலையில், 6 மாதங்களின் பின்பு, வினாத்தாள்கள் ஏற்கனவே வெளியாகிவிட்டதாகப் பொய்க் காரணம் கூறி, அந்தப் போட்டிப் பரீட்சையினை இரத்துச் செய்தார்கள். இந்தப் போட்டிப் பரீட்சையிலும் இன ரீதியாகத் தமிழர்கள் அதிகமாகச் சித்தியடைந்ததன் காரணத்தினாலேயே இந்தப் பரீட்சையை இரத்துச் செய்தார்கள். இந்த வகையில், 2017ஆம் ஆண்டு செப்ரம்பர் மாதம் 17, 24, 25 ஆகிய திகதிகளில் நடைபெற்ற இலங்கை நிர்வாக சேவை தரம் III போட்டிப் பரீட்சையினையும் இரத்துச் செய்வதற்குரிய முயற்சியை நிறுத்தி, குறித்த பரீட்சையில் சித்தியடைந்த வர்களை உள்வாங்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கௌரவ பிரதம அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், இலங்கையில் தமிழர்களுடைய கல்விச் செயற் பாடுகளை ஒடுக்குவதற்குரிய நடவடிக்கைகளை முன்னைய ஆட்சியாளர்கள் மேற்கொண்டதைப் போன்று தங்களுடைய ஆட்சியிலும் நடைபெறாதிருப்பதற்குத் தாங்கள் நடவடிக்கை எடுக்க வேண்டும் என்றும் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාවගේ උසස්වීම්, ඔවුන් ඉදිරියට යෑම නවත්වන්න අපට ඕනෑ නැහැ. අපිත් කැමැතියි, වැඩි සංඛ්‍යාවක් එකතු වනවාට. මේ ප්‍රශ්නයත් දැනට පාර්ලිමේන්තුවේ සාකච්ඡා කර තිබෙනවා. මේ විභාග සම්බන්ධ කරුණු හොඳින්ම දන්නේ විභාග දෙපාර්තමේන්තුව අයත් අමාත්‍යාංශය භාරව කටයුතු කරන ගරු අධ්‍යාපන ඇමතිතුමායි. එතුමා මේ ගැන විටින් විට කරුණු කියා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමා මේ පිළිබඳව දන්නවා. මොකද, මෙතැනට රාජ්‍ය සේවා කොමිසමත් සම්බන්ධ වෙලා තිබෙන නිසා. 2017 සැප්තැම්බර් 17, 23 සහ 24 වන දින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියට බඳවා ගැනීමේ තරග විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පැවැත්වූවා.

මෙම විභාගය, සැප්තැම්බර් 24 වන දින පවත්වන ලද "සාමාන්‍ය බුද්ධිය" විෂයට අදාළ ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න කිහිපයක් විභාගයට පෙර ප්‍රසිද්ධියට පත්වීම හේතුවෙන් එම ප්‍රශ්න පත්‍රය පමණක් අවලංගු කළා. ඒක විභාග දෙපාර්තමේන්තුවෙන් කළේ. නැවත වතාවක් 2018 පෙබරවාරි 17 වැනි දා එම විෂය සඳහා විභාගය පැවැත්වූවා. මෙම විභාගයේ ප්‍රතිඵල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී නිකුත් කිරීමට නියමිතයි. එක ප්‍රශ්න පත්‍රයක් පමණක් අවලංගු කරලා, පසුව ඒ සඳහා නැවත විභාගයක් පවත්වා තිබෙනවා. එහි ප්‍රතිඵල නිකුත් කරන්න පමණයි තිබෙන්නේ. ඒක විභාග දෙපාර්තමේන්තුවෙන් ගත් තීරණයක්. මම හිතන විධියට ඒ පසුබිම ගැන හොඳටම දන්නේ අපේ අධ්‍යාපන ඇමතිතුමා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීමට 2017 වසරේ අප්‍රේල් මස කොළඹ හා යාපනයේ දී විභාග පැවැත්වූවා. එම විභාගය සම්බන්ධයෙන් අයදුම්කරුවන් රාශියක් විසින් කරන ලද පැමිණිලි විභාග කිරීමට පත් කරන ලද විශේෂඥ විමර්ශන කමිටු වාර්තාව අනුව එම විභාගය අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණයක් ගෙන තිබෙනවා. අමාත්‍යාංශයෙන් නොවෙයි. මේක ස්වාධීන කොමිසමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව තවත් අයදුම්කරුවන් පිරිසක් විසින් මේ සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කර තිබෙනවා. එහිදී ඉදිරිපත් වුණු කරුණු අනුව අභියාචනාධිකරණය විභාගය අවලංගු කිරීමේ තීරණය පිළිගෙන නඩුව නිෂ්ප්‍රභා කොට තිබෙනවා. ඒක

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

අධිකරණය විසින් දෙනු ලැබූ තීරණයක්. ඒ නිසා අපේ ගරු මන්ත්‍රීතුමාට මා විශේෂයෙන්ම යෝජනා කරනවා, මේ සම්බන්ධයෙන් අදාළ ඇමතිතුමන්ලා දෙදෙනා සමඟ සාකච්ඡා කරන්න කියලා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Do you have any Supplementary Questions?

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Yes.

අරස නිර්වාක අමෛච්සර් අවර්කළ් තර්පොළුතු සපෛක්කුළ් වන්තුකොණ්ටිරුක්කින්රාර්. ඉව්විටයත්තෛ නාන් අවරුටෛය කවනත්තිර්කුම් කොණ්ටු වරුකින්රේන්. කෛරව පිරතම අමෛච්සර් අවර්කළේ, 2001 - 2002 කාලප්පකුතිකළිල් අප්පෝතෛය අරසාන්ක්කත්තිර්කුම් තමීළීළ විටුතලෛප් පුලිකළිනුටෛය තලෛවරුක්කුමිටෛයිල් ඔර් උටන්පටික්කෛ ඒර්පටුත්තප්පට්ටු, කෛතිකළ් පරිමාර්ත්තම් නටෛපෙර්රතු. අප්පොළුතුම් තාන්කළ්තාන් ඉන්ත නාට්ටිනුටෛය පිරතමරාක ඉරුන්තීර්කළ්; පයන්කරවාතත් තටෛච් චට්ටමුම් නටෛමුරෛයිලිරුන්තතු. කෛරව පිරතම අමෛච්සර් අවර්කළේ, තර්පොළුතු ඉලන්කෛයිල් 107 අරසියල් කෛතිකළ් සිරෛයිල් වාටුකින්රාර්කළ්. අවර්කළුක්කුරිය තීර්වෛ අරසියල් රීතියාක එටුක්ක වේණ්ටුමෙන්පතෛ නාන් ඉන්ත ඉටත්තිල් වලියුරුත්ත විරුම්පුකින්රේන්. මේතකු ජනාතිපති අවර්කළ්, කෛරව පිරතමරාකිය තාන්කළ්, කෛරව නීතියමෛච්සර් අවර්කළ් මර්රුම් චට්ට මා අතිපර් ආකිය නාන්කු පේරුම් ඔරේ මේසෛයිල් අමර්න්තු පේසි, අවර්කළුක්කුරිය තීර්වෛ අරසියල් රීතියාක මුන්වෛක්ක වේණ්ටුමෙන්රු නාන් කෝරික්කෛ විටුක්කින්රේන්.

කෛරව පිරතම අමෛච්සර් අවර්කළේ, කට්චි පේතමිල්ලාමල් සකල පාරාළුමන්ර උරුප්පිනර්කළුම් තමිෆ් අරසියල් කෛතිකළ් චාර්පාන පේච්සුවාර්ත්තෛයිල් කලන්තු කොළ්වතර්කුත් තන්කළාල් ඒර්පාටු සෙය්තුකොටුක්ක මුටියුමා? එන්රු නාන් ඉන්නේරත්තිල් උන්කළිටම් කේට්ක විරුම්පුකින්රේන්. ඒනෙන්රාල්, ඒර්කනවේ ඉප්පටියාන ඔරු විටයම් තන්කළුටෛය ආට්චික් කාලප්පකුතියාන 2001 - 2002 කාලප්පකුතිකළිල් නටෛපෙර්රිරුක්කිරතු. අප්පෝතුම් නාට්ටිල් පයන්කරවාතත් තටෛච්චට්টම් අමුලිල් ඉරුන්තතු. තර්පොළුතු පිරපාකරන් ඉල්ලෛ. ඉරුප්පිනුම්, ඉන්තප් පාරාළුමන්රත්තිල් ඉරුක්කින්ර තන්කළුටෛය කට්චියෛච් චාර්න්ත අමෛච්චර්කළ්කූට, ඉතෛක් කොඤ්චම් අමුත්තිච් චොල්ලුන්කළෙන්රු එන්කළිටම් චොල්කිරාර්කළ්. ආකවේ, කෛරව පිරතමර් අවර්කළේ, ජනාතිපතියුම් තාන්කළුම් නීතියමෛච්චරුම් චට්ට මාඅතිපරුම් ඔරේ මේසෛයිල් අමර්න්තු ඉතර්කුරිය අරසියල් තීර්වෛ එට්ටුවතර්කුත් තන්කළාලාන මුයර්චියෛ එටුක්කවේණ්ටුමෙන්රු කේට්ටුක්කොළ්කින්රේන්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය එතුමා කලින් අසන ලද ප්‍රශ්නයට අදාළ නැහැ. මා දන්නා හැටියට 2001දී සමහර එල්ටීටීඊ සැකකරුවන් අපි නිදහස් කර තිබෙන්නේ විශේෂයෙන්ම ඒ අයට තිබුණු චෝදනා බරපතළ චෝදනා නොවුණු නිසායි. ඊට පසු ආණ්ඩුවත් විටින් විට ඒ අය නිදහස් කර තිබෙනවා. 2015 වර්ෂයෙන් පසුවත් අපි විශාල පිරිසක් නිදහස් කර තිබෙනවා. මේ 100දෙනාගෙන් සමහර අය දැනට උසාවියෙන් දඬුවම් ලබා තිබෙනවා. මම හිතන විධියට ඒ සාතන සම්බන්ධයෙනුයි. අනික් අයට නඩු තිබෙනවා. මේ කාරණාවලට තමන්ගේ සම්බන්ධකමක් තිබුණේ නැහැ කියා මේ සමහර අය ඉල්ලීම් කර තිබෙනවා. ඒවා ගැනත් සලකා බලා අපි මේ ගැන යළි සාකච්ඡා කරන්නම්. මේ ප්‍රශ්නය අධිකරණ ඇමතිතුමියටයි යොමු කරන්න ඕනෑ. එතුමිය අද ලංකාවේ නැහැ.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මගේ second Supplementary Question එක ඇසීමේ අවස්ථාව Chief Opposition Whipට ලබාදෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු අගමැතිතුමනි, අපේ චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා පළමුවෙන්ම ප්‍රශ්න කළේ පරිපාලන සේවා විභාගය පිළිබඳවයි. ඒක විභාග දෙපාර්තමේන්තුවත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් ගත් තීන්දුවක්ය කියා ඔබතුමා කිව්වා. ඔබතුමාත් දන්නවා, මේ රටේ විභාග අවලංගු කළ අවස්ථා තිබෙන බව. ඉන් එක අවස්ථාවක් තමයි, ප්‍රශ්න පත්‍ර පිටවීම නිසා විභාග අවලංගු කිරීම. විභාගය පවත්වද්දි සිදුවුණු අක්‍රමිකතා නිසා තවත් අවස්ථාවලදී විභාග අවලංගු කර තිබෙනවා.

නමුත්, මේ එවැනි අවස්ථාවක් නොවෙයි. ප්‍රතිඵල නිකුත් කරලා, අදාළ පරිපාලන සේවයෙන් ඒ මොහොතේ සුදුසුකම් ලබන කණ්ඩායම තෝරාගෙන, ඒ අයගේ නම් ප්‍රසිද්ධියට පත් කළාට පසුව තමයි විභාගය අවලංගු කරන්නේ. එතකොට සාධාරණ සැකයක් මතු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විභාගය පවත්වපු වෙලාවේ සිදු වූ අක්‍රමිකතා නිසා විභාගය අත් හිටුවීමේදී, ප්‍රශ්න පත්‍ර පිටවීම නිසා විභාගය අත් හිටුවීමේදී නම් කවුරුවත් ප්‍රතිඵල දන්නේ නැහැ. එතකොට ඒක කළේ විභාගයේ යම් අක්‍රමිකතාවක් නිසාය කියන කාරණය සාධාරණ ලෙස පිළිගන්න පුළුවන්. හැබැයි ප්‍රතිඵල නිකුත් කළාට පසුව, ප්‍රතිඵල දැන ගත්තාටත් පසුව, pass වුණු අයගේ නම් ප්‍රසිද්ධ කළාට පසුව, 158කට ආසන්න ප්‍රමාණයක් තෝරා ගත්තාටත් පසුව විභාගය අවලංගු කරනවා. එය කිසිසේත්ම සාධාරණ දෙයක් නොවෙයි. විභාග අවලංගු කිරීම් ඉතිහාසයේදී අපි අත් විඳ තිබෙනවා. හැබැයි ඉතා පැහැදිලි ලෙස ප්‍රතිඵල දැන ගත්තාට පසුව, ඒ අය තෝරා ගත්තාට පසුව විභාගය අවලංගු කිරීම සඳහා තීරණයක් ගන්නේ ඇයි කියන එක පිළිබඳව සාධාරණ සැකයක් මතු වෙනවා. ඒකයි, මෙතැන තිබෙන ප්‍රශ්නය. අසමත් වුණු අය campaign කරනවා. මේ කරපු දෙය සාධාරණ නැහැ. ගරු ඇමතිතුමනි, විභාගය අවලංගු කරන්න කලින්, මේ විභාගය පවත්වපු වෙලාවේ ඔබතුමාට කුමක් හෝ පෙත්සමක් ලැබුණාද? එහෙම නැත්නම්, ඒ ප්‍රශ්න පත්‍ර පිළිබඳව ඔබතුමාට යම් පෙත්සමක් ලැබුණාද? ඒ මොකුත් නැතිව, ප්‍රතිඵල නිකුත් කළාට පසුව විභාගය අවලංගු කිරීම සම්පූර්ණයෙන්ම වැරැදියි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Law and Order)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විභාගය තවම අවලංගු කර නැහැ. මේ සම්බන්ධව විභාග දෙපාර්තමේන්තුවෙන් අපට වාර්තාවක් ලැබෙන්න තිබෙනවා. ඒ වාර්තාව ලැබුණාට පසුව තමයි තීරණය ගන්නේ. කාටවත් අසාධාරණයක් නොවෙන්න අපි කටයුතු කරනවා. යම් පැමිණිල්ලක්, යම් කාරණයක් මත තමයි මේ විධියට එය තාවකාලිකව අත් හිටුවා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු අගමැතිතුමා වෙත ඉදිරිපත් කරන 4වන ප්‍රශ්නය. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මට මේ ප්‍රශ්නය ගරු අගමැතිතුමාටම යොමු කරන්න සිදුවුණේ මේ නිසායි. මේ කාරණය මම අවස්ථා ගණනාවකදීම මේ පාර්ලිමේන්තුවේත්, බොහෝ අමාත්‍යවරුන්ගේත් විමසීමට ලක් කළා. නමුත් එයට පිළිතුරු ලබා දෙන්න අසමත් වී තිබෙනවා. ඒ වාගේම මේ අවස්ථාව වන විට මෙම ප්‍රශ්නය රටේ සාමාන්‍ය ජනතාවගේ ජීවිතවල පැවැත්මට අහිතකර බලපෑමක් ඇති කර තිබෙනවා.

එම නිසා මේ පාර්ලිමේන්තුවේ සිටින අපි පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දැනගත යුතුයි.

(i) ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අළෙවි මිල තීරණය කිරීම සඳහා සකස් කර ඇතැයි ප්‍රකාශ කරනු ලබන මිල සූත්‍රය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ii) තෙල් මිල සූත්‍රය ක්‍රියාත්මක වූයේ කවදා සිටද?

(iii) එම මිල සූත්‍රයට අනුව මේ වන විට කොපමණ අවස්ථා ගණනාවකදී කොපමණ ප්‍රමාණවලින් තෙල් මිල වැඩි කරනු ලැබ තිබේද?

(iv) මෙම සූත්‍රයට අනුව ඩොලරයේ උච්චාවචනය තෙල් මිල ගණනය කිරීමට අදාළ කර ගනු ලබන්නේද?

(v) මෙම තෙල් මිල සූත්‍රය සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන තිබේද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට මේ කාරණය ගැන වැඩිදුරටත් සාකච්ඡා කරලා විවාද කළ යුත්තේ මුදල් අමාත්‍යාංශය සමඟයි. එහෙත් මේ ගැන රජය ප්‍රතිපත්ති, තීරණ කීපයක් මතු කළ නිසා මම කියන්න කැමැතියි, 2018 වසරේ මැයි 11වන දින මේ නව ක්‍රමවේදය හඳුන්වා දුන් බව. ඊළඟට, 2018 ජූලි 10වන දින කැබිනට් තීරණ අනුව, මිල සූත්‍රය මත පදනම්ව තෙල්වල සිල්ලර මිල සංශෝධනය කිරීමට නිලධාරී කමිටුවක් පත් කර තිබෙනවා. ඒ කියන්නේ, ජූලි මාසයේ තමයි මේ කමිටුව පත් කළේ. ඒ අනුව, තෙල් මිල තීරණය වීමේදී ඛනිජ තෙල් ගොඩ බෑමේ පිරිවැය මුළු මෙහෙයුම් පිරිවැයට එකතු වනවා.

මේ සියල්ලම ගත්තාම, ඇත්ත වශයෙන්ම ලංකාවේ සිදු වුණේ තෙල් මිල අඩු වැඩි වනකොට ඒ තීරණ පරිපාලන තීරණ බවට පත් වීමයි, ආණ්ඩුවලින් ඒ තීරණ ගැනීමයි. එහෙත් අද ලෝකයේ තෙල් මිල දිනෙන් දින වෙනස් වෙන්න පුළුවන්; මිල වැඩි වෙන්න පුළුවන්, අඩු වෙන්නත් පුළුවන්. 2015 වර්ෂයේ අප යෝජනා කළේත් තෙල් මිල අඩු වනකොට ඒ වාසිය ජනතාවට ඒම සහ මිල වැඩි වනකොට ඒ අවාසිය අපට ගැනීමයි. ඒ දෙකම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. එහෙම නැත්නම් වෙන්නේ, තෙල් මිල අඩු වනකොට තෙල් මිල අඩු කරන්නේ නැතිව, තෙල් මිල වැඩි වුණාම මිල තවත් වැඩි කරගෙන යෑමයි. මේ අනුව තමයි ඉන්දියාව ආදි රටවල ලෝකයේ තෙල් මිල සමඟම දෛනිකව තෙල් මිල සංශෝධනය කරන්නේ. සමහර රටවල සතියකට වතාවක් එය කරනවා. සමහර රටවල මාසයකට වතාවක් එය කරනවා. අපට දෛනිකව එය කරන්න අවශ්‍ය තාක්ෂණයවත්, ශක්තියවත් නැති නිසා තමයි මේ ක්‍රමවේදයට යන්නේ. මේ යටතේ ලෝකයේ තෙල් මිල අනුව අපේ තෙල් මිල විටින් විට අඩු වෙනවා, වැඩි වෙනවා. ඒකයි විශේෂයෙන්ම අප මෙය කරගෙන යන්නේ. එහෙම නැත්නම්, මිලදී ගන්නා තැන් ආදි ඔක්කෝම ගැන මා විශේෂයෙන් කියනවා නම්- අපට ඒකට බදු ගෙවන්න තිබෙනවා. වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද ආදිය ගෙවන්න තිබෙනවා. Platts ආයතනය විසින් සිංගප්පූරු තෙල් මිල අනුව ප්‍රකාශයට පත් කරනු ලබන MOPS -Mean of Platts Singapore- අගය, අධිභාරය -premium- සහ FOB - Freight on Board - අගයන්ට අනුව මිල තීරණය කරගෙන යනවා. මා හිතන විධියට, මේ ගැන පාර්ලිමේන්තුවේදී මුදල් අමාත්‍යතුමාගෙන් ප්‍රශ්න කර පිළිතුර ලබාගෙන වාද කරන එකයි කරන්න තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අහන්නේ අතුරු ප්‍රශ්න නොවෙයි. ගරු අගමැතිතුමනි, මම නිශ්චිත වශයෙන් ඔබතුමාගෙන් අහපු ප්‍රශ්න කීපයක් තිබෙනවා. පළමුවන එක තමයි, මේ සූත්‍රය සභාගත කරන්නේද කියන එක. එයට "ඔව්" ද "නැහැ" ද කියන උත්තරය ඔබතුමා කියන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
සභාගත කරන්න මා ළඟ ඒ සූත්‍රය නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඊළඟ ප්‍රශ්නය, තෙල් මිල සූත්‍රය ක්‍රියාත්මක වුණේ කවදාද කියන එකයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඇමතිතුමා සමඟ සාකච්ඡා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඊළඟට මා අහනවා, මේ සූත්‍රය ක්‍රියාත්මක වූ දවසේ ඉඳන් මිල වැඩි කරපු අවස්ථා මොනවාද කියා සහ මේකට ඩොලරයේ උච්චාවචනය බලපෑමක් ඇති කරනවාද කියා.

මේ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමතියක් තිබෙනවා ද? ඔබතුමා මේ කාරණයට පිළිතුරක් දුන්නේ නැහැනේ. "ඉන්දියාවේ

[ගරු අනුර දිසානායක මහතා]

මෙහෙම වෙනවා. ලෝකයේ මෙහෙම වෙනවා." කියා ඔබතුමා කිව්වාට වැඩක් නැහැ. මම නිශ්චිත වශයෙන් ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අසා තිබෙනවා. ඔබතුමා අංක 1, 2, 3, 4, 5 ලෙස එම ප්‍රශ්නවලට උත්තර දෙන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
නැහැ. නැහැ. ඔබතුමාට මම කිව්වා, ජූලි මාසයේදී කැබිනට් මණ්ඩලයේ තීරණය අරගෙන -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කැබිනට් මණ්ඩලයෙන් කමිටුවක් පත් කර තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒ තීරණය අරගත්තේ - [බාධා කිරීමක්] නැහැ. නැහැ. අපි කිව්වා, "2018 මැයි මස 09වැනි දින කැබිනට් අනුමතිය ලබා ගෙන තිබෙනවා." කියා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ ක්‍රමවේදයට.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
නව ක්‍රමවේදයට. [බාධා කිරීමක්] මේක අහගන්නකෝ. ඊට පස්සේ ජූලි 10 වැනිදා ඒ සඳහා කොමිටිය පත් කර තිබෙනවා, ඒ සංශෝධනය ක්‍රියාත්මක කරන්නය කියා. ඒ දෙකම ක්‍රියාත්මක වෙලා තිබෙනවා. නීත්‍යානුකූලව කැබිනට් මණ්ඩලයේ අනුමතිය ලැබිලා තිබෙනවා. ප්‍රධාන ප්‍රශ්නයක් හැටියට පිළිතුර දුන්නා. ක්‍රියාත්මක වන දින ටිකත් ඔබතුමාට ලබා දී තිබෙනවා.

ඊළඟට, මිල සූත්‍රය ගනිමු. කී වතාවක් වෙනස් වුණාද කියා මම ලබා දෙන්නම්. ඒකයි මම කිව්වේ, වඩා හොඳයි මේවායේ තාක්ෂණික කරුණු ටික ඇමතිතුමාත් සමඟ සාකච්ඡා කරන එක කියා. මේ ක්‍රමවේදය ගෙනාවායින් පස්සේ සිදු වුණු දේ මම ගරු මන්ත්‍රීතුමාට විශේෂයෙන් මතක් කරන්නට කැමතියි. අද ලෝක තෙල් වෙළඳපොළේ විශාල වෙනසක් වෙලා තිබෙනවා. අද බොර තෙල් බැරලයක් ඇමෙරිකානු ඩොලර් 80යි. අපි දන්නේ නැහැ, ඒක තව වැඩිවේවිද නැද්ද කියා. නොවැම්බර් මාසය වෙනකොට විශේෂයෙන් ඉරානයට විරුද්ධව ඇමෙරිකාව සම්බාධක දැම්මාම එයින් නැතිවන තෙල් ප්‍රමාණය නිෂ්පාදනය කරන්නට පුළුවන්ද කියා ප්‍රශ්නයක් තිබෙනවා. නොවැම්බර් මාසයේ සිට අප්‍රේල් මාසය වෙනකොට ශීත කාලය නිසා තෙල් භාවිතාව වැඩි වෙනවා. මෙතැනදී ලෝකයේ හැම දෙනාම බලාගෙන ඉන්නේ නොවැම්බර් මාසයේ මොකක්ද වෙන්නේ කියායි. සමහරු කියනවා, බොර තෙල් බැරලය ඇමෙරිකානු ඩොලර් 90ට යාවිය කියා. තවත් අය කියනවා, එහෙම යන්නේ නැහැ කියා. කොහොම වුණත් අද තිබෙන විශාලම ප්‍රශ්නය බැලුවාම, ලෝකයේ තෙල් භාවිතාව වැඩි වෙලා තිබෙනවා. ඉරානයට එරෙහිව ඇමෙරිකාව සම්බාධක පැනවීම නිසා තෙල් මිල වෙනස් වෙන්නට පුළුවන්. විශේෂයෙන් යුරෝපීය සමාගම් ඉරානයෙන් තෙල් ගන්න අකමැති වෙලා තිබෙනවා.

ඒ එක්කම දෙවැනි කාරණාව හැටියට එන්නේ ඇමෙරිකානු ඩොලරයයි. ඇමෙරිකානු ඩොලරයේ වටිනාකම වෙනස් වෙනවා. ඇමෙරිකානු ඩොලරය ශක්තිමත් වෙලා, අනෙක් හැම රටවලම මුදලේ වටිනාකම අඩු වෙලා තිබෙනවා. මේ කාරණා දෙක එකතු වෙලා සාමාන්‍යයෙන් දියුණු වන රටවලට එය ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ ගැන සලකා බලා තමයි අපි විශේෂයෙන් පළමුවැනිව, මේකෙන් ආර්ථික වශයෙන් අපි ඉදිරියට යන්නේ කොහොමද; දෙවනුව, ජනතාවට දෙන සහනය කුමක් ද කියාත් තීරණය කරන්නේ.

අද එදා වාගේ ඩොලර් දෙකක් මෙහාට වෙනවා, ඩොලර් එකක් අඩු වෙනවා නොවෙයි. මෙතැන තෙල් සූත්‍රය නොවෙයි, කොයි සූත්‍රය දැම්මත් අද ලෝකය තිබෙන විශාල අර්බුදයට විසඳුමක් කවුරු හෝ ලබා දෙන්න වුවමනායි. සමහරු කියනවා, බොර තෙල් බැරල් එකක මිල ඇමෙරිකානු ඩොලර් 90 වනතෙක් වැඩිවෙන්න පුළුවන් කියලා. තවත් අය කියනවා, බොර තෙල් බැරල් එක ඇමෙරිකානු ඩොලර් 80, 81, 82ට ගියාට පස්සේ අඩු වෙයි කියලා. නමුත්, කාටවත් නිශ්චිත වශයෙන් කියන්න බැහැ. මම පිටරට ගිය වෙලාවේත් නෝර්වේවලින් සහ එංගලන්තයෙන් මේ ගැන ඇහුවාම ඒ කාටවත් තවම නිශ්චිතව කියන්න බැහැ, මොකක්ද වෙන්නේ කියලා. හැම එක්කෙනාම නොවැම්බර් මාසයේ සම්බාධකවලින් පස්සේ මොකක්ද සිද්ධ වෙන්නේ කියලා බලාගෙන ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අතුරු ප්‍රශ්න තිබෙනවා ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නිශ්චිත වශයෙන් ඇහුවේ මෙයයි. අද 10වැනි දා. සෑම මාසයකටම වරක්ම, 10වැනි දා මේ තෙල් මිල නව සූත්‍රයකට අනුව ගළපනවා. මම ගරු මුදල් අමාත්‍යවරයාගෙන් මේ පාර්ලිමේන්තුවේදී අවස්ථා දෙකකදී විමසා සිටියා, මෙම මිල සූත්‍රය පාර්ලිමේන්තුවේ සභාගත කරනවා ද කියලා. ඒ මුදල් අමාත්‍යවරයා සමඟ තවදුරටත් මේ ගැන සාකච්ඡා කිරීමෙන් පළක් නැහැ. එතුමා මේක සභාගත කළේ නැහැ. අනතුරුව තමයි මම අග්‍රාමාත්‍යවරයාගෙන් මේ පිළිබඳව විමසුවේ.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තොරතුරු දැනගැනීමේ පනත යටතේත් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් මෙම මිල සූත්‍රය ඉල්ලා සිටියා. ඒකෙන් දැනුම් දීලා තිබෙන්නෙත්, ලබා දෙන්න බැහැ කියලයි. ඊයේ මුදල් අමාත්‍යවරයාගෙන් මාධ්‍ය විමසන කොට එතුමා කිව්වා, "මම දන්නේත් නැහැ, වෙන මොකක්ද සූත්‍ර කල්ලියක් තමයි මේක කරන්නේ" කියලා. මේ වාගේ විගඩම් උත්තර දෙන්න බැහැ නේ, අමාත්‍යවරයා. හැම මාසයකම 10වැනි දින අපේ ආර්ථිකයට විශාල බලපෑමක් ඇති කරන මේ මිල සූත්‍රය පිළිබඳ නිශ්චිත අදහසක් මේ පාර්ලිමේන්තුව දැනගත යුතුව තිබෙනවා. මට අග්‍රාමාත්‍යවරයාගෙන් දැනගන්න අවශ්‍ය නැහැ, ශීත කාලය පටන් ගන්නේ කවදා ද; ශීත කාලයට ඩීසල් මිල වැඩි වෙනවා ද; ඉරානයේ සම්බාධක මොනවා ද කියලා. ඒවා මෙතැනට අදාළ නැහැ. එතුමා වෙන අවස්ථාවකදී ඒ ගැන කිව්වාට මට කමක් නැහැ. එතුමා කියන මේ දේවල් මගේ ප්‍රශ්නයේ පිළිතුරට අදාළ නැහැ. මම මේ ප්‍රශ්නයෙන් නිශ්චිත වශයෙන් අහන්නේ, "මෙම තෙල් මිල සූත්‍රය සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන

තිබේ ද? එසේ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබෙනවා නම්, එම සූත්‍රය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අගමැතිවරයා කටයුතු කරන්නේ ද?" කියලයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "x", "y", "z", අපගමනය, අනුලෝම, සමානුපාතික මොනවා හෝ දාලා හදපු සූත්‍රයක් අපට ඉදිරිපත් කරන්න කියන්න. එතකොට අපට තේරුම් ගන්න පුළුවන්, "x" කියන්නේ මේකයි; "b" කියන්නේ බැඳුම්කරය; "c" කියන්නේ අර්ජුන කියලා මොකක් හෝ අපට තේරුම් ගන්න පුළුවන්. හැබැයි, කිසි දෙයක් තේරුම් ගන්න බැරිව අපේ ජනතාව ඇයි හැම 10වැනිදාම, ආණ්ඩුව රටට ඉදිරිපත් කරන්නේ නැති සූත්‍රයකට ගණන් ගෙවන්නේ? හැම 10වැනි දාම කියනවා, තෙල් සූත්‍රයෙන් මෙච්චර මුදලක් වැඩි වුණා කියලා. අද රු. තෙල් මිල වැඩි වෙනවා. හැබැයි, ජනතාව අහපුවාම තෙල් සූත්‍රය මොකක්ද කියලා, ඒක ජනතාවට දෙන්නේ නැහැ. ඒ ගැන ඇහුවාට පස්සේ ශීත කාලයක් ගැන කියනවා. ශීත කාලය නම් "x" කියලා දාලා හෝ කමක් නැහැ, මොනවා හෝ දාලා මේ සූත්‍රය හදලා දෙන්න. හැබැයි, අපට මිල සූත්‍රය දෙන්න. මිල සූත්‍රය දෙන්නේ නැති නිසා අද මොකද වෙලා තිබෙන්නේ? මේ මිල සූත්‍රය නිසා හැම 10වැනි දාම ජනතාවට මිල වැඩිවීමක් වෙනවා. එතකොට ජනතාව තමන්ගේ මිල වැඩිවීම දරා ගන්න වෙනවා. හැබැයි, වැඩි වන ආකාරය මොකක්ද කියලා ඇහුවාට අග්‍රාමාත්‍යවරයා හෝ මුදල් අමාත්‍යවරයා හෝ කිසිම කෙනෙක් මේ පාර්ලිමේන්තුවට උත්තර ලබා දෙන්නේ නැහැ.

ඒ නිසා මේ සූත්‍රය මොකක්ද කියලා අපට කියන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදැසන 8.30ට 9.00ට විතර මම ලංකාවට පැමිණියේ. යෝජනාවක් තිබුණා, අද මේ ප්‍රශ්න කල් දමන්න කියලාත්. නමුත් මම කිව්වා, "නැහැ, තිබෙන කරුණු අනුව පිළිතුරු දෙන්නම්" කියලා. ඇත්තටම මට පෙනුණා, සමහර ප්‍රශ්නවලට ඇමතිවරු පිළිතුරු දිය යුතුයි කියලා. කෙසේ හෝ මගේ යුතුකම ඉෂ්ට කරන්නට මම මේ ගරු සභාවට පැමිණියා.

මේ සූත්‍ර ක්‍රමවේද ලංකාවේ විතරක් නොවෙයි ඉන්දියාවෙත් හැමදාම වෙනස් වෙනවා. හැමදාම ඉන්දියාවෙන් අහන්න නැහැ, කොහොමද මේක වෙන්නේ කියලා. දවසක වැඩි වෙනවා, තව දවසක නැවත වැඩි වෙනවා, තව දවසක අඩු වෙනවා. කොහේවත් නිශ්චිත සූත්‍රයක් නැහැ. මුදල් ඇමතිතුමාට මෙතුමාගේ ප්‍රශ්න ටික මම යොමු කරන්නම්.

අනෙක් කාරණය තමයි කුමන සූත්‍රය දැම්මත්, කුමන ක්‍රමවේදය දැම්මත්, ආණ්ඩුව තීරණය කළත් අද ලෝකයේ තෙල් පිළිබඳව අර්බුදයක් තිබෙනවා. ඒ වාගේම ඩොලරය පිළිබඳව අර්බුදයක් තිබෙනවා. මට අමතක වුණු කාරණයක් තිබෙනවා කියන්නට, ඒක කිව්වා කියලා දැන් මට ආපහු බණින්නට ඉඩ තිබෙනවා. අනෙක් අතට ඇමෙරිකාවයි, චීනයයි අතර තිබෙන තීරු බදු යුද්ධයෙනුත් අපට බලපෑම් ඇති වෙන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම ලෝකයේ තෙල් මිල වැඩිවෙලා තිබෙන්නේ ඉන්දියාවෙයි, චීනයේයි ඉල්ලීම නිසායි. චීනයේ ඉල්ලීම අඩු වුණොත් තෙල් මිලට බලපෑමක් සිදු වෙන්නට පුළුවන්. දැනට ඒ ගැන කියන්න අපට බැහැ.

අපි දැනගන්නට ඕනෑ, ආර්ථිකය හසුරුවන්නත්, ජනතාවට සහන ලබා දෙන්නත්. ඒ දෙක අපි පිළිගෙන ඉවරයි. කොහොමද කරන්නේ, මොකක්ද වෙන්නේ කියන එක තීරණය කිරීමට තමයි ආණ්ඩුව තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මට තේරෙනවා, සමහර ප්‍රශ්නවලට උත්තර ලබා ගැනීම ඉබබන්ගෙන් පිහාටු ලබා ගන්නවා වාගේ වැඩක් බව. එම නිසා ඒ අනර්ථ ප්‍රයත්නයේ තවදුරටත් යෙදීමෙන් ඵලක් නැහැ. ආණ්ඩුව මේ සූත්‍රය වසන් කරමින්, රටට ඉදිරිපත් නොකර, හැම මාසයේම 10වෙනි දාට තෙල් වැඩි කිරීමේ සූත්‍රයකට මේ සූත්‍රය උපයෝගි කරගෙන තිබෙන බව පැහැදිලියි.

මම අහන ප්‍රශ්නය මෙයයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යාම සිද්ධ වෙනවා. ඩොලරය මේකට බලපෑමක් ඇති කරනවා. හැබැයි මම අදත් කියනවා, අදටත් පෙට්‍රල් ලීටරයක් වරායෙන් ගොඩබාන විට මිල රුපියල් 81යි. PAL එක ඒ කියන්නේ වරාය හා ගුවන් තොටුපොළ බද්ද ගහනවා, රුපියල් 6.12ක්, Excise Duty එක ගහනවා, රුපියල් 27ක්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. රේගු බද්ද ගහනවා, රුපියල් 35ක්. ඒ කියන්නේ රුපියල් 81ක් වන පෙට්‍රල් ලීටරයට රුපියල් 68.12ක බද්දක් ගහනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම ඩීසල් ලීටරයකටත් රුපියල් 34.58ක බද්දක් තිබෙනවා. තමුන්නාන්සේලා කියන විධියට ඩොලරයේ අගය ඉහළ යනවා නම්, ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යනවා නම් මිල ස්ථාවරව පවත්වා ගැනීම සඳහා මේ බද්දේ යම් වෙනසක් කළ හැකිව තිබෙනවා.

මොකද, කොළඹ වරායෙන් ගොඩබානකොට අදත් පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 81යි. එයට තමුන්නාන්සේලා රුපියල් 68.12ක් බදු එකතු කරනවා. ඒ නිසා තමුන්නාන්සේලාට පුළුවන්කම තිබෙනවා, මේ බද්ද උස් පහත් කිරීම හරහා තෙල් මිල යම් ප්‍රමාණයකට ස්ථාවරව පවත්වාගෙන යන්න. ඒ නිසා පෙට්‍රල් ලීටරයකට රුපියල් 68.12ක බදු අය කිරීම සාධාරණද කියා ගරු අගමැතිතුමාගෙන් මා දැන ගන්න කැමතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා සූත්‍රය දන්නවා නම් මගෙන් අහන්නේ ඇයි? එතුමාටයි, මුදල් ඇමතිතුමාටයි මේ ගැන වාද කරන්න කියන්නම්. හැම රටක්ම ඉන්ධනවලින් බදු අය කරලා තිබෙනවා. මා නෝර්වේ සිටියා. එහි ඉන්ධන නිෂ්පාදනය කරනවා. එය ආණ්ඩුවට ප්‍රධාන බද්දක්. ඒ සූත්‍රයට යන්න ඉස්සෙල්ලාත් බදු අය කළා. දැනුත් බදු අය කරනවා. හැම ආණ්ඩුවක්ම ඉන්ධනවලින් බදු අය කරලා තිබෙනවා. ඒකෙන් යම්කිසි මුදලක් ලැබෙනවා. නමුත් මෙතැන ප්‍රධාන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ බදු නොවෙයි. අද ලෝකයේ අර්බුදය තිබෙන්නේ ඉන්ධන ගැනයි. ඇත්ත වශයෙන්ම 70 සිට 90 දක්වා වැඩි වුණාම මොකද වෙන්නේ? යම්කිසි සහනයක් ජනතාවට දෙන්න තිබෙනවා. අපි නැහැයි කියන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒක දැන ගත්තාම කියන්නම්. ජනතාවටත් සහනයක් දෙන්න තිබෙනවා. සහන නොදී ඉන්න බැහැ. ඒත් දැන් තිබෙන්නේ අලුත් ක්‍රමවේදයක්. දෛනික ක්‍රමයද, පරණ ක්‍රමයද, වෙන සූත්‍රයක්ද කියලා කියා වැඩක් නැහැ. අද තිබෙන්නේ මේ ප්‍රශ්නයට මුහුණ දීලා, රට ඒකට ලැස්ති කරන්නයි. හැම රටක්ම ඒක කරනවා. ඉන්දියාව ඒක කරනවා. ඉන්දුනීසියාව ඒක කරනවා. දැන් බලන්න, නයිජීරියාව. නයිජීරියාව ඉන්ධන නිෂ්පාදනය කරනවා. නමුත් ඉන්ධන මිල වැඩි වනකොට අපටත් වඩා මිල වැඩි වෙනවා. එහෙම වෙන්නේ එහි පිරිපහදුවක් නැති නිසායි. මූලික ප්‍රශ්නයට යන එකයි අපට තිබෙන්නේ. ඉන්ධන මිල වැඩි වෙන්නේ බදු ගත්ත නිසා කියන ඒවා විසඳුම් නොවෙයි. අද රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයට විසඳුම තමයි සොයන්න තිබෙන්නේ.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ඩිජිටල් හැඳුනුම්පත: ඇස්තමේන්තුගත පිරිවැය
### டிஜிட்டல் அடையாள அட்டை: மதிப்பிடப்பட்ட செலவினம்
### DIGITAL IDENTITY CARD: ESTIMATED COST

49/'18

**1. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2016 අයවැයෙහි අංක 187 යෝජනාවෙන් හඳුන්වාදීමට යෝජනා කරන ලද ඩිජිටල් හැඳුනුම්පතෙහි දළ සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

(ii) එම හැඳුනුම්පත නිකුත් කිරීමේ බලධාරියා කවුරුන්ද;

(iii) පුරවැසියන්ට හැඳුනුම්පත් ලබාදීම වෙනුවෙන් ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(iv) එම පිරිවැය දරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(v) 2017 වර්ෂය තුළදී ඩිජිටල් හැඳුනුම්පත් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය අයවැයෙන් වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புக்கள் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தின் 187ஆம் இலக்க முன்மொழிவின் பிரகாரம் அறிமுகப்படுத்துவதற்கு முன்மொழியப்பட்ட டிஜிட்டல் அடையாள அட்டையின் பருமட்டான வடிவமைப்பைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(ii) மேற்படி அடையாள அட்டையை விநியோகிக்கும் அதிகாரி யாரென்பதையும்;

(iii) பிரசைகளுக்கு அடையாள அட்டைகளை விநியோகிப்பதற்காக மதிப்பீடு செய்யப்பட்டுள்ள செலவினம் யாதென்பதையும்;

(iv) அச்செலவினம் யாரால் ஏற்கப்படுமென்பதையும்;

(v) 2017ஆம் ஆண்டில் டிஜிட்டல் அடையாள அட்டைத் திட்டத்தை நடைமுறைப்படுத்துவதற்காக அரசாங்க வரவு செலவுத்திட்டத்திலிருந்து ஒதுக்கப்பட்டுள்ள நிதி ஏற்பாடு எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Telecommunication, Digital Infrastructure and Foreign Employment:

(a) Will he inform this House-

(i) whether he will forward the sketch of the digital identity card proposed to be introduced through proposal No.187 of the 2016 budget;

(ii) the issuing authority of that identity card;

(iii) the estimated cost for providing identity cards to the citizens;

(iv) by which party such cost would be borne; and

(v) the amount allocated from the State budget to implement the digital identity card scheme in 2017?

(b) If not, why?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புகள் அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication, Digital Infrastructure and Foreign Employment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) 2016 අය වැයෙහි අංක 187 යටතේ ජාතික ඩිජිටල් අනන්‍යතාව -National Digital Identity- හඳුන්වාදීම සම්බන්ධයෙන් කර ඇති යෝජනාව පරිදි වඩාත් ඵලදායී ලෙස මුදල් අමාත්‍යාංශය මඟින් ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සම්ප්‍රේෂණය කුටුම්භ ගනුදෙනු කළමනාකරණය - Household Transfer Management System- පිණිස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙහි ව්‍යාපෘතියක් ලෙස මෙම හැඳුනුම්පත මෙරට පුරවැසියන්ට ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණ.

ඩිජිටල් අනන්‍යතාව ජනතාවට ලබා දීමේ ක්‍රම කිහිපයක් තිබෙන අතර, ඒ සඳහා භෞතික කාඩ්පතක් නිකුත් කිරීම එයින් එක් ක්‍රමයක් පමණි. මුල් සැලසුමෙහි භෞතික කාඩ්පතක් සඳහා යෝජනාවක් තිබුණද ප්‍රසම්පාදනයෙහි පියවර ගණනාවක් ගිය පසු ඒ පිළිබඳ නැවත විචාරයක් මඟින් විශේෂිත භෞතික කාඩ්පතක් අත්‍යවශ්‍ය නොවන හෙයින් එම ප්‍රසම්පාදනය අවලංගු කොට කාඩ්පතක් නොමැතිව සෑම පුරවැසියෙකුටම ඩිජිටල් අනන්‍යතාව ලබා දීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී. තවද, සඵලදායී ඒකාබද්ධ ප්‍රවේශයක් සඳහා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ ජාතික ඩිජිටල් අනන්‍යතාවය ස්ථාපිත කිරීම සම්බන්ධව සාකච්ඡා පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව මේ වනවිට ඉදිරිපත් කිරීමට ඒ සඳහා දළ සැලැස්මක් නැත.

(ii) අවලංගු කරන ලද ප්‍රසම්පාදනයට අදාළ ව්‍යාපෘතිය මඟින් නිකුත් කිරීමට නියමිතව තිබූ හැඳුනුම්පත

නිකුත් කිරීමේ බලධාරියා වශයෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය - ICTA එක- හඳුනාගෙන තිබුණි. නව යෝජනාව පරිදි ඩිජිටල් අනන්‍යතාවද සහිත හැඳුනුම්පත නිකුත් කිරීමේ බලධාරියා පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වේ.

(iii) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් යෝජනා කරන ලද කුටුම්භ ගනුදෙනු කළමනාකරණ ව්‍යාපෘතිය - Household Transfer Management System - HTM- සඳහා 2016දී රුපියල් මිලියන 1,322.40, 2017දී රුපියල් මිලියන 2,365 හා 2018දී රුපියල් මිලියන 2,000 ලෙස රුපියල් මිලියන 8,000ක සමස්ත ඇස්තමේන්තුවක් තිබුණද, ඉහත (i) ප්‍රශ්නයට ලබා දී ඇති පිළිතුර පරිදි සම්පූර්ණ සංකල්පය හා අදාළ ප්‍රසම්පාදනය නැවත විවරණය කරනු ලබන බැවින් එයට අනුකූලව ඇස්තමේන්තු පිරිවැය බොහෝ සෙයින් අඩු විය යුතු අතර, අවසන් තාක්ෂණික යෝජනාව අනුමත කොට නොමැති බැවින් එහි පිරිවැය නිශ්චිතව ගණනය කිරීම මේ අවස්ථාවේදී අසීරු වේ.

(iv) මේ දක්වා පැවැති ප්‍රසම්පාදනය අවලංගු කොට ව්‍යාපෘතිය නැවත සැලසුම් කෙරෙමින් පවතී. කුටුම්භ ගනුදෙනු කළමනාකරණ ව්‍යාපෘතිය - Household Transfer Management System - HTM- සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ආර්ථිකය ඩිජිටල්කරණය කිරීමේ වැඩසටහන යටතේ පිරිවැය දරනු ලැබේ.

(v) 2017 වර්ෂය සඳහා විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ කුටුම්භ ගනුදෙනු කළමනාකරණ ව්‍යාපෘතිය -Household Transfer Management System - HTM- සඳහා වෙන් කළ මුදල රුපියල් මිලියන 2,365කි.

(ආ) අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2016 අය වැය යෝජනාවේ ඇමුණුම VI වශයෙන් ඩිජිටල් හැඳුනුම්පතක් නිකුත් කිරීම සම්බන්ධයෙන් වන සම්පූර්ණ පිටුවක සැලැස්මක් මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා.

ඒ කියන්නේ එම යෝජනාවත් සමඟ ඩිජිටල් හැඳුනුම්පත නිකුත් කිරීමේ සමස්ත ක්‍රියාවලිය සිද්ධ වෙන්නේ කෙසේද කියන එක පිළිබඳව අය වැය ලේඛනයේ හයවැනි ඇමුණුම වශයෙන් දීර්ඝ සැලැස්මක් ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මගේ ප්‍රථම අතුරු ප්‍රශ්නය මෙකයි. 2016 අය වැය ලේඛනයෙන් නිශ්චිත වශයෙන් මේ ගරු සභාවට ඉදිරිපත් කළ සැලැස්ම ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන එකද, ඔබතුමා දැන් සඳහන් කළ පිළිතුර අනුව අදහස් කරන්නේ කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැඳුනුම්පත් ඩිජිටල්කරණය කිරීම සම්බන්ධයෙන් වූ මෙම යෝජනාවට කැබිනට් මණ්ඩලයෙන් අනුමතිය ලැබිලා, ටෙන්ඩර් කැඳවා, CAPC එකක් form කරලා මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යනකොට, මේ සම්බන්ධයෙන් පැවැති නොයෙක් අඩුපාඩු දැක්කා. ගරු මන්ත්‍රීතුමා අසා තිබෙන ප්‍රශ්නයේත් අසා තිබුණු පරිදි බලධාරියා කවුද, අයිතිකරු කවුද කියන ප්‍රශ්න තිබුණා. ඒ සම්බන්ධයෙන් ගැටලු නිර්මාණය වුණා. ඒ වාගේම අපි ලෝකයේ අනෙක් රටවල් එක්ක අපේ රට සංසන්දනය කරලා බැලුවා. ඉන්දියාවේ ආධාර ඩිජිටල් ක්‍රියාවලියේ තිබුණු අඩුපාඩු සහ එහි තිබුණු ශක්තීන් ගැන බැලුවා. ඒත් එක්කම සියලුම technical committeesවලින් ලබා දුන් යෝජනා අනුව මේක තමයි අපි දැක්වූ සැලැස්ම. ඒ සැලැසුම අනුව අපේ රටට අනුකූල වෙන්නේ මොකක්ද, ඒ වාගේම බලධාරියා කවුද කියන ප්‍රශ්න තිබුණා. මොකද, data collection සම්බන්ධ නීතිය අනුව data අයිතිය තබා ගන්න පුළුවන් අපේ ICTA එකටද, එහෙම නැත්නම් පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවටද කියන නීති ප්‍රශ්නයේදීත් අපි හිරවීමක් සහ යටවීමක් වුණා. ඒක තමයි හිරවීමේ ලොකුම ප්‍රශ්නය. Data law එක සම්බන්ධයෙන් ලොකු හිරවීමක් සිදු වුණා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙකයි. ඩිජිටල් යටිතල පහසුකම් ඇමතිතුමා ලෙස මේ ව්‍යාපෘතිය කරන්න ගරු ඇමතිතුමාට පූර්ණ බලය දුන්නා නම්, මෙවැනි තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ කියන එක තමයි මගේ විශ්වාසය. එයට හේතුව මේ අය වැය යෝජනා මඟින් මිලියන 8,000ක්-10,000ක් පමණ වටිනා විශාල ඇස්තමේන්තු පිළියෙල කළාට, වෙන game එකක තමයි මෙම ව්‍යාපෘතිය තිබිලා තියෙන්නේ. ගරු ඇමතිතුමනි, එසේ නොවී ඔබතුමාට මේ කටයුත්ත කරන්න අවස්ථාව ලබා දුන්නා නම්, මෙලඟකට මෙම කටයුත්ත සිද්ධ වෙලා තිබෙනවා කියන එක ඔබතුමා පිළිගන්නවාද කියන කාරණය මා අහන්න කැමැතියි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු අග්‍රාමාත්‍යතුමා පසුගිය දවසක කිව්වා, ඩිජිටල් නීතියක් ලංකාවට ගෙනෙන්න ඕනෑ කියලා. මම හිතන විධියට එතුමා එහෙම කියන්න ඇත්තේත් ඒ හේතුව නිසා තමයි. ඩිජිටල් නීතියක් ලංකාවේ නැහැ. මොකද, මේ ආයතනවල එම කටයුතු කරගෙන යනකොට, ඩිජිටල්කරණය කිරීමේ එම නීතිය ඩිජිටල් අමාත්‍යාංශයට යොමු වෙලා නැහැ. ගොඩක් අමාත්‍යාංශ ඇතුළේ තමන්ගේ ව්‍යාපෘති තමන් කරගෙන යෑම සම්බන්ධයෙන් විශාල අඩුපාඩුවක්, ගැටලුවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඉදිරියේදී ඒ නීතිය ක්‍රියාත්මක වුණොත්, ඩිජිටල් අමාත්‍යාංශයට ඩිජිටල්කරණය කිරීම සම්බන්ධ අයිතිය ලැබුණොත් මෙය සාර්ථක වෙයි කියලා මා හිතනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 2 - 137/'18 - (2), ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## බන්ධනාගාර නියාමක තනතුරු : පත්වීම්
## சிறைச்சாலைக் காவலாளிப் பதவி: நியமனங்கள்
## POSTS OF PRISON GUARD: APPOINTMENTS

396/'18

**3. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) බන්ධනාගාර නියාමක තනතුරු සඳහා බඳවා ගැනීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ බව දන්නේද;

(ii) එසේ නම්, 2016.10.19 සිට 2016.10.27 දක්වා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ සහ 2016.11.03 සිට 2016.11.12 දක්වා පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත අදාළ තනතුරු සඳහා තෝරාගන්නා ලද අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තනතුරු සඳහා බඳවා ගැනීම් කර ඇති බව හා අදාළ ගිවිසුම් 2016.11.24 දින අත්සන් කරන ලෙස සුදුසුකම්ලාභීන්ට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දී නැවත එය කල් දැමුවේ මන්ද;

(iv) එසේ කල් දැමූ පත්වීම් මේ වනවිටත් ලබා නොදීමට හේතුව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පත්වීම් ලබා දීමේ ගැටලු සහගත තත්ත්වයක් තිබියදී, පත්වීම්ලාභීන් අපහසුතාවයට පත්වන අයුරින් ඔවුන්ට ගිවිසුම් ලිපි ලබා දුන්නේ මන්ද;

(ii) සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ට පත්වීම් ලබා නොදීමෙන් ඔවුන් දැඩි අපහසුතාවයකට පත්ව සිටින බව පිළිගන්නේද;

(iii) එසේ නම්, පත්වීම් නැවත ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේ ද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) சிறைச்சாலை காவலாளி பதவிக்கு ஆட்சேர்ப்பு செய்வதற்காகச் சிறைச்சாலைகள் திணைக் களத்தினால் 2016ஆம் ஆண்டு நேர்முகப் பரீட்சையொன்று நடாத்தப்பட்டதென்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், 2016.10.19ஆம் திகதி முதல் 2016.10.27ஆம் திகதிவரை நடைபெற்ற நேர்முகப்பரீட்சை மற்றும் 2016.11.03ஆம் திகதி முதல் 2016.11.12ஆம் திகதிவரை நடாத்தப்பட்ட கட்டமைக்கப்பட்ட நேர்முகப்பரீட்சைப் பெறு பேறுகளின் அடிப்படையில் சம்பந்தப்பட்ட பதவிகளுக்குத் தெரிவுசெய்யப்பட்ட விண்ணப்ப தாரிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) மேற்படி பதவிகளுக்கு ஆட்சேர்ப்புச் செய்யப் பட்டுள்ளதென்பதையும் சம்பந்தப்பட்ட உடன் படிக்கையில் 2016.11.24ஆம் திகதி கையொப்ப மிடுமாறு தகைமை பெற்றவர்களுக்கு சிறைச் சாலைகள் திணைக்களத்தினால் அறிவிக்கப் பட்டு மீண்டும் அது ஒத்திவைக்கப்பட்டமைக் கான காரணம் யாதென்பதையும்;

(iv) அவ்வாறு ஒத்திவைக்கப்பட்ட நியமனங்கள் இற்றைவரை வழங்கப்படாமைக்கான காரணம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) நியமனம் வழங்குவதில் சிக்கல்மிகு நிலை உள்ளபோது நியமனம் பெறுபவர்களை அசௌகரியப்படுத்தும் வகையில் இவர்களுக்கு உடன்படிக்கைக் கடிதம் வழங்கப்பட்டமைக் கான காரணம் யாதென்பதையும்;

(ii) தகைமைகளைப் பூர்த்திசெய்துள்ள நியமனப் பெறுனர்களுக்கு நியமனங்களை வழங்காததன் மூலம் இவர்கள் பெரும் அசௌகரியத்திற்கு உள்ளாகியுள்ளார்கள் என்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(iii) ஆமெனில், நியமனங்களை மீள வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) ஆமெனில், அத்தேதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice & Prison Reforms:

(a) Will she inform this House-

(i) whether she is aware that an interview was conducted by the Department of Prisons in the year 2016 for recruitment for the post of Prison Guard;

(ii) if so, the number of applicants selected for the relevant posts on the basis of the results of interviews conducted from 19.10.2016 to 27.10.2016 and the structured interview conducted from 03.11.2016 to 12.11.2016;

(iii) as to why the process of recruitment was postponed in spite of the fact that the qualified applicants have been informed by the Department of Prisons that the recruitments have been made for the said posts and asking them to sign the particular contracts on 24.11.2016; and

(iv) the reason for not hitherto making the appointments thus postponed?

(b) Will she also inform this House-

(i) as to why letters of contract have been provided to the appointees, putting them into further difficulty, in spite of the prevalence of the problematic condition obstructing this process;

(ii) whether it is admitted that the qualified applicants have been subjected to severe difficulty owing to not granting the appointments;

(iii) if so, whether measures will be taken to make the appointments once again; and

(iv) if so, of the date on which it will be done?

(c) If not, why?

**ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා (අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த - நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு பிரதி அமைச்சர்)
(The Hon. H.R. Sarathie Dushmantha - Deputy Minister of Justice and Prison Reforms)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා 2016.10.19 දින සිට 2016.10.27 දක්වා ආයතනික මට්ටමින් මූලික සම්මුඛ පරීක්ෂණ සහ 2016.11.03, 04, 08, 10, 11, 12 යන දිනයන්හි බන්ධනාගාර මූලස්ථාන පරිශ්‍රයේදී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලදී.

(ii) එම සම්මුඛ පරීක්ෂණයේදී, බන්ධනාගාර නියාමක (පිරිමි) - 287; බන්ධනාගාර නියාමක (කාන්තා) - 45ක් තෝරා ගන්නා ලදී.

(iii) ඉහත තෝරා ගත් අයදුම්කරුවන්ට පත්වීම ලබාදීම සඳහා තනතුරට අදාළ ගිවිසුම් අත්සන් කිරීමට 2016.11.24 දින කැඳවන ලද නමුත්, පත්වීම ලබාදීම අවලංගු කරන ලෙස බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා භින්දු ආගමික කටයුතු ගරු අමාත්‍යතුමා, - එතුමාට ලැබුණු යම් අක්‍රමිකතාවන් පිළිබඳ තොරතුරු මත- විසින් දන්වන ලද වාචික උපදෙස් පරිදි ගිවිසුම් අත්සන් කිරීමට කැඳවීම කල් දැමීම සිදු කරන ලදී.

(iv) 2016 වසරේ ඉහත සම්මුඛ පරීක්ෂණයෙන් බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලැබ ගිවිසුම් අත්සන් කිරීමට කැඳවීම් ලිපි යවන ලද අයදුම්කරුවන්ගේ සහ ඊළඟ සම ලකුණු ලැබීම හේතුවෙන් බඳවා නොගත් අයදුම්කරුවන්ගේ සුදුසුකම් නැවත පරීක්ෂා කරන ලදී. ඒ අනුව අයදුම්කරුවන් තුන්සිය හැත්තෑදෙදෙනෙකුගේ (372) සුදුසුකම් පරීක්ෂා කිරීමට 2017.09.06, 07, 08, 11, 12 හා 13 යන දිනයන්හි සම්මුඛ පරීක්ෂණ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපනය, නැවත පදිංචි කිරීම හා භින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේදී පවත්වන ලදී. එම සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ සියලුම අයදුම්කරුවන් එනම්, නියාමක (පිරිමි) 271, නියාමක (කාන්තා) 34ක් 2017.11.27 දින සිට බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගන්නා ලදී.

(ආ) (i) මුල්වරට ගිවිසුම් අත්සන් කිරීම සඳහා කැඳවීම් ලිපි යොමු කරන අවස්ථාව වන විට ගැටලු සහගත තත්ත්වයක් උද්ගත වී නොතිබිණි.

(ii) ඉහත කරුණු අනුව පැන නොනඟී.

(iii) පත්වීම් ලබා දී ඇත.

(iv) 2017.11.27.

(ඇ) ඉහත (අ) සහ (ආ) අනුව පැන නොනඟී.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විස්තරාත්මක පිළිතුරක් ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වනවා.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

යම් යම් ගැටලු සහගත තත්ත්වයන් සහ නොගැළපීම් තිබෙන බව ගරු ඇමතිතුමා දැනගත් බව සඳහන් කළා. මේ පත්වීම් සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කිරීමට කැඳවීමට පෙර එය දැනගැනීමට නොහැකි වූයේද යන්න පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

**ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த)
(The Hon. H.R. Sarathie Dushmantha)

ඒ කාල සීමාව තුළ එතුමා ලබා දුන් උපදෙස් අනුව පෙනී ගියේ යම් යම් අසාධාරණකම් පිළිබඳව තොරතුරු මෙම තනතුරට ඉදිරිපත් වුණු සමහර අයගෙන් එතුමාට ලැබී තිබෙන බවයි. ඒවා සියලු දේවල් අමාත්‍යාංශයට දන්වලා තිබෙනවා. ඒ අනුව වඩාත් සාධාරණයක් ඉෂ්ට සිද්ධ කිරීම සඳහා තමයි එතුමා ඒ තීන්දුව අරගෙන තිබෙන්නේ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමාගේ පිළිතුරේ සඳහන් වුණා, එම පත්වීම් නැවත ලබා දී තිබෙනවා කියලා. එම පත්වීම් ලබා දීමේදී ගිවිසුම් අත්සන් කිරීමට පෙර කැඳවපු අයට එම පත්වීම් ලැබුණේද? එසේ නැතොත් ඒ අය ඉවත් කරලා වෙනත් කණ්ඩායමකට පත්වීම් ලබා දුන්නාද යන්න පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා.

**ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த)
(The Hon. H.R. Sarathie Dushmantha)

මම ඒ ප්‍රශ්නයට පිළිතුර ලබා දී තිබෙනවා. ඒ අයටම තමයි පත්වීම් ලබා දී තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 4 -495/'18- (2), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils, Local Government and Sports)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
හැබැයි, උත්තරය තිබෙනවා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
උත්තරය තිබෙනවා. නමුත්, උත්තරය ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 5 -521/'18- (2), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා - *[සභා ගර්භය තුළ නැත]*

## එච්අයිවී ආසාදිතයන් : වයඹ පළාත
## எச்.ஐ.வி தொற்றுக்குள்ளானோர்: வடமேல் மாகாணம்
HIV-INFECTED PERSONS: NORTH-WESTERN PROVINCE

602/'18

**6. ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා වයඹ පළාත තුළ වාර්තා වී ඇති එච්අයිවී ආසාදිතයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එච්අයිවී ආසාදිතයන් සංඛ්‍යාව වැඩි වී තිබේ නම්, එයට බලපා ඇති හේතු කවරේද;

(iii) වයඹ පළාත තුළ එච්අයිවී ආසාදිතයන් සංඛ්‍යාව වර්ධනය වීම වැළැක්වීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச் சரைக் கேட்டவினா:

(அ) (i) 2010ஆம் ஆண்டு தொடக்கம் இதுவரை வடமேல் மாகாணத்தில் அறிவிக்கப்பட்டுள்ள எச்.ஐ.வி தொற்று உள்ளவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) எச்.ஐ.வி தொற்று உள்ளவர்களின் எண்ணிக்கை அதிகரித்திருப்பின், அதில் தாக்கம் செலுத்திய காரணிகள் யாவை என்பதையும்;

(iii) வடமேல் மாகாணத்தில் எச்.ஐ.வி தொற்று உள்ளவர்களின் எண்ணிக்கை அதிகரிக்கப்படு வதைக் கட்டுப்படுத்த அமைச்சு எடுக்கவிருக்கும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine :

(a) Will he inform this House,-

(i) the number of HIV-infected persons reported in the North-Western Province from the year 2010 up to now;

(ii) if the number of HIV-infected persons has increased, the reasons for it; and

(iii) the steps that will be taken by the Ministry to prevent the increase of the number of HIV-infected persons in the North-Western Province?

(b) If not, why?

**ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim - Deputy Minister of Health, Nutrition and Indigenous Medicine)
Hon. Deputy Speaker, on behalf of the Hon. Minister of Health, Nutrition and Indigenous Medicine, I answer that Question.

(a) (i)

| Year | No of Patients |
|---|---|
| 2010 | 07 |
| 2011 | 07 |
| 2012 | 12 |
| 2013 | 21 |
| 2014 | 23 |
| 2015 | 38 |
| 2016 | 22 |
| 2017 | 23 |
| 2018 up to June 30th | 15 |
| Total | 168 |

(ii) No increase.

(iii) Does not arise. But below-mentioned procedures are implemented to control it.

- Conduct two STD Clinics and implement consultancy services actively in the two districts.
- Conduct STD Clinics at selected Base Hospitals.
- Implement mobile programmes weekly for vulnerable groups to identify the patients.
- Implement special programmes to prevent mother to child transmission of HIV
- With the Ministry of Education, under "13 year guaranteed education programmes", HIV awareness has been introduced for school children.
- Implement awareness programmes in selected public institutions once in two weeks.
- Conduct clinics and implement awareness programmes for sex workers which is the highly vulnerable group in collaboration with non-governmental organizations.
- Implement programmes to provide condoms to the vulnerable groups and to those who participate in clinics and educate how to avoid getting STDs.
- Conduct special clinics and programmes for those who come from abroad.

(b) Does not arise.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිළිතුර ලබා දීම පිළිබඳව අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය වයඹ පළාතට සීමා කර ඇසුවත්, මෙය මුළු ලංකාවටම බලපාන ප්‍රශ්නයක්. අපේ රට, සංචාරක කර්මාන්තය ඉලක්ක කරගෙන දියුණු වීමට උත්සාහ කරන රටක් විධියට, HIV රෝගය පිළිබඳව මුල් අවධියේ විවෘත කථාබහක් තිබුණාට, වර්තමානය වෙද්දී ඒ පිළිබඳ කථා කරන ප්‍රමාණය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය උපදෙස් ලබා දෙන හා මැදිහත් වන ප්‍රමාණය අඩු බවක් අපට පෙනී යනවා. රෝගය පාලනය කිරීමට ගත් උත්සාහය තුළදී 2010 වසරේ සිට මේ දක්වා අමාත්‍යාංශයට සතුටු විය හැකි ආකාරයේ පාලනයක් සංඛ්‍යාලේඛන දත්තවල තිබෙනවාද කියා මම ඔබතුමාගෙන් අහන්න කැමතියි.

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය නැවත අහනවාද?

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුර අනුව HIV රෝගය පාලනය කිරීම සඳහා සහ ඒ පිළිබඳ දැනුවත් කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තය ඉලක්ක කරගෙන දියුණු වෙමින් පවතින රාජ්‍යයක් විධියට මේ රෝගය පිළිබඳව විදේශ රටවල සහ අපේ රට තුළ යම් කිසි කතිකාවක් ගොඩ නැඟී තිබෙනවා. හැබැයි, මෙම රෝගය හඳුනා ගත් මුල් වකවානුවේදී මෙම රෝගය පාලනය කිරීමට තිබුණු උනන්දුව වර්තමානය වන විට එළිපිට අපට දකින්න නැහැ. ඒ මොන හේතුවක් නිසාද දන්නේ නැහැ. සමහර රෝගීන් ඒ පිළිබඳව ප්‍රසිද්ධියේ කියා ප්‍රතිකාර ලබා නොගන්න තැනට ඇවිත් තිබෙනවා. 2010 වසරේ සිට මේ දක්වා කාලය ගත්තොත් ඔබ අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන හා දත්ත අනුව මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළ පිළිබඳ සෑහීමට, සතුටට පත් වෙන්න පුළුවන්ද? අමාත්‍යාංශය මේ පිළිබඳ දරන මතය මොකක්ද?

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අපි අරගෙන තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳ අපි සතුටු වෙනවා. නමුත් මේ සම්බන්ධයෙන් මීට වඩා පුළුල් ලෙස වැඩ කරන්න කැමැතියි.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාසල් පද්ධතියේත්, උසස් අධ්‍යාපන පද්ධතියේත් විෂය මාලාව හරහා ලිංගිකත්වය, එහෙම නැත්නම් ලිංගික රෝග පිළිබඳව දරුවන් දැනුවත් කිරීම වර්තමානයේ කාලෝචිත මාතෘකාවක් බවට පත් වී තිබෙනවා.

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ එවැනි වැඩ පිළිවෙළකට යම්කිසි ආරම්භයක් අරගෙන තිබෙනවාද කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

අපි අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක වැඩ කරන්නේ. පාසල්වල ඉහළ පන්තිවලට මේ සම්බන්ධයෙන් අපි කියලා දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 7 - 608/'18 - (2), ගරු දයාසිරි ජයසේකර මහතා.
*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 - 1129/'18 - (2), ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන වටය.

## රෝහල්වලට රුධිර කාන්දු පෙරන යන්ත්‍ර සැපයීම: විස්තර

## வைத்தியசாலைகளுக்குக் குருதி மாற்றூட்டல் இயந்திரங்களை வழங்கல்: விபரம்

PROVISION OF DIALYSIS MACHINES TO HOSPITALS: DETAILS

521/'18

**5. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2017 අය වැයෙන් වකුගඩු රෝගීන් සඳහා රුධිර කාන්දු පෙරන යන්ත්‍ර රෝහල්වලට ලබා දීම වෙනුවෙන් වෙන් කළ මුදල කොපමණද;

(ii) 2017 වර්ෂයේ මැද භාගය වනවිට රජයේ රෝහල් වෙත ලබා දුන් රුධිර කාන්දු පෙරන යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) ඉතිරි යන්ත්‍ර ලබා දෙනු ලබන දිනය කවරේද;

(iv) ඒ සඳහා විධිමත් ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(v) එසේ නම්, සැපයුම්කරුවන් හා ඔවුන්ගේ මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අත්‍යාවශ්‍ය ඖෂධ රට තුළ නිපදවා ගැනීමේ ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා 2017 වර්ෂයේ වෙන් කළ මුදල කොපමණද;

(ii) ඉහත වැඩපිළිවෙළ දියත් කිරීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති සැලසුම්/ අධ්‍යයනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාරම், පෝසණෙ මර්‍රුම් සුදේස මරුත්තුව අමෙච්සරෛක් කේට්ට විනා:

(அ) (i) 2017 வரவு செலவுத்திட்டத்தின் மூலம் சிறுநீரக நோயாளர்களுக்கான குருதி மாற்றூட்டல் இயந்திரங்களை வைத்தியசாலைகளுக்குப் பெற்றுக்கொடுப்பதற்காக ஒதுக்கப்பட்ட பணத் தொகை யாது என்பதையும்;

(ii) 2017ஆம் ஆண்டின் நடுப்பகுதியளவில் அரசாங்க வைத்தியசாலைகளுக்கு வழங்கப் பட்ட குருதி மாற்றூட்டல் இயந்திரங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மீதி இயந்திரங்களை வழங்கும் திகதி யாது என்பதையும்;

(iv) அதற்காக முறைசார்ந்ததாக கேள்விப்பத்திரம் கோரல் மேற்கொள்ளப்பட்டுள்ளதா என்ப தையும்;

(v) ஆமெனில், வழங்குநர்கள் மற்றும் அவர்களின் விலைமனுக்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அத்தியாவசிய மருந்துகளை நாட்டினுள் உற்பத்தி செய்துகொள்ளும் கருத்திட்டத்தை ஆரம்பிக்கவென 2017ஆம் ஆண்டில் ஒதுக்கப் பட்ட பணத் தொகை யாது என்பதையும்;

(ii) மேற்படி வேலைத்திட்டத்தை முன்னெடுப்பதற் காகத் தற்போது அமுல்படுத்தப்பட்டுள்ள திட்டங்கள் / கற்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House-

(i) the amount allocated to provide dialysis machines to hospitals for the benefit of kidney patients from the Budget for year 2017;

(ii) the number of dialysis machines provided to government hospitals by mid 2017;

(iii) the date when rest of the machines will be provided;

(iv) whether a proper tender procedure has been followed for the purpose; and

(v) if so, the suppliers and their rates?

(b) Will he also inform this House-

(i) the amount allocated in year 2017 to implement projects to manufacture drugs within the country; and

(ii) the plans made / studies carried out to launch the above programme?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රු.මි.68. (රුපියල් මිලියන හැට අටක්)

(ii) 50කි (පණහ)

(iii) මේ වන විට යන්ත්‍ර සියල්ලම රෝහල් වෙත ලබා දී ඇත.

(iv) ඔව්.

(v)

1. සියෝකා පුද්ගලික සමාගම - 68,000,000.00
2. බී. බ්‍රවුන් පුද්ගලික සමාගම (පළමු මිල) - 61,250,000.00
3. බී. බ්‍රවුන් පුද්ගලික සමාගම (දෙවන මිල) - 87,250,000.00

4. ප්‍රීමියර් හෙල්ත්කෙයාර් පුද්ගලික සමාගම - 58,750,000.00

(ආ) (i) රට තුළ ඖෂධ නිපදවා ගැනීමේ ව්‍යාපෘති සඳහා අය වැය මඟින් මුදල් වෙන් කිරීමක් කර නොමැත.

(ii)

* 2017 හා 2018 වර්ෂයේදී නව කර්මාන්තශාලා 04ක් ආරම්භ කර, ඒ මඟින් අත්‍යවශ්‍ය ඖෂධ හා අනෙකුත් අත්‍යවශ්‍ය සෞඛ්‍ය උපකරණ නිෂ්පාදනය කර ඇත.

* රජයට අවශ්‍ය ඖෂධ නිපදවීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමඟ බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ආයෝජකයන් 31දෙනකු කැඳවා ඇත.

* 2018 වසරේ සම්පූර්ණ කිරීමට අපේක්ෂිත රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ කර්මාන්තශාලාව පුළුල් කිරීම හා අලුත්වැඩියාව සඳහා ජයිකා (JICA) අරමුදල මඟින් රුපියල් බිලියන 1.7ක් වෙන් කරගෙන ඇත. මෙම පුළුල් කිරීම සමඟ 2018 වසරේ පෙති හා කරල් නිෂ්පාදනය ඒකක මිලියන 2000 සිට 4000 දක්වා වැඩිවනු ඇත.

* ගබඩා කිරීම, පරිපාලනය, නඩත්තු කිරීම සහ ඉංජිනේරු අංශය සඳහා නව ගොඩනැඟිලි ඉදිකිරීම ආරම්භ කර ඇත.

* කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වැඩිකිරීම, තත්ත්ව සහතික කිරීම සහ තත්ත්ව පාලනය සඳහා නවතම රසායනාගාරයක් ඉදි කිරීමට කටයුතු කිරීම.

* හවුල් ව්‍යාපාර සමාගම් සමඟ එක්ව යුරෝපීය සංගමයේ ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රතිජීවක ඖෂධ නිෂ්පාදනාගාරයක් ඉදි කිරීමට කටයුතු කර ඇත.

* ඖෂධ නිෂ්පාදන කර්මාන්තය තුළ සේවය කරන පුද්ගලයින් පුහුණු කිරීම, කුසලතා වර්ධනය කිරීමට ශ්‍රී ලංකාව තුළ පළමුවරට ඖෂධ නිෂ්පාදන ආයතනයක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.

* ප්ලාස්මා අවශ්‍යතාව සපුරාලීම 2018 වසරේදී ජාතික රුධිර පාරවිලයන බැංකුව සමඟ ඒකාබද්ධව ප්ලාස්මා නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

* 2018 වසරේ පිළිකා නාශක ඖෂධ නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීමට ආයෝජකයන් හා නිෂ්පාදකයින් හඳුනාගෙන ඇත.

* බද්ධ ව්‍යාපාර සමාගම්වල කටයුතු අධීක්ෂණය, කළමනාකරණය සඳහා බද්ධ ව්‍යාපාර පාර්ශ්වකරුවන්ගේ ජාතික මණ්ඩලයක් පිහිටුවා ඇත.

(ඇ) පැන නොනඟී.

## සමෘද්ධි බැංකුව: විස්තර
## சமுர்த்தி வங்கி: விபரம்
## SAMURDHI BANK: DETAILS

608/'18

**7. ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. Lakshman Yapa Abeywardena on behalf of the Hon. Dayasiri Jayasekara)

සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) අද වනවිට සමෘද්ධි බැංකුව සතු වත්කම් ප්‍රමාණය කොපමණද;

(ii) දිවයින පුරා පිහිටි සමෘද්ධි බැංකු සංඛ්‍යාව සහ සමෘද්ධි මහා සංගම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සියලු සමෘද්ධි සංගම් සතුව දැනට තිබෙන වත්කම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2018 මැයි දින සැමරුමේදී අග්‍රාමාත්‍යවරයා සඳහන් කළ පරිදි සමෘද්ධි (දිවිනැගුම) බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව යටතට පවරා ගන්නේද;

(ii) 2013 අංක 1 දරන දිවිනැගුම පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිදහස් කර ඇති එම බැංකුව යළි පවරා ගැනීමට හැකියාවක් පවතීද;

(iii) එසේ පවරා ගන්නේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சமூக வலுவூட்டல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் சமுர்த்தி வங்கி வசமுள்ள சொத்துக்களின் அளவு யாது என்பதையும்;

(ii) நாடெங்கிலுமுள்ள சமுர்த்தி வங்கிக் கிளைகள் மற்றும் சமுர்த்தி மகா சங்கங்களின் எண்ணிக்கை தனித்தனியாக யாது என்ப தையும்;

(iii) இன்றளவில் அனைத்துச் சமுர்த்தி சங்கங்கள் வசமுள்ள சொத்துக்களின் அளவு யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) 2018 மே தினக் கொண்டாட்டத்தின்போது பிரதம அமைச்சர் குறிப்பிட்டதன்படி, சமுர்த்தி (வாழ்வின் எழுச்சி) வங்கி இலங்கை மத்திய வங்கியின்கீழ் கொண்டுவரப்படுமா என்ப தையும்;

(ii) 2013ஆம் ஆண்டின் 1ஆம் இலக்க வாழ்வின் எழுச்சிச் சட்டத்தின்படி, இலங்கை மத்திய வங்கியிலிருந்து விடுவிக்கப்பட்டுள்ள மேற்படி வங்கியை மீண்டும் பொறுப்பேற்பதற்கு வாய்ப்பு உள்ளதா என்பதையும்;

(iii) அவ்வாறு பொறுப்பேற்கப்படின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Social Empowerment:

(a) Will he inform this House-

(i) the amount of assets owned by the Sumurdhi Bank at present;

(ii) the number of Samurdhi Banks and Samurdhi General Societies throughout the island, separately; and

(iii) the amount of assets owned by all Samurdhi Societies at present?

(b) Will he also inform this House-

(i) whether the Samurdhi (Divineguma) Bank will be taken over by the Central Bank of Sri Lanka as stated by the Hon. Prime Minister at the 2018 May day celebration;

(ii) whether there is any possibility of that bank which has been exempted from the control of the Central Bank of Sri Lanka under

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

Divineguma Act, No.1 of 2013, being taken over again by the Central Bank of Sri Lanka; and

(iii) if it is to be taken over in that manner, the reasons for that?

(c) If not, why?

**ගරු පී. හැරිසන් මහතා (සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - சமூக வலுவூட்டல்கள் அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Social Empowerment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2018.03.31 දිනට සමෘද්ධි ප්‍රජාමූල බැංකු සතු මුළු වත්කම් ප්‍රමාණය රු. බිලියන 148.5කි.

(ii) දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංඛ්‍යාව 1074කි.

ප්‍රාදේශීය සමිති 331කි

ජාතික මහා සංගම් 01කි

(iii) සමෘද්ධි බැංකු සමිති සතු වත්කම් ප්‍රමාණය රු.බිලියන 8.3 (2018.01.01 දිනට)

(ආ) (i) නැත.

(ii) නැත.

(iii) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

(ඇ) මෙම සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති හා ජාතික මහා සංගමය දිවිනැගුම (සමෘද්ධි) පනත අනුව ස්වාධීන නෛතික ඒකක ලෙස ක්‍රියාත්මක වේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ස්ථාවර නියෝග 27.(2) යටතේ ප්‍රශ්නය. ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## I

## මුලතිව් සෙම්මලෙයි ප්‍රදේශයේ ඉඩම් නැවත ජනතාවට ලබා දීම
## முல்லைத்தீவு, செம்மலைப் பகுதி மக்களின் காணிகளை மீள ஒப்படைத்தல்
## HANDOVER OF LANDS BELONGING TO PEOPLE IN SEMMALAI, MULLAITIVU

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சர் மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களிடம் கேள்வி கேட்க அனுமதியளித்ததற்கு நன்றி!

முல்லைத்தீவு மாவட்டத்தில் நாயாறு - கொக்குத் தொடுவாய் பிரதான வீதியின் மேற்குப் புறமாக அமைந்துள்ள புளியமுனைப் பகுதியிலுள்ள சுமார் 720 ஏக்கர் காணியானது, 1972ஆம் ஆண்டு செம்மலைப் பகுதியில் வசித்த 350 குடும்பங்களுக்குப் பயிர்ச்செய்கைக்காக வழங்கப்பட்டது என்றும், அக்காலம் முதல் இம்மக்கள் அக்காணியில் வயல் செய்கையினையும் கச்சான், சோளம் போன்ற உப உணவுப் பயிர்ச் செய்கையினையும் மேற்கொண்டு வந்துள்ளனர் என்றும், பின்னர் ஏற்பட்ட யுத்தம் காரணமாகப் பயிர்ச்செய்கைகளைக் கைவிட்டு, யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்டதன் பின்னர் அவர்கள் இக்காணியில் ஒரு பகுதியைத் துப்புரவுசெய்து பயிர்ச்செய்கைகளை மேற்கொண்டு வந்திருந்தனர் எனவும் தெரிவிக்கப்படுகின்ற நிலையில், இக்காணிகள் வழங்கப் பட்டிருந்த 350 குடும்பங்களில் 270 குடும்பங்கள் 2015ஆம் ஆண்டு கரைத்துறைப்பற்றுப் பிரதேச செயலகம்மூலமாக காணிகளுக்கான உறுதிப்படுத்தல்கள் கோரப்பட்ட நிலையில், தமது காணிகள் உறுதிப்படுத்தப்பட்டு, உறுதிப்பத்திரங்கள் பெறப்பட்டுள்ளன என்றும், அண்மையில் வனவளத் திணைக் களத்தினர் இந்தக் காணி அடங்கலாக சுமார் 100 ஏக்கர் காணியை அது தங்களுக்கு உரிமையானது; அத்துமீறி நுழைந்தால் சட்ட நடவடிக்கை எடுக்கப்படும் என்று கூறியுள்ளனர் என்றும் அந்த மக்கள் தெரிவிக்கின்றனர். இந்நிலையில், இம்மக்கள் தங்களுக்கான வாழ்வாதாரங்க ளின்றிப் பாரிய பாதிப்புகளை எதிர்நோக்கியிருக்கின்றனர்.

மேற்படி விடயம் தொடர்பில் எனது பின்வரும் கேள்வி களுக்கான விடைகளையும் எடுக்கக்கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் சுற்றாடல் அமைச்சர் என்ற வகையில் மேதகு ஜனாதிபதி அவர்கள் வழங்குவார் என நான் எதிர்பார்க்கின்றேன்.

01. முல்லைத்தீவு, செம்மலைப் பகுதி மக்களுக்கு வழங்கப் பட்டிருந்த இக்காணியினை, அக்காணிக்கான உறுதிப் பத்திரங்களைக் கொண்டிருப்போரிடம் ஒப்படைப் பதற்கு, அம்மக்களின் வாழ்வாதார நிலைமையினை அவதானத்தில் கொண்டு நடவடிக்கை எடுத்து உதவ முடியுமா?

02. முல்லைத்தீவு மாவட்டம் உட்பட வடக்கு, கிழக்கு மாத்திரமின்றி ஏனைய மாவட்டங்களிலும் வனவளத் திணைக்களத்தினர் தங்களுக்கான காணி உரித்தினை நிலைநாட்ட முனைகின்றபோது, பிரதேச செயலகங் களுக்கும் குறிப்பிட்ட மக்களுக்கும் முன்கூட்டியே அறிவுறுத்தல்கள் மேற்கொள்ளப்பட்டு செயற்பாடுகள் மேற்கொள்ளப்படுகின்றனவா?

03. ஏற்கனவே மக்கள் வாழ்ந்திருந்த மற்றும் பயிர்ச் செய்கைகளை மேற்கொண்டிருந்த பகுதிகள், யுத்தம் காரணமாக அம்மக்கள் இடம்பெயர்ந்து சென்று மீளக் குடியேற வந்தநிலையில் பற்றைகள், காடுகள் மண்டிக் கிடப்பதனால் அவை யாவும் வனவளத் திணைக் களத்திற்குரியவை என அடையாளம் காணப்படு கின்றதா?

04. முல்லைத்தீவு, துணுக்காய்ப் பிரதேச செயலாளர் பிரிவின் கீழுள்ள புத்துவெட்டுவான் பிரதேசத்தில் கடந்த எட்டு வருங்களாக காடுகள் அழிக்கப்பட்டு, 'கிரவல்' அகழ்வுகள் மேற்கொள்ளப்பட்டு வருவதாக முறைப்பாடுகள் எழுந்துள்ளமை தொடர்பில் இது வரையில் ஏதாவது நடவடிக்கைகள் மேற்கொள்ளப் பட்டுள்ளனவா?

என்னுடைய இந்தக் கேள்விகளுக்கான பதில்களை, மேதகு ஜனாதிபதி அவர்கள் சார்பில் பிரதி அமைச்சர் அவர்கள் வழங்குவார் என நான் நம்புகின்றேன்.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - Deputy Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු පහත පරිදි වේ.

1. ඔව්. විශේෂයෙන් මෙම ප්‍රදේශය, වන රක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත ආන්ඩාමකුළම් රක්ෂිත භූමියට ඇතුළත් වේ. උතුරු නැඟෙනහිර කැලෑ ඉඩම් නිදහස් කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි දිස්ත්‍රික් තාක්ෂණික කමිටුවක් හා ජනාධිපති ලේකම්තුමාගේ සහභාගිත්වයෙන් යුත් ජාතික කමිටුවක් පත් කර ඇත.

   මෙම ඉඩම් භාවිත කළ බවට සනාථ කළ හැකි ලේඛන, බලපත්‍ර ආදිය දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවතින දිස්ත්‍රික් තාක්ෂණික කමිටුවට ඉදිරිපත් කර එම නිර්දේශ ජාතික කමිටුවට ඉදිරිපත් කළ පසු එම ලේඛන මඟින් අදාළ භූමිය භාවිත කළ බවට තහවුරු වන්නේ නම්, ජාතික කමිටුවේ අනුමැතිය මත මෙම ඉඩම් අදාළ කටයුතු සඳහා ලබා දිය හැකිය.

   ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් මුලතිව් දිස්ත්‍රික්කය තුළ තමයි ශ්‍රී ලංකාවේ වැඩිම වන ආවරණය තිබුණේ. 2010 සංගණනයට අනුව සියයට 65.5ක් වනාන්තරවලින් වැසී ඇති දිස්ත්‍රික්කයක් තමයි මුලතිව් දිස්ත්‍රික්කය. ඒ කියන්නේ, හෙක්ටෙයාර් එක්ලක්ෂ හැත්තෑඑක්දහස් හාරසිය විසිදෙකක ප්‍රමාණයක් වනය තිබුණා. එතරම් හෙක්ටෙයාර් ප්‍රමාණයක වනයක් පවතින්න හේතුව, අවුරුදු 30ක කාලයක් තුළ එම ප්‍රදේශයේ මිනිස් ක්‍රියාකාරකම් නොපැවතීමයි. යුද්ධය අවසන් වීමෙන් පස්සේ විවිධ ආයතන, විවිධ පුද්ගලයන් තමන්ගේ අයිතිය කියමින් කටයුතු කරලා මේ වනය විනාශ කරන්න පටන් ගත්තා. පසුගිය කාලයේ සමාජ වෙබ්අඩවි ඔස්සේ පවා "අන්න, මුලතිව් කැලේ කපනවා" කියලා රජයට විවිධ ප්‍රශ්න, චෝදනා නඟන ආකාරය අපි දැක්කා. අතිගරු ජනාධිපතිතුමා මේ පිළිබඳව සැලකිල්ලට ගෙන, උතුරු නැඟෙනහිර පළාත්වල අවසර ලබා දුන් සහ අවසර ලබා නොදුන් කැලෑ එළිපෙහෙළි කිරීම් සියල්ල එතුමා තහනම් කළා. විශේෂයෙන්ම අපේ රජය බලයට පත්වුණාට පසුව ලබා දුන් මාධ්‍ය නිදහසත් එක්ක මෙක අපට පැන නැඟුණු ලොකු ප්‍රශ්නයක් බවට පත් වුණා.

   ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා කියන දෙය අපි පිළිගන්නවා.

   ප්‍රශ්නයක් තිබෙනවා. මොකක්ද? අපි මේක නවත්වන්න ගැසට් කරනකොට චන්ද්‍රිකා තාක්ෂණය, GIS අනුව, ඒ වාගේම GPS ක්‍රමවේදය අනුව තමයි ගැසට් කළේ. එම ගැසට් එක අනුව මෙම තාක්ෂණය තුළ පෞද්ගලික ඉඩම් පවා ඇතුළත් වෙලා තිබෙනවා. මොකක්ද, හේතුව? ඒ තාක්ෂණය තුළ අපට ඉඩම් මැන මැන යන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ගැසට් කිරීම තුළ විශේෂයෙන්ම පැහැදිලි කරලා තිබෙනවා, මෙම ඉඩම්වල මායිම් සටහන් කරලා තිබුණත් රාජ්‍ය ඉඩම් පමණයි ගැසට් වෙන්නේ කියලා. එම නිසා තමයි කමිටුවක් පත් කරලා තිබෙන්නේ. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා, මහවැලි සංවර්ධන හා පරිසර පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්තුමා, තිරසර සංවර්ධන, වනජීවී අමාත්‍යාංශයේ ලේකම්තුමා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා, ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්තුමා, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලේකම්තුමා, වනජීවී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු කමිටුවක් ජනාධිපති ලේකම්තුමාගේ සභාපතිත්වයෙන් යුතුව පත් කරලා තිබෙනවා. ඒ කමිටුවට සහාය දීම සඳහා තවත් තාක්ෂණික කමිටුවක් දිසාපතිතුමාගේ සභාපතිත්වයෙන් යුතුව හදලා තිබෙනවා. ඒ අනුව මේ ගොන්නට පෞද්ගලික ඉඩම් ඇතුළත් වෙලා තිබෙනවා නම්, අපට ඒවා නිදහස් කිරීම පිළිබඳ කිසිම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒ කමිටුවට යොමු කරන්නට ඕනෑ. එහෙම නැත්නම් සියයට සියයක්ම ඒක පෞද්ගලික ඉඩමක්ය කියන එක අපේ නිලධාරීන්ට ජේනවා නම් විවිධ නිර්ණායක අනුව ඒක නිදහස් කිරීමේ හැකියාවක්, ව්‍යාපාර කටයුතු කිරීමේ හැකියාවක් සලසා දෙන්න පුළුවන්.

2. වනරක්ෂණ ආඥා පනතේ තුන්වැනි වගන්තිය අනුව, "යම් ප්‍රදේශයක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයන් මඟින් රක්ෂිත, සංරක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කළ හැක. පනතේ තුන සහ හතර වගන්තිය අනුව අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත මෙම ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබා දීමට කටයුතු කළ යුතුය" කියලා සඳහන් වනවා. ඔබතුමා කියන්න ජනතාව කොහොමද දැනුවත් වෙන්නේ කියන එක. තවදුරටත් සඳහන් වෙනවා, "ඒ අනුව වනාන්තර රක්ෂිත, සංරක්ෂිත ප්‍රකාශයට පත් කිරීමේදී අදාළ ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරනු ඇත" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංරක්ෂිත වනාන්තර, රක්ෂිත වනාන්තර, ගම්බද වනාන්තර සහ වෙනත් කියලා කැළෑ වර්ග ගැසට් කළ හැකියි. විශේෂයෙන්ම සංරක්ෂිත වනාන්තරයක් වුවත් කිසියම් කෙනෙකුට නැරඹීම සහ පරීක්ෂණ කටයුතු කරන්න විතරයි පුළුවන්. වෙනත් දෙයක් කරන්න බැහැ. රක්ෂිත කැළෑවක් කියලා කිව්වාම යම් කළමනාකරණයක් කරන්න අපට පුළුවන්. හැබැයි, මේ මොන දේ ගැසට් කළත්, ආඥා පනත අනුව එය ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රසිද්ධියට පත් කරන්න අවශ්‍යයි කියලා තිබෙනවා.

   එහෙම ජනතාව සඳහා ප්‍රසිද්ධියට පත් කරන්නේ නැතුව කිසි විටෙක ගැසට් කිරීමේ හැකියාවක් නැහැ. එම නිසා ඒක පනත අනුවම කරන්න සිද්ධ වෙනවා.

03. නැත.

   පවත්නා වනාන්තර සීමා මායිම් අනුව රක්ෂිත වනාන්තරය ප්‍රකාශයට පත් කර ඇති අතර, එසේ ප්‍රකාශයට පත් කර ඇත්තේත් එම මායිම් තුළ පවතින රජයේ ඉඩම් පමණක් වේ. ගරු මන්ත්‍රීතුමනි, කලින් ප්‍රශ්නයටත් මේ උත්තරය ආවා. මෙම මායිම් තුළට කිසියම් පෞද්ගලික හෝ ජනතාව පදිංචි ඉඩම් ඇතුළත්ව ඇත්තේ නම් අදාළ චක්‍රලේඛනය පරීක්ෂා කර එම ඉඩම් රක්ෂිත භාවයෙන් බැහැර කිරීමට කටයුතු කෙරේ. මම කලින් ප්‍රශ්නයට උත්තරය ලබා දෙන විටත් ඔබතුමාට ඒක සඳහන් කළා.

04. ඔව්.

   යුද්ධය අවසානයත් සමඟම අපි දැක්කා "උතුරු වසන්තය" වැනි සංවර්ධන ව්‍යාපෘති ඇති වුණු බව. "උතුරු වසන්තය" ඇතුළු විවිධ සංවර්ධන කටයුතු හේතුකොටගෙන මෙම ප්‍රදේශවලින් බොරලු ඉවත් කිරීම සිදු කරගෙන ගිය අතර, මේ වන විට එම කාර්ය පාලනය කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබෙනවා. මේ අනුව අපි 2018.12.31 වනතෙක් විතරක් ක්‍රමානුකූලව බනිජ ද්‍රව්‍ය ඉවත් කිරීමට අවසර දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි,

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

වර්තමාන රජය බලයට පත් වෙන්න කලින් ක්‍රමානුකූලව බලපත්‍ර ලබා දීමේ ක්‍රමයක් තිබුණේ නැහැ. "උතුරු වසන්තය" කියලා විවිධ කැණීම් කටයුතු සිද්ධ වෙලා තිබෙනවා. නමුත්, වර්තමාන රජය වෙත ආපු පැමිණිලි මත අතිගරු ජනාධිපතිතුමා පරිසර අමාත්‍යවරයා වශයෙන් වන **සංරක්ෂණ** දෙපාර්තමේන්තුවේ පාලනයේ පවත්නා මෙම භූමියේ විශාල වශයෙන් ඛනිජ ඉවත් කිරීම නිසා සිදු වන පරිසර හානිය වැළැක්වීමේ අරමුණින් 2017.03.10වැනි දින අංක 8/2014 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා 2017.03.21වැනි දා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණා. නමුත්, සංවර්ධන කටයුතු සඳහා තිබෙන ප්‍රශ්න නිසා මෙහි **කාලය** දික් කරන්න කියලා දිසාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් ඉල්ලීමක් කළා. එතකොට 3/2/7/1 GSMB හා 2017.05.19 දිනැති උපදෙස් ලිපිය අනුව අලුතෙන් බලපත්‍ර නොදී, ඛනිජ ද්‍රව්‍ය ඉවත් කරන්න මෙතෙක් බලපත්‍ර ලබා දීපු ස්ථානවලින් පමණක් පරිසර හානියක් නොවන්නේ නම් ඛනිජ ද්‍රව්‍ය ඉවත් කිරීමට අනුමැතිය ලබා දීමට කැබිනට් මණ්ඩල අනුමැතිය **ලබා දුන්නා.** ඒ අනුව, ඒ වන විට ඛනිජ ඉවත් කරමින් පැවැති වන **සංරක්ෂණ** දෙපාර්තමේන්තුවේ පාලනයේ පැවැති භූමිය තුළින් 2018 වර්ෂය අවසානය දක්වා ඛනිජ ඉවත් කිරීම සඳහා අවසරය ලබා දෙන ලදි. මේ අනුව ඛනිජ ද්‍රව්‍ය ඉවත් කරන්න අවසර දුන් ස්ථානවලින් පමණක් ඛනිජ ද්‍රව්‍ය ඉවත් කරන්න 2018 දෙසැම්බර් 31වැනි දා වනතෙක් තිබෙන බලපත්‍ර **අනුව** විතරක් **අවසර** දීලා තිබෙනවා. 2018 දෙසැම්බර් 31වැනි දායින් පස්සේ බලපත්‍ර නිකුත් කිරීම නවත්වන්න අපි බලාපොරොත්තු වනවා. අලුත් බලපත්‍ර කොහොමත් නිකුත් කරන්නේ නැහැ. පැරණි බලපත්‍ර විතරයි 2018.12.31 දින දක්වා තවමත් ක්‍රියාත්මක වෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

## II

## ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවට එරෙහි දූෂණ චෝදනා
## இலங்கை கிரிக்கெட்டுக்கு எதிரான ஊழல் குற்றச்சாட்டுகள்
## CORRUPTION CHARGERS AGAINST CRICKET IN SRI LANKA

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ මෙම ප්‍රකාශය කිරීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව ආශ්‍රිතව විශාල ලෙස දූෂණ හා අක්‍රමිකතා සිදු වී ඇති බවට ජාත්‍යන්තර චෝදනා එල්ල වෙමින් තිබීම හේතුවෙන් ඇති වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

තරග ජයග්‍රහණය කිරීම හෝ පරාජය වීම නොසලකා ශ්‍රී ලංකාව මෑත කාලීනව ලෝකය තුළ ප්‍රසිද්ධියට පත් කළා වූ එක් ක්ෂේත්‍රයක් වනුයේ ක්‍රිකට් ක්‍රීඩාවයි. එසේම භේදයකින් තොරව රටම එකතු වී ක්‍රිකට් ක්‍රීඩාවටත්, ක්‍රීඩකයින්ටත් ආදරය කරමින් සිටිනවා. එහෙත් අන් බොහෝ ක්ෂේත්‍රයන්ට මෙන්ම ක්‍රිකට් ක්‍රීඩාවටද දූෂණ චෝදනා එල්ලවනු පසුගිය වසර කිහිපය පුරා දෙස් විදෙස් ජනමාධ්‍ය ඔස්සේ අසන්නට, දකින්නට ලැබුණා. මෙහි උච්ඡතම අවස්ථාවක් වන්නේ, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයේ දූෂණ විමර්ශන ඒකකයේ නිලධාරීන් ලංකාවට පැමිණ මේ වන විට පරීක්ෂණ කටයුතු සිදු කරමින් සිටීමයි.

මුදලට තරග පාවා දීමේ චෝදනා, ඔටුවුවලට අනුව තණතිලි වෙනස් කරලීමේ චෝදනා මෙන්ම, ක්‍රිකට විකාශන අයිතිය ලබා දීමේදී දූෂණ හා වංචා සිදු වී ඇති බවටද කරුණු වාර්තා වෙමින් තිබෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව හා එංගලන්තය අතර ක්‍රිකට් තරගාවලියේ විකාශන අයිතිය පැවරීමේදී ඩොලර් මිලියන 5.5ක මුදලක් වංචා කිරීමට උත්සාහ ගෙන තිබෙන බවට බරපතළ චෝදනාවක්ද එල්ල වී තිබෙනවා. එසේම තරග පාවා දීම්වලට ඇතැම් ක්‍රීඩකයින් සම්බන්ධ බවට හෙළිදරව් වී ඇති බවද අමාත්‍යවරයා විසින් ප්‍රකාශකොට තිබෙනවා. මෙය හුදු පුද්ගලයින් සම්බන්ධ ප්‍රශ්නයක් පමණක් නොව, රටේ කීර්ති නාමය සහ ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවේ අනාගතය පිළිබඳ කරුණක්ද වනවා.

ලංකාවේ ක්‍රිකට් සම්බන්ධයෙන් භයානක තත්ත්වයක් ඇති වී ඇතැයි ජාත්‍යන්තර විමර්ශන නිලධාරීන් විසින් ප්‍රකාශ කළ බව ක්‍රීඩා අමාත්‍යවරයාම පසුගිය දා ප්‍රකාශ කර තිබීම නිසා මෙහි බරපතළකම පැහැදිලියි.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට ගරු ඇමතිතුමා පිළිතුරු ලබාදෙනු ඇතැයි මා බලාපොරොත්තු වනවා.

01. ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලය විසින් මේ පිළිබඳව රජය වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබ තිබේද? ලබා දී ඇති තොරතුරු මොනවාද?

02. ලැබී ඇති වාර්තා හෝ හෙළිදරව් වී ඇති කරුණු පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාවේ පාර්ශ්වයෙන් පරීක්ෂණ සිදු කර තිබේද?

    ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයට අමතරව තමුන්නාන්සේලා විසින් පරීක්ෂණයක් සිදුකර තිබේද කියන එකයි මේ අහන්නේ.

03. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පරීක්ෂණවල මේ වන විට ප්‍රගතිය කවරේද?

04. අනාවරණය වන තොරතුරු සම්බන්ධයෙන් සහ ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා ආණ්ඩුවේ මැදිහත්වීම කවර ආකාරද?

ගරු ඇමතිතුමනි, දැනට යම් යම් ගිණුම් හරහා ඇමෙරිකා එක්සත් ජනපදයේ ගිණුම් වෙත මුදල් මාරු වී ඇති බවටද යම් සඳහනක් තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමා මේ පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරනවාද කියාත් මම දැන ගන්න කැමැතියි.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

01. a) මෙතෙක් එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නැත.

    b) පැන නොනඟී.

02. ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයේ දූෂණ පිටුදැකීමේ කාර්ය පටිපාටි සංග්‍රහය - International Cricket Council Anti-Corruption Code - ප්‍රකාරව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා

තරගවලට අදාළ දූෂණ චෝදනා පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමේ බලය එකී කවුන්සලය සතු වේ. එම කවුන්සලයේ සාමාජික රටවලට කිසිදු ජාත්‍යන්තර තරගයකට අදාළව නැඟෙන දූෂණ චෝදනා විමර්ශනයට බලතල නොමැත.

03. ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයේ දූෂණ පිටු දැකීමේ ඒකකය පවත්වනු ලබන සියලු විමර්ශන අතිශය රහස්‍යභාවයකින් යුක්තව සිදු කෙරේ. ඒ නිසා පරීක්ෂණයක් සිදු වන අතරතුර එහි ප්‍රගතිය පිළිබඳව තත්ත්වය අදාළ සාමාජික රටවලට වාර්තා කිරීමක් සිදු කරනු නොලබයි. පරීක්ෂණ නිමා වූ පසු කවුන්සලය විසින් ඊට අදාළව සියලු අනාවරණ සිදුකොට, සුදුසු පරිදි දඬුවම් පැමිණවීම කරනු ලබයි. මේ නිසා ශ්‍රී ලංකාවට අදාළව සිදුවෙතැයි පැවසෙන පරීක්ෂණවලින් අනාවරණය වන තොරතුරු සම්බන්ධයෙන් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයෙන් නිවේදනයන් කරන තුරු පූර්ව නිගමනයන් කළ නොහැකිය.

04. ක්‍රිකට් ක්‍රීඩාවේ විනිවිදභාවය සහතික කිරීමට හා දූෂණ පිටුදැකීමට ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයේ දූෂණ විමර්ශන ඒකකයක් ශ්‍රී ලංකාවේ පිහිටුවීමට රජය විසින් දැනටමත් යෝජනාවන් ඉදිරිපත් කර ඇත.

තරග පාවාදීම හා ක්‍රීඩාව ආශ්‍රිත වෙනත් දූෂණ ක්‍රියා සාපරාධී අපරාධ බවට පත් කරමින්, ඒ සම්බන්ධයෙන් නෛතික පියවර ගැනීම සඳහා පනත් කෙටුම්පතක් සැකසීමට මේ වන විට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට පවරා ඇත. ඊට අමතරව, ලංකාවේ ක්‍රීඩා නීතියේ ද අවශ්‍ය සංශෝධන කිරීම අරමුණු කොට නීතිපති සමඟ සාකච්ඡා අරඹා ඇත.

ඊළඟට, ඇමෙරිකන් ඩොලර් 187,000ක මුදලක් ගැන අනුර දිසානායක මන්ත්‍රීතුමා ඇහුවා. ඒ සඳහා ඇමෙරිකාවේ "ශ්‍රී ලංකා ක්‍රිකට්" කියන ගිණුම open කර තිබෙනවාය කියා අනාවරණය වෙලා තිබෙනවා. එම මුදල ඒ ගිණුමට බැර වෙලා තිබෙනවා. ඊට අමතරව, ඩොලර් මිලියන 5.5ක මුදලක් remit කරන්න තැත් කිරීම සම්බන්ධයෙනුත් අපට කරුණු අනාවරණය වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කිරීම අපි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදී තිබෙනවා. දැන් එහි විමර්ශන කටයුතු කරගෙන යනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාම කියනවා, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයේ දූෂණ පිටුදැකීමේ ඒකකයෙන් පැමිණි කණ්ඩායම කරන ඒ පරීක්ෂණ පිළිබඳ කරුණු කිසිවක් පරීක්ෂණ අහවර වන තෙක් ලබා නොදෙන බව. හැබැයි, අපේ ක්‍රිකට්වල භයානක තත්ත්වයක් තිබෙන බව එම නිලධාරීන් විසින් ඔබතුමාට ප්‍රකාශ කළාය කියා ඔබතුමාම මාධ්‍යවලට ප්‍රකාශ කර තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතකොට ඒකෙන් යම් ඉඟියක් ලැබෙනවා. පරීක්ෂණවලින් තහවුරු නොවුණත්, ඔබතුමා මාධ්‍ය හරහා යම් ඉඟියක් ලබා දී තිබෙනවා, මෙම පරීක්ෂණවලට අනුව යම් භයානක ක්‍රියාවලියක් සිදු වන බව. මම එය ඔබතුමාගේම වචනවලින් කියන්නම්. "භයානක තත්ත්වයක් ඇති වී තිබෙන බව" කියා තමයි ඔබතුමා කිව්වේ. ඒ වාගේම, මේ කණ්ඩායම ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයාත් මුණ ගැසුණු බව තවත් මාධ්‍ය වාර්තාවල සඳහන් වී තිබුණු ආකාරය මම දැක්කා. එතකොට ඒක තවත් භයානකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දූෂණ පිටුදැකීමේ කණ්ඩායමක් පරීක්ෂණයක් කරනකොට, ඒ අය එම රටේ ඉන්න ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා මුණ ගැසෙනවා නම්, එයින් පෙන්නුම් කරන්නේ මොකක්ද? මේ තත්ත්වය තවත් භයානක බව තමයි එයින් දෙන ඉඟිය වන්නේ. එය භයානකද, නැද්ද කියා මම දන්නේ නැහැ. නමුත් එයින් දෙන ඉඟිය ඒකයි. "එම කණ්ඩායම ජනාධිපතිතුමා හමු වුණා, ජනාධිපතිතුමාටත් මෙහෙම කිව්වා; අගමැතිතුමාත් හම්බ වුණා, අගමැතිතුමාටත් මෙහෙම කිව්වා" කියා තමයි වාර්තා වී තිබෙන්නේ. එතකොට, ඒ කණ්ඩායම ජනාධිපතිවරයා හෝ අගමැතිවරයා මුණ ගැසෙන්න ඉල්ලීමක් කළාද, එහෙම නැත්නම්, ජනාධිපතිවරයා හෝ අගමැතිවරයා එම කණ්ඩායම මුණ ගැසිය යුතුයි කියා කිව්වාද, එය සිදු වී තිබෙන්නේ කෙසේද, ඔවුන් එතුමන්ලා හමුවට ගොස් මේ ගැන වාර්තා කළාද කියා මම දැන ගන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, මෙය භයානක තත්ත්වයක් යැයි මාධ්‍යවලට කියන්න, ඔබතුමාට ඔවුන් විසින් කරන ලද ප්‍රකාශයන් කවරේද කියාත් මම දැනගන්න කැමැතියි.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

මේ Anti-Corruption Unit එක අතිගරු ජනාධිපතිතුමා සහ අගමැතිතුමා හමු වුණා; ඒ අය මාවත් හමු වුණා. අපට තරුණ කණ්ඩායමක් ඉන්නවා. අපේ team එක corrupt කරන්න තුන්වන පාර්ශ්වයක් උත්සාහයක් දරයි කියන බය මේ Anti-Corruption Unit එකට තිබෙනවා.

එම නිසා ඒ අවදානම් තත්ත්වය ඔවුන් අපට පැහැදිලි කළා. හැබැයි, ඔවුන් කිසිම ක්‍රීඩකයකු හෝ කිසිම කෙනෙකු නම් කිරීමක් කළේ නැහැ. ඒ උදවිය ඕනෑම රටකට ගිය අවස්ථාවකදී, යම් අවදානම් තත්ත්වයක් තිබෙනවා නම්, එහෙම තත්ත්වයක් තිබෙනවාය කියා පැහැදිලි කරනවා. ඔවුන් අතිගරු ජනාධිපතිතුමා සහ අගමැතිතුමා හම්බ වෙලා කිව්වෙත්,- [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් හම්බ වෙන්න ඒ ගොල්ලන් අවස්ථාවක් ඉල්ලුවාද?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

අගමැතිතුමායි, ජනාධිපතිතුමායි හම්බ වෙන්න ඒ ගොල්ලන්ට අවශ්‍යතාවක් තිබුණා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මෙකයි තත්ත්වය. ඒ ගොල්ලන් නම්, ගම් හෙළිදරව් කරන්නේ නැහැ. හැබැයි, අවසානයකට වාගේ, අද අන්තර්ජාලය තුළ නොයෙක් නම් දකින්න ලැබෙනවා. එය අපේ ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ ආත්ම ගෞරවයටත් පහරක්. ඒ වාගේම තවත් නොයෙක් උදවියටත් පහරක්. ඒ ගොල්ලන් කිසිම කෙනෙකුගේ නමක් සඳහන් කළේ නැහැ. හැබැයි, ඒ උදවිය අපට කියන්නේ "යම් ක්‍රියාමාර්ගයක් ගන්න, නීති රාමුව පුළුවන් තරම් ඇතුළත් කරන්න" කියායි. ඒ වාගේම ක්‍රීඩා ඇමතිවරයා හැටියට මගෙන් ඒ අය ඉල්ලීමක් කළා, ඒකකයක් පිහිටුවීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙන්න කියා. හැබැයි, මෙහිදී අපි සියලුදෙනාම බැලිය යුත්තේ මේ ප්‍රශ්නයට ලබා දිය හැකි විසඳුම් මොනවාද කියායි. අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඕනෑම රටක තරුණ ක්‍රිකට් කණ්ඩායමක් ඉන්න කොට භයානක තත්ත්වයක් තිබෙනවා. ඒ උදවිය මට කිව්වේ අපේ කණ්ඩායම ආරක්ෂා කරන්න අවශ්‍ය නීති සහාය ලබා දෙන්න කියායි.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

තරුණ අයට විතරද, ගරු ඇමතිතුමනි?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමනි, ඒ අය මට පැහැදිලි කරලා කිව්වේ, තරුණ කණ්ඩායමක් ඉන්න කොට risk එකක් තිබෙනවා කියායි. මම ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් මේ කරන්නේ. They are vulnerable. "පුළුවන් තරම් නීති රාමුව ගේන්න, ඒවාට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙන්න" කියා ඔවුන් කිව්වා. හැබැයි, ඒ අය කිසිම කෙනෙකුගේ නමක් සඳහන් කළේ නැති බව මම වග කීමකින් කියනවා. අපේ ක්‍රිකට් ක්‍රීඩකයන් මෙවැනි සිද්ධීන්වලට කිසිසේත්ම සම්බන්ධ නැති බව මම විශ්වාස කරනවා. නමුත්, vulnerable තත්ත්වයක් තිබෙනවාය කියන එක තමයි ඒ ගොල්ලන් පැහැදිලි කළේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, කිසිදු ක්‍රීඩකයකුගේ නම්, ගම් සඳහන් වුණේ නැති බව ඔබතුමා දැන් කිව්වා. නමුත්, මේ තත්ත්වය ගොඩ නැහෙන්නේ නිකම් නොවෙයි නේ? එක පැත්තකින් එම කණ්ඩායම අග්‍රාමාත්‍යවරයා සහ ජනාධිපතිවරයා හම්බවෙනවා. ඔවුන් අපේ රටට ඇවිල්ලා තේ බොන්න හෝ කළු කෝපි බොන්න හෝ ගියා නොවෙයි කියා ඒකෙන්ම පෙන්නුම් කරනවා. මේ සිද්ධිය තුළ යම් භයානක තත්ත්වයක් තිබෙනවාය කියන හැඟීමක් තමයි ඒකෙන් උත්පාදනය කරන්නේ.

ගරු ඇමතිතුමනි, භයානක තත්ත්වයක් තිබෙනවාය කියා ඔබතුමාත් ප්‍රකාශ කරනවා. එතකොට, ක්‍රිකට් ක්‍රීඩාව ඇතුළේ විශාල වංචා, දූෂණ, තරග පාවාදීම් වැනි කරුණු සිද්ධ වන බවට මේ තුළින් යම් පදනමක් සකස් වනවා; පසු බිමක් හැදෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එවැනි පසු බිමක් හැදුණාට පස්සේ, නොයෙක් කණ්ඩායම් ක්‍රීඩකයන්ගේ නම් ඒකට සම්බන්ධ කරනවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමා කිසිදු තැනක, කිසිදු ප්‍රකාශයක් කරනවා මෙතෙක් මම දැක්කේ නැහැ. අද මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම ගැන ඔබතුමාට මම ස්තුතිවන්ත වනවා. මෙම ඒකකයෙන් කිසිදු ක්‍රිකට් ක්‍රීඩකයකු නම් කර නැති බවත්, ඔවුන් අවධානය යොමු කළේ මෙවැනි ප්‍රශ්නයකටය කියන එකත් ඔබතුමා මෙතෙක් කිව්වේ නැහැ.

නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් රට තුළ මතු වී තිබෙන තත්ත්වය මොකක්ද? දැනටත් අපේ කණ්ඩායමේ සෙල්ලම් කරන සමහර ක්‍රීඩකයන්ගේ නම් සමඟ තමයි දූෂණ චෝදනා එල්ල කර තිබෙන්නේ. එම නිසා මම හිතනවා මෙය නිවැරැදි කිරීම සඳහා පියවර ගන්න අමාත්‍යාංශය පැත්තෙන් විශාල වගකීමක් තිබෙනවා කියා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

මම වගකීමකින් කියනවා, මා මීට කලින් ප්‍රකාශයක් කළ බව. මම විවෘතව මාධ්‍යයට කිව්වා, කිසිම නම් ගම් සඳහන් කිරීමක් නැහැ කියා. මේ උදව්ය අපට පැවසුවේ අවදානම් තත්ත්වයක් තිබෙනවා කියායි. ඒ සම්බන්ධයෙන් අපට නෛතික ක්‍රියා මාර්ග ගන්නත්, තාක්ෂණික- [බාධා කිරීමක්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මම වගකීමෙන් යුතුව කියනවා, මා ප්‍රකාශයක් කළ බව. එය මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වුණේ නැති එක ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. හැබැයි, මම කිසිසේත් මගේ වගකීම් පැහැර හැර නැහැ. මම ප්‍රකාශයක් කළා. අපේ ක්‍රීඩකයන්ගේ නම් සඳහන් කර තිබුණා. නොයෙක් අයගේ නම් සඳහන් කර තිබුණා. ඒ ගැන මමත් කනස්සල්ලට පත් වුණා. කෙනෙකුගේ නමක් දැම්මා නම්, එය ඒ පුද්ගලයාගේ ආත්ම ගෞරවයට පහරක්. ඒ නිසා මා මේ ගරු සභාවටත් කියන්නේ මෙකයි. මා දිගටම කියූ දෙයක් තමයි, චූදිතයකු වශයෙන් නම් කරන තාක් කිසිම කෙනෙකුගේ නමක් සඳහන් වීමක් කෙරෙන්නේ නැහැ කියන එක. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මම කලිනුත් දිගින් දිගටම ප්‍රකාශ කළා, කිසිම කෙනෙකුගේ නමක් ගමක් සඳහන් කිරීමක් නැති බව. Anti -Corruption Unit එකේ සාමාන්‍ය inquiry එකක් කරනකොට යමෙකු චූදිතයකු වන තුරු කිසිම නමක් සඳහන් කරන්නේ නැති සම්ප්‍රදායයක් ඒ උදව්යගේ තිබෙනවා. හැබැයි, රටක් හැටියට ලංකාවට යම් යම් තත්ත්වයන් උදා වෙලා තිබෙනවා කියන එක ඒ අය පැහැදිලි කරනවා. දෙයක් වුණාට පසුව වැඩක් නැහැ නේ, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. ඒ අය වගකීමකින් කියන්නේ, අවදානම් තත්ත්වයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් බලා ගන්න- [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අවදානම් තත්ත්වයක් තිබෙනවා කියන්නේ, අනාගතයේ ප්‍රශ්නයක් නේ.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එහෙම නම්, පරීක්ෂණයක් පැවැත්වෙන්නේ මොකටද?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

මෙතැන Anti-Corruption Unit- [බාධා කිරීමක්] එංගලන්තය, South Africa සහ ඕස්ට්‍රේලියාව කියන රටවල තමයි තරග පාවා දීම සම්බන්ධ නීතිය තිබෙන්නේ. මුලින්ම අපට නීති රාමුවක් තිබෙන්න ඕනෑ නේ. හැබැයි මම බලාපොරොත්තු වෙනවා, ඕනෑම ක්‍රීඩකයකු හෝ සංගමයක නිලධාරියකු රාජ්‍ය නිලධාරියකු හැටියට සලකන්න. එතකොට අපට එය Bribery Act එකට ඇතුළු කර කරන්න පුළුවන් කියන විශ්වාසය තිබෙනවා. හැබැයි, මා තවම නීතිපතිතුමාත් සමඟ මේ සම්බන්ධයෙන් කතා කර නැහැ. කොච්චර කථා කළත් අප නීති සම්පාදනය කළේ නැති නම් අප හැමදාම කතා කරනවා විතරක් වේවි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔබතුමාට ඒ වගකීම පැවරී තිබෙනවා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ඔව්, ඒ වගකීම ඉටු කරන බවට මම මේ ගරු සභාවට පොරොන්දුවක් දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. මීළඟට, අමාත්‍යාංශ නිවේදන. උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා.

# පුරාවිද්‍යාත්මක ස්ථාන විනාශ වන බවට පළවන අසත්‍ය මාධ්‍ය වාර්තා: උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

# தொல்பொருள் இடங்கள் அழிவதாக வெளியான உண்மையற்ற ஊடக அறிக்கைகள்: உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரினது கூற்று

# FALSE MEDIA REPORTS ON DESTRUCTION OF ARCHEOLOGICAL SITES: STATEMENT BY MINISTER OF HIGHER EDUCATION AND CULTURAL AFFAIRS

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේ මේ කරුණු විශේෂයෙන්ම මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න තීරණය කළේ, අපේ රටේ ඉතා වටිනා පුරාවස්තු සහ පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන විනාශ වනවා කියා මේ දිනවල නිරන්තරයෙන්ම මාධ්‍ය තුළින් විශාල ප්‍රචාරයක් ගෙන යාම නිසායි.

ඒවා ආගමික භේද ඇති කිරීමේ යටි අරමුණෙන් කරන බවට සමහර මාධ්‍ය කරුණු ඉදිරිපත් කරනවා. ජාතීන් වශයෙන් යම් යම් මත භේද ඇති වන ආකාරයට තොරතුරු ඉදිරිපත් කිරීම් සිදු වෙනවා. එම නිසා 2016 ජනවාරි මාසයේ 01 වැනිදා සිට 2018 ජූලි මාසයේ අවසානය දක්වා පුරාවිද්‍යා පනත යටතේ සිදු වුණු වැරදි පිළිබඳව දත්ත සහ සංඛ්‍යා ලේඛන මම මේ අවස්ථාවේදී මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

මෙම අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ පුරාවස්තු සොරකම් කිරීම් 36ක්, පුරාවස්තු විනාශ කිරීම් 75ක්, පුරාවස්තු සෙවීමට අනවසර කැණීම් සිදු කිරීම් 515ක්, පනතට ගැනෙන වෙනත් වැරදි 51ක් වශයෙන් මෙම පුරාවිද්‍යා පනත උල්ලංඝනය කිරීම් 677ක් සිද්ධ වෙලා තිබෙනවා.

අද මාධ්‍ය මඟින් පළ වන කරුණු අනුව, විශාල වශයෙන් මතයක් හදා තිබෙනවා, පුරාවස්තු විනාශ කිරීම්, සොරකම් කිරීම් සිදු කරනු ලබන්නේ උතුරු සහ නැඟෙනහිර පළාතේ ජීවත් වන ජනතාව සහ ඒ ප්‍රදේශවල ඉන්න උදවිය කියා. ඒ අතින් ගත්තාම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තොරතුරු ඉතාමත් වැදගත් වෙනවා. මේ ආකාරයේ පුරාවස්තු වැරදි 677 අතුරෙන් වැඩිම වැරදි සංඛ්‍යාවක් සිද්ධ කර තිබෙන්නේ, බහුතර සිංහල බෞද්ධ ජනතාව ඉන්න දිස්ත්‍රික්කවලයි. අනුරාධපුරයේ පුරාවස්තු වැරදි සංඛ්‍යාව 178යි. කුරුණෑගල පුරාවස්තු වැරදි සංඛ්‍යාව 75යි. මොනරාගල පුරාවස්තු වැරදි සංඛ්‍යාව 58යි. බදුල්ලේ පුරාවස්තු වැරදි සංඛ්‍යාව 41යි. මහනුවර පුරාවස්තු වැරදි සංඛ්‍යාව 36යි. මාතලේ පුරාවස්තු වැරදි සංඛ්‍යාව 28යි. පොළොන්නරුවේ පුරාවස්තු වැරදි සංඛ්‍යාව 28යි. හම්බන්තොට පුරාවස්තු වැරදි සංඛ්‍යාව 26යි. ගම්පහ පුරාවස්තු වැරදි සංඛ්‍යාව 23 යි. රත්නපුරය පුරාවස්තු වැරදි සංඛ්‍යාව 23යි. පුරාවස්තු වැරදි අඩුවෙන්ම සිද්ධ වුණු පළාත් තමයි විශේෂයෙන් උතුරු නැඟෙනහිර දෙපළාත. දිස්ත්‍රික් වශයෙන් ගත්තාම යාපනය පුරාවස්තු වැරදි 01යි. මන්නාරම පුරාවස්තු වැරදි 03යි. කිලිනොච්චිය පුරාවස්තු වැරදි 03යි. මුලතිව් පුරාවස්තු වැරදි 05යි. මඩකලපුව පුරාවස්තු වැරදි 06යි. අම්පාර පුරාවස්තු වැරදි 20යි. ත්‍රිකුණාමලය පුරාවස්තු වැරදි 24යි. මේ අතින් ගත්තාම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා, උතුරේ හෝ නැඟෙනහිර සිදුවුණු යම් හුදකලා වූ එක සිද්ධියක් හෝ දෙකක් අල්ලා විශාල වශයෙන් ජාතීන් අතර ඝට්ටනයක් ඇති කරන්න, ආගම් අතර ගට්ටනයක් ඇති කරන්න, ජාතිවාදය සහ ආගම් වාදය හදන්න අන්තවාදී කණ්ඩායම් ඉතා සුළු ප්‍රමාණයක් හැම තැනම, තැනින් තැන සිටින බව. අනුරාධපුරයේ තමයි වැඩියෙන්ම පුරාවස්තු වැරදි සිදු වී තිබෙන්නේ. සිදු වීම් 178ක් තිබෙනවා. කුරුණෑගල පුරාවස්තු වැරදි 75ක් සිදු වී තිබෙනවා. මෙයින් අද බොහොම පැහැදිලිව තිබෙනවා. මාධ්‍යයත් නොමඟ ගිහින් තිබෙනවා. මාධ්‍ය තොරතුරු තුළින් මුළු රටේම ජනතාවත් නොමඟ ගිහින් තිබෙනවා. මේ පළාත්වල ජනතාව ආගම් භේදයකින් තොරව, ඉතාමත් සාමයෙන් සමඟියෙන් ජීවත් වෙනවා. සාමය උහුලන්නට බැරි අය සිංහල සමාජයේත්, දෙමළ සමාජයේත්, මුස්ලිම් සමාජයේත් ඉතාමත්ම අතලොස්සක් -සුළු ප්‍රමාණයක්- සිටිනවා. අද මේ තොරතුරු ගලනය වෙන්නේ මේ දෙතුන් දෙනෙකුගේ අවශ්‍යතාවයන් ඉෂ්ට කර ගන්නටයි. එම නිසා මෙම ගරු සභාවත්, ජනතාවත් මේ පිළිබඳව දැනුවත් කිරීම මගේ යුතුකමක් විධියට මම සලකනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැරදි අතරින් අප බරපතළ විධියට සලකන්නේ පුරාවස්තු සොරකම් කිරීමයි. මේ අවුරුදු දෙකහමාරට පුරාවස්තු සොරකම් කිරීම් 36ක් සිදු වෙලා තිබෙනවා. මහනුවර තමයි වැඩියෙන්ම සිදුවෙලා තිබෙන්නේ. මහනුවර 09ක් සිදු වෙලා තිබෙනවා. අනුරාධපුරයේ 06ක් සිදු වෙලා තිබෙනවා. කෑගල්ල 05ක් සිදු වෙලා තිබෙනවා.

ඊළඟට පුරාවස්තු විනාශ කිරීම් ගැන කියන්නට ඕනෑ. පුරාවස්තු විනාශ කිරීම් ඔය කාලසීමාව තුළදී 75ක් සිදු වෙලා තිබෙනවා. ඒවා බරපතළ ගණයේ ඒවා. ඒ අතරින් වැඩිම ප්‍රමාණයක් පුරාවස්තු විනාශවෙලා තිබෙන්නේ අනුරාධපුරයේ. පුරාවස්තු විනාශවීම් අනුරාධපුරයේ 13යි, මහනුවර 11යි, කුරුණෑගල 08යි, ගම්පහ 06, මාතර 06යි. ඒ අනුව බොහොම පැහැදිලිව පෙනෙනවා, උතුරු- නැඟෙනහිර යම් කිසි අර්බුදයක් නිර්මාණය කිරීම පිණිසම සමහර තොරතුරු විකෘති කර සමාජගත කිරීමේ ක්‍රියාවලියක් අපේ රටේ සිද්ධ වෙන බව. එය ජාතික සංහිඳියාවට බරපතළ බාධාවක්.

ඒ එක්කම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දකින්නට ඇති, මීට දවස තුන හතරකට කලින් "ලංකාදීප" පුවත්පතේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවක් සම්බන්ධව පළ වුණ බව. එහි ප්‍රධාන ශීර්ෂ පාඨය විධියට සඳහන් වුණා, වවුනියාවේ විශ්වවිද්‍යාලයේ බුදු පිළිමයක් තියන්න දුන්නේ නැත. එහි බුදු පිළිමයක් තියන්න ගිය ශිෂ්‍යයන්ගේ පත්ති තහනම් කිරීමක් කරලා, ඒ පිළිබඳව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කළා කියා.

නමුත්, ඒ පුවත් පත ඉදිරිපත් කරපු ප්‍රධාන ශීර්ෂයෙන් රටට, ජනතාවට දෙන පණිවුඩය නඩුව ගැන නොවෙයි. "වවුනියාව විශ්වවිද්‍යාලයේ ඉන්න සිංහල බෞද්ධ ශිෂ්‍යයන්ට බුද්ධාගම අදහන්න බුදු පිළිමයක් ගෙනියන්න තරම්වත් අද අවස්ථාවක් උතුරු-නැඟෙනහිර නැහැ" කියන ජාතිවාදී මතය වපුරන ආකාරයට තමයි ඒ ප්‍රවෘත්තිය ඉදිරිපත් කරලා තිබුණේ. ඒක අලුත් කාරණයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක මීට පෙර වුණු සිද්ධියක්. වවුනියාව විශ්වවිද්‍යාලයේ ආගම් හතරම අදහන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉන්නවා. ඒ කණ්ඩායම් හතරටම ප්‍රමාණවත් විධියට තම තමන්ගේ ආගම් අදහන්න ආගමික ස්ථාන හතරක් වෙන වෙනම ඒ උදවියට හදලා දීලා තිබෙනවා. සිංහල බෞද්ධයෙක් විධියට මට කියන්න කනගාටුයි, වවුනියාව විශ්වවිද්‍යාල මණ්ඩපයේ බෞද්ධ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තමන්ගේ ආගම අදහන්න බුදු පිළිමය හදලා දීපු තැන තමයි සියලු දුරාචාරයන් සිද්ධ වෙන්නේ. කසිප්පු බොන ඒවා, ගංජා බොන

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ඒවා පවා සිද්ධ වෙන්නේ මේ බුදු පිළිමයට මුවා වෙලා. මේ ශිෂ්‍ය කණ්ඩායම්වල ශිෂ්‍යයෝ කීප දෙනෙක් තමයි, මේ සියලු පහසුකම් තිබියදී පීයාධිපතිට නොදන්වා විශ්වවිද්‍යාලයේ පොදු ස්ථානයක බලහත්කාරයෙන් ස්ථාවර බුදු පිළිමයක් ඉදිකරන්න කටයුතු කළේ. ඒ ඉදිකිරීම වළක්වන්න ගියාට පස්සේ තමයි මෙතැන විශාල ඝට්ටනයක් ඇති වුණේ.

ඊට පස්සේ විශ්වවිද්‍යාලය විධියට ඒ උදවියට සිද්ධ වුණා, විනය තීන්දු තීරණ ගන්න. ඒ අනුව පන්ති තහනම් කිරීමක් සිද්ධ වෙලා තිබෙනවා. නමුත්, ඒක වවුනියාව මණ්ඩපයේ හෝ යාපනයේ දෙමළ ජනතාව, බෞද්ධයන් බුද්ධාගම අදහන එකට කරපු බාධාවක් නොවෙයි. ඔය ශිෂ්‍ය කණ්ඩායමේ නායකයා පෙරටුගාමී ශිෂ්‍යයෙක්. ඔහුගේ පියා අපේ රටේ ගෞරවනීය භික්ෂූන් වහන්සේ නමක් සමඟ ඇවිල්ලා මාව මුණ ගැහිලා මීට මාසයකට විතර කලින් සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදී අපේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමාත්, මමත්, ලේකම්තුමාත් මේකේ වෙච්ච ඇත්ත සිද්ධිය මේ ශිෂ්‍යයාට පහදලා දුන්නාට පස්සේ, ඔහු ඒක පිළිගත්තා. ඔහු කිව්වා, "අපට සමාවෙන්න" කියලා. ඒ භික්ෂූන් වහන්සේයි, පියායි කිව්වා, "මේ ගොල්ලන් වරදක් තමයි කරලා තිබෙන්නේ. පුළුවන් නම් මේකට සමාව දීලා, මේ ශිෂ්‍යයන්ට ආපහු ඉගෙන ගන්න අවස්ථාව දෙන්න" කියලා. ඒ හැරෙන්න වවුනියාව මණ්ඩපය තුළ ආගමික වශයෙන් අසාධාරණයක් සිද්ධ වුණේ නැහැ කියන කාරණය බොහොම පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ එක්කම තවත් සිද්ධි ගණනාවක් පිළිබඳව සොයා බලන්න උතුර සහ නැඟෙනහිර පළාත්වලට මම පෞද්ගලිකව ගියා. වවුනියාව ප්‍රදේශයට විශේෂයෙන්ම ගියා. සමහර ස්ථානවල බුදු පිළිමවලට තාර ගහලා තිබුණා. සමහර ස්ථානවල බුදු පිළිම කීපයකටම හානි කරලා තිබුණා. මේ පිළිබඳව කරුණු පරීක්ෂා කිරීමේදී මට දැනගන්න ලැබුණු දේ තමයි, මේ බුදු පිළිම බොහොමයක් තිබුණේ තාවකාලික හමුදා බණ්ඩ පවත්වාගෙන ආපු ස්ථානවල බව. මේ තාවකාලික හමුදා බණ්ඩ ආරම්භ කරන වෙලාවේදී ඒ ප්‍රදේශයේ බෞද්ධ භික්ෂු බලමණ්ඩලවල සභාපති, ලේකම් හාමුදුරුවරු උපදෙස් දීලා තිබෙනවා, "තාවකාලිකව ඉදිකරන හමුදා බණ්ඩ ගලවා ගෙන යන නිසා, ස්ථිර බුදු පිළිම මේ තැන්වල සවි කරන්න එපා" කියලා. නමුත්, ඒවා අහන්නේ නැතිව සමහර තැන්වල ස්ථිර බුදු පිළිම සවි කරලා තිබෙනවා.

ඉන් පසුව හමුදා බණ්ඩ අකුලා ගෙන එනකොට බුදු පිළිමය විතරක් එනැන තියලා ඇවිත් තිබෙනවා. ඒ විධියට බුදු පිළිම තියලා ආවාට පස්සේ සමහර වෙලාවට කවුරු හෝ ඒ පිළිමයට තාර ටිකක් විසි කළා වෙන්න පුළුවන්. සමහර විට අපට හිතෙනවා, දකුණෙන් ගිය සමහරු හිතා මතාම බුදු පිළිමයට තාර විසි කරලා ෆොටෝ ගහලා ගෙනැල්ලා, "උතුරේ බුදු පිළිමයක්වත් තියා ගන්න දෙන්නේ නැති තත්ත්වයක් තිබෙන්නේ" කියලා දකුණේ පෙන්වනවා ද කියලාත්. ඒක තමයි අද ඒ පිළිබඳ තත්ත්වය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුරාවිද්‍යා පනත ගැන කථා කරද්දී ඔබතුමාගේ බල ප්‍රදේශය වන කතරගම ගැනත් විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. කතරගම ප්‍රදේශයේ අද වන විට ඉතා ගැටුම්කාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වල්ලිගුහාව පන්සල ඉතා පැරණි පන්සලක් බව ඔබතුමා දන්නවා. ඒ පන්සලේ තිබුණේ සාංඝික ඉඩමක්. ඒ සාංඝික ඉඩම පසුගිය රජයේ දේශපාලන බලවතෙක් කැලි කැලිවලට කඩලා, වැටවල් ගහලා තමන්ගේ ආධාරකරුවන්ට බාර දීලා තිබෙනවා. ඒ පන්සලේ හිටපු නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඉතා අසනීප තත්ත්වයෙන් වයෝවෘද්ධව හිටියේ. ඒ භික්ෂූන් වහන්සේ භය කරලා මේ කාර්ය සිද්ධ කළා. වර්තමානයේ ඉන්න අනුප්‍රාප්තික භික්ෂූන් වහන්සේගෙන් මේවාට ලියකියවිලි, ඔප්පු කඩදාසි ලබා ගැනීම සඳහා විශාල බලපෑමක්, තෙරපුමක් උන්වහන්සේලාට තිබුණා; දැනටත් ඒ බලපෑම තිබෙන බව අපි දන්නවා.

ඔය ඉඩම් ලබා ගැනීමේදී ඒ ප්‍රදේශයේ සිවිල් සේවයේ ප්‍රබලම නිලධාරිනියකගේ ස්වාමි පුරුෂයකුත් එතැන ඉඩම් කොටසක් ලබාගෙන තිබෙනවා. ඒ ප්‍රදේශයේ පොලිසියේ ස්ථානාධිපතිත් මේකෙන් ඉඩමක් අරගෙන තිබෙනවා. එම නිසා ඒගොල්ලන්ට මේ ඉඩම් ඔප්පුවලින් ලබා දෙන්නේ නැහැයි කියන හේතුව පදනම් කරගෙන පුරාවිද්‍යා පනතට මුවාවෙලා, -එහි වගන්ති පාවිච්චි කරලා- පුරාවිද්‍යා පනත උල්ලංඝනය කළ බවට තිස්සමහාරාම අධිකරණයේ නඩුවක් ගොනු කරලා ඒ භික්ෂූන් වහන්සේ අත් අඩංගුවට ගැනීමට කටයුතු කරලා තිබෙනවා. මේක පුරාවිද්‍යා ප්‍රශ්නයක් නොවෙයි. පුරාවිද්‍යා පනත යටතේ නඩු පැවරීමට, එතැන තිබෙන පුරාවිද්‍යා දේපොළවලට කිසිදු හානියක් සිද්ධ වෙලා නැහැ. නමුත් ඉඩම් මංකොල්ල කෑමේ ව්‍යාපාරයක යෙදිලා සිටින රජයේ නිලධාරීන් සමඟ එකතුවෙලා පුරාවිද්‍යා පනත වැරදි විධියට පාවිච්චි කරලා භික්ෂූන් වහන්සේ නමක් හිරේ දාන තරමට අද මේ තත්ත්වය උග්‍ර වෙලා තිබෙනවා. අපි ඉතා වගකීමෙන් කියන්නේ, පුරාවිද්‍යා පනත සම්බන්ධයෙන් යම් වරදක් වුණා නම් අපි කිසිදු භේදයකින් තොරව, තරාතිරමකින් තොරව හැම ස්ථානයකම නීතිය ක්‍රියාත්මක කරලා තිබෙන බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛනය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා. ස්තූතියි.

***සභාමේසය මත තබන ලද ලේඛනය:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
*Document tabled:*

පරිපාලන දිස්ත්‍රික් අනුව පුරාවස්තු වැරදි සම්බන්ධ [illegible] වාර්තාව
**2016 ජනවාරි සිට 2018 ජූලි මස අවසානය දක්වා**

| අනු අංකය | පරිපාලන දිස්ත්‍රික්කය | පුරාවස්තු සොරකම | පුරාවස්තු විනාශය | පුරාවස්තු සෙවීමට අනවසර කැණීම් කිරීම | පනතට ගැනෙන වෙනත් වැරදි | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1 | අනුරාධපුර | 6 | 13 | 117 | 42 | **178** |
| 2 | පොළොන්නරුව | | | 28 | | **28** |
| 3 | පුත්තලම | | | 20 | | **20** |
| 4 | කුරුණෑගල | 3 | 8 | 64 | | **75** |
| 5 | කළුතර | 1 | | 7 | | **8** |
| 6 | කොළඹ | 1 | | 1 | | **2** |
| 7 | ගම්පහ | 2 | 6 | 14 | 1 | **23** |
| 8 | මන්නාරම | | 1 | 2 | | **3** |
| 9 | වවුනියාව | | 1 | 18 | | **19** |
| 10 | යාපනය | | | 1 | | **1** |
| 11 | කිලිනොච්චිය | | 1 | 2 | | **3** |
| 12 | මුලතිව් | 1 | | 4 | | **5** |
| 13 | මාතර | 1 | 6 | 11 | | **18** |
| 14 | ගාල්ල | | 5 | 5 | | **10** |
| 15 | හම්බන්තොට | 1 | 3 | 22 | | **26** |
| 16 | රත්නපුර | 1 | 2 | 17 | 3 | **23** |
| 17 | කෑගල්ල | 5 | 5 | 9 | | **19** |
| 18 | අම්පාර | | 1 | 18 | 1 | **20** |
| 19 | ත්‍රිකුණාමලය | | 1 | 22 | 1 | **24** |
| 20 | මඩකලපුව | | 1 | 4 | 1 | **6** |
| 21 | මහනුවර | 9 | 11 | 15 | 1 | **36** |
| 22 | මාතලේ | 1 | 2 | 25 | | **28** |
| 23 | නුවර එළිය | 2 | 1 | | | **3** |
| 24 | මොණරාගල | 2 | 4 | 52 | | **58** |
| 25 | බදුල්ල | | 3 | 37 | 1 | **41** |
| | **එකතුව** | **36** | **75** | **515** | **51** | **677** |

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු ඇමතිතුමනි, උත්තර ලබා දීමට ඔබතුමා කැමැති නම් මම පොඩි පැහැදිලි කර ගැනීමක් බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේ අවස්ථාවේදී ප්‍රශ්න අහන්නට පුළුවන්කමක් නැහැ.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක තමයි ගරු ඇමතිතුමාගේ කැමැත්ත මත විමසන්න කල්පනා කළේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අහන්නට බැහැ, එහෙම නම් ඔබතුමා වෙනම විවාදයක් ඉල්ලන්න.

අමාත්‍යාංශ නිවේදන අංක 2, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම මහතා.

## අපහාසාත්මක මාධ්‍ය වාර්තා : සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## அவதூறான ஊடக அறிக்கைகள்: அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சரினது கூற்று

## DEFAMATORY MEDIA REPORTS: STATEMENT BY MINISTER OF DEVELOPMENT STRATEGIES AND INTERNATIONAL TRADE

**ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)
Hon. Deputy Speaker, I wish to inform you that there seems to be a targeted attempt by certain sections of the social media and an electronic media channel in particular, to discredit me.

While I was in Germany on official work about 10 days ago, I was made to understand that a Director of Ceylon High Speed Railway Limited, a company who had sent a proposal to the Board of Investment to produce and export high speed trains, has accused the State Minister and myself of requesting for a commission of US Dollars 25 million to have the project proposal approved. This is totally a false allegation. In fact, I have never met this party, nor have I spoken to them or even seen the colour of them.

I do not wish to delve into the details of the process through which the BOI and the Single Window Investment Approval Committee approves the investment proposals submitted to the BOI, since the BOI Officials have given a detailed description of how the proposals are evaluated and approved. At no stage do the Ministers get involved in the approval process. However, I have requested for and received a report of this proposal from BOI, which I would like to **table***.

I would like to highlight some elements of the proposal submitted, so that Hon. Members of this House can see for themselves whether the proposal should be approved or not. Sir, the investor is a company set up in Sri Lanka on 09th April, 2015 with two local directors and the company has 100 shares. The proposal is to setup a high speed train manufacturing plant in Sri Lanka, including seven final assembly plants and 34 factories to produce sub-systems for the final assembly line. They also want to construct a dedicated jetty at Muthurajawela. Project investment for the initial phase is Euro 488 million; the working capital is Euro 2.2 billion and the timeline is 12 years.

What do they require from us? They want outright purchase of Government lands of 2,242 acres in three locations and a private land of 1,823 acres in six locations. So, in total, over 4,000 acres and they want all these areas to be declared as licensed zones under Section 22 of the BOI Law.

Then, they also want to bring in the following capital goods free of customs duties and free of all charges. I will read that out. They want to bring, 220 prime movers, 40 excavators, 30 JCBs, 600 fork lifts, 75 boom trucks, 100 land vehicles, 50 buses, 400 bicycles, 1,200 water pumps, 1,500 air-conditioning units, four helicopters with aviation approval, 22 special vehicles for families of investors, three 36-floor office buildings, two ships and 10,000 mobile phones.

The other requirements they want from the Government are - relaxation of import and export control procedures; 95 per cent special income tax exemptions and all spare parts and fuels on tax free basis; electricity power under special tariff; permission to operate a fully-fledged private bank to facilitate leasing, loans, finance, current accounts, L/Cs, bank guarantees and so on; permission to set up a private university; approval and licence to be given to set up and maintain technological and educational public TV channels and radio channels and three-star level accommodation building in each zone with a licence to operate with international liquor and club licence to cater to the needs of foreign employees.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මලික් සමරවික්‍රම මහතා]

මේවා තමයි ඒ ගොල්ලෝ ඉල්ලා තිබෙන්නේ. ඔබතුමන්ලාටම දැන ගන්න පුළුවන්, මෙහි සත්‍ය තත්ත්වය.

Again last week, the same media institutions alleged that a sum of Rs. 150 million - that is Rs. 1,500 lakhs- had been received to be credited to my bank account and that the Central Bank had frozen the funds. This is again a totally false allegation. I have checked with the Central Bank and I was informed that no such funds had been received to be credited to any Cabinet Minister's account. However, I have written to the DIG of the CID to investigate into this matter at his earliest convenience and take necessary action against any Cabinet Minister, if such funds had been received. Sir, I am **tabling*** the letter I have sent to the DIG.

Sir, is this the media freedom that we wanted? This is nothing, but freedom of the wild ass.

I request the Hon. Speaker to kindly take necessary steps to prevent Members of Parliament from being insulted and defamed by the irresponsible media coming out with fake news. If not, no decent person will want to enter Parliament.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රධාන කටයුතු ආරම්භයේදී හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම.

අද දින සලකා බැලීමට නියමිත, න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ලෙස සඳහන් "හානිපූරණය සඳහා වන කාර්යාලය" නමැති පනත් කෙටුම්පත 2018 ජූලි 17වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, 2018 අගෝස්තු මස 23වන දින ආර්ථික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සලකා බලා ඒ සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව 2018 සැප්තැම්බර් 04 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද බවත් මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

## හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත
## இழப்புக்கான எதிரீடுகள் பற்றிய அலுவலகம் சட்டமூலம்
## OFFICE FOR REPARATONS BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[2.48 p.m.]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister and Minister of National Policies and Economic Affairs}
Hon. Deputy Speaker, I move,

"That the Bill be now read a Second time"

Sir, the Office for Reparations Bill is one of those that we have proposed to ensure reconciliation in this country. We have had a long history of fighting - I need not go into it - of armed conflicts, not only in the North, but also in the South and of people who have disappeared. Once we put all this behind us, it is necessary that we find out what has happened to them and also give reparation to the affected parties.

Providing reparations has been a policy of the Government since 1983 when the July riots took place and we established by law the Rehabilitation of Persons, Properties and Industries Authority. This Office for Reparations will replace that Authority. We are repealing the Persons, Properties and Industries Authority Act by this Bill, but all acts done under that law and all the programmes undertaken by that Authority will be carried on by the Office for Reparations. As far as the employees of the Authority are concerned, all will be absorbed to this Office except for those who prefer to take compensation and leave.

The objectives of this Office for Reparations are to formulate and recommend to the Cabinet of Ministers Policies on Reparations, facilitate and implement such policies and monitor and evaluate the progress of delivery of reparations to eligible aggrieved persons. In the Bill, under "Interpretation", the "aggrieved persons" have been defined as "persons who have suffered a violation of human rights or humanitarian law". In the Amendment, we have further defined them in terms of the First, Second, Third and Fourth parts of the Geneva Convention of 1949.

Reparations can be "individual reparations" or "collective reparations" as defined in the Bill. In addition to that, they will also take action on the recommendations made by the Office on Missing Persons. If a person is missing and reparation has to be given, it will be done.

So, Sir, that is the scope of the legislation we have introduced to this House. It is a needed piece of legislation. The Office for Reparations will be run by five Members appointed by the President on the recommendation of the Constitutional Council, one of whom he will appoint as the Chairperson. So, this is a much needed piece of legislation which will look after reparations either for people who have been affected or for their families, maybe, in the North, maybe, in the South, maybe, in the East, maybe, in the West or maybe, in the Central Province.

Sir, I commend the Bill to the House and leave it to my Colleague, the Hon. Minister of Foreign Affairs, to give a longer description of what is planned by this.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා. 2.52]

**ගරු තිලක් මාරපන මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலக் மாரபன - வெளிநாட்டலுவல்கள் அமைச்சரும்)
(The Hon. Tilak Marapana -Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පත ඇත්ත වශයෙන්ම ඉතාම කාලෝචිත පනත් කෙටුම්පතක්. මම හිතන හැටියට මේ පනත් කෙටුම්පත මඟින් අපේ ලංකාව තුළ තිබුණු නොයෙක් අඩුපාඩු සම්පූර්ණ වනවා. මොකද, 1982දී වුණු කලබලවලින් සිදු වූ හානිවලට යම්කිසි පහසුකම් සහ සහන ලබා දීමට "REPPIA" කියන පනත තිබුණාට ඇත්ත වශයෙන්ම උතුරු පළාතේ දෙමළ ජනතාවට වුණු පාඩුව විතරයි ඒකෙන් පිරිමැසුණේ.

මේ පනත් කෙටුම්පත ඊට වඩා බොහොම පුළුල් පනත් කෙටුම්පතක්. "සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ස්ථාවර වූ සඵලදායී ප්‍රතිකර්මයක් වශයෙන් පරිපූර්ණ හානිපූරණය කිරීමේ යෝජනා ක්‍රමයක් අනාගත පරපුර ඇතුළත් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සුබසිද්ධිය සහ ආරක්ෂාව උදෙසා ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වන හෙයින්ද:" කියලා මේ පනත් කෙටුම්පතේ පූර්විකාවේ සඳහන් වනවා.

Hon. Deputy Speaker, if I may continue in English, you will see that the objectives of this Bill are set out in Clause 2, which states, I quote:

> "(*a*) to formulate and recommend to the Cabinet of Ministers, Policies on Reparations to grant individual and collective reparations to aggrieved persons;"

So, this implies that it is not only those in the North and the East - who have been affected due to the war situation that prevailed - who are included, but also the aggrieved persons as defined in this Bill. It is a much larger category of persons. The interpretation of "aggrieved persons" that is contained in Clause 27 of this Bill would also include all those persons who have suffered in connection with political unrest or civil disturbances, in the course of systematic gross violation of the rights of individuals and also who have suffered in consequence of the conflict that took place in the Northern and the Eastern Provinces. Therefore, - [*Interruption.*]

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Hon. Minister, are you referring to the Amendments that have been made to Clause 27?

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
The Amendments are there, but there is no Amendment to this -[*Interruptio.]*

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
There are Amendments that are placed on our tables.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
What I read out was -

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
What is given in the Bill is what had been proposed earlier. But, the Determination of the Supreme Court is on the Amendments. What you were reading out is in the Bill.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
Hon. Member, there is no Amendment to - [*Interruption.]*

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
There are Amendments to Clause 27, which have been placed on our tables.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
Clause 27(*a*) (ii) has not been amended in that way; it still remains: “in connection with political unrest or civil disturbances;”. That is what I read out. That still remains; that has not been amended. - [*Interruption.*] Clause 27 has been amended, but that particular subsection which states “in connection with political unrest or civil disturbances" has not been amended; it remains as it is. What gets amended is the whole of subsection (a) of Clause 27. That complete subsection will be left out and then be substituted with the line “persons who have suffered damage as a result of .....”. That is the substitution.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Will the lines which refer to, “Northern and Eastern Provinces" be left out?

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
“Northern and Eastern Provinces...” portion will be there. But the earlier line will be left out. If you look at the Amendments that are suggested, only line 14 will be left out. But lines 15 and 16 which refer to “Northern and Eastern Provinces” will remain.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
That will remain?

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
Yes, that will remain. This is only to bring it in line with the observations of the Supreme Court where it was decided to leave out this portion and replace it with the Amendments suggested.

Anyway, Hon. Deputy Speaker, as I was saying, there is much to be achieved by means of this piece of legislation. Our people have suffered due to various riots and civil disturbances earlier. For example, we can remember the riots that took place in Kandy in the recent past, some sort of civil disturbances. Then, we also had a similar incident in Beruwala area some time ago. Then, I recall, in 1997, I think, there was a lot of unrest in Ratnapura with the assassination of the Hon. Member of Parliament, Nalanda Ellawala: many houses were burnt and there were a lot of rioting and many people suffered loss to their properties due to those disturbances. We had an insurrection also in 1971. There were disturbances that took place in the country in 1986. We all are aware of these things. I do not want to remind you and reiterate all these things. In all these instances, though there were severe damages and losses caused to various persons, there was no permanent mechanism to make reparation for those damages. Also, there were ad hoc Cabinet Papers that were presented. But I do not think that those Cabinet Papers served justice to all those persons who had suffered as a result of those disturbances.

So, I think, the establishment of a permanent body in the nature of Office for Reparations is very laudable. It is a much-needed mechanism to address all those things that had happened in the past. I believe that the scope of this legislation would be wide enough to apply to all category of persons. Irrespective of their community and political differences, anyone in Sri Lanka who has suffered as a result of disturbances or any type of an upheaval as set out in Clause 27, will now have an opportunity of being classified as a person who is required to be compensated and reparation will be made available to him.

So, I think this piece of legislation, which was primarily intended to address the issues and reparations arisen as a result of the war for the Northern and the Eastern Province is equally applicable to the South where a lot of our people, from time to time, have suffered due to various communal disturbances and unrests. So, they can also make use of this piece of legislation to get the reparation they deserve.

In conclusion, I wish to say, Mr. Deputy Speaker, that these type of legislations are things that we have undertaken on our own, not done merely because we are required to do it by the international community. Just like human rights, I think, we should take this very seriously for the sake of our own people so that their living conditions will be made better and they will enjoy the fruits of life. So, as a responsible Government, we should ensure that these things are in place so that our people can get the benefit of these things. Human rights privileges that we are seeking to get for our people, is only a part of it. So, I would commend the House to endorse this piece of legislation without any division so that our people can reap the benefits of this.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you. The next speaker is the Hon. S. Shritharan. Before he commences his speech, will an Hon. Member propose the Hon. Kanaka Herath to the Chair?

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
I propose that the Hon. Kanaka Herath do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. KANAKA HERATH *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. S. Shritharan, please.

[பி.ப. 3.04]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்கள், தங்களுடைய சொத்துக்களை இழந்தவர்கள், உறவுகளை இழந்தவர்கள், தங்களுடைய எதிர்காலம் பற்றிய எண்ணங்களோடு இருக்கின்றவர்கள் போன்றோரின் இழப்புக்கான எதிரீடுகளை வழங்குதல் தொடர்பாக பிரதம அமைச்சர் அவர்களால் இந்தச் சபையிலே சமர்ப்பிக்கப்பட்ட "இழப்புக்கான எதிரீடுகள் பற்றிய அலுவலகம் சட்டமூலம்" இன்றைய தினம் அங்கீகரிக்கப்பட இருக்கின்றது. அதனுடைய இரண்டாம் மதிப்பீட்டின் மீதான விவாதத்தின்பொழுது, எனது கருத்துக்களையும் சொல்ல வாய்ப்பு வழங்கியமைக்கு நன்றி கூறுகிறேன்.

இந்த நாட்டிலே பாரியதொரு யுத்தம் நடைபெற்று முடிந்திருக்கிறது. இதன்போது, இந்த நாட்டிலே வாழ்ந்த ஒரு தேசிய இனம் சார்ந்த மக்கள், இராணுவத்தினுடைய கோரப் பிடிக்குள் அகப்பட்டுப் பல்லாயிரக்கணக்கில் கொல்லப் பட்டார்கள். நீண்டநெடு வரலாற்று ரீதியாக வாழ்ந்த அந்த மக்களுடைய நிலங்கள் சிதைக்கப்பட்டன; குடிமனைகள்

அழிக்கப்பட்டன; எதிர்காலம் பற்றிய எண்ணங்கள் இல்லாத ஒரு நிலைக்கு அவர்கள் தள்ளப்பட்டார்கள். அதனுடைய தொடர்ச்சியான செயற்பாடுகள் இப்பொழுதும் இடம்பெற்றுக் கொண்டிருக் கின்றன. இவ்விடயம் தொடர்பில் இன்றைய தினம் உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் விஜயதாஸ ராஜபக்ஷ அவர்கள் தன்னுடைய அமைச்சு சம்பந்தப்பட்ட கருத்துப் பகிர்வின்போது, தொல்பொருள் திணைக்களம் சம்பந்தமாக என்னென்ன விடயங்கள், எவ்வாறெல்லாம் புனையப்படுகின்றன என்பது தொடர்பில் நீண்ட விளக்கத்தை அளித்தார். இவ்வாறான சம்பவங்கள் எமது பிரதேசங்களில் மட்டுமல்ல, நூற்றுக்கணக்கான சம்பவங்கள் எமது நாட்டின் தென் பகுதியிலேதான் இடம்பெற்றிருக்கின்றன என்றும் யாழ்ப்பாண மாவட்டத்திலே ஒரு சம்பவமும், கிளிநொச்சி மாவட்டத்திலே மூன்று சம்பவங்களும், மன்னாரிலே மூன்று சம்பவங்களும் இடம்பெற்றிருப்பதாகவும் புள்ளிவிபர அடிப்படையில் குறிப்பிட்டார்.

வடக்கிலும் கிழக்கிலும் பாரம்பரியமாக, வரலாற்று ரீதியாகத் தங்களுடைய மண்ணிலே வாழ்ந்த மக்கள் எவ்வாறு அழிக்கப்பட்டார்கள்? அவர்கள் 1981இல் என்ன விகிதாசாரத்திலே அந்தந்த நிலங்களிலே வாழ்ந்தார்கள்? அவ்வாறு வாழ்ந்த மக்கள் தங்களுடைய சொந்த நிலங்களிலே நிம்மதியோடு வாழக்கூடிய ஒரு சூழ்நிலை இன்னும் உருவாக்கப்படவில்லை. யுத்தத்திலே பல்லாயிரக்கணக் கானவர்கள் கொல்லப்பட்டார்கள். இதனைவிட, அங்கு பலர் வலிந்து காணாமல் ஆக்கப்பட்டார்கள். தங்களுடைய பிள்ளைகளைத் தங்களுடைய கைகளால் ஒப்படைத்த பெற்றோர்கள் இன்றும் போராட்டம் நடாத்திக் கொண்டிருக்கிறார்கள். இப்போராட்டமானது, கிட்டத்தட்ட 600 நாட்களைக் கடந்திருக்கிறது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இது இந்த நாட்டிலே புரையோடிப் போயிருக்கின்ற ஒரு விடயமாகும். இந்த விடயத்தைக் கையாள்வதிலும் இதற்கு ஒரு நியாயமான பதிலைக் கொடுப்பதிலும் நல்லிணக்கம் பேசிவந்த இந்த அரசாங்கம் தன்னுடைய பயணத்தை இன்னும் தூரத்திற்குக் கொண்டு செல்லவேண்டியிருக்கிறது. அதாவது, இவர்களாலும் இந்த விடயம் இன்னும் சரியாக அணுகப்படவில்லை; பார்க்கப் படவில்லை. யுத்தத்திலே அழிக்கப்பட்டவர்கள் தமிழர்கள்! அழித்தவர்கள் சிங்கள இராணுவத்தினர்! இந்த நாட்டிலே, தாங்களே இந்தப் பிரச்சினையை விசாரித்துத் தீர்ப்புச் சொல்கின்றோமென்று இப்பொழுது அரசாங்கம் சொல்கின்றது. யார் ஒருவன் மீது குற்றம் புரிந்தானோ, யார் ஒருவன் மீது தாக்குதலை நடத்தினானோ, அவனே "நானே விசாரணை செய்கின்றேன்; நானே தீர்ப்பு வழங்குகின்றேன்" என்று சொல்வதுபோல் இது உள்ளது. இது இந்த நாட்டிலே நியாயமானதாக இருக்குமா? ஒருவனுக்கு அடித்து, அவனது காலையும் கையையும் முறித்து, அவனுடைய வீட்டையும் அடித்து நொருக்கிய பின், உனக்கு நான் இழப்பீடு தருகிறேன் என்றால், அவனுடைய வாழ்க்கை எவ்வாறு அமையும்? அவன் எவ்வாறு பேச முடியும்? இவ்வாறுதான் இந்த நிலைமையும் இருக்கின்றது.

அண்மையிலே இந்த நாட்டினுடைய அதியுத்தம ஜனாதிபதி அவர்கள் ஐக்கிய நாடுகள் சபையிலே உரையாற்றியிருந்தார். நேற்றைய தினம் சகோதரக் கட்சியான JVP இனைச் சேர்ந்தவர்கள், "அதிமேதகு ஜனாதிபதி அவர்கள் 60 பேரோடு ஐக்கிய நாடுகள் சபைக்குச் சென்றிருந்தார்" என்று குறிப்பிட்டிருந்தார்கள். அதனைவிட, அவர் அழைத்துச் சென்ற ஊடகவியலாளர்களுக்கு 4 இலட்சம் ரூபாய் வீதம் பணமும் வழங்கியிருந்தார் என்றும் கூறினார்கள். இவ்வாறெல்லாம் செலவுகளைச் செய்து சென்ற அதிமேதகு ஜனாதிபதி அவர்கள் அங்கு குறிப்பிட்டது என்னவென்றால், "இந்த நாட்டிலுள்ள பிரச்சினைகளில் யாரும் தலையிடக்கூடாது; அதிலும், காணாமற்போனவர்கள் தொடர்பிலும் இங்கு நடந்த யுத்தக் குற்றங்கள் தொடர்பிலும் வெளிநாடுகள் எதுவும் தலையிடக்கூடாது; நாங்களே அதனைக் கையாள்கின்றோம்; விசாரிக்கின்றோம்" என்பதாகும். இவ்வாறு அவர் குறிப்பிட்டது ஒரு கால ஓட்டத்தில் இந்த உலகத்தை ஏமாற்றுகின்ற விடயமாகப் படவில்லையா? எங்களுடைய கட்சியினுடைய தலைவர் அண்ணன் கௌரவ மாவை சேனாதிராஜா அவர்களும் இங்கிருக்கின்றார். 2015ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் நடந்த ஐக்கிய நாடுகள் மனித உரிமைகள் ஆணையகத்தின் அமர்விலே அவரும்கூட கலந்து கொண்டிருருந்தார். அவ்வாறிருக்கின்றபொழுது, அப்போதைய வெளிநாட்டமைச்சர் மங்கள சமரவீர அவர்கள் "நாங்கள் இந்த விடயங்களை வெளிநாட்டுத் தூதுவர்கள், வெளிநாட்டு நீதிபதிகள், வெளிநாட்டு technicians - தொழில்நுட்ப உதவியாளர்கள் ஆகியோரின் அனுசரணையோடு கையாண்டு இந்தப் பிரச்சினைக்குத் தீர்வு காண்கின்றோம்; குற்றங்கள் பற்றி விசாரிக்கின்றோம்" என்று குறிப்பிட்டிருந்தார். ஆனால், இதுவரை இவ்விடயத்தில் எந்த முன்னேற்றங்களும் ஏற்படுத் தப்படவில்லை. பெயரளவிலே ஓர் அலுவலகம் திறக்கப்பட்டிருக்கின்றது. அதற்கு நியமிக்கப்பட்டவர்கள் யாரும் சரியான முறையிலே செயற்படுத்தப்படவில்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்த நாடு பொருளாதார ரீதியாக வளர முடியாதிருக்கின்றது; நாட்டுக்கு அவப்பெயர் எற்பட்படிருக்கின்றது. இந்த நாடு செய்த இனப்படுகொலை, போர்க்குற்றம் என்பன பற்றி இன்று உலகத்திலே பேசப்படுகின்றது. உலகம் இன்று அந்த விடயத்தைக் கையிலே எடுத்திருக்கின்றது. இந்தப் பிரச்சினைக் கான தீர்வைக் கொடுக்க முடியாமல், "நாங்கள் எதிரீடுகளைச் செய்கின்றோம் - இழப்பீடுகளை வழங்குகின்றோம்" என்றால், இந்த நாட்டிலே இது நீதியானதாக இருக்குமா? யுத்தம் 2009ஆம் ஆண்டு மே மாதத்துடன் முடிவுக்கு வந்த பிற்பாடு வடக்கிலும் கிழக்கிலும் விடுதலைப் புலிகளால் ஒரு வெடிச்சத்தம்கூட ஏற்படுத்தப்படவில்லை. யுத்தம் முடிவுக்கு வந்து இன்று கிட்டத்தட்ட 10 ஆண்டுகள் கடக்கப்போகின்றன. ஆனால், இந்த இழப்புக்களைச் சந்தித்த மக்களுக்கான நீதி இந்த 10 ஆண்டுகளில் இன்னும் கிடைக்கவில்லை; இந்த மக்களுக்கான நீதி விசாரணைகள் நடைபெறவில்லை. தங்களுடைய பிள்ளைகளை இராணுவத்தினரிடம் ஒப்படைத்த தாய், தந்தையர்கள் பிள்ளைகளின் வரவுக்காகக் காத்திருக் கின்றார்கள். கிளிநொச்சியிலே தன் பிள்ளைக்காகப் போராடிய ஒரு தந்தை சென்ற வாரம் மரணமடைந்துவிட்டார். அவ்வாறு போராடிய தாய்மாரில் ஆறுக்கு மேற்பட்டவர்கள் இதுவரை இறந்திருக்கின்றார்கள். அதாவது பிள்ளைகள் காணாமற் போயிருக்கின்றார்கள். பிள்ளைகளுக்காக வயோதிபத் தாய், தந்தையர்கள் போராடிக் கொண்டிருக்கின்றார்கள். தங்களு டைய வயோதிபக் காலத்தில் அவர்களைப் பராமரிக்க ஆளில்லாமல் அவர்கள் காலமாகிக் கொண்டிருக்கின்றார்கள். இந்த நாட்டிலே இவ்வளவு அநியாயங்களும் நடைபெற்றுக் கொண்டிருக்கின்றபோது, இந்த அரசாங்கம் வெறுமனே இழப்பீடுகளுக்கான ஒரு சட்டமூலத்தை நிறைவேற்றுவதன் மூலம் இந்த நாட்டிலே உண்மையை நிலைநாட்டுகின்ற சூழலையை ஏற்படுத்த முடியுமா?

2015ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் அரசாங்கம் 4 பொறிமுறைகளை ஏற்றுக்கொண்டது. அதாவது நல்லிணக்கம் என்ற அடிப்படையிலே சமாதானத்துக்கான, நல்லிணக் கத்துக்கான 4 தூண்களை ஏற்றுக்கொண்டிருந்தது. உண்மை யைக் கண்டறிதல், அவற்றுக்கான தீர்வுகளை வழங்குதல்,

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

பொறுப்புக்கூறல் என்ற அடிப்படையிலே அரசாங்கம் தன்னுடைய செயற்பாடுகளை முன்வைத்திருந்தது. ஆனால், இதுவரை உண்மைகள் கண்டறியப்பட்டு, யார் குற்றவாளிகள் என்பது வெளியிலே கொண்டுவரப்படவில்லை. அதேநேரம் அதிமேதகு ஜனாதிபதி அவர்கள், "இந்த நாட்டிலே குற்றம் செய்தவர்களையும் மற்றும் இராணுவத்தினரையும் நாங்களே விசாரித்து மன்னிப்பு வழங்குகின்றோம்" என்ற அடிப்படையில் பேசுகின்றார். இறுதி யுத்தத்திலே மக்கள்மீது குற்றம் புரிந்தார்கள், அவர்களைப் படுகொலை செய்தார்கள் என்ற குற்றச்சாட்டின் பெயரிலே இந்த நாட்டிலே இதுவரை எத்தனை இராணுவத்தினர் கைது செய்யப்பட்டிருக்கின்றார்கள்? அல்லது எத்தனை பொலிசார் கைது செய்யப்பட்டிருக்கின்றார்கள்? அல்லது எத்தனை அரசியல்வாதிகள் கைது செய்யப்பட்டிருக் கின்றார்கள்? இவை நடக்காத ஒரு சூழலில் எவ்வாறு நீதி நிலைநாட்டப்படும்? எவ்வாறு நியாயம் கிடைக்கும்? வெறுமனே நாங்கள் பேச்சளவில் இவற்றைச் சொல்லிக் கொண்டிருக்க முடியாது. இந்த நாடு நீதியான நாடாக இருந்தால், ஜனநாயகத்தை மதிக்கின்ற நாடாக இருந்தால், நேர்மையான வழியிலே கொண்டுசெல்லப்படுகின்ற நாடாக இருந்தால், இந்த நாட்டிலே அழிக்கப்பட்ட மக்கள் சார்பில் நீதி கிடைக்கவேண்டும்.

நேற்று மெகசின் சிறைச்சாலைக்கும் நேற்று முன்தினம் அநுராதபுரம் சிறைச்சாலைக்கும் சென்று அங்குள்ள சிறைக் கைதிகளை நாங்கள் பார்த்தோம். அவர்கள் இந்த மண்ணிலே போராடினார்கள், தமிழீழ விடுதலைப் புலிகள் அமைப்பிலே இருந்தார்களென்ற காரணத்திற்காக இன்று சிறையிலே இருக்கின்றார்கள். இன்று கொண்டுவரப்பட்ட இந்தச் சட்டமூலத்தில் பாதிக்கப்பட்டவர்களுக்குப் புனர்வாழ்வளித்தல் என்ற விடயம் முக்கியமாகச் சொல்லப்பட்டிருக்கின்றது. அதனைவிட, இறந்தவர்களுக்கு அஞ்சலி செலுத்துதல் பற்றியும் தெளிவாகக் குறிப்பிடப்பட்டிருக்கின்றது. இருந்தபோதிலும் மாவீரர் துயிலும் இல்லங்களை அரசாங்கம் தன்னுடைய இராணுவ முகாம்களாக வைத்திருக்கின்றது. அதனால், இறந்துபோன தன்னுடைய பிள்ளைகளுக்கு விளக்கேற்ற அல்லது பிள்ளைகளை நினைத்து அஞ்சலி செலுத்த, பிள்ளைகளுக்காக ஒரு சொட்டுக் கண்ணீர் வடிக்கக்கூட தாய் தந்தையருக்கு முடியவில்லை. இதுதானா இந்த நாட்டின் நல்லிணக்கம்? இதனால் எவ்வாறு நல்லிணக்கம் ஏற்பட முடியும்? ஆனால், வடக்கிலும் கிழக்கிலும் எங்கு பார்த்தாலும் இராணுவத்தினுடைய நினைவுத்தூபிகள் - நினைவுச் சின்னங்கள் நிறுவப்பட்டிருக்கின்றன. ஆனையிறவு, கிளிநொச்சி, யாழ்ப்பாணம், கேப்பாப்புலவு போன்ற பிரதேசங் களிலே நிறுவப்பட்டிருக்கின்ற இராணுவ நினைவுச் சின்னங்கள் ஆக்கிரமிப்பின் சின்னங்களாக அந்த மக்களை அச்சுறுத்துகின்றன. எமது மக்கள் போகின்றபோது, வருகின்றபோதெல்லாம் "நாங்கள் உங்களை ஆக்கிரமிக்க வந்தவர்கள்" என்ற வடிவத்தோடு அவை காணப்படுகின்றன. இது இந்த நாட்டிலே நீதியைக் கொண்டுவருமா? நீதி, நியாயங்களை வழங்கும் வகையில் கொடுக்கப்படுகின்ற இழப்பீடுகள் சரியானதாக அமையுமா? இந்த நாட்டிலே புரையோடிப்போயிருக்கின்ற பிரச்சினைகளைத் தீர்க்காமல், நடந்து முடிந்த யுத்தத்திற்கான தீர்வை, அழிக்கப்பட்ட மக்களுக்கான நீதியை வழங்காமல், அபிவிருத்தி என்ற போர்வையில் நீங்கள் தங்கத்தால் தார் ஊற்றினால்கூட, எங்களுடைய மக்கள் அதனை ஏற்றுக்கொள்ளத் தயாராக இல்லை. முதலிலே இழப்பீடுகள் என்பதற்கப்பால், இழப்பீடு களுக்கான காரணங்கள், உண்மைகள் கண்டறியப்பட்டு, அதற்கான பொறுப்புக்கூறல் மேற்கொள்ளப்பட வேண்டும், அதனூடாகத் தண்டனைகள் வழங்கப்பட வேண்டும்; நீதி நிலைநாட்டப்பட வேண்டும். அந்த நீதி வெளிக்கொண்டு வரப்படுகின்றபொழுதுதான் நாட்டினுடைய உண்மையான ஜனநாயகத்தைத் தெளிவாக ஏற்றுக்கொள்ள முடியும் என்பதை நான் இந்த இடத்திலே குறிப்பிட விரும்புகின்றேன்.

"இழப்புக்கான எதிரீடுகள் பற்றிய அலுவலகம்" பற்றிய சட்டமூலம் சிங்களத்திலிருந்து தமிழுக்கு மொழிபெயர்க்கப் பட்டிருக்கிறது. ஆனால் சிங்கள, தமிழ் மொழிபெயர்ப்புக் கிடையே ஏதேனும் ஒவ்வாமை என்றால், சிங்களத்துக்குத்தான் முன்னுரிமை என்று குறிப்பிடப்பட்டிருக்கின்றது. ஆகவே, தமிழிலே எப்படியும் மொழிபெயர்ந்துவிட்டுப் போகலாமென்ற அடிப்படையில்தான் விளக்கமில்லாத மொழிபெயர்ப்புக்கள் இங்கு கொண்டுவரப்படுகின்றன. காணாமல் போனவர்களுக் கான இழப்பீடுகளா அல்லது கொல்லப்பட்டவர்களுக்கான இழப்பீடுகளா வழங்கப்படவிருக்கின்றது? Father Francis Xavier உடன் சரணடைந்த முன்னாள் போராளிகள் 58 பேர், வெள்ளைக்கொடியோடு வந்த புலித்தேவன், நடேசன் போன்றவர்கள் எவ்வாறு கொல்லப்பட்டார்கள்? இவர்களுக்கு என்ன நடந்தது? அதேபோல, பாலகுமாரனும் அவருடைய மகனும் சரணடைந்தது பற்றிய செய்தியை "Sri Lanka Guardian" பத்திரிகையும் மற்றும் பல ஊடகங்களும் வெளியிட்டிருந்தன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have got two minutes left.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

இரண்டு வருடங்களுக்கு முன்பு BBC செய்தியாளராக இருந்த பிரான்சிஸ் ஹரிசன் அவர்களும்கூட தன்னுடைய Twitter இல் அந்தச் செய்தியை வெளியிட்டிருந்தார். இவ்வா றெல்லாம் ஆதாரங்கள், கண்கண்ட சாட்சியங்கள் இருக் கின்றன. தங்களுடைய கணவன்மாரை ஒப்படைத்த மனைவிமார் இன்றும் போராடிக்கொண்டிருக்கிறார்கள். இவற்றுக்கு இந்த நாட்டிலே இன்னும் தீர்வு இல்லை. இந்த நிலையில் இழப்பீடுகள் பற்றிப் பேசுவதாலும் இழப்பீடுகளுக் கான சட்டமூலங்களைக் கொண்டு வருவதாலும் இந்த நாட்டிலே எவ்வாறான முன்னேற்றத்தைக் காணமுடியும்? கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, யாருக்கு இழப்பீடு வழங்கப்படப்போகின்றது? உண்மையில் காணாமல் போனவர்களுக்கா? அல்லது யுத்தத்திலே கொல்லப்பட்டவர் களுக்கா? உண்மையைக் கண்டறிதல், பொறுப்புக்கூறல், நீதியை நிலைநாட்டுதல் என்பவற்றை நிறைவேற்றுவதில் அரசாங்கம் ஏன் இன்னும் காலம் கடத்துகின்றது? அரசாங்கம் அதற்கான நீதியான பாதையை ஏன் திறக்கவில்லை? இவ்வளவையும் வைத்துக்கொண்டு, வெறுமனே காலத்தை இழுத்தடிப்பதற்காகவும் தமிழ் மக்களுடைய உண்மையான பிரச்சினைகளை வேறு திசைகளுக்குக் கொண்டு செல்வதற்காகவும் அரசாங்கம் முயற்சிக்கின்றதா? என்ற சந்தேகம் எங்களுக்கு இருக்கின்றது. ஆகவே, யுத்தத்திலே பாதிக்கப்பட்ட மக்களுடைய வாழ்க்கையிலே மாற்றங்களைத் தருவதாகவிருந்தால், அவர்களுடைய பிள்ளைகளை முதலிலே விடுவியுங்கள்! அவர்கள் எங்கே இருக்கிறார்கள் என்பதைச் சொல்ல வேண்டும். அதாவது, அவர்கள் எத்தனைபேர் சித்திரவதை முகாம்களிலே கொல்லப்பட்டிருக்கிறார்கள், காணாமல் ஆக்கப்பட்டிருக்கின்றார்கள் அல்லது அவர்கள் இப்போது உயிரோடு இருக்கிறார்களா? என்பது போன்ற விபரங்களைச் சொல்ல வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
අණ්මෙයිල්කූට නාන් இதுகுறித்த சில செய்திகளைப் படித்தேன். அதாவது 25 வருடங்களுக்குப் பின்னர் வந்த தன்னுடைய கணவனை ஒரு மனைவி வாஞ்சையோடு அரவணைத்த செய்தியை மற்றும் தன்னுடைய பிள்ளை வந்ததைப் பற்றித் தாயொருவர் குறிப்பிட்டிருந்த செய்தியைப் படித்தேன். அதேபோல, இன்னும் எத்தனையோ பேர் இராணுவ முகாம்களிலும் புலனாய்வுத் துறையினரின் முகாம்களிலும் இருப்பதாக அவர்கள் அஞ்சுகிறார்கள். முதலிலே அதற்குரிய நீதியை முன்வையுங்கள் என்று கூறி, எனது பேச்சை நிறைவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා. එය අහන්න ඔබතුමා අවසර ලබාදෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය පාර්ලිමේන්තු රැස්වීම් වාර තුළදී මම ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක ගණනාවක ඇති පුරාවස්තු සම්බන්ධයෙන් ප්‍රශ්න ගණනාවක් මේ ගරු සභාවේදී විමසා තිබෙනවා. 2016 ජනවාරි සිට 2018 ජූලි මාසය දක්වා කාලය තුළ ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කවල පුරාවස්තු සොරකම් සහ පුරාවස්තු විනාශය, පුරාවස්තු සෙවීම්වලට අදාළ වාර්තාවක් ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා අද පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු අමාත්‍යතුමාගෙන් ඒ පිළිබඳව වෙනත් වෙලාවක විමසන්න.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩියක් ඇතුළත මගේ ප්‍රශ්නය අසා අවසන් කරනවා. මේ පුරාවස්තු විනාශය සම්බන්ධ වාර්තාවක් ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙනවා. මේ වාර්තාවෙන් එතුමා පෙන්වන්න හදන්නේ, අපි ඉදිරිපත් කළ කාරණා සුළුයි කියන එකයි. මම ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට අභියෝග කරනවා, පුළුවන් නම් මේ සම්බන්ධව පාර්ලිමේන්තුවේ විවාදයක් දෙන්න කියා. උතුරු, නැඟෙනහිර පළාත්වල පවතින මේ ප්‍රශ්නය සම්බන්ධ පූර්ණ වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න මම පෞද්ගලිකව සූදානම් බවත් මම එතුමාට කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 7ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 3.17]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මෙම අවස්ථාව ලබාදීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින් අද දින හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සඳහා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මෙය හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම පිණිස හා ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වැදගත් පනත් කෙටුම්පතක්. ගරු අග්‍රාමාත්‍යතුමා වෙනුවෙන් විදේශ කටයුතු අමාත්‍ය, ගරු තිලක් මාරපන මැතිතුමා ඒ ගැන කරුණු සඳහන් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කථා කළ ගරු එස්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමාගේ කථාවට මම සවන් දුන්නා. අපි මෙම පනත ගෙනාවේ ඇයි? ඉතිහාසය දෙස බලනකොට, අපේ රට පිළිබඳව ලෝකය තුළ කළු ලපයක් තිබුණු කාල පරිච්ඡේදයක් තිබුණා. විශේෂයෙන්ම ජාත්‍යන්තරය තුළ අපේ රට සම්බන්ධව කළු චිත්‍රයක් මවා තිබුණු කාලයක් තිබුණා. ඒ කාරණා නිසා අපට බොහෝ දේවල් අහිමි වුණා. ඒ නිසා ජාත්‍යන්තරයෙන් අපේ ආර්ථිකයට විශාල වශයෙන් බලපෑම් එල්ල වුණා. අපි ඒවා ගැන අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ.

අපි දන්නවා, එදා අපට යුරෝපා මත්ස්‍ය තහනමට ලක් වෙන්න සිද්ධ වුණු බව. ඒ විතරක් නොවෙයි, අපිට GSP Plus අහිමි වුණා. 2015 ජනාධිපතිවරණය පැවැති කාලය වෙනකොට තිබුණු තත්ත්වය මොකක්ද කියා මේ මන්ත්‍රීතුමන්ලා කවුරුත් දන්නවා. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විදුලි පුටුවට ගෙන යනවාය කියා තමයි එදා කියා තිබුණේ. ජාත්‍යන්තරය තුළ අපේ රට කෙරෙහි කිසිම විධියක විශ්වාසයක් තිබුණේ නැහැ. ඒ නිසා අපි දැඩි අසීරුතාවකට පත් වුණා. අපේ විදේශ ඇමතිවරයකුට විදේශ රටකට ගිහින් කථා කරන්න දුන්නේ නැහැ; තානාපති කාර්යාලයකට යන්න දුන්නේ නැහැ. අපේ නියෝජිත පිරිසක් එක්සත් රාජධානියට, නැත්නම් ඕස්ට්‍රේලියාවට, එහෙමත් නැත්නම් කැනඩාවට ගියොත් විරෝධතා පුවරු එල්ලා ගෙන සිටියා. ඒ වාගේ, මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක තිබුණු රටක්. එහෙම සිද්ධ වුණේ මොකද? එවැනි තත්ත්වයකට පත් වුණේ මොකද කියා අපි දන්නවා. ඒ නිසා ඒ තත්ත්වයෙන් මිදෙන්න නම්, විශේෂයෙන්ම ජාත්‍යන්තරය තුළ අපේ රට

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

සම්බන්ධව කීර්තිමත්බවක් ඇති කර ගන්න නම්; ජාත්‍යන්තරය තුළ අපේ රට පිළිබඳව විශ්වාසය ගොඩනඟා ගන්න නම් අපි බොහෝ දේවල් කළ යුතුයි.

අද සමහර අය උතුරට ගිහින් එක දෙයක් කියනවා; දකුණට ගිහින් තව දෙයක් කියනවා. මම දැක්කා, ඊයේ එක්තරා ගරු මන්ත්‍රීවරයෙක් මාධ්‍යයට ප්‍රකාශයක් කළ ආකාරය. ඒ සම්බන්ධව මම ඉතාම කනගාටු වෙනවා. මේකේ "කොට්" කියලා වචනයක් කොහේද, තිබෙන්නේ? එතුමා ප්‍රසිද්ධියේ මාධ්‍යයක ප්‍රකාශ කළා, "මෙය මේ රට විනාශ කළ කොටින්ට සහන සලසන්න, නැත්නම් මිය ගිය කොටින්ගේ පවුල්වලට සහ දේපළවලට වන්දි ගෙවන්න හදන එකක්" කියා. ඒ ගැන ඉතාම කනගාටුයි. මේ වාගේ [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඇහුවාද, බැලුවාද කියා අපි දන්නේ නැහැ. කරුණාකර අහගෙන ඉන්න. අහගෙන ඉඳලා කථා කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 30ක් පැවැති යුද්ධය අවසන් කිරීමේ ගෞරවය ඒ ආණ්ඩුවට ලැබෙනවා. හැබැයි, එම ගෞරවය කෙලෙසා, නැවත වතාවක් අවි ආයුධ අරගෙන, උතුරත්, දකුණත් භේද කරලා, නැවත එවැනි තත්ත්වයක් ඇති කර මේ රට විනාශ කරන්න ලැහැස්ති වෙන්න එපා. අන්න ඒ විනාශයෙන් මේ රට බේරා ගන්න ඕනෑ නිසා තමයි, අපේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ අපේ රජය මේ කටයුතු කරන්නේ.

මොකද, ඉතිහාසය ඉතාම කනගාටුදායකයි කියා අපි දන්නවා. යම් යම් සිදුවීම් වුණා. ඒකට වග කිවයුතු වන්නේ එක කොටසක් නොවෙයි. කවුරුත් ඒවාට වග කියන්න ඕනෑ.

අපේ ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කියනවා, ඒ ජනතාවට සහන සැලසුණේ නැති ලු; නොයෙක් දේවල් වුණා ලු. ඒ සහන සැලසුවේ නැත්තේ අපි නොවෙයි. අපි තමයි අද ඒවාට සහන සලසන්න හදන්නේ. ඒ සඳහා ලැහැස්ති වෙන කොට දකුණෙන් අවි අමෝරා ගෙන එනවා. දකුණේ අය කියනවා, "ජාති හිතෛෂීබවක් මේ අයට නැහැ" කියා. එහෙම බලවේග තිබියදී, එහෙම අභියෝග තිබියදී තමයි, නැවත එවැනි තත්ත්වයක් ඇති නොවන්න අපි මේ රටට මෙවැනි අණ පනත් ගෙනෙන්නේ. මෙවැනි දේ දඩබීම්මා කරගෙන නැවත මේ රටේ ජාතිවාදය අවුස්සන්න කවුරු හෝ කටයුතු කරනවා නම්, ඒ අයගේ තරාතිරම නොබලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඉතාම තදින් ඒ අය වෙනුවෙන් කටයුතු කරන්නය කියා අපි කියනවා. විශේෂයෙන්ම, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වන ආකාරයට කටයුතු කිරීම තුළින් ඇති වන තත්ත්වය උදා වෙන්න අපි ඉඩ දෙන්න ඕනෑ නැහැ.

මුලතිව් සහ වවුනියාව ප්‍රදේශවල සිද්ධ වුණු සිදුවීම් කිහිපයක් ගැන ඊයේ අපේ ගරු මන්ත්‍රීවරයෙක් මේ ගරු සභාවේදී ප්‍රකාශ කළා. මම නැවත එය සඳහන් කරන්නේ නැහැ. සමහර විහාරස්ථානවල ඇති වුණු තත්ත්වයන් ගැන; සමහර විහාරස්ථාන, කෝවිල් හදනකොට ඇතිවුණු තත්ත්වයන් ගැන කිව්වා. ඒකට මේ සියලුදෙනාම වග කියන්න ඕනෑ. මේ ආණ්ඩුව සංහිඳියාව ඇති කරන්නයි කටයුතු කරන්නේ; මේ රටේ සිංහල, දමිළ, මුස්ලිම් සියලු ජන කොටස්වලට එකට ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයකුයි නිර්මාණය කරන්නේ. ඒ නිසා හානිපූරණය සඳහා වන කාර්යාලය ස්ථාපිත කරන්න, ඒකට වග කීම ලබාදෙන්න කටයුතු කරනකොට මේ විධියට එක එක දේවල් කියන්න හොඳ නැහැ කියායි මම නම් හිතන්නේ.

1971 කැරැල්ලේදී සිද්ධ වුණු දේවල් අපි දන්නවා. 1988, 1989 කාලයේත් යම් යම් දේවල් වුණා. 1971දී ප්‍රේමවතී මනම්පේරිලා නිරුවත් කර මරා දැමූ හැටි අප දන්නවා. යුද හමුදාවේ යම් යම් නිලධාරීන් ඒ සිද්ධියට අහු වෙලා, ඔවුන්ට අවිවූ කළා. එසේ දඬුවම් කිරීම අපි අගය කරනවා. ඒ, එක සිදුවීමක්. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ එවැනි සිදුවීම් වුණා. 1988, 1989 කාලයේත් යම් යම් සිදුවීම් වුණා. ඒ වාගේම තමයි, පසුගිය යුද්ධ කාලයේත් යම් යම් සිදුවීම් වුණා. ඒකේ අරුමය මොකක්ද? යුද්ධයක් ඇති වෙනකොට යම් යම් දේවල් සිද්ධ වෙනවා. එහිදී සාධාරණ දේවල් වෙන්න පුළුවන්; අසාධාරණ දේවල් වෙන්නත් පුළුවන්. හතුරෝ එනකොට කොයි විධියද කියලා යුද්ධයකදී බලන්න බැහැ. වෙඩිල්ලක් තියනකොට ඒ පිළිබඳ සීමා බලන්න පුළුවන්කමක් නැහැ. එතැනදී කොහාට වුණත් වදින්න පුළුවන්. හැබැයි, ඒ වෙඩිල්ල වැදුණු එකෙන් යම් හානියක් වෙලා තිබෙනවා නම්, ඒ ගැන බලන්න ඕනෑ. එහෙම කළේ එල්ටීටීඊ සංවිධානයේ අය වෙන්න පුළුවන්; වෙනත් සංවිධානයක අය වෙන්න පුළුවන්; ඩග්ලස් දේවානන්දා මැතිතුමාගේ කණ්ඩායම වෙන්න පුළුවන්; සම්පන්දන් මැතිතුමාගේ අය වෙන්න පුළුවන්; ශ්‍රීතරන් මන්ත්‍රීතුමාගේ අය වෙන්න පුළුවන්; සමහරවිට දකුණේ ජනතා විමුක්ති පෙරමුණේ අය වෙන්න පුළුවන්; එහෙම නැත්නම් එක්සත් ජාතික පක්ෂයේ අය වෙන්න පුළුවන්; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය වෙන්න පුළුවන්. හැමෝම අතින් සාතන සිද්ධ වුණා. මෙවැනි දේවල් මේ රටේ නැවත නැවතත් සිද්ධ වෙන්න බැහැ කියා අපි කියන්නේ ඒ නිසායි.

මේ රටේ ජීවත් වන හැම මිනිහෙකුටම මේ මහ පොළොවේ, තමන්ගේ මාතෘ භූමිය තුළ තමන්ට කියා උරුමයක් තිබෙනවා. ඒ නිසා තමන්ට කියලා ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරන්න ඕනෑ. සැකයෙන්, භයෙන් ජීවත් වෙන්න බැහැ. ද්‍රවිඩ මිනිහෙකුට, සිංහල මිනිසුන් පෙනෙන්නේ හතුරෝ විධියට නම්, මුස්ලිම් මිනිසුන් පෙනෙන්නේ හතුරෝ විධියට නම්, මේ අය යම් යම් පළිගැනීම්වලට ලක් කරන්න ඒ අය සූදානම් වෙනවා නම්, ඒකට ඉඩ දෙන්න බැහැ. මේ ආණ්ඩුව බලයට ආවේ ඒකට නොවෙයි. ඒ දේවල් වළක්වන්න තමයි අපි, "යහ පාලනයක්" කියන තේමාව යටතේ බලයට ආවේ; අපි යහ පාලන ආණ්ඩුව හැදුවේ ඒකටයි. මේ රටේ හැටදෙලක්ෂයක ජනතාවක් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දුන්නේ ඒ සඳහායි; රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළුව මේ ආණ්ඩුව බලයට පත් කරන්න කටයුතු කළේ ඒ සඳහායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ ආණ්ඩුව පෙරළන්න අපි ඉඩ දෙන්නේ නැහැ. සමහර අය එක එක සෙල්ලම් දමනවා. අද ගේනවා ලු, "සහාග ආණ්ඩුවක්". සහාග ආණ්ඩු කොහේද තිබෙන්නේ? මේ වචන ටිකේ තේරුමවත් දන්නේ නැති අය තමයි මේ කථා කරන්නේ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, මේ පනත් තුළින් මේ රටේ සහජීවනයක් ඇති වෙන්න ඕනෑ බව. මේ පනත් තුළින් මේ රටේ අහිංසක මිනිසුන්ගේ මානව හිමිකම් ආරක්ෂා වෙන්න ඕනෑ.

1971 කැරැල්ල ගැන කථා කරන විට අපට සිහියට එන්නේ ප්‍රේමවතී මනම්පේරිගේ ඝාතනයයි. ඒ වන විට මම කතරගම

ප්‍රදේශයේ තමයි හිටියේ. ඒක මගේ ඇස් දෙකෙන් දැකපු සිද්ධියක්. මගේ ගෙදරට අල්ලපු ගෙදර තමයි ප්‍රේමවතී මනම්පේරි හිටියේ. ඒ කාලයේ මම කතරගම කනිෂ්ඨ විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබුවා. ඒ වෙලාවේ වුණු දෙය අපි දැක්කා; ඇය නිරුවත් කර වෙඩි තියපු හැටි අපි දැක්කා. ඒ සිද්ධිය නිසා ඒ දෙමවුපියන්ට, සහෝදර සහෝදරියන්ට වුණු හානිය, ඒ ගෙවල් දොරවල්වලට වුණු හානිය අපි දැක්කා. ඒ නිසා, "ජේවීපී" නිසා ගෙවල් විනාශ වෙන්න ඕනෑ නැහැ; "යූඑන්පී" නිසා ගෙවල් ගිනි තියන්න ඕනෑ නැහැ; ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිසා එහෙම වෙන්න ඕනෑ නැහැ; "එල්ටීටීඊ" එක නිසාත් එහෙම වෙන්න ඕනෑ නැහැ. ඒක මතක තියා ගන්න ඕනෑ.

මේ සියලු ජන කොටස්වලට සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑය කියා මම කියනවා. මෙවැනි පනත් තුළින් එසේ ඇතිවන අපහසුතා නැති කරන්න කටයුතු සැලසෙනවා. කුමන හෝ තරාතිරමක වේවා, මේ රටේ වනේ වන හතුරෙකුටවත් මෙවැනි දෙයක් සිද්ධ නොවේවායි කියා මම ප්‍රාර්ථනා කරනවා. ඒ වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාත්, ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත් ගන්නා උත්සාහයට ආණ්ඩු පක්ෂය හැටියට අපේ සම්පූර්ණ දායකත්වය ලබාදෙන්න සූදානම් බව සියලුදෙනාටම අපි මතක් කරනවා. පටු වාද භේද නැතිව, කුහකකමින් බලන්නේ නැතිව, සාධාරණව, ප්‍රජාතන්ත්‍රවාදීව, බුදු දහම අනුව මෛත්‍රියෙන් බලන්නට කියා අපි කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.27]

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත -Office for Reparations Bill- ගැන විවාද කරන මේ අවස්ථාවට සම්බන්ධ වීමට ලැබීම ගැන මම සතුටු වෙනවා. මීට පෙර කථා කළ ගරු එස්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු සම්බන්ධව වචනයක් කිව යුතුයි. ත්‍රස්තවාදීන් කවුද, සාමාන්‍ය ජනතාව කවුද කියන එක පිළිබඳව තෝරා බේරා ගැනීම රටකට වැදගත් කියන එකට ඇති වෙන්න සාධක ලෝකය ඉදිරියේ තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධව කවුරුත් අනුකම්පා සහගත විය යුතුයි, ඒ ගැන අපේ තර්කයක් නැහැ. හැබැයි, ත්‍රස්තවාදීන් කළ විනාශය සහ ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද අනෙකුත් කණ්ඩායම්වලටත් ඒ අයිතිවාසිකම ඒ ආකාරයෙන්ම තිබිය යුතුයි කියන එකයි මගේ මතය වන්නේ.

විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ 30/1 යෝජනාව අනුව තමයි මේ පනත් කෙටුම්පත, මේ වැඩ පිළිවෙළ ඉදිරියට එන්නේ.

If we take reparation, we say "yes" to compensate the aggrieved non-LTTEers and "no" to compensate terrorists or the LTTE. Mr. Presiding Member, the LTTE remains a banned terrorist organization not only in Sri Lanka, but in 32 countries including India, the USA, the UK, Canada, the UAE and Malaysia. The UNSC Resolution 1373 incorporated by the Government of Sri Lanka in April, 2014 has listed 15 foreign-based organizations as LTTE fronts, warranting the countries to investigate from where those fronts are functioning and hold them to account for material support for a terror movement under their laws as the LTTE is banned in those countries. So, taking that into consideration, when 33 countries have banned the LTTE, we are talking of reparation - [*Interruption*.] One of the Hon. Members said "කොටින්ට". ඒක ඇත්තයි. ඔවුන් මේ රටේ කළ විනාශය එතරම්.

In addition to Resolution 1373, the UNHRC has passed three Resolutions holding only the armed forces accountable for the conflict. ශ්‍රීතරන් මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමා කිව්වේ, -

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මට විනාඩියක් දෙනවාද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
හොඳයි.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ඔබතුමා කථා කරනවා, කොටින්ට හානිපූරණ ප්‍රදාන දෙනවාය කියා. මා ඔබතුමාගෙන් එක කාරණයක් අහන්නම්. විනායගමූර්ති - කරුණා- කියන්නේ කවුද? එයා එල්ටීටීඊ එකේ සිටියේ නැද්ද? ඔබතුමන්ලා තමයි ඔහුව උඩට ගෙනාවේ. එහෙම නම් අනික් අයටත් හානිපූරණ ප්‍රදාන දෙන්න කියායි අපි ඉල්ලීම් කරන්නේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මේ ගරු සභාවේ සිටින TNA එකේ මන්ත්‍රීවරුන්ගෙන් සමහර උදවිය එදා එල්ටීටීඊ එකට සහයෝගය ලබා දුන්නා. ඒ අය මෙහේ ඉඳගෙන proxies හැටියට කටයුතු කළා. ඒවා ගැන කථා කරන එක සතුටුදායක වෙන්නේ නැහැ. [බාධා කිරීමක්] මගේ අවස්ථාව මට දෙන්න. ඔබතුමාගේ අවස්ථාවේදී කථා කරන්න. විශේෂයෙන්ම UNHRC has passed three Resolutions holding the armed forces accountable and responsible for the conflict. එහෙම නම් ඒ අයත් ඒ විධියටම සැලකිල්ලට භාජන විය යුතුයි. So, this is retributive justice to the national army, which is defending the country and its citizens, while offering restorative justice to LTTE terrorists, who were responsible for three decades of gruesome, premeditated murder. Only Tamils who had no links to the LTTE should receive any compensation. The LTTE terrorists should not be given any compensation. That is my case.

There was a civilian force. Who were that civilian force? මේ කියන civilian හමුදාව නොවෙයිද, ශ්‍රී මහා බෝධියට ප්‍රහාර එල්ල කළේ, දළ දා මාලිගාවට ප්‍රහාර එල්ල කළේ? එදා ශ්‍රී ලංකා මහ බැංකුව ඔවුන් කැඩුවේ -අද වෙන කට්ටියක් කැඩුවා.- civilian clothesවලින් ඇවිල්ලා නොවෙයිද? අරන්තලාවේ භික්ෂූන් වහන්සේලා ඝාතනය කළේ "civilians"ලා නොවෙයිද? එහෙම නම් ඒ කියන "civilians"ලා කොයි ආකාරයෙන්ද වෙනස් වෙන්නේ? එක්සත් ජාතීන්ගේ සංවිධානයට අපි බොහොම පැහැදිලිව ප්‍රශ්න තුනක් ඉදිරිපත් කළා. මා හිතනවා, එක්සත් ජාතීන්ගේ සංවිධානය තවම ඒ ගැන නිශ්චිත විධියේ වැඩ පිළිවෙළකට දායකත්වය ලබා දීලා නැහැයි කියා. Is the

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

Government of Sri Lanka, in giving compensation to terrorists, not doing an injustice to the real civilians that the LTTE killed? So far, even the UN has failed to ask for the death toll of the civilians who were not involved in any acts of terror, civilians who were part of the LTTE armed forces and the civilians who were involved in hostilities either by force or voluntarily.

අද ඉදිරිපත් කරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත පිළිබඳව අපට ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. Clause 27(a)(i) states, I quote:

"in the course of, consequent to, or in connection with the conflict which took place in the Northern and the Eastern Provinces or its aftermath; or"

Hon. Minister, I am seeking your advice. Article 12 of the Constitution clearly states, I quote:

" (1) All persons are equal before the law and are entitled to the equal protection of the law.

(2) No citizen shall be discriminated against on the grounds of race, religion, language, caste, sex, political opinion, place of birth or any one of such grounds :"

So, considering Article 12 (1) and (2) of the Constitution - I am proposing an amendment to take out the words "Northern and Eastern Provinces" in Clause 27 (a)(i) - you are giving special treatment to them. You cannot give special treatment to them under the Article 12 of the Constitution of Sri Lanka. Therefore, I would ask that to be recorded for action to be taken accordingly.

Then, there are a few other questions that have to be asked. In terms of reparation, compensation must be given only to the civilians who were not involved in any LTTE terror acts at the time of death. How sure can the Office of Missing Persons be of this account? How can the Office of Missing Persons be sure that those people were civilians? How do you describe a "civilian" in a war situation, particularly in relation to those in the LTTE areas? A "civilian" has been described as a person who did not have a weapon with him.

"Civiliansලා" කියන්නේ කවුද? යුද්ධ කාලයේදී "civiliansලා" කියන්නේ කවුද කියා ජාත්‍යන්තර මාධ්‍යය ඉදිරියේදී මා ප්‍රකාශයක් කළා. අපි කවුරුත් දන්නවා, එල්ටීටීඊ සංවිධානයේ සිවිල් ඇඳුම් ඇඳ ගත්ත කණ්ඩායම් ත්‍රස්තවාදීන් හැටියට සිටියාය කියා. ඒ අය මැරුණාම ඒ අයගේ තුවක්කුව ඉවත් වෙනවා, ඇඟේ තිබෙන බෝම්බය ඉවත් වෙනවා. එතකොට ඔහුව civilian කෙනෙක් හැටියට සලකනවා. එහෙම නම් මේ රටේ taxpayersලාගේ, එහෙම නැත්නම් මේ රටේ බදු ගෙවන්නන්ගේ මුදල්වලින් වන්දි ගෙවන්න සිද්ධ වෙන්නේ ඒ civilianටද? ඔවුන්ට ඒ විධියට මුදල් ගෙවන අතරතුර විශේෂයෙන්ම සිවිල් වැසියන්ට සහ මේ රට ආරක්ෂා කරපු හමුදාවට ඒ සම්බන්ධව තහංචි පනවා තිබෙනවා. ඔවුන් සඳහා මේ පනත් කෙටුම්පතින් ඇති කර තිබෙන ඉඩකඩ අවමයි කියන එකත් බොහොම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, විශිෂ්ට නීතිඥවරයකු - as a lustrous lawyer in the legal profession - හැටියට ඔබතුමා දන්නවා, මෙතැන විශාල ප්‍රශ්නයක් මතුවෙනවාය කියා. මොකක්ද, ප්‍රශ්නය? මේ වන්දි ගෙවීම සම්බන්ධව තීන්දු ගන්නා මේ මණ්ඩලයට, එහෙම නැත්නම් මේ Office එකට, එහෙමත් නැත්නම් මේ කොමිටියට යම්කිසි කෙනෙකුගෙන් දත්ත ගන්න බැරි වුණොත්, දත්ත ගන්න බලපෑම් කරනවාය කිව්වොත් ඔවුන්ට පුළුවන්, කෙළින්ම Court of Appeal ගිහින් Court of Appeal එකට අපහාස කළාය කියා ඒ තැනැත්තාට විරුද්ධව චෝදනාවක් ගොනු කරන්න. මේ තුළින් කරන්න උත්සාහ කරන්නේ මොකක්ද? සාමාන්‍යයෙන් රටේ නීතියක් තිබෙනවා. ඒ නීතියෙන් යන්න තැනක් තිබෙනවා. මේ පනත් කෙටුම්පතේ හැටියට ඒ වෙනුවට යන්න තිබෙන්නේ කොහෙටද? මේ පනත් කෙටුම්පතේ හැටියට බැරිවෙලාවත් කාර්යාලයකට ඇවිල්ලා, "අපට මේකේ තිබුණු tape එකක් දෙන්න. මේකේ තිබුණු යම්කිසි සහනයක් දෙන්න"යි කියා ඒ අය කිව්වොත් මොකද කරන්නේ? මේ පනත් කෙටුම්පතේ තිබෙනවා, "සද්භාවයෙන්" කියා. "සද්භාවය" කියන එක උසාවියේදී ඔප්පු කරන්නේ කොහොමද කියා මා දන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත්, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාටත් කියන්න පුළුවන් වෙයි, මේ "සද්භාවය" කියන එක කොයි ආකාරයෙන්ද උසාවියකදී පිළිගන්නේ කියා. සද්භාවයෙන් ඔවුන් යමක් කළත්, එයට විරුද්ධව යම්කිසි මතයක් ඉදිරිපත් වුණොත්, අභියාචනාධිකරණයට -Court of Appeal එකට - අපහාස කළාය කියා ඔහුට විරුද්ධව කාට හෝ නඩු පවරන්න පුළුවන්ය කියා සඳහන් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම පැහැදිලිව මේ කාරණය කියන්නට ඕනෑ. මේ රට විනාශ කරපු, අවුරුදු තිහක් මේ රට කාලකණ්ණි ඉරණමකට තල්ලු කරපු අයට වන්දි ගෙවන්න අත උස්සනවා නම් ඊට වඩා පාවා දීමක් කරන කණ්ඩායමක් සිටිනවාය කියා අපට සලකන්නට බැහැ. ඒ නිසා මෙවැනි පාවා දීමකට අත උස්සන්න එපා කියන ප්‍රකාශය මම බොහොම පැහැදිලිව කරනවා. Sir, I would like to state that no country in the world would compensate or pay compensation to terrorists. Name one country in the world which has paid compensation when terrorists have been named and identified as destructive elements of that country. I state this to go on record that the country must compensate victims of terror, not the perpetrators of terror.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ඉල්ලීම මෙයයි. ත්‍රස්තවාදයෙන් දුක් විඳපු, ත්‍රස්තවාදීන් නිසා අපහසුතාවට පත් වුණු, ජීවිතක්ෂයට පත් වුණු, නැති වුණු මේ රටේ සියලු දෙනාට වන්දි ගෙව්වාට අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ත්‍රස්තවාදය මුල් කරගෙන, ත්‍රස්තවාදයට මුල් තැන දීලා, ත්‍රස්තවාදී කණ්ඩායම් හැටියට ඉන්න කණ්ඩායම් අහිංසකයන් හැටියට සලකලා, ඒ අය යුද භූමියේදී මැරුණු නිසා ඒ අයට වන්දි ගෙවනවා නම් මේ පනත් කෙටුම්පතේ තිබෙන කොළ කැලි ටිකවත් වටින්නේ නැහැ කියලා මම කියනවා. මේ රටේ මූලික අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන කිසිම කෙනෙකුට ඒ කොළ කැල්ලට අත උස්සන්න අයිතියක් තිබෙනවාය කියලා මම විශ්වාස කරන්නේ නැහැ. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 16ක් තිබෙනවා.

[අ.භා. 3.39]

**ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා සහ අපි පැති දෙකක හිටියත් එතුමා අද කියපු අවසාන පද පේළිය සමඟ මම පැහැදිලිවම එකඟ වනවා.

ඒ සමඟම මම මේ කාරණයත් කියන්න ඕනෑ. ත්‍රස්තවාදීන් පිළිබඳව, මූලික අයිතිවාසිකම් ගැන කථා කරන මේ අවස්ථාවේදී මාධ්‍ය ත්‍රස්තවාදය පිළිබඳව දෙවැනි වතාවටත් අද මේ ස්ථානයේදී මට කථා කරන්න සිදු වෙලා තිබෙනවා. ඊයේ දවසේදීත් මම මේ කාරණය පිළිබඳව කථා කළා. එහෙත් මට සාධාරණයක් ඉෂ්ට වුණේ නැහැ. ඒ නිසා තමයි මට දෙවැනි වතාවටත් අද මේ පිළිබඳව කථා කරන්න සිදු වුණේ. මන්ත්‍රී කෙනෙකු වුණත් මම සාමාන්‍ය පුද්ගලයෙකු -පුරවැසියෙකු- විධියට මගේ මූලික අයිතිවාසිකම් කඩ වීම යම් තාක් දුරකට මෙතැනට බලපාන නිසා - මාතෘකාවට අදාළ නොවුණත්- මම මේ පිළිබඳව කථා කරන්න කල්පනා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 8වැනිදා, ඒ කියන්නේ මීට දවස් දෙකකට කලින්, ඊයේ නොවෙයි පෙරේදා, මට අදාළව මහාධිකරණයේ යම් නඩු කටයුත්තක් සිද්ධ වුණා. ඒ නඩු කටයුත්ත අවස්ථාවේදී ගරු විනිසුරුතුමන්ගේ කැමැත්ත මත හා එතුමාගේ ප්‍රකාශය මත රජය නියෝජනය කරන නීතිඥතුමන්ලාත්, මගේ නීතිඥතුමන්ලාත්, අනෙක් පාර්ශ්වයේ නීතිඥතුමන්ලාත් එක් ස්ථානයකට කැඳවා මේ නඩු කටයුත්ත කෙටි ක්‍රමයකින් අවසන් කර ගැනීම සඳහා සමථයකට පත් වෙන්න කැමැතිද කියලා ඉතාමත් පැහැදිලිව අපෙන් අසා සිටියා. එතැනින් එහාට වෙන කිසිම දෙයක් කථා වුණේ නැහැ. ගරු විනිසුරුතුමන් ඉදිරියේ එපමණයි කථා වුණේ. ඒ සඳහා මගේ පැත්තේත්, අනෙක් පැත්තේත් නීතිඥතුමන්ලා සාක්ෂි දරාවි. එසේ තිබියදී 8වැනි දා දෙරණ නාලිකාවේ රාත්‍රී ප්‍රවෘත්තිවල යනවා, මම ඒ වැරැද්ද පිළිගන්න කැමැති වුණා කියලා. ඒක ඉතාමත් බරපතළ ප්‍රකාශයක්. මන්ත්‍රීවරියක විධියට මම මගේ අයිතිවාසිකම් ඉතාම පැහැදිලිව දන්නවා. ඒ නිසයි අද මම මෙතැන කථා කරන්නේ. විශේෂයෙන්ම මේ රටේ පුරවැසියෙක් විධියටත් මේක මට එල්ල වූ ඉතාම බරපතළ ප්‍රකාශයක්. මොකද, මම යම් කිසි වැරැද්දක් කරලා තිබෙනවා නම් විතරයි ඒ වැරැද්ද භාර ගන්න ඕනෑ. වැරැද්ද කරපු පුද්ගලයන් ඒ වැරැද්ද පිළිගෙන, ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙලා, මේ වෙනකොට ඔවුන් දඬුවම් විඳලාත් ඉවරයි. ඒ නිසා තමයි මම 8වැනි දා මගේ නඩුවට ලැහැස්ති වෙලා නීතිඥවරුන්ටත් උපදෙස් දුන්නේ, අපි මේ නඩුවේ trial එක කරගෙන යමු කියලා. සමථයකට පත් වෙන්න කැමැතිද කියලා රජයේ නීතිඥතුමන් අපෙන් විමසා සිටියා විතරයි. එතැනින් එහාට වෙනත් දෙයක් සිද්ධ වුණේ නැහැ. ප්‍රවෘත්තිය විකාශනය වෙලා මේ වෙනකොට දවස් දෙකක් වෙනවා. එසේ තිබියදීත්, අඩුම ගණනේ ප්‍රධාන මාධ්‍ය ජාලයක් වන "දෙරණ" නාලිකාව විසින් "තමන් අතින් සිද්ධ වුණේ වැරැද්දක්" කියලාවත් කියන්නේ නැහැ. 8වැනි දා සවස "දෙරණ" නාලිකාවේ ඒ news එක ගිහිල්ලා ඊට පස්සේ "හිරු" නාලිකාව ඊයේ රාත්‍රියේ මේ news එක විකාශනය කරනවා. ඒ විතරක් නොවෙයි, ඊයේ උදේ වන විට ලංකාවේ තිබෙන සෑම ප්‍රධාන පත්තරයකම headline එක යනවා, "හිරුණිකා වරද පිළිගනී" කියලා. මම වැරැද්දක් පිළිගත්තේ නැහැ. වැරැද්දක් පිළිගන්න නම් වැරැද්දක් කරන්න ඕනෑ. මම දැන් පිළිගන්නේත් නැහැ, අනාගතයේදී පිළිගන්න බලාපොරොත්තුවකුත් නැහැ. එක්කෝ මේ නඩුව සාමාන්‍ය නඩුවක් යන විධියට කරගෙන ගිහිල්ලා අවසන් කරනවා, එහෙම නැත්නම් මම යම් කිසි වැරැද්දක් කර තිබෙනවා නම් විනිසුරුතුමන් විසින් දඬුවම් නියම කරාවි. එහෙම නැතුව මම වැරැද්දක් පිළිගෙන නැහැ. මේක කොච්චර කිව්වත්, මාධ්‍යවලින් මට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැත්නම් මගේ වරප්‍රසාද යටතේ අඩුම ගණනේ මම පාර්ලිමේන්තුවේදිවත් මේ ගැන කථා කරන්න ඕනෑ. මොකද, මගේ ඡන්ද දායකයෝ අහනවා, මගේ වැඩිහිටියෝ අහනවා, යාළුවෝ මිත්‍රයෝ අහනවා, මෙතැනට ආවාම සියලුම මන්ත්‍රීවරු, ඇමතිවරු අහනවා, "ඔබ වැරැද්දක් නොකර වැරැද්ද පිළිගත්තේ ඇයි?" කියලා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ ඉතාමත් පැහැදිලිව මා ප්‍රකාශ කරන්න ඕනෑ, මන්ත්‍රීවරියක් විධියට මගේ කීර්ති නාමයට එයින් හානියක් වෙලා තිබෙන බවත්, මන්ත්‍රීවරියක් විධියට මගේ වරප්‍රසාද කඩවීම පිළිබඳව ගරු කථානායකතුමා, ගරු නියෝජ්‍ය කථානායකතුමා ප්‍රමුඛ පාර්ලිමේන්තුව යම් කිසි විධියක තීරණයක් ගන්න ඕනෑ බවත්.

විශේෂයෙන්ම "හිරු" නාලිකාව මට මෙවැනි ප්‍රවෘත්තිවලින් ගහන එක සාධාරණයි. "හිරු" නාලිකාවේ ප්‍රධානියාගේ මල්ලී මගේ තාත්තාව මැරුවා. එසේ මරපු දවසේ ඉඳලා මම ඒ සටන ගෙන ගිහින් ඔහුට මරන දඬුවම ලබා දුන්නාට පස්සේ ඔවුන්ට මාත් එක්ක පෞද්ගලික තරහක් තිබෙනවා කියන්න පුළුවන්නේ. ඒක හරි. හැබැයි, "දෙරණ" නාලිකාවට මගෙත් එක්ක තිබෙන ප්‍රශ්නය මොකක්ද? අනෙක් කිසිම නාලිකාවකින් නැතුව දෙරණත්, හිරු නාලිකාවත් මට මෙහෙම ගහන්නේ ඇයි? මට මෙහෙම සැකයක් තිබෙනවා. ළඟදී දවසක එක් මාධ්‍යවේදියෙක් මගෙන් ඇහුවා, "ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයට ආවොත් ඔබතුමියන්ලා මොකද කරන්නේ?" කියලා. මම කිව්වා, "එතුමා බලයට ආවොත් අපට නම් ප්‍රශ්නයක් නැහැ, හැබැයි මාධ්‍යවේදීන් විධියට ඔබලාගේ ජීවිත ගැන වග කියන්න කිසි කෙනෙකුට බැහැ" කියලා. සමහර විට ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ගැන මම ඒ වගේ කථාවක් කිරීම වැරැදි විධියට අරගෙන "දෙරණ" නාලිකාවට හිත රිදුණාද දන්නේ නැහැ. ඒ නිසා මට ගහනවාද දන්නේ නැහැ. මේ කාරණා දෙක පැත්තක තියන්නකෝ.

ඊළඟට අද පුවත් පතක තිබෙනවා, "මගනැගුම සුබසාධක ගිණුමකින් හිරුණිකාටත් වෙනත් වැඩටත් කෝටි 2ක් දීලා" කියලා.

2014 පළාත් සභාවෙන් තමයි මම දේශපාලනයට ආවේ. මම දේශපාලනයට ඇවිල්ලා අදට අවුරුදු 3ක් වෙනවා. මගේ ජීවිතේට රජයේ මුදලක්, තුට්ටු දෙකක දෙයක් මම අරගෙන නැහැ. මම ඉතාමත් පිරිසිදුව තමයි මගේ දේශපාලනය කරන්නේ. භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මිනිසුන්ගේවත්, රජයේවත් සල්ලි සත පහක්වත් හොරකම් කරලාත් නැහැ; මම හොරකම් කරලාත් නැහැ. මට ඒක ඉතාමත් පැහැදිලිව සහ භය නැතුව කියන්න පුළුවන්. අපට ඔය වගේ චෝදනා එල්ල කරනවා නම්, පත්තරවලින් පළමුවෙන්ම, "ඒක ඇත්තද?" කියලා මට දුරකථනයෙන් කථා කරලා අහන්න ඕනෑ. මගේ දුරකථනය පැය 24ම වැඩ කරනවා. මම පැය 24ම දුරකථනය ක්‍රියාකාරී තත්ත්වයෙන් තබාගෙන ඉන්නේ. කථා කරලා අහන්න ඕනෑ, ඒ සිද්ධිය ඇත්තද, බොරුද කියලා. එක් පාර්ශ්වයකින් විතරක් කරුණු විමසලා පත්තරයක පළ කරනකොට අපේ පෞරුෂත්වයට මොකද වෙන්නේ, අපි කොහොමද ගිහිල්ලා මිනිසුන්ට මුහුණ දෙන්නේ කියලා පොඩ්ඩක් කල්පනා කරලා බලන්න. මේක මට අද වුණා නම්, හෙට ඔබට වෙන්න පුළුවන්. එහෙම වුණොත් ඔබ

[ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය]

වෙනුවෙනුත් කථා කරන්න කෙනෙක් නැති වෙයි. එම නිසා මේක හැම කෙනෙක්ම නැඟී සිටිය යුතු කාරණයක්. මේක පෞද්ගලික කාරණයක් නොවෙයි.

මාධ්‍යවලින් හැමකෙනාටම පෞද්ගලිකව මඩ ගහනවා. මේ ක්‍රියාව වැරදියි. කල්පනා කරලා බලන්න. කෝටි දෙකක් කියලා කියන්නේ ලක්ෂ දෙසීයක්. ඉතාම ලොකු මුදලක්. මේ ගැන FCID එකට වගකීමක් තිබෙනවා. මේ ගැන FCID එක උසාවියට වාර්තා කරයිලු. එහෙමනම් මේක ඇත්තද, බොරුද කියලා පළමුවෙන්ම මාව ගෙනැත් කටඋත්තරයක් ගන්න ඕනෑ. සාධාරණත්වයක් තිබෙන්න ඕනෑ. අද මම මේ ගරු සභාවේ කථා කරන දේ එළියට යන නිසා මම මේ වේලාවේ FCID එකෙන් ඉල්ලා සිටිනවා අනිවාර්යයෙන්ම අද මාව FCID එකට කැඳවන්න කියලා. එහෙම නැත්නම් මම FCID එකට එනවා. මොකද, මේක ඉතාම බරපතළ කථාවක්. මගේ හිත මේ තරම් රිදෙන්නේ මම මේ වාගේ වැඩ කරලා නැති නිසායි. අපි ඉතා පිරිසිදුව දේශපාලනය කරන අය. මගේ අම්මායි, මමයි විතරයි ලංකාවේ ඉන්නේ. අපේ හෝ අපේ නැදෑයන්ගේ බැංකු ගිණුම් සම්බන්ධ තොරතුරු මම මේ වේලාවේ FCID එකට ලබා දෙන්න කැමතියි. ඕනෑම ගිණුමක් අරගෙන බලන්න. අපේ ගෙවල්වලට ඇවිත් අපි ගැන සොයා බලන්න. මට යම් මුදලක් අතින් දීලා තිබෙනවා නම් ඒකටත් සාක්ෂි ඇති නේ. ඒ පුද්ගලයන්වත් ගෙන්වන්න කියලා මම මේ වේලාවේ කියනවා. මේ වාගේ බරපතළ චෝදනා කරන්න එපා. මොකද, අපි ඉතා පිරිසිදුව දේශපාලනය කරගෙන යන්න කැමති කට්ටිය; අනාගතයක් බලාගෙන දේශපාලනය කරන කට්ටිය. අපි කැමති නැහැ, මේ වාගේ කුණු අපේ නම්වලට ගාගන්න. ඒක ප්‍රධාන වශයෙන් කියන්න ඕනෑ. උදේට "හිරු" රූපවාහිනී නාළිකාවේ පත්තරේ විස්තරේ යනකොට පත්තරේ බලාගෙන සුරංගනා කථා කියන රංගන කියලා මනුස්සයෙක් ඉන්නවා නේ. ඒ මනුස්සයා පත්තරේ බලාගෙන පත්තරේ තිබෙන දේවල් නොවෙයි කියන්නේ; සුරංගනා කථා කියන්නේ. මිනිහා කියනවා මේවා අහගෙන ඉන්නකොට "ඇඟ කිලි පොළා" යනවාලු. ඇඟ කිලි පොළා යන්න ඕනෑ මේ වාගේ බොරු කථා කියනවාට නොවෙයි. මහ දවල් මිනිසුන් හතරදෙනෙක් පාර මැද මරලා දමනකොටයි ඇඟ කිලි පොළා යන්න ඕනෑ. රංගනලාගේ හිරු නාළිකාවේ ප්‍රධානියාගේ මල්ලි මහ දවල් දෙනෝ දාහක් බලා ඉද්දී මිනිසුන් හතරදෙනෙක් මරලා දමනකොට තමයි ඇඟ කිලි පොළා යන්න ඕනෑ. හරිද? තමන්ගේ මල්ලි office එකේදී අම්මාවයි, පාසල් යන දුවවයි එක සැරේ දූෂණය කරන එක දිහා බලාගෙන ඉන්නකොටයි ඇඟ කිලි පොළා යන්න ඕනෑ. හිරු නාළිකාවේ අයිතිකාරයාගේ නෝනා ක්‍රිකට් ක්‍රීඩකයොත් එක්ක වෙන වෙන සෙල්ලම් කරනකොට, ඒවා බැලුවාමයි ඇඟ කිලි පොළා යන්න ඕනෑ. එහෙම නැතිව මට කියන මේ බොරු කථාවලට නොවෙයි, රංගනගේ ඇඟ කිලි පොළා යන්න ඕනෑ. මම ඉතා වගකීමෙන් කියනවා ගැහැණු කෙනෙකුට ඇඟිල්ල දිගු කරන්න කලින් තමුන්ගේ පැත්තේ, තමුන්ගේ ලොක්කාට තිබෙන චෝදනා, තමුන්ගේ ලොක්කාගේ බිරිඳට තිබෙන චෝදනා, තමුන්ගේ ලොක්කාගේ මල්ලිට තිබෙන චෝදනා දිහා මුලින් බලන්න කියලා. නිකම් පාඩුවේ පැත්තකට වෙලා ඉන්න අපි වාගේ කට්ටියට ඇඟිල්ල දිගු කරන්න කලින් ඒවා ගැන බලන්න. මහින්ද රාජපක්ෂ මහත්මයා ඉන්න කාලයේ දුමින්ද සිල්වා එක්ක හැප්පුණු මට මෛත්‍රීපාල සහ රනිල් වික්‍රමසිංහ එක්ක ඉන්නකොට ඔවුන් දෙදෙනාත් සමඟ දුමින්ද සිල්වා එක්ක හැප්පෙන එක මහ ලොකු දෙයක් නොවෙයි කියලා හොඳට මතක තියා ගන්න. ඒක හොඳට මතක තියාගන්න. එම නිසා බොරුවට මට මඩ ගහගෙන තමුන් සවුත්තු වෙන්න ලැහැස්ති වෙන්න එපා. මම පැහැදිලිව කියන්නේ, මම ඉතා ඉවසිමෙන් පසුගිය දවස්වල හිටියා. [බාධා කිරීමක්] මම අනිවාර්යයෙන් මේකට නඩු දමනවා. ඒ විතරක් නොවෙයි. දුමින්ද සිල්වා මහත්මයාගේ appeal එකේ තීන්දුව හෙට එනවා කියලා ආරංචියක් තිබෙනවා. අනේ මහත්තයෝ, අපි නම් ඔය පාලකයෝ ළඟට ගිහින් වැඳ වැටිලා "මාධ්‍ය ආවරණය දෙන්නම්, අනේ මගේ මල්ලිව අයින් කරලා දෙන්න. මුදල් දෙන්නම්, ඊළඟ සැරේ මගේ මල්ලිට ඡන්දය ඉල්ලන්න list එකට දමලා දෙන්න" කියලා කිව්වේ නැහැ. අපි නම් ඔය දේවල් කියලාත් නැහැ; කථා කරලාත් නැහැ. හැබැයි, අපි දන්නවා කවුද ගිහින් ඒවා ගැන කථා කළේ, කාටද කථා කළේ කියලා. අපට ඔය කිසිම deal එකක් නැහැ. ඒක නේ අපට මේ වාගේ චෝදනා එන්නේ. මම හරි ආවේගයෙන් කථා කරන්නේ. ඒ වෙන මොන හේතුවක් නිසාවත් නොවෙයි, වැරදි කළාට පසුව වැරදි කරපු අය ඒ වැරැදි වහගෙන, පාඩුවේ පැත්තකට වෙලා ඉන්න අපට චෝදනා කරන නිසායි. අපි පසුගිය දවස්වල ඉතාම නිහඬව හිටියා. අපිව නැවතත් පාරට ගෙන්වා ගන්නයි මේ හදන්නේ. අපි නිහඬව, පාඩුවේ දේශපාලනය කරගෙන ගියා. කරුණාකර බොරුවට පෞද්ගලිකව මඩ ගහන්න එපා. ඒ වාගේම මෙතැන ඉන්න සියලුදෙනාට මේක පොදුයි. මේ හැමකෙනාවම අල්ලාගෙන පෞද්ගලික නාළිකාවලින්, පෞද්ගලික පත්තරවලින් තමුන්ගේ වාසියට මඩ ගහනවා. තමුන්ගේ පත්තර අයිතිකාරයන්ට, නාළිකා අයිතිකාරයන්ට හොඳ හිත නැත්නම් ඒ මනුස්සයාගේ පෞද්ගලික ජීවිතය, දේශපාලනය මේ හැමදේම අල්ලාගෙන ඒ මනුස්සයාව නැත්තටම නැති කරනවා. ඒක websitesවලත් කෙරෙනවා. මේක වැරදි දෙයක්. ඇත්තටම අපහාස කිරීමට නඩු පැවරීමේ අයිතිය අපේ ආණ්ඩුව විසින්මයි ඉවත් කළේ. මම කියන්නේ ඒක නැවත ඇති කළ යුතුයි කියලායි. ඇති කරලා මේ විධියට අපහාස කරන මිනිසුන්ට, මේ වාගේ -[බාධා කිරීමක්] ඒක තමයි. විශේෂයෙන් අපි කාන්තාවෝ. මොන දේ වුණත්, දේශපාලනය කළත් අපි කාන්තාවෝ. අපි ගෙදර ගිහින් බිරිඳක් විධියට, මවක් විධියට සැමියාත් එක්ක, ළමයි එක්ක, අපේ අම්මලා තාත්තලා එක්ක ජීවත් වෙන්න ඕනෑ.

මේ වාගේ ජරා කථා කිව්වායින් පස්සේ අපි කොහොමද එළියට ගිහිල්ලා මිනිසුන්ට මුහුණ දෙන්නේ? අපට ලජ්ජාව කියලා දෙයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන කාන්තාවන් එක්කෙනෙකුටවත් කවදාවත් මූල්‍ය අපරාධ චෝදනා ඇවිල්ලා නැහැ. එහෙම චෝදනා එන්න ඕනෑත් නැහැ. මොකද, කාන්තාවන් සාමාන්‍යයෙන් එවැනි දේවල් කරන්න භයයි; ලජ්ජයි. ඒ නිසා කරුණාකර කාන්තාවන්ට මඩ ගහන එක නවත්වන්න කියා මා ඉල්ලා සිටිනවා. විශේෂයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරියක් විධියට මගේ වරප්‍රසාද කඩ වීම හේතුවෙන් මේ සඳහා පියවර ගන්න කියා ගරු කථානායකතුමාගෙනුත්, ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙනුත් මා ඉල්ලා සිටිනවා. මේක මූලික පියවරක් විධියට ගන්න. එතකොට අනෙක් අයත් තමුන්ට ආව අපහාස චෝදනා ගැන කියාවි. එතකොට ඒ ගොල්ලන්ටත් සාධාරණය ඉෂ්ට කරන්න පුළුවන්. ඒ නිසා කරුණාකර මේ සඳහා පියවර ගන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, විශේෂයෙන් කියන්න ඕනෑ, ඔය "හිරු" සහ "දෙරණ" කියන නාළිකා දෙකම කරගෙන යන්නේ මාධ්‍යකරණය නොවෙයි කියන එක. ඔවුන් මාධ්‍යකරණය ගැන දන්නේ නැහැ. මාධ්‍යකරණය කියන්නේ ඕක නොවෙයි. ඔවුන් මනුෂ්‍යයකුගේ පෞද්ගලික දෙයක් අරගෙන, උදේ ඉඳන් රෑ වෙනකම් ඒ එකම දේ ගැන කියමින් පහර ගහනවා. මොකක්ද ඒ මාධ්‍යකරණය? අපි දන්නා කාලයේ ඉඳන් මේ වාගේ ජරා මාධ්‍යකරණයක් තිබුණේ නැහැ. "හිරු" එකේ website එක අරගෙන බලන්න, කවුරුන් හෝ කාන්තාවක් දූෂණය වුණාම, ඒ කාන්තාවගේ මුහුණ සමඟ ඒ කාන්තාවගේ මුළු ඉතිහාසයම ඒකේ පළ කරනවා. ඒවා තුප්පහි කථා; කැත කථා. ඒ වාගේ කුණු ප්‍රවෘත්තිවලිනුයි ඒ අය හම්බ කරගන්නේ. රංගනලා, ඒ වාගේම ඒ නාළිකාවල උදේට පත්තර කියවන අය ඒවායේ කොටස්කාරයින්. කිසිම ජාතියක්, ජන්මයක්

නැති, අම්මෙක්, අප්පෙක් නැති, හිත උණු වීමක් නැති, ගැහැනියකගේ දුකක්, කරදරයක් තේරෙන්නේ නැති, හැමදේම සල්ලි කරගත්ත එවන් ජරා ජීර්ණ මිනිස්සු තමයි මෙවැනි ආකාරයෙන් මඩ ගහන්නේ. ඒ අය යම්කිසි තත්ත්වයකට එයි. හැබැයි, හෙට අනිද්දා ජනතාව විසින්ම සෙරෙප්පුවෙන් ගහලායි ඒ මිනිස්සුන් එළවන්නේ. මේ වන අසාධාරණයට පියවරක් ගන්න කියා ගරු කථානායකතුමාගෙනුත්, ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙනුත්, විශේෂයෙන්ම ගරු අගමැතිතුමාගෙනුත් මා ඉතා වුවමනාවෙන් ඉල්ලා සිටිනවා. මා ඉතාමත් ආවේගයෙනුයි කථා කරන්නේ. මොකද, අපි හොරු නොවෙයි. අපි හොරකම් කරලා නැහැ; මිනී මරලා නැහැ; කාමරවලට එන්න කියලා ගැහැණු ළමයින්ව දූෂණය කරලා නැහැ; නිළියන්ට කාමරවලට එන්න කියලා "අර ගණන දෙන්නම්, මේ ගණන දෙන්නම්, television එකේ නාට්‍යවලට වැඩිපුර අවස්ථාව දෙන්නම්" කියලා ඒ කාන්තාවන්ගේ ජීවිත විනාශ කරලා නැහැ. අපි ඒවා කරලා නැහැ. හැබැයි, මට මඩ ගහන ඒ මාධ්‍ය ආයතනයේ ප්‍රධානියාත්, ඔහුගේ මල්ලිත් ඒවා කරලා තිබෙනවා. ඒ නිසා තමයි පසුගිය කාලයේ දෙවියන්ගේ ශාපයක් වාගේ තමුන්ගේ බිරිඳගෙන්ම තමුන්ගේ රෙදි ටික ගැලවුණේ. අපි දැක්කානේ පසුගිය දවස්වල වුණු දේවල්. සෑම පිරිමි ළමයකුගේම දුරකතනවල තිබුණා ඒ සම්බන්ධ video එක. විහිළුවක් බවට පත් වුණානේ. එහෙම වුණේ කාන්තාවන්ට මඩ ගහන නිසායි. අඩුම තරමින් ඒකෙන්වත් පාඩමක් ඉගෙන ගත්තේ නැහැ. කරුණාකර, මේ වැඩේ නවත්වන්න ඕනෑ. මේක කාටත් එකයි. විපක්ෂයේ අයටත් එකයි, ආණ්ඩුවේ අයටත් එකයි.

අනෙක් කථන්දරය මේකයි. මෙතැන ඉන්න මේ සියලුම ගරු මන්ත්‍රීවරුන් එක්කෝ මගේ තාත්තාගේ යහළුවන්; නැත්නම් මගේ යහළුවන්. බැරි වෙලාවත් මෙතුමන්ලා මගේ උත්සවයකට සහභාගි වුණොත්, එහෙම නැත්නම් මේ ඉන්න කවුරු හෝ පාර්ලිමේන්තුවේ Chamber එකේදී මමත් එක්ක ටිකක් වැඩිපුර වේලාවක් කථා කර කර හිටියොත්, ඊළඟ දවසේ හිරු නාළිකාවේ අයිතිකාරයාගෙන් එතුමන්ලාට call එකක් එනවා, "ඇයි උඹ හිරුණිකා එක්ක කථා කර කර හිටියේ? මොකක්ද තිබෙන සම්බන්ධය? පුළුවන් නම් හිරුණිකාට පොඩි මඩක් ගහපන්. නැත්නම් හෙට ඉඳන් උඹේ news දාන්නේ නැහැ" කියලා. මේක ඇත්තද, බොරුද කියලා මේ පසු පෙළ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් අහන්න. මේ පිටුපස ඉඳගෙන හිනා වෙන අයට ඒක වෙලා තිබෙනවා. ඒකයි ඒගොල්ලන් හිනා වෙන්නේ. "උඹ හිරුණිකා එක්ක තිබෙන යහළුකම නවත්තපන්. නැත්නම් උඹේ news දාන්නේ නැහැ" කියලා කියනවා. ඔන්න ඕකයි තිබෙන තත්ත්වය. මා එක්ක තිබෙන තරහට අනෙක් මන්ත්‍රීවරුන්ගෙන් පළි ගන්න එපා කියන එක මා කියනවා. ඒ අය ඔහොම නොවෙයි, ඔළුවෙන් හිටගෙන කිව්වත් මේ ඔක්කෝම මගේ මිත්‍රයින්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
හොඳයි.

ඒ අය මගේ තාත්තා එක්ක මිත්‍රකම් පවත්වපු අය; මා එක්ක මිත්‍රකම් පවත්වන අය. මේ අය මේ කොහේවත් යන නාළිකාවක් නිසා තමන්ගේ මිත්‍රකම් නැති කර ගන්නේ නැහැ. මේ අය මොන පක්ෂයේ හිටියත් මගේ තාත්තා එක්ක එකට දේශපාලනය කරපු අය; තාත්තාට දේශපාලනය උගන්වපු අය; තාත්තා එක්ක එකට පෙළ පාළි ගිය අය; පළමුවරට මම ඡන්දය ඉල්ලපු වෙලාවේදී පැහැදිලිවම එළියට බැහැලා මට උදව් කරපු අය; ඊට පස්සේ මා වෙන පක්ෂයකට ගියත් "දුවේ" කියලා අදටත් මා එක්ක කථා කරන මිනිස්සු. මේ මිනිසුන්ගෙන් පළි ගන්න එපා, මා එක්ක තිබෙන තරහට. ඒ නිසා මා ඉල්ලන්නේ මේ සම්බන්ධයෙන් ගරු කථානායකතුමා යම් කිසි තීරණයක් අරගෙන, ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරවීමට මට සහය දෙන්න කියායි. මේ සම්බන්ධයෙන් මම අදම ගිහිල්ලා පොලීසියේ පැමිණිල්ලක් දමනවා. මේ සඳහා මට සහය දෙන්න කියලා මා ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.55]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත ගැන විවාද වෙන අවස්ථාවේදී යම් කරුණු කිහිපයක් කියන්න කැමතියි. මෙම පනත් කෙටුම්පතට අදාළව ගත්තොත්, අපේ රටේ දේශපාලන, සිවිල් කලකෝලාහල නිසා විවිධ හානිවලට, විවිධ ප්‍රශ්නවලට ගොදුරු වුණු අයට වන්දි ලබා දීම සඳහා ස්ථාපනය කරන ලද, දැනට තිබෙන පුනරුත්ථාපන අධිකාරිය වෙනුවට වෙනත් කාර්යාලයක් ආරම්භවීමක් සිද්ධ වෙනවා; ආයතනයක් ආරම්භ වීමක් සිද්ධ වෙනවා. එතකොට, අපේ දැනීමේ හැටියට පුනරුත්ථාපන අධිකාරිය ඉදිරියට ක්‍රියාත්මක වෙන්නේ මේ කාර්යාලය හරහායි. ඒ වාගේම, අපට පෙනෙන හැටියට ව්‍යවස්ථාදායක සභාවම පාවිච්චි කරලා ඒ කාර්යාලට නිලධාරීන් පත් කිරීම් ක්‍රියාවලිය කරනවා. ඊට අමතරව මේ චින්දිතයන් කවුද, හානියට ලක් වූ පුද්ගලයන් කවුද යන්න පිළිබඳ යම් කිසි නිර්වචන ප්‍රමාණයක් මේ පනත් කෙටුම්පතින් ඉදිරිපත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිසුන් තනි තනිව වැරදි කරනවා. ඒ වාගේම, මිනිස්සු සමූහයක් විධියට වැරදි කරනවා. ඒ වාගේම, මිනිස්සු අනෙක් අය කරන වැරදිවලට ගොදුරු වනවා. ඒ වාගේම, ආණ්ඩුවලින් අපරාධ කරනවා. ලෝකයේ ප්‍රසිද්ධම කාරණයක් තමයි වැඩිම අපරාධ කරන්නේ ආණ්ඩුවලින් කියන එක. ලෝකයේ වැඩිම අපරාධ කරන්නේ රාජ්‍යයන්. ඊට පස්සේ සමාගම්. ඊටත් පස්සේ පුද්ගලයන්. අපරාධ, වැරදි යන මේ ක්‍රියාවලි හැම එකකම පුද්ගලික වැරදිත් තිබෙනවා. ඒ කියන්නේ, පෞද්ගලිකව -තනි තනි පුද්ගලයා- දායකවන අපරාධ තිබෙනවා. නමුත්, බොහෝ අවස්ථාවල සිද්ධ වෙන්නේ ආණ්ඩුවලින් කරන්නා වූ වැරදිවලට එරෙහිව යම් යම් සමාජ විරෝධී ක්‍රියා ඇති වීමයි. ජනතාව පෙළීමේ, ජනවර්ගයා කොන් කිරීමේ, ජන කණ්ඩායමක් හෝ වෘත්තීය සමිති හෝ ශිෂ්‍ය සංගම් හෝ කලාකරුවන් හෝ මාධ්‍යවේදීන් හෝ විරුද්ධ දේශපාලන පක්ෂ හෝ මර්දනය කිරීමේ ප්‍රතිඵලයක් විධියට, සමාජයෙන් ඒවාට පෙරළා ප්‍රතිචාර නැගෙනවා. ඒක නතර වෙන්නේ නැහැ. ලෝකයේ හැම දේශපාලන සමාජ ඉතිහාසයම එහෙම තමයි. ආණ්ඩුවලින් අනවශ්‍ය ලෙස ප්‍රජාතන්ත්‍රවාදය සීමා කරනකොට, උල්ලංඝනය කරනකොට ඒවාට පෙරළා ක්‍රියාමාර්ග ඇති වෙන එක වළක්වන්න බැහැ. ඒ ආණ්ඩුවලින් වාගේම, යම් යම් සමාජ සංවිධානවලින් ඒවා කෙරෙනකොටත් ඒවාට පෙරළා ප්‍රතිචාර එනවා. ඒ නිසා ඇත්ත වශයෙන්ම අපි දකිනවා වැරදිවල වැඩි

[ගරු බිමල් රත්නායක මහතා]

කොටස තිබෙන්නේ සමාජයට බව. එහි ප්‍රධාන ආයතනය වශයෙන් ආණ්ඩුවට.

අපේ රටේ විශාල වශයෙන් සමාජ අරගළ සිද්ධ වෙලා තිබෙනවා. අපේ රට නිදා ගෙන ඉන්න ජනතාවක් සිටින රටක් නොවෙයි. අපේ රටේ ජනතාව සටන් කරනවා. ඒක හොඳ දෙයක්. ආණ්ඩුවලින් කරන ලද මහා දැවැන්ත මර්දන, අපරාධ නිසා ජනතාව ඒ තැන්වලට තල්ලු වෙලා තිබෙනවා. ඒ සටන් ඇතුළේ ඒ සංවිධානවලින් වූ වැරදි හා අඩුපාඩුකම් තිබෙනවා. මිනිස්සු හුදකලාව අපරාධකරුවන් වෙන්නේ නැහැ. කවුරුවත් උපදිනකොට මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස ඉපදෙන්නේ නැහැ. "මධුෂ්කද" කවුද කියන ප්‍රසිද්ධ පාතාල නායකයෙක් ගැන දැන් කියනවා. මම ඒ ගැන දන්නේ නැහැ. සමහර මන්ත්‍රීවරුන් නම් එයා දන්නා බව අපට පෙනෙනවා. නමුත් කවුරුවත් ඒ විධියට උපදින්නේ නැහැ. ඉපදුණාට පස්සේ තමයි මිනිසුන් සමාජයීය තත්ත්ව අනුව ඒ ඒ තැන්වලට තල්ලු වෙන්නේ. නමුත්, පුද්ගලයාටත් වගකීමක් තිබෙනවා. මේ කාර්යාලය දිහා අපි බලන්නේ ඒ ආකාරයෙන්. ඒ නිසා හානි සිදු වූ අයට වන්දි ලබා දීමට පිළිවෙළක් සහිත ක්‍රමවේදයක් හදන එක, හානි වුණු අයට උදව් කරන එක අපි පිළිගන්නවා. මේ කාර්යාලය ආරම්භ කිරීම ජනතා විමුක්ති පෙරමුණ දකින්නේ ඒ දෘෂ්ටි කෝණයෙන්. මේ ගැන මට අවබෝධයක් තිබෙනවා. නමුත් ඇමතිවරයාගේ පැත්තෙන් මේ කාරණය පැහැදිලි කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතේ උතුරු සහ නැඟෙනහිර කියන කොටස අවධාරණය කරලා තිබෙන නිසා, මේ වන්දි ලබා ගැනීමේ අවස්ථාව ලැබෙන්නේ කොපමණ කාලයක සිටද කියලා පැහැදිලි කරන්න ඇමතිවරයාට නිශ්චිතවම වගකීමක් තිබෙනවා.

1972දී පැවති ආණ්ඩුව මඟින් මේ රටේ විශාලම හානි, ඝාතන සිදු වුණා. ප්‍රේමවතී මනම්පේරිය සහෝදරිය ඇතුළු 10,000කට ආසන්න පිරිසක් ඝාතනය කළාය කියලා සාමාන්‍ය අදහසක් තිබෙනවා. ආණ්ඩුවලින් ගෙවල් ගිනි තැබුවා. එවැනි දේවල් විශාල ලෙස සිද්ධ වුණා.

ඒ නිසා, අඩු ගානේ එතැන් සිට හෝ සාධාරණය ඉටු කළ යුතුයි. ඊට කලිනුත් මේ රටේ සමාජ අරගළ සිද්ධ වෙලා තිබෙනවා. '1953 හර්තාලය' වාගේ අරගළ සිද්ධ වෙලා තිබෙනවා. මිනිස්සු කවුරුත් ඒ පැරණි සිද්ධි මේ කාර්යාලයට ඉදිරිපත් කරන්න එන එකක් නැති වෙයි. නමුත්, යුක්තිය පසිඳලනවා නම් ඒ අයටත් ඉඩකඩක් තිබිය යුතුයි. ඒ ඉඩකඩ එක සීමාවක් සඳහා පමණක්, එක කාලයකට පමණක් සීමා විය යුතු නැහැ. අඩු ගානේ අපි දන්නා ඉතිහාසය සඳහාත් ඒ අවස්ථාව තිබෙන්න ඕනෑ. මොකද, අද වැඩිපුර අවධානය යොමු වෙලා තිබෙන දේවල් බවට පත් වෙලා තිබෙන්නේ, අපට මතක, මේ බොහොම මෑතක වාගේ වුණු සිදුවීම් නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වන්දි ලබා දීමේ ක්‍රියාවලිය ගැන කථා කරපු නිසා ඒ ගැන මම ඉතා කෙටියෙන් කියන්න කැමැතියි. මෙම ක්‍රියාවලියට විනිවිදභාවයක් අවශ්‍යයි. නමුත්, වන්දි ලබා ගන්න ගිය සමහර අවස්ථාවලදී අපි දන්නවා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරන තරම් බරපතළ ආකාරයට ලිපි ලේඛන ඉදිරිපත් කරන්න තිබෙන බව. වන්දි ලබා ගන්න ගිය බොහෝ දෙනෙකු එවැනි විශාල දුෂ්කරතාවකට මුහුණ පාලා තිබෙනවා. 1989දී විනාශ කරපු, ඝාතනය කරපු, ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන්ගේ පවුල් ගත්තත් ඒ දුෂ්කරතාවට මුහුණ දීලා තිබෙනවා. එම නිසා, ඒ දුන්නු සොච්චම් වන්දිය ගන්නත් හුහක් අම්මලා ඉදිරිපත් වුණේ නැහැ. සමහර අය ඉදිරිපත් වුණා. නමුත් ඒ ඉදිරිපත් වූ අයටත් ඒ වන්දි ගන්න අමාරු වුණා. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවකට ඉදිරිපත් කරනවාට වඩා ලිපි ලේඛන එහිදී ඉදිරිපත් කරන්න ඕනෑ වුණා. අද උතුරු සහ නැඟෙනහිර ප්‍රදේශවලත් ඒ තත්ත්වය තිබෙනවා. එහේ දුප්පත් දෙමළ අම්මලා ඉන්නේ. මේ ඉල්ලන ලේඛන ටික දෙන්න අඩු ගානේ ජනාධිපති නීතිඥයෙක්වත් වෙන්න ඕනෑ. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඒ ඉදිරිපත් කරන ලිපි ලේඛන සරල කරන්න කියලා. මටත් ඒ පිළිබඳ අත්දැකීම් තිබෙනවා. පුනරුත්ථාපන අධිකාරියෙන් ඉදිරිපත් කරපු සමහර forms අපි දැක තිබෙනවා. ඒ සියලු දේවල් සම්පූර්ණ කිරීම ඉතාම දුෂ්කර කටයුත්තක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් විවිධ අර්ථකථන දෙමින්, ජාතිවාදී හැඟීමකින් මේ පනත් කෙටුම්පත දිහා බලනවා. එම නිසා, මේ ගැන කරුණු කීපයක් කියන්න ඕනෑකම තිබෙනවා. රට බෙදීම සම්බන්ධ උතුරේ යුද්ධයට එල්ටීටීඊ සංවිධානය මූලික වුණා. රටට එරෙහි, ජනතාවට එරෙහි, ජාතිවාදී යුද්ධයක් එල්ටීටීඊය ආරම්භ කළා. ඊට කලින්, එල්ටීටීඊ එකක් හදන්න විශාල වශයෙන් හේතු වුණේත්, ලංකාවේ තිබිච්ච ආණ්ඩු දෙමළ ජනතාවට කරපු හිරිහැර, ඝාතන, තර්ජන, ඡන්ද කොල්ල කෑම් හා අසාමාන්‍ය ලෙස සැලකීම් කියන කරුණු. ඒ හේතු නිසා ඇති වෙච්ච එල්ටීටීඊයෙන් කරපු දේවලුත් වැරදියි; ආණ්ඩුවෙන් කරපු දේවලුත් වැරදියි.

හානිපූරණය සඳහා වන මෙම කාර්යාලය හරහා එල්ටීටීඊ සාමාජිකයන් වශයෙන් හිටපු අය පුනරුත්ථාපනය කරලා, ඔවුන්ට සමාජගත වීමට යම් ආකාරයකින් උදව් කළ යුතුද, නැද්ද කියන විවාදය සමාජය තුළ තිබෙනවා. දැන් ලෝකයේ 'පුනරුත්ථාපනය' කියන එක පිළිබඳව ගොඩක් සාකච්ඡා තිබෙන බව අපි දන්නවා. නමුත්, අපි දකින දේ මෙයයි. මේ රටේ පැවැති යුද්ධය අවසන් වුණේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා හැටියට සිටි කාලයේදීයි. එතුමාගේ කාලයේදීත් පුනරුත්ථාපන කඳවුරු විශාල වශයෙන් පිහිටුවලා, මගේ දැනීමේ හැටියට 13,000කට අධික එල්ටීටීඊ සාමාජිකයන් පිරිසක් පුනරුත්ථාපනය කරලා, නිදහස් කළා. ඒකටත් රජයේ මුදල් තමයි වියදම් කළේ; රටේ බදු මුදල් තමයි වියදම් කළේ. ඒ ගැටුම්වල තනිකර වැරැද්ද ඒ එක් එක් එල්ටීටීඊ සාමාජිකයාගේද? ඔවුන්ටත් වගකීමක් නැහැ නොවෙයි. මම ඒකත් කියනවා. නමුත්, මෙය එල්ටීටීඊ සාමාජිකයන් විසින් තනි තනිව කරපු වැරැද්දක් නොවෙයි. මේක සමාජ ප්‍රශ්නයක්. ඒ නිසා උතුරේ ලක්ෂ ගණනක් ජනතාව තවදුරටත් රට බෙදන පැත්තට තල්ලු කරන්නේ නැතුව, ලංකාව තුළ තියා ගන්න ඕනෑ නම් ඔවුන්ටත් සමාන විධියට සලකන්න ඕනෑ.

මහින්ද රාජපක්ෂ මහතාත් ලෝකයේ පිළිගත් සම්මතය අනුව එල්ටීටීඊ සාමාජිකයන් පුනරුත්ථාපනය කළා; ඒ සඳහා වියදම් කළා. සමහරුන්ට රැකියාත් දුන්නා. මම දැක්කා, එතුමාගේ කාලයේ ඔවුන් විවාහ කරලාත් දුන්නා. ඒ වාගේම, එතුමාගේ කාලයේ එල්ටීටීඊ සාමාජිකයන්ගේ නංගිලා, මල්ලිලා හමුදාවට බඳවා ගත්තා; පොලීසියට බඳවා ගත්තා. ඒ අයටත් සාමාජගත වෙලා සාමාන්‍ය ජීවිතයක් ගත කරන්න තිබෙන ඉඩකඩ ලබා දෙන්න ආණ්ඩුවෙන් උදව් කරන්න ඕනෑ. ඒගොල්ලන්ට මානසික ප්‍රශ්නයක් තිබෙනවා කියලා මම විශ්වාස කරන්නේ නැහැ. මොකද, ඔය සටන් කරපු කිසිම කෙනෙක් -සියයට 99ක්ම- මානසික ප්‍රශ්න නිසා නොමඟ ගිය අය නොවෙයි. සාමාජයේ ප්‍රශ්න විසින් ඔවුන් තල්ලු කරනවා, එතැනට. ඒ තල්ලු වෙන එකේ අන්තවලට ගියාම ඒ අය අතින් වැරදි වනවා. නැතුව, ඒ ගොල්ලෝ මානසික රෝගීන් නොවෙයි. ඒ නිසා එවැනි අය සමාජගත කරනවා කියන්නේ, මානසික රෝගීන් සමාජගත කරනවා කියන එක නොවෙයි. ඒ නිසා සමාජයේ සහ පාලනයේ වැරැද්දෙන් අන්තගාමී තත්ත්වයට ගිය අයට ජීවත් වෙන්න අවස්ථාවක් දිය යුතුයි. ඒක ප්‍රතික්ෂේප කරන්නේ නරුමයන්. ඒක ප්‍රතික්ෂේප කරන්න පුළුවන් රාජ්‍ය පාලනය ගැන කිසිම අදහසක්

නැති නරුමයකුට පමණයි. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේත් එල්ටීටීඊ සාමාජිකයන් 13,000ක් විතර, නිකම් හිතවතුන් නොවෙයි, ex-combatantsලා පුනරුත්ථාපනය කළා.

ඒ නිසා අපි කියනවා, ඒ කටයුත්ත කෙරෙන්න ඕනෑ කියලා. අපි නම් ඒක දකින්නේ එල්ටීටීඊ එකට උදව් කිරීමක් ලෙස නොවෙයි. මේ කාරණයේ දී ඒ පුනරුත්ථාපන ක්‍රියාවලිය සම්බන්ධව, ඔවුන්ට අවස්ථාව ලබාදීම සම්බන්ධව අපට එකඟතාවක් තිබෙනවා. නමුත් පුනරුත්ථාපන ක්‍රියාවලිය, නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය ගත්තාම අපට පෙනෙනවා, උතුරු සහ නැගෙනහිර ජනතාවට සහ ඒ ආශ්‍රිත වැඩිපුර සිංහල ගම්මානවලට එල්ටීටීඊ සංවිධානයෙන් සිද්ධ වෙච්ච විශාල විනාශයන් කොපමණද කියා. මේ සියල්ල සලකා බැලුවාට පස්සේ ඒ තුවාලය සුවපත් කිරීමේ ක්‍රියාවලිය ඉතාම හෙමින් තමයි සිද්ධ වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි අපි ජනතා විමුක්ති පෙරමුණ විධියට, මේ රට බෙදීමට විරුද්ධව දැවැන්තම දේශපාලන කාර්ය භාරයක් ඉටුකරපු දේශපාලන පක්ෂය විධියට, ජාතිවාදයෙන් තොරව මේ රට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ කියන කාටත් සියයට සියයක් හරියටම අයිතියි කියා විශ්වාස කරන දේශපාලන පක්ෂයක් විධියට යම් වැඩ පිළිවෙළක් යෝජනා කළේ. යුද්ධය අවසන් වුණේ 2009 මැයි මාසයේ 19වැනිදා. ඊට සතියකට පසුව, අපේ පක්ෂයේ දේශපාලන මණ්ඩලය මහින් මැයි 27වැනිදා යම් යම් වැඩ පිළිවෙළක් යෝජනා කළා. යුද්ධයෙන් පීඩාවට පත් වූ ජනතාව, දෙමළ ජනතාව මුහුණ දී තිබුණු ගැටලු අඩු කරන්න ප්‍රායෝගික විසඳුමක් ඉදිරිපත් කළා. අපි එතැනදී ප්‍රධාන කරුණක් යෝජනා කළා. යුද්ධය සම්බන්ධ සියලු ප්‍රශ්න සම්බන්ධ කර ගත් "සත්‍ය ප්‍රතිසන්ධාන කොමිසමක්" පිහිටුවන්න කියලා යෝජනා කළා; Truth Commission එකක් පිහිටුවන්න යෝජනා කළා.

අද මේ ප්‍රශ්නය සාකච්ඡා කරන්න අවශ්‍යයි. මොකද, එදා ඒ යුද්ධය ඇතුළේ වැරදි කළේ අපේ රටේ ආණ්ඩු විතරක් නොවෙයි. ආණ්ඩුත් ජාතිවාදය කළා; එල්ටීටීඊ සංවිධානයත් ජාතිවාදය කළා; ඒ ආණ්ඩු යටතේ සිටි හමුදාවේ සමහර අයත් ජාතිවාදය කළා; ඒ වාගේම සාමාන්‍ය මිනිස්සුත් ජාතිවාදය කළා. 1983 කඩ ගිනි තිබ්බේ යුඑන්පී ආණ්ඩුවේ නායකයන් බව ඇත්ත. හැබැයි, සාමාන්‍ය මිනිසුන් දෙමළ මිනිසුන්ට ගැහුවේ නැද්ද? ගැහුවා. මඩකලපුවේ හිටපු සිංහල මිනිසුන්ට ගහලා එව්වේ එල්ටීටීඊය පමණක් නොවෙයි. එහේ හිටපු සාමාන්‍ය දෙමළ මිනිසුන් පවා සිංහල මිනිසුන්ට ගහලා එව්වා. උතුරේ දෙමළ ජනතාව උතුරේ හිටපු සිංහල මිනිසුන් එළවද්දී, ඒ තුළ හිටියේ එල්ටීටීඊ එක පමණක් නොවෙයි. එහේ හිටපු සමහර දෙමළ ජනතාවත් ජාතිවාදී වුණා. මොකද, ආණ්ඩුවකට පුළුවන් සමාජයක් ජාතිවාදී කරන්න. දැනට මාස හතර පහකට කලින් මෙහේ මුස්ලිම් මිනිසුන්ට විරුද්ධව, සාධාරණ මුස්ලිම් මිනිහාට ලංකාවේ ඉන්න බැරි විධියේ දැවැන්ත phobia එකක් හැදුවා නේ. ඒවා ආණ්ඩුවලින් හදනවා; ඒවා සමාජ මාධ්‍යවලින් හදනවා; televisionවලින් හදනවා; දේශපාලන ව්‍යාපෘතිවලින් හදනවා. මිනිසුන් ඒවාට ගොදුරු වෙනවා. මිනිසුන් ඒවායේ අභිංසක ඉන්නත් බවට පත් වෙනවා. එක්කෝ දැනුවත් ඉන්නත් බවට පත් වෙනවා; නැත්නම් අභිංසක ඉන්නත් බවට පත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිස් අවුරුදු යුද්ධයේදී කරපු අපරාධ, මිනීමැරුම්, පහරදීම්, ගෙවල් ගිනිතැබීම්, දේපළ පැහැර ගැනීම් ගත්තොත් ආණ්ඩුවෙන් තමයි එහි වැඩි ප්‍රමාණය කර තිබෙන්නේ. වැඩි ප්‍රමාණය ආරක්ෂක හමුදා සහ එල්ටීටීඊ සංවිධානය මහින් තමයි සිදු කළේ. හැබැයි, සාමාන්‍ය මිනිසුන් වශයෙන් මොනවත් වැරදි කරලා නැද්ද? සාමාන්‍ය මිනිස්සුත් වැරදි කරලා තිබෙනවා. එතකොට ඒ කරපු සියලු වැරදි සම්බන්ධයෙන් නඩු අහලා අපට විසඳන්න පුළුවන්ද? නඩු අහලා විසඳන්න බැහැ. ඒ නිසා තමයි ග්වාතමාලා, South Africa වාගේ ලෝකය පුරා මේ වාගේ තත්ත්වයන් පැවැති රටවල් Truth Commissions පත් කරලා තමන්ගෙන් වෙච්ච වැරැද්ද කියන්න අවස්ථාවක් දුන්නේ. විනී මැන්ඩෙලා Truth Commission එකට ගිහින් කිව්වා, "ඔව් මම ළමයෙක් මැරුවා" කියලා. සුදු පොලිස් නිලධාරියෙක් ඇවිල්ලා කිව්වා, "මම කළු මිනිසුන් 100ක් මරලා අතන වළ දැම්මා" කියලා. නමුත් දකුණු අප්‍රිකාවේ Truth Commission එකේ result එක තිබෙනවා. ඒ අනුව හිරේ ගියේ සුළු පිරිසයි. නමුත් සාමාන්‍ය ජනතාව සහ ආණ්ඩු විධියට කරපු ඒ අපරාධ ගැන, ඒ වෛරය විමෝචනය කර ගන්න මිනිසුන්ට අවස්ථාවක් ලැබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වෛරය ප්‍රකාශ කරලා තමන්ගෙන් වෙච්ච අඩුපාඩුකම් රට ඉස්සරහ කියලා "අපෙන් මෙහෙම වැරදි වුණා; මේක වැරදියි; මට නිදහස් වෙන්න දෙන්න" කියලා කියන්න මිනිසුන්ට අවස්ථාවක් ලැබුණා. නමුත් රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවත් ඒක කළේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි.

මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ආණ්ඩුව ඒ දේ කළේත් නැහැ. ඒ නිසා දැන් ඉතුරු වෙච්ච ගැටලු තිබෙනවා, නඩු මහින් තමයි ඒවා විසඳන්න යන්නේ. මේ තුවාලය කවදාවත් නඩු අහලා විසඳන්න බැහැ. විශේෂයෙන්ම අපේ රටේ වැඩිහිටි පරම්පරාවේ හැම කෙනාම වාගේ පීඩාවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම සිංහල ප්‍රදේශවල හිටපු දෙමළ මිනිසුන්ට සාමාන්‍ය සිංහල මිනිසුන් කොච්චර හිරිහැර කළාද. ඒ වාගේම උතුරේ හිටපු සිංහල ජනතාවට සාමාන්‍ය දෙමළ ජනතාව කොච්චර හිරිහැර කළාද. මම බය නැහැ කියන්න. මම දන්නවා, වර්තමාන උතුරු පළාත් සභාවේ සභාපති ශිවඥානම් මන්ත්‍රීතුමා ගැන. එතුමා හිටපු නාගරික කොමසාරිස්වරයෙක්. එතුමා විසින් බේරා ගත් සිංහල නිලධාරීන් ඉන්නවා. එතුමා දෙමළ නායකයෙක්. ඒ කාලයේ එතුමා නිලධාරියෙක්. යාපනයේ හිටපු සිංහල අයට සමහර දෙමළ ජාතිවාදීන් ගහනකොට එතුමා ඔවුන් බේරා ගත්තා. එතුමාගේ කථා පත්තරවල පළ වෙලා තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය නඩු අහලා විසඳන්න බැහැ. අපි දකින දේ තමයි, ඒ මිනිසුන්ට එහෙම අවස්ථාවක් ලැබුණේත් නැහැ කියන එක.

දැන් සිදුවෙලා තිබෙන්නේ, තරගයට ජාතිවාදය පතුරුවන එකයි. මට වෙලාව මදි නිසා ඔබතුමාට කරුණු කියන්න බැරිවෙයි. දැන් ජාතිවාදය දෙපැත්තට යනවා. මේ සඳහා ඉතාම කුඩා සිද්ධීන් උපයෝගී කර ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට මාස දෙකකට කලින් කිලිනොච්චියේ කොටියෙකුගේ ප්‍රශ්නයක් සමාජ මාධ්‍ය තුළින් ප්‍රචාරය වෙලා රටේ ආන්දෝලනයකට තුඩු දුන් ආකාරය ඔබතුමාටත් මතක ඇති. එම කොටියාගේ ප්‍රශ්නය හරහා විශාල සාකච්ඡාවක් ඇති වුණා. සමහර අමු ජාතිවාදී සිංහල දේශපාලන නායකයන්, ඇතැම් ජනමාධ්‍ය මේ සම්බන්ධයෙන් කියපු දේවල් අපි දැක්කා. ඒවා උලුප්පන ඉතාම කැත ජනමාධ්‍ය සම්ප්‍රදායයක් මේ රටේ තිබෙනවා. ඒ අය මොකක්ද කිව්වේ? ඒ කොටියාට පහර දෙන දෙමළ මිනිස්සු දැක්කාම, ඔවුන් හොඳ එල්ටීටීඊ පුහුණුවක් ලැබූ අය කියලා හිතෙනවා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ගම කෑගල්ල. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමාගේ ගමට -සිංහල ගමකට- කොටියෙක් ආවොත්, සිංහල මිනිස්සු බත් උයලා කන්න දෙනවාද කියලා. බත් උයලා කන්න දෙනවාද? ඔළුව අත ගානවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම වෙන්නේ නැහැ. එක්කෝ ගහලා පන්නනවා. නැත්නම් මිනිස්සු පැනලා දුවනවා. උතුරේ මිනිස්සු කළේත් ඒකයි. ඒක වැරැදියි. ඒ කරපු විධිය බලාගෙන ඉන්න බැහැ තමයි. හැබැයි ඒක සිංහල ජාතිවාදී වෙලා ඉන්න සිංහල පත්තරවලින් ගත්තා, දෙමළ මිනිසුන්ගේ නරුමත්වය ගැන කියන්න. උතුරේ පත්තර මොකක්ද කළේ? මගේ ළඟ ඒ paper cuttings තිබෙනවා. උතුරේ පත්තර කිව්වා, ඒ කොටියා හමුදාවේ camp එකක හදපු කොටියෙක්, හමුදාවෙන් තමයි කොටියා නිදහස් කළේ කියලා. උතුරේ ගොඩක් දෙමළ පත්තර වාර්තා කළේ, කොටියා හමුදාවේ කියලා. එතකොට ඒ කොටියා සාමාන්‍ය biological කොටියෙක් නොවෙයි. ඌ මෙහේදී එක ජාතියක කොටියෙක්; එහේදී තව ජාතියක කොටියෙක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ වාගේම, මේ ළඟදී අභයගිරියේ ගඩොල් සම්බන්ධව මහා විශාල උද්ඝෝෂණයක් කළා. 2011 වසරේ දී අභයගිරිය චෛත්‍යය හදන්න භාවිත කළ ප්‍රමිතියෙන් තොර ගඩොල් හමුදාවෙනුත් පාවිච්චි කරලා ඉතුරු වුණු ටිකක් ඉවත් කළා කියලා විශාල ඝෝෂාවක් ඇති කළා. අනෙක් පැත්තට මොකක්ද කළේ? අනෙක් පැත්තට හැදුවා, මේ පුරාවිද්‍යා ස්ථාන- [බාධා කිරීමක්]

වෙලාව නැති නිසා මම කෙටියෙන් කියන්නම්. අද උතුරේත්, දකුණේත් ඉතාම ජනප්‍රිය ලෙස අමු ජාතිවාදය, සිංහල සහ දෙමළ ජාතිවාදය, මුස්ලිම් ජාතිවාදය ගෙන යනවා. ඒ නිසා තමයි අද මේ හානිපූරණය සඳහා වන කාර්යාලය සම්බන්ධවත් විශාල ප්‍රශ්නයක් තිබෙන්නේ. මම පැහැදිලිව කියනවා, ගරු සම්පන්දන් මැතිතුමා විපක්ෂ නායකතුමා වශයෙන්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කෙටි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම කථාව අවසන් කරනවා. ගරු සම්පන්දන් මැතිතුමනි, උතුරේ ජීවත් වන සිංහල සහ මුස්ලිම් මිනිසුන්ට සමාන අයිතියක් තිබෙනවා කියලා ඔබතුමා පිළිගන්නා බව මා අසා තිබෙනවා. සිංහල සහ මුස්ලිම් මිනිසුන්ට ලංකාවේ අනෙක් ප්‍රදේශවල ජීවත් වෙන්න අයිතිය තිබෙනවා වාගේම උතුරේත් ඒ අයිතිය තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් අහනවා. ඒක ඔබතුමා නැවත කියන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මොකද, මෙහේ ඉන්න සිංහල ජාතිවාදීන්ගේ පැත්තෙන් හැම විටම මතු කරන දෙයක් තමයි එහේ එහෙම පිළිගන්නේ නැහැ කියන එක. එහේ මහ ඇමතිවරයෙක් ඉන්නවා, අමු ජාතිවාදී. ඒකටම කත් අදින තව පිරිසක් ඉන්නවා. ඒවා මෙහේට පාවිච්චි කරනවා. ඒ නිසා මේ හානිපූරණය සඳහා වන කාර්යාලය ජාතික සමඟියේ පැත්තට පාවිච්චි කරන්නේ නැතුව ජාතිවාදය පැත්තට පාවිච්චි කරන්න යනවා නම්, අපි ඒකට විරුද්ධයි. ඒ නිසා මූලික වශයෙන් අපි මේ පනත් කෙටුම්පතට එකඟයි. මේ පනත් කෙටුම්පතේ සියලු කරුණුවලට එකඟ වනවා නොවෙයි. නමුත් මූලික වශයෙන් අපි මෙය අවශ්‍යතාවක් ලෙස දකිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවුෆ් හකීම් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[4.13p.m.]

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
*Bismillahir Rahmanir Raheem.*

Hon. Presiding Member, when we are discussing the Office for Reparations Bill today, I am glad that the Hon. Minister of Foreign Affairs is here in the House. This is as a result of the Joint Resolution that had been passed in the UN Human Rights Council and also the previous undertakings that we have given under the Universal Periodic Review to address this issue of paying reparations for people who have been made to forcibly disappear and affected by the war or any other civil disturbance.

Sir, I would like to initially discuss the matter pertaining to the repeal of the REPPIA Act by this Act. Now, as a matter of fact, since the Foreign Affairs Minister had been a former Attorney General, he knows the whole history of the REPPIA Act. The REPPIA Act came into being after the 1983 disturbances. At that time, the then administration brought in the REPPIA Act through the Emergency Regulations that were promulgated to cover the entire Island. So, it was part of the Emergency Regulations initially and thereafter in 1987, they formally legislated to make REPPIA as an authority with some legal status. REPPIA was an institution that not only looked at reparations to be paid to individuals and collective bodies of people but also to

restore, take over, vest the properties and to pay compensation for the properties. As a matter of fact, after the 1983 disturbances, the then J. R. Jayewardena administration felt that there were various misapprehends and various unlawful elements who were going into occupation of properties of affected people who had fled the city and other areas and they vested the properties in the REPPIA. Now, by repealing REPPIA and by not providing adequate provisions in the new Act, we are doing away with an existing mechanism which provides certain relief at very very difficult and emergency situations. Now, for instance, - [*Interruption.*] Yes, you have to bring transitional provisions. - [*Interruption.*] I do not know, but anyway, Hon. Minister, you can reply later.

Take for instance, what happened in Kandy a few months ago? There were several properties affected - a large number of properties in the Kandy District starting from Digana to Akurana and various other areas were affected. The REPPIA is the authority which is looking into the compensation element. Now, as a matter of fact, I want to raise that issue here, so that that will be brought to the notice of the Hon. Minister. I have raised this several times in the Cabinet. There are about 80 files for which more than Rs. 500,000 had to be paid as compensation. Some properties have been damaged and certain people have lost their businesses amounting to several millions of rupees. Now, these assessments have still not been completed and a proper Cabinet assessment has not been done to pay compensation for them. The REPPIA is the institution that is tasked with the responsibility to pay these compensation. So, if we are going to abolish that institution, then there has to be sufficient new provisions that should be included in the new Act which we are bringing in to replace the REPPIA as an institution. That is one issue that I want to raise with you, Hon. Minister. - [*Interruption.*]

Okay, thank you very much. I think there is a provision for you to formulate some policies on reparation, and recommend to the Government for approval and thereafter for the Cabinet to approve them. At least through that process, include whatever that is missing from the REPPIA Act on to this Office for Reparations Bill and that will be a very necessary thing that you should implement.

I must also say that this focuses on the missing persons also. Actually, the Office on Missing Persons Act is referred to several times in this particular Bill and this is a sequel to that Act. Therefore, the Office on Missing Persons when they identify affected people - people who have been made to disappear, people who had gone missing as a result of the war and as a result of various other agencies of Government or any other individual agencies, victims of war or civil disturbances- reparations could be paid through this Bill. But, the affected properties and affected other entitlements may not be restored through such a Bill. So, there has to be a proper provision to look into that issue and I thought that I should highlight it here.

Now, the Office on Missing Persons had been in existence for the last seven months, Hon. Minister. They have gone all over the country, all over the place, had various public sittings and have received applications from a variety of affected people. But victims are still continuing to have some distrust in any government mechanism whether that would ultimately bring them any relief. That has been the feeling that people have. Therefore, in the first place, we have to restore that confidence. For instance, the Hon. Minister of Foreign Affairs as a former Attorney General is aware that in the past - Hon. Sumanthiran is also here - if people go missing the only recourse we had was a *habeas corpus* application in the Court of Appeal. What does the Court of Appeal do? I have myself filed these *habeas corpus* applications, nothing comes out of it. You file a *habeas corpus* application by an aggrieved party, the court entertains it and they refer it to a Magistrate for inquiry. That is the end of it. The Hon. Minister of Foreign Affairs will endorse this as an Attorney General. He would have had hundreds of thousands of *habeas corpus* applications in files in the Attorney General's Department without any finality. So, hopefully through this Office on Missing Persons and the Office for Reparations Bill, for all these victims, some kind of finality for their loss have to be brought about and at least some reparations have to be paid. This is the onerous duty that is cast on the Members who are appointed to these two institutions, the Office for Reparations as well as the Office on Missing Persons.

So I thought I must highlight some of these things. Look at the issue that is happening in Mannar. There is a mass grave that has been found. There are anthropologists, there are archaeologists and there are forensic experts who are going and digging this mass grave. There was a mass grave that had been found in Matale. What has come out of the investigations? God knows. When did this happen? Was it during the JVP insurrection or was it during the LTTE war? There are certain excuses being trotted out to say that there was some serious health hazard that happened in that area and therefore, thousands of people could have been buried in such a fashion. I do not think anybody remembers such an incident happening anywhere in this country. But this has to be gone into. What is happening to the Matale graves? What is happening to the Mannar graves? These two issues, I think, is a matter for anybody with conscience that we have to bring finality to these things. So forensic examinations and inquiries cannot go on forever without any closure. Some closure has to be brought to this.

Therefore, I would rather urge through you, Mr. Presiding Member, that this country as an accountable international citizen should clear its name by bringing in Bills such as this to give redress to the affected people.

Thank you.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා නැඟී සිටියේ පැහැදිලි කිරීමක් කරගන්නද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු රවුෆ් හකීම් ඇමතිතුමනි, ඔබතුමා කැබිනට් මණ්ඩලය නියෝජනය කරන නිසා ඔබතුමාගෙන් මම මේ කාරණය දැනගන්න කැමැතියි. මන්නාරම සමූහ මීනී වළ ගැන ඔබතුමා දැන් ප්‍රකාශයක් කළා. මගේ දැනීමේ හැටියට, එහි කැණීම් භාරව සිටි රාජ් සෝමදේව මහාචාර්යවරයාගේ කැණීම් බලපත්‍රය දැනට අත් හිටුවා තිබෙනවා. එම නිසා, කැබිනට් මණ්ඩලය වශයෙන් ඔබතුමන්ලා මේ සම්බන්ධව මොකක්ද කරන්නේ කියා මා දැනගන්න කැමැතියි. මොකද, එතැනින් දැනට ඇට සැකිලි 154ක් හම්බ වෙලා තිබෙනවා.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
මට ආරංචි වුණු හැටියට ඒ කැණීම්වලදී සොයා ගත් ඇට සැකිලි carbon dating සඳහා ඇමෙරිකානු laboratory එකකට යවන්න තීරණය කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ සිද්ධිය කවදාද වුණේ, එය මොන වාගේ සිද්ධියක්ද කියන එක පිළිබඳව නිගමනයකට එන්න පුළුවන්කම ලැබෙන්නේ ඒ carbon dating එක උඩයි කියලා පුවත් පත්වල පළ වී තිබෙනවා මම දැක්කා. නමුත්, අමාත්‍යවරයකු හැටියට මම දැන් තමයි ඔබතුමා කියන ඔය කාරණා දන්නේ. ඔබතුමාට ඕනෑ නම්, ඒ ප්‍රශ්නයට අපේ විදේශ කටයුතු ඇමතිතුමා පිළිතුරු දෙයි. මම නම් ඒ ගැන කිසි කාරණයක් දන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

Next, the Hon. Rajavarothiam Sampanthan. You have 10 minutes. Before that, will an Hon. Member propose the Hon. Mayantha Dissanayake to the Chair?

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
I propose that the Hon. Mayantha Dissanayake do now take the Chair.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු කනක හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. KANAKA HERATH *left the Chair, and* THE HON. MAYANTHA DISSANAYAKE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Leader of the Opposition.

[4.24p.m.]

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)
Thank you, Mr. Presiding Member. I would like to express a few views, Sir, on this Office for Reparations Bill which has come up somewhat belatedly. But we are all happy that it has come up. In fact, the Office on Missing Persons (Establishment, Administration and Discharge of Functions) Bill also was delayed considerably and passed but eventually not implemented for a long time even after being passed. But, subsequently, after the Office on Missing Persons was appointed, the persons handling that responsibility, I think, are doing their very best to be as effective as they can and we are grateful for that.

I would like to make a few comments in regard to this matter because the ascertainment of truth, the delivery of justice, the issue of accountability, reparations and non-recurrence are all fundamental components of the transitional justice process; process to bring about reconciliation on the basis of truth, justice and accountability in the country which has gone through several decades of armed conflict. This Bill is a very welcome feature, Sir, but it must not be used to sideline truth and justice. Truth and justice must always prevail. Even the issue of missing persons or the issue of reparations must be dealt with on the basis of truth and justice. The Office on Reparations should be able to formulate policies based upon truth and to ensure justice to all victims. That is fundamental.

I find certain provisions in the Bill which will enable the Government to play a role in regard to the implementation of whatever policies are formulated by the Office for Reparations. This must not be a matter that comes under the control of the Government, Sir. The Office for Reparations must have the freedom to act independently in this matter to formulate the required policies and be able to find avenues to offer reparation to persons who have been victimized. Youth have been victimized in a very large manner. What are the reparations that can be given? They must be empowered to acquire skills that will enable them to carry on their life in the future independently and as best as they can. There will be reparation that must be given to youth. People need to be economically empowered. People have been impoverished as a result of the war. There needs to be economic empowerment to the people to enable them to lead their life without deprivation or denial.

Land is a fundamental issue. Yet, land is being held by the military, by the armed forces. I know that after the present Government came into being substantial action has been taken and lands have been released in many places, but land still continues to be in the occupation of the military. People have lost their lands. People have been evicted from their lands. Displaced people, when they came back to their villages, have found that their

lands are being occupied by other people or, they are unable to occupy the lands. Those lands must be released to those people. Reparation in regard to land is one of the fundamental issues that the Office for Reparations has got to handle. People affected by the war as a result of the war taking place in some parts of the country, the North and the East, have not been able to receive state lands. There have been no land Kachcheries; there has been no action taken to give lands to landless people. That must be done. The Office for Reparations must formulate policies to ensure that all problems in regard to land that victims of the war have faced, whether it be army occupation, whether it be the issue of land being denied to them, whether they are unable to occupy land to which they want to return because somebody else is occupying it, all these matters must be addressed on the basis of policies that are drawn out and implemented to achieve these matters.

I also want to mention one other matter, Sir. The detainees, persons in custody, some have been convicted; some have not been charged; some have been charged and charges are pending. This matter has gone on for a long time. A number of persons are carrying out demonstrations and fasts in various prisons and various parts of the North and the East demanding the release of these people. Something needs to be done. A large number of people have been convicted purely on the basis of their confessions. In the case of a large number of people, the only evidence available against them is the confession they have made. There is no other evidence available against them. I have not been able to study the Counter Terrorism law that was tabled in Parliament, yesterday.

But I am told that under the Counter Terrorism law, confessions can no longer be admissible at the trial of a person charged with any offence. If confessions are being completely ruled out, and even the new Counter Terrorism law accepts that position, then the Government is obviously accepting the position that there can be no conviction, not even a charge based upon the confession. If that be so, the persons in custody, even persons who have been convicted, must be dealt with on the basis that they have been convicted on the confession which was the only available evidence, there being no other evidence against them, which the Government accepts now as a matter of policy is inadmissible, is invalid, is something that which Government policy would not permit to accept and is not in keeping with international norms. If that be the position Sir, I would appeal to the Government to take steps for the release of all these persons who are in custody based purely on their confession. Whether they have been convicted or charged and not convicted does not matter, but if the only evidence against them is a confession, then I would submit that they must be released and the Office for Reparations can play a role, in my view, should play a role, in ascertaining the truth in regard to this matter and taking steps with the Government to have these persons released.

Sir, we know after the Indo-Sri Lanka Accord in 1987 and during the JVP insurrection in 1971, 1988/1989, a large number of persons were released; some may not have been released, but a large number of persons were released. So, the same rule should apply in this instance Sir. These persons are in custody for long periods of time. Sometimes they have been in custody for periods of time longer than they would have been in custody if they were tried, convicted and sentenced. I do not think Sir, that should continue and that is also a matter which I think would come within the purview of the Office for Reparations.

The Office for Reparations must comprise of capable people who are able to formulate policies based upon the hardships, the denials, the deprivations that people affected by the war, victims of the war, have gone through and be in a position to address their needs and requirements, their necessities in all these areas in a comprehensive manner.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. K. Kader Masthan. You have seven minutes.

[பி.ப. 4.36]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා (නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන හා උතුරු සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கா. காதர் மஸ்தான் - மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. K. Kader Masthan - Deputy Minister of Resettlement, Rehabilitation and Northern Development)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இழப்புக்கான எதிரீடுகள் பற்றிய அலுவலகச் சட்டமூலம் சம்பந்தமான இன்றைய விவாதத்தில் பேசுவதற்கு எனக்கு நேரம் ஒதுக்கித் தந்ததற்கு முதலில் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். எமது அமைச்சின்கீழ் இயங்கும் புனர்வாழ்வு அதிகாரசபைக்கூடாக பல வேலைத் திட்டங்களைத் தற்பொழுது மிகவும் நல்ல முறையில் நாங்கள் செய்துகொண்டிருக்கின்றோம். அந்த அடிப்படையில் இந்த அதிகாரசபையானது, 1983ஆம் ஆண்டு நாட்டில் ஏற்பட்ட இனக்கலவரம், யுத்தம் ஆகியவற்றால் பாதிக்கப்பட்ட மக்களுக்கு நஷ்ட ஈடு மட்டுமன்றி நிவாரணம் வழங்கியமை, 1990ஆம் ஆண்டிற்குப் பிறகு யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு வீட்டுத்திட்டம் வழங்கியமை, யுத்தத்தால் இறந்தவர்களுக்கும் பாதிக்கப்பட்டவர்களுக்கும் நட்ட ஈடு வழங்கியமை, பாதிக்கப்பட்ட மக்களின் வாழ்வாதாரத்தைக் கட்டியெழுப்பக் கடன் திட்டம் வழங்கியமை போன்ற இன்னோரன்ன பணிகளை முன்னெடுத்திருந்தது. குறிப்பாக வடக்கு, கிழக்கில் இருக்கின்ற மக்களுக்குப் பாரிய சேவையைச் செய்திருக்கின்றது.

இந்தப் புனர்வாழ்வு அதிகாரசபைக்குச் சென்ற வருடம் 2,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது. அதில் கிட்டத்தட்ட 1,300 மில்லியன் ரூபாய் நஷ்டஈடுகளாக வழங்கப்பட்டது. அதாவது இறந்தவர்கள், காயமுற்றோர் என 1,589 பேருக்காக அதிகாரசபைக்கூடாகக் கிட்டத்தட்ட 130 மில்லியன் ரூபாய் நஷ்ட ஈடுகளாக வழங்கப்பட்டது. அதேபோல் 7,587 சாதாரண பொதுமக்களுக்கு 487 மில்லியன் ரூபாயும் 2,190 அரசாங்க ஊழியர்களுக்கு 290 மில்லியன் ரூபாயும் நஷ்ட ஈடுகளாகக் கொடுக்கப்பட்டது. மேலும், 350 வணக்கஸ்தலங்களுக்கு 66

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

මිල්ලියන් රූපාය් නෂ්ට ඊටාකක් කොටුක්කප්පට්ටිරුක්කින්රතු. කුරිප්පාක, පේරුවළෙ, අළුත්කමෙයිල් ඒර්පට්ට පාතිප්පුකළුක්කාක 212 නපර්කළුක්කු 186 මිල්ලියන් රූපාය් වළංකප්පට්ටතු. ඉතේපෝල්, කටන්ත වරුටම් කින්තෝට්ටෙයිල් ඒර්පට්ට කලවරත්තිනාල් පාතික්කප්පට්ට 126 පේරුක්කු 4 මිල්ලියන් රූපාය් වළංකප්පට්ටිරුක්කින්රතු. කණ්ටියිල් ඒර්පට්ට කලවරත්තිනාල් පාතික්කප්පට්ට 534 පේරුක්කු ආරම්පක් කට්ටමාක 26 මිල්ලියන් රූපාය් වළංකප්පට්ටිරුක්කින්රතු. සුයතොළිල් කටන්කළාක 335 පේරුක්කු කිට්ටත්තට්ට 72 මිල්ලියන් රූපාය් වළංකප්පට්ටිරුක්කින්රතු. මුන්නාළ් පෝරාළිකළ් 152 පේරුක්කුක් කටනාක 35 මිල්ලියන් රූපාය් වළංකප්පට්ටිරුක්කින්රතු.

ඉන්ත වරුටත්තිල් ඉව්වාරු එමතු පුනර්වාළ්වු අතිකාර සපෙයානතු පල වේලෙකළෙච් චෙය්තපෝතිලුම්, මක්කළුටෙය වේවෙක්කු ඒර්ර මාතිරි නිතිකළ් ඔතුක්කප්පටාත තනාල්, නට්ටෙට්ටුක්කාක කාත්තිරුප්පෝරින් පට්ටියල් නීණ්ටුකොණ්ටු පෝකින්රතු. අන්ත අටිප්පටෙයිල් සුමාර් 10 වරුටංකළුක්කු මුන් විණ්ණප්පිත්තවර්කළුක්කුක්කූට, නට්ටෙටු කළෙක් කොටුක්ක වේණ්ටිය තේවෙ එමතු අමෙච්චුක්කු ඉරුක්කින්රතු. ඉන්ත අතිකාරසපෙක්කුත් තේවෙයාන නිතියානතු ඔතුක්කප්පටාමෙයේ ඉතර්කුක් කාරණමාකුම්. ඉන්ත අතිකාරසපෙක්කූටාකප් පල වේලෙත්තිට්ටංකළෙච් චෙය්තිරුක් කින්රෝම්; නෂ්ට ඊටුකළෙ වළංකියිරුක්කින්රෝම්. ඉරුන්තාලුම්කූට, ඉන්ත අතිකාරසපෙයෙ නාංකළ් ඉන්නුම් වලුවානතාක්ක වේණ්ටුම්. අන්ත වකෙයිල්, අප්පකුතිකළින් තේවෙප්පාටුකළෙයුම් කෂ්ටංකළෙයුම් අරින්තු, එමතු මක්කළුටෙය පිරච්චිනෙකළෙත් තීර්ත්තු, අවර්කළුක්කු නිරන්තරමානතුම් නිලෙයානතුමානතොරු වාළ්ක්කෙත්තරත්තෙ ඒර්පටුත්තුම් විතමාක ඉන්ත අතිකාරසපෙයෙ මාර්රියමෙක්ක වේණ්ටියතොරු සූළ්නිලෙ ඉරුක්කින්රතු.

ඉළප්පුක්කාන එතිරීටුකළ් පර්රිය අලුවලකම් එන්ර ඉන්තච් චට්ටම් උරුවාක්කප්පට්ටාලුම් මීළ්කුටියේර්රම්, පුනර්වාළ් වළිප්පු, වටක්කු අපිවිරුත්ති අමෙච්චුක්කූටාකච් චෙයර්පටුත්තප්පටුම් වේලෙත්තිට්ටංකළෙක් කට්ටාය්ම් අන්ත අමෙච්චුක්කූටාකවේ චෙය්ය වේණ්ටුම්. ඒනෙන්රාල්, අන්ත අමෙච්චුත්තාන් වටක්කු අපිවිරුත්තිකළෙච් චෙය්ය වේණ්ටුම්. මුන්නර් පෝන්රු පුනර්වාළ්වු අතිකාරසපෙයෙ එමතු අමෙච්චුක්කූටාකක් කොණ්ටුනටාත්තුම්පොළුතු, එව්වාරු නාංකළ් අංකුළ්ළ වේවෙප්පාටුකළෙප් පට්ටියලිට්ටුච් චෙය්තෝමෝ අන්ත අටිප්පටෙයිල් මිකවුම් නන්රාක අවර්රෙච් චෙය්යක්කූටියතාක ඉරුක්කුම්. REPPIA මූලමුම් ඉව්වාරු පල වේලෙකළෙ නාංකළ් චෙය්තිරුක්කිරෝම්. කෙළරව තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉන්තච් චට්ටමූලම් නිරෙවේර්රප්පට්ටු, අතනූටාක එමතු මක්කළුක්කු ඉන්නුම් පාරියළවිල් චේවෙ චෙය්යක්කූටිය අළවුක්කු නිතිකළෙයුම් පෙර්රුක් කොටුක්ක වේණ්ටුම්. අතර්කු ඔරු චන්තර්ප්පමාක ඉන්තච් චට්ටමූලත්තෙප් පයන්පටුත්තික් කොළ්ළ වේණ්ටුම්. නාන් කේට්ටුක්කොළ්වතෙන්නවෙන්රාල්, ඉන්ත අලුවලකම් එමතු අමෙච්චුක්කූටාක ඉයංකුවතර්කුරිය ඒර්පාටුකළෙච් චෙය්තුතරවේණ්ටුම් එන්රුතාන්. ඒනෙන්රාල්, වටක්කු අපිවිරුත්තිකළ් චම්පන්තප්පට්ට, අන්ත මක්කළුටෙය වාළ්වාතාරත්තෙ උයර්ත්තුම් විතමාන එමතු අමෙච්චුක්කුරිය වේලෙත්තිට්ටත්තෙත්තාන් ඉතුවුම් කොණ්ටිරුක්කුම්. එමතු වටක්කු මාකාණම් යුත්තත්තාල් කූටුතලාකප් පාතික්කප්පට්ට මාකාණමාකුම්.

ඉංකු නාන් ඉන්නුමොන්රෙයුම් කූරවේණ්ටුම්. අතාවතු, පිරතාන 2 කට්චිකළුම් චේර්න්තු චෙය්කින්ර චිල වේලෙත්තිට්ටංකළ් තිටීරෙන්රු ඔව්වොරු කට්චි චාර්න්ත වේලෙත්තිට්ටමාක අමෙන්තුවිටුකින්රතු. කුරිප්පාකච් චොල්වතෙන්රාල්, වටක්කු මාකාණත්තිල්, නීණ්ටකාලමාක ඉටම්පෙයර්න්ත මක්කළුක්කාන වේලෙත්තිට්ටංකළුක්කෙන ඔරු චෙයලණි උරුවාක්කප්පට්ටතු. අන්තච් චෙයලණි නාන්කු ඉණෙත් තලෙවර්කළෙක් කොණ්ටතාක අමෙක්කප්පට්ටතු. අන්තච් චෙයලණි එමතු අමෙච්චුක්කුරිය mandate එන්රපටියිනාල්, එමතු අමෙච්චින් චෙයලාළර් අවර්කළ් ඉන්තච් චෙයලණික්කුච් චෙයලාළරාක නියමික්කප්පට්ටු, එමතු අමෙච්චුක්කූටාක ඉන්ත වේලෙත්තිට්ටංකළ් චෙය්යවේණ්ටුම් එන්ර අටිප්පටෙයිල්තාන් Cabinet Paper චමර්ප්පික්කප් පට්ටිරුන්තාලුම්, කාලප්පෝක්කිල් ඔරු gazette අරිවිත්තල් මූලම් අන්ත නිලෙයෙ මාර්රි වේලෙත්තිට්ටංකළෙ implement පණ්ණුවතර්කාන ඔරු නටවටික්කෙ මේර්කොළ්ළප් පට්ටතු. අතාවතු, ඉන්තච් චෙයලණික්කූටාක චිල අරචියල් කට්චිකළෙච් චාර්න්ත අතිකාරිකළාල් එමතු පකුතිකළුක්කාන අතිකාරිකළ් වර්පුරුත්තප්පටුකින්රාර්කළ්. ඔරු නියායමාන මුරෙයිලන්රි, නේර්මෙයර්ර විතත්තිලුම් - පක්කච්චාර්පාන මුරෙයිලුම් ඉතෙත්තාන් චෙය්ය වේණ්ටුම් එන්රු තිණික්කප්පටුකින්රාර්කළ්. එනවේ ඉව්වාරාන චෙයර් තිට්ටංකළෙ නීංකළ් චෙය්කින්රපොළුතු එටුත්ත එටුප්පිලන්රිච් චරියාකච් චින්තිත්තුච් චෙයර්පටුත්ත වේණ්ටුම්. එර්කෙනවේ පිමෙයාන ඔරු මුරෙ උළ්ළපටියාල්තාන් නාන් ඉතෙක් කේට්කින්රේන්. එමතු අමෙච්චුක්කූටාක නියමික්කප් පට්ටිරුන්ත ඉන්ත මීළ්කුටියේර්රච් චෙයලණියුටෙය implementation ඉච් චෙය්ය වේණ්ටියිරුන්ත එමතු අමෙච්චෙ මාර්රියතුකූටප් පිමෙයාන මුරෙයිල්තාන් මාර්රප් පට්ටිරුක්කින්රතු. ඉතුකුරිත්තුප් පේචුම්පෝතුකූටච් චරියාක ඉන්ත ආට්චියිල් ඔරු නියායම් කිටෙක්කවිල්ලෙයෙන්රාල් නාංකළ් එංකේ පෝවතෙන්පතුතාන් එංකළුටෙය පිරච්චිනෙයාකවිරුක්කින්රතු. උණ්මෙයිලේ, ඉන්ත අමෙච්චින් පිරතියමෙච්චරාන නාන්, ඉව්වාරාන චෙයර්පාටුකළුක්කු එනතු ආට්චේපනෙයෙ මිකවුම් වන්මෙයාක ඉන්තප් පාරාළුමන්රත්තිලිරුන්තුකොණ්ටු තෙරිවික්කින්රේන්.

වරුංකාලත්තිලාවතු අන්තන්ත අමෙච්චුක්කුරිය mandate අටිප්පටෙයිල් වේලෙත්තිට්ටංකළෙච් චෙය්වතර්කුරිය නටෙමුරෙකළෙ වරුකින්ර වරවු චෙලවුත්තිට්ටත්තිර්කූටාකච් චෙයර්පටුත්තප්පට වේණ්ටුම්. ඉල්ලෙයෙන්රාල්, චිල පක්කච්චාර්පාන අරචියල් නටවටික්කෙකළ්මූලම් එමතු පකුති මක්කළ් තොටර්න්තුම් පාතිප්පටෙවාර්කළ්. ඉතෙ නිවර්ත්തි චෙය්තු වරුංකාලංකළිල් එමතු මක්කළුටෙය වාළ්ක්කෙයිල් එන්තවිත පාතිප්පුක්කළුම් ඉල්ලාමල්, නියායමාකවුම් නේර්මෙයාකවුම් පක්කච්චාර්පු ඉල්ලාමලුම් චෙයර්පටුත්තක් කූටිය අළවුක්කු ඉණෙත්තලෙමෙකළ් නියමික්කප්පට වේණ්ටුම්. අතර්කාකත්තාන් ඉණෙත් තලෙමෙකළ් නියමික්කප්පට්ටනර්. ආනාල් ඉංකු අන්ත ඉණෙත් තලෙමෙකළ් එව්වාරු නටත්තප්පටුකින්රාර්කළ් එන්රු එනක්කුත් තෙරියවිල්ලෙ. එනවේ ඉන්ත මීළ්කුටියේර්රච් චෙයලණියිල් වේලෙත්තිට්ටංකළෙ ඔළුංකාකච් චෙයර්පටුත් තුවතර්කුරිය ඒර්පාටුකළෙ මිකවුම් චිරප්පාකච් චෙය්ය වේණ්ටුම් එන්රු කේට්ටු, චන්තර්ප්පත්තිර්කු නන්රිකූරි, විටෙපෙරුකින්රේන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගොහොම ස්තුතියි. මීළඟට, ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 4.47]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම සහ ඊට ආනුෂංගික වන්නා වූ ප්‍රතිපාදන ඇති කිරීම සඳහා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙනවා. මේ හා සමාන පනත් කෙටුම්පත් කීපයක් පසුගිය කාලය තුළ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත හා සම්බන්ධ වන, -සෘජුව සම්බන්ධ නොවුණත්- ඉදිරි කාලය තුළ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත ත්‍රස්තවාදය වැළැක්වීම පනතේ අලුත් පනත් කෙටුම්පත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳව දෙවැනි වාර්තාව ආදිය පෙළ ගැසී තිබෙනවා. මම හිතන විධියට මේ සියල්ලම පෙළ ගැස්වීමට ප්‍රධාන හේතුව වුණේ, 2015 සැප්තැම්බර් මාසයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේදී ශ්‍රී ලංකාව සම අනුග්‍රාහකත්වය දක්වමින් 30/1 යෝජනාව සම්මත කිරීමයි. ඒ සම අනුග්‍රහය දැක්වීම සඳහා එදා ඇමෙරිකා එක්සත් ජනපදයත් සම්බන්ධ වුණා. හැබැයි, ඇමෙරිකා එක්සත් ජනපදය මේ UNHRC එකෙන් දැන් ඉවත් වෙලා. හැබැයි, දැන් මේ සියලුම රටවල් කියන්නේ, අපි මේකට සම අනුග්‍රාහකත්වය දැක්වූවා නම් එහි කරුණු දැන් ඉටු කිරීමේ වගකීම රජයට තිබෙනවා කියලායි. හැබැයි, මම මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්න ඕනෑ, 30/1 යෝජනාවට අපේ රට සම අනුග්‍රාහකත්වය දැක්වුවේ මේ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමකින් හෝ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් නොවන බව. කොටින්ම, අතිගරු ජනාධිපතිතුමා පවා එතුමාගේ අදහස පසුගිය එක්සත් ජාතීන්ගේ මහා සමුළුවේදී පැහැදිලිව සඳහන් කළා. මම ඒ ගැන දැන් ආපහු කියන්න යන්නේ නැහැ.

දැන් මම ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ සංශෝධන කෙරෙහි මගේ අවධානය යොමු කරන්න කැමැතියි. මේ පනත් කෙටුම්පතේ 27වන වගන්තියේ (අ) (i)හි මුලින් තිබුණේ, "උතුරු සහ නැඟෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම්" යනුවෙනුයි. හැබැයි, දැන් "උතුරු සහ නැඟෙනහිර පළාත්වල" යන්න ඉවත් වෙලා, ඒ වෙනුවට "සන්නද්ධ ගැටුම් අතරතුර" කියන වචන ආදේශ වෙනවා. දැන් මේකේ මූලික අරමුණ වෙලා තිබෙන්නේ, මේ ප්‍රදේශවල සිදුවූ සන්නද්ධ ගැටුම්වලදී හානියට පත් වෙච්ච පුද්ගලයන්ට හානිපූරණය කිරීම ද කියන ප්‍රශ්නයයි නිතැතින්ම එන්නේ. කෙසේ හෝ දැන් ඒක සංශෝධනය වෙනවා. සංශෝධනය වෙන එක හොඳයි.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
සංශෝධනයක් නැහැ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

සංශෝධනයක් නැහැ? එහෙම නම්, "උතුරු සහ නැඟෙනහිර පළාත්වල" කියන කොටස එහෙමම තිබෙනවා. දැන් මතු වන ප්‍රශ්නය මෙයයි. උතුරු-නැඟෙනහිර සන්නද්ධ අරගළයේ ප්‍රතිඵලයක් හැටියට පිටකොටුවේ බෝම්බ පිපිරුණා; මහ බැංකුවේ බෝම්බ පිපිරුණා; මරදානේ බෝම්බ පිපිරුණා; මාතර බෝම්බ පිපිරුණා. ඒ විධියට උතුරු-නැඟෙනහිරට පිටින්, මේ සන්නද්ධ අරගළයේ ප්‍රතිඵල හැටියට හානියට පත් වෙච්ච පුද්ගලයන්ට මෙයින් සහන ලබාගන්න බැරිද? [බාධා කිරීමක්] මේ පනත් කෙටුම්පතේ 27වන වගන්තියේ (අ) (ii)හි සඳහන් වන්නේ, "දේශපාලන නොසන්සුන්තාවයක් හෝ සිවිල් කැළඹීම් සම්බන්ධයෙන්" යනුවෙනුයි. එතකොට කොහොමද දැන් ඒකට ගන්නේ? දේශපාලන නොසන්සුන්තාවයක් නිසා නොවෙයි නේ, අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ පියාණන් වන ගාමිණී දිසානායක මැතිතුමා අභාවප්‍රාප්ත වුණේ? එතුමා අභාවප්‍රාප්ත වුණේ නොටළඟ පිපිරවූ බෝම්බයට අසුවෙලායි. වීරසිංහ මල්ලිමාරච්චි මැතිතුමායි, එතුමායි දෙදෙනාම ඒ බෝම්බයට අසු වුණා. ගාමිණී දිසානායක මැතිතුමා ඒ වෙලාවේ ජනාධිපති අපේක්ෂක. හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා ඝාතනය කළා. හිටපු ආරක්ෂක ඇමති රන්ජන් විජේරත්න මැතිතුමා ඝාතනය කළා. මම මේ කිව්වේ, එක්සත් ජාතික පක්ෂයේ හිටපු ඝාතනය වුණු නායකකාරකාදීන් ගැනයි. අපේ සී.වී. ගුණරත්න මැතිතුමා ඝාතනය කළා. අපේ ගරු කංචන විජේසේකර මැතිතුමාගේ පියාණන් අද සදාකාලිකව රෝගී තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ මාතර පුපුරපු බෝම්බය නිසායි. එතකොට මේ අයට ඒකෙන් හානිපූරණයක් ලැබෙන්නේ නැද්ද? අපේ හමුදාවේ රණ විරුවෝ, පොලීසියේ හිටපු අය දහස් සංඛ්‍යාත පිරිසක් අතුරුදන් වුණා. ඔවුන් ගැන තව වෙනතුරුත් තොරතුරක් නැහැ. එතකොට ඒ ගොල්ලන්ව මේකට අයිති වෙන්නේ නැද්ද? එක්සත් ජාතික පක්ෂ පාලනය තිබියදී පොලීසියේ 600ක් නැඟෙනහිර පළාතේ ඝාතනය කළා. ඒවායේ තොරතුරු නැහැ. මේ පනත් කෙටුම්පත ගේන්නේ එදා UNHRC එකේ සම අනුග්‍රහය දක්වලා සම්මත කරපු 30/1 යෝජනාවට අනුකූලවයි; එල්ටීටීඊ ඩයස්පෝරාවේ ඕනෑකමටයි. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, මේකට දර දිය අදින ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන ආදී මේ ඔක්කෝම එකතු වෙලායි අද මේ පනත් කෙටුම්පත ගේන්නේ. හානියට පත් වුණු සියලුදෙනාට වෙනස්කමකින් තොරව හානිපූරණය කරනවා නම් අපට ප්‍රශ්නයක් නැහැ.

නමුත් දැන් තිබෙන ප්‍රශ්නය, මේ අර්ථ නිරූපණයට උතුරු නැඟෙනහිරින් පිට අයිති වනවාද, නැද්ද කියන එකයි. ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, මේ පනත් කෙටුම්පත සම්මත වෙන්න කලින් කාරක සභා අවස්ථාවේදී මේ පාර්ලිමේන්තුවට ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්නය කියලා. අපි අදහස් කළේ, ඔබතුමා ඉදිරිපත් කළ මේ සංශෝධනය අනුව "උතුරු නැඟෙනහිර" කියන කොටස ඉවත් වෙනවාය කියලායි. එහෙම නම්, "සන්නද්ධ අරගළය"? දැන් ප්‍රශ්නය, "සන්නද්ධ අරගළය" මොකක්ද කියන එකයි. ලංකාවේ විතරක් නොවෙයි, යුරෝපා සංගමය විතරක් නොවෙයි, එක්සත් ජනපදය ඇතුළු රටවල් ගණනාවක් කොටි සංවිධානය තහනම් කළා. එතකොට සන්නද්ධ අරගළය, කා එක්කද? මම දැක්කා, එක මන්ත්‍රීවරයෙක් කිව්වා, සිංහල හමුදාව -ඒක හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වුණා- තමයි මේ ඝාතන කළේ කියලා. සිංහල හමුදාවක් රටේ නැහැ. රටේ තිබෙන්නේ ආරක්ෂක හමුදාව. ඒ ආරක්ෂක හමුදාවේ සිංහල, දෙමළ, මුස්ලිම් වර්ග තුනම ඉන්නවා. මුලතිව්වලදී මිය ගිය මේජර් මුතාලිෆ් සිංහලද? හමුදාවේ දමිළ සාමාජිකයෝ නැද්ද? ඒ ගොල්ලන් මිය ගියේ නැද්ද? පාක්‍යසෝති ගුවන් හමුදාවේ නිලධාරියෙක්. එහෙම නම් ඒ මන්ත්‍රීතුමා කිව්ව එක සම්පූර්ණ වැරදියි. අපි ඒකට එකඟ වෙන්නේ නැහැ. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, අපි එදා UNHRC එකේදී කරපු වැඩේ නිසා GSP Plus හම්බ වුණා කියලා. GSP Plus ලැබුණු එක තමයි ලොකු, යුද්ධය නැවැත්වූවාට වඩා. යුද්ධය නවත්වපු මිනිස්සු remand එකේ. යුද්ධය නවත්වපු මිනිස්සු විශේෂ අධිකරණ ඉස්සරහ. මොනවාටද? For misappropriation and criminal breach of trust. ඒවාට ගිහිල්ලා දැන් ඇතුළේ. නැඟෙනහිර පළාත් සභාව පිහිටෙව්වේ කවුද? උතුරු පළාත් සභාව පිහිටෙව්වේ කවුද? ඒවා අමතකයි. ඒවා කරපු මිනිසුන්ව කූඩුවලට නග්ගනවා. රණවිරුවෝ detention orders මත රඳවාගෙන ඉන්නවා. හැබැයි, දැන් වන්දි ගෙවන්න යනවා. මේවාට අයිති වෙන්නේ නැද්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ඉතාම පැහැදිලිව කියනවා, මේ හානි පූරණය සිංහල, දමිළ, මුස්ලිම් කිසිම කෙනෙකුට-

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පොඩ්ඩක් වාඩිවෙන්න. දැන් මගේ කථාව. ඔබතුමාගේ කථාවේදී ඔබතුමා කථා කරන්න. මට මිනිත්තුවයි තිබෙන්නේ. තමුන්නාන්සේ වාඩිවෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට මම ඒ මිනිත්තුව ලබා දෙන්නම්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම කැමති නැහැ. ඔබතුමාගේ කථාවේදී කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ඒ මිනිත්තුව ලබා දෙන්නම්. එතුමා point of Order එකක් raise කළේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම කැමැති නැහැ. මට තව මිනිත්තුවයි තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමනි, එතුමා point of Order එකක් raise කළේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථාවක් ඉල්ලා ගෙන කථා කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු සහ නැඟෙනහිර පළාත්වල විතරද කියලා මෙතුමා වැදගත් ප්‍රශ්නයක් නැඟුවා. මෙම පනත් කෙටුම්පතේ අර්ථ නිරූපණය ගැන සඳහන් වන 27වන වගන්තියේ ඇති "පීඩාවට පත් තැනැත්තන්" කියන තැන සංශෝධනය කර තිබෙනවා, අද ඉදිරිපත් කර තිබෙන සංශෝධනවලින්. අපි එය පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. "සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක් වශයෙන්" කියලා. එතකොට ඒ ඔක්කෝම ආවරණය වනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ තිබෙන්නේ,- [බාධා කිරීමක්] උතුරු නැඟෙනහිර කථාවක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි, බොහොම ස්තුතියි.

ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක් තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මට ඒ මිනිත්තුව ඕනෑ. දැන් මම නිලක් මාරපන ඇමතිතුමාගෙන් විවෘතව ඇහුවා, මේ මූලික කෙටුම්පතේ තිබුණු "උතුරු සහ නැඟෙනහිර පළාත්වල සිදු වූ" යන්න ඉවත් කර "සන්නද්ධ ගැටුම් අතරතුර" කියන වචන විතරද දැන් මේ කෙටුම්පතේ තිබෙන්නේ කියලා. එතුමා කිව්වා, "නැහැ" කියලා.

**ගරු නිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
ඒ පළමුවෙනි වගන්තියේ විතරයි. අනික් ඒවා එහෙමම තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හරි. අනික් ඒවා අදාළ වන්න මෙතැන ඉඳලා නේ පටන් ගන්නේ.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
තමුන්නාන්සේ කියන ඔක්කෝම අනික් ඒවාට අදාළ වනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ප්‍රශ්නයක් තිබෙනවා නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උසාවියකට ගිහිල්ලා කවුරු හරි මේ සම්බන්ධයෙන් තර්ක කරන කොට මෙහි අර්ථ නිරූපණය දෙන්නේ ව්‍යවස්ථාදායකය අපේක්ෂා කළ ආකාරයට නේ? එතකොට ව්‍යවස්ථාදායකය අපේක්ෂා කළේ කොහොමද? "සන්නද්ධ ගැටුම් අතරතුර", "උතුරු සහ නැඟෙනහිර පළාත්වල" කියලා. එතකොට එහි ප්‍රතිඵල හැටියට නේ මේ අනික් හැම තැන්වලම බෝම්බ පිපිරුණේ?

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
Clause 27 (a) (i), (ii), (iii) -

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
All right. Clause 27 (a) (ii) talks about දේශපාලන නොසන්සුන්තාවය. හරි, දේශපාලන නොසන්සුන්තාව නිසාද Central Bank එකේ බෝම්බ පිපිරුණේ, දළ දා මාළිගාවේ බෝම්බ පිපිරුණේ, අනුරාධපුරයේ බෝම්බ පිපිරුණේ, කොටළහ බෝම්බ පිපිරුණේ? සිවිල් කැලඹීමක් තිබුණේ නැහැ, එල්ටීටීඊ එක ඇවිල්ලා suicide bombs පිපිරෙව්වා. - [බාධා කිරීමක්] No, you cannot interpret it like that. That is the issue. විශේෂ කරලා තිබෙන්න ඕනෑ, මේ සන්නද්ධ අරගළය මොකක්ද කියලා. එහෙම නම්, සන්නද්ධ අරගළය නිවුණේ තහනම් කරපු කොටින් එක්ක නේ? එතකොට කොහොමද සන්නද්ධ අරගළයක් වෙන්නේ? රටේ ආරක්ෂක හමුදාව බැඳී ඉන්නවා, ආණ්ඩුවක් බැඳී ඉන්නවා, රටේ පුරවැසියෝ ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කරන්නත්, රටේ ඒකීයභාවය රකින්නත්. එතකොට ඒ සඳහා ගිය මිනිස්සු මේකට අහු වෙන්නේ නැහැ නේ? ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, සැක හැර ඉතාම නිවැරදිව ජනතාවට පැහැදිලි වන ආකාරයට මේ පනත් කෙටුම්පතේ අර්ථ නිරූපණය කාරක සභා අවස්ථාවේදී ලබා දෙන්න කියලා.

මගේ කාලය අවසානයි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Douglas Devananda, please. You have eight minutes.

[ප.ව. 4.56]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2015ஆம் ஆண்டு ஜெனீவா மனித உரிமைகள் பேரவையில் இலங்கை தொடர்பில் நிறைவேற்றப்பட்ட பிரேரணையின் நான்காவது செயற்பாட்டுப் பிரிவின் மூன்றாவது விடயத்திற்கு ஏற்ப, இழப்புகளுக்கான நட்டஈடு வழங்கும் அலுவலகம் அமைப்பது தொடர்பில் சமர்ப்பிக்கப்பட்டுள்ள சட்டமூலம் பற்றி இன்று நாங்கள் விவாதங்களை மேற்கொண்டு வருகின்றோம். இந்த நிலையில் தமிழ் அரசியல் கைதிகள் தங்களுக்கான நியாயத்தினைக் கோரி உண்ணாவிரதம் இருந்து வருகின்றனர். அனுராதபுரம் சிறைச்சாலையில் கடந்த மாதம் 14ஆம் திகதி ஆரம்பிக்கப்பட்ட இந்த உண்ணாவிரதம், இன்று ஏனைய சிறைச்சாலைகளில் தடுத்து வைக்கப்பட்டுள்ள தமிழ் அரசியல் கைதிகளாலும் மேற்கொள்ளப்பட்டு வருகின்றது. இந்த தமிழ் அரசியல் கைதிகளுக்கு நீதி, நியாயம் நிலைநாட்டப்பட வேண்டும் என்பதை நாங்கள் ஆரம்பந்தொட்டே வலியுறுத்தி வருகின்றோம். இத்தகைய நிலைமையில், "இந்த நாட்டில் அரசியல் கைதிகள் என ஒருவரும் இல்லை" என்ற கதையினைக் கூறி, அரசாங்கம் இந்த விடயத்தைத் தட்டிக் கழித்து வருகின்றதேயன்றி, இதற்கொரு முடிவினை எடுப்பதற்கு பின்னடித்து வருகின்றது.

"அரசியல் கைதிகள்" என்ற சொற்பிரயோகமானது இன்று நேற்றல்ல, 1940களில் அன்றைய அரசு, சமசமாஜக் கட்சியின் தலைவர்கள் சிலரைக் கைதுசெய்து, சிறையில் அடைத்தது முதல் இந்த நாட்டில் பயன்படுத்தப்பட்டு வருகின்ற சொற் பிரயோகமாகும். அதன்பின்னர் 1971 மற்றும் 1988 - 89 காலகட்டங்களில் தென்பகுதியில் ஏற்பட்டிருந்த சிங்கள இளைஞர்களின் கிளர்ச்சிகளின்போதும் இந்தச் சொற்பிரயோகம் மிகவும் அழுத்தமாகப் பிரயோகிக்கப்பட்டு வந்திருந்தது. அதன் தொடர்ச்சியாகவே நாங்கள் இந்தத் தமிழ் அரசியல் கைதிகளின் தடுப்பினையும் பார்க்க வேண்டியுள்ளது. இவர்கள் பாதாள உலகக் கோஷ்டியினர் அல்லர். தங்களது சுயத்திற்காக சமூக விரோதச் செயற்பாடுகளில் ஈடுபட்டோரும் அல்லர். தமிழ் மக்களின் விடுதலை நோக்கிய போராட்டத்தின் ஒரு காலகட்டத்தில் விரும்பி இணைந்தோ அல்லது பலவந்தமாக இணைத்துக்கொள்ளப்பட்டோ செயற்பட்டவர்கள் என்ற அடிப்படையிலேயே இவர்கள் கைது செய்யப்பட்டுள்ளனர். இவர்கள் தாங்களும் வாழ்வதற்காகவே போராடி வருகின்றனர்; நீதி நியாயம் கோருகின்றனரேயன்றி, இவர்களை வைத்து வெளியிலிருந்து யாரும் அரசியல் செய்வதற்காக அல்ல. இவர்கள் அனைவரும் பயங்கரவாதத் தடைச் சட்டத்தின் கீழ் கைது செய்யப்பட்டவர்கள். இலங்கையின் சட்டத்தின் பிரகாரம் குற்றம் ஒன்றினை உறுதிப்படுத்துவதற்குப் பொலிஸாரினால் கைதிகளிடமிருந்து பெறப்படுகின்ற ஒப்புதல் வாக்குமூலத்தைப் பயன்படுத்த இயலாது. எனினும், இந்தத் தமிழ் அரசியல் கைதிகள் அனைவருமே இன்னமும் பிணைகூட இன்றித் தடுப்பில் இருப்பதற்கு ஒரே காரணம் அவர்களிடமிருந்து பொலிஸார் பெற்றுக்கொண்டுள்ள வாக்குமூலங்கள் என்றே கூறப் படுகின்றது. இந்த வாக்குமூலங்களை எப்படியெல்லாம் பெற்றிருக்கக்கூடும் என்பது பற்றி நான் சொல்லி, நீங்கள் தெரிந்து கொள்ள வேண்டியதில்லை. ஆக, இந்த நாட்டில் தமிழ் மக்களுக்கு ஒரு சட்டமும் சிங்கள மக்களுக்கு ஒரு சட்டமும் எனத் தொடர்ந்து செயற்படுத்தப்பட்டால், நீங்கள் அதிகளவில் செலவுசெய்து விளம்பரப்படுத்திக்கொண் டிருக்கும் 'தேசிய நல்லிணக்கம்' என்பது வெறும் கண்துடைப்புத்தானே! என்றே கேட்க விரும்புகின்றேன்.

தமிழ் அரசியல் கைதிகளை இவ்வாறு தொடர்ந்து நீதி, நியாயமின்றித் தடுத்து வைத்திருப்பதன்மூலம் அவர்களது மனித உரிமைகள் திட்டமிடப்பட்டு மீறப்படுகின்றன. இந்த இழப்புகளுக்கான எதிரீடுகள் அலுவலகச் சட்டமூலத்தில் 'இன்னலுற்ற ஆட்கள்' பற்றிய வரைவிலக்கணத்தின் (அ) 1ஆம் பந்தியில் "வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் நடைபெற்ற மோதலின்போது, அதன் விளைவாக, அல்லது அதனுடன் தொடர்புடைய, அல்லது, அதன் பின்னரான" என்றும், 3ஆம் பந்தியில், "இலங்கையிலுள்ள தனியாட்களின்,

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

குழுக்களின் அல்லது மக்கள் சமுதாயங்களின் உரிமைகள் மீதான முறைப்படுத்தப்பட்ட முழுமையான மீறுகைகளின் போது" எனவும் குறிப்பிடப்பட்டுள்ளது. இந்த வரைவிலக்கணத்தின்படி இந்தத் தமிழ் அரசியல் கைதிகளும் அதனுள் அடங்குகின்றனர் என்றே கருதப்பட வேண்டும். அந்தவகையில், இவர்களுக்கு அதாவது, இந்தத் தமிழ் அரசியல் கைதிகளுக்கு என்ன இழப்பீடுகளை வழங்கப் போகிறீர்கள்? எனக் கேட்க விரும்புகின்றேன். எனவே, இந்தத் தமிழ் அரசியல் கைதிகள் விடயத்தில் ஒரு தீர்க்கமான முடிவுக்கு வாருங்கள்! மேலும் இந்த விடயத்தைத் தள்ளிப் போடாதீர்கள்! எனக் கேட்டுக் கொள்கின்றேன்.

தமிழ் அரசியல் கைதிகளின் விடுதலைக்கு விரைந்து நடவடிக்கை எடுப்பதாகக் கூறிக்கொண்டு, வடக்கு, கிழக்கு மாகாணங்களில் எமது மக்களின் வாக்குகளை அபகரித்தவர்கள், இந்த அரசாங்கத்தைத் தாங்கள்தான் கொண்டுவந்ததாகக் கூறித் திரிபவர்கள், உண்மையிலேயே தமிழ் அரசியல் கைதிகள்மீதோ, இந்தத் தமிழ் அரசியல் கைதிகளின் விடுதலைக்காக அல்லற்பட்டுக்கொண்டிருக்கும் அவர்களது உறவினர்கள்மீதோ அக்கறைகொண்டிருந்தால், ஆளுமை மிக்கவர்களாக இருந்திருந்தால், தமிழ் அரசியல் கைதிகளின் விடுதலையை விரும்பியிருந்தால், அவர்களை எப்போதோ விடுவித்திருக்கலாம். அதற்கான அரசியலதிகாரம் அவர்களிடம் இருந்திருக்கின்றது. குறிப்பாக, 2015ஆம் ஆண்டின் புதிய அரசின் 100 நாட்கள் வேலைத்திட்டக் காலகட்டத்திலேயே இதனைச் செய்திருக்கலாம். அதை விடுத்து, இப்போது - அதாவது, தமிழ் அரசியல் கைதிகள் உண்ணாவிரதங்களை மேற்கொள்கின்ற காலங்களில் - இங்கே வந்து நீலிக் கண்ணீர் வடிக்கத் தேவையில்லை என்றே கருத வேண்டியுள்ளது.

இழப்புகளுக்கான எதிரீடு அலுவலகமென்பது, யுத்தம் இந்த நாட்டில் முடிவுக்குக் கொண்டுவரப்பட்டு, கிட்டத்தட்ட ஒன்பது வருடங்கள் கழிந்த நிலையில் இன்றும் அதுபற்றிப் பேசப்பட்டுக் கொண்டிருக்கின்ற நிலையில், இந்த அலுவலகம் துரித கதியில் அமையப்பெற வேண்டும் என்பதே எமது எதிர்பார்ப்பாகும். கடந்தகால யுத்தம் காரணமாக அனைத்தையும் இழந்து நடுத்தெருவில் நிற்கின்ற எமது மக்களுக்கு இது பூரண மன நிம்மதியைத் தந்துவிடாது. எனினும், அவர்களது மனக் காயங்களுக்கு ஒத்தடமாகவாவது இது அமையும் என்றே நாம் கருதுகின்றோம்.

கடந்த காலத்தில் புனர்வாழ்வு வழங்கப்பட்டவர்களில் பெரும்பாலானவர்கள் இன்னமும் போதிய வாழ்வாதாரங்கள் இன்றிய நிலையில், மிகவும் பரிதாபகரமான வாழ்க்கை யினையே மேற்கொண்டு வருகின்றனர். இந்த மக்களுக்கு ஒரு முழுமையான வாழ்வாதார உதவியாக ஒரு தொகை நிதியுதவி வழங்கப்பட வேண்டுமென நான் ஏற்கனவே பலமுறை இந்தச் சபையின் மூலமாகக் கோரிக்கை விடுத்திருந்தேன். அது தொடர்பில் மீள்குடியேற்றம் மற்றும் புனர்வாழ்வு அமைச்ச ரினால் ஓர் அமைச்சரவைப் பத்திரம் சமர்ப்பிக்கப்பட்டதாகவும், அது அமைச்சரவையில் நிராகரிக்கப்பட்டதாகவும் ஊடகங்கள் செய்தி வெளியிட்டிருந்தன. அத்தகைய துரதிருஷ்டவசமான நிலைமைகள் ஏற்படாத வகையில், கடந்தகால யுத்தம் காரணமாகப் பாதிக்கப்பட்டுள்ள எமது மக்களுக்கு ஒரு முழுமையான வாழ்வாதார ஏற்பாடு இந்த அலுவலகத்தின் மூலமாக நிறைவேற்றப்பட வேண்டும் என்பதே எமது எதிர்பார்ப்பாகும். தற்காலத்திலும் பாதுகாப்பு அமைச்சுக்கு அதிக நிதி ஒதுக்கீடுகளை மேற்கொள்வதைப் போன்று, இந்த மக்களும் இந்த நாட்டு மக்கள் எனக் கருதி, அவர்களும் இந்தச் சமூகத்தில் வாழ வேண்டிய மக்கள் என்ற நிலைப்பாட்டிலிருந்து எதிர்வரும் வரவு செலவுத் திட்டத்தில் இந்த மக்களின் வாழ்வாதாரங்களுக்கென ஒரு விசேட நிதி ஒதுக்கீடு மேற்கொள்ளப்பட வேண்டும் என்பதை ஒரு கோரிக்கையாக இங்கு முன்வைக்கின்றேன்.

குறிப்பாக, கடந்தகால யுத்தப் பாதிப்புகள் காரணமாகவே எமது மக்களில் பலர், குறிப்பாகப் பெண் தலைமைத்துவக் குடும்பங்கள், தங்களது வாழ்க்கையினை முன்னெடுத்துச் செல்லுமுகமாக நுண்கடன் உட்பட நிதி நிறுவனங்களில் கடன் தொகைகளைப் பெற்றுள்ளனர். இதனால் இன்று அவர்கள் பெரும் கடன்காரர்களாகி, தற்கொலை செய்து கொள்கின்ற நிலை தொடர்கின்றது. மேலும், பல குடும்பங்கள் விவாகரத்துப்பெற்று பிரிந்து வாழுகின்ற நிலையும் எமது பகுதிகளில் உருவாகி வருகின்றது. இவை எல்லாம் எமது சமூகத்தில் சொல்லொணாத் துயரங்களாகவே தொடர்கின்றன. இத்தகைய நுண்கடன் பெற்றவர்களுக்கு ஒரு தீர்வாக இந்த அரசு ஓரிலட்சம் ரூபாய்க்கு உட்பட்ட கடனாளிகளுக்கென ஒரு திட்டத்தினைக் கொண்டுவந்தபோதிலும், அதனது விண்ணப்பத்திற்குரிய தகைமைகள் தொடர்பில் அறிவிப்பதற் கான காலக்கெடு போதுமானதாக இல்லாத காரணத்தினால் அது எமது மக்களுக்கு உரிய பயன்பாடுகளைத் தரவில்லை என்றே கருத வேண்டியுள்ளது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one more minute.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
மேலும், மேற்படி கடன் திட்டங்கள் தொடர்பில், அரச மட்டத்தில் தீர்மானங்கள் எடுக்கப்படுகின்றபோது, அவை கடன் கொடுத்தவர்கள் கடன் பெற்ற எமது மக்கள்மீது பாரிய அழுத்தங்களை வெவ்வேறு வடிவங்களில் மேற்கொள்வதற்கு வழிவகுத்து வருவதையும் இங்கு குறிப்பிட வேண்டும். எனவே, அந்த மக்களை முழுமையாகத் தற்போதைய கடன் தொல்லை நிலைமைகளிலிருந்து மீட்பதற்கு ஏதுவான நடவடிக்கைகளைத் துரிதமாக மேற்கொள்வதற்கு இந்த அலுவலகத்தினூடாக வழிவகைகள் ஏற்படுத்தப்பட வேண்டும். அந்தவகையில், இழப்புக்கான எதிரீடுகள் பற்றிய அலுவலகம் தொடர்பான சட்டமூலத்தில், குடும்பங்களின் தலைமைத்துவத்தினை ஏற்றிருக்கின்ற பெண்கள் தொடர்பில் விசேட செயற்திட்டங்களை மேற்கொள்வது தொடர்பிலான விடயமும் இணைத்துக் கொள்ளப்பட வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, please give me just one more minute.

மேலும், 'அங்கவீனமுற்ற ஆட்கள்' என இங்கு குறிப்பிடப் பட்டிருக்கிறது. கடந்தகால யுத்தம் காரணமாக முள்ளந்தண்டு

පාතික්කප්පට්ටවර්කළාක පලනූරු පේර් වටක්කු, කිළක්කු මාකාණංකළිලේ උරිය මරුත්තුව වසතිකළෛප් පෙර මුටියාත නිලෛයිල් වාළ්න්තු වරුකින්රනර්. ඉවර්කළ් තොටර්පිල් ඔරු විසේට මරුත්තුව වසතිකළ් කොණ්ට ඔර් අමෛප්පු මුරෛමෛ ඒර්පටුත්තප්පටුවතු අවසියමාකින්රතු එන්පතෛයුම් කවනත්තිල් කොළ්ළ වේණ්ටුම්. අත්තුටන් ඉංකේ, ඉන්නලුර්ර ආට්කළින් කුලුක්කළුක්කාන අල්ලතු අත්තකෛය ඉන්නලුර්ර ආට්කළින් උරවිනර්කළුක්කාන පයනුළ්ළවොරු පරිකාරත්තිර්කුම්, නලන්කළුක්කුමාන උරිමෛයෛ ඒර්රු අංකීකරික්ක කරුතප්පටුකින්ර වලිමුරෛකළ් පර්රික් කූරප්පටුකින්රතු.

කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, නේරම් පෝතාමෛයිනාල් මේලතික උරෛයිනෛ නාන් සපෛක්කුච් සමර්ප්පික්කින්රේන්*. ඉතනෛ හන්සාට් අර්පික්කෛයිල් චේර්ත්තුක්කොළ්ළුමාරු වේණ්ටුකින්රේන්. නන්රි.

*සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

'ඉන්නලුර්ර ආට්කළින් උරවිනර්කළ්' එන්කින්රපෝතු, අන්ත උරවිනර්කළුම් ඉන්නලුරුකින්රවර්කළේ එන්ර වකෛයිල් කණික්කප්පෙර්රේ අවර්කළුක්කාන ඉළප්පීටුකළ් අළික්කප්පට වේණ්ටුම්. ඉංකු ඔරුවරාතු ඉරප්පිනාල් - කොලෛයිනාල් අල්ලතු කාණාමර්පෝකච් චෙය්යප්පට්ටතනාල් අල්ලතු අංකවීනමානතාල් අතර්කුරිය ඉළප්පු එන්කින්ර අටිප්පටෛයිල් ඔරු කණිප්පුම්, අන්ත ඉරන්ත - කොලෛයාන අල්ලතු කාණාමර්පෝකච් චෙය්යප්පට්ට අල්ලතු අංකවීන මාන නපරිනාල් අන්තක් කුටුම්පම් ඉළක්ක නේරිට්ටුළ්ළ වරුමානම් එන්ර අටිප්පටෛයිල් ඔරු කණිප්පුම් කොණ්ටු මේර්පටි ඉළප්පීටුකළ් මේර්කොළ්ළප්පට වේණ්ටුම් එන්ර කෝරික්කෛයෛයුම් ඉන්ත ඉටත්තිල් මුන්වෛක්ක විරුම්පු කින්රේන්.

මේලුම්, ඉන්ත අලුවලකම් කාණප්පෝවතාකච් කූරප්පටුකින්ර පරිකාරංකළ් - නලන්කළ් තොටර්පාන විටයංකළිල් 'නිනෛවුච් චින්නංකළ් උට්පට ඉරන්ත ආට්කළෛ නිනෛවූට්ටික් කොළ්ළුම් වළිවකෛකළ්' එනවුම් කුරිප්පිටප්පට්ටුළ්ළතු. යුත්තම් කාරණමාක ඉරන්තවර්කළෛ නිනෛවුක්කූරත්තක්ක වකෛයිලුම්, මතක් කිරියෛකළෛ මේර්කොළ්වතර්කුම් ඔරු පොතුවාන නිනෛවුත්තූපි අමෛක්කප්පට වේණ්ටුම් එන්ර කෝරික්කෛයිනෛ නාන් ඉන්තච් සපෛයිලේ පිරේරණෛයාක මුන්වෛත්තිරුන්තේන්. අතර්කාන අනුමති කිටෛත්තිරුන්තුම් අතු ඉන්නුම් චාත්තියමාකාත නිලෛ කාණප්පටුකින්රතු. එනවේ, ඉරුති යුත්තම් නටෛපෙර්රු, අතිකළවිලාන උයිර්කළ් පලියාන ඉටත්තිල් අන්ත නිනෛවුත්තූපියෛ අමෛප්පතර්කු නටවටික්කෛ එටුක්කප්පටල් වේණ්ටුම් එන්පතෛ මීණ්ටුම් වලියුරුත්තුකින්රේන්.

අත්තුටන්, යුත්ත අළිවුච් චින්නංකළෛ වටක්කු, කිළක්කු මාකාණංකළිල් ඉරුන්තු අකර්රුවතෛයුම් ඔරු විටයමාක ඉතිල් චේර්ත්තුක් කොළ්ළප්පටල් වේණ්ටුම්. ඉතිලුම්කූට තේසිය නල්ලිණක්කම් පර්රි කතෛක්කින්ර නීංකළ් පාරපට්චමේ පාර්ක්කින්රීර්කළ්. යුත්ත කාලත්තිල් වටක්කු, කිළක්කු මාකාණංකළුක්කු වෙළියිල් ඒර්පට්ටිරුන්ත යුත්තප් පාතිප්පු ඉටංකළ් අනෛත්තුම් මීළප් පුනරමෛක්කප්පට්ටු, මීළක් කට්ටියෙළුප්පප්පට්ටු, අවෛ ඉන්රු ආක්කත්තිනෛ නෝක්කි නකර්ත්තප්පටුකින්රන. ආනාල්, එමතු පකුතිකළිල් මාත්තිරම් අවර්රෛ අප්පටියේ වෛත්තුප් පළෛය කුරෝතංකළෛ මීණ්ටුම් තූණ්ටුකින්ර වකෛයිල් අතෛප් පාර්ක්කින්ර පෙරුම්පාන්මෛ ඉන මක්කළුක්කු කාට්චිප්පටුත්ති වරුකින්රීර්කළ්. මරුපක්කත්තිල් එමතු මක්කළ් ඉත්තකෛය චෙයර්පාටුකළුක්කු මුන්පාක මිකවුම් වේතනෛයටෛකින්ර, උණර්වුකළාල් ඔරුවිතමාන තුන්පංකළෛච් චුමක්කින්ර නිලෛයේ කාණප්පටුකින්රතු. එනවේ, ඉන්ත විටයංකළෛ අවතානත්තිල් කොණ්ටු, එව්විතමාන පාරපට්චංකළුම් අර්ර වකෛයිල්, පාතික්කප්පට්ටුළ්ළ එමතු මක්කළුක්කු උතවක්කූටිය වකෛයිල් ඉන්ත අලුවලකම් උරුප්පෙර්රුච් චෙයර්පට වේණ්ටුම් එන්ර එතිර්පාර්ප්පිනෛ මුන්වෛත්තු, විටෛපෙරු කින්රේන්. නන්රි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළහට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

**[අ.භා. 5.07]**

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම අද මේ ඉදිරිපත් කර තිබෙන හානිපූරණය සඳහා වන කාර්යාලය පිළිබඳ පනත් කෙටුම්පත සහ එහි තිබෙන නිර්ණායක, ඒ වාගේම එහි තිබෙන අරමුණු, එමඟින් අප විශේෂයෙන්ම බලාපොරොත්තු වන දේවල් දිහා බැලුවාම අපේ රට සංහිඳියාව කරා යන මේ ගමනේ දී අප මූලිකවම එකඟ විය යුතු කාරණයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසුගිය කාලයේ පැවැති යුද්ධය නිසා මේ රටේ සියලු දෙනාටම විශාල වශයෙන් හානි සිදු වෙලා තිබෙනවා. උතුරද, දකුණද කියලා වෙනසක් නැතිව, යුද්ධයේ විපාක අප සියලුදෙනාම භුක්ති වින්දා. ඒ, යුද්ධයේ තිබුණු මිලේච්ඡත්වය අපි සියලු දෙනාම දැක්කා. ඒ, යුද්ධයේ තිබුණු කුරිරු බව අප සියලු දෙනාම දැක්කා. නමුත් අද ඒ යුද්ධය අවසානයකට ඇවිල්ලා, අපි මේ රටේ සංහිඳියාව ගැන කතා කරන මොහොතක නැවත ඒ පාලම හදාගන්න, ඒ සම්බන්ධය නැවත ධනාත්මක පැත්තට ගොඩනඟන්න යම් යම් යන්ත්‍රණ අපට අනිවාර්යයෙන් අවශ්‍ය වෙනවා. ඒ යන්ත්‍රණ අපට අවශ්‍ය වන්නේ මේ රට නැවත යුද්ධයකට ගෙන යන්න හෝ නැවත මේ රටේ ජාතිවාදය අවුස්සන්න හෝ මේ රටේ තිබෙන සමඟිය නැවත කඩා දමන්න හෝ නොවෙයි. ජාතීන් අතර පැවැති සංහිඳියාව, සමඟිය නැවත ඇති කරන්න, ජාතීන් අතර තිබූ සැකය දුරු කරගෙන අපට අලුත් ගමනක් යන්න යන්ත්‍රණ අවශ්‍ය වෙනවා. යුද්ධය අවසන් වුණාය කියලා සියලු දේවල් අවසන් වෙලා නැහැ. යුද්ධය අවසන් වුණාය කියලා මේ රටේ තිබුණු ප්‍රශ්න අවසන් වෙලා නැහැ. ඒ නිසා අලුත් ගමනක් යන්න අලුත් යන්ත්‍රණ හදාගන්න අපට සිදු වෙනවා. ඒ අතරින් එක් යන්ත්‍රණයක් තමයි අද අපි විවාදයට ලක් කර තිබෙන මේ පනත් කෙටුම්පත. මේ සම්බන්ධයෙන් නොයෙකුත් අදහස් තිබෙනවා. සමහර අය කියන්න පුළුවන්, මෙය උතුර නැඟෙනහිරට විතරක් සීමා වෙලා තිබෙනවා කියලා. මේ පනත් කෙටුම්පතේ පැහැදිලිවම කියා තිබෙනවා, "උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක් වශයෙන්, හෝ ඊට සම්බන්ධව හෝ එහි පසුවිපාකයක් ලෙස, හෝ..." කියලා. ඒ කියන්නේ, ඕනෑම තැනක වෙච්ච සිද්ධියක් සම්බන්ධව මේ හානි පූර්ණය අදාළ වනවා කියන එකයි. ඒ සිදුවීම වුණේ ලංකාවේ මාතර වෙන්න පුළුවන්; හම්බන්තොට වෙන්න පුළුවන්; අම්පාරේ වෙන්න පුළුවන්; මඩකලපුවේ වෙන්න පුළුවන්; කොළඹ වෙන්න පුළුවන්. එහෙම නැත්නම් වයඹ පළාතේ වෙන්නත් පුළුවන්. අපේ රට තුළ ඕනෑම තැනක ඒ කාලයේ වූ සිදුවීම්වලට මේ පනත් කෙටුම්පත අදාළ වෙනවා. නමුත් අද විපක්ෂයේ යම් යම් උදවිය මෙය වෙනත් පැත්තකට හරවන්න හදනවා. මේ අය කියනවා, සන්නද්ධ අරගළය මොකක්ද කියා මෙහි විස්තර කරන්න ඕනෑ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

බව. එවිට මතු වන ගැටලුව මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 1971දීත් සන්නද්ධ අගළයක් ඇති වුණා නේ. 1971දීත් මේ රටේ කැරැල්ලක් ගැහුවා. ඒකත් සන්නද්ධ අරගළයක්. අපි දන්නවා, 1971දී සිදු වූ සන්නද්ධ අරගළය සම්බන්ධයෙනුත් වන්දි දීලා නැහැ කියාලා. ඒ සම්බන්ධයෙන් කිසිදු ගෙවීමක් කළේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා, 1971දී වූ සිදුවීම්වලටත් මේ පනත් කෙටුම්පත අදාළ කරගන්න අපට හැකියාවක් තිබෙනවාද, ඒකටත් යම් සාධාරණත්වයක් ඉෂ්ට කරන්න මේ පනත් කෙටුම්පත හරහා පුළුවන්කමක් තිබෙනවාද කියලා ගරු ඇමතිතුමා කියයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ හරහාත් යම් ජාතිවාදී අදහසක් ගොඩ නඟන්න පුළුවන්ද කියලා ඇතැම් අය බලනවා. උතුරේ වෙන්න පුළුවන්; දකුණේ වෙන්න පුළුවන්, ප්‍රභාකරන් එක්ක, ඒ වැරැදි මතවාද තුළ ඉදගෙන කටයුතු කළේ අපේ රටේ ළමයින් බව අපි දැක්කා. එහෙම නැතිව, ඒ අය කල්ලතෝනි අය නොවෙයි. උතුරේ වෙන්න පුළුවන්; කිලිනොච්චියේ වෙන්න පුළුවන්; මඩකලපුවේ වෙන්න පුළුවන්, ඒ අපේ රටේ ඉපදුණු ද්‍රවිඩ අම්මලා තාත්තලාගේ ළමයින්. ප්‍රභාකරන්ගේ වැරැදි අදහසක්, වැරැදි මතවාදයක් උඩ, මේ රටේ තිබුණු යම් යම් දේශපාලන ක්‍රියා හේතුවෙන් ඔවුන් යම් වැරැදි ගමනක් ගියා. අපි සියලු දෙනාම එය පිළිගත යුතුයි. එහෙම නැතිව, ඉන්දියාවේ ඉඳලා ආපු උදවිය නොවෙයි. ඉන්දියාවේ ඉඳලා ආපු කල්ලතෝනි උදවිය නොවෙයි එදා තුවක්කු අරගෙන ආවේ. සයනයිඩ් කරල බෙල්ල වටා බැඳගෙන ආවේ, suicide jacket එක දාගෙන ආවේ තමිල්නාඩුවෙන් ආපු උදවිය නොවෙයි.

අපේ රටේ ඉපදුණු අපේම අම්මල තාත්තලාගේ, සහෝදර ජනතාවගේ ළමයි. ඒ ළමයි වැරදි පාරක ගියා. අද යුද්ධය අවසාන වෙලා තිබෙනවා. ඒ ළමයි පුනරුත්ථාපනය කරලා, ඔවුන්ගේ ජීවිත නැවත හදා ගන්නට පුළුවන් යාන්ත්‍රණයක් හදා ගන්න අද අපට සිදුවෙලා තිබෙනවා. ඒක අත්‍යවශ්‍ය කාරණයක්. ලෝකයේ හැම රටකම සිවිල් යුද්ධයක් අවසාන වුණාට පසුව, යුද්ධය හරහා අපහසුතාවට ලක් වුණු උදවිය, යුද්ධයෙන් හානි වුණු උදවිය, ජීවිත නැති වුණු උදවිය සිටින්න පුළුවන්. එහි ප්‍රතිඵල අනෙක් පැත්තට හරවා ගන්න යම් යම් යාන්ත්‍රණ හදලා තිබෙනවා. ලංකාවේ විතරක් නොවෙයි, ලෝකයේ සිවිල් යුද්ධ ඇති වුණු හැම රටකම ඒක සිදු වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි 2ක් ලැබෙනවා. ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමාත් විනාඩි 2ක් ලබා දෙනවා. ඒ අනුව මට තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

අද ලෝකයේ හැම රටක්ම සිවිල් යුද්ධ අවසන් වුණාට පසුව නැවත තමන්ගේ රට තුළ යුද්ධයක් ඇති වීම වළක්වන්නට කටයුතු කර තිබෙනවා. යුද්ධය තුළ අසරණ වුණු ජනතාවට, යම් ජන කොටසකට, ඒවාට සම්බන්ධ වුණු පිරිස්වලට, ඒ පවුල්වලට යම් අලාභහානි සිදුවෙලා තිබෙනවා නම් ඒවා යථා තත්ත්වයට පත් කරගෙන ඔවුන්ගේ ජීවන රටාව, ජීවන තත්ත්වය නඟා සිටුවන්නට පුළුවන් නීන්දු, තීරණ අරගෙන තිබෙනවා. ලෝකයේ මානව ඉතිහාසය තුළ හැම රටක්ම ඒ කාර්යයට යොමු වෙලා තිබෙනවා.

අපි මේවාගේ නීන්දු ගන්නා විට තමුන්නාන්සේලා මේ සභාවට ඇවිල්ලා කථා කරන්නේ, අධිරාජ්‍යවාදීන්, "එන්ජීඕ" නඩය, බෙදුම්වාදය ගැනයි. - බෙදුම්වාදය කියලා කියපු ගමන් ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා මගේ මූණ දිහාත් බලනවා. - ඒවා ගැන තමයි කථා කරන්නේ. මෙතුමන්ලාට ඒවායින් තොර අදහසක් නැහැ. ඕක හැමදාම කියන්නට පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඕක හරහා වෙනත් කිසිම දෙයක් සිදු වන්නේ නැහැ. ඕක කිය කියා මේ රටේ සමාජය තව තවත් බෙදන්නට පුළුවන්; මේ රටේ ජාතීන් අතර තව තවත් වෛරය ඇති කරන්නට පුළුවන්; රටේ ජනතාව තව තවත් ඈත් කරන්නට පුළුවන්. ඒක තමයි කරන්නට පුළුවන් දේ. මොකද, දැන් මේ පනත් කෙටුම්පත හරහා ලොකු බිල්ලෙක් මවනවා. "අන්න බෙදුම්වාදයට පාර කපනවා, අන්න දැන් නැවත එල්ටීටීඊ එක හිස ඔසවන්නයි යන්නේ, එල්ටීටීඊකාරයන්ට සල්ලි දෙන්නයි මේ යන්නේ" කියලා ලොකු බිල්ලෙක් මවනවා. මේ පනත් කෙටුම්පත හරහා මේ රටේ සිංහල සාමාන්‍ය ජනතාව අතර භයක්, සැකයක් ඇති කරන්නට යම් පිරිසක් උත්සාහ කරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒගොල්ලන්ගේ දේශපාලන ඉතිහාසයේ හැමදාමත් කුණු බක්කියට තමයි ගිහින් තිබෙන්නේ කියන එකයි අපට කියන්න තිබෙන්නේ. ඒ අයගේ දේශපාලනය හරහා කවදාවත් මේ රටට සෙතක් වෙලා නැහැ. ඒ අයගේ දේශපාලනය හරහා මේ රටේ ජන කොටස්වලට, මේ රටේ ඉදිරි පරම්පරාවට සෙතක් වෙලා නැහැ. ඒ තුළ තිබෙන්නේ මිලේච්ඡත්වය, ඒ තුළ තිබෙන්නේ වර්ගවාදය. මිනිස් සංහතියටම විරුද්ධව කථා කරන දේවල් විතරයි ඒ තුළ තිබෙන්නේ. ඒ තුළින් අපට ගන්න පුළුවන් ආදර්ශවත් දේවල් නැහැ. එම නිසා අද අපට රජයක් හැටියට වගකීමක් තිබෙනවා.

2009 දී යුද්ධය අවසාන වුණා. ඒ යුද්ධය අවසාන වුණාට පසුව අපි යම් ගමනක් යන්න පටන් ගෙන තිබෙනවා. ඒ ගමන තුළ අඩු පාඩුකම් තිබෙන්නට පුළුවන්. ඒ ගමනට විරුද්ධ අය ඉන්නවා. උතුරේත් ඉන්නවා. අපේ විග්නේස්වරන් මහ ඇමතිතුමා වාගේ අය ඉන්නේ වෙනත් අදහසක, සිවාජිලිංගම් ඉන්නේ වෙනත් අදහසක. නමුත් බහුතර දෙමළ ජනතාවගේ අදහස ඒක නොවෙයි. ඒක අපි මතක තියා ගන්නට ඕනෑ. එදා 2015 ජනාධිපතිවරණයේ දී සිවාජිලිංගම් මැතිතුමා ඡන්දය ඉල්ලුවා, එතුමාට දෙමළ ජනතාව ඡන්දය දුන්නේ නැහැ. එතුමාට ඡන්දය දෙන්නේ නැතිව පොළොන්නරුවේ ඉපදුණු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට තමයි බහුතර දෙමළ ජනතාව ඡන්දය දුන්නේ. නමුත්, ඒ බහුතර දෙමළ ජනතාවගෙන් යම් පිරිසක් - තරුණ තරුණියෝ - තමයි එදා ප්‍රභාකරන් සමඟ ඒ ගමන ගියේ. නමුත් ඒගොල්ලන්ගේ අම්මලා තාත්තලා ඡන්දය දුන්නේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට. තව පිරිසක් මහින්ද රාජපක්ෂ මහත්මයාටත් ඡන්දය දුන්නා. ඒ තරුණ තරුණියන්ව පුනරුත්ථාපනය කර, ඔවුන්ගේ ජීවන තත්ත්වය නැවත නඟා සිටුවන්නට, අලුත් අදහස් තුළින් ඔවුන්ගේ ජීවිත නැවත හදා ගන්නට ආණ්ඩුවක් හැටියට අපි යම් යාන්ත්‍රණයක් හදනවාද, එවැනි යාන්ත්‍රණයක් හදන්නේ නැතිව නැවත අපි ඔවුන්ව අන්තවාදීන්ගේ තුරුලට තල්ලු කරනවාද කියන තීන්දුව තමයි අපට අද ගත යුතුව තිබෙන්නේ. රජයක් හැටියට අපි හරි තීන්දුව අරගෙන තිබෙනවා කියලා මම හිතනවා. මේක අපි ඉස්සරහාට ගෙන යන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි දේශපාලන සිරකරුවන් පිළිබඳ ප්‍රශ්නය. මේකත් මානුෂික ප්‍රශ්නයක්. අපි දන්නවා අවුරුදු 10ක 15ක ඉඳලා තවම සිර ගෙවල්වල ඉන්න අය සිටින බව. ඔවුන් පිළිබඳවත් තීන්දුවක් ගත

යුතුයි. ඔවුන් සියලුදෙනාම මේ රටේ තරුණයෝ; වැරදි මාවතක ගිය තරුණයෝ. 1971 දී රාජ්‍යයට විරුද්ධව කැරලි ගහපු තරුණයන්ටත් අපි ඔය තීන්දුවම අනුගමනය කළා.

88-89 කැරැල්ලට අසුවුණු තරුණයන් සිරභාරයට පත් වුණාම, ඔවුන්ව නිදහස් කරන්න ඕනෑය කියන කාරණයට අපි සියලුදෙනාම එකඟ වුණා. නමුත් උතුරේ කැරලි ගහපු තරුණයන් සම්බන්ධව කථා කරනකොට; ඒ ගැන අපි යම් තීන්දුවක් ගන්න යනකොට, "එල්ටීටීඊකාරයෝ එළියට දමන්න හදනවා, බෙදුම්වාදය ශක්තිමත් කරන්න හදනවා" කියලා කෑ ගහනවා. මේ රටේ දෙමළ ජනතාව නැවත අන්තවාදීන්ගේ තුරුලට තල්ලු කරන කථා කියලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. මේ හානිපූරණය සඳහා වන කාර්යාලය පනත අපට අත්‍යවශ්‍ය එකක්. අපට ලොකු ගමනක් යන්න තිබෙනවා. ජාතික සංහිඳියාව, සමගිය ඇති කිරීමේ වුවමනාව අපි කාටත් තිබෙනවා. ශ්‍රී ලාංකික ජාතියක් ගොඩ නඟන්න ඕනෑය කියන අදහසෙයි ඉදගෙනයි අපි මේ කථා කරන්නේ. ඒ කථාවට මෙවැනි පනත් සහ යන්ත්‍රණ අපිට අනිවාර්යයෙන්ම වුවමනා වෙනවා. එම කාර්යය ශක්තිමත් කරන්න, අපි, තමුන්නාන්සේලා බලාපොරොත්තු වන ශ්‍රී ලාංකික ජාතිය ගොඩ නඟන්න මෙම පනත තුළිනුත් විශාල ශක්තියක් ලැබෙයි කියන කාරණය ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[5.17 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Hon. Presiding Member, for the opportunity given to me to say a few words on the Office for Reparations Bill that has been taken up for debate today. It is a long overdue piece of legislation and so, we welcome the introduction of this process.

Nevertheless, I wish to place on record certain misgivings that we have, even shortcomings with regard to this Bill. Before doing that, may I say that I would like to echo the sentiments of the Hon. Bimal Rathnayake and the Hon. Leader of the Opposition who spoke before me, both of whom said that a process of ascertaining the truth ought to have preceded this Office for Reparations. Truth being the first pillar in transitional justice, there should be a Truth Commission of sorts that is established to bring out the truth of what happened, particularly during the armed conflict and the various violations that took place during that period. Any armed conflict will have that feature; there is no clean armed conflict in any part of the world. So, it is important that after it is over, that we look back not with a view to vengeance, but with the view to learning lessons and with the aim of ensuring that it does not recur. So, we would have preferred a Truth Commission to precede this Bill. Nevertheless, as I said before, we welcome the introduction of this Bill.

Then, I would like to point to a couple of concerns that we have. The first is with regard to Clause 11. (1) (*g*), under which the Office is to "formulate and recommend to the Cabinet of Ministers, Policies on Reparations and guidelines with regard to the grant of individual and collective reparations....". In my understanding, the legislation that is approved by Parliament must set out the policy; the policy must be determined by the Legislature. So, it is the policy of the Government to make reparations for persons who have been affected by various violations and it must categorize who those are and provide for the different kinds of reparations that must be made available to them. If the Office that is being set up through this legislation has to formulate policies and then will have to recommend to the Cabinet of Ministers the kind of reparations and the grant of reparations to individuals and others collectively, we fear that this process might be politicized. We have seen or heard the discussions that have taken place in the Cabinet - those were reported - when this Bill for Office for Reparations was discussed there.

That concerns us because we saw in this House also today a mechanism such as this, which the whole House ought to endorse wholeheartedly, being made the object of divisive politics and that kind of sentiment, unfortunately, had come out even in Cabinet discussions. In that background, we are concerned about the provision that the Office for Reparations must obtain Cabinet approval for policies and guidelines. So, as I said, that policy and guideline or the policies, at least, ought to be in the Bill itself.

Secondly, a concern which has been expressed in certain quarters - that appears in Clause 22(4) - is as to whether the disbursements that are to be made, whether every one of those disbursements, need Parliamentary approval. I do not think so. Reading that Clause, it seems that it is only the policy guidelines with regard to these disbursements that Parliament must approve. But, nevertheless, since some doubt has been aired with regard to this issue, I would very much like the Hon. Minister to clarify that situation because if that fear is justified, then it will become a mockery for Parliament to be approving each and every disbursement and I hope that is not the case.

Thirdly, one looks at this Bill and finds Clause 27 with regard to the interpretation of various words and phrases that have been used in this Bill. Then, you have the Committee Stage Amendments that have been proposed by the Government. I understand those are in keeping with the Determination of the Supreme Court. I have read the Determination of the Supreme Court and I must say, with all due respect to their lordships, that I am unable to understand or agree with that Determination. - [*Interruption.*] Thank you. That, again, mirrors a certain kind of fear and it is unfortunate that that fear comes through a judicial pronouncement. You find the definition of "aggrieved person" to be as contained in the First, Second, Third and Fourth Geneva Conventions of 1949 and the Supreme Court seems to think that that seems to violate the sovereignty of the country. These are all Conventions that Sri Lanka is signatory to and you do not have to pass enabling domestic legislation in order to adopt a definition. There are many laws that we have passed which adopt the definitions in international instruments that we have signed and ratified. So, to say that unless domestic legislation is first passed, a good definition that is found in an international instrument ought not to be adopted defeats any logic. In any case, even if that be so, this is the domestic legislation that is

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

adopting that definition. So, the fact that we are a dualist country does not take away from the fact that we can look at a good definition and adopt it as the definition that we will follow. But, unfortunately, that is the Determination of the Supreme Court and therefore, I understand that you have to change that.

But I must place here our concern with regard to even the Supreme Court falling into this kind of error and entertaining illogical fears, even with regard to the definition of human rights. Now that is being deleted entirely because, I suppose, that goes on to say, "To give effect to international human rights treaties which have been ratified by Sri Lanka." If Sri Lanka has ratified those treaties, what is wrong in adopting those definitions. That is, I repeat again, an act of passing domestic legislation. So, it is, as I said, unfortunate that we have got this Determination of the Supreme Court and these changes are being made, but I hope that making these changes does not in effect take away the intent of the Government to understand and appreciate who an "aggrieved person" is, and what is meant by "human rights".

With regard to the functioning of this office, it is our fervent hope that it will start functioning soon, and that since reparations are to be made particularly with regard to persons who have disappeared, and also those who have been affected by armed conflict et cetera that the functioning of the Office be speeded up, so that persons who have long suffered after the end of the armed conflict, for almost ten years by the time this Office starts functioning, will at least after a decade be able to find some solace.

Before I sit down might I repeat that a mechanism for the ascertainment of the truth be brought urgently alongside this Bill, so that truth as it is, whether it is palatable or not, is made known to the country so that all of us from all the different backgrounds, from all sides of the divide will learn our lessons in order that the country does not go through such a phase as we have gone through for thirty long years of the armed conflict.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා. ඊට ප්‍රථම මූලාසනය සඳහා ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன )
(The Hon. Tilak Marapana )

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී "ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු මයන්ත දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MAYANTHA DISSANAYAKE *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

[අ.භා. 5.30]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එල්ටිටීඊ‍ය කියන්නේ මේ රට බෙදා ගැනීම සඳහා, දෙකඩ කිරීම සඳහා මිලේච්ඡත්වය, කෲරත්වය, දුෂ්ටත්වය වාගේම පැසිස්ට් බලය යෙදූ ලෝකයේ බිහිසුණුම මිලේච්ඡ සංවිධානය කියන එක පිළිබඳව මේ ගරු සභාවේ විවාදයක් නැතිව ඇති. ඒ වාගේම මේ මිලේච්ඡ සංවිධානය, පැසිස්ට් සංවිධානය, එල්ටිටීඊ‍ය ශ්‍රී ලාංකීය ජාතියට කළ හානිය කොපමණදැයි කියා අපි තවම මැණලාත් නැතිව ඇති කියායි විශ්වාස කරන්නේ.

හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත එන්නේ මොකටද? වෙන මොකටවත් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්නට තිබෙන්නේ විනාඩි පහයි. මේ ආණ්ඩුවේ හිටපු විදේශ අමාත්‍ය මංගල සමරවීර මහත්මයා එදා ජිනීවාවලට ගිහින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේත් එකඟතාවය සහිතව ජිනීවාහිදී ශ්‍රී ලංකාවේ හමුදාව මිලේච්ඡ හමුදාව යයි පිළිගෙන සෙයිඩ් රාඩ් අල් හුසේන් කුමාරයා හැදුව යෝජනාව ඇලපිල්ලක්, ඉස්පිල්ලක්, පාපිල්ලක් නැතිව පිළි අරගෙන සම අනුග්‍රහය දක්වා අත්සන් කළ ඊනියා ජිනීවා සම්මුතිය - යටත් වීමේ යෝජනාව අනුව තමයි මේ පනත් කෙටුම්පත එන්නේ. මේක පෙරහැරක්. එදා අතුරුදහන් වූවන්ගේ කාර්යාලය පිහිටුවනකොට කිව්වා, ඒකෙන් හැත්තෑඑකේ, අසූනවයේ අතුරුදහන් වූවන් ගැනත් සොයන්න පුළුවන් ය කියා. අදත් කියනවා, හැත්තෑඑකේ අයටත් හානිපූරණය කරන්න පුළුවන්ලු. ඒ කියන මන්ත්‍රීතුමාලාට ඒ ගැන කියා දෙන්න මේ අවස්ථාවේදී කාලය නැහැ.

ඊළඟට මේ කලාපයේ කිසිම රටක් තමන්ගේ රටේ නීතියට ඇතුළත් කර නොගත් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය අපේ රටේ නීතියට ඇතුළත් කර ගත්තා. ඉන්දියාව ඇතුළත් කර ගෙන තිබෙනවා ද? පාකිස්තානය ඇතුළත් කර ගෙන තිබෙනවා ද? චීනය, රුසියාව යන රටවල් ඇතුළත් කර ගෙන තිබෙනවා ද? කවුද ඒක ඇතුළත් කර ගෙන තිබෙන්නේ? මාර්තු මාසයේ 7 වනදා පාර්ලිමේන්තුවෙන් මේ රටේ නීතියට ඇතුළත් කර ගත්තා. ඊළඟට සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත සංශෝධනය කර දැන් යාන්ත්‍රණය හදා ඉවරයි. රණවිරුවෝ දංගෙඩියට දක්කන්න ඕනෑකරන යාන්ත්‍රණය දැන් හදා ඉවරයි. දැන් ගෙනෙනවා හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පතක්. අපි විරුද්ධ නැහැ, නැවත යාල්දේවී උතුරට ගමන් කිරීම ආරම්භ කළාට. අපි විරුද්ධ නැහැ, උතුරේ වැව හදනවාට. අපි විරුද්ධ නැහැ, උතුරේ පාසල හදනවාට. අපි විරුද්ධ නැහැ, උතුරේ කෝවිල හදනවාට. මේ රටේ දෙමළ ජනතාවට සම අයිතිය ලබා දෙනවාට අපි විරුද්ධ නැහැ. මේ උත්තරීතර සභාවේ අපි ඉල්ලන්නේ මෙයයි. දෙමළ වීම නිසාවෙන් හෝ මුස්ලිම් වීම නිසාවෙන් හෝ යම් කෙනෙකුට අයිතියක් අහිමි වී

තිබෙනවා නම් ඒ අයිතිය ලබා ගැනීම වෙනුවෙන් සටන් වදින්නේ කවුද? ඒ අයිතිය වෙනුවෙන් සටන් වදින ඕනෑම කෙනෙකුත් සමඟ අත් දෙකම උස්සාගෙන සටන් වදින්න අපි ලැහැස්තියි. නමුත් මේ එන්නේ මොකක්ද? හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත කියා මේ එන්නේ වෙන මොකුත් නොවෙයි. දැනට ලෝකයේ රටවල් 32ක් එල්ටීටීඊ සංවිධානය තහනම් කර ඉවරයි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය 1373 යෝජනාව යටතේ ලෝක සාමයට බාධාවක්ය කියා ලෝකයේ එල්ටීටීඊ සංවිධානයත් සමඟ සම්බන්ධ සංවිධාන පහළොවක් දැන් තහනම් කර අවසානයි.

ලෝකයේ රටවල් 32කින් තහනම් කරපු සංවිධානයකට, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය 1373 යෝජනාව යටතේ තහනම් කරපු සංවිධානවලට තමයි මේ වන්දි ගෙවන්න හදන්නේ, වෙන මොකකටවත් නොවෙයි. මෙය, කොටි ත්‍රස්තවාදය නැවත ප්‍රවර්ධනය කිරීමට ගන්නා උත්සාහයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ විධියට කොටින්ට වන්දි ගෙවනවා; මේ රට අමු අමුවේ මහා මිනිස් ලේ ගංගාවක් බවට පත් කරපු කොටි ත්‍රස්තවාදින්ට වන්දි ගෙවනවා; මේ රට අමු සොහොනක් බවට පත් කරපු කොටි ත්‍රස්තවාදින්ට වන්දි ගෙවනවා. මේ රටේ මළ කඳන් පුරවපු කොටි ත්‍රස්තවාදින්ට වන්දි ගෙවනකොට, මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් ජනයා කොටි ත්‍රස්තවාදයෙන් ගලවා ගැනීම සඳහා කැප වීමෙන් කටයුතු කළ රණ විරුවන්ට මොකද වෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව තව විනාඩියකින් අවසන් කරන්න.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
විමලවීර දිසානායක මන්ත්‍රීතුමාගේ කාලයෙන් මට විනාඩි 2ක් දෙන්න.

කොටින්ට වන්දි ගෙවනකොට කොටි ත්‍රස්තවාදයෙන් මේ රට ගලවා ගන්න කැප වුණු රණ විරුවන්ට මොකද වෙන්නේ? ලුතිනන් කර්නල් එරන්ද පීරිස් දැන් දවස් 21ක් තිස්සේ කොළඹ CRP සිර මැදිරියක අන්ත දුක් විඳිනවා. මොකටද දුක් විඳින්නේ? එරන්ද පීරිස් කියන්නේ හත්වෙනි බුද්ධි බලකායේ අණ දෙන නිලධාරියා; භාෂා පහකින්, හයකින් වැඩ කරන්න පුළුවන් විශිෂ්ට බුද්ධිමය රණ විරුවෙක්. ඔහුට විරුද්ධව තිබෙන චෝදනාව මොකක්ද? ඒ, 077345363 අංක දරන දුරකථනයෙන් call එකක් ආවාය කියන චෝදනාවයි. ඔහු කියනවා, "ආවේ නැහැ"යි කියලා. ශානි අබේසේකරගේ පොලීසිය කියනවා, "call එකක් ආවා, එය පිළිගනින්" කියලා. එය පිළිගත්තේ නැහැයි කියලා අද ලුතිනන් කර්නල් එරන්ද පීරිස් බුද්ධි අංශයේ රණ විරුවා හිරේ ඉන්නවා. කොටි ත්‍රස්තවාදය කම්මුතු කිරීමට ජීවිත පූජාවෙන් කැප වුණු රණ විරුවන් හිරේ ඉන්නවා. Telephone call එකක් ආවාය කියලා කෝප්‍රල් උළුගෙදර අද හිරේ ඉන්නවා. එක්නැලිගොඩ කියන ඊනියා කොටි මාධ්‍යවේදියා එක්ක පස්සෙන් ආවාය කියලා හිරේ; පිළිගත්තේ නැහැයි කියලා හිරේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න. ඔබතුමාට නියමිත වේලාව දැන් අවසානයි.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න.

ෂම්මි කුමාරරත්න මාස 14ක් හිරේ සිටියා. ලුතිනන් කර්නල් ෂම්මි කුමාරරත්නගේ පඩිය ගෙවලා නැහැ. ඔහුගේ පඩිය රුපියල් 18,70,000ක් ගෙවන්න තිබෙනවා. ප්‍රබෝධ සිරිවර්ධනගේ පඩිය ගෙවලා නැහැ. ඒ වාගේම රණ විරුවන් 14දෙනකුගේ පඩි ගෙවලා නැහැ. ඒ විස්තර සඳහන් ලේඛනයක් මා ළඟ තිබෙනවා. මා මෙම ලේඛනය **සභාගත*** කරනවා.

මේ රට කොටි ත්‍රස්තවාදයෙන් මුදා ගැනීමට කැප වුණු බුද්ධි අංශ රණ විරුවන්ගේ පඩි ගෙවලා නැහැ. පඩි ගෙවන්නේ නැති ආණ්ඩුවක් හානිපූරණයට කොටින්ට වන්දි ගෙවන්න පනත් කෙටුම්පත් ගෙනෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකක්ද යුක්තිය? ලුතිනන් කර්නල් එරන්ද පීරිස් හිරේ දමනවා, ඔහුගේ දුරකථනයට ඇමතුමක් ආවාය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාගේ කාලයෙනුත් මට විනාඩියක් දෙන්නම් කියනවා. ඒ විනාඩියත් මට දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුරකථන පණිවුඩයක් ආවාය කියලා එරන්ද පීරිස් හිරේ දමනවා. එරන්ද පීරිස් අද හිරේ ඉන්නවා. නාමල් කුමාර කියන්නේ පොලිස් ඔත්තුකරුවෙක්. කැබිනට් ප්‍රකාශක රාජිත සේනාරත්න ඇමතිතුමා පිළිගන්නවා, නාමල් කුමාර කියන්නේ පුරුදු පුහුණු කරපු පොලිස් ඔත්තුකරුවෙක්ය කියලා. ඔහු නාලක සිල්වාගේ හඬ පටය ඉදිරිපත් කිරීමෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඝාතන කිරීමේ කුමන්ත්‍රණය හෙළිදරවු වෙනවා. නාලක සිල්වා ගෙදර, දුරකථන ඇමතුමක් ලැබුණු එරන්ද පීරිස් හිරේ. එක්නැලිගොඩත් එක්ක බස් එකේ පිටපස්සෙන් ආවාය කියලා ඊනියා තොරතුරක් මත කෝප්‍රල් උළුගෙදර හිරේ. මොකක්ද, නීතිය? නීතියේ සමානාත්මතාව මොකක්ද? කල්පනා කරලා බලන්න. එහෙම තත්ත්වයක් යටතේ තමයි හානිපූරණය කරන්න කියලා කොටි ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කරන මේ ඊනියා පනත් කෙටුම්පත ගෙනෙන්නේ.

මා විශ්වාස කරනවා, ත්‍රස්තවාදයට විරුද්ධ කිසිවකුට මේ පනත් කෙටුම්පතට පක්ෂව අත උස්සන්න පුළුවන්කමක් නැහැයි කියලා. ඒ නිසා මේ දේශ ද්‍රෝහී පනත් කෙටුම්පත පරාජය කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත පරාජය කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත පරාජය කරනවාය කියන්නේ දෙමළ ජනතාවගේ අයිතීන් උදුරා ගැනීමට පක්ෂ වීමක් නොවෙයි. අපි කැමැතියි, දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් ලබා දෙනවාට. අපට ඕනෑ, දෙමළ ජනතාව, සිංහල ජනතාව, මුස්ලිම් ජනතාව, මැලේ ජනතාව, බර්ගර් ජනතාව යන කවුරුත් සමඟියෙන් එකට වෙසෙන රටක්. හැබැයි මේ පනත් කෙටුම්පතින් කරන්නේ බෙදුම්වාදය, ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කරන එකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ පනත් කෙටුම්පත පරාජයට පත් කිරීම සඳහා සැමගේ සහාය අපි ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. ඊළඟට ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.38]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙටි කාලයක් හෝ ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. අද ඉදිරිපත් කළ මේ පනත් කෙටුම්පතේ වැදගත්කම හරිහැටි කියවා අවබෝධ කර ගන්න බැරි, කුහක මානසිකත්වයකින් පෙළෙන, සමහර දේශපාලනික අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටින කථිකයන් ඔස්සේ මේ මාතෘකාව යටපත් වෙන්න හැරියාට රටේ සෑම මනුෂ්‍යයන් වෙනුවෙන් සමානාත්මතාවෙන් හිතන සමාජයක් උදෙසා අවශ්‍ය තවත් එක්තරා පියවරක් විධියටයි, අද දින මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට රැගෙන ඒම මා දකින්නේ.

මොකද, පසුගිය අවුරුදු දෙක තුනේ මේ උත්තරීතර සභාවට ගෙනා හැම පනත් කෙටුම්පතක් ගැනම කොරහේ කිඹුල්ලු දකිනවා වාගේ සමහර අය දකින ආකාරය අපි දැක්කා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එදා මේ පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කරන විට විපක්ෂයේ කවුරුවත් මේ පනත් කෙටුම්පතේ වටිනාකම ගැන කථා කළේ නැහැ. හැබැයි, අද ඒ පනතේ තිබෙන වටිනාකම ඔවුන්ට අවබෝධ වෙලා තිබෙනවා. 1990 ගිලන් රථ සේවය මේ රටට ගෙන එන කොට "ඉන්දියාවේ 'රෝ' ඔත්තු සේවය එනවා. මේ රටේ අහිංසක රියැදුරෙකුට කරන්න තිබෙන රැකියාව නැති වනවා. ඉන්දියාවේ ඔත්තුකරුවන් මේ එන්නේ" කියලා ඒ දෙස මහා කැත විධියට දැකපු විපක්ෂයක් තමයි අද අපේ රට නියෝජනය කරන්නේ කියන එක මේ රටේ ජනතාව දැක්කා. හැබැයි, අද ඒවා ඔවුන්ට අමතක වෙලා තිබෙනවා. එක එක දේශපාලනඥයන්ගේ වුවමනා එපාකම් වෙනුවෙන්, එක එක දේශපාලන අරමුණු වෙත ගිය සමහර උන්මත්තක නායකයන්ගේ ඕනෑ එපාකම් වෙනුවෙන්, තමන්ගේ අයිතිය අහිමි කර ගත් මිනිසුන් වෙනුවෙන්, මේ රටේ වග කියන රජයක් විධියට ගෙනෙන මේ 'හානිපූරණය සඳහා වන කාර්යාලය' පනත් කෙටුම්පත සම්මත කර ගන්න වෙලාවේ මීට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමා කරපු විග්‍රහය අපි දැක්කා. එතුමා ඉන්නේ මොන ලෝකයේද කියලා කියන්න මම දන්නේ නැහැ. 71 මේ රටේ තරුණයන් බිල්ලට දීලා, 88 තරුණයන් බිල්ලට දෙන කටයුත්තේ සාමාජිකයකු වුණ එතුමා මෙතැන කෑ ගහනකොට මේ රටේ කී දෙනෙකු එය අහගෙන ඉන්නවාද? මෙහෙම කථා කරන්නේ එල්ටීටීඊ සුද්ද කරන්නද, වෙන කවුරුන් හෝ වෙනුවෙන්ද කියන කාරණය අපට අදාළ වන්නේ නැහැ. එය මේ රටේ සෑම සාමාන්‍ය පුරවැසියකුටම අයිති දෙයක්. මේ කාලය, රජයක් විධියට මේ වාගේ ප්‍රගතිශීලී යෝජනාවන් ගෙන එන එක ගැන කල්පනා කරන්න ඕනෑ කාලයක් කියලා මම හිතනවා. මුස්ලිම් ඡන්ද ටික තමන්ගේ ගොඩට දා ගන්නද හදන්නේ, දෙමළ ඡන්ද ටික තමන්ගේ ගොඩට දා ගන්නද හදන්නේ ආදී වශයෙන් විකාරරූපී විධියට හිතන ගොබ්බ මානසිකත්වයක් තිබෙන කෙනෙකුට හිතන්න පුළුවන්, "මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ එල්ටීටීඊය සනසන්න" කියලා. මහත්වරුනේ, පපුවට තට්ටු කරලා මේ ගැන අහන්න කියලා අපි කියනවා. 1988 අහිංසක ජීවිත කීයක් බිලි ගත්තාද, අම්මලා තාත්තලා කී දෙනෙකුට තමන්ගේ දරුවන් නැති වුණාද, දරුවන් කී දෙනෙකුට තමන්ගේ අම්මලා තාත්තලා නැති වුණාද? නමුත් ඊට පස්සේ ආපු කිසිම රජයක් ඒ ගැන හොයා බැලුවාද? නැහැ. එල්ටීටීඊය නිසා හානියට පත් වුණු අහිංසක මිනිසුන් කොච්චර දකුණේ ඉන්නවාද? උතුරේ ඉන්න සියලු දෙනා "කොටි" කියලා හඳුන්වපු, උතුරේ ඉන්නේ සියලු දෙනා එල්ටීටීඊකාරයන් වශයෙන් හඳුන්වමින් ගෙනා පනත් කෙටුම්පතක් විධියට මේ පනත් කෙටුම්පත අර්ථ නිරූපණය කරන්න තරම් දුර්වල මානසිකත්වයක් තිබෙන දේශපාලනඥයන් එක්ක අපට ඉන්න සිදු වීම ලොකු කනගාටුවක් කියලා මම මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි. හැම දෙයක් කෙරෙහිම තමන්ගේ දේශපාලන කුණු කෝණයෙන් බලන තුරු, මේ රටේ මිනිසුන් බලාපොරොත්තු වන නිවැරැදි, වැදගත්, ප්‍රගතිශීලී ගමනක් යන්න බැහැ කියන කාරණය මේ රටේ ජනතාව සිහිපත් කර ගන්න ඕනෑ. හැම වෙලාවේම තිබෙන්නේ වෛරය, ක්‍රෝධය වාගේම තමන්ගේ ගොඩ වැඩි කරගෙන දේශපාලනික වශයෙන් තමන්ගේ අරමුණ කරා යන ගමන. ඒ නිසා මේ රටේ ජනතාව ඒ ජාතියේ අයට 2015 ජනවාරි 08 වැනිදා උත්තරයක් ලබා දුන්නා. නැවත ඒ ගමන යන්න උත්සාහ කළාට මේ රටේ ජනතාව ඒ මෝඩ, ජනතා විරෝධී ගමන යන්න අවස්ථාව සලසා දෙන්නේ නැහැ කියන කාරණයත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

අද ගෙනෙන මේ පනත් කෙටුම්පත, සාමාන්‍ය ජනතාවට වාගේම මුළු රටටම වග කියන රජයක් විධියට ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් කියලා මම සඳහන් කරන්න කැමැතියි. මේ රටේ නැවතත් යුද්ධයක් ඇති නොවෙන්න, නැවතත් ජාතිවාදී බේද මේ රටේ ඇති නොවෙන්න ගෙනා පනත් කෙටුම්පතක් විධියට මේ පනත් කෙටුම්පත හඳුන්වන්න පුළුවන්. අපි රජයක් විධියට රටේ ජනතාවට තවදුරටත් මේ රජය කරන්න පුළුවන් වන ආකාරයට යහ පාලන යෝජනා ඉදිරියටත් ගෙනෙනවාය කියන කාරණයත් මතක් කරමින් මගේ වචන කීපය අවසන් කරනවා.

[අ.භා. 5.43]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත අද එන්නේ අපිම එකතු වෙලා සම්මත කළ ජිනීවා සම්මුතිය අනුව කියලා අපි කවුරුත් දන්නවා. එහෙම නොවෙයි නම් මේ වාගේ දෙයක් එන්නේ නැහැ. අපේ රටේ ඉතාම ප්‍රබල ත්‍රස්තවාදී අරගළයක් නිමා කළ එක ගැන අද කවුරුත් පිළිගන්නේ නැහැ. අද කථා කරන්නේ "එවැනි දෙයක් සිදු වුණේ නැහැ. එවැනි දෙයක් මතක නැහැ. නමුත් යම්කිසි හේතුවක් නිසා ඇති වුණු ගැටුමක් හේතුවෙන් අසාධාරණයට ලක් වුණු පිරිසකට - ඒ කියන්නේ ත්‍රස්තවාදියා අසාධාරණයට ලක් වුණු තැනැත්තෙක්. ඒ තැනැත්තාට, - කොහොමද, අපි සලකන්නේ" කියන එක ගැනයි.

මමවත්, මේ කවුරුන්වත් ජාතිවාදීන් නොවෙයි. මෙතැන විරුද්ධ පක්ෂයේ සිටින අපි කිසිම කෙනෙක් ජාතිවාදි ස්වරූපයන් අනුමත කරන්නේ නැහැ. හැබැයි, අපි ඉතාම බිහිසුණු කාලයක් ගත කෙරුවා. එසේ බිහිසුණු කාලයක් ගත කළ අපි රජයක් හැටියට නැවත ඒකීය, නිදහස්, සාමකාමී රටක් හදා තමයි තමුන්නාන්සේලාට මේ රට ලබා දුන්නේ. එසේ ලබා දුන්නත් අද කථා කරන්නේ ඒ පිළිබඳව කිසිම දෙයක් දන්නේ නැහැ වාගේයි. ඇත්ත කථා කරලා ඒ අනුව "මෙන්න මෙහෙම කරමු" කියලා යෝජනා කළා නම් වඩා හොඳයි කියලා මා හිතනවා. එතකොට අපි කාටත් මේකට එකඟ වෙන්න පුළුවන්.

ප්‍රධාන වශයෙන් මෙම පනත් කෙටුම්පත ඇතුළේ හරිම ගුප්ත දෙයක් තිබෙනවා කියලා මා අදහස් කරනවා. මට තවම ඒක තේරුම් ගන්න බැහැ. මෙම පනත් කෙටුම්පතෙහි සඳහන් "උතුරු නැගෙනහිර පළාත් දෙක" කියන කොටස ඉවත් වෙනවාද, නැද්ද

කියලා අපට තවම පැහැදිලි නැහැ. ඇමතිතුමා ඒ ගැන පැහැදිලි කිරීමක් කළේ නැහැ. ඒක, එක කාරණයක්. ඊළඟ, කාරණය මේකයි. මේ රටේ මීට කලිනුත් සන්නද්ධ අරගළ තිබුණා. ඒ අය සම්බන්ධයෙන් මේ පනත් කෙටුම්පතින් යම් කිසි ආකාරයක සහනයක් ලැබෙනවාද කියලා අපට කිසිම දැනුවත්කමක් ඇති වුණේ නැහැ. මේ පනත් කෙටුම්පතට අනුව ආචිච්ලා, සීයලා, මුනුපුරාලා, මාමණ්ඩිවරු, මස්සිනාවරු, නැනාවරු, බෑනාවරු ගැන කියලා තිබෙන නිසා, මේක පොඩ්ඩක් උඩට ගෙනිහින් ඒ කට්ටියත් මේකට සම්බන්ධ කර ගත්තොත් හොඳයි කියලා මම විශ්වාස කරනවා. මොකද, ඒ ගොල්ලන්ගේත් මුනුපුරු-මිනිබිරියෝත්, සීයලා-ආච්චිලාත්, නැන්දම්මලා-මාමණ්ඩිලාත් ඉන්නවා; මේ පාර්ලිමේන්තුවේත් ඉන්නවා. ඒ නිසා ඒ අයත් සම්බන්ධ කර ගත්තොත් හොඳයි. 1971 කැරැල්ලට සම්බන්ධ වූ දෙපැත්තම ගැන කල්පනා කරන්න ඕනෑ; 88-89 කැරැල්ලට සම්බන්ධ වූ දෙපැත්ත ගැනත් කල්පනා කරන්න ඕනෑ. ඒ අය දකුණේ නිසා එක කණ්ඩායමක් අමතක කරලා අනෙක් අයට විතරක් සහන ලබා දුන්නාම රටේ සංහිඳියාව ඇති වෙනවා කියලා කවුරුහරි කියනවා නම්, මම නම් ඒක පිළිගන්නේ නැහැ.

ඊළඟට, මට දැන ගන්න අවශ්‍ය වැදගත්ම දෙය මේකයි. මේකේ හරිම අපූරු වගන්තියක් තිබෙනවා. ඒ තමයි මේ තුළින් ලබා දී තිබෙන බලතල සහ කාර්යය ඉටු කරන කොට, කවුරුහරි ප්‍රතිවිරෝධය පානවා නම්, බාධා කරනවා නම්, කාර්යාලයට අයුතු ලෙස බාධා කරනවා නම්, එම කාර්යාලයට අසත්‍ය තොරතුරු දෙනවා නම්, පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් රහස්‍ය තොරතුරු හෙළි කරන්නේ නම් එවැනි තැනැත්තන් හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධිකාරි බලයට අපහාස කිරීමේ වරදට වරදකරු විය යුතුයි කියලා මෙහි සඳහන් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
එහෙමයි. මේක කොහේටද, යන්නේ? මේ අපහාසය අභියාචනාධිකරණයට විරුද්ධව කරන ලද අපහාසයක් හැටියට සලකා අභියාචනාධිකරණය ඉදිරියේ නඩු පවරන්න ඕනෑ. මොකක්ද, මේ කරන්න හදන්නේ? මේ කාර්යාලයේ කරන කිසිම දෙයකට මොනම ආකාරයේ හෝ විරුද්ධතාවක් දැක්වුවොත්, ඒ අයට පුළුවන් එය අපහාස කිරීමක් හැටියට සලකා අභියාචනාධිකරණය ඉදිරියේ නඩුවක් පවරන්න. ලෝකයේ මෙහෙම පනතක් තිබෙන්නේ කොහේද? ලංකාවේ තිබෙන මෙවැනි එක පනතක් මට පෙන්වන්න. මීට වඩා භයානක පනත් ලංකාවේ තිබෙනවා. රජයේ නිලධාරියෙක් හැටියට කාර්යාලයක සේවය කරන කෙනෙකුට විනිශ්චයකාරවරයෙකුගේ බලතල ආරෝපණය කරලා තිබෙන, එවැනි කෙනෙකුට අපහාස කිරීම අභියාචනාධිකරණයට අපහාස කිරීමක් සේ සලකා අභියාචනාධිකරණය ඉදිරියේ නඩු පවරන්න කියලා තිබෙන පනතක් මට පෙන්වන්න. මම හිතන විධියට මේ පනත් කෙටුම්පත ඇතුළේ හැංගිච්ච දේවල් ගොඩක් තිබෙනවා; පෙනෙන්නේ නැති ගොඩක් දේවල් තිබෙනවා. ඒ කියන්නේ මේ පනත් කෙටුම්පත ඇතුළේ එක්තරා පුද්ගලයින් කණ්ඩායමකට ඕනෑ කරන -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක්තරා පුද්ගලයින් කණ්ඩායමකටයි මේක කරන්න ඕනෑ. ඒ අවස්ථාවේදී අනෙක් අය ඒ සම්බන්ධව විරෝධය පෑවොත්, ඒ අයව හිරේ දමා මේ බලතල රැක දෙන්න තමයි මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ. අන්න ඒ පිළිබඳව අපේ දැඩි විරෝධය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රෝහිණි කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි හතරක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 5.47]

**ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳව අදහස් පළ කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මම සතුටු වෙනවා. මෙම පනත් කෙටුම්පත පිළිබඳව මතවාද පළ කිරීමේදී අපි ඉතාම සැලකිලිමත් වෙන්න ඕනෑ. මොකද, පටු වර්ගවාදි, ජාතිවාදි, ආගම්වාදි හැඟීම් තුළින් මේ දෙස බලා, දේශපාලන දෘෂ්ටිකෝණයකින් මේ දෙස බලා මෙය විග්‍රහ කරන්නට සමහරෙක් උත්සාහ ගන්නවා.

අද ලංකාවේ සිදුවෙන දේවල් ගත්තාම, හැම දෙයටම දේශපාලන වටිනාකමක්, මුහුණුවරක් දීමට පිරිසක් කටයුතු කරන බව පෙනී යනවා. මම හිතන විධියට ඒක අපේ රටේ අවාසනාව. බලයෙන් ඉවත් වෙච්ච දවසේ ඉඳලාම බලය ලබා ගැනීම සඳහා උත්සාහ කරන අන්තවාදින්, මෙම පනත් කෙටුම්පත උතුරු නැහෙනහිර සිද්ධ වෙච්ච අවාසනාවන්ත යුද්ධයෙන් පීඩාවට පත් වෙච්ච එල්ටීටීඊ හිතවාදි පිරිස්වලට සහන සලසන ප්‍රයත්නයක් ලෙස ලඝු කොට දක්වන්නට උත්සාහ දරනවා.

මීට පෙර කථා කළ මහත්වරුන් කථා කළේම, "එල්ටීටීඊය, කොටියා" කියන කණ්ණාඩියක් දමා ගෙනයි. මේ සම්බන්ධව එවැනි සමාජ මතවාදයක් ගොඩනඟන්න මේ අය මෙහෙම උත්සාහ දරනවා. නමුත් මෙම කෙටුම්පත මැනවින් අධ්‍යයනය කරන කෙනෙකුට පෙනී යනවා, එහෙම වෙන්නේ නැහැ කියන එක. මේ පනත් කෙටුම්පත තුළින් හානිපූරණයේ කාල රේඛාව පැහැදිලිව දක්වා තිබෙනවා.

මට පෙර කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, "මෙයින් සලකා බලන්නේ යුද්ධය පැවති කාලය ගැන විතරයි" කියලා. 1971 ඉඳලා 2018 දක්වා රට පුරා ඇති වුණ විවිධ සිදුවීම් තුළින් ජීවිත, දේපොළ හානිවූවන්ගේ පවුල් සඳහා සහන සැලසීම පිළිබඳව මේ තුළින් සාකච්ඡා වෙනවා. දශක තුනක සිවිල් යුද්ධය, 1971 කැරැල්ල, 88-89 කැරැල්ල, බන්ධනාගාර තුළ සිදු වූ ඝාතන, ජන වාර්ගික අරගළ නිසා සිදු වූ ජීවිත හා දේපොළ හානි සඳහා වන්දි ගෙවීමට මේ තුළින් අවස්ථාව සැලසෙනවා. ඒ නිසා මම කියනවා, මෙය පටු දේශපාලනය සඳහා වෙනත් ආකාරයකට අර්ථ දක්වනවා නම්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, විනාඩියකින් කථාව අවසන් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එහෙම අර්ථ දක්වනවා නම් ඒක බරපතළ අසාධාරණයක්. මෙවැනි වැඩ පිළිවෙළක අවශ්‍යතාව පෞද්ගලිකවම දකින කෙනෙක්, මම. 88-89 භීෂණ සමයේ මගේ පියාගේ සහෝදරයා ඝාතනයට ලක් වුණා. ඒ අයගේ අසරණ වූ පවුල් සඳහා කිසිදු පිළිසරණක් ලැබුණේ නැහැ. ඒ වාගේම, ලග්ගල ප්‍රදේශයේ සියයකට ආසන්න මගේ ඥාතීන් පිරිසක් ඝාතනය වුණා. ඒ අය සඳහාත් කිසිම පිළිසරණක් ලැබුණේ නැහැ. ඒ වාගේම ඒ සන්නද්ධ අරගළයට සහභාගි වෙලා සිටි තරුණ පිරිස් විනාශ වෙලා ගියා. ඒ අයගේ දරු පවුල් සඳහාත් කිසිම පිළිසරණක්, වන්දියක් ලබා දීමට පියවර ගත්තේ නැත්තේ මෙවැනි ක්‍රමවේදයක් ඒ වෙන කොට සකස් වෙලා තිබුණේ නැති නිසායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, කථාව අවසන් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

මම විශ්වාස කරනවා අද ඉදිරිපත් වන මේ පනත් කෙටුම්පත, මේ ඓතිහාසික අතපසුවීම, වැරැද්ද නිවැරැදි කිරීමට ගත් උත්සාහයක් කියලා. ලංකාව බහු වාර්ගික, බහු භාෂාමය, බහු ආගමික රටක්; සමාජයක්. ඒ තුළ නීතියේ හිමිකම් සියලු දෙනාටම ලැබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවේ ඉතුරු කොටස මම **සභාගත*** කරනවා.

මම කියන්න ඕනෑ, යම් පීඩාවකට පත් වුණ අයෙකුට ඒ සඳහා සාධාරණය ඉටු කර ගත හැකි ක්‍රම කිහිපයක් තිබෙන බව. එයින් ප්‍රධාන වශයෙන්ම, තමන් පීඩාවට පත් කළ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කර ගැනීම වාගේම තමන්ට සිදු වූ හානියට අනුරූපව යම් වන්දියක් ලබා ගැනීමට කටයුතු කිරීම සඳහන් කරන්න පුළුවන්.

මම අවසාන වශයෙන් මේ වෙලාවේ ධම්මපදයේ ගාථාවක් මතක් කරන්න ඕනෑ.

ධම්මපදයේ සුබ වග්ගයේ මෙන්න මෙහෙම ගාථාවක් තිබෙනවා:

"සුසුඛං වත ජීවාම - වෙරිනෙසු අවෙරිනෝ
වෙරිනෙසු මනුස්සෙසු - විහරාම අවෙරිනෝ"

එහි අර්ථය, "වෛර සහිතව ජීවත්වන මිනිසුන් අතුරෙහි අපි වෛර රහිතව ඒකාන්තයෙන් ම සුවසේ ජීවත් වෙමු. අපි වෛරී මිනිසුන් මැද අවෛරී ව වෙසෙමු" කියන එකයි.

මේ පනත් කෙටුම්පත එවැනි මිනිසුන්ගේ උත්සාහයක් බව ප්‍රකාශ කරන අතර, ජාතිවාදීව හෝ තමන්ගේ බලය ලබා ගැනීමේ අවශ්‍යතාව මුදුන්පත් කරගැනීමේ අභිලාෂයෙන් මේ සියලු දේ දිහා බලන්න එපාය කියන කරුණ ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.52 ]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බොහොම වැදගත් පනත් කෙටුම්පතක් ගැන විවාදයකුයි මේ ගරු සභාවේ පැවැත්වෙන්නේ. විශේෂයෙන්ම අපි කියන්නට ඕනෑ, සත්‍ය වශයෙන්ම මේ පනත් කෙටුම්පතත් අර පෙරහැරේ ආපු තවත් එක පනත් කෙටුම්පතක් බව. අතුරුදහන් වූවන්ගේ පනත් කෙටුම්පත වැනි පනත් කෙටුම්පත් කිහිපයක් මේ ආණ්ඩුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අපේ හිටපු විදේශ කටයුතු ඇමතිතුමා කියන විධියට ජනාධිපතිතුමා දන්නේත් නැහැලු, අගමැතිතුමා දන්නේත්ත් නැතිලු, කැබිනට් එක දන්නේත් නැතිලු, ගිහිල්ලා 30/1 යෝජනාවට පක්ෂව අත උස්සලා ආවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ සංහිඳියාව, නීතියේ ආධිපත්‍යය, යහ පාලනය, මානව හිමිකම් මේ ඔක්කෝම දැන් කානුවේ දෝරේ ගලාගෙන යනවාය කියා අපට පෙනෙනවා. හැබැයි, මේවා එක තැනකවත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක තමයි තිබෙන බරපතළ ප්‍රශ්නය.

මේ පනත් කෙටුම්පත ගැන සලකා බලන කොට මෙහි මූලික අරමුණ තමයි, පීඩාවට පත් අයට සහන ලබා දීම. මම ගරු ඇමතිතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතෙහි 27වන වගන්තියේ තිබෙනවා, පීඩාවට පත්වුණු පුද්ගලයෝ කවුද කියන කාරණය. ඔබතුමා දැන් සංශෝධන ඉදිරිපත් කළා. අපට සංශෝධනයක් ලබා දීලා තිබෙනවා.

එහි සඳහන් වෙනවා, "5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න" කියලා. ඒකේ තිබෙන්නේ "සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක්" කියලා. පනත් කෙටුම්පතෙහි 22වෙනි පිටුවේ 27වන වගන්තියේ, 5වැනි පේළියේ තිබෙන්නේත්, "සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක්" කියලායි. මම දන්නේ නැහැ මේක කාට වැරදිලාද කියලා. ඒකට කිසිම සංශෝධනයක් නැහැ. එකම දේ තමයි ඒකේ තිබෙන්නේ. කරුණාකරලා,- [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන එකක් ගැන නොවෙයි මම කියන්නේ. ඔබතුමා දන්නවා, පනත් කෙටුම්පතක වඩාත් බලාත්මක වෙන්නේ සිංහල භාෂාවෙන් තිබෙන එක කියා. [බාධා කිරීමක්] ඒක තමයි, මම මේ කියන්නේ.

මේක වැරැද්දක්. මේක වැරැද්දක් කියන එක තමයි මම ඔබතුමාට කියන්නේ. මේක ලෝක වරද්දක්. ගරු ඇමතිතුමනි, කරුණාකරලා ඒක නිවැරදි කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, මේ පනත් කෙටුම්පතේ II වන කොටසේ 11.(1)හි මේ කාර්යාලය සතු බලතල ගැන සඳහන් වෙනවා. හානිපූරණය සඳහා වන කාර්යාලයට පත් කරන නිලධාරීන්ට තමයි මේකෙන් සම්පූර්ණ බලතල දීලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා තමයි එම නිලධාරීන් පත් කරන්නේ. ඇත්තටම අපි දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දීපු මිනිස්සු. ඒ සම්බන්ධයෙන් අද අපි කනගාටු වෙනවා. මොකද, ඇත්තටම අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විහිළුවක් වෙලා තිබෙන නිසා. මේ රටේ ජනාධිපතිවරයා බලයට ගේන්න කටයුතු කරපු උදවියගේ කණ්ඩායමෙන් සැදුම්ලත් එකක් තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඒකෙන් කරන පත්වීම් පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත තමයි වර්තමාන පොලිස්පතිවරයා පත් කළේ. අගමැතිවරයා එක තැනකට ගිහිල්ලා "ලෝකයේ ඉන්න හොඳම පොලිස්පතිවරයා අපේ රටේ ඉන්නවා" කියලා කියන කොට, අපේ රටේ ජනාධිපතිවරයා කියනවා, "මේ රටේ පොලිස්පතිවරයා ජෝකර් කෙනෙක්, විහිළුකාරයෙක්" කියලා. එතකොට අපි කවුරු කියන එකද පිළිගන්නේ? මේ රටේ ජනාධිපති එකක් කියනවා, අගමැති තව එකක් කියනවා. මෙන්න මේ වාගේ ව්‍යවස්ථා සභාවකින් නම් මේ කාර්යාලයටත් නිලධාරීන් පත් කරන්නේ, ඇත්තටම අපට ඒ පත්වීම් එක්ක එකඟ වෙන්න බැහැ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, මේක සම්පූර්ණයෙන්ම මේ රටේ ජනතාව නොමඟ යවන්න කරන උත්සාහයක් බව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම තව කාරණයක් ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. මට කලින් කථා කළ මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ පනත් කෙටුම්පතේ "උතුරේ සහ නැඟෙනහිර" කියලා තිබුණාට මාතර වුණත්, කොහේ වුණත් වෙච්ච සිදුවීමක් සම්බන්ධයෙන් වන්දි ගන්න පුළුවන් කියලා. එහෙම නම් අපි අහනවා, මේ පනත් කෙටුම්පතේ තිබෙන, "උතුරු සහ නැඟෙනහිර පළාත්වල සිදු වූ" කියන කොටස ඔබතුමන්ලා ඉවත් කරන්නේ නැත්තේ ඇයි කියලා. එහෙම නම් ඒ වෙනුවට, "ශ්‍රී ලංකාවේ සිදු වුණු සන්නද්ධ ගැටුම් අතර තුර" කියලා ඔබතුමන්ලාට ආදේශ කරන්න පුළුවන්. එහෙම කරන්නේ නැතුව, "උතුරු හා නැඟෙනහිර පළාත්වල පමණක් සිදු වූ" කියන එකෙන් ඔබතුමන්ලා ව්‍යංගයෙන් අදහස් කරන්නේ, එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට වන්දි ගෙවීමට උත්සාහ කිරීමක් කියන එකයි අපි කියන්නේ.

එම නිසා මේ රටේ අහිංසක මිනිසුන්ගේ මුදලින් එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට උදවු කරන්න යෑම පිළිබඳව අපේ සම්පූර්ණ විරුද්ධත්වය ප්‍රකාශ කරනවාය කියන කාරණය සඳහන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
මම ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමැතියි, 1995දී මහනුවර දිස්ත්‍රික්කයේ ජේවීපී ත්‍රස්තවාදී කලබල කාලයේ ඝාතනය වුණු 50දෙනෙකුට මහින්ද විජේසේකර මැතිතුමා ඇවිල්ලා මගේ ප්‍රධානත්වයෙන් වන්දි දුන්නා. ඒ කාලයේ රුපියල් 50,000 ගණනේ දුන්නා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
දැන් කියක් දෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පොඩ්ඩක් අහගෙන ඉන්න. 1995දී මම ඒ ආණ්ඩුවේ ඇමතිවරයෙකු හැටියට ඉන්න කොට මහින්ද විජේසේකර මහත්මයා තමයි පුනරුත්ථාපන කටයුතු පිළිබඳ ඇමති. එදා මගේ ප්‍රධානත්වයෙන් මහනුවර නගරයේ රැස්වීමක් කැඳවලා 1988-1989 කාලයේ මියගිය 50දෙනෙකුට වන්දි මුදල් දුන්නා, රුපියල් 50,000 ගණනේ. මම අතීතය මතක් කරන්නේ. මේ ගැන වාදයක් ඕනෑ නැහැ. මේක තමයි 1994දීත් වුණේ. [බාධා කිරීම්] නැහැ, නැහැ. මම කියන්නේ 1994 තිබුණු ආණ්ඩුවෙනුත් වන්දි දුන්නා. ඒ රැස්වීමේ මූලාසනයේ සිටියේ මම. එතකොට ඔබතුමන්ලා සිටියේත් නැහැ. මොනවාද මේ කථා කරන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 3ක කාලයක් පමණයි තිබෙන්නේ.

[අ.භා.5.58]

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි "හානිපූරණය සඳහා වන කාර්යාලය" පනත් කෙටුම්පත ගැන කථා කරනවා නම්, විශේෂයෙන්ම අවුරුදු 30ක යුද්ධයක් පසුකර පැමිණි අපි, නැවත යුද්ධයක් ඇති නොවන ආකාරයට රට ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියන එක ගැන තමයි කථා කරන්න ඕනෑ. යුද්ධය ගැන කථා කරන කොට, යුද්ධය නිසා වූ, අපට නිවැරදි කරගත යුතුව තිබෙන අවශ්‍යතා තිබෙන බව අපි දැනගන්න ඕනෑ. විවිධ සමාජයීය අවශ්‍යතා තිබෙනවා. ඒ වාගේම, සමාජ ව්‍යුහයක් ගොඩනඟන්නේ කොහොමද කියන එක දැනගන්න ඕනෑ. ඒ එක්කම අපි ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩනඟන්න ඕනෑ. අපි සංහිඳියාවෙන් යුත් රටක් බිහි කරන කොට කලබලවලින් පීඩාවට පත්වූවන් නොසලකා හරින්න අපට බැහැ. ඒ අය උතුරේද, නැඟෙනහිරද කියලා අපි වර්ග කරලා නැහැ. යම් කලබලයක් වෙලා යම් අසාධාරණයක් වුණා නම්, සමස්ත ශ්‍රී ලංකාවේම ජනතාවට මේ සහනය ලැබෙන්නට ඕනෑ.

මේ රටේ ඇති වන කෝලාහල, ගැටුම්වලින් සිවිල් වැසියන්ට සිදු වන හානි පූරණයට තමයි මේ පනත් කෙටුම්පත සම්මත කිරීමට සූදානම් කර තිබෙන්නේ. ඇත්තටම මෙයින් උතුරු නැඟෙනහිර ප්‍රදේශවල අයට පමණක් වන්දි ගෙවීමට නොවෙයි සූදානම් වෙලා තිබෙන්නේ. එම කරුණ විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. හානිපූරණය මඟින් අපයෝජන පිළිගැනීම, වින්දිතයන් පුනරුත්ථාපනය කිරීම හා වින්දිතයන්ගේ අයිතීන් හා අභිමානය ප්‍රතිෂ්ඨාපනය කිරීම කර තිබෙනවා. වර්තමාන රජය ඉදිරිපත් කරන ලද මෙම පනත් කෙටුම්පත ගැන පමණක් විරුද්ධව කථා කරන්නේ ඇයි කියලා මම මේ අවස්ථාවේ අහන්න කැමතියි. පසු ගිය රජය කාලයේ හිටපු ජනාධිපතිතුමාත් උතුරු නැඟෙනහිර පුනරුත්ථාපනයට සහයෝගය ලබා දුන්නා. එදා "උතුරු වසන්තය" කියලා වැඩසටහනක් කළා. එල්ටීටීඊ

[ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය ]

සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීමට උදව් කරනකොට කවුරුවත් ඊට විරුද්ධව කථා කළේ නැහැ. හැබැයි, අද සමස්ත ශ්‍රී ලංකාවාසීන් වෙනුවෙන්ම මෙවැනි පනතක් ඉදිරිපත් කරනකොට ජාතිවාදය අවුස්සා ඒකට විරෝධය පානවා. අද සමස්ත ජනතාවටම ලැබී තිබෙන මේ අවස්ථාව- [බාධා කිරීමක්] මම කාටවත් බාධා කළේ නැහැ. කරුණාකර මට බාධා කරන්න එපා. අපි වෙච්ච වැරැදි ගැන නොවෙයි කථා කරන්න ඕනෑ. අපට උදාහරණයක් විධියට රුවන්ඩාවේ පැවැති සිවිල් ගැටුම සලකා බලන්න පුළුවන්. රුවන්ඩාව සිදුවුණු සියලු වැරැදි අමතක කර රටක් විධියට සෑහෙන්න ඉදිරියට ඇවිත් තිබෙනවා. අද රුවන්ඩාව කියන රට සාර්ථකත්වයට පත් වී තිබෙනවා. අද රුවන්ඩාව කාන්තාවන් බහුතරයක් විසින් තමයි පාලනය කරන්නේ. අද ගෙනාපු මේ පනත් කෙටුම්පත කාලෝචිත පනත් කෙටුම්පතක් කියා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේ දී ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.***

*අතන්පිටකු, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. HESHA WITHANAGE *took the Chair.*

[අ.භා. 6.02]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාම, අපි ඊට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ විශේෂයෙන් අපිත්, මා මිත්‍ර නීතිඥ පාලිත සේනාධීර මහත්මයාත් ජනාධිපති නීතිඥ මනෝහර සිල්වා මැතිතුමා මඟින් අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව, රටට හානිදායක ලෙස මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා කියලා කරුණු දැක්වීමක් කළා. ශ්‍රේෂ්ඨාධිකරණය එම කාරණය පිළිගත්තා. එම නිසා සමහර වගන්ති සම්මත වීමට තුනෙන් දෙකක ඡන්දයකුත්, ජනමත විචාරණයකුත් අවශ්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරණය කියා සිටියා. ඒ නිසා රටට එතරම් හානිකර සහ භයංකර පනත් කෙටුම්පතක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ සංශෝධන ඉදිරිපත් කරනවා කියලා කිව්වාට, අපට මේ ආණ්ඩුව තඹ සතයකටවත් විශ්වාස නැහැ. මේ ආණ්ඩුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දුන් තීන්දු ක්‍රියාත්මක නොකර, තමන්ට ඕනෑ විධියට සංශෝධන ඇතුළත් කරමින් හැම දාම රටට හානි කරපු ආණ්ඩුවක් බව මේ පනතට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ නඩු පවරපු මහජන නියෝජිතයකු විධියට මම කියනවා. මේ පනතේ ඇත්ත භයානක තත්ත්වය හෙළි කිරීම මේ ගරු මන්ත්‍රීවරු සියලුදෙනාගේ වගකීමක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේ, කොටි සංවිධානය නිසා හෝ සන්නද්ධ ගැටුම්වලින් හානියක් සිදු වූ විට වන්දියක් ගෙවීම මොකද වෙන්නේ කියලා අහුවා. වන්දි ගෙවීම පමණක් නොවෙයි. මේ පනත් කෙටුම්පතේ 23වැනි පිටුව බලන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වේලාව වෙන් කර තිබෙනවා, විමලවීර දිසානායක මන්ත්‍රීතුමා-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා කථා කරන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
එහෙම කරන්න බැහැ. ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි භයක කාලයක් මට ලබා දීලා තිබෙනවා. කාලය දීර්ඝ කර අපට කථා කරන්න වේලාව දෙන්න. මේ පනතට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය මන්ත්‍රීවරයා විධියටයි මම මේ කරුණු කියන්නේ. මෙම පනත් කෙටුම්පතේ තිබෙනවා, "ස්මාරක ඇතුළුව මිය ගිය තැනැත්තන් අනුස්මරණ ක්‍රම" කියලා.

දැන් හමුදා විරුවන්ගේ අනුස්මරණ ක්‍රම තිබෙනවා. ස්මාරක ඉදි කරලා තිබෙනවා. එහෙනම් මේ ස්මාරක හදන්න කියන්නේ කා වෙනුවෙන්ද? එල්ටීටීඊ කොටි ත්‍රස්තවාදීන්ටයි. මේ අනුස්මරණය කරන්න කියන්නේ එල්ටීටීඊ කොටි ත්‍රස්තවාදීනුයි. ඒවා කරන්නේ කාගේ මුදලින්ද? අද මධ්‍යම රාත්‍රියේ තෙල් මිල වැඩි වේවි. තෙල් මිල වැඩි කරලා අභිංසක මිනිසුන්ගෙන් ලබා ගන්නා බදු මුදල්වලින් තමයි, ජයශ්‍රී මහ බෝධීන් වහන්සේට පහර දුන්නු, දළ දා වහන්සේ වැඩ සිටින මාළිගාවට පහර දුන්නු, අරන්තලාවේ භික්ෂූන් වහන්සේලාට පහර දුන්නු මිලේච්ඡ කොටි ත්‍රස්තවාදීන් අනුස්මරණය කරන්න මේ ආණ්ඩුව මුදල් වෙන් කරන්නේ කියන එක අපි මේ රටේ ජනතාවට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මේ පනත් කෙටුම්පතේ සඳහන් වන ආකාරයට හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් අධ්‍යාපනික වැඩසටහන්, පුහුණු කිරීම් සහ

කුසලතා සංවර්ධන වැඩසටහන් පවත්වනවා. ඒක හොඳයි. නමුත්, මේ අධ්‍යාපන වැඩසටහන් මඟින් නැවත වතාවක් රට බෙදීම ප්‍රවර්ධනය කළොත්, ඒක නවත්වන්න පුළුවන්ද? ඒක නවත්වන්න බැහැ. ඒකයි මගේ තර්කය. ඒ නිසා ආණ්ඩුවේ මුදල් යොදා ගෙන රට බෙදීම ප්‍රවර්ධනය **කරනවා** නම්, ආණ්ඩුව වෙනුවෙන් ඕනෑම දේශද්‍රෝහී ක්‍රියාවලියකට අත ඔසවන අය ඒකට වග උත්තර සපයන්න ඕනෑ. ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගේ ඡන්දවලින් අද මේ පනත් කෙටුම්පත සම්මත කර ගනීවි. හැබැයි, අපි මේ රටේ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, මේ දේශද්‍රෝහී පනත් කෙටුම්පතට අත ඔසවන මන්ත්‍රීවරුන් දිහා බලන්න, ඒ හැම මන්ත්‍රීවරයකුම පරාජය කරන්න කටයුතු කරන්නය කියලා.

ඊළඟට, මේ පනත් කෙටුම්පතේ 16වැනි පිටුවට මා අවධානය යොමු කරනවා. එහි සඳහන් වන ආකාරයට, මේ පනත යටතේ බලය පවරනු ලබන යම් නිලධරයකුට තමා වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රතිරෝධය දක්වනවා නම්, සිය බලතල සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අයුතු ලෙස බලපෑමක් කරනවා නම්, එම තැනැත්තා එම කාර්යාලයට අපහාස කළා, අභියාචනාධිකරණයට අපහාස කළා කියා සැලකීමෙන් ඔහුව සිර භාරයට පත් කරන්න පුළුවන්. එහෙම නම් කොටි හෝ ඊලාම්වාදී ව්‍යාපාරය, රට බෙදන ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ අධ්‍යයන වැඩපිළිවෙළක් මේ කාර්යාලය මඟින් සිදු කළහොත් එය නවත්වන්න පුළුවන්කමක් තිබෙනවාද? එයට විරෝධය පළ කරන්න පුළුවන්කමක් තිබෙනවාද? එසේ විරෝධය පළ කළොත් ඒ තැනැත්තන්ව අත්අඩංගුවට ගන්න, අභියාචනාධිකරණයට අපහාස කළායි කියලා නඩු පවරන්න ඔවුන්ට හැකියාව ලැබී තිබෙනවා. "ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන්" කියලා කියපු නරුම දේශපාලනඥයන්ට නම් මේවා විහිළුවට කථාන්දර වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත වෙනුවෙන් පෙනී සිටින තිලක් මාරපන මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේ දී කිව්වා, මේ රටේ පොලීසිය කරපු නින්දිතම ක්‍රියාදාමය 2001 රනිල් වික්‍රමසිංහ මහතාගේ ආණ්ඩුව යටතේ මීල්නියම්සිටි හමුදා කඳවුර පාවා දීම බව. මේ රටේ ඉතිහාසයේ පොලීසිය කරපු නරකම දේ ඒකයි කියලා, එම ගරු ඇමතිතුමා මේ සභාවේ ප්‍රකාශ කළා. ඒ නිසා මේ රටේ යුද්ධය වෙනුවෙන් පෙනී සිටි රණ විරුවන් දංගෙඩියට යවන්න, සිර ගෙවල්වල දමා වධ බන්ධන දෙන්න කටයුතු කරමින්, ත්‍රස්තවාදීන් පිනවීම සඳහා කටයුතු කරන්නේ වෙන මොනවත් නිසා නොවෙයි, ඡන්දය ලබා ගැනීම සඳහායි. අද මොවුන්ගේ පැවැත්ම තිබෙන්නේ එසේ ලබා ගත් ඡන්ද ටිකකින් විතරයි. මේ රටේ බහුතර මිනිසුන්ගේ ඡන්දය අද එක්සත් ජාතික පක්ෂයට දෙන්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වාගේ දේශීය, ජාතික මතවාදයක් දරපු ව්‍යාපාරයක නායකයින් මේ පනත් කෙටුම්පතට අද අත ඔසවනවා නම් ඒක තමයි මේ රටට කරන ලොකුම නින්දාව. ඒ ගැන අපි කනගාටු වෙනවා. ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කියනවා, මංගල සමරවීර මැතිතුමා ඇමෙරිකාවට, ජිනීවා නුවරට ගිහිල්ලා 30(1) යෝජනාව යටතේ ඉදිරිපත් කරපු යෝජනා ගැන දන්නේ නැහැ කියලා. සරත් ෆොන්සේකා මැතිතුමා කියනවා, "එවැනි යෝජනා තිබුණාද කියලා අපි දන්නේ නැහැ. එහෙනම් අපි විරුද්ධ වෙනවා" කියලා. මේ ආණ්ඩුව නියෝජනය කළ සුසිල් ප්‍රේමජයන්ත හිටපු ඇමතිතුමා කියනවා, "කැබිනට් මණ්ඩලයට ජිනීවා යෝජනාව ගෙනාවේ නැහැ" කියලා. එහෙනම් හැමදාමත් හිතුවක්කාර ලෙස වැඩ කරපු, දේශද්‍රෝහී වැඩ කරපු, දේශද්‍රෝහින් විසිනුයි අද මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ. අද ඒ අය කියනවා, අපි මේවාට විරුද්ධව කෑ ගහන්නේ ඡන්ද ලබා ගැනීම සඳහායි කියලා.

ඡන්ද ලබා ගැනීම සඳහා තමයි රටට හානිකර, රටට විරුද්ධ මෙවැනි යෝජනා ගෙනෙන්නේ. දවසින් දවස මේ යෝජනා ගෙනෙන්නේ ඒකයි. මේ වන්දි ගෙවන්න සූදානම් වෙන්නේ කාටද කියලා අපි දන්නවා. කවුරු සඳහාද මේ වන්දි ගෙවන්න සූදානම් වෙන්නේ? ලංකා ඉතිහාසයේ නැති කරුණු තමයි මේ යෝජනාවේ තිබෙන්නේ. මෙන්න! වන්දි ගෙවීම් සඳහා යෝජනා කරන කණ්ඩායම්. කලත්‍රයා, ළමයින්, දෙමවුපියන්, සහෝදර-සහෝදරියන්, නැන්දනියන්, මාමණ්ඩියන්, බෑනාවරුන්, නෑනාවරුන්, මුනුපුරු-මිනිබිරියන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කාලය අවසානයි. ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ඒ නිසා මෙවැනි හිතුවක්කාර ලෙස රටට හානිකර, දේශද්‍රෝහී පනත් කෙටුම්පත් සම්මත කර ගැනීම සඳහා අත ඔසවන මිනිසුන්ට විරුද්ධව ඡන්දය දෙන්න කියලාත්, මේ පනත් කෙටුම්පත ජයග්‍රහණය කළොත් ඊට සහාය දෙන මන්ත්‍රීවරුන් පරදවන්න කටයුතු කරන්න කියලා මේ රටේ ජනතාවගෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ජාතිකත්වය සහ ජාතීන් අතර ප්‍රශ්න තුළ -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*අතන් පිටකු, මාණ්පුමිකු හේසා විතානකේ අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ් තලైමை වකිත්තාර්කළ්.*

*Whereupon* THE HON. HESHA WITHANAGE *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 6.11]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතිකත්වය සහ ජාතීන් අතර ප්‍රශ්න තුළින් තමන්ගේ දේශපාලනය ජීවත් කරවීම සඳහා උත්සාහ දරන සමහර දේශපාලන කණ්ඩායම්වලට අද ඉදිරිපත්

[ගරු චමින්ද විජේසිරි මහතා]

කර තිබෙන මේ හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත අමෘතයක් සේ සලකනවා ඇති. සිසිර ජයකොඩි මන්ත්‍රීතුමනි, ඔබතුමා අහනවා; ඔබතුමා කියනවා, මේ ගෙවන්න හදන්නේ කාටද කියලා. මම පෙන්වා දෙන්නම්. ඔබතුමන්ලා දැක්කේ නැද්ද මේ හානිපූරණ කාල රේඛාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2012දී බන්ධනාගාරයක් තුළ සමූල ඝාතනයක් සිදු වෙනවා. මේ ඝාතන සැලැස්ම කුමක් නිසා සිදු වෙනවාද කියන කාරණය අද සමාජය, රටම දන්නවා. හැබැයි, මේ ඝාතන සියල්ලට සම්බන්ධ වුණු කණ්ඩායම කවුද; ඒ පුද්ගලයා කවුද කියලා එදා දැක්කේ නැහැ. එදා පෙනුණේ නැහැ. මේවා සිදු වුණේ ඇයි? යම් දේශපාලන අරමුණක්, යම් පුද්ගලයකුගේ අරමුණක්, පුද්ගල කණ්ඩායමකගේ අරමුණක් වෙනුවෙන් අහිංසක රැඳවියන් ඝාතනය කිරීමට ලක් කළාය කියන කාරණය අද එම කණ්ඩායමට අමතක වෙලා තිබෙනවා. ඒ සඳහා භාජනය වුණු කණ්ඩායමට ලක්ෂ 20ක මුදලක් ගෙවන්න අද මේ පනත් කෙටුම්පත තුළින් අනුමත වෙනකොට ඒක වැරැද්දක්ද කියන කාරණය අපි අහනවා. ඒක සිදුකළ කණ්ඩායමට අපි කියනවා, හෘදය සාක්ෂියෙන් අහලා බලන්න කියලා. ඒක වැරැද්දක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2014දී සිදුවීමක් සිදු වෙනවා. ඒ මොකක්ද? ජනවාර්ගික අරගළයක්. ඒ තමයි අලුත්ගම-බේරුවල සිදුවීම. මේක ඇති කළේ කවුද? එදා ඒ ජාතික ප්‍රශ්නය ඇති කරලා, ඒ ජාතික ප්‍රශ්නය නිර්මාණය කළ උදවිය අද ඇවිල්ලා කියනවා, "ඒකට වන්දි ගෙවන්න එපා" කියලා. තමුන්නාන්සේලා එදා උත්සාහ දැරුවේ ජාතීන් අතර ප්‍රශ්නයක් ඇති කරලා තමන්ගේ දේශපාලන අරමුණු ඉෂ්ට කර ගන්නයි. තමුන්නාන්සේලාගේ ඒ අරමුණ තුළින් නිර්මාණය වුණු කණ්ඩායම්වලට වන්දි ගෙවන්න - හානිපූරණය ගෙවන්න- අපි සූදානමින් ඉන්නවා. මොවුන් උත්සාහ දරනවා, මේක එල්ටීටීඊ සංවිධානය සඳහා ගෙවනවාය කියන කාරණය පෙන්වා දෙන්න. එහෙම නැහැ. තමුන්නාන්සේලා අතින් දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදු වූ සියලු හානිපූරණය සඳහා ගෙවන්න අපේ අණ්ඩුව හැටියට අපි කටයුතු කරනවා. එපමණක් නොවෙයි, 2018 දී දිගන ප්‍රදේශයේ සිදුවීම ඇති කළේ කවුද? එහි අරමුණ මොකක්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ ඒ සිදු වූ සියල්ලටම වන්දි ගෙවීම සඳහායි. ඒ වැරදි නිවැරදි කිරීම සඳහා අවස්ථාවක් අපි සලසා තිබෙනවාය කියන කාරණය අපි නිර්භයව කියනවා. මේ පනත් කෙටුම්පත තුළින් එදා ආණ්ඩුව කළ සියලු වැරදි නිවැරදි කිරීමට කටයුතු කිරීම පිළිබඳ ගරු අග්‍රාමාත්‍යතුමාට මගේ ප්‍රශංසාව පුද කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු (ආචාර්ය) එස්.එම්. මොහොමඩ් ඉස්මායිල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[පි.ප. 6.14]

**ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**
(මාණ්පුමිකු (කලානිති) சீ.மு. முகம்மட் இஸ்மாயில்)
(The Hon. (Dr.) S. M.Mohamed Ismail)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இழப்புக்கான எதிரீடுகள் பற்றிய அலுவலகம் சட்டமூலம் சம்பந்தப்பட்ட விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மிகவும் சந்தோசமடைகின்றேன். இந்தச் சட்டமூலத்தில் பல்வேறுபட்ட நல்ல விடயங்கள் உள்ளடக்கப்பட்டிருக்கின்றன. அதேநேரம், இங்கு சில விமர்சனங்களும் முன்வைக்கப்பட்டிருக்கின்றன. இதன் அடிப்படையில் வடக்கு, கிழக்கில் மாத்திரமல்லாமல், இலங்கையின் அனைத்துப் பகுதிகளிலும் பாதிக்கப்பட்ட வர்களுக்கு இழப்பீடுகள் வழங்கப்படவிருக்கின்றன. அந்த வகையில், 1971ஆம் ஆண்டிலிருந்து இன்றுவரை இடம்பெற்ற இனமோதல்கள், முரண்பாடுகளின்போது பாதிக்கப்பட்டவர் களுக்கு இழப்பீடுகள் வழங்கப்படும் என்ற ஒரு நல்ல செய்தி இங்கு தெரிவிக்கப்பட்டிருக்கின்றது.

வடக்கு, கிழக்கிலும் ஏனைய பகுதிகளிலும் தனிப்பட்ட வர்களின் பல்வேறுபட்ட சொத்துக்கள் இழக்கப்பட்டிருக் கின்றன. அவற்றுக்கான இழப்பீடுகளை வழங்கவேண்டிய ஒரு தேவையிருக்கின்றது. ஏனெனில், பல்வேறுபட்ட தொழில் முயற்சிகள், தனிப்பட்டவர்களின் சொத்துக்கள் அழிக்கப் பட்டதன் காரணத்தினால், இந்த நாட்டில் இன நல்லிணக் கத்திற்குப் பதிலாக இனமுறுகல் காணப்பட்டுவந்தது. இந்த நாட்டில் இருக்கின்ற மக்களிடையே சமாதானத்தையும் நல்லிணக்கத்தையும் ஏற்படுத்துவதற்கான ஒரு நல்ல வாய்ப்பை இந்தச் சட்டமூலம் ஏற்படுத்தும் என்ற நம்பிக்கை எனக்கிருக்கின்றது. அந்த அடிப்படையில், இந்த வாய்ப்பைப் பயன்படுத்திக்கொள்ள வேண்டும். கடந்த காலங்களில் இந்த நாட்டில் ஏற்பட்ட அசௌகரியங்களுக்காகவேண்டி எதிர்வரும் காலத்தில் இந்தச் சட்டத்தின்மூலம் இழப்பீடுகள் வழங்கப்பட வேண்டும். அதுமாத்திரமல்லாமல், வடக்கு, கிழக்கில் இருக்கின்ற மக்களின் பல்வேறுபட்ட உரிமைகள் மீறப் பட்டிருக்கின்றன; சொத்துக்கள் இழக்கப்பட்டிருக்கின்றன; காணிகள் பறிக்கப்பட்டிருக்கின்றன. அந்தக் காணிகளை மீட்கமுடியாமல் இருக்கின்றனர். இவ்வாறான தேவைகளைக் கருத்திற் கொண்டு எதிர்வரும் காலங்களில் இந்தச் சட்டத்தை அமுல்படுத்துகின்றபோது, எதுவித பக்கச்சார்பும் இல்லாமல் சரியான முறையில் அமுல்படுத்துவீர்கள் என்ற நம்பிக்கை யோடு வாய்ப்பளித்தமைக்கு நன்றிகூறி, விடை பெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Thank you. The next speaker is the Hon. Velu Kumar. You have two minutes.

[පි.ප. 6.16]

**ගරු වේලු කුමාර් මහතා**
(මාණ්පුමිකු වේලු කුමාර්)
(The Hon. Velu Kumar)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நன்றி. இழப்புக்கான எதிரீடுகள் பற்றிய அலுவலகம் சட்டமூலமானது இன்றைய காலகட்டத்தினுடைய ஒரு முக்கிய தேவையாக இருக்கின்றது. குறிப்பாக, கடந்த காலங்களில் ஏற்பட்ட தவறைத் திருத்திக்கொண்டு நாட்டிலே இன்று தேவைப்படுகின்ற சமாதானத்தையும் நல்லிணக்கத்தையும்

முன்னெடுப்பதற்குரிய ஓர் அடித்தளமாக இது அமையப் போகின்றது. இதற்குப் புலிச் சாயம் - LTTE சாயம் பூசி, இந்த விடயத்தைப் பிழையான ஒன்றாக எடுத்துக்காட்ட முயல்வது, இந்த நாட்டை மேலும் பாதாளத்துக்குக் கொண்டு செல்கின்ற செயற்பாடாகும். 1971இல் அல்லது 1983இல் ஏற்பட்ட கலவரங்களின் பின்னர் நாங்கள் எங்களைத் திருத்திக் கொண்டிருந்தால், கடந்தகால வரலாற்றில் வடக்கு, கிழக்கிலே ஏற்பட்டிருந்த அந்தப் பாரிய இழப்பை சந்தித்திருக்க வேண்டிய நிலை ஏற்பட்டிருக்காது. வடக்கு, கிழக்கில் ஏற்பட்ட அந்தப் பாரிய இழப்பே இந்த நாட்டின் வரலாற்றில் ஏற்பட்ட மிகப் பெரிய இழப்பாகும். ஆகவே, சம்பந்தப்பட்டவர்களுக்கு இந்த இழப்பீட்டைப் பெற்றுக்கொடுப்பது எந்த வகையில் தவறாகும்? என்று நான் இந்த இடத்திலே கேட்க விரும்புகின்றேன். இன்று அங்கே வாழ்பவர்கள் விடுதலைப் புலிகள் - LTTE இனர் அல்லர். இலங்கை நாட்டுப் பிரஜைகளான எமது நாட்டு மக்கள்தான் அங்கே வாழ்கின்றனர். சிங்களவர்கள், முஸ்லிம்கள், தமிழர்கள் என்பதைத் தாண்டி, இலங்கையருக்கு ஏற்பட்டிருக்கக்கூடிய அந்த இழப்பை ஈடுசெய்வதனூடாக நாட்டிலே ஒரு நல்லிணக்கத்தைக் கட்டியெழுப்புவதற்கான ஒரு செயற் பாடாகவே இது அமையும். அண்மையில், கண்டி திகன பகுதிகளிலே ஏற்பட்ட இழப்புகள் தொடர்பாகச் சரியானதொரு பொறிமுறை இல்லாததினால் அவர்களுக்கான இழப்பீடுகள் இன்னும் கிடைக்கப்பெறாமல் இருக்கின்றது. இந்தச் சட்டம் அவர்களுக்கும் இழப்பீடு வழங்குவதற்கும் இந்த நாட்டில் ஸ்தீரமான நல்லிணக்கம் ஏற்படுவதற்கும் வழிகாட்டியாக அமையுமெனவும் நாங்கள் எதிர்பார்க்கின்றோம். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත දෙවන වර කියවීම, සභාව එකඟද?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
විරුද්ධයි; Divide!

*බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු-*
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின்-*
*At the conclusion of the division bell-*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාවේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා කාලය දීර්ඝ කර ගැනීමට අවශ්‍යයි. ඒ සඳහා සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීවරුනි, දැන් ඔබතුමන්ලාගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

*මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.*
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)*
*(At this stage, the Voting commenced.)*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවාද? පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ අවස්ථාවට ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීතුමන්ලා ඡන්දය දෙන්නේ පක්ෂවද, විරුද්ධවද කියා කරුණාකර ප්‍රකාශ කරන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
විරුද්ධව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සෙයිඩ් අලි සාහීර් මවුලානා නියෝජ්‍ය අමාත්‍යතුමා. How do you vote?

**ගරු සෙයිඩ් අලි සාහීර් මවුලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Yes.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. D.M. Swaminathan, how do you vote?

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
Yes.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඡන්දය පාවිච්චි නොකළ වෙනත් ගරු මන්ත්‍රීතුමන්ලා ඉන්නවාද?

*ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-*
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඡන්දය ප්‍රකාශ කර අවසානයි. ඡන්ද ප්‍රතිඵල දැන් ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය වෙයි.

***මේ අවස්ථාවේ පහත සඳහන් නම් සහ ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***

*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது)*

*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 57: විරුද්ධව 42: වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***

*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 57: எதிராக 42: சமூகமின்மை 0.*

*According to Electronic Voting, Parliament divided: Ayes 57: Noes 42: Abstain 0.*

| | |
|---|---|
| G 003. Nimal Siripala de Silva | Yes |
| G 004. Gamini Jayawickrama Perera | Yes |
| G 006. Lakshman Kiriella | Yes |
| G 007. Ranil Wickremesinghe | Yes |
| G 009. Gayantha Karunatileka | Yes |
| G 010. Rauff Hakeem | Yes |
| G 015. Malik Samarawickrama | Yes |
| G 017. Tilak Marapana | Yes |
| G 019. Wajira Abeywardana | Yes |
| G 022. S.B. Nawinne | Yes |
| G 024. Patali Champika Ranawaka | Yes |
| G 025. Mahinda Amaraweera | Yes |
| G 027. Ranjith Siyambalapitiya | Yes |
| G 030. P. Harrison | Yes |
| G 033. Arjuna Ranatunga | Yes |
| G 035. Chandrani Bandara | Yes |
| G 039. Abdul Haleem | Yes |
| G 043. Faiszer Musthapha | Yes |
| G044. Ravindra Samaraweera | Yes |
| G 045. A.H.M. Fowzie | Yes |
| G 046. Piyasena Gamage | Yes |
| G 048. Lucky Jayawardana | Yes |
| G 050. Palitha Range Bandara | Yes |
| G 059. Wasantha Aluwihare | Yes |
| G 061. Sriyani Wijewickrama | Yes |
| G 063. Ajith P. Perera | Yes |
| G 064. Weerakumara Dissanayake | Yes |
| G 066. J.C. Alawathuwala | Yes |
| G 067. Muthu Sivalingam | Yes |
| G 077. Ashok Abeysinghe | Yes |
| G 085. Nalin Bandara Jayamaha | Yes |
| G 094. Anura Sidney Jayarathne | Yes |
| G 095. K.K. Piyadasa | Yes |
| G 098. Hector Appuhamy | Yes |
| G 103. Ashoka Priyantha | Yes |
| G 104. Velu Kumar | Yes |
| G 107. Kavinda Heshan Jayawardana | Yes |
| G 109. Mylvaganam Thilakarajah | Yes |
| G 110. Mayantha Dissanayake | Yes |
| G 111. Sujith Sanjaya Perera | Yes |
| G 112. Hirunika Premachandra | Yes |
| G 116. Imran Maharoof | Yes |
| O 007. Mavai S. Senathirajah | Yes |
| O 013. Dinesh Gunawardana | No |
| O 019. W.D.J. Senewiratne | No |
| O 020. Sumedha G. Jayasena | No |
| O 021. Selvam Adaikkalanathan | Yes |
| O 028. M.A. Sumanthiran | Yes |
| O 029. Gamini Lokuge | No |
| O 030. C.B. Ratnayake | No |
| O 031. Mahinda Yapa Abeywardena | No |
| O 032. Keheliya Rambukwella | No |
| O 033. Kumara Welgama | No |
| O 035. Johnston Fernando | No |
| O 037. Anura Priyadharshana Yapa | No |
| O 038. A.D. Susil Premajayantha | No |
| O 043. Kaveendiran Kodeeswaran | Yes |
| O 046. Gnanamuthu Srineshan | Yes |
| O 049. S.M. Chandrasena | No |
| O 050. Mahindananda Aluthgamage | No |
| O 051. Piyankara Jayaratne | No |
| O 055. Duleep Wijesekara | No |
| O 056. S.C. Mutukumarana | No |
| O 057. Lakshman Yapa Abeywardene | No |
| O 058. Chandima Weerakkody | No |
| O 060. Susantha Punchinilame | No |
| O 061. Ashu Marasinghe | Yes |
| O 062. Ishak Rahuman | Yes |
| O 063. Mujibur Rahuman | Yes |
| O 065. Arundika Fernando | No |
| O 066. Nimal Lanza | No |
| O 067. Wimalaweera Dissanayaka | No |
| O 068. Jayantha Samaraweera | No |
| O 069. P. Udayashantha Gunasekara | No |
| O 071. Mohan Priyadarshana De Silva | No |
| O 072. T. Ranjith De Zoysa | No |
| O 074. Vijitha Berugoda | No |
| O 075. Roshan Ranasinghe | No |
| O 076. Lohan Ratwatte | No |
| O 078. Sudarshini Fernandopulle | No |
| O 082. Thusitha Wijemanna | Yes |
| O 083. Rohini Kumari Wijerathna | Yes |
| O 084. Chaminda Wijesiri | Yes |
| O 085. Namal Rajapaksa | No |
| O 086. Janaka Wakkumbura | No |
| O 087. Vidura Wickramanayaka | No |
| O 088. Thenuka Vidanagamage | No |
| O 090. Kanaka Herath | No |
| O 092. D.V. Chanaka | No |
| O 095. Piyal Nishantha De Silva | No |
| O 096. Sanath Nishantha Perera | No |
| O 101. Hesha Withanage | Yes |
| O 104. Wijepala Hettiarachchi | Yes |
| O 105. Mohamadu Nazeer | Yes |
| O 106. S.M. Mohamed Ismail | Yes |
| O 109. S. Premarathna | No |
| O 110. Tharaka Balasuriya | No |
| O 113. Kanchana Wijesekara | No |
| O 114. Indika Anuruddha Herath | No |

*Total Voting Results:*

| | |
|---|---|
| Yes | 57 |
| No | 42 |
| Abstain | 00 |

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ අවස්ථාවට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 57; විරුද්ධව 42යි. නැතී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. නැතී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව පනත් කෙටුම්පත දෙවන වර කියවීමට පක්ෂව මුළු ඡන්ද සංඛ්‍යාව 59යි; විරුද්ධව 43යි.

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය.:*
*"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු තිලක් මාරපන මහතා]*

*තීරණය කරන ලදී.*
*"සිවිල් මූලික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ සහ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වූ පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament."*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
*[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]*
*කුලුගෙ ආරාය්පට්ටු.*
*[මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.]*
*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1** සිට **26** තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*

*1ආම් වාසගත්තිලිරුන්දු 26ආම් වාසගම් වරෙ සට්ටමූලත්තින් පකුදියාග ඉරුක්කවේණ්ඩුමෙනක් කට්ටළෙයිට්ප්පට්ටදු.*

*Clauses 1 to 26 ordered to stand part of the Bill.*

## 27වන වගන්තිය.- (අර්ථ නිරූපණය.)

වාසගම් 27. - (பொருள் கோடல்)

CLAUSE 27.- (*Interpretation.)*

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
Sir, I move,

(1) "In page 22, leave out all words in lines 8 to 12 (both inclusive) and insert:

'(a) persons who have suffered damage as a result of loss of life or damage to their person or property,-' ";

(2) "In page 22, leave out all words in line 14 and insert:

'connection with the armed conflict which' ";

(3) "In page 22, leave out all words in line 17 and insert:

'(ii) due to political unrest' ";

(4) "In page 22, leave out all words in lines 19 and 20 and insert:

'(iii) such damage being in the nature of prolong and grave damage suffered by individuals,' ";

(5) "In page 23, leave out all words in lines 16 to 20 (both inclusive)."

*සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*තිරුත්තංකළ් විට්ටුක්කප්පට්ට එට්රුක්කොළ්ළප්පට්ටන.*
*Amendments put, and agreed to.*

***27** වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*27ආම් වාසගම් තිරුත්තප්පට්ටවාරු, සට්ටමූලත්තින් පකුදියාග ඉරුක්ක වේණ්ඩුමෙනක් කට්ටළෙයිට්ප්පට්ටදු.*
*Clause 27, as amended, ordered to stand part of the Bill.*

***28** වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*

*28 ආම් වාසගම් සට්ටමූලත්තින් පකුදියාග ඉරුක්කවේණ්ඩුමෙනක් කට්ටළෙයිට්ප්පට්ටදු.*
*Clause 28 ordered to stand part of the Bill.*

***පූර්විකාව පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*මුන්නුරෙ සට්ටමූලත්තින් පකුදියාග ඉරුක්ක වේණ්ඩුමෙනක් කට්ටළෙයිට්ප්පට්ටදු.*
*Preamble ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*සට්ටමාගු වාසගමුම් තලෛප්පුම් සට්ටමූලත්තින් පකුදියාග ඉරුක්ක වේණ්ඩුමෙනක් කට්ටළෙයිට්ප්පට්ටදු.*
*සට්ටමූලම් තිරුත්තංකළුඩන් අරික්කෙ සෙය්යප්පට්ටදු.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
I move,

"That the Bill, as amended, be now read the Third time."

I also request to give permission to correct the typographical errors, grammatical errors, numerical errors and consequential Amendments to the Bill.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*විනා විටුක්කප්පට්ටු, එට්රුක්කොළ්ළප්පට්ටදු.*
*අදන්පඩි, සට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්රාම්මුරෙයාග මදිප්පිටප්පට්ටු නිරෙවේට්රප්පට්ටදු.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*විනා එටුත්තියම්පප්පෙට්රදු.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඊට පෙර, මූලාසනය සඳහා ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මේ අවස්ථාවේදී ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

## හෝමාගම තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම
## ஹோமகம தொழில்நுட்ப நகர அபிவிருத்திக் கருத்திட்டத்துக்கான காணிச் சுவீகரிப்பு
## ACQUISITION OF LAND FOR TECH CITY DEVELOPMENT PROJECT IN HOMAGAMA

[අ.භා. 6.34]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"හෝමාගම පිටිපන ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත තාක්ෂණික නගරය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී එම ප්‍රදේශවල දීර්ඝ කාලයක් පදිංචි සහ වැවිලි වගා කළ ඉඩම් හිමි ජනතාවට අසාධාරණයක් වන බව එම ජනතාව ප්‍රකාශ කර සිටිති. තාක්ෂණික නගරයක් ඉදිකර රටට නව තාක්ෂණික ආයෝජන කැඳවා ගැනීමට අප කිසිවෙක් විරුද්ධ නොවන අතර, එම කටයුත්ත සඳහා ඉඩම් පවරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ පැන නැඟී ඇති සැක සංකා මේ නොසන්සුන් බවට හේතු වී ඇත. මෙම ව්‍යාපෘතිය සම්බන්ධව පවතින ව්‍යාකූලත්වය දුරු කර එම ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම් පිළිබඳ අවධානය යොමු කරන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

එම යෝජනාව ස්ථිර කිරීම, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව වගකීමකින් යුතුව ස්ථිර කරන අතර, මීට අදාළව අමාත්‍යාතුමා විධිමත් පිළිතුරක් ලබාදෙයි කියා මා විශ්වාස කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1978 තරම් ඈත කාලයක අපේ රටට විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නත්, එයින් බලාපොරොත්තු වූ ආකාරයට විශාල වශයෙන් විදේශ ආයෝජන හා තාක්ෂණය ගලාගෙන ආවේ නැහැ කියන එක අපි කවුරුත් පිළිගන්නවා. ඒ නිසාම අද අපේ රටේ කර්මාන්ත ආරම්භ කිරීමේදී, කෘෂි කර්මාන්තය සඳහා නවෝත්පාදන ආර්ථිකයක් කරා ගමන් කිරීමේදී තාක්ෂණ දරිද්‍රතාවෙන් අපි පීඩාවට පත්වෙලා සිටිනවා. තාක්ෂණයෙන් අපට වඩා ගව් ගණන් පිටුපසින් සිටි රටවල් - දකුණු කොරියාව වෙන්න පුළුවන්. තායිවානය වෙන්න පුළුවන්. මැලේසියාව වෙන්න පුළුවන්. සිංගප්පූරුව වෙන්න පුළුවන්.- තාක්ෂණික වශයෙන් වේගයෙන් අපි පසුකරගෙන ගිහිල්ලා තිබෙනවා.

60,70 දශකයේ තමයි ලෝකය තාක්ෂණික විප්ලවයන් ගැන කථා කළේ. නමුත් අපේ පාසල් විෂය නිර්දේශය සඳහා තාක්ෂණවේදය විෂයය හඳුන්වා දීලා තවම වසර තුන-හතරක්වත් ගත වෙලා නැහැ. තවමත් අපේ විශ්වවිද්‍යාල තුළ තාක්ෂණ පීඨ ආරම්භ කර ගෙන යනවා. අපේ රටට මේ තාක්ෂණයේ අවශ්‍යතාව පිළිබඳව අපි කාගේත් විවාදයක් නැහැ. වර්තමානයේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ධුරය උසුලන අමාත්‍යතුමා ඉංජිනේරු විද්‍යාව ඉගෙන ගත් කෙනෙක්. මම වෛද්‍ය විද්‍යාව ඉගෙන ගත් කෙනෙක්. මූලාසනයේ සිටින ඔබතුමිය වෛද්‍ය විද්‍යාව ඉගෙන ගත් කෙනෙක්. ඒ නිසා අපි කවුරුත් මේ තාක්ෂණය අපේ රටට හඳුන්වා දිය යුතුය, එය වේගයෙන් රටට ගලා ආ යුතුය කියන එක පිළිබඳව කිසිදු දෙගිඩියාවකින් තොරව පෙනී සිටිනවා. එවැනි අරමුණු රාශියක් පෙරදැරි කරගෙන බව පවසමින් තමයි හෝමාගම තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය ඉදිරිපත් කර තිබෙන්නේ. අපේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයත්, දකුණු කොරියාවේ ඉඩම්, යටිතල පහසුකම් සහ ප්‍රවාහන අමාත්‍යාංශයත් ඒකාබද්ධ ව්‍යාපෘතියක් හැටියට මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න යන බවයි අමාත්‍යාංශය විසිනුත්, විවිධ අවස්ථාවල මේ ව්‍යාපෘති වාර්තා මඟිනුත් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සඳහා ඉඩම් පවරා ගැනීමේදී, හෝමාගම, පිටිපන, මහේනවත්ත ආදී ප්‍රදේශවල ජනතාවගේ ඉඩම් පවරා ගැනීමේදී ගැටලුවක් පැන නැඟී තිබෙනවා. ඇමතිතුමාම පිළිගන්නා විධියට, අමාත්‍යාංශය විසින් නිකුත් කළ වාර්තාවක එතුමාම කියනවා, "මෙම තාක්ෂණික නගරය ඉදි කිරීමට යෝජිත ප්‍රදේශයේ වර්තමානයේ බොහෝ විට කෘෂි කාර්මික කටයුතුවල නියැලෙන පිරිස් සහ පෞද්ගලික හා රජයේ රැකියාවල නියුතු ජනතාව බහුලව සිටියි. බහුල ප්‍රමාණයක් කෘෂි කර්මාන්තය සහ සුළු ආදායම් මාර්ගවල නියැලෙන බවත් අපගේ සමීක්ෂණ මඟින් තහවුරු වී ඇත" කියලා. ඒ නිසා ඒ ප්‍රදේශය කාලයක් තිස්සේ කෘෂි කර්මාන්තයේ, වී ගොවිතැනේ, ඒ වාගේම රබර් වගාවේ නිරත වන ජනතාව ඉන්න ප්‍රදේශයක්; කාලයක් තිස්සේ ඒ ජනතාව විසින් සංවර්ධනය කළ ගොඩනැඟිලි, නිවාස තිබෙන ප්‍රදේශයක්. දැනටමත් ඒ අවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වන හෝමාගම, පාදුක්ක, හොරණ ආදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල මේ ඉඩම් අත්පත් කර ගන්නවා කියලා ඒ ජනතාවට දැනුම් දීලා තිබෙනවා. මා දන්නා හැටියට මේ සඳහා අක්කර 4,000ක පමණ ඉඩම් ප්‍රමාණයක් වුවමනා වෙලා

තිබෙනවා. මේ ඉඩම් අත්පත් කර ගැනීමේදී මුලින් අමාත්‍යාංශය කියපු කාරණා සහ ඊට පසුව ප්‍රාදේශීය ලේකම්වරු විටින් විට මතු කළ කාරණා අතර බරපතළ පරස්පරතා පැන නැඟී තිබෙනවා. මේ ජනතාව සඳහන් කරන ආකාරයට මේ ඉඩම් අත්පත් කර ගැනීමේදී මුලින් මේ අදාළ ආයතන ප්‍රකාශ කරලා තිබෙන්නේ, රජය සතු ඉඩම්, එහෙම නැත්නම් වගා නොකළ විශාල ඉඩම් මේ සඳහා පවරා ගන්නවා කියලායි. නමුත් මේ වනකොට ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් මේ ජනතාවට ඉදිරිපත් කර තිබෙන ලිපි දෙස බැලුවාම පෙනෙනවා, දැන් ඒ ජනතාව පදිංචි වෙලා ඉන්න, වගා කරලා තිබෙන ඉතාම සුළු ප්‍රමාණයේ ඉඩම් පවා මේ ව්‍යාපෘතියට පවරා ගැනීමට යන බව. ඒක තමයි මේ නොසන්සුන්තාවට හේතු වෙලා තිබෙන්නේ. ගරු ඇමතිතුමාත් දන්නවා, මේ සම්බන්ධයෙන් විටින් විට ඒ ජනතාව විවිධ උද්ඝෝෂණ ක්‍රියාමාර්ගවල නිරත වුණා; අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කළා; අමාත්‍යාංශයට ගිහිල්ලා සාකච්ඡා කළා; ඇමතිවරයා ඒ ප්‍රදේශයට ගිහිල්ලා සාකච්ඡා කළා කියලා. නමුත් මේ ප්‍රශ්නය සඳහා විශ්වාසදායී පිළිතුරක්, විසඳුමක් තවම ලබා දීලා නැහැ. මේ කථා කරන අය කවුරුවත් සංවර්ධනයට විරුද්ධ අය නොවෙයි. ඔබතුමා පිළිගන්නා ආකාරයට ඔවුන් කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම නගරය ආශ්‍රිතව ජීවත් වන, පිළිගත හැකි වැදගත් වෘත්තීන්වල නිරත වන, යම් ආදායම් මාර්ග හිමි ජනතාවක්. ඒ නිසා ඒ අයට කරුණු කාරණා තේරුම් ගන්න පුළුවන්; කරුණු කාරණා අවබෝධ කරලා දෙන්න පුළුවන්. ඒ නිසාම තමයි ඒ ජනතාව විටින් විට මේ ප්‍රශ්නය මතු කරන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියාට පසුව එකක් කියනවා, අමාත්‍යාංශයට ගියාට පසුව තව එකක් කියනවා, ඒ වාගේම විවිධ කණ්ඩායම් කැඳවලා විවිධ උත්තර දීලා තිබෙනවා. ඒ නිසා පැන නැඟී තිබෙන ඉතාම සැක සංකා සහිත තත්ත්වයක් තමයි මේ නොසන්සුන්තාවට හේතු වෙලා තිබෙන්නේ. මේ කවර තාක්ෂණික නගරයක් ඇති කළත්, අපේ රටට තාක්ෂණය කැඳවාගෙන ආවත්, එහෙම නැත්නම් විදේශ ආයෝජන කැඳවා ගත්තත් අපේ බලාපොරොත්තුව, රට සංවර්ධනය කිරීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රට සංවර්ධනය කරනවා කියන්නේ වෙන කිසි එකක් නොවෙයි, ජනතාවගේ ජීවිත තිබෙනවාට වඩා සංවර්ධනය කිරීම; දැන් තිබෙනවාට වඩා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම. මේ රටට තාක්ෂණය ගෙනැල්ලා අපි බලාපොරොත්තු වන්නේත් ඒක නම්, ඒ වාගේම තාක්ෂණය ගෙන ඒම හරහා රැකියා උත්පාදනය කරලා බලාපොරොත්තු වන්නේත් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම නම්, ඒ ජනතාවගේ ජීවිත අවිනිශ්චිතතාවට පත් කරලා, ඔවුන් කාලයක් තිස්සේ ගොඩ නහාගෙන ඉන්න ඉඩ කඩම් අහිමි කරලා, ඔවුන්ගේ වැවිලි වගාවන් අහිමි කරලා -දැන් මේ ඉඩම් පවරා ගැනීමේ ලියුම් නිකුත් කළාට පසුව කිසිදු ඉදිකිරීමක් කරන්න හම්බ වෙන්නේ නැහැ.- ඔවුන්ගේ අනාගතය පිළිබඳව ඇති කරලා තිබෙන මේ අවිනිශ්චිතතාව තමයි මේ ප්‍රශ්නයට මූලික වී තිබෙන්නේ. මේ ජනතාව කියන කරන ආකාරයට ඔවුන් සංවර්ධනයට විරුද්ධ ජනතාවක් නොවෙයි.

ඒක මම නැවත නැවතත් කියනවා. ඔවුන් සංවර්ධනයට පක්ෂපාතයි; සංවර්ධනය ඉත සිතින් පිළිගන්නවා. තාක්ෂණය රටට ගෙන ඒම සම්බන්ධයෙන් ඔවුන්ට කිසිම ගැටලුවක් නැහැ. මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ බාධාවක් නැහැ. මේ ජනතාව කරුණු කාරණා තේරුම් ගන්න පුළුවන් අය. එවැනි ජනතාවක් සිටියදී, කිසිදු සැලැස්මකින් තොරව මේ ඉඩම් පවරා ගැනීම සම්බන්ධවත්, විටින් විට කියනු ලබන ප්‍රකාශ හරහා මතු වෙලා තිබෙන තත්ත්වය පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලාත්, ඒ වාගේම මේ ජනතාවගේ හඬට ඇහුම් කන් දෙන්න කියලාත් මම ඉල්ලීමක් කරනවා. මොකද, මේ ඉඩම් පවරා ගැනීම සම්බන්ධයෙන් දැන් ඔවුන් මතු කරන මේ ප්‍රදේශයට සිදු විය හැකි හානිය, විශේෂයෙන් පාරිසරික හානිය, ඒ වාගේම මේ ප්‍රදේශයේ තිබෙන දිය සීරාවන් සිඳී යෑම ආදී කරුණු කාරණා කිසිවක් අපට නිකම්ම බැහැර කරන්න බැහැ. එම නිසා මේ සියලු කරුණු කෙරෙහි අවධානය යොමු කරමින්, අපි සංවර්ධනය ගෙන යන්නේ ජනතාවට නම්, ඒ ජනතාවගේ ජීවිත ස්ථාවර කිරීම සඳහා මේ ගෙන යන ව්‍යාපෘතිය පිළිබඳව ආණ්ඩුව පැත්තෙන්, ඇමතිවරයාගේ පැත්තෙන්, වගකිව යුතු පිළිතුරක්, එහෙම නැත්නම් මේ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුමක් ලබා දෙයි කියලා මා බලාපොරොත්තු වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 6.43]

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටේ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් පවරා ගැනීම පිළිබඳව කටයුතු කරන සෑම විටකම ඒ පිළිබඳව විරෝධතා මතුවීම අපේක්ෂා කරන්න පුළුවන්. විශේෂයෙන්ම ජනගහනය අධික ප්‍රදේශයක ඉඩම් පවරා ගන්න කොට මේ තත්ත්වය තවත් සංකීර්ණ වනවා. නමුත්, අපේ රටේ අනාගතය උදෙසා නිෂ්පාදන කර්මාන්ත, ඒ වාගේම සේවා හා බැඳුණු අලුත් ආයතන පිහිටුවිය යුතුයි. ඒවා රටේ සෑම තැනකම පිහිටුවන්න පුළුවන්කමක් නැහැ. රටේ පුරවැසියන්ට සමීප විය හැකි, ප්‍රවාහන පද්ධතිය සකස් කර ගත හැකි ප්‍රදේශවල එම ආයතන පිහිටුවිය යුතුව තිබෙනවා.

ඇත්ත වශයෙන්ම මේ ඉදිවන නව තාක්ෂණික නගරය කොළඹ දිස්ත්‍රික්කයට පමණක් නොවෙයි, කළුතර දිස්ත්‍රික්කයටත් ඉතා වැදගත්. අද ඉතා විශාල භූමි ප්‍රදේශයක ජීවත් වන, තමන්ගේ සුදුසුකම්වලට ගැළපෙන රැකියා නොමැතිකම නිසා කනගාටුවෙන් පසුවන දස දහස් ගණනක් වූ තරුණ තරුණියන්ටත්, නිදහස් අධ්‍යාපනයේ ශක්තියෙන් වාගේම පෞද්ගලික අධ්‍යාපනයේ ශක්තියෙන් සුදුසුකම් ලබා අපේ රටට සේවය කරන්න, අපේ රටේ ජීවත් වන්න අපේක්ෂා කරන මේ රටේ ජනතාවට රැකියා උත්පාදනය කරන ප්‍රදේශයක්, විශේෂිත වූ කලාපයක් අපට අවශ්‍යයි. චීනය වන්නට පුළුවන්, දකුණු කොරියාව වන්නට පුළුවන්, මලයාසියාව වන්නට පුළුවන්, සිංගප්පූරුව වන්නට පුළුවන්, ඉන්දියාව වන්නට පුළුවන්, මේ සෑම රටකම මෙවැනි විශේෂිත ප්‍රදේශ හඳුනා ගෙන විශේෂිත පහසුකම් සලසා ඒ හරහා ආයෝජකයන්ටත්, ඒවායේ සේවය කරන සේවකයන්ටත් අවශ්‍ය වාතාවරණය ගොඩ නඟනවා. එම නිසා මෙය කොළඹට වාගේම කළුතර දිස්ත්‍රික්කයටත්, මුළු රටටමත් ඉතා වැදගත් බව කියන්න ඕනෑ. අලුතෙන් ඉදිවන මාර්ග හරහා කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව විශේෂයෙන් මෙයට සම්බන්ධ වනවා. බොහෝදෙනෙකු මේ වාසිය තවම දැකලා නැහැ. මේ ආයතනවලට අවශ්‍ය ශ්‍රම සම්පත වැඩියෙන්ම ගලා ගෙන ඒමට නියමිත කළුතර දිස්ත්‍රික්කයටයි. එම නිසා පළමුව මේ ස්ථානය තෝරා ගැනීම ගැන අපි ස්තුතිවන්ත වනවා. මේ සංකල්පය ගෙන ඒම පිළිබඳව චම්පික රණවක ඇමතිතුමාට අපේ ස්තුතිය පළ කරමින් මේ වැඩ පිළිවෙළ සාර්ථක වේවා! කියා අපි ප්‍රාර්ථනා කරනවා.

විවිධ අවස්ථාවල මතුවන විවිධ අදහස් නිසාත්, ඒ වාගේම නිලධාරීන්ගේ පරස්පර විරෝධී අදහස් නිසාත් ඒ ප්‍රදේශවල ජීවත් වන මෙයින් පීඩාවට පත්වන ජනතාවට ගැටලු තිබෙන බව අපි

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

අසා තිබෙනවා. අපට ඒ ගැන පැමිණිලි ලැබී තිබෙනවා. ඒවාට අපිත් සංවේදියි. ඒ නිසා (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ විධියට ඒ ප්‍රදේශයේ ජනතාවට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන ඒ කරුණු පිළිබඳව රජය හැටියට අපත් සංවේදී බව විශේෂයෙන්ම මම සඳහන් කරන්න කැමැතියි. නමුත්, මේ අපට විසඳා ගැනීමට නොහැකි කරුණු නොවෙයි. මේ හැම ප්‍රශ්නයක්ම අපට විසඳා ගත හැකියි. මේ රටේ අනාගතය උදෙසා මෙවැනි පහසුකම් සහිත, ජනගහන ඝනත්වය සහිත, ආයෝජකයන්ගේ ආකර්ෂණයට ලක්වන ප්‍රදේශයක මේ භූමිය අපි නිර්මාණය කර ගත යුතුව තිබෙනවා. එම නිසා එක් පැත්තකින්, ඒ සඳහා කැපවීම් කරන ජනතාවට මගේ උපහාරය පුද කරනවා. අනික් අතට, මෙහිදී සිදුවන අපහසුතා අවම කරන්නත්, උපරිම වන්දි මුදල් ලබා දෙන්නත් අවශ්‍ය පියවර රජය විසින් ගනු ඇතැයි මම අපේක්ෂා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

මීළඟට, ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා.6.47]

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මා අද දවසේ යම්කිසි කාරණාවක් පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න පමණක් කාල වේලාව ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වර්තමානයේ මේ ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයකු වශයෙන් කටයුතු කරන රන්ජන් රාමනායක මහතා අද දවල් මාධ්‍ය හමුවක් පවත්වා මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වයට විශාල බලපෑමක් කළා. මේ ආණ්ඩුව බලයට පත් වුණේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන, යහ පාලනය ක්‍රියාත්මක කරන, නීතිය සියලුදෙනාට සමානව ක්‍රියාත්මක කරන ආණ්ඩුවක් හැටියටයි. එතුමාගේ මාධ්‍ය හමුවේදී එතුමා විශේෂයෙන්ම මතක් කර සිටියා, හෙට අනිද්දා දවසක මේ රටේ අධිකරණයෙන් ලබා දීමට නියමිත නඩු තීන්දුවක් එතුමාට ලැබී තිබෙනවා කියා. ඒ ආරංචිය අනුව එතුමා ඒ තීන්දුව ප්‍රකාශයට පත් කළා, මාධ්‍ය හමුවේදී.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට දැන් බරපතළ ගැටලුවක් තිබෙනවා. මේ ආණ්ඩුව නියෝජනය කරන ඇමතිවරුන්ගේ අවධානයත් අපි ඒ පිළිබඳව යොමු කරවනවා. විශේෂයෙන්ම රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිවරයා කියන්නේ පසු ගිය කාලයේම දිගින් දිගටම අධිකරණයට ප්‍රහාර එල්ල කළ පුද්ගලයෙක්. එතුමා විනිශ්චයකාරවරුන්ට ප්‍රහාර එල්ල කළා; නීතිඥයන්ට ප්‍රහාර එල්ල කළා; අධිකරණයේ සියලු ක්ෂේත්‍රවලට ප්‍රහාර එල්ල කළා. එය දැන් විශාල වශයෙන් බලපෑමක් බවට පත් වෙනවා. හෙට, අනිද්දා දවසක කුමන හෝ පාර්ශ්වයක කුමන හෝ නඩු තීන්දුවක් එන්න තිබෙනවා නම්, ඒ නඩු තීන්දුව පිළිබඳව රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා කල් ඇතිව දැන ගෙන තිබෙනවා නම්, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජොන්ස්ටන් ප්‍රනාන්දු හිටපු අමාත්‍යතුමා රිමාන්ඩ් බන්ධනාගාරගත කරලා, ඒ නඩුව අහන වෙලාවේ, මූල්‍ය අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් ඒ සියලු තොරතුරු විකෘති කරලා එතුමා සිරගත කරන්න කටයුතු කරපු ආකාරය පිළිබඳව උසාවියේදී කරුණු අනාවරණය වුණා අපි දැක්කා. අධිකරණය -විනිශ්චයකාරතුමිය- අවවාද කළා, පොලීසියේ ඒ නිලධාරීන්ට. දැන් අපට විශාල ප්‍රශ්නයක් මතු වෙනවා, රජයේ සිටින ඇමතිවරුන් නඩු තීන්දු පිළිබඳව දැනුවත් වෙන්නේ කොහොමද කියා. නඩු දමන්නේ ඇමතිවරුද? නඩුවේ කරුණු පිළිබඳව ඔවුන් සාකච්ඡා වෙන්නේ කොහොමද? එය විනිශ්චයකරුවන් පමණක් දන්නා තීන්දුවක්. හෙට හෝ අනිද්දා දෙන තීන්දුවක් නම් එය දන්නේ උසාවියේ විනිශ්චයකරුවන් විතරයි. ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි දිගින් දිගටම කිව්වා, රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවෙන් විශේෂයෙන්ම අධිකරණයට විශාල බලපෑමක් එල්ල කරනවා කියා, නීතිපතිවරයා යොදාගෙන. දැන් මේ කරුණු සනාථ වෙනවා. රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා යම්කිසි නඩුවක තීන්දුවක් කල් ඇතිව දැන ගන්නවා නම්, එය බරපතළ ගැටලුවක් බවට පත් වෙනවා. ඒකෙන් ඒ නඩුවට පෙනී සිටින සියලුදෙනා විශාල හානියකට, අගතියකට ලක් වෙනවා. විශේෂයෙන්ම මේ ආණ්ඩුව නියෝජනය කරන නියෝජ්‍ය අමාත්‍යවරයකු වන, අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරක් එල්ල කරන රන්ජන් රාමනායක මැතිතුමා පිළිබඳව අපි විශේෂයෙන්ම ගරු කථානායකතුමාගේත්, මේ ගරු සභාවේත් අවධානය යොමු කරවනවා. මන්ත්‍රී වරප්‍රසාදවලට යට වෙලා අධිකරණයේ ස්වාධීනත්වයට ප්‍රහාරයක් එල්ල කරන්න යම්කිසි කෙනකු උත්සාහයක් ගන්නවා නම්, ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි එය හෙළා දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියත් අද දවසේ මේ පාර්ලිමේන්තුවේදි නොයෙක් ආකාරයේ චෝදනා එල්ල කරනවා අපි දැක්කා. එතුමිය අද FCID එක පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී චෝදනා කරනවා. හැබැයි FCID එකට චෝදනා කරන්න එතුමියට අවස්ථාව ලැබුණේ එතුමියට විරුද්ධව අධිකරණයේදී කරුණු අනාවරණය වෙද්දියි. හැබැයි අපේ මන්ත්‍රීවරුන් චෝදනා නැතිව අරගෙන ගිහින් සිරගත කරලා, තිබෙන සියලු කරුණු විකෘති කරලා අධිකරණයට කරුණු දක්වා රිමාන්ඩ් බන්ධනාගාරගත කරන කොට මේ ආණ්ඩුවේ සිටින කිසිම ඇමතිවරයෙක්, කිසිම මන්ත්‍රීවරයෙක් ඒ පිළිබඳව කතා කළේ නැහැ. අප එදා දවසේ කියපු කාරණා අද දවස වන විට ඔප්පු වෙමින් පවතිනවා. පොලීසියේ මැදිහත් වීම තුළ, ඒ පරීක්ෂණවලට රජය මැදිහත් වීම තුළ අපේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් පමණක් නොව මේ ආණ්ඩුවට විරුද්ධව සටන් කරන සියලුදෙනා දඩයම් කිරීමේ ක්‍රමවේදයක් අද නිර්මාණය කර තිබෙනවා. ඒක තමයි FCID එක හරහා පසු ගිය කාලයේම කරන්න උත්සාහ කළේ. අධිකරණය ස්වාධීන තීන්දු ලබා දෙන්න උත්සාහ කරන කොට දැන් හදනවා, ඒ තීන්දුවලට බලපෑමක් කරන්න. අපි හිතනවා, අපි විශ්වාස කරනවා රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා අද දවසේ මාධ්‍ය හමු පාවිච්චි කරන්නේ ඒ තීන්දුවලට යම්කිසි බලපෑමක් ඇති කරලා, ඒ විනිශ්චයකරුවන්ටත් යම්කිසි බලපෑමක් ඇති කරන්නය කියා. රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමාට එරෙහිව අද අධිකරණයේ නඩු ගණනාවක් පවරා තිබෙනවා. අපි දන්නවා, එතුමා පසු ගිය කාලයේ දිගින් දිගටම විවිධ අසත්‍ය චෝදනා එල්ල කළ බව; අපේ හිටපු රාජ්‍ය නායකයා ඇතුළු සියලු දෙනාට විශාල වශයෙන් අසත්‍ය චෝදනා එල්ල කළ බව. අද දවසේ එතුමා බරපතළම ප්‍රකාශයක් කළා. එතුමා නඩු නිමිත්තක තීන්දුව දැන ගන්නේ කොහොමද?

නඩුවක තීන්දුව පිළිබඳව එතුමා දැන ගන්නවා නම්, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව විශාල ගැටලුවක් අපට

මතුවනවා. යම්කිසි පාර්ශ්වයක් එයින් අගතියට පත් වෙනවා නම් ගරු කථානායකතුමාගෙනුත් අපි ඉල්ලීමක් කරනවා, මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා. විශේෂයෙන්ම රජයේ පාර්ශ්වය නියෝජනය කරන නියෝජ්‍ය ඇමතිවරයෙක් අධිකරණයේ ස්වාධීනත්වයට එල්ල කරපු මේ මරු පහර ඒකාබද්ධ විපක්ෂය හැටියට නැවත චෝදනාවක් අපි තරයේ හෙළා දකිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා.

[අ.භා.6.57]

**ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වැරැදි පදනමක ඉඳගෙන වුණත් ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමා තාක්ෂණ නගරය පිළිබඳව මේ විවාදය කැඳවීම ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම මේ තාක්ෂණ නගරයක් ඇති කරන්නේ ඇයි කියන ප්‍රශ්නය අපි ගත්තාම, මූලික ප්‍රවණතා දෙකක් නිසා තමයි මේ රජය අපේ මහානගර සැලසුම -තාක්ෂණ නගර ව්‍යාපෘතිය- දියත් කළේ. අපි දන්නවා, මේ රටේ 1947 සිට 1977 දක්වා ආනයන ආදේශක ආර්ථිකයක් ගෙනියන්න උත්සාහ කළ බව. විශේෂයෙන්ම 1970-1977 ආණ්ඩුව රට ඇතුළේ භාණ්ඩ නිෂ්පාදනය කරලා, ආනයන පුළුවන් තරම් සීමා කරලා, ආනයන ආදේශක නිර්මාණය කරන රටක් හදන්න උත්සාහ කළා. 1976දී ඊලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමා ඒ ආර්ථිකය ලිහිල්කරණය කරලා, අපනයන අභිමුඛ ආර්ථිකයක් හදන්න කටයුතු කළා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තමයි ඒකේ මූලික කටයුත්ත කළේ. එතැනදී ආයෝජකයන් කැන්දා ගැනීම සඳහා ලංකාව උපක්‍රම කීපයක් පාවිච්චි කළා. එක උපක්‍රමයක් තමයි, ලාභ ශ්‍රමය, ලාභ සම්පත්, පහත් පෙළේ පරිසර නීති, පහත් මට්ටමේ ශ්‍රම නීති කියන මේ කාරණා එක්ක බටහිර රටවල වෙළෙඳ පොළ ආකර්ෂණය කර ගැනීම සඳහා බටහිර රටවල්වලට පක්ෂපාතී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම. එතුමාගේ මේ ක්‍රියාදාමය නිසා මුල් අවුරුදු කීපයේ ඉතාම ශක්තිමත් ප්‍රතිඵල ලංකාවට ලැබුණා. රුපියල අවප්‍රමාණය වීම ගැන අද මේ සභාවේ කථා කළා; රුපියල අවප්‍රමාණය වීම ආර්ථික අර්බුදයක් වෙනවා කියලා කථා කළා.

ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලයේ 1977 නොවැම්බර් මස 16වැනි දා වැනි දවසක රොනී ද මැල් මහත්මයා එකපාරටම රුපියල සියයට සියයකින් අවප්‍රමාණය කළා. හැබැයි, ඒ අවුරුද්දෙයි, ඊළඟ අවුරුද්දෙයි රටේ ආර්ථික වර්ධන වේගය සියයට 8කට වඩා වැඩි වුණා. ඒ මොකද, අර ලාභ ශ්‍රමය නිසා ආපු ක්‍රියාදාමය. උපාලි විජේවර්ධන මහත්මයා, ලලිත් ඇතුළත්මුදලි මහත්මයා වැනි අය එදා ඇති කළ අපනයන සැකසුම් කලාප තමයි, අද චීනයේ ෂෙන්ෂෙන්, ගොන්ෂෝ වැනි පර්ල් නදිය අවට තිබෙන ලෝකයේ ප්‍රධානම කාර්මික නගරයේ ආදර්ශ බවට පත් වුණේ. එදාත් කටුනායක, බියගම අපනයන සැකසුම් කලාප ඇති කරනකොට මෙවැනි විරෝධතා එල්ල වුණා. පොල් ගස් කපනවා කිව්වා; ජන ජීවිතය අඩාළ වෙනවා කිව්වා; මීගමුව කළපුව විනාශ වෙනවා කිව්වා. මේ වාගේ නොයෙක් විරෝධතා ව්‍යාපාර මැද - විදේශිකයන්ට රට විකුණනවා, විශේෂ නීති පද්ධතියක් මෙතැන ඇති වෙනවා කිව්වා- තමයි එදාත් ගමන් කළේ. නමුත්, ඒකෙන් මේ රටේ එතෙක් තිබිච්ච තේ, පොල්, රබර් ආර්ථිකය වෙනුවට අලුත් අපනයන ආර්ථිකයක් ඇති වුණා. නමුත්, කාලයාගේ ඇවෑමෙන් දැන් තවදුරටත් ඒ අපනයන සැකසුම් කලාප ඉදිරියට ගෙනියන්න බැහැ.

කටුනායක, බියගම, කොග්ගල ආදී ස්ථානවලට සීමා වෙලා තිබුණු කර්මාන්ත රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ ගමට ගෙනගියා. ඒකෙන් බලාපොරොත්තු වුණේ ලාභ ශ්‍රමය ගමෙන් ලබාගන්නයි. ඒ පියවරත් 1990 ගණන් වන විට අවසන් වුණා. ඒ අනුව අපි ආර්ථික විද්‍යාවේ හඳුන්වන නිෂ්පාදන සාධක ලාභ කිරීමෙන් ආයෝජකයන් කැඳවා ගැනීම කියන ප්‍රතිපත්තිය, උපාය මාර්ගය දැන් ලංකාවට වලංගු නැහැ. දැන් ලංකාවේ ආසනයක් ආසනයක් පාසා අපනයන සැකසුම් කලාප හැදුවත්, කිසිම ආයෝජකයෙක් මේ රටට එන්නේ නැහැ. ඒක තමයි යථාර්ථය. එහෙම නම්, වර්තමානයේ අපේ උපාය මාර්ගය මාරු කරන්න ඕනෑ. අපේ උපාය මාර්ගය වන අපනයන ක්‍රියාදාමය මාරු කරන්න ඕනෑ. 1990දී ලංකාවේ තේ, පොල්, රබර්, ඇඟලුම් සහ අනෙකුත් භාණ්ඩ හා සේවාවල යම් අපනයන සැකසුමක් තිබුණා ද, අවුරුදු 30කට පස්සේ අද තිබෙන්නේත් ඒ සැකසුමමයි. මේක තමයි අද ලංකාවේ තිබෙන අපනයන අර්බුදය.

අපේ ආනයනය වැඩි වුණාට අපනයනය වැඩි වෙලා නැහැ. 1990දී වියට්නාමයේ අපනයනය බිලියන 5යි. ලංකාවේත් බිලියන 5යි. වියට්නාමයේ අද අපනයනය බිලියන 175යි. ලංකාවේ බිලියන 10යි. මේ තත්ත්වය වෙනස් කරන්න මොකක්ද කරන්න ඕනෑ? මේ තත්ත්වය වෙනස් කරන්න නම් අවශ්‍ය කරන්නේ නවෝත්පාදන උපාය මාර්ගයකට ගමන් කිරීමයි. ලාභ ශ්‍රමය ලංකාවේ නැති වුණාට, අපට ශක්තිමත් දැනුම සහිත බුද්ධිමය පරපුරක් ඉන්නවා. ඒකයි අපි නිතරම අවධාරණය කරන්නේ කෝටි දෙකක බඩවල්වලට කථා කරන දේශපාලනය වෙනුවට, කෝටි දෙකක මොළවලට කථා කරන ආර්ථික ප්‍රතිපත්තියක් රටට අවශ්‍යයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ නවෝත්පාදනය වෙනුවෙන් අපි සෑහෙන වැඩ පිළිවෙළක් දියත් කළා. 2013 වර්ෂයේදී මම තාක්ෂණික ඇමති හැටියට ලංකාවට නවෝත්පාදන උපාය මාර්ගයක් හඳුන්වා දුන්නා. අපි එදා පෙන්වා දුන්නා, මේ රටේ සියයට පහක හයක ආර්ථික වර්ධනයක් ගන්න දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 30ක්, 35ක් ආයෝජනය කරන්නට ඕනෑ බව. හැබැයි, තාක්ෂණ ක්ෂේත්‍රයේ අපි සියයට එකක් ආයෝජනයක් කළොත් එයින් ආර්ථික වර්ධනයට ලැබෙන ප්‍රවේගය ඔය අනෙකුත් ක්ෂේත්‍රවල ආයෝජනය කරනවා වාගේ හතර පස් ගුණයක් වෙනවාය කියලා අපේ ආර්ථික මහාචාර්යවරු පැහැදිලිව පෙන්වා දීලා තිබෙනවා. ඒ උපාය මාර්ගය අපි ලබා දුන්නා. පසු ගිය රජය යටතේ ඒ උපාය මාර්ගය මත පදනම්ව යම් යම් පියවර ගත්තා. ඒ අවස්ථාවේ සිටි අධ්‍යාපන ඇමතිතුමා සහ ඒ ආදී පිරිස් ඒ සම්බන්ධව සාකච්ඡා කළා. මට තවමත් මතකයි. ඒ යෝජනාව මුලින්ම ආවේ එදා අපේ කැබිනට් මණ්ඩලය කිලිනොච්චියේදී මුලින්ම රැස්වුණ අවස්ථාවේයි. කලා ක්ෂේත්‍රයේ උපාධිවලට තවත් පිරිස ගොඩ කරන්නේ නැතිව තාක්ෂණ ක්ෂේත්‍රයේ උපාධි ඇති කරන්නට ඕනෑට කියලා අපි යෝජනා කළා. ඒ අනුව තමයි තක්ෂණ පාඨමාලාව ආරම්භ කළේ. නමුත් විධිමත් තාක්ෂණය, නවෝත්පාදනය ඉදිරියට ගන්නට පුළුවන් වන විධියේ විධිමත් වැඩසටහනක් එතැන තිබුණේ නැහැ. ඒක තමයි තිබුණු ප්‍රශ්නය. රටට තාක්ෂණ නගරයක් අවශ්‍යයි. ඒ වාගේම, තාක්ෂණ ව්‍යාප ඉදිරියට ගෙන යන්නට පුළුවන් කාර්මික පුරවරයක් අවශ්‍යයි. හැම තැනම ගොඩ නැඟෙන අපනයන සැකසුම් කලාප වෙනුවට දැනුම අපනයනය කරන නව යුගයකට අවශ්‍ය පසුබිම රටට අවශ්‍යයි.

[ගරු පායලී චම්පික රණවක මහතා]

දෙවැන්න, අද ලෝකයේ පවතින තාක්ෂණ රටාවේ තාක්ෂණ ක්‍රියාදාමය මොකක්ද? අද අපි ඒක හඳුන්වන්නේ හතරවන කාර්මික විප්ලවය කියලායි. අපි දන්නා තරමින් වර්ෂ 1760දී මේ ලෝකයේ පළමුවන කාර්මික විප්ලවය ආරම්භ වුණා. අපි ඒකට කිව්වා, යන්ත්‍ර යුගය - Machine Age - කියලා. ඒක අවුරුදු සියයක් ඉදිරියට ගියා. එයින් ලෝකයේ විශාල පරිවර්තනයක් සිද්ධ කළා, 1860 දක්වා. වර්ෂ 1860 න් පස්සේ තෙල්, ගල් අඟුරු, විදුලිය, ගෑස් ආවා. ඒවාත් එක්ක අලුත් යුගයක් ආවා. ඒ යුගයට කිව්වා, පොසිල ඉන්ධන යුගය - Fossil Age - කියලා. ඊට පසුව, 1960දී අර්ධ සන්නායක යුගය, ඉලෙක්ට්‍රොනික යුගය සහ චන්ද්‍රිකා යුගය ආරම්භ වුණා. එයත් එක්කම තොරතුරු තාක්ෂණ යුගය - Information Age - එක ආවා. ආවා. දැන් 2010 වර්ෂයේ සිට අපේ ලෝකයේ තිබෙන්නේ සුහුරු යුගය යි. අපි එයට කියනවා, Smart Age කියලා. මොනවාද එයින් වෙන්නේ? එයින් වෙන්නේ අලුත් තාක්ෂණ ධාරා ගණනාවක් විසින් ලෝකය විප්ලවකාරී විධියට පරිවර්තනය කරන එක. ඉන් එකක් තමයි නැනෝ තාක්ෂණය. අනෙක තමයි ජීව තාක්ෂණය. තව එකක් තමයි, අණුක ජීව විද්‍යා තාක්ෂණය. ඒ වාගේම, ආහාර තාක්ෂණය, හරිත තාක්ෂණය, රොබෝ තාක්ෂණය, චන්ද්‍රිකා තාක්ෂණය යනාදී වශයෙන් අන්තර්ජාලය හරහා එකිනෙක ගැට ගැසුණු ක්‍රියාදාම ගණනාවක් ඇති වෙනවා.

ඊට අමතරව ලංකාවේ අලුත් දැනුම් ක්ෂේත්‍රයේ සේවා ඇති වෙලා තිබෙනවා. අද තේ පොල් රබර් කියන තුනෙන් රබර් සහ පොල්වලට වඩා ලොකු අපනයන ආදායමක් අදටත් ආණ්ඩුවේ කිසිම සහයෝගයක් නැතිව, දැනුම පදනම් කර ගත් ව්‍යාපාර විසින් ලබා ගන්වා. අපි ඒවාට කියන්නේ BPO and KPO කියලා. ඉතාම දුෂ්කර මට්ටමින් පටන් ගෙන තිබෙන මේ start-up companies විසින් දැනට ඩොලර් මිලියන 600කට අධික ප්‍රමාණයක් විදේශ විනිමය රටට ගෙන එනවා. මෙය බිලියන ගණනක ආදායමක් බවට පරිවර්තනය කරන්න පුළුවන් දෙයක්. මේ කාර්මික විප්ලවයට අපි සම්බන්ධ වන්නට ඕනෑ. තායිවානය, සිංගප්පූරුව, හොංකොං, කොරියාව යන මේ හැම රටක්ම බලවත් වුණේ තමන්ගේ සාපේක්ෂ වාසිය තෝරා ගැනීමෙන්. අපි එයට කියනවා, comparative advantage කියලා. ලංකාවේ අද මේ සාපේක්ෂ වාසිය ලාභ ශ්‍රමය නොවෙයි, අපට තිබෙන දැනුම මුල්කර ගත් ක්‍රියාදාමයයි. එම නිසා, මේ හතරවන කාර්මික විප්ලවයට අදාළ ඒ දැනුම අපේ දරුවන්ට ලබා දෙන ප්‍රධාන ස්ථානය තමයි අද හෝමාගම සහ මාලබේ ඉදි කරගෙන යන්නේ.

මම කියන්න ඕනෑ, ඒ පළාතේ මිනිසුන්ගේ ඉඩම් අක්කර 4000ක් ගන්නවාය කියලා පට්ටපල් බොරුවක් පතුරුවා තිබෙන බව. එවැනි කිසිම ක්‍රියාදාමයක් නැහැ. ඒ වාගේම, මේ ඉඩම් කොරියාවට විකුණන්නට යනවාය කියලා චෝදනාවක් තිබෙනවා.

කිසිම කොරියානු ආයතනයකට මෙතැන ඉඩම් විකුණන්නේ නැහැ. ඇත්තටම අපි කොරියානු ආණ්ඩුවට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ මුළු ප්‍රදේශයේම මූලික සැලසුම, ප්‍රධාන සැලසුම - Master Plan - අපට නොමිලේම සකස් කර දීම ගැන. ඇත්තටම "land use" කියන ඉංග්‍රීසි වචනය පටලවාගෙන තමයි මේ අක්කර 4,000ක් කොරියාවට දෙනවාය කියන කථාව පටන් ගත්තේ. නමුත් එවැනි කිසිම ක්‍රියාදාමයක් මෙතැන සිදු නොවන බව තහවුරු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම කියන්නට ඕනෑ, අපි මෙතැනින් දැනටමත් මෙන්න මේ ආයතනවලට ඉඩම් ලබා දීලා තිබෙන බව. මම මේ කියන්නේ 'කොරියාවට ඉඩම් විකුණනවාය' කියන තක්කඩින්ට උත්තරයක්. අපි කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය ගෙන යන්න අක්කර 17ක් දීලා තිබෙනවා. කොළඹ විශ්වවිද්‍යාලය තිබෙන්නේ ලංකාවේ, කොළඹ; කොරියාවේ නොවෙයි. අපේ දරුවන් තමයි එහි ඉගෙන ගන්නේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය ඉතාම දුෂ්කර තත්ත්ව යටතේ රත්මලානේ පවත්වාගෙන යනවා, සර්වෝදයට අයිති ඉඩම්වල, කිසිම පහසුකමක් නැතිව. අපි ඒ දරුවන්ට අක්කර 20ක් ලබාදීලා තිබෙනවා. ඒක මේ රටේ අපේ දරුවන්ටයි දීලා තිබෙන්නේ. ඊළඟට, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයට අපි අක්කර 20ක් දීලා තිබෙනවා. ඒක මේ රටේ ප්‍රධානතම තාක්ෂණ මධ්‍යස්ථානයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ඉඩම් දීලා තිබෙනවා. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය අපේ රටේ අනාගතයේදී ඉතාම ප්‍රබල ඉදිරි ගමනක් යනවා. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ඒ ප්‍රදේශයේ අනාගත සන්නිවේදන ධාරාවේ ප්‍රධාන කොදු නාරටිය, ඒ රැහැන් පද්ධතිය සැකසීමට භාරගෙන තිබෙනවා. අද ඒ අයගේ ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානය එතැන ස්ථාපිත කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම නැනෝ තාක්ෂණ ආයතනයට අක්කර 45ක් දීලා තිබෙනවා. අද සමහරු ගිහිල්ලා ඒ පළාතේ ජනතාවට කියනවා, මේ නැනෝ පර්යේෂණාගාරයෙන් නිකුත්වුණු කිරණවලින් තමයි පසු ගිය කාලයේ පෑවිල්ල ඇති වුණේ කියලා. මෙන්න මේ වාගේ කථා කියනවා. නැනෝ තාක්ෂණ ආයතනයේ අපේ ආචාර්ය, මහාචාර්යවරු ඉතාම විප්ලවකාරී පරිවර්තන කිහිපයක් කළා. එකක් තමයි, අද ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ඇඳුම. ඒක self-cleaning apparel එකක්; දහඩිය ගෑවෙන්නේ නැහැ. අපේ රටේ නෙළුම් කොළයේ ආදර්ශය අරගෙන තමයි නැනෝ තාක්ෂණ ආයතනය ඒ ඇඳුම නිර්මාණය කළේ. ඒක අද ලෝකයේ ප්‍රධාන තාක්ෂණ පිම්මක් බවට පත් වුණා.

අද අපේ කුඹුරුවලට යොදන පොහොරවලින් සියයට 50ක් අපතේ යනවා. නමුත් නැනෝ තාක්ෂණ ආයතනයේ අපේ විද්‍යාඥවරියක් පොහොරවලින් සියයට 50ක් ඉතිරි කර ගන්නට පුළුවන් වැඩ පිළිවෙළක් nanoparticles වලින් නිර්මාණය කළා. ඒවා තමයි මෙතැන කෙරෙන්නේ. ඒවා තමයි අද මේ රටට අවශ්‍ය. තුට්ටු දෙකේ දේශපාලනය කරන අය, මේ පළාතේ මිනිස්සු තමන්ගේ විප්ලවයේ කොටස්කාරයන් කර ගන්නට, "මෙතැනින් අහසට තරංග යවලා පෑවිල්ල ඇති කළාය" කියන්නට උත්සාහ කරනවා, භය වද්දලා. ඒ අපේ ජනතා විමුක්ති පෙරමුණ නොවෙයි. ඒකත් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙන්න මෙවැනි ඉදිරි ගමනක් ඒ නැනෝ තාක්ෂණ ආයතනය ආරම්භ කරලා තිබෙනවා. අපි ඒකේ ඊළඟ පියවරටත් යනවා.

අද අපේ රටේ මුලතිවුවල විශාල ඛනිජ සම්පතක් තිබෙනවා. අපට ඒ ඛනිජ සම්පතින් ටයිටේනියම් ලෝහය වෙන් කර ගන්නට පුළුවන් නම්, ටයිටේනියම් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 14,000ක් ගන්න අපට පුළුවන්. අද අපට හම්බ වෙන්නේ ඇමෙරිකානු ඩොලර් 300යි. ඒ ලෝහයෙන් ටයිටේනියම් වෙන් කර ගැනීමේ පර්යේෂණ සිදු කරන පර්යේෂණාගාරය සහ ඒ සඳහා අවශ්‍ය අනෙකුත් උත්පාද ක්‍රියාවලිය එතැන සිදු වෙනවා. තව අවුරුද්දකින් දෙකකින් ඒ ප්‍රතිඵලය අපට හම්බ වෙනවා. එතකොට, මේ රටට ඒවා අපනයනයෙන් යෝධ ධනයක් ගලාගෙන එනවා. මෙන්න මේකයි අපි අද ඒ නැනෝ තාක්ෂණ ආයතනයෙන් කරගෙන යන්නේ.

ඊළඟ කාරණය, මහින්ද රාජපක්ෂ විද්‍යාලය. අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාට. එතුමා ඒ ප්‍රදේශයේ ආසන සංවිධායක. නමුත්, එතුමා මේ කටයුතුවලට එක

වචනයකින්වත් විරුද්ධ වෙලා නැහැ. මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ ළමයි 7,000ක් ඉගෙන ගන්නවා. අද ඒ පළාතට මේ ගැන සාකච්ඡා කරන්නට ගියාම, ඒ මිනිස්සු කියන්නේ මොකක්ද? ඉස්සර මේ වත්තේ පොල් ගෙඩි 4,000ක් කැඩුණා, දැන් ඒක නැති වුණා මහින්ද රාජපක්ෂ හින්දා කියලා. ඒ පළාතේ ශිෂ්‍යත්වය පාස් වුණු ළමයි 7,000ක් ඉගෙන ගෙන විශ්වවිද්‍යාලවලට යනවා. ඒ කාරණයයි මේ පොල් ගෙඩි 4,000යි සංසන්දනය කරනවා. මේක තමයි අපි වෙනස් කර ගන්නට ඕනෑ ආකල්පය. ඒ පාසල එතැන හැදීම නිසා ඇත්තටම ඒ ප්‍රදේශයට ආලෝකයක් ලැබුණා. නමුත් ඒකට පහසුකම් නැහැ; යන්න පාරක් නැහැ; ඒක දියුණු කරන්නට විධියක් නැහැ. මේ ක්‍රියාවලියෙන් සිදු වන්නේ ඉදිරියේදී ඒකත් දියුණු වන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මිණුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවට අක්කර 5ක් දීලා තිබෙනවා. පොත් ගබඩාවකට දීලා තිබෙනවා, අක්කර 7ක්. ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයට අක්කර 2ක් දීලා තිබෙනවා. ඉදිරියේදී අපි කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට, කැලණිය විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයට ඉඩම් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, අපට ජේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධි ආයතනයකට යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා. මාලබේ කාර්මික තාක්ෂණ ආයතනයෙන් වාගේම ජානවිද්‍යා සහ අනුපරමාණුක ජීවවිද්‍යා පර්යේෂණ කරන ආයතනවලින් අපට යෝජනා ඇවිල්ලා තිබෙනවා. අපි ඒවා ඉදිරියේදී සලකා බලනවා.

අපි මේ සඳහා මොනවාද කරගෙන යන්නේ? අපි මේ සඳහා ඉඩම් අක්කර 246ක් අත්කර ගන්න යනවා. ඒ ඉඩම් අක්කර 246ට කිසිම පුද්ගලයකුගේ පර්චස් 10, පර්චස් 15 ඉඩම් කැබලි හෝ අක්කර භාගයේ ඉඩම් කැබලි හෝ එකම ගෙයක් හෝ අයිති වන්නේ නැහැ. මේවා ප්‍රධාන වතු 5ක්. දෙහිගහවත්ත පිටිපන දකුණේ අක්කර 23ක්, තලගලවත්ත තලගල උතුරේ අක්කර 27ක්, දඹගොල්ලවත්ත අක්කර 34ක්, හොරගලවත්ත අක්කර 120ක්, කාවුලූහේන අක්කර 42ක් අත්කරගෙන තිබෙනවා. මේ ඉඩම්වල අයිතිකරුවන් 5දෙනාගෙන් 3දෙනෙක් ඇවිල්ලා මාව හම්බවෙලා, "මෙවැනි විශිෂ්ට කාර්යයකට මේ ඉඩම් දෙන්න ලැබීම අපේ පිනක්" කියලා කිව්ව බව මා කියන්න ඕනෑ. අද මේ පෙළපාළි යන අය ඒ කාරණය මතක තබා ගන්න ඕනෑ. කිසිම කෙනකුගේ නිවාසයක් තිබෙන ඉඩම් අපි අත්පත් කර ගන්නේ නැහැ. අපි NSBM ආයතනය එතැන හැදුවා. දැන් ඒක පළල් කරන්න යනවා. එය පළල් කරන්න කුරුඳුවත්ත ගත්ත එක ඇත්ත. ඊට මෙහා පැත්තේ අවුරුදු ගණනක් පරණ උක් වගාවක් තිබෙනවා. අද හරිත විශ්වවිද්‍යාලයෙන් ඉතාම විශිෂ්ට ගණයේ සේවයක් සිද්ධ වෙනවා. අපි ඒවා තවදුරටත් පළල් කරනවා.

ඒ විතරක් නොවෙයි. තාක්ෂණික නගරය ඉදි කිරීම නිසා මේ ප්‍රදේශයේ පාරවල් වැඩිදියුණු වෙනවා. පිටිපන - තලගල පාර, දාම්පේ මාර්ගය, උඩුවන පාර, කහතුඩුව, මාඟේන්වත්ත පිවිසුම් මාර්ගය, ඒ වාගේම අභ්‍යන්තර ප්‍රධාන මාර්ග මේ ආයතනවලට ප්‍රවාහන පහසුකම් සපයනවා. ඒ ප්‍රවාහන පහසුකම ලැබෙනවාත් එක්ක මොකද වෙන්නේ? මේ ඉඩම්වල වටිනාකම වැඩි වෙනවා. රුපියල් 50,000කට තිබුණු පර්චස් එක, මේ පාරවල් හදන්න පටන් ගත්තාට පස්සේ දැනටම රුපියල් ලක්ෂ 3 දක්වා වැඩිවෙලා තිබෙනවා. ජනතාවගේ ඉඩම් කොල්ල කනවාය කිව්වාට යථාර්ථය තමයි රාජ්‍ය ආයෝජනත් එක්ක මේ ඉඩම්වල මිල ගණන් වැඩිවන එක. හයිලෙවල් පාර පළල් කරනකොටම ඉඩම් මිල වැඩි වුණා. අපි දැක්කා, කඩවත දක්වා අධිවේගී මාර්ගය ඉදි කිරීමට පෙර රුපියල් ලක්ෂ එකහමාරට, රුපියල් ලක්ෂ දෙකට තිබුණු පර්චස් එක අද රුපියල් ලක්ෂ 30ක් කියලා. අධිවේගී මාර්ගය හම්බන්තොට දක්වා ඉදිවනකොට අහුනකොළපැලැස්ස ප්‍රදේශයේ ඉඩම් පර්චස් එකක මිල රුපියල් මිලියන ගණනක් වෙනවා. අපි හැමදෙනාම කථා කරනවා, ඉඩම් කොල්ලකෑම ගැන. නමුත් මේ තුළින් සෑම පෞද්ගලික ඉඩමකම වටිනාකම වැඩිවෙනවා.

ඒ විතරක් නොවෙයි. ඉතිහාසයේ කවරදාකවත් නැති විධියට 220KV විදුලි බල පද්ධතිය අපි මෙතැනට ගෙනෙනවා. ඒ වාගේම ජල පද්ධතිය පැති දෙකකින් මෙතැනට ගෙනෙනවා. එතකොට මේ කලාපයේ තිබෙන ජනාවාසවලටත් අලුතින් ජලය ලැබෙනවා වාගේම අනාගතයේදී කවුරුන් හෝ ඒ ප්‍රදේශයේ පදිංචි වෙනවා නම් ඒ හැම කෙනාටම මේ තුළින් ප්‍රයෝජනයක් ලැබෙනවා.

අද බලන්න, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් 11,000ක් අධ්‍යාපනය ලබනවා. එම විශ්වවිද්‍යාලය තුළින් අද විජේරාම ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය මොන තරම් ගොඩනැඟිලා තිබෙනවාද? බත් මුල දෙන්න, hostel එක දෙන්න, ඒ වාගේම අනෙකුත් ඇඳුම් පැළඳුම් දෙන්න, පොත පත විකුණන්න ආදී වශයෙන් මොන තරම් ආර්ථිකයක් අද විජේරාම ප්‍රදේශයේ ගොඩනැඟිලා තිබෙනවාද?

තාක්ෂණික නගරය ඉදි කිරීම නිසා තව අවුරුදු 10කින් හෝමාගම ප්‍රදේශයට ශක්තිමත්, බලගතු ආර්ථිකයක් ඇතිවෙනවා. අද විරෝධතා දක්වන සියලුදෙනාගෙන් ඇතැම් පිරිස්වලට නම් මේ ගැන වුවමනාවක් නැහැ. මේ ගැන යම්කිසි කෙනෙක් මායාවක ඉන්නවා නම් ඒ හැම කෙනාටමත්, ඒ ප්‍රදේශයේ පදිංචි ඇත්තන්ටත් -පිට ප්‍රදේශවලින් ඇවිල්ලා ඉන්න විප්ලවකාරයින්ට නොවෙයි- අනිවාර්යයෙන්ම මෙයින් ප්‍රයෝජනයක් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ඉඩම්වලින් මොකක්ද කරන්න යන්නේ? දෙහිගහවත්ත අක්කර 23හි අපි තාක්ෂණික බෙදා හැරීමේ හා සුළු මධ්‍ය පරිමාණ ව්‍යාපාර උපකාරක මධ්‍යස්ථානයක් -incubation centre එකක්- සහ නවෝත්පාදන වාණිජකරණය කිරීමේ ආයතනයක් ඇති කරනවා. නවෝත්පාදනය සඳහා කැපවන තරුණ තරුණියන් ඉන්නවා නම්, වෙනත් අය ඉන්නවා නම්, ඒ අයගේ නවෝත්පාදන වාණිජකරණය - commercialization - කිරීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණාගාරයක් ඉදි කරනවා. ඊළඟට හරිත කලාපයක් ඇති කරනවා. ඉතින් මේවා වැරැදිද? මේවාද, අපි කරන හානිය?

ඊළඟට, තලගල උතුරේ අක්කර 27හි අපි ප්‍රධාන වශයෙන්ම කරන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ grid උපපොළ ඉදි කරන එකයි. ඒ වාගේම එම ප්‍රදේශයට වැටෙන වැසි ජලය සහ අනෙකුත් ජලය පිරිසිදු කිරීම සඳහා පිරිපහදු මධ්‍යස්ථානයක් අපේ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් පිහිටුවනවා.

දඹගොල්ලවත්ත අක්කර 34හි පෙව තාක්ෂණික පර්යේෂණ ආයතනයක් ඇති කරනවා. මෙහිදී කියන සරලම කාරණය මොකක්ද? ලංකාවේ ජාන හොරකම් කරන්න යනවාය කියනවා. ලංකාවේ ජාන හොරකම් කරන්න යනවාය කියලායි මේ කියන්නේ. ලංකාවේ ජාන පමණක් නොවෙයි, ලෝකයේ ඕනෑම ජානයක් සම්බන්ධයෙන් ඕනෑම කෙනකුට පර්යේෂණය කරන්න පුළුවන්. රජයේ සම්පූර්ණ අධීක්ෂණය යටතේ මේ රටේ ජාන ක්‍රියාදාමය මඟින් අද කරලා තිබෙන දේවල් නලින්ද ජයතිස්ස වෛද්‍යාචාර්යතුමා දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් දන්නවා. ජාන ක්‍රියාදාමය මඟින් අද ලෙඩ රෝග ගණනාවකට පිළිතුරු දීලා තිබෙනවා. මවගේ සිට ඒ ක්‍රියාදාමය වෙනස් කරලා, මේ ලෝකයේ ආවේණික ලෙඩ රෝග දහස් ගණනක් සුවකර තිබෙනවා. ඒ වාගේම අපේ සතුන්ට, ශාකවලට නොයෙක් ආකාරයට වැලඳෙන රෝග වළක්වන්නත් මේ ක්‍රියාදාමය තුළින් පුළුවන්වෙලා තිබෙනවා.

[ගරු පායලී චම්පික රණවක මහතා]

හැබැයි, අපි එක් කාරණයක් කියනවා. ජාන විකෘති කිරීමෙන් හෝ අනෙකුත් කාරණාවලින් කෙරෙන දේවල් පර්යේෂණවලට හසු කරන්නේ නැතිව කිසිම ආකාරයකින් මනුෂ්‍ය පරිභෝජනයට හෝ වෙනත් කරුණුවලට යොදා ගන්නේ නැහැ. කිසිම ආකාරයකින් පසුව ප්‍රශ්න ඇති නොවන දේවල්වලට විතරයි මෙතැන ඉඩකඩ සලසලා තිබෙන්නේ කියලා දැනටමත් ලෝකයට සහතික වෙලා තිබෙනවා.

හොරගලවත්තේ අක්කර 120ක ආතර් සී ක්ලාක් පර්යේෂණ ආයතනය ඉදි කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම විද්‍යා හා තාක්ෂණික ආයතනය ඉදි කරන්නත් බලාපොරොත්තු වනවා. දැන් එතැන නේචර්ස් සීක්‍රට්ස් ආයතනය පවත්වාගෙන යනවා. එතැන තවදුරටත් එම ආයතනය පවත්වාගෙන යන්න කියලා අපි ඒගොල්ලන්ට ඉඩ දීලා තිබෙනවා. ඒ ඉඩම අපි ගන්නේ නැහැ. ඒ ආයතනයටම ඒ කටයුත්ත ඉදිරියට ගෙන යන්න අපි ඉඩකඩ ලබා දෙනවා. ඒ වාගේම ළමා උද්‍යානයක්, වාණිජ මධ්‍යස්ථානයක් එතැන ඉදි කරන්න අපි බලාපොරොත්තු වනවා.

ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය ගැනත් මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ලංකාවට අභ්‍යවකාශයේ චන්ද්‍රිකා දෙකක් රඳවා ගැනීමේ අයිතිය තිබෙනවා. පසුගිය ආණ්ඩුව කාලයේ කළේ මොකක්ද? චීන චන්ද්‍රිකාවක් යවනකොට, ලංකා විදුලිබල මණ්ඩලය ගල්අඟුරුවලින් උපයා ගත් රුපියල් මිලියන 460ක් රාජපක්ෂ පුතාට දීලා, ලංකාවේ චන්ද්‍රිකාවක් යැව්වාය කිව්වා. ලංකාවේ කිසිම චන්ද්‍රිකාවක් ඒ ආකාරයට යවලා නැහැ. නමුත් ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය අපේ පළමුවැනි චන්ද්‍රිකාව වශයෙන් නැනෝ චන්ද්‍රිකාවක් යවන්න දැන් සූදානම් කරලා තිබෙනවා. ඒ වාගේම UNESCAP එක අපට චන්ද්‍රිකාවක් ලබා දෙන්න බලාපොරොත්තු වනවා. ඒ චන්ද්‍රිකාවේ සම්ප්‍රේක්ෂණය ලබා ගන්නා ස්ථානය - receiving station එක- අපි මේ ස්ථානයේ පිහිටුවනවා. ඒ අනුව සියලුම කාලගුණ වාර්තා, අනෙකුත් සියලුම දේශගුණික වාර්තා, ඒ වාගේම GIS mapping යන මේ සියල්ලම අපේ විද්‍යාඥයන්ට රට ඇතුළේ කරන්න පුළුවන්. අද මේ කටයුත්තට රුපියල් කෝටි ගණනක් ගෙවන්න ඕනෑ.

අද අපේ අමාත්‍යාංශය විසින් ජල මට්ටම පිළිබඳව දැනුම් දෙනවා. මම හැම දාම කථානායකතුමාට කථා කරලා කියනවා, "අද ජල මට්ටම මීටර් 1.2යි. මීටර් 1.65යි. මීටර් 2 වුණු හැටියේ ගංවතුර එනවා" කියලා. අද අපි මෙහෙම කියන්න ජපානයෙන් තමයි මේ තොරතුරු ලබා ගන්නේ. ජපානය අපිට දැනෙන සේවයක් හැටියට තමයි මේ කටයුත්ත කරන්නේ. නමුත් ඉදිරියේදී ඔවුන් අපිට එය සේවයක් හැටියට කරන්නේ නැහැ. මේ මධ්‍යස්ථානය තුළින් අපට මේ සියල්ලම ලබා ගැනීමේ හැකියාව තිබෙනවා.

අභ්‍යවකාශයේ ඉඳලා බැලුවාම ලංකාව කියන්නේ පුංචි තැනක්. සෑම දෙයක්ම මේ මධ්‍යස්ථානයෙන් කරන්න පුළුවන්. නමුත් මේ සම්බන්ධයෙන් කියලා තිබෙන කථාව මොකක්ද? මේ මධ්‍යස්ථානයේ ඉඳලා කිලෝමීටර් දෙකක් දක්වා කිරණ නිකුත් වනවා ලු. මේ මධ්‍යස්ථානය නිසා පිළිකා හැදෙනවා ලු. මේක තමයි මේ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් කියන කථාව. මෙන්න මේ වාගේ අමූලික අසත්‍ය මත පදනම් වෙලා තමයි කථා කරන්නේ. අපි අනිවාර්යයෙන්ම මේ තාක්ෂණික ප්‍රවාහයට ඇතුළු වෙන්න ඕනෑ. අපට තනියෙන් කර ගන්න බැරි දෙයක් අද එක්සත් ජාතීන්ගේ සංවිධානයේත් ශක්තිය ඇතිව කරගෙන යාම සඳහා ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයට ලැබිලා තිබෙනවා. ඇත්තටම ආතර් සී ක්ලාක් මහත්මයා ගැන අපි ආඩම්බර වන්නට ඕනෑ. එතුමා 1945දී තමයි මේ විද්‍යාත්මක පත්‍රිකාව ලිව්වේ. චන්ද්‍රිකා තුනක් දැම්මාට පස්සේ ලෝකයේම පණිවුඩ හුවමාරු කරන්න පුළුවන් කියලා එතුමා මේ විද්‍යාත්මක පත්‍රිකාව ලිව්වා. එතුමාට ඒකට ලැබුණේ පවුම් 15යි. හැබැයි, අද ඒක ට්‍රිලියන ගණනක ව්‍යාපාරයක්. ඒ නිසා අපි වහාම මේ ක්‍රියාදාමයට ඇතුළු විය යුතුයි.

ඊළඟට, අපේ ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණික පර්යේෂණ සංකීර්ණය අපි කාවුලුහේන ප්‍රදේශයේ පිහිටුවන්න බලාපොරොත්තු වනවා. ඒ කටයුත්ත කරන්නේ COSTI කියන ආයතනයෙන්. ඇත්තටම 1960 ගණන්වල විද්‍යා හා තාක්ෂණ ආයතන අපේ රටේ පිහිටුවද්දි මීට සමාන්තර ආයතන කොරියාව වැනි ප්‍රදේශවලත් පිහිටෙව්වා. නමුත් අපේ ආයතනයට සාර්ථක වෙන්න බැරි වුණාට ඒ රටවල්වල ආයතන සාර්ථක වෙලා තිබෙනවා. ඒ ආදර්ශය සැලකිල්ලට අරගෙන නව විද්‍යා හා තාක්ෂණික පර්යේෂණ ආයතනයක් එතැන අපි කරගෙන යනවා. ඒ වාගේම මෙහි යටිතල පහසුකම් සියල්ල අපි සපයනවා.

මම මේ කාරණයත් ගැනත් මේ අවස්ථාවේ දී කියන්න ඕනෑ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, අපජල කළමනාකරණය, යන ඒ සියල්ලම මෙතැන සිදු වනවා. ඒ වාගේම මේ ඉඩම් අත්පත් කර ගැනීමේ දී රජය ඒ අයට වන්දි ලබා දෙනවා. ඕනෑම කෙනෙක් තමන්ගේ අයිතිවාසිකම නිශ්චිතව සහතික කළ වහාම ඒ අයට වන්දි ලබා දෙනවා. අපි ඒ වන්දිය ප්‍රාදේශීය ලේකම්වරයා ළඟ තැන්පත් කරනවා. දැනට තිබෙන තත්ත්වය අනුව සෑම අවුරුද්දක් පාසාම සියයට 7 ගණනේ ඒ වන්දි මුදල ඉහළ යනවා, අයිතිකරු සොයාගෙන ගෙවන තුරු. මෙහි තිබෙන ඇතැම් වගන්ති අල්ලාගෙන, ඇතැම් අයගේ තිබෙන දේශපාලන වුවමනාවන් මත මේ කටයුත්ත ක්‍රියාත්මක වනවා. අපි මේවා ගැන දැනුවත් කළේ නැහැ කිව්වාට මේ කාරණා සම්බන්ධයෙන් අපි පුළුවන් තරම් ජනතාව දැනුවත් කළා. හෝමාගම ප්‍රදේශයේ මේ රජයට අයිති පක්ෂවලින් නොවෙයි පසුගිය දවස්වල ප්‍රාදේශීය සභාව පිහිටුවා තිබෙන්නේ. ප්‍රාදේශීය සභාව පිහිටුවලා තිබෙන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන්. ඒ ප්‍රදේශයේ දේශපාලන බලධාරියා අපේ බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමායි. තවම කවුරුවත් ඒවාට විරුද්ධ වෙලා නැහැ. ඒගොල්ලන් අපේ අමාත්‍යාංශයට ඇවිල්ලා කථා කරලා, මේ කරුණු ඉගෙන ගෙන, අපිටත් යම් යම් යෝජනා ඉදිරිපත් කරනවා. ඔවුන් අපිත් එක්ක සහයෝගයෙන් කටයුතු කරගෙන යනවා. කවුද, මේක කරන්නේ? SAITM ප්‍රශ්නයෙන් පස්සේ තමන්ට දඩ බිමක් හොය හොයා ඉන්න දේශපාලන කල්ලියක් දෙකක් ගිහිල්ලා, ජනතාව බිය වද්දමින් කටයුතු කරනවා. මේකයි ඇත්ත. අපේ දරුවනුත්, අපිත් ජීවත් වෙන්නේ මේ රටේ. හැබැයි, ඔය උද්ඝෝෂණකරුවන්ගේ දරුවන් ජීවත් වෙන්නේ, පවුල් ජීවත් වෙන්නේ ඕස්ට්‍රේලියාවේ. එහේ ඉඳගෙන තමයි මේ ළමයි ටික පාරට ගන්නේ. ඒගොල්ලන්ගේ ළමයි ඕස්ට්‍රේලියාවේ ජීවත් වනකොට, ඔවුන් අපේ ළමයි ටික පාරට ගෙනෙනවා.

ඒක තමයි, මේ උද්ඝෝෂකයන්ගේ ක්‍රියාදාමය. මමත්, අපේ දරුවෝත් -අපි හැමෝම- මේ රටේ ඉපදිලා, මේ රටේ ඉගෙන ගන්නා අයයි. මගේ ළමයි ඉගෙන ගන්නේත් ආණ්ඩුවේ විශ්වවිද්‍යාලයේ. අපි මේ රටේ සිටින අයයි. අපි ඒක සෑම ජන කණ්ඩායමකටම බොහොම පැහැදිලිව කියනවා. මම මේ කොළඹ දිස්ත්‍රික්කයේ කෙනෙක්. මටත් මනාපය ලබා දුන් ජනතාවක් මෙහේ ඉන්නවා. අපි ඒ අයට කියනවා, අපි කිසිම අවස්ථාවක අපේ ජනතාවට වැරැද්දක් වෙන දෙයක් කරන්නේ නැති බව. ඒ වාගේම, මේ රටේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියට හෝ ඒ ක්‍රියාදාමයට අපි වැරැද්දක් කරන්නේ නැහැ. නමුත්, අපි එක දෙයක් මතක තබා ගන්න ඕනෑ. මේ සාම්ප්‍රදායික ආර්ථික උපාය මාර්ගයෙන්, මේ සාම්ප්‍රදායික අධ්‍යාපන උපාය මාර්ගයෙන්, මේ සාම්ප්‍රදායික තාක්ෂණ උපාය මාර්ගයෙන් මේ රට ගොඩගන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ ලෝකයේ ලොකුම ධනවතුන් කවුද? කාලයකට කලින් නම් මේ ලෝකයේ ලොකුම ධනවතුන් ආයුධ වෙළෙඳුන්. කාලයකට කලින් මේ ලෝකයේ ලොකුම ධනවතුන් ඖෂධ වෙළෙඳුන්. ඔබතුමිය මේ දේවල් දන්නවා. කාලයකට කලින් මේ ලෝකයේ ලොකුම ධනවතුන් වුණේ තෙල්-ගෑස්කාරයෝයි. තෙල්, ගෑස්, ගල් අඟුරු ව්‍යාපාරිකයෝ තමයි ලෝකයේ ලොකුම ධනවතුන්. නමුත් අද ලෝකයේ ලොකුම ධනවතුන් කවුද? ඇමෙරිකා එක්සත් ජනපදයේ ලොකුම ධනවතුන් කවුද? ඒ ලොකුම ධනවතුන්ට කියන්නේ "FAANG" කියායි. මොකක්ද, ඒකේ තේරුම? "F" අකුරෙන්, Facebook; "A" අකුරෙන්, Apple; අනෙක් "A" අකුරෙන්, Amazon; "N" අකුරෙන් Netflix -අද මුළු ලෝකයේම සියලුම වීඩියෝ පට, චිත්‍රපට හදන්නේ Netflix.- "G" අකුරෙන්, Google එක. මේ අය තමයි අද ලෝකයේ ට්‍රිලියනාධිපතිවරු. මේවා ට්‍රිලියනයක් වත්කම් තිබෙන ව්‍යාපාර. කිසිම තෙල් හා ගෑස් සමාගමක්, කිසිම ඖෂධ සමාගමක්, කිසිම ආයුධ නිපදවන්නෙක් කිට්ටුවකවත් නැහැ. මේ සමාගම් සියල්ල කොහොමද බිහි වුණේ? පසුගිය අවුරුදු 10 තුළ තමයි මේවා බිහි වුණේ. අවුරුදු 10කට කලින් Facebook එකක් තිබුණාද?

මාක් සකර්බර්ග් කියන්නේ කවුද? ඔහු සාමාන්‍ය කෙනෙක්. අද අපේ රටේත් එවැනි ව්‍යාපාරික පන්තියක් බිහි වෙමින් සිටිනවා. අද ලංකාවේ ලොකුම ධනපතියා තොරතුරු තාක්ෂණය ඔස්සේ ගොඩනැඟුණු කෙනෙක් මිසක්, ලංකාවේ අපි දන්නා කියන සල්ලිකාරයෝ නොවෙයි. ඔහුගේ වත්කම ඩොලර් බිලියන 1.7යි. ඉදිරියේ මෙවැනි දහ පහළොස්දෙනෙක් බිහි වෙනවා. අපි සතුටු වෙන්න ඕනෑ, කෙනෙක් එතැනට ගිය එක ගැන. මේ රටේ වතු අක්කර තිස් හතළිස්දහසක අයිතිය තිබිලා හෝ, මේ රටේ සමාගම් තිහ හතළිහක අයිතිය තිබිලා හෝ, මේ රටේ බැංකුවල අයිතිය තිබිලා හෝ, මේ රටේ අරක්කු කඩවල අයිතිය තිබිලා හෝ නොවෙයි ඒ අය එතැනට ඇවිත් තිබෙන්නේ. ඒ අය එතැනට ඇවිත් තිබෙන්නේ දැනුම පදනම් කර ගත් අයිතියකින්. අද එවැනි ව්‍යාපාරික පිරිස් බය නැතුව ඉදිරියට ඇවිල්ලා මේ ක්‍රියාදාමයට ඇතුළු වෙනවා. අපි ඒ ගොල්ලන්ට ශක්තිය වෙන්න ඕනෑ; ඒ ඉඩකඩ ලබා දෙන්න ඕනෑ. ඒ කටයුත්ත කරන්න බැංගලෝරයට පුළුවන් නම්, අපිටත් එය පුළුවන් වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉංජිනේරුවෙකු හැටියට මම මෙන්න මේ කාරණයත් කියන්න කැමැතියි. අද ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉංජිනේරුවෙකුගෙන් වැඩක් ගන්න නම් - විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණ ඉංජිනේරුවෙකුගෙන්- දවසකට අඩුම ගණනේ ඩොලර් හත් අටසියයක් ගෙවන්න වෙනවා. නමුත් ලංකාවේ ඒ කුසලතාවම තිබෙන අය ඉන්නවා. ඒ අය ඩොලර් තිහට, හතළිහට වැඩ කරන්නේ. එයින් පෙනී යන්නේ, ඒ කුසලතාව සහිතව අද ලංකාවේ ඉඳගෙන අපට කටයුතු කරන්න පුළුවන්ය කියන එකයි. අද ඩී.එස්. සේනානායක හන්දියේ සහ හැම තැනකම එම ව්‍යාපාර කටයුතු කරගෙන යනවා. දැන් ඒ ව්‍යාපාරය පටන් අරගෙනයි තිබෙන්නේ. ඒ මොකක්ද? KPO business එක. ඔස්ට්‍රේලියාවේ සුපිරි වෙළෙඳ සැල්වල accounts හදන්නේ ලංකාවේ. අද කොළඹ ඉඩ නැහැ. ඒක තමයි අද අපි එතැන ඇති කරන්න යන්නේ. මේ ක්‍රියාදාමයට ඉඩ දෙන්න. මේ තාක්ෂණ විප්ලවයට කරුණාකරලා ඉඩ දෙන්න. මේක තමයි අපේ අනාගතය.

අද චීනය දිහා බලන්න. චීනයේ ගොඩනහා තිබෙන දේවල් දිහා බලන්න. සාමාන්‍ය අය කෝටිපතියෝ වෙලා. ඊයේ-පෙරේදා විශ්‍රාම ගිය අලිබාබා ව්‍යාපාරයේ ජැක් මා, ඉංග්‍රීසි ගුරුවරයෙක්. ලෝකයේ ලොකුම හුවාවි සමාගමේ නිර්මාතෘවරයා චීනයේ රතු හමුදාවේ හිටපු සෙබළෙක්. Baidu කියන ප්‍රධාන search engine එක මෙහෙය වූ පුද්ගලයා සාමාන්‍ය තරුණයෙක්. අද මෙවැනිම පිරිසක් මලයාසියාවේත් බිහි වෙලා ඉන්නවා; ඉන්දියාවෙත් බිහි වෙමින් ඉන්නවා. ලංකාවෙත් අපි මෙවැනි පිරිසක් බිහි කරන්න ඕනෑ.

ගරු නලින්ද ජයතිස්ස මැතිතුමාටත්, එතුමන්ලාටත් වැඩියෙන් විප්ලවය ගැන කථා කරන අයටත් මම එක දෙයක් කියන්න ඕනෑ. අපි ඉස්සර -තරුණ- කාලයේ කිව්වේ, "අපි යන්නේ කොයි පාරේ? ෆිදෙල් කැස්ත්‍රෝ ගිය පාරේ" කියායි. දැන් කැස්ත්‍රෝලාගේ යුගය ඉවරයි. බොහොම කනගාටුවෙන් වුණත් මම ඒක කියන්න ඕනෑ. නමුත් අපි ආඩම්බරයෙන් කියන්න ඕනෑ, ලංකාවත්, කියුබාවත් අද මානව සංවර්ධන දර්ශකයෙන් ආසන්නයෙන් සමානයි කියන එක. ඒකයි ඇත්ත. අද වනවිට අපි දෙගොල්ලන්ම ආසන්නයෙන් සමානයි. ඒ නිසා අද අපි යන්න ඕනෑ, සකර්බර්ග්ගේ පාරෙයි. අපි ඒකෙන් කැස්ත්‍රෝට අවමානයක් කරන්නේ නැහැ; වේ ගුවේරාට අවමානයක් කරන්නෙත් නැහැ. අපිත් කොල්ලෝ කාලයේ ඒවා ඔක්කෝම කළා. අපි දැන් යන්න ඕනෑ, සකර්බර්ග්ගේ පාරෙයි. ඒකට අවශ්‍ය කරන "සකර්බර්ග්"ලා දහස් ගණනක් මේ රටින් බිහි කරන ව්‍යාපාරයක් ඇති කරන්න ඕනෑ. මේකට එරෙහිව කටයුතු කරන, වංචාවෙන් මුළාවෙන් කටයුතු කරන සියලුදෙනාටම අනාගතයේ දිනයක කනගාටු වෙන්න සිදුවෙයි. අපි කිසිම ජනතාවකට හානියක් නොකර, කිසිම බලහත්කාරකමක් පාන්නේ නැතිව, කිසිම කෙනෙකුට එරෙහිව බලය පාවිච්චි කරන්නේ නැතිව ඉතාම සබුද්ධිකව මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යනවා. මේ යහ පාලනයේ අරමුණත් ඒකයි.

"ජේම්ස් ටෙලර් 1867දී ලංකාවේ මුල්ම තේ පැළය හිටවපු වෙලාවේ, ඒ තේ ගහ ලංකාවේ අපනයන ආර්ථිකයේ බලවතා වෙයි කියලා ඔහු කවදාවත් කල්පනා කළේ නැතිව ඇති" කියා විවෘත කිරීමේ උත්සවයට ගරු අගමැතිතුමා පැමිණි දවසේ අපි කිව්වා. 1977දී උපාලි විජේවර්ධන කටුනායකට ගිහින් නිදහස් වෙළෙඳ කලාපය ඇති කළ වෙලාවේ, ආර්ථිකයේ ඊළඟ පිම්ම මේකයි කියා ඔහු කල්පනා කළේ නැහැ. අද මේ ආරම්භ කර තිබෙන දේ තමයි ඉදිරි දශකයේදී මේ රටේ ආර්ථිකයේ ජවන ඇන්ජිම වෙන්නේ. ඒ සඳහා දායක වන ලෙස මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුදෙනාගෙන්ම මා ඉල්ලා සිටිනවා. එයට අදාළ ඕනෑම ප්‍රශ්නයක් අහන්න. ඊට අදාළ වන ඕනෑම සංවාදයකට අපි විවෘතයි. මෙහිදී කිසිම කෙනෙකුට කිසිම අසාධාරණයක් නොකරන බවත් ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*ඒකමතිකව විධිවත් කරන ලදී.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.23ට, 2018 ඔක්තෝබර් 11වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය.***


*அதன்படி பி.ப. 7.23 மணிக்கு பாராளுமன்றம், 2018 ஒக்ரோபர் 11, வியாழக்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 7.23 p.m. until 10.00 a.m. on Thursday, 11th October, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 263 - இல. 11
Volume 263 - No. 11

2018 ඔක්තෝබර් 11වන බ්‍රහස්පතින්දා
2018 ஒக்ரோபர் 11, வியாழக்கிழமை
Thursday, 11th October, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ආපදාවට ලක් වූවන්ට සහන
සයිටම් ආයතනය සම්බන්ධව ගත් තීරණ හේතුවෙන් පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය

**වරප්‍රසාද:**
පාර්ලිමේන්තුවේ කථා කිරීමට කාලය වෙන් නොකිරීම

**රසායනික අවි සම්මුතිය පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමු වන වර කියවන ලදී.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව:**
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නියෝජිතයන් නම් කිරීම

**ආනයන හා අපනයන (පාලන) පනත:**
නියෝග

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත:**
නියෝගය

**කල්තැබීමේ යෝජනාව:**
මහවැලි "එල්" කලාප සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ දෙමළ ජනතාවගේ පාරම්පරික ඉඩම් අත්පත් කරගැනීම


---

# பிரதான உள்ளடக்கம்


**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
அனர்த்தத்தினால் பாதிக்கப்பட்டவர்களுக்கு நிவாரணம்
சைட்டம் நிறுவனம் பற்றிய தீர்மானங்கள் தொடர்பில் எழுந்துள்ள நெருக்கடி நிலைமை

**சிறப்புரிமை:**
பாராளுமன்றத்தில் உரையாற்ற நேரம் ஒதுக்கப்படாமை

**இரசாயன ஆயுதங்கள் சமவாயம் (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது.

**அரசியலமைப்பின்கீழான தீர்மானம்:**
அரசியலமைப்புப் பேரவைக்கு உறுப்பினர்களை நியமித்தல்

**இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் (கட்டுப்பாட்டுச்) சட்டம்:**
ஒழுங்குவிதிகள்

**இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்:**
கட்டளை

**ஒத்திவைப்புப் பிரேரணை:**
மகாவலி 'எல்' வலய அபிவிருத்தித் திட்டத்தின் கீழ் தமிழர்களின் பூர்வீக நிலங்கள் அபகரிக்கப்படல்


---

# PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Relief for Disaster-affected Persons
Problematic Situation Arisen Due to Decisions Made on SAITM

PRIVILEGE:
Non-allocation of Time to Speak in Parliament

CHEMICAL WEAPONS CONVENTION (AMENDMENT) BILL:
Read the First time

RESOLUTION UNDER THE CONSTITUTION:
Nomination of Members to Constitutional Council

IMPORTS AND EXPORTS (CONTROL) ACT:
Regulations

SRI LANKA EXPORT DEVELOPMENT ACT:
Order

ADJOURNMENT MOTION:
Takeover Traditional Lands of Tamils under Mahaweli Development Scheme “L”

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2018 ඔක්තෝබර් 11වන බ්‍රහස්පතින්දා*
*2018 ஒக்ரோபர் 11, வியாழக்கிழமை*
*Thursday, 11th October, 2018*

**පූ.භා.10.00ට පාර්ලිමේන්තුව රැස්වීය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම 2015 වර්ෂය සඳහා සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2016 සහ 2017 වර්ෂ සඳහා ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

ශ්‍රී ලංකා ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය - 2018. - [තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තිරසර සංවර්ධන හා වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු නවින් දිසානායක අමාත්‍යතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු කබීර් හාෂිම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෙම්මාතගම, සියඹලාව, අංක එච්78 දරන ස්ථානයේ පදිංචි ඩී.එම්. සමරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කැලණිය, වනවාසල, අංක 148 දරන ස්ථානයේ පදිංචි පී.ඩී. ප්‍රේමතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### නාය යෑම් හේතුවෙන් අවතැන් වූ වතු පවුල් : කෑගල්ල දිස්ත්‍රික්කය
### மண்சரிவினால் இடம்பெயர்ந்துள்ள தோட்டக் குடும்பங்கள்: கேகாலை மாவட்டம்
### ESTATE FAMILIES DISPLACED DUE TO LANDSLIDES: KEGALLE DISTRICT

13/'18

**1. ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 මැයි මාසයේ ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ සිදු වූ නාය යෑමෙන් අවතැන් වූ වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට අවතැන් වූ වතු පවුල් සඳහා නිවාස ලබා දී තිබේද;

(iii) එසේ නම්, නිවාස ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙතෙක් නිවාස නොලැබුණු වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(v) එම නිවාස ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 மே மாதத்தில் ஏற்பட்ட சீரற்ற காலநிலை காரணமாக, கேகாலை மாவட்டத்தில் ஏற்பட்ட மண்சரிவினால் இடம்பெயர்ந்துள்ள தோட்டக் குடும்பங்களின் எண்ணிக்கை யாது;

(ii) இதுவரை இடம்பெயர்ந்துள்ள தோட்டக் குடும்பங்களுக்கு வீடுகள் வழங்கப்பட்டுள்ள னவா;

(iii) ஆமெனில், வீடுகள் வழங்கப்பட்டுள்ள தோட்டக் குடும்பங்களின் எண்ணிக்கை யாது;

(iv) இதுவரை வீடுகள் வழங்கப்படாத தோட்டக் குடும்பங்களின் எண்ணிக்கை யாது;

(v) மேற்படி வீடு வழங்கல் தாமதமடைவதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources & Disaster Management :

(a) Will he inform this House-

(i) the number of estate families displaced due to landslides caused by adverse weather conditions in the Kegalle District in May 2016;

(ii) whether displaced estate families have been provided with houses by now;

(iii) if so, the number of families provided with houses;

(iv) the number of estate families not provided with houses up to now; and

(v) the reason for the delay in providing houses?

(b) If not, why?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Irrigation and Water Resources and Disaster Management)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 2016 මැයි මාසයේ ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් සිදු වූ නායයෑමෙන් අවතැන් වූ වතු පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අරණායක | අදාළ නොවේ. |
| 02 | මාවනැල්ල | අදාළ නොවේ. |
| 03 | රඹුක්කන | අදාළ නොවේ. |
| 04 | කෑගල්ල | අදාළ නොවේ. |
| 05 | ගලිගමුව | 04 |
| 06 | වරකාපොල | 10 |
| 07 | රුවන්වැල්ල | 08 |
| 08 | දෙහිඕවිට | 04 |
| 09 | දැරණියගල | 50 |
| 10 | යටියන්තොට | 02 |
| 11 | බුලත්කොහුපිටිය | 32 |
| | එකතුව | 110 |

(ii)

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 2016 මැයි මාසයේ ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් සිදු වූ නායයෑමෙන් අවතැන් වූ වතු පවුල් සංඛ්‍යාව | අවතැන් වූ වතු පවුල් සඳහා නිවාස ලබා දී තිබේද යන්න |
|---|---|---|---|
| 01 | අරණායක | අදාළ නොවේ. | අදාළ නොවේ. |
| 02 | මාවනැල්ල | අදාළ නොවේ. | අදාළ නොවේ. |
| 03 | රඹුක්කන | අදාළ නොවේ. | අදාළ නොවේ. |
| 04 | කෑගල්ල | අදාළ නොවේ. | අදාළ නොවේ. |
| 05 | ගලිගමුව | 04 | නිවාස ලබා දී ඇත. |
| 06 | වරකාපොල | 10 | නිවාස ලබා දී ඇත. |
| 07 | රුවන්වැල්ල | 08 | පවුල් 7ක් සඳහා පමණක් මේ වන විට නිවාස ලබා දී ඇත. එක් පවුලකට පමණක් නිවසක් ලබා දීමට ඇත. |
| 08 | දෙහිඕවිට | 04 | පවුල් 2ක් සඳහා පමණක් මේ වන විට නිවාස ලබා දී ඇත. |
| 09 | දැරණියගල | 50 | නිවාස ලබා දී ඇත. |
| 10 | යටියන්තොට | 02 | නිවාස ලබා දී නැත. |
| 11 | බුලත්කොහුපිටිය | 32 | පවුල් 24ක් සඳහා නිවාස ලබා දී ඇති අතර, පවුල් 8ක් සඳහා නිවාස ලබා දී නැත. |
| | එකතුව | 110 | |

(iii)

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 2016 මැයි මාසයේ ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් සිදුවූ නාය යෑමෙන් අවතැන් වූ වතු පවුල් සංඛ්‍යාව | අවතැන් වූ වතු පවුල් සඳහා නිවාස ලබා දී තිබේද යන්න | නිවාස ලබා දී ඇති පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | අරණායක | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 02 | මාවනැල්ල | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 03 | රඹුක්කන | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 04 | කෑගල්ල | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 05 | ගලිගමුව | 04 | නිවාස ලබා දී ඇත | 04 |
| 06 | වරකාපොල | 10 | නිවාස ලබා දී ඇත | 10 |
| 07 | රුවන්වැල්ල | 08 | පවුල් 7ක් සඳහා පමණක් මේ වන විට නිවාස ලබා දී ඇත | 07 |
| 08 | දෙහිඕවිට | 04 | පවුල් 02ක් සඳහා පමණක් මේ වන විට නිවාස ලබා දී ඇත | 02 |
| 09 | දැරණියගල | 50 | නිවාස ලබා දී ඇත | 50 |
| 10 | යටියන්තොට | 02 | නිවාස ලබා දී නැත | 00 |
| 11 | බුලත්කොහුපිටිය | 32 | පවුල් 24ක් සඳහා නිවාස ලබා දී ඇති අතර, පවුල් 08ක් සඳහා නිවාස ලබා දී නැත | 24 |
| | එකතුව | 110 | | 97 |

(iv)

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 2016 මැයි මාසයේ ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් සිදුවූ නාය යෑමෙන් අවතැන් වූ වතු පවුල් සංඛ්‍යාව | අවතැන් වූ වතු පවුල් සඳහා නිවාස ලබා දී තිබේද යන්න | නිවාස ලබා දී ඇති පවුල් සංඛ්‍යාව | මෙතෙක් නිවාස නොලැබුණු වතු පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | අරණායක | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 02 | මාවනැල්ල | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 03 | රඹුක්කන | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 04 | කෑගල්ල | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 05 | ගලිගමුව | 04 | නිවාස ලබා දී ඇත | 04 | අදාළ නොවේ |
| 06 | වරකාපොල | 10 | නිවාස ලබා දී ඇත | 10 | අදාළ නොවේ |
| 07 | රුවන්වැල්ල | 08 | පවුල් 7ක් සඳහා පමණක් මේ වන විට නිවාස ලබා දී ඇත | 07 | 01 |
| 08 | දෙහිඕවිට | 04 | පවුල් 02ක් සඳහා පමණක් මේ වන විට නිවාස ලබා දී ඇත | 02 | 02 |
| 09 | දැරණියගල | 50 | නිවාස ලබා දී ඇත | 50 | 00 |
| 10 | යටියන්තොට | 02 | නිවාස ලබා දී නැත | 00 | 02 |
| 11 | බුලත්කොහුපිටිය | 32 | පවුල් 24ක් සඳහා නිවාස ලබා දී ඇති අතර පවුල් 08ක් සඳහා නිවාස ලබා දී නැත | 24 | 08 |
| | එකතුව | 110 | | 97 | 13 |

(v)

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 2016 මැයි මාසයේ ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් සිදුවූ නාය යෑමෙන් අවතැන් වූ වතු පවුල් | අවතැන් වූ වතු පවුල් සඳහා නිවාස ලබා දී තිබේද යන්න | නිවාස ලබා දී ඇති පවුල් සංඛ්‍යාව | මෙතෙක් නිවාස නොලැබුණු වතු පවුල් සංඛ්‍යාව | එම නිවාස ලබා දීම ප්‍රමාද වීමට හේතු |
|---|---|---|---|---|---|---|
| 01 | අරණායක | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 02 | මාවනැල්ල | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 03 | රඹුක්කන | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 04 | කෑගල්ල | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| 05 | ගලිගමුව | 04 | නිවාස ලබා | 04 | අදාළ | අදාළ |

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 2016 මැයි මාසයේ ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් සිදුවූ නාය යෑමෙන් අවතැන් වූ වතු පවුල් සංඛ්‍යාව | අවතැන් වූ වතු පවුල් සඳහා නිවාස ලබා දී තිබේද යන්න | නිවාස ලබා දී ඇති පවුල් සංඛ්‍යාව | මෙතෙක් නිවාස නොලැබුණු වතු පවුල් සංඛ්‍යාව | එම නිවාස ලබා දීම ප්‍රමාද වීමට හේතු |
|---|---|---|---|---|---|---|
| 06 | වරකාපොල | 10 | නිවාස ලබා දී ඇත | 10 | අදාළ නොවේ | අදාළ නොවේ |
| 07 | රුවන්වැල්ල | 08 | පවුල් 7ක් සඳහා පමණක් මේ වන විට නිවාස ලබා දී ඇත | 07 | 01 | 2013 වසරේදී රජය මඟින් ඉඩමක් ලබා දී ඇති අතර වතු සමාගම් විසින් නිවසක් ඉදිකර දෙන තෙක් සමාගමට අයත් වතු නිවසක මේ වන විට පදිංචිව සිටී |
| 08 | දෙහිඕවිට | 04 | පවුල් 02ක් සඳහා පමණක් මේ වන විට නිවාස ලබා දී ඇත | 02 | 02 | වල්පොල ග්‍රාම නිලධාරී වසමේ ලලාන් වැවිලි සමාගමට අයත් සපුමල්කන්ද කොටසේ පදිංචිව සිටී එම්. පද්මනාදන් සහ සුරේෂ් කුමාර් යන අය 2016 වර්ෂයේ නාය යාමේ අධි අවදානම් වාර්තාවට ඇතුළත්ව ඇති අතර, ඔවුන් පදිංචි නිවාස වතු සමාගමට අයත් ඉඩමක අනවසරයෙන් ඉදි කර ඇති නිවාස දෙකක් බව විමසීමේදී අදාළ වතු සමාගම දන්වා ඇත. කෙසේ නමුත් ඉහත සඳහන් පවුල් දෙක සඳහා වැවිලි මානව හාරය මඟින් ඉදි කිරීමට යෝජිත නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවාස ලබා දීමට කටයුතු කරන බව වැවිලි සමාගම මඟින් වැඩදුරටත් දන්වා ඇත. |
| 09 | දැරණියගල | 50 | නිවාස ලබා දී ඇත. | 50 | 00 | අදාළ නොවේ. |
| 10 | යටියන්තොට | 02 | නිවාස ලබා දී නැත. | 00 | 02 | වතු නිවාසවල හිමිකාරිත්වය වතු සමාගම විසින් දරන බැවින් අදාළ ඉදිකිරීම් සඳහා එම සමාගම විසින් ඉදිරි කටයුතු කරනු ලැබේ. |
| 11 | බුලත්කොහුපිටිය | 32 | පවුල් 24ක් සඳහා නිවාස ලබා දී ඇති අතර පවුල් 08ක් සඳහා නිවාස ලබා දී නැත. | 24 | 08 | අදාළ පවුල් පදිංචි කරවීම සඳහා සුදුසු ඉඩමක් ලබා ගැනීමේදී ඉඩම් 03ක් පරීක්ෂා කිරීමට සිදු වූ අතර, මුලින්ම යෝජනා වූ ස්ථානය ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් ප්‍රතික්ෂේප විය. ඉන් අනතුරුව යෝජනා කළ ස්ථානය සඳහා වතු වෘත්තීය සමිති විරුද්ධ විය. තෙවනුව අක්කර 91 නමැති ස්ථානය පරීක්ෂා කරන ලදී. තෙවනුව පරීක්ෂා කරන ලද ස්ථානයේ යෝග්‍යතාව සම්බන්ධයෙන් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් මූලික භූ සම්ක්ෂණ වාර්තාව 2018.08.09 දින වතු අධිකාරී වෙත යවා ඇත. ඒ අනුව, පදිංචි කිරීම් සම්බන්ධ ඉදිරි කටයුතු අදාළ වතු සමාගම විසින් සිදු කරනු ඇත. තවද, මෙම ව්‍යාපෘතිය ඇරඹීමට ප්‍රමාද වූයේ සුදුසු ස්ථානයක් තෝරා ගැනීම සම්බන්ධයෙන් වතු වෘත්තීය සමිති හා පාලන අධිකාරිය හා අවතැන් වූවන් අතර එකඟතාවකට පැමිණීමට නොහැකි වූ බැවිනි. |
| | එකතුව | 110 | | 97 | 13 | |

(ආ) පැන නොනඟී.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළ සංඛ්‍යාවල යම්කිසි වෙනසක් තිබෙනවා. විශේෂයෙන් බුලත්කොහුපිටිය, කළුපහන ප්‍රදේශවල වතුකරයේ නිවාස 80ක් පමණ විනාශ වුණා. නමුත්, අද වන කොට හදලා අවසන් කර තිබෙන්නේ ඔබතුමා කියන ආකාරයට නිවාස 27යි. නමුත්, අවසන් කර ලබා දෙන්න තිබෙනවා තව නිවාස 13ක් විතර. ඒ වාගේම තව 40ක්ම අලුතින් හදන්නත් තිබෙනවා. මා හිතන විධියට වැරදි සංඛ්‍යා ටිකක් තමයි ඔබතුමාට ලබා දීලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි අනෙක් කාරණය තමයි සමහර ස්ථානවල අර්ධ වශයෙන් හානි වුණු නිවාසවලට ඒ අවශ්‍ය කරන ද්‍රව්‍ය ලැබිලා නැහැ. ඒ කියන්නේ, නිවාස ආධාරයක් ලැබිලා නැති ස්ථානත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාට තොරතුරු ලබා දෙන්න මට පුළුවන්. මේ පිළිබඳව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ඉතාමත් කඩිනමින් ක්‍රියාමාර්ගයක් ගන්න වැඩසටහනක් තිබෙනවාද? මොකද, දැනට අවුරුදු දෙකයි මාස 4ක් ගතවී තිබෙනවා. ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්න වැඩසටහනක් තිබෙනවාද, ඒ පිළිබඳව හොයා බලා කටයුතු කරනවාද කියලා මම ඇමතිතුමාගෙන් දැන ගන්න කැමතියි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙන්නේ 2016 වර්ෂයේ සිදු වූ සිදුවීමක් ගැනයි. 2016 වර්ෂයේදී අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයට ප්‍රාදේශීය ලේකම්තුමන්ලා එවා තිබෙන වාර්තාවට අනුව තමයි ඒ නිවාස සකස් කිරීමට කටයුතු කරලා තිබෙන්නේ. ඒ අනුව තමයි ඉතිරි නිවාස කිහිපය ඉදි කරන්න තිබෙන්නේ. එහිදී ගැටලුවක් වී තිබෙන්නේ වතුවල වෘත්තීය සමිතිවලින් ප්‍රශ්න ඇති කිරීමයි. ඒ වාගේම වතු සමාගම්වලින් ඉඩම් ලබා ගැනීම ප්‍රශ්නයක් වී තිබෙනවා. ඔවුන් නිර්දේශ කරනු ලබන, ඔවුන් එකඟතාව පළ කරනු ලබන ඉඩම සකස් කිරීමට යාමේදී ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය මඟින් පරීක්ෂණයට ලක් කළාම එම ස්ථානයත් ආපදාවට ලක්වන ස්ථානයක්. එවැනි ස්ථානවල නිවාස ඉදිකිරීම සඳහා අපේ අමාත්‍යාංශයට මුදල් වැය කිරීමට පුළුවන්කමක් නැහැ. එතකොට ඒ අය තවත් අනාරක්ෂිත

ස්ථානයක තමයි පදිංචි කරන්න වෙන්නේ. ඒ නිසා ඒ ගොල්ලන්ගේ ආරක්ෂාව වෙනුවෙන් සුළු ප්‍රමාදයක් තිබෙනවා. ඒ, කිහිප ස්ථානයක විතරයි. ඔබතුමා කියන අන්දමට මේ සංඛ්‍යාවල වැරැද්දක් තිබෙනවා නම්, මට ඒ පිළිබඳ තොරතුරු ලබා දෙනවා නම් මට සොයා බලා ඔබතුමාට වාර්තා කිරීමට පුළුවන්කම තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර්ධ හානි සඳහා අපි රුපියල් 10,000ක මූලික අත්තිකාරම් ගෙවීමක් පමණයි සිදු කරන්නේ. අනෙක් මුදල -රජයේ තක්සේරු වටිනාකම- ජාතික රක්ෂණ භාර අරමුදල මඟිනුයි ගෙවීම කරන්නේ. එතැන යම් ප්‍රමාදයක් තිබෙනවා. ඒ ප්‍රමාදය කලෙක ඉඳලා එන එකක්. එය කඩිනම් කිරීම සඳහා අප පියවර අරගෙන තිබෙනවා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, අපේ ප්‍රදේශවල සියයට සියයක් නාය යන තැන්වල පදිංචි ජනතාව දැන් එම නිවාසවලින් ඉවත් කර තිබෙනවා. ඊළඟට, අර්ධ වශයෙන් නාය යන ස්ථාන හඳුනාගෙන තිබෙනවා. නමුත්, එම ස්ථානවල පදිංචි ජනතාව එම නිවාසවලින් ඉවත් කර නැහැ. තදින් වැස්සොත් එම ස්ථානවලින් අයින් වෙන්න කියලා තිබෙනවා. එහෙමත් නැත්නම් දැනුම් දීමක් කරනවා. එම නිසා, ඒ ජනතාව දැඩි අපහසුතාවක ඉන්නේ. අර්ධ වශයෙන් නාය යන ස්ථාන සියයට 70ක් තිබෙනවා; විශාල ප්‍රමාණයක්. ජනතාව එම නිවාසවලයි ඉන්නේ. වැස්ස වහිද්දී ඔවුන් ළඟම තිබෙන පන්සලට, පල්ලියට හෝ කෝවිලට යනවා. වැස්ස ඉවර වනතෙක් එම ස්ථානවල ඉන්න ඕනෑ. නව නිවාස හදලා ඉවර කරන්න ක්‍රමයක් නැහැ. මෙය එම නාය යන ප්‍රදේශවල ඉන්න ජනතාවට විශාල ගැටලුවක් වෙලා තිබෙනවා. මේ වෙනුවෙන් මොකක් හෝ විසඳුමක් කඩිනමින් ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, 2016 නාය යෑම නිසා කළුපහන වතු යායේ තිබුණු නිවාස ටික ඔක්කෝම යට වුණා. ඒ නිවාස ටික යට වුණා පමණක් නොවෙයි, මාර්ගයත් අබලන් වෙලා තිබෙනවා. එතැන තිබෙන නිවාසවලිනුත් සියයට 50ක් පමණ තමයි සංවර්ධනය වෙලා තිබෙන්නේ. ඒ මාර්ගය මුළුමනින්ම අබලන් වෙලා තිබෙන්නේ. වතුකරයේ ඉඳලා ළඟම තිබෙන පාසලට දුර කිලෝ මීටර් හයක් තිබෙනවා. ඒ වතුකරයේ ඉන්න දරුවන් කිලෝ මීටර් 6ක් දුර ගෙවාගෙන පාසලට යන්න ඕනෑ. ඒ මාර්ගයත් සාදා දෙන්න කියන ඉල්ලීම කරනවා. විශේෂයෙන්ම මහාමාර්ග විෂයය භාර අමාත්‍යතුමා අපේ දිස්ත්‍රික්කයේ ඉන්න නිසා මා එතුමාටත් මේ කාරණය මතක් කරනවා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, කළුපහන වතු යායේ ඉන්න දරුවන් හැම දාම කිලෝ මීටර් 6ක් දුර ගෙවාගෙන පාසලට යන්න ඕනෑ. එම මාර්ගය අබලන් වෙලා. ඒක පිළිසකර කර දෙන්න කියලාත් මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම සියයට 70ක් අර්ධ වශයෙන් නාය යන ස්ථානවල ඉන්න ජනතාවට යම්කිසි පිළියමක් ලබා දෙන්න වැඩසටහනක් ක්‍රියාත්මක කරනවාද කියලා මා ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු මන්ත්‍රීතුමනි, මා දන්නා විධියට කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ තමයි, ඒ අභ්‍යන්තර මාර්ග සංවර්ධනය වන්නේ. අනිකුත් මාර්ග සම්බන්ධයෙන් මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා පිළිතුරු දෙයි. අපේ අමාත්‍යාංශය යටතේ ගත යුතු අනිකුත් හැම ක්‍රියාමාර්ගයක්ම අපි ගන්නවා. ආපදාවට ලක් වූ හැම පවුලකම දරුවන්ට අවශ්‍ය පොත් පත්, ඇඳුම් පැළඳුම්, වැහි කබා, ටෙන්ට් රෙදි ආදී සියලු දේ ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අනතුරුදායක තැන් හඳුනා ගෙන, ආපදා අවස්ථාවලදී ඒ ස්ථානවලින් ඉවත් වන්න කියන්නේ එම ස්ථානවල පදිංචිවූවන්ගේ ආරක්ෂාව වෙනුවෙන්. එවැනි ස්ථාන හානියට පත්වනවා නම්, ඒ අවස්ථාවේදී අපට මැදිහත්වීමට අවකාශය තිබෙනවා. ඒ අනුව තමයි අපි ඔවුන්ට නිවාස ඉදිකර දෙන්න කටයුතු කරන්නේ.

මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා මාර්ග සම්බන්ධයෙන් පිළිතුර දෙයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කෙටි අවස්ථාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමාට පැහැදිලි කර ගැනීම කරගන්න තිබෙන්නේ ගරු කබීර් හාෂිම් අමාත්‍යතුමාගෙන්ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

එතුමාගෙන් නොවෙයි, පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය අමාත්‍යතුමාගෙන්.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මම උත්තර දුන්නාට පසුව ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කබීර් හාෂිම් අමාත්‍යතුමා උත්තර දුන්නාට පසුව ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කනක හේරත් මන්ත්‍රීතුමා කැගල්ල දිස්ත්‍රික්කයට අදාළව ප්‍රශ්න කීපයක් ඇහුවා.

2016 වර්ෂයේ සිදු වූ නාය යෑමෙන් පසුව අරණායක මැනිවරණ කොට්ඨාසයේ නිවාස 850ක් අලුතින් හදන්න ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ආදී අමාත්‍යාංශ කටයුතු කළා. ඒ වාගේම, ඒ ප්‍රදේශයේ තිබෙන හානි වූ පාරවල් හදන්නත් පටන් ගත්තා. විශේෂයෙන්ම ඒ කළුපහන මාර්ගය මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට අයිති නොවුණත්, ඒ මාර්ගය පළාත් සභාවට අයිති වුණත් අපි ඉදිරියේදී ඒ මාර්ගය හදන්නත් කටයුතු කරන බව ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි. ඒ වාගේම ග්‍රාමීය මාර්ග ටික හදන්නත් අපි ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

[ගරු කබීර් හාෂිම් මහතා]

ඔබතුමන්ලාගේ කණ්ඩායම ඒකට විරුද්ධ වුණා කිව්වා. හදන්න ඉඩ දෙනවා නම්, ඕනෑම පාරක් හදන්න අපි ලෑස්තියි. ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, එක් එක්කෙනා ඒකට විරුද්ධ වන එකයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුරේ සඳහන් කළා, ඉඩම් ලබා ගැනීමේදී ඒ වතු සමාගම් එක්ක ඇති වී තිබෙන ගැටලුව ගැන. වතු සමාගම් එකඟ වන ඉඩම් අප ලබා ගත යුතුය යන අදහසක් කියැවුණා. වතු සමාගම්වලට බදු දී තිබෙන ඉඩම් රජයට අයිති ඉඩම් බව ඔබතුමා දන්නවා. ඒ ගිවිසුම් අනුව රජයට තිබෙන පරම අයිතිය සහතික වෙලා තිබෙනවා, රන් කොටස්වල අයිතිය හැටියට. ඒ රන් කොටස්වල අයිතිය තිබෙන්නා වූ රජයට ඒ ඉඩම් සම්බන්ධයෙන් තීරණ ගැනීමට තිබෙන්නා වූ බලය ක්‍රියාත්මක කරමින් තමන්ට ඕනෑ තැන්වලින්, අවශ්‍ය තැන්වලින් ඒ ඉඩම් ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට ඔබතුමන්ගේ ආණ්ඩුව මැලි නොවිය යුතුය කියමින් මම තවත් එක කාරණයක් මතක් කරනවා.

රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු දෙකක් පැවැත්වුණා. ඒ දෙකේදීම- ජාතික රක්ෂණ හාර අරමුදලින් හා භාණ්ඩාගාරයෙන් ලැබෙන්න තිබෙන රුපියල් මිලියන සිය ගණනක් අපේ රත්නපුරය දිස්ත්‍රික්කයේ මිනිසුන්ගේ වන්දි පූර්ණයට තවම ලැබී නැති බව මම තමුන්නාන්සේට දන්වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමා ඒකට උත්තර දෙනවාද?

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කනක හේරත් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු කබීර් හාෂිම් අමාත්‍යතුමනි, ඔබතුමා මුදල් යොදවා තිබෙන ග්‍රාමීය මාර්ග සෑදීම ගැන අපේ කිසිම විරෝධතාවක් නැහැ. පළාත් පාලන ආයතනවලින් ඉල්ලා සිටින්නේ ඇස්තමේන්තු කිරීමේ සහ ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේ බලය පමණක් ලබා දෙන්න කියලායි. මූල්‍යමය අයිතිය RDA එකට ලබා දෙන්න. මුදල් ගෙවීම, කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම ආදි සියල්ල RDA එකට ලබා දෙන්න. ඒ ව්‍යාපෘති ප්‍රමිතියකට අනුව කරනවාද කියා පරීක්ෂා කිරීමේ අයිතියත්, ඇස්තමේන්තු කිරීමේ අයිතියත් පළාත් පාලන ආයතනයට ලබා දෙන්න. ඒ ඉල්ලීම තමයි අප කරන්නේ.

ගරු ඇමතිතුමනි, සංවර්ධන කමිටුවේ එදා ඔබතුමා හිටියේ නැහැ. එදා අපි ඒ යෝජනාව ඉදිරිපත් කළා.

## අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය: විස්තර
## கைப்பற்றப்பட்டுள்ள போதைவஸ்துக்கள்: விபரம்
## DRUGS TAKEN INTO CUSTODY: DETAILS

181/'18

**2. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2010 වර්ෂයේ සිට මේ දක්වා අත්අඩංගුවට ගත්,

(i) කේරල ගංජා;

(ii) හෙරොයින්;

(iii) කොකේන්;

ඇතුළු මත්ද්‍රව්‍ය ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අත්අඩංගුවට ගත් එම මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර කවරේද;

(ii) එම මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට ගත් පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතර සිටින විදේශිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2010ஆம் வருடம் முதல் இதுவரை கைப்பற்றப் பட்டுள்ள,

(i) கேரள கஞ்சா

(ii) ஹெரொயின்

(iii) கொகேன்

உட்பட்ட போதைவஸ்துக்களின் அளவு, வருட வாரியாக தனித்தனியாக எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கைப்பற்றப்பட்டுள்ள மேற்படி போதை வஸ்துகள் தொடர்பாக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாதென்பதையும்;

(ii) மேற்படி போதைவஸ்துக்களுடன் கைதுசெய்யப் பட்டவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அவர்களுடன் இருக்கின்ற வெளிநாட்டவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration & Management and Law & Order:

(a) Will he inform this House in respect of each year separately, the quantity of drugs including;

(i) kerala ganja;

(ii) heroin;

(iii) cocaine;

that have been taken into custody from 2010 up to now?

(b) Will he also inform this House-

(i) the steps that have been taken regarding the drugs took into custody;

(ii) the number of persons that have been taken into custody along with those drugs; and

(iii) the number of foreigners found among them?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i), (ii), (iii) යන ප්‍රශ්න සඳහා පිළිතුරු පහත වගුවේ පරිදි වේ.

| වර්ෂය | මත්ද්‍රව්‍ය වර්ගය හා අත් අඩංගුවට ගත් ප්‍රමාණය (kg) | | | | | |
|---|---|---|---|---|---|---|
| | කේරළ ගංජා | | හෙරොයින් | | කොකේන් | |
| | kg | g | kg | g | kg | g |
| 2010 | 22 | 983 | 142 | 835 | 4 | 000 |
| 2011 | 40 | 703 | 39 | 169 | 10 | 463 |
| 2012 | 43 | 433 | 33 | 243 | 7 | 522 |
| 2013 | 158 | 989 | 349 | 792 | - | - |
| 2014 | 468 | 194 | 312 | 539 | 0 | 26 |
| 2015 | 693 | 418 | 46 | 76 | 5 | 774 |
| 2016 | 440 | 881 | 207 | 154 | 1650 | 788 |
| 2017 | 929 | 052 | 321 | 90 | 220 | 700 |
| 2018.09.20 | 1602 | 314 | 179 | 849 | 13 | 902 |

(ආ) (i) අත්අඩංගුවට ගත් එම මත්ද්‍රව්‍ය රස පරීක්ෂක විශ්ලේෂණය සඳහා රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර මත්ද්‍රව්‍ය හඳුනාගැනීමෙන් අනතුරුව ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර අධිකරණ නියෝගය අනුව එම මත්ද්‍රව්‍ය ගරු මහෙස්ත්‍රාත්තුමා ඉදිරියේ ප්‍රසිද්ධියේ විනාශ කරනු ලබයි.

(ii) 2010 වර්ෂයේ සිට 2018.09.20 දින දක්වා කේරළ ගංජා, හෙරොයින් සහ කොකේන් යන මත්ද්‍රව්‍ය සමඟ පුද්ගලයන් දෙලක්ෂ දෙදහස් පන්සිය හැත්තෑහත් දෙනෙක් (202,577) අත්අඩංගුවට ගෙන ඇත.

(iii) 2010 වර්ෂයේ සිට 2018.09.20 දින දක්වා කේරළ ගංජා, හෙරොයින් සහ කොකේන් යන මත්ද්‍රව්‍ය සමඟ විදේශික පුද්ගලයන් දෙසිය තිස් දෙනෙකු (230) අත්අඩංගුවට ගෙන ඇත.

(ඇ) පැන නොනගී.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන බැලුවාට පසුව මේ ප්‍රශ්නයේ බරපතළකම පෙනෙනවා. හෙරොයින් කිලෝග්‍රෑම් එක්දහස්හයසිය ගණනක්, ඒ වාගේම, කොකේන් කිලෝග්‍රෑම් දෙදහසකට ආසන්න ප්‍රමාණයක් අත් අඩංගුවට ගෙන තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්, කිලෝග්‍රෑම් හාරදහස් ගණනක්. මේ කලාපයේ මත් ද්‍රව්‍ය කේන්ද්‍රය බවට ලංකාව පත් වෙලා තිබෙනවා. කාලයක් තිස්සේ මෙය වර්ධනය වෙලා, අපේ පාසල් සිසුන් අතර පවා මේ මත් ද්‍රව්‍ය ප්‍රචලිත වෙලා තිබෙනවා.

මේ අනතුර බරපතළ ලෙස තේරුම් ගත්තා නම්, රටට මත් ද්‍රව්‍ය ගෙන ඒම වැළැක්වීම සඳහා සහ විශේෂයෙන් තරුණයන් සහ පාසල් දරුවන් අතර මේ මත් ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා ආණ්ඩුව ගෙන තිබෙන කඩිනම් ක්‍රියා මාර්ග මොනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව ක්‍රියා මාර්ග රාශියක් ගත්ත බව අපි දන්නවා. අමාත්‍යාංශය හැටියට වග කිවයුතු පිළිතුරක් ඔබතුමාගේ ඒ අතුරු ප්‍රශ්නයට අපි ලැබෙන්න සලස්වන්නම්. පියවර ගන්නා බව නම් අපිත් දන්නවා. නමුත්,-

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ප්‍රශ්නය ඊට වඩා බරපතළයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ප්‍රශ්නය බරපතළයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දෙවන අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ප්‍රශ්නය අහන්න පුළුවන්. ගරු අමාත්‍යතුමා සාමාන්‍යයෙන් පිළිතුරු එවනවා. ඒ නිසා මම දෙවන අතුරු ප්‍රශ්නයත් අහලා තියන්නම්.

[බාධා කිරීමක්] උත්තර දෙනවා, උත්තර දෙනවා. බොහොම ස්තුතියි. ඔබතුමා ඒ වැඩේත් කර තිබුණා. මගේ දෙවන ප්‍රශ්නය ඔබතුමා යොමු කරන්න. මම මේ ප්‍රශ්නය අහන්නේ තුන්වැනි අවස්ථාවටයි.

පොලිස් ආරක්ෂක සහායකයින් නිත්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා මාස ගණනක් කල් අරගෙන තිබෙනවා. ඒ කටයුතු සිද්ධ කර අවසන් කරන්නේ කවදාද කියන කාරණය පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට උත්තරයක් ලබා දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 3 - 214/'18 - (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

## නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත් කිරීම වැළැක්වීම: පියවර
## நக்கல்ஸ் மலைத்தொடர் உலக மரபுரிமை அந்தஸ்திலிருந்து நீக்கப்படுவதைத் தடுத்தல்: நடவடிக்கை
## PREVENTION OF DELISTING KNUCKLES RANGE FROM WORLD HERITAGE STATUS: STEPS TAKEN

222/'18

**4. ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2000.05.05 දිනැති අංක 1130/22 දරන ගැසට් නිවේදනය මඟින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, කොන්දේසි සහිතව නකල්ස් කඳු වැටිය සඳහා ලෝක උරුම තත්ත්වය ලැබුණු බවත්;

(ii) ඉහත කොන්දේසිවල ප්‍රධාන කොන්දේසිය ප්‍රකාරව, නකල්ස් කඳුවැටියට ඉතා ආසන්නව පිහිටි මිනිපේ, පන්විල, පාතදුම්බර, ලග්ගල, විල්ගමුව, රත්තොට, උකුවෙල හා මාතලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ට අයත් අක්කර 2,000ක විශාලත්වයෙන් යුත් භූමි ප්‍රමාණයක් උක්ත කඳුවැටිය සමඟ ඒකාබද්ධ කර නොමැති බවත්;

(iii) එබැවින්, නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත් කිරීමේ අවදානමකට ලක්වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත් කිරීම වළක්වා ගැනීම සඳහා ඉහත සඳහන් අක්කර 2,000ක භූමි ප්‍රමාණය නකල්ස් කඳු වැටිය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2000.05.05ஆம் திகதிய 1130/22ஆம் இலக்க வர்த்தமானி அறிவித்தலின்மூலம் ஐக்கிய நாடுகள் அமைப்பின் நிபந்தனைகளுடனான உலக மரபுரிமை அந்தஸ்து நக்கல்ஸ் மலைத் தொடருக்கு கிடைத்ததென்பதையும்;

(ii) குறிப்பிட்ட நிபந்தனைகளிலுள்ள பிரதான நிபந்தனையின்படி, நக்கல்ஸ் மலைத்தொடருக்கு மிக அண்மையில் அமைந்துள்ள மினிப்பே, பன்வில, பாத்தும்பர, லக்கல, வில்கமுவ, ரத்தொட்ட, உக்குவெல மற்றும் மாத்தளை ஆகிய 8 பிரதேச செயலாளர் பிரிவுகளுக்குரிய 2000 ஏக்கர் பரப்பளவு கொண்ட நிலப்பகுதி குறிப்பிட்ட மலைத்தொடருடன் ஒன்றிணைக்கப் படவில்லை என்பதையும்;

(iii) எனவே, நக்கல்ஸ் மலைத்தொடர் உலக மரபுரிமை அந்தஸ்திலிருந்து நீக்கப்படும் ஆபத்துக்கு உள்ளாகியுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) நக்கல்ஸ் மலைத்தொடர் உலக மரபுரிமை அந்தஸ்திலிருந்து நீக்கப்படுவதை தவிர்ப்பதற்காக மேலே குறிப்பட்ட 2000 ஏக்கர் நிலப்பரப்பை நக்கல்ஸ் மலைத்தொடருடன் ஒன்றிணைக்க நடவடிக்கை மேற்கொள்வாரா;

(ii) ஆமெனில், அதன் தற்போதைய நிலைமை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that-

(i) the Knuckles Range received world heritage status on conditions from the United Nations Organization through the Gazette Notification No. 1130/22 dated 05.05.2000;

(ii) according to the main condition of the above conditions, an area with an extent of 2000 acres belonging to 8 Divisional Secretary's Divisions namely Minipe, Panvila, Pathadumbara, Laggala, Wilgamuwa, Rattota, Ukuwela and Matale in the close proximity to the knuckles range have not been amalgamated with it; and

(iii) as a result, the knuckles range faces the threat of being delisted from world heritage status?

(b) Will he inform this House-

(i) whether steps will be taken to amalgamate the above 2000 acres with the knuckles range in order to prevent it from being delisted from world heritage status; and

(ii) if so, the current status of it?

(c) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඇත්තටම මගේ අමාත්‍යාංශය යටතට වැටෙන එකකුත් නොවෙයි. මේ ප්‍රශ්නය අදාළ වන්නේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයටයි. නමුත්, මම මේ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්නම්.

(අ) (i) 2000.05.05 දිනැති අංක 1130/22 දරන ගැසට් නිවේදනය මඟින් සිදු කර ඇත්තේ වන ආඥාපනතේ අංක 03 වගන්තිය යටතේ, වන සම්පත් හා පරිසර අමාත්‍ය මහින්ද විජේසේකර අමාත්‍යවරයා විසින් නකල්ස් වනාන්තරය වර්ෂ 2000 අප්‍රේල් 10 වන දින සිට සංරක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමක් වේ. උක්ත සඳහන් ගැසට් නිවේදනය මඟින් ලෝක උරුම තත්ත්වයක් ලැබී නැත. එසේ වුවද, 2010.07.18 වන දින පවත්වන ලද එක්සත් ජාතීන්ගේ ලෝක උරුම කමිටුවේ සැසිවාරයේදී නකල්ස් කඳුවැටියද අයත්ව ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය ලෝක උරුම වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

(ii) 2000.05.05 දිනැති අංක 1130/22 දරන ගැසට් නිවේදනය මඟින් නකල්ස් සංරක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ දී පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල දක්වා ඇති ප්‍රදේශ සංරක්ෂිත වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

<u>මහනුවර දිස්ත්‍රික්කය</u>

මිනිපේ, උඩුදුම්බර, පාතදුම්බර හා පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මිනුම් අනුරේඛන අංක: මහ/යූඩීඩී/98/985 ට ඇතුළත් මායිම් උපලේඛනය.

<u>මාතලේ දිස්ත්‍රික්කය</u>

උකුවෙල, රත්තොට, ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මිනුම් අනුරේඛන අංක මා/නකල්ස්/97/39ට ඇතුළත් මායිම් උපලේඛනය.

<u>මාතලේ දිස්ත්‍රික්කය</u>

පල්ලේගම හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මිනුම් අනුරේඛන මා/නකල්ස්/98/10ට ඇතුළත් මායිම් උපලේඛනය.

(iii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලෝක උරුම කමිටුව (World Heritage Committee) 2010.07.18 වන දින පවත්වන ලද සැසිවාරයේ දී ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය ලෝක උරුම වනාන්තරයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇත. එයට නකල්ස් වනාන්තර පද්ධතිය, ශ්‍රී පාද ස්වාභාවික වන රක්ෂිතය හා හෝර්ටන්තැන්න ජාතික වනෝද්‍යානය ඇතුළත් වේ.

ඉන් පසු පවත්වන ලද කමිටු සැසිවාරයකදී ශ්‍රී ලංකාවේ නකල්ස් සංරක්ෂණ වනාන්තරය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත් කිරීමට යෝජනා වී නැත.

ඒ අනුව නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත් කිරීමේ අවදානමක් දැනට නැත.

(ආ) (i) කළමනාකරණ පහසුව සඳහා නකල්ස් වනාන්තර පද්ධතියට අත්තර්ගත පෞද්ගලික ඉඩම්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අත්පත් කර ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙහිදී ඉඩම් අයිතිය නිශ්චිතව හඳුනා ගත් ඉඩම්වලට වන්දි ගෙවීමක් කරමින් අත්පත් කර ගනු ඇත.

(ii) මෙම ක්‍රියාවලියේ මූලික අදියර සිට භුක්තිය පවරා ගන්නා ලද අදියර දක්වා විවිධ අදියරයන්හි පවතින ඉඩම් කැබලි 423ක් ලග්ගල, රත්තොට, මිනිපේ, මැදදුම්බර, පන්විල, උඩුදුම්බර, උඩපළාත, අඹන්ගහකොරලේ, යටවත්ත, නාඋල සහ ගඟ ඉහළ කොරලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවතී.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

නන්ත්‍රි, කෞරව අමෙච්චර් අවර්කලේ! මේර්පඩි මරපුරිමෙය් පිරදේසත්තිල් අමෙන්තුළ්ළ කාණිකළ් තනියාර් සුර්රුලා හෝටල් උරිමෙයාළර්කළුක්කු විර්පනෙ සෙය්යප්පට්ටුළ්ළතා? කුරිප්පාක, නක්කල්ස් පාතුකාප්පු වනප් පිරදේසත්තිල් අමෙන්තුළ්ළ පෙරුන්තෝට්ටක් කූට්ටුත්තාපනත්තුක්කුච් සොන්තමාන මෙතවත්ත තෝට්ටක් කාණියිල් ඉරුන්තු 35 සතුර ඒක්කර් පරප්පළවුළ්ළ කාණියානතු, ඕර් ඒක්කර් 2,775 රූපා වීතම් මිකක් කුරෙන්ත විලෙක්කුත් තනියාර් නිර්වනම් ඔන්රුක්කු විර්පනෙ සෙය්යප්පට්ටුළ්ළතාකක් කූරප්පටුකින්රතු. අතු උණ්මෙයා? එනක් කේට්ක විරුම්පුකින්රේන්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව මට එකවර උත්තර දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ සම්බන්ධව සොයා බලා පිළිතුරක් දෙන්නම්.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

කෞරව පිරතිච් සභානායකර් අවර්කලේ, මේර්පඩි මරපුරිමෙය් පිරදේසත්තුක්කෙන ඒර්කෙනවේ, 21,000 හෙක්ටයර් කාණියුම් පින්නර් මේලුම් 14,000 හෙක්ටයර් කාණියුම් උළ්ළටක්කප්පට්ටුළ්ළතාකක් කූරප්පටුකින්ර නිලෙයිල්, තර්පෝතු මේර්පඩි මරපුරිමෙය් පිරදේසත්තිලුළ්ළ මොත්තක් කාණියින් අළවු එත්තනෙ හෙක්ටයර් එන්රු කූර මුඩියුමා?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, ඉඩම්වල ප්‍රමාණය කියන්න පුළුවන්කමක් නැහැ. දැන් මේ විෂය පථය අයිති වෙන්නේ ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාටයි. එතුමා ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී ඔබතුමා දැනුවත් කරාවි.

## ගොඩකවෙල, වැලිගෙපොල සහ ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස : අනවසර වැලි හැරීම හා ගල් කැඩීම

## கொடக்கவெல, வெலிகெபொல, ஓப்பநாயக்க பிரதேச செயலாளர் பிரிவுகள்: அனுமதியற்ற மணல் அகழ்வு மற்றும் கல்லுடைத்தல்

GODAKAWELA, WELIGEPOLA AND OPANAYAKA DS DIVISIONS: UNAUTHORIZED SAND MINING AND QUARRYING

261/'18

**5. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් බලපත්‍ර නිකුත් කර ඇති ගොඩකවෙල, වැලිගෙපොල සහ ඕපනායක යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල විවිධ වූ ව්‍යාපෘති හා අදාළ බලපත්‍රලාභීන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වංචනික ලෙස සැකසූ බලපත්‍ර යොදාගනිමින් විවිධ වූ අනවසර වැලි හැරීම, ගල් කැඩීම් වැනි ක්‍රියාකාරකම් සිදුවන බව දන්නේද;

(iii) මෙවැනි ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් නවතාලීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசியக் கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) புவிச்சரிதவியல் அளவை மற்றும் சுரங்கப் பணியகம் மூலமாக உரிமங்கள் விநியோகிக் கப்பட்டுள்ள கொடக்கவெல, வெலிகெபொல மற்றும் ஓப்பநாயக்க ஆகிய பிரதேச செயலாளர் பிரிவுகளின் பல்வேறு கருத்திட்டங்கள் மற்றும் சம்பந்தப்பட்ட உரிமம் பெறுனர்கள் பற்றிய விபரங்கள் வெவ்வேறாக யாவை;

(ii) மோசடியாகத் தயாரிக்கப்பட்ட உரிமங்களைப் பயன்படுத்தி பல்வேறு அனுமதியற்ற மணல் அகழ்வு, கல்லுடைத்தல் போன்ற செயற்பாடுகள் இடம்பெறுகின்றனவென்பதை அறிவரா;

(iii) இத்தகைய கருத்திட்டங்களையும் செயற்பாடு களையும் தடுத்து நிறுத்த மேற்கொள்ளப் படுகின்ற நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) separately, the various projects in the Godakawela, Weligepola and Opanayaka Divisional Secretaries' Divisions for which permits have been issued by the Geological Survey and Mines Bureau and the relevant permit holders;

(ii) whether he is aware of the fact that activities such as unauthorized sand mining and quarrying take place on forged permits; and

(iii) the steps that would be taken to curb these kinds of projects and activities?

(b) If not, why?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - Deputy Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් වාර්තා කර ඇති පරිදි, කාර්යාංශය මඟින් ව්‍යාපෘති නාමයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමක් සිදු නොකරන අතර, ගොඩකවෙල, වැලිගෙපොල සහ ඕපනායක යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අදාළව බලපත්‍ර නිකුත් කර ඇති බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් විස්තර ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

(ii) එවැනි ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා වී ඇත.

(iii) වංචනික ලෙස සකස් කරන ලද බලපත්‍ර මඟින් ප්‍රවාහනය සිදු කරන අවස්ථාවලදී පොලිසිය මඟින් එම පුද්ගලයන් සඳහා නඩු පැවරීම් සිදු කරනු ලබන අතර, එම බලපත්‍ර සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, පොලීසිය වෙත අදාළ තොරතුරු අනලස්ව ලබාදීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් දැනටමත් සිදු කරනු ලබයි.

මෙවැනි වංචනික ආකාරයේ ව්‍යාජ බලපත්‍ර සකස් කරන ආයතන වැටලීම් කර නීතිමය පියවර ගැනීම සඳහා විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සමඟ එක් වී පියවර ගෙන ඇති අතර, එම බලපත්‍ර යොදා ගනිමින් කැණීම් හා ප්‍රවාහන කටයුතු සිදු කරනු ලබන පුද්ගලයන් නීතියේ රැහැනට හසුකර ගෙන එම පුද්ගලයන්ගේ ලොරි රථ අසාදු ලේඛනගත කිරීමද කාර්යාංශය මඟින් සිදු කරනු ලැබේ.

වංචනික ව්‍යාජ බලපත්‍ර සකස් කරන ස්ථාන හා පුද්ගලයන් සම්බන්ධයෙන් විශේෂ කාර්ය බලකාය හා පරිසර පොලීසිය දැනුවත් කර, එම පුද්ගලයන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සහභාගිත්වය ඇතිව නීතියේ රැහැනට හසුකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, කාර්යාංශයට අදාළ විශේෂ වැටලීම් ඒකකය මඟින් ද ලැබෙන තොරතුරු මත එවැනි ස්ථාන හා පුද්ගලයන් වැටලීම් කර අත් අඩංගුවට ගැනීම සිදු කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

ඇමුණුම **සභාගත*** කරමි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

වංචනික ලෙස සැකසූ බලපත්‍ර යොදාගෙන විවිධ වූ අනවසර වැලි හැරීම්, ගල් කැඩීම් සිදුවන බව අමාත්‍යාංශය දන්නවාය කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා.

අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් දැනුවත් වෙලා, ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග ගත්තාට, ඒවා ප්‍රතිඵලදායක නොවී තිබීම ගැන අපි කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ රටේ රාජ්‍ය ආයතනවලින් කිහිපයක් අද වනවිට ජනතාව විසින් "දූෂිත රාජ්‍ය ආයතන" ලෙස නම් කර තිබෙනවා. මම උදාහරණයක් කියන්නම්. රේගුව කියන ආයතනය තුළ සිදුවන මගඩි වැඩ, හොර වැඩ ගැන රටේ ජනතාව අතර හොඳ ප්‍රසිද්ධියක් තිබෙනවා. අද වෙනකොට භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයත් ඒ තත්ත්වයට පත්වී තිබෙන බව මම ඔබතුමාට කියන්න කැමැතියි. නිදසුන් සහිතව ඒ ගැන විස්තර ඔබතුමාට ලබා දෙන්න අපට පුළුවන්.

මේ වන විට මනම්පිටිය ප්‍රදේශයේ ගඟ ආශ්‍රිතව සිදු කළ වැලි කැණීම් එම ප්‍රදේශයේ ජනතාව විසින් නතර කරලා, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය මැදිහත් වෙලා වෙනම සමාගමක් හරහා තමයි දැන් ඒ කටයුතු කෙරෙන්නේ. කොළඹ සිටින ජනතාවට ලොරි රථවලින් වැලි ටිකක් ඇදලා ජීවත් වුණු ඒ මිනිසුන්ට තිබුණු ඒ අයිතියත් අද වනවිට අහිමි කර තිබෙනවා. දානය සකසා අවසන් වූ පසුව, බුද්ධ පූජාවට මුලින්ම අයින් කරනවා වාගේ වැඩක් තමයි එතැන සිද්ධ වෙන්නේ. අද වෙනකොට "වැලි රජ්ජුරුවෝ" කියා නමක් තිබෙන පොළොන්නරුවේ එක්තරා පුද්ගලයකුට වැලි අයින් කරලා තමයි, අනෙක් අයට සල්ලිවලට ලොරියට වැලි ටික ලබා දෙන්නේ. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය මේ තරම් දුරට දේශපාලනීකරණය වෙලා, එක් එක් කණ්ඩායම්වල අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටීම තුළ, රටේ ජනතාවට [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඒ පැත්තට ගියා නම් ඔබතුමාට ඒක හොයා ගන්න පුළුවන්.

මේ රටේ අහිංසක මිනිසුන්ට සමානව සේවය කළ යුතු ආයතනයක් මෙහෙම දේශපාලනීකරණය වෙලා, රටේ අහිංසක මිනිසුන් මේ වාගේ හිර කර තිබීම සම්බන්ධයෙන් පියවරක් ගන්නවාද කියා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි. ඒ සම්බන්ධයෙන් පියවරක් ගන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඇත්තටම දැන් නොවෙයි මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. දූෂණ, වංචා සිදු වෙන ස්ථානයක් බව දැන ගෙන තමයි අතිගරු ජනාධිපතිතුමා මේ අමාත්‍යාංශය තමන් යටතට ගත්තේ. මෙතෙක් කල් සම්ප්‍රදායානුකූලව ජනාධිපතිවරයා භාරගන්නේ මුදල් අමාත්‍යාංශය. එහෙම මුදල් අමාත්‍යාංශය භාර ගන්නේ නැතුව, පරිසර අමාත්‍යාංශය භාර අරගෙන මේක නිවැරැදි කිරීමේ කාර්යයට තමයි පෙලඹිලා තිබෙන්නේ. මේකේ වංචා, දූෂණ සිදු වෙනවා. ඒක පිළිගන්නවා. ඒ සඳහා තමයි අපි විශේෂ වැටලීම් ඒකකයක් යොදලා තිබෙන්නේ. වංචා දූෂණ සිදු වෙනවා කියා දන්නේ නැත්නම්, විශේෂ වැටලීම් ඒකකයක් අවශ්‍ය නැහැ නේ. දන්නා නිසා තමයි විශ්‍රාමික මේජර් ජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විශේෂ වැටලීම් ඒකකයක් හදලා තිබෙන්නේ. ඒ ඒකකය ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහා කටයුතු කෙරෙනවා. වැලි කිව්වාම ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ වැලි ගොඩ දැමීම පසු ගිය කාලයේ ඉවක්-බවක් නැතුව සිදු වුණා. කැලණි ගඟ වාගේ ගංගාවල මුහුදටත් වඩා ගැඹුරු විධියට වැලි කැණීම් කටයුතු කර පරිසරයට දරුණු අපරාධ සිදු වෙලා තිබෙනවා. ඒවා යාවත්කාලීන කිරීම සඳහා කටයුතු සිදුවෙමින් පවතිනවා. ඒ වාගේම වැලි ප්‍රවාහනය ගැන කථා කරපුවාම අපට ගොඩක් දුෂ්කරතා ආවා. වර්තමාන රජයට සමහර තැන්වලදී බැණුම් අහන්න වෙනවා, වැලි ප්‍රවාහනයට, පස් ප්‍රවාහනයට දැඩි නීති දමා තිබෙනවා කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි අක්‍රමිකතා සිදු වෙන නිසා තමයි දැඩි නීති පනවන්න හේතු වුණේ. දැඩි නීති පැනවුවත් සමහර වෙලාවට වංචනික පුද්ගලයා විවිධ උපක්‍රම දමා තමුන්ට අවශ්‍ය විධියට ඒ දේවල් කර ගන්න පුළුවන්. නමුත් සාධාරණව කටයුතු කරන පුද්ගලයාට තමයි මේ නීති ගොඩක් බලපාන්නේ. ඒ ගැනත් අපේ අවධානය යොමු කර කටයුතු කරන්න උත්සාහ කරනවා. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රශ්න අපට ආවා, වැලි ලොරියකට පර්මිට් ගත්තාම ඇත ඉඳන් එන ලොකු වැලි ලොරියට පොඩි පාරවල යන්න බැරි ප්‍රශ්න තිබෙනවා කියා. අපි ඉදිරියේදී බලනවා ලොකු ලොරියකින් ගෙන එන වැලි, ප්‍රවාහන අපහසුව නිසා පොඩි ලොරියකින් හෝ, ට්‍රැක්ටරයකින් හෝ වැලි ටික ගම ඇතුළට ප්‍රවාහනය කරද්දී අර ලොකු ලොරියට ලබා දීපු බලපත්‍රය භාවිත කරමින් පැය 24ක් ඇතුළත ප්‍රවාහන කටයුතු කරවන්න. මේකේ ලොකු ප්‍රශ්න තිබෙනවා. ඔබතුමා කියන දේ හරි, ගරු මන්ත්‍රීතුමනි. වැදගත් ප්‍රශ්නයක් තමයි අහන්නේ. ලොකු ප්‍රශ්න තිබෙනවා. "අද මේ තත්ත්වයට වැටී තිබෙනවා." කියන එකට මම විරුද්ධ වෙනවා. නමුත් කාලයක් තිස්සේ නීති-රීති නැතුව වැලි ගොඩ දැමීම්, පස් කැපීම්, ගල් කැඩීම් සිදු වුණා. ඒක තමයි නීති ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා යම් අපහසුතාවකට අපි ඔක්කෝම පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඉදිරියේදී සාධාරණ පුද්ගලයාට මේ නීති ලිහිල් කරන්නේ කොහොමද කියන දේ ගැන අපි සොයා බලා කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා මේ වැලි බෙදාවාකය නිසා ඔබතුමා නියෝජනය කරන ආසනයේත් විශාල ප්‍රශ්නයක් තිබෙන බව. මම මේ කාරණය කෙරෙහි ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි.

රත්නපුර දිස්ත්‍රික්කය ගත්තාම අහිංසක මිනිහෙකුට පතලක් කපාගන්න, ගඟේ ඉල්ලම් ටිකක් සෝදාගන්න ඉඩ දීමට තරම් ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය සංවේදී වෙන්නේ නැහැ. මම කියන්නේ ඒ කටයුතු නීති විරෝධී නොවන ආකාරයෙන් කළ යුතුය කියායි. නමුත්, සාමාන්‍ය අහිංසක පුද්ගලයෙකුට වැලි ටිකක් ගොඩ දමාගන්න නීතියෙන් අවස්ථාවක් නැහැ. නමුත්, අද වන විට ජාවාරම්කරුවෝ භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ සහයෝගය ඇතිව එම කටයුතු විශාල වශයෙන් කරගෙන යනවා. මම නියෝජනය කරන රක්වාන මැතිවරණ කොට්ඨාසයේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සම්බන්ධීකරණ කමිටුව තීන්දුවක් ගත්තා, පස් කපා සෝදා වැලි ලබා ගන්නා වැඩසටහන නැවැත්විය යුතුයි කියා. නමුත්, ප්‍රාදේශීය ලේකම්වරයා නොසලකා හැර භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ ඉහළින් ලැබෙන සහයෝගය හා ශක්තිය මත ඒ

[ගරු හේෂා විතානගේ මහතා]

කටයුතු ක්‍රියාත්මක වෙනවා. එම නිසා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විධියට ඔබතුමාගෙන් සහ ඔබතුමාගේ අමාත්‍යවරයා වන අතිගරු ජනාධිපතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. ප්‍රාදේශීය ලේකම්වරයා නොසලකා වැඩ කිරීමට භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයට තිබෙන භයිය මොකක්ද කියා මම අහනවා. ඒ වාගේම මේ විධියට නිලධාරීන් මුදලට විකිණීම පිළිබඳව යම් පියවරක් ගන්න කටයුතු කරනවාද කියන ප්‍රශ්නයටත් මම ඔබතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු මන්ත්‍රීතුමනි, සංවේදී විධියට පරිසරය ගැන බලා කටයුතු කිරීම පිළිබඳව ඇත්තටම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ජනතාව ගැන සිතීම පිළිබඳවත් ස්තුතිවන්ත වෙනවා. ඉවක් බවක් නැතුව පතල් හෑරීම, ඒ වාගේම යන්ත්‍රෝපකරණ භාවිත කර පතල් හාරලා ඒ ස්ථානය යථා තත්ත්වයට පත් කරන්නේ නැතුව එම ස්ථානයෙන් පැනලා යෑම වාගේ දේවල් සිද්ධ වෙනවා. එවැනි කටයුතු නැවැත්වීම සඳහා සහ ඔබතුමා කිව්වා වාගේ විවිධ අය සමඟ එකතු වෙලා කරන හොර ජාවාරම් නැවැත්වීම සඳහා තමයි අපට මෙවැනි නීති රීති පද්ධතියක් දමන්න සිද්ධ වුණේ. විශේෂයෙන්ම අමාත්‍යාංශය වශයෙන් අපි පිළිගන්නවා, මේ නීති රීති පද්ධතිය නිසා රටේ ජනතාව යම් පසු බෑමකට ලක්වෙලා තිබෙනවා කියා. අපට පරිසරය ආරක්ෂා කරන්නත් අවශ්‍යයි, පරිසරය ආරක්ෂා කරමින් අනාගත පරපුරට හොඳ රටක් භාර දෙන්නත් අවශ්‍යයි. හැබැයි, මෙතෙක් පුරුදු වී තිබුණු ඉවක් බවක් නැතුව කරන පරිසර හානිය අපට නවත්වන්න සිදු වුණා. එතැනදී එසේ ඉවක් බවක් නැතුව පරිසරයට හානි කරමින් කරනු ලබන ක්‍රියාදාමවලින් යැපෙන පිරිසක් මේ රටේ සිටිනවා. ඒ අයට යම් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපි අතිගරු ජනාධිපතිතුමාගේ මෙහෙයවීම හා සම්බන්ධීකරණය මත මේ තාක් පනවා තිබෙන නීති පද්ධතිය විටින් විට ලිහිල් කරන්න කටයුතු කරන්නේ. හැබැයි, බොහොම පරිස්සමින්. මොකද අපි දන්නවා, නීති පද්ධතිය ලිහිල් කරනකොට ඒකෙනුත් ප්‍රයෝජනය ගන්නේ ජාවාරම්කාරයෝ බව. ඒ නිසා බොහොම පරිස්සමින් ඒක කරනවා. ඒ වාගේම මහජන නියෝජිතයෙක් වශයෙන් -ගමේ ජනතාව වෙනුවෙන් කටයුතු කරන ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන්- ඔබතුමා සතුව තිබෙන තොරතුරු සහ දත්ත අපට ලබා දෙන්න. විශේෂයෙන්ම අපි ඒ ගැනත් කටයුතු කරනවා. මොකද, ඔබතුමා වාගේ මන්ත්‍රීවරයෙක් තමන්ගේ ගම ගැනත්, පරිසරය ගැනත් හිතලා මේ වගේ ප්‍රශ්න අහන එක පිළිබඳව අපට ආඩම්බරයි.

අපි විශේෂ කාර්යාංශයක් පිහිටුවලා තිබෙනවා. එම කාර්යාංශය මඟින් මේ සම්බන්ධව කටයුතු කරනවා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා ඔබතුමාගේ ඔය ප්‍රශ්නය සැලකිල්ලට ගෙන ශිල්පීය කැණීම්, ඒ කියන්නේ අතින් කපලා, උදැල්ලෙන් කපලා මැණික් පතල් කරන අයට දැන් නිදහස ලබා දී තිබෙනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ඒ වුණාට ඒක නීතියක් විධියට ගැසට් එකකින් ඇවිත් නැහැ. අතිගරු ජනාධිපතිතුමා රත්නපුරයට ගිහින් ප්‍රකාශයක් කරලා ආවා. ඊට පසුව මිනිසුන් ගහේ ඒ වැඩ කටයුතු කළා. පස්සේ STF එකෙන් ඇවිත් සියල්ලෝම අල්ලාගෙන ගොස් උසාවි දැම්මා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ඔබතුමා නිවැරදියි. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙන්නේ ඒක නිසා තමයි. ඔබතුමා ගමේ ඉඳගෙන සිදු වන යථාර්ථය දකිනවා. පසුගිය දවස්වල STF එකේ ක්‍රියාකාරකම් නිසා අහිංසක මිනිසුන් දුවන්න ගිහින් මැරිලා තිබෙන බව අපි දැක්කා. ඒ කියන්නේ බලපත්‍රයක් නැතිව කැණීම් කටයුතු කරලා ප්‍රශ්නවලට මුහුණ දී තිබෙනවා. එම නීතිය ක්‍රියාත්මක වෙලා නැත්නම්, ජනාධිපතිතුමාගේ ප්‍රකාශය ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, ඒ ගැන සොයා බැලීමේ වගකීම නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් මම භාර ගන්නවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අද දවසේ වැඩ කටයුතු තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීළඟට තිබෙන මගේ ප්‍රශ්නයට අතුරු ප්‍රශ්න අහන්නේ නැතිව මම මේ ප්‍රශ්නයට අදාළව දැන් අතුරු ප්‍රශ්නයක් අහන්නම්. මටත් මේ ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් කරන්න තිබෙනවා. මගේ අතුරු ප්‍රශ්න ඇසීමේ කාලය මම දැන් ගන්නද? මට වැදගත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මගේ ප්‍රශ්නයට පිළිතුර සභාගත කළත් කමක් නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මගේ ප්‍රශ්නය ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයමයි. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රකාශයෙන් පසුව අපි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ කථා කරලා STF එක කරන මෙහෙයුම් නැවැත්වීමට පහළට දැනුම් දිය යුතුයි කියා නියෝජ්‍ය

පොලිස්පතිතුමා ඇතුළු පිරිසට දැනුම් දුන්නා. ඒ අනුව උදැල්ලෙන්, කුඩෙන් ගංගාවල, ඇළදොළවල වැලි හේදීමේ අයිතිය තහවුරු කරන්න කියා පොලිසියට කිව්වා. පොලිසිය ඒක භාර ගත්තා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා කලින් ඒ ගැන පිළිතුරු දුන්නා නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
කලින් පිළිතුරු දුන්නා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 6 - 496/'18 (2), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රශ්නය අහනවා. මගේ කාලය ගෙන මට ගරු අජිත් මාන්නප්පෙරුම නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න බැරිද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම කනගාටුයි. ඒකට ඉඩ දෙන්න බැහැ. ඔබතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරු දීමට ගරු ඇමතිතුමා ඉන්නවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මිනිස්බල සේවකයන් අන්තර්ග්‍රහණය : ලංකා විදුලිබල මණ්ඩලය

### மனிதவலு ஊழியர்களை உள்ளீர்த்தல்: இலங்கை மின்சார சபை

ABSORPTION OF MANPOWER WORKERS: CEYLON ELECTRICITY BOARD

544/'18

**7. ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,- (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ, මධ්‍යම, වයඹ, උතුරු, උතුරු මැද හා නැගෙනහිර ඇමතුම් මධ්‍යස්ථාන තුළ මිනිස්බල සේවකයන් 83 දෙනෙකු ඇමතුම් නිලධාරීන් ලෙස වසර 03කට අධික කාලයක් පැය 24 පුරා සේවා මුර 03ක් යටතේ මහජන සේවයේ යෙදී සිටින බවත්;

(ii) මිනිස් බල සමාගම් හරහා කොන්ත්‍රාත් පදනම මත සේවය කළ 6700කට වැඩි පිරිසක් ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර හා අනියම් කාර්ය මණ්ඩලයට 2016.01.01 දින හා 2016.10.18 යන දිනයන්හිදී බඳවා ගත්තද, ඉහත 83 දෙනාගේ සේවයේ ස්ථිර කිරීමක් නොමැතිව තවමත් මිනිස් බල සමාගම් හරහා අඛණ්ඩව සේවය කරන බවත්;

(iii) ලංකා විදුලිබල මණ්ඩල පාලන අධිකාරිය විසින් ඔවුන් සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බවත්;

එතුමා දන්නේ ද?

(ආ) ඔවුන්ගේ සේවය පිළිබඳව සලකා බලා ඔවුන් ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර හෝ තාවකාලික සේවයට අන්තර්ග්‍රහණය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மின்சார சபையின் மத்திய, வடமேல், வடக்கு, வடமத்திய மற்றும் கிழக்கு அழைப்பு நிலையங்களில் 83 மனிதவலு ஊழியர்கள் அழைப்பு உத்தியோகத்தர்களாக 03 வருடங் களுக்கு மேலாக 24 மணிநேரமும் 03 கடமைச் சுற்றுகளின்கீழ் பொதுசன சேவையில் ஈடுபட்டுள்ளனரென்பதையும்;

(ii) மனிதவலுக் கம்பனிகள் ஊடாக ஒப்பந்த அடிப்படையில் சேவையாற்றிய 6700க்கு மேற்பட்டோர் இலங்கை மின்சார சபையின் நிரந்தர மற்றும் அமையப் பதவியணியில் 2016.01.01 மற்றும் 2016.10.18 ஆகிய திகதிகளில் சேர்த்துக்கொள்ளப்பட்டபோதிலும், மேற்படி 83 பேர்களின் சேவை நிரந்தரமாக்கப் படாமல் இன்னமுமே தொடர்ச்சியாக மனித வலுக் கம்பெனிகள் ஊடாக அவர்கள் சேவையாற்றி வருகின்றனரென்பதையும்;

(iii) இலங்கை மின்சார சபையின் நிர்வாக மேலாண்மை இவர்களைச் சேவையிலிருந்து நீக்க நடவடிக்கை மேற்கொண்டுவருகின்தென் பதையும்;

அவர் அறிவாரா?

(ஆ) இவர்களின் சேவைபற்றிக் கருத்திற்கொண்டு அவர்களை இலங்கை மின்சார சபையின் நிரந்தர அல்லது தற்காலிக சேவையில் உள்ளீர்க்க நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Is he aware that-

(i) 83 employees from manpower agencies have been employed at Call Centres of Ceylon Electricity Board in the Central, North Western, Northern, North Central,

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

and Eastern Provinces to serve the public as Customer Service Officers round the clock in 03 shifts for a period of over 03 years;

(ii) despite that over 6,700 employees who had served on contract basis through manpower agencies were absorbed to the permanent and casual cadres of Ceylon Electricity Board on 01.01.2016 and on 18.10.2016, the aforementioned 83 employees have not been confirmed in their service yet, and they have continued to serve through manpower agencies; and

(iii) the administration of Ceylon Electricity Board is taking measures to remove them from their service?

(b) Will he inform this House whether steps will be taken to absorb them to the permanent or temporary cadre of Ceylon Electricity Board taking into consideration the service they have provided so far?

(c) If not, why?

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්, ඒක සත්‍යයක්.

(ii) ඔව්, ඒක සත්‍යයක්.

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ පාලනාධිකාරිය විසින් ඔවුන් සේවයෙන් ඉවත් කිරීමට අදහස් කර නැත. ඔවුන් බැඳිලා තිබෙන්නේ කොන්ත්‍රාත් පදනම මතයි. තව දුරටත් කොන්ත්‍රාත් පදනම මත කටයුතු කරමින් සිටී.

(ආ) මෙහි සඳහන් ඇමතුම් මධ්‍යස්ථාන සේවකයින් අතරින් සුදුසුකම් සපුරා ඇති අය ලංවිම ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට සලකා බැලීම සඳහා ඇමතුම් මධ්‍යස්ථාන ක්‍රියාකරු ස්ථිර තනතුරට බඳවා ගැනීමට අදාළ විභාගය පැවැත්වීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රහුණු කිරීම්) විසින් කටයුතු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා විදුලිබල මණ්ඩලය manpower සේවකයන් 6,000කට ආසන්න ප්‍රමාණයක් ස්ථිර කර තිබෙනවා. ඒ වාගේම 2014 අවසානය වන විට මාස 6කට වඩා සේවය කර තිබුණාද කියන පදනම තමයි අපි සලකා බැලුවේ. මූලික සුදුසුකම් නැති අයටත් අවස්ථාවක් දුන්නා. නමුත්, අමාත්‍ය මණ්ඩලය manpower සේවකයන් විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන අවස්ථාවේදී, මෙය අවසාන වතාව බවත්, නැවත මෙවැනි අන්තර්ග්‍රහණය කිරීම්වලට ඉඩ නොදෙන බවත්, නොදිය යුතු බවත් දැනුම් දීලා තිබෙනවා. ඒ නිසා අපි ඇමතුම් මධ්‍යස්ථානවල සේවය කරන සේවක සේවිකාවන් කෙරෙහි කාරුණිකව සලකා බලා -ඔවුන් ඉන්නේ කොන්ත්‍රාත් පදනම මත,- ඒ තැනැත්තන්ගෙන් සුදුසුකම් ඇති අයට අයදුම් කිරීමට අවස්ථාව දීලා තිබෙනවා. අනෙක් සෑම කෙනකුම තරග විභාගයට මුහුණ දීලා, සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීලා සේවයට ඇතුළත් විය යුතුව තිබෙනවා. ඒ සඳහා අවකාශය අපි ලබා දෙනවා කියන කාරණය කියන්න කැමැතියි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය ඇසීම ආරම්භ කරන්නේ මිනිස්බල සේවකයින් 6,000ක් අන්තර්ග්‍රහණය කිරීම ගැන විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයට ප්‍රශංසා කරමිනුයි. ඇත්තටම මේ අය අන්තර්ග්‍රහණය කරන්න වෙන්නේ මේ අය බඳවා ගැනීම නිසයි. මේ අය බඳවා ගැනීමේ නීතියක් පැහැදිලිව තිබෙනවා නම් මේ ප්‍රශ්නය මතු වන්නේ නැහැ. ඒක ඔබතුමන්ලාට භාරයි. දෙවන කාරණයත් ඒකත් එක්කම මතු වන කාරණයක්. මේ පවත්වන්න යන විභාගයට ඉල්ලුම් කරන්න ඇමතුම් මධ්‍යස්ථානවල ඉන්න අයට තිබිය යුතු සුදුසුකම් මොනවාද? එතකොට මේ අයට ඒ සුදුසුකම් නැති වුණත් ඒ සුදුසුකම් ලබාගන්න කාලයක් දෙනවා නම් ඒක නේද සාධාරණය හා යුක්තිය? ඒ මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල මණ්ඩලයේ කලින් තිබුණු ප්‍රතිපත්තිය තමයි ස්ථිර සේවකයන්ගේ සංඛ්‍යාව වැඩි නොකළ යුතුයි; ආයතනයේ ලාභය තකා කොන්ත්‍රාත්, manpower සමාගම් හරහා සේවකයන් බඳවා ගෙන අඩු වැටුපකට අඩු පහසුකමකට සේවය ලබා ගැනීම තමයි කළ යුතු වන්නේ කියන එක. අපි බලයට පත් වෙද්දි ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මැතිවරණ ව්‍යාපාරයේදීම අපේ ඉල්ලීම අනුව පොරොන්දුවක් දුන්නා, "මෙම ප්‍රතිපත්තිය අපි වෙනස් කරනවා. දැනට manpower සේවකයන් වශයෙන් ශ්‍රමය සූරාකෑමට ලක් වන ඒ සේවකයන් දහස් ගණනකට අපි සේවය ලබා දෙනවා" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි ඇති බරපතළකම, මුළු විදුලිබල මණ්ඩලයේම සේවකයන් ඉන්නේ 25,000යි. අපි 6,000ක් ස්ථිර කළා. ඒ කියන්නේ සියයට 25ක්. අද විදුලිබල මණ්ඩලයේ ඉන්න සේවකයන්ගෙන් හතරෙන් පංගුවක් manpower සේවකයන් විධියට ඉඳලා ස්ථිර කරපු අයයි. අපේ රජය බලයට පත් වුණේ නැත්නම් මේක වෙන්නේ නැහැ. කලින් රජයෙන් තිබුණේ ශ්‍රම සූරාකෑමේ ප්‍රතිපත්තිය. ඒක අපි අහෝසි කළා. මම ඔබතුමාට වගකීමෙන් කියනවා, අලුතෙන් කිසිම manpower සේවකයෙක් බඳවා ගන්නේ නැහැ කියලා. manpower ප්‍රතිපත්තිය අපි සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා. එකම සේවය තුළ වරප්‍රසාද දෙකක් ලබන සේවකයන් සිටීම තුළ ආයතනයෙහි බොහෝ ගැටලු මතු වුණා. මානුෂිකත්වය පිළිබඳ ගැටලුත් මතු වුණා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒකාබද්ධ විපක්ෂයෙන් ඔබතුමන්ට ප්‍රශංසා කළා නේද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බොහොම ස්තුතියි. ඒ manpower සේවකයන් වශයෙන් ඇතුළත් වෙලා හුදෙකලා වෙලා ඉතිරි වෙලා ඉන්න මේ පිරිස ගැන

අපි සානුකම්පිතව සලකා බලනවා. අපි ඔබතුමන්ලාගේත් අදහස් සලකා බැලීමෙන් පසුව ඔවුන්ට අවස්ථාව සලසා දෙන්න තීරණය කරලායි තිබෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම ඇහුවේ විභාගයට යන්න ඒ අයට අදාළ වන සුදුසුකම් මොනවාද කියායි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ අයට අදාළ සුදුසුකම් වෙන්නේ ලිපිකරුවන් හා අදාළ වන සමාන සුදුසුකම්. ඒ අනුව ඉංග්‍රීසි, සිංහල, ගණිතය විෂයයන්වලට සම්මාන ඇතුව සාමාන්‍ය පෙළ සහතිකය සහ උසස්පෙළ සුදුසුකම.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ සඳහා සුදුසුකම් නැති අයට ඒ සුදුසුකම් ලබා ගන්නට කාලයක් ලබා දෙනවාද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එසේ කරන්නට නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය නැවත වෙනස් කරන්න වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා ප්‍රශ්න කිහිපයක්ම ඇහුවා. දැන් මේ කී වෙනි අතුරු ප්‍රශ්නයද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයයි අහන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නයට එතුමා පිළිතුරක් දුන්නා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පළමුවෙනි අතුරු ප්‍රශ්නයටයි එතුමා පිළිතුරු දුන්නේ. දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දැන් දෙවැනි අතුරු ප්‍රශ්නයයි. එතුමා පිළිතුරු දෙමින් යනකොට-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මට කිසිම ගැටලුවක් නැහැ. නමුත්, අද කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මම ඒකයි කියන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දවසේ වැඩ කටයුතු තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතියි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ලංකා විදුලිබල මණ්ඩලයට සම්බන්ධ ප්‍රශ්නයක් නිසා මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. සුළං බලයෙන් -wind power - විදුලිය උත්පාදනය කිරීම සහ පුනර්ජනනීය බල ශක්තිය පිළිබඳව විශාල වශයෙන් ප්‍රශ්න ඇවිල්ලා තිබෙනවා. මෙගාවොට් 100ට වැඩියෙන් විදුලිය නිෂ්පාදනය සඳහා තිබෙන ව්‍යාපෘති සියල්ලම දැනට නතර වෙලා තිබෙන්නේ. දැන් විශාල අර්බුදයක් තිබෙනවා. ඔබතුමන්ලා බිලියන ගණනක් -විශාල මුදලක්- වියදම් කර කර තාප විදුලි බලයෙන් විදුලිය නිෂ්පාදනය කරනවා. ඔබතුමන්ලා මේකට වැඩ පිළිවෙළක් සකස් කරන්නේ කවදාද? ඒ වැඩ පිළිවෙළ දැනට සම්පූර්ණයෙන්ම නතර වෙලා තිබෙන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේකට ගොඩක් මහන්සි වෙන කෙනෙක්. එම නිසා දැනට මේ සම්බන්ධව ඔබතුමා අරගෙන තිබෙන පියවර පිළිබඳව අපට කරුණාකරලා කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමා, පුළුවන් තරම් කෙටියෙන් උත්තරයක් දෙන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් තිබුණු දූෂිත බලපත්‍ර ක්‍රමය අහෝසි කළා. ඒ වෙනුවට තරගකාරී, පිරිසිදු ක්‍රමවේදයක්

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

පටන් ගත්තා. මෙගාවොට් 1 බැගින් වූ සූර්ය බලාගාර 60ක්, ඉන් පසුව නැවත මෙගාවොට් 1 බැගින් වූ බලාගාර 90ක් සඳහා ටෙන්ඩර් කැඳෙව්වා. තව මාසයකින් මෙගාවොට් 70ක සුළං බලාගාර හා මෙගාවොට් 150ක සූර්යය බලාගාර සඳහා ටෙන්ඩර් කැඳවනවා. ඒ වාගේම මෙගාවොට් 10 බැගින් වූ බලාගාර 2ක් සඳහා ටෙන්ඩර් කළා. කලින් මිලෙන් සියයට 50කට අඩු වුණා. ඒ වාගේම සුළං බලාගාර 2ක් සඳහා ටෙන්ඩර් කළා. කලින් මිලෙන් සියයට 50කට අඩු වුණා. ඔය 100, 200, 300 කියලා අරන් එන සියලුදෙනාම කියන්නේ, unsolicited විධියට ඔවුන් කියන ගණන්වලට කොමිස් එකක් මත බලපත්‍ර දෙන්න කියලායි. අපි එහෙම දෙන්නේ නැහැ. තරගකාරී ලෙස ඉදිරිපත් වෙලා ඒ අවස්ථා ලබාගත යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සූර්ය බලයේ වර්ධනය අපි එනකොට තිබුණේ මෙගාවොට් 32යි. දැන් මෙගාවොට් 200ක් තිබෙනවා. ඒ කියන්නේ, සියයට 700ක වර්ධනයක් තිබෙනවා. ඒ වාගේම සුළං බලයේ සියයට 50ක වර්ධනයක් තිබෙනවා. ඊළඟට, ඉදිරියේදී මෙගාවොට් 100 බැගින් වූ මහා පරිමාණ බලාගාර දෙකක් පුනරින් සහ සියඹලාණ්ඩුවේ ආරම්භ වනවා. ආයෝජකයින් ඉන්නවා නම්, සූදානම් වෙලා ඉන්න. නියම ආයෝජකයින්ට, -ඒ කියන්නේ, දූෂිත ක්‍රමවලට එන අය නොවෙයි.- අමාත්‍යාංශයට ඇවිල්ලා විස්තර ලබා ගන්න පුළුවන්. දැන් ඉඳලා සූදානම් වෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ටෙන්ඩර් කාර්යය පටිපාටිය සඳහා පමණක් අපි දැන් සූදානම් වෙලා ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 8 - 569/'18-(1), ගරු අශෝක ප්‍රියන්ත මහතා - [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 9 - 588/'18-(1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා - [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 10-609/'18-(2), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ අවතැන් වූ පුද්ගලයන් : නිවාස ලබාදීම
## அநுராதபுரம் மாவட்டத்தில் இடம்பெயர்ந்தோர்: வீடு வழங்கல்
## DISPLACED PEOPLE IN ANURADHAPURA DISTRICT: PROVISION OF HOUSING

971/'18

**11. ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) යුද්ධය නිමා කර දැනට වසර ගණනාවක් ගත වී ඇතත්, යුද්ධයෙන් අවතැන් වූඅසරණ පුද්ගලයන් මේ වනවිටත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිටින බව දන්නේද;

(ii) එසේ නම්, මේ පිළිබඳව සොයා බලා නිවැරදි සංඛ්‍යා ලේඛන මත මෙම අවතැන්වූවන්ට ස්ථිර පදිංචි ස්ථාන හෝ නිවාස ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு அபிவிருத்தி மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யுத்தம் முடிவுறுத்தப்பட்டு இற்றைக்குப் பல வருடங்கள் கடந்துள்ளபோதிலும் யுத்தத்தினால் இடம்பெயர்ந்துள்ள நிர்க்கதியான ஆட்கள் தற்போதுகூட அநுராதபுரம் மாவட்டத்தில் உள்ளனரென்பதை அறிவாரா என்பதையும்

(ii) ஆமெனில், இது தொடர்பாக ஆராய்ந்து சரியான புள்ளிவிபரங்களுக்கமைய மேற்படி இடம்பெயர்ந்தோருக்கு நிரந்தர வசிப்பிடங்களை அல்லது வீடுகளைப் பெற்றுக்கொடுக்கும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Resettlement, Rehabilitation, Northern Development & Hindu Religious Affairs :

(a) Will he inform this House-

(i) whether he is aware that although many years have elapsed after ending the war, there are helpless persons who still remain in a state of displacement in the Anuradhapura District, out of those displaced by the war;

(ii) if so, the date on which these persons will be provided with permanent abodes or houses based on accurate statistics after looking into it?

(b) If not, why?

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு அபிவிருத்தி மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)
(The Hon. D.M. Swaminathan - Minister of Resettlement, Rehabilitation, Northern Development and Hindu Religious Affairs)

(அ) (i) ஆம்.

(ii) அநுராதபுர மாவட்டத்தினுள் 2017ஆம் ஆண்டு வரையான காலப்பகுதியிலே பதவிய, கெப்பிதிக் கொல்லாவ, மதவாச்சி, ஹொரவப்பொத்தானை, மஹவிலச்சி ஆகிய பிரதேச செயலாளர் பிரிவுகளில் 257 குடும்பங்களுக்கு முன்னுரிமை அடிப்படையிலே அரசாங்கத்தினாலும் மற்றும் தொண்டர் அமைப்புக்களினாலும் வீடுகள் அமைத்துக் கொடுக்கப்பட்டன. நிரந்தரமாக மீள் குடியேறியவர்களில் எஞ்சிய 604 குடும்பங் களுக்கு வீடுகள் வழங்க வேண்டியுள்ளன. எதிர்வரும் ஆண்டிலே நிதி அமைச்சின் ஒதுக்கீடுகளுக்கமைய முன்னுரிமை அடிப்படை யிலே இந்த வீடுகளை வழங்குவது குறித்துப் பரிசீலிக்கப்படும்.

(ஆ) எழவில்லை.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය.

கௌரவ அமைச்சர் அவர்களே, 1993ஆம் ஆண்டிலிருந்து அநுராதபுர மாவட்டத்திலே, மிஹிந்தலை தேர்தல் தொகுதியிலே, கனவல்பொல எனும் நகரிலே 15 குடும்பங்கள் இன்றுவரை அகதிகளாக வாழ்ந்து கொண்டிருக்கிறார்கள் என்பது உங்களுக்கு நன்றாகத் தெரிந்திருக்கும். இது சம்பந்தமாக உங்களுக்குப் பலமுறை நான் கடிதங்கள் அனுப்பியிருக்கின்றேன். ஆனால், இன்னும் அவர்களுக்குரிய வீட்டுத்திட்டங்களை நீங்கள் வழங்கவில்லை. அதேநேரம், என்னுடைய மாவட்டத்திலே 266 வீடுகளைக் கட்டிக் கொடுத்திருக்கிறீர்கள். அதற்கு உங்களுக்கு நான் நன்றி செலுத்துகின்றேன். நீங்கள் கொடுத்தது தேவையான வர்களுக்குச் சென்றடையவில்லை. ஆகவே, அநுராதபுர மாவட்டத்திலே கனவல்பொலையில் 1993ஆம் ஆண்டிலிருந்து வாழ்கின்ற அந்த மக்களுக்கு உங்களால் ஏன் அந்த வீட்டுத்திட்டத்தைக் கொடுக்க முடியாது? என்று மிக மனவருத்தத்துடன் உங்களிடம் கேட்கின்றேன்.

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
நீங்கள் மனவருத்தமடைவதையிட்டு நான் வருந்துகிறேன். நான் கூறியதுபோல், 257 குடும்பங்களுக்கு வீடுகளைக் கட்டிக்கொடுத்திருந்தோம். அந்த வீடுகள் உரிய முறையிலே மக்களுக்குச் சென்றடையவில்லையென்றால், அந்தக் குறையை நிவர்த்தி செய்வதற்கு நீங்கள் அந்த நேரத்திலேயே நடவடிக்கை எடுத்திருக்க வேண்டும். மேலும், அநுராத புரத்திலே 861 குடும்பங்களுக்கு வீடுகள் கட்டிக் கொடுக்க வேண்டும். இப்பொழுது 257 வீடுகள் கொடுக்கப் பட்டிருக்கின்றன. உண்மையிலே அங்கு 29.8 வீதத்தினருக்கு வீடுகளைக் கொடுத்திருக்கின்றோம். வடக்கு, கிழக்குப் பகுதிகளில் 184,000 வீடுகள் தேவை. எங்களுடைய அமைச்சின் மூலமாக என்னுடைய பதவிக் காலத்திலே 17,000 வீடுகளைக் கட்டிக்கொடுத்திருக்கிறோம். அப்படிப் பார்க்கும்பொழுது 9.2 வீதத்தினருக்கு வடக்கு, கிழக்குப் பகுதிகளில் வீடுகளைக் கொடுத்திருக்கின்றோம். ஆனால், அநுராதபுரத்திலே 29.18 வீதமானவர்களுக்கு வீடுகள் கொடுக்கப்பட்டிருக்கின்றன என்பதை நான் இங்கு கூற விரும்புகிறேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවෙනි අතුරු ප්‍රශ්නය.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය.

கௌரவ அமைச்சர் அவர்களே, அநுராதபுர மாவட்டத்தின் மதவாச்சித் தேர்தல் தொகுதி முல்லைத்தீவு மாவட்டத்தின் எல்லைப்புறத்திலும், அநுராதபுர ඓතිහ தேர்தல் தொகுதி மன்னார் மாவட்டத்தின் எல்லைப்புறத்திலும், ஹொரவப் பொத்தானை தேர்தல் தொகுதி திருகோணமலை மாவட்டத்தின் எல்லைப்புறத்திலும் அமைந்திருக்கின்றன. இங்கு வாழ்கின்ற மக்கள் பயங்கரவாதத்தினால் பாரிய இழப்புக்கு உள்ளாக்கப்பட்டவர்கள். அவர்களின் வீட்டுப் பிரச்சினை அநுராதபுர மாவட்டத்திலுள்ள வேறெந்த நிறுவனத்தினாலோ வேறெந்த அமைப்பினாலோ இன்னும் தீர்க்கப்படவில்லை. இங்கு சம்பந்தப்பட்டவர்கள் பேசுகின்ற பொழுது, அதற்கென்று ஓர் அமைச்சை ஏற்படுத்தியிருப் பதாகவும், குறித்த அமைச்சர் மூலந்தான் அந்தப் பிரச்சினைக்குத் தீர்வு காணப்படவேண்டுமென்றும் கூறுகின்றனர். ஆனால், நீங்கள் உங்களுடைய வடக்கு, கிழக்கு வீட்டுத்திட்டத்தை விகிதாசார அடிப்படையிலே நிர்மாணிக்கின்றீர்கள். இம்முறை வரவு செலவுத் திட்டத்திலும் பல்லாயிரக்கணக்கான கோடி ரூபாய் நிதி வடக்கு, கிழக்கு மாவட்டங்களின் வீட்டுத்திட்டங்களுக்கு ஒதுக்கப்பட்டிருக் கின்றன. நாங்கள் அதைச் சந்தோஷமாக ஏற்றுக் கொள்கின்றோம்.

அநுராதபுரத்தில் வாழ்கின்றவர்களும் மக்கள்தான்! அவர்கள் பாரிய பிரச்சினைகளுக்கு உள்ளாக்கப்பட்டவர்கள்; எல்.ரீ.ரீ.ஈ. இயக்கத்தினருக்கும் இராணுவத்தினருக்கும் இடை யிலான யுத்தத்தின்போது பாதிக்கப்பட்டவர்கள். எனவே, அவர்கள் அனைவரையும் நீங்கள் சமமான அந்தஸ்தில் வைத்து கவனிக்க வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் வடக்கு, கிழக்கில் வாழுகின்ற மக்களுக்குக் கொடுக்கும் முன்னுரிமையை ஏன், அநுராதபுர மாவட்டத்தில் வாழுகின்ற பாதிக்கப்பட்ட மக்களுக்குக் கொடுக்காமல் இருக்கின்றீர்கள்? அரசாங்கத்தால் நிதி ஒதுக்கப்பட்டால் மாத்திரம் அவர்களுக்கான வீட்டுத் திட்டங்களை வழங்குவதாகச் சொல்கின்றீர்கள். ஏன், இந்தியா போன்ற மற்றைய நாடுகளில் இருந்து வருகின்ற வீட்டுத் திட்டத்தை அநுராதபுர மாவட்டத்தில் வாழுகின்ற சம்பந்தப்பட்ட குடும்பங்களுக்கும் உங்களால் கொடுக்க முடியாது என நான் இந்தச் சபையிலே மிகவும் கவலையோடு கேட்க விரும்புகின்றேன்.

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் கேட்ட கேள்விக்கு நான் மறுமொழி கொடுத்திருக்கிறேன். எனக்கு நிதி கிடைத்தால், அநுராதபுரத்தில் மாத்திரமல்ல, இந்த நாட்டின் எந்தப் பகுதியில் உள்ள வீட்டுப் பிரச்சினையையும் அந்த மக்களுக்கு ஏற்றவிதத்தில் என்னுடைய அமைச்சின்மூலமாகத் தீர்த்துவைக்க முடியும். நான் முன்பு கூறியதுபோல், முதலாவது வருடத்திலே எனது அமைச்சுக்கு 19 பில்லியன் ரூபாய் கொடுத்தார்கள். அதற்குப் பிறகு, 14 பில்லியன் ரூபாய் கொடுத்தார்கள். 19 பில்லியன் ரூபாய் கொடுத்த காலத்தில் நான் எனது அமைச்சினூடாக 11,000 வீடுகளைக் கட்டினேன். அடுத்தமுறை 14 பில்லியன் ரூபாய் கொடுத்தபொழுது, 7,000 வீடுகளைக் கட்டினேன். எல்லாமாக இப்பொழுது, நாங்கள் 18,000 வீடுகளை மக்களுக்குக் கட்டிக்கொடுத்திருக்கின்றோம். சென்ற ஆண்டு எங்களுக்கு நிதி கிடைக்கவே இல்லை. 750 மில்லியன் ரூபாய்தான் கொடுத்தார்கள். இந்த ஆண்டிலே எங்களுக்கு நிதியைக் கொடுத்தால், அந்த நிதியின்மூலம் உங்களுடைய மக்களுக்கான வீட்டுத் திட்டத்தை ஏற்படுத்தித் தருவோம். இந்தியா அல்ல, யார் கட்டினாலும் எனக்குப் பிரச்சினை இல்லை! அந்த வீடுகளைக் கட்டுவதற்கு ஒரு வழி இருந்தால், அவற்றைக் கட்டி நாங்கள் உங்களுடைய மக்களுக்குக் கொடுப்போம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Sorry, Hon. Member, no more Supplementary Questions can be allowed.

ප්‍රශ්න අංක 12-1107/'18-(1), ගරු විජිත හේරත් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, 11 වන ප්‍රශ්නයට අදාළව ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා. තවත් ප්‍රශ්න අහන්න බැහැ.

ප්‍රශ්න අංක 13-1130/'18-(1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම කරුණ කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මට ලැබෙන වරප්‍රසාද යටතේ මම අහන ප්‍රශ්නයකට අදාළ ඇමතිවරයා පිළිතුරු දෙන්න කලින් ඒ ආයතනයෙන් මට පිළිතුරු ලිපිය එවනවා. මම හිතන හැටියට ඒක සම්පූර්ණයෙන් වැරදියි. මේ පිළිබඳව සොයා බලා පියවර ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, පාර්ලිමේන්තුවේදී අපි අසන ප්‍රශ්නවලට පාර්ලිමේන්තුවේදී ඇතුළේ පිළිතුරු දෙන්න ඕනෑ අදාළ ඇමතිවරයා විසින්. ඒ ආයතනයට බැහැ සෘජුව මට ඒ පිළිතුර එවන්න.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 14-1143/'18-(1), ගරු ඒ.එල්.එම්. නසීර් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 15-1181/'18-(1), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ රැස්වීම් සඳහා හැම දාම සහභාගි වෙන, ඒ වාගේම අවසානය වනතුරුම සිටින මන්ත්‍රීවරයකු වශයෙන් අදත් මම මෙතැන ඉන්නවා. මේ සභාවේ ප්‍රශ්න අහන විධිය මා හොඳට අධ්‍යයනය කළා. තමුන්නාන්සේ සමහර අයට ඕනෑ තරම් කථා කරන්න අවස්ථාව දෙනවා. ඒත් අපට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මම ඒක පිළිගන්නේ නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා කියපු ඒ වචනයේ තේරුම දැන ගන්න පුළුවන්ද? [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වචනයේ තේරුමක් නැත්නම් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ශුද්ධ සිංහල.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒ ශුද්ධ සිංහල ඔබතුමන්ලාට හොඳයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන වටය.

## රාජ්‍යතාන්ත්‍රික පත්වීම්: විස්තර
## இராஜதந்திர நியமனங்கள்: விபரம்
## DIPLOMATIC APPOINTMENTS: DETAILS

214/'18

**3. ගරු ජයන්ත සමරවීර මහතා( ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜயந்த சமரவீர - மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில சார்பாக)
(The Hon. Jayantha Samaraweera on behalf of the Hon. Udaya Prabhath Gammanpila)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2017.09.30 දිනට රාජ්‍යතාන්ත්‍රික පත්වීම් ලබා සිටින ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන පුද්ගලයන් කවුරුන්ද;

(ii) 2017.09.30 දිනට රාජ්‍යතාන්ත්‍රික පත්වීම් ලබා සිටින ද්විත්ව පුරවැසියන් වන පුද්ගලයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වෙළිනාට්ටලුවල්කළ් අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) 2017.09.30ஆம் திகதி உள்ளவாறு இராஜதந்திர நியமனங்களைப் பெற்றுள்ள இலங்கைப் பிரசைகள் அல்லாத ஆட்கள் யாவர் என்பதையும்;

(ii) 2017.09.30 ஆம் திகதி உள்ளவாறு இராஜதந்திர நியமனங்களை பெற்றுள்ள இரட்டை பிரசாவுரிமையுடைய ஆட்கள் யாவர் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House -

(i) the names of persons other than citizens of Sri Lanka who have received diplomatic appointments as at 30.09.2017; and

(ii) the names of persons possessing dual citizenship who have received diplomatic appointments as at 30.09.2017?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii)

| නම | තනතුර, දූත මණ්ඩලය, රට | ද්විත්ව පුරවැසිභාවය |
|---|---|---|
| i. සොනාලි සමරසිංහ මිය | අමාත්‍ය උපදේශක, නිව්යෝර්ක්, ඇමරිකා එක්සත් ජනපදය | ඇමරිකා එක්සත් ජනපද - ශ්‍රී ලංකා |
| ii. ස්වර්ණා පී. ගුණරත්න මෙය | කොන්සල් ජනරාල්, ලොස් ඇන්ජලීස්, ඇමරිකා එක්සත් ජනපදය | කැනඩා - ශ්‍රී ලංකා |
| iii. මනෝජ් වර්ණපාල මහතා | උපදේශක, ලන්ඩන්, එක්සත් රාජධානිය | බ්‍රිතාන්‍ය - ශ්‍රී ලංකා |
| iv. සෑම නන්දලාල් කුරේ මහතා | තුන්වන ලේකම්, ලන්ඩන්, එක්සත් රාජධානිය | බ්‍රිතාන්‍ය— ශ්‍රී ලංකා |
| v. වයි.කේ. ගුණසේකර මෙය | මහ කොමසාරිස්, ඩකා, බංග්ලාදේශය | ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා |
| vi. ඩබ්.එස්. බාලසූරිය මහතා | දෙවන ලේකම්, අම්මාන්, ජෝර්දානය | ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා |

(ආ) පැන නොනගී.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 8 -569/'18 - (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 9 -588/'18 - (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා.

**ගරු හේෂා විතානගේ මහතා**
(මාණ්පුමිකු හේසා විතානකේ)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ශ්‍රී ලන්කන් එයාර්ලයින්හි ගුවන් යානා ඉංජිනේරු තනතුර: බඳවා ගැනීම
## ஸ்ரீலங்கன் எயார்லைன் விமானக் கம்பனியின் விமானப் பொறியியலாளர் பதவி: ஆட்சேர்ப்பு
## POST OF AIRCRAFT ENGINEER IN SRILANKAN AIRLINE: RECRUITMENT

1107/'18

**12. ගරු බිමල් රත්නායක මහතා (ගරු විජිත හේරත් මහතා වෙනුවට)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - மாண்புமிகு விஜித ஹேரத் சார்பாக)
(The Hon. Bimal Rathnayake on behalf of the Hon. Vijitha Herath)

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2018 වසර සඳහා සී/ස ශ්‍රී ලන්කන් එයාර්ලයින් ගුවන් සමාගමේ ගුවන් යානා ඉංජිනේරු තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම තනතුර සඳහා ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) අදාළ තනතුර සඳහා තෝරාගත් පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඒ සඳහා ඉදිරිපත් වූ 35 දෙනාගෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් පැමිණ, දැනට ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ සේවය කරනු ලබන අයදුම්කරුවන් තිදෙනාම අසමත් කරන ලද පදනම කවරේද;

(ii) එම තනතුර ලබා දුන් පුද්ගලයන්ගේ සේවා පළපුරුද්ද කොපමණද;

(iii) අවුරුදු පහකටත් වඩා අඩු සේවා කාලයක් ඇති නුපුහුණු පුද්ගලයන්ට එම තනතුර ලබා දීමෙන් අවුරුදු 20කට වැඩි සේවා කාලයක් හා පළපුරුද්දක් ඇති පුද්ගලයන්ට ආසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(iv) මෙම ආසාධාරණයට ලක්වූවන්ට සාධාරණ පදනමක් මත උසස්වීම් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச தொழில் முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2018இல் வரையறுக்கப்பட்ட ஸ்ரீலங்கன் எயார்லைன் விமானக் கம்பனியின் விமானப் பொறியியலாளர் பதவிக்கான விண்ணப்பங்கள் கோரப்பட்டனவா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி பதவிக்காகக் கிடைக்கப் பெற்ற விண்ணப்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) மேற்படி பதவிக்காகத் தேர்ந்தெடுக்கபட்ட நபர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அதற்காகத் தோற்றிய 35 விண்ணப்பதாரிகளில் இலங்கை விமானப் படையிலிருந்து வந்து தற்போது ஸ்ரீலங்கன் எயார்லைன் விமானக் கம்பனியில் கடமையாற்றுகின்ற விண்ணப்ப தாரர்கள் மூவர் எந்த அடிப்படையில் தெரிவு செய்யப்படவில்லை என்பதையும்;

(ii) மேற்படி பதவி வழங்கப்பட்டவர்களின் சேவைக் காலம் மற்றும் அனுபவம் எவ்வளவென் பதையும்;

(iii) ஐந்து வருடங்களுக்கும் குறைவான சேவைக் காலம் உள்ள, பயிற்சிபெறாத நபர்களுக்கு அப்பதவி வழங்கப்பட்டமையினால் 20 வருடங்களுக்கும் அதிகமான சேவைக் காலமும் அனுபவமும் உள்ளவர்களுக்கு அநீதி நேர்ந்துள்ளது என்பதை அவர் ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(iv) மேற்படி அநீதி ஏற்பட்டவர்களுக்கு நியாயமான அடிப்படையில் பதவி உயர்வுகள் வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise and Kandy City Development:

(a) Will he inform this House -

(i) whether applications were called in year 2018 for the post of Aircraft Engineer in SriLankan Airlines Ltd.;

(ii) if so, the number of applications received for the abovementioned post; and

(iii) the number of persons selected for the above post?

(b) Will he also inform this House -

(i) out of the 35 applicants, of the basis on which all three applicants currently employed at the SriLankan Airlines having been formerly employed at the Sri Lanka Air Force were not selected for the aforementioned post;

(ii) the service experience of the persons who were selected to the above-mentioned post;

(iii) whether he admits that selecting untrained persons with less than five years of service has caused injustice to persons who have not been selected despite their service and experience of over 20 years; and

(iv) whether action will be taken to grant promotions fairly to those who faced this injustice;

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I **table*** the Answer for Question No. 12.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) Yes.

(ii) 38

(iii) 31

(b) (i) Out of 35 applicants, of the basis on which all three applicants currently employed at the SriLankan Airlines having been formerly employed at the Sri Lanka Air Force were not selected for the aforementioned post.

(ii) Between 06 to 22 years.

(iii) No. Experience has not been the only criteria for selection. The interview panel was of the view that younger candidates though with lesser number of years of experience, exhibited more potential, knowledge and thirst for the job. All of the persons selected had the requested training for the job.

(iv) We do not believe that injustice has been caused.

(c) Not applicable.

## මහවැලි "සී" කලාපයේ ගල්දමුගොඩ ඉඩමේ පදිංචිකරුවන් : ඉඩම් බලපත්‍ර
## மகாவலி "சீ" வலய கல்தமுகொட காணிக் குடியிருப்பாளர்கள்: காணி உரிமம்
## RESIDENTS IN GALDAMUGODA LAND IN MAHAWELI "C" ZONE: LAND PERMITS

1143/'18

**14. ගරු ඒ.එල්.එම්. නසීර් මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். நசீர்)
(The Hon. A.L.M. Nazeer)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, "සී" කලාපයේ, සඳුන්පුර කොට්ඨාසයට අයත් අංක 142-1 මාවනාගම ග්‍රාම නිලධාරී වසමේ, මායිම් ගල්දමුගොඩ නමැති ඉඩමේ වසර ගණනාවක් සිට ස්ථිර ලෙස පදිංචි වී සිටින පවුල්වල ගෘහමූලිකයන් පිළිබඳ සමීක්ෂණයක් කර තිබේද;

(ii) එම ඉඩම්වල ජීවනෝපාය මාර්ග ලෙස ගොවිතැන් කරමින් සිටින පදිංචිකරුවන් සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් නීත්‍යානුකූල ලෙස ඉඩම් බලපත්‍ර ප්‍රදානය කිරීමට අපේක්ෂා කරනු ලබන නිශ්චිත දිනය කවරේද;

(iii) අංක 279, 228, 229, 282, 283, 280, 300, 290, 341, 323, 334, 133, 143, 275, 366, 302, 390, 281, 292, 318 හා 289 යන ඉඩම් කොටස් ඇතුළුව අනිකුත් ඉඩම් කොටස්වල දීර්ඝ කාලයක් පදිංචි වී ගොවිතැන් කරමින් සිටින පිරිසට ඉඩම් බලපත්‍ර කඩිනමින් නිකුත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மகாவலி அதிகாரசபையின், "சீ" வலயத்தில் சந்துன்புர பிரிவுக்குரிய 142-1 ஆம் இலக்க, மாவனாகம கிராம அலுவலர் பிரிவில், எல்லை கல்தமுகொட காணியில் பல ஆண்டுகளாக நிரந்தரமாகக் குடியிருக்கும் குடும்பங்களைச் சேர்ந்த குடும்பத் தலைவர்கள் தொடர்பாக ஆய்வொன்று மேற்கொள்ளப் பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி காணிகளில் வாழ்வாதாரத் தொழிலாக விவசாய நடவடிக்கைகளை மேற்கொண்டுள்ள குடியிருப்பாளர்களுக்கு இலங்கை மகாவலி அதிகாரசபையின்மூலம் சட்டரீதியாகக் காணி உரிமங்களை அளிப்பதற்கு எதிர்பார்க்கப்படும் திட்டவட்டமான திகதி யாதென்பதையும்;

(iii) 279, 228, 229, 282, 283, 280, 300, 290, 341, 323, 334, 133, 143, 275, 366, 302, 390, 281, 292, 318 மற்றும் 289ஆம் இலக்கக் காணித்துண்டுகள் உள்ளிட்ட இதர காணித் துண்டுகளில் நீண்ட காலமாகக் குடியிருந்து பயிர்ச்செய்கை நடவடிக்கைகளில் ஈடுபட்டுவரும் ஆட்களுக்குத் துரிதமாகக் காணி உரிமங்களை வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු ඒ.එල්.එම්. නසීර් මහතා]

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he state -

(i) whether a survey has been carried out regarding the heads of households belonging to the families which have been residing permanently for years in the land called Mayim Galdamugoda located in the no.142-1,Mawanagama Grama Niladhari Division of the Sandunpura Division coming under Zone C of the Sri Lanka Mahaweli Authority;

(ii) the specific date on which the Mahaweli Authority expects to grant legitimate land permits to persons residing in the aforementioned lands and engaging in cultivations in the said lands as their livelihood; and

(iii) whether steps will be taken immediately to issue land permits to persons residing and farming in the said land lots including lot numbers 279, 228, 229, 282, 283, 280,300,290,341,323, 334,133, 143, 275, 366,302,390, 281,292,318 and 289;

(b) If not, why?

**ගරු වීරකුමාර දිසානායක මහතා (මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க - மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Weerakumara Dissanayake - State Minister of Mahaweli Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් මහවැලි සී කලාපයට අයත් සියලු ඉඩම්ලාභීන් පිළිබඳව සමීක්ෂණයක් ආරම්භ කර ඇති අතර, ඒ යටතේ මෙම ගැටලුවට අදාළ කොටසෙහිද සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

(ii) අදාළ ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් කච්චේරි පවත්වා ඇත. මෙම ඉඩම් සම්බන්ධයෙන් පවතින ගැටලු නිරාකරණය කර, ඉඩම් බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් පවත්නා නීතිමය විධිවිධාන යටතේ කටයුතු කර ඉදිරියේ දී ඉඩම් බලපත්‍ර ලබා දීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් කටයුතු කරනු ලැබේ.

(iii) ඉහත (ii) පිළිතුරෙහි දක්වා ඇති ආකාරයට කටයුතු කර කඩිනමින් ඉඩම් බලපත්‍ර ලබාදීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් කටයුතු කරනු ලැබේ.

(ආ) පැන නොනගී.

**ගරු ඒ.එල්.එම්. නසීර් මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். நசீர்)
(The Hon. A.L.M. Nazeer)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சர் -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

It has to be tabled. You cannot ask Supplementary Questions in the Second Round.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## ආපදාවන්ට ලක්වූවන්ට සහන
## அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம்
## RELIEF FOR DISASTER-AFECTED PERSONS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

පසු ගිය දිනවල ශ්‍රී ලංකාව මුහුණ දුන් ධාරානිපාත වර්ෂාව, ගංවතුර, පිටාර ගැලීම්, දරුණු සුළි සුළං හා කුණාටු තත්ත්වය නිසා හානියට පත් ජන ජීවිත හා ඊට පෙරාතුවද ඇති වී තිබූ පාරිසරික හානි පිළිබඳව මුළු රටම හා පාර්ලිමේන්තුව දැනුවත්ව ඇත.

එහෙයින්,

1. පසුගිය දිනවල රටපුරා, එනම්, කුරුණෑගල, පුත්තලම, මඩකළපුව, නුවරඑළිය, මහනුවර, මාතලේ, ගාල්ල, කෑගල්ල, රත්නපුර, මොනරාගල, කළුතර, ගම්පහ, කොළඹ යන දිස්ත්‍රික්කවලට බලපෑ දරුණු වර්ෂාව, ගංවතුර, පිටාර ගැලීම්, සුළිසුළං නිසා බලපෑමට ලක් වූ පවුල්, පුද්ගලයන්, මියගොස් ඇති ගණන, රෝහල්ගත වී ඇති සංඛ්‍යාව ප්‍රකාශ කරනවාද? ආපදාවට ලක්වූවන්ට සහන සැපයීම සඳහා ගෙන ඇති පියවර හා ගන්නා පියවර මොනවාද?

2. මේ නිසා හානියට පත් වී ඇති ගොවිතැන්, ව්‍යාපාර හා සේවා වෙනුවෙන් ලබා දීමට බලාපොරොත්තු වන සහන හා ආධාර මොනවාද, ඒ කවදාද?

3. ශ්‍රී ලංකාව කාලගුණික විපර්යාසවලට ගොදුරු වෙමින් දරුණු නියඟ -පසුගිය මාස ගණනාවම අපි දරුණු නියඟයකට මුහුණ දුන්නා- ගංවතුර, කුණාටු හා සුළිසුළංවලට භාජන වීම වැඩි වන බව ශ්‍රී ලංකාවේ විශේෂඥයන් හා ජාත්‍යන්තර වාර්තාද ප්‍රකාශ කර ඇත. මේ සම්බන්ධ ජාතික වශයෙන් හදිසි හා වැදගත් මැදිහත්වීමක් සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවෙන් අප රට පසු වේ. ජාත්‍යන්තර කීර්තිය දිනා ගත් අප රටවැසි, මහාචාර්ය මොහාන් මුණසිංහ, ආචාර්ය රනිල් සේනානායක, ආචාර්ය ජගත් ගුණවර්ධන යන අය විසින් අඛණ්ඩව දක්වන අදහස්, ක්ෂේත්‍රයට අදාළ විශේෂඥයන්, විශ්වවිද්‍යාල හා සමාජයෙන් ඉදිරිපත් වන අදහස් ලබාගෙන වැඩ පිළිවෙළක් සකස් කිරීමට අදාළ රජයේ දෙපාර්තමේන්තු හා ආයතන සක්‍රියව ක්‍රියා කරවීමට පියවර ගන්නවාද?

ගරු ඇමතිතුමනි, මම හිතන විධියට එය ඉතාම වැදගත් දෙයක්. අපි ඉදිරිය සඳහා ගිවිසුම් අත්සන් කරනවා, කාලගුණ විපර්යාස -climate change- සම්බන්ධයෙන්. නමුත් මේ පිළිබඳව ලෝකයේ අනෙක් රටවලට පවා උපදෙස් දෙන මා ඉහත සඳහන් කළ ශ්‍රී ලාංකික ආචාර්යවරුන්ගෙන් සමන්විත මණ්ඩලයක් මඟින් අප රට වෙනුවෙන් පියවර ගැනීමේ අවශ්‍යතාව මතු වී තිබෙනවා. එහෙම නැත්නම් අපට දිගටම මේ කාලගුණික විපර්යාසයේ අනිටු

එල විපාකවලට ලක් වෙන්න සිද්ධ වෙනවා. 2018 අගෝස්තු 28 වන දා "The Island" පුවත් පතේ පළ වූ රනිල් සේනානායක මැතිතුමාගේ "The Water Bomb" නමැති ලිපියේ සහ 2018 ජූනි 29 දිනැති ලිපියේ සංවර්ධනය අඩපණ වී ආපස්සට හැරීමේ - "Developing Downwards"- භයානකකම තිබෙනවා. තවත් එවැනි ලිපි රාශියක් තිබෙනවා. මහාචාර්ය මොහාන් මුණසිංහ කියන්නේ, නොබෙල් ත්‍යාගයේ එක කොටසක් දිනා ගත් ශ්‍රී ලාංකිකයා. මේ ආපදා වෙනුවෙන් මේ අයගේ සක්‍රිය දායකත්වය ඇති වැඩ පිළිවෙළක් සකස් කිරීමට සලකා බලනවාද කියලා මා දැන ගන්න කැමැතියි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Irrigation and Water Resources and Disaster Management)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි:

1. පිළිතුර සඳහා ඇමුණුම 01 සහ 02 බලන්න.

| | |
|---|---|
| ආපදාවට ලක්වූ පවුල් සංඛ්‍යාව | - 17,303 |
| ආපදාවට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව | - 69,583 |
| ආපදාවෙන් මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව | - 12 |
| ආපදාවෙන් තුවාල ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව | - 18 |

ඇමුණුම 03 බලන්න.

කඩිනම් ආපදා සහන සැලසීම සඳහා (පිසූ ආහාර, වියළි සලාක, එක් පුද්ගලයෙකුට රු. 100,000 බැගින් වූ මරණ වන්දි, ජලය ලබා දීම හා වෙනත් අත්‍යවශ්‍ය සහනාධාර ද්‍රව්‍ය) රක්ෂණාවරණ වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිකුත් කර ඇති මුදල් ප්‍රමාණය - රුපියල් 12,500,000.00යි.

මීට අමතරව දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම් අනුව ටෙන්ට්, වැහිකබා, තුවා, කුස්සි උපකරණ කට්ටල, වතුර බෝතල් ආදි ද්‍රව්‍ය එම දිස්ත්‍රික්ක වෙත ලබා දී ඇත. ඇමුණුම 05 බලන්න.

එම සංඛ්‍යාව කියන්න අවශ්‍යද, ගරු මන්ත්‍රීතුමා? අවශ්‍ය නම් එය 05වන ඇමුණුමේ සඳහන්ව තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එය කියවන්න ඕනෑ නැහැ. ඇමුණුම ලැබෙන්න සලස්වන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මම ඔබතුමාට මෙය ලබා දෙන්නම්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා, - [බාධා කිරීමක්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ප්‍රශ්නය අසා තිබෙන මන්ත්‍රීතුමාට මෙය එවන්නම්. එතකොට copy එකක් ඔබතුමා ඉල්ලා ගන්න.

ඇමුණුම 04 බලන්න.

ආපදාවෙන් හානියට පත් නිවාස වාසස්ථානයට සුදුසු පරිදි කඩිනමින් පිළිසකර කර ගැනීම සඳහා රුපියල් 10,000ක අත්තිකාරම් මුදලක් ලබා දීම සඳහා රක්ෂණාවරණ වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිකුත් කර ඇති මුදල් ප්‍රමාණය - රුපියල් 23,010,000.00යි.

හානි වූ නිවාස සහ ගෘහ උපකරණ සඳහා හානි තක්සේරු කමිටුවක් මඟින් එම හානිය තක්සේරු කර රක්ෂණාවරණ වැඩසටහන යටතේ වන්දි ලබා දීමේ කටයුතු කඩිනමින් සිදු කරනු ලැබේ. එක් නිවසක් සඳහා උපරිමය රුපියල් මිලියන 2.5යි. එනම්, රුපියල් ලක්ෂ 25යි, ගරු මන්ත්‍රීතුමා.

රුපියල් මිලියන 10ට අඩු පිරිවැටුමක් සහිත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ගොඩනැඟිලි හා තොග හානි සඳහා හානි තක්සේරු කමිටුව මඟින් තක්සේරු කර එම වන්දි මුදල් රක්ෂණාවරණ වැඩසටහන යටතේ කඩිනමින් ලබා දීම සිදු කරනු ලැබේ. උපරිමය රුපියල් මිලියන 2.5යි. එනම්, රුපියල් ලක්ෂ 25යි. තොග, උපකරණ, යන්ත්‍ර සූත්‍ර හානි ආදියට උපරිමය රුපියල් ලක්ෂයට යටත් කරනවා.

2. මෙය අපට අදාළ වන්නේ නැහැ. මෙය අයත් වන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කෘෂි රක්ෂණ මණ්ඩලයට.

3. ඔව්.

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන ගංගා ද්‍රෝණිවල අලුත් ජලාශ ඉදි කිරීම මඟින් වැසි ජලය, ජලය අවශ්‍ය ගංගා ද්‍රෝණිවලට හැරවීම මෙන්ම ගංවතුර අවම කිරීමේ වැඩ කටයුතු සිදු වෙමින් පවතී.

මේ අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ තල්පිටිගල ජලාශය සකස් කිරීමේ වැඩකටයුතු කඩිනමින් ආරම්භ කරනවා. මේ වන විටත් ඒ සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කරලා කොන්ත්‍රාත් සමාගම් ඇවිල්ලා අවසන්, ගරු මන්ත්‍රීතුමනි. මේ වන විටත් සෙංගල්ඔය ව්‍යාපාරය ආරම්භ කරලා, දැදුරුඔය හරස් කරලා ආරවිචිකට්ටුවට ජලය ගෙන යෑම ආරම්භ කර තිබෙනවා. අන්දරවැව ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙනවා; මාන්කුලම් ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම කැළණි ගඟ පිළිබඳව සමස්ත අධ්‍යයනයක් කරලා වාර්තාවක් සකස් කර තිබෙනවා. කැළණි ගඟ වයඹට හැරවීම සම්බන්ධයෙන් ජපන් රජයේ නියෝජිත කණ්ඩායමක් සමඟ අපි ඊයේත් සාකච්ඡාවක් පැවැත්තුවා. ඒ අනුව ගංගා ද්‍රෝණිවල ජලය රැස් කිරීම සඳහා ජලාශ සකස් කිරීමට අවශ්‍ය පියවර ගනු ලබනවා. ඒ වාගේම රත්නපුර කළු ගඟේ ප්‍රශ්නය විසඳීම සඳහා මල්වල ජලාශය සෑදීම පිළිබඳව රත්නපුර ජනතාවගේ විරෝධතාවක් තිබෙනවා. ඒ ගොල්ලෝත් එක්ක සාකච්ඡා කරලා ඒ විරෝධතාව අවම කරගැනීමට අපි උත්සාහයක යෙදිලා ඉන්නවා. මේ ආදී වශයෙන් ගංගා ද්‍රෝණිවල ජලය වෙනත් ප්‍රදේශවලට හැරවීම සහ ගබඩා කර තැබීම සඳහා පියවර ගනිමින් සිටිනවා.

ඒ වාගේම දේශගුණික සුහුරු කෘෂිකාර්මික ව්‍යාපෘතිය යටතේ දේශගුණික විපර්යාසවලට අනුකූලව කෘෂිකර්මාන්තයේ වෙනස්කම් සිදු කෙරෙමින් පවතිනවා. එය කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ සිදු වෙනවා.

ඇමුණුම් සියල්ල **සභාගත*** කරමි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ නිකුත් කර තිබෙන නිවේදන අනුව අදාළ වන්දි ගෙවීම් තව අවුරුදු දෙකක් ඇතුළතවත් කරන්න පුළුවන් වෙයිද? මීට අවුරුදු දෙකකට පෙරත් කැළණි ද්‍රෝණියේ, කළු ගඟ ද්‍රෝණියේ සිදු වුණු හානිවල සියලු වන්දි ගෙවලා නැහැ. එතකොට ඔබතුමන්ලා ජනතාවට වන්දි දුන්නාය කියලා කියන්නේ කොහොමද ?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු මන්ත්‍රීතුමනි, වන්දි ගෙවීමේ කටයුත්ත ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් සිදු කරනවා. අපේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ එයින් කොටසයි සිදුවන්නේ. පසුගිය අවස්ථාවේ යම් ප්‍රශ්නයක් තිබුණා. ඒ වෙලාවේ ජාතික රක්ෂණ භාර අරමුදලේ මෙය තක්සේරු කරන නිලධාරීන් කවුරුවත් හිටියේ නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා එහි සිටින නිලධාරීනුයි මේ තක්සේරුව කරලා එවලා තිබුණේ. මෙන්න මේ තක්සේරු වටිනාකම් පිළිබඳව ඇති වූ ගැටලුසහගත තත්ත්වයන් නිසා එම තක්සේරු ගෙවීමේ ප්‍රමාදයක් ජාතික රක්ෂණ භාර අරමුදලට තිබුණා. නමුත්, අපි ඒ ගොල්ලන් එක්ක සාකච්ඡා කරලා එම කටයුත්ත කඩිනම් කරන්න කටයුතු කරගෙන යනවා.

ගරු මන්ත්‍රීතුමනි, දේශගුණික අවබලපෑම් එක්ක මේ රටට බලපාන්න යන තත්ත්වය පිළිබඳව ඔබතුමා තව කාරණයක් ඉදිරිපත් කර තිබුණා. ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා, අපි කවුරුත් දැන් කථා කරන්නේ 2020 ජනාධිපති අපේක්ෂකයා කවුද, ආණ්ඩු පිහිටුවන්නේ කවුද යන දේවල් පිළිබඳවයි. නමුත්, 2050දී රටට සිදු වන විනාශය පිළිබඳව අපි කවුරුත් කථා කරන්නේ නැහැ. දේශගුණික බලපෑම යටතේ 2050 වන විට ලංකාවේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 2කින් වැඩි වෙනවා. ඒ වාගේම, ගම්පහ, උතුරු මැද, වයඹ, ඌව, දකුණ, උතුර මෙන්න මේ ප්‍රදේශ සියල්ලම දැඩි නියං තත්ත්වයකට මුහුණ දෙනවා. ආපදා කළමනාකරණ කමිටුවේ ගරු සභාපතිතුමා අතිගරු ජනාධිපතිතුමායි. අපි මේ පිළිබඳව,- [බාධා කිරීමක්] නැහැ, අහගන්න.

මේ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කර තිබෙනවා. සියලු ආයතනත් සමඟ ඒකාබද්ධව මෙයට අවශ්‍ය වැඩ පිළිවෙළ සූදානම් කරන්න අපි අවස්ථාව ඉල්ලා තිබෙනවා. ඒ අවස්ථාව ලැබෙයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලගුණික විපර්යාසය පිළිබඳ ගරු ඇමතිතුමා කිව්වා, ගංගා ද්‍රෝණිවල සංවර්ධනය සහ වැව් ගැන. ප්‍රශ්නය නියඟයකුත් තිබෙනවා. දරුණුම ප්‍රශ්නය නියඟය. මේ සම්බන්ධව මහාචාර්ය මොහාන් මුණසිංහ, මහාචාර්ය රනිල් සේනානායක වැනි අයගේ අදහස් ලබාගෙන අපේ විශ්වවිද්‍යාලවල අයත් එකතු කර ගෙන අලුත් වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි. නිලධාරීන් හා කාර්යාල අතර ඔය ගිවිසුම් අත්සන් කර භාණ්ඩාගාරයෙන් මුදල් පොරොන්දු වෙන ව්‍යාපෘති ගැන හැමදාම කථා කළා. ඒ ව්‍යාපෘති එනකොට අපිට සිදුවෙන හානිය සිදුවෙලා ඉවරයි. එම නිසා අමාත්‍යාංශය හැටියට හෝ රජය හැටියට මෙවැනි පියවරක් ගැනීමට බලාපොරොත්තු වෙනවාද කියා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලගුණික හා දේශගුණික අවබලපෑම් පිළිබඳව දේශීය හා විදේශීය විශේෂඥයන්ගේ සම්බන්ධතාව අපේ අමාත්‍යාංශයත් එක්ක සෘජුවම තිබෙනවා. ඒ ලැබෙන උපදෙස් තොරතුරු අපි පරිහරණය කරනවා. ඒ ලැබෙන තොරතුරු අනුව තමයි , ඒ දැනුම අනුව තමයි අපි යම් යම් ක්‍රියාවල නිරත වෙලා තිබෙන්නේ. ඒ අනුව ලංකාවේ වැව් ගැඹුරු කිරීමේ ව්‍යාපෘතිය අපි ආරම්භ කර තිබෙනවා, ඉදිරියේ දී ඇතිවන වියළි කාලගුණයට ඔරොත්තු දෙන විධියට ජලය ගබඩා කර ගැනීම සඳහා. එම නිසා තමයි මම මූලික ප්‍රශ්නයට පිළිතුරු දීමේ දී රත්නපුරය ඇතුළු විවිධ ස්ථානවල අලුතෙන් ඉදි කරන්නට යන ව්‍යාපෘති පිළිබඳව සඳහන් කළේ. ඒ වාගේම උතුරු මැද පළාතේ අනුරාධපුර ආරම්භ කරන්නට යන මල්වතු ඔය ව්‍යාපාරය පිළිබඳවත් සඳහන් කරන්නට ඕනෑ. ලංකාවේ වාරිමාර්ග ක්ෂේත්‍රයේ තුන්වැනි විශාලතම ජලාශය ඉදිකරන්නට යන්නේ උතුරු මැද පළාතේ අනුරාධපුරයේ මලවතු ඔය, තන්තිරිමලේ. මේ ක්‍රියාමාර්ග ගෙන තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමා කියන්නා වූ දේශීය හා විදේශීය විශේෂඥයන්ගේ දැනුම ලබාගෙනයි .

ජාතික ආපදා කළමනාකරණ කමිටුවේ ගරු සභාපතිතුමා අතිගරු ජනාධිපතිතුමායි. එම නිසා අපි මේ පිළිබඳව වාර්තාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කර තිබෙනවා. අනෙකුත් සියලුම ආයතන හා විද්වතුන් සම්බන්ධ කර ගෙන සමස්ත ලංකාව වෙනුවෙන්ම වැඩසටහනක් අපි සකස් කළ යුතු වෙනවා. එසේ නැත්නම් 2050 වර්ෂය වනවිට දේශගුණික අවබලපෑම හේතුවෙන් අපේ රට තුළ විනාශකාරී තත්ත්වයක් ඇති වන්නට පුළුවන්. වියළි කාලගුණය, උෂ්ණත්වය වැඩි වීම, ජල හිඟය, දැඩි සුළං තත්ත්වයන් වැනි ප්‍රශ්න රාශියකට අපට මුහුණ දෙන්නට සිදු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. ස්ථාවර නියෝග 27(2) යටතේ දෙවැනි ප්‍රශ්නය. [බාධා කිරීමක්] ඔව්, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු ඇමතිතුමාගේ උත්තරයට බොහොම ස්තුතිවන්ත වෙනවා. නොබෙල් ත්‍යාගය හිමි මහාචාර්ය මොහාන් මුණසිංහ මහත්මයා කවුද කියාවත් ගරු ඇමතිතුමා සඳහන් කරන්නේ නැහැ. මෙවැනි අයගේ සහයෝගයක් නැති ආණ්ඩුවක් රටට තවත් විපතක් කරන්නේ නැතිව ඉක්මනින් ගෙදර යන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මහාචාර්ය මොහාන් මුණසිංහ මහත්මයා ජාතික තිරසර සංවර්ධනය පිළිබඳ විද්වත් කමිටුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරනවා. [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. [බාධා කිරීමක්]

ගරු ඇමතිතුමා උත්තර දුන්නා නේ. [බාධා කිරීමක්] ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of of Buddhasasana)

මොහාන් මුණසිංහ මහාචාර්යතුමා ජාතික තිරසර සංවර්ධනය පිළිබඳ විද්වත් කමිටුවේ ප්‍රධාන උපදේශකවරයා ලෙස කටයුතු කරනවා. එතුමා එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන සමුළුවටත් සහභාගී වුණා. තිරසර වැඩ සටහන යටතේ මේ ඔක්කොම සම්බන්ධ වෙනවා. එතුමාගේ සම්බන්ධීකරණය තුළ, ඒ උපදෙස් ලබාගෙන රේඛීය අමාත්‍යාංශය වැඩ කටයුතු කරනවා. දියුණු රටවල් කළ පරිසර විනාශයන් තුළ සිදුවන දේවල් ගැන බොරුවට මේ ගරු ඇමතිතුමාව ඇදගන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] ඔබතුමා දීර්ඝ උත්තරයක් දුන්නා නේ ගරු ඇමතිතුමා. [බාධා කිරීමක්] ගරු රංගෙ බණ්ඩාර ඇමතිතුමා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා එක එක පුද්ගලයන් පිළිබඳව පූර්විකාවක් කරන්න කිව්වා නම් මම එය කරනවා. මෙතුමා ගැනත් කියන්න ඕනෑ නම්, බොරළුගාඩ සිංහයාගෙන් පටන් අරගෙන අවසානයේ - [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ දෙවැනි ප්‍රශ්නය, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

## II

## සයිටම් ආයතනය සම්බන්ධව ගත් තීරණ හේතුවෙන් පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය
## சைட்டம் நிறுவனம் பற்றிய தீர்மானங்கள் தொடர்பில் எழுந்துள்ள நெருக்கடி நிலைமை
## PROBLEMATIC SITUATION ARISEN DUE TO DECISIONS MADE ON SAITM

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මාලබේ සයිටම් පෞද්ගලික වෛද්‍ය ආයතනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව ලබා දුන් විසඳුම් සහ අධිකරණය මඟින් ලබාදුන් තීරණය හේතුවෙන් පැනනැඟී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

2009 වර්ෂයේ ආරම්භ කර, රට තුළ මහත් අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය කළ සයිටම් ආයතනයේ මතුවූ ගැටලුවලට, 2018 ජූනි 20 දින 2018 අංක 17 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත සම්මත කරමින් මෙම පාර්ලිමේන්තුව විසඳුමක් ලබා දෙනු ලැබුවා. මම මේ කථාවේ ඒ පනතේ වගන්තියක් උපුටා තිබෙනවා. කෙසේ වුවත්, එම පනත් කෙටුම්පත ඉදිරිපත් කළ වෙලාවේදී ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා කළ කථාව ඊට වඩා වැදගත් කියලා මට හිතුණා. ගරු ඇමතිතුමනි, ඒ කථාවේදී ඔබතුමා ප්‍රකාශ කර තිබෙන කාරණා කීපයක් මම දැන් කියන්නම්

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2018 ජූනි 20වන දින පළ වූ හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 733හි එතුමා මෙසේ කියා තිබෙනවා:

> "....ඒ නිසා කාරක සභා අවස්ථාවේදීත් මෙම පනත් කෙටුම්පතට තව සංශෝධනයක් අපි ඇතුළු කරනවා. ඒ තමයි මේ පනත් කෙටුම්පතේ සඳහන් SAITM වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කර ගැනීම අවසන් වූ වහාම SAITM විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මඟින් උපාධි ප්‍රදානය කිරීමේ බලයක් ඔවුන්ට නොමැති බවට සහ..."

ඒක ඉතා වැදගත්. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා තවදුරටත් මෙහෙම කියනවා:

> "....SAITM විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මඟින් උපාධි ප්‍රදානය කිරීමේ බලයක් ඔවුන්ට නොමැති බවට සහ ඒ සමඟම ඒ වෛද්‍ය පීඨය නීතියෙන් අහෝසි තත්ත්වයකට පත් වෙනවා කියන කාරණය. ඒ අනුව ඒ සංශෝධනය මේ පනත් කෙටුම්පතට ඇතුළු කළාට පස්සේ කාටවත් සැක සංකාවක් තියා ගන්න කිසි අවශ්‍යතාවක් නැහැ. මේ පනත මඟින්ම ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ අන්තර්ග්‍රහණය කරලා හමාර වෙනවාත් සමඟම එම වෛද්‍ය පීඨය අහෝසි වෙනවා. ඔබතුමන්ලා ඒකට කැමැතියි නේද?"

ඒක තමයි, ගරු ඇමතිතුමා මේ පනතේ අන්තර්ගතය පිළිබඳව එදා දීපු අර්ථකථනය. ඒ සඳහා අවශ්‍ය වන වගන්තියක් මා ඇතුළත් කර තිබෙනවා. නමුත්, 2018 සැප්තැම්බර් මස 21වන දින ලබා දුන් අධිකරණ තීන්දුව මඟින් එසේ පාර්ලිමේන්තුවෙන් ලබා දුන් විසඳුම දැන් ව්‍යාකූලත්වයට පත් කර තිබෙනවා. එම අධිකරණ තීන්දුව යටතේ සයිටම් ආයතනයේ උපාධිය ලබාගත් බව පවසන ශිෂ්‍යාවක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියා පදිංචි කිරීමට නියෝග කර තිබෙනවා. ඔබතුමා කියන පරිදි, සයිටම් ආයතනයෙන් උපාධියක් ලබා දිය නොහැකියි කියා අපි නීතියක් සම්පාදනය කරනවා. හැබැයි දැන් සිදුවී තිබෙන දෙය මොකක්ද? අධිකරණයෙන් දැන් කියනවා, ඒක පිළිගන්න කියා. මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු ගරු ඇමතිතුමා විසින් සභාව හමුවේ තබනු ඇතැයි මා අපේක්ෂා කරනවා.

01. 2018 අංක 17 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත අනුව, සයිටම් ආයතනයේ ඉගෙනුම ලබමින් සිටි හා උපාධිය ලබා ගත් බව පවසන සිසුන් සියලුදෙනා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මේ වන විට ලියා පදිංචි කර තිබේද?

02. එසේ ලියා පදිංචි කර නොමැති නම්, ඒ සඳහා කටයුතු නොකළේ මන්ද? මේ සම්බන්ධයෙන් යම් බාධක තිබේද? තිබේ නම් ඒ මොනවාද?

03. සිසුන් ඇතුළත් කිරීම සඳහා පවතින බාධක ඉවත් කිරීම සඳහා මෙම 2018 අංක 17 දරන කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනතට යම් සංශෝධනයක් ගෙන ඒම අවශ්‍යද?

මම ඒ ගැන දන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන කියන්න, සංශෝධනයක් ගෙන ඒම අවශ්‍යද, නැද්ද කියා.

[ගරු අනුර දිසානායක මහතා]

04. සයිටම් ආයතනය අහෝසි කිරීමේ ගැසට් පත්‍රය නිකුත් කරන්නේ කවදා ද?

මොකද, ඔබතුමාගේ ඒ කථාවේම තව කොටසක -එම හැන්සාඩ් වාර්තාවේ තිරු අංක 734හි- මෙසේ සඳහන් වෙනවා:

"....මේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ අන්තර්ග්‍රහණය කරපු වහාම එය අවලංගු කිරීමේ ගැසට් පත්‍රයක් නිකුත් කරනවා කියලා. නමුත්, යම් යම් පාර්ශ්ව මේ පිළිබඳව සැක ඇති කළ නිසා තමයි අපි මේ වාගේ ප්‍රතිපාදනයක් හඳුන්වා දුන්නේ...."

ඊට පස්සේ ගැසට් එක නිකුත් කරනවාය කියා ඔබතුමා කිව්වා.

ඊළඟට, මේ හා සම්බන්ධවම මට ඔබතුමාගෙන් දැනගත යුතු තවත් කාරණයක් තිබෙනවා. ඒ, අනුරාධපුර, රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ඇතිවෙලා තිබෙන පරිපාලන ගැටලුව ගැනයි. එහි පීඨාධිපතිතුමා ඇතුළු අංශ ප්‍රධානීන් පරිපාලන කටයුතුවලින් ඉවත්වෙලා, දේශන කටයුතුවලට පමණක් සහභාගි වීම තමයි දැනට රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආචාර්යවරුන් කරමින් සිටින්නේ. පරිපාලන කටයුතු සිදු වන්නේ නැතිව දේශන පවත්වන්නත් බැහැ. එම නිසා දැන් ඒ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ යම් අරාජිකත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. එතැන තිබෙන්නේ වැටුප් පිළිබඳ ප්‍රශ්නයක්. COPE එකේදීත් ඒ ගැන සාකච්ඡාවට ගැනුණා. COPE එක නිර්දේශ කර තිබෙන්නේත්, අනෙක් විශ්වවිද්‍යාලවලට ලබා දී තිබෙන වැටුප් සහ දීමනා රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයටත් ලබාදෙන්න කියායි. ඒ නිර්දේශය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත යොමු කරන්න ඇති කියා මා හිතනවා. මෙම ගැටලු දෙක පිළිබඳව ඔබතුමා මෙම පාර්ලිමේන්තුව දැනුවත් කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්න යොමු කිරීම පිළිබඳව ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා සයිටම් එක පිළිබඳවයි පළමුවෙන්ම ඇහුවේ. මේ සයිටම් වෛද්‍ය සිසුන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත යටතේ ප්‍රතිපාදන සලසා තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු සභා ගර්භයේ පවතින මේ සෝෂාවත් සමඟ ප්‍රශ්නයකට උත්තර දෙන්න හරි අමාරුයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අවධානය යොමු කරලා මේ සභාවේදී කිසිම ප්‍රශ්නයකට උත්තරයක් දෙන්න බැහැ මේ සෝෂාව නිසා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා තමන්ගේ ආසනවල වාඩි වෙන්න. [බාධා කිරීමක්] Order, please!

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව ශිෂ්‍ය කණ්ඩායම් වර්ග දෙකක් ඉන්නවා. එකක් තමයි, සයිටම් එකේ වෛද්‍ය පීඨය මඟින් උපාධිය සම්පූර්ණ කළ බවට සහතික නිකුත් කළ 81දෙනකුගේ කණ්ඩායම. ඊට අමතරව, පළමුවැනි වසරේ සිට පස්වැනි වසර දක්වා අධ්‍යාපනය ලබමින් සිටි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉන්නවා. මේ කණ්ඩායම් දෙකටම MBBS (KDU) -කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධිය- ලබාගැනීමට සුදුසුකම් ලබාගත හැකි ආකාරයට මෙම පනතින් ප්‍රතිපාදන සකස් වුණා. ඒ අනුව මේ වන විට උපාධි සහතිකය නොලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 874දෙනකුගේ ලිපි ගොනු -ඔවුන්ගේ අවම සුදුසුකම් තිබෙනවාය කියන සහතිකයත් සමඟ- කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට යොමු කර තිබෙනවා.

මේ වනවිට එම 874දෙනාගෙන් 514දෙනකුගේ සුදුසුකම් සහ ඔවුන් ලබාගෙන තිබෙන අධ්‍යාපනයේ ප්‍රමාණය ඇගැයීමකට ලක් කරලා, නිසි පරිදි ලියා පදිංචි කර තිබෙනවා. තවත් 360දෙනකු සඳහා ලියා පදිංචි කිරීමේ ක්‍රියාවලිය මේ වනවිට ක්‍රියාත්මක වෙනවා.

අනික් කොටස තමයි, උපාධි සහතිකය ලබාගෙන තිබෙන 81දෙනාගේ කණ්ඩායම. ශ්‍රේෂ්ඨාධිකරණය ඒ ගැන දුන් තීන්දුව සම්බන්ධයෙන් තමයි ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රශ්නය මතු කළේ. මෙවැනි කාරණයකදී වුණත් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රායෝගික පැත්ත නොවෙයි බලන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පවතින නීතිය අර්ථ නිරූපණය කරලා, ඒ වගන්තියට නීත්‍යනුකූලව අර්ථ නිරූපණයක් ඉදිරිපත් කිරීමක් තමයි අධිකරණයෙන් කරන්නේ. ඒ ඉදිරිපත් කිරීම තුළ, ඒ සහතිකය ලබා ගත් එක ශිෂ්‍යාවකගේ වාසියට නඩු තීන්දුවක් දුන්නා. අපි දන්නා තරමින් මේ සම්බන්ධව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට ගත හැකි විකල්ප දෙකයි තිබෙන්නේ. පළමුවන විකල්පය, ඒ ශිෂ්‍යාවගේ උපාධි සහතිකය වෛද්‍ය සභාවෙන් ලියා පදිංචි කරන්න ඕනෑ. දෙවන විකල්පය මේකයි. අනික් 80දෙනාත් ඉන්නේ ඒ ශිෂ්‍යාව හා සමාන මට්ටමේ නම්, එකම ක්‍රමවේදයක්, එක ප්‍රතිපත්තියක් අනුගමනය කරනවාය කියා ඒ 80දෙනාත් ලියා පදිංචි කරන්න පුළුවන්. එහෙම නැත්නම්, "මේ ශිෂ්‍යාවගේ උපාධි සහතිකය පමණයි ලියා පදිංචි කරන්නේ, අනික් අයගේ උපාධි සහතික ලියා පදිංචි කරන්නේ නැහැ" කියා කිව්වොත්, ඒ උදවියට නැවත වතාවක් අධිකරණයට යන්න වෙනවා, නියෝගයක් ලබා ගන්න. එවැනි අවශ්‍යතාවක් පැන නොනඟින විධියට තමයි, අපි පනත කෙටුම්පත් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. එහි සඳහන් 2 (ඇ) ඡේදය කෙරෙහි මා මේ සභාවේ අවධානය යොමු කරවනවා. එහි මෙසේ සඳහන් වනවා:

"මූලික සුදුසුකම් සහිත හා නියමිත දින හෝ ඊට පෙර සයිටම් හි එම්බීබීඑස් උපාධිය ප්‍රදානය කිරීම සඳහා වන අධ්‍යයන වැඩසටහන සම්පූර්ණ කර ඇති ශිෂ්‍යයන්ට ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කළමනාකාරිත්ව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි නියමයන් මත එම්බීබීඑස් උපාධිය (කේඩියු) ප්‍රදානය කිරීම;"

ඒ අනුව එම්බීබීඑස් සහතිකය තිබෙන උදවියටත් කොතලාවල විශ්වවිද්‍යාලයට ඉල්ලීමක් කරන්න පුළුවන්.

අපි කලිනුත් සඳහන් කළා, අපි අනුගමනය කරන ප්‍රතිපත්තිය අනුව වෛද්‍ය වෘත්තිය කියන්නේ ජනතාවගේ ජීවිතය සම්බන්ධව බරපතළ තීන්දු තීරණ ගන්නා ඉතාම වැදගත් වෘත්තියක් බව. ඒ වෘත්තියේ ප්‍රමිතිය පිළිබඳව මේ සභාවේ සියලුදෙනාගේම මතය එකයි; රටේ මතයත් එකයි. ප්‍රමිතිය රැකෙන්න ඕනෑ. ඒ නිසා මහාචාර්ය ඒකකද ඇතුළුව, මාස 10ක සායනික පුහුණුවක් ලබා දීලා, විභාගයක් පවත්වා, එයින් සමත්වනවා නම් අපි ඔවුන්ට උපාධි සහතිකය නිකුත් කරනවා. එහෙම සමත් වෙන්න බැරි නම්, උපාධි සහතිකයක් නිකුත් වෙන්නේ නැහැ. ඒ නිසා දැනට මේ 81දෙනාගේ කණ්ඩායමට තීරණයක් ගන්න තිබෙනවා. එක්කෝ අධිකරණ තීන්දුව මත යැපෙමින්, පූර්ණ වශයෙන් අධිකරණ තීන්දුවේ ආවරණය ලබා ගනිමින් වෛද්‍ය සභාවේ ලියා පදිංචිය අරගෙන වෛද්‍යවරුන් වෙන්න ඕනෑ. ලෝකයේ ඉන්න එකම සයිටම් වෛද්‍යවරුන් 81දෙනා කවුද පිළිගන්නේ, මොන ලෙඩාද ඔවුන් ළඟට යන්නේ, ආණ්ඩුවේ මොන දෙපාර්තමේන්තුවේද මේ ගොල්ලන්ට රැකියා දෙන්නේ, පෞද්ගලික අංශයේ මොන රෝහලේද රැකියා ලැබෙන්නේ කියන එක ඒ ගොල්ලන්ට අදාළයි.

එහෙම නැත්නම් ඒ ගොල්ලන්ට දෙවැනි විකල්පයක් තිබෙනවා. ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය වෙලා, නිසි ප්‍රමිතියට අනුව ලෝකය පිළිගත් වෛද්‍ය උපාධියක් ලබාගෙන වෛද්‍යවරු බවට පත් වෙන්න අවශ්‍ය දොර අපි විවෘත කර තිබෙනවා. අපිට දිගින් දිගටම මේ කාරණය ඇදගෙන යන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේදී මේ දැන්වීම පුවත් පත්වල භාෂා තුනෙන්ම පළවෙලා තිබෙනවා. එම්බීබීඑස් උපාධි සහතිකය සයිටම් වෙතින් ලබා ගෙන තිබෙන අයත් -ඔවුන් එකඟ නම්- අපි ලබා දෙන සායනික පුහුණුව ඇතුළු අධ්‍යාපන කටයුතු නිමා කර විභාගයකින් සමත් වෙන්න කැමති නම්, ඒ අයටත් මේ මාසයේ 30 වැනි දින දක්වා මේ දැන්වීම අනුව ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. මොකද, ඒ 81 දෙනා මේ දක්වා අපි සමඟ කිසිම සම්බන්ධයක් නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයටවත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවටවත්, ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයටවත් ඒ 81 දෙනා සම්බන්ධව කිසිම තොරතුරක් ලැබිලා නැහැ. ඔවුන් අපි සමඟ කිසිම සම්බන්ධයක් නැහැ. හැබැයි, 31 වැනි දිනට ප්‍රථම ඒ උදවිය මූලික සුදුසුකම් සපුරා තිබෙනවායි කියා නිසි පරිදි ඉල්ලීමක් ඉදිරිපත් කළොත් ඒ උදවියට ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට ඇතුළු වෙලා සායනික පුහුණුව සහ විභාගය සමත් වුණාට පස්සේ එම්බීබීඑස් උපාධිය ලබා ගන්න පුළුවන්. ඒ ගොල්ලන්ගේ අනාගතය මොන පැත්තෙන්ද විසඳෙන්න ඕනෑ, ඒ සඳහා විකල්පය මොකක්ද කියන එක ඒ ගොල්ලන් තමයි තීරණය කරන්න ඕනෑ.

දෙවැනි කාරණය මෙයයි. සැක සංකා දුරු කරන්න මේ පනතට 3වැනි වගන්තිය ඇතුළත් කළා කියා අපි කිව්වා. මේ 81 කණ්ඩායමට අදාළ කටයුතු මේ මාසයේ 31 වැනිදායින් පසුව අවසාන වනවා. ඔවුන් ආවත් එකයි, නාවත් එකයි. ඕනෑ නම් එන්න පුළුවන්, නැත්නම් නැවිත් ඉන්න පුළුවන්. මම කියපු අනික් ශිෂ්‍යයන් 874 දෙනාගෙන් ඉතිරි 360 දෙනා අපි ලියා පදිංචි කරනවා. තවත් කවුරු හෝ සිටිනවා නම් ඒ උදවියටත් මේ වාගේම අපි දැන්වීමක් දෙනවා. ඒ දැන්වීමේ දින අවසන් වනකොට මේ ක්‍රියාවලිය අවසානයි. අපිට ඔවුන් ලියා පදිංචි වුණත් එකයි, නැතත් එකයි. නීතියට අනුව අපි කටයුතු කරනවා. ඒ අනුව මේ පනත ඉබේම අහෝසි වනවා. එය වඩාත් තහවුරු කිරීම සඳහා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් ගැසට් පත්‍රයකුත් නිකුත් කරන්න අපිට බලය තිබෙනවා. මේ ඉතිරි 360 දෙනාගේ ලිපි ගොනු ලැබිලා තිබෙනවා. ඒ කටයුත්තත් මාස දෙකක් වාගේ කාලයකදී නිමා කරන්න අපි බලාපොරොත්තු වනවා. ඉන් ඔබ්බට යෑමේ අවශ්‍යතාවක් නැහැ. මේ පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවක් නැහැ. අපි මේ සියලු ප්‍රශ්න බලාපොරොත්තු වුණා. ඒ ප්‍රශ්නවලට ගැළපෙන විධියට තමයි මේ නීතිය හදලා සම්මත කර ගත්තේ. ඔබතුමාට ලබා දුන් පිළිතුරෙන් ඔබතුමා සෑහීමට පත් වෙන්න ඇති කියා මම හිතනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ බරපතළ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒකට හේතුව දුෂ්කර ප්‍රදේශවල තිබෙන විශ්වවිද්‍යාලවල -[බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ කාරණය සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දීලා තිබෙන තීරණය හා පළාත් සභා මැතිවරණය ගැනත් සඳහන් කරමින් මම කාරණයක් අසන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, පාර්ලිමේන්තුවේ සම්මත කරන නීතිය උත්තරීතරයි නේද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔව්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතකොට සම්මත කරන නඩු තීන්දු, පාර්ලිමේන්තුවෙන් සම්මත කරන නීතියේ උත්තරීතරභාවයට යටත් වෙනවාද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මෙතැන ගැටීමක් ඇති වෙලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අපි පාර්ලිමේන්තුවේ පනත සම්මත කරන්නට කලින් ඔය කියන 81 දෙනාට SAITM එකේ MBBS උපාධි සහතිකය පිරිනමා තිබුණා. ඒ නිසා එම තීන්දුව අදාළ වෙන්නේ අපි පනත සම්මත කරන්නට කලින් MBBS උපාධිය SAITM එකෙන් ලබා ගත් අයට විතරයි. ඒ නිසා ගැටීමක් ඇති වෙන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි පාර්ලිමේන්තුවෙන් සම්මත කරන පනත අබ්බවා යන්න බැහැ නේද? දැන් ඔබතුමා පැහැදිලි කළේ ඒකනේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
බැහැ. ඔබතුමා හරි. ඇත්තටම අබ්බවා යෑමක් සිද්ධ වෙලා නැහැ. හේතුව, පනත සම්මත වෙන්න කලින් උපාධි සහතික නිකුත් කර තිබුණා. ඒ නිසා අබ්බවා යෑමක් සිද්ධ වෙලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දුෂ්කරයි කියන ප්‍රදේශවල පවතින විශ්වවිද්‍යාලවලට ගුරුවරුන් බඳවා ගැනීමේදී අපට ලොකු ගැටලුවක් තිබෙනවා. විශේෂයෙන්ම ඔලුවිල්, මඩකලපුව, ත්‍රිකුණාමලය, ඌව වාගේ ප්‍රදේශවල පවතින විශ්වවිද්‍යාලවල

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

මෙම ගැටලුව පවතිනවා. අනුරාධපුරයක් කාලයක් ඒ මට්ටමේ තිබුණා. දැන් නම් ඔය කියන තරම්ම දුෂ්කර තත්ත්වයක් අනුරාධපුර ප්‍රදේශයේ නැහැ.

රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ උගන්වන ගුරුවරුන්ට අමතර දීමනාවක් ලබා දීම 2014 වසරේ රජරට විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය අනුමත කරගෙන තිබෙනවා. ඒක රඳවා තබා ගැනීමේ දීමනාවක් - retention allowance - විධියටයි නම් කර තිබෙන්නේ. ඒක විශ්වවිද්‍යාලය විසින්ම ස්වායත්තව ගත්ත තීරණයක්. ඒ අනුව මහාචාර්යවරයෙකුට රුපියල් ලක්ෂයක දීමනාවක් මාසයකට ලබා දී තිබෙනවා. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුට රුපියල් අසූදහසක් සහ අනෙක් කථිකාචාර්යවරුන්ට රුපියල් පනස්දහස බැගින් මේ දීමනාව ගෙවා තිබෙනවා. මේ දීමනාව මෙසේ ලබා දෙමින් තිබියදී, 2018 මාර්තු මස 21 වැනි දා COPE එකට මේ විශ්වවිද්‍යාලය කැඳවූ වේලාවේ මෙසේ මුදල් ගෙවීම මූල්‍ය අක්‍රමිකතා ගණයට වැටෙනවා කියා දැඩි දෝෂ දර්ශනයට ලක් වෙලා තිබෙනවා.

ඊට අමතරව මුදල් අමාත්‍යාංශය 2018.07.18වැනි දා භාණ්ඩාගාරය අනුමත නොකරපු කාරණා සඳහා මුදල් ගෙවීම සහ අනුමත කාර්ය මණ්ඩලයෙන් පිටත බඳවා ගත් උදවියට කිසිදු ගෙවීමක් කිරීම තහනම් කර චක්‍රලේඛයක් එවා තිබෙනවා. ඒ චක්‍රලේඛය සහ COPE එකේ නිරීක්ෂණ අනුව ඒ මණ්ඩලය විසින්මයි -උපකුලපතිතුමා විසින්මයි- ගෙවන්නේ නැහැ කියා මේ තීරණය අරගෙන තිබෙන්නේ. එතුමන්ලා තමයි ගෙවන්න තීරණය කළේ. ගෙවීම නතර කරන්න තීරණය කළෙත් ඒ මණ්ඩලය විසින්ම පමණයි. ඒකට UGC එකේ හෝ අමාත්‍යාංශයේ කිසිම සම්බන්ධතාවක් නැහැ. ඒ සමඟම COPE එකෙන් නිර්දේශ කර තිබෙනවා, මේ වාගේ ගෙවීමක් ගෙවන්න අවශ්‍ය නම් කැබිනට් මණ්ඩලයේ තීරණයකට අනුමැතියක් ගන්න කියා. මේ හා සමානම කැබිනට් පත්‍රිකා දෙකක් අපි ඉදිරිපත් කර තිබෙනවා. ඉදිරිපත් කළේ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ගුරුවරුන්ට මේ ආකාරයේ ගෙවීම් කරන්න. ඒ කැබිනට් පත්‍රිකා දෙකම ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. ඒක නිසා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විධියට අපට උභතෝකෝටික ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා.

එක පැත්තකින් රටේ මූල්‍ය නීතිය අනුව ගෙවන්න බැරි තත්ත්වයක්, අපට නිර්දේශ කරන්න බැරි තත්ත්වයක් ඇවිල්ලා තිබෙනවා. අනෙක් පැත්තෙන් මේ විශ්වවිද්‍යාලය පවත්වාගෙන යෑමට අවශ්‍ය ගුරුවරු රඳවා ගැනීමේ ගැටලුව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට බලපාපු ඉතාමත් වැදගත් කාරණයක් තිබෙනවා. විශ්වවිද්‍යාලවල උපකුලපතිතුමන්ලාට සහ පීඨාධිපතිවරුන්ට තමයි මේ ගුරුවරු බඳවා ගැනීමේ වග කීම තිබෙන්නේ. ඒ ගොල්ලන්ගේ අභිමතය පරිදි තමයි ඒක ක්‍රියාත්මක වෙන්නේ. බොහෝ විශ්වවිද්‍යාල මේ කාර්යය වෙලාවට කෙරෙන්නේ නැහැ. උදාහරණයක් ගත්තොත් රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මෙන්න මේ විධියට ඇබෑර්තු තිබෙනවා. Anatomy අංශයට approved cadre එක අට දෙනයි; වැඩ කරන්න ඉන්නේ දෙදෙනයි. Biochemistry අංශයට අනුමත අට දෙනයි; ඉන්නේ හතර දෙනයි. Physiology අංශයට අනුමත අට දෙනයි; ඉන්නේ හතර දෙනයි. Parasitology අංශයට අනුමත පස් දෙනායි; ඉන්නේ දෙදෙනයි. ඒකෙනුත් එක්කෙනෙක් නිවාඩුයි. Pharmacology අංශයට හය දෙනෙක් ඕනෑ; ඉන්නේ දෙදෙනයි. Community Medicine අංශයට හත්දෙනෙක් ඉන්න ඕනෑ; ඉන්නේ තුන් දෙනයි. Microbiology අංශයට හය දෙනෙක් ඕනෑ; ඉන්නේ තුන් දෙනයි. එයිනුත් එක්කෙනෙක් නිවාඩුයි. Pathology අංශයට අට දෙනෙක් ඉන්න ඕනෑ; ඉන්නේ එක්කෙනයි; දෙදෙනෙක් නිවාඩු ගිහිල්ලා. Forensic Medicine අංශයට ඉන්න ඕනෑ හය දෙනෙක්; ඉන්නේ එක්කෙනයි. Family Medicine අංශයට ඉන්න ඕනෑ හය දෙනෙක්; ඉන්නේ එක්කෙනයි. Medicine අංශයට හත් දෙනෙක් ඉන්න ඕනෑ; හය දෙනයි ඉන්නේ. මෙන්න මේ වාගේ හිඟ ඇබෑර්තු - vacancies - බර ගණනක් තිබෙනවා.

අපි අමාත්‍යාංශය විධියට සහ UGC එක විධියට මේ සෑම විශ්වවිද්‍යාලයක්ම ගෙන්වලා වරින්වර කියනවා, "මුදල් අඩු පාඩුවක් නැත්නම්, කිසිම බාධාවක් නැත්නම් මේවා පුරවන්න පියවර ගන්න." කියා. උපකුලපතිවරුන්ට සහ පීඨාධිපතිවරුන්ට උපදෙස් දීලා තිබෙනවා, මේ උදවිය බඳවා ගන්න කියා. සෑම මාසයකම මම දිනයක් වෙන් කර තිබෙනවා, විශ්වවිද්‍යාල උපකුලපතිතුමන්ලාට ඇවිල්ලා මාසිකව සාකච්ඡා පවත්වන්න. එහිදී මේ අඩු පාඩු ගැන සාකච්ඡා කරනවා. ඒක නිසා සමහර විශ්වවිද්‍යාල උනන්දුවෙන් කටයුතු කර, ඇබෑර්තු පුරවා ගන්නවා. සමහර විශ්වවිද්‍යාල උනන්දුවක් නැහැ. මේ පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වන්නේ නැහැ. ඇබෑර්තු තිබෙනවා. ඒක නිසා අධ්‍යාපනය ලබන දරුවන්ට එතැන මහත් බාධාවක් තිබෙනවා. අපි දන්නවා, මේ ප්‍රශ්නය බැරෑරුම් ප්‍රශ්නයක් කියා. මේ සම්බන්ධව මුදල් අමාත්‍යාංශයත් සමඟ ඉදිරි දින කිහිපය තුළ සාකච්ඡා කර විසඳන්න බලාපොරොත්තු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

විශේෂයෙන් රජරට විශ්වවිද්‍යාලයේ තත්ත්වය ගැනයි මම කියන්නේ. ඇත්තටම COPE එකේ නිර්දේශය මොකක්ද? ඒ පවත්වාගෙන යන ආකාරය ගැන මොන යම් හෝ වෙලාවක විගණන විමසුමක් ආවොත් එයට පරිපාලනය වග කිව යුතු වෙනවා. ඒ නිසා රජරට විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය කළ යුතු වන්නේ ඒ ලබා දෙන දීමනාව යම් නීත්‍යානුකූල තත්ත්වයකට පත් කර ගන්න එකයි. ඒ නිසා තමයි COPE එකේ නිර්දේශයක් දෙන්නේ, "මෙය කැබිනට් මණ්ඩලයේ අනුමැතියට ලක් කර ගත්තා නම් විශ්වවිද්‍යාල පරිපාලනය මේකට වග කිව යුතු වන්නේ නැහැ." කියා. ඒ ලබා දෙන දීමනාව නීත්‍යානුකූලකොට දිගටම පවත්වාගෙන යෑමේ අරමුණයි තිබුණේ. අවසානයේදී ඇති වී තිබෙන තත්ත්වය මෙයයි. එතෙක් ලබා දීපු දීමනාව විශ්වවිද්‍යාලය විසින් මේ අර්බුදය නිසා නතරකොට තිබෙනවා. නියමානුකූල කිරීමත් සිදු වෙලා නැහැ. ඒක නිසා විශ්වවිද්‍යාලයේ පරිපාලන වැඩ කටයුතුවලින් ආචාර්යවරු, මහාචාර්යවරු සියලු දෙනා ඉල්ලා අස්වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජරට විශ්වවිද්‍යාලය වගේ දුර පළාතක වෛද්‍ය පීඨයකට ආචාර්යවරු, මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු යනවා නම් ඔවුන්ට විශේෂ දිරිගැන්වීමක් ලබා දිය යුතුයි කියන එක දැන් අපි කවුරුත් පිළිගත යුතුව තිබෙනවා. මොකද, අපි දන්නවා, ඒවායේ නේවාසික ප්‍රශ්න තිබෙනවා; දරුවන්ගේ පාසල් පිළිබඳ ප්‍රශ්න තිබෙනවා; ගමනාගමනය පිළිබඳ ප්‍රශ්න තිබෙනවා කියලා. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාත් එක්ක මඩකළපුව විශ්වවිද්‍යාලය ගැන කථා කරන කොටත් යෝජනා කළා, යම් විශේෂ,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අග්නිදිග විශ්වවිද්‍යාලය.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, අග්නිදිග විශ්වවිද්‍යාලයේ Engineering Faculty එකේ ප්‍රශ්නයක් පිළිබඳව,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, COPE එකෙන් නිවැරදි නිර්දේශයක් එනවා නම්, ඒක නීත්‍යානුකූල කරන්න වඩාත් පහසු වෙනවා. එම විශ්වවිද්‍යාලයට ඒක දෙන්න ඕනෑ කියලා ඔබතුමන්ලාට නිර්දේශයක් කරන්න පුළුවන් නම්, එතකොට ඒක නීත්‍යානුකූල කරන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමා කියන විධියට දැන් සිද්ධ වෙලා තිබෙන දේ මෙකයි. මඩකළපුව විශ්වවිද්‍යාලයට මේ යෝජනාව ගේනකොට කැබිනට් මණ්ඩලය විසින් ඒක ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. ඒ නිසා ඇමතිතුමා පූර්ව නිර්දේශයක ඉන්නවා, රජරට විශ්වවිද්‍යාලයටත් ඒක ගෙනාවොත් ප්‍රතික්ෂේප වීමේ අනතුරක් තිබෙනවා කියලා. එම නිසා කැබිනට් මණ්ඩලය හැටියට තමුන්නාන්සේලා තීරණයක් ගත යුතුව තිබෙනවා, දුර පළාත්වල විශ්වවිද්‍යාලවල ළමයින්ට සාධාරණයක් ඉටුවීම සඳහාත්, එහි වැඩ කරන මහාචාර්යවරුන්ට, ආචාර්යවරුන්ට ඔවුන්ගේ ජීවිතය විධිමත් මට්ටමින් පවත්වාගෙන යෑම සඳහාත් යම් දීමනාවක් නිර්දේශ කළ යුතුයි කියලා. එහෙම නැතුව ඔවුන් රජරටට යන්නේ නැහැ. වතුරත් නැහැ, ඉන්න තැනකුත් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔලුවිල් විශ්වවිද්‍යාලයේ ඔය ප්‍රශ්නය ඇති වුණාම මහාචාර්ය කපිල පෙරේරා මහතා යැව්වා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ සඳහා Project එකක් හැදුවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමා Project එකක් හදලා වැඩිපුර දීමනාවක් දෙන්න අපි තීරණය කළා. ඔබතුමන්ලා COPE එකෙන් නිර්දේශ කරනවා නම්, ඒක කරන්න වඩාත් පහසු වෙනවා. ඇමතිතුමාට පහසු වෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
COPE එකෙන් නිර්දේශ කළා. COPE එකේ නිර්දේශය වුණේ, එසේ ලබා දුන්නොත් කොයි මොහොතක හෝ ඒ සඳහා ගැටලුවක් මතු වෙන්න පුළුවන් කියන එකයි. මොකද, එම දීමනා ලබා දෙන ක්‍රමයේ පොඩි නීත්‍යානුකූල නොවන ස්වභාවයක් තිබුණු නිසා. එය නීත්‍යානුකූල කර ගැනීම සඳහා තමයි කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා අනුමැතිය ගන්න කියලා කිව්වේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
COPE එකේ නිර්දේශයක් තිබෙනවා නම් ඒ ඉල්ලීම ශක්තිමත් වෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
COPE එකේ නිර්දේශයත් සමඟ තමයි උපකුලපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්තුමාට යොමු කළා කියලා මට තොරුතුරු ලැබුණේ. මම හරියටම දන්නේ නැහැ, ඒ පිළිබඳ ලිපියක් තිබෙනවා. කොහොම වුණත් මේ සඳහා සභානායකතුමාත් එකඟ නම්, දුෂ්කර විශ්වවිද්‍යාල සියල්ල ගැන කල්පනා කර බලා ගරු ඇමතිතුමා විසින් ඉතා ඉක්මනින්ම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න ඕනෑ කියන එකයි මම කියන්නේ. ඔබතුමා මේක මුදල් අමාත්‍යතුමාත් එක්ක කථා කරලා බේරුම් කර දෙන්න ඕනෑ. මොකද, මුදල් අමාත්‍යතුමා බොහෝ දුරට උත්සාහ කරන්නේ අමතරව පොඩ්ඩක් හෝ ලබා දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම උසස් අධ්‍යාපන ඇමති කාලයේ ඒක බේරාගන්න උත්සාහ කළා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මට මතකයි, බහුදින යාත්‍රා සඳහා විජයමුණි සොයිසා ඇමතිතුමා ඉදිරිපත් කළ යෝජනාව. බහුදින යාත්‍රාවලට මුහුදු යන්න බැරි නිසා රුපියල් බිලියනයක්වත් දුන්නොත්,- නේද? දැන් ඒ ගොල්ලෝ යන්නේ නැහැ. ඇයි, මුදල් ඇමතිතුමා ඒකට එකඟ වෙන්නේ නැහැ. මුදල් ඇමතිතුමාගේ ඇහෙන් ඇටයක් ගන්නවා වගේ තමයි, අවශ්‍ය කටයුතුවලටත් මුදල් වෙන් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එම නිසා විශ්වවිද්‍යාල පද්ධතිය පවත්වාගෙන යන්න නම් මේ කටයුත්ත අත්‍යවශ්‍යයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මම කියන්නේ මේකයි. කැබිනට් ඇමතිවරු ගණනාවක් ඉන්නවා; ඇමතිතුමා කැබිනට් පත්‍රිකාවක් දාලා ඉතා ඉක්මනින්ම කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා දීම තමයි මේකට තිබෙන එකම විසඳුම කියන එකයි අපි විශ්වාස කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන කාරණා කිහිපයක් තිබෙනවා. එකක් තමයි, මෙම දීමනා ගෙවීම පිළිබඳව තිබෙන අක්‍රමිකතාව මොකක්ද කියලා COPE එකෙන් පෙන්වා දී තිබෙනවා. ඊට අමතරව විගණක කොමිසමෙන් අවස්ථා ගණනාවක් කැඳවලා, මේ ගැන ප්‍රශ්න කිරීම් කරලා එම ගෙවීම් නීති විරෝධීයි කියලා පෙන්වා දී තිබෙනවා. තුන්වැනි කාරණය මෙයයි. එතැනදී මෙන්න මේ ආකාරයට විශ්වවිද්‍යාලයෙනුත් යම්

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

අක්‍රමිකතාවක් වෙලා තිබෙනවා. මම කලින් කියපු විධියට ඇබෑර්තු විශාල සංඛ්‍යාවක් තිබියදී ඒවා පුරවන්නේ නැතුව, පත් කර සිටින කිහිප දෙනාට ඇබෑර්තු පුරවපු නැති ගුරුවරුන්ට ගෙවන්න තිබෙන වැටුප් පාවිච්චි කරලා එම ගෙවීම දිගින් දිගට කරලා තිබෙනවා. ඒ කියන්නේ 10දෙනෙක් ඉන්න ඕනෑ තැනට 5දෙනෙක් අරගෙන ඒ 5දෙනාට පඩි ගෙවන ගමන් පීඨාධිපතිතුමා කරන්නේ, බඳවා නොගත් 5දෙනෙකුට ගෙවන්න වෙන් කරපු මුදලින් සේවයේ සිටින 5දෙනාගේ දීමනා ගෙවන එකයි. ඒක නිසා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය automatically පස්සට ගියා. ඒ නිසා මෙතැනදී විශ්වවිද්‍යාල පාලනාධිකාරියේ, ඒ කියන්නේ පීඨාධිපතිවරයාගේ බරපතළ වරදක් තිබෙනවා. ඒකත් අපි මේ ගරු සභාවේ දැන ගැනීම පිණිස කියන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, COPE එකේ සාමාජිකයෙක් වශයෙන් මේ පිළිබඳව මගේ මතකයේ තිබෙන කරුණු මම ඔබතුමාට විනාඩියකින් කියන්න කැමැතියි. ඇත්තටම හැම විශ්වවිද්‍යාලයකම අක්‍රමිකතා තිබෙන බව ඔබතුමා දන්නවා. නමුත්, මඩකළපුව විශ්වවිද්‍යාලයට ලබාදෙන විශේෂ දුෂ්කර දීමනාව රටේ අනෙකුත් දුෂ්කර විශ්වවිද්‍යාලවලට ලැබෙන්නේ නැහැ. එම නිසා COPE එක විධියට අක්‍රමිකතා පෙන්වා දුන්නාට අමතරව අපි කරපු දේ තමයි, රජරට විශ්වවිද්‍යාලයේ ආචාර්යවරු දැගෙන නොසිටි මඩකළපුව සරසවියට ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා සිටින කාලයේ ලබා දෙන්න කටයුතු කළ විශේෂ දුෂ්කර දීමනාත්, අමතර දීමනාත් ලබා දෙන්න කියලා යෝජනා කිරීම.

එතකොට එතැන විශ්වවිද්‍යාල පරිපාලනයට වගකීමක් තිබෙනවා, වැඩිපුර ලැබෙන වේතන් අනුමත කරගෙන මේ ප්‍රශ්නය විසඳාගන්න. COPE එක ඔවුන්ගේ දීමනා නතර කළා නොවෙයි. අක්‍රමිකතා පෙන්වා දුන්නාට අමතරව මඩකළපුවට ලබා දුන් විශේෂ දීමනා ලබා දෙන්න කියන ඉල්ලීම තමයි කළේ. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ආවා නම්, එතුමාට මේ කාරණය වඩා හොඳින් පැහැදිලි කරන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අමාත්‍යාංශය විධියටවත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විධියටවත් කිසිම අවස්ථාවක මේ දීමනා නවත්වන්න කියලා නැහැ. එම විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා ප්‍රමුඛ පාලක මණ්ඩලය විසින් තමයි මේ තීරණය අරගෙන තිබෙන්නේ. COPE එකේ පෙන්වා දීමත්, විගණන කොමිසමේ පෙන්වා දීමත්, ඊට අමතරව මුදල් අමාත්‍යාංශය නිකුත් කළ චක්‍රලේඛනයත් මේ සඳහා බලපා තිබෙනවා. එම නිසා අපට වෙන විකල්පයක් නැහැ. මේ පිළිබඳ මුදල් අමාත්‍යාංශයත් සමඟ සාකච්ඡා කර ඉදිරියේදී විසඳුමක් ලබා දීම තමයි කරන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ විධියට විශ්වවිද්‍යාල පවත්වා ගෙන යන්න බැහැ. ඒකයි වෙලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය.

## වරප්‍රසාද : පාර්ලිමේන්තුවේ කථා කිරීමට කාලය වෙන් නොකිරීම
## சிறப்புரிமை: பாராளுமன்றத்தில் உரையாற்ற நேரம் ஒதுக்கப்படாமை
## PRIVILEGE: NON-ALLOCATION OF TIME TO SPEAK IN PARLIAMENT

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் வன்னித் தேர்தல் மாவட்டத்தில் மக்களின் ஆணையைப் பெற்று இந்த எட்டாவது பாராளுமன்றத்தினைப் பிரதிநிதித்துவப்படுத்திக் கொண்டிருக்கின்றேன். எமது ஈழ மக்கள் புரட்சிகர விடுதலை முன்னணி, தமிழ்த் தேசியக் கூட்டமைப்பின் ஸ்தாபக பங்காளிக் கட்சியாகும். அந்தக் கட்சியின் செயலாளர் நாயகமாக நான் பதவி வகிக்கின்றேன். கடந்த தேர்தலில் எமது கட்சி தமிழ்த் தேசியக் கூட்டமைப்புடன் இணைந்து இலங்கைத் தமிழரசுக் கட்சியின் சின்னத்தில் போட்டியிட்டிருந்தது. அதன் பின்னர் கூட்டமைப்பால் நடத்தப்பட்ட புதிய அரசியலமைப்புக்கான இடைக்கால அறிக்கை பற்றிய பயிற்சிப் பட்டறை ஒன்றில் எமது கட்சி பங்கேற்கவில்லை. அது எமது கட்சியின் தனிப்பட்ட முடிவாகும். அவ்வாறிருக்கையில், இடைக்கால அறிக்கை சம்பந்தமான விவாதம் உட்பட அதற்குப் பின்னரான பாராளுமன்றச் சபை நடவடிக்கைகள் அனைத்திலும் எனது கருத்துக்களை முன்வைப்பதற்கான நேர ஒதுக்கீட்டை எதிர்க் கட்சித் தலைவரும் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தலைவருமான கௌரவ இரா. சம்பந்தன் அவர்கள் வழங்குவதைத் தவிர்த்து வருகின்றார் என்பதனை நான் ஏற்கனவே பல தடவைகள் தங்களின் கவனத்திற்குக் கொண்டுவந்துள்ளேன். இருப்பினும், அதற்கான தீர்வு இதுவரையில் கிடைக்க வில்லை.

யுத்தத்தின் உக்கிரத்திற்கு முகங்கொடுத்த வன்னிவாழ் மக்களின் குரலாக, அவர்களின் பிரதிநிதியாகப் பாராளுமன்றத்தினைப் பிரதிநிதித்துவப்படுத்தும் எனக்கான பேச்சுரிமை மறுக்கப்பட்டிருக்கின்றது. இது அடிப்படை மனித உரிமை மீறலாகும். அதுமட்டுமன்றி, நான் பிரதிநிதித்துவப்படுத்தும் மக்களின் பிரச்சினைகளை, தேவைகளை, கோரிக்கைகளை, எதிர்பார்ப்புகளை வெளிப்படுத்த இடமளிக்காது அவர்களின் குரலை நசுக்கும் ஒரு செயற்பாடாகவே இதனைக் கருதவேண்டியுள்ளது. பாராளுமன்ற உறுப்பினருக்கான பேச்சுரிமை சபைக்குள்ளேயே மறுக்கப்படும் இந்த நிலைமையை இந்த ஆட்சி மாற்றத்தின் பின்னர், பரந்துபட்ட ஜனநாயகம், நல்லாட்சி என்று பேசப்படும் காலத்தில், எந்த வகைக்குள் கொள்வது என்ற கேள்வியை எமக்குள் எழச் செய்கின்றது. பாராளுமன்ற உறுப்பினராகிய எனது கருத்துக்களைச் சபையில் தெரிவிப்பதற்குக் கடந்த பத்து மாதங்களுக்கும் அதிகமாக நேர ஒதுக்கீடு மறுக்கப்பட்டு வருகின்றது. இது எனது சிறப்புரிமையை மீறும் செயலாகும். உறுப்பினர்களுக்கான நேர ஒதுக்கீட்டைச் சபாநாயகர் என்ற

அடிப்படையில் பெற்றுக்கொடுப்பதற்கு அவர் பொறுப்புடைய வராவார். இந்தச் சபையில் சுயாதீனமாகச் செயற்படுவதாக அறிவித்த பாராளுமன்ற உறுப்பினர்களுக்குச் சபாநாயகர் நேர ஒதுக்கீட்டைப் பெற்றுக்கொடுத்த வரலாறும் இந்த சபைக்கு உள்ளது. ஆகவே, எந்தவொரு கட்சியையும் சாராது நடுநிலைமையுடன் செயற்பட்டு வருகின்றவர் என்ற அடிப்படையில் தாங்கள் இவ்விடயம் சம்பந்தமாக உரிய கவனமெடுத்து விரைவாகப் பதிலளிக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். இங்கேயுள்ள 225 பாராளுமன்ற உறுப்பினர்களுக்கும் இருக்கக்கூடிய சிறப்புரிமையைத்தான் நான் தொடர்ந்து கடந்த 10 மாதங்களாகக் கேட்டுக்கொண்டு வருகின்றேன். மூன்று தடவைகளுக்கு மேல் சபாநாயகர் அவர்களுக்கு இவ்விடயம் தொடர்பில் நான் எழுத்துமூலம் தெரிவித்திருக்கின்றேன்; நேரடியாகவும் பேசியிருக்கிறேன். அதற்குச் சபாநாயகர் அவர்கள் தொடர்ச்சியாக, தான் இவ்விடயம் தொடர்பில் கட்சித் தலைவர்களின் கூட்டத்தில் பேசி ஒரு முடிவைச் சொல்வதாகச் சொல்கின்றார்; எதிர்க்கட்சித் தலைவருடன் பேசி ஒரு முடிவைச் சொல்வதாகச் சொல்கிறார். இவ்வாறு சொல்லிச் சொல்லி, இன்றைக்கு 10 மாதங்களாகிவிட்டன.

ஜனநாயகம், சுதந்திரம் மற்றும் பாதுகாப்பு வேண்டும் என்று சொல்லித்தான், நாங்கள் எல்லோருமே 2015இல் ஓர் ஆட்சி மாற்றத்தைக் கொண்டுவந்தோம். ஆனால், இன்றைக்குப் பாராளுமன்ற உறுப்பினராக இருக்கக்கூடிய எனக்கு இந்தச் சபையிலே பேசுவதற்கு உரிமை இல்லை என்று சொன்னால், நாட்டிலே இருக்கக்கூடிய சாதாரண குடிமகனுக்கு எப்படி உரிமைகள் வழங்கப்படும்? என்று நான் கேட்க விரும்புகின்றேன். ஆகவே, நான் எந்தக் கட்சியைச் சார்ந்தவனாக இருந்தால் என்ன, எந்தக் கொள்கையைச் சார்ந்தவனாக இருந்தால் என்ன, இங்கிருக்கக்கூடிய 225 பேருக்கும் இருக்கின்ற கருத்துச் சுதந்திரம் எனக்கும் இருக்கிறது. அப்படி இருக்கையில், எனது கருத்துச் சுதந்திரம் இச்சபையிலே கடந்த 10 மாதங்களாக மறுக்கப்பட்டு வருகின்றது. ஆகவே, இந்த விடயம் தொடர்பாக அரசாங்கம், சபாநாயகர் ஆகியோர் கட்சி சார்பில்லாமல் செயற்பட்டு, எல்லா உறுப்பினருக்கும் இருக்கிற அந்த உரிமையை எனக்கும் வழங்கவேண்டும் என்பதைத்தான் நான் தொடர்ந்து கேட்டுக்கொண்டிருக்கிறேன். ஆகவே, தயவுசெய்து எதிர்வருகின்ற வரவு செலவுத்திட்ட விவாதங்களின்போது என்னுடைய கருத்தைச் சொல்வதற்கு எனக்கு முழுச் சுதந்திரமும் அளிக்கப்பட வேண்டும்.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, what he says is outside the text. Hon. Member, you can raise your matter of Privilege, but you cannot go outside the text.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is the point of Order, Hon. Sumanthiran?

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, the Hon. Member has raised a Question of Privilege. Having raised it, he cannot make a speech. That is the point of Order I am raising.

But, I also wish to state that the issue he has raised is, as he himself says, if a Member functions independently, that Member must have a right to speak in Parliament. If he declares himself to be an independent Member, meaning independent of the Illankai Tamil Arasu Kadchi, from which he was elected, then the Hon. Speaker can allocate time for him. That has been the tradition. But, so long as he remains a Member of the ITAK, he must fall by the Whip of the ITAK. If he does not fall by the Whip of the ITAK, he will not be allocated any time. I say this on behalf of all the Members of the ITAK, the other fifteen Members of Parliament.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I will bring this to the notice of the Hon. Speaker.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is the point of Order, Hon. Dinesh Gunawardena?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
The Hon. Sivasakthi Ananthan has raised a very important issue for the second time in the last few months; this is the second time. The Hon. Member of Parliament has requested repeatedly for an opportunity to express his views as a Member of Parliament representing the people who have elected him. The tradition, to which the Hon M.A. Sumanthiran referred to, is totally different. The Hon. Lalith Athulath Mudali was deprived of that opportunity when he got up to speak. It was the same, I remember, for the Hon. Gamini Dissanayake and the Hon. G.M. Premachandra. But, the then Hon. Speaker, the Hon. M.H. Mohamed said, “I recognize the Member." The time allocated, of course, could be limited on the request of the Whip, but you cannot deprive a Member from expressing his views, for which he has a right.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

Secondly, when the Hon. (Dr.) M.L.A.M. Hizbullah was facing a similar situation under the Hon. M.H.M. Ashraff - we, the Hon. Bandula Gunawardane and myself, were seated in the Opposition - the then Hon. Speaker ruled that the Hon. (Dr.) M.L.A.M. Hizbullah could speak, but time was allocated only from the allocation for the Opposition. So, I do not think it is fair to deprive the Hon. Sivasakthi Ananthan of his right to express his opinion in the House.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
As I said earlier, I will bring this matter to the notice of the Hon. Speaker.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sivasakthi Ananthan, what is your point of Order?

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நாங்கள் தனிக் கட்சியாகப் போட்டியிடவில்லை. நான்கு கட்சிகள் கொண்ட தமிழ்த் தேசியக் கூட்டமைப்பாகத்தான் தேர்தலிலே போட்டியிட்டிருந்தோம். ஐக்கிய மக்கள் சுதந்திரக் கூட்டமைப்பு என்ற கட்சியில் போட்டியிட்ட பாராளுமன்ற உறுப்பினர்களுக்கு ஏற்கெனவே இதேமாதிரியான நேர ஒதுக்கீட்டுப் பிரச்சினைகள் இருந்து, பின்னர் அவர்களுக்கான நேரம் ஒதுக்கப்பட்டிருக்கின்றது. நான் ஒரு கட்சியைச் சேர்ந்தவன். கடந்த 35 வருட காலமாக அந்தக் கட்சியில் உறுப்பினராக இருக்கிறேன். தற்சமயம் அந்தக் கட்சியின் செயலாளராக இருக்கின்றேன். தொடர்ச்சியாக நான் வன்னி மாவட்ட மக்களைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஒரு பாராளுமன்ற உறுப்பினராக இருந்து வருகின்றேன். இவ்வாறான நிலையில், சம்பந்தப்பட்டவர்கள் எனக்கு இங்கு நேரம் ஒதுக்கித் தராமல் என்னைப் புறக்கணித்துக் கொண்டிருக்கிறார்கள். நான் இன்று இந்தச் சிறப்புரிமை விடயத்தை முன்வைப்பதையிட்டு அவர்கள் பயப்படுகிறார்கள். ஆனால், இங்கிருக்கின்ற 225 பாராளுமன்ற உறுப்பினர்களுக்கும் இருக்கக்கூடிய சிறப்புரிமையத்தான் நான் கேட்கிறேனே தவிர, இவர்கள் யாரிடமும் பிச்சை கேட்கவில்லை. அதாவது இந்தச் சபையில் இருக்கின்ற அனைத்துக் கட்சிகளைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களுக்கும் என்ன உரிமை இருக்கிறதோ அதைத்தான் கேட்கிறேன். இதுவரை காலமும் அரச பயங்கரவாதத்தைப் பற்றியும் சிங்களப் பேரினவாதத்தைப் பற்றியும் ஊடக சுதந்திரத்தைப் பற்றியும் வாய்கிழியப் பேசியவர்கள் இன்று ஒரு தமிழ்ப் பாராளுமன்ற உறுப்பினருக்கான நேர ஒதுக்கீட்டைத் தர மறுக்கிறார்கள். அவ்வாறானவர்களுக்கு ஜனநாயகத்தைப் பற்றி, சுதந்திரத்தைப் பற்றிக் கதைப்பதற்கு என்ன அருகதை இருக்கிறது? தமிழர்களுடைய 70 வருட அரசியல் வரலாற்றில் ஓர் எதிர்க்கட்சித் தலைவர், தான் சார்ந்த ஒரு தமிழ்ப் பாராளுமன்ற உறுப்பினருக்கு இங்கு பேசுவதற்கு நேரம் ஒதுக்கிக் கொடுக்க மறுக்கிறார். தமிழர்களுடைய 70 வருட அரசியல் வரலாற்றில் இதுமாதிரியான ஒரு மோசமான செயல் இல்லையென்று நான் நினைக்கிறேன். ஆகவே, இந்த உயரிய சபையானது எனக்குரிய நேரத்தை ஒதுக்கித் தருவதற்கு இடமளிக்க வேண்டும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! Now, I have heard you, Hon. Member. - [*Interruption*.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, I rise to a point of Order. - [*Interruption*.]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sumanthiran, what is your point of Order?- [*Interruption*.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, even after being ruled by the Chair, the Hon. Member keeps on making a speech. He is only entitled to raise a Question of Privilege, he is not entitled to make a speech like this. - [*Interruption*.]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! As I said earlier, I will bring this to the Hon. Speaker's attention. - [*Interruption.]*

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
It is a good thing that he is getting the support from the Joint Opposition. - [*Interruption.*]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] ඔබතුමාට කථා කරන්න අවස්ථාව ලබා දී තිබෙන්නේ. [බාධා කිරීම්] ඔබතුමා කාරණය මතු කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල සභානායකතුමා මේ ගැන හොඳටම දන්නවා. මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේ දීර්ඝ කාලීන අත්දැකීමක් එතුමාට තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
Sir, the Hon. Sumanthiran says he has no objection if we give him time. We are ready to give him time.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(මාණ්ඩලික එම්.ඒ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
No, I never said that.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
That is what you said, if the Joint Opposition is ready to give him time. Do not deprive -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්ඩලික පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
මම මේ කාරණාව සම්බන්ධයෙන් ගරු කථානායකතුමා දැනුවත් කරන්නම්. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාරණය අවසන් කරන්න. අපට අද දවසේ කළ යුතු වැඩ කටයුතු ගොඩක් තිබෙනවා. [බාධා කිරීම්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාරණය අවසන් කරන්න. [බාධා කිරීම්]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(මාණ්ඩලික එම්.ඒ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
The only supporting hand is from the Joint Opposition.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්ඩලික වාசுදේව நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
How can you deprive a Member? - [*Interruption.*]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(මාණ්ඩලික එම්.ඒ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Now you show your hand. - [*Interruption.*]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්ඩලික වාசுදේව நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
What is the hand? - [*Interruption.*]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්ඩලික (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, it is very unfair. - [*Interruption.*]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්ඩලික පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාරණය අවසන් කරන්න. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්ඩලික (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මෙතුමා වාඩි වෙන්නේ නැහැ නේ. ඔබතුමා කරුණාකර මෙතුමා වාඩි කරවන්නකෝ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්ඩලික පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට කථා කරන්න අවස්ථාව ලබා දී තිබෙන්නේ. කථා කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්ඩලික (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මේ අය වාඩි කරවන්නකෝ. දැන් මෙතැන ගරු සභානායකතුමා -ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා- ඉන්නවා. එතුමා මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේ තිබුණු සම්ප්‍රදාය ගැන හොඳටම දන්නවා. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා, එතුමාගේ ආධිපත්‍යයට මේ පාර්ලිමේන්තුව යටත් කිරීම වැරැදියි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට තමන් නියෝජනය කරන ජනතාව වෙනුවෙන් තමන්ගේ හඬ නැඟීමට තිබෙන අයිතියට ඉතිහාසයේ කථානායකවරු අවසර ලබා දී තිබෙනවා. එම්.එච්. මොහොමඩ් මැතිතුමා කථානායකතුමා වශයෙන් සිටි අවස්ථාවේ, දෝෂාභියෝගය ඉදිරිපත් කළ වේලාවේ -ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාගෙන් අහන්න-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්ඩලික පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
මීට කලින් එම කාරණය ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මතක් කළා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්ඩලික (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගාම්භීර දිසානායක මැතිතුමාට, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාට මේ පාර්ලිමේන්තුවේ කථා කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දුන්නා. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සඳහන් කළ ආකාරයට මෙතැන අෂ්රොෆ් මන්ත්‍රීතුමා එක්ක ඉන්නකොට -තමුන්නාන්සේ සාක්ෂි දරනවා- හිස්බුල්ලා මැතිතුමාට කථා කරන්න ඉඩ දුන්නා. [බාධා කිරීම්] මෙතුමා අලුතෙන් ඇවිල්ලා -[බාධා කිරීම්] මෙතුමා කවුද පාර්ලිමේන්තුවට ඇවිල්ලා -[බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්ඩලික පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, -[බාධා කිරීම්] Order, please! [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්ඩලික (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
How can you do that?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්ඩලික පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මම අවස්ථාව ලබා දී තිබෙනවා. මම මේ කාරණය පිළිබඳව ගරු කථානායකතුමා දැනුවත් කර තීරණයක් අරගෙන දෙන්නම්. ඔබතුමා එතෙක් ඉන්න.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(මාණ්ඩලික (පේරාසිරියර්) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්ඩලික පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ පිළිගත් දේශපාලන පක්ෂ හයයි තිබෙන්නේ. ඒ පිළිගත් දේශපාලන පක්ෂ හයට නීත්‍යානුකූලව කාලය වෙන් කරනවා, කථා කරන්න. [බාධා කිරීම්] මේ අවස්ථාවේ කිඹුල් කඳුළු හෙළන මන්ත්‍රීවරුන්ට මම කියනවා, පිළිගත් දේශපාලන පක්ෂ හයට විතරයි මේ අවස්ථාවේ -[බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. මීට වඩා මේ වෙනුවෙන් කාලය ගත කරන්න පුළුවන්කමක් නැහැ. [බාධා කිරීම්] මේ වෙනුවෙන් මීට වඩා කාලය ගත කරන්න බැහැ. මම මේ කාරණය පිළිබඳව -[බාධා කිරීම්] Order, please! ගරු මන්ත්‍රීතුමන්ලා, කරුණාකර මට අවස්ථාව දෙන්න. මම මේ කාරණය පිළිබඳ ගරු කථානායකතුමා දැනුවත් කරනවා. එතුමා ඒ පිළිබඳ තීරණයක් දෙයි. බොහොම ස්තුතියි.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද? මේ, මේ කාරණය සම්බන්ධ අවසන් point of Order එක. මීට වඩා මේ කාරණයට මම අවස්ථාව ලබා දෙන්නේ නැහැ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට වෙලා තිබෙන්නේත් ඕක තමයි. වේලාව ගැනීම ගැන ප්‍රශ්නයක් අපට තිබෙනවා. අපට අනුකම්පාවෙන් වේලාව දෙනවා මිසක් නැත්නම් දෙන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුව පවත්වනවාට වඩා හොඳයි නොපවත්වා ඉන්න එක. මම කියන්නේ කිසිම වැදගත් කාරණාවක් මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න වේලාව නැහැ. එම නිසා එකිනෙක පක්ෂවලට වේලාව වෙන් කිරීම වෙනුවට, රෑ එළිවෙනකම් හරි කථා කරලා අවසන් කරන්න කරුණාකර වේලාව විවෘත කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මෙතැන කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන්නේ. මම කිව්වා ඒක මේ කාරණය සම්බන්ධයෙන් අවසාන point of Order එක කියලා. ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඒකට අදාළ කාරණයක් නොවෙයි. වෙනත් කාරණයක්. මම ගිය සතියේ-

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, විනාඩියක් ඉන්න. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ point of Order එකෙන් පස්සේ අවස්ථාව දෙන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පසු ගිය පාර්ලිමේන්තු සතියේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඇහුවා, ඉන්දියානු සමාගම් වෙත ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පවරා දීම පිළිබඳව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් ඒ ගැන සාකච්ඡා කරන්න අවස්ථාවක් නැහැනේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම ඒ ගැන ප්‍රශ්නයක් ඇහුවා. ඒ වෙලාවේ ගරු ඇමතිතුමා උත්තර දුන්නේ නැහැ. ගරු සභානායකතුමා කිව්වා, ඊට පසුව දා උත්තර දෙනවා කියලා. මම ඊයේ ඒ ගැන ඇහුවාම කිව්වා, අද උත්තර දෙනවා කිව්වා. ස්ථාවර නියෝග 27.(2) යටතේ අපට අයිතිය තිබෙනවා, විශේෂ කාරණයක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අහන්න. තෙල් සංස්ථාව භාර අමාත්‍යවරයකුත් ඉන්නවා; නියෝජ්‍ය අමාත්‍යවරියකුත් ඉන්නවා. තෙල් ටැංකි සංකීර්ණය විකුණුවාට පස්සේ මෙතැනට ඇවිල්ලා ඒ ගැන උත්තර දීලා වැඩක් නැහැ. හැබැයි, මම අවස්ථා කිහිපයකදීම මේ ගැන ඇහුවා. නමුත් උත්තර දෙන්නේ නැහැ. මොකක්ද වෙලා තිබෙන්නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I have been informed by the Minister that he will be answering this Question tomorrow.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Thank you.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### රසායනික අවි සම්මුතිය පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත
### இரசாயன ஆயுதங்கள் சமவாயம் (திருத்தம்) சட்டமூலம்
### CHEMICAL WEAPONS CONVENTION (AMENDMENT) BILL

"2007 අංක 58 දරන රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා විසිනි.***

***2018 ඔක්තෝබර් 25වන බ්‍රහස්පතින්දා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2018 ஒக்ரோபர் 25, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs; to be read a Second time upon Thursday, 25th October, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That the proceedings on Item No.1 of Public Business appearing on the Order Paper be exempted at this day's sitting from the provisions of the Standing Order No. 27 of Parliament."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නියෝජිතයන් නම් කිරීම
## அரசியலமைப்பின்கீழான தீர்மானம்: அரசியலமைப்புப் பேரவைக்கு உறுப்பினர்களை நியமித்தல்
## RESOLUTION UNDER THE CONSTITUTION: NOMINATION OF MEMBERS TO CONSTITUTIONAL COUNCIL

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Deputy Speaker, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I move,

"That this Parliament resolves that the under mentioned persons who are not Members of Parliament appointed to the Constitutional Council on the nomination of both the Prime Minister and the Leader of the Opposition under sub-paragraph (e) of paragraph (1) and paragraphs (4) and (5) of Article 41 A of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka, and such nomination be approved by Parliament in terms of paragraph (5) of Article 41 A of the Constitution:-

1. Dr. Jayantha Dhanapala
2. Mr. Ahmad Javid Yusuf
3. Mr. Naganathan Selvakkumaran"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, before this Item gets approved, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවා පාර්ලිමේන්තුවට දැනුම් දුන්නාට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කරන අය කිසිම නීතියක්, රීතියක් අනුව පත් නොකරන බව සඳහන් කරමින්, ගරු කථානායකතුමා විසින්ම පොලිස් කොමිසම කැඳවා, පොලිස්පති කැඳවා කරන ලද ආඥාවක් තිබුණත් අද වනතුරු පිළිපැදලා නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති ගරු කථානායකතුමායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මූලාසනයේ ඉන්නේ ඔබතුමායි. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අපි අනුමැතියක් දුන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කටයුතු මේ විධියට කරන්නද? නැත. ඒ පිළිබඳ විශ්වාසය කඩ වී ඇත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ රීති පිළිපදින්නේ කොයි විධියටද කියලා අද වනතුරු කවුරුවත් දන්නේ නැහැ. උසස්වීමක් දෙන්නේ ජ්‍යෙෂ්ඨත්වයටද, සුදුසුකමටද එහෙම නැත්නම් දේශපාලන හිතවත්කම්වලටද? දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ විශ්වාසය අද සම්පූර්ණයෙන් පළුදු වී තිබෙනවා. ඒක මුළු සමාජයේ දිනපතා පුවත් පත්වල

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

විවේචනයට ලක් වෙමින් තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුවේදී අපි මේ නම්වලට අනුමැතිය දීමට මත්තෙන් ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. අපට එක ප්‍රශ්නයකට පිළිතුරු දෙන්න. මෙතෙක් කරන ලද පත්කිරීම් වැරදි බවත්, ඒ පත්වීම් ලද වැරදි කළ අය ගෙන්වා අවවාද කළත් ඒ අවවාද පිළිනොගෙන කටයුතු කරන තත්ත්වය ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විධියට මොකක්ද-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ඔහොම ඉන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිළිතුරු දෙන්න ඉස්සර මට මේ කාරණය අහන්න ඉඩ දෙන්න. තමුන්නාන්සේලාට බහුතරය තිබෙනවා මෙය සම්මත කර ගන්න. නමුත්, අපේ අදහස්වලටත් ඉඩ දෙන්න. දැන් එක මන්ත්‍රීවරයකුගේ අදහස යටපත් කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යටපත් කළේ නැහැ. මම එතුමාට අවස්ථාව දුන්නා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් අපට මේ කාරණය මතු කරන්න ඉඩ නොදී ඉන්නද හදන්නේ? අපි මේ මතු කරන්නේ වෙනම ප්‍රශ්නයක්; බරපතළ ප්‍රශ්නයක්. විවාද කරන්න ඉඩ දෙන්නේ නැති නිසායි මේ විධියට අහන්නේ. අපට විපක්ෂ නායක කාර්යාලයෙන් විවාද දෙන්නේ නැහැ. ඒ නිසායි අප මේවා අහන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පත් කිරීමට නියමිත නිලධාරීන්ගේ නම් සඳහන් කරන්නේ නැහැ, සුදුසු නැති නිසා.

හෙට දිනය වන කොට අග්‍ර විනිශ්චයකාරවරයා විශ්‍රාම යනවා. නමුත් තවමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත්වීම් කර ගන්න බැරි වෙලා තිබෙනවා. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පත් කර ගත්ත, ගරු කථානායකතුමා මූලාසනය දරන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කටයුතු කරන්නේ මොහෙමද?

හෙට, අග්‍රවිනිශ්චයකාරවරයා විශ්‍රාම ගියාම මොකද වෙන්නේ? අපි ඒක දැන ගන්න කැමතියි. මේ කරුණු සාකච්ඡා කරන්න එපා කියන එක නොවෙයි අපි කියන්නේ. මූලාසනයේ ගරු කථානායකතුමා නොමැති වුවත්, ගරු නියෝජ්‍ය කථානායකතුමාට පුළුවන් මේ ගැන සාකච්ඡා කරන්න ඉඩ දෙන්න. මේක අතිශය වැදගත් ප්‍රශ්නයක්.

මීට ප්‍රථම කාන්තා නියෝජනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තිබුණා. දැන් ඒ කාන්තා නියෝජනය නොදී ඉන්නේ ඇයි කියලායි මම ඔබතුමාගෙන් අහන්නේ. කාන්තා නියෝජනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නොදී ඉන්නේ ඇයි? ඒක කරන්නේ මොන රීතියක් යටතේද? එහෙම හැසිරෙන්නේ ඇයි? අපි ඒ ගැන දැන ගන්න කැමතියි. ඔබතුමන්ලා එක එක යෝජනා ඉදිරිපත් කළ පමණින් ඒවාට පක්ෂ වීම පමණක් නොවෙයි, ඒවාට සම්බන්ධ කරුණු ගැන ප්‍රශ්න කිරීමට තිබෙන අයිතිය ආරක්ෂා වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මොන රීතිය යටතේද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙම පත්වීම් අනුමත කර ගන්න යන්නේ කියන එකටවත් අවම වශයෙන් පිළිතුරු දෙනවා නම් හොඳයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමන්ලාට අවස්ථාව දුන්නා. දැන් ගරු සභානායකතුමාට පිළිතුරු දීමට අවස්ථාව ලබා දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ පැවති පක්ෂ නායක රැස්වීමේ දී දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ ගැන කිසිම විරෝධතාවක් දැක්වූයේ නැහැ. ඊයේ පැවති පක්ෂ නායක රැස්වීමේ දී මේ ගැන පැයක් විතර සාකච්ඡා කළා. එතුමා කිසිම විරෝධතාවක් දැක්වූයේ නැහැ. ඇත්ත වශයෙන්ම මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායයට විරුද්ධවයි කටයුතු කරන්නේ. ඊයේ නිහඬව ඉඳලා අද අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති කරන්නයි මේ හදන්නේ. නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සාකච්ඡා කළාය කියන්නේ බොරුවක්. මේ හතර පස් දෙනාට ඕනෑ විධියට තීරණ ගන්නවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමා දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු අවස්ථාවේ එතුමාට කැමති විධියට විනිශ්චයකාරවරු උසස් තනතුරුවලට පත් කිරීමේ අයිතිය දුන්නා. මම මේ අයට මතක් ඒක කරන්න කැමතියි. දැන් ඒ අයිතිය ජනාධිපතිතුමාටවත් නැහැ. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ මහින්ද රාජපක්ෂ මැතිතුමා පැය 24න් නීතියක් ගෙනැල්ලා, තමන්ට ඕනෑ අය පත් කරන්න කටයුතු කළා. අග්‍රවිනිශ්චයකාරවරයා, විනිශ්චයකාරවරු, පොලිස්පති, හමුදාපතිවරු -එතුමාට ඕනෑ අය- පැය 24න් පත් කරන්නයි දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. අපි දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්වාධීන කළා. එම නිසා ජනාධිපතිතුමා එවන නමක් වුවත් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට තිබෙනවා. අපි ඒ ගැන ආඩම්බර වෙන්න ඕනෑ. ජනාධිපතිතුමා එවන නමක් වුණත් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට තිබෙනවා. මහින්ද රාජපක්ෂගේ සපත්තුවට යට වෙලා හිටපු, එහෙම කටයුතු කරපු අය තමයි අද මෙහෙම නැඟිටලා ඉන්නේ. අපි තමුන්නාන්සේලා ඒකෙන් මුදා ගත්තා. - We liberated you. මේ ගොල්ලන් මේ කථා කරනවා-

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
Sir, I rise to a point of Order.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙතුමා මහින්ද රාජපක්ෂ එක්කත් හිටියා. අපි එක්කත් හිටියා. හැම ආණ්ඩුවේම හිටියා. හැම ආණ්ඩුවම නොමඟ හැරියා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ ගැන ඡන්දයක් පවත්වමු.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඒක වැරදියි. මමයි point of Order එක මුලින්ම ඉල්ලුවේ.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවන් ගැන කථා කරන මේ අය හිටපු අග්‍රවිනිශ්චයකාරතුමිය ගෙදර යැව්වා. මේ අය කාන්තාව ගැන කියලා කිඹුල් කඳුළු හළන්නේ බොරුවට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද අනුමත කරන්නේ දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ කෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නව පත්වීම්. මෙම දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළේ 2015 අප්‍රේල් මාසයේ. මේ පාර්ලිමේන්තුවේ මහ ලොකුවට දේශපාලන පක්ෂ ගැන කථා කරන අය එදා ඒ ගැන කථා කළේ නැහැ. මම සන්ධානයේ මහලේකම් ලෙස සිටියදී සන්ධානයට මන්ත්‍රීවරු 142ක් හිටියා. එදා එක්සත් ජාතික පක්ෂයේ 46 දෙනයි හිටියේ. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න කියලා ඉවර වෙනකන්. [බාධා කිරීම්] එහෙම කොහොමද? එදා අපි දායක වුණා, මේ ව්‍යවස්ථාදායක සභාව හදන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුමත කරන්න. එහෙම නම් දැන් මේ පත් කරන අය- [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මේ අවස්ථාවේ දී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.*

*අතන්පිටකු, මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, චපානායකර් අවර්කළ් [மாண்புமிகு கரு ஜயசூரிய] තලෛමෛ වකිත්තාර්කළ්.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* SPEAKER [THE HON. KARU JAYASURIYA] *took the Chair.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
පොඩ්ඩක් ඉන්න, මම කථා කරලා ඉවර වෙනකල්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා වාඩි වෙන්න. මේ රැස්වීම පවත්වාගෙන යන්න ඉඩ දෙන්න. මම අවස්ථාව දෙන්නම්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, දැනට යෝජනා වෙලා තිබෙන ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් තුන්දෙනා පත් කිරීම පිළිබඳ කාරණය සම්බන්ධයෙන් ඔබතුමා මූලාසනයට පැමිණෙන්න කලින් දැඩි වාද විවාද ඇති වුණා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් කියපු විධියට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී බලාපොරොත්තු මුදුන්පත් කර ගැනීමේ අරමුණෙන් මේ රටේ සියලු ජනතාවගේ ආශීර්වාදය ඇතුව සම්මත කර ගත් බව අපි පිළිගන්නවා. විපක්ෂයේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ට අපි එදත් ස්තුතිවන්ත වුණා. අපි සුළුතර ආණ්ඩුවක් විධියට තිබුණත්, එතුමන්ලා එක්ක සාකච්ඡා කරලා එතුමන්ලාගේ සහයෝගය ඇතිව 158කට වැඩි ඡන්ද සංඛ්‍යාවක් අරගෙන ඉතාම ශ්‍රේෂ්ඨ බලාපොරොත්තුවක් ඇතිව තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් මේ ව්‍යවස්ථා සභාවට ප්‍රතිපාදන හඳුන්වා දුන්නේ. අද දිනයේත් ව්‍යවස්ථා සභාව පිළිබඳව විවේචන ඉදිරිපත් වුණා. ඒවායේ යම් අඩුපාඩු තිබෙන්නට පුළුවන්. සියයට 100ක් නිවැරදි තීරණ නොගත්තා වෙන්නට පුළුවන්. එහි අඩුපාඩුවක් තිබෙනවා නම් නිවැරදි කර ගැනීමේ වගකීම මේ ගරු පාර්ලිමේන්තුවේ අප කාටත් තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද දිනයේ මතු වුණු කාරණය තමයි ව්‍යවස්ථා සභාව සඳහා සිවිල් සමාජය නියෝජනය කරන තිදෙනෙකුගේ නම් ඉදිරිපත් වෙලා තිබෙනවා. එතකොට මේ සභාවේ ඉතාම වැදගත් සාධකයක් වෙනවා, සිවිල් සමාජයේ නියෝජනය. සමාජය පිළිගත්, ගෞරවයට පාත්‍ර වුණු, යම් යම් ක්ෂේත්‍රවල විශිෂ්ටයන් බවට පත් වුණු උදවියගේ නම් තමයි මෙතැනට ඉදිරිපත් විය යුත්තේ. ඒ වාගේ නම් තුනක් අද ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ නම් තුන ඉදිරිපත් වුණු වෙලාවේ අපි ඒ පිළිබඳව විවෘතව, දැඩි වාග් ප්‍රහාර මඟින් වාද විවාද ඇති කර ගත්තොත් එහෙම, ඒ තුන්දෙනාගේ පත්වීමේ වලංගුභාවය සම්බන්ධයෙන් යම් සැක සංකාවක් තිබෙන බවක් රටට පෙනෙනවා. රටේ ජනතාවගෙන් ඒ පිළිබඳ විවේචන එන්න ඉඩ තිබෙනවා. ඒ නිසා මම ගරු සභාවට යෝජනා කරන්නේ, ව්‍යවස්ථා සභාවේ තිබෙන අඩුපාඩු, දුර්වලකම් ගැන අපි පක්ෂ නායක කමිටුවේදී හෝ වෙනත් ආකාරයෙන් සාකච්ඡා කරලා විසඳා ගන්නා අතරේ, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව, ඕත් අමනාපකම් ඇති කර ගන්නේ නැතුව- [බාධා කිරීමක්] නැහැ, ඒක අපි කරමු. දැන් අපි සෑහෙන දුරක් ඇවිල්ලා තිබෙනවා නේ. ප්‍රජාතන්ත්‍රවාදය තුළ යමක් කරන්න එක පාරටම බැහැ. සෑහෙන කාලයක් ගත වෙනවා. ඒක නිසා ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කර ගැනීමේ අයිතිය අපි තබා ගනිමු. මේ පත්වීම් ටික ගෞරවනීය විධියට සිදු නොවුණොත්, සමහර වෙලාවට මේ යෝජනා වී සිටින උදවිය මේ තනතුරු භාර ගන්න එකතුත් නැහැ. ඒ වාගේ තත්ත්වයක් තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ. ඔබතුමන්ලාගේ අදහස් අපි අවතක්සේරු කරන්නේ නැහැ, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි. ප්‍රශ්න තිබෙන ඒවා පිළිබඳව අපි ප්‍රජාතන්ත්‍රවාදීව සාකච්ඡා කරමු.

අපි ඔබතුමන්ලාගේ අදහස් ප්‍රතික්ෂේප කිරීමක්, එම අදහස්වලට අගරු කිරීමක් කරන්නේ නැහැ. වග කිවයුතු ආණ්ඩුවක් විධියට අපි කියන්නේ මේකයි. මේ ව්‍යවස්ථා සභාවේ පූර්ණ සේවය සහ එහි ප්‍රතිලාභ ඉදිරියට රටට ලබා දෙන්න පුළුවන් විධියට කරුණාකරලා අපි සියලු දෙනාම මෙය ගරු ගාම්භීර විධියට සම්මත කර ගත්තොත් ව්‍යවස්ථා සභාවේ වැඩ කටයුතු කරගෙන යාම පහසු වනවා.

දැන් ඔබතුමන්ලා සඳහන් කළා වාගේ අනිද්දා වනකොට අග විනිසුරු තනතුරට පත්වීම කරන්න ඕනෑ. ඒ වාගේ හදිසි කාරණා ගොන්නක් තිබෙනවා. මේ සියල්ල සලකා බලා, මේ කාරණයේ දී අපි විවෘත ගැටුම් ඇති කර ගන්නේ නැතුව මේ පත් කිරීම් කර ගත්තොත් මේ සභාවේ ගෞරවය හා ප්‍රජාතන්ත්‍රවාදයේ අයිතිය කියන දෙකම ආරක්ෂා වනවාය කියන කාරණය මා සඳහන් කරනවා. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා, මේ පත්වීම් පිළිබඳව ගැටුම් ඇති කර ගන්නේ නැතිව අපි මේ පිළිබඳව වෙනම සාකච්ඡා කරමු කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභාව මට පොඩ්ඩක් අවසර දෙන්න. [බාධා කිරීම්] මේ ප්‍රශ්නය පිළිබඳව පැහැදිලි කරන්න මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. මේ ගරු සභාවේ කියනවා මම අහගෙන හිටියා, "කවුරුවත් පත් කරලා නැහැ" කියලා. අනෙක් සාමාජිකයෝ ඔක්කෝම පත් කරලා, ලියුම් පවා දීලා ඉවරයි ගරු මන්ත්‍රීතුමනි. දැන් 7දෙනෙක් පත් කරලා තිබෙනවා. නව අග්‍ර විනිශ්චයකාරවරයා පත් කර ගැනීම සඳහා හෙට දහවල් 12.00ට ව්‍යවස්ථා සභාව රැස් වෙනවා. මේ නම් තුන අපි ලබා ගත්තේ සිවිල් සමාජයෙන්. මෙතැන කිසිම දේශපාලන ඇඟිලි ගැසීමක් තිබුණේ නැහැ. අපි සිවිල් සමාජයෙන් ගෞරවයෙන් ඉල්ලුවා, එම තනතුරට යෝජනා ඉදිරිපත් කරන්න කියලා. සිවිල් සමාජය ඉදිරිපත් කරපු යෝජනාවලින් තමයි අපි මේ නම් තුන තෝරා ගත්තේ. මේ අය කිසිම විධියකින් ඉල්ලුම් කරපු අය නොවෙයි. මේ අය සමාජය තුළ ලොකු ගරුත්වයක් තිබෙන පුද්ගලයන්. ඒ නිසා මෙතැනදී මේ ආකාරයෙන් කටයුතු කරන එක මට හිතෙන්නේ ඒ අයට කරන අපහාසයක් කියලායි. මේ අය ඉතාමත්ම කීර්තිමත් පුද්ගලයන්. මේ අයගේ කිසිම අඩු පාඩුවක් මා දකින්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි,

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ඔබතුමාට අවස්ථාව දෙනවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙතැන ප්‍රශ්න දෙකක් තිබෙනවා. එකක් මේ ව්‍යවස්ථා සභාවේ ක්‍රියාකාරිත්වය සහ ව්‍යවස්ථා සභාව විසින් පත් කරන ලද කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වය. ඒ ගැන තමයි ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විශේෂයෙන් ප්‍රශ්න කළේ. සමහර කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වයේ ප්‍රශ්න ඇති වී තිබෙනවා. ඒ වාගේම එම කොමිෂන් සභා විසින් පත් කරන අය පිළිබඳව ප්‍රශ්න තිබෙනවා. විශේෂයෙන්ම වත්මන් පොලිස්පතිවරයා වාගේ කෙනෙක් ගත්තොත් එතුමාටත් වගකීමක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ව්‍යවස්ථා සභාව විසින් පත් කරන ලද කෙනෙක් නිසා එතුමා ව්‍යවස්ථා සභාවේ ගරුත්වයත් ආරක්ෂා වන පරිදි හැසිරීමක් පෙන්විය යුතුව තිබෙනවා. හැබැයි, එතුමාගේ හැසිරීම් විසින් මුළුමනින්ම ව්‍යවස්ථා සභාවේ ක්‍රියාකාරිත්වය ගැන සැකයක් මතු වෙලා තිබෙනවා.

මෙහි සාමාජිකයන් පිළිබඳව කථා කරනවා නම්, ඔබතුමා කියූ පරිදිම පාර්ලිමේන්තුව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් හත්දෙනෙක් සිටිය යුතුයි, ගරු කථානායකතුමනි. ඒ කියන්නේ අගමැතිවරයා, විපක්ෂ නායකතුමා සහ ඔබතුමා ඇතුළු තව මන්ත්‍රීවරු හතර දෙනෙක් පත් විය යුතුව තිබෙනවා. එහිදී විශේෂයෙන්ම අගමැතිතුමාගේ සහ විපක්ෂ නායකතුමාගේ එකඟතාව මත දෙදෙනෙක් පත් කළ යුතුව තිබෙනවා. ඒ දෙදෙනාගෙන් එක් අයෙක් ගරු වමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා -හිටපු කථානායකතුමා- බව ප්‍රකාශ කර තිබෙනවා. ඒ කියන්නේ, විපක්ෂ නායකතුමාගේ සහ අගමැතිතුමාගේ නිර්දේශ මත තමයි එතුමා පත් වී තිබෙන්නේ. අනෙක් සාමාජිකයා හැටියට මම හිතන විධියට ගරු තලතා අතුකෝරල ඇමතිතුමිය තමයි මේ සභාව නියෝජනය කරන්නේ. ඊට අමතරව, ආණ්ඩුවත්, විපක්ෂයත් නියෝජනය නොකරන පක්ෂවලට හිමි පත් වීමක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් නියෝජනය නොකරන පක්ෂවල එකඟතාවෙන් බිමල් රත්නායක අපේ මන්ත්‍රීතුමා ඒකට පත් වී තිබෙනවා. ඒක නිසා ඔබතුමා කියූ පරිදිම ව්‍යවස්ථා සභාව සඳහා අවශ්‍ය වන පාර්ලිමේන්තුව නියෝජනය කරන සාමාජිකයන් හත්දෙනා දැන් පත් වෙලා අවසන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලියුම් දීලාත් ඉවරයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, ලියුම් දීලාත් තිබෙනවා. එහෙම නම් දැන් සිවිල් සංවිධාන නියෝජනය කරන තිදෙනෙක් පත් කර ගැනීමේ අවස්ථාව අපට තිබෙනවා. එය පාර්ලිමේන්තුවේ අනුමැතියට ගත යුතුයි කියලා තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් මේක අනුමත කළායින් පස්සේ, පැය දෙකක් ඇතුළත ඒ ලියුම් මෙහාට එයි. එතකොට හෙට දහවල් 12.00ට ව්‍යවස්ථා සභාව රැස් වෙන්නත් පුළුවන්.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා එක කරුණක් මතු කළා. ඒ තමයි, පොලිස් කොමිසම දීපු තීන්දු ක්‍රියාත්මක කළේ නැහැ කියලා. මම ගරු සභාවට කියනවා, දින 14ක් ඇතුළත ඒ කියපු සෑම නිර්දේශයක්ම ක්‍රියාත්මක කරලා අවසානයි කියලා. පොලිස් කොමිසම මාව දැනුවත් කළා, පොලිස්පතිතුමා ඒක අරන් ගියා කියලා. ඒ කොමිසම මම කැඳෙව්වා. කැඳවලා, දින 14ක් දුන්නා. ඒ ඔක්කෝම අනුමත කරලා, ක්‍රියාත්මක කරලාත් ඉවරයි. ඒ කාරණය ගැනත් මම ගරු සභාව දැනුවත් කරන්න කැමැතියි. අපි මේක මෙතැනින් ඉවර කරමුද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, එක දෙයක් කියන්න මට අවසරයි.

ගරු කථානායකතුමනි, ඔබතුමා මේ වෙලාවේ මූලාසනයේ සිටින එක හොඳයි. අපි ඔක්කෝම එකතු වෙලා තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළේ. ව්‍යවස්ථා සභාවේ කටයුතු ගැන මේ පාර්ලිමේන්තුවට තමයි බලය තිබෙන්නට ඕනෑ කියලා අපි කිව්වා. සමස්තයක් වශයෙන් මේ ව්‍යවස්ථා සභාවේ කටයුතු ගැන පාර්ලිමේන්තුවටයි බලය තිබෙන්නට ඕනෑ. නමුත්, අපට කිසි බලයක් නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සෑම කොමිෂන් සභාවකම වාර්තා ව්‍යවස්ථානුකූලව අවුරුද්දකට සැරයක් ලබාදෙනවා. මාස හයෙන් හයට, මාස තුනෙන් තුනට අපි ඒවායේ කරුණු ඉදිරිපත් කරනවා; ඒ දේවල් කෙරෙනවා. පාර්ලිමේන්තුවෙන් තමයි මේ නියෝජනය දෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එහෙම නොවෙයි නේ, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒක යෝජනා කරන්නේ කොහොමද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමාගේ සභාපතිත්වයෙන් ඒ සභාව රැස් වුණාම, යම් යම් තීරණවලට එළඹෙන්නා වූ කාර්ය ක්‍රමය මොකක්ද, එහිදී ප්‍රතිපත්තිමය වශයෙන් මොන විධියේ ක්‍රියාදාමයක් අනුගමනය කරනවාද කියා අපට මොකක් හෝ දැනුමක් තිබෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කියන්නේ පත් කිරීමේදීද, තීරණද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ හැම දෙයක් ගැනම. ඒ කමිටුවේ හැම කටයුත්තක්ම,- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒවා ස්වාධීන කොමිෂන් සභා. අපි ඒ කටයුතුවලට ඇඟිලි ගහන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, මේකයි මම කියන්නේ.

මේ කමිටුවේ ක්‍රියාකාරිත්වය සිදුවන ආකාරයත්, කමිටුව මොන මොන තීරණ, මොන මොන නිර්ණායක අනුව ගන්නවාද කියාත් පාර්ලිමේන්තුව හැටියට අප දැන ගැනීම අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අවශ්‍ය තීරණ ගන්නවා. තින්දු කියන්නේ; පත් කිරීම් කරනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒවා ගැන පාර්ලිමේන්තුව දන්නේ නැත්නම්, පාර්ලිමේන්තුවට භීතා ගන්න වෙන්නේ තමුන්නාන්සේලා කැමැති තීන්දු ගන්නවා කියායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි. මම ඒ ගැන පැහැදිලි කරන්නම්. ඒ ස්වාධීන කොමිෂන් සභාවලට පවරා තිබෙන වැඩ කටයුතු අධීක්ෂණය කරලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වශයෙන් අපි ඒ ගැන පාර්ලිමේන්තුව දැනුවත් කරනවා. ඒ සෑම දෙයක්ම සම්බන්ධයෙන්ම අපි පාර්ලිමේන්තුව දැනුවත් කරනවා. අපි ස්වාධීනත්වයට හානි වන දෙයක් කරන්නේ නැහැ. ඕනෑ නම් මම තව පැහැදිලි කරන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ඔබතුමා මගේ අයිතිය නැති කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට දිගටම මේ ගැන කියන්න පුළුවන්. ඔබතුමා කරුණු කිව්වාම මම ඒ සම්බන්ධයෙන් පැහැදිලි කළා. [බාධා කිරීමක්] හොඳයි, I take your point.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අපේ ප්‍රශ්නය වෙන මොකක්වත් නොවෙයි. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් මතු කරන්නේ මේ කාරණය තමයි. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පත් කරලා මේ වනවිට අවුරුදු තුනක් වනවා; අවුරුදු තුනක් තිස්සේ එය ක්‍රියාත්මකයි. වාසුදේව නානායක්කාර මැතිතුමාත්, අපි සියලුදෙනාත් අහන්නේ මේකේ රීති සමුදාය මොකක්ද කියන එකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවා තිබෙන්නේ අපේ ජන රජයේ සම්මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව; ඒ නීති අනුවයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒකෙන් කරන පත් කිරීම්වල රීති ටික මොනවාද, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පත් කිරීම් කරන ක්‍රමය ගැන තමයි දැන් අපි දැනුවත් කරන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව තුළ ඒක කළේ නැහැ. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සිවිල් සමාජය මේ අය ඉල්ලා තිබෙනවා; සිවිල් සංවිධාන අනුමත කර තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි අහන්නේ ඒ රීති ටික මොනවාද කියායි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා කියන්නේ මොකක්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටුවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තිබුණේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා යටතේයි. දැන් මේක ස්වාධීනයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ස්වාධීනයි. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තිබුණේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා යටතේයි. ඒකයි වෙනස. [බාධා කිරීම්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කියන කාරණයේ තිබෙන පසුබිම ඉතාම වැදගත්. මොකද, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන වෙලාවේ, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා එතුමාගේ ස්ථාවරයේ තදින් එල්බ සිටියා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය තුළ පාර්ලිමේන්තුවට බහුතරයක් තිබෙන්න ඕනෑය කියා. ඒ සම්බන්ධයෙන් ලොකු විවාදයක් තිබුණා. ඒ විවාදය අවසානයේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතියේ බහුතරය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ලබා ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඊට වඩා වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒක තමයි, මේ ස්වාධීන කොමිෂන් සභාවලට සහ ඉහළ ධුර සඳහා පත් කිරීම් කළාට පස්සේ, එම ඉහළ නිලධාරීන්ගේ ක්‍රියාකාරිත්වයයි, ස්වාධීන කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වයයි,- [බාධා කිරීම්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
අපි අහන්නේ ඒ කාරණය නොවෙයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමා ඉවසා ගෙන පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ.

ඒ ක්‍රියාකාරිත්වය පිළිබඳව පාර්ලිමේන්තුවට තිබෙන අධීක්ෂණ බලය මොකක්ද? ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවට වග කිව යුතුයි කියා අපි කිව්වාට, පාර්ලිමේන්තුවට වග කියන ක්‍රමය නිශ්චිතව නැති බවක් පෙනෙනවා. ඒ කියන්නේ, අපි මෙතැනදී ස්වාධීනත්වය සහ පාර්ලිමේන්තුවට වගකීම කියන එක හරියට බෙදා හදාගෙන නැති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒක හදා ගනිමු.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක හදා ගන්න ඕනෑ. මේ හදා ගැනීමට අපි හැමදෙනාම එකතු වෙලා වැඩ කරමු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි. ව්‍යවස්ථාවේ අඩු පාඩුකම් තිබෙනවා නම්, අපි ඒ ගැන කථා කරමු. මට ප්‍රශ්නයක් නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා මතු කරන කාරණය මොකක්ද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, ඉතාම ගෞරවනීය පුරවැසියෝ තුන්දෙනෙකුගේ නම් තුනක් තමයි මේ ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඇත්තටම මේ සභාවේ කවුරුත් එය පිළිගන්නවා. මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ ඒ තුන්දෙනා ගැන නොවෙයි. [බාධා කිරීමක්] ඔව්. මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ කාරණා දෙකක් සම්බන්ධවයි.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න.

පළමුවන කාරණය මේකයි, ගරු කථානායකතුමනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින් පත් කිරීම් කරමින්, අවුරුදු තුනක් තිස්සේ අපි අත් හදා බැලීමක් කළා. හැබැයි ඒ පත් කිරීම් තුළ, යම් යම් අංශවල ජනතාව බලාපොරොත්තු වූ දේවල් ඉෂ්ට වන්නේ නැති බව අපි දැක්කා. ඒ සම්බන්ධව කාරණා දෙකක් වැදගත් වෙනවා. පළමුවන කාරණය තමයි, පත් කිරීම් කිරීමේදී අවම වශයෙන් සැලකිල්ලට භාජන කළ යුතු නිර්ණායක පද්ධතිය අප හදාගෙන නැහැ කියන එක. [බාධා කිරීම්]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
එකක්වත් නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ නිර්ණායක පද්ධතිය- [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
අන්න ඒක තමයි අපි කිව්වේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, අපට යුතුකමක් තිබෙනවා, අලුත් ව්‍යවස්ථාදායක සභාව පත් වුණාට පසුව, මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුදෙනාගේ සහයෝගය ඇතිව සාකච්ඡා මාර්ගයෙන් එකඟතාවකට ඇවිත් ඒ නිර්ණායක මොනවාද කියා තීරණය කරගන්න. [බාධා කිරීම්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඒක තමයි අපි කියන්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒකට මේ පාර්ලිමේන්තුවේ කවුරුවත් විරුද්ධ වන්නේ නැහැ.

දෙවන කාරණය මේකයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිතුමා පත්වීම් කළාට පසුව, ඒ පත් වන උදවිය -මේ කොමිෂන් සභාවලට පත් වන උදවිය- විශ්‍රාමික අයයි කියා අපි බොහෝ විට දකිනවා. මෙය විශ්‍රාම ගැනීමේ වයස පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. ඒ උදවියට වගකීමක් තිබෙන්න ඕනෑ. මා මුල ඉඳලාම දැරූ මතය තමයි, සමහර කොමිෂන් සභාවලට විශ්‍රාමිකයන් පත් කරලා වැඩක් නැහැය කියන එක, ගරු කථානායකතුමනි. ඒ අයගෙන් සේවයක් ඉෂ්ට වන්නේ නැහැ. [බාධා කිරීම්] ඒ නිසා ඒවාට පත් කරන්න ඕනෑ රාජකාරියේ යෙදී සිටින පොලීසියේ නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, අධිකරණ නිලධාරීන්, සිවිල් සේවයේ නිලධාරීන් වැනි අයයි. මොකද, ඒ අයට වගකීමක් තිබෙනවා, ඒ අයට විනය පද්ධතියක් තිබෙනවා, ඒ අය ආයතන සංග්‍රහයෙන් පාලනය වෙනවා, වැරැද්දක් කළොත් දඩුවම් ලැබෙනවා, වැරැද්දක් කළොත් රස්සාව නැති වෙනවා, pension එක අහිමි වෙනවා. විශ්‍රාමිකයන් ස්වාධීනයි කියා පත් කළාම, ඒ අය කාටවත් වග කියන්නේ නැහැ. ඒ අය මහ ජනතාවගේ මුදලින් ප්‍රතිලාභ ලබමින් කොමිෂන් සභාවල කාලය ගත කරනවා විතරයි. එයින් පලක් වෙන්නේ නැහැ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හරියට හරි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අඩු පාඩු තැන් තිබෙනවා නම්, අපි කථා කරලා ඒ අඩු පාඩු හදා ගනිමු.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
සමහර කොමිෂන් සභා -විශේෂයෙන්ම ජාතික පොලිස් කොමිසම වාගේ ඒවා- සම්බන්ධයෙන් අනාගතයේදී අපි ප්‍රතිපත්ති තීන්දුවක් ගනිමු. දැන් බලන්න, අධිකරණ සේවා කොමිෂන් සභාව දිහා. එය හොඳින් ක්‍රියාත්මක වෙනවා. මොකද, එහි ඉන්නේ දැනට තනතුරු දරන විනිශ්චයකාරවරුන්. ඒ අය අතින් වරදක් වෙන්නේ නැහැ. වරදක් කරන්න හේතුවක් නැහැ. ඒ නිසා කොමිෂන් සභාවල සංයුතිය -composition එක- පිළිබඳව අපි සාකච්ඡා කරලා තීරණයක් ගනිමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි පාර්ලිමේන්තුවේ සිටින සෑම මන්ත්‍රීවරයකුටම අවස්ථාව දීලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩු පාඩුකම් හදා ගනිමු. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න වෙනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ කාරණා ටික ඉදිරි මාස කීපය තුළ හදා ගැනීමේ එකඟතාව මත, කරුණාකර මේ නම් තුන අනුමත කරන්න කියා සියලු මන්ත්‍රීවරුන්ගෙන් මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තව අවස්ථාවක් දෙන්න පුළුවන්ද, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පුළුවන්, පුළුවන්. අවස්ථාවක් දෙන්නම්. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මේ කාරණය ගැන කථා කිරීම දැන් අවසන් කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම මේ කාරණයත් කියන්න කැමැතියි. කාන්තාවන් වෙනුවෙන් අපේ ගරු තලතා අතුකෝරල ඇමතිතුමිය පත් කර තිබෙනවාය කියා අපට ආරංචියක් තිබෙනවා. අපි උදාහරණයක් ලෙස ගනිමු, අග්‍ර විනිශ්චයකාරතුමා පත් කිරීම. එකී පත්කිරීම කරනකොට අධිකරණ අමාත්‍යතුමිය, ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකාවක්. මට එතුමිය ගැන පෞද්ගලිකව කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් මෙය විශාල ප්‍රශ්නයක් වෙනවා. මොකද, බැඳීම් පිළිබඳව යම් ගැටුමක් ඇති වෙන්න පුළුවන්.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
අග්‍ර විනිශ්චයකාරතුමා පත් කිරීමේදී විතරක් නොවෙයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍ර විනිශ්චයකාරතුමා විතරක් නොවෙයි, ඉහළ විනිශ්චයකාරවරුන් සියලුදෙනා සම්බන්ධයෙන් එහෙම වෙන්න

පුළුවන්. කාන්තාවක් විධියට එතුමිය පත් කිරීම ගැන අපට කිසි ගැටලුවක් නැහැ. හැබැයි එතුමිය අධිකරණ අමාත්‍යතුමිය වන නිසා Conflict of interest ඇති වෙන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීට ඉස්සරත් අධිකරණ අමාත්‍යවරු එහි සිටියා. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාත් සිටියා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ අවස්ථාවේදී වෙනස් කරන්න පුළුවන්- [බාධා කිරීම්] ඒ ගැන කථා කරමු.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, එය පැහැදිලි කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම කියන්නේ, - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමාට පැහැදිලි කරන්න ඉඩ දෙන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, එතුමා නැඟූ ඒ තර්කයේ කිසි හරයක් නැහැ. මොකද ඒවා, ඒ ඒ පක්ෂවලින් ඒවායේ නායකවරුන් ඉදිරිපත් කරන නම්. ඒ උද්වේග දරන අමාත්‍යාංශය නොවෙයි වැදගත්. සමහර විට, පොලීසිය භාර ඇමතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඉන්න පුළුවන්. එහෙම නැතිනම්, අධිකරණ ඇමති ඉන්න පුළුවන්. වෙනත් ඇමතිවරයකු ඉන්නත් පුළුවන්. අධිකරණ විනිශ්චයකාරවරුන් පත් කිරීමේ ක්‍රියාදාමයේදී අධිකරණ ඇමතිට කිසිම වගකීමක් - role එකක්- නැහැ. මොකක්ද තිබෙන වගකීම? [බාධා කිරීම්] අධිකරණ ඇමතිට කිසිම දෙයක් කරන්න බැහැ, එකී පත් කිරීමේදී. [බාධා කිරීම්] කොහේද තිබෙන්නේ- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. [බාධා කිරීම්] Order, please! දිවා භෝජන විවේකය ගන්නේ නැතිව අපි සභාවේ කටයුතු පවත්වාගෙන යමුද, ගරු සභානායකතුමනි? තවත් විනාඩි තුනකින් සභාවේ කටයුතු නතර කරන්න තිබෙනවා, lunch එක සඳහා. දිවා භෝජනය සඳහා සභාවේ කටයුතු නවත්වනවාද? නැත්නම්, දිගටම පවත්වාගෙන යනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, දිවා ආහාර විවේකය නොගෙන සභාවේ කටයුතු කරගෙන යමු කියා මම යෝජනා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සඳහා සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඉහත කාරණය පිළිබඳව සාකච්ඡා කරන්න අපටත් අවස්ථාවක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවස්ථාවක් දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි. එහි ප්‍රශ්නයක් නැහැ. ඒ කාරණය සම්බන්ධයෙන් එකඟයි.

මීළඟට, Item Nos. 2, 3 and 4.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move Item Nos. 2, 3 and 4.

## ආනයන හා අපනයන (පාලන) පනත : නියෝග
## இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் (கட்டுப்பாட்டுச்) சட்டம்: ஒழுங்குவிதிகள்
## IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Development Strategies and International Trade, I move,

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

"That the Regulations made by the Minister of Development Strategies and International Trade under Section 20 read with Section 4(3) and Section 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 relating to Imports and Exports (Control) regulations and published in the Gazette Extraordinary No. 2076/4 of 18th June 2018, which were presented on 17.07.2018, be approved.

(Cabinet approval signified.)"

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*විනා එදුත්තියම්පප්පෙට්ටතු.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*අතන්පිරකු, මාණ්පුමිකු සපානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [මාණ්පුමිකු සෙල්වම් අඩෙක්කලනාතන්] තලෛමෛ වකිත්තාර්කළ්.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Sujeewa Senasinghe, you may start your speech now.

[අ.භා. 12.28]

**ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු සුජීව සේනසිංහ - සර්වදේශ වර්ත්තක ඉරාජාංක අමෛච්චර්)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග දෙකක් ගැන තමයි අද අපට අදහස් දක්වන්න තිබෙන්නේ. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, please continue with your speech. -[*Interruption*.] ගරු මන්ත්‍රීතුමන්ලා වාඩිවෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ අවස්ථාවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සම්බන්ධයෙන් උත්තර දීලා යහ පාලනයේ කාර්ය භාරය හොඳට පෙන්නුම් කළා. යහ පාලන ආණ්ඩුව මේ ආකාරයෙන් ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කිරීම අපි අගය කරන්න ඕනෑ. පසු ගිය ආණ්ඩුවත් සමඟ සංසන්දනය කරපුවාම ජනතාවාදී, ජනතාව වෙනුවෙන් පෙනී සිටින ආණ්ඩුවක් වශයෙන් සියලු දෙනා සමඟ එකහත්වයකට ඇවිල්ලා අපට ඒ තීන්දුව ගන්න ලැබීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඒ මාතෘකාවට පස්සේ එන්නම්. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග දෙකක් සම්බන්ධව තමයි මට අදහස් ඉදිරිපත් කරන්න තිබෙන්නේ. මේක අපේ අමාත්‍යාංශයට කෙළින්ම අදාළ නොවුණත්, ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව අපේ අමාත්‍යාංශය යටතේ එන නිසා මෙම නියෝග දෙක පිළිබඳව මම අදහස් කිහිපයක් දක්වන්න බලාපොරොත්තු වනවා.

විශේෂයෙන්ම වාහන සම්බන්ධයෙන් Euro 4 සහතිකය සම්බන්ධ නියෝගයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. මේකට හේතුව, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම වාහන අනතුරු, බරපතළ අනතුරු, ඒ වාගේම වායු දූෂණය යන මෙන්න මේ දේවල් සම්බන්ධයෙන් සමාජයේ බොහෝ අවධානය යොමු වෙලා තිබීමයි. ඒ නිසා මේ අනතුරු වළක්වා ගැනීම සඳහාත්, ඒ වාගේම වායු දූෂණයෙන් වන අනතුරු වළක්වා ගැනීම සඳහාත්, මේ ආණ්ඩුව විසින් ගත් තවත් හොඳ පියවරක් වශයෙන් මේක හඳුන්වා දෙන්න පුළුවන්. ලෝක ප්‍රමිතියට අනුව Euro 4 සහතිකයක්. අපි මේ අවස්ථාවේ බලාපොරොත්තු වෙනවා, ගෙන්වන සියලු වාහනවලට එය අදාළ කර ගන්න. නමුත් යම් යම් අඩුපාඩුකම් අපට දකින්න පුළුවන්. සමහර වෙලාවට මෙම ප්‍රමිතියට අනුව සමහර රටවලින් වාහන එවීම යම්කිසි ආකාරයකට,-

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිදි) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Three-wheelersවලට මේ Euro 4 සහතිකය අදාළ වෙනවාද, නැද්ද කියාගෙනම ඔබතුමාගේ කථාව කළොත් හොඳයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමනි, Euro 4 සහතිකය අපේ නියෝගවලින් ඉදිරිපත් කළාට සමහර three-wheelersවලට, සමහර පොඩි වාහනවලට, motorbikesවලට, ඒ වාගේම ඉන්දියාවෙන් එන වාහනවලට සමහර වෙලාවට මේ නියෝග ඉදිරිපත් කළ විගසින්ම අනුගමනය නොකරන්න පුළුවන්. දැන් මේවා ලෝකයේ එක එක රටවලින් අනුමත වෙලා,-

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිදි) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මගේ ප්‍රශ්නය ඉන්දියාවෙන් ගෙන්වන වාහනවලට පමණක් ඒ ප්‍රමිතිය අදාළ වෙන්නේ නැහැ කිව්වාම ඔබතුමා ඔය බලාපොරොත්තු වන පරිසර දූෂණය පිළිබඳ ප්‍රශ්නයට එයින් විසඳුමක් ඇති වෙන්නේ නැහැ නේද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
ඉන්දියාවෙන් ගෙන්වන වාහනවලට අදාළ වෙන්නේ නැහැ කියන එක නොවෙයි මම කිව්වේ. ඔබතුමන්ලා හොයන්නේ අපි යම්කිසි නියෝගයක් ගෙනාවාට පස්සේ,- [බාධා කිරීමක්]

ඔබතුමන්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සම්බන්ධයෙන් කථා කළා නේ. අවුරුදු ගණනාවකට නොකරපු දෙයක් නේ මේ ආණ්ඩුව කළේ. එහි අඩුපාඩු තිබෙන්න පුළුවන්.

විශේෂයෙන් වායු දූෂණයට සම්බන්ධ වන Euro 4 එක සම්බන්ධ මේ නියෝග එකපාරට ගෙන ආවාම ගරු මන්ත්‍රීතුමනි, අපට සමහර රටවල් ඒකට අනුගත කර ගන්න බැරි වෙයි. හැබැයි, ඉදිරියේදී අනිවාර්යයෙන්ම අපි එය අදාළ කර ගන්නවා. ඒකෙන් ඉන්දියාව බැහැර කරන්නේ නැහැ. සමහර වෙලාවට ජපානයේ සමහර භාණ්ඩ සම්බන්ධයෙන් Euro 4 සහතිකය නැහැ. සමහර රටවල නැහැ. [බාධා කිරීමක්] Let me explain. ඉඳගෙන පොඩ්ඩක් අහගන්නකෝ. [බාධා කිරීමක්] වැඩක් තිබෙනවාද, නැද්ද කියා බලන්න අහගෙන ඉන්න එපායැ. අදහසක් ප්‍රකාශ කරන්න දෙන්නේ නැත්නම් කොහොමද ඔබතුමන්ලා නියෝගයක් තිබෙනවාද කියා දැන ගන්නේ. මෙහි තිබෙන අපහසුතාවන් ගැන මම කියන්නම්. අපි නියෝග ගෙනෙන එක හොඳ එකක් නේ. නියෝග ගෙනෙනකොට අපට ප්‍රායෝගික ප්‍රශ්නවලට මුහුණපාන්න සිද්ධ වනවා.

දැන් අපි කියනවා, ඔක්කෝම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තමන් ඇඳ සිටින ජානික ඇඳුමේ උඩ button එක දමාගෙන එන්න ඕනෑ කියා. Button එක නොදා එන මන්ත්‍රීවරු සිටිනවා. එතකොට එහෙම එකක් ගෙන ආවාම ඒවා සම්පාදනය කරගන්න ඕනෑ. උදේ එනකොට button එක නැතිවෙන්න පුළුවන්. එතකොට අපි කියන්නේ අනිත් දවසේ එනකොට button එක මහගෙන එන්න ඕනෑ කියා.

නියෝග ගෙනෙනකොට අපට ප්‍රයෝගික අපහසුතාවලට මුහුණපාන්න සිදුවෙනවා. මේ විධියට නියෝග පැනවීම හොඳ දෙයක්. ඒ නියෝග ගෙනෙනකොට, ඔබතුමා ඔය කියන ප්‍රශ්නම අපිත් අපේ නිලධාරි මහත්වරුන්ට ඉදිරිපත් කරනවා. ඉන්දියාව අපටත් කලිනුයි මේ Euro 4 සහතිකය සම්බන්ධ නියෝග අනුගමනය කළේ. නමුත්, එහෙම නැතිව සමහර වාහන අපේ රටට එවන්න හදනවා. නමුත්, අපි මේ නියෝග ශක්තිමත් කර අපි කියනවා, "නැහැ. එහෙම කරන්න බැහැ. ඕනෑ නම් මාසයක් දෙන්නම්." කියා. නොයෙකුත් රටවලට අවුරුදු ගණනක් මේ වෙනුවෙන් අවස්ථාව දුන්නා. ඉදිරියට අපි මේ නියෝග ගෙනැල්ලා, මේ අණ පනත් ශක්තිමත් කර, යම් කිසි කාලයක් දීලා ඒ රටවලුත් මේකට අනුගත කරගන්න එක තමයි අපි කරන්න හදන්නේ. තව මාස තුනකින්, හතරකින් පහකින් අපි බලාපොරොත්තු වනවා සියලුම රටවල් Euro 4 සහතිකය අනුව තමන්ගේ වාහන,-

හැම වාහනයටම අපට සහතිකයක් ගන්න බැහැ, මන්ත්‍රීතුමනි. ඔබතුමා දැන් අපට ඔය කියන කාරණය ඉදිරිපත් කළාම බෙන්ස් ආයතනයෙන් ඇවිල්ලා කිව්වා, එතුමන්ලාට තිබෙන ප්‍රායෝගික අපහසුතා ගැන. Company එකෙන් එන හැම වාහනයටම මේකත් දෙන්න ඕනෑ බව කිව්වා. එතකොට ඒ ගොල්ලන් කිව්වා, "ඒ company එකෙන් දෙන්නේ නැහැ." කියා. එහෙම දෙන්නේ model එකට. මේ වාගේ ප්‍රායෝගික අපහසුතාවලට අපට මුහුණපාන්න සිදු වුණා. ඒවා එකින් එකට සාකච්ඡා කර, මහ ජනතාවට, ඒ වාගේම රටට හොඳ දේ කරන්න අපි හැම වෙලාවේම ඉදිරිපත් වෙනවා.

මෙයින් කෙරෙන කාර්ය භාරය පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරනවා. අපි මෙය හොඳට සැලකිල්ලට ගන්න ඕනෑ.

විශේෂයෙන්ම වායු දූෂණය කෙරෙහි ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා. අපි කාර්මික රටක් නොවෙයි. වාහනවලින් තමයි වායු දූෂණය වැඩියෙන් සිදු වන්නේ. වෙනත් රටවල කර්මාන්තවලිනුයි එහෙම සිදු වන්නේ. අපේ රටේ වායු දූෂණය කර්මාන්තවලට වඩා සියයට හැටක වාගේ ප්‍රමාණයක් වාහනවලින් තමයි සිදු වන්නේ. වායු දූෂණය නිසා තිස්දහසක වැනි පිරිසක් මිය යනවා. මේ කටයුත්තේදී මේවා කෙරෙහි අපි ඔබතුමාගේ අවධානය යොමු කරනවා. හිතලා බලන්න, දැනට ගෙනැවිත් තිබෙන වාහන ටිකට මොකද කරන්නේ? මේ අවුරුද්දේ Euro 4 සහතිකය ගෙනාවත් මීට කලින් ගෙනෙන ලද Euro 4 සහතිකය නැති වාහන කීයක් රටේ තිබෙනවාද? මේ සියලු වාහන පුච්චන්න කියනවාද? එවැනි ප්‍රායෝගික අපහසුතාවලට අපට මුහුණපාන්න සිදු වනවා. මීට පෙර ගෙනෙන ලද වාහන එකක්වත් Euro 4 සහතිකයට අදාළ නොවෙන්න පුළුවන්. Euro 4 සහතිකයට නොවෙයි, ළඟටවත් එන්නේ නැති දුම් කෝච්චි වැනි වාහන තිබෙනවා. ඒ වාහන සම්බන්ධවත් අපි හෙමින් හෙමින් නියෝග ගෙනැල්ලා, දුම් පරීක්ෂාවකට භාජනය කරන්න ඕනෑ. පරණ වාහනවලට දුම් පරීක්ෂාවක් අවශ්‍ය නැහැ. එහෙම ප්‍රශ්නයකුත් තිබෙනවා. අසූගණන්වලින් ඉහළ පරණ වාහන මා ළඟත් තිබෙනවා. ඒ නිසා මම ඒ ගැන දන්නවා. පරණ වාහනවලට දුම් සහතික ඉල්ලන්නේත් නැහැ. ඒ වාගේ ප්‍රායෝගික අපහසුතා මැඩගෙන, ප්‍රායෝගිකව වඩාත්ම හොඳ දේ කරන්න තමයි මේ අවස්ථාවේදී අපි අවධානය යොමු කරන්නේ. මෙහිදී සියලුම නිලධාරි මහත්වරුන්ට අපි ස්තුතිවන්ත වනවා. ඉදිරි අනාගතයේදී හැකිතරම්දුරට පරිසර දූෂණය අවම කරන ආකාරයට කටයුතු කරන්න අදහස් කරනවා.

අපේ ආණ්ඩුවෙන් විශේෂයෙන්ම කොළ ආර්ථිකයක් නිර්මාණය කරන්නයි බලාපොරොත්තු වන්නේ. 2050 වෙද්දී මුළු රටම විදුලි වාහනවලින් අංගසම්පූර්ණ කරන්න බලාපොරොත්තු වනවා. ඒක අමාරු කර්තව්‍යයක්. නමුත්, අපි ඒක කරන්න බලාපොරොත්තු වෙනවා. පරණ වාහන යම් ප්‍රමාණයක් තිබුණත්, ඉදිරියේදී කෝච්චි, ලොරි, කාර්, මෝටර් රථ, motorbikes වැනි සියලුම වාහන සඳහා වැය වන වියදම අඩු වෙනවා. එහෙම වුණාම, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමන්ලා මතු කරන තෙල් ප්‍රශ්නයත් ඉදිරි අනාගතයේදී නිරාකරණය කරගන්න පුළුවන්. ඉදිරියේදී ලෝකයේ සියලුම රටවල් පුනර්ජනනීය බලශක්තිය භාවිත කරන්න පටන් ගත්තාට පසුව ලෝකයේ තෙල් නිපදවන රටවලට විශාල ප්‍රශ්නයක් වෙයි. එයින් අපට හොඳ දෙයක් කරන්න පුළුවන් කියා මම බලාපොරොත්තු වනවා.

ඉදිරියේදී ඔබතුමාට තව ප්‍රායෝගික ප්‍රශ්න පැන නැඟෙයි, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි. බෙන්ස් ආයතනයෙන් තමයි අපට ඔය කාරණයත් මතු කළේ. ඔය වාගේම තව කාරණා අපේ නිලධාරි මහත්වරුන් සමඟ මම සාකච්ඡා කළා. ඒ අය කියනවා ජපානයේ motorbikesවලට ඔය ප්‍රශ්නය තිබෙනවා කියා. Three-wheelersවලට අනිවාර්යයෙන්ම ඔය ප්‍රශ්නය තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේත් two-stroke three -wheelers තමයි ගෙන්නුවේ. මට මතක විධියට ඒක four-stroke කළා. Two-stroke එකේ දුම වැඩියි. අපි කාර්මීකරණය නොවුණු නිසා වායු දූෂණය අවම කරගන්න අපි බලාපොරොත්තු වනවා. චීනයේ නම් වායු දූෂණය නිසා කිලෝමීටර දෙකක්, තුනක්වත් එහාට පෙනෙන්නේ නැහැ. එහෙම ප්‍රශ්නයක් අපට තවම නැහැ. ලංකාවේ ඒ කාර්ය භාරය අපේ නිලධාරි මහත්වරුන්, හිටපු ආණ්ඩුත් හොඳට ඉටු කර තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා තවදුරටත් මේක ශක්තිමත් කර, වායු දූෂණය අවම කරගන්නා ආකාරයේ මේ නියෝග ඉදිරිපත් කර, එයට ඔබතුමන්ලාගේ සහයෝගය ලබාගන්න.

අතුරලියේ අපේ රතන නායක ස්වාමීන් වහන්සේ මේ ගරු සභාවේ ඇති කියා මම හිතනවා. විශේෂයෙන්ම ග්ලයිෆොසේට් සම්බන්ධයෙනුත් නියෝගයක් ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම

[ගරු සුජීව සේනසිංහ මහතා]

තේ සහ රබර්වලට ග්ලයිෆොසේට් නැවත යෙදීම සඳහා ජනාධිපතිතුමා විශේෂ කමිටුවක් පත්කර මේ සම්බන්ධ හොඳ අධ්‍යයනයක් කරනවා.

අපේ ගරුතර අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ මේ සම්බන්ධයෙන් විශාල ලෙස සාකච්ඡා කළා. මම උදේ දැක්කා, උන්වහන්සේ මෙම ගරු සභාවේ සිටිනවා. උන්වහන්සේත් මේ ගැන අදහස් ප්‍රකාශ කරාවි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම කාරණය කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ කටයුත්තක් වුණත්, අපේ අමාත්‍යාංශයට කෙළින්ම අදාළ නොවුණත්, ආනයන අපනයන රෙගුලාසි යටතේ අපට ඉදිරිපත් කරන්නට සිදුවන නිසා, මට මේ ගැන විශේෂ දැනුමක් නොතිබුණත්, මම මේ සම්බන්ධයෙන් යම් අදහසක් ප්‍රකාශ කරන්නම්.

Sir, the Secretary to His Excellency the President has appointed the following members to that Committee: Mr. B. Wijayaratne, Secretary to the Ministry of Agriculture; Dr. Priyantha Weerasinghe, Director, Horticulture Research and Development Institute; Dr. J.A. Sumith, Registrar of Pesticides; Dr. Lakshman Amarasinghe, Retired Director, Field Crop Research and Development Institute; Prof. Buddhi Marambe, Weed Scientist, Faculty of Agriculture, University of Peradeniya; Dr. I. S. B. Abeysinghe. Director, Tea Research Institute; Dr. L. S. K. Hettiarachchi, Additional Director, Tea Research Institute; Dr. G. G. Jayasinghe, Deputy Director (Research), Department of Export Agriculture; Dr. Kumuduni Gunasekara, Agribusiness Specialist, Ministry of Primary Industries; Mr. D.A. Perera, Chairman, Special Council; Prof. Sarath Gunatilake; Prof. Shanthi Mendis and Prof. Ranil Senanayake.

මෙන්න මේ නම් සහිත අයගෙන් යුත් මෙම විශේෂඥ කමිටුව පත් කරලායි, මෙම කමිටුවේ නිර්දේශ සහ මෙම රෙගුලාසි ඉදිරිපත් කරන්නට ඉවහල් වුණේ. මෙය බොහෝ විවාදයට පත් වුණු මාතෘකාවක්. මේ ගැන නිසි දැනුමක් නොමැතිව වුණත් අපි බොහෝ වෙලාවට අදහස් ප්‍රකාශ කරනවා. මටත් මේ සම්බන්ධයෙන් කිසිම දැනුමක් තිබුණේ නැහැ. 'සයිටම්' ප්‍රශ්නය වාගේම බොහෝ අදහස් එහාට මෙහාට යන විශාල කතිකාවතක් බවට මෙය පත් වුණා. ගරු හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් මෙයට එකඟ වෙනවා ඇති. අපි මේ ගැන ගරු ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත්, මීට අදාළව කථා කළ මන්ත්‍රීවරුන්ටත් විශේෂ ස්තුතියක් පුද කරන්නට ඕනෑ. විශේෂයෙන් 'සයිටම්' ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාත් විශාල හඬක් නැඟුවා. අපිට දුන් අවුල් ජාලයක් අපි නිරාකරණය කර දුන්නා. එය බොහොම අමාරු කාර්ය භාරයක්. මම අද සන්තෝෂ වුණා, 'සයිටම්' ප්‍රශ්නය සම්බන්ධයෙන් උත්තර දෙද්දී. ඒ වාගේම තමයි මේ ග්ලයිෆොසේට් ප්‍රශ්නය සම්බන්ධයෙනුත් කරන්නට පුළුවන් හොඳම කතිකාව ඇති කර, ඒ සම්බන්ධයෙන් විශේෂඥ දැනුම පාවිච්චි කර කටයුතු කළා. මම මේ නම් ටික කියෙව්වේ, කෙනෙක් විශේෂයෙන් කියන්නට පුළුවන්, "මේ පරීක්ෂණත් වැරදියි; මේ නිගමනයන් වැරදියි" කියා. මේ අයගේ සුදුසුකම් ටික බැලුවොත්, මේ සඳහා ඉතාමත් සුදුස්සන් මේ විශේෂඥ කමිටුවට පත් කර තිබෙන්නේ කියන එක පෙනෙනවා. ඒ සම්බන්ධයෙන් රටට වග කියන ආකාරයෙන් තීන්දු තීරණ ගැනීමට මෙම විශේෂඥ කමිටුව පත් කිරීම බොහෝදුරට ඉවහල් වුණා.

එහිදී තේ වගාවටත්, රබර් වගාවටත් මේ පොහොර පාවිච්චි කරන්න මාස 36ක කාලයකට අවස්ථාව ලබා දී තිබෙනවා. ඉතිරි වගාවන්වලට කෙසේදැයි කියන එක ගැන මේ අවස්ථාවේදී කියන්න මට එම වාර්තාව පරිශීලනය කරන්නට බැරි වුණා. ඒ සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර ඉතිරි වගාවන් සම්බන්ධයෙන් එම කොමිෂන් සභා වාර්තාවේ මොන නිර්දේශ ඉදිරිපත් කළාද කියන එක ගැන අපට අනාගතයේදී කථා කරන්නට පුළුවන්. මේ වෙනකොට අපට අදාළ වෙන්නේ විශේෂයෙන්ම මේ කාරණායි. නැවතත් මේවා විවාදාත්මක වෙන නිසා මෙම කොමිෂන් සභාව විසින් කළ නිර්දේශත් සඳහන් කළොත් අපට අවුල් සහගත තත්ත්වය නිරාකරණය කර ගන්නට පුළුවන්.

Sir, the Cabinet of Ministers granted approval to implement the following recommendations made by the Committee mentioned in the Cabinet Memorandum dated 08th May, 2018.

"a) Revoke the ban imposed on Glyphosate ONLY for Tea and Rubber Sectors for a period of 36 months, effective from the date that the TRI and RRI design and develop an effective mechanism within one month to ensure strict geographical control of its use and the follow up monitoring mechanism in consultation with Registrar of Pesticides and other relevant regulatory bodies to prevent the misuse and overuse of Glyphosate, especially the illegal transfer of issued Glyphosate to other crop sectors and environmental linkage to the water bodies."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙයින් යෝජනා කර තිබෙන අංග ටික කියෙව්වොත් ඉතිරිව තිබෙන සැක සංකා ටිකත් දුරු කර ගන්නට පුළුවන් වෙයි. එම නිසායි මම මේ කාරණය ගැන වැඩියෙන් අවධානය යොමු කරවන්නේ.

"b) Address the key factors driving the use of Glyphosate and encourage an accelerated programme to ensure adopting Good Agriculture Practices including in filling vacancies and replanting tea field to minimize the opportunity for weed growth and proper ground cover crop options for the rubber sector."

ග්ලයිෆොසේට් ඉදිරියේදී යෙදීම අඩු කරන්නටත් යෝජනා කිහිපයක් මෙහි ඉදිරිපත් කර තිබෙනවා.

"c) Strictly regulate and monitor the volume of imports of herbicides by the ROP, Sri Lanka Customs and conduct surveillance on any commercial leakage of Glyphosate from the tea and rubber sector based on the information provided by the relevant stakeholder organizations."

වෙනත් භෝගවලට මේවා යෙදීම වළක්වාලීම සඳහාත් ඒකට යම් යම් යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා.

"d) Ascertain whether the formulations with adjuvants of the substance in question are approved and used by the developed countries that have acquired stringent regulations and this should be done by the ROP."

ඒ, දියුණු රටවල අනුගමනය කරන ක්‍රමවේදය.

"e) Decide the distribution model for the imported Glyphosate by the state institutions responsible for food crop and plantation crop sectors in consultation with the ROP;

f) Focus on application technologies on safe and effective use of herbicides (pesticides in general) in promulgation with the line Ministries to minimize and possible human and environmental health hazards (The proposed activities could be incorporated in to the Good Agricultural Practices (GAP) programme, which is already implemented by the relevant state institutions."

හොඳ කෘෂි කාර්මික පුරුදු - Good Agricultural Practices - සම්බන්ධයෙනුත් මේකේ අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා. ග්ලයිෆොසේට් භාවිතය අවම කරගන්නා ආකාරය සඳහන් කරලා තිබෙනවා.

"g) Take measures to avoid the use of Glyphosate, including any other herbicides or pesticide within a demarcated area of a registered and certified Organic Farming system/unit, by identifying the micro watersheds that are impacted with the herbicide and pesticide usage;

h) Entrust the Ministry of Science, Technology and Research to be the focal point to coordinate with all the relevant ministries and stakeholders to direct the research institutions and universities to carry out research to minimize the use of herbicides within the 36 months and development cost effective and credible alternative technologies for weed control."

කෘමීන් මර්දනය සඳහා විශේෂයෙන්ම විශ්වවිද්‍යාලවලින් පර්යේෂණ කරලා, පුළුවන් තරම් පරිසරයට හානි නොවන ආකාරයට සහ මනුෂ්‍ය ජීවිතවලට හානි නොවන ආකාරයට ක්‍රමවේදයන් අනුගමනය කරන්නත් උපදෙස් දීලා තිබෙනවා.

"i) At the appropriate stage during the 36 months usage granted for the Tea and Rubber sectors, a review is recommended for other agriculture sectors that may request the use of Glyphosate."

ඒක තමයි මම කිව්වේ. අනෙකුත් භෝගවලටත් මේක අදාළ කරගන්න පුළුවන්. අපට මාස 36ක් මේ සම්බන්ධව පරීක්ෂා කළාට පස්සේ දැන ගන්න පුළුවන්, මේකේ ප්‍රතිවිපාක සහ ප්‍රතිඵල මොන ආකාරයෙන්ද කියලා. ඒක අධ්‍යයනය කළාට පස්සේ අනෙකුත් භෝගවලටත් අපි මේක කොහොමද පාවිච්චි කරන්නේ කියන දේ සම්බන්ධයෙන් අපට කතිකාවක් ගොඩ නහන්න පුළුවන්. ඒ වාගේම, අපට ඒ ගැන අධ්‍යයනයක් ලබා ගන්න පුළුවන් කියන එකත් මෙහිදී ඉතාමත් මැනවින් පැහැදිලි කර දී තිබෙනවා.

"k) Ministry of Agriculture to study and report on usage of Glyphosate of the requirement exists and if not propose alternative measures to control the issues related to weed eradication."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහිදී ග්ලයිෆොසේට් පාවිච්චි නොකර කොහොමද මෙම වල් මර්දනය කරන්නේ කියන එක ගැනත් ඉදිරි අනාගතයේදී සාකච්ඡා කරලා රටට සුදුසුම, ජනතාවට සුදුසුම දේ කරන්න මේ ආණ්ඩුව වගකීමෙන් බැඳී ඉන්නවා. මේ සම්බන්ධයෙන් මහන්සි වෙලා ඉතා දීර්ඝ කාලයක් තුළ විවාදයට තුඩු දුන්නු කාරණා කීපයක් සම්බන්ධයෙන්ම හොඳ ප්‍රතිඵල ලබා දෙන්න පුළුවන් නිගමනවලට එළඹීමට ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත්, අදාළ අමාත්‍යාංශ නිලධාරී මහත්ම මහත්මීන්ටත්, මේ පාර්ලිමේන්තුවේ අද දිනයේ රාජ්‍ය නිලධාරී කුටියේ ඉන්න මහත්ම මහත්මීන්ටත් හැකියාව ලැබීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම, මේ සඳහා ඔවුන්ගේ ශක්තිය යෙදීම සම්බන්ධයෙනුත් ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙකට අදාළ නොවුණත් තේ සම්බන්ධයෙන් පැන නැගිලා තිබෙන සෙස් බද්ද පිළිබඳ ප්‍රශ්නයත් මට ඉදිරිපත් වෙලා තිබුණා. මේ සෙස් බද්ද අපනයනකරුවන්ට විශාල ප්‍රශ්නයක් වෙලා තිබුණා. සෙස් බද්ද අය කිරීම සම්බන්ධයෙන් පැහැදිලි ක්‍රමවේදයක් තිබුණේ නැහැ. මම දන්නේ නැහැ, ඒ ඇයි කියලා. ප්‍රථම වශයෙන් ඒකට මම නිලධාරී මහත්වරුන්ට දොස් කියනවා. කිලෝග්‍රෑමයකට රුපියල් 10ක් හෝ සියයට 2.5ක් කියන ඒ ප්‍රමාණයෙන් වැඩි අගයක් සෙස් බද්ද වශයෙන් අය කරන්න ක්‍රමවේදයක් හදලා තිබුණා.

එය ඉතාමත් සංකීර්ණ ක්‍රමවේදයක්; වෙලාවෙන් වෙලාවට වෙනස් වෙනවා. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් පිළිගන්නවා ඇති, COPE කොමිටියේ අපහසුතාවන් මහ හරින්න ගොඩාක් වෙලාවට මේ ආයතනවලට අපි උපදෙස් දෙන බව. යවන යවන ඇණවුම්වලට සෙස් බද්ද විශාල වශයෙන් වෙනස් වෙනවා. සියයට 2.5 වෙනස් වෙන්න පුළුවන්. රුපියල් 10 ද කියන එක වෙනස් වෙන්න පුළුවන්. ඒකේ වැඩි ප්‍රමාණය කියන එක වෙනස් වෙන්න පුළුවන්. එතකොට dutyවලට ගියාම documentation වෙනස් වෙන්න පුළුවන්. ඒ කරපු වැරැද්ද නිවැරැදි කරලා, කිලෝග්‍රෑම් එකකට රුපියල් 10 කියන එක ප්‍රමාණයකට ගෙනැල්ලා තිබෙනවා. එතකොට තොග වශයෙන් අපනයනය කරන අපනයනකරුවන්ට කිසි ප්‍රශ්නයක් නැහැ. ඔවුන්ගේ ඉල්ලීම පරිදිම රුපියල් 10 දක්වා අපි ඒක නම් කරලා තිබෙනවා. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, අපි දේශපාලනය අතින් පැනිවලට බෙදිලා කොච්චර විවාද කර ගත්තත්, අපි හරි දේට හරියි කියන්න ඕනෑ. මමත් අද මේ සභාවේ ඉඳගෙන අහගෙන හිටියේ විශේෂයෙන්ම ව්‍යවස්ථාදායක සභාව සම්බන්ධයෙන් කියන ලද කතායි. අංග සම්පූර්ණ නොවෙන්න පුළුවන්. හැබැයි, ගිය ආණ්ඩුවෙන් හිතලාවත් නැති කාලයේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ඇතිව අපි කොමිෂන් සභා 9ක් ඇති කළා. ඒ පත් වෙන නිලධාරීන් සම්බන්ධයෙන් අඩු පාඩු තිබෙන්න පුළුවන්. ඒක ව්‍යවස්ථාදායක සභා පනතේ අඩු පාඩුවක් නොවෙයි. සමහරු ඒකේ තිබෙන අඩු පාඩු දැක්වුවා, පාර්ලිමේන්තුවට වග කියන්නේ කොහොමද, පාර්ලිමේන්තුවට වග කියන ක්‍රමවේදයක් නැහැ කියලාත්. අපට ඔය ප්‍රශ්නය COPE කමිටුවෙත් එනවා නේද, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා?

නිලධාරීන්ව කැඳවලා, විමර්ශනය කරලා නිර්දේශ ඉදිරිපත් කළාම සමහර වෙලාවට ඒ නිර්දේශ අනුගමනය කරන්නේ නැහැ. එහිදී අපේ විධානයන් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් අඩු පාඩු තිබෙනවා. හැබැයි, මේ කාරණය සම්බන්ධයෙන් ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත් අපි ස්තුතිවන්ත වනවා. ආණ්ඩුවේ අඩු පාඩු තිබෙනවා, අපි "නැහැ"යි කියන්නේ නැහැ. හැබැයි, මේ දේවල් -යහ පාලනය, ව්‍යවස්ථාදායක සභාවට සාමාජිකයන් පත් කිරීම- සම්බන්ධයෙන් අපි එතුමන්ලාට ස්තුතිවන්ත වන්න ඕනෑ. බලන්න, ඒ කාලයේ පත් කළේ තමන්ගේ සහෝදරයෝ, තමන්ගේ පවුලේ උදවිය. දැන් එහෙම නැතිව විශාල ගෞරවයක් සහිත පුද්ගලයන් පත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කරලා තිබෙනවා. ඔබතුමන්ලා සඳහන් කළ එක කාරණයකුත් හරි. එහි අධිකරණ අමාත්‍යවරිය සිටින විට conflict of interest එකක් ඇති වෙන්න පුළුවන් හැකියාවකුත් තිබෙනවා. අපි ඉදිරියේදී ඒවා නිරාකරණය කර ගන්නට ඕනෑ. නිලධාරීන් සහ සාමාජිකයන් පත් කිරීමේදී conflict of interest

[ගරු සුජීව සේනසිංහ මහතා]

එකක් ඇති නොවන ආකාරයේ ක්‍රමවේදයක් ඇති කර ගන්නට ඕනෑ. අපි ඒ කාරණා කාලයත් සමඟ තව ප්‍රගුණ කරන්නට ඕනෑ. [බාධා කිරීමක්] ඔව්, කථා කරලා ඉවත් කරන්නත් පුළුවන්, පත් නොකර සිටින්නත් පුළුවන්. පත් නොකරන ක්‍රමවේදයකුත් ඉදිරියේදී ඇති කරන්නට ඕනෑ, හරියටම යහ පාලනය-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, your time is over.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Give me one more minute, Sir. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමන්ලා හොඳ කාර්ය භාරයක් කරනවා, බොහෝ දේවල් හරි මහට යොමු කරන්නට. හැබැයි, අපි ඉඳලා හිටලාවත් හොඳ දෙයක් කළාම ස්තුතියක් පිරිනමන්නේ නැහැ. මම හිතන විධියට මේ කාරණා සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ තිබෙන්නේ aggressive type of politics.

SAITM එක සම්බන්ධයෙන් කථා කරනවා නම් කොයි තරම් අවුල් ජාලාවක්ද පසුගිය ආණ්ඩුවෙන් අපට දුන්නේ කියලා ඔබතුමා දන්නවා. කිසිම ප්‍රමිතියකින් තොරව අනුමත කරලා, ලිහන්නට බැරි තරමට ගැට ගහලා තමයි ඒ ප්‍රශ්නය මේ ආණ්ඩුවට භාර දුන්නේ. ඒක ඉතාමත්ම අමාරු, සංකීර්ණ ප්‍රශ්නයක්; දරුවන්ගේ ප්‍රශ්නයක්. ඒ දරුවෝ ඒවාට වැරදි නැහැ. මේ ප්‍රශ්නය විසඳන්නට මේ ආණ්ඩුවෙන් කළ කාර්ය භාරය සම්බන්ධයෙන් මම විශේෂ ස්තුතියක් පිරිනමනවා, අදාළ අමාත්‍යවරුන්ට සහ නිලධාරී මහත්වරුන්ට.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාත් එකඟ වෙනවා ඇති පසුගිය ආණ්ඩුවෙන් ලබා දුන්නු, ලොකු ප්‍රශ්නයක් වෙලා තිබුණු කුණු ප්‍රශ්නය විසඳන්නත් අපි දැන් බොහෝ දුරට කටයුතු කරලා තිබෙනවා කියන කාරණය ගැන. ඒ වාගේම ඔබතුමන්ලා එක්සත් ජාතීන්ගේ සංවිධානය ගැනත් කථා කරනවා. මම දැක්කා ඊයේත් නාලිකා දෙක තුනකම ඒ ගැන කථා කරනවා. කොහෙන් හෝ අවුලක් ඇති කරන්නමයි යම් පිරිසක් උත්සාහ කරන්නේ. කොහොම හරි නැවත යුද්ධයක් ඇති කරන්නමයි යම් පිරිසක් -ජාතිහිතෛෂී කියන පටිට හොරු ටිකක්- උත්සාහ කරන්නේ. පල් හොරු කියන්නේ, පසුගිය කාලයේ regulatory bodiesවල හිටපු සභාපතිවරු. කෝටි ගණන්වලින් වංචා කරලා ඇවිල්ලා ජාතිය ආරක්ෂා කරන්නට උත්සාහ කරන මුවාවෙන් යුද්ධය නැවත ඇති කරන්නේ කොහොමද කියලා බලනවා. ඒ අය "දෙමළ ජනතාවට කිසිම සහනයක් දෙන්න එපා, මෙය කොටිවාදීන් සඳහා ඇති කරන දෙයක්" කියලා හැම වෙලාවේම ජාතිවාදය අවුස්සන්නට උත්සාහ කරනවා. හොර කණ්ඩායම් ලොකුම ආයුධය කර ගන්නේ ජාතිවාදයයි. ඒ අයගේ අරමුණ ජාතිවාදයේ මුවාවෙන් රටේ අස්ථාවර භාවය ඇති කිරීමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කරන හොඳ දේවල් බොහෝ වෙලාවට මාධ්‍යවල පෙන්වන්නෙත් නැහැ. ආණ්ඩුවෙන් කළ හොඳ ටික එක, දෙක, තුන, හතර, පහ කියලා දාලා කරපු වැරදි ටිකත් එක, දෙක, තුන, හතර, පහ කියලා දැම්මොත් අපටත් ලොකු ශක්තියක් එනවා කරපු හොඳ නැවත කරන්නත්, වැරදි නොකරන්නත්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහොම ස්තුතියි, මට ලබා දුන් කාලය සම්බන්ධව. It did not go to waste, Sir. All are good ideas that have been expressed. Thank you very much.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Sunil Handunnetti. You have 28 minutes.

[අ.භා.12.52]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග සම්බන්ධයෙන් අදහස් කිහිපයක් දැක්වීමට මම බලාපොරොත්තු වෙනවා. ඊට පෙර මේ සභාවේ සාකච්ඡා වුණු කාරණාවක් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්නට ඕනෑ. අද උදෑසන ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයකට උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා පිළිතුරු ලබා දීමේදී රජරට විශ්වවිද්‍යාලය පිළිබඳ කාරණාවේදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා වුණු කරුණු පදනමක් ලෙස අරගෙන තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතැනදී සිදු වුණු දේ හරියටම පැහැදිලි කළ යුතුයි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට රජරට විශ්වවිද්‍යාලය 2018 මාර්තු 21වෙනි දා සවස කැඳවුවා. එහිදී 2012, 2013, 2014, 2015 සහ වර්තමාන තත්ත්වය පිළිබඳ සාකච්ඡා කළා. එතැනදී අපට පැහැදිලි වුණු දෙයක් තමයි රජරට විශ්වවිද්‍යාලයේ විශාල ආචාර්ය හිඟයක් තිබෙන බව. වෛද්‍ය පීඨයේ පමණක් ආචාර්යවරුන් 65කගේ පමණ පුරප්පාඩු තිබෙනවා. අනෙකුත් පීඨවලට වඩා වෛද්‍ය පීඨයේ පුරප්පාඩු ප්‍රශ්නය බරපතළයි. එතැනදී සාකච්ඡා වුණු ප්‍රධාන කාරණාවක් තමයි, රජරට, නැඟෙනහිර වාගේ ඈත පළාත්වල තිබෙන විශ්වවිද්‍යාලවල ආචාර්ය, මහාචාර්යවරුන්ට තිබෙන පහසුකම් ප්‍රමාණවත් නොවීම ඔවුන් රඳවා ගන්නට විශාල ගැටලුවක් වෙලා තිබෙන බව. ඒ ආචාර්ය, මහාචාර්යවරුන් වෙනත් විශ්වවිද්‍යාලවලට මාරුවෙලා යාම සහ විදේශගත වීම මේ දරුවන්ට වන විශාල අසාධාරණයක් නිසා, ඒ වෙලාවේ ඒ සඳහා ප්‍රායෝගික උත්තරයක් හැටියට ඒ විශ්වවිද්‍යාලවල ආචාර්ය, මහාචාර්යවරුන්ට රඳවා ගැනීමේ දීමනාවක් ගෙවලා තිබුණා.

හැබැයි, ඒ රඳවා ගැනීමේ දීමනාව ගෙවලා තිබුණේ භාණ්ඩාගාරයේ එකඟතාවකින් හෝ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරවයි. එහිදී අපි සාකච්ඡා කළේ ඒ දීමනාව ගෙවන එක නතර කරන්න කියලා නොවෙයි. මා ඊයේත් උපකුලපතිතුමාට කථා කළා. භාණ්ඩාගාරයේ නිලධාරිනුත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඇවිල්ලා සිටියා. ඔවුන්ද එයට එකඟ වුණා. මොකද, එහෙම නැතුව රජරට විශ්වවිද්‍යාලය වැනි තැනක විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, මහාචාර්යවරුන් තබා ගන්න බැහැ. ඔවුන්ට කොළඹ ඉඳලා එහේට යන්නත් තිබෙනවා. ඔවුන්ට ප්‍රශ්න රාශියක් තිබෙනවා. අපි ඒ ප්‍රශ්න පිළිබඳව කථා කළා. එතැනදී අපි කිව්වේ, ඒ ගෙවීම් සඳහා නිසි අනුමැතිය ලබා ගන්න කියලායි; භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගන්න කියලායි. මා ඒ Minutes සියල්ලම ගෙනාවා. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ලබාදෙන රඳවා ගැනීමේ දීමනාව සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගන්න කියලායි අපි කිව්වේ. භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපි ඉදිරිපත් කරන්න කියලායි කිව්වේ. භාණ්ඩාගාරයේ නිලධාරින්ද එයට එකඟ වුණා. මගේ ළඟ ඒ වාර්තාව තිබෙනවා. 2016 දෙසැම්බර් 31 වනවිට අනුමැතිය නැතිව දීමනා වශයෙන් ගෙවා තිබුණා, රුපියල් 468,39,886ක්. ඕනෑ නම් හදිසියේ තීරණයක් ගන්න පුළුවන්, මේ මුදල ගෙවන්නේ නැහැයි කියලා. ඒ මුදල ගෙවන්නේ නැහැයි කියා

හදිසි තීරණයක් ගැනීම වැළැක්වීම සඳහාම, ඒ ගෙවීම යම් විධියකට ක්‍රමානුකූල කිරීම සඳහාම, ගෙවීමේ අනුමැතිය නිසි පරිදි ලබාදීම සඳහාම තමයි අපි -පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව- ඒ තීරණය ගත්තේ. එහෙම නැතුව දීමනා ගෙවන එක COPE එකෙන් නැවැත්වූවාය කියලා කවුරුන් හෝ උපුටා දක්වන්න හදනවා නම්, උළුප්පන්න හදනවා නම් ඒක වැරැදියි. මා ඊයේ උපකුලපතිතුමාට කථා කළාම එතුමා පිළිගත්තා, අපි සහයෝගයක් ලබා දුන් බව. සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ ඒ අයට වැඩ කරන්න අවශ්‍ය සහයෝගයයි අපි දුන්නේ; උදව්වයි අපි දුන්නේ. එහෙම නැතුව ඒ දීමනා ගෙවන එක නතර කරන්න නොවෙයි අපි කිව්වේ. අමාත්‍යාංශය පැත්තෙන් තමයි දැන් කළ යුත්ත කරන්න තිබෙන්නේ. අමාත්‍යාංශයේ ලේකම්තුමා භාණ්ඩාගාරයත් එක්ක සාකච්ඡා කරලා ඉතා ඉක්මනින් ඒ ගෙවීම් නීත්‍යානුකූල කර දෙන එක, විධිමත් කර දෙන එක තමයි කළ යුත්තේ. එහෙම නැතුව ඒ දීමනා ගෙවීම නවත්වන එක නොවෙයි කළ යුත්තේ. COPE එකේ සමහර තීරණ අරගෙන ගිහින් ඒ නිලධාරින්ට වුවමනා විධියට ගලපා හදනවා, COPE එකෙන් කිව්වාය කියලා. ඒ ගොල්ලෝ හැම එකක්ම නොකර ඉන්න නම් COPE එක පාවිච්චි කරනවා. ඇත්තටම මේක වැරැදියි. COPE එකෙන් කිව්ව නිසා ගෙවන්නේ නැහැයි කියනවා. COPE එකෙන් කිව්ව නිසා නොගෙව්වා නොවෙයි. ඒ ගොල්ලන්ට වියදම් කරන්න ඕනෑ ඒවා වියදම් කරනවා. ගෙවන ඒවා සියල්ලම ගෙවනවා. මා මේ කියන්නේ රජරට විශ්වවිද්‍යාලයට අදාළව නොවෙයි, පොදුවේ සිද්ධ වන දෙයක්.

සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පා පන්දු සම්මේලනය පිළිබඳව සාකච්ඡා කරනකොට ඔබතුමා මැදිහත් වුණා. පා පන්දු සම්මේලනයට අදාළ නීතිය ක්‍රියාත්මක කරන්න, හිටපු සභාපතිවරයාගේ වැරැදිවලට නඩු පවරන්න සියල්ල තීන්දු කරලා, විගණන පරීක්ෂණය කරලා, COPE එක තීරණය කරලා නඩුව පවරන්න ගියාට පස්සේ, නඩුව පැත්තකින් තබා ඒ ගොල්ලෝ නැවත වාර්තා හදනවා, ඒ කරුණු විකෘති කරන්න පුළුවන් විධියට. වංචා, දූෂණ නිවැරැදි කර ගන්න පුළුවන් විධියට වාර්තා හදනවා. එවැනි භාවිතයක් තමයි තිබෙන්නේ. මේක තමයි ඇත්ත.

දැන් ඇමතිතුමාට පුළුවන්, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් අහන්න. ඒ අවස්ථාවේදී ලේකම්තුමා සිටියා, භාණ්ඩාගාරයේ නිලධාරින් සිටියා, උපකුලපතිතුමා සිටියා. මෙතැන ලොකු අවුලක් හදන්නේ නැතුව ඒ ප්‍රශ්නය නිරාකරණය කරලා, ඒ රඳවා ගැනීමේ දීමනාව, ආචාර්යවරුන්ටත්, මහාචාර්යවරුන්ටත් ලබා දෙන්න. ඒ දීමනා ලබා දෙන එක නතර කරන්න කියලා නොවෙයි අපි කිව්වේ. අපි කිව්වේ, භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන ගෙවීම් කරන්න කියලායි. එහෙම නැත්නම්, මේ තිබෙන විධියට ඕනෑ වෙලාවක හදිසියේම ඒ දීමනාව නවත්වන්න පුළුවන්. ඒ නිසා ඒ ගෙවීම් කිරීම නවත්වන්න එපාය කියලායි මා කිව්වේ කියන එක අවධාරණය කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව -

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

දැන් ඔබතුමා කිව්ව කාරණය ඉතාම නිවැරැදියි. බොහෝ විට නිලධාරි මහත්වරුන් COPE එක පාවිච්චි කරනවා, COPE එකේ නිර්දේශ කියලා අවශ්‍ය දේවල් නොකර ඉන්න. COPE එකේ සභාපති වන ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, අනිවාර්යයෙන්ම ඒ නිලධාරින් නැවත කැඳවන්න කියලා. ඒ නිලධාරින් ඒ ගැන වැරැදි විධියට අදහසක් දීලා තිබෙනවා නම්, දිනයක් නියම කරලා ඒ නිලධාරින් කැඳවා, පාර්ලිමේන්තු වරප්‍රසාද යටතේ යම් නියෝගයක් කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිනුම් ප්‍රමිති ක්‍රියාත්මක කිරීම හොඳ දෙයක්. රටක් දියුණු වෙනවාය කියන්නේ සියලු අංශවලින් දියුණු වන එකයි. අපි දන්නවා, වාහනයේ seat belt එක දමාගෙන යන එක අපේ රටේ සාමාන්‍ය සම්ප්‍රදායයක් හැටියට තිබුණේ නැහැයි කියලා. නමුත් ඒ නීතිය ක්‍රියාත්මක කරලා යම් කාලයක් යනකොට අපි හැමදෙනාම, සාමාන්‍ය මිනිසුන් පවා, ඕනෑ කෙනෙක් ආණ්ඩුවේ නීතියක් හැටියට නොවෙයි, තමන්ගේ ආරක්ෂක කටයුත්තක් හැටියට seat belt එක දමාගන්න පුරුදු වුණා. ඒක ස්වාභාවිකව සිද්ධවන පුරුද්දක් බවට පත් කර ගන්න යම් කාලයක් යනවා.

රාජගිරියේ තිබෙන බස් ලේන් එකේ බස් එකට විතරක් යන්න ඉඩ තිබුණාට, පාරේ යන වෙනත් වාහන ඉවත් කරන්න උදේට පොලීසියේ රාළහාමිලා මීටර් 50න් 50 ඉන්න ඕනෑ බව මම දන්නවා. ඒකට වෙනම ඇඳුමක් අන්දපු පොලිස් නිලධාරියෙක් ඉන්නවා, "රථ නියාමක" කියලා. ඔවුන් කරන්නේ දඩ ගහන එක නොවෙයි, බස්වලට යන්න ඉඩ දීලා වෙන වෙන වාහන අයින් කරන එකයි. ඒක ඇත්තටම එහෙම කළ යුතු දෙයක් නොවෙයි. විදේශිකයෙකු එහෙම මේවා දැක්කොත් හිනා වෙනවා. වාහන අයින් කරන්නත් පොලීසියේ කෙනෙක් මීටර් 50න් 50 දාන්න ඕනෑද කියලා අපට ලජ්ජා හිතෙනවා. යම් කාලයක් යනකොට සමහර විට ඒවාට පුරුදු වෙයි. මේ ලේන් එකේ යන්න පුළුවන් බස්වලට විතරයි කියන එක හදිසියට ත්‍රී වීලර් එකේ යන කෙනා, මෝටර් බයිසිකලේ යන කෙනා -අනික් කට්ටිය- තේරුම් ගනිවි. බස් යන්න තිබෙන මාර්ගයේ බස් විතරක් යන්නේ නැත්නම් ඇත්තටම ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්න බැහැ. බස් ලේන් එකේ යන්න බස් රථ රියදුරන් පුරුදු වෙන්නෙත් නැහැ. වෙන වාහනත් මේ ලේන් එකේ යනවා නම් මම විතරක් මේ ලේන් එකේ යන්නේ මොකටද කියලා ඔවුන් කල්පනා කරනවා. ඊට පස්සේ ඒ අයත් අනික් ලේන්වල යනවා. මේ කටයුතුවලට පුරුදු වෙන්න යම් කාලයක් ගත වන බව ඇත්ත.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තටම අද මගේ ප්‍රශ්නය ඒක නොවෙයි. 2018 අගෝස්තු 10 දිනැති අංක 2083/37 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් වනවා, "2018 ජූලි මස 13 වන දින හෝ ඊට පෙර විවෘත කරන ලද ණයවර ලිපි මත ආනයනය කරනු ලබන මෝටර් වාහන සඳහා මෙම විධිවිධාන අදාළ නොවේ. එම ණයවර ලිපි සංශෝධනය නොකළ යුතු අතර අදාළ ආනයනය කරන ලද මෝටර් වාහන 2018 ඔක්තෝබර් මස 31 වන දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කළ යුතුයි" කියලා. අද අපි සාකච්ඡා කරන මේ කාරණය බලාත්මක වනකොට ඔක්තෝබර් 31 වැනි දා වෙන්න කලින් මේ මට්ටමේ නොවන වාහන ආනයනය කරලා තිබුණොත් ඒවා රේගුවෙන් නිදහස් කර ගන්න වනවා. එතැනදී සමහර විට වාහන ආනයනය කරන ආයතනත් යම් ප්‍රමාණයකින් අපහසුතාවට පත් වෙන්න ඉඩ තිබෙනවා. මොකද, එම ගැසට් පත්‍රයේම ඊට කලින් තිබෙන වගන්තියකදී ඔබතුමන්ලා කියනවා, "එහෙම වාහන ගෙනාවොත් ආනයනකරුම නැවත ප්‍රතිඅපනයනය කරන්න ඕනෑ" කියලා. වාහන ආනයනය කරන ආයතන මේ ගැන දැනුවත් වෙලා, ඔක්තෝබර් 31 වැනි දා වනකොට කොච්චර ප්‍රමාණයකින් මේ කටයුතු අවසාන කරන්න පුළුවන්කම තිබේවිද කියන කාරණය සම්බන්ධයෙන් තිබෙන නීතිය පිළිබඳව මම දන්නේ නැහැ. එහෙම නම් මේ පිළිබඳව ප්‍රායෝගිකව හිතලා, තව යම්කිසි සහන කාලයක් දෙන්න අවශ්‍ය වුණොත් ඒ සහන කාලය දෙන්න වෙයි කියලායි මම කියන්නේ. මොකද, වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ තවමත් රඳවාගෙන තිබෙන ඒවා නම්.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගරු ඇමතිතුමනි, පෞද්ගලිකව වාහන ගෙන්වන අයට මුදල් හොයා ගැනීමේ ආදී ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඒ වාගේ ප්‍රශ්න තිබෙන නිසා ඒ අයට යම් සහන කාලයක් දිය යුතුද කියන කාරණය ගැන සැලකිලිමත් වෙන්න කියලා තමයි මට කියන්න තිබෙන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ඔබතුමා කියපු කාරණයත් එක්ක අනිවාර්යයෙන්ම මම එකඟ වනවා. මම හිතන්නේ ඒ අය ණයවර ලිපි ආරම්භ කරලා අවසන් නේ. ඒ නිසා කාලය දීර්ඝ කරන එක නම් අනිවාර්යයෙන්ම කළ යුතුයි. නොවැම්බර්, දෙසැම්බර් වනතුරු කාලය දීර්ඝ කළත් කමක් නැහැ. මොකද, ඒ අය නැවත අලුතින් වාහනයක් ගෙන්වන්නේ නැහැනේ. ඒ නිසා ඒකට ප්‍රායෝගිකව යම්කිසි ප්‍රතිකර්මයක් යෙදිය යුතුයි කියලා මමත් අදහස් කරනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒ ගැන සැලකිලිමත් වෙන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, ඔබතුමා කියපු තේ සම්බන්ධ ප්‍රශ්නය ගත්තොත්, ඇත්තටම තේවල විවිධ මට්ටම්, විවිධ අනුපාත සහ අගයන් තිබුණා. ඒ නිසා ඒක හරිම සංකීර්ණ ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබුණා. තේ අපනයනකරුවන්ගේ සංගමයේ ඉල්ලීම අනුව තමයි, තේ කිලෝවකට රුපියල් 10 කියන පොදු අගය ඇති කළේ. අපි ඒ ගැන නොවෙයි අද සාකච්ඡා කරන්නේ. නමුත් තේ අපනයනය කිරීම මත අය කරන සෙස් අරමුදලක් තිබෙනවා. ඒ සෙස් අරමුදල තිබෙන්නේ තේ මණ්ඩලය යටතේ තේ ප්‍රවර්ධන අරමුදලක් හැටියටයි. මේ මුදල එකතු වෙලා, පසුගිය කාලයේ බිලියන 6කට - මිලියන 6,000කට- වැඩි ප්‍රමාණයේ අරමුදලක් බවට මෙය පත්වෙලා තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. භාණ්ඩාගාරයේ මුදල් අවශ්‍යතාවට මේ අරමුදලින් විශාල මුදල් ප්‍රමාණයක් එකවර ගන්නවාය කියලා වතාවක් මේ පාර්ලිමේන්තුවේදී අපට සාකච්ඡා කරන්න සිදු වුණා. නවීන් දිසානායක ඇමතිතුමා ඒකට විරුද්ධ වෙලා යම්කිසි අර්බුදයකුත් මතු වුණා. මොකද, සෙස් අරමුදලක අභිලාෂයම ඒ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමයි. තේ කර්මාන්තයේ දියුණුවට ඒ මුදල් යෙදවීමයි විය යුත්තේ. අද අපේ රට තේ කර්මාන්තයේ සැලකිය යුතු අර්බුදයක ඉන්න බව අපි දන්නවා. විශේෂයෙන්ම මේ වනකොට ලෝක වෙළෙඳ පොළට විවිධ ප්‍රමාණයෙන් වෙනත් රටවල්වල තේ ආක්‍රමණ ඇවිල්ලා තිබෙනවා. කලින් තිබුණු "Ceylon Tea" කියන මට්ටම අද ඒ ප්‍රමාණයෙන්ම නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. උදාහරණයක් හැටියට ගත්තොත්, 2017 අපේ අපනයන සංයුතිය ඇතුළත කෘෂි කාර්මික නිෂ්පාදන අපනයන ආදායම ඩොලර් මිලියන 2,767ක් තිබුණා. 2017දී මුළු අපනයන ආදායම අපට තිබුණේ ඩොලර් මිලියන 11,360යි.

ඒකෙන් තේ අපනයන ආදායම විධියට තිබෙන්නේ ඩොලර් මිලියන 1,529යි. නමුත් අද වනවිට කෙන්යාව වාගේම වෙනත් අප්‍රිකානු රටවල්, වියට්නාමය හා චීනය පවා තේ වෙළෙඳ පොළේ තමන්ගේ කොටස අත්පත් කර ගැනීමට මැදිහත් වෙලා තිබෙනවා. දැන් අපට සොයා බැලීමට අවශ්‍ය වෙලා තිබෙන්නේ, ලෝක වෙළෙඳ පොළේ අවශ්‍යතාවට අනුව කොච්චර තේ ප්‍රමාණයක් අපේ රටෙන් සපයන්න පුළුවන්ද, ඒ සඳහා රට ඇතුළේ අප කරන නිෂ්පාදනයේ ඵලදායීතාව කොච්චරද, අපි එක තේ අක්කරයකින් දැන් ලබන ඵලදායීතාව වැඩි වෙලා තිබෙනවාද, තේ ෆැක්ටරිවල තත්ත්වය කොහොමද කියන කාරණා පිළිබඳවයි. අපේ සමහර තේ ෆැක්ටරි බොහොම පහළ මට්ටමකයි දැන් තිබෙන්නේ. ඒවා තාක්ෂණය පැත්තෙන් පහළ මට්ටමකයි තිබෙන්නේ. තේ දළු කඩන කෙනා වාගේම තේ ෆැක්ටරි හිමියාත් ආරක්ෂා වෙන්නට ඕනෑ. මොකද, තේ ෆැක්ටරි හිමියන් හරියාකාරව ආරක්ෂා වුණොත් විතරයි, තේ කර්මාන්තය දියුණු වෙන්නේ. නමුත් අපේ ණය නිසා, බැංකු ණය, විදුලි බිල වැඩිවීම හා විවිධ ගාස්තු ගෙවීම් නිසා අද තේ කර්මාන්තය පිරිහිලා තිබෙනවා. අද තේ කර්මාන්තයේ යෙදෙන අයට එය කරගෙන යන්න බැරි මට්ටමට පත් වෙලා තිබෙනවා. එසේ තිබියදී දැන් සෙස් අරමුදල පාවිච්චි කරලා ගෝලීය ප්‍රවර්ධන වැඩ පිළිවෙළක් හදන්න කියලා අපට යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා.

තේ මණ්ඩලය දැන් ගෝලීය ප්‍රවර්ධන වැඩ පිළිවෙළකට ගිහිල්ලා තිබෙනවා. මම දන්නා තරමට තේ අරමුදලේ බිලියන හයක -මිලියන හයදහසක- විතර මුදල එකවර ව්‍යාපෘතියක් හැටියට යොදවන්න ජාත්‍යන්තර සමාගමක් වන ෆීනික්ස් කියන ආයතනය මේ සඳහා පාවිච්චි කරලා තිබෙනවා. ඒ වාගේම ඩෙන්ට්සු කියන ආයතනය මේ සඳහා තෝරාගෙන තිබෙනවා. මෙම මුදල එකවර ව්‍යාපෘතියක් හැටියට යෙදවීමෙන් ඔවුන් බලාපොරොත්තු වෙන්නේ ජාත්‍යන්තර වැඩසටහන්වල වීඩියෝ දර්ශන විකාශනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ තේ ප්‍රවර්ධනය කිරීමයි. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, ශ්‍රී ලංකාව සම්බන්ධව ප්‍රවර්ධන කටයුතු කරන අතරේ, අපි බලාපොරොත්තු නොවුණු ආකාරයට ශ්‍රී ලංකාවේ මොනවා හෝ අලකලංචියක් වුණොත්, අර ප්‍රවර්ධනයත් බිඳ වැටෙන්න පුළුවන්. අනෙක් පැත්තෙන් අපේ තේ පිළිබඳව අනෙක් රටවල ප්‍රවර්ධන කටයුතු කිරීමත් එක්ක, ලෝකයේ අනෙක් රටවල "Ceylon Tea" සඳහා අවශ්‍යතාවක් ඇති වෙනකොට ඒ අවශ්‍යතාව සපයන්න ලංකාවේ තේ නිබෙනවාද? එම අවශ්‍යතාව සපයන්න පහතරට තේ නිෂ්පාදකයින්ට පුළුවන්ද ?

මේ තිබෙන මිලියන හයදහස එකවර වියදම් කරගෙන අපි මොනවා හෝ ප්‍රවර්ධන වැඩසටහන් කරයි තමයි. එතකොට ඒ වැඩසටහන්වලට යන අයටත් ඒකෙන් වාසියක් තිබේවි. ඒ පෞද්ගලික සමාගම් පවා ඒකෙන් මොනවා හෝ උපයා ගනියි. නමුත් ප්‍රශ්නය වෙන්නේ ඒකට ගැළපෙන්න අපි නිෂ්පාදනය වැඩි කරනවාද කියන එක ගැනයි. ඒකට ගැළපෙන්න අපි මොනවාද හදන්නේ? අපේ තේ අපනයනය කිරීම සඳහා සූදානම් කිරීමේ පැත්ත -රටේ පැත්ත- අපි සකස් කරනවාද? දකුණේ -පහතරට- තේ, එහෙම නැත්නම් මධ්‍යම කඳුකරයේ තේ නිෂ්පාදනය අපි කොයි තරම් ප්‍රමාණයකට වර්ධනය කරනවාද? එම ප්‍රවර්ධනය නිසා වෙන්න පුළුවන් දේ තමයි, "Ceylon Tea" හැටියට ලෝක වෙළෙඳ පොළේ තේ අවශ්‍යතාව වැඩි වෙන එක. හැබැයි, අපේ "Ceylon" කියන නාමය පාවිච්චි කරලා වෙනත් රටවල්වල අයට පුළුවන් අපේ තේ කලවම් කරන්න. අපේ තේ යම් ප්‍රමාණයක් කලවම් කළාට පසුව ඒ තුළින් "Ceylon" කියන නාමය පාවිච්චි කරගන්න ඒ ගොල්ලන්ට පුළුවන්. මොකද, අපෙන් පවා blended tea හැටියට අරගෙන තිබෙනවා. එහෙම අපේ තේ කලවම් කරලා හදා ගත්තාට පසුව, "Ceylon" කියන නාමය අපි ප්‍රවර්ධනය කරලා වෙන කාටහරි ආදායම හදා දෙනවා. එහෙම වෙන්න පුළුවන්කම තිබෙනවා.

ඒ නිසා පළමුවෙන්ම කළ යුතුව තිබෙන්නේ සෙස් අරමුදලින් යම් ප්‍රතිශතයක් හෝ පාවිච්චි කරලා කුඩා තේ නිෂ්පාදකයා ශක්තිමත් කරන එකයි; තේ ෆැක්ටරිකරුවන් ශක්තිමත් කරන එකයි; තේ නැවත වගාව ශක්තිමත් කරන එකයි. තේ කර්මාන්තයට යොදවා තිබෙන අක්කරයක ප්‍රමාණයේ ඉඩකඩින් වැඩි ඵලදායීතාවක් ගන්න පුළුවන් විධියට ප්‍රවර්ධනය කරන එකයි. ඒ සඳහා යම් වැඩ පිළිවෙළක ඕනෑකම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම්වල දැන් අනු පවුල් බිහි වෙලා තිබෙනවා. තේ අක්කරයක්-දෙකක් තිබුණ කුඩා තේ වතු හිමියන්ගේ වතුවල අද අනු පවුල් පදිංචිව සිටිනවා. ඒ අයගේ දරුවන් පදිංචි වෙලා සිටින නිසා ඔවුන්ගේ භූමිය පුංචි වෙලා තිබෙනවා. හැබැයි, ඉඩකඩ ප්‍රමාණය කුඩා වුණාත් ඵලදායීතාව වැඩි වෙනවා නම් ඔවුන් ඒ භූමිය තුළ නැවත තේ කර්මාන්තය කරනවා. ඒ සඳහා වන ක්‍රමෝපායන් හඳුන්වා දීමේ ඕනෑකම තිබෙනවා. ඒ සඳහා ආණ්ඩුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හෝ තේ මණ්ඩලය අවශ්‍ය තරමින් මැදිහත්වීමක් කරනවා කියලා මම නම් දකින්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, තේ පර්යේෂණ - tea research - පැත්ත ගැන හොයන්නේම නැහැ. ඒවා කඩා වැටිලා තිබියදී එකවර මේ අරමුදල ආණ්ඩුව ගනියි කියලා බයට හෝ භාණ්ඩාගාරය ගනියි කියලා බයට හෝ මේක අරගෙන ගිහිල්ලා වියදම් කළොත්, ප්‍රතිලාභයක් ලැබෙන්නේ නැහැ. ඒ කාරණය අවධාරණය කළ යුතුව තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඊළඟට, විශේෂයෙන්ම කථා වුණු අනෙක් කාරණාව තමයි අපේ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව. මේ පිළිබඳව මාධ්‍යවල ප්‍රසිද්ධ නොවුණාට, මේ දවස්වල වැඩිපුර සාකච්ඡාවට ලක් වෙන ආයතනයක්. හේතුව රුපියල කඩා වැටීම. ආණ්ඩුව කියන විධියට ඩොලරය ශක්තිමත් වෙලා තිබෙනවා. අපි එය දකින්නේ රුපියල කඩා වැටීම විධියටයි. රුපියල කඩා වැටීම නිසා ප්‍රධාන වශයෙන් සිදු වෙන්නේ අපේ ආනයන වියදම් වැඩි වෙන එකයි.

ආනයන වියදම් වැඩි වෙනවා. ආනයනය වියදම් වැඩි වෙන්නේ, ඩොලර්වලින්. ඩොලර්වලින් වැඩි වෙන මේ ආනයන වියදම, අපි ඩොලර් උපදවා ගන්නේ නැතුව හොයා ගන්නේ කොහෙන්ද? අපේ ආනයන සංයුතිය ඇතුළේ -අපි පිටරටින් ගෙන්වන භාණ්ඩ සංයුතිය ඇතුළේ- සියයට 50ක්ම තිබෙන්නේ අත්‍යවශ්‍ය භාණ්ඩ නම්, අපි මේ රටට ගෙන්වන එක නවත්වන්න බැරි භාණ්ඩ නම්, අපි කියන්නේ ඒක බරපතළ ප්‍රශ්නයක් බවයි. ඔබතුමන්ලා පසු ගිය දවස්වල වාහන ආනයනය මත සියයට 100ක LC open කරද්දී තැන්පතුවක් තියන්න යම් සීමාවක් හැදුවා. වාහන permit සීමා කළා. මන්ත්‍රීවරුන්ට, නිලධාරින්ට වාහන permit සීමා කළා. අපේ ආනයන වියදමෙන් ලංකාවට ගෙන්වන වාහනවලට වියදම් කරන ප්‍රතිශතය කොච්චරද? සියයට 3.7යි. ඔය සීමාව පැනෙව්වත් වාහන ගෙන්වන අය ගෙන්වනවා. සියයට 100ක සීමාවක් යටතේ වුණත් super luxury වාහන ගෙන්වන්න පුළුවන් අය ගෙන්වනවා. නමුත් ඒ ගෙන්වන ඒවා පැත්තකින් තියලා, අපි හිතමු සියලුම වාහන ගෙන්වන එක නැවැත්වුවා කියලා. සියලුම වාහන ගෙන්වන එක නැවැත්වුවා කියලා අපි උපකල්පනය කළත්, එය ආනයන වියදමේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම සියයට 3.7යි.

රජයේ නිලධාරින්ගේ වාහන ගෙන්වන permit එකේ ප්‍රතිශතය ගත්තොත් එය දශම ගණනක් වෙන්නේ. වාහන ගෙන්වීම නැවැත්වුවායි කියන එක ප්‍රචාරාත්මක විධියට මොහොතකට හොඳ වෙන්න පුළුවන්. නමුත් පිට රටට ඇදිලා යන අපේ ඩොලර් ප්‍රමාණය වළක්වන්න ඇත්තටම බැහැ. ඒකේදී අපි බලන්න ඕනෑ, අපේ සංයුතිය ඇතුළේ වැඩිම ආනයනය වියදමක් දරන්නේ මොනවාටද කියලා. සියයට 50ක් විතර ප්‍රමාණයක් වැය වන්නේ, අත්‍යවශ්‍ය භාණ්ඩවලට. මම සංයුතිය ඔබතුමන්ලාට කියන්නම්. 2017 අවුරුද්දේ අත්‍යවශ්‍ය භාණ්ඩ විධියට ආහාර සඳහා වැය වෙනවා, ඩොලර් මිලියන 1,841ක්. ඒකෙන් සහල් ගෙන්වන්න අපි වැය කරලා තිබෙනවා, ඩොලර් මිලියන 301ක්. සීනිවලට ඩොලර් මිලියන 256යි. කිරි නිෂ්පාදනවලට ඩොලර් මිලියන 316යි. ලූනුවලට ඩොලර් මිලියන 123යි. මම මේ ටික ගත්තේ උදාහරණයකට. ආහාර සංයුතිය ඇතුළේ ඩොලර් මිලියන 1,841ක් අපි වියදම් කරනවා. ආනයන වියදමෙන් සියයට 16ක් අපි තෙල්වලට වියදම් කරනවා. මුදලක් හැටියට හිතුවොත් ගිය අවුරුද්දේ අපේ ආනයනය වියදමෙන් ඩොලර් මිලියන 3,428ක් තෙල්වලට වියදම් කරලා තිබෙනවා.

පිට රටට විකුණන රෙදි වාගේම අපි අමුද්‍රව්‍යයක් හැටියට රෙදි ආනයනය කරන ප්‍රමාණයක් තිබෙනවා. ඒ සඳහා ඩොලර් මිලියන 2,724ක් වියදම් වෙනවා. එය ප්‍රතිශතයක් හැටියට ගත්තොත් ආනයන ප්‍රතිශතයෙන් සියයට 13ක්. ඒ කියන්නේ අපි ඇඟලුම් පිටරට යැවීම සඳහා අන්තර් භාණ්ඩයක් හැටියට මෙරටට ගෙන්වන අමුද්‍රව්‍ය සඳහා ආනයන ප්‍රතිශතයෙන් සියයට 13ක් වියදම් කරනවා. අපි යම් අපනයන ආදායමක් ලබනවා තමයි. අපේ අපනයන ආදායම විධියට රෙදිපිළි සහ ඇඟලුම්වලින් ඩොලර් මිලියන 5,031ක් ලබනවා. හැබැයි, අපනයන ආදායම ඩොලර් 5,031ක් කියලා අපි උස්සලා කිව්වාට වැඩක් නැහැ. ඇඟලුම් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ගෙන්වන්න ඩොලර් මිලියන 2,724ක් අපි වියදම් කරලා තිබෙනවා. ඔය අතර වෙනස තමයි අපට එකතු කළ අගය හැටියට ලැබෙන්නේ. හැබැයි, කෘෂි කර්මාන්තයේ අපි එකතු කළ අගය එයට වඩා වැඩියි.

අපි තේ, රබර්, කුරුඳු, ගම්මිරිස්, කෝපි හා මැණික් ඇතුළු අනෙකුත් ද්‍රව්‍යවල එකතු කළ වටිනාකම වැඩි කළෝතින්, ඛනිජ සම්පත්වලට එකතු කළ වටිනාකම වැඩි කළෝතින් අපේ එම ආදායම ඊට වඩා වැඩි වෙනවා. ඒක ඇත්තටම කෙටි කාලීන පැලැස්තරවලින් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. යම් දිගු කාලීන සැලැස්මක් ඇතුළේ කළ යුතු දෙයක්. විශේෂයෙන් මම ඔබතුමන්ලාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවනවා. අන්තර් භාණ්ඩයක් හැටියට රෙදි මහන්න මෙහාට රෙදි ගෙනෙන එකෙන් අපේ ආනයන වියදම වැඩි වෙනවා. තෙල්වලින් සියයට 16ක් වැඩි වෙනවා. තෙල්වලට යන වියදම මම කලින් කිව්වා, ඩොලර් මිලියන 3,428ක් කියලා. ඔබතුමන්ලා වාහන permit සීමා කරන්න දඟලන දැඟලිල්ල වෙනුවට නගරවලට එන වාහනවලට කාලසටහනක් හදන්න. දරුවෝ ඉස්කෝලයට එන වෙලාවට - උදේ 6.30ට, 7.30ට පමණ - නගරයට එන වැලි ලොරි ටික, ටිපර් රථ ටික නවත්වන්න. වැලි ලොරි, ටිපර් රථ හදිසියේ උදේ හයහමාරට එන්න ඕනෑ නැහැ. උදේ පාන්දර ගෙවල් හදන්න පටන් ගන්නේ නැහැ. ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න. කුරුණෑගල නගරයට, නුවර නගරයට, ගාල්ල නගරයට, මාතර නගරයට, කොළඹ නගරයට -මේ ප්‍රධාන නගරවලට- කන්ටේනර් ඇතුළු ලොකු වාහන පැමිණෙන වෙලාව ඔබතුමා හරියට පාලනයක් කළොත්, ඒ සඳහා යම් ක්‍රමවේදයක් හැදුවොත් මේ ඉන්ධන වියදම අඩු කර ගන්න පුළුවන්.

අපේ අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා පාර්ලිමේන්තුවට එන්න ඇවිත්, මේ වාහන තදබදය නිසා එන්න බැරිව, පාරේ යන කෙනෙකුගේ මෝටර් සයිකලයක නැඟලා ආව ලු. එතුමාට මෝටර් සයිකල් එකේ එන්න සිද්ධ වෙන්නේ ඇයි? බලන්නකෝ, උදේ කාලයේ කොච්චර නම් container ප්‍රමාණයක් පාරේ යනවාද කියා. තෙල් බවුසර් කොච්චර යනවාද? ලොකු ලොරි කොච්චර යනවාද? කොළඹ වරාය තිබෙන්නේ කොළඹ නගරය මැද්දේ; හරියටම මර්මස්ථානයේයි. වරායෙන් එළියට යන වාහනවලට කාල සටහනක් -වෙලාවක්- තිබෙනවාද? ප්‍රමිතියක් තිබෙනවාද? මේක තමයි ලොකුම ප්‍රශ්නය. මිනිස්සු රාජකාරි සඳහා යන වෙලාවේම සියලුම බර වාහන ටිකත් පාරේ යනවා. ඔබතුමන්ලා වෙන රටකට ගිහින් බලන්න. අපේ ප්‍රවාහන ඇමතිතුමා ඕනෑ තරම් රටවලට යනවා ඇති නේ. ඒ රටවල ඒ ඒ පාරවල යන අනෙකුත් වාහනවලට වෙනම ප්‍රමිතියක් තිබෙනවා; යා යුතු වෙලාවක් තිබෙනවා; ඒ මිනිසුන් ඒවා අනුගමනය කරනවා. ඔබතුමන්ලා මේ සඳහා මොකක් හෝ ප්‍රචාරන වැඩ සටහනක් හදලා, "මෙහෙම කළොත් අපට ඉන්ධන වියදම මෙච්චර අඩු කරන්න පුළුවන්"

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

කියා ඒ අයට කිව්වොත්, ඒක ඉතාම හොඳ වැඩ පිළිවෙළක් වෙයි. දැන් එවැනි ක්‍රමවේදයක් නැහැ. එහෙම එකක් ඇත්තේම නැති නිසා මම මේ කථා කරන දේවල් එච්චර වැදගත් වෙන එකක් නැහැ. යකඩ මල්ලට ගුල්ලෝ ගැහුවා නම්, හාල් මල්ලට මොකද වුණේ කියා හොයලා වැඩක් නැහැ වාගේ, මහා පරිමාණ වශයෙන් සිද්ධ වන නාස්තිය, විනාශය අස්සේ මේක මොකක්ද කියා හිතෙනවා ඇති. නමුත්, ඔබතුමන්ලා අද රජයේ සේවකයන්ගේ permit එක සීමා කිරීම වාගේ, පුංචි පුංචි පැලැස්තර නම් දමනවා. ඒවා දශම ගණන්වලින් උත්තර ලැබෙන විසඳුම් පමණයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව ඔබතුමා යටතේ තිබෙන ආයතනයක්. කවුද, ඒකේ නිලධාරීන්? ඒ ගොල්ලෝ රාජකාරි කරන්නේ කොහොමද? ඒ ගොල්ලන්ගේ වගකීම් මොනවාද? ඒ ගොල්ලන්ට මොකක් හෝ පැමිණිල්ලක් ආවොත් එය විසඳන්න වැඩ කරනවා මිසක්, ආණ්ඩුවෙන් මේ වගේ ගැසට් එකක් හදලා, "මෙන්න මේක පනවපන්" කියලා නීති හදන්න දුන්නොත් වැඩ කරනවා මිසක්, ආනයනයේ ඇති අවශ්‍යතා මොනවාද, නාස්තිකාර ආනයන කොපමණ එනවාද, ඒවායින් පාලනය කරන්න පුළුවන් මොනවාද කියා සොයා බලා සැලැස්මක් ඉදිරිපත් කර තිබෙනවාද? එතුමන්ලා එහෙම සැලැස්මක් ඉදිරිපත් කරන්න ඕනෑද, නැද්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Sujeewa Senasinghe.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමනි, එවැනි සංකීර්ණ ප්‍රශ්නයක් අධ්‍යයනය කරන්න අවශ්‍ය සම්පත් ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවට නැහැ. ඉතාම සීමාසහිත කාර්ය මණ්ඩලයක් එහි ඉන්නේ. ඔබතුමා කරන යෝජනාව හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. ඒ සඳහා වෙනම අංශයක් ස්ථාපනය කිරීම ඉතාම හොඳයි. ඒක ඉතාම හොඳ යෝජනාවක්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(මාණ්පුමිකු සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
ඇත්තටම ඒක හොඳ යෝජනාවක්. මම කියන්නේ මේකයි. ආහාර සංයුතිය ඇතුළේ, අපි ලංකාවට ගෙන්වන ආහාරවල - අපි ඒකට බාධාවක් කරනවාය කියන එක නොවෙයි මම කියන්නේ.- අවශ්‍යතාව බලන්න ඕනෑ. රේගුවෙන් කොපමණ එනවාද, වරායෙන් කොපමණ එනවාද, ඒවා කොපමණ අවශ්‍යද කියලා බලන්න ඕනෑ. අපි පුංචි කාලයේ ඉස්කෝලේ යනකොට මුලින්ම නිර්මාණය කළ ලොකුම නිර්මාණය මොකක්ද? අපි ගුවන් යානය හැදුවා. ඒ කොහොමද? ඒක තමයි, සරුංගලය. සම්බරතාව මැනලා -ඇඟිල්ලේ තියලා දෙපැත්ත balance වෙනවාද කියා බලලා- ඉරටු දෙක නමලා, සව්කොල ගෙනැල්ලා සරුංගලය හදනවා. ඒක ලස්සන නිර්මාණයක්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(මාණ්පුමිකු සුනිල් හඳුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපේ පුංචි මනසේ මුලින්ම නිර්මාණය වුණේ සරුංගලයයි. හැබැයි, අද මොකද වෙලා තිබෙන්නේ? අද තාත්තාට, අම්මාට වෙලාව නැති නිසා රුපියල් 350ක්, 400ක් වියදම් කරලා කඩෙන් සරුංගලය අරන් දෙනවා. ඒ ආදායම යන්නේ කොහාටද? චීනයටයි. පසුගිය පාසල් නිවාඩු කාලයේ සරුංගල් 10ක් උඩ ඇරියා නම්, ඒවායින් 8ක් චීන සරුංගල්. නැද්ද කියන්නකෝ. චීනයට ඒ ආදායමත් යනවා නේ. අපි තෙල් නිෂ්පාදනය කරන්නේ නැති නිසා තෙල් ගෙන්වන එක සාධාරණයි. හැබැයි, අපට සරුංගලය හදාගන්න බැරිද? වෙසක් කූඩුවක් හදාගන්න බැරිද? මේ අවස්ථාවේ ඉඳලා පලතුරු, එළවලු, හාල්, ලූනු, කොත්තමල්ලි වැනි දේවල්වලට යන වියදම් නතර කරන්න බැරිද? අපි උලු හාල් පවා පිට රටින් ගෙන්වනවා. ඒවාට යන වියදම් නතර කරන්න බැරිද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පිට රටින් උලු ගෙන්වනවා. ඒක ඔබතුමා දන්නවා නේ. ඔබතුමන්ලාගේ පළාත්වල -උතුරු, නැගෙනහිර- උලු වගා කරන්න පුළුවන් ගොවි ජනතාව ඕනෑ තරම් ඉන්නවා. නමුත්, මිලියන ගණනක් දීලා අපි පිට රටින් උලු ගෙන්වනවා. ඒවා සීමා කර ගත්තොත්, මේ වගේ පැලැස්තර විසඳුම්වලට වඩා වැදගත් විසඳුමක් දෙන්න පුළුවන්. එහිදී ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවට ලොකු රාජකාරියක් තිබෙනවා. එම දෙපාර්තමේන්තුව දැන් "ආනයන අපනයන දෙපාර්තමේන්තුව" වෙලායි තිබෙන්නේ. එහි "පාලන" කියා කොටසක් නැහැ. ඒකට දැන් "ආනයන අපනයන දෙපාර්තමේන්තුව" කියලා තමයි කියන්න වෙන්නේ. මේ වගේ ගැසට් ගෙනෙන එක විතරයි ඒ අය කරන්නේ. ගැසට් ගේනවාට වඩා දෙයක් ඒ අය කරන්නේ නැහැ. ඒ නිසා, මේ ආයතනය ආනයන අපනයන දෙපාර්තමේන්තුව වෙලා වැඩක් නැහැ. මේ වෙලාවේ; මේ ආර්ථික අර්බුදය ඉස්සරහා ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවට සැලකිය යුතු රාජකාරියක් තිබෙනවා. ඒ සම්බන්ධව නිසි බලය දීලා, නිසි අධිකාරිත්වය දීලා, නිසි පිරිසක් හදලා මේ වෙලාවේ ඒ වෙනුවෙන් වෙනම කාර්ය සාධන කණ්ඩායමක් -කාර්ය සාධන බලකායක්- හැදුවොත් ඒක වැදගත් කියා යෝජනා කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.19]

**ගරු කබීර් හාෂිම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු කபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. I am happy to speak on the export sector today when two Regulations have been presented and taken up for debate. විශේෂයෙන්ම බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා මෙම ගරු සභාවේ සිටින අවස්ථාවේ කථා කිරීමට ලැබීම සතුටට කාරණාවක්. එතුමා මගේ කථාව අහගෙන ඉඳියි කියා මා විශ්වාස කරනවා.

1977දී, එවකට සිටි ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා යටතේ අපි මේ රටට විවෘත වෙළෙඳ පොළ ප්‍රතිපත්තිය හඳුන්වා දුන්නා. It was called an era of "trade liberalization". 1993 වන විට අපේ රටේ තිබුණු තීරුබදු ව්‍යුහය සංශෝධනය කර, සියයට 10, සියයට 20 සහ සියයට 35 ලෙස තීරු තුනක තීරුබදු ව්‍යුහයක් -three -band tariff structure එකක්- අපි සකස් කළා. අපි එහෙම කළේ එය පහසු කරවන්නයි. ඉන් පසුව, පැවැති රජය වෙනස් වී අලුත් රජයක් බලයට පත් වුණා. ඒ වෙලාවේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය, මහින්ද රාජපක්ෂ මැතිතුමා, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා, බන්දුල ගුණවර්ධන මැතිතුමා ආදී වශයෙන් වූ කණ්ඩායමක් අලුත් ආණ්ඩුවේ ඇමතිවරු හැටියට පත් වුණා. ඒ අවස්ථාවේ එතුමන්ලා කරුණු කාරණා කිහිපයක් පිළිබඳව කථා කරමින්, එක්සත් ජාතික පක්ෂය ගෙන ගිය වැඩ පිළිවෙළ දැඩි ලෙස විවේචනය කරමින්, එදා එක්සත් ජාතික පක්ෂය ගෙන ආ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බව ප්‍රකාශ කරමින්, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉරා දමනවාය කියා ප්‍රතිඥාවක් දුන්නා. ඒ වාගේම අපි හඳුන්වා දුන් විවෘත ආර්ථික ක්‍රමය වහාම නැති කර අලුත් ආර්ථික ක්‍රමයකට අවතීර්ණ වෙනවාය කියාත් සඳහන් කරමින් මේ රටට විශාල බලාපොරොත්තුවක් දුන්නා. නමුත්, එම කරුණු තුනෙන් එකක්වත් සිදු වුණේ නැහැ. එදා එක්සත් ජාතික පක්ෂය හදා දුන් දේශපාලන, ආර්ථික, සමාජ ව්‍යුහයම එම පක්ෂයට පින් සිදු වෙන්න 1994 සිට 2014 වර්ෂය දක්වා දිගටම ක්‍රියාත්මක වුණා. නමුත් අවුලෙන් අවුලට පත් වෙමින් තමයි එය ක්‍රියාත්මක වුණේ. මොකද, එතුමන්ලාට විධිමත් ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. එදා විවෘත ආර්ථිකයට විරුද්ධව ආවෘත ආර්ථිකයක් පිළිබඳ කථා කළාට, ඒක සිදු වුණේ නැහැ. හැම වෙලාවේම දේශ ප්‍රේමීත්වය සහ අපේකම ගැන කථා කරන අයට ඉස්සර වෙලාම පැහැදිලි ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. ඒ ප්‍රතිපත්තිය තිබෙනවා නම්, එම ප්‍රතිපත්තිය තුළ ඕනෑම දෙයක් කරන්න පුළුවන්.

සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා අප ආනයනය කරන ආහාර පිළිබඳව කථා කළා. අපි ආහාර වර්ග ආනයනය කළ යුතු කාල තිබෙනවා. අපට අපනයනය කළ හැකි කාල තිබෙනවා. කජු ලංකාවට ආනයනය කරනවා. ඒ වාගේම කජු ලංකාවෙන් අපනයනයත් කරනවා. යම් යම් කාලවල අපේ නිෂ්පාදනය අඩු වැඩි වෙනවා. පුංචි රටක් හැටියට අපේ න්‍යාය මොකක්ද, අපේ සැලැස්ම මොකක්ද කියන එක අපි ඉස්සර වෙලාම හඳුනා ගන්න ඕනෑ. 1995 සිට 2001 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ව්‍යවහාරික වෙළෙඳ ආනයන තීරුබදු අනුපාතය සියයට 50කින් අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, සියයට 20ට තිබුණු තීරුබදු සමස්තය සියයට 9.4ක අනුපාතයට අඩු වෙලා තිබෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව පැවැති කාලයේ තීරුබදු ප්‍රතිශතය 50කින් අඩු වෙනවා. කෙටියෙන් කියනවා නම්, ආරක්ෂණ තීරුබදු සඵල අනුපාතය - Effective Rate of Protection - ඒ කියන්නේ, දේශීය කර්මාන්ත ආරක්ෂා කරන හෝ ආනයන ආදේශන යන්ත්‍රණයක් බවට පාවිච්චි කළ හැකි ප්‍රධානම යන්ත්‍රණය අඩු වෙලා තිබෙනවා. 1994දී ERP එක -Effective Rate of Protection එක- සියයට 70යි. නමුත් 2001 වන විට එය සියයට 56 දක්වා අඩු වුණා. දේශීය නිෂ්පාදනය ආරක්ෂා කරන්න ඕනෑය කියමින් දැනටත් ඒ පැත්තේ ඉඳගෙන කථා කරන උදවිය බලයේ ඉන්නකොට කටයුතු කර තිබෙන්නේ කොයි ආකාරයටද? එතුමන්ලා දේශ ප්‍රේමීත්වය, දේශීය නිෂ්පාදනය ගැන නම් මහා ලොකුවට කථා කරනවා. ඒ වුණාට එතුමන්ලාගේ කාලයේ තීරුබදු ප්‍රතිශතය අඩු වෙලා තිබෙන හැටි තමයි මම මේ පෙන්වා දෙන්නේ.

මහින්ද රාජපක්ෂ යුගයේ -මම කියන්නේ 2005න් පස්සේ- 2014 වනකොටත් තීරුබදු ඉලක්කය තිබුණේ සියයට 63යි. ඒ කියන්නේ, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එදා මේ රටේ විවෘත ආර්ථිකයක් ඇති කෙරුවාට පසු අපි 1994 මේ රටේ දේශීය නිෂ්පාදනය ආරක්ෂා කරන්න ගත්ත පියවර අයින් කර කටයුතු කර තිබෙන බව පැහැදිලිව පෙනී යනවා. එපමණක් නොවෙයි. 2005 සිට 2014 දක්වා වූ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩු කාලයේ ගජ මිතුරන්ට, තමන් දන්නා හඳුනන අයට, ඥාතීන් ඇතුළු පවුලේ අයට තීරු බදු ඉවත්කර, බදු සහන දීලා ඕනෑ තරම් දේවල් ගෙනෙන්න දුන්නා. එක කාලයක එතනෝල් ගෙනාවා. එක කාලයක බල්ලන්ට දෙන කෑම ගෙනාවා. මේ වාගේ තමයි එදා ප්‍රතිපත්තියක් නැතිව මේ රට පාලනය කළේ. අද අපට මේ තත්ත්වයට පත් වෙන්න ඒ කාරණාත් හේතුවක් වෙලා තිබෙනවා. ඒ අවිධිමත් වැඩ පිළිවෙළ දේශීය කර්මාන්තවලට, දේශීය නිෂ්පාදනවලට බලපෑවා. කෙසේ වුවත්, මේ සම්බන්ධයෙන් යම්කිසි ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න ඕනෑ. ආනයන ආදේශන ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා නම් ඒ ප්‍රතිපත්තියම අනුගමනය කරන්න ඕනෑ. අපි විවෘත ආර්ථික ප්‍රතිපත්තිය විශ්වාස කළා. අපි වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයක් විශ්වාස කළා. එහිදී අපි යම් යම් තීරණ ගත්තා. නමුත්, හැම වෙලාවේම මේ රටට ආවේණිකව අපි ඒවා ක්‍රියාත්මක කරන්න කටයුතු කළා. අපි යුද්ධයෙන් පසු - post-war - ගත්තොත්, the post war growth was very impressive, but just for a year or two - ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා මා සමඟ එකඟ වේවිද කියා මා දන්නේ නැහැ. 2009 යුද්ධය අවසන් වුණාට පස්සෙ තමයි අපට මේ රට වෙනස් කරන්න හොඳම අවස්ථාව ආවේ. 2010, 2011, 2012 වන තුරු අපේ ආර්ථික වර්ධන වේගය වැඩි වුණා. ඒක ඇත්ත. මොකද, 2010 වනකොට සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් තිබුණා. 2012 වනකොට ඒක සියයට 6.4කට වැටුණා. 2013, 2014 වනකොට සියයට 4ට වාගේ අඩු වුණා. එතැනදීත් මොකක්ද වුණේ? අපි ස්ථීර නිෂ්පාදිත පදනම හදා ගත්තේ නැහැ. මොකද, පශ්චාත් යුද සමය තුළ ආර්ථික වර්ධනයට රුකුලක් වූ ප්‍රධාන අංශ දෙකක් තිබුණා. එකක් ඉදි කිරීම් අංශය. අනෙක, සේවා අංශය. ඉදිකිරීම් සහ සේවාවන් ගත්තාම ඒවා දේශීය නිෂ්පාදනයට ස්ථීර වශයෙන් පදනමක් හදන ක්ෂේත්‍ර දෙකක් නොවෙයි. ඒ නිසා ඉදිකිරීම් සහ සේවා අංශ දෙකම ඒ කාලයේ ආනයන මත පදනම් වූ අංශ දෙකක් හැටියටයි මා දකින්නේ. The share of the economy of these two sectors is huge. සමස්ත ආර්ථිකයේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම සේවාවන් හා ඉදිකිරීම් සියයට 16යි. The growth in both these sectors are heavily import-dependent. It turns out that access to imported raw materials was a major factor in the growth of the construction industry. In the three years between 2010-2012, the importation of construction material has quadrupled in quantity and value. So, basically, that, in a sense, drove the economy, but it was import-driven. The growth was import-driven, not production-driven. So, that was one of the problems.

Services in import trade relates to retail and wholesale of a whole lot of imported consumer goods.

යුද්ධයෙන් පසු 2010, 2011 වර්ෂ තුළ සේවාවන් - services - වැඩි වුණා කිව්වාට ඒ වර්ෂ දෙකේම පරිභෝජන භාණ්ඩ - consumer goods - ආනයනය සියයට 130කින් වැඩි වුණා. එතකොට නිකමට හිතන්න, අපේ නිෂ්පාදනයට මොකද වුණේ කියා. අපේ තරගකාරීත්වය ශක්තිමත් කරන්න, අපේ දේශීය නිෂ්පාදනය ශක්තිමත් කරන්න හොඳම වෙලාව වුණේ ඒ කාලයයි. ඒ වෙනුවෙන් විදේශ රටවලින් බඩු භාණ්ඩ ආනයනය කරන්න අපි වෙළෙඳ පොළ විවෘත කර දුන්නා. ඒ දවස්වල චීනයෙන් පුළුන්, වෙසක් කූඩු, වෙස් මුහුණු ගෙන්වූවා වාගේම ඕස්ට්‍රේලියාවෙන් මස් වර්ග, මැලේසියාවෙන් නූඩ්ල්ස් ඒ හැම

[ගරු කබීර් හාෂිම් මහතා]

එකක්ම ගෙනෙන්න පටන් ගත්තා. මේක අපට ප්‍රශ්නයක් වුණා. 1994 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ අපනයන වාර්තාව ගත්තාම පැහැදිලිව පෙනී යනවා, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට අපි සියයට 35ක අපනයනයක් සකස් කර තිබුණු බව. ඒක ඉහළම ඉලක්කයක්. සාමාන්‍යයෙන් ලෝකයේ ඕනෑම රටක් සමඟ සසඳා බලනකොට අපි ඉහළම තැනකයි හිටියේ. නමුත්, 2012 වනකොට මොකද වුණේ? 2012 වනකොට අපනයනය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට සියයට 16.8කට අඩු වෙලා තිබුණා.

අපි 2015 වර්ෂයේදී තමයි මේ රට භාර ගන්නේ. 2014 වෙනකොට අපේ අපනයනය සියයට 12කට අඩු වෙලා තිබුණා. ඒ කියන්නේ අපේ අපනයන වටිනාකම ඩොලර් මිලියන 11යි. Since May 2012, exports declined not only as a share of GDP, but also in absolute value. ඒ කියන්නේ, අපනයනයේ නිර්පේක්ෂිත වටිනාකම ඒ කාල පරිච්ඡේදය තුළ වැටෙන්න පටන් ගත්තා. ගෝලීය අපනයනය සමඟ ලාංකික අපනයනය සංසන්දනය කිරීමේදී ලාංකික අපනයනය ලෝක අපනයන ප්‍රතිශතයක් ලෙස 2004දී අඩු වුණා. 2004දී ලාංකික අපනයනය ලෝක අපනයන ප්‍රතිශතයක් ලෙස දශම 08යි. ඒක 2012 වන විට දශම 05ට අඩු වුණා.

Trade to GDP ratio in 2004 was 88 per cent. But, trade to GDP ratio in 2014 had come down to 48 per cent. So, you can imagine how we have fallen. A country such as ours, as small as ours, has to depend on trade. If you take the Singapore export revenue, Singapore, as a small island country without any natural resources has US Dollars 480 billion. But, Sri Lanka is still at US Dollars 15 billion. We have a long way to go. We have to think about being in national policies; to think on one line to whichever party we belong. Since 2015, we have tried to do an export push, we have tried to increase it. I must say, by 2014, exports as a percentage of GDP was only 11 per cent, at its lowest. Our target was 35 per cent. We want to go back to 35 per cent of GDP. I am happy to say and I must thank the Minister, the Hon. Malik Samarawickrama and his able State Minister, the Hon. Sujeewa Senasinghe, they have pushed, in 2017, exports to grow up to US Dollars 17 billion which is 18 per cent of GDP. So, now we are moving forward slowly, but steadily. But, I think, we have a long way to go. Actually, the Hon. Malik Samarawickrama should be appreciated for the hard work he has done.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
I am finishing. He has come up with a national export strategy. That is what we need. We need a strategy first, any government needs that, and this national export strategy looks at a few things. One is, to focus on diversification of products and markets which is very important. බන්දුල ගුණවර්ධන මැතිතුමා පිළිගනියි, අපි එක කාලයක වැවිලි කර්මාන්තයක හිටියා කියා. ඊට පසු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ නිදහස් වෙළෙඳ කලාපයෙන් අපි නිෂ්පාදන භාණ්ඩ හදන්න පටන් ගත්තා. ඊට පසුව, ප්‍රේමදාස මැතිතුමා ඇඟලුම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වෙනසක් කළා. එයින් පසුව අපේ නිෂ්පාදන පද්ධතිය වැඩි වෙලා නැහැ. අපි මේ ඉන්නේ එකම තැනකයි.

තවමත් අපේ අපනයනවලින් සියයට 60ක් විතර garments, තේ සහ රබර්වලිනුයි තිබෙන්නේ. ඒක වෙනස් කරන්න ඕනෑ. පසුගිය අවුරුදු 22ක කාල පරිච්ඡේදය තුළ ඒක වෙනස් වුණේ නැහැ. අපි ඒක වෙනස් කරන්න ඕනෑ.

Secondly, focus on innovation and quality improvement to break into new markets, because if we do not diversify and if we do not have innovation, then we cannot move forward.

Thirdly, address policy and regulatory bottlenecks to drive exports forward. That is why it is taking time. So, we need policy changes.

Finally, I would like to say that the GSP Plus was a great victory. A lot of people do not understand what the Hon. Prime Minister did. He should be respected for the great job he did because GSP Plus brought duty reductions on 6000 plus tariff lines. It also brought in US Dollars 480 million increase in exports to the EU. For example, apparel duties came down from 9.6 per cent to zero. Sea food duties came down from 28 per cent to zero. Fresh processed fruits and vegetable duties came down from 12.5 per cent to zero. Porcelain and ceramic duties came down from 8.4 per cent to zero. Like this, there was a huge win which most people in the country do not really even appreciate.

The world market for exports is heavily concentrated on a few countries. According to the trade map of the International Trade Centre in 2016, there were 228 trading nations that imported goods to the combined value of US Dollars 16 trillion. Five countries alone accounted for 38 per cent of total world imports in 2016. Just five countries! China is the world's second largest importer and India is moving up as a major importer and as an important market for exporters. In fact, it is the fourteenth largest in the world. Their imports have increased sevenfold between 2001 and 2017. They imported around US Dollars 50 billion but now they are importing up to US Dollars 350 billion. Their world's share has increased.

Our neighbour is one of the largest countries and one of the largest markets in the world. So, when we enter into a Free Trade Agreement with them which is advantageous to us, some people think we are committing suicide. But, this is the way to go. Our main export markets are still USA, the UK and India. we have not been able to tap Japan, China, South Korea or Hong Kong. Sri Lanka has to move into these countries because we need to diversify our products. Only then, will Sri Lanka be strong in its export diversification.

I would like to therefore, at this moment, say that the Hon. Malik Samarawickrama has steered his export drive in the proper direction. But, we need to become more

competitive. It is not only through depreciation or devaluing, which is a natural phenomena, but we have to have production costs coming down and we have to look stronger, we have to diversify, we need to have technology and innovation. Those are the new challenges.

At this moment, I would like to thank the Hon. Minister and his State Minister for the good job they have done. Thank you.

[අ.භා.1.35]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ උගත් මිත්‍ර කබීර් හාෂිම් මැතිතුමාගේ කථාවට පිළිතුරු කථාවක් කරන්න තිබෙනවා නම් ඇත්තටම හොඳයි. කබීර් හාෂිම් ඇමතිතුමනි, ඔබතුමා ඔය කියපු කථාව, පක්ෂය වෙනුවෙන්, පොඩි පොතක් විධියට ලියන්න කියලා මම ඔබතුමාට ආරාධනය කරනවා. ඒකට උත්තර පොත මම ලියන්නම්. අපි දෙන්නා ඒ වගකීම ඉෂ්ට කරමු.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මම ඔබතුමාට disturb කරන්න කැමැති නැහැ. ඔබතුමා හොඳයි පොත් ලිය ලියා ඉන්න. ඔබතුමා පොත් ලියන්න, අපි වැඩ කරන්නම්.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

නැහැ. ඔබතුමා කරපු වැඩ ටික කියන්නයි මම මේ හදන්නේ. ඔබතුමා උගත් මිත්‍රයෙක් නිසායි මම කිව්වේ. වෙන කෙනෙකුට නම් මම එවැනි යෝජනාවක් කරන්නේ නැහැ. ආර්ථික විද්‍යාත්මකව යමක් කියන නිසාත්, ඒක විෂයයක් ලෙස උගන්වලා තිබෙන නිසාත් ඔබතුමා න්‍යායාත්මකව පොතක් ලියන්න; ඊට පසු මම ඒකට උත්තරයක් ලියන්නම් කියලායි කිව්වේ. සාපේක්ෂව පොඩි ඇගයීමක් කරලායි කිව්වේ. ඉතින්, ඒක තේරුණේත් ඔය විධියට නම්, රටට වෙන්නේ මොකක්ද කියන එක හිතා ගන්න පුළුවන් නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම සුජීව සේනසිංහ මැතිතුමාගෙනුත් ඇහුවේ මේ ගැනයි. මේ ගෙනෙන නීතිය තුළ මෙය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අප බොහොම සතුටු වෙනවා. මොකද, පරිසරය පිළිබඳ සංවේදී වෙන ඒකාබද්ධ විපක්ෂයේ අපි, නිරන්තරයෙන්ම රටේ ආර්ථික සංවර්ධනය සමඟ පරිසරය රැක ගැනීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරපු රජයක්. ඒ, මහින්ද රාජපක්ෂ රජය. නමුත් වර්තමානයේදී සිදු වෙලා තිබෙන පරිසර දූෂණයේ ප්‍රධාන අංශයක් තමයි වායු දූෂණය. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ සිට විශාලම පරිසර හානිය සිදු වෙලා තිබෙන්නේ වන වගාවටයි. ඒක නිසා ජනාධිපතිතුමා ප්‍රතිපත්තියක් වශයෙන් කියනවා, "වන වගාව සියයට 28කින් අඩු වෙලා. එය සියයට 35කට වැඩි කිරීම සඳහා සියලු දෙනා කටයුතු කළ යුතුයි" කියලා. ඒක තමයි ජාතික ප්‍රතිපත්තිය. මාධ්‍ය ආයතන, විවිධ ස්වේච්ඡා සංවිධාන, රටට ආදරය කරන මිනිසුන්, හිතවත් අය ගස් වවනවා. දේශීය වශයෙන් පවතින ගස් ටික ඉතිරි කරලා පාරිසරික විනාශයන් වැළැක්වීම සඳහා මහින්ද රාජපක්ෂ රජය කළේ ඒ කාලයේ ආනයනය කරන දැව සඳහා වැට් එක සම්පූර්ණයෙන් ඉවත් කිරීමයි.

"වැට්" එක සම්පූර්ණයෙන් ඉවත් කරලා තිබුණේ ඇයි? ඒ, දේශීය අවශ්‍යතා සඳහා අවශ්‍ය කරන දැව විදේශයන්ගෙන් ආනයනය කිරීම සඳහායි. ආනයනය කරන දැවවල මිල සාපේක්ෂව අඩුයි; විවිධ කාර්යය සඳහා යොදා ගැනීම පහසුයි. එම නිසා දැව විශාල වශයෙන් ආනයනය කළා. මලයාසියාව වාගේ රටවල් අපනයනය සඳහා අක්කර ලක්ෂ ගණනින් දැව වගා කරලා තිබෙනවා. ඒ රටවල් අපනයනය අරමුණ කරගෙන දැව නිෂ්පාදනය කරලා තිබෙන නිසා, අපට ඒ දැව ආනයනය වාසි නිසා, මහින්ද රාජපක්ෂ යුගයේදී දිගටම දැව ආනයනය දිරි ගන්වා තිබුණා. මේ රජය බලයට පත් වෙලා මෑතක් වනතෙක් ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරලා, අගෝස්තු මාසයේ 16වැනි දා ආනයනය කරන දැව සඳහා සියයට 15ක වැට් එකක් පැනෙව්වා. ඒ "වැට්" එක පැනෙව්වාට පස්සේ ආනයනය කරන දැවවල මිල ඉහළ යාමට කරුණු දෙකක් බලපෑවා. එකක් අතිරේකව සියයට 15ක "වැට්" එකක් පැනවෙනවා. අනෙක් කාරණය, ඩොලරයට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය එන්න එන්න වර්ධනය වෙනවා. රුපියල මස්තබාල්දු වනකොට ආනයනය සඳහා ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය වැඩි වන අතර, බදු එයට එකතු වීම තුළින් මිල විශාල ලෙස ඉහළ යාමක් සිද්ධ වනවා. එහි ප්‍රතිඵලයක් ලෙස, දැන් ගස් කැපීම වැඩි වෙනවා; වන විනාශය වැඩි වෙනවා.

පරිසර විනාශයන් නතර කර ගන්න තමුන්නාන්සේලා ක්‍රියා කරනවා කිව්වාට එවැනි ප්‍රතිපත්තිමය එකඟතාවක් තමුන්නාන්සේලා අතර නැහැ. වාහන දුම නිසා සිදු වන පරිසර හානිය නතර කර ගන්න තමුන්නාන්සේලා ක්‍රියා කරනවා කිව්වාට මොකක්ද කළේ? එයට හොඳම උදාහරණය මෙයයි. තමුන්නාන්සේලා පෙට්‍රල් වාහනවල බදු අඩු කරලා, ඉන්ධන පිරිමැස්මක් තිබෙන 'හයිබ්‍රිඩ්' වාහනවලට අය කරන බද්ද වැඩි කළා. බදු වැඩි කළා විතරක් නොවෙයි. මොකක්ද කළේ? එය පැහැදිලි කර දීම පිණිස මම කැමැතියි, 2015 මහ බැංකු වාර්තාවේ මේ කොටස කියවන්න. 2015 මහ බැංකු වාර්තාවේ, 154 පිටුවේ මෙසේ සඳහන් වනවා:

> "... රථවාහන ආනයනය සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ඉන්දියාවෙන් සිදු කරන ලද ආනයන එ.ඡ. ඩොලර් මිලියන 4,268ක් දක්වා සියයට 6.1කින් වර්ධනය විය. 2015 ජනවාරි මාසයේ පැවැති අතුරු අය වැය මඟින් විශේෂයෙන් එන්ජින් ධාරිතාවය 1,000ට අඩු කුඩා රථවාහන සඳහා ආනයන බදු අඩු කිරීම මේ සඳහා හේතු විය. ඒ අනුව, 2015 වසරේ දී ඉන්දියාවේ සිදු කරන ලද මෝටර් රථ, මෝටර් සයිකල් සහ ත්‍රිරෝද රථ ආනයන පිළිවෙළින් සියයට 565.6කින්, සියයට 15.5කින් සහ සියයට 56.3කින් වර්ධනය විය....."

එතකොට ඉන්දියාවෙන් ආනයනය කෙරුණු පරිසර දූෂණයට වැඩියෙන්ම අදාළ වන වාහන ආනයනය 2015 වර්ෂයේදී පමණක් සියයට 600කට වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය වුණා. දැන් මේ ප්‍රතිපත්තිමය ගැටුම බලන්න. මේකයි අපි තේරුම්ගත යුත්තේ. ආණ්ඩුවේ එක කොටසක් ගන්න ප්‍රතිපත්තිමය තීරණ තව කොටසක් දන්නේ නැහැ. දැන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය හිතනවා, එක ක්‍රමයකට. රජය, ජනාධිපතිතුමා සහ අනෙක් පාර්ශ්ව හිතනවා, තව ක්‍රමයකට. එක වරෙක කියනවා, "වකුගඩු රෝගයෙන් මනුස්ස ජීවිත බේරා ගැනීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි ග්ලයිෆොසෙට් තහනම් කරනවා" කියලා. "ග්ලයිෆොසෙට් තහනම් කරනවා" කියන ප්‍රතිපත්ති තීරණය අරගෙන එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරනවා. ඒ තහනම ඉවත් කරලා අද කියනවා, "මාස 36ක් යනතෙක් තේ වගාව සඳහා ග්ලයිෆොසෙට් යොදා ගන්න පුළුවන්" කියලා. - තේ සමඟ රුසියාවට කුරුමිණියෝ යනවා.- එක වෙලාවකට කියනවා, "ඇස්බැස්ටෝස් පිළිකා කාරකයි. ගෙවල්වල වහලයට ඇස්බැස්ටෝස් යෙදීම නතර කරන්න ඕනෑ. ඒ වෙනුවට දේශීය උළු කර්මාන්තය නඟා සිටුවන්න ඕනෑ. සියලුදෙනා සූදානම් වෙන්න. ඒ තහනම වහාම ක්‍රියාත්මක කරනවා" කියලා. ටික

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

දවසක් යනකොට කියනවා, "ඇස්බැස්ටෝස් නිසා පිළිකා හැදෙන්නේ නැහැ. දැන් ඇස්බැස්ටොස් පාවිච්චි කරන්න" කියලා. එක වෙලාවකට, ඇස්බැස්ටෝස් තහනම් කරනවා; තව වෙලාවකට ඒ තහනම ඉවත් කරනවා. එක වෙලාවකට, ග්ලයිෆොසෙට් තහනම් කරනවා; තව වෙලාවක ඒ තහනම ඉවත් කරනවා. දැන් ප්‍රතිපත්තියක් නැතිකම ප්‍රතිපත්තියක් වන රටකට අනාගතයක් තිබෙනවාද කියන ප්‍රශ්නයට උත්තරයක් හදා ගන්න එපායැ. ප්‍රතිපත්තියක් නැති වීම ප්‍රතිපත්තියක් වන රටක් ඉස්සරහට ගෙන යෑමේ ප්‍රශ්නයක් පවතිනවා. ඒ නිසා දැන් යම්කිසි ප්‍රශ්නයකට දේශපාලන වශයෙන් තීන්දුවක් ගන්නකොට බුද්ධිමතුන්ගෙන් කරුණු විමසිය යුතුයි. මේ රටේ විවිධ ක්ෂේත්‍රවල බුද්ධිමතුන් ඉන්නවා. විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය ගත්තොත්, විවිධ දේ පිළිබඳ පර්යේෂණ කරන ආචාර්යවරු, මහාචාර්යවරු විශාල පිරිසක් ඉන්නවා.

දේශපාලනඥයන් නිහතමානී වෙලා, මේ විෂයානුබද්ධ කරුණු පිළිබඳව අප නොදන්නා ක්ෂේත්‍ර ගැන තීන්දු ගැනීමේදී ඔවුන්ට වැඩි ඉඩ ප්‍රස්ථාවක් ලබා දීලා, රට පැත්තේ ඉඳලා රටට ආදරෙන් තීන්දුවක් ගන්නවා නම්, විටින් විට මේ වාගේ අර්බුදයක් මතු වන්නේ නැහැ; ප්‍රතිපත්ති වෙනස් කරන්න වෙන්නේ නැහැ.

උදාහරණයක් වශයෙන් කටුපොල් වගාව ගත හැකියි. ආනයන වියදම් අඩු කරන්න අදාළ වන, ඵලදායිත්වය වැඩි භෝගයක් තිබෙනවා, කටුපොල් කියලා. කටුපොල් වගාව ගැන මත දෙකක් රටේ තිබෙනවා. රංජිත් සියඹලාපිටිය අමාත්‍යවරයා ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම මත, -මම දැක්ක විධියට මම නිවැරදි වෙන්න ඕනෑ.- කෑගල්ල දිස්ත්‍රික්කයේ කටුපොල් වගාව නතර කළා. නතර කරන්නේ, පරිසරයට අහිතකරයි කියලා. දැන් අපේ ප්‍රදේශවලත් සමහර පුද්ගලයන් ඇවිල්ලා අපට කියනවා, "කටුපොල් වගාව නිසා දිය සීරා සියල්ල සිඳී යනවා; ජල උල්පත් නැති වෙනවා; මේක හානිකරයි" කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Will an Hon. Member propose the Hon. Kanaka Herath to the Chair?

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
I propose that the Hon. Kanaka Herath do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. KANAKA HERATH *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
කටුපොල් වගා කිරීම කරනවාද, නැද්ද කියන කාරණය සම්බන්ධයෙන් රජයක් වශයෙන් වැවිලි ක්ෂේත්‍රයට හා ආනයන ක්ෂේත්‍රයට මහ පෙන්වීමක් කරන්න එපා යැ. ඒ අතර පාම් ඔයිල් සඳහා විශාල ජාවාරමක් සිදු වනවා, හැම දවසේම. විශාල තොගයක් ගෙනැල්ලා, මුදල් අමාත්‍යාංශය කොහොම හෝ මේ පාම් ඔයිල්වල බද්ද හිටිහැටියේ වැඩි කරනවා. නැවත හිටි හැටියේ අඩු කරනවා. මේ දෙකම කරනවා කිරිපිටිවලටත්. මහින්ද රාජපක්ෂ යුගයේ කිරිපිටි කිලෝග්‍රෑමයකට රුපියල් 225ක බද්දක් තිබුණා, ඒක රුපියල් දෙකට අඩු කළා. සීනිවලට රුපියල් 30ක බද්දක් තිබුණා, එය සත 25ට අඩු කළා. මේ ගෙන්වන පාම් ඔයිල් වුණත් තොගයක් වුණාම, බද්ද වැඩි කරනවා.

දැන් බලන්න, සීනිවලට අද වෙලා තිබෙන ප්‍රශ්නය. සීනි මෙට්‍රික් ටොන් 65,000ක් ගෙනැල්ලා රට ඇතුළේ තිබුණා. තිබුණු සීනිවල බද්ද හදිසියේ අගෝස්තු මාසයේ වැඩි කළා, රුපියල් 14කින්. එතකොට ඒ අය කිව්වා, "නැහැ, අපි සීනි මිල එලෙසින් වැඩි කරන්නේ නැහැ, රුපියල් 10කින් විතරයි වැඩි කරන්නේ" කියලා. පරණ තොගය මෙට්‍රික් ටොන් 65,000ක් තිබී එක්තරා සමාගමක් විතරක් තනියෙන් කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත මුදලක් හම්බ කර ගත්තා. එහෙම නම් අඩු ගණනේ තිබෙන stock එක ඉවර වන තෙක් හෝ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට පුළුවන්කම තිබුණා, සීනි කිලෝවක උපරිම සිල්ලර මිල රුපියල් 100යි කියලා නියම කරන්න. ඒක කළේ නැහැ, ඒක කරන්නේ නැහැ. ඇයි? ජාවාරම්කරුවන් විසින් තමයි මේ බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීම සඳහා කටයුතු කරන්නේ. ඒ නිසා මේ සීනි ජාවාරම, කිරිපිටි ජාවාරම, පාම් ඔයිල් ජාවාරම ආදී මේ ජාවාරම් කරන්න කරන්න, රටේ ඇත්ත ව්‍යාපාර කරන සාධාරණ ව්‍යාපාරිකයන්ට ව්‍යාපාර ලෝකයේ තරගකාරී ලෙස කටයුතු කරන්න ඉඩක් ලැබෙන්නේත් නැහැ. හිතුවක්කාරී ලෙසයි අලුත් බදු පනවන්නේ. තමන්ට හිතෙන විධියට, හිතෙන හිතෙන පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කරලා තමයි මෝටර් වාහන බදු වෙනස් කරන්නේ. ඉතින් ඒ නිසා මේ කියන ප්‍රගතියක් මේ රටේ විවෘත වෙළෙඳ ආර්ථිකය ඇති කළාය කියලා සිදු වුණේ නැහැ.

අපි ප්‍රශ්නය තේරුම් ගත යුතු වෙනවා. 1977 වසරෙන් පසුව බලයට පත් වුණු මහින්ද රාජපක්ෂ රජයවත්, චන්ද්‍රිකා කුමාරතුංග රජයවත් විවෘත වෙළෙඳ පොළ ප්‍රතිපත්තිය වෙනුවට ආවෘත ආර්ථික ප්‍රතිපත්තියක් හඳුන්වා දෙනවා කියලා කොහේවත් කියලා නැහැ; එහෙම කළේත් නැහැ. මේ විවෘත වෙළෙඳ පොළ ආර්ථිකය වෙනුවට මහින්ද රාජපක්ෂ යුගයේ කළේ, guided market economy. මේ වෙළෙඳ පොළ ක්‍රමය රාජ්‍ය මැදිහත්වීම තුළින් පාලනය කරලා, අපේ රටේ සම්පත් හා අපේ රටේ මිනිස්සු මත විශ්වාසය තියලා, ඒ අයගේ නිෂ්පාදනය වැඩි කර, ආනයන අඩු කර, අපනයනය කරන ප්‍රමාණය වැඩි කර, ගෙවුම් ශේෂය මත තිබෙන පීඩනය අඩු වන විධියේ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් දියත් කිරීම. විවෘත ආර්ථිකය තිබුණත්, ආවෘත ආර්ථිකය තිබුණත්, මොන ආර්ථිකය තිබුණත්, පසුගිය වර්ෂ තිහේ නිදහසින් පසුව ලංකාවට කිසිම වගතුවක් නොවුණේ, මේ රටේ මුහුදු වෙරළෙන් තුනෙන් දෙකක්, මහ පොළොවෙන් තුනෙන් එකක් - උතුරු නැහෙනහිර පළාත්වල- කැඩීම සඳහා වන ත්‍රස්තවාදී ව්‍යාපාරය තිබුණු නිසයි. නිෂ්පාදන හැකියා වක්‍රයට -production possibility curve එකට- වමෙන් පිහිටි ලක්ෂ්‍යයක තමයි ඒ කාලයේ නිෂ්පාදනය තිබුණේ. වර්ග කිලෝමීටර 18,800ක නිෂ්පාදනය ජාතියට එකතු කර ගන්න බැරි වුණා, අවුරුදු 30ක්.

ඒ ප්‍රදේශවල නිෂ්පාදනය පහත වැටුණා. අක්කර දහස් ගණනක් පුරන් වුණා. අපේ කබීර් හාෂිම් ඇමතිතුමාත් ඒ

සම්බන්ධයෙන් දන්නවා ඇති. කුඹුරු යායවල් වැඩ කළේ නැහැ. ඉද්ද ගැහුවා වාගේ තිබුණු ඒ ප්‍රදේශවල වාහන ගමනාගමනයක් තිබුණේත් නැහැ. දකුණේ නිෂ්පාදන උතුරට ගියේ නැහැ. උතුරේ නිෂ්පාදන දකුණට ආවේ නැහැ. ප්‍රභාකරන්ගේ ආණ්ඩුව තිබුණේ. මේ යටතේ මොන විවෘත ආර්ථිකය තිබුණත්, ආයෝජකයෝ කවුරුවත් ආවේ නැහැ. මේ රටේ නිදහසින් පස්සේ යුද්ධය නිම වන තෙක් සමස්ත ආර්ථික ක්‍රියාවලීන්වල ප්‍රතිඵලය වන ජාතික නිෂ්පාදනයේ -රටේ මුළු නිෂ්පාදනයේ- වටිනාකම මොන ආණ්ඩුවටවත්, මොන රාජ්‍ය නායකයෙකුටවත් ඇමෙරිකානු ඩොලර් බිලියන 25කට වඩා වැඩි කරන්න බැරි වුණා. මම අභියෝග කරනවා, ඕනෑම කෙනෙකුට පුළුවන් නම් කියන්න කියලා නිදහස ලැබුණු 1948 වසරේ සිට යුද්ධය නිම කරන තෙක් අපේ ජාතික නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් බිලියන 25ට වඩා වැඩි වුණු වසරක් කියන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
අපි 2009දී යුද්ධය නිම කළා. 2010න් පස්සේ අපි මේ රටේ සංවර්ධනයේ වේගවත්ම යුගය ඇති කරලා 2014 වසරේ ආණ්ඩුව භාර දෙනකොට ඇමෙරිකානු ඩොලර් බිලියන 80 වන තෙක් ලංකාවේ ආර්ථිකය ඉහළට ගෙන ආවා. ලංකාව එතෙක් අඩු ආදායම් ලබන, නොදියුණු, සංවර්ධනය වෙමින් පවතින, දුප්පත් රටක් වශයෙන් වර්ග කරලා තිබුණේ. ජාත්‍යන්තර වශයෙන් ලෝකයේ සියලුම රටවල් ඒක පිළිගත්තා. 2010න් පස්සේ ඇති වුණු මහා පිම්ම නිසා ලංකාව මැදි ආදායම් ලබන රටක් බවට පරිවර්තනය වුණා. ඒ කාර්ය භාරය කරපු ලංකා ඉතිහාසයේ එකම නායකයා මහින්ද රාජපක්ෂ පමණයි කියන එක සංඛ්‍යා දත්ත සහිතව ඔප්පු කරලා තිබෙනවා. ඒක නැහැයි කියන්න කාටවත් බැහැ. නිදහසින් පස්සේ ඩී.එස්. සේනානායක යුගය වෙන්න පුළුවන්; බණ්ඩාරනායක යුගය වෙන්න පුළුවන්; ප්‍රේමදාස යුගය වෙන්න පුළුවන්; ජේ.ආර්. ජයවර්ධන යුගය වෙන්න පුළුවන්, ඒ ඕනෑම යුගයක මේ රටේ සමස්ත නිමැවුමේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 25කට වඩා වැඩි කරන්න කිසිම අවුරුද්දකදී බැරි වුණා. එහෙම වැඩි කළේ මේ අවුරුද්දේය කියලා කාට හරි පෙන්වන්න පුළුවන් නම් පෙන්වන්න. ඒකට හේතුව, ඒ නායකයන්ගේ වැරද්ද නොවෙයි; ප්‍රතිපත්තියේ වැරැද්ද නොවෙයි; මේ රටේ යුද්ධයක් පැවැතීමයි. ඒක නිකම් යුද්ධයක් නොවෙයි. මරාගෙන මැරෙන ත්‍රස්තවාදීන් සිටින, ලේ විලක් බවට පත් වුණු රටක් වශයෙන් තිබුණු මේ රටට නැවත හුස්ම ගන්න අවස්ථාව ලැබුණේ ප්‍රභාකරන් නන්දිකඩාල් කලපුවේදී ඉවර කරලා මේ රටේ සිංහල, මුස්ලිම්, දෙමළ, බර්ගර් කියන සියලු ජාතීන්ට නිදහසේ පාරේ යන්න හා නිෂ්පාදන කටයුතු කරන්න ඉඩ ලැබීමෙන් පසුවයි. ඊට පසුව තමයි ජාතික නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් බිලියන 80ට වැඩි වුණේ. මේ වනකොට සමස්ත අපනයනයේ වැඩිවීමක් සිද්ධ වෙලාය කියලා ඔබතුමන්ලා හිතාගෙන ඉන්නවා නම්, ඒක මිථ්‍යාවක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විනාඩියෙන් මගේ කථාව අවසන් කරනවා.

අපේ රටේ 2011දී අපනයන වර්ධනය වුණා, සියයට 22.4කින්. 2012 දී එය අඩු වුණා, සියයට 7.4ට. 2013දී අපනයන වැඩි වුණා, සියයට 6.4කින්. 2014දී අපනයන වැඩි වුණා, සියයට 7.1කින්. 2015දී අපනයන අඩු වුණා, සියයට 5.6කින්. 2016දී අපනයන අඩු වුණා, සියයට 2.2කින්. නමුත්, 2018දී අපනයන සියයට 10.2කින් වැඩි වුණා. අපනයන එලෙස වැඩි වනකොට ආයාත වැඩි වෙලා තිබෙනවා, සියයට 9.4ට.

ඊළඟට ආනයන බලන්න. 2012දී ආනයන -පිට රටින් බඩු ගෙන්වීම- අඩු වුණා, සියයට 5.4කින්. 2013දී ආනයන අඩු වුණා, සියයට 6.2කින්. 2014දී ආනයන සියයට 7.9කින් වැඩි වුණා. 2015දී ආනයන සියයට 2.5කින් අඩු වුණා. 2016දී ආනයන සියයට 2.5කින් වැඩි වුණා. 2017දී ආනයන සියයට 9.4කින් වැඩි වුණා. ආනයන වැඩි කරන්න හේතුව තමයි, දිගින් දිගටම රටේ නිෂ්පාදනය කඩා වැටීම.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තත්පර ගණනකින් නිෂ්පාදනය කඩා වැටුණු ප්‍රමාණය ගැන කියා මගේ කථාව අවසන් කරනවා. 2014 වසරේ සිට 2017 වසර වනකොට අපේ රටේ ලොකු ලූනු වගා කළ බිම් ප්‍රමාණය සියයට 56කින් අඩු වුණා; නිෂ්පාදනය සියයට 47කින් අඩු වුණා. උඳු වගා කළ බිම් ප්‍රමාණය සියයට 28කින් අඩු වුණා; නිෂ්පාදනය සියයට 25කින් අඩු වුණා. මිරිස් වගා කළ බිම් ප්‍රමාණය සියයට 22කින් අඩු වුණා; නිෂ්පාදනය සියයට 27කින් අඩු වුණා. කවුපි වගා කළ බිම් ප්‍රමාණය සියයට 41කින් අඩු වුණා; නිෂ්පාදනය සියයට 43කින් අඩු වුණා. තල වගා කළ බිම් ප්‍රමාණය සියයට 38කින් අඩු වුණා; නිෂ්පාදනය සියයට 45කින් අඩු වුණා. මුං ඇට වගා කළ බිම් ප්‍රමාණය සියයට 35කින් අඩු වුණා; නිෂ්පාදනය සියයට 35කින් අඩු වුණා. රට කජු වගා කළ බිම් ප්‍රමාණය සියයට 12කින් අඩු වුණා; නිෂ්පාදනය සියයට 11කින් අඩු වුණා. කුරක්කන් වගා කළ බිම් ප්‍රමාණය සියයට 43කින් අඩු වුණා; නිෂ්පාදනය සියයට 37කින් අඩු වුණා. බඩ ඉරිහු වගා කළ බිම් ප්‍රමාණය සියයට 22කින් අඩු වුණා; නිෂ්පාදනය සියයට 19කින් අඩු වුණා. ඒ අනුව බලන කොට පෙනෙනවා, මේ රටේ සමස්ත ආර්ථිකය කඩා වටිටලා තිබෙන බව.

මේක තේරෙන්නේ නැතිව මෙතුමන්ලා කියන්නේ මොකක්ද? මේ ඔක්කෝම දේවල් ගෙන්වන්න වුණාම ඩොලරය රුපියල් 200ට යනවා. ඩොලරය අද කළු කඩේ විකිණෙන්නේ රුපියල් 180ටයි. කළු කඩේ ඩොලරය ගන්නේ රුපියල් 175ටයි. මේ යථාර්ථය තේරුම් ගන්න කියමින් මගේ වචන කිපය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා.1.53]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු කාමිණි ජූයවික්‍රම පෙරේරා - පුත්තසාසන අමෙච්සර්)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of of Buddhasasana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කථා කළ මගේ මිත්‍ර ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා කරුණු කීපයක් කිව්වා. හිටපු අමාත්‍ය අපේ ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා මතක තියාගන්න, පසු ගිය අවුරුදු දෙක තුළ අපේ රටේ ඉතා දරුණු නියහයක් පැවතුණු බව. ඒ නිසා ලංකාවේම නිෂ්පාදනයේ අඩු වීමක් වුණා. නමුත් මතක තියා ගන්න, මේ අවුරුද්දේ දැන් අපට හොඳින් වැසි ලැබී තිබෙනවා කියා. මේ වැස්සත් එක්ක අද ලංකාවේ කෘෂි ආර්ථිකයේ වේගවත් මහා සංවර්ධනයක් නැවත සිදු වනවා. මා ඒක කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Enterprise Sri Lanka තුළින් අපි අපේ කර්මාන්ත සහ කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත - agro-based industries - දියුණු කරන්න ඕනෑ. ඇයි, මා එහෙම කියන්නේ? මම දේශපාලනයේ ජ්‍යෙෂ්ඨයෙක්. මම දිසා ඇමති විධියටත්, වයඹ පළාතේ ප්‍රධාන ඇමති විධියටත් කටයුතු කළා. මම එදා පාර්ලිමේන්තුවෙන් ගිහින් වයඹ ප්‍රධාන ඇමති විධියට කටයුතු කළේ මොකද්? ඒ මා ගියේ, දකුණේ භීෂණයක් පැවැති වෙලාවේයි. මා එසේ ගියේ මොකද්? අලුත් සංකල්පයකට අනුව වැඩ කරලා පෙන්වන්න මට ඕනෑ වුණා. දිසා ඇමතිකෙනකුට වඩා විශාල බලයක් ප්‍රධාන ඇමතිට දීලා තිබුණු නිසා ප්‍රධාන ඇමතිට තමන්ගේ පළාතට වැඩක් කරන්න පුළුවන්කම තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා මට දෙවන වාරයත් ලැබුණා නම්, අපේ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා, ගාමිණී දිසානායක මැතිතුමා ඇතුළු අය රාජාලියා ලකුණ දරන පක්ෂය හදාගෙන ගියේ නැති නම් මම එදා වයඹ පළාත දියුණු කරනවා, "One Area, One Product" කියන සංකල්පය යටතේ. මා ළඟ දැන් තිබෙනවා එම වැඩසටහන. මම එය පෙන්වන්නම්. ඒ ගැන කියන්න කාලය මදි නිසා මා එය **සභාගත*** කරනවා.

එදා මා කළ ඒ සංවර්ධනය තුළින් කෘෂි ආර්ථිකයේ විශාල දියුණුවක් ඇති කිරීමට-

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු අමාත්‍යතුමා, ඔබතුමා මට පොඩි වෙලාවක් දෙනවා නම්-

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(මාණ්පුමිකු කාමිණි ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
අනේ බැහැ. මොකක්ද, ඔබතුමා කියන්න හදන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උறුப්பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු ඇමතිතුමනි, ඔබතුමා එදා මහ ඇමතිවරයකු වශයෙන් "One Area, One Product" කියන සංකල්පය යටතේ ජාතික නිෂ්පාදනය යටතේ රට තුළ කළ හැකි දේවල් කරන්න උත්සාහ කරපු හොඳ ඇමතිවරයෙක් කියා මම පිළිගන්නවා. නමුත් ඒ ප්‍රතිපත්තියට හාත්පසින් වෙනස් එකක් තමයි අද දවසේ ක්‍රියාත්මක වන්නේ කියන එකත් ඔබතුමා පිළිගන්න ඕනෑ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(මාණ්පුමිකු කාමිණි ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
තමුන්නාන්සේලාගෙනුත් ඒ අඩු පාඩුව සිදු වුණා. එදා විශාල වශයෙන් පැවැති තේ, පොල්, රබර් ආදි වගාවන් තමුන්නාන්සේලා දියුණු කළාද? තමුන්නාන්සේලා බලය අරගෙන, යුද්ධය දරුණු ලෙස පැවැතුණේ නැති කාලයේත් -1993 ඉඳලා අවුරුදු 15ක, 18ක පමණ කාලයේත්- පාලනයේ සිටියා. එදා ඒ සැලසුම් ක්‍රියාත්මක වුණා නම් මේ ආණ්ඩුව ආවාට පසුව මේ අවුරුදු දෙකතුනේ විශාල සංවර්ධනයකට යන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වියට්නාමයේ CITES සමුළුවට ගියා. ඒ ගිය වෙලාවේ මට එරට කෘෂිකර්ම ඇමතිවරයා හමුවුණා. Vietnam exports US Dollars 60 billion worth of agricultural products. යුද්ධය දරුණු විධියට පැවතුණු වියට්නාමයත් එතරම් ප්‍රමාණයක් අපනයන කරනවා. අපිත් අපේ දේශීය කර්මාන්තකරුවන්ට හා අපේ දේශීය කෘෂි කර්මාන්තකරුවන්ට අත දෙන්න ඕනෑ. ඒ කටයුත්ත දැන් අපේ රජය ආරම්භ කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වියළි කලාපයේ බෝග වගා කරන්න අමාරුයි කියනවා. මම ඒක පිළිගන්නේ නැහැ. වියළි කලාපය වුණාට අනුරාධපුරය, පුත්තලම ප්‍රදේශවල බෙහෙත් ඖෂධ වර්ග කොච්චර නම් වෙලේ හැදෙනවාද? නමුත් අපි ඒ ඖෂධ වර්ග කොච්චර ප්‍රමාණයක් ඉන්දියාවෙන් ගෙනෙනවාද? ඩොලර් මිලියන ගණනක ඖෂධ වර්ග ගෙනෙනවා. අප ඖෂධ පැළෑටි ක්‍රමානුකූලව වගා කළ යුතුයි. එදා මම වයඹ ප්‍රධාන ඇමති විධියට පටන් ගත්තා, අඹ ගම්මාන, දෙහි ගම්මාන, දොඩම් ගම්මාන, කරපිංචා ගම්මාන. එදා නිකවැරටිය ප්‍රදේශයෙන් ගෙනා කරපිංචා දැන් ගෙනෙන්න යන්නේ අනුරාධපුරයෙන් එහාටයි. ඇයි ඒ? දැන් ඒවාට විශාල ඉල්ලුමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ මගේ කාමරයේ ඉන්නවා බටහිර වෛද්‍යවරයකු වන Dr. Jeewaka. එතුමා GMOA එකේ වර්ජනවලට ගිය කෙනෙක් නොවෙයි. එතුමා දැන් මගේ කාමරයේ ඉන්නවා. අද අපි කතා කරනවා අපනයන වැඩ පිළිවෙළක් ගැන. එතුමා මගේ ආසනය වන කටුගම්පොළ කම්හලක් ආරම්භ කළා. එතුමා ගන්නවා, මුරුංගා වියළි කොළ. යාපනය දිහා හැම තැනම පාහේ මුරුංගා වවනවා. කරල් වේළිලා යනවා, විකුණාගන්න බැරිව. එතුමා කියනවා අක්කර දහස් ගණනක් වවන්න කියා. මුරුංගා කොළවල මහත් ගුණාත්මක වටිනාකමක් තිබෙනවා. අද එතුමා මෙහි ඇවිල්ලායි ඉන්නේ. අපි දයා ගමගේ ඇමතිතුමා එක්ක, කෘෂිකර්ම ඇමතිතුමා එක්ක සාකච්ඡා කරනවා. "One Area, One Product" කියන වැඩ පිළිවෙළට අපි යන්න ඕනෑ. එතුමා මුරුංගා ඉල්ලනවා, කරපිංචා ඉල්ලනවා. ටොන් ගණන් ඉල්ලන්නේ. සේර, නයි මීරිස්, කුරුඳු, ගම්මිරිස් ආදි දේවල් ඉල්ලනවා.

මේ එක පොඩි පුද්ගලයෙක් ගැනයි මම කිව්වේ. අපි වගා වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. එය වියලි කලාපයේ හෝ තෙත්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කලාපයේ වෙන්න පුළුවන්. ඒකට ගැළපෙන අපනයනකරුවන් අපි සම්බන්ධ කරන්න ඕනෑ. රජය ඉන්න ඕනෑ, ප්‍රතිපත්ති තීරණය කරන්න. ඒ වාගේම සැලසුම් සෑදීමට. පෞද්ගලික අංශය කරන්න ඕනෑ, ගොවියාට අතහිත දීමයි. ඔවුන් අතුරු බෝග වවන ගොවීන් වෙන්න පුළුවන්. ඒ අයට අත දෙන්න ඕනෑ. අත දීලා එක පළාතක ක්‍රමානුකූලව එක වගාවක් කරන්න ඕනෑ. පොල් වගාකරනවා නම් එහෙමයි. අපි හිතමු ගස්ලබු හිටවනවා කියලා. එහෙම නම් එක ඉඩමක පමණක් ගස්ලබු හිටුවලා හරි යන්නේ නැහැ. අපේ ගරු දයා ගමගේ ඇමතිතුමා, ඒ එක්කම කෘෂිකර්ම ඇමතිතුමා ගැන මට හරි ආඩම්බරයි. අපේ කෘෂිකර්ම ඇමතිතුමා හොඳ සංකල්ප ගැන කථා කරනවා, පන්සලත් එක්ක සම්බන්ධවෙලා වැඩ කටයුතු කිරීම වාගේ. මේ පොතේ තිබෙන්නේ ගමයි පන්සලයි සංකල්පය ගැන. එතකොට මේ වැඩ පිළිවෙළට ලංකාවේම කතෝලික පල්ලිය සහ කෝවිලත් අපි සම්බන්ධ කර ගන්නවා. මෙවැනි වැඩ පිළිවෙළක්, සැලසුමක් තුළ විශාල ප්‍රදේශයක බෝග වර්ග හැදුවාම ඒ නිෂ්පාදකයාට තමන්ගේ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා ගැණුම්කරුට වැඩිමිලකට දෙන්න පුළුවන්. Outgrower system ගිවිසුමක් පරිදි ක්‍රියාකරන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි වැඩ පිළිවෙළක් අපේ මේ රජය ආරම්භ කරනවා. පන්සල, පල්ලිය, කෝවිල එක්ක කටයුතු කරන්න පුළුවන් වන ඒ වැඩ පිළිවෙළ කැබිනට් මණ්ඩලයත් අනුමත කරලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඊයේත් අපි සාකච්ඡා කළා. අපි වහාම ආගමික ආයතන එක්ක ගම සම්බන්ධ කරලා මේ කටයුත්ත කරන්න බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න, මල් ගැන. මම වනජීවී ඇමති විධියට හිටියා. ඒ කාලයේ National Botanical Gardens Department එක මගේ යටතේ තිබුණේ. අද මම BBC news බැලුවා. කෙන්යාව මල් විතරක් අපනයනය කරනවා, ඇමෙරිකන් ඩොලර් මිලියන 800ක. කෙන්යාව කියන්නේ කාන්තාරයක් වාගේ රටක්. නමුත් පෞද්ගලික අංශයත් එක්ක එකතුවෙලා විශාල වගකීම් පවරා ක්‍රමානුකූලව ඒ කටයුතු කරනවා. වැඩියෙන්ම ඒ මල් දෙන්නේ චීනයට ලු. අන්න එතැනට අපිත් යන්න ඕනෑ. National Botanical Gardens Department එකත් එක්ක සාකච්ඡා කරලා Netherlandsවල Ambassador ඇවිල්ලා, කඳුරටින්, අඩි 1,700ට ඉහළ අපේ ඉඩමක් ඉල්ලුවා. ඒ ඉඩම ලබා දෙන්න කියලා කිව්වා. ඒ අය ඕකිඩ් වැනි මල් වවනවා. නෙදර්ලන්තය තමයි ලෝකයේ වැඩිම මල් ගැණුම්කරුවා. ඒ අයට ඒ කටයුතු කරන්න ඉඩ දුන්නා. මම හිතනවා ඒ වැඩ පිළිවෙළ දැන් ක්‍රියාත්මක වෙනවා ඇති කියලා. ඒ කටයුතු ක්‍රියාත්මක වෙන්න ඕනෑ. අපි විශාල වශයෙන් මල් ගම්මාන ඇති කරන්න ඕනෑ. මල් සඳහා දේශීයවත් විශාල ඉල්ලුමක් තිබෙනවා. මහුල් ගෙවල්වලට සහ නොයකුත් උත්සවවලදී මල්වලට විශාල ඉල්ලුමක් තිබෙනවා. අපි ඉන්දියාවෙන් මල් ගෙනෙනවා; තායිලන්තයෙන් ගෙනෙනවා. ඒවා නවත්වා අපි මල් වවන්න ඕනෑ. දැන් ජනාධිපතිතුමා කියලා පිටරටින් මල් ගෙන්වීම නවත්වලා. අපි එක පළාතක නියමිත වගා වැඩ පිළිවෙළක යෙදෙන්න ඕනෑ. කර්මාන්තකරුවන්, පෞද්ගලික අංශය, කෘෂිකර්මාන්තකරුවන් එකතු වෙන්න ඕනෑ. ඒ අයට තමයි “Enterprise Sri Lanka” තුළින් සහනදීලා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපට මේ රටේ ආර්ථිකය දියුණු කරන්න විදේශ ආයෝජකයන් දෙසම බල බලා ඉන්න ඕනෑ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි අපේ දේශීය නිෂ්පාදකයා, කර්මාන්තකරුවා නහාසිටුවමු. කෘෂිකර්මයෙන්ම අපට ඒ දේ කරන්න පුළුවන්. නිදහසට කරුණු වශයෙන් පායනවා කියන එක කියන්න එපා. මම ඒක පිළිගන්නේ නැහැ. මොකද, පායද්දී පවා කුඹුරුවල බෙහෙත් පැළෑටි වර්ග කීයක් නම් නිකම්ම හැදෙනවාද? ඒ යාපනයේ වෙන්න පුළුවන්, වවුනියාවේ වෙන්න පුළුවන්, අනුරාධපුරයේ වෙන්න පුළුවන්. නමුත් අපි ඒවා කොච්චර නම් පිටරටින් ගෙනෙනවාද? මගේ ළඟ ඒ සංඛ්‍යාලේඛන තිබෙනවා. කාලය මදි නිසා මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. මෙන්න මේ නිසා හිතන්න, අපි ඉන්දියාවේ ගොවියා ධනවත් කරනවාද නැත්නම් අපේ ගොවියා ධනවත් කරනවාද කියලා. ඒ නිසා අපි සැලසුමක් තුළ ක්‍රියා කළ යුතුයි. මේ ආණ්ඩුව දැන් ඒවා හොයාගෙන සැලසුමක් අනුව ක්‍රියාත්මක වනවා. ඒ සම්බන්ධයෙන් මම කෘෂිකර්ම ඇමතිතුමාට මගේ ස්තුතිය පුද කරනවා. ගරු දයා ගමගේ ඇමතිතුමා මා හමු වෙනවා. අපි කථා කරලා වැඩ පිළිවෙළක් හදන්න බලාපොරොත්තු වනවා. ඒ අඹ වෙන්න පුළුවන්, පළතුරු වෙන්න පුළුවන්, එළවලු වෙන්න පුළුවන්. ඒ අය එක්ක එකතුවෙලා එක පළාතක එක වගාවක් කරලා ඒ තුළින් අපේ ගොවියාගේ ආර්ථිකය දියුණු කරන්න බලාපොරොත්තු වනවා. පෑවිල්ල කියන එක මම පිළිගන්නේ නැහැ. රජය හැම දාම නියං ආධාර දෙමින් කටයුතු කරන්න ඕනෑය කියන එකත් මම පිළිගන්නේ නැහැ. අපි ආදායම මධ්‍යම මට්ටමට ගෙන ආවා කියනවා. මධ්‍යම මට්ටමට ගෙන ආවා කියන එක ලෝක බැංකු තර්කයක්. නමුත් දැන් ඒකත් වෙනස් වෙලා. ඇයි අපි එහෙම කියන්නේ? එක්සත් ජාතීන්ගේ "තිරසර" ප්‍රතිපත්තිය තුළ ඒක පුද්ගල ආදායම - per capita income - තුන්දහස් ගණන කියන එක නොවෙයි, එක්සත් ජාතීන්ගේ සංවිධානය දැන් පිළිගෙන තිබෙනවා, "Gross National Happiness" කියන එක. පවුලකට සන්තෝෂයක් දෙන්න පුළුවන් නම් ඒක තමයි තිරසර ප්‍රතිපත්තිය. තමාගේම නිවසක පදිංචි වෙලා, උදේට කාලා, දවල්ට කාලා, රෑට කාලා, දරුවන්ට හොඳ අධ්‍යාපනයක් දීලා, වාහනයක් හැටියට මෝටර්සයිකලයක් හරි තියාගෙන සතුටින් ඉන්න පුළුවන් නම් ඒකට තමයි "Gross National Happiness" කියන්නේ. එක්සත් ජාතීන්ගේ තිරසර ප්‍රතිපත්තිය තුළත් අද ඒක පිළිගෙන තිබෙනවා. අපේ ප්‍රතිපත්තිය ඒකයි. තිරසර පවුලක්, තිරසර ගමක්, තිරසර සමාජයක්, මත් කුඩු, මත් ද්‍රව්‍ය නැති සමාජයක් අපි හදන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙවැනි වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ලෝකයේ ප්‍රසිද්ධ, හොඳ ගණයේ, හොඳම වර්ගයේ කෝපි තිබෙන්නේ අපේ ලංකාවේ. ලෝකයේ හොඳම ගම්මිරිස් අපේ රටේ තිබෙනවා. ලෝකයේ ඉතාම උසස් කුරුඳු අපේ රටේ තිබෙනවා. පුවක් ගත්තත් ඒ වාගේමයි. මෙවා ඔක්කෝම ලංකාවේ වැවෙනවා. අද මොකද වෙලා තිබෙන්නේ? අද ඉන්දුනීසියාවෙන් ලංකාවට පුවක් ගෙනැල්ලා නැවත අපනයනය කරනවා. ඇයි අපට පුවක් වවන්න බැරි? පුවක් ගහට වතුර දමන්න ඕනෑද? පුවක් ගහේ වටිනාකම වැඩි වෙලා අපනයනකරුවන්ගෙන් විශාල ඉල්ලුමක් තිබියදී, ඉන්දුනීසියාවෙන් ලංකාවට පුවක් ගෙනැල්ලා, නැවත පිට රටට පටවනවා. කුරුඳු ගත්තාම, ලෝකයේ ඉතාම උසස් කුරුඳු ලංකාවේ තිබෙනවා. ඒකත් කලවම් කරලා හදනවා. වියට්නාමයෙන් මේ රටට ගම්මිරිස් ගෙනෙනවා. එහෙම ගෙනැල්ලා ලංකාවේ ගම්මිරිස් සමඟ කලවම් කරලා පිට රට යවන නිසා ලංකාවට අද ලෝකයේ තිබෙන නම කැත වෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා, කැබිනට් මණ්ඩලයේ තීරණයක් අනුව ගම්මිරිස් පිට රටින් ලංකාවට ගෙන ඒම තහනම් කළා.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

දයා ගමගේ ඇමතිතුමාගේ අමාත්‍යාංශය එක්ක අපි දැන් ඒ ඒ පළාත්වල කෘෂිකර්ම ඇමතිතුමා සමඟ එකතු වී මාසයක් ඇතුළත වැඩ පිළිවෙළක් ආරම්භ කර ක්‍රියාත්මක කරනවා. කෝපි, ගම්මිරිස්, සාදික්කා, කරාබු නැටි වෙන්න පුළුවන්, ඒ ඒ කලාපයට ගැළපෙන වර්ග වවන්න කටයුතු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කාරණයක් තිබෙනවා. බෝගවලට බෙහෙත් වර්ග ගැසීම අපි නවත්වන්න ඕනෑ. ඒවාට වස, විෂ ගැහුවාම ඒ ගොවියාත් ලෙඩෙක් වෙලා මැරෙනවා. ඒ වස, විසෙන් ඒ ගොවියාගේ දරුවෝත් මැරෙනවා. මෙය අද ස්වභාව ධර්මයේ දඬුවමක් වාගේ වෙලා තිබෙනවා. නමුත්, අද අපේ ගොවියෝ පැරණි වගා ක්‍රමවලට - organic cultivation - දැන් හුරුවෙමින් ඉන්නවා. අපි එතැනටයි යන්න ඕනෑ. අපි ඒ ගැන දැනුවත් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

අද ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමාගේ අමාත්‍යාංශය ඉදිරිපත් කළ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග ගත්තාම, අපනයනය කරනවාය කියන්නේ කෘෂිකර්මයෙන් වෙන්න පුළුවන්, කර්මාන්තවලින් වෙන්න පුළුවන්, අතුරු භෝගවලින් වෙන්න පුළුවන්. අපේ රටේ පළමුවැනි තැන විධියට අපේ අපනයන ශක්තිමත් කරන්න ඕනෑ. අපි රජයක් විධියට ටිකක් ප්‍රමාද වුණා තමයි. වාහන ගෙන්වීම වැනි දේ නිසා අපේ විදේශ වත්කම අඩු වෙලා ආදායමට වඩා වියදම් වැඩි වීම සිද්ධ වුණා. නමුත්, දැන්වත් රජය වශයෙන් ඒ ගැන තීරණයක් ගන්න ඕනෑ. දැන් නිෂ්පාදන අංශය වැඩි කරන්න ඕනෑ. කිසියම් තත්ත්වයකට අපි මේ රට ගෙනියලා මේ රට ලෝකයේ ආදර්ශවත් රටක් බවට පත් කරන්න ඕනෑ. ඒ අනුව, 2025දී මෛත්‍රී-රනිල් රජය ලංකාව ආඩම්බර සමාජයක් කරා ගෙන යන බව මම පැහැදිලිව කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහළොවක කාලයක් තිබෙනවා.

[අ.භා.2.06]

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සාකච්ඡාවට ගැනෙන්නේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග පැනවීම සම්බන්ධවයි. විශේෂයෙන් පිට රටින් ගෙන්වන විවිධ ආහාර භෝග, වෙනත් භාණ්ඩ පිළිබඳ කාරණා ගත්තාම, ඒවායේ කිසිම විනයක් නැති, කිසිම සැලැස්මක් නැති, කිසිම ක්‍රමවේදයක් නැති කාරණය පැහැදිලි වුණා. අපේ ගාමිණී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා ඒ ගැන පැහැදිලි කළා. ඇත්තෙන්ම විදේශ රටවලින් ගෙනෙන සමහර දේවලට මෙහිදී තවත් දේවල් කලවම් කරනවා. මේ ගැන අපි නිරන්තරයෙන්ම කථා කළා.

විශේෂයෙන් වියට්නාමයෙන් ලංකාවට ගම්මිරිස් ගෙනෙනවා. ලෝකයේ විශේෂ අවධානයක් ලංකාවේ ගම්මිරිස් කෙරෙහි යොමු වී තිබෙන මොහොතක, බාල ගම්මිරිස් ලංකාවේ ගම්මිරිස්වලට කලවම් කරලා පිට රටට පටවනවා. ඒ වාගේම, අපේ රටේ සුළු අපනයන භෝග විධියට එනසාල්, කරාබු නැටි, සාදික්කා, වසාවාසි තිබෙනවා. මෙතුමා කියන විධියටම ලෝකයේ හොඳම කුරුඳු තිබෙන්නේ අපේ ලංකාවේ. ඒ කුරුඳුවලට සාපේක්ෂ කුරුඳු ලෝකයේ කොහේවත් නැහැ. කුරුඳු බීමක් විධියට ගන්න පුළුවන්. ඒ වාගේම, ආහාරයට සහ ඖෂධයක් විධියටත් ගන්න පුළුවන්.

මේ කාර්යය ගැන ලොකු උනන්දුවක් දක්වන කුරුඳු වෙළෙඳ සංගමයේ සභාපති කොහොන මහත්මයා මට ඊයේ හමු වුණා. මේ ක්ෂේත්‍රයේදී අද ඒ අය මුහුණ දී තිබෙන තත්ත්වය එතුමා මට පැහැදිලි කළා.

කොහොන මහත්මයාගේ ප්‍රකාශයේ හැටියට අද අතිවිශාල ඉඩම් ප්‍රමාණයක කුරුඳු වගා කර තිබෙනවා. ඒ සඳහා හොඳ වෙළෙඳ පොළක් යෝජනා කර තිබුණත්, එක්සත් ජාතික පක්ෂ රජයේ අපනයන වැඩ පිළිවෙළේ සැලැස්මක් නොමැතිභාවය නිසාම ඒ වෙළෙඳ පොළ විනාශ කර තිබෙනවා. හුහක් නිලධාරීන් මේ කුමන්ත්‍රණය තුළ ඉන්නවා. නිලධාරීන් හිතා මතා කරන කොමිස් ගැහීම් වැනි දේවල් එක්ක තමයි මේ තත්ත්වය මතු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටින් ගෙන්වන සහල්වල තත්ත්වය ගැනත් මම කියන්නට ඕනෑ. ආසනික් කලවම් වුණු සහල් විශාල ප්‍රමාණයක් ගෙනෙනවා. විද්‍යා හා තාක්ෂණික අමාත්‍යාංශයේ තිබෙනවා, මේ පිළිබඳව පරීක්ෂා කරන්නට පුළුවන් ඒකකයක්. නමුත් පරීක්ෂා කෙරෙන්නේ නැහැ. එම විෂය භාරව හිටපු ඇමතිතුමා දැන් මා ළඟ සිටිනවා. රසායනාගාර රටේ තිබෙනවා. නමුත් ඒ පිළිබඳව -[බාධා කිරීමක්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒවා කෙරෙනවා. [බාධා කිරීමක්]

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
එතුමා ඒක කළා. අද කෙරෙන්නේ නැහැ කියන එකයි මම කියන්නේ. [බාධා කිරීමක්] ඒ කාලයේ කළා. අද කෙරෙන්නේ නැහැ. අද කිසිම විනයක් නැතිව ලංකාවට සහල් ආනයනය කරනවා. මියෙන්මාර් සමාගමට ටෙන්ඩර් පහක් දීලා තිබෙනවා. ඒ වාගේම ඒ රටේ, ඒ කලාපයේ පොළොවේ තිබෙන ස්වාභාවික ආසනික් තත්ත්වය නිසා ගොයම් පැළය වැඩීමේදීම ගොයම් ගහට ඒවා උරා ගන්නවා. එසේ ගොයමට ආසනික් උරා ගැනීම නිසා දැන හෝ නොදැන ආසනික් මිශ්‍ර සහල් ලංකාවටත් ලැබෙනවා.

ලංකාවේ ඇති වී තිබෙන වකුගඩු රෝගය පිළිබඳව අපි සැලිකිලිමත් වෙන්නට ඕනෑ. උතුරු ප්‍රදේශයේ, වයඹ පළාතේ සහ අනෙකුත් පළාත්වල ඇති වී තිබෙන වකුගඩු රෝගයට ප්‍රධාන හේතුව වන්නේ ආසනික් මිශ්‍ර ආහාර අනුභවයයි. මේ තත්ත්වය වැළැක්වීම පිළිබඳව විද්‍යාත්මක වැඩ පිළිවෙළක් නැහැ. ශ්‍රී ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය පසුගිය කාලයේ මේවා සම්බන්ධයෙන් පරීක්ෂා කළා. දැන් එවැනි පරීක්ෂා කිරීමක් කෙරෙන්නේ නැහැ. එම නිසා ඉන්දියාව, බංග්ලාදේශය වැනි රටවල් මෙන්ම වේල් තුනම සහල් පරිභෝජනයට ගන්නා රටක් හැටියට ලංකාව විශේෂයෙන්ම ශරීරයට හානිකර මෙවැනි සහල් පිටරටින් ගෙන්වීම තුළින් සිදුවන හානිය ගැන කල්පනා කරන්නට ඕනෑ.

මේ රටේ ජනගහනයෙන් අඩකට වැඩි ප්‍රමාණයක්, එනම් මිලියන 77ක් පමණ ජනතාව ආසනික් විසවීමට භාජනය වී තිබෙනවා. ඒ පිළිබඳව පළිබෝධ නාශක හා පොහොර පිළිබඳව අන්තර් ජාතික කලාපයේ මහාචාර්යවරු ගණනාවක් පැහැදිලි කර තිබෙනවා. මා හිතන විධියට ඒ පැහැදිලි කිරීම් සැලකිල්ලට ගැනීමක් කර නැහැ. පසුගිය කාලය පුරාම සහල් වෙළෙඳ පොළේ මේ තත්ත්වයට සමගාමීව කෘෂිකර්මාන්ත අංශයේ හා පාරිභෝගික අංශවල පරීක්ෂණ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වුණා. 2017 වසරේ සහල්, අල, ලූනු, මිරිස් ආදී ආහාර ද්‍රව්‍ය ගෙන්වීමේදී සැලසුමක් නොමැතිව ක්‍රියාත්මක වුණු වැඩ පිළිවෙළ නිසා තමයි මේ තත්ත්වය නිර්මාණය වෙලා තිබෙන්නේ. මේවා නිලධාරීන් හිතා මතා කරන දේවල්. ආහාර ද්‍රව්‍යවල ප්‍රමිතිය පිළිබඳව සොයා බැලීමක්, පරීක්ෂණ ක්‍රියාත්මක කිරීමක් දැන් සිදු වන්නේ නැහැ.

ලංකාවේ සුළු අපනයන භෝග පිළිබඳව ලොකයේ ඉතාමත් ආකර්ෂණීය තත්ත්වයක් අපට තිබෙනවා. මාධ්‍යයෙන් පෙන්වා දී තිබෙනවා, සංවිධානාත්මකව කසළ තේ පිටරට ගෙන ගිහින් කලවම් කර ලංකාවේ හොඳ තේවල කීර්තිනාමය නැති කරන බව. අපේ තානාපති සේවා තිබෙන්නේ ඒ පිළිබඳව සොයා බලන්නයි. තානාපති කාර්යාලවල වෙළෙඳ අංශයේ නිලධාරියෙක් ඉන්නවා. ඒ නිලධාරියාට පුළුවන් මේ පිළිබඳව සොයා බැලීමක් කර මේ තත්ත්වය සමනය කරන්න. මේ සඳහා යම් යම් විසඳුම් ක්‍රියාත්මක කරන්න පුළුවන්.

යම් යම් භෝග වගාවන් කරන කාලයන් තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, මේ කාලයේ ලංකාවේ ඉඟුරු වගා කරනවා. මොකද ඉඟුරුවලට හොඳ මිලක් තිබෙනවා. ඉඟුරු අක්කරයක් වගා කළොත් රුපියල් කෝටියකට ආසන්න මුදලක් ලබා ගන්නට පුළුවන් වෙලා තිබෙනවා.

දැන් අපේ රටේ ඉඟුරු වගා කරද්දීත් ඉන්දියාවෙන් ඉඟුරු ගෙන්වනවා. මේක ගොවියාත් එක්ක වෛරයෙන් කරන වැඩක්. සාමාන්‍යයෙන් ඉඟුරු ලංකාවේ හොඳ ඵලදාවක් ලැබිය හැකි භෝගයක්. ඒ වාගේම ඉඟුරුවල තිබෙන ඖෂධීය ගුණය ඉතාමත් වැදගත්. ඉන්දියාවෙන්, පාකිස්තානයෙන් ගෙන්වන ඉඟුරුවලට වඩා අපේ රටේ ඉඟුරුවල ඒ ගුණය තිබෙනවා. මේ තත්ත්වය තුළ අපේ ඉඟුරු වගා කරන ගොවියා දිරිමත් කරන්න, ඒ අයව ශක්තිමත් කරන්න වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. අපි එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැහැ.

රටේ ආනයන සහ අපනයන විනයක් තිබෙන්නට ඕනෑ. එවැනි විනයක් නොමැතිවීමත් එක්ක තමයි මේ තත්ත්වය නිර්මාණය වෙලා තිබෙන්නේ. එසේ නිර්මාණය වීම පිළිබඳව බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා පැහැදිලි කළා. වාහන ආනයනය කිරීමේදී අති විශාල සැලැස්මක් නොමැතිව, එන්ජින් ධාරිතාව පිළිබඳව සැලකිල්ලට ගන්නේ නැතිව, ඒ පිළිබඳව සැලසුම් ක්‍රියාත්මක කිරීම ගැන කල්පනා කරන්නේ නැතිව වැඩ කිරීම ගැනත් පැහැදිලි කළා. ඒ නිසා තමයි අපේ ආදායමට ගැළපෙන එන්ජින් ධාරිතාවට අයත් වාහන, hybrid තාක්ෂණයෙන් පාවිච්චි කරන්න පුළුවන් වාහන, ඩීසල්, පෙට්‍රල් වැඩියෙන් වැඩ කරන වාහනවලට හොඳ මිලක් තිබෙද්දී, එයට පරිබාහිරව කටයුතු ක්‍රියාත්මක කර තිබෙන්නේ. ඒ නිසාම, රුපියල් මිලියන 3.7ක් වාගේ බද්දක් අය කිරීම තුළින් ටොයෝටා වර්ගයේ රථයක මිල රුපියල් මිලියන 7.1ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඇත්තෙන්ම මේ වාගේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමේ දී ආනයන සහ අපනයන ක්‍රමවේදය පිළිබඳව සාකච්ඡා වෙන්නේ නැහැ. සමහර ව්‍යාපාරිකයන්ට ඕනෑ විධියට, සමහර සමාගම්වලට ඕනෑ විධියට, සමහර ඇමතිවරුන්ට ඕනෑ විධියට තමයි කටයුතු සිද්ධ වන්නේ. එක ඇමතිවරයෙක් රූපවාහිනී සාකච්ඡාවකදී පිළිගත්තා, එම අමාත්‍යාංශය විසින්ම පිට රටින් ගෙන්වන ගම්මිරිස් කලවම් කරනවා කියලා. ඒ ඇමතිවරයා ඒක පිළිගත්තා නම්, ඒ පිළිබඳව කැබිනට් මණ්ඩලයේ දී සාකච්ඡාවක් කරලා නිගමනයකට එන්න බැරි ඇයි? අපේ රටේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවක් තිබෙනවා. නමුත්, අද එම සුළු අපනයන භෝගවල මිල බැහැලා. අපේ ගම්මිරිස් කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 450ක් දක්වා අඩුවෙලා තිබෙනවා. ඒ වාගේම, කුරුඳුවල මිල අඩුවෙලා තිබෙනවා. කුරුඳු කිලෝග්‍රෑම් එකක් රුපියල් එක්දහස් ගණනට අළෙවි වුණා. ඒක ඉතාමත් හොඳ මිල මට්ටමක්. ගම්මිරිස් කිලෝග්‍රෑම් එකකුත් එවැනි මුදලකට අළෙවි වුණා.

ලෝකයේ හොඳ වෙළෙඳ පොළක් තිබෙන, ලෝකය වැඩියෙන්ම ඉල්ලන කිතුල් හකුරු සහ කිතුල් පැණි නිෂ්පාදනය කිරීම සඳහා සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවෙන් කිසිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. මේවා ආකර්ෂණීය වෙළෙඳ පොළක් තිබෙන භාණ්ඩ. විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, සබරගමුව පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මාතලේ දිස්ත්‍රික්කයේ මේවා වැඩියෙන් නිෂ්පාදනය කරන්න දිරිමත් කිරීම් කරලා, ඒ පළාත්වල මේවා ක්‍රියාත්මක කරන්න පුළුවන්.

අපේ ආනයන හා අපනයන විනය ක්‍රියාත්මක කිරීම තුළින් අපේ වෙළෙඳ පොළට හොඳ කීර්තියක් විතරක් නොවෙයි, හොඳ වෙළෙඳ ශක්තියකුත් ලබා ගැනීමේ අවකාශය තිබෙනවා. මේ වැඩ සටහනත් එක්ක එම අවකාශය ලබා ගැනීමට පුළුවන්කමක් නැහැ. ඒ නිසා ආනයන හා අපනයන (පාලන) යටතේ නියෝග ක්‍රියාත්මක කිරීමේදී මේ විශේෂ ගැසට් නිවේදනය අනුව යහපත් සැලසුම් ක්‍රියාත්මක කිරීමත් එයට අන්තර්ගත කළ යුතුයි. ඒ නිසා විශේෂයෙන්ම 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ මෙරටට මෝටර් රථ වාහන ආනයනය කිරීමේ දී නිෂ්පාදන ආයතන විසින් නිකුත් කරනු ලබන නිෂ්පාදන සහතිකය ඉදිරිපත් කිරීම ක්‍රියාත්මක නොකිරීම නිසා විශේෂයෙන්ම වාහන ගෙන්වන සමාගම්වලටත්, ඒ සමාගම්වල කොටස්කරුවන්ටත් මේ පිළිබඳ ප්‍රශ්න ගණනාවකටම මුහුණ දෙන්න සිද්ධ වුණා. එහෙත්, 2018 ජූනි මාසයේ 13වැනි දා විවෘත කරන ලද ණයවර ලිපි මඟින් ආනයනය කරනු ලබන මෝටර් රථ වාහන ප්‍රමාණය විධිමත් නොවන ආකාරයට ශ්‍රී ලංකා රේගුව විසින් කල්පනාවකින් තොරව නිදහස් කර තිබෙනවා. මේවා කාගේ වුවමනාව මත නිදහස් කළාද කියලා පසුගිය කාලයේ පුවත් පත්වල සඳහන්ව තිබුණා. පවතින රෙගුලාසිවලට පටහැනිව වාහන ගෙනැත්, කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් නොමැතිව නිදහස් කර තිබෙනවා. ඒවා එක ඇමතිවරයකුගේ ඕනෑකමට නිදහස් කළාය කියා තමයි සඳහන් වෙලා තිබෙන්නේ. කිසිම විනයක් නැති, සැලැස්මක් නැති මෙවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම නිසා, මෝටර් රථ ආනයනය සඳහා පැනවූ බදු නිසා අද වාහන ආනයනය අඩුවෙලා තිබෙනවා. මේ කාරණය සැලකිල්ලට ගනිමින්, රාජ්‍ය නිලධාරීන්ට, වෛද්‍යවරුන්ට හා වෙනත් ශ්‍රේණිගත නිලධාරීන්ට වාහන බලපත්‍ර ලබාදීම රජය පසුගිය කාලයේ නවත්වලා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාහන බලපත්‍රත් එක්කම එය නැවැත්වූවාය කියා ඒක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඇගේ ගැහුවා. එහෙම එකක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාටම තිබුණේ නැහැ. ඒවා ගොඩක් කාලයකින් ලබා දුන්නු බලපත්‍රයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණයවෙලා හෝ, කොටසක් ගෙවලා හෝ වාහනයක් ගැනීමට දහසක් බලාපොරොත්තු තියාගෙන සිටි රජයේ නිලධාරින් මේ හේතුව නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙස වෛරයෙන් බැලුවා. මොකද, මන්ත්‍රීවරුන් නිසා මේක අහිමි වුණාය කියා ඔවුන් හිතුවා.

තවත් කාරණා ගණනාවක් තිබුණත්, අවසාන වශයෙන් මම තව එක් කාරණයක් විතරක් කියන්නම්. අද අපේ පළාතේ විතරක් නොවෙයි, වියළි කලාපීය බොහෝ ප්‍රදේශවල වල් අලි ප්‍රශ්නය තිබෙනවා. රාජ්‍ය නායකයෝ දෙදෙනා තරගයට විදේශගත වන අවස්ථාවල, ඒ විදේශීය නායකයන්ට දෙන්න තෑගි අරගෙන යන ආකාරය අප දකිනවා. ඒ තෑගි ලෙස හුඟක්ම අරගෙන යන්නේ ලීවලින් සෑදූ ඇතුන් සහ වර්ණවත් කළ, වීදුරු ගල් අල්ලපු ඇතුන්. දැන් වන අලින් 8,000ක් පමණ ගම් වැදිලා ඉන්නවා. මේ අලින් පරණ අලි ගාල් ක්‍රමයට අල්ලලා, හීලෑ කරලා විදේශවලට තෑගි දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත්, රටට අභිමානයක් වාගේම, රට ගැන හොඳ ආකල්පයක් ඇති වෙනවා. ඊයේ පෙරේදා උතුරු කොරියානු ජනාධිපතිතුමා දකුණු කොරියාවේ ජනාධිපතිතුමාට බලු පැටවුන් දෙදෙනෙකු තෑගි කර තිබුණු ආකාරය අපි දැක්කා. අපිට බලු පැටවුන් දෙන්න ඕනෑකමක් නැහැ. නමුත් අපිට අලි පැටවුන් දෙන්න පුළුවන්. ලී අලි පැටවුන් දෙනවා වෙනුවට, ආහාර සඳහා ගම් වදින මේ හොඳ අලින් හීලෑ කරලා විදේශවලට දෙන්න පුළුවන්. මේ අලින් දැන් කෝච්චිවලට හැපිලා මැරෙනවා; වෙනත් විෂ වර්ග කන්න දීම නිසා මැරෙනවා; "කරන්ට්" එක වැදිලා මැරෙනවා. මේක විශාල ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නයට කිසිම ඇමතිවරයකුගෙන් විසඳුමක් ලබා ගන්න බැරි වුණා. වල් අලින් සම්බන්ධව කටයුතු කරන දෙපාර්තමේන්තු තිබෙනවා; ආයතන තිබෙනවා. ගම්වාසීන් මේ අලින් කුපිත කරනවා. එක පැත්තකින් අලි වෙඩි දමන අතරේ, අනෙක් පැත්තෙනුත් අලි වෙඩි දමනවා; ඊට එහා පැත්තෙනුත් අලි වෙඩි දමනවා. මේ තත්ත්වය තුළ අලියා මරාගෙන මැරෙන්න යනවා; ගෙවල් කඩා දමනවා. එම නිසා මෙම අලින් විදේශවලට තෑගි දීමේ යම් ක්‍රමවේදයක් හැදීම වාගේම, සුහද ආනයන අපනයන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම කෙරෙහිත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කනක හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. KANAKA HERATH *left the Chair, and* THE HON. K. THURAIRETNASINGAM *took the Chair.*

[අ.භා.2.21]

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වූ නියෝග දෙකක් හා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ වූ නියෝගයක් පිළිබඳවයි අද අපි කථා කරන්නේ. නමුත්, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු අමුතුම මානසිකත්වයක ඉඳගෙන කථා කරන බවක් අපි දැක්කා. නියං තත්ත්වය නිසා කන්න භයක් වගා කරන්න බැරි වුණු රටක ඉන්න මන්ත්‍රීවරු විධියට අද එතුමන්ලා කථා කරනවා, කෘෂිකාර්මික නිෂ්පාදනය අඩු වෙලාය කියා. කෘෂිකාර්මික නිෂ්පාදනය අඩුවීම ගැන කියන්න දෙයක් නැහැ. කන්න භයක් වගා කටයුතු කරන්න බැරි වුණාම නිෂ්පාදනය අඩු වෙනවා තමයි. ඒ කියන්නේ, එතුමන්ලා පසුගිය කාලයේ ඉඳලා තිබෙන්නේ ලංකාවේ නොවෙයි, ඒරොප්පේ. එතුමන්ලා ඒ විධියට තමයි කථා කරන්නේ.

අපේ නිෂ්පාදන සම්බන්ධයෙන් තිබෙන සංඛ්‍යා ලේඛන ගැන ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කළා. එක දිගට සංඛ්‍යා ලේඛන කියාගෙන කියාගෙන යන්න එතුමා බොහොම දක්ෂයි කියා අප දන්නවා. එහෙම කියාගෙන කියාගෙන ගිහින්, රුපියල් 2,500කින් හතරදෙනෙකුට මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියාත් පසුගිය කාලයේ එතුමා කිව්වා. න්‍යායාත්මක කරුණුවලින් පරිබාහිරව, කටට එන දේ කියන ඒ වාගේ මන්ත්‍රීවරුන් පිරිසක් අද ඒකාබද්ධ විපක්ෂයේ ඉන්නවා.

මෙතුමන්ලා වාහන ගැන කථා කළා. මුලින් කිව්වා, අනවශ්‍ය විධියට වාහන ගෙන්වනවාය කියලා. ඊට පස්සේ කියනවා, වාහන ගෙන්වන එක අඩු කරලාය කියා. පසුගිය කාලයේ පොඩි කාර්වල බද්ද වැඩි කළාය කියා කොපමණ විරෝධතා මතු කළාද?. හැබැයි මැතිවරණයෙන් පස්සේ කුඩා වාහනවල බදු අඩු කරලා වාහන ගෙන්වන්න කෙටි කාලයක් දීලා තිබුණා. ඒ කාලයේ කිව්වා, "වාහන ගෙනෙනවා වැඩියි" කියා. ඊට පස්සේ බද්ද වැඩි කරලා වාහන ගෙන්වන එක සීමා කළාම, "දැන් වාහන ගෙන්වන එක අඩුයි" කියනවා.

අපි දන්නවා, අද ශ්‍රී ලංකාවේ වායු විමෝචන ප්‍රමිතීන් ගැන ප්‍රශ්නයක් තිබෙන බව. ඒ නිසා තමයි යූරෝ 4 වායු විමෝචන ප්‍රමිතීන් සහ ඒ නිර්දේශ අනුගමනය කරන්නේ. එහෙම කරලා, අද මේ ගැසට් පත්‍ර මඟින් නියෝග නිකුත් කිරීම තුළින් පරිසරය සංරක්ෂණය කරන ක්‍රමවේදයක් තමයි යෝජනා කර තිබෙන්නේ.

සමහර මන්ත්‍රීතුමන්ලා මේ සභාවට ඇවිල්ලා කියවන්නේ ගැළපෙන්නේ නැති දේවල්. බලාගෙන ගියාම, මෙතුමන්ලා අද විපක්ෂයේ සිටියාට ජීවත් වෙන්නේ වෙනත් ලෝකවලයි.

මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, අද මේ ගරු සභාවට නියෝග තුනක් ඉදිරිපත් කර තිබෙන බව. මේ නියෝග මඟින් විශේෂයෙන්ම ග්ලයිෆොසේට් අඩංගු වල්නාශක තහනම ඉවත් කර තිබෙනවා. මෙය පසුගිය කාලයේ බරපතළ තත්ත්වයක් බවට පත්වෙලා තිබුණා. ඒ නිසා නිෂ්පාදන වියදම වැඩිවෙලා තිබුණා, අපනයන වෙළෙඳ පොළ විශාල ගැටලුවකට මුහුණ දුන්නා. මේ වනකොට තේ සහ රබර් සඳහා, අදාළ නිර්දේශවලට අනුකූලව ග්ලයිෆොසේට් තහනම ඉවත් කරන්න කටයුතු කර තිබෙනවා. එතකොට, වී ගොවිතැනට මොකද වෙන්නේ කියා ප්‍රශ්නයක් මතු වෙනවා. ග්ලයිෆොසේට් තහනම වී ගොවිතැනට බලපානවා. වීවල නිෂ්පාදන වියදම ඉහළ යන්නේ නැද්ද කියන ගැටලුව මතු වෙනවා. ඒ නිසා වී සඳහාත් නියමිත මාත්‍රාව පිළිපදිමින් ග්ලයිෆොසේට් පාවිච්චි කිරීමට අවස්ථාව දෙන්න කියන යෝජනාව මා ඉදිරිපත් කරනවා.

අද මේ වගාවන් ගැන කථා කරනකොට විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කෑ ගහනවා. එතුමන්ලා පාලන බලයේ ඉන්න කාලයේ ලටෙක්ස් පවා පිට රටවලින් ගෙන්වුවා. සියලුම දේශීය නිෂ්පාදන බදු අය නොකර පිට රටින් ගෙන්වුවා. අමුද්‍රව්‍ය ආනයනය කරලා, අපනයන වෙළෙඳ පොළට නිකුත් කරන අත් මේස් ඇතුළු රබර් නිෂ්පාදනවල සම්පූර්ණ නිෂ්පාදන ක්‍රියාවලිය පසුගිය කාලයේ බිඳ වැටුණා. ඒ ගොල්ලන්ට අද ඒවා මතක නැහැ.

ග්ලයිෆොසේට් ගැන කථා කරන මහාචාර්යවරයෙක් අනුරාධපුර ප්‍රදේශයේ ඉන්නවා. එතුමා පසුගිය කාලයේ ජිනීවා මානව හිමිකම් කොමිසමේ සැසි වාරයකට සහභාගිවෙලා ඇවිත් ලොකුවට කථා කරනවා. පසුගිය රාජපක්ෂ යුගයේ මේ රටේ විදුලි පුටු ප්‍රශ්නයක් තිබුණා; මේ රටට සම්බාධක පැනවීමේ ප්‍රශ්නයක් තිබුණා. සමුළුවේ පසුගිය සැසි වාරයේදී ශ්‍රී ලංකා රජය නියෝජනය කරන්න ගිය රාජ්‍ය නිලධාරීන් හරිහැටි කථා කළේ නැහැය කියා මෙතුමන්ලා අද කථා කරනවා. එහෙම කථා කළේ නැත්නම් අද වනකොට විවිධ ප්‍රශ්න මතුවෙලා තිබෙන්න ඕනෑ. එහෙම කිසි ගැටලුවක් අද ඇතිවෙලා නැහැ. රාජපක්ෂ මහත්මයාගේ විදුලි පුටු ප්‍රශ්නයත් විසඳුවේ යහ පාලන ආණ්ඩුවෙන්ය කියන එක මතක් කර දෙන්න ඕනෑ. ඒ වාගේම අපි දන්නවා, මේ පුද්ගලයන්ගෙන් බහුතරයක් මහාචාර්යවරුන් ලෙස පෙනී සිටිමින්, ස්වේච්ඡා සංවිධාන විධියට පෙනී සිටිමින් කඩේ යන්නේ රාජපක්ෂ මහත්මයාට බව. ග්ලයිෆොසේට් තහනම ඉවත් කරලා තිබෙන්නේ මාස 36කට පමණයි. ඒ මාස 36 ඇතුළත සිදුවන යම් යම් විපර්යාස නිරීක්ෂණය කරලා, ඉදිරියේදී අවශ්‍ය වුණොත් මේ තීන්දු තීරණ වෙනස් කරන්න අවකාශ තබාගෙන තමයි මේ ගැසට් නිවේදන නිකුත් කර තිබෙන්නේ.

ඊළඟට, සෙස් බද්ද සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. සෙස් බද්ද අඩු වැඩි වන නිසා ශ්‍රී ලංකාවේ තේ අපනයනකරුවන්ට, විශේෂයෙන් ව්‍යාපාරිකයන්ට තමන්ගේ ඉදිරි මිල නිවැරැදිව ඉදිරිපත් කරන්න බැරි ප්‍රශ්නයක් තිබුණා.

අද වනකොට කිලෝවකට රුපියල් 10ක සෙස් බද්දක් ගහලා, ස්ථාවරව තමන්ගේ මිල ඉදිරිපත් කරන්න පුළුවන් පසු බිමක් නිර්මාණය කර දීලා තිබෙනවා. හැම දෙයකින්ම බලාපොරොත්තු වන්නේ ප්‍රජාවේ යහපත උදෙසා කියන එක මතක් කර දෙන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදයට ජනතාව යොමු කර ගැනීම තරමක් අපහසු කාර්යයක්. අපි ලබා දෙන ප්‍රජාතන්ත්‍රවාදය භාවිත කරමින්, ප්‍රජාව පීඩනයට පත්කොට බලයට ගෙන ඒමේ ක්‍රියාවලියක් මේ දවස්වල ක්‍රියාත්මක වනවා. බලයේ සිටින කාලයේ ජනමාධ්‍ය ආයතනවලට ඇවිල්ලා ප්‍රසිද්ධියේ තර්ජන ගර්ජන කරපු අය අද ජනමාධ්‍යවේදීන් අසන විවිධ ප්‍රශ්නවලට හිනා මුසු මුහුණින් තමයි උත්තර දෙන්නේ. රතුපස්වල සිද්ධිය, හලාවත කටුනායක සිද්ධිය අපට මතකයි. ලසන්ත වික්‍රමතුංග, ප්‍රගීත් එක්නැලිගොඩ, තාජුඩීන්, කීත් නොයාර්, පෝද්දල ජයන්ත වාගේ පුද්ගලයන්ට මුහුණ දෙන්න සිදු වෙච්ච පසු බිම අපට මතකයි. අද සිනා මුසු මුහුණින් කථා කරන උදවිය එදා මොන තරම් වියරු මට්ටමින්ද තමන්ගේ කටයුතු කළේ කියන එක විශේෂයෙන්ම මතක් කර දෙන්නට ඕනෑ.

අද පොලිස්පතිවරයාට විරුද්ධව විවිධ මත ඉදිරිපත් වනවා. පොලිස්පතිවරයාගේ අඩුපාඩු තිබෙනවා නම් ඒවාට විනය ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අද විපක්ෂයේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මේකයි. මෙච්චර උද්ඝෝෂණ කර, මෙච්චර විරෝධතා කර, මෙච්චර පාරවල් වැහුවත්, අද වනතුරු එක මිනිහෙක් මරා ගන්න බැරි වුණා. ඒ ප්‍රශ්නය තමයි තිබෙන්නේ. පොලීසියෙන් විරෝධතාකරුවන් කීප දෙනෙකුට වෙඩි තියලා මැරුවා නම් අද විපක්ෂයට කථා කරන්න වේදිකාවක් තිබෙනවා, සමාජගත කරන්න මතයක් තිබෙනවා. එහෙම තත්ත්වයක් නැති නිසා පොලිස්පතිවරයාට අද ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. පසුගිය කාලයේ වාගේ ඒකාධිපති වියරුවෙන් මිනිසුන්ට වෙඩි තියන්න, විරෝධතාකරුවන්ට වෙඩි තියලා ඝාතනය කරන්න උපදෙස් දෙන්නේ නැති එකයි තිබෙන ප්‍රශ්නය වන්නේ. "මේ පොලිස්පතිවරයා හරි යන්නේ නැහැ. මේ පොලිස්පතිවරයා සිටින තුරු විරෝධතාකරුවන්ට වෙඩි තියන්නේ නැහැ. එක්කෙනෙක් මරලා දෙන්නේ නැහැ. විපක්ෂයට දේශපාලනය කරන්න විධියක් නැහැ. ඒ නිසා පොලිස්පතිවරයා මාරු කරන්න ඕනෑ." කියා දැන් විවිධ චෝදනා නඟනවා. පොලිස්පතිවරයාගේ ප්‍රශ්න තිබෙනවා නම් ඊට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගන්න ඕනෑ කියා මම පැහැදිලිවම කියනවා. හැබැයි, මෙතැන ක්‍රියාත්මක වෙන්නේ එහෙම එකක් නොවෙයි. තමන්ගේ බංකොලොත් දේශපාලනය ඉදිරියට ගෙන යමින්, අවුරුදු තුනහමාරක්, හතරක් තිස්සේ උද්ඝෝෂණය කරන මිනිහෙක් මරා ගන්න බැරි වෙච්ච නිසා තමයි මේ ගැටලුව ඇතිවෙලා තිබෙන්නේ කියන කාරණය මම මතක් කර දෙන්නට ඕනෑ. [බාධා කිරීමක්]

පසුගිය කාලයේ -2015 ඉඳලා- මේ රටේ අගමැති වෙන්න සිහින මැව්වා. පෝය දෙක තුනකින් ආණ්ඩු මාරු කරන්න කථා කළා. පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ මහින්ද රාජපක්ෂ මහත්තයාට මේ රටේ අගමැති වෙන්න පුළුවන් කියා කිව්වා. හැබැයි, එතුමාට අගමැති වෙන්න බැරි වුණා. විශ්වාස භංග යෝජනා ගෙනැල්ලා මේ රටේ අගමැති වෙන්න හැදුවා. යහ පාලනයේ හිටපු, යහ පාලනයට නොගැළපෙන දහසය දෙනෙකු තමන්ගේ නම් අහගෙන විපක්ෂ නායක වෙන්න උත්සාහ කළා. ඒ එකක්වත් කර ගන්න බැරි වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is Hon. Gnanamuthu Srineshan. ඔබතුමාට විනාඩි 13ක් තිබෙනවා.

[ප.ව. 2.32]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்தச் சபையிலே, இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் கட்டுப்பாட்டுச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதம் நடைபெற்றுக்கொண்டிருக்கின்றது.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

இன்று நாங்கள் எமது நாட்டில் ஏற்றுமதியின் நிலை எவ்வாறிருக்கின்றது, இறக்குமதியின் நிலை எவ்வாறிருக் கின்றது, எமது நாட்டின் கடன் தொகை எவ்வாறிருக்கின்றது, எமது வரவு செலவுத்திட்டத்தின் துண்டுவிழும் தொகை எவ்வாறிக்குக்கின்றது, சென்மதி நிலுவை எவ்வாறிருக்கின்றது, வர்த்தக மீதி எவ்வாறிருக்கின்றது என்றெல்லாம் பல கோணங்களில் எமது நாட்டின் நிதி நிலைமை பற்றி ஆராய வேண்டியிருக்கின்றது. அதேவேளை எமது ரூபாயின் பெறுமதி எவ்வாறிருக்கின்றது என்பதையும் நாங்கள் நோக்க வேண்டியிருக்கின்றது. அந்த வரிசையில் பார்க்கின்றபோது, ஒரு நாடு பொருளாதாரத்தில் ஸ்திரமாக இருக்கவேண்டுமாக இருந்தால், அந்த நாட்டின் ஏற்றுமதியால் கிடைக்கின்ற வருமானம் உயர்ந்திருக்க வேண்டும். அதேவேளை, இறக்குமதியின் அளவு குறைக்கப்பட்டிருக்க வேண்டும். ஆனால், புள்ளிவிபரங்களைப் பார்க்கின்றபோது எமது பொருளாதாரத்தின் நிலைமைகளை எங்களால் கணக்கிட்டுப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. 2016 - 2017ஆம் ஆண்டில் ஒரு புள்ளிவிபரமும் 2017 - 2018இல் மற்றொரு புள்ளிவிபரமும் காணப்படுகின்றது. அதன்படி பார்க்கின்றபோது, இந்த வருடத்தில் எமது பொருளாதார வளர்ச்சி வீதமானது, மொத்தத் தேசிய உற்பத்தியில் 3.2 சதவீதமாகக் காணப்படுகின்றது. கடந்த ஆண்டு அது 3.8 சதவீதமாக இருந்தது. அதாவது 0.6 சதவீதத்தினால் பொருளாதார வளர்ச்சியில் ஒரு பின்தங்கிய நிலை காணப்படுவதை அவதானிக்கக்கூடியதாக இருக் கின்றது. அதேவேளை, 2016 - 2017இற்கு இடைப்பட்ட காலத்தில் தொழிலின்மை வீதத்தினை எடுத்துப்பார்க்கின்ற போது, 2016இல் 4.4ஆக இருந்த தொழிலின்மைச் சதவீதமானது, 2017இல் 4.2 ஆகக் குறைந்திருக்கின்றது. இது ஒரு சாதகமான குறிகாட்டியாக இருக்கின்றது. அதாவது 0.2 வீதத்தினால் தொழிலின்மைச் சதவீதம் குறைந்திருக்கின்றது.

அதேவேளை இன்னுமொரு விடயத்தையும் நான் குறிப்பிட வேண்டும். எமது ஏற்றுமதி, இறக்குமதியினூடாகக் கிடைக்கின்ற வர்த்தக மீதியினைப் பார்க்கின்றபோது, அது மறைகணியத்தில் அதாவது, -9.6 ஆகக் காணப்படுகின்றது. இது எமது பொருளாதார நிலைமையில் பின்தங்கிய ஒரு தன்மையைக் காட்டுகின்றது. இது இவ்வாறிருக்கையில், அரச கடனை எடுத்துப்பார்க்கின்றபோது மொத்தத் தேசிய உற்பத்தியில் அது 77.4 சதவீதமாகக் காணப்படுகின்றது. அதாவது எமது அரச கடனானது 77.4 சதவீதமாகக் காணப்படுவதென்பது எமது மொத்தத் தேசிய உற்பத்தியில் ஏறத்தாழ முக்கால் பகுதியினை நாங்கள் கடனுக்காக செலுத்தவேண்டிய நிலைமை காணப்படுவதனையே இந்தப் புள்ளிவிபரம் கூறுகின்றது. இவற்றையெல்லாம் ஒட்டுமொத்த மாகப் பார்க்கின்றபோது, எமது பொருளாதாரம் ஒரு நேர்க்கணியமான திசையை நோக்கி நகர்ந்து செல்லாது எமது துண்டுவிழும் தொகை அதிகரித்துக் கொண்டு செல்லுகின்ற ஒரு நிலைமையே காணப்படுகின்றது. அண்மையில் நிதியமைச்சர் வெளியிட்ட ஒரு புள்ளிவிபரத்தின்படி இந்த நாடு நான்கு டிரில்லியன் ரூபாய்களை வெளிநாடுகளுக்குக் கடனாகச் செலுத்த வேண்டியிருக்கின்றதென்ற கருத்தினைச் சொல்லியிருந்தார். அந்த வகையில், எமது நாட்டின் பொருளாதாரம் மேம்பட வேண்டுமாக இருந்தால், எமது நாட்டின் ஏற்றுமதி வருமானத்தை எவ்வாறு நாங்கள் அதிகரிக்க முடியும் என்ற விடயத்தில் கவனம் செலுத்த வேண்டியிருக் கின்றது. அதேவேளையில் எமது திறந்த பொருளாதாரக் கொள்கையின் அடிப்படையில் வெளிநாடுகளிலிருந்து இறக்குமதிகளைச் செய்கின்ற அளவு அதிகரித்துச் செல்கின்றது. இறக்குமதிகளின் மூலமாக அந்நியச் செலாவணி யினை குறைத்துக் கொள்ளுகின்ற ஒரு நிலைமைதான் காணப்படுமே ஒழிய அதிகரிப்பதற்குரிய வாய்ப்புகள் இல்லாமல் போய்விடுகின்றன. எமது ரூபாய் நாணயப் பெறுமதியினை உட்பெறுமதி மற்றும் வெளிப்பெறுமதி என இரண்டு முகங்களாகப் பார்க்கலாம். உட்பெறுமதி அடிப்படையில் பார்க்கின்றபோது அதாவது உள்நாட்டு ரீதியாகப் பொருட்கள், சேவைகளைக் கொள்வனவு செய்கின்றபோது எமது ரூபாயின் கொள்வனவுச் சக்தி எவ்வாறு இருக்கின்றது என்பதை நாங்கள் பார்க்கின்றோம். அதேபோல, வெளிப்பெறுமதி அடிப்படையில் எடுத்துப் பார்க்கின்றபோது, வெளிநாட்டு நாணயங்களைக் கொள்வனவு செய்வதற்கு எமது ரூபாயின் கொள்வனவுச் சக்தி எப்படி இருக்கின்றது என்பதைப் பார்க்கின்றோம்.

அந்த அடிப்படையில் பார்க்கின்றபோது, ரூபாயின் உட்பெறுமதி, வெளிப்பெறுமதி என்று சொல்லப்படுகின்ற இந்த இரண்டு பெறுமதிகளும் குறைந்து கொண்டு செல்வதையே நாங்கள் பார்க்கின்றோம். இந்த ரூபாயின் பெறுமதி குறைந்துகொண்டு செல்வதற்கு எமது ஏற்றுமதி, இறக்குமதியில் காணப்படுகின்ற ஒரு சமனின்மை காரணமாக இருக்கின்றது. இந்த ரூபாயின் உட்பெறுமதி, வெளிப்பெறுமதி ஆகிய இரண்டு பெறுமதிகளும் குறைந்துகொண்டு செல்கின்ற நிலையில், எமது ஏற்றுமதியின் அளவு எங்களுக்குச் சாதகமாக இருக்கின்றதா? இறக்குமதியின் அளவு எந்தளவிற்கு எங்களுக் குப் பாதகமாக இருக்கின்றது? போன்ற விடயங்களை நோக்கவேண்டிய நிலையிலிருக்கின்றோம். இதன்மூலமாக எமது ரூபாய் நாணயத்தின் உறுதித் தன்மை குறைந்து கொண்டு செல்கின்றபோது உள்நாட்டு, வெளிநாட்டு முதலீடுகள் குறைகின்ற ஒரு நிலைமையை, பாதிப்படைகின்ற தன்மையை நோக்கக் கூடியதாக இருக்கின்றது. எமது நாணயத்தின் பெறுமதி அடிக்கடி வீழ்ச்சியடைந்து கொண்டிருக்கின்றபோது, வெளிநாட்டு முதலீட்டாளர்கள் இங்கு முதலிடுவதை விரும்பாத ஒரு தன்மையை அது ஏற்படுத்துகின்றது. அதேவேளை, வெளிநாட்டுப் பொருட்களை அடிப்படையாகக் கொண்ட முதலீட்டாளர்கள் பெருமளவு பாதிப்படையக்கூடிய ஒரு நிலைமையிருக்கின்றது. மொத்தத்தில் பார்க்கின்றபோது, ரூபாயின் மதிப்பிறக்கத்தினால் இறக்குமதிப் பொருட்களின் விலை அதிகரித்துக்கொண்டு செல்கின்ற தன்மையிருக் கின்றது. அதாவது, அமெரிக்க டொலரோடு ஒப்பிட்டு எமது ரூபாயைப் பார்க்கின்ற நிலையில், ஓர் அமெரிக்க டொலர் 160 ரூபாயாக இருந்போது, அண்மையில் ஓர் அரிசி ஆலைக்கான இயந்திர சாதனத்தை இறக்குமதி செய்வதற்காக ஒரு நிதியறிக்கை சமர்ப்பிக்கப்பட்ட போது, சம்பந்தப்பட்டவர்கள் கணித்த தொகை 42,000,000 ரூபாயாக இருந்தது. சில நாட்களின் பின்னர் பார்க்கின்றபோது, 160 ரூபாயாக இருந்த டொலருக்கான ரூபாய்ப் பெறுமதி திடீரென்று 10 - 12 ரூபாயினால் அதிகரித்துக் காணப்பட்டது. அந்த வகையில், குறுகிய காலத்தில் அந்த இயந்திர சாதனத்தை இறக்குமதி செய்வதற்காகச் செலவு செய்யவேண்டிய தொகை அதிகரித்துக் காணப்பட்டதை அவதானிக்கக்கூடியதாக இருந்தது.

எது எப்படியாக இருந்தாலும், எமது இலாபம் குறைவது, நட்டம் அதிகரிப்பது, தொழிற்சாலைகள் மூடப்படுகின்ற நிலைமை, உள்ளூர் உற்பத்திப் பொருட்கள் வெளிநாட்டு உற்பத்திப் பொருட்களோடு போட்டியிட முடியாத நிலைமை, தொழில்வாய்ப்புக் குறைந்து செல்கின்ற நிலைமை, வாழ்க்கைச் செலவு அதிகரித்துக்கொண்டு செல்கின்ற ஒரு போக்கு, சேமிப்புக் குறைவடைதல், முதலீடு குறைவடைதல் போன்றவை இந்த ரூபாயின் மதிப்பிறக்கத்தினால் ஏற்படு

கின்ற பாரிய விளைவுகளாக இருக்கின்றன. எனவே, இவற்றுக்கான தீர்வுகளைக் காணக்கூடிய விதத்தில் எமது விவசாயப் பொருளாதாரம், கைத்தொழில் பொருளாதாரம் என்பவற்றைத் திட்டமிட்டுச் செயற்படுத்தவேண்டிய ஒரு நிலைமை இங்கு உணரப்படுகின்றது. அந்த அடிப்படையில் நான் இங்கு ஒரு விடயத்தைச் சுட்டிக்காட்ட வேண்டும். அதாவது, 1970ஆம் ஆண்டிலிருந்து 1977ஆம் ஆண்டு வரையான ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியின் ஆட்சிக் காலத்தில், சிறிமா அம்மையார் பொருளாதாரத்தில் ஓர் இறுக்கமான நிலைமையினைக் கடைப்பிடித்தார். அதாவது, ஒரு மூடப்பட்ட பொருளாதார நிலைமையினை ஏற்படுத்தியபோது, அந்தக் காலத்தில் வடக்கு, கிழக்குப் பகுதியில் உள்ளூர் பொருளாதாரத்தில் அபரிமிதமான அதிகரிப்பைப் பார்க்கக் கூடியதாக இருந்தது. உள்நாட்டு விவசாயிகள் தங்களது உற்பத்தியில் கரிசனைகொண்டு, மிகக் கூடுதலான விவசாயப் பொருட்களை உற்பத்தி செய்ததன் மூலமாக "வீட்டிலும் தன்னிறைவு, நாட்டிலும் தன்னிறைவு" என்ற அடிப்படையில் நாட்டின் பொருளாதாரத்தை விவசாயத்தின் மூலமாகக் கட்டியெழுப்பக்கூடிய ஒரு தன்மை காணப்பட்டது. அதற்குப் பின்னர் கொண்டுவரப்பட்ட திறந்த பொருளாதாரக் கொள்கையினால் எமது ஏற்றுமதிகளைக் குறைக்கின்ற நிலைமையும் இறக்குமதிகளை அதிகரிக்கின்ற நிலைமையும் காணப்பட்டபடியால், வரவு செலவுத்திட்டத்தில் ஏற்படுகின்ற துண்டுவிழும் தொகை அதிகரிக்கின்ற அதேவேளையில், எமது பொருளாதாரத்திற்கு ஒரு பாதகமான தன்மை ஏற்படக்கூடிய நிலைமை காணப்பட்டது. வடக்கு, கிழக்கில் வாழ்கின்றவர்கள் - மனித சக்திகள் நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு ஏற்ற விதத்தில் செயற்படுவதற்குத் தயாராக இருக்கின்றார்கள். எனவே, அவர்களை ஊக்குவிக்கக்கூடிய விதத்தில் இந்த அரசாங்கம் அவர்களுக்குரிய சாதனங்களை வழங்கவேண்டும். அவர்கள் எமது பொருளாதாரத்தின் பங்குதாரர்களாக இருந்து இந்த நாட்டை முன்னேற்றுவதற்கு ஏற்ற விதத்தில் அவர்களுக்குரிய சாதகமான சமிக்கைகளை இடவேண்டிய ஒரு தேவைப் பாடிருக்கின்றது. ஏற்றுமதியின் அளவுகளை அதிகரித்துக் கொண்டு, இறக்குமதியின் அளவுகளைக் குறைக்கக்கூடிய நிலைப்பாடிருக்கின்றது என்ற விடயத்தைச் சுட்டிக் காட்டுவதோடு, சமகாலத்தில் காணப்படுகின்ற சில பிரச்சினைகளையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அண்மையில் தொண்டராசிரியர்களுக்கான நிரந்தர நியமனம் தொடர்பாகத் தொண்டராசிரியர்கள் பல முயற்சி களை எடுத்திருந்தார்கள். வட மாகாணத்தில் தொண்டர் ஆசிரியர்களுக்கான நிரந்தர நியமனங்கள் கொடுக்கப் பட்டிருக்கின்றன. ஆனால், இன்னும் கிழக்கு மாகாணத்தில் தொண்டராசிரியர்களுக்கான நிரந்தர நியமனங்கள் வழங்கப்படவில்லை. வருகின்ற நவம்பர் மாதத்தில் அந்தத் தொண்டராசிரியர்களுக்கான நிரந்தர நியமனம் கொடுக்கப் படவுள்ளதாகக் கூறப்படுகின்றது. எனவே, நீண்ட காலமாகப் பணியாற்றிய அந்தத் தொண்டராசிரியர்களுக்கான நிரந்த நியமனங்கள் வழங்குவதை நல்லாட்சி அரசாங்கம் துரிதப்படுத்த வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். பட்டதாரி நியமனத்துக்கான நேர்முகப் பரீட்சையின்போது உள்வாரி, வெளிவாரி என்பது முன்பு பார்க்கப்படவில்லை. திடீரென்று உள்வாரியாகக் கல்வி கற்றவர்களுக்குச் சந்தர்ப்பம் கொடுக்கப்பட்ட அதேவேளையில், வெளிவாரியாகக் கல்வி கற்றவர்களுக்கு உரிய சந்தர்ப்பம் மறுக்கப்பட்டிருப்பது, அவர்களுக்கு மன உளைச்சலை ஏற்படுத்துகின்ற ஒரு விடயமாக இருக்கின்றது. அதேவேளை, பட்டதாரி நியமனத்துக்கான வயதெல்லை 45 ஆக வரையறுக்கப்பட்டு இருக்கின்றபோதிலும், தற்போது 43 - 44 வயதுகளில் இருக்கின்றவர்கள் இன்னும் புறக்கணிக்கப்படுகின்றபோது, அவர்கள் பட்டதாரி நியமன வயதெல்லையைக் கடந்த பின்னர், அரச தொழில்வாய்ப்புகளைப் பெறுவதற்குரிய வாய்ப்பு அவர்களுக்குக் குறைவாக இருக்கின்றது. எனவே, இந்த சிரேஷ்ட வயதில் காணப்படுகின்றவர்களுக்கு முன்னுரிமை வழங்கப்படவேண்டும் என்பதைக் கூறிக்கொள்ள விரும்புவதோடு, உடற்பயிற்சியாளர்களின் நியமனம் தொடர்பாகவும் இங்கு சொல்லவேண்டும். Coach என்று சொல்லப்படுகின்ற உடற்பயிற்சியாளர் நியமனம் நீண்ட நாட்களாக வழங்கப்படாமல், இழுபறிநிலையில் இருக்கின்றது. எனவே, இந்த உடற்பயிற்சியாளர்களுக்குரிய நியமனங்களை அரசு துரிதமாக வழங்கி, அவர்களுடைய எதிர்பார்ப்புகளை நிறைவேற்ற வேண்டும். கடந்த காலத்தில் அந்த நியமனம் விரைவாக வழங்கப்படுவதாகக் கூறப்பட்டது. எனினும், இப்போது இழுபறிநிலையில் காணப்படுகின்றபடியால், physical education உடன் சம்பந்தப்பட்ட உடற்பயிற்சியாளர் அல்லது coach நியமனத்தினைத் துரிதப்படுத்தவேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன்.

இன்று தமிழ் அரசியல் கைதிகள் நீண்டகாலமாக உண்ணாவிரதம் இருந்துகொண்டிருக்கிறார்கள். எனவே, இந்த விடயத்தை மனிதாபிமான அடிப்படையில் அணுகி, அவர்களுக்குரிய தீர்வினைப் பெற்றுக்கொடுப்பதற்கு நல்லாட்சி அரசாங்கம் முயற்சி செய்யவேண்டும். கடந்த காலத்தில் தென்பகுதியில் ஏற்பட்ட புரட்சியின்போது கைது செய்யப்பட்டுச் சிறையில் அடைக்கப்பட்டிருந்த கைதிகள் பொதுமன்னிப்பின் அடிப்படையில் விடுதலை செய்யப்பட்ட வரலாறுகள் இருக்கின்றபடியால், இந்தத் தமிழ் அரசியல் கைதிகள் விடயத்திலும்கூட, அவ்வாறான ஒரு போக்கினைக் கடைபிடிக்கவேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன். சனாதிபதி அவர்கள் United Nations General Assembly இல் - ஐக்கிய நாடுகள் சபையில் உரையாற்றுகின்றபோது, உள்நாட்டுப் பிரச்சினைகளைத் தீர்க்கக்கூடிய இயலுமை தன்னிடம் இருப்பதாகக் குறிப்பிட்டிருந்தார். ஆகவே, இந்த இயலுமையைப் பயன்படுத்தி, உள்நாட்டில் இருக்கின்ற இவ்வாறான பல்வேறுபட்ட பிரச்சினைகளைத் தீர்ப்பதன் மூலமாக, அவர் மீது மக்கள் நம்பிக்கை கொள்ளக்கூடிய ஒரு நிலைமையை உருவாக்கவேண்டும் என்று கூறி, எனது உரையினை நிறைவுசெய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
நன்றி. அடுத்ததாக, கௌரவ அரவிந்த் குமார் அவர்கள்!

[பி.ப. 2.44]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி. இன்று இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் (கட்டுப்பாட்டுச்) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தப்பட்ட விவாதத்திலே நாங்கள் கலந்து கொண்டிருக்கிறோம். இதிலே விசேடமாக glyphosate எனும் கிருமிநாசினி தொடர்பான விடயம் குறிப்பிடப்பட்டிருக்கின்றது. எமது நாடு ஒரு விவசாய நாடு என்பதிலே எவ்விதச் சந்தேகத்துக்கும் இடமில்லை. ஆனால், இன்று எமது நாட்டில் உற்பத்தி செய்யப்படும் அனைத்து விவசாயப் பொருட்களும் கிருமிநாசினியினூடான ஒரு செயற்கையான உற்பத்திகளாக மாறிப்போயிருக்கின்றன. உரத்தை எடுத்துக்கொண்டாலும், அதுகூட செயற்கையான உரம்! விவசாயச் செய்கையில் கிருமிநாசினிகளின் பாவனை

[ගරු අ. අරවින්ද් කුමාර් මහතා]

මික අධිකමාක இருக்கின்றதென்று சொல்லிக்கொண்டே இன்று சம்பந்தப்பட்டவர்கள் கிருமிநாசினிப் பாவனையில் மூழ்கிப் போயிருக்கின்றார்கள்.

இன்று சந்தைக்குப் போனால், அங்கு மிகப் பளபளப்புடன் பிரகாசிக்கும் மரக்கறி வகைகளை எங்களால் பார்க்கக்கூடிய தாக இருக்கின்றது. இவ்வாறு சந்தையிலே விற்பனைக்குள்ள அனைத்து மரக்கறி வகைகளும் மினுமினுப்புடன்கூடிய தன்மையைக் கொண்டிருப்பதற்கான முழுமையான காரணம், கிருமிநாசினிகளின் பாவனைதான் என்பதிலே சந்தேகமில்லை. அப்படியென்றால், நாங்கள் தினந்தோறும் உட்கொள்ளும் மரக்கறி, கோதுமை, அரிசி வகைகள் என அனைத்தும் கிருமி நாசினிகளுடன்கூடிய உணவுப்பொருட்களாகவே மாறிப் போயிருக்கின்றன. அதன் தாக்கத்தினால் உடலில் சிறிது சிறிதாக நஞ்சுத்தன்மை ஏற்பட்டு மனிதனுடைய உடல் நச்சுத்தன்மையுடன்கூடிய உடலாக மாறும். இதனால் இன்று ஒவ்வொருவரும் நோய்வாய்ப்புக்குட்படும் நிலைமை ஏற்படுகின்றது. பழவகைகள்கூட கிருமிநாசினிகளுடன் கூடியதாகத்தான் இருக்கின்றன. இதனால்தான் பல வகைகள் மிகப் பளபளப்பாக இருப்பதை எங்களால் உணரக்கூடியதாக இருக்கின்றது. அப்படியென்றால், நாங்கள் அனைவரும் தெரிந்துகொண்டே கிருமிநாசினிகளுடன்கூடிய உணவுப் பொருட்களை உட்கொள்ளும் நிலைமை மேலோங்கி இருக்கின்றது. இவ்வாறான உணவுகளை உட்கொள்வதன் காரணமாக மனிதர்களின் உடல் நோய்வாய்ப்புக்குட்படுகின்ற மற்றும் இயற்கையான உடல் ஆரோக்கியத்தை இழக்கின்ற நிலைமைகள் ஏற்படுவதை அவதானிக்கக்கூடியதாக இருக்கின்றது.

இந்த glyphosate கிருமிநாசினி விசேடமாக புற்களை இல்லாமலொழிப்பதற்காகப் பாவிக்கப்படுகின்றது. இது தோட்டப்புறங்களில் பல தசாப்த காலமாக மிக உச்சக்கட்டப் பாவனையில் இருந்துவந்தது. இந்த glyphosate இன் நச்சுத்தன்மை சிறுநீரக நோய்களை அதிகமாக ஏற்படுத்துகின்றதென்ற காரணத்தை முன்வைத்து glyphosate பாவனை அண்மைக் காலத்திலே தடை செய்யப்பட்டது. அதன் தாக்கம் தோட்டப்புறங்களை விசேடமாக, தேயிலைத் தோட்டங்களுள்ள பிரதேசங்களை வெகுவாகப் பாதித்தது. இந்த நிலையில் புற்களை இல்லாதொழிப்பதற்காகப் பாவிக்கப்பட்ட இந்த glyphosateக்கு மாற்றீடான களை நாசினிகளைத் தோட்ட நிருவாகிகள் அறிமுகப்படுத்தவில்லை. இந்த glyphosate இனைவிட ஏனைய கிருமிநாசினிகளின் விலை மிக அதிகம் என்பதனால், தோட்டப்புறங்களிலே தோட்ட நிருவாகங்கள் அதன் பாவனையைக் கைவிட்டன. அதன் காரணமாக ஒட்டுமொத்தமாக அனைத்துத் தோட்டங்களும் புற்காடுகளாக மாறிப்போயின. தேயிலைச் செடிகளை மேலோங்கிப் புற்கள் முளைத்து, செடி கொடிகள் முளைத்து தோட்டப்புறங்களிலே தொழிலாளர்கள் வேலை செய்ய முடியாத அளவுக்கு மிக மோசமாகக் காட்சியளித்தன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் 3 நிமிடங்கள் உள்ளன.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

இந்த நிலையில் தோட்ட நிருவாகிகளும் அனைத்துக் கம்பனிக்காரர்களும் மீண்டும் இந்த glyphosate பாவனையை அனுமதிக்குமாறு கோரிக்கை முன்வைத்தார்கள். இன்று அந்த glyphosate பாவனைக்கான அனுமதி கிடைத்திருக்கின்றது. இந்நேரத்தில் இன்னுமொரு விடயத்தை நாங்கள் பார்க்க வேண்டி இருக்கின்றோம். அதாவது தோட்டங்கள் அனைத்தும் மலைகளிலே - உயர்ந்த நிலப்பரப்புக்களிலே அமைந்திருக் கின்றன. ஆறாக இருக்கலாம், குளமாக இருக்கலாம், வாவிகளாக இருக்கலாம். நீர் நிலைகள் அனைத்தும் கீழ் நிலத்தில்தான் காணப்படுகின்றன. அது இயற்கையான அமைப்பாகும். முன்பெல்லாம் தோட்டங்களிலே agricultural practice என்று சொல்லப்படும் விவசாயச் செயற்பாட்டுகளின் போது கான் வெட்டுவது மிகப் பிரதானமானதொரு செயற்பாடாக இருந்தது. தேயிலைத் தோட்டங்களிலே வரிசையாக நடப்பட்டிருக்கும் செடிகளுக்கிடையில் இந்தக் கான்கள் வெட்டப்பட்டு வந்தன. மழைக் காலங்களில் அதிலே நீர் தேங்கியிருக்கும். வெயில் காலங்களில் தேயிலைச் செடிகள் அந்த நீரை உறிஞ்சிக்கொள்ளும் வண்ணமே இவ்வாறு கான்கள் ஒவ்வொரு தோட்டத்திலும் வெட்டப்பட்டு வந்தன. ஆனால், தோட்ட நிர்வாகங்கள் இலாபங்கருதி இவ்வாறு கான்கள் வெட்டும் முறையை இப்பொழுது கைவிட்டுவிட்டன. இந்த glyphosate பாவனையினூடாகக் கீழேயிருக்கும் நீர் நிலைகள் கிருமிநாசினியுடன் கூடிய தன்மையைக் கொண்டிருக்கின்றன என்ற குற்றச்சாட்டில் ஓரளவுக்கு உண்மையிருக்கின்றதை நான் இந்த இடத்திலே ஏற்றுக் கொண்டே ஆகவேண்டும். ஏனெனில், தோட்டங்களில் கிருமி நாசினிகள் தெளிக்கப்படும்போது, அவை அந்த மலைகளிலே மண்ணோடு மண்ணாகப் படர்ந்திருக்கும். மழை பெய்யும் போது அவை கழுவப்பட்டு வந்து இந்தக் கான்களிலே தங்கிவிடும். அவை கீழே வருவதற்கான வாய்ப்பில்லை. ஆனால், இப்பொழுது தோட்ட நிர்வாகங்கள் இலாபம் கருதி இந்தக் கான் வெட்டும் செயற்பாட்டைக் கைவிட்டதன் காரணமாக மழைகாலங்களிலே அனைத்து நீரும் வழிந்தோடி வந்து கீழேயிருக்கும் ஆற்றிலும் குளத்திலும் வாவிகளிலும் கலக்கும் ஒரு தன்மை ஏற்பட்டிருக்கின்றது.

ஆகவே, glyphosate பாவனையைத் தோட்ட நிர்வாகங் களுக்கு அனுமதிப்பதென்பது நிபந்தனையுடன்கூடிய தாக இருக்கவேண்டும். இந்தக் கான் வெட்டுதலை draining என்று ஆங்கிலத்திலே சொல்வார்கள். கான் வெட்டுவதை மீண்டும் தோட்டங்களில் அமுல்படுத்தினால் மாத்திரமே glyphosate பாவனையை மேற்கொள்ள முடியும் என்ற நிபந்தனையைப் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு விதிக்க வேண்டும் என்பதே எனது கருத்தாக இருக்கின்றது; நிலைப்பாடாக இருக்கின்றது. அவ்வாறு செய்தால், இந்த glyphosate பாவனையினூடாகச் சிறுநீரகக் கோளாறு வருவதை ஒரு மட்டத்திற்குத் தவிர்க்கக் கூடியதாக இருக்கும். தவிர்க்கலாம் என்ற நம்பிக்கையிருக்கின்றது என்பதைத் தெரிவித்து, வாய்ப்பளித்த அவைத் தலைவர் அவர்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා කථා කළාට පස්සේ මම කථා කරන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා.2.53]

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගැනෙන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග දෙකක් වාගේම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගයක් පිළිබඳව කථා කරන මේ මොහොතේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. වර්තමානයේ අපේ ආර්ථිකය කෘෂි කර්මාන්ත, කර්මාන්ත සහ සේවා කියන අංශවලින් සමන්විත වෙනවා. මේ ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීමේදී සහ මේ රටේ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් කටයුතු කිරීමේදී විශේෂයෙන්ම වර්තමාන ආණ්ඩුවේ ක්‍රියා පිළිවෙත පිළිබඳව අපි කථා කළ යුතු වෙනවා. මීට කලින් මේ සභාවේ පළ කළ අදහස්වලට මා සවන් දුන්නා. ඔවුන් විවෘත ආර්ථිකය - වෙළෙඳ පොළ ආර්ථිකය- ගැන කථා කළා. වෙළෙඳ පොළ ආර්ථිකය - විවෘත ආර්ථිකය- ගැන කථා කරන කොට ආනයන හා අපනයන වෙළඳාම ගැන අපට කථා කරන්න සිදු වෙනවා. ආනයන හා අපනයන වෙළඳාම ගැන කථා කරන කොට මේ රටේ තිරසාර සංවර්ධනය පිළිබඳව අපට අවධානය යොමු කරන්න වෙනවා. තිරසාර සංවර්ධනය -කල්පවත්නා සංවර්ධනය- වෙනුවෙන් මේ රටේ පරිසරය ආරක්ෂා කර ගැනීම පිළිබඳව අපේ අවධානය යොමු කරන්න වෙනවා.

රටක් සංවර්ධනය කරන කොට, රටක භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වැඩි කරන කොට, අපනයන ආදායම වැඩි වෙන කොට, මේ රට සංවර්ධනය වෙන කොට අපට යම් ප්‍රමාණයක ස්වාභාවික සම්පත් කැප කරන්න වෙනවා. මවක් දරුවෙක් බිහි කරන කොට තමන්ගේ ශරීරයේ යම් ප්‍රමාණයක් ක්ෂය වෙනවා වාගේම සංවර්ධනය වෙනුවෙන් පරිසරය යම් ප්‍රමාණයක් කැප කිරීමට වෙනවා. ඒ, වනාන්තර වෙන්න පුළුවන්; ස්වභාවික වාතය වෙන්න පුළුවන්; ජලය වෙන්න පුළුවන්; ඉඩකඩම් වෙන්න පුළුවන්. මේ සියලු දේවල් -විශේෂයෙන් භෞතික ප්‍රාග්ධනය- කැප කරන්න වෙනවා. හැබැයි, අනාගත පරපුර දිහා බලා, අනාගත පරිසර ආරක්ෂාව පිළිබඳව බලා වර්තමාන සංවර්ධන තීන්දු, තීරණ ගන්න අපි කටයුතු කරන්න ඕනෑ කියන කාරණය අපි කවුරුත් පිළිගන්නවා.

අද ඉදිරිපත් කරනු ලැබූ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග සම්බන්ධයෙන් කථා කරද්දී විශේෂයෙන්ම ග්ලයිෆොසේට් පිළිබඳව කථා කළා; අපි අහගෙන හිටියා. පසු ගිය ජනාධිපතිවරණයේදී වේදිකාවල ග්ලයිෆොසේට් සම්බන්ධයෙන් කථා කළා. ග්ලයිෆොසේට් කියන වල්නාශකය කෘෂි කර්මාන්තයේදී -පාරිභෝගික කෘෂි කර්මාන්තය වෙන්න පුළුවන්, වැවිලි කෘෂි කර්මාන්තය වෙන්න පුළුවන්.- භාවිතය බරපතළ විධියට යොදා ගත්තා. ඒ හේතුවෙන් සමාජයේ කථිකාවක් මතු වුණා. ඒ කථිකාව තමයි, ග්ලයිෆොසේට් භාවිතය නිසා වකුගඩු රෝගය සහ පිළිකා රෝගය මේ රටේ බරපතළ සෞඛ්‍ය ප්‍රශ්නයක් බවට පත් වෙනවා කියන එක. විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කය, පොළොන්නරුව දිස්ත්‍රික්කය, අනුරාධපුර දිස්ත්‍රික්කය, හම්බන්තොට දිස්ත්‍රික්කය වාගේ දිස්ත්‍රික්කවල වකුගඩු රෝගීන් වැඩි වීම ඒ වාගේම පිළිකා රෝගීන් වැඩි වීම බරපතළ කාරණයක් බවට පත් වුණා. විශේෂයෙන් කෘෂි කර්මාන්තයට සම්බන්ධ පවුල්වලට තමයි මේ වාගේ සෞඛ්‍ය ප්‍රශ්නවලට බරපතළ විධියට මුහුණ දෙන්න සිද්ධ වුණේ. මේ නිසා තමයි තීන්දුවක් අරගෙන ආණ්ඩුව ආරම්භයේදීම ග්ලයිෆොසේට් තහනම් කළේ. හැබැයි, ඒ නිසා වැවිලි කර්මාන්තයේ ඒ වාගේම පාරිභෝගික කෘෂි කර්මාන්තයේ සමහර ගොවීන් මේ පිළිබඳව කනස්සල්ලෙන් පසු වුණා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි, කෘෂි කර්මාන්තය නැත්නම් වැවිලි කෘෂි කර්මාන්තය වෙනුවෙන් මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති වෙනස් කළේ. පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳව ආණ්ඩුව ගත් ඒ ප්‍රතිපත්තිය වෙනස් කිරීමට සිද්ධ වුණේ එක අතකින් නිෂ්පාදනය, අනෙක් පැත්තෙන් සෞඛ්‍ය කියන මේ දෙකම බේරාගෙන කටයුතු කරන්න අමාරු නිසායි.

කොහොම වුණත් අපි දකිනවා, පරිසරය ආරක්ෂා කර ගත්තොත් තමයි මානවයා ආරක්ෂා කර ගන්න පුළුවන් වන්නේ කියලා. අද පෙනී යනවා, විශේෂයෙන්ම විදේශ වෙළෙඳාමේදී අපනයන ආදායම සුළු ප්‍රමාණයකින් වැඩි වුණත් ආනයන වියදම බරපතළ විධියට වැඩි වෙලා තිබෙන බව. ආනයන - අපනයන අතර පරතරය ඩොලර් බිලියන නවයක් විතර වෙනවා. අද අපනයන ආදායම ඩොලර් බිලියන 11ක් වෙන කොට, ආනයනය වියදම ඩොලර් බිලියන 21ක් බවට පත් වෙලා තිබෙනවා. මේ නිසා වෙළෙඳ හිඟය, වෙළෙඳ ශේෂය මේ රටට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ නිසා ආර්ථිකය සංවර්ධනය කරන කොට අවධානය යොමු කරන්නට ඕනෑ, අපනයන ආදායම වැඩි කර ගන්නයි. අපනයන ආදායම වැඩි කරනවා කියලා අදහස් ඉදිරිපත් කළාට ප්‍රමාණවත් වන්නේ නැහැ. අපනයන ආදායම වැඩි කළ යුතුයි කියලා වේදිකා ගණනේ කෑ ගැසුවාට වැඩක් නැහැ. ඒ ගැන විපක්ෂයට චෝදනා-අවලාද නැඟුවාට වැඩක් වෙන්නේ නැහැ. ආණ්ඩුව ඒ සම්බන්ධව ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වෙන්න ඕනෑ. අද අපනයන විවිධාංගීකරණය ගැන කථා කරනවා; අපනයනවල ගුණාත්මක තත්ත්වය වැඩි කරන්න කථා කරනවා; අපනයන නිෂ්පාදන වැඩි කරන්න හදනවා. ඒ තුළින් අපනයන ආදායමේ වැඩිවීමක් අපට අපේක්ෂා කරන්නට බැහැ. අද බලන්න, තේ වගාවට වෙලා තිබෙන්නේ මොකක්ද? රබර් වගාවට මොකක්ද, වෙලා තිබෙන්නේ? ඒ වාගේමයි පොල් වගාව. මේවා සාම්ප්‍රදායික අපනයන. මේ සාම්ප්‍රදායික අපනයනවලට අද අගය එකතු කිරීමක් සිද්ධ වෙන්නේ නැහැ. අද ජාත්‍යන්තර වෙළෙඳාමේදී අගය එකතු කිරීම තුළින් තමයි අපනයන ආදායම වැඩි කරන්න පුළුවන් වෙන්නේ; අපනයනයට තිබෙන ඉල්ලුම වැඩි කරගන්න පුළුවන් වෙන්නේ; අලුත් වෙළෙඳ පොළවල් සොයා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. හැබැයි, අපනයනවල ගුණාත්මක තත්ත්වය වැඩි නොකර, අපනයන නිෂ්පාදන ප්‍රමාණය වැඩි නොකර, අපට මේ අපනයන ආදායම වැඩි කර ගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

ඊළඟට, පර්යේෂණ තුළින්, අත්හදා බැලීම් තුළින් ජාත්‍යන්තර ප්‍රජාවගේ ඉල්ලුම වැඩි වෙන විධියේ නිෂ්පාදන අපි වෙළෙඳ පොළට මුදා හරින්න ඕනෑ. මොකක්ද, ඒකට ආණ්ඩුවේ තිබෙන ප්‍රතිපත්තිය? සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය මේ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවාද? එහි ප්‍රතිඵලයක් විධියට අපනයන ආදායම වැඩි වෙලා තිබෙනවාද? නැහැ. එක පැත්තකින් අපි රටවල් එක්ක වෙළෙඳ ගිවිසුම් අත්සන් කරනවා. ලංකාවට අවාසිදායක කොන්දේසි පදනම් කරගෙන තමයි මේ වෙළෙඳ ගිවිසුම් අත්සන් කරන්නේ. මේ නිසා ලංකාවට ලැබෙන තීරුබදු සහනය අඩු වෙනවා. හැබැයි, ආනයන වියදම දිගින් දිගටම වැඩි වෙනවා. මේ රටට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, මේ රටට අවශ්‍ය අමු ද්‍රව්‍ය වාගේම ප්‍රාග්ධන භාණ්ඩ ගෙන්වීම නිසා නිරන්තරව අපේ ආනයන වියදම වැඩි වෙනවා.

එක පැත්තකින් ඩොලරයේ අගය වැඩි වෙනකොට, රුපියලේ අගය පිරිහෙනවා. දෛනිකව ඉර බහිනවා වාගේ තමයි රුපියලේ අගය පිරිහෙන්නේ. ඒ තරමටම මේ ආණ්ඩුවේ පැවැත්මත් අඩු වී

[ගරු විජිත බේරුගොඩ මහතා]

இந்த அரசாங்கத்தை ஆட்சிபீடம் ஏற்றியவர்கள் மலையக மக்கள்! இந்த நாட்டில் பல ஜனாதிபதிகளை ஆட்சிக்குக் கொண்டு வந்தவர்கள் மலையக மக்கள்! இந்த அரசாங்கத்திற்கு உந்துசக்தியாக இருப்பவர்கள் மலையக மக்கள்! ஆகவே, இவர்களின் சம்பள உயர்வு விடயத்திலே அனைவரும் கவனம் செலுத்த வேண்டும். நாங்கள் வீதிக்கு இறங்கிப் பல போராட்டங்களை நடத்தியிருக்கின்றோம்; பாராளுமன்றத்தில் போராட்டம் நடத்தியிருக்கின்றோம்; கைது செய்யப்பட்டிருக் கின்றோம். இவை அனைத்தும் எங்களது அறிவுக்கு எட்டிய வரையில் அநாவசியமான விடயங்களல்ல. அதாவது, தொழிற்சங்கப் போராட்டத்தை நடத்தி, அரசியல் ரீதியிலே குரல்கொடுத்தோம். அப்பாவித் தோட்டத் தொழிலாளர் களுடைய சம்பளத்தை உயர்த்துவதற்காகவே இவை அனைத்தையும் செய்தோம். எனவே, இந்த உயரிய சபை இந்தத் தோட்டத் தொழிலாளர்களது சம்பள உயர்வு தொடர்பாக நடவடிக்கையெடுக்க வேண்டும். அந்த வகையில் தோட்டத் தொழிலாளர்களுக்கு 1,000 ரூபாய் சம்பளம் வழங்கவேண்டுமென்று 22 தோட்டக் கம்பனிகளுக்கும் அரசாங்கம் கட்டளையிட வேண்டும். அவ்வாறு கட்டளையிட்டால்தான் தோட்ட நிர்வாகத்தினர் நிச்சயமாக 1000 ரூபாய் சம்பள உயர்வு கொடுப்பார்கள். 1,000 ரூபாய் சம்பளம் கொடுத்தால்தான் நாங்கள் மரியாதையோடும் கௌரவத்தோடும் இந்தப் பாராளுமன்றத்தில் வந்து அந்த மக்களுக்காக உரையாற்ற முடியும். ஆகவே, அனைவரும் அதற்காகக் குரல்கொடுக்க வேண்டும். 1,000 ரூபாய் அடிப்படைச் சம்பளம் கொடுக்காவிட்டால் பாரிய பிரச்சினைக்கு இந்தத் தோட்டக் கம்பனிகள் முகம்கொடுக்க நேரிடும்; எங்களுடைய போராட்டத்தின் வடிவமும் மாறும் என்று இந்த உயரிய சபையிலே கூறிக்கொண்டு விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඕළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

[අ.භා.4.04]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතියි.

පළමුවෙන්ම කියන්න ඕනෑ, අද උදේ සාකච්ඡා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැන. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අමු බොරු එකක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු පියංකර ජයරත්න මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Law and Order)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු පියංකර ජයරත්න මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ක. තුරෛයිරෙත්නසිංහම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු පියංකර ජයරත්න මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பியங்கர ஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. K. THURAIRETNASINGAM *left the Chair, and* THE HON. PIYANKARA JAYARATNE *took the Chair.*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියාගෙන ආවේ අද උදේ සාකච්ඡාවට භාජන වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැනයි. ඒ සඳහා මන්ත්‍රීවරුන් නොවන තුන්දෙනා පත් කිරීමේ යෝජනාවක් අද ඉදිරිපත් කර තිබුණා. අපි කියන්නේ, 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්වාධීනයි' කියන එක බොරුවක් බවයි. අපි ඒක මීට පෙරත් කිව්වා. මේකට නීතියක්, රීතියක්, නිර්ණායකයක්, කාර්ය පටිපාටියක්, මොකවත් නැහැ. හිතුමතේ හිතු කෙනෙකු පත් කරනවා. ඒකට මොකක්වත් පදනමක් නැහැ. ඉතින් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පිළිගත හැකි තත්ත්වය මොකක්ද? මේක අරාජික තත්ත්වයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන කොට අපි කිව්වේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට මන්ත්‍රීවරුන් තුන්දෙනෙක් පත් කරන්න කියායි. අගමැතිතුමා කොහොමත් පත් වෙනවා. විපක්ෂ නායකතුමා මන්ත්‍රීවරයෙක්. ජනාධිපතිතුමා පත් කරන කෙනාත්, අගමැතිතුමා පත් කරන කෙනාත්, අගමැතිතුමායි විපක්ෂ නායකතුමායි එකතු වෙලා පත් කරන කෙනාත් මන්ත්‍රීවරුන් විය යුතු බවයි අපි කිව්වේ. ඇයි අපි එහෙම කිව්වේ? අපි එහෙම කිව්වේ, අද උදේ අපි පෙන්වා දුන්නා වාගේම, ඇමතිවරුන් පත් කළාම ඒ ඇමතිවරුන්ගේ විධායක බලයේ බලපෑමට ඒ කොමිෂන් සභා යටත් වෙන හින්දායි. ඉතින් කොහොමද, ඒවා ස්වාධීන වෙන්නේ? කොමිෂන් සභාවලට ස්වාධීනව වැඩ කරන්න නම් විධායකයේ නොවන නියෝජිතයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යවස්ථාදායකය කියා එකක් තිබෙනවා; විධායකය කියා එකක් තිබෙනවා; අධිකරණය කියා එකක් තිබෙනවා. අපි විධායකයේ උදවිය කිසියම් හෝ ස්වාධීන ආයතනයකට පත් කරන්නේ නැහැ. ඇයි ඒ? ඒ අය විධායක බලතල මෙහෙයවන නිසා. විධායක බලතල මෙහෙයවන අයට තමන්ගේ විධායක ක්ෂේත්‍රය පිළිබඳව යම් උනන්දුවක් තිබෙනවා. කොමිෂන් සභාවලට පත් කරන ඒ අය තමන්ගේ විධායක ක්ෂේත්‍රයට තිබෙන්නා වූ උනන්දුව අනුව, ඇඟවීම් වශයෙන් ඒ අයගේ යම් අදහස් ඒ කොමිෂන් සභා වෙත ගියත් ඒ කොමිෂන් සභාවල ස්වාධීනත්වය නැති වෙනවා. අපි මෙය පෙන්වා දුන්නත්, එය ඇහුවේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන සංශෝධනයේ සඳහන්ව තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට මන්ත්‍රීවරුන් පත් විය යුතුයි කියලායි. අපි ඒක මුලදීම කිව්වා. එයට මන්ත්‍රීවරුන් පත් කරන්න කියලා අපි කිව්වා. විධායකයේ බලය තිබෙන ඇමතිවරුන් ඒ සභාවට පත් වුණාම ස්වාධීන කොමිෂන් සභා විධායක බලයට එක්තරා ප්‍රමාණයකට යටත් පහත් වෙනවා. නමුත් අපි කියපු දේ පිළිගත්තේ නැහැ. ආණ්ඩුව කිව්වා, ඇමතිවරු කියන්නේත් මන්ත්‍රීවරුන්ම තමයි කියලා. ඒක හරියට, ඕනෑම වතුරක් හැටියට වැවක් ගණන් ගන්න අපට පුළුවන් කියනවා වාගෙයි. නමුත් හැම වතුරක්ම වැවක් නොවෙයි. මෙන්න මේ තර්කන න්‍යාය ආණ්ඩුවට තේරෙන්නේ නැහැ; තේරුම් ගන්න ආණ්ඩුවට වුවමනාවකුත් නැහැ. අගමැතිතුමායි, අගමැතිතුමා විසින් පත් කර ගන්නා ලද විරුද්ධ පාර්ශ්වයේ නායකතුමායි, අගමැතිතුමා පත් කරපු ජනාධිපතිතුමායි කියන තුන් දෙනාත්, කථානායක හැටියට පත් කරපු අගමැතිතුමාගේම පක්ෂයේ කථානායකවරයාත් කියන හතර දෙනාම ආණ්ඩුවේ. ඒ හතරදෙනා එකතු වෙලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නිලධාරීන් පත් කර ගන්නවා. විපක්ෂය පැත්තේ අද අපේ මන්ත්‍රීවරු 70ක් ඉන්නවා. එදා හිටියා අපේ මන්ත්‍රීවරු 52ක්. නමුත් ඔය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අපේ නියෝජනයක් නැහැ. අපේ මන්ත්‍රීවරු කවුරුවත් ඒ සභාවේ නැහැ. එයට පත් කරගන්නේ ආණ්ඩුව පත් කරපු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාගේ පක්ෂයේ අය සහ ආණ්ඩුව පත් කරපු විපක්ෂ නායකවරයාගේ පක්ෂයේ අයයි.

එතකොට මේක ආණ්ඩුව විසින් මෙහෙයවන ආණ්ඩුවේම උදවියගේ ආණ්ඩු කොමිටියක්. ඒ නිසා මේ ව්‍යවස්ථා සභාව ගැන පුරාජේරු කථා කරලා වැඩක් නැහැ. ඒක මම පළමුවෙන්ම කියන්න ඕනෑ. ඒ නිසා අපි මේ සම්බන්ධව දවසක විවාදයක් ඉල්ලා සිටිනවා. මේ ව්‍යවස්ථා සභාව ගැනත්, ව්‍යවස්ථා සභාවට අදාළ කරුණු කාරණා පිළිබඳවත් කථා කරන්න අවස්ථාවක් ලබා දෙන හැටියට අපි ඉල්ලා සිටිනවා. අද කථානායකතුමා ඒකට අවස්ථාවක් දෙන බව කියලා මේ ගරු සභාවෙන් පිටව ගියා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒක අපි දන්නවා. ඒක අපි තේරුම් ගන්නත් ලැහැස්තියි. නමුත්, යම් කථානායකවරයෙක් කොච්චර එහෙම පක්ෂයට බැඳී තිබුණත්, ඒ පක්ෂයෙන් පත් කරනු ලැබුවත්, කථානායකවරයා වුණාට පස්සේ ඊට වඩා ගරු ගාම්භීර ස්වාධීනත්වයක් සාපේක්ෂව හෝ තබා ගන්නවා. ඒ ප්‍රමාණයටවත්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එවැනි ගරු ගාම්භීරත්වයක් හෝ සාපේක්ෂ ස්වාධීනත්වයක් තිබෙන බව නිකමට පෙනෙන්නවත් සලස්වන්න බැරි තරම්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දැන්, අද දිනට නියමිත ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග පිළිබඳව මා කථා කරන්න කැමැතියි. ග්ලයිෆොසේට් ගැන කථා කරනවා නම්, ග්ලයිෆොසේට් තහනම ආණ්ඩුව ඉවත් කරන්නයි යන්නේ. අපි වස විසෙන් තොර කෘෂි භෝග හැදීම ගැන; වැවිලි භෝග හැදීම ගැන තිබෙන උනන්දුව උඩ තමයි මේ ග්ලයිෆොසේට් ඉවත් කළේ.

මෑත කාලයේ විදෙස් රටක ග්ලයිෆොසේට් භාවිතය නිසා පිළිකාවක් හැදුණු බව තහවුරු වෙච්ච කාන්තාවක්, ඒ පිළිබඳව විශාල නඩුවක් කියලා ඒ නඩුවෙන් දිනුවා. ග්ලයිෆොසෙට් නිසා පිළිකාවක් ඇති වෙන්න පුළුවන් කියන වෛද්‍ය මතය පිළිගෙන, ඒ කාන්තාවට විශාල වන්දියක් ගෙවන්න කියලා එරට අධිකරණයෙන් ග්ලයිෆොසෙට් භාවිතය සම්බන්ධයෙන් මොන්සැන්ටෝ කොම්පැනියට නියෝග කළා. මම හිතන විධියට ඒ තීන්දුව සම්බන්ධයෙන් ඉහළ අධිකරණයක අභියාවනා කරලා ඇති. අභියාවනයේ දී අන්තිමට කොහොම වෙයි ද කියලා මට කියන්න බැහැ. නමුත්, අඩු ගණනේ ප්‍රාථමික අධිකරණයක් මේ පිළිබඳව යම් ඉතා වැදගත් තීන්දුවක් දීලා තිබෙනවා.

අද අපේ රටෙත් සමහරු ඉල්ලනවා, "අපේ කුඩා තේ වතු ග්ලයිෆොසෙට් නැතිව ගෙනියන්න බැහැ. අද අපට කම්කරු ශ්‍රමය මදි, ඒ නිසා අපට ග්ලයිෆොසෙට් දෙන්න" කියලා. මම හිතන විධියට මේ අවස්ථාවේ ගරු සභාවට පැමිණි අපේ කේ.කේ. පියදාස මන්ත්‍රීතුමා, - මම එතුමාට "පියදාස මල්ලී" කියලයි කියන්නේ. - එතුමාත් තේ ඉඩම්වල ග්ලයිෆොසේට් භාවිතය පිළිබඳ ප්‍රශ්නය ගැන උනන්දුවක් දක්වනවා. [බාධා කිරීමක්] හොඳයි, දැන් ඉතින් මේක තීන්දු කරලා ඉවරයි නේ. දැන් ඉතින් මේ ගැන කථා කරලා වැඩක් නැහැ. ග්ලයිෆොසේට් භාවිත කිරීම ගැන එක දෙයක් මම පෙන්වා දෙන්නම්. තේ ඉඩමක වල්

වැවෙන්නේ තේ වියන හරියට නැත්නම්. තේ වියන හරියට තිබෙනවා නම්, වල් වැවෙන ප්‍රමාණය ඉතාම අඩුයි. ඒ නිසා මෙතැන කරන්න තිබෙන්නේ infilling කරන එකයි. ඒ කියන්නේ, පාළු ඉන්දන එක. පාළු හරියට වෙලාවට ඉන්දවලා ඒවායින් පැළේ හැදිලා තේ වියන හරියට හැදුණොත්, ග්ලයිෆොසේට් නැතුවත් වල් හැදෙන ප්‍රමාණය පාලනය කරගන්න පුළුවන්.

නමුත්, එහෙම නොකර ග්ලයිෆොසේට් පාවිච්චි කරන්න ඉල්ලුවොත්, තේ පරීක්ෂකවරු යොදවලා බලන්න ඕනෑ, තේ පැළ සිටුවීමේ කටයුත්ත හරියාකාරව කරලා, තේ වියන හරියට ලැබෙන පරිදි මේ උදවිය පාළු ඉන්දලා තිබෙනවාද කියලා. ඒවා ගැන හරි ක්‍රියා මාර්ගයක් අරගෙන නැත්නම්, ග්ලයිෆොසේට් භාවිතයට ඉඩ දෙන්න එපා කියලා මම පළමුවෙන්ම ඉල්ලීමක් කරන්න බලාපොරොත්තු වෙනවා. මේ මිනිස්සු තමන්ගේ තේ ඉඩම්වලින් එන තේ පලදාවක් අරගෙන දැනට ඒක විකුණලා ජීවත් වෙනවා. පොහොර ටික දානවා. නමුත්, තේ පාළු ඉන්දලා තේ වියන හරියට හැදුනොත් ලොකු දළු ප්‍රමාණයක් අපට කඩන්න පුළුවන්. අද විශාල දළු හිඟයක් තිබෙනවා. ඒ දළු හිඟය වැඩි නිසා දැන් කර්මාන්තශාලා දුවන්නේ ඇත්තටම ධාරිතාවයෙන් අඩුවයි. ඒ නිසා නිෂ්පාදන වියදම වැඩි වෙනවා. ඒ නිසා ලාභය අඩු වෙනවා. ඒ නිසා කම්කරුවන්ට වැටුප් දීම ප්‍රශ්නයක් බවට පත් වෙනවා.

මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමාගේ කථාව මම අහගෙන හිටියා. එතුමා කොම්පැනිකාරයන්ට හොඳට දෙහි කැපුවා. ඒක නම් ඉතාමත් යුක්ති සහගතයි. ඒ වාගේම එතුමා කිව්වා, මිනිස්සු ගල්වලට යට වෙලා මිය යනවා, ඒ මිනිස්සුන්ට ගෙයක් හදාගන්න ඉඩම් කෑල්ලක් දෙන්නේ නැහැ කියලා. ඒ මිනිස්සු අද වහල් මෙහෙවර කරලා වැටුපක් ඉල්ලුවාම, ජීවත් වෙන්න පුළුවන් වැටුපක් දෙන්නේ නැහැ. එහෙම නම්, මේ ආණ්ඩුවට අයිති ඉඩම් කරුණාකරලා මේ කොම්පැනිකාරයන්ගෙන් ආපහු ගන්න.

අරගෙන ඉවරවෙලා මේ කම්කරුවන්ට දිය යුතු වැටුපක් දෙන්න. මට දෙමළ භාෂාව තේරුණු හැටියට, එතුමා කියපු දේ මම ප්‍රතිරාවය කරමිනුයි කථා කරන්නේ. මම කියනවා, එතුමා කියලා තිබෙන්නේ නිවැරදි දෙයක් බව.

තේවලට පමණක් නොවෙයි, රබර්වලට සිදු වෙලා තිබෙන විපතත් එතුමා කිව්වා. රබර් කම්කරුවන්ටත්, රබර් කට්ටිකරුවන්ටත් අද යන එන මං නැහැ. මේ තත්ත්වය යටතේ තමයි අපේ ගම්වල ණයබර වැඩි වෙන්නේ. කාන්තාවන් ණය අරගෙන, ඒ ණය පැටව් ගහලා, ඒවා ගෙවන්නට තවත් ණය අරගෙන අද ගෙවල් දොරවල්වල ඉන්න හැටියක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
තව විනාඩියක්? අපෝ! එහෙම නම් මොකක්වත් කරන්න බැහැ.

ඔබතුමා කියන නිසා මම කථාව අවසන් කරන්නම්. ඔබතුමා කියන නිසා ඒක නොකරත් බැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියනවා. රසකාරක එකතු කළ යුතු තේ, නොකළ යුතු තේ, ඒ අනුව ගැසිය යුතු සෙස් බද්ද, මේ ආදිය ගැනත් කථා කළ යුතුව තිබෙනවා. නමුත්, ඒවා සම්බන්ධයෙන් කථා කිරීමට මට වෙලාවක් නැහැ. ඒ නිසා මම මේ කාරණය ගැන පමණක් කියනවා.

නිසි ආරක්ෂක මිනුම් ප්‍රමිතීන් නැති වාහන ගෙන්වන්න දෙන්න බැහැ කියන කාරණය සඳහන් කළා. මේක මොන මෝඩ නීතියක්ද? අපේ ත්‍රීවීලර්ස්වල, බස්වල, මෝටර් බයිසිකල්වල යන විශාල මගීන් සංඛ්‍යාවට මොකක්ද තිබෙන ආරක්ෂාව? මොකක්ද තිබෙන ආරක්ෂක පටිය? ඒ උදවිය වෙනුවෙන් තිබෙන ආරක්ෂක මෙවලම මොකක්ද? මුකුත්ම නැහැ නේ. මෝටර් බයිසිකලයක ගිහින් හැප්පුනොත් මැරෙනවා. හෙල්මට් එක විතරයි ආරක්ෂක මෙවලමක් හැටියට තිබෙන්නේ. හෙල්මට් එක කියන ආරක්ෂක මෙවලමෙන් බේරෙන්න පුළුවන් ඔළුව විතරයි. නමුත්, අනතුරේ විපාක විඳින්න වෙනවා. [බාධා කිරීමක්] මම කථාව අවසන් කරනවා.

බස් එකේ මොකක්ද තිබෙන මෙවලම්? මොනවත් නැහැ. බස් accident එකක් වෙලා මැරුණොත් මැරෙන්නේ මෙවලම් නැති නිසායි. ත්‍රීවීලර් එකෙත් ආරක්ෂක මෙවලම් නැහැ. මම අහන්නේ මේකයි. ආරක්ෂක මෙවලම්, බැලුන්, ආරක්ෂක පටි, දුම පාලනය කරන යම් යම් යන්ත්‍ර, නැත්නම් මීටර් ඕනෑ කාර්වල යන අයට විතරද? මේක මෝඩ නීතියක්. ප්‍රවාහනයේදී බහුතරයක් ජනතාවට මුහුණ දෙන්න සිදුවන විශාල අනතුරුදායක තත්ත්වයන් මේ නීතියෙන් වළක්වන්න බැහැ. මේ නීතිය කාර්වලට විතරයි. මෝටර් සයිකල්වලට නැහැ; ත්‍රීවීලර්වලට නැහැ; බස්වලට නැහැ. පාර්ලිමේන්තුවේ මේ පිළිබඳ කමිටුවේ මේ ගැන සාකච්ඡා වෙනකොට අපි ඒ දේවල් කථා කළා. ඒ අයත් ඒ කාරණය පිළිගත්තා. ඒ අයටත් කියන්න උත්තරයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට වඩා කථා කරන්නේ නැහැ. මොකද, ඔබතුමා කථානායක පුටුවේ ඉඳගෙන නියෝගයක් කළාම ඒකට අපි අවනත වෙන්න ඕනෑ. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.16]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ ආනයන අපනයන ගැන කථා කරන මේ වෙලාවේ, මේ රටේ අපි කවුරුත් පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය ගැන වචන කිහිපයක් කථා කරන්න මා කල්පනා කළා.

රුපියල අවප්‍රමාණය වීම ගැන මේ දිනවල අපි කවුරුත් කථා කරනවා. ඒ ගැන වාද විවාද කරන්න අවශ්‍යතාවක් නැහැ. අපේ රටට විතරක් නොවෙයි, බොහෝ රටවලට ඒ ප්‍රශ්නයට මුහුණ

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

දෙන්න සිද්ධ වුණා. එයට හේතුව මෙයයි. 2008, 2009 කාලයෙන් පස්සේ ඇමෙරිකාව අනුගමනය කළේ QE - Quantitative Easing කියන ප්‍රතිපත්තියයි. ඔවුන්, ඔවුන්ගේ පොලී අනුපාත ඉතාම පහළට ගෙනාවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් හැටියට කියනවා නම්, සියයට 6ට පමණ තිබුණු LIBOR එක, 2008 වන විට සියයට 0.5ට අඩු වුණා. එය අවුරුදු ගණනක් තිස්සේ සියයට 0.5ට තිබිලා දැන් සියයට දෙකහමාර, සියයට තුන විතර වෙන තරමට ඉහළ යමින් පවතිනවා. සංවර්ධනය වෙමින් පවතින රටවලට ලැබුණු මුදල් ඒ නිසා දැන් නැවතත් ඇමෙරිකාවට ගලාගෙන යනවා. ඒ පිළිබඳව තර්ක කරන්න අවශ්‍යතාවක් නැහැ. එයයි ඇත්ත කථාව. ලංකාවට පමණක් නොවෙයි, ඉන්දියාවට, ඉන්දුනීසියාවට, පාකිස්තානයට, චීනයට, ඕස්ට්‍රේලියාවට පවා මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඇයි, සමහර රටවලට මෙය තදට බලපාන්නේ, සමහර රටවලට එය එසේ තදින් බලපාන්නේ නැත්තේ මොකද කියා අපි කල්පනා කරන්න ඕනෑ. එයට හේතුව මේකයි. තමන්ගේ වෙළෙඳ ශේෂයේ තිබෙන surplus එක නිසා සමහර රටවලට ජංගම ගිණුමේ මේ ගැටලුව අඩු කර ගත හැකි ශක්තියක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන් දත්ත ටිකක් ඉදිරිපත් කරන්නම්. මෙයයි ඇත්ත කථාව. අපේ රට කුඩා රටක්. අපේ රටේ ඉන්නේ මිලියන විස්සක ජනතාවක්. කුඩා වෙළෙඳ පොළක් තිබෙන්නේ. අපේ රටේ දේශීය කර්මාන්ත දියුණු කරන්න නම් අපි ජාත්‍යන්තර වෙළෙඳ පොළ තරණය කරන්න ඕනෑ. වෙන රටවල දේශීය ආර්ථිකය දියුණු කරන්න අපි කාටවත් අවශ්‍ය වෙන්නේ නැහැ. අපට අවශ්‍ය අපේ රටේ ආර්ථිකය දියුණු කරන්නයි; අපේ රටේ ව්‍යවසායකයන් දියුණු කරන්නයි; අපේ රටේ මිනිසුන්ට රැකියා ලබාදෙන්නයි; අපේ ජාතික නිෂ්පාදනය වැඩි කරන්නයි. අපේ ජාතික නිෂ්පාදනය වැඩි කරන්න නම්, අපි වෙළෙඳ පොළ ජාත්‍යන්තරව තරණය කළ යුතුයි; අපනයන වැඩි කළ යුතුයි. මට මතකයි, මම විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට ඉන්න කාලයේ ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා හැටියට ඉන්න කොට, පාර්ලිමේන්තු සාකච්ඡාවලදී මම දිගින් දිගටම කියපු දෙයක් තමයි, "ගරු ජනාධිපතිතුමනි, කරුණාකර බලන්න, දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපනයනය කඩා වැටෙනවා, මේක සිද්ධ වෙන්න දෙන්න එපා, මෙහෙම වුණොත් ඉස්සරහට ප්‍රශ්න එනවා" කියන එක. නමුත් ඒවාට ඇහුම්කන් දුන්නේ නැහැ; ඒ ප්‍රතිපත්ති වෙනස් කළේ නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා මේ කාරණය අහගෙන හිටියොත් හොඳයි. ගරු මන්ත්‍රීතුමනි, 2004දී දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 27.9ක් අපි අපනයනය කළා. අපේ අපනයන සම්බන්ධව මහ බැංකුවෙන් ඊයේ ලැබුණු ප්‍රස්තාර සටහන මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

2002 කාලයේ ඉඳලා පහළට වැටුණු අපනයන ප්‍රතිශතය, 2004 වන විට යාන්තම් ඉහළට අරගෙන තිබුණා. දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව 2003දී අපේ අපනයනය සියයට 27.2යි. 2004දී එය සියයට 27.9ක් වෙනවා. ඉන් පසුව මොකද වුණේ? ඉන් පසුව ඔබතුමන්ලාගේ රජය බලයට පත් වුණා. 2005දී එය සියයට 26යි; 2006දී සියයට 24.3යි; 2007දී සියයට 23.6යි; 2008දී සියයට 19.9යි; 2009දී සියයට 16.8යි; 2010දී සියයට 15.2යි; 2011දී සියයට 16.2යි; 2012දී සියයට 14.3යි; 2013දී සියයට 14යි; 2014දී සියයට 14යි. මේ විධියට අපේ අපනයන පහළට වැටිලා අපට ආණ්ඩුව එනකොට -2016 වන විට- මේ ප්‍රමාණය සියයට 12.6 දක්වා කඩා වැටිලා තිබුණා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා මගේ නිරීක්ෂණය කියන්න ඉඩ දෙනවාද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම ඔබතුමාට මේ විස්තරය දෙන්නම්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, මගේ නිරීක්ෂණයයි මම මේ කියන්න හදන්නේ. මගේ නිරීක්ෂණය තමයි, දළ දේශීය නිෂ්පාදිතය වැඩිවීම හේතුවෙන් තමයි ඔය අපනයන ඉලක්කම් පහළ ගියේ කියන එක. ඔබතුමා ඒකත් පිළිගන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පොඩ්ඩක් ඉන්නකෝ, ගරු මන්ත්‍රීතුමනි. මෙන්න මේකයි අපි තේරුම් ගත යුත්තේ. අපි රටක් හැටියට දියුණු වනකොට ආනයන වැඩි වෙනවා. ඒක අපේ රටට විතරක් වෙන දෙයක් නොවෙයි. අපි එදාට වඩා වාහන පාවිච්චි කරනවා. පසුගිය මාස අට තුළ, ඊට පෙර මාස 8ට සාපේක්ෂව වාහන අපනයනය සියයට එකසිය ගණනකින් වැඩිවෙලා තිබෙනවා. අද හැම ගෙදරම වාගේ ත්‍රීවීලර් එකක් තිබෙනවා; හැමෝටම මෝටර් සයිකලයක් තිබෙනවා; "ෆ්‍රිජ්" එකක් තිබෙනවා; "ටෙලිෆෝන්" එකක් තිබෙනවා; "ටීවී" එකක් තිබෙනවා. සමාජය දියුණු වෙනකොට ආනයන වැඩි වෙනවා. ආනයන වැඩි වෙනකොට ඒවාට ගෙවන්න අපි අපනයන වැඩි කර ගන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව දිගින් දිගටම අපනයන කඩාගෙන වැටෙනවා නම්, මේ රුපියලට වදින පහරට ඒක තමයි මූලිකම හේතුව.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එතකොට බාධක ඉවත් කිරීම, පෞද්ගලික මුදල් කිසිම බාධාවක් නැතිව ඒ ධනවතුන් රටින් පිටට අරගෙන යාම වැනි කාරණා ගණන් ගන්නේ නැද්ද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
සාමාන්‍යයෙන් වෙළෙඳ පොළ ප්‍රතිපත්තියක් හරහා රටක් දියුණු වෙනකොට අපි යම්කිසි ලිහිල්කරණයක් කර තිබෙනවා. අපි ආනයන සඳහා මුදල් පිට රට යවනවා. විදේශ ආයෝජකයෝ ලංකාවේ මුදල් ආයෝජනය කරනවා. ලංකාවේ ආයෝජකයෝත් වෙනත් රටවලට ගිහින් ආයෝජනය කරනවා. අපේ ආයෝජකයෝ බංග්ලාදේශයේ, උගන්ඩාවේ, කෙන්යාවේ, වියට්නාමයේ ආයෝජනය කර තිබෙනවා. පසුගිය දවසක මට බංග්ලාදේශයේ ශ්‍රී ලංකා තානාපතිතුමා කිව්වා, ලාංකිකයන් ඒ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

රටේ ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක පමණ ආයෝජනයක් කර තිබෙන බව. ගරු මන්ත්‍රීතුමනි, එක පැත්තකට විතරක් වහන්න අපට බැහැ. එක පැත්තකට විතරක් මුදල් එන්න සලස්වලා කිසිම රටක් දියුණු වෙලා නැහැ.

අපි අපේ ප්‍රාග්ධන ගිණුම විවෘත කර නැහැ. ජංගම ගිණුම විතරයි විවෘත කර තිබෙන්නේ. ගේට්ටු සියල්ලම ඇරියා වාගේ, ප්‍රාග්ධන ගිණුම විවෘත කළා නම්, ඒ විධියට මුදල් එළියට යන්න පුළුවන්. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, නමුත් අපි එහෙම කර නැහැ. අපි වගකීමකින් තමයි ඒ කටයුත්ත කරලා තිබෙන්නේ. අපි මේ කාරණය තේරුම් ගන්න අවශ්‍යයි. අපි දේශපාලන වශයෙන් කොයි තරම් මඩ ගහ ගත්තත් මේ ප්‍රශ්නයට විසඳුම එතැන නොවෙයි තිබෙන්නේ. මේ ප්‍රශ්නයෙන් ගැලවීමට තිබෙන එකම පිළියම අපේ අපනයන බව අපි තේරුම් ගන්න ඕනෑ. එම නිසා තමයි 2005 සිට එක දිගට කඩා වැටුණු අපේ අපනයනය 2016දී සියයට 12.6ක් වෙලා 2017 වන විට සියයට 13ක් දක්වා වැඩිවෙලා තිබෙන්නේ.

මෙහිදී මම කථා කළේ භාණ්ඩ අපනයනය ගැන විතරයි. මේ දවස්වල අපි සේවා අපනයනය ගැනත් කථා කරනවා; සංචාරක ව්‍යාපාරය ගැන කථා කරනවා; IT තාක්ෂණය ගැන කථා කරනවා. නමුත්, "භාණ්ඩ අපනයනය අඩු වුණාට සේවා අපනයනය වැඩි වෙලා තිබෙනවා, එම නිසා හර්ෂ ද සිල්වලා කියන ඔය කථා අපට පිළිගන්නට බැහැ" කියා කියන්න සමහරු උත්සාහ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැනත් කියන්නම්. භාණ්ඩ හා සේවා කියන දෙකම එකතු කළාම, 2014 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස අපේ අපනයන සියයට 36ක අගයක තිබුණා.

ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඉවත් වෙනකොට සියයට 36ක් වශයෙන් තිබුණු දළ දේශීය නිෂ්පාදනය සියයට 20 දක්වා බැහැලා තිබුණා. පසුගිය අවුරුද්දේ තමයි සියයට 22 දක්වා වැඩිවෙලා තිබෙන්නේ. කරුණාකර මේක තේරුම් ගන්න. කොපමණ නම් මේක කියන්නද? දේශීය වෙළෙඳ පොළේ පමණක් නියැලිලා මේ වැඩ කටයුත්ත කර මේ ජයග්‍රහණය ලබාගන්න අපට හැකියාවක් නැහැ. ඒක කරන්න බැහැ.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, දළ දේශීය නිෂ්පාදනයේ වැඩි වීම නිසාත්, ඊට වඩා අපනයන වැඩි වීම අඩු නිසාත් ප්‍රතිශතයක් හැටියට මෙය අඩුවෙලා තිබෙනවාය කියා ඔබතුමා කිව්වා. ඔබතුමා වියට්නාමය ගැන හොඳට දන්නවා. අපි බොහෝදෙනා වියට්නාමය ගැන කථා කරනවා. මේ අවුරුද්දේ වියට්නාමයේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපනයනය සියයට 102යි. සිංගප්පූරුව වාගේ රටක් ගත්තොත් සියයට 160යි. ඒකෙන් පෙනෙනවා, ඒ රටවලට -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
*ආයෝජකයෝ යනවා.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
*ආයෝජකයෝ යන එක තමයි.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
*හොඳයි.*

නිදහස් වෙළෙඳ ගිවිසුම් 17ක් වියට්නාමය අත්සන් කර තිබෙනවා. ඒ වෙළෙඳ ගිවිසුම් 17 හරහා ඔවුන්ගේ වෙළෙඳ පොළ ප්‍රවර්ධනය කර ගන්න, ගෝලීය වෙළෙඳ පොළට ඇතුළු වෙන්න ඔවුන්ට හැකිවෙලා තිබෙනවා. අපි මේ දේශපාලනයෙන් එහාට යන්න ඕනෑ. අපි එකඟතාවකට එන්න ඕනෑ. මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ශුභ සිද්ධිය සඳහා attitudinal change එකකුත් අවශ්‍ය වෙනවා. [බාධා කිරීමක්]

මේ කාරණය කියා මගේ කථාව අවසන් කරන්නම්. කෙටි කාලීන ඇමෙරිකානු පොලී අනුපාතය පිළිබඳ ප්‍රශ්නය සමහර විට හෙට, අනිද්දා වනකොට ඉවර වෙන්නත් ඉඩ තිබෙනවා, සමහර විට තවදුරටත් ඉදිරියට යන්නත් ඉඩ තිබෙනවා. මොකද, ඔවුන් කියනවා, ඉදිරි මාස 6 ඇතුළතදී තව දෙවතාවක්වත් පොලී අනුපාතය වැඩි කරන්න තිබෙනවාය කියා. අපි දීර්ඝ කාලීන වැඩසටහනකට යනවා නම්, කොයි ආණ්ඩුව කළත් ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒ යථාර්ථය තේරුම් ගන්න ඕනෑ.

අද සමහරු බඩු මිල සම්බන්ධයෙන්, උද්ධමනය සම්බන්ධයෙන් කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ සඳහන් ප්‍රස්තාරයක් මා **සභාගත*** කරනවා. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා 2004දී ආණ්ඩුව භාර ගන්නකොට උද්ධමනය සියයට 4ක් වශයෙන් තිබුණු බව ඔබතුමාට මතකද? නමුත් 2008 වනකොට ඔබතුමන්ලා උද්ධමනය සියයට 29 දක්වා ගෙන ගියා. අපේ මිනිසුන්ට මේ බව අමතක වෙලාද? 2008දී උද්ධමනය සියයට 29යි.

**ගරු සී.බී. රත්නායක මහතා**
(මාණ්පුමිකු சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
*පිස්සු හැදිලාද?*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
පිස්සු නොවෙයි, ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමනි. මා අසත්‍යයක් කියන්නේ මොනවාටද? මා සභාගත කළ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ සඳහන් ප්‍රස්තාරයේ photocopy එකක් ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමාටත්, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාටත් දෙන්න. 2008දී උද්ධමනය සියයට 29යි. මෙය අසත්‍ය නම් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමී මැතිතුමාට කියන්න මෙය නිවැරැදි කරන්නය කියා. මෙය එතුමා ඉදිරිපත් කරපු ප්‍රස්තාරයක්. දැන් වනකොට උද්ධමනය සියයට 5 දක්වා අඩුවෙලා තිබෙනවා. ඒ අයට ඒවා අමතකවෙලා. [බාධා කිරීමක්] ඒවා ගැන කථා කරන්නේ නැහැ. ඔබතුමන්ලාගේ කාලයේ උද්ධමනය සියයට 29 දක්වා වැඩි වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරන්නම්. ඔබතුමා කියන්නේ උද්ධමනය වැඩි වුණේ නැහැයි කියාද? [බාධා කිරීමක්] ඔබතුමා කියන්නේ ඔබතුමන්ලාගේ කාලයේදී උද්ධමනය සියයට 29 දක්වා වැඩි වුණේ නැහැයි කියාද? මට ඊට වඩා argue කරන්න විධියක් නැහැ. [බාධා කිරීමක්] මා මේ ලේඛනය සභාගත කළා. කරුණාකර මේ ලේඛනයේ photocopy එකක් ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාට දෙන්න.

ආර්ථිකය කළමනාකරණය කර ගනිද්දී සමහර වෙලාවට ගැටලු මතු වෙනවා. ඒවා නිරාකරණය කර ගන්නවා. කොයි ආණ්ඩුවටත් මේ ගැටලු මතු වෙනවා. මේ අවස්ථාවේදී අපේ ආණ්ඩුවටත් යම්කිසි අභියෝගයක් තිබෙනවා. නමුත් අපි අභියෝගය ජයග්‍රහණය කර ගන්න සියලු වැඩ කටයුතු සම්පාදනය කර තිබෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මට එක කාරණයක් කියන්න තිබෙනවා. ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමනි, එහෙම නම් අපි වියට්නාම ක්‍රමයට එකඟ වෙමුද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
වියට්නාම ක්‍රමය කියන්නේ අපනයන ක්‍රමයක්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
වියට්නාමය ගන්න ඕනෑ නැහැ. එහෙම නම් බංග්ලාදේශය ගන්න, මැලේසියාව ගන්න. උදාහරණයක් වශයෙන් මා වියට්නාමය ගත්තේ එතුමා වියට්නාමය ගැන කථා කළ නිසායි. තායිලන්තය ගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය ගතවෙනවා. ඔබතුමා කථාව ආරම්භ කරන්න.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වාසුදේව නානායක්කාර මැතිතුමාට කථා කරන්න ඕනෑ නම් මගේ වේලාවෙන් ගත්තාට කමක් නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වියට්නාම ක්‍රමයට එකතු වෙන්න කියා එතුමාට කියන්න.

[අ.භා.4.30]

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම පළමුවෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පුද කරනවා. පසුගිය කාල වකවානුවේදී -අපි බලයේ ඉන්න වෙලාවේදී- "මේ යන ආර්ථිකය වැරැදියි. අපි ආවොත් මෙහෙම කරනවා"ය කියා රට සමාජගත කරන්න ආර්ථිකය පිළිබඳව පැහැදිලි, දැනුම් සම්භාරයක් තිබෙන ඔබතුමා 'සිරස' ආයතනයත් සමඟ එකතුවෙලා විශාල වශයෙන් ප්‍රචාරණ කටයුතු කරගෙන ගියා. බහුවාර්ගික වාගේම තේ ආර්ථිකය මත රැඳී සිටින ජනතාවක් සිටින දිස්ත්‍රික්කයක් නියෝජනය කරන කෙනෙකු හැටියට මම මේ කාරණා දිහා බලනකොට විශ්වාස කරනවා, මේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන තේ අපනයනය කිරීමේදී සිදු වන හානිය පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම වැදගත් කියා.

අපේ රට දූපත් රාජ්‍යයක් හැටියටයි තිබෙන්නේ. දූපත් රාජ්‍යයේ නිෂ්පාදනකරුවන් අඩු වෙන්න පුළුවන්. හැබැයි, ගැනුම්කරුවන් විශාල වශයෙන් සිටිනවා. ගැනුම්කරුවන් විශාල වශයෙන් ඉන්නකොට එම ගැනුම්කරුවන් සඳහා රට රාජ්‍යයන් තර්ක කරනවා. ඒ සඳහා අපනයන ගෙනෙනවා. මෙලෙස අපනයන ගෙනෙනකොට අපිට ඒවා ක්‍රියාත්මක කරන්න බැහැ. අපිට අපනයන ක්‍රියාවලියට යන්න පුළුවන්. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේදී ගෙනාපු ක්‍රියාදාමය හොඳයි කියා දැන් අපිට හිතෙනවා නේද? විවෘත ආර්ථිකය නිසා අපේ ආර්ථිකය එන්න එන්නම පහළට වැටිලා තිබෙනවා වාගේ නේද කියා අපිට හිතෙනවා නේද? අපි දේශීය ආර්ථිකය ගොඩ නහන්න විශාල මහන්සියක්, වෙර වීර්යයක් දැරුවා වාගේම අපේම දේ අපි නිෂ්පාදනය කර ගන්නත් උත්සාහ කළා. අපේ රජය පැවති කාලයේ "දිවි නැඟුම" වැඩසටහන යටතේ අපි ක්‍රමක්‍රමයෙන් -අදියරෙන් අදියර- අපේ ජනතාවගේ ආර්ථිකය සකස් කර ගන්න අපනයන ආර්ථිකයට යොමු වනවා වාගේම ආනයන කරන ඒවායෙන් බැහැර වෙලා අපේ ආර්ථිකය සකස් කර ගන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන ගියා. ඒ නිසා පොහොර සහනාධාර දීලා, හාල් ටික නිෂ්පාදනය කර ගන්න අපිට පුළුවන්කම ලැබුණා.

වියට්නාමය වාගේ රටවල යුද්ධ ගණනාවක් තිබුණා. අපේ රට වාගේම ආක්‍රමණය කරපු රටක් තමයි කොරියාව. කොරියාව ඔවුන්ගේ ප්‍රතිපත්තිය විවෘත කරමින් කටයුතු කරපු නිසා අද අපේ දේශීය නිෂ්පාදනකරුවනුත් මියන්මාරය, වියට්නාමය වාගේ රටවලට ගිහිල්ලා දැන් ඒවායේ ආයෝජන කටයුතු සිදු කිරීමට ක්‍රියා කරනවා. ඔවුන්ගේ ආර්ථිකය ඒ විධියට යනවා. ලංකාවේ ආයෝජනය කරන්න ඔවුන් එන්නේ නැහැ. ආයෝජකයන් එනවා නම් ලංකාවේ නිෂ්පාදනය කරන්න තමයි මම හිතන්නේ ආර්. ප්‍රේමදාස මැතිතුමා කර්මාන්තපුරයන් ආරම්භ කර, ආයෝජකයන්ට එන්න කිව්වේ. නමුත් දැන් ඉන්න ආයෝජකයන් සියලු දෙනාම අපේ රටින් යනවා. මේ රටේ ආර්ථිකයේ ප්‍රධාන තැනක් උසුලන සංචාරක ව්‍යාපාරය ගත්තොත්, මේ වනකොට සංචාරක ව්‍යාපාරය යටතේ තිබෙන හෝටල් ටිකත් වැහීගෙන යන තත්ත්වයට පත්වෙලා තිබෙනවා.

ඇමෙරිකානු ඩොලරය අහස උසට ගිහිල්ලා, ඒ නිසා රුපියල බාල්දු වෙලා. රුපියල බාල්දු වීම නිසා ගොවියා, කම්කරුවා අනාථ භාවයට පත්වෙලා සිටිනවා. ඒ නිසා තේ ආර්ථිකයේ යෙදිලා ඉන්න කම්කරුවාගේ දෛනික වැටුප රුපියල් 1000 කරන්න කියා අවුරුදු ගණනාවක් තිස්සේ ඉල්ලනවා. අපි පසුගිය ආණ්ඩුවට ඇඟිල්ල දික් කර වැඩක් නැහැ. ඔබතුමන්ලා අවුරුදු හතරකට ආසන්න කාලයක් මේ ක්‍රියාවලිය තුළ සිටිනවා. අවුරුදු හතරක් කියන්නේ විශාල කාල පරිච්ඡේදයක්. ඒ කියන්නේ, ආර්ථිකය සකස් කර ගන්න පුළුවන් කාල පරිච්ඡේදයක්. මේ කාල පරිච්ඡේදය තුළ ආර්ථිකය ක්‍රියාත්මක කළේ කොහොමද?

මේ දවස්වල ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් මිල ඉහළ යනවාය කියා කියන නිසා පෙට්‍රල් වැනි ඉන්ධනවල මිල ඉහළ යනවා. 2015, 2016, 2017 බොර තෙල් මිල අඩු වීම මත ලැබූ වාසිය අපි අපේ රටේ ජනතාවට කොයි ආකාරයටද දුන්නේ කියන එක ප්‍රශ්නයක් නේද? හම්බන්තොට වරාය විකුණලා ගත්තා වූ මුදල වාගේම IMF එකෙන් ගත්ත ණය කන්දරාව එකතු කළාම බිලියන ගණනක් තිබෙනවා නේද? මේ බිලියන ගණනින් ලැබූ සහන සහ දුන්නු සහන මොනවාද?

අපි ආනයන-අපනයන ක්‍රියාවලිය පිළිබඳව දිගින් දිගටම කථා කරනවා. මම දීර්ඝ වශයෙන් ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ. අද වතු කම්කරු ජනතාවගේ වැටුප් පිළිබඳව එම සමාගම් සමඟ සාකච්ඡා කිරීම අවශ්‍ය වනවා. ඒ සමාගමට ගොඩනැඟෙන්න බැරි නම් භාණ්ඩාගාරයෙන් ඒ සඳහා අවශ්‍ය මුදල් ලබා දීලා, වතු කම්කරුවන්ගේ වැටුප් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වනවා. ඒක රජයේ වගකීමක් වනවා.

මේ රටේ පුරවැසියන් වන සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව ශ්‍රී ලාංකික ජනතාවක් හැටියට ඉස්සරහට යන්න කටයුතු කරද්දී, ඔවුන්ගේ වැටුප් තලය වැඩි කර ගන්න මේ රජය තුළින් මොනවාද කර තිබෙන්නේ? එක පැත්තකින් භාණ්ඩ මිල අහස උසට ගිහිල්ලා, ඔවුන්ගේ දෛනික අවශ්‍යතාවන් සඳහා වන වියදම විශාල වශයෙන් වැඩිවෙලා. පාසැලට ඇතුළත් කරන දරුවාට කොච්චර වියදමක් යනවාද කියන එක ඔවුන්ට විශාල වශයෙන් දැනෙනවා. මෙන්න මේ කටයුතු වෙනුවෙන් සහන ලබා දීමට අපි වග කීමෙන් යුතුව ක්‍රියා කරන්න ඕනෑ. ඒ නිසා මේ තේ ආර්ථිකයත් සමඟ ක්‍රියා කරන කම්කරුවන්ට ඒ සහන ලබා දුන්නේ නැත්නම් ඔවුන්ට සේවා තෘප්තියක් ලැබෙන්නේ නැහැ. සේවා තෘප්තිය නැති වෙනවා වාගේම, අපේ 'ශ්‍රී ලංකා තේ' - "Ceylon Tea"- කියන නාමය නැත්තටම නැති වෙලා යයිද කියන ප්‍රශ්නයත් තිබෙනවා. ඒ නිසා මෙතැනදී අතරමැදියන් කරන්නා වූ ක්‍රියාවලිය පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, අපේ හොඳ තේ ටික අනෙක් රටවලින් එකතු කරගෙන ගිහිල්ලා ආපසු වෙනත් රටවලට යවනවා. ඒ තුළින් අපේ වෙළෙඳ සන්නාමය නැති කිරීම සඳහා විශාල වෙහෙසක් දරනවා. මෙන්න මේ ටික නේද, ගම්මිරිස්වලට වුණේ? ගම්මිරිස් ආනයනය කිරීම නිසා අද දේශීය ගම්මිරිස් කර්මාන්තකරුවන් පාරට බැහැලා නේද? ඒ කාලයේ ඔවුන්ගේ සාක්කු, අටුකොටු පිරුණා නේද? අද එහෙම නැහැ නේද? ඇයි, ඒ දේවල් කළේ? කාගේ වුවමනාවටද, කා සඳහාද එහෙම කළේ? ගම්මිරිස් නිෂ්පාදකයන් අද පාරට බැහැලා. එම කම්කරුවන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කරගනිමින් ඉස්සරහට ආවේ. එයට ශක්තිය දීලා ඉස්සරහට ගියේ. නමුත් අද වනවිට ඔවුන්ගේ ජීවන තත්ත්වය පහළට හෙළීම නිසා ඔවුන්ගේ ජීවිතය ගොඩ නහාගන්න බැරි මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. අද ඔවුන් පාසල් යන දරුවාට සපත්තු දෙකක් අරගෙන දෙන්න බැරි මට්ටමට, ඔවුන්ගේ ආර්ථික ජීවිතය ගැට ගසා ගන්න බැරි මට්ටමට වැටිලා තිබෙනවා. වතු කම්කරුවා වෙන්න පුළුවන්; ගම්මිරිස් වගාකරුවා වෙන්න පුළුවන්; දේශීය කුරුඳු වගාකරුවා වෙන්න පුළුවන්, මෙන්න මේ වගාකරුවන්ගේ අතපය බිඳ දමා ආනයනය ගැන අපි කථා කරනවා. ආනයනය ගැන කථා කරනවා නම් අපේ ගොවියාත් ශක්තිමත් කරන්න ඕනෑ. එසේ ශක්තිමත් කිරීමේදී අපට ආනයනය කරන්න පුළුවන් දේ අපි කොයි ආකාරයෙන්ද කළ යුත්තේ කියන එක සම්බන්ධව අපි වගබලා ගන්න ඕනෑ. රජයක් හැටියට ඒ සම්බන්ධව යුතුකමක් හා වගකීමක් තිබෙන්න ඕනෑ. අපි පොහොර සහනාධාර ලබා දීලා මේ රටේ ගොවිතැන් බහින් ජීවත් වන ජනතාවගේ වී නිෂ්පාදනය, එළවලු නිෂ්පාදනය, තේ නිෂ්පාදනය, පොල් නිෂ්පාදනය, රබර් නිෂ්පාදනය කියන මේ සියලු නිෂ්පාදන සඳහා දායකත්වය ලබා දුන්නා. එම දායකත්වය නැති වෙනකොට, ඔවුන් ඒ කරන ගොවිතැනින් ශීඝ්‍රයෙන් ඈත් වෙනවා.

ගරු අමාත්‍යතුමනි, අපේ ගම් දනවුවල පවතින තත්ත්වය ගැන මම කියන්න කැමැතියි. දැන් ඔවුන් වෙන මොකක්වත් නොවෙයි, කරන්නේ. "කොළඹට ඇවිල්ලා රස්සාව කරන්නම්, හාල් මිටියක් කඩේකින් ගන්නම්" කියනවා. "දැන් කුඹුරට යන්න බැහැ. වියදම් වැඩියි. ඒ නිසා හාල් ටිකක් කඩේකින් ගෙනෙමු" කියනවා. මේ ක්‍රමය නිසාම ධාන්‍යාගාරයක් හැටියට තිබුණු මේ රටේ ධාන්‍ය ටික දැන් නැත්තට නැති වෙලා තිබෙනවා. දැන් සහල් ආනයනය කරන්න වෙනවා නේද, ඕනෑවටත් වඩා? ඒ වාගේම ගම්මිරිස් ටිකෙන් ජීවත් වුණ මිනිසුන්ට, ඒවා විකුණා ජීවිතය ගැට ගසා ගත්ත මිනිසුන්ට අද එතැනින් ඉවත් වෙන්න පුළුවන්කමක් නැහැ නේද? නමුත් ඒ තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. මේ නිසා වෙලා තිබෙන්නේ මොකක්ද?

මහ බැංකුවෙන් සංඛ්‍යා ලේඛන, දත්ත ඒ සඳහා ඉදිරිපත් කරන්න පුළුවන්. එම දත්ත ඉදිරිපත් කරලා තිබෙන්නේ මහ බැංකුවේ දැන් ඉන්නා අධිපතිතුමා නොවෙයි කියන එක මම විශ්වාස කරනවා. මොකද, අර්ජුන මහේන්ද්‍රන් -මේ රටට බොරු කරපු, මේ රටේ ධනස්කන්ධය විනාශ කරපු, බැඳුම්කරයට උරුමකම් කියන කෙනා හැටියට,- මේ ගෙනා වැරැදි දත්ත එක්ක කටයුතු කළා. 2008දී අපි යුද්ධය අහවර කරමින් ඉන්නා වේලාවකයි, අපේ රටේ එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබුණා නම් ඇති වෙලා තිබෙන්නේ කියන කතන්දරය අපි කියන්න ඕනෑ. අමතක කරන්න එපා, තිස් අවුරුදු ශාපලත් යුද්ධයක් නිසාම අපේ රටේ මර්මස්ථාන අපට නැති වෙනකොට, අපේ රටට ආයෝජකයන් එන එකත් යම් තරමකට අඩු වෙනකොට අපි සම්‍යක් ප්‍රයෝග හැටියට සමහර ඒවා පාවිච්චි කළ බව. සම්‍යක් ප්‍රයෝග කියලා කිව්වේ වෙන මොකක්වත් නොවෙයි. යුද්ධය අහවර කරලා, නිදහස් වූ රටක් හැටියට "අපේ රට නිදහස් රටක්; ආයෝජකයන්ට විවෘත කරන රටක්" කියලා ලෝකයේ පිළිගත් හැම සමාගමකටම අපි ආරාධනා කළා, අපේ රටට එන්න කියලා. ඒ සමාගම් අපේ රටට ආවා. ඇවිල්ලා ආයෝජනය කරන්න පටන් ගත්තා. ආයෝජනය කරන්න පටන්ගෙන "ශ්‍රී ලංකාව නිදහස් වූ රටක්, සංචාරය සඳහා හොඳම රට ශ්‍රී ලංකාව" කියන එක ලෝකයේ හැම තැනකින්ම කියාගෙන ආවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

අවසානයේදී ලෝකයේ අනෙක් රටවල් කිව්වේ, ශීඝ්‍රයෙන් සංවර්ධනය වෙන රටක් තමයි ශ්‍රී ලංකාව; ශීඝ්‍රයෙන් පිරිසිදු වෙන

[ගරු සී.බී. රත්නායක මහතා]

නගරයක් තමයි කොළඹ නගරය කියලායි. නමුත් පසුව අපි පහළට වැටිලා-වැටිලා අපිරිසිදුම නගරයක් බවට කොළඹ නගරය පරිවර්තනය වෙන තැනටත් ඇවිල්ලා; ආයෝජකයෝ ගිහිල්ලා. අපේ අපනයන ගැන අපි මොනවාද, මේ කථා කරන්නේ?

ගරු ඇමතිතුමනි, ඔබතුමා මහ පොළොවේ පය ගහලා ඉන්න ඇමතිවරයෙක්. ඔබතුමා එදා කෝච්චි strike කරපු වේලාවේ දරුවන්ට පාසලට යන්න විධියක් නැති වෙනකොට, ඔබතුමාගේ නිල වාහනයේ රාජගිරියේ ඉඳලා පාසල් දරුවන් අරගෙන ගිය කෙනෙක්. ඒ නිසා ඔබතුමා වතු කම්කරුවා ගැනත් බලන්න. වතු කම්කරුවාගේ වැටුප, දීමනාව සඳහා විශේෂ අවධානයක් යොමු කරලා එය භාණ්ඩාගාරයෙන් ලබා දෙන්න කටයුතු කරන්න. අර්බුදය මහේන්ද්‍රන්ලාට බිලියන, ට්‍රිලියන ගණන් ගහන්න පුළුවන් නම්, මේ කම්කරුවාට ඒ අවස්ථාව සලසා දෙන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නය මතු කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[පි.ප. 4.41]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(මාණ්ඩලික මයිල්වාගනම් තිලකරාජා)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் கட்டுப்பாட்டுச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள்மீதும் இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டத்தின் கீழான கட்டளைமீதுமான இந்த விவாதத்தில் உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக முதலில் உங்களுக்கு நன்றி தெரிவித்துக்கொள்ளக் கடமைப்பட்டிருக் கின்றேன். இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் (கட்டுப்பாட்டுச்) சட்டத்தின்கீழ் கொண்டுவரப்பட்டிருக்கின்ற ஒழுங்குவிதியில் மிக முக்கியமாக சொல்லப்படுவதானது கிளைபோசெட் பற்றிய விடயமாகும். 2015.06.11ஆம் திகதிய, 1918/22ஆம் இலக்க விசேட வர்த்தமானி ஊடாகப் பொருளாதாரக் கைத்தொழிலில் அதாவது, பெருந்தோட்டக் கைத்தொழிலில் 'கிளைபோசெட்' தடைசெய்யப்பட்டது. பெருந்தோட்டக் கைத்தொழிலில் மீண்டும் கிளைபோசெட் பாவனையை அமுல்படுத்துவதற்கான அனுமதியை இன்று இந்தப் பாராளுமன்றம் கோரிநிற்கின்றது. அதாவது, 2018 மே 08 சமர்ப்பிக்கப்பட்ட அமைச்சரவைப் பத்திரத்திற்கு ஏற்பாக எதிர்வரும் 36 மாத காலத்துக்கு இந்த 'கிளைபோசெட்' பாவனையை நடைமுறைப்படுத்துவதற்கு ஏற்றாற்போல இந்த அனுமதி கோரப்பட்டுள்ளது.

ஒட்டுமொத்தமாக இந்த நாட்டின் சுகாதாரப் பிரச்சினையெனக் காரணம்காட்டி 'கிளைபோசெற்' தடையை அறிவித்துவிட்டு, குறித்த கம்பனிகள் தொடர்ச்சியாகக் கொடுத்துவருகின்ற அழுத்தம் காரணமாக 'கிளைபோசெற்' பாவனையை மீண்டும் பெருந்தோட்டக் கைத்தொழிலில் மாத்திரம் நடைமுறைப்படுத்துவதற்கு அமைச்சரவை அனுமதியளித்திருக்கின்றது. இந்தச் சந்தர்ப்பத்தில் நாங்கள் ஒரு விடயத்தை ஞாபகப்படுத்த வேண்டியிருக்கிறது. அதாவது பெருந்தோட்டப் பகுதியில் கிளைபோசெட்டைப் பாவிப்பதா? இல்லையா? என்பதைத் தீர்மானிப்பதற்கு அமைச்சரவை அனுமதியும் இந்தப் பாராளுமன்றத்தின் அனுமதியும் கேட்கப்படுகின்றது. ஆனால், நாங்கள் எத்தனைமுறை தோட்டத் தொழிலாளர்களின் சம்பள விடயமாகப் பேசுகின்றபோதும் இதே பாராளுமன்றம்தான் பராமுகமாக இருந்து வருகின்றது. அதற்கு மிக முக்கியமான காரணம் இருக்கின்றது. அதாவது, இந்தப் பாராளுமன்றத்திற்கு எந்தவிதமான பொறுப்பும் கூறவேண்டியதாக அல்லாத வகையிலே, அமைச்சரவையின் தீர்மானத்திற்கு அப்பாற் பட்டதாகக் கடந்த 25 வருட காலமாகப் பெருந்தோட்டக் கைத்தொழில் சார்ந்து நடைமுறைப்படுத்தப் பட்டு வருகின்ற கூட்டு ஒப்பந்த முறையாகும்.

இங்கே பேசுகின்ற எல்லாப் பாராளுமன்ற உறுப்பினர்களும் பெருந்தோட்டக் கைத்தொழிலில் ஈடுபட்டுள்ள தொழிலாளர்களுக்கு ஏன் இந்தச் சம்பள அதிகரிப்புப் பிரச்சினை மாத்திரம் இருக்கின்றது என்கின்ற நிலையில் இருந்து அதைப் பார்க்காமல், தனியே அவர்களது சம்பளம் அதிகரிக்கப்பட வேண்டும் என்கின்ற கோரிக்கையை மாத்திரம் முன்வைக்கின்றார்கள். ஆனால், இது இன்று இப் பாராளுமன்றத்தில் முன்வைக்கப்பட்டிருக்கின்ற இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் கட்டுப்பாட்டுச் சட்டத்தின் கீழாக விவாதிக்கப்பட வேண்டிய ஒரு விடயமாகும். இந்தப் பெருந்தோட்டக் கைத்தொழிலில் ஈடுபடுத்தப்படுகின்ற தொழிலாளர்களின் சம்பளம் அதிகரிக்கப்படவேண்டுமாக இருந்தால், இந்த நாட்டின் ஏற்றுமதி வருமானம் அதிகரிப்பப்பட வேண்டும். ஏற்றுமதி வருமானத்தினை அதிகரிப்பதென்றால், இந்த நாட்டின் பாரம்பரிய ஏற்றுமதிப் பொருளாக இருந்த தேயிலை, இறப்பர் அதேபோல தென்னை ஏற்றுமதிகள் ஊக்குவிக்கப்பட வேண்டும். ஆனால், கடந்த 25 வருட காலமாக இந்தத் தோட்டங்கள் பிராந்தியக் கம்பனி களுக்கு ஒப்படைக்கப்பட்டதன் பின்னர், அரசாங்கத்தினது பங்களிப்பென்பதும், பார்வையென்பதும் இந்தத் துறைகளிலே மிக மோசமாக இருப்பதன் காரணமாக, இந்தத் துறையினூடாகக் கிடைக்கின்ற ஏற்றுமதி வருமானம் தொடர்ச்சியாகக் குறைந்துகொண்டு செல்கின்றது.

கடந்த 25 ஆண்டுகால வரலாற்றை எடுத்துப்பார்த்தால், முதல் நிலையில் இருந்த தேயிலை ஏற்றுமதி வருமானம் இன்று 3ஆம் 4ஆம் நிலைகளுக்குத் தள்ளப்பட்டிருப்பதைக் காணலாம். ஆடைக் கைத்தொழில் 2ஆம் இடம் என்று சொல்லப்பட்டு வந்தபோதும்கூட அதன்மூலமாகக் கிடைக்கின்ற தேறிய ஏற்றுமதி வருமானம் என்பது குறைவாக இருந்துவருகிறது. இதற்குக் காரணம் ஆடைக் கைத்தொழிலுக்கான பெரும்பாலான முதலீடுகள் வெளிநாட்டிலிருந்து பெற்றுக் கொள்ளப்படுவதாகும். அந்தவகையில், ஆடைக் கைத்தொழில் உற்பத்தியிலே கிடைக்கின்ற ஏற்றுமதி வருமானத்தில் பெருமளவான வருமானம் மீண்டும் நாட்டைவிட்டு வெளியே செல்லுகின்ற நிலைமைதான் காணப்படுகின்றது. அப்படியாயின், எமது நிலத்தில் ஏற்கெனவே பயிரிடப்பட்ட தேயிலை, இறப்பர் போன்ற பெருந்தோட்டப் பயிர்களிலிருந்து கிடைக்கக்கூடிய வருமானத்தை வெறுமனே கைவிட்டு விட்டு, ஒரு முறைசார்ந்த கைத்தொழிற்றுறையை முறைசாராத ஒரு துறையாக இன்று நாங்கள் பராமரித்து வருகிறோம் என்பதுதான் உண்மை. கடந்த 25 வருட காலமாகப் பெருந்தோட்டங்களை நிர்வகித்து, அதன் பிரதான பயிர்களான தேயிலை, இறப்பர் போன்ற பயிர்களின் உற்பத்தியை மேற்கொண்டு, அவற்றின் ஏற்றுமதிகளினூடாகக் கிடைக்கின்ற வருமானத்தைப் பெற்று, அதிலிருந்து சம்பளக் கொடுப்பனவுகளைச் செய்யவேண்டிய கம்பனிகள் அதனை விடுத்து, பராமுகமாக இருந்து, தொழிலாளர்களைத் துச்சமாக மதித்து, தொழிலாளர்களைப் பராமுகமாகப் பார்த்து வெவ்வேறு வழிகளில் தோட்டங்களை நடாத்திச் செல்வதன் காரணமாக இன்று தோட்டங்கள் பெரும் நட்டத்தில்

இயங்குகின்ற நிலைமை காணப்படுகின்றது. நட்டம் என்பதற்கப்பால், அந்தப் பிரதான பொருளாதாரத்துறையான தேயிலை, இறப்பர் மற்றும் தென்னை போன்ற பயிர்களின் வருமானம் வீழ்ச்சியடைந்து செல்ல, அங்கு அவர்கள் வேறு வகையில் வருமானத்தைப் பெற்றுக்கொள்கின்றார்கள்.

இந்த நிலையில்தான், 'கூட்டு ஒப்பந்தம்' சம்பந்தமாக நீதிமன்றம் சென்று நீதி கோரப்பட்டது. நீதிமன்றத்துக்குச் செல்கின்றபோது இந்தக் கூட்டு ஒப்பந்தத்தில் கைச்சாத்திடுகின்ற தரப்பினர் சொல்லுகின்ற கருத்தும், ஊடகங்களுக்குச் சொல்லுகின்ற கருத்தும், மக்களிடத்திலே சொல்லுகின்ற கருத்தும் வெவ்வேறானவையாக இருக்கின்றது. அதாவது, ஊடகங்களுக்குக் கருத்துச் சொல்கின்றபோது, தமிழ் முற்போக்குக் கூட்டணியினர் கைச்சாத்திட்டு இடைக்காலக் கொடுப்பனவொன்றைப் பெற்றுக்கொடுத்ததால்தான் தங்களால் நிலுவைப்பணத்தைப் பெற்றுக்கொடுக்க முடியாமல் போனது எனக் கூறுபவர்கள், நீதிமன்றத்திற்கு அறிக்கையிடும் போது, நிலுவைப்பணத்தைப் பெற்றுக்கொடுக்க வேண்டும் என தாங்கள் கூட்டு ஒப்பந்தத்தில் எங்கும் குறிப்பிட்டிருக்க வில்லை எனச் செல்கின்றார்கள். குறிப்பிட்ட கால இடைவெளியில் கூட்டு ஒப்பந்தம் கைச்சாத்திடப்படவில்லை என்று குற்றஞ்சாட்டினால், அத்தகைய ஓர் ஏற்பாடு அந்தக் கூட்டு ஒப்பந்தத்திலே இல்லை எனக் குறைகூறுகின்றார்கள். இத்தகைய குறைபாடான கூட்டு ஒப்பந்த முறையை நடைமுறையில் வைத்துக்கொண்டு, அந்தக் கூட்டு ஒப்பந்தத்தில் கைச்சாத்திடுகின்ற தொழிற்சங்கமான இலங்கைத் தொழிலாளர் காங்கிரஸின் தலைவரும் பாராளுமன்ற உறுப்பினருமான கௌரவ ஆறுமுகம் தொண்டமான் அவர்கள் நேற்று ஊடகங்களுக்கு அதிரடியாக ஒரு விடயத்தைக் கூறியுள்ளார். அதாவது "இந்த விடயத்தை நாங்கள் பாராளுமன்றத்திற்குக் கொண்டுவருகின்றோம், ஏனைய பாராளுமன்ற உறுப்பினர்கள் இதற்கு ஆதரவு தர வேண்டும்" என்பதாகும்.

நான் சம்பந்தப்பட்டவர்களுக்கு ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, நிச்சயமாக எங்களது ஆதரவு இந்தப் பாராளுமன்றத்திலே உங்களுக்கு இருக்கிறது. நீங்கள் அவதானமாகச் சட்டதிட்டங்களைப் பார்க்கவேண்டும்! முதலில் பாராளுமன்றத்திற்குப் பிரேரணையைக் கொண்டுவாருங்கள்! அதற்கு முன்பதாக நீங்கள் பாராளுமன்றத்திற்கு வாருங்கள்! வேலையாட்களின் தேசிய குறைந்தபட்ச வேதனச் சட்டத்தைப் புரட்டிப் பாருங்கள்! இதில் சொல்லப்பட்டிருக்கும் ஒரு சில வசனங்களைத்தான் தோட்டக்கம்பனிகள் திரும்பத் திரும்ப உங்களுக்குச் சொல்லி, 1ஆம் கட்டத் தோல்வி, 2ஆம் கட்டத் தோல்வி, 3ஆம் கட்டத் தோல்வி எனத் தோல்வியை ஏற்படுத்தி, உங்களை வெளியே அனுப்பிக் கொண்டிருக்கின்றார்கள்! நீங்கள் நாற்காலியை உதைத்துவிட்டு வெளியேவந்து ஊடகங்களுக்குக் காட்டுகின்ற நாடகங்களால் நாற்காலிக்கு வலிக்காமல் இருக்கலாம்! ஆனால், உங்களது பேச்சுவார்த்தை முடிவில் சம்பள உயர்வை எதிர்பார்த்துக்கொண்டிருக்கின்ற மக்களின் மனதை அது வலிக்கச்செய்கிறது. தேசிய குறைந்தபட்ச நாளாந்த வேதனம் 400 ரூபாயாதல் வேண்டுமென இந்தச் சட்டத்திலே சொல்லப்பட்டிருக்கின்றது. அதிலுள்ள இந்த வரிகளைக் காட்டிக் காட்டித்தான் 400 ரூபாயைவிட அதிகமான தொகையைத் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பளமாகப் பெற்றுக்கொடுக்கிறோம் எனச் சம்பந்தப்பட்டவர்கள் கூறுகின்றார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one more minute.

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
Only seven minutes have passed. I have two more minutes, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
No.

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
I have more time left.

2016ஆம் ஆண்டின் 3ஆம் இலக்க, வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனச் சட்டத்தின் ஒரு பகுதியை நான் அவர்களுக்கு நினைவுபடுத்த விரும்புகிறேன். அதாவது, "தேசிய குறைந்தபட்ச வேதனம் என்பது, வேலையாளரின் ஒப்பந்த முறையிலான வேதனம் அல்லது சம்பளம் அல்லது வேலையாளர் எந்தக் கைத்தொழிலை அல்லது சேவையைச் சேர்ந்துள்ளாரோ அந்தக் கைத்தொழிலுக்கு அல்லது சேவைக்கு சம்பளச் சபைகள் கட்டளைச் சட்டத்தின்கீழ் விதித்துரைக் கப்பட்ட வேதனம்; அத்துடன், வாழ்க்கைச் செலவுப்படி, விசேட வாழ்க்கைப் படி அல்லது வேறேதேனும் ஒத்த படி என்பவற்றுடன் சேர்த்து வேதனம் அல்லது அடிப்படைச் சம்பளம் என்று பொருளாகும்" என்று குறிப்பிடப்பட்டுள்ளது. அந்த வகையில் அடிப்படைச் சம்பளம் என்பது வாழ்க்கைச் செலவுடன் சேர்ந்ததாக இருக்கும்.

எனவே, வெறுமனே ஊடக நாடகமாடி, "இப்போது அடிப்படைச் சம்பளத்தை 1,000 ரூபாயாக நாங்கள் கோருகிறோம்" என நீங்கள் கூறுகின்ற நாடகத்தை நிறுத்த வேண்டும். உங்களது ஊடக நாடகங்களை நாங்கள் நன்கறிவோம். இவ்வாறான பேச்சுவார்த்தை அறைக்குள் நடக்கும் விடயங்களை ஊடகத்துக்கு அம்பலப்படுத்தும் நீங்கள், உங்களது மைத்துனர் முத்துவிநாயகம் தொண்டமான் அவர்கள் வாங்கிய இலஞ்சம் தொடர்பான செய்திகள் எந்தளவு தூரம் ஊடகத்தில் வெளிவராமல் இருப்பதற்குப் பார்த்துக் கொண்டீர்கள் என்பதை நீங்கள் கவனமாகப் புரிந்துகொள்ள வேண்டுமென நான் இந்த உயரிய சபையிலே கேட்டுக் கொள்ள விரும்புகின்றேன். எனவே, தொடர்ச்சியாக ஊடக நாடகங்களின் ஊடாகப் பேச்சுவார்த்தைகளைத் தோல்வி, தோல்வி என்ற காரணத்தின் அடிப்படையில் பிற்போட்டுக் கொண்டு செல்லாமல், குறைந்தபட்ச வேதனச் சம்பளத்தின் அடிப்படையில் பேசுவதற்கு -

**ගරු මුතු සිවලිංගම් මහතා (සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முத்து சிவலிங்கம் - சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Muthu Sivalingam - Deputy Minister of Social Welfare and Primary Industries)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! There is a point of Order being raised. Hon. Muthu Sivalingam, what is your point of Order?

**ගරු මුතු සිවලිංගම් මහතා**
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

முத்துவிநாயகத்தின் பிரச்சினை தேயிலைத் தோட்டத்துடன் சம்பந்தம் இல்லாதது; இந்தக் குடும்பத்துக்கும் சம்பந்தம் இல்லாதது. ஆகவே, தொண்டமானை இழுத்து, சம்பந்தப்படுத்தி இவர் பேசுவது தப்பு! இதனை வாபஸ் வாங்க வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
That is not a point of Order.

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

அதற்கு நான் பதில் அளிப்பதற்குக் கடமைப் பட்டிருக்கின்றேன். எங்கள் மக்கள் வாக்களித்து, அந்த வாக்குகளின் ஊடாகப் பெற்றுக் கொள்ளப்பட்ட கால்நடை அபிவிருத்திக்குப் பொறுப்பான அமைச்சின்கீழ் இயங்கக்கூடிய தேசிய கால்நடை அபிவிருத்திச் சபையின் தலைவராக இருக்கின்ற முத்துவிநாயகம் தொண்டமானைத்தான் நான் சொல்கின்றேனே தவிர, கௌரவ முத்து சிவலிங்கம் அவர்கள் இங்கு குறிப்பிட்ட தனிப்பட்ட முத்துவிநாயகத்தைப் பற்றி நான் குறிப்பிடவில்லை. அதாவது, தேசிய கால்நடை அபிவிருத்திச் சபையின் தலைவராக இருக்கின்ற முத்துவிநாயகம் தொண்டமான் அவர்கள் பெற்றுக்கொண்ட இலஞ்சம் பற்றியே நான் இந்தப் பாராளுமன்றத்தில் கருத்துரைத்தேன் என்பதைத் தெரிவித்துக் கொண்டு வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Ishak Rahuman.

[අ.භා.4.51]

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ පැවැත්වෙන විවාදය සම්බන්ධව පළ වුණු අදහස් පිළිබඳව මම උදේ ඉඳලා අහගෙන හිටියා. අද දවසේ විවාදයට අදාළ මාතෘකාව ගැන හැම කෙනාම වාගේ කථා කළා. හැබැයි, පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාම ලජ්ජා වෙන්න ඕනෑ. 1948දී තමයි ලංකාවට නිදහස ලැබුණේ. එදා බ්‍රිතාන්‍යයන් අපට ලංකාව භාර දීලා ගියා. මේ රට තමයි, ලෝකයේ තිබෙන සුන්දරම රට; පුංචි රට; සියලුම සම්පත් තිබෙන රට. හැබැයි, අද ලෝකයේ අනෙක් රටවල් හැම පැත්තකින්ම දියුණු වෙලා තිබෙනවා. ලංකාව හැම පැත්තෙන්ම -ආර්ථිකමය වශයෙන්, සමාජමය වශයෙන්- විනාශ වෙලා තිබෙනවා. ආණ්ඩු බලයට පත් වෙන පාලකයෝ, කාලයෙන් කාලයට පාලනය කරපු අයට ඇඟිල්ල දික් කරමින් කථා කරනවා. මම කථා කරන්නේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාව ගැනයි. ඒ දිස්ත්‍රික්කය කෘෂි කර්මාන්තයෙන් ජීවත් වෙන ජනතාවක් සිටින දිස්ත්‍රික්කයක්.

ලංකාව කෘෂි කාර්මික රටක් කියලා අපි හැම කෙනාම කථා කරනවා. අපේ රටේ පැවති රජයන් අපේ රටේ කෘෂිකර්මය වෙනුවෙන් මොනවාද කරලා තිබෙන්නේ කියන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. මගේ දිස්ත්‍රික්කය තමයි අනුරාධපුර දිස්ත්‍රික්කය. ඉස්සර ඒ දිස්ත්‍රික්කයේ මිරිස් වගා කෙරුවා. පිට රටවලින් ආදායම් ලැබූ ගොවි මහත්වරුන්ගේ ප්‍රධානම ව්‍යවසාය කටයුත්ත වුණේ මිරිස් වගා කිරීම. ලෝකයේ රටවලට යවලා ආදායමක් ගත්තු මිරිස් 1997දී චන්ද්‍රිකා බණ්ඩාරනායක හිටපු ජනාධිපතිතුමියගේ කාලයේ මහ පාරේ දාලා ගිනි තිබ්බා. අද වනතෙක් ඒකට කිසිම විසඳුමක් ගත්තේ නැහැ. මේ ගොවි මහත්වරුන් පිට රටට මිරිස් යවා ලබපු ඩොලර් ආදයම නැවත ලබා ගන්න අද වෙන කල් කිසිම දෙයක් කෙරුවේ නැහැ. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා කෘෂි කර්මාන්තයට බොහොම ආදරය කරන කෙනෙක්. 1948 නිදහසෙන් පස්සේ ඩී.එස්. සේනානායක මහත්තයා, ඩඩ්ලි සේනානායක මහත්තයා, 1977දී ජේ.ආර්. ජයවර්ධන මහත්තයා, ගාමිණී දිසානායක මහත්තයා කෘෂිකර්මයට මුල් තැන දුන්නා. ඊට පසුව ඔබතුමා තමයි කෘෂිකර්මයට මුල් තැනක් දෙන නායකයා.

ගරු ජනාධිපතිතුමනි, යහපාලන ආණ්ඩුව බලයට ඇවිල්ලා දැන් අවුරුදු තුනක් වෙනවා. ඔබතුමා මහවැලි "එච්" කලාපයේ කෘෂිකර්මයට මුල් තැන දෙනවා. ඔබතුමාගේ සංකල්පය අනුව මේ දවස්වල ව්‍යාපෘති එනවා; වයඹ ඇල කපනවා. ඒ වාගේම කළු ගහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. මේ වාගේ මහා විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඔබතුමාගේ විශේෂ අවධානයක් මේ කාරණය කෙරෙහි යොමු කරන්න ඕනෑ. මගේ ආදරණීය අනුරාධපුර දිස්ත්‍රික් ජනතාවගේ විශේෂ ආදායම් මාර්ගයක් තමයි, මිරිස් වගාව. ඒ අය පිට රටවලට මිරිස් අපනයන කරලා එදා ආදායමක් ගත්තු ඒ මිරිස් වගාවට මුල් තැන දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කන්න පහක් අපට ගොවිතැන් කරන්න බැරි වුණා. වතුර නැතුව ගොවි මහත්වරුන්ට මහා විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම ආහාර පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේ දවස්වල ඒ අය සම්බන්ධයෙනුත් ඔබතුමා විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා.

අද රුපියලට සාපේක්ෂව ඩොලරයේ වටිනාකම වැඩි වෙලා යනවා. ඩොලරයේ වටිනාකම වැඩි වෙනවා කියලා කථා කරලා හරි යන්නේ නැහැ. ඩොලරය පාලනය කරන්න නම්, අපේ රටේ නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. අපේ නිෂ්පාදනය වැඩි නොකෙරුවොත් කවදාවත් මේ ඩොලරයේ අගය වැඩිවීම පාලනය කරන්න බැහැ. අපේ තිබෙන ඩොලර්වලින්, පිට රටවලින් බඩු ගන්න ගියාම අපේ රටට අවශ්‍ය වන ඩොලර් සංචිත ප්‍රමාණය මදි වෙනවා. අපට ඩොලර් අව්වු ගහන්න බැහැ. එදා ඩී.එස්. සේනානායක මහත්තයා, ඩඩ්ලි සේනානායක මහත්තයා මේ කෘෂි කර්මාන්තයට මුල් තැන දුන්නා වාගේ අපිත් කෘෂි කර්මාන්තයට මුල් තැන දෙන්න ඕනෑ. ලංකාව කෘෂි කාර්මික රටක් නම්, කෘෂි කර්මාන්තයට මුල් තැන දීලා ආදායම් වැඩි කර ගන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමාට විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවා. ඔබතුමා කෘෂි කර්මාන්තයට ආදරයක් තිබෙන ජනාධිපති කෙනෙක්. ඒ නිසා විශේෂ ව්‍යාපෘති පටන් අරන්ගෙන ලංකාව කෘෂි කාර්මික භාණ්ඩ අපනයන කරන රටක් විධියට පත් කරන්න ඕනෑ. ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ කර්මාන්තපුරවල garment factories ඇති කරලා ඒවායින් ආදායම් ගත්තා.

අද අපට එවාත් නැහැ. අපි ලජ්ජා වෙන්න ඕනෑ. අද ලංකාව අල්පෙනෙත්තක්වත් -ඉඟුරු- හදන්න බැරි රටක් බවට පත් වෙලා තිබෙනවා. අද අපේ රටේ තිබෙන හැම භාණ්ඩයක්ම වාගේ made in Bangladesh, made in China. අඩු ගණනේ සරුංගලයක්වත් ලංකාවේ නිෂ්පාදනය කරන්නේ නැහැ. පොඩි ළමයි සෙල්ලම් කරන සරුංගලයත් අද චීනයෙන් තමයි අපි

ගෙන්වන්නේ. අපි ඒ ගැන ලජ්ජා වෙන්න ඕනෑද නැද්ද කියලා මම අහනවා. පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225දෙනා හිතන්න ඕනෑ ලංකාව දැන් කොතැනටද ගිහින් තිබෙන්නේ කියලා. අපි කොහොමද ලංකාව ලෝකය ඉදිරියට අරගෙන යන්නේ කියලා හිතන්න ඕනෑ. අපි දැන් ආර්ථිකය විනාශ වුණු රටක් බවට පත් වෙලා ඉවරයි. ඒ නම ඇති කරලා ඉවරයි. ඒ නිසා අපි කරන්න ඕනෑ මොනවාද කියලා පක්ෂ විපක්ෂ හැම එක්කෙනාම හිතන්න ඕනෑ කාලයක් ඇවිත් තිබෙනවා. අපි ආණ්ඩු පක්ෂයේ ඉඳලා විපක්ෂයට ඇඟිල්ල දිගු කරනවා. විපක්ෂයේ ඉඳලා ආණ්ඩු පක්ෂයට ඇඟිල්ල දිගු කරනවා. එහෙම කරලා වැඩක් නැහැ. මේ ලංකාවේ ඉන්න කෝටි දෙකහමාරක ජනතාව අපි ගැන ලොකු විශ්වාසයක් තියලා තමයි අපට මේ රට භාර දීලා තිබෙන්නේ. මේ රටේ විනාශ වුණු ආර්ථිකය, නැවතුණු සංවර්ධනය ඔබතුමන්ලා නැවත ආරම්භ කරලා අපට හොඳ රටක් හදලා දෙන්න කියලා තමයි ජනතාව අපට මේ රට භාර දුන්නේ.

අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා නිතරම කියනවා සිංගප්පූරුව විධියට ලංකාව හදන්න ඕනෑ කියලා. හැබැයි, එදා සිංගප්පූරුවේ හිටපු අගමැති ලී ක්වාන් යූ මැතිතුමා කිව්වේ ලංකාව වාගේ සිංගප්පූරුවත් හදන්න ඕනෑ කියලායි. එතුමාගේ සිහිනය එතුමා එදා ඉෂ්ට කර ගත්තා. ගරු අග්‍රාමාත්‍යතුමනි, ලංකාව සිංගප්පූරුව වාගේ හදන්න ඕනෑ කියලා ඔබතුමාගේ සිහිනය තිබෙනවා. කර්මාන්තපුර ඇති කිරීමේ වැඩ පිළිවෙළක් ඔබතුමාට තිබෙන බව අපට දකින්න තිබෙනවා. හැබැයි, අපට තිබෙන්නේ පොඩි කාලයයි. එම කාලය තුළ ඉතා ඉක්මනින් කර්මාන්ත ගෙනැත් ආදායම වැඩි කිරීමේ මාර්ගය හදන්න ඕනෑ.

අද අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශාල ප්‍රශ්න තිබෙනවා. ගොවි මහත්වරුන්ට වල් අලින්ගෙන් සිදු වන හානිය විශාලයි. මිනිසුන්ට කිසි දෙයක් ඉතිරි කර ගන්න බැහැ. ඔවුන්ගේ ආදායම වැඩි කර ගන්න බැහැ. ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම වල් අලින්ගෙන් අපේ රටේ තිබෙන සම්පත් දවසින් දවස විනාශ වෙනවා. මේවාට වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. අද අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි මහත්වරුන් වගා කටයුතු කරගන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. Forest Department එකේ නිලධාරීන්, Wildlife Conservation Department එකේ නිලධාරීන් ගිහිල්ලා ඒ අයට අවශ්‍ය විධියට හරි නීතියක්, පිළිවෙළක් නැතිව මායිම් දමනවා. නිදහස ලැබුණු කාලයේ ඉඳලා ගොවිතැන් කටයුතු කරපු ගොවි මහත්වරුන්ට අද හේන් ගොවිතැනවත් කර ගන්න බැරි තත්ත්වයක් අද තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම Forest Department එකටයි, Wildlife Conservation Department එකටයි කියනවා, නීතිය ක්‍රියාත්මක කරන්න, ප්‍රශ්නයක් නැහැ. හැබැයි, එදා ඉඳලා ගොවිතැන් කරපු ගොවි මහත්වරුන්ට ඒ අයගේ භූමිය ලබා දීමට කටයුතු කරන්න කියලා. එහෙම නොවුණොත් අපේ රට කාර්මික රටකුත් නොවෙයි, කෘෂි කාර්මික රටකුත් නොවෙයි. ඒ නිසා අපි ලෝකයේ මොන ලිස්ට් එකටද ලංකාව ඇතුළු කරන්නේ කියලා තමයි මම කනගාටු වන්නේ.

මේක වාදයක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන දේ නොවෙයි මම කියන්නේ. ඓතිහාසිකව, ත්‍රිකුණාමලයේත් සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව එකට හිටියා. මුලතිව්වලත් සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට එකට හිටියා. 1983ට කලින් යාපනයේ සිංහල පවුල් හිටියේ නැද්ද? හිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මම හිටපු කාලයේ සිංහල පවුල් 13,000කට ආසන්න පිරිසක් යාපනයේ හිටිය බව උප්පැන්න සහතිකවලින් වාර්තා වුණා. ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් සහයෝගය අවශ්‍ය නම්, මේ හැම තැනකම සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව සමඟ අපි ඓතිහාසිකව එකට හිටියා කියන කාරණය අපි තේරුම් ගන්න ඕනෑ. ඒකයි මම කියන්නේ. ඒ අය ඓතිහාසිකව එකට හිටියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ඓතිහාසිකව සිටීම පිළිගැනීමෙන් තමයි සැබෑ සහජීවනය, ඇත්ත සහජීවනය ඇති වෙන්නේ. [බාධා කිරීමක්] මට නම් point of Order එකක් තේරෙන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒක හරි. මම ඔබතුමාට පැහැදිලි කරන්නම් මගේ කථාවේදී. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව මට දෙන්න. [බාධා කිරීමක්] මම දන්නවා. මම ඒකත් කියනවා. මම දැන් ඒකත් කියනවා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මම ඒකත් කියනවා.

මම පිළිගන්නවා යුද්ධය හේතුවෙන් අවතැන් වූ දෙමළ ජන කොටසක් ඉන්න බව. යුද්ධය හේතුවෙන් සාම්ප්‍රදායිකව ජීවත් වුණු ගම්මානවල ඉඩම් අයිතිය අතහරින්න සිද්ධ වුණු ස්ථාන ඇති. ඒ වාගේම, පීඩාවට පත් වුණු මුස්ලිම් ජනතාවත් ඉන්නවා. ඒ යුද්ධයෙන් පීඩාවට පත් වුණු සිංහල මිනිස්සුත් මුලතිව්, වැලිඔය, ජානකපුර කියන ගම්මානවල ඉන්නවා. එල්ටීටීඊ යුද්ධයෙන් ජානකපුර හිටපු සිංහල මිනිස්සුත් බැට කෑවා; කොටියාගල මිනිස්සුත් බැට කෑවා; මහ කළුගොල්ලේ මිනිස්සුත් බැට කෑවා; මංගලගම මිනිස්සුත් බැට කෑවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මඩකළපුවේ තිබෙන එකම සිංහල ගම්මානය තමයි මංගලගම. කොහුකුඹුරේ රටේ රාළලා පටන් ගත්ත 1818 විමුක්ති සටනේදී සුද්දෝ එක්ක සටන් කරපු මිනිස්සු අදත් ඉන්නවා මඩකළපුවේ ඒ එකම සිංහල ගම්මානයේ. ඒ මිනිසුන්ට පදිංචි වෙන්න ප්‍රාදේශීය ලේකම් තවම ඉඩ දීලා නැහැ. ඇත්ත කථාවයි මම මේ කියන්නේ. ජාතිවාදය ඕනෑ නැහැ, ආගම්වාදය ඕනෑ නැහැ. සිංහල මිනිහාගේ ප්‍රශ්නයත්, දෙමළ මිනිහාගේ ප්‍රශ්නයත්, මුස්ලිම් මිනිහාගේ ප්‍රශ්නයත් එකයි කියන එක ආණ්ඩුව දකින්න පටන් ගන්න ඕනෑ. කුමන පාලකයා වුණත් අන්න ඒක දැක්කොත්, එතැන ඉඳලා ප්‍රශ්නය විසඳෙනවා. එහෙම නැතිව, දෙමළ ජනයාට සුවිශේෂී ප්‍රශ්න තිබෙනවාය කියලා හිතලා, මුස්ලිම් ජනයාට සුවිශේෂී ප්‍රශ්න තිබෙනවාය කියලා හිතලා, සිංහල ජනයාට සුවිශේෂී ප්‍රශ්න තිබෙනවාය කියලා දකින එකෙන්ම, ඒ සියලු ජන වර්ග අතරේ ජාතිවාදය ආගම්වාදය වැපිරෙනවා.

ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, මම පදිංචි වෙලා ඉන්නේ මොනරාගල, සාමමලේ වත්තේ. මම ඉන්නේ සාමමලේ වත්තේ. සාමමලේ වත්තේ පූජකතුමාගෙන් අහන්න, එතැන තිබෙන කෝවිලට වැඩියෙන්ම උදව් කරන්නේ කවුද කියලා. ඒ මිනිස්සු කියයි, සුමේධා ජී. ජයසේන මැතිනුමියගේ නම. ඒ මිනිස්සු කියයි, පද්ම උදයශාන්ත ගුණසේකරගේ නම. ඒ මිනිස්සු කියයි, එහේ ඉන්න සිංහල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ නම. අපේ ගම්වල සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව එකට ඉන්නවා. එම නිසා ඔබතුමාගේ ගම්මානවලත් සාම්ප්‍රදායිකව සිටි සිංහල මිනිහා එළවන්න හදන්න එපා. සිංහපුරේ හිටපු සිංහල මිනිසුන්ට ඉන්න දෙන්න. තෙන්නමරම්වාඩියේ ඉන්න සිංහල මිනිසුන්ටත් ඉන්න දෙන්න. කෝකිලායිවල සිංහල, දෙමළ ජනතාව එකට සිටියා. ඔවුන් එක කෝවිලකට ගියා. ඔබතුමන්ලා දන්නවා නේ, යාපනයේ හින්දු-බෞද්ධ ජනතාව එකට ඉන්නවා. යාපනයේ හින්දු -බෞද්ධ සමාජයක් තිබෙනවා. ඒ වාගේම, හින්දු-දෙමළ සමාජයකුත් තිබෙනවා. මේ සියලුදෙනාම ඉතිහාසයේ සහජීවනයෙන් සිටියා. එම නිසා මා ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ මේ වර්ගවාදී අදහස නැවත ව්‍යාප්ත කරන්න උත්සාහ කරන්න එපා කියලායි. ඉඩම් අයිතිය කාටත් ඕනෑ. සිංහල මිනිහාටයි, දෙමළ මිනිහාටයි, මුස්ලිම් මිනිහාටයි කියන කාටත් එය හිමියි.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
Sir, I rise to a point of Order.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தயவுசெய்து நீங்கள் எங்களையும் கதைக்க அனுமதிக்க வேண்டும். நாங்கள் இனவாதம், மதவாதம் பேசவரவில்லை. நிரந்தரமாக வாழ்ந்த மக்கள் அங்கிருந்து விரட்டியடிக்கப் பட்டார்கள்; கலைக்கப்பட்டார்கள். அவர்கள் மீண்டும் சொந்த நிலத்தில் குடியேற அனுமதிக்கப்பட வேண்டும். அவர்களின் நிலங்களைப் பறித்து வேறு யாருக்கும் கொடுக்கக்கூடாது.

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

இந்த விடயத்தைத்தான் இன்று நாங்கள் Adjournment Motion ஆக முன்வைத்திருக்கின்றோம். அதைவிடுத்து, நாங்கள் இனவாதம், மதவாதம் பேச வரவில்லை. எனக்கு அவரின் விளக்கம் தேவையில்லை. எங்களது மக்கள் சொந்த மண்ணில் வாழ அனுமதியுங்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසන් කරනවා. එතකොට ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමන්ලාට කථා කරන්න පුළුවන්.

මම කියන්නේ මේකයි. අවතැන් වීම හේතුවෙන් දෙමළ ජනතාවගේ ඉඩම් අයිතිය නැති වුණා නම්, ඒ දෙමළ ජනතාවට ඒ ඉඩම් අයිතිය දෙන්න ඕනෑ. හැබැයි, ඒ ඉඩම් අයිතිය දෙනකොට, කුච්චවේලි ප්‍රදේශයේ තෙන්නමරම් වාඩියේ, සිංහපුර, කෝකිලායිවල හා වැලිඔය, ජනකපුර, කල්‍යාණපුර ඉන්න සිංහල මිනිසුන් එළවා ඒ ඉඩම් අයිතිය දෙන්න ගියොත් ඒ සිංහල මිනිසුන් කොහේ නවතින්නද? දෙමළ මිනිසුන්ට ඉඩම් නැතිවනවා වාගේම සිංහල මිනිසුන්ටත් ඉඩමක් නැති වනවා නම්, ඔවුන්ගේ සාම්ප්‍රදායික ගම් නැතිවනවා නම්, ඒ සිංහල මිනිහාටත්, දෙමළ මිනිහාටත්, මුස්ලිම් මිනිහාටත් හදවතේ කකියන්නේ එකම වේදනාවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දෙමළ මිනිසුන්ට තම ඉඩම් අයිතිය නැති වනකොට වේදනාව දැනෙනවා වාගේම, කිසියම් වර්ගවාදී හෝ අන්තවාදී සංවිධානයකින් එතැන සාම්ප්‍රදායිකව ජීවත් වුණු සිංහල මිනිහා ඉවත් කරන්න හැදුවොත්, ඒ මිනිහාටත් දැනෙන්නේ එම වේදනාවම තමයි කියන එක අවසන් වශයෙන් මම කියනවා. මේ රට රකිනවා නම්, සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ සහජීවනය සැබෑ ලෙස හදනවා නම්, කෝවිලටත්, පන්සලටත්, පල්ලියටත් එක සමානව සලකන පාලකයෙක් මේ රටට ඕනෑ. ඒ ප්‍රතිපත්තිය මේ රටේ තහවුරු කරන්නය කියන ඉල්ලීම කරමින්, වර්ගවාදයට නැවත මේ පාර්ලිමේන්තුවේ ඉඩ තියන්න එපා කියන ඉල්ලීම කරනවා. අවුරුදු 30ක් මේ යුද්ධයෙන් අපි සියලුදෙනාම බැට කෑවාය කියන කාරණයත් මතක් කරමින්, සියලු ජනතාවට සමානව සලකන්න කටයුතු කරන්න කියලා ආණ්ඩුවට කියමින් මා නවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ලබා දුන් කාලයට බොහොම ස්තුතියි.

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
Sir, I rise to a point of Order.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவ்வாறான இன வக்கிரத்தைத் தூண்டுகின்ற மனநிலைதான் தமிழ், முஸ்லிம், சிங்களவர்களிடையே 30 வருடங்களாக பாரிய பிரச்சினைகளை ஏற்படுத்தியது. நாங்கள் சட்டத்தை, நியாயத்தை, நீதியைப் பற்றித்தான் கதைக்கின்றோம். ஏனெனில் இன்று பிழையான முறையிலே சட்டங்கள் பிரயோகிக்கப்படுகின்றன. அவை எமது மக்களைப் பாதிக்கின்றன. இவ்வாறான சட்டங்களை மீளப்பெறுங்கள், பூர்வீகமாக வாழ்ந்த அந்த மக்களை அங்கே மீள வாழ விடுங்கள் என்றுதான் நாங்கள் கேட்கின்றோமே தவிர, இன முரண்பாட்டை ஏற்படுத்துகின்ற வகையிலே கதைக்கவில்லை. ஒன்றுபட்ட நாட்டுக்குள் ஒற்றுமையாக எங்களுக்குரிய -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මී ළඟට, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මම කිසිදු ජාතිවාදී අදහසක් කියලා නැහැ. මම අදත් ඉන්නේ මොනරාගල, සාමමලේ වත්තේ. මම පදිංචි ඒ දෙමළ වත්තේ. එම නිසා මම ජාතිවාදියෙක්වත් නොවෙයි, ආගම්වාදියෙක්වත් නොවෙයි. හැම මිනිහෙකුගේම ඇහේ දුවන්නේ එකම රක්ත රුධිරයක්ය කියලා විශ්වාස කරන මිනිහෙකු හැටියටයි පාර්ලිමේන්තුවේදී මම කථා කරන්නේ. ජාතිවාදී හෝ ආගම්වාදී මතයක් මට නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දැන් කථා කරන්න.

[අ.භා.6.07]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට මුලින්ම ස්තුතිවන්ත වනවා. අද දින සභාව කල් තැබීමේ යෝජනාව ගැන මම කථා කරන්න හිටියේ නැහැ. ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා ගෙනා මේ යෝජනාව සද්භාවයෙන් ගෙනා යෝජනාවක්ය කියලා මම විශ්වාස කරනවා. හැබැයි, අපේ ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මන්ත්‍රීතුමියගේ ප්‍රකාශයක් නිසා මටත් හිතුණා මේ ගැන වචනයක් කථා කරන්න ඕනෑය කියලා. එතුමිය දැන් නැහිටලා කිව්වා, "මම ජාතිවාදී ප්‍රකාශයක් මෙතැන උලුප්පා දැක්වූයේ නැහැ, පෙන්වන්න උත්සාහ කළේ නැහැ"යි කියලා. අපි මේ පාර්ලිමේන්තුවේදී වාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමන්ලාත් එක්ක හැම දාම සහයෝගයෙන් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දවසේ පැවැති අපේ විවාදයේ දී ඒකාබද්ධ විපක්ෂයේ අපි මඩ කකා උත්සාහ කළේ මේ රටේ සියලු දෙනාට සමාන අයිතිය තිබෙන්නට ඕනෑය කියන මතය මේ උත්තරීතර සභාව තුළින් සමාජගත කරන්නයි. ගරු මන්ත්‍රීතුමිය කිව්වා, ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා මහවැලි යෝජනාව හරහා එතුමියගේ ජනතාව එළවා දැමුවා කියලා. "අපේ ජනතාව එළවා දමා සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කළා"යි

කියලා එතුමිය කිව්වා. මේ රටේ දමිළ ජනතාව පමණක් නොවෙයි, මේ රටේ කිසිම ජන කොටසක් එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ආරම්භ කළ, ගාමිණී දිසානායක මැතිතුමා ක්‍රියාත්මක කළ මහවැලි යෝජනා ක්‍රමය ප්‍රතික්ෂේප කර එයට විරුද්ධව වචනයක් හෝ කියනවා මම අද තමයි ඇහුවේ. ඒ ගැන මට පොඩි වේදනාවක් ආවා. ඒ නිසා එම ප්‍රකාශය පිළිබඳව මා කථා කරන්නට ඕනෑය කියා සිතුවා.

විශේෂයෙන්ම මේ අවස්ථාවේ දී මා කියන්නට ඕනෑ, මේ රටේ අද නිර්මාණය වෙලා තිබෙන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලු සුළු ජාතීන්ට සමානව සලකන නායකයන් දෙදෙනෙකු විසින් රට කරවන ආණ්ඩුවක් බව. ඔබතුමියත් එය දකිනවා ඇති. අපේ ගරු මන්ත්‍රීතුමා මෙම යෝජනාව ගෙන එන්නට ඇත්තේ සද්භාවයෙන්ය කියා මම කියන්නේ ඒකයි. යම් ගැටලු ඇති. සමහර වෙලාවට අපි දකිනවා, සිංහල ජන කොටස් තුළත් ආගම්වාදය වපුරා තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් හිට ගන්නට යම් කණ්ඩායම් උත්සාහ කරන බව. වීවරය ප්‍රයෝජනයට අරගෙන ආගම මූලිකකොට ගත් බෞද්ධ ආගමික භක්තිකයන් ඉස්සරහට අරගෙන සමාජය විකෘති මාවතකට ගෙන යන්නට උත්සාහ කරන අවස්ථා අපි දකිනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් අපේ රාජ්‍ය අමාත්‍යතුමා ලබා දෙයි. හැබැයි පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විධියට අපි ඉල්ලීමක් කරනවා. මීට පෙර පැවැති රජයේ වැඩ පිළිවෙළවල් තුළින් බෙදී ගිය, සමානව තිබුණු අයිතිය අහිමි වූ දමිළ ජනතාවට, මුස්ලිම් ජනතාවට, ඒ සියලු දෙනාටම අද එක තැන හිට ගන්නට පුළුවන් වට පිටාවක් නිර්මාණය වෙලා තිබෙන අවස්ථාවක අපේ නායකයන්ගේ ක්‍රියාදාමයන් පිළිබඳව විවේචනය කිරීම වටින්නේ නැහැ; යුතු නැහැ කියන එක. එම නිසා අපි ඉල්ලීමක් කරනවා. "අපේ ජනතාව" කියා දමිළ ජනතාවට පමණක් නොවෙයි, අපේ රටේ සිටින සිංහල, මුස්ලිම් සියලුම ජනතාවට ආමන්ත්‍රණය කරන්න ඔබතුමාට, ඔබතුමියට පුළුවන් නම්, එතකොට තමයි අපි බලාපොරොත්තු වන තැනට එන්න පුළුවන් වන්නේ.

අද මා නියෝජනය කරන රක්වාන මැතිවරණ කොට්ඨාසයේ දමිළ ජනතාව 13,000ක් ඉන්නවා. මුස්ලිම් ජනතාව 7,000ක් ඉන්නවා. සිංහල ජනතාව 78,000 ක් ඉන්නවා. මේ ඔක්කොම අපේ ජනතාව, මගේ ජනතාව කියා මට කියන්නට පුළුවන්. ඒ මිනිස්සු එක මානසිකත්වයක, එකම තැනක, අපේ රට, අපේ ජාතිය කියන තැන ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු පෙළ මන්ත්‍රීවරයකු හැටියට මම ඉල්ලීමක් කරනවා. මම හිතන විධියට එතුමිය අපිත් එක්ක පළමු වතාවට පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරියක්. අපිත් එක්ක පළමුවන වතාවට පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීතුමන්ලා සිටිනවා. ඔබට, අපට පුළුවන් මේ රටට පණිවුඩයක් දෙන්න. "මේ අපේ ජනතාව" කිව්වාම ඔය ඔක්කොම අයිතියි. එසේ නැතිව උතුරේ විතරක්, ත්‍රිකුණාමලයේ විතරක් නොවෙයි. ඒ ප්‍රශ්න ටික විතරයි අපිට මේ උත්තරීතර සභාව තුළ කථා කරන්නට තිබෙන්නේ. "ඒ ප්‍රශ්න ටිකේත් වැඩි වාසිය අපේ කොටසට එන්න ඕනෑ"යි කියලා ප්‍රකාශ කරනවා නම්, එතැන ඔබ ජාතිවාදී ප්‍රකාශයක් නොකළාට ව්‍යංගාර්ථයෙන් ඒක සිදු වෙනවා. මේ රටේ මුස්ලිම් කෝලාහල ඇති කර, මුස්ලිම් ප්‍රශ්න ඇති කර තමන්ගේ ඡන්ද ගොඩ වැඩි කර ගන්නට සමහරුන් උත්සාහ කරනවා. තමන්ගේ හුදු බාල මානසිකත්වයන් තුළ ඉඳගෙන කටයුතු කිරීම තුළ තමයි මේ රටේ ජනතාව ජාතිවාදී කෝලාහලවලට යන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අපේ ගරු ඇමතිතුමාගෙන් පිළිතුර ලැබෙනවා.

අවසාන වශයෙන් මේ කාරණය ගැනත් මා කියන්නට ඕනෑ. මේ රටේ සියලු ජනකොටස්වලට ඒකරාශීව ජීවත් වෙන්නට පුළුවන් ආකාරයට හැම කෙනෙකුටම සමාන පහසුකමක් දෙන්න. අවුරුදු ගණනාවක් මේ රටේ දමිළ ජනතාව හිටියා. ලයින් කාමරවලින් එළියට යන්නට බැරිව තිබුණු යුගයක් අද අවසන් කර පර්චස් 7ක භූමි ප්‍රමාණයක ගෙයක් හදා දෙන්න මේ රජය ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේ රජයේ එම වැඩසටහන දැන් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒ තුළින් අපි කියන්න බලාපොරොත්තු වන්නේ සිංහල මිනිහාට තිබෙන අයිතියම දමිළ මිනිහාටත්, මුස්ලිම් මිනිහාටත් තිබෙන්නට ඕනෑය කියන එකයි. ඒ වාගේම උතුරු නැඟෙනහිර තිබෙන ප්‍රශ්න එකින් එක හඳුනාගෙන ඒවා සියල්ල එකින එක නිරාකරණය කරනවා. අපි දන්නවා, විග්නේෂ්වරන් මහත්මයාට තිබෙන්නේ වෙනම ප්‍රශ්නයක් බව. ඔබතුමියන්ලා, ඔබතුමන්ලා ඊට වඩා ඉහළට ගිහින් ජනතාවත් එක්ක බැඳීමෙන් කටයුතු කරන පිරිසක් විධියට හරි තැන හිටගන්නට ඕනෑ. එම නිසා මම ඉල්ලීමක් කරනවා. මේ පාර්ලිමේන්තුව තුළ ඔබේ වග කීම වෙන්නේ අප සියලු දෙනා එකට එකතුවෙලා ඉන්නවාය කියන හැඟීමෙන් ප්‍රකාශ නිකුත් කිරීමයි. ඒ හැර, "මේ අපේ කොටස, අපේ අයිතිය දෙන්න" කියා ඉල්ලනකොට, මීට අවුරුදු ගණනකට පෙර තිබුණු ප්‍රශ්නයට උත්තරයක් අපි තවම සොයාගෙන නැහැ කියන හැඟීමක් අපට එනවා. එම නිසා ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ තිබෙන සංහිඳියාව වාගේම, මන්නාරමට ගියාම, යාපනයට ගියාම, මුලතිව්වලට ගියාම අපට ඔබත් එක්ක ඉන්න පුළුවන් වාගේම, ඔබටත් මාතරට, හම්බන්තොටට ඇවිත් අපිත් එක්ක ඉන්න පුළුවන් සමනිය මේ රටේ නිර්මාණය වෙන්න ඕනෑ. ඒ පාර කැපෙන්න තිබෙන දුර තව තවත් ඈත් කරන්න එපාය කියා ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු වීරකුමාර දිසානායක මහතා

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! கௌரவ அமைச்சர் அவர்களே! நான் இன்று இங்கு கொண்டு வந்திருக்கின்ற ஒத்திவைப்புவேளைப் பிரேரணை அங்கிருந்து விரட்டியடிக்கப்பட்ட மக்கள் திரும்பவும் அந்த இடத்திலே குடியமர்த்தப்பட வேண்டும் என்பது பற்றியதாகும். கௌரவ சார்ள்ஸ் நிர்மலநாதன் அவர்கள் கூறியதுபோல், அந்த நிலம் எமது மக்கள் பரம்பரை பரம்பரையாக, பாரம்பரியமாக வாழ்ந்து வந்த அவர்களுடைய சொந்த நிலம். ஆகவே, அந்த மக்கள் தாங்கள் வாழ்ந்த நிலத்திலே மீண்டும் சென்று

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

වාழ්වතற්කාන உரිත්තைப් பறித்து, இன්නோர් இனத்துக்கு அந்தக் காணி அனுமதிப்பத்திரங்கள் வழங்கப்படக் கூடாது. மாறாக அந்த நிலங்கள் அங்கு வாழ்ந்த எமது மக்களுக்கே வழங்கப்பட வேண்டும். ஆனால், அந்தத் தமிழர்களுடைய காணிகளைப் பறித்துச் சிங்களவர்களுக்கு வழங்கியதற்கான permit என் கைவசம் இருக்கின்றது. இன்று இவ்வாறான செயற்பாடுதான் அங்கு இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. நாங்கள் நாட்டின் ஒற்றுமையைக் குலைப்பதற்கு அல்லது இனவாதம், மதவாதம் பேசுவதற்கு இங்கு வரவில்லை. வரலாறு பேசுவது என்றால், இந்த மண்ணிலே யார் முதலிலே வாழ்ந்தார்கள், இதனுடைய வரலாறு என்னவென்பதைப் பற்றி நாங்கள் இன்னொரு நாளில் விவாதிக்கலாம். ஆகவே, தமிழ் மக்களிடம் பறித்த காணிகளை அந்த மக்களிடம் திரும்பவும் வழங்குங்கள்! அதுதான் மிக முக்கியமானது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேவை என்றால் நீங்கள் என்னோடு வாருங்கள், நான் உங்களைக் கூட்டிக் கொண்டு போய் அந்த இடங்களைக் காட்டுகிறேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය අමාත්‍යතුමා කථාව පටන් ගන්න කලින් ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමාට මම කාරණයක් කිව යුතුයි. ගරු මන්ත්‍රීතුමනි, යෝජනාවක් ඉදිරිපත් කළාට පසුව විවිධ මන්ත්‍රීවරුන් විවිධ අදහස් ඉදිරිපත් කරනවා. අප ඒවාට ඉඩ දෙන්න ඕනෑ.

මීළඟට, පිළිතුරු කථාව, ගරු රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා.6.14]

**ගරු වීරකුමාර දිසානායක මහතා (මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க - மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Weerakumara Dissanayake - State Minister of Mahaweli Development)

ගරු එස්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා මේ යෝජනාව ගැන කරුණු ඉදිරිපත් කළත්, මා මුලින්ම කියන්න ඕනෑ, මේ යෝජනාව තුළ ඉඩම් ප්‍රශ්නයට අදාළව අපට විවාද කරන්න තරම් කරුණක් නැති බව. ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා අතිගරු ජනාධිපතිතුමා විසින් උතුරු නැඟෙනහිර පළාත් සංවර්ධන ජනාධිපති කාර්ය සාධන බලකාය පසුගිය දිනවල පාර්ලිමේන්තුවේදී කැඳවනු ලැබූ බව. මා හිතන විධියට, ඔය ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන් එයට සහභාගි වුණා. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා පැහැදිලිවම පිළිතුරු සපයා තිබෙනවා. ජාති, ආගම් භේදයකින් තොරව ඒ ප්‍රදේශයේ සිටින සියලු ජනතාවගේ ඉඩම් අයිතිය නිවැරැදිව තහවුරු කරන්න කියා එතුමා දන්වා තිබෙනවා. දෙසැම්බර් මාසය වන විට දින දීලා, එහි සමාලෝචන කටයුතුත් කෙරිගෙන යන වෙලාවේ තමයි අප අද මේ විවාදය කරන්නේ. මහවැලි අධිකාරියට අයිති ප්‍රදේශවල සියලු ඉඩම්, ඒ බලපත්‍ර සහ අවශ්‍ය දේවල් අපි ලබාදෙනවා. එහි කිසි ප්‍රශ්නයක් නැහැ. ඉඩම් අයිතිය ලබාදීමේදී සිංහල, දෙමළ, මුස්ලිම් ආදී කිසිම ජාති භේදයක් අපට නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ යෝජනාව කියවා බැලුවා. ඒ යෝජනාවේ කරුණු ටිකක් බරපතළයි කියා මම හිතනවා. "ඉඩම් කුට ලෙස ආක්‍රමණය කරන්න එනවා" ආදී වචන එහි තිබෙනවා. මහවැලි "එල්" කලාපය සම්බන්ධයෙන් කිසි ලෙසකින් හෝ එසේ කිරීමේ අවශ්‍යතාවක් මහවැලි සංවර්ධන අමාත්‍යාංශයට නැහැ. "එල්" කලාපය කියන්නේ, මහවැලි සංවර්ධන අමාත්‍යාංශයට අයිතිව තිබෙන කලාප 10න් එකක්. අපේ කලාපවල, -උතුරු නැඟෙනහිර පළාත්වල පිහිටි කලාපවල පමණක් නොවෙයි, අනෙක් පළාත්වල පිහිටි කලාපවලත්- දෙමළ ජනතාව, මුස්ලිම් ජනතාව සහ සිංහල ජනතාව ජීවත් වෙනවා. ජාති භේදයකින්, ආගම් භේදයකින් තොරව අප ඒ සියලුදෙනාට ඉඩම් අයිතිය ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා මේ රටේ නීතියේ ඉඩම් අයිතිය ලබා දෙන්න පුළුවන් ආයතන කීපයක් තිබෙන බව. ඉන් එකක් තමයි, ඉඩම් අමාත්‍යාංශය. ඉඩම් අමාත්‍යාංශයට පුළුවන්කම තිබෙනවා, ජනතාවට ඉඩමක ඔප්පුවක් ලබා දෙන්න. ඒ වාගේම, මහවැලි සංවර්ධන අමාත්‍යාංශයට පුළුවන්කම තිබෙනවා, රටේ ජනතාවට නීත්‍යානුකූල ඔප්පු ලබා දෙන්න. ඊළඟට, ජාතික නිවාස සංවර්ධන අධිකාරියටත් පුළුවන්කම තිබෙනවා, නීත්‍යානුකූල ඔප්පුවක් ලබා දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, සිංහල වුණත්, දෙමළ වුණත්, මුස්ලිම් වුණත් ඉඩමක අයිතිය කියන එක මිනිසුන්ට හරිම වටින බව. ඉඩමක අයිතියක් නැතිනම්, බලපත්‍රයක් නැතිනම්, ඔප්පුවක් නැතිනම් ඔවුන්ට ඔවුන්ගේ පැවැත්මේ නීත්‍යානුකූලභාවයක් දැනෙන්නේ නැහැ. ඉඩම් ඉල්ලාගෙන, බලපත්‍ර ඉල්ලාගෙන, ඔප්පු ඉල්ලාගෙන මගේ අමාත්‍යාංශයට හැම දාම ජනතාව පෝලිමේ එනවා. මීට පෙර මේ කාරණාව උද්ඝෝෂණයක් වෙලාවේ මුලින්ම මතු කළ විට චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමාට මම කිව්වා, "කිසි ප්‍රශ්නයක් නැහැ. අපේ මහවැලි අධිකාරියේ කාර්යාලයට ඔබතුමන්ලා ගිහින් මහවැලි "එල්" කලාපයේ සියලු ඉඩම්, ඒ අයිතිය ලබා ගන්න" කියා. ඒ ගැන අපට කිසි ප්‍රශ්නයක්, ජාති භේද ප්‍රශ්නයක් නැහැ. ඒ අය දෙමළද, සිංහලද, මුස්ලිම්ද කියා මම ඇහුවේ නැහැ. "චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කාර්යාලයට යන්න, මම සියලුම පහසුකම් ටික ලබා දෙන්නම්, ඉඩම් නැති අයට ඒ ඉඩම් ලබා දෙන්න" කියා මම කිව්වා. ඉඩමක් ලබාදීමේ පරමාර්ථයයි අපට තිබෙන්නේ. මොකද, ඉඩම් අයිතියක් ලැබුණාම තමයි, තමන් ඒ භූමියේ පදිංචියි, තමන්ට ඒ භූමිය ලැබුණා කියා අපේ ජනතාවට තේරෙන්නේ. ඒ නිසායි මා චාල්ස් මන්ත්‍රීතුමාටත් කිව්වේ, "ඔබතුමා යන්න. මම අපේ නිලධාරීන් සම්බන්ධ කර දෙන්නම්. ඒ ඉඩම්වල අයිතිය ජනතාවට ලබා දෙන්න" කියා. ඒ නිසා මහවැලි අධිකාරියට, අපට කිසිම අවශ්‍යතාවක් නැහැ, ඉඩම් ලබා නොදී ඉන්න. "එල්" කලාපයේ අයිතිය 1988 සහ 2007 වර්ෂයේදී තමයි විශේෂ ගැසට් පත්‍රයකින් මහවැලියට ලැබී තිබෙන්නේ. මහවැලියට අයිති වුණු සියලු කලාප ගත් විට, එයට උතුරු නැඟෙනහිර ප්‍රදේශවල පිහිටි කලාප විතරක් නොවෙයි අයත් වන්නේ. ඊට අපේ මොනරාගල දිස්ත්‍රික්කයේ කොටසක් අයිති වෙනවා; රත්නපුරය දිස්ත්‍රික්කයේ කොටසක් අයිති වෙනවා; ඒ වාගේම අම්පාර දිස්ත්‍රික්කයේ කොටසක් අයිති වෙනවා. පොළොන්නරුව, අනුරාධපුරය කියන හැම දිස්ත්‍රික්කයකම කොටස් එයට අයිති වෙනවා. මේ ලංකාවේ භූමියෙන් තුනෙන් එකක් මහවැලියට අයිති භූමි බවට ගැසට් කර තිබෙනවා. එහිදී මහවැලි අධිකාරිය ප්‍රධාන වෙනවා. ඔබතුමන්ලාගේ ඔබතුමියලාගේ සටන් පාඨවල, "අපට මහවැලිය එපා; මහවැලි වතුර එපා" යනුවෙන් කියා තිබුණා. ඒක තේරුමක් නැති සටන් පාඨයක් කියායි මම නම් හිතන්නේ. ඒ සටන් පාඨයෙන් ලැබෙන ප්‍රතිඵලයක් නැහැ. ඒ අතරම ඔබතුමන්ලාගේ ප්‍රකාශවල කියනවා, "මහවැලිය මැදිහත් වෙලා අපේ ප්‍රදේශ සංවර්ධනය කරනවා" කියා. ඉතින්, සංවර්ධනය කරන එක හොඳයි නේ. රුපියල් මිලියන 400ක් යොදවලා ඒ ප්‍රදේශ සංවර්ධනය කරනවාය කියා ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කිව්වා. එහෙම සංවර්ධනය කරන එක හොඳයි නේ, ගරු මන්ත්‍රීතුමනි. සංවර්ධනය කරන්න ඕනෑ. මහවැලි වතුර එපාය කියන්න එපා. මහවැලි වතුර ජනතාවට ඕනෑ.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(මාණ්පුමිකු சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්න හදන්නේ මොකක්ද?

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(මාණ්පුමිකු சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, நீங்கள் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சர் என்ற வகையில் அந்தப் பிரச்சினையைப் பற்றி உங்களுக்கு நேரடியாகவே தெரியும். அது வரலாற்று ரீதியாக, பாரம்பரியமாக தமிழர்கள் வாழ்ந்த இடமாகும். அவர்களுக்கு ஏற்கெனவே காணி அனுமதிப்பத்திரங்கள் வழங்கப்பட்டிருக்கின்றன. அந்த ஆவணங்கள் இப்பொழுது என் கையில் இருக்கின்றன. ஆனால், அவர்கள் 1984ஆம் ஆண்டு வலுக்கட்டாயமாக அங்கிருந்து கலைக்கப்பட்டார்கள். பின்னர், 1990இல் மீண்டும் வலுக்கட்டாயமாகக் கலைக்கப்பட்டார்கள். அதன்பிறகு மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாக இருந்த காலத்தில் அந்தத் தமிழ் மக்களுடைய காணி அனுமதிப் பத்திரங்களை இரத்துச் செய்து, சிங்கள மக்களுக்குக் காணி உறுதிகள் வழங்கப்பட்டன. அதைவிடுத்து, இப்பொழுது இரண்டு மாதங்களுக்கிடையில் திரும்பவும் தமிழர்களுடைய காணியிலிருந்து 6 குடும்பங்களுக்குக் காணி அனுமதிப் பத்திரங்கள் வழங்கப்பட்டிருக்கின்றன. நாங்கள் ஹம்பாந்தோட்டையிலோ பொலன்னறுவையிலோ மாத்தறையிலோ போய் உங்களின் காணியைக் கேட்கவில்லை. நாங்கள் பூர்வீகமாக வாழ்ந்த எங்களுடைய காணியைத்தான் திரும்பத் தரச் சொல்லிக் கேட்கிறோம். அதைக் கொடுங்கள்!

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(මාණ්පුමිකු வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
ඔබතුමා කියන කාරණය මට පැහැදිලියි.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(මාණ්පුමිකු சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
ஒரு நிமிடம் தாருங்கள்! வடக்கு, கிழக்கு துரித அபிவிருத்திக்கான ஜனாதிபதி செயலணிக் குழுக் கூட்டத்தின் முதற் கூட்டத்தில் மேதகு ஜனாதிபதி அவர்கள், அப்படி எதுவும் அங்கு வழங்கப்படவில்லையென்று கூறினார். ஆனால், அடுத்த கூட்டத்தில் அவர் அவ்வாறு வழங்கப்பட்டதாக ஏற்றுக்கொண்டார். திசெம்பர் மாதத்திற்குள் உரிய தீர்வைப் பெற்றுத் தருவதாகவும் கூறப்படுகின்றது. அங்கே பேசப்படும் விடயம் பாராளுமன்றத்துடன் சம்பந்தமான விடயங்களல்ல; அது வடக்கு, கிழக்கு அபிவிருத்தி சம்பந்தமான குழுக் கூட்டமாகும். நாங்கள் அபிவிருத்திக்கு எதிரானவர்களல்லர். ஆனால், அபிவிருத்தி என்ற போர்வையின்கீழ் ஓர் இனம் மெல்ல மெல்ல அழிக்கப்பட்டுக் கொண்டு போகக்கூடாது என்பனால்தான் நாங்கள் இந்த Adjournment Motion ஐக் கொண்டு வந்தோம். அவர்களுடைய உரித்துக்கள் காப்பாற்றப்பட வேண்டும்; உரிமைகள் பாதுகாக்கப்பட வேண்டும்; அவர்களின் வாழ்வுரிமை பேணப்பட வேண்டும். அதனை முதலில் உறுதிப்படுத்துக்கள்! அதன்பிறகு நாட்டில் எல்லோரும் சேர்ந்து வாழலாம்! உங்களுடைய கலாசாரம், பண்பாடு, மொழி போன்று எங்களுக்கும் இருக்கின்றது.

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(මාණ්පුමිකු வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
ඔබතුමා එහෙම කථා කරන්නේ ඇයි? ඔබතුමා වෙන රටකද ඉන්නේ? "ඔබතුමාගේ සංස්කෘතිය" කියා කියන්නේ, ගරු මන්ත්‍රීතුමා වෙන රටකද ඉන්නේ? ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ දිවුරුම් දීලා තිබෙන්නේ, රට බෙදා වෙන් කරන්න නොවෙයි. ඔබතුමා වෙන රටක නොවෙයි ඉන්නේ. මම කථා කරන්නේත් දෙමළ ජනතාවගේ ඉඩම් අයිතිය ගැනයි.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(මාණ්පුමිකු சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, நான் ஓர் இலங்கையன் என்று சொல்ல வேண்டுமானால், என்னுடைய மண்ணையும் வாழ்வையும் நீங்கள் உறுதிப்படுத்துவீர்களா? என்னுடைய நிலத்தை உங்களால் உறுதிப்படுத்த முடியுமா? அப்படி உறுதிப்படுத்துவதாகச் சொன்னால் 'நான் இலங்கையன்' என்று சொல்வேன். இல்லையென்றால் நான்

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මණ්ණුක්குச் சொந்தக்காரன் என்றுதான் சொல்வேன்.

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(මාණ්පුමිකු வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඒ අයිතිය තහවුරු කිරීම ගැන තමයි මම මේ කථා කරන්නේ. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, ගරු රාජා ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(මාණ්පුමිකු வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ඉඩම් සම්බන්ධයෙන් නීතියක් තිබෙනවා. ඉඩම් සම්බන්ධයෙන් තිබෙන ඒ නීතිය ගැන මම ඔබතුමාට පැහැදිලි කළා. ඉඩම් අමාත්‍යාංශය ඉඩම් ලබා දෙනවා; නිවාස සංවර්ධන අධිකාරිය ඉඩම් ලබා දෙනවා; මහවැලි අධිකාරියත් ඉඩම් ලබා දෙනවා. මහවැලි අධිකාරිය ගැසට් කරපු area එකක -ප්‍රදේශයක- තිබෙන ඉඩම්වලට මහවැලි සංවර්ධන පනතට අනුව වෙන කිසිම කෙනෙකුට ඇඟිල්ලක්වත් ගහන්න බැහැ. මහවැලි අධිකාරිය තමයි ඒ ඉඩම් අයිතිය ලබා දෙන්නේ. මහවැලි අධිකාරිය එම ඉඩම් අයිතිය ලබා දීමේදී මහවැලි අධිකාරියේ බලප්‍රදේශ තුළ ඇති සියලුම ආයතන එයට යටත්. ඒක නිසා තමයි මහවැලි අධිකාරිය ඒ ඉඩම් බලපත්‍ර ලබා දෙමින් කටයුතු කරන්නේ. ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, පසුගිය දිනක මම ජනකපුර, කෝකිලායි ආදී ප්‍රදේශවල සංචාරයක යෙදුණු බව සමහර විට ඔබතුමා දන්නේ නැතිව ඇති. ඒ ප්‍රදේශවල දෙමළ පවුල් 810ක් ඉඩම් නැතිව

[ගරු වීරකුමාර දිසානායක මහතා]

ඉන්නවා මම දැක්කා. මොකද, ඔබතුමන්ලා මතු කළ කාරණය වන, පරණ ඉඩම් වෙන් කරද්දී ඒ අය ඒ ප්‍රදේශවලින් ගිහිල්ලා. ඔබතුමා කියපු කාරණය හරි. මම ඒක පිළිගන්නවා. ඔවුන් ඒ ප්‍රදේශවලින් ගිය නිසා ඒ අයගේ ඉඩම් නැහැ. මහවැලි සැලැස්මට අනුව දෙන්න පුළුවන් වන්නේ ඉඩම් අක්කර දෙකයි. නමුත්, මම සොයා බැලුවාම මට පෙනී ගියා, ඒ පරණ සමහර දෙමළ අය අතරේ, ඉඩම් අක්කර 10 අහිමි වෙලා තිබෙන අය ඉන්න බව; ඉඩම් අක්කර 15ක් තිබුණු අය ඉන්න බව. ඒ වාගේම අක්කර 5ක් තිබුණු අය ඉන්නවා; අක්කර භාගය තිබුණු අය ඉන්නවා. මේ සියලුදෙනාම දෙමළ අයයි. මම අපේ මහවැලි අධිකාරියේ නිලධාරීන් කැඳවලා කිව්වා, "මහවැලි නීතියට අනුව මේ ඉඩම් ලබාදීම ඔබතුමන්ලාට විසඳන්න බැහැ, කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න වහාම කැබිනට් පත්‍රිකාවක් සූදානම් කරන්න, අක්කර 10ක අයිතිය තිබුණු පරණ අයට ඒ අක්කර 10 දෙන්න, අක්කර 15ක් තිබුණු අයට ඒ අක්කර 15 දෙන්න, අක්කර 5ක් තිබුණා නම්, අක්කර 5 දෙන්න, අක්කර භාගයක් වගේ තිබුණු අයට අපේ අයිතියට අනුව ඉඩම් ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා නේ'" කියා. අක්කර භාගය, අක්කර දෙක දෙන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ විධියට ඒ ජනතාවට ඉඩම් ලබා දෙන්න අවශ්‍ය කටයුතු සූදානම් කරන්න කියා මම කිව්වා. මේ දෙමළ ජනතාවට ඉඩම් ලබාදීමේදී ජාතිවාදයක් අපි ළඟ නැහැ. ඒ සියල්ල සූදානම් කරලා තිබෙනවා. අපි කථා කළේ ඒවා දැකලායි -[බාධා කිරීමක්]- ඔව්, කියන්න ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

සභාවේ වැඩ කටයුතු අවසන් කරන්න තව විනාඩි 5යි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමියනි. එම නිසා කෙටියෙන් ප්‍රශ්නය අසා අවසන් කරන්න.

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) චාන්ති ශ්‍රීස්කන්දරාසා)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, நீங்கள் காணி வழங்குவது பற்றி உங்களோடு நாங்கள் முரண்படவில்லை. ஆனால், எங்களுடைய மக்களது காணிகளை அடாத்தாகப் பிடித்து நீங்கள் சிங்கள மக்களுக்கு வழங்குகிறீர்கள்! LLRC அறிக்கையின்படி அந்தப் பிரதேசத்திலே இருக்கின்ற காணிகள் முதலில் அவ்வூர் மக்களுக்கு வழங்கப்பட வேண்டும்; அப்பிரதேச மக்களுக்கு வழங்கப்பட வேண்டும்; அம்மாவட்ட மக்களுக்கு வழங்கப்பட வேண்டும்; அம்மாகாண மக்களுக்கு வழங்கப்பட வேண்டும்.

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(මාණ්පුමිකු වීරකුමාර තිසානායක්ක)
(The Hon. Weerakumara Dissanayake)

හොඳයි, මම ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්නම්. අපට දැන් කාලය අඩුයි නේ. ඔබතුමියට මම උත්තර දෙන්නත් ඕනෑ නේ.

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) චාන්ති ශ්‍රීස්කන්දරාසා)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
Hon. Minister, please give me one minute.

ஆனால், இதுவரை உங்களால் மகாவாலி 'L' வலையத்திலே வழங்கப்பட்ட காணிகளில் ஓர் ஏக்கர் காணி கூடத் தமிழ் மக்களுக்கு வழங்கப்படவில்லை. இதுதான் எங்களுடைய பிரச்சினை! நீங்கள் சட்ட, திட்டங்களுக்கு -

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(මාණ්පුමිකු වීරකුමාර තිසානායක්ක)
(The Hon. Weerakumara Dissanayake)

ඔබතුමිය හෙට මගේ office එකට එන්න. ඔබතුමියට ඕනෑ බලපත්‍ර ටික, ලැබිලා නැති ඒවා, ඒ සියල්ල ලබා දෙන්න මම ලැහැස්තියි. කිසි ප්‍රශ්නයක් නැහැ. ඒක නිසා මහවැලි අධිකාරියටවත්,-[බාධා කිරීමක්]-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(මාණ්පුමිකු චමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාට දැනගන්න ඕනෑ මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(මාණ්පුමිකු චමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

මට දැන ගන්නට ඕනෑ කාරණයක් තිබෙනවා ගරු රාජ්‍ය ඇමතිතුමනි. මේ කියන ඉඩම් බෙදා දීම සඳහා වර්තමාන ආණ්ඩුව ක්‍රියාත්මක වීමට කලින් ඔය කියන ඉඩම් ඔය කියන පදිංචිකරුවන්ට අහිමි වුණේ කුමන කාරණයක් නිසාද කියන එක මේ ගරු සභාවට පැහැදිලි කරන්න. ඒ නිජබිමේ, භූමියේ අයිතිය දෙමළ හෝ සිංහල හෝ කණ්ඩායම්වලට නීත්‍යානුකූලව බෙදා දීමේ වැඩ පිළිවෙළ ආණ්ඩුව ගෙන යනවා. ඒ ගැන කවුරුත් මේ ගරු සභාවේදී කියන්නේ නැහැ. හැබැයි, ඒ ඉඩම් අයිතිය එදා ලබා ගන්න බැරි වුණේ කුමන කාරණය නිසාද කියන එකත් මේ ගරු මන්ත්‍රීතුමන්ලා දැන ගත යුතුයි.

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(මාණ්පුමිකු වීරකුමාර තිසානායක්ක)
(The Hon. Weerakumara Dissanayake)

ගරු මන්ත්‍රීතුමන්ලා මේ ප්‍රශ්නය දන්නවා.

එකක් තමයි, මේ ප්‍රදේශයේ ඉඩම්වල අලුතෙන් එකම පවුලක්වත් පදිංචි කර නැහැ. සිංහල පවුල් පදිංචි කරනවා කියා ගරු එස්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තිබුණා. නමුත්, අලුතෙන් පදිංචි කරන්නට කිසිම සැලැස්මක් නැහැ. ඒ වාගේම, එකම පවුලක්වත් අලුතෙන් පදිංචි කර නැහැ. පසු ගිය යුද්ධය තිබුණු කාලයේ ඔය ප්‍රදේශවල පවුල් නැතිව පාළුවෙලා ගිහින් තිබුණා. [බාධා කිරීමක්] ඒ කාලයේ මිනිස්සු පදිංචිවෙලා තිබුණා.

**ගරු හේෂා විතානගේ මහතා**
(මාණ්පුමිකු හේෂා විතානකේ)
(The Hon. Hesha Withanage)

ඔබතුමා කිව්වා ඒ ප්‍රදේශවල සිංහල පවුල් පදිංචි කර නැහැ කියා. මගේ ප්‍රශ්නය, ඇයි සිංහල පවුල්වලට පදිංචි වෙන්න බැරි?

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(මාණ්පුමිකු වීරකුමාර තිසානායක්ක)
(The Hon. Weerakumara Dissanayake)

නැහැ, නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මේ සභාව කල් තැබීමේ යෝජනාවේ තිබෙන්නේ සිංහල පවුල් බලහත්කාරයෙන් පදිංචි කරනවා කියා. නමුත් අද වනතුරු කිසිම සිංහල පවුලක් අලුතෙන් පදිංචි කර නැහැ.

කාලය අඩු නිසා කෝකිලායි අධිකරණයේ තිබුණු ප්‍රශ්නයක් ගැන මම ඉතා කෙටියෙන් කියන්නම්. ප්‍රාදේශීය ලේකම් විසින් නිවාස දෙකක් ඉවත් කරන්නට කියා කෝකිලායි අධිකරණයේ නඩුවක් පවරලා තිබුණා. ඒ ප්‍රදේශයට ගිය වෙලාවේ මම දැනගත්තා මෙවැනි නඩුවක් පවරා තිබෙන බව. මම අපේ නිලධාරීන්ට දැනුම් දුන්නා ඒ නඩුව වහාම ඉවත් කර ගන්න කටයුතු කරන්න කියා. මොකද, මහවැලි ගැසට් එක තුළ ප්‍රාදේශීය ලේකම්වරයාට පුළුවන්කමක් නැහැ උසාවියේ නඩු පවරන්නට. ඒක කරනවා නම් මහවැලියෙන් කරන්නට ඕනෑ. ප්‍රාදේශීය ලේකම්වරයා නඩු පවරලා ඒ ගෙවල් දෙක ඉවත් කළොත් අපේ ගැසට් එකේ නීතිමය බලයට අභියෝගයක් එනවා. එම නිසා මහවැලිය මැදිහත්වෙලා ඒක නැවැත්වුවා. ප්‍රාදේශීය ලේකම් හරහා නඩු දාපු එක වැරදියි, ප්‍රාදේශීය ලේකම්වරයා ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීම වැරදියි, ඒක ප්‍රාදේශීය ලේකම්ගේ කාර්ය භාරයක් නොවෙයි. මේ ප්‍රදේශය මහවැලි අධිකාරිය යටතේ තිබියදී උසාවියට කරුණු ඉදිරිපත් කරන්නට ප්‍රාදේශීය ලේකම්වරයාට අයිතියක් නැහැ. ඒ ගැසට් එකට අදාළව මහවැලි අධිකාරිය මැදිහත් වෙලා කථා කළා. ඉන් පසුව රාජ්‍ය ආයතන දෙකක් අතර සාකච්ඡා බැහැයි කියා නීතිපති උපදෙස් ආවා. ඉන් පසුව ඒක නිරවුල් කරන්නට අපි දැන් සාකච්ඡා කරමින් යනවා.

අවසාන වශයෙන් කියන්නට ඕනෑ, අතිගරු ජනාධිපතිතුමා සැලසුම් කරන්නේ උතුරු - නැඟෙනහිර ජනතාව වළපල්ලට යවන්නට නොවන බව. සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාව ඒ ප්‍රදේශවල දුක් විඳිනවා. ඔබතුමන්ලා මහවැලි ජලය එපා කියා කිව්වා. ඒක හරිම අකාරුණික ප්‍රකාශයක්. මම තමුන්නාන්සේලාට කියනවා එවැනි ප්‍රකාශ කවදාවත් කරන්න එපා කියා. අපි මොරගහකන්ද හදලා ඒ ජලය උතුරු - නැඟෙනහිර පළාත්වලට දෙන්නයි හදන්නේ.

මොරගහකන්ද උතුරු මැදින් එන ජලය උතුරු මැද මහ ඇල හරහා යනවා. ඒ විතරක් නොවෙයි. කැලණි ගඟ, කළු ගඟ හරවලා මොරගහකන්දට ජලාශයට දාලා, මොරගහකන්ද හරහා උතුරු ප්‍රදේශය සංවර්ධනය කරන්නට උතුරු ප්‍රදේශයට වතුර දෙන්නයි සැලසුම් කර තිබෙන්නේ. ඒ විධියට සංවර්ධනය කරන්නට පුළුවන්කම තිබෙන්නේ මහවැලි පනතට අනුව මහවැලි කලාප ගැසට් කර, උතුරට ගියොත් විතරයි. එම නිසා උතුරේ පදිංචි දෙමළ, සිංහල, මුස්ලිම් ජනතාවට ආගම් භේදයකින් තොරව සංවර්ධනය යා යුතුව තිබෙනවා. ඔබතුමන්ලා සහයෝගය දෙන්න ඕනෑ, ඉඩම් අයිතිය දෙන්න ඕනෑ. අපි ලැහැස්තියි දෙන්න. ඔබතුමන්ලායි දෙන්න එපා කියන්නේ. ඇයි දෙන්න එපා කියන්නේ? අපි ලැහැස්තියි දෙන්න. එන්න අපේ කාර්යාලයට, අපේ අමාත්‍යාංශයට එන්න. මම ඒ සඳහා දොරවල් ඇරලා තමයි තිබෙන්නේ. ඉඩම් අයිතිය ලබා දෙන්නම්. ජනාධිපතිතුමා කියා තිබෙන්නෙත් දෙන්න කියා. එම නිසා ඔබතුමන්ලා මේ කටයුත්තට සහයෝගය දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු එස්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(මාණ්පුමිකු சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ இராஜாங்க அமைச்சர் அவர்கள் மீண்டும் மீண்டும் இனவாத ரீதியாகத்தான் பேசுகிறார். நீங்களும் நாங்களும் இந்த நாட்டில் ஒற்றுமையாக வாழவேண்டுமென்றால், தமிழர்கள் பாரம்பரியமாக வாழ்ந்துவந்த அவர்களுடைய சொந்த நிலங்களைத் தாருங்கள்! இதைத்தான் நாங்கள் கேட்கிறோம். ஆனால், நாங்கள் சிங்கள மக்களுடைய நிலத்தைப் பறிக்கவில்லை.

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

ගරු මන්ත්‍රීතුමා, මම ජාතිවාදීව කිව්ව එක වචනයක් කියන්න. [බාධා කිරීමක්] මම ජාතිවාදීව කියපු එක වචනයක් කියන්න. [බාධා කිරීමක්] මගේ කථාවේ recording එක තිබෙනවා. ජාතිවාදීව කියපු එක වචනයක් කියන්න. [බාධා කිරීමක්] ඒ recording එක තිබෙනවා. ජාතිවාදීව කියපු එක වචනයක් කියන්න. දෙමළ ජනතාවට සංවර්ධනය යනවාට ඔබතුමන්ලා විරුද්ධ නම් අපට කරන්නට දෙයක් නැහැ. අපට නම් ජාති භේදයක්, ආගම් භේදයක් නැහැ.

මහවැලි අධිකාරියට නීත්‍යානුකූලව තිබෙන බලය අපි පාවිච්චි කරනවා. ඒ බලය පාවිච්චි කරලා ජනතාවට දෙන්න පුළුවන් අයිතිවාසිකම් සියල්ල ලබා දෙනවා. එයට ඔබතුමන්ලා විරුද්ධ වුණොත් ඒ අයිතිවාසිකම් ලබා ගන්න හෙට අලුත් දෙමළ ව්‍යාපාරයක් උතුරෙන් නැඟිටියි; ඒ අයිතිවාසිකම් ලබා ගන්න හෙට අලුත් ව්‍යාපාර නැඟිටියි. අපට ඒකට කරන්න දෙයක් නැහැ. මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් මා සිටින කල් දෙමළ ජනතාවගේ ඉඩම් අයිතියත් ආරක්ෂා කරනවා, සිංහල ජනතාවගේ ඉඩම් අයිතියත් ආරක්ෂා කරනවා, මුස්ලිම් ජනතාවගේ ඉඩම් අයිතියත් ආරක්ෂා කරනවා. කිසිම ජාතිවාදී ව්‍යාපාරයකට හෝ දේශපාලන ක්‍රියා මාර්ගයකට හෝ අපේ සංවර්ධන ක්‍රියාදාමය නවත්වන්න බැහැ. මහවැලි ජලය උතුරට ගෙන ගිහින් උතුරේ ජනතාවට දීලා තමුන්නාන්සේලාටත්, තමුන්නාන්සේලාගේ දරුවන්ටත් සතුටින් ඉන්න පුළුවන් ව්‍යාපාරයක් හදන්න මහවැලියට ආකල්ප තිබෙනවා. මා කියන්නේ තමුන්නාන්සේලාගේ මනසත් ඒ තත්ත්වයට හදා ගන්න කියායි. එහෙම නැතුව මේ ගමන යන්න බැහැ. ඒ පිළිබඳව තමුන්නාන්සේලාගේ බුද්ධිය, දැනුම හදා ගන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.32ට, 2018 ඔක්තෝබර් මස 12 වන සිකුරාදා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය.***


*அதன்படி பி. ப. 6.32 மணிக்கு பாராளுமன்றம், 2018 ஒக்ரோபர் 12, வெள்ளிக்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 6.32 p.m. until 10.00 a.m. on Friday, 12th October, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 12වන කලාපය
தொகுதி 263 - இல. 12
Volume 263 - No. 12

2018 ඔක්තෝබර් 12වන සිකුරාදා
2018 ஒக்ரோபர் 12, வெள்ளிக்கிழமை
Friday, 12th October, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**ජාතික පොලිස් කොමිෂන් සභාවේ වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ තෙල් ටැංකි ඉන්දියානු තෙල් සමාගමට පැවරීම:**

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී.

**කල්තැබීමේ යෝජනාව:**

මහත්මා ගාන්ධි මැතිතුමාගේ 150වන ජන්ම සංවත්සරය


---

# பிரதான உள்ளடக்கம்


**எல்லை நிர்ணய ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**தேசிய பொலிஸ் ஆணைக்குழுவின் அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**திருகோணமலை எண்ணெய்க் குதத்திலுள்ள எண்ணெய்த் தாங்கிகளை இந்திய எரிபொருள் கம்பனியிடம் ஒப்படைத்தல்:**

பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சரினது கூற்று

**விசாரணை ஆணைக்குழுக்கள் (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

மகாத்மா காந்தியின் 150ஆவது ஜனன தினம்


---

# PRINCIPAL CONTENTS


PERFORMANCE REPORT OF DELIMITATION COMMISSION

REPORT OF NATIONAL POLICE COMMISSION

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

HANDOVER OF OIL TANKS AT TRINCOMALEE OIL TANK FARM TO INDIAN OIL COMPANY:

Statement by Minister of Petroleum Resources Development

COMMISSION OF INQUIRY (AMENDMENT) BILL:
Second Reading - Debate Adjourned

ADJOURNMENT MOTION:
150 th Birth Anniversary of Mahatma Gandhi

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2018 ඔක්තෝබර් 12වන සිකුරාදා*
*2018 ஒக்ரோபர் 12, வெள்ளிக்கிழமை*
*Friday, 12th October, 2018*

**පූ.භා.10.00ට පාර්ලිමේන්තුව රැස්විය.**
**නියෝජ්‍ය කථානායකතුමා**
**[ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள்
[மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. DEPUTY SPEAKER
[THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

## සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## எல்லை நிர்ணய ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT OF DELIMITATION COMMISSION

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 වර්ෂයේ පළමු කාර්තුව (2018.01.01-2018.03.31) සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ජාතික පොලිස් කොමිෂන් සභාවේ වාර්තාව
## தேசிய பொலிஸ் ஆணைக்குழுவின் அறிக்கை
## REPORT OF NATIONAL POLICE COMMISSION

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2015-2018 කාලසීමාව වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් 2017 වර්ෂය සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2015 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2017 වර්ෂය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(v) 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගාල්ල, සර්කියුලර් පාර, අංක 30 ලිපිනයේ පදිංචි ඒ.එච්.එම්. ෆර්මී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) බලපිටිය, වලගෙදර, ගාලු පාර, අංක 527 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.එච්.කේ.එස්.එස්. හේවගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் )
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩුපුස්සැල්ලාව, රූපහ, පල්ලේවෙල, "ප්‍රියන්ත නිවස" ලිපිනයෙහි පදිංචි බී.එම්.ආර්.කේ. සේනානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு புத்திக பதிரண - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හත පිළිගන්වමි.

(1) අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ පාර, අංක 37 දරන ස්ථානයේ පදිංචි ඒ.පී.එම්.ඩී.එස්. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) වැලිගම, බොරාල පාර, අංක 148 දරන ස්ථානයේ පදිංචි ආනන්ද රංජිත් දළුවත්ත මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මාතර, පල්ලිමුල්ල, අංක 265 දරන ස්ථානයේ පදිංචි බී.ජී.බී. මුතුකුමාරණ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) මාතර, තොටමුණ, නිල්වලා හරස් පාර, "ජය නිවස", අංක 24/1 දරන ස්ථානයේ පදිංචි එල්.බී.ඩබ්ලිව්. ජයන්තා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(5) තංගල්ල, කදුරුපොකුණ, සියඹලාගහහේන යන ලිපිනයෙහි පදිංචි එම්.කේ. බුද්ධදාස ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) හක්මණ, කෝංගල, වෙන්දේසිවත්ත, "හංසී" යන ලිපිනයෙහි පදිංචි ආර්. නිහාල් රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) මාතර, වේරගම්පිට, ගහ මාවත, අංක 13/18සී දරන ස්ථානයෙහි පදිංචි එස්.ජේ. පල්ලියගුරු මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෝමපුර, පුබුදුගම, R.B.01, අංක 43/බී දරන ස්ථානයෙහි පදිංචි එස්.එච්. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 1 - 63/'18 - (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

මේ ප්‍රශ්නය ජාතික වශයෙන් ඉතාම වැදගත් ප්‍රශ්නයක්. මෙය මුදල් අමාත්‍යාංශයට නියෝජ්‍ය ඇමතිවරයා ලවා හෝ පිළිතුරු දිය හැකි ප්‍රශ්නයක්. මක් නිසා ද, අපේ රටට ජාත්‍යන්තර වෙළෙඳ පොළෙන් ගන්න පුළුවන් උපරිම ණය ප්‍රමාණය ඩොලර් බැලුම්කරවලින් අරගෙන, ඊට පස්සේ අපට තවදුරටත් ණය සපයා ගත නොහැකි වන නිසා චීනයට ගිහිල්ලා චීන මධ්‍යම බැංකුව හරහා ණය ගන්නවා කියලා යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. අද ඩොලරය කළු කඩේ රුපියල් 200කට විකිණෙනවා. මෙවැනි දැවැන්ත මූල්‍ය අර්බුදයක් හමුවේ මේ වාගේ ප්‍රශ්නයකටවත් උත්තර දෙන්නේ නැත්නම් මුදල් ක්‍රමය හසුරුවන්නේ කොහොමද? මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න මේ ගරු සභාවට නියෝජ්‍ය ඇමතිවරයෙක් හෝ එවන්න පුළුවන් නේ. ඒක දන්නේ නැහැ. සති දෙකක් කල් ඉල්ලන්නේ මොකටද?

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කළු ගඟේ ලවණ බාධකය ඉදිකිරීම : ප්‍රගතිය
## களு கங்கையின் உத்தேச உவர் தடுப்பு நிர்மாணம்: முன்னேற்றம்
## CONSTRUCTION OF SALINITY BARRIER IN KALU GANGA: PROGRESS

182/'18

**2. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළු ගඟට කරදිය මිශ්‍රවීම හේතුවෙන් සෑම වසරකම පෙබරවාරි හා මාර්තු මාසවල එම ගඟෙහි ජලය පරිභෝජනය කරන ජනතාව පීඩාවට පත්වන බව පිළිගන්නේද;

(ii) එම ගැටලුව විසඳීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන විසඳුම කවරේද;

(iii) යෝජිත ලවණ බාධකය ඉදිකිරීමේ ප්‍රගතිය කවරේද;

(iv) කුඩා ගඟේ නව ජල පවිත්‍රාගාරයක් ඉදි කිරීමේ යෝජනාවේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களு கங்கையில் உவர் நீர் கலப்பதன் காரணமாக ஒவ்வொரு வருடத்திலும் பெப்ருவரி மற்றும் மார்ச் மாதங்களில் மேற்படி கங்கையின் நீரை பயன்படுத்துகின்ற மக்கள் பாதிக்கப்படுகின்றனர் என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) மேற்படி பிரச்சினையைத் தீர்ப்பதற்கு மேற் கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

(iii) உத்தேச உவர் தடுப்பு நிர்மாணிப்பின் முன்னேற்றம் யாதென்பதையும்;

(iv) குடா கங்கையில் புதிய நீர் சுத்திகரிப்பு நிலைய மொன்றை அமைக்கும் திட்டத்தின் முன்னேற்றம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply:

(a) Will he inform this House-

(i) whether he admits that the people who consume water from Kalu Ganga face various difficulties in February and March every year since the water in Kalu Ganga gets mixed with sea water;

(ii) the solution that will be provided to solve that problem;

(iii) the progress of the construction of the proposed salinity barrier; and

(iv) the progress of the proposal to construct a water purifying treatment plant in Kuda Ganga?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) එම ගැටලු විසඳීම සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන විසඳුම් වශයෙන් පහත සඳහන් අයුරින් කටයුතු කරනු ලැබේ.

**(1) කෙටි කාලීනව ක්‍රියාත්මක විසඳුම්:-**

(1-1) කළු ගඟ ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ පානදුර දක්වා ලබාදෙන ජලය, නළ මාර්ග වැඩිදියුණු කිරීම හා ජල කපාට ක්‍රියාත්මක කිරීම - valve operation - මඟින් වාද්දුව ප්‍රදේශයේ පදිංචිකරුවන් 38,000ක් සඳහා (ජල සම්බන්ධන 8,500ක් පමණ) පානීය ජල අවශ්‍යතා සපුරාලීමට හැකියාව ලැබී ඇත.

(1-2) මෙයට අමතරව බවුසර් 15ක් පමණ යොදාගෙන ජල ටැංකි 450ක් පමණ විවිධ ස්ථානවල ස්ථාපිත කිරීම මඟින් ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය සපයනු ලැබේ.

(1-3) තවද, ජලයේ ලවණතාව කොතෙක් ඉහළ ගියද, නොනවත්වාම අනෙක් අවශ්‍යතා සඳහා නළ ජල සැපයුම ද සිදු කරනු ලබයි.

**(2) මධ්‍ය කාලීනව ක්‍රියාත්මක විසඳුම්:-**

මෙහිදී කළුතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට ආරම්භ කර ඇති අලුත්ගම, මතුගම හා අගලවත්ත ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් කුඩා ගඟ මූලික කරගෙන නව තුළුමුවක් හරහා ජලය ලබා ගෙන කෙත්ගේන ජල පවිත්‍රාගාරය වෙත ජලය ගෙන ගොස් පවිත්‍රීකරණය සිදුකර, ජලය බෙදා හැරීමේ මධ්‍ය කාලීන පියවරක් ද ආරම්භ කර ඇත. මෙම නව තුළුමුව කරා ලවණ ජලය ගමන් නොකරයි. 2020 වනවිට මෙම ව්‍යාපෘතිය නිම කිරීමට යෝජිතය.

පානදුර සිට වාද්දුව දක්වා විෂ්කම්භය 400mm වූ ජල නලයක් එලීම මඟින් එම ප්‍රදේශයේ පදිංචිකරුවන් 30,000කගේ පමණ (ජල සම්බන්ධන 7,000කට පමණ) පානීය ජල සැපයුම අඛණ්ඩව පවත්වා ගැනීමට හැකි වනු ඇත. මේ සඳහා අදාළ ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 190ක් පමණ වන අතර මේ වන විට ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හඳුනා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

**(3) දීර්ඝ කාලීනව යෝජිත විසඳුම්:-**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ලවණ බාධකයක් ඉදිකිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් වී ඇති අතර ඒ සඳහා පාරිසරික අධ්‍යයන කටයුතු ඔවුන් විසින් ආරම්භ කිරීමට යෝජිත වී ඇත. එසේම පැතිරෙන තවත් දූර්මතයක් නම් කඳන ජල පවිත්‍රාගාරයේ පිරිපහදු ජලය කෙත්හේනට ලබා ගැනීම සිදු නොකරන්නේ මන්දැයි යන්නයි. කඳන ජල පවිත්‍රාගාරය දැනටමත් එහි නිෂ්පාදන ධාරිතාව අදියර 1, පියවර 1, 2 හා 3 යටතේ උපරිමයකට ළඟා වී තිබීම මෙයට හේතුව වේ.

ඒ අනුව කෙටි කාලීනව හා දීර්ඝ කාලීනව ඉහත ප්‍රකාශ කළ ආකාරයට නල ජලය සැපයීම මඟින් ලවණ ජලය මිශ්‍ර වීමේ ගැටලුවට වඩාත් යෝග්‍ය වූ විසඳුම් සෙවීමේ දැඩි වෙහෙසකර කටයුත්තට මණ්ඩලය මේ වන විටත් යොමු වී ඇති බව දන්වනු කැමැත්තෙමි.

මෙම ලවණ බාධකය ඉදිකිරීම තුළින් ජල සම්පාදන පාරිභෝගිකයන්ගේ පානීය ජලයට ලවණ ජලය මුසු වීම වැළැක්වීම අපගේ ඒකායන ප්‍රයත්නය බව වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමු.

(iii) මේ ප්‍රශ්නයට ප්‍රධාන වශයෙන් මුහුණ දෙන පාර්ශ්වකරුවන් වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළත්ව කමිටුවක් පිහිටුවන ලදී.

ඒ අනුව වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් යෝජිත ලවණ බාධකය ඉදිකිරීම සඳහා කළ යුතු ශක්‍යතා අධ්‍යයනය සඳහා විෂය නිර්ණය සටහන - Terms of Reference- සකස් කරන ලද අතර අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන් විසින් ඒ සඳහා අදහස් හා යෝජනා ඇතුළත් කරන ලදී.

2018 ජූලි 30වන දින නැවත වතාවක් කමිටුව රැස් වූ අතර විෂය නිර්ණය සටහන සඳහා තීරණයකට එළඹෙන ලදී. තවද, ශක්‍යතා අධ්‍යයනය සඳහා දළ ඇස්තමේන්තුගත වියදම මිලියන 20ක් ඉක්මවන නිසා ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ද තීරණය කරන ලදී.

(iv) කුඩා ගඟෙහි ඉදිකරනු ලබන්නේ ජල පවිත්‍රාගාරයක් නොව ජල තුළුමුවකි. කුඩා ගඟෙහි ඉදි කෙරෙන තුළුමුව මඟින් කුඩා ගඟෙන් ලබා ගන්නා ජලය කිලෝ මීටර් 15.5ක දිගින් යුතු නළ මාර්ගයක් ඔස්සේ කෙත්හේන ජල පවිත්‍රාගාරයට සම්ප්‍රේෂණය කරනු ලැබේ. එම ජලය කෙත්හේන නව ජල පවිත්‍රාගාරයේදී පවිත්‍රීකරණයට ලක්කර මහජනතාවගේ අවශ්‍යතා සඳහා බෙදා හැරීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතියේ සැලසුම් කටයුතු නිමවෙමින් පවතී. කුඩා ගඟෙන් ජලය ලබා ගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය දැනටමත් ලබාගෙන ඇත. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2018 ඔක්තෝබර් මාසයේදී ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, කළු ගඟේ ජලය වැඩි වීම නිසා රත්නපුර දිස්ත්‍රික්කය මුහුණ දෙන ප්‍රශ්නය තමයි මේ ප්‍රශ්න අංක (අ)(iv)හි තිබෙන්නේ. කළු ගඟේ ජලය අඩු වුණාට පස්සේ අපේ දිස්ත්‍රික්කයේ ජනතාවට අවුරුද්දකට දෙපාරක් -පෙබරවාරි - මාර්තු පමණක් නොවෙයි, වැසි සමය පටන් ගන්න කලින් අගෝස්තු - සැප්තැම්බර්වලත්- මේ ප්‍රශ්නය පැන නැඟුණා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙකයි. ඔබතුමන්ලා ලවණ බාධකය සහ කුඩා ගඟේ තුළුමුව ඉදිකිරීම සඳහා මුදල් ප්‍රතිපාදන සපයා ගන්න බලාපොරොත්තු වන්නේ කොහොමද, ඒ මුදල මහා භාණ්ඩාගාරයෙන් සපයනවාද? ගරු රවුෆ් හකීම් ඇමතිතුමා මීට කලින් අවස්ථාවක පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කළා මේ සඳහා යම් විදේශ ආධාරයක් ලබා ගැනීමට උත්සාහ කරමින් සිටින බව. ඔබතුමාට මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට හැකි නම්, මේ සඳහා මුදල් ප්‍රතිපාදන යෙදවීමට ඔබතුමන්ලා අදහස් කරන ක්‍රමවේදය මොකක්ද කියලා මම දැන ගන්න කැමතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

වගකිව යුතු පිළිතුරක් සඳහා මම හැම දාම මේ අතුරු ප්‍රශ්න එතුමාට යවලා තිබෙනවා. ඒ වාගේම, මේ ප්‍රශ්නයත් යවනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඔව්. ඔබතුමා වගකීමෙන් ඒක කරනවා.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පිළිතුරේදී සඳහන් කළා බවුසර් මඟින් ජලය බෙදා හරිනවා කියලා. ඇත්තටම ඇමතිතුමනි, එම පිළියම ප්‍රමාණවත් නැහැ. ලවණ මිශ්‍ර වුණාම බොන්න බැරි තරමට ජලය සවුත්තු වෙනවා. ඔබතුමන්ලාගේ සැලසුම් කාලයක් තිස්සේ ඇදි ඇදී යනවා. කළුතර දිස්ත්‍රික්කය වෙනුවෙන් කරන්න පුළුවන් ලොකුම ව්‍යාපෘතිය තමයි කළු ගඟේ ලවණ ප්‍රශ්නය විසඳන එක. ඒ සඳහා අමාත්‍යාංශය පැත්තෙන් ඉතා වේගවත් මැදිහත්වීමක් කරන්න කියලා මා මේ වේලාවේ ඉල්ලා සිටින්න කැමතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

දැනට බවුසර් 15ක් විතර යොදාගෙන ජල ටැංකි 450ක් විවිධ තැන්වල ස්ථාපනය කරලා තිබෙනවා. එය ප්‍රමාණවත් නැතිනම් තව වැඩි කරන්න කියන්නම්. අතුරු ප්‍රශ්නවලට පිළිතුරු මම ඉක්මනින් ලබා දෙන්නම්.

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පළමු පන්තිය: උසස්වීම්

இலங்கை கல்வி நிர்வாகச் சேவையின் முதலாம் வகுப்பு: பதவியுயர்வுகள்

CLASS 1 OF SRI LANKA EDUCATION ADMINISTRATIVE SERVICE: PROMOTIONS

230/'18

**3. ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පළමු පන්තිය සඳහා උසස්වීම් ලබාදුන් අවසන් දිනය කවරේද;

(ii) පළමු පන්තියට උසස්වීම් ලබාදීම සඳහා මෙම සේවයේ දෙවන පන්තියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේදී මූලික තොරතුරු ඉල්ලා සිටිනු ලැබුවේද;

(iii) ඉහත උසස්වීම් මෙම සේවයේ නිලධාරීන් විශ්‍රාම ලැබූ පසු ලබාදෙන ක්‍රමවේදයක් තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(v) නොඑසේ නම්, ඉහත උසස්වීම් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை கல்வி நிர்வாகச் சேவையின் சிரேஷ்ட உத்தியோகத்தர்களுக்கு இலங்கை கல்வி நிர்வாகச் சேவையின் முதலாம் வகுப்புக்கான பதவியுயர்வு வழங்கப்பட்ட இறுதித் திகதி யாது;

(ii) முதலாம் வகுப்புக்கான பதவியுயர்வு வழங்குவதற்காக இந்த சேவையின் இரண்டாம் வகுப்பைச் சேர்ந்த சிரேஷ்ட உத்தியோகத்தர்களிடமிருந்து கல்வி அமைச்சினால் 2016ஆம் ஆண்டில் பூர்வாங்கத் தகவல்கள் கோரப்பட்டிருந்தனவா;

(iii) மேற்படி பதவியுயர்வுகளை இந்தச் சேவையின் உத்தியோகத்தர்கள் ஓய்வுபெற்ற பின்னர் வழங்குகின்ற முறையியலொன்று உள்ளதா;

(iv) ஆமெனில், அந்த முறையியல் யாது;

(v) இன்றேல், மேற்படி பதவியுயர்வுகள் வழங்கப் படும் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the last date on which promotions to Class I of the Sri Lanka Education Administrative Service were given to senior officers in the Sri Lanka Education Administrative Service;

(ii) whether the Ministry of Education took action in year 2016 to request basic information from the senior officers of the Class II of the above-mentioned service in order to grant them promotions to Class I;

(iii) whether there is a methodology through which the aforesaid promotions can be granted to the said officers after their retirement;

(iv) if so, the methodology that will be adopted to do so; and

(b) if not, the date on which the aforesaid promotions will be granted;

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2013.01.01

(ii) ඔව්

(iii) ඔව්

(iv) පළමු පන්තියට උසස්වීම් ලබා දීම සිදුකරනු ලබන්නේ (පැරණි සේවා ව්‍යවස්ථාව අනුව) සෑම වර්ෂයකම ජනවාරි 01 දිනට හා ජූලි 01 දිනට පවතින පළමු පන්තියේ පුරප්පාඩු පදනම් කරගෙනය. ඒ අනුව, එදිනට පවතින පුරප්පාඩු ප්‍රමාණය මෙන් තුන්ගුණයක් වූ නිලධාරීන් සංඛ්‍යාවකට අමාත්‍යාංශය මඟින් අයදුම්පත් නිකුත් කරනු ලබයි.

යම් නිලධාරියකු අදාළ අයදුම්පත් නිකුත් කරනු ලබන දිනයේදී, විශ්‍රාම ලබා ඇති නමුත් අයදුම්පත් නිකුත් කර පුරප්පාඩු පිරවීමට අදහස් කරන දිනට එම නිලධාරියා සේවයේ යෙදී සිට ඇත්නම් හා එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් වූ නිලධාරි සංඛ්‍යාව යටතට වැටෙන්නේ නම් එම නිලධාරියාට මෙම අමාත්‍යාංශය මඟින් අයදුම්පත් නිකුත් කරනු ලබයි.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

## රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර ආපදා: විසඳුම්

இரத்தினபுரி மாவட்ட வெள்ளப்பெருக்கு அனர்த்தம்: தீர்வுகள்

FLOOD DISASTER IN RATNAPURA DISTRICT: SOLUTIONS

262/'18

**4. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ නිරන්තරයෙන් ගංවතුර තත්ත්වය ඇතිවෙන බවත්;

[ගරු හේෂා විතානගේ මහතා]

(ii) මෙම තත්ත්වය හේතුකොට ගෙන රත්නපුර නගරය විශාල වශයෙන් විනාශයට පත්වන බවත්;

(iii) මේ සඳහා කළු ගඟ ආශ්‍රිත යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර විවිධ හේතූන් නිසා එය මේ වනවිට අතහැර දමා ඇති බවත්;

(iv) මේ සම්බන්ධයෙන් විකල්ප ක්‍රමවේදයක් සඳහා යෝජනා නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) රජය විසින් මේ සඳහා ස්ථිර විසඳුමක් යෝජනා කර තිබේ නම්, එම විසඳුම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

*நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:*

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் அடிக்கடி வெள்ளப் பெருக்கு ஏற்படுகின்றது என்பதையும்;

(ii) இந்நிலைமை காரணமாக இரத்தினபுரி நகரம் பெரிதும் அழிவுக்குள்ளாகிவருகின்றது என்பதையும்;

(iii) இதற்காக களு கங்கையுடன் தொடர்புடைய ஒரு திட்டத்தைச் செயற்படுத்த உத்தேசிக்கப்பட்டிருந்ததுடன் பலவித காரணங்களினால் அது தற்போது கைவிடப்பட்டுள்ளது என்பதையும்;

(iv) அது தொடர்பிலான மாற்றுத் திட்டமொன்று முன்மொழியப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) அரசாங்கத்தினால் இது தொடர்பாக மாற்றுத் தீர்வொன்று முன்மொழியப்பட்டிருப்பின், அத்தீர்வு யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Irrigation and Water Resources & Disaster Management:

(a) Is he aware-

(i) that floods constantly occur in the District of Ratnapura;

(ii) that the Ratnapura City gets massively damaged owing to this situation;

(iii) it was planned to initiate a scheme related to the Kalu Ganga to address this and however, this scheme has been currently abandoned due to various reasons; and

(iv) that there are no proposals regarding an alternative methodology on this?

(b) Will he inform this House the permanent solution which has been proposed by the government for this issue, if any?

(c) If not, why?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)**

*(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சர்)*

(The Hon. Palitha Range Bandara - State Minister of Irrigation and Water Resources and Disaster Management)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) (ii) රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර හා තදාසන්න ප්‍රදේශ නිරන්තර ගංවතුර තර්ජනයට ලක්වීම හා එමඟින් ජන ජීවිතවලට ගැටලු ඇතිවීම දිගු කාලයක සිට මෙම අමාත්‍යාංශයේ අවධානයට ලක් වී ඇත. එමෙන්ම මේ සඳහා විවිධ විසඳුම් යෝජනා ක්‍රම හා ව්‍යාපෘති වරින්වර අධ්‍යයනය කර ඇත.

(iii) සමස්තයක් ලෙස කළු ගඟේ ගංවතුර පාලනය කිරීම් හා ජල සම්පත් සංවර්ධනය සඳහා යෝජනා වී තිබූ ක්‍රමවේද නම්,

1. කුකුළේ ගඟ ජලාශ යෝජනා ක්‍රමය

2. මල්වල බහුකාර්ය ජලාශ යෝජනා ක්‍රමය

3. රත්නපුර නගර ආශ්‍රිතව ගංවතුර පාලන බැම්ම ඉදිකිරීම හා ගඟේ ජලයෙන් කොටසක් විකල්ප ඇළ මාර්ගයක් මඟින් - bypass canal - හරවා යැවීම

ඉහත ව්‍යාපෘති මිනුම් සමීක්ෂණ හා අධ්‍යයන අවස්ථාවලදීම මහජන විරෝධතා හේතුවෙන් නතර කිරීමට හෝ ප්‍රමාණයෙන් කුඩා කර ඉදි කිරීම (කුකුළේ ගඟ ජලාශය) නිසා අපේක්ෂිත ගංවතුර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක නොවිණි.

එසේම කළු ගඟේ පහළ නිම්නයේ එවකට පැවති වගා බිම් ගංවතුරින් විනාශ වීම වැළැක්වීම සඳහා ඉදි කර ඇති සුළු ගංවතුර පාලන බැම්ම හා නිර්මිත පද්ධතියක් මේ දක්වාම වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ ක්‍රියාත්මක වේ. මීට අමතරව කළු ගඟේ පහළ නිම්නයේ ගංවතුර වැඩි වන අවස්ථාවල මෝය කට විවෘත කිරීම මඟින් ගංවතුර ඉක්මනින් අඩු කර ගැනීමේ ක්‍රමවේදයක් ද ක්‍රියාත්මක වේ.

(iv) අදාළ නොවේ.

(ආ) ඉහත තත්ත්වය පිළිබඳ පරීක්ෂා කර බැලීමෙන් පසුව යෝජිතව තිබූ මල්වල ගංවතුර පාලන ජලාශය ඉදිකිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් කිරීමට හා මුළු ද්‍රෝණියේම ජල සම්පත් කළමනාකරණය හා ගංවතුර වැළැක්වීම පිළිබඳ පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් කිරීම සඳහා 2013/2014 වසරවල පියවර ගන්නා ලද නමුත් අදාළ මිණුම් කටයුතු කිරීමට මල්වල ප්‍රදේශයේදී හා රත්නපුර දිස්ත්‍රික් මට්ටමේ රැස්වීම්වලදී බාධා පැමිණවීම නිසා මල්වල ජලාශය පිළිබඳ අධ්‍යයනය අත්හැර දමන ලදී.

එසේ වෙතත් කළු ගඟේ ද්‍රෝණියේ සමස්ත සංවර්ධනය පිළිබඳ පූර්ව ශක්‍යතා අධ්‍යයනය නිම කර ඇත.

එමඟින් නිර්දේශ කර ඇති මූලික ව්‍යාපෘති වනුයේ,

1. කළු ගඟ ඉහළ ද්‍රෝණියේ (රත්නපුර) ගංවතුර පාලනය සඳහා ගංවතුර පාලන ජලාශ 03ක් (Dry Dams) (මල්වල, දැල II හා දැල III ) ඉදි කිරීම.

2. කළු ගහ පහළ ද්‍රෝණියේ (කළුතර හා ආසන්න ප්‍රදේශවල) ගංවතුර පාලනය හා වියළි කාලවල ලවණ ජලය -ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයටත් මෙය අදාළ වනවා.- ඇතුළු වීම පාලනය කිරීම අරමුණු කර ගනිමින් ගංගා මෝය සංවර්ධනය කිරීම.

ඉහත නිර්දේශිත ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයන හා පාරිසරික ඇගයීම් වාර්තා සකස් කර ක්‍රියාත්මක කිරීම පිළිබඳ මූලික කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇත.

ඉහත නිර්දේශිත ව්‍යාපෘතිවලට අතිරේකව කළු ගහ ද්‍රෝණියේ අතිරේක ජලය ප්‍රයෝජනවත් ලෙස සංවර්ධනයට යොදවා ගැනීමට ගිණිකොන දිග වියළි ප්‍රදේශය (වලවේ ද්‍රෝණියට) හරවා යැවීමේ හැකියාව පිළිබඳව ද යෝජනා වී ඇති අතර, ඒ පිළිබඳව ද ඉදිරියේ දී අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් ලබා දීම සම්බන්ධව මා ගරු රාජ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම මීට පෙර දිනකදීත් ගරු ඇමතිතුමාගේ අවධානයට මේ කාරණය යොමු කර තිබෙනවා. මේ දවස්වල වැස්ස ටිකක් වැඩි නිසා, දැන් අපේ රත්නපුර දිස්ත්‍රික්කයට ගංවතුර අවදානමක් තිබෙන කාලයක්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර තුළත් තිබුණා, මල්වල යෝජනා ක්‍රමය මේකට සාර්ථක විසඳුමක් වුවත්, ජනතාවගේ මැදිහත් වීම තුළ මේ වැඩේ කරන්නේ නැතිව දේශපාලනඥයන් අඩියක් පස්සට තබන බව. අපි දැක්කා සම්බන්ධීකරණ කමිටුවලදී හිටපු අමාත්‍ය ගරු ජෝන් සෙනෙවිරත්න මැතිතුමා හා පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනිය මේ ගැන උනන්දු වෙලා මේකට යම් ක්‍රියා මාර්ග ගන්න ඕන්න-මෙන්න කියන තත්ත්වයට ආවා. නමුත්, ක්‍රියාත්මක වුණේ නැහැ. ගංවතුර අවදානම ආවාට පස්සේ අපි නැවතත් සිහිපත් කරනවා, එම යෝජනා ක්‍රමය තිබුණා නම් හොඳයි කියලා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, යහ පාලන රජයක් ක්‍රියාත්මක වන මේ වෙලාවේ දේශපාලන වශයෙන් වෙන හානිය ගැන හිතලා ජනතාවගේ විරෝධය නිසාම මේ කටයුත්ත ආපස්සට ගන්නවාද කියලා, මම ඔබතුමාගෙන් අහනවා. මොකද, මේක සාර්ථක වැඩක්.

උමා ඔය ව්‍යාපෘතිය වාගේ ඉතා බැරෑරුම් ව්‍යාපෘති මේ රටේ හැදුවා නම්, මේක ඉතා පහසු වැඩක්. මේ වෙනුවෙන් රජය මැදිහත් වෙලා විසඳුමක් හොයන්න බැරිද? අවුරුදු ගණනාවක් තිස්සේ දුක් විඳින; අවුරුදු ගණනාවක් තිස්සේ ජාතික ධනය වැය වන රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන ගංවතුරට එකම සාර්ථක උත්තරය මේක. එහෙම නැත්නම්, විකල්පයක් විධියට කළු ගහ හරස් කරලා වෙනත් ප්‍රදේශවලට ඒ අවශ්‍ය කටයුතුවලට වතුර අරගෙන යන්න පුළුවන්. එම අදහස කෙරෙහි මම ගරු රාජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. මමත් රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්, අපේ දිස්ත්‍රික් නායිකාව තලතා අතුකෝරල මැතිනිය, අපි කවුරුත් එක තැනක ඉඳලා මේ වෙනුවෙන් තින්දුවක් අරගෙන පක්ෂ, පාට භේදයකින් තොරව යමක් කරන්න පියවරක් තියන්න බැරිද?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. අපි මේ පිළිබඳව ඔබතුමන්ලා සියලුදෙනා එක්ක කථා කළා. ඔබතුමා, දුනේෂ් ගන්කන්ද මැතිතුමා, විජේතුංග මැතිතුමා, තලතා අතුකෝරල ඇමතිතුමිය ඇතුළු මේ සියලුදෙනා එක්ක මම පෞද්ගලිකව පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධයෙන් කථා කළ බව ඔබතුමාට මතක ඇති. ඒ ප්‍රදේශයේ ජනතාවත් එක්ක මේ පිළිබඳව සාකච්ඡා කරන්න ඔබතුමන්ලාට පහසු දිනයක්, මල්වල ප්‍රදේශයේ ජනතාවට පහසු දිනයක් සූදානම් කරලා මට දැනුම් දෙන්න කියලා මම ඉල්ලීමකුත් කළා. මල්වල ජලාශයේ මුලින් තිබුණු සැලැස්ම දැන් අපි වෙනස් කරලා තිබෙනවා. මොකද, මේ ජලාශය හැදුණොත් ඒ ගොල්ලන්ගේ ජීවනෝපාය වන මැණික් ගැරීමේ කර්මාන්තය කර ගන්න බැරි වෙයි කියලා ඒ ප්‍රදේශයේ ජනතාවට ප්‍රශ්නයක් තිබෙනවා. නමුත්, අපි මේ කාරණය සැලකිල්ලට ගෙන මේ ව්‍යාපෘතියේ සැලසුම වෙනස් කළා, ගරු මන්ත්‍රීතුමනි. එම නිසා මේ ව්‍යාපෘතිය දැන් ජනතාවට හානියක් නොවන අන්දමට කරන්න පුළුවන් තත්ත්වයකට අපි සකස් කරලා තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ඔබතුමන්ලා සූදානම් නම්, අපි ඇවිල්ලා සාකච්ඡා කරලා, ජනතාවගේ ප්‍රශ්නය තේරුම් ගෙන, ඒවා අවබෝධ කර ගෙන, ඒවාට විසඳුම මොකක්ද කියන එක තේරුම් කර දීලා, මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරන්න අපිත් සූදානම්.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවෙනියට ඇහුවා, වෙනත් ප්‍රදේශයකට මේ ගහ හරවා යවන්න බැරිද කියලා. වලවේ ගංගා ද්‍රෝණියට යම් වතුර ප්‍රමාණයක් ගෙන යන්න පුළුවන්කම තිබෙනවාය කියන එක සම්බන්ධයෙන් දැන් අපි අධ්‍යයනයක යෙදී ඉන්නවා. නමුත්, සමස්ත වතුර ප්‍රමාණය එහෙට ගෙන යන්න පුළුවන් වන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මෙයට පිළිතුරක් දෙන්න ඔබතුමාට පුළුවන් නම් හොඳයි කියා මා හිතනවා. ඔබතුමන්ලාගේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය හරහා සිදු වන ව්‍යාපෘති සම්බන්ධයෙන් අප දකින දෙයක් තිබෙනවා. මා එක් උදාහරණයක් ලෙස යාන්ඔය ව්‍යාපෘතිය ගන්නම්. යම්කිසි ජාවාරම්කරුවන් පිරිසකගේ වුවමනාව මත සිදු වන දෙයක් ගැනයි මා කියන්න යන්නේ. මා හිතනවා ඔබතුමන්ලාගේ අමාත්‍යවරුන්ට මේ ගැන ලොකු අවබෝධයක් නැතිව ඇති කියා. දේශපාලනික මැදිහත්වීම් මත මහා ලොකු මංකොල්ලයක් සිද්ධ වෙනවා, විශේෂයෙන්ම යාන්ඔය කියන ප්‍රදේශයේ. ඔබතුමා මේ ගැන දන්නවා ඇති. පොළොන්නරුවේ සිටින එක්තරා පිරිසක් තමන්ගේ හයිය, ශක්තිය අරගෙන විශාල මං කොල්ලයක නිරත වෙනවා. වැල්ලවාය පැත්තට යන කොට අපි මෙය දකිනවා; උඩවලව පැත්තට යනකොට දකිනවා. කෙලින් වැඩ කරන රාජ්‍ය අමාත්‍යවරයකු වන ඔබතුමාගෙන් මා මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා. දේශපාලනඥයන්ගේ ඕනෑකමට, ඒ අයගේ හයිය අරගෙන යම් පිරිසක් දහලන කොට අහිංසක පුංචි මිනිසුන්ට ලොකුවට හානි සිදු වනවා. ඒ නිසා ඔබතුමා මේ වෙනුවෙන් සාධාරණ මැදිහත්වීමක් කරන්න. ඒ ප්‍රදේශයේ සාමාන්‍ය මිනිසුන්ට යම් ආදායමක් උපයා ගන්න තිබෙන අවස්ථාව අහිමි වන තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා ඇහේ හයිය තිබෙන අය කරගෙන යන මේ ක්‍රියාවලිය නතර කිරීම වෙනුවෙන් යම් පියවරක් තබන්න ඔබතුමාට පුළුවන් කියා මම විශ්වාස කරනවා. ඒ ගැන පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
යාන්ඔය ඉදි කිරීම් කාලය අවසන් වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. තවත් මාසයයි ඒ සඳහා තිබෙන්නේ. තවත් මාසයකින් පසුව ඒ ගැටලු ඔක්කෝම අවසන් වනවා. ඒ ඉදි කිරීම් - ඒ කැණීම්- එතැනින් එහාට කරන්න පුළුවන්කමක් ඇති වන්නේ නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමා එකඟ නම් මට යම් පැහැදිලි කර ගැනීමක් සඳහා අවස්ථාව ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, පැහැදිලි කර ගැනීමක් සඳහා අවස්ථාව දෙන්න ඔබතුමා එකඟද?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හැමදාම මම එතුමාට පැහැදිලි කර දෙනවා නේ. අදත් පැහැදිලි කර දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, කරුණාකර ඉතාම කෙටියෙන් අහන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කෙටියෙන් අහන්නම්. රත්නපුරයේ නව නගර සැලැස්මක් හැදෙනවා. කළු ගඟේ වතුර ඇළ මාර්ගයක් හරහා එක්තරා විධියකට බෙදා හැරීමක් ගැන ඒ නව නගර සැලැස්මෙහි ඇතුළත් වෙනවා.

ඒ නව නගර සැලැස්ම හදා තිබෙන්නේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවෙන්. මේ කරුණු සලකා බැලීමේදී ඒකත් සැලකිල්ලට ගන්න කියායි මා ඔබතුමාට කියන්නේ.

ඊළඟට, මල්වල කියන උස් මුදුනෙන් -උස් බිමෙන්- වැඩිපුර එන වතුර ජලාශයක රැඳවීමකින් තොරව උමං මාර්ගයකින් පහළට හැරවීමට පුළුවන්කම තිබෙනවාද කියන කාරණය ගැනත් සලකා බලන්න. ජලාශ හදන්න ගියාම තමයි මිනිසුන් විරුද්ධ වෙන්නේ. මොකද, මිනිසුන්ගේ ඉඩම් ඒකට යට වෙනවා නේ. ජලාශයක් සෑදීමෙන් තොරව, වැඩි ජලයක් එන වෙලාවට ඒ ජලය උමං මාර්ගයකින් හැරවීමට ඇති හැකියාව ගැනත් කල්පනා කර බලන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව නැවත ශක්‍යතා අධ්‍යයනයක් කර තිබෙනවා. ඒ අනුව යම්කිසි ප්‍රමාණයක ජලාශයක් සකස් කරන්න වෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කුඩා ජලාශයක්, නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔව්, කුඩා එකක්. ඒ ජලාශය සකස් කිරීම තුළින් ජනතාවට වෙන්න තිබෙන හානිය අවම කර ගැනීමේ හැකියාව තිබෙනවා.

දෙවැනි එක, ඔබතුමා කියූ නව නගරය පිළිබඳ කාරණයයි. ඒ පිළිබඳව මම මගේ අමාත්‍යාංශයේ නිලධාරීන් දැනුවත් කරන්නම්. අවශ්‍ය සහාය දෙන්න කියන්නම්.

## සීනි පරිභෝජනය : මුළු වැය
*சீனி நுகர்வு: மொத்தச் செலவு*
SUGAR CONSUMPTION: TOTAL AMOUNT SPENT

403/'18

**5. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික සීනි පරිභෝජනය මෙට්‍රික් ටොන් කොපමණද;

(ii) ඒ සඳහා වැය වන මුළු මුදල කොපමණද;

(iii) සීනි නිෂ්පාදනය කිරීම සඳහා ආරම්භ කරන ලද හිඟුරාන කර්මාන්තශාලාවේ වාර්ෂික සීනි නිෂ්පාදනය කොපමණද;

(iv) එම කර්මාන්ත ශාලාව ආශ්‍රිතව පාරිසරික හානියක් සිදු වන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

අරස තොළිල්මුයර්චිකළ් මර්‍රුම් කණ්ඩි නකර අපිවිරුත්ති අමෛච්චරෙක් කේට්ට විනා:

(அ) (i) இலங்கையில் வருடாந்த சீனி நுகர்வு மெட்ரிக் தொன் எவ்வளவு;

(ii) இதற்காக செலவிடப்படும் மொத்த நிதித்தொகை யாது;

(iii) சீனி உற்பத்திக்காக ஆரம்பிக்கப்பட்ட ஹிங்குரான தொழிற்சாலையின் வருடாந்த சீனி உற்பத்தி யாது;

(iv) மேற்படி கைத்தொழிற்சாலையை அண்மித்ததாக சூழல் மாசடைவு இடம்பெறுகின்றதா;

(v) ஆமெனில், இது தொடர்பில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise and Kandy City Development:

(a) Will he inform this House-

(i) the annual sugar consumption in Sri Lanka in metric tonnes;

(ii) the total amount of money spent on it;

(iii) the total production of sugar by the Hingurana Factory, which was started for manufacturing sugar;

(iv) whether any environmental damage is caused in association with that sugar factory; and

(v) if so, what measures have been taken regarding that?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙට්‍රික් ටොන් 554,000 - 2017 වර්ෂය සඳහා.

(ii) රුපියල් බිලියන තිස් නවයයි.

2012 වසරේදී ගල්ඔය වැවිලි සමාගම ආරම්භ කරන ලද අතර, (iii) කොටසේ සිට පිළිතුරු ලබා දී ඇත්තේ ගල්ඔය වැවිලි සමාගම වෙතින් ලබා ගත් තොරතුරු පදනම් කරගෙන බව විශේෂයෙන් සඳහන් කරමි.

(iii) 2012 සිට 2017 දක්වා උක් ඇඹරූ ප්‍රමාණය හා සීනි නිෂ්පාදනය පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | උක් ඇඹරූ ප්‍රමාණය (මෙ.ටො) | විකිණිය හැකි සීනි නිෂ්පාදනය (මෙ.ටො) |
|---|---|---|
| 2013/14 | 133,770 | 10,521 |
| 2014/15 | 246,349 | 19,837 |
| 2015/16 | 206,146 | 14,528 |
| 2016/17 | 146,740 | 10,091 |
| 2017/18 | 169,940 | 12,541 |

(iv) නැත.

(v) මෙම කර්මාන්තශාලාව ඉතා පැරණි කර්මාන්තශාලාවක් වන බැවින්, දුම් සමඟ අළු පිටවීම ප්‍රශස්ත තත්ත්වයේ නොතිබීම හේතුවෙන් දිගින් දිගටම එය මැඩපැවැත්වීමට විවිධ ක්‍රම යොදාගෙන ඇත. මේ අතරතුර මධ්‍යම පරිසර අධිකාරිය මඟින් මෙම ගැටලුව හේතුවෙන් නීතිමය පියවර ගෙන ඇති අතර, එම නඩුව විභාග වෙමින් පවතී.

මෙම ගැටලුව මහඟරවා ගැනීම සඳහා 2017 වර්ෂයේ ඇඹරුම් වාරය අවසන් වීමත් සමඟ රුපියල් මිලියන 107ක වියදමින් ඉන්දියානු තාක්ෂණය උපයෝගි කරගනිමින් නව තාක්ෂණික ක්‍රමයක් ස්ථාපිත කරන ලද අතර, එය ඉතා සාර්ථක වී ඇත.

එබැවින් මේ පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය දැනුවත් කර අවශ්‍ය බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇත.

තවද, ජල පිරිපහදු ඒකකයක් - wastewater treatment plant - හා ජීව වායු නිෂ්පාදන ඒකකයක් - biodigester - රුපියල් මිලියන 100ක පමණ හා රුපියල් මිලියන 75ක පමණ වියදමින් ස්ථාපිත කර ඇත. එමෙන්ම ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ඒකකයක්ද (කොම්පෝස්ට් නිෂ්පාදන ඒකකයක්) රුපියල් මිලියන 60ක පමණ වියදමින් ස්ථාපිත කර ඇත.

ඉහත ඒකක සියල්ල මඟින් පරිසර හිතකාමී සීනි නිෂ්පාදන සංකීර්ණයක් ක්‍රියාත්මක කිරීම අරමුණ වන බවද සඳහන් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විස්තරාත්මක පිළිතුරක් ලබාදීම පිළිබඳව ගරු ඇමතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, මේ සීනි කර්මාන්ත ව්‍යාපෘතියට වෙන් කරන ලද මුළු භූමි ප්‍රමාණයම මේ වන විට වගාව සඳහා යොදාගෙන තිබෙනවාද, නැත්නම්, ඉඩම්ලාභී ගොවීන් උක් වගාවෙන් ඉවත් වුණු තත්ත්වයක් දැනට දැකගන්න තිබෙනවාද, එහෙම නම්, ඒකට හේතුව මොකක්ද කියා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ප්‍රශ්නය වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයෙන් අහලා නැහැ. එම නිසා ඒ ප්‍රශ්නයට මේ අවස්ථාවේදී උත්තරයක් දෙන්න අමාරුයි. මොකද, ඉඩම් ප්‍රමාණය ගැන කථා කිරීම සංකීර්ණ ප්‍රශ්නයක්. මිනිසුන් හැමතැනම ඉඩම් අල්ලා ගන්නා බව ඔබතුමා දන්නවා නේ. ඒක ලංකාවේ තිබෙන සිරිතක්. හිස් ඉඩම් තිබෙනවා නම්, කවුරු හෝ ගිහින් ඒ ඉඩම් අල්ලා ගන්නමයි උත්සාහ කරන්නේ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට දැන් පිළිතුරක් දෙන්න අපහසුයි නම්, කමක් නැහැ. පස්සේ වෙලාවක ඒකට පිළිතුරක් දෙන්න. මම ඒකෙන් බලාපොරොත්තු වුණේ, මේ ව්‍යාපෘතියට වෙන් කළ මුළු ඉඩම් ප්‍රමාණයම මේ වන විට උක් වගාව සඳහා යොදා ගෙන තිබෙනවාද කියන එකට පිළිතුරක්. දැන් ඒකට පිළිතුරු ලබාදීම අපහසුයි නම්, ප්‍රශ්නයක් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඉදිරියේදී ඒකට පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

හොඳයි.

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

ඊළඟට, මට දැන ගත යුතු තවත් වැදගත් කාරණයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ රජය පසුගිය මාසයේදී සීනි සඳහා සියයට 18ක බද්දක් පැනෙව්වා. ඒ සම්බන්ධව මුදල් අමාත්‍ය, ගරු මංගල සමරවීර මැතිතුමාගෙන් අප විමසුවා. "සීනි සඳහා පනවන ලද බද්ද කුමන හේතුවක් නිසාවත් පාරිභෝගිකයාගෙන් අය කරන්නේ නැහැ, මොකද, සීනිවලට විශාල සහනයක් තිබෙනවා, ඒක අපි ආනයනය කරන කෙනාගෙන් තමයි අය කරන්නේ" කියා එතුමා ඒ ගැන පැහැදිලි කරමින් ගිය සතියේ මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළා. නමුත්, මේ වන විට සීනි මිල රුපියල් 10කින් වැඩි කර තිබෙනවා. ඒ නිසා, මුදල් ඇමතිතුමා කළ ප්‍රකාශය නිවැරැදි නැහැ නේද කියා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපිට නම් එහෙම ආරංචියක් ලැබිලා නැහැ. නමුත්, මට මතකයි මුදල් ඇමතිතුමා පැහැදිලිව කිව්වා ඒ වැඩිවෙන බද්ද ජනතාව මත දමන්නේ නැහැයි කියා. [බාධා කිරීමක්]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඒ සහනය පාරිභෝගිකයාට ලබා දෙමින්ම නැවත සීනි මිල අඩු කිරීමක් කරනවාද කියා දැනගන්නට කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇත්ත වශයෙන්ම මේක මුදල් අමාත්‍යතුමාට අදාළ ප්‍රශ්නයක්. මම එතුමාට යොමු කරන්නම්.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා, මම මේ ප්‍රශ්නය සඳහා අතුරු ප්‍රශ්න දෙකකට අවස්ථාව දුන්නා.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොතේ අම්පාර දිස්ත්‍රික්කයට වර්ෂා කාලය. මේ කාලයට උක් වගා කළොත් ඒවා කුණු වෙනවා. එම නිසා වැස්ස අවසන් වනතෙක් ඒ ඉඩම්වල වී වගා කර ගන්නට උක් ගොවීන්ට ඉඩ දෙන්න කියායි මම යෝජනා කරන්නේ. ඒ සඳහා අම්පාරේ ලොකු අරගළයක් තිබෙනවා. කරුණාකර ඔබතුමන්ලා LOLC එකට උපදෙස් දෙන්න, උක් වගා කරන තෙක් මේ අයට මේ කන්නයේ මාස තුනකට වී වගා කරන්නට ඉඩ දෙන්න කියා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ඒක යොමු කරන්නම්.

## ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අක්‍රමිකතා: ගනු ලබන පියවර
## ஊவா மாகாண கல்வித் திணைக்களத்தின் முறைகேடுகள்: எடுத்த நடவடிக்கை
## MALPRACTICES IN DEPARTMENT OF EDUCATION IN UVA PROVINCE: STEPS TAKEN

497/'18

**6. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2015 සහ 2016 වර්ෂවලට අදාළව, ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා 2016.10.18 දිනැති විගණන විමසුමක් නිකුත් වී තිබෙන බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම විගණන විමසුමේ පාසල් පාදක කළමනාකරණ හා පාසල් පාදක ගුරු සංවර්ධනය පිළිබඳව තායිලන්තයේ හා පිලිපීනයේ පැවති ගුරු පුහුණු වැඩමුළුවලට අදාළව, අංක 2, ආ, ඇ, ඈ, ඉ සහ ඊ යන වගන්තිවල දැක්වෙන කරුණු සහ අංක 3 ඡේදයේ දැක්වෙන කරුණු ඉදිරිපත් කරන්නේද;

(iii) එහිදී සිදු වී ඇති යම් අක්‍රමිකතා, දූෂණ හා නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

මාකාණ සපෙකළ්, උළ්ලූරාට්චි මට්‌රුම් විළෙයාට්ටුත් තුරෙ අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளுக்கு ஏற்புடைய தாக, ஊவா மாகாண கல்வித் திணைக்களம் தொடர்பாக 2016.10.18ஆம் திகதிய கணக்காய்வு வினாவொன்று வெளியிடப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அக்கணக்காய்வு வினாவில் பாடசாலை அடிப்படையிலான முகாமைத்துவம் மற்றும் பாடசாலை அடிப்படையிலான ஆசிரியர் அபிவிருத்தி தொடர்பாக தாய்லாந்திலும் பிலிப்பைனிலும் நடைபெற்ற ஆசிரியர் பயிற்சி செயலமர்வுகளுக்கு ஏற்புடையதாக, இலக்கம் 2, ஆ, இ, ஈ, உ, ஊ ஆகிய பிரிவுகளிலுள்ள விடயங்கள் மற்றும் 03 ஆம் இலக்க பந்தியிலுள்ள விடயங்களை இச்சபைக்கு சமர்ப்பிப்பாரா;

(iii) அதன்போது நடைபெற்றுள்ள ஏதேனும் முறை கேடுகள், ஊழல்கள் மற்றும் சட்டவிரோத செயல்களுடன் தொடர்புடைய உத்தியோகத்தர் களுக்கு எதிராக நடவடிக்கை மேற்கொள்வாரா;

(iv) ஆமெனில், அந்நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House -

(i) whether he is aware that an audit query dated 18. 10. 2016 has been issued on the Department of Education of Uva Province in respect of year 2015 and 2016;

(ii) if so, whether he will submits the particulars in section 2 b,c,d,e and f and the paragraph 3 of the audit query in respect of the school-based management and teacher training programmes which were held in Thailand and the Philippines;

(iii) whether measures will be taken against the officials who are connected with certain malpractices, corrupt activities and illegal activities that have occurred there; and

(iv) if so, the aforesaid measures?

(b) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) උඟව පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් මේ සම්බන්ධව විමසීමක් කරන ලද අතර, ප්‍රධාන ලේකම් එම විගණන විමසුම මෙම අමාත්‍යාංශය වෙත එවා ඇත.

ඒ අනුව පාසල් පාදක කළමනාකරණ හා පාසල් පාදක ගුරු සංවර්ධනය පිළිබඳව තායිලන්තයේ හා පිලිපීනයේ පැවැති ගුරු පුහුණු වැඩමුළුවලට අදාළව විගණකාධිපති විසින් යොමු කර ඇති ඔහුගේ අංක UVP/BD/B/EDM/FA/2016/74 හා 2016.10.18 දිනැති විගණන විමසුමේ අංක 02, ආ, ඇ, ඈ, ඉ සහ ඊ වගන්ති යටතේ ඇති කරුණු ඇමුණුම 01 මඟින්ද, අංක 3 ඡේදය යටතේ දැක්වෙන කරුණු ඇමුණුම 02 මඟින් ද දක්වා ඇත.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඔබතුමිය ඇමුණුම 01 කියෙව්වා නම් හොඳයි. ඒක තමයි මගේ අතුරු ප්‍රශ්නවලට යොමු වන්නේ.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමනි, ඇමුණුම 01 මම කියවන්නම්. ගරු මන්ත්‍රීතුමනි, අංක 02 ඡේදයේ කරුණු ඇමුණුම් අංක 01 මඟින් ඉදිරිපත් කර තිබෙනවා.

ඇමුණුම් 01

(ආ) විදේශ පුහුණු සැසි සඳහා තෝරාගෙන තිබූ මල්ටිපල් ඉන්ටලිජන්ස් ඉන්ටනැෂනල් කම්පැනි ලිමිටඩ් ආයතනය තෝරා ගෙන පුහුණු වැඩමුළුව සඳහා රුපියල් 8,358,553ක මුදලක් ගෙවා තිබූ අතර, ආයතනයේ පරිණතභාවය හා හැකියාව පිළිබඳව ඇගයීමක් සිදුකර නොතිබුණි.

(ඇ) ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියේ අරමුදල් උපරිම ඵලදායිතාවකින් උපයෝජනය කර අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන් කිහිප දෙනෙකු පුහුණු කර ඒ තුළින් උඟව පළාතම ආවරණය වන පරිදි එම දැනුම බෙදා හැරීමේ ක්‍රමවේදයක් සැකසිය හැකිව තිබියදී වෙනත් ක්ෂේත්‍රවල නිලධාරීන් ද ඇතුළුව 30 දෙනෙකු සහභාගි කරවා ඒ වෙනුවෙන් රුපියල් 30,879,834ක් වියදම් කර තිබුණි.

(ඈ) පාසල් පාදක කළමනාකරණය හා පාසල් පාදක ගුරු සංවර්ධනය සඳහා වූ පුහුණුවකට අදාළ විෂය සඳහා සෘජුව සම්බන්ධ පූර්ව අත්දැකීම් ඇති හා තමන් ලබා ගන්නා දැනුම බෙදා හැරීමේ හැකියාව මත පදනම්ව නිලධාරීන් තෝරාගත යුතු වුවද, ඊට පටහැනිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන්ගෙන් සමන්විත වන පරිදි නිලධාරීන් තෝරාගෙන තිබුණි.

(ඉ) පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී විවෘත ක්‍රියා පටිපාටියක් අනුගමනය කර නොතිබූ අතර, තෝරා ගැනීමේ පදනම විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඊ) විදේශ ගමන් හා සම්බන්ධ නිලධාරීන්ගේ ගමන් අනුමත කිරීම්, නිවාඩු අනුමත කිරීම හා ඒවාට අදාළ ගෙවීම් සම්බන්ධ තොරුතුරු ලිපිගොනු කිහිපයක් මඟින් නඩත්තු කිරීම නිසා විදේශ ගමන්වලට අදාළව සතුටුදායක අභ්‍යන්තර පාලන ක්‍රමයක් තුළින් විගණනය සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවුණි.

අංක 3 ඡේදයේ දැක්වෙන කරුණු මෙහි ඇමුණුම් අංක 02 යටතේ ඉදිරිපත් කර තිබෙනවා.

ඇමුණුම 02

03. තායිලන්ත හා ඉන්දුනීසියානු සංචාරය

උඟව පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්, උඟව ප්‍රජා ගුවන්විදුලියේ කළමනාකරු හා මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ නිසි බලධාරියා ඇතුළුව නිලධාරීන් තිදෙනෙකු තායිලන්තයේ හා ඉන්දුනීසියාවේදී 2016 ජනවාරි 16 දින සිට 25 දින දක්වා දින 9ක කාලයක් පැවැති "Provincial Public Sector Capacity Building Exposure Visit Programme on Good Governance and Leadership in Public Sector" පිළිබඳ පුහුණු වැඩ මුළුවට සහභාගි වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම TSEP ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීමේ වැඩසටහන යටතේ යහපාලන හා අධ්‍යාපන සේවා සැපයීම යටතේ වූ "මානව සම්පත් සංවර්ධනය"ට ඇතුළත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමේ අරමුණට පටහැනිව ඉහත සඳහන් නිලධාරීන්ට විදේශගත වීමට අදාළව සංයුක්ත හා අනියම් දීමනා ලෙස රුපියල් 1,283,678ක මුදලක් වැයකර තිබුණි.

(ආ) 2015 මැයි 15වැනි දිනැති අංක මු.අ. 01/2015/1 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ නිසි බලධාරියා ලෙස විදේශ ගමනට සහභාගි වූ ජී.ඒ. ආනන්දසිරි ගොඩකන්ද මහතාට අනියම් දීමනාව

[ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය]

ලෙස ඇමෙරිකානු ඩොලර් 40ක දීමනාවක් ගෙවා තිබියදී තායිලන්තයේ හා ඉන්දුනීසියාවේ අභ්‍යන්තර ගමන් වියදම් සඳහා රුපියල් 16,200ක මුදලක් අදාළ නිලධාරියාගේ නමට ගෙවා තිබුණි.

(ඇ) විදේශ ගමන් හා සම්බන්ධ නිලධාරීන්ගේ ගමන් අනුමත කිරීම, නිවාඩු අනුමත කිරීම හා ඒවාට අදාළ ගෙවීම් සම්බන්ධ තොරතුරු ලිපිගොනු කිහිපයක් මඟින් නඩත්තු කිරීම නිසා විදේශ ගමන්වලට අදාළව සතුටුදායක අභ්‍යන්තර පාලන ක්‍රමයක් තුළින් විගණනය සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවුණි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(මාණ්පුමිකු සමිඳ්ත විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, පිළිතුරේ ඉතිරි කොටස සභාගත කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔබතුමිය පිළිතුරේ ඉතිරි කොටස සභාගත කරනවාද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) ශ්‍රීයාණි විජේවික්කිරම)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
පිළිතුරේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி :*
** Rest of the Answer tabled:*

(iii) මෙම කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේදී 2017.03.23 වන දින පරීක්ෂණයට භාජන කර ඇත. මේ පිළිබඳව මෙතෙක් අවසන් තීරණයක් ලැබී නොමැති අතර, ගිණුම් කාරක සභාවේ අවසන් තීරණය ලැබීමෙන් පසුව ඒ අනුව ක්‍රියා කිරීමට පියවර ගනිමි.

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(මාණ්පුමිකු සමිඳ්ත විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
මම පුංචි කාරණයක් කියන්නේ. (අ) (iii) යටතේ අසා තිබෙන "එහිදී සිදු වී ඇති යම් අක්‍රමිකතා, දූෂණ හා නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව පියවර ගන්නේද" කියන කාරණය මා ඔබතුමියගේ අවධානයට යොමු කරවනවා. මෙන්න මේ කියන විගණන විමසුම් කාරණා පිළිබඳව පළාතේ ජනතාව සහ පළාතේ අදාළ බලධාරීන් දැනුවත් කරන්න කියන කාරණය තමයි මම පසුගිය කාලය පුරාවට දිගින් දිගටම අනාවරණය කළේ කියන එක ගරු කථානායකතුමාට සහ මේ ගරු සභාවට කියන්න කැමතියි. ඊට අදාළ පිළිතුර මේ ගරු සභාවේදී කියවීම සම්බන්ධයෙන් වාගේම එය සභාගත කිරීම සම්බන්ධයෙන් මගේ ගෞරවනීය ස්තුතිය මා ඔබතුමියට පුද කරනවා. ඒ නිසා මම අතුරු ප්‍රශ්න අහන්නේ නැහැ.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) ශ්‍රීයාණි විජේවික්කිරම)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
අනික් ප්‍රශ්නවලට,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(මාණ්පුමිකු සමිඳ්ත විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
(iii) වැනි කොටසට පිළිතුරු දුන්නා නේ. ඒ ඇති.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(මාණ්පුමිකු (තිරුමති) ශ්‍රීයාණි විජේවික්කිරම)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
(iii) වැනි කරුණට අවධානය යොමු කරන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(මාණ්පුමිකු සමිඳ්ත විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරන්න පුළුවන් නම් එලෙස කටයුතු කරන්න.

## රජයේ රෝහල්වල ශල්‍යකර්ම සඳහා පොරොත්තු ලේඛනයේ සිටින රෝගීන් : විස්තර

அரசாங்க வைத்தியசாலைகளில் அறுவைச் சிகிச்சைக்காக காத்திருப்போர் பட்டியலிலுள்ள நோயாளர்கள்: விபரம்

PATIENTS IN WAITING LIST FOR SURGERIES IN GOVERNMENT HOSPITALS: DETAILS

545/'18

**7. ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ, ගාල්ල, යාපනය, නුවර, බදුල්ල, අනුරාධපුර සහ අම්පාර ආදී ප්‍රධාන රජයේ රෝහල්වල ශල්‍යකර්ම උදෙසා පොරොත්තු ලේඛනයේ සිටින රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම රෝගීන් සංඛ්‍යාව පසුගිය වසර 3 තුළ කෙතරම් ප්‍රමාණයකින් වැඩිවී හෝ අඩුවී තිබේද;

(iii) 2017.11.30 දිනැති සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාවේ නිර්දේශය පිළිබඳව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග සහ කාල රාමු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 'ලිට්ල් හාට්' ව්‍යාපෘතියට අවශ්‍යව ඇති මූල්‍ය ප්‍රතිපාදන 2018 අය වැයෙන් ලබා දෙන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு, காலி, யாழ்ப்பாணம், கண்டி, பதுளை, அநுராதபுரம் மற்றும் அம்பாறை ஆகிய பிரதான அரசாங்க வைத்தியசாலைகளில் அறுவைச் சிகிச்சைக்காக காத்திருப்போர் பட்டியலில் காத்திருக்கும் நோயாளர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(ii) மேற்படி நோயாளர்களின் எண்ணிக்கை கடந்த 3 வருட காலப்பகுதியில் எந்தளவு அதிகரித்துள்ளது அல்லது குறைவடைந்துள்ளது;

(iii) 2017.11.30ஆம் திகதிய சுகாதாரம் மற்றும் மானிட நலனோம்புகை, சமூக வலுவூட்டல் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு அறிக்கையின் விதப்புரைகள் குறித்து அறிவாரா;

(iv) ஆமெனில், இது தொடர்பில் மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் மற்றும் காலவரையறை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 'லிடில் ஹார்ட்' கருத்திட்டத்துக்குத் தேவையாகவுள்ள நிதி ஏற்பாடுகள் 2018 ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின் மூலம் வழங்கப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House -

(i) separately, the number of patients in the waiting list for surgeries in major government hospitals such as Colombo, Galle, Jaffna, Kandy, Badulla, Anuradhapura and Ampara;

(ii) whether there has been an increase or decrease of the number of such patients during the past 03 years;

(iii) whether he is aware of the recommendation of the report of the Sectoral Oversight Committee on Health, Human Welfare and Social Empowerment dated 30.11.2017; and

(iv) if so, the measures to be taken in that regard together with relevant time frames?

(b) Will he also inform this House whether the financial provisions required for the `Little Heart' project will be provided from the 2018 B udget?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)

(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| රෝහල | රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ ජාතික රෝහල | 6234 |
| කරාපිටිය ශික්ෂණ රෝහල | 8960 |
| යාපනය ශික්ෂණ රෝහල | 4395 |
| මහනුවර ශික්ෂණ රෝහල | 5973 |
| බදුල්ල මහ රෝහල | 872 |
| අනුරාධපුර ශික්ෂණ රෝහල | 5830 |
| මහරගම අපේක්ෂා රෝහල | මාසයක්, මාස දෙකක් අතර පොරොත්තු ලේඛනයේ රැඳී සිටිති. |
| රිජ්වේ ආර්යා ළමා රෝහල | 4718 |
| අම්පාර මහ රෝහල | පොරොත්තු ලේඛනයක් නොමැත. |

(ii)

| රෝහල | 2015 | 2015 සිදු කරන ලද ශල්‍යකර්ම |
|---|---|---|
| ශ්‍රී ලංකා ජාතික රෝහල | 3747 | 78173 |
| කරාපිටිය ශික්ෂණ රෝහල | 7936 | 43164 |
| යාපනය ශික්ෂණ රෝහල | - | සියලු ශල්‍යකර්ම සිදු කර ඇත. |
| මහනුවර ශික්ෂණ රෝහල | 5351 | 62155 |
| බදුල්ල මහ රෝහල | 1143 | 25582 |
| අනුරාධපුර ශික්ෂණ රෝහල | 6613 | 6796 |
| මහරගම අපේක්ෂා රෝහල | - | 6263 |
| රිජ්වේ ආර්යා ළමා රෝහල | - | 15930 |

| රෝහල | 2016 | 2016 සිදුකරන ලද ශල්‍යකර්ම |
|---|---|---|
| ශ්‍රී ලංකා ජාතික රෝහල | 4165 | 77314 |
| කරාපිටිය ශික්ෂණ රෝහල | 8121 | 46360 |
| යාපනය ශික්ෂණ රෝහල | - | සියලු ශල්‍යකර්ම සිදුකර ඇත |
| මහනුවර ශික්ෂණ රෝහල | 5583 | 58861 |
| බදුල්ල මහ රෝහල | 1210 | 27863 |
| අනුරාධපුර ශික්ෂණ රෝහල | 7036 | 26895 |
| මහරගම අපේක්ෂා රෝහල | - | 6571 |
| රිජ්වේ ආර්යා ළමා රෝහල | - | 15880 |

| රෝහල | 2017 | 2017 සිදුකරන ලද ශල්‍යකර්ම |
|---|---|---|
| ශ්‍රී ලංකා ජාතික රෝහල | 5793 | 78157 |
| කරාපිටිය ශික්ෂණ රෝහල | 8750 | 46110 |
| යාපනය ශික්ෂණ රෝහල | - | සියලු ශල්‍යකර්ම සිදුකර ඇත |
| මහනුවර ශික්ෂණ රෝහල | 5783 | 62853 |
| බදුල්ල මහ රෝහල | 1287 | 24386 |
| අනුරාධපුර ශික්ෂණ රෝහල | 7603 | 27744 |
| මහරගම අපේක්ෂා රෝහල | - | 6404 |
| රිජ්වේ ආර්යා ළමා රෝහල | - | 15469 |

ගරු මන්ත්‍රීතුමනි, පොරොත්තු ලේඛනය කියලා මේකේ සඳහන් වෙන්නේ ජනවාරි 01 වැනි දා ඉඳලා waiting list එකක් තිබුණු නිසායි. ඒ නිසා තමයි මේ ගොල්ලන් මේ විධියට පිළිතුර එවා තිබෙන්නේ. නමුත් අද වනවිට එම waiting list එක නැහැ. අද වනවිට ශල්‍යකර්ම සිදු කර තිබීම නිසා ඉතා සුළු ප්‍රමාණයකට මේ සංඛ්‍යාව අඩු වී තිබෙනවා.

(iii) ඔව්.

(iv) ශල්‍ය වෛද්‍ය ඇතුළු සියලු විශේෂඥවරුන් පුහුණු කිරීම පශ්චාත් උපාධි වෛද්‍ය ආයතන මඟින් 2015දී දෙගුණ කර ඇත. Cadre එකෙන් භාගයයි තිබෙන්නේ. ඒ නිසා මම PGIM එකේ Chairman සහ සියලු Boards of Study Chairpersonsලා ගෙන්වා කථා කරලා එකඟ කර ගත්තා, එම ප්‍රමාණය දෙගුණයක් කර ගන්න. ඒ අනුව එම ප්‍රමාණය දෙගුණයක් කර ගන්න කටයුතු කරනවා. හැබැයි, ඒවායේ ප්‍රතිඵල ලැබෙන්න තව අවුරුදු දෙකක් විතර ගත වෙනවා.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ශල්‍යකර්ම සඳහා පොරොත්තු ලේඛනවල ඇතුළත් රෝගීන් සංඛ්‍යාව අඩු කිරීම සඳහා හඳුනා ගත් ශික්ෂණ රෝහල්, දිස්ත්‍රික් මහ රෝහල්, පළාත් මහ රෝහල්වල ශල්‍ය වෛද්‍යවරුන් ගණන වැඩි කර ඇති අතර, එම විශේෂඥතාවන් සඳහා ඒකක දැනට සාදා නොමැති රෝහල්වල එම ඒකක ඇති කිරීමට කටයුතු යොදා ඇත. එමෙන්ම පශ්චාත් උපාධි ආයතන හරහා බඳවා ගන්නා ලද වෛද්‍යවරුන්ගේ සේවය උපරිමයෙන් ලබා ගැනීමට සේවා කාලය වසර 63 දක්වා දීර්ඝ කරන ලදී. එමෙන්ම "After Hour Surgery" සංකල්පය යටතේ ප.ව. 04.00න් පසුව ශල්‍යකර්ම සිදු කිරීමට විශේෂ වැඩසටහනක් දියත් කර ඇත.

ඒ වාගේම transplant surgery ගැන කථා කරනවා නම්, මම එනකොට වකුගඩු බද්ධය විතරයි ලංකාවේ කරලා තිබුණේ. ඒකත් අවුරුද්දකට 40යි කරලා තිබුණේ. නමුත් ගිය අවුරුද්දේ හාරසිය ගණනක් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අනෙක් අවයව බද්ධයත් දැන් සිදු වෙනවා. පළමුවැනි වරට පටන් ගත්තේ අක්මා බද්ධයෙන්. ඒකත් අද ජාතික රෝහල, උතුරු කොළඹ රෝහල හා මහනුවර රෝහලේ කරනවා. අග්න්‍යාශ බද්ධය කළා, පාද බද්ධය කළා, අත් බද්ධය කළා, අන්තිමට හෘදය බද්ධය කළා. 1967න් පසුව හෘදය බද්ධයක් කරන්න අපට අවුරුදු 50ක් ගත වුණා. අපි ඒකත් කළා. හෙට-අනිද්දා වෙනකොට තුන්වැනි හෘදය බද්ධ කිරීමත් කරනවා.

ලියුකේමියා රෝගීන්ට ඇටමිදුලු බද්ධ කිරීම ආරම්භ කළා, අපේක්ෂා රෝහලේ. දැන් රෝගීන් 70ක්, 80ක් පමණ ඉන්නවා. මේ වනතෙක් ලියුකේමියා හා මයිලෝමා රෝගවලින් දුප්පත් සියලු දරුවන් මිය ගියා. ඒ නිසා තමයි අපි ඇටමිදුලු බද්ධ කිරීම ආරම්භ කළේ. සල්ලි තිබෙන අය ඔක්කොම ඉන්දියාවට ගිහින් ඒ ශල්‍යකර්ම කර ගත්තා. අද සියලු දුප්පත් ලියුකේමියා රෝගීන් ඇටමිදුලු බද්ධ කිරීම තුළින් සහනයක් ලබනවා. ඇටමිදුලු බද්ධ කිරීමේ දෙවන මධ්‍යස්ථානය LRH එකේ ආරම්භ කරනවා.

දුප්පත් සියලු තැලසීමියා රෝගීන් -දරුවන්- මිය ගියා. අපි තැලසීමියා සංකීර්ණයක් ආරම්භ කරනවා. ලංකාව පුරාම තැලසීමියා රෝගීන් සමීක්ෂණය කරනවා. අවුරුදු 12න් ඉහළ තැලසීමියා රෝගි සෑම පාසල් ළමයකුටම card එකක් දෙනවා. තැලසීමියා රෝගීන් දෙදෙනකු විවාහ වුණොත් විතරයි තැලසීමියා දරුවකු ඇති වන්නේ. තැලසීමියා සංකීර්ණයක් අපි ආරම්භ කරනවා. ලබන අප්‍රේල් මාසයේදී මහනුවර රෝහලේ තැලසීමියා රෝගය සඳහා ශල්‍යකර්ම කිරීම ආරම්භ කරනවා.

ඒ ඒ රෝහල්වල සේවා අවශ්‍යතාව පරිදි රෝහල් ප්‍රධානීන් විසින් ඒ ඒ වකවානුවලදී අමාත්‍යාංශයට ලබා දෙන ප්‍රමුඛතා ලේඛනය මත පදනම්ව වෛද්‍යවරුන් ලබා දීම සිදු කෙරේ. එහිදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති තනතුරු ගණන මත, තිබෙන පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් ඒ ඒ රෝහල් වෙත පශ්චාත් සීමාවාසික වෛද්‍ය නිලධාරි පත් කිරීම මඟින් වෛද්‍ය නිලධාරීන් ලබා දේ. ඒ සඳහා පුරප්පාඩු ප්‍රසිද්ධ කර අයදුම් පත් කැඳවා ජ්‍යොෂ්ඨත්වය මත පදනම්ව පත්වීම් ලබා දීම සිදු කරනු ලබයි. ගරු මන්ත්‍රීතුමනි, එක කාරණයක් කියන්න මට අමතක වුණා. දැනට ලෝකයේ පාද බද්ධ කිරීම් පහයි කරලා තිබෙන්නේ. ඒකෙන් විදේශවලදී පාද බද්ධ කරපු හතරදෙනාම මිය ගිහින් තිබෙනවා. අද ලෝකයෙන්ම පාද බද්ධ කළ කෙනෙක් ජීවත් වෙන්නේ ලංකාවේ විතරයි. පාද බද්ධ කිරීමෙන් පසු ඔහු දැනට අවුරුදු දෙකක් ජීවත් වෙනවා.

මේ වනවිට ශ්‍රී ලංකාව තුළ පවතින සියලුම රෝහල්වල භාණ්ඩ හා උපකරණ පිළිබඳ සමීක්ෂණයක් සැලසුම් ඒකකය මඟින් සිදු කරමින් පවතී. මෙය අවසානයේදී හඳුනාගත් රෝහල්වලට ප්‍රමුඛතාවක් ලබා දී භාණ්ඩ හා උපකරණ ලබාදීම තවදුරටත් විධිමත් කරනු ලැබේ. ඒ සමඟම ඉහත සඳහන් රෝහල්වල පහසුකම් වැඩි කිරීම සඳහා විශාල සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ඇත. මහනුවර මහ රෝහලේ ඇඳන් 305කින් යුත්, මහල් 12කින් යුත් සම්පූර්ණ පිළිකා ප්‍රතිකාර ඒකකයේ 10වන මහල දක්වා දැනට ඉදිකිරීම් කරමින් පවතී. ඒ සඳහා මුළු වියදම රුපියල් මිලියන 1,975යි.

රුපියල් මිලියන 550ක වියදමින් පහත උපකරණ ලබා ගැනීමට කටයුතු කර ඇත.

Linear accelerators දෙකයි, PET scanner එකයි, gamma camera එකයි, Brachytherapy එකයි.

මහල් 8කින් යුත් තැලසීමියා ඇටමිදුලු බද්ධ කිරීමේ වාට්ටු සංකීර්ණයක් ඉදිකරමින් පවතී. දැනට දෙවන මහල දක්වා ඉදි වී ඇත. ඒ සඳහා වියදම රුපියල් මිලියන 1,200යි. Blood Bank එහි ඇතුළත් වී ඇත.

2019 අප්‍රේල් මාසය වනවිට තැලසීමියා ඒකකය විවෘත කිරීමට සැලසුම් කර ඇත. මහල් 4කින් යුත් හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකයේ දැනට තුන්වන මහල දක්වා ඉදිවෙමින් පවතී. ඒ සඳහා වියදම රුපියල් මිලියන 650යි. ලබන අවුරුද්දේ අගෝස්තු මාසයේ විවෘත කෙරේ.

රෝගීන් 50ක් සඳහා මහල් 7කින් යුත් නේවාසිකාගාරයක් ජනාධිපති අරමුදලින් ඉදිකරමින් පවතී. වකුගඩු රෝගීන් සඳහා dialysis machines 50කින් යුත් රුධිර කාන්දු ඒකකයක් ජනවාරි මාසයේ විවෘත කිරීමට නියමිතයි. ශ්‍රී ලංකා යුද හමුදාව ඉදි කිරීම් කටයුතු සිදු කරයි. ඒ සඳහා රුපියල් මිලියන 175ක් මේ වනවිට වියදම් කර ඇත. සම්පූර්ණ වියදම රුපියල් මිලියන 200යි. ඒ මුදල ජනාධිපති අරමුදලෙන් ගෙවනු ලැබේ.

මධ්‍යම පළාතට විශේෂ දැඩි සත්කාර ඒකකයක් - Maternal Super Centre - ඉදි කරමින් පවතී. ඒ සඳහා වියදම රුපියල් මිලියන 250යි.

2019 වසරේ JICA අරමුදලින් මහල් 10කින් යුත් අංග සම්පූර්ණ රසායනාගාරයක් ඉදිවෙනවා; රුපියල් මිලියන 850යි. JICA අරමුදලින් Cath Labs තුනකුත්, රජයේ අරමුදලින් එකකුත් ඇතුළුව Cath Labs හතරක් ඉදිකරනවා. රුපියල් මිලියන 1,500ක විශාල සංවර්ධනයක් 2019 වර්ෂයේ සිදු කිරීමට නියමිතයි. රුපියල් මිලියන 350ක හෙද නිල නිවාසයක් ඉදිවෙමින් පවතින අතර Dialysis Unit හා Surgical Unit පුළුල් කර තිබෙනවා. ඒ වාගේම Occupational Therapy Unit එක 2018 දෙසැම්බර් අවසන් වීමට නියමිතයි. ඒ වාගේම ජාතික රෝහලේ Epilepsy Theatre එක විවෘත කර වකුගඩු හා අක්මා බද්ධ කිරීම ආරම්භ කළා. OPD සංකීර්ණය තට්ටු නවයකින් යුත් ගොඩනැඟිල්ල යු-ආන් මිලියන 450ක චීන ණය ආධාර මත ඉදිවෙනවා. Dialysis Unit එක සකසා අවසන් කරලා තිබෙනවා. Night lab එකක් වෙනමම ආරම්භ කරලා තිබෙනවා. සම්පූර්ණ රෝහලම ආවරණය වෙන fiber-optic cable system එකක් සකස් කර Management Information System එකක් සකසා තිබෙනවා. Accident Service එක සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය - digitalize - කරලා තිබෙනවා. Lab MIS - Management Intranet System - එකක් හඳුන්වා දීලා

තිබෙනවා. ඒ වාගේම මහල් දහනවයකින් යුක්ත ශල්‍ය වෛද්‍ය සංකීර්ණයක් සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම මහල් 13කින් යුක්ත හෘදය රෝග සංකීර්ණයක් දැනට ඉදිකිරීමට සැලසුම් කරලා තිබෙනවා.

**කරාපිටිය රෝහල -** මහල් 10කින් යුත් වකුගඩු ඒකකයක් සහ වකුගඩු බද්ධ කිරීමේ ඒකකයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 900ක් වෙන් කර ඇති අතර එය 2019 ජනවාරි 8වැනි දින ජනපති පදවි ප්‍රාප්තිය වෙනුවෙන් විවෘත කිරීමට නියමිතය. ළමා රෝග රෝහල් සංකීර්ණයක් ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන් කර ඉදිකිරීම් සිදු කරමින් පවතී. මහල් අටකින් යුක්ත දන්ත වෛද්‍ය ඒකකයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1,200ක් වෙන් කර ඇති අතර ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු මේ වන විට අවසන් කර ඇත. මහල් 10කින් යුත් විශේෂිත ශල්‍ය ඒකකයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1,500ක් වෙන් කර මේ වන විට ඉදිකිරීම් ආරම්භ කර ඇත. රුපියල් මිලියන 80ක වියදමින් Stroke Unit එකක් ඉදිකිරීම සිදු වෙමින් තිබෙනවා. Plastic Surgery සහ Dialysis Units සහ හදිසි අනතුරු ඒකක සංවර්ධනය කර ඇත. රෝහලේ ඇතුළත විශේෂිත වෛද්‍ය ඒකක 10කින් වැඩි වී ඇති අතර එමඟින් එම ඒකක සඳහා සියලු පහසුකම් සපයා ඇත. MRI සහ CT Scanners වැනි යන්ත්‍ර අලුතින් මේ වන විටත් රෝහල වෙත ලබා දී ඇත.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු ඇමතිතුමනි, තවත් දීර්ඝ විස්තරයක්ද තිබෙන්නේ?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අවසන් කරනවා.

Then, with regard to the development work at the Jaffna Teaching Hospital, the A & E Building built at a cost of Rs. 600 million will be opened in December, 2018, the rehabilitation building built at a cost of Rs. 530 million will be opened in August, 2019, refurbishment work of existing buildings has been done by spending Rs. 200 million, the cardiothoracic building and the Maternity Ward Complex are in planning stage, the nurses' quarters built at a cost of Rs. 600 million has been opened and cardiothoracic surgeries have been started from August, 2018 and so far, 60 surgeries have been done.

(ආ) ඔව්. "ලිට්ල් හාර්ට්ස්" ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නාවික හමුදාව වෙත පවරා ඇති අතර, ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සඳහා මෙම අමාත්‍යාංශ වැය ශීර්ෂ 111-02-13-133-2014(11) යටතේ රුපියල් මිලියන 300ක ප්‍රතිපාදන 2018.02.27වැනි දින පවරා දී ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ලිට්ල් හාර්ට්ස් අරමුදල යටතේ හමුදාව විසින් කරන ඉදිකිරීම් කටයුතුවල වියදමට තව කොපමණ මුදල් අවශ්‍ය වී තිබේද? එය මෙවර අය වැයෙන් සැපයීමට ඔබතුමා කටයුතු කරනවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
දැනට රුපියල් මිලියන 300ක් ලබා දී තිබෙනවා. මුළු මුදලම රජයෙන් වියදම් කරනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මෙවර අය වැයෙන් එම මුදල් වෙන් කරනවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා විසින් ඉටු කර තිබෙන කාර්ය භාරය ප්‍රශංසනීයයි. ඒ පිළිබඳ විස්තර ලබා දුන් පසුව අපි නිරුත්තර නොවෙයි, නිර්ප්‍රශ්නභාවයට පත් වී තිබෙනවා. නමුත් එක දෙයක් මම මතක් කරන්න ඕනෑ. ගාල්ල, කරාපිටිය රෝහලේ ICU එකේ air conditioner එක වැඩ කරන්නේ නැහැ. Air conditioner එක වැඩ නොකර කාලයක් තිබුණා. රෝගීන් ලොකු අපහසුතාවකට පත් වුණා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රමාදය තිබුණේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ. රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට ගියාම තිබෙන බාධක දන්නවා නේ. ඒ ඔක්කොම දැන් සකස් කර අවසන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 8 -952/'18- (1) ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -960/'18- (2) ගරු මයන්ත දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -972/'18- (1) ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.*

ප්‍රශ්න අංක 11 -996/'18- (1) ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.*
*Question ordered to stand down.*

## පොදු මගී ප්‍රවාහන ගාස්තු: මිල සූත්‍රය
පොතුப் போக்குவரத்துக் கட்டணம்: விலைச் சூத்திரம்
PUBLIC TRANSPORT FARE: PRICE FORMULA

1117/'18

**12. ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඉන්ධන මිල උච්චාවචනය වනවිට පොදු මගී ප්‍රවාහන සේවාවන්වල ගමන් ගාස්තුද උච්චාවචනය වන ලෙස මිල සූත්‍රයක් හඳුන්වා දී තිබේද;

(ii) එසේ නම්, එම මිල සූත්‍රය හඳුන්වා දුන් වර්ෂය කවරේද;

(iii) එම මිල සූත්‍රය ඉදිරිපත් කරන්නේද;

(iv) පොදු මගී සේවාවන්ට සම්බන්ධ සංගම්/මණ්ඩල වෙත එම මිල සූත්‍රය පිළිබඳ පැහැදිලි දැනුවත් කිරීම් සිදුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉන්ධන මිල උච්චාවචනය වන අවස්ථාවලදී එම මිල සූත්‍රයට අනුව පොදු ප්‍රවාහන ගාස්තු අඩු වැඩි කර තිබේද;

(ii) එසේ නම්, එම අවස්ථා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

(iii) මිල සූත්‍රයක් හඳුන්වා දී නොමැති නම්, ඉදිරියේදී ඒ සඳහා කටයුතු කරන්නේද;

(iv) මිල සූත්‍රයක් හඳුන්වා දීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) எரிபொருள் விலை தளம்பல் அடையும்போது பொதுப் போக்குவரத்துச் சேவைகளின் பயணக் கட்டணமும் தளம்பல் அடையக்கூடிய விதத்தில் விலைச்சூத்திரமொன்று அறிமுகப்படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்விலைச் சூத்திரம் அறிமுகம் செய்யப்பட்ட வருடம் யாதென்பதையும்;

(iii) அவ்விலைச் சூத்திரத்தை இச்சபையில் சமர்ப்பிப் பாரா என்பதையும்;

(iv) பொதுப் பிரயாணிகள் சேவைகளுடன் சம்பந்தப் பட்ட சங்கங்கள்/ சபைகளிடம் மேற்படி விலை சூத்திரத்தைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) எரிபொருள் விலை தளம்பல் அடையும் சந்தர்ப் பங்களின்போது அவ்விலைச் சூத்திரத்திற்கமைய பொதுப்போக்குவரத்துக் கட்டணம் குறைக்கப் பட்டு/அதிகரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி சந்தர்ப்பங்கள் பற்றிய தகவல்களை சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) விலைச்சூத்திரமொன்று அறிமுகப்படுத்தப்பட வில்லை எனில், எதிர்காலத்தில் அதற்கான நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) விலைச்சூத்திரமொன்றினை அறிமுகப்படுத்த எதிர்பார்க்கின்ற திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation :

(a) Will he inform this House -

(i) whether a price formula which will cause fluctuation in the fare levied by public transport services in response to fluctuations in the price of fuel has been introduced;

(ii) if so, the year in which such a price formula was introduced;

(ii) whether he will present the said price formlula to this House;

(iv) whether associations and boards connected to public passenger transport services were made aware of the said price formula?

(b) Will he also inform this House -

(i) `whether fares levied by public transport services have been subjected to rise and fall in accordance with the price formula that causes fluctuations in the fuel prices;

(ii) if so, whether information pertaining to such instances of fluctuation will be presented to this House;

(iii) if a price formula has not been introduced, whether action will be taken in future to do so;

(iv) the date on which it is expected to introduce a price formula?

(c) If not, why?

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) විශේෂයෙන් එවැනි මිල සූත්‍රයක් නොමැති වුවද වෙළඳ පොළ සිදුවන උච්චාවචනයන් හමුවේ බස් සේවා සඳහා එහි සියලු අංශ නියෝජනය වන පරිදි පිරිවැය සුචියක් - index එකක්- සම්පාදනය කර ඇත. බස් රථවලට අදාළ අංගෝපාංග පිළිබඳ පිරිවැය වෙනස්වීම් ද බස් සේවාවල ක්‍රියාත්මක වීමේ වියදම් වෙනස්වන ආකාරය ද එම සුචියෙන් පිළිබිඹු වන අතර බස් ගාස්තු ප්‍රතිශෝධනය කිරීම

සඳහා මාර්ගෝපදේශක සුවියක් වශයෙන් මෙම නිර්ණායක භාවිත කෙරේ. ඒ සඳහා පාදක කරගෙන ඇති වියදම් කොටස් 12 පහත පරිදි වේ.

I. ඉන්ධන
II. සේවක පිරිස්
III. තෙල් සහ ලිහිසි
IV. ටයර් සහ ටියුබ්
V. වායු සමීකරණ
VI. අලුත්වැඩියාවන්
VII. දිනපතා පොදු කාර්ය වියදම්
VIII. මාසික පොදු කාර්ය වියදම්
IX. වාර්ෂික පොදු කාර්ය වියදම්
X. ක්ෂය වීම්
XI. ප්‍රාග්ධනය සඳහා පොලිය
XII. ව්‍යවසාය පිළිබඳ අවදානම

(ii) එකී මිල සූත්‍රය 2002 වර්ෂයේදී හඳුන්වා දුනි.

(iii) ඔව්. ඇමුණුම් අංක 1,2.

අමුණුම අංක -(1)

**BUS OPERATING COST (RS PER REVENUE BUS KM)**

2016 May

| | A Long Distance (Low C) | B Long Distance (Low C) (AC) | C Long Distance (Up C) | D Long Distance (Up C) (AC) | E Regional | F Urban Line Haul | G Urban Line Haul (AC) | H Urban Crosstown | I Urban Feeder | J Rural | (A-J) Weighted Composite | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| *OPERATIONAL COST* | | | | | | | | | | | | % |
| C1. Fuel Cost (Diesel) | 29.31 | 32.59 | 30.95 | 34.11 | 30.48 | 33.98 | 34.51 | 36.80 | 38.34 | 33.54 | **33.57** | *31* |
| C2. Crew Cost | 12.25 | 11.81 | 16.65 | 16.22 | 16.51 | 25.82 | 20.77 | 31.16 | 37.86 | 20.74 | **22.01** | *20* |
| C3. Service & Lubricants | 5.92 | 6.50 | 6.22 | 6.81 | 6.07 | 6.01 | 5.12 | 5.88 | 5.80 | 5.97 | **5.81** | *5* |
| C4. Tires & Tubes | 10.41 | 10.41 | 13.93 | 13.93 | 11.63 | 10.35 | 7.12 | 10.44 | 10.50 | 10.38 | **10.27** | *10* |
| C5.Air Conditioner (mainten | 0.00 | 2.42 | 0.00 | 2.51 | 0.00 | 0.00 | 1.81 | 0.00 | 0.00 | 0.00 | **0.27** | *0* |
| C6. Repairs | 10.27 | 17.15 | 10.27 | 17.15 | 10.27 | 10.27 | 15.25 | 10.27 | 10.27 | 7.04 | **9.95** | *9* |
| C7. Daily Overheads | 0.24 | 0.23 | 0.25 | 0.24 | 0.31 | 0.55 | 0.45 | 0.75 | 2.07 | 0.77 | **0.66** | *1* |
| C8. Monthly Overheads | 3.30 | 3.33 | 3.69 | 3.73 | 3.93 | 6.07 | 5.25 | 8.07 | 9.50 | 5.60 | **5.55** | *5* |
| C9. Annual Overheads | 1.29 | 2.00 | 1.44 | 4.08 | 1.14 | 1.51 | 2.06 | 1.71 | 1.69 | 0.75 | **1.36** | *1* |
| C10. Depreciation of Bus | 8.86 | 14.81 | 8.90 | 14.87 | 8.91 | 8.81 | 13.04 | 8.89 | 8.95 | 6.04 | **8.59** | *8* |
| C11. Financing of Bus | 5.59 | 9.44 | 6.26 | 10.57 | 4.75 | 6.03 | 9.42 | 6.44 | 5.88 | 2.38 | **5.20** | *5* |
| C12. Provision for Risk | 4.83 | 8.15 | 5.41 | 9.13 | 4.10 | 5.21 | 8.13 | 5.56 | 5.08 | 2.06 | **4.49** | *4* |
| *Total Cost* | **92.26** | **118.84** | **103.99** | **133.36** | **98.09** | **114.62** | **122.94** | **120.41** | **135.94** | **95.28** | **107.73** | *100* |

අමුණුම අංක -(2)

*Revision # 23*
*Revision Type: Annual*

**BUS OPERATING COST INDEX Rs./km 2018 - May**

| | 2018 May | 2017 June | 2018 May- 2017 June Increase Rs | Increase % |
|---|---|---|---|---|
| *OPERATIONAL COST* | | | | |
| C1. Fuel Cost (Diesel) | 33.57 | 29.26 | 4.31 | 14.7 |
| C2. Crew Cost | 22.01 | 21.07 | 0.93 | 4.4 |
| C3. Service & Lubricants | 5.81 | 5.77 | 0.04 | 0.7 |
| C4. Tires & Tubes | 10.27 | 10.08 | 0.18 | 1.8 |
| C5.Air Conditioner (maintenece+ overhaul) | 0.27 | 0.23 | 0.03 | 13.1 |
| C6. Repairs | 9.95 | 9.41 | 0.54 | 5.7 |
| C7. Daily Overheads | 0.66 | 0.66 | 0.00 | 0.0 |
| C8. Monthly Overheads | 5.55 | 5.33 | 0.22 | 4.2 |
| C9. Annual Overheads | 1.36 | 1.30 | 0.06 | 4.3 |
| C10. Depreciation of Bus | 8.59 | 8.12 | 0.47 | 5.7 |
| C11. Financing of Bus | 5.20 | 5.11 | 0.09 | 1.7 |
| C12. Provision for Risk | 4.49 | 4.73 | -0.24 | -5.0 |

(iv) තිබේ.

(ආ) (i) තිබේ.

(ii) ඔව්.

මෙම මිල සූත්‍රය හඳුන්වා දීමෙන් පසු 2018 වර්ෂයේ අගෝස්තු මස වන විට 23 වරක් බස් ගාස්තු සංශෝධනය කර ඇති අතර, ඒ අතරින් ඉන්ධන මිල වැඩිවීම පමණක් සලකා පහත සඳහන් අවස්ථාවලදී බස් ගාස්තු සංශෝධනය සිදු කර ඇත.

| වර්ෂය | බස් ගාස්තු අඩු වූ/වැඩි වූ ප්‍රතිශතය % |
|---|---|
| 2002 අගෝස්තු | -2.5 |
| 2004 ඔක්තෝබර් | 5.0 |
| 2008 පෙබරවාරි | 4.6 |
| 2008 නොවැම්බර් | -11.6 |
| 2009 ජනවාරි | -4.3 |
| 2015 ජනවාරි | -8.2 |

(iii) 2002 වර්ෂයේ හඳුන්වා දී ඇති දැනට පවතින මිල සූත්‍රය වර්තමානයට ගැළපෙන පරිදි සංශෝධනය කිරීමට කැබිනට් මණ්ඩලය විසින් කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටුව විසින් මේ වන විට ගාස්තු ප්‍රතිපත්තිය සංශෝධනයට අදාළ දත්ත රැස් කිරීමට උපදෙස් දී ඇත.

(iv) එම සංශෝධිත මිල සූත්‍රය 2018 වසර අවසන් වීමට පූර්ව හඳුන්වා දීමට නියමිතය.

(ඇ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ස්තුතියි. මා පළමුවෙන් මතක් කරන්න කැමැතියි, පෙට්‍රල් සහ ඩීසල් මිල වැඩි වීමත් එක්ක පාසල් වෑන් රථවල ගාස්තු වැඩි කරන්නත් අවශ්‍ය කටයුතු කර තිබෙන බව.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඊයේ ප්‍රවෘත්ති බලන කොට මම දැක්කා, "පාර්ලිමේන්තුවේ ඉන්න 225 දෙනාටම හෙණ ගහන්න" කියලා මිනිස්සු කියනවා. [බාධා කිරීමක්] ඔව්. සමහර අය කියනවා, පාර්ලිමේන්තුව ගිලා බහින්න ඕනෑය කියා. මේක පුදුම ප්‍රශ්නයක්. දැන් මේ 225 දෙනාම මේවාට වග කියන්න ඕනෑද කියන එකයි අපට තිබෙන ප්‍රශ්නය. මොකද, ඒ විධියට බණින්නේ, ශාප කරන්නේ අපි සියලු දෙනාටමයි. තෙල් මිල වැඩිවීමත් එක්ක දැන් පාසල් වෑන් රථ ගාස්තුවත් ඔවුන් වැඩි කරන්න හදනවා; ත්‍රිරෝද රථ ගාස්තුත් තව රුපියල් 10කින් වැඩි කරන්න හදනවා. එක් ඇමතිවරයකු කියා තිබුණා, තෙල් පරිස්සමින් පාවිච්චි කරන්න කියලා. වතුර කියලා හිතාගෙනද දන්නේ නැහැ, එහෙම කිව්වේ. කෙසේ වෙතත්, මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, පාසල් වෑන් රථවල ගාස්තු වැඩි කිරීම සම්බන්ධව ඔබතුමන්ලා යම් නිර්ණායකයක් හදලා තිබෙනවාද, ඒ සඳහා යම් ක්‍රියාදාමයක් තිබෙනවාද කියලා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, මෙවර ඩීසල් මිල වැඩි වීමක් වෙලා නැහැ. ලංකාවේ පාසල් වෑන් රථ හතළිස්පන්දහසක් පමණ තිබෙනවා. ඒවා නියාමනය කිරීම සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව තමයි ක්‍රියාත්මක වෙන්නේ. මෙවර ඩීසල් මිලෙහි වැඩි වීමක් නැති නිසා මා හිතනවා ඔවුන් ඒ ගාස්තු වැඩි කරන එකක් නැහැ කියලා. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක සම්බන්ධයෙන් අපි එම සංගම් සමඟ සාකච්ඡා කරනවා. ලෝක වෙළෙඳ පොළේ තත්ත්වය අනුව මේ විධියට දිගින් දිගටම ඉන්ධන -තෙල්- මිල වැඩි වෙන්න ගියොත්, ජනතාවට මේ බර නොදැනෙන්න පොදු ප්‍රවාහනය සඳහා සහ මෙවැනි දේවල්වලට යම් කිසි සහනාධාරයක් දෙන්න පුළුවන්ද කියන එක සම්බන්ධයෙන් මා ගරු මුදල් ඇමතිතුමා එක්කත් සාකච්ඡා කළා. ඒ පිළිබඳව වැඩිදුරටත් අපි සාකච්ඡා කරගෙන යනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් LIOC එක ඩීසල් මිල වැඩි කරලා තිබෙනවා. ඒකත් මේ ප්‍රශ්නයට එක පැත්තකින් බලපානවා. භූමිතෙල් රුපියල් විසි ගණනකින් වැඩි වෙලා තිබෙනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

මෙවර -10 වෙනි දා- තෙල් මිල වැඩි කිරීමේදී භූමිතෙල් සහ ඩීසල් මිල වැඩි කළේ නැහැ. රජය එහෙම කළේ සාමාන්‍ය ජනතාව ගැන හිතලායි. භූමිතෙල් දුගී ජනතාව පාවිච්චි කරනවා. ඒ නිසා භූමිතෙල් මිල වැඩි කළේ නැහැ. ඩීසල් මිල වැඩි කළේත් නැහැ. නමුත් මම කලින් කිව්වා වාගේ, මේවායේ මිල දිගින් දිගටම වැඩි වෙනවා නම් සහනාධාරයක් ලබා දීම ගැන අපි සාකච්ඡා කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒකත් එක්කම මම ඔබතුමාගෙන් මේ කාරණයත් අහන්න කැමැතියි.

අපේ බස්වලට විශාල වශයෙන් භූමිතෙල් දමලා තමයි දුවන්නේ. ඒ විතරක් නොවෙයි, සාමාන්‍ය විධියට යන බස් රථය එක වරම කපලා අරගෙන අනෙක් බස් රථය ඉස්සරහින් නවත්වනවා. ඒක කරන්නේ, බස් රථයේ සුක්කානමට power steering කොටසක් සවි කරලා. මේක නවත්වන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න ඔබතුමාට පුළුවන්නම් හොඳයි. මේ හැම බස් රථයකම power steering කොටසක් සවි කරලා තිබෙන නිසා තමයි මේ විධියට එක තැන කපන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒක කරන්න බැරි විධියට වැඩ පිළිවෙළක් හදා දෙන්න පුළුවන් නම් හොඳයි.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා සඳහන් කළ කාරණය පිළිබඳව සොයා බලන්නම්.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී මේ කාරණයත් කියන්න ඕනෑ ඔබතුමා කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී කෙනකු නිසා. ඔබතුමාගේ ප්‍රදේශයටත් අයිතිවන කටුපොත-කුරුණෑගල මාර්ගයේ අපි ඒකාබද්ධ බස් සේවයක් ඇති කළා. මෙතෙක් කල් කටුපොත-කුලියාපිටිය බස් තිබුණේ නැහැ, කටුපොත-කුරුණෑගල බස් විතරයි තිබුණේ. අපි කුරුණෑගල සහ කටුපොත අතර ඒකාබද්ධ බස් සේවයක් ඇති කළා. දැන් ඒකාබද්ධ විපක්ෂයේ නගරාධිපතිවරයෙක් තමයි කුරුණෑගල ඉන්නේ. එතුමාට සම්බන්ධ බස් රථ දෙකක් පමණක් මේකට කැමති නැති නිසා, කුරුණෑගල බස් නැවතුම්පොළට ඒ බස් රථ ඇතුළු වීම තහනම් කරලා තිබෙනවා. ලංකා ගමනාගමන මණ්ඩලයේ සහ පෞද්ගලික බස් රථ ඒ ඒකාබද්ධ සේවයට අයිතියි. එතුමාට සම්බන්ධ බස් රථ දෙකට හෝ තුනට විතරයි බස් නැවතුම්පොළට ඇතුළත් වෙන්න අවසර දීලා තිබෙන්නේ. මෙවැනි වැඩ කරන එක ඉතාම අසාධාරණයි. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, අපි එකතු වෙලා මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ කියලායි. මම රටේ ජනතාවටත් මේ කාරණය කියනවා. ඒ නගරාධිපතිවරයා තනි බලය පාවිච්චි කරලා ඒකාබද්ධ කාලසටහනට දුවපු කුරුණෑගල- කටුපොත බස් සියල්ලම නතර කරලා ඒකාබද්ධ කාලසටහනේ බස් රථ කුරුණෑගල බස් නැවතුම් පොළට ඇතුළු කරන්න දෙන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒක හොඳ තත්ත්වයක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

තව අවස්ථාව දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මෙය රටට වැදගත් ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි, අවසාන වශයෙන් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ක්‍රියාදාමය ගැනීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. දැන් ගොඩක් පළාත් සභා විසිරීගෙන යන්නේ. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, ආණ්ඩුකාරවරු එක්ක හෝ සාකච්ඡා කරලා ඒකාබද්ධ කාලසටහන් ලංකාව පුරා ක්‍රියාත්මක කරන්න කියලා. කරුණාකරලා ඔබතුමා කොහොම හරි මේ වැඩේට අත ගහන්න. දෙන්න පුළුවන් සහයෝගයක් මම නම් දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 13 - 1144/'18-(1), ගරු ඒ.එල්. මුහම්මදු නසීර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 14 - 1182/'18-(1), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## වැව් සංවර්ධනය : කුරුණෑගල දිස්ත්‍රික්කය

குளங்களின் அபிவிருத்தி: குருநாகல் மாவட்டம்
DEVELOPMENT OF TANKS: KURUNEGALA DISTRICT

952/'18

**8. ගරු කේ.කේ. පියදාස මහතා (ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවට)**

(மாண்புமிகு கே. கே. பியதாஸ— மாண்புமிகு துஷார இந்துனில் அமரசேன சார்பாக)

(The Hon. K.K. Piyadasa on behalf of the Hon. Thushara Indunil Amarasena)

වාරිමාර්ග සහ ජලසම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් එක් එක් මැතිවරණ කොට්ඨාසය අනුව කවරේද;

(iii) යහ පාලන රජය බලයට පත්වීමෙන් පසුව මේ දක්වා දිස්ත්‍රික්කයේ දියුණු කරන ලද වැව් හා ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iv) රේඛීය අමාත්‍යාංශය මඟින් වයඹ පළාත් වාරිමාර්ග සංවර්ධනය කිරීමට මෙම වර්ෂය සඳහා රුපියල් මිලියන 400ක් මුදා හැර ඇතත්, අදාළ සංවර්ධන කටයුතු මේ වනතෙක් ආරම්භ කර නොතිබීම හේතුවෙන්, එම මුදල් යළි භාණ්ඩාගාරයට යෑමේ අවදානමක් මතු වී ඇති බව දන්නේද;

(v) එසේ නම්, එම මුදල් දිස්ත්‍රික්කයේ වැව් සංවර්ධනය සඳහා යොදා ගැනීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்திலுள்ள குளங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி குளங்களின் பெயர்கள் ஒவ்வொரு தேர்தல் தொகுதி வாரியாக யாவை என்பதையும்;

(iii) நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர் இதுவரை மாவட்டத்தில் அபிவிருத்தி செய்யப் பட்ட குளங்கள் மற்றும் அதற்காக செலவிடப் பட்ட தொகை யாது என்பதையும்;

(iv) நிரல் அமைச்சின் மூலம் வடமேல் மாகாண நீர்ப்பாசன அபிவிருத்திக்காக இந்த ஆண்டிற்கு ரூபா 400 மில்லியன் விடுவிக்கப்பட்டுள்ள போதிலும், குறித்த அபிவிருத்திப் பணிகள் இதுவரை ஆரம்பிக்கப்படாத காரணத்தினால், குறித்த பணத் தொகை திறைசேரிக்கு திரும்பிச் செல்லும் ஆபத்து தோன்றியுள்ளதை அறிவாரா என்பதையும்;

(v) ஆமெனின், மேற்படி பணத்தை மாவட்டத்தி லுள்ள குளங்களை அபிவிருத்தி செய்வதற்குப் பயன்படுத்த அமைச்சு எடுக்கும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources and Disaster Management:

(a) Will he inform this House-

(i) the number of tanks in the Kurunegala District;

(ii) the names of the aforesaid tanks as per the electorates;

(iii) the tanks that have been developed in the district since the Government of Good Governance came into power and the amount of money spent for it;

(iv) whether he is aware that though 400 million rupees has been released for this year by the line Ministry for the development of irrigation in the North Western Province, the relevant development work has not commenced yet and there has arisen a risk of the aforesaid money being transferred to the Treasury again; and

(v) if so, the steps to be taken by the Ministry to utilize the aforesaid money for the development of the tanks in the area?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරිමාර්ග සහ ජලසම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පාලනය වන වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වැව් 18ක් සහ අමුණු 08ක් ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පාලනය වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ග්‍රාමීය වැව් 5,039ක් සහ අමුණු 943ක් ඇත.

(ii) *ඇමුණුම - 01 (i) හා 01 (ii) මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) අදාළ වැව් *ඇමුණුම - 01 මඟින් ඉදිරිපත් කර ඇති අතර, වියදම් *ඇමුණුම - 02 (i), 02 (ii), 02 (iii) මඟින් ඉදිරිපත් කර ඇත.

(iv) පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අදාළ වේ.

(v) ඉහත (iv) පිළිතුර අනුව අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 9-960/'18-(2), ගරු මයන්ත දිසානායක මහතා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රාජාංගනය වැව : ප්‍රතිසංස්කරණය
## இராஜாங்கனைக் குளம்: புனர்நிர்மாணம்
## RAJANGANAYA TANK: RENOVATION

972/'18

**10. ගරු කේ.කේ. පියදාස මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கே.கே. பியதாஸ - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. K.K. Piyadasa on behalf of the Hon. Ishak Rahuman)

වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි රාජාංගනය වැව, උතුරු මැද පළාතේ පිහිටා ඇති විශාල වැව්වලින් එකක් බවත්;

(ii) දැනට මෙම වැවේ, වැව් ඉවුර සහ ඇළ වේලි ඇතුළු වාරිමාර්ග පද්ධති සියල්ලම දීර්ඝ කාලයක් ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් අබලන් වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) මෙම වැව කඩිනමින් ප්‍රතිසංස්කරණය කර ගොවි ජනතාවගේ සුබ සිද්ධිය සඳහා පවරා දෙනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அனுராதபுரம் மாவட்டத்தில் அமைந்துள்ள இராஜாங்கனைக் குளம், வடமத்திய மாகாணத்திலுள்ள பாரிய குளங்களில் ஒன்று என்பதையும்;

(ii) தற்பொழுது மேற்படி குளத்தின் குளக்கரை மற்றும் கால்வாய் அணை போன்றன உள்ளடங்கலான நீர்ப்பாசனக் கட்டமைப்புகள் யாவும் நீண்டகாலமாகப் பராமரிக்கப்படாமையின் காரணமாகச் சேதமடைந்துள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மேற்படி குளத்தைத் துரிதமாகப் புனர்நிர்மாணம் செய்து விவசாயிகளின் பயன்பாட்டிற்குக் கையளிக்கப்படும் தினம் யாதென்பதை இச்சபைக்கு அவர் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources & Disaster Management:

(a) Is he aware that -

(i) the Rajanganya Tank, which is situated in Anuradhapura District, is one of the largest tanks in the North Central Province;

(ii) all the irrigation systems of this tank including the bank and the dams of this tank are in a dilapidated condition at present due to the fact that they have not been maintained for a long period of time?

(b) Will he inform this House the date on which this tank will be commissioned for the benefit of farming community having renovated it expeditiously?

(c) If not, why

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රාජාංගනය වැව උතුරු මැද පළාතේ වැව්වලින් එකකි.

(ii) රාජාංගනය ව්‍යාපාරයේ රාජාංගන වැවේ වැව් බැම්ම ඇතුළු වාරි පද්ධති මෑත කාලයේදී ප්‍රතිසංස්කරණය කර ඇත. මෑතකදී සිදු කරන ලද අලුත්වැඩියා පිළිබඳ *ඇමුණුම් 01 මඟින් ඉදිරිපත් කර ඇත.

(ආ) ප්‍රමුඛත්වය අනුව අත්‍යවශ්‍ය අංග සියල්ලම පුනරුත්ථාපනය කර ඇත. අවශ්‍යතාව පරිදි ප්‍රමුඛතාව අනුව රාජාංගනය ව්‍යාපාරයේ වාර්ෂික නඩත්තු කටයුතු ද සිදු කරනු ලබයි. දැනටමත් රාජාංගනය ව්‍යාපාරයේ ගොවිතැන් කටයුතු සතුටුදායක ලෙස සිදු කරනු ලබයි.

(ඇ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 13-1144/'18-(1), ගරු ඒ.එල්. මුහම්මදු නසීර් මහතා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඒ.එල්. මුහම්මදු නසීර් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය : නිල වාහන

தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சரின் பிரத்தியேகப் பதவியணி: உத்தியோகபூர்வ வாகனங்கள்

PRIVATE STAFF OF MINISTER OF POST, POSTAL SERVICES AND MUSLIM RELIGIOUS AFFAIRS: OFFICIAL VEHICLES

1182/'18

**14. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු බිමල් රත්නායක මහතා වෙනුවට)**

(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு பிமல் ரத்நாயக்க சார்பாக)

(The Hon. Nihal Galappaththi on behalf of the Hon. Bimal Rathnayake)

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියා පදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சரின் பிரத்தியேக பதவியணிக்கு இணைக்கப்பட்டுள்ள உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஒவ்வோர் உத்தியோத்தரதும் பெயர், பதவி, ஒதுக்கப்பட்டுள்ள வாகனத்தின் வகை, பதிவிலக்கம் மற்றும் அவ்விதம் ஒதுக்குவதற்கு அங்கீகாரம் வழங்கியது யார் என்பதை வெவ்வேறாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Post, Postal Services and Muslim Religious Affairs:

(a) Will he inform this House separately the name and designation of each officer who is attached to the private staff of the of Post, Postal Services and Muslim Religious Affairs who have been allocated a vehicle, along with details on the type of vehicle allocated to them, registration number and the name of the officer who authorized such allocation of a vehicle?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) ඔව්.

ගරු තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර ඇති වාහන පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනය

| නිලධාරියාගේ නම | තනතුර | වෙන් කළ වාහනයේ වර්ගය | ලියා පදිංචි අංකය | අනුමැතිය ලබා දුන් නිලධාරියා |
|---|---|---|---|---|
| එම්.එච්.එම්. ෆාහිම් මහතා | ගරු අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් | Discovery 4 | CAB - 9854 | අමාත්‍යාංශ ලේකම් ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මහතා |
| පී.එම්.ජී.එම්.ආර්. මලික් මහතා | ගරු අමාත්‍යතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරි | Toyota Cab | PF - 6385 | අමාත්‍යාංශ ලේකම් ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මහතා |
| එම්.එච්. මුයිනුදීන් මහතා | ගරු අමාත්‍යතුමාගේ උපදේශක | Mitsubishi Cab | PG - 9881 | අමාත්‍යාංශ ලේකම් ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මහතා |
| එම්.එච්.එම්. රාෂි මහතා | ගරු අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම් | Nissan Sylphy | KY -5537 | අමාත්‍යාංශයේ හිටපු ලේකම් ඩී.ජී.එම්.වී. හපුආරච්චි මහතා |
| බී.ඒ.වී.එම්. රමීම් මහතා | ගරු අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම් | Nissan Sylphy | KY - 5534 | අමාත්‍යාංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් පී.එල්. පත්මකුමාර මහතා |
| ජෙරල්ඩ් රිබේරා මහතා | ගරු අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම් | Toyota Cab | PF - 6386 | අමාත්‍යාංශයේ හිටපු ලේකම් විමලසිරි පෙරේරා මහතා |

(ආ) අදාළ නොවේ.

# ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ තෙල් ටැංකි ඉන්දියානු තෙල් සමාගමට පැවරීම : ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## திருகோணமலை எண்ணெய்க் குதத்திலுள்ள எண்ணெய்த் தாங்கிகளை இந்திய எரிபொருள் கம்பனியிடம் ஒப்படைத்தல் : பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சரினது கூற்று

## HANDOVER OF OIL TANKS AT TRINCOMALEE OIL TANK FARM TO INDIAN OIL COMPANY: STATEMENT BY MINISTER OF PETROLEUM RESOURCES DEVELOPMENT

**ගරු අර්ජුන රණතුංග මහතා (ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Petroleum Resources Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විසින් 2018.09.21 දින අසන ලද ප්‍රශ්නයට මා අද පිළිතුරු ලබා දෙනවා.

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය පිළිබඳව 2018.07.13 දිනැති අංක 18/1602/831/016 අමාත්‍ය මණ්ඩල සංදේශය 2018.08.07 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී සලකා බලා පහත පරිදි ප්‍රතිපත්ති තීරණයක් ගෙන ඇත.

1. පහළ කොටසේ පිහිටි ටැංකි සංකීර්ණයේ තිබෙන ලංකා ඉන්දියන් ඔයිල් සමාගම විසින් දැනට භාවිතයට ගනු ලබන ටැංකි 15, අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාල සීමාවකට යටත්ව ලංකා ඉන්දියන් ඔයිල් පීඑල්සී සමාගමට භාවිත කිරීමට බලය දීම;

   ත්‍රිකුණාමලයේ ඉහළ කොටසේ පිහිටි ටැංකි සංකීර්ණයේ තිබෙන ටැංකි 85, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඉන්දියන් ඔයිල් පීඑල්සී සමාගම විසින් ඒකාබද්ධව සංවර්ධනය කිරීම උදෙසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඉන්දියන් ඔයිල් පීඑල්සී සමාගම අතර උප සමාගමක් පිහිටුවීම;

   ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ප්‍රමුඛත්වය දක්වන ඉහළ ටැංකි සංකීර්ණයේ තිබෙන ටැංකි 16ක් එකී උප සමාගම විසින් සංවර්ධනය කර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් ම භාවිතය සඳහා භාරදීම;

   ත්‍රිකුණාමලයේ ඉහළ කොටසේ ටැංකි සංකීර්ණයේ තිබෙන ඉතිරි ටැංකි 69, අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාල සීමාවකට යටත්ව ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තයේ ඒකාබද්ධ ව්‍යාපාරික ආකෘතියක් වශයෙන් එකඟත්වය මත එකී උප සමාගම විසින් සංවර්ධනය කර භාවිතයට ගැනීම;

   ත්‍රිකුණාමලයේ පහළ සහ ඉහළ ටැංකි සංකීර්ණ පිහිටි ඉඩම්වල අයිතිය දැනටමත් ඇති පරිදි ශ්‍රී ලංකා රජය වෙත තබා ගැනීම;

   ත්‍රිකුණාමලයේ පහළ හා ඉහළ ටැංකි සංකීර්ණයේ පහසුකම් පිළිවෙළින් ලංකා ඉන්දියන් ඔයිල් පීඑල්සී සමාගමට හා **ඉහත** II ඡේදයේ සඳහන් පරිදි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඉන්දියන් ඔයිල් පීඑල්සී සමාගම අතර ස්ථාපිත කිරීමට නියමිත උප සමාගමට බදු දීම පිණිස නව ගිවිසුමක් ගරු නීතිපතිතුමාගේ අනුමැතියට යටත්ව අත්සන් කිරීම සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම, ශ්‍රී ලංකා රජය හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2003 පෙබරවාරි මස 07 දින අත්සන් කරන ලද ගිවිසුම එකී නව ගිවිසුම දිනයේ සිට අහෝසි කිරීම.

2. එවැනි තීරණයක් ගෙන නොමැත.

3. අදාළ නොවේ.

4. මෙම තෙල් ටැංකි සංකීර්ණය පිහිටි ඉඩමේ අයිතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව නොමැති අතර, එම අයිතිය ශ්‍රී ලංකා රජය සතු බව නීතිපතිතුමා විසින් පැහැදිලි කොට ඇත. එහෙයින් මෙම තෙල් ටැංකි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පවරා ගැනීම සම්බන්ධව ප්‍රතිපත්ති තීරණයක් රජය විසින් ගත යුතුය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි 2002දී තමයි මේ ගිවිසුම අත්සන් කර තිබෙන්නේ. නමුත්, ඒ ගිවිසුමේ බදු ගිවිසුම අත්සන් කරලා නැහැ. මෙතෙක් කල් මේ සංවර්ධන කටයුතු කරලා නැහැ. නමුත්, මේ ටැංකි ටික ආරක්ෂා වෙලා තිබෙනවා, ඒ කාලයේ ඉන්දියන් ඔයිල් සමාගමට භාර දීමෙන්. අපි මේ ටැංකි පරීක්ෂා කර බලද්දි පෙනී ගියා, මේ ටැංකි දැනට පාවිච්චියට ගන්න පුළුවන්කමක් නැහැයි කියලා. ඒ හින්දා තමයි අපි මේ තීරණය ගත්තේ. තෙල් ටැංකි එකක්වත් නැතිව සිටි අපි තෙල් ටැංකි 16ක් අරගෙන උප සමාගමක් මඟින් ඒවා සංවර්ධනය කළා, අපට මුදල් නැති හින්දා. එලෙස තෙල් ටැංකි අරගෙන සංවර්ධන කටයුතුවලට යන්න අපි තීරණය කළා.

මේ ප්‍රශ්නය යොමු කිරීම ගැන මම විශේෂයෙන් අනුර දිසානායක මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම, අපි ඔබතුමන්ලාට තවත් කරුණක් කියන්න ඕනෑ. ඔබතුමන්ලා මේ අසත්‍ය දේවල් ප්‍රචාරය කරන්න එපා. ජාතික ඇඳුම අදින, රට ගැන කථා කරන එක්කෙනෙක් මේ සම්පත් හොරෙන් දෙනවා කියලා මාධ්‍යයෙන් මටත් ඊයේ මඩ ගහලා තිබුණු හැටි මම දැක්කා.

මේවා හොරොන් දීලා නැහැ. අපට අයිතියක් නැති දෙයක් අපි ලබා ගෙන තිබෙනවා. මා ජාතික ඇඳුම ඇඳගෙන තමයි හැම තැනම ඉන්නේ. මම කලිසම් ඇඳගෙන යන කෙනෙක් නොවෙයි. ඒ වාගේ මඩ ව්‍යාපාර, බොරු ව්‍යාපාර කරන්න එපා කියා මම ඉල්ලා සිටිනවා. මගේම ඉස්කෝලයට ගිය, ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරයෙක් මාධ්‍ය සාකච්ඡාවකදී ඉතාම නරක විධියට එසේ කියා තිබෙනවා. ඒ වාගේ බොරු ප්‍රචාරය කරන්න එපා. මොකද, එයින් විනාශය සිදු වන්නේ මේ රටටයි. පාවිච්චි කරන්න බැරි ටැංකි ටිකක් අපට ලබාගෙන අප කටයුතු කරන්න හදන කොට එයට විරුද්ධ වෙන්න එපා, කුහක වෙන්න එපා කියලා මා ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොඩි ප්‍රශ්නයක් අහන්න ඉඩ දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒ සඳහා ඉඩ දෙන්න බැහැ. බොහොම කනගාටුයි. මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේ දී යෝජනා පිළිබඳ දැනුම් දීම, ගරු පාර්ලිමේන්තුවේ සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the Government Business shall have precedence this day."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

### I

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of the Standing Order No.8 of the Parliament and the motion agreed to by Parliament on 20.06.2018, the hours of sitting of Parliament of this day shall be 10.00 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 7.30 p.m. At 1.30 p.m. Standing Order No. 8(5) of the Parliament shall operate. At 7.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 10.00 a.m. on Thursday 25th October, 2018."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම. අද දින සලකා බැලීමට නියමිත, න්‍යාය පත්‍රයේ විෂය අංක 32 ලෙස සඳහන් පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) නමැති පනත් කෙටුම්පත 2018 මැයි 09වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව 2018 ජුනි මස 22වන දා සහ ජූලි මස 19 යන දිනයන්හි නෛතික කටයුතු දූෂණ විරෝධී සහ මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී සලකා බලා ඒ සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව 2018 අගෝස්තු 07වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද බව මෙම ගරු සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා.

## පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත
## விசாரணை ஆணைக்குழுக்கள் (திருத்தச்) சட்டமூலம்
## COMMISSIONS OF INQUIRY (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කර විවාද කිරීම අද දින සිදු වන බව දැන් දැනුම් දුන්නා. මේ පිළිබඳව ගරු සභානායකතුමාගේත් අවධානය යොමු කරවන්න කැමැතියි. දැන් එයට සංශෝධන රාශියක් ඉදිරිපත් කර තිබෙනවා. එම සංශෝධන අපට අද උදේ ලැබී තිබෙනවා. මේ පනත් කෙටුම්පත පිළිබඳ විවාද කිරීමට යළිත් දවසක් අපට ලබා දී, ඒ දවසට ඡන්ද විමසීම සිදු කරන්න පුළුවන්ද කියා මා ගරු සභානායකතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ ගැන විවාද කරලා ඡන්දයක් පවත්වන්නේ නැතිව විවාදය කල් දමලා, ඊළඟ දිනයේ දී නැවත විවාද කරලා ඡන්දය ගන්න අපි පක්ෂ නායක රැස්වීමේ දී එකඟ වුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, එය ආපසු දිනයක ගන්නවා කියා එදා රැස්වීමේදී තීරණයක් ගත්තා. ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමනි, ඔබතුමා කතා කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, මෙහි සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ. තිබෙන විධියටයි යන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
No, there are some amendments-[*Interruption.*]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Are you suggesting amendments? [*Interruption.*] I will consider your amendments also.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අවස්ථාව.

[පූ.භා. 11.07]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරීක්ෂණ කොමිෂන් සභා පනතට සංශෝධන කිහිපයක් අද දින ඉදිරිපත් කරනවා . පරීක්ෂණ කොමිෂන් සභා පනත 1948 අංක 17 දරන පනතින් තමයි සංස්ථාපිත වෙලා තිබෙන්නේ. මේ පනත වරින් වර සංශෝධනය වෙලා තිබෙනවා. 1950 අංක 8 දරන සංශෝධන පනතෙන්, 1953 අංක 40 දරන සංශෝධන පනතෙන්, 1955 අංක 8 දරන සංශෝධන පනතෙන්, 1955 අංක 29 දරන සංශෝධන පනතෙන් සහ 2008 අංක 16 දරන පනත මගින් සංශෝධනයට ලක් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම නීතිය රටට හඳුන්වා දීලා තිබෙන්නේ රජයේ ආයතනවල ක්‍රියාත්මක වන යන්ත්‍රණයන් වංචාවෙන්, දූෂණයෙන් තොරව නීතියේ ආධිපත්‍ය ආරක්ෂා වන විධියට ජනතාවගේ උපරිම යහපත වෙනුවෙන් සියලු කටයුතු කිරීම තහවුරු කරන්නයි. යම් අවස්ථාවකදී රාජ්‍ය ආයතනයක, දෙපාර්තමේන්තුවක, අමාත්‍යාංශයක, පළාත් පාලන ආයතනයක, එහෙමත් නැත්නම් රජයට අයත් සමාගමක හෝ සංස්ථාවක, මණ්ඩලයක වැනි කුමන හෝ ආයතනයක යම්කිසි දූෂණයක් සිද්ධ වෙලා තිබෙනවා නම්, බලය අයථා ලෙස කවුරුන් හෝ භාවිත කරලා තිබෙනවා නම්, එමගින් රජයට, ජනතාවට හානියක්, පාඩුවක් වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳව කාරණා සොයා බලන්න fact-finding mission එකක් විධියට, කරුණු ගවේෂණය කර අනාවරණය කර ගැනීමේ යන්ත්‍රණයක් විධියට තමයි මෙම පනත 1948 නිදහස ලබපු අවුරුද්දේ පටන් අපේ රටේ ස්ථාපිත කරලා ක්‍රියාත්මක වෙන්නේ. එතකොට මේ වාගේ නිශ්චිත කාරණයක් හඳුනා ගත්තාට පස්සේ ඒ සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීමේ බලය ජනාධිපතිතුමාට පැවරෙනවා. මේ හා සමාන තවත් පනතක් පසුකාලයක අපේ රටට හඳුන්වා දුන්නා. ඒ, 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව. එම විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත සහ මේ කොමිෂන් සභා පනත අතර පැහැදිලි වෙනසක් තිබෙනවා. පරීක්ෂණ කොමිෂන් සභාවේ හෙළිදරව් වන තොරතුරු භාවිත කරලා යම් නිර්දේශයක් කිරීම මිස ඉන් ඔබ්බට ඒ කොමිසමට බලයක් නැහැ. ඒ නිර්දේශ මත රජයේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට, නීතිපති දෙපාර්තමේන්තුවට බලය ලැබෙනවා, නීතිමය පියවර ගන්න.

විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ ඉන් ඔබ්බට ගිය වැඩිපුර බලතල රාශියක් තිබෙනවා. යම් යම් අයට දඬුවම් කිරීමට පවා කරන නිර්දේශ පාර්ලිමේන්තුව මඟින් සහ අධිකරණය මඟින් ක්‍රියාත්මක කරගැනීමේ ක්‍රමවේදයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමානයේ පැනනැඟී තිබෙන ප්‍රශ්නය තමයි, මෙවැනි කටයුත්තක්, චෝදනාවක්, නීති විරෝධී දෙයක් සම්බන්ධව සිදු කරන ලද පරීක්ෂණයකදී යම් යම් කරුණු හෙළිදරව් වුණත්, නීතිය ක්‍රියාත්මක කරන ආයතනයට ඒ මත විශ්වාසය තබලා නඩු පැවරීමේ කටයුත්තක් කරන්න බැහැ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙන්න පුළුවන්, පොලීසිය වෙන්න පුළුවන්, එම කාරණය පිළිබඳව ප්‍රමාණවත් කරුණු කොමිෂන් සභාවකින් හෙළිදරව් කරලා තහවුරු කර තිබුණා වුණත්, ඒවා පදනම් කරගෙන අධිකරණයේ නඩුවක් ගොනු කිරීමේ හැකියාව නැහැ. ඒ නිසා පොලීසියට සිද්ධ වනවා, එම කටයුත්ත පිළිබඳව නැවත අලුතෙන් විමර්ශන ආරම්භ කරන්න. වෙනම විමර්ශනයක් ආරම්භ කරලා එම කරුණු යොදා ගත්තා වුණත්, පරීක්ෂණය ස්වාධීනව වෙනම පරීක්ෂණයක් විධියට සිද්ධ වනවා. එහෙම පරීක්ෂණයක් කරලා කරුණු අනාවරණය වුණොත්, අධිකරණය ඉදිරියට ගිහිල්ලා ඔප්පු කරන්න පුළුවන් ප්‍රමාණවත් සාක්ෂි පවතින අපරාධයක් සිදුවෙලා තිබෙනවා කියලා නඩු පැවරීමක් කරන්න පුළුවන්.

මේ එකම ක්‍රියාදාමය, එකම අපරාධය සම්බන්ධව රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක වීමේ දී මේ පිළිබඳව දෙවතාවක් සොයා බලන්න ඕනෑ; පරීක්ෂණ කරන්න ඕනෑ; නිරීක්ෂණ කරන්න ඕනෑ. මෙය අඩුපාඩුවක් කියලා දැක්කේ මීට බොහෝ කලකට පෙර. එම නිසා, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට 2008 අංක 16 කියලා සංශෝධන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. 2008 අංක 16 දරන පනතින් අද අපි කොමිෂන් සභා පනතට හඳුන්වා දෙනු ලබන සංශෝධනයට සමාන සංශෝධනයක් මේ පාර්ලිමේන්තුව විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ඉදිරිපත් කරනු ලැබූ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ යුතුව තිබුණේ ගරු අධිකරණ ඇමතිතුමිය විසිනුයි. අධිකරණ ඇමතිතුමිය අද මේ සභාවේ නැහැ. ගරු උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිතුමා මෙය ඉදිරිපත් කිරීම සම්බන්ධව අපට කිසිම ගැටලුවක් නැහැ. එතුමා ඒක ඉදිරිපත් කිරීම ගැන නොවෙයි මම මේ අහන්නේ. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ යුතු අධිකරණ ඇමතිතුමිය සභාවේත් නැතිව, එය වෙනත් ඇමතිවරයකු විසින් ඉදිරිපත් කිරීම පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඒ සම්බන්ධව කරුණු පැහැදිලි කිරීමක් මම ඔබතුමාගෙන් බලාපොරොත්තු වනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මම ඒ ගැන පැහැදිලි කරන්නද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පැහැදිලි කරන්න, ගරු ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මේ විෂයය අයිති වන්නේ අතිගරු ජනාධිපතිතුමාටයි. පරීක්ෂණ කොමිෂන් සභා, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා, අල්ලස් දෙපාර්තමේන්තුව වැනි ස්වාධීනව කටයුතු කරන ආයතනවල විෂයය භාර ඇමතිතුමා වශයෙන් කටයුතු කරන්නේ අතිගරු ජනාධිපතිතුමායි. එතුමා වෙනුවෙන් තමයි, මේ පනත් කෙටුම්පත දෙවන වර කියවීම සඳහා අද දිනයේ ඉදිරිපත් කරන්නේ. එහෙම නැතිව, අධිකරණ ඇමතිතුමිය වෙනුවෙන් නොවෙයි. ආණ්ඩුව වෙනුවෙන් තමයි. නමුත්, මෙය ඉදිරිපත් කරන්න ඕනෑම අමාත්‍යවරයකුට පුළුවන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් මේ සම්බන්ධව කාරණයක් කියන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ මොකක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන එක ගැන අපට ගැටලුවක් නැහැ. නමුත්, අධිකරණ කටයුතු සඳහා විෂයය භාර ඇමතිවරයෙක් සිටිනවා නම්, අධිකරණ විෂයය භාර ඇමතිවරයා හෝ ඇමතිතුමිය මේ ගරු සභාවේ ඉඳගෙන මෙය පැහැදිලි කරන්න උදව් වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මේක ඔබතුමාගේ විෂයය නොවෙයි. ඔබතුමා ජනාධිපතිවරයාගේ උප ජනාධිපතිවරයාත් නොවෙයි. ඔබතුමා උදව්වක් කරන එක අපි අගය කරනවා. නමුත්, සම්ප්‍රදායය වෙනස් කරලා කටයුතු කරන එක වැරැදියි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා වැරැදි වැටහීමකින් මේ තර්කය ඉදිරිපත් කරන්නේ. Commission to Investigate Allegations of Bribery or Corruption අධිකරණ අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් වෙනවාය කියා ඔබතුමා කියනවාද? මට එය පෙන්වා දෙන්න. මොන පනත යටතේද එය අධිකරණ අමාත්‍යාංශයේ විෂය පථයට අයිති වන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හුඟක් දේවල් ජනාධිපතිතුමාගේ විෂය පථයට අයිති වෙලා තිබෙනවා. ඔබතුමා දන්නවා, මේ පනත අධිකරණය හරහා ගමන් කළ යුතු පනතක් බව.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
අධිකරණය හරහා තමයි නීතියේ කොයි දේත් ක්‍රියාත්මක වෙන්නේ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෑම ඇමතිවරයකුටම තමන්ට අයිති විෂයයන් ගැසට් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ විෂයය අධිකරණ අමාත්‍යාංශයට අයිති විෂයයක් හැටියට කොතැන හෝ ගැසට් කර තිබෙනවාය කියා ඔබතුමා පෙන්වන්න කෝ. එහෙම තිබෙන්නේ කොයි ගැසට් එකේද කියා කියන්න. එහෙම ගැසට් කරන්නේ නැහැ. [බාධා කිරීමක්] මට අයිතියි කියා ගැසට් කර නැහැ. එම නිසායි, ජනාධිපතිතුමාගේ විෂයයට අයිති මේ පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සඳහා මම ඉදිරිපත් කරන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වේ මොකක්ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ යම් කටයුතු මේ ගරු සභාව ඉදිරියට ගෙන ආ හැම වෙලාවේම, ඒවා ගෙනාවේ අධිකරණ ඇමතිතුමායි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එහෙම ගෙනැත් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා අධිකරණ ඇමතිවරයා හැටියට කටයුතු කළ කාලයේත් එහෙමයි නේ, කළේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එහෙම කිසිම බාධාවක්, සීමාවක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කැබිනට් මණ්ඩලය අනුමත කළ පනත් කෙටුම්පතක් කැබිනට් මණ්ඩලයේ ඕනෑම ඇමතිවරයකුට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි මෙහි තිබෙන සුවිශේෂීභාවය තමයි, මේක කිසිම ඇමතිවරයකුට වෙන් කළ විෂයයක් නොවන එක. ඔබතුමා අය වැය ලේඛනය බලන්න, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වැය ශීර්ෂය එන්නේත් අතිගරු ජනාධිපතිතුමා යටතේයි. ඒවා ස්වාධීන ආයතනයි. ඒවා අමාත්‍යවරු පාලනය කරන ආයතන නොවෙයි. මේ රටේ ඉන්න කිසිම අමාත්‍යවරයකුට, "අසවල් දෙය කරන්න" කියා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට නියෝගයක් දෙන්න බලයක් නැහැ. ඒක ස්වාධීන ආයතනයක්. ඒ ස්වාධීන ආයතනය වෙනුවෙන් අපේ රටේ වග කිවයුත්තේ මේ රටේ ප්‍රධාන පුරවැසියා වන අතිගරු ජනාධිපතිතුමායි. මේක එතුමා වෙනුවෙන් ඉදිරිපත් කළ පනත් කෙටුම්පතක්. කැබිනට්

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

මණ්ඩලයේ ඕනෑම ඇමතිවරයකුට එතුමා වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවට එය ඉදිරිපත් කරන්න පුළුවන්. එහි කිසි ගැටලුවක් නැහැ; කොහේවත් බාධාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනතට මෙතුමන්ලාගේ විරෝධතාවයක් තිබෙනවාද, නැද්ද කියා මම දන්නේ නැහැ. මොකද, නීතියේ ආධිපත්‍යය පිහිටුවන්න ඕනෑය කියන එක මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනාම හැම දාම කථා කරන මාතෘකාවක්. ඒ සඳහා නීතියේ තිබෙන අඩු පාඩුවක්, දුර්වල තැනක් නිවැරැදි කර ගන්න උත්සාහ කරනකොට ඔබතුමන්ලා ඒකට විරුද්ධ වෙනවා නම් ඒක ඔබතුමන්ලාගේ තීරණයක්. ඒක මට ප්‍රශ්නයක් නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
Procedure එක ගැනයි අප කිව්වේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Procedure එකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. ගරු ජනාධිපතිතුමා වෙනුවෙන් එතුමා විසින් පවරනු ලබන ඕනෑම ඇමතිවරයකුට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න පුළුවන්. මොකද, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අතිගරු ජනාධිපතිතුමාට මේ පාර්ලිමේන්තුවට ඇවිත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න බැහැ, ඒකයි සාමාන්‍ය සම්ප්‍රදායය.

ඔබතුමන්ලාට මතක ඇති, මීට පෙරත් ජනාධිපතිතුමාගේ විෂයයන් සම්බන්ධව අපි සංශෝධන කිහිපයක් ගෙනා බව. ඒ කියන්නේ, ජනාධිපතිතුමා යටතේ තිබෙන ආරක්ෂක අමාත්‍යාංශය සම්බන්ධ කාරණයක්වත්, පරිසර අමාත්‍යාංශය සම්බන්ධ කාරණයක්වත් නොවෙයි. ස්වාධීන කොමිෂන් සභාවල ඒවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් කටයුත්තක් තිබෙනවා නම් ඒ සියල්ල ජනාධිපතිතුමාගේ විෂයයන් විධියටයි සැලකෙන්නේ. ඒවා ජනාධිපතිතුමාගේ නාමයෙන් තමයි අප ඉදිරිපත් කරන්නේ. ඒවා ස්වාධීන ආයතන විධියට තමයි තිබෙන්නේ. නමුත් ඒ වෙනුවෙන් නීතිමය කටයුතු කිරීමේ බලය තිබෙන්නේ මේ රටේ ජනාධිපතිතුමාටයි. ඒක 1978 මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වුණු පළමුවැනි දවසේ සිට තිබෙන ක්‍රමයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉදිරිපත් කරමින් සිටියේ මේ කාරණයයි. මේ වාගේ පරීක්ෂණ කටයුත්තක් නීත්‍යානුකූලව සිදු වෙලා සාක්ෂි ලබාගෙන, සියලු සාක්ෂි පැහැදිලි ලෙස අනාවරණය කරගෙන තිබියදීත්, නීතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී තිබෙන බාධකය තමයි, නැවතත් පරීක්ෂණයක් සිදු කරන්න අපි මෙය වළක්වාගන්න ඕනෑය කියන පදනම මත, [බාධා කිරීමක්]

ඔබතුමන්ලාට මතක ඇති, 2008 වසරේ මීට සමාන,- [බාධා කිරීමක්]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(මාණ්පුමිකු சிசிர ஜயකොඩි)
(The Hon. Sisira Jayakody)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர් அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සිසිර ජයකොඩි මහතා**
(මාණ්පුමිකු சிசிர ஜயකොඩි)
(The Hon. Sisira Jayakody)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍ය, ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා සභාව නොමඟ යවන ප්‍රකාශයක් මේ අවස්ථාවේ කරන නිසා, එය නිවැරැදි කිරීම සඳහායි අපි ඉදිරිපත් වෙන්නේ. මේ කොමිෂන් සභාවේ කටයුතු සාක්ෂි ආඥාපනත අනුව සිද්ධ කරනවාය කියා එතුමා කියනවා. එතුමා ජනාධිපති නීතිඥවරයෙක්. මේ කොමිෂන් සභාවේ වාර්තා අධිකරණමය කරුණුයි කියා එතුමා සලකන එක පිළිබඳව අප ඉතාම කනගාටු වෙනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා නිකරුණේ කාලය කා දැමීමක් මේ කරන්නේ.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(මාණ්පුමිකු சிசிர ஜயකොඩි)
(The Hon. Sisira Jayakody)
ප්‍රශ්නය පැහැදිලි කරන්නයි, මම ඉල්ලීම කරන්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැන point of Order එකක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, කථා කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය මේ පාර්ලිමේන්තුවට අලුත් දෙයක් නොවෙයි. අද මේ පිළිබඳව විපක්ෂයේ සිට ප්‍රශ්න මතු කළ ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාත් දන්නවා. එතුමන්ලාත් මේ සම්බන්ධයෙන් 2008 අංක,- [බාධා කිරීමක්]- ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක පාර්ලිමේන්තුවක්ද, මාළු කඩයක්ද, නැත්නම් මස් කඩයක්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමනි, කරුණාකර ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න. Hon. Minister, you continue.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
There must be decorum in Parliament. School children are watching; the whole country is watching. What is this nonsense? They should know how to behave in Parliament as Parliamentarians. They cannot conduct like goons. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධව විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතට සංශෝධනයක්

ඉදිරිපත් කළා. ඒ 2008 අංක 16 දරන සංශෝධනයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන් ඒක කියවන්නම්.

> "Notwithstanding anything to the contrary in the Code of Criminal Procedure Act, No. 15 of 1979 or any other law, it shall be lawful for the Attorney-General to institute criminal proceedings in a court of law in respect of any offence based on material collected in the course of ah investigation or inquiry or both an investigation and inquiry, as the case may be, by a Commission-"

විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට දීපු සංශෝධනයේ පැහැදිලිව කියනවා, ඒ කොමිෂන් සභාවේදී අනාවරණය වුණු සාක්ෂි මත, වෙනත් පරීක්ෂණයක් නොකර වුණත්, සෘජු ලෙස ඒ පිළිබඳව විශ්වාසය තබලා නීතිපතිවරයාට නඩු කටයුත්තක් අධිකරණයට ඉදිරිපත් කරන්න පුළුවන් කියා. ඒ එක්කම, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙන් හෙළිදරව් වූ කරුණු පිළිබඳව නීතිපතිවරයා සහ පොලීසිය සැහීමකට පත් වෙන්නේ නැත්නම්, ඒවාත් පදනම් කරගෙන තවදුරටත් සාක්ෂි අනාවරණය කර ගැනීම තුළින් නඩු පැවරීමේ බලය නීතිපතිවරයාට දීලා තිබෙනවා. අද දින අපි පරීක්ෂණ කොමිෂන් සභා පනතට ඉදිරිපත් කළ සංශෝධනයත් ඒකමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකේ කිසි වෙනසක් නැහැ. වෙනස තිබෙන්නේ මෙතැනයි. විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ මතුවන කරුණුවලින් නඩු පැවරීමේ බලය තිබෙන්නේ නීතිපතිවරයාටයි. මෙම පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේත් හෙළිදරව් වූ කරුණු සම්බන්ධව නඩු පැවරීමේ බලය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ ගැනෙන වරදක් නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතට ඒ බලය ලබාදීමක් තමයි මෙතැනින් කරන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු ඇමතිතුමනි, මට පැහැදිලි කර ගැනීමක් කරගන්න අවශ්‍යයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
කිසි ප්‍රශ්නයක් නැහැ. අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා Amendment එකක් එවලා තිබෙනවා. ඒ Amendment එකේ පැහැදිලිව කියා තිබෙනවා, "No person is liable on account of whatever proceedings that transpired in a Commission of Inquiry." කියා

මම අහන්නේ මේකයි. එවැනි Amendment එකක් අවශ්‍ය වුණේ, "it may direct the Director General to institute criminal proceedings" කියා මේ කෙටුම්පතේ තිබෙන නිසා නේද? ඒ වරද නේද, ඔබතුමන්ලා මේ Amendment එක හරහා නිවැරැදි කර ගන්න හදන්නේ?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ අඩුව හදා ගන්නයි සංශෝධනය දීලා තිබෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කෙටුම්පතේ මේ වරද තිබෙනවාය, ඒක නිවැරැදි කරන්නයි මේ Amendment එක එවලා තිබෙන්නේ කියා ඔබතුමා කියන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ ගැන සඳහන් වන පිටපත මට දෙන්න, ගරු මන්ත්‍රීතුමනි, මගේ මේසයට තවම ඒක එවා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. පරීක්ෂණ කොමිෂන් සභා පනතින් හෝ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතින් හෝ යම් අපරාධයක් සම්බන්ධව සාක්ෂියක් හෙළිදරව් වෙලා තිබෙනවා නම්, ඒ මතම කිසි කෙනෙකුට දඬුවමක් ලබාදීමේ ක්‍රමවේදයක් නැහැ. [බාධා කිරීමක්] ඔව්, ඒ මත පමණක්ම බැහැ. යම් වරදක් වුණාය කියා ඒ සාක්ෂිවලින් සම්පූර්ණයෙන් හෙළිදරව් වුණත්, දඬුවම් දෙන්න කොහොමටවත් බැහැ. ඒ සාක්ෂිය වෙනත් නඩුවකදී, සාමාන්‍ය ක්‍රමය යටතේ ඉදිරිපත් කරන නඩුවකදී ආවේශ්‍ය කර ගැනීම පමණයි කරන්න පුළුවන්, admissible evidence එකක් වෙන එක පමණයි වෙන්නේ.

අපි දන්නවා සාක්ෂි වර්ග දෙකක් තිබෙන බව. හැම සාක්ෂියක්ම නීතියෙන් පිළිගන්නා සාක්ෂි විධියට අධිකරණයෙන් පිළිගන්නේ නැහැ. ඒවා නඩුවකදී ආවිශ්‍ය සාක්ෂි - admissible evidence එකක් - විධියට තිබෙනවා නම් පමණයි පිළිගන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදාහරණයක් විධියට ගත්තොත් සමහර කාරණාවලදී අපි ඡායාරූප පිටපතක් ඉදිරිපත් කළාම කියනවා මුල් පිටපත නැතිව මේක ආවිශ්‍ය කරගන්න බැහැයි කියා. අධිකරණය එවැනි නිගමනයකට එනවා නම් මුල් පිටපත ඉදිරිපත් නොකළහොත් ඒ සාක්ෂිය ප්‍රතික්ෂේපිත සාක්ෂියක්. ඒ වාගේම මේ සාක්ෂි ආවිශ්‍ය කරගෙන යම් නඩුවකදී ඒ කරුණු සනාථ කර ගැනීම සඳහා උත්සාහ කිරීමක් තමයි කරන්නේ. ඒ වෙනුවෙන් මෙම පනත් කෙටුම්පතේ ඉදිරිපත් කර තිබෙන්නේ මෙහෙමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පතේ 2 වන වගන්තියේ සඳහන් වන්නේ මෙසේයි:

> "24අ.(1) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, 2 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින්, අවස්ථාවෝචිත පරිදි, පවත්වන ලද විමර්ශනයක දී හෝ පරීක්ෂණයක දී හෝ එම විමර්ශනය සහ පරීක්ෂණය යන දෙකේදී ම හෝ රැස් කරන ලද කරුණු සලකා බැලීමේ දී පහත දැක්වෙන නීති යටතේ යම් වරදක් සිදු කර ඇති බවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සෑහීමට පත්වන විට දී එය විසින්-
>
> (අ) අල්ලස් පනත;
>
> (ආ) වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත;
>
> (ඇ) අල්ලස් පනත ප්‍රකාර ව අල්ලස් හෝ දූෂණය, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාකාරකමක් වන අවස්ථාවක මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත; හෝ
>
> (ඈ) අල්ලස් පනත හෝ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත ප්‍රකාර ව සිදු කරන ලද වරදක් සමඟ එකම ක්‍රියාවලියකදී දණ්ඩ නීති සංග්‍රහය යටතේ යම් වරදක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවේ දී නීතිපතිගේ එකඟත්වය ඇතිව දණ්ඩ නීති සංග්‍රහය,
>
> ප්‍රකාරව අපරාධ නඩු පවරන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විධාන කරනු ලැබිය හැකිය."

ඒ කාරණය පිළිබඳව තමයි මේ සංශෝධනය ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මඟින් මේ පනත් දෙකේම -විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව, පරීක්ෂණ කොමිෂන් සභා පනත- සම තත්ත්වයක් ඇති කර ගන්න තමයි අපි උත්සාහ කරන්නේ. ඒ වාගේම duplicity of the proceedings, ඒ කියන්නේ එකම කාරණය පිළිබඳව විමර්ශන දෙකක් පැවැත්වීම

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

වළක්වා ගැනීම සහ අවම කර ගැනීම. වළක්වා ගැනීම කියන වචනය නිවැරදි නැහැ; අවම කර ගැනීම. මොකද, මේ සාක්ෂි මතම යැපිලා නඩුවක් ඉදිරිපත් කරන්න ඕනෑය කියා ක්‍රමයක් නැහැ. සමහරවිට එහි කොටසක් වෙන්න පුළුවන්, ඉතිරි සාක්ෂි ටික පිළිබඳව විමර්ශන කරන්න ඕනෑ. එහෙම විමර්ශන කර, සොයා ගෙන තමයි නඩුවක් පැවරීමේ හැකියාව තිබෙන්නේ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ශක්තිමත් කිරීම අපි පාර්ලිමේන්තුවේ නිරන්තරයෙන්ම සාකච්ඡා කරන මාතෘකාවක්. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම පසුගිය -2017- වසරේ පවරන ලද නඩුවලින් 57 දෙනෙක් වැරදිකරුවන් බවට අධිකරණය තීන්දුව දී තිබෙනවා. 2018 වසරේ මේ දක්වා අල්ලස් චෝදනා ලැබූ 59 දෙනෙක් අධිකරණය මඟින් වැරදිකරුවන් බවට පත් කර තිබෙනවා. ඒ වාගේම 2018 ජනවාරි 01වැනිදා ඉඳලා සැප්තැම්බර් 30 දක්වා කාලසීමාව තුළ අලුතින් නඩු 35ක් ගොනු කර තිබෙනවා. අල්ලස් පනත යටතේ ගොනු කර දැනට අධිකරණවල පවරන ලද සම්පූර්ණ නඩු සංඛ්‍යාව 333ක් වෙනවා. එයින් නඩු 106ක් අධි චෝදනා පත්‍ර මත මහාධිකරණවල ගොනු කර තිබෙනවා, 227ක් මහෙස්ත්‍රාත් අධිකරණවල තමයි ගොනු කර තිබෙන්නේ. ඒ වාගේම අල්ලස් පනත යටතේ වැටලීම් විශාල සංඛ්‍යාවක් කර තිබෙනවා. 2017 වසරේ වැටලීම් 57ක් කර තිබෙනවා. 2018 වසරේ මේ දක්වා වැටලීම් 30ක් කර තිබෙනවා. කාලයක් තිස්සේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට දිගින් දිගටම අපි කවුරුත් කළ චෝදනාව තමයි හාල්මැස්සෝ අල්ලන net එකක් මිසක් මෝරු අල්ලන net එකක් අල්ලස් පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට නැහැ, එවැනි දෙයක් සිද්ධ වන්නේ නැහැයි කියන කාරණය. එහෙම කියන්න සාධාරණ හේතු කාරණා ජනතාවට තිබුණා. ඔබතුමන්ලාට මතක ඇති 1994 චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමියගේ ආණ්ඩුව ආවාට පසුව ගෙනාපු පළමුවැනි පනත. මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා අධිකරණ ඇමතිවරයා විධියට පාර්ලිමේන්තුවේ සිටි සියලු දෙනා එකට එකතුවෙලා සම්මත කර ගත් ඒ පනත තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත.

එම පනත සම්මත කරන්නට කලින් අපේ රටේ අල්ලස් දෙපාර්තමේන්තුවක් තිබුණා. එම අල්ලස් දෙපාර්තමේන්තුව හොඳින් ක්‍රියාත්මක වුණා. හැබැයි, ඒ අල්ලස් දෙපාර්තමේන්තුවත් දේශපාලනීකරණය වෙලා තිබෙනවා. දේශපාලන අවශ්‍යතා මත දේශපාලනඥයන් එය හැසිරෙව්වාය කියන එක පිළිබඳව විශාල චෝදනා තිබුණා. විශේෂයෙන්ම 1970-1977 කාලයේ එය මේ රටේ විශාල ආත්දෝලනාත්මක කාරණයක් බවට පත් වුණා. "සාගරයක් මැද" චිත්‍රපටය නිෂ්පාදනය කිරීමට තරම් මේ මාතෘකාව අපේ රටේ ප්‍රස්තුතයක් බවට පත්වෙලා තිබුණා. ඒ තත්ත්වය වළක්වන්න තමයි 1994දී මේ පනත මඟින් අල්ලස් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට ස්වාධීන කොමිසමක් ගෙනැල්ලා විශ්‍රාමික විනිශ්චයකාරවරුන් ඇතුළු පිරිසකගෙන් සමන්විත කොමිෂන් සභාවක් පත් කළේ. ඒක මේ රටේ කවුරුත් දන්නා කාරණයක්. එම අවුරුදු 5 ඇතුළතම අල්ලස් පනත යටතේ අධිකරණයට පැවරුණේ එකම එක නඩුවයි. ඒ තමයි රජයේ ජාතික පාසලකට ශිෂ්‍යාවෙක් ඇතුළත් කර ගැනීම සඳහා ගුරුවරයෙකුට පීරිසි කෝප්ප 6ක් අල්ලසක් විධියට දුන්නාය කියන නඩුව. එතකොට ඒ අවුරුදු 5 තුළ එම කොමිසම නඩත්තු කරන්න අපේ රටේ මහ ජනතාව කෝටි ගණනක් මුදල් වියදම් කළා. අපේ රටේ අල්ලස, දූෂණය නැති කරන්න බැරි බව දන්නවා, ඒවා අවම කරන්න තමයි මහ ජනතාව මුදල් වියදම් කළේ. නමුත්, එහෙම පිහිටුවූ එම කොමිෂන් සභාවෙන් මේ රටට ඵලක් වුණේ නැහැ. ඒ අවුරුදු 5 තුළ ජනතාව දරපු වියදම නාස්තියක්. අල්ලස් ගැනීම වාගේම බරපතළ කාරණයක් තමයි ඒකත්. ඒ කියන්නේ මහජන මුදල් නාස්ති කිරීම. ඒකේ වෙනසක් නැහැ. වෙනත් රටක මෙහෙම වුණා නම්, නීතිය විධියට ඒ අවුරුදු 5දී ගෙවූ පඩි-නඩි සම්බන්ධයෙන් එම කොමසාරිස්තුමන්ලාට විරුද්ධව නඩු දමන්නට ඕනෑ. මොකද, ඒකත් නාස්තියක්, ඒකත් වංචාවක්, ඒකත් දූෂණයක්. මේ සා විශාල මහජන මුදලක් අරගෙනත් රටට වැඩක් වෙලා නැහැ. ඒක එහෙම නම්, ඒ වරදත් බරපතළ වරදක් කියන කාරණය අපි දකින්නේ නැහැ. ඒක තමයි අපේ තිබෙන වැරැද්ද. ඒවා හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. දැන් ඒ තත්ත්වය නිවැරදි කරගෙන මේ ආයතනය ශක්තිමත් කරන්න තමයි මේ පනත් මඟින් අපට වුවමනා කර තිබෙන්නේ. හාල්මැස්සෝ අල්ලනවා, මෝරු අල්ලන්නේ නැහැයි කියන චෝදනාව දිගින් දිගටම තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි අපි පසුගිය දවස්වල වාර්තා අරගෙන බැලුවාම, නඩු කටයුතු පිළිබඳව බැලුවාම දැන් සිටින ජනාධිපතිගෙයි, මීට පෙර හිටපු ජනාධිපතිගෙයි, ඊටත් පෙර හිටපු ජනාධිපතිනියගෙයි මාණ්ඩලික ප්‍රධානියෝ තුන්දෙනාම අල්ලස් නඩුවලට පැටලිලා ඉන්නේ. එක්කෝ රිමාන්ඩ්, එක්කෝ ඇප පිට. ජනාධිපතිවරු තුන්දෙනාගේම මාණ්ඩලික ප්‍රධානියෝ දැන් අල්ලස් නඩුවලට කුඩුවේ ඉන්නේ. අපි මොනවා කිව්වත්, නිලධාරින්ට දොස් කිව්වත්, ඒ නිලධාරින් ඔවුන්ට පුළුවන් උපරිම ආකාරයෙන් ඒ කටයුතු ඉෂ්ට කරගෙන යෑම ගැන අපි එක්තරා ප්‍රමාණයකට සතුටු වෙන්න ඕනෑ. මොකද, ඒක ඉතිහාසයේ මෙතෙක් නොවුණු දෙයක්. අනිත් එක තමයි, පසුගිය අවුරුදු දෙකේ සිදු වූ තරමට අධිකරණවල මේ වගේ අල්ලස් වැරදි ඔප්පු කිරීම් වෙලා නැහැ, වැටලීම් වෙලා නැහැ. දැන් එම ආයතනය ඉතාම ශක්තිමත්ව කරගෙන යනවා. ඒක නිසා පාර්ලිමේන්තුවේ අපි මහජන නියෝජිතයෝ විධියට, රටේ ජනතාව විධියට ඒ ආයතනය ශක්තිමත් කරන්නට ඕනෑ, ඒ ගොල්ලෝ ධෛර්යවත් කරන්නට ඕනෑ.

පසුගිය වසර දෙක තුළ ජාත්‍යන්තර දූෂණ විරෝධී දර්ශකයේ අපි හිටියේ 96වැනි ස්ථානයේ. ඊට බලපෑ ප්‍රධානම කාරණය තමයි, අල්ලස් හෝ දූෂණය සම්බන්ධයෙන් අපි හරියට නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැයි කියන එක. නමුත්, දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ක්‍රියාත්මක වන නිසා මේ වන විට අපි එම දර්ශකයේ 96වැනි ස්ථානයේ සිට 91වැනි ස්ථානය දක්වා ඉහළට ගිහිල්ලා තිබෙනවා. අපි එහි ප්‍රශස්ත මට්ටමක් අත් කරගෙන තිබෙනවා. මොකද, මේක අවුරුදු 5කින්, 10කින් කරන්න පුළුවන් දෙයක් නොවෙයි කියා අපි දන්නවා. දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් තුළින් තමයි අපට එය ජයග්‍රහණය කරගන්නට පුළුවන්කම ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තුළ ප්‍රමාණවත් සුදුසුකම් තිබෙන විශේෂඥයෝ නැහැ. පළමුවැනි වතාවට තමයි අල්ලස් කොමිසමට විශේෂඥයෝ පත් කරගන්න යන්නේ. ඒ සම්බන්ධයෙන් කොමිසම අයදුම් පත් කැඳවා තිබෙනවා. ගිණුම් විෂය, ඉංජිනේරු විෂය, digital forensics, කළමනාකරණ විෂය වාගේ නොයෙකුත් විෂයයන් පිළිබඳව ප්‍රාමාණික දැනීමක් නැති උදවියට සිදු වූ වංචාවක් පිළිබඳව පරීක්ෂණයක් කරන්න බැහැ.

ඒගොල්ලන්ට ඒ පිළිබඳව දැනීමක් නැහැ. ඒ නිසා එම විෂයය පිළිබඳව විශේෂඥ දැනීම තිබෙන උදවිය පත් කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පුවත් පත්වල අයදුම් පත් කැඳවලා, මේ වනවිට අයදුම් පත් 5,000ක් ලැබිලා තිබෙනවා. මේ අයදුම් පත් 5,000 තුළින් සුදුසු අය තෝරා පත් කර ගැනීම ඉදිරියේදී සිදු වනවා. මොකද, අපේ රට අල්ලස හෝ දූෂණය අඩු රටවල් සමඟ සංසන්දනය කරන කොට අපේ රටට ප්‍රමාණවත් සම්පත් නැහැ;

ප්‍රමාණවත් විශේෂඥයන් නැහැ. හොං කොං රටේ ජනගහනය ඉන්නේ මිලියන 6යි. ජනගහනය මිලියන 6ක් -ලක්ෂ 60ක්- වුණාට ඒ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පරීක්ෂණ නිලධාරීන් 1,000ක් ඉන්නවා. අපේ රටේ ලක්ෂ 200ක් ජනගහනය ඉන්නවා; නමුත් විශේෂඥ නිලධාරීන් එක් කෙනෙකුවත් නැහැ. මැලේසියාව ගත්තොත්, හොං කොං රටේ පිළිවෙතම තමයි ඒ රටත් අනුගමනය කරන්නේ. ඒ නිසා තමයි, අපි මේ ආයතනය ශක්තිමත් කරන්න කටයුතු කරන්නේ.

මේ අල්ලස් පනතට ගෙනෙන සංශෝධනයෙන් පමණක් අපට සෑහීමකට පත් වෙන්න බැහැ. ඒ සඳහා චත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. මේ වනවිට ඊට අදාළ සංශෝධනවලට කැබිනට් අනුමැතිය ලැබිලා තිබෙනවා. අපේ රටේ අල්ලස, දූෂණය සම්බන්ධව තවමත් අපි කථා නොකළ, අත නොගසපු වපසරියන් කීපයක් තිබෙනවා. අල්ලස හා දූෂණය වැළැක්වීමට අවශ්‍ය නීතිය නොගෙනාවොත් අප බලාපොරොත්තු වන ඉලක්කයට අපේ රට ගෙනි යන්න බැහැ.

පෞද්ගලික අංශයේ අල්ලස ගැන බලමු. නීතියෙන් ආවරණය වන්නේ රජයේ අංශය විතරයි. නමුත් අපේ රටේ පෞද්ගලික අංශයේ කෙරෙන ගනුදෙනු, රජයේ ගනුදෙනුවලට සෘජු ලෙස බලපානවා. පෞද්ගලික අංශයේ අල්ලස වළක්වන්නත්, ඔවුන්ට දඬුවම් ලබා දෙන්නත් ලෝකයේ දියුණු රටවල වාගේ අපේ රටේ නීතියක් නැහැ. ඒ නිසා අපි අලුතින් අවධානය යොමු කරපු කාරණයක් තිබෙනවා. ගනුදෙනුවලදී බොහෝ අල්ලස් තෑගි ලෙස ලබා දීම -තෑග්ගට මුවාවෙලා ලබා දීම,- විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව රටට අලුතින් නීති හඳුන්වා දීමේ අවශ්‍යතාව තිබෙනවා.

ප්‍රතිවිරුද්ධ අයිතිවාසිකම් -conflict of interest- තිබෙන රජයේ නිලධාරීන් හෝ කොමිෂන් සභාවල නිලධාරීන් හෝ වෙනත් ආයතනවල නිලධාරීන් ගනුදෙනු කිරීමේදී මහ ජනතාවට ඒ ගනුදෙනුවලින් අගතියක්, හානියක් සිදු වනවා. ඒ පිළිබඳව අපේ රටට තවම අපි පැහැදිලි නීතියක් හඳුන්වා දීලා නැහැ.

අපේ රට විදේශ රටවල් සහ විදේශ ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු කිරීමේදී සිදු වන අල්ලස් දීම්, මුදල් තෑගි හුවමාරු වීම් සම්බන්ධයෙන් අපට පැහැදිලි නීතියක් නැහැ. වර්තමාන සමාජය විශාල වශයෙන් කථා කරන්නේ මේ කාරණය. විදේශ රටවල් සමඟ ගනුදෙනු කරන කොට ඒ ඒ පාර්ශ්වයන් අතින් සිදු කරනු ලබන අල්ලස් සහ දූෂණ ගනුදෙනු පිළිබඳව නියම යන්ත්‍රණයක් රට තුළ නැති නිසා සමහර වෙලාවට යම් දේවල් දැන ගත්තා වුණත් නීතිය ක්‍රියාත්මක කරන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ පනත සංශෝධනය කිරීම ජාතික අවශ්‍යතාවක් කියා අපි විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් පක්ෂ භේදයකින් තොරව, රටේ නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කිරීමට, ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කිරීමට බැඳී සිටින මේ පාර්ලිමේන්තුවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහාය අපි බලාපොරොත්තු වනවා. ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*විනා විධුත්තියම්පප්පෙට්රත්තු.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. ඊළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා. ඊට පෙර ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විඩුක්කප්පට්ටු ඒර්ත්රුක්කොණ්ඩප්පට්ටது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.***

*අතන්පිරකු, මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.41 ]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලබන වසරේ ජනවාරි මාසය වනකොට ජනාධිපතිවරණය පවත්වලා වසර හතරක් ගත වනවා. මම හිතන්නේ අපේ රටේ දේශපාලන ඉතිහාසයේ පසුගිය වසර තුනයි මාස දහයක කාලය තරම් වංචා, දූෂණ පිළිබඳව කථා කරපු, එයට එරෙහිව හඬක් නැඟුණු, ජනතාවගේ බදු මුදල් ආරක්ෂා කිරීම සඳහා යම් නිශ්චිත ක්‍රමවේදයන් සකස් විය යුතුය කියන මතවාදයක් ගොඩ නැඟුණු කාලයක් තවත් තිබුණේ නැහැ.

මොකද, අපේ රටේ දේශපාලන ඉතිහාසයේ විටින්-විට වංචා, දූෂණවලට එරෙහිව හඬ නැඟී තිබෙනවා. ඒවා මැතිවරණ වේදිකාවේ ප්‍රමුඛ වුණා; මැතිවරණයෙන් පසුව මාස කිහිපයක් සාකච්ඡා වුණා. එතැනින් පසුව ඒවා එහෙමම කාලයේ වැලි තලාවට වැහිලා ගියා. 1970දී සමඟි පෙරමුණ බලයට පත් වුණේ රටේ ජනතාව තුළ ජාතික සම්පත් පිළිබඳව, විදේශීකරණයට එරෙහිව සහ ජාතික ආර්ථිකයක් ගොඩ නැඟීම වෙනුවෙන් ඉතාම ආස්වාදජනක හැඟීම් ඇති කරමින්. නමුත් 1977දී සමඟි පෙරමුණේ නායිකාව හැටියට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඒ වේදිකාවෙන් බැස යද්දී, එතුමියගේ ආණ්ඩුවට විශාල දූෂණ චෝදනා එල්ල වෙලා තිබුණා. ඒ වාගේම ඔබට මතක ඇති, 1993-1994 කාලයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පරාජය කිරීමේදී ඒ ආණ්ඩුව අනුගමනය කරපු ප්‍රජාතන්ත්‍රවිරෝධී ක්‍රියාමාර්ගවලට අමතරව ඔවුන් විසින් සිදු කරන ලද වංචා, දූෂණ බලපෑ අන්දම. ඒ ආණ්ඩුවේ හිටපු මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් කරපු වංචා, දූෂණ හෙළිදරව් වුණා. ඒ නිසා තමයි චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපති අපේක්ෂිකාව විධියට වේදිකාවක්, වේදිකාවක් ගණුනේ කිය-කියා ගියේ, "හොරු අල්ලා ගෝල් ෆේස් එකේ එල්ලනවා" කියලා. හැබැයි, හොරු "ගෝල් ෆේස්" එකේ එල්ලන්න ආපු එතුමිය අවසානයේ තමුන්ගේ ධුරයෙන් බැහැලා යනකොට, එතුමිය බලයට ගෙනෙන්නට උදව් කරපු, පිටුපසින් හිටපු ජනමාධ්‍යවේදීන් පොත් ලිව්වා, ඇය "චෞර රැජින" කියලා

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

හදුන්වමින්. මෙහෙම තමයි අපේ දේශපාලන ඉතිහාසය ලියැවුණේ.

මෙහෙම අපි කඩුලු පැන-පැන ආවා. 2015 ජනාධිපතිවරණය කියන්නේ අපේ රටේ වංචා, දූෂණයට එරෙහිව ප්‍රබල මතයක් සමාජගත වුණු මැතිවරණ ව්‍යාපාරයක්. එය හුදෙක් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ පෞද්ගලික ප්‍රතිරූපයෙන් ලබා ගත්ත ජයග්‍රහණයක් නොවෙයි. විශේෂයෙන් මේ රටේ 2011-2012 කාලයෙන් පසුව අඛණ්ඩව එවකට පැවැති ආණ්ඩුවේ මර්දනකාරීත්වයට, මාධ්‍ය මර්දනයට එකඟ නොවුණු, හසු නොවුණු බොහෝ පිරිසක් සාමූහිකවත්, කුඩා කණ්ඩායම් වශයෙනුත්, පෞද්ගලිකවත් ගොඩනඟන ලද වංචා, දූෂණ විරෝධී මතවාදයක ප්‍රතිඵලයක් තමයි මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවේ පරාජය. ජනතාව බලාපොරොත්තු වුණා, අලුතින් පත් වන ආණ්ඩුව -ජනාධිපතිවරයා සහ අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව- විසින් වංචා, දූෂණ හෙළිදරව් කරනවාට අමතරව, එම වංචනිකයන්ට, දූෂිතයන්ට නීතිය හමුවේ කඩිනමින් දඬුවම් පමුණුවයි කියලා. අපි කාටත් තිබුණේ ඒ වංචනිකයන්, දූෂිතයන් පිළිබඳව හුදු පෞද්ගලික වෛර නොවෙයි. ඔවුන් හොරකම් කරලා තිබෙන්නේ; අවභාවිත කරලා තිබෙන්නේ මේ රටේ ජනතාවගේ බදු මුදල්. එදා වේල හම්බ කර ගන්නට දැඩි මහන්සියක් දරන, තේ දල්ලත් එක්ක, රබර් කට්ටියත් එක්ක හැප්පෙන, එහෙම නැත්නම් මැද පෙරදිග රැකියාවේ යෙදෙන, රජයේ සේවයේ යෙදෙන, එයින් උපයා ගන්නා ආදායමෙන් විශාල කොටසක් බදු හැටියට භාණ්ඩාගාරයට ගෙවන ඒ ජනතාවගේ බදු මුදල් වංචා කළාට පසුව ඒ වංචනික ක්‍රියාවලියට, ඒ වංචාකරුවන්ට දඬුවම් දිය යුතු වන්නේ තමන්ගේ බදු මුදල් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන්ය කියන මතයක ජනතාව සිටියා. හැබැයි, ජනතාව බලාපොරොත්තු වුණු ආකාරයට පසුගිය වසර තුනයි මාස දහයකට ආසන්න කාලයක් තුළ ඒ බලාපොරොත්තු වෙච්ච වේගයෙන්, බලාපොරොත්තු වෙච්ච කාර්යක්ෂමතාවෙන් වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් පැමිණවීමේ ක්‍රියාවලිය සිද්ධ වුණේ නැහැ කියන එක අපි කවුරුත් පිළිගන්නවා. ඒකට එක පැත්තකින් ඒ වංචා, දූෂණවලට සම්බන්ධ අය රාජ්‍ය යන්ත්‍රණයේ ඉහළම සිටීමත් බලපෑවා. ඒ වාගේම ආණ්ඩුව තුළ වංචා, දූෂණ වැළැක්වීම සඳහා තිබුණු අධිෂ්ඨානය දුර්වල වී තිබුණා. එය දේශපාලන වේදිකාවේ හුදු සටන් පාඨයක් බවට පත් කර ගැනීමක් පමණක් වී තිබුණා. ඒ වාගේම අනෙක් පැත්තෙන් වංචා, දූෂණවලට සෘජුවම සම්බන්ධ අය විසින් ඇති කරන ලද බලපෑමත් ඔවුන්ට බලපෑවා.

අපි දැක්කා, 2015 ජනාධිපතිවරණයෙන් පසුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට කෙනෙක් කැඳවන කොට, ඒ අවට බොහෝ උද්ඝෝෂණ තිබුණු ආකාරය. ඒ උද්ඝෝෂකයන්ගේ අතේ ජාතික කොඩි තිබුණා. සමහර ජාතික කොඩි විකෘති කරලාත් තිබුණා. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට ඒක මතකත් ඇති. විකෘති කරපු ජාතික කොඩි අරගෙන, ජාතිකත්වය, දේශීයත්වය, දේශප්‍රේමය පිළිබඳව හඬ නඟා පවසමින්, තමන්ට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් කැඳවීම් කරන්නේ තමන් දේශප්‍රේමියෙක් වීම නිසාමයි කියන මතයක් සමාජගත කරන්න ඔවුන් උත්සාහ කළා. හැබැයි, එහෙම උද්ඝෝෂණ කිහිපයක් කළාට පසුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම හමුවට කැඳවන වාර ගණන වැඩි වෙනකොට, ඒ උද්ඝෝෂණ යට ගිහින් ඒවා මාධ්‍යවල voice cut එකකට පමණක් සීමා වුණා.

ඒ කියන්නේ, තමන් විසින් කරන ලද හොරකම්, වංචා, දූෂණවලට එරෙහි ප්‍රබල මතයක් සමාජගත කරන්නට වංචනිකයන්ට, දූෂිතයන්ට එතරම් පහසු වුණේ නැහැයි කියන එකයි. හැබැයි ඒ පහසුව සලසා දුන්නේ වෙන කවුරුවත් නොවෙයි, ආණ්ඩුව විසිනුයි. පරණ ආණ්ඩුවේ හොරුන්ට, වංචනිකයන්ට දඬුවම් කරන්න තමන්ට තිබුණු සුජාත අයිතිය ශ්‍රී ලංකා මහ බැංකු බැඳුම්කර වංචාව හරහා අහිමි කර ගත්තේ, සියතින් ගෙල සිඳ ගත්තේ මේ ආණ්ඩුවම තමයි. තමන් එවැනි මහා පරිමාණ වංචාවකට අත ගහලා තිබියදී, තමන්ගේ ආණ්ඩුවේ අගමැතිවරයා, මුදල් ඇමතිවරයා ප්‍රමුඛ ආණ්ඩුවේ ප්‍රබලයින් ඒ ක්‍රියාවලියට සම්බන්ධයි කියලා COPE එක හමුවේ, ජනාධිපති විමර්ශන කොමිසම හමුවේ හෙළිදරව් වෙලා තිබියදී, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම හරහා හෝ නීතිපති දෙපාර්තමේන්තුව හරහා හෝ අධිකරණය හරහා ආණ්ඩුවක් පැරණි හොරුන්ට දඬුවම් පමුණුවන්නේ කොහොමද? ඒ නිසා තමයි මේ වංචා, දූෂණ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් අඩාළ වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එළියේ පොඩි වැහි රැල්ලක් යනකොට "මේ පාර්ලිමේන්තුවට හෙණ ගහපන්" කියලා මිනිසුන් කියන්නේ; එළියේ පොඩි වැහි රැල්ලක් යනකොට "මේ පාර්ලිමේන්තුව වතුරෙන් යටවෙයන්" කියලා මිනිසුන් කියන්නේ ඒ නිසායි. බදු මුදල් හරහා තමන්ට ලැබෙන්න ඕනෑ සමාජ ශුභ සාධන සියල්ල කප්පාදු වෙනකොට, ඒ වරප්‍රසාද මේ පාර්ලිමේන්තුවේ හැන්ද අතේ තබාගෙන ඉන්න අය බෙදා ගන්නකොට ජනතාව තුළ කලකිරීම, වෛරය, කෝපය ඇතිවන එක සාධාරණයි.

ඔබතුමන්ලා දන්නවා, වරප්‍රසාදයක් හැටියට රජයේ සේවකයන්ට, රජයේ නිලධාරීන්ට හිමිවෙලා තිබුණු වාහන බලපත්‍රය ඔවුන්ට ලබාගන්න බැරි විධියේ නීතියක් පසුගිය දවසක ආණ්ඩුව හිටිහැටියේ පැනෙව්වාය කියලා. එය සාධාරණීකරණය කිරීම සඳහා කිව්වා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් දැන් වාහනයක් ගන්න අයිතිය නැහැයි කියලා. හැබැයි රටම දන්නවා, ඒ වනකොට permits ගත්ත පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරුන් සියලුදෙනාම වාහන අරගෙනයි තිබෙන්නේ කියලා. තමන් රජයේ සේවයේ යෙදී සිටීම නිසා උපයා ගත් ඒ වරප්‍රසාදය රජයේ නිලධාරීන්ට තමයි අහිමි කළේ.

ඒ විතරක් නොවෙයි. බදු පනවනකොට ආණ්ඩුව කියනවා, හැමදෙනාටම සාධාරණ බදු ප්‍රතිපත්තියක් තමයි අනුගමනය කරන්නේ කියලා. හැබැයි රජයේ සේවකයාට නිල වශයෙන් හිමිවෙලා තිබෙන වාහනයටත්, එයට හිමි ඉන්ධන ටිකටත්, එයට හිමි රියැදුරාටත් රජයේ නිලධාරියාටම බදු ගෙවන්න සිද්ධ වනකොට ඒ නිලධාරීන් තුළ, ඒ රජයේ සේවකයන් තුළ වෛරයක්, කෝපයක්, ද්වේෂයක් ඇතිවන එක සාධාරණයි. ඒ නිසා තමයි හැන්ද අතේ තබාගෙන ඉන්න අය තමන්ගේ බදු මුදල් අවභාවිත කරනකොට ඒ අය කෙරෙහි මෙතරම් වෛරයක්, කෝපයක්, ද්වේෂයක් ඇතිවෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රටක් හැටියට ඉදිරියට යන්න නම් වංචාවලට, දූෂණවලට එරෙහිව මේ පාර්ලිමේන්තුවම එකහෙළා හඬ නැඟිය යුතුව තිබෙනවා.

අද උදෑසන අධිකරණ ඇමතිවරිය වෙනුවට උසස් අධ්‍යාපන ඇමතිවරයා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනකොට සමහර මන්ත්‍රීවරුන් බොහොම කලබල වුණු බව අපි දැක්කා. භූමිතෙල් ගෑවුණු ගැරඩි වාගේ කලබල වෙන්න පටන් ගත්තා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පුළුවන් තරම් පස්සට දමාගන්න, විකෘති කරගන්න, වෙනත් ප්‍රශ්න ඇති කර ගන්න උත්සාහ කළා. මේ පනත් කෙටුම්පතේ යම් අඩුපාඩුවක් තිබෙනවා නම්, එය නිවැරැදි කරගෙන, මේ පාර්ලිමේන්තුව වංචාවට, නාස්තියට, දූෂණයට, විරුද්ධයි කියන මතයක් එක හඬින්, එක හෙළා සමාජගත කරන්නට අපි සමත් වෙන්නට ඕනෑකම තිබෙනවා. මේ අවභාවිත කරන්නේ මේ රටේ මහ ජනතාවගේ බදු මුදල්. ඒ මහ ජනතාව තමයි ඒ බදු මුදල් පාලනය කිරීම සඳහා මූල්‍ය පාලනයේ වගකීම

තිබෙන පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් හැටියට අපව පත් කරන්නේ. එවැනි පිරිසක් විසින්ම ජනතාවගේ බදු මුදල් හොරකම් කළාට කමක් නැහැයි කියලා මතයක් ඉදිරියට ගෙනෙන්න උත්සාහ කරනවා නම් අපි අනිවාර්යයෙන්ම එය හෙළා දැකිය යුතුයි.

දැන් ප්‍රශ්නය තිබෙන්නේ මෙයයි. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාත් මේ සම්බන්ධයෙන් කිව්වා. අපේ රටේ අල්ලස් දෙපාර්තමේන්තුවක් තිබුණා. ඊට පස්සේ එය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම බවට පත් කළා. ගරු ඇමතිතුමා කිව්වා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම යටතේ 57දෙනකුට පමණ දඬුවම් කරලා තිබෙනවාය කියලා. ඒ 57දෙනා සම්බන්ධයෙන් බැලුවොත් ඔවුන් කවුද? ඔවුන් ග්‍රාම නිලධාරීන්, පොලිස් කොස්තාපල්වරුන්, ගුරුවරුන්, විදුහල්පතිවරුන් වැනි පහළ මට්ටමේ රජයේ සේවකයනුයි. මේ අල්ලස් දැලට අහුවෙන්නේ එවැනි පොඩි මිනිස්සුයි. මහා පරිමාණයෙන් අල්ලස් ගන්න අය අල්ලස් දැලට අහුවෙන්නේ නැත්තේ ඇයි? එක වරක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, තෝරු මෝරු අල්ලන්න නම් තෝරු මෝරුන්ගෙන්ම සාක්ෂි ඕනෑය කියලා.

ඒකේ යම් ඇත්තක් තිබෙනවා. පාසලට දරුවෙක් ඇතුළත් කර ගන්නට අල්ලසක් දෙන සාමාන්‍ය පුද්ගලයා තමයි, ඒ විදුහල්පතිට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ. තමන්ගේ ලී ටික ප්‍රවාහනය කර ගන්න පොලිස් කොස්තාපල්ට අල්ලස් දෙන සාමාන්‍ය පුද්ගලයා තමයි ඒ පොලිස් කොස්තාපල්ට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ. හැබැයි, මහා පරිමාණයෙන් අල්ලස් ගන්න, උඩ මට්ටමින් මේ දූෂණයේ යෙදෙන අය, සාමාන්‍ය රජයේ සේවකයෙකුට, සාමාන්‍ය ගුරුවරයෙකුට, ග්‍රාම සේවකයෙකුට ගිහිල්ලා අල්ලස් දෙන්න පුළුවන් කට්ටිය නොවෙයි. ඒ ගොල්ලන්ට අල්ලස් දෙන්නේත් ඒ වාගේම මහා බලසම්පන්න අයයි. තෝරුන්ට - මෝරුන්ට අල්ලස් දෙන්නේ තෝරු - මෝරුම තමයි. ඒක නිසා තෝරු - මෝරු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ඇවිල්ලා අහවලාට විරුද්ධව සාක්ෂියක් දෙන්නේ නැහැ. ඒක කෙරෙනවා නම් බොහොම කලාතුරකින් සිද්ධ වෙන වැඩක්. ඒක හරියට "නොකෙරෙන වෙදකමට කෝටුරු තෙල් හත් පට්ටයකුත් තව චුට්ටකුත් ඕනෑ" වාගේ වැඩක්. මහා පරිමාණ වංචා - දූෂකයන් අල්ලා ගන්නට නම් අපට මෑත කාලයේ තිබුණු -මෑත ඉතිහාසයේ තිබුණු- අත්දැකීම තමයි මෙවැනි විමර්ශන කොමිෂන් සභා හරහා තමයි එවැනි සාක්ෂි යම් ප්‍රමාණයක්වත් හරි හෙළිදරව් වුණේ කියන එක.

අපි දැක්කා, මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධව කෝප් කමිටුවේ විමර්ශන සිද්ධ වෙන කොට හෙළිදරව් නොවුණු තොරතුරු ප්‍රමාණයක් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේදී හෙළිදරව් වුණු බව. දැන් මගේ අතේ තිබෙනවා, ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාව. මේ වාර්තාවේ තිබෙන කරුණු මේ රටේ ජනතාව නිසි පරිදි අධ්‍යයනය කළොත් - මේකේ තිබෙන්නේ දූෂණ ක්‍රියා 34ක් සම්බන්ධ වාර්තා පමණයි. මේ රටේ ජනතාව මේ එක එක වාර්තාව කියෙව්වොත්- ඒ අහිංසක මිනිසුන්ගේ බදු මුදල් කොතරම් ප්‍රමාණයක් බලය තිබෙන අය අවභාවිතා කරලා තිබෙනවාද කියලා තේරුම් ගන්න පුළුවන්. මම එකම එක උදාහරණයක් විතරක් කියන්නම්. මේකේ 28වැනි පෙත්සම යටතේ තිබෙනවා, "ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ තිබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු කඩ සාප්පු සහ මහල් නිවාස 2012 දේපළ කළමනාකරණ චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව ලබා දීම හා එකී අමාත්‍යාංශය යටතේ තිබූ ආයතනවල සේවය කරන ලද නිලධාරීන් වෙත නීත්‍යානුකූල ක්‍රමවේදයෙන් බැහැරව පොලිස් නිලධාරීන්ගේ ආරක්ෂාව ලබා දීම සම්බන්ධ පෙත්සම." කියලා. මම මේ කාරණය තමයි උදාහරණයට ගන්නේ. මේ පරීක්ෂණයට අදාළව අනාවරණය වූ පාර්ශ්වයන් හැටියට 17දෙනෙක් හඳුනාගෙන තිබෙනවා. ඒ 17දෙනාගෙන් 6දෙනෙක්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු; තුන්දෙනෙක් දැන් ඉන්න මන්ත්‍රීවරු; තුන්දෙනෙක් හිටපු මන්ත්‍රීවරු. ඒ කියන්නේ නිවාස සංවර්ධන අධිකාරිය සතු දේපළ අයථා විධියට බෙදා හැරීම සම්බන්ධයෙන් චෝදනා ලබපු තුන්දෙනෙක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. තව තුන්දෙනෙක් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. මෙහෙම ඉදිරිපත් වෙන සාක්ෂි ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවකදී හෙළිදරව් වුණොත් හැර, වෙන තැනක නම් මේවා එළියට එන්නේ නැහැ. ඒක නිසා අපි සකස් කර ගත යුතු වන්නේ, අපේ රටේ පවතින නීතිය ක්‍රියාත්මක කර ගැනීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කර ගැනීම සඳහා මේ සාක්ෂි භාවිතා කරන්නේ කොහොමද කියන එකයි. ජනතාවගේ තිබෙන ඉල්ලීමට, ඒ තිබෙන තෙරපුමට මැතිවරණයකින් පස්සේ ආණ්ඩුවක් පිහිටුවූවාට පස්සේ යම් යම් ක්‍රියාමාර්ග ගන්නවා. සාමාන්‍යයෙන් අපේ රටේ සුලභ දේශපාලන සිදුවීමක් තමයි, ඡන්දයක් අවසන් වූවාට පස්සේ විවිධ කොමිෂන් සභා පත් කිරීම. කාලයක් නම් කොමිෂන් සභා තිබුණා. පස්සේ කාලයක ආවා, ඇමති අනුකමිටු. ඇමති අනුකමිටු දාලා තිබෙනවා. ජනතාවත් දන්නවා, මේ කොමිෂන් සභාවලින් වෙන වැඩක් නැහැ කියලා.

විශ්‍රාමලත් විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත කොමිෂන් සභා පත් කරනවා. ඒක පුද්ගල කොමිෂන් පත් කරනවා. සමහර කොමිෂන් සභා වාර්තා ගන්නට තොරතුරු දැන ගැනීමේ පනත එනකල් ඉන්න සිද්ධ වුණා. නමුත් මෙවායේදී විමර්ශනය වන තොරතුරු අපේ අධිකරණ ක්‍රියාදාමයට සම්බන්ධ කර ගන්නේ කොහොමද කියන ගැටලුව තමයි තිබුණේ. මේ තොරතුරු මත පදනම් වෙලා අගතියකින් තොරව, දේශපාලන පක්ෂග්‍රාහීත්වයකින් තොරව, ඉලක්ක කරන ලද තමන්ගේ දේශපාලන ප්‍රතිවිරුද්ධවාදියා මැඩපැවැත්වීමට නොව, සැබෑවටම අල්ලස - දූෂණය වැළැක්වීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන්නට මේ නීති ගෙන එනවා නම් අපි කාටවත් ඒකට විරුද්ධ වෙන්න බැහැ. ඇමතිතුමා පැහැදිලි කරපු විධියටම මේ කොමිෂන් සභාවේ තිබෙන සාක්ෂි පාවිච්චි කරලා කාටවත් දඬුවම් කරන්න බැහැ.

අල්ලස් පනත යටතේ ගැනෙන වරදක් නම් අපට එම සාක්ෂි අධිකරණ ක්‍රියාදාමය සඳහා පාවිච්චි කරන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපේ රටේ තිබෙන පනත්වල බොහෝ බරපතළ අඩු පාඩුකම් නිසා නොවෙයි, හොරු නිදැල්ලේ ඉන්නේ. අල්ලස් පනත, වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත, මුදල් විශුද්ධිකරණ පනත, දණ්ඩ නීති සංග්‍රහයේ සමහර කොටස් යන නීති ප්‍රමාණවත් හොරු අල්ලන්න; හොරුන්ට දඬුවම් කරන්න. හැබැයි, මම කලින් කිව්වා වාගේ මෙවාට සම්බන්ධ වී සිටින්නේ තෝරු මෝරු නිසා, විවිධ ක්‍රම මඟින් -මුදල්වලින් වෙන්න පුළුවන්, ඥාති සම්බන්ධකම්වලින් වෙන්න පුළුවන්, දේශපාලන සම්බන්ධකම්වලින් වෙන්න පුළුවන්- රාජ්‍ය යන්ත්‍රණයේ ඉහළට බලපෑම් කර මේ පරීක්ෂණ ක්‍රියා මන්දගාමී කරන්නට ඔවුන්ට පුළුවන්කම තිබෙනවා. අඩු ගණනේ පළමුවැනි අවුරුදු දෙක තුන පන්නා ගත්තොත්, "ඊළඟ ආණ්ඩුවට එන්නේ අපි, අපි ආවාට පසුව ඕවාට මැදිහත් වුණු නිලධාරීන්ට අපේ ආණ්ඩුව යටතේ දඬුවම් කරනවා" කියලා බලාපොරොත්තුවක් හදාගන්න පුළුවන්. දැන් ඒ ක්‍රියාදාමය පටන් අරගෙන තිබෙන්නේ. එම නිසා ගරු ඇමතිතුමනි, දැනුත් ප්‍රමාද වැඩියි. මේ ක්‍රියාවලිය ආණ්ඩුවේ පළමුවැනි වසර දෙක ඇතුළත සිදු කළ යුතුව තිබුණා.

වංචා, නාස්ති, දූෂණවලට සම්බන්ධ අයගේ ප්‍රධාන උත්සාහය තමයි, තමන් යළි බලයට පත් වෙනවාය කියලා නීතිපති

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

දෙපාර්තමේන්තුවේ, FCID එකේ, පොලිසියේ, අල්ලස් කොමිසමේ නිලධාරීන් තුළ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර වරුන් තුළ භයක් ඇති කරලා මේ කටයුතු අඩපණ කරන එක. ඒක පසුගිය කාලයේ සිද්ධ වුණා. ඔවුන් පසුගිය කාලයේ FCID එකේ අධ්‍යක්ෂවරුන්ට ගල් ගහලා මරනවා කියලා ප්‍රසිද්ධියේ කිව්වා. ශ්‍රේෂ්ඨාධිකරණයේ සමහර විනිශ්චයකාරවරුන්ට තර්ජනය කළා; නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට තර්ජනය කළා. එහෙම කරලා ඔවුන් බැලුවේ ජනබලයක් පෙන්වලා, එහෙම නැත්නම් තර්ජනය කරලා මේ පරීක්ෂණ ක්‍රියාවලිය අඩපණ කරන්නයි. නමුත් ඔවුන්ට ඇඟිල්ල දිගු කරනවා වෙනුවට, ආණ්ඩුවක් හැටියට, ජනවරමක් ලබා ගත් කණ්ඩායම හැටියට මේ වංචනිකයන්ගේ, දූෂිතයන්ගේ මේ ක්‍රියාවලිය ආපස්සට හරවන්නට දැඩි අධිෂ්ඨානයක් තිබුණේ නැහැ කියන චෝදනාව අපට තිබෙනවා. එම චෝදනාව අපට තිබෙනවා. මම කියන්නේ ඒකයි. ඒ තත්ත්වය ආණ්ඩු විසින්ම තමයි හිමි කර ගත්තේ. අපි තවමත් සමත් වෙලා නැහැ කිසිදු ආණ්ඩුවක හිටපු ඇමතිවරයෙකුට, අගමැතිවරයෙකුට එරෙහි වංචා, දූෂණ චෝදනා ඔප්පු කර දඬුවම් කරන්නට. පසුගිය දවසක දකුණු කොරියාවේ හිටපු ජනාධිපතිවරයාට වසර 15ක සිර දඬුවමක් නියම වුණු බව ඔබතුමන්ලා දන්නවා. චීනයේ ප්‍රාන්තවල ආණ්ඩුකාරවරුන්ට, සමහර ඇමතිවරුන්ට දඬුවම් ලැබෙනවා. ලෝකයේ රටවල ඒ නීතිය ක්‍රියාත්මක වෙනවා. හැබැයි, අපේ රටේ වංචා, දූෂණවලට දඬුවම් පැමිණවීමේ ක්‍රියාවලිය පිළිබඳ තිබෙන විශ්වාසය බිංදුවට වටිටාගෙනයි තිබෙන්නේ. දැන් වංචා, දූෂණ විතරක් නොවෙයි, වංචා, දූෂණවලට එරෙහි සටනත් හොරු අතට පත්කර ගන්නයි උත්සාහය තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩිපුර දේශප්‍රේමීත්වය ගැන කථා කරන, වැඩිපුර රට ගැන කථා කරන, වැඩිපුර ජිනීවා ගිහින් රට බෙරා ගන්න ඕනෑ කියන අය දිහා බැලුවොත්, ඔවුන් තමයි වැඩිපුර වංචා, දූෂණවලට හවුල් වී තිබෙන්නේ. ඔවුන් මේ රට ඉදිරියට දමන්නේ, ජාතිය, ආගම ඉදිරියට දමන්නේ වෙන මොකටවත් නොවෙයි, තමන්ට එල්ල වෙලා තිබෙන වංචා, දූෂණවලින් ගැලවෙන්නයි. ඒ නිසා පාර්ලිමේන්තුව හැටියට, මේ රටේ ජනතාවට වගකියන නියෝජිතයන් හැටියට කවර පැත්තකින් සිද්ධ වුණත් - ඒක පසුගිය ආණ්ඩුවෙන් වෙන්න පුළුවන්, මේ ආණ්ඩුවෙන් වෙන්න පුළුවන්, අනාගතයේ ඇති වන ආණ්ඩුවකින් වෙන්න පුළුවන්- වංචා, දූෂණ, නාස්තිය වැළැක්වීමට තිත තැබීමට වගකීමක් තිබෙනවා කියා අපි හිතනවා. අපි කළ යුතු වන්නේ පුද්ගලයන් ඉලක්ක කර ගත් දඬුවම් ක්‍රමවේද සකස් කිරීම නොවෙයි. ඒ වෙනුවට පුද්ගලයන්ට රිංගා යන්න බැරි විධියට යම් ශක්තිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක පමණ කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

වංචනිකයන්ට, දූෂිතයන්ට රිංගා යන්න බැරි විධියේ ශක්තිමත් දූෂණ විරෝධී යන්ත්‍රණයක් සකස් කළ යුතුව තිබෙනවා. වංචනිකයන්ට, දූෂිතයන්ට අධිකරණය මඟින් දඬුවම් පමුණුවයි කියන විශ්වාසය ජනතාව තුළ ගොඩ නැඟිය යුතුව තිබෙනවා. මේ ආණ්ඩුවට රටේ ආර්ථිකය ගොඩ නඟන්න බැහැ. කියපු ආකාරයට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරලා ප්‍රජාතන්ත්‍රවාදය ගොඩ නඟන්න මේ ආණ්ඩුවට බැරි වේවි.

හැබැයි, වංචාවට, දූෂණයට එරෙහිව ශක්තිමත් ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ලැබුණු ලක්ෂ හැටදෙකක ජනවරම මත පිහිටා, මේ ආයතන ශක්තිමත් කරලා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම පිළිබඳව, එහි නිලධාරීන් පිළිබඳව, ඒ විශේෂඥභාවය, වෘත්තීයභාවය ගැන ජනතාවගේ විශ්වාසය තහවුරු කරලා මේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන්න පුළුවන් නම්, අඩු තරමින් තමන් ගත්ත ජන වරමට යම් සාධාරණයක් වේවි කියලා මා හිතනවා. නමුත්, අපට ඒ පිළිබඳව මහා විශ්වාසයක් නැහැ. මොකද, මේ ආණ්ඩුවේ හැසිරීම තුළ පෙන්නුම් කරන්නේ ඔවුන්ද හොරු ආරක්ෂා කරනවා, ඔවුන්ට ඉඩ කඩ දෙනවා කියන එක පමණයි. නමුත්, ජනාධිපතිවරයා හරහා පාර්ලිමේන්තුවට ආපු මේ උත්සාහය, වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් පැමිණවීමේ ක්‍රියාවලිය එක දශමයකින් හෝ ඉස්සරහට ගන්නට ශක්තියක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් මගේ අදහස් ඉදිරිපත් කිරීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.02]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ අමාත්‍යවරයා වෙනුවෙන් ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා අද මෙම පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කළා. එතුමා ප්‍රකාශ කළා, "මේ නඩු සම්බන්ධ කරුණු කාරණා ඉක්මන් කරන්නයි මේක කළේ" කියලා. ඒ කියන්නේ, duplicate නොවී ඉක්මනින් අදාළ කටයුතු කරගන්නයි එතුමා උත්සාහ කරන්නේ කියලා කිව්වා. ඒක බොහොම හොඳයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ගත්ත ඒ පියවර ගැන අපි සතුටු වෙනවා. එහෙම තමයි කෙරෙන්න ඕනෑ. නමුත්, ඔබතුමා මේ කථාව ඇත්තටම අවංකවම කිව්වාද කියන එක ගැනයි මට සැක. ඇයි මම එහෙම කියන්නේ? පසුගිය කාල වකවානුවේ සිද්ධ වුණු දේවල් දිහා බැලුවාම, මේ "ස්වාධීනයි" කියන කොමිෂන් සභාවලින් අවංකවම කටයුතු සිද්ධ වුණාද කියන ප්‍රශ්නය තිබෙනවා. එක්තරා වෙලාවක ඔබතුමාත් ප්‍රකාශ කර තිබෙනවා, එහෙම අවංකව කටයුතු කරලා නැහැයි කියන කාරණාව. ගරු ඇමතිතුමනි, ඔබතුමා එක වෙලාවක කිව්වා, "පොලිස් කොමිසම මහළු මඩමක් වාගෙයි" කියලා. ඒක වැඩක් නැති ආයතනයක් කිව්වා. ඉතින් මේ රටේ ස්වාධීන ආයතන පිළිබඳව ගරු ඇමතිතුමන්ලා දරන අදහස මේක නම් මේවාට තවත් බලතල දෙන්නේ මොකටද? මේවා ගැන තවත් කථා කරන්නේ මොනවාද? මේවා කොමිෂන් සභාද?

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඒකාබද්ධ විපක්ෂය "Top Ten" නමින් පැමිණිලි 10ක් ඉදිරිපත් කර තිබෙනවා, දැනට අවුරුදු දෙකකට කලින්. මේ වනතුරු ඒවා ගැන කරපු පරීක්ෂණය මොකක්ද? නමුත්, ගරු ඇමතිතුමනි, ඔබතුමා කියනවා, "මේ කටයුතු ඉක්මන් කරන්නයි මේ සංශෝධනය ගෙනෙන්නේ" කියලා. මේක ඉක්මනක්ද? මේ රටේ ආර්ථිකය කඩා දමාපු, මේ රට විනාශ කරපු, බඩු මිල වැඩි වෙලා අද ජනතාවට දුක් විඳින්න හේතු වුණු හොරකම, මේ රටේ සිද්ධ වුණු දැවැන්තම හොරකම වන මහ බැංකු බැඳුම්කර හොරකමට අදාළ පරීක්ෂණ කටයුතු ඉක්මන් කරන්න තමුන්නාන්සේලා මෙහෙම දෙයක් කළාද? ඒකෙන් හෙළිදරව් වුණු කරුණු පිළිබඳව,

එක්තරා අමාත්‍යවරයකුට විරුද්ධව නැඟුණු චෝදනා ගැන ජනාධිපතිතුමාගේ නියෝගයක් අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් විභාග කරනවා, පරීක්ෂණ කරනවා, නඩු දමනවා කියලා කිව්වා. අද වනතුරු ඒක කළාද? මෙච්චර කාලයක් මේ වැඩ කරන්න බාධා වෙලා තිබුණු නීතියක්ද තමුන්නාන්සේ මේ ඉවත් කරන්නේ?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
බාධාවක් -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
හැබැයි, අපේ ඒවාට ඒ බාධාව නැහැනේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, දැන් Bond Commission එකේ වාර්තා තිබෙනවා. ඒ කොමිසමට ඉදිරිපත් වුණු සාක්ෂි පදනම් කරගෙන පමණක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට නඩු පවරන්න බැහැ. නමුත්, මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ නැවත වතාවක් පරීක්ෂණ, ගවේෂණ නොකර, ඒ ලැබුණු සාක්ෂි මත යැපෙන්න පුළුවන් නම්, ඒවා ප්‍රමාණවත් නම් ඒ මත නඩු දමන්න පුළුවන්. ඒ වෙනුවෙන් තමයි මේ සංශෝධන ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(මාණ්පුමිකු මහින්ත යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමා විද්වත් නීතිඥයකු හැටියට කියපු කාරණාව මා භාර ගන්නවා. නමුත් මා අහන්නේ මේකයි. මේ වනතුරු එහෙම කළාද? [බාධා කිරීමක්] නැහැනේ? මේ වනතුරු ඒක කළාද ඇහුවාම ඔබතුමා පිළිතුරක් දෙන්නේ නැහැ. ඉතින්, මොකද කරන්නේ? මේ ගැන සිහි කැඳවීම් කරලා තිබෙනවා. මේක මේ තරම් හදිසියට කරන්නේ මොකද? මේ බාධා ඉවත් කරලා, "මේක තමයි මෙතැනින් එහාට අපට තිබුණු ලොකුම බාධාව. ඒ නිසා අපි ඒක ඉවත් කළා"යි කියලා කිව්වා නම්, අපි ඔබතුමාගේ වචනය සතුටින් පිළිගන්නවා. නමුත්, මේකත් එක බාධාවක්. නමුත් ඒ බාධාවක් නැතිව කරන්න පුළුවන් දේවල් ඇහුවාම ඔබතුමා මෙහෙම කියනවා. ඉතින්, මේකේ තේරුම මොකක්ද? ඒ ගැන ඔබතුමාට කරන්න දෙයක් නැහැ. ඒක ඇත්ත. මේ යන්නේ වෙන ගමනක්ය කියන එක තමයි අපි කියන්නේ. මේ යන්නේ දේශපාලන පළිගැනීම් තව තවත් පහසු කර ගැනීම සඳහා තමන්ට තිබෙන බාධාවන් ඉවත් කර ගන්නයි. ඒක ඔබතුමා සභාවට කියන්න. රටටම කියන්න. අලුත් උසාවියක් දාලා ඒක කරගෙන යනවා. ඒකට වුවමනා කරන තව අඩුපාඩු තිබෙන ඒවා තමයි හදන්න හදන්නේ. මේකේ ඉලක්කය මෙතැන නොවෙයි. මේකේ ඉලක්කය කොහේද තිබෙන්නේ? මෙපමණ කාලයක් -මේ පසුගිය කාල වකවානුව තුළ- මේ ආණ්ඩුව කරගෙන ආපු දේශද්‍රෝහී, දුෂ්ට පළිගැනීමේ වැඩ පිළිවෙළේ තවත් එක් අංගයක් තමයි මේ කරන්න හදන්නේ. පොඩි බාධාවක් ඉවත් කර ගැනීම. හැබැයි, මෙපමණ කාලයක් මේ රටේ මහා විනාශයක් සිදු කරපු දේවල් ගැන කථා කළේ නැහැ.

දැන් මේ එල්ල කරපු චෝදනා අතරේ තිබෙනවා, - හොඳයි, එපමණ ඕනෑ නැහැ. ඊයේ-පෙරේදා අමාත්‍යවරයකුගේ ගිණුමකට රුපියල් ලක්ෂ 1,500ක මුදලක් බැර වෙලා තිබෙනවා. ඒක ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී පිළිගත්තා. නැහැ කිව්වේ නැහැ. මහ බැංකු අධිපතිවරයා පිළිගත්තා, ඒ ගිණුම freeze කරලා තිබෙනවා කියන එක. මම දන්නේ නැහැ ඒක බොරුවට කිව්වාද කියලා. කොහොම හරි රූපවාහිනී සාකච්ඡාවේ දී කිව්වා, ඒක freeze කරලා තිබෙනවා කියලා. [බාධා කිරීමක්]

කාගේද කියලා දන්නේ නැතිව freeze කරන්න බැහැ නේ. ඒක කළුවරේ අත ගාලා freeze කළේ නැහැ නේ. ඒකටද මේ යන්නේ? ඒක ගැන හොයන්න තිබෙන බාධාවක්ද මේ ඉවත් කරන්නේ? ඔබතුමා ඒක කියන්න. ඒ වාගේ වැදගත් දෙයක්, ඒ වාගේ දැවැන්ත දෙයක් හොයා ගන්න තිබෙන පොඩි බාධාවක් තමයි මේ ඉවත් කරන්නේ. ඒකද, මේ කරන්න හදන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකයි මේ කතාන්දරය. මෙහි තිබෙන්නේ මෙතැනින් එහාට ගිය දුෂ්ට අරමුණක්. බලාපොරොත්තුව මේක නොවෙයි. මේ කරුණු කාරණා යථා පරිදි යහපත්ව රටේ යහපත වෙනුවෙන් - [බාධා කිරීමක්]

එතුමා කිව්වේ එහෙම කරන්න නොවෙයි. එතුමා කිව්වේ, මුදල් අවභාවිතය සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කරන්න පුළුවන් කියලායි. එකම නඩුවයි දාලා තිබෙන්නේ. ඒ, ඒ කාලයේ. එතකොට මේ කාලයේ මොකද වෙන්නේ? මේ කාලයෙත් වෙන්නේ ඒකම නේ? හැබැයි, වුවමනා ඒවාට යනවා. රජයෙන් තීන්දු කරන ඒවාට, අග්‍රාමාත්‍යවරයාගේ නිල නිවාසයෙන් ගන්නා තීන්දුවලට, අරලිය ගහ මන්දිරයෙන් ගන්නා තීන්දුවලට ක්‍රියාත්මක වෙනවා. මේක තමයි මේ රටට හඳුන්වා දීලා තිබෙන අලුත්ම සංස්කෘතිය. එතැන තමයි මේ කාර්යාලය තිබෙන්නේ. ඒ, කාමරයේ තමයි මේක තීන්දු කරන්නේ. මලලසේකර මාවතේ නොවෙයි. ඒ අතින් බැලුවාම, ඒ මිනිසුන් අසරණයි. ඒ ගොල්ලන් කියාපු දේවල් තමයි මේ කරන්නේ. එහෙම නැත්නම් මොකද වෙන්නේ? එහෙම නැත්නම් තනතුර නැහැ; එහෙම නැත්නම් promotion එක නැහැ. එහෙම නැත්නම් ඊළඟ ලාභය ලෝභය නැති වෙනවා. Station එක නැහැ. ජොන්ස්ටන් ප්‍රනාන්දු මහත්මයාගේ නඩුව කුරුණෑගල අධිකරණයේ දී විභාග වෙනවා. මොනවාද, එදා උසාවියේ දී මතු වුණේ? උසාවියේ දී එක් කරුණක් මතු වුණා. එක්තරා නිලධාරිනියක් ඇවිල්ලා සාක්ෂි දුන්නා, "මා ලව්වා බලහත්කාරයෙන් බිල්පත් වෙනස් කෙරෙව්වා" කියලා. උසාවියටයි එහෙම කිව්වේ. ඔබතුමා නීතිඥයෙක්. "අත්සන හොරට ගැහුවා" කියලා එතුමිය උසාවියට ඇවිල්ලා කිව්වා. එතුමිය කිව්වා, මගෙන් බලහත්කාරයෙන් මේවා කරවා ගත්තා කියලා. ඒවා කරවන්නද මේ හදන්නේ? නැවත අනාගතයේත් ඒවාම කරන්නද හදන්නේ? දැන් හඬපටයක් ගැන කථාවක් තිබෙනවා. මොකක්ද, ඒ හඬපටය අරගෙන කරපු පරීක්ෂණය? ඒකද, මේ වුවමනා කරන්නේ? FCID එකේ තිබෙන හඬ පටය. ඒවායේ පොඩි අඩුපාඩුවක් තිබුණා නම් දැන් මේකෙන් නිවැරදි කර ගන්නද හදන්නේ? ඒක නේ දැන් මේ කර ගන්න හදන්නේ. Panama Deposits ගැන කවුරුවත් හොයනවාද? මම හිතන්නේ එහෙම නැහැ නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඇමතිතුමාගේ යාළුවාගේ ගිණුම් එහෙම තිබුණා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(මාණ්පුමිකු මහින්ත යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
"පැනමාවල ගිණුම් තිබෙනවා"යි කිව්වා. නමුත්, අපේ Commissions කිසි එකක් ඒ ගැන හොයන්න, බලන්න ගියේ

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

නැහැ. මේ මොකක්ද කියලා බලන්න ආණ්ඩුවේ වියදමින් අඩු ගානේ පැනමාවට ගිහින් එන්න තිබුණේ නේ. හුහක් වෙලාවට මේවා කෙරුණේ එහෙම නේ. පසුගිය කාලයේ FCID එක මේවා හොයන්න, ඕස්ට්‍රේලියාවට ගියා; සිංගප්පූරුවට ගියා. ඒ ගුවන් ගමන්වලට ගෙව්වෙත් අපේ සල්ලි නේ; මේ රටේ ජනතාවගේ සල්ලි නේ. රටේ සල්ලි වියදම් කරලා, එහෙම ගිහිල්ලා ආවා නේ. මොනවා හරි සොයාගෙන ආවාද? මොනවා හරි කළාද? පැනමා කියන්නේ, නිතර යැවෙන රටක් නොවෙයි. ඈත තිබෙන රටක්. නිකම් හෝ ගිහින් ආවා නම්, අඩු වශයෙන් ඒකත් එකක්. මේ තොරතුරු වාගේම, FCID එක ගැන, එතැන වෙන්නේ මොකක්ද කියලා තමුන්නාන්සේලා හැමෝම දන්නවා. එතැන කළේ මොකක්ද කියලාත් තමුන්නාන්සේලා දන්නවා. ඒ කරපු කාරණා නීත්‍යානුකූල කර ගැනීමේ උත්සාහයක් නේද ඔබතුමා මේ දරන්නේ කියලා මා අහනවා. ඒක නේද මේ කරන්න හදන්නේ? පොඩි අඩු පාඩුවක්, නීත්‍යානුකූල නොවන තැනක් තිබෙනවා නම්, මේකෙන් පුළුවන් ඒක හදා ගන්න. ඒකයි මේ කරන්න හදන්නේ. ගරු ඇමතිතුමනි, මේ තත්ත්වය ඉතා අවාසනාවන්තයි කියලා කියන්නේ ඒකයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමනි, මේ සංශෝධිත පනත් කෙටුම්පත හරහා අපි අරමුණු කරන්නේ ඔබතුමා කියන කාරණය නම්, ඒ කාර්ය ඔබතුමන්ලා 2008 වසරේ ඉෂ්ට කර දීලායි තිබෙන්නේ. ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, අඩු පාඩුව ඒක නම්, ඔබතුමන්ලා ඒ අඩු පාඩුව 2008දී නිවැරදි කර දීලා තිබෙනවා. 2008 වසරේදී මේ පනතට සංශෝධනයක් ගෙනැල්ලා, මේ සාක්ෂි පිළිගත හැකි සාක්ෂි විධියට භාරගෙන නඩු පවරන්නට නීතිපතිවරයාට බලය දීමේ සංශෝධනය ඔබතුමන්ලා සම්මත කළා. ඒක කළේ, 2008දී.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ඔබතුමා ඒ කියන්නේ, අපි ඉල්ලගෙන කෑවා කියලාද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒක මම දන්නේ නැහැ. ඉල්ලගෙන කාලාද, දීලා කාලාද කියලා දන්නේ නැහැ. අපි ඒකම කරනවා කියලා ඔබතුමා අපට චෝදනා කරනවා නම්, අපි නොවෙයි, ඒක කර තිබෙන්නේ ඔබතුමන්ලා බව මම කියන්න කැමැතියි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු ඇමතිතුමනි, මේ රටේ මැතිවරණයක් ඉවර වුණාම සාමාන්‍යයෙන් ගෙවල්වලට ගහනවා; ගල් ගහනවා. ඒ වාගේම ගොම ගහනවා, තණකොළ ගිහින් දානවා, කිතුල් කොටයක් ඇදගෙන ගිහින් දානවා. ඉස්සර කළේ එවා නේ. මට මතකයි 1977 ආණ්ඩුව පෙරළුණු වෙලාවේ විරුද්ධ පක්ෂයේ උදවියව ලේක්හවුස් එකේදී කොළ පාට වතුරෙන් නෑව්වා. පළි ගැනීම් කියලා කළේ ඒවා නේ. හැබැයි, 2015න් පස්සේ ඒවා වුණේ නැහැ. අවුරුදු හතරක් තිස්සේ, නොමරා මරනවා; නොමරා මරනවා. මේ කරන්නේ ඒක නේ. මේ පසුගිය අවුරුදු කීපය තුළ දේශපාලන පළිගැනීම් තුළින් නොමරා මරනවා. උසාවිවලට ඇදගෙන යනවා. නීතිය හදනවා. ගරු ඇමතිතුමනි, සුද්දෝ මේ රට අල්ලා ගත්ත වෙලාවේ ජෝන් ඩොයිල් කළෙත් මේක තමයි. ඔබතුමා ඒ ඉතිහාසය අරන් බලන්න. ඔබතුමා හොඳට ඉතිහාසය දන්නවා. ඉංග්‍රීසි ආණ්ඩුව මේ රටේ ජනතාවගේ නිදහස් ගමන පාලනය කළේ කොහොමද කියා බලන්න. උසාවි හැදුවා; නීති හැදුවා; බොරු චෝදනා දැම්මා; අන්තිමට ඒ මිනිස්සු හිරේට දැම්මා. එදා හෙන්රි පේදිස් මැතිතුමා ගෙනගිහින් මරා දැම්මේ, එතුමා කරපු වරදකට නොවෙයි. නීතිය හැදුවා. නීතිය හදලා එතුමාව මරා දැම්මා. ඔබතුමන්ලා ඒ ගැන උනන්දු වෙලා, ඒ චිත්‍රපටය හදපු එක ගැන මම සතුටු වනවා. ඒ මනුස්සයා මරා දැම්මා. රට තුළ යම්කිසි වැඩ පිළිවෙළක් කරගෙන ආපු, රට වෙනුවෙන් කථා කරපු ඒ උදවිය මරා දැම්මා. ගරු ඇමතිතුමනි, අද වෙන්නෙත් ඒකයි. මේ ආණ්ඩුවේ ඉන්න එක ගැන ඔබතුමා ලජ්ජා වෙන්න ඕනෑ. ඔබතුමා ඉස්සර ලජ්ජා වුණා. මම හිතන විධියට දැන් නම් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ලජ්ජා නහරය කපලා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

තාවකාලිකව ඒක පොඩ්ඩක් ඉවත් කරගෙන. අපි ඒ ගැන සතුටු වනවා. කොහොම හරි කමක් නැහැ. මේ කුණු ගොඩට ඔබතුමා උදව් කරන්න. මේ ජරාගොඩ ඇදගෙන යන්න ඉඩ දෙන්න. ඔබතුමන්ලා ඉතිහාසයට එකතු වනවා. එකතු වන්නේ, ඉතාමත් දරුණු ලෙස පළිගත්ත ආණ්ඩුවක් විධියට. ඉතාමත් සූක්ෂම විධියට නීතිය මෙහෙයවලා පළිගත්ත ආණ්ඩුවක් හැටියටයි මේ ආණ්ඩුව ඉතිහාසයට එකතු වෙන්නේ. ඒකට ඔබතුමා දායක වෙන්න එපා. ඔබතුමා, ශ්‍රේෂ්ඨ ගණයේ නීතිඥයෙක්; අපි ගරු කරන පුද්ගලයෙක්. ඔබතුමා අපේ ගමේ, අපි ගරු කරන, අපිට ආඩම්බරයක් වෙච්ච පුද්ගලයෙක්. ඔබතුමා මේවාට දායක වෙන්න එපා. ඔබතුමා මේවාට විරුද්ධව නැඟී සිටින්න. යුතුකම වෙනුවෙන් නැඟී සිටින්න.

යුතුකම වෙනුවෙන් කෙළින් සිටින ගුණය ඔබතුමාගේ ලේවල තිබෙනවා. ඒක ඉතිහාසයේ ඉඳලාම තිබෙනවා. ඒක අපි දන්නවා. ඒක හැම දාම තිබුණා. ඔබතුමා ඒක මේ වෙලාවෙත් පාවිච්චි කරන්න. ඔබතුමා වැදගත් තනතුරකයි ඉන්නේ; ආණ්ඩුවත් එක්කයි ඉන්නේ. ඔබතුමා මේ යුතුකම වෙනුවෙන්; රට වෙනුවෙන් පෙනී සිටින්න. ඒක ඔබතුමාගේ උරුමයක්. ඒක අධිකරණය වෙනුවෙන් ඔබතුමාගේ උරුමයක් හැටියටයි අප දකින්නේ. ඔබතුමා මේ කරුමයට අත ගහන්න එපා. මේ නොවැදගත්, ඉතාම පහත්, දේශපාලන පළිගැනීම් වැඩ පිළිවෙළට ඔබතුමා දායක වන්න එපාය කියන ඉල්ලීම කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා.12.17]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මට පෙර කථා කළ කථිකයන් කිහිපදෙනෙකුගේ කථා මම අහගෙන හිටියා. ඇත්තටම මේ පනත ප්‍රථමයෙන්ම ඉදිරිපත් කළේ 1994 වර්ෂයේ පත් වුණු අපේ ආණ්ඩුවකින් බව මම මුලින්ම මතක් කරන්න කැමැතියි. ඊට කලින් තිබුණු අල්ලස් පනත ඉවත් වෙලා නව පනතක් හැටියට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත ඉදිරිපත් වුණේ 1994දී පත් වුණු අපේම රජයකින් නිසා, මේ පනත ගැන අදහස් රාශියක් ඉදිරිපත් කරන්න අපට ඉඩ තිබෙනවා.

"මේ රටේ මන්ත්‍රීවරු බොහොම දූෂකයෝ, අල්ලස්කරුවෝ" කියා අද ලංකාවේ ලොකු මතයක් ඇති කර තිබෙනවා. 1994 වර්ෂයේ බලයේ සිටි එක්සත් ජාතික පක්ෂ රජයේ පරාජයටත් මේ අල්ලස හා දූෂණය විශාල වශයෙන් බලපෑවාය කියා මට මතකයි. ඒ කාලයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම යටතේ තිබුණු, තේ, පොල් වගා කරන්න නිසි කළමනාකාරිත්වයක් යටතේ මහජනයාට බෙදා දුන් ඉඩම් එක්සත් ජාතික පක්ෂයේ එවකට සිටි සමහර මන්ත්‍රීවරු, ඇමතිවරු අක්කරය රුපියල ගණනේ අරගෙන, ඒ ඉඩම් තමන්ගේ නමට පවරා ගත්තා. ඒකත් දූෂණයක්; අල්ලසක්. හැබැයි, 1994දී ආ පනතින් අපූරු වැඩක් සිද්ධ වුණා. ඒක තමයි, එවකට තිබුණු පනත පරිවිඡින්න වෙලා අලුත් කොමිෂන් සභාවක් ගෙන ඒම. එම නිසා එදා ඒ ආණ්ඩුවේ තිබුණු දූෂණ වැහුණා. මොකද, අලුතෙන් ගෙනා පනත නිසා ඔවුන්ට නඩු දමන්න බැහැ. එම නිසා ඒ අය මොනවත් නොකරපු අය හැටියට හිටියා. යම් පුද්ගලයකුගේ වරදකට දඬුවම් කිරීම සඳහා අපි ඔවුන් පසුපස එළවා ගෙන යා යුතුයි කියා මම කියන්නේ නැහැ. නමුත්, ඒක වුණා.

පසුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තුළින් විශේෂ දෙයක් වුණා. මෙතෙක් කල් පැවැති, "අල්ලස" කියන වචනයට "දූෂණය" -Corruption- කියන වචනයත් එකතු වුණා. මේ වචනය හරිම බියකරු වචනයක්. මේ යටතේ සාමාන්‍ය මන්ත්‍රීවරයකු පළමුවන ශ්‍රේණියට දරුවකු දමන්න කියලා විදුහල්පතිවරයකුට දෙන ලිපියක් පවා දූෂණයක් හැටියට ගැනෙන්න පුළුවන්. එහෙම නඩුවක් පසුගිය කාලයේ මහ ඇමතිවරු එක් කෙනෙකුට හෝ දෙදෙනෙකුට පවරා තිබුණා. ඒ නඩුව ඉදිරියට ගියාද කියා මම දන්නේ නැහැ.

මේ "දූෂණය" කියන වචනයට අර්ථ නිරූපණයක් අවශ්‍යයි කියා මගේ හැම දාම තර්කයක් තිබෙනවා. "දූෂණය" කියන්නේ මොකක්ද? එහෙම නැත්නම්, මේ රටේ පාර්ලිමේන්තුවට පත්වන මන්ත්‍රීවරයකුට, ඇමතිවරයකුට කිසි වැඩක් කරන්න හම්බ වන්නේ නැහැ. තමන් සද්භාවයෙන් වැඩ කළාය කියලා කියන්නේ තමන්නේ. නමුත්, ඒක ඔප්පු කරන්නේ කොහොමද? රජයක වැඩ කරනකොට කරන්න වැඩ සම්භාරයක් තිබෙනවා. රජයේ නිලධාරියකු කරන වරදක් පවා කැබිනට් මණ්ඩලයට ගෙන ගියොත්, කැබිනට් ඇමතිවරයා ඊට වග කිව යුතු තරමට මේ තත්ත්වය පුළුල් වෙලා තිබෙනවා.

දෙවැනි කාරණය තමයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඇමතිවරු "හොරු" කියලා අදහසක්, නැත්නම් මතයක් අද රටේ පැවතීම. ඕනෑම බිත්තර ගොඩක් ඇතුළේ එක කුණු බිත්තරයක් තිබෙන්න පුළුවන්. හැබැයි, අනික් බිත්තර සියල්ලම නරක් වුණු ඒවායි කියලා ඒකෙන් අදහස් කරන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා සිටින දෙපැත්තේම, තුන්පැත්තේම අය මම බොහොම හොඳට අඳුරනවා. ඒ බොහෝ අය ඉතාම වැදගත් අයයි. ඒ අය තමන්ගේ රාජකාරිය අකුරට ඉටු කරන්න බොහොම මහන්සි ගන්නා අයයි. එම නිසා මේ සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කිරීම වැරැදියි කියන එක මම අදහස් කරනවා.

පසුගිය කාලයේ කොමිෂන් සභා පත් කළා. මම ඒ කොමිෂන් සභාවලට අගෞරවයක් කරන්න කැමැති නැහැ. නමුත්, ඉතාම කීර්තිමත් නිලධාරීන් මේ කොමිෂන් සභාවලට ගෙන්වලා, ඒ අයගෙන් ප්‍රශ්න කළා.

ඒ අයගෙන් කීපදෙනෙක් ගැන මම දන්නවා. මා හිතන විධියට, ඔවුන් රාජ්‍ය සේවයේ සිටි ඉතාම විශිෂ්ට ගණයේ නිලධාරීන්. මම දන්නා එක් නිලධාරියෙක් ඉන්නවා, ඔහු කවදාවත් තමන්ගේ රාජකාරිය වැරැදි විධියට පාවිච්චි කළේ නැහැ; අල්ලසක් ගත්තේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහු කොයි තරම් ජාති මාමකයකුද කියා කිව්වොත්, මේ රටේ හදන්නේ නැති බඩුවක් කවදාවත් තමන්ගේ ගෙදරට ගෙන ගියේ නැහැ. නමුත්, ඔහුටත් චෝදනාවක් එල්ල වුණා. ඔහුත් ගිහින් බංකුවක් උඩ වාඩි වෙලා කට උත්තරයක් දුන්නා. මා මේ එක් උදාහරණයක් පමණයි කියන්නේ. මම ඔහුගේ නම කියන්නේ නැහැ. ඔහු ලංකාවේ සිටි කීර්තිමත් විද්‍යාඥයෙක්. ඔහු එයින් කලකිරිලායි සිටියේ. කොයි තරම් කලකිරීමට පත් වෙලා සිටියාද කිව්වොත්, තමන්ගේ රෝගී තත්ත්වය උත්සන්න වෙලා ඔහු මිය ගියා. අපි මේවා ගැන කල්පනා කරන්න ඕනෑ. කොමිෂන් සභා පත් කරලා, ගිය ආණ්ඩුවේ සිටි සියලුදෙනාම හොරු කියලා එහි වැඩ කරපු මිනිසුන් ඇතුළු සියලුදෙනාම එකට ගෙනැත් දමලා FCID එකට, එහේට, මෙහේට ගෙන යෑම නිසා කීදෙනකුගේ සිත් නරක් වෙලා තිබෙනවාද? ඒ අය වැදගත් මිනිස්සු. මේ වැඩේ අරමුණ මොකක්ද? අරමුණ වෙලා තිබෙන්නේ, ඒ ආණ්ඩුවේ සිටි සේරම අය වැරැදියි කියා ඒ අයට නඩු පවරන එක නම්, කරුණාකර ඒ මතය ඉවත් කරගන්න කියා මා ඇමතිතුමාට කියන්න කැමැතියි. වරදක් කර තිබෙනවා නම්, ඒ වරදට දඬුවම් දෙන්න. හැබැයි පොදු basket එකකට දමලා සියලුදෙනාම එකම තැනකට ගෙන යන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උසාවියේදී සාක්කි පිට ඔප්පු වී තිබෙනවා, FCID එකේ නිලධාරීන් දෙදෙනෙකු කොළ කඩලා තොරතුරු ඇතුළත් කර තිබෙනවාය කියා. මා නම් එය පුවත් පත්නුයි දැක්කේ. එහෙමද, පරීක්ෂණ කරන්න ඕනෑ? පරීක්ෂණ කරනවාය කියන එකෙන් අදහස් කරන්නේ, සත්‍යය වටහා ගැනීමයි. මා ඊට උදාහරණයක් ගෙනෙන්නම්. ඕස්ට්‍රේලියාවේදී අපේ ලාංකිකයෙක් -මුස්ලිම් ජාතික ළමයෙක්- ඒ රටේ ත්‍රස්තවාදී කටයුත්තක් සම්බන්ධයෙන්ය කියා අත් අඩංගුවට ගත්තා. මොකක්ද, ඔහුට කර තිබුණු චෝදනාවට අදාළ වරද? ඔහු සමහම වැඩ කරන එක්කෙනා කියා තිබුණා, "ත්‍රස්තවාදී ක්‍රියාවලින් මරණයට පත් කළ යුතු ආණ්ඩුවේ අය ගැනත්, ස්ථාන කිහිපයක් ගැනත් ඔහුගේ note පොතේ ලියා තිබෙනවා" කියා. ඔහු අත් අඩංගුවට ගත්තා. කිසිකෙනෙකුට බලන්න යන්න දුන්නේ නැහැ. නීතිඥයකුට පමණයි හම්බ වෙන්න ඉඩ දුන්නේ. ඒ, තමුන්නාන්සේලාගේ ඇමතිවරයකුගේ ඥාති පුත්‍රයෙක්. හැබැයි, එහිදී මොකක්ද වුණේ? අවසානයේදී සොයා ගත්තා ඒ note පොතේ තිබෙන්නේ ඔහුගේ අත් අකුරු නොවන බව. සොයා ගත් දෙවැන්න මොකක්ද? ඒ note පොත ඒ වෙලාවේ ඔහු සතුව තිබුණේ නැහැ කියාත් ඔප්පු වුණා. ඒ රටේ සිටින රාජ්‍ය නීතිඥයා අධිකරණයට -උසාවියට- ගිහින් කිව්වා, "ඔහුට ඇප දෙන්න, අපි තවත් පරීක්ෂණ කරනවා. ඇප දුන්නාට පසුව ඔහු ඕස්ට්‍රේලියාවේ සිටියාවේ, මොකද, මේ අත් අකුරු එයාගේ නොවෙයි, මේ note පොත ඒ වෙලාවේ එයා භාරයේ තිබුණේ නැහැ" කියා. එහෙම

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

පරීක්ෂණ පවත්වන නිලධාරීන් පෙළක් ලංකාවේ සිටිනවාද? මා තමුන්නාන්සේලාගෙන් අහන ප්‍රශ්නය එයයි. මොකද, කවදා හෝ දවසක තමුන්නාන්සේලාටත් එහෙම වෙනවා. එදාටත් කියන්න ලැහැස්ති වෙනවාද, "අපටත් විරුද්ධව පැමිණිලි කළේ වැරදි විධියටයි" කියා? යමක් කරනවා නම්, එය අයුතු ලෙස භාවිත කරන එක ඉස්සර වෙලාම නවත්වන්න. අපටත් තිබෙනවා, තොරතුරු ගොඩවල්. ඒවා අධිකරණයට යන්න තිබෙන හින්දා අපි ඒවා ගැන ඒක මෙක කථා කරන්නේ නැහැ.

"මේවා හැදුවාම ලංකාවේ අපරාධ සේරම නැතිව යනවා" කියා කලින් කථා කළ එක් මන්ත්‍රීවරයෙක් කිව්වා. ලෝකයේ දියුණුම රටවලටවත් එය කරගන්න බැරිව ඉන්නවා. අපට පාලනය කරන්න පුළුවන්. පාලනය කිරීම සඳහා නීති අවශ්‍ය බව මම පිළිගන්නවා. හැබැයි, පරීක්ෂණ පවත්වන අය සද්භාවයෙන් ඒක කරනවාද? තමන් අතින් වරදක් වුණා නම් වරදක් වුණාය කියා අධිකරණය ඉදිරියේ ඍජුව කථා කරන්න පුළුවන් අය ඉන්නවාද? මොකද, මේ හැම එකකටම දේශපාලනය ඇතුළු කර තිබෙනවා. තමුන්නාන්සේලා FCID එක හදනකොට සොයා බලා ඒක ඇතුළට ගත්තේ තමුන්නාන්සේලාගේ ඉතාම භක්තිමත් පාක්ෂිකයන්. එය අද කවුරුත් දන්නවා. මා ඒ ආයතන ගැන දොස් කියනවා නොවෙයි. වුණු සිදුවීම් ගැන විතරයි මා කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප එක දෙයක් මතක තබා ගන්න ඕනෑ. අප යම් නීතියක් ගෙනෙනවා නම්, ඒ නීතිය ඉදිරියට ගෙන යන මිනිසුන්ටත් ආත්ම ගෞරවයක්, අදහසක්, ඔවුන් කරන කාර්යය පිළිබඳ තමන්ගේ නිවැරැදිභාවය ප්‍රකාශ කිරීමේ අදහසකට අවස්ථාවක් ඉතිරි කරන්න ඕනෑ. ඕනෑ තරම් නීති ගෙනෙන්න අපට පුළුවන්. ඕනෑ නම්, තවත් ඉදිරියේදී නීතියක් ගෙනෙන්න පුළුවන්, පුද්ගලයකු වරදක් කර තිබෙනවා නම්, ඒ වරද කළේ නැති බව තමන්ම ඔප්පු කරන්න ඕනෑ කියා. හරිම ලෙහෙසියි. එතකොට කිසිම කරදරයක් නැහැ නේ. ඔහු උසාවියට ඉදිරිපත් කරනවා; ඒ පුද්ගලයාට ඔප්පු කිරීමේ භාරය දෙනවා. ඒ කියන්නේ, අපේ ඔප්පු කිරීමේ භාරය අනෙක් පැත්තට හරවනවාය කියන එකයි. එතකොට හරි. එහෙම නීති ගෙනෙන්න පුළුවන්. මා කියන්නේ මේ හැම එකම කරනකොට කරුණාකර සිතා බලන්න කියායි. මේවා හොඳ දේවල් බව ඇත්තයි. මේවා ඉතා හොඳ දේවල් කියා අපට එළියට පෙනෙනවා. වෙනදා නම්, කොමිෂන් සභාවක වාර්තා වන කරුණක් සම්බන්ධයෙන්, කොමිෂන් සභාවේ පොත වැහුවාම මොකවත් කරන්න බැහැ. නීතිපතිට විතරයි නඩු දමන්න පුළුවන්. ඔහු නඩු දමන්නේ නැහැ කියා සිතමු කෝ.

ඒක කොමිෂන් සභාවට භාර දෙනවා. කොමිෂන් සභාව සෑහීමට පත් වෙනවා නම් නඩු දමනවා. ඉතාම හොඳයි. කොමිෂන් සභාව ස්වාධීනයි. නිලධාරීන් ගැන අපට අවංක විශ්වාසයක් තිබෙනවා. එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා ගැන මට නම් ඉතාම හොඳ විශ්වාසයක් තිබෙනවා. ඒක ඇත්ත. නමුත් මේ කාරණාවලදී ඒ කොමිෂන් සභාවල උදව්ය මොන දේ කිව්වත් සමහර වෙලාවට ඒක වැරදි විධියට තමයි අර්ථ නිරූපණය වෙන්නේ. රාජ්‍ය සේවය නිකම් කරන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවය කරනකොට ක්‍රමවේදයක් තිබෙන බව ඇත්ත. හැබැයි, රටේ අවශ්‍යතාවයන් අනුව සමහර වෙලාවට ඒ ක්‍රමවේදයන් අබිබවා වැඩ කරන්න වෙනවා. මම උදාහරණයක් කියන්නම්. රටේ ගංවතුරක් ඇති වෙනවා. අපි ආහාර දෙනවා. මම ආපදා කළමනාකරණ අමාත්‍ය ධුරය දරනකොට මට කිව්වා, "ආහාර දෙන අයගේ ලැයිස්තුවක් ඒ ගොල්ලන්ගේ ID numbers සමඟ එවන්න." කියා. මම කිව්වා, රටේ ගංවතුරක් ඇති වුණාම ගංවතුරට අහුවෙච්ච නැති මිනිහාත් ආහාර සොයාගෙන එනවා. මම කොහොමද හොයන්නේ, නිලධාරීන් කොහොමද හොයන්නේ කියා. කඳවුරකට ගිහින් මේ මිනිහාට ගංවතුර, අර මිනිහාට නැහැ කියා කිව්වොත් එතැන ගුටි කෑලියක් යනවා. ගංවතුර ගැලූ හැම අවස්ථාවකම එහෙමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ නිසා මට වඩා හොඳින් ඒ බව දන්නවා. ආණ්ඩුව, ගංවතුරට මුහුණ දුන් මිනිසුන්ටත් කන්න දීලා තිබෙනවා. එහෙම නැති මිනිසුන්ටත් කන්න දීලා තිබෙනවා. නමුත් කරන්න දෙයක් නැහැ. එතකොට කොයි විධියකින් හෝ මේක ඔප්පු වුණොත් ඒ නිලධාරියා ගෙදර නේ. ඒ සිද්ධියේ අවස්ථාව ගැන කවුද, කථා කරන්නේ? එතකොට අහයි, "ගංවතුරක් ගැලුවේ නැහැ. මොකටද කන්න දුන්නේ." කියා. එහෙම නේ පොලීසිය අහන්නේ? "කොහේද යකෝ ගංවතුර ගැලුවේ." කියා අහයි. ඒ නිසා මේ කාරණය ගැන කථා කරනකොට මේක හොඳයි. හැබැයි, ඒ හොඳ දේ පාවිච්චි කරනකොට ප්‍රවේසමෙන් කරන්න කියනවා. ඉස්සර වෙලාම මේ පරීක්ෂණ පවත්වන නිලධාරීන් හොඳ පුහුණුවක් සහිත ගෞරවාන්විත නිලධාරීන් බවට පත් කරන්න. එහෙම කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
හොඳයි.

මේ ගෙනෙන පනත් කෙටුම්පතෙන් කරන්නේ සාක්කි කාරයාට සියලුම මුක්තිය දෙනවා. ඒ කියන්නේ පරීක්ෂණ පවත්වලා, සාක්ෂිකාරයෙක් කිව්වොත් "මේ අහවල් එක ගත්තා." කියා, ඒ තැනැත්තාට කිසිම නඩුවක් පවරන්න බැහැ. ඒකත් හරි කියමුකෝ. පරීක්ෂණ පවත්වනකොට එතැනට ගිහිල්ලා සාක්කිකාරයා කියන දේ ලියා ගන්නවාද? සාක්කිකාරයා කාමරයකට දාලා බංකුවක වාඩි කරවලා බලපෑම් කර "කියන එක ලියපන්." කියා නේ ලියා ගන්නේ. දැන් ඔප්පු වෙන්නේ එහෙම නේ. ඒ නිසා ඉස්සර වෙලා එතැන හදන්න. එතැන හදනකොට වරදකාරයා එළියට එනවා. නමුත් මේක හදන්නේ නිවැරදිකාරයා වරදකාරයා කරන්න නම්, තමුන්නාන්සේලා ඒක කට ඇරලා කියන්න. අපට ඕනෑ කරන්නේ ඕනෑ කෙනෙකුට පැමිණිල්ලක් තිබෙනවා නම්, නඩුවක් පවරා හිරේ දමන එකයි කියා කියන්න. එතකොට ඉවරයි. එතකොට අපට ජාමය බෙරාගත්ත හැකියි. එතකොට තිබෙන්නේ වෙනත් ගේම් එකක් නේ. 1977 ආණ්ඩුවත් ඕක කෙරුවා. 1977 ආණ්ඩුව ඒක කර, මොකද වුණේ? 1988, 1989 වෙනකොට ලංකාවේ ලොකුම ජනතා නැතිවිල්ල ආවා. ඒ නිසා මම කියන්නේ කරුණාකර විනිවිද පෙනෙන සුළු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරුවොත් වරදකාරයා අල්ලන්න පුළුවන්. එහෙම නැත්නම් අල්ලන්න පුළුවන් වන්නේ අභිංසක මිනිහෙක් පමණයි. දේශපාලන විරුද්ධකාරයෙක් අල්ලන්න නම්, මේක හොඳ ක්‍රියාවක්. ඒක කරන්න. හැබැයි, එහි අවසානයක් තිබෙන බවත් මතක තියා ගන්න. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මේ අවස්ථාවේ මෙම විවාදය වෙනත් දිනකට කල් තබනවා.

*එකල්හි වේලාව අ. භා **12.30** වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.*

*அப்போது பி.ப. 12.30 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*It being 12.30 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ශ්‍රීමත් මහත්මා ගාන්ධිතුමාගේ 150 වන ජන්ම දින සංවත්සරය සිහි කිරීම සඳහා පවත්වනු ලබන විශේෂ කල් තැබීමේ විවාදය අ.භා. 1.30ට ආරම්භ කිරීමට නියමිත බැවින්, එතෙක් දිවා ආහාරය සඳහා සභාවේ කටයුතු අත්හිටුවනු ලැබේ.

*රැස්වීම රීට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. **1.30**ට ගරු කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා]ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி.ப.1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* THE HON. SPEAKR [THE HON. KARU JAYASURIYA] *in the Chair.*

## මහත්මා ගාන්ධි මැතිතුමාගේ 150වන ජන්ම සංවත්සරය
## மகாத்மா காந்தியின் 150 ஆவது ஜனன தினம்
## 150TH BIRTH ANNIVERSARY OF MAHATMA GANDHI

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please!

I wish to announce that this House cordially welcomes His Excellency Taranjit Singh Sandhu, the High Commissioner of India and other Diplomatic Officials from the High Commission of India in Sri Lanka now present at the Speaker's Gallery.

ගරු මන්ත්‍රීවරුනි, 2018 සැප්තැම්බර් 20 වෙනි දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී තීරණය කළ පරිදි, ශ්‍රීමත් මහත්මා ගාන්ධිතුමාගේ 150 වැනි ජන්මදින සැමරුම ස්මරණය කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට අවස්ථාවක් ලැබීම ඉමහත් භාග්‍යයක් සේ සලකමි.

අප අසල්වැසි මිත්‍ර රට වන ඉන්දියාවෙන් බිහි වූ ශ්‍රේෂ්ඨ නායකයෙකු වූ මහත්මා ගාන්ධි ශ්‍රීමතාණන්ගේ සත්‍යය සහ අවිහිංසාවාදය යන මූලික මානව ප්‍රතිපත්ති පෙරදැරි කරගත් දර්ශනය මුළු ලෝකයටම යහපත් මහපෙන්වීමක් බව නොඅනුමානයි. "ඉන්දියාවේ පියා" යන ගෞරව නාමයෙන් පිදුම්ලත් මහත්මා ගාන්ධිතුමා සත්‍යය අවබෝධය තුළින් පුද්ගලයාට විමුක්තිය ලැබීමට හැකි බව පෙන්වා දෙමින්, අවිහිංසාවාදය සහ සත්‍යය මුල් කරගෙන භාරතයේ නිදහස් ව්‍යාපාරයට නිරන්තරයෙන් සහය දක්වන ලදී. "අවිහිංසාවාදයේ පියා" යන විරුදාවලිය ලත් මහත්මා ගාන්ධිතුමා ස්වදේශීයත්වය අගය කිරීම සිය ජීවිතාර්ථයෙන් පෙන්වා දෙමින්, මුළු ලෝකයටම ආදර්ශයක් වූ බව සඳහන් කරනු කැමැත්තෙමි.

මෙම සියලු කාරණා එකතු කරමින් මෙම අවස්ථාවේදී මෙම විශේෂ විවාදය ආරම්භ කරන ලෙස ගරු අග්‍රාමාත්‍යතුමාට මම ආරාධනා කර සිටිනවා.

[1.33p.m.]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

Hon. Speaker, I move,

"This Parliament resolves to commemorate the 150th Birth Anniversary of the late Mahatma Gandhi, who spearheaded the Independence Movement of India through his non-violent campaign which was a forerunner of several similar movements throughout the world, particularly in South Asia including our own country."

Mahatma Gandhi is shared by all of us. Though he is known for leading the freedom struggle in India, his influence was such that it immediately influenced the countries around India, such as Sri Lanka. But then as his fame spread, it has today engulfed and covered the whole world, where non-violence and democratic movements of protests have taken over from violence and some of the biggest changes or revolutionary changes made in the last four to five decades has been due to the campaigns of Gandhi which were copied by people elsewhere.

Mahatma Gandhi, Hon. Speaker, is known as the icon of nonviolence. What did he preach? He preached first and foremost, "*Ahimsa*" or nonviolence - achieve your objective through nonviolence. The means of achieving an objective through nonviolence was "*Sathyagraha*", the fight for truth and his objective for India was a "Swaraj". That was the Mahatma Gandhi nonviolence; firstly, do not commit any violent act, refrain from violence. He stopped some of his mass campaigns when people resorted to violence. His force was "*Sathyagraha*" - the truth force. What did it mean? It meant mobilizing large numbers of people to whom truth was the objective and mobilizing a large number of people to indulge in non-violent activity and that non-violent activity was to be the change agent. Actually Gandhi utilized this means of non

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

-violence to achieve his main objective, "Swaraj". But for him "Swaraj" meant not merely political independence but also self-sufficiency of reviving the villages in India.

In the mid 20th Century when one world war was over and armaments not seen before were available; when large empires were created; when there were revolutions such as the Soviet Revolution, Gandhi used a simple weapon. What did he say? He said, "I can see that in the midst of death, life persists; in the midst of untruth, truth persist and in the midst of darkness, light persists." That was the confidence that he gave the people of India; the confidence which others copied from the people of India as they struggled to win their freedoms.

Gandhi, as I said, was the icon of non-violence but he was more than that. He was a political strategist who created non-violence and who enshrined non-violence as a means of achieving objectives.

His mentor in Indian politics was Gopal Krishna Gokhale. He was a mentor not only to Gandhi but he was copied by Jinnah; he was copied by F.R. Senanayake and the leaders of Sri Lanka. But Gopal Krishna Gokhale advocated his freedom struggle within the constitutional framework. Gandhi realized that to free India, they had to mobilize the masses and they had to use the legal framework as their tool. So what Gandhi actually did was to mobilize the people. Actually, I could call him, "an extraordinary political strategist" because he challenged the largest Empire of the world, not with the armies, not with the Royal Navy which is the largest fleet in the world, not with the Royal Air Force, but with the poor people of India through Satyagraha.

He declared *"Purna Swaraj"* on 26th of January, 1930 what is called the, "Republic Day of India" and to prove it in a very simple act, a handful of people started walking to Dandi where they made salt in defiance of the British laws. By the time he reached his goals, there were 60,000 people marching with him. He went to the shores, he made salt and he gave himself up. He went voluntarily to prison followed by a large number of elite in India. Within villages, people found different ways to protest. They protested, "Do not pay taxes; do not cooperate; leave your employment in the British Empire."

He took the British Empire on at one of its strongest points. That is its economy. Gandhi realized that the industrial revolution created the United Kingdom, because the United Kingdom was the first manufacturer of textiles and they started exporting textiles to their empires and that was a very easy measure that they could take. In our part of the world, the traditional dress was really the undress or people wore very little clothing. So, when the United Kingdom came along, it took over the colony and passed a law against "obscenity" or "indecent exposure" and then it was able to clad hundreds of millions of people. Twenty five per cent of the world was clad in British clothing. Gandhi did not ask his people to go naked. He said, "Wear your traditional dress, give up the British cloth, set fire to your British cloth, make your cloth in India and wear the clothes yourselves." He wore the traditional dress of peasants. Others preferred to wear the Indian national dress which they devised, but the main purpose was to deprive the British economy of one of its sources of income.

As people gave up British manufactured goods, that also affected the British economy. So, it became a political weapon; it became an economic weapon. At times, India became ungovernable and then there were roundtable conferences where Indians started making progress. Sometimes we wonder what would have happened if India like Sri Lanka had the Universal Franchise in 1931. As some of our leaders said, we received seven-tenths of what we wanted. But India had to go through a difficult time.

Mahatma Gandhi was a person who brought about change. Not only did he bring about change, but he was also overcome by change. The last phase of his life saw the World War II with fighting in the Far East and Asia. But, nevertheless, after the war was over, after the British Empire had won, they did not have the complete strength or the ability to control their Indian Empire. The consciousness that Gandhi had raised was such that the British had no option, but to give Independence to India. But, that independent India was away from Gandhi's thinking of having one common unit; it came in two. It was accompanied by violence, which distressed Gandhi and Gandhi's life was cut short by the same violence.

So, here we have a person whose influence was felt and has changed this part of the world. It was followed by Martin Luther King in the United States, whose ideals have also been followed in many other parts of the world. Mahatma Gandhi was a person without the Nobel Peace Prize. But, the "Peace Prize" he had given us is far bigger than the Nobel Peace Prize: "*Ahimsa*" - nonviolence - and "*Sathyagraha*". Those are the forces he left behind.

The India of today may not be the India that Gandhi's ideals strove for. Modernization brings its own changes. So, all of Gandhi's ideals could not be accommodated in a modern State. The other extreme was China. The Revolution of Mao Zedong is not what you find today in China. Those are vast countries, economies and India will become one of the greatest economies of the world. They say that the second largest economy will be India. A modern State is being built up.

Then, what is it that Gandhi had left us? Gandhism has imbued democracy and enshrined non-violence in democracy. You need not have revolutions like the French Revolution or the American War of Independence to insist on democracy. Today, Ghandhi's ideals and democracy are interwoven and those democratic changes can be achieved by peaceful means. That is the lasting contribution that Mahatma Gandhi has made to democracy and the rule of law. But in a bigger sense, he had preached non-violence and that is much more relevant to the world today than even in his time.

So, Hon. Speaker, on behalf of the House, I would like to mark here the gratitude that the people of Sri Lanka have towards Mahatma Gandhi, when we commemorate the 150th Anniversary of his birth.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Thank you, Hon. Prime Minister. Now, I call upon the Hon. Leader of the Opposition, the Hon. Rajavorathiam Sampanthan, to second the Motion.

[1.45p.m.]

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Hon. Speaker, it is with a great deal of humility, Sir, that I rise today to a say a few words on this Motion moved by the Hon. Prime Minister, commemorating the 150th Birth Anniversary of Mahatma Gandhi, perhaps the noblest human being who traversed the earth in the past several centuries.

The country of his birth, India, was under foreign rule. He was convinced that the Indian people should receive Independence and rule themselves. He organized several movements to achieve this objective. One was the Non-Cooperation Movement. He took the view that if the Indian people refused to cooperate with the British rulers, the British would not be able to rule them. The objective of that Movement was to make the British rulers lose control of India. His was a non-violent movement based upon *Ahimsa*, *Satyagraha* - the truth and civil disobedience. An illustration of the Civil Disobedience Movement was the Salt Satyagraha - the Dandi March - designed to resist taxation and the British monopoly over salt. He convinced the people that power lay with them and that if they engaged in non-violent civil disobedience, they would emerge victorious and independent, that the British would wilt in the face of such resistance, and the British did wilt and realized that India could no longer be ruled against the will of the Indian people.

Then, there was the Quit India Movement. He called upon the British to quit India. He told the British in no uncertain terms that they had no business to be in India, that rule of India must be left in Indian hands. The Conservative Government under Winston Churchill attempted to resist his demand. But, the defeat of the Conservative Government and the election of the Labour Government in the mid 40s somewhat changed the British attitude and resulted in Round Table Conferences and negotiations that led to Independence of India.

Sir, before Mahatma Gandhi started his *Satyagraha,* his Civil Disobedience Movement based on *Ahimsa* in India, he was a young lawyer practising in South Africa. As a young lawyer when he practised in South Africa, he led the Indian people and the South African people against apartheid. There was one incident that happened in South Africa which attracted the attention of the whole world. That was when Gandhi defied apartheid and travelled in a train compartment which had been reserved for the the Whites, defying White South African Rule, the result being that he was pulled out of the compartment and thrown on to the pavement.

I remember, Sir, listening to a speech made by President Barack Obama - the first Black President of USA - some years ago, shortly after he assumed Office as the President of the United States, at a Joint Session of the Indian Parliament - the Lok Sabha and the Rajya Sabha - when President Barack Obama said, "My journey to the White House commenced on the day Mahatma Gandhi was thrown out of that train in which he was seated in a compartment meant for Whites. That was the day on which my journey to the White House commenced." So, really, Sir, Mahatma Gandhi's influence was not only in India, his influence was all over the world.

Mahatma Gandhi was a person who, I think, was largely responsible for many countries in Asia achieving Independence including Sri Lanka and we must all be grateful to this great son of India for the concept of non-violence -*Ahimsa, Satyagraha*- truth and civil disobedience, which he introduced into the thinking of the ordinary people as an instrument to fight injustice, inequality and subservience.

He also, Sir, united India; he unified India. India is a large country currently with a population of **1,000,200,000** people. There are both large States and small States in India. He preserved their identity. Every Indian, whether he is a Bengali, a Panjabi, a Telugu, a Malayali or a Tamil, first call himself an Indian. Mahatma Gandhi united them. Mahatma Gandhi unified India and made India one country which belonged to the Indian people in which the Indian people lived with self-respect. Their own identities, individual identities came thereafter.

He was responsible for ensuring, as the Prime Minister said, that there was every effort made not merely to achieve political independence but to bring about self-sufficiency for the people of India. I think Mahatma Gandhi played a big role in regard to that matter and he also played a big role in uniting India, keeping India together, not merely by recognizing linguistic identity and carving out States on the basis of linguistic identity but ensuring that its linguistic identity did not, in any way, surpass the Indian identity. By preserving the Indian identity, he ensured that all Indians, with their own languages, their own culture, their own civilization and their own history would be able to preserve their independence, their individuality and their identity in their own States. It was a great service that Mahatma Gandhi rendered to the Indian people.

I might mention, Sir, thinking of our own country and the situation in our own country, I have often thought that in 1977 when there was a UNP Government elected under President J.R. Jayewardene and we ourselves had come to

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

Parliament in large numbers from the North and the East of this country, we could have averted an armed struggle in this country if we had resorted to *satyagraha*, civil disobedience and *ahimsa* on the lines of what Gandhiji taught us.

In 1977, we, the Tamil Members of Parliament were elected very substantially to Parliament from the North and the East. We won all the Seats in the North and the East except one Seat which we lost by a few hundred votes. If we had launched a *Satyagraha* campaign against the Sri Lankan Government on the basis of *ahimsa,* on the basis of *satyagrahaya* - truth and civil disobedience - we could have averted an armed struggle and won our own self-rule in our areas without violence. I think, it was a mistake that we did not engage in such a course of action. It is my hope that we will never have violence in this country again, that we will abide by the teachings of Mahathma Gandhi. If the Government fails to deliver on its commitment to find an adequate solution to the national question, the Tamil people, instead of resorting to violence, will resort to *satyagraha*, will resort to *ahimsa* on the basis of truth, on the basis of civil disobedience to win their rights.

Sir, I thank the Hon. Prime Minister and the Government for introducing this Motion today in Parliament and giving us an opportunity of paying our respects, our highest regard to the late Mahathma Gandhi who not merely influenced the course of events in India but the course of events in the whole world.

I thank you Sir.

[අ.භා. 1.56]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මහා භාරතයට අයෝමය නායකත්වයක් ලබා දුන් යුග පුරුෂයකු මෙන්ම උත්තරීතර මානවවාදියෙකු වූ මහත්මා ගාන්ධිතුමන් පිළිබඳව මේ උත්තරීතර සභාවේදී වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට ලැබීම මා ලද භාග්‍යයක් ලෙසයි සලකන්නේ.

ගරු කථානායකතුමනි, ඉන්දියාව බිහි කළ ශ්‍රේෂ්ඨ යුග පුරුෂයන් ලෝක ඉතිහාසයේ සුවිසල් පරාසයක සිය යශෝරාවය සටහන් කර තිබෙනවා. තිලෝගුරු බුදුපියාණන් වහන්සේ, මෞර්ය වංශයේ ධර්මාශෝක අධිරාජ්‍යයා, මෝගල් රාජ වංශයේ මහා අක්බර් අධිරාජ්‍යයා වැනි ශ්‍රේෂ්ඨයන්ගේ කුලකයට ඇතුළත් වන විසිවන සියවසේ අසමසම මිනිසා වන මහත්මා ගාන්ධිතුමාත් විශේෂ පුද්ගලයෙක්. ඒකට හේතුව තමයි, හැම තරාතිරමකම, හැම ආගමකම, හැම සංස්කෘතියකම ජනතාවගේ ආදරයට, ගෞරවයට එතුමා පාත්‍රවීම.

ගරු කථානායකතුමනි, දහස් ගණන් ආගම්වලින් සමන්විත ඉන්දියාවේ ඒ සකලවිධ ආගම්වලින් කියා දුන් මනුෂ්‍යත්වය එක් පුද්ගලයකු විසින් එක් තැනකට ගොනු කළා නම් ඒ පුද්ගලයා වෙන කවුරුවත් නොවෙයි, අද අපි ගෞරවයෙන් සිහිපත් කරන මහත්මා ගාන්ධිතුමාත්, සමර්මති ආශ්‍රමයත් බව මම කියන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, මහත්මා ගාන්ධිතුමා බොහෝවිට ප්‍රකට වන්නේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට එරෙහිව ශ්‍රේෂ්ඨ අවිහිංසාවාදී සටනක් දියත් කළ යුග පුරුෂයකු විධියටයි. නමුත් ගරු කථානායකතුමනි, පුදුමාකාර පන්ති භේදයක්, විවිධත්වයක් සහිත සංස්කෘතික සම්මිශ්‍රණයක් තිබුණු භාරතීය දේශයට, විවිධත්වය මැද සහජීවනයෙන් ජීවත් වීමේ ශ්‍රේෂ්ඨ පාඩම කියා දුන්නේ මහත්මා ගාන්ධිතුමායි. එතුමා කියා දුන් ඒ පාඩම ඉන්දියාවට පමණක් නොවෙයි, මුළු ලෝකයටම සදාතනික පාඩමක් කරගත හැකි යැයි මම විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මහා භාරතයට නිදහස උරුම කරදුන් වීරෝදාර සටනේදී මහත්මා ගාන්ධිතුමා සතුව පැවති ආයුධ ගැන අපි කල්පනා කර බැලුවොත්, එතුමා සතුව පැවතියේ අවිහිංසාවාදී ආයුධ පමණයි. ලෝකයේ හැම ආගමකින්ම මේ යථාර්ථය පෙන්වා දී තිබුණත්, අවාසනාවකට බොහෝවිට ලෝකය පාවිච්චි කළේ හිංසාවාදී ආයුධ පමණයි. නමුත්, ඉවසීම, අවිහිංසාව, සංසුන් බව සහ නොපසුබස්නා වීර්යය මේ සියල්ලටම වඩා තියුණු අවි බව ලෝකයට කියා දුන් අවිහිංසාවාදී නායකයා මහත්මා ගාන්ධිතුමා බව එතුමාගේ 150 වන ජන්ම සංවත්සරය සමරන මේ අවස්ථාවේදී අපි ගෞරවයෙන් සිහිපත් කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ අපි රටක් ලෙස මහා භාරතයෙන් බොහෝ දේ උරුම කරගෙන තිබෙනවා. බුදු දහම වැනි ශ්‍රේෂ්ඨ ආගමක්, බ්‍රාහ්මීය අක්ෂර කලාවක්, මෞර්ය රාජ්‍ය පදවිප්‍රාප්ති සම්ප්‍රදායයක්, උඩරට පහතරට නැටුම් කලාවට පදනම සපයන කොහොඹා කංකාරිය, දෙවොල් මඩු වැනි ශාන්තිකර්මත්, භාරතීය සංගීතය වාගේම කැටයම් හා මූර්ති කලාවත් අපි ඉන්දියාවෙන් දායාද කරගෙන ශ්‍රී ලාංකික මුහුණුවරකට සකසා ගත්තා. එම නිසාම භාරත දේශය ගැන ශ්‍රී ලංකාවේ අපට තිබෙන්නේ ඉතාමත්ම ගෞරවාන්විත හැඟීමක්.

ගරු කථානායකතුමනි, මහත්මා ගාන්ධිතුමන් අනුගමනය කළ නිදහස් සටන් ක්‍රමෝපායන් අපට ගුරුකොට ගැනීමට හැකි වුණා වාගේම අපට තව බොහෝ දේ මහත්මා ගාන්ධි චරිතයෙන් ඉගෙන ගත යුතුව තිබෙන බවයි වර්තමානය කියා පාන්නේ.

ගරු කථානායකතුමනි, ගාන්ධිතුමා කිසි දිනක දේශකයෙක් පමණක් වුණේ නැහැ. එතුමා මුලින්ම ආදර්ශය සපයා එය අනුගමනය කරන්න තම අනුගාමිකයන්ට ඉඩ සැලසූ පරමාදර්ශී නායකයෙක්. ජනනායකයෙක් විධියට එතුමාගේ ජීවිතයේ මමත්වය පිළිබඳව, ආත්මාර්ථය පිළිබඳව අබමල් රේණුවකවත් හැඟීමක් නොතිබුණු බවත් අපට පැහැදිලිව දකින්නට තිබෙනවා. සමාජයට ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයන් ලබා දුන් එතුමා ගත කළේ සැපවත් ජීවිතයක් නොවෙයි. ඉතාම කර්කෂ, අල්පේච්ඡ ජීවිතයක් තමයි ගාන්ධිතුමා ගත කළේ. සාම්ප්‍රදායික ප්‍රභූ ඇඳුම් පවා අතහැර, කාදි රෙද්දෙන් මැසූ ජෝතිය ඇඳ සිටි එතුමන් ලෝක ඉතිහාසයේ අද්විතීය පුද්ගල සංකේතයක්. ගරු කථානායකතුමනි, ඒ වාගේම එතුමාගේ සටන් ව්‍යාපාරයේ ගමන් සගයන් වුණේ ඉන්දියාවේ පීඩිත ජනතාවයි. නුහුරු නුපුරුදු අවිහිංසාවාදී සටනක් සඳහා එතුමා ජනතාව පෙළ ගැස්වූ බලය මොකක්ද කියා අවබෝධ කර ගන්න ලෝකයාට තව බොහෝ කලක් යාවිය කියා මම කල්පනා කරනවා.

ගරු කථානායකතුමනි. එතුමා තුළ තිබුණු සුවිශේෂී බලය අන් කිසිවක් නොවෙයි, සත්‍යාග්‍රහය බවයි. මහත්මා ගාන්ධිතුමාගේම වචනවලින් එතුමා පැවසුවේ, "දෙවියන් සොයා ගිය ඒ දුෂ්කර

වාරිකාවේදී මට හමු වුණු දෙවියන් අන් කිසිවෙක් නොව සත්‍යයයි" කියන එකයි. එතුමා හැමවිටම ප්‍රකාශ කළේ එයයි. එම නිසා සත්‍යවාදී වීම දේවත්වයේ ලා සැලකූ මේ උදාර, සුවිශේෂී සම්භාවනීය භාරත ජනතා පුත්‍රයාගේ 150වැනි ජන්ම සංවත්සරය සමරමින් අපේ පාර්ලිමේන්තුවේ මේ ඇති කරන කතිකාව එම යුග පුරුෂයාට කරන උපහාරයක් මෙන්ම අපේ කිට්ටුවන්තම, බලවත් අසල්වාසී භාරත ජනතාවට කරන ගෞරවයක් ලෙසත් මම සඳහන් කරන්නට කැමැතියි.

ගරු අග්‍රාමාත්‍යතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද මේ වැදගත් යෝජනාවට අපේ අදහස්ද එකතු කරමින්, මහත්මා ගාන්ධිතුමාගේ ජන්ම දිනය වෙනුවෙන් අපට මෙම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැනත් ඔබතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා.

[අ.භා. 2.03]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, මහා භාරතය අපේ රටට ඉතා සමීප රටක් වන අතරම අපේ රට හා සමඟ තිබෙන සහ සම්බන්ධතාව ශතවර්ෂ ගණනාවකට ඇදී යනවා. ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා ප්‍රකාශ කළ පරිදි එම කාල පරාසය තුළ ශ්‍රී ලංකාවේ සංස්කෘතිය, ශ්‍රී ලංකාවේ කලා ශිල්ප, ඒ වාගේම ශ්‍රී ලංකාවේ විවිධ කාර්යන් සඳහා විශාල බලපෑමක් ඇති කිරීමට මහා භාරතයට පුළුවන් වුණා. ඒ වාගේම මහා භාරතය නූතන යුගයේ බිහි කරන ලද ශ්‍රේෂ්ඨතම යුග පුරුෂයා වන්නේ, අද අප මේ පාර්ලිමේන්තුව තුළ 150 වැනි ජන්ම සංවත්සරය සිහි කරන මහත්මා ගාන්ධි මැතිතුමායි. එතුමා භාරතය තුළ පමණක් නොවෙයි, ඉන් ඔබ්බට සමස්ත ලෝක ප්‍රජාව දක්වාම සිය මානව වර්ගයා කෙරෙහි ඇති ආදරය, අවිහිංසාවේ ශක්තිය ප්‍රදර්ශනය කළා පමණක් නොව ක්‍රියාවෙන්ම පෙන්වා දුන් නායකයෙක්. බොහෝ දේශකයින් ඉන්නවා; කාරණා කියන අය ඉන්නවා. නමුත් ඔවුන් කියන ඒ කරුණුවල සත්‍යතාව හා ප්‍රායෝගික බව පිළිබඳව ඔවුන්ගේ ක්‍රියාවන් තුළින් අපට දැක ගන්නට ලැබෙන්නේ නැහැ.

නමුත්, මහත්මා ගාන්ධි මැතිතුමා විශ්වාස කරපු, ප්‍රචාරය කරපු, අනුගමනය කරපු අවිහිංසාව නැමැති අවිය තුළින් කොයි තරම් විශාල සමාජ පරිවර්තනයක් ඉන්දීය ජනතාව සඳහා පමණක් නොව, සමස්ත ලෝකවාසී ජනතාව සඳහා ලබා දුන්නාද කියන එක අපට ඉතිහාසය ඉතාම හොඳින් පෙන්වා දී තිබෙනවා. බොහෝ විට අවි ආයුධවලින්, බෝම්බවලින්, යුද්ධ ටැංකිවලින් බිඳ දමන්නට නොහැකි වුණු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය, එතුමාගේ අවිහිංසාවාදී ව්‍යාපාරය තුළින් සලිත කරවලා, සොලවලා, එහි පදනම් පුපුරුවලා ඉන්දීය ජනතාවට පමණක් නොවෙයි, මහා භාරතයට පමණක් නොවෙයි, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය පැහිරී ගිය අනෙකුත් රටවල්වලටත් නිදහස ලබා ගැනීමට එතුමාගේ මේ අවිහිංසාවාදී ව්‍යාපාරය සුවිශේෂී දායකත්වයක් ලබා දුන්නා. ඒ වාගේම එතුමා විශේෂයෙන්ම පෙන්වා දුන්නා, මේ අවිහිංසාවාදය කියලා කියන්නේ නිකම්ම නිකම් බලයක් නැති දෙයක් නොවෙයි කියන එක. අවිහිංසාවාදය සමහර විට අවි ආයුධවලට වඩා ශක්තිමත් අවියක් බව එතුමා ප්‍රායෝගිකව පෙන්වා දුන්නා. එතුමා අනුගමනය කරන ලද ක්‍රමෝපායන් බොහෝ විට අවිහිංසාවාදය මත පදනම්ව ලේ වැගිරීමකින් තොරව, නමුත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ ඒ පවුරු පදනම් බිඳ දමා නිදහස කරා යන ගමනට විශාල උත්තේජකයක් බවට පත් වුණා. ඒ නිසා එතුමා තුළ තිබුණු අවිහිංසාවාදය පිළිබඳ වූ දර්ශනය ගැන බලන කොට එතුමා සුවිශේෂී දර්ශනවාදියෙක්. දර්ශනවාදියෙක් මෙන්ම එතුමා සමහර විට දේශපාලනඥයන්ටත් වඩා ඔබ්බට ගිය ප්‍රායෝගික දේශපාලනඥයෙක් වුණා. මොකද, එතුමාගේ ඒ ව්‍යායාමයේදී එතුමා ගමින් ගමට, බිමින් බිමට යමින් ජනතාව සමඟ ගැටිලා, ජනතාව ඒකරාශී කරලා සියලු බලමුළු එකතු කර ගැනීමට එතුමා ආකර්ෂණයක් කර ගත්තේ එතුමාගේ අවංක කැපවීමයි.

එතුමාට දේශපාලන න්‍යාය පත්‍රයක් තිබුණේ නැහැ. -he had no political agenda. එතුමාට තිබුණු එකම න්‍යාය පත්‍රය භාරත මාතාවට නිදහස ලබා දීමේ වැඩ පිළිවෙළ පමණයි. ඒ නිසා එතුමා එක අතකින් ඉතාම සාර්ථක චින්තකයකු වාගේම අනෙක් අතින් සාර්ථක දේශපාලනඥයකු විධියට මා කල්පනා කරනවා. තමා ඉටු කිරීමට බලාපොරොත්තු වූ කාරණය නිසි ලෙස ඉටු කිරීමට අවිහිංසාවාදය පාවිච්චි කර ගැනීමට එතුමාට පුළුවන් වුණා. ඉන්දීය සමාජය ඉතාම ව්‍යාකූල සමාජයක්. කුල, ගෝත්‍රවලට බෙදිලා ජාති, ආගම්, කුල, භාෂා, ප්‍රාන්ත මේ විධියට දැඩි විවිධත්වයක් හා සමතුලිත බවක් නොවූ සමාජයක් තුළ ඒ සියලු සමාජ බලවේගයන් ඒකරාශී කර ගැනීමට එතුමාට පුළුවන් වුණා. ඒක තමයි එතුමා තුළ තිබෙන සුවිශේෂී දක්ෂතාව. එවැනි සමාජයක් තුළ සියලු දෙනා ඒකරාශී කරගෙන නිදහස් සටන සඳහා උපයෝගී කරගන්න පුළුවන් වුණා. ඒ වාගේම, එතුමා නිර්භයව තමාගේ මේ වැඩ පිළිවෙළ හරහා ඉන්දියාවට පමණක් නොවෙයි, දකුණු අප්‍රිකාවේ නිදහස් සටනටත් එතුමා පණ දුන්නා. එතුමා ප්‍රායෝගිකව පහළම මට්ටමට බැහැලා ඒ වැඩ කටයුතු හා රාජකාරී ජනතාව වෙනුවෙන් ඉටු කළා. එතුමාගෙන් අපට ලබා ගත හැකි ආදර්ශයක් තිබෙනවා. ඒ තමයි, ස්වදේශකත්වය.

දේශීය කර්මාන්ත, දේශීය ව්‍යවසාය පදනම් කරගෙන, ඉන්දීය අධිරාජ්‍යය වැටී තිබුණු තත්ත්වයෙන්, පරගැති බවින් මුදවලා, බටහිර දෙස හැම වෙලාවේම බලන දෘෂ්ටිකෝණය වෙනස් කරලා, බටහිර හෝ වෙනත් රටවල් දිහා බලනවාට වඩා තමන්ගේ රට තුළ තිබෙන ශක්තියෙන් තමන්ගේ ජාතික ආර්ථිකය ගොඩනඟා ගැනීම සඳහා හැකියාව ඒ රටේ ජනතාවට තිබෙන බව මහත්මා ගාන්ධි මැතිතුමා පෙන්වා දුන්නා. ඒ මාර්ගයේ ගමන් කරලා, අද ඉන්දියාව සියයට 8.5ක ආර්ථික වර්ධන වේගයක් ලබාගෙන තිබෙනවා. අද ඉන්දියාවේ දේශීය කර්මාන්ත විදේශීය කර්මාන්ත සමඟ තරග කරමින්, රටට අවශ්‍ය ආහාර පාන රට තුළම නිපදවා ගනිමින් සිටිනවා. විද්‍යාව හා තාක්ෂණය අතින් අද ඉන්දියාව ආසියාවේ පළමුවැනි තැනට පමණක් නොවෙයි, ලෝකයේම පළමුවැනි තැනට පැමිණීමට තරම් විශාල දියුණුවක් ලබාගෙන තිබෙනවා. විද්‍යාව, තාක්ෂණය, නව නිපැයුම් ආදී සෑම අංශයකින්ම අද ඉන්දියාව දියුණු වෙලා තිබෙනවා. ඒක අපට ශක්තියක්; සතුටක්. මේ සියල්ලටම පාදක වුණේ මහත්මා ගාන්ධි මැතිතුමාගේ දර්ශනය, වැඩ පිළිවෙළ සහ එතුමා ඒ ජනතාවට ලබා දුන් ශක්තියයි.

ගරු මහත්මා ගාන්ධි මැතිතුමාගේ 150වන ජන්ම දින සංවත්සරයේදී, එතුමා ඉන්දියාවට කරන ලද සේවය පමණක් නොවෙයි, සමස්ත ලෝකවාසී ජනතාවට, ශ්‍රී ලංකාවට එතුමා කරන ලද සේවාව අප අගය කරන බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. එම නිසා අගමැතිතුමා විසින් මේ ගරු සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක් බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.13]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ලොව මානව සංහතිය සෙලවිය හැකි අලුත් ආශිර්වාදයක් හා ආස්වාදයක් ජනිත කළ, දායාද කළ එතුමාට, මොහන්දාස් කරම්චාන්ද් ගාන්ධි නමින් ඉපිද, "මහත්මා" යන ලෝපනල ගෞරවය ලබා ගැනීමට හැකි වුණේ එතුමා අනුගමනය කළ, මිනිස් සමාජය ගොඩ නැඟීමේ ඒ උත්තරීතර වූ ක්‍රියාමාර්ග හේතු කොට ගෙනයි. එතුමාගේ 150වන ජන්ම දින සංවත්සරය නිමිත්තෙන්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත්ව තිබෙන මේ වෙලාවේ, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් එම යෝජනාවට අපි එකතු වෙන්නේ, උත්තුංග ගුණාංගවලින් යුතු භාරතයේ අභිමානවත් පුරවැසියා ලෙස අදත් සිහිපත් කළ හැකි ආකාරයට එතුමා දායාද කළ ඒ ක්‍රියාමාර්ගය නිසායි.

මිනිසකුගේ ජීවිතය හමාරවෙලා කාලයක් ගියාම, ඔහු අමතක වී යාම සාමාන්‍ය දෙයක්. එවැනි නායකයන් බොහොමයක් සිටිනවා. නමුත් මුළු ලොවම යළි යළිත් සිහිපත් කරන මහත්මා ගාන්ධි මැතිතුමා එසේ සිහි කරන්නේ, ලෝකයේ විශාලත්වයෙන් දෙවැනි ජනගහනය ජීවත් වන රටක නායකයා ලෙස කටයුතු කිරීම නිසා පමණක් නොව, එතුමා, -දේශසීමා හරහා- නිදහස සහ මිනිස්කම පතා නැඟූ හඬට නායකත්වය දුන් නායකයා වූ නිසායි.

උගතකු හැටියට, අනුගමනය කළ යුතු නීති සම්ප්‍රදායන් පිළිබඳව දැනුමක් ලබා ගනිමින්, ඉන්දියාවේ දුක්ඛිත මිනිසුන් අතරින් නැඟිට, දකුණු අප්‍රිකාවේ මිලේච්ඡ ප්‍රතිපත්තියක් අනුගමනය කළ බ්‍රිතාන්‍ය වර්ණභේදවාදී සුදු පාලනයට එරෙහිව ඇති වුණු කටුකත්වයට මහත්මා ගාන්ධි මැතිතුමා මුහුණ දුන්නා. ඒ අත්දැකීම් තුළින් යළිත් වරක් මනුෂ්‍ය ජීවිතයක් ඇති කළ හැකි, මනුෂ්‍ය අයිතිවාසිකම් ජනිත කළ හැකි සමාජයන් ඇති කිරීමේ කර්තව්‍යයට නායකත්වය සැපයෙන ක්‍රියාමාර්ගයේ ශක්තිය එතුමාගේ ජීවිතයට ඇති වුණා. ඉන්දියාවට පැමිණි, "හිරු නොබසින අධිරාජ්‍යය" ලෙස නම් කරනු ලැබූ බ්‍රිතාන්‍ය මහා අධිරාජ්‍යයේ පාලන යන්ත්‍රණය සෙලවිය හැකි අයෝමය නායකයා බවට මහත්මා ගාන්ධි මැතිතුමා පත් වුණා. දැන් සඳහන් කරන ලද, කවුරුත් දන්නා, ප්‍රසිද්ධ කාරණයක් තිබෙනවා. Hon. Speaker, the most peaceful *avihinsa* exemplary character that he gave in "The Salt March" changed not only India, changed even the British Empire and freedom struggles across the world including our country.

අප රටත් එසේ වෙනස් කිරීමට පමණක් නොව, අප වැනි රටවල් රාශියකට නිදහස උදා කර ගැනීම සඳහා එතුමාගේ අයෝමය නායකත්වය දැවැන්ත බලපෑමක් ඇති කළා. ඉන්දියාව නිදහස් නොවන්නට, ඉන්දියානු නිදහස් සටන ජය නොගන්නට, ඉන්දියාව අරක්ගෙන සිටි විදේශීය පාලනය ඉවත් කර යැවීමට කටයුතු නොකරන්නට යටත් විජිතවාදී කෲරකම තව දිගු කලක් ලොව ස්ථාපිත වනවා. ඒ නිසා ඉන්දියාවේ අවිහිංසාවාදී මහා ව්‍යාපාරය, ස්වරාජ්‍ය ඇති කිරීමේ ව්‍යාපාරය මුළු භාරත දේශය හරහාම නව ප්‍රාණයකින් අවදිකොට මහ පෙන්වන්න පුළුවන් වීම අනගාරික ධර්මපාලතුමා 1922දී " සිංහල බෞද්ධයා" පුවත් පතේ සඳහන් කරන්නේ මෙසේයි, "A miracle worker who toils for the upliftment of 300 million Indian people is in action in India."

එයින් කියන්නේ, ඒ අවස්ථාවේදී මිලියන 300කට අධික ජනතාවකට නායකත්වය දුන් අවිහිංසාවාදී මහත්මා ගාන්ධි මැතිතුමාගේ ක්‍රියා මාර්ගය එම දේශය හරහා තවත් දේශයන් කරා ගමන් කර තිබුණු බවයි.

ගරු කථානායකතුමනි, එතුමාගේ අවිහිංසාවාදී ක්‍රියාදාමය සටන් බවට පත් කළේ මර්දනය, තර්ජනය, අශිෂ්ටකම හා අශීලාචාර ලෙස මිනිස් ජීවිත හමාර කරන යුද බලයත් සමඟයි. අපි දන්නවා, ඉන්දියානු ඉතිහාසයේ මේ අවිහිංසාවාදී ජන අරගළවලට වෙඩි තබා මරා දැමූ හැටි. එසේ සිදු වුවද මහත්මා ගාන්ධි මැතිතුමා නායකත්වය දුන් අවිහිංසාවාදී නිදහස් සටන නැවතුණේ නැහැ. එතුමා අනුගමනය කළ ක්‍රියා මාර්ග නිසා අවසානයේදී බ්‍රිතාන්‍ය ආණ්ඩුවට මහත්මා ගාන්ධි කියන මේ අවිහිංසාවාදී නායකයා සමඟ සාකච්ඡා කරන්න සිද්ධ වුණා. බ්‍රිතාන්‍යයට සිදු වුණු ඒ සිදුවීමට හේතු සාධක රාශියක් තිබුණා. ඒ මේ නායකත්වයයි. එතුමා බොහොම සුළුවෙන් අනුගමනය කළ ක්‍රියා මාර්ගයකින් බ්‍රිතාන්‍ය ආර්ථිකයේ ශක්තිමත් බව කඩාකප්පල් කිරීමට පුළුවන් වුණා. බ්‍රිතාන්‍ය ආණ්ඩුව කඩා වැටෙමින් තිබෙනවා යයි බ්‍රිතාන්‍යයේ වයිට් හෝල් මැදිරියට දැනුණා. ඉන්දියාවේ චක්‍රයෙන් ආරම්භ කළ කපු කැටීමේ ව්‍යාපාරය තුළ බ්‍රිතාන්‍යයේ මුළු රෙදි කර්මාන්ත ක්ෂේත්‍රයම අඩපණ වුණු අතර, බ්‍රිතාන්‍ය සකස් කළ සැලසුම් සියල්ල කඩා වැටුණා.

විවිධ ආගම්වලින් පිරුණු, විවිධ කුල භේදයන්ගෙන් පිරුණු, ඒ සියල්ල හරහා මහා භාරතයට නායකත්වය දීමට පුළුවන් වුණු මහත්මා ගාන්ධි මැතිතුමාගේ 150වැනි ජන්ම සංවත්සරය ලොවට ඉතාම වැදගත් බව සිහිපත් කරන්නට පුළුවන් වන්නේ, ඔහු ඉටු කළ ඒ මහා කාර්ය භාරය නිසයි. එතුමා සමඟ ඒ නිදහස් සටනේ ජයග්‍රහණයට දීර්ඝ කාලයක් නායකත්වය දුන් ජවහර්ලාල් නේරු මැතිතුමා, ජින්නා මැතිතුමා, ඒ වාගේම නූතන ඉන්දියාව එක්සේසත් කළ යෝධයා ලෙස සලකන වල්ලභ්බායි පටෙල් මැතිතුමා වැනි යෝධයන් පිළිබඳව මම විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. ඒ මහා යෝධයන් සමඟ ගොඩනැඟූ එම ව්‍යාපාරය නිසා නොසෙල්වෙන ඉන්දියාවක්, මහා සංස්කෘතියකින් යුත්, මහා ශිෂ්ටාචාරයකින් යුත් භාරත දේශයක් ලොවට දායාද කරන්නට පුළුවන් වුණා වාගේම, අභිමානවත් ජාතියක් බවට යළි නිස ඔසවා අද ලොව ප්‍රධානතම ජාතියක් බවට තම ජයග්‍රහණයන් එක්කර තිබෙනවා. මහත්මා ගාන්ධි මැතිතුමන් අවිහිංසාවාදය ජයග්‍රහණය බවට පරිවර්තනය කළා. ඒ වාගේම අහිංසාවාදය නිසා පසු කාලයක ඇති වුණු අරගළයන් රාශියකින් ගොඩනැඟුණු "හර්තාලය" කියන වචනය, "හර්තාලය" කියන අරගළය භාරතයෙන් ලෝකයේ වචන සමුදායට එක් වුණා. බුදුරජාණන් වහන්සේ උපන් භූමියෙන්, බුද්ධ ධර්මය සොයාගත් භූමියෙන් ලොවට දායාද වූ අවිහිංසාවාදී නායකයෙකු ලෙස ඔහු නූතන ඉන්දියාවට දැවැන්ත ජයග්‍රහණයන් ගෙනෙන්නට කටයුතු කළ නායකයෙක්. ඔහු ලබා දුන් නිදහස පමණක් නොව ආදර්ශය බොහොම චාම්, බොහොම සරල වූ එකක්. බලයෙන් අභිමානවත් නොවුණු ඒ ආදර්ශය සියලු පාලකයන්ට එක් කළා නම්, ඒ මහත්මා ගාන්ධි මැතිතුමාය කියන එක අදත් අපට සිහිපත්කොට අනුගමනය කරන්නට පුළුවන් වෙනවා. ඒ වාගේම නිදහස ලබාගත් ජයග්‍රහණයෙන් පසු කිසිම ආකාරයක තනතුරක් භාර නොගත්තා වාගේම, නූතන ඉන්දියාව ගොඩනැඟීම සඳහා පෙන්වන ලද මාර්ගය සහ උපදෙස් නිසා නිදහස් ඉන්දියාවේ නායකත්වයන්ට ඒ ජයග්‍රාහී තත්ත්වය ගොඩනහන්නට පුළුවන් වුණා. පංචායත් රාජ්‍යයේ පදනම වන්නේ මහත්මා ගාන්ධි, ස්වංයපෝෂිත ඉන්දියාවක පදනම මහත්මා ගාන්ධි. ඔහු එය ආරම්භයේදීම පෙන්නුවා. දියුණු සහ බලවත් කාර්මික යෝධයන් බිහි කරන්නට ඉන්දියාවට තිබෙන හැකියාව මහත්මා ගාන්ධි ආශ්‍රයකොට ගොඩනඟපු ක්‍රියාදාමයේ තවත් උදාහරණයක්.

අද ඉන්දියාව එලෙස ගොඩ නඟා තිබෙනවා. මා උපුටනයක් කියවමින් උත්තරීතර මානව සංහතියට ගරුත්වය ගෙනාපු

මහත්මා ගාන්ධි මැතිතුමාව මේ අවස්ථාවේදී සිහි කරනවා. එම උපුටනයේ මෙසේ සඳහන් වනවා:

"He invested heavily in self-help and invented "Small is Beautiful", long before E.F. Schumacher."

එයයි සැබෑවේ සහ සත්‍යයේ සාධාරණත්වය. අලුත් ලෝකයක් දකින්නට බලා සිටින සැම දෙනාට ප්‍රජාතන්ත්‍රවාදී, මානව දයාවෙන් පිරුණු, අභිමානවත් ලෝකයක් බිහි කිරීමට හැකි බව මහත්මා ගාන්ධි මැතිතුමා විසින් ආරම්භ කරන ලද ක්‍රියා මාර්ගයේ සඳහන් වනවා. අද එය ලොව ඉතිහාසයට එක් වී තිබෙනවා. එතුමා තවත් අවස්ථාවක මෙසේ සඳහන් කර තිබෙනවා. "You must not lose faith in humanity. Humanity is an ocean; if a few drops of the ocean are dirty, the ocean does not become dirty."

එවැනි ගැඹුරු, උතුම්, දාර්ශනික අදහස්වලින් පිරුණු නායකයෙකු වසර 150කට පසු අද අපි සිහිපත් කරනවා. එතුමා නිසා ඉන්දියාවට නිදහස ලැබුණා. නිදහස් සටන ජයග්‍රහණය කළා. තම දේශ සීමාවෙන් පිට රාජ්‍යයන් රාශියකට එතුමා නිසා නිදහස දිනා ගැනීමේ ශක්තිය ඇති වුණා. අලුත් සිතුම් පැතුම්වලින් පිරුණු ඉන්දීය ශිෂ්ටාචාරය කෙරෙහි ඇති ගෞරවය හා ගැඹුරු වටිනාකම මිනිස් සමාජයට හුක්ති විඳින්නට පුළුවන්කම ලැබෙන ආකාරයට ඉන්දියාව දියුණු වුණා. අගමැතිතුමා සඳහන් කළ විධියට ශ්‍රී ලංකාවේ නිදහස් සටනේ නායකයන් රාශියක් මහත්මා ගාන්ධි මැතිතුමා සමඟ ඒ නිදහස් සටනට එකතු වුණු බව මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. එම නිදහස් සටනට එකතු වුණු ශ්‍රී ලංකාවේ නායකයෙකුගේ පුත්‍රයෙකු හැටියට මම මේ කාරණයත් සඳහන් කරන්න කැමතියි. ඉන්දියාවේ හිර බත් කාපු පිලිප් ගුණවර්ධනයන්, ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා වැනි නායකයන් වෙනුවෙන් යළිත් වරක් මම මේ අවස්ථාවේදී ඒ උත්තුංග මිනිසාට -නායකයාට- සදා ගෞරවය පුදු කර සිටිනවා.

[පි.ප. 2.29]

**ගරු පලනි දිගම්බරම් මහතා (කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு பழனி திகம்பரம் - மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சர்)

(The Hon. PalanyThigambaram - Minister of Hill Country New Villages, Infrastructure and Community Development)

கௌரவ சபாநායகர් අවර්කළේ, මහාත්මා කාන්තියින් 150ආවදු පිබන්දනාළෙ නිනෙවුකූර්න්දු ඉන්රු ඉන්ද උයිරිය සපෙයිල් මුන්වෛක්කප්පට්ටිරුක්කුම් සපෙ ඔත්තිවෛප්පු වේළෛප් පිරේරණෙයිල් උරෙයාට්ර වාය්පළිත්තමෛක්කු මුදලිල් නන්රි තෙරිවික්කින්රේන්. මහාත්මා කාන්දි ඉන්දියාවිල් පිබන්දවරාග ඉරුක්කලාම්, ඉන්දිය දේසත්තින් විදුදලෛක්කාකප් පෝරාටියවරාග ඉරුක්කලාම්, ආනාල්, අදර්කාග අවර් කෛයාණ්ඩ වළිමුරෛ අකිම්සෛ එන්පදන් කාරණමාග ඉන්රු උලකම් මුළුවදුම් පෝර්ප්පප්පඩුම් ඔරු මහාත්මාවාග අවර් දිකළ්කින්රාර්. අවර් උලකෛවිට්ටු මරෛන්දපෝදුම් උලකමෙංකුම් අවර් පුකළ් පේසප්පඩුකින්රදු. අවරදු කොළ්කෛ පින්පර්රප්පඩුකින්රදු. අවර් දනදු අකිම්සෛක් කොළ්කෛයිනාලාග ඉන්දිය දේස විදුදලෛයෛ වෙර්රි කොණ්ඩදු මට්ටුමල්ල, උලකමෙංකුම් වාළුම් මක්කළින් මනංකළෛ වෙර්රිකොණ්ඩවර්. ඉදනාල් උලකින් පල නාදුකළිලිරුන්දුම් අවරුක්කු අළෛප්පු වන්දදු. උලකින් පල නාදුකළුක්කු අකිම්සෛයින් දූදුවරාග අවර් පයණම් සෙය්දාර්.

මුදන්මුදලිල් 1927ආම් ආණ්ඩු ඉලංකෛක්කු විජයම් සෙය්ද මහාත්මා කාන්දි ඉලංකෛයින් පල පාකංකළුක්කුම් පයණම් සෙය්දාර්. මලෛයකත්තින් කණ්ඩි, මාත්තළෛ, පදුළෛ, නුවරෙලියා පෝන්ර පකුදිකළුක්කු පයණිත්තපෝදු අංකු වාළුම් ඉන්දිය වම්සාවළියිනරාකිය මලෛයකත් තමිළ් මක්කළ් මහාත්මා කාන්දි අවර්කළෛප් පෙරුම් කෙළරවත්තෝදු වරවේර්රනර්. අදන් අడෛයාළංකළාග මාත්තළෛ නකරිලුම් නුවරෙලියාවුක්කු අණ්මිත්ත නානුඔයාවිලුම් 'කාන්දි මණ්ඩපම්' එන නිනෛවු මණ්ඩපංකළ් අමෛයප් පෙර්රුළ්ළන. මාත්තළෛයිල් අමෛන්දුළ්ළ කාන්දි මණ්ඩපම් අණ්මෛයිල් ඉන්දිය අරසාංකත්තින් නිදියුදවියුඩන් පුනරමෛක්කප්පට්ටදු. නානු ඔයාවිල් අමෛන්දුළ්ළ මණ්ඩපමුම් අව්වාරු පුනරමෛක්කප්පඩවේණ්ඩිය දේවෛයුළ්ළදු එන්පදෛ නිනෛවුපඩුත්ත විරුම්පුකින්රේන්. ඉවෛ මහාත්මා කාන්දියින් පුකළෛ නිනෛවුකූරුම් සින්නංකළාකුම්.

මහාත්මා කාන්දියින් ඉලංකෛ වරුකෛයානදු ඉලංකෛයෙංකුම් පරන්දුපට්ටු වාළ්න්ද ඉන්දිය වම්සාවළි මක්කළුක්කු ඔර් අඩෛයාළත්තෛප් පෙර්රුක්කොඩුත්තදු. මහාත්මා කාන්දියින් මලෛයක වරුකෛ එන්පදු අදුවරෛයාන මලෛයක අරසියල් සෙයල්නෙරියිල් ඔරු මාර්රත්තෛ ඒර්පඩුත්තියදු. එනිනුම්, ඉන්දියාවුක්කුම් ඉලංකෛවාළ් ඉන්දිය වම්සාවළි මලෛයකත් තමිළ් මක්කළුක්කුම් ඉඩෛයිල් උරවුප් පාලත්තෛ ඒර්පඩුත්තිය පයණමාග අදු අමෛන්දිරුන්තදු. අන්ත උරවුප් පාලම් ඉන්රුම් තොඩර්න්දුකොණ්ඩිරුක්කින්රදු. ඉන්දිය අරසාංකත්තින් පෙරුමළවු නිදියුදවියුඩන් හට්ටන්, ටික්කෝයා මාවට්ට වෛත්තියසාලෛ පුනර්නිර්මාණම් සෙය්යප්පට්ටු මක්කළ් පාවනෛක්කුක් කෛයළික්කප්පට්ටුළ්ළන. අදනෛ මක්කළුක්කුක් කෛයළික්කුම් නිකළ්විල් ඉන්දිය පිරදමර් ශ්‍රී නරේන්දිර මෝදි අවර්කළ් වරුකෛ තන්දදිරුන්දමෛ කුර්ප්පිඩත්තක්කදු. අවර්කළුක්කු මලෛයකත් තමිළ් මක්කළාකිය නාංකළ් ඔන්රු සේර්න්දු පෙරුම් වරවේර්පෛ වළංකි යිරුන්දෝම්. ඉන්දියාවුක්කුම් ඉන්දිය වම්සාවළියිනරාන එමදු මලෛයකත් තමිළ් මක්කළුක්කුමාන උරවු නෙරුක්කත්තෛ අදු කාට්ටියිරුන්දදු. ඉන්දිය අරසාංකත්තුක්කු නන්රි තෙරිවික්කුම් වකෛයිල් ටික්කෝයා මාවට්ට වෛත්තියසාලෛ 'ඉන්දිය දේසපිතා මහාත්මා කාන්දි වෛත්තියසාලෛ' එනප් පෙයරිඩප්පඩ වේණ්ඩුමෙන කෙළරව සුකාදාර අමෛච්සර් රාජිත සේනාරත්න අවර්කළිඩම් නාන් පිරේරණෛ මුන්වෛක්කින්රේන්.

කාන්දියින් කොළ්කෛකළිල් කවරප්පට්ට මලෛයකත් තමිළ් මක්කළ් ඉන්රුම්කූඩ අවර්කළදු වීදුකළිල් මහාත්මා කාන්දියින් උරුවප්පඩත්තෛත් තොංකවිට්ටිරුප්පදෛ අවදානික්කලාම්. ආංකාංකේ සිල තෝට්ටංකළිල් මහාත්මා කාන්දියින් සිලෛයෛ වෛත්තිරුක්කිරාර්කළ්. මහාත්මා කාන්දියින්මීදු අත්තකෛය අන්පු කොණ්ඩ මලෛයකත් තමිළ් මක්කළුක්කු 4,000 වීදුකළෛප් පෙර්රුක්කොදුක්ක ඉන්දිය අරසාංකම් මුන්වන්දදු. 2012ආම් ආණ්ඩු අන්ත වීඩමෛප්පුත් තිට්ටම් කිටෛක්කප්පෙර්රපෝදුම් අදනෛ නෙඩෛමුරෛප් පඩුත්තුවදිල් පල්වේරු සික්කල්කළ් ඉරුන්ද නිලෛයිල්, 2015ආම් ආණ්ඩු මලෛනාට්ටු පුදිය කිරාමංකළ්, උට්කට්ටමෛප්පු වසදිකළ් මර්රුම් සමුදාය අපිවිරුත්දි අමෛච්සිනෛප් පොරුප්පේර්ර නාන්, අදනෛ නෙඩෛමුරෛප්පඩුත්තියතෝදු අන්තත් තිට්ටත්තිල් අමෛයප්පෙර්ර මුදලාවදු ඉන්දිය වීඩමෛප්පුත් තිට්ට පුදිය කිරාමම් පූණ්ඩුලෝයා ටන්සිනන් තෝට්ටත්තිල් අමෛයප්පෙර්රපෝදු, අදර්කු 'මහාත්මා කාන්දිපුරම්' එනප් පෙයරිට්ටෝම්. අදන් දිරප්පු විළාවින්පෝදු ඉලංකෛප් පිරදමර් කෞරව රණිල් වික්කිරමසිංක අවර්කළුම් කාණි අමෛච්සර් කයන්ද කරුණාදිලක්ක, නකරත් තිට්ටමිදල් මර්රුම් නීර්වළංකල් අමෛච්සර් රවූප් හක්කීම්, පෙරුන්තෝට්ටක් කෛත්තොළිල්

[ගරු පලනි දිගම්බරම් මහතා]

அமைச்சர் நவீன் திசாநாயக்க உள்ளிட்ட அரசியல் பிரமுகர்களும் இலங்கைக்கான இந்திய உயர் ஸ்தானிகர் தரன்ஜித் சிங் அவர்களும் நேரடியாக வருகை தந்ததோடு, இந்தியப் பிரதமர் நரேந்திர மோடி அவர்கள் இணைய வழியாக இணைந்து அங்கு உரையாற்றியிருந்தமை குறிப்பிடத்தக்க அம்சமாகும். முன்னதாக நோர்வூட் விஜயத்தின்போது அவர் அளித்த வாக்குறுதியின்படி எமக்குக் கிடைக்கப்பெற்ற 10,000 வீடுகளுக்கான ஒப்பந்தத்திலும் இலங்கை அமைச்சர் என்ற வகையில் நானும் இந்திய அரசாங்கத்தின் பிரதிநிதியாக இந்தியத் தூதுவரும் மகாத்மா காந்திபுரத்தில் கைச்சாத்திட்டமை வரலாற்று நிகழ்வாகும். அதனை நான் பெரும் பாக்கியமாகவே கருதுகின்றேன்.

இந்திய தேசபிதா மகாத்மா காந்தி உலகத்துக்கே அகிம்சையைப் போதித்தார். அதனால்தான் இன்று அவரது 150ஆவது பிறந்த தினத்தை உலகமே நினைவுகூருகின்றது. அன்னாரது 150ஆவது அகவையை நினைவுகூரும் வகையிலும் இலங்கைவாழ் இந்திய வம்சாவளி மலையகத் தமிழர்களுக்கு இந்திய அரசாங்கம் தொடர்ச்சியாக வழங்கிவரும் உதவிகளுக்கு நன்றி செலுத்தும் வகையிலும் நுவரெலியா மாவட்டத்தின் டன்சினன் தோட்டத்தில் அமைக்கப்பட்ட 404 வீடுகளைக் கொண்ட இந்திய வீடமைப்புத் திட்டத்திற்கு 'மகாத்மா காந்திபுரம்' எனப் பெயரிட்டோம் என்பதை இந்த உயரிய சபையில் மீண்டும் அறிவிப்பதில் பெரு மகிழ்ச்சியடைகின்றேன். மகாத்மா காந்தி வாழ்ந்து காட்டிய அகிம்சை வழியில் எமது மக்களுக்கான அரசியல், சமூக செயற்பாட்டு பாதையில் தொடர்ச்சியாகப் பயணிக்கத் திடசங்கற்பம் கொள்வோம் என்று கூறி, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

[பி.ப. 2.34]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

கௌரவ சபாநாயகர் அவர்களே, அகிம்சையின் வழிகாட்டியாக வாழ்ந்து எமக்கெல்லாம் பாடத்தைக் கற்பித்துச் சென்ற மகாத்மா காந்தி அவர்களின் 150ஆவது பிறந்த தினத்தை நினைவுகூரும்முகமாக இந்த உயரிய சபையிலே முன்வைக்கப்பட்டிருக்கும் ஒத்திவைப்புப் பிரேரணையிலே ஒரு சில வார்த்தைகளைப் பேசக் கிடைத்த வாய்ப்பை நான் பெரும் பாக்கியமாகக் கருதுகின்றேன். அதுமாத்திரமன்றி, இந்திய வம்சாவளி இலங்கைத் தமிழன் என்ற வகையிலே எனக்குப் பெருமையைத் தேடித் தரும் ஒரு விடயமாகவும் அதை நான் இந்த உயரிய சபையிலே பதிவுசெய்ய விரும்புகின்றேன்.

ஆங்கிலேயர்கள் என்றால் உலகிலேயே அவர்களை விஞ்சியவர்கள் எவரும் கிடையாது. எல்லோரையும்விட தாங்கள்தான் மேன்மையானவர்கள் என்ற கொள்கையோடும் மமதையோடும் இருக்கின்ற ஒரு ஜனக் கூட்டமாகத்தான் நாங்கள் அவர்களைப் பார்க்க முடியும். அவ்வாறான ஆங்கிலேயர்களையே தனது அகிம்சையினூடாக மண்டியிட வைத்த பெருமை மகாத்மா காந்தியடிகளையே சாருமென்றால் அதனை யாராலும் மறுதலிக்க முடியாது. அவர் அகிம்சைக்கு எடுத்துக்காட்டாக வாழ்ந்தவர். அகிம்சையினூடாக எதையும் சாதிக்கலாமென்ற ஒரு பாடத்தை உலகிலேயுள்ள அனைத்து மக்களுக்கும் கற்றுத்தந்த ஒரு மகான்தான் மகாத்மா காந்தி அடிகள். இந்திய நாட்டின் சுதந்திரத்திற்காகப் போராட்டம் செய்தவர்கள் பலர்; ஆயுதம் ஏந்திப் போராட்டம் செய்தவர்கள் பலர்; வெவ்வேறு வழிகளிலே சுதந்திரத்தை அடைய வேண்டும் என்ற எண்ணத்தோடு செயற்பட்டவர்கள் பலர். அவர்கள் மத்தியிலே அகிம்சையினூடாகச் சுதந்திரத்தைப் பெற்றுக்கொள்ளமுடியுமென்ற கருத்தை வலியுறுத்தி, அதை முன்நிலைப்படுத்திச் செயற்பட்ட ஒரு மகான்தான் மகாத்மா காந்தி அடிகள் என்று சொன்னால், அது மிகையாகாது. அவர் அகிம்சைக்கு இலக்கணம் வகுத்தவர். அகிம்சையினூடாகச் சுதந்திரத்தைப் பெற்றுக் கொள்வதற்காக ஆங்கிலேயர்களுக்கு எதிராகப் பல்வேறு அகிம்சை ரீதியிலான போராட்டங்களை மேற்கொண்ட பெருமை அந்த மகானையே சாரும்.

சுதந்திரத்திற்காக ஆங்கிலேயர்களுக்கு எதிராக அவர் மேற்கொண்ட உப்புச் சத்தியாக்கிரகமானது இன்றும் உலகளாவிய ரீதியிலே பேசப்பட்டு வருகின்றது. இந்த உப்புச் சத்தியாக்கிரகத்தினூடாக ஆங்கிலேயர்களையே ஆட்டங்காண வைத்த ஓர் அகிம்சைவாதியென்றால், அவர் மகாத்மா காந்தி அடிகள் என்பதிலே எவ்வித சந்தேகமுமில்லை. அவரின் கதர் உடைக்கொள்கை ஆங்கிலேயர்களை ஆட்டங்காண வைத்தது; அவரின் அகிம்சைப் போராட்டம் ஆங்கிலேயர்களை ஆட்டங்காண வைத்தது. அவ்வாறான அகிம்சை ரீதியிலான அந்தப் போராட்டத்தினூடாக இந்திய நாட்டுக்குச் சுதந்திரத் தைப் பெற்றுக்கொடுத்த அந்த மகான் இன்றும் எம் மனதுக்குள் வாழ்ந்து கொண்டிருக்கின்றார் என்று சொன்னால், அதனை எவராலும் மறுதலிக்கமுடியாது. அகிம்சை என்ற ஒரு வார்த்தைக்கு நாங்கள் இன்றும்கூட இலக்கணம் காண்பித்தால், மகாத்மா காந்தி அடிகளையே காண்பிக்கின்றோம். அகிம்சை என்ற பொருளுக்குச் சொந்தக்காரராக அவர் மாறிப்போயிருக்கிறார். அவர் ஆங்கிலேயர்களுக்கு நிகராக இங்கிலாந்து நாட்டு சர்வகலாசாலையிலே பட்டம் பெற்றவர்! ஆங்கிலேயர்களுக்கு நிகராக அல்லது ஆங்கிலேயர்களைவிட ஒருபடி மேலாகக் கல்வியிலே சிறந்து விளங்கிய ஒரு கல்விமான்! அவ்வாறான அந்தச் சூழலிலே வாழ்ந்தாலும்கூட, தான் ஓர் இந்தியன் என்ற அந்த உணர்வோடு இந்திய மண்ணுக்காக, தனது மக்களுக்காக அகிம்சை ரீதியான போராட்டத்தை நடாத்திச் சுதந்திரத்தைப் பெற்றுக்கொடுத்த அந்த மகானின் நினைவுகள் என்றென்றும் உலகத்தைவிட்டு நீங்காதென்பதில் எவ்வித சந்தேகமுமில்லை. இந்த மகான் இங்கிலாந்து நாட்டுப் பல்கலைக்கழகத்திலே படித்துக் கொண்டிருந்தபோது, அவரின் விரிவுரையாளர் ஒரு விடயத்தைக் கூறினார். அதாவது –

When he was studying in the university in England, his professor was jealous of him because he was extremely brilliant and outstanding, and because of his high qualities, he attracted very many people of that university. So, this particular white-skinned English professor wanted to irritate, humiliate and penalize him. Once, he called Mahatma Gandhiji and said, "Look here, you Indians are like horses in our country, which are of different colours. We find horses of different colours in our country. Likewise, Indians are of different colours; they have different-coloured skins." Then, the respectable Mahatma Gandhiji, in a very polite manner, replied him back and said, "Of course, yes, Sir. I fully admit what you say because we Indians are of different colours like the horses in your country. Similarly, you white-skinned people, men of one colour, are like the monkeys in our country. All the monkeys in our country are of the same colour. There is no colour difference. So, you all are like the monkeys in our country." This polite reply made the

professor humiliated, irritated and penalized. So, the professor thought that he made these utterances to a wrong person, who was Mahatma Gandhiji.

அகிம்சை என்ற ஒரு வார்த்தை உலகிலே இருக்கும்வரை, மகாத்மா காந்தி அவர்களை எங்களால் மறக்க முடியாது. அதேபோல, மகாத்மா காந்தி என்ற பெயர் உலகிலே இருக்கும்வரை அகிம்சை என்ற வார்த்தையை எங்களால் மறக்க முடியாது. அவரின் ஞாபகார்த்தமாக எமது நாட்டிலும் பல்வேறு மண்டபங்கள், பாடசாலைகள் மற்றும் வீடமைப்புத் திட்டங்களுக்கு அந்த அகிம்சைவாதியின் பெயரைச் சூட்டியிருக்கிறோம். அந்த அகிம்சைவாதமானது உலகம் என்று ஒன்றிருக்கும்வரை தொடர்ந்து இருக்கும் என்று நான் நம்புகின்றேன். எனவே, அவரின் அகிம்சைப் போராட்ட மானது நம் எல்லோருக்கும் ஒரு நல்ல பாடத்தைப் புகட்டி, எங்களை இன்றும் நல்வழிப்படுத்திக் கொண்டிருக்கின்றது என்று கூறிக்கொண்டு, சந்தர்ப்பம் அளித்த சபாநாயகர் அவர்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[பி.ப. 2.44]

**ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**

(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன் - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Selvam Adaikkalanathan - Deputy Chairman of Committees)

கௌரவ சபாநாயகர் அவர்களே, மகாத்மா காந்தியின் 150ஆவது ஜனன தினத்தை முன்னிட்டு, சனநாயக மரபுகளைக் கொண்ட இவ்வுயரிய சபையிலே அவரை நினைவுகூர்கின்ற வகையில், ஓர் ஒத்திவைப்புவேளைப் பிரேரணையைக் கொண்டுவருவதற்கு முன்னணியிலே நின்று செயற்பட்ட உங்களுக்கும் பிரதமர் அவர்களுக்கும் கட்சித் தலைவர்களுக்கும் எனது நன்றியையும் வணக்கத்தையும் தெரிவித்துக் கொள்கின்றேன். மகாத்மா காந்தி அவர்கள் ஓர் அகிம்சைப் போராளியாகத்தான் இப்பொழுதும் பேசப்படு கின்றார். உலகமெல்லாம் அகிம்சையைக் கொண்ட ஒரு மகாத்மா என்று அழைத்தால், அது எங்களுடைய இந்திய தேசத்தின் மகாத்மா காந்தியைத்தான் குறிப்பிடுகின்றது. எந்தவொரு நாட்டிற்கும் கிடைக்காத ஒரு வரப்பிரசாதம் இந்தியாவுக்குக் கிடைத்திருக்கிறது. அதுதான், மாபெரும் அகிம்சைப் போராளியாகத் திகழ்ந்த மகாத்மா காந்தியை இந்தியா பெற்றுக்கொண்டது. அவரால் இந்தியாவுக்குப் பெருமை கிடைத்திருக்கிறது.

இந்தியாவானது உலகத்திலே ஜனநாயக நாடுகளில் முதன்மை நாடாக இன்றைக்கும் பேசப்படுகின்றது என்று சொன்னால், அதற்கு மகாத்மா காந்தியினுடைய அகிம்சைப் போராட்டம்தான் காரணமாகும். அந்த வகையில் உலகத்திலே பேசப்படுகின்ற ஒரு மகான் அவர். உலகத்திலே அகிம்சைப் போராட்டத்தினூடாக விடுதலை பெறமுடியும் என்ற வரலாற்று முக்கியத்துவத்தைக் கோடிட்டுக் காட்டியவர் எங்களுடைய மகாத்மா காந்தி அவர்கள்! அவருடைய பாதங்கள் எங்களுடைய தேசத்திலே பட்டிருக்கின்றன என்றால், அது உண்மையிலே பெருமைப்படக்கூடிய ஒரு முக்கியமான விடயமாகும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகிறேன். இலங்கையிலே பல இடங்களில் அவருடைய பாதங்கள் பட்டிருக்கின்றன. மலையகத்திலே, கண்டியிலே, ஏன், யாழ்ப்பாணத்தின் பருத்தித்துறையில்கூட, அவருடைய பாதங்கள் பட்டுச் சென்றிருக்கின்றன.

ஒரு நாட்டின் விடுதலையைப் பெற்றுக் கொடுப்பதற்கு முன்னுதாரணமாக இருந்த மகாத்மா காந்தி அவர்களைப் பற்றி, அவரால் முன்னெடுக்கப்பட்ட சாத்வீகப் போராட்டங்களை, அகிம்சைப் போராட்டங்களைப் பற்றி எங்களுடைய தேசத்தின் நாடாளுமன்றத்திலே பேசுவதை நாங்கள் பெருமையாகக் கொள்கின்றோம். மகாத்மா காந்தியின் 150ஆவது ஜனன தினத்திலே அவரை நினைவுகூருகின்ற நாங்கள் அவருடைய வரலாற்றைச் சொல்பவர்களாக மட்டும் நின்றுவிடக் கூடாது. உண்மையிலே அது ஏற்புடையதாகவும் இருக்காது. அவருடைய அகிம்சைப் போராட்டத்தினூடாக நாங்கள் பெற்ற அனுபவங்களைப் பார்க்க வேண்டும். இலங்கை நாடு அவருடைய வாழ்க்கையை முன்னுதாரணமாக எடுத்துக் கொள்ள வேண்டும். அதுதான் இந்த நினைவுகூரலின் நோக்கமாக இருக்க வேண்டும். அவருடைய வரலாற்றை மட்டும் பேசிவிட்டுச் சென்றுவிடுவதென்பது சாலச்சிறந்ததல்ல. அவருடைய வரலாற்றினூடாக எங்களுடைய தேசம் எப்படிச் செயற்பட்டிருக்கின்றது, ஜனநாயக ரீதியிலே, அகிம்சை ரீதியிலே தன்னுடைய மக்களை எப்படி அரவணைத்துச் செல்லுகின்றது என்பதைப் பற்றிப் பார்க்க வேண்டும். அதைப் பிரதான நோக்கமாக நாங்கள் கொள்ள வேண்டும்.

மகாத்மா காந்தியவர்கள் அகிம்சைப் போராட்டத்தினூடாக அந்நிய ஏகாதிபத்தியத்திற்கு எதிராகச் செயற்பட்ட அதேவேளையில், உள்ளூர் உற்பத்திகளுக்கு முக்கியத்துவம் கொடுக்கின்ற ஒரு வரலாற்றையும் பதித்திருக்கிறார். உள்ளூர் உற்பத்திக்கு முக்கியத்துவம் கொடுக்கின்ற வகையிலே பருத்தியிலே நெசவு செய்த துணியை அணிந்துகொண்டு உப்புச் சத்தியாக்கிரகத்தை மேற்கொண்டார். அவருடைய செயற்பாடுகளைப் பார்க்கின்றபோது, அவர் உள்ளூர் உற்பத்திகளுக்குக் கொடுத்திருந்த முக்கியத்துவம் புலனா கின்றது. இன்றைக்கு எங்களுடைய தேசத்திலே நாங்கள் எவ்வளவு சதவீதம் உள்ளூர் உற்பத்திகளுக்கு முக்கியத்துவம் கொடுப்பவர்களாக இருக்கின்றோம்? இந்தியாவிலே பல பிரச்சினைகள் இருந்தாலும் ஒவ்வோர் இந்தியக் குடிமகனும் 'நான் இந்தியன்' என்று உரிமையுடன் சொல்லிக் கொள்கின்றான். அந்தவகையில், இந்த ஜனநாயக நாட்டிலே எங்களுடைய மக்களும் 'நான் இலங்கையன்' என்று சொல்லக்கூடிய வகையிலே எங்களுடைய செயற்பாடுகள் அமைவதற்கான சாத்தியக்கூறுகள் உருவாக வேண்டும் என்பதை இந்த நிகழ்விலே நாங்கள் சொல்லிக்கொள்ள விரும்புகின்றோம்.

இந்த ஆட்சி மாற்றத்தின் பின்பு, எங்களுடைய மக்களின் பிரச்சினைகள் தொடர்பாக அவர்களால் அகிம்சை ரீதியான போராட்டங்கள் மேற்கொள்ளப்படுகின்றபோது அவற்றைக் கவனத்திலெடுத்து செயற்பட்டால்தான் மகாத்மா காந்தியின் அகிம்சை தர்மத்தை நாங்களும் கொண்டுள்ளோம் என்று சொல்லிக்கொள்ள முடியும். அந்தக் கொள்கையுடையவர் களாக நாங்களும் இருக்கிறோம் என்பது இந்த நினைவு நாளிலே ஒரு செய்தியாக இருக்க வேண்டும். அந்த வகையில், எங்களுடைய தேசத்திலே ஒட்டுமொத்த இலங்கையரும் சுதந்திரமாக 'நான் இலங்கையன்' என்று சொல்லக்கூடிய நிலைமையை உருவாக்க வேண்டுமென்று கூறி, வாய்ப்பளித்ததற்கு நன்றி கூறி விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

අතිගරු ජනාධිපතිතුමා.

[අ.භා.2.52]

**අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (ජනාධිපතිතුමා, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා සහ ආරක්ෂක අමාත්‍යතුමා)**

(மேதகு மைத்திரிபால சிறிசேன - ஜனாதிபதியும் மகாவலி அபிவிருத்தி, சுற்றாடல் அமைச்சரும் பாதுகாப்பு அமைச்சரும்)

(His Excellency Maithripala Sirisena - President, Minister of Mahaweli Development and Environment and Minister of Defence)

ගරු කථානායකතුමනි, විසිවන සියවසේ මුල් භාගයේදී මුළුමහත් මානව සමාජයටම බිහි වූ සැබෑ මානවවාදියකු, විශිෂ්ටයකු සහ ශ්‍රේෂ්ඨයකු වූ මහත්මා ගාන්ධිතුමා පිළිබඳවයි අද අපි කථා කරන්නේ; ගුණ සිහිපත් කරන්නේ. අපි සෑම කෙනෙක්ම දන්නවා, මහත්මා ගාන්ධිතුමා සැබෑ ලෙසම දේශපාලනඥයෙක් නොවෙයි කියලා. දේශපාලනඥයකු නොවූ මානවවාදියකු වූ මහත්මා ගාන්ධිතුමා මහා භාරතයට බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලබා ගැනීම සඳහා ගෙනගිය නිදහස් අරගළයේදී සමකාලීන නායකයන් සමඟ විශිෂ්ට නායකත්වයක් ලබාදුන්නා. එහිදී ඇතිවුණු ගැටුම් පිළිබඳව කථා කළහොත්, අද සිටින දේශපාලනඥයන් ජනතා අරගළවලදී ඇති කර ගන්නා වූ ගැටුම්වලට වඩා වෙනස් ස්වරූපයක හිංසාවාදයෙන් තොර, ප්‍රචණ්ඩත්වයෙන් තොර ගැටුම්වලටයි එතුමා සම්බන්ධ වුණේ.

ගරු කථානායකතුමනි, මහත්මා ගාන්ධි චරිතය ඉන්දීය ජනතාවගේ පමණක් නොවෙයි, අසල්වැසි මිත්‍ර රාජ්‍යයක් විධියට අපේ පමණක් නොවෙයි, මුළු ලෝකයේම ගෞරවයට, ප්‍රණාමයට, භක්තියට, ආදරයට, සෙනෙහසට හා දයාවට ලක් වූ චරිතයක්. එතුමා අපේ රටට පා තැබූ විශිෂ්ට ඉන්දීය නායකයෙක්. එතුමා සැබෑ මානව හිතවාදියෙක්. ඒ යුගය තුළ බ්‍රිතාන්‍ය පාලනයෙන් බැට කා පීඩනයට පත් වූ ඉන්දීය ජනතාව හසුරුවන්නට සහ ජාතික අරගළයට නායකත්වය දෙන්නට එතුමාට තිබූ දක්ෂතාව, බැරිස්ටර්වරයකු විධියට එතුමා ලැබූ උසස් අධ්‍යාපනය, එතුමා තුළ තිබුණු භික්මීම, විනය ගරුකභාවය, ඉවසීම, සැබෑ ලෙස මිනිසුන්ට ආදරය කිරීමේ විශිෂ්ට ගුණාංගය, එදා සහ අද පමණක් නොවෙයි, හෙට උපදින දරුවන්ගේ පවා ඉමහත් ගෞරවයට පාත්‍රවෙනවා. සටන්වලදී එතුමා ප්‍රචණ්ඩත්වයෙන් තොරව, හිංසාවෙන් තොරව ජනතාව ඒකරාශි කරගත්තා. එදා ඒ යුගයේ තවත් කෙනකුට සම කළ නොහැකි එතුමාටම ආවේණික වූ ඒ විශිෂ්ට චරිතය පිළිබඳව අද අපි කථා කළ යුත්තේ ගුණ ගායනා කිරීමට, ඒ චරිතය සිහිපත් කිරීමට පමණක් නොවෙයි, ගරු කථානායකතුමනි. අපත්, අපේ රටේ උගත් නව පරපුරත්, ඒ වාගේම හෙට උපදින දරුවනුත් ඒ සැබෑ විශිෂ්ට චරිතයේ බොහෝ ගති ලක්ෂණ, ගුණාංග රාශියක් ආදර්ශයට ගත යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මහත්මා ගාන්ධිතුමාගේ චරිත කථා පොත් කොතෙක් කියවා ඇද්දැයි කියා මට මතකයක් නැහැ. ඒ තරමටම මහත්මා ගාන්ධි චරිත කථා පොත් මා කියවා තිබෙනවා. අද මගේ කොළඹ නිල නිවසට කෙනෙක් ගියොත් දැක ගන්න පුළුවන්, මගේ නිල නිවසේ මහජන හමුවීම් පවත්වන ස්ථානයේ බිත්තියෙහි මුදුනෙන්ම ගෞතම බුදු රජාණන් වහන්සේගේ පුංචි ප්‍රතිමාවක් තිබෙන බව. මගේ නිවසේ ඒ බුදුන් වහන්සේගේ ප්‍රතිමාවට යටින් තිබෙන්නේ මහත්මා ගාන්ධිතුමාගේ ඡායාරූපයක්. මහත්මා ගාන්ධි චරිතය පොතකින් කියවා, ඒ අවබෝධය, දැනුම සහ මතකය අවදි කර ගන්නවා වාගේම, ඒ චරිතය අප අධ්‍යයනය කළ යුතු චරිතයක්. ඒ චරිතය අපි කියැවිය යුතු චරිතයක්. ඒ පොත නොවෙයි, ඒ චරිතය අප විසින් කියවිය යුතුයි. ඒ චරිත කථාවේ තිබෙන හැටියට, බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ඉන්දීය ජාතික නිදහස් අරගළයේදී සිය ජනතාවත් සමඟ එතුමා ගෙන ගිය සටන්වල ප්‍රතිඵලයක් හැටියට බ්‍රිතාන්‍ය පාලනයෙන් මහා භාරතයට -ඉන්දියාවට- නිදහස ලබා දෙන ඒ නිල නිවේදනය නිකුත් කරන්න සතියකට පමණ පෙර මහත්මා ගාන්ධිතුමාට දැන ගන්න ලැබුණා. ඒ පණිවුඩය එතුමාට දුන්නේ එවකට ඉන්දියාවේ සිටි බ්‍රිතාන්‍ය පාලනය විසින් පත් කරනු ලැබූ ආණ්ඩුකාරතුමා. ඒ පණිවුඩය දුන්නාට පසු මහත්මා ගාන්ධිතුමා වසර ගණනාවක් තුළ ගෙන ගිය භාරත නිදහස් ජාතික සටනට නායකත්වය දුන්, පණුදුන් තමාගේ සමකාලීනයන් රාශියක් එක මේසයකට කැඳෙව්වා. එක මේසයකට කැඳවලා තමාගේ සාමකාලීන ඉන්දීය ජාතික සටනේ නායකයන්ට, මිත්‍රයන්ට, සහෝදරයන්ට ගාන්ධිතුමා කිව්වා, "අපට තව දින කිහිපයකින් බ්‍රිතාන්‍ය පාලනය නිදහස ලබා දෙනවා. ඒ නිදහස ලබා දීමත් සමඟම අපි සූදානම් වෙන්න ඕනෑ, ඉන්දියාවේ පළමුවැනි නිදහස් ආණ්ඩුව හදන්න. ඒ නිදහස් ආණ්ඩුව හදන විට අප සියලුදෙනාම එකට කටයුතු කරන්න ඕනෑ." කියලා.

පාකිස්තානය වෙනම රාජ්‍යයක් විධියට අවශ්‍ය යැයි කියා නිදහස දීමටත් පෙර ප්‍රකාශ කළ, ඒ වාගේම නිදහස දෙන අවස්ථාවක පාකිස්තානයේ කොටස ඉන්දියාවෙන් වෙන් කර දිය යුතුයි කියා ඒ වන විටත් බ්‍රිතාන්‍ය පාලනයට දැනුම් දුන් පුද්ගලයා වූයේ පාකිස්ථානයේ නිර්මාතෘවරයා වූ මොහොමඩ් අලි ජින්නා මැතිතුමායි. මොහොමඩ් අලි ජින්නා මැතිතුමාත් ඒ සාකච්ඡාවට සහභාගි වුණා. ඒ සාකච්ඡාවට සහභාගි වූ අවස්ථාවේ, "තව දින කිහිපයකින් අපට නිදහස ලැබෙනවා. අපි ඉන්දියාවේ පළමුවැනි නිදහස් ආණ්ඩුව සැදිය යුතුයි" කියලා මහත්මා ගාන්ධිතුමා ප්‍රකාශ කරන විට, මොහොමඩ් අලි ජින්නා මැතිතුමා කිව්වා, "නිදහස ලැබෙනවාත් සමඟ හෝ ඊට පෙර අපට පාකිස්තානය වෙනම රාජ්‍යයක් විධියට අවශ්‍යයි" කියලා. එතැනදී මහත්මා ගාන්ධි චරිතයේ විශිෂ්ටත්වය වුණේ මොකක්ද? දේශමාමකයකු විධියට, දේශප්‍රේමියකු විධියට, දේශවාන්සල්‍යයකු විධියට, දේශජයකු විධියට මහත්මා ගාන්ධි මැතිතුමාගේ චරිතයේ තිබුණු ලක්ෂණ පෙන්නුම් කරමින් මොහොමඩ් අලි ජින්නා මැතිතුමාට කිව්වා, "ඔබ පාකිස්තානය කියා වෙනම කොටසක් මේ රටින් වෙන් කර ඉල්ලන්න එපා. පාකිස්තානය කියලා වෙන් කළ රාජ්‍යයක් ඉන්දියාවෙන් ඉල්ලන්න එපා. අපි සියලුදෙනාම එකම රටක ජීවත් වෙමු." කියලා. නමුත් ගරු කථානායකතුමනි, මොහොමඩ් අලි ජින්නා මැතිතුමා ඒ පිළිබඳව බොහෝ කරුණු ඉදිරිපත් කළා. බොහෝ තර්ක - විතර්ක ඉදිරිපත් කළා. එය බොහෝ සංවාදශීලී වටමේසයක් බවට පත් වුණා.

ගරු කථානායකතුමනි, අවසානයේ මොහොමඩ් අලි ජින්නා එහිදී තදින්ම කියා සිටියා, "අපට පාකිස්තානය වෙන් කර ගැනීම ඉතාම අත්‍යවශ්‍යයි" කියලා. ගරු කථානායකතුමනි, මා කියවූ මහත්මා ගාන්ධි චරිත කථාවේ සඳහන් වෙනවා, එවිට මහත්මා ගාන්ධිතුමා මොහොමඩ් අලි ජින්නාට කිව්වේ මොකක්ද කියලා. "ඔබ පාකිස්තානය කියා රටක් වෙන් නොකර මේ මහා භාරත ඉන්දියාවේ ඔබ අගමැති වෙන්න. ඔබ මේ රටේ නායකයා වෙන්න. ඔබ මේ රට භාර ගන්න. ඔබට කැමැති ඇමති මණ්ඩලයක් පත් කර ගන්න. ඔබට කැමැති හමුදාපතිවරු පත් කර ගන්න. ඔබට කැමැති අමාත්‍යාංශ ලේකම්වරු පත් කර ගන්න. ඔබ රටේ නායකයා වී මේ සටන ගෙන ගිය සමකාලීන මිත්‍රයන් සමඟ ඉන්දියාව ඉස්සරහට ගෙන යන්න" කියලා කිව්වා. නමුත් එයට මොහොමඩ් අලි ජින්නා මැතිතුමා කැමැති වුණේ නැහැ. පාකිස්තානය වෙන් කරමු කියලා එතුමා ඉල්ලා සිටියා. මහත්මා ගාන්ධිතුමාගේ චරිත කථාවේ තිබෙනවා, ඒ ශ්‍රේෂ්ඨ මානවවාදියා; ශ්‍රේෂ්ඨ යුගපුරුෂයා, විසිවන සියවසේ ලෝකයටම ආදර්ශයක් දුන් මහා සැබෑ මිනිසා, ඒ වෙලාවේ කථා කළා පමණක් නොවෙයි, මහ හයියෙන් හඬන්නට වූ බව. කඳුළු සලමින්, හඬමින් මහත්මා ගාන්ධිතුමා මොහොමඩ් අලි ජින්නාගෙන් ඉල්ලා සිටියා,

පාකිස්තානය කියා වෙනම කොටසක් ඉල්ලන්න එපාය කියලා. නමුත් අවසානයේ ඒ ඉල්ලීමට ඉඩ ලැබුණේ නැහැ. පාකිස්තානය කියා වෙනම රටක් හැදුණා, වෙන් වුණා.

ගරු කථානායකතුමනි, පසුගිය දශක කිහිපය තුළ පැවැති ඉන්දු -පාකිස්තාන් දේශසීමා අරගළ ගැන අපි කියවා තිබෙනවා. ඉන්දු-පාකිස්තාන් දේශසීමාවල ඇති වුණු යුද්ධ ගැන අපි කියවා තිබෙනවා; අපි දැක තිබෙනවා; අසා තිබෙනවා. ඉන්දියාව නිදහස ලබා ගත්තායින් පසුව මේ දක්වා ඉන්දු-පාකිස්තාන් දේශසීමා අරගළ නිසා දහස් ගණනක් මිය ගිය බව අපි දන්නවා; වාර්තා වෙනවා. ඒ අවස්ථාවලදී දෙරටේම ආර්ථිකය කොතරම් විනාශ වුණාද කියන කාරණාව අපි දන්නවා. අද්‌ත් පාකිස්තානය සහ ඉන්දියාව සිය ජාතික ආරක්ෂක කටයුතුවලදී පාකිස්තානු සහ ඉන්දීය දේශසීමා අතරේ ගැටුම් වළක්වා ගැනීමට, සාමකාමීව පවත්වා ගෙන යෑමට, යුද්ධයක් ඇති වීම වැළැක්වීමට ආරක්ෂක වියදම් වෙනුවෙන් මොන තරම් බිලියන ප්‍රමාණයක් වියදම් කරනවාද කියන එක ඒ රටවල්වල අය වැය යෝජනා තුළින් පැහැදිලි වෙනවා.

ඒ සිද්ධියෙන් පසුව රටවල් දෙක වෙන්වීමත් එක්ක -එක රට දෙකක් වීමෙන් පසුව- ලක්ෂ ගණන් ජනතාව පාකිස්තාන් දේශයේ සිට ඉන්දියාව පැත්තටත්, ඉන්දියානු දේශයේ සිට පාකිස්තානය පැත්තටත් මහා පෙරහැරවල් වාගේ, ගංගා ගලනවා වාගේ ලක්ෂ ගණන් ගලා යන්නට පටන් ගත්තා. එකම රටක ජීවත් වූ සහෝදර ජනතාව රටවල් දෙකක් වීමෙන් පසුව ඇති වූ තත්ත්වය තුළ, තමන්ට ලැබුණු ප්‍රතිඵලය යහපත් හෝ වේවා, අයහපත් හෝ වේවා වර්ෂ ගණනාවක් තිස්සේ කටුක අත්දැකීමක් ලැබුවා. එම කටුක අත්දැකීම තුළ බොහෝ ප්‍රශ්න ඇති වුණා. බොහෝ දේශපාලන ප්‍රශ්න, බොහෝ සමාජ ප්‍රශ්න, බොහෝ ආර්ථික ප්‍රශ්න ඒ තුළ ඇති වුණා. ඒ වාගේම ඉන්දියාවේ මහා භාරතයේ අන්තවාදී හින්දු ජාතිකයන් කණ්ඩායමක් තුළ සැකයක් ඇති වුණා, මහත්මා ගාන්ධිතුමාගේ කැමැත්තෙන් තමයි පාකිස්තානය කියන රට ඉන්දියාවෙන් වෙන් කරලා දුන්නේ කියලා.

ඒ සැක කළ කාරණය කොතරම් සත්‍ය ලෙස අන්තවාදී හින්දු ජාතිකයින්ගේ හදවතට එක් වුණාද කියනවා නම්, ඔවුන් තීරණය කළා ඉන්දියාවේ කොටසක් කැඩීමේ පාපයට වගකිව යුත්තා මහත්මා ගාන්ධිතුමායි කියලා. එසේ සැක කර; අවිශ්වාස කර ඔවුන් කුමන්ත්‍රණය කරලා මහත්මා ගාන්ධිතුමා අමු අමුවේ ඝාතනය කළා; මරලා දැම්මා. එතුමා උත්සවයකට සහභාගී වීමට ගිය අවස්ථාවේ, එතුමා ඝාතනය කළ පුද්ගලයා මල් පොකුරක් අරගෙන මහත්මා ගාන්ධිතුමා පිළිගන්න එතුමා ළඟට ආවා. මහත්මා ගාන්ධිතුමාට මල් පොකුර දීලා, මහත්මා ගාන්ධිතුමා එය පිළිගන්නවාත් සමඟම මහත්මා ගාන්ධිතුමා විනාශ කළ ඝාතකයා ඔහුගේ ඉනේ සඟවා ගෙන සිටි රිවෝල්වරය අරගෙන එක දිගට මහත්මා ගාන්ධිතුමාට වෙඩි තියන්න පටන් ගත්තා. එම සිද්ධියෙන් තමයි එතුමාගේ අභාවය සිදු වුණේ. අද ලෝකයම ගරු කරන, මානවවාදයේ විශිෂ්ටත්වය සහ ශ්‍රේෂ්ඨත්වය පෙන්නුම් කරන ඒ සැබෑ ගුණ ගරුක මිනිසා, දේශපාලනඥයෙක් නොවූ ජාතික නිදහස් සටන් අරගළය ගෙන ගිය මහත්මා ගාන්ධිතුමාව ඇතැම් වේලාවට ඝාන්තුවරයෙක් වශයෙන් හඳුන්වනු ලබනවා.

ගරු කථානායකතුමනි, මහත්මා ගාන්ධිතුමා වැනි මහා ශ්‍රේෂ්ඨ චරිතයක් පිළිබඳ ගුණ කථනයන් කිරීමට ඔබතුමා මේ ගරු සභාවේ කාලය වෙන් කර අවස්ථාව ලබා දීම පිළිබඳව මේ රටේ පුරවැසියකු විධියට, එතුමා ගැන කියැවූ කෙනෙකු විධියට, මේ රටේ ප්‍රධාන මහජන සේවකයා හැටියට මම සතුටු වෙනවා. අපි අද්‌ත් එතුමාට ගරු කරනවා; හෙටත් එතුමාට ගරු කරනවා. අපි 'මහත්මා ගාන්ධි චරිතය' පොත් කියවනවා වාගේම අප විසින් එතුමාගේ චරිතයත් කියවිය යුතු වෙනවා. එයින් අද ලෝකයේ තිබෙන බොහෝ ප්‍රශ්නවලට විසඳුම් ලැබෙනවා.

දේශ සීමා අරගළ, අභ්‍යන්තර ගැටුම්, මෙන්ම තවමත් ඇතැම් රටවල පවතින සිය රටේ අනන්‍යතාව සහ ජාතිකත්වය පිළිබඳ නිදහස් අරගළ, වාර්ගික ගැටුම්, ආගමික ගැටුම් යන සියල්ල සඳහා ආගමික සහජීවනය, භාෂාමය සහජීවනය, ජාතීන් අතර සහජීවනය, සැබෑ සංහිඳියාව වැදගත් වෙනවා. අපි සංහිඳියාව ගැන කථා කරනකොට ඇතැමුන් අපට විහිළු කරන්න පටන් ගන්න පුළුවන්. යහ පාලන රටක තිබිය යුතු, ජාති, ආගම් රාශියක් නියෝජනය කරන රටක තිබිය යුතු සැබෑ සංහිඳියාවට මහත්මා ගාන්ධිතුමාගේ චරිතය ආදර්ශයක් දුන්නා. එතුමාගේ ක්‍රියාශීලිත්වය, නායකත්වය, එතුමාගේ අදහස්-යෝජනා, එතුමාගේ වචන, එතුමා පැවැත්වූ කථා, එතුමාගේ ඉතා දක්ෂ විශිෂ්ට වූ මහා වාග් ප්‍රහාර බ්‍රිතාන්‍ය පාලකයන් බියට පත් කළා. බ්‍රිතාන්‍ය පාලකයන්ට තර්ජන ස්වරූපයෙන්, සෙනෙහසින් සහ අවිහිංසාවෙන් එතුමා එල්ල කළ ප්‍රබල වාග් ප්‍රහාර සෑම අතින්ම ආදර්ශයක් දුන්නා. මහත්මා ගාන්ධිතුමාගේ ගුණ සිහිපත් කරන මේ අවස්ථාවේ එතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ බොහෝ තිබෙනවා. මහත්මා ගාන්ධිතුමා වැනි චරිත අද දකින්න නොලැබුණත්, මහත්මා ගාන්ධිලා එක්කෙනෙක් නොව සියයක් අවශ්‍ය යුගයක රජය වෙනුවෙන්, අපේ රටේ ආදරණීය ජනතාව වෙනුවෙන් ගුණ ගරුක යහපත් සමාජයක් බිහි කිරීමට කැප වී සිටින පිරිසක් විධියට අපට එතුමාගේ චරිතයෙන් උගත හැකි බොහෝ දේ තිබෙනවා. අද ජීවත් වන මිනිසුන් මෙන්ම හෙට උපදින දරුවන් සඳහාත් නව ලෝකයක, නව ගමන් මඟක යන්නට එතුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශය ක්‍රියාවට නංවමු කියන ගෞරවනීය ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.12]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன அமைச்சர்)

(The Hon. Gamini Jayawickrama Perera - Minister of of Buddhasasana)

ගරු කථානායකතුමනි, මහත්මා ගාන්ධි නම් ඒ ශ්‍රේෂ්ඨ පුද්ගලයා ගැන අතිගරු ජනාධිපතිතුමා කළ කථාවෙන් පසුව මට කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මහත්මා ගාන්ධිතුමා එදා නිදහස ලබා ගැනීම වෙනුවෙන් සටන ගෙන යන අවස්ථාවේ මම නාලන්දා විද්‍යාලයේ ඉගෙන ගන්නා පොඩි කොල්ලෙක්. නිදහස ලබා ගැනීම සඳහා එදා සුදු ජාතිකයන් සමඟ; මහා බලවත් ජාතියක් වන බ්‍රිතාන්‍ය ජාතිකයන් සමඟ අවිහිංසාවාදීව එතුමා ඒ සටන ගෙන යන ආකාරය පාසල් දරුවකු විධියට එදා මා ඉතාම අගය කළා.

ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමනි, අපේ අනාගත පරපුර වන පාසල් ශිෂ්‍යයන්ට අපි එවන් ශ්‍රේෂ්ඨයන්ගේ ජීවිත කථා කියවීමට දිය යුතුයි කියා මා හිතනවා. ඒ තුළින් තමයි ජීවිත ආලෝකවත් වන්නේ; සමාජය පිළිබඳ හොඳ හැඟීමක් ඇති පුද්ගලයන් බිහි වන්නේ. මහත්මා ගාන්ධිතුමා මිනිසුන් අතර නොමියෙන, නොමැකෙන මහා ශ්‍රේෂ්ඨ පුද්ගලයකු, ජීවමාන දෙවි කෙනකු විධියටයි අපි කුඩා කාලයේත් සැලකුවේ. මම නාලන්දා විද්‍යාලයේ ඉගෙන ගන්න කාලයේ බෝඩිමේ ඉන්නකොට එක් දිනක රාත්‍රියේ 9.00ට, 9.30ට විතර සියලුදෙනා ඝෝෂාවක් නඟමින් එළියට බැහැලා, පිට්ටනියට -ground එකට - දුවලා අහස දෙස බලාගෙන හිටියා. පොඩි කොල්ලන් විධියට අපිත් නැඟිටලා seniorsලා එක්ක ගිහිල්ලා අහස දෙස බැලුවා. අපි දැක්කා, දුර්ලභ වල්ගා තරුවක් ලොකුවට අහසේ දර්ශනය වන ආකාරය. ඒ වෙලාවේ අපේ ගුරුවරු කිහිපදෙනකු කිව්වා, "කුමක් හෝ දෙයක්

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

සිදු වෙන්නයි යන්නේ" කියා. එසේ කියලා දින දෙකක් ගියේ නැහැ, මහත්මා ගාන්ධිතුමා ඝාතනය කළාය කියන ප්‍රවෘත්තිය අපට අහන්න සිදු වුණා.

ගරු කථානායකතුමනි, ජවහර්ලාල් නේරු, ආචාර්ය විනොබා බාවෙ වැනි ශ්‍රේෂ්ඨ නායකයන් එදා ඉන්දියාවේ බිහි වුණා. සර්වෝදය ව්‍යාපාරයේ නිර්මාතෘ ආචාර්ය ඒ.ටී. ආරියරත්න මැතිතුමා නාලන්දා විද්‍යාලයේ සේවය කරන අවධියේ අපි නාලන්දා විද්‍යාලයේ ශිෂ්‍යයන්. ගෞතම බුදුන් වහන්සේ වදාළ පරිදි, අපි උත්පත්තියෙන් බ්‍රාහ්මණයකු හෝ වසලයකු වන්නේ නැහැ. එදා ඉන්දියාවේ මහා කුල වාදයක් පැවැතුණා. නමුත්, සුදු ජාතිකයන්ට විරුද්ධව එම සටන ගෙන යන්න මහත්මා ගාන්ධිතුමා ගෞතම බුදුන් වහන්සේගේ ධර්මය පොත් මඟින් කියවා සමානාත්මතාව, අවිහිංසාවාදය, කරුණාව, මෛත්‍රිය කියන ඒ ශ්‍රේෂ්ඨ ගුණාංග අනුගමනය කරන්න ඇති කියා මා හිතනවා. ශ්‍රේෂ්ඨ රජ පවුලක උත්පත්තිය ලබා, සසර කලකිරීමෙන් පැවිදි වී, බුද්ධත්වය ලබා සමාජයේ කුලවාදය ඉවතලා සමානාත්මතාව ඇති කිරීම වෙනුවෙන් ක්‍රියා කළ ශ්‍රේෂ්ඨ උත්තමයකු වන ගෞතම බුදුන් වහන්සේගේ චරිතය මහත්මා ගාන්ධි මැතිතුමා පොත් කියවීමෙන් ආදර්ශයට ගත්තාය කියා මා හිතනවා. එවැනි ශ්‍රේෂ්ඨ යුග පුද්ගලයන් එදා ඉන්දියාවේ -මහා භාරතයේ- බිහි වුණා. එතුමා දකුණු අප්‍රිකාවේ නීතිඥයකු විධියට ඉන්න අවස්ථාවේ ලැබූ කටුක අත්දැකීම් තුළින් එතුමාගේ ජීවිතයට නව පණක් ලැබෙන්න ඇතැයි කියා මා හිතනවා. එතුමා first class ටිකට් එකක් අරගෙන, සුදු ජාතිකයන් සමඟ එකම දුම්රියේ යද්දී, සුදු ජාතිකයන් එතුමාට හිරිහැර කර, තල්ලු කරලා ඉවත් කිරීම තුළින් එතුමාගේ ශක්තිය තවත් වැඩි කළා. ඒ ශක්තිය එතුමා වෛරයක් බවට පෙරළා ගත්තේ නැහැ. ඒ තුළින් විප්ලවයක් කරන්න ගියේ නැහැ; වෙඩි උණ්ඩ අතට ගැනීමට කළු ජාතිකයන් දිරි ගැන්වුවේ නැහැ.

එතුමා අවිහිංසාවාදය, කරුණාව, මෛත්‍රිය තුළින් යන ඒ ගමන දකුණු අප්‍රිකාවෙන් ආරම්භ කළා. එහේ ඉඳලා එතුමා මහා භාරතයට පැමිණියා. එදා මහා භාරතයේ ජාතිවාදය, කුලවාදය, ආගම්වාදය බලවත් වෙලා තිබුණා. එවැනි රටක නිදා සිටි මුළු මහත් ඉන්දීය ජාතිකයන් සුදු ජාතිකයන්ට විරුද්ධව අවදි කරවන්න එතුමා කටයුතු කළා.

ගරු කථානායකතුමනි, එතුමා ඉන්දීය ජාතිකයන් අවදි කළේ වෛරය තුළින් නොවෙයි; වෙඩි උණ්ඩය, ත්‍රස්තවාදය තුළින් නොවෙයි. එතුමා ඔවුන් අවදි කළේ ආදර්ශයෙනුයි. අවිහිංසාවාදය තුළින්, සත්‍ය ක්‍රියාවන් කරමින් එතුමා නිහතමානීව ජනතාව පාරට බැස්සුවා. එදා සුදු ජාතිකයන් ඒ අහිංසක වීරයන්ට හිරිහැර කර වෙඩි තියලා ඝාතනය කරද්දි, මහත්මා ගාන්ධිතුමා එම සටන නොනැවතුණු මහා රැල්ලක්, මහා අධිෂ්ඨාන බලවේගයක් බවට පත් කළා. ගරු කථානායකතුමනි, එහි ප්‍රතිඵලය ලෙස තමයි, "නොනැමෙන මහා ජාතිය" ලෙස හැඳින්වූ සුදු ජාතිකයන් දණ ගහන්න පටන් ගත්තේ. ඒ ආභාසය ලංකාවටත් ආවා. 1815 වර්ෂයේ සිටම, අපේ රටට නිදහස ලබාගැනීම වෙනුවෙන් ලාංකිකයන් ජීවිත පූජා කළ බව අප දන්නවා. නමුත්, අපේ රටට නිදහස ලබාගන්න අප අනුගමනය කළේ මහත්මා ගාන්ධිතුමාගේ වාගේ ඝට්ටනවාදී ක්‍රමයක් නොවෙයි. එදා මේ රටේ සියලුදෙනාම ශ්‍රී ලාංකිකයෝ ලෙස එකතු වෙලා වැඩ කළා. එදා සිංහල ජාතිය බලවත් ජාතියක්ය කියා කිව්වේ නැහැ; මුස්ලිම් ජාතිය කුඩා ජාතියක් කියා කිව්වේ නැහැ; දෙමළ ජාතිය හෝ බර්ගර් ජාතිය කුඩා ජාතියක් ලෙස සැලකුවේ නැහැ. ගාන්ධිතුමාගෙන් ලත් ආභාසය ඔස්සේ, සර් ඩී.බී. ජයතිලක, සර් පොන්නම්බලම් අරුණාචලම්, සර් රසික් ෆරීඩ්, මහාමාන්‍ය ඩී.එස්.සේනානායක වැනි උත්තමයන් ශ්‍රී ලාංකිකයන් ලෙස එකට එකතු වෙලා නිදහස ලබාගැනීම වෙනුවෙන් සටන් කළා. එදා ඉන්දියාවෙන් කොටසක්, "පාකිස්තානය" ලෙස කැඩුවා වාගේ, අපේ රටත් භේද කරන්න, වෙන් කරන්න සුදු ජාතිකයෝ උත්සාහ කළා. නමුත්, ඒ වෙලාවේ අපේ ඒ ශ්‍රේෂ්ඨ උත්තමයෝ එකට එකතු වුණා. අපි අදත් ඒ අයට ගරු කරනවා. එතුමන්ලා සුදු ජාතිකයන්ගේ කපටිකම් දැන ගත්තා. සුදු ජාතිකයන්ගේ කපටිකම් දැනගෙන, ඒවාට විරුද්ධව එදා ලාංකිකයන් විධියට එකතු වෙලා, "එක්සත් ජාතික පක්ෂය" කියා එකක් හදලා, මහත්මා ගාන්ධි මැතිතුමාගෙන් ලද ආභාසයත් ඔස්සේ ඒ වීර උතුමන්ලා ක්‍රියා කළ නිසායි අපේ රටට අද මේ නිදහස ලැබී තිබෙන්නේ. එතුමන්ලා ඒ නිදහස ලබා ගත්තේ වෙඩි උණ්ඩ තුළින්වත්, ලේ හලලාවත් නොවෙයි. අපි ඒ කාරණය අමතක නොකළ යුතුයි. මහත්මා ගාන්ධිතුමාට එදා, "මේ සුදු ජාතිකයන්", "මේ කළු ජාතිකයන්" කියා වෙනසක් තිබුණේ නැහැ. "කෙනෙකු බ්‍රාහ්මණයකු හෝ වසලයකු වන්නේ ඔහුගේ ජාතිය, ආගම හෝ කුලය අනුව නොව, ඔහුගේ ප්‍රතිපත්තිය අනුවයි" කියා අපේ ගෞතම බුදුරජාණන් වහන්සේ දේශනා කළා. මහත්මා ගාන්ධිතුමාත් අනුගමනය කළේ එවැනි ප්‍රතිපත්තියක්.

ගරු කථානායකතුමනි, එතුමාගේ ඒ සටන ලෝකයම අවදි කළා. එතුමා ලෝකයට මාර්ගයක් පෙන්නුවා. අපි දන්නවා, හින්දු ආගමේත් දෙවිවරුන්ට ගරු කරන බව. අපේ රටේ හින්දු භක්තිකයන් ඉන්නවා; ඉස්ලාම් භක්තිකයන් ඉන්නවා. මම ඔබතුමන්ලාට මෙන්න මේ කාරණය කියන්න කැමැතියි. කතරගම මහා දේවාලය අසළ ඊශ්වර දෙවියන්ගේ කෝවිල තිබෙනවා. එතැනම වල්ලිඅම්මාගේ කෝවිලත් තිබෙනවා.

එතැන මුස්ලිම් බැතිමතුන්ගේ - ඉස්ලාම් ආගමේ - පල්ලිය තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති 2015 වසරේ ඔබතුමායි මමයි ගියා කතරගම පෙරහැර ආරම්භ කරන්න කොඩිය ඔසවන්න. ඔබතුමාට මතකද මම දන්නේ නැහැ, මුස්ලිම් බැතිමතුන්ගේ පල්ලියට ඇතුළු වන තැන උඩින් හොඳ වැකියක් ලියා තිබෙන බව අපි දැක්කා. මම ඒකේ photograph එකක් ගත්තා. මොකක්ද එහි ලියා තිබුණේ? පල්ලියට ඇතුළු වන තැන උඩින්ම ලියා තිබෙන්නේ, "යම් කෙනෙක් අධර්මයෙන් හම්බ කරනවාද, ඒ පුද්ගලයාගේ දානයවත් එපා." කියා. මම ඊයේ-පෙරේදා ගිය වෙලාවකත් එම වැකියේ photograph එකක් නැවත ගත්තා. කුරාණයේ තිබෙන්නේ, මේවා. හින්දු ආගමේ තිබෙන්නේ, මේවා. බයිබලයේ තිබෙන්නේ, මේවා.

ගරු කථානායකතුමනි, 'බුද්ධ ධර්මය' කියන ඉතා ශ්‍රේෂ්ඨ ධර්මය අවබෝධ කරගත් මහා ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයන් බිහි වුණේ, මහා ශ්‍රේෂ්ඨ නායකයෝ බිහි වුණේ ඉන්දියාවේ කියන එක අපි පිළිගන්න ඕනෑ. ශ්‍රී ලාංකිකයෝ වන අපි මහත්මා ගාන්ධිතුමාට සලකන්න ඕනෑ. එතුමාට උපහාර දක්වන්න කල් තැබීමේ යෝජනාවක් ගෙන ඒම ගැන මම ස්තුතිවන්ත වනවා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සමහර අය අහනවා, "ලාංකිකයෙකු නොවන කෙනෙකුට මෙවැනි උපහාරයක් දක්වන්නේ ඇයි?" කියා. මම කිව්වා, "ඒ උත්තමයා තමයි මේ මුළු ලෝකයටම අවිහිංසා වාදය හඳුන්වා දුන්නේ." කියා. නෙල්සන් මැන්ඩෙලා ගන්න. එදා සුදු ජාතිකයින් කළු ජාතිකයින්ට වෙඩි තබා මරා දැම්මා. නෙල්සන් මැන්ඩෙලා සුදු ජාතිකයින්ට විරුද්ධව සටන ආරම්භ කළා. එතුමාව අවුරුදු විසි ගණනක් අඳුරු සිර මැදිරියක සිරකොට තැබුවා. එතුමාව නිදහස් කරනකොට සෞඛ්‍ය පිරිහිලා, අන්ධභාවයට පත්ව සිටියා.

මෙතුමාගේ මහා ශ්‍රේෂ්ඨ ගුණාංගවලට හේතු වුණේ ගෞතම බුදුරජාණන් වහන්සේගෙන් ලැබුණු ආභාසයත්, මහත්මා ගාන්ධිතුමාගේ ජීවිතයෙන් ඉගෙන ගත් දේවලුත්. නිදහස ලබා

ගත්තාට පසු එතුමා කිව්වා, "සුදු ජාතිකයෝ එළවන්න බැහැ. සුදු ජාතිකයාත්, කළු ජාතිකයාත් සමානයි. මේ අප්‍රිකාව ඔක්කෝටම අයිතියි, සමානයි." කියා. බලන්න, මහත්මා ගාන්ධිතුමා ලෝකය හෙල්ලුවා, ලෝකය අවදි කළා. මහා බ්‍රිතාන්‍ය කියන යටත් විජිතයට විරුද්ධව එතුමා ඒ වෙලාවේ ක්‍රියා කළේ වෙඩි උණ්ඩවලින් නොවෙයි. මහත්මා ගාන්ධිතුමාගේ ආභාසය නෙල්සන් මැන්ඩෙලා මැතිතුමා ගත්තා. මහත්මා ගාන්ධිතුමාට වෙඩි තැබුවා. වෙඩි වැදී තුවාල වෙලා සිටි වෙලාවේදීත් එතුමා මොකක්ද කිව්වේ? "මට හිරිහැර කරපු කෙනාට මොකුත් කරන්න එපා"ය කියා එතුමා කිව්වා. බලන්න, එතුමාගේ තිබුණු කරුණාව මෛත්‍රිය. අන්න! එතුමාගේ උත්තම ගුණය. කරුණාව, මෛත්‍රිය තුළ එතුමා එහෙම කිව්වා. එවැනි උත්තමයෙකු සම්බන්ධයෙනුයි අද අපි කථා කරන්නේ.

ගරු කථානායකතුමනි, පාසල් ශිෂ්‍යයින්ට හැකීමක් එන්න පෙළ පොත්වලට අපි ඇතුළු කරන ජීවිත කථාවල චරිතවලට මෙවැනි උත්තමයින්ගේ චරිත ඇතුළු කරන්න ඕනෑ. මම පාසල් ගිය කාලයේ එවැනි චරිත සම්බන්ධයෙන් කියවා තිබෙනවා. එදා ඒබ්‍රහම් ලින්කන් මැතිතුමා වහල්භාවයට විරුද්ධව උතුරු ඇමෙරිකාවේ ක්‍රියා කළා. ඒබ්‍රහම් ලින්කන් මැතිතුමා එදා සිවිල් යුද්ධයෙන් නිදහස ලබා දුන්නාට, මාටින් ලූතර් කිං වැනි කළු ජාතික ඇමෙරිකානුවන්ට එදා නිදහස ලැබුණේ නැහැ. ඔවුන් කළේ අවිහිංසාවාදී සටනක්. ඔවුන් ආදර්ශයට ගත්තේ කවුද? මහත්මා ගාන්ධිතුමාගේ ප්‍රතිපත්තියයි. වෙඩි උණ්ඩයෙන් එතුමාගේත් ජීවිතය නැති වුණා. නමුත්, එතුමා රටේ පිබිදීම් ඇති කළා. ඒ නිසා මම මේ වෙලාවේ මේ උත්තමයා සම්බන්ධයෙන් කථා නොකර හිටියා නම්, ඒක මගේ ජීවිතයේදී මගෙන් වුණු ලොකු අතපසුවීමක් වනවා. එතුමා මම ගරු කරපු කෙනෙක්, ශ්‍රේෂ්ඨ උත්තමයෙක්. අපි පිදිය යුත්තාට පුදන්න ඕනෑ. එලෙස පිදීමේදී ජාති, ආගම්, කුලවාද, වර්ණයෙන් වැඩක් නැහැ. එහිදී ඕනෑ කරන්නේ ප්‍රතිපත්තියයි. එතුමා ප්‍රතිපත්තියෙන් උතුම් කෙනෙක්. මේ වනකොට මහත්මා ගාන්ධිතුමා උසස් තැනක ඉපදී ඇති. අපි අදහන බුද්ධ ධර්මය අනුව ඒ සඳහා එතුමා කළ පින් ඇති. සමහර විට එතුමා දෙවි කෙනෙක් වෙලා ඇති. අපි අද ඉන්දියාවේ පොඩි පැල්පතකට ගියත් දකිනවා, මහත්මා ගාන්ධිතුමාව ඔවුන් සලකන්නේ දෙවියෙකු විධියට බව. ඉන්දියානු රජයත් එතුමාට සලකන්නේ ඒ විධියටයි. අද මේ ලොවට ඕනෑ කරන්නේ කරුණාව හා මෛත්‍රියයි. කරුණාව හා මෛත්‍රිය සපිරි අන්න එවැනි උත්තමයෙකුට අපේ ආගමේ හැටියට අමා මහ නිවන් සුව අත් වෙලා, පරිසරය විනාශ කරන මිනිසුන් සිටින මේ පෘථිවියේ මහත්මා ගාන්ධි වැනි උත්තමයෝ තවත් බිහිවේවා!යි මා ප්‍රාර්ථනය කරනවා.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මී ළඟට, ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

[පි.ප. 3.28]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே! பெரும் மதிப்பிற்குரிய மோகன்தாஸ் கரம்சந்த் காந்தி - மகாத்மா காந்தி அவர்களது 150வது ஆண்டு ஞாபகார்த்தம் தொடர்பில் இடம்பெறுகின்ற இந்த ஒத்திவைப்பு பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு, எனது கருத்துக்களையும் பதிவு செய்வதற்கு வாய்ப்பு வழங்கியமை தொடர்பில் முதலில் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். மகாத்மா காந்தி அடிகளின் வாழ்க்கை வரலாறு இன்றும்கூட உலகில் வியந்து போற்றத்தக்கதொரு வரலாறாக இருக்கின்றது. இந்தியாவுக்கு ஓர் அடையாளத்தைக் கொடுத்த மகாத்மா காந்தி அடிகளாரது வாழ்க்கையில் மிக முக்கிய மூன்று விடயங்கள் தொடர்பில் மாத்திரம் கூறலாமென எண்ணுகின்றேன். அதிலிருந்து இந்த நாடு சில படிப்பினைகளைப் பெறவேண்டுமென எதிர்பார்க்கின்றேன்.

ஒன்று, அவரது தண்டி யாத்திரை - இது 1930ஆம் ஆண்டு மார்ச் மாதம் 23ஆம் திகதி மகாத்மாவின் சபர்மதி ஆசிரமத்திலிருந்து 240 மைல்கள் தொலைவில் இருந்த தண்டி வரை 23 நாட்கள் நீடித்த நடைபயணமாகும். இந்தியாவை ஆட்சி செய்திருந்த ஆங்கிலேயர்கள் உப்புக்கு விதித்த வரியை எதிர்த்தே அன்று இந்த நடைபயணம் மகாத்மாவினால் ஆரம்பிக்கப்பட்டு, வெற்றியீட்டப்பட்டது. உப்பு அனைத்து மக்களுக்கும் போய்ச் சேர வேண்டும் என்பது மகாத்மாவின் எண்ணமாக இருந்தது. இலங்கை நாட்டைச் சூழவும் கடல் இருந்தும் உப்பையும் நீங்கள் இறக்குமதி செய்து, அத்தனைக்கும் வரி விதித்துக் கொண்டிருக்கின்றீர்கள்; மக்கள் சகித்துக் கொண்டிருக்கிறார்கள். மகாத்மாவின் தண்டி நடைபயணம்போல், ஒரு கண்டி நடைபயணத்தையாவது அவர்கள் சுயமாக ஆரம்பிக்க இதுவரையில் ஆயத்தமாக இல்லை. இனி எப்படியோ! அதைக் கூற முடியாது என்றாலும், தமிழ் அரசியல் கைதிகளின் விடுதலையைக் கோரி யாழ்ப்பாணப் பல்கலைக்கழக மாணவர்கள் ஒரு நடைபயணத்தை ஆரம்பித்திருக்கின்றார்கள். அது வெற்றியளிக்க வேண்டும் என்பதே எமது எதிர்பார்ப்பாகும்.

வடக்கு, கிழக்கு மாகாணங்களைப் பொறுத்தவரையில் அங்கு காணப்படக்கூடிய உப்பளங்களை மீள உரிய முறையில் அபிவிருத்தி செய்தாலே எமது நாட்டின் நுகர்வுத் தேவைக்கு போதுமான, தரமான உப்பினைப் பெற்றுக்கொள்ள முடியும். அதேநேரம், ஏற்றுமதிக்கெனவும் பயன்படுத்த முடியும். யுத்தத்திற்கு முற்பட்ட காலத்தில் மன்னார், ஆனையிறவு, குறிஞ்சாத்தீவு போன்ற உப்பளங்கள் பாரிய இலாபத்துடன், பல்லாயிரக் கணக்கானோருக்கான வேலைவாய்ப்புகளுடன் செயற்பட்டு வந்திருந்தன. எனவே, இவ்விடயம் தொடர்பில் இந்த அரசு அவதானங்களைச் செலுத்த வேண்டும்.

அடுத்தது, மகாத்மா காந்தியின் சிந்தனையில் உருவான 'சர்வோதயா' அமைப்புத் திட்டம். இது அனைத்து மக்களுக்கும் பொருளாதார பலத்தினை ஏற்படுத்துகின்ற சோசலிச சிந்தனை கொண்ட திட்டம். அந்நியப் பொருட்களைத் தவிர்த்தல், கிராமங்கள் தோறும் உற்பத்தியைப் பரவலாக்குதல், கிராமத்தின் உற்பத்திப் பொருட்களை நாட்டு மக்களிடம் சேர்த்தல் என்பதே இத்திட்டமாகும். கூட்டுறவுச் சங்கங்களை வலுப்படுத்தி, உற்பத்தி, சந்தை மற்றும் நுகர்வை இணைக்கும் வகையில் இத்திட்டம் கட்டியெழுப்பப்பட்டது. இத்திட்டத்தில் விவசாயம் என்பது வெறுமனே தனியார் தொழிற்துறைகளாகப் பார்க்கப்படாமல், கிராம, தற்சார்பு உற்பத்திகளாகப் பார்க்கப்பட்டன. இத்தகைய திட்டம் இன்று இந்த நாடு முகங்கொடுத்துள்ள பொருளாதார நெருக்கடி நிலைமையில் ஆராய்ந்து பார்க்க வேண்டியதொரு திட்டமாகும்.

இந்தத் திட்டமானது, கிராமியக் கைத்தொழில்களான நெசவு, தோற்பொருட்கள், அலங்காரக் கைவினைப் பொருட்கள், மரத் தளபாடங்கள், படுக்கை விரிப்புகள், சங்கு, மாலைகள், வேம்புச் சவர்க்காரங்கள், தேங்காய் எண்ணெய், தேங்காய்த் தும்புக் கயிறுகள் என்று அனைத்துப் பொருட்களையும் ஒருங்கே இணைத்த சந்தை வாய்ப்பாக உருவாக்கப்பட்டிருந்தது. கிராம மட்டப் பொருளாதாரத்தின்

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

வளர்ச்சியானது இந்த நாட்டின் இன்றைய முக்கிய தேவையாக உள்ளது. குறிப்பாக, வடக்கு, கிழக்கு மாகாணங்களில் காணப்படுகின்ற வளங்களைப் பயன்படுத்தி இத்துறையினை வளர்த்தெடுத்தாலே போதிய ஏற்றுமதித் துறைசார்ந்த பயன்களை இந்த நாடு பெறக்கூடியதாகவும், அதிக இறக்குமதிகளைத் தவிர்க்கக்கூடியதாகவும் இருக்கும்.

குறிப்பாக, ஒட்டுசுட்டான் ஓட்டுத் தொழிற்சாலை, பரந்தன் இரசாயனக் கூட்டுத்தாபனம், காங்கேசன்துறை சீமெந்துத் தொழிற்சாலை, அச்சுவேலி மற்றும் வவுனியா - பூந்தோட்டம் கைத்தொழிற் பேட்டைகள், வாழைச்சேனைக் காகிதத் தொழிற்சாலை எனப் பல்வேறுபட்ட கைத்தொழில் நிறுவனங்கள் அங்கு காணப்படுகின்றன. உப்பு முதல் சீனி வரையில் உற்பத்திகளை மேற்கொள்ள முடியும். பனை வளத்தை மேலும் மேம்படுத்த முடியும். விவசாயத்தை நவீனமயப்படுத்தி, அதிக பயன்களைப் பெற முடியும். பழ வகைகள் உற்பத்தியில் வெற்றிகாண முடியும். கடல் வளத்தை உரிய முறையில் பாதுகாத்து, நவீனமயப்படுத்தி, உரிய பயன்களைப் பெற்றால், அதுவே இந்நாட்டு எற்றுமதியில் அதிக பங்கினை ஏற்கும். அந்தவகையில், கண்ணுக்குப் புலப்படுகின்ற இத்துறைகளில் அபிவிருத்திகளை மேற்கொள்ளாமல், இறக்குமதிக் கனவுகளில் மாத்திரம் நீங்கள் மிதந்து கொண்டிருந்தால் இந்த நாட்டை எவராலும் காப்பாற்ற இயலாமல் போய்விடும்.

அடுத்ததாக, மகாத்மா காந்தியின் அகிம்சைவழிப் போராட்டம் தொடர்பில் பார்க்கின்றபோது, ஆங்கிலேயர்களிடமிருந்து தமது தாய் நாட்டை விடுவித்துக் கொள்வதற்கு மகாத்மா காந்தி ஏந்திய வலிமை மிகுந்த ஆயுதமே அகிம்சை வழிப் போராட்டமாகும். இன்று, வடக்கிலே எமது மக்கள் வருடக் கணக்கில் தங்களது சொந்தக் காணி, நிலங்களை விடுவித்துக்கொள்வதற்காக, காணாமற்போகச் செய்யப்பட்ட தங்களது உறவுகளைக் கண்டறிவதற்காக, அகிம்சைவழிப் போராட்டங்களில் ஈடுபட்டு வருகின்றனர். மகாத்மா காந்தியின் அகிம்சைவழிப் போராட்டத்திற்கு ஆங்கிலேயர்கள் செவிமடுத்தனர். ஆனால், இந்த நாட்டில் எமது மக்களின் அகிம்சைவழிப் போராட்டத்திற்கு யாருமே செவிமடுப்பதாக இல்லை. எமது உரிமைக்கான போராட்டமும் அகிம்சைவழியில் தொடங்கியதாகச் சொல்லப்படுகிறது. ஆனாலும், எமது மூத்த அரசியல் தலைவர்களின் அகிம்சைப் போராட்டம் மாகாத்மாவின் அகிம்சைப் போராட்டம்போல் வலிமை மிக்கதாக இருக்கவில்லை. மகாத்மாவின் சில நடைமுறைகள் குறித்த விமர்சனங்கள் பலருக்கும் இருப்பதுபோல், எமக்கும் இதுபற்றிய விமர்சனங்கள் இருப்பதில் தவறேதும் இல்லை. ஆனாலும், எச்சாமமும் விழித்திருந்து, ஆத்ம பலத்தோடு போராடியவர் மகாத்மா காந்தி. யாழ். கச்சேரி முன்பாகவும் காலிமுகத்திடலிலும் எம் முன்னோர்கள் நடத்திய அகிம்சைப் போராட்டங்களை நான் கொச்சைப்படுத்த விரும்பவில்லை. ஆனாலும், அந்தப் போராட்டங்கள் மாகாத்மாவின் அகிம்சைப் போராட்டங்கள்போல் இடையறாது நீடித்து நடத்தப்பட்டிருக்க வேண்டும். இலக்கை அடைந்தே தீரவேண்டும் என்ற உயிர்த்துடிப்பும், தன்னலமற்ற தாயக விடியலின் உறுதிப்பாடும் எமது மூத்த தலைவர்களுக்கு இருந்திருக்க வேண்டும்.

தூங்குகின்ற தமிழனைத் தட்டி எழுப்புபவன் நீயா, நானா? என்று உசுப்பேற்றும் போட்டி அரசியலுக்குள் மயங்கிக் கிடந்த மூத்த தமிழ்த் தலைவர்கள், தென்னிலங்கை அரசுகளிடமிருந்து தமிழ் மக்களுக்குத் தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்று மகாத்மாவைப்போல் ஆத்ம பலத்தைக் கொண்டிருக்கவில்லை. தெற்கு நோக்கி ஓடிக்கொண்டிருக்கும் புகைவண்டியில் பின் பெட்டியை நோக்கி நடந்து செல்லும் பயணி ஒருவன் தான் வடக்கு நோக்கிச் செல்வாதாகக் கூறினானாம். அதுபோலவே எமது பாரம்பரியத் தமிழ் அரசியல் தலைமைகளும் நடந்துகொண்டதாக முதுபெரும் இடதுசாரித் தலைவரான தோழர் கார்த்திகேசன் மாஸ்டர் கூறியதை இங்கு நான் ஞாபகப்படுத்த விரும்புகிறேன். எமது மூத்த அரசியல் தலைவர்கள் தாம் நடத்தியதாகக் கூறிய அகிம்சைவழிப் போராட்டத்தை உறுதிபட, சரிவர நடத்தியிருந்தால், தமிழ் மக்களின் நியாயமான சாத்வீக எண்ணங்களை அன்றைய தென்னிலங்கை அரசுகள் ஏற்று நடந்திருந்தால், இலங்கைத் தீவு இரத்தத் தீவாக ஒருபோதும் மாறியிருக்காது.

மூத்த அரசியல் தலைவரான எஸ்.ஜே.வி. செல்வநாயகம் அவர்கள் "தமிழ் மக்களைக் கடவுள்தான் காப்பாற்ற வேண்டும்" என்று இறுதியாகத் தனது இயலாமையை வெளிப்படுத்தி விட்டு மறைத்ததுபோல், நாமும் எமது மக்களுக்கான உரிமையை நோக்கிய பயணத்தை இடைவழியில் கைவிட்டுச் சென்றுவிட முடியாது. அரசியல் தீர்வின்றித் தொடரும் அவலத்தையும், எமது மக்களின் கனவை வெல்வதற்கான கடமைகளையும் அடுத்த சந்ததிமீது நாமும் சுமத்திவிட்டுச் சென்றுவிட முடியாது. எமது அனுபவங்களும், ஆற்றலும், ஆத்ம பலமும், இலக்கை எட்டிவிட வேண்டும் என்ற ஆழ்மன விருப்பங்களும் மக்கள் எமக்கு வழங்கும் ஆணைக்காகக் காத்திருக்கின்றன. அப்போது சாதித்த நம் கரங்கள் சரித்திரம் படைக்கும்! எமது மக்களின் கனவுகள் யாவும் நிச்சயம் நிறைவேறும்! 'ஆற்றிலே போட்டுவிட்டுக் குளத்திலே தேடுவதுபோல்' இன்று எமது மக்களும் எவரிடமிருந்தோ வாக்குறுதிகளைப் பெற்றுவிட்டு, அவர்களுக்கே வாக்குகளை வழங்கிவிட்டு, அடுத்தவர்களிடம் கையேந்தும் துயர நிலையில் ஏங்கிக்கொண்டிருக்கின்றார்கள். மகாத்மாவின் சிந்தனை களுக்கு மதிப்பளிப்பதாக இருந்தால், இந்த அரசு இன்று எழுந்திருக்கும் எமது மக்களின் அகிம்சைக் குரல்களுக்கு மதிப்பளிக்க வேண்டும். மகாத்மா காந்தியைப் பற்றிப் பேசுகின்றவர்கள் அவரது சிந்தனைகளை முடிந்தளவுக்காவது செயற்பாடுகளில் கொண்டுவர வேண்டும் எனக் கேட்டுக் கொண்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you, Hon. Member.

Next, the Hon. Rauff Hakeem.

[3.38p.m.]

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
*Bismillahir Rahmanir Raheem.*

Thank you, Hon. Speaker. On the 150th Birth Anniversary of Mohandas Karamchand Gandhi - Mahatma Gandhi - we are gathered here today to commemorate interesting facets of the iconic effervescent

life of a philosopher, political activist and most of all, his colossal persona as a prophet of non-violence in the freedom struggle of India.

Personally I believe, Mr. Speaker, of his multi-spirited and multi-dimensional activism, every aspect remains relevant to the current world of politics. Of these what holds most immediate currency for the politics of the day is his unswerving potential of non-violence struggle for democratic self-rule and the constitutional process that he supported.

The Indian Constitution, needless to say, remains a historical document relevant globally even at this day and age, when thoughts are evolving on systems that look beyond nation States. Mr. Speaker, we all know that Mahatma Gandhi was not directly involved in the making of the Indian Constitution. But all his ideas were sufficiently reflected in the two plans that he submitted in 1946 and in 1948 - incidentally on the day of his assassination that was in 1948. A follower and enthusiast of Gandhi, Shriman Narayan Agrawal drafted the Volume, "Gandhian Constitution for Free India." Mahatma Gandhi made a comment about it in a Foreword of this Volume published in 1946 where he says, "The Constitution based on his writing is not inconsistent with what I would like to stand for. This draft was based on the principle that violence leads to centralization. The essence of non-violence for him meant decentralization and devolution for the periphery."

In Mahatma Gandhi's draft Constitution, the primary political unit would be the village *Panchayat* where the *Panchayat* Members would be elected by the village elders. Obviously, this was fraught with disapprovals and contestations at that time. However, these thoughts remain valid to date and demand serious consideration and deliberation even in Sri Lanka.

Mr. Speaker, his own thoughts of non-violence kept evolving to a point that in his latter days, he stopped using the word, "non-violence". He says, "My vocabulary on the subject is still in the process of formation." This was because of his thoughtfulness towards the minority languages and his sensitivities towards their understanding of this concept, especially when he had to address the Muslims of the North who were embroiled in the Khilafat Movement against the British. He also had to appease to them, then to the Hindus in Gujarat, the people of Panjab, the Sheikhs, then a mixed audience in Calcutta et cetera. He adopted the term " non-cooperation" instead of "non-violence" for want of a better word in vernacular translations to appease to all sentimentalities, to mobilize them to unite for a single course to take the *Swadeshi* vow to boycott foreign goods.

He praised the Muslims in his autobiography. I quote:

> "The Musalmans have adopted a very important resolution. If the peace terms are unfavourable to them, - which may God forbid, - they will stop all co-operation with Government. It is an inalienable right of the people thus to withhold co-operation. We are not bound to retain Government titles and honours, or to continue in Government service. If Government should betray us in a great cause like the Khilafat we could not do otherwise than non-co-operate. We are therefore entitled to non-co-operate with Government in case of a betrayal."

This is just an example evident of his all-encompassing power and belief in inclusivity, how he included the Muslims of the North to adopt his cause. Needless to say that his struggle for inclusivity against communal and religious discrimination, women's empowerment against marginalization of impoverished groups, rights of farmers and the trading communities and also the Indian merchants' rights, their own internal struggles in a continuum are all mind-blowing. That, in itself, was an achievement that he rejoiced. The Mahatma, as you could see, had many internal victories to celebrate before he could ultimately win Independence.

He transformed Indian nationalism that evolved to inextricably intertwined integrities of equality, liberty, solidarity sans inconsequential politics and inclusive nationalism. That bulwark is gone, but the Mahatma's heroism lives on. Sir, as President Obama proclaimed recently, the Mahatma's heroism is not something just for India, but for the world. I quote the words of former President Obama:

> "…in the life of Gandhiji and in his simple and profound lesson to be the change we seek in the world."
>
> "As just as he summoned Indians to seek their destiny, he influenced champions of equality in my own country, including a young Martin Luther King....."

Hon. Speaker, we are indeed very pleased to be involved in this particular Debate to pay tribute to one of the greatest sons ever to set foot in this world and we pay him homage through this Debate.

Thank you.

[பி.ப. 3.46]

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

கௌரவ சபாநாயகர் அவர்களே, மாபெரும் இந்தியத் தலைவர், இந்திய சுதந்திரத் தந்தை மகாத்மா காந்தி அவர்களது 150வது பிறந்த தினத்தையொட்டி, இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசின் பாராளுமன்றத்திலே விசேடமாக இவ்வாறான ஒரு நாளையும் நேரத்தையும் ஒதுக்கி, தந்தை மகாத்மா காந்தி சார்பாகப் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கும் வகையில், இந்தப் பிரேரணையை இங்கு கொண்டுவந்ததற்குக் கௌரவ பிரதம மந்திரி ரணில் விக்கிரமசிங்க அவர்களுக்கும் இந்தப் பாராளுமன்றத்துக்கும் இந்திய வம்சாவளியைச் சார்ந்தவன் என்ற வகையிலே நன்றி கூறக் கடமைப்பட்டிருக்கின்றேன்.

மகாத்மா காந்தி அவர்களது நாட்டுக்கும் எமக்கும் தொப்புள் கொடி உறவு இருப்பதையிட்டு மிகவும் பெருமையாக இருக்கின்றது. அவரது வழிகாட்டல்கள், அவர் வாழ்ந்த விதம், அவருடைய அகிம்சாவழிப் போராட்டங்கள், அவருடைய சத்தியாக்கிரகம், இந்திய நாட்டினுடைய பொருளாதாரம், சுதந்திரம் இவையனைத்துமே இன்று ஒட்டுமொத்தச் சர்வதேசத்திற்குமே உதாரணங்களாக இருக்கின்றன. பாரத நாட்டைச் சார்ந்த, அந்த வம்சாவளியைச் சார்ந்த மக்கள் என்ற வகையிலே மலையக மக்கள் - என்னுடைய மலையகச் சொந்தங்கள் இன்று மகாத்மா

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

காந்தியை ஒரு தெய்வமாகப் பார்க்கின்றார்கள். மகாத்மா காந்தியினுடைய இலங்கை விஜயத்தின்போது, மாத்தளைத் தமிழ் மகா வித்தியாலயத்திற்கும் பதுளைக்கும் விஜயம் செய்தமை பெரும் பாக்கியமாக இருக்கின்றது. அவருடைய பெயரைப் பறைசாற்றுகின்ற சான்றுகள் இன்றும் மலையகத்திலே ஆங்காங்கே இருக்கின்றன. இன்றைக்கு வீடமைப்புத் திட்டங்களுக்கு மகாத்மா காந்தி அவர்களுடைய பெயர் சூட்டப்படுகின்றது. அவருடைய பெயரில் வீதிகள் இருக்கின்றன. மலையகத்திலே ஆங்காங்கே அவருடைய பெயரில் மண்டபங்கள் இருக்கின்றன. அவருடைய சேவைகளும் போராட்டமும் இன்றைய எங்களுடைய மலையக சமூகத்திற்கு ஒப்பானதாக இருக்கின்றது.

விசேடமாக மகாத்மா காந்தியவர்கள் முழு உலகத்தினாலும் கௌரவிக்கப்படுபவர். அனைவரும் அவரைப் பக்தியுடன், இந்தியத் தலைவராக மட்டுமல்லாது - சர்வதேசத்தினுடைய ஒரு வழிகாட்டியாகப் பார்க்கின்றார்கள். மக்களை ஒன்றுசேர்த்தல், போராடுதல், மக்களுக்கு எவ்வாறு தலைமைதாங்குதல் எனப் பல வழிகளிலும் அந்த மாபெரும் தலைவர் எமக்கு வழிகாட்டிச் சென்றிருக்கின்றார். அரசியல் ரீதியான கருத்தரங்குகளுக்காக நாங்கள் பல சர்வதேச நாடுகளுக்கும் விஜயம் செய்யும்போது, அங்கெல்லாம் மகாத்மா காந்தி அவர்களுடைய படத்தைப் பார்க்கும்போது, பெருமையடைகின்றோம்.

பாரத தேசமான இந்தியா எங்களுடைய அண்டை நாடு. நாங்கள் அந்தத் தேசத்தினுடைய பரம்பரையைச் சார்ந்தவர்களாக இருந்தாலும், இன்று இந்த நாட்டினுடைய பிரஜைகளாகவிருந்து செயற்பட்டுக் கொண்டிருக்கின்றோம். மகாத்மா காந்தியவர்களுடைய வழிமுறைகளை இன்று எங்களுடைய பாடசாலை மாணவர்கள் தொடக்கம் வயது வந்தவர்கள் வரை அனைவரும் பின்பற்றுகின்றார்கள். மாணவச் செல்வங்கள் உட்பட அனைவருக்கும், ஒவ்வொரு விடயங்களிலும் மகாத்மா காந்தி அவர்களுடைய வழிகாட்டல்களை ஞாபகப்படுத்திப் பல உதாரணங்களைக் காட்டி, எங்களுடைய சமூகத்தின் ஒற்றுமையை நிலை நாட்டுகின்றோம். விசேடமாக நான் மலையகப் பெருந் தோட்டத் தொழிலாளர் வர்க்கத்தினுடைய ஒரு பிரதிநிதி என்ற வகையிலே, எங்களுடைய மலையகப் பெருந்தோட்டத் தொழிலாளர்களினுடைய உரிமைகள், பிரஜா உரிமைகள், அத்துடன் எங்களுடைய சம்பளப் போராட்டங்கள், எங்களுடைய நில உரிமைகளுக்கெல்லாம் நாங்கள் மகாத்மா காந்தியினுடைய வழிமுறைகளைப் பின்பற்றிய போராட் டங்களை நடத்தியதை இங்கு குறிப்பிட விரும்புகின்றேன். அமரர் சௌமியமூர்த்தி தொண்டமான் ஐயா அவர்களுடைய காலகட்டத்திலே, மகாத்மா காந்தியவர்களுடைய அந்தச் சத்தியாக்கிரகப் போராட்டம் போன்ற பல அகிம்சாவழிப் போராட்டங்களின்மூலம் எமது சமூகம் அவர்களுடைய உரிமைகளைக் கட்டங்கட்டமாக வென்றிருக்கின்றது. ஆகவே, நாம் இந்திய வம்சாளி மக்களைச் சார்ந்தவர்கள் என்ற வகையிலே மிகவும் பெருமையடைகின்றோம்.

இந்த இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசு நாட்டுக்கு 1948ஆம் ஆண்டு சுதந்திரம் கிடைத்தாலும்கூட, 1977ஆம் ஆண்டுக்குப் பிறகுதான் மலையக மக்களுக்குச் சுதந்திரம் கிடைத்தது. அதனடிப்படையில், 1977ஆம் ஆண்டுக்குப் பிறகு இந்த நாட்டிலே, பல வேலைத்திட்டங்களிலும் உரிமைப் போராட்டங்களிலும் எங்களுக்கு வெற்றி கிடைத்திருந்ததுடன் கட்டங்கட்டமாக எமது மக்களுக்குப் பிரஜா உரிமையும் வழங்கப்பட்டது. இந்திய நாட்டிலிருந்து இலங்கைக்கு தோட்டத் தொழிற்றுறைக்காக அழைத்து வரப்பட்ட எமது முன்னோர்களில் பல்லாயிரக்கணக்கானோர் அந்தப் பயணத் தின்போதே உயிரிழந்தார்கள். அதாவது, இந்தியாவிலிருந்து இராமேஸ்வரம் வழியாகத் தோணிகளில் இலங்கைக்கு வந்தபோது, அவர்கள் வந்த தோணிகள் விபத்துக்குள்ளாகிய காரணத்தினால், முன்னோர்கள் பலர் கடலிலே தங்களுடைய உயிரை இழந்தார்கள். பிறகு மாத்தளையில் தொடங்கி பதுளை வரை கட்டம் கட்டமாக இந்த மக்கள் பரவியிருந்தபோது, ஒரு காலகட்டத்திலே "இந்த நாட்டிலிருந்து இந்திய வம்சாவளி மக்கள் அனைவரையும் இந்தியாவுக்கு அழைத்துவிடுங்கள்!" என்று கூறப்பட்டபோது, இந்திய நாட்டுப் பிரதமர் சாஸ்திரி அவர்களுக்கும் அப்போது இந்த நாட்டில் இருந்த பிரதம மந்திரி சிறிமாவோ பண்டாரநாயக்க அவர்களுக்கும் இடையில் கைச்சாத்திடப்பட்ட, "சிறிமா - சாஸ்திரி ஒப்பந்தம்" என்ற அந்த ஒப்பந்தத்தின் அடிப்படையிலே - 50:50 என்ற அடிப்படையில் ஒரு புரிந்துணர்வு ஏற்படுத்தப்பட்டது.

அந்தக் காலகட்டத்தில் சிறுவர்கள் மகாத்மா காந்தியை “காந்தித் தாத்தா” என்று கூறினார்கள். மகாத்மா காந்தி அவர்களுடைய வழிமுறையிலே எங்களுடைய முன்னோர்கள் பல போராட்டங்களை நடாத்தியிருக்கிறார்கள். நாங்களும் சிறு வயதிலிருந்து காந்தி அவர்களுடைய கதர் துணியிலான உடை, அவருடைய நடைமுறைகள் ஆகியவற்றைப் பின்பற்றியது மாத்திரமன்றி, அவர் எவ்வாறு பிரித்தானிய நாட்டவருடன் - வெள்ளையர்களுடன் போராடி, பாரத தேசத்திற்கு சுதந்திரத்தைப் பெற்றுக்கொடுத்தார் என்பதை எல்லாம் கதைகளினூடாக அறிந்துகொண்டிருப்பது மட்டுமல்ல, அவரது வழிமுயையைப் பின்பற்றி நடைமுறைச் சாத்தியமான வகையில் பல வேலைத்திட்டங்களையும் மேற்கொண்டிருக் கின்றோம். இன்றும்கூட, மலையகத்திலே மகாத்மா காந்தி அவர்களுடைய சிலைகள் ஆங்காங்கே ஆலயங்கள் - கோவில்களுக்கு அருகாமையில் இருக்கின்றன. நாங்கள் இந்த நாட்டில் வாழுகின்ற பெரும்பான்மை மக்களை - இலங்கை நாட்டினுடைய சிங்கள மக்களை மதிக்கின்றோம், கௌரவிக்கின்றோம். அவர்கள்கூட எங்களுக்குக் கூறுவார்கள், “மகாத்மா காந்தியை முன்னுதாரணமாக எடுத்துச் செயற்படுங்கள்!” என்று. அதையிட்டு நாங்கள் பெருமைப்படுகின்றோம்.

இன்றைய தினத்திலே இந்த நாட்டினுடைய பிரதமர் கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களும் சனாதிபதி மேதகு மைத்திரிபால சிறிசேன அவர்களும் இச்சபைக்குச் சமுகமளித்து, மகாத்மா காந்தியினுடைய வாழ்க்கை வரலாறு, அவருடைய அகிம்சைப் போராட்டத்தின் பின்னணி, அவருடைய செயற்பாடுகள் என்பன பற்றி மிகச் சிறப்பாகக் குறிப்பிட்டார்கள். இதன்மூலமாக இந்த நாடு, இந்த அரசாங்கம் மலையக மக்களைக் கௌரவித்து இருக்கின்றது என்று நான் நினைக்கின்றேன். இந்திய வம்சாவளி மலையக மக்களை இந்தப் பிரேரணையின் மூலமாக இந்த அரசாங்கம் கௌரவித்து இருக்கின்றது. இதனையிட்டு நாங்கள் பெருமை கொள்கின்றோம். இதற்காக இந்திய வம்சாவளி மக்களுடைய பிரதிநிதி என்ற வகையிலே, நான் நன்றி கூறக் கடமைப்பட்டு இருக்கின்றேன்.

இன்று இங்கு பலர் பேசும்போது, இந்திய அரசாங்கத்தின் நிதி உதவியுடன் மேற்கொள்ளப்படுகின்ற வைத்தியசாலை நிர்மாணங்கள் மற்றும் வேலைத்திட்டங்களுக்கு மகாத்மா காந்தியினுடைய பெயர் சூட்டப்பட வேண்டுமென்று கூறினார்கள். நிச்சயமாக அவருடைய பெயர் சூட்டப்பட வேண்டும். அது அரசியல், தொழிற்சங்க நன்மைக்காக அல்ல. மாறாக, அது எதிர்காலச் சந்ததியினர் அவரை

ඥාපකප්පඩුත්තුවතර්කුම්, අවරුටෙය චෙයර්පාටුකළෛප් පින්පර්රුවතර්කුම් අතු ඔරු මුන්නුතාරණමාක ඉරුක්කුම් එන නාන් නිනෛක්කින්රේන්.

ඉන්රු මකාත්මා අරසියල්, මකාත්මා තොළිර්ච් චංකම් එන්රෙල්ලාම් පේචප්පට්ටුක්කොන්ඩු ඉරුක්කින්රතු. ආකවේ, මකාත්මා කාන්ති අවර්කළුටෙය අකිම්චෛප් පෝරාට්ටම් පාරිය වෙර්රිකණ්ඩු, පාරත නාට්ටුක්කු - මුළු ඉන්තිය නාට්ටිර්කුම් එව්වාරු ඕර් එටුත්තුක්කාට්ටාක ඉරුන්තතෝ, අතෛ එම් නාට්ටිනුටෙය තලෛවර්කළුම් පින්පර්රි, මලෛයක මක්කළෛ ඉන්නෝරන්න පෝරාට්ටංකළිලේ වීතික්කු ඉරංක වෛක්කාමල්, මකාත්මා කාන්තියින් කොර්කෛයින් අටිප්පටෛයිලේ වාළ්න්තු, අවරුටෙය නටවටික්කෛකළෛප් පින්පර්රික් කොණ්ටිරුක්කින්ර එමතු චමූකත්තෛ - මලෛයක මක්කළෛ ඉන්ත අරචාංකමුම් ඉන්ත නාටුම් කෞරවිත්තු, අකිම්චාවළියිල් පෝරාටික්කොණ්ටු ඉරුක්කින්ර එම්මක්කළින් පිරච්චිනෛකළෛත් තීර්ත්තු වෛක්කවේණ්ටුම්; අවර්කළුටෙය තේවෛකළෛ නිරෛවේර්රවේණ්ටුම්.

ඉප්පෝතු ඉරුක්කින්ර චූළ්නිලෛයිලේ පෙරුන්තෝට්ටත් තොළිලාළර්කළුටෙය චම්පළ උයර්වෛවිට වේරු එන්ත විටයම් පර්රියුම් පේචවතර්කු එනක්කු මනම් වරුවතුතිල්ලෛ; අව්වාරාන චින්තනෛයුටනුම් නාන් ඉල්ලෛ. ආකවේ, නාන් ඉන්තච් චන්තර්ප්පත්තෛ - මකාත්මා කාන්ති අවර්කළුටෙය 150ආවතු ජනන තිනත්තෛයොට්ටි අවරෛ නිනෛවු කූර්වතර්කාක ඉන්තච් චපෛයිලේ කොණ්ටුවන්තිරුක්කින්ර ඔත්තිවෛප්පුවේළෛප් පිරේරණෛයෛ - ඉතර්කාන ඔරු චන්තර්ප්පමාකප් පයන්පටුත්තික්කොළ්ළ නිනෛක්කින්රේන්. ඉන්තප් පෙරුන්තෝට්ට මක්කළ් ඉන්තිය නාට්ටිලිරුන්තු - මකාත්මා කාන්තියිනුටෙය නාට්ටිලිරුන්තු ඉන්ත නාට්ටුක්කු වන්තු, ඉන්ත නාට්ටින් පොරුළාතාරත්තෛක් කට්ටියෙළුප්පු වතර්කාකප් පාටුපට්ටුක්කොණ්ටු ඉරුක්කින් රාර්කළ්. ඉව්වාරු පාටුපට්ටුක්කොණ්ටිරුක්කින්ර මලෛයක මක්කළිනුටෙය වේතන උයර්වුප් පෝරාට්ටත්තෛ මකාත්මා අරසියල්, මකාත්මා තොළිර්ච්චංකම් එන්පවර්රින්මූලමාක වෙර්රිකරමාක මුන්නෙටුත්තු, එතිර්වරුකින්ර වරවු චෙලවුත් තිට්ටත්තුක්කු මුන්පතාක අවර්කළුක්කු 1,000 රූපාය් අටිප්පටෛච් චම්පළත්තෛ වළංකුවතර්කුච් චම්පන්තප්පට්ට අනෛවරුම් ඔන්රුචේර්න්තු ඔත්තුළෛප්පු වළංකවේණ්ටුම්. ආකවේ, මකාත්මා කාන්තියිනුටෙය ඥාපකාර්ත්තම් චම්පන්තමාක ඉන්ත උයිරිය චපෛයිලේ කොණ්ටුවන්තිරුක්කින්ර ඉන්තප් පිරේරණෛ ඉතර්කොරු පාරිය උන්තුචක්තියාක අමෛයුම් එනක්කරුති, චන්තර්ප්පම් වළංකියමෛක්කාක කෞරව චපානායකර් අවර්කළුක්කු එනතු මනමාර්න්ත නන්රියෛ මලෛයක මක්කළ් චාර්පාකත් තෙරිවිත්තු, විටෛපෙරුකින්රේන්. නන්රි, වණක්කම්.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු චපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මීළහට, ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා.

ර්ට ප්‍රථම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*අතන්පිරකු, මාණ්පුමිකු චපානායකර් අවර්කළ් අක්කිරාචනත් තිනින්රු අකලවේ, කුළුක්කළින් පිරතිත් තවිචාළර් අවර්කළ් [මාණ්පුමිකු චෙල්වම් අටෛක්කලනාතන්] තලෛමෛ වකිත්තාර්කළ්.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[අ.භා.3.58]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් යාප්පා අපේවර්තන)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයේ ඉතාම ශ්‍රේෂ්ඨ ගණයේ පුද්ගලයකුගේ 150වන ජන්ම සමරුවයි අද දින සමරන්නේ. විශේෂයෙන්ම අපි එතුමා හඳුන්වන්නේ, අවි රහිතව මහා අධිරාජ්‍යය මෙල්ල කළ අහිංසක වීරයා ලෙසට. විශේෂයෙන්ම, අද කාලයේ ජනතාවට, රාජ්‍ය නායකයන්ට වාගේම, රටවල් පාලනය කරන පාලකයන්ට මහත්මා ගාන්ධි චරිතය ඉතාම වැදගත් වනවාය කියා මා හිතනවා. අවි රහිතව මහා අධිරාජ්‍යයක් මෙල්ල කළ අවිහිංසාවාදයේ වීරයා හැටියටයි අපි එතුමා සිහිපත් කරන්නේ. එතුමාගේ සටන බලය ලබා ගැනීම සඳහා වූ සටනක් නොවෙයි. එතුමාගේ සටන වුණේ තමන් ජීවත් වුණු දේශය නිදහස් කරගැනීමේ සහ දේශයේ ජනතාවට අයිතිවාසිකම් ලබා දීමේ අවිහිංසාවාදී සටනක්.

අද ලෝකය අවි ආයුධවලින් ශක්තිමත් වී තිබෙනවා. ඒ අවි ආයුධ භාවිත කරමින් එකිනෙකාට විරුද්ධව කරන මේ අරගළයෙන් අද ලෝකය ජයග්‍රහණය කරලා නැහැ, විනාශය කරා ගිහින් තිබෙනවා. නමුත්, මහත්මා ගාන්ධි මැතිතුමා අනුගමනය කළ ක්‍රියා කලාපය තුළ මිනිස් ජීවිත ආරක්ෂා කරගනිමින්, මිනිසුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දෙමින් මිනිසුන්ගේ නිදහස ලබා ගැනීමට හැකි වුණා. ඒ නිසා එතුමා ශ්‍රේෂ්ඨ නායකයකු හැටියටයි අපි දකින්නේ.

එතුමා ස්වදේශිකත්වය මුල් කරගෙන එතුමාගේ අරගළය ගෙන ගියා. අදත් ඉන්දියාවේ දියුණුව තිබෙන්නේ එම නිසායි. අද ඉන්දියාව බටහිරට ගැති වෙලා නැහැ. ඉන්දියාව බටහිර රටවල් සමඟ සම්බන්ධකම් තිබෙනවා. නමුත්, ස්වදේශිකත්වය කියන එක ඉන්දියාව අමතක කරලා නැහැ. මහත්මා ගාන්ධිතුමා ලබා දුන් පන්නරය නිසා තමයි එවැන්නක් සිද්ධ වෙලා තිබෙන්නේ. මෑත ඉතිහාසයේ ඉන්දියාවේ බිහි වූ රවීන්ද්‍රනාත් තාගෝර් වාගේම අනෙකුත් ශ්‍රේෂ්ඨ නායකයන් දිහා බැලුවාම, මහත්මා ගාන්ධිතුමාගේ පන්නරය තුළින් එතුමන්ලා බිහි වූ බව අපට පෙනෙනවා.

විශේෂයෙන්ම මහත්මා ගාන්ධි චරිතයේ එක වැදගත් ස්ථානයක් තිබෙනවා. ජපානයේ නාගසාකිවලට බෝම්බ දමන අවස්ථාව ලෝකය විශාල කැලඹීමකට පත් වූ අවස්ථාවක්. එවැනි අවස්ථාවක මෙවැනි ගැටුම්වලට පිළිතුර වන්නේ අවිහිංසාවාදය බව ඉතාම පැහැදිලිව ප්‍රකාශ කළ නායකයෙක් තමයි මහත්මා ගාන්ධිතුමා.

ඒ වාගේම, දකුණු අප්‍රිකාවේ ශ්‍රේෂ්ඨ නායකයකු වූ නෙල්සන් මැන්ඩෙලා මැතිතුමාගේ පොතක සඳහන් වී තිබෙනවා, මහත්මා ගාන්ධිතුමා දකුණු අප්‍රිකාවේ වර්ගවාදී අරගළය වෙලාවේ, විශේෂයෙන්ම කළු ජාතීන්ට තර්ජන, ගර්ජන, හිංසා එල්ල වුණු වෙලාවේ අතහැර නොගොස් දකුණු අප්‍රිකාවේ සිට ඒ සටනට සහයෝගය දුන් නායකයෙක් බව. එතුමා වසර 21ක් දකුණු අප්‍රිකාවේ ගතකර තමයි ඉන්දියානු සටනට නායකත්වයක් දෙන්න ඉන්දියාවට ආවේ. දකුණු අප්‍රිකාවේ සිටි කාලය ඇතුළත වර්ගවාදයට, වර්ණවාදයට විරුද්ධව විශාල වශයෙන් මත ප්‍රකාශ කරලා ඒ සටනට සහයෝගය දුන් නායකයකු හැටියට මහත්මා ගාන්ධිතුමා සඳහන් කරනවා.

අපි එතුමාගේ අරගළ ගැන සඳහන් කරනකොට, විශේෂයෙන්ම එතුමාගේ "ලුණු පා ගමන" සඳහන් කරන්න පුළුවන්. ඒ පා ගමනේදී මුලින් එතුමා සමඟ ඉතාම සුළු පිරිසක්

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

තමයි එක්කාසු වුණේ. නමුත්, එතුමා කිලෝමීටර් 200ක ගමන යන කොට, කිලෝමීටර් 3ක ජනගහනයක් එතුමාගේ පිටුපසින් ආධාරකරුවන් වශයෙන් ආවා.

විශේෂයෙන්, බ්‍රිතාන්‍යයේ බදු ක්‍රමයට විරුද්ධව විශාල සටනක් කරලා එමඟින් ජයග්‍රහණය ලබන්න එතුමාට පුළුවන්කම ලැබුණා. ඉන්දියාව කියන්නේ කුල භේදය, වර්ග භේදය ආදි සියලු දේවල් තිබෙන රටක්. ඒ රටෙහි සියලු ජනතාව ඒකරාශි කිරීමට ඒ අවිහිංසාවාදි පුද්ගලයාට පුළුවන්කම ලැබුණා. ඒක තමයි ඉතාම වැදගත් වන්නේ. එය අපේ රටට ලොකු ආදර්ශයක් වනවා. අපේ රටට වඩා ජාතින් විශාල සංඛ්‍යාවක් ජීවත් වන, විවිධ කුලවලට අයත් විශාල සංඛ්‍යාවක් ජීවත් වන, වර්ග භේදවාදය, කුලවාදය ඉස්මතු වී ගිය රටක සියලු ජනතාව ඒක රාශි කරන්න පුළුවන්කම ලැබුණේ එතුමා තුළ පැවැති අවිහිංසාව නිසායි. එතුමා ලැබූ ජයග්‍රහණයේ මූල අවිහිංසාවයි. අද වාගේ කාලයක මුළු ලෝකයටම ප්‍රධාන වශයෙන්ම ගන්න තිබෙන ආදර්ශයක් තමයි, මහත්මා ගාන්ධි දර්ශනය. මොකද, අද ලෝකය අවියෙන් ජයග්‍රහණය කර නැහැ. බුදු රජාණන් වහන්සේ දේශනා කර තිබෙන ආකාරයට, අවි ගත්තෝ අවියෙන්ම නසිති. අවි ගත්තෝ අවියෙන්ම නසින බව දැන ගෙන භාරතයේ උපන් ශ්‍රේෂ්ඨ පුද්ගලයකු හැටියට එතුමා හැම අවස්ථාවේම අවිහිංසාව මුල් කරගෙන තම සටන ගෙන ගියා. ඒ සටනයි ජයග්‍රහණය කළේ. අද ලෝකයේ අවි භාවිත කරලා සටන් ජයග්‍රහණය කර නැහැ. අවි භාවිතය නිසා දියුණුවෙන් දියුණුවට යන ලෝකය අද විනාශ වී තිබෙනවා. ඒ නිසා මේ වාගේ වෙලාවක මහත්මා ගාන්ධිතුමා සිහිපත් කිරීම පමණක් ප්‍රමාණවත් නැහැ. එතුමා වාගේ පුද්ගලයන් දස දහස් ගණනක් මේ ලෝකයේ බිහි වෙන්න ඕනෑ. එහෙම බිහි වුණොත් තමයි අවිහිංසාවෙන් මේ හිංසාව මර්දනය කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ආයුධයක් හැටියට භාවිත කළ යුත්තේ අවිහිංසාවයි කියන එක මහත්මා ගාන්ධි චරිතය තුළ දැක ගන්න අපට පුළුවන්කම ලැබෙනවා.

මහත්මා ගාන්ධි මැතිතුමා සිහි කිරීම සඳහා අද දින සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙන ඒම ඉතාම වැදගත් වෙනවා. මොකද, මෙවැනි නායකයන් පිළිබඳව දැන් සමාජයේ සිටින දරුවන්ට, වර්තමාන සමාජයට හැඟීමක් නැහැ. මොකද, මෙවැනි නායකයන්ගේ චරිත පිළිබඳව අධ්‍යයනය කිරීමක් දැන් සිදු වන්නේ නැහැ. අපි ඒවායින් ඈත් වෙලායි ඉන්නේ. එවැනි නායකයන් පිළිබඳව සමාජය දැනුවත් කිරීමේ වැදගත්කම අද අපට පෙනෙනවා. එවැනි දැනුවත් වීමක් නොමැතිකම අද අපේ රටේත් තිබෙන බොහෝ ප්‍රශ්නවලට මූලික වශයෙන් හේතුකාරක වනවා. අවිහිංසාව, අන් අයට ජීවත් වීමේ අයිතිය ලබා දීම, අන් අයගේ සම අයිතීන් ලබා දීම, අන් අයගේ අවශ්‍යතාවන් පිළිබඳව සලකා අරගළයකින් තොරව ඔවුන්ට සියලු අයිතිවාසිකම් ලබා දීමට සිත් පහළ කර ගැනීම සඳහා කටයුතු කරන ආකාරය එතුමා පෙන්වා දී තිබෙනවා. එතුමාගේ දර්ශනය අද මේ ලෝකයට ඉතා වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහත්මා ගාන්ධි මැතිතුමාගේ චරිතයෙන් ගත හැකි ඇති තවත් ආදර්ශයක් තමයි, එතුමා ජයග්‍රහණය කර බලය ලබා ගන්න උත්සාහ කළේ නැහැ. එතුමා ජයග්‍රහණය කරලා බලයෙන් ඉවත් වුණා. පාකිස්තානයට වෙනම රාජ්‍යයක් අවශ්‍ය වන කොට එතුමා කිව්වේ, "මේ සියලු බලය ගන්න. බෙදීමක් අවශ්‍ය වන්නේ නැහැ" කියලායි. එතුමා මොහොමඩ් අලි ජින්නාට කිව්වා, "නායකත්වයට පත් වන්න. ඔබගේ අමාත්‍ය මණ්ඩලයක් පත් කර ගන්න. නමුත්, බෙදීමක් ඇති කරන්න එපා" කියලා. හැම දෙනාටම ඒ අයිතිවාසිකම් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මහත්මා ගාන්ධි දර්ශනය අපේ වාගේ රටකටත් ඉතාම වැදගත් වනවා. ඉන්දියාවට තිබෙන ප්‍රශ්න හා සංසන්දනාත්මකව බැලුවාම අපට තිබෙන්නේ ඉතාම සුළු ප්‍රශ්න. ඒවා විසඳා ගන්න අපට පුළුවන්. එතුමාගේ දර්ශනය තුළින් ආදර්ශයක් අරගෙන සියලු ජාතීන් එකට ජීවත් වන රටක් නිර්මාණය කරන්න අපට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.4.06]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ රටේ පමණක් නොව මුළු ලෝකයේම කීර්තියක් දිනාගෙන තිබෙන ජාතික වීරයෙකු, විශේෂයෙන්ම ජාත්‍යන්තරවාදියකු හැටියට සලකන මහත්මා ගාන්ධි මැතිතුමාගේ 150වන ජන්ම දිනය සැමරීම කරන මේ අවස්ථාවේ වචන කීපයක් කතා කරන්නට ලැබීම භාග්‍යයක් විධියට මා සලකනවා. අප කවුරුත් ඒ ශ්‍රේෂ්ඨ ගාන්ධි චරිතය ගැන, එතුමාගේ පරිත්‍යාගයන් ගැන, එතුමාගේ ඓතිහාසික කාර්ය භාරයන් ගැන කතා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා නිදහස් සටනේ දී පාවිච්චි කරපු අවිය අවිහිංසාවාදයයි. ඒ ජාතික නිදහස් සටනේ ආභාසය ලාංකීය නිදහස් සටනටත් එකතු වුණා.

අපි දන්නවා, මහත්මා ගාන්ධි මැතිතුමා ප්‍රමුඛ ඉන්දියානු නිදහස් අරගළයේ නායකයන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට විරුද්ධව එම අරගළය ජයග්‍රහණය කරා මෙහෙයවන කොට ලංකාවේ නිදහස් අරගළයේ තත්ත්වයද වර්ධනය වෙමින් තිබුණු බව. මට මතකයි, අපේ ඉතිහාසයේ සඳහන් වෙන විධියට මහත්මා ගාන්ධි මැතිතුමා සිරභාරයේ ඉන්න වෙලාවේ අපේ පක්ෂයේ නායක දොස්තර වික්‍රමසිංහ මැතිතුමා එංගලන්තයේ අධ්‍යාපනය ලබා ලංකාවට පැමිණියා. ඒ අවස්ථාවේ දොස්තර වික්‍රමසිංහ මැතිතුමා මහත්මා ගාන්ධි මැතිතුමාව දකින්නට ගියා; එතුමා සමඟ කථා කළා. ඒ නිසා පසුකාලයේ ලාංකීය වමේ ව්‍යාපාරයට නායකත්වය දීපු නායකයන් ඒ අරගළයෙන් පණ පෙවුණා. ඒ අනුව තමයි, 1931 දී දොස්තර වික්‍රමසිංහ මැතිතුමා මොරවක ආසනයට තරග කරන අවස්ථාවට සති කිහිපයකට කලින් ලංකාවේ තිබුණු තරුණයන්ගේ සම්මේලනයකට නේරු මැතිතුමා ඇතුළු කණ්ඩායමක් සහභාගි වුණේ. නිදහස් ප්‍රතිසංස්කරණයක් නොවෙයි, පූර්ණ නිදහස සඳහා ගෙන යන සටන ඉස්සරහට ගෙනයන්න ඕනෑය කියන අදහස එම කණ්ඩායම විසින් ලාංකීය තරුණයන්ට ලබා දුන්නා. ඒ අනුව ලාංකීය නිදහස් සටන පෝෂණය වුණා. මහත්මා ගාන්ධි මැතිතුමාගේ නායකත්වය යටතේ ශ්‍රීමත් නේරුතුමා ඇතුළු එම නිදහස් අරගළයේ වීරවරයන්ගේ කැපවීම සහ ඓතිහාසික ක්‍රියා මාර්ග අපේ රටේ නිදහස් අරගළය ශක්තිමත් කරන්නටත් තදබල බලපෑමක් ඇති කළා.

මහත්මා ගාන්ධි චරිතය දිහා බලනකොට එතුමාගේ අරගළයේ යම් මානුෂිකවාදී ස්වභාවයක් තිබුණු බව අපට පෙනෙනවා. එතුමා නිදහස් අරගළය ගෙන ගියා වාගේම, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට විරුද්ධ අරගළය ඓතිහාසික වශයෙන් විවිධ තත්ත්වයන් යටතේ ඉස්සරහට ගෙනයන්න ලාංකීය අරගළවාදීන්ට, ලාංකීය සටන්කාමීන්ටත් සිද්ධ වුණා. කෙසේ වෙතත්, මේ නිදහස් අරගළයේ මූල බීජය ශක්තිමත් කිරීමට මහත්මා ගාන්ධි මැතිතුමාගෙන් ලැබූ දැනුම, අත්දැකීම් ඉවහල් වුණා. ඒවා මුළු ලොවේම තරුණ ව්‍යාපාරයන් තුළට, මුළු ලොවේම නිදහස් අරගළ වෙනුවෙන් පෙනී සිටි සියලු දෙනාගේම හදවත් තුළට විශේෂ බලපෑමක් ඇති කළා.

මහත්මා ගාන්ධි මැතිතුමා සම්බන්ධයෙන් මේ කාරණා පිළිබඳව අපි කවුරුත් කථා කළා. ඒ තමයි එතුමා මුහුණ දීපු සමහර අත්දැකීම්. දකුණු අප්‍රිකාවේ වර්ගවාදී, වර්ණ භේදවාදී ක්‍රියා හේතුකොටගෙන එතුමා ප්‍රතිනිර්මාණය වුණා. ඒ අත්දැකීම්වලින් ප්‍රතිනිර්මාණය වූ මිනිසෙක් හැටියට එතුමා ගොඩනැගුණු නිසා වර්ගවාදී, ජාතිවාදී, එහෙම නැත්නම් යටත් විජිතවාදී, යටත්වාදී, අධිරාජ්‍යවාදී බලපෑම්වලින් තමන්ගේ රට මුදා ගන්න ඕනෑ කියන පන්තරය ඇති වුණා. ඒ අනුව කිසිදු රටක් බෙදනවාට එතුමාගේ කැමැත්තක් තිබුණේ නැහැ. එතුමාගේ දෘෂ්ටියේ තිබුණේ සියලු ජනතාව එක රටක ජනතාවක් විධියට සලකන්න ඕනෑය කියන එකයි. මහත්මා ගාන්ධි මැතිතුමා ගැන රවීන්ද්‍රනාත් තාගෝර් මැතිතුමා කියා තිබෙනවා; "විශාල වශයෙන් මහත්මා ගාන්ධි මැතිතුමා සිහිපත් වන්නේ මිනිසාගේ එක්සත් භාවය ඇති කිරීම යන පරමාර්ථය ඉටු වූ විටයි" කියලා. මිනිසාගේ එක්සත් බව, මනුෂ්‍යත්වය එතුමා අගය කළා. රටවල් ඇතුළේ විවිධ ආගමිකයන් අතර, විවිධ ජාතීන් අතර කැලඹීම් ඇතිවෙච්ච අවස්ථාවල එතුමා ඉතාම සංයමයෙන්, සාමකාමීව, බුද්ධියෙන් ඒවාට උත්තර සැපයුවා. සමහර අවස්ථාවල එතුමාගේ අරමුණු ජයග්‍රහණය කරන්නට බැරි වුණත්, එතුමා අවිහිංසාවාදය අවියක් කරගෙන ඒ රටේ එක්සත්කම ආරක්ෂා කරන්න, එක්සත් ජාතියක් ගොඩනඟන්න, ඒ රට ඇතුළේ කැපවී ක්‍රියාකරපු, ඒ වාගේම ඓතිහාසික වශයෙන් ලෝකයට පූර්වාදර්ශයක් දීපු නායකයෙක්. එම නිසා, එතුමාගේ ජීවිතයෙන් අපට බොහෝ දේවල් උකහා ගන්නට පුළුවන්.

ඉන්දියානු නිදහස් අරගළය මෙහෙය වූවා වාගේම, එතුමා තුළ යම් චින්තනයක් තිබුණා. ඒක තමයි, මානව ගුණය; මානව වාදය සමාජය තුළ ශක්තිමත් කරන්න ඕනෑය කියන එක. මානව වාදයෙන් තොරව, පරිත්‍යාගයෙන් තොරව, සත්‍යයෙන් තොරව අපට වෙනත් උරුමයක් දිනා ගත නොහැකිය කියන චින්තනයයි එතුමා තුළ තිබුණේ. එම නිසා එතුමා හැමවිටම සත්‍යයට ගරු කළා. කරන්න පුළුවන් දෙය ගැන කථා කළා; ඒ වෙනුවෙන් පෙනී සිටියා; කැප වුණා. තමන්ගේ දේශයට පමණක් නොවෙයි, දකුණු අප්‍රිකානු නිදහස් අරගළයේදීත් එතුමා ජාත්‍යන්තරවාදියකු විධියට, පීඩාවට පත් වුණු ඒ ජන කොට්ඨාස වෙනුවෙන් -ඔවුන්ගේ නිදහස ආරක්ෂා කරන්න, ඔවුන්ගේ අයිතිය ආරක්ෂා කරන්න- තමන්ගේ හැම ශක්තියක්ම යෙදවුවා; දැනුම යෙදවුවා; ඒ වෙනුවෙන් පෙනී සිටියා.

අපේ රට තුළ අද අප මුහුණ දෙන සමහර සමාජ ප්‍රශ්නවලදීත්, රටවල් තුළ ජාතීන් වශයෙන්; වර්ගවාදී විධියට, කුලවාදී විධියට බෙදී තිබෙන සමාජයන් තුළ එක්සත්කම ගොඩනැඟීමේ කාර්යයේදීත් ගාන්ධිතුමාගේ චරිතයෙන් අපිට හොඳ ආදර්ශයක් ගත හැකි බව මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. අපි කෙනෙකුගේ ගුණ සමරන්නේ ගුණ සැමරීමේ ඒ හඬ වායු ගෝලයට එකතු කිරීමට නොවෙයි. අප සැමරිය යුත්තේ එතුමාගේ ජීවිතය තුළ තිබෙන පරමාදර්ශයනුයි. අපේ සමාජයට යමක් ලබාදෙන එතුමාගේ ඒ චරිතයෙන් යම් ආදර්ශයක් අරගෙන කටයුතු කිරීමයි අප කළ යුත්තේ. අපේ රටේ ජාතික අනන්‍යතාව, එක්සත්කම, අභිවෘද්ධිය වාගේම, ජාතිකත්වය, දේශීයත්වය ගොඩනඟන්න, තවත් රටකට යටත් නොවී; වහල් නොවී සිටීමේ චින්තනය ශක්තිමත් කරන්න එතුමාගේ ගමන් මහට අනුගතව ක්‍රියා කිරීමයි එතුමාට අප කරන ලොකුම ගෞරවය වන්නේ. එතුමා අපට හඳුන්වා දුන්; එතුමාගේ ජීවිතය තුළින් ලබාගත් අත්දැකීම් අපේ රටට එකතු කර ගන්න එක එතුමාට කරන ගෞරවයක් හැටියට මා සලකනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලබාදුන් කෙටි කාලය වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

[பி.ப. 4.15]

**ගරු මුතු සිවලිංගම් මහතා (සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு முத்து சிவலிங்கம் - சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் பிரதி அமைச்சர்)

(The Hon. Muthu Sivalingam - Deputy Minister of Social Welfare and Primary Industries)

கௌரவ குழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළේ, இந்தியத் தலைமகனாக வாழ்ந்த மகாத்மா காந்தி அவர்களின் 150ஆவது பிறந்த தின ஞாபகார்த்த நிகழ்வில் கலந்துகொண்டு பேசுவதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். அவர் இந்திய நாட்டின் சுதந்திரத்திற்காக மாத்திரமல்ல, முழு உலகத்திலும் வாழ்ந்த மக்களின் சுதந்திரத்திற்காகப் போராடியவர். உதாரணமாக, ஆங்கிலேயர் ஆட்சிக் காலத்தின்கீழ், ஆசியக் கண்டத்தின் பெரும்பகுதியிலும் ஆபிரிக்கக் கண்டத்தின் பெரும்பகுதியிலும் வாழ்ந்த மக்கள் அடிமைத்தனத்தோடு நடத்தப்பட்டார்கள். அந்தச் சந்தர்ப்பத்தில்தான் மகாத்மா காந்தியவர்கள் தனி மனிதனாகத் தனது உயிரையும் மதிக்காது- உயிரைப் பணயமாக வைத்துப் போராடியது மாத்திர மல்லாமல், பகைவனையும் நண்பனாகக் கருதி நேசித்த ஒரு மாமனிதர்.

இந்தியா சுதந்திரமடைவதற்கு முன்பு இந்திய மக்களில் பெரும்பாலானவர்கள் வேலை நிமித்தமாவும் வேறு காரியங்களுக்காகவும் இந்தியாவிலிருந்து பல நாடுகளுக்கும் அழைத்துச் செல்லப்பட்டார்கள். இவ்வாறு பிரிட்டிஷ் நாட்டவர்களால் பெரும்பாலான இந்தியத் தமிழர்கள் இலங்கைக்கும்கூட, அழைத்துவரப்பட்டார்கள். அப்படி அன்று அழைத்துவரப்பட்ட அந்த மக்களுடைய உரிமைகள், பாதுகாப்பு என்பன பல வழிகளிலும் இன்னல்களுக்குள்ளாக் கப்பட்டு, அவர்கள் அடிமைகளாக வாழ்ந்தார்கள். உதாரணமாக, railway திணைக்களத்திலும் habourஇலும் வேலை செய்யவும் மூட்டை தூக்கவும் நியமிக்கப்பட்டிருந்த தொழிலாளர்கள் கொழும்பிலே வேலைநிறுத்தப் புரட்சி யொன்றைச் செய்திருந்தார்கள். அப்போது, வெள்ளையர் களால் அந்த மக்கள் அடிமைகளாகக் கருதப்பட்டு அடித்து நொறுக்கப்பட்ட காலகட்டமான, 1938ஆம் ஆண்டு இந்தியாவில் இருந்து இலங்கைக்கு நேரு அவர்களை அனுப்பி வைத்திருந்தார். அவர் நமது மக்களை ஒருமித்தவாறு ஒற்றுமையாக இருக்குமாறு வேண்டிக்கொண்டார்.

ප්‍රජාතන්ත්‍රවාදීව, දේශපාලනිකව අයිතිවාසිකම් දිනා ගැනීමේ ක්‍රියාමාර්ගයට වෙනත් විකල්ප නැහැ. ඇත්තේ අවිහිංසාව පමණයි; ප්‍රජාතන්ත්‍රවාදය පමණයි. රටක් හැටියට අපි ඉදිරියට යනවා නම්, ජාතියක් හැටියට ඉදිරියට යනවා නම් අපේ සෑම දේශපාලන උපාය මාර්ගයකම තිබෙන්නට අවශ්‍ය අවිහිංසාව මත පදනම් වුණු ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනික මූලධර්ම පමණයි. හිංසාවට යොමු වුණු සමහර වෙලාවට තාවකාලික ජයග්‍රහණ ලැබෙන්නට පුළුවන්; තාවකාලික සතුටක් ලැබෙන්නට පුළුවන්; තාවකාලිකව යම් යම් දේවල් ලබා ගන්නට පුළුවන්. නමුත්, හිංසාවෙන් දිගු කාලීනව ලබා ගත්ත දෙයක් නැහැ. 1971දීවත්, 1989දීවත්, ඉන් පසුවවත් අපි හිංසාවෙන් කිසිවක් ලබා ගත්තේ නැහැ. සිදු වුණේ අහිමි වීම පමණයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ අපට මහත්මා ගාන්ධි ශ්‍රීමතාණන්ගේ ජීවිතයෙන් උගතහැකි මහඟු පාඩමක් තිබෙනවා. ඒ තමයි එතුමාගේ අවිහිංසාවාදී ප්‍රතිපත්ති මත තමන්ගේ පෞද්ගලික ජීවිත හැඩගස්වා ගැනීම. මහත්මා ගාන්ධි ගැන කථා කරන බොහෝ දෙනෙකු මහත්මා ගාන්ධිගේ ජීවිතය තුළ තිබුණු වටිනාකම් ගැන කථා කරන්නේ නැහැ; මහත්මා ගාන්ධිගේ ජීවිතය තුළ තිබුණු ශ්‍රේෂ්ඨ අරමුණු ගැන කථා කරන්නේ නැහැ. මහත්මා ගාන්ධි ශ්‍රීමතාණන් තවත් ආභරණයක් ලෙස, පලිහක් ලෙස භාවිත කිරීම පමණයි සිද්ධ කරන්නේ. එම නිසා අපේ රටට ඕනෑ, මහත්මා ගාන්ධි ශ්‍රීමතාණන්ගේ ජීවිතයේ මාවත අනුගමනය කරන නායකයන්; මහත්මාගාන්ධි ශ්‍රීමතාණන්ගේ ඒ අවිහිංසාවාදී මාවත අනුගමනය කරන අනුගාමිකයන්. ඒ ශ්‍රේෂ්ඨ, ප්‍රඥාවන්ත නායකයා අනුගමනය කරන, සත්‍ය වශයෙන් අනුගමනය කරන නායකයන් සහ අනුගාමිකයන් අපේ රටට අවශ්‍ය කරලා තිබෙනවා. එසේ කළොත් තමයි සිංහල, මුස්ලිම්, දෙමළ අප හැමෝටම එක ජාතියක් ලෙස, රටක් හැටියට එකට නැඟී සිටින්නට පුළුවන්කම ලැබෙන්නේ.

විසඳාගත නොහැකිව තිබෙන ප්‍රශ්න රාශියක් අද අපි අතර තිබෙනවා. බොහෝ දෙනෙක් කියනවා, ඒ ප්‍රශ්න ප්‍රජාතන්ත්‍රවාදය තුළ අපි සාකච්ඡාවෙන් සහ සම්මුතියෙන් විසඳා ගත්තේ නැත්නම්, නැවත මේ රට සන්නද්ධ අරගළයකට යන්න ඉඩ කඩ තිබෙනවා කියලා. මම කියනවා, අපි එයට ඉඩ නොදිය යුතුයි කියලා. සන්නද්ධ අරගළයෙන් දිනාගත් දෙයක් නැහැ; ඇත්තේ අහිමි වූ දේ පමණයි. එම නිසා එතැනට යොමු නොවන තැනට කටයුතු කරලා මේ රට අපි සියලුදෙනාගේම කියන හැඟීමෙන්, "එකම රටක්" කියන හැඟීමෙන් යුතුව අපට එකතු විය හැකි අතර මැද මාවතක් සොයා ගන්න වර්තමාන නායකයන් ප්‍රඥාවන්ත විය යුතුයි. එම නිසා ඉතාම වැදගත් සැමරීමක් සිදු කරන වෙලාවේ මෙම විවාදයේ අවසාන කථිකයා විධියට රජය වෙනුවෙන් කථා කරන්නට ලැබීම ඉමහත් සතුටක්. ඒ සඳහා අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.40ට, අද දින සභා සම්මතිය අනුව, 2018 ඔක්තෝබර් මස 25 වන බ්‍රහස්පතින්දා පූ .භා. 10.00 වන තෙක් කල් ගියේය.***


*அதன்படி பி. ப. 5.40 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2018 ஒக்ரோபர் 25, வியாழக்கிழமை மு.ப.10..00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.40 p.m. until 10.00 a.m. on Thursday, 25th October, 2018, pursuant to the Resolution of Parliament of this Day.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 13 වන කලාපය
தொகுதி 263 - இல. 13
Volume 263 - No. 13

2018 ඔක්තෝබර් 25 වන බ්‍රහස්පතින්දා
2018 ஒக்ரோபர் 25, வியாழக்கிழமை
Thursday, 25th October, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් කථානායකතුමාගේ සහතිකය

**ජාතික විගණන කාර්යාලයේ අය වැය ඇස්තමේන්තු - 2019**

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ මූල්‍ය ස්ථාවරභාවය

විදුලි බිල්පත් නිකුත් කිරීමේදී සිදුවන ප්‍රමාදය

**වරප්‍රසාද:**

2018.10.25 වැනි දින "ද අයිලන්ඩ්" පුවත්පත් වාර්තාව

**ණය සහනදායක (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමු වන වර කියවන ලදී.

**මුදල් පනත් කෙටුම්පත:**

දෙවන වර හා තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි.

**නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත:**

නියම

**කල් තැබීමේ යෝජනාව:**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ බන්ධනාගාරගත රැඳවියන් නිදහස් කිරීම


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புக்கள்:**

பயங்கரவாத எதிர்ப்பு சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்

சபாநாயகரது சான்றுரை

**தேசிய கணக்காய்வு அலுவலகத்தின் வரவு செலவுத்திட்ட மதிப்பீடுகள் – 2019**

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

இலங்கை வங்கி மற்றும் மக்கள் வங்கியின் நிதிநிலை ஸ்திரத்தன்மை

மின் கட்டணச் சிட்டைகளை வழங்குவதிலுள்ள தாமதம்

**சிறப்புரிமை:**

2018.10.25 ஆம் திகதிய "த ஐலன்ட்" பத்திரிகை அறிக்கை

**கடன் இணக்கம் (திருத்தம் சட்டமூலம் :**

முதன் முறை மதிப்பிடப்பட்டது.

**நிதிச் சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப் பட்டவாறு நிறைவேற்றப்பட்டது.

**உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டம்:**

கட்டளைகள்

**ஒத்திவைப்புப் பிரேரணை:**

பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின்கீழ் தடுத்து வைக்கப் பட்டுள்ள கைதிகளை விடுதலை செய்தல்


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Counter Terrorism Bill: Petitions to the Supreme Court

Speaker's Certificate

BUDGET ESTIMATES OF NATIONAL AUDIT OFFICE -2019

AUDITOR-GENERAL'S REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

PUBLIC FINANCE COMMITTEE REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Financial Stability of People's Bank and Bank of Ceylon

Delay in Issuance of Electricity Bills

PRIVILEGE:

"The Island" Report of 25.10.2018

DEBT CONCILIATION (AMENDMENT) BILL:

Read the First time

FINANCE BILL:

Read a Second, and the Third time, and passed as amended

EXCISE (SPECIAL PROVISIONS) ACT:

Orders

ADJOURNMENT MOTION:

Release of Persons Detained Under Prevention of Terrorism Act

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2018 ඔක්තෝබර් 25 වන බුහස්පතින්දා*
*2018 ஒக்ரோபர் 25, வியாழக்கிழமை*
*Thursday, 25th October, 2018*

**පූ.භා.10.00ට පාර්ලිමේන්තුව රැස්විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පත :ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### பயங்கரவாத எதிர்ப்பு சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### COUNTER TERRORISM BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව "ත්‍රස්තවාදය වැළැක්වීමේ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් අටක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

### II

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 ඔක්තෝබර් 22 දින මවිසින් පහත සඳහන් පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

හානිපූරණය සඳහා වන කාර්යාලය

### III

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 ඔක්තෝබර් මස 25 වන බුහස්පතින්දා, එනම් අද දින අපර භාග 3.00ට පර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සභාගී වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලුදෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

### ජාතික විගණන කාර්යාලයේ අයවැය ඇස්තමේන්තු - 2019
### தேசிய கணக்காய்வு அலுவலகத்தின் வரவு செலவுத்திட்ட மதிப்பீடுகள் - 2019
### BUDGET ESTIMATES OF NATIONAL AUDIT OFFICE -2019

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 54 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 34 වගන්තිය ප්‍රකාරව, විගණන සේවා කොමිෂන් සභාව විසින් සකස් කරන ලදුව මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද සමඟ ඉදිරිපත් කරන ලද ජාතික විගණන කාර්යාලයේ 2019 අයවැය ඇස්තමේන්තු මම සභාගත කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

එකී ඇස්තමේන්තු රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### විගණකාධිපතිවරයාගේ වාර්තාව
### கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
### AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2014 මුදල් වර්ෂය සඳහා

[ගරු කථානායකතුමා]

විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXVII හා XXVIII සහ තෙවැනි කාණ්ඩයේ XIII කොටස;

2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXII හා තෙවැනි කාණ්ඩයේ X කොටස; සහ

2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ I කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2016 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2017 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතිඥන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරමි.

එම පරිපූරක ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට සහ ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මම 1995 අංක 5 දරන වරදකරුවන් භාරදීමේ පනතේ 2 වගන්තිය යටතේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ඔක්තෝබර් 02 දිනැති අංක 2091/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරමි.

එම නියමය නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමිය වෙනුවෙන්, තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(ii) 2014 වර්ෂය සඳහා ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2011, 2012, 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on "Orders under the Excise (Special Provisions) Act" and "Resolution Under the Active Liability Management Act", which were referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු රංජිත් අලුවිහාරේ මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ranjith Aluvihare - State Minister of Tourism Development and Christian Religious Affairs)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) උකුවෙල, තවලන්කොය, අංක 149/8 දරන ස්ථානයෙහි පදිංචි ජේ.එන්.බී.පී. විජේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතලේ, කළුදැවල, සුදුගහ වත්ත, පළමු පටුමඟ යන ලිපිනයෙහි පදිංචි කේ.ජී. පුණ්‍යසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) කිඹිස්ස, සීගිරි පාර, රණවිරු මාවත යන ලිපිනයෙහි පදිංචි එම්.ඒ. ප්‍රියංකා මල්කාන්ති මෙනවියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) මාතලේ, පලාපත්වල, කවටයාමුණ, අංක 145 දරන ස්ථානයෙහි පදිංචි පී.එම්.එස්.ආර්. දේශප්‍රිය මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - Deputy Minister of Environment)

ගරු කථානායකතුමනි, අඹේපුස්ස, කීණදෙනිය, අංක 56/3 දරන ස්ථානයෙහි පදිංචි එම්.පී.එස්. ප්‍රියංකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු කථානායකතුමනි, ලුණුගම්වෙහෙර, නව නගරය, අංක 38 දරන ස්ථානයෙහි පදිංචි සුදුසිංහ අබේසුන්දර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, මහරගම, ගොඩිගමුව, යහම්පත් මාවත, අංක 21 දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්.ජී.සී. ධර්මවර්ධන මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 - 147/'18 - (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 2 - 184/'18 - (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### මාර්ග ව්‍යාපෘති : සබරගමු පළාත් සභාව
### வீதிக் கருத்திட்டங்கள்: சப்ரகமுவ மாகாண சபை
ROAD PROJECTS : SABARAGAMUWA PROVINCIAL COUNCIL

264/'18

**3. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සබරගමු පළාත් සභාවේ මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද මාර්ග ව්‍යාපෘති සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දේශපාලන අවශ්‍යතා මත අනවශ්‍ය ලෙස මුදල් වියදම් කරන ලද සමහර යෝජනා ඇති බවත්, ඒ සම්බන්ධයෙන් විගණන පරීක්ෂණයන් සිදුවන බවත් පිළිගන්නේද;

(iii) දේශපාලනඥයන්ගේ අවශ්‍යතා මත ක්‍රියාත්මක කරන අක්‍රමවත් ව්‍යාපෘති තුළින් සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத் துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சப்ரகமுவ மாகாண சபையின் நெடுஞ்சாலைகள் அமைச்சினால் 2017ஆம் ஆண்டில் செயற்படுத் தப்பட்ட வீதிக் கருத்திட்டங்களின் எண்ணிக்கை, ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவு வாரியாகத் தனித்தனியாக யாதென்பதையும்;

(ii) மேற்படி கருத்திட்டங்களைச் செயற்படுத்துகை யில் அரசியல் தேவைப்பாடுகளின்போில் அனாவசியமாகப் பணம் செலவிடப்பட்ட சில திட்டங்கள் உள்ளனவென்பதையும், அது தொடர்பாகக் கணக்காய்வு விசாரணைகள் மேற்கொள்ளப்படுகின்றன என்பதையும் ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(iii) அரசியல்வாதிகளின் தேவைகளின்போில் செயற் படுத்தப்படும் ஒழுங்கற்ற கருத்திட்டங்களின் ஊடாக ஏற்படும் இழப்புகளைத் தடுப்பதற்கு எடுக்கப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports :

(a) Will he inform this House -

(i) separately on per Divisional Secretary's Division basis, of the number of road projects implemented by the Ministry of Highways of the Sabaragamuwa Province in the year 2017;

(ii) whether he will admit that there were certain projects on which money was spent unnecessarily in implementing those projects because of political influence and audit inquiries are being carried out in that regard; and

(iii) the measures that will be taken to prevent the losses that are caused by implementation of such irregular projects on the requirements of politicians?

(b) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා. සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් විසින් එවා ඇති තොරතුරු අනුව පහත පරිදි පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සබරගමුව පළාත් සභාවේ මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද මාර්ග ව්‍යාපෘති සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව පහතින් දක්වා ඇත.

රත්නපුර

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අයගම | 03 |
| 02 | බලංගොඩ | 18 |
| 03 | ඇහැළියගොඩ | 16 |
| 04 | ඇලපාත | 08 |
| 05 | ඇඹිලිපිටිය | 259 |
| 06 | ගොඩකවෙල | 08 |
| 07 | ඉඹුල්පේ | 05 |
| 08 | කහවත්ත | 19 |
| 09 | කලවාන | 04 |
| 10 | කිරිඇල්ල | 02 |
| 11 | කොලොන්න | 22 |
| 12 | කුරුවිට | 75 |
| 13 | නිවිතිගල | 09 |
| 14 | ඕපනායක | 13 |
| 15 | පැල්මඩුල්ල | 43 |
| 16 | රත්නපුර | 63 |
| 17 | වැළිගෙපොල | 02 |

කෑගල්ල

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අරණායක | 04 |
| 02 | බුලත්කොහුපිටිය | 06 |
| 03 | දෙහිඕවිට | 07 |
| 04 | දැරණියගල | 06 |
| 05 | ගලිගමුව | 02 |
| 06 | කෑගල්ල | 22 |
| 07 | මාවනැල්ල | 03 |
| 08 | රඹුක්කන | 13 |
| 09 | රුවන්වැල්ල | 11 |
| 10 | වරකාපොල | 13 |
| 11 | යටියන්තොට | 10 |

(ii) 2017 වර්ෂයට අදාළව සබරගමුව පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත ප්‍රතිපාදන වෙන් කළ කර්මාන්ත පිළිබඳව විගණනය විසින් විශේෂ පරීක්ෂණයක් සිදු කරමින් පවතී.

(iii) මහජන නියෝජිතයන්ගෙන් ලැබෙන ඉල්ලීම්, මහජනතාවගෙන් ලැබෙන ඉල්ලීම් හා විධායක ඉංජිනේරුවන්ගෙන් ලැබෙන ඉල්ලීම් අතරින් ප්‍රමුඛ අවශ්‍යතාවලට මුල් තැන දෙන අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් කර්මාන්ත ප්‍රදානය කිරීම සිදු කරනු ලබයි. ඉදිකිරීම් කටයුතුවල අඩු පාඩුවක් නිරීක්ෂණය වුවහොත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදු කරනු ලබයි.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(*மாண்புமிகு ஹேசா விதானகே*)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධව ගරු රාජ්‍ය ඇමතිතුමියට ස්තුතිවන්ත වෙනවා. මට අවශ්‍ය කාරණය මතු වුණා, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ පළාත් මහාමාර්ග අමාත්‍යාංශය හරහා සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් විගණනයට ලක් වී මේ වන විට විගණන විමසුමකට භාජනය වෙමින් තිබෙනවා කියා.

මේ කටයුතු ඔබතුමියගේ අමාත්‍යාංශය යටතේ තිබුණාට, මේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්නේ ටිකක් අඩුවෙන්. ඒ සම්බන්ධයෙන් ඔබතුමිය වැරදි නැහැ. පළාත් ප්‍රධාන ලේකම්වරයා ඇඟ බේරාගන්න තමයි උත්තර දෙන්නේ. නමුත්, මම දන්නා කාරණා අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ විතරක් නොවෙයි, ඔබතුමිය කියපු ඔය සියලු ව්‍යාපෘති පළාත් මහාමාර්ග අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාට අවශ්‍ය පරිදියි දීලා තිබෙන්නේ. දේශපාලන වශයෙන් ගමේ ශාඛා සංවිධානවල ඉන්න අයට, තමන්ගේ දේශපාලන රැස්වීම් තියන අයට තමයි මේ ඔක්කෝම ව්‍යාපෘති ආරම්භ කරන්න දීලා තිබෙන්නේ. එහි ප්‍රතිඵලයක් විධියට මේ වන විට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ව්‍යාපෘති රාශියක් සම්බන්ධයෙන් ගැටලු මතු වී තිබෙනවා. සමහර ව්‍යාපෘතිවලට අද අත්සන් කරලා හෙට උදේට ඇවිල්ලා මුදල් අරගන්නවා. මා දන්නේ නැහැ, මේ රටේ කොහේද එහෙම ක්‍රමවේදයක් තිබෙන්නේ කියලා. දැන් තිබෙන්නේ යහපාලන ආණ්ඩුවක්. අපි හැම තිස්සේම දූෂණ, වංචා ගැන කථා කරනවා. එවැනි තත්ත්වයක් තිබියදීත්, අද උදේ අත්සන් කරලා හෙට උදේට ගිහිල්ලා ව්‍යාපෘතියේ මුදල් ගන්නවා. ඒ නිසා මේ විධියට පළාත් සභාවට විධියට ඕනෑ ඕනෑ විධියට සෙල්ලම් කරමින් රටේ අහිංසක මිනිසුන්ගේ බදු මුදල් නාස්ති කරනවා. මේ සම්බන්ධයෙන් විගණන විමසුමක් තිබුණත්, අවුරුදු ගණනක් ගිහිල්ලා ඒකට උත්තර එනකොට වැඩක් නැහැ. මේ වෙනුවෙන් කඩිනම් පියවරක් ගන්න අමාත්‍යාංශය බැඳී ඉන්නවා කියලා අපි දන්නවා. ඒ නිසා පළාත් සභා, පළාත් පාලන ගරු ඇමතිතුමා හෝ රාජ්‍ය ඇමතිතුමිය විධියට ඔබතුමිය ඒ වෙනුවෙන් යම් පියවරක් ගන්නවාද කියා දැන ගන්න කැමැතියි.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(*மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம*)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන සොයා බලා වැරදි තිබෙනවා නම් විගණනය කරලා ඒ අවශ්‍ය කටයුතු කරන්න උපදෙස් දෙන්න පුළුවන්. පළාත් සභාවට අදාළ කටයුත්තක් සම්බන්ධයෙන් තමයි ඔබතුමා ප්‍රශ්නය අහලා තිබෙන්නේ. ඒ අය එවා තිබෙන උත්තරය තමයි මට දෙන්න වෙලා තිබෙන්නේ. ඒ නිසා-

**ගරු හේෂා විතානගේ මහතා**
(*மாண்புமிகு ஹேசா விதானகே*)
(The Hon. Hesha Withanage)

ඔබතුමිය කියන කාරණාව ඇත්ත. නමුත්, අපට පළාත් සභාවෙන් ප්‍රශ්න අහන්න බැහැනේ. මම ජීවත් වන ප්‍රදේශයේ මේ දේ සිදු වන බව ඇස් දෙකෙන් දැකලා ඒ ගැනප්‍රශ්නයක් ඇහුවාම ඔබතුමිය ඔහොම උත්තරයක් දුන්නාට ප්‍රශ්නයට විසඳුමක් ලැබෙන්නේ නැහැ. අද වන කොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ සිට බහුතරයක් මන්ත්‍රීවරු මේ ක්‍රියාවට

[ගරු භේෂා විතානගේ මහතා]

තනිකරම සම්බන්ධයි. වර්තමාන සභාපතිවරයා සහ මන්ත්‍රීවරුන් එකතු වෙලා කරන මේ විනාශය සම්බන්ධ විගණන පරීක්ෂණ අවුරුදු ගණන් ඇදගෙන යන්නේ නැතිව, ඔබතුමියට පුළුවන් නම් පළාත් සභාවට නියෝගයක් දීලා මේ ක්‍රියාමාර්ග කඩිනම් පියවරක් ගන්න කියා මා ඉල්ලීමක් කරනවා.

නැත්නම් ගරු කථානායකතුමනි, අපි මේ ප්‍රශ්න පාර්ලිමේන්තුවේ කථා කළාට වැඩක් වෙන්නේ නැහැ.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු මන්ත්‍රීතුමනි, කඩිනම් කරන්න අපි පියවර ගන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ප්‍රශ්න අංක 4 - 506/'18 - (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, බුද්ධශාසන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 575/'18 - (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 596/'18 - (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Industry and Commerce, I ask for two weeks' time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 - 599/'18 - (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 - 974/'18 - (1), ගරු ඉෂාක් රහුමාන් මහතා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 - 998/'18 - (1), ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 - 1131/'18 - (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 11 - 1133/'18 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 12 - 1146/'18 - (1), ගරු ඒ.එල්.එම්. නසීර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 13 - 1148/'18 - (1), ගරු එස්.සී. මුතුකුමාරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 14 - 1152/'18 - (1), ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## අධ්‍යාපන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය : නිල වාහන
## கல்வி அமைச்சரது பிரத்தியேகப் பதவியணி: உத்தியோகபூர்வ வாகனங்கள்
## PRIVATE STAFF OF MINISTER OF EDUCATION: OFFICIAL VEHICLES

1184/'18

**15.ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) අධ්‍යාපන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියා පදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමැතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) கல்வி அமைச்சரின் பிரத்தியேக பதவியணிக்கு இணைக்கப்பட்டுள்ள உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஒவ்வோர் உத்தியோத்தரதும் பெயர், பதவி, ஒதுக்கப்பட்டுள்ள வாகனத்தின் வகை, பதிவிலக்கம் மற்றும் அவ்விதம் ஒதுக்குவதற்கு அங்கீகாரம் வழங்கியது யாவர் என்பதை வெவ்வேறாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House separately the name and designation of each officer who is attached to the private staff of the Minister of Education and has been allocated a vehicle, along with details on the type of vehicle allocated to them, registration number and the name of the officer who authorized such allocation of a vehicle?

(b) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) ඔව්.

| නිලධාරියාගේ නම | තනතුර | වෙන්කර ඇති වාහන යේ වර්ගය | ලියාපදිංචි අංකය | අනුමැතිය ලබාදුන් නිලධාරියා |
|---|---|---|---|---|
| බී.ඒ.ඩී.සී. බුලත්සිංහල මහතා | සම්බන්ධීකරණ ලේකම් | ජීප් | KJ-6272 | අතිරේක ලේකම් (පාලන) |
| එම්.ඩී.එස්.එස්. පෙරේරා මහතා | සම්බන්ධීකරණ ලේකම් | කැබ් | PG-2051 | අතිරේක ලේකම් (පාලන) |
| එච්.එම්.වයි. හේරත් මහතා | මහජන සම්බන්ධතා නිලධාරි | කැබ් | PD-1279 | අතිරේක ලේකම් (පාලන) |
| එච්.කේ.කේ.ජී. ගුණරත්න මහතා | මාධ්‍ය ලේකම් | නිල වාහනය වෙනුවට ප්‍රවාහන දීමනාව ලබා ගනී. එබැවින් නිල වාහනයක් අනුයුක්ත කර නොමැත. | | |

(ආ) අදාළ නොවේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේක අතුරු ප්‍රශ්නයක් නොවෙයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේ පළමු නිලධාරීන් දෙදෙනා පාවිච්චි කරන වාහනවල වර්ග සඳහන් කළේ නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මම 'කැබ්' කියලා කිව්වා නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මුල් දෙකේ කිව්වේ නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔක්කෝම කිව්වා. හොඳයි, මම නැවත කියන්නම්.

1. බී.ඒ.ඩී.සී. බුලත්සිංහල මහතා, සම්බන්ධීකරණ ලේකම්, ජීප්, KJ-6272
2. එම්.ඩී.එස්.එස්. පෙරේරා මහතා, සම්බන්ධීකරණ ලේකම්, කැබ්, PG-2051
3. එච්.එම්.වයි. හේරත් මහතා, මහජන සම්බන්ධතා නිලධාරි, කැබ්, PD-1279

එපමණයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අහන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම තනතුරුවලට ඥාතීන් පත් කර තිබෙනවාද කියලා ගරු ඇමතිතුමාගෙන් මා දැනගන්න කැමැතියි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
කිසිවකු පත් කර නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු අමාත්‍යතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළව ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔව්, අහන්න. ගරු කථානායකතුමනි, ඒ වාගේම මා තව දෙයක් කියන්න ඕනෑ. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා මෙම ප්‍රශ්නය අහන්න ඇත්තේ එතුමාට ලැබුණු යම් තොරතුරක් මත හෝ කුමක් හෝ හේතුවක් නිසා නේ. ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මගේ අමාත්‍යාංශයේ කිසිම කෙනෙකුට මා නිල කටයුතුවලට හැරෙන්න වෙනත් කටයුතු සඳහා වාහන දීලා නැහැ. ඒ වාගේම අමාත්‍යාංශයේ වාහන අයථා ලෙස භාවිත කිරීම නිසා පසුගිය දවස්වල මම එක් අයකු interdict කළ බවත් කියන්න ඕනෑ. කවදාවත් pool එකෙන් පෙට්‍රල් අරගෙන ගිහිල්ලා මෙම වාහන සඳහා භාවිත කරලා නැහැ. නමුත්, අයථා කටයුත්තක් සම්බන්ධයෙන් යම් යම් අයට විරුද්ධව දඬුවම් දුන්නාම, බොහෝ වෙලාවට ඒ ගොල්ලන් අනෙක් පැත්තට කරකවලා ගහන එකයි කරන්නේ. ඔබතුමා ඒක දන්නවා නේ. මගේ රාජකාරී කටයුතු කිහිපයක් සඳහා පසුගිය දවස්වල නැගෙනහිර පළාතේ දවස් තුනක් පමණ ගත කළා. මගේ වාහනවලට රුපියල් 50,000ක පමණ ඩීසල් ගැහුවා. මගේ රාජකාරී ස්වභාවයේ හැටියට එම වියදම් සීමාව ඉක්මවා යනවා. මොකද, එවැනි ගමනකදී වාහන දෙකක්වත් පාවිච්චි කරන්න සිදු වනවා. මට තිබෙන්නේ වාහන තුනයි. නමුත් එයින් දෙකයි මම පාවිච්චි කරන්නේ. එම වාහන දෙකත් බන්දුල ගුණවර්ධන මැතිතුමා පාවිච්චි කරපු, කිලෝමීටර් 250,000ට වඩා දුවලා තිබෙන වාහන දෙකක්. අපි එක වාහනයයි අලුතෙන් අරගෙන තිබෙන්නේ. මේ

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

ප්‍රශ්නය අහලා තිබෙන්නේ පට්ටපල් බොරු තොරතුරක් සම්බන්ධවයි. තුන්වැනි පන්තියේ කටයුතු කරන සමහර පුද්ගලයන් වැරැදි තොරතුරු ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමා මේ ගැන අහන්න යම් කිසි හේතුපාදකයක් තිබෙන්න ඇති නේ. අපි මේ සම්බන්ධව ඉතා විධිමත්ව කටයුතු කරලා තිබෙනවා. එවැනි අයථා ක්‍රියා සම්බන්ධයෙන් මා කිහිප දෙනෙක්ව interdict කළා. එපමණක් නොවෙයි, මම අධ්‍යාපන ඇමතිවරයා විධියට පත්වෙද්දි අමාත්‍යාංශයේ driversලා සිකුරාදාට වාහනයත් අරගෙන ගෙදර යන තත්ත්වයක් තිබුණේ. ආයෙත් වාහනය අරගෙන එන්නේ සඳුදාටයි. එම ක්‍රියාවලියට සම්බන්ධ driversලා සියලු දෙනාවම මාරු කළා. ඒවායේ ප්‍රතිඵල විධියට තමයි මේ දේවල් කරන්නේ; මෙවැනි වැරැදි තොරතුරු ලබා දෙන්නේ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ගරු බිමල් රත්නායක මැතිතුමනි, ඊළඟ අතුරු ප්‍රශ්නය අහනවාද?

**ගරු බිමල් රත්නායක මහතා**
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් විධියටම නොවෙයි මම මෙය අහන්නේ. ගරු ඇමතිතුමා මගේ ප්‍රශ්නය පිළිබඳව කිසියම් දුරකට විමර්ශනය කරලා ඔවුන්ට දඩුවම් ලබා දීම ගැන මා සතුටු වනවා.

මම මේ ප්‍රශ්නය සියලු ඇමතිවරුන්ගෙන් අසා තිබෙනවා. මට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ වෙනත් කිසිවකුගෙන් තොරතුරු ලැබුණේ නැහැ. වාහන භාවිත කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් හදන්න කියලා මා ගරු සභානායකතුමා මඟින් ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කළා. මා ඒ ගැන නැවත කියන්න යන්නේ නැහැ. අමාත්‍යවරුන්ගේ සමහර පෞද්ගලික ලේකම්වරුන්, සම්බන්ධීකරණ ලේකම්වරුන්, සමහර නියෝජ්‍ය අමාත්‍යවරුන්ටත් වඩා හොඳ වර්ගයේ වාහන පාවිච්චි කරන නිසා තමයි මා මේ ප්‍රශ්නය ඇසුවේ. ඔබතුමාව නිශ්චිත කරලා ඇහුවා නොවෙයි, ගරු අමාත්‍යතුමනි.

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන්ම පාසල් සංවර්ධන සමීතිවලින් පාසල්වල නඩත්තු කටයුතු සඳහා මුදල් අය කිරීම නතර කිරීම සම්බන්ධව ඔබතුමා අධ්‍යාපන ඇමතිවරයා වූ ගමන්ම යම් යම් නිර්දේශ නිකුත් කර තිබුණා. දැන් එම චක්‍රලේඛය අහෝසි කරලා, පාසල්වල කටයුතු සඳහා මුදල් අය කිරීම ප්‍රවර්ධනය වන ආකාරයට ඔබතුමා හෝ අමාත්‍යාංශය මඟින් නව චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවාද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(මාණ්පුමිකු අක්කිල විරාජ් කාරියවසම්)
(The Hon. Akila Viraj Kariyawasam)
කිසිසේත්ම නැහැ, ගරු මන්ත්‍රීතුමනි. පරණ චක්‍රලේඛයම තමයි ක්‍රියාත්මක වන්නේ. අපි එවැනි කටයුතු පාලනය කර තිබෙනවා. ඒ වාගේම, එවැනි කටයුතු කළ විශාල පිරිසකට විරුද්ධව චක්‍රලේඛය ප්‍රකාරව නීතිමය ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා. ඒ වාගේම එම චක්‍රලේඛය වෙනස් කරලාත් නැහැ. කොහේ හෝ තැනක යම් වැරැද්දක් වෙනවා නම් ඔබතුමා හෝ කවුරුන් හෝ අපව දැනුවත් කළා නම්, අපි එවේලේම විමර්ශනයක් කරලා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. දෙවන වටය.

## දුම්රිය එන්ජින් හා මැදිරි පෞද්ගලික ආයතන වෙත ලබා දීම: විස්තර
## புகையிரத என்ஜின்கள் மற்றும் புகையிரதப் பெட்டிகளைத் தனியார் நிறுவனங்களுக்கு வழங்கியமை: விபரம்
## HANDOVER OF RAILWAY LOCOMOTIVES AND CARRIAGES TO PRIVATE INSTITUTIONS: DETAILS

147/'18

**1. ගරු කේ.කේ. පියදාස මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு கே.கே. பியதாஸ - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. K.K. Piyadasa on behalf of the Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය එන්ජින් හා දුම්රිය මැදිරි පෞද්ගලික ආයතන වෙත ලබා දී තිබේද;

(ii) එසේ නම්, එසේ ලබා දී ඇති ආයතනවල නම් කවරේද;

(iii) දුම්රිය එන්ජින් හා මැදිරි ලබා දීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(iv) දුම්රිය එන්ජින් හා මැදිරි පෞද්ගලික ආයතන වෙත ලබා දුන් දින සිට අද දක්වා එමඟින් දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබුණු වාර්ෂික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මෙම ගිවිසුම්වලින් දුම්රිය දෙපාර්තමේන්තුවට විශාල මුල්‍යමය හානියක් සිදුවන බවට විවිධ පාර්ශ්වවලින් නැඟෙන චෝදනා නිවැරදි කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

පෝක්කුවරත්තු මත්‍රුම් සිවිල් විමානච් සේවෙකළ් අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) இலங்கைப் புகையிரதத் திணைக்களத்திற்குச் சொந்தமான புகையிரத என்ஜின்கள் மற்றும் புகையிரதப் பெட்டிகள் தனியார் நிறுவனங்களுக்கு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வாறு வழங்கப்பட்டுள்ள நிறுவனங்களின் பெயர்களையும்;

(iii) புகையிரத என்ஜின்கள் மற்றும் புகையிரத பெட்டிகள் வழங்கும்போது பின்பற்றப்பட்டுள்ள நடைமுறை யாதென்பதையும்;

(iv) புகையிரத என்ஜின்கள் மற்றும் புகையிரதப் பெட்டிகள் தனியார் நிறுவனங்களுக்கு வழங்கப்பட்ட தினம் முதல் இற்றைவரை அதன் மூலமாகப் புகையிரதத் திணைக்களத்திற்குக் கிடைக்கப்பெற்றுள்ள வருடாந்த வருமானம் தனித்தனியாக எவ்வளவென்பதையும்;

(v) மேற்படி உடன்படிக்கைகள் காரணமாகப் புகையிரதத் திணைக்களத்திற்குப் பாரிய நிதிசார் இழப்பீடு ஏற்படுவதாகப் பல்வேறு தரப்பினராலும் எழுப்பப்படுகின்ற குற்றச்சாட்டுகளை நிவர்த்தி செய்ய அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House-

(i) whether railway locomotives and carriages belonging to the Department of Sri Lanka Railways have been given to private establishments;

(ii) if so, the names of such establishments;

(iii) the methodology followed in giving locomotives and carriages;

(iv) the income accrued to the Department of Sri Lanka Railways in each year from the date of giving locomotives and carriages to private establishments up to now, separately in respect of each year; and

(v) what steps will be taken by the Ministry to counter the allegations raised by various sections that a vast financial loss is caused to the Department of Sri Lanka Railways by this arrangement?

(b) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)

(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ජේ.එෆ්. ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් සමාගම

එක්ස්පෝ කොන්සොලිඩේටර්ස් (පුද්ගලික) සමාගම

බ්ලූ ලයින් (පුද්ගලික) සමාගම

සියාම් සිටි සිමෙන්ට් ලංකා සමාගම

(iii) ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව විවෘත තරගකාරී මිල කැඳවීම මඟින් හෝ විශේෂ ගිවිසුම්වලට එළඹ බදු පදනමින් ලබා දීම සිදු කරයි.

(iv)

| වර්ෂය | ජේ.එෆ්. ටුවර්ස් ආයතනයෙන් ලද ආදායම (රුපියල්) | එක්ස්පෝ කොන්සොලිඩේටර්ස් ආයතනයෙන් ලද ආදායම (රුපියල්) | බ්ලූ ලයින් ආයතනයෙන් ලද ආදායම (රුපියල්) | සියාම් සිටි සිමෙන්ට් ලංකා ආයතනයෙන් ලද ආදායම (රුපියල්) | එකතුව |
|---|---|---|---|---|---|
| 2010 | 0.00 | 0.00 | 0.00 | 55,242,000.00 | 55,242,000.00 |
| 2011 | 2,489,782.00 | 26,272,524.00 | 17,119,210.00 | 32,224,500.00 | 88,695,163.50 |
| 2012 | 4,853,335.00 | | | 5,735,812.50 | |
| 2013 | 7,228,194.40 | 32,317,710.00 | 20,738,500.00 | 55,040,074.80 | 115,324,479.20 |
| 2014 | 16,523,158.40 | 24,290,390.00 | 23,215,340.00 | 42,467,254.27 | 106,496,142.67 |
| 2015 | 14,516,319.04 | 23,184,570.00 | 22,834,830.00 | 126,240,778.13 | 186,776,497.17 |
| 2016 | 18,539,450.37 | 24,089,680.00 | 29,362,294.00 | 31,015,037.11 | 71,991,424.37 |
| 2017 | 14,960,407.41 | 5,586,560.00 | 5,258,400.00 | 18,699,390.52 | 44,504,757.93 |
| 2018 ජූනි | 7,647,759.75 | 0.00 | 0.00 | 0.00 | 7,647,759.75 |
| | | | | | 676,678,224.59 |

(v) වෛස්රෝයි විශේෂ දුම්රිය බදු ලබා දීමට අදාලව අලාභයක් සිදු වී නොමැති අතර, වර්ෂ 2010 සිට 2015 දක්වා කාලය තුළ බිල්පත් සංශෝධනය වීම මත ඇති වූ හිඟ ගාස්තුව රුපියල් 9,788,540.08කි.

අයකර ගැනීමට ගත් ක්‍රියා මාර්ගය:-

මෙම හිඟ ගාස්තුව කාර්තුවකට අවම රුපියල් 500,000.00කට යටත්ව රුපියල් 699,180.00 බැගින් වූ සමාන වාරික 13ක් සහ රුපියල් 699,200.08 බැගින් වූ වාරික 01කින් ගෙවා 2021.03.31 දිනෙන් අවසන් වන කාර්තුවෙන් පියවීමට ජේ.එෆ්. ටුවර්ස් ආයතනය එකඟ වී ඇත. මේ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගෙන ඇති අතර, 2018.06.30 දින වන විට හිඟ මුදලින් රුපියල් 1,500,000.00ක් (500,000 වාරික 03ක්) අය කරගෙන ඇත.

වර්ෂ 2005 සහ 2008 කාලය තුළ දී වෛස්රෝයි විශේෂ දුම්රියේ මැදිරි සම්පූර්ණයෙන් වෙනස් කර ධාවනයට යෙදවීමට නඩත්තු වියදම් ලෙස රුපියල් 6,119,582.28ක මුදලක් වැය වී ඇත. එම කාල සීමාවේ දී විධිමත් ගිවිසුමක් නොතිබූ බැවින්, නඩත්තු වියදම් දැරීම ජේ.එෆ්. ටුවර්ස් ආයතනය ප්‍රතික්ෂේප කර ඇත.

අය කර ගැනීමට ගත් ක්‍රියා මාර්ගය:-

මෙම මුදල අය කර ගැනීමට ගරු නීතිපතිතුමාගේ උපදෙස් විමසා ඇති අතර, ජේ.එෆ්. ටුවර්ස් ආයතනය විසින් කරන ලද ඉල්ලීමකට අනුව එම අලුත්වැඩියාව කර ඇත්නම්, ඒ පිළිබඳව පරීක්ෂා කළ හැකි බව ගරු නීතිපතිතුමා විසින් දන්වා ඇති බැවින්, අදාළ ලිපි ලේඛන තවදුරටත් උපදෙස් පිණිස ගරු නීතිපතිතුමා වෙත යොමු කර ඇත.

ටී 1 දරන රේල්කාර් රථය ද ජේ.එෆ්. ටුවර්ස් ආයතනය වෙත බදු ලබා දී ඇති අතර, එම රථය සඳහා නඩත්තු වියදම් ලෙස රුපියල් 2,317,081.20ක මුදලක් වැය වී ඇත. අදාළ මුදල අය කර ගැනීම සඳහා ජේ.එෆ්. ටුවර්ස් ආයතනයට දැන්වූ අවස්ථාවේ එම මුදල ගෙවීමට එකී සමාගම බැඳී නොමැති බව වාර්තා කර තිබූ නිසා මේ සම්බන්ධයෙන් විසඳුමක් ලබා ගැනීමට ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරන ලදී. අදාළ වියදම් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් දැරිය යුතු බවට කමිටුව නිර්දේශ කර ඇති අතර, එම නිර්දේශිත තීරණ ක්‍රියාත්මක කිරීමට ගරු නීතිපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -184/'18- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**

(மாண்புமிகு நிஹால் கலப்பத்தி)

(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අසනවා.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු වාරිමාර්ග අමාත්‍යතුමාගෙනුයි, ප්‍රශ්නය අහන්නේ. ගරු සභානායකතුමනි, දෙවන ප්‍රශ්නය වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා අමාත්‍යතුමාගෙන් අසා තිබෙන්නේ. ඔබතුමා ළඟ එම ප්‍රශ්නයට පිළිතුර තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්ඩලික ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා කල් ගන්නවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*විනාඩි මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5- 575/'18 - (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා. මේ ප්‍රශ්නයත් වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් තමයි අහලා තිබෙන්නේ.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(මාණ්ඩලික කේ.කේ. පියදාස)
(The Hon. K.K. Piyadasa
ගරු කථානායකතුමනි, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවෙන් එම ප්‍රශ්නය අහනවා. ඔබතුමා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවාද, නැත්නම් කල් ගන්නවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්ඩලික ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*විනාඩි මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 - 599/'18 - (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා. මේ ප්‍රශ්නයත් වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් තමයි අහලා තිබෙන්නේ.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(මාණ්ඩලික කේ.කේ. පියදාස)
(The Hon. K.K. Piyadasa
ගරු කථානායකතුමනි, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්ඩලික ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*විනාඩි මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 - 998/'18 - (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා. මේ ප්‍රශ්නයත් වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් තමයි අහලා තිබෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්ඩලික විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්ඩලික ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*විනාඩි මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 - 1131/'18 - (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(මාණ්ඩලික කේ.කේ. පියදාස)
(The Hon. K.K. Piyadasa
ගරු කථානායකතුමනි, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(මාණ්ඩලික නිරෝෂන් පෙරේරා - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*විනාඩි මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 1133/'18 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් එම ප්‍රශ්නය කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු අසනවාද?

කිසිම මන්ත්‍රීවරයෙකු එම ප්‍රශ්නය නොඅසන බවයි පෙනී යන්නේ.

ප්‍රශ්න අංක 12 - 1146/'18 - (1), මුහම්මද් නසීර් මහතා. ගරු මුහම්මද් නසීර් මන්ත්‍රීතුමා වෙනුවෙන් එම ප්‍රශ්නය කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකු අසනවාද?

එම ප්‍රශ්නයත් ගරු මන්ත්‍රීවරයෙකු නොඅසන බවයි පෙනී යන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්ඩලික විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්ඩලික විමල් වීරවන්ශ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා "කල් ගන්නවා" කියා කිව්වාට සති දෙකද, මාසයද, කොපමණ කාලයක්ද කියා කියන්නේ නැහැ. ඒ නිසා ඒ ප්‍රශ්න අසන ලද මන්ත්‍රීවරුන්ට සාධාරණයක් වීම සඳහා කල් ගන්නා කාලය කොපමණද කියා සඳහන් කරන්න.

**ගරු කථානායකතුමා**
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
හරි. ඊළඟ ප්‍රශ්නයේ සිට සඳහන් කරන්න පුළුවන් නේ.

ප්‍රශ්න අංක 13 - 1148/'18 - (1), ගරු එස්.සී. මුතුකුමාරණ මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(මාණ්ඩලික ரී. රඤ්ජිත් ත සොය්සා)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්ඩලික ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
Sir, I need two weeks' time to answer this Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නාගොඩ-බද්දේගම ප්‍රධාන මාර්ගය දක්වා වූ පාර ඉදිකිරීම : ප්‍රතිපාදන

நாகொட - பத்தேகம பிரதான வீதி வரை பாதை நிர்மாணம் : நிதி ஒதுக்கீடு

CONSTRUCTION OF ROAD UPTO NAGODA-BADDEGAMA MAIN ROAD: ALLOCATION OF FUNDS

1152/'18

**14. ගරු කේ.කේ. පියදාස මහතා (ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා වෙනුවට)**
(මාණ්ඩලික කේ.කේ. පියතාස - මාණ්ඩලික පන්තුල ලාල් පණ්ඩාරිකොට සාර්පාග)
(The Hon. K.K. Piyadasa on behalf of the Hon. Bandula Lal Bandarigoda)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වැලිවිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිට බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සම්බන්ධ වන අගලිය මුල්කඩ යා කිරීම සඳහා විශාල මුදලක් වැය කර පාලමක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) මෙම පාලමේ සිට නාගොඩ බද්දේගම ප්‍රධාන මාර්ගය තෙක් දිවෙන පාර සකස් නොකිරීමෙන් මගී ජනතාව දුෂ්කරතාවට පත්වී ඇති බව පිළිගන්නේද;

(iii) මෙම මාර්ගය සකස් කරන මෙන් ඉල්ලා මා විසින් 2016 හා 2017 වර්ෂවල ඇස්තමේන්තු සහිතව ඉල්ලීම් ඉදිරිපත් කළ නමුත්, මේ දක්වා ප්‍රතිපාදන නොලැබුණු බව දන්නේද;

(iv) 2018 වර්ෂයේදී මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඔබ අමාත්‍යාංශය යටතේ මුදල් වෙන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

මාකාණ සපෙකළ්, උළ්ලූරාට්චි මර්රුම් විළෙයාට්ටුත් තුරෙ අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) වෙලිවිට්ටිය පිරදේස සෙයලාළර් පිරිවු තොටක්කම් පත්තේකම පිරදේස සෙයලාළර් පිරිවුටන් තොටර්පු පටුත්තුම් අකලිය මුල්කටවරෙ ඉණෙප්පතර්කු පෙරුම් නිදි සෙලවිටප්පට්ටු ඔරු පාලම් නිර්මාණික්කප්පට්ටුළ්ළතෙ අවර් අරිවාරා එන්පතෙයුම්;

(ii) මේර්පටි පාලත්තිලිරුන්තු නාකොට - පත්තේකම පිරතාන වීතිවරෙ සෙල්ලුම් පාතෙ නිර්මාණික් කප්පටාමෙයිනාල් පයණිකළාන මක්කළ් පෙරුම් අසෙකරියඞ්කළුක්කු ආළාකියුළ්ළනර් එන්පතෙ අවර් ඒර්රුක් කොළ්වාරා එන්පතෙයුම්;

(iii) ඉන්ත වීතියෙ නිර්මාණික්කුමාරු කෝරි නාන් 2016 මර්රුම් 2017ආම් ආණ්ටුකළිල් මතිප්පීටුකළුටන් කෝරික්කෙකළෛච් චමර්ප්පිත්තපෝතිලුම්, ඉතු වරෙ නිදි ඒර්පාටුකළ් කිටෙක්කවිල්ලෙ එන්පතෙ අරිවාරා එන්පතෙයුම්;

(iv) 2018ආම් ආණ්ටිල් ඉන්ත වීතියෙ නිර්මාණික්ක උඞ්කළ් අමෙච්චින්කීළ් නිදි ඔදුක්කප්පටුමා එන්පතෙයුම්;

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House -

(i) whether he is aware that a large sum of money was spent on building a bridge between Agaliya and Mulkada connecting the Welivitiya Divisional Secretary's Division and the Baddegama Divisional Secretary's Division;

(ii) whether he admits that failure to construct the road that stretches from the aforementioned bridge to the Baddegama main road has caused difficulties to commuters;

(iii) whether he is aware that provisions for constructing the aforesaid road have not been allocated up to now although I have made requests to that effect together with estimates in years 2016 and 2017; and

(iv) whether the Ministry will allocate funds for the construction of this road in year 2018?

(b) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) 2017 වර්ෂයට ඉල්ලීමක් ලැබී නැත. නමුත්, 2016 වර්ෂයේ ලද ඉල්ලීමක් අනුව පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නඟා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන යටතේ උඩුගම-බද්දේගම මාර්ගයට සම්බන්ධ අගලිය මුල්කඩ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රුපියල් 6,148,270.49ක් අනුමත කරන ලදී. ඊට පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ දායකත්වය රුපියල් 4,000,000ක් වන අතර, රුපියල් 2,148,270.49ක් වූ ඉතිරි මුදල සභාව මඟින් දරා ගැනීමට එකඟ වී ඇත. ඒ අනුව, බද්දේගම ප්‍රාදේශීය සභාව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙන ඇති අතර, අදාළ කොන්ත්‍රාත් සමාගම විසින් මාර්ගය සංවර්ධනය කිරීම ආරම්භ කර ඇතත් ඉටු කර ඇත්තේ මාර්ග තලය පුළුල් කර අවශ්‍ය ABC රැගෙන විත් මුවට කිරීම (Piling) පමණකි. ඉටු කර ඇති එම වැඩ කොටස් සඳහා පමණක් පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය වෙත බිල්පත් ඉදිරිපත් කර තිබූ අතර, ඒ වෙනුවෙන් රුපියල් 578,027.88ක මුදලක් බද්දේගම ප්‍රාදේශීය සභාව වෙත යවා ඇතත්, නියමිත පරිදි කර්මාන්තය නිම නොකිරීම හේතුවෙන් එම මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවා නැති බව දකුණු පළාතේ පළාත් පාලන කොමසාරිස් වාර්තා කර ඇත.

(iv) නැත.

(ආ) 2017, 2018 වර්ෂවලදී ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලීමක් කර නැත.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ මූල්‍ය ස්ථාවරභාවය
### இலங்கை வங்கி மற்றும் மக்கள் வங்கியின் நிதி நிலை ஸ்திரத்தன்மை
### FINANCIAL STABILITY OF PEOPLE'S BANK AND BANK OF CEYLON

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ ගරු අග්‍රාමාත්‍යතුමා වෙතයි. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා ලෙස එතුමාගෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

රජය -ආණ්ඩුව- පාර්ලිමේන්තුවට කලින් දෙන ලද විස්තර පදනම් කරගෙනයි මා මේ සමහර කාරණා විමසන්නේ. අද වන විට ශ්‍රී ලංකා රුපියලේ අගය දිනපතාම කඩා වැටෙමින් පවතිනවා. එම නිසා අද අප රටේ ඉතිහාසයේ දරුණුතම මූල්‍ය හා විනිමය අර්බුදය හටගෙන ඇති බව අපි දන්නවා. ඊයේ දිනය වන විට ඇමෙරිකානු ඩොලරය රුපියල් 174.50ක් දක්වා ඉහළ ගොස් තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි 2015 ජනවාරි 8වන දා ආණ්ඩුව භාරදෙන විට ඇමෙරිකානු ඩොලරය රුපියල් 132ටයි තිබුණේ. එදා සිට අද දක්වා කාලය ගත්තොත්, මේ ආණ්ඩුව අවුරුදු තුනහමාරක් තිස්සේ මේ රට පාලනය කරමින්, අය වැය ලේඛන හතරකදී දුන් මිථ්‍යා පොරොන්දු කඩා දමා, අද ඇමෙරිකානු ඩොලරය රුපියල් 174ක් දක්වා වන තරමට අපේ රුපියලේ වටිනාකම බාල්දු කර තිබෙනවා.

මෙහි අනිටු විපාක රාශියක් තිබෙනවා. මේ අවස්ථාවේදී මම ඒවා විස්තර කරන්න උත්සාහ කරන්නේ නැහැ. නමුත්, රජය මේ දේවල් පාලනය කර ගන්න බැරි ආණ්ඩුවක් බවට පත්වීම නිසා ඇති වී තිබෙන යම් යම් පැමිණිලි සැලකිල්ලට ගෙන, ජනාධිපතිතුමා යම් නියෝගයක් ප්‍රසිද්ධියට පත් කර තිබුණා.

01. ශ්‍රී ලාංකීය ජනතාවගේ දායකත්වයෙන් ගොඩනැඟුණු රුපියල් බිලියන 3,500කටත් වැඩි වත්කම් ප්‍රමාණයක් හිමි, ප්‍රධානතම රාජ්‍ය බැංකු දෙක වන ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ සිදු වී ඇතැයි සැලකෙන වංචා, දූෂණ, අක්‍රමිකතා සහ අකාර්යක්ෂම කළමනාකරණය නිසාවෙන් අනිගරු ජනාධිපතිතුමා කරන ලද නියෝගය මත අලුතින් සභාපතිවරු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල පත් කරනු ලැබුවේද? මෙම රාජ්‍ය බැංකු දෙකෙහි ස්ථාවරභාවය නැවත ඇති කර, ප්‍රාග්ධනය යථායෝග්‍ය මට්ටමට ගොඩනැංවීමට රජය අනුගමනය කිරීමට බලාපොරොත්තු වන වැඩ පිළිවෙළ ගරු අගමැතිතුමා මෙම ගරු සභාවට දැනුම් දෙන්නේද?

02. සෘජු විදේශ ආයෝජන ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීමේ වග කිව යුතු රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේද ඇතිවූයේ යැයි සැලකෙන අනීතික හා අයථා ක්‍රියා මාර්ග හේතුවෙන් ජනාධිපතිතුමාගේ නියමය පරිදි නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරනු ලැබුවේද?

ශ්‍රී ලංකාවට විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමට හා ඒවා රැක ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය යළි ගොඩනැංවීමට ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද?

අපේ රටට පැමිණෙන ආයෝජන නැවතී තිබෙන අතර, අපේ රටේ කරන ලද විවිධ ආයෝජනද අද ආපසු ගලන භයානක තත්ත්වයකට රට පරිවර්තනය වී තිබෙන බව රජය, මහ බැංකු අධිපතිවරයා සහ සමස්ත ආර්ථික හා මූල්‍ය විශේෂඥයන්ද මේ වන විට පිළිගෙන තිබෙනවා. එම තත්ත්වය මෙම මූල්‍ය අර්බුදය තවත් උත්සන්න කර තිබෙනවා.

අපේ රටේ මේ කේන්ද්‍රීය රාජ්‍ය බැංකු දෙක නිසා තමයි අපේ මූල්‍ය ක්‍රමය දැවැන්ත ආරක්ෂාවක පවතින්නේ. ලැබී තිබෙන චෝදනා මත, ඒ සම්බන්ධයෙන් ගන්නා වූ පියවර හා ගතහැකි ක්‍රියා මාර්ග පිළිබඳව ජනාධිපතිවරයා විසින් දැන් යම් යම් නියෝග නිකුත් කර තිබෙනවා. එම නිසා, මේ බරපතළ අවස්ථාවේදී ගරු අග්‍රාමාත්‍යතුමා ඒ සම්බන්ධව පැහැදිලි කරනවා නම්, එය මම අගය කරනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු මා සතුව තිබෙනවා. ගරු අගමැතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා එම ප්‍රශ්නය තුළින් කරුණු කිහිපයක් ඉදිරිපත් කළා. මෙම බැංකු දෙක අස්ථාවර මට්ටමක නොපවතින බව මුලින්ම මම අවධාරණය කරන්න ඕනෑ.

ඍජු විදේශ ආයෝජන කිසි විටෙකත් එළියට ගලාගෙන ගොස් නැහැයි කියන එකත් මේ අවස්ථාවේ ජනතාවගේ දැන ගැනීම පිණිස කියන්නට ඕනෑ. ගරු කථානායකතුමනි, අපි විකුණන භාණ්ඩාගාර බිල්පත්වල සියයට 12.5ක් ආයෝජනය කරන්න විදේශිකයන්ට අවස්ථාව දෙන්න අපට හැකියාවක් තිබෙනවා. ඒ අවස්ථාව බොහෝ දෙනෙක් ප්‍රයෝජනයට ගත්තා. මොකද, ලෝකයේ පොලී අනුපාතවල ලොකු වෙනසක් තිබුණා. ගරු කථානායකතුමනි, LIBOR කියන ලෝක පොලී අනුපාතය සියයට 5 සිට සියයට 0.5 දක්වා වැටුණා. සියයට 0.5ට වැටුණාට පස්සේ 2007, 2008 ඉඳලා 2015, 2016 දක්වා එය ඉතාම අඩු පොලී අනුපාතයකටයි තිබුණේ. ඒ අවස්ථාවේ බොහෝ බටහිර ආයෝජකයන්, emerging marketsවලට ඒ ආයෝජන ගෙනාවා. ඒ අනුව ලංකාවටත් විශාල ආයෝජන ප්‍රමාණයක් ගලාගෙන ආවා. ඒ කාලයේදී තමයි සමහර අවස්ථාවල International Sovereign Bonds ඉරහා සියයට 8.875ට, සියයට 9ට පවා අපි එම ණය ලබා ගත්තේ. නමුත්, දැන් වෙනකොට ඒ LIBOR පොලී අනුපාතය සියයට 0.5 ඉඳලා සියයට 3 දක්වා පමණ වැඩි වෙලා තිබෙනවා. මෙම ක්‍රියාවලිය තුළ තමයි emerging marketsවලින් ආයෝජන නැවත ගලාගෙන යන්නේ. ගරු කථානායකතුමාට මතක ඇති, ජපානයේ ඍණ පොලී අනුපාතයක් පවා තිබුණ බව. දැන් ලෝකයේ ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා තිබෙනවා. කිසිම විධියකට මහජන බැංකුවට, ලංකා බැංකුවට ඒකේ වග කීමක් නැහැ. මේ කථාව ඒ බැංකු දෙකට කිසිසේත්ම අදාළ නැහැ. ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

ලංකා බැංකුව, මහජන බැංකුව හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යන ආයතනවල කර්තව්‍යයන් තවදුරටත් කාර්යක්ෂම කිරීමේ අරමුණින් ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත එම ආයතන ප්‍රතිසංවිධානය කිරීම මේ වනවිට අරඹා ඇත. ඒ අනුව එම ආයතන සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම පිළිබඳව මේ වනවිට සලකා බලමින් සිටින අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා මේ වනවිටත් නව පත් කිරීම් සිදු කර ඇත. සභාපති හැටියට හේමසිරි ප්‍රනාන්දු මැතිතුමාත්, ආචාර්ය හිරාන් සුබසිංහ මැතිතුමා සහ ආචාර්ය නිහාල් සමරප්පුලි කියන පුද්ගලයන් සාමාජිකයන් හැටියට මේ වනවිට ජනාධිපතිතුමා විසින් පත් කර තිබෙන බව අපි දන්නවා. මහජන බැංකුවට සභාපතිවරයෙකු පත් කරමින් සිටින බව අද දවස වනකොට අපිට දැනගන්න ලැබෙනවා. මොකද, බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන්න පුළුවන්. නමුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වලා තමයි ඔවුන් ඒකට අනුමැතිය ලබා දෙන්නේ. ඒකයි මම කිව්වේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරමින් පවතිනවාය කියා.

අනික් කාරණය මෙයයි. ලංකාවේ ප්‍රධානම රාජ්‍ය බැංකු වන ලංකා බැංකුව හා මහජන බැංකුව කිසි ලෙසකින් අස්ථාවර මට්ටමකට පත් වී නොමැති බව අපි අවධාරණය කරන්න කැමතියි. ශ්‍රී ලංකාවට ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා පුළුල් වැඩ පිළිවෙළක් මේ වනවිටත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ආරම්භ කර තිබෙන බව අපි කවුරුත් දන්නවා. ලංකාවට වැඩිපුරම විදේශ ආයෝජන ලැබුණේ 2017 වර්ෂයේදී බව මම නැවතත් ඔබතුමාට මතක් කරන්න කැමතියි. 2020 වනකොට වාර්ෂිකව ලැබෙන විදේශ ආයෝජන ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් බිලියන 5 දක්වා වැඩි කිරීම තමයි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉලක්කය වන්නේ. ඒ අනුව 2017 වර්ෂයේදී මෙතෙක් වාර්තා වූ ඉහළම ඍජු විදේශ ආයෝජන ප්‍රමාණය වන ඇමෙරිකන් ඩොලර් බිලියන 1.9 වාර්තා වුණා.

2018 වර්ෂයේදී ළඟා කර ගැනීමට අපේක්ෂිත ඍජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5ක් වන අතර, වර්ෂයේ මුල් භාගය අවසානය වන විට ලබා ගත් ඍජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4ක් වේ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එතුමාට කථාව කරගෙන යන්න ඉඩ දෙන්න. Do not disturb. Let the Hon. State Minister speak.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ආයෝජන මණ්ඩලය විසින් මෙහෙයවන අපනයන සැකසුම් කලාප 16ම මේ වන විට ඒවායේ උපරිම ධාරිතාවට ළඟා වී ඇති බැවින්, අලුතෙන් කලාප තුනක් හම්බන්තොට, මිල්ලනිය, බිංගිරිය යන ප්‍රදේශවල පිහිටුවීමට අවශ්‍ය සියලු පියවර ගෙන තිබෙන බව අපට දන්වා තිබෙනවා.

ඍජු විදේශ ආයෝජන ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලියෙහි පැවැති බරපතළ ප්‍රමාදයන් මඟහරවා ගැනීම පිණිස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විවිධ අනුමැතීන් කඩිනමින් ලබා ගැනීම තහවුරු කිරීම පිණිස තනි කවුළු ආයෝජන පහසුකම් සැපයීමේ කාර්ය සාධන බලකාය -SWIFT-Single Window Investment Facilitation Taskforce- ඉරහා එවැනි ආයතන 24ක් සමඟ බද්ධ වන ක්‍රමවේදයක් සකස් කරනවා.

දැනට සිටින ආයෝජකයන් සිය ව්‍යාපාර පුළුල් කිරීම හා දියුණු කිරීම සඳහා ප්‍රතිආයෝජනයට පහසුකම් සැලසීම සහ ඒ සඳහා ඇති ගැටලු නිරාකරණය කිරීම සඳහා උදවු ලබා දෙනවා. 2018 වර්ෂයේ පළමු භාගය තුළදී ඇමෙරිකානු ඩොලර් මිලියන 25කට ආසන්න ප්‍රතිආයෝජන -ආයෝජනවලට අමතරව,- වාර්තා වෙලා තිබෙනවා. ඉලක්කගත ක්ෂේත්‍ර සඳහා ඍජු විදේශ ආයෝජන ළඟා කර ගැනීම වෙනුවෙන් විශේෂිත වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික්, ආහාර නිෂ්පාදනය, නැව් හා බෝට්ටු, සංචාරක, තොරතුරු තාක්ෂණය, ඖෂධ නිෂ්පාදන, ඛනිජ නිෂ්පාදන, වාහන කොටස් හා සේවා ආශ්‍රිත අපනයන ක්ෂේත්‍ර සඳහා ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් මේ වන විට ආයෝජන මණ්ඩලය දියත් කරමින් සිටිනවා.

ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ඉලක්කගත රටවල් කරා ප්‍රවර්ධන වැඩසටහන් යොමු කරනවා. මේ අනුව ගෝලීය ව්‍යාපාර ප්‍රමුඛයන්ගේ ආයෝජන ඉලක්කකොට ගෙන ජර්මනිය, ජපානය හා සිංගප්පූරුව යන ප්‍රධාන වෙළෙඳ පොළවල සාර්ථක ප්‍රවර්ධන වැඩසටහන් 2018 වර්ෂයේදී පැවැත්වූ බව ආයෝජන මණ්ඩලය අපට දන්වා තිබෙනවා. 2019 වර්ෂයේ පළමු කාර්තුවේදී ඉන්දියාවේ මුම්බායිහි එවැනි ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීමට නියමිතව තිබෙනවා.

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුර වශයෙන් ඍජුවම අපට කියන්න තිබෙන්නේ, "ඔව්, අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත ප්‍රතිසංවිධාන කටයුතු ආරම්භ කර තිබෙනවා" කියලායි. ආයෝජන මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩලය පත් කර තිබෙනවා; බැංකු දෙකට පත් කරමින් පවතිනවා. මොකද, මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් යෝග්‍යතා පරීක්ෂා කරන්න තිබෙන නිසා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍ය නම් අවස්ථාව දෙන්නම්. නමුත් මේ සම්බන්ධයෙන් විවාදයක් පවත්වන්න අපහසුයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, විෂය භාර අමාත්‍යවරයා හැටියට මම යමක් කියන්න ඕනෑ. මේ වන විට ලංකා බැංකුවත්, මහජන බැංකුවක් වාර්තාගත ලාභ ලබා තිබෙනවා. අනෙක, Auditor-Generalවරයාගේ වාර්තාව අනුව කිසිම දූෂණයක් හෙළිදරව් වෙලා නැහැ. අවුරුදු තුනක් ඒ අය ඉඳලා තිබෙනවා. කාලයෙන් කාලයට අපි වෙනස් කරනවා. හැම කෙනකුටම අවුරුදු තුනයි දෙන්නේ.

අනෙක් කාරණය, පසුගිය රජය බැංකුවලට අධ්‍යක්ෂවරුන් පත් කරන කොට පත් කළේ ශාස්ත්‍රකාරයන්, කේන්ද්‍ර බලන අය. පසුගිය රජය ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන් විධියට පත් කළා, කේන්ද්‍ර බලන අය. අපි එහෙම අය දමන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, හැම අධ්‍යක්ෂවරයෙක්ම පත් කරන්නේ මහ බැංකුවේ යෝග්‍යතා පරීක්ෂණයට ලක් කරලායි. හොඳ උගත්, බුද්ධිමත්, ගණකාධිකරණය ගැන දන්නා අය තමයි පත් කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ඊළඟට ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රුපියල බාල්දු වන වේගය, මේ රටේ විදේශ විනිමය අවාසියක් බවට පරිවර්තනය වන වේගයට එකතුවෙලා තිබෙන බව ගරු රාජ්‍ය ඇමතිතුමා පිළිගැනීමක් කළේ නැහැ. ඒ ගැන බොහොම කනගාටුයි. මේ පාර්ලිමේන්තුව මුදල් පිළිබඳ ප්‍රධාන-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න. ඔබතුමා උත්තරය දුන්නා.

අපේ රුපියල දිනපතා බාල්දු වෙනවා. ඔබතුමා නැඟිටලා කියනවා, අපේ විදේශ විනිමයට කිසිම හානියක් නැහැයි කියලා. විදේශ විනිමය ආයෝජනය කරන ලද විවිධ ක්ෂේත්‍රවලින් ඒවා ආපසු ගලමින් තිබෙනවා. ඒක ඔබතුමා විතරක් නොවෙයි, ජාත්‍යන්තර මූල්‍ය ආයතන විසිනුත් ප්‍රකාශයට පත් කර තිබෙනවා. අර්බුදයක් පවතිනවා. වහන්න දෙයක් නැහැ. අපි අර්බුදය විසඳා ගන්නේ කොහොමද කියන ප්‍රශ්නයට තමයි මුහුණ දෙන්න තිබෙන්නේ ගරු කථානායකතුමනි. ඒ නිසා හදිසියේ මේ බැංකු දෙකේ හා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල වෙනස් කරන්න කියලා ජනාධිපතිතුමා කිව්වේ ඒවායේ යම්කිසි අකාර්යක්ෂමතාවක් හෝ වැරැදි දේවල් කිරීමට කටයුතු කර තිබෙනවාය කියන චෝදනාව මතයි. ඒ නිසා ඒක වහන්න එපා. ඒකට මැදිහත් වෙන්න ඕනෑ. ඒ පිළිබඳව කොමිෂන් සභාවක් හෝ පත් කරන්න. මේ බැංකු පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කොමිසමක් පත් කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපි ඒ අවස්ථාව දෙමු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකද, ගරු කථානායකතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ එවකට හිටපු මුදල් ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේ නැඟිටලා ප්‍රකාශ කළා, මහජන බැංකුව බංකොලොත් කියලා. අපේ නියෝජ්‍ය ඇමතිතුමා ඒක හොඳට දන්නවා**.** එදා විපක්ෂයේ අපි නැඟිටලා, "මහජන බැංකුව බාකොලොත්" කියන වැරැදි ප්‍රකාශය ආපසු හරවලා, මහජන බැංකුව එසේ බංකොලොත් කිරීමට ඉඩ දුන්නේ නැහැ. එවැනි අරමුණක් ඔබතුමන්ලාට තිබෙනවාය කියන සැකය බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා ඒ පිළිබඳව මැදිහත් වන්න නව අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන්නේ කොහොමද**?**

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, කරුණාකරලා ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න මට සහාය දෙන්න. මේ සම්බන්ධව විවාදයකට යන්න බැහැ. දැන් ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය ඇසුවා. ගරු රාජ්‍ය ඇමතිතුමා පැහැදිලි කිරීමක් කළා. ඒ නිසා අපි ඊළඟට තිබෙන කටයුතුවලට යොමු වෙමු.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග අනුව මේ සම්බන්ධව විවාද කරන්න බැහැ, ආචාර්යතුමනි. මේ සම්බන්ධව වෙනම අහන්න. විවාදයකට යෑමට වෙනම අවස්ථාවක් දෙන්නම්, කථා කරලා. [බාධා කිරීම්] මෙතුමා ඇසුවොත්, [බාධා කිරීම්] - මෙතැන වාද කරන්න බැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, මෙතැන විවාදයක් නැහැ. මම මේකට උත්තර දීලා වාඩි වෙන්නම්. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය මම දෙකට කඩන්නම්. ඒ අනුව පළමුවැනි ප්‍රශ්නය තමයි, රුපියල මත තිබෙන පීඩනය සහ අපේ විදේශ විනිමය පිළිබඳව තිබෙන ප්‍රශ්නය. දෙවැනි ප්‍රශ්නය තමයි, මහජන

බැංකුවේ සහ ලංකා බැංකුවේ යම් කිසි විධියකට අක්‍රමිකතා සිද්ධ වෙලා තිබෙනවාද කියන එක. මේ දෙක, දෙකක්. මේ දෙක පටලවා ගන්න එපා, පටලවා ගන්න බැහැ.

පළමුවැනි ප්‍රශ්නයට උත්තරය, "ඔව්, අපි ඒක පිළිගන්නවා" කියන එකයි. රුපියලට පීඩනයක් තිබෙනවා. ඒක "නැහැ" කියන්න මෙතැනදී අපට කිසිම අවශ්‍යතාවක් නැහැ. රුපියල යම් කිසි විධියකට අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඒ හරහා අපිට විතරක් නොවෙයි, "Emerging Markets" කියන කලාපයටම යම් කිසි අභියෝගතාවලට මුහුණ පාන්න සිද්ධ වෙලා තිබෙනවා. නමුත් අපි ඒක පිළිගන්නා ගමන් -

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවඞ්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
පොඩ්ඩක් ඉන්න, ගරු විමල් මන්ත්‍රීතුමනි. අපි ඒක පිළිගන්නා ගමන්, අපේ සම්පූර්ණ උත්සාහය යොදනවා, මේ අභියෝගයට මුහුණ දෙන්න. මේ අභියෝගයට මුහුණ දෙන්න ක්‍රමවේද කිහිපයක් තිබෙනවා.

අපි වහාම කෙටි කාලීනව -short term- මේකට මුහුණ දෙන්නේ කොහොමද? එතැනදී අපිට එක්කෝ උත්සාහ කරන්න පුළුවන්, අපේ තිබෙන සංචිත වෙළෙඳ පොළට මුදා හැරලා ඒ මඟින් රුපියලට තිබෙන ඉල්ලුම සැපයුම හරහා සමතුලිත කරලා, රුපියලේ අගය යම් කිසි ප්‍රමාණයකට සමතුලිතව තබා ගන්න පුළුවන්ද කියලා බලන්න. නමුත් අපි දැකලා තිබෙනවා, 2011-2012 කාලයේදී අපේ සංචිතවලින් සියයට 40කට වඩා මේ විධියට මුදා හැරිය බව. එතැනදී ඇමෙරිකානු ඩොලර් මිලියන 4,300ක් පමණ මුදා හැරියා. එවකට අපිට තිබුණේත් ඩොලර් මිලියන 8,000ක් විතර. ඒකෙන් මිලියන 4,300ක් විතර මුදා හැරියා. අවසානයේදී රුපියල සියයට 14.3කින් අවප්‍රමාණය වුණා, 2011-2012 කාලයේදී. ඊට පසුව 2015දී [බාධා කිරීම්] මේ ප්‍රශ්නයම නැවත සිද්ධ වුණා. ඒ අවස්ථාවේදී මහ බැංකුව විසින් සංචිතයෙන් ඩොලර් මිලියන 3,000ක් පමණ මුදා හැරලාත් රුපියල සියයට 10කින් විතර අවප්‍රමාණය වුණා. [බාධා කිරීම්] නමුත් මේ අවස්ථාවේදී එහෙම මුදා හැරීමක් සිද්ධ වෙලා නැහැ. ඒ අනවශ්‍ය උච්චාවචනය මග හැරීම සඳහා මහ බැංකුව විසින් ඩොලර් මිලියන 350ක විතර ප්‍රමාණයක් මුදා හැරලා තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. ඩොලර් මිලියන 350ක විතර ප්‍රමාණයක් මුදා හැරලා තිබෙනවා. Undue volatility නවත්වන්නයි එහෙම කරලා තිබෙන්නේ. එහෙම නැතුව රුපියල බලෙන් අල්ලා ගන්න නොවෙයි. මොකද, අපට ඒකට හැකියාවක් නැහැ. ඒ නිසා තමයි එහෙම කළේ. [බාධා කිරීම්] නමුත් මධ්‍ය කාලීනව අපට අවශ්‍ය වෙන්නේ අපේ ආයෝජන ප්‍රමාණය වැඩි කර ගැනීම, ගලා ගෙන එන අපනයන ආදායම් ප්‍රමාණය වැඩි කර ගැනීම සහ විදේශ සංචාරකයන්ගෙන් එන ආදායම් ප්‍රමාණය වැඩි කර ගැනීමයි.

අද වනකොට විදේශ සංචාරකයාට හොඳම තැන ලංකාවයි කියා "Lonely Planet" සඟරාවෙන් අපට පළමුවන ස්ථානය ලැබී තිබෙනවා. ඊළඟ මාස දෙකේ, තුනේ තමයි වැඩිපුරම සංචාරකයන් එන්නේ. ඒ හරහා අපට ඒ මුදලුත් ලැබෙනවා. Panda Bond එකත් තිබෙනවා, Samurai Bond එකත් තිබෙනවා. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මැතිතුමා විසින් මේ සම්බන්ධයෙන් ක්‍රියා කරගෙන යනවා. අභියෝගයක් තිබෙනවාය කියලා අපි පිළිගන්නවා, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි. අභියෝගයක් "නැහැ"යි කියලා අපි කියන්නේ නැහැ. අපි ඒ අභියෝගයට මුහුණ දෙනවා. ඒ අභියෝගයට මුහුණ දීලා ඒ අභියෝගය ජය ගන්නවාය කියන එකත් මම කියන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අද දවස පුරාම මුදල් සම්බන්ධයෙනුයි කථා කරන්නේ. නැඟිටලා සිටි මන්ත්‍රීවරුන්ටත් අවස්ථාව ඒ වෙලාවට දෙන්නම්; ඒ අවස්ථාවේදී පැහැදිලි කරන්න. ගරු මන්ත්‍රීවරුනි, ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න කරුණාකරලා ඔබතුමන්ලා මට සහාය දෙන්න. [බාධා කිරීම්] ඔබතුමන්ලාට කථා කරන්න අවස්ථාව ලැබෙනවා. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ නමත් කථික ලැයිස්තුවේ තිබෙනවා. ඔබතුමා ඒ වෙලාවට කථා කරන්න. ස්ථාවර නියෝග අනුව දැන් ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීම්] ස්ථාවර නියෝග කියවා බලන්න. You can debate during the day. -[*Interruption].* When you speak, you mention it. Please help me to conduct the House.

ඊළඟට ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, අද දවස පුරාම ඔබතුමාට අවස්ථාව ලැබෙනවා. අද වටිනා Debate එකක් තිබෙන්නේ. ස්ථාවර නියෝග අනුව දැන් ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ. මා දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට අවස්ථාව දුන්නා. [බාධා කිරීම්] ස්ථාවර නියෝග කියවා බලා කථා කරන්න.

දැන් ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ශ්‍රී මුඛය ටිකක් ප්‍රවේශම් කර ගන්න. [බාධා කිරීම්] ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා කථා කරන්න.

## II

## විදුලි බිල්පත් නිකුත් කිරීමේදී සිදුවන ප්‍රමාදය
## மின் கட்டணச் சிட்டைகளை வழங்குவதிலுள்ள தாமதம்
## DELAY IN ISSUANCE OF ELECTRICITY BILLS

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
கௌரவ சபாநாயகர் அவர்களே, மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர் கௌரவ ரஞ்ஜித் சியம்பலாப் பிடிய அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்தமைக்கு நன்றி!

யாழ்ப்பாணம், தென்மராட்சிப் பகுதியிலுள்ள தென் மட்டுவில், கைதடி, நுணாவில், நுணாவில் மேற்கு போன்ற கிராம சேவையாளர் பிரிவுகளைச் சேர்ந்த மின் பாவனையாளர் களுக்குக் கடந்த ஜூன் மாதம் மின் பாவனைக் கட்டணச் சிட்டைகள் வழங்கப்பட்டதன் பின்னர், ஒக்டோபர் மாதம் வரையில் வழங்கப்படவில்லை என்றும், இத்தகைய நிலையில் அண்மையில் மின் பாவனைக் கட்டண நிலுவையைச் செலுத்தாவிடில் மின்னிணைப்புத் துண்டிக்கப்படுமெனக் குறிப்பிட்டு, இறுதி அறிவித்தல் வழங்கப்பட்டுள்ளதாகவும் அம்மக்கள் தெரிவிக்கின்றனர்.

இதேநேரம் கிளிநொச்சி, பரந்தன் பகுதியில் பல மாதங்களாக மின் பாவனைக் கட்டணச் சிட்டைகள் பாவனையாளர்களுக்கு வழங்கப்படாதிருந்து எவ்விதமான முன்னறிவித்தலும் இன்றி, கடந்த 11ஆம் திகதி மின் விநியோகம் துண்டிக்கப்பட்டதால், அம்மக்கள் பாரிய பாதிப்புக்களுக்கு முகங்கொடுத்துள்ளதாகத் தெரிவிக்கின்றனர். குறிப்பாக, பரீட்சைக்குத் தோற்றிவருகின்ற பாடசாலை மாணவர்கள், குழாய்க் கிணறுகள் மூலமாக நீரைப் பெறுவோர், கடுமையான நோயாளிகள் போன்றோர் பாரிய பாதிப்புகளை எதிர்நோக்கி இருப்பதாகத் தெரிவிக்கின்றனர். இவ்வாறு மின் பாவனைக் கட்டணச் சிட்டைகள் வழங்குவதில் ஏற்படுகின்ற பல மாத காலத் தாமத நிலைமையானது இன்று நேற்றல்ல, கடந்த சில வருடங்களாகவே வடக்கு மாகாணத்தில் பல பகுதிகளிலும் காணப்படுகின்றன.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

மேற்படி, விடயம் தொடர்பில் எனது பின்வரும் கேள்விகளுக்கான பதில்களையும், எடுக்கப்படக்கூடிய நடவடிக்கைகள் தொடர்பிலான விளக்கங்களையும் கௌரவ அமைச்சர் அவர்கள் வழங்குவாரென எதிர்பார்க்கின்றேன்.

01. வடக்கு மாகாணத்தில் பல்வேறு பகுதிகளில் மின் பாவனையாளர்களுக்கு மின் கட்டணச் சிட்டைகளை மாதாந்தம் விநியோகிப்பதில் தொடர்ந்து ஏற்பட்டு வருகின்ற தாமதங்களுக்கான காரணம் என்ன?

02. வாழ்வாதார ரீதியில் மிகவும் பாதிக்கப்பட்டுள்ள வடக்கு மாகாண மக்களுக்கு மாதாமாதம் ஒழுங்கு ரீதியில் மின் கட்டணச் சிட்டைகள் வழங்கப்படாமல், பல மாதக் கட்டணச் சிட்டைகளை ஒரே தடவையில் வழங்கி, அத்தொகையினைச் செலுத்தாதவிடத்து மின் விநியோகம் துண்டிக்கப்படுமென இறுதி அறிவித்தல் வழங்குவதிலும், மின் விநியோகத்தைத் துண்டிப் பதிலும் நியாயம் இல்லை என்பதால், மேற்படி மின் பாவனையாளர்களது நிலுவையைத் தவணை அடிப் படையில் அறவிடுவதற்கும், மின் விநியோகத் துண்டிப்பினை மேற்கொள்ளாதிருப்பதற்கும், மின் விநியோகம் துண்டிக்கப்பட்டவர்களுக்கு, அதன் அடிப் படையில் மீள் மின் விநியோகத்தினை வழங்குவதற் கும் நடவடிக்கை எடுக்க முடியுமா?

03. மின் சிட்டைகளை வழங்குவதற்கோ அல்லது மின் மானி வாசிப்பிற்கோ ஆளணிப் பற்றாக்குறை இருப்பின், வடக்கு மாகாணத்தில் வேலைவாய்ப்புக் களின்றி ஆயிரக்கணக்கானோர் இருக்கின்ற நிலை யில், அவர்களிடமிருந்து மேற்படி ஆளணியினைப் பூர்த்திசெய்துகொள்வதற்கு நடவடிக்கை எடுக்கப் பட்டிருக்கின்றதா?

04. வடக்கு மாகாணத்தைச் சாராத வேறு மாகாணங் களிலிருந்து வடக்கின் மின்சார சபைகளுக்கான ஆளணிகள் நிரப்பப்பட்டுள்ளனவா?

05. ஆமெனில், மாவட்ட ரீதியில் அவ்வாறு இணைக்கப் பட்டுள்ளவர்களது எண்ணிக்கை யாது? அதற்கான காரணங்கள் என்ன?

## වරප්‍රසාද : 2018.10.25වැනි දි "ද අයිලන්ඩ්" පුවත් පත් වාර්තාව

## சிறப்புரிமை : 2018.10.25 ஆம் திகதிய "த ஐலன்ட்" பத்திரிகை அறிக்கை

## PRIVILEGE: "THE ISLAND" REPORT OF 25.10.2018

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Hon. Speaker, for permitting me to raise this Question of Privilege.

As this House is aware, on 20th February, 2018, when the adjourned Adjournment Debate on the Reports of the Bond Commission and the PRECIFAC was about to be resumed, I raised a point of Order to the effect that the PRECIFAC Report was available only in the Sinhala language. Previously at a Party Leaders' Meeting, when the said Debate was fixed for the 06th of February, I stated the position of the ITAK, that the said Debate should be held early, but if that was held any time before the 10th of February, we would not be in a position to participate in it. There was also a previous agreement amongst the Party Leaders that this Debate could start with only the English version of the PRECIFAC Report and that the Sinhala and the Tamil versions could be provided later. It is in that context, Sir, that I raised the issue that the PRECIFAC Report was only in Sinhala, because the Party Leaders had decided that both Reports could be only in English.

"The Island" newspaper of today, 25th October, 2018, in a news report titled "Public still waiting for Bond Commission report debate", quotes the Hon. (Dr.) Bandula Gunawardane as having said that I sabotaged the Debate on the Bond Commission Report by asking for Tamil and Sinhala translations. Sir, I am **tabling*** that newspaper report.

That newspaper report is not true and not true to the knowledge of the Hon. (Dr.) Bandula Gunawardane, if he, in fact, had said that as reported today.

Although I have a right to demand that the two Reports be made available in Tamil, I did not, in fact, do so, as will be revealed from the Hansard of 20th February, 2018. I only referred to the fact that the Party Leaders had agreed to debate the Reports so long as those were in English, but that the PRECIFAC Report was available only in Sinhala. It has also been brought to my notice that in several broadcasts over the last several months, the MTV channels - MTV, Sirasa and Shakthi - have consistently carried out the same untrue propaganda against me.

I consider all of that as breaches of my Privilege as a Member of Parliament and I respectfully urge the Hon. Speaker to take action accordingly against, one, the Hon. (Dr.) Bandula Gunawardane, two, "The Island' newspaper and three, the MTV Television Network. The newspaper report I tabled today quotes the Hon. (Dr.) Bandula Gunawardane as having said, I quote:

> "Gunawardena said that in early Feb this year an adjournment debate on the treasury bond scam report was sabotaged by Tamil National Alliance (TNA) Jaffna District MP and party spokesman M.A. Sumanthiran. The TNA took up the position that it would be unfair to go ahead with the debate in absence of the Sinhala and Tamil translations of the report."

I never asked for Tamil or Sinhala translations. As I said earlier, I only asked that in accordance with the Party Leaders' decision, that the PRECIFAC Report, not even the Bond Commission Report, must be available in English.

Therefore, I urge the Hon. Speaker to take appropriate action.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. (Dr.) Bandula Gunawardane, your name has been mentioned. So, you have the Floor.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරපු නිසා මට මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. අපේ පාර්ලිමේන්තුවේ කටයුතුවලදීත් මේ රටේත් දැවැන්තම ආන්දෝලනාත්මක සිද්ධිය බවට පත් වුණේ මහ දවල් මහ බැංකුවේ සිද්ධ වුණු මහා මුදල් මංකොල්ලයයි කියන එක ඔබතුමා පිළිගන්නවා ඇති. ඒ පිළිබඳව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පත් කළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීමේ සහ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිසමේ වාර්තාව පැමිණීමේදී මේ සභාවේ විවිධ වාද-විවාද ඇති වුණා. ඔබතුමාගේ හා පක්ෂ නායකවරුන්ගේ එකඟත්වය ඇතිව ඒ විවාදය මේ සභාවේ ආරම්භ වුණා. ඒ විවාදයේදී රට දැන නොසිටි බොහෝ කරුණු හෙළිදරව් වෙන කොට අපේ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ඒ පිළිබඳ මතු කළ ස්ථාවර නියෝගය ඔබතුමා පිළිගැනීමෙන් තමයි ඒ විවාදය නතර වුණේ. ඒකයි සත්‍යය. ඒ සම්බන්ධව මගේ අදහස, මගේ හැඟීම මෙයයි. අපට විපක්ෂයේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩි වුණාට, අපට විපක්ෂයේ භූමිකාව කරන්න සිදු වෙලා තිබෙන්නේ අනේකවිධ දුෂ්කරතා මැද්දේයි. අපට එහෙම අවස්ථාවක් නැහැ. එතකොට එතුමාගේ යුතුකම හා වගකීම තිබුණේ විපක්ෂ නායකතුමා හරහා මේ පරිවර්තන ඉතාම ඉක්මනින් ලබා ගන්න එකයි. එහෙම දෙනවා කිව්වාට අද වෙන කල් ඒක ලැබිලා නැහැ.

දෙවැනි කරුණ වන්නේ මෙයයි. මේ රට සම්පූර්ණයෙන්ම දැවැන්ත පාවාදීමකට යටත් කරලා අත්සන් කරපු සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම -පිටු එක්දහස් ගණනක ගිවිසුම- පිළිබඳ විවාදය පැවැත්වුණා. ඒ ගිවිසුම සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන් පමණයි තිබෙන්නේ. අද වෙන කල් එහි සිංහල හෝ දෙමළ පරිවර්තනයක් දෙන්න බැරි වුණා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා, සිංහල හා දෙමළ භාෂාවලින් මේ සියල්ල ඉදිරිපත් කළ යුතුයි කියලා. මේ, බ්‍රිතාන්‍ය යටත් විජිත යුගය නොවෙයි. ඔබතුමා මේ ගරු සභාවට ඉදිරිපත් වෙන ලියකියවිලි යනාදිය පිළිබඳව මීට වඩා සාධාරණ, නිවැරදි ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා නම්, මෙතුමාට මට මේ චෝදනාව නහන්න අවශ්‍ය වෙන්නේ නැහැ. හිතා මතා, චුවමනාවෙන්ම මේ බැඳුම්කර සිද්ධිය -ලංකාවේ තිබුණු විශාලතම හොරකම- යට ගහන්න හදන උත්සාහය අපි කවුරුත් එකතු වෙලා පරාජය කළ යුතු වෙනවා. එතුමාගේ ඉල්ලීම අනුව ඔබතුමා දැන් වහාම ඉෂ්ට කළ යුතු යුතුකම් දෙකක් තිබෙනවා. පළමු වැනි එක තමයි, බැඳුම්කර කොමිසමේ වාර්තාව සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කරලා, නතර කරලා තිබෙන විවාදය වහා පටන් ගැනීම. දෙවැනි එක තමයි, සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳව නීති විරෝධී ආකාරයට කරගෙන යන මේ වැඩ පිළිවෙළ නවත්වන්න කටයුතු කිරීම. සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම වාගේ නිදහස් වෙළෙඳ ගිවිසුම් ගහලා මේ රට විවෘත වුණොත් වක්කඩ කැඩුවා වාගේ වෙලා ඩොලරය රුපියල් දෙසීය නොවෙයි, රුපියල් තුන්සියයට යයි. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ආචාර්ය ගුණවර්ධන මැතිතුමනි. අද අපි පක්ෂ නායක රැස්වීමේදී මේ ගැන කථා කරන්නම්.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Sumanthiran, do you want to respond?

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Yes, with regard to just one matter, Sir, with respect. The Hon. (Dr.) Bandula Gunawardane is again misrepresenting what I said. He says that I request to give the translations in Tamil and Sinhala. No, I did not request for translations in Tamil and Sinhala. That is the point I am making. I said we were prepared to debate it while it was in English. That was the Party Leaders' decision. Even on that day, I did not ask - although it is my right to ask - for it in Tamil and Sinhala. I asked for the PRECIFAC Report, not for the Bond Commission Report, to be in English. I asked for the PRECIFAC Report to be in English because that was the Party Leaders' decision. Now, again when the Hon. (Dr.) Bandula Gunawardane speaks, he says, "The Hon. Sumanthiran says that it has to be in Sinhala and Tamil." I did not ask for it in Sinhala and Tamil. That is untruth.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, we will discuss that.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයට විවාදය කල් දමන්න ඕනෑ වුණා නම් සිංහල පරිවර්තනය නැහැ කියලා කල් දමන්න තිබුණා. නමුත් විවාදයක් අවශ්‍ය නිසා ඉංග්‍රීසි පරිවර්තනය මත විවාදය කළ යුතුයි කියලා දෙගොල්ලම පිළිගත්තා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මැතිතුමාගේ නම සඳහන් වුණු නිසා ඔබතුමාටත් කථා කරන්න අවස්ථාව දෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේක වැදගත්ම දෙයක්. මේක මට අදාළයි. මාධ්‍ය තුළින් මා තමයි මේ ප්‍රශ්නයට මුල් කරගෙන තිබෙන්නේ. මම අහන්නේ මේකයි. ඒ විවාදය යම් තැනක නැවතුණා. ඒ විවාදය එක්කෙනෙක් දෙන්නෙක් ඉලක්ක කරගෙන තමයි නැවතිලා තිබෙන්නේ. නමුත් ඊට වැඩිය හුඟදෙනෙක් මේ තුළ ඉන්නවා. ඇයි ඒ විවාදය ගෙනැල්ලා නැත්තේ කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මැතිතුමනි, අපි අද මේ ගැන සාකච්ඡා කරමු.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලුවා, "උසාවියෙන් ලැබෙන තීන්දුව සම්පූර්ණයෙන් ඉදිරිපත් කරන්න, කොටසක් විතරක් ඉදිරිපත් කරන්න එපා." කියලා. ඔබතුමා කිව්වා, "කොටසක් දුන්නාට කමක් නැහැ කියලා නීතිපති කිව්වා." කියලා. එතකොට අපට මොන සාධාරණයක්ද? මම ඒ කාලයේ මුදල් ඇමතිත් නොවෙයි; විෂය භාර ඇමතිත් නොවෙයි. මහ බැංකුව කියන කොටස මට අයිති වෙලා තිබුණේත් නැහැ. නමුත් මේ සිද්ධිය මුල්කොට ගෙන අද වනතුරු හිරිහැර කිරීම විතරයි කරන්නේ. ඇයි ඒ විවාදය කරන්නේ නැත්තේ ඇයි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, නීතිපතිතුමා කිව්වේ තව පරීක්ෂණ තිබෙන නිසා සමහර ඒවා-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක පාක්ෂිකව අපේ චරිතය ඝාතනය කරන්න හදනවා නම්, ඒක නවත්වන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ගැන අපි අද සාකච්ඡා කරමු.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ වාගේම ගරු කථානායකතුමනි, -

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
What I raised was a Question of Privilege. The other issues are -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
He was an affected party. That is why I allowed him.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
The other issues are sidetracking issues. What I raised was a Question of Privilege that false allegations are being made about what I said in the House and I want you to take action on that.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, let me work according to the Standing Orders.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, it is the same privilege that I am looking for.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, I know. Your name was mentioned and that is why I allowed you.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
When the non-actors' characters are being assassinated, I want to know as to why no action has been taken to stop that.

And also, Sir, I want to mention that there is a serious infringement on my security. Today morning, at 9.30a.m., D.M.M. Lahiru who is apparently working for Swarnavahini and ITN, without any permission, has used a drone which has gone over my house and recorded. For our luck, my private security personnel, which is more effective - I do not keep any MSD personnel at all - have captured that man. He has said that it is for ITN or something and has given false excuses. So, I would like to know whether there has been permission given in this high security area for a person to record. The recordings are in my hand. They are basically saying that this is an attempt of the ITN.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I will check on that.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, -[බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට කමක් නැහැ, කවුරු වුණත්. මේ අවස්ථාවේදී චරිත ඝාතන කිරීමේ attempt එකක් තිබෙනවාය කියා පෙනෙනවා. මම නමින් කියන්නම්. ඩී. එම්.එම්. ලහිරු; National Identity Card No. 873411600v. ඔහු කියනවා ඔහුට dronesවලට certificate එකක් දීලා තිබෙනවා කියලා. ආරක්ෂාව සහිතව තිබෙන මේ පාර්ලිමේන්තුව අවට ප්‍රදේශයට ඔබතුමන්ලා එවැන්නක් දීලා තිබෙනවාද? එසේ දීලා තිබෙනවා නම් මොකක් සම්බන්ධයෙන්ද? ඒකට මගේ ගෙදර අදාළ කරගෙන තිබෙන්නේ ඇයි? මේ සම්බන්ධයෙන් වහාම දැනුවත් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මවිසින් එවැනි අවසරයක් දීලා නැහැ. මම අද පොලීසියටත් කියලා හොයා බලා ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
හැබැයි, ගරු කථානායකතුමනි, ඔබතුමා පොලීසියට කිව්වාට මෙලෝ දෙයක් වෙන්නේ නැහැ. මාස නවයකට ඉස්සෙල්ලාත් UDA එකෙන් මෙහෙම දෙයක් වෙලා තිබුණා. මේ වනතුරු මෙලෝ දෙයක් වෙලා නැහැ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ, නැහැ. මේ සම්බන්ධයෙන් හොයා බලන්නම්. කවුරු හෝ හොයා බලන්න එපායැ?

**ගරු රවි කරුණානායක මහතා**
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඒ ගොල්ලන් තවමත් මගේ ගෙදර ඉන්නවා, equipment තියාගෙන. මොන වාගේ දෙයක්ද වෙන්නේ? එක පැත්තකින් CID එක. අනෙක් පැත්තෙන් FCID එක. තවත් පැත්තකින් Bribery Commission එක. මේ රටේ පරිපාලනමය වශයෙන් වෙන්නේ මොනවාද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට විතරද?

**ගරු රවි කරුණානායක මහතා**
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
නැත්නම්? වෙන කවුද ඉන්නේ?

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, මොකක්ද, point of Order එක?

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක හිටපු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරන කාරණය ඉතා බරපතළයි.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්. ඒක මම තේරුම් අරගෙනයි ඉන්නේ. ඒ ගැන දැනටමත් instruct කළා මගේ ආරක්ෂක අංශයට.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
මට මේ කාරණය කියන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කියන්න, කියන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
එතුමාගේ නිවස ආණ්ඩුවේම යම්කිසි කෙනකුගේ බලපෑම මත වීඩියෝගත කිරීමක් වෙනවා නම් එතැන තිබෙනවා විශාල ප්‍රශ්නයක්. සමහර වෙලාවට මේක දිට්ඨධම්ම වේදනීය කර්මය වෙන්න පුළුවන්. මම අහන්නේ මේකයි. දැන් එතුමා කියන විධියට බැඳුම්කර කොමිෂන් සභා වාර්තාවේ තෝරාගත් කොටස් පමණක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා හංගා ගත්තු කොටස් ටික තවමත් එළියට දමන්නේ නැත්තේ ඇයි? ඒ හංගා ගත්තු කොටස් ටිකත් ඇතුළුව මුළු වාර්තාව මේ සභාවේ සාකච්ඡාවට බඳුන් නොවන්නේ ඇයි?

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන අපි පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී කථා කළා. මොකද, සමහර කරුණු ගැන පරීක්ෂණ කරන්න බාධා වන හින්දා Attorney-General අපට නියෝග කළා, ඒවා එළියට දමන්න එපා කියලා. ඒකයි හේතුව. වෙන හේතුවක් නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඒක යකාගේ කථාවක්නේ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
යකාගේද කාගේද කියන්න මම දන්නේ නැහැ. අපි උපදෙස් පිටයි වැඩ කරන්නේ. [බාධා කිරීම්] I take your point. [බාධා කිරීමක්] පරීක්ෂණවලට බාධා කරන්න ඉඩ දෙන්න බැහැ. මම නැවත ඒ ගැන සාකච්ඡා කරනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
පාර්ලිමේන්තුවට නියෝග කරන්න එතුමාට බැහැ. පාර්ලිමේන්තුව තිබෙන්න ඕනෑ - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නියෝගයක් නොවෙයි, ඉල්ලීමක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ඔය කියන විධියට පාර්ලිමේන්තුවක් කියලා දෙයක් තියෙන්න ඕනෑ නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පරීක්ෂණ කරනවා නම් ඒ පරීක්ෂණවලට බාධාවන ඉල්ලීම්වලට අපට ඉඩ දෙන්න බැහැ නේ. අපි අද ඒ ගැන සාකච්ඡා කරනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාට කථානායක හැටියට යම් බලයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. කථානායක වුණාට ඒකාධිපතියෙක් වාගේ හැසිරෙන්න බැහැ. [බාධා කිරීම්] රටේ නීතිවලට ගරු කරන්න ඕනෑ. [බාධා කිරීම්] හොඳයි. දැන් වාඩි වෙන්න. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමා කියන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, කරුණාකරලා ඔබතුමා මා කියපු දේ ගැන සොයා බලා කටයුතු කරනවා නම් සතුටුයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි මම හොයලා බලන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකද, තවම ඒ අය ගෙදර සිටිනවා equipment එක්ක. CID එකෙන් අපට හිරිහැර කරනවා වාගේම, කවුද මේ පසුපස සිටින්නේ කියලා අද හැන්දෑව වන විට කියන්න පුළුවන් නම් හොඳයි කියලා ඔබතුමාගෙන් බැගෑපත්ව ඉල්ලනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම හොයලා බලන්නම්. මම කිසිම විධියකින් ඒ කරුණ යටපත් කරන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඔබතුමාගෙන් ඉල්ලනවා, අඩු තරමින් ශිලාචාර බව ගැන අපේ පාර්ලිමේන්තුවට කියලා දෙන්න කියලා.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ණය සහනදායක (සංශෝධන) පනත් කෙටුම්පත
### கடன் இணக்கம் (திருத்தம்) சட்டமூலம்
### DEBT CONCILIATION (AMENDMENT) BILL

"(81 වන අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනත සංශෝධන කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා විසිනි.***

***2018 නොවැම්බර් 05වන සඳුදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர் சார்பில் மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2018 நவம்பர் 05, திங்கட்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Lakshman Kiriella on behalf of the Minister of Justice and Prison Reforms; to be read a Second time upon Monday, 05th November, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That November 07th Wednesday, 08th Thursday, 09th Friday, 10th Saturday, 12th Monday, 13th Tuesday and 14th Wednesday 2018 be allotted days for consideration of the "Appropriation Bill (2019)".

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

### I

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 75(2) of the Parliament, the hours of Sittings of Parliament on allotted days for consideration of the "Appropriation Bill (2019)" on 07th Wednesday, 08th Thursday, 09th Friday, 10th Saturday, 12th Monday and 13th Tuesday November, 2018 shall be 9.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 7.30 p.m.:

Provided that at 7.00 p.m. paragraphs (5) and (6) of the Standing Order No. 8 of the Parliament shall operate."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That notwithstanding the provisions of Standing Order No. 75(2) of the Parliament, the hours of Sittings of Parliament on 14th Wednesday, November, 2018 allotted for consideration of the "Appropriation Bill (2019)" shall be 9.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 5.00 p.m.. At 5.00 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That notwithstanding the provisions of Standing Order No. 8 of the Parliament and the motion agreed to by Parliament on 20.06.2018, the hours of Sittings of Parliament of this day shall be 10.00 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 7.30 p.m.. At 5.30 p.m. Standing Order No. 8(5) of the Parliament shall operate. At 7.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා කටයුතු.

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ලෙස සඳහන්ව ඇති මුදල් පනත් කෙටුම්පත 2018 සැප්තැම්බර් මස 4 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, 2018 සැප්තැම්බර් 18 වන දින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සලකා බලා ඒ සම්බන්ධව එකී කාරක සභාවේ වාර්තාව 2018 සැප්තැම්බර් 20 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බවත්, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සිට 4 දක්වා ඇති නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියම තුන 2018 සැප්තැම්බර් 21 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, 2018 ඔක්තෝබර් 22 වන දින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සලකා බලා ඒ සම්බන්ධව වූ එකී කාරක සභාවේ වාර්තාව 2018 ඔක්තෝබර් මස 25 වෙනි දින -එනම් අද දින- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බවත් මෙම ගරු සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

# මුදල් පනත් කෙටුම්පත
## நிதிச் சட்டமூலம்
## FINANCE BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Bill be now read a Second time."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා.

[පූ.භා.11.06]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ගරු කථානායකතුමනි, අද අපි මුදල් පනත් කෙටුම්පත දෙවන වර කියවීම සහ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් 3ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගර සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELAVM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, please continue with your speech.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඉන් පළමු වන එක තමයි, රජයේ නිලධාරීන් සඳහා වූ වාහන බලපත්‍ර ක්‍රමය අනුව වාහනයක් මත වන නිෂ්පාදන බදු නිදහස් කිරීමේ උපරිම සීමාව අඩු කිරීම. මෙය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ මැයි 21වැනි දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් අනුව ඉදිරිපත් කරනවා. වාහන බලපත්‍රයේ සහනදායී අනුපාතය මත වාහනයක් මත ගෙවිය යුතු නිෂ්පාදන බදු, උපරිම බදු නිදහස් සීමාව මිලියන 5 සිට මිලියන 3.6කට අඩු කර තිබෙනවා.

දෙවනුව, භූමිතෙල් මත නිෂ්පාදන බදු පැනවීම. මේක 2018 මැයි 10වැනි දින ක්‍රියාත්මක වන පරිදි පිරිවැය පිළිබිඹු කෙරෙන සූත්‍රය මත පදනම් වූ ඉන්ධන මිල ක්‍රමය හඳුන්වා දුන් අවස්ථාවේදී භූමිතෙල්වල මිල වැඩි වීමත් සමඟම පොදු සහනාධාර ක්‍රමයක් තුළ අනවශ්‍ය ප්‍රතිලාභ අවම කිරීමෙන් කුඩා පරිමාණ ධීවර බෝට්ටු අයිතිකරුවන්ටත්, විදුලි බලය සඳහා පිවිසුම් නොමැති සමෘද්ධිලාභීන් හා වැවිලිකරුවන් සඳහාත් 2018 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉලක්කගත භූමිතෙල් සහනාධාර ක්‍රමයක් අපි ස්ථාපිත කළා. ඒකත් අපි මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒක වැඩි කරන ගමන්, ඒ හේතුවෙන් යෝජිත භූමිතෙල් සහනාධාර ක්‍රමයේ **මූල්‍යනය** සඳහා ආදායම් එකතු කිරීමේ අදහසින් ලීටරයකට රුපියල් 7ක නිෂ්පාදන බද්දක් පැනවීමට රජය තීරණය කළා. ඒ වාගේම භූමිතෙල් නිෂ්පාදන බද්ද ඉවත් කළා. ඉලක්කගත භූමිතෙල් සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පෙර සැමට පොදු භූමිතෙල් සහනාධාර ක්‍රමයක් නැවත හඳුන්වා දෙන ලෙස මහ ජනයා විසින් රජයට ඉල්ලීම් ඉදිරිපත් කළා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද 2018 ජුනි 11වන දින දරන අමාත්‍ය මණ්ඩල සන්දේශය අනුව අමාත්‍ය මණ්ඩලය විසින් භූමිතෙල් සිල්ලර විකුණුම් මිල ලීටරයකට රුපියල් 101 සිට රුපියල් 70 දක්වා අඩු කිරීමට තීරණය කළා. ඒ අඩු කිරීම නිසා වන අලාභය අවම කිරීමේ අදහසින් 2018 ජුනි මස 14වන දින සිට ක්‍රියාත්මක වන පරිදි භූමිතෙල් විකිණීම මත පනවන ලද ලීටරයක් රුපියල් 7ක් දක්වා වූ නිෂ්පාදන බද්ද ඉවත් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන අනුව ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර ඇති ඉහත නියමයන් තුන පාර්ලිමේන්තුවේ අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18වන දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි මුදල් පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ දී මෙම කෙටුම්පතට ඇතුළත් වී තිබෙන ප්‍රධාන කරුණු ගැන මම බොහොම කෙටියෙන් විස්තර කරන්නම්. 2016, 2017 සහ 2018 වාර්ෂික අය වැය මඟින් යෝජිත පරිදි නව බදු පැනවීම් පිණිස ඇතැම් බදු සංශෝධනය කිරීම සඳහා 2018 මුදල් පනත මඟින් විධිවිධාන සලසා තිබෙනවා. සංචාරක සංවර්ධන බද්ද - Tourism Development Levy - සංශෝධනය මඟින් වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 12ක් නො ඉක්මවන හෝ කාර්තුවකට රුපියල් මිලියන 3ක් නො ඉක්මවන පිරිවැටුමක් සහිත යම් ආයතනයකින් එකී ආයතනයේ අදාළ පිරිවැටුම මත සියයට 0.5ක සංචාරක සංවර්ධන බද්දක් පනවනු ලැබේ. එතෙක් මෙවැනි ආයතන සංචාරක සංවර්ධන බද්දට යටත් වෙලා තිබුණේ නැහැ. ඒ වාගේම, මාර්ගගත සංචාරක නියෝජිතවරුන්ගෙන් අය කරගනු ලබන සංචාරක සංවර්ධන බද්ද සහ සියයට 0.5ක අනුපාතිකයක් යටතේ අය කරනු ලබන සංචාරක සංවර්ධන බද්ද ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කෙරේ. දෙවැන්න, කොටස් ගනුදෙනු බද්ද - Share Transaction Levy - ගැනයි. 2016 අය වැය යෝජනාව අනුව ජනවාරි මාසයේ 01වන දා සිට මාර්තු මාසයේ 31වන දා දක්වා කොටස් ගනුදෙනු බද්ද ඉවත් කරන ලද අතර, එය 2016 අප්‍රේල් මාසයේ 01වැනි දා සිට නැවත පනවන ලදී. අය නොකරන ලද කාල සීමාව වලංගු කිරීම සංශෝධනය මඟින් බලාපොරොත්තු වෙනවා.

තුන්වනුව මෙහි සඳහන්ව තිබෙනවා, ඉදි කිරීමේ කර්මාන්ත ඇප සුරැකුම් ආවරණ අරමුදල ගැන. එම කොන්ත්‍රාත්කරුවන් මත අය කරනු ලැබූ ඇප සුරැකුම් ආවරණ අරමුදල 2016 ජනවාරි 01වැනිදා සිට ඉවත් කර තිබෙනවා.

ඊළඟට, වාණිජ කේන්ද්‍රස්ථානවලට අදාළ ප්‍රතිපාදන සංශෝධන ගැන සඳහන් වෙනවා. වාණිජ කේන්ද්‍රස්ථාන ක්‍රියාකාරකම්වල නිරත ආයතනවලට එකතු කළ අගය මත බදු පනත අදාළ නොවේ. එවැනි ආයතනවලට එකතු කළ අගය මත බදු සඳහා ලියා පදිංචි විය නොහැකි නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලයේ දී විලම්බනය කරන ලද එකතු කළ අගය මත බදු මුදල් ලබා ගැනීමේ හැකියාවක් නොමැති අතර, යෝජිත සංශෝධනය තුළින් එවැනි ආයතනවලට සරල කරන ලද එකතු කළ අගය මත බදු සඳහා ලියා පදිංචි වීමට ඉඩප්‍රස්තාව සලසනු ලබනවා. ඒ වාගේම සුඛෝපභෝගී මෝටර් වාහන මත බද්ද හා අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන මත බද්ද සඳහා යෝජිත සංශෝධනය අනුව, 2018 සැප්තැම්බර් මාසයේ 01වෙනිදා සිට පෙර ආනයනය කරන ලද වාහන සඳහා සුඛෝපභෝගී හා අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද අය කරනු ලබනවා. ඉන්පසුව එම බද්ද "සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද" ලෙස ප්‍රතිස්ථාපනය කෙරෙනවා.

ඊළඟට, 2015 අංක 10 දරන මුදල් පනත යටතේ මන්දිර බද්දක් පනවා තිබුණා. එම පනත ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි එය අහෝසි කෙරෙනවා.

හත්වෙනුව තිබෙනවා, මෝටර් වාහන මත බද්දක්. සුඛෝපභෝගී සහ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද වෙනුවට සුඛෝපභෝගී මෝටර් වාහන මත බදු පනවනු ලබනවා. වාහනය රේගුවෙන් නිදහස් කර ගන්නා අවස්ථාවේ දී රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම බද්ද එකතු කර ගනු ලබනවා. බදු අනුප්‍රමාණය මුදල් අමාත්‍යවරයා විසින් නිර්දේශ කරනු ලබනවා.

ඊළඟට, වාහන හිමිකම් අය බද්ද. මෝටර් වාහන ආනයන බලපත්‍ර ගාස්තුව වෙනුවට 2016 ජනවාරි මාසයේ 01 වෙනිදා සිට වාහන හිමිකම් අය බද්දක් පනවනු ලැබුවා.

ඊට පස්සේ සඳහන් වනවා, වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ බද්ද පිළිබඳව. ඒක 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලබනවා. කෙසේ වෙතත් එන්ටර් ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහනට සමගාමී රජයේ මූල්‍යාභාරයන්ට අනුකූලව එම බද්ද 2016 වර්ෂය සඳහා පමණක් සීමා වේ. ඒ සඳහා ලැයිස්තුගත පොදු සමාගම්වලට අනුප්‍රමාණය තිබෙනවා, වර්ෂයකට රුපියල් ලක්ෂ 15ක්. පෞද්ගලික සමාගම්වලට රුපියල් 30,000ක්.

ණය ආපසු ගෙවීමේ බද්ද 2018 ඔක්තෝබර් 01වන දින සිට බලපැවැත්වේ. මූල්‍ය ආයතන විසින් සපයන මූල්‍ය සේවාවන්ට ආරෝපණය කළ හැකි, එකතු කළ අගය මත සියයට 7ක ණය ආපසු ගෙවීමේ බද්ද අය කරනු ලැබේ.

කාබන් බද්ද ගැනයි ඊළඟට මම කියන්නේ. පරිසරය ආරක්ෂා කිරීමටයි මෙම බද්ද පනවන්නේ. එම බද්ද 2019 ජනවාරි 01වන දින සිට බලපැවැත්වේ. වාහනවල එන්ජින් ධාරිතාව, වයස, ඉන්ධන වර්ගය පදනම් කර ගනිමින් මෝටර් වාහන මත කාබන් බද්දක් පනවනු ලැබේ. වාර්ෂික ලියාපදිංචි කිරීම අලුත් කරන අවස්ථාවේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම බද්ද එකතු කරනු ලැබේ. විදුලි බලයෙන් ක්‍රියා කරන වාහන කාබන් බද්දෙන් නිදහස් කර ඇත.

මේවා පසුගිය අය වැය ලේඛනයේදී ඉදිරිපත් කරන ලද යෝජනා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නමුත් අපි මේවා ක්‍රියාත්මක කරන්නේ 2019 ජනවාරි මාසයේ සිටයි.

ඊළඟ කාරණය තමයි, දුරකථන සන්නිවේදන කුලුනු බද්ද. මෙයත් ගිය වසරේ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කළ බද්දක්. මේ බද්දත් බලපැවැත්වෙන්නේ 2019 ජනවාරි මාසයේ සිටයි. දුරකථන කුලුනු හිමි ජංගම දුරකථන ක්‍රියාකරුවන්ගෙන් එක් එක් දුරකථන සන්නිවේදන කුලුනක් සඳහා වර්ෂයකට රුපියල් ලක්ෂ 2ක බද්දක් අය කරනු ලැබේ. මෙම බද්ද සමාන කාර්තුමය වාරිකවලින් ගෙවිය යුතුයි. ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය කරන බද්ද 2019 ජනවාරි මාසයේ 01වන දා සිටයි ක්‍රියාත්මක කරන්නේ. මෙය සාමාන්‍ය ජංගම දුරකථන පාවිච්චි කරන පුද්ගලයන්ට අදාළ වන්නේ නැහැ. එහෙත් ජංගම දුරකථන හරහා විශාල ග්‍රාහක සමූහයකට යවනු ලබන වාණිජ අරමුණු සහිත කෙටි පණිවුඩ සඳහා දැන්වීම්කරු හෝ පණිවුඩය යවන්නා විසින් මෙම බද්ද ගෙවිය යුතුයි. එහිදී කෙටි පණිවුඩයකට ශත 25ක බද්දක් අය කරනු ලබනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සමහර ඒවා පසුගිය අය වැය ලේඛන ඉදිරිපත් කිරීමේදී ගෙනෙන ලද යෝජනායි. මුදල් පනත් කෙටුම්පත යටතේ අනුමත කර ගැනීමට අපි අද එම යෝජනා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම විවාදය පටන් ගැනීමට ප්‍රථමයෙන් අද පාර්ලිමේන්තුවේදී අපේ ආර්ථිකය ගැන සාකච්ඡාවක් ඇති වුණා. අද අපේ ආර්ථිකයත් ලෝකයේ අනෙක් සමහර රටවල් වාගේ, ජාත්‍යන්තර බලපෑම්වලට මුහුණ දෙනවා. රටක ආර්ථිකයක් ගොඩ නඟනකොට ඒ සඳහා බලපාන අභ්‍යන්තර කරුණු, හේතු ගැන අප සලකා බලනවා. අභ්‍යන්තරව අපි අනුගමනය කරන ප්‍රතිපත්ති තිබෙනවා. ඒවා හරිද, වැරැදිද කියන කාරණා ගැනයි අපි පාර්ලිමේන්තුවේදී වාද විවාද කරන්නේ.

අද රටවල් ජාත්‍යන්තරව මුහුණ දෙන ප්‍රශ්න කිහිපයක්ම තිබෙනවා. මේ අවස්ථාවේදී ඒවා ගැනත් කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. ඒවායින් ලංකාවට ඇතිවන බලපෑම කොහොමද කියා අපි බලන්න ඕනෑ. පළමුවෙන්ම මම මේ කාරණය කියන්නම්. ගිය වසරේදී යුරෝපා සංගමයෙන් ඉවත් වෙන්න බ්‍රිතාන්‍යයේ ජනතාව තීරණයක් ගත් බව අපි දන්නවා. ඒ තීරණයට "Brexit" කියා කියනවා. එම තීරණය ගත් දවසේදීම බ්‍රිතාන්‍යයේ කොටස් වෙළෙඳ පොළ කඩා වැටුණා පමණක් නොවෙයි, ඩොලර් එකත් සමඟ සසඳන විට ඒ මොහොතේදී බ්‍රිතාන්‍ය පවුමේ විනිමය අගයේ සියයට 10ක වෙනසක් සිදු වුණා. එසේ වුණේ බ්‍රිතාන්‍යයේ ආර්ථිකය දවසෙන් දුර්වල වූ නිසා නොවෙයි. එවැනි තීරණයක් ගත්තාම ඉදිරියේදී මොනවාද සිදු වෙන්න යන්නේ කියා විශාල අනුමානයක් තිබෙනවා. බ්‍රිතාන්‍යය යුරෝපයත් එක්ක ගැටෙමින් අවුරුදු 30ක්, 40ක් වැඩ කර තිබෙන නිසාත්, ඒ අයගේ ආර්ථිකයන් සෘජුවම සම්බන්ධ වෙලා තිබෙන නිසාත් මෙවැනි තීරණයක් ගත්තාම, ඒවා විසඳනතුරු යම්කිසි අනුමාන, සැකයන් ඇති වෙනවා. එතෙක් ආර්ථිකයට ඒක ප්‍රශ්නයක් වෙනවා.

දැන් අපි ලංකාවේ අපනයනය ගැන බලමු. අපි බ්‍රිතාන්‍යයට විශාල ප්‍රමාණයක් අපනයනය කරනවා. අපි ඩොලර් බිලියනයක අගයට වඩා බඩු භාණ්ඩ බ්‍රිතාන්‍යයට අපනයනය කරනවා. බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වෙන්නේ කොහොමද, එසේ ඉවත් වෙනවා නම් බ්‍රිතාන්‍යයට තිබෙන කොන්දේසි මොනවාද කියන කාරණය තවමත් පැහැදිලි නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රට පාලනය කිරීමේ වගකීම 2015 ජනවාරි 8වන දා අපේ රජය විසින් භාර ගත්තාට පසුව අපි ජාත්‍යන්තරය සමඟ අපේ සම්බන්ධතා ගොඩ නඟාගෙන ගියා. විශේෂයෙන්ම අපේ සාම්ප්‍රදායික වෙළෙඳ පොළවල් තිබෙන ඇමෙරිකාව, යුරෝපය වැනි රටවල ඒ වෙළෙඳ පොළවල් ආරක්ෂා කරන්න අපේ විදේශීය ප්‍රතිපත්තියක් අපි අනුගමනය කළා. එහි ප්‍රතිඵලයක් ලෙස අපට GSP Plus කියන සහනාධාරය දැන් ලැබී තිබෙනවා. මේ සහනාධාරය දැනට අපට අවුරුදු තුනකට තිබෙනවා. මෙහි ප්‍රතිලාභය ඉදිරියේදී තමයි අපිට දකින්න ලැබෙන්නේ. අපි ඇස්තමේන්තු කර ඇති ආකාරයට GSP Plus එක හරහා ලැබෙන ප්‍රතිලාභය ඩොලර් මිලියන 480ක් විතර වෙන්න පුළුවන්. බ්‍රිතාන්‍යයට ඩොලර් බිලියනයක පමණ අපේ අපනයනයක් තිබෙනවා. නමුත්, මොනවාද වෙන්නේ කියා අනුමානයක් තිබෙනවා. මොකද, Brexit එක හරහා බ්‍රිතාන්‍යය යුරෝපය සමඟ ගහන ගිවිසුම් අනුව GSP Plus එක දැන් බ්‍රිතාන්‍යයට අදාළ නොවෙන්න පුළුවන්. එතකොට ලංකාව බ්‍රිතාන්‍යය සමඟ වෙනම සාකච්ඡාවක් තියලා, අපි වෙනම ගිවිසුමකින් ඒ ප්‍රතිලාභ ආරක්ෂා කරගන්න ක්‍රියා කළ යුතුයි. ඒක අපට තිබෙන පළමුවන අභියෝගයයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට අමතරව චීනයයි, ඇමෙරිකාවයි වාණිජ යුද්ධයක - trade war එකක - යෙදී සිටිනවා. ඇමෙරිකාවේ නව ජනාධිපතිතුමා චීනයෙන් ඇමෙරිකාවට ආනයනය කරන බඩු භාණ්ඩ සඳහා ඩොලර් බිලියන 34ක බදු පැනෙව්වා. ඒ පැනෙව්වේ border taxes වාගේ රේගුවේදී අය කරන ඒවායි. ඒ ප්‍රමාණය සියයට 25ක් පමණ වෙනවා. චීනයෙන් ඇමෙරිකාවට එවැනි බඩු එනවා නම්, ඇමෙරිකාවේ පාරිභෝගිකයා ඒ බඩුවලට ගෙවිය යුතු මිල ඉහළ යනවා. චීනය මොනවාද කළේ? ඒ අයත් ඇමෙරිකාවට විරුද්ධව එවැනිම ප්‍රමාණයක -ඩොලර් බිලියන 34ක පමණ- බදු පැනෙව්වා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have only two more minutes.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
එදා චීන රජය, "මෙය වාණිජ යුද්ධයක්" කියන වචන පාවිච්චි කළා. ඉතිහාසයේ තිබෙන විශාලම වාණිජ යුද්ධය මෙයයි කියන එකත් චීන රජය විසින් ප්‍රකාශ කරනු ලැබුවා. මේක හරහා ලෝකයේ අනෙක් රටවලට බලපෑම් තිබෙනවා. මේ වාගේ වාණිජ යුද්ධයක් තිබෙන කොට විශේෂයෙන්ම අපි වාගේ කුඩා ආර්ථික තිබෙන රටවලට එයින් බලපෑමක් තිබෙනවා. ඒකෙන් අපට වැඩියෙන් ඍණ බලපෑමක් වෙයිද, ධන බලපෑමක් වෙයිද කියා අපට තවම කියන්න බැහැ. නමුත්, කෙටිකාලීනව ඒක ඍණ බලපෑමක් වෙනවා. ඒ වාගේම, ඒක ධන බලපෑමකුත් වෙන්න පුළුවන්. මොකද, අපේ බඩු භාණ්ඩත් ඇමෙරිකාව වැනි රටවල වෙළෙඳ පොළවලට ගෙනයන්න අපට ඒකෙන් අවස්ථාවක් ලබාගන්න පුළුවන්.

නමුත් තවම කාටවත් -කිසිම විශ්ලේෂකයෙකුටවත් - හරියටම කියන්න බැහැ, මේ වාණිජ යුද්ධය සමථයකට පත් වෙන්නේ කොහොමද කියන එක. එය සමථයකට පත්වීම ලෝක ආර්ථිකයට හොඳයි. මොකද, ස්ථාවරභාවයක් තිබෙනකොට තමයි ලෝක ආර්ථිකය ශීඝ්‍රයෙන් වර්ධනය වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇමෙරිකා එක්සත් ජනපදයේ African Growth and Opportunity Act - AGOA - කියා පනතක් තිබෙනවා. මේ පනත අනුව, අප්‍රිකාවෙන් ඇමෙරිකාවේ වෙළෙඳ පොළට යවන භාණ්ඩ හා සේවා බොහොම අඩු බදුවලට එවන්න පුළුවන්. It basically reduces all the border taxes in exporting goods from Africa into the United States of America.

අපේ රටේ ඇඟලුම් කර්මාන්තයේ වර්ධනයත් සමඟ, අපේ ආයෝජකයන්, අපේ රටේ සමාගම් අප්‍රිකාවේ රටවල් දෙක තුනකට ගිහින් ඒ රටවල ආයෝජනය කරලා -අප්‍රිකාවේ නිෂ්පාදනය කරලා- ඔය AGOA එක යටතේ ඇමෙරිකාවේ වෙළෙඳ පොළ ආක්‍රමණය කරනවා. පෞද්ගලික අංශයේ සිටින අපේ ව්‍යාපාරිකයන්ගේ දියුණුව මේ හරහා අපට පැහැදිලිව පෙනෙනවා. අපේ රටේ වැඩ කරන ජනතාවගේ වැටුප් ඉහළ යන විට ඒ ආයෝජකයන් එම වෙළෙඳ පොළවල් ආක්‍රමණය කරන්න නම් ඉහළම ප්‍රමිතියෙන් අඩු මිලට භාණ්ඩ නිෂ්පාදනය කළ යුතුයි. මේක ස්වාභාවිකයි. එවිට අඩුවෙන් වියදම් කරන්න පුළුවන්, අඩුවෙන් වැටුප් ගෙවන්න පුළුවන් වෙළෙඳ පොළවලට ඒ ආයෝජනය විය යුතුයි. මේක මුල ඉඳලාම ලෝකයේ සිදුවී තිබෙන දෙයක්. ඒ නිසා තමයි මේ රටේ කෝපි වැවිලි කර්මාන්තයක් ඇති වුණේ; ඒ නිසා තමයි මේ රටේ තේ වැවිලි කර්මාන්තයක් ඇති වුණේ. මොකද, ඒ ආයෝජනය සාමාන්‍යයෙන් ගමන් කරන්නේ අඩුවෙන් වියදම් කරලා නිෂ්පාදනය කරන්න පුළුවන් තැන්වලටයි. අද අපේ රටේ පවතින ඒ දියුණුව නිසා අපි වැඩි වැඩියෙන් එකතු කළ අගය වැඩි නිෂ්පාදනවලට යා යුතුයි. අපට තරග කරන්න බැහැ . අපට හුඟක් වෙලාවට අඩු මිලකට නිෂ්පාදනය කරන චීනය, ඉන්දියාව වැනි රටවල් සමඟ තරග කරන්න බැහැ. මොකද, අඩු වැටුපකට වැඩ කරන්න සූදානම් විශාල පිරිසක් තවමත් ඒ රටවල සිටිනවා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මම රටවල් සඳහන් නොකළත්, මම හිතන විධියට ඒ සමහර රටවල ඒ සේවකයන් ආරක්ෂා කරන්න EPF, ETF, pension වැනි අරමුදල්වත් නැහැ. මම හිතන විධියට ඒ අයට අසාධාරණ ලෙස පුළුවන්, සේවකයන් ආරක්ෂා කරන අප වැනි රටවල් එක්ක තරග කරන්න. මෙය තමයි යථාර්ථය. ඒ නිසා අපට අවස්ථා ලැබුණාම අපත් ප්‍රයෝජනය ගන්න ඕනෑ, අනෙක් රටවලට ගිහිල්ලා ආයෝජනය කර ඒ ආයෝජනය හරහා විදේශ විනිමය ලබන්න, වෙනත් වෙළෙඳ පොළවල් ආක්‍රමණය කරන්න. නමුත්, මෙයත් ප්‍රශ්නයක් වෙනවා. මොකද, AGOA කියන ඇමෙරිකානු පනත ඇමෙරිකන් රජය තවමත් අහෝසි කර නැහැ. නමුත්, අපට තිබෙන අභියෝග බැලුවාම ලංකාවේ කර්මාන්තවලට මෙයත් අභියෝගයක් වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉරානයට ඇමෙරිකාව සම්බාධක දමා තිබෙන බව අපි දන්නවා. ඉරානය දවසකට බොර තෙල් බැරල් මිලියන 4ක් විතර නිෂ්පාදනය කරනවා. එයින් බැරල් මිලියන 2ක් පමණ ඉරානය අනෙක් රටවලට අපනයනය කරනවා. අපි හුඟක් වෙලාවට ඉරානයෙන් පැමිණෙන crude oil තමයි ගන්නේ. ඒක අපි අරගෙන මේ රටේ,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. කථාව අවසන් කරන්න.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව අවසන් කරන්න මට ටික වෙලාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
I will give you only one more minute.

**ගරු කබීර් හාෂිම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ වෙලාවෙන් ගරු රාජ්‍ය ඇමතිතුමාට කාලය දෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Okay.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Thank you. අගෝස්තු මාසයේ 28වැනිදා ඇමෙරිකාව ඉරානයට සම්බාධක දමා තිබෙනවා. නොවැම්බර් මාසයේ 5වැනිදා -ඊළඟ සතියේ- අලුත් සම්බාධක එනවා. ඒ සම්බාධක ආවාම විශේෂයෙන්ම එය අපේ රටට ගැටලුවක්, ප්‍රශ්නයක් වෙනවා. මොකද, අපේ රටෙන් ඉරානයට තේ යවනවා. ඒ වාගේම ඉරානයෙන් අපේ රටට තෙල් ගෙනෙනවා. ඒක අභියෝගයක්. මොකද, අපි ආනයනය කරන ප්‍රමාණය සමඟ සසඳලා බලනකොට අපනයනය කරන ප්‍රමාණය අඩුයි. එහෙම ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ විධියට සම්බාධක පැනවීමෙන් අපට සිදු වන අවාසිය පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා යම් වන්දියක් ඔවුන්ට ගෙවන්න කියා ඉල්ලීමක් කරන්නේ නැද්ද?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඇත්තටම ඔබතුමා කියන දේට මම පිළිතුර දන්නේ නැහැ. නමුත්, ඔබතුමාගේ අදහස ගැන විදේශ ඇමතිතුමා සමඟ සාකච්ඡා කරන්නම්. රටවල් කිහිපයකට මේ ප්‍රශ්නය තිබෙන නිසා අපට එකට ක්‍රියා කරන්න පුළුවන්ය කියා මම හිතනවා. අපි මේවාට විසඳුම් හොයා ගෙන යනවා. දැනට මිත්‍ර රටවල් සමඟ අපි සාකච්ඡා පවත්වනවා.

ලංකාවට නොකඩවාම තෙල් ලැබෙනවා. එහි කිසිම අඩුපාඩුවක් සිදු වෙන්නේ නැහැ. මොකද, ඒ ක්‍රියාදාමයේ අපි දැනටම යෙදී සිටිනවා. රුපියලේ අගය අඩු වීම ගැන අද ගරු මන්ත්‍රීවරුන් කථා කළා. ඔව්, රුපියලේ අගය අඩු වුණාද ඩොලරයේ අගය වැඩි වුණාද කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. මේ සාකච්ඡාව මතු වනකොට මුලින්ම හිතුවේ මේක ආසියාවේ තිබෙන ප්‍රශ්නයක් කියායි. මේක ආසියාවේ ප්‍රශ්නයක් නොවෙයි, සංවර්ධනය වෙමින් පවතින රටවල, emerging marketsවල ප්‍රශ්නයක් කියා ඊට පස්සේ කිව්වා. නමුත් මේක ඊට වැඩිය ජාත්‍යන්තර ප්‍රශ්නයක් කියා දැන් අපිට පැහැදිලිව පෙනෙනවා.

ජනවාරි මාසයේ ඉඳලා ඔක්තෝබර් මාසයේ 21 වැනිදා දක්වා බැලුවොත් රුපියල 11.9කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා, ඒ කාලය තුළදීම ඉන්දියානු රුපියල සියයට 15කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා, පාකිස්තානයේ රුපියල සියයට 21කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. චීනය තමයි ලෝකයේ තිබෙන දෙවැනි විශාලම ආර්ථිකය. චීනයේ යුවාන් එක - Renminbi එක - සියයට 6.38කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. තුර්කිය ගැන මම කියන්න අවශ්‍ය නැහැ. සියයට 50කට වැඩිය තුර්කියේ භාවිත වන මුදලේ අගය කඩා වැටිලා තිබෙනවා. ආජන්ටිනාව ගැන මම කියන්න අවශ්‍ය නැහැ. දකුණු ඇමෙරිකාවේ භාවිත වන මුදලේ අගය විශාල ප්‍රමාණයකින් කඩා වැටිලා තිබෙනවා. ඉන්දුනීසියාවේ භාවිත වන මුදලේ අගය අවප්‍රමාණය වීම ලංකාවේ වාගේමයි. ඇත්තටම අපි බැලුවොත් Thai Baht එක, Singapore Dollar එක වාගේ ඒවා තමයි තවම ආසියාවේ ශක්තිමත්ව පවත්වාගෙන යන්නේ. මේක ගැටලුවක් කියන කාරණය අපි පිළිගන්න ඕනෑ. නමුත් මේ ගැටලුව පිටින් එන ගැටලුවක් කියන එක මම සඳහන් කරන්නට අවශ්‍යයි.

මේ කාරණයත් කියා මම ඉක්මනට මගේ කථාව අවසන් කරන්නම්. මේ කාල සීමාව තුළදී අපි අය වැය පරතරය අඩු කර තිබෙනවා. සියයට 7.7 ඉඳලා සියයට 5කට ආසන්න ප්‍රමාණයකට අපි අය වැය පරතරය ගෙනැල්ලා තිබෙනවා. අය වැය පරතරය සියයට 3.5කට ගෙනි යන්න අපි බලාපොරොත්තු වනවා. මොකද, අය වැය පරතරය තුළ තමයි අපේ මූලික ගැටලුව -ප්‍රශ්නය- තිබෙන්නේ. මේ ප්‍රශ්නය විසඳන්න අපි -අපේ රජය- මොනවාද කර තිබෙන්නේ? ආදායම එකතු කිරීමේ පැත්තට තමයි අපි

ගිහිල්ලා තිබෙන්නේ. We have gone for a revenue consolidation in order to overcome the deficit that we have in our Budget. It is not a cost cutting exercise, we have not done that.

අපේ ප්‍රතිපත්ති නිසා උද්ධමනය පහළටම ඇවිල්ලා තිබෙනවා. අවුරුදු 20කට පස්සේ 2018 අප්‍රේල් මාසයේ තමයි අඩුම උද්ධමනය තිබිලා තිබෙන්නේ. 2018 අගෝස්තු මාසයේ උද්ධමනය සියයට 2.53යි. මම මේ කාරණය කියන්න හේතුව මෙකයි. හුඟක් වෙලාවට බඩු මිල ගැන කථා කරනවා. බඩු මිල ගැන කථා කරනකොට බඩු මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා කියා සඳහන් කරනවා. එය සත්‍ය දෙයක් නොවෙයි.

ඇත්තටම අපි හාල් මිල බැලුවොත්, පරිප්පු මිල බැලුවොත්, ලූනු මිල බැලුවොත්, සැමන් ටින් එකේ මිල බැලුවොත්, එදාට වඩා අද මිල අඩුයි. නමුත් බඩු මිල ගැන කථා කරනකොට මිල ගැන විතරක් කථා කර වැඩක් නැහැ. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඉස්සර වෙලා ප්‍රකාශයක් කළා. එතුමාට මතක ඇති, එතුමා පාසල් යන කාලයේදී පාන් ගෙඩිය සත 25ක් විතර වෙන්න ඇති කියා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
සත 25යි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
සත 25යි. සීනි කිලෝව සත 72යි. අද පාන් රාත්තල රුපියල් 60යි. බඩු මිල ඉහළ යන එක ගැන නොවෙයි කථා කරන්න ඕනෑ. මොන ආණ්ඩුව තිබුණත් බඩු මිල කොහොමත් ඉහළ යනවා. ඉහළ යාමේ වේගය ගැනයි අපි කථා කරන්න ඕනෑ. උද්ධමනය ගැනයි කථා කරන්න ඕනෑ. උද්ධමනය අඩු වෙලා තිබෙනවා. අපේ රජය යටතේ උද්ධමනය ශීඝ්‍ර ලෙස අඩු වෙලා තිබෙනවා. අපනයනය වැඩි වෙලා තිබෙනවා. ඔව්, පරතරයත් වැඩි වෙලා තිබෙනවා. මොකද, අපි ආනයනය කරනවා, නිෂ්පාදනය කරන්න. පසු ගිය වසරේ පමණක් සියයට 10.2කින් අපනයනය වැඩි වෙලා තිබෙනවා. විදේශ විනිමය විශාල ප්‍රමාණයක් -සියයට 9ක් විතර - තිබුණා. ඔව්, පසුගිය මාසයේ තිබුණු අර්බුද සමඟ විදේශ විනිමය ප්‍රමාණය අඩු වෙලා තිබෙන බව අපි පිළිගන්න අවශ්‍යයි. නමුත් ඒක පාලනය කරන්නේ, ඒ තීරණය ගන්නේ මහ බැංකුව. රුපියලේ අගය ගැන මහ බැංකුව තමයි තීරණය ගන්නේ. 2014 වසරේ මේ රටට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව ලක්ෂ 15යි. 2017 වසර වනකොට සංචාරකයින් ලක්ෂ 21ක් මේ රටට ඇවිල්ලා තිබෙනවා. 2018 වසර වනකොට සංචාරකයින් සංඛ්‍යාව ලක්ෂ 23කට, 24කට ඉහළ යයි කියා අපි බලාපොරොත්තු වෙනවා. සංචාරකයින්ගෙන් ලැබුණු විදේශීය ආදායම ලක්ෂ 24,311යි. ඩොලර් ලක්ෂ 24,311යි. එය ලක්ෂ 39,249කට ශීඝ්‍රයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. මම දන්නවා, සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින සමහර හෝටල්වලට ප්‍රශ්න තිබෙන බව. නමුත් අපි මුළු ක්ෂේත්‍රයම ගත්තොත්, මේ කෙටි කාලය තුළ ලංකාව ඉහළම තැනකට ගිහිල්ලා තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රය තුළ වෙනස් වීම් වේගෙන යනවා. ලෝකය වටේම වෙන වෙනස්වීම්. එතකොට සමහර කොටස්වලට අවාසි වෙන්න පුළුවන්. අනෙක් කොටස්වලට ලාභයි. නමුත් අපේ රටට වාසිදැයි නැද්ද කියන එක තමයි අහන්න ඕනෑ. ඒ නිසා Lonely Planet සඟරාව, ලෝකයේ හැමෝම දැන ගන්න ඒ සඟරාව, අපි බැලුවොත් රටවල් 10ක් නම් කර තිබෙනවා. ලංකාව නම් කර තිබෙන්නේ ලෝකයේ පළමුවන රට හැටියට. සංචාරකයින් ආ යුතු පළමුවන රට හැටියට ඒ අය ජාත්‍යන්තරයෙන්ම සඳහන් කර තිබෙනවා. විදේශ සෘජු ආයෝජනය 2017 වසර අවසන් වන විට ඉහළ ගිහිල්ලා තිබෙනවා. මේ අභියෝග සියල්ලක්ම තිබියදීත් පසු ගිය අවුරුද්දට වඩා 2018 වසරේදී අපේ විදේශ ආයෝජනය ඉහළට යයි කියා අපි විශ්වාස කරනවා. අපට අභියෝග තිබෙනවා. මේවා හංගන්න දේවල් නොවෙයි. මොන ආණ්ඩුව තිබුණත්, ජාත්‍යන්තර අභියෝග කාටවත් හංගන්න බැහැ. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, අපි අනුගමනය කරන මේ ප්‍රතිපත්තිය මඟින් ආර්ථිකයේ මූල්‍ය කරුණු හරි ගස්සන්න, අය වැය පරතරය අඩු කරන්න. ඒ වාගේම ආදායම එකතු කරන්න තිබෙන තැන්වලින් එකතු කරන්න අපි පැකිලෙන්නේ නැහැ. තිබෙන මිනිසුන්ගෙන් අපි ආදායම ගන්න ඕනෑ. මේ රටේ ඉන්න සාමාන්‍ය දුප්පත් ජනතාවගේ අධ්‍යාපනය, සෞඛ්‍යය, සමෘද්ධිය, සමාජ ගෙවීම් අපි කරන්න ඕනෑ. අපි එකක්වත් කපලා නැහැ. මේ අවුරුදු තුන තුළ ඒ සියල්ලක්ම වැඩි කර තිබෙනවා. ඒක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. හැබැයි, බදු ගන්න ඕනෑ තැන්වලින් බදු අරගෙන ඒ ක්‍රියාදාමය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාල වේලාව ලබා දීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[மு.ப. 11.36]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய விவாதத்தில் நிதிச் சட்டமூலம் சம்பந்தமாக நுணுக்கமாகவும் அதேவேளை, பொதுவாகவும் கூறப்பட வேண்டிய கருத்துக்கள் இருக்கின்றன. ஒரு நாட்டில் நிதி, நீதி என்பன மிக முக்கியமான எண்ணக்கருக்களாக இருக்கின்றன. நிதியென்பது பொருளாதார அபிவிருத்தியோடு தொடர்புபட்ட விடயமாகும். நீதியென்பது ஜனநாயக அரசியலோடு சம்பந்தப் பட்ட விடயமாகும். அந்தவகையில், நீதியென்கின்ற எண்ணக்கரு இன்றைய விவாதத்திற்கு எடுத்துக் கொள்ளப்படாதுவிட்டாலும் நிதியென்கின்ற விடயம் இப்போது ஆராயப்பட்டுக்கொண்டிருக்கின்றது. நிதி பற்றிய விடயம் எமது நாட்டில் ஒரு தளம்பலான நிலையில் காணப்படுகின்றது என்பதை நாங்கள் அறிந்துகொள்ள வேண்டும். ரூபாயின் வீழ்ச்சி பற்றிப் பேசப்படுகின்றது; டொலரின் பெறுமதியின் உயர்ச்சி பற்றிப் பேசப்படுகின்றது; பணவீக்கம் பற்றிப் பேசப்படுகின்றது. ரூபாயின் பெறுமதியை எவ்வாறு ஓர் நிலையான, தளம்பலற்ற நிலையில் வைத்துக் கொள்வது? டொலரின் பெறுமதி உயர்வுக்கு ஈடுகொடுத்து எமது அந்நியச் செலாவணியை எவ்வாறு மீதப்படுத்திக் கொள்வது? போன்ற விடயங்களெல்லாம் இங்கு ஆராயப்பட இருக்கின்றன.

அந்த அடிப்படையில், நிதிச் சட்டமூலம் என்கின்ற விடயத்தில் எமது நாட்டின் பொருளாதாரம் தங்கியிருக்கின்றது; எமது நாட்டின் அபிவிருத்தி தங்கியிருக்கின்றது. ஒவ்வொரு வரவு செலவுத்திட்டத்திலும் வரவைவிடச் செலவு அதிகரித்துக் காணப்படுகின்ற போக்கு அதிகரித்துக்கொண்டு செல்வதையும் அதேவேளை, துண்டுவிழும் தொகை என்கின்ற பற்றாக்குறை அதிகரித்துக்கொண்டு செல்கின்ற போக்கினையும் நாங்கள் அவதானிக்கின்றோம். நாட்டில் யுத்தம் முடிவடைந்துவிட்டது. யுத்தத்தினால் பாரிய செலவினம் ஏற்பட்டதாகக் கூறப்படாலும் கூட, யுத்தம் முடிந்த பின்னரும்கூட வரவு செலவுத்திட்டத்தில் பாதுகாப்புக்காக அபரிமிதமான நிதி ஒதுக்கப்படுகின்ற ஒரு தன்மையை நாங்கள் அவதானிக்கின்றோம். நாட்டின் கல்வி முக்கியமானது, சுகாதாரம் முக்கியமானது, உட்கட்டுமான அபிவிருத்திகள் முக்கியமானவை எனப் பேசப்பட்டாலும்கூட,

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

நாங்கள் அதிகமாக இவற்றையெல்லாம் கணக்கில் கொள்ளாமல் ஏனைய துறைகளுக்குக் கொடுக்கப்படுகின்ற முக்கியத்துவம் அதிகரித்துக்கொண்டு செல்வதென்பது, எமது நாடு ஒரு ஜனநாயக அரசியலை நோக்கிச் செல்கின்றதா? அல்லது ஜனநாயகததிற்கு முரணான அரசியலை நோக்கிச் செல்கின்றதா? என்பதைப் பற்றி நாங்கள் ஆராயவேண்டிய நிலையிலிருக்கின்றோம் என்பதை உணர்த்துகின்றது.

நாங்கள் சுதந்திரமடைந்து 70 ஆண்டுகளைக் கடந்திருக் கின்றோம். இன்று நாங்கள் சுதந்திரம் பெற்றதன் பின்னர் எமது நாட்டில் ஸ்திரமான ஒரு நிதி நிலைமையை ஏற்படுத்திக் கொள்ளக்கூடிய விதத்தில் பொருளாதாரப் பொறிமுறை யொன்று காணப்படுகின்றதா? என்பதைப்பற்றிச் சிந்திக்க வேண்டியவர்களாக இருக்கின்றோம். அந்த வகையில், பொருளாதாரப் பொறிமுறையொன்று வகுக்கப்படுகின்ற போதுதான் நிதி நிலைமையில் ஒரு ஸ்திரமான நிலையை அடையக்கூடியதாக இருக்கும். குறிப்பாக, திறந்த பொருளாதாரம் என்கின்ற பொருளாதாரப் பொறிமுறை யென்பது தாராளமான ஏற்றுமதி, தாராளமான இறக்குமதி என்கின்ற விடயங்களோடு சம்பந்தப்பட்டிருக்கின்றது. நாங்கள் தாராளமாக எல்லாவற்றையும் இறக்குமதி செய்கின்றோம். ஆனால், தாராளமாக ஏற்றுமதி செய்கின்றோமா? என்கின்ற கேள்வி எம்மிடம் இருக்கின்றது. அதற்குரிய பதில் நிச்சயமாக இல்லையென்றுதான் அமையும். எனவே, நாட்டில் நிதி நிலைமையினை உறுதியாகப் பேணவேண்டுமாக இருந்தால், ஏற்றுமதிகள் அதிகரிக்கப்பட வேண்டும்; ஏற்றுமதி செய்கின்ற பொருட்களுக்கான சந்தைமானம் உயர்வாக இருக்க வேண்டும். அந்த உயர்வின் மூலமாக அந்நியச் செலாவணியை உறுதியான நிலையில் பேணிக்கொள்வதற்குரிய வாய்ப்பிருக்கின்றது.

எமது நாட்டில் உறுதியான, ஒற்றுமையான மக்கள் கட்டமைப்பு இருக்கின்றதா? ஐக்கியத்தை ஏற்படுத்தக்கூடிய முன்மாதிரியான அரசாங்கச் செயற்பாடுகள் இருக்கின்றதா? என்று பார்க்கின்றபோது, கடந்த காலத்திலிருந்து இல்லாத நிலைமைதான் காணப்படுகின்றது. சிங்கப்பூர் நாட்டின் பிரதமராக இருந்த லீக்குவான் யூ அவர்கள் இன்றும் பேசப்படுகின்ற முக்கியமான ஒரு தலைவராக விளங்குகின்றார். அந்த நாட்டை வடித்தெடுத்த சிற்பி என்றும்கூட அவரைக் குறிப்பிடலாம். நாட்டின் ஐக்கியத்தை, இன ஒருமைப்பாட்டை, மக்களிடையே ஒற்றுமையைக் கட்டியெழுப்பியதன் பின்னர்தான் நாட்டின் பொருளாதாரத் தையும் அபிவிருத்தியையும் மேம்படுத்தியதாக அவர் குறிப்பிட்டிருந்தார். எனவே, இதற்கான அடித்தளமென்பது நாட்டு மக்களின் ஐக்கியத்துடன் தொடர்புபட்டிருக்கின்றது. நாம் எல்லோரும் இந்த நாட்டவர் என்ற அடிப்படையில் ஒற்றுமைப்படக்கூடிய விதத்தில் இன, மத, மொழிகளுக்கு அப்பால் எமது செயற்பாடுகள் அமைய வேண்டும். பேச்சினால் மாத்திரமல்லாமல், செயல்கள் மூலமாகவும் ஐக்கியத்தை ஏற்படுத்தக்கூடிய தலைமைத் துவங்கள் அல்லது வழிகாட்டிகள் நாட்டில் உருவாக வேண்டிய தேவையிருக்கின்றது. அதையும்விட, எமது நாட்டில் தேசிய முக்கியத்துவம் வாய்ந்த நிகழ்ச்சி நிரலுக்கு அமையச் செயற்படுவதற்கு அப்பால், அரசியல் சுயலாபம், அரசியல் கட்சி இலாபம் என்ற அடிப்படையில் செயற்படுகின்றபோது அரசியல்வாதிகள் சிலவேளைகளில் பிழைத்துக் கொள்ளக்கூடிய ஒரு நிலைமை காணப்பட்டாலும், நாடும் மக்களும் பிழைத்துக்கொள்ள முடியாத ஒரு துர்ப்பாக்கிய நிலைமை ஏற்படும். எது எப்படி இருந்தாலும், இந்த நாட்டில் அபிவிருத்தி ஏற்பட வேண்டுமாகவிருந்தால் நாட்டில் தேசிய ஐக்கியம் பேணப்பட வேண்டும். தேசிய ஐக்கியம் பேணப்பட வேண்டுமாக விருந்தால், நாட்டில் நிரந்தரமானதோர் அரசியல் தீர்வு, அரசியலமைப்பு மாற்றம் ஏற்பட வேண்டும்.

"புண்ணுக்குப் புனுகு தடவுதல்" என்று சொல்வார்கள். அதாவது, புண் ஏற்பட்டால் முறையாக அதனைச் சுத்தப்படுத்தி அதற்குரிய மருந்தினை இடுவதன்மூலமாகத்தான் அந்தப் புண்ணை - காயத்தை ஆற்றிவிட முடியும். மாறாக புண் நாற்றமெடுக்கின்றது என்பதற்காக அதற்கு மேல் புனுகு - scent தடவுகின்ற வழிமுறையென்பது தற்காலிகமானதொன்றாகத் தான் இருக்க முடியும். எனவே, இனப் பிரச்சினைக்கு - அரசியல் பிரச்சினைக்கு நிரந்தரமாகத் தீர்வு காண்பதை விடுத்து, வெறுமனே அபிவிருத்தி என்ற போர்வையில் செயற் பட்டதன் காரணத்தினால்தான் எமது நாடு 30 ஆண்டுகளாக யுத்தத்தினைச் சந்தித்தது. அதன் காரணமாகப் பெருமளவான மனித வளங்கள் அழிக்கப்பட்டிருக்கின்றன; பொருளாதார வளங்கள் அழிக்கப்பட்டிருக்கின்றன; நிதி வளம் விரயம் செய்யப்பட்டிருக்கின்றது. அதனால், நாங்கள் இவற்றை யெல்லாம் விடுத்து, சரியான, தெளிவான முற்போக்கான தொரு பாதையில் செல்லவேண்டும். அதற்காக நாங்கள் பொருளாதரத் திட்டமிடலையும் அரசியல் திட்டமிடலையும் சமாந்தரமாகக் கொண்டுசெல்லவேண்டியவர்களாக இருக் கின்றோம். அவ்வாறு செய்யவில்லையென்றால், போலித் தனமான அரசியலும் போலித்தனமான நடைமுறைகளும்தான் இந்த நாட்டில் எஞ்சியிருக்கும். அதாவது ஐந்து ஆண்டுகளுக்கு ஒரு தடவை ஆட்சி மாற்றம் ஏற்படலாம். ஆனால், நாட்டில் அபிவிருத்தியென்பது மேம்படாதென்பதை விளங்கிக்க கொள்ள வேண்டும்.

இந்த நாட்டின் கடன் சுமையானது 4 trillion ரூபாவாகக் காணப்படுவதாக நிதி அமைச்சர் அவர்கள் அண்மையில் குறிப்பிட்டிருந்தார். அதாவது, அந்நிய நாடுகளுக்கு நாங்கள் செலுத்தவேண்டிய பணம் 4 trillion ரூபாவாகக் காணப் படுவதாக அவர் குறிப்பிட்டிருந்தார். எமது நாட்டுக்காக நாங்கள் பெற்றுக்கொள்கின்ற வருமானத்தைவிடச் செலுத்த வேண்டிய கடன் தொகை அதிகமாகக் காணப்படுகின்ற தென்பதை மறந்துவிடக்கூடாது. இவ்வாறான நிலைப் பாட்டைத்தான் நாங்கள் பார்க்கின்றோம். எனவே, ஏற்றுமதி என்கின்ற விடயத்தில் கூடுதலாக அக்கறை செலுத்தி அதன் மூலமாக எமது நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்பு வதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். பொருளாதாரக் கட்டமைப்பினை வலுப்படுத்திப் பொருளாதார அபிவிருத்தியினை ஏற்படுத்தவேண்டுமாக இருந்தால், ஏற்றுமதியின் அளவினை உயர்த்தவேண்டுமாக இருந்தால், நாட்டின் சகல பாகங்களிலும் பாரபட்சமில்லாமல் அனைத்துத் துறைகளும் - விவசாயத்துறையாக இருந்தாலென்ன, பொருளாதாரத்துறையாக இருந்தாலென்ன, சுற்றுலாத் துறையாக இருந்தாலென்ன, சம்பந்தப்பட்ட துறைகள் அனைத்தும் – கட்டியெழுப்பப்பட வேண்டிய தேவைப்பாடு இருக்கின்றது. அரசியல் தேவைக்காகக் குறிப்பிட்ட சில மாவட்டங்களில், குறிப்பிட்ட சில மாகாணங்களில் மாத்திரம் அத்துறைகள் கட்டியெழுப்பப்படுகின்ற நிலைமையானது நாட்டில் மீண்டும் பாரபட்சப் போக்குகள் ஏற்பட்டு, முரண்பாடுகளைத் தோற்றுவிக்கக்கூடியதாகவே இருக்கும்.

எமது மட்டக்களப்புக்கு அண்மையிலுள்ள பொலன் னறுவை மாவட்டமானது மாண்புமிகு ஜனாதிபதி அவர்களின் மாவட்டமாக அமைந்திருக்கின்றது. அந்த மாவட்டத்தில் அண்மையில் பல அபிவிருத்தித் திட்டங்கள் ஒன்றன்பின் ஒன்றாக மேற்கொள்ளப்பட்டுவந்தன. நிச்சயமாக அந்த மாவட்டத்தில் மேற்கொள்ளப்படுகின்ற அபிவிருத்திச்

செயற்பாடுகளை நாங்கள் எதிர்க்கவில்லை. அதேநேரம் குறித்த மாவட்டத்திற்கு அதிகமான அபிவிருத்தி கொண்டுசெல்லப் படுகின்றபோது, அந்த அபிவிருத்தியின் 10 சதவீதமாவது அதன் பக்கத்தில் இருக்கின்ற யுத்தத்தினால் சீர்குலைந்துள்ள மட்டக்களப்பு, திருகோணமலை போன்ற மாவட்டங்களுக்குச் சென்றிருக்கின்றதா? என்பதுபற்றி நாங்கள் சித்தித்தாக வேண்டும். ஆனால், இன்று நல்லாட்சி என்கின்ற மகுடத்தை அணிவித்துவிட்டு, நல்லாட்சி என்ற சொல்லுக்கு முரணான விதத்தில் அபிவிருத்திச் செயற்பாடுகள் பாரபட்சமான முறையில் நகர்த்திக் கொண்டு செல்லப்படுகின்றன. ஒரு மாவட்டம் அபிவிருத்தி செய்யப்பட வேண்டுமாக இருந்தால், அந்த மாவட்டத்தில் ஜனாதிபதிகள் உருவாக வேண்டும், பிரதம மந்திரிகள் உருவாக வேண்டும், பொறுப்புமிக்க அமைச்சர்கள் உருவாக வேண்டும். அவ்வாறு உருவாகின்றபட்சத்தில்தான் அந்தந்த மாவட்டங்கள் அபிவிருத்தி செய்யப்படுமென்ற ஒரு நிலைப்பாடு இருக்குமாக இருந்தால், வடக்கு, கிழக்கில் அபிவிருத்தியைக் காண்பது மிகவும் சிரமமாகும்; கடிமான ஒரு காரியமாகத்தான் இருக்க முடியும். எனவே, "ஊருக்கு உபதேசம் உனக்கல்லடி மகளே" என்று தமிழில் ஒரு பழமொழி இருக்கின்றது. அதாவது, வார்த்தைகளில் அருமையான விழுமியங்கள் மற்றும் கருத்தாடல்கள் பற்றிப் பேசப் படுகின்றது. ஆனால், குறித்த கருத்தாடல்களுக்குரிய பிரதி பலிப்புக்கள் அல்லது பதிலீடுகள் செயற்பாடுகளில் இருக்கின்றனவா? என்பதைப் பற்றிச் சிந்தித்துப் பார்க்க வேண்டும் என்பதைப் பற்றித்தான் இங்கு நான் சொல்ல விரும்புகின்றேன்.

அண்மைக் காலத்தில் நல்லாட்சி ஏற்பட்டதன் பின்னர் பலவிதமான அபிவிருத்திகளைப் பற்றி நாங்கள் இந்தச் சபையில் கூறியிருந்தோம். அதற்கான உத்தரவாதங்களும் அளிக்கப்பட்டிருந்தன. குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்தில் படுவான்கரை, எழுவான்கரை என்கின்ற பிரதேசங்கள் வாவியினால் பிரிக்கப்பட்டு இரண்டு துண்டங்களாகக் காணப்படுகின்றன. அந்த நிலங்களை இணைப்பதற்கான பாலங்களை அமைத்துத்தருவதாக அப்போதைய நிதி அமைச்சர் கௌரவ ரவி கருணாநாயக்க அவர்கள் கூறியிருந்தார். அது சம்பந்தமான அறிவித்தல் gazette - வர்த்தமானி மூலமாகப் பிரசுரிக்கப்பட்டிருந்தது. அதில் 5 பாலங்கள் வரை அமைக்கப்படுமெனக் குறிப்பிடப்பட்டிருந்தது. ஆனால், இன்று 3 வருடங்கள் கடந்து விட்டன. ஒரு பாலங்கூட அந்த இடத்தில் அமைத்துத் தரப்படவில்லை. எனவே, வெறுமனே வார்த்தைகளால் மாத்திரம் அபிவிருத்திகளைக் கொண்டு செல்ல முடியாது என்பதை இந்த இடத்தில் நான் கூறி வைக்க விரும்புகின்றேன். பல விடயங்களுக்குரிய உத்தரவாதங்கள் இலாவகமாகச் சொல்லப்படுகின்றன; மிகவும் கச்சிதமாகச் சொல்லப்படுகின்றன. ஆனால், அந்த உத்தரவாதங்களுக்குரிய நடைமுறைகள், செயற்பாடுகள் மந்தமாக நகர்ந்து கொண்டிருக்கின்றன.

நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சர் கௌரவ கபீர் ஹாஷிம் அவர்கள் இங்கு இருக்கின்றார். அவருடைய அமைச்சுக்கு நான் பல தடவைகள் சென்றிருக்கிறேன். கௌரவ அமைச்சர் அவர்களே! மட்டக்களப்பு மாவட்டத்தில் வீதி அபிவிருத்தி பற்றிய விடயத்தில் பாரிய இடைவெளி காணப்படுவது சம்பந்தமாக தங்களிடம் கதைத்திருந்தேன். சில வீதிகளை அபிவிருத்தி செய்து தருமாறு கேட்டபோது, அந்த அபிவிருத்திக்குத் தாங்கள் 3 மில்லியன் ரூபாய் தந்தீர்கள். அதற்கு நன்றியைத் தெரிவிக்கின்றேன். ஆனால், அபிவிருத்திக்கான நிதித் தேவை அதிகமாகக் காணப்படுகின்றது. இன்று High Priority Road Development Project, iRoad Project என்று சொல்லப்படுகின்ற இரண்டு எண்ணக்கருக்கள் மூலமாக அந்தப் பகுதிகளை அபிவிருத்தி செய்வதற்குரிய நடைமுறைகளை முன்னெடுப்ப தாகச் சொல்லப்பட்டிருக்கின்றது. எதிர்வருகின்ற டிசம்பர் மாதத்திற்குள் iRoad Project மட்டக்களப்பு மாவட்டத்தில் நடைமுறைப்படுத்தப்படவிருப்பதாக நீங்களும் உங்களுடைய பிரதியமைச்சர் கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்களும் குறிப்பிட்டிருந்தீர்கள். இந்த வருடத்திற்குள் அந்த iRoad திட்டம் சம்பந்தமான proposal - முன்மொழியப்படும் என்று நாங்கள் எதிர்பார்க்கின்றோம். கௌரவ அமைச்சர் அவர்களே, தயவுசெய்து நீங்கள் யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசங்கள் மீது விசேடமாகக் கவனம் செலுத்தவேண்டும். ஏனென்றால், வடக்கு, கிழக்குப் பகுதிகளில் குறிப்பிட்ட சில பிரதேசங்கள் மாத்திரம் அபிவிருத்தி செய்யப்பட்டுக்கொண்டிருக்கின்றன. அந்த அபிவிருத்தியானது கட்சி ரீதியான அபிவிருத்தியா? அல்லது சமூக ரீதியான அபிவிருத்தியா? என்பது பற்றி இன்று மக்கள் சிந்திக்கின்றார்கள். எனவே, குறிப்பிட்ட பிரதேசங்கள் மாத்திரம் அதீதமானதும் அபரிமிதமானதுமான அபிவிருத்திகளைப் பெற்றுக்கொள்கின்றபோது, அதன் பக்கத்துக் கிராமங்கள் gravelகூட இடப்படாத வீதிகளோடு இருப்பது என்பது வேதனைக்குரிய விடயமாக இருக்கின்றது. ஆனால், அமைச்சர் அவர்களே, உங்களுடைய அமைச்சு நெடுஞ்சாலைகளுக்குப் பொறுப்பான அமைச்சாக இருப்பதால் குறித்த குறைபாடுகள் பற்றி உங்களிடம் நான் சொல்ல முடியாது. மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சர் கௌரவ பைசர் முஸ்தபா அவர்கள் இருக்கின்றார். அவருடைய அமைச்சுக்கூடாகப் பல வீதிகள் அபிவிருத்தி செய்யப்பட வேண்டியிருக்கின்றன. குறிப்பாகச் சொன்னால், RDA road - வீதி அபிவிருத்தித் திணைக்களத்திற்குச் சொந்தமான வீதிகள் பற்றிக் குறிப்பிடலாம்.

அதனைவிட, உள்ளூராட்சிச் சபைகளுக்குச் சொந்தமான வீதிகளும் அங்கு அபிவிருத்தி செய்யப்பட வேண்டியிருக் கின்றன. ஆனால், அங்கிருக்கின்ற உள்ளூராட்சிச் சபைகளைப் பொறுத்தமட்டில், அவை நிதி மூலமில்லாத காரணத்தினால் மிகவும் கஷ்டமான நிலையில் இயங்கிக் கொண்டிருக்கின்றன. சம்பந்தப்பட்ட உள்ளூராட்சிச் சபையின் அங்கத்தவர்கள் குறித்த வீதிகளைச் சென்று பார்வையிடுவதற்குக்கூட முறையான வாகன வசதிகள் செய்து கொடுக்கப்படவில்லை. குறிப்பாக வெல்லாவெளி, வவுணதீவு, பட்டிப்பளை மற்றும் வாகரை போன்ற பிரதேச சபைகளின் தவிசாளர்களுக்கு அந்தக் களநிலத் தரிசிப்புகளைச் செய்வதற்குரிய வாகன வசதிகள்கூட செய்யப்படாத ஒரு நிலைமை காணப்படுகின்றது. அவர்கள் உந்துருளிகளிலும் - மோட்டார் சைக்கிள்களிலும் முச்சக்கர வண்டிகளிலும் சென்று தங்களுடைய பிரதேசங்களைப் பார்வையிடுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலைமை காணப் படுகின்றது. நல்லாட்சி என்கின்ற மகுடத்தின்கீழ் சில பிரதேசங்களில் அபரிமிதமான வாகன வசதிகள், அபிவிருத்திக்கான செயற்பாடுகள் மேற்கொள்ளப்பட்டுக் கொண்டிருக்கின்றபோது இவ்வாறான குறிப்பிட்ட சில பிரதேசங்களில் அவை புறக்கணிக்கப்பட்டுக்கொண்டிருப்ப தானது இந்த நல்லாட்சியை ஏற்படுத்தியதில் அர்த்தமில்லை யென்று சம்பந்தப்பட்டவர்கள் சொல்லக்கூடிய ஒரு நிலைமையை ஏற்படுத்திவிடும். ஆகவே, இனிமேலாவது அந்த நிலைமையை உருவாக்கிவிட வேண்டாமென்று கேட்டுக் கொள்ள விரும்புகின்றேன். மேலும், வீதி அபிவிருத்தித் திணைக்களத்திற்குரிய வீதிகள், பிரதேச - உள்ளூராட்சிச் சபைகளுக்குரிய வீதிகள் என்பன குன்றும் குழியுமாகக் காணப்படுகின்றன. போக்குவரத்துச் சாதனங்கள்கூட செல்ல முடியாதளவுக்கு அவை கரடுமுரடாகக் காணப்படுகின்றன. வடக்கிலும்கூட, தீவுப் பகுதிகளில் காணப்படுகின்ற வீதிகள் 30 - 40 வருடங்களுக்கு முன்னர் அபிவிருத்தி செய்யப்பட்ட

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

නිලයිලේයේ කිඩක්කින්රන. එනවේ, ඉන්ත විඩයංකළ් මීදු එදිර්වරුම් වරවු සෙලවුත් තිට්ඩත්තින්පෝදු මිකක් කූදුදලාන කවනම් සෙලුත්ත වේණ්ඩුමෙන්රු කේට්ඩුක්කොළ්කින්රේන්.

ඉන්නුමොරු විඩයත්තෙයුම් නාන් සොල්ලික්කොළ්ළ විරුම්පුකින්රේන්. අතාවදු කඩන්ත කාලංකළිල් විළෙයාට්ඩුත්තුරෙක්කුප් පොරුප්පාන පෝතනාසිරියර්කළෙ අල්ලදු පයිර්රුවිප්පාළර්කළෙත් තොරිවුසෙය්යප්පෝවතාක ආරවාරමාකප් පේසප්පට්ඩදු. ඉදු තොඩර්පාකප් පත්තිරිකෙකළිලුම් මර්රුම් ඌඩකංකළිලුම් සෙය්තිකළ් වෙළිවන්රන. තේසිය රීතියිල් 3,880 විළෙයාට්ඩුප් පයිර්රුවිප්පාළර්කළෙ ආට්සේර්ප්පුච් සෙය්වතාකක් කූරප් පට්ඩදු. ආනාල්, අතර්කුරිය සෙයර්පාඩුකළ් මන්තමාන නිලයිලිල් කාණප්පඩුකින්රන. අන්ත විළෙයාට්ඩුත්තුරෙ සාර්න්දු තේසිය මට්ඩත්තිලුම් සර්වතේස මට්ඩත්තිලුම් මාකාණ මට්ඩංකළිලුම් සාතනෙ පඩෙත්ත පයිර්රුවිප්පාළර්කළ් අන්නත් තොළිලුක්කාක ඒංකික් කොණ්ඩිරුක්කින්රාර්කළ්. තනිප්පට්ඩ මුරෙයිල් අවර්කළ් මාත්තිරම් ඒංකික්කොණ්ඩිරුක්කවිල්ලෙ; අවර්කළුටෙය කුඩුම්පංකළුම් ඒංකික්කොණ්ඩිරුක්කින්රන. අතාවදු උරිය තකුතියිරුන්දුම් අවර්කළ් අන්නප් පතවික්කාක ඒංකික්කොණ්ඩිරුක්කිරාර්කළ්. එනවේ, විරෙවාක විළෙයාට්ඩුප් පයිර්රුවිප්පාළර් පතවිකළ් වළංකප්පඩ වේණ්ඩුම් එන්පතෙ ඉන්ත මාතත්තිල් ඉරණ්ඩාවදු තඩවෙයාකවුම් පතිවුසෙය්තුකොළ්ළ විරුම්පුකින්රේන්; ඉතර්කුරිය නඩවඩික්කෙකළ් එඩුක්කප්පඩ වේණ්ඩුමෙන්රු කේට්ඩුක්කොළ්කින්රේන්.

ඉන්නුමොරු විඩයත්තෙයුම් නාන් සොල්ලියාක වේණ්ඩුම්. අතාවදු, කඩන්ත සිල නාට්කළුක්කු මුන්පු මට්ඩක්කළප්පිල් ඔරු නිකළ්වු නඩෙපෙර්රදු. අතාවදු, මයිලම්පාවෙළි එන්නුම් කිරාමත්තිල් පරමේස්වරන් එන්පවරුක්කුච් සොන්තමාන තනියාර් කාණියොන්රු ඉරුක්කින්රදු. අතිල් අරස මරමොන්රු මුළෙත්ත්, කිළෙ පරප්පියිරුන්තදු. අන්ත අරස මරක්කිළෙ මින්සාරක් 'කේපි'ළුක්කුළ් සෙන්රු මින්සාරත් තඩංකලෙ ඒර්පඩුත්තක්කූඩිය ඔරු නිලෙමෙ කාණප්පට්ඩදු. අතනාල් අන්ත වීට්ඩු උරිමෙයාළර් අන්ත අරස මරත්තෙ අඩියෝඩු වෙට්ඩවිල්ලෙ. ආනාල්, මින්සාර වයරුක්කුළ් සෙන්ර කිළෙකළෙ අකර්රියිරුන්තාර්. ආනාල්, අංකු නඩන්ත විපරීතම් එන්නවෙන්රාල්, අංකිරුක්කින්ර මංකළරාම විකාරෙක්කුප් පොරුප්පාක ඉරුක්කින්ර පෞත්ත මතකුරු අන්ත ඉඩත්තුක්කු වන්දු මිකවුම් අනාකරිකමාන මුරෙයිල් සෙයර්පට්ඩු, මිකවුම් වක්කිරමමාන වාර්ත්තෙකළෙප් පේසියදු මට්ඩුමල්ලාමල්, ඕර් ඉනත්තෙච් සේර්න්දවර්කළෙ මිකවුම් කීළ්ත්තරමාන මුරෙයිල් තිට්ඩිත් තීර්ත්ත සෙයර්පාට්ඩිනෙයුම් සෙය්තාර්. කඩන්ත කාලත්තිලුම්කූඩ, අරස නිර්වාකංකළ් මුරෙයාක සෙයර්පඩුවතර්කුත් තඩංකලෙ ඒර්පඩුත්තක්කූඩියවිතත්තිල් අන්ත මතකුරු සෙයර්පට්ඩිරුන්තාර්.

අදු මට්ඩුමල්ල, කඩන්ත වරුඩත්තිල් නඩෙපෙර්ර ඔරු සම්පවත්තෙයුම් ඉන්ත වේළෙයිලේ කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්. අතාවදු, කිරාම සේවෙ උත්තියෝකත්තර් ඔරුවරෙ මිකවුම් තාරුමාරාක අවර් පේසියතෝඩු, අවරෙත් තාක්කුවතර්කුම් මුර්පට්ඩිරුන්තාර්. අතේනේරම් අංකු පෙණ් පොලිස් උත්තියෝකත්තර් ඔරුවර් තාක්කුතලුක්කු ඉලක්කාකක් කූඩිය ඔරු නිලෙමෙයුම් කාණප්පට්ඩදු. අතුමට්ඩුමල්ලාමල්, නේර්රු මුන්තිනම් ඔරු සම්පවම් නඩන්තදු. අතාවදු, ඒරාවූර්ප්පර්රු පිරතේස සෙයලකත්තින් සෙයලාළර් තිරු. විල්වරට්ණම් අවර්කළෙ අන්නප් පික්කු 'සේර්ට්'ටිල් පිඩිත්තුත් තාක්කක්කූඩිය ඔරු නිලෙමෙ කාණප්පට්ඩදු. ඉන්ත විඩයම් සම්පන්තමාක නාංකළ් මුරෙප්පඩි පොලිස් නිලෙයත්තිර්කුච් සෙන්රු උතවිප් පොලිස් අත්තියට්සකරිටම් මුරෙප්පාට්ඩු සෙය්තිරුන්තෝම්. අන්ත මුරෙප්පාට්ඩින් පිරකාරම්, අවර් උණ්මෙයෙය ඔත්තුක්කොණ්ඩාර්; අංකු නඩන්ත සම්පවම් තවරු එන්පතෙයුම් ඒර්රුක්කොණ්ඩාර්. ආනාල්, අතර්කුරිය නඩවඩික්කෙකළ් තුරිතමාක එඩුක්කප්පඩවිල්ලෙ.

සට්ටත්තින් මුන්නිලෙයිල් යාවරුම් සමමාකවිරුන්තාල් තවරු සෙය්කින්රවර්කළ්, කෙට්ට වාර්ත්තෙකළෙප් පේසුකින්රවර්කළ්, ඉනංකළ් මත්තියිල් පිරිවිනෙයෙය ඒර්පඩුත්තක්කූඩිය විතත්තිල් සෙයර්පඩුකින්රවර්කළ් ඉන්දුමතක් කුරුක්කළාක ඉරුන්තාල් එන්න, කිරිස්තව මතක් කුරුක්කළාක ඉරුන්තාලෙන්න, ඉස්ලාමිය මතක් කුරුක්කළාක ඉරුන්තා ලෙන්න, පෞත්තමතක් කුරුක්කළාක ඉරුන්තාලෙන්න, අවර්කළුක්කු එතිරාක උරිය නඩවඩික්කෙයෙඩුක්කප්පඩ වේණ්ඩුම්. අරස සේවෙයිල් උළ්ළවර්කළ්කූඩ තංකළුටෙය පණිකළෙ මේර්කොළ්ළ මුඩියාතළවුක්කු මිකවුම් කොඩුරමාන, වක්කිරමාන පෝක්කුඩන් සෙයර්පඩුම් අන්ත මතකුරුවුක්කු එතිරාක නඩවඩික්කෙ එඩුක්කප්පඩ වේණ්ඩුම්. අව්වාරු ඉල්ලෙයෙන්රාල්, ඉන්ත නාට්ටිල් මීණ්ඩුම් ඉන රීතියාන මුරුකල් නිලෙමෙ ඒර්පඩලාම්. ආනාල්, මිකවුම් නියායමාකවුම් නිතානමාකවුම් පොරුප්පුඩනුම් සෙයර් පඩුකින්ර මතකුරුමාරෙ නාංකළ් වණංකුකින්රෝම්; මතික්කින්රෝම්; අවර්කළුක්කු මරියාතෙයළික්කින්රෝම්. අතේනේරත්තිල්, තේසිය ඉක්කියත්තුක්කු ඌරුවිළෙවික්කක් කූඩිය විතත්තිල් සෙයර්පඩුකින්රවර්කළුක්කු එතිරාක ඉන්ත නල්ලාට්සි අරසු උඩනඩියාක නඩවඩික්කෙ එඩුක්ක වේණ්ඩු මෙනක් කූරි, එනදු උරෙයිනෙ නිරෙවු සෙය්කින්රේන්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(මාණ්පුමිකු කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)

අදුත්තු, කෞරව අමෙච්සර් කපීර් හාෂීම් අවර්කළ්! උංකළුක්කු 8 නිමිඩම් ඔදුක්කප්පට්ඩිරුක්කින්රදු,

[පූ.භා. 11.56]

**ගරු කබීර් හාෂිම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු කපීර් හාෂීම් - නෙදුඤ්චාලෙකළ් මර්රුම් වීති අපිවිරුත්ති අමෙච්සර්)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම 2018 වන විට මුළු ලෝකයම ආර්ථිකමය පසුබෑමකට ලක්වෙලා තිබෙන අවස්ථාවක, ආසියානු කලාපයේ විතරක් නොවෙයි, යුරෝපයේ ආදී වශයෙන් විවිධ රටවල් ලොකු ආර්ථික අර්බුදවලට මුහුණ දී තිබෙන අවස්ථාවක තමයි ආණ්ඩුවක් හැටියට අපි අද ලංකාවේ ආර්ථිකය ස්ථාවර කිරීමට පියවර කිහිපයක් අරගෙන තිබෙන්නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න ඇමතිතුමා මුදල් ඇමතිතුමා වෙනුවෙන් මේ විවාදය ආරම්භ කළා. ගරු මුදල් ඇමතිතුමාටත්, එතුමාටත් ආණ්ඩුව වෙනුවෙන් විශේෂ ස්තුතියක් පුද කරන්න ඕනෑය කියලා මා හිතනවා. ඉතාම අමාරු වෙලාවක ප්‍රශ්න කිහිපයක් තිබෙද්දී, රටට බාහිර බලපෑම් විශාල ප්‍රමාණයක් තිබෙද්දී ඒවා කළමනාකරණය කරමින් මේ රටේ නිෂ්පාදනය වැඩි කරන්නට, මේ රටේ උද්ධමනය පාලනය කරන්නට, මූල්‍ය කළමනාකරණය කරන්නට අපි විශේෂ උනන්දුවක් දක්වා තිබෙනවාය කියන එක මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

මම හිතනවා, විපක්ෂයේ වාඩිවෙලා ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් විශාල පිරිසක් ඉන්නවා, ආණ්ඩුව විවේචනයට ලක් කරන අය. නමුත්, අවුරුදු ගණනාවක් ආණ්ඩු බලයේ සිටිද්දී ඒ අයගේ ක්‍රියාකාරකම් සහ ක්‍රමවේද දිහා බලන කොට මීට වඩා මේ රට තුළ තිබුණු අර්බුද කිහිපයක් පැහැදිලි වෙනවා. අද තිබෙන මේ අර්බුද වෙනුවෙන් අද අපි අරගෙන තිබෙන පියවරවල ප්‍රතිඵල ගැන මම කියන්න කැමැතියි.

එකක් තමයි, 2018 පළමුවැනි කාර්තුව තුළ විශේෂයෙන්ම කෘෂිකර්ම අංශයේ නිෂ්පාදනය සියයට 4.8ක වර්ධනයක් අපි දකිනවා. මේ වෙලාවේ ඒක හොඳ දෙයක්. ඒ වාගේම, කර්මාන්ත ගත්තාම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7ක වර්ධනයකුත් තිබෙනවා. කර්මාන්ත සහ සේවා අංශයේ වර්ධනයක් තිබෙනවා. 2016 - 2017 වර්ෂයේ මහ කන්නයත් එක්ක සසඳන කොට 2017 - 2018 වර්ෂයේ මහ කන්නයේ වී නිෂ්පාදනය සියයට 60ක වර්ධනයක් තිබෙනවා. 2016 - 2017 වර්ෂයේ වී මෙට්‍රික් ටොන් මිලියන 1.5ක් තිබෙද්දී මේ වසරේ එය මෙට්‍රික්ටොන් මිලියන 2.4 දක්වා වැඩිවෙලා තිබෙනවා. ඒ නිසා බාහිර ප්‍රශ්න තිබුණාට දේශීය වශයෙන් අපේ නිෂ්පාදනය, අපේ නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කර තිබෙනවා.

අපේ මත්ස්‍ය නිෂ්පාදනය ගත්තාම GSP Plus එකෙන් පස්සේ විශේෂයෙන්ම මුහුදු මාළු අපනයනය විශාල වශයෙන් වැඩිවෙලා තිබෙනවා. මම දිගටම මතු කරන තර්කයක් තමයි මුහුදෙන් වට වූ දිවයිනක් වශයෙන් අපේ ප්‍රධාන අපනයනයක් හැටියට මත්ස්‍ය අපනයනය තබා ගත යුතු බව. එය සියයට 100ක value addition එකක් තිබෙන කර්මාන්තයක්. පසු ගිය අවුරුදු දහය තුළත් මේ කාර්මාන්තය දියුණු වුණේ නැහැ. අපි තවමත් මේ කර්මාන්තයට බර දමා තිබෙනවා මදියි කියලා මම හිතනවා. ඒ නිසා ඒක වැඩි කරන්න ඕනෑ. අපේ විනිමය ආදායම වැඩි කරන්න නම් මෙවැනි පියවර ගැනීම වැදගත්.

අපේ මූල්‍ය පැත්තෙන්, විදේශ සහ බාහිර මූල්‍ය අංශ පැත්තෙන් ගත්තාම, මේ අමාරුම කාලය තුළ මෙවැනි බලපෑම් තිබෙද්දීත් අපේ මුදල් අමාත්‍යාංශයෙන් හා භාණ්ඩාගාරයෙන් අරගෙන තිබෙන පියවර ගැන අපි විශේෂයෙන්ම සතුටු වෙන්න ඕනෑය කියලා මම හිතනවා. 2018 වර්ෂයේ පළමුවැනි මාස හතර ගත්තාම, විදේශ සේවකයන්ගෙන් එන මුදල් ප්‍රමාණය වැඩිවෙලා තිබෙනවා. ඒ වාගේම, මේ රටට එන විදේශ සංචාරකයන්ගේ ප්‍රමාණය වැඩිවෙලා තිබෙනවා.

මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. පොඩි අඩුපාඩුවක් වෙනකොට බොහෝ දෙනෙක් ආණ්ඩුව විවේචනය කරනවා. නමුත් හොඳ වැඩක් කරන කොටත් විපක්ෂයේ හිටියත් මොන පැත්තේ හිටියත් ප්‍රශංසා කිරීම වගකීමක් යුතුකමක් වෙනවා. "Lonely Planet" කියන්නේ tourism flow එක rate කරන ලොකුම agency එකක්; ජාත්‍යන්තරයේ තිබෙන ලොකුම agency එකක්. මේ "Lonely Planet" agency එකෙන් ශ්‍රී ලංකාව පළමුවැනි තැනට rate කර තිබෙනවා. මම හිතන හැටියට මේක ඉතා වැදගත් ඉතිහාසගත වන දෙයක්. ලෝකයේම ප්‍රශ්න තිබෙද්දී, අපිත් එක්ක ආසියාවේ රටවල් විතරක් නොවෙයි, විවිධ රටවල් තරග කරද්දී, ලංකාව සංචාරය කළ යුතු ලෝකයේ හොඳම රටක් බවට "Lonely Planet" කියන rating agency එක වාර්තා කර තිබෙනවා. මේක ලොකු දෙයක්. මේ වෙලාවේ අපි මේ තත්ත්වය ඉදිරියට ගෙන යන්න නම්, අපේ විදේශ විනිමය තවත් වැඩි කරන්න නම්, රුපියල ස්ථාවර කරන්න නම් මෙවැනි පියවර ගැනීම වැදගත්.

මේවා විවේචනය කර කර ඉන්න එක නොවෙයි කරන්න ඕනෑ. මේවා සිදුවන්නේ බාහිර බලපෑම් මත තමයි. විශේෂයෙන් 2018 වසරේ පසුගිය මාස හතර ගත්තාම, අපේ විදේශ සංචිතය මේ රටේ ඉතිහාසයේ වැඩිම ගණනකට ඉහළ ගිහිල්ලා තිබෙනවා. 2018 වසරේ අප්‍රේල් වනකොට අපේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 9.9ට ඉහළ ගියා. ඒකට හේතුව ඒ වෙලාවේදී ජාත්‍යන්තර බැඳුම්කර -International Sovereign Bonds- නිකුත් කිරීම වාගේම කොටස් වෙළඳපොළට විශාල වශයෙන් විදේශ ආයෝජන ඇතුළුවීමයි. කාලයකට පසු 2018 අප්‍රේල් වනකොට අපේ ගෙවුම් ශේෂයේ surplus එකක් ලබා ගන්න අපට පුළුවන් වුණා. අවුරුදු ගණනාවකට පසුව පළමුවෙනි වතාවට ඩොලර් මිලියන 2,036ක surplus එකක් අපට තිබුණා, ඊට කලින් අවුරුද්දට සාපේක්ෂව බලන කොට. ඒ අනුව අපට පෙනී යන්නේ මොකක්ද? 2018 වසර වනකොට මේ ආණ්ඩුව රටේ ආර්ථික ගමන වෙනස් කරලා තිබෙනවා. මේ වනකොට එහි සාර්ථක ප්‍රතිඵල ලැබී තිබෙනවාය කියන එක අපට පෙනෙනවා. ඒ අනුව දේශීය නිෂ්පාදනය, කෘෂිකර්මය, සංවර්ධනය, මූල්‍ය ක්ෂේත්‍රය මූල්‍ය සංචිත, විදේශ සංචිත ඔක්කෝම ඉහළ ගියා. එතකොට 2018 අප්‍රේල්වලින් පසුව මොකක්ද වුණේ? 2018 අප්‍රේල්වලින් පසුව ආණ්ඩුවේ ක්‍රියාකාරකම්වල වෙනසක් වුණාද? නැහැ. ඉන් පසුව ලෝකයේ නිර්මාණය වූ ආර්ථික අර්බුදය අපේ රටට වාගේම විවිධ රටවලට බලපෑමක් ඇති කළා. ඒ තත්ත්වය පාලනය කරන්න අපට තිබුණු ශක්තිය සීමිතයි. ඇමෙරිකාවේ ට්‍රම්ප් ජනාධිපතිතුමා ගත් යම් යම් තීරණ, ඉරානයට පැන වූ සම්බාධක ආදී විවිධ ප්‍රශ්න ලංකාවටත් බලපාන්න පටන් ගත්තා. ඒත් එක්කම අපේ විදේශ සංචිත ප්‍රමාණය අඩුවනවා වාගේම, රුපියලේ වටිනාකමත් අඩුවන්න පටන් ගත්තා. දැන් ඒ ප්‍රශ්නවලට මුහුණ දෙන ආකාරය සහ ඒ තත්ත්වය කළමනාකරණය කිරීමේ හැකියාව තමයි වැදගත් වන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you have two more minutes.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Okay, Sir, I will finish.

මේ වාගේ වෙලාවකදී අපි මොකක්ද කරන්නේ කියලා විශේෂයෙන්ම මම කියන්න කැමැතියි. අපි අපේ අපනයන ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න කටයුතු කළා. 2018 අප්‍රේල් මාසය වනකොට -පළමුවෙනි කාර්තුවේ- අපේ අපනයනය සියයට 6කින් වැඩි වෙලා ඩොලර් මිලියන 3,784ක අපනයනයක් අපි සිද්ධ කළා. මේ වනකොට අපි අපනයන ක්ෂේත්‍රයත් දියුණු කරලා තිබෙන්නේ. ඒ අනුව අපනයනවලින් එන ආදායම වැඩි කරන්න අපට පුළුවන් වුණා.

මේ ඔක්කෝම අපි අනික් රටවල් එක්ක සසඳා බලමු කෝ. ලංකාවේ විතරක් බලලා වැඩක් නැහැ නේ. 2017දී රුසියාවේ ආර්ථික වර්ධන වේගය සියයට 1.5යි. විලී රටේ ආර්ථික වර්ධන වේගය සියයට 1.5යි. ඕස්ට්‍රේලියාවේ ආර්ථික වර්ධන වේගය සියයට 2.3යි. කැනඩාවේ ආර්ථික වර්ධන වේගය සියයට 1.3යි.

මැලේසියාවේ ආර්ථික වර්ධන වේගය සියයට 5.9යි. සිංගප්පූරුවේ ආර්ථික වර්ධන වේගය සියයට 3.6යි. කොරියාවේ ආර්ථික වර්ධන වේගය සියයට 3.1යි. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට 3.4යි. ශ්‍රී ලංකාව විතරක් අරගෙන, "අපේ ආර්ථික වර්ධන වේගය අඩුවෙලා. රට ඉවරයි. ආර්ථිකයේ අර්බුදයක් තිබෙනවා"යි කියලා කිව්වාට, ඕස්ට්‍රේලියාව, කොරියාව, තායිලන්තය, සිංගප්පූරුව යන මේ හැම රටක්ම ලංකාවට වඩා

[ගරු කබීර් හාෂිම් මහතා]

ආර්ථික වර්ධන වේගයක් පෙන්නුම් කරනවා. මේ කාල පරිච්ඡේදය තුළ මුළු ලෝකයේම ආර්ථික වර්ධන වේගයේ අඩුවීමක් සිදුවෙලා තිබෙන බව ඉතාම පැහැදිලියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය ආදායම වැඩි කරලා තිබෙනවා. මේ වසරේ පළමුවන කාර්තුවේ රාජ්‍ය ආදායම සියයට 5.6කින් වැඩි කරලා තිබෙනවා. එය වැදගත් කාරණයක්.

ඒ විතරක් නොවෙයි. ආදායම් බදු වැඩි කිරීම සඳහා අපි කටයුතු කරලා තිබෙනවා. 2017 වනකොට ආදායම් බදුත් වැඩි කරලා තිබෙනවා. අපට එල්ල කරපු ලොකුම චෝදනාව තමයි, අපි පුංචි මිනිසුන්ගෙන් බදු අය කරනවා වැඩියි කියන එක. මා මෙහිදී විශේෂයෙන්ම බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ, තමන්ගේ පාලන කාලය දිහා බලන්න කියලා. 2009 වසරේ අය කරපු සෘජු බදු ප්‍රමාණය ප්‍රතිශතයක් හැටියට ගත්තාම සියයට 22යි; වක්‍ර බදු ප්‍රමාණය සියයට 77යි. 2010 වනකොට සෘජු බදු ප්‍රමාණය සියයට 18 දක්වා අඩු වෙනවා; වක්‍ර බදු ප්‍රමාණය සියයට 81ක් දක්වා වැඩිවෙනවා. වක්‍ර බදු වැඩි වෙන්නේ කොහොමද? වැට් එක, ජාතිය ගොඩ නැඟීමේ බද්ද, ආර්ථික සේවා බද්ද ආදී වශයෙන් බදු අය කරලා, කිරි පිටිවලට, පරිප්පුවලට, සීනිවලට, කොත්තමල්ලිවලට ඒ කාලයේ පුංචි මිනිසුන්ගෙන් බදු අය කරගෙන ඒවා සාක්කුවලට දමා ගත්තා. 2011 වනකොට සෘජු බදු ප්‍රමාණය සියයට 18යි; වක්‍ර බදු ප්‍රමාණය සියයට 81.4යි. 2014 වර්ෂයේ අවසානයේ දී සෘජු බදු ප්‍රමාණය සියයට 18යි; වක්‍ර බදු ප්‍රමාණය සියයට 81.1යි. අද අපි මේ නියමයන් මඟින් ගෙන එන අලුත් ආදායම් බදු ප්‍රතිපත්තිය තුළින් විශේෂයෙන්ම ඉලක්ක කරන්නේ, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අවසාන වශයෙන් මේ කාරණය පිළිබඳවත් මා සඳහන් කරන්න කැමැතියි. අද තිබෙන සියයට 18ක් වූ සෘජු බදු ප්‍රතිශතය සියයට 40 දක්වා වැඩි කරන්නත්, අද තිබෙන සියයට 82ක් වූ වක්‍ර බදු ප්‍රතිශතය සියයට 60ක් දක්වා අඩු කරන්නත් තමයි මේ අලුත් බදු ප්‍රතිපත්තිය අපි අනුගමනය කරන්නේ කියන එක විශේෂයෙන්ම සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තූතියි. මීළඟට ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා.12.06]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන අණ පනත් සම්බන්ධයෙන් රජය වෙනුවෙන් කථා කළ අපේ උගත් මිත්‍ර ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමාත්, උගත් මිත්‍ර කබීර් හාෂිම් ඇමතිතුමාත් ප්‍රථම වතාවට පිළිගත්තා, ඉතා විශාල බාහිර කම්පනයන්ට ඔරොත්තු දීම සඳහා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට වැඩ පිළිවෙළක් නැහැයි කියලා. එය පිළිගැනීම ගැන මා සතුටු වෙනවා. එයට හේතුව මොකක්ද? ට්‍රම්ප් ජනාධිපතිතුමායි, චීනයයි අතර තිබෙන වෙළෙඳ යුද්ධය හෝ ඇමෙරිකා එක්සත් ජනපදයේ පොලී වැඩිවීමේ සිද්ධිය නිසා මේ ආර්ථිකය කළමනාකරණය කර ගන්න බැහැයි කියලා පිළිගැනීම ම ආණ්ඩුවේ නොහැකියාව පිළිගැනීමක්. මොකද, ලංකා ඉතිහාසයේ නිදහසින් පස්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවට පෙර ආණ්ඩු කාල පරිච්ඡේද 14ක් තිබිලා තිබෙනවා. මේ රටේ කිසිම රාජ්‍ය නායකයෙක් ලංකා ඉතිහාසයේ රාජ්‍ය පාලන කාල පරිච්ඡේද 14 තුළම මුහුණ නොදුන්නු වැඩිම බාහිර කම්පන ප්‍රමාණයකට මුහුණ දුන්න රජය මහින්ද රාජපක්ෂ රජයයි.

පළමුවන කාරණය මෙයයි. ලෝක වෙළෙඳ පොළේ තෙල් බැරලයක මිල ඩොලර් 127ක් වැනි ඉහළ මට්ටමකට ගිහින් මුළු ලෝකයම තෙලෙන් බැඳෙනවා. අද ඛනිජ තෙල් පිළිබඳ එවැනි කිසිම අර්බුදයකට ඔබතුමන්ලා මුහුණ දීලා නැහැ. මොකද, දැනුත් ලෝක වෙළෙඳ පොළේ තෙල් බැරලයක මිල ඩොලර් 80යි. තෙල් බැරලයක මිල ඩොලර් 80ට තිබෙනකොටත් අපේ කාලයේ පෙට්‍රල් මිලට වඩා දැන් පෙට්‍රල් මිල වැඩියි; අපේ කාලයේ ඩීසල් මිලට වඩා දැන් ඩීසල් මිල වැඩියි. මුළු ලෝකයේම දැවැන්ත අර්බුදයක් තිබිලාත් 2012, 2013, 2014 කියන වර්ෂ තුනේදීම ලෝක වෙළෙඳ පොළේ තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 105ට වඩා වැඩියි. මුළු ලෝකයම තෙලෙන් බැඳිලා. මුළු ලෝකයේ සියලුම රටවල බැංකු ක්‍රමය, ණය ක්‍රමය හෙල්ලෙනවා, තෙල් බිල ගෙවන්න ගියාම. ලංකා බැංකුවට, මහජන බැංකුවට මා සඳහන් කළ යුතු වෙනවා, අපේ කිසිම රාජ්‍ය නායකයකුගේ කාලයක ලංකාවට ඛනිජ තෙල් ආනයනය කරන්න ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් වියදම් කරන්න සිද්ධ වෙලා නැහැයි කියලා. අවුරුදු තුනකට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අපි ගන්න ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5යි. මහින්ද රාජපක්ෂ යුගයේ තෙල් ගෙනෙන්න ඩොලර් බිලියන 5ක් වැය වුණා. මේ ආණ්ඩුව කාලයේ හරියට ඒ ප්‍රමාණයෙන් භාගයයි වැයවෙලා තිබෙන්නේ. ලෝක ඛනිජ තෙල් අර්බුදය තිබුණු අවස්ථාවේ මේ රජය තිබුණා නම්, ඒ බාහිර කම්පනයට මුහුණ දෙන්නේ කොහොමද? මේ රජයට එයට මුහුණ දෙන්න බැහැයි කියන එක ඉතා පැහැදිලියි.

දෙවන කාරණය මෙයයි. 2007 සිට ලෝකයේම දැවැන්තම මූල්‍ය අර්බුදයක් තිබුණා. එක්සත් ජනපදයේ විතරක් බැංකු 450ක් වැටුණා. අද වාගේ නොවෙයි. Mutual Bank කඩාගෙන වැටුණා, Lehman Brothers බංකොලොත් වුණා. කාඩ් කුට්ටම පෙරළෙනවා වාගේ මුළු ලෝකයේම මූල්‍ය ක්‍රමය කඩාගෙන වැටුණා. මූල්‍ය ක්‍රමය කඩා වැටෙනකොට ලංකාවේ සෙලාන් බැංකුව හෙල්ලෙන්න පටන් ගත්තා. මහින්ද රාජපක්ෂ මැතිතුමා මොකක්ද කළේ? එක තීන්දුවෙන් සෙලාන් බැංකුව රජය යටතට ගත්තා. ලෝක මූල්‍ය අර්බුදයට මුහුණ දුන්නු එක බැංකුවක්වත් කඩා වැටෙන්නේ නැති වෙන්න ලංකාව ඒ බාහිර අර්බුදයට මුහුණ දුන්නා.

තුන්වැනි කාරණය මෙයයි. අවුරුදු 30කට පස්සේ ලෝකයේ දැවැන්තම ආහාර අර්බුදයක් ඇති වුණා. මම වෙළෙඳ ඇමතිවරයා වශයෙන් සිටි නිසා මම ප්‍රායෝගිකව අත්විඳින්දා. ලෝකයේ භාණ්ඩ මිල රොකට් වේගයෙන් වැඩි වුණේ. පරිප්පු මිල, කිරි පිටි මිල, තිරිඟු පිටි මිල වැඩි වුණා. මුළු ලෝකයටම කෑම නැති වුණා. කෑම දෙන රටවල් කෑම අපනයනය කරන්නේ නැති වුණා. ඒක නිසා මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් සමරතුංග මහතායි, වෙළඳ ඇමතිවරයා වශයෙන් මමයි කන්න ගේන්න දිහාවක් නැතුව අවසානයේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නියමයෙන් බුරුමයට ගියා, හාල් ටිකක් ගෙනෙන්න. මොකද, ඒ තරම්ම

දැවැන්ත ආහාර අර්බුදයක් ඇති වුණා. එහෙම ආහාර අර්බුදයක් කවදාවත් ලෝකයේ ඇති වෙලා තිබුණේ නැහැ. ලෝක ආහාර අර්බුදයට අපි මුහුණ දුන්නා. මහින්ද රාජපක්ෂ යුගයේ එම අර්බුද තුනම තිබෙන කොට අපේ රටේ තවත් අර්බුදයක් තිබුණා. ඒ තමයි, මුහුදු වෙරළෙන් තුනෙන් දෙකක්, මහ පොළොවෙන් තුනෙන් එකක් වෙනම කඩලා ඊලාම් රටක් ගොඩනැඟීම සඳහා වන මරාගෙන මැරෙන ත්‍රස්තවාදී යුද්ධය. අපේ රට ලෝකයේ සංචාරකයන්ට එන්න හොඳම රට වුණේ, මේ එල්ටීටීඊය නැති වුණු නිසා; යුද්ධය නැති වුණු නිසා. එදා යකඩ ගැටෙන අමිහිරි ශබ්දය, උණ්ඩයේ අමිහිරි සුවඳ, දුක - වේදනාව - මරලතෝනිය විතරක් තිබෙන කොට සංචාරකයෝ මේ රටට ආවාද? කටුනායක ගුවන් තොටුපොළට ප්‍රහාරය එල්ල කරන කොට, ගුවන් යානා කැලි කැඩෙන කොට මේ රටට සංචාරකයන් ආවාද? කෝච්චිය ඇතුළේ බෝම්බය පුපුරන කොට, බස් එකේ බෝම්බය පුපුරන කොට සංචාරකයන් ආවාද? මරාගෙන මැරෙන ළඳක් ඇවිල්ලා බදා ගන්නකොට, - ළඳක් නිසා බදා ගන්න වෙලාවට පොඩි සනීපයක් දැනුණත්, පුපුරන කොට තමයි වේදනාව දැනුණේ. එතකොට කවුද ආපු ආයෝජකයෝ? කවුද ආපු සංචාරකයෝ? මේ මහා දැවැන්ත අවුරුදු 30ක අභියෝගයට මේ ආණ්ඩුවට මුහුණ දෙන්න වුණා නම්, කොහොමද මුහුණ දෙන්නේ?

ඉතාම පැහැදිලිව ලංකා ඉතිහාසයේ රාජ්‍ය පාලන යුග 14ක් තිබිලා තිබෙනවා. එම යුග 14න් මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තරම් දැවැන්ත ප්‍රමාණයේ අර්බුදවලට මුහුණ දුන් කිසිම ආණ්ඩුවක් ලංකා ඉතිහාසයේ මෙතෙක් බිහි වෙලා නැහැ. ලෝක ඛනිජ තෙල් අර්බුදය, ලෝක ආහාර අර්බුදය, ලෝක මූල්‍ය අර්බුදය, මේ සියල්ල තිබෙද්දී තමයි රට කඩන යුද්ධයේ අර්බුදය - ත්‍රස්තවාදය - නිමා කරලා, රටේ නිෂ්පාදනය වැඩි කරලා, ආදායම වැඩි කරලා, රක්ෂා අවස්ථා වැඩි කරලා, ජීවන වියදම අඩු කරලා මේ රට සංවර්ධනයේ මාවතට ගෙන ආවා. අපේ අවාසනාවට ආචාර්ය හර්ෂ ද සිල්වා මගේ උගත් මිත්‍රයා උදේ වරුවේ කථා කරමින් අසත්‍ය ප්‍රකාශයක් කළා, මේ රුපියල අවප්‍රමාණය වුණේ අද නොවෙයි කියලා. කබීර් හාෂිම් මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව ගත්ත පළමුවැනි අවුරුද්දේ -2015දී- සියයට 9.3කින් රුපියල අවප්‍රමාණය වුණා; බාල්දු වුණා. එදා කොහොමද තිබුණේ?

මහින්ද රාජපක්ෂ යුගයේ 2012දී ඩොලරයේ මිල රුපියල් 127යි. 2013 වර්ෂයේ ඩොලරය රුපියල් 130යි. 2014 වර්ෂයේ ඩොලරය රුපියල් 131යි. එතකොට 2012 වර්ෂයේ ඉඳලා 2013 වෙන කොට ඩොලරයට ගෙවන මිල වැඩි වෙලා තිබෙන්නේ රුපියල් තුනයි. ඊළඟට, 2014 වෙනකොට වැඩි වෙලා තිබෙන්නේ රුපියල් එකයි. ඒක නිසා 2013 - 2014 අවුරුද්දේ දී රුපියල අධිප්‍රමාණය වුණා. රුපියල අධිප්‍රමාණය වීම නිසා ජාතියේ ණය බර 2013දී අඩු වුණා, බිලියන 19කින්. 2014දී ජාතියේ ණය බර අඩු වුණා, බිලියන 89කින්. ඒ, රුපියල අධිප්‍රමාණය වීම නිසා. රුපියල අවප්‍රමාණය වුණේ කොහොමද? මේ ආණ්ඩුව ගත්තු පළමුවැනි අවුරුද්දේ -2015දී- රුපියල් 131ක් වුණු ඩොලරයට රුපියල් 144ක් ගෙවන්න සිදු වුණා. රුපියල් 13ක් වැඩි පුර ගෙවන්න සිදුවුණා. 2016දී ඩොලරය රුපියල් 150යි. 2017දී ඩොලරය රුපියල් 158යි. 2018දී ඩොලරය රුපියල් 174යි. ලංකා ඉතිහාසයේ මෙලෙසින් කවදාවත් මේ රටේ මුදලේ අගය -රුපියල- මෙච්ච බාල්දු වෙලා නැහැ. ඒකේ ප්‍රතිඵලය විධියට 2015දී ජාතියේ ණය බර වැඩි වෙලා තිබෙනවා, රුපියල් බිලියන 285කින්. 2016දී වැඩි වෙලා තිබෙනවා, රුපියල් බිලියන 137කින්. 2017දී වැඩි වෙලා තිබෙනවා, රුපියල් බිලියන 225කින්. මේ අවුරුද්දේ රුපියල අවප්‍රමාණය වීම නිසා ණය බර රුපියල් බිලියන 328ක් වෙයි කියලා විශ්වාස කරනවා. රුපියල මෙච්ච බාල්දුවීම කරනකොට ගෙන ජාතියේ ණය බර රුපියල් බිලියන 1,022කින් වැඩි වෙලා තිබෙනවා. මීට කලින් මෙහෙම වෙච්ච ආණ්ඩු කාලයක් ගැන කාටහරි කියන්න පුළුවන්ද? කාටහරි පුළුවන් නම් කියන්න කියලා අපි අභියෝග කරනවා. අද තරම් කවදාවත් රුපියල කඩා වැටිලා නැහැ. 2015දී කිසි ප්‍රශ්නයක් තිබුණේ නැති රටක් තමයි ඔබතුමන්ලා භාර ගත්තේ.

මම ඔබතුමන්ලාට එය පෙන්වා දෙන්නම්. 2015දී විදේශ ණය සේවාකරණයට -ණය වාරික හා පොලී ගෙවන්න- යූඑස් ඩොලර් මිලියන 4,683ක් අවශ්‍ය වුණා. මහින්ද රාජපක්ෂ යුගයේදී -2014දී- ණය වාරික සහ පොලී ගෙවන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 3,479ක් අවශ්‍ය වුණා. 2015දී ණය ගෙවීමට මහින්ද රාජපක්ෂ යුගයට වඩා වැඩිපුර ඇමෙරිකානු ඩොලර් මිලියන 1,204ක් අවශ්‍ය වුණු එක ඇත්තයි. ඒක පොඩි ප්‍රශ්නයක්. ඒ ණය ගෙවන්න වැඩිපුර බිලියන 1.2ක් අවශ්‍ය වුණා. නමුත් තෙල් මිල අඩුවීමෙන් රට ඇතුළේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.9ක් ඉතිරි වුණා. ඒ මුදලින් හම්බන්තොට වරාය සැදීමට ගත් ණය එකවර ගෙවා දමන්න තිබුණා. ඇයි? ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩුවීම නිසා, රටින් පිටට යන සල්ලි -ඇමෙරිකානු ඩොලර් බිලියන 1.9ක්- ඉතිරි වුණා. "එහෙම ඉතිරි වුණේ නැහැ" කියා පුළුවන් නම් කියන්න. එහෙම ඉතිරි වුණා. ඒ ඉතිරි වුණු මුදලින් හම්බන්තොට වරායට ගත් ඩොලර් බිලියන 1.4ක ණය ප්‍රමාණය එකවර ගෙවා දමන්න තිබුණා. එහෙම කළා නම් ඒ වරාය විකුණන්න ඕනෑ නැහැ.

ඊළඟට, 2015දී මොකද, කළේ? 2015 අවුරුද්දේදී -රවි කරුණානායක මැතිතුමා අමාත්‍ය ධුරය දැරූ කාලයේදී- ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කළා. ඒකෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 2,150ක් සොයා ගත්තා. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කළා. ඒකෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 2,491ක් සොයා ගත්තා. ඉන්දියානු සංචිත බැංකුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක් ගත්තා. තෙල් බිලෙන් ඩොලර් මිලියන 1,900ක් ඉතිරි වුණා. ඒ අනුව 2015 අවුරුද්දේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 8,041ක් රට ඇතුළේ තිබුණා. ඩොලර් මිලියන 8,041ක් කියන්නේ බිලියන අටක්. සංවර්ධන බැඳුම්කර නිකුත් කරලා, ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කරලා, ඉන්දියානු සංචිත බැංකුවෙන් ගැනීමෙන් සහ තෙල් මිල අඩු වීම නිසා 2015 අවුරුද්දේ යූඑස් ඩොලර් බිලියන අටක් තිබුණා. වැඩි වුණු ණය ටික ගෙව්වාට පසුව, තව යූඑස් ඩොලර් බිලියන 6.8ක් ඉතිරි වෙලා තිබුණා. ඒ ටිකට මොකද, වුණේ?

ඔබතුමන්ලා මෙන්න මේ ඇත්ත කථාව පිළිගන්න. රටේ තිබෙන්නේ ප්‍රධාන විදේශ විනිමය වියදම් වර්ග දෙකයි. එකක් තමයි, විදේශ ණය වාරික හා පොලී ආපසු ගෙවන්න යන වියදම; ණය සේවාකරණ ගෙවීම. දෙවැනි එක තෙල් බිලයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට අදාළ ලේඛන මම **සභාගත*** කරනවා.

මහින්ද රාජපක්ෂ යුගයේදී -2012දී- මේ වියදම් දෙක සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 7,720ක් වැය වුණා. 2013දී ඇමෙරිකානු ඩොලර් මිලියන 8,352ක් වැය වුණා. 2014දී ඇමෙරිකානු ඩොලර් මිලියන 8,232ක් වැය වුණා. තමුන්නාන්සේලාගේ පාලනය ගෙන ගිය මේ අවුරුදු තුනේදීම එම වියදම් දෙක සඳහා වැය වුණු ප්‍රමාණය ඊට වඩා අඩුයි. 2015දී ඒ සඳහා වැය වෙලා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 7,472යි; 2016දී ඇමෙරිකානු ඩොලර් මිලියන 6,942යි; 2017දී ඇමෙරිකානු ඩොලර් මිලියන 7,987යි. "ඒක වැරැදියි, ඔය අසත්‍යයක් කියන්නේ, පාර්ලිමේන්තුව නොමඟ යවනවා" කියා පුළුවන් නම් කියන්න. මේ ප්‍රධාන වියදම් වර්ග දෙකම සඳහා මහින්ද රාජපක්ෂ යුගයේ 2012, 2013 හා 2014 කියන අවුරුදු තුනේදී වැය කර තිබෙන ප්‍රමාණයට වඩා, 2015, 2016 හා 2017

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

කියන අවුරුදු තුනේම වැය වෙලා තිබෙන ප්‍රමාණය අඩුයි. වෙන ප්‍රශ්නයක් මෙතැන තිබෙන්නේ. ඔබතුමන්ලා මේ ප්‍රශ්නය තේරුම් ගන්න.

මම දැන් කියන්න යන කාරණය ගැනව ඒ ප්‍රදේශවල තත්ත්වය කොහොමද කියා අපේ ගරු කථානායකතුමාගෙන් වුණත් අහලා බලන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක එක පළාත්වල, විදේශ රැකියාවලට ගිය අයගේ නිවෙස්වලට ගිහින් රුපියල් 175ට ඩොලර් ගන්නවා. ඩොලර් තිබෙනවා නම්, රුපියල් 175ට ගන්නවා. වැල්ලවත්තේ, පිටකොටුවේ අද උදේ ඩොලර් එක විකුණුවේ රුපියල් 180ටයි; උණ්ඩි කරන්න, වෙන දේවල්වලට. මේ black market එක පාලනය කරන්න තිබෙන ක්‍රමය මොකක්ද? ලබන සුමානය වන විට ඩොලර් එක රුපියල් 178ට ගන්නවා. මේ ටික නිල වශයෙන් බැංකුවට එන්නේ නැහැ. රට රක්ෂාවකට ගිය අය හෝ ඕනෑම කෙනෙකු කැමැතියි, තමන් ගෙනෙන රට සල්ලිවලට වැඩි මුදලක් ගන්න. කිසිදු පාලනයකින් තොරව කැෂියර් එකෙන් දෙනවා, මේ විදේශ විනිමය. කිසි ප්‍රශ්නයක් නැහැ, කවුරුවත් බලන්නේ නැහැ. පොලිස්පතිතුමාට වුණත් රට සල්ලි ටිකක් වැඩිපුර සොයා ගෙන යන්න ඕනෑ වුණොත්, යන්නේ කළු කඩයටයි. රහස් පොලීසිය මේ බව දන්නවා; මූල්‍ය අපරාධ ඒකකය දන්නවා; අනික් සියලුදෙනාත් දන්නවා. කළු කඩයේ එහෙම දෙනවා. කළු කඩයේ ඩොලරය රුපියල් 180ට විකිණෙන කොට, එය රුපියල් 200ට යන එක නතර කරන්න කිසිම වැඩ පිළිවෙළක් තමුන්නාන්සේලාට නැහැ.

රටක මුදල් ඒකකය කඩාගෙන වැටෙනවා නම්, රජයක් විධියට, ආර්ථික විද්‍යා මූලධර්ම අනුව එය සමනය කිරීමට කටයුතු කරන්න ඕනෑ. ඒක ශාස්ත්‍රීය කටයුත්තක්. එතකොට රටේ මහ බැංකුව තමන්ගේ පොලී අනුපාතය වැඩි කරන්න ඕනෑ. අපේ මහ බැංකුව පොලී අනුපාතය වැඩි කරන්නේ නැහැ. ආර්ථික විද්‍යා මූලධර්මයටත් පටහැනිව රටක් ගෙන යනවා නම් අපි මේ කථා කරන එකේ තේරුමක් තිබෙනවාද? මේ මොකක්ද කරන්නේ කියා මම දන්නේ නැහැ. දේශපාලනඥයන්ට මේ වැඩේ භාර දෙන්නේ නැතිව, රටක සිටින ආර්ථික විද්‍යාඥයෝ, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉන්නා අය, මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව, විනිමය පාලන දෙපාර්තමේන්තුව, ආර්ථික සැලසුම් දෙපාර්තමේන්තුව කියන ආයතනවල ඉන්නා විෂයානුබද්ධ විද්වතුන් රැස් වෙලා මේ සඳහා උත්තරය හොයන්න ඕනෑ. නමුත් උත්තරය හොයන්න දෙන්නේ නැහැ. උත්තරය හොයන්න තිබෙන අඩු තමුන්නාන්සේලා කැඩුවා. එහෙම කඩන්න හේතුව මේකයි. අපිට විනිමය පාලන පනතක් - Exchange Control Act - තිබුණා. 1953 සිට තිබුණ පනත, liberalize කරනවා කියලා ගෙනැත්, ඔක්කොම ටික අත්හැර දැමුවා. අතහැර දමලා, සියල්ල නිදහසේ සිදු වෙන්න ඉඩ ඇරියා. ඒකාබද්ධ විපක්ෂය වශයෙන් අපි විතරක් ඒ වෙනුවෙන් උසාවියට ගියා. හීලෑ විපක්ෂය ගියේ නැහැ; "සීල්" විපක්ෂය ගියේ නැහැ. "මෙහෙම වුණොත් මේ රට වැටෙනවා, මේ රටේ මිනිසුන් මේ ඔක්කොම අරගෙන යන්න පටන් ගනිවී, එදාට මේක නතර කර ගන්න බැහැ" කියා අපි උසාවියට ගිහින් කිව්වා. අද තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරන්නේ සිංගප්පූරු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමයි. "ලබන වසරේ සිට උඳු, කව්පි, මිරිස් ගෙනෙන්න දෙන්නේ නැහැ, ගොවියෝ වැටිලා ඉවරයි, ඔවුන්ට යන එන මං නැහැ, ඒ නිසා ඒවා ගෙනෙන්න දෙන්නේ නැහැ" කියා මහින්ද අමරවීර ඇමතිතුමා කියනවා. එහෙම ගේන්න නොදෙන්නේ කොහොමද? සිංගප්පූරු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම තිබෙනවා; චීන නිදහස් වෙළෙඳ ගිවිසුම, තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම අත්සන් කරන්න යනවා. එතකොට ආනයන තහනම් කරන්න පුළුවන්ද? මම මහින්ද අමරවීර ඇමතිවරයාට කියනවා, එතුමාගේ කැබිනට් මණ්ඩලය අනුමත කර තිබෙන, "ශ්‍රී ලංකාවේ වෙළෙඳ ප්‍රතිපත්තිය" කියන පොත කියවන්න කියා. ඒක අනුව, සීමා කිරීම් කරන්න බැහැ; බාධා කිරීම් කරන්න බැහැ. වක්කඩ කැඩුවා වාගේ, සියලුම භාණ්ඩ පිටරටින් මෙහාට ගෙනෙන්න ඉඩදෙන්න ඕනෑ. Liberalizationවලත් අන්තය තමයි තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ. ඒ ප්‍රතිපත්තියට විරුද්ධව මහින්ද අමරවීර ඇමතිවරයාට නැඟී සිටින්න බැහැ.

දැන් කෘෂිකර්මය කඩා වැටිලා ඉවරයි; සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කඩා වැටිලා ඉවරයි; ව්‍යාපාරිකයෝ වැටිලා ඉවරයි; බැංකු ක්‍රමය හා මූල්‍ය ආයතන කඩා වැටෙන්න යනවා. තමුන්නාන්සේලා අද ගෙනෙන මේ පනතින් ලංකාවේ සියලු බැංකුවලට, සියයට පහළොවේ VAT එකට අතිරේකව සියයට 7ක debt recovery levy එකක් දමනවා. ඒකට කියන්නේ, "ණය ආවරණ බද්ද" කියායි. ඒ අනුව සියයට 7ක් සියලුම බැංකු විසින් ගෙවන්න ඕනෑ. මේ සියලුම **බදු** එකතු වුණාම ලංකාවේ බැංකුවලට ගෙවීමට සිදු වන බදු ප්‍රමාණය -මම ආර්ථික පර්යේෂණ ඒකකයේදී ගණන් හදලා බැලුවා.- සියයට 52ක් වෙනවා. දැන් කිව්වා, "බැංකු කෝටි ප්‍රකෝටි ගණන් ලාභ ලබනවා" කියා. ඒ බදු ටික මාරු කරන්නේ කාටද? බැංකුවේ ගනුදෙනුකරුවන්ටයි. "ජාතියේ මහා පහන් ටැඹ"; ලංකා බැංකුව, "ජනහද හඳුනන බැංකුව"; මහජන බැංකුව කියන මේ බැංකු ආණ්ඩුවට සියයට 52ක් බදු ගෙව්වාම ඒ අය සෙත්ත පොව්වි වෙනවා. අද මේ බැංකුවලට සියයට හතක බද්දක් අලුතින් පනවනවා. බැංකු එකක්වත් දන්නේ නැහැ. ඒක ගනුදෙනුකරුගෙන් ගන්න ඕනෑ. ඊළඟට, තමන්ගේ ගජ මිතුරන් බැංකුවලට නොපියවූ ණය; නොගෙවූ ණය - outstanding loans - සියල්ලම "බොල් ණය" කියා කෝටි ප්‍රකෝටි ගණනින් කපා හරිනවා. ඉන් පසුව තමන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අයටයි, යහළුවන්ටයි සහනදායී පොලියට, නැත්නම් ආණ්ඩුව පොලියෙන් කොටසක් ගෙවලා ණය ටික බෙදා ගන්නවා. රාජ්‍ය බැංකු දෙක මේ විධියට කොල්ල කනකොට බැරිම තැන තමයි මෙහෙම කරන්න ඇත්තේ. මේ බැංකු දෙක ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා භාරයේයි තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මම කියන මේ කාරණය ගැන සොයා බලන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා අලුතින් නේ, මේ විෂයය භාර ගත්තේ. මට මතකයි, අපිත් ඉන්නකොට අතීතයේ දවසක ඩිංගිරි බණ්ඩා විජේතුංග ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිත් කිව්වා, "බැංකු දෙකම බංකොලොත්" කියා. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් ඒක මතක ඇති. එහි ප්‍රතිඵලය වුණේ මොකක්ද? ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාට එය මතක ඇති. මුළු ලෝකයම කිව්වා, "ලංකා බැංකුවෙයි, මහජන බැංකුවෙයි LC භාර ගන්නේ නැහැ" කියා. එතකොට මේක ලොකු ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නයට සුන්දර කථා කියලා හරියන්නේ නැහැ. ශ්‍රී ලංකා මහ බැංකුවට අර්ජුන මහේන්ද්‍රන්ව පත් කරලා, මහ දවල් මහ බැංකුව කොල්ල කාලා, සල්ලි කොළය අව්වු ගහන තැන විශ්වසනීයභාවය කඩා වැටුණා. ඒ නිසා, ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකේ අධ්‍යක්ෂවරු තමන්ට බෙදාගෙන තිබෙන ආකාරය ගැන තීරණය කරලා, අලුත් අධ්‍යක්ෂවරු පත් කළා.

ආයෝජන මණ්ඩලයේ සභාපතිතුමා සිංගප්පූරුවට ගිහින්, සමහර ගනුදෙනු arbitrationවලට පියවලා සිද්ධ වුණු දේවල් මොනවාද කියා අපි නොදන්නවාට, ව්‍යාපාර ලෝකයේ ඉන්න හැමෝම ඒවා දන්නවා. ඊළඟට, ලංකාවේ සපත්තු කර්මාන්තය විනාශ වන ආකාරයට BOI එක ඉන්දීය ෆැක්ටරිය අනුමත කළේ කොහොමද කියා දන්නා අය දන්නවා. ඒක නතර කරන්න BOI එකේ අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැරියා. මේ ආයතන තුන ගැන පරීක්ෂා කරන්න තේරීම් කාරක සභාවක් පත් කරන්න. මහ බැංකුවේ මංකොල්ලය සමඟ එයට සම්බන්ධ කොච්චර දේවල් හෙළිදරව් වුණාද? COPE එකේදී හෙළිදරව් නොවුණු දේවල්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී හෙළිදරව් නොවුණු දේවල්, පාර්ලිමේන්තුවේදී හෙළිදරව් නොවුණු දේවල් එළි වුණේ

ජනාධිපතිතුමා බැඳුම්කර කොමිසමක් පත් කළ නිසායි. අපි කියන්නේ ලංකා බැංකුව, මහජන බැංකුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙනුවෙන් තේරීම් කාරක සභාවක් පත් කරන්න; එතෙක් ජනාධිපති විශේෂ කොමිසමක් පත් කර මේ ගැන හොයන්න කියායි. බැංකු ක්‍රමය රදා පවතින්නේ මහජනයාගේ විශ්වසනීයභාවය මතයි. මහජන විශ්වසනීයභාවය නැති වුණු දවසට බැංකු ක්‍රමය කඩා වැටෙනවා. මූල්‍ය ආයතන කඩා වැටිලා තව ආයතන 21ක් පිළිබඳ අවදානමක් ඇති වෙලා තිබෙනවා. තමන් තැන්පත් කරපු මුදල් නැති වීම නිසා මිනිසුන් යම් යම් ස්ථානවලට ගිහින් පොල් ගහනවා. මේ විධියට බැංකුත් සමඟ සෙල්ලම් කරන්න එපා. රටේ ප්‍රධාන බැංකු දෙකක් ඒ. ඉතිහාසයේ ඩිංගිරි බණ්ඩා විජේතුංග මුදල් ඇමතිවරයාගේ කාලයේත් මේ දේම සිදු වුණා. අපේ රටේ මේ ආයතන කඩා වැටුණොත්, ඩොලර් එක රුපියල් 200ට ඉහළ ගියොත් ආණ්ඩු කරන ඕනෑ කෙනෙකුට ඒක බලපානවා. ඒ නිසා අපි කියන්නේ එතැනට යන්න දෙන්න එපා කියන එකයි. ඩොලර් එක රුපියල් 200ට යන්න දෙන්න එපා. මේ බැංකු ටික මේ විධියට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්න ලැහැස්ති වෙන්න එපා. Basel III එකට අනුව, මෙහි ප්‍රාග්ධනය වැඩි කරන්න ඕනෑ. ප්‍රාග්ධනය වැඩි කරනකොට පෞද්ගලීකරණය කරන්න කිසි වෙලාවක බැංකුකරුවන් ඉඩ දෙන්නේ නැහැ. ඔයිට වඩා ලොකු මුදල් ඇමතිවරු හිටපු කාලයේත්, ආචාර්ය එන්.එම්. පෙරේරා වැනි මුදල් ඇමතිවරු හිටපු කාලයේත් ලංකාවේ බැංකු සේවකයින් පාරට බැහැලා බැංකු ක්‍රමය ආණ්ඩුවට ඕනෑ විධියට හසුරුවන්න දෙන්නේ නැතිව රැක්කා. බැංකු පෞද්ගලීකරණය කරන එක හරි ලේසියිනේ ගරු ඇමතිතුමනි. බ්‍රහස්පතින්දා දවසට ලංකාවේ සියලුම බැංකුවල L/C අරින එක නතර කළොත්, සිකුරාදාත් නැහැ, සෙනසුරාදාත් නැහැ, ඉරිදාත් නැහැ. ඒ දවස් ටිකේ ඒක නතර වුණාම රටේ ආර්ථිකය ඉවරයි. ඒක ලේසියෙන් බැංකුවට කරන්න පුළුවන්. බැංකු සේවකයින් ඒක දන්නවා. හැබැයි, ඒ අය ඒ ආයුධය අනවශ්‍ය විධියට පාවිච්චි කරන්නේ නැහැ. ඒ වෘත්තීය වගකීම ඒ අයට තිබෙනවා. එක සතියක් බැංකු වැහුවොත් සියල්ල සෙත්තපෝච්චි වෙනවා. ඒ භයිය ඒ සේවකයින්ට තිබෙනවා. ඒක කරන්න බැංකු සේවකයින්ට ශක්තිය තිබෙනවා. දේශපාලන පක්ෂ එතැනට ගිහිල්ලා "අපි බැංකු වටලනවා. බැංකුවල අය කොළඹ ගෙනෙනවා. පෙළ පාළි යනවා." කියා කියන්න ඕනෑ නැහැ.

මේ රටේ ජාතික බැංකු පෞද්ගලීකරණය කරන අදහසක් තිබෙනවා නම් ඒ අදහස අත්හැර ගන්න. ඒවායේ වංචා, දූෂණ, අක්‍රමිකතා පිළිබඳ සොයා බලන්න කොමිසමක් පත් කරන්න, තේරීම් කාරක සභාවක් පත් කරන්න. බැංකුවට දරන්න බැරි බදු පනවන්න එපා. අවසාන වශයෙන් අද මේ සම්මත කරන්න යන බද්දත් සමඟ සියයට 52ක් බදු ගෙවනකොට ඒ බර මේ රටේ ජනතාවටයි දරන්න සිද්ධ වෙන්නේ.

ඊළඟට, සෘජු විදේශ ආයෝජන විශාල ලෙස ඇවිල්ලා තිබෙන බව සඳහන් කළා. ලංකා ඉතිහාසයේ සෘජු විදේශ ආයෝජන වැඩිම ප්‍රමාණය ඇවිල්ලා තිබෙන්නේ යුද්ධය නිම වුණාට පස්සේයි. ඊට ඉස්සෙල්ලා ජේ.ආර්. ජයවර්ධන යුගයේවත්, රණසිංහ ප්‍රේමදාස යුගයේවත් එහෙම ගෙන්වන්න බැරි වුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මම අවසන් කරනවා. සෘජු විදේශ ආයෝජන 2012දී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,382ක් ලැබිලා තිබෙනවා. 2013දී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,438ක් ලැබිලා තිබෙනවා. 2014දී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,635ක් ලැබිලා තිබෙනවා. 2015දී මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,160ට අඩු වුණා. 2016දී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,078ට අඩු වුණා. 2017දී විතරක් තිබුණු රාජ්‍ය වත්කම් ටික ප්‍රසිද්ධ වෙන්දේසියේ කුණුකොල්ලෙට විකිණීම නිසා ඇමෙරිකානු ඩොලර් මිලියන 1,841ට වැඩි වෙලා තිබෙනවා. මේ ආපු ආයෝජනවලිනුත් වැඩිම ප්‍රමාණයක් මහින්ද රාජපක්ෂ යුගයේදී ඇති කරගත්ත ගිවිසුම් අනුව ආපු ආයෝජන. අද ආයෝජකයකු එනවා නම් මේ රටේ දේශපාලන ස්ථාවරත්වයක් තිබෙනවාද, බදු ස්ථාවරත්වයක් තිබෙනවාද කියන එක බලනවා. ඉතිහාසයේ මුළු මහින්ද රාජපක්ෂ යුගයේම අය කරපු වැඩිම බදු ප්‍රමාණය වුණේ ට්‍රිලියන 1යි. ඒ කියන්නේ රුපියල් බිලියන 1,000යි. මේ ආණ්ඩුව මේ වර්ෂයේ ට්‍රිලියන 2ක් අය කරනවා. ලංකා ඉතිහාසයේ මිනිසුන් මත පටවපු බදු ප්‍රමාණය රුපියල් බිලියන 1,000කින් වැඩි කරපු එකම ආණ්ඩුව මේ ආණ්ඩුවයි. පුළුවන් නම් "එහෙම නැහැ." කියා කියන්න. බදු ආදායම ට්‍රිලියන දෙකයි. ඒ කියන්නේ සෘජු බදු හා වක්‍ර බදු. අපේ කාලයේ ට්‍රිලියන 1යි. එතකොට මේ ආණ්ඩුව කාලයේ අවුරුදු හතරට බදු ආදායම විතරක් වැඩි කර තිබෙනවා රුපියල් බිලියන 1,000කින්. ඒක ගෙවන්නේ මේ රටේ මිනිස්සු. මේක බදු දඩයමක්. මේ විධියට බදු අය කර "අපි රටේ බදු ආදායම වැඩි කළා"යි කියාබොහොම ආනන්දයෙන් කථා කරනවා නම්, ඒ බදු බර උසුලා ගත නොහැකිව වැහෙන ව්‍යාපාර, කර්මාන්ත පිළිබඳ අවබෝධයක් නැත්නම්, ඒ ටික අවබෝධ කර ගන්න වුවමනාවක් නැත්නම්, නිකම් බොරු කථා කියා එක් එක් කෙනාට බැණලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඔබතුමන්ලා ජනතාව කියන දේට කන් දීලා බලන්න. යක්කල මදුරු දඟර සමාගමක් තිබුණා. ඒ සමාගම අවුරුදු 20ක් මදුරු දඟර හැදුවා.

මේ ප්‍රතිපත්තිය යටතේ මදුරු දඟර හදනවාට වඩා ගෙන්වන එක හොඳයි කියා ඒ කර්මාන්තශාලා වැහුවා. මේවා ගැන බලන්න. ගොවියන්, කර්මාන්තකරුවන්, ව්‍යාපාරිකයන්, සුළු ජාතිකයන් අද මුහුණ දෙන යථාර්ථවාදී ප්‍රශ්නය මහ පොළොවට බැහැලා දේශපාලනයෙන් තොරව බලන්න. රටේ මූල්‍ය ක්‍රමය කඩා ගෙන වැටුණොත්, බැංකු ක්‍රමය කඩාගෙන වැටුණොත්, ණය ක්‍රමය කඩා ගෙන වැටුණොත් මේ රට ගොඩගන්න අමාරුයි. බැංකු භාර අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා අලුතෙන් භාර අරගෙන තිබෙන්නේ අනුන්ගේ කුණු ගොඩක්. ඒ නිසා පරණ කුණු ටික නිරවුල් කරන්න මැදිහත් වෙන්න කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා විෂයභාර -බැංකු භාර - ඇමතිවරයා විධියට, අපේ බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට පැහැදිලි කරන්න කැමතියි, මේ බැංකු දෙකේ ස්ථාවරභාවය ආරක්ෂා වෙලා තිබෙනවාය කියා. මේ බැංකු දෙක පසුගිය අවුරුද්දේ විශාල ලාභ ලැබුවා. අනෙක් එක නම්, මේ බැංකු දෙකේ සභාපතිවරු හා අධ්‍යක්ෂවරු අවුරුදු තුනක් එම තනතුරේ ඉන්නවා. අවුරුදු තුනෙන් තුනට ඒ අය මාරු කරනවා. ඒ වාගේ දෙයක් තමයි මෙහි වෙන්නේ. අනෙක් එක, එම බැංකු පෞද්ගලික අංශයට පවරන්න යනවා කියා මෙතුමා කිව්වා. එහෙම කිසිම අදහසක් නැහැ. ඇත්තවශයෙන්ම ප්‍රධාන බැංකු දෙක කටයුතු ගැන කිසිම පදනමක් නැති විධියට කථා කරනවා. මෙහෙම කථා කිරීම අසාධාරණයි. විගණකාධිපතිවරයාගේ විගණන වාර්තාවේ - Auditor-Generalගේ audit report එකේ- කිසිම දූෂණයක් ගැන හෙළිදරව් කර නැහැ. මේ බැංකු දෙක විශාල ලාභ ලබලා තිබෙනවා. අධ්‍යක්ෂවරු අවුරුදු තුනක් එම තනතුරේ ඉන්නවා. ඔවුන් අවුරුදු තුනෙන් තුනට මාරු කරනවා. [බාධා කිරීමක්]

එම කටයුතු පෞද්ගලික අංශයට පවරන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Hon. Leader of the House, we have to suspend Sittings for lunch at 12.30 p.m.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, we can proceed without the lunch break.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Bandula Gunawardane.
**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**

(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු අමාත්‍යතුමනි මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. දැන් මෙම වංචා, දූෂණ, අක්‍රමිකතා මොකුත්ම නැහැ කියමු. Basel III යටතේ මේ බැංකු දෙකේ ප්‍රාග්ධනය යථා යෝග්‍ය මට්ටමට වැඩි කිරීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවාද නැද්ද කියා මට කියන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම ප්‍රශ්නයක් නැහැ. එවැනි මුදල් අවශ්‍යතාවක් වුණොත් භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගන්න පුළුවන්. මොකද, ලංකා බැංකුව සහ මහජන බැංකුව හැම අවුරුදේදේම විශාල මුදලක් භාණ්ඩාගාරයට දෙනවා. පසු ගිය අවුරුද්දේ ලංකා බැංකුව රුපියල් මිලියන 30ක් දුන්නා. මහජන බැංකුව රුපියල් මිලියන 28ක් දුන්නා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
අපි සියලු දෙනාගේ රාජ්‍ය බැංකු දෙක නේ මේ. අපි ඔබතුමාට යෝජනා කරන්නේ මේකයි. රුපියල් කෝටි-ප්‍රකෝටි ගණන් ලාභ ලැබුවා කියනවා. එම නිසා කිසිම පෞද්ගලීකරණයක් නොකර අතීතයේ ලැබූ ලාභය දාලා Basel III එක යටතේ ප්‍රාග්ධනය වැඩි කිරීමේ කටයුත්ත ඔබතුමා මැදිහත්වෙලා කරන්න. ඒක මෙලොව වශයෙන් කීර්තියක්. පරලොව වශයෙන් පින්කමක්. හොඳට නින්ද යනවා.

[අ.භා. 12.33]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින මුදල් පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සභාගිවීමට අවස්ථාවක් ලැබීම ගැන සියලු දෙනාටම ස්තුතිවන්ත වනවා. අද අපි ලංකාවේ ආර්ථිකය ගැන විවාද කරන මේ මොහොතේදී, ඒ පිළිබඳව සත්‍ය ජනතාවට අවබෝධ කරදීම ඉතාම වැදගත් ලෙස අපි සලකනවා. මට ඉස්සෙල්ලා අපේ ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කරුණු රාශියක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. අපි එතුමාට මතක් කර දෙන්න කැමතියි, විශේෂයෙන්ම අපේ අපනයනය කඩා වැටුණේ එතුමන්ලා පාලනය කරපු කාලයේ කියා. 2000දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 33ක් වුණු අපනයනය 2015 වන විට සියයට 14ක් දක්වා පල්ලම් බැස්සේ ඔය කියන theory එකම අනුගමනය කළ නිසාය කියන එක එතුමාට මතකද අමතකද මම දන්නේ නැහැ. නමුත් සියයට 50කින් අපේ අපනයනය කඩා වට්ටලා, අපේ අපනයන පදනම විනාශ කර, අපට GSP Plus සහනය ඕනෑ නැහැ කියා යුරෝපා මන්ත්‍රීන් අපනයනයට තහංචි දමා ගෙන ඒ ඔක්කෝම විනාශ කර අද කථා කරනවා රුපියල ආරක්ෂා කර ගන්නේ කොහොමද කියා.

එතුමා ඒ කියන theory එකෙන් දියුණු වුණු රටක් පෙන්වන්න කියලා, අපි එතුමාට අභියෝග කරනවා. විශේෂයෙන්ම අපනයනය පදනම්ව තමයි අද බොහෝ රටවල් ඉදිරියට ගොස් තිබෙන්නේ. එතුමා කියන ඒ theory එක, රුසියාව අනුගමනය කළා; චීනය අනුගමනය කළා; වියට්නාමය අනුගමනය කළා. දැන් ඒ රටවලුත් ඉන් මිදිලා අපනයනය මත පදනම්ව යන ගමනක් අද අපට පෙනෙන්න තිබෙනවා. විශේෂයෙන්ම අපි දැක්කා, වියට්නාමය වුණත් එතුමන්ලාගේ දේශපාලන ක්‍රමය කුමක් වුවත්, අද වනකොට අපනයනය පදනම් කර ගත්ත ආර්ථිකයක් ඇති රටක් බවට පරිවර්තනය වෙලා තිබෙන බව. ඒ වාගේම චීනයත් අද අපනයනය පදනම් කර ගත්ත ආර්ථිකයක් ඇති රටක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. අපි කියන ආර්ථික ක්‍රමවේදය, ඒ රටවල් අනුගමනය කරන ආර්ථික ක්‍රමවේදය හා සමාන නම්, එම ආර්ථික ක්‍රමවේදය මත පදනම්ව ඒ රටවලට ඉදිරියට යන්න පුළුවන් නම්, ඇයි ගෝලීය ආර්ථිකයට සම්බන්ධ වෙලා, අපනයනය මත පදනම් වෙලා, ඉදිරියට යන්නට එම ක්‍රමවේදය අපට පිළිගන්න බැරි කියන ප්‍රශ්නය විශේෂයෙන්ම අහන්න සිද්ධ වෙනවා.

අපේ අපනයන ආදායම, 2017දී ඇමෙරිකන් ඩොලර් බිලියන 11.4යි. මම හිතන හැටියට ඒ තමයි, මේ මෑත ඉතිහාසයේ අපි ලැබූ වැඩිම අපනයන ආදායම. විදේශ ආයෝජන ගත්තාම, 2017දී ඇමෙරිකන් ඩොලර් මිලියන 1,913යි. මෑත ඉතිහාසයේ වැඩිම අපනයන ආදායමක් ලද හා ආයෝජනය එන රටක් කඩා වැටෙනවාය කියන්න පුළුවන් මොන වාගේ මනසකින්ද කියලා මට නම් ඇත්තටම තේරෙන්නේ නැහැ. යම් යම් ආර්ථික අභියෝග අපට තිබෙන බව අපි පිළිගන්නවා. එදා විනාශ කරපු අපනයන පදනම නැවතත් යථා තත්ත්වයට පත් කරන්නට, එය වැඩිදියුණු කරන්නට හා ශක්තිමත් කරන්නට මේ වනකොට අභියෝග මැද්දේ කටයුතු කරනවාය කියන එක අපි පිළිගන්නවා. නමුත්, මේ ආර්ථිකය බිමටම කඩා වැටිලා කියලා එතුමා කියන්නේ කොහොමද? එසේ නොවන බව පෙන්වීම සඳහා මම සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න කැමැතියි.

දැන් එතුමා කිව්වා, පොඩි මිනිහට රථ වාහන සහ අනිකුත් දේවල් ගෙන්වන එක අපි නැවැත්වූවා කියලා. නමුත්, 2018දී මේ රටට වාහන 162,286ක් ආනයනය කර තිබෙනවා. මෝටර් රථ 30,236ක් ආනයනය කර තිබෙනවා; ත්‍රිරෝද රථ 5,144ක් ආනයනය කර තිබෙනවා; යතුරුපැදි 113,346ක් ආනයනය කර තිබෙනවා; මගී ප්‍රවාහන රථ 1,077ක් ආනයනය කර තිබෙනවා; භාණ්ඩ ප්‍රවාහන රථ 9,056ක් ආනයනය කර තිබෙනවා; ඉඩම් වාහන 3,427ක් ආනයනය කර තිබෙනවා. සියල්ල එකතු කළාම, රථ වාහන 162,286ක් ආනයනය කර තිබෙනවා. දැන් මොනවත් කන්නත් නැති, ආර්ථිකය බිමට සමතලා වුණු රටකට තමයි ඔය වාහන ගෙනැවිත් තිබෙන්නේ! ඒ වාහන ගන්න සල්ලි කොහෙන්ද, කොහෙන්ද ඒවා ආවේ කියලා කරුණාකරලා එතුමාගේ theory එකේ හැටියට අපට පෙන්වා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

අද වනකොට අපේ රටේ විරැකියාව සියයට 4.2යි. ඒ, මෑත ඉතිහාසය ගත්තාම අඩුම විරැකියා ප්‍රතිශතය. අපේ රටේ ආර්ථිකය බංකොලොත් නම්, දැන් ඔය කියන අන්දමට මදුරු දහර නිෂ්පාදනය කරන ව්‍යාපාරත් වසා දමනවා නම්, අනෙක් ව්‍යාපාරත් වසා දමනවා නම්, එහෙම නම් රස්සා ටික නැති වනවා. එතකොට විරැකියාව වැඩි වෙන්න ඕනෑ. ඒ සංඛ්‍යා ලේඛන කොහේද ගියේ කියලා එහෙම නම් අපට කියා දෙන්න. 2017දී මේ රටේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 4,073යි. එතුමන්ලා අපට මේ රට භාර දුන් අවුරුද්දේ ඉඳලා අපි ඒක පුද්ගල ආදායම වැඩි කර තිබෙනවා. ඒක පුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 4,073ක මට්ටමට ගෙනා ආණ්ඩුවක් ඉතිහාසයේ තිබෙනවාද කියා අපට පෙන්වා දෙන්න. අද වනකොට ජංගම දුරකථන භාවිතය දෙස බැලීමේදී පෙනී යනවා, මේ රටේ 100දෙනෙකු ගත්තාම ජංගම දුරකථන 143.6 ක් තිබෙනවා කියලා. කන්න නැත්නම් ඉස්සෙල්ලාම ජංගම දුරකථනය විකුණුයි, කෑම ගන්න. එතකොට ජංගම දුරකථන භාවිතය ඒ තරම් වැඩිවෙලා තිබෙන්නේ කොහොමද කියලා මේ වෙනකොට අපට තේරුම් ගන්න පුළුවන්.

ලංකා ඉතිහාසයේ වැඩිම සංචාරකයන් එන වර්ෂය කුමන වර්ෂයද කියලා අද වෙනකොට අපට පෙන්වා දී තිබෙනවා. අද වෙනකොට මේ රටේ පරිසරය යහපත් කරලා, යටිතල පහසුකම්, ඒ වාගේම අනෙකුත් පහසුකම් වැඩි කරලා තිබීම හේතුවෙන් විශේෂයෙන්ම "Lonely Planet" කියන සංචාරක උපදේශන ග්‍රන්ථ ප්‍රකාශන ආයතනය අද වෙනකොට සංචාරය සඳහා සුදුසු ලෝකයේ රටවල් අතරින් ලංකාව අංක එකට හඳුන්වා දී තිබෙන වෙලාවේ අපි අපේ සංචාරක ව්‍යාපාරය ශක්තිමත් කරන්න කටයුතු කරලා තිබෙනවා. අපෙන් අහනවා, "ඔබතුමන්ලා බදු අරගෙන මොනවාද කළේ?" කියලා. විශේෂයෙන්ම අපේ බදු ආදායමින් ලබාදුන් සේවාවන් මොනවාද කියලා මම ඉතාම ඉක්මනින් මතක් කරන්න කැමැතියි.

ත්‍රිපෝෂ සඳහා 2018 දී රුපියල් මිලියන 1,944ක්, ඒ වාගේම පොත් සහ පාසල් නිල ඇඳුම් සඳහා රුපියල් මිලියන 1,966ක්, පාසල් වාර ප්‍රවේශ පත්‍ර සඳහා රුපියල් මිලියන 1,234ක්, පාසල් පෝෂාදායී ආහාර සඳහා රුපියල් මිලියන 1,377ක්, පොහොර සහනාධාරය සඳහා රුපියල් මිලියන 8,009ක්, සමෘද්ධිය සඳහා රුපියල් මිලියන 13,142ක්, ආබාධිත රණවිරු දීමනා සඳහා රුපියල් මිලියන 9,461ක්, වැඩිහිටි දීමනා සඳහා රුපියල් මිලියන 3,050ක්, ආබාධිත දීමනා සඳහා රුපියල් මිලියන 371ක් සහ ආහාර, ගංවතුර සහ නියං ආධාර සඳහා රුපියල් මිලියන 1,328ක් අපි වියදම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම මුදල් රාජ්‍ය අමාත්‍යතුමා කිව්ව පරිදි ජනතාව වෙනුවෙන්, ඔවුන්ගේ ශුභ සිද්ධිය වෙනුවෙන් කරන වැඩවල කිසිම කප්පාදුවක් කරලා නැහැ. අපි ඒවා ශක්තිමත් කරලා, ඒ වාගේම මේ ආර්ථික ක්‍රමය තව තවත් ශක්තිමත් කරලා ඉදිරියට යනවාය කියන කාරණය කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 12.42]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශය විසින් මුදල් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාව රටක් හැටියට අපි බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණ දී තිබෙන වෙලාවක් බව අපි දිගින් දිගටම කිව්වා. අපි දන්නවා, මේ වනකොට රුපියල අවප්‍රමාණය වීම නිසා ලංකා ඉතිහාසයේ වැඩිම ප්‍රමාණයකට ඩොලරයේ අගය ඉහළ ගිහිල්ලා තිබෙන බව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය දවස් දෙකේ රුපියල් 2කින් ඩොලරයේ අගය ඉහළ ගියා. රුපියල් 171කට තිබුණු ඩොලරයේ අගය දැන් රුපියල් 173යි. මේ වනකොට රටක් හැටියට අපි ගත් විදේශ ණය ප්‍රමාණය US Dollars බිලියන 30ක් කියලා අපි දන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි US Dollars බිලියන 30ක් විදේශ ණය අරගෙන තිබෙන කොට සතියක් තුළ රුපියල් 2කින් ඩොලරය වැඩි වුණා කියලා කියන්නේ එයින් රටට වුණු පාඩුව රුපියල් බිලියන 60ක්. දවස් දෙකක් තුළ රුපියල් දෙකකින් ඩොලරයේ අගය ඉහළ ගිය නිසා රටට වෙලා තිබෙන පාඩුව රුපියල් බිලියන 60ක්! ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කටුනායක අධිවේගී මාර්ගය හදන්න ගියේ රුපියල් බිලියන 55යි. කිරිඇල්ල ඇමතිතුමනි, පසුගිය දවස් දෙකේ රුපියල් 2කින් ඩොලරය ඉහළ ගිය නිසා අපට කටුනායක අධිවේගී මාර්ගය වාගේ අධිවේගී මාර්ගයක් හැදීමේ අවස්ථාව අහිමි වුණා. කටුනායක අධිවේගී මාර්ගය හදන්න ගියේ රුපියල් බිලියන 55යි, පසුගිය දවස් දෙකේ ඩොලරයේ අගය රුපියල් 2කින් වැඩි වීම නිසා අපට වුණු පාඩුව රුපියල් බිලියන 60යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුවට මේ තත්ත්වය පාලනය කර ගන්න හැකියාවක් නැහැ.

ඒ විතරක් නොවෙයි. පසුගිය දිනක මහ බැංකු අධිපතිතුමා ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වා කිව්වා, චීනයේ එක්සිම් බැංකුවෙන් ගිය සතියේ රුපියල් බිලියනයක ණයක් ගත්තා කියලා. රුපියල් බිලියනයක ණයක් ගත්තාම මේ දවස් දෙකේ ඩොලරයේ අගය රුපියල් 2කින් වැඩි වුණු නිසා අපට වුණු පාඩුව රුපියල් බිලියන 2යි. ඒ අනුව ඒ ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 2කින් වැඩි වීමක් සිද්ධ වෙලා තිබෙනවා. බලන්න, සතියක් තුළ රුපියල් 2කින් ඩොලරය ඉහළ යෑම නිසා රටට වෙලා තිබෙන පාඩුව! ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තත්ත්වය කළමනාකරණය කර ගන්න මේ ආණ්ඩුවට හැකියාවක් නැහැ.

දැන් තෙල් මිල පිළිබඳව මිල සූත්‍රයක් දමා තිබෙනවා. මුදල් ඇමතිතුමාම කිව්වා, "මේක මට තේරෙන්නේත් නැහැ"යි කියලා. ඊ ළඟට, එතුමා බෝඩ් එකක් අරගෙන ඇවිල්ලා කියනවා, "මේක හරි සරල දෙයක්" කියලා. මේ මිල සූත්‍රය පිළිබඳව මුදල් ඇමති දන්නේත් නැහැ; ජනාධිපති දන්නේත් නැහැ; කිරිඇල්ල ඇමතිතුමා දන්නේත් නැහැ. මේ මිල සූත්‍රය පිළිබඳව කවුරුවත් දන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දන්නවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දන්නවා නම්, ඔබතුමා නැඟිටලා මේ මිල සූත්‍රය පිළිබඳව කියන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මිල සූත්‍රය කියන්නේ මෙකයි. ජාත්‍යන්තරයේ තෙල් මිල වැඩි වනකොට මෙහේත් තෙල් මිල වැඩිවනවා, ජාත්‍යන්තරයේ තෙල් මිල අඩු වනකොට මෙහේත් තෙල් මිල අඩුවනවා. සරලව කියනවා නම්, මිල සූත්‍රය කියන්නේ ඕක තමයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අන්න, මිල සූත්‍රය. ඔන්න අහගන්න, මිල සූත්‍රය!

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මිල සූත්‍රය කියලා සරලව කියන්නේ ඕක තමයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හරි, හරි. දැන් ඉඳගන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
When the world market price increases, we have to increase the price here; when the world market price decreases, we have to decrease the price here.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Okay. Please sit down. ගරු ඇමතිතුමනි, මොළය තළා ගන්නේ නැතිව ඔබතුමා ඉඳගන්න. உட்கார சொல்லுங்க

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඉන්දියාවේ හැම දාම මේ මිල වෙනස් වනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමාට ඉඳගන්න කියන්න. මගේ වෙලාව. It is not a point of Order.

කිරිඇල්ල ඇමතිතුමාට ඊයේ-පෙරේදා අස්ගිරි පාර්ශ්වයෙන් ගෞරව නාම සම්මානයකුත් හම්බ වුණා. මහා නායක හාමුදුරුවන්ට මේක ඇහුණොත්, ඒ ගෞරව නාම සම්මානය ආපහු ඉල්ලා ගන්නවා. මෙතුමා කියනවා, මිල සූත්‍රය කියන්නේ ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යනකොට මෙහේත් මිල ඉහළ යනවා; ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල පහළ යනකොට මෙහේත් තෙල් මිල පහළ යන එකට කියලා. මෙතුමා කියන විධියට ඒක තමයි මිල සූත්‍රය. ඔක කලින් කියන්න තිබුණා නේ? ඔබතුමා ගිහිල්ලා ජනාධිපතිතුමාට ඔක කියන්න කෝ. ඔක ජනාධිපතිතුමා දන්නේත් නැහැ; මුදල් ඇමතිතුමා දන්නේත් නැහැ. ඉහළ යනකොට නඟිනවා ලු, පහළ යනකොට බහිනවා ලු. ඕකද, මිල සූත්‍රය කියන්නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සරලව කියනවා නම්, ඕක තමයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සරලව එහෙමයි? හරි.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේත් දන්නවා, FDIs - Foreign Direct Investments- පිළිබඳව. මම අහගෙන සිටියා, හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා කියනවා, 2017 දී තමයි වැඩිම විදේශ ආයෝජන ප්‍රමාණයක් ආවේ කියලා. අසත්‍ය කියන්න එපා. ඔබතුමන්ලා රටට අසත්‍ය කියනවා. 2017 දී සෘජු විදේශ ආයෝජන ආවේ US Dollars මිලියන 17යි. අනෙක් සියල්ලම මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන සමයේ අත්සන් කරපු ඒවායෙන් ලැබුණු ඒවා. Port City එකෙන් ලැබුණු සල්ලි, ෂැන්ග්‍රි -ලා එකෙන් ලැබුණු සල්ලි, ඒ ආ ආයෝජන සියල්ල මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ අත්සන් කළ ආයෝජන. පුළුවන් නම් මට කියන්න කිරිඇල්ල ඇමතිතුමනි, 2018 අවුරුද්දේ ආ එක විදේශ ආයෝජනයක්. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට පුළුවන් වුණාද, එක විදේශ ආයෝජනයක් ගෙනෙන්න?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුව මේ දවස්වල රටේ ප්‍රධාන හෝටල් දෙකක් විකුණන්න දමා තිබෙනවා. හයට හෝටලය සහ හිල්ටන් හෝටලය විකුණන්න දමා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ හෝටල් දෙකම විකුණන්න දමා තිබෙන්නේ US Dollars මිලියන 200කට. මේ රටේ ප්‍රධාන හෝටල් දෙකක් වන හයට් හෝටලය සහ හිල්ටන් හෝටලය විකුණන්න ආණ්ඩුව දැන් ලැහැස්තියි. මේ සඳහා ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා, ඇමරිකානු ඩොලර් මිලියන 200ක ආයෝජනයක්. ඒ සඳහා ටෙන්ඩර් කැඳවන්න ලබා දී තිබෙන්නේ සුමාන දෙකයි. කිරිඇල්ල ඇමතිතුමා, ඔබතුමාගේ අමාත්‍යාංශය half sheets ගන්න ගියත් ටෙන්ඩරයකට සාමාන්‍යයෙන් සති දෙකකට වඩා කල් දෙනවා නේද? එවැනි ටෙන්ඩර් එකකට පවා සුමාන දෙකකට වඩා කල් දෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කැබිනට් මණ්ඩලය මාසයක් කල් දුන්නා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කල් දුන්නේ, ඒ කාරණය ඇදුණාට පසුවයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔව්. කල් දුන්නේ, ඒ කාරණය ඇදුණාට පසුවයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ කාරණය ඇදුණාට පසුවයි කල් දුන්නේ, ගරු ඇමතිතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එය වෙනස් කළා. කැබිනට් මණ්ඩලය මාසයක් කල් දුන්නා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
යටින් ගන්න හැදුවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඇයි, කලින් ටෙන්ඩරය දැම්මේ නැත්තේ? [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මම ඔබතුමාට කියන්නම්, කතාව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හයට් හෝටලයයි, හිල්ටන් හෝටලයයි දෙන කෙනා තීරණය කර අවසානයි. එය තීරණය කරන්නේ මලික් සමරවික්‍රම ඇමතිතුමායි. එතුමා එය තීරණය කර ඉවරයි; ආයෝජකයාත් එක්ක කතා කරලා ඉවරයි. තමන්ට ඕනෑ ආයෝජකයාට දෙන්න ඕනෑ නිසා ටෙන්ඩරයේ කාලය සුමාන දෙකක් ලෙස දැම්මා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හරියට බැලුවොත්, දවස් 8යි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔව්. හරියට බැලුවොත් දවස් 8යි. ලංකාවේ ඇමරිකානු ඩොලර් මිලියන 200ක ආයෝජනයකට අදාළව දමන ටෙන්ඩර් එකක්, එය. ඇමතිතුමනි, සාමාන්‍යයෙන් අමාත්‍යාංශයකට වාහනයක් hire කරනවා නම්, ටෙන්ඩරය කැඳවීම සඳහා මාසයක් කල් ඉල්ලා ගන්නවා. නමුත් සුමාන දෙකයි මේ වෙනුවෙන් ගන්නේ. ඇයි ඒ? ආණ්ඩුව ආයෝජකයා සොයාගෙන ඉවරයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම අද කියන්නම්, ඒවා දෙන්නේ ඇමරිකානු ඩොලර් බිලියන 80කට බව. එහි කොමිෂන් එක තිබෙනවා ඇමරිකානු ඩොලර් බිලියන 20ක්. දැන් ඒ කොමිෂන් ගැන කතා කරලා ඉවරයි. ඇමරිකානු ඩොලර් බිලියන 100කට ඒ හෝටල් ගනුදෙනුව කතා කරලා ඉවරයි. හිල්ටන් හෝටලය සහ හයට් හෝටලය ඇමරිකානු ඩොලර් බිලියන 100කට දෙන්න කතා කරලා සියයට 20ක් අතට අරගෙන ඇමරිකානු ඩොලර් බිලියන 80ට දෙනවා. ගරු ඇමතිතුමනි, අද මා ඔබතුමාට කියනවා, ඒක එහෙම වෙනවාමයි කියා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපි නඩුවක් දමනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපි මේ සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්නවා. දැන් තමුන්නාන්සේලා මෙයට consultancy සමාගම් දෙකත් සොයා ගෙන තිබෙනවා. MTI Consulting (Pvt.) Limited සහ Lazard Asia Limited කියන ආයතන දෙක මේ ටෙන්ඩර් එකට සම්බන්ධ consultancy සමාගම්. අපි ඔබතුමන්ලාගෙන් අහනවා, ඒ අය තෝරා ගත් පදනම මොකක්ද කියා. ඒ අය තෝරා ගත්තේත් මේ හෝටල් දෙක ගන්න ඉන්න කොම්පැනියේ ඉල්ලීම නිසායි. ගරු ඇමතිතුමා, අපි ඔබතුමන්ලාගෙන් අහන්නේ, රට ආර්ථික වශයෙන් මෙච්චර වැටී තිබෙන වෙලාවක තමුන්නාන්සේලා මහ දවල් කරන මේ වැඩේ හරිද කියලායි.

ගරු කිරිඇල්ල ඇමතිතුමනි, තමුන්නාන්සේලා කෙරවළපිටිය LNG බලාගාරය චීනයට දුන්නා. තමුන්නාන්සේලා එය දුන්නේ නීතියෙන් -ටෙන්ඩර් එකෙන්- බැහැරවයි. ඒ අය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණය රිංයේ තීන්දුවක් දුන්නා ඒ ටෙන්ඩරය දුන් එක වැරැදියි කියා. කවුද ඒ දීම පිටුපස ඉන්නේ? කවුද, ඒ LNG බලාගාරය චීනයට දීපු ටෙන්ඩර් එක පිටුපස ඉන්නේ? ලංකාවේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරවයි තමුන්නාන්සේලා ඒ ටෙන්ඩර් එක දුන්නේ. කවුද ඒවා පිටුපස ඉන්නේ? එක් පැත්තකින් රටේ ආර්ථිකය කඩාගෙන වැටිලා. තමුන්නාන්සේලා හොරකම් කරනවා, හිටගෙන. තමුන්නාන්සේලා බලයට පත් වුණේ හොරකම් කරන්නද? හොරකම නවත්වනවා කියා බලයට පත් වූ තමුන්නාන්සේලාගේ ඇමතිවරුන් අද මොනවාද කරන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය ඉතා අවාසනාවන්ත තත්ත්වයක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාට කිව්වා, විදේශ ආයෝජන පිළිබඳව. ගරු කිරිඇල්ල ඇමතිතුමා, මේ අවුරුදු 4ටම තමුන්නාන්සේලාට බැරි වුණා, කිසිම විදේශ ආයෝජකයකු රටට ගෙනෙන්න. ආයෝජකයන් රටට එන්නේ කොහොමද, ඇමතිතුමා? රටේ ජනාධිපතිතුමා කියනවා, "රටේ රාජ්‍ය බැංකු දෙක - මහජන බැංකුව, ලංකා බැංකුව - දූෂිතයි. ඒ නිසා මම සභාපතිවරුන් දෙදෙනා ඉවත් කරනවා. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දූෂිතයි. එය භාරව සිටින ඇමතිවරු කෝච්චිවලින් කොමිස් ඉල්ලනවා. ඒ නිසා මා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය අයින් කරනවා" කියා. එහෙම කළාම රටකට ආයෝජකයන් ඒවිද? රටේ ජනාධිපතිතුමා කියනවා, "ආයෝජන මණ්ඩලය දූෂිතයි; BOI එක corrupt" කියා. "රාජ්‍ය බැංකු දෙක දූෂිතයි" කියනවා. එහෙම කිව්වාම මේ රටට ආයෝජනය කරන්න ආයෝජකයකු ඒවිද? මොකක්ද, තමුන්නාන්සේලා මේ රටට කරන්නේ? මෙය ඉතාම අවාසනාවන්ත තත්ත්වයක් බවට පත් වී තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. දැන් බලන්න මේ රටේ මූල්‍ය කළමනාකරණය ගැන. ගරු ඇමතිතුමා, මේක හොඳින් මතක තියාගන්න. තමුන්නාන්සේලාගේ මූල්‍ය කළමනාකරණයේ තිබෙන අඩු පාඩුව තමයි මෙයට මූලික හේතුව වෙලා තිබෙන්නේ. මේ ආර්ථිකය කඩා වැටීමේ සම්පූර්ණ වගකීම අගමැතිවරයා භාර ගන්න ඕනෑ. මේ රටේ මූල්‍ය කළමනාකරණය සිදු කරන්නේ මුදල් ඇමතිවරයා සහ අගමැතිවරයායි. ඒ නිසා මෙහි -මේ ආර්ථිකය කඩා වැටීමේ- වගකීම අගමැතිවරයා භාර ගන්න ඕනෑ. කවුද අද මුදල් අමාත්‍යාංශයේ තීන්දු ගන්නේ? ඔබතුමා දන්නවා ඒ පාස්කරලිංගම් මහත්මයා බව. පාස්කරලිංගම් මහත්මයා තමයි අද තීන්දු ගන්නේ. මේ රටේ ආර්ථිකය පිළිබඳව තීන්දු ගන්නේ පාස්කරලිංගම් මහත්මයායි. විකුණන කොම්පැනිය ගැන තීරණය කරන්නේ මලික් සමරවික්‍රම මහත්මයායි. කොහේටද, තමුන්නාන්සේලා මේ රට ගෙන යන්නේ?

මම දැක්කා, මංගල සමරවීර මුදල් ඇමතිතුමා මාධ්‍ය සාකච්ඡාවලදී කිව්වා, "ඩොලරය රුපියල් 200ට ගියත් ප්‍රශ්නයක්

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

නැහැ, ඒකෙන් ආර්ථිකය කඩා වැටෙන්නේ නැහැ" කියලා. ගරු කිරිඇල්ල ඇමතිතුමා, මට නම් මේ කියන කාරණය තේරෙන්නේ නැහැ. මම ඔබතුමාට කිව්වා, පසුගිය දවස් දෙක තුළ රුපියල් දෙකකින් ඩොලරයේ අගය ඉහළ ගිය නිසා විදේශ ණය විතරක් රුපියල් බිලියන 60කින් වැඩිවෙලා කියලා. ඒ වාගේම චීනයෙන් ගත් ණය නිසා බිලියන දෙකක් වැඩි වෙලා තිබෙනවා. මේ කාරණා දෙක ගැන විතරක් ගත්තොත්, සතියක් ඇතුළත රුපියල් බිලියන 62ක් රටට පාඩුවෙලා තිබෙනවා. නමුත් කිරිඇල්ල ඇමතිතුමනි, මංගල සමරවීර ඇමතිතුමා කිව්වා, ඒක ප්‍රශ්නයක් නැහැ කියලා. එතුමාට ප්‍රශ්නයක් නැහැ; අගමැතිතුමාට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඔබතුමාට, අපට ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ඔබතුමාට අපට දරුවන් ඉන්නවා. ඒ අයට රටක් තිබෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට තමයි දැන් මේ රට පත්වෙමින් යන්නේ. අපි දිගින් දිගටම මේ ආණ්ඩුවට කියනවා, මේ විධියට ආණ්ඩුව ඉදිරියට ගෙනියන්න තමුන්නාන්සේලාට බැහැ කියලා. තමුන්නාන්සේලාට මේ රට ගෙනියන්න බැහැ. ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා අද බලන්න, හිටපු මුදල් ඇමති රවි කරුණානායක මැතිතුමා කියපු දේ. ආණ්ඩුවේ හිටපු මුදල් ඇමති රවි කරුණානායක මැතිතුමා අහනවා, "බැදුම්කර වංචාව සම්බන්ධයෙන් මා විතරක් ඉලක්ක කරගෙන ගහන්නේ ඇයි? බැදුම්කර හොරකම පිටිපස්සේ ආණ්ඩුවේ ඇමතිවරු ඉන්නවා. ඇයි, මෙවා එළියට දාන්නේ නැත්තේ?" කියලා. රටේ හිටපු මුදල් ඇමති එහෙම කියනවා. රවි කරුණානායක ඇමතිවරයා කියනවා, "ඇයි, මට විතරක් ගහන්නේ? මම තනියම කෑවේ නැහැ. මම මේක බෙදාගෙන කෑවේ; බදාගෙන කෑවේ නැහැ" කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා කියනවා, "මම මේක බදාගෙන කෑවේ නැහැ; මේක බෙදාගෙන කෑවේ; ඇයි, අනිත් අය ගැන කියන්නේ නැත්තේ?" කියලා. අපේ කථානායකතුමාට බැරි වුණා, මාස හයක් යනතුරුත් බැදුම්කර වාර්තාවේ සියලු වාර්තා ටික මේ පාර්ලිමේන්තුවට ගෙන්වා දෙන්න. එතුමා කියනවා, නීතිපතිතුමා දෙන්න බැහැ කිව්වා ලු. නීතිපතිවරයාට බලයක් නැහැ, පාර්ලිමේන්තුවට නියෝග දෙන්න. පාර්ලිමේන්තු ඉතිහාසය බැලුවොත් ශ්‍රේෂ්ඨාධිකරණය දීපු තීන්දු පවා අබිබවා ගිහිල්ලා තිබෙනවා. පාර්ලිමේන්තුව උත්තරීතරයි. තමුන්නාන්සේලා ඒ තොරතුරු ගෙනෙන්නේ නැහැ. මොකද, තමුන්නාන්සේලා බැදුම්කර කොමිසමේ වාර්තා සියල්ල එළියට දැම්මොත් තමුන්නාන්සේලාගේ අගමැතිතුමාගේ ඉඳලා අමාත්‍යවරු ගණනාවක් මේකට අහුවෙනවා. කිරිඇල්ල ඇමතිතුමනි, අපි දන්නේ නැහැ, බැදුම්කර වංචාවේ සල්ලි පාර්ලිමේන්තුවටත් දීලා ද කියලා. මේ වාර්තාව ගෙනෙන්නේ නැති වුණාම, පාර්ලිමේන්තුවට මේ ගැන උනන්දුවක් නැති වුණාම, ඇලෝසියස්ගේ සල්ලි පාර්ලිමේන්තුවටත් දීලා ද කියා සැකයක් අපට ඇති වනවා.

කිරිඇල්ල ඇමතිතුමනි, තමුන්නාන්සේලාට මේ ආර්ථිකය කළමනාකරණය කරන්න බැහැ. යථාර්ථය ඒකයි. ආර්ථිකය කළමනාකරණය කරන්න නොහැකිවීම හරහා මේ රට තවත් අගාධයට ඇද දමන්න එපා. ඔබතුමන්ලාට මේක කරන්න බැරි නම්, දෙයියන්ගේ නාමයෙන් පුළුවන් කෙනෙකුට දීලා යන්න. ඇමතිතුමා, ලබන අවුරුද්දේ ජනාධිපතිවරණය එනවා; තමුන්නාන්සේලා පරදිනවා; වෙන ආණ්ඩුවක් එයි. හැබැයි, ඒ ආණ්ඩුව ආවාම ඒ ආණ්ඩුවටත් ගෙනියන්න රටක් තිබෙන්න ඕනෑ. මේ කඩා වැටෙන ආර්ථිකය උස්සන්න තමුන්නාන්සේලාට බැහැ. මේ විධියට තව අවුරුද්දක් ගියොත් රට ඉවරයි. කිරිඇල්ල ඇමතිතුමනි, ඔබතුමා බලන්න දවස් දෙකකට රුපියල් බිලියන 62ක් රටට පාඩු වුණා. පොඩි කාරණා දෙකක් ගැන පමණයි මම ඔබතුමාට කිව්වේ. විදේශ ණයවලින් පමණක් රුපියල් බිලියන 60ක් පාඩු වුණා, දවස් දෙකට රුපියල් දෙකකින් ඩොලරයේ අගය ඉහළ ගිය නිසා. හැබැයි, ඉහළ ගියේ රුපියල් දෙකකින් නොවෙයි, කිරිඇල්ල ඇමතිතුමා. පසුගිය කාලයේ රුපියල් 131 සිට රුපියල් 173ට ඩොලරයේ අගය ඉහළ ගියා. එහෙම ගණන් හැදුවොත් පාඩුව බිලියන ගණනක් වෙනවා. තමුන්නාන්සේලා බලන්න, අපේ ආණ්ඩුව කාලයේ අපි අපි අරගෙන තිබෙන ණය ප්‍රමාණය ට්‍රිලියන 5යි. අවුරුදු ගණනාවක් තුළ මහින්ද රාජපක්ෂ මහත්තයා අරගෙන තිබූ ණය ප්‍රමාණය ට්‍රිලියන 5යි. නමුත් තමුන්නාන්සේලා මේ අවුරුදු හතරට අරගෙන තිබෙනවා, ට්‍රිලියන 5ක්. මොනවාද, තමුන්නාන්සේලා කළේ? තමුන්නාන්සේලා කියනවා, ණය ගෙව්වා කියලා. එහෙම නම් පෙන්වන්න. අපි ආණ්ඩුවට අභියෝග කරනවා, පුළුවන් නම් තමුන්නාන්සේලා ගත්ත ට්‍රිලියන 5න් ගෙවූ ණය ප්‍රමාණයන් පිළිබඳ විස්තර මේ පාර්ලිමේන්තුවට සභාගත කරන්න කියලා. තමුන්නාන්සේලාට එහෙම කරන්න බැහැ. තමුන්නාන්සේලා ණය ගෙව්වා නොවෙයි, තමුන්නාන්සේලා ආර්ථික වශයෙන් ශක්තිමත්, තමුන්නාන්සේලා හොඳ වැඩකාරයෝ කියා පෙන්වන්න ඩොලරය ස්ථාවර මට්ටමක තියා ගන්න තමුන්නාන්සේලා සල්ලි ටික දැම්මා. ඒක තමයි වුණේ. තමුන්නාන්සේලාට එදා,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි.

තමුන්නාන්සේලාට එදා තෙල් මිල අඩු කරන්න කියා මිනිසුන් කිව්වේ නැහැ. ඔබතුමන්ලා තෙල් මිල අඩු කළා. ඒකෙන් වෙච්ච පාඩුව බිලියන 300කට වැඩි ප්‍රමාණයක්. ඒ නිසා ගරු ඇමතිතුමා, ඔබතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා. මොකද, මෙහෙම ඉදිරියට යන්න බැහැ. මෙහෙම ගියොත් රට ඉවරයි; ආර්ථිකය ඉවරයි. තමුන්නාන්සේලා ඕනෑ ඕනෑ දේවල්, අණ පනත් පාර්ලිමේන්තුවට ගෙනෙයි. හැබැයි, මේ ආර්ථිකය ගොඩගන්න තමුන්නාන්සේලාට හැකියාවක් නැහැ. ඒ නිසා අපි මේ ආණ්ඩුවට වැඳලා ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ කරුණාකරලා අගමැතිතුමා ඇතුළු ආණ්ඩුව ඉල්ලා අස්වෙන්න කියන එකයි. තමුන්නාන්සේලා දන්නවා, හෙට අනිද්දා යන්න වෙනවා කියලා. ඒ නිසා යන එක බැත ගොඩකරගෙන යන්න හදන්නේ; උපරිම deals ටික දාලා යන්න හදන්නේ. යන එකා කොරහත් බිඳගෙන යන්න හදනවා; හොඳ deals ටිකක් දාගෙන යන්න හදනවා. අරහෙන් කෝච්චියෙන් ගහනවා. මෙහෙන් හයට එකෙන් ගහනවා; හිල්ටන් එකෙන් ගහනවා; LNG බලාගාරයෙන් ගහනවා. බැදුම්කරයෙන් ගැහුවා. ඔක්කෝම ගහලා මුළු රටම නැති කරලා යන්නයි තමුන්නාන්සේලා හදන්නේ. එතැනට මේ රට ගෙනියන්න එපා, ඇමතිතුමා. එතැනට මේ රට ගෙනයන්න එපා ඇමතිතුමා. මේ ආර්ථිකය ගොඩ ගන්න ඔබට හැකියාවක් නැහැ. මේ වසර හතරට එය ඔප්පු කරලා ඉවරයි. එම නිසා ගෙදර යන්න කියන ඉල්ලීම පමණයි අපට කරන්නට තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

[අ.භා. 12.58]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද පැවැත්වෙන මුදල් පනත දෙවනවර කියැවීමේ විවාදයේදී ගරු

නිරෝෂන් පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා කියපු කාරණයකට පළමුවෙන්ම උත්තර දෙමින් මගේ කථාව පටන් ගන්න කැමැතියි. එතුමා කිව්වා, මේ අපේ theory එක අනුව දියුණු වෙච්ච රට මොකක්ද කියලා. එතුමා වියට්නාමය ගැනත් කිව්වා; චීනය ගැනත් කිව්වා. මම එතුමාට කියන්න කැමැතියි, සැලැස්මක් උඩ ආර්ථිකයක් මෙහෙයවීම තමයි අපේ theory එක කියලා. ඒ සැලැස්මට වුවමනා කරන රාජ්‍ය ආයතන සහ රාජ්‍ය මර්මස්ථාන ඒ සැලැස්ම යටතේ මෙහෙයවීම තමයි අපේ theory එක. ඊළඟට, රටට මොන ආයෝජන එනවාද කියලා තීන්දු කරන එකත් අපේ theory එකට ඇතුළත්. අපනයනය කිරීම අපේ theory එකේ ප්‍රධාන කාරණය නොවෙයි. වියට්නාමයේත් චීනයේත් ප්‍රධාන කාරණය අපනයනය නොවෙයි. ප්‍රධාන කාරණය, ඒ රටේ ආර්ථිකය දේශීය වශයෙන් පණ ගැන්වීම තුළින්, ශක්තිමත් කිරීම තුළින්, නිපදවීම තුළින් දුප්පත්කම අඩු කරමින් යෑමයි. ඒ ක්‍රියාදාමය තුළ ඇති තවත් එක පියවරක් තමයි අපනයනය. දැන් බලන්න, අපි තේ රබර් අපනයනය කරලා තිබෙනවා. අපේ තේ හා රබර් අපේ රටට වුවමනා ප්‍රමාණය පාවිච්චි කරලා ඉතිරි ඒවා පිටරට යවනවා. එහෙම නේ කරන්නේ. නමුත්, අද තමුන්නාන්සේලා අපනයනය කියලා කථා කරන්නේ මේ රටේ මිනිස්සු නොකා නොබී -පරිභෝජනය නොකර- අපනයනය කරලා මුදල් සෙවීමයි.

ඊළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න ඇමතිතුමා ඇසුව ප්‍රශ්න දෙකකට මම උත්තර දෙන්න ඕනෑ. එතුමා කිව්වා, මේ බාහිර සාධක නිසා තමයි අපේ ආර්ථිකය වැටිලා තිබෙන්නේ කියලා. මොනවාද ඒ බාහිර සාධක? ට්‍රම්ප් බලයට ඇවිත් චීන බඩුවලට ඇමෙරිකාවේ සම්බාධක දැමීමද? නැත්නම් බදු දැමීමද? ඉරානයට සම්බාධක දැමීමද? ඒවා කොහොමද අපට බලපාන්නේ? තවම නම් බලපෑවේ නැහැ. බලපාන්න ඉඩ තිබෙනවා කියලායි කිව්වේ. තවම ඒවා බලපෑවේ නැති කාලයේ අපේ රටට මොකද වෙලා තිබෙන්නේ? මොනවාද අපේ රටට බලපාන ඒ බාහිර සාධක? ඒ සාධක නොවෙයි අපේ රටට බලපෑවේ. අපි මුල පටන්ම වල්බූරු ආනයන ප්‍රතිපත්තියකට ගියා: ආනයන ප්‍රතිපත්තිය විවෘත කළා, ඕනෑ දෙයක් ගෙනෙන්: ඕනෑ තරමක් ගෙනෙන් කියලා. ඒකෙන් මොකක්ද මේ රටේ වෙන්නේ? ඒකෙන් මේ රටේ නිෂ්පාදනය වැටුණා. අනෙක් පැත්තෙන් අපේ විදේශ විනිමය සංචිතය වැටුණා. විදේශ විනිමය ඒ ප්‍රමාණයට හුවමාරු වෙනකොට ඩොලරයේ වටිනාකම නැග්ගා. ඒ ප්‍රමාණයට අපේ රුපියල වැටුණා. මෙන්න මේකයි ඇත්ත කාරණය. ඒක තමුන්නාන්සේලාට තේරෙන්නේ නැහැ. අවුරුදු තුනක් යනකොට පස්ස රත් වුණා. එතකොට ඉක්මනට යම් යම් බදු දැමීම් කළා, ආනයනය කිරීමේ අංශ පුළුවන්තරම් අධෛර්යවත් කරන්න. අද තමුන්නාන්සේලා ඒ පියවර අරගෙන තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නවලට බලපෑ පළමුවනම කාරණය තමයි මේ ආණ්ඩුව කරපු ඒ වැරැද්ද. අපේ රටට බලපෑ පළමුවනම කාරණය තමයි මම ඒ කිව්වේ.

අනෙක් එක තමයි, අපේ ණය පැටව් ගහන ආකාරයට අපි විදේශ ණය අරගෙන තිබෙන එක. අපි ඩොලර්වලින් විදේශ ණය අරගෙන ඒවාට ගෙවීම් කළ යුත්තේ අපේ වැඩි රුපියල් ප්‍රමාණයකින්. රුපියල් ප්‍රමාණය වැඩියෙන් උපයන්නට නම්, වැඩියෙන් බදු දාන්න අපට සිද්ධ වෙනවා. ඒකයි මේ සිද්ධ වෙලා තිබෙන්නේ. වැඩියෙන් බදු දමනවා. ඒ මගින් අපේ අය වැය පරතරය අඩුකර ගන්නවා. ඊළඟට ඒ වැඩියෙන් දමන බදුවලින් අපේ ණය ගෙවන්නට වුවමනා රුපියල් ප්‍රමාණය සොයා ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම තව කාරණයක් ගරු ඉරාන් වික්‍රමරත්න ඇමතිතුමාට කියන්නට කැමතියි. අපේ රටේ උද්ධමනය ගැනත්, ජීවන වියදම ගැනත් කථා කළා. කොයි කාලයේත් වියදම වැඩි වෙනවාය කිව්වා. මෙන්න වර්ෂ 2005 සිට 2015 දක්වා වැඩි වුණු ජීවන වියදම් ඒකක ගණන 52යි. නමුත් 2015 සිට 2017 දක්වා අවුරුදු තුනට වැඩි වුණු ජීවන වියදම් ඒකක ගණන 78යි. ඒකයි අපි පෙන්වන්නේ. 2005 සිට 2015 දක්වා වැඩි වුණේ ජීවන වියදමේ ඒකක 52යි. 2015 ඉඳලා 2018 දක්වා අවුරුදු තුනට ජීවන වියදමේ වැඩිවීම ඒකක 78යි. අන්න ඒකටයි ඉරාන් වික්‍රමරත්න මැතිතුමා උත්තර දිය යුත්තේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Piyankara Jayaratne to the Chair?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I propose that the Hon. Piyankara Jayaratne do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු පියංකර ජයරත්න මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரியங்கர ஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. PIYANKARA JAYARATNE *took the Chair.*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියාගෙන ආවේ, ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමාගේ කියමනකට උත්තරයයි. ඊළඟට මම එතුමාට කියන්න කැමැතියි, 2014දී අපේ රටේ ජීවන වියදම තිබුණේ 105ක බව. 2018 වන විට ඒක 127 දක්වා වැඩි වෙලා තිබෙනවා.

ඊළඟට මම කැමැතියි, උද්ධමනය ගැන කියන්න. එතුමා කිව්වා, උද්ධමනය අඩුවෙලා කියලා. නමුත්, 2015දී 3.7ට තිබුණු උද්ධමනය 2018 මේ වන විට 5.9 දක්වා නැඟලා. එතුමා එතුමාට වාසිදායක ආකාරයට අප්‍රේල් මාසයේ උද්ධමනය අරගෙන පෙන්නුවා. එහෙම මාසයෙන් මාසයට පෙන්නුවාට කමක් නැහැ. එහෙම නම් අනෙක් මාසවලත් පෙන්වන්න ඕනෑ. 2018 සැප්තැම්බර් මාසයේ උද්ධමනය 5.4යි. 2017 ඔක්තෝබර් මාසයේ උද්ධමනය 6.1යි. 2017 සැප්තැම්බර් මාසයේ උද්ධමනය 5.8යි. එතුමා මේ මාසවල මේ ඉලක්කම් පෙන්නුවේ නැහැ. එතුමා පෙන්වුවේ අප්‍රේල් මාසයේ උද්ධමනය විතරයි. ඒකයි මම කල්පනා කළේ. සැප්තැම්බර්, ඔක්තෝබර් මාසවල උද්ධමනය 5.8යි, 6.1යි. ඒ නිසා මම හිතනවා, ආණ්ඩුවේ ඇමතිවරු මීට වඩා වගකීමෙන් මේ ඉලක්කම් ඉදිරිපත් කරනවා නම් හොඳයි කියලා. තමන් තෝරා ගත්ත ඉලක්කම්, තමන්ට වාසිදායක ලෙස පෙනෙන ඉලක්කම් ඉදිරිපත් කරලා, අනෙක් ඉලක්කම් හංගන එක ලජ්ජා නැති වැඩක්. ඒ නිසා මේ ජීවන වියදම් අංකය වැඩි වූ වේගයත්, ජීවන වියදම ඇත්තටම වැඩි වූ ප්‍රමාණයත් කියන මේ දෙක ගැනම මේ ආණ්ඩුව මුහුණ දෙන්නේ චෝදනා පත්‍රයකට. මට පසුව කථා කරන මැති ඇමතිවරුන්ගෙන් මම ඉල්ලා සිටිනවා, අඩු ගණනේ හැබෑ ඉලක්කම් ඇතුව මේ කියන ප්‍රශ්නවලට උත්තර දෙන්න කියලා. මම ඒ අයට කියනවා, මම මේ කියපු මාසවල, මම මේ කියපු අවුරුදුවල, මම මේ කියපු වැඩි වෙච්ච ජීවන වියදමේ ඒකක

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

ගණන ගැන පුළුවන් නම් උත්තර දෙන්න කියලා. උද්ධමනය පිළිබඳව මම සඳහන් කළ මාසවල ඉලක්කම් ගැන උත්තර දෙන්න කියලා මම අභියෝග කරනවා.

ඊළඟට මම කැමැතියි, රජරට විශ්වවිද්‍යාලය ගැන කියන්න. රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය වහලා දැන් සති දෙකක් වෙනවා. ඒ වෛද්‍ය පීඨයේ කථිකාචාර්යවරු ඒ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වෙලා ගිහිල්ලා. ඒකට හේතුව, රැඳී සිටීමේ දීමනාවක් ලෙස ඒ කථිකාචාර්යවරුන්ට ලබා දුන් මුදල -ඒ වැඩ පිළිවෙළ- මුදල් අමාත්‍යාංශයෙන් නැවැත්වීමයි. COPE එකත් යම් යම් ප්‍රශ්න මතු කරන කොට මතක තියාගන්න ඕනෑ, නිකම්ම නීතියේ රූලට පමණක් ප්‍රශ්න මතු කරලා වැඩක් නැහැ කියලා. ඒ ප්‍රශ්න නීතියේ රූලට මතු කරන අතර, අවශ්‍යතාව සහ යුක්තියේ කරුණත් ඒකට එකතු කරන්න ඕනෑ. මේ රැඳී සිටීමේ දීමනාව දුන්නේ වෛද්‍ය පීඨය පවත්වා ගෙන යෑම සඳහා මේ කථිකාචාර්යවරු පුළුවන් තරම් ඒ විශ්වවිද්‍යාලයේ නවත්වා ගන්නයි. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණේ මුළු විශ්වවිද්‍යාලයේ වියදම්වලට දුන්නු මුදලින් පංගුවක් ඒ වෙනුවෙන් වෙන් කරලා. විශ්වවිද්‍යාලයේ මුළු වියදම්වලට දුන්නු මුදල් වෙනත් වෙනත් දේවල්වලට වියදම් කරන අතර, ඒවායින් ඉතුරු කරගත්ත මුදලින් තමයි මේ රැඳී සිටීමේ දීමනාව දුන්නේ. දැන් භාණ්ඩාගාරයෙන් කියනවා, "එක දේකට දීපු මුදල් වෙනත් දේකට වියදම් කරන්න බැහැ" කියලා. ඒ නියමයත් එක්ක මේ රැඳී සිටීමේ දීමනා නවත්වා තිබෙන නිසා අද ඒ කථිකාචාර්යවරු විශ්වවිද්‍යාලයෙන් පිටවෙලා ඇවිල්ලා. අද ඒ වෛද්‍ය විද්‍යා පීඨය වැහිලා තිබෙන නිසා අපේ රත්නපුර දිස්ත්‍රික්කයේත් ළමයි රාශියක් ගෙවල්වලට වෙලා ඉන්නවා. මේ ඇති වන ප්‍රමාදය නිසා මේ ළමයින්ගේ කාලයෙන් අවුරුද්දක පමණ කාලයක් බාල්දුවීමක් සිද්ධ කරන්න පුළුවන් කියලා ඒ කථිකාචාර්යවරුනුත්, ඒ උපකුලපතිතුමාත් කියනවා.

උපකුලපතිතුමා කියනවා, "මම මේක ගෙවාගෙන ආවා. නමුත්, මේ ආණ්ඩුවෙන් එවපු චක්‍රලේඛයත් සමඟ මේ ගෙවීම් කරන්න බැරි වුණා" කියලා.

ග්‍රෑන්ඩ් හයට් හෝටලය, හිල්ටන් හෝටලය කියන හෝටල් දෙක විකිණීමට පත්තරයේ දැන්වීමක් දැම්මා. ඒ දැන්වීම මම බැලුවා. "Daily News" පත්තරයේ තිබෙන ඒ දැන්වීම බලපුවාම පෙනෙනවා, අනාගත ආයෝජකයන්ට උනන්දුව පළ කිරීමේ ලිපි එවීමට කාලය ලබා දීලා තිබෙන්නේ දවස් 8යි කියලා. දවස් 8ක් තුළ මේක කරන්නට බැහැ කියලා මම ලියුමක් යැව්වා. මම ඒ ලියුම යැව්වේ අගමැතිටයි, මුදල් ඇමතිටයි. ඉන් පසුව කැබිනට් එකේ ඇහැ ඇරිලා, -බොරුවට නිදාගෙන ඉඳලා ඇහැ ඇරලා- මාසයක් කල් දුන්නා. මගේ ලියුමෙන් පසුව මුදල් ඇමතිතුමා ප්‍රකාශයක් නිකුත් කළා.

Interestingly, the Finance Ministry Statement states, I quote:

"Meanwhile Lazard and MTI through their global offices have already begun to reach out to international real estate investors covering many countries"

I would like to know what the terms of references are. How could they have been already engaged in doing so even before the actual mandate was given to them? The advertisement appears on a particular day and the next day, I send a letter and then the Minister makes a statement to say that the agents are already looking out for investors.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙයින් පෙනෙන්නේ දැනටම තමුන්නාසේලා මේ ගැන වැඩ සැලැස්මක් දාගෙන වැඩ කරගෙන යන බවයි. ඒ අනුව මේ හයට හෝටලයේ වටිනාකම පමණක් ඇමෙරිකානු ඩොලර් මිලියන 400කට වැඩියි. දැනටම ඇමෙරිකානු ඩොලර් මිලියන 160ක් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 80ක් පමණ මේ සඳහා ආයෝජනය කරලා තිබෙනවා. අපේ සේවක අර්ථසාධක අරමුදල, රක්ෂණ සංස්ථාව සහ ලිට්ට්‍රෝ සමාගම යන මේ සියල්ලම රාජ්‍ය ආයතන. දැන් මම නඩුවක් දමන්නයි යන්නේ, මේ වංචනික ගනුදෙනුව නවත්වන්න. තමුන්නාන්සේලා යටින් ඇති කර ගත්ත ගිවිසුමක් මත මේක කුණු කොල්ලයට දීලා UNP එකේ අරමුදලට ලොකු ගණනක් කපා ගන්නයි මේ ලැහැස්ති වෙන්නේ. තමුන්නාන්සේලාට ඒක කරන්නට ඉඩ දීලා අපි නිහඬව බලාගෙන ඉන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ මේ දූෂණ අද සම්පූර්ණයෙන්ම නිරාවරණය වෙලා ඉවරයි. නමුත් මේ දූෂණ සම්බන්ධව තමුන්නාන්සේලාගේ පොලීසියවත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවවත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නමුත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ බලය ඉවරවුණු දාට මේ ආර්ථික ඝාතකයින්ව යම් ආකාරයකට දඬුවම් දීම සඳහා පාර්ලිමේන්තුව අසල තැනකට කැඳවන්න අපි අධිකරණයක් පිහිටුවන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා.1.12]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - Deputy Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මුදල් පනත් කෙටුම්පත දෙවෙනිවර කියවීම සහ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් පිළිබඳව කථා කරන මේ අවස්ථාවේ දී, බදු පැනවීම සහ බදු නිදහස් කිරීම පිළිබඳව පැවැත්වෙන මේ විවාදයට සහභාගි වීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. අද රටේ බදු ගැන, බදු පැනවීම ගැන ලොකු කථිකාවතක් තිබෙනවා. ඒ වාගේම බදු බර වැඩියි කියලා විපක්ෂය කෑ ගහනවා. එවැනි වැඩ පිළිවෙළවල් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු අය කිරීම ගැන බැලුවොත් රජ කාලයේ ඉඳලාම බදු අය කරනවා. පසුගිය කාලය දෙස බැලුවොත්, අපට තිබුණු ප්‍රශ්නය බදු අය කිරීම නොවෙයි. බදු අය කරන්නට ඕනෑ. කවුරුත් කියන්නේ නැහැ, බදු අය කරන්නට ඕනෑ නැහැ කියලා. නමුත් අපට අභියෝගය තිබුණේ පසු ගිය කාලයේ අය කරපු බදු මුදල් බොහොමයක් යටිමඩි ගැසීම සහ එක එක්කෙනාගේ සාක්කුවලට යාමයි. ඒ නිසා සමාජ සේවයට, මහජන සේවයට සහ බදුවලින් කළ යුතු ක්‍රියාදාමවලට ඒ මුදල්

යොමු වුණේ නැහැ. අපට ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා; ජනතාවට ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. බදු අය කිරීම ගැන ජනතාව දන්නේ නැහැ, බදු අය කළේ අහිංසක මිනිසුන්ගෙන්. උපයන අයගෙන් නොවෙයි, ධනවත් අයගෙන් නොවෙයි බදු අය කළේ. වැඩි ප්‍රමාණයක් බදු අය කළේ අහිංසක මිනිසුන්ගෙන්. ඒ මිනිස්සු දන්නෙත් නැහැ ඒ අයගෙන් බදු අය කරනවා කියන එක. ඒ අය රත් වෙන දිය හැළියේ නටන කකුළුවෝ ටික වාගේ බොහොම සතුටින් හිටියා. දන්නෙම නැතිව විවිධ ක්‍රමවලින් ඔවුන්ගේ සාක්කුවේ තිබුණු මුදල් "පික්පොකට්" ගැහුවා.

වර්තමාන රජය ඇවිල්ලා ඒවා හෙළිදරව් කළා; ඒවා පෙන්නුවා; "බදු" කියන්නේ මොකක්ද කියලා කිව්වා. තමුන්ගෙන් කීයක් බදු අය කරනවාද කියලා ජනතාවට දැනගන්න දුන්නා. ජනතාව සමහර වෙලාවට හිතනවා, "මේ බදු අයකිරීම අලුතෙන් පටන් ගත්ත එකක්ද, ඉස්සර බදු අය කළේ නැද්ද" කියලා. ඉස්සර අපි දන්නේ නැහැ නේ බදු අය කළා කියලා. නමුත්, දැන් දන්නවා බදු අය කරනවා කියලා. ඒ ගැන විශේෂ කතිකාවත්, වාද විවාද, විවේචන ඇති වුණා. සමාජ වෙබ් අඩවි, මාධ්‍ය ආයතන මේ බදු ගැන කථා කළා. මේ සඳහා ජනතාව විවිධ විධියට පෙළ ගැහෙනවා. සමහර වෙලාවට විපක්ෂය ගිහිල්ලා ජනතාව පෙළ ගස්වනවා, "මෙන්න මේ මේ දේවල් සිදුවෙනවා" කියලා. හරියට ඒ ගොල්ලන්ගේ කාලයේ බදු අය කළේ නැහැ වාගේ. නමුත් මේ රජයට 2015 ජනවාරි 8 වැනිදා ජනතාව ලබා දුන් ජයග්‍රහණය අනුව කළ යුතුව තිබුණු දෙයක් තමයි, රටේ විනිවිද පෙනෙන පාලනයක් ඇති කිරීම. විනිවිද පෙනෙන පාලනයක් රටේ ඇති කරන කොට ප්‍රශ්න ඇති වෙනවා. ජනතාව ඒවා දකිනවා.

උදාහරණයක් ගත්තොත්,"මන්ත්‍රීවරයා jeep එක විකුණුවා; 'පර්මිට්' එකට ගෙනා වාහනය විකුණුවා" කියනවා. එහෙම විකුණන්න "පර්මිට්" එක හදලා දුන්නේ පසුගිය ආණ්ඩුව. ඒ කාලයේ විකුණුවා. "පර්මිට්" එකට ලැබෙන වාහනය අවුරුදු පහක් යනතුරු විකුණන්න බැහැ කියලා කොන්දේසියක් තිබුණා. ඊටපස්සේ පසුගිය ආණ්ඩුව කිව්වා, "ඒ කොන්දේසිය ඕනෑ නැහැ, විකුණන්න පුළුවන්" කියලා. හැබැයි රටේ ජනතාව දන්නේ නැහැ, "පර්මිට්" එක විකුණුවා කියන කාරණය. ජනතාව හිතාගෙන ඉන්නේ එහෙම විකුණන්නේ නැහැ කියලා. නමුත්, වර්තමාන ආණ්ඩුව බලයට ආවාට පසුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත වාගේ පනත් ගෙනැල්ලා, රජය කරන දේ ජනතාවට විනිවිද දකින්න පුළුවන් විධියේ ක්‍රමවේද, නීති නිර්මාණය කරන කොට ජනතාව හිතනවා, මේවා අලුතෙන් සිදු වෙන සිද්ධීන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාඩිවෙන්න පුටුවක් ගන්න පළාත් සභාවක් රුපියල් ලක්ෂ හයහමාරක් වියදම් කළා කියලා පසුගිය දිනවල ලොකු ආන්දෝලනයක් ඇති වුණා. මේ මුදල් කාගේද? ජනතා මුදල්. ජනතාවගෙන් අයකරන බදු මුදලින් තමයි මෙවැනි පුටු ගන්නේ. නමුත්, මීට කලින් ඊටත් වඩා මිල වැඩි පුටු සවි කරන්න ඇති. නමුත් රටේ ජනතාව ඒවා දන්නේ නැහැ; රටේ ජනතාවට ඒ තොරතුරු දැනගන්න පුළුවන් යන්ත්‍රණයක් මේ රටේ ක්‍රියාත්මක වුණේ නැහැ. රජය වියදම් කරන සල්ලි මොනවාද, වියදම් කරන්නේ මොකටද කියන එක රටේ ජනතාව දැනගෙන සිටියේ නැහැ. රටේ ජනතාව හිතාගෙන ඉන්නේ මේවා ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ, එහෙමත් නැත්නම් කාගේ හරි ලොක්කෙකුගේ සාක්කුවෙන් ගන්න සල්ලි කියලා. තමුන්ගේ සල්ලි වියදම් වෙනවා කියලා දැනුවත්කමක් තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් විධියට පාරක් හැදීම පිළිබඳව ගත්තොත්, ඒ පාර හදන්නේ ජනතා බදු මුදල්වලින්. නමුත් ජනතාව ඒක දන්නේ නැහැ. මොකද, මන්ත්‍රීතුමාගේ board එක තමයි එතැන තිබෙන්නේ. ඒ ගැන සොයා බැලුවොත්, පාර හදන්න ලබා දුන් මුදලින් භාගයක් සාක්කුවේ දමාගෙන, ඉතිරි භාගයෙන් පාර හදලා තමන්ගේ board එක ගහගන්නවා. මිනිස්සු කියනවා, "අනේ කමක් නැහැ. අපේ පාර හදලා දුන්නා නේ" කියලා. ඊටපස්සේ කවුරු හරි කිව්වොත්, ඒකට රුපියල් ලක්ෂ දහයක් වියදම් වුණා කිව්වාට වියදම් වුණේ රුපියල් ලක්ෂ පහයි කියලා, "කමක් නැහැ අනේ, හොරකම් කරලා හරි පාර හදලා දුන්නා නේ" කියනවා. රටේ ජනතාවගේ බදු මුදල්වලට දෙවියන්ගේම පිහිටයි! මෙතෙක් කාලයක් ජනතාව මේ ගැන දැනුවත් වෙලා තිබුණේ නැහැ.

වර්තමාන රජය තමයි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත, ඒ වාගේම විගණන පනත ගෙනාවේ. ඇමතිවරයෙකුගේ, ජනාධිපතිවරයෙකුගේ යටතේ නොවන විධියට රජයේ මුදල් වියදම් වෙනවා නම් ඒ ගැන පාර්ලිමේන්තුවට වග කියන විධියට විගණන පනත ගෙනැල්ලා රාජ්‍ය නිලධාරීන් ශක්තිමත් කළා. රාජ්‍ය ආයතනවල වංචා, දූෂණ හොයන්න තිබෙන කමිටුව වන COPE එකේ සභාපති ධුරය විපක්ෂයට භාර දුන්නා. පසුගිය කාලයේ ඒ විධියට විපක්ෂයට එහි සභාපතිකම භාර දුන්නේ නැහැ. ආණ්ඩුවේ ඇමතිවරයෙක් තමයි COPE එකේ සභාපතිවරයා වශයෙන් පත් වුණේ. නමුත්, අද මෙවැනි විවිධ යන්ත්‍රණ නිර්මාණය කරලා, ජනතා බදු මුදල් පාවිච්චි වෙන්නේ මොනවාටද, ජනතා බදු මුදල් පරිහරණය කරන්නේ කොහොමද කියන කාරණය ජනතාවට දැනගැනීම සඳහා විවිධ ක්‍රමවේද සකස් කර තිබෙනවා. වර්තමානය වෙන කොට ආණ්ඩුවේ හෝ වේවා, විපක්ෂයේ හෝ වේවා, රජයේ දේශපාලනඥයෙක් වේවා, එහෙම නැත්නම් රාජ්‍ය නිලධාරියෙක් වේවා, ජනතා මුදල් වැරදි විධියට පාවිච්චි කරනවා නම්, විවිධ මාධ්‍ය ඔස්සේ එවැනි දේ ප්‍රචාරය වෙනවා. එහෙම නැත්නම් උද්ඝෝෂණ ව්‍යාපාර එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලයේ හම්බන්තොට වරාය වෙනුවෙන් ගත් ණය මුදල කීයද කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් අපි දැනගෙන සිටියේ නැහැ. හම්බන්තොට වරාය හදන්න ණය අරගෙන ඒකට ගෙවන පොලිය කීයද, අවුරුද්දකට කීයක් ණය ගෙවනවාද කියලා දැන සිටියේ නැහැ. හම්බන්තොට වරායේ, එහෙම නැත්නම් මත්තල ගුවන් තොටුපොළේ ආදායම කීයද කියලා අපි දන්නේ නැහැ. ඒ සඳහා ගෙනාපු ගෘහ භාණ්ඩවල, ඒ වෙනුවෙන් ගෙනාපු පුටුවල වටිනාකම කීයද කියලා දන්නේ නැහැ. ඒවා සම්බන්ධයෙන් ජනතාව දැනුවත් වෙලා තිබුණේ නැහැ. ජනතා රහස් විධියට තමයි එදා රජය බදු මුදල් පාවිච්චි කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන් වශයෙන් මේ ගැන සොයා බලන්න ගිය බව ඔබතුමාට මතක ඇති. ජනතාවගේ බදු මුදල්වලින් ක්‍රියාත්මක කරන, ජනතාවගේ බදු මුදල්වලින් ණය ගෙවන මේ ආයතනවල තත්ත්වය පිළිබඳව සොයා බලන්න අපට වගකීමක් තිබෙනවා. එහෙම සොයා බලන්න නීතිමය අවකාශයක් තියා, අපට ගිහිල්ලා ඒවා පිළිබඳව සොයා බලන්න හැකියාවක් තිබුණාද? ඒ පිළිබඳව සොයා බලන්න ගිය අවස්ථාවේ දී එදා රජයේ මැරයෝ පිස්තෝල අරගෙන ඇවිල්ලා අපට පිස්තෝල එල්ල කරලා අඩන්තේට්ටම් කළා. අපි ගිය වාහනයේ windscreen එක කුඩු කරලා, අපව ආපහු හරවා යැව්වා. අපට සොයා බලන්න ඉඩ දුන්නේ නැහැ. මොකද, ජනතා බදු මුදල් කියන එක රජයේ දේපොළක්; රජයේ බුදලයක් විධියට මිස, ජනතාවගේ මුදල් විධියට මේ අය සැලකුවේ නැහැ.

විශ්වවිද්‍යාල දරුවෝ පාරට බැහැලා උද්ඝෝෂණය කරන නිසා ඒ අයට උපාධිය ගන්න තිබෙන කාලය අවුරුද්දකින් දීර්ඝ වෙලාය කියා ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා අද බොහොම කනගාටුවෙන් ප්‍රකාශ කරනවා. ඔවුන්ගේ දෙමව්පියෝ කනස්සල්ලෙන් ඉන්නවාය, දහසක් බලාපොරොත්තු තියාගෙන,- [බාධා කිරීමක්] ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ, මේ විධියට ගියොත් උපාධිය අරන් අවුරුදු

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

5කින් විශ්වවිද්‍යාලයෙන් එළියට එන දරුවාගේ කාලය තව අවුරුද්දකින් දෙකකින් දිගු වෙනවා කියලා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් අවුරුදු 4කින් උපාධිය ගන්න විශ්වවිද්‍යාලයට ඇතුළු වුණු කෙනෙක්. නමුත්, මටත් උපාධිය සම්පූර්ණ කරගන්න අවුරුදු 6ක් ඉන්න වුණා. ඔබතුමා ඔය කථාව කියද්දී ඒ සඳහා වග කියන්නේ කවුද? විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන කාලය වැඩියෙන්ම නාස්ති වුණේ සයිටම් අර්බුදය නිසායි. සයිටම් අර්බුදය නිර්මාණය කළේ මේ අයමයි. අද විපක්ෂයේ සිටින, එදා ආණ්ඩුව කළ කටවැටිය තමයි සයිටම් එක හැදුවේ; ඒකෙන් වෛද්‍ය උපාධිය දුන්නේ. රජයේ විභාග කරන අයට ශිෂ්‍යත්ව දීලා සයිටම් එකට යැවිවේ මේ අයමයි. ඊට පස්සේ, සයිටම් එක හොඳ නැහැය කියා උද්ඝෝෂණ මෙහෙයවූවේත් ඒ අයමයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එම දරුවන්ට අධ්‍යාපනය ලැබීමට තිබෙන කාලය නාස්ති කරලා දැම්මෙත් මේ අයමයි. ඒ දෙය කරලා, "අනේ! දරුවන්ගේ කාලය නාස්ති වෙනවා" කියා අද කිඹුල් කඳුළු හෙළනවා. මේ අර්බුද නිර්මාණය කළේ කවුද? ඒ ශිෂ්‍යයෝ පාරට බැස්සුවේ කවුද? "සයිටම් එක හොඳයි" කියලා එදා ඒක හැදුවා නම්, අදත් මේ අයට කියන්න තිබුණා, "ඒක හරි" කියා.

එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමා අපට දුන්න අවවාදය මට තවම මතකයි. අධිවේගී මාර්ග හදද්දී ගම්වල මිනිසුන් උද්ඝෝෂණය කරලා, විපක්ෂයේ සිටි අපටත් කථා කර කිව්වා, "අධිවේගී මාර්ගවලට විරුද්ධව උද්ඝෝෂණ මෙහෙයවන්න ඔබතුමන්ලා නායකත්වය දෙන්න" කියා. "අපේ ආණ්ඩුවක් ආවත් අධිවේගී මාර්ග හදන්න ඕනෑ, එම නිසා ඔවාට විරුද්ධ වෙන්න එපා, ඔවාට යන්න එපා" කියා ඒ වෙලාවේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා අපට කථා කරලා අවවාදයක් දුන්නා. විපක්ෂයේ කාර්ය භාරය වන්නේ ජනතාවට නිවැරැදි දේ තේරුම් කර දෙන එකයි. අපි වැරැද්දක් කරනවා නම් එහි ප්‍රතිඵල අපට ලැබෙනවා. නමුත්, මේ විපක්ෂය කරන්නේ අපි මොන තරම් හොඳ දේ කළත් අපට විරුද්ධව ජනතාව පෙළගස්වන්න බොරු දේවල් මවා පෑම මිසක්, ජනතාවට සත්‍ය තේරුම් කර දෙන්න උනන්දු වන එක නොවෙයි. අපි අද මේ රටේ විනිවිද පෙනෙන පාලනයක් හදලා තිබෙනවා. ජනතාවගේ බදු මුදල්වලට වෙන්නේ මොනවාද කියා බලා ගැනීමට ජනතාවටම බලය දීලා තිබෙනවා. එම නිසා ඉදිරි කාලය වෙනකොට ජනතා බදු මුදල් සියල්ල නිසි ආකාරයට යෙදවිලා, හොඳ වැඩසටහන් ක්‍රියාත්මක වෙලා, මේ රට අපි බලාපොරොත්තු වන තැනට, ආසියාවේ ඉහළම තැනකට ගෙනයන්න අපට ශක්තිය ලැබෙයි කියා අපි විශ්වාස කරනවා.

[පි.ප. 1.21]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ நிதி அமைச்சர் அவர்களினால் கொண்டுவரப்பட்ட நிதிச் சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்தில் என்னைப் பேச அனுமதித்தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். குறிப்பாக நிதி அமைச்சானது, ஒரு நாட்டினுடைய பொருளாதார முன்னேற்றத்துக்கும் மற்றும் நாட்டு மக்களுடைய தேவைகளைப் பூர்த்திசெய்வதற்கும் பாரிய பங்காற்றுகின்றது. ஆனால், இன்று இலங்கையின் பொருளாதாரம் கேள்விக்குறியாகச் சென்றுகொண்டிருக் கின்றது. இவ்வாறு பொருளாதாரமானது கேள்விக்குறியாகச் சென்றுகொண்டிருக்கின்ற இந்த நாட்டில், மக்களின் அடிப்படைப் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு அரசாங்கம் முன்வருகின்றதா என்றால், அது சந்தேகமாகத்தான் இருக்கிறது. தற்பொழுது இந்த நாட்டில் அமெரிக்க டொலரின் பெறுமதி அதிகரித்திருக்கிறது. டொலரின் பெறுமதி அதிகரித்ததன் காரணத்தினால் எரிபொருட்களின் விலைகள் அதிகரித்திருக்கின்றன. எரிபொருட்களின் விலை அதிகரிப்பின் காரணமாக, அன்றாடத் தேவைக்கு மக்கள் பயன்படுத்துகின்ற உணவுப் பொருட்களின் விலைகள் முதல் போக்குவரத்துச் செலவினங்கள் வரை எல்லாம் அதிகரித்திருக்கின்றன. இவ்வாறானதொரு சூழ்நிலையில், இந்த நாட்டில் வாழுகின்ற ஒரு சாதாரண குடும்பம் எப்படி வாழ்க்கையைக் கொண்டு செல்வது? இவ்வாறான மிகவும் கடினமான ஒரு சூழ்நிலையில் தான் இன்று இந்த நாட்டிலுள்ள மக்கள் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். இப்படியான நிலையிலும்கூட, இந்த அரசாங்கத்தின் கொள்கைகள் மாற்றப்படவில்லை.

அண்மையில் சுவிற்சர்லாந்திற்கு ஆய்வுச் சுற்றுலாவொன் றுக்குச் சென்றிருந்த இலங்கைப் பாராளுமன்றக் குழுவில் நானும் அங்கம் வகித்திருந்தேன். பொருளாதார வளம் பொருந்திய, அபிவிருத்தியடைந்த அந்த நாட்டில் ஏழு பேர்தான் அமைச்சர்களாக இருக்கின்றார்கள். ஆனால், இங்கு எத்தனை அமைச்சர்கள் இருக்கிறார்கள்? இது மிகப் பெரியதொரு கேள்வியாக இருக்கிறது. வளர்ச்சியடைந்து வருகின்ற எமது நாட்டில், விவசாய உற்பத்திப் பொருட்கள், மீன்பிடி உற்பத்திப் பொருட்கள் போன்ற உற்பத்திகள் நிறைய இருக்கின்றன. அப்படியிருந்தும் அவற்றைப் பயன்படுத்த முடியாமல், பொருட்களை இறக்குமதி செய்துகொண்டிருக் கின்ற இந்த நாட்டில் அமைச்சர்களினுடைய எண்ணிக்கை மிகவும் அதிகமாக இருக்கின்றது. உண்மையில் எங்களுடைய நாட்டிலுள்ள அமைச்சர்களின் எண்ணிக்கையைக் குறைத்தால், மிகப் பெரியதொரு பணத்தொகையை எங்களால் மீதப்படுத்த முடியும். அதன்மூலம் மக்களுடைய சுமையைக் குறைக்க முடியும். அண்மையில் பிரதி அமைச்சர் ஒருவர், தன்னுடைய அமைச்சில் 56 வாகனங்கள் இருப்பதாகவும், எனினும், தான் 6 இலட்சம் ரூபாய் வாடகைக்கு ஒரு வாகனத்தை எடுத்திருப்பதாகவும் கூறியிருந்தார். இப்படிப்பட்ட ஒரு நிலையில்தான் எமது நாட்டில் ஒவ்வோர் அமைச்சும் இருக்கின்றது. ஆகவே, ஒவ்வோர் அமைச்சினதும் செலவினங்கள் மட்டுப்படுத்தப்படவேண்டும். அவ்வாறு செலவினங்கள் மட்டுப்படுத்தப்பட்டு, மீதப்படுத்தப்படுகின்ற பணத்தின்மூலம் மக்களுடைய சுமையைக் குறைக்கின்ற வகையில் திட்டங்களை உருவாக்க வேண்டும். அப்படி உருவாக்கினால் மட்டுந்தான், மக்களைப் பொருளாதார நெருக்கடியிலிருந்து காப்பாற்ற முடியும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாளாந்தம் உழைக்கின்ற மலையக மக்கள் இவ்வளவு விலைவாசிக்கு மத்தியில் தங்களுக்கு அடிப்படைச் சம்பளமாக ஆகக்குறைந்தது 1,000 ரூபாய் வழங்கப்படவேண்டுமென்று கோரி, எல்லா இடங்களிலும் போராட்டம் நடாத்து கின்றார்கள். அவர்கள் தங்களுடைய பிரதேசத்தில் போராட்டம் நடத்தினார்கள்; அவர்களுக்கு ஆதரவாக யாழ்ப்பாணத்தில் போராட்டம் நடத்தினார்கள்;

கிளிநொச்சியில் போராட்டம் நடத்தினார்கள். நேற்றுக்கூட, மலையக இளைஞர்கள் கொழும்பில் பாரிய போராட்டத்தை நடத்தியிருந்தார்கள். உண்மையில் அது நியாயமான கோரிக்கையாகும். அந்த மக்களுடைய உழைப்பு இந்த நாட்டினுடைய பொருளாதாரத்துக்குப் பாரிய பலமாகக் காணப்படுகின்றது. தற்பொழுதிருக்கின்ற பொருட்களின் விலைவாசி அதிகரிப்புக்கு மத்தியில் அந்த 1,000 ரூபாய்கூடப் போதாது. ஆயினும், அந்த மக்கள் அடிப்படைச் சம்பளமாக ஆகக்குறைந்தது 1,000 ரூபாயைத் தாருங்கள் என்றுதான் கேட்கின்றார்கள். ஆனால், 'கூட்டு ஒப்பந்தம்' என்று சொல்லி இந்த அரசாங்கம் தன்னுடைய பொறுப்பிலிருந்து நழுவப் பார்க்கின்றது. உண்மையில் அப்படியிருக்க முடியாது. ஏனென்றால், இந்த அரசாங்கத்தை உருவாக்குவதற்கு அந்த மக்கள் மிகப் பாடுபட்டார்கள். அந்த மக்கள் வாக்களிக்க வில்லையென்றால் இந்த அரசாங்கம் அமைவதற்கு வாய்ப்பேயில்லை. நான்கு இலட்சம் வாக்குகள் வித்தியாசத்தில் தான் இந்த அரசாங்கம் அமைந்தது. அந்த வகையில், அரசாங்கம் அமைவதற்கு அந்த மக்களின் கணிசமான வாக்குகளும் காரணமாக இருந்ததென்பதை நான் இந்த நேரத்தில் கூறிக்கொள்ள விரும்புகிறேன். எனவே, அரசாங்கம் உடனடியாகப் பெருந்தோட்டக் கம்பனி நிருவாகிகளை அழைத்து, அவர்களுடன் உரையாடி, இந்த மக்களுக்கு ஆகக்குறைந்தது 1,000 ரூபாய் அடிப்படைச் சம்பளம் வழங்கப்படுவதற்கு ஆவன செய்வதற்கு முன்வர வேண்டும். அப்படிச் செய்யாவிட்டால், இந்த அரசாங்கம் பாரிய பின்னடைவைச் சந்திக்கும். அந்த மக்களுடைய கண்ணீரை, வேதனையைச் சுமக்கின்ற ஓர் அரசாங்கமாக இந்த அரசாங்கம் மாறும் என்பதில் எந்தவிதமான சந்தேகமுமில்லையென்பதை நான் இந்த நேரத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். நிதி அமைச்சினுடைய விவாதம் இடம்பெறும் இந்த வேளையில் இந்த விடயம் மிக முக்கியமானதாக இருக்கின்றது. அந்த மக்களுடைய கோரிக்கை நியாயமானது. அந்தக் கோரிக்கையை யாரும் நிராரிக்கவில்லை. ஆனால், ஏன் அந்தக் கோரிக்கையை நிறைவேற்றச் சம்பந்தப்பட்டவர்கள் மறுக்கிறார்கள் என்பதுதான் இன்று ஒரு புரியாத புதிராக இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நிதி அமைச்சினுடைய இந்த விவாதத்தில் இன்னும் ஒருசில விடயங்களை நான் கூற விரும்புகின்றேன். குறிப்பாக, மன்னார் மாவட்டத்தில் மாவட்ட விளையாட்டு மைதான மொன்றை அமைப்பதற்கென 2011ஆம் ஆண்டு தீர்மானிக்கப் பட்டு, 2017ஆம் ஆண்டிலேயே அதனுடைய வேலைகள் ஆரம்பிக்கப்பட்டன. ஆனால், அந்தக் கட்டுமான வேலைகள் தற்பொழுது நிறுத்தப்பட்டிருக்கின்றன. தொல்பொருள் ஆராய்ச்சித் திணைக்களத்தினுடைய தலையீடு காரணமாக இது நிறுத்தப்பட்டிருக்கிறது. ஆனால், அதில் குறித்த இடத்தைத் தவிர்த்து மற்றைய இடத்தில் விளையாட்டு மைதானத்தை அமைப்பதற்கு அனுமதி வழங்குவதாகத் தீர்மானமொன்று எடுக்கப்பட்டது. என்றாலும், தொல்பொருள் ஆராய்ச்சித் திணைக்களம் உரிய அனுமதிக் கடிதத்தை வழங்காததன் காரணத்தினால் அதனுடைய கட்டுமான வேலைகள் தற்காலிகமாக நிறுத்தப்பட்டிருக்கின்றன. தற்காலிகம் என்பதைவிட நிரந்தரமாக என்று கூறுமளவுக்கு கிட்டத்தட்ட எட்டு மாதங்களாக அந்த வேலைகள் நிறுத்தப் பட்டிருக்கின்றன. இந்த நிலைமை தொடர்ந்துகொண்டிருக் கின்றது. இவ்வாறானதொரு விடயம் தென்பகுதியிலுள்ள ஒரு மாவட்டத்தில் நடந்திருந்தால், எட்டு நாட்களில் அந்தப் பிரச்சினை தீர்க்கப்பட்டிருக்கும். இங்கிருக்கின்ற அமைச்சர்கள் அது தொடர்பாகக் கலந்துரையாடி தீர்மானம் எடுத்து விடுவார்கள். ஆகவே, தயவுசெய்து, தொல்பொருள் ஆராய்ச்சித் திணைக்களமும் விளையாட்டுத்துறை அமைச்சும் சேர்ந்து அந்த விளையாட்டு மைதானத்தை அமைப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்.

அதேநேரத்தில், யுத்தத்தினால் முற்றுமுழுதாகப் பாதிக்கப் பட்ட முல்லைத்தீவு மாவட்டத்தில் இன்னும் மாவட்ட விளையாட்டு மைதானம் ஆரம்பிக்கப்படவில்லை. குறிப்பாக, தென்பகுதியில் பல விளையாட்டு மைதானங்கள் ஆரம்பிக்கப்பட்டுக் கட்டட வேலைகளும் நிறைவடைந்திருக் கின்றன. அந்த விளையாட்டு மைதானங்களில் அந்தப் பிரதேச இளைஞர், யுவதிகள் விளையாட்டுப் பயிற்சியில் ஈடுபட்டுக் கொண்டிருக்கின்றார்கள். ஆனால், யுத்தத்தினால் முழுமையாகப் பாதிக்கப்பட்ட முல்லைத்தீவு மாவட்டத்தில் மாவட்ட விளையாட்டு மைதானத்துக்கான இடம் தீர்மானிக்கப் பட்டிருந்தும், கட்டட வேலைகளை ஆரம்பிப்பதற்கு இன்னமும் எந்தவிதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை. நான் அண்மையில் விளையாட்டுத்துறை அமைச்சினுடைய பணிப்பாளரிடம் இதுபற்றி விசாரித்தபோது, அதற்குப் பணம் இல்லையென்று அவர் கூறினார். உண்மையில், இது மனவேதனையான ஒரு விடயமாகும். யுத்தத்தினால் முற்று முழுதாகப் பாதிக்கப்பட்ட முல்லைத்தீவு மாவட்டத்தில், மாவட்ட விளையாட்டு மைதானம் ஒன்றை அமைப்பதற்குக் கிட்டத்தட்ட 300 மில்லியன் ரூபாய் தேவைப்படுமென்று நான் நினைக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
மிகவும் அத்தியாவசியமான அந்த விளையாட்டு மைதானத்தை அமைப்பதற்கு உங்களிடம் பணமில்லை! ஆனால், அமைச்சர்களுக்குத் தங்களுடைய தொகுதிகளில் தேவையற்ற விதத்தில் எல்லா வழிகளிலும் செலவழிப்பதற்கு அரசாங்கத்திற்கு எப்படிப் பணம் கிடைக்கின்றது என்பது எங்களுக்குத் தெரியவில்லை. கௌரவ நிதி அமைச்சர் அவர்களே, எதிர்வரும் 2019ஆம் ஆண்டிலாவது, முல்லைத்தீவு மாவட்டத்தில் மாவட்ட விளையாட்டு மைதானத்தினை ஆரம்பிப்பதற்குரிய நடவடிக்கையினை எடுக்கவேண்டு மென்று கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.31]

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීමේ විවාදය මේ ගරු සභාවේ පැවැත්වෙන අද දවසේ මටත් ඒ සම්බන්ධයෙන් කථා කරන්න කෙටි කාලයක් හෝ ලබා දීම පිළිබඳව මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඇත්තෙන්ම මේ රටේ ආර්ථිකය දෙස බැලුවාම අපි හඳවතට එකඟව, සතුටින් හෝ අකැමැත්තෙන් හෝ මේ රටේ මහ

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

පොළොවේ පවතින තත්ත්වය පිළිබඳව ප්‍රකාශ කළ යුතුයි. ග්‍රාමීය ආසන නියෝජනය කරන මහජන නියෝජිතයන් හැටියට අපි හමු වෙන්න එන සාමාන්‍ය ජනතාව සිටින්නේ සතුටකින් නොවන බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. ඒ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට ඔවුන් හැම වෙලාවේම ඇවිල්ලා අපිට කියනවා, "අපිට ආර්ථික වශයෙන් යම්කිසි සහන දෙන්න. මොකද, අපි ඉතා අමාරුවෙන් තමයි අපේ ජීවන කටයුතු කරගෙන යන්නේ." කියා. තමන්ගේ පඩිය රුපියල් දාහක් කරන්න කියලා අද වතු කම්කරු ජනතාව කියනවා.

විශේෂයෙන්ම වතුකරයේ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට මම හඳවතින්ම ඒ ජනතාවගේ පැත්තේ ඉන්නවා. මොකද, දුක්ඛිත -දුක් විඳින- ජීවිතයක් ගත කරමින්, ලේ, දහඩිය, කඳුළු වගුරලා, අපේ රටේ ජාතික ආදායමට වැඩි දායකත්වයක් ලබා දෙන වතුකරයේ ජනතාවගේ ඉල්ලීම ඉතා සාධාරණ ඉල්ලීමක් බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ දේශපාලන ඉතිහාසය ගත්තාම, විවිධ දේශපාලන පක්ෂ මේ රට පාලනය කළත්, මේ හැම දේශපාලන පක්ෂයක්ම ගෙදර යවලා තවත් පක්ෂයක් බලයට ගෙනාවේ මේ රටේ ජනතාවයි. තට්ටු මාරු ක්‍රමයට මේ රටේ දේශපාලන ක්‍රමය වෙනස් කරන සිරිතක් අපි කුඩා කාලයේ සිට තිබුණු ආකාරය අපිට මතකයි. මනාප දේශපාලන ක්‍රමය සමඟ විවිධ ආකාරයෙන් පාර්ලිමේන්තුව, පළාත් සභාව සහ ප්‍රාදේශීය සභාව මුදල්වලින් හසුරුවන්න පුළුවන් හැකියාව 1978 මුදල් (සංශෝධන) පනත තුළින් ඇති කර දුන්නා. ඒ විපර්යාසයත් සමඟ අද රටේ ජනතාවට තමයි ඒ දුක්ඛිත තත්ත්වයට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙන්නේ. 1960, 1965, 1970, 1977 ආණ්ඩුව වෙනස් කරන්න යෝජනා ගෙනාපු හැම වෙලාවේම "හාල් සේරුවක් දෙන්නම්. හාල් සේරු දෙකක් දෙන්නම්. ඇට අටක් දෙන්නම්. සමෘද්ධිය දෙන්නම්. ජන සවිය දෙන්නම්." වාගේ යෝජනා ක්‍රම ගෙනාපු හැටි අපිට මතකයි. මේ සියලු දේවල් ආර්ථිකයත් සමඟ ගැළපිච්ච, පැටලිච්ච යෝජනා ක්‍රම. නමුත් කොයි ආණ්ඩුවවත් මේවාට හරියට උත්තර දුන්නාද, ජනතාවගේ පොරොන්දු හරියට ඉෂ්ට කළාද කියන්න මම දන්නේ නැහැ.

අපි අපනයන කෘෂි කර්මාන්තයෙන් ජීවත් වන අය. 'උපන් දිනයට පැළයක් හිටුවන්න.' කියා මේ ළඟදී ජනාධිපතිතුමා කිව්වා. හැබැයි, ජනාධිපතිතුමා කියන්න ඉස්සෙල්ලා මම ඒ කටයුත්ත සිදු කළා. මට දරුවන් තුන් දෙනෙක් ඉන්නවා. මගේ පළමුවැනි දරුවාට මේ වනකොට අවුරුදු 15ක් විතර වෙනවා. **දරුවන් තුන් දෙනාටම මම පොත් ලියලා,-** මම දරුවන්ගේ උපන් දිනයට ගස් හිටවපු කෙනෙක්. දීර්ඝ කාලයක් තිස්සේ එලෙස හිටවන ලද අපනයන බෝගයන් තුළින් අපි ආදායම් ලබන තත්ත්වයට පත්වෙලා සිටිනවා. හැබැයි, අද අපනයන බෝග ආදායම කඩා වැටිලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපනයන ආදායම අද කඩා වැටිලා.

විශේෂයෙන් කන්ද උඩ රට ජනතාව වගා කරන කරාබු නැටි අස්වැන්න අද මිලදී ගන්නේ නැති තත්ත්වයට පත්වෙලා තිබෙනවා. කරාබු නැටි ගොවියා අමාරුවෙන් තමයි ජීවත් වෙන්නේ. කරාබු නැටි වගා කරන සමහර ගොවීන්ට වෙන ආදායමක් ඇත්තේ නැහැ. 1970, 1977 කාලයේ කරාබු නැටිවලින් විශාල ආදායමක් ලැබිලා තිබුණා. ඒ වාගේම අද ගම්මිරිස් කඩන්නේ නැති මට්ටමට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගම්මිරිස් ගොවියා අමාරුවේ වැටිලා සිටිනවා. අපි මොන දේශපාලන පක්ෂයක් නියෝජනය කළත්, මේ රටේ මහ ජනතාව නියෝජනය කිරීම තමයි මෙතැනදී වැදගත් වෙන්නේ. අපි මොන පිරුවටයෙන් මේවා වහගෙන තිබුණත් ජනතාව ඒකට උත්තරයක් දීලා තිබෙනවා. අපි ඒ කාරණය දැනගන්න ඕනෑ. මහජන නියෝජිතයන් හැටියට ජනතාවගේ පැත්තේ හිටියොත් තමයි ඒ කාරණය ඉෂ්ට වෙන්නේ. අපිට රතු එළියක් පත්තු කර තිබෙනවා. අපේ ආණ්ඩු පක්ෂයට පසුගිය මැතිවරණ ඉතිහාසය තුළදී සමුපකාර ඡන්දය දිනා ගන්න බැරි වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම අපේ ආණ්ඩුවක් තියාගෙනත් පළාත් පාලන ඡන්දය අපිට දිනන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අපි ඉන්නේ හොඳ තැනක නොවෙයි කියන මතය අපි මේ බලධාරීන්ට ලබා දෙන්න ඕනෑ.

මගේ පොඩි වැඩක් කර ගන්න මම උදේ අපේ ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙකුට කථා කළා. මම මේ අවස්ථාවේදී එතුමාගේ නම කියන්නේ නැහැ. "මට වැඩිය පියන්ට බලය තිබෙනවා. පියන්ට කිව්වා නම් ඔක කර ගන්න පුළුවන්." කියා ඇමතිතුමා කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔක තමයි අද මේ රටේ තිබෙන දේශපාලන තත්ත්වය. අපිට වැඩක් කර ගැනීමේ අවස්ථාව නැති වෙලා තිබෙනවා. තමුන්නාන්සේ මූලාසනයේ සිටින අවස්ථාවේදී අපිට කථා කරන්න අවස්ථාව ලබා දීලා, මේ කටයුතු සිදු කිරීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.36]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ මුදල් පනත යටතේ විවිධ බදු කාණ්ඩ රාශියක් අද ඉදිරිපත් කරලා තිබෙනවා. මීට කලින් කථා කළ කථිකයින් කිව්වා, වක්‍ර බදු අඩු කරලා ඍජු බදු වැඩි කරන්න තමයි මේ උත්සාහ ගන්නේ කියලා. මගේ තර්කය අනුව මේ නිසා ලංකාවේ වක්‍ර බදු අඩු වෙන්නේත් නැහැ; ඍජු බදු වැඩි වෙන්නේත් නැහැ. ඒකට කරුණු කාරණා රාශියක් මට කියන්න පුළුවන්. මේ රජයේ තිබෙන අමනෝඥ බදු ප්‍රතිපත්ති නිසා තමයි මේ විධියට බදු අය කරන්න අද අපට සිදු වෙලා තිබෙන්නේ. අද කාණ්ඩ ගණනාවක් යටතේ බදු අය කරනවා. ඒ අනුව මෝටර් වාහන මත, වාහන හිමිකම් මත, මුදල් පනත සංශෝධනයෙන්, සංචාරක කර්මාන්තය යටතේ ආදී වශයෙන් බදු පනවනවා. මේ බදු පනවන්නේ ඇයි? මේ බදු පැනවීමට ප්‍රධාන හේතුව වක්‍ර බදු අඩු කරලා ඍජු බදු වැඩි කරන්න නොවෙයි. අද අපේ රටේ තිබෙන ඇත්තම ආර්ථික තත්ත්වය තමයි මේ බදුවලින් කියන්නේ. මම කරුණු කිහිපයක් දක්වන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, ජනගහන අනුපාතය අනුව අපේ රටේ ජංගම දුරකථන භාවිතය සියයට 117යි. ඒ කියන්නේ එක්කෙනෙකුට අඩු වශයෙන් ජංගම දුරකථන දෙකක්වත් තිබෙනවා. මේ ජංගම දුරකථන සඳහා බදු අය කිරීම පසුගිය කාලයේ මේ රජය බලයට ආවාට පසුව වැඩි කළා. සාමාන්‍යයෙන් මේ වැඩි කිරීම කොච්චර විශාලද කිව්වොත්, රුපියල් 5,000ක ජංගම දුරකථන බිලක් ගෙවන කෙනෙක් රුපියල් 1,640ක බද්දක් ගෙවනවා. ඒ කියන්නේ, පුද්ගලයෙක් ජංගම දුරකථනයක් පාවිච්චි කරලා රුපියල් 5,000ක් ගෙවනවා නම්, -සාමාන්‍යයෙන් මධ්‍යම පාන්තික පුද්ගලයෙක් දළ වශයෙන් රුපියල් 5,000ක් ගෙවනවා නේ.- ඒකෙන් රුපියල් 1,640ක්

සම්පූර්ණයෙන් බදු. එතකොට සෘජු බදු වැඩි වෙලාද, වක්‍ර බදු වැඩි වෙලාද කියලා මම මුදල් ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. මේ සියල්ලෙන්ම මොකක්ද පෙනෙන්න තිබෙන්නේ? ආණ්ඩුවට මුදල් නැති වීමේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මුදල් නැති වීමෙන් බේරෙන්න කරන්න තිබෙන්නේ, සාමාන්‍ය මිනිසුන්ගෙන් බදු අය කිරීම. ඒක තමයි මේ සියල්ලන්ගේම උපක්‍රමය. ලංකාවේ අය සෑම දෙයකින්ම බදු ගෙවනවා. ලංකාවේ අය පරිභෝජනය කරන හැම භාණ්ඩයකින්ම ලංකාවේ ජනතාවගෙන් බදු අය කරනවා. ඒ නිසා ලංකාව බදු නොගෙවන රටක් නොවෙයි. ලංකාව කියන්නේ දුගී දුප්පතාත් බදු ගෙවන රටක් කියලා තමයි මට නම් කියන්න තිබෙන්නේ. මේ බදු අය කිරීම හරහා සිදු වෙලා තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි අපේ රටේ ආර්ථික අර්බුදය අපට පෙන්වීම. ඒ කියන්නේ, එක පැත්තකින් ඩොලර් එකේ අගයට සාපේක්ෂව රුපියලේ අගය අඩු වෙනවා. මම දැක්කා, එක අවස්ථාවක මුදල් අමාත්‍යාංශයෙන් කියනවා, ඩොලරයේ අගය වැඩි වීම හොඳයි කියලා. ඒ විදේශ විනිමය අපි ළඟ තියාගෙන ඉන්නවා කිව්වා, ණය ගෙවන්න.

මම එක ප්‍රශ්නයක් අහන්න කැමැතියි. අපි සියල්ලෝම අත ඔසවලා හම්බන්තොට වරාය අවුරුදු 99කට බදු දුන්නා නේ. ඒ බදු දීපු මුදල ණයට කපලා තිබෙනවාද? එහෙම නැත්නම් ඒකෙන් ණය ගෙවලා තිබෙනවාද? එහෙම නම් ඒ ණය ගෙවලා ඉවර වෙන්න එපා යැ. බිලියන 1.1ක් ලබා ගත්තා නම්, ඒක හම්බන්තොට වරාය හදන්න ගත්ත ණයවලට හිලවු කරන්න එපා යැ. එහෙම කළා කියලා කවුරුත් කියන්නේ නැහැ නේ. ඒ නිසා ණය බර එහෙමමයි; ඒ ගත්ත මුදල් එක එක දේවල්වලට වියදම් වුණා. දැන් ආපසු සැරයක් අපේ රුපියල වේගයෙන් අවප්‍රමාණය වනකොට ඒ හා සමාන වේගයකින් අපේ රට අභ්‍යන්තරයේ භාණ්ඩ මිල වැඩි වෙනවා; අපේ කර්මාන්තශාලා වැහෙනවා; අපේ රටේ උදවියගේ ආදායම් අඩු වෙනවා. ආදායම් අඩු වෙන නිසා ඒ මත තව තවත් බදු පැනවීමෙන් මේ විධියට ජනතාවට විශාල ප්‍රශ්නයක් ඇති කරනවා කියලා මම කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා (තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித தெவரப்பெரும - வலுவாதார அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் பிரதேச அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Palitha Tewarapperuma - Deputy Minister of Sustainable Development, Wildlife and Regional Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේදී ගරු තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු පියංකර ජයරත්න මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වීය.***

*அதன்பிறகு, மாண்புமிகு பியங்கர ஜயரத்ன அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. PIYANKARA JAYARATNE *left the Chair, and* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල් අමාත්‍යාංශයට මම එක් කාරණයක් පෙන්වා දෙන්න කැමැතියි. විශේෂයෙන්ම මෝටර් රථවලින් බදු අය කිරීම පසුගිය කාලයේ තිබුණේ, CIF price එකට. ඊට පසුව ඒක Unit price එකට මාරු කළා. Unit price එකට මාරු කළාම, ලංකාවේ සමහර වාහන කාණ්ඩවල බදු විශාල වශයෙන් අඩු වුණා. මධ්‍යම පන්තිය පාවිච්චි කරන වාහනවල බදු විශාල වශයෙන් වැඩි වුණා.

මම උදාහරණ කිහිපයක් කියන්නම්. මම කියන්න කැමැතියි, CIF price එක වෙනුවට Unit price ගෙන ඒම නිසා BMW i8 කියන කූඩා රථයේ බදු ප්‍රමාණය මිලියන 17කින් අඩු වුණු බව. Audi Q2 කියන රථයේ මිලත් විශාල වශයෙන් අඩු වුණා. හැබැයි Lamborghini Aventador කියන රථය - මේ රටේ අපි හුහාක් කථා කරන වචනයක් 'ලැම්බෝගිනි' කියන්නේ.- සම්බන්ධයෙන් බදු සියයට 78කින් අඩු වුණා. ඒ කියන්නේ රුපියල් මිලියන 244ක් වුණු රථයේ මිල රුපියල් මිලියන 71ක් දක්වා අඩු වුණා. BMW 530e කියන රථය අපේ ගරු ඇමතිතුමන්ලා පාවිච්චි කරන රථයක්. ඒ රථයේ බදු ප්‍රමාණය සියයට 127කින් අඩුවෙලා තිබෙනවා. CIF price එක වෙනුවට Unit price ගෙන ඒම නිසා Audi Q7 කියන වාහනයේ බදු ප්‍රමාණය සියයට 136කින් අඩුවෙලා තිබෙනවා. Range Rover Vogue කියන රථයේ බදු ප්‍රමාණය සියයට 149කින් අඩුවෙලා තිබෙනවා. Bentley Continental කියන රථය සම්පූර්ණයෙන්ම අතින් හදන ඉතාම සුඛෝපභෝගී රථයක්. ඒ රථයේ බදු ප්‍රමාණය සියයට 179කින් අඩුවෙලා තිබෙනවා. මේක මෙහෙම වෙන්නේ ඇයි කියලා දැන ගන්න මම කැමැතියි. ඒ වාගේම සාමාන්‍ය උදවිය පාවිච්චි කරන Toyota Prius කියන රථයේ බදු ප්‍රමාණය සියයට 201කින් වැඩිවෙලා තිබෙනවා. Lamborghini, Range Rover, Bentley රථවල බදු ප්‍රමාණය සියයට 179කින් අඩු වෙන කොට සාමාන්‍ය ජනයා පාවිච්චි කරන මේ රථයේ මිල, නැත්නම් බදු ප්‍රමාණය එක්ක එන මිල සියයට 201කින් වැඩිවෙලා තිබෙනවා. Toyota Corolla රථයේ බදු ප්‍රමාණය සියයට 202කින් වැඩිවෙලා තිබෙනවා. Mitsubishi Outlander කියන රථය සියයට 233කින් වැඩිවෙලා තිබෙනවා. Nissan X-Trail කියන රථය සියයට 245කින් වැඩිවෙලා තිබෙනවා. Toyota Camry කියන රථය සියයට 361කින් වැඩිවෙලා තිබෙනවා. අඩුම වශයෙන් Mahindra Bolero කියන රථයේ මිල සියයට 731කින් වැඩිවෙලා තිබෙනවා. එතකොට තමුන්නාන්සේලාගේ වාහන පිළිබඳව තිබෙන බදු ප්‍රතිපත්තිය තුළින් සාධාරණ, සමාන අවස්ථාවක් ඇති කරන්නේ කොහොමද? ඒක සම්පූර්ණයෙන්ම එක පැත්තකට වාසිදායකයි. මැද පන්තියේ ඉන්න සාමාන්‍ය ජනතාවට අවාසිදායකයි. ඒ නිසා තමයි ලංකාවට මේ තරම් විශාල වාහන තොගයක් ආවේ. කවුරුවත් දැනගෙන හිටියේ නැහැ, වාහන කාණ්ඩ 1000ට අඩු

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

වාහනවල බදු අඩු කරන කොට යුරෝපයේ සුවිශේෂයෙන් විශාල නගරවල ගමන් කිරීම සඳහා cc 600-1000ත් අතර විශාල වාහන ප්‍රමාණයක් නිර්මාණය කර තිබුණු බව.

ඉන්දියාව එවැනි වාහන නිර්මාණය කර තිබෙන බව දැනගෙන හිටියේ නැහැ, ජපානය නිර්මාණය කර තිබෙනවාය කියලා දැනගෙන හිටියේ නැහැ. ඒ නිසා ආනයනකරුවන් හරහා ඒ වාහන විශාල වශයෙන් ලංකාවට ආවා. ඒක නිසා තමයි ලංකාවේ වාහන ආනයනය සඳහා විශාල බදු මුදලක් තමුන්නාන්සේලාට ගෙවන්න සිද්ධ වුණේ. අත්දැකීම් නැති, වගකීම් නැති අඩු ගණනේ වාහනයක සුක්කානමවත් හසුරුවන්න බැරි උදවිය වාහනවල බදු තීන්දු කරන්න ගිහිල්ලා, ලංකාවේ බදු ක්‍රමයට විශාල අවාසියක් වෙලා, අද සාමාන්‍ය මිනිහෙකුටවත් වාහනයක් ගන්න බැරි තැනට ආවේ මේ බදු ක්‍රමය ඇතුළේ කරන ප්‍රතිසංස්කරණ නිසායි. නොදන්න මිනිස්සු නොදන්න වෙදකම් කරන්න ගියාම කවදාවත් ඒක සාර්ථක වන්නේ නැහැයි කියන එකයි මම කියන්නේ. ඒ නිසා මේ පිළිබඳව තමුන්නාන්සේලාගෙන් දැනුවත් කර ගැනීමක් කර ගන්න මම කැමැතියි. මොකද, ඔබතුමන්ලාගේම මැතිවරණ ප්‍රකාශනවල තිබුණු දෙයක් තමයි සෑම කෙනකුටම වාහනයක් ලබා ගැනීමට තිබෙන අයිතිය ඇති කරවන බව. ඒකට ඒ කාලයේ රූපවාහිනී දැන්වීම් පවා දමා තිබුණා මම දැක්කා. හැබැයි අද වන විට එක පැත්තකින් ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව වැඩි වෙන්නේත් නැහැ. ඒකත් එහෙමමයි. අනෙක් පැත්තෙන් ඔබතුමන්ලාගේ බදු ප්‍රතිපත්තියේ වැරැදි නිසා වාහනයක් ගෙන්වා ගන්නත් බැහැ. අද ඒකට තවත් බදු තුනක් එකතු කරනවා. ඒ බදු එකතු කිරීම නිසා සාමාන්‍ය පුද්ගලයකුට වාහනයක් මිල දී ගැනීම සිහිනයක් බවට පත් වෙනවා.

කොටින්ම කියනවා නම්, ඉදිරියේදී ලංකාවට වාහන ගෙන ඒමට හැකියාවක් ඇත්තේ නැහැ. ඒ නිසා තිබෙන වාහනවල මිලත් ඉහළ යනවා. ඒ නිසා කිසි කෙනෙකුට අඩු ගණනේ පාවිච්චි කළ වාහනයක් මිලදී ගන්නවත් පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ඇයි මේ? මේ බදු ප්‍රතිපත්තියේ වැරැද්ද නිසා. මෙහෙම කරන්න බැහැ, මේක. අපි පසු ගිය රජය කාලයේ මීට වඩා ඉතාම සාර්ථක ක්‍රම අනුගමනය කරලා මේ රටේ ජනතාවට, රජයේ සේවකයන්ට අවශ්‍ය කරන වාහන ගෙන්වන්න ඉඩප්‍රස්තාව ලබා දීලා තිබුණා. අද රජයේ සේවකයින්ට permit එකක් දීලා තිබෙනවා. හැබැයි, වාහනය ගෙන්වන්න බැහැ. Permit එක ගෙදර තබා ගෙන දුම් අල්ල-අල්ලා ඉන්න ඕනෑ. මොකද, වාහනයක් ගෙන්වන්න විධියක් නැහැ නේ. ඒක නවත්වලා.

අද සාමාන්‍ය පුද්ලයෙක් වාහනයක් ගෙන්වනවා නම්, සියයට 200ක් බැංකුවේ තැන්පත් කරන්න ඕනෑ. කවුද, ඒක කරන්නේ? කාටද, එහෙම සල්ලි තිබෙන්නේ? බදු වැඩි කිරීම හරහා මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ජීවිතයට තවත් හානිදායක දෙයක් කරනවා මිසක්, මේ බද්දෙන් ශත පහක්වත් ආණ්ඩුවට එකතු වෙන්නේ නැහැ. මේ හරහා ආණ්ඩුවට නරක නාමයක් විතරයි එකතු වෙන්නේ. මොකද, සුඛෝපභෝගී භාණ්ඩ කියලා මිනිසුන් දැන් කිසිම වාහනයක් ගෙන්වන්නේ නැහැ. එතකොට සුඛෝපභෝගී නොවන භාණ්ඩත් නැහැ, සුඛෝපභෝගී භාණ්ඩත් නැහැ, මෙලෝ දෙයක් නැහැ. ඒ නිසා මතක තබා ගන්න, අද වනවිට පනවා තිබෙන හුඟාක් බදු අය වෙන්නේ නැහැ කියන එක. අපිට මේවා ගැන ඕනෑ තරම් කරුණු කියන්න පුළුවන්. මතක තබා ගන්න, බදු ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමේදී අවශ්‍ය වෙන්නේ බදු ප්‍රතිපත්තියේ සෘජු බදු වැඩි කරන එකද, වක්‍ර බදු අඩු කරන එකද; වක්‍ර බදු වැඩි කරන එකද, සෘජු බදු අඩු කරන එකද කියන එක නොවන බව. ඒක යම් ආකාරයකට තිබිය යුතුයි. නමුත් ඒ බද්ද අපේ රටේ ජනතාවට සාධාරණද කියන එක අපි කල්පනා කරන්න ඕනෑ. බදු පනවන කොට, බද්දෙන් එන ආදායම් හරහා වාසියක් ගන්න පුළුවන් කියලා හුඟාක් දෙනෙක් කල්පනා කරනවා.

මම උදාහරණයක් කියන්නම්. ඊයේ-පෙරේදා උදේ පාන්දර මාව හම්බවෙන්න එක්තරා පුද්ගලයෙක් ආවා. මේ පුද්ගලයා තමන්ගේ බිරිඳ හා දරුවන් දෙදෙනා එක්ක මාව හම්බවෙන්න ආවේ. ඔහු මාසයකට රුපියල් 25,000ක් බැගින් ගෙවීමට finance කරලා වාහනයක් අරගෙන තිබෙනවා. මම හිතන විධියට "ඕමෝ බට්ටා" කියන කුඩා රථයක් තමයි ඔහු අරගෙන තිබුණේ. මේ පුද්ගලයාට තිබෙන්නේ පර්චස් 60යි. මේ පුද්ගලයා ඉන්නේ සාමාන්‍ය ගෙදරක. ඔහු සාමාන්‍ය කෙනෙක්. ඔහුට ආදායම් බදු දෙපාර්තමේන්තුව එවා තිබුණා ලිපියක්, "ඔබ වාහනයක් අරගෙන තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඔබ අපට බදු ගෙවන්න" කියලා. ඔහු ගැහි-ගැහී මාව හම්බවෙන්න ආවේ. මම ඔහුව බදු සකස් කරන්නෙක් ළඟට යවලා, ඔහුගේ තත්ත්වය පැහැදිලි කරලා ලිපියක් ලියන්න කියලා කිව්වා. අද ග්‍රාම නිලධාරි ළඟට ඇවිත් ආදායම් සහතිකයක් අරගෙන යන මනුෂ්‍යයෙකුටත් එම ව්‍යාපාරය කරන්න ඉස්සෙල්ලා අනෙක් පැත්තෙන් -හැරෙන තැපෑලෙන්- ආදායම් බදු ගෙවන්න කියලා ලිපියක් හම්බ වෙනවා. ව්‍යාපාරයක් කරන්න ඕනෑ නැහැ. ව්‍යාපාරයක් කරන්න හිතන එක විතරයි, කරන්න ඕනෑ. එහෙම කළ ගමන් බදු පත්‍රයක් එනවා. එහෙම කරලා රටේ සමස්ත ජනතාව ආදායම් බදු ගොන්නට රැස් කරගන්න උත්සාහ කරනවා නම්, ඒක මොන තරම් මෝඩ වැඩක්ද? ඒ විධියට ලංකාවේ ඔක්කෝටම ආදායම් බදු ගෙවන්න ආදායම් තිබෙනවාද? අද සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? ආදායම් බදු ගෙවමින් ව්‍යාපාර කරන උදවියට අද ඒ ව්‍යාපාර කරන්න බැහැ. ඒ, එක පැත්තකින් අධික බදු නිසා; අනෙක් පැත්තෙන් රුපියලේ අවප්‍රමාණය තුළින් ඇති වන තත්ත්වය නිසා. ඒ නිසා මේ දවස්වල ඔවුන් අනිවාර්යයෙන්ම තමන්ගේ මුළු ව්‍යාපාරයම හකුළුවමින් ඉන්නේ. ව්‍යාපාරය ව්‍යාප්ත කරන්නේ නැහැ. මේ වාගේ වෙලාවල්වල රජයක් කළ යුත්තේ රටේ ජනතාවට ව්‍යාපාර කරන්න ඉඩ දෙන එකයි; ඒ සඳහා පුළුවන් තරම් උදව් කරන එකයි. මොකද, එළියේ දෙයක් කරන්නත් බැරි නම්, රට ඇතුළේ හෝ රටේ නිෂ්පාදනය වැඩි කරන්න, රටේ වෙළෙඳාම වැඩි කරන්න, රටේ කර්මාන්ත අංශය දියුණු කරන්න ක්‍රියා කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම අවසන් කරන්නම්. නමුත් මොකක්ද, මේ වෙන්නේ? අද වෙන්නේ මුළුමනින්ම ආර්ථිකය අකර්මණ්‍ය කරමින්, ජනතාවට බිය පතුරුවමින්, ජනතාවට ආදායම් බදු ගෙවීම සඳහා වන ක්‍රමවේද නිර්මාණය කරමින් සාමාන්‍ය මිනිසුන් පිටුපස යෑමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි. මේ ආර්ථිකය ගොඩගන්න බැරි ආර්ථිකයක් බවට මේ ආණ්ඩුව පත් කරනවා. එසේ පත් කිරීම සඳහා ඕනෑ කරන අය බදු තමයි කොහෙන් හෝ, කාගෙන් හෝ හොයා ගෙන මේ දමා තිබෙන්නේ. ඒවායේ කිසිම තේරුමක් නැහැ. මේකෙන් මේ රටේ ආර්ථිකය ගොඩ නැහෙන්නේත් නැහැ; රටේ ආදායම වැඩි වෙන්නේත් නැහැ. මේ තුළින් මිනිසුන් තුළ අසහනය, කෝපය සහ ක්‍රෝධය පමණයි වැඩි වෙන්නේ. ඒ නිසා මේක නිවැරදි ආර්ථික ක්‍රමයක් නොවෙයි කියන එක විතරක් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි හයක කාලයක් ලබා දී තිබෙනවා.

[අ.භා. 1.52]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කාලය ලබා දීම පිළිබඳව මා ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද දින අපේ රටේ ආර්ථිකය ගැන කථා කරද්දී, අපේ රට සංවර්ධනය කරන්න, ඒ වාගේම අපේ රට සංවර්ධිත රටක් බවට පත් කරන්නට අවශ්‍ය කරන පසුබිම අපි නිර්මාණය කරන්නට අවශ්‍යයි කියන කාරණය සඳහන් කරන්නට ඕනෑ.

එය කරන්නට නම් මේ රටට නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරන්නට ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ හරහා මේ රට තුළ නිෂ්පාදනය ඇති කරලා, අපනයන ආර්ථිකයක් ඇති කරලා, මේ රටේ මානව සම්පතින් උපරිම ප්‍රයෝජනයක් අරගෙන, බුද්ධි ගලනය නතර කරලා මේ රට තුළ ඉන්න තරුණ තරුණියන්ගේ රැකී රක්ෂා ප්‍රශ්නවලට ඍජු පිළිතුරක් ලබා දීලා ඒ තුළින්, දැනට අපේ රටේ ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙන ඩොලරයේ අගය ඉහළ යෑම නතර කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා නම් මා හිතන හැටියට අපට යම් තාක් දුරට ආර්ථික වශයෙන් ඉහළට යන්නට පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවුරුදු ගණනක් තිස්සේ මේ රටේ පැවතුණු ආණ්ඩු සහ පැවතුණු ආණ්ඩුවල නිලධාරීන් කටයුතු කරපු ආකාරයත් එක්ක මේ රටේ ආර්ථික තත්ත්වය දිනෙන්-දින අගාධයට වැටුණා. ඒ හරහා අපේ රට අද ණය බරින් තෙරපුණු, මිරිකුණු රටක් බවට පත්වෙලා තිබෙනවා. මේ අවුරුද්දේ ඩොලර් මිලියන 3,000ක් ලෝකයට ගෙවන්නත්, ඊළඟ අවුරුද්දේ ඩොලර් මිලියන 4,000ක් ලෝකයට ගෙවන්නත් සිද්ධවෙලා තිබෙනවා. ඒ නිසා අද මේ රට ආර්ථික වශයෙන් හිරවීමකට ලක්වෙලා තිබෙනවා. අද මේ රටේ ව්‍යාපාර කරන අයට, ඒ වාගේම ව්‍යාපාරවලට මුදල් යොදවන අයට ඒ තුළින් ප්‍රශ්න, ගැටලු ඇතිවෙලා තිබෙනවා. මෙයට පැවතුණු ආණ්ඩු වග කියන්නට ඕනෑය කියන එක අපි පැහැදිලිව කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ ආර්ථිකය ගොඩ ගන්නට අපට අවශ්‍යවෙලා තිබුණත්, මේ රටේ ව්‍යාපාර කරන සමහර පුද්ගලයන් හරිහැටි බදු ගෙවන්නේ නැහැයි කියන එක ඔබතුමන්ලා දන්නවා. ඒ වාගේම දූෂණ, අක්‍රමිකතා හරහා යටි මඩි ගහගන්න පිරිස් ඉන්නවා. ඒ හරහා මේ රටට රුපියල් කෝටි ගණනක් අහිමි වෙනවා. ඒ වාගේම බදු ගෙවිය යුතු පුද්ගලයන් බදු ගෙවන්නේ නැති නිසා අද මේ රටේ වක්‍ර බදු ප්‍රමාණය වැඩිවෙලා තිබෙනවා. අද ඍජු බදු ගෙවිය යුතු අයගෙන් සමහර අය පමණක් ඍජු බදු ගෙවන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඒ නිසා මේ සඳහා යම්කිසි ආකාරයේ නිසි ක්‍රමවේදයක් -system එකක්- ඇති කරන්නට ඕනෑ. ඒ හරහා මුළුමහත් රටේම බදු පාලනය, ඒ වාගේම බදු ගෙවීම අතුළු මේ සිල්ලක්ම අපට හරියාකාරයට ක්‍රියාත්මක කරන්නට පුළුවන් වෙයි.

අද අපි යහ පාලන ආණ්ඩුවෙන් බලාපොරොත්තු වන්නේ මොකක්ද? ගමේ ඉන්න තරුණ තරුණියන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන්නට අපි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ප්‍රධාන වශයෙන්ම "Enterprise Sri Lanka" වැඩසටහන යටතේ අද NVQ කර තිබෙන තරුණ-තරුණියන්ට තමන්ට ස්වයං රැකියාවක් ආරම්භ කරන්නට, තමන්ගේ ව්‍යාපාර ක්‍රියාත්මක කරන්නට, තමන් ඉගෙන ගත් දෙයින් තමන්ගේ දක්ෂතා, කුසලතා තුළින් ව්‍යාපාරයක් ආරම්භ කරන්නට පුළුවන්කම තිබෙනවා. ඒ ව්‍යාපාරය ආරම්භ කරන්නට මූල්‍ය වශයෙන් ණය මුදලක් ආණ්ඩුව ඔවුන්ට ලබා දෙනවා. ඒ හරහා එක පුද්ගලයකුට රුපියල් මිලියනයකට වැඩි මුදල් ප්‍රමාණයක් ලැබෙනවා. ඒ පොලියෙන් භාගයක්, එනම් සියයට 6.75ක් ආණ්ඩුව විසින් දරාගනු ලබනවා. ඒ හරහා අපි බලන්නේ මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි? ඒ අයට තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් මේ රටේ ආර්ථිකයට දායක වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කිරීමයි.

ඒ විතරක් නොවෙයි. අපේ රටට විශේෂයෙන්ම විදේශ ආයෝජන එන අතර තුරදී විදේශිකයන් එන ප්‍රමාණයත් වැඩි කර ගන්න ඕනෑ. මොකද, පිහිටීම අතින් බලනකොට අපේ රට ඉතාමත් ලස්සන, සුන්දර දූපතක්. රට වටේම මුහුදු තිබෙනවා. ඒ වාගේම අපේ රටේ අවුරුදු 2,500ක ඉතිහාසය ගැන බලන්න, කියවන්න, දකින්න විදේශිකයෝ කැමැතියි. එහෙම නම් විදේශිකයන් ගෙන්වා ගැනීමේ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්නට ඕනෑ. මේ වනකොට අපි එය ක්‍රියාත්මක කරලා තිබෙනවා. මා හිතන හැටියට මේ වනවිට විදේශිකයන් මිලියන 2කට වැඩි ප්‍රමාණයක් රටට එනවා. ඒ කියන්නේ රටට ඩොලර් ගලා ඒමක් සිද්ධ වෙනවා. ඒ හරහා අපට පුළුවන්කම ලැබී තිබෙනවා, "Enterprise Sri Lanka" ව්‍යාපෘතිය යටතේ ව්‍යාපාර කරන විදේශිකයන්ට, විශේෂයෙන්ම homestay ව්‍යාපාර කරන අයට, ඒ වාගේම හෝටල් කර්මාන්තය කරන අයට ණය පහසුකම් ලබා දෙන්න. ඒ සඳහා අය කරන පොලියෙන් සියයට 50ක බර ආණ්ඩුව දරා ගන්නවා. ඒ තුළින් ඒ අය තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමෙන්, ඒ හරහා ගමේ ආර්ථිකය ශක්තිමත් කිරීමෙන්, ගමේ ආර්ථිකය ශක්තිමත් කිරීම තුළින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ රටේ බදු අය කිරීම ක්‍රමානුකූලව හරි මාර්ගයකට සකස් කරනවා. නමුත් එදා එතනෝල් ගෙන්වපු අය බදු ගෙව්වේ නැහැ. එදා වෙනත් ව්‍යාපාර කරපු අය බදු ගෙව්වේ නැහැ. අද මේ කටයුතු සියල්ලම එක හා සමානව හරි ක්‍රමවේදයකට ආණ්ඩුව සකස් කරගෙන යනවා. අපට තේරෙනවා, ආර්ථික වශයෙන් රටේ ජනතාවට ප්‍රශ්න තිබෙන බව. නමුත් කල්පනා කරලා බලන්න. අද මුළු මහත් ලෝකයේම ආර්ථිකය කඩාගෙන වැටිලායි තිබෙන්නේ. ඇමෙරිකාව ගන්නා වූ ආර්ථිකමය තීන්දු-තීරණ මත අපි දන්නේ නැහැ, හෙට-අනිද්දා වෙනකොට සෞදි අරාබියට මොන වාගේ තහංචි පැනවෙයිද කියලා. මාධ්‍යවේදියෙක් ඝාතනය කළාය කියලා චෝදනාවක් ඒ රටට තිබෙනවා. අපේ රටෙත් එවැනි චෝදනා එදා තිබුණා. මාධ්‍යවේදීන් අතුරුදහන් වුණා; මාධ්‍යවේදීන් ඝාතනය වුණා. දැන් සෞදි අරාබියට මොන වාගේ තහංචි පැනවෙයිද දන්නේ නැහැ. ඒකත් එක්ක ලෝක ආර්ථිකයට බැඳෙන ප්‍රශ්න අපටත් තිබෙනවා. ඒ වාගේම, කටාර් රාජ්‍යයට සෞදි අරාබිය තහනම් පනවලා තිබෙනවා. ඉරානයට තහනම් පනවලා තිබෙනවා. මේ සියල්ලම ගත්තාම ලෝකය අද දැවැන්ත ආර්ථික අර්බුදයක තිබෙන්නේ. චීනය එක පැත්තකින් අදිනවා. ඇමෙරිකාව තවත් පැත්තකින් අදිනවා. රුසියාව අද සිරියාවත් එක්ක එකතු වෙලා ISIS සටන්වලට ඉදිරිපත් වෙලා තිබෙනවා. ඔවුන්ගේත් ආර්ථිකය කඩාගෙන වැටිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලංකාව පොඩි රටක්. අපට මහ ලොකු ජනගහනයක් නැහැ. මිලියන 20ක ජනගහනයක්

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

ඉන්නේ. අපි නිෂ්පාදනය කරන දේවල් ලෝකයට අලෙවි කිරීමේදී අපට ගැටලු ඇති වෙනවා. විශේෂයෙන්ම අපි වැඩි හරියක්ම value-added services කරන්නේ. අපි පිට රටවලින් දේවල් අපේ රටට ආනයනය කරලා ඒකට තව යමක් එකතු කරලා තමයි අපනයනය කරන්නේ. අද ඒ සඳහා වන ව්‍යදමත් වැඩි වෙලා තිබෙනවා. මම මේ ළඟදී නුවරඑළිය ප්‍රදේශයේ ගොවියෙකුට කථා කළා. එතුමා මට කිව්වේ, "අල ඇට ටික ගෙන්වන්නේ පිට රටින්. ඒකට ගහන කෘමි නාශක ටික ගෙන්වන්නේ පිට රටින්. ඒකට ගහන පොහොර ටික ගෙන්වන්නේ පිටරටින්. පසුයි, වතුරයි, ශ්‍රමයයි විතරයි ලංකාවේ" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) කවින්ත හේෂාන් ජයවර්තන)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝකයම අද ආර්ථික අර්බුදයක තිබෙනවා. ඒ ගැන ලංකාවට විතරක් ඇහිල්ල දික් කරන එක වැරදියි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Douglas Devananda. You have got ten minutes.

[பி.ப. 1.59]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நிதிச் சட்டமூலம், உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டத்தின் கீழான கட்டளைகள் என்பன தொடர்பில் இடம்பெறுகின்ற விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களையும் தெரிவிக்க விரும்புகின்றேன். என்றாவது ஒரு நாள் இந்த நாடு முன்னேறும் என்று எதிர்பார்த்தால், நாளுக்குநாள் இந்த நாடு அனைத்துத் துறைகளிலும் வீழ்ச்சி நிலைகளையே சந்தித்துக்கொண்டிருக் கின்றது. இத்தகைய நிலையில், இந்த நாட்டு மக்கள் இன்று முகங்கொடுத்துள்ள உயிர்வாழ்வதற்கான சவாலானது மிகவும் பாரதூரமானதாகவே காணப்படுகின்றது. இந்த பாரதூரத் தன்மையானது வடக்கு, கிழக்கு மக்களைப் பொறுத்த வரையில், பன்மடங்கு அதிகரித்த பாரதூரத்தையே சுட்டிக் காட்டி நிற்கின்றது. வடக்கு மக்களைப் பொறுத்தவரையில், அவர்களுக்குப் பொருளாதாரப் பிரச்சினைகள் இல்லையா? என்று சிலர் கேட்கிறார்கள். அதாவது, சொந்தக் காணி - நிலங்கள் விடுவிப்பு, தமிழ் அரசியல் கைதிகளின் விடுவிப்பு, வலிந்து காணாமற்போகச் செய்யப்பட்டோரைக் கண்டறிதல், மகாவலி 'எல்' வலயம், தொல்பொருள், வனவள மற்றும் வனஜீவராசிகள் திணைக்கள ஆக்கிரமிப்புகள் தொடர்பில் மட்டுமே வடக்கு மக்கள் தங்களது போராட்டங்களை முன்னெடுத்துவருகின்ற நிலையில், அம்மக்களுக்குப் பொருளாதாரப் பிரச்சினைகள் இல்லையா? என்றொரு கேள்வி எழுப்பப்படுகின்றது. மறுபக்கத்தில், வடக்கு மக்களுக்குப் பொருளாதாரப் பிரச்சினையே அன்றி வேறு ஏதும் பிரச்சினைகள் இல்லை என்றும் கூறப்படுகின்றது. இவ்வாறு இரு தரப்பினர் இருவேறு விதமாகக் கூறினாலும், இந்த அனைத்துப் பிரச்சினைகளுடனும் அரசியல் உரிமைகள் என்ற பிரதான பிரச்சினையும் எமது மக்களுக்கு உண்டு.

எமது மக்கள் தங்களது அன்றாடப் பிரச்சினைகள் தொடர்பில் போராடுவதற்கு, அவர்களது அடிப்படைப் பிரச்சினைகளும் உணர்வுசார்ந்த பிரச்சினைகளும் அம் மக்களுக்கான பிரதான சுமைகளில் இருந்து அம்மக்களை இன்னும் விடுவிக்கவில்லை என்பதை அனைவரும் புரிந்து கொள்ள வேண்டும். இவற்றில் இந்த அரசியல் உரிமைகள் தொடர்பான பிரச்சினைக்குப் புதிய அரசியல் யாப்பின் ஊடாக ஒரு நிரந்தரத் தீர்வு கிட்டும் என்ற நம்பிக்கை இப்போது எமது மக்களிடமிருந்து அகன்றுவருவதையும் நான் இந்தச் சந்தர்ப்பத்திலும் கூறியே ஆக வேண்டும். இதைத்தான் நான் "வரும், ஆனால் வராது" எனக் கூறிவருகின்றேன். இந்தப் புதிய அரசியல் யாப்புச் செயற்பாடுகளில் ஈடுபட்டுள்ளதாக அல்லது அதில் அக்கறையுள்ளவர்களாகத் தங்களைப்பற்றிக் கூறிக்கொள்கின்ற தமிழ் அரசியல்வாதிகள், புதிய அரசியல் யாப்பு "இதோ முடிந்துவிட்டது, அதோ முடிந்துவிட்டது; இதோ வருகிறது, அதோ வருகிறது" எனக் கூறிக்கூறியே இந்த அரசாங்கத்தின் முக்கால்வாசிக் காலத்தை வீணடித்து விட்டார்கள். இப்போது, "ஒற்றையாட்சி என்றால் என்ன?" "ஒருமித்த நாடு என்றால் என்ன?" என்பதுபற்றி எமது மக்களுக்கு முன்பள்ளிகளை நடத்திக்கொண்டிருக்கிறார்கள். இது சிங்கள மக்களைத் திருப்திப்படுத்திக்கொண்டு, தமிழ் மக்களை ஏமாற்றுகின்றதும், தமிழ் மக்களைத் திருப்திப் படுத்திக்கொண்டு சிங்கள மக்களை ஏமாற்றுகின்றதுமான ஒரு கபட நாடகமாகும். இந்த ஏமாற்று நாடகம் எத்தனை மேடைகளில் அரங்கேற்றப்பட்டாலும், இதனால் இறுதிவரை ஏமாறப்போவது இந்த ஏமாற்றுக்காரக்களுக்கு வாக்களித்த எமது தமிழ் மக்களே என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். இப்படியே எமது மக்கள் தொடர்ந்தும் ஏமாற்றப்பட்டுக்கொண்டிருக்கின்றார்கள். இவ்வாறு எமது மக்கள் ஏமாற்றப்படுவது அரசியல் உரிமைகள் தொடர்பிலான விடயத்தில் மட்டுமல்ல என்பதையும் நீங்கள் புரிந்துகொள்ள வேண்டும்.

"நாங்கள் விட்ட தவறுகளைக் கூறி, அடுத்த தேர்தலில் எமது மக்களிடம் வாக்குக் கேட்போம்" என ஒரு கட்சி கூறுமானால், அக்கட்சி தொடர்பிலான எமது மக்களின் நம்பிக்கை எந்தளவிற்கு இருக்குமெனச் சிந்தித்துப் பார்க்க வேண்டும். இதன்படி பார்க்கின்றபோது, அவர்கள் எமது மக்களுக்குத் தவறுகளைத்தான் செய்திருக்கின்றார்களேயன்றி, ஏதும் நன்மைகளைச் செய்யவில்லை என்றே சுட்டிக்காட்டப் படுகின்றது. ஏதாவது நன்மை செய்திருந்தால், அதைக் கூறி அடுத்த தேர்தலில் எமது மக்களிடம் வாக்குக் கேட்பதற்கு அவர்களால் முடிந்திருக்கும். இதே கட்சியில் பல வருட காலமாகச் சுகபோகங்களை அனுபவித்துக்கொண்டு, இதே தவறுகளையே எமது மக்களுக்குச் செய்துவந்த இன்னுமொரு தரப்பினர், தமிழ் மக்களைப் பயன்படுத்தி யார் அதிகம் சம்பாதிப்பது என்ற உட்கட்சி மோதலால் கட்சியிலிருந்து பிரிந்துள்ள நிலையில், "மக்களுக்கு ஏதாவது செய்வதற்கு அவர்கள் விடவில்லை, இவர்கள் விடவில்லை" எனக் "கூரை ஏறிக் கோழி பிடிக்காதவன், வானம் ஏறி வைகுண்டம் போகிறேன்" என்பதுபோல் கூறிக்கொண்டிருக்கிறார்கள். எமது வரலாறு தெரியாத, எமது வரலாற்றுடன் இணைந்து பங்கேற்காத, இத்தகைய செயற்பாடுகளால் எமது வரலாற்றுக்குப் பெருமை சேர்க்காத, எமது மக்களுக்கு எதுவும் செய்யாத உருத்திராட்ச மாலை அணிந்த பூனைகளும் எமது சமூகத்தில் இருக்கத்தான் செய்கின்றன.

நாங்கள் ஏற்றிருக்கின்ற அரசியற் செயற்பாடுகளில் இவ்வளவு காலமும் எமது மக்களுக்கு நாங்கள் எவ்வளவோ நன்மைகளைச் செய்திருக்கின்றோம். நாங்கள் தேர்தல்களின் போது வாக்குக் கேட்கின்ற நிலையில், எமது மக்களுக்கு நாம் செய்தவற்றைச் சொல்லிக்காட்டுவதில்லை. மாறாக, எமது மக்களுக்கு மேலும் என்னென்ன நன்மைகளைச் செய்யப் போகின்றோம் என்பதையே எடுத்துக் கூறிவருகின்றோம். எமது மக்களுக்கு எவ்விதமான நன்மைகளும் செய்யாதவர்களால் எமது மக்களது நிம்மதியானதும் சுதந்திரமானதும் பொருளாதார வளமானதுமான வாழ்க்கை சிதைக்கப்பட்டுள்ளது. அதேநேரம், எமது மக்களின் நன்மை கருதி எதையாவது செய்வதற்கு எவரும் முன்வந்தாலும், அவர்களையும் இவர்கள் தடுத்து வருவதால் எமது மக்களின் வாழ்க்கை நிலை எந்தளவிற்குப் பாதிக்கப்பட்டிருக்கும் என்பதை நீங்களே நினைத்துப் பாருங்கள்! எமது மக்களால் வாக்களிக்கப்பட்டுத் தேர்ந்தெடுக்கப்பட்ட பல பிரதிநிதிகளினாலும் எமது மக்கள் வாழ்க்கையில் தடுக்கப்பட்டு வருகின்றார்கள்; இவர்கள் தவிர்ந்து மேலும் பல தரப்புகளினாலும் தடுக்கப்பட்டு வருகின்றார்கள் என்பதே உண்மை நிலைமையாகும். அந்த வகையில், எமது மக்களின் தலைவிதியுடன் கடந்த ஐந்து வருட காலமாக விளையாடிக் கொண்டிருந்த ஒரு மாபெரும் தடையானது, "எமது மக்களின் தலைவிதியுடன் இனி எவரும் விளையாடக்கூடாது; நாங்கள் மட்டுமே விளையாடுவோம்" எனக் கூறிக்கொண்டு நேற்று விடைபெற்றுவிட்டது. போகிற போக்கில் சும்மா போகாமல் எமது மக்களை எச்சரித்துவிட்டே போயிருக்கின்றது. அதாவது, "ஆபத்துக் காத்திருக்கிறது! மக்களே விழித்திருங்கள்!" எனக் கூறி எமது மக்களை எச்சரித்துச் சென்றிருக்கின்றது.

"தமிழர் ஆட்சி மலர்ந்தது!" எனக் கூறப்பட்டுக் கொண்டு வரப்பட்ட வடக்கு மாகாண சபையின் கடந்த 5 வருட ஆட்சிக் காலமானது தமிழ் மக்களுக்குப் பாரிய துரோகங்களை இழைத்துவிட்டு, "முடிந்தது தமிழ்த் துரோக ஆட்சி" என முடிவுக்கு வந்துவிட்டது. இந்த வடக்கு மாகாண சபை ஆட்சிப்பீடமேறிய காலத்திலிருந்து கடந்த 23 ஆம் திகதி அதன் இறுதி அமர்வு இடம்பெற்றது வரையில் ஆண்டிருந்த கட்சியின் உறுப்பினர்களினதும் அதே கட்சியின் நாடாளுமன்றத்தினைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற உறுப்பினர்களினதும் கருத்துப் பரிமாற்றங்களை உற்றுநோக்குகின்ற எவருக்கும், தமிழ் மக்களுக்கு ஆபத்து இந்தக் கட்சிக்காரர்களிடமும் ஆரம்பந்தொட்டு இந்தக் கட்சி சார்ந்து வழிவந்த கட்சிகள் மற்றும் குழுக்களிடமுமே காத்திருக்கின்றது என்பது மிக இலகுவாகப் புரியும் என நினைக்கின்றேன். தமிழ் மக்களின் துரோகிகள் யார்? என இவர்கள் தங்களுக்குள்ளேயே ஆளுக்காள் ஒற்றை விரலை நீட்டி மற்றவரைக் குற்றஞ்சாட்டி, மூன்று விரல்களைத் தம் பக்கம் மறைமுகமாக மடக்கி மூன்று மடங்கு துரோகிகள் தாங்கள் என்பதை ஒப்புக்கொண்டு வருகின்றார்கள். அந்த வகையில், ஒரு வழியில் எமது மக்களின் வாழ்க்கை தொடர்பில் இதுவரையில் இருந்துவந்த ஒரு பாரிய தடை நீங்கிவிட்டது. தமிழ் மக்களுக்குத் தமிழ்த் தரப்பின் ஏனைய சில அரசியல்வாதிகளினால் ஏற்படுத்தப்பட்டு வருகின்ற ஏனைய தடைகளையும் காலம் நீக்கிவிடும் என்ற நம்பிக்கை எமக்கிருக்கின்றது. அதனை அடுத்தடுத்த தேர்தல்களில் எமது மக்கள் முடிவுசெய்வார்கள் என நாம் நம்புகின்றோம்.

இந்த நிலையில், இன்று இந்த நாட்டில் ஒரு பொருளின் உற்பத்தி தொடக்கம் அந்தப் பொருளினை நுகர்கின்ற வரையிலும் ஒவ்வொரு நகர்வுக்கும் என வரிகள் விதிக்கப்பட்டு வருகின்றன. இது ஒட்டுமொத்த நாட்டு மக்களையும் பெரிதும் பாதித்து வருகின்றது. இந்த விடயம் தொடர்பில் எவரும் அவதானம் செலுத்துவதாக இல்லை. பொருட்களுக்கான வரி அறவீடுகள், பொருட்களின் விலையேற்றங்கள் என்பன நாளுக்குநாள் அதிகரித்துவரும் நிலையில், இந்த நிலை எப்போதாவது மாறி, எமது மக்களுக்குச் சுமையற்ற ஒரு வாழ்க்கையினை வாழக்கூடிய சந்தர்ப்பம் கிட்டும் என எமது மக்களால் நம்ப முடியாத அளவுக்கு இன்று இந்த நாட்டின் நிலை மாறிவிட்டது. இன்றுதான் இப்படி, நாளை இந்த நிலை மாறும் என்பதற்கு வெறும் வார்த்தைகளால் சமாளிப்புக்களை வழங்குவதைத் தவிர, நாளை இந்த நிலை மாறும் என்பதற்கு உங்களிடமும் எவ்விதமான நடைமுறைச் சாத்தியமான திட்டங்களும் இல்லை. இவ்வளவு காலமாக அறவிட்டுக் கொண்டிருகின்ற வரிகளைவிட, வேறு எந்தெந்த வழிகளில் வரிகளை அறவிட முடியும் என்பதையே சதா ஆராய்ந்து பார்த்துக்கொண்டு, அதற்கேற்ப வரிகளை அறவிட்டுக் கொள்வதற்கான சட்டமூலங்களைக் கொண்டுவருகின்றீர்கள். இன்று அமெரிக்க டொலருக்கு நிகரான இலங்கை ரூபாயின் வீழ்ச்சியானது 175 ரூபாயை எட்டியிருக்கின்றது. பெறுமதி குறைந்த காகித நோட்டுக்களை அதிகளவில் அச்சிட்டு, இல்லாததொரு பொருளாதார அபிவிருத்தியைக் காட்டிக் கொண்டு, நாட்டின் அந்நியச் செலாவணியானது தேவையற்ற வகைகளில் வீண்விரயமாக்கப்பட்டதன், வீண்விரயமாக்கப் படுவதன் விளைவினையே நாம் இந்த ரூபாயின் வீழ்ச்சியில் காண்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one minute more.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Okay, Madam.

இந்த நிலைக்கு ஒப்பான நிலைமையே வடக்கிலும் காணப்படுகின்றது. பெறுமதியில்லாத வெறும் கருத்துக்களைக் கூறிக்கூறியே இல்லாததொரு கற்பனை இராஜ்ஜியத்தை எமது மக்களுக்குக் காட்டி எமது மக்களின் பெரும்பாலான வாக்குகளை அபகரித்தவர்கள், தங்களது சுகபோக வாழ்க்கைக்காக எமது மக்களின் நலன்களுக்கான பேரம் பேசக்கூடிய வாய்ப்புகளை வீண்விரயம் செய்து வருவதால், இன்று எமது மக்கள் இலங்கை ரூபாயின் மதிப்பைவிடப் பல மடங்கு வீழ்ச்சியான வாழ்க்கையையே வாழ்ந்து வருகின்றனர். அந்நியச் செலாவணியின் ஈட்டல்கள் இன்றி இந்த நாட்டினை ஒருபோதும் முன்னேற்ற முடியாது என்பதுபோல், அடிப்படைப் பிரச்சினைகள், அபிவிருத்தி, அரசியல் உரிமைகள் தொடர்பிலான தீர்வு என்பவை இல்லாமல் எமது மக்களின் வாழ்க்கை நிலையை ஒருபோதும் முன்னேற்ற முடியாது.

இன்று இந்த நாட்டில் மக்களின் வாழ்வாதாரங்களை முன்னிறுத்திப் பல்வேறு திட்டங்களை மேற்கொள்வதாக விளம்பரங்கள் வெளியிடப்படுகின்றன; மேடைகள் தோறும் பேசப்படுகின்றன. வடக்கிலும் கிழக்கிலும் பல வேலைத் திட்டங்கள் மேற்கொள்ளப்படுவதாகவும், மேற்கொள்ளப் போவதாகவும் கூறப்படுகின்றது. இவை எல்லாம் எமது மக்களுக்கு எவ்விதமான நன்மைகளைக் கொண்டுவரப் போகின்றது? என்பது தொடர்பில் உறுதியான நம்பிக்கையினைக் கொள்ள முடியாதுள்ளது என்று கூறி எனது உரையினை இத்துடன் முடித்துக்கொள்கின்றேன். நன்றி. வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you, Hon. Member. මීළඟට, ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා.

[பி.ப. 2.11]

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நிதியமைச்சினுடைய உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டத்தின் கீழான கட்டளைகள் சம்பந்தமான விவாதத்திலே மலையக மக்களுடைய பிரதிநிதியென்ற வகையிலே கலந்துகொள்வதில் பெருமகிழ்ச்சியடைகின்றேன். நிதி அமைச்சு என்று கூறும்போது, பொருளாதாரம் பற்றிப் பேச வேண்டும்; பொருளாதாரம் என்று கூறும்போது, நாட்டினுடைய பொருளாதாரம் பற்றிப் பேசவேண்டும். நாட்டினுடைய பொருளாதாரம் பற்றிப் பேசுவதாக இருந்தால், இந்த நாட்டில் வாழ்கின்ற ஒட்டுமொத்த மக்களுடைய பொருளாதாரத்தைப் பற்றித்தான் பேச வேண்டும். ஆனால், இன்று இந்த உலகத்திலேயே முதன்முதலாகத் தங்களுடைய உழைப்புக்கேற்ற ஊதியம் கேட்டு, வீதிக்கு இறங்கி, பல பிரச்சினைகளுக்கு முகம்கொடுத்து, போராடித் தங்களுடைய சம்பளத்தை உயர்த்திக்கொள்ளவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைமை மலையகத்திலேயே ஏற்பட்டிருக்கின்றது. அந்த வகையில், மலையகச் சமூகம் முழுமையாகப் புறக்கணிக்கப்பட்டுள்ளது. அவர்களுடைய உழைப்புக்கேற்ற ஊதியம் தொடர்பாக - சம்பள உயர்வு சம்பந்தமாகப் பேச்சுவார்த்தைகள் நடத்தப்பட்டன; அரசாங்கத்திற்கு எடுத்துரைக்கப்பட்டது; பாராளுமன்றத்திலே பலமுறை பேசப்பட்டது. ஆனால், அவை நடைமுறைப்படுத்தப்படாததன் காரணத்தினால் இன்று மக்களே வீதிக்கு இறங்கிப் போராட வேண்டிய ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. மலையக மக்களுக்கு ஆதரவளித்து வடக்கு, கிழக்கு மற்றும் சர்வதேசம் என அனைவரும் இன்று வீதிக்கு இறங்கியிருக்கிறார்கள். குறித்த அரசாங்கம் 22 பெருந்தோட்டக் கம்பனிகளுக்கு இந்தப் பெருந்தோட்டங்களைத் தாரைவார்த்துக் கொடுத்ததன் விளைவாகவே இந்த நிலைமை ஏற்பட்டிருக்கின்றது.

இந்த நாட்டில் சுமார் 1,500,000 வாக்குகளைத் தம் கையில் வைத்துக்கொண்டிருக்கின்ற மலையக மக்களை இன்று சம்பந்தப்பட்டவர்கள் அனைவரும் சீண்டிப் பார்க்கின்றார்கள். இந்த நிலையில் தொழிலாளர் வர்க்கத்தின் சந்ததியினரான மலையக மக்கள் பொறுமை இழந்து வீதிக்கு இறங்க வேண்டிய ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. இந்த 22 தோட்டக் கம்பனிகள், அரசாங்கத்திற்கும் கௌரவ தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சருக்கும் கௌரவ பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சருக்கும் மலையகத் தோட்டத் தொழிலாளர்களுக்கு அடிப்படைச் சம்பளமாக 1,000 ரூபாய் கொடுக்க முடியுமா? முடியாதா? என்பதையும், அதேபோன்று, தீபாவளி allowance ஆக 10,000 ரூபாய் கொடுக்க முடியுமா? முடியாதா? என்பதைப் பற்றியும் தெரிவிக்க வேண்டும். பொறுப்புவாய்ந்த அமைச்சர்கள் ஊடக சந்திப்பின் மூலமாக அது பற்றி மக்களுக்குத் தெளிவுபடுத்த வேண்டும். அதன் பின்னர், மலையக மக்களுடைய வாக்குகளின்மூலம் பாராளுமன்றத்திற்கு வந்த நாங்கள் என்ன செய்ய வேண்டும் என்பது பற்றித் தீர்மானிப்போம். எங்களுக்குச் சாதகமான பதில் கிடைக்காவிட்டால் ஒரு தோட்டக் கம்பனிகூட பெருந்தோட்டத்தை நிருவகிக்க முடியாமற்போகும். பெருந்தோட்டங்களை நிருவகிக்கின்ற கம்பனிக்காரர்கள் விரட்டியடிக்கப்படுவார்கள்! ஆனால், இன்னும் நாங்கள் அவ்வாறான நிலைக்கு வரவில்லை. ஐந்தாவது பரம்பரையாக இந்தப் பெருந்தோட்டங்களைக் காப்பாற்றித் தங்களுடைய வாழ்நாள் முழுவதையும் அதற்காக அர்ப்பணித்து, இந்த நாட்டின் பொருளாதாரத்தைச் சக்திமிக்கதாக்குவதற்கான செயற்பாடுகளைச் செய்த அந்த மக்கள், தங்களின் உழைப்புக்கேற்ற ஊதியத்தையே கேட்கின்றார்கள். ஆகவே, கூட்டு ஒப்பந்தம்மூலம் சம்பளம் உயர்த்தப்படும்போது இன்றைய வாழ்க்கைச் செலவுக்கேற்ற வகையிலே அவர்களது சம்பளம் உயர்த்தப்பட வேண்டும்.

மலையகத்தில் இரு பிள்ளைகளைக்கொண்ட ஒரு சாதாரண குடும்பத்தின் ஒரு நாளுக்கான வாழ்க்கைச் செலவு 846 ரூபாய் ஆகும். ஒரு சாதாரண குடும்பத்திற்கு 846 ரூபாய் என்றால், நோயாளிகள், வயோதிபர்கள், உயர் கல்வி கற்கும் மாணவர்கள் இருக்கும் வீட்டில் வாழ்க்கைச் செலவானது ஒரு நாளைக்கு 1,000 - 1,500 ரூபாயைத் தாண்டும். ஆனால், இன்று அவர்களுடைய உழைப்பு முழுமையாகச் சுரண்டப் படுகின்றது. இந்த 1,000 ரூபாய் சம்பளத்திற்கு இவ்வளவு கேவலமாக அந்த மக்கள் வீதிக்கு இறங்கிப் போராட வேண்டியிருக்கின்றார்கள். இதனால் இன்று நாங்கள் பாராளுமன்றத்திலே இருக்க வேண்டுமா, இல்லையா? என்று தீர்மானிக்கவேண்டிய ஒரு நிலைக்குத் தள்ளப்பட்டிருக் கிறோம். ஆகவே, உடனடியாகத் தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் இதற்கு உரிய நடவடிக்கையினை எடுக்க வேண்டும். உரிய நடவடிக்கை எடுக்கப்பட்டிருந்தால் எங்களுடைய மக்களுக்கு மீண்டும் மீண்டும் வீதிக்கு இறங்கிப் போராடும் நிலைமை ஏற்பட்டிருக்காது. இவற்றை எங்களால் மீண்டும் மீண்டும் சொல்லிக்கொண்டிருக்க முடியாது. மலையக மக்களுடைய வாக்குகள் உங்களுக்கு இருந்திருக்காவிட்டால் அரசாங்கத்தை அமைத்திருப்பீர்களா? மலையக மக்களுடைய பிரதிநிதிகள் - பாராளுமன்ற, மாகாண சபை, பிரதேச சபை உறுப்பினர்கள் - அரசாங்கத்துடன் இல்லாவிட்டால், இந்த நாட்டினுடைய ஸ்தம்பிதத் தன்மை எப்படியிருக்கும் என்பதைத் தெரிந்துகொள்ளக் கூடியதாகவிருக்கும். ஆகவே, மலையக மக்களுடைய பிரதிநிதிகள் என்ற வகையிலே சில உருக்கமானதும் இறுதியானதுமான ஒரு தீர்மானத்தை எடுக்க வேண்டிய நிலைமைக்கு நாங்கள் தள்ளப்பட்டிருக்கிறோம். விரும்பியோ, விரும்பாமலோ அந்தத் தீர்மானம் விரைவிலே எடுக்கப்படும். ஆகவே, அரசாங்கம் இதை முழுமையாகக் கவனத்திற்கொள்ள வேண்டும். இந்தப் பெருந்தோட்ட மலையக மக்களுடைய சம்பள உயர்வு சம்பந்தமாக உடனடியாக நடவடிக்கை எடுக்காவிட்டால், பாரிய விளைவு ஏற்படும் என்பதை நான் இந்தத் தருணத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன். விசேடமாக கொழுந்து பறிக்கும் தாய்மார், தந்தைமார் என்று மலையக மக்கள் அந்தத் தொழில்துறையிலே தங்களை முழுமையாக அர்ப்பணித்துச் சேவை செய்து கொண்டிருக்கின்றார்கள். இந்த நிலையிலேயே இன்று நாம் பொருளாதாரம் பற்றிப் பேசிக்கொண்டிருக்கின்றோம்.

இன்று மலையகத்தில் எங்கு பார்த்தாலும் மதுபான சாலைகள் - Bars காணப்படுகின்றன. அதாவது அங்கே மதுபானசாலைகளைத் திறப்பதற்கு எந்தவிதமான தடையும் இல்லாத நிலைமை காணப்படுகின்றது. எங்கெங்கோ இருந்தெல்லாம் licence பெற்று மலையகத்திலே மதுபான சாலைகளை நடத்திக்கொண்டிருக்கின்றார்கள். மலையகத்தின் பொருளாதாரப் பின்னடைவுக்கு அதுவும் முக்கியமானதொரு காரணமாக இருக்கின்றது. ஆகவே, தேயிலை, இறப்பர்,

තෙන්නන්තෝට්ටංකුලිලේ, අතේපොන්රු මුළුතැන්කාය්ත තෝට්ටංකුලිලේ වේලෙසෙය්කින්ර තෝට්ටත් තොළිලාළර් කළෙ අරසාංකමුම් පොරුප්පුවාය්න්ත අමෙච්චර්කළුම් මීන්ඩුමොරු මුරෙ තිරුම්පිප් පාර්ප්පදු නන්රාක ඉරුක්කුමෙන නාන් නිනෙක්කින්රේන්. ඉල්ලෙයෙන්රාල්, තොළිර්චංකප් පෝරාට්ටම් මිකවුම් මෝචමාක වෙට්ක්කක්කූටිය ඔරු සූල්නිලෙ ඒර්පටුම්. ඉන්රු මලෙයක මක්කළුක්කාක මුළු නාටුමේ ආදරවළිත්තුක්කොණ්ටිරුක්කිරදු. අන්ත වකෙයිල් නේර්රු කොළුම්පු කාලිමුකත්තිටලිලේ මලෙයක ඉළෙඤර්කළ් වීදික්කු ඉරංකිප් පෝරාටියිරුක්කිරාර්කළ්. වෙළිනාටුකළිල් උළ්ළවර් කළුම් මලෙයක මක්කළුක්කු ආදරවළිත්තු වීදික්කු ඉරංකිප් පෝරාටියිරුක්කිරාර්කළ්. අවර්කළුක්කු ඉන්ත උයිරිය සපෙයිල් එනදු නන්රියිනෙත් තෙරිවිත්තුක්කොළ්ළ ආසෙප් පටුකින්රේන්.

ඉන්තච් චම්පළ උයර්වු වළංකප්පටාවිට්ටාල්, අටුත්ත කට්ටප් පෝරාට්ටම් අරසියල්වාතිකළුටෙය පෝරාට්ටමාක අමෙය වේණ්ටුම්. අරසියල්වාතිකළුටෙය පෝරාට්ටමානදු පිරතේස සපෙ තොටක්කම් මාකාණ සපෙ, පාරාළුමන්රම් වරෙ ඉරුක්ක වේණ්ටුම්. මලෙයක මක්කළෙප් පිරතිනිතිත්තුවප් පටුත්තුකින්ර අනෙත්තු උරුප්පිනර්කළුක්කුම් ඔරු කූරෙයින්කීළ් අමර්න්තු චිල මුක්කිය තීර්මානංකළෙ එටුක්ක වේණ්ටිය චූල්නිලෙ ඒර්පටුම්. අන්තත් තීර්ප්පු - අන්ත මුටිවු කචප්පානතාක අමෙයුමෙන නාන් කූරික්කොල්කින්රේන්. ඉන්ත උයිරිය සපෙයාන පාරාළුමන්රත්තිලේ වරවු චෙලවුත්තිට්ටම් චමර්ප්පික්කප්පටවිරුක්කිරදු. අතර්කාන ඉන්නෝරන්න වේලෙත්තිට්ටංකළ් නටෙපෙර්රුක්කොණ්ටිරුක්කින්රන. පෙරුන්තෝට්ට මක්කළුටෙය චම්පළ උයර්වු විටයම් තොටර්පාක, අවර්කළුටෙය පොරුළාතාරත්තෙච් චක්තිමික්කතාක්කක්කූටිය වේලෙත් තිට්ටංකළ් තොටර්පාක ඕරිරු නාට්කළුක්කුළ් ඉන්ත අරචාංකම් නටවටික්කෙ එටුක්කාවිට්ටාල්, එංකළුටෙය නිලෙප්පාට්ටිනෙ මීළ් පරීචීලනෙ චෙය්ය වේණ්ටිය චූල්නිලෙ ඒර්පටුමෙනත් තෙරිවිත්තුක්කොණ්ටු විටෙපෙරුකින්රේන්. නන්රි, වණක්කම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළහට, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.18]

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
මට කථා කරන්න අවස්ථාව ලබාදුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

"පංච තන්ත්‍රය" නමැති පොතේ තිබෙනවා, එක්තරා රජ කෙනකුට බහු ශක්ති, උග්‍ර ශක්ති සහ අනන්ත ශක්ති නමින් පුතුන් තිදෙනෙකු හිටියා කියා. හැබැයි, ඒ පුතුන් තිදෙනාම මෙලෝ දෙයක් ඉගෙන ගෙන නැහැ. ඒ නිසා එක වෙලාවක රජු තමන්ගේ උපදේශකයන්ට කියා තිබෙනවා, "නූපන් පුතු ගැන හිතේ ඇති වන වේදනාව සමනය කර ගන්න පුළුවන්, එයා ඉපදුණේ නැහැ කියා හිතලා; මැරුණු පුතු ගැන ඇති වන වේදනාව සමනය කර ගන්න පුළුවන්, දැන් ඒක වෙලා ඉවරයි නේ කියා හිතලා; නමුත්, මෝඩ පුතුන් විසින් ඇති කරන වේදනාව සමනය කරන්න අමාරුයි" කියා. අද මේ රට මේ වේදනා විඳින්නේ මෝඩ පුතුන්ගේ ආණ්ඩුවක් හදා ගත්ත නිසායි. මේ මෝඩ පුතුන්ගේ ආණ්ඩුව ගත්ත මරිමෝඩ, තකතීරු, අමන ආර්ථික උපාය මාර්ගය නිසා තමයි අද මේ රටේ ආර්ථිකය ප්‍රපාතයකට ඇද වැටිලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2014 වර්ෂයේ අග භාගය වන විට ලංකාව ඩොලරයට ගෙව්වේ රුපියල් 132යි. අද ඒක රුපියල් 174ත් ඉක්මවා තිබෙනවා. රුපියල් 40කට වැඩි මුදලකින් රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඩොලරයට සාපේක්ෂව, එක රුපියලකින් රුපියල වැටෙන කොට, මේ රටේ ණය බර රුපියල් බිලියන 55කින් ඉහළ යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රුපියල් බිලියන 55ක් කියන්නේ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හදන්න යන වියදමයි. ඩොලරයට සාපේක්ෂව එක රුපියලකින් රුපියල වැටෙන කොට රුපියල් බිලියන 55කින් ණය බර ඉහළ යනවා. දැන් ඩොලරයට සාපේක්ෂව රුපියල රුපියල් 40කින් පහත වැටිලා තිබෙනවා. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය වාගේ මාර්ග 40ක් හදන්න වැය වන මුදල අතිරේකව ණය බරට එකතු වෙලා තිබෙනවා. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය වාගේ මාර්ග 40ක් හදන්න වැය වන මුදලට සමාන මුදල් ප්‍රමාණයකිනුයි ණය බර ඉහළ ගියේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තුළ එක් අවස්ථාවකදී රුපියල සියයට 2.2කින් පහළ වැටුණා. මේ ගත වුණු වසර තුනහමාර තුළ සාමාන්‍යයෙන් අවුරුද්දකට සියයට 7.8ක ප්‍රමාණයෙන් රුපියල කඩා වැටිලා තිබෙනවා. ඒ නිසා මේ ආණ්ඩුව රුපියල අවප්‍රමාණය වීම වළක්වා ගන්න බැරි ආණ්ඩුවක්. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යුද්ධ කරන ගමන්, යුද්ධයට අවි ආයුධ ගෙනෙන ගමන්, මේ රටේ ආර්ථිකයත් කළමනාකරණය කරන ගමන්, රුපියලත් බේරා ගෙන, රටත් බේරා ගත්තා. රට බේරා ගන්න කියලා ආපු කට්ටිය දැන් අපට කියනවා, රුපියල බේරා ගන්න මැදිහත් වෙන්නය කියා; "ජනතාවනි, රුපියල බේරා ගැනීමට එක්වව්" කියා කියනවා. රුපියල බේරා ගන්න සටන් වදින්න සිද්ධ වන දවසක් උදාවෙයි කියා කවුද හිතුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රුපියල කඩා වැටිලා තිබෙන්නේ ඩොලරයට සාපේක්ෂව විතරක් නොවෙයි. ඉතියෝපියාවේ "බිර්" කියන මුදල් ඒකකට සාපේක්ෂව සියයට 9.2කින් රුපියල කඩාගෙන වැටිලා තිබෙනවා. බංග්ලාදේශයේ "ටකා" කියන මුදල් ඒකකයට සාපේක්ෂව රුපියල සියයට 7.5කින් කඩාගෙන වැටිලා තිබෙනවා. සිම්බාබ්වේ ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 11.1කින් කඩාගෙන වැටිලා තිබෙනවා. මේ ගත වුණු වසර තුනට -2015 -2017 කාලයට- විතරක් රුපියලේ වැටීම නිසා පමණක් මේ රටේ ණය බර රුපියල් බිලියන 696.9කින් ඉහළ ගියා. තමුන්නාන්සේලාගේ අගමැතිතුමාට, ජනාධිපතිතුමාට, මැති ඇමතිවරුන්ට මේක ප්‍රශ්නයක් නොවෙයි. ඒ අයට අතිරේක දීමනා හම්බ වෙනවා; අත යට තව දේවල් හම්බ වෙනවා; වරප්‍රසාද හම්බ වෙනවා; රජයේ මුදලින් යැපෙනවා. ඒ නිසා ඒ අයට මේක අදාළ නොවෙන්න පුළුවන්. හැබැයි, බදු බර ඉවසා ගන්න බැරිව සිය දිවි නසා ගන්නා ඉරණමට වැටුණු මිනිසුන් මේ පොළොවේ අද ජීවත් වෙනවා. තමන්ගේ දෛනික ආර්ථිකය කළමනාකරණය කර ගන්න බැරිව දස අතේ ණය වෙලා, උගුරු දණ්ඩ හිරවෙන මට්ටමට ණය වුණු මිනිසුන් මේ රටේ අද ජීවත් වෙනවා. ඇත පිටිසර රජරට ප්‍රදේශවල, කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රදේශවල ඒ ජනයා වගා කරගන්න බැරිව, කරන්න රක්ෂාවක් නැතිව වධ වේදනා විඳිනවා. රැකියා දස ලක්ෂයක් උපදවන්න පැමිණි මේ ආණ්ඩුව, රැකියා කළ අය ලක්ෂ දෙකකට වඩා පසුගිය අවුරුදු තුන ඇතුළත පාරට ඇද දමා තිබෙනවා. අපි නොවෙයි, මහ බැංකු වාර්තාවයි ඒක කියන්නේ. මේ රට මෙතැනට වැටුණේ කොහොමද? රුපියල අවප්‍රමාණය කරන්නේ අපිද? රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් වැඩිවන ආනයනික වියදම්වල, භාණ්ඩ වියදම්වල බර උසුලන්නේ කවුද? ඒ මිනිසුන්ට ලැබෙන සහනය මොකක්ද? එක පැත්තකින් ඒ බර පැටවෙන අතරේ, අනෙක් පැත්තෙන් බදු බර පටවනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සානාව කියන අප්‍රිකානු රටට හදපු පනත තමයි මේ ගොල්ලන් ගෙනැත් සම්මත කළේ. මේ, ඒ පනතේ පරිවර්තනයක්. "සානාව" කියන නම වෙනුවට

[ගරු විමල් වීරවංශ මහතා]

"ශ්‍රී ලංකාව" කියලා දැම්මා. සානාවේ ආර්ථිකය වනසාලීමට හදපු බදු ප්‍රතිපත්තිය තමයි ලංකාවට ගෙනැත් පැටෙව්වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තමුන්නාන්සේලාගේ බෙල්ලෙන් අල්ලාගෙනයි ඉන්නේ. ඔවුන් ලබාදෙන ණය වාරිකය දෙන්නේ ඉතිරි වැඩ ටික කළාට පසුවයි. ඒ විධියට ඒ අය තමුන්නාන්සේලා blackmail කර අවසානයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ බදු ප්‍රතිපත්තිය අරගෙන එන්නේ රටක් වට්ටන්නයි. ඒක තමයි, නව ලිබරල්වාදී ආර්ථික මූලෝපාය වන්නේ. රුපියලේ අගය කඩා වැටෙනකොට තමුන්නාන්සේලා අහසට බැණලා වැඩක් නැහැ. මේ විධියට රුපියලේ අගය පහළට යවා ගත්තේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ආනයන වියදමින් සියයට 10කට වැඩි ප්‍රමාණයක් යන්නේ ආහාර සඳහායි. එතකොට රුපියලේ අගය පහත වැටෙන නිසාම පමණක් මේ සියයට දහයේම මිල ඉහළ යනවා. අපේ රුපියල අවප්‍රමාණය වූ විධිය ගැන තමුන්නාන්සේලා කල්පනා කර බලන්න. 2015දී මෙරට පාන් පිටි පරිභෝජනය මෙට්‍රික් ටොන් ලක්ෂ 13ක් වෙලා තිබුණා. 2017දී එය මෙට්‍රික් ටොන් ලක්ෂ 17ක් වුණා. අවුරුදු දෙකයි ගත වුණේ. මෙහෙම වුණේ ඇයි? තමුන්නාන්සේලා පාන් පිටිවලට රුපියල් මිලියන 34,000ක බදු සහනයක් දුන්නා. රුපියල් මිලියන 34,000ක බදු සහනයක් දුන්නාට පාන් ගෙඩියේ මිල අඩු වුණේ නැහැ. තිරිඟු පිටි ආනයනය කරන සමාගම්වලට අවුරුද්දකට රුපියල් මිලියන 34,000ක බදු සහනයක් දුන්නාම පාන් පිටි පරිභෝජනය වැඩි වෙනවා. ඒ සල්ලි ටික රටෙන් එළියට යනවා. "ඉලෙක්ට්‍රොනික භාණ්ඩ ගන්න එපා, කාර් ගේන්න එපා, අරවා ගන්න එපා, මේවා ගන්න එපා" කියා දැන් කියනවා. රජයේ සේවකයන්ට දීලා තිබුණු වාහන බලපත්‍රයටත් තට්ටු කරනවා. ඉතින් කොහොමද, රටක් හැදෙන්නේ? අපේ ආණ්ඩුව කාලයේ ආනයනික කිරි පිටි කිලෝග්‍රෑම් එකකට රුපියල් 225ක විශේෂ බද්දක් පනවා තිබුණා. එහෙම තිබුණේ දේශීය කිරි නිෂ්පාදන කර්මාන්තය දියුණු කරන්නයි; පැල්වත්ත කිරි සමාගම වැනි දේශීය සමාගම්වලට වෙළෙඳ පොළේ ශක්තිමත්ව ස්ථාපිත වෙන්න ඉඩ හදා දෙන්නයි; ස්වදේශික නිෂ්පාදකයාට මාවත හදන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2016 වන විට හතර වතාවකදී මෙම බදු අඩු කළා. බදු අඩු කරලා, දැන් ආනයනික කිරි පිටි කිලෝග්‍රෑම් එකකට තිබෙන්නේ රුපියල් 2ක බද්දක්. එතකොට මොකද වෙන්නේ? ආනයනික කිරි පිටි පරිභෝජනය වැඩි වෙනවා. දේශීය කිරි පිටි නිෂ්පාදකයාට වෙළෙඳ පොළේ හිමිවී තිබෙන ස්ථානය අහිමි වෙනවා. මෙහෙම මී හරක් ප්‍රතිපත්තියක් අනුගමනය කරලා රුපියල රකින්න පුළුවන්ද? ඒක ශක්තිමත් කරන්න පුළුවන්ද?

ආනයනික පාන් පිටි කාරයාට බදු සහන දෙනවා. ආනයනික කිරි පිටි කාරයාට බදු සහන දෙනවා. දේශීය කිරි නිෂ්පාදකයාට දීපු එක බදු සහනයක් මට කියන්න. ස්වදේශික කර්මාන්තකරුවන්ට දීපු බදු සහනයක් මට කියන්න. මේ රටේ ඉපදුණු, මේ රටේ හැදුණු වැඩුණු, මේ රටේ අධ්‍යාපනය ලබලා, මේ රටෙදි තමන් සොයා ගත් දැනුමෙන් මේ රටට යමක් නිපදවා දෙන මේ රටේ කර්මාන්තකාරයෙකුට දීපු බදු සහනයක් තිබෙනවා නම් කියන්න. එහෙම එකක්වත් නැහැ. තමුන්නාන්සේලා මේ බදු සහන සියල්ල දුන්නේ ආනයනික සමාගම්වලටයි. ඒ නිසා කිරි පිටි කිලෝග්‍රෑම් එකකට තිබුණු බද්ද රුපියල් දෙක දක්වා අඩු කළා. මේ නිසා ආණ්ඩුවට අහිමි වන බදු ආදායම හා අයුතු ලාභය අවුරුද්දකට රුපියල් මිලියන 18,000යි. වසරකට කිරි පිටි මෙට්‍රික් ටොන් 80,000ක් ආනයනය කරනවා. ටිකක් හිතන්න, රටෙන් එළියට යන සල්ලි ප්‍රමාණය කොච්චර ප්‍රබලද කියා. මේ නිසා ආණ්ඩුවට අවුරුද්දකට රුපියල් මිලියන 18,000ක බදු ආදායමක් අහිමි වෙනවා. ආණ්ඩුව ආනයනික කිරි පිටිවලට බදු සහන දෙනවා. එතකොට එතැනින් ලැබෙන බදු ආදායම අඩු වෙනවා. ඒ අඩු වන බදු ආදායම ස්වදේශික ව්‍යාපාරිකයා මත පටවනවා. ස්වදේශික ව්‍යාපාරිකයා ඒ බදු ගෙවාගෙන තමන්ගේ ව්‍යාපාරය කර ගන්න බැරිව ළතැවෙනවා. මේක තමයි අද මේ රටට වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ නිසා ආණ්ඩුවට අහිමි වන මුදල රුපියල් මිලියන 18,000ක් නේ. රටේ සමෘද්ධි සහනාධාරය දෙන්න වැය වන්නේ ඊට වඩා අඩු මුදලක්. මුළු රටේම දුගී-දුප්පත් ජනයාට සමෘද්ධි සහනාධාරය දෙන්න යන්නේ අවුරුද්දකට ඊට වඩා අඩු මුදලක්. ඊට වඩා වැඩියි, රුපියල් මිලියන 18,000ක බදු ආදායම අහිමි වීම. ඉතින් මෙහෙම ආණ්ඩුවක් යටතේ රටක් කොහොමද නැඟිටින්නේ? කිරි පිටි හා පාන් පිටි බදු සහනයෙන් විතරක් -මේ දෙකටම දීපු බදු සහනවලින් විතරක්- අහිමි වෙච්ච බදු ආදායම අවුරුද්දකට රුපියල් මිලියන 52,000යි. මේ බදු සහන හින්දා කිරි පිටි මිල අඩු වුණේ නැහැ. මේ බදු සහන නිසා පාන් ගෙඩියේ මිල අඩු වුණේ නැහැ. බදු සහනය දෙනවා. දීපු ඇමතියි, කොම්පැනියයි බදු සහනයෙන් අවුරුද්දට ලැබෙන ගණන බෙදා ගන්නවා. ඒක තමයි අලුත්ම හොරකම් කරන උපක්‍රමය වෙලා තිබෙන්නේ. ඇයි, බැඳුම්කරවලින් ගැහුවොත් අතේ මාටටු වෙනවා නේ. ඒ නිසා මේක තමයි දැන් අලුත්ම ක්‍රමය වන්නේ.

දැන් බලන්න. ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමෙන් තමුන්නාන්සේලා බදු සහන දෙනවා. සිංගප්පූරුවෙන් ගෙනෙන භාණ්ඩවලින් දැනට අපි අවුරුද්දකට සාමාන්‍යයෙන් රුපියල් මිලියන 1,600ක බදු ආදායමක් උපදවනවා. බදු සහන දුන්නාම මොකද වෙන්නේ? ඒ මුදල නැති වෙනවා. අවුරුද්දකට රුපියල් මිලියන 1,600ක් ලැබෙන බදු ආදායම අපි අහිමි කර ගන්නවා. ඊළඟට, ඒ රුපියල් මිලියන 1,600 ස්වදේශිකයාගේ කරමත පටවනවා. ස්වදේශිකයාට ඔරොත්තු දිය නොහැකි, දරාගත නොහැකි අධික බදු බරක් පටවනවා. ඒකෙන් මොකක්ද වෙන්නේ? ස්වදේශිකයා ආර්ථිකයේ රඟදක්වන ලද භූමිකාව අහිමි වෙනවා. ස්වදේශිකයාට භූමිකාව අහිමි වෙනකොට මොකද වෙන්නේ? විදේශිකයාට පාර අරිනවා.

එටකා ගිවිසුම දෙසැම්බර්වල අත්සන් කරනවා කියා ඉන්දියානු මාධ්‍ය කියනවා. එටකා ගිවිසුම දෙසැම්බර්වල අත්සන් කළොත් මොකද වෙන්නේ? ස්වදේශික ආර්ථිකය වැටෙනකොට ලයිකමොබයිල්කාරයා ස්වර්ණවාහිනී නාලිකාව ඇතුළුව වැටිච්ච ඊඑපී ආයතන ජාලය කොටි සල්ලිවලින් ග්‍රහණයට ගත්තා වාගේ තත්ත්වයට වැටෙනවා. දැන් "සැවෝයි" එකත් අයිති ලයිකමොබයිල් කොටි සල්ලිකාරයාට. රාජගිරියේ "ඉම්පාලා" සිනමාශාලාව අයිති ලයිකමොබයිල් කොටි සල්ලිකාරයාට. මේ රටේ සිනමාශාලාවලින් වැඩි ප්‍රමාණයක් අයිති ලයිකමොබයිල් කොටි සමාගමට. ලයිකමොබයිල් කියන්නේ කොටින්ට අරමුදල් නිපදවීමට හදාපු සමාගමක්. චන්ද්‍රිකා කුමාරතුංග නෝනා තමයි මේ ගනුදෙනුව පිටිපස්සේ හිටියේ. මනෝ තිත්තවැල්ල තමයි කපුකම කළේ. මනෝ තිත්තවැල්ලලාට ලැබුණු ගණන් අපි දන්නවා. අන්න ඒ විධියට ස්වදේශිකයාට එම අවස්ථාව අහිමි වෙනවා. විදේශිකයා එම අවස්ථාව අත්පත් කර ගන්නවා. ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුමෙන් ලබා දෙන බදු සහන ඔක්කොම දුන්නාම ඒක තවත් වර්ධනය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළු ආර්ථික මූලෝපාය අනුගමනය කරන උදවියට අවශ්‍ය වෙලා තිබෙන දේ. ඒ ගොල්ලන්ට ඕනෑ විදේශිකයාට දොර ඇර දෙන්නයි. අපේ ආණ්ඩුව කාලයේ තිබුණු පනත අනුව මේ රටට ගෙනෙන ඩොලර්, විදේශ මුදල් මහ බැංකුව අධීක්ෂණය කරනවා. මහ බැංකුව දැනුවත්ව තමයි ඒ දේවල් සිදු වෙන්නේ. විදේශ මුදල් ගෙනියන්නේත්, විදේශ මුදල් ගෙනෙන්නෙත් මහ බැංකුව දැනුවත්වයි. ඒ අධීක්ෂණය නැති

වුණා. කළු සල්ලිවලට විදේශ මුදල් ගෙනෙන්න පුළුවන් වුණා. ඒක මහ බැංකුව දන්නේ නැහැ. ඒ අතර විදේශිකයාට ඉඩම් සින්නක්කරව මිලදී ගන්න පුළුවන් වන විධියට තමුන්නාන්සේලා නීති හදලා දුන්නා. අපේ ආණ්ඩුව කාලයේ විදේශිකයෙක් apartment building එකක නිවසක් මිලදී ගත්තොත් සියයට සියයක බද්දක් ගෙව්වා. නිවසේ මිල වාගේ දෙගුණයක් ගෙව්වා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඒක බින්දුවට බැස්සුවා. විදේශිකයාට ගහන බදු බස්සනවා. දැන් විදේශිකයා ඒ නිවස මිලදී ගන්නේත්, ස්වදේශිකයා ඒ නිවස මිලදී ගන්නේත් එකම මිලටයි. විදේශිකයාව දිරිගන්වනවා. විදේශිකයාට ඉඩම් සින්නක්කරව මිලදී ගන්න නීති හදනවා. විදේශිකයාට කළු සල්ලි අරගෙන එන්න තිබෙන බාධා අයින් කරනවා. විදේශිකයාට apartment building එකක නිවසක් ගන්න තිබෙන බාධාව අයින් කරනවා. ආර්ථිකයක් වැටෙනකොට, ස්වදේශිකයා හොම්බෙන් යනකොට, ඒ අවස්ථාව කුණු කොල්ලයට අත්පත් කර ගන්න විදේශිකයාට මහ පැදෙනවා. ETCA එක ගැහුවොත් රම්පෙට පොරි හැලෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසානයේ තමන්ගේ රාජ්‍ය තමන්ට අහිමි වුණු ස්වදේශිකයෙක් බවට මේ රටේ මිනිහා පත් වෙනවා. ඒකට තමයි නව ලිබරල්වාදී මූලෝපාය කියන්නේ. ස්වදේශිකයාට සිය රාජ්‍ය අහිමි කිරීම. ස්වදේශිකයා සිය රාජ්‍ය තුළ දෙවැනි පෙළ පුරවැසියෙක් බවට පත් කිරීම. දෙවැනි පෙළ රටවැසියෙක් බවට පත් කිරීම. විදේශීයකරණය අපට අදාළ නැහැ. විදේශීයකරණය චීනයටද, ඇමෙරිකාවටද, ඉන්දියාවටද, කියන එක අපට අදාළ නැහැ. කොහොම වුණත් වෙන්නේ මේ රාජ්‍ය ස්වදේශිකයාට -සිංහල, දෙමළ, මුස්ලිම් අපි කාටත්- අහිමි වීම. එම නිසා මේ යන ආර්ථික මූලෝපායේ තිබෙන වැරැද්ද අපි තේරුම් ගන්න ඕනෑ.

අද ට්‍රම්ප් ජනාධිපතිවරයා ඇමෙරිකාවේ කරන්නේ අගමැති වික්‍රමසිංහ මෙහේ කරන එකද? ඇමෙරිකාවේ ට්‍රම්ප් ජනාධිපතිතුමා විදේශ නිෂ්පාදනවලට වැඩියෙන් බදු ගහනවා. චීනයේ නිෂ්පාදනය කර ඇමෙරිකානු වෙළෙඳ පොළට එන ඒවාට අය කරන බද්ද සියයට 40යි. ඇමෙරිකානු කර්මාන්තකරුවා දිරිගන්වනවා. දැන් iPhone එක හදන ඇපල් සමාගම චීනයේ තිබෙන තමන්ගේ ෆැක්ටරිය ගලවලා ඇමෙරිකාවේ දමන්න හදනවා. චීනය හරහා ඇමෙරිකානු වෙළඳ පොළට නිෂ්පාදන එවනකොට අය කරන බදු වැඩියි. එම නිසා ඇමෙරිකාවෙන් තෙල් ගන්නේ නැහැ කියා චීනය තීරණය කර තිබෙනවා. ඒ ගැටුම ඇති වන්නේ මොකද? ස්වදේශික ආර්ථිකයට ඕනෑ විධියට ට්‍රම්ප් ජනාධිපතිතුමා තීරණ ගන්නකොට ඒක චීනයට ප්‍රතිවිරෝධයක් බවට පත් වෙනවා. මෙතැන වෙන්නේ ඒකේ අනෙක් පැත්ත. ට්‍රම්ප්ගේ අනෙක් පැත්ත. අපි හිතුවේ මෙතුමා ට්‍රම්ප්ව අනුගමනය කරයි කියායි. සිදු වෙන්නේ ට්‍රම්ප්ගේ අනෙක් පැත්ත. මෙහේ විදේශිකයාටයි පාර කපන්නේ, විදේශිකයාටයි බදු සහන දෙන්නේ. ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුමෙන් විදේශිකයාටයි දොර අරින්නේ. ETCA එක ගැහුවොත් ඉන්දියානුවාට තමයි දොර අරින්නේ. ස්වදේශිකයාට බදු සහන නැත. ස්වදේශිකයාට අතිරේක බදු, තව තවත් බදු. අවසානයේ තමන් උපන් රාජ්‍ය තුළ - උපන් භූමිය තුළ- දෙවැනි පෙළට ඇද වැටුණු රටවැසියෙක් බවට මේ රටේ ස්වදේශික ජනයා පත් වෙනවා. මේක තමයි මේ ගමනේ අවසාන ප්‍රතිඵලය වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආර්ථිකය පැත්තෙන් ස්වදේශිකයා මෙහෙම අනාථ කරනවා. ජාතික ආරක්ෂාව පැත්තෙන් ආරක්ෂක හමුදා දුර්වල කරනවා. බුද්ධි අංශ නිලධාරීන් හිරේ දමනවා. නාවික හමුදාවේ නිලධාරියෙක් හිරේ දමන්න අදත් ලැහැස්ති වෙලා ඉන්නවා. මොනවා හෝ චෝදනාවක් පටලවලා හිරේ දමනවා. ජිනීවා මානව හිමිකම් කොමිසම ළං වෙනකොට බුද්ධි අංශ හිරේ දමනවා. ළං වෙනකොට හිරේ දමනවා. රාජ්‍ය ආරක්ෂාව දුබල කිරීම, බෙලහීන කිරීම තමයි සිදු කරන්නේ.

කොටින්ට වන්දි දෙනවා. ත්‍රස්තවාදීන්ට වන්දි දෙන ලෝකයේ අරුම පුදුම එකම රට තමයි මේ. සජිත් ප්‍රේමදාස මහත්මයාගේ තාත්තාව මරපු කොටියාගේ -බාබුගේ- පවුලටත් වන්දි ලැබෙනවා. අම්මා, තාත්තා නැතත් පවුලේ වෙන අය ඉන්නවා නම්, ඒ අයටත් වන්දි දෙනවා. ගාමිණී දිසානායක මහත්මයාව මරපු කොටියා මැරුණා නම් ඒ කොටියාගේ පවුලට වන්දි ලැබෙනවා. ඒ පනතේ තිබෙනවා, "වන්දි දෙනකොට විවේචනය කළොත් මහාධිකරණයට අපහාස කළා සේ සැලකෙනවා. අභියාචනාධිකරණයට අපහාස කළා සේ සැලකෙනවා." කියා. අපි හිතමු, බාබුගේ පවුලේ කෙනෙකුට වන්දිය දෙනකොට අපි ඒක විවේචනය කළා කියලා. එතකොට අභියාචනාධිකරණයට අපහාස කළා සේ සලකනවා. ඒ කියන්නේ, අපේ කටවලුත් වහනවා. මේක පුදුම ලෝකයක්! මේක පුදුම ආණ්ඩුවක්!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තොරතුරු දැනගැනීමේ අයිතිය ගැන වැල් බයිලා කියලා මෙතුමන්ලා මෙතැනට ආවේ. අද මේ රටේ මිනිසුන්ගේ කටවල් වහලා තමයි කොටි කියන අපරාධකාරයන්ට, ත්‍රස්තයන්ට, මේ රට බෙදන්න ආපු ඒ මිනී මරු ත්‍රස්තවාදී කල්ලියට සල්ලි දෙන්නේ. යුද්ධයෙන් බැට කාපු අහිංසක සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාවට වන්දි දුන්නාට කමක් නැහැ. නමුත් මේ වන්දි දෙන්නේ, ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් කරලා මේ රට බෙදන්න සටන් කරපු කොටියාගේ පවුල්වලට. දළදා මාළිගාවට ගහලා මැරිච්ච කොටියාගේ පවුලටත් වන්දි දෙනවා, ජය ශ්‍රී මහා බෝධියට බෝම්බ ගහලා මැරුණු කොටියාගේ පවුලටත් වන්දි දෙනවා, කාන්තන්කුඩි මුස්ලිම් දේවස්ථානයට ගහලා මැරිච්ච කොටියාගේ පවුලටත් වන්දි දෙනවා, කදිර්ගාමර් මරලා, මැරුණු කොටියාගේ පවුලටත් වන්දි දෙනවා, ඩග්ලස් දේවානන්දා මැතිතුමා මරන්න කීප වතාවක් උත්සාහ කරලා, මැරිච්ච කොටින්ට වන්දි දෙනවා. මේ වන්දි දෙන්නේ එහෙම. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රට අද ඉතා විෂකුරු, බියකරු ගමනක යන්නේ. රාජ්‍යය ආරාජිකයි. රාජ්‍යය ස්වදේශිකයාට අහිමියි. රාජ්‍ය ආරක්ෂාව බිඳ වටිටනු ලබමින් තිබෙනවා. අපි පක්ෂ කීපයක ඉන්න පුළුවන්. අද ආණ්ඩු පක්ෂයේ, හෙට විපක්ෂයේ. මොනවා වුණත් අපට මේ රට තිබෙන්න ඕනෑ; මේ රාජ්‍ය අපට තිබෙන්න ඕනෑ. මේ ජාතික රාජ්‍යය, චිරාත් කාලයක් තිස්සේ අපේ මුතුන් මිත්තෝ රැක බලා ගත් රාජ්‍යය; ක්‍රි. පූ. 2දී දුටු ගැමුණු මහ රජ්ජුවෝ ඒකච්ඡත්‍ර කරපු රාජ්‍යය; මේ මහා සභ්‍යත්වයක් දරාගෙන ඉන්න රාජ්‍යය; ථේරවාදී බුද්ධාගමෙන් පෝෂණය වුණු රාජ්‍යය අපට තිබෙන්නට ඕනෑ. අපේ මේ රාජ්‍යය ආරක්ෂා වෙන්න ඕනෑ. මේ රාජ්‍යය අහිමි කරමින්, මේ රාජ්‍යය තුළ ස්වදේශිකයා අවතැන් වූවකු බවට පෙරළන මේ ආර්ථික ගමන වහාම නතර කළ යුතුයි. එසේ නොවනතාක්, රාජ්‍ය උරුමය අපට අහිමි වෙයි; රාජ්‍ය අයිතිය අපට අහිමි වෙයි; ස්වදේශිකයා තමන් උපන් භූමිය තුළ අසරණයෙක්, අනාථවූවෙක් බවට පත් වෙයි; විදේශීයකරණ වීම පමණක් ශීඝ්‍රව සිදු වෙයි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පක්ෂ දේශපාලනය පැත්තකට දමා මේ කියන දේ පිළිබඳව සිතමු. මා පිළිබඳව තිබෙන අර්ථ කථනය අනුව නිගමනයට එන්නේ නැතුව, මේ කියන කරුණු අනුව මේ ගැන හිතලා බලලා, මේ යන විපත්තිදායක මාවතෙන් අපේ ස්වදේශිකයාත්, ස්වදේශිකයාට අයිති රාජ්‍යයත් ආරක්ෂා කර ගන්න අපි සියලුදෙනාම කැප වෙමු කියලා ආරාධනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.37]

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(මාණ්පුමිකු මුජිපුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අද ඉදිරිපත් කර තිබෙන මුදල් පනත් කෙටුම්පත හා සම්බන්ධ කරුණු ගැන කථා කරනකොට විශේෂයෙන්ම අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු වර්තමාන දේශපාලනය ගැනත් කථා කළා. එතුමන්ලා ලොකු චෝදනාවක් කළා, අපි කොටින්ට මුදල් දෙනවා කියලා; බාබුට හා හිටපු අමාත්‍ය ගරු ගාමිණී දිසානායක මැතිතුමාව ඝාතනය කරපු අයට, මුස්ලිම් ජනතාව ඝාතනය කරපු අයට අපි වන්දි දෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ පැවැති යුද්ධය ඉවර වෙලා දැන් අපි අලුත් ගමනක් පටන් ගෙන තිබෙන්නේ. හැබැයි, සංහිඳියාව ඇති කරන එක ලේසි නැහැ. එල්ටීටීඊ එකේ දෙමළ තරුණයෝ කියලා කියන්නේත්, මේ රටේ තරුණයෝ. ඒ ගොල්ලෝ ඉන්දියාවෙන් ආපු කල්ලතෝනියෝවත්, වෙනත් ජාතියක්වත් නොවෙයි. ඒ තරුණයෝ වැරදි මාවතක ගියා. වැරදි මාවතක ගිය ඒ තරුණයෝ අද පුනරුත්ථාපනය කරලා සමාජගත කරනවා. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලයේත් එල්ටීටීඊ සාමාජිකයෝ 12,000ක් පුනරුත්ථාපනය කරලා සමාජගත කළා. ඇයි එහෙම කළේ? උතුරු-නැහෙනහිර ඡන්දය දිනන්න, මහින්ද රාජපක්ෂ මහත්තයා එල්ටීටීඊ සාමාජිකයෝ 12,000ක් නිදහස් කළා.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Madam Presiding Member, I rise to a point of Order.

ඔබතුමිය කියනතෙක් "මයික්" එක දෙන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු තලෛමෛතාන්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
මොකද, ඒ ගොල්ලන්ට ඔබතුමියගේ කට හඬ අහන්න ආසයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතුමා ගරු සභාව නොමහ යැවීමක් කරනවා. අපි කියන්නේ නැහැ කොටි සංවිධානයේ හිටපු අය පුනරුත්ථාපනය කරලා ඒ ගොල්ලෝ නිසි මහට ගෙනැල්ලා සමාජගත කරන්න එපා කියලා. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඒ එක දෙයක්. ඒකට අපි එකඟයි. නමුත්, ත්‍රස්ත ක්‍රියා මාර්ගවල යෙදිලා මැරුම් කාපු අයගේ පවුල්වලට වන්දි දුන්නාම එතැනින් අනාගත පරපුරට දෙන ආදර්ශය භයානකයි.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(මාණ්පුමිකු මුජිපුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
දැන් ඔබතුමන්ලා හොඳ ආදර්ශයක් දුන්නා.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ඒ කියන්නේ?

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(මාණ්පුමිකු මුජිපුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
මතක තබා ගන්න. දැන් ඔබතුමා කිව්වා දළදා මාළිගාවට ගහපු, අරන්තලාවේ භික්ෂූන් වහන්සේලා ඝාතනය කරපු, කාන්තන්කුඩි මුස්ලිම් ජනතාව මරපු ඒ අයටත් අපි සල්ලි දෙනවාය කියලා. කරුණා අම්මාන් පක්ෂයේ උප සභාපති කළේ- [බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ත්‍රස්ත ක්‍රියා මාර්ගවල යෙදිලා මැරිච්ච අයගේ පවුල්වලට වන්දි නැහැ.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(මාණ්පුමිකු මුජිපුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
දැන් ඔබතුමා කියනවා, [බාධා කිරීම්] හරි, දැන් ප්‍රශ්නය ඉවරයි නේ. [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු තලෛමෛතාන්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(මාණ්පුමිකු මුජිපුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මෙතැනදි මතු කරපු කාරණය මේකයි. මේ රටේ සිවිල් යුද්ධයක් පැවතුණා. ඒ සිවිල් යුද්ධයේදී හැම කෙනාටම හානි වෙලා තිබෙනවා. මේ රටේ තරුණයෝ, දෙමළ තරුණයෝ වැරදි මාවතක ගියා. වැරදි මාවතක ගිය ඒ තරුණයන්ව නිවැරදි මාවතට ගෙන එන්න රජයක් හැටියට අපට වගකීමක් තිබෙනවා. ඒක 1970දීත් වුණා. 71 කැරැල්ල වුණා. 89 කැරැල්ලේදීත් මේ රටේ සිංහල තරුණයෝ රාජ්‍යයට විරුද්ධව කැරලි ගැහුවා. කැරලි ගැහුවාම මොකක්ද කළේ? ඔවුන්ව සිරගත කළා. අන්තිමට අපි උද්ඝෝෂණය කළා. අපි කිව්වා, "සියලුදෙනා නිදහස් කරන්න" කියලා. එදා අපි එහෙමයි ඒ වෙනුවෙන් පෙනී සිටියේ.

1989 දී ඔබතුමායි, මමයි එකම වේදිකාවක සිටියා. ඔබතුමාට ඒක මතක නැද්ද කියලා මම දන්නේ නැහැ. නමුත්, අපි එදා එහෙම එකම වේදිකාවක සිටියා. එහෙම නම්, දකුණේ තරුණයන්ටත් ඒ නීතිය නම්, උතුරේ තරුණයන්ටත් ඒ නීතිය තිබෙන්න ඕනෑ.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු තලෛමෛතාන්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කැරලි ගහපු ජනතා විමුක්ති පෙරමුණේ අයගේ පවුල්වලටත් වන්දි දුන්නාද? එම නිසා මේ

දේවල් කරන්නේ ජිනීවාවලින් එන න්‍යාය පත්‍රයට අනුවයි. ඩයස්පෝරාවත් එක්ක එකඟ වූ දේවල් තමයි මේ කරන්නේ. 'සහජීවනය' කියන වචනය නිකම් ගණිකා වෘත්තියේ යොදවන්න එපා.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(මාණ්පුමිකු මුජිපුර් රහූමාන්)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතා විමුක්ති පෙරමුණේ 71 කැරැල්ල, 89 කැරැල්ල ආදී ඒ සියලු දේවල් මේ හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ අපි ඇතුළත් කරලා තිබෙනවා. ඒක හින්දා සියලුදෙනාටම වුණු අසාධාරණකම් වෙනුවෙන්; ඒ පවුල්වලට සාධාරණත්වය ඉෂ්ට කිරීම වෙනුවෙන් අපි පෙනී සිටිනවා. උතුර වෙනුවෙන් එක නීතියකුත්, දකුණ වෙනුවෙන් තව නීතියකුත් වෙනුවෙන් අපි පෙනී සිටින්නේ නැහැ. ශ්‍රී ලාංකිකයින් සියලුදෙනාටම එක නීතියක් කරන්න ඕනෑය කියන එක වෙනුවෙන් තමයි අපි පෙනී සිටින්නේ. නමුත්, මෙතුමන්ලා එහෙම නොවෙයි. මෙතුමන්ලාට කන්න ඕනෑ වුණාම කබරගොයාත් තලගොයා කර ගන්නවා. මෙතුමන්ලා වැඩ කරන්නේ එහෙමයි. ඒකයි ඉතිහාසය. විමල් වීරවංශ මන්ත්‍රීතුමා කථා කළා, නුවර දළදා මාළිගාවට ප්‍රහාර එල්ල කරපු එක ගැන. එතුමා කිව්වා, නුවරට ප්‍රහාර එල්ල කළා; කාත්තන්කුඩිය මුස්ලිම් පල්ලියට ප්‍රහාර එල්ල කළා; අරන්තලාවේ භික්ෂු ඝාතන කළා, අපි ඒ ගොල්ලන්ටත් වන්දි ගෙවනවා කියලා. මෙතුමාට මතක නැහැ, ඒවාට වග කියන්න ඕනෑ කරුණා අම්මාන් මෙතුමන්ලාත් එක්ක එකට ඒ ආණ්ඩුවේ සිටි බව. අරන්තලාවේ භික්ෂු ඝාතන කළේ කවුද? දළදා මාළිගාවට පහර දුන්නේ කවුද? කාත්තන්කුඩි මුස්ලිම් පල්ලියේදී මුස්ලිම් ජාතිකයින් මැරුවේ කවුද? ඒ, කරුණා අම්මාන්. ඒ කරුණා අම්මාන් එක්ක මෙතුමන්ලා එකට සිටියා. මෙතුමන්ලා කරුණා අම්මාන් එක්ක එකට සිටි ඡායාරූප තිබෙනවා. මෙතුමන්ලා අද ඇවිල්ලා කියනවා, අපි කොටින්ට වන්දි ගෙවනවා කියලා. මේ හතර බිහිරි කතාව මොකක්ද? ඔබතුමන්ලා එහෙම කථා කරන්න එපා.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවස්ථා දෙකක් ලබා දුන්නා. ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(මාණ්පුමිකු මුජිපුර් රහූමාන්)
(The Hon. Mujibur Rahuman)

ගරු මන්ත්‍රීතුමනි, එක ප්‍රතිපත්තියක ඉන්න. තමුන්නාන්සේලාට හොඳ වනකොට කරුණා අම්මාන් හොඳයි; පිල්ලෙයාන් හොඳයි; කේපී හොඳයි. ඒ ඔක්කොමලා හොඳයි. පිල්ලෙයාන්ව මහ ඇමති කරවන්න තමුන්නාන්සේලාට පුළුවන්. කරුණා අම්මාන්ව ගෙනැල්ලා අන්තිමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපති කළා. ඒ කවුද? ඒ, අරන්තලාවේ භික්ෂු ඝාතනයට වග කියන්න ඕනෑ කෙනා; දළදා මාළිගාවට ප්‍රහාර එල්ල කරපු කෙනා; කාත්තන්කුඩි මුස්ලිම් පල්ලියට ප්‍රහාර එල්ල කළ නායකයා. ඔහුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උපසභාපති කරන්න හොඳයි; ඔහු එක්ක එකට කැබිනට් එකේ වාඩි වෙන්න හොඳයි; ඔහුත් එක්ක රැස්වීම්වල කථා කරන්න හොඳයි. නමුත්, කරුණා අම්මාන්ලාගේ පිටුපසින් වැරදි මාවතේ ගිය දහස් ගණුන් තරුණයන්ට අපි සාධාරණය ඉෂ්ට කරන එක ගැන තමයි මේ ගොල්ලන්ට අමාරුව තිබෙන්නේ. කරුණා අම්මාන්ට දෙනකොට හොඳයි; පිල්ලෙයාන්ට දෙනකොට හොඳයි; කේපීට දෙනකොට හොඳයි. ඒවායේ කිසි ගැටලුවක් නැහැ.

මට හරියට නම මතක නැහැ, මහින්ද රාජපක්ෂ මහත්තයා උතුරු නැගෙනහිර මැතිවරණය දිනන්න මඩකලපුවේ සිටි suicide squad එකේ නායකයා නිදහස් කළා, තවත් 12,000ක් එක්ක. එතකොට හොඳයි. එතකොට එල්ටීටීඊ එකේ කොටි නොවෙයිද එහෙම එළියට දැම්මේ? එහෙම එළියට දැම්මේ කවුද? 12,000ක්! නඩුත් නැහැ, මොකුත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි අලුත් ගමනක් ආරම්භ කරලා තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා.

**ගරු චන්දිම ගමගේ මහතා**
(මාණ්පුමිකු සන්දිම කමකේ)
(The Hon. Chandima Gamage)
Point of Order නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

ඔබතුමාගෙන් නොවෙයි, මම point of Order ඉල්ලුවේ මූලාසනයෙනුයි.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(මාණ්පුමිකු අසෝක්ක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
මෙතුමා සභාව නොමඟ යවනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(මාණ්පුමිකු උදය පිරපාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)
I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(මාණ්පුමිකු උදය පිරපාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා දිගින් දිගටම ප්‍රශ්න කළා, කරුණා අම්මාන්ට නියෝජ්‍ය අමාත්‍ය ධුරයක් ලබා දීම පිළිබඳව. මම එතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. ලෝකයේ සෑම රටක්ම වාගේ ත්‍රස්තවාදීන්ව පුනරුත්ථාපනය කරන්න කටයුතු කර තිබෙනවා. ඒක ලංකාවේ විතරක් නොවෙයි, ලෝකයේත් කළා. දකුණේ ත්‍රස්තවාදීන්ටත්,

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

උතුරේ ත්‍රස්තවාදීන්ටත් එක ලෙස කටයුතු කළා. හැබැයි, ත්‍රස්තවාදීන්ට සහ ඔවුන්ගේ පවුල්වලට වන්දි ගෙවන ලද එක රටක් පිළිබඳව මට කියන්න, ලංකාව හැර.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

අපි මේ හානිපූරණය සඳහා වන කාර්යාලය පනත ගෙනාවේ ත්‍රස්තවාදීන්ට වන්දි ගෙවන්න නොවෙයි. මේ යුද්ධය හරහා හානියට පත් වූ පවුල් ඉන්නවා. මේ යුද්ධය නිසා අවතැන් වූ අය ඉන්නවා. දකුණේ වෙන්න පුළුවන්, උතුරේ වෙන්න පුළුවන්, නැහෙනහිර වෙන්න පුළුවන්, මේ යුද්ධය හරහා හානි වූ පවුල් ගණනාවක් සිටිනවා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

Madam Chairperson, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක කාරණයයි මට කියන්න තිබෙන්නේ. දැන් මෙතැනදී කියැවුණා, එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධ වී සිටි 12,000ක් දෙනා පුනරුත්ථාපනය කරලා එළියට දැම්මේ, ඡන්දය දිනන්නයි කියා. ඡන්දය දිනන්න නොවෙයි ඒ අය එළියට දැම්මේ. එදා ඒ පුනරුත්ථාපන වගකීම භාර ඇමතිවරයා හැටියට සිටි මම කියනවා, අවි අතට ගන්නා දේශපාලනයකට අද ඔවුන් ප්‍රවේශ නොවුණේ ඒ පුනරුත්ථාපන ක්‍රියාවලියේ සාර්ථකභාවය නිසාය කියා. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා, ඔබතුමා කිව්වේ සම්පූර්ණ වැරැදි අදහසක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා, කතා කරන්න.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නිටපු ඇමතිතුමනි, ඔබතුමා කියපු ඒ 12,000ක් දෙනා එළියට දැමූ එකට මා විරුද්ධ නැහැ. මා කියන්නේ, එය හොඳ වැඩක් බවයි. එදා එය කරන කොට ඔබතුමන්ලාගේ පැත්තේ ඉන්න ඔය කට්ටිය නිශ්ශබ්දව සිටියා. දැන් අප එය කරන්න ගියාම තමයි කියන්නේ, කොටියාට කරනවා කියා.

**ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
තමුන්නාන්සේලා කොටි හදනවා.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

අප කරන්න ගියාම තමයි, "කොටියාට කරනවා" කියන්නේ. ඔබතුමන්ලා කරන කොට හොඳයි. කරුණා අම්මාන්ට සමාව දෙන්න ඔබතුමන්ලාට පුළුවන්, පිල්ලෙයාන්ට සමාව දෙන්න ඔබතුමන්ලාට පුළුවන්, කේපීට සමාව දෙන්න ඔබතුමන්ලාට පුළුවන්, 12,000ක් දෙනා එළියට දමන්න ඔබතුමන්ලාට පුළුවන්. ඔබතුමන්ලා එහෙම කරන්නේ රට වෙනුවෙන්; දේශ ප්‍රේමය වෙනුවෙන්. එතකොට හොඳයි. [බාධා කිරීමක්] දැන් අප කරන්න හැදුවාම තමයි, කොටියාට දෙනවා කියන්නේ. අප කරන්න හැදුවාම තමයි, රට බෙදන්න හදනවා කියන්නේ. [බාධා කිරීමක්] මෙතුමන්ලා ෂංග්‍රි-ලා එක විකුණන කොට, ඒක දේශ ප්‍රේම් ක්‍රියාවක්. Galle Face එකේ තිබුණු හමුදා කඳවුර විකුණන කොට, ඒක දේශ ප්‍රේමියි. එය මහින් මේ රට පාවා දෙන්නේ නැහැ; විකුණන්නේත් නැහැ. අප මොකක් හෝ කරන කොට රට බෙදනවා ලු, රට විකුණනවා ලු, ඉන්දියාවට දෙනවා ලු, සිංගප්පූරුවට දෙනවා ලු, චීනයට දෙනවා ලු. නමුත් මෙතුමන්ලා දීපු ප්‍රමාණය කොච්චරද? මෙතුමන්ලා කොච්චර ඉඩ කඩම් දුන්නාද? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ බහු ජාතික සමාගම්වලට කොච්චර ඉඩ කඩම් දී තිබෙනවාද? එතකොට ඒවා ගැන කතා කළේ නැහැ. එතකොට පූස් පැටවු වාගෙයි සිටියේ. එතකොට මෙතුමන්ලාගේ ටිකරි මොළවලට ඒවා තේරුණේත් නැහැ. එතකොට නිශ්ශබ්දවයි සිටියේ. දැන් තමයි ඔක්කෝම දේවල් තේරෙන්නේ. ඇයි ඒ? දැන් බලය නැහැ. බලය නැති වුණාම ජාතිවාදය අවුස්සන්න ඕනෑ; දකුණේ සිංහල ජනතාව බය කරන්න ඕනෑ. "අන්න දැන් කොටියා එනවා. අපි දැන් නැතිවින්න ඕනෑ. දැන් දුටුගැමුණුලා වෙන්න ඕනෑ." කියනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා එදා ඉඩම් විකුණන කොට මේ දුටුගැමුණුලා සිටියේ කොහේද දන්නේ නැහැ. චීනයට හමුදා කඳවුර විකුණන කොට දුටුගැමුණුලා කොහේද සිටියේ? එතකොට එළියට යන්න තිබුණා. නමුත් ගියේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතිවාදය අවුස්සාගෙන මේ රටට ඉස්සරහට යන්න බැහැ. මේ රට නැවත මිලේච්ඡත්වය කරා ගෙන යන්නයි මේ අඩ ගහන්නේ. නැවත ජාතිවාදය, ආගම්වාදය අවුස්සා අප ආපස්සට ගෙන යන්නයි මේ කතා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප ඉන්නේ ඉතාම තීරණාත්මක මොහොතකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

අප නැවත මිලේච්ඡත්වයට ඉඩ දෙනවාද; ආගම්වාදයට, ජාතිවාදයට යට වෙනවාද, ඒකට විරුද්ධව නැඟී සිටිනවාද කියන එක තමයි අද අප තීන්දු කරන්න ඕනෑ. මොකද, 2015 වසරේ අපි ඒවාට විරුද්ධව නැඟී සිටියා. ශ්‍රී ලාංකික අනන්‍යතාවකින් යුක්ත රටක් හදන්න ඕනෑ කියන කාරණය අද අප ඉස්සරහට ඇවිත් තිබෙනවා. ඒ ගමන යන්න අමාරුයි. ඒක එසේ මෙසේ ගමනක් නොවෙයි. ඒ ගමන යද්දී අපට නොයෙක් බාධක එනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ඒ බාධක උතුරේත් තිබෙනවා; දකුණේත් තිබෙනවා. අපි දන්නවා විග්නේෂ්වරන් කියන කතා ගැන. විග්නේෂ්වරන්ගේ මල්ලිලා මේ පැත්තේත් ඉන්නවා; ඔහුගේ බාප්පලා මේ පැත්තේත් ඉන්නවා. ඒ නිසා මෙය අලුත් ගමනක් නොවෙයි. ඉතිහාසය පුරා

හැම දාම අපි මෙයට මුහුණ දී තිබෙනවා. මේ කතා කරන උදවිය තමයි එදා බණ්ඩාරනායක මැතිතුමා ඝාතනය කළේත්. ඒවායේ බලවේගයි මේ. ඒ අයගේ බාප්පලායි මේ. බණ්ඩාරනායක මැතිතුමාව ඝාතනය කරපු අයගේ බාප්පලායි මේ. එදා බණ්ඩාරනායක මැතිතුමාත් මේ ගමන යන්න හැදුවා. ඒ ගමන යන්න හදනකොට එතුමාට වෙඩි තියලා දැම්මා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා සංඥා කරනවා, එතුමාගේ කාලයත් ඔබතුමාට ලබා දෙන්න කියා. එතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

එතුමාගේ කාලයත් මට ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අප තීරණාත්මක මොහොතකට ඇවිත් ඉන්නවා. ඒ තීරණාත්මක මොහොත මොකක්ද? අප මේ රටේ ආර්ථික සංවර්ධනය මොන ආකාරයට කරන්න හැදුවත්, මොන දේ කරන්න හැදුවත් මේ රටේ ජාතික සමඟිය හදන්න අපට බැරි නම්, ජාතීන්ගේ එකමුතුව හදන්න අපට බැරි නම් අපට අඩියක්වත් ඉස්සරයට යන්න බැහැ. ඒක තමයි ලෝකය අපට උගන්වා දීපු පාඩම. අපි ලෝකයේ මේ වාගේ රටවල් දැක තිබෙනවා. අපි දැක තිබෙනවා, දකුණු අප්‍රිකාව. අපි දැක තිබෙනවා සිංගප්පූරුව, මැලේසියාව, ඉන්දියාව. ලෝක ඉතිහාසයේ ඒ වාගේ රටවල් අපි දැක තිබෙනවා. අපි කතා කරනවා, චීනය ගැන. අපි කතා කරනවා, සිංගප්පූරුව ගැන. අපි කතා කරනවා, මැලේසියාව ගැන. ඒ සියලු රටවලට පුළුවන් වුණා, තමන්ගේ රටවල් තුළ ජාතික සමඟිය ගොඩ නඟාගන්න. ජාතීන්ගේ අනන්‍යතාව පිළිගන්න ඒ රටවලට පුළුවන් වුණා. ඒ උඩ තමයි අද ඒ රටවල් දියුණු වී තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ ජාතික සමඟිය, ජාතීන්ගේ අනන්‍යතාව, එකමුතුභාවය කියන්නේ අපට ඉතාම වැදගත් දේවල්. අපි, අවුරුදු 30ක යුද්ධයකට යට වෙලා සිටි ජාතියක්. ඒ අවුරුදු 30 යුද්ධයේ කෲරත්වයට, ඒ යුද්ධයේ තිබුණු භයානකකමට, ඒ බිහිසුණුකමට අපි සියලුදෙනා මුහුණ දී තිබෙනවා. යුද්ධය වෙනුවෙන් අපි වන්දි ගෙවා තිබෙනවා. උතුරේ වෙන්න පුළුවන්, දකුණේ වෙන්න පුළුවන්, නැහෙනහිර වෙන්න පුළුවන්, 'මැරුණු ඒ හැම කෙනෙක්ම මේ රටේ ශ්‍රී ලාංකිකයෙක්' කියන එක මතක තියාගන්න ඕනෑ. එය, අපේ රටේ ඇති වූ ප්‍රශ්නයක්. එය විසඳාගන්න අපට බැරි වුණා. අපට එයට උත්තර දී ගන්න බැරි වුණා. ඒ නිසා තමයි යුද්ධයකට ගිහින් ඒ යුද්ධයෙන් දහස් ගණනක් ජීවිත අපට අහිමි වුණේ. දකුණේ සිටි හමුදා සොල්දාදුවන්, උතුර නැහෙනහිර සාමාන්‍ය පුරවැසියන්, වැරදි මාවතක ගිහින් එල්ටීටීඊ එකට බැඳුණු තරුණයන් කියන ඔක්කෝම අපේ රටේ ළමයි. ඒ ඔක්කෝම අපේ රටේ දරුවන්. අපි ජාතික ගීය ගායනා කරනවා, "එක මවකගේ දරු කැළ" කියලා. ඒක ජාතික ගීයට පමණක් සීමා කරලා වැඩක් නැහැ. එක මවකගේ දරුවෝ කියන එක මේ මහ පොළොවේ යථාර්ථයක් කරන්න ඕනෑ. නමුත් අපි දන්නවා, මේ ගොල්ලන් එක්ක ගිහිල්ලා නම්, අපට එක මවකගේ දරුවෝ හදන්න බැහැ කියලා. එහෙම හදන්න බැහැ. ඒ අදහස අපට පෙනෙනවා. ඒ ගොල්ලන් හිතන්නේ ඒ ගොල්ලන් විතරයි ජීවත් වෙන්න ඕනෑ කියලායි. මේ රටේ ඉන්නා අනික් අය ඒ ගොල්ලන්ට වැඩක් නැහැ; අනික් ජන කොටස් ඒ ගොල්ලන්ට අදාළ නැහැ. ඒ ගොල්ලන් මොකක්ද කියන්නේ? ඒ ගොල්ලන් කියන දේ අපට තේරෙනවා. අපි ඔය ගැන අවුරුදු ගණනාවක් වාද කරලා තිබෙනවා. අපි විශ්වවිද්‍යාලයේ ඉන්න කාලයේ ඉඳලාම ඔය කාරණය ගැන වාද කරලා තිබෙනවා. නමුත් ඔය ප්‍රශ්නයට පිළිතුරු නැහැ. ඔය ප්‍රශ්නය අද ඊයේ ආපු ප්‍රශ්නයක් නොවෙයි. නමුත් ඔය කාරණය තුළ ගමනක් නැහැ. ඔය කාරණයේ අදහස තුළ තිබෙන ගමනට යන්න පුළුවන් විනාශය කරා පමණයි. ඒ අදහස තිබෙන ගමන තුළින් නැවත ම්ලේච්ඡත්වය කරා යන්න පුළුවන්; නැවත වර්ගවාදයකට යන්න පුළුවන්. ඒ අදහස තමයි එහි ගැබ්වෙලා තිබෙන්නේ. ඊට එහා අදහසක් නැහැ. අලුත් අදහස් එන්නේ නැහැ. අලුතෙන් හිතන්නේ නැහැ. ලෝකය අලුතෙන් දකින්නේ නැහැ. එහෙම මිනිසුන් එක්ක රටක් ඉස්සරහට ගෙනියන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එහෙම යන්න පුළුවන් විනාශය කරා පමණයි. අපේ අඩුපාඩු තිබෙනවා. මේ ආණ්ඩුව තුළ අඩුපාඩු තිබෙනවා; ප්‍රශ්න තිබෙනවා. නමුත් දැන් අපි ගමනක් ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. අපි උතුරේ සිටින ජනතාවට දැන් දිගු කරලා තිබෙනවා. අපි නැහෙනහිර සිටින ජනතාවට දැන් දිගු කරලා තිබෙනවා. අපි එක රටකට යමු. නමුත් අපි මේ කියන දේට විරුද්ධ අය උතුරෙත් ඉන්නවා. විග්නේස්වරන් මහත්තයා වෙනම ගමනක් යන්න ලැහැස්ති වෙනවා. ඒක අපට පෙනෙනවා. එයා වෙනම ගමනක ඉන්නවා. නමුත් උතුරේ බහුතර දෙමළ ජනතාව ඒ ගමනත් එක්ක නැහැ. අපි ඒක දැක්කා. අපි ඒක 2015 ජනවාරි 08වෙනි දා ඡන්දය ඉල්ලනකොට දැක්කා. එදා සිවාජිලිංගම් මහත්තයා ඡන්දය ඉල්ලුවා. නමුත් උතුරේ ජනතාව සිවාජිලිංගම් මහත්තයාට නොවෙයි ඡන්දය දැම්මේ; පොළොන්නරුවේ ඉපදුණු මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට තමයි ඡන්දය දැම්මේ. ඊට කලින්, උතුරේ වැඩිම ඡන්ද ගත්තේ මහින්ද රාජපක්ෂ මහත්තයා. ඒකෙන් අපට පෙනෙනවා, උතුරේ ඉන්න බහුතරය ඒ අන්තවාදී අදහස්වල එල්ලිලා නැහැ කියා. නමුත් ඒ ජනතාව නැවත අන්තවාදී තුරුළට තල්ලු නොකිරීමේ වගකීම අපි අතර තිබෙනවා. ඒ නිසා තමයි අපි උතුර වෙනුවෙන් හැම තිස්සේම කථා කරන්නේ. ඒ මිනිසුන්ට දෙන පණිවිඩය තමයි "අපි එකතු වෙලා යමු. අපි එකට යමු. අපි අවුරුදු දහස් ගණනක් එකට ජීවත් වුණා." කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දකුණු අප්‍රිකාවේ කල්ලන් සහ සුද්දන් මරා ගත්තා. මේ විධියට නොවෙයි, ඒ යුද්ධය ගියේ. ඉතාම දරුණු විධියට ම්ලේච්ඡ විධියට දකුණු අප්‍රිකාවේ යුද්ධය තිබුණා. සුද්දන් සහ කල්ලන් මරා ගත්තා. ඒ විධියට මරා ගත් සුද්දා සහ කල්ලා අද එකට ජීවත් වෙනවා. සුද්දන්ට සහ කල්ලන්ට එකට ඉන්න පුළුවන් නම් ඇයි, අපට එකට ඉන්න බැරි? ඊට වඩා අවුරුදු දහස් ගණනක ඉතිහාසයක් අපට තිබෙනවා. අපට එකට ඉන්න පුළුවන්. [බාධා කිරීම්] අපට ඉන්න බැරි, මෙන්න මේ වාගේ මොලේ අමාරු තිබෙන කට්ටියක් ඉන්න නිසායි. මෙන්න මේ වාගේ විෂබීජ තිබෙන කට්ටියක් ඉන්නවා. හැමදාම බලය වෙනුවෙන්, හැමදාම මේ රටේ බලය ගන්න එක වෙනුවෙන් සිංහල ජනතාව අතරට ගිහිල්ලා මේ රටේ සුළු ජාතීන් කෙරෙහි වෛරය ඇති කරන මෙන්න මේ බලවේග නිසා තමයි අපට එකට ඉන්න බැරි. එකට ඉන්න බැරි මෙන්න මේ බලවේගය නිසා තමයි. අද මේ බලවේගයත් එක්ක කවුද, එකතුවෙලා ඉන්නේ? ඒ එකතුවෙලා ඉන්නේත් ඒ අදහස් තිබෙන පිරිස්. අද එක එක නම්වලින්, එක එක සංවිධාන වලින් ඒ අය පෙනී සිටිනවා. ඒ අය රාවණා බලය වෙන්න පුළුවන්; අර බලය වෙන්න පුළුවන්; මේ බලය වෙන්න පුළුවන්. ඒ ඔක්කෝම ඉන්නේ එක කණ්ඩායමක් ඇතුළේ. ඒ ගොල්ලන් මොකක්ද, කියන්නේ? රෝ ප්‍රවෘත්ති සාකච්ඡා බලනකොට අපට තේරෙනවා, ඒ කියන පණිවිඩය; ඒ යන ගමන. මොකක්ද, මේ කියන්නේ? මොකක්ද, මේ හදන්න යන්නේ කියන එක අපි ඔක්කෝටම තේරෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ඉතාම තීරණාත්මක කාලපරිච්ඡේදයකට දැන් ඇවිල්ලා ඉන්නවා. ඒ කාලපරිච්ඡේදයේදීවත් අපට හරියට මේ ගමන යන්න බැරි නම්, මේ ගමන යන්න අවශ්‍ය කරන තීන්දු අපට ගන්න බැරි නම්, නැවත අපි දේශපාලන ඉතිහාසයේ වළපල්ලට යනවා. ඒ දේශපාලන ඉතිහාසයේ වළපල්ලට යනවාද, අපේ දේශපාලනයේ කුණු බක්කියට යනවාද, එහෙම නැත්නම් මේ රටේ ජනතාවගේ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

නිදහසත් එක්ක ජාතික සමගිය වෙනුවෙන්, ජාතික අනන්‍යතාවය වෙනුවෙන්, ශ්‍රී ලාංකික අනන්‍යතාවය ඇති ජාතියක් ගොඩනගනවාද කියන එක අපි තීන්දු කළ යුතුයි. 2015න් පස්සේ අපි ඒ වෙනස ඇති කරගෙන යනවා. එසේ ඇති කරන වෙනස ඉතා ලෙහෙසි පහසු කටයුත්තක් නොවෙයි. අවුරුදු තිහක් තිස්සේ පැවැති යුද්ධයක් අවසන් වෙලා ඒ අලුත් ගමන යන්න මුල පුරන්න, අලුත් ගමනක් යන්න ඕනෑ කියන ඒ තීන්දුව ගන්න එක එහෙම ලෙහෙසි නැහැ. එහෙම ගමනක් එකපාරටම යන්න බැහැ. නමුත් රජයක් හැටියට මේ රටේ ජාතික සමගිය ඇති කිරීම වෙනුවෙන් අපි පටන් අරගෙන තිබෙන ගමන මොන අභියෝග ආවත්, මොන බාධක ආවත් නවත්වන්නේ නැහැ කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.54]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ජාතික සමගිය ගැන කථා කළා. අපි ජාතික සමගියට විරුද්ධ අය නොවෙයි. මේ රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී ජාතීන් අතර බැඳීම, මිත්‍රත්වය සහජීවනය ඕනෑ. අපි ඒක පිළිගන්නවා. නමුත් මම කියන්න කැමතියි, මේ සහජීවනය නැති වුණෙත් එක්සත් ජාතික පක්ෂය ගෙන ගිය දේශපාලන ප්‍රතිපත්තිත් එක්කයි කියලා. එදා මේ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය ඉස්සරහට ගෙන ගිය ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා මේ රටේ ජනතාව මත අසීමිත පීඩනයක් පැටෙව්වා. සිංහල -බෞද්ධ, මුස්ලිම්, දෙමළ කියන මේ රටේ සියලු ජන කොටස්වලට ඒ පීඩනය ගලා ගියා. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි, ඒ පැවතුණු ආර්ථික ක්‍රමවේදයට විරුද්ධව, ඒ ධනේෂ්වර පීඩනයට විරුද්ධව මේ රටේ තරුණයෝ නැඟිටින්නට පටන් ගත්තේ. ඒක උතුරේත් වුණා; දකුණේත් වුණා. එම නිසා දිළිඳුකම ගමට ගලා ගෙන ගියා. ඊට එරෙහිව උතුරේ තරුණයෝ ආයුධ අරගෙන නැඟිටිටා. ආයුධ අරගෙන ඒ නැඟිටිට එක හරි කියලා නොවෙයි මම කියන්නේ. ස්වාභාවිකවම ඒ ජන කොටියාස ඒ තත්ත්වයට පත් වුණා. උතුරේ වාගේම දකුණේත් ඒ විධියේ කැරළි ආවා. එම නිසා අපි ජාතික සමගිය කථා කරනවා විතරක් නොවෙයි, ඒ සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසි හදන්න ඕනෑ. මේ ආණ්ඩුව ගෙන යන ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය අද මුළුමනින්ම අසාර්ථකවෙලා තිබෙනවා; තදබල විධියට අසාර්ථක වෙලා තිබෙනවා. අපේ ජාතික ආදායම වර්ධනය වෙන්නේ නැහැ. අපි ආනයනය කරන භාණ්ඩවලින් යැපෙන රටක් බවට පත් වෙලා තිබෙනවා. අපේ රටේ නිර්යාතවල වර්ධනය වීමක් ඇත්තේ නැහැ. අපේ රටේ ගොවීන් ශක්තිමක් වුණු යුගයක් තිබුණා. අපේ රටේ දේශීය කර්මාන්ත ශක්තිමත් වුණු අවධියක් තිබුණා. අපේ රටේ ජනතාවට ස්වශක්තියෙන් පෝෂණය ලබා ගන්න පුළුවන් අවධියක් තිබුණා. ඒ සියල්ල නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය විසින් යටපත් කළා. එම නිසා තමයි අද රට පුරා මෙවැනි අරාජික තත්ත්වයක් මතු වෙලා තිබෙන්නේ. එම නිසා අදටත් අපේ රට බරපතළ ආර්ථික අමාරුකමකට මුහුණ දෙනවා. ඒක නැහැයි කියන්න අපි කාටවත් බැහැ. අද ඇති නැති පරතරය වැඩි වෙලා තිබෙනවා. සීමිත ධනපති පන්තියක් අතර මුදල් ඒකරාශි වෙනවා. කවර විධියේ ණය ලබා ගැනීමකින් වුවත්, බදු ප්‍රතිපත්තියකින් වුවත් පහළ ජන කොටියාසවලට ප්‍රතිලාභ ගලා යන ක්‍රමවේදයක් මේ රට තුළ නැහැ. දිළිඳු බවයි, ඇති නැති පරතරය වර්ධන වන වේගයයි -මේ ආර්ථික ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළ- තමයි අප රට තුළ අසහන ඇති කරන, ජනතාව තුළ ආණ්ඩු විරෝධී හැඟීම් මතු කරන, ජනතාව අරගලවලට පොළඹවන ප්‍රධාන සාධක වෙලා තිබෙන්නේ. පසුගිය කාලයේ මේ ආණ්ඩුව කවර ප්‍රතිඥා දුන්නත් ඒවා ඉදිරියට ගෙන යන බවක් අපට පෙනෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දෙවැනි වර කියවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මුදල් පනත් කෙටුම්පනත තුළින්වත් ඒ සඳහා වැඩ පිළිවෙළක් අපිට පෙනෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1995, 2003, 2005, 2012, 2015 මුදල් පනත්වලට අද සංශෝධන ඉදිරිපත් කරනු ලබනවා. සංශෝධන වැලක්, බදු වැලක් අද ඉදිරිපත් කරනවා. මේ ඉදිරිපත් කරන හැම බද්දක්ම ඍජු බදු නෙවෙයි, වක්‍ර බදු. අවසාන වශයෙන් මේවායේ ප්‍රතිඵලයට මුහුණ දෙන්නේ මේ රටේ පාරිභෝගිකයන්. මේ බදුවල විග්‍රහයේදී භාණ්ඩ හා සේවා ගාස්තු වැඩිවීමෙන් අවසාන ප්‍රතිඵලය වන්නේ සාමාන්‍ය ජනතාවට බර පැටවීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටක ආර්ථික ක්‍රියාවලියේදී බදු ආදායම අවශ්‍යයි. ඒක නැතැයි කියා අපි කියන්නේ නැහැ. ජනතාව මත බදු බර පැටවීමෙන් හා දේශීය හා විදේශීය ණය වලින් මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්නට කල්පනා කරනවා නම් එය වැරදි ආර්ථික ප්‍රතිපත්තියක්. එම නිසා මේ රටට අවශ්‍ය නිවැරදි ආර්ථික ප්‍රතිපත්තියක්, නිවැරදි ආර්ථික දැක්මක්, නිවැරදි ආර්ථික කළමනාකරණයක්, නිවැරදි ඉතිරිකිරීම් ක්‍රමවේදයක් හඳුන්වාදීම අද යුගයේ වගකීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සියල්ලටම වග කියන්න ඕනෑ මේ ආණ්ඩුවේ අගමැතිවරයා බව මම කියන්න ඕනෑ. අගමැතිතුමා පළමුවැනි ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් කිව්වා, "අපේ රටේ බදු ආදායමේ වෙනසක් කරනවා" කියලා. මේ රජයේ පළමුවැනි අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට එදා හිටපු මුදල් ඇමතිවරයා කිව්වා, "ඍජු බදු 40ත්, වක්‍ර බදු 60ත් වන අනුපාතයට ගෙනෙනවා" කියලා. නමුත්, ඒක එහෙම වුණේ නැහැ. ඒ වාගේම, අගමැතිතුමාගේ ප්‍රකාශයේදී අගමැතිතුමා කිව්වේ මොකක්ද? අගමැතිතුමාත් කිව්වා, "ඍජු බදු සහ වක්‍ර බදු අතර අනුපාතය 40ත්, සියයට 60ත් දක්වා ගෙනෙන්න අපි බලාපොරොත්තු වෙනවා" කියලා. දැන් වසර තුනහමාරක් ගත වෙලා තිබෙනවා, ඒ වෙනස සිද්ධ වෙලා නැහැ. ඇත්ත වශයෙන්ම නවමත් සාමාන්‍ය ජනතාව මත වැඩි බදු බරක් පටවලා, මේ රටේ ප්‍රධාන ධනපති ප්‍රභූවරු මත අඩු බදු ප්‍රතිශතයක් පනවලා තමයි මේ රටේ ආර්ථිකය යන්නේ. ඒ නිසා මම කියන්න කැමැතියි, මේ බදු බර අද සාමාන්‍ය ජනතාව මත පැටවී තිබෙන බව. ඒ නිසා දිළිඳුබව, මන්දපෝෂණය, අසහනය ආදී මේ සියල්ල වෙලාගත්ත සමාජ ක්‍රමයක කොටස්කරුවන් හැටියට අද මේ රටේ ජනතාවට ජීවත් වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. බදු මුදල් හරහා රටට අවශ්‍ය අරමුදල් ලබා ගැනීමේ අරමුණ පිළිබඳව අපේ ප්‍රශ්නයක් නැහැ. නමුත්, අපි බැලිය යුත්තේ එහි එල විපාකය විඳින්න වන්නේ, එහි බර පැටවෙන්නේ කාට ද කියන එකයි. සාමාන්‍ය ප්‍රජාවට, දිළිඳු ජනතාවට, මේ රටේ වැඩ කරන පන්තියට මේ බදු බර පැටවෙනවා නම්, ඇත්ත වශයෙන්ම ඒක අපට පිළිගත හැකි දෙයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලයේ ඉඳලා මේ රටේ ගෙන ගිය නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියට විරුද්ධව වමේ පක්ෂ,

විශේෂයෙන්ම අපේ පක්ෂය සටන් කළා. අපි දැක්කා, ඒ පළමුවැනි අය වැයෙන් මිනිසුන්ගේ බඩට ගහපු හැටි. එදා මිනිසුන්ගේ හාල් සලාකය උදුරා ගත්තා. හාල් මිල ඉහළ දැම්මා. හාණ්ඩ මිල ඉහළ දැම්මා. ජනතාව මත බදු බර පටවලා සීමිත ධනපති පන්තියක් අතට මේ රටේ සම්පත් ගලා එන, ධනය ගලා එන ක්‍රමවේදය සකස් කළා. ඒ ගමන තමයි තවම යන්නේ. ඒකෙන් වෙනස් වෙන්න අපට පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ නිසා අද මේ රටේ ආදායම් ලබා ගැනීමේ ක්‍රමවේදය අඩු වෙලා තිබෙනවා. මේ ගෙන යන ආර්ථික ප්‍රතිපත්තිය නිසා අද ජාතික ආදායම, රාජ්‍ය ආදායම අඩු වෙලා තිබෙනවා. රාජ්‍ය ආදායම අඩු වෙනකොට අපි අනෙක් පැත්තෙන් යොමු වෙලා තිබෙනවා, විදේශ රටවල්වලින් සහ දේශීය ව්‍යාපාරිකයන්ගෙන් ණය ලබා ගන්න. ඒ විධියට ලබා ගන්නා දේශීය හා විදේශීය ණය ගෙවන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ විදේශීය ණය බර වැඩිවීම නිසා ඒවා ගෙවන්න නැවත නැවත ණය ගන්න තත්ත්වයකට අපේ රට පත් වුණා. ඒ නිසා තමයි අපි ණය උගුලක හිර වෙලා තිබෙන්නේ. මේ ණය උගුලෙන් මිදෙන්න නම්, අපි මේ රටේ ජාතික ආර්ථික සම්පත් සංවර්ධනය කරන ආර්ථික වැඩ පිළිවෙළක් ඉස්සරහට ගෙනයන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(මාණ්පුමිකු சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අපි බලාගෙන ඉන්නවා, ඊළඟ අය වැයේදීවත් එක්සත් ජාතික පක්ෂය -මේ හවුල් ආණ්ඩුව- එහෙම වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරයි කියලා. නමුත් අපට එහෙම විශ්වාසයක් නැහැ. අපට මේ ගොල්ලන්ගේ ආර්ථික ක්‍රමවේදය තේරෙනවා. අද බණ කථා කළත්, ඇත්ත වශයෙන්ම මේ රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් නොකර, විදේශ ප්‍රාග්ධනයට අසීමාන්තිකව දොරගුළු විවෘත කරලා රට ගෙනියන්න හදන ක්‍රමවේදය අසාර්ථකයි කියන එක ලෝකය පුරා නිදසුන්වලින් පැහැදිලි වෙලා තිබෙනවා. මේ සමාජ ව්‍යසනයට, අද අපි මුහුණ දෙන ආර්ථික ව්‍යසනයට ලෝකයේ රටවල්වලට ඇහිල්ල දික් කරන්නේ නැතිව සැලසුම් හදාගන්න ඕනෑ. මට මතකයි, ජාත්‍යන්තර මුල්‍ය අරමුදල මීට වසර ගණනාවකට උඩදී කිව්වා, 2017 - 2018 වන විට ලෝකය පුරා ආර්ථික අර්බුදයක සලකුණු පහළ වෙනවා කියලා.

එහෙම දැක්මක් ඇතිව වැඩ කළා නම්, අපේ ජාතික ආර්ථිකය ශක්තිමත් කරන්නට සහ අපේ ආර්ථිකය ශක්තිමත් කරන්න අවශ්‍ය විධියට විදේශීය ප්‍රාග්ධනය ආයෝජනය කරන්නට අපට පුළුවන්කම තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න. [බාධා කිරීමක්]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(මාණ්පුමිකු சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒසේ ක්‍රියා කිරීම හැර අපට වෙනත් විකල්පයක් නැහැ. අපි මේ රටේ ජාතික සම්පත ගැන කථා කරනවා. නමුත්, අද කම්කරු සම්පතයවත් නැහැ මේ ආණ්ඩුවට. අද රට පුරාම අරගළ මතු වෙමින් තිබෙනවා. වතුකරයේ ජනතාව පාරට බැහැලා තිබෙනවා. මේ 31වෙනි දා කම්කරු පන්තිය පාරට බහිනවා. කම්කරු පන්තිය පාරට බැසීමත් සමඟ පසුගිය යුගයේ හර්තාල් සමයේ ඇති වුණු බෙදනීය තත්ත්වයන් හා සමාන තත්ත්වයක් මේ රටේ නිර්මාණය විය හැකි බව ප්‍රකාශ කරමින්, ඒවාට පිළිතුරු දිය හැකි ආර්ථික ක්‍රමවේදයක් සකස් කරන්නට ජනතාව වෙනුවෙන් කැප වෙන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

ඊට පෙර, කවුරු හෝ මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු හා වෘත්තීය සම්පති සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரவீந்திர சமரவீர - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர்)
(The Hon. Ravindra Samaraweera - Minister of Labour and Trade Union Relations)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *left the Chair, and* THE HON. HESHA WITHANAGE *took the Chair.*

[අ.භා. 3.07]

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මුදල් පනත් කෙටුම්පත දෙවෙනි වර කියවීම සහ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් තුනක් පිළිබඳවයි විවාදයට ගැනෙන්නේ. අද දින විවාදය වෙනත් මාතෘකාවලට යොමුවෙමින් තමයි මෙතෙක් දුර ආවේ. විශේෂයෙන්ම මතක් කරලා දෙන්නට ඕනෑ, මේ ආණ්ඩුව බලයට පත් වුණු දවසේ ඉඳලා උත්සාහ කළේ වක්‍ර බදු අඩු කරලා ඍජු බදු වැඩි කිරීමට බව. ඒක කොයි තරම් දුරට සාර්ථකද, අසාර්ථකද කියන එක අද අපට පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා.

මීට පෙර පැවැති රජය තම පාලන කාලය තුළ ලබා ගත් ණය ගෙවා ගන්න බැරිව, ඉදිරියේ දී ඇති වෙන දේශපාලන බිඳ වැටීමට බියෙන්, එම ආණ්ඩුවට තව අවුරුදු දෙකක පාලන කාලයක් ඉතිරිව තිබියදීත් ඡන්දයකට ගිහින් දිනන්නට උත්සාහ කළත්, ඡන්දයෙන් පැවැති රජය පරාජයට පත් වුණා.

විශේෂයෙන්ම බදු ගැන කථා කරන මේ අවස්ථාවේ දී මේ රටේ නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍ය සේවය, රාජ්‍ය සේවය, ප්‍රවාහන සේවය, මහා මාර්ග, වැව් අමුණු වැඩි දියුණු කිරීම වාගේම අද අපි පූර්ව ගිලන් රථ සේවයක්, -1990 සුවසැරිය ව්‍යාපෘතිය- ක්‍රියාත්මක කර තිබෙන බවත් මතක් කර දෙන්නට ඕනෑ. අද වන විට මේ රටේ පළාත් දෙකක පමණයි මේ "සුවසැරිය" ව්‍යාපෘතිය

[ගරු වන්දිම ගමගේ මහතා]

ක්‍රියාත්මක නොවෙන්නේ. අනෙක් හැම තැනකම සුවසැරිය ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වාගේම මේ බදුවලින් සුරක්ෂා රක්ෂණය දෙන්නට අපට හැකියාව ලැබිලා තිබෙනවා. එවැනි විශාල කාර්ය භාරයක් මේ රජය තුළින් ක්‍රියාත්මක වෙලා තිබෙනවා වාගේම, අද සෑම කෙනාටම රජය විවේචනය කිරීමේ අයිතියත් ලබා දීලා තිබෙනවා. එම නිසා ඕනෑම කෙනෙකුට රජය විවේචනය කිරීමේ හැකියාව තිබෙනවා. නමුත්, අපි ආණ්ඩුවක් විධියට කර තිබෙන දේවල් මේ අවස්ථාවේ දී මතක් කර දෙන්නට අපට යුතුකමක් තිබෙනවා.

අද දින විවාදයට ගැනෙන මේ බදු සංශෝධන ගෙනැල්ලා තිබෙන්නේ සාමාන්‍ය ජනතාවට අසාධාරණයක් නොවන පරිදියි. විශේෂයෙන්ම සුඛෝපභෝගී වාහන බද්ද, මන්දිර බද්ද, සංචාරක ප්‍රවර්ධන බදු, කොටස් ගනුදෙනු පිළිබඳ බදු, කුලුනු බද්ද වැනි බදු ගෙනැල්ලා තිබෙන්නේ මේ රටේ ආදායම් සහ වියදම් පියවා ගැනීමටයි.

අද ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් මිල ඉහළ යාම නිසා ඉන්ධන මිල සම්බන්ධයෙනුත් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අද ඉන්ධන මිල ගැන විතරයි කථා කරන්නේ. මේ ඉන්ධන මිල නිර්මාණය වීමේදී, අවුරුදු ගණනාවක් තිස්සේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබන පාඩුව පියවා ගන්න ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරලා නැහැ. විශේෂයෙන්ම Cross Country Pipeline ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අපි මතක් කර දෙන්නට ඕනෑ. ඒ වාගේම අපේ ලිහිසි තෙල් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මතක් කරලා දෙන්නට ඕනෑ. ඒ වාගේම CEYPETCO සහ Lanka IOC භවුලේ ඉන්ධන බෙදා හැරීමේ දී අපි දෙපාර්ශ්වයෙන් අය කරන බදු සම්බන්ධයෙන් මතක් කරලා දෙන්නට ඕනෑ. මේවා නිවැරදි කිරීමේ ක්‍රමවේදයකට යොමු වෙන්නට සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම මතක් කරලා දෙන්නට ඕනෑ, ඉන්ධන පොම්ප කිරීම ප්‍රමාදවීම තුළ දින තුනකට ඇමෙරිකානු ඩොලර් හැටදහසක් නැව් ගාස්තු වශයෙන් ගෙවන්නට සිද්ධ වෙලා තිබෙන බව.

මේ වෙනකොට දුම්රිය මාර්ගයේ සිට මීටර් 140ක් තුළ පිහිටා තිබෙන නිවාස ඉවත් කිරීමේ දී එක් නිවසක් සඳහා රුපියල් ලක්ෂ 40 ගණනේ 20 දෙනෙකුට මුදල් ගෙවා එහි පදිංචි ජනතාව ඉවත් කරන්න අපි කටයුතු කර තිබෙනවා. පසුගිය කාලයේ මෙන් කොම්පඤ්ඤවීදියේ, නාරාහේන්පිට ඉඩම්වල පදිංචිව සිටි ජනතාව පන්නපු ආකාරයට මේ ජනතාව පන්නලා අපි ඉඩම් ගත්තේ නැහැ. ඒ අයට වන්දි ගෙවලා, පදිංචියට ගෙවල් දීලා තමයි ඉඩම් ටික ගත්තේ. හැබැයි, ඒ සියල්ලම දුම්රිය රක්ෂිතයේ ඉඩම් බවත් මතක් කර දෙන්නට ඕනෑ. දුම්රිය රක්ෂිතයේ සිටි ජනතාව ඉවත් කළේ, එක් අයෙකුට රුපියල් ලක්ෂ 40 ගණනේ ගෙවලා. තවත් තුන්සිය අනූගණනකට මුදල් ගෙවිය යුතුව තිබෙනවා. අපි අසාධාරණ විධියට ජනතාව ඉවත් කරලා නොවෙයි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ.

ඉන්ධන පොම්ප කිරීම සඳහා අහල් 12ක විශ්කම්භයෙන් යුතු පළමු නළ මාර්ගය යෙදුවාම, දින තුනක නැව් ගාස්තු අඩුකර ගන්න හැකියාව ලැබෙනවා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවන්න සිදු වී තිබෙන දින තුනක නැව් ගාස්තුව වන ඇමෙරිකන් ඩොලර් 60,000ක මුදල ඉතිරි කර ගන්න ලැබෙනවා. අවුරුදු ගණනක් ප්‍රමාද වී තිබුණු මෙවැනි ව්‍යාපෘති මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අද ලිහිසි තෙල් ව්‍යාපාරය සඳහා ඇමෙරිකන් ඩොලර් මිලියන 18ක වියදමෙන් ලිහිසි තෙල් නිෂ්පාදනාගාරය ඉදිකර තිබෙනවා. ඉදිරියේ දී එය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා. කවුරු මොන කතන්දර කිව්වත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වේවා, වෙනත් ආයතනයක හෝ වේවා වියදම සහ නාස්තිය අවම කරන්න අද මේ ආණ්ඩුව කටයුතු කරගෙන යනවා. "මේ සියල්ලම අපට නවත්වන්න පුළුවන්, නවත්වන්න කටයුතු කර තිබෙනවා"යි කියා මම කියන්නේ නැහැ. එවැනි ක්‍රියා සමහර තැන්වල තවම සිදු වෙනවා.

අද ඉන්ධන මිල සූත්‍රය ගැන විවේචන ඉදිරිපත් කළත්, එදා මේ රටට කෝටි 2,500කට අධික මුදලක් අහිමි කළ "හෙජින්" ගිවිසුම ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ. ඔළුව එහාට මෙහාට හරවමින්, අත පය කරකවමින් මිල සූත්‍රය ගැන හරබර විවේචන ලබා දෙන ආචාර්ය, මහාචාර්යවරු එදා "හෙජින්" ගිවිසුම ඉදිරියේ නිහඬව සිටියා. එදා ඒ ගැන කට ඇරියේ නැත්තේ, රැකගන්න ඇමතිකමක් තිබුණු නිසාද, සුදු වැන්වලට භයේද, දේශද්‍රෝහී ලේබලයට භයේද? එහෙම නැත්නම් රාජපක්ෂ මන්ත්‍රීතුමා ළඟ තිබුණු filesවලට භයේද කියලා මම අහන්න කැමැතියි.

ඇමෙරිකන් ඩොලර් 80කට බොර තෙල් බැරලය තිබුණු කාලයේ, "හෙජින්" ගිවිසුම නිසා බොර තෙල් බැරලයට ඩොලර් 110ක් ගෙවන්න සිද්ධ වුණා. එදා මේ දේශප්‍රේමී අය කොහේද හිටියේ කියන ප්‍රශ්නය තිබෙනවා. තෙල් මිල කොතෙක් ඉහළ ගියත් සාමාන්‍ය ජනතාව ගැන හිතලා, කුඩා පරිමාණයේ ධීවරයාගේ හඬට ඇහුම්කන් දීලා; වාරි කර්මාන්තකරුවන්ගේ හඬට ඇහුම්කන් දීලා නැවතත් තෙල් මිල අඩු කළා. රුපියල් 101ට තිබුණු භූමිතෙල් ලීටරය රුපියල් 45ක් දක්වා අඩු කළා. බස්වල ප්‍රශ්නය නිසා අද එය රුපියල් 70 දක්වා වැඩි කර තිබෙනවා. අද ඒකාබද්ධ විපක්ෂයේ සිටින සමහර කණිෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් අපි ප්‍රශ්න කරන්නට ඕනෑ, ඔබතුමන්ලා මේ ගැන නොදැනද කථා කරන්නේ, එහෙම නැත්නම් අහක බලාගෙනද කථා කරන්නේ කියලා. අද භූමිතෙල් - kerosene- කියලා කිව්වාම, ඇත්තම කථාව නම්, භූමිතෙල් කියලා විකුණන්නේත් එකම දේයි; jet fuel කියලා විකුණන්නේත් එකම දේයි. අපේ රටේ jet fuel සහ භූමිතෙල් කියන දෙකම එකයි. දළ වශයෙන් මෙට්‍රික් ටොන් 1,000ක නිෂ්පාදනයක් අපේ පිරිපහදුවෙන් අපට සපයන කොට දවසකට මෙට්‍රික් ටොන් 1,800ක් අවශ්‍ය වෙනවා. ඒ නිසා මෙට්‍රික් ටොන් 800ක් අද ආනයනය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ ආනයනය කිරීම තුළත් බදු ගැසීමේ ප්‍රශ්නයක් තිබෙන නිසා යම් කිසි පාඩුවක් සිදුවී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සහජීවනය ගැන විවිධ අය කථා කළා; විවිධ අය වන්දි දීමනා ගැන කථා කළා. ඒ සියලුම දේවල් අපි සමථයකට පත් කරලා තිබෙනවා. ඒ වාගේම විදුලි පුටුව සම්බන්ධ කාරණයත් සමථයකට පත් කරලා තිබෙනවා. ඒ වාගේම මේ රටට යුධ අපරාධ සම්බන්ධයෙන් තිබුණු චෝදනා ආදී සියලුම ගැටලු සමථයකට පත් කරන්න මේ ආණ්ඩුවට හැකියාව ලැබී තිබෙන බවත් මතක් කරන්නට ඕනෑ. මේ ආණ්ඩුව පිළිබඳව විවේචනය කරනවා වාගේම, එදා හම්බන්තොට වරාය ඉදි කිරීමට ලබාගත් ණය මුදල ත්‍රිකුණාමල වරාය සංවර්ධනය කිරීමට යොදා ගන්න හැකියාව තිබුණා නම් අද මේ තත්ත්වය ඇති වෙන්නේ නැහැ කියන එකත් මතක තබාගන්නට ඕනෑ.

Port City ව්‍යාපෘතිය මඟින් අපට අහිමි වෙන්න ගිය අක්කර 80ක භූමි ප්‍රමාණයක් ආණ්ඩු වෙනස් වීම තුළ රැකගන්න හැකියාව ලැබුණු බවත් මතක් කරන්න ඕනෑ. අපි දිගින් දිගටම මේ රටේ උන්නතිය වෙනුවෙන් යම් යම් දේවල් සිද්ධ කළාට, ඒ දේවල් පැසසුමට ලක් වන බවක් පෙනෙන්නේ නැහැ. එහෙම පැසසුම් නොලැබෙන්න එක හේතුවක් තමයි, දැන් තිබෙන මාධ්‍ය නිදහස. මාධ්‍ය මඟින් ඕනෑ ඕනෑ දේවල් ප්‍රචාරය කරනවා වාගේම, එසේ ප්‍රචාරය කරන මාධ්‍යවලට විරුද්ධව ක්‍රියාමාර්ග නොගැනීම තුළ අද වෙනකොට විවිධ ප්‍රශ්න ඇතිවෙලා තිබෙනවා. එම නිසා මාධ්‍ය හරහා කරන චෝදනා සහ විවේචන සියයට 100ක් නිවැරැදියි කියා

කවුරු හෝ හිතනවා නම්, ඒ පුද්ගලයා මාධ්‍ය පිස්සෙක්. මාධ්‍ය කියන්නේ කලාවක්. එම කලාව තුළින් හොඳ දෙය නරක දෙය බවට පත් කරන්නත්, නරක දෙය හොඳ දෙය බවට පත් කරන්නත් හැකියාව තිබෙනවා. එම නිසා අපි මතක් කර දිය යුතු කාරණයක් තිබෙනවා. සමහරු මෙතැන වරුවක් තිස්සේ බොරුවට කෑ ගැහුවා. තමන්ගේ ආණ්ඩුව කාලයේ සිදු වුණු සියලුම අපරාධ, හානි ගැන කථා නොකර උඩ බලාගෙන හිටපු උදවිය අද මෙතැනට ඇවිත් මාධ්‍ය විසින් උලුප්පා දක්වන කරුණු ඉස්මතු කරගෙන මේ රටේ සංවර්ධනය ගැන කථා කරනවා. අද සංවර්ධනය ගැන කථා කළ කවුරුවත්, එදා මේ රටට අහිතකර විධියට ණය ගන්නකොට එය විවේචනයට ලක් කළේ නැහැ. විශේෂයෙන්ම ඉදිරියේදී මේ රටේ ණය බර තව දුරටත් වැඩි වුණොත් මේ රට වළ පල්ලට යන රටක් බවට පත් වෙයි. එම නිසා තමයි පසුගිය රජය කාලයේ ණය ගෙවන්න -රාජපක්ෂ යුගයේ ගත් ණය ගෙවන්න- වක්‍ර බදු අඩු කරමින්, සෘජු බදු වැඩි කරමින් අපේ මේ රජය දැඩි උත්සාහයක් දරන්නේ. එම උත්සාහය ව්‍යර්ථ කරන්න, මේ රට නැවතත් අරාජිකත්වයට පත් කරන්න, මේ රටේ ගොඩනැඟීගෙන එන සංවර්ධන ක්‍රියාවලිය නැති කරන්න උත්සාහ ගන්නා දේශ ද්‍රෝහී පිරිසක් තවමත් අපිත් එක්ක ඉන්නවා. ඒ විතරක් නොවෙයි, එම කාර්ය භාරයට උල්පන්දම් දෙන, එම කාර්ය භාරයට සහයෝගය ලබාදෙන නිලධාරීන් පිරිසකුත් රාජ්‍ය යන්ත්‍රණය තුළ සිටිනවා. මා එම කරුණු කාරණා ටික මතක් කර දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් විධියට අපි ගෙන යන මේ යහපත් පාලනය සමහර උදවියට ගැළපෙන්නේ නැහැ. වහල් පාලනය තමයි ඒ ගොල්ලන්ට ගැළපෙන්නේ. ඒ වහල් පාලනය ඕනෑය කියන පිරිසක් තවමත් මේ රටේ ඉන්නවා. ඒ උදවිය වහල් පාලනය ලබා ගන්න නොයෙකුත් උප්පරවැට්ටි යොදනවා. ඒවාට රැවටෙන කට්ටියකුත් මේ රටේ ඉන්නවා. එම නිසා, මේ යහ පාලනය නොතේරෙන කට්ටිය ටියුෂන් පන්තියකට ගිහින් හෝ යහ පාලනය ඉගෙන ගන්නය කියන කාරණයත් අවසාන වශයෙන් මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.18]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් පනත් කෙටුම්පත හා තවත් වැදගත් නියමයන් කිහිපයක් පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඇතිවෙලා තිබෙන ගැටලුව පිළිබඳව අදාළ අමාත්‍යාවරුන්ගේ අවධානය යොමු කරවන්න පළමුවෙන්ම මා බලාපොරොත්තු වෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවා ව්‍යවස්ථාවේ 12 (1) වගන්තිය අනුව, දේශීය ආදායම් කොමසාරිස්වරයා ලෙස එම දෙපාර්තමේන්තුවේම විශේෂ ශ්‍රේණියේ කෙනෙක් පත් කළ යුතුව තිබෙනවා. සේවා ව්‍යවස්ථාවේ එසේ තිබියදී සහ එම විශේෂ ශ්‍රේණියේ සුදුසුකම් සහිත පුද්ගලයන් 31දෙනකු සිටියදී තමයි, මුදල් ඇමතිවරයා අත්තනෝමතික තීන්දුවක් අරගෙන මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙක් එම තනතුරට පත් කර තිබෙන්නේ. ඒ හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතර බලවත් නොසන්සුන්තාවක් ඇතිවෙලා තිබෙනවා. එම නිසා සම්මත කරගෙන තිබෙන සේවා ව්‍යවස්ථාව අනුව, එම දෙපාර්තමේන්තුවේ සේවය කරන, අත් දැකීම් හා පළපුරුද්ද සහිත අයට අවස්ථාව ලබාදෙමින් ආණ්ඩුව තමන්ගේ අත්තනෝමතික තීන්දුව නිවැරැදි කරාවි කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට මේ මුදල් පනත් කෙටුම්පත සහ මෙම නියමයන් පිළිබඳව කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ, රට තුළ ඉතාම බරපතළ ආර්ථික අර්බුදයක් පැනනැඟී තිබෙන වෙලාවකයි. මෙම අර්බුදය බරපතළයි කියලා අපට, ජනතාවට දැනුණාට, ඕනෑම ආර්ථික විශේෂඥයෙක් මේක බරපතළ ආර්ථික අර්බුදයක් කියලා පිළිගත්තාට, එහෙම ආර්ථික අර්බුදයක් නැහැය කියා මුදල් ඇමතිවරයා දිගින් දිගටම කියනවා මම දැක්කා. මේ රටේ ආර්ථික අර්බුදයක් තිබෙනවාය කියා එතුමාට දැනෙන්න නම් කොතරම් ප්‍රමාණයක ආර්ථික නිර්ණායක එතුමාට දක්වන්න ඕනෑද කියා මම දන්නේ නැහැ. රුපියල අවප්‍රමාණය වෙලා ඇමෙරිකානු ඩොලරයේ වටිනාකම රුපියල් 175ට ළඟා වෙනතුරු මුදල් ඇමතිවරයාට ආර්ථික අර්බුදයක් පිළිබඳව දැනුණේ නැත්නම්, කොටස් වෙළෙඳ පොළේ කඩා වැටීම ආර්ථික අර්බුදයක් ලෙස මුදල් ඇමතිවරයාට පෙනෙන්නේ නැත්නම්, මෙතරම් බදු බර, බඩු මිල වැඩිවීම ආර්ථික අර්බුදයක් ලෙස මුදල් ඇමතිවරයාට පෙනෙන්නේ නැත්නම්, අපේ ආනයන අපනයන පරතරය මෙතරම් ප්‍රමාණයකින් වැඩිවීම ආර්ථික අර්බුදයක් ලෙස මුදල් ඇමතිවරයාට පෙනෙන්නේ නැත්නම්, ඒ වාගේම රාජ්‍ය ආදායම දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 11 දක්වා කඩා වැටීම ආර්ථික අර්බුදයක් ලෙස මුදල් ඇමතිවරයාට පෙනෙන්නේ නැත්නම්, කවර සාධකයක් ආර්ථික අර්බුදයක් ලෙස ගණන් අරගෙන එතුමාට පෙනෙන්න ඕනෑද කියන එකේ ප්‍රශ්නයක් තිබෙනවා. ජනතාව අතරින් කාගෙන් ඇහුවත්, "දරාගන්න බැරි පීඩනයක් තමයි තිබෙන්නේ" කියා ඔවුන් කියනවා. භාණ්ඩ හා සේවා මිල දෛනිකව ඉහළ යනවාට අමතරව, ආණ්ඩුව දැන් මිල සූත්‍රයක් හඳුන්වා දීලා සෑම මසකම 10වන දාට හෙණ ගෙඩියක් කඩා පාත් කරනවා වගේ තෙල් මිල වැඩි කරනවා. තෙල් මිල වැඩි වුණාට පසුව, ඒ මත පදනම් වෙලා අනෙකුත් භාණ්ඩ හා සේවා සියල්ලේ මිල වැඩි වෙනවා. එසේ තිබියදී; දරාගන්න බැරි ආර්ථික අමාරුකමකින් ජනතාව පීඩා විඳිද්දී ඊට සරිලන ආකාරයට, ඊට සංවේදීව, ඒ ආර්ථික බර ජනතාවගෙන් සමහන් කරන්න පුළුවන් ආකාරයෙන් ආණ්ඩුව හැසිරෙනවාද කියන විවිකිච්ඡාව තිබෙනවා. ජනතාව මෙතරම් පීඩාවකින් පෙළෙන කොට, පසුගිය සතියේ මුදල් ඇමතිවරයා මාධ්‍ය ඉදිරියට ඇවිත්, "මිල සූත්‍රය" කියලා එකක් පෙන්නලා ලෝක විහිළුවක් ප්‍රකාශයට පත් කළා.

ඇත්තටම තෙල් මිල වැඩිවීම ජනතාවගේ ඇහට දැනෙනවා. මුදල් ඇමතිවරයා මිල සූත්‍රය පෙන්නුවාට පස්සේ ඒක දැනෙන්නේ මොළයටයි. ජනතාව මෙතරම් පහත් අඩියකට ඇද දමන්න, ඔවුන්ගේ බුද්ධියට නිගා කරන්න එවැනි සූත්‍රයක් පෙන්වලා, ඒ සූත්‍රය ඔලොක්කුවට අරගෙන, ජනතාව අපහසුතාවට සහ අපහාසයට පත් වන ආකාරයේ හැසිරීමක් තමයි එතුමා පෙන්නුම් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එයින් ගම්‍ය වන්නේ වෙන මොකක්වත් නොවෙයි. ජනතාවට දැනෙන මේ පීඩනය, මේ බර පිළිබඳව එතුමන්ලාට කිසි වග කීමක් නැහැ, ඔවුන් එය වැදගැම්මක් නැති දෙයක් ලෙස සලකනවාය කියන එකයි එයින් ගම්‍ය වන්නේ. මෙහෙම ආර්ථික අර්බුදයක් තිබියදී ඒ ආර්ථික අර්බුදයෙන් රට ගොඩ ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයත්, සමස්ත ආණ්ඩුවත් ඉදිරිපත් කර තිබෙන සැලසුම් මොනවාද? මේ අර්බුදයෙන් කෙටිකාලීනව ගොඩ ඒම සඳහා දිගුකාලීනව හා මැදිකාලීනව ආණ්ඩුව ඉදිරිපත් කරන සැලසුම් මොනවාද? අපිට එවැනි කිසිම සැලැස්මක් පෙනෙන්න නැහැ. ඒ වෙනුවට, එදිනෙදා -දවස් හතරක්, පහක්- ජීව කාලය අල්ලා හිටින ප්‍රවෘත්ති

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

නිර්මාණය කරලා, ඒ ප්‍රවෘත්ති පස්සේ දුවන විධියක් තමයි ආණ්ඩුව පෙන්නුම් කරමින් සිටින්නේ. මේ දවස්වල -හැම දාම- නියෝජ්‍ය පොලිස්පතිවරයා CID එකට කැඳවීම, ඔහු හවස ගෙදර යාම, ඔහුගේ වාර්තා සටහන් කර ගැනීම - පස්වන වතාවටත් අද ඔහු CID එකට ඇවිත් තිබෙනවා.- වැනි දේවල් තමයි පෙන්නුම් කරමින් තිබෙන්නේ. ඒ නාඩගම පෙන්නුම් කරමින්, ඒකත් කෙළවර කරන්නේ නැතිව, ඒකටත් මොකක්වත් විසඳුමක් දෙන්නේ නැතිව ඔහේ යනවා. සතියක් දෙකක් දුවන එවැනි ප්‍රවෘත්තිවලින් යන්න තමයි ආණ්ඩුව කල්පනා කර තිබෙන්නේ. මේ ආර්ථික අර්බුදයේ දිග, පළල, ගැඹුර හරියට තේරුම් ගන්න බැරි ආණ්ඩුවක් රටක් පාලනය කරන්නේ කොහොමද?

ඔබතුමන්ලාට මම මේ කියන්න යන කාරණය මතක ඇති. මීට අවුරුදු තුනහමාරකට කලින් -දැන් අවුරුදු හතරකට ආසන්න වෙනවා.- විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු බලය ඉල්ලන කොට ඔවුන් කිය කියා හිටියේ මොකක්ද? "මාස 60න් අලුත් රටක් හදනවා" කියලා තමයි ඔවුන් කිව්වේ; "මාස 60න් අලුත් රටක්" කියන එකයි ඔවුන්ගේ තේමාව වුණේ. එතුමන්ලා බලයට ඇවිත් මාස 10න් අලුත් රටක් හැදෙයි, අලුත් බබෙක් හැදෙයි කියලා ජනතාව බලාගෙන හිටියා. ඊට පස්සේ මාස 20ක් බලාගෙන හිටියා; මාස 30ක් බලාගෙන හිටියා. මේ අවුරුද්ද අවසාන වනවිට මාස 40ක් වනවා. මාස 60න් මාස 40ක් ඉවරයි. හදපු අලුත් රටකුත් නැහැ. මේ කියන විධියට, මාසයක හැම 10වන දාම තෙල් මිල වැඩි කරන එක, බඩු මිල වැඩි කරන එක, වරායයි, ගුවන් තොටුපොළයි, කල්පිටිය දූපත් ටිකයි, තෙල් ටැංකි ටිකයි විකුණන එකද, "අලුත් රට" කියලා එක්සත් ජාතික පක්ෂය කල්පනා කළේ? අපි අන්න ඒ ගැන හිතා බලන්න ඕනෑ. "මාස 60න් අලුත් රටක්" කියා බලයට ඇවිත්, අද වන විට තිබුණාට වඩා බංකොලොත්භාවයට රට ඇද වැටිලා තිබෙනවා.

රටේ ජනතාවත් බොරුවට හෝ හිතාගෙන හිටියා, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවාට පස්සේ නම් රටේ ආර්ථිකය හැදෙයි කියා. හැබැයි, එහෙම කිසි දෙයක් නොවී, අලුත් ආයෝජනයක් එන්නේ නැතිව, අලුත් කර්මාන්තයක් ආරම්භ වෙන්නේ නැතිව, රැකියා දස ලක්ෂය තියා අඩු ගණනේ රැකියා ලක්ෂයකටවත් ළඟා වෙන්න බැරිව ආර්ථිකය එක තැන පල් වෙන තැනකට තමයි අද රට ඇද වැටිලා තිබෙන්නේ. අද එක පැත්තකින් මේ අසහනය පුපුරා යමින් තිබෙනවා. ඒ නිසා තමයි වතු කම්කරුවන් දෙනිකව රුපියල් 1,000ක වැටුපක් ඉල්ලලා, එළියට බහින්න පටන් අරගෙන තිබෙන්නේ; තෙල් මිල දරා ගන්න බැරිව ජනතාව විවිධ තැන්වල උද්ඝෝෂණය කරන්න පටන්ගෙන තිබෙන්නේ; උපාධියක් ලබා ගත් තරුණයන් රැකියාවක් ඉල්ලලා, උද්ඝෝෂණය කරන්න පටන්ගෙන තිබෙන්නේ. අභ්‍යන්තරව විශ්වවිද්‍යාලයෙන් හෝ බාහිරව උපාධියක් ගත් තරුණයාට රස්සාවක් ලබාදීමේ වගකීම ආණ්ඩුවට තිබෙනවා. ඔවුන් රැකියාවක් ඉල්ලන්නේ නිකම් නොවෙයි. තමන් ඉගෙන ගත් ප්‍රමාණයට -තමන්ගේ උපාධියට සරිලන- රැකියාවක් ලබාදීලා, තමන්ගෙන් වැඩක් ගන්න කියලා තමයි ඔවුන් ඉල්ලන්නේ. මේ රටේ ජනතාව බදු මුදල් ගෙවලා, ඒ තරුණයන්ට උපාධිය ලබාදීම දක්වා මහන්සි වෙලා තිබෙනවා. බදු මුදල් ඒ වෙනුවෙන් වියදම් කර තිබෙනවා. උපාධියට හරියන විධියට තමන්ට වැඩක් කරන්න අවස්ථාවක් දෙන්න කියා තමයි ඔවුන් පාරට බැහැලා ඉල්ලා සිටින්නේ. එසේ ඉල්ලා සිටින රැකියා විරහිත උපාධිධාරීන් තමයි ආණ්ඩුව නොසලකා හරිමින් යන්නේ, අවමන් කරමින් යන්නේ. නිකම් තුණ්ඩු කෑල්ලට රැකියා ලබා දෙන්න බැහැ. අපි දන්නවා සමහර තැන්වල, සමහර අමාත්‍යාංශවල පොඩි පොඩි ජොබ් කටුවලට බඳවා ගැනීම් කරන බව. හැබැයි, ඒකෙන් ආර්ථිකය ප්‍රසාරණය වෙන්නේ නැහැ. ඒකෙන් ආර්ථිකයට දායකත්වයක් හම්බ වෙන්නේ නැහැ. ඒ වෙනුවට සැලැස්මක් කෝ? අපි අහන්නේ ඒකයි. දැන්, අගමැතිතුමා යටතට ආර්ථිකයේ තිබෙන මර්මස්ථාන ටික අරගෙන තිබෙනවා. එතුමාගේ සමීපතම අයට ආර්ථිකයේ තිබෙන වැදගත් අමාත්‍යාංශ ටික පවරා තිබෙනවා. නමුත් වසර හතරකට ආසන්න කාලයක් ගත වෙලාත් ආර්ථිකයේ සිදු වුණු වර්ධනය මොකක්ද? එක පැත්තකින් ගත්තොත් අපේ රටේ භූ විෂමතාව, අපේ රටේ දේශගුණය, අපේ රටේ ජෛව විවිධත්වය ආදී ස්වාභාවික කාරණා නිසා සංචාරක ව්‍යාපාරයෙන් ඉස්සරහට යන්න අපට අවස්ථාවක් ලැබී තිබෙනවා. ඒ නිසා සංචාරක ව්‍යාපාරයේ ඉතා හොඳ ගමනාන්තයක් බවට ලංකාව පත් කරගෙන පවතින බව ලෝකයම පිළිගෙන තිබෙනවා. ඒ සංචාරක ව්‍යාපාරය උපයෝගි කරගෙන රටට ආදායම් ගෙන්වන්නේ කොහොමද කියන එක පිළිබඳව ආණ්ඩුවට වැඩ පිළිවෙළක්, සැලැස්මක් තිබෙනවාද? චීන ජනගහනයෙන් සියයට 10ක් හැම අවුරුද්දකම සංචාරකයින් හැටියට එළියට යනකොට ඒ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ආණ්ඩුවට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? [බාධා කිරීමක්] ගමනාන්තය හොඳ වෙන්න පුළුවන්. ගමනාන්තය හොඳ වුණු පළියට සංචාරකයින් එන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒක තමුන්නාන්සේලාගේ ආණ්ඩුව නිසා ලැබුණු එකක් නොවෙයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
සංචාරක ව්‍යාපාරයෙන් 2019ට අප තමයි පළමු වන රට -

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඒක තමුන්නාන්සේලාගේ ආණ්ඩුව නිසා ලැබුණු එකක් නොවෙයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එහෙම නම් කොහොමද හම්බ වුණේ?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඒ සංචාරකයින් ගෙන්වා ගත්තොත් තමයි ආණ්ඩුවේ ජයග්‍රහණයක් කියා කියන්න පුළුවන්කම ලැබෙන්නේ. මේවා තමයි ආදායම් මාර්ග. ඊළඟට, තොරතුරු තාක්ෂණයෙන් විවර වෙලා තිබෙන වෙළෙඳ පොළ අපේ රටට ලබා ගන්න තමුන්නාන්සේලාට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? එහෙම නැතුව ඒ ආදායම් මාර්ග සියල්ල ඔහේ නිකරුණේ නාස්ති කරන්න ඉඩ දීලා, රටට ආදායම් උත්පාදනය කරන්න තිබෙන ප්‍රභවයන් විදේශිකයින්ට කුණු කොල්ලයට පවරලා, ජනතාව මත බදු ගහලාම දුවන්න නම් තමුන්නාන්සේලා ලැහැස්ති වන්නේ, ඒක අලුත් ආර්ථික උපාය මාර්ගයක් නොවෙයි. ඒකට තමුන්නාන්සේලා අලුතෙන් මහා ආර්ථික ඔස්තාර්ලා වෙන්න වුවමනාවක් නැහැ. ඒක පරණ කාලයෙත් කරපු වැඩේම තමයි. ඒ වුණාට අලුත් ආණ්ඩුවක් බලයට පත් කර ජනතාව බලාපොරොත්තු වුණේ වෙන මොකක්වත් නොවෙයි. අලුත් ආර්ථික උපාය මාර්ගයක් හඳුන්වා දීලා, අලුත් ආර්ථික ක්ෂේත්‍රයන් අත්පත් කරගෙන ලෝක වෙළෙඳ පොළේ කොටසක් අත්පත් කර ගනියි කියායි. නමුත් දැන් ජනතාවට පෙන්නුම් කරන්නේ, තමුන්නාන්සේලා ඒ කිසිවක් අවධානයට ලක් කරන බවක් නොවෙයි. ඒ නිසා තවදුරටත් අර පරණ ආර්ථික මොඩලයම කරපින්නාගෙන යනවා හැරෙන්න වෙන උත්තරයක් නැහැ. ඒ නිසා තමුන්නාන්සේලාට කරන්න ඉතුරු වෙලා තිබෙන්නේ, යළි

යළිත් ජනතාව මත බදු බර පැටවීම පමණයි. ඒ වාගේම මේ රටේ වරාය වෙන්න පුළුවන්, ගුවන් තොටුපොළ වෙන්න පුළුවන්, දුපත් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් අපේ තෙල් ටැංකි සංකීර්ණය වෙන්න පුළුවන්. මෙන්න මේවා කුණු කොල්ලයට විදේශිකයන්ට විකුණමින්, එහෙම නැත්නම් තමුන්නාන්සේලා කියන හැටියට අවුරුදු 99කට ආසන්න කාලයකට බදු දෙමින් යන ගමන හැර වෙන උත්තරයක් අපට පෙන්නුම් කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි අපේ රටට දැන් වෙනස් වර්ගයේ ආර්ථික වැඩ පිළිවෙළක් වුවමනා කර තිබෙන්නේ. මේ රටේ දේශීය සම්පත් ආරක්ෂා කරගෙන, ඕනෑ නම් ලෝකයෙන් ඒකට අවශ්‍ය කරන තාක්ෂණය සහ ප්‍රාග්ධනය කැඳවාගෙන, අපේ දේශීය දැනුම උපයෝගි කර ගත්ත අලුත් ආර්ථික ගමනකට අපි තල්ලු විය යුතුව තිබෙනවා. ඒ පිළිබඳව හිතා බැලිය යුතුව තිබෙනවා. අපේ අධ්‍යාපන ක්‍රමය සකස් විය යුතුව තිබෙන්නේ ඒ අනුවයි. අපේ උසස් අධ්‍යාපන පද්ධතිය පුළුල් විය යුතුව තිබෙන්නේ ඒ අනුවයි. හැබැයි, අඩු තරමේ නිකමට හෝ අපේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් එළියට එන උපාධිධාරීන් සඳහා ඒ පහසුකම් ටික සලසන්නවත් තමුන්නාන්සේලා කටයුතු කළාද කියන ප්‍රශ්නය තිබෙනවා.

අද වනකොට අග්නිදිග විශ්වවිද්‍යාලයේ ඔලුවිල් මණ්ඩපයේ ශිෂ්‍යයින් දවස් සියයකට වඩා පන්ති තහනමට ලක් වෙලා තිබෙනවා. අවුරුදු එකහමාරක් තිස්සේ ඔවුන්ගේ විභාග තහනම්. ඒ ශිෂ්‍යයින්ගේ දෙමව්පියන් ගිහිල්ලා එතැන රැඳිලා ඉන්නවා. මම දන්නවා, මේ වනකොට ඒ ශිෂ්‍යයින් විසුරුවා හැරීම සඳහා එතැනට කැරලි මර්දන ඒකකය යවලා තිබෙන බව. රජරට විශ්වවිද්‍යාලය ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු නවත්වලා දැන් දවස් විස්සකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. අපි මේ ප්‍රශ්නය ගැන පාර්ලිමේන්තුවේදී මීට කලින් සාකච්ඡා කළා. ගරු විජයදාස රාජපක්ෂ උසස් අධ්‍යාපන ඇමතිතුමාට පෙන්නුම් කර දුන්නා, ඒ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ රඳවා ගැනීමේ දීමනාව ලබා දීලා, එය මහා භාණ්ඩාගාරය ලවා නීත්‍යානුකූල කරගෙන, ඒ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට ඉගෙන ගන්න අවස්ථාව ලබා දෙන්න කියා. එහෙම ලබා දුන්නාම ඒ ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ. කාලයක් තිස්සේ තිබුණු retention allowance එක වෙන වෙන හේතු ඉදිරිපත් කර නතර කිරීම නිසා තමයි අද රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ ශිෂ්‍යයින්ට ඉගෙන ගන්න අවස්ථාව අහිමි වෙලා තිබෙන්නේ. මීට කලින් තමුන්නාන්සේලා ඒ ශිෂ්‍යයින් සයිටම් ප්‍රශ්නයට ඇදලා දමපු නිසා අවුරුද්දක් විතර තිස්සේ ඒ ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන කාලය අහිමි වෙලා තිබෙනවා. දැන් දවස් විස්සකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. මේක රටේ ජනතාවගේ බදු මුදල්වලින් නඩත්තු වන විශ්වවිද්‍යාල පද්ධතියක්. අපට වුවමනා කරන්නේ ඉතා ඉක්මනට ඒ උපාධිධාරීන් එළියට අරගෙන ඔවුන් මේ ආර්ථික ක්‍රියාවලියට දායක කර ගන්නයි. එහෙම නොවී, එහෙම නොකර, ඒවා ගැන අවධානයක් නොමැතිව ඇමතිවරු වෙන වෙන දේවල් කරන්න ගියාට පස්සේ තමයි මේ අවුල ඇතිවෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාව මීට අවුරුදු හතරකට කලින් බලාපොරොත්තු වුණු ආකාරයට ආර්ථිකයේ මහා ප්‍රසාරණයක් හෝ ආර්ථිකයේ ප්‍රතිලාභ ගම් මට්ටම දක්වා ගලා යාමක් හෝ, අලුත් ව්‍යාපාරික අවස්ථා උදාවීමක් වෙනුවට යළිත් වතාවක් ජනතාව පීඩාවට පත් කරන ආර්ථික ගමන් මහකම මේ අයත් ගමන් කරමින් ඉන්නවා. දැන් හැම තැනින්ම ඇහෙන ආර්ථික ගමන වෙනුවට අපේ රටේ ආර්ථික විශේෂඥයන්ගේ උපදෙස් සහිත විකල්ප ආර්ථික වැඩ පිළිවෙළක් සකස් කර ගන්නත්, එය බලයට පත් කර ගන්නත් වෙච්ච ජනතා පෙළගැස්මක් අවශ්‍යවෙලා තිබෙනවා. ඒ සඳහා මේ රටේ අපේ විශ්වවිද්‍යාලවලින් පිට වුණු, අපේ ආර්ථිකය සෑදීමට සැබෑ වුවමනාවක් තිබෙන විශේෂඥයින්ට, ව්‍යවසායකයින්ට, ව්‍යාපාරිකයන් ඇතුළු හැම දෙනාටම ආරාධනා කරමින් මගේ කථාව නතර කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*විනා විවාදයෙන් පිළිගනු ලැබිණි.*
*අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලය (සංශෝධන) පනත් කෙටුම්පත*
*[ගරු මංගල සමරවීර මහතා]*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' -- [ගරු මංගල සමරවීර මහතා ]***
*තීරණය කරන ලදී.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு மங்கள சமரவீர]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Mangala Samaraweera.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***
*කමිටුවේ සලකා බලන ලදී.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ආම් වාරකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළైයිටප්පට්ටතු.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (2003 අංක 25 දරන පනතේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.)

### வாசகம் 2.- (2003ஆம் ஆண்டின் 25ஆம் இலக்கச் சட்டத்தின் 11ஆம் பிரிவை திருத்தம் செய்தல்.)

CLAUSE 2.- *(Amendment of section 11 of Act, No. 25 of 2003.)*

**ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් සංශෝධන මා ඉදිරිපත් කරනවා:

(1) " 1 වන පිටුවේ, 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'2. (මේ කොටසේ මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටසේ (සංචාරක' ";

(2) "1වන පිටුවේ, " 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'වෙනුවට "2018 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන්' ";

(3) "2 වන පිටුවේ, 1 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

' එසේම තවදුරටත්, 2019 ජනවාරි මස 1 වන' ";

(4) "2 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

' (2) 2019 ජනවාරි මාසයේ 1 වන දිනයේ පටන්' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

[ගරු මංගල සමරවීර මහතා]

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*2ආ ම වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*

*Clause 2, as amended, ordered to stand part of the Bill.*

## 3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 3.- (මුතන්මෙච් චට්ටවාක්කත්තින් 12ආ ම පිරිවෙත් තිරුත්තුතල්.)

CLAUSE 3.- *(Amendment of section 12 of the principal enactment.)*

**ගරු මංගල සමරවීර මහතා**
(මාණ්පුමිකු මංකළ චමරවීර)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් සංශෝධන මා ඉදිරිපත් කරනවා.

(1) "3 වන පිටුවේ, 6 වන සහ 7 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ලබාගෙන ඇති මාර්ගගත සංචාරක නියෝජිතවරුන්ගෙන් එකතු කර ගනු ලැබූ බද්ද සහ 11 වන වගන්තිය යටතේ සියයට 0.5ක අනුප්‍රමාණයකට එකතු කර ගනු ලැබූ බද්ද හැර, (1) වන උප වගන්තිය' ''

(2) "3 වන පිටුවේ, 10 වන සහ 11 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ලබාගෙන ඇති මාර්ගගත සංචාරක නියෝජිතවරුන්ගෙන් එකතු කර ගනු ලැබූ බද්ද සහ 11 වන වගන්තිය යටතේ සියයට 0.5ක අනු ප්‍රමාණයකට එකතු කර ගනු ලැබූ බද්ද ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය' ''

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*තිරුත්තඞ්කළ් විටුක්කප්පට්ටු එර්ත්රුක්කොළ්ළප්පට්ටතු.*
*Amendments put, and agreed to.*

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ආ ම වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

***4 සිට 10 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*4ආ ම වාසකත්තිලිරුන්තු 10ආ ම වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*

*Clauses 4 to 10 ordered to stand part of the Bill.*

## 11 වන වගන්තිය.- (1995 අක 16 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 11. - (1995ආ ම ආණ්ටින් 16ආ ම ඉලක්කච් චට්ටත්තින් 3ආ ම පිරිවෙත් තිරුත්තුතල්.)

CLAUSE 11.- *(Amendment of section 3 of Act, No. 16 of 1995.)*

**ගරු මංගල සමරවීර මහතා**
(මාණ්පුමිකු මංකළ චමරවීර)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් සංශෝධනය මා ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 24 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

' කරනු ලබන වර්ෂය 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට' ";

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*තිරුත්තම් විටුක්කප්පට්ටු එර්ත්රුක්කොළ්ළප්පට්ටතු.*
*Amendment put, and agreed to.*

***11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*11ආ ම වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*

*Clause 11, as amended, ordered to stand part of the Bill.*

## 12 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 12.- (මුතන්මෙච් චට්ටවාක්කත්තින් 4ආ ම පිරිවෙත් තිරුත්තුතල්.)

CLAUSE 12.- (*Amendment of section 4 of the principal enactment.*)

**ගරු මංගල සමරවීර මහතා**
(මාණ්පුමිකු මංකළ චමරවීර)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 1 වන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2019 ජනවාරි මස 1 වන දින' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*තිරුත්තම් විටුක්කප්පට්ටු එර්ත්රුක්කොළ්ළප්පට්ටතු.*
*Amendment put, and agreed to.*

***12 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*12ආ ම වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*
*Clause 12, as amended, ordered to stand part of the Bill.*

## 13 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 13.- (මුතන්මෙච් චට්ටවාක්කත්තින් 5ආ ම පිරිවෙත් තිරුත්තුතල්.)

CLAUSE 13.- (*Amendment of section 5 of the principal enactment.*)

**ගරු මංගල සමරවීර මහතා**
(මාණ්පුමිකු මංකළ චමරවීර)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 9 වන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'කරනු ලබන වර්ෂය 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*තිරුත්තම් විටුක්කප්පට්ටු එර්ත්රුක්කොළ්ළප්පට්ටතු.*
*Amendment put, and agreed to.*

***13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*13ආ ම වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*

*Clause 13, as amended, ordered to stand part of the Bill.*

## 14 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 14.- (முதன்மைச் சட்டவாக்கத்தின் 8ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 14.- (*Amendment of section 8 of the principal enactment.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 15 වන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ගෙවිය යුතු දිනය 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***14 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*14ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 14, as amended, ordered to stand part of the Bill.*

## 15 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 15.- (முதன்மைச் சட்டவாக்கத்தின் 8அ என்னும் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 15.- (*Amendment of section $8_A$ of the principal enactment.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 20 වන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'යුතු දිනය 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට පෙරාතුව' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***15 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*15ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 15, as amended, ordered to stand part of the Bill.*

## 16 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 8ආ වගන්තිය ඇතුළත් කිරීම.)

வாசகம் 16.- (முதன்மைச் சட்டவாக்கத்தின் 8ஆ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்.)

CLAUSE 16.- (*Insertion of new section $8_B$ in the principal enactment.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 26 වන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'8ආ. (1) බද්ද ගෙවිය යුතු දිනය 2019 ජනවාරි' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***16 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*16ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 16, as amended, ordered to stand part of the Bill.*

## 17 වන වගන්තිය.- (2015 අංක 10 දරන පනතේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 17.- (2015ஆம் ஆண்டின் 10ஆம் இலக்கச் சட்டத்தின் 27ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 17.- (*Amendment of section 27 of Act, No. 10 of 2015.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "7 වන පිටුවේ, 22 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

| | |
|---|---|
| '2015 අංක 10 දරන පනතේ VII වන කොටස ඉවත් කිරීම | 17. (මේ කොටසේ ඕන්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) 2015 අංක 10 දරන මුදල් පනතේ VII වන කොටස (මන්දිර බද්ද) මෙයින් ඉවත් කරනු ලැබේ' " |

(2) "8 වන පිටුවේ, 1 වන පේළියේ සිට 5 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டன.*
*Amendments put, and agreed to.*

***17 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*17ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 17, as amended, ordered to stand part of the Bill.*

***18 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*18ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 18 ordered to stand part of the Bill.*

## 19 වන වගන්තිය.- (මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද පැනවීම.)

வாசகம் 19.-(மோட்டார் வாகனங்களின் மீது ஆடம்பர வரியை விதித்தல்.)

CLAUSE 19.- (*Imposition of Luxury Tax on motor vehicles.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

[ගරු මංගල සමරවීර මහතා]

"8 වන පිටුවේ, 11 වන පේළියේ සිට 14 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'19. පළමු ලියාපදිංචි කිරීමේ වර්ෂය මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය හැකි දිනයක හෝ ඉන්පසුව එළඹෙන නිශ්චිතව සඳහන් කරන ලද සෑම මෝටර් වාහනයක් මත ම ඒ නියෝග මගින් නියම කරනු ලබන අනුප්‍රමාණ මත (මේ' "

*සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.*
*Amendment put, and agreed to.*

***19 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*19ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 19, as amended, ordered to stand part of the Bill.*

## 20 වන වගන්තිය.- (ආනයනය කරනු ලබන අවස්ථාවේ දී බද්ද එකතු කිරීම.)

வாசகம் 20.- (இறக்குமதி செய்யும் நேரத்தில் வரியைச் சேகரித்தல்.)

CLAUSE 20.- (*Collection of tax at the time of importation.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"8 වන පිටුවේ, 18 වන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'20. (1) 19 වන වගන්තිය යටතේ නියම කරනු ලබන දිනයේ හෝ ඉන් ' "

*සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***20 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*20ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 20, as amended, ordered to stand part of the Bill.*

## 21 වන වගන්තිය.- (ලියාපදිංචි කරන අවස්ථාවේ දී බද්ද එකතු කිරීම.)

வாசகம் 21.- (பதிவு செய்யும் நேரத்தில் வரியைச் சேகரித்தல்.)

CLAUSE 21.- (*Collection of tax at the time of registration.)*

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"9 වන පිටුවේ, 1 වන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'21. (1) 19 වන වගන්තිය යටතේ නියම කරනු ලබන දිනයට පෙර' "

*සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***21 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*21ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 21, as amended, ordered to stand part of the Bill.*

***22 සිට 24 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*22ஆம் வாசகத்திலிருந்து 24ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 22 to 24 ordered to stand part of the Bill.*

## 25 වන වගන්තිය.- (2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින දක්වා වන කාලසීමාව සඳහා අය බද්ද එකතු කිරීම.)

வாசகம் 25.- (2016, சனவரி 1ஆந் தேதியிலிருந்து தொடங்குகின்றதும் இச்சட்டம் தொடங்குகின்ற தேதி வரையானதுமான காலப் பகுதிக்காக அறவீட்டைச் சேகரித்தல்.)

CLAUSE 25.- (*Collecting the levy for the period commencing from January 1, 2016 to the date of commencement of this Act.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "10 වන පිටුවේ, 10 වන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'2019 ජනවාරි මස 1 වන දිනයට පෙර අවසන් වන' "

(2) "එහි පැති සටහන ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2019 ජනවාරි මස 1 වන දින දක්වා වන කාලසීමාව සඳහා අය බද්ද එකතු කිරීම' "

*සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***25 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*25ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 25, as amended, ordered to stand part of the Bill.*

## 26 වන වගන්තිය.- (මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා වන අය බද්ද එකතු කිරීම.)

வாசகம் 26. - (இச்சட்டம் தொடங்கும் தேதியன்று அல்லது அதன் பின்னர் தொடங்குகின்ற ஏதேனும் காலப் பகுதிக்காக அறவீட்டைச் சேகரித்தல்.)

CLAUSE 26.- (*Collecting the levy for any period commencing on or after the date of commencement of this Act.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "11 වන පිටුවේ, 21 වන සහ 22 වන පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'26. (1) 2019 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ණයවර ලිපිය විවෘත කරනු ලැබ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් වාහනයකට අදාළව 2019 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව' "

(2) "එහි පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'2019 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා වන අය බද්ද එකතු කිරීම' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*තිරුත්තංකල් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.*
*Amendments put, and agreed to.*

***26 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*26ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clause 26, as amended, ordered to stand part of the Bill.*

***27 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*27ආම් වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clause 27 ordered to stand part of the Bill.*

## 28 වන වගන්තිය. - (වලංගු කිරීම.)

வாசகம் 28. - (செல்லுபடியாக்கல்.)

CLAUSE 28.- (*Validation.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

(1) "12 වන පිටුවේ, 11 වන පේළියේ සිට 21 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වලංගු කිරීම 28. මේ පනතේ මේ කොටස ප්‍රකාරව, කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් බැංකුවක් විසින් 24 වන වගන්තිය යටතේ වන අය බද්දෙහි යම් මුදල් ප්‍රමාණයක් 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී යම් මෝටර් වාහනයක් ආනයනය කරන තැනැත්තකුගෙන් එකතු කරනු ලැබ ඇති අවස්ථාවක දී සියලු කාර්යයන් සඳහා එම එකතු කිරීම වලංගු ලෙස සිදු කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී එකතු කිරීමට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමෙන් බැංකුව සහ කොමසාරිස් ජනරාල්වරයා මෙයින් විනිර්මුක්ත කරනු ලැබේ.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.*
*Amendment put, and agreed to.*

***28 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*28ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clause 28, as amended, ordered to stand part of the Bill.*

***29 සහ 30 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*29ආම්, 30ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clauses 29 and 30 ordered to stand part of the Bill.*

## 31 වන වගන්තිය. - (වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ අය බද්ද පැනවීම.)

வாசகம் 31. - (வருடாந்தக் கம்பெனிப் பதிவு அறவீட்டை விதித்தல்.)

CLAUSE 31.- (*Imposition of Annual Company Registration Levy.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "13 වන පිටුවේ, 10 වන සහ 11 වන පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'31. 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2016 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය සඳහා දෙවන උපලේඛනයේ සඳහන් එක් එක්' " ;

(2) "22 වන පේළියේ සිට 25 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(2) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සෑම අදාළ සමාගමකින්ම 2019 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර අය බද්ද එකතු කර' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*තිරුත්තංකල් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.*

*Amendments put, and agreed to.*

***31 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*31ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clause 31, as amended, ordered to stand part of the Bill.*

## 32 වන වගන්තිය. - (ඇතැම් සමාගම් අය බද්ද ගෙවීමෙන් නිදහස් බව.)

வாசகம் 32. - (குறித்த சில கம்பெனிகளுக்கு அறவீட்டுக் கொடுப்பனவிலிருந்து விலக்களிக்கப்படுதல் வேண்டும்.)

CLAUSE 32.- (*Certain companies to be exempted from payment of the levy.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"14 වන පිටුවේ, 2 වන පේළියේ සිට 5 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

[ගරු මංගල සමරවීර මහතා]

'වුව ද, 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2016 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලබන යම් සමාගමක් අය' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.*

*Amendment put, and agreed to.*

***32 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*32ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clause 32, as amended, ordered to stand part of the Bill.*

***33 සහ 34 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*33ආම්, 34ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clauses 33 and 34 ordered to stand part of the Bill.*

## 35 වන වගන්තිය. - (පාර්ලිමේන්තුව යෝජනා සම්මතයක් මඟින් අය බද්දේ අනුප්‍රමාණ සංශෝධනය කිරීම.)

### வாசகம் 35. - (பாராளுமன்றத் தீர்மானத்தின்மூலம் அறவீட்டின் வீதங்களைத் திருத்துதல்.)

CLAUSE 35.- (*Amendment of the rates of the levy by resolution of Parliament.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"14 වන පිටුවේ, 29 වන පේළියේ සිට 32 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'වලංගු කිරීම 35. මේ පනතේ මේ කොටස ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් 31 වන වගන්තිය යටතේ වන අය බද්දෙහි යම් මුදලක් ඒ වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව සඳහා 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ දී 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කළ හෝ ලියාපදිංචි කළ යම් සමාගමකින් එකතු කරනු ලැබ ඇති අවස්ථාවක දී, සියලු කාර්යයන් සඳහා එම එකතු කිරීම වලංගු ලෙස සිදු කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී එකතු කිරීමට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා මෙයින් විනිර්මුක්ත කරනු ලැබේ.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.*

*Amendment put, and agreed to.*

***35 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*35ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clause 35, as amended, ordered to stand part of the Bill.*

## 36 වන වගන්තිය.- (ණය ආපසු ගෙවීමේ අය බද්ද පැනවීම.)

### வாசகம் 36. - (தனிசு மீள்கொடுப்பனவு அறவீட்டை விதித்தல்)

CLAUSE 36.- (*Imposition of Debt Repayment Levy.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "15 වන පිටුවේ, 3 වන සහ 4 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'36. (1) 2018 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන නමුත් 2021 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන සෑම මාසයක් සඳහා ම සෑම මූල්‍ය ආයතනයකින් ම, එක් එක්' ";

(2) "15 වන පිටුවේ, 10 වන පේළියේ සිට 14 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(2) මේ වගන්තියේ කාර්ය සඳහා සපයනු ලබන මූල්‍ය සේවාවන්ට ආරෝපණය කළ හැකි එකතු කළ අගය 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25 ඇ වගන්තියේ නිශ්චිතව සඳහන් විධිවිධාන මත පදනම්ව, ගණන් බැලිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සපයනු ලබන මූල්‍ය සේවාවන්ට ආරෝපණය කළ හැකි එකතු කළ අගය ගණනය කිරීම සඳහා සැළකිල්ලට ගනු ලබන මූල්‍ය ආයතනයේ මෙහෙයුම් ලාභයේ හෝ පාඩුවේ ප්‍රමාණය, මෙම වගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25අ වන වගන්තිය යටතේ ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද සහ 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ (2) වන උපවගන්තියේ (iii) වන ඡේදය යටතේ ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද යන බදු අඩු කිරීමට පෙරාතුව එකී මූල්‍ය ආයතනයේ ලාභයේ හෝ පාඩුවේ ප්‍රමාණය විය යුතුය.' ";

(3) "15 වන පිටුවේ, 16 වන සහ 17 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'එකතු කළ අගය මත ප්‍රකාශයක් සමඟ අදාළ මාසයෙන් පසු එළඹෙන මාසයේ විසිවන දින හෝ ඊට පෙර' ";

(4) "15 වන පිටුවේ, 19 වැනි පේළියේ සිට 22 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(4) මූල්‍ය ආයතනයක් විසින්, එම මූල්‍ය ආයතනයේ එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් වාර්තාවක්, ඒ මුදල් වර්ෂයේ අවසානයේ සිට මාස හයක කාල සීමාවක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන යම් ආකෘතියකින් ඉදිරිපත් කළ යුතු ය.' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*තිරුත්තංකළ් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.*

*Amendments put, and agreed to.*

***36 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*36ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clause 36, as amended, ordered to stand part of the Bill.*

***37 සහ 38 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*37ආම්, 38ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.*

*Clauses 37 and 38 ordered to stand part of the Bill.*

## 39 වන වගන්තිය.- (අර්ථ නිරූපණය.)
வாசகம் 39. - (பொருள்கோடல்.)
CLAUSE 39.- (*Interpretation.)*

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"16 වන පිටුවේ, 17 වන පේළි සහ 18 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ආ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක්,' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.*

*Amendment put, and agreed to.*

***39 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*39ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 39, as amended, ordered to stand part of the Bill.*

## 40 වන වගන්තිය.- (කාබන් බද්ද පැනවීම.)
வாசகம் 40. - (காபன் வரியை விதித்தல்.)
CLAUSE 40.- (*Imposition of Carbon Tax*.)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"16 වන පිටුවේ, 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'40. (1) 2019 ජනවාරි මස 1 වන දින සිට සෑම' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***40 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*40ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 40, as amended, ordered to stand part of the Bill.*

***41 සිට 43 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*41ஆம் வாசகத்திலிருந்து 43ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 41 to 43 ordered to stand part of the Bill.*

## 44 වන වගන්තිය.- (දූරකථන සන්නිවේදන කුළුණු අය බද්ද.)
வாசகம் 44. - (செல்லிடத் தொலைபேசிக் கோபுர அறவீட்டை விதித்தல்.)
CLAUSE 44.- (*Imposition of Cellular Tower Levy.)*

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"18 වන පිටුවේ, 13 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:-

'(3) (අ) යම් ජංගම දූරකථන ක්‍රියාකරුවකුට අයත් නොවන යම් දූරකථන කුළුණක් සම්බන්ධයෙන්, (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු අය බද්ද, එම දූරකථන කුළුණ භාවිත කරන ජංගම දූරකථන ක්‍රියාකරුගෙන් අය කරනු ලැබිය යුතු ය.

(ආ) ජංගම දූරකථන ක්‍රියාකරුවන් එක් අයකුට වඩා දූරකථන කුළුණක් භාවිත කරන අවස්ථාවක දී, එම ජංගම දූරකථන ක්‍රියාකරුවන් විසින් එම අය බද්ද සමාන කොටස්වලින් ගෙවනු ලැබිය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***44 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*44ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 44, as amended, ordered to stand part of the Bill.*

***45 සහ 46 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*45ஆம், 46ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 45 and 46 ordered to stand part of the Bill.*

## 47 වන වගන්තිය.- (අර්ථ නිරූපණය.)
வாசகம் 47. - (பொருள்கோடல்.)
CLAUSE 47.- (*Interpretation.*)

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 වන පිටුවේ, 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'කර ඇති දූරකථන සන්නිවේදන ස්ථානයක් අදහස් " "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***47 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*47ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 47, as amended, ordered to stand part of the Bill.*

**48 වන වගන්තිය.- (ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද පැනවීම. )**
வாசகம் 48. - (செல்லிடத் தொலைபேசிக் குறுஞ்செய்திச் சேவைகள் மீதான அறவீட்டை விதித்தல்.)
CLAUSE 48.- (*Imposition of levy on mobile short message services.)*

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 වන පිටුවේ, 25 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස අදේශ කරන්න:-

'48.(1) 2019 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***48 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*48ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*

*Clause 48, as amended, ordered to stand part of the Bill.*

***49 සිට 52 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*49ආම් වාසකත්තිලිරුන්තු 52ආම් වාසකම් වරෙ චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*

*Clauses 49 to 52 ordered to stand part of the Bill.*

***පළමුවන උප ලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*මුතලාම් අට්ටවණෙ චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*

*First Schedule ordered to stand part of the Bill.*

***දෙවන උප ලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*ඉරණ්ටාම් අට්ටවණෙ චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*

*Second Schedule ordered to stand part of the Bill.*

***තුන්වන උප ලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*මූන්රාම් අට්ටවණෙ චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*

*Third Schedule ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*චට්ටමාකු වාසකමුම් තලෙප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.*
*චට්ටමූලම් තිරුත්තංකළුටන් අරික්කෙ චෙය්යප්පට්ටතු.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***

*විනා විටුක්කප්පට්ටු, ඒර්රුක්කොළ්ළප්පට්ටතු.*
*අතන්පටි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්රාම්මුරෙයාක මතිප්පිටප්පට්ටු නිරෙවේර්රප්පට්ටතු.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත: නියමය
## உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டம்: கட்டளை
## EXCISE (SPECIAL PROVISIONS) ACT: ORDER

## I

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 31 දිනැති අංක 2073/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.*
*Question put, and agreed to.*

## II

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 08 දිනැති අංක 2074/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 14 දිනැති අංක 2075/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, "එක දේශපාලන සිරකරුවකුවත් නැහැ" කියලා. නමුත්, දේශපාලන සිරකරුවන් හැටියට හඳුනා ගත්තේ කොයි විධියේ අපරාධ කරපු අයද කියන එක ගැන මට ගැටලුවක් තිබෙනවා. මම අදටත් කියන්නේ දේශපාලන සිරකරුවන් -මොකක් හෝ රාජ්‍ය විරෝධී දෙයක්, කුමන්ත්‍රණ කිරීමක් වැනි දෙයක් සම්බන්ධ අය- ඉන්නවා නම් අපි ඕනෑම වෙලාවක මැදිහත්වීමක් කරන්න සූදානම්. හැබැයි, 2009ට පෙර සිද්ධ වූ දේවල් ගැනත් අපි පුළුවන් උපරිම ශක්තිය යොදලා ඒ අවශ්‍ය කටයුතු කරන්න බලනවා. නමුත්, මා කලින් සඳහන් කළ 43දෙනා-

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Shritharan, what is your point of Order?

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே! நீங்கள் குறிப்பிடுவதுபோல சிறையிலிருக்கின்ற அரசியல் கைதிகள் விடுதலைப் புலிகளோடு தொடர்புபட்டிருந்தார்கள். விடுதலைப் புலிகள் இருந்த காலத்தில் விடுதலைப் புலிகளுடைய போராட்ட நடவடிக்கைகளில் தொடர்புபட்டிருந்தார்கள் என்ற காரணத்தினால்தான் இவர்கள் கைது செய்யப்பட்டிருக்கிறார்கள். ஏற்கெனவே, இங்கு கௌரவ உறுப்பினர் சார்ல்ஸ் நிர்மலநாதன் அவர்கள் குறிப்பிட்டதுபோல, மாறிமாறி வந்த அரசாங்கங்கள் விடுதலைப் புலிகளோடு பேசியிருக்கின்றன. ஆகவே, யுத்தம் நடந்த காலத்தில், விடுதலைப் புலிகளின் உறுப்பினர்கள் என்ற அடிப்படையிலே கைது செய்யப்பட்ட அவர்கள், தமிழ் அரசியல் கைதிகளென்பது நிரூபணமான உண்மையாகும். இப்பொழுது அவர்களுடைய விடயத்தை வேறொரு திசைக்குக் கொண்டுசெல்லாமல், அவர்களது உண்மையான நிலவரங்களை அறிந்து, அவர்கள் போர்க்காலத்திலே குற்றங்கள் செய்திருந்தால் பொது மன்னிப்பின் அடிப்படையில் மன்னித்து, அவர்களைத் தயவுசெய்து விடுவிக்கவேண்டும் அல்லது புனர்வாழ்வு அடிப்படையில் அவர்களை விடுவிக்க வேண்டும். ஏற்கெனவே பலர் இவ்வாறு விடுவிக்கப்பட்டிருக்கிறார்கள். அந்த வகையில் அவர்கள் அரசியல் கைதிகள் என்பது ஏற்கெனவே ஏற்றுக்கொள்ளப்பட்ட ஒரு விடயம். ஆகவே, தயவுசெய்து அதனைப் புரிந்துகொண்டு, அந்த அடிப்படையில் இந்தக் கைதிகளை நோக்குங்கள்!

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කියපු කාරණයට මට එකඟ වෙන්න බැහැ. මොකද, අධිකරණයේ ස්වාධීනත්වය උපරිම වශයෙන් ආරක්ෂා කරන අපි, අධිකරණයෙන් දෙන ලද තීන්දුවකට එරෙහිව කටයුතු කරන්නේ නැහැ. අභියාචනා ඉදිරිපත් කිරීම හරහා අධිකරණය තුළ තිබෙන ප්‍රතිපාදන මඟින් සමාවක් ලබා ගන්නවා මිස, ඇමතිවරිය හැටියට මට ඒ ගැන වගකීමක් භාර ගන්න බැහැ. හැබැයි, අපි දැන් බන්ධනාගාර තුළ වෙනත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. එහිදී පළමුවෙන් මත් ද්‍රව්‍ය පානයට ඇබ්බැහි වෙලා

බන්ධනාගාරගත කරන අය දීර්ඝකාලීන පුනරුත්ථාපනය කරන්න අපි ලබන අවුරුද්දේ සිට කටයුතු කරනවා. ඒ වාගේම, කාලකට ඉස්සර ක්‍රියාත්මක වී දැන් නැවතිලා තිබෙන, බලපත්‍ර මඟින් නිදහස් කිරීමේ කටයුත්ත පටන් ගන්නත් මේ වන කොට අපි කටයුතු කරගෙන යනවා. දැන් කියන්නේ, "Prisons" කියලා නොවෙයි, "Correctional Centres" කියලායි. ඒ කියන්නේ, අවම දඬුවම්වලට යටත් වන අය බන්ධනාගාරගත කර ඒ අයගේ මානසිකත්වය කඩා දමන්නේ නැතිව, ඒ බන්ධනාගාරවල තදබදය වැඩි කරන්නේ නැතිව, ඒ අය නිවැරදි පුද්ගලයන් බවට පත් කිරීමේ අරමුණින් නොයෙකුත් ව්‍යාපෘති සඳහා ලබන අවුරුද්දේ ඉඳලා යොමු කරන්නයි අපි කටයුතු කරන්නේ. මට නැවත නැවතත් කියන්නට තිබෙන්නේ මේකයි. ඒ කිසි කෙනකු දේශපාලන ක්‍රියාවලියක් තුළ, කොටි ත්‍රස්තවාදීන් හැටියට අත්අඩංගුවට අරගෙන තිබෙනවාය කියන එක මම නම් විශ්වාස කරන්නේ නැහැ. නමුත්, රටේ පවතින අපරාධ නීතිය යටතේ, දඬුවම් ලැබිය යුතු වරදක් හැටියට තීන්දු කරපු දේවල් සම්බන්ධයෙන් තමයි ඒ 40දෙනකු දඬුවම් ලබන්නේ.

අවසාන වශයෙන්, ගරු විපක්ෂ නායකතුමාත් මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ මම කියන්නට ඕනෑ, ඒ බන්ධනාගාරගත උදවිය ගැන අපි මානුෂීය මට්ටමකින් බලලා තමයි මේ ප්‍රශ්න විසඳන්න හදන්නේ කියන එක. අධිකරණය දීපු තීන්දුවකට පරිබාහිරව ගිහිල්ලා යම් වෙනත් ක්‍රියාමාර්ග ගන්න කාට හරි පුළුවන් නම්, අවශ්‍ය උපරිම සහයෝගය අපි රජයක් හැටියට දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ හැර අපට පුළුවන්කමක් නැහැ හිතුමතේට තීරණ ගන්න. මොකද, අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට අපි කටයුතු කරන නිසා.

මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට නීතිපතිතුමා, ගරු විපක්ෂනායකතුමාවත්, සුමන්තිරන් මන්ත්‍රීතුමාවත් මුණගැසුණා. ඒ වෙලාවේ එතුමා පුද්ගලයින් 54 දෙනෙකුගේ නඩු සම්බන්ධයෙන් අපට කිව්වා. මම හිතන්නේ නඩු හැටියට ගත්තොත් නම් ඉතාම පොඩ්ඩයි තිබෙන්නේ. එම නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව කඩිනම්ව කටයුතු කරලා මාස දෙක, තුනක් ඇතුළත, එනම් ජනවාරි මාසය පමණ වෙනකොට අදාළ කටයුතු කිරීමට එතුමා බලාපොරොත්තු වෙන බව කිව්වා. සමහර නඩු තිබෙනවා, ඒ අය සිංහලද; ද්‍රවිඩද කියලා නැහැ, දේශපාලන ප්‍රවණ්ඩ ක්‍රියාවක් හෝ වෙනත් ත්‍රස්ත ක්‍රියාවක් වුණත් එම නඩු විභාග කර අවසන් වීමට බොහෝ කල් ගත වෙනවා. සමහර අපරාධ නඩු, මීනීමැරුම් නඩුවක් වුණත් අවසන් වෙන්න අවුරුදු 20ක් පමණ කාලයක් ගත වනවා කියලා දුෂණ සම්බන්ධයෙන් කටයුතු කරන අධීක්ෂණ කාරක සභාවේ දී ප්‍රකාශ වුණා. මීනී මැරුම් නඩුවක් අවසන් වෙන්න සාමාන්‍යයෙන් අවුරුදු 10ක්, 12ක් ගත වනවා. ඒ සම්බන්ධයෙන් තීන්දුව දීලා appeal කළාම තවත් අවුරුදු 7ක් පමණ ගත වෙනවා. Appeal එක සම්බන්ධයෙන් තීන්දුව දීලා අවසන් වුණාට පසුව තමයි දඬුවම් කාලය පටන් ගන්නේ. එතකොට සමහර වෙලාවට අවුරුදු 20ක් විතර කාලයක් දඬුවම විඳලා අභියාචනා තීන්දුවෙන් පසුව තමයි නැවත ඒ දඬුවමට යටත් වෙන්න සිදු වෙන්නේ. මොනම හේතුවක් නිසාවත් ඒ සඳහා එක පුද්ගලයෙක්, එක කණ්ඩායමක් ඉලක්ක කරගෙන නැහැ. හැබැයි අපි සැමවිටම බලන්නේ, "සිරකරුවෝ මනුෂ්‍යයෝ ය" කියන කාරණය හොඳට තේරුම් අරගෙන ඒ තුළ ඉඳගෙන කටයුතු කරන්නයි. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාගෙන් මම විශේෂ ඉල්ලීමක් කරනවා, අපට නීතියෙන් ලැබී තිබෙන ප්‍රතිපාදන තුළ ගැනීමට හැකි වෙනත් ක්‍රියාමාර්ගයක් තිබෙනවා නම් යෝජනා කරන්න කියලා. අපි ඒ සම්බන්ධයෙන් උපරිම සහයෝගය ලබා දෙන්න බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.


***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*ඒකමතිකව පිළිගනු ලැබිණි.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.09ට, 2018 ඔක්තෝබර් මස 26 වන සිකුරාදා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி.ப. 5.09 மணிக்கு பாராளுமன்றம், 2018 ஒக்ரோபர் 26, வெள்ளிக்கிழமை மு. ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Parliament adjourned accordingly at 5.09 p.m. until 10.00 a.m. on Friday, 26th October, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

263 වන කාණ්ඩය - 14 වන කලාපය
தொகுதி 263 - இல. 14
Volume 263 - No. 14

2018 ඔක්තෝබර් 26 වන සිකුරාදා
2018 ஒக்ரோபர் 26, வெள்ளிக்கிழமை
Friday, 26th October, 2018



# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

බරපතළ, වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරය අනිසි ලෙස භාවිතා කිරීම විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තන

2018 නොවැම්බර් 05 වන දින විශේෂ ආරක්ෂක වැඩ පිළිවෙළ

**විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට සපයා ඇති ආරක්ෂාව වැඩි කිරීම

සමෘද්ධි අධිකාරියේ සේවය කළ අයට පත්වීම් ලිපි නිකුත් නොකිරීම

**සක්‍රීය වගකීම් කළමනාකරණ පනත:**

යෝජනාව

**පරිපූරක මුදල:**

මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබා ගත් දේශීය හා විදේශීය ණය පියවීම


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புக்கள்:**

பாரிய மோசடி, ஊழல், அதிகாரத் துஷ்பிரயோகம், அரச சொத்துக்கள் மற்றும் சிறப்புரிமைகளைத் துஷ்பிரயோகம் செய்தமை தொடர்பாக விசாரணை செய்யும் ஜனாதிபதி விசாரணை ஆணைக்குழுவின் இறுதி அறிக்கையின் தமிழ் மற்றும் ஆங்கில மொழிபெயர்ப்புக்கள்

2018 நவம்பர் 05 ஆம் திகதிய விசேட பாதுகாப்பு ஒழுங்குகள்

**கணக்காய்வுச் சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கு வழங்கப்பட்டுள்ள பாதுகாப்பினை அதிகரித்தல்

சமூர்த்தி அதிகாரசபையில் சேவையாற்றியவர்களுக்கான நியமனக் கடிதங்கள் வழங்கப்படாமை

**தீவிர பொறுப்பு முகாமைத்துவச் சட்டம்:**

தீர்மானம்

**குறைநிரப்புத் தொகை :**

வீதி அபிவிருத்திக் கருத்திட்டம் சம்பந்தமாகப் பெறப்பட்ட உள்நாட்டு மற்றும் வெளிநாட்டுக் கடன்களை தீர்த்தல்


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Tamil and English Translations of Final Report of Presidential Commission of Inquiry to Investigate and Inquire Into Serious Acts of Fraud, Corruption and Abuse of Power, State Resources and Privileges

Special Security Arrangements on 5th of November, 2018

PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

PUBLIC FINANCE COMMITTEE REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Enhance Security Provided to Former President Mahinda Rajapaksa

Non-issuance of Appointment Letters to Employees of Samurdhi Authority

ACTIVE LIABILITY MANAGEMENT ACT:

Resolution

SUPPLEMENTARY SUPPLY:

Settlement of Local and Foreign Funded Loans Obtained for Road Development Projects

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2018 ඔක්තෝබර් 26 වන සිකුරාදා*
*2018 ඔක්ටோபர் 26, வெள்ளிக்கிழமை*
*Friday, 26th October, 2018*

**පූ.භා.10.00ට පාර්ලිමේන්තුව රැස්විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.

சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තන

### பாரிய மோசடி, ஊழல், அதிகாரத் துஷ்பிரயோகம், அரச சொத்துக்கள் மற்றும் சிறப்புரிமைகளைத் துஷ்பிரயோகம் செய்தமை தொடர்பாக விசாரணை செய்யும் ஜனாதிபதி விசாரணை ஆணைக்குழுவின் இறுதி அறிக்கையின் தமிழ் மற்றும் ஆங்கில மொழிபெயர்ப்புக்கள்

### TAMIL AND ENGLISH TRANSLATIONS OF FINAL REPORT OF PRESIDENTIAL COMMISSION OF INQUIRY TO INVESTIGATE AND INQUIRE INTO SERIOUS ACTS OF FRAUD, CORRUPTION AND ABUSE OF POWER, STATE RESOURCES AND PRIVILEGES

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 ජනවාරි 23 වැනි දින සභාවේ අවසරය ඇතිව සිංහල භාෂාවෙන් පමණක් සභාගත කරන ලද, බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තන අඩංගු සංයුක්ත තැටියක් සෑම ගරු මන්ත්‍රීවරයකුගේම සභා මේසය මත තබා ඇති බව දැනුම් දීමට කැමැත්තෙමි.

## II

### 2018 නොවැම්බර් 05 වන දින විශේෂ ආරක්ෂක වැඩ පිළිවෙළ

### 2018 நவம்பர் 05 ஆம் திகதிய விசேட பாதுகாப்பு ஒழுங்குகள்

### SPECIAL SECURITY ARRANGEMENTS ON 5TH NOVEMBER, 2018

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 නොවැම්බර් මස 05 වැනි සඳුදා ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2019 වර්ෂය සඳහා අය වැය කථාව ඉදිරිපත් කිරීමට අදාළව පහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන, කලින් වසරවලදී සිදු කළ ආකාරයටම ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත මෙයින් දන්වනු කැමැත්තෙමි.

- 2018 නොවැම්බර් මස 02වැනි සිකුරාදා සහ 05වැනි සඳුදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විවේක කාමර, ඇඳුම් අල්මාරි ද ඇතුළුව සමස්ත පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලම ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ලැබේ.
- 2018 නොවැම්බර් මස 05වැනි සඳුදා ආරක්ෂක වැඩ පිළිවෙළ පහත සඳහන් ආකාරයට සිදු කරනු ලබන බවද දන්වනු කැමැත්තෙමි.

(අ) මෙදින මහජන ගැලරිය ආරාධිත අමුත්තන් සඳහා පමණක් සීමා කරනු ලැබේ.

(ආ) මෙදින තම කලත්‍රයා කැටුව පැමිණෙන මන්ත්‍රීවරුන්ට කාර්ය මණ්ඩල පිවිසුමේ දී තම වාහනයෙන් බැස පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලට පිවිසිය හැකිය.

(ඇ) මෙදින මහජන ගැලරිය ආරාධිත අමුත්තන් වෙනුවෙන් සීමා කර ඇති බැවින්, තම කලත්‍රයා හැර තමන් කැටුව පැමිණෙන වෙනත් අමුත්තන් වෙතොත් ජයන්තිපුර පිවිසුමේදී වාහනයෙන් බැස්සවීමට කටයුතු කරන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

(ඈ) මෙදින පාර්ලිමේන්තුවට පැමිණීමේ දී, හැකිතාක් දුරට රියැදුරෙකු කැටුව පැමිණෙන ලෙස ද, අමුත්තන් කැටුව පැමිණීමෙන් වැළකී සිටින ලෙස ද, ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

(ඉ) මෙදින රථ වාහන පොලිසිය සහ සමීප පොලිස් ස්ථානයන් විසින් විශේෂ රථ වාහන සැලැස්මක් ක්‍රියාත්මක කරනු ඇත.

(ඊ) ඉහත යොමුවන විශේෂ විධිවිධාන සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අපේක්ෂා කෙරේ.

## විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## கணக்காய்வுச் சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) සහ 153ඌ ව්‍යවස්ථා ප්‍රකාරව 2018 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා (2018.04.01 - 2018.06.30) විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ලංකා - ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රතිසන්ධානය හා උතුර හා නැගෙනහිර නැවත ගොඩනැඟීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, **"වැය ශීර්ෂය 117 - වැඩසටහන 02 දරන පරිපූරක ඇස්තමේන්තුව"** සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on, "Appropriation Bill" and "Supplementary Estimate No 1 of 2018" which were referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

# පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පාඨලී චම්පික රණවක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ජේ. සී. අලවතුවල මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. J.C. Alawathuwala - State Minister of Home Affairs)
ගරු කථානායකතුමනි, මහවෙල, පල්දෙනිය, නුගහපොල වලව්ව යන ලිපිනයෙහි පදිංචි ජී.එල්.ජී. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා (තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித தெவரப்பெரும - வலுவாதார அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் பிரதேச அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Palitha Tewarapperuma - Deputy Minister of Sustainable Development, Wildlife and Regional Development)
ගරු කථානායකතුමනි, වැලිපැන්න, විතානගොඩ යන ලිපිනයෙහි පදිංචි සුනිත්‍රා ගයනී ජයසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ප්‍රසන්න රණවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### මන්නාරම, කිලිනොච්චිය, මුලතිව් හා වන්නි දිස්ත්‍රික්ක : වෛද්‍ය පීඨවලට සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන්
### மன்னார், கிளிநொச்சி, முல்லைத்தீவு, வன்னி மாவட்டங்கள்: மருத்துவ பீடத்திற்குத் தகைமைபெற்ற மாணவர்கள்
### MANNAR, KILINOCHCHI, MULLAITIVU AND VANNI DISTRICTS: STUDENTS QUALIFIED FOR MEDICAL FACULTIES

185/'18

**1. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2005 - 2014 සහ 2016 - 2017 වර්ෂවලදී මන්නාරම, කිලිනොච්චිය, මුලතිව් හා වන්නි යන දිස්ත්‍රික්කවලින් ජීව විද්‍යා විෂය ධාරාවෙන් පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව හා ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව හා ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා / ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනුම් ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உயர்கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2005 - 2014 மற்றும் 2016 - 2017ஆம் ஆண்டுகளில் க.பொ.த. (உயர் தர) பரீட்சைக்கு உயிரியல் பாடத்துறையில் மன்னார், கிளிநொச்சி, முல்லைத்தீவு மற்றும் வன்னி மாவட்டங்களிலிருந்து தோற்றியுள்ள மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கையில், பல்கலைக்கழக அனுமதிக்கான தகைமையை பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iii) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iv) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவன் அல்லது மாணவியின் ஆகக்குறைந்த பெறுபேறு, Z பெறுமதி, கல்வி கற்ற பாடசாலை மற்றும் தெரிவுசெய்யப்பட்ட மருத்துவ பீடம் யாதென்பதையும்;

ஒவ்வொரு மாவட்டத்தின்படி தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education & Cultural Affairs:

(a) Will he inform this House in respect of each district, separately-
  (i) the number of students who sat for the G.C.E. (Advanced Level) Examination in the Biology stream in 2005-2014 and 2016-2017 from Mannar, Kilinochchi, Mullaitivu and Vanni Districts;
  (ii) the number and the percentage of the students who were qualified for university entrance;
  (iii) the number and the percentage of the students qualified for Medical Faculties; and
  (iv) the minimum result of the students who were qualified for the Medical Faculty, the Z-score, the school in which each student studied and the Medical Faculty to which they got selected?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා අද දිනයේ නොමැති නිසා ගරු රාජ්‍ය ඇමතිතුමාටයි පිළිතුර ලබා දීමට නියමිතව තිබෙන්නේ. නමුත්, රාජ්‍ය අමාත්‍යතුමාත් මේ අවස්ථාවේදී ගරු සභාවේ නොමැති බැවින් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා. ගරු කථානායකතුමනි, මේ පිළිතුරට අදාළ විස්තර සංඛ්‍යා ලේඛන සහිතව ලොකු වගු හැටියටයි තිබෙන්නේ. මේ පිළිතුර සභාගත කරනවා නම් හොඳයි කියලායි මට නම් හිතෙන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, මම අසා තිබෙන ප්‍රශ්නයේ (iv) වැනි කොටසේ, "වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා / ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය" යන ප්‍රශ්නයට ඔබතුමා පිළිතුරක් ලබා දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ ප්‍රශ්නයට පිළිතුරත් ඇතුළත්ව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු තිබෙනවා. ඒ සියලුම පිළිතුරු දීර්ඝ වගු සහිතවයි තිබෙන්නේ. සංඛ්‍යා ලේඛන සියල්ල සහිතවයි පිළිතුර තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

කමක් නැහැ, එහෙම නම් ඔබතුමා මේ පිළිතුර සභාගත කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ පිළිතුර සභාගත කළාට පස්සේ ගරු මන්ත්‍රීතුමාට ඒක ප්‍රයෝජනයට ගන්න පුළුවන් නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම මේ පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|---|
| | කිලිනොච්චි | මන්නාරම | මුලතිව් | වවුනියා |
| 2005 | 106 | 171 | 113 | 183 |
| 2006 | 107 | 173 | 108 | 148 |
| 2007 | 72 | 132 | 51 | 138 |
| 2008 | 61 | 133 | 46 | 138 |
| 2009 | 54 | 112 | 32 | 167 |
| 2010 | 131 | 131 | 91 | 202 |
| 2011 | 129 | 155 | 113 | 177 |
| 2012 | 101 | 152 | 105 | 152 |
| 2013 | 132 | 173 | 139 | 199 |
| 2014 | 164 | 201 | 187 | 233 |
| 2016 | 184 | 228 | 175 | 316 |
| 2017 | 182 | 235 | 197 | 326 |

(ii)

| වර්ෂය | දිස්ත්‍රික්කය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කිලිනොච්චි | | මන්නාරම | | මුලතිව් | | වවුනියා | |
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 2005 | 51 | 48.1% | 74 | 43.3% | 59 | 52.2% | 88 | 48.1% |
| 2006 | 48 | 44.9% | 66 | 38.2% | 52 | 48.1% | 77 | 52.0% |
| 2007 | 24 | 33.3% | 67 | 50.8% | 27 | 52.9% | 78 | 56.5% |
| 2008 | 27 | 44.3% | 64 | 48.1% | 16 | 34.8% | 82 | 59.4% |
| 2009 | 13 | 24.1% | 64 | 57.1% | 13 | 40.6% | 104 | 62.3% |
| 2010 | 55 | 42.0% | 72 | 55.0% | 31 | 34.1% | 124 | 61.4% |
| 2011 | 66 | 51.2% | 73 | 47.1% | 47 | 41.6% | 107 | 60.5% |
| 2012 | 57 | 56.4% | 75 | 49.3% | 50 | 47.6% | 82 | 53.9% |
| 2013 | 52 | 39.4% | 82 | 47.4% | 55 | 39.6% | 105 | 52.8% |
| 2014 | 87 | 53.0% | 102 | 50.7% | 78 | 41.7% | 120 | 51.5% |
| 2016 | 102 | 55.4% | 115 | 50.4% | 93 | 53.1% | 170 | 53.8% |
| 2017 | 86 | 47.3% | 119 | 50.6% | 106 | 53.8% | 171 | 52.5% |

(iii)

| වර්ෂය | දිස්ත්‍රික්කය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කිලිනොච්චි | | මන්නාරම | | මුලතිව් | | වවුනියා | |
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 2005 | 4 | 7.8% | 5 | 6.8% | 6 | 10.2% | 6 | 6.8% |
| 2006 | 5 | 10.4% | 5 | 7.6% | 6 | 11.5% | 9 | 11.7% |
| 2007 | 6 | 25.0% | 5 | 7.5% | 6 | 22.2% | 9 | 11.5% |
| 2008 | 6 | 22.2% | 5 | 7.8% | 6 | 37.5% | 7 | 8.5% |
| 2009 | 6 | 46.2% | 5 | 7.8% | 6 | 46.2% | 8 | 7.7% |
| 2010 | 6 | 10.9% | 5 | 6.9% | 5 | 16.1% | 6 | 4.8% |
| 2011 | 9 | 13.6% | 7 | 9.6% | 6 | 12.8% | 13 | 12.1% |
| 2012 | 5 | 8.8% | 6 | 8.0% | 6 | 12.0% | 10 | 12.2% |
| 2013 | 7 | 13.5% | 5 | 6.1% | 5 | 9.1% | 9 | 8.6% |
| 2014 | 6 | 6.9% | 5 | 4.9% | 4 | 5.1% | 11 | 9.2% |
| 2016 | 7 | 6.9% | 6 | 5.2% | 5 | 5.4% | 17 | 10.0% |
| 2017 | 10 | 11.6% | 6 | 5.0% | 4 | 3.8% | 14 | 8.2% |

(iv) ඇමුණුම* යටතේ දක්වා ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, එහෙම නම් මම අතුරු ප්‍රශ්න දෙකක් ඔබතුමා මාර්ගයෙන් යොමු කරන්නම්. ඔබතුමා සාමාන්‍යයෙන් අසා තිබෙන අතුරු ප්‍රශ්නවලට වගකීමක් සහිතව පිළිතුරු එවා තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අසන සෑම අතුරු ප්‍රශ්නයකටම මම දැන් පිළිතුරු යවනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන මට ආරංචි වුණා. ඒක බොහොම හොඳයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඒක බොහොම හොඳයි.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමා දන්නවා ඇති, අග්නිදිග විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ පැන නැඟිලා තිබෙන ප්‍රශ්නය ගැන.

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා සභාවට පැමිණියා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, උසස් අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා සභාවට ආවා.

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education and Cultural Affairs)
මම උත්තර දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, අග්නිදිග විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ඇතිවෙලා තිබෙන ප්‍රශ්නය ඔබතුමාත් දන්නවා. දැන් දින 100කට වැඩි කාලයක් ශිෂ්‍යයන් කිහිප දෙනෙකුගේ පන්ති තහනම් කරලා, කිහිප දෙනෙකුගේ ශිෂ්‍ය භාවය අහෝසි කරලා තිබෙන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, එම ශිෂ්‍යයින් මොන වරදක් කළත් දැන් මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්නට ඕනෑ. ඒ ශිෂ්‍යයින්ගේ දෙමව්පියොත් මෙයට මැදිහත් වුණා. ඊයේ වන විට ශිෂ්‍යයෝ 15 දෙනෙකු අත් අඩංගුවට අරගෙනත් තිබෙනවා. ඒ වාගේම කැරැලි මර්දන ඒකකය සහ ගමේ අය මැදිහත් කරලා ශිෂ්‍යයන්ට පහර දෙන්නත් උත්සාහ කරලා තිබෙනවා. මෙහෙම ගියොත් මේ ප්‍රශ්නය ජාතිවාදී ගැටුමකින් කෙළවර වෙන්නත් පුළුවන්. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දිගින් දිගටම ඉතාම මුරණ්ඩු ආකාරයට මේ ප්‍රශ්නයට මැදිහත් වීම නිසා තමයි අද මෙතරම්ම දුර දිග ගිහිල්ලා තිබෙන්නේ. එම නිසා ඔබතුමන්ලා මේ ප්‍රශ්නය විසඳන්නට කල්පනා කරන්නේ කොහොමද?

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ගරු කථානායකතුමනි, මේක කාලයක් තිස්සේ සිදු වෙච්ච දෙයක්. නවක වදය දීම වෙනුවෙන්, සිසුන්ට දඬුවම් පැමිණවීමට විරුද්ධව අනෙක් සිසුන් කටයුතු කිරීම නිසා මේ ප්‍රශ්නය දිගින් දිගටම ගිහින් තිබෙනවා. මේ තිරිසන් නවක වදය නවත්වනවා නම් අපට මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්. නවක වදය නිසා අනෙක් අයගේ අයිතිවාසිකම් අහිමි වෙනවා නම්, ශිෂ්‍යයෝ විශ්වවිද්‍යාල අතහැර දමා යනවා නම්, එක අවුරුද්දකට සිය ගණනක්, සමහරවිට දහස් ගණනක් ශිෂ්‍යයෝ විශ්වවිද්‍යාලය තෝරා නොගෙන ඉන්නවා නම් ඒකට විසඳුම කුමක් හෝ කරලා නවක වදය නැවැත්වීම නොවෙයිද? ඔබතුමා දැන් කියනවා මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්නට ඕනෑ කියලා. දෙන්න පුළුවන් විසඳුම තමයි, කුමක් හෝ ක්‍රමයකින් මේ නවක වදය නැවැත්වීම. ඒ තාක් අපට මේ ගමන යන්නට සිද්ධ වෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
නවක වදය නිසා සමස්ත විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝම පීඩාවට පත් වෙන්නට ඕනෑ නැහැ. ඔබතුමා දන්නවා, දැන් මේ ප්‍රශ්නයට අවුරුදු එකහමාරකට ආසන්න කාලයක් ගතවෙලා තිබෙන බව. තාක්ෂණවේදය කියන විෂය ධාරාව අපි අලුතෙන් පටන් ගත්තේ. අපට තාක්ෂණවේදීන් වුවමනා කරනවා. විශේෂයෙන්, එතැන ශිෂ්‍යාවෝත් ඉන්නවා. මේ අය පීඩාවට පත් වෙනවා. දෙමවුපියෝත් දැන් දිගටම මෙයට මැදිහත් වුණා. ඒ වාගේම, යම් කිසි ආකාරයකට මෙහි වග කීමකුත් දෙමවුපියෝ භාර ගත්තා. එසේ තිබියදී, විශ්වවිද්‍යාල පරිපාලනයත් ශිෂ්‍යයන් වාගේ හැසිරෙන්න පටන් අරගෙන තිබෙන බව මට පෙනෙනවා.

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ඇත්තවශයෙන්ම, ශිෂ්‍යයෝ කියන කතන්දරයත්, වැඩිහිටියෝ හැටියට වග කීමක් නැතිව අපි සමාජයට දෙන පණිවිඩයත් මේ විධිය වුණාම, දෙමවුපියෝ නොමඟ යනවා. ඒ ආපු දෙමවුපියෝ ඉතා හොඳින් ඒ කරුණු තේරුම් අරගෙන තමයි දවස් දෙකකට පසුව ආපසු ගියේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔය කියන විධියට ඒ විශ්වවිද්‍යාලයට කැරලි මර්දන හමුදා දමලා නොවෙයි, උසාවි නියෝගයක් අරගෙනයි ඒ කටයුතු කළේ. විශ්වවිද්‍යාල පරිපාලන කාර්යාලය තුළ නැවතිලා, කිසිම පරිපාලනයක් නොකෙරෙන විධියට ශිෂ්‍යයෝ හතරදෙනෙක් කටයුතු කළා. එයිනුත් එක් අයෙකුගේ පමණයි මුලින්ම පන්ති තහනම් කරලා විශ්වවිද්‍යාලයෙන් ඉවත් කරන්න සිද්ධ වුණේ. ඔබතුමා කියන විධියට විසඳුමක් හැටියට අනෙක් අයට සමාව දුන්නාම, ඒ සමාව ලැබුණු ශිෂ්‍යයෝ ආපහු rag කළා. එක වතාවක් වරදකට අහුවෙලා, ඔබතුමා කියන විධියට විශ්වවිද්‍යාල දරුවෝ කියලා විසඳුමක් හැටියට සමාව දීලා, probationary period එකක් දුන්නාම, ඒ කාලය තුළ නැවතත් ගිහින් rag කරනවා. ඊට පසුව තමයි තවත් තුන්දෙනෙක් ආපහු අයින් කරන්න සිද්ධ වුණේ. එහෙම කළාට පස්සේ, මේ හතරදෙනාගේ ප්‍රශ්නය මුල් කරගෙන තව සිය ගණනක් එකතු කරගෙන දැන් මේ විධියට කටයුතු කරනවා. ඔබතුමා හිතනවා නම් මේක සාධාරණයි කියලා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ නොවෙයි, කිසිම සාරධර්මයක් නැති, කිසිම ආකාරයක සංයමයක් නැති ජනතාවක්ද අපි අනාගතයේ හදන්නේ? ඒකද ඔබතුමා කියන්නේ?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙවැනි ප්‍රශ්නයක් ඇතිවී අවුරුදු එකහමාරක්, දෙකක් යන කොට ඒකට මොකක් හෝ විසඳුමක් ගන්න අපි මැදිහත් වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ඇති වී තිබෙන ප්‍රශ්නය ගැන මේ සභාවේදී මීට සති දෙකකට කලිනුත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළා. ඇත්තටම ඒ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ලබාදෙන retention allowance එක කාලයක් තිස්සේ දුන්නා. නමුත් ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය නිවැරදිව අරගෙන නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නයට COPE එක පටලවාගන්න වුවමනාවක් නැහැ. ඒක දඩමීමා කරගෙන ඒ retention allowance එක දෙන්නේ නැහැ. අපි කිව්වේ, මහා භාණ්ඩාගාරයේ නිසි අනුමැතිය අරගෙන ඒ දීමනාව දෙන්න කියන එකයි. අග්නිදිග විශ්වවිද්‍යාලයේ ඒ විධියට දුන්නා. මේ වෙනකොට දවස් 20කට වැඩි කාලයක් තිස්සේ වෛද්‍ය පීඨය වසා දමා තිබෙනවා. ඒ ළමයින්ට මීට අවුරුද්දකට කලිනුත් අධ්‍යාපන කටයුතු අහිමි වුණා. මේක විසඳන්න පුළුවන් ප්‍රශ්නයක්. ආණ්ඩුව මුදල් දෙනවා නම්, ඒක නීත්‍යානුකූල කරගෙන දිගටම ලබා දෙන්න බැරි ඇයි?

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා**
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

ගරු මන්ත්‍රීතුමනි, වෛද්‍ය පීඨය වහලා දාලා තිබෙන්නේ අපි නොවෙයි. ගුරුවරු තමයි ඒක කරලා තිබෙන්නේ. ආචාර්ය මහාචාර්යවරු වැඩට යන්නේ නැහැ. අපි ඒ ගොල්ලන්ට දීලා තිබෙන honorarium එක දිරි දීමනාවකුත් නොවෙයි. එහෙම දීමනාවක් දෙන්න කිසිම ආකාරයක නීත්‍යානුකූල ක්‍රමයක් ඇත්තේත් නැහැ. එහෙත්, ආරම්භයේ සිට රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ තිබෙන ආචාර්යවරුන්ගේ නිහය නිසා ඒ ගොල්ලන්ට මේ විධියේ දීමනාවක් දීලා තිබෙනවා. ඇත්තටම බැලුවොත්, ඒ මුදල කිසිම ආකාරයක නියමිත අනුමැතියක් ඇතිව නොවෙයි දීලා තිබෙන්නේ. අදත් ඒ සඳහා වන සාකච්ඡාවක් අමාත්‍යාංශයේ පැවැත්වෙනවා. මොකක් හෝ ක්‍රමයකින් එම දීමනාව නීත්‍යානුකූල කරගන්න පුළුවන් නම් එහෙම හෝ, වෙනත් ක්‍රමයකින් හෝ අපි මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න තමයි කටයුතු කරන්නේ. වාර්තාවලින් මේ දීමනාව ගැන දැනගත්තාට පස්සේ, ඒ දීමනාව දුන්නේ කොහොමද කියලා හොයලා බලලා තමයි මහා භාණ්ඩාගාරය ඒක නවත්වලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර ලැබුණා නේද ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඒ දීමනාව දෙන එක COPE එකෙන් නැවැත්තුවේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් ගරු රාජ්‍ය ඇමතිතුමා, ඒ පිළිබඳව අවධානය යොමු කරන්න.

ප්‍රශ්න අංක 2 -250/'18- (2), ගරු හේෂා විතානගේ මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -405/'18- (1), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

## ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය: බඳවා ගැනීම්

## ஊவா மாகாண வீதிப் பயணிகள் போக்குவரத்து அதிகாரசபை: ஆட்சேர்ப்பு

## UVA PROVINCIAL ROAD PASSENGER TRANSPORT AUTHORITY: RECRUITMENT

507/'18

**4. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 2010 වර්ෂයේ සිට අද දක්වා සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව එම අධිකාරියේ මේ දක්වා ලබාදී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ රැකියා ලබාදුන් අයගේ නම්, ලිපිනය හා තනතුරු නාම කවරේද;

(iv) එම තනතුරු සඳහා බඳවා ගැනීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(v) ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවකයන්ගේ සුබසාධනය සඳහා ඌව පළාත් සභාව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத் துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊவா மாகாண சபையின் கீழ் நிருவகிக்கப் படுகின்ற ஊவா மாகாண வீதிப் பயணிகள் போக்குவரத்து அதிகாரசபையில் 2010ஆம் ஆண்டில் இருந்து இற்றைவரை சேவையில் ஈடுபட்டுள்ள மொத்த ஊழியர் எண்ணிக்கை ஆண்டுவாரியாக தனித்தனியாக எவ்வளவு;

(ii) நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர் மேற்படி அதிகாரசபையில் இற்றைவரை வழங்கப்பட்டுள்ள தொழில்களின் எண்ணிக்கை யாது;

(iii) இவ்விதமாக தொழில் வழங்கப்பட்டவர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் பதவிப் பெயர்கள் யாவை;

(iv) மேற்படி பதவிகளுக்காக ஆட்சேர்ப்பு செய்த வேளையில் கடைப்பிடிக்கப்பட்ட முறையியல் யாது;

(v) ஊவா மாகாண வீதிப் பயணிகள் போக்குவரத்து அதிகாரசபை ஊழியர்களின் நலனோம்பலுக்காக ஊவா மாகாணசபை மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House-

(i) separately, on per year basis from 2010 up to now, the total number of employees serving in the Uva Provincial Road Passenger Transport Authority coming under the Uva Provincial Council;

(ii) the number of jobs that have been given in that Authority from the day the "Good Governance" Government came into power;

(iii) the names, addresses and the designations of the persons to whom the aforesaid jobs were given;

(iv) the procedure followed to recruit persons to those posts; and

(v) the steps that have been taken by the Uva Provincial Council with regard to the welfare of the employees in the Uva Provincial Road Passenger Transport Authority?

(b) If not, why?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 2010 වර්ෂයේ සිට අද දක්වා සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව පහත දැක්වේ.

| වර්ෂය | සේවක සංඛ්‍යාව |
|---|---|
| 2010 | 139 |
| 2011 | 132 |
| 2012 | 120 |
| 2013 | 118 |
| 2014 | 118 |
| 2015 | 120 |
| 2016 | 112 |
| 2017 | 114 |

(ii) එත්මන් යහ පාලන රජය බලයට පත් වීමෙන් අනතුරුව එම අධිකාරියේ මේ දක්වා ලබා දී ඇති රැකියා සංඛ්‍යාව 10කි.

(iii)

| අනු අංකය | නම | ලිපිනය | තනතුර |
|---|---|---|---|
| 1 | ඩී.බී. ආනන්ද කරුණානායක මහතා | පර්සි සමරවීර මාවත, මීගහකිවුල | සාමාන්‍යාධිකාරී |
| 2 | කේ.සමන්ත විජේසේකර මහතා | 248/53, ධම්මෝදය පාර, මොනරාගල | ප්‍රධාන ස්ථාන පාලක |
| 3 | එච්.පී. සාගර මහතා | අංක 59, සිරිමයුරපුර, මොනරාගල | ස්ථාන පාලක |
| 4 | ශෂිකා අමෝදා දිල්හාරි වනිගාබදු මෙනවිය | නවතානායම අසල, ඇල්ල පාර, වැල්ලවාය | කළමනාකරණ සහකාර |
| 5 | එච්.ඩබ්ලිව්. ජානක තිලක් මහතා | සෙත්සිරි මාවත, පොතුවිල් පාර, මොනරාගල | සටහන්කරු |
| 6 | ලසිත නිර්මල ගුණසේකර මහතා | අංක 484, කෙළින්විදිය, පස්සර | වේලා සටහන්කරු |
| 7 | ආර්.එම්. සමන්ත කුමාරසිරි මහතා | දියවැටනැල්ල, අලවතුගොඩ, බෝගහකුඹුර | වේලා සටහන්කරු |
| 8 | සිවරාජා රවීන්ද්‍ර කුමාර් මහතා | 60/බී, බදුලුපිටිය, බදුල්ල | වේලා සටහන්කරු |
| 9 | ආර්.එම්. වසන්ත රත්නායක මහතා | නිල්මිණි සෙවණ, 8 කණුව, තල්දෙන | වේලා සටහන්කරු |
| 10 | කේ.ජී. සුදේෂ් තරංග මහතා | ගමගේ, විහාරමහදේවි පෙදෙස, කතරගම | වේලා සටහන්කරු |

(iv) අර්ධ රාජ්‍ය ආයතනයක් වශයෙන්, ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියට සේවකයන් බඳවා ගැනීම සඳහා වන බලතල 2001 අංක 01 දරන ඌව පළාත් මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 21 වන වගන්තිය යටතේ, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව, අධිකාරියේ කටයුතු කරගෙන යෑමට අවශ්‍ය කාර්ය මණ්ඩලය තීරණය කිරීම සහ එම කාර්යයට අදාළව සේවකයන් පත් කිරීම සඳහා ගරු සභාපතිතුමාට බලය ඇත.

ඒ අනුව ප්‍රවාහන අධිකාරියේ ගරු සභාපතිතුමාට හා අධිකාරියේ කාර්යාලයට ලැබෙන රැකියා අයදුම්පත් අනුව පුද්ගලයන් සම්මුඛ පරීක්ෂණයකට හාජන කර -සුදුසුකම් පරීක්ෂා කර- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය පරිදි සුදුස්සන් බඳවාගෙන ඇත.

(v) ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය අර්ධ රාජ්‍ය ආයතනයක් වන බැවින්, පළාත් සභා අරමුදල් සුබසාධන කටයුතු සඳහා යොදා ගනු නොලැබේ. කෙසේ වෙතත් සේවකයන්ගේ සුබසාධන කටයුතු ඔවුන් ස්වේච්ඡාවෙන්/ සාමූහිකව සිදු කර ගනු ලබයි.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, පිළිතුර ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වනවා. ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට විශාල සේවක සංඛ්‍යාවක් බඳවා ගෙන තිබෙනවා. ඒ විධිමත් ක්‍රමවේදය පිළිබඳව ඔබතුමිය පැහැදිලි කළා. හැබැයි, මේ බඳවා ගන්නා සේවකයන්ගේ රාජකාරි අතරින් එකක් තමයි බස් ධාවනය සඳහා බලපත්‍ර -permits- ලබා දීම. ගරු කථානායකතුමනි, රේඛීය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාත් මේ සභාවේ ඉන්නවා. අද රුපියලක්-දෙකකට ජීවිත විශාල සංඛ්‍යාවක් නැති වෙන්නේ, මේ route permits ලබා දීමේදී අවිධිමත් ආකාරය නිසායි. පළාත් සභාව එක පැත්තකින් route permits දෙනවා; මධ්‍යම රජය තව පැත්තකින් route permits දෙනවා. ඉතින් මේ නිලධාරීන් බඳවාගෙන මේ වැඩ පිළිවෙළ නිසියාකාරව නොකිරීම, මා කලින් සඳහන් කළ අර්බුදයට වාගේම, අද රටේ විශාල මාර්ග තදබදයක් ඇති වීමටත් හේතු වෙලා තිබෙනවා. අසීමිත ලෙස route permits ලබා දෙනවා. ඒ නිසා මේ බලපත්‍ර ලබා දීමේදී අනුගමනය කළ යුතු වැඩ පිළිවෙළක් සහ ධාවන කාල සටහනක් පිළිබඳව ඒ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් අමාත්‍යාංශය මට්ටමෙන් පවත්වන්න ඕනෑය කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමියනි, එහෙම නැත්නම් ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධ වෙලා ඔබතුමියගේ අමාත්‍යාංශය මේ තිබෙන ගැටලුව - ඔබතුමිය මේ ගැටලුව දකිනවාද කියලා මා දන්නේ නැහැ. මම සමාජය තුළ ඉන්න නිසා මේ තිබෙන ගැටලුව මා ප්‍රායෝගිකව දකිනවා. ඔබතුමිය එම ගැටලුව දකිනවා නම් එය මහහරවා ගැනීම සඳහා ස්ථිර වැඩ සටහනක් අමාත්‍යාංශය හැටියට යෝජනා කරනවාද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමා කියපු විධියේ ප්‍රශ්නයක් රටේ තිබෙන බව අපට පෙනිලා තිබෙනවා. මෙහිදී මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියත්, පළාත් සභාවේ ප්‍රවාහන අමාත්‍යාංශයත්, මධ්‍යම රජයේ ප්‍රවාහන අමාත්‍යාංශයත් එකතුවෙලා කරන වැඩ පිළිවෙළකින් තමයි මේ ගැටලුව විසඳා ගන්න පුළුවන් වන්නේ. සමහර තැන්වල යම් තරමකට විසඳාගෙන තිබෙනවාය කියලා අපි දැක තිබෙනවා. එය තවදුරටත් විසඳන්න ඕනෑ නම් අමාත්‍යාංශ දෙකම එකතුවෙලා කටයුතු කරන එක තමයි කරන්න තිබෙන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඒකම තමයි මමත් ඔබතුමියට යෝජනා කළේ. ඔබතුමිය මම කියපු කාරණයම සඳහන් කිරීම නොවෙයි මම බලාපොරොත්තු වුණේ. මම බලාපොරොත්තු වුණු උත්තරය යෝජනාවක් සහ වැඩ සටහනක් කියන කාරණයයි.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඇත්තටම මේ ආයතනය සතු තවත් එක් කාර්ය භාරයක් තමයි ඔය බඳවා ගන්නා නිලධාරීන්ගේ ලොග් සටහන් පොත් කලට වේලාවට නිකුත් කිරීම. මම දන්නා විධියට මේ ආයතනයට ලැබෙන්න තිබෙන මුදල රජයට ලැබිය යුතු මුදලක්. විශේෂයෙන්ම අපේ පළාත තුළ මේ රජයට ලැබිය යුතු මුදල පෞද්ගලික කණ්ඩායමක් විසින් අය කර ගැනීම සිදු වෙනවා. ඒක මම පැහැදිලිම දන්නවා. මම පසු ගිය කාලයේත් මේ ප්‍රශ්නය මතු කළා. නමුත් ඒක නතර වෙලා නැහැ. පෞද්ගලික බස් සමාගමක් විසින් මේ ලොග් සටහන් මගින් රජයට ලැබිය යුතු ආදායම එකතු කිරීම සඳහා කටයුතු කර තිබෙනවා. මම හිතන විධියට ඒක ශුභසාධන කටයුත්තක් සඳහා යොදවලාද දන්නේ නැහැ. වක්‍රාකාරව ඒක නැවතත් පළාතේ දේශපාලන අධිකාරියේ සාක්කුවට යනවාද කියන එක තමයි සමාජයේ තිබෙන කථිකාව.

ඒ නිසා විශේෂයෙන්ම රජයට එකතු විය යුතු මුදල ලබා ගෙන තිබෙනවාද, ඒ වාගේම මා මුලින් සඳහන් කළ ආකාරයට එහෙම කටයුතු කරනවාද යන්න විමසා බලා, මේ කාරණය සම්බන්ධව ගත හැකි තීරණය-තීන්දුව මේ සභාවට වාර්තා කරන්න ඔබතුමියට පුළුවන්ද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මේ සම්බන්ධයෙන් දැන් පිළිතුරක් ලබා දීමට අවශ්‍ය තොරතුරු මා ළඟ නැහැ. ඒ නිසා ඉදිරියේ දී මන්ත්‍රීතුමාට පිළිතුරක් ලබා දීමට කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 5 -547/'18- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

## වගා හානි සඳහා වන්දි : කුරුණෑගල දිස්ත්‍රික්කය
## பயிர்ச் செய்கைச் சேதத்திற்கான இழப்பீடு: குருநாகல் மாவட்டம்
## COMPENSATION FOR CROP DAMAGES: KURUNEGALA DISTRICT

576/'18

**6. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1);

(අ) (i) වගා හානි හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පීඩාවට පත්වී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) වන්දි ලබා ගැනීම සඳහා මේ වනවිට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට ඉල්ලුම් කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල් අතරින් දැනට වන්දි ලබාදී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පවුල් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ගොවි පවුල් සඳහා කඩිනමින් වන්දි ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பயிர்ச் செய்கை சேதமடைந்ததால் குருநாகல் மாவட்டத்தில் பாதிக்கப்பட்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) இழப்பீட்டுக்காக தற்சமயம் விவசாய மற்றும் கமநலச் சேவைக் காப்புறுதிச் சபையிடம் விண்ணப்பித்துள்ள குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) மேற்படி குடும்பங்களில் இழப்பீடு பெற்றுக் கொடுக்கப்பட்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) இக்குடும்பங்களின் எண்ணிக்கை பிரதேச செயலாளர் பிரிவிற்கு ஏற்ப தனித்தனியே எவ்வளவென்பதையும்;

(v) மேற்படி விவசாயக் குடும்பங்களுக்கு விரைவில் இழப்பீட்டைப் பெற்றுக்கொடுப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் வழிமுறைகள் யாவை என்ப தையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture :

(a) Will he inform this House-

(i) the number of families that got affected due to the crop damages in the Kurunegala District ;

(ii) the number of families that have applied for compensation from Agriculture and Agrarian Insurance Board by now;

(iii) the number of families for which the compensation has been provided out of the aforesaid families;

(iv) separately, in terms of each Divisional Secretary's Division, of the aforesaid number of families,

(v) the measures that would be taken by the Ministry for the immediate delivery of compensation for aforesaid families?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2017/18 මහ කන්නය සඳහා වගා හානි හේතුවෙන් පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව 15,984කි.

(ii) 2017/18 මහ කන්නය සඳහා වගා හානි වූ ගොවීන් 13,007 දෙනෙකු වන්දි ඉල්ලුම් කර තිබුණි.

(iii) 2017/18 මහ කන්නය සඳහා වන්දි ඉල්ලුම් කළ ගොවීන් 12,041කගේ හානි වූ වගා බිම් අක්කර 8,436.28ක් සඳහා රුපියල් 110,045,779.75ක වන්දි මුදලක් මේ වනවිට ගෙවා නිම කොට ඇත. වන්දි ඉල්ලීම්වල ගැටලු පැවති ගොවීන් සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී ඇත.

(iv) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගෙවීම් සිදු නොකරන අතර, 2017/18 මහ කන්නයේ වගා හානි වී, වන්දි ඉල්ලුම් කළ ගොවීන් සඳහා ගෙවූ වන්දි මුදල් පිළිබඳ විස්තර, ගොවිජන සේවා මධ්‍යස්ථාන අනුව වගුවක් හැටියට ඉදිරිපත් කර තිබෙනවා. එය දීර්ඝ ලේඛනයක් නිසා මා එම වගුව **සභාගත*** කරනවා. එහි එකතුව පමණක් මා සඳහන් කරන්නම්. ගොවීන් සංඛ්‍යාව 12,041යි, අක්කර ප්‍රමාණය 8,436.28යි, ගෙවූ වන්දි මුදල රුපියල් 110,045,779.75යි.

(v) වගා බදු අරමුදල ද ඇතුළුව කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අරමුදල් යොදා ගනිමින්, 2017/18 මහ කන්නය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ වගා හානි වූ ගොවීන් සඳහා ඉහත දක්වා ඇති පරිදි අදාළ වන්දි මුදල් ගෙවා ඇති අතර වන්දි ඉල්ලීම්වල ගැටලු පැවති ගොවීන් සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී ඇත. මෙම අභියාචනාවල හේතු සලකා බැලීමේදී, තවදුරටත් වන්දි හිමිවිය යුතු ගොවීන් සිටී නම්, එම ගොවීන් සඳහා ද ඉදිරියේදී අදාළ වන්දි මුදල් ලබා දීමට අපේක්ෂා කෙරේ.

(ආ) අදාළ නොවේ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම ඇමතිතුමා අද දින මේ ගරු සභාවේ සිටියා නම් මා ඉතාමත් සන්තෝෂ වෙනවා. නමුත් එතුමා මේ සභාවේ නැහැ. මට අතුරු ප්‍රශ්න අහන්න අවශ්‍ය නැහැ. නමුත් යම් ප්‍රකාශයක් කළ යුතුයි. කෘෂි රක්ෂණ මණ්ඩලය ගැන මට ප්‍රශ්නයක් තිබෙනවා. මා අද ප්‍රසිද්ධියේ මෙය ප්‍රකාශ කරනවා. මේ ප්‍රශ්නය කෙරෙහි මුළු රටේම අවධානය යොමු කරන්න අවශ්‍යයි. දුරකථන ඇමතුමකට නිලධාරියකු සම්බන්ධ කර ගන්න බැරි පුදුමාකාර ආයතනයක් තමයි, අපේ රටේ තිබෙන කෘෂි රක්ෂණ මණ්ඩලය. මා හිතන විධියට අවුරුදු ගණනාවක සිට මේ ප්‍රශ්නය තිබෙනවා. දුරකථන ඇමතුමක් ගත්විට සාමාන්‍ය ලිපිකාරිණියකවත් - කළමනාකරණ සහකාරවරයකුවත් - එම දුරකථන ඇමතුමට පිළිතුරු දෙන්නේ නැහැ. විසි වාරයක්, තිස් වාරයක් දුරකථනය නාද කිරීමෙන් පසුව ඇමතුමට ආවත්, අපි යම් නිලධාරියකුගේ නමක් කියා ඉල්ලුවාම දෙන්නේ නැතිව දුරකථනය විසන්ධි කරනවා. ඒ තරම් අයාලේ යන ආයතනයක්.

අපේ රටේ ගොවියෝ බොහොම අහිංසකයි. ඔවුන් දුප්පත්, සාමාන්‍ය මිනිසුන්. මහජන නියෝජිතයන් හැටියට අපි, "මම තමයි අහවලා" කියා හඳුන්වා දෙන විටත් එම දුරකථන ඇමතුම් සහ ඒ සන්නිවේදන ඒ විධියට අවභිර කරනවා නම්, අපේ රටේ ගොවි ජනතාවට, ඒ අහිංසක මිනිසුන්ට මේ ආයතනයෙන් සිදු වන අවනඩුව ගැන කියන්නේ කාටද? ගරු කෘෂිකර්ම ඇමතිතුමා මේ ගරු සභාවේ දැන් හිටියා නම් හොඳයි. මම මේ අවස්ථාවේදී ඒ ගැන විශේෂ අවධානය යොමු කරවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමාත් ඒ ගැන අවධානය යොමු කරන්න. එහෙම වෙනවා නම් ඒක හොඳ මදි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, වගා හානි වෙනුවෙන් වන්දි ලබාදීමේදී, එක් එක් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවලට විවිධ විධියට එම වන්දි ලැබී තිබෙන ආකාරය අපි දැක්කා. එක් එක් ග්‍රාම නිලධාරි වසම්වලටත් විවිධ විධියටයි එම වන්දි ලැබී තිබෙන්නේ. ඒ වන්දි නිසි ප්‍රමිතියකින් තොරවයි ලබාදී තිබෙන්නේ. වන්දි ලැබිය යුතු අයට ලැබිලා නැහැ. නුසුදුසු අයට ලැබී තිබෙනවා. මේ පිළිබඳවත් මට ගැටලු තිබෙනවා. ඒ ගැන කථා කරන්නත් කෘෂිකර්ම ඇමතිතුමා මේ අවස්ථාවේ සිටියා නම් හොඳයි. මම ඒ පිළිබඳවත් අවධානය යොමු කරවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ පිළිබඳවත් ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න, ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

එම කාරණා දෙකම මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -597/'18- (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -600/'18- (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ඉහලකාගම පුරාණ විහාරස්ථානය සංවර්ධනය: ගනු ලබන පියවර
## இஹலகாகம புராண விகாரையின் அபிவிருத்தி: எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள்
## DEVELOPMENT OF IHALAKAGAMA ANCIENT TEMPLE: STEPS TAKEN

975/'18

**9. ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉහලකාගම පුරාණ විහාරස්ථානය සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம் மாவட்டத்தின் இப்பலோகம பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள இஹலகாகம புராண விகாரையை அபிவிருத்தி செய்ய அவசியமான நடவடிக்கைகளை எடுப்பாரா;

(ii) ஆமெனில், அத்திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana:

(a) Will he inform this House-

(i) whether he will take necessary steps to develop the Ihalakagama ancient temple located within Ipalogama Divisional Secretariy's Division in the Anuradhapura District;

(ii) if so, the date on which this will be done?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබාදෙනවා.

මෙතුමා අහන විධියේ පන්සලක් නැහැය කියා බුද්ධ ශාසන අමාත්‍යාංශයෙන් දැනුම් දීලා තිබෙනවා. ඒ පන්සලේ නම ආපහු කියන්න, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ඉහලකාගම විහාරය. ගරු ඇමතිතුමාට එන්න කියන්න. මම එතුමා එක්කගෙන ගිහින් පෙන්වන්නම්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

එහෙම නොවෙයි, ඒ පන්සලේ නම කියන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඇමතිතුමා එක්කගෙන යන්න ඔබතුමාට අමාරුයි. ඒ නිසා විස්තර කියන්න, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමනි.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ඉහලකාගම.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

පන්සලේ නම කියන්න.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ඉහලකාගම පුරාණ විහාරය. හැරිසන් ඇමතිතුමාත් ඒ පන්සල ගැන දන්නවා. මේ එතුමාගේ ගමට අල්ලපු ගමයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
"ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉහලකාගම පුරාණ විහාරස්ථානය නමින් විහාරස්ථානයක් නැත" කියා බුද්ධ ශාසන අමාත්‍යාංශය කියනවා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, ලංකාව බෞද්ධ රටක්. බෞද්ධ රටක අමාත්‍යාංශයක් මෙහෙම කියන එක ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන සොයා බලන්න කියමු.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
අපේ හාමුදුරුවෝ තමයි මේ ලියුම දුන්නේ. ගරු කථානායකතුමනි, ලංකාවේ රජ කළ බොහෝ රජවරු තමන්ගේ රාජධානිය බවට පත් කර ගත් තැනක් තමයි අනුරාධපුරය. පුරාණ විහාරවලට ආධාර ලබා දෙනවාය කියා අපේ රජයේ ප්‍රතිපත්තියක් තිබුණා. මම පුරාණ විහාර 100කට මුදල් ඉල්ලුවා. අද වන තෙක් මම ඉල්ලපු එක විහාරයකටවත් සතයක්වත් දුන්නේ නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළව එවා තිබෙන පසුබිම් වාර්තාව මම දැන් කියවන්නම්. "ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබාගත් තොරතුරු අනුව එම කොට්ඨාසයේ, 'ඉහලකාගම පුරාණ විහාරස්ථානය' නමින් විහාරස්ථානයක් නොමැත. එසේ වුවද, ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි 'ඉහලකාගම බුදුගේකන්ද රජමහා විහාරස්ථානය' සංවර්ධනය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කර ඇත" කියා එහි සඳහන් වෙනවා. එම විහාරස්ථානයේ සංවර්ධනය සඳහා 2018 වසරේ මෙම අමාත්‍යාංශය ප්‍රතිපාදන වෙන් කර නැහැ. මෙතැනදී නමේ පටලැවිල්ලක් වෙන්න ඇති කියා මම හිතනවා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තමයි වැඩිම බෞද්ධ ජනතාවක් ජීවත් වන්නේ. ඒ නිසා අපි බෞද්ධාගම රකින්න ඕනෑ. මෙහෙම ගියොත් අපි කොහොමද එය රකින්නේ? ඒ ගැන මට හරි වේදනාවක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක පටලැවිල්ලක්ද දන්නේ නැහැ. ඒ ගැන අපි හොයා බලමු.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, කිසි පටලැවිල්ලක් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට පිටුපස පේළියේ ගරු පී. හැරිසන් ඇමතිතුමාත් ඉන්නවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමා කියපු විධියේ පන්සලක් නැහැ, නමුත්, ආධාර දීපු පන්සලක් තිබෙනවාය කියා ගරු පී. හැරිසන් ඇමතිතුමා කියනවා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
හැරිසන් ඇමතිතුමා දන්නේ නැහැ. එතුමා යන්නේ ලොකු පන්සල්වලට නේ. එතුමා පොඩි පන්සල්වලට යන්නේ නැහැ.

**ගරු පී. හැරිසන් මහතා (සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - சமூக வலுவூட்டல்கள் அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Social Empowerment)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ඇමතිතුමනි, කියන්න.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා කියන විධියට ඉහලකාගම පන්සල කියා වෙනම පන්සලක් නැහැ. ඉහලකාගම කියන්නේ ගමක්. ඒ ගමේ පන්සලේ නම ඉහලකාගම බුදුගේකන්ද රජමහා විහාරස්ථානයයි. ඒ පන්සල සංවර්ධනය සඳහා ගිය අවුරුද්දේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රතිපාදන යටතේ මුදල් දීලා තිබෙනවා. බුද්ධ ශාසන අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කර නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් එයට මුදල් වෙන් කර තිබෙනවා. ලොකු පන්සල්වල ස්වාමීන් වහන්සේලාත් මාත් එක්ක එකඟයි, පොඩි පන්සල්වල ඉන්න හාමුදුරුවරුනුත් එකඟයි, බෞද්ධයකු හැටියට මම ඒ සියලු පන්සල්වලට යනවාය කියන එක ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමාට මම කියන්න ඕනෑ. මේක ඡන්දය බලාගෙන කරන විජ්ජාවක් නොවෙයි, ගරු කථානායකතුමනි. සියලුම ආගමික ස්ථානවලට අපි සහයෝගය ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක පටලැවිල්ලක් වෙන්න ඇති කියා මම කිව්වේ ඒකයි. අපි මේ කාරණය විසඳා ගනිමු, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු ඇමතිතුමනි, අපිත් ඡන්ද බලාගෙන වැඩ කරන්නේ නැහැ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාව මා ගැන තැබූ විශ්වාසයට පක්ෂ, පාට, කුල මල භේදයක් නැතිව මම වැඩ කරනවා. මට පක්ෂයක් නැහැ, ගරු ඇමතිතුමනි. කිසිදු ආගම් භේදයක් නැතිව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාව වෙනුවෙන් මම වැඩ කරනවා. ඔබතුමා බෞද්ධයෙක්. මම මුස්ලිම් ජාතිකයෙක්. මම හැම ආගමකටම සම ස්ථානය දීලා කටයුතු කරන මනුෂ්‍යයෙක්.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. බුද්ධ ශාසන අමාත්‍යතුමා දැනුවත් කරන්නම්. බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා වරද්ද වරද්ද හෝ ඒ ප්‍රශ්නය අහපු එක ගැන අපි සන්තෝෂ වෙන්න ඕනෑ. ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා මඟින් දෙවැනි අතුරු ප්‍රශ්නය බුද්ධ ශාසන ඇමතිතුමාට මා යොමු කරනවා. ගිලන් වූ හාමුදුරුවන් වහන්සේලා සඳහා රජයේ යම් දීමනාවක් ලබා දුන්නා. මට හාමුදුරුවන් වහන්සේලා දෙනමක් කථා කර කිව්වා, "පසුගිය ජූලි මාසයේ ඉඳලා ඒ දීමනාව ලැබෙන්නේ නැහැ." කියා. ගිලන් වූ හාමුදුරුවන් වහන්සේලා ඉන්නේ සීමිත සංඛ්‍යාවක් පමණයි. එම නිසා මම ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි, එම දීමනාව අඛණ්ඩව ලබා දීම සඳහා බුද්ධ ශාසන ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කියා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
හොඳයි.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, එතුමාගේ අවධානයට යොමු කරවන්න.
ප්‍රශ්න අංක 10 - 999/'18 - (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා- *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 11- 1135/'18 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 12- 1149/'18 - (1), ගරු එස්.සී. මුතුකුමාරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 13- 1174/'18 - (1), ගරු විදුර වික්‍රමනායක මහතා.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(මාණ්පුමිකු විතුර වික්කිරමනායක්ක)
(The Hon. Vidura Wickramanayaka)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*වෙනත් දවසක් සඳහා ප්‍රශ්නය කල් තබන ලදී.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14- 1186/'18 - (1), ගරු බිමල් රත්නායක මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය. ප්‍රශ්න අංක 2.

## සෙවනගල සීනි කර්මාන්තශාලාව: නිෂ්පාදනය ඉහළ නැංවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග
## செவனகல சீனித் தொழிற்சாலை: உற்பத்தியை அதிகரிக்க எடுத்த நடவடிக்கைகள்
## SEVANAGALA SUGAR FACTORY: MEASURES TAKEN TO INCREASE PRODUCTION

250/'18

**2. ගරු කේ.කේ. පියදාස මහතා (හේෂා විතානගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு கே.கே. பியதாஸ - மாண்மிகு ஹேசா விதானகே சார்பாக )
(The Hon. K.K. Piyadasa on behalf of the Hon. Hesha Withanage)
රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) සෙවනගල සීනි කර්මාන්තශාලාව පසුගිය වසර 10 තුළ ලබා ඇති ලාභය හෝ අලාභය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දැනට මෙම කර්මාන්තශාලාවේ සේවයේ නියුතු ස්ථිර හා අනියම් කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වසර කිහිපය තුළ මෙම කර්මාන්තශාලාවේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මෙම කර්මාන්තශාලාවෙන් මීට වඩා නිෂ්පාදනයක් ළඟා කර ගැනීම සඳහා සුදුසුකම්ලත් නිසි කළමනාකාරිත්වයක අවශ්‍යතාවය පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ වෙනුවෙන් ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මේ සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

අරස තොළිල්මුයර්චි මර්‍රුම් කණ්ඩි නගර අපිවිරුත්දි අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) செவனகல சீனித் தொழிற்சாலை கடந்த 10 ஆண்டுகளில் பெற்றுள்ள இலாபம் அல்லது நட்டம் வருட வாரியாக தனித்தனியாக எவ்வள வென்பதையும்;

(ii) தற்போது மேற்படி தொழிற்சாலையில் கடமை யாற்றுகின்ற நிரந்தர மற்றும் அமைய பணியாட் டொகுதியினர் தனித்தனியாக எவ்வளவென் பதையும்;

(iii) மேற்படி தொழிற்சாலையின் உற்பத்தியை அதிகரிக்கச் செய்ய கடந்த சில ஆண்டுகளில் எடுத்துள்ள நடவடிக்கைகள் யாவையென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி தொழிற்சாலையிலிருந்து இதைவிட அதிகமான உற்பத்தியை அடையப்பெறுவதற் காக தகைமைமிக்க உரிய முகாமைத்துவ மொன்றின் தேவையை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) ஆமெனில், அது தொடர்பாக எதிர்காலத்தில் மேற்கொள்ள உத்தேசித்துள்ள நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise and Kandy City Development:

(a) Will he inform this House -

(i) the profit earned or the loss incurred by the Sevenagala Sugar Factory during the last 10 years, separately each year;

(ii) the number of permanent and casual staff employed in this factory separately; and

(iii) the measures taken in the last few years to increase the production of this factory?

(b) Will he also inform this House-

(i) it is admitted that a well qualified and proper management is required to achieve a higher production from this factory; and

(ii) if so, the measures expected to be taken in the future?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | ලබා ගෙන ඇති ලාභය/ අලාභය (මිලියන) |
|---|---|
| 2008 | පෞද්ගලික ව්‍යවසායකයෙකු යටතේ පාලනය වූ කාල සීමාවකි |
| 2009 | |
| 2010 | |
| 2011 | |
| 2012 | 428,121,943 |
| 2013 | 323,591,646 |
| 2014 | 135,630,713 |
| 2015 | (234,365,443) |
| 2016 | 388,013,213 |
| 2017 | 485,772,566 |

(ii)

| 2018.08.31 වන විට - සේවක සංඛ්‍යාව | |
|---|---|
| සේවක කාණ්ඩය | ප්‍රමාණය |
| ස්ථිර සේවකයින් | 332 |
| නිශ්චිත කාලීන කොන්ත්‍රාත් සේවකයින් | 289 |
| අනියම් සේවකයින් | 289 |
| පුහුණු සේවකයින් | 29 |
| එකතුව | 939 |

(iii) සෙවනගල ව්‍යාපෘතියේ සැලසුම අනුව උක් වගා කළ හැකි උපරිම බිම් ප්‍රමාණය හෙක්ටෙයාර 4215 වන අතර පසුගිය වසර කිහිපය තුළ එම ඉලක්කය ක්‍රම ක්‍රමයෙන් ඉහළ නැංවීමට පියවර ගැනීම (2012 වසරේ හෙක්ටෙයාර 2450ක් වූ උක් වගා කරන ලද බිම් ප්‍රමාණය 2017 වන විට හෙක්ටෙයාර 3503 දක්වා වැඩි කිරීමට හැකිවීම).

කම්හලේ දැනට ඇඹරුම් ධාරිතාව දිනකට මෙට්‍රික් ටොන් 1250ක් වන අතර, එම ප්‍රමාණය දිනකට මෙට්‍රික් ටොන් 1500 ප්‍රමාණය දක්වා වැඩි කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට පියවර ගැනීම.

(ආ) (i) ඔව්.

(ii) නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ගැනීම සහ නව උපදේශකත්වයක් මඟින් සේවාවන් බාහිරින් ලබා ගැනීමට අපේක්ෂා කර ඇත. දැනට අමාත්‍යාංශයේ විශේෂඥ මණ්ඩලයේ සහය ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

සීනි සහ එතනෝල් තරගකාරීත්ව මිලකට විකිණීම සඳහා දැනට අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

(ඇ) අදාළ නැත.

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 - 405/'18 - (1), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

**ගරු විමල් වීරවංශ මහතා**

(மாண்புமிகு விமல் வீரவங்ச)

(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ගරු ටී. රංජිත් ද සොයිසා මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***

*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.*

*Question ordered to stand down.*

## නිවාස ණය ලබාදීම : ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මැදිහත්වීම

## வீடமைப்புக் கடன் வழங்குதல் : எஹலியகொடை பிரதேச செயலகத்தின் தலையீடு

## GRANTING OF HOUSING LOANS :INVOLVEMENT BY EHALIYAGODA DIVISIONAL SECRETARIAT

547/'18

**5. ගරු විමල් වීරවංශ මහතා ( ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට)**
(மாண்புமிகு விமல் வீரவங்ச - மாண்புமிகு வாசுதேவ நாணாயக்கார சார்பாக)
(The Hon. Wimal Weerawansa on behalf of the Hon. Vasudeva Nanayakkara)

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2018 වර්ෂයේදී රුපියල් ලක්ෂ දෙක බැගින් නිවාස ණය ලබාදීම සඳහා ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නාම ලේඛනයක් යවා තිබේද;

(ii) නොඑසේ නම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවැනි ලේඛනයක් සකස් කර තිබේද;

(iii) එකී ලේඛනයට ඇතුළත් පුද්ගලයන් සියලුදෙනාම පාහේ එක්සත් ජාතික පක්ෂයට හිතවත් පුද්ගලයන් වීම සිදුවූයේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එකී පුද්ගලයන්ගේ දේශපාලන පක්ෂපාතීභාවය දැනගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සම්බන්ධ කේෂ්ත්‍ර නිලධාරීන් මාර්ගයෙන් විමසීමක් සිදු කළහැකි බව පිළිගන්නේද;

(ii) එසේ විමර්ශනයක් සිදු කිරීමට එකඟ වන්නේද;

(iii) නොඑසේ නම්, දේශපාලන පක්ෂපාතීත්වය අනුව නිවාස ණයදීම අනුමත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2018ஆம் ஆண்டு இரண்டு இலட்சம் ரூபாய் வீதம் வீடமைப்புக் கடன்களை வழங்குவதற்கு எஹலியகொடை பிரதேச செயலகத்துக்குப் பெயர்ப் பட்டியலொன்று அனுப்பிவைக்கப் பட்டுள்ளதா;

(ii) அல்லது பிரதேச செயலகத்தினால் அவ்வாறான பட்டியலொன்று தயாரிக்கப்படடுள்ளதா;

(iii) அந்தப் பட்டியலில் பெயர் குறிப்பிடப்பட்டுள்ள அனைவரும் எவ்வாறு ஐக்கிய தேசியக் கட்சியின் ஆதரவாளர்கள் ஆனார்கள்;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா ?

(ஆ) (i) அவ்வாறான நபர்களின் அரசியல் ஆதரவினை அறிந்துகொள்வதற்காக பிரதேச செயலகத் துடன் சம்பந்தப்பட்ட வெளிக்கள உத்தியோகத் தர்கள்மூலம் ஆராய்ந்துப் பார்க்க முடியும் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா;

(ii) அவ்வாறான ஓர் ஆய்வினை மேற்கொள்ள அவர் உடன்படுவாரா;

(iii) இன்றேல் அரசியல் பக்கச்சார்புக்கமைய வீடமைப்புக் கடன் வழங்குவதை அனுமதிப் பாரா;

என்பதையும் அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing and Construction:

(a) Will he inform this House-

(i) whether a list of names has been sent to the Ehaliyagoda Divisional Secretariat in order to grant housing loans of two hundred thousand rupees each in the year 2018;

(ii) if not, whether the Divisional Secretariat has prepared such a list; and

(iii) as to how almost all the persons included in the aforesaid list were the loyalists of the United National Party?

(b) Will he also inform this House -

(i) whether he admits that an inquiry can be conducted through the field officers attached to the Divisional Secretariat to ascertain the political loyalty of the aforesaid persons;

(ii) whether he agrees to conduct such an inquiry ; and

(iii) if not, whether he admits the fact of granting housing loans based on political loyalty?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii) නැත.

(iii) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

## දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් : අළෙවිය හෝ බදු දීම

### புகையிரதத் திணைக்களத்தின் காணிகள்: விற்பனை அல்லது குத்தகை

### LANDS BELONGING TO DEPARTMENT OF RAILWAYS: SALE OR LEASE

597/'18

**7. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා වෙනුවට)**
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන - மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. (Dr.) Bandula Gunawardane)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට නීත්‍යානුකූලව උරුම වී අයිතිය පවත්නා මුළු ඉඩම් ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(ii) වර්ෂ 1977න් පසු මේ දක්වා උක්ත ඉඩම්වලින් රාජ්‍ය අංශයට හෝ පෞද්ගලික අංශයට අළෙවි කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් මිලදී ගත් ගැණුම්කරුවන්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වලින් දිගුකාලීන හෝ කෙටිකාලීන බදු පදනම යටතේ වෙනත් පාර්ශවයන්ට බදු දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එක් එක් දිස්ත්‍රික්කය අනුව, එම බදු/කුලීකරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ගෙවීමට එකඟ වූ බදු කුලිය දැක්වෙන ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைப் புகையிரதத் திணைக்களத்துக்குச் சட்டரீதியாக உரித்தாகியுள்ள முழுக் காணிகளின் அளவு ஒவ்வொரு மாவட்டத்துக்கமைய எவ்வளவென்பதையும்;

(ii) 1977ஆம் ஆண்டுக்குப் பின்னர் இதுவரை மேற்படி காணிகளில் அரச துறைக்கு அல்லது தனியார் துறைக்கு விற்கப்பட்டுள்ள காணி எவ்வளவென்பதையும்;

(iii) மேற்படி காணிகளைக் கொள்வனவு செய்தவர்களின் பெயர்ப்பட்டியலைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) புகையிரதத் திணைக்களத்துக்குச் சொந்தமான காணிகளில் நீண்டகால அல்லது குறுகியகால குத்தகை அடிப்படையில் வேறு தரப்புகளுக்கு குத்தகைக்கு அளிக்கப்பட்டுள்ள காணிகளின் அளவு எவ்வளவென்பதையும்;

(v) ஒவ்வொரு மாவட்டத்துக்கமைய மேற்படி குத்தகை/வாடகை குடியிருப்பாளர்களின் பெயர்களையும் அவர்களால் செலுத்துவதற்கு இணங்கியுள்ள வாடகை விபரங்களையும் கொண்ட ஆவணமொன்றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House-

(i) on per district basis, of the total extent of lands that Sri Lanka Railway Department is legally in possession of;

(ii) out of the aforesaid extent of lands, the extent of lands that have been sold either to the public sector or to the private sector from 1977 to date;

(iii) whether a list of names of the buyers of those lands will be presented;

(iv) out of the lands belonging to the Department of Railways, of the extent of lands that have been leased to other parties on long-term or short-term lease basis; and

(v) whether a list prepared on per district basis containing the names of the aforesaid lessees/tenants and the amount of the lease that they had agreed to pay would be presented?

(b) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| දිස්ත්‍රික්කය | දුම්රිය දෙපාර්තමේන්තුවට නීත්‍යානුකූලව උරුම වී අයිතිය පවතින මුළු ඉඩම් ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව (අක්කරවලින්) |
|---|---|
| කොළඹ | 1020 |
| කළුතර | 177 |
| ගාල්ල | 295 |
| මාතර | 118 |
| ගම්පහ | 900 |
| කුරුණෑගල | 1170 |
| කෑගල්ල | 375 |
| මහනුවර | 1165 |
| මාතලේ | 110 |

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

| දිස්ත්‍රික්කය | දුම්රිය දෙපාර්තමේන්තුවට නිත්‍යානුකූලව උරුම වී අයිතිය පවතින මුළු ඉඩම් ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව (අක්කරවලින්) |
|---|---|
| නුවරඑළිය | 395 |
| බදුල්ල | 790 |
| පුත්තලම | 775 |
| අනුරාධපුරය | 1215 |
| පොළොන්නරුව | 1225 |
| වවුනියාව | 1025 |
| කිලිනොච්චිය | 149 |
| යාපනය | 850 |
| මන්නාරම | 640 |
| මඩකලපුව | 675 |
| ත්‍රිකුණාමලය | 625 |
| රත්නපුර | 435 |
| එකතුව | 14129 |

(ii) මෙම ඉඩම් අළෙවිකිරීමක් සිදුකර නොමැති අතර පැවරීම් වශයෙන් පහත ආයතන වෙත ලබා දී ඇත.

| | ඉඩමේ පිහිටීම | සැලසුම් අංකය | වර්ෂ 1977 න් පසු රාජ්‍ය / පෞද්ගලික අංශයට ලබා දී ඇති බිම් ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|
| | | | අක්කර | රූඩ් | පර්චස් |
| 1 | රත්මලාන | 2550 1-2 | 3 | 1 | 39.17 |
| 2 | බැස්ටියන් මාවත (පාවෙන වෙළඳ සංකීර්ණය) | LA/68/13 | 1 | 1 | 7.55 |
| 3 | ට්‍රිපෝලි ඉඩම | LA/06/13 | 9 | 0 | 0 |
| 4 | දෙමටගොඩ (මිහිදුසෙන් පුර) | මු.සි.නො.9234 කැබලි අංක 1, 2 | 5 | 0 | 30.9 |
| 5 | දෙමටගොඩ (මිහිදුසෙන්පුර 30 පළල පාර) | 2007 කැබලි අංක 01 | 1 | 0 | 3.64 |
| 6 | මාලිගාවත්ත (ශ්‍රී සද්ධර්ම මාවත) | මු.සි.නො. 9219 කැබලි අංක 1 | 3 | 0 | 39.7 |
| 7 | මාලිගාවත්ත (ශ්‍රී සද්ධර්ම මාවත) | මු.සි.නො. 9294 | 7 | 0 | 2.45 |
| 8 | ඩී.ආර්. විජේවර්ධන මාවත (නෙළුම් කුලුන) | 1883 කැබලි අංක 04 | 0 | 0 | 29.81 |
| 9 | කොම්පඤ්ඤ වීදිය | 1916 කැබලි අංක 4 | 0 | 3 | 30.4 |
| 10 | බණ්ඩාරවෙල බස් නැවතුම්පොළ | B/BND/2014/546 | 0 | 3 | 29 |
| | එකතුව | | 32 | 1 | 12.62 |

(iii)

| | ඉඩමේ පිහිටීම | ඉඩම් ලබා දුන් රාජ්‍ය ආයතනයේ නාම ලේඛනය |
|---|---|---|
| 1 | රත්මලාන | නාගරික සංවර්ධන අධිකාරිය |
| 2 | බැස්ටියන් මාවත (පාවෙන වෙළඳ සංකීර්ණය) | ප්‍රාදේශීය ලේකම් (කොළඹ) |
| 3 | ට්‍රිපෝලි ඉඩම | නාගරික සංවර්ධන අධිකාරිය |
| 4 | දෙමටගොඩ (මිහිදුසෙන්පුර) | ප්‍රාදේශීය ලේකම් (තිඹිරිගස්යාය) |
| 5 | දෙමටගොඩ (මිහිදුසෙන්පුර 30 පළල පාර) | නාගරික සංවර්ධන අධිකාරිය |
| 6 | මාලිගාවත්ත (ශ්‍රී සද්ධර්ම මාවත) | ප්‍රාදේශීය ලේකම් (කොළඹ) |
| 7 | මාලිගාවත්ත (ශ්‍රී සද්ධර්ම මාවත) | නාගරික සංවර්ධන අධිකාරිය |
| 8 | ඩී.ආර්. විජේවර්ධන මාවත (නෙළුම් කුලුන) | නාගරික සංවර්ධන අධිකාරිය |
| 9 | කොම්පඤ්ඤ වීදිය | නාගරික සංවර්ධන අධිකාරිය |
| 10 | බණ්ඩාරවෙල බස් නැවතුම්පොළ | නාගරික සංවර්ධන අධිකාරිය |

(iv)

| දිස්ත්‍රික්කය | දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වලින් දිගුකාලීන හෝ කෙටිකාලීනව බදු පදනම යටතේ වෙනත් පාර්ශවයන්ට බදු ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය (අක්කරවලින්) |
|---|---|
| කොළඹ | 97 |
| කළුතර | 04 |
| ගාල්ල | 31 |
| මාතර | 04 |
| ගම්පහ | 129 |
| කුරුණෑගල | 131 |
| කෑගල්ල | 129 |
| මහනුවර | 190 |
| මාතලේ | 27 |
| නුවරඑළිය | 137 |
| බදුල්ල | 174 |
| පුත්තලම | 35 |
| අනුරාධපුරය | 56 |
| පොළොන්නරුව | 180 |
| වවුනියාව | 12 |
| කිලිනොච්චිය | 14 |
| යාපනය | 8 |
| මන්නාරම | 17 |
| මඩකලපුව | 8 |
| ත්‍රිකුණාමලය | 17 |
| රත්නපුර | 85 |
| එකතුව | 1485 |

(v) ඇමුණුමෙහි* සඳහන්ව ඇත.

(ආ) පැන නොනගී.

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

**වයඹ පළාත : පොහොර හිඟය**
**வடமேல் மாகாணம்: உரத் தட்டுப்பாடு**
NORTH -WESTERN PROVINCE: SCARCITY OF FERTILIZER

600/'18

**8. ගරු කේ.කේ. පියදාස මහතා (ගරු අශෝක ප්‍රියන්ත මහතා වෙනුවට)**
(மாண்புமிகு கே.கே. பியதாஸ - மாண்புமிகு அசோக்க பிரியந்த சார்பாக)
(The Hon. K.K. Piyadasa on behalf of the Hon. Ashoka Priyantha)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වයඹ පළාතේ ඇති ගොවිජන සේවා කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) පළාතේ පවතින දැඩි පොහොර හිඟය හේතුවෙන් මෙවර යල කන්නයේ වගා කටයුතු කිරීමට නොහැකි වී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடமேல் மாகாணத்தில் உள்ள கமத்தொழில் சேவைகள் வலயங்களின் எண்ணிக்கை எவ்வளவு;

(ii) அவற்றின் பெயர்கள் யாவை;

(iii) மாகாணத்தில் நிலவும் பெரும் உரத்தட்டுப்பாடு காரணமாக இம்முறை சிறுபோகத்தில் பயிர்ச் செய்கை நடவடிக்கைகளை மேற்கொள்ள முடியாமல்போனதை அவர் ஏற்றுக்கொள்வாரா;

(iv) அவ்வாறெனின் இப்பிரச்சினையைத் தீர்க்க அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாது;

என்பதை அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House-

(i) the number of Agrarian Services Regions found in the North Western Province;

(ii) the names of those regions;

(iii) whether he admits the fact that cultivation activities could not be carried out in Yala Season of this year due to the acute scarcity of fertilizer in the province; and

(iv) if so, the steps that will be taken by the Ministry to solve the aforesaid problem ?

(b) If not , why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ගොවිජන සේවා බලප්‍රදේශ - 74කි.
කුරුණෑගල දිස්ත්‍රික්කයේ බල ප්‍රදේශ - 56
පුත්තලම දිස්ත්‍රික්කයේ බල ප්‍රදේශ - 18

(ii) ඇමුණුමෙහි* දක්වා ඇත.

(iii) නැත.

(iv) ගැටලුවක් මතු නොවීය.

(ආ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

**(ඇමුණුම: 01)**

**ගොවිජන සේවා බල ප්‍රදේශ - 74**

| අනු අංකය | දිස්ත්‍රික්කය | |
|---|---|---|
| | **කුරුණෑගල දිස්ත්‍රික්කය - 56** | **පුත්තලම දිස්ත්‍රික්කය - 18** |
| 01 | කොටවෙහෙර | හාල්දඹුවන |
| 02 | මහගිරිල්ල | නයිනමඩම |
| 03 | රස්නායකපුර | නාත්/තබ්බෝව |
| 04 | නිකවැරටිය | කුඩාවාව |
| 05 | කොබෙයිගනේ | මාදම්පේ |
| 06 | දිවුල්ලෑගොඩ | මුන්නේශ්වරම |
| 07 | මහානාන්නේරිය | රාජකදළුව |
| 08 | ගල්ගමුව | සේරුකැලේ |
| 09 | ඇහැටුවැව | මදුරන්කුලිය |
| 10 | රාජාංගනය | පුත්තලම |
| 11 | තඹුත්ත | පාලකුඩා |
| 12 | අඹන්පොල | වනාතවිල්ලුව |
| 13 | නාගොල්ලාගම | ආණමඩුව |
| 14 | මහව | ඉඹිණිමිටිය |
| 15 | රඹේ | නවගත්තේගම |
| 16 | මොරගොල්ලාගම | මහකුඹුක්කඩවල |
| 17 | මඩහපොල | පුත්/තබ්බෝව |
| 18 | කුඹුක්ගැටේ | ඉහල පුලියන්කුලම |
| 19 | ගනේවත්ත | |
| 20 | ඉබ්බාගමුව | |
| 21 | මැල්සිරිපුර | |
| 22 | නාථගනේ | |
| 23 | වාරියපොල | |
| 24 | අඹුලේගම | |
| 25 | පඬුවස්නුවර | |
| 26 | කනෝගම | |

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

| | | |
|---|---|---|
| 27 | මූණමල්දෙණිය | |
| 28 | තාරණ | |
| 29 | බිංගිරිය | |
| 30 | දුම්මලසූරිය | |
| 31 | උඩුබද්දාව | |
| 32 | යක්විල | |
| 33 | හමන්ගල්ල | |
| 34 | වෙල්පල්ල | |
| 35 | කුලියාපිටිය | |
| 36 | හොරොම්බාව | |
| 37 | කිතලව | |
| 38 | දිගල්ල | |
| 39 | වැවගම | |
| 40 | නාරම්මල | |
| 41 | අලව්ව | |
| 42 | මහරවිවිමුල්ල | |
| 43 | දඹදෙණිය | |
| 44 | පොල්ගහවෙල | |
| 45 | පොකුණුර | |
| 46 | වීරඹුගෙදර | |
| 47 | කුරුණෑගල | |
| 48 | කුඩාගල්ගමුව | |
| 49 | බෙය්යගනේ | |
| 50 | වැල්ලව | |
| 51 | මාවතගම | |
| 52 | වේරවැල්ල | |
| 53 | දොඩංගස්ලන්ද | |
| 54 | රම්බඩගල්ල | |
| 55 | කරදගොල්ල | |
| 56 | බොරළුවැව | |

## වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය: අම්පාර දිස්ත්‍රික්කය

## நீர்ப்பாசனத் திட்டங்களின் புனரமைப்பு: அம்பாறை மாவட்டம்

## REHABILITATION OF IRRIGATION SCHEMES: AMPARA DISTRICT

999/'18

**10. ගරු විමල් වීරවංශ මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**

(மாண்புமிகு விமல் வீரவங்ச - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)

(The Hon. Wimal Weerawansa on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)

වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කරනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015, 2016 மற்றும் 2017ஆம் ஆண்டுகளில் அம்பாறை மாவட்டத்தில் புனரமைக்கப்பட்ட சிறிய, மத்திய மற்றும் பாரிய அளவிலான நீர்ப்பாசனத் திட்டங்கள் யாவையென்பதையும்;

(ii) ஒவ்வொரு புனரமைப்புப் பணிக்காகவும் மதிப் பிடப்பட்ட பணத்தொகை தனித்தனியாக எவ்வள வென்பதையும்;

(iii) மேற்படி புனரமைப்புப் பணிகளுக்காகக் கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா என்ப தையும்;

(iv) ஆமெனில், அக்கேள்விப்பத்திரங்களைப் பெற்றுக் கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டியலொன்றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(v) மேற்படி ஒவ்வொரு வருடத்துக்கும் ஏற்புடைய தான புனரமைப்புப் பணிகளின் பௌதிக மற்றும் நிதிசார் முன்னேற்றம் தனித்தனியாக யாதென் பதையும்;

(vi) மேற்படி புனரமைப்புப் பணிகளுக்கான சாத்தியக் கூறு ஆய்வு, சுற்றாடல் மற்றும் பொறியியல் அறிக்கைகளைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(vii) மேற்படி புனரமைப்புப் பணிகளின்போது அகற்றப் பட்ட வண்டல் படிவு, மண் அல்லது மணலுக்காக கேள்விப்பத்திரங்கள் கோரப்பட்டனவா என்பதை யும்;

(viii) ஆமெனில், கேள்விப்பத்திரங்களைப் பெற்றுக் கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டியலொன் றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources and Disaster Management:

(a) Will he inform this House-

(i) the minor, medium and major irrigation schemes rehabilitated in Ampara District in 2015, 2016 and 2017;

(ii) the estimated amount for each rehabilitation work, separately;

(iii) whether tenders were called for the said rehabilitation work;

(iv) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted;

(v) the physical and financial progress of the rehabilitation work with relevance to each of the aforesaid years;

(vi) whether the feasibility study, environmental and engineering reports will be submitted;

(vii) whether tenders were called for the silt, soil or sand removed in such rehabilitation work; and

(viii) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i), (ii), (iii), (iv) , (v) ඇමුණුම* මගින් දක්වා ඇත.

(vi) මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා තෝරාගෙන ඇත්තේ භාවිතයේ පවතින සුළු හා මහා වාරිමාර්ග ව්‍යාපාරය. ඒවා වැඩිදියුණු කිරීමේදී ඉඩම් පවරා ගැනීමක් සිදු කළ යුතු නොවේ. මේවායේ ගොවීන් විසින් වගා කටයුතු සිදු කරන ලබන අතර, මෙම වැඩිදියුණු කිරීම මගින් බලාපොරොත්තු වනුයේ එම ව්‍යාපාර සංවර්ධනයකොට හිඟයකින් තොරව ජලය ලබාදීමයි. ගල් ඔය ව්‍යාපෘතිය, කාලගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP) සහ ඵලදායීතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PEISEIP) සඳහා ශක්‍යතා වාර්තා සකස් කර ඇති බව සඳහන් කරමි. තව ද අදාළ සියලු කාර්යයන් ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදුකර සැලසුම් කිරීමෙන් අනතුරුව ඇස්තමේන්තු සකස් කර ඇති බව සඳහන් කරමි.

(vii) ඒ සඳහා ටෙන්ඩර් කිරීමක් සිදු කර නැත.

(viii) නැත.

(ආ) මෙම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී රොන්මඩ හා පස් ඉවත් කිරීමේ කර්මාන්ත අවම ප්‍රමාණයක් සිදු කර ඇති අතර ඒවා දෙපාර්තමේන්තු මාර්ග සංවර්ධනය සඳහා යොදවා ගෙන ඇත.

---

** ඇමුණුම පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Annex Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 11 - 1135/'18 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස එකහමාරක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 12 - 1149/'18 - (1), ගරු එස්.සී. මුතුකුමාරණ මහතා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගරු එස්.සී. මුතුකුමාරණ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය : නිල වාහන
## மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்: உத்தியோகபூர்வ வாகனங்கள்
## PRIVATE STAFF OF MINISTER OF WOMEN AND CHILD AFFAIRS: OFFICIAL VEHICLES

1186/'18

**14. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු බිමල් රත්නායක මහතා වෙනුවට)**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு பிமல் ரத்நாயக்க சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. Bimal Rathnayake)

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

(අ) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියා පදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரின் பிரத்தியேக பதவியணிக்கு இணைக்கப்பட்டுள்ள உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஒவ்வோர் உத்தியோத்தரதும் பெயர், பதவி, ஒதுக்கப் பட்டுள்ள வாகனத்தின் வகை, பதிவிலக்கம் மற்றும் அவ்விதம் ஒதுக்குவதற்கு அங்கீகாரம் வழங்கியது யார் என்பதை வெவ்வேறாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Women and Child Affairs:

(a) Will she inform this House separately the name and designation of each officer who is attached to the private staff of the Minister of Women and Child Affairs and has been allocated a vehicle, along with details on the type of vehicle allocated to them, registration number and the name of the officer who authorized such allocation of a vehicle?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ● පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා අනුයුක්ත කර ඇති වාහන පිළිබඳ තොරතුරු

| | නිලධාරියාගේ නම | තනතුර | වාහන වර්ගය | ලියාපදිංචි අංකය |
|---|---|---|---|---|
| 1. | දිලුක්ෂාන් ජයසිංහ මයා | පෞද්ගලික ලේකම් | Motor car Nissan - Teana | KY-3506 |
| 2. | රංජිත් කුළසිංහ මයා | සම්බන්ධීකරණ ලේකම් | Motor Car Nissan Sunny | KB-0377 |
| 3. | සිරිවර්ධන දහනායක මයා | සම්බන්ධීකරණ ලේකම් | Motor Car Toyota Corolla | KR-3009 |
| 4. | එච්.ඩී.යූ. විජේසිංහ මයා | මාධ්‍ය ලේකම් | Double Cab | PG-1195 |

මෙම සියලු වාහන ලබාදීම සඳහා අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමැතිය ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ඔබතුමා මට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ස්තුතියි.

මුදල් ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා මේ කාරණය කියන්න අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවකයන් අද ලෙඩ නිවාඩු දමා ඇති නිසා ඒ දෙපාර්තමේන්තුවේ කටයුතු අකර්මණ්‍ය වෙලා තිබෙන බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඒ සම්බන්ධයෙන් අහන්න ඔබතුමාට පසුව අවස්ථාව දෙන්නම්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

# I

## හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට සපයා ඇති ආරක්ෂාව වැඩි කිරීම
## முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கு வழங்கப்பட்டுள்ள பாதுகாப்பினை அதிகரித்தல்
## ENHANCE SECURITY PROVIDED TO FORMER PRESIDENT MAHINDA RAJAPAKSA

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ මා මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ ගරු අග්‍රාමාත්‍යතුමා වෙතයි.

ශ්‍රී ලංකාව බෙදීමට කෲර ත්‍රස්තවාදීන්ගෙන් එල්ල වුණු භයානක අනතුරෙන් රට බේරා ගැනීමට නායකත්වය දුන් ජනාධිපති ලෙස ඒ කර්තව්‍යය ඉටු කළේ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා බව රටම පිළිගනී. 5වන විධායක ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාවට තර්ජනයක් පවතින බව රජය පිළිගත්තද, එතුමාගේ ආරක්ෂාව අඩු කර, ප්‍රධාන ආරක්ෂක නිලධාරි කැඳවා එතුමාගේ ජීවිතයට තර්ජන පවතින බව පසුගිය දා උපදෙස් දුන්නද, ආරක්ෂාව වැඩි කිරීමට පියවරගෙන නොමැත. එසේ නම්, ආරක්ෂාව පිළිබඳ එම අවශ්‍ය හදිසි පියවරවල් ගන්නේද කියන කාරණාව දැන ගන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මීට කලිනුත් මෙම ප්‍රශ්නය ගරු සභාවට ඉදිරිපත් කළා. ගරු අගමැතිතුමා පසුගිය අවුරුද්දේ මේ ප්‍රශ්නයට දෙවරක් පාර්ලිමේන්තුවේ උත්තර දීලා, අවශ්‍ය ආරක්ෂාව ලබා දීමේ කටයුතු පිළිබඳව යම්කිසි සොයා බැලීමක් කළා. අද අලුතෙන් ඇති වී තිබෙන තත්ත්වය තමයි ගරු කථානායකතුමනි, ප්‍රධාන ආරක්ෂක නිලධාරිට යම්කිසි දැන්වීමක් කර තිබෙනවා, -මේ රහස් තෙරතුරු මම ප්‍රසිද්ධ කරන්න ඕනෑ නැහැ.- මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජීවිතයට තර්ජනයක් පවතින බවට. එම නිසා 5වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට සපයා තිබෙන ආරක්ෂක පහසුකම් මදි බැවින් අපි විශේෂයෙන් අග්‍රාමාත්‍යතුමා හා රජයෙන් ඉල්ලා සිටිනවා, ඒ අවශ්‍ය පියවර වහාම ගන්න කියලා. එසේ අවශ්‍ය පියවර වහාම ගන්නේ කවදාද කියලාත් දැන ගන්නට කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා පිළිතුරු දෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශයට දැනුම් දුන්නොත්, ඇත්ත වශයෙන්ම ඒ ගැන සලකා බලන්න සූදානම්. මොකද, හිටපු ජනාධිපතිතුමාගේ ජීවිතය ආරක්ෂා කරන්න අපටත් වුවමනාව තිබෙනවා. එම නිසා අලුත් තොරතුරු මොනවත් ලැබිලා තිබෙනවා නම්, ඒ තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශයට ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒ සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු සභානායකතුමනි, ඔබතුමා මේක සරලව ගන්න එපා. ප්‍රභූ ආරක්ෂාව භාරව කටයුතු කරන ප්‍රධාන නිලධාරියා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාව භාර ප්‍රධාන නිලධාරියාව ගෙන්වලා වාචිකව කියා තිබෙනවා, "5වන විධායක ජනාධිපතිතුමාට මරණීය තර්ජනයක් තිබෙනවා. ඒ නිසා එතුමාගේ ආරක්ෂාව ගැන සැලකිලිමත්ව කටයුතු කරන්න" කියලා. හැබැයි, එහෙම දැනුම් දුන්නාට ඒ සම්බන්ධයෙන් ගන්න විශේෂ ක්‍රියා මාර්ග මොනවාද කියලා එතැනදී උපදෙසක් දීලා නැහැ. ඒ විශේෂ තත්ත්වයට අනුව යොදවන ආරක්ෂාව මොකක්ද කියලා කියා නැහැ. එම නිසා ඒ දැනුම් දීම පමණක් ප්‍රමාණවත් නැහැ. ඒ දැනුම් දීම අදාළ නිලධාරියා ඔහුගේ ලොග් සටහන්වලත් ඇතුළත් කරලා තිබෙනවා. එම නිසා මේ සම්බන්ධයෙන් සුළුකොට තකන්නේ නැතිව කටයුතු කරන්න. මේ සම්බන්ධයෙන් දැනුවත් කරලා තිබෙන්නේත් ඒ පොලීසියේම බලධාරින්. එම නිසා ඒ දැනුවත් කිරීමට පමණක් සීමා වෙන්නේ නැතිව, අදාළ ආරක්ෂාව වෙනුවෙන් ගත යුතු අතිරේක පියවර ගැනීම සඳහා කටයුතු කරන්න කියන එකයි අපි කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමා මේ සම්බන්ධයෙන් පැහැදිලි කරනවාද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}
ඔව්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, 2015.07.08 දින සිට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂක ඒකකය විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොටියාසය (v) ලෙස ස්ථාපිත කරන ලදී. අංක 1938 හා 2015.10.28 දිනැති ශ්‍රී ලංකා පොලිස් ගැසට් පත්‍රය මඟින් විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොටියාසය (v) ස්ථාපිත කිරීම පිළිබඳව නිවේදනය කර ඇත. ඒ වන විට කොටියාසයට අනුයුක්තව සිට ඇති නිලධාරීන් ප්‍රමාණය 103කි.

දැන් සිටින සංඛ්‍යාව මට මෙතැන කියන්න පුළුවන්. එහෙම නැත්නම්, එම සංඛ්‍යාව නොකියන එක වඩා හොඳයි. එම නිසා මා සංඛ්‍යාව කියන්නේ නැහැ. එම නිලධාරීන් කොහාටද යොදවා තිබෙන්නේ කියලා මම කියන්නම්.

තවද, ඇමති ආරක්ෂක කොටියාසයට අනුයුක්ත නිලධාරීන් ද, පිටත කොටියාසවල සිටි නිලධාරීන් ද එම කොටියාසය වෙත ස්ථිර ස්ථාන මාරු කර ඇති අතර, එසේ විවිධ අවස්ථාවලදී ස්ථාන මාරුවීම් ලබා පැමිණීමෙන් සහ පිටව යාමෙන් පසු නිලධාරීන් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා.

ඒ සංඛ්‍යාව මට ගරු විමල් වීරවංශ මහතාටත්, ගරු දිනේෂ් ගුණවර්ධන මහතාටත් දෙන්න පුළුවන්. මම මෙතැන එම සංඛ්‍යාව ප්‍රකාශ කරන්න යන්නේ නැහැ.

මීට අමතරව, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පදිංචිව සිටින විජේරාම, මැදමුලන සහ කාල්ටන් යන නිවෙස්වල ආරක්ෂාව, සමීප හා පෙර ආරක්ෂක රාජකාරි සහ කොටියාසයේ කාර්යාල රාජකාරි සඳහා දැනට තවත් නිලධාරීන් විශාල සංඛ්‍යාවක් යොදවා තිබෙනවා.

එසේම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වර්තමානයේදී සක්‍රිය ලෙස දේශපාලන කටයුතුවල නියැලී සිටින බැවින්, එතුමාට ඇති තර්ජන හේතුවෙන් නිල රථයෙන් ගමන් ගන්නා අවස්ථාවලදී පසු ගමන් ආරක්ෂාව වෙනුවෙන් පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ සහාය ද ලබා දී ඇත.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

දැනට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් ඒ සංඛ්‍යාව යොදවා තිබෙනවා. එතුමාට තිබෙන තර්ජන වැඩි වනවා නම්, ඒ සම්බන්ධයෙන් සලකා බලා අපට ඒ සංඛ්‍යාව වැඩි කර ගන්න පුළුවන්. එහෙත් මම මේ සභාවට එනකොට මට ඇහුණා, දැනට උද්ගත වී ඇති තත්ත්වය ගැන මේ සභාවේ කථා කරනවා. එම නිසා නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමාට මම ආරාධනා කරනවා, ඒ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්න.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර - අරස නිරුවාක මුකාමෛත්තුව මට්රුම් චට්ටමුම් ඔළුංකුම් අමෛච්චර්)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management and Law and Order)
ගරු කථානායකතුමනි, නාමල් කුමාර කියන පුද්ගලයා කළ පැමිණිල්ල අනුව පොලිස් පරීක්ෂණ කර ගෙන යනවා. රහස් පොලීසියෙන් බොහොම ස්වාධීනව එම පරීක්ෂණ කර ගෙන යනවා. මා හිතන විධියට එහිදී මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා සම්බන්ධව නාමල් කුමාර හෝ, කවුරුන් හෝ කිසිම සඳහනක් කර නැහැ. ඒ පරීක්ෂණ කරගෙන යනවා. දැනට ඒ නියෝජ්‍ය පොලිස්පතිවරයා අත් අඩංගුවට ගෙන තිබෙනවා. ඒ පරීක්ෂණ කටයුතු ස්වාධීනව කරගෙන යනවා. ඒ පුද්ගලයා කියූ කරුණු පදනම් කරගෙන පරීක්ෂණ කළා.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු අමාත්‍යතුමා, එතුමාට මරණීය තර්ජනයක් තිබෙනවා කියා කියන්නේ අපි නොවෙයි. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාව භාර ප්‍රධානියාව කැඳවනවා, ප්‍රභූ ආරක්ෂාව භාර ප්‍රධානියා. එම අංශයේ ප්‍රධානියා වාචිකව කියනවා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට මරණීය තර්ජනයක් තිබෙනවා, ආරක්ෂාව ගැන උපරිමයෙන් සැලකිලිමත්ව කටයුතු කරන්න කියා. ඒක අලුත් ප්‍රකාශයක්; දැනට සති එකහමාරකට පමණ පෙර කරන ලද ප්‍රකාශයක්.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
කවුද ඒ ප්‍රකාශය කරන්නේ?

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ප්‍රභූ ආරක්ෂාව භාර ප්‍රධානියා. මා දන්නේ නැහැ, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා-

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
කියන්න, කියන්න ඒ කවුද කියා. මොකද, ඒ කියන පුද්ගලයා සම්බන්ධව එවැනි තොරතුරක් හෝ එවැනි පැමිණිල්ලක් හෝ අපට ලැබී නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු අමාත්‍යතුමා, එහෙම නම් විෂයය භාර ඇමතිවරයා හැටියට ඔබතුමාට පුළුවන්, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව භාරව සිටින ප්‍රධාන නිලධාරියාව කැඳවා විමසන්න. මොකද, මා දන්නා විධියට, ඔහු ඒ දැනුම් දීම තමාගේ ලොග් සටහන් පොත්වල් සටහන් කර තිබෙනවා. ඔහු කැඳවා ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මා ඒ සම්බන්ධව පොලිස්පතිතුමාට උපදෙස් දෙන්නම්, ඒ නිලධාරියා කැඳවා අවශ්‍ය උපදෙස් දෙන්න කියා. මොකද, ඔහු පොලිස් නිලධාරියෙක්.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක තමයි බලාපොරොත්තු වන්නේ. බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමා. ඊළඟට, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, he has not finished yet.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Okay, go ahead.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඊළඟට, නාමල් කුමාර ඉදිරිපත් කරපු සිද්ධිය සම්බන්ධව-

**ගරු විමල් වීරවංශ මහතා**
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
නැහැ, නැහැ. අප ඇහුවේ ඒ ගැන නොවෙයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඒක අවශ්‍ය නැද්ද? ඒ කටයුත්ත ස්වාධීනව හොඳින් කරගෙන යනවා. එච්චරයි.

**ගරු කථානායකතුමා**
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Order, please! I wish to announce that this House cordially welcomes the participants of the Sri Lanka Foreign Relations and Economic Diplomacy Programme - 2018, now present at the Speaker's Gallery. We welcome all of you.

Next, Hon. Douglas Devananda.

## II

## සමෘද්ධි අධිකාරියේ සේවය කළ අයට පත්වීම් ලිපි නිකුත් නොකිරීම

### சமுர்த்தி அதிகாரசபையில் சேவையாற்றியவர்களுக்கான நியமனக் கடிதங்கள் வழங்கப்படாமை

### NON- ISSUANCE OF APPOINTMENT LETTERS TO EMPLOYEES OF SAMURDHI AUTHORITY

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, சமூக வலுவூட்டல்கள் அமைச்சர் கௌரவ பீ. ஹரிசன் அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி!

சமுர்த்தித் திணைக்களமானது சமுர்த்தி அதிகாரசபையாக இருந்த நிலையில் அதில் சேவையாற்றியவர்கள், 2013ஆம் ஆண்டு சமுர்த்தி அதிகாரசபை சமுர்த்தி திணைக்களமாக மாற்றப்பட்ட நிலையில், புதிய சுற்றறிக்கையின் பிரகாரம் புதிய நியமனங்களைப் பெற்று உள்வாங்கும் வகுதிக்குள் கொண்டுவரப்பட்டனர் என்றும், இவர்கள் அனைவரும் விருப்புத் தெரிவின் அடிப்படையிலேயே புதிய வகுதியில் உள்வாங்கப்பட்டனர் என்றும், இவ்வாறு உள்வாங்கப் பட்டவர்களுக்கு இதுவரையில் நியமனக் கடிதங்கள் வழங்கப்படவில்லையென்றும் தெரிய வருகின்றது. ஆனால், தற்போது புதிதாக நியமனங்களைப் பெறுகின்றவர்கள் உரிய நியமனக் கடிதங்கள் வழங்கப்பட்டு, சேவையில் இணைத்துக் கொள்ளப்படுகின்ற நிலையிலும், ஆரம்பந்தொட்டுப் பணியாற்றியவர்களுக்குக் நியமனக் கடிதங்கள் வழங்கப் படவில்லையென்றே கூறப்படுகின்றது. இதன் காரணமாக ஆரம்பந்தொட்டுப் பணியாற்றி வருகின்ற பணியாளர்கள் தாங்கள் தொழில் ரீதியில் பல்வேறு பிரச்சினைகளையும் இடையூறுகளையும் எதிர்கொண்டுவருவதாகத் தெரிவிக் கின்றனர்.

இவ்விடயம் தொடர்பிலான எனது பின்வரும் கேள்விகளுக் கான பதில்கள் மற்றும் எடுக்கப்படக்கூடிய நடவடிக்கைகள் பற்றிய விளக்கங்களை கௌரவ அமைச்சர் பீ. ஹரிசன் அவர்கள் வழங்குவார் என நான் எதிர்பார்க்கின்றேன்.

01. சமுர்த்தி திணைக்களமானது சமுர்த்தி அதிகார சபையாக இருந்த காலந்தொட்டு வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் குறித்த பணியில் இருந்தவர்களின் எண்ணிக்கை யாது?

02. ஏனைய மாகாணங்களில் இந்த நிலையில் இருப்போரது எண்ணிக்கை யாது?

03. இவர்கள் அனைவருக்கும் இதுவரையில் புதிய நியமனங்கள் வழங்கப்பட்டுள்ளனவா?

04. வழங்கப்பட்டிருப்பின், அவர்களது எண்ணிக்கை யாது?

05. வழங்கப்படவில்லையெனில், அதற்கான காரணம் யாது?

06. இவர்களுக்கான புதிய நியமனங்கள் எப்போது வழங்கப்படும்?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison )

ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. 3810කි.

02. 21,677යි.

03. මුල් සේවා නිලධාරීන් ලෙස අන්තර් ග්‍රහණය වූ නිලධාරීන්ට නව පත්වීම් ලිපි ලබා දී ඇත. නව සේවා පත්වීම් ලබා දී නොමැත.

එම සංඛ්‍යාව කොපමණද කියායි එතුමා අහන්නේ. මුල් සේවා කාලය සමඟ මනාපය පළ කරන ලද MN 7 සමෘද්ධි කළමනාකරුවන්ගේ සංඛ්‍යාව 420යි. MN 4 සමෘද්ධි කළමනාකරුවන්ගේ සංඛ්‍යාව 100යි. MN 1 සමෘද්ධි කළමනාකරුවන්ගේ සංඛ්‍යාව 6540ක් සඳහා පත්වීම් ලිපි නිකුත් කර ඇත. නව සේවා සහ EPF මනාපය පළ කරන ලද නිලධාරීන් සඳහා මෙතෙක් පත් වීම් ලිපි නිකුත් කර නොමැත.

04. නව පත්වීම් සඳහා වැටුප් හා කොන්දේසි පිළිබඳව ඇති වූ ගැටලු මත පත්වීම් ලබා දීම ප්‍රමාද වී ඇත. මේ වන විට ගැටලු නිරාකරණය වී පත්වීම් ලිපි නිකුත් කිරීමට කටයුතු යොදා ඇත.

05. ඉහත සඳහන් අංක 4හි සඳහන් කර ඇත.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, are you satisfied with the answer?

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Okay, Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම. යෝජනා අංක 1. [බාධා කිරීමක්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Weerawansa, I will give you the chance after taking up the Items. - [*Interruption*.] පාර්ලිමේන්තුවේ සභානායකතුමා. [බාධා කිරීමක්] මම අවස්ථාවක් දෙන්නම්.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)
Hon. Speaker, I move,

"That the proceedings on Item Nos. 1 and 2 of Public Business appearing on the Order Paper be exempted at this day's Sitting from the provisions of Standing Order No. 27 of Parliament."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

### I

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 8(1), the Parliament shall sit on Monday 05th November, 2018."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 3.00 p.m. on Monday 05th November, 2018."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ගරු මුදල් ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි කිව්වා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන බොහොම ස්තුතියි. මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. ගරු මුදල් ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්න නිසා එතුමාගෙන් මට මේ කාරණය දැනගන්නට අවශ්‍යයි. ඔබතුමා දන්නවා ඇති, ආදායම් බදු දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්, සේවකයන් ලෙඩ නිවාඩු දමා මේ වන විට එම දෙපාර්තමේන්තුව අකර්මණ්‍ය තත්ත්වයකට පත් වෙලා තිබෙන බව. සාමාන්‍යයෙන් ඉතිහාසයේ හැම දාම ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුර ලැබුණේ ජ්‍යෙෂ්ඨත්වය අනුවයි. එම දෙපාර්තමේන්තුවට පිට ආයතනවලින් කවුරුවත් ගෙනැල්ලා එහි ප්‍රධාන තනතුර භාර දුන්නේ නැහැ. ජනාධිපතිතුමා පත් කළ කමිටුවකින් සම්මුඛ පරීක්ෂණ පවත්වලා එයින් නිර්දේශ කර තිබෙනවා, මෙම තනතුරට සුදුසු නඳුන් ගුරුගේ කියන නිලධාරි මහත්මයා බවත්, මේ තනතුර දිය යුත්තේ ඔහුට බවත්. එසේ තිබියදී ගරු මුදල් ඇමතිතුමා අමාත්‍ය මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර, 2018.10.31වැනි දා විශ්‍රාම යාමට නියමිත නියෝජ්‍ය මහ බැංකු අධිපති සී.පී.ජේ. සිරිවර්ධන මහත්මයා, එම ආයතනයේ පැවැති සම්ප්‍රදායට පිටින් පත් කරන්න යනවා. ඉතිහාසයේ කවදාවත් ආදායම් බදු දෙපාර්තමේන්තුවට එහෙම බැහැරින් කෙනෙක් පත් කර නැහැ. එවැනි තීරණයක් ගැනීමෙන් ආදායම් බදු දෙපාර්තමේන්තුව අකර්මණ්‍ය තත්ත්වයකට පත් වෙනවා. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, එම සම්මුඛ පරීක්ෂණ වාර්තාව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න කියා. මෙතෙක් ඉතිහාසයේ සිදු වුණු විධියට ජ්‍යෙෂ්ඨත්වය අනුව එම තනතුර දෙන්න. නියෝජ්‍ය මහ බැංකු අධිපති කෙනෙක් පිටින් ගෙනැල්ලා මෙම තනතුරට පත් කළොත් ඒ ආයතනය අකර්මණ්‍ය වෙනවා. තමුන්නාන්සේලා බදු ගැහුවාට ඒ ආදායම එකතු කර ගන්න තමුන්නාන්සේලාට පුළුවන් වෙයි කියා අපි හිතන්නේ නැහැ. කරුණාකර ඔබතුමා මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා, "ආදායම් බදු දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් ලෙඩ නිවාඩු දාලාය" කියා. එය නිවැරදි ප්‍රකාශයක් නොවෙයි. සමහර සේවකයන් ලෙඩ නිවාඩු දමා තිබෙනවා. ඇත්තවශයෙන් මේ වෙනකොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බහුතරයක් සේවකයන් වැඩ කරනවා. ඉතාමත්ම සුළු පිරිසක් මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති සිරිවර්ධන මහත්මයා පත් කිරීම ගැන කනස්සල්ලෙන් ඉන්නවා.

ඇත්ත වශයෙන්ම එවැනි තීන්දුවක් ගන්නට මම තීරණය කරලා ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගත්තේත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අකර්මණ්‍ය වෙලා ගොඩාක් කාලයක් වන නිසායි. ඇත්ත වශයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පැවැති ක්‍රමය අනුව ගියා නම්, රටක් හැටියට අපට ලැබිය යුතු ආදායම ලබා ගැනීමටවත් නොහැකි වෙනවා. මෙතෙක් තිබුණු මේ ක්‍රමය තුළ ලැබිය යුතු ආදායම ලබා ගැනීම අසාර්ථක වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අද මේ රටේ ඍජු බදු ගෙවන්නේ සියයට 18යි. සියයට 82ක්ම වක්‍ර බදු ගෙවනවා. ගරු කථානායකතුමනි, මේ රටේ දුප්පත් ජනතාව -සාමාන්‍ය ජනතාව- තමයි අපේ රටේ ආදායමෙන් සියයට 82කට කර ගහන්නේ. අනෙක් පැත්තෙන් සියයට 18ක් විතරයි ඍජු බදු ගෙවන්නේ. ඒ ගෙවන අයත් ඇත්ත වශයෙන්ම විවිධ ආකාරයට, විවිධ

නිලධාරින්ගේ පිහිටෙන්,- මම මේක භය නැතිව කියනවා. ඉතාමත්ම දූෂිත නිලධාරින් එතැන ඉන්නවා. ඒ අයගේ පිහිටෙන්- ගෙවිය යුතු ගණනවත් ගෙවන්නේ නැහැ. කෝටි ගණන් turnovers තිබෙන ආයතන සමහර වෙලාවට ලක්ෂ 4ක්, 5ක් එහෙම නැත්නම්, ලක්ෂ 10ක් ගෙවලා බේරෙන හොඳ හොඳ අවස්ථා තිබෙනවා. ඒ නිසා මේක දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අලුත් මාර්ගයක්. අපි ඉතාමත්ම කෙටි කාලයක් තුළදී නව දේශීය ආදායම් බදු පනත ගෙනාවෙත් මේ තත්ත්වය වෙනස් කරන්නයි. අන්න ඒ සඳහා නායකත්වය දෙන්න පුළුවන් ගොඩාක් අත්දැකීම් තිබෙන, ස්වාධීනව කටයුතු කරන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති සී.ජේ.පී. සිරිවර්ධන මැතිතුමා මම මේ තනතුරට පත් කරලා තිබෙනවා. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉල්ලීමක් කරනවා නම් interview board එකේ විස්තරත් මට සපයන්න පුළුවන්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මම කියන්නේ,-[බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, අපි මේ විවාදය ගොඩක් දුර ගෙනියන්නේ නැතිව මෙතැනින් අවසන් කරමු.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම අසන අවසන් ප්‍රශ්නය. ගරු කථානායකතුමනි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අයිති සේවා ව්‍යවස්ථාවක් තිබෙනවා. ඒ සේවා ව්‍යවස්ථාව අනුව බැහැරින් කෙනෙක් පත් කරන්න බැහැ. එතකොට මෙතැන සේවා ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබෙනවා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
සේවා ව්‍යවස්ථාවට වඩා ඉහළින් තිබෙන්නේ කැබිනට් මණ්ඩලය.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමනි, කැබිනට් මණ්ඩලය උඩින් තිබෙනවා කියලා කියනවා නම්, එහෙම නම් කිසිම ආයතනයක සේවා ව්‍යවස්ථාවක් ගණන් ගන්න ඕනෑ නැහැ. මම ඔබතුමාගෙන් අවධාරණය කරලා ඉල්ලන්නේ, ආයතනය තුළ අක්‍රමිකතා තිබෙනවා නම් ඒවාට පියවර ගන්න; හැබැයි, මෙතෙක් කවදාකවත් කිසිම ආණ්ඩුවක් බැහැරින් කෙනෙක් පත් නොකරපු මේ ආයතනයට පිටින් කෙනෙක් දාලා අවුලක් තිබෙනවා නම්, ඒ අවුල දෙගුණ, තෙගුණ කරන්න කටයුතු කරන්න එපා කියලායි.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
පිටින් නොවෙයි, හඳෙන් හරි ගෙනැල්ලා දක්ෂ නිලධාරියෙක් එතැනට දාලා මම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් රටට ලැබිය යුතු ආදායම ගන්න අවශ්‍ය පසුබිම සකස් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අපි දැන් මේ කාරණය මෙතැනින් නවත්වමු.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා, වාදයක් ගෙන යන්න බැහැ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, වාදයක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉන්න, ඉන්න. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාට අවස්ථාව දීලා ඉන්න ඕනෑ. එතුමායි ඉස්සෙල්ලා නැඟිටිටේ. [බාධා කිරීමක්]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මට "මයික්" එක දීලා තිබෙන්නේ ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම්, අහන්න.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා ගරු මුදල් ඇමතිතුමාගෙන් අහපු ප්‍රශ්නයේ මූලික පදනම මෙයයි. මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවේ සඳහන් කරලා තිබෙන්නේ, "2018.09.28 දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලදී. නමුත් එහිදීද මෙම තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු තෝරා ගැනීමට අපොහොසත් වී ඇත" කියලා. මේක තමයි කියපු දේ. විමල් වීරවංශ මන්ත්‍රීතුමා අහන්නේ, උදය සෙනෙවිරත්න මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා, පද්මසිරි ජයමාන්න ලේකම්තුමා සහ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ඒකනායක මැතිනිය කියන මේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දුන් ලකුණු සංඛ්‍යාව, -ඔබතුමා සුදුස්සෙක් නැහැයි කියන නිසා- සභාගත කරනවාද කියලායි. මොකද, එතුමාට ලැබිලා තිබෙන තොරතුරු මත පදනම් වෙලා-

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නිල වශයෙන් ඉල්ලන්න. දැන් ඉල්ලුවාට මට සභාගත කරන්නට බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අවධානය යොමු කරන්න.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අනෙක් කාරණය මෙයයි, පළමුවෙනි වටයේ සුදුස්සෙක් ඉදිරිපත් නොවුණු නිසා දෙවෙනි වටයටත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වුවා. දෙවතාවක්ම සම්මුඛ පරීක්ෂණය පවත්වලා තමයි අපි මේ තීන්දුව ගත්තේ. මම දන්නවා, ඇත්ත වශයෙන්ම එක්තරා පුද්ගලයකුට මේ තනතුර නොලැබුණා කියලා මේ රටේ ජාවාරම්කාර පැළැන්තිය ගොඩක් කනගාටුවෙන් ඉන්න බව. ඔබතුමාටත් එවැනි කනගාටුවක් තිබීම ගැන මම පුදුම වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් මෙය නවත්වමු. බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඉන් පසුව මහාචාර්ය ආශු මාරසිංහ මන්ත්‍රීතුමා, we will finish.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නය-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙතැනින් අපි මෙය නවත්වමු. අද හුහාක් වැඩ කටයුතු තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, මට තිබෙන ප්‍රශ්නය පුද්ගල බද්ධ -පුද්ගලයා සම්බන්ධයෙන්- කාරණයක් නොවෙයි. මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා හෝ පත් වෙන්න ඉන්න පුද්ගලයා පිළිබඳව අපි දන්නේ නැහැ. නමුත් මේ ආයතනයේ සම්මත කර ගත්ත සේවා ව්‍යවස්ථාවක් තිබෙනවානේ. ඒ සේවා ව්‍යවස්ථාවේ 12 (1) වගන්තියේ තිබෙනවා විශේෂ ශ්‍රේණියේ කෙනෙක් තමයි මෙයට පත් වෙන්න ඕනෑ කියලා. විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් 31 දෙනෙකු මේ ආයතනය තුළ සිටිනවා. ඔවුන්ට උසස් වීම සඳහා ක්‍රමවේදයක් සේවා ව්‍යවස්ථාවෙන්ම සකස් කර දීලා තිබියදීයි මෙවැනි දෙයක් කරලා තිබෙන්නේ. ඔබතුමා කියනවා නම් ඒ කවුරුවත් සුදුසු නැහැයි කියලා, ඒක වෙනම කාරණයක්. නමුත් මෙතැන සම්මත කර ගත්ත ක්‍රමයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ප්‍රශ්නය අහලා ඉවරද? ගරු මුදල් අමාත්‍යතුමා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඇත්තවශයෙන්ම පළමු වටයට සුදුසුකම් තිබෙන අයත් යම් යම් හේතු නිසා ඉදිරිපත් වුණේ නැහැ. පසුව අපට දැනගන්න ලැබුණා, ඉදිරිපත් වෙන්න එපා කියලා බොහෝ අයට විවිධ ආකාරයට තර්ජන කරලා තිබුණු බව. මමත් ඒකයි බැලුවේ එහෙම වුණේ මොකද කියලා. පළමු වටයට දෙදෙනායි ඉදිරිපත් වුණේ.

ඊට පස්සේ මෙය යළිත් දෙවන වටයට විවෘත කර, ඇතුළේ සිටින සියලුදෙනාටම ඉදිරිපත් වෙන්න කියලා මම කිව්වා. විශේෂයෙන්ම හොඳ, දක්ෂ කාන්තාවන් මේ ආයතනයේ හිටියා. දෙවැනි වටයේදීත් මේ හැම කෙනෙක්ම interview board එකේදී කියලා තිබෙනවා, "අපි මේක withdraw කරගන්නවා" කියලා. පසුව බලන කොට දැනගන්න ලැබුණා, මේ සඳහා ඉදිරිපත් වෙන්න එපා කියලා මේ සමහර අයට තර්ජන, ගර්ජන සිදු වෙලා තිබෙන බව. ඔන්න ඕකයි ඇත්ත තත්ත්වය.

එවැනි තත්ත්වයක් යටතේ ඇමතිවරයා හැටියට මගේ වග කීම වන්නේ, මේ ස්ථානයේ මේ කාර්යය කරන්න පුළුවන් කියලා මම හිතන පුද්ගලයා එතැනට පත් කිරීමයි. ඒ ගැන මට ලොකු විශ්වාසයක් තිබෙනවා. එතුමා පළමුවැනි දා වැඩ භාරගන්නවා. එතුමා මේ ස්ථානයේ කරන වෙනස මොකක්ද කියලා බලන්න අපි අවුරුද්දක් පමණ එතුමාට දීලා බලමු.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අවුරුදු තුනක් තිස්සේ අපි දැක්ක ප්‍රශ්නයක්. මම හිතන විධියට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තිබෙන මේ බල අරගළය, මාෆියාවක්. මේ මාෆියාව නිසා රජයට අයවිය යුතු බදු මුදල් නොලැබී යෑම විශාල ප්‍රශ්නයක්. ඒ වාගේම, මේ මාෆියාව නිසා මේ රටේ ජනතාවට ලැබිය යුතු මුදල් නොලැබී යනවා. සමහර අය අපටත් කථා කරලා කිව්වා, "අපි කැමැතියි මේ පුටුවේ වාඩි වෙන්න. නමුත්, මේ පුටුවේ වාඩි වුණොත් ඇසිඩ් ගහනවා කිව්වා" කියලා. එවැනි තර්ජන මෙතැන තිබෙනවා. එවැනි තර්ජන කරන්නේ මේ පුටුවේ වාඩි වෙන අදහසින් ඉන්න එක පුද්ගලයෙක්. ඒ පුද්ගලයා ඊට පහළ ඉන්න දක්ෂ නිලධාරීන්ට, නිලධාරිනියන්ට කියනවා, "ඔයාලා මේ තනතුරට apply කරන්න එපා. Apply කළොත් අපි ඇසිඩ් ගහනවා" කියලා. එවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ, ගරු කථානායකතුමනි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උද්ගත වී තිබෙන මෙම තත්ත්වය බරපතළ තත්ත්වයක්. මේ අය ආරක්ෂා කරන්න යනවා කියන්නේ, රටේ මහ ජනතාවට ලැබිය යුතු මුදල් මේ හොරුන් අතට යන්න දරන උත්සාහයක්. මෙය බරපතළ ප්‍රශ්නයක්.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු කථානායකතුමනි, එතුමා කියන එක ඇත්ත. ඇත්තෙන්ම මේ මාෆියාවේ ඉන්නේ අතලොස්සක්. ඒ වාගේම, අපි මතක් කරන්න ඕනෑ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බහුතරයක් ඉතාම අවංකව, හොඳින් වැඩ කරන බව. අපි නව ප්‍රවේශයකට යන්න හදන මේ මොහොතේ සිරිවර්ධන මහතාට සහයෝගය දීලා, අපට සහයෝගය දීලා ඉදිරියට යමු කියලා මම ඒ අයටත් ආරාධනා කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන කටයුතු ආරම්භ කරන්න තිබෙනවා. කාලය නොමැති නිසා කෙටියෙන් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඇමතිතුමා ලබා දුන් පිළිතුර අනුවයි මෙය අහන්නේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මාෆියාවක් තිබෙනවාය කියන එක සම්පූර්ණ අසත්‍යයක් කියලා මම කියන්න කැමැතියි. 2015 සිට මෙපමණ කාලයක් මේ රටේ දළ ජාතික නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අරගෙන තිබෙන බදු ආදායමේ ප්‍රමාණය බැලුවොත්, විශාල වශයෙන් ආදායම් බදු වැඩි වෙලා තිබෙන බව කියන්න පුළුවන්, ගරු කථානායකතුමනි.

එම බදු එකතු කිරීමට ඒ අය විශාල වෙහෙසක් දරලා තිබෙනවා. එසේ නොකරන කිහිප දෙනෙක් ඉන්නවා ඇති. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ සිටින නිලධාරීන් හැම කෙනෙක්ම කාලයක් තිස්සේ ජ්‍යෙෂ්ඨත්වය අනුව ක්‍රමානුකූලව තමයි ඒ තනතුරට ඉල්ලුම් කළේ. සමහර අය ඉල්ලුම් කරන්නේ නැහැ, සමහර අය ඉල්ලුම් කරනවා. මංගල සමරවීර ඇමතිතුමා හොඳ පියවර ගණනාවක් අරගෙන තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අද කොටස් දෙකකට බෙදිලා තිබෙන්නේ වෙන කාරණයක් නිසා නොවෙයි ගරු කථානායකතුමනි. RAMIS එකට විරුද්ධ කට්ටියක් තමයි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඇතුළේ කෙනෙක් මේ තනතුරට එනවාට විරුද්ධ වෙලා තිබෙන්නේ. RAMIS එක නවත්වන්න කියන එක තමයි ඒ අයගේ අදහස වෙන්නේ. ගරු කථානායකතුමනි, ආයතන 23කට වැඩි ප්‍රමාණයක් එකතු කරලා RAMIS එක ආවා නම්, අපි වාහනයක් ලියා පදිංචි කළත්, අපි ඉඩමක් ලියා පදිංචි කළත් ඒ සම්පූර්ණ මුදල් ටික - ආදායම් බදු ටික- රජයට එනවා. ඒකට විරුද්ධ කට්ටිය තමයි දැන් පිටින් කවුරු හෝ ගෙන්වලා ඒ තනතුරට දමන්න හදන්නේ. අද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තිබෙන තත්ත්වය ගැන මම කියන්න කැමැතියි. එහි ඉහළ නිලධාරීන් විතරක් නොවෙයි, මාණ්ඩලික නිලධාරීන් විතරක් නොවෙයි, ලබන සතිය වෙනකොට සාමාන්‍ය නිලධාරිනුත් මේ ප්‍රශ්නයට මැදිහත් වෙනවා. අද මාණ්ඩලික නිලධාරීන් විතරයි මේකට සම්බන්ධ වෙලා ඉන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ගන්න හොඳ පියවර තිබෙනවා.

ගරු කථානායකතුමනි, වැඩිම ලකුණු ගත්, ඊළඟට සිටින කොමසාරිස්තුමා වන ගුරුගේ කියන පුද්ගලයාගේ නම උදය සෙනෙවිරත්න මැතිතුමාගේ කමිටුව විසින් නිර්දේශ කරලා තිබුණා. ඒ නිර්දේශය පැත්තකට විසි කරලා තමයි මේ තීන්දුව අරගෙන තිබෙන්නේ. ඒකයි මම කිව්වේ, කරුණාකරලා මේ සම්බන්ධව තිබෙන තත්ත්වය දැනුම් දෙන්න කියලා. මංගල සමරවීර ඇමතිතුමා ගන්න සමහර තීන්දු ඉතාම හොඳයි. මම ඔබතුමාට බොහොම ගෞරවයෙන් මේ කරුණ කියනවා. ආණ්ඩුවට අනවශ්‍ය විශාල ප්‍රශ්නයක් ඇති කිරීම සඳහා තමයි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ මේ ප්‍රශ්නය ඇති කරගෙන තිබෙන්නේ. [බාධා කිරීමක්] මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිතුමා ඉතාම හොඳ නිලධාරියෙක්. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. නමුත්, මේ පත්වීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඇතුළේ කෙනෙකුට දෙන්න කියන ඉල්ලීම තමයි මම කරන්නේ.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මම මෙතැනදී එකම දෙයයි තව දුරටත් කියන්නේ. ඇත්තවශයෙන් මාෆියාවක් කියන එකෙන් කිව්වේ මේ මුළු ආයතනයම මාෆියාවක් කියන එක නොවෙයි. නමුත්, බහුතරය යටපත් කරගෙන පාලනය කරන්න හදන එක්තරා පිරිසකගේ පුංචි මාෆියාවක් තිබෙනවාය කියන එකත් ඇත්ත. ඒ නිසා තමයි අපි කාටවත් යට නොවන ස්වාධීන පුද්ගලයෙක් ඒ තනතුරට දාලා තිබෙන්නේ. ඒ වාගේම, RAMIS එක අපි තවත් ශක්තිමත් කරනවා. ඒක අපි අනිවාර්යයෙන්ම කරන දෙයක්, භය වෙන්න එපා. විශේෂයෙන්ම විවිධ පුද්ගලයන්ගේ බලපෑමට විවිධාකාර වර්ජනය කරන අයට මම කියනවා, කරුණාකර වහාම වැඩට යන්න, ගිහිල්ලා අලුත් Commissioner Generalතුමාට සහයෝගය දෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, විෂය අංක 1 යටතේ සක්‍රීය වගකීම් කළමනාකරණ පනත යටතේ යෝජනාව සම්මත කිරීම සහ විෂය අංක 2 යටතේ ශීර්ෂය 117 - වැඩසටහන 02, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ පරිපූරක මුදල අනුමත කිරීම.

අද දින සලකා බැලීමට නියමිත, න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ලෙස සඳහන් සක්‍රීය වගකීම් කළමනාකරණ පනත යටතේ යෝජනාව 2018 ඔක්තෝබර් මස 22 වැනි දින නිකුත් කරන ලද අංක 2(5) දරන පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකයේ පළ කරන ලදුව, 2018 ඔක්තෝබර් 22 වැනි දින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සලකා බලා ඒ සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව 2018 ඔක්තෝබර් 25 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද බවත්, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 ලෙස සඳහන් පරිපූරක මුදල - ශීර්ෂ 117 - වැඩසටහන 02, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය- 2018 ඔක්තෝබර් 25 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, එදිනම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සහ ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සලකා බලා ඒ සම්බන්ධයෙන් එකී කාරක සභාවල වාර්තා 2018 ඔක්තෝබර් 26 එනම්, අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද බවත් මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

දැන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

# සක්‍රීය වගකීම් කළමනාකරණ පනත : යෝජනාව
# தீவிர பொறுப்பு முகாமைத்துவச் சட்டம்: தீர்மானம்
# ACTIVE LIABILITY MANAGEMENT ACT: RESOLUTION

[11.05 a.m.]

**ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

Hon. Deputy Chairman of Committees, I move,

"That this Parliament resolves that a sum not exceeding Rs. 310 billion may be raised by way of loans, in or outside Sri Lanka for such purposes as specified in the provisions of Section 3 of the Active Liability Management Act, No.8 of 2018."

(Cabinet approval signified.)"

Hon. Deputy Chairman of Committees, let me take the Floor by assuring that our Government has a clear strategy to address the issue of our local and foreign debts. Of course, the debt issue in our hand was a legacy of pre-2015 mismanagement and therefore let me begin my short remarks by underlining the colossal burden that was left on our shoulders.

This Government took over a very fragile and structurally imbalanced economy. In fact, I would go as far to say that the economy was in shambles when our Government took over in 2015. The economic growth in the post-war years was dominated by foreign debts funded construction boom. The then Government went on a spending spree on infrastructure investments, many of which yielded a little or no returns. The Government at the time expanded its unproductive expenditure in such an irresponsible manner without proper attention to developing revenue sources to meet such expenditure. As a result, there developed a fiscal time bomb, which this Government is in the process of diffusing. Again, as I said earlier, we inherited a fiscal time bomb, and over the last three and a half years, we have been in the process of defusing the bomb successfully. For example, 77 per cent of the share of our foreign debt servicing in 2019 and 2020 will be on pre-January 2015 borrowings.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උදාහරණයක් හැටියට 2019 සහ 2020 වසරවල අප ගෙවිය යුතු ණය ප්‍රමාණය ගත්තොත්, ඇත්ත වශයෙන්ම ඒ වසරවල ගෙවිය යුතු ණය ප්‍රමාණයෙන් සියයට 77ක්ම 2015 වසරට ඉස්සර වෙලා රාජපක්ෂ රජය ගත්ත ණය බව මා මතක් කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. අපි මේ අවුරුද්දේ ඇමෙරිකන් ඩොලර් බිලියන 2,845ක් ගෙවන්න තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එයින් සියයට 63ක්ම 2015 වසරේ අපේ ආණ්ඩුව බලයට පත් වෙන්න ඉස්සර වෙලා ගත් ණය. ඒ වාගේම 2019 වසරේ දී -ඊළඟ වර්ෂයේදී- අපි ඉතාම බරපතළ විධියට ඩොලර් බිලියන 4,285ක් ණය වශයෙන් ගෙවන්න ඕනෑ. එයිනුත් සියයට 77ක්ම රාජපක්ෂ සමයේ ගත් ණය. 2020 වසරේ දී ඩොලර් බිලියන 3,768ක් ගෙවන්න තිබෙනවා. එයින් සියයට 77ක්ම රාජපක්ෂ යුගයේ ණය. ආයෙමත් 2021 වසරේ දී ඩොලර් බිලියන 3,441ක් ගෙවන්න තිබෙනවා. එයින් සියයට 83ක්ම රාජපක්ෂ සමයේ ණය. 2022 වසරේ දී ඩොලර් බිලියන 3,840ක් ගෙවන්න තිබෙනවා. එයින් සියයට 71ක්ම රාජපක්ෂ සමයේ ණය. 2023 වසරේ දී ඩොලර් බිලියන 2,250ක් ගෙවන්න තිබෙනවා. එයින් සියයට 71ක්ම රාජපක්ෂ සමයේ ණය. 2024 වසරේ දී ඩොලර් බිලියන 2,218ක් ගෙවන්න තිබෙනවා. එයින් සියයට 69ක් රාජපක්ෂ සමයේ ණය. ඊට පසුව 2025 වසරේ දී ඩොලර් බිලියන 4,275ක් ගෙවන්න තිබෙනවා. එතකොට නම් රාජපක්ෂ සමයේ ණය සියයට 33 දක්වා අඩු කරන්න අපට පුළුවන් වනවා. මෙන්න මේ විධියට කිසිම වගකීමකින් තොරව, ඇත්ත වශයෙන්ම කොමිස් කුට්ටිය දිහා බලලා ඒ වෙනුවෙන් ගත්ත ණය නිසාම අපි බරපතළ තත්ත්වයකට පත් වුණත්; 2015 වසරේ සිට මේ මහා ණය බරට කර ගහන්නට අපට සිදු වුණත්, අපි ඒ සඳහා විධිමත් සැලැස්මක් ඇති කරමින්, ඒ ප්‍රශ්නයට සෘජුව, සාර්ථකව මුහුණ දෙමින් ඉස්සරහට යනවා.

The Sovereign Bonds issued during 2010-2014, amounted to US Dollars 4.5 billion; that is US Dollars 4,500 million, will be maturing in 2019-2022 period. In dollar terms, our annual interest payments on these Sovereign Bonds would exceed US Dollars 300 million.

Sir, much of the increase in borrowing by the previous Government was from expensive external commercial debt, which requires investments in productive assets. Unfortunately, no productive investments were mechanized, instead of draining our resources to utter wastage. Fortunately for this country, in 2015, the direction of that disastrous path took a different direction and now for the first time in history, we have a clear approach to manage our debts.

Therefore, we are fully cognizant of our outstanding debt liabilities denominated in foreign and local currencies. In view of the necessity for institutionalizing a legal framework for managing the country's public debt profile in a prudent manner that brings debt sustainability and macroeconomic stability, the Parliament enacted the Active Liability Management Act in March, 2018. Similar Acts have been introduced in countries like Malaysia, Indonesia and Philippines with successful results.

I must say this was the first such legal framework in our country by which we introduced a prudent and pre-emptive debt management strategy. The Act provides the legal framework for the Government to raise loans in or outside Sri Lanka for management of public debt in terms of relevant laws such as the Monetary Law Act, the Local Treasury Bills Ordinance, Registered Stock and Securities Ordinance and the Foreign Loans Act.

The active liability management framework of Sri Lanka is focused on acting in advance to re-finance and pre-finance debt repayable beyond the financial year covered under the annual Budget.

Our liability management strategy is designed to ease the repayment of debt in the future and to ensure that such repayments are done at the lowest possible cost in

line with the Government's cash flow, prevailing and expected interest rates and the future maturities of public debt.

The Active Liability Management Framework was duly approved by the Cabinet and once the Resolution is passed by the Parliament to raise Rs. 310 billion by way of loans in or outside Sri Lanka for Active Liability Management, it would provide much needed legal framework to adopt strategies depending on the market conditions.

The Government and the Central Bank have already initiated action within the Active Liability Management Strategy formulated within the legal framework set out under the Act to diversify market based foreign funding sources to jurisdictions, such as the Chinese Panda Market, Japanese Samurai Market and the very liquid Sukuk Market.

We are confident that the Liability Management Strategy being adopted would enable the debt management authorities to proactively address refinancing requirements in coming years and to extend maturity duration of both domestic and foreign debt in a cost-effective manner.

I seek your indulgence to pass the Resolution today with majority endorsement. Thank you.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Item No. 2 - the Hon. Kabir Hashim, the Minister of Highways and Road Development.

[ප.භා. 11.13]

**ගරු කබීර් හාෂිම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development)

Hon. Deputy Chairman of Committees, I would like to move a Supplementary Estimate for the Ministry of Highways and Road Development for Rs. 30 billion.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගැන වචන ස්වල්පයක් කථා කරන්න මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා.

ශ්‍රී ලංකාව තුළ ආර්ථික හා සමාජයීය සංවර්ධනය කඩිනම් කිරීම සඳහාත්, පුරවැසියාගේ ගමනාගමන අවශ්‍යතා කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ඉටු කර දීම සඳහාත් අවශ්‍ය වන අධිවේගී මාර්ග ඇතුළු මහාමාර්ග පද්ධතියක් විධිමත් ලෙස සහ ක්‍රමානුකූල ලෙස සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ මූලික අරමුණයි. වර්තමානයේ දක්ෂිණ අධිවේගී මාර්ගය දකුණු දිගුව, පිටත වටරවුම් මාර්ග අදියර තුන්වන කොටස, මධ්‍යම අධිවේගී මාර්ගයේ දෙවන කොටස ඇතුළත්ව අධිවේගී මාර්ග සංවර්ධනය දිවයිනේ විවිධ පළාත් සම්බන්ධ කරනු ලබන ජාතික මහාමාර්ග ඉදිකිරීම් හා නඩත්තු කිරීම් සහ මහාමාර්ගවලට සම්බන්ධ පාලම්, බෝක්කු ඇතුළු අනෙකුත් ව්‍යුහ පහසුකම් දියුණු කිරීම වැනි විශාල ප්‍රමාණයේ ව්‍යාපෘති රාශියක් අප අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. එමෙන්ම මහාමාර්ග භාවිත කරනු ලබන මඟී ජනතාව මෙන්ම පදිකයන්ගේ ආරක්ෂාව සඳහා මාර්ග ආරක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීමද අමාත්‍යාංශයේ වගකීම් අතර වේ.

2017 ආරම්භයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වශයෙන් ස්ථාපනය කර තිබූ මෙම අමාත්‍යාංශය මහාමාර්ග අංශයට අදාළව උක්ත අරමුණු ඉටු කර ගැනීම සඳහා 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් රුපියල් මිලියන 1,25,000ක ප්‍රතිපාදනද, අයවැය යෝජනා මඟින් රුපියල් මිලියන 11,000ක ප්‍රතිපාදනද වශයෙන් සම්පූර්ණයෙන් රුපියල් මිලියන 1,36,000ක ප්‍රතිපාදන වෙන් කරනු ලැබීය. කෙසේ වුවද අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති නියමිත සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම හේතුවෙන්, වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන වර්ෂයේ මුල් මාස හය සඳහා පමණක් ගෙවීමට ප්‍රමාණවත් විය.

විශේෂයෙන්ම විදේශීය ණය මුදල් මත ක්‍රියාත්මක වන විදේශ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිකිරීම් කරනු ලබන මාර්ග සංවර්ධන ව්‍යාපෘති, භෞතික සංවර්ධන ඉලක්ක සැලසුම් කළ ලෙසටම සපුරා ගැනීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. විදේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති ගිවිසුම්ගත කොන්දේසිවලට යටත්ව ඉටු කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතු අතර, අමාත්‍යාංශය විසින් ඉටු කරන ලද කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට අදාළ ගෙවීම් නියමිත කාලය තුළ නිරවුල් කිරීමට බැඳී සිටී.

අදාළ ගිවිසුම් අනුව, කිසියම් හේතුවක් මත ගෙවීම් ප්‍රමාද වුවහොත්, ඒ සඳහා පොලී මුදල් සහ ප්‍රමාද ගාස්තු ගෙවීමට රජයට සිදු වෙයි. ඒ අනුව 2018 මැයි මස සිට සැප්තැම්බර් මස දක්වා ඉටු කරනු ලබන කාර්යයන් වෙනුවෙන් ඉදිරිපත් වී ඇති බිල්පත්වල වටිනාකම නිරවුල් කිරීම සඳහා විදේශ අරමුදල් යටතේ රුපියල් මිලියන 17,941ක්ද, එම ගෙවීම් හා සම්බන්ධ වන සියයට 15ක් වන දේශීය වාරිකය ගෙවීම, මෙම ගෙවීම්වලට අදාළ සියයට 15ක් වන බදු - VAT - මුදල් ගෙවීම සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශීය බැංකුවලින් ලබාගෙන ඇති ණය වාරික හා පොලී ගෙවීම් සඳහා දේශීය අරමුදල් මිලියන 12,059ක් වශයෙන්, රුපියල් මිලියන 30,000ක ප්‍රමාණයක් මෙම පරිපූරක ඇස්තමේන්තුව මඟින් අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රතිපාදනය හඳුනා ගෙන ඇති ව්‍යාපෘතිවල සැලසුම් කර ඇති ප්‍රගතිය ළඟා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වෙයි. මුදල් ගෙවීමෙහි ප්‍රමාදයන් ඇති වුවහොත් ඉදිකිරීම් සැලසුම්වලට අනුව ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් 2019 වර්ෂයේදී මෙම මාර්ග මහ ජනතාව සඳහා විවෘත කිරීමට නොහැකි වෙයි කියන කාරණය මෙහිදී විශේෂයෙන්ම සිහිපත් කළ යුතුයි.

ඒ අනුව රජය විසින් ප්‍රමුඛතා ලබා දී ඇති විදේශ අරමුදලින් ක්‍රියාත්මක වන ප්‍රධාන ව්‍යාපෘතිවල ගෙවීම් නිරවුල් කිරීම සඳහා හා අත්‍යවශ්‍ය වන අනෙක් ගෙවීම් සඳහා අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කර, 2018.10.11වන දින අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරන ලදී. 2018 වර්ෂයේ 10වන මාසයේ 23වන දින පැවැති කැබිනට් මණ්ඩල රැස්වීමේදී ඒ වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අනුමතිය ලැබී ඇත. ඒ අනුව රුපියල් මිලියන 30,000ක මෙම පරිපූරක ඇස්තමේන්තුව පාර්ලිමේන්තුවේ අනුමතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

[ගරු කබීර් හාෂිම් මහතා]

මහාමාර්ග අමාත්‍යාංශය අද වෙනකොට අධිවේගී මාර්ග කිහිපයක -මාතර හම්බන්තොට දකුණු අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය හා මධ්‍යම අධිවේගී මාර්ගයේ දෙවැනි කොටසෙහි- ඉතා හොඳ ප්‍රගතියක් ලබා තිබීම පිළිබඳව මම විශේෂයෙන්ම සතුටු වෙනවා. ඒ අතර මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමුවන කොටස සහ තුන්වන කොටස ආරම්භ කිරීමට ගිවිසුම් අත්සන් කිරීමට අපි දැන් කටයුතු සූදානම් කරනවා. මේ අවුරුද්ද තුළ එම ගිවිසුම් අත්සන් කරන්න පුළුවන්. ඒ වාගේම රුවන්පුර අධිවේගී මාර්ගයේ පළමුවන කොටසේ RFP එක නිකුත් කර තිබෙනවා. ඊළඟට, කුලුනු මත ඉදිකරන අධිවේගී මාර්ග දෙකක් සකස් කරන්න කටයුතු කරනවා. එයින් එකකට මේ වනවිට RFPs කැඳවා තිබෙනවා. ඒවා තාක්ෂණික කමිටුව - Technical Evaluation Committee එක - යටතේ තිබෙනවා. අනෙක් එක, BOT ක්‍රමවේදය තුළ ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ කියන්නේ, කැලණි පාලමේ සිට රාජගිරිය දක්වා පළමුවන අදියර සහ රාජගිරියේ සිට අතුරුගිරිය දක්වා දෙවන අදියර වශයෙන් ඉදිකරනවා. මේ ටික සම්පූර්ණ කළා නම් කෙනෙකුට තමන්ගේ ගමන හම්බන්තොටින් ආරම්භ කරලා, ප්‍රධාන නගරය වන කොළඹට කිසිම බලපෑමක් නොවෙන්න මහනුවර දක්වා අධිවේගී මාර්ගයෙන්ම යන්නට පුළුවන් කියා අපි විශ්වාස කරනවා. මෙය තමයි අපි බලාපොරොත්තු වන ඉලක්කය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහිදී අපේ යුතුකම් අපි කිසිම වෙලාවක අමතක කළේ නැහැ. ඒකාබද්ධ ග්‍රාමීය මාර්ග ආයෝජන වැඩසටහන යටතේ දකුණු, මධ්‍යම, උතුරු මැද, වයඹ සහ සබරගමුව යන පළාත් පහේ සහ කළුතර දිස්ත්‍රික්කයේ පාරවල් 741ක් -කිලෝමීටර් 3,130ක්- සකස් කර තිබෙනවා. අනික් පළාත් වන ඌව, නැඟෙනහිර, උතුර සහ බස්නාහිර පළාත්වල ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 3,404ක් ඉදිකිරීමේ කටයුතු දැන් ආරම්භ කර තිබෙන බව ඉතාම සතුටින් කියන්න ඕනෑ. මේ කටයුතු කරන්නේ අනිකුත් අතිරේක වැඩවලට අමතරවයි.

මා හිතන හැටියට පසුගිය කාලයේ මහින්ද රාජපක්ෂ මහත්මයා හිටපු ජනාධිපතිවරයා හැටියට සහ මහාමාර්ග ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ 2015 වනකොට එතුමා ඉඩම් පවරාගෙන තිබුණාට වන්දි ගෙවා තිබුණේ නැහැ. අද වනකොට ඒ සඳහා රුපියල් කෝටි 6,500ක වන්දි මුදලක් ගෙවන්න අපේ රජයට සිදුවෙලා තිබෙනවා. 2010 සිට 2014 දක්වා කාලයේ මිනිසුන්ගෙන් බලෙන් ඉඩම් පවරා ගෙන තිබෙනවා. ඒ අයට ගෙවිය යුතුව තිබුණු රුපියල් කෝටි 6,500ක වන්දි මුදල අපට ගෙවන්න සිද්ධවෙලා තිබෙනවා. මේ පරණ පව්වලටත් අද භාණ්ඩාගාරයෙන් මුදල් ගන්න සිද්ධවෙලා තිබෙනවා. ඒ නිසා මෙවැනි වන්දි ගෙවීම් සඳහා විටින්-විට මුදල් ඉල්ලා තිබෙනවා. ඒ ගැන මුදල් ඇමතිවරයාට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, 2015න් පසුව අධිවේගී මාර්ගවලට පමණක් ඉඩම් කට්ටි 17,100ක් පවරාගෙන තිබෙනවා. 2015 සිට අද වන තුරු ඒ සියලුදෙනාටම ඒ වෙනුවෙන් රුපියල් කෝටි 4,000ක වන්දි මුදලක් කලට වෙලාවට ගෙවාගෙන යනවා. දැනුත් ඒ පවරා ගැනීම් සඳහා ඒ අවස්ථාවේදීම වන්දි ගෙවන්න කටයුතු කරන බව මේ අවස්ථාවේදී ඉතාම සතුටින් මතක් කරන්න කැමැතියි. එම සියලු කාරණා ඔබතුමන්ලාට මතක් කර දෙමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 11.21]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ යුගයේ ගත්තා යයි කියන ණය ගැන ප්‍රලාප කියමින්, අද දින ගරු මුදල් ඇමතිතුමාත් මේ සභාවෙන් රුපියල් බිලියන ගණනක ණය මුදලක් සඳහා අනුමැතිය ගන්නවා. එතුමා, එය සාධාරණීකරණය කරන්නත් විවිධ හේතු ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේත් මේ ගරු සභාවේදී මම මේ කාරණය සඳහන් කළා. මේ රටේ රුපියල එක රුපියලකින් අවප්‍රමාණය වනවිට මේ රටේ ආර්ථිකයේ ණය බරතාව අතිරේකව රුපියල් බිලියන 55කින් ඉහළ යනවා. රුපියල් බිලියන 55ක් කියන්නේ කටුනායක-කොළඹ අධිවේගී මාර්ගය හදන්න ගිය වියදමයි. මේ ආණ්ඩුව ආවාට පස්සේ, මේ තිබෙන අකාර්යක්ෂම ආර්ථික කළමනාකරණය හේතු කොටගෙන ඉතා දරුණු මූල්‍ය අර්බුදයකට අද මේ රට ඇද වැටිලා තිබෙනවා. තමුන්නාන්සේලා පසුගිය දිනවලත් එදා වේල ගෙවන්න චීනයෙන් ඩොලර් බිලියන එකක ණයක් ගත්තා, අවුරුදු අටක් තුළදී ගෙවා අවසන් කරන්න. ඒ, ඉතා ඉහළ පොලියකටයි. ඒ දවස්වල හම්බන්තොට වරායේ දෙවන අදියර පටන් ගන්න ඩොලර් මිලියන දෙතුන් සියයක ණයක් ගන්න කොට ඒකට කියපු දේවල් මට මතකයි. ඒ ඩොලර් මිලියන දෙතුන් සියයක ණයක් ගන්න එදා යෝජනා කළේ, හම්බන්තොට වරායේ දෙවන අදියරටයි. අද තමුන්නාන්සේලා අවුරුදු අටකදී ගෙවන්න, ඉහළ පොලියකට චීනයෙන් ඩොලර් බිලියන එකක ණයක් ගන්නේ, එදා වේල පිරිමහගන්නයි.

ඇත්ත වශයෙන්ම මේ මූල්‍ය අර්බුදය නිර්මාණය කර ගත්තේ තමුන්නාන්සේලායි. තමුන්නාන්සේලාට මට ඒ බැව් පෙන්වන්න පුළුවන්. 2015 ජනවාරි වනවිට බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල විදේශිකයන් සතු ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 454යි. 2015 අප්‍රේල් වනවිට -මහ බැංකු මංකොල්ලය සිදු වන කාලය වනවිට- ඒක රුපියල් බිලියන 465 දක්වා වැඩි වෙලා තිබුණා. ජනවාරිවල තිබුණේ රුපියල් බිලියන 454යි. අප්‍රේල් වන කොට රුපියල් බිලියන 465යි. වැඩි වීමක් තිබෙනවා. හැබැයි, මහ බැංකු මංකොල්ලයෙන් පස්සේ අවුරුද්දක් ගත වෙලා බලන කොට -2016 අප්‍රේල් වෙනකොට- ඒ රුපියල් බිලියන 465, රුපියල් බිලියන 220 දක්වා අඩු වුණා. මහ බැංකු බැඳුම්කර මංකොල්ලයෙන් පස්සේ, භාණ්ඩාගාර බිල්පත්වල හා බැඳුම්කරවල මුදල් ආයෝජනය කර තිබුණු විදේශිකයන්ට මේ රටේ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ විශ්වාසය එහෙම පිටින්ම නැති වුණා.

2015 ජනවාරි වෙනකොට විදේශිකයා ඒ ක්ෂේත්‍රවල රුපියල් බිලියන 454ක් ආයෝජනය කර තිබුණා. අප්‍රේල් වෙනකොට රුපියල් බිලියන 465ක් බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල නැන්පත් කර තිබුණා; ආයෝජනය කර තිබුණා. හැබැයි, මහ බැංකු මංකොල්ලයෙන් පස්සේ අවුරුද්දක් ගත වෙනකොට -2016 අප්‍රේල් වෙන කොට- ඒ ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 220 දක්වා අඩු වුණා. භාණ්ඩාගාර බිල්පත්වල හා බැඳුම්කරවල විදේශිකයන් ආයෝජනය කර තිබුණු මුදල් රැගෙන ගියා. එසේ මුදල් රැගෙන යන්න මහ බැංකු මංකොල්ලය හේතු වුණා.

ඉහළ දේශපාලන උපදෙස් අනුව බැංකු පොලී අනුපාතය කෘත්‍රිමව ඉහළ දාලා, කවදාවත් නොවුණු විධියට මහ බැංකු අධිපතිවරයා බැඳුම්කර නිකුත් කරන කාර්යාලය ඇතුළට ගිහින්, තමන්ගේ බෑනාගේ සමාගමට ප්‍රකෝටි ගණන්ක ධනයක් උපයන්න, ලාභයක් හොයන්න ක්‍රමානුකූලව, සැලසුම් සහගතව සිදු කරපු ඒ මංකොල්ලය නිසා තමයි විදේශීය ආයෝජකයා භාණ්ඩාගාර බිල්පත්වල සහ බැඳුම්කරවල මුදල් නැන්පත් නොකර පසු බහින්න පටන් ගත්තේ. ඒ නිසා තමයි 2015 වසරේ අප්‍රේල් වෙනකොට රුපියල් බිලියන 465ක් වූ විදේශ ආයෝජනය 2016 අප්‍රේල් වෙනකොට -අවුරුද්දක් වෙනකොට- රුපියල් බිලියන 220 දක්වා අඩු වෙන්නේ. තමුන්නාන්සේලා කියනවා මෙහෙම

වෙන්නේ ට්‍රම්ප්ගේ ආර්ථික ප්‍රතිපත්තිය නිසාලු. හැමදේටම මහින්ද රාජපක්ෂව අල්ලනවා වාගේ කොහේවත් ඉන්න ට්‍රම්ප් කෙනෙක් අල්ලා ගන්න එපා. මේක ඇත්තටම වුණේ තමුන්නාන්සේලාගේ මහ බැංකු මංකොල්ලය නිසායි. අද අර්ජුන මහේන්ද්‍රන් ලංකාවේ නැහැ. අර්ජුන මහේන්ද්‍රන් ගැන මම වග කියනවා කියාපු අගමැතිතුමා, අද අර්ජුන මහේන්ද්‍රන් ගැන වග කියන්නේ නැහැ. සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමා 'මහ බැංකු බැඳුම්කර ක්‍රියාවේ ඇත්ත නැත්ත' කියා පොතකුත් ලිව්වා. දැන් ඒ පොතත් සොයා ගන්න නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා කල්පනා කර බලන්න- [බාධා කිරීමක්] පොත ගැන කථා කරන්න ගිහින් මගෙන් තව ටිකක් අහගන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බැඳුම්කර මහ මංකොල්ලය තමයි මේ රටේ ආර්ථිකයේ අද පවතින කඩා වැටීමේ තීරණාත්මක මර්මස්ථානය බවට පත් වුණේ. බැඳුම්කර මහ මංකොල්ලය නිසා තර වෙච්ච අය ඉන්නවා, ගෙවල් අරගත්ත අය ඉන්නවා, apartments ලබා ගත් අය ඉන්නවා, හෝටල් ලබා ගත් අය ඉන්නවා. ඒ හෝටල්වලට තමන්ගේ ගෝලයෝ ගෙන ගොස් සාද පවත්වන අය ඉන්නවා. ඒ ගොල්ලන්ට හරි ගියා. හැබැයි, මේ මංකොල්ලය තමයි මේ රටේ මූල්‍ය වෙළෙඳ පොළ, මූල්‍ය ආර්ථිකය ප්‍රධාන වශයෙන් තීරණාත්මකව කඩා වැටිටුවේ. ණෘත්‍රීමව පොලී අනුපාතය සියයට තුනකින් ඉහළට ගියා. මේ රටේ බැංකු සමඟ ගනුදෙනු කරන මිනිසුන්ට ඒ පොලී අනුපාතය වැඩි වීම දරා ගන්න බැරි වුණා. රටේ ක්‍රමානුකූලව සිදුවන ආර්ථික ක්‍රියාදාමය කඩා වැටෙන්න පටන් ගත්තා. ඒක මුළු මහත් සමාජයටම බලපෑවා. අද මුදල් ඇමතිතුමා මොනවා කිව්වත්, මේ රටේ ප්‍රධාන පෙළේ ඉදිකිරීම් ආයතන පවත්වාගෙන යන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. සමහර ආයතන වැහිලා. ප්‍රමුඛ ඉදිකිරීම් ආයතන වැහිලා. අද ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන පමණක් නොව විවිධ මට්ටමේ ව්‍යාපාර පවත්වාගෙන යන්න බැරි තරමේ අර්බුදයකට මේ රටේ ව්‍යාපාරික ප්‍රජාව පරිවර්තනය වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2015 ජනවාරි 08ට කලින් ආර්ථිකය ගැන මවපු හීනවලට, පුංචි කාර් ගැන මවපු හීනවලට අද මොකද වෙලා තිබෙන්නේ? 2015 ජනවාරි 08 වැනිදාට කලින් මේ රටේ ආර්ථිකය ගැන දැනගෙන හිටියේ නැද්ද? තමුන්නාන්සේලා අද කියන්නේ "මහින්ද රාජපක්ෂ මේ රටේ ආර්ථිකය දරුණු අර්බුදයකට ගෙන ගිහිල්ලා තිබුණු නිසා මෙහෙම වුණා." කියා නේ? එතකොට අර 10,000 පොරොන්දු දෙනකොට, පුංචි කාර් හීන මවනකොට දැනගෙන හිටියේ නැද්ද, මහින්ද රාජපක්ෂ මේ රටේ ආර්ථිකය එවැනි තත්ත්වයකට අරගෙන ගිහිල්ලායි තිබෙන්නේ කියා. ඒක නොදැනද ඒ හීන මැව්වේ? මට මතකයි, චම්පික රණවක ඇමතිතුමා මේ රටේ ඉන්ධනවලට ගහපු බදු ගැන කියමින් "රාජපක්ෂ පවුල පිනවන්නයි මේ බදු ගහලා තිබෙන්නේ. අපි ආපු ගමන් ඔය බදු ඔක්කෝම අයින් කරනවා." කියා ත්‍රී විලර් පදවන මල්ලිලාට කිව්වා. අනේ! මේ රටේ ලක්ෂ 62ක් ඒ පව බේගල් විශ්වාස කළා. අද තමුන්නාන්සේලා ඉන්ධනවලට ගහන්නේ කොයි විධියේ බද්දක්ද? සියයට පණහක පමණ බදු ප්‍රමාණයක් තමුන්නාන්සේලා මුළුමහත් ඉන්ධනවලට ගහලා තිබෙනවා. එදා ලෝක වෙළෙඳ පොළේ තෙල් බැරලයක මිලට වඩා අද මිල අඩුයි. එදා ලෝක වෙළෙඳ පොළේ තෙල් බැරලයක මිල මීට වඩා වැඩියි. තමුන්නාන්සේලා ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩු වෙලා තිබෙන වෙලාවකයි අධික බදු ප්‍රමාණයක් ගහලා ඉන්ධනවල මිල මාසයෙන් මාසය, මාසයෙන් මාසය වැඩි කර තිබෙන්නේ. ඒක හරියට ඔසප් චක්‍රය වාගෙයි. මාසයේ එක් දවසක සුත්තර පුංචා එනවා, සුත්තරයෙන් තෙල් මිල නග්ගනවා. සුත්තරය නැත්නම් තෙල් මිල නග්ගන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා මවපු හීන අද පට්ටපල් බොරු බේගල් වෙලා. නාමල් බේබිලාගේ ලැම්බෝ ගිනි ගැන කිය කියා ආවා. දැන් ලැම්බෝගිනිවල මිල සියයට 70කින් අඩු කරලා. හැබැයි, බදු ගහලා අර පුංචි කාර් එකේ මිල සියයට හැටගණනකින් නග්ගලා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා දීපු පොරොන්දුවල ප්‍රමාණයයි, අද තමුන්නාන්සේලා මේ ආර්ථිකය වට්ටලා තිබෙන තැනයි ගැන කල්පනා කර බලන්න.

සාමාන්‍ය නිෂ්පාදකයාට අද පවතින්න බැහැ. මේ රටේ ව්‍යාපාරිකයාට බදු සහන නැහැ. මේ රටේ සම්භාණ්ඩ හදන්න තමුන්නාන්සේලා ඉන්දියානු ව්‍යාපාරිකයෙක් ගෙන්වූවා. ආයෝජන මණ්ඩලය බදු සහන දුන්නා. ඔහු සම් භාණ්ඩ හදන්න පටන් ගත්තා. කොන්දේසියක් තිබෙනවා, මේ රටේ වෙළෙඳ පොළට ඔහුට සම්භාණ්ඩ දමන්න බැහැ කියා. හැබැයි, ආයෝජන මණ්ඩලය ඒකටත් ඔහුට ඉඩ දුන්නා. ඔහු මේ රටට ඇවිල්ලා, මේ රටේ සම්භාණ්ඩ කර්මාන්තය පටන් අරගෙන, සම්භාණ්ඩ නිපදවා විදේශ වෙළෙඳ පොළට යැවිය යුතු වුණත්, අර බදු සහනත් අරගෙන මේ රටේ වෙළෙඳ පොළටත් ඒ ඉන්දියානු සමාගම සම් භාණ්ඩ දමනවා. අද දේශීය සම්භාණ්ඩ කර්මාන්තකරුවාට මේකත් එක්ක තරග කරන්න බැරි වෙලා තිබෙනවා. විදේශිකයාට තමයි තමුන්නාන්සේලා සලකන්නේ. "විදේශ ආයෝජකයින් එනවා." යැයි කියමිනුයි තමුන්නාන්සේලා ඒ අය පිනවන්නේ. හැබැයි, මේ ආර්ථිකය ඇතුළේ දේශීය ව්‍යවසායකයා අද ඉතා බරපතළ අර්බුදයකට පත් වෙලා තිබෙනවා. මේක ගැන තමුන්නාන්සේලාට පෙනෙන්නේ නැහැ.

ඊයේ ඉහළ අහසේ ලස්සන දේදුන්නක් පායා තිබුණා. ඒක ගොඩක් අය දැකලා තිබුණා. දේදුනු පායන කාලයක් මේක. ඒ නිසා තමුන්නාන්සේලාට මේවා සංවේදී වෙන්නේ නැහැ, දැනෙන්නේ නැහැ, තේරෙන්නේ නැහැ.

මේ රටේ දෙවේල කා ගන්න බැරිව -කබීර් හාෂිම් ඇමතිතුමනි, ඔබතුමාට මේක අදාළ නැහැ. - අසරණ වුණු මිනිසුන් කොපමණ ඉන්නවාද කියා තමුන්නාන්සේලාගේ කොට්ඨාසවලට ගිහිල්ලා අහලා බලන්න. [බාධා කිරීමක්] දැන් තමුන්නාන්සේලාට කොහොමද පෙනෙන්නේ? තමුන්නාන්සේලාට කොහොමද දැනෙන්නේ? මේ රටේ සාගින්නෙන් මැරෙන්න යන දරු පවුල්වලට වහ කවනවා. රජරට ප්‍රදේශයේ මිනිසුන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් ණය අරගෙන තිබෙනවා. අනුරාධපුර උසාවියට ගිහිල්ලා පොඩ්ඩක් ඉඳගෙන ඉඳලා බලන්න. ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල පැමිණිලිවලින් අසරණ කාන්තාවන් හැමදාම 10ක්, 15ක් හිරේට දමනවා. සමහරවිට ඒ ණය රුපියල් 75,000ක ණයක්, රුපියල් ලක්ෂයක ණයක් වෙන්න පුළුවන්. ඒ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයෙන් ණය ගන්න තමුන්නාන්සේලාගේ යූඑන්පී සංවිධායකවරයාගේ අත්සන ඕනෑ. ඒ අත්සන අරගෙන ගිහිල්ලායි ණය ගත්තේ. ඔවුන්ට ණය ගෙවා ගන්න බැහැ. ගෙවා ගන්න විධියක් නැහැ. හතර අතේ ණය වුණා. අවසානයේදී, ඒ අසරණ කාන්තාවන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය මහින් උසාවියට ගෙන යනවා. බොහෝ වෙලාවට ඔවුන්ව රිමාන්ඩ් බන්ධනාගාරගත කරනවා. අනුරාධපුර උසාවිය විතරක් ක්ෂුද්‍ර මූල්‍ය ණය ගත්තු කී දෙනෙක් දවසකට රිමාන්ඩ් බන්ධනාගාරගත කරනවාද කියා හොයා බලන්න. ඒ නිසා පහළ මට්ටමේ සිට මැද පන්තිය දක්වා ඉහළ ව්‍යාපාරිකයා දක්වා මේ රටේ බොහොම ප්‍රබල සමාගම් අද පාඩු ලබන සමාගම් බවට පත් වෙලා. වැහෙන මට්ටමකට පත් වෙලා. මෙතෙක් දිගු කාලීනව ලාභ ලබන ආයතන, සමාගම් ඒවායේ නම් මම මෙම ගරු සභාවේදී කියන්න අදහස් කරන්නේ නැහැ. සමාගම් බොහෝමයක් අද පාඩු ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. තව සමාගම් ප්‍රමාණයක් ලබමින් හිටපු ලාභය අඩු මට්ටමකට පත් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා බදු පටවලා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවටත් පිටින් කෙනෙක්

[ගරු විමල් වීරවංශ මහතා]

දාලා ඒක පාවිච්චි කර, තව තවත් මේ රටේ මහජනයා මත බදු බර පීඩනය වැඩි කර, රීරි මාංශය සුරාගෙන කාලා හෝ මේ කරන්න හදන සෙල්ලමෙන් වෙන්නේ මේ රට නන්නත්තාර වෙන එකයි. මෙහෙම ගියොත් ලබන අවුරුද්ද වන විට මේ රටේ මිනිසුන්ට පාරට බහිනවා හැර වෙන කරන්න දෙයක් ඉතුරු වන්නේ නැහැ. එතැනට තමුන්නාන්සේලා ආර්ථිකය අරගෙන ගිහිල්ලා ඉවරයි. තමුන්නාන්සේලා ණය ගන්නේ එදා වේල ගෙවන්නයි. මේ රටේ මහ පරිමාණ සංවර්ධන ව්‍යාපෘති අද නතර වෙලා. තමුන්නාන්සේලා අධිවේගී මාර්ග කරනවා කිව්වාට, අපේ ආණ්ඩුවක් තිබුණා නම් මධ්‍යම අධිවේගී මාර්ගය අද හදලා අවසන්. එදා තිබුණු ඇස්තමේන්තුවටත් වඩා තුන් ගුණයකටත් ඉහළ ඇස්තමේන්තුවලට තමයි අධිවේගී මාර්ග අද තමුන්නාන්සේලා හදන්නේ. හැබැයි, එදා තමුන්නාන්සේලාගේ සහෝදර පක්ෂය වුණු ජනතා විමුක්ති පෙරමුණේ නායකයා අපෙන් ඇහුවා,"මේවා රත්තරන් ද?" කියා. එකම වෙනස තිබෙන්නේ එතුමා අද ඔබතුමන්ලාගෙන් අහන්නේ නැහැ මේවා ප්ලැටිනම් ද කියා. එච්චරයි වෙනසකට තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ක්‍රමයෙන් මේ රටට ඉස්සරහට යන්න බැහැ. අපි තමුන්නාන්සේට ඉතා ඕනෑකමින් අවධාරණය කරනවා අපේ රට ඇද වැටෙමින් තිබෙන ආර්ථික ප්‍රපාතයෙන් එළියට ගන්න නම්, තමුන්නාන්සේලාගේ මූලෝපාය, එහෙම නැත්නම් තමුන්නාන්සේලාගේ දැක්ම වෙනස් කළ යුතුයි කියා. ඒ දැක්මට, ඒ මූලෝපායට මේ රට ආර්ථික වශයෙන් ගොඩගන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි.

අපි ඉතා ඕනෑකමින් මේ කාරණා අවධාරණය කරනවා. හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග ගත් ණය හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ගෙව්වා. හිටපු ජනාධිපති ඩී.බී. විජේතුංග ගත් ණය හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ගෙව්වා. හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස ගත් ණය හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ගෙව්වා. ඒ සියලුම දෙනා ණය ගත්තා. ඒ කවුරුත් රටේ අවශ්‍යතාවයට ණය ගත්තා. එසේ ගත් හැම ණයකම පීඩනය, වාරිකය ගෙව්වා. නමුත් නහයෙන් ඇඹුවේ නැහැ මේක චන්ද්‍රිකා ගත් ණය, මේක ජේ.ආර්. ගත් ණය; මේක ප්‍රේමදාස ගත් ණය කියා. මේ රටේ ආර්ථිකය ගොඩ ගන්න ණය ගත්තා විතරක් නොවෙයි, යුද්ධයකුත් කළා. යුද්ධය නිසා ණය අරගෙන අවිආයුධ ගන්න සිද්ධ වුණා. යුද්ධය ජයග්‍රහණය කළා. යුද්ධයට පිච්චිච්ච සල්ලි අද පිච්චෙන්නේ නැහැ. අද මේ රටේ ජනතාවට යුද්ධයක් නැහැ. යුද්ධයක් නොපවතින තත්ත්වයක් යටතේ භාරගත් රට තමයි තමුන්නාන්සේලා ආර්ථික වශයෙන් කාබාසිනියා කරගෙන යන්නේ. ඒ නිසා මේ ගමනට වැඩි ආයු කාලයක් නැති බව අවධාරණය කරනවා. මේ විධියට එදා වේල ගත කිරීම සඳහා තොග පිටින් ණය අරගෙන අවප්‍රමාණය වෙන හැම රුපියලකින්ම රුපියල් බිලියන 55ක අතිරේක ණය බරක් ණය තොගයට එකතු කර මේ රට බරපතළ අර්බුදයක් කරා ඇදගෙන යන තමුන්නාන්සේලාට මේ රට ආර්ථිකය ප්‍රපාතයට ගෙනියනවා හැරෙන්න ඒකට ජීවය දෙන්න බැරි බව අවධාරණය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා.11.35]

**ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අදහස් දක්වන්න ඉඩ ලබාදුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. ඉතාම සැර කථාවක් විමල් වීරවංශ මහත්තයා කළා. විශේෂයෙන්ම එතුමාට අපි මතක් කරනවා, යුද්ධය ඉවර වුණා කියන එක අපි පිළිගන්නවා කියන කාරණය. යුද්ධය ඉවර වුණාට පස්සේ ලොකු සුද්දයක් පටන් ගත්තා. අද යටිගිරියෙන් කෑ ගැහුවාට, අපි මේ විඳින්නේ ඒ සුද්දයේ ප්‍රතිඵල තමයි. වේලක් දෙකක් කා ගන්න බැරිව හිටපු මන්ත්‍රීවරයෙක් තමයි -මේ කථා කරන- අද විශාල ධන කුවේරයෙක් බවට පත්වෙලා ඉන්නේ,- [බාධා කිරීමක්] ඔබතුමාට නොවෙයි. මම නමක් සඳහන් කළේ නැහැ. තොප්පි දමා ගන්න එපා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Wimal Weerawansa.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බැදුම්කර

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අපට මඩ ගහන්න එනවා. බැදුම්කර

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මම තමුන්නාන්සේට අභියෝග කරනවා නම කියන්න කියා. මන්ත්‍රීවරයෙකුගේ,-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
That is not a point of Order, Sir. I just started.-[*Interruption.*] I did not disturb you.-[*Interruption.*] Let me speak.

තොප්පි දමා ගන්න එපා. මම කාටවත් නොවෙයි කථා කළේ. මම කථා කළේ,- [බාධා කිරීමක්] නම් කියන්නේ මොකටද? මම ඒ නම් සඳහන් කරන්න ඕනෑ නැහැ. ධන කුවේරයෙක් බවට පත් වෙලා ඉන්නවා නම්, වේලක් දෙකක් කා ගන්න බැරුව හිටියා නම්, දැන ගන්න ඕනෑ කවුද, ඒ මන්ත්‍රීවරයා කියා. මොකද, මම ඒ නම් සඳහන් කරන්නේ නැහැ නේ. මම ඒ නම් කියන්නේ නැහැ. ඒ නිසා මිනිසුන්ට නිකම් මඩ ගහන්න කලින් කථා කරනකොට තමන්ගේ පැටිකිරිය පොඩ්ඩක් පරීක්ෂා කර බලලා කථා කරන්න. අපි දන්නවා කවුද, කොහෙන්ද ආවේ කියා. කරන දේවලුත් අපි දන්නවා. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලයේ වුණු සිද්ධි අපි හැම කෙනෙක්ම දන්නවා, මොනවාද වුණේ කියා.

අපි ණය ගෙවන්න බය නැහැ. අපි ණය ගෙවනවා. ඩී.බී. විජේතුංග මහත්තයා ගත් ණය ගෙව්වා වාගේ අපි ගෙවනවා. මහින්ද රාජපක්ෂ මහත්තයා ගත් ණය අපි ගෙවනවා. ඒක නොවෙයි, මේකට අදාළ වෙන්නේ. අදාළ වෙන්නේ,- [බාධා කිරීමක්] හොරා කවුද කියන එක දන්නවා නේ. තමන්ගේ පවුලට කවුද නිවාස දුන්නේ? මම එකින් එකට කියන්නම්.

කවුද, හොර ID හැදුවේ? කවුද, හොර Passport හැදුවේ? කවුද, හම්බ කරපු සල්ලි සියල්ලම වෙන channelවලින් රටින් පිට මං කළේ? ඒවා කළේ කවුද කියලා අපි කථා කරමු කෝ. අපි නිකම් බොරුවට මඩ ගහගෙන වැඩක් නැහැ නේ. කථා කරනවා නම්, අපි facts කථා කරමු. මම රටේ ආර්ථිකය ගැන කථා කරන්නයි පටන් ගත්තේ. ඔබතුමා මගේ නම සඳහන් කරපු නිසායි මම මේවා කිව්වේ. මම පොතක් ලිව්වා. ඒ පොතේ කරුණු සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරමු, ඔබතුමන්ලා ඕනෑ තැනකට එන්න. Direct Placements මොනවාද, auctions මොනවාද කියන එක Bond Commission එකට පවා අපි ඉදිරිපත් කළා. විශේෂයෙන්ම අපි යොදපු footnotes ඇතුළු සියලු දේවල් Bond Commission එක නිවැරදි බව කිව්වා. අපි කරපු දේවල්වලට අපි වග කියනවා. අපි ඒවා නැහැ කියන්නේ නැහැ. අපි භය නැහැ, අපි හැංගෙන්නේ නැහැ, අපි කෙළින් කථා කරන මිනිස්සු, අපි කෙළින් වැඩ කරන මිනිස්සු. ඒ නිසා අපට හැංගෙන්න ඕනෑ නැහැ.

විශේෂයෙන්ම පසුගිය රජය කාලයේ ඇති වූ ණය ප්‍රමාණය, රුපියල් ට්‍රිලියන 10ක්. මහින්ද රාජපක්ෂ මහත්තයා රට භාර ගන්නකොට තිබුණු ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 2යි. ඔබතුමා කථා කරනවා, highways ගැන. මම ඇත්තටම highways විෂය භාර අමාත්‍යතුමාට සහ ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. ගරු දයාසිරි ජයසේකර මහත්තයා කිව්වේ ඇත්ත. ආදායම් බදු ප්‍රමාණය වැඩි වුණා. ආදායම් බදු ප්‍රමාණය වැඩි වුණේ, මේ අවුරුදු 2-3 ඇතුළත අපේ ආණ්ඩුව කරපු කාර්ය භාරය නිසායි. ආදායම් බදු විශාල වශයෙන් වැඩි වුණා. ඒ වාගේම, අපි පාරවල් හදලා පෙන්වන්නම්. තවම අවුරුදු දෙකයි ගියේ. මහනුවර අධිවේගී මාර්ගයේ දෙවැනි පියවර අගෝස්තු වනකොට ඉවරයි. ඉතුරු ටික තව මාස 14-15ක් යනකොට ඉවරයි. ඔබතුමන්ලා අවුරුදු 20ටම හැදුවේ අධිවේගී මාර්ග දෙකයි. අපි මේ කෙටි කාලය තුළ පාරවල් විශාල ප්‍රමාණයක් හදලා තිබෙනවා.

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමා රටේ ආර්ථිකය සම්බන්ධයෙන්, රුපියලේ අගය සම්බන්ධයෙන් සඳහන් කළ කරුණුවලට පිළිතුරු දෙනවා නම්, මට කියන්න තිබෙන්නේ චීනය, ඉන්දියාව, ඇතුළු බොහෝ රටවල් අද මේ ප්‍රශ්නයට මුහුණ පාලා තිබෙන බවයි. අපි ඒ ප්‍රශ්නයට මුහුණ දුන්නේ විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ කාලයේ ගත් ක්‍රියා මාර්ග නිසායි. මඩ ගහන්නේ නැතුව, අපි facts කථා කරමු. ඔබතුමන්ලාගේ කාලයේ විශේෂයෙන්ම Direct Placements දාලා කෘත්‍රිමව රුපියල control කරලායි තිබ්බේ. එලෙස රුපියලේ අගය පාලනය කරපු නිසා මේ රට විශාල අගාධයකට වැටුණා. ඒ වෙලාවේ ආර්ථික වශයෙන් තාවකාලික පැලැස්තරයක් යෙදුවේ. හැබැයි, රට විශාල අගාධයකට වැටුණා. රුපියල පාලනය කළොත්, පොලී අනුපාතය කෘත්‍රිමව පාලනය කළොත්, ඒ රටවල් ඇද වැටෙනවා. ඒක තමයි ග්‍රීසියට සිදු වුණේ. අපි ඒ කාර්ය භාරය කරන්නේ නැහැ. අපි හරියට ආර්ථිකය කළමනාකරණය කරනවා. ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, අපට විශාල ණය ප්‍රමාණයක් තිබෙනවා ගෙවන්න. අපි ගෙවනවා. "ගෙවන්නේ නැහැ" කියා අපි කියන්නේ නැහැ. අපි කියන්නේ, සැලසුමකින් නැතිව වැඩ නොකරන බවයි. හම්බන්තොට වරාය ව්‍යාපෘතියේදී මොකක්ද වුණේ? සැලසුමක් තිබුණේ නැහැ. ඉදිරි ගමනක් සම්බන්ධයෙන් කිසිම කථිකාවක් තිබුණේ නැහැ. ව්‍යාපෘතියක් ගෙනාවා; හැදුවා; ඉවර කළා. හැබැයි, නැව් ආවේ නැහැ. ඒ ණය ප්‍රමාණය අපි පියෙව්වා. අපි එකහත්වයකට ආවා. අපි එකඟ වෙලා, අපේ ණය ප්‍රමාණය චීනයට භාර දුන්නා. ඔබතුමන්ලා අපේ රජයට භාර දුන්නු ණය ප්‍රමාණය අපි යම්කිසි ආකාරයකට කළමනාකරණය කළා. අපි වෙන දෙයක් කළේ නැහැ.

ගරු මුදල් අමාත්‍යතුමනි, ආර්ථිකය ගැන හැම දෙනාම කථා කරපු නිසා ඔබතුමාත් ගරු සභාවේ ඉන්න වේලාවේ මා විශේෂයෙන්ම මේ කාරණය කිව යුතුයි. ගරු ඇමතිතුමනි, අපේ රටේ තිබෙන ජාවාරම්කාර මූල්‍ය ආයතනවලට බොහෝ වෙලාවට අපේ දුප්පත් ජනතාව අහු වෙනවා. මේවා සම්බන්ධයෙන් රටේ නීතිය ඇත්තටම ශක්තිමත් නැහැ. කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, මේ මූල්‍ය ආයතන නිසා ඇති වෙලා තිබෙන ප්‍රශ්න ගැන. මේ හොර මූල්‍ය ආයතන නිසා මම දැක්කා, ඊයේ-පෙරේදා විශාල ප්‍රශ්නයක් ඇති වුණ බව. ඒ මූල්‍ය ආයතනවලට නීතිමය රාමුවක් නැති නිසා, මේ රටේ chequesවලට නීතියක් බලපාන්නේ නැහැ; හොර ගනුදෙනුවලට නීතියක් බලපාන්නේ නැහැ; බැංකුවලින් ණය මුදල් අරගෙන ගෙව්වේ නැත්නම් නීතියක් බලපාන්නේ නැහැ. මේවායින් ගැලවෙන්න පුළුවන්. එම නිසා මම විශේෂයෙන්ම ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කරවනවා. ගරු ඇමතිතුමනි, මේ මූල්‍ය ආයතන අභිංසක ජනතාව රවටවනවා. ඒ නිසා අපට තිබෙන්න ඕනෑ database එකක්. මම ඔබතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ මූල්‍ය ආයතනවලට අභිංසක ජනතාව අහු නොවන්නට වැඩ පිළිවෙළක් හදන්න කියලා. විශේෂයෙන්ම සක්චිති, දඬුවම් මුදලාලි, ගෝල්ඩන් කී වාගේ ප්‍රධාන මූල්‍ය ආයතන කීපයක්ම අභිංසක ජනතාව රැවැට්ටුවා.

ගරු ඇමතිතුමනි, මේ දවස්වල ඔබතුමාටත් ප්‍රශ්නයක් තිබෙනවා, ඊඒපී සමූහ ව්‍යාපාරය සම්බන්ධව. ජනතාව එම ආයතනයේ විශාල මුදල් ප්‍රමාණයක් තැන්පත් කර තිබෙනවා. එම මුදල් නැවත ලබා ගත නොහැකිව එම තැන්පත්කරුවන් අද අතර මං වෙලා ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ-පෙරේදා මටත්, ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමාටත් මඩ ප්‍රහාරයක් ගැහුවා, කෝච්චියක් සම්බන්ධයෙන්. ඒක විදුලි කෝච්චියක් කිව්වා. හැබැයි, ඒක අසූචි කෝච්චියක්. ඒ මඩ ප්‍රහාරය එල්ල කරපු පුද්ගලයා සම්බන්ධව මම තොරතුරු සියල්ලම හොයා ගත්තා. ඒකට මට දවස් 10ක් විතර ගියා. ඔහුගේ නම, මුතුකුඩආරච්චිගේ දොන් ඇන්ටන් ධම්මික දේශප්‍රිය. හිටපු අමාත්‍යවරයෙකු වන ගරු ෆීලික් පෙරේරා මැතිතුමා මට කථා කරලා කිව්වා, මෙම පුද්ගලයා සහ පවුල ආයෝජන මණ්ඩලයේ sausage factory එකක් ආරම්භ කරනවා කියලා අවුරුදු 9කට කලින් එතුමාගෙන් රුපියල් ලක්ෂ 50ක මුදලක් ලබා ගත් බව. එතුමා ඒ සම්බන්ධයෙන් පොලීසියේ පැමිණිල්ලක් දාලා තිබෙනවා. එම පැමිණිල්ලේ පිටපත් මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

එය විශාල මං කොල්ලයක්. මේ වගේ පුද්ගලයෝ සම්බන්ධයෙන් රට දැනුවත් වෙන්න ඕනෑ. ඇත්තටම BOI ආයතනය දැනගෙන හිටියා නම් මේ පුද්ගලයා හොරෙක් කියලා, එතුමා මේ වාගේ ප්‍රශ්නයකට මුහුණ දෙන්නේ නැහැ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
පොතක් ලියන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අපි ලියන්නම්. ඒ ගැන ලියන්නම්. අපේ පක්ෂයේ ඉන්නකොට ඔබතුමා ලියපු පොත් ගැනත් අපි දන්නවා නේ. ඔබතුමා කරපු කාර්ය භාරය අපි දන්න නිසා, ඒ ගැන අපි කථා කරන්නේ නැහැ.

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු සුජීව සේනසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සමාගමේ ඉන්නේ සහෝදරයෝ- [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, අහ ගන්න කෝ. අපි ඔබතුමාට බාධා කරන්නේ නැහැ නේ. අපි කවදාවත් ඔබතුමාට මඩ ගහන්නේත් නැහැ නේ. තරුණ මන්ත්‍රීවරයෙක් කථා කරනකොට කරුණාකරලා අහගෙන ඉන්න. අපි ඔබතුමාගේ දරුවෝ වාගෙයි. ඒ නිසා මඩ ගහන්නේ නැතුව අපි හරියට දේශපාලනය කරමු. මා මේ කියන්නේ අසත්‍යයක් නම් ඔබතුමා මට ඕනෑ දෙයක් කියන්න.

මෙම පවුලේ මුතුකුඩආරච්චිගේ දොන් ඇන්ටන් ධම්මික දේශප්‍රිය රත්නප්‍රිය කියන්නේ අයියා. මුතුකුඩආරච්චිගේ දොන් නිකලස් ශ්‍රීමාල් රත්නප්‍රිය කියන්නේ මල්ලී. බැස්ටියන් කෝරළගේ ගර්ට්‍රූඩ් ජොසපින් රොද්‍රිගු කියන්නේ අම්මා. අනුෂ්කා රේණු කියන්නේ භාර්යාව. මේ එක පවුලක් විසින් BOI එකත් අන්දලා රුපියල් ලක්ෂ 250ක මුදලක් මහජන බැංකුවෙන් අරගෙන, මේ වෙනකොටත් එම මුදල් ගෙවා නැහැ. ඒ වාගේම පිට රට යවනවා කියලා තරුණයන් 10දෙනෙකුගෙන් මේ පවුල ලක්ෂ 10 ගණනේ අරගෙන තිබෙනවා. මේ තරුණයෝ එම ලක්ෂ 10ක ණය මුදල අරගෙන තිබෙන්නේ පොලියට. ඒ තරුණයන්ගේ නම් ඇතුළත් ලිපි සියල්ලම මා ළඟ තිබෙනවා. මේ සිද්ධියට අදාළ එම පවුලේ 4දෙනාම CRIB එකේ ඉන්නවා. ඒ ඉඳලාත්, විශේෂයෙන්ම මහින්ද යාපා මන්ත්‍රීතුමාගේ සහෝදර මන්ත්‍රීතුමාගෙන් ෆීලික්ස් පෙරේරා හිටපු ඇමතිතුමා ඇවිල්ලා අහලා තිබෙනවා, වත්තල ප්‍රදේශයේ මඩුවක -hut එකක- මේ වාගේ ආයතනයක් තිබිලාත් ඒ සඳහා BOI approval එක ලැබුණේ කොහොමද කියලා. ලක්ෂ 1,200ක මූල ධනයක් යොදවනවා කියලා BOI approval එක හොරට අරගෙන, ශත 5ක්වත් යොදවන්නේ නැති වුණාම BOI එක ඒක cancel කරලා තිබෙනවා. නමුත්, ඒ ගත්ත approval එක පාවිච්චි කරලා තමයි මොවුන් විශාල හොරකමක් කරලා තිබෙන්නේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Do you have a question, Hon. Member? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට වෙලාව දෙන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් නිරන්තරයෙන් පසුගිය සති දෙක තුන තිස්සේ විශාල සාකච්ඡාවක් යනවා. ඔබතුමා, ඔබතුමාගේ පැත්තෙන් කථාවක් කියනවා. අනික් පැත්තෙන් තවත් කතන්දර කියනවා. මේ සම්බන්ධයෙන් දෙපැත්තෙන්ම මඩ ගහගන්නවා. මේ දෙපැත්තේම මඩ ගැහිල්ල, එහෙම නැත්නම් ඒ කථාවට වඩා මේක විශාල අර්බුදයකට ඇවිල්ලා තිබෙන දෙයක්. එම නිසා මේ සම්බන්ධයෙනුත් Commission එකක් පත් කරන්න. Bond Commission එක පත් කළාම ඒකෙන් අපි හිතපු නැති දේවල් ගණනාවක් reveal වෙලා තිබෙනවා. දැන් ඔබතුමා ඔය කාරණාව කිව්වාට එහි වටිනාකමක් නැහැ නේ? කිසි වටිනාකමක් නැහැ, ඔබතුමා ඔහේ කියවනවා. එතකොට අනික් කෙනා තව කථාවක් කියනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
I get your point. Thank you very much.

மேலும், எமது நாட்டின் பொருளாதாரத்திற்கு அந்நியச் செலாவணியை ஈட்டிக்கொள்வதற்கான நல்லதொரு வாய்ப்பு ஏற்பட்டிருக்கின்றது என்றே நாம் கருத முடிகின்றது. அதாவது, 2019ஆம் ஆண்டில் உல்லாசப் பிரயாணங்களை மேற்கொள்வதற்கு உகந்த நாடு என்ற வகையில் "Lonely Planet" என்ற சஞ்சிகை இலங்கையை முதலிடத்தில் தேர்வு செய்திருக்கின்றது. பாரிய உலக உல்லாசப் பிரயாணத்துறை வழிகாட்டியான இச்சஞ்சிகையின் இந்தத் தேர்வானது எமது நாட்டுக்கு உல்லாசப் பிரயாணத்துறை சார்ந்து நல்லதொரு வாய்ப்பினை ஏற்படுத்தித் தந்திருகின்றது. எனவே, இந்த வாய்ப்பினை உரிய முறையில் பயன்படுத்திக் கொள்வதற்கு இந்த நாடு முன்வர வேண்டும். குறிப்பாக, நாட்டில் தற்போது மலிவாகக் காணப்படுகின்ற பணிப் புறக்கணிப்புக்கள், போராட்டங்கள், ஊர்வலங்கள் என்பன நிகழாதவண்ணம் அவற்றின் தேவைகளுக்கான தீர்வுகளை வழங்குவதற்கு இப்போதே உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். அத்துடன் இந்தச் செயற்பாடுகளை எல்லாம் அடக்கி, ஒடுக்கிவிட வேண்டுமென முன்வந்தால் கிடைக்கின்ற அந்த அரிய வாய்ப்பும் பாதிக்கப்பட்டுவிடும்.

இன்று மலையகத் தோட்டத் தொழிலாளர்கள் தங்களது வேதனத்தை ஆயிரம் ரூபாயாக அதிகரிக்க வேண்டும் எனக் கோரி நாடளாவிய ரீதியில் போராட்டங்களை முன்னெடுத்து வருகின்றனர். இவர்களது கோரிக்கையானது மிகவும் நியாயமானதொரு கோரிக்கையாகும். ஆனால், இதற்கொரு தீர்வினை இதுவரையில் காணாதிருப்பது அநியாயமான விடயமாகும். மலையகத் தோட்டத் தொழிலாளர்களின் இத்தகைய கோரிக்கைகள் தொடர்ந்தும் புறக்கணிக்கப்பட்டு வருவதனால் சுமார் 5 இலட்சமாக இருந்த மலையகத் தோட்டத் தொழிலாளர்களது எண்ணிக்கை தற்போது 150,000 வரை குறைந்துள்ளது. எனவே, இந்தத் தோட்டத் தொழிலாளர்களுக்கு 1,000 ரூபாய் குறைந்தபட்ச ஊதியத்தை வழங்குவதற்குத் தோட்டக் கம்பனிகளை இணக்கத்திற்குக் கொண்டுவர வேண்டியது இந்த அரசின் பொறுப்பாகும். அவ்வாறு இயலாதவிடத்து, மேற்படி தோட்டங்களை மீண்டும் அரசுடமையாக்கி அல்லது தோட்டத் தொழிலாளர்களுக்கு 1,000 ரூபாய் குறைந்தபட்ச நாளாந்த ஊதியம் வழங்க முடிந்த தனியாருக்கு வழங்கி, இப்பிரச்சினையைத் தீர்ப்பதற்கு முன்வர வேண்டும் என்பதையும் இங்கு வலியுறுத்திக் கூற விரும்புகின்றேன்.

அத்துடன், அதிவேகப் பாதைகள் மேலும் அதிகரிக்கப்பட வேண்டும். பெருந்தெருக்கள் யாவும் செப்பனிடப்பட வேண்டும். மேலும் உல்லாசப் பிரயாணத்துறை சார்ந்த இடங்களின் தேவை கருதி வீதிகள் அமைக்கப்படவும் புனரமைக்கப்படவும் செப்பனிடப்படவும் வேண்டும். அத்துடன் தென் பகுதியையும் வடக்கு மாகாணத்தையும் இணைக்கின்ற வகையில் அதிவேகப் பாதையொன்று அமைக்கப்படும் என முன்னர் கூறப்பட்டது. அதன் இன்றைய நிலை என்ன என்பது பற்றி எதுவும் தெரியாமல் இருக்கின்றது. அந்த வகையில், இந்த நாட்டின் எதிர்காலத்தில் தெரியக்கூடியதாக இருக்கின்ற இருளை நீக்குகின்ற வகையிலான செயற்பாடுகளை மேற்கொள்வதற்கு அனைத்துத் தரப்பினரும் முன்வர வேண்டும் எனக் கேட்டுக்கொண்டு விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தீவிரப் பொறுப்பு முகாமைத்துவச் சட்டத்தின் கீழான தீர்மானம், நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சின் குறை நிரப்பும் தொகை என்பன தொடர்பாக இன்றைய தினம் விவாதம் நடைபெறுகின்றது. கூடுதலாகக் கவனம் செலுத்தி, முகாமை செய்ய வேண்டுமென அடையாளம் காணப்பட்ட விடயங்களைத் தீவிரப் பொறுப்பு முகாமைத்துவம் என்கின்ற விடயத்துக்குள் அடக்க முடியும். முகாமைத்துவம் என்ற அடிப்படையில், இருக்கின்ற வளத்தினை உச்சமாகப் பயன்படுத்தி, விரயங்கள் இல்லாமல் மக்களுக்கு அல்லது நாட்டுக்குப் பணியாற்றக்கூடிய வகையில் இந்தத் தீவிர முகாமைத்துவ சேவை அமைய வேண்டும். தீவிரப் பொறுப்பு முகாமைத்துவமானது, எந்தெந்தப் பகுதிகளில் கூடுதலான பாதிப்புகள் இருக்கின்றன, எந்தப் பகுதிகளுக்கு முன்னுரிமை கொடுக்கப்பட வேண்டும், எந்த இடங்கள் கவனிக்கப்படாமல் நீண்ட காலமாக ஒதுக்கப்பட்டிருக்கின்றன என்கின்ற விடயங்களையெல்லாம் ஆய்ந்து அறிந்து, அவற்றை அடையாளம் கண்டு, அவற்றுக்கு முக்கியத்துவம் கொடுக்கக்கூடிய விதத்தில் அமைந்திருக்க வேண்டும். ஆனால், துரதிருஷ்டவசமாக எமது நாட்டில் நடைபெறுகின்ற அபிவிருத்தியைப் பார்க்கின்றபோது, அதில் சமத்துவம் இருக்கின்றதா, சமச்சீர்த்தன்மை இருக்கின்றதா என்பதைப் பற்றி நாங்கள் சிந்தித்தாக வேண்டும். அரசியலில் சமத்துவம், சமூகத்தில் சமத்துவம், பொருளாதாரத்தில் சமத்துவம், நீதியில் சமத்துவம் என்கின்ற அடிப்படையில் அபிவிருத்தி விடயத்தைப் பார்க்கின்றபோது, பொருளாதார ரீதியான சமத்துவம் சகல மாகாணங்களுக்கும் சகல மாவட்டங்களுக்கும் வழங்கப்பட்டிருக்கின்றனவா? என்பதைப் பற்றி நாங்கள் தீவிரமாக ஆராய வேண்டிய நிலையில் இருக்கின்றோம். எந்தவொரு விடயத்தைச் செய்கின்றபோதும், அரசியல் நோக்கத்திற்கு அப்பால், அரசியல் கட்சி பேதங்களுக்கு அப்பால் எந்த இடங்கள் முன்னுரிமைப்படுத்தப்பட வேண்டுமென்பதைக் காய்தல், உவத்தல் இல்லாமல் கண்டறிந்து அவற்றை அபிவிருத்தி செய்யக்கூடிய பக்குவம் அரசியல்வாதிகளிடமும் மற்றும் அரசியல் தலைமைகளிடமும் இருக்க வேண்டும்.

அநேகமாக உயர் பதவிகளைப் பெறுகின்றவர்கள் அல்லது அமைச்சுப் பதவிகளைப் பெறுகின்றவர்கள் தத்தமது மாவட்டங்களையும் தொகுதிகளையும் அபிவிருத்தி செய்துவிட்டால் போதும் என்ற அடிப்படையிலும், அதன்மூலமாக வாக்கு வங்கியைத் தக்கவைத்துக் கொள்ளலாம் என்ற அடிப்படையிலும் செயற்படுகின்ற ஒரு போக்கு - பாங்கு எமது நாட்டில் வாழையடி வாழையாகத் தொடர்ந்துகொண்டு வருகின்றது. அப்படி இல்லாமல் இந்தத் தீவிரப் பொறுப்பு முகாமைத்துவமானது சற்று வித்தியாசமாக அமைய வேண்டும். அதாவது, நம்பிக்கையைப் பெறக்கூடிய விதத்திலும் நம்பகமான அம்சங்களைக் கொண்ட விதத்திலும் வெளிப்படைத் தன்மையுடனும் இந்த அபிவிருத்திகள் நடைபெற வேண்டும். மாறாக, இந்த நாட்டின் தலைவர்களாக இருக்கின்றவர்கள், பொறுப்புமிக்க அமைச்சர்களாக இருக்கின்றவர்கள் ஊருக்காக, உறவுக்காக, சமூகத்திற்காக என்ற அடிப்படையில் குறுகிய வட்டங்களுக்குள் நின்று செயற்படுகின்றபோது அந்த முகாமைத்துவப் பணியினை ஒரு நாளும் நாங்கள் தீவிரமானதாக, சமத்துவமானதாகக் கொள்ளமுடியாது.

இன்றைய நிலையில் மலையகத் தோட்டத் தொழிலாளர்கள் தங்களுக்கு நியாயமான சம்பள உயர்ச்சி கோரிப் போராட்டம் நடத்திக்கொண்டு இருக்கின்றார்கள். அந்தப் போராட்டத்திற்கு எந்தளவுக்குச் செவிசாய்க்கப்பட்டிருக் கின்றது. அந்தப் போராட்டம் பற்றி எந்தளவுக்கு சிந்திக்கப்பட்டிருக்கின்றது என்று பார்த்தால், அதற்குரிய சிந்தனைகள் ஒரு முற்போக்கான சிந்தனையாக அமைய வில்லையென்பது தெரிய வரும். உச்சமாக உழைக்கின்றவர்களுக்கு உச்சமான வேதனத்தைக் கொடுக்க வேண்டுமென்பது ஒரு பொது நீதியாக அமைய வேண்டும். இன்றைய நிலையில் அந்தத் தன்மையை எங்களால் அவதானிக்க முடிவதில்லை. நாட்டுக்காக உழைக்கின்ற வர்களுக்கு மரியாதை கொடுப்பதாக இருந்தால், பெருந்தோட்டத் தொழிலாளர்களின் கடின உழைப்பினைக் கருத்திற்கொண்டு, அதற்கு மரியாதை அளித்து, உகந்த சம்பளத்தைக் கொடுப்பது என்பது சாதாரண ஒரு விடயமாகும். இன்று சாதாரண கூலித் தொழிலாளிகள்கூட, 1,000 ரூபாய்க்கு மேல் வேதனம் பெறுகின்றபோது, தினமும் உழைத்துக் கொண்டிருக்கின்ற தோட்டத் தொழிலாளர்களுக்கு அந்தச் சம்பள உயர்ச்சியைக் கொடுப்பதற்கு பொறுப்புவாய்ந்த தலைவர்கள் கரிசனையாகச் செயற்பட வேண்டும்.

அதேவேளை, இன்றைய வாதப்பொருளாக அல்லது தர்க்கத்துக்குரிய விடயமாக அமைந்திருக்கின்ற வீதி அபிவிருத்தி, நெடுஞ்சாலைகள் அபிவிருத்தி, பாலங்கள் அமைத்தல் என்கின்ற விடயங்களைப் பற்றி நாங்கள் பார்க்க வேண்டியிருக்கின்றோம். இந்த நல்லாட்சி ஆரம்பித்த 2015ஆம் ஆண்டில் 2016ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத் திட்டம் சமர்ப்பிக்கப்பட்டது. நாங்கள் கிழக்கு மாகாணத்தை குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பிரதிநிதிகளாக இருக்கின்றோம். அந்த மட்டக்களப்பு மாவட்டத்தின் பெரும்பகுதி எழுவான்கரை, படுவான்கரை என்ற விதத்தில் இரண்டு துண்டங்களாகக் காணப்படுகின்றன. எழுவான்கரைப் பிரதேசம் ஓரளவுக்கு அபிவிருத்திகளைக் கண்டிருந்தாலும், அதிலும் தமிழ்ப் பகுதிகள் அபிவிருத்தி குன்றிக் காணப்படுகின்றன. இந்தப் படுவான்கரை என்று சொல்லப்படுகின்ற மேற்குக்கரைப் பிரதேசம் அபிவிருத்தியில் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றது. அங்கு கிழக்கையும் மேற்கையும் இணைக்கக்கூடிய விதத்தில் பாலங்கள் அமைக்கப்பட வேண்டும் என்கின்ற விடயத்தை 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின்போது நான் மிகவும் விலாவாரியாகவும் உறுதியாகவும் குறிப்பிட்டிருந்தேன். அவ்வேளையில் குறிப்பிட்ட சில பாலங்களை அடையாளப்படுத்தியும் கூறியிருந்தேன். அந்த வகையில் கிரான் புலிபாய்ந்தகல் பாலம், நரிப்புல் தோட்டம் பங்குடாவெளிப் பாலம், சந்திவெளி திகிலிவட்டைப் பாலம், கிண்ணையடி முறுக்கன்தீவுப் பாலம், மண்டூர் குருமண்வெளிப் பாலம், இராணமடு மாலையர்கட்டுப் பாலம், அம்பிலாந்துறை குருக்கள்மடப் பாலம், தும்பாலைப் பாலம், அம்பிலாந்துறை வீரமுனைப்பாலம் போன்ற பாலங்களைச் சுட்டிக் காட்டியிருந்தோம். கௌரவ பிரதியமைச்சர் அவர்களும் இங்கு இப்பொழுது வந்திருக்கிறார். இவ்விடயத்தைக் கரிசனையுடன் கவனத்திற்கொள்ளுமாறு நான் அவரைக் கேட்டுக் கொள்கின்றேன்.

அப்போது நிதி அமைச்சராக இருந்த கௌரவ ரவி கருணாநாயக்க அவர்களிடம் இவ்வாறான பாலங்கள் பற்றிக் குறிப்பிட்டபோது, 2016ஆம் ஆண்டில் 4 பாலங்களை அமைத்துத் தருவதாகக் குறிப்பிட்டிருந்தார். அவரது உரை ஹன்சாட் இலும் பதியப்பட்டிருக்கின்றது. அதற்குரிய சில முன்னாயத்த நடவடிக்கைகள் நடைபெற்றிருந்தபோதும்கூட, அவற்றிற்குரிய கட்டுமான வேலைகள் இதுவரை நடைபெறவில்லை. 2005ஆம் ஆண்டில் ஆரம்பிக்கப்பட்ட அம்பிலாந்துறை வீரமுனை 10/2 என்று சொல்லப்படுகின்ற வீதியில் முன்னேற்றகரமான செயற்பாடுகள் இடம்பெற்று வருவதாக இன்றுவரை தெரியவில்லையென்ற செய்தியைத் தொலைபேசி மூலமாக ஒருவர் குறிப்பிட்டிருந்தார். இப்போது 2018ஆம் ஆண்டு நடந்து கொண்டிருக்கின்றது. இன்று "பாலங்கள் மற்றும் மேம்பாலங்கள் நிர்மாணம்" எனக் கருத்தியல் ரீதியில் அல்லது கோட்பாட்டு ரீதியில் குறிப்பிடப்பட்டிருக்கின்ற அந்த விடயத்தினைச் செயற்பாட்டு ரீதியாகச் செயலுருப் பெறக்கூடிய விதத்தில் செயற்படுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். இந்த நல்லாட்சி அரசாங்கத்தில் ஜனாதிபதி அவர்கள் ஆட்சிப்பொறுப்பை ஏற்று ஏறத்தாழ 3 ½ வருடங்கள் கடந்துள்ள நிலையில் பாராளுமன்றத்தின் பதவிக்காலம் 3 வருடங்களை மேவிச் சென்று கொண்டிருக்கின்றது. இந்த நிலையில் கொடுக்கப்பட்ட வாக்குறுதிகளை நீங்கள் பதவியிலிருக்கின்ற காலத்திலேயே நிறைவேற்றக்கூடிய விதத்தில் மேற்குறிப்பிட்ட பாலங்களை அமைப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும்.

எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்த ஹிஸ்புல்லாஹ் அவர்கள் நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி இராஜாங்க அமைச்சுப் பொறுப்பைப் புதிதாக ஏற்றுக்கொண்டிருக்கின்றார். கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களும் கௌரவ அமைச்சர் கபீர் ஹாஷிம் அவர்களும் இணைந்து செயற்பட்டு, இந்தப் பாலங்களின் நிர்மாணப் பணிகளை முடிவுறுத்துவதற்கு ஏற்ற விதத்தில் நடவடிக்கை எடுக்க வேண்டும். ஆகவே, உங்களுடைய பதவிக் காலத்திலேயே அந்தப் பாலங்களை அமைத்துத் தருமாறு நான் தயவுடன் கேட்டுக்கொள்கின்றேன். அதேவேளையில், கௌரவ மனோ கணேசன் அவர்கள் தேசிய ஒருமைப்பாடு, நல்லிணக்க அமைச்சை இப்போது பொறுப்பேற்றிருக்கிறார். "யார் குத்தியாவது அரிசாக வேண்டும்" என்ற அடிப்படையில் உங்களுடைய செயற்பாடுகளின் மூலமாகக் குறித்த பாலங்கள் கட்டி முடிக்கப்பட வேண்டும். அங்கு ஒரு பிரதேசம் புறக்கணிக்கப்படக்கூடிய நிலைமையில் இல்லாமல் எழுவான்கரை, படுவான்கரை என்கின்ற இரண்டு பிரதேசங்களிலும் அபிவிருத்திகள் சமத்துவமாகவும் சமாந்தரமாகவும் நடைபெற வேண்டும். அந்த விதத்தில் சகல பிரதேசங்களுக்குமான போக்குவரத்து மார்க்கங்களைத் திறந்துவிடுவதற்கு ஏற்ற வகையில் இந்தப் பாலங்களைக் கட்டி முடிப்பதற்குரிய செயற்பாடுகளை நீங்கள் கட்டாயமாக முன்னெடுக்க வேண்டும். யுத்த காலத்தின்போது யுத்த வலயமாக, யுத்த காண்டப் பிரதேசமாகக் காணப் பட்டனவென்று புறக்கணிக்கப்பட்ட இந்தப் பிரதேசங்கள் இன்றும்கூட அபிவிருத்தியில் புறக்கணிக்கப்படுகின்ற நிலைதான் காணப்படுகின்றது. எனவே, குறிப்பிட்ட பாதைகளையும் போக்குவரத்து வீதிகளையும் மாத்திரம் கவனத்திலெடுத்துத் தொடந்தும் அவற்றை அபிவிருத்தி செய்து கொண்டிருக்காமல், அபிவிருத்தியில் புறந்தள்ளப்பட்ட - புறக்கணிக்கப்பட்ட பிரதேசங்களுக்கும் விசேடமான நிதியத்தை ஒதுக்கி, அங்கு அபிவிருத்தியைச் செய்வதற்குரிய செயற்பாடுகள் முன்னெடுக்கப்பட வேண்டும். இன்று பல வீதிகள் போக்குவரத்துச் சாதனங்கள் செல்லமுடியாத அளவுக்குச் சிதைந்த நிலையில் காணப்படுகின்றன.

குறிப்பாக, நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சின்கீழ் வராத மாகாண உள்ளூராட்சி அமைச்சோடு சம்பந்தப்பட்ட மற்றும் மாகாண வீதி அபிவிருத்தித் திணைக்களத்தோடு சம்பந்தப்பட்ட பல வீதிகள் மிகவும்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

மோசமான நிலையில் காணப்படுகின்றன. iRoad Project, High Priority Road Development Project என்று இரண்டு projects அறிமுகஞ்செய்யப்பட்டிருக்கின்றன. இந்தச் செயற்றிட்டங்கள் மூலமாகவேனும் இந்தப் பாதைகள் அபிவிருத்தி செய்யப்பட்டு, போக்குவரத்திற்கு உகந்த பாதைகளாக அவை மாற்றியமைக்கப்பட வேண்டிய தேவை காணப்படுகின்றது. எனவே, மீதமிருக்கின்ற பதவிக் காலத்தில் முடிந்தவரைக்கும் இந்தச் சாலைகளை மற்றும் பாலங்களை விருத்தி செய்வதற்குரிய ஆக்கபூர்வமான நடவடிக்கைகளை எடுக்கவேண்டுமென்று இச்சபையில் கூறிக்கொள்ள விரும்புகின்றேன். எனவே, பாராளுமன்றத்தில் பேசப்படுகின்ற பேச்சுக்கள் வெற்றுப் பேச்சுக்களாக, புத்தகங்களை உரைகள் மூலம் நிரப்பிக் கொள்கின்ற பேச்சுக்களாக அல்லாமல், அந்தப் பேச்சுக்களில் 50 சதவீதமாவது நிறைவேற்றப்படக்கூடிய ஒரு யதார்த்த நிலையை உருவாக்க வேண்டுமென்று இந்த இடத்தில் நான் கேட்டுக்கொள்கின்றேன்.

இதைவிடவும், மேம்பாலங்களின் தேவைகளும் உணரப் பட்டிருக்கின்றன. சன நெரிசல் கூடிய இடங்களில், வீதி விபத்துக்கள் அதிகமாக நடைபெறுகின்ற பிரதேசங்களில், பாடசாலைச் சுற்றுச் சூழலில் அநேகமாக விபத்துக்கள் இடம்பெறுகின்றன. மஞ்சள் கடவை மாத்திரம் விபத்துக்களைத் தவிர்த்துக் கொள்வதற்கான பாதுகாப்பு அம்சமாக அமைந்திருக்க முடியாது. அந்த வகையில், சன நெரிசல் உள்ள இடங்கள் கவனத்திலெடுக்கப்பட வேண்டும். குறிப்பாக, காத்தான்குடி சன நெரிசல் உள்ள ஓர் இடமாகும். அங்கே ஏற்கனவே மேம்பாலம் அமைக்கப்பட்டிருக்கின்றது. ஓட்டமாவடிப் பிரதேசமும் சன நெரிசல் உள்ள பிரதேசமாகும். அங்கேயும் மேம்பாலம் அமைக்கப்பட்டிருக்கின்றது. அதேபோன்று, செங்கலடிப் பாடசாலை அமைந்திருக்கின்ற இடமும்கூட நகரத்தையும் கிராமத்தையும் இணைக்கின்ற ஒரு பொதுவான இடமாக இருக்கின்றபடியால், அந்தப் பிரதேசமும்கூட மேம்பாலத்திற்காகப் பரிசீலனை செய்யப்பட வேண்டிய இடமாக இருக்கின்றது.

இதைவிட, தேத்தாத்தீவு என்கின்ற பிரதேசத்தை எடுத்துக்கொண்டால், அங்கு பாடசாலைக்கு மைதானம் இல்லாத நிலையில் மாணவர்கள் வீதியைக் கடந்துதான் அங்குள்ள ஒரு மைதானத்திற்குச் செல்லவேண்டிய நிலைமை காணப்படுகின்றது. இதனால் அந்தப் பாடசாலைக்கும் மைதானத்திற்கும் செல்லுகின்ற மாணவர்கள் அநேகமாக வீதி விபத்துகளுக்கு உள்ளாக்கப்படக்கூடிய வாய்ப்புகள் இருக்கின்றன. அதேபோன்று பின்நேர வேளைகளில் விளையாட்டு வீரர்கள் அந்த வீதியினைக் குறுக்கறுத்து மைதானத்திற்குச் செல்கின்றபோதும் விபத்துக்கள் ஏற்படுகின்ற நிலைமையிருக்கின்றது. தேத்தாத்தீவு பிரதேசத்து மக்கள் அந்த மைதானத்திற்குச் செல்வதற்கும் போக்குவரத்தை இலகுபடுத்திக் கொள்வதற்குமாக மேம்பாலம் பற்றிச் சிந்திக்கின்றார்கள். அது அந்த மக்களின் கோரிக்கையாகவும் உள்ளது.

இதேபோன்றுதான் களுவாஞ்சிக்குடிப் பிரதேசமும் நெரிசல் கூடிய இடமாக இருக்கின்றது. எனவே, அபிவிருத்தி என்று சொல்லுகின்றபோது உயிர்களைப் பாதுகாத்து, மனித வளங்களைப் பாதுகாப்பது என்பதும் முக்கிய அம்சமாக இருக்கின்றபடியால் வாழைச்சேனை, செங்கலடி, களுவாஞ்சிக்குடி, தேத்தாத்தீவு, மட்டக்களப்பு நகர மத்தி போன்ற சன நெரிசல் காணப்படுகின்ற இடங்களில் மேம்பாலங்களை அமைக்க வேண்டிய தேவையிருக்கின்றது. எனவே, குறிப்பிட்ட இடங்களில் சாத்தியவள ஆய்வுகளை மேற்கொண்டு உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி இராஜாங்க அமைச்சர் அவர்கள் மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்தவர் என்ற வகையில் இதுதொடர்பில் அவருடைய கவனம், கரிசனை அதிகமாக இருக்க வேண்டுமென்று இந்த இடத்தில் நான் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், கட்டடக் கொந்தராத்துக்காரர்களின் நிலைமை பற்றியும் எங்களுக்கு நன்றாகத் தெரிய வேண்டும். கடந்த காலங்களில் வீதிகளை அமைத்தவர்கள், பாலங்களை அமைத்தவர்களுக்குக்கூட அவர்களுக்குரிய கொடுமதிகள் இன்னும் கொடுக்கப்படாத நிலையில், அடுத்த கட்டமாக வீதிகளை அல்லது பாலங்களை அமைக்கின்ற விடயத்தில் தாங்கள் சிரமப்படுவது பற்றிய தங்களுடைய கருத்துக்களை எங்களிடம் அவர்கள் கூறியிருக்கிறார்கள். அபிவிருத்தியில் துரிதமான தன்மை காணப்பட வேண்டுமாகவிருந்தால், இந்தக் கொடுமதிகளும் விரைவுபடுத்திக் கொடுக்கப்பட வேண்டும். ஒட்டுமொத்தமாகச் சொல்லுகின்றபோது, இந்த நல்லாட்சி அரசாங்கத்தின் மூலமாகச் செய்யப்படவேண்டிய அபிவிருத்தியென்கின்ற விடயத்தில், யுத்தத்தால் பாதிக்கப்பட்ட, யுத்த காண்டமாகக் காட்சியளித்த வடக்கு, கிழக்குப் பிரதேசங்கள் இன்னும் சுந்தரகாண்டமாக மாறவில்லை. எனவே, யுத்தத்தினால் முழுமையாக அழிவுக்குள்ளாக்கப்பட்ட பிரதேசங்களுக்கென்று விசேட நிதியம் ஒன்று உருவாக்கப்பட்டு, அதன்மூலமாக வடக்கு, கிழக்கில் யுத்தத்தால் முழுமையாகப் பாதிக்கப்பட்ட பிரதேசங்கள் அடையாளம் காணப்பட்டு, அந்தப் பிரதேசங்களை அபிவிருத்தி செய்வதற்குரிய ஆக்கபூர்வமான நடவடிக்கைகளை எஞ்சியிருக்கின்ற இந்த சொற்ப காலத்திற்குள் இந்த நல்லாட்சி அரசாங்கம் முன்னெடுக்க வேண்டும்.

மேதகு ஜனாதிபதி அவர்கள் பொலன்னறுவையில் பல அபிவிருத்தித் திட்டங்களை மேற்கொண்டு வருகின்றார். அந்த வகையில், பொலன்னறுவை அழகுபடுத்தப்பட்டுக் கொண்டிருப்பதைப் பார்த்து நாங்களும் மகிழ்ச்சியடைகின்றோம். அதேநேரத்தில் பொலன்னறுவையின் எல்லையில் அமைந்திருக்கின்ற மட்டக்களப்பு மாவட்டத்தின் நிலைமையினை ஒப்புநோக்குகின்றபோது, மலையும் மடுவும்போல அங்கு அபிவிருத்தியில் இடைவெளிகள் காணப்படுவதைப் பார்க்கலாம். ஒரு சமத்துவமான, சமச்சீரான அபிவிருத்தி நடைபெற வேண்டுமாகவிருந்தால், குறித்த மாவட்டத்தில் அபிவிருத்தி நடக்கின்றபோது அதன் பக்கத்திலிருக்கின்ற மாவட்டங்கள் மற்றும் தொகுதிகள் எப்படியிருக்கின்றன, கிராமங்கள் எப்படியிருக்கின்றன மற்றும் பிரதேசங்கள் எப்படியிருக்கின்றன என்பதைப் பற்றியும் மதிப்பிட்டு, அவற்றையும் அபிவிருத்தி செய்ய வேண்டும். அவ்வாறு செய்வதன் மூலமாகத்தான் நல்லாட்சி அரசாங்கத்தின் உண்மையான தருமம் வெளிப்படுத்தப்படும். ஆகவே, ஏற்கனவே சென்ற வழியில் செல்லாது புதிய பாதையை அமைத்து முற்போக்கான திசையில் அபிவிருத்தி என்கின்ற அம்சத்தை நகர்த்திக்கொண்டு செல்ல வேண்டும். அபிவிருத்தியின்போது வறுமை நிலையை அடிப்படையாகக் கொண்டுகூட பட்டியல்படுத்தி, ஒரு மாவட்டம், ஒரு மாகாணம் அபிவிருத்தியில் எந்த நிலையில் இருக்கின்றது, பிரதேச செயலகப் பிரிவுகள் எப்படியிருக்கின்றன என்று கணிப்புகள் செய்யப்படலாம். இந்த நிலையில், எந்தப் பகுதிகளில் அபிவிருத்தியில் விசேட கவனம் செலுத்தப்பட வேண்டும் என்கின்ற அறிவிப்புகள்கூட பத்திரிகைகளிலும் ஊடகங்களிலும் வெளிவந்து கொண்டிருக்கின்றன. ஆனால்,

இன்று நிதி ஒதுக்கீடுகளைப் பார்க்கின்றபோது, பாதிக்கப்பட்ட பிரதேசங்களுக்கென்று விசேடமான நிதி ஒதுக்கப்படாமல், குறித்த பிரதேசங்கள் புறக்கணிக்கப்பட்டிருப்பதைக் காணக் கூடியதாக இருக்கின்றது.

குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்தில் காணப்படுகின்ற வவுணதீவு, வாகரை, கிரான், படுவான்கரை, வெல்லாவெளி போன்ற பிரதேசங்கள் யுத்தத்தினால் கூடுதலாகப் பாதிக்கப்பட்ட நிலையில், யுத்தம் முடிவடைந்து பல ஆண்டுகள் கடந்தும் இன்னும் அங்குள்ள வீதிகளும் பாலங்களும் அபிவிருத்தி செய்யப்படாத நிலைமை காணப்படுகின்றது. எனவே, இந்த இடங்களின் அபிவிருத்தியில் மிகவும் உன்னிப்பாக கவனம் செலுத்த வேண்டியுள்ளது. அந்த வகையில் பேச்சளவில் மட்டும் இருந்துவிடாது, செயற்பாடுகளையும் துல்லியமாக முன்கொண்டு செல்வதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்.

நான் ஒரு விடயத்தைக் குறிப்பாகச் சொல்ல விரும்புகின்றேன். அதாவது, மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்த கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்கள் இன்று பொறுப்புமிக்க இராஜாங்க அமைச்சராக இருக்கின்றார். அந்த வகையில் அவரால் இந்தப் பிரதேசங்களில் காணப்படுகின்ற குறைபாடுகளை அக்குவேறு ஆணிவேறாக அவதானித்துத் தீர்த்து வைக்க முடியும். அவர் ஏறத்தாழ 30 வருடங்கள் அரசியலில் இருந்து தன்னுடைய காலத்தை கடத்தியிருக்கிறார் என்று நான் சொல்லவில்லை. காலத்தைக் கொண்டு சென்றிருக்கிறார் என்றுதான் சொல்கின்றேன். கௌரவ இராஜாங்க அமைச்சர் அவர்கள் இந்தப் பகுதிகளில் காணப்படுகின்ற குறைபாடுகளில் மிகவும் கவனம் செலுத்தி, தன்னுடைய பதவிக் காலத்தில் அவற்றை நிவர்த்தி செய்ய முயல வேண்டும். ஆனால், திறைசேரியிடம் நிதி இல்லாதபோது தாங்கள் என்ன செய்வது என்று கேட்கலாம்! இந்த நிலையில் இந்தப் பிரதேசங்களின் அபிவிருத்திக்கு வெளிநாட்டு நிதியங்களை முழுமையாகப் பயன்படுத்த வேண்டும். குறிப்பிட்ட பாலங்களின் நிலை பாவமாக இருக்கின்றது. அவற்றை அபிவிருத்தி செய்வதற்கான சிற்சில மதிப்பீடுகள் மற்றும் ஆய்வுகள் மேற்கொள்ளப்பட்டுள்ளன. ஆனால், அதனோடு மட்டும் நின்று விடாமல் அதனை முன்கொண்டு செல்வதற்குரிய நடவடிக்கையை முன்னெடுக்க வேண்டும். அதேநேரம், இன்று கிராமியப் பாலங்கள் ஓரளவுக்கு புனரமைப்புச் செய்யப்பட்டிருக்கின்றன. ஆனால், இராணமடு, மாலையன்கட்டு ஆகிய பாலங்கள் இன்னும் பூர்த்தி செய்யப்படாத நிலையில் இருக்கின்றன. அந்தப் பாலங்கள் உங்களுடைய அமைச்சின்கீழ் வரவில்லை. அவை மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சுக்குக்குரிய பாலங்களாகும். எனவே, இந்த விடயத்திலும் கவனம் செலுத்தி அந்தப் பாலங்களை அபிவிருத்தி செய்ய நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

அடுத்து, தலைப்புக்கு அப்பாற்பட்டாலும் சமகாலப் பிரச்சினையாக இருக்கின்ற தொண்டர் ஆசிரியர்களின் நியமனம் பற்றியும் இங்கு நான் ஒருசில வார்த்தைகளைக் குறிப்பிட விரும்புகின்றேன். இன்று இந்தத் தொண்டர் ஆசிரியர்களின் நியமனம் தொடர்பாக ஒரு சர்ச்சை ஏற்பட்டிருக்கின்றது. அதாவது, கிழக்கு மாகாணத் தொண்டர் ஆசிரியர்களுக்கு நேர்முகப் பரீட்சை நடாத்தப்பட்டு குறித்த பெயர்ப் பட்டியல் உரிய இடத்திற்கு அனுப்பப்பட்டுள்ள நிலையிலும், சம்பந்தப்பட்ட பலரது பெயர்கள் அதிலிருந்து நீக்கப்பட்டிருப்பதாக முறைப்பாடு செய்யப்பட்டிருக்கின்றது. ஆகவே, இந்த விடயத்திலும் கவனம் செலுத்த வேண்டும்.

இன்று எமது மட்டக்களப்பு மாவட்டத்தில் குறிப்பிட்ட மதகுரு ஒருவர் இன முறுகலை ஏற்படுத்தக்கூடிய விதத்தில் மிகவும் வன்மையான சொற்களைப் பிரயோகித்து வருவதுடன், வக்கிரமான போக்கிலும் நடந்து கொள்கின்றார். "சட்டத்தின் முன்னிலையில் யாவரும் சமன்" என்ற அடிப்படையில் அந்தப் பௌத்த குரு சம்பந்தமாக நடவடிக்கை எடுப்பதன் மூலம் அந்தப் பகுதியில் இன, மத ரீதியான இடைவெளிகள், வக்கிரங்கள் ஏற்படாமல் தடுக்கலாம். ஆகவே, இந்த உயரிய சபையினூடாக அதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென்றும் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. (Dr.) Harsha De Silva. Before he starts, will an Hon. Member propose the Hon. Mylvaganam Thilakarajah to the Chair?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)

I propose that the Hon. Mylvaganam Thilakarajah do now take the Chair.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

*වීසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு மயில்வாகனம் திலகராஜா அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. MYLVAGANAM THILAKARAJAH *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමා, කථා කරන්න.

[2.04 p.m.]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Mr. Presiding Member, in fact, we are debating today a very important Resolution under the Active Liability Management Act and a Supplementary Sum for the

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

Ministry of Highways and Road Development. We are moving this Resolution under the Active Liability Management Act to get approval to raise Rs. 310 billion of new borrowings. This is the first time, such a Resolution has been brought in this Parliament and I will tell you why.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ රටවලින් ණය ගත්තාම කාලයක් තිස්සේ අපි පුරුදු වෙලා සිටියේ අවුරුදු 25ක, 30ක, 50ක කාලයක් අතර ඒ ණය ටික ටික ගෙවන්නයි. සාමාන්‍යයෙන් අපි ගෙයක් හදන්න housing loan එකක් ගත්තත්, එහෙමත් නැත්නම් ආයතනයක ආයෝජනයක් කරන්න බැංකුවෙන් ණයක් ගත්තත්, අපට ගෙවාගන්න පුළුවන්; අපේ පඩියට අනුව ගෙවා ගන්න පුළුවන් කුඩා ප්‍රමාණයක් තමයි ගන්නේ. NSB එකට ගිහිල්ලා කිව්වොත්, "මට housing loan එකක් ගන්න ඕනෑ" කියලා, NSB එකෙන් කියනවා, "මට පෙන්වන්න, ඔයාගේ pay slip එක. ඔයාගේ මාසික වියදම කීයද, ඔයාට කන්න බොන්න කොච්චර වියදම් වෙනවාද කියලා පෙන්වන්න" කියලා. මෙන්න මේ ප්‍රමාණය තමයි වැටුපෙන් ඉතිරි වෙන්නේ කියලා පෙන්වුවාම, ඒකෙන් යම් ප්‍රමාණයක් තමයි අපට ණයක් හැටියට දෙන්නේ. එහෙම අරගෙන කාලයක් තිස්සේ -අවුරුදු 25ක්, 30ක්- ඒ ණය ගෙවනවා. එහෙම තමයි අපි මේ රටේ ණය ගෙවන්න පුරුදු වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි අපට කිසිම දවසක නැවත ණය ගෙවීම පිළිබඳව ගැටලුවක් ඇති වුණේ නැත්තේ. ඒක තමයි අපි බොහොම ආඩම්බරයෙන් කියන්නේ, "කිසිම දවසක අපේ ණයක් default වෙලා නැහැ, reschedule වෙලා නැහැ" කියලා. ණය ඒ ආකාරයට ගෙවාගෙන යන නිසා.

එතකොට හදිසියේම මොකද වුණේ? 2007 ඔක්තෝබර් මාසයේ 24 වැනිදා මේ වැඩකටයුත්ත හදිසියේම වෙනස් වෙන්න පටන් ගත්තා. එදා තමයි එවකට පැවති රජය මුලින්ම ගිහිල්ලා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිකුත් කළේ. අපි ඒකට කියනවා, International Sovereign Bond කියලා. ඇමෙරිකන් ඩොලර් සියයට 8.25ක පොලී අනුපාතයකට අනුව අවුරුදු පහකින් එකවර ගෙවන්න ඩොලර් මිලියන 500ක්, 2007 ඔක්තෝබර් මාසයේ 24 වැනිදා ගත්තා. පළමුවරට තමයි එහෙම දෙයක් කළේ. එහෙම කළාම, අපි පුරුදු වෙලා සිටි ගෙවීම් ක්‍රමයට වඩා අපේ ණය ප්‍රමාණය එකවරම විශාල ලෙස වෙනස් වුණා. ඒ කියන්නේ, අපි පසුගිය කාලයේ ඩොලර් මිලියන 500ක ණයක් ගත්තා නම්, මම කලින් කිව්වා වාගේ අවුරුදු 25ක, 30ක, 50ක කාලයක් තුළ එම ඩොලර් මිලියන 500 ගෙවන්න තිබුණේ වාර්ෂිකව පොඩි කොටස්වලිනුයි. මේක එහෙම නොවෙයි. එකවරම; එක දවසේ ඩොලර් මිලියන 500ම ගෙවන්න ඕනෑ. ඊට පස්සේ 2009දී සියයට 7.4කට ඩොලර් මිලියන 500ක්, 2010දී තව ඩොලර් මිලියන 1,000ක්, 2011දී ඩොලර් මිලියන 1,000ක්, 2012දී ඩොලර් මිලියන 1,000ක්, 2014දී ඩොලර් මිලියන 1,000ක්, නැවතත් 2014දී ඩොලර් මිලියන 500ක් යනාදී වශයෙන් එකවර ගෙවන්න ISB කියන ඒවා නිකුත් කළා. එතකොට මොකද වුණේ? අර සාමාන්‍යයෙන් ගෙවන්න තිබෙන ණය ප්‍රමාණයට අමතරව එකවර වැඩිපුර ගෙවන්න තිබෙන ණය ප්‍රමාණයක් එකතු වුණා. හැම දාම ගෙවන ණය ප්‍රමාණය තිබෙනවා නේ. ඊට අමතරව එක්කෝ ඩොලර් මිලියන 500ක්, එක්කෝ ඩොලර් මිලියන 1,000ක්, එක්කෝ ඩොලර් මිලියන 1,500ක් එකවර ගෙවන්න වුණා. ඊට අමතරව නොයෙකුත් swap agreementsවලට ගියා. ඊට පස්සේ ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් හරහා ඩොලර්වලින් නොයෙකුත් වාණිජ ණය ලබා ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක හොඳ උදාහරණයක් කියන්නම්.

2013දී පැවැති රජය ජාතික ඉතිරිකිරීමේ බැංකුව හරහා ඇමෙරිකානු ඩොලර් මිලියන 750ක ණයක් ගත්තා. ජාතික ඉතිරිකිරීමේ බැංකුව කිසි දවසක ඩොලර් ණය අරගෙන නැහැ. එම බැංකුව කරන්නේ, ලංකාවේ සාමාන්‍ය පුද්ගලයන්ට ගෙවල් හදන්න ණය දෙන එකයි. එතකොට ඔවුන්ට ඩොලර් ආදායමක් නැහැ. මට හොඳට මතකයි, අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට Consultative Committee on Finance එකේ ඉන්න කොට, ඒ අය ඒ ඩොලර් ණය ගන්න බැහැය කිව්වාම ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එවකට සිටි සභාපතිවරයා අස් කළ ආකාරය. සභාපති අස් කරලා, ඒ කට්ටිය කැමැති සභාපති කෙනෙක් පත් කරලා, ලංකා ඉතිහාසයේ ගෙවපු වැඩිම පොලියට 2013දී ඇමෙරිකානු ඩොලර් මිලියන 750ක ණයක් ගත්තා. එහි පොලිය සියයට 8.875යි. ඒකට service charges ආදී සියලු දේවල් එකතු වුණාම පොලිය සියයට 9ක් වුණා. දැන් මොකද වෙන්නේ? 2018දී මේ ඇමෙරිකානු ඩොලර් මිලියන 750ම එකවර ගෙවන්න ඕනෑ. ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ඒ ඇමෙරිකානු ඩොලර් මිලියන 750 එකවර ගෙවා ගන්න හැකියාවක් තිබුණාද? නැහැ. ඒ ගත්ත ණය මුදල ඔවුන් කෙළින්ම ආණ්ඩුවට දුන්නා. ආණ්ඩුව නොයෙක් නොයෙක් දේවලට ඒ මුදල් වියදම් කළා; නොයෙකුත් buildings හැදුවා. ඒ මුදල්වලින් ශත පහක ආදායමක් ලැබුණේ නැහැ. ඒ ඇමෙරිකානු ඩොලර් මිලියන 750ම 2018දී එක පාරටම; ගෙඩිය පිටින් ගෙවන්න ඕනෑ. ඒ සඳහා කෝ සල්ලි? ගත්ත මිනිහාත් නැහැ, ඒ හිටපු මිනිස්සුත් පැනලා ගිහින්. ඒ ණය ගත්ත මිනිස්සු දැන් විපක්ෂයට ගිහින් කියනවා, "ණය ගෙවාපිය" කියලා. ගෙවනවා තමයි. හැබැයි, ඒ මුදල ගෙවන්න අපට ක්‍රමවේදයක් ඕනෑ.

2010දී දළ ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව අපේ භාණ්ඩ හා සේවා අපනයනය සියයට 40යි. හැබැයි, 2015දී මේ අය අපට ආණ්ඩුව භාරදෙන විට දළ ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව අපේ භාණ්ඩ හා සේවා අපනයනය සියයට 20යි. අපේ අපනයන සියයට 40 සිට සියයට 20 දක්වා අඩු කරලා, විශාල ණය කන්දරාවක් ගොඩ ගහලා, ඊටත් අමතරව එක පාරට ගෙවිය යුතු bullet repayment ගෙනැත්, "මොකක්ද මේ වෙලා තිබෙන්නේ?" කියා දැන් අපෙන් ප්‍රශ්න කරනවා. එදා ආණ්ඩුව කළ, අද විපක්ෂයේ සිටින, -මේ වෙලාවේ සභා ගර්භයේ කවුරුත්ම නැති- මන්ත්‍රීවරුන්ගෙන්, අපි පෙරළා අහන්න ඕනෑ"මොකක්ද ඔහේලා කළේ, කෝ වගකීම?" කියා. වගකීමක් නැතිව තමයි ඒ ණය අරගෙන අන්තිමට අපේ පිටින් දමලා තිබෙන්නේ. අපි ඒ ණය ගෙවනවා. කවුරු ණයට ගත්තත් අපේ ස්වෛරී රාජ්‍ය තමයි ඒ ණය ගෙවන්න බැඳිලා ඉන්නේ. ඒ නිසා අපි ණය ගෙවන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තව ප්‍රශ්නයක් තිබෙනවා. අපි අවුරුද්දකට සැරයක් Appropriation Bill එක ඉදිරිපත් කරනවා. ඒ Appropriation Bill එකේ මොකක්ද කියන්නේ? අපට මේ පාර්ලිමේන්තුව හරහා ණය ගන්න පුළුවන් වෙන්නේ, ඒ අවුරුද්දේ ගෙවන්න තිබෙන ණය පියවන්න පමණයි කියා ඒකේ තිබෙනවා. ඒක තමයි කාලයක් තිස්සේ පැවති ක්‍රමය වන්නේ. එකවර විශාල ණය ප්‍රමාණයක් ගෙවන්න වුණේ නැති නිසා, කාලයක් තිස්සේ අපට ඒක ප්‍රශ්නයක් වුණේ නැහැ. නමුත්, ලෝකයේ පොලී අනුපාතය ඉහළ යනවා, පහළ යනවා. දැන් පොලී අනුපාත ඉහළ යමින් පවතිනවා. අප දන්නවා, එන අවුරුද්දේ විශාල ණය කන්දරාවක් අපට ගෙවන්න තිබෙන බව. එතකොට අපි මොකද කරන්නේ? අපේ Budget එකෙන් අවසර දීලා තිබෙන්නේ, ඒ අවුරුද්දේ ගෙවන්න තිබෙන ණය පියවන්න විතරයි. නමුත් අපි එන අවුරුද්ද වනතුරු ඉන්න අවශ්‍යද? ලෝකයේ පොලී අනුපාතය ඉහළ යන බව පෙනි-පෙනී තිබියදී, අපි ඒ ණය ගෙවන්න ලබන අවුරුද්දේ පොලී අනුපාතය ඉහළ යනතුරු ඉන්නවාද, නැත්නම් මොළය පාවිච්චි කරලා අලුත් ක්‍රමවේදයක් හදලා, -ඒ පොලිය ඉහළ යන බව දන්නා නිසා- ඊට

කලින් ඒ ණය පියවන්න කටයුතු කරනවාද කියන එක තමයි අපට තිබුණු ප්‍රශ්නය. එහිදී එවැනි වැඩ කටයුත්තකට අත ගහන්න අපට නෛතික හැකියාවක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි, සක්‍රීය වගකීම් කළමනාකරණ පනත හරහා, එන අවුරුද්දේ සහ ඊළඟ අවුරුද්දේ අධික පොලියට ගෙවන්න තිබෙන ණය යම්කිසි විධියකට කළමනාකරණය කර ගෙවා ගන්න පුළුවන් වෙන තත්ත්වයකට පහළට ගේන්නේ. අන්න ඒකයි මේ සක්‍රීය වගකීම් කළමනාකරණ පනත හරහා අපි කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා තමයි මේකට "වගකීම" කියලා කියන්නේ. ඒ සඳහා තමයි, ඉදිරියේදී -මේ අවුරුද්දේ නොවෙයි.- පියවන්න තිබෙන ණය කළමනාකරණය කරගැනීමේ හැකියාව ලබාගන්න අපිට මේ පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වෙලා තිබෙන්නේ.

දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපේ ණය වැඩි වුණාය, අඩු වුණාය කියා දැන් සමහරු කියනවා. ඇත්ත වශයෙන්ම ඒක නොවෙයි අපි අද වෙනකොට බලන්න ඕනෑ. උදාහරණයක් විධියට අපි පලතුරු අරගෙන බලමු. පලතුරු කිව්වාම නොයෙකුත් වර්ගයේ පලතුරු තිබෙනවා නේ. කෙසෙල් ගෙඩි තිබෙනවා; අඹ ගෙඩි තිබෙනවා; වරකා තිබෙනවා; රට ඉඳි තිබෙනවා. "අපට පලතුරු දෙන්න" කියා අපි කිව්වොත්, ඒ සියලු ජාතියේ පලතුරු දෙයි. එක්කෝ අපි කියන්න ඕනෑ, අඹ ගෙඩි, එහෙම නැත්නම් කෙසෙල් ගෙඩි, එහෙමත් නැත්නම් රට ඉඳි දෙන්න කියා. අන්න ඒ වගේ වැඩක් තමයි මෙතැන තිබෙන්නේ. මම උදාහරණයක් කියන්නම්. ඉස්සර කාලයේ "පලතුරු" කිව්වාම අපට හම්බ වුණේ එක ජාතියේ පලතුරකුයි. ඒ මොකක්ද? දීර්ඝ කාලයකින් ගෙවීමට හැකියාව තිබෙන, ඉතාම සහනදායී පොලියට ලැබෙන ණය. නමුත් මම කිව්වා නේ, 2007 ඉඳලා ඒක වෙනස් වුණු බව. 2005 වර්ෂය වෙනකොට අපේ වාණිජ ණය ප්‍රමාණය සියයට 3.9යි. ඉතිරි සියල්ලම සහනදායී ණයයි. හැබැයි, 2015 වෙනකොට ඒ වාණිජ ණය ප්‍රමාණය සියයට 51.2යි. මම නැවතත් ඒක කියන්නම්. 2005දී වාණිජ ණය ප්‍රමාණය සියයට 3.9යි; 2015දී එය සියයට 51.2යි. වාණිජ ණය සියයට 3.9 සිට සියයට 51.2 දක්වා වැඩි වුණා. එතැනයි මේ ප්‍රශ්නය පැන නැඟුණේ. අපි ලබාගත් සහනදායී ණය තිබෙනවා නම්, ඒවා අවුරුදු 50කින් ගෙවන්න තිබෙනවා නම්, සාමාන්‍යයෙන් එම ණය ආපසු ගෙවන්න තිබෙන්නේ -afford කරන්න තිබෙන්නේ- පොඩි පොඩි ගණන්වලින් නම් ගැටලුවක් නැහැ. අපට ණය ගෙවන්න තිබෙනවාය කියා කලබල වෙන්න ඕනෑත් නැහැ. නමුත්, මේ කලබලයට හේතුව තමයි, ඒකේ composition එක සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා තිබීම. මේ "ණය" කියන එක අරගෙන බැලුවොත්, හැම ණයම එක ජාතියේ ණය නොවෙයි. ඉතාම භයංකාර ණය වර්ගයක් තමයි ISB හරහා දැන් එකවර අපට ගෙවන්න වෙලා තිබෙන්නේ. එම නිසා අපට මේ සක්‍රීය වගකීම් කළමනාකරණ පනත හරහා හැකියාවක් තිබෙනවා, to engage in active Treasury management. What we have to do is to change - if at all possible - within limits the tenure of the liabilities that we have. This is Treasury management in general. If we have to pay back a loan of US Dollars 500 million in January of next year and we know that the interest rates are going up by January of next year, we must then try to accommodate it either by paying it off early or else try and re-configure that loan so that we can pay it down the road when the interest rates come down. So active management of that liability is important.

අපට එදා වාගේ passive position එකක් ගන්න බැහැ. ලෝකයේ තරගකාරී වෙළෙඳ පොළ තුළ මේ ණය ගෙවීම් ටික කළමනාකරණය කරන්නේ කොහොමද කියා අපි බලන්න ඕනෑ. මම මීට කලිනුත් ඔබතුමාට පැවසූ ආකාරයට, ඒකට තමයි මේ Active Liability Management Act එක හරහා අපි මුදල් ලබා ගන්න බලාපොරොත්තු වෙන්නේ. මම මීට වඩා ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දේවල්වලට සම්බන්ධ නැති වුණත් මම තව එක කාරණයක් කියන්න ඕනෑ. අද වෙනකොට වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය තුළ යම්කිසි ගැටලු සහගත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ කාරණය ඔබතුමාටත් අදාළයි. වතු කම්කරුවෝ ඔවුන්ගේ දෛනික පඩිය රුපියල් 1,000 දක්වා වැඩි කරන්න කියා ඉල්ලීමක් කරනවා; උද්ඝෝෂණය කරනවා. දේශපාලනඥයෝත් ඒකට මැදිහත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් හොඳට දන්නවා, ඉස්සර වතු කම්කරුවෙකුට ලැබුණේ රුපියල් 500ක් වැනි මුදලක් බව. දැන් incentive එකත් එක්ක සාමාන්‍යයෙන් දිනකට රුපියල් 805ක් ලැබෙනවා. නමුත් දැන් ඔවුන් කියනවා, "දවසකට රුපියල් 1,000ක් දෙන්න" කියා. රුපියල් 500 සිට රුපියල් 1,000 දක්වා වැඩි කරන්න කියලා ඔවුන් ඉල්ලනවා. නමුත්, ඉදිරිපත් කර තිබෙන්නේ, රුපියල් 600ක basic එකකුයි, අනික් incentive එකතු කළාම රුපියල් 940ක දෛනික වැටුපක්. දැන් තිබෙන තත්ත්වය අනුව, "අපි රුපියල් 940ක් දෙන්නම්" කියා වැවිලි ආයතනවලින් කියනවා. රුපියල් 600ක මූලික පඩිය සහ ඒකට incentive එකතු කළාම තමයි ඒ රුපියල් 940 හැදෙන්නේ.

නමුත් සමහර trade unions කියනවා, "නැහැ. අපිට රුපියල් 1,000ම ඕනෑ" කියා. මේ කාරණයේ දෙපැත්තක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද වනකොට ලෝකයේ තේ මිලට මොකද වෙලා තිබෙන්නේ කියා ඔබතුමා දන්නවා. තේ මිල පහළ යනවා. වතු අයිතිකරුවන්ට ඔවුන්ගේ කර්මාන්තය කරගෙන යාම පිළිබඳව ගැටලු ඇතිවෙලා තිබෙනවා. මේ වතාවේ තේ ලැබෙන ප්‍රමාණයත් යම්කිසි මට්ටමකට අඩුවෙලා තිබෙනවා. එතකොට අපිට දෙපැත්තම ගැන කල්පනා කරන්න වෙනවා. දැනට මේ සාකච්ඡා ඉදිරියට යනවා. ඊළඟට, [*Interruption.*] Just a minute. I will let you speak. I will answer you. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිතුමා මේ කටයුත්තට සම්බන්ධ වෙලා සිටිනවා; වැවිලි කර්මාන්ත ඇමතිතුමා මේ කටයුත්තට සම්බන්ධවෙලා සිටිනවා. මේ සාකච්ඡා දිගටම පවත්වාගෙන ගිහින්, රුපියල් 940ත්, රුපියල් 1,000ත් අතර වැටුපක් දෙන්න යම්කිසි එකඟතාවකට ආ යුතුයි කියායි අපි හිතන්නේ.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

Hon. State Minister, I disagree with your point for the mere reason that until 1992, when estates were handed over to private companies, the estate workers' wages were determined by the Wages Board. If that had continued up to today, the wage of an estate worker would have been much more than this Rs. 500. Also, what you claim here to be Rs. 940 is inclusive of the contribution of the estate management to the EPF and the ETF. Actually, you cannot add that to the daily wage. That 15 per cent is also added when they calculate the day's wage at Rs. 940.

Not only that. Sir, the other point is, the plantation companies are claiming that from 1992 onwards, from the day they took over the estates, the estates have been running at a loss. If that is the case, if the estates have been incurring losses, for the past so many years, how have they been running these estates? So, there is a big doubt that has been created. Therefore, we, as trade unionists and Representatives of the plantation community, are not prepared to accept what the companies are claiming.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Thank you. Sir, I think the Hon. Member is making a valid point.

But, what I am saying is, always there can be negotiations on the salary. That is how collective agreements are negotiated. You have, on the one hand, the employer and on the other, the employee. I am not saying that you should agree to that Rs. 940 or that you should agree to the EPF and the ETF being added to that Rs. 940. All what I am saying is, let us be patient. There is no need to panic, protest, burn things down or do anything like that. I am not saying that you are doing it. But, there has to be some negotiations because there are two sides to the story. As you very well know, under Government management, the plantations were making utter loses. I do not have to say what happened to the JEDB, the Janawasama and all that. There is also a genuine case made by the trade unions and the poor plantation workers; I am not saying no. All what I am saying is, let us agree to negotiate and come to some compromise where it is possible to pay the employees a decent wage and the employees are happy with the wage they get.

Thank you very much, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Vijitha Herath. You have 30 minutes.

[අ.භා. 2.22]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු හර්ෂ ද සිල්වා ඇමතිතුමා ප්‍රශ්න කළා, "එතුමන්ලා විපක්ෂයේ සිටියදී එදා ආණ්ඩුව ණය ගත්තා. ඒ ණය ගැන එතුමන්ලා ප්‍රශ්න කළා. එතුමන්ලා දැන් ආණ්ඩුව නියෝජනය කරනවා. දැන් විපක්ෂයෙන් ප්‍රශ්න කරනවා මේ ආර්ථිකය වැටුණේ කොහොමද, මේ ණය ගෙවා ගන්නේ කොහොමද?" කියා. ඇත්තටම ඔබතුමන්ලා ආණ්ඩුව බාර ගත්තේ ඔය ණය කන්ද දැකලා. "රාජපක්ෂලාගේ ණය වැඩියි. අපිට ඕක බාර අරගෙන ගෙවා ගන්න බැහැ. ඒ නිසා අපිට ආණ්ඩු කරන්න බැහැ." කියා එදා කිව්වේ නැහැනේ. එහෙනම් එදා කියන්න තිබුණානේ. දැන් මොකක්ද මේ කරන්නේ? දැන් ඔබතුමන්ලා කියන්නේ බැරිකම ගැනනේ. හැබැයි, එදා එහෙම කිව්වේ නැහැනේ. "දෙන්න අපිට. අපි ගෙවන්නම්." කියානේ එදා කිව්වේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ණය ගෙවනවා. අපි කවදාවත් ණය නොගෙවා ඉන්නේ නැහැ. ණය ගෙවන්න අවශ්‍ය නීතිමය අවශ්‍යතාව තමයි අද පාර්ලිමේන්තුවට දමා අනුමත කර ගන්නේ. ඒකයි මම කියන්නේ. සක්‍රීය වගකීම් කළමනාකරණ පනත,-

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ණය ගෙවන්න මේ පනත අවශ්‍ය වෙලා නැහැනේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒකට තමයි,-

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ණය ගන්නකොට වගකීමෙන් ගන්න කියන එකට තමයි මේ පනත ඕනෑ වෙන්නේ. ණය ගෙවන්න ඔය ප්‍රශ්නය නැහැ. ණය ගෙවන්න අලුතින් නීති ප්‍රශ්නයක් ඇවිල්ලා නැහැ. මේ පනතින් ගෙවන්න තිබෙන්නේ මොනවාද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේ පනත ගෙනැල්ලා තිබෙන්නේ ණය ගෙවන්න විතරයිනේ.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ණය ගන්න එකේදී? වගකීම් විරහිතව ණය ගන්න එපායැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අපිට තිබෙන්නේ bunching of debtනේ. ඒ කියන්නේ, එක වතාවට bullet paymentsවලට 500, 1000, 750, 250 ගෙවන්න තිබෙන එකනේ. Bullet paymentsවලට අපිට ගෙවන්න හැකියාවක් නැති නිසා තමයි මේ පනත සංශෝධනය කරන්නේ.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
එහෙම ගෙවන්න දැන් ඔබතුමන්ලාට හැකියාවක් නැහැ කියානේ ඔබතුමන්ලා කියන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මට නොවෙයි. මම කියන්නේ, අපේ රටේ ආර්ථිකය,-

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ආණ්ඩුවටනේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
රට.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
රට තමයි. අපි නියෝජනය කරන්නේ ආණ්ඩුවනේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒ නිසා තමයි මේක වෙනස් කරන්නේ. ඒකනේ අපිට ගෙවන්න පුළුවන් වන විධියට අපි ඒවා හදා ගන්නේ, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒකෙන් ඔබතුමන්ලා පිළිගන්නවානේ, ඔබතුමන්ලාට දැන් ඒ ණය ගෙවා ගන්න බැහැ කියා. ඒක කියන්නේ නැත්තේ ඇයි?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒකට අවශ්‍ය නීතිය තමයි මේ සම්පාදනය කරන්නේ.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒ කියන්නේ, එක වතාවේ ගෙවන්න බැහැ, කොටස් වශයෙන් ගෙවන්න ඉඩ දෙන්න කියන එකනේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, නැහැ. කොටස් වශයෙන් අපිට එහෙම ගෙවන්න බැහැ, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ගත්ත ණය අපි ගෙවන්න ඕනෑ.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒක හරි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
අපි පුරුදු වෙලා තිබෙන ක්‍රමයට වඩා ලොකු ණය ප්‍රමාණයක් එන අවුරුදු හතරේ අපිට ගෙවන්න තිබෙනවා. හදිසියේ ගෙවන්න තිබෙන ලොකු ණය ප්‍රමාණය අපිට ගෙවන්න අවශ්‍ය නීතිමය පසුබිම අපි සකස් කර ගන්න ඕනෑ. එහෙම නැත්නම් ඒක market එකට ගිහිල්ලා, trade කර ඒකේ කාලය දික් කර ගන්න ඕනෑ. ඒකටයි මේ පනත ගෙනැල්ලා තිබෙන්නේ. නැතිව ණය නොගෙවා ඉන්න නොවෙයි. ණය ගෙවන්න ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒ කියන්නේ, ඔබතුමාගේ පැහැදිලි කිරීම අනුවම ඒ දවස්වල ගත්ත ලොකු ණයක් තිබෙනවා. ඒ ණය අපිට එකවර ගෙවා ගන්න බැහැ. ඒකට තව කාලයක් දික් කර ගන්න ඕනෑ, කොටස් වශයෙන් දීර්ඝ කාලයකදී ගෙවන්න. ඒ සඳහා තමයි මේ නීතිය ගෙනෙන්නේ. අපිට මේ ණය ගෙවා ගන්න බැහැ කියා ඔබතුමා පිළිගන්නේ ඒකෙන් නේද? අද ඒ අර්බුදයේ අපි ඉන්නවා. ඒක තමයි දැන් මේ කියන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙම කිව්වොත් වෙන පණිවුඩයක් යනවා වෙන්න පුළුවන්.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒකනේ මේකේ කියන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
අපිට යම්කිසි ගෙවීමේ ශක්තියක් තිබෙනවා. ඒක අපේ සාමාන්‍ය හැකියාව. එන අවුරුද්දේ අපිට එක වතාවට ඩොලර් බිලියන පහක, හයක විතර ණය ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා. අපි ඒ ණය ප්‍රමාණය ගෙවන්න ඕනෑ. ඒක රජයේ වගකීම. එන අවුරුද්ද වනකොට පොලී අනුපාතය තවදුරටත් ඉහළ යන බව අපි දන්නවා. මේ ඉහළ යන පොලී අනුපාතය හරහා ණය නැවත ලබා ගන්න එන අවුරුද්ද වනතුරු බලාගෙන ඉන්නේ නැතිව, අපි දැන් මේ ණය ගෙවන්න සූදානම් වනවා.

ඒ එන අවුරුද්දට, අවුරුදු පහෙන් ගෙවන්න තිබෙන ණයවල tenure එක වෙනස් කරලා trade කරන්න පුළුවන් නම්, - නිවියෝර්ක්වල, ටෝකියෝවල ඒ ණය trade කරන්න පුළුවන්.- trade කරලා තව අවුරුදු දෙකකින් ගෙවන්න පුළුවන් නම්, තව අවුරුදු පහකින් ගෙවන්න පුළුවන් නම්, අපට ඒක පොඩ්ඩක් smooth out කර ගන්න පුළුවන්. ඒකයි මේකෙන් කරන්න උත්සාහ කරන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඔබතුමා ඔය මොන වවන දැම්මත් අවසානයේදී ගෙවා ගන්න අමාරුයි කියන එක පිළිගන්න. ගෙවා ගන්න බැහැ. හිර වෙලා තිබෙන්නේ. ඒක තමයි ඇත්ත කථාව.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
අමාරුයි. බැහැ නොවෙයි, අමාරුයි.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
අන්න ඒක නේ මම ඇහුවේ. ඔබතුමා ඒකට හරි උත්තරය දෙන්නේ නැතුව වටේ කැරකි කැරකි යනවා. මේ යෝජනාව ගෙනෙන්නෙත් ඒ බැරිකම නිසයි. ඇත්ත කථාව ඒකයි. නමුත් ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගන්නකොට ඔය කථාව කිව්වේ නැහැ. ආණ්ඩුව භාර ගන්නකොට කිව්වේ, "බය වෙන්න එපා, දෙන්න අපට ආණ්ඩුව, රාජපක්ෂ පාලනය මේ රට ණය කන්දක හිර කළා. අපි ආණ්ඩුව ගත්ත ගමන් හතර වටෙන් ආයෝජකයෝ ගලාගෙන එනවා. වොක්ස්වැගන් කොම්පැනිය එනවා. කාර් ෆැක්ටරි දමනවා. අලුතෙන් කාර් හදනවා. රස්සා එනවා. රැකියා ලක්ෂ දහයක් දෙනවා. ආර්ථිකය ශක්තිමත් කරනවා. අපි පරණ ණයත් ගෙවනවා. ඉස්සරහට ණය වෙන්න දෙන්නේ නැහැ." කියායි. ඔය කථාව නේ එදා කිව්වේ. දැන් තමයි මේ කියන්නේ, "බැහැ, අපට අමාරුයි." කියා. අන්න ඒකයි මම මේ මතු කළේ. දැන් මේ පනතේ හරයෙන් ඔබතුමන්ලා පිළිගන්නවා, ඔබතුමන්ලා එදා එහෙම කිව්වාට, අද ඔබතුමන්ලා ඇත්තට මුහුණ දීලා තිබෙන අර්බුදය මොකක්ද කියා. ඒක හරි පැහැදිලිව තේරෙනවා, දැන් මේ

[ගරු විජිත හේරත් මහතා]

රුපියලේ කඩා වැටීමෙන්. මේ තරම් වේගයෙන් රුපියල කඩා වැටුණේ නැහැ, අපේ රටේ කිසිදු ආණ්ඩු පාලනයක් යටතේ. වැඩිම වේගයකින් රුපියල කඩා වැටුණේ, ඔබතුමන්ලාගේ මේ අවුරුදු තුනහමාරක පාලන කාලය තුළ. ඒක ඔබතුමන්ලා පිළිගන්න ඕනෑ. එහෙම වෙලා තිබෙන්නේ, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ වගකීමක් නැතිකම නිසයි; කළමනාකරණයක් නැතිකම නිසයි; සක්‍රිය නැතිකම නිසයි. අද ඔබතුමන්ලා මේ යෝජනාව ගෙනෙන්නේ, සක්‍රිය වගකීම් කළමනාකරණ පනත යටතේයි.

ඇත්තටම ගත්තොත් අද ආර්ථිකය සක්‍රියත් නැහැ; ඒක මුළුමනින්ම අක්‍රියයි; වගකීමකුත් නැහැ; වගකීම් විරහිතයි; මේකට උත්තර බඳින්න කෙනෙකුත් නැහැ; කළමනාකරණයත් නැහැ. ඇත්තටම ගත්තොත් ඔය තුනම නැහැ. වගකීමත් නැහැ; කළමනාකරණයත් නැහැ; සක්‍රියත් නැහැ. දැන් රුපියල කඩාගෙන වැටෙනකොට, ආර්ථිකය කඩාගෙන වැටෙනකොට, ඒකට වග කියන්න ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කවුද ඉදිරිපත් වෙන්නේ? කිසි කෙනෙක් නැහැ. හැබැයි, යුද්ධය අවසන් කළ එකට අයිතිකාරයෝ ගොඩයි. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා කියනවා, ඒක කළේ "මම" කියා; ගෝඨාභය රාජපක්ෂ මහත්මයා කියනවා, "මම" කියා; ෆොන්සේකා මහත්මයාත් කියනවා, "මම" කියා. මම දැක්කා, ඊයේ පෙරේදා ජනාධිපතිතුමාත් කිව්වා, "අන්තිම සති දෙකේ මම තමයි ඉවර කළේ." කියා. ඒකට අයිතිකාරයෝ ගොඩයි. හැබැයි මේ වැටිල්ලට, මේ අර්බුදයට වග කියන්න කවුරුවත් නැහැ. ඒකෙන් ලිස්සලා යනවා. වග කියන්න ඕනෑ එතැනට. මේ මූල්‍ය කඩා වැටීමට, මේ ආර්ථිකයේ අද ඇති වෙලා තිබෙන කඩා වැටීමට වග කියන්න ඕනෑ ආණ්ඩුව. අන්න ඒකට මොකක්ද තිබෙන පනත? මේ පනතෙන් බැහැ නේ, ඒකට උත්තරය හොයන්න. මේ පනතෙන් ඉස්සරහට අර කියන අර්බුදයට තාවකාලික පැලැස්තරයක් එයි. ඔබතුමන්ලා කියන විධියට තාවකාලික පැලැස්තරයක් ගහ ගන්න පුළුවන්. හැබැයි, මේ හැදිච්ච ලෙඩෙ නිෂ්ඨාවට සුව කර ගන්න මේ පැලැස්තරයෙන් බැහැ. ඒක හරි පැහැදිලියි, අද රටේ තිබෙන ආර්ථික අර්බුදයත් සමඟ.

ඇත්තටම ගත්තොත්, ණය අර්බුදයෙන්- ඔබතුමන්ලා එදා ආණ්ඩුව ණය ගත්තා කියා විවේචනය කළා. අද ඔබතුමන්ලා නැවත ණය ගන්න පටන් අරගෙන තිබෙනවා. අර කියපු වැඩි පොලී අනුපාතවලටම වේගයෙන් ණය ගන්න පටන් අරගෙන තිබෙනවා. ඒක රට පුරා ව්‍යාප්ත වෙලා, ගම් මට්ටමට ව්‍යාප්ත වෙලා තිබෙනවා. ගමේ ඉන්න සාමාන්‍ය මනුස්සයාටත් අද ණය නැතුව ජීවත් වෙන්න බැහැ. ඒ නිසා තමයි මුළු රටේම බරපතළ ප්‍රශ්නයක් බවට මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය අර්බුදය පත් වුණේ. ක්ෂුද්‍ර මූල්‍ය ණය අර්බුදය කියන එක සුළුපටු එකක් නොවෙයි. අද වැඩියෙන්ම සිය දිවි නසා ගන්නේ, ණය ගෙවා ගන්න බැරුව. මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, යාපනය දිස්ත්‍රික්කයේ මරණ සංඛ්‍යාව බැලුවොත්, වැඩිම මරණ සංඛ්‍යාවක් සිදු වෙලා තිබෙන්නේ, ගත්ත ණය ගෙවා ගන්න බැරුවයි. සියයට 40ට, 60ට- මුදල් ඇමතිවරයාම පිළිගත්තා, සියයට 40ට, 60ට නොව සියයට 240 පොලී අනුපාතයටත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ණය දෙනවා කියා. එදා ඔබතුමන්ලා මේ ණය අර්බුදය ගැන කථා කරද්දී, විශේෂයෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ණය ප්‍රශ්නය ගැන කථා කරද්දී, - යාපනය, මන්නාරම, මඩකලපුව දිස්ත්‍රික්කවල කාන්තාවන්ට මේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ගෙදරටම ඇවිල්ලා ණය දෙනවා. ඒ ණය ගෙවා ගන්න බැරි වෙනවා. ඊළඟ සතියේ තව කොම්පැනියක් එනවා. ඒ කොම්පැනියෙන් ඊට වඩා වැඩි පොලියට ණය ගන්නවා. අරගෙන, අර පරණ ආයතනයෙන් දීපු ණය ටික ගෙවනවා. ඊට පසුව අලුත් ණය ගෙවා ගන්න බැහැ, ආපසු හිර වෙනවා.

එවිට ඊටත් වඩා වැඩි පොලියට තවත් ආයතනයකින් ණය ගන්නවා. ඒ විධියට චක්‍රය වාගේ ණය, ණය, ණය පිට ඉස්සරහට යනවා. ඒ ණය ගෙවා ගන්න බැරිව අද වැඩිම සිය දිවි නසා ගැනීම් සිද්ධ වන්නේ මඩකලපුව, මන්නාරම, යාපනය දිස්ත්‍රික්කවලයි. ඒ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල අධික පොලියට ණය දෙන එක වහාම නවත්වනවා කියලා ඔබතුමන්ලා කිව්වා. අධික පොලියට ණය දෙන එක වහාම නවත්වනවා කියන එක ඉතා පැහැදිලිව මාධ්‍යවල වාර්තා වුණා. ඒ ප්‍රදේශවල කාන්තාවෝ, විශේෂයෙන්ම වැන්දඹු කාන්තාවෝ, ණය ගෙවා ගන්න බැරිව දරිද්‍රතාවයෙන් පීඩා විඳින කාන්තාවෝ සතුටු වුණා, අධික පොලියට ණය දෙන එක නවත්වනවා; යම් කිසි සීමාවක් දක්වා ගත්ත ණය කපා හරිනවා කියලා මුදල් ඇමතිවරයා කිව්ව එක ගැන. නමුත් අද වන තෙක් ඒක සිද්ධවෙලා නැහැ. අදටත් ඒක වෙලා නැහැ. නමුත් මාධ්‍යවල නිකම් ප්‍රචාරයක් ගියා. ඇත්තටම ඒ අර්බුදයට තවම උත්තරයක් නැහැ. ඒ නිසා අන්න ඒවාට වග කියන්න. ඒ කරපු ප්‍රකාශවලට වග කියන එක ආණ්ඩුවේ ප්‍රධාන වගකීමක්. ඒ නිසා ඒ වගකීම ඉටු කරන්න කියලා කියනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා අපනයන පිළිබඳව කථා කළා. අපනයන කඩාගෙන වැටිලා. ඔබතුමන්ලා රජය භාර ගත්තාට පස්සේත් අපනයනවල මහ ලොකු වර්ධනයක් වෙලා නැහැ. ආනයන වියදම ඩොලර් මිලියන 20,000යි. අපනයන ආදායම ඩොලර් මිලියන 10,000යි. ඒ ආනයන වියදමෙන් වැඩිම වියදමක් යන්නේ මොනවාටද? ඩොලර් මිලියන 5,000ක් යන්නේ ආහාර පානවලට; කෑම බීමවලට. ඒක ඉතා පැහැදිලියි. අපි ඩොලර් මිලියන 20,000ක ආනයන කරන කොට ඒකෙන් ඩොලර් මිලියන 5,000ක්ම යන්නේ ආහාර පාන ගෙන්වීම සඳහායි. වාහන ගෙන්වීමට යන්නේ කීයද? ඩොලර් මිලියන 750යි. හැබැයි, ඔබතුමන්ලා ගත්ත තීරණය මොකක්ද? ඔබතුමන්ලා හදිසියේ තීරණයක් ගත්තා, "රජයේ සේවකයන්ට තීරුබදු රහිත වාහන ගෙන්වීම වහාම නතර කරනු ලැබේ" කියලා. හැබැයි, ඔබතුමන්ලාගේ ආනයන වියදම වැඩිවෙලා තිබෙන්නේ කොහොමද කියන එක හරියට විශ්ලේෂණය කළා නම්; හරියට බැලුවා නම් වැඩිම වියදම යන්නේ වාහන ගෙන්වීමට නොවෙයි. වැඩිම වියදම යන්නේ මම කලින් කිව්ව ආහාර පාන ගෙන්වීමටයි. සියඹලා කරලේ ඉඳලා, කරුංකා ගෙඩියේ ඉඳලා දැන් ඔබතුමන්ලා ගෙන්වනවා. පලතුරු ටික, එළවලු ටික පවා ගෙන්වන්න පටන් ගෙනයි තිබෙන්නේ. ඒවා අපේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් දේවල්. සීනි ටික, කිරිපිටි ටික, මිරිස් ටික, බී ලූනු ටික පිටරටින් ගෙන්වනවා. අපේ අවශ්‍යතාවයෙන් සියයට 91.5ක්ම සීනි ගෙන්වන්නේ පිටරටින්; අපි නිෂ්පාදනය කරන්නේ නැහැ. කිරිපිටිවලින් සියයට 80ක් පිටරටින් ගෙන්වනවා. මිරිස් සියයට 82ක් පිටරටින් ගෙන්වනවා. ඒ අනුව ඩොලර් මිලියන 20,000ක් වන ආනයන වියදමින් වැඩි වියදමක් තිබෙන්නේ ආහාර පාන සඳහායි; වාහනවලට නොවෙයි.

ඔබතුමන්ලා ගත්ත තීරණයෙන් අසාධාරණයට ලක් වුණේ මේ රටේ රජයේ සේවකයෝයි. රජයේ සේවකයෝ ඉතා බරපතළ විධියට අසාධාරණයට ලක් වුණා. මොකද, ඔවුන්ට තීරුබදු බලපත්‍රයක් දුන්නා, ඊට පස්සේ ඔබතුමන්ලා තීරණයක් ගත්තා, L/C open නොකළ අයට කරන්න දෙයක් නැහැ, ඒවා අත්හිටුවනවා කියලා. හැබැයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ වන විටත් මාස 4ක් 5ක් වනවා, සමහර විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු, ආචාර්යවරු, වෛද්‍යවරු, විවිධ තනතුරුවල වගකීම් දරන රජයේ සේවකයන් වාහන බලපත්‍රය පාවිච්චි කරලා බැංකුවලින් ණය අරගෙන L/C open කළා. හැබැයි, L/C open කළාට ඒ අදාළ company එක, ඔබතුමා දන්නවා ඇති, ඩිමෝ කොම්පැනිය, කාර්මාර්ට් කොම්පැනිය International L/C එක open කරලා නැහැ. International L/C එක open නොකළේ ඒ අදාළ පුද්ගලයා; රජයේ සේවකයා නොවෙයි. Company එක. Company එක bulk එකක් එන තෙක් - කිහිපයක් එකතු වන තෙක්- හිටියා. එහෙම එකතු වන තෙක් ඉඳලා අන්තිමට ඔබතුමන්ලාගේ තීරණයත්

එක්ක දැන් වෙලා තිබෙන්නේ මොකක්ද, අර රජයේ සේවකයන් බැංකුවලින් ණය අරගෙන තැන්පත් කළ සල්ලි රුපියල් ලක්ෂ 50, 60 නිරපරාදේ තිබෙනවා. රටට වැඩකුත් නැහැ; ඒ පුද්ගලයන්ට වැඩකුත් නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව දෙන්න. මම ඔබතුමාව නිවැරදි කරන්න කැමැතියි. ඔබතුමා කිව්වා, අපේ ආනයන වියදම වන ඩොලර් මිලියන 20,000න් ඩොලර් මිලියන 5,000ක් යන්නේ කෑමට කියලා.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
කෑම බීම, ආහාර පානවලට.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාව නිවැරදි කරන්න කැමැතියි. 2017 කෑම බීමවලට අපි සම්පූර්ණයෙන් වියදම් කර තිබෙන්නේ ඩොලර් මිලියන 1,841යි. ඒක මහ බැංකු වාර්තාවේ තිබෙනවා. එතකොට ඔබතුමාගේ දත්තය පිළිබඳව පොඩි වැරැදීමක් තිබෙනවා. මම ඒක නිවැරදි කරන්නම්.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
නැහැ, ඔය Heading එක නොවෙයි, ඔක්කොම subheadings කියවන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මෙහෙමයි තිබෙන්නේ "Food and Beverages - US Dollars 1.8 billion". ඒක ඇතුළේ තිබෙනවා, "Rice - US Dollars 300 million; Sugar - US Dollars 258 million; Dairy - US Dollars 315 million ; Lentils - US Dollars 114 million; Other - US Dollars 851 million."

එතකොට ගරු මන්ත්‍රීතුමනි, සම්පූර්ණයෙන්ම ආහාර ආනයනය කිරීම සඳහා අපි 2017 වියදම් කර තිබෙන්නේ ඩොලර් මිලියන 1,841යි.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
වැරදියි. ඔබතුමා ඔය වාර්තාවේ subheadings සියල්ලම කියවන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මම කියවන්නම්.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒක විතරක් නොවෙයි, -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
හරි, මම කියවන්නම්. ආහාර සඳහා ඩොලර් මිලියන 1,841යි. ඊළඟට, Other Consumer Goods, ඒ කියන්නේ වාහනවලට - ඩොලර් මිලියන 772යි, Medical Equipmentවලට - ඩොලර් මිලියන 520යි, Home Appliancesවලට - ඩොලර් මිලියන 258යි, Clothingවලට - ඩොලර් මිලියන 369යි, Other - ඩොලර් මිලියන 741යි, එතකොට Consumer Goods, ඒ කියන්නේ -

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
අන්න ඒක.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
Consumer Goods කියන්නේ පාරිභෝගික භාණ්ඩ. පාරිභෝගික භාණ්ඩවලට ඩොලර් මිලියන 4,502ක් පමණ වැය කර තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
හරි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
හැබැයි, පාරිභෝගික භාණ්ඩ තුළ තිබෙන ආහාර සඳහා වැය කර තිබෙන්නේ ඩොලර් මිලියන 1,841යි. වාහන තිබෙන්නේත් පාරිභෝගික භාණ්ඩ හැටියටයි.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
මම ඔය වාර්තාව අරගෙනම ඔබතුමාට පැහැදිලි කරන්නම්. ඔය වාර්තාවේම තිබෙන විධියට ආහාර පානවලට වැය කර තිබෙන්නේ ඩොලර් මිලියන දෙදහස් ගණනක් නේ; වාහනවලට වැය කර තිබෙන්නේ ඩොලර් මිලියන හත්සිය ගණන නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
එහෙම නම් ඔබතුමාගේ ගණන කියන්න කෝ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
හාල්, ඒ කියන්නේ Rice -

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
Food and Beverages සියල්ලටම කීයද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
Food and Beverages සියල්ලටම වැය කර තිබෙන්නේ ඩොලර් මිලියන 1,841යි.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
වාහනවලට කීයද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
වාහනවලට ඩොලර් මිලියන 772යි.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
එතකොට ඔබතුමා පිළිගන්නවානේ, වැඩිපුර වැය කර තිබෙන්නේ වාහනවලට නොවෙයි කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මම ඔබතුමාත් එක්ක තර්ක කරනවා නොවෙයි.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඔය කියන subheadings තිබෙනවා, පාරිභෝගික භාණ්ඩ කියන එක ඇතුළේත් ආහාර තිබෙනවා. ඕනෑ නම්, මම ඒක වෙනම ඔබතුමාට පෙන්වන්නම්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
පාරිභෝගික භාණ්ඩ කියන එක ඇතුළේ ආහාර තිබෙනවා. පාරිභෝගික භාණ්ඩ ඇතුළේ තමයි ආහාර තිබෙන්නේ.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒ, 1,800ට අමතරව.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
වාහන තිබෙන්නේත් ඒක ඇතුළේ. එතකොට පාරිභෝගික භාණ්ඩ යටතේ වාහන සඳහා ඩොලර් මිලියන 772ක් වැය කර තිබෙනවා. ආහාර සඳහා ඩොලර් මිලියන 1,841ක් වැය කර තිබෙනවා. මම ඔබතුමාත් එක්ක argue කරනවා නොවෙයි. මම ඔබතුමාට පෙන්වා දුන්නේ අපි ආහාර ආනයනය සඳහා ඩොලර් මිලියන 5,000ක් වැය කරන්නේ නැහැ කියන එකයි. ඩොලර් මිලියන 1,800ක් පමණ තමයි ඒ සඳහා වැය කර තිබෙන්නේ.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
දැන් මගේ අතේ මහ බැංකු වාර්තාවක් නැහැ නේ. ඔබතුමා මට වාර්තාව එවන්න. වේලාව තිබෙනවා නම් මම ඒක පෙන්වන්නම්. ඔබතුමාම කියන නිසා, ඔබතුමා කියන එක නිවැරදියි කියලා පිළිගනිමුකෝ. ඔබතුමා කියන එක හරි. වාර්තාවේ තිබෙනවා කියමුකෝ, ඔබතුමා කියපු විධියට. ඔබතුමා කියනවා, ආහාර පාන සඳහා ඩොලර් මිලියන එක්දහස් අටසිය ගණනක් වැය කළේ කියලා. වාහනවලට වැය කර තිබෙන්නේ ඩොලර් මිලියන හත්සිය හැටදෙකක් පමණ. ඉතින් වාහනවලට වැයකර තිබෙන ප්‍රමාණය අඩුයි නේ. [බාධා කිරීමක්] ඒක තමයි මම මේ කියන්නේ. ආහාර ආනයනය සඳහා වැය කර තිබෙන්නේ ඩොලර් මිලියන 5,000 නොවෙයි කියමු කෝ. දැනට ඔබතුමා කියන විධියට - තාවකාලිකව- ඩොලර් මිලියන 5,000 නොවෙයි කියමුකෝ. නමුත් ඉතා පැහැදිලිව වාහන ගෙන්වනවාට වඩා ඔබතුමන්ලා වියදම් කරන්නේ ආහාර පාන ගෙන්වන්නයි. ආහාර පාන ගෙන්වන්න වියදම් කරන එකෙන් තමයි අපේ අපනයන වැටිලා තිබෙන්නේ. අපට නිෂ්පාදනය කරන්න පුළුවන් ඒවා අපි නිෂ්පාදනය කරන්නේ නැතුව පිට රටින් ගෙන්වනවා. මේකට උත්තරයක් නැතුව ඔබතුමන්ලා තාවකාලික පැලැස්තරය දැම්මේ, වාහන ගෙන්වන එක නවත්වන්නයි. වාහන ගෙන්වන එක නවත්වපු එකෙන් වුණේ, රජයේ සේවකයන්ට මෙතෙක් ලැබුණු මොකක් හෝ සහනයක් තිබුණා නම්, ඒක නැති වුණු එකයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා කියන එක හරි. අපි 2017දී වාහනවලට වියදම් කරලා තිබෙන්නේ ඩොලර් මිලියන 772ක් පමණ, ආහාර පානවලට වියදම් කරලා තිබෙන්නේ ඩොලර් මිලියන 1,841යි. මමත් ඒක පිළිගන්නවා. මේක මුදල් ඇමතිවරයා තාවකාලිකව පනවා තිබෙන නියමයක් පමණයි. ටික දවසකින් එම restriction එක අයින් වේවි. දැන් ඔබතුමා කිව්වා රජයේ නිලධාරින් L/Cs open කර තිබෙනවා, නමුත් ඩිමෝ, කාර්මාර්ට් කොම්පැනි International L/Cs open කරලා නැහැ කියලා. නමුත් ඒවා ඒ වේලාවට ඒ කට්ටියට ලැබේවි. මේක හැම දාටම කරන දෙයක් නොවෙයි. මේක, කෙටි කාලීනව, තාවකාලිකව ගරු මුදල් ඇමතිතුමා පනවා තිබෙන නියමයක් පමණයි ගරු මන්ත්‍රීතුමනි.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
හොඳයි. ඔබතුමා මට මහ බැංකු වාර්තාව මේ පැත්තට එව්වානේ. එම වාර්තාවේම තිබෙන එක මම කියවන්නම්. Consumer goodsවල Food and beveragesවලට වැය කර තිබෙන්නේ ඔබතුමා කියපු විධියට ඒ ගණන. ඊට යටින් තිබෙන එක බලන්න, Intermediate Goods කියලා. Intermediate Goodsවල තමයි තිරිහු සහ බඩ ඉරිහු -Wheat and Maize- තිබෙන්නේ. ඒවා තිබෙන්නේ එතැන. ඒවා තිබෙන්නේ අර යටතේ නොවෙයි. මේ ටික සියල්ලම එකතු කරන්න, ඩොලර් මිලියන 5,000 එනවා. Intermediate Goods කියන එක ඇතුළේ තිරිහු තිබෙනවා. තිරිහු කියන්නේ කෑමක් නොවෙයිද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
නැවත export කරන්න ගෙනෙන ඒවා තමයි Intermediate Goods යටතේ තිබෙන්නේ.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
තිරිහු පිටි ගැන කියන්නකෝ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මෙතැන Consumer Goods කිව්වාම පරිභෝජනය කරන ඒවා.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
හරි. Intermediate Goods කිව්වාම -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
කවුරුත් දන්නවා, පරිභෝජනය කරන්න ගෙනෙන ඒවා තමයි Consumer Goods කියලා තිබෙන්නේ.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
හරි. මට මේක කියන්නකෝ, සරලව. Intermediate Goods කියන එක ඇතුළේ තිරිඟු පිටි තිබෙනවානේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒ කියන්නේ mill කරලා පිට රට අරින ඒවා තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
තිරිඟු පිටි ආපසු export කරන්නද, ගෙනෙන්නේ?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්. ඇයි, mill කරලා පිට රට යවනවානේ. Mill කරලා පිට රට යවන ඒවා තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
අපි ගෙන්වන තිරිඟු පිටිවලින් වැඩි ප්‍රමාණයක් export කරනවාද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒ ගැන ඔතැන සඳහන් වෙනවානේ. ඔතැන තිබෙන්නේ Intermediate Goods හැටියටනේ, Consumer Goods හැටියට නොවෙයිනේ. අපිට ඒක බලන්න පුළුවන්, මොකක්ද කියලා. අපි කියවා බලමු.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
අන්න හරි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
කියවා බලමු.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
Intermediate Goods ඇතුළේ තමයි ඉතා පැහැදිලිව Wheat and Maize තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්. අපි ඊළඟ දවසේ ඒ ගැන සාකච්ඡා කරමු.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඔබතුමා පිළිගන්නවා, වාහන ගෙන්වන්න අපට වැය වුණේ ඩොලර් මිලියන 772ක් පමණ කියන එක. නමුත් අපි ආහාර පාන සඳහා වැය කරන ප්‍රමාණය -ඔබතුමා කියන විධියට, මේකේ තිබෙන වෙන් කිරීම් විධියට- 5,000 නොවෙයි කියමුකෝ. ඒත් වැඩියි. අපි උත්තරය හොයන්න ඕනෑ එතැනට නේ.

නමුත් ඔබතුමන්ලා උත්තරය සෙව්වේ වෙන තැනකටයි. වෙන තැනකට උත්තරය සොයන්න ගිය එකෙන් සිද්ධ වුණු ප්‍රශ්නයයි මා කියන්නේ. ඒ මොකක්ද? රජයේ සේවකයෝ කාර්මාර්ට් එකේ, එහෙම නැත්නම් ඩිමෝ ආයතනයේ රුපියල් ලක්ෂ හැට, රුපියල් ලක්ෂ හැත්තෑව තැන්පත් කරලා LCs open කළා. ඒ ගොල්ලෝ international LC එක open කරලා නැහැ. හැබැයි මාස 4ක් විතර වෙනවා. දැන් ඒ සල්ලි ටික බැංකුවේත් නැහැ, ඒ පුද්ගලයාට පොලියක් එන්නේත් නැහැ, ඔබතුමන්ලාට - ආණ්ඩුවට, Treasury එකට - පොලියක් එන්නේත් නැහැ. Treasury එකට මේ මුදල් use කරන්නත් බැහැ. මේ මුදල් තිබෙන්නේ අතර මැදයි. ගන්ධබ්බ අවධියේ තිබෙන account එකක් විධියටයි ඒක තිබෙන්නේ. මේකෙන් රජයට ශත 05කවත් ආදායමක් එන්නේත් නැහැ, අදාළ රජයේ සේවකයාට වැඩක් වෙන්නේත් නැහැ. ඔබතුමන්ලා දැනට කියලා තිබෙනවා නේ, මේ තහනම මාස 6ක් තිබෙනවාය කියලා. ඒ නිසා ඒ රජයේ සේවකයාට සිදුවන බරපතළ ප්‍රශ්නය තමයි, මාස 6ක් යන කල් රුපියල් ලක්ෂ 40ක්, රුපියල් ලක්ෂ 50ක් ඔහේ නිකම් තිබෙන එක. බැංකුවලින් අධික පොලියට ගත්ත ණය මුදලට ඒ රජයේ සේවකයාට පොලිය ගෙවන්නත් වෙනවා. එතකොට වාහනයත් නැහැ, -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා යෝජනා කරන්නේ මොකක්ද?

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒ මුදල් නිදහස් කරන්න. දැනට LCs open කරලා තිබෙන අයගේ මුදල් නිදහස් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
වාහන කොම්පැනිවල අය කියන්නේ, දැන් ඒ ගොල්ලන් orders place කරලා, ඒ ordersවලට වාහන හැදෙනවාය කියලායි. එතකොට මුදල් නිදහස් කරන්නේ කොහොමද? එතකොට මුදල් නිදහස් කිරීම සම්බන්ධයෙන් ඒ ගොල්ලන්ට ප්‍රශ්නයක් මතු වෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒකට ප්‍රශ්නයක් නැහැ නේ. දැන් ඒ සල්ලි ටික නිකම්ම එක තැනක තැන්පත්වෙලා තිබෙනවා නේ. ඒ මුදල් අදාළ රටට ගිහිල්ලාත් නැහැ නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙනම්?

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒ ගොල්ලෝ international LC එක open කරලා නැහැ; local LC එක open කරලා තිබෙනවා. එතකොට සල්ලි ටික තිබෙන්නේ මෙහේ. මෙහේ සල්ලි ටික තිබුණාට ඒකෙන් කාටවත් වැඩක් නැහැ. ඒ මුදල් කොම්පැනියට ආපසු ගන්නත් බැහැ; Treasury එකට යන්නේත් නැහැ; අදාළ රජයේ සේවකයාට යන්නේත් නැහැ. කොහේ හෝ සේප්පුවක දැම්මා වාගේ ඒ මුදල් නිකම් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමාගේ යෝජනාව අපි මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරන්නම්.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
හොඳයි. ඒක යෝජනාවක් වාගේම ඉල්ලීමක්. මොකද, මෙයින් අසාධාරණයට ලක් වුණු රජයේ සේවකයන් ගණනාවක් ඉන්නවා. පුද්ගලයෝ වැඩිදෙනෙක් නැහැ. මා හිතන හැටියට විශ්වවිද්‍යාල ආචාර්යවරු, වෛද්‍යවරු 300ක්, 500ක් පමණ ඇති.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
300ක්.

**ගරු විජිත හේරත් මහතා**
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
300ක් කියමුකෝ. 300දෙනකුගේ මුදල් නිදහස් කරන එක ප්‍රශ්නයක් නැහැ. ඒකෙන් ඩොලර් එකට බලපෑමක් වෙන්නේත් නැහැ, අපේ සල්ලි පිට යන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ වගකීම් සහ කළමනාකරණයේදී අපේ ආර්ථිකයට සල්ලි ලැබෙන ප්‍රධාන ආයතන තමයි, සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව. දැන් අද මොකක්ද වෙලා තිබෙන්නේ? සක්‍රීය කරන්න මේ යෝජනාව ගෙනෙනකොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මුළුමනින්ම අක්‍රියවෙලා තිබෙනවා. ඊයේ හැන්දෑවේ ඉඳලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන්ම අක්‍රියවෙලා තිබෙනවා. එහි සියලුම ඉහළ නිලධාරීන් අද ලෙඩ නිවාඩු දමා රාජකාරියට ආවේත් නැහැ. ඒ ඇයි? මෙතෙක් කල් සේවා ව්‍යවස්ථාවක් - Service Minute එකක් - තිබුණා, අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරද්දී ඒ ආයතනයේම ඊට පහළ හිටපු කෙනෙක් එතැනට පත් කළ යුතුයි කියලා. එහෙම කරන්නේ ඇයි? මොකද, ඒක වෙනම තාක්ෂණික විෂයයක්. මේ tax ගන්න එක නිකම්ම කෙනකුට කරන්න බැහැ. මුදල් අමාත්‍යාංශයේ නිලධාරියකුට ඇවිල්ලා එක වරටම ඒක කරන්න බැහැ. ඒකේ තිබෙන යන්ත්‍රණය - technology එක - පිළිබඳව ලොකු අත් දැකීමක් තිබෙන්න ඕනෑ. ඒ නිසා තමයි Service Minute එකට ඒ වගන්තිය ඇතුළත් කරලා තිබුණේ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් 9දෙනෙක් ඉන්නවා. ඒ 9දෙනාගෙන් එක් කෙනෙක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරන එක තමයි මෙතෙක් කල් අනුගමනය කළ ක්‍රමවේදය. ඔබතුමන්ලා මොකද කළේ? මාසයක් විතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිලධාරියෙක් සිටියේ නැහැ. ප්‍රධාන නිලධාරියකු පත් කළේ නැහැ. ඊට පස්සේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් 9දෙනාගෙන් දෙදෙනකු interview කළා. ඊට පස්සේ ඒ 9දෙනාම වෙන වෙනම කැඳවා interview කළා. හැබැයි අවසානයේදී මොකද කළේ? ඔක්තෝබර් 30වන දා විශ්‍රාම යන්න ඉන්න කෙනෙක් Treasury එකෙන් පත් කළා. ඔක්තෝබර් මාසයේ 30වන දා එතුමා විශ්‍රාම යනවා. දැන් එතුමා පත් කළා. Service Minute එක උල්ලංඝනය කරලායි ඒක කළේ. එතකොට ඔබතුමන්ලා කියන යහ පාලනය නැහැ නේ. දැන් සේවා ව්‍යවස්ථාවක් තිබියදී එය උල්ලංඝනය - violate - කරන්නේ කොහොමද? එතැන යහ පාලනය කෝ? අද ලොකු අර්බුදයක් තිබෙනවා. අර්බුදය මොකක්ද? අලුතින් පත් කළ නිලධාරියා එතැන වැඩ භාර ගත්තොත් ඔහුට රාජකාරිය කරගෙන යන්න දෙන්නේ නැහැ. එතැන ඉන්න අනිකුත් නිලධාරින්, ව්‍යත්තීය සමිති, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරින්ගේ ව්‍යත්තීය සමිති අද ලෙඩ නිවාඩු දමා තිබෙනවා. ඔහු සේවයට ආවොත් එතැන ලොකු අර්බුදයක් ඇති වෙනවා. කළමනාකරණයක් නැහැ, වග කීමක් නැහැ. අද ඔබතුමන්ලා හදිසියේම කරන්න යන්නේ මොකක්ද? Service Minute එක වෙනස් කරන්න යනවා. හදිසියේම සේවා ව්‍යවස්ථාව වෙනස් කරනවා. පිටින් කෙනකුට පත් වෙන්න පුළුවන්ය කියා සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරලා, තවත් තනතුරු දෙකක් එතැනට අලුතින් ආදේශ කරමින් Service Minute එක අලුතින් ගැසට් කරලා ඔබතුමන්ලා ගත්ත තීරණය දැන් බලහත්කාරයෙන් ක්‍රියාත්මක කරන්න හදනවා.

මේක වැරැදියි. ඔබතුමන්ලා හිතනවා නම් ඒ ආයතනයේම කෙනෙක් පත් වෙන එක වැරැදියි කියලා -මම කියන්නේ නැහැ, ඒක වැරැදියි කියලා.- එහෙම නම් ඔබතුමන්ලාට කරන්න තිබුණේ කල් ඇතුව ඒ සේවා ව්‍යවස්ථාව වෙනස් කරලා, ඒ සංශෝධනය ගැන ඔවුන්ට පැහැදිලි කරලා ඔබතුමන්ලාගේ තීන්දුව ක්‍රියාත්මක කරන්නයි. හැබැයි, ඔබතුමන්ලා කළේ බලහත්කාරයෙන් කෙනෙක්ව පත් කරලා ඒ පත් කරපු කෙනා අනිවාර්යයෙන්ම එතැන සේවයේ රඳවන්න සේවා ව්‍යවස්ථාව වෙනස් කරන එකයි. ඒක නිසා මේක අද ලොකු අර්බුදයක් වෙලා තිබෙනවා. මෙතැන සල්ලි එන තැන; ආදායම් එකතු කරන තැන. Inland Revenue Department එකෙන් තමයි ආණ්ඩුව දුවන්න සල්ලි එකතු කරන්නේ. නමුත් බදු ගැන කථා කළාට බදු එකතු කරන ආයතනය අකර්මණ්‍ය කරලා තිබෙනවා; අක්‍රිය කරලා තිබෙනවා. ඒක නිසා වහාම ඒ ප්‍රශ්නය විසඳන්න කියන එක ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි රජරට විශ්වවිද්‍යාලයේ ප්‍රශ්නය. ඒ ප්‍රශ්නයට දැන් සති ගණනාවක් වෙනවා. විශ්වවිද්‍යාල පරිපාලනය සම්පූර්ණයෙන්ම අක්‍රිය වෙලා තිබෙන්නේ; කඩාගෙන වැටිලා තිබෙන්නේ. විශ්වවිද්‍යාලයට අවශ්‍ය ආචාර්යවරු, මහාචාර්යවරු ප්‍රමාණය 107යි. නමුත් අද ඉන්නේ 39යි. 107ක් විශ්වවිද්‍යාල ආචාර්යවරු, මහාචාර්යවරු වැඩ කරන්න ඕනෑ විශ්වවිද්‍යාලයේ අද ඉන්නේ 39යි. පුරප්පාඩු

ගණනාවක් තිබෙනවා. ඒ පුරප්පාඩුවලට කවුරුවත් යන්නේ නැහැ කියන ප්‍රශ්නයක් තිබෙනවා. යන්නේ නැත්තේ ඇයි? ඒ ප්‍රදේශයේ රාජකාරි කරන එක දුෂ්කරයි. තමන්ගේ දරුවන්ගේ ප්‍රශ්න තිබෙනවා; පාසල් ප්‍රශ්න තිබෙනවා; නවාතැන් පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. ඒක විසඳන්න තමයි ඔබතුමන්ලාගේ පැත්තෙන් යම් කිසි දීමනාවක් දෙනවා කියලා පසු ගිය කාලයේ තීරණයක් ගත්තේ. රජරට විශ්වවිද්‍යාලයේ, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සේවය කරන ඒ ආචාර්යවරුන්ට අමතර දීමනාවක් දෙන්න තීරණයක් ගත්තා. ඒක කෝප් කමිටුවට ආවාම කෝප් කමිටුවෙන් කිව්වා, "මේක නීත්‍යානුකූල කර ගන්න, Treasury එකේ අනුමැතියක් ගන්න. Treasury එකේ අනුමැතියකට යටත්ව මේ ගෙවීම කරන්න." කියලා. ඔවුන්ගේ පත්වීම් ලිපියේ තිබෙනවා, එහෙම අමතර දීමනාවක් දෙනවා කියලා. නමුත් තවම ඒක කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරලා නැහැ. මේ ප්‍රශ්නය ගිය මාසයේ මේ සභාවේ කථා කළා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Council එකෙන් ඒක අනුමත කළා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරලා නැහැ නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම උසස් අධ්‍යාපන ඇමතිවරයා කාලයේ ඒක ගෙවන්න පටන් ගත්තේ. මේ විශ්වවිද්‍යාලයට මහාචාර්යවරු යන්නේ නැති නිසා අපි ඒ අයට දීමනාවක් දුන්නා. ඒක Council එකෙන් අනුමත කෙරුවා. හැබැයි, COPE එකෙන් නැවැත්වූවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
නැවැත්වූයේ නැහැ. අන්න ඒක තමයි වැරැදි මතය.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමන්ලාට කාල සීමාවක් දෙන්න තිබුණා, මේක නීත්‍යානුකූල කර ගන්න. ඒක දුන්නේ නැහැ, COPE එකෙන්.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
COPE එකේ සාමාජිකයෙක් විධියට මම නැහැ. හැබැයි, COPE එකේ සාමාජිකයන් ගොඩක් ඉන්නවා. COPE එකෙන් ගත්තු තීරණය වැරැදි විධියට අර්ථකථනය කරලා තිබෙනවා, COPE එකෙන් නැවැත්වූවා කියලා. COPE එකෙන් නැවැත්වූයේ නැහැ. COPE එකෙන් කියලා තිබෙන්නේ මොකක්ද? හොඳට බලන්න, COPE එකේ තීන්දුව. ඉතා පැහැදිලිව කියලා තිබෙන්නේ මේ දීමනාව නීත්‍යානුකූල කර ගන්න, Treasury එකෙන් මේකට අනුමැතිය ගන්න කියලායි. Treasury එකෙන් අනුමැතිය ගන්න ගියාම, Treasury එකේ නිලධාරීන් කියනවා, "අපට Cabinet approval එකක් ඕනෑ, ඒ අනුමැතිය දෙන්න." කියලා. ඔතැන නේ ප්‍රශ්නය තිබෙන්නේ. කැබිනට් අනුමැතිය දෙන්න තිබෙන්නේ -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන දෙන්න තිබෙන්නේ ඔබතුමන්ලාට. ඒක නිසා මේ ප්‍රශ්නය දිග් ගස්සන්න එපා. වෛද්‍ය ශිෂ්‍යයන්ට, වෛද්‍ය ශිෂ්‍යන්ගේ දෙමව්පියන්ට ආපහු පාරට බහින්නයි සිද්ධ වෙලා තිබෙන්නේ. අද මෙය ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. මේකට කරන්න තිබෙන්නේ එකම දෙයයි. ඒ ගෙවීම කරන්නත් ඔබතුමන්ලා එකඟ වුණා නම්, ඒ ගෙවීම කරමින් තිබුණා නම් මේ පිළිබඳව කැබිනට් මණ්ඩලයෙන් තීන්දුවක් ගන්නයි තිබෙන්නේ. මුදල් ඇමතිතුමාගෙන් ඒකට යම් කිසි මුදලක් වෙන් කර ගන්නයි තිබෙන්නේ. හරි සරල දෙයක්. ප්‍රශ්නය තිබෙන්නේ එතැනයි. ඒ ප්‍රශ්නයට වහාම උත්තරයක් දෙන්න කියන එක මතක් කරනවා.

අවසන් විනාඩියේ මේ කාරණයත් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතු කම්කරුවන්ගේ ප්‍රශ්නය ගැන ගරු ඇමතිතුමාත් කථා කළා. ඒ ප්‍රශ්නය අද දවසේ ගොඩාක් සාකච්ඡාවට ලක් වුණා. වතු කම්කරුවන්ට ඇත්තටම ලැබෙන්නේ දවසකට රුපියල් 500යි. අමතර දීමනා කියන ඒවා, බොරු කථා. රුපියල් 500කට දවසක් වැඩ කරන්න පුළුවන්ද? අද බඩු මිල වැඩි වෙලා; තෙල් මිල වැඩි වෙලා; ගෑස් මිල වැඩි වෙලා; ජීවන වියදම වැඩි වෙලා රුපියල් 500ක් දවසකට අරගෙන කොහොමද මිනිස්සු ජීවත් වෙන්නේ? මේ රටේ වැඩිම ආදායම් හොයන තැන වතු ක්ෂේත්‍රය. ඒ අයට සලකන්නේ නැතුව ආර්ථිකය ගොඩනඟන්න බැහැ. ඒක ඔබතුමන්ලාගේ වග කීම. රුපියල් 100ක සොච්චමක් වැඩි කළාට වැඩක් නැහැ. රුපියල් 100ක් වැඩි කළාම රුපියල් 600යි. අද මේසන් බාස් කෙනෙකුට අත් වැඩ දුන්නත් රුපියල් 1,600ක් ගෙවන්න ඕනෑ. එහෙම නැතුව මේසන් බාස්ට අත් වැඩ දෙන්නවත් එන්නේ නැහැ. දවසක කුලී දීමනාව රුපියල් 1,600යි; 2,000යි.

මේ රටේ ආර්ථිකයේ ජීවනාලිය බඳු ඒ වතු ක්ෂේත්‍රය නඟා සිටුවන වතු කම්කරුවන්ට ගෙවන්නේ රුපියල් 500යි. ඒක සාධාරණ නැහැ. ඒක ඔබතුමන්ලා පිළිගන්න. ඒකට ඔබතුමන්ලා උත්තර දෙන්නේ, "තේ කර්මාන්තය කඩාගෙන වැටිලා. අපේ ජාත්‍යන්තර තේ වෙළඳාම අඩු වෙලා." කියලා. ඒවා උත්තර නොවෙයි. ඒක නඟා සිටුවන්න තමයි ආණ්ඩුව බලයට පත් වුණේ. ආර්ථිකය භදන්න. ඒ estatesවල අයිතිකාරයන්ගේ ආදායම කඩාගෙන වැටිලා නම්, ඒකට උත්තරය හොයන්න ඕනෑ ආණ්ඩුවයි.

ඒක වතු කම්කරුවන්ට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ අසරණ කම්කරුවන්ට වතු අයිතිකරුවන්ගේ ප්‍රශ්න විසඳන්න බැහැ. වතු අයිතිකරුවන්ට ප්‍රශ්නයක් තිබෙනවා නම් තිබෙන්නේ ඔබතුමන්ලාගේ ආර්ථිකයේ වගකීම් විරහිතභාවය නිසායි. ඒකට උත්තරය සෙවීමේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවට මිස සේවකයන්ට නොවෙයි. ඒ ප්‍රශ්නය සේවකයන් පිට පටවන්න එපා. මේ ප්‍රශ්නයට වහාම විසඳුමක් දෙන්න. ඒක බරපතළ, දැවෙන ප්‍රශ්නයක්. හැම දාම කළා වාගේ ඒ අදාළ වෘත්තීය සමිති නියෝජනය කරන දේශපාලනඥයාට, එහෙම නැත්නම් මන්ත්‍රීවරයාට ඇමතිකමක් දීලා, වරදානයක් දීලා මේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්න එපා. හැම දාම කළේ ඒක නේ. වතුකරයේ ඒ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ඇමතිකමක් දෙනවා; ආණ්ඩුවට ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඊට පස්සේ ප්‍රශ්නය යට ගහනවා. එහෙම කරන්න එපා. මේ ප්‍රශ්නයට වහාම විසඳුමක් ලබා දෙන්න. තේ කර්මාන්තය කඩා වැටිලාය කියන ඒ උත්තරය දීලා බේරෙන්න හදන්න එපා. වතු කම්කරුවන් ඉල්ලන සාධාරණ ඉල්ලීම ලබා දෙන්න. මේ ආර්ථිකය කළමනාකරණය කිරීමට ඔබතුමන්ලාට හැකියාවක් නැත්නම් හිටපු මුදල් ඇමතිතුමා -අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමා- ඉන්නවා. එතුමා දකුණු ආසියාවේ හොඳම මුදල් ඇමතිතුමා. ඔබතුමන්ලා ඩ්‍රෝන් යාත්‍රාවක් යවලා එතුමා කොහොමද මේ ආර්ථිකය මෙහෙයවුවේ කියලා පරීක්ෂා කරලා තිබුණා. එම පරීක්ෂාවේ ඡායා පිටපත් හෝ ලබාගෙන මේ ආර්ථිකය ගොඩ ගන්න මැදිහත් වෙන්න කියමින් මා නවතිනවා.

[අ.භා.2.53]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකය ගැන වචන ස්වල්පයක් කථා කිරීමට මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. මා මිත්‍ර විජිත හේරත් මන්ත්‍රීතුමා එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා. අපට තිබෙන්නේ මේ වැටී තිබෙන ආර්ථිකය කොහොමද නිවැරදි මාර්ගයට ගේන්නේ කියන ප්‍රශ්නයයි. අපි බලන්න ඕනෑ ඒක කරන්න බැරිද කියන එක නොවෙයි, කරන්න ඕනෑකමක් තිබෙනවාද කියන එකයි. රටට දේශපාලන නායකත්වයක් දෙන්න තමයි රජයක් බලයට පත් වෙන්නේ. බලයට පත්වන රජය තුළින් රටේ ආර්ථිකය නිවැරදි මාර්ගයට ගෙනෙන එක තමයි අවශ්‍ය වන්නේ. 2015 ජනවාරි 08වැනි දින අපට ලැබුණු ආර්ථිකය මීට වැඩිය වැටුණු, දණ ගස්සපු, ණය බරින් පෙළුණු ආර්ථිකයක් විධියට තමයි අපට ලැබුණේ. නමුත් ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් සමඟ නිවැරදි නායකත්වය ලබා දී මුදල් අමාත්‍යාංශයේ හිටපු දක්ෂ නිලධාරීන් හා අනෙක් සියලුදෙනාගේ උදව් තුළින් ආර්ථිකය කළමනාකරණය කරලා අපි වෙනසක් ඇති කළා. දැන් ඒක වෙන්නේ නැත්තේ ඇයි කියන කාරණය තමයි අපි සලකා බලන්න අවශ්‍ය වන්නේ. මෙතැනදී තමයි අපි දේශපාලන නායකත්වය දිය යුත්තේ.

විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපේ රටේ ආදායම් උපයන ප්‍රධාන ආයතන තුනක් තිබෙනවා. ඒ තමයි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ රේගු දෙපාර්තමේන්තුව. අපි බැලුවොත්, මේ ආයතන තුනටම Service Minutesවලින් පිටස්තරව තමයි පත්වීම් ලබා දීලා තිබෙන්නේ. 2018 වසරේ අපේක්ෂිත ආදායම රුපියල් බිලියන 2,050යි. මම හිතන විධියට එම මුදලින් බිලියන 1,000ක් රේගු දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂා කරනවා. එම ආයතනයට බොහොම හොඳ නෝනා කෙනෙක් පත් කර තිබෙනවා. නමුත් රේගු දෙපාර්තමේන්තුව වැනි තැනක කටයුතු කිරීමට දක්ෂතාව, දැනුවත්කම අවශ්‍යයි. අපි 2015 වර්ෂයේ රේගු දෙපාර්තමේන්තුව භාර ගෙන ඊට පෙර වසරට සාපේක්ෂව සියයට 50කින් පමණ ආදායම වැඩි කර ගැනීමට හැකි වුණේ එම ආයතනයේ තිබුණු දූෂණය නැති කර ආදායම වැඩි කර ගැනීමට අපට හැකියාව තිබුණු නිසායි. 2016 වසරේ 2015 වසරට වඩා සියයට 40කින් ආදායම වැඩි වුණා. 2017 වර්ෂයේ මැද භාගය වෙනකම් ඒ ආකාරයෙන්ම වැඩි වෙන ප්‍රතිශතයක් තමයි තිබුණේ. නමුත් අද පිටස්තර පුද්ගලයෙක් එතැනට දමලා එම නිලධාරීන්ගේ චිත්ත ශක්තිය නැති කරලා තිබෙනවා. ඒ ආයතනවල වැඩ කරන සියලුදෙනාට ඉදිරියට යෑමේ හැකියාව තිබෙනවා; වුවමනාව තිබෙනවා. යම් විධියකින් ඒකට බාධා කළොත් ඔවුන්ගේ උනන්දුව නැති වෙනවා. මේක තමයි අද රේගු දෙපාර්තමේන්තුවට වෙලා තිබෙන්නේ. බොහොම හොඳ නෝනා කෙනෙක් තමයි අද පත්වෙලා ඉන්නේ. නමුත් එම පත්කිරීම තුළින් ආදායම අඩු වී තිබෙන බව අද අපට පෙනෙන්න තිබෙන කරුණක්. මම Monetary Fiscal Policiesවලට එන්න කලින් පරිපාලනය තුළ තිබෙන දුර්වලතාව පෙන්වන්නයි හදන්නේ.

ඊළඟට, සුරාබදු දෙපාර්තමේන්තුව ගැන බලමු. අපි 2015 වර්ෂයේ සුරාබදු දෙපාර්තමේන්තුව භාර ගන්නකොට මාසයකට රුපියල් බිලියන දෙකක ආදායමක් තමයි තිබුණේ. අපි මාසික ආදායම රුපියල් බිලියන 11 දක්වා වැඩි කළා. අද එය රුපියල් බිලියන 7කට අඩු වෙලා තිබෙනවා. සුරාබදු දෙපාර්තමේන්තුවටත් පත් කළේ පිටස්තර පුද්ගලයෙක්. මුදල් අමාත්‍යාංශයේ නිලධාරියෙක් තමයි පත් කළේ. තනතුරු දෙකක් දරන පුද්ගලයෙක් එතැනට දැමීම නිසා වැඩ කිරීමේ හැකියාව අඩු වෙලා තිබෙනවා. ඒ නිසා ආදායම අඩු වෙලා තිබෙනවා. රුපියල් බිලියන 11ක, 12ක, 13ක මාසික ආදායමක් ගන්න පුළුවන් තැන අද මාසික ආදායම රුපියල් බිලියන 7ක්, ඒ කියන්නේ මිලියන 7,500ක් බවට පත් වෙලා තිබෙනවා. අවුරුද්දකට බැලුවොත් බිලියන 70ක් විතර, ඒ කියන්නේ රුපියල් කෝටි 700ක් අඩු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි ආර්ථිකයේ තිබෙන දෙවැනි ප්‍රශ්නය.

තුන්වැනි කරුණ විජිත හේරත් මන්ත්‍රීතුමා කියූ ආකාරයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව -Department of Inland Revenue. ඒ ආයතනය closed circuit එකක්. මීට පෙර ඒ ආයතනය තුළින් තමයි ආර්ථිකයේ වැඩිම වෙනසක් ඇති කළේ. මොකද, ඒ ආයතනය තමයි හොඳින්ම ආදායම හොයා ගන්න පුළුවන් ආයතනය. මට මතක විධියට දක්ෂයන් දෙදහස් හැටපස්දෙනකු සිටින තැනක්; ලේසියෙන් එහෙට මෙහෙට කරන්න බැරි තැනක්. එහි Service Minute එක බැලුවොත් කෙළින්ම සඳහන් වෙනවා, ඒ ආයතනය closed circuit එකක් කියලා. වෙනත් තැන්වලින් පුද්ගලයන් ගෙනැල්ලා එතැනට දමන්න බැහැ. නමුත්, අද මහ බැංකුවෙන් තමයි එතැනට නිලධාරීන් ගෙනෙන්නේ. පොළොවේ පය නොගහන, අද මේ රටේ තත්ත්වය නොදන්නා පුද්ගලයන් තමයි අද මහ බැංකුවේ සිටින්නේ. ඒකේ ඉන්න අය ගෙනැල්ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දැම්මාම, ඒ ආයතනයත් නැති වෙලා යන එකයි තිබෙන ප්‍රශ්නය. ඊට පස්සේ වෙන දේවල් ගැන කථා කරන්න අවශ්‍ය වනවා ද?

ඒ ආයතනය ගිය අවුරුද්දේ බිලියන 647ක ආදායමක් ඉපැයුවා. මේක 2013 වන විට බිලියන 350ක ආදායමක් ඉපැයූ දෙපාර්තමේන්තුවක්. මේ අවුරුද්දේත් අපේක්ෂා කරලා තිබෙනවා බිලියන 792ක ආදායමක්. හැබැයි, ඔක්තෝබර් 15වැනි දා වන විට ලැබිලා තිබෙන ආදායම බිලියන 508යි. බිලියන 75ක හිඟ මුදලක් තිබෙනවා. එය අවුරුද්ද අවසාන වන විට බිලියන 125ක විතර හිඟයක් වෙයි කියලා ඒ අය අපේක්ෂා කරනවා. ඒ වාගේ ආයතනයකට පිටස්තර පුද්ගලයන් ගෙන ගිහිල්ලා දැම්මාම ඇති වන ප්‍රතිවිපාකය මේකයි. මම දන්නේ නැහැ, මුදල් අමාත්‍යාංශයට අද මොනවාද වෙලා තිබෙන්නේ කියලා. ඒකට අංශ භාගය හැදිලා තිබෙනවා වාගෙයි. මීට පෙර මුදල් අමාත්‍යාංශයේ තිබුණේ මෙවැනි තත්ත්වයක් නොවෙයි. කාර්යක්ෂමතාවකින් වැඩ කරන්න පුළුවන් පුද්ගලයන් තමයි එතැන සිටියේ. මට පුදුමයි

මෙවැනි අදහස් ඇතිවීම ගැන. මේක මුදල් ඇමතිතුමාට කියලා වැඩක් නැහැ. මොකද, නිලධාරීන්ගෙන් ලැබෙන අදහස් අනුව තමයි එතුමා ක්‍රියාත්මක කරන්නේ. හැම කෙනාටම සියලු ක්ෂේත්‍ර ගැන දක්ෂතා නැහැ. නමුත්, මේ ආයතනයත් වැරදි මාර්ගයේ යන බවයි මට කියන්න තිබෙන්නේ. අපට මේ අවුරුද්ද බිලියන 2050ක ආදායමක් නොවෙයි, බිලියන 2,300ක විතර ආදායමක් හොයා ගන්න තිබුණු අවුරුද්දක්. නමුත්, මේක තමයි අද අත්වෙලා තිබෙන ඉරණම. අපි Liability Management ගැන කථා කරනවා. නමුත්, දේශීය වශයෙන් ලබා ගන්න පුළුවන් ආදායම කොපමණද? සියයට 10.2ක්ව තිබුණු දළ දේශීය නිෂ්පාදනය අපට සියයට 15 දක්වා වැඩි කරන්න හැකියාව තිබුණා. නමුත්, එය නැවතත් අඩු වන ස්වරූපයක් තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. ඒ නිසා මේ තත්ත්වය වහාම නිවැරදි කරන්න අවශ්‍යයි. මා දන්නේ නැහැ, මහ බැංකුවේ පුද්ගලයකු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙනෙන්න අවශ්‍ය වන්නේ ඇයි කියලා. දක්ෂයෝ ගණනාවක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉන්නවා; ජ්‍යෙෂ්ඨත්වය තිබෙන අය ඉන්නවා. ඒ තුළින් දක්ෂ නිලධාරීන් හොයා ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා මේ ඇති වෙලා තිබෙන තත්ත්වය නිවැරදි කිරීම අත්‍යවශ්‍යයි.

දැන් මේ ආයතනයේ Service Minute එකේ 12.1 - Qualifications යටතේ Commissioner General සම්බන්ධව මෙහෙම සඳහන්ව තිබෙනවා:

"To be an officer in Special Grade of the Sri Lanka Inland Revenue Service"

මේ ආයතනය closed circuit එකක්. ඉතින් කොහොමද මහ බැංකුවේ පුද්ගලයකු ඒ තනතුරට ආවේ?

ඊළඟට, 12.2 හි Method of Selection යටතේ Commissioner General පත් කිරීම සම්බන්ධව මෙසේ සඳහන් වෙනවා:

"Appointment will be made by the Cabinet of Ministers"

ඒ තනතුරට පත් කරන කොට තිබිය යුතු පළමුවන නිර්දේශය, criteria එක තමයි Department of Inland Revenue එකේ පුද්ගලයකු විය යුතුයි කියන එක. ඒක තමයි ඒ සඳහා අත්‍යවශ්‍ය වන්නේ. ඒ නිසා මේ අවස්ථාවේ යම් කිසි වැරදි මාර්ගයකින් නිලධාරීන් පත් වෙලා තිබෙනවා නම් ඒක නිවැරදි කිරීම අත්‍යවශ්‍යයි කියන එක මතක් කරන්න කැමැතියි.

මෙතැනදී Fiscal Policy එකයි, Monetary Policy එකයි අතර තිබෙන වෙනස තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. ආදායම් සහ වියදම් අතර තිබෙන පරතරය ඇති කරන්නේ මුදල් අමාත්‍යාංශයෙන්. හැබැයි, අද මහ බැංකුවේ අධිපතිතුමා තමයි මේ ගැන කථා කරන්නේ. 2018 ඔක්තෝබර් 25වැනි දා "Daily FT" newspaper එකේ සඳහන් වන කාරණයක් මම quote කරනවා. එහි මෙසේ සඳහන් වෙනවා :

"Budget deficit 5.3% says CB Chief"

නමුත් යටතේ තිබෙන Monetary Policy එක ගැන හරියට කථා කරන්නේ නැති පුද්ගලයකුට Fiscal Policy එක ගැන කථා කරන්න මොන අයිතියක්ද තිබෙන්නේ? මම එදා සිටම මේ සම්බන්ධයෙන් කථා කරන්නේ වගකීමක් ඇතිවයි; ප්‍රායෝගික දැනුමක් සහිතවයි. මේ රටේ දේශපාලන අරමුණට විරුද්ධව කටයුතු කරන ආයතනයක් තමයි මහ බැංකුව. මේ රටේ උද්ධමනය පාලනය කරනවා කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ඕනෑ විධියට නටන්න යෑම තුළ අද අපේ රටේ අහිංසක ජනතාව ණය බරින් පෙළෙනවා. අසල්වාසී රටවල් වන බංග්ලාදේශයේ ණය පොලී අනුපාතය සියයට 6,7 වන කොට, මාලදිවයිනේ සියයට 9ක් වන කොට, ඉන්දියාවේ සියයට 8යි, 9යි, 10යි අතර තිබෙන කොට, ලංකාවේ අපි සියයට 15, 16, 17 පොලියට ණය අරගෙන -ලංකාව ඒ පොලිය ගෙවන්න හැකියාව තිබෙන රටක් ලෙස සැලකුවත්, - ඒ රටවල් සමඟ තරගකාරී තත්ත්වයක් ඇති කරන්න හැකි වනවාද? මේවා තමයි නිවැරදි විය යුත්තේ. ඒ නිවැරදි කිරීම කළ යුත්තේ මහ බැංකුවෙන්. මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය අනුව ණය පොලී අනුපාතය එවැනි වැඩි මට්ටමක තිබුණාම, ඒක කෙළින්ම රටේ ආර්ථිකයට බලපානවා.

අනෙක් කාරණය තමයි රුපියල අවප්‍රමාණය වීම. රුපියල අවප්‍රමාණය වීම තුළ ඒ අය අපේක්ෂා කරන්නේ පුළුවන් තරම් අපනයනය වැඩි කරන්නයි. අපනයනය වැඩි කිරීම තුළින් රුපියලේ අගය වැඩි වෙනවා නම්, එහෙම නම් රුපියල දෙසියක් කරන එක නේ හොඳම දේ. නමුත් ඒක වෙන්නේ නැහැ. මේ රටට සියයට 70ක ආනයනයක් කරනවා. ඒ සියයට 70ට සාපේක්ෂව සියයට 25ක් තමයි අපනයනය කරන්නේ. සියයට 70කින් රුපියල වැඩි වෙලා, ප්‍රතිඅපනයනය කරන්න ඒක උපයෝගී කර ගන්නවා නම්, GSP එක තුළින් අපනයන වැඩි කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒකෙන් අපනයනය වැඩි වෙලා තිබෙනවා. හැබැයි, ඒ අපනයනය වැඩි කිරීම කරන්න අවශ්‍ය වන්නේ value addition තුළින්. මේ විධියට රුපියල අවප්‍රමාණය වීම තුළින් නොවෙයි. මම එදා ඉඳලාම කිව්වේ, රුපියල අවප්‍රමාණය වීම තුළින් අපේ රටේ අය වැයට රුපියල් බිලියන 55ක ප්‍රශ්නයක් ඇති වෙන බවයි. ඒ කියන්නේ වියදමක් ඇති වෙනවා. මෙය කෙළින්ම බලපාන්නේ අය වැයටයි. මේ අවුරුද්දේ අය වැය හිඟය සියයට 4.4ක්ව තිබිය යුතු ප්‍රමාණය, සියයට 5.3ක් වනවා කියන්නේ අය වැය හිඟය රුපියල් බිලියන 140ක් විතර වැඩි වෙලා තිබෙනවා. රුපියල අවප්‍රමාණය වීම තුළින් වෙලා තිබෙන්නේ මොකක්ද? ප්‍රාග්ධන වියදම් සියල්ලම කරලා නැහැ. පුනරාවර්ථන වියදම සියයට 80කට ගියාට, ප්‍රාග්ධන වියදම සියයට 20යි, 25යි අතර ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. අද හැම අමාත්‍යාංශයකටම සල්ලි නැහැයි කියලා කියන්න බැහැ. අපි වෙන් කරලා තිබෙන මුදල ලබා දිය යුතුයි. මේක තමයි අපි ඇති කරන්න අවශ්‍ය වන්නේ. මම කියන්නේ මේකයි. සුබවාදීව ජනතාව පත් කරපු ආණ්ඩුවක්, නිකරුණේ පිට රට තිබෙන ප්‍රශ්න ලංකාවට ගෙනැල්ලා, දැන් නිසරදයක් තිබෙනවාය කියලා හරියන්නේ නැහැ. අපි මේකට උත්තර හොයන්න අවශ්‍යයි. ඒකට තමයි ආණ්ඩුවක් තිබෙන්නේ. ඒක කරන්න බැරිකම නොවෙයි, කරන්න ඕනෑකමක් නැති එකයි තිබෙන්නේ. මේක රජයේ නිලධාරීන්ට භාර දුන්නත් ලැබෙන උත්තරය ඕකයි. ජනතාව ඉදිරියට යන්නේ රජයේ නිලධාරීන්ද? නැහැ. ආණ්ඩුව තමයි ජනතාව ඉදිරියට යන්නේ. අපේ ජනාධිපතිතුමාට, අපේ අගමැතිතුමාට තමයි ඒ සම්බන්ධව හිසරදය තිබෙන්නේ. ඒ නිසා තමයි කණ්ඩායමක ස්වරූපයෙන් උත්තර දෙන්න තිබෙන්නේ. කරන්න බැරි දේ තමයි දැන් මේ කරලා තිබෙන්නේ.

මුදල් අමාත්‍යාංශය තුළින් කරන්න තිබෙන ප්‍රකාශය මහ බැංකුවේ සිටින මෙවැනි පුද්ගලයන් කළාම, ඒ ගොල්ලන් හිතනවා අද මේ රටේ ආර්ථිකය දුවන්නේ මහ බැංකුව තුළින්ය කියලා. මේ රටේ පාලනය ගෙන යන්නේ CID එකේ දෙන්නෙක්, තුන් දෙනෙක් හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ දෙන්නෙක්, තුන්දෙනෙක්ය කියලා. දැන් පෙනෙනවා නේ, මොනවාද වෙන්නේ කියලා. රටේ පරිපාලනයට ප්‍රශ්නයක් ඇති වන්නේ මේ නිසායි. මේක නිවැරදි කරන්න අවශ්‍යයි. මේක ආර්ථික මට්ටමෙන් හදලා ගන්න එක තමයි අවශ්‍ය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හැම අවස්ථාවකදීම කියන දෙයක් තිබෙනවා. 2000, 2001 වසරවලදී අපේ ආර්ථිකය

[ගරු රවි කරුණානායක මහතා]

ඍණ ආර්ථිකයට තල්ලු කිරීමක් ඇති වුණා. ඒ අවස්ථාවේදී නායකත්වය දුන්නේ එවකට හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියයි. එතුමියගේ කාලයේ හිටපු මනෝ තිත්තවෙල, තිලාන් විජේසිංහ, ඉන්ද්‍රජිත් කුමාරස්වාමී වාගේ අය තමයි අද මේ පරිපාලනය ගෙන යන්නේ. නැවතත් ඒ හොල්මන් කාලය තමයි ඇවිල්ලා තිබෙන්නේ. අප මේ සඳහා උත්තරයක් හොයා ගන්න අවශ්‍යයි. රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය මෙයයි. අද එක්සත් ජාතික පක්ෂය යන ගමන නැති කරන ස්වරූපයක් ඇති කර තිබෙන්නේ මෙවැනි පුද්ගලයනුයි. මම බය නැතිවයි කියන්නේ. මොකද, අපි අවුරුදු 22ක් විපක්ෂයේ ඉඳලා අමාරුවෙන් ආණ්ඩුවක් හැදුවේ. මේ වාගේ තුන් හතර දෙනෙකුට මේක ලෙහෙසියෙන් නැති කරන්න ඉඩ දෙන්න බැහැ. බලන්න! භයට හෝටලය සහ හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය ගැන කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යාංශයේ තිලාන් විජේසිංහ 2018.09.21වන දින Hyatt International එකේ Mr. Peter Fultonට ලිපියක් ඉදිරිපත් කරනවා. මම අහනවා, මේ ලිපිය ඉදිරිපත් කරන්න එතුමාට කැබිනට් අවසරයක් ලැබුණාද? ලැබුණා නම් කා වෙනුවෙන්ද මේ කථා කරන්නේ? ආණ්ඩුව ඒ සම්බන්ධව සොයා බලා කටයුතු කරන්න කලින් "භයට්" එකට එතුමා උත්තර දෙන්නේ කොහොමද? මෙන්න මේ දේවල් තුළින් තමයි ආණ්ඩුවට නරක නාමයක් එන්නේ. දෙන්නෙක්, තුන් දෙනෙක් ඇවිල්ලා ඇහිලි ගහලා මේ රජය අපකීර්තියට පත් කරන්න කටයුතු කරනවා.

Sir, owing to the fact that I do not have enough time at this moment, I would **table*** this letter to be included in Hansard. This is an official document sent by the Ministry of Finance and Mass Media to Hyatt International. On what basis Mr. Thilan Wijesinghe got the authority to sign this, if the Cabinet of Ministers have not designated as to whom the case should be referred to? You are talking of Hyatt International on one side and Hotel Hilton is in litigation on the other side. How on earth can you go for privatization when there is litigation?

These are the matters that you should look into. When you give wishful thinking that revenue is coming and suddenly when that is not happening those are the multiple problems that we are artificially trying to create. These are the answers that we require. There is no point of talking about Trump. He has got to do what is good for America and we have to do what is good for Sri Lanka. So, on that basis, all I want to do is to ensure that we kick -start or rekindle the economy that was bubbling during May to July in 2017. Let us get back and ensure that we basically bring back that prosperity that has vanquished in the last couple of months. Together we can make that difference. All what we want to do is to ensure that the economy is strong enough to withstand the vicissitudes that we have got to go through.

Certainly, the dollar is now becoming stronger and currencies in Asia are having a tough time. But, "tough time" does not mean that that is the end of the economy. We have to forecast this. These are not unknown things. When Trump came in, he was trumpeting himself that he was going to make an inroad of dollars back into America. These are known by our Central Bankers. When I was the Finance Minister, they were guiding us. We are now certainly running into these problems owing to the fact that the American Government as well as the American Federal Reserve is talking of more intrusive type of an economy that is there. So, these are planned situations. If those are planned, why are we unprepared for this? These are the things on which we have to take corrective actions. So, all I want to do is to ensure that we get back the confidence that the UNP and President Maithripala Sirisena can do this. However, two or three people are getting into the middle and trying to rack the confidence that is there. But, we need to ensure that this cancer is removed and the same confidence that was there between the President and the Prime Minister is re-echoed, brought back and strengthened giving the feeling that they can do it; not that two or three people have misguided and ruined the economy. If you eradicate those issues, you will be back in the correct sandal and be able to move the country forward.

So, as time is becoming a limited factor, I do not want to speak any longer. But, all I want to say is, it is not that you cannot do it, it is whether you want to do it. Together you can make that difference and let us make that happen.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න.

[අ.භා. 3.09]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ කථාවට තව වෙලාව තිබුණු නිසායි කථාව ආරම්භ කරන්න ප්‍රමාද වුණේ. ඒ ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

සක්‍රීය වගකීම් කළමනාකරණ පනත යටතේ වූ යෝජනාව සහ මහාමාර්ග අමාත්‍යාංශයට අදාළව ඉදිරිපත් කර තිබෙන පරිපූරක ඇස්තමේන්තුව ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේ, ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත්, ඒ වාගේම මේ ආණ්ඩුවේ හිටපු මුදල් ඇමතිතුමාත්, අනෙකුත් අමාත්‍යතුමන්ලාත් අද රටේ ආර්ථිකය කොතැනද තිබෙන්නේ කියන කාරණය ගැන අදහස් ප්‍රකාශ කළා. ඒ සෑම ප්‍රකාශයකින්ම අපට අහන්න ලැබුණේ වෙන මොනවත් නොවෙයි. රජය ගෙන යන්න, ආර්ථිකය ගොඩ නහන්න, රටේ ඉදිරි වැඩකටයුතු කර ගන්න මුදල් නැහැ කියන එකයි අපට ඒ කථාවලින් අහන්න ලැබුණේ. "රට මෙවැනි තත්ත්වයකට පත් වනවා, ආර්ථිකය මේ විධියට කඩාගෙන වැටෙනවා" කියා මේ යහ පාලන ආණ්ඩුව ආරම්භ කරද්දීම අපි කිව්වා. මොකද, ජනාධිපතිතුමා යම් සාධනීය තීන්දුවක් ගනිද්දී

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අගමැතිතුමා ඒකට සහයෝගය දක්වන බවක් අපි දකින්නේ නැහැ. මේක 2015 ජනවාරි 8වන දායින් පසුව දිගටම සිද්ධ වුණු දෙයක්. ජනාධිපතිවරයා යම්කිසි ප්‍රතිපත්තිමය තීන්දුවකට යෝජනාවක් ගෙනෙද්දි, කැබිනට් මණ්ඩලය රැස් වෙලා ඒකට හාත්පසින්ම වෙනස් යෝජනාවක් තමයි ගෙනෙන්නේ. ඒ වාගේම, ඒ අවුරුද්දේ පෙබරවාරි මාසයේ 26, 28 වෙද්දි මහ බැංකුවට සිද්ධ වුණු දැවැන්ත මූල්‍යමය පාඩුව නිවැරැදි කර ගන්න අද වනතෙක් අපට පුළුවන්කමක් ලැබිලා නැහැ.

අද අමාත්‍යවරු තමුන්ගේ කාර්ය භාරය පැත්තක තියලා වෙනත් වෙනත් දේවල් ඔස්සේ යන ආකාරයක් අපි දකිනවා. ගරු මුදල් ඇමතිතුමා මීල සූත්‍රයක් ගෙනාවා. ඒ මීල සූත්‍රය තුළින් රටේ ආර්ථිකයට මොන තරම් විපත් ගෙනැත් තිබෙනවාද කියන එක මේ රටේ ධීවරයෝ, ප්‍රවාහන ක්ෂේත්‍රයේ, වෙළෙඳ ක්ෂේත්‍රයේ ඉන්න අය කවුරුත් දන්නවා. අද කවුරු, කොහොම, මොන ආකාරයෙන් කිව්වත් ඩොලරය ශීඝ්‍රයෙන් ඉහළ යද්දි, රුපියල ශීඝ්‍රයෙන් කඩා වැටෙද්දි මේ රට තුළ අස්ථාවරභාවයක් නිර්මාණය වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද ආයෝජකයෝ කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරන්නේ නැති තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා; ආයෝජකයෝ මේ රටේ ආයෝජනය කරන්නේ නැති ත්ත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඒ ඇයි? රටේ ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීන්දුවල නැහැ. රටේ දේශපාලනය අස්ථාවරයි. රටේ මේ දේශපාලන අස්ථාවරභාවය ජාත්‍යන්තරයටත් දැනිලා තිබෙනවා. මේ රටේ දේශපාලන අස්ථාවරභාවය කොකැනට, කොහොම ගිහින් තිබෙනවාද කිව්වොත්, ප්‍රජාතන්ත්‍රවාදයේ මූල බීජයක් වන මැතිවරණ පවත්වන්නේ නැති තත්ත්වයට අද වෙද්දි මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. මැතිවරණ පවත්වන්න කිසිම අපහසුතාවක් නැහැ. ඒවා කල් දමන්න කිසිම වුවමනාවක් නැහැ. මේක සාධාරණ සමාජයක් නම්, ප්‍රජාතන්ත්‍රවාදී රටක් නම්, අනිවාර්යයෙන්ම මැතිවරණ පවත්වන්න ඕනෑ. මේ වනවිට සමහර පළාත් සභාවල නිල කාලය ඉකුත් වෙලා අවුරුද්දකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. මේ අස්ථාවරභාවය නිසා මේ රට අද කඩා වැටෙමින් පවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! சபைக்குத் தலைமை தாங்குவதற்காக மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்களின் பெயரை முன்மொழியவும்.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I propose that the Hon. K. Thurairetnasingam do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.***

*අතන්පිටකු, மாண்புமிகு மயில்வாகனம் திலகராஜா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MYLVAGANAM THILAKARAJAH *left the Chair, and* THE HON. K. THURAIRETNASINGAM *took the Chair.*

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකය මේ ආකාරයෙන් කඩා වැටෙන්නේ රටේ නියම දේශපාලන නායකත්වයක් නැති නිසායි. අගමැතිවරයා එකක් කියද්දි ජනාධිපතිවරයා තව එකක් කියනවා. මේ වන විට කවුරුත් දන්නා ප්‍රසිද්ධ දෙයක් තිබෙනවා. "රෝ" සංවිධානයෙන් ජනාධිපතිවරයාව ඝාතනය කරන්න වැඩ පිළිවෙළක් තිබෙනවාය කියා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් මාධ්‍ය නිවේදන නිකුත් වනවා. ඒ වාගේම අගමැතිවරයා සහ පොලිස්පතිවරයා එකතු වෙලා ජනාධිපතිවරයා ඝාතනය කිරීමේ කුමන්ත්‍රණයක් තිබෙනවාය කියා මාධ්‍යවල පළ වනවා. බලන්න, මිනී මරුවෝ, මං කොල්ලකාරයෝ, දේපොළ විනාශ කරන්නෝ කියන සියලුදෙනා සිටින හොර නඩයක් බවට අද මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. අරාජිකයි කියන්න, ජරාජීර්ණයි කියන්න, විනාශයි කියන්න, මේ ආණ්ඩුවේ තව මොනවාද ඉතිරි වෙලා තිබෙන්නේ? දේපොළ ඇතුළු මේ ආණ්ඩුවට තිබෙන සියලුම දේවල් මං කොල්ල කනවා; හොරකම් කරනවා; මිනී මැරීමට තැන් කරනවා. මේ සියල්ල මේ ආණ්ඩුවේ තිබෙනවා. එහෙම නම්, මේක යහ පාලන ආණ්ඩුවක්ද? මේ ආණ්ඩුව 2015 ජනවාරි 8වන දා බලය ගත්තේ, "යහ පාලන ආණ්ඩුවක්" කියායි. මේ ආණ්ඩුව පාලනය කරනවාය කිව්වේ ලිඛිතව් යෝගයෙන්. සියලුදෙනා සම සේ එකතු වෙලා; සම සේ සාකච්ඡා කරලා; සම සේ රටේ තිබෙන ප්‍රශ්න විසඳනවාය කියන පොරොන්දුව තමයි බලයට පත් වෙද්දි මේ ආණ්ඩුව ජනතාවට දුන්නේ. නමුත්, අද වෙද්දි ජනතාවට තුන් වේලවත් කන්න විධියක් නැහැ.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉවත් වන්නය කියා පසුගිය දවස්වල ජනාධිපතිවරයා කියනවා අපි දැක්කා. ඒ වාගේම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉවත් වන්න කියලා ජනාධිපතිවරයා කිව්වා. ආයෝජන එද්දි, කොහෙන් හෝ කෝච්චි පෙට්ටියක් ගෙනාවත් කීයක් හෝ ගසා කන්නයි ආණ්ඩුවේ ඉන්න ඇමතිවරු බලන්නේ. "Enterprise Sri Lanka" කියා වැඩසටහනක් හඳුන්වා දීලා තිබෙනවා. කෝටි ප්‍රකෝටිපතියන් අතර වැඩි මුදල් ප්‍රමාණයක් හුවමාරු කිරීම තමයි එහි අධ්‍යක්ෂ මණ්ඩලය තුළින් සිද්ධ වෙලා තිබෙන්නේ කියා ජනාධිපතිවරයා එය විවේචනය කරනවා.

තේ දළු කඩන, වතුකරයේ සිටින අහිංසක මිනිසුන් දිහා බලන්න. පසුගිය දවස්වල වතුකරයේ නායකයෝ හැසිරුණු විධිය අපි දැක්කා. වතු කම්කරුවන්ගේ පඩි වැඩි වුණේ නැත්නම්, පෙට්‍රල් හලාගෙන ගිනි තියා ගන්නවාය කිව්වා. පෙට්‍රල් හලාගෙන ගිනි තියා ගන්නවාය කියපු ඇමතිවරු අද පාර්ලිමේන්තුවට ඇවිත්, ඒ වරප්‍රසාද භුක්ති විඳිමින්, හොඳට කාලා බීලා, මේ සියලු දේවල්වලට සම්බන්ධ වෙලා ඉන්නවා. අන්තිමට වතුකරයේ මිනිසුන්ට සිද්ධ වුණේ කූඩැල්ලෝ කාලා නිකම් තුවාල කර ගන්න විතරයි. ඒ මැති ඇමතිවරු වතුකරයේ ජනතාවගේ පඩිය ගැන හිතුවේ නැහැ. ඔවුන් ඩොලර් එක වැඩියි කියලා හූරේ දමනවා. ඩොලර් එක වැඩි නිසා අපනයන ආදායම ඉහළ යනවාය කියනවා. එහෙම නම්, තේ දළු අපනයනය කළාම එන මුදල -ඒ විදේශ විනිමය- උපයෝගි කරගෙන ඒ අහිංසක මිනිසුන්ගේ පඩිය රුපියල් 1,000 දක්වා වැඩි කරන්න ආණ්ඩුවට බැරි ඇයි? හාමිපුතුන්ට ඒ යෝජනාව ඉදිරිපත් කරන්න ආණ්ඩුවට බැරි ඇයි? තේ කර්මාන්තයේ; වතු ක්ෂේත්‍රයේ රැකියාවල යෙදී සිටින අයට පහසුකම් දීලා, ඒ අහිංසක ජනතාවට සලකන්න බැරි ඇයි? මැතිවරණයක් එන කාලයට නම්, වතුකරයට ගිහින් ඒ මිනිසුන්ට කප්පරක් බලාපොරොත්තු දෙනවා. නමුත්, මේ ආණ්ඩුව ඒ කිසි බලාපොරොත්තුවක් ඉෂ්ට සිද්ධ කර නැහැ. එම නිසා දේශපාලනඥයන් එපා කියලා, ඒ ද්‍රවිඩ තරුණයන් ඊයේ-පෙරේදා කොළඹට ඇවිත් උද්ඝෝෂණයක් කළා; කොළඹ වැටලුවා; ඔවුන්

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

කොළඹට ඇවිත්, බල කරලා ඒ කාරණය කිව්වා. එම නිසා, වතුකරය නියෝජනය කරමින් මේ ආණ්ඩුවේ ඇමතිකම් භුක්ති විඳින අයට මම කියනවා, මේ අය වැයට තමුන්නාන්සේලා පක්ෂ වනවා නම්, අර අහිංසක ජනතාවගේ අහිංසක ඉල්ලීමටත් ඉඩ දෙන්න කියා. එහෙම නොකර ඔබතුමන්ලා ගමට යන්න එපා. මේ අය වැයෙන් මේ ගොල්ලන්ට ඒ ජයග්‍රහණය දිනාගන්න බැරි වුණොත්, මේ මැති ඇමතිවරුන්ට හොඳින් සලකන්න කියලා මේ කථාව අහගෙන ඉන්න ගමේ ද්‍රවිඩ තරුණයන්ට මම කියනවා.

ජනතාව ඒ විධියට ඉදිරියට එන්න ඕනෑ. එහෙම නැත්නම් මේ වාගේ වල්මත් වෙච්ච ආණ්ඩු හැදෙන්නේ නැහැ. ආණ්ඩු හදන්න නම් ආණ්ඩු හදන තැන ජනතාව කෙළින් ඉන්න ඕනෑ. ජනතාවට අප යෝජනා කරන්නේ, මෙසේ වල් බූරු විධියට හැසිරෙන ආණ්ඩු එළවන්න කියායි. මෙතුමන්ලා මැතිවරණ දෙන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාට වෙන් කර තිබෙන විනාඩි 15න් විනාඩි 5ක් මා ඉල්ලා සිටිනවා. අනුමත කරවා ගන්න හදන මේ මුදල් මාර්ග සංවර්ධනයටද, වෙනත් ආයෝජනයකටද, ඒ මොනවාටද කියා මම අහනවා. අපේ ගරු රාජ්‍ය අමාත්‍යතුමා කිව්වා, "ඊළඟට ගෙවන්න තිබෙන ණය නිසායි මේ මුදල් දැන් අනුමත කරවා ගන්නේ." කියා. ඒ වාගේම එතුමා කිව්වා, "2013 වර්ෂයේදී අපි අතිවිශාල පොලියකට ණය ගත්තා." කියා. අතිවිශාල පොලියකට - සියයට 8 පොලියට- අපි ඩොලර් මිලියන 750ක් ගත්තා කියා එතුමා කිව්වා. අපි ණය ගත්තා තමයි. අපි ඩොලර් මිලියන 750ක් නොව, ඊටත් වඩා ණය ගත්තා. හැබැයි අපි රටට වැඩ කළා. අද වෙද්දී සමස්ත ණය රුපියල් බිලියන 11,000 පැනලා තිබෙනවා. රුපියල් බිලියන 7,000ක් ලෙස පැවැති ණය ප්‍රමාණය තමුන්නාන්සේලා මේ අවුරුදු 4ට රුපියල් බිලියන 4,000කින් වැඩි කර තිබෙනවා. ඒවායෙන් මොනවාද කළේ? මෙහි සිටින ඇමතිතුමන්ලා, මෙතැන සිටින මන්ත්‍රීතුමන්ලා, ආණ්ඩුව නියෝජනය කරන අය නැඟිටලා කියන්න බලන්න, ඒවායෙන් මොනවාද කළේ කියා. කරපු කිසිම දෙයක් නැහැ. ජාතික පද්ධතියට විදුලි ඒකකයක් එකතු කරගන්න බැරිව ගිය "පීච්චං වෙච්ච" ආණ්ඩුවක් තමයි තමුන්නාන්සේලාට තිබෙන්නේ. "පීච්චං වෙච්ච" ආණ්ඩුවක් තමයි තිබෙන්නේ. එදා කෙරවළපිටිය බලාගාරය හැදුවා, ඉහළ කොත්මලේ බලාගාරය හැදුවා, නොරොච්චෝලේ බලාගාරය හැදුවා. ඔන්න, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවලින් විදුලිය පද්ධතියට කරපු සේවාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ හිඟන ආණ්ඩු තියෙන්න තියෙන්න ජනතාවට හිඟා කන්න වෙන එක අහන්න දෙයක් නොවෙයි. අද ළතෝනි දෙනවා. "ණය වැඩියි" කියනවා. "කවුද ණය ගත්තේ?" කියා අහනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා යුද්ධය තිබෙද්දී රට භාර ගෙන ළතෝනි දුන්නාද? "ප්‍රේමදාස මහත්මයාත්, ජේ.ආර්. මහත්මයාත් තමයි මේවා පටන් ගත්තේ. යාපනයේ පුස්තකාලය ගිනි තියලා, ඒවා විනාශ කරලා තමයි මේවා පටන් ගත්තේ" කියා එතුමා ළතෝනි දුන්නාද? නැහැ. අවුරුදු 5න් යුද්ධය ඉවර කළා. නමුත්, ඊට පසුව ආණ්ඩු බලය ලැබුණු තමුන්නාන්සේලා හම්බන්තොට වරාය විකුණා ඇමෙරිකානු ඩොලර් මිලියන 1,300ක් ගත්තා. අපි අහනවා, ඒකෙන් මොනවාද කළේ කියා. තමුන්නාන්සේලා ඇමෙරිකානු ඩොලර් මිලියන 1,300ක් අරගෙන එක් එක් කෙනාට ජරාව කන්න, මාටියා ගහන්න, පගා ගන්න එක එක ව්‍යාපෘතිවලට දැම්මා. අද ඒ ව්‍යාපෘතිවල ප්‍රතිඵල නැහැ. මා අහනවා, ජනාධිපතිතුමාට යන්න ඉතිරි වෙලා තිබෙන්නේ තවත් රටවල් කීය ද කියා; අගමැතිතුමාට යන්න ඉතිරි වෙලා තිබෙන්නේ තවත් රටවල් කීයද කියා. ලෝකය වටේ සවාරි ගැහුවා මිසක් ගෙනාපු-

**ගරු ලොහාන් රත්වත්තේ මහතා**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
අයිස්ලන්තයට විතරයි තව යන්න තිබෙන්නේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඔව්, අයිස්ලන්තයට විතරයි තව යන්න තිබෙන්නේ. රටට ගෙනාපු මහා ලොකු ආයෝජනයක් නැහැ. රටට ආදරය තිබෙන වතුකරයේ මන්ත්‍රීතුමන්ලා ඉන්නවා නම්, රටට ආදරය තිබෙන උතුරුකරයේ මන්ත්‍රීතුමන්ලා ඉන්නවා නම්, රටට ආදරය කරන ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා -හයදෙනකු හෝ- ඉන්නවා නම් මේ වසර අවසානයේ එන අය වැය වෙනුවෙන් තීන්දුවක් ගන්න කරුණාකර සුදානම් වෙන්න. එහෙම නැතිනම් සියලුදෙනා අළෙවි වූ මන්ත්‍රීවරුන් වේවි. ඒක තමයි අපට කියන්න තිබෙන්නේ. "ඩොලරයේ අගය ඉහළ යෑම, රුපියල කඩා වැටීම ලෝක ආර්ථිකයේ සිද්ධ වන දෙයක්. එහෙම නැත්නම්, එය ට්‍රම්ප් මහත්මයාගේ වැඩක්." කිය කියා ඇමෙරිකාව ගැනත්, වෙනත් රටවල් ගැනත් බූත කියව කියවා ඉන්නවාට වඩා ස්වදේශිකත්වය ගොඩ නඟන එක හොඳයි කියායි මා හිතන්නේ. අපට ඕනෑ කුරක්කන් ටික අද ගෙන්වන්නේ බංග්ලාදේශයෙන්. අපේ රටට අවශ්‍ය බඩ ඉරිඟු ටික අද ගෙන්වන්නේ පාකිස්තානයෙන්. අපට ඕනෑ හාල් ටික අද ගෙන්වන්නේ පාකිස්තානයෙන්. ඒ නිසා අපේ රටේ වවාගන්න අවශ්‍ය කෘෂි ආර්ථිකය ගොඩ නඟන්න වැඩ පිළිවෙළක් සූදානම් කරන්න. ඒක තමයි රට කරන ඇත්තන් කළ යුතු දේ, කෘෂිකර්ම ඇමතිවරයා කළ යුතු දේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් හම්බන්තොට වරාය දීලා ඉවරයි. කොළඹ තිබෙන ප්‍රධාන පෙළේ හෝටල් ටික හෙට අනිද්දාට විකුණන්න හදනවා. ඒ වාගේම, මත්තල ගුවන් තොටුපොළ විකුණන්න හදනවා.

අධිවේගී මාර්ග ටික විකුණන්න හදනවා. විකුණාගෙන කන සංස්කෘතිය ඉවත් කරන්න. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි තව එක විනාඩියකින් මගේ කථාව අවසන් කරනවා. ජාත්‍යන්තරය දිනුවාය කිව්ව ආණ්ඩුවට ජාත්‍යන්තරයේ කිසිම කෙනෙක් තඹ දොයිතුවක උදව්වක් කරන්නේ නැහැ. මේ ආණ්ඩුව ගැන විශ්වාස නැහැ. එම නිසා අපි යෝජනා කරනවා. මේ රටේ තිබෙන සම්පත් ටික රැක ගන්න, රටේ තිබෙන දේපළ ටික රැක ගන්න ඒ වාගේම රටේ ස්වදේශිකත්වය ඇති කරන්න සිංහල, දෙමළ, මුස්ලිම් ජාති වශයෙන් හෝ පක්ෂ භේදයකින් හෝ තොරව එක් වී මෙවර අය වැය වෙනුවෙන් තීන්දුවක් ගන්නය කියා ඉල්ලනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. අදුත්තු, கௌரவ அரவிந்த் குமார் அவர்கள்! உங்களுக்கு 8 நிமிடங்கள் உள்ளன.

[பி.ப. 3.24]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி! இன்று இந்தச் சபையில் நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சின் குறைநிரப்புத்தொகை சம்பந்தமான விவாதத்தில் நாங்கள் கலந்துகொண்டு கருத்துக்களை முன்வைத்துக்கொண்டிருக்கின்றோம். இந்த அமைச்சைப் பொறுத்தளவிலே, இது இந்த நாட்டிலுள்ள முக்கிய அமைச்சுக்களில் ஒன்றாக இருக்கின்றது. அதன் செயற்பாடுகள் மக்களின் நாளாந்த வாழ்க்கையோடு தொடர்புபட்டதாக இருப்பதையும் பார்க்கக்கூடியதாக இருக்கின்றது.

இந்த நாட்டைப் பொறுத்தளவிலே, வாகன நெரிசல் நாளுக்குநாள் அதிகரித்தவண்ணம் இருக்கின்றது. இதன் காரணமாக மக்களின் இயல்பு வாழ்க்கை குலைந்துபோவதைக் காணலாம். விசேடமாக கொழும்பு, கண்டி போன்ற பிரதான நகரங்களில் வாகன நெரிசல் மிக அதிகமாக இருப்பதன் காரணமாக, அங்குள்ள மக்கள் தங்களது அன்றாடத் தேவைகளைப் பூர்த்திசெய்துகொள்வதில் பல்வேறு தடங்கல் களையும் இடைஞ்சல்களையும் எதிர்நோக்குகின்றனர். ஆகவே, வாகன நெரிசலைக் குறைக்க வேண்டுமெனில், அதற்கு மாற்றுவழியாக அதிகளவு மேம்பாலங்களை அமைக்கின்ற திட்டத்தை முன்னெடுக்க வேண்டும். அதன்மூலமும் இந்த வாகன நெரிசல் பிரச்சினையிலிருந்து விடுபடக்கூடியதாக இருக்கும்.

அமைச்சின் ஓர் அங்கமாக இருந்து செற்பட்டுக் கொண்டிருக்கின்ற வீதி அபிவிருத்தி அதிகாரசபையானது தனது செயற்பாடுகளை இன்னும் அதிகம் விஸ்தரிக்க வேண்டிய ஒரு காலகட்டத்திலே இருக்கின்றது. ஆனால், அதற்கு நிதிப் பற்றாக்குறை இருக்கின்றது என்பது எமக்குத் தெரியும். அதாவது, வீதி அபிவிருத்தி அதிகாரசபையின் செயற்பாடுகளுக்குத் தடையாக இருப்பது நிதி நெருக்கடி யாகும். இதன் காரணமாகவே குறித்த அபிவிருத்தி வேலைகளில் பாரிய தடை ஏற்பட்டிருக்கின்றது. நாட்டிலுள்ள பெரும்பாலான பிரதான வீதிகள் அபிவிருத்தி செய்யப் பட்டிருக்கின்றன. ஆனால், இரண்டாம் மூன்றாம் நான்காம் தர வீதிகளை எடுத்துக்கொண்டால் இன்னும் அவை அபிவிருத்தி செய்யப்படவேண்டிய நிலையில் இருக்கின்றன. ஆகவே, முன்னுரிமை அடிப்படையில் அவற்றைத் திருத்துவதற்கான நடவடிக்கைகளைக் கட்டாயம் மேற்கொள்ளவேண்டிய தேவை இருக்கின்றது.

நான் பிரதிநிதித்துவப்படுத்தும் பதுளை மாவட்டத்தைப் பொறுத்தளவிலே, அங்குள்ள பல பிரதான வீதிகள் இன்னும் செப்பனிடப்படாத நிலையில் இருக்கின்றன. அதன் காரணமாகவே அங்கு தரமான போக்குவரத்து வசதிகளை மேற்கொள்ள முடியாத ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. உதாரணமாகப் பல பாதைகளைக் குறிப்பிடலாம். பெரகலையிலிருந்து வெல்லவாயவுக்குச் செல்லும் பாதை, பண்டாரவளை நகரிலிருந்து பூணகலைக்குச் செல்லும் பாதை, எல்ல பிரதேசத்திலிருந்து நமுணுகல ஊடாக பசறை நகருக்குச் செல்லும் பாதை, பசறையிலிருந்து மடுல்சிம நகரத்துக்குச் செல்லும் பாதை, வெலிமடையிலிருந்து உடபுசல்லாவைக்குச் செல்லும் பாதை, ஹாலிஎல நகரிலிருந்து சாரணியா மற்றும் நாரங்கல பகுதிக்குச் செல்லும் பாதை, ரேந்தபொல நகரிலிருந்து அம்பேவல வரை செல்லும் பாதை என்பன மிகப் பிரதான பாதைகளாகும். ஆனால், அவை இன்னும் செப்பனிடப்படாமல் இருப்பதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. குறித்த அமைச்சாக இருக்கலாம், அதிகார சபையாக இருக்கலாம். எதுவாக இருந்தாலும் இந்த வீதிகள் தொடர்பில் சம்பந்தப்பட்ட நிறுவனங்கள் மிக அதிக கவனம் செலுத்த வேண்டும் என்று இந்த உயரிய சபையினூடாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

நுவரெலியா மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு லிந்துலவில் இருந்து டயகம வரை உள்ள பாதை, ரதல்ல ஊடாக நானுஓயா வரையான பிரதான பாதை, நுவரெலியா விலிருந்து உடபுசல்லாவைக்குச் செல்லும் பாதை, புரூக்சைட்டிலிருந்து கோனப்பிட்டிய வரை செல்லும் பாதை, பத்தனையிலிருந்து நாவலப்பிட்டி வரை செல்லும் பாதை என்பன இன்னும் செப்பனிடப்படாமல் இருக்கின்றன. இதனால் மக்கள் பல்வேறு அசௌகரியங்களைச் சந்தித்துக் கொண்டிருக்கின்றார்கள். இந்த நாட்டிலே தோட்டப் புறங்களில் மாத்திரம்தான் மிக மோசமான நிலையில் வீதிகள் சீர்கெட்டுப்போய் இருக்கின்றன. நோயாளிகளைக்கூட அவசரமாக வைத்திசாலைக்குக் கொண்டுசெல்ல முடியாத அவல நிலைமை அங்கு காணப்படுகின்றது.

தோட்டப்புற மக்களைப் பொறுத்தளவிலே அவர்கள் கடின உழைப்பாளிகளாவர். நாட்டுக்கு அந்நியச் செலாவணியை ஈட்டித் தருவதிலே தோட்டத் தொழிலாளர்கள் முதன்மை யானவர் ஷகளாக விளங்குகிறார்கள். ஆகவே, தோட்டத் தொழிலாளர்கள் வசிக்கும் பிரதேசங்கள் அபிவிருத்தி செய்யப்பட வேண்டும்; அவர்களின் ஊதியம் அதிகரிக்கப்பட வேண்டும்; அவர்களுக்கு தொழிலுக்கேற்ற ஊதியம் வழங்கப்பட வேண்டும். இவ்வாறு செய்வதுதான் தோட்டத் தொழிலாளர்களை கௌரவப்படுத்தியதாகவும், அவர்களின் வாழ்வாதாரப் பிரச்சினைக்கு ஒரு தீர்வை ஏற்படுத்தியதாகவும் அமையும்.

முன்னைய அரசாங்க காலத்தின்போது பாதைகள் மிக வேகமாக அபிவிருத்தி செய்யப்பட்டன; சீர்திருத்தம் செய்யப் பட்டன. ஆனால், இன்று எமது அரசாங்கத்தினூடாக பாதைகளின் சீர்திருத்தமானது மந்த கதியிலே இடம் பெறுகின்றன என்பதாக இன்று மக்கள் மத்தியில் பொதுவான ஓர் அபிப்பிராயம் இருக்கின்றது. இதனை நான் நல்ல அபிப்பிராயமாகப் பார்க்கவில்லை. ஆகவே, இந்த நிலைப்பாட்டில் மாற்றத்தை ஏற்படுத்த வேண்டுமெனில், மிக வேகமாக இயங்க வேண்டிய தேவை இருக்கின்றது; அவசியமிருக்கின்றது.

வீதி அபிவிருத்தி அதிகாரசபையின் தலைவரான பொறியியலாளர் நிஹால் சூரியாரச்சி அவர்கள் மிகத் திறமையானவர்; சுறுசுறுப்பாக இயங்கக்கூடியவர்; அனைவருடனும் அந்நியோன்னியமாகப் பழகக்கூடிய தன்மை யுடையவர். இந்த அதிகாரசபை அவரின் தலைமையிலே மிகச் சிறப்பாக இயங்கக்கூடிய நிலைமையை நாங்கள் ஏற்படுத்த வேண்டும். ஆகவே, நாம் அனைவரும் இந்த அதிகாரசபைக்குத் துணையாக இருந்து செயற்படுவது மக்களின் தேவைகளைப் பூர்த்தி செய்துகொள்வதற்கு பெரும் வாய்ப்பாகவும் சௌகரியமாகவும் அமையும் எனக் கூறிக்கொண்டு, வாய்ப்பளித்த உங்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Hon. (Dr.) Nalinda Jayathissa - *[Not in the Chamber.]*

Next, the Hon. Prasanna Ranaweera.

[අ.භා. 3.32]

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සාකච්ඡාවට බඳුන් වන සක්‍රීය වගකීම් කළමනාකරණ පනත යටතේ යෝජනාව සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මෙම පනත ලංකාවේ ණය කළමනාකරණය සඳහා ගෙනා පනතක්. අද වෙනකොට ණය කළමනාකරණය කෙසේ වෙතත්, 2005 මහින්ද රාජපක්ෂ මැතිතුමා රජය භාර ගන්නා වෙලාවේ සමස්ත ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 2යි. 2005 සිට 2015 දක්වා ඒ ආණ්ඩුව වසර දහයක් ඇතුළත ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන හතක් දක්වායි වැඩි වුණේ. හැබැයි අපි ඒ වසර 10 ක කාලය තුළ ගත් රුපියල් ට්‍රිලියන පහක ණයවලින් අධිවේගී මාර්ග, පාසල් පද්ධතිය , සෞඛ්‍යය, මං මාවත්, විදුලි බලාගාර, වරායවල්, ගුවන් තොටුපොළවල් ඇති කරමින් ඇහැට පෙනෙන, ඇහට දැනෙන විශාල දැවැන්ත සංවර්ධනයක් මේ රටේ කළා.

මේ රටේ දැවැන්ත සංවර්ධනයක් හා හොරකම, නාස්තිය, දූෂණය වළක්වා මහින්දලා කළා වාගේ දහ ගුණයක් කරන්නට ඊට පස්සේ ආපු යහ පාලන ආණ්ඩුව පසුගිය වසර හතරට ගත් ණය ප්‍රමාණය නිසා ඒ රුපියල් ට්‍රිලියන 7 රුපියල් ට්‍රිලියන 12 දක්වා වැඩි වුණා. කරපු එක වැඩක් නැහැ; හොරකම විතරයි. ජනවාරි 8 වැනිදා බලයට ආවා. පෙබරවාරි 27 වැනිදා, ලංකා ඉතිහාසයේ මහ හොරකම, බැඳුම්කර සිද්ධිය, ඇති වුණා. මේ රටේ රාජ්‍ය පාලකයෝ එකතු වෙලා මහ බැංකුව අමු දවාලේ මංකොල්ල කනකොට මේ රටට ආයෝජකයන් එයිද? ආයෝජකයන් තුළ මේ රට ගැන විශ්වසනීයභාවයක් ඇති වෙයිද? නැහැ. ඒ තුළ කඩාවැටෙන්නට ගත් මේ ආර්ථිකය; එදා රුපියල් 131 ට තිබුණු ඩොලරය අද රුපියල් 174 දක්වා වැඩි වෙලා තිබෙනවා. කොහොමද, ආර්ථික ඔස්තාර්ලාගේ ආර්ථික කළමනාකරණය? එදා චම්පිකලා වේදිකාවල කිව්වේ කොහොමද ? රාජපක්ෂලා ගන්න තෙල්වල බදු ප්‍රමාණයෙන් මේ රටේ ත්‍රී වීල් පදවන මල්ලිලා නංගිලාට තෙල් සහන දෙන්න පුළුවන් කිව්වා. කෝ? අද චම්පිකලා ඇටි කෙහෙල් කාපු

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගෙයි; කථා නැහැ. මහලොකු ආර්ථික ඔස්තාර්ලාගේ ආර්ථික කළමනාකරණය කෝ? 1977 සිට දිගටම රුපියල අවප්‍රමාණය වුණා; මස්තබාල්දු වුණා. හැබැයි 1987-1996 කාලය තුළ යුද්ධයත්, රටේ දකුණේ ත්‍රස්තවාදයත් එක්ක එදා සියයට 7.4කට තමයි රුපියල මස්තබාල්දු වුණේ.

1996-2002 දක්වා කාලය තුළ රුපියල සියයට 6කින් මස්තබාල්දු වුණා. මහින්ද රාජපක්ෂ යුගයේ මේ රටේ දැවැන්ත යුද්ධයක් තියාගෙනත්, දැවැන්ත ආර්ථික සංවර්ධනයක් කරා ගිය ගමනේදීත් එතුමාගේ වසර 10ක පාලන කාලය තුළ රුපියලේ අගය සියයට 2.8කින් තමයි අවප්‍රමාණය වුණේ. ඊට පස්සේ 2015 ජනවාරි 08වැනි දා මේ රටේ පාලන බලය ආර්ථික ඔස්තාර්ලා ගත්තා. 2015 ජනවාරි 08වැනි දා රුපියල් 131ට තිබුණු ඇමෙරිකානු ඩොලරය අද වන විට රුපියල් 174 දක්වා වැඩි වෙලා තිබෙනවා. තවම මේ වර්ෂය අවසානත් නැහැ. නමුත්, මේ වන විට රුපියල් 43කින් රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා. මේ වර්ෂය අවසාන වන විට ඇමෙරිකානු ඩොලරය රුපියල් 200කට ආසන්න ප්‍රමාණයකට ඉහළ යන්න පුළුවන්. මෙන්න බලන්න, මේ රටේ ආර්ථික ඔස්තාර්ලාගේ ආර්ථික කළමනාකරණ හැකියාව. මෙතුමන්ලා බලයට එන්න කලින් මේ රටේ පාරිභෝගික ජනතාවට මහ ලොකුවට කිව්වේ කොහොමද? "අපි සෘජු බදු වැඩි කරලා, වක්‍ර බදු අඩු කරනවා" කියලා කිව්වා. නමුත්, රුපියල කළමනාකරණය කරන්න බැරිවීම නිසා මේ රටේ දුප්පත් අහිංසක පාරිභෝගික ජනතාවට ගෙවන්න වුණ වියදම් ටික දිහා බලන්න. මේ රටේ මිනිසුන්ගේ අවශ්‍යතාවන්ට පිට රටින් භාණ්ඩ ආනයනය කරනවා. එළවලු, වියළි ආහාර, පිටි නිෂ්පාදන වර්ග, මාළු ආහාර වර්ග, කුළු බඩු වර්ග, පලතුරු, බීම වර්ග ආදී අත්‍යවශ්‍ය භාණ්ඩ ටික මේ රටට ආනයනය කරන්න අපට වර්ෂයකට US Dollars මිලියන 1,841ක් වියදම් වෙනවා. මේ කුළු බඩු ටික සහ අත්‍යවශ්‍ය භාණ්ඩ ටික අපේ රටට ආනයනය කරන්න US Dollars මිලියන 1,841ක් යනවා. ඇමෙරිකානු ඩොලර් එකකට අපි වැඩිපුර රුපියල් 43ක් ගෙවන්න වෙලා තිබෙනවා. එතකොට **US** Dollars මිලියන 1,841ක ගණන, ඩොලරයේ අගය වැඩි වුණ රුපියල් 43න් වැඩි කළාම අපේ අහිංසක දුප්පත් පාරිභෝගික ජනතාව රුපියල් කෝටි 7,500ක් වැඩිපුර ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ තත්ත්වයට අපේ රට පත් වුණේ මේ රුපියල මස්තබාල්දුවීම නිසයි.

2017ට සාපේක්ෂව මේ රටේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන් අත්‍යවශ්‍ය භාණ්ඩවලට අමතරව පාරිභෝගික භාණ්ඩත් ගෙන්වා තිබෙනවා. ඖෂධ වර්ග, ගෘහ උපකරණ, වාහන, ඇඳුම් පැලඳුම්, පොත් පත්, දුරකථන ආදී භාණ්ඩ වර්ග සඳහා අපට වර්ෂයකට US Dollars මිලියන 2,661ක් යනවා. මේ මුදල ඩොලරය වැඩි වෙලා තිබෙන රුපියල් 43න් වැඩි කළාම කීය ද? පාඩුව කෝටි 11,000යි. එතකොට අත්‍යවශ්‍ය භාණ්ඩ ගෙන්වීම තුළින් පාඩුව කෝටි 7,500යි, පාරිභෝගික භාණ්ඩ ගෙන්වීම වෙනුවෙන් කෝටි 11,000යි එකතු කළාම කෝටි 18,500ක් මේ රටේ ජනතාවට ගෙවන්න වෙලා තිබෙනවා, රුපියල මස්තබාල්දුවීම නිසා. හම්බන්තොට වරාය අවුරුදු 99කට විකුණලා ගත්ත මුදලට වඩා වැඩියි මේ ණය ප්‍රමාණය. ඒ මුදල හම්බන්තොට වරාය අවුරුදු 99කට බදු දීලා චීනයෙන් ගත්ත මුදලට වඩා වැඩියි. කොහොමද ආර්ථික ඔස්තාර්ලාගේ හැකියාව? අද හම්බන්තොට වරාය විකුණලා ගත්ත මුදලේ ණය ගෙව්වා ද? ණය ප්‍රමාණය අඩු වුණා ද? නැහැ. ඒවා කාබාසිනියා කරලා ඉවරයි. ජාතියට, අනාගත පරපුරට, අපේ මතු උපදින්න ඉන්න දරුවන්ට තිබුණු ඒ භූමියත් මේ රටේ ආර්ථික ඔස්තාර්ලාගේ ආර්ථික කළමනාකරණය නිසා ඉවර කළා. පසුගිය වසර 4 ඇතුළත ඩොලරයේ වෙනස්වීම නිසා පාඩුව කෝටි 18,500යි. පසුගිය දවස් දෙකේ රුපියල මස්තබාල්දුවීම තුළ පමණක් බිලියන 55ක් ගෙවන්න වුණා. ගිය සතියේ රුපියල අවප්‍රමාණය වීම තුළ අපට ගෙවන්න වුණු ණය ප්‍රමාණයේ මුදලට සමානයි කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය හදන්න ගිය මුදලට. අද කියනවා, "ඇමෙරිකාවේ ආර්ථිකය ශක්තිමත්වීම තුළ අද අපේ රුපියල ඇතුළු සියල්ල මස්තබාල්දු වුණා" කියලා. එහෙම නම් ආණ්ඩුවක් ගන්න ඕනෑ යැ. මහ ලොකු ඔස්තාර්ලා ආණ්ඩුව ගත්තේ ඔක කරන්න යැ.

මේ රටේ ආර්ථිකය ලස්සනට කළමනාකරණය කරලා, මේ රටේ ජනතාවට සහන ලබාදීලා සුබිත මුදිත ජීවිතයක් ඇති කරනවා කියලා, තරුණ තරුණියන්ට රැකී රක්ෂා දස ලක්ෂයක් දෙනවා කියලා කියාගෙන ආපු ආණ්ඩුවක් නේ මේක. Free Wi-Fi දෙනවා කියලා, නංගිලාට පුංචි කාර් දෙනවා කියලා ආපු ආණ්ඩුව ගහපු කෙළිය කොහොම ද? අද වන විට පුංචි කාර් එකට duty ගැහීම කොහොමද? මේක ද, ආර්ථික කළමනාකරණය? ඒ නිසා අපි මේ ආණ්ඩුවට බොහොම පැහැදිලිව කියනවා, ආර්ථිකය කළමනාකරණය කරන්නවත්, මේ රට ඉදිරියට ගෙනියන්නවත් මේ ආණ්ඩුවට බැහැ කියලා. මේ යහ පාලන ආණ්ඩුවේ හොර නඩය මේ රටේ වර්ග කිලෝමීටර් 65,610ක් වූ භූමිය එකට එකතු කරලා වික්කත්, මේ රට ගොඩ ගන්න මේ ආණ්ඩුවට බැහැයි

කියන එකත් මම ප්‍රකාශ කරන්න ඕනෑ. ඉදිරියේදී මේ ආණ්ඩුව ගෙදර යවන සටනට එක්සත් ජාතික පක්ෂයේ ප්‍රගතිශීලී තරුණ තරුණියන්ට අපි ආරාධනා කරමින් මේ අවස්ථාවේදී මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා කථා කරන්න.

[ප.ව. 3.41]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இங்கு விவாதத்திற்கு எடுத்துக் கொள்ளப்பட்டிருக்கின்ற தீவிர பொறுப்பு முகாமைத்துவச் சட்டத்தின் கீழான தீர்மானம், நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சின் குறைநிரப்புத் தொகை என்பன தொடர்பிலான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவிக்கின்றேன். பொறுப்புடமை முகாமை என்கின்றபோது, கடன் பெறுவதில், கடன் வழங்குவதில் திறைசேரி மேற்பார்வை செய்கின்ற நிறுவனங்களின் பொறுப்புடைமையை அவதானிப்பது தொடர்பிலும் திறைசேரிக்கு முக்கிய பங்கிருக்கின்றது. அந்த வகையில் பெருந்தோட்ட மனிதவள அபிவிருத்தி நிதியத்தின் பணிப்பாளர் சபையில் நிதியமைச்சின் பிரதிநிதியாகத் திறைசேரியின் ஓர் உறுப்பினர் இருக்கின்றார். ஆகவே, அந்த உறுப்பினருக்கு அல்லது திறைசேரிக்குப் பெருந்தோட்ட மனிதவள அபிவிருத்தி நிதியம் தொடர்பில் பொறுப்பு இருக்கின்றது. பெருந்தோட்டப் பிராந்தியக் கம்பனிகள் மாதாந்தம் தங்களது வருமானத்தின் ஒரு பகுதியைத் தோட்டத் தொழிலாளர்களின் சேமநலன்களைக் கவனிப்பதற்காக உருவாக்கப்பட்டிருக்கும் நிதியத்திற்குச் செலுத்தவேண்டும். ஆனால், அந்தப் பணத் தொகையை உரியமுறையில் செலுத்தாத பெருந்தோட்டப் பிராந்தியக் கம்பனிகள் இன்று 400 மில்லியன் ரூபாவை செலுத்த வேண்டியிருக்கின்றது. எனவே, அந்தப் பெருந்தோட்டப் பிராந்தியக் கம்பனிகள் எவ்வாறு பெருந்தோட்டத் தொழிலாளர்களின் சேமநல விடயங்களில் கவனம் செலுத்தும் என்று நான் வினா எழுப்ப வேண்டியிருக்கின்றது. ஆகவே, இது சம்பந்தமாக மேற்பார்வை செய்யவேண்டிய பொறுப்பு திறைசேரிக்கு இருக்கின்றது.

நான் இந்தப் பொறுப்புடைமை பற்றி நினைவுபடுத்துவதற்குக் காரணம் இருக்கின்றது. ஏனெனில், தோட்டத் தொழிலாளர்களுக்கு வழங்க வேண்டிய சம்பளத்தின் ஒரு பகுதியை தாங்கள் பணமாக வழங்காது, தோட்டத் தொழிலாளர்களின் உட்கட்டுமான வசதிகளை மேம்படுத்துவதற்காக பயன்படுத்துகின்றோம் என்று அவர்கள் சொல்லி வருகின்றார்கள். சம்பளப் பேச்சுவார்த்தைகளின்போது, தோட்டத்தொழிலாளர்களின் சேமநல விடயங்களுக்காகத் தாங்கள் ஒரு தொகை நிதியை ஒதுக்கீடு செய்வதாகச் சொல்கின்ற இந்தக் கம்பனிகள், அப்படிச் செலுத்துவதானால் அதனை முறையாகச் செலுத்த வேண்டும். ஆனால், இன்றைய நாட்களில் தோட்டத் தொழிலாளர்கள் வாழுகின்ற பகுதிகளில் உட்கட்டுமான வசதிகளையும் வீடமைப்பு வசதிகளையும் செய்வதற்கு, அரசாங்கம் என்ற வகையிலே, கௌரவ அமைச்சர் திகாம்பரம் அவர்களின் மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சின் ஊடாகவே பல்வேறு வேலைத்திட்டங்களும் முன்னெடுக்கப்பட்டு வருகின்றன. எனவே, அத்தகைய பொறுப்பிலிருந்து விலகியிருக்கும் பெருந்தோட்டப் பிராந்தியக் கம்பனிகள் இவ்வாறு அந்தச் சேமநல விடயங்களுக்குக் கொடுக்காமல் இருக்கின்ற 400 மில்லியன் ரூபாய்களை செலுத்துவதன் மூலமாக, தோட்டத் தொழிலாளர்களின் 1000 ரூபாய் சம்பளக் கோரிக்கையை நிச்சயமாக நிறைவேற்ற முடியும். ஆனால், அவர்கள் வேறாக ஓர் உடன்படிக்கையைச் செய்து கொள்கிறார்கள். இந்தத் தகவலை யாரும் வெளியிலே சொல்வதில்லை. அத்தகைய உடன்படிக்கை 2 ஆவது உடன்படிக்கையாக இந்தக் கூட்டு ஒப்பந்தத் தரப்பினரிடையே மேற்கொள்ளப்படுகின்றதெனக் கூட்டு ஒப்பந்தத்தில் கைச்சாத்திடுகின்ற இலங்கைத் தேசியத் தோட்டத் தொழிலாளர் சங்கத்தின் பொதுச் செயலாளரும் பாராளுமன்ற உறுப்பினருமான வடிவேல் சுரேஷ் அவர்கள் ஊடகங்களிலே தெரிவித்த கருத்தினை ஆதாரபூர்வமாக ஊடக விவாதம் ஒன்றின்போது நான் தெரிவித்திருந்தேன்.

அந்த விவாதத்தில் கலந்துகொண்ட கூட்டு ஒப்பந்தத்தில் கைச்சாத்திடுகின்ற இலங்கைத் தொழிலாளர் காங்கிரஸின் உப தலைவர் அருள்சாமி அவர்கள் அத்தகைய ஒப்பந்தமொன்று செய்யப்படுவதில்லை எனச் சொன்னார். எனவே, ஒப்பந்தத்தில் கைச்சாத்திடுகின்ற இரண்டு தரப்பினர் ஒன்றுக்கு ஒன்று முரணான தகவலைத் தெரிவிக்கின்றார்கள். அவ்வாறு சேமநலன்களைக் கவனிப்பதற்கான குறிப்பிட்ட ஒப்பந்தம் ஒன்று செய்யப்படுகிறதென்றும் செய்யப்படவில்லையென்றும் அவர்கள் சொல்கின்றார்கள். ஆகவே, இந்த விடயம் பாராளுமன்றத்தில் விவாதிக்கப்பட வேண்டியது. அந்த நிதியத்தின் ஓர் உறுப்பினர் என்ற வகையிலே, திறைசேரிக்கும் இதில் பாரிய பொறுப்பு இருக்கிறது. ஆகவே, 400 மில்லியன் ரூபாய் செலுத்தப்படாதது தொடர்பிலும் ஒவ்வொரு காலமும் அதனை இவர்கள் கொடுத்திருக்கிறார்களா? இல்லையா? என்பது பற்றியும் அறிக்கையிடப்பட வேண்டும். பெருந்தோட்ட நிதியம் தனியார் கம்பனிச் சட்டத்தின்கீழ் பதிவு செய்யப்பட்டிருக்கின்றதென்ற வகையில், அது பாராளுமன்றத்திற்குப் பொறுப்புக் கூறக்கூடிய வகையில் கணக்குகளைக் கொண்டிருப்பதில்லை. அது தனியார் கம்பனிகள் சம்பந்தப்பட்டது என்கின்ற வகையில்தான் அது சம்பந்தமான கணக்குகள் பதியப்படுகின்றன. எனவே, இந்த விடயங்கள் தொடர்பில் திறைசேரி உறுப்பினர் கேள்வி எழுப்பி, அது பற்றிய விபரங்களை பாராளுமன்றத்திற்கு அறிவிக்க வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

இந்தச் சபையில் சம்பளம் தொடர்பாக இராஜாங்க அமைச்சர் ஹர்ஷ த சில்வா அவர்கள் சொன்ன கருத்துக்களுக்கு எங்களால் உடன்பட முடியாமல் இருக்கின்றது. ஏனெனில், 805 ரூபாய் என்பது ஒரு நாமத் தொகை. அவ்வாறான ஒரு தொகை கிடைக்கப்பெறுவதாக கணக்குக் காட்டுகிறார்களே தவிர, அது உண்மையாகக் கிடைக்கப் பெறுவதில்லை. அதைப் பற்றிய தெளிவான விளக்கத்தைத் தெரிவித்த மக்கள் விடுதலை முன்னணியின் பாராளுமன்ற உறுப்பினர் விஜித ஹேரத் அவர்களுக்கு நன்றி தெரிவிக்க வேண்டும். அதற்கு மேலதிகமாகவும் ஒரு சில விடயங்களைச் சொல்லிவைக்க விரும்புகின்றேன். இந்தச் சம்பளப் பேச்சுவார்த்தையில் ஈடுபடுகின்ற தொழிற் சங்கங்களில் இலங்கைத் தொழிலாளர் காங்கிரஸ், இலங்கைத் தேசிய தோட்டத் தொழிலாளர் சங்கம் அதேபோல கூட்டுக் கமிட்டி ஆகிய தொழிற்சங்கங்கள் இடம்பெற்றிருக்கின்ற

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

වේලයියිලේ, இந்தச் சம்பள விடயம் தொடர்பான எந்தவிதப் பேச்சுவார்த்தைகளும் இந்தப் பாராளுமன்றத்தில் இடம்பெறுவ தில்லை. பாராளுமன்றத்திற்கு வெளியேதான் முதலாளிமார் சம்மேளனத்திற்கும் அதேபோல கூட்டு ஒப்பந்தத்திலே கைச்சாத்திடுகின்ற தொழிற்சங்கங்களுக்கும் இடையில் பேச்சுவார்த்தைகள் இடம்பெற்று வருகின்றன. எனவே, இது பாராளுமன்றத்தில் பேசப்படாத ஒரு விடயமாக இருக்கின்ற போது, இலங்கைத் தொழிலாளர் காங்கிரஸின் தலைவர் ஆறுமுகன் தொண்டமான் அவர்கள் பாராளுமன்ற உறுப்பினர் பதவியிலிருந்து விலகுவதாகக் கூறி நாடகமாடுகின்றார். அவர் இதனூடாகச் சொல்லவருவது என்ன? ஆறுமுகன் தொண்டமான் அவர்கள் பாராளுமன்ற உறுப்பினர் பதவியிலிருந்து விலகுவதுதான் முடிவெனில், அதைச் செய்யட்டும்! இந்த முடிவுதான் மலையகத்தின் விடிவு! இதைத்தான் காலிமுகத்திடலிலே அன்று கூடியிருந்த அத்தனை இளைஞர், யுவதிகளும் கோரினார்கள். ஆகவே, உங்கள் முடிவு தாராளமானதாக இருக்கும்! அந்த முடிவுதான் மலையக மக்களின் விடிவு! அதுமாத்திரமல்ல, இந்த நாடகத்தினூடாக இவர்கள் அரங்கேற்ற நினைப்பது என்னவென்று எங்களுக்குத் தெரியும்.

கௌரவ உறுப்பினர் அவர்களே! உங்களது மாமனாரான முன்னாள் பாராளுமன்ற உறுப்பினர் அண்ணாமலை அவர்களின் மகளை இப்போது நீங்கள் கட்சியின் செயலாளராக்கியிருக்கின்றீர்கள். நீங்கள் இங்கு விலகிக் கொண்டால் அந்த இடத்திற்கு அனுஷா சிவராசா வரப்போகின்றார்! உங்கள் திட்டம் அப்படித்தான் அமைந்திருக்கின்றது. மக்களுக்காக இதைச் செய்வீர்களாக இருந்தால், நீங்கள் பதவி விலகுவது மாத்திரமல்ல, இலங்கைத் தொழிலாளர் காங்கிரஸ் ஊடாக உங்களது வாக்குகளோடு சேர்ந்து பாராளுமன்றத்துக்கு வந்த பிரதியமைச்சர் முத்து சிவலிங்கம் அவர்களும் பதவி விலகவேண்டும்; நீங்கள் பாராளுமன்றத்திற்குக் கொண்டுவருவதற்குத் திட்டமிட்டிருக் கின்ற அனுஷா சிவராஜா அவர்கள் பாராளுமன்றத்திற்கு வராமலிருக்க வேண்டும். இத்தகைய முடிவுகளை எடுங்கள்! இதுதான் மலையகத்தின் விடிவுக்கான ஒரேயொரு விடயம் என்பதை நான் இந்த இளைஞர்களின் சார்பாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். ஆனால், நீங்கள் செய்வது ஒட்டுமொத்தத்தில் ஒரு நாடகம்! இந்த நாடகத்தின் ஊடாக - தாங்கள் பதவி விலகிவிட்டதன் ஊடாகப் பொதுமக்களுக்காக ஏதோ ஒரு வரலாற்றுச் சாதனையை ஏற்படுத்தவிருப்பதாக இவர்கள் சொல்கின்றார்கள். சௌமியமூர்த்தி தொண்டமான் அவர்களின் நினைவு நாளில் அந்தப் பதவி விலகலைச் செய்யப் போவதாகவும் அறிவிக்கின்றார்கள். நிச்சயமாகச் செய்யுங்கள்! அது நினைவு நாள் மாத்திரமல்ல, மலையக மக்களின் வாழ்க்கையில் ஒரு நன்னாளாகவும் இருந்துவிட்டுப் போகட்டும்! அந்த நன்னாளிலிருந்து மலையக மக்களின் மறுவாழ்வு ஆரம்பிக்கட்டும்!

இன்று இளைஞர், யுவதிகள் என எல்லோரும் காலிமுகத்திடலிலேயும் வீதி எங்கிலும் நகரம் எங்கிலும் கூடிநின்று கோருவது நீங்கள் கூட்டு ஒப்பந்தத்திலிருந்து விலகுங்கள் என்றுதான். எனவே, தெளிவாக விளங்கிக் கொள்ளுங்கள்! மக்களின் கோரிக்கை நீங்கள் கூட்டு ஒப்பந்தத்திலிருந்து விலக வேண்டும் என்பதே! நீங்கள், ஒன்றுக்கும் பிரயோசனமில்லாமல் வகிக்கும் இந்தப் பாராளுமன்றப் பதவியில் இருந்து எதைச் சாதித்துக் காட்டியிருக்கின்றீர்கள்! பாராளுமன்றத்துக்கு வந்து, எத்தனை நாள், எத்தனை விடயங்களை முன்வைத்திருக்கின்றீர்கள்! பாராளுமன்ற உறுப்பினர் பதவியில் நீங்கள் இருந்தால் என்ன? இல்லாவிட்டால் என்ன? அதைப்பற்றி மக்களுக்கு அக்கறையில்லை. உண்மையில் மக்கள்மீது அக்கறையிருந்தால், எவ்வித பொறுப்புமில்லாமல் ஒன்றுக்கு இரண்டு என இரகசிய ஒப்பந்தங்கள் செய்துகொள்வதை விடுத்து, கூட்டு ஒப்பந்தத்திலிருந்து விலகுங்கள்! இன்று மலையகத்திற்குத் தலைமை கொடுக்க வந்திருக்கும் இளைஞர் கூட்டமாகிய நாங்கள் பொறுப்புவாய்ந்தவர்கள் என்ற வகையில் எங்களது பாதை என்ன என்பதைத் தீர்மானிப்பதற்குத் தயாராக இருக்கின்றோம்! தொடர்ந்தும் இந்த ஏமாற்றுக் கூட்டு ஒப்பந்தம் குறித்து நீங்கள் வெவ்வேறு விதமாக நாடகமாடுவது பற்றி நிச்சயமாக நாங்கள் அம்பலப்படுத்துவோம்!

பாராளுமன்ற உறுப்பினர் வடிவேல் சுரேஸ் அவர்களிடம் ஒரு முக்கியமான விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். நான் அவருக்கு நன்றி தெரிவிக்க வேண்டும். ஏனெனில், இத்தனை 23 வருட காலமாக இரண்டாவது ஒப்பந்தமாக ஓர் இரகசிய - மறைமுக ஒப்பந்தம் செய்யப்பட்டு வந்திருக்கின்றது. அதைப் பற்றி இலங்கைத் தொழிலாளர் காங்கிரஸ் எங்கும் வாய்திறக்காமல் இருந்தது. ஆனால், கடந்த வருடம் இலங்கைத் தேசியத் தோட்டத் தொழிலாளர் சங்கத்தின் பொதுச் செயலாளர் பதவியை ஏற்றுக்கொண்ட வடிவேல் சுரேஷ் அவர்கள் கடந்த வாரம் ஊடகங்களிலே இத்தகைய இரண்டாவது ஒப்பந்தமொன்று செய்யப்படுவது பற்றிச் சொல்லியிருந்தார். "இன்று மாட்டைப் பிடித்துவிட்டார்களாம்! இனித்தான் கயிறு வாங்க வேண்டுமாம்!" என்று இவர்கள் சொல்கின்றார்கள். ஆனால், கயிறு கம்பனி முதலாளிமாரின் கையில் இருக்கின்றது. இவர்கள் மாடுகளாக அந்த ஒப்பந்தத்தின் பின்னால் சுற்றிக் கொண்டிருக்கின்றார்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
நன்றி! உங்களது நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
எனவே, இந்தக் கதையை விட்டு விட்டு, மாடுகளாக ஒப்பந்தத்தின் பின்னால் சுற்றாமல், கயிறுகளைப் பிடித்துக் கொண்டிருக்கும் முதலாளிமார் சம்மேளனத்திடமிருந்து தோட்டத் தொழிலாளர்களுக்கு உரிய சம்பளத்தைப் பெற்றுக் கொடுப்பதற்கு உரிய தரப்பு உரிய முடிவுகளை எடுக்க வேண்டுமென்று கேட்டு, வாய்ப்புக்கு நன்றி கூறி விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා. 3.50]

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සාකච්ඡාවට බඳුන් වන සඤ්ඤ වගකීම් කළමනාකරණ පනත යටතේ වූ යෝජනාව සම්බන්ධව අදහස් පළ කිරීමට ලැබීම ගැන මම සතුටු වෙනවා. මේ පිළිබඳව අද දවසේ කළ කථාවලට අනුව, අපට මේ රටේ ආර්ථිකය පිළිබඳ චිත්‍රයක් පෙනෙනවා. බොහෝ අය ප්‍රකාශ කරන විධියට අද වන විට මේ ආර්ථිකය දුර්වල මට්ටමකයි පවතින්නේ. ඒකට හේතු වුණු එක කාරණයක් තමයි, අපට දේශීය සහ විදේශීය වශයෙන් විශාල ණය කන්දරාවක් ගෙවන්නට සිද්ධ වෙලා තිබීම. ඒ වාගේම, මේ රටේ දේශීය මුදලේ විදේශීය අගය අඩු වෙනවා.

තවත් පැත්තකින් අද රැකියා වියුක්තිය වැඩි වෙලා තිබෙනවා. ජීවන වියදම වැඩිවෙගෙන යනවා. රටේ බඩු මිල ඉහළ යනවා. එම නිසා, මිනිසුන්ට ජීවත් වීමේ ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක පැත්තකින් රටේ ජනාධිපතිතුමා සහ අගමැතිතුමා අතර යම් ප්‍රශ්නයක් තිබෙනවාය කියලා අපි මාධ්‍ය හරහා දකිනවා. ජනාධිපතිතුමා මාධ්‍ය හමුවේ ප්‍රකාශ කරනවා, මූල්‍ය විනය කියන එක නිවසකටත් අදාළ කර ගන්න කියලා, මූල්‍ය විනය නිවසින් ආරම්භ කරන්න කියලා. එතුමා ඒකෙන් අදහස් කරන්නේ මේ රටේ මූල්‍ය විනය බරපතළ බාදනයකට ලක් වෙලා තිබෙන බවයි. ආර්ථිකය කඩා වැටෙනකොට, ආර්ථිකය අර්බුදයට ලක් වෙනකොට ජනතාවගේ ජීවන තත්ත්වය පහළ යනවා. අනෙක් පැත්තෙන්, ඒ පවුල්වල ආර්ථිකය බරපතළ අර්බුදයකට ලක් වෙනවා. මේ කාරණය තමයි අද රට හමුවේ තිබෙන බැරෑරුම් ප්‍රශ්නය. ආණ්ඩුවක් විධියට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නට ඕනෑ. විපක්ෂය විධියට අපට වගකීමක් තිබෙනවා මෙවැනි අර්බුදකාරී අවස්ථාවල ආණ්ඩුවට අවශ්‍ය සහයෝගය දෙන්නට.

හැබැයි, 2015 ජනවාරි 08වෙනි දා මේ සම්මුති ආණ්ඩුව බලයට පත් වෙනකොට ජනතාවට විශාල බලාපොරොත්තු රාශියක් දුන්නා. මේ තුළ ජනතාව බලාපොරොත්තු වුණා, ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහයක් තුළ බොහොම යහපත් ජීවන තත්ත්වයක් ගත කරන්නට පුළුවන් රටක් ඉදිරියේදී හැදෙයි කියලා. හැබැයි, අද වෙනකොට මේ සියලු ප්‍රාර්ථනා, බලාපොරොත්තු සුන්වෙලා තිබෙනවා. පසුගිය අවුරුදු තුනහමාරක කාල සීමාව තුළ ජනතාවගේ ජීවන තත්ත්වය දිහා බැලුවාම අපට සතුටු වෙන්නට පුළුවන්කමක් නැහැ. අවුරුදු තුනහමාරක් ගිහිල්ලත් මේ සම්මුති ආණ්ඩුවේ වැඩ පිළිවෙළ පිළිබඳව ආණ්ඩුව සෑහීමකට පත්වෙලා නැහැ. ඒ නිසා තමයි අලුත් අණපනත් සම්මත කරලා ඉදිරියේදී එන අර්බුදයට මුහුණ දෙන්නට සූදානම් වෙන්නේ. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවේ තිබුණු බරපතළ අඩු පාඩු, වැරදි, චෝදනා බරපතළ විධියට පෙන්වලා දීලා තමයි මේ ආණ්ඩුව බලයට ආවේ. එතකොට ජනතාව තුළ බලාපොරොත්තුවක් ඇති වුණා මේ සම්මුති ආණ්ඩුවෙන් ජනතාවාදීව, ජනතාවට හිතවත් වැඩ පිළිවෙළක් තුළ මේ රට ඉස්සරහාට යයි කියලා. හැබැයි, අද රටේ ජනතාව කබලෙන් ලිපට වැටිලා. අද මේ ආණ්ඩුවේ ආර්ථික වැඩ පිළිවෙළ අසාර්ථක වෙලා තිබෙනවා.

අපට මතකයි, රවි කරුණානායක මැතිතුමා මුදල් ඇමති වුණාට පස්සේ මේ ආර්ථිකය හදන්නට විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ බව. "ආසියාවේ හොඳම මුදල් ඇමති" සම්මානය එතුමාට හිමි වුණා. හැබැයි, මේ රටේ සිද්ධ වුණු බරපතළම මූල්‍ය අපරාධය වන මහ බැංකු බැඳුම්කර වංචාවට එතුමාත් සම්බන්ධයි කියලා චෝදනාවක් ආපු නිසා එතුමාට ඒ අමාත්‍ය ධුරය අහිමි වුණා. ඒ වාගේම, ඒ බැඳුම්කර වංචාවට සම්බන්ධ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට අනුබද්ධ සමාගම්වලින් මුදල් ලබා ගත්තා කියලා එතුමාට චෝදනාවක් ආවා. ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුටම ඒ චෝදනාව එල්ල වුණා. දූෂණය නැති කරනවා, වංචාව නැති කරනවා, නාස්තිය නැති කරනවා කියලා බලයට ආපු මේ සම්මුති ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ටත් පාරා වළල්ලක් විධියට දූෂණ චෝදනා එල්ල වුණා.

ඒ වංචා චෝදනාවලට ලක් වුණා. හැබැයි, මේ චෝදනාවලට පිළිතුරු දෙන්න මේ අයට තවම බැරි වෙලා තිබෙනවා. මේ ආණ්ඩුවට සහ ඒ ඇමතිවරුන්ට ජනතාව හමුවේ බරපතළ චෝදනා පත්‍රයක් තිබෙනවා. නමුත් අද ඒවාට උත්තර දෙන්න බැරි වෙලා තිබෙනවා.

පසුගිය දවස්වල රාජ්‍ය ඇමති වසන්ත සේනානායක මැතිතුමා කිව්වා, "මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනා වාගේ දූෂණයකට, හොරකමට සම්බන්ධ වෙලා තිබෙනවා" කියලා. පත්තරයක ඒ ගැන තිබෙනවා මම දැක්කා. නමුත් අපි විශ්වාස කරනවා පාර්ලිමේන්තුවේ සිටින හැමෝම එහෙම නැහැ කියලා. ආණ්ඩු පක්ෂයේත් ඉන්නවා බොහොම වැදගත් විධියට ආත්මගරුත්වය ආරක්ෂා කරගෙන කටයුතු කරන ඇමතිවරු. ඒ වාගේම විපක්ෂයේත් ඉන්නවා. හැබැයි, මේ යන ගමනේදී මේ රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් ආණ්ඩුව විසින් කළ යුතු බොහෝ දේවල් තිබෙනවා.

මේ රට කෘෂි ආර්ථිකයක් තිබෙන රටක්. මේ රටේ දිස්ත්‍රික්ක 25න් වැඩි දිස්ත්‍රික්ක ප්‍රමාණයක ජනතාව සම්බන්ධ වෙලා ඉන්නේ කෘෂි කර්මාන්තයට. නමුත්, කෘෂි කර්මාන්තය පිළිබඳව මේ රටේ තිබෙන ප්‍රතිපත්තිය මොකක්ද? මේ රටේ සියයට 70ක් පමණ වන ගොවි ජනතාවගේ කෘෂි ආර්ථිකය නංවන්නට, ඔවුන්ගේ ආදායම වැඩි කරන්නට, ඔවුන්ගේ නිෂ්පාදනය වැඩි කරන්නට මේ ආණ්ඩුව ක්‍රියාත්මක කර තිබෙන වැඩ පිළිවෙළ කුමක්ද?

විදේශ වෙළෙඳාම දිහා බැලුවාම, අපනයන ආදායමට වඩා ආනයන වියදම වැඩියි කියලා අපි දකිනවා. අපනයන ආදායම ඩොලර් බිලියන 10ක් වෙන කොට, ආනයන වියදම ඩොලර් බිලියන 21ක් විතර වෙනවා. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන්කම තිබියදී, ඒවා විදේශ රටවලින් ගෙන්වනවා. මේ සඳහා වැය වෙන්නේ මේ රටේ විදේශ සංචිත; විදේශ විනිමය. නිවැරැදි කෘෂි කාර්මික ප්‍රතිපත්තියක් තිබෙනවා නම්, නිෂ්පාදන ආර්ථිකයකට යන්න ඕනෑය කියා මේ ආණ්ඩුව පුන පුනා නිතර දෙවේලේ කියනවා නම්, අවුරුදු තුනහමාරක් යනකල් ඒ නිෂ්පාදන ආර්ථිකය ගොඩනඟන්න බැරි වුණේ ඇයි? කෘෂි කර්මාන්තය දියුණු කරගන්න බැරි වුණේ ඇයි? මෙයට පිළිතුරු සොයන්නට ඕනෑ. නමුත්, දැන් අවුරුදු තුනහමාරක් ගිහිල්ලා, තව අවුරුදු එකහමාරයි මේ ආණ්ඩුවේ ආයුෂ කාලය තිබෙන්නේ. අශ්වයා පැනලා ගියාට පස්සේ ඉස්තාලය වහලා වැඩක් නැහැ. මෙයින් දුක් විඳින්නේ කවුද? මෙයින් පීඩාවට පත් වෙන්නේ කවුද? ඒ, මේ රටේ සමස්ත මහ ජනතාව. අද වෙන කොට කෘෂි කර්මාන්තයේ යෙදෙන විශාල පිරිසකගේ ආදායම අඩු වෙමින් පවතින්නේ. ඔවුන්ගේ නිෂ්පාදන නියමිත සාධාරණ මිලකට විකුණා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා ආදායම අඩු වෙනවා; වියදම් දෙනිකව වැඩි වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

යෙදවුම්වලට, ප්‍රවාහනයට සහ ඔවුන්ගේ එදිනෙදා ජීවත්වීමේ කටයුතුවලට වැය වන වියදම වැඩි වෙනවා. ආදායම අඩුයි. මේ නිසා තමයි ණය ගන්න සිද්ධ වෙන්නේ.

ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් ණය ගැනීම නිසා අද ග්‍රාමීය ප්‍රදේශවල විශාල පිරිසක් ණය බරින් මිරිකෙනවා. ඒ ණය ගෙවාගන්න බැරි වෙලා තිබෙනවා. තමන්ගේ එකම වත්කම තමයි කෘෂි කර්මාන්තයේ යෙදෙන ඉඩම. මේ වන විට බොහෝ

[ගරු විජිත බේරුගොඩ මහතා]

පිරිසකගේ -සියයට හැට ගණනකටත් වැඩි පිරිසකගේ- එම ඉඩම් උකස් තියලායි මේ ණය අරගෙන තිබෙන්නේ. අද ඒ ණය ගෙවා ගන්න බැරි වෙලා තිබෙනවා. මේ රටේ කෘෂි කර්මාන්තයේ යෙදෙමින් ජීවත් වන ගොවි ජනතාව, ග්‍රාමීය ජනතාව අද වන කොට හෙම්බත් වෙලා, ආර්ථික වශයෙන් පීඩනයට පත් වෙලා, ණයගැතිභාවයට පත් වෙලා ජීවත්වීමට අපහසු තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මම එහෙම කිව්වත්, ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා ඊයේ කිව්වා, "බඩු මිල වැඩි වෙලා නැහැ. ජීවන වියදම වැඩි වෙලා නැහැ. උද්ධමනය අඩු වෙලා තිබෙනවා" කියලා. සමහරවිට කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව උද්ධමනය අඩු වෙලා තිබෙන්න පුළුවන්. නියැදිවලින් ගන්නා ඒ දර්ශක තුළ පෙන්නුම් කරන අංක අනුව තමයි උද්ධමනය වැඩි වෙලාද, අඩු වෙලාද කියලා දැනගන්න පුළුවන් වෙන්නේ. හැබැයි, එයින් සමස්ත ජනතාවගේ ජීවන වියදම එයින් පෙන්නුම් කරන්නේ නැහැ. සැබෑ විධියට ජනතාව අතරට ගිහින් ජනතාවගේ අදහස්වලට සවන් දුන්නොත්, ඒ මිනිස්සු එක්ක ගැටුණොත්, ඒ මිනිස්සු ජීවත් වන විධිය අපට දැනගන්න පුළුවන්කම ලැබෙනවා. කෘෂි ආර්ථිකය විනාශ වුණු, නිෂ්පාදන ආර්ථිකය විනාශ වුණු, ව්‍යාපාරික ආර්ථිකය විනාශ වුණු තත්ත්වයක් අද මේ රටේ තිබෙනවා. ඒ වාගේම, විදේශ ආයෝජන සහ විදේශ වෙළඳාමේදී බොහොම අවාසිදායක පරිසරයක් ගොඩනැහුණු තත්ත්වයක් තමයි තිබෙන්නේ.

එක පැත්තකින් ණය ප්‍රමාණය වැඩි වෙනවා. වාර්ෂිකව ඒ ණය ගෙවා ගන්න බැරිව තව තවත් වැඩි වෙනවා. වටිනා රාජ්‍ය ආයතන කුණුකොල්ලෙට විකුණනවා. රටකට මෙහෙම පවතින්න පුළුවන්ද? මේ විධියට ආර්ථිකයක් ගෙනයන්න පුළුවන්ද? එම නිසා මේ සම්මුති ආණ්ඩුවේ නිරුවත ප්‍රදර්ශනය වන මේ මොහොතේ අපි ආණ්ඩුවට යෝජනා කරනවා, ජනතාවට දුන් පොරොන්දු ඉෂ්ට කරන්න කියලා. මේ රටේ අනාගතය වෙනුවෙන්; මේ රටේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් මේ මොහොතේ සිට හෝ කල්පනා කර බලා මේ රට නිවැරදි දිසාවට ගෙන යන්න, ජනතාව වෙනුවෙන් ඒ වැදගත් යහ පාලන ප්‍රතිපත්ති සැබෑ විධියට ක්‍රියාත්මක කරන්න කියලා යෝජනා කරමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.01]

**ගරු සුජීත් සංජය පෙරේරා මහතා**
(මාණ්පුමිකු සුජිත් සඞ්ජය පෙරේරා)
(The Hon. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද සක්‍රීය වගකීම් කළමනාකරණ පනත යටතේ යෝජනාව සහ මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ පරිපූරක මුදල පිළිබඳව පැවැත්වෙන මෙම විවාදය අවස්ථාවේ ඊට සම්බන්ධ වීමට අවස්ථාව සලසා දීම පිළිබඳව මේ අවස්ථාවේ ඔබතුමාට මගේ ස්තුතිය පිරිනමනවා.

විශේෂයෙන්ම අද මෙම යෝජනා ඉදිරිපත් කර තිබුණා වුණත්, අද කථා කළ සෑම කථිකයෙකුම, විශේෂයෙන්ම විපක්ෂයට සම්බන්ධ උදවිය කථා කළේ මේ රටේ තිබෙන ආර්ථික අර්බුදය ගැනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන ආර්ථික අර්බුදය ගැන කථා කළා වුණත්, මෙම ආර්ථික අර්බුදයට වර්තමාන රජය සම්පූර්ණයෙන්ම වගකිව යුතුයි කියා අපි විශ්වාස කරන්නේ නැහැ. අපි මේ රජය ගන්න ඉස්සෙල්ලා කාල සීමාව තුළදී ගත් ණය කන්දරාව ගැන ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමා ප්‍රකාශ කළා. එදා ණය ගත්තා වුණත්, එම ණයවලින් මේ රටේ ජාතික ආදායම වැඩි කරන්න, එහෙම නැත්නම් මේ රටේ ආර්ථිකය නහා සිටුවීමේ ව්‍යාපෘති සඳහා එම ණය මුදල් යෙදෙව්වාද කියන එක තමයි අපට තිබෙන ගැටලුව. අපි කවුරු කොහොම කිව්වත්, එසේ ලබා ගත් ණය මුදල්වලින් 2012, 2013, 2014 වසරවලදී විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළේ විශේෂයෙන්ම ආර්ථික වශයෙන් ඵලදායී නොවන ව්‍යාපෘති සඳහා කියන එක අපි කථා කරන්නට ඕනෑ.

හම්බන්තොට වරාය ගත්තාම, ඒ වාගේම මත්තල ගුවන් තොටුපළ ගත්තාම, එම ගුවන් තොටුපළ සහ වරාය මේ රටට වුවමනා වුණත්, ඒවා මේ තරම් ඉක්මනින් මේ රටට අවශ්‍ය කරන ව්‍යාපෘතීන් හැටියට අපට සලකන්නට බැහැ. ඒ නිසා අපට ඔරොත්තු නොදෙන තත්ත්වයකට තමයි අද පත්වෙලා තිබෙන්නේ. මේ අය මොන විධියට කථා කළත්, විශේෂයෙන්ම CHOGM ව්‍යාපෘතිය සඳහා වියදම් කළ මුදල් සම්භාරය දිහා බලනකොට, ඒ වාගේම පොදුරාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල පවත්වන්න සහ ඒ සම්බන්ධ මූලික කටයුතු කරන්න වියදම් කළ විශාල මුදල් කන්දරාව දිහා බලනකොට ඒ මහින් පසුගිය කාලයේ මේ රටේ ආර්ථිකයට කරපු හානිය මේ රටට විශාල වශයෙන් බලපා තිබෙනවාය කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. ඒ නිසා තමයි අද වන විට අපට දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අපේ ආණ්ඩුව විතරක් නොවෙයි, එදා හිටපු මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවත්, විශේෂයෙන්ම ඊට සම්බන්ධ වෙලා හිටපු පක්ෂත් මේ ආර්ථික අර්බුදයට මුහුණ දුන්නා. 2014 දීත් ඒ අය ආර්ථික අර්බුදයකට මුහුණ දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන් 2014 දී ආර්ථික අර්බුදයකට මුහුණ දුන් නිසා තමයි නියමිත කාලයට කලින් ඡන්දයකට යන්නත් හේතු වුණේ. මොකද, මේ ආර්ථික අර්බුදයට මුහුණ දෙන්න, එහෙම නැත්නම් මේ ණය කන්දරාව ගෙවන්න ඔවුන් ඒ අවුරුදු දෙකත් ගත කළා නම්, එවකට තිබූ ආණ්ඩුව ඒ අවස්ථාවේ විශාල අර්බුදයකට මුහුණ දෙනවාය කියන එක අපි මේ අවස්ථාවේ මතක් කරන්නට ඕනෑ. ඒකට මුහුණ දෙන්න ඒ අයට පුළුවන්කමක් නැති නිසා තමයි කලින්ම ජනාධිපතිවරණයකට ගිහිල්ලා ජනතා වරමක් ගන්න උත්සාහ කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 වසරේදී අපි මේ ආණ්ඩුව භාර ගත්තාට පස්සේ මේ ණය අර්බුදයට මුහුණ දෙන්න, විශේෂයෙන්ම මෙම විශාල ණය කන්ද ගෙවීම සඳහා නොයෙකුත් ආකාරයේ වැඩ කටයුතු කරන්න වර්තමාන රජයට සිද්ධ වුණු බව තමුන්නාන්සේත් දන්නවා ඇති. ඒ අතරින් ජනප්‍රිය නොවන කාරණාවලට යන්නත් මේ රජයට සිද්ධ වුණු බව අපි දන්නවා. විශේෂයෙන්ම හම්බන්තොට වරාය දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීලා යම් කිසි මුදලක් අරගෙන, ඒ තුළින් හම්බන්තොට වරායට ගෙවන්නට තිබෙන ණය මුදල ගෙවාගන්නත් අවස්ථාව උදා කරගන්න සිද්ධ වුණේ ඒ හේතුව නිසාය කියන එකත් මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරන්නට ඕනෑ. මම ඒ සම්බන්ධයෙන් දිගින් දිගට කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව අද තිබෙන වැදගත්ම දේ තමයි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ පරිපූරක මුදල. මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ පරිපූරක මුදල ගැන කථා කරන අද දවසේ, විශේෂයෙන්ම මීට ඉස්සෙල්ලා කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරු පසුගිය කාලයේ මාර්ග සංවර්ධනය සඳහාත්, ඒ වාගේම ඒ වෙනුවෙන් කළ විශාල ආයෝජන ගැනත් දීර්ඝ වශයෙන් කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ 2018 වසරේ පරිපූරක අය වැය ඇස්තමේන්තු සම්බන්ධයෙන් බැලුවොත්, මෙම වැය ශීර්ෂයට අද දින ලබාගන්න

බලාපොරොත්තු වෙන්නේ රුපියල් මිලියන 30,000යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේ රජය 2018 වසර සඳහා මාර්ග සංවර්ධනය වෙනුවෙන් විතරක් රුපියල් මිලියන 136,000ක මුදලක් වෙන් කරන්න කටයුතු කර තිබෙනවා. එහෙම බැලුවොත් "මේ රටේ සංවර්ධනය ඇන හිටලා තිබෙනවා. එදා කිව්වා වාගේම මාර්ග සංවර්ධන කටයුතු ඇන හිටලා තිබෙනවා" කියලා අපට කියන්න පුළුවන්කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සා විශාල මුදල් සම්භාරයක් වෙන් කරමින්, මේ වනකොට අවශ්‍ය කටයුතු කරන්න සූදානම් කරලා තිබෙන බව අපි දන්නවා. විශේෂයෙන්ම මධ්‍යම අධිවේගී මාර්ගයත්, ඊට අමතරව මෙහි සඳහන් කර තිබෙන ආකාරයට අනෙකුත් මාර්ග සංවර්ධනය සඳහාත් තමයි මේ මුදල් වෙන් කරන්න කටයුතු කරලා තිබෙන්නේ. ඒ කටයුතු හොඳින් සිදු වුණා. ඒ කටයුතු හොඳින් සිදු වෙච්ච නිසා තමයි අපේ මුදල් අමාත්‍යාංශයටත්, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයටත් අද මේ සම්බන්ධයෙන් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න සිදුවෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපේ මේ වැඩ කටයුතු නිසි වේලාවට -කලට වේලාවට- සිදු වෙච්ච නිසා තමයි රුපියල් 30,000ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉල්ලන්න සිදුවෙලා තිබෙන්නේ. කලට වේලාවට ඒ මුදල් ටික ගෙවීමට අවශ්‍ය නිසා තමයි, මේ පරිපූරක ඇස්තමේන්තුව සකස් කරලා තිබෙන්නේ කියන කාරණය මම මේ අවස්ථාවේ දී කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව මේ අවස්ථාවේදී තව කාරණයක් ගැන මා සඳහන් කරන්න ඕනෑ. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මහාමාර්ග ඇමතිවරයා වශයෙන් කටයුතු කරනකොටත්, ඒ වාගේම වර්තමාන අමාත්‍ය ගරු කබීර් හාෂීම් ඇමතිතුමා යටතේත් මාර්ග සංවර්ධන කටයුතු සඳහා විශාල මුදල් සම්භාරයක් වෙන් කරන්න කටයුතු කළ බව අපි දන්නවා. එය මේ අවස්ථාවේ දී අපි ස්තුතිපූර්වකව සිහිපත් කරන්නට ඕනෑ. මොකද, මේ රජයේ "දින සියය" වැඩසටහන යටතේ විශේෂයෙන්ම ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරීම සඳහා අපේ ගරු කබීර් හාෂීම් මැතිතුමා එවකට මහාමාර්ග අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ ආකාරය අපට මතකයි. ඒ" ශ්‍රේණියේ සහ "බී' ශ්‍රේණියේ මාර්ග විතරක් නොවෙයි, ග්‍රාමීය මාර්ගත් නහා සිටුවන්න ඕනෑය කියලා එතුමා එදා හැම මැතිවරණ කොට්ඨාසයකටම රුපියල් ලක්ෂ 300ක විතර මුදලක් ලබා දෙන්න කටයුතු කළ බව අපි දන්නවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා වශයෙන් පත් වුණාට පස්සේ, සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටම තමන්ගේ කොට්ඨාසයේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ 600ක මුදලක් ලබා දෙන්න කටයුතු කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ග්‍රාමීය ආර්ථිකය නහා සිටුවන්න වාගේම ග්‍රාමීය ආර්ථිකයේ යටිතල පහසුකම් ටික වැඩිදියුණු කරන්න ඒ තුළින් විශාල පිටුවහලක් ලැබුණාය කියන කාරණයත් මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. වර්තමාන ගරු ඇමතිතුමා මේ වසරේදී මම හිතන හැටියට රුපියල් ලක්ෂ 5,000ක -රුපියල් මිලියන 500ක- මුදලක් දීප ව්‍යාප්තව ලංකාව පුරාම මාර්ග සංවර්ධන කටයුතු සඳහා මේ වනකොට ලබා දෙන්න කටයුතු කර තිබෙනවාය කියන කාරණයත් මේ අවස්ථාවේ දී මා සන්තෝෂයෙන් මතක් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී අප අවධානය යොමු කළ යුතු තවත් කරුණු කීපයක් තිබෙනවා. ගරු ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටින නිසා ඒ සම්බන්ධව යම් අදහසක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. මොකද, වර්තමාන රජය බලයට පත් වුණාට පස්සේ විශේෂයෙන්ම ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් පටන් ගත් බව අපි දන්නවා. එලෙස පටන් ගත් ව්‍යාපෘතිවලින් සමහර ව්‍යාපෘති සමහර දිස්ත්‍රික්කවල සාර්ථකව ක්‍රියාත්මක වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් රත්නපුර දිස්ත්‍රික්කයේ හා මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ මේ කටයුතු නිසියාකාරව සිදු වෙන්නේ නැති බව කනගාටුවෙන් වුණත් මා කියන්නට ඕනෑ. එයට හේතුවෙලා තිබෙන්නේ, මේ කොන්ත්‍රාත්තුව බාර ගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රශ්නයක්. විශේෂයෙන්ම එක් කොන්ත්‍රාත්කරුවකු නිසා අද රත්නපුර දිස්ත්‍රික්කයේ මාර්ග කොටසකුත්, කෑගල්ල දිස්ත්‍රික්කයේ මාර්ග කොටසකුත් ඉදි කරන්න බැරිව අතර මඟ වැඩ නතර කරලා තිබෙනවා. ඒ නිසා මේ කටයුතු සම්බන්ධව ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මොකද, කේ.ඩී. ඊබට් සහ පුත්‍රයෝ කියන සමාගම තමයි කෑගල්ල දිස්ත්‍රික්කයේ මාර්ග සෑදීමේ කොන්ත්‍රාත්තුව බාර ගත්තේ. ඒ සමාගම දැන් බංකොලොත් වෙලා තිබෙනවාය කියලා අපට දැනගන්න ලැබිලා තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේත් මේ වාගේ පාරවල් 15ක් විතර තිබෙනවා. ඒවායේ වැඩ කටයුතු පටන් අරගෙන අතරමඟදී නතර වෙලා තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, මේ ප්‍රශ්නය දැන් බරපතළ ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. මොකද, පාරවල් හැදුවාට ඒ පාරවල් නඩත්තු වෙන්නේ නැහැ. හාගෙට පාරවල් හදලා තිබෙන නිසා ඒවායේ යන්න එන්න පුළුවන්කමක් නැහැ. විවිධ අවස්ථාවල දී අපි මහාමාර්ග අමාත්‍යාංශයට මේ සම්බන්ධව කරුණු යොමු කළාම, එම කොන්ත්‍රාත්කරුවන්ගේ ගිවිසුම් කාලය අවසන් කරන්න කටයුතු කරන බව ප්‍රකාශ කර තිබෙනවා. අද කෑගල්ල දිස්ත්‍රික්කයේ සහ රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට මෙය බරපතළ ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධව ඔබතුමන්ලාගේ කඩිනම් අවධානය යොමු කරලා, විශේෂයෙන්ම මේ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය සක්‍රීය කිරීමට කටයුතු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

**ගරු සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට හෝ මේ කටයුත්ත බාර දීලා මෙය සාර්ථකව අවසන් කරන්න අවශ්‍ය කටයුතු කරයි කියා අපි බලාපොරොත්තු වනවා. මොකද, තව බොහොම කෙටි කාලයයි තිබෙන්නේ. අවුරුදු දෙකකුත් අවසන් වෙලා තිබෙනවා. මම මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. අද මේ විවාදයට සම්බන්ධ වෙන්න මට අවස්ථාව සලසා දීම පිළිබඳව නැවත වරක් ඔබතුමාට මගේ ස්තුතිය පිරිනමමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.10]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට අදාළව පරිපූරක ඇස්තමේන්තුවක්ද

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ඉදිරිපත් කර තිබෙන නිසා, මුලින්ම මහාමාර්ග හා මාර්ග සංවර්ධන ඇමතිතුමා වෙත කාරණා දෙකක් ඉදිරිපත් කිරීමට මම කැමැතියි. මීට පෙර ආණ්ඩුව කාලයේත් රුවන්පුර අධිවේගී මාර්ගය පිළිබඳව යෝජනාවක් තිබුණා. රුවන්පුර අධිවේගී මාර්ගය, කහතුඩුව ප්‍රවේශයෙන් පටන්ගෙන පැල්මඩුල්ල දක්වා ගමන් කරන විධියට තමයි යෝජනා වුණේ. එහි පළමු කොටස විධියට කහතුඩුවේ ඉඳලා ඉංගිරිය දක්වා නම් කරලා, මැනුම් කටයුතු සිදු කරලා දැන් අවුරුදු පහක් පමණ ගත වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. හොරණ, මාපුටුගල, කැකුළුදොල යන ග්‍රාම නිලධාරී වසම්වල පවුල් 50ක් පමණ සිටිනවා. ඒ අයගේ ඉඩම් මැනලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඒ අවශ්‍ය නිල කටයුතු කරලා අවසන් කරලායි තිබෙන්නේ. නමුත් මේ අධිවේගී මාර්ගය ඉදිවන බවක් පෙනෙන්නේ නැහැ. ඒ නිසා ඒ ජනතාවට වන්දි ලැබෙනවාද, නැද්ද, ලැබෙනවා නම් ඒ කොතරම් ප්‍රමාණයක්ද, ඒ වන්දි වැඩි කර ගන්නේ කොහොමද කියන එක ගැන නිශ්චිත අදහසක් රජය පැත්තෙන්, නිලධාරීන්ගේ පැත්තෙන් ඉදිරිපත් වෙලාත් නැහැ. දැන් මැනුම් කටයුතු අවසන් කර තිබෙන නිසා ඒ අයට අලුතෙන් ගෙයක් හදා ගන්න විධියක් නැහැ; තමන්ගේ ගෙදරට අලුතින් කාමරයක්වත් එකතු කර ගන්න විධියක් නැහැ. සමහර අය නිවාස ණය අරගෙන තිබෙනවා. ඒ ගත්ත ණයට වාරිකයයි, පොලියයි ගෙවනවා. හැබැයි ගේ කෑල්ලක් හදා ගන්න බැහැ. මේ විධියට ඔවුන් ප්‍රශ්න ගණනාවකට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා මේ මාර්ගය ඉදිකිරීම සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ සැලැස්ම මොකක්ද, එය ඉදිකරන්නේ කොයි කාලයේද, දැන් දැන් මේ මාර්ගය ඉදිකරයි කියා ඉඩම් වෙන් කරගෙන බලාගෙන ඉන්න ජනතාවට ඔබතුමන්ලා දෙන නිශ්චිත පිළිතුර මොකක්ද කියා මා දැනගන්න කැමැතියි.

අනික් කාරණය මේකයි. දක්ෂිණ අධිවේගී මාර්ගයේ කහතුඩුව සහ දොඩංගොඩ අතර පැල්පොල ප්‍රදේශයේ අලුතෙන් අන්තර් හුවමාරුවක් ඉදි කරන්න ඉඩම් මැනුම් කටයුතු කර තිබෙනවා. මේ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ මීට කලින් සාකච්ඡා වුණා. දක්ෂිණ අධිවේගී මාර්ගයේ පළමු සැලැස්ම හැටියට දොඩංගොඩ බෝම්බුවලට මේ අන්තර් හුවමාරුව දෙන්න කියා මම යෝජනා කළා. නමුත් මිල්ලනිය ප්‍රදේශයේ කර්මාන්තපුරයක් ඉදි කරනවාය කියන අදහස ඇතිව, පැල්පොලට ඒ අන්තර් හුවමාරුව ලබා දීලා තිබෙනවා. එතැනත් තිබෙන ගැටලුව මේකයි. මේ ව්‍යාපෘතිය සඳහා පවරා ගන්නා ඉඩම් සම්බන්ධයෙන්, ඒ ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් පැල්පොල, ගල්පාත ප්‍රදේශයේ ජීවත් වන පවුල් 40ක පමණ ජනතාවට නිශ්චිත අදහසක් ලබා දීලා නැහැ. ඒ නිසා ඒ අවිනිශ්චිතතාව නිරාකරණය කර ගැනීම සඳහා, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම්වරයා සහ මාර්ග සංවර්ධන අධිකාරිය මැදිහත් කරගෙන, සිදු වන්නේ මොකක්ද කියන එක පිළිබඳව ඒ ජනතාවට අදහසක් ඉදිරිපත් කරන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඉදිකළ මාර්ගවල සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් රුපියල් බිලියන 30ක් ඉල්ලමින් ගරු ඇමතිතුමා අද මේ පාර්ලිමේන්තුවට පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. මේ ඉදිකළ මාර්ගවලට මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය රුපියල් බිලියන 30ක් විතර ඉල්ලනකොට පොඩි බයකුත් දැනෙනවා. මොකද, හදපු පාරවලට 2015 පෙබරවාරි මාසයේදී රුපියල් බිලියන 15ක් ඉල්ලන්න ගිහින් තමයි අවසානයේදී මහ බැංකුවටත් වැඩේ දුන්නේ. ඉතින් මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයම, හදපු පාරවලට රුපියල් බිලියන 30ක් ඉල්ලාගෙන එනකොට පොඩි බයක් එන එක සාධාරණයි. දැන් නම් ඉතින් මේ මුදල් දෙන්න වෙන්නේ භාණ්ඩාගාරයෙන්. කෙසේ නමුත්, මහ බැංකුවට වුණු සංගදියම තවත් කොහේට හෝ වෙයිද්ෝ කියන සැකයකුත් මතු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට අදාළ කාරණාවලට අමතරව අපි ආර්ථිකය ගැනත් කථා කළ නිසා මම මෙන්න මේකත් කියන්න ඕනෑ. මම ඊයෙත් මේ ගැන සඳහන් කළා. ජනතාවට දරා ගන්න බැරි විධියට දැන් තෙල් මිල වැඩි වෙලා තිබෙනවා; අනෙක් පැත්තෙන් බඩු මිල වැඩි වෙනවා. හැම මාසයේම 10වන දාට මොකක්ද්ෝ චක්‍රයක් වාගේ බඩු මිල වැඩි වෙනවා; තෙල් මිල වැඩි වෙනවා. හැම මාසයකම 10වන දා වනකොට මේ මාරාන්තික බෝම්බය තමන්ගේ ඇඟ මතට වැටෙන නිසා ජනතාවත් දැන් හිත හදාගෙන ඉන්නවා. "කැබිනට් මණ්ඩලය නම් මේ මිල සූත්‍රය දන්නේ නැහැ" කියා පෙරේදා "සිලෝන් ටුඩේ" පුවත් පතට ගරු මහින්ද අමරවීර ඇමතිතුමා කියා තිබෙනවා මම දැක්කා. "කැබිනට් මණ්ඩලය මිල සූත්‍රයක් හදන්න කියලා කිව්වා, ඇමතිතුමා එය භාර ගත්තා, ඒ අනුව එතුමා හදපු මිල සූත්‍රය කැබිනට් මණ්ඩලයටවත් ඉදිරිපත් කළේ නැහැ, ඒ නිසා ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතියවත් නැහැ" කියා එතුමා කියා තිබුණා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නායකයෙක් හැටියට මහින්ද අමරවීර ඇමතිතුමා කියපු දේ අපට පිළිගන්න සිදු වනවා. එතුමා කියන තොරතුරුත් අතිශය නිවැරැදිව කියනවා කියා අපි විශ්වාස කරනවා.

කැබිනට් මණ්ඩලයේ "රෝ" ඔත්තුකාරයෝ හතර දෙනකුත් ඉන්නවාය කියා දැන් එතුමාම කියනවා. එතුමා ඒක හෙළිදරව් කරන්නත් සූදානම් වන නිසා මේ කරුණු කාරණා වගකීමක් ඇතිව කිව්වාය කිය අපි හිතනවා. අඩු ගණනේ දැන් මේ මිල සූත්‍රය කැබිනට් මණ්ඩලය දන්නේත් නැහැ. මුදල් ඇමතිතුමා දැනගෙන හිටියේත් නැහැ. මුදල් ඇමතිතුමාත් පස්සේ තමයි කොහෙන් දෝ අහුලාගෙන ඇවිත්, V1 + V2 + V3 + V4 කියලා සූත්‍රයක් හඳුන්වා දුන්නේ. මේ මොන සූත්‍රය හඳුන්වා දුන්නත්, අවසානයේ ඒක ඇතුළේ තිබෙන්නේ බදුයි. පෙට්‍රල් ලීටරයක් ගත්තොත්, ඒකේ සියයට 60යි පෙට්‍රල් මිල තිබෙන්නේ; පෙට්‍රල් ගොඩබාන කොට සියයට 60යි. සියයට 36ක් ආණ්ඩුව ගහන බද්දයි තිබෙන්නේ. ඒ කියන්නේ, රුපියල් 100ක තෙල් ගැහුවොත්, එයින් රුපියල් 36ක්ම බදු. රුපියල් 60කයි තෙල් වදින්නේ. මොන සූත්‍රයෙන් හෝ බදු එකතු කිරීම තමයි කරන්නේ. බදු ගහලා, ගහලා එකතු කරනවා. ජනතාවට තිබෙන ප්‍රශ්නය තමයි, මේ ගහන බදුවලට මොකද වෙන්නේ කියන එක. තමුන්නාන්සේලා නම් කියනවා, "ණය, ණය, ඒ ණය ගෙවනවා" කියා.

ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමාත් කිව්වා, "රාජපක්ෂලා ගත්ත ණය, ඒ පව තමයි ගෙවන්නේ" කියා. හැබැයි, ප්‍රශ්නය මේකයි. දැන් ඔබතුමන්ලාට ආණ්ඩු බලය තිබෙනවා. ඔබතුමන්ලාට විගණකාධිපති දෙපාර්තමේන්තුව යොදාගෙන, රාජපක්ෂ පාලන සමයේ -ඒ අවුරුදු 10 තුළ- ගත්ත ණය, ඒ ණයවලින් හදපු වත්කම් පිළිබඳව ජනතාවට හෙළිදරව් කරන්න පුළුවන්; "මෙන්න ගත්ත ණය, මෙන්න තිබෙන වත්කම්" කියා හෙළි කරන්න පුළුවන්. "අපි ණය ගත්තා තමයි, අපි නම් වැඩ කළා" කියා ඒ ගොල්ලොත් කියනවා. ඒ අය පිටිටනිය පෙන්වනවා; වරාය පෙන්වනවා; ගුවන් තොටුපොළ පෙන්වනවා; අධිවේගී මාර්ගය පෙන්වනවා. ඒවායේ වත්කම් නිවැරැදිව ගණනය කරලා, "මෙන්න, වත්කම් මෙච්චරයි තිබෙන්නේ, හැබැයි, මෙච්චර ණය අරගෙන තිබෙනවා" කියා රටට, ජනතාවට පෙන්වන්න තමුන්නාන්සේලාට පුළුවන්. එහෙම නැතිව, ණයම, ණයම, ණයම කියා කිව්වාම, "තමුන්නාන්සේලා ගත්ත ණය නිසා තමයි ජනතාවට බදු ගහන්න සිද්ධ වන්නේ" කියා ඊළඟට පත්වන ආණ්ඩුවත් කියාවි.

බදු ගහලා, ගහලා ණය ගෙවනවාය කිව්වාට, ජනතාවට පටි තද කර ගන්නය කිව්වාට, තමුන්නාන්සේලා රජයේ වියදම් එහෙම කප්පාදු කරගෙන නැහැ. අමාත්‍යාංශවල ඇමතිවරුන්ගේ නඩත්තුවට යන වියදම් අඩු කරගෙන නැහැ. බදු ගහලා එකතු කරගන්න ඒ මුදල් ටික එක්තරා කණ්ඩායමක සුඛ විහරණය සඳහා යොදවනවා මිස, සාමාන්‍ය ජනතාවට පෙරළා ඒ මුදල් යෙදවෙන්නේ නැහැය කියන එක සත්‍යයක්. මම ඒකට සරල උදාහරණයක් කියන්නම්. ජනතාවගෙන් ගන්න මේ බදුවලින් ජනතාවට පෙරළා සේවයක් නොවන නිසා තමයි අද පහේ පන්තියේ ඉගෙන ගන්නා දරුවනුත් පීඩාවට පත් වන්නේ. මේ නිසා ශිෂ්‍යත්ව විභාගය කරන දරුවනුත් පීඩාවට පත් වෙනවා. ශිෂ්‍යත්ව විභාගය කරන දරුවා සමත් ලකුණ 168 දක්වා ඉහළ යන්නේ ඒ දරුවාගේ දෙමව්පියන් ආණ්ඩුවට ගෙවන බදු නිසියාකාරව යෙදවෙන්නේ නැති නිසායි. ඒ බදුවලින් කොටසක් වියදම් කරලා, ශිෂ්‍යාධාර දෙන ප්‍රමාණය වැඩි කළා නම් -15,000කට දෙන ශිෂ්‍යාධාරය 30,000කට දෙන්න ආණ්ඩුව කටයුතු කළා නම්- එක දරුවකුට මාසයකට රුපියල් 500 ගණනේ එකතු කරන්න තිබුණා. එහෙම වුණා නම් ශිෂ්‍යත්ව කඩඉම් ලකුණත් සාමාන්‍යයෙන් 145ට, 150ට අඩු කරන්න පුළුවන්. ඒ දරුවන්ගේ දෙමව්පියන්ගේ බොටුව මිරිකලා ගන්න බදු මුදල් පෙරළා නිසියාකාරව ජනතා සේවයට යෙදවන්නේ නැති නිසා, ඒ බදු ගෙවන, ඒ බදු මුදල් ආරක්ෂා කරන්න කතිරය ගහන දෙමව්පියෝ පමණක් නොවෙයි, ඒ දෙමව්පියන්ගේ අන්ත අසරණ, අභිංසක දරුවෝත් පීඩාවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා, තමුන්නාන්සේලා "යහ පාලනය" කියන නාමකරණය හරියට පාවිච්චි කරනවා නම්, අඩු තරමින් මේ එකතු කරන බද්ද කොහාටද යෙදවෙන්නේ කියලා කියන්න ඕනෑකම තිබෙනවා.

නැවත වටයකින් පාසල්වල මුදල් අය කිරීම සඳහා දැන් ආණ්ඩුව අලුත් චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. මේ වන විට එයට එරෙහිව තැන් තැන්වල විරෝධතා ව්‍යාපාර ආරම්භ කර තිබෙනවා. ආණ්ඩුව අලුතින් චක්‍රලේඛයක් නිකුත් කර තිබෙන්නේ, පාසලක් නඩත්තුවට යන වියදම පාසල් සංවර්ධන සමිතියෙන් තීන්දු කරලා, ඒක පාසලට අය කර ගන්න අවස්ථාව ලබා දෙන්නයි. එක පැත්තකින් ජනතාව තමන්ගේ දරුවාට උගන්වන්න ආණ්ඩුවට බදු ගෙවන අතර, ඒ දෙමව්පියන් මතම තවත් බරක් පටවා තිබෙනවා. ඒ නිසා, ජනතාව තළා පෙළා ගහන බදු ටිකවත් පෙරළා ජනතා සේවයට යොදවන්න තමුන්නාන්සේලා අසමත්වෙලා තිබෙනවා. මේ පෙන්නුම් කරන්නේ වෙන මොකක්වත් නොවෙයි. තමුන්නාන්සේලා බණින පසුගිය ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තියම යස අගේට කරපින්නා ගෙන යන එකයි මේ කරන්නේ. බොහොම ස්තුතියි.

[පි.ප. 4.20]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சின் குறைநிரப்புத் தொகை மீதான இன்றைய விவாதத்தில் எனக்கும் பேசச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டுச் சந்தோச மடைகின்றேன். இன்று நாட்டில் இரண்டு ஹர்த்தால்கள் இடம்பெற்றிருக்கின்றன. அதாவது திருகோணமலை மாவட்டத்திலே பாலத்தோப்பூர் - தோப்பூர் junction இலே திருகோணமலை - மட்டக்களப்பு வீதியை மறித்து மக்கள் ஆர்ப்பாட்டம் செய்து பல மணிநேரம் போக்குவரத்தை ஸ்தம்பிக்கச் செய்திருக்கின்றார்கள். காரணம், அங்கிருக்கின்ற வீதி செப்பனிடப்படாமையாகும். அங்கு பாலத் தோப்பூர் சந்தியிலேயிருக்கின்ற பாலம் நீண்ட காலமாக மக்களுடைய போக்குவரத்திற்கு இடைஞ்சலாக இருந்து வருகின்றது. அது ஒரு குறுகிய பாதையாகவும் இருக்கின்றது. இது தொடர்பாக RDA இற்கு நான் அறிவித்து, 450 மில்லியனுக்கு அதனுடைய estimate தயாரிக்கப்பட்டது. ஆனால், அந்த வீதியைக் கடந்த 3 வருடங்களாகச் செப்பனிட முடியாமலிருக்கின்றது. இது சம்பந்தமாக கௌரவ பிரதம மந்திரி அவர்களிடம் எடுத்துச் சொன்னபோது, அவர் கடந்த வருடம் 11ஆம் மாதம் 7ஆம் திகதி இதனை உடனடியாகச் செய்யுமாறு பணித்தபோதும்கூட, வீதி அபிவிருத்திக்குப் பொறுப்பான அமைச்சினால் அது மேற்கொள்ளப்படவில்லை. பாலத்தோப்பூர் சந்தியிலேயிருந்து சேருவில 'பன்சல' வரையுள்ள 7 கிலோ மீற்றர் வீதியிலே 300 மீற்றர்கள் மட்டுமே அமைச்சின் நிதியைக் கொண்டு செப்பனிடப்பட்டது. இன்று அந்த மக்களிடம் ஒரு வாக்குறுதியளித்து அவர்களை அந்த ஆர்ப்பாட்டத்திலிருந்து விலக்கியிருக்கின்றோம். இந்த வீதிக்குத் தேவையான நிதி 450 மில்லியன். இது தமிழ், சிங்கள மக்களுடைய உறவைப் பாதுகாக்கின்றது.

அடுத்தது, பள்ளிக்குடியிருப்பு இறால்ப் பாலம் என்ற 7 கிலோ மீற்றர் வீதி. அந்த வீதியை iRoad Project இலே சேர்த்திருந்தோம். மற்றது, கச்சக் கொடித்தீவு - ஆயிலியடி வீதி. அதற்கு 315 மில்லியன் தேவைப்படுகின்றது. அதற்கான நிதியை ஒதுக்குமாறு பிரதம அமைச்சர் அவர்கள் நிதி அமைச்சிடம் பணித்திருந்தார். அதுவும் செய்யப்படவில்லை. இவற்றிற்கான 3 estimates இனையும் RDA ஊடாக வீதி அபிவிருத்தி அமைச்சு தயாரித்தது. ஆனால், கடந்த 2 வருடங்களாக அந்த விடயம் நிறைவேற்றப்படாமல் ஏமாற்றப்பட்டிருக்கின்றது. அதேபோன்று, 17 Grama Niladhari Divisions இலே உள்ள குறிஞ்சாக்கேணி bridge வேலைகளை 2017ஆம் ஆண்டு ஆரம்பித்து 2018ஆம் ஆண்டு முடிக்குமாறு அதிமேதகு ஜனாதிபதி அவர்களினாலும் கௌரவ பிரதம மந்திரி அவர்களினாலும் கடந்த 3 வருட காலத்திலே மாறி மாறி வந்த வீதி அபிவிருத்திக்குப் பொறுப்பான அமைச்சுக்களிடம் பணிக்கப்பட்டிருக்கின்றது. வீதி அபிவிருத்தி அதிகாரசபையின் DG அவர்களுக்கும் அது சம்பந்தமாத் தெரிவிக்கப்பட்டது. ஆனால், அதனுடைய borehole, designing எல்லாம் செய்து முடிக்கப்பட்டு, அதற்கான மதிப்பீட்டுத் தொகையாக 750 மில்லியன் ரூபாய் நிதியமைச்சிடம் கோரப்பட்டது. இது நடைமுறைப்படுத்தப் படாமை குறித்தும் ஒரு ஹர்த்தால் நடைபெற்றிருக்கின்றது. அதற்கான நிதியை 2019ஆம் ஆண்டுகான Budget இல் இருந்தாவது ஒதுக்குமாறு மாண்புமிகு பிரதம அமைச்சர் அவர்கள் தற்பொழுது பணித்திருக்கின்றார். கடந்த 3 வருட காலமாக ஏனைய மாவட்டங்களிலே பாரிய அபிவிருத்திகள் நடைபெற்று வருகின்றன. உங்களுக்கு அதிகூடிய வாக்குகளை அளித்து ஆட்சி மாற்றத்திற்குப் பங்காளிகளாக இருக்கின்ற திருகோணமலை மாவட்ட மக்களுடைய கோரிக்கையினை ஏற்று இந்தக் கிராமிய வீதிகளைச் செப்பனிடுவதற்கான நிதியை நிதி அமைச்சர் அவர்கள் வீதி அபிவிருத்தி அமைச்சுக்கு ஒதுக்கிக் கொடுப்பதன் மூலம் இன்று நடைபெற்ற இரண்டு ஹர்த்தால்களுக்கும் தீர்வு காண முடியுமென்று நினைக்கின்றேன்.

அதுமட்டுமல்ல, குறிஞ்சாக்கேணி bridge என்பது 17 Grama Niladhari Divisions களிலே இருக்கின்ற 31 பாடசாலைகளோடு தொடர்புபட்ட ஒரு பாலமாகும். அதற்கு

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

alternative ඇත ඉරුක්කින්ර කුට්ටික්කරෙ bridge උම් කටන්ත වාරම් උටෙන්තුළ්ළතු එන්පතු උංකළුක්කුත් තෙරියුම්. අතර්කු RDA තර්කාලිකත් තීර්වාක 'කොංකිරීට්' ඉට්ටිරුක්කින්රතු. තර්පෝතු මාරි කාලමාක ඉරුක්කින්ර කාරණත්තිනාල් අන්තප් පාලමුම් උටෙප්පෙටුත්තාල්, අන්තප් පිරතේසත්තින් පෝක්කුවරත්තු මට්ටුමල්ල, කල්වියුම් පාතික්කප්පටුම්. ඉන්රු පාලෙත්තෝප්පූර් මක්කළ් මිකවුම් කෂ්ටමාන සූළලිලේ ඉරුක්කිරාර්කළ්. අරසාංකත්තින් පංකාළිකළාක ඉරුක්කින්ර එමතු පිරතේස මක්කළුටෙය තේවෙකළෙප් පූර්ත්ති සෙය්යක්කූටිය වකෙයිල් ඉතර්කාන නිති ඔතුක්කප්පට වේණ්ටුමෙන්පතිලේ නීංකළ් කවනම් සෙලුත්ත වේණ්ටුම්. ඒර්කෙනවේ මේතකු ජනාතිපති අවර්කළුම් කෙළරව පිරතම මන්තිරි අවර්කළුම් ඉතනුටෙය තේවෙයින් මුක්කියත් තුවත්තෙ නිති අමෙච්චුක්කුම් වීති අපිවිරුත්තික්කුප් පොරුප්පාන අමෙච්චුක්කුම් කටිතමූලම් තෙරිවිත්තිරුක්කිරාර්කළ්.

මේලුම්, පාලෙත්තෝප්පූර් junction ඉලිරුන්තු සේරුවිල වරෙයාන වීතික්කු 450 මිල්ලියනුම් පාලෙත්තෝප්පූර් junction ඉලිරුන්තු අරපා නකර් වරෙයාන වීතික්කු 363 මිල්ලියනුම් කච්චක්කොටිත්තීවිලිරුන්තු ආයිලියඩි වරෙ ඉරුක්කින්ර වීතික්කු 317 මිල්ලියනුම් තේවෙප්පටුකින්රතු. කුරිප්පාක, 3 චමූකංකළුම් පයන්පෙරුම් වකෙයිල් තලා 7 කිලෝ මීර්රර් වීතියෙ අමෙක්කුමාරු නාන් 3 වරුටංකළුක්කු මුන්නරේ කෝරියිරුන්තේන්. ආනාල්, ඔව්වොරු වරුටමුම් ඉතු පින්තළ්ළප්පට්ටුක් කොණ්ටේයිරුක්කින්රතු. ආකවේ, ඉතර්කාන නිතියෙ වීති අපිවිරුත්ති අමෙච්චුක්කු ඔතුක්කික් කොටුක්ක වේණ්ටුමෙන්රු කේට්ටුක් කොළ්කින්රේන්. ඉන්රෙය තිනම් අන්ත මක්කළ් මේර්කොණ්ට හර්තාලෙ චිල චකෝතරර්කළ් චෙන්රු පේචි, කෙවිටච් චෙය්තිරුක්කින්රාර්කළ්. ආනාල්, එප්පොළුතුම් ඉතනෙච් චෙය්ය මුටියාතු. එනවේ, එංකළුටෙය මක්කළින් කෂ්ට නිලෙමෙයෙ අරින්තු අතර්කාන නිතියෙ ඔතුක්කිත් තර වේණ්ටුමෙන්රු කේට්ටුක් කොළ්කින්රේන්.

ඉන්රු කණ්ටියිලේ, මාත්තරෙයිලේ, හම්පාන් තෝට්ටෙයිලේ අපිවිරුත්තිත් තිට්ට මුන්නෙටුප්පුකළ් නටෙපෙර්රුක් කොණ්ටිරුක්කින්රන. අතන් මූලමාක අන්තන්ත මාවට්ට මක්කළ් නලන් පෙරුකින්රාර්කළ්. අන්ත වකෙයිල්, එමතු මාවට්ට මක්කළුටෙය කුරෙයෙයුම් නිවර්ත්তි චෙය්තු තරුවතර්කු කෙළරව නිති අමෙච්චර් අවර්කළ්, වීති අපිවිරුත්তි අමෙච්චුක්කුත් තේවෙයාන නිතියෙ ඔතුක්කික්කොටුක්ක වේණ්ටුම්. කුරිත්ත අමෙච්චු කටන්ත 2 වරුට කාලමාක අතර්කාන design, borehole test එන අත්තනෙයෙයුම් චෙය්තු මුටිත්තිරුක්කිරතු. එනවේ, අතර්කාන නිතියෙ ඔතුක්කිත්තර වේණ්ටුමන්රු කේට්ටුක්කොළ්කින්රේන්. මේලුම්, ඉන්ත අමෙච්චිනුටෙය චකල නල්ල කාරියංකළෙයුම් වරවේර්පතෝතු, ඉන්තක් කුරෙනිරප්පුත්තොකෙ තේවෙයාන තොන්රු එන්පතනෙ අංකීකරිත්තු, එමතු මක්කළුටෙය කුරෙයෙ නිවර්ත්তි චෙය්වතර්කු ඔළුංකු චෙය්තුතර වේණ්ටුම් එන්රු කේට්ටු, විටෙපෙරුකින්රේන්. නන්රි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෙමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළහට, ගරු ඩී. වී. චානක මහතා.

[අ.භා.4.27]

**ගරු ඩී. වී. චානක මහතා**
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුති කරන්න කැමැතියි. විශේෂයෙන්ම පාරවල් හැදීමේ තිබෙන වටිනාකම පහු වෙලා හෝ මේ ආණ්ඩුවට තේරුණු එක පිළිබඳව මම පළමුවෙන්ම සතුට ප්‍රකාශ කරනවා. අපි දන්නවා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයේ ප්‍රධානම කාර්යයක් වශයෙන් තිබුණේ රටේ මහාමාර්ග පද්ධතිය දියුණු කිරීම බව. මහාමාර්ග පද්ධතිය දියුණු කරද්දී, විවිධාකාරයෙන් අපේ රටට වාසි ලැබෙනවා. විශේෂයෙන්ම මිනිස් පැය ඉතුරුවීම තුළින් ගණනය කරන්න බැරි තරම් ලාභයක් රටට ලැබෙනවා. මේ අවස්ථාවේදී බිලියන 30ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර, මාර්ග පිළිසකර කිරීමට එය යොදා ගැනීම පිළිබඳව අපි සතුටු වෙනවා.

ගරු අමාත්‍යතුමා මෙතැන ඉන්නා නිසා, මම ඔබතුමාට ප්‍රශ්නයක් යොමු කරන්න කැමැතියි. මම ඔබතුමාගෙන් මීට කලින් ඉල්ලීමක් කළා. ගරු ඇමතිතුමනි, හම්බන්තොට-සූරියවැව මාර්ගය සකස් කිරීමේදී ඉඩම් අහිමි වූ විශාල පිරිසකට මේ වෙනකොටත් වන්දි ලබා දීලා නැහැ. මම ඔබතුමාට කිහිප වතාවක්ම මේ පිළිබඳව දැනුම් දුන්නා. අද වනතුරුත් ඒ සඳහා විසඳුමක් ලැබී නැති බැවින් ඔවුන් විශාල අපහසුතාවකට පත් වී සිටිනවා. ඔවුන්ගේ ඉඩම් නැති වෙලා; ඒ වාගේම ගෙවල් නැති වෙලා. එම පිරිසට එම වන්දි මුදල් ලබා දෙන්න පුළුවන් කවදාද කියා මම අමාත්‍යතුමාගෙන් දැන ගන්න කැමැතියි. මොකද, අද වනවිට එම ජනතාව විශාල ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. අද ඔවුන්ගේ ඉඩම් නැහැ, ගෙවල් නැහැ. ඒ නිසා අද ඉන්න තැනක්වත් නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මේ රටේ පාරවල් හදනකොට, -

**ගරු කබීර් හාෂිම් මහතා**
(මාණ්පුමිකු කබීර් හාෂිම්)
(The Hon. Kabir Hashim)
එම ජනතාවට වන්දි ගෙවීම සඳහා දැනට මුදල් සූදානම් කර තිබෙනවා. මම හිතන විධියට තව සති දෙකක් ඇතුළත ගෙවීම් කටයුතු කරන්න පුළුවන්.

**ගරු ඩී. වී. චානක මහතා**
(මාණ්පුමිකු ටි.වී. චානක)
(The Hon. D. V. Chanaka)
ගරු ඇමතිතුමනි, එසේ ලබා දෙන්න පුළුවන් නම් අපි විශේෂයෙන් ස්තුති කරන්න කැමැතියි. මොකද, ඔවුන් මේ වනවිට අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ පාරේ තමයි ඉන්නේ. ඔවුන් අවුරුද්දක් තිස්සේ tent එකක් ගහගෙන, උපවාස කරනවා. මේ වනවිට ඉතාම අසීරු තත්ත්වයකට ඔවුන් පත් වෙලා තිබෙනවා.

අපි දන්නවා, එදා කොළඹ-මාතර highway එක හදනකොට, ගාල්ල highway එක හදනකොට මේ ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් ඇසුවේ, "ඇඹුල් තියල් ගෙනියන්නද?" කියලා බව. හැබැයි, අද ආණ්ඩුවේම අමාත්‍යවරුන් මේ තිබෙන highwaysවල වටිනාකම, ඒ වාගේම මාර්ග පද්ධතිවල වටිනාකම තේරුම් ගැනීම පිළිබඳව අපි සතුටු වෙනවා. නමුත් දුකටත් කාරණයක් තිබෙනවා. ඒ තමයි එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා highway එකක් හදනකොට, එක කිලෝමීටරයකට යෙදවූ මුදල වාගේ දෙගුණයක් අද වැය වෙන එක. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ කටයුතු කරනකොට ඇසුවේ, "මේවා රත්තරන්වලින්ද, හදන්නේ?"

කියායි. හැබැයි, අද ඒ වාගේ දෙගුණයක් වැය කර තමයි මේ මාර්ග පද්ධතිය හදන්නේ. ඒක තමයි අද රටේ ඇත්ත. එදා රාජපක්ෂ පාලනයට පාරවල් හදද්දී දූෂණ චෝදනා එල්ල කළා. හැබැයි, අද ඒ සියල්ලම බොරු වෙලා තිබෙනවා. අද මෙතුමන්ලා ඒ වාගේ දෙගුණයක් වැය කර තමයි මේ පාරවල් හදන්නේ.

ඊළඟට, අගමැතිතුමා දිගින් දිගටම කියනවා, රටේ ආර්ථික අර්බුදයක් නැහැ කියා. හැබැයි, එළියට බැහැලා ජනතාව හමු වුණා නම්, ජනතාව ඉන්නා අර්බුදය කෙසේද කියා මේ ආණ්ඩුවට තේරුම් ගන්න පුළුවන් වෙයි. අද මෙතැනදී රටේ ආර්ථික අර්බුදයක් නැහැ කිව්වාට, අද ආර්ථික සංවර්ධන වේගය සියයට 7.2 සිට 3.2 දක්වා කඩා වැටිලා. විරැකියාව වැඩි වෙනවා. අද උද්ධමනය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම අද ඩොලරයේ වටිනාකම වැඩි වෙලා. අද ඩොලරයට ගෙවන රුපියල් ප්‍රමාණය එන්න-එන්නම වැඩි වෙනවා. ඒ වාගේම තෙල් මිල වැඩි වෙනවා. හැබැයි, රටේ අමාත්‍යවරුන් කියනවා, අද රට තුළ කිසිම ප්‍රශ්නයක් නැහැ; ආර්ථික අර්බුදයක් නැහැ කියා. අපි දන්නවා, මේ හැම දේටම මෙතුමන්ලා නිදහසට කාරණය විධියට කියන්නේ, "මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ණය" කියලා බව. හැබැයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා අවුරුදු දහයටම ගත්තේ ට්‍රිලියන පහයි. මේ ට්‍රිලියන පහ ඇතුළේ තමයි දවසට කෝටි තිස්තුනක් වැය වුණු යුද්ධයක් රටේ තිබුණේ. ඒ යුද්ධය ඉවර කළා, මහාමාර්ග පද්ධතිය හැදුවා, යෝධ සංවර්ධන ව්‍යාපෘති කළා. මේ සියලුම දේ කරන්න වැය වුණේ, බිලියන 5,000යි.

හැබැයි, අද වෙනකොට මහින්ද රාජපක්ෂ මැතිතුමන්ලා, රණ විරුවන් ඉවර කරපු යුද්ධයට අයිතිකාරයෝ ගොඩායි. මේ දවස්වල රූපවාහිනිය නරඹනකොට, අපිට ඒ වාගේ අයිතිකාරයන් දවස ගණනේ දකින්න පුළුවන්. මුලින්ම සරත් ෆොන්සේකා මැතිතුමා කිව්වා, "එතුමා තමයි සියයට 100ක් මේ යුද්ධය ඉවර කළේ." කියා. ඊට පසුව අපි දැක්කා, ඊයේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය කියනවා, එතුමිය සියයට 93ක් මේ යුද්ධය ඉවර කර තමයි රට භාර දුන්නේ කියා. වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කියනවා, "අමාරුම කාලයේ, අන්තිම සති දෙකේ යුද්ධය කළේ මම" කියා. ඒ වාගේම අපි දැක්කා, ඊයේ චම්පික රණවක ඇමතිතුමා කියනවා, එතුමා තමයි මේ යුද්ධය ඉවර කළේ, මහින්ද රාජපක්ෂ මැතිතුමා බයයිද, කියා. හැබැයි, ඇත්තටම යුද්ධය ඉවර කළේ කවුද?

යුද චෝදනා එල්ල වෙන්නේ, මානව හිමිකම් චෝදනා එල්ල වෙන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට, ගෝඨාභය රාජපක්ෂ මහතාට හා රණ විරුවන්ටයි. හැබැයි යුද්ධය අවසන් කළාය කියලා අයිතිවාසිකම් ගන්න නම් ඕනෑ තරම් අය ඉන්නවා. අපි දකින්නේ නැහැ නේ, චම්පික රණවක ඇමතිතුමාට මෙහෙම චෝදනා එල්ල වෙනවා. අපි දකින්නේ නැහැ, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මෙහෙම චෝදනා එල්ල වෙනවා; චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියට මෙහෙම චෝදනා එල්ල වෙනවා. හැබැයි චෝදනා එල්ල වෙන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාටයි. කරපු හොඳ වැඩ ටික මේ ආණ්ඩුවෙන් ගන්න තමයි උත්සාහ කරන්නේ. මේ සියලුම දේවල් කරන්නත් එදා වැය වුණේ රුපියල් බිලියන 5,000යි. හැබැයි අද රුපියල් බිලියන 4,500ක් මේ ආණ්ඩුව අරගෙන තිබෙනවා. ඒ මුදල්වලින් මොනවාද කළේ? කරපු දෙයක් අපට පෙනෙන්න නැහැ. පාරක් හදන්නේ නැහැ, සංවර්ධන ව්‍යාපෘති නැහැ. හැබැයි මේ ආණ්ඩුව විශාල ණය ප්‍රමාණයක් ගන්නවා. එක පැත්තකින් රුපියල් බිලියන 4,500ක් ගන්න ගමන් රටේ තිබෙන බදු දෙගුණ කරලා බදුවලින් තව රුපියල් බිලියන 1,000ක් ගන්නවා. ඒ මුදල්වලට මොකද වුණේ? ඒ ප්‍රශ්නය නිසා තමයි අද රටේ උද්ඝෝෂණ වැඩිවෙලා තිබෙන්නේ.

අපි දැක්කා, අද වතු කම්කරුවන් එළියට බැස්සා. වතු කම්කරුවන් දවසකට රුපියල් 1,000ක් ඉල්ලන්නේ ඇයි? ඒ, මේ රටේ තිබෙන බදු වැඩියි. අද වක්‍ර බදු සියයට 100ක් වැඩි කරනකොට වතු කම්කරුවන්ගේ ඉල්ලීම් සාධාරණයි. අද වතු හිමියනුත් අසරණවෙලා ඉන්නවා. අද වතු හිමියන්ගෙන් අය කරන බදු පවා සියයට 100ක් වැඩිවෙලා තිබෙනවා. වතු හිමියන්ටත් බදු වැඩි වෙනවා, වතු කම්කරුවන්ටත් බදු වැඩි වෙනවා. එතකොට දෙපැත්තේම ඉල්ලීම් සාධාරණයි. වතු කම්කරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්ම මේ පාර්ලිමේන්තුවට ආපු අමාත්‍යවරු, මන්ත්‍රීවරු මේ ආණ්ඩුවේ ඉන්නවා. හැබැයි එතුමන්ලාගේ වරප්‍රසාද හරියාකාරව ලැබෙනවා. වතු කම්කරුවන්ගේ ප්‍රශ්නයට විසඳුමක් දෙනවා නම්, එක්කෝ වතු හිමියන්ගෙන් අය කරන බදු අඩු කරන්න ඕනෑ, එහෙම නැත්නම් වතු කම්කරුවන්ගෙන් අය කරන බදු අඩු කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් රුපියල් 500ක්, රුපියල් 600ක් අරගෙන ඒ කම්කරුවන් ජීවත් වෙන්නේ කොහොමද? මේ එක කණ්ඩායමක් විතරයි. සියලුම ක්ෂේත්‍රවල ජනතාව එළියට බහින එක වැඩි ඇතක නොවෙයි. තෙල් මිල බලද්දී, අත්‍යවශ්‍ය භාණ්ඩ මිල බලද්දී, පඩිය බලද්දී සියලුම ජනතාව එළියට එනවා. ඒක නවත්වන්න බැහැ. අද තෙල් මිල වැඩි කරන්න මිල සූත්‍රයක් තිබෙනවා. හැබැයි ජනතාවගේ පඩි වැඩි කරන්න කිසිම සූත්‍රයක් නැහැ. අද විශ්වවිද්‍යාලයට යන ළමයාගේ මහපොළ ශිෂ්‍යත්ව අරමුදල වැඩි කරන්න සූත්‍රයක් නැහැ, සමෘද්ධිය වැඩි කරන්න සූත්‍රයක් නැහැ, පඩිය වැඩි කරන්න සූත්‍රයක් නැහැ. හැබැයි තෙල් මිල වැඩි කරන්න සූත්‍රයක් තිබෙනවා. අනික් හැම දෙයම වැඩි කරන්න සූත්‍රයක් තිබෙනවා. හැබැයි ජනතාවට සේවයක් වන සූත්‍රයක් අපි දකින්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආර්ථික අර්බුදයට ප්‍රධානම හේතුව මොකක්ද? ප්‍රධානම හේතුව තමයි බැඳුම්කර වංචාව. එදා බැඳුම්කර වංචාව සිදුවෙලා මාස තුනක් ඇතුළත බැඳුම්කරවල තිබුණු විදේශ ආයෝජන රුපියල් බිලියන 7,000ක් රටින් ගෙන ගියා. ඒවායේ ප්‍රතිඵල හැටියට තමයි මේ ඩොලර් එකේ අගය වැඩි වෙන්නේ. මෙතුමන්ලා මේ ආණ්ඩුවේ හිටපු මේ අවුරුදු තුනට විතරක් බැඳුම්කරවල හා කොටස් වෙළෙඳ පොළේ තිබුණු රුපියල් බිලියන 15,000ක් පිට රටට ගෙන ගොස් තිබෙනවා. ඒවායේ ප්‍රතිඵල තමයි මේ බැඳුම්කර වංචාවත්. පෙබරවාරි මාසයේදියි මේ වංචාව සිදු වෙන්නේ. හැබැයි අද වන කල් ඒවායේ පරීක්ෂණ සිදු වෙන්නේ නැහැ. ප්‍රාදේශීය සභා මැතිවරණයටත් කලින් කොමිෂන් සභා වාර්තාව ආවා. ඒ වාර්තාවේ ඉංග්‍රීසි පිටපත විතරයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ. අද වනකොට ඉංග්‍රීසි පිටපත ඉදිරිපත් කරලා මාස 10ක් ගතවෙලා තිබෙනවා. මාස 10ක් යන කල්, මේ වාර්තාව දෙමළ භාෂාවට සහ සිංහල භාෂාවට පරිවර්තනය කරන්න බැරිද? මාස 10ක් ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? ඔබතුමන්ලා කරන්නේ මේක යට ගහන එකයි. අද අර්ජුන් ඇලෝසියස් විතරක් හිරේ දමා තිබෙනවා. බැඳුම්කර වාර්තාවේ අර හංගපු කොටසේ තමයි අගමැතිතුමාට විරුද්ධව තිබෙන චෝදනා තිබෙන්නේ. ඒ හංගපු කොටසේ තමයි ආණ්ඩු පක්ෂය පැත්තේ ඉස්සරහ පේළියේ ඉන්න වැඩිදෙනකුට විරුද්ධව තිබෙන චෝදනා තිබෙන්නේ. සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමාට විරුද්ධව චෝදනා තිබෙන්නේ ඒ කොටසේයි, රවි කරුණානායක මන්ත්‍රීතුමාට විරුද්ධව චෝදනා තිබෙන්නේ ඒ කොටසේයි. සරත් ෆොන්සේකා ඇමතිතුමාට, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට හා මේ බැඳුම්කරයේ සල්ලි ගත්ත සියලුදෙනාටම විරුද්ධව චෝදනා තිබෙන්නේ ඒ කොටසේයි. ඒ කොටස විතරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැහැ. ඒ කොටස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැත්තේ ඇයි? අර්ජුන් ඇලෝසියස් තනියමද මේ හොරකම් කළේ? නැහැ. මේ ආණ්ඩුවේ අගමැතිතුමා ඒකට වග කියන්න ඕනෑ, මේ ආණ්ඩුවේ ඉන්න ඇමතිවරු ඒකට වග කියන්න ඕනෑ. හැබැයි ඒ ගොල්ලන්ට විරුද්ධව පරීක්ෂණ සිදු වෙන්නේ නැහැ. අර්ජුන් ඇලෝසියස්

[ගරු ඩී. වී. චානක මහතා]

විතරයි හිර ගෙදරට දමා තිබෙන්නේ. ඒ දෙයම තමයි හෙට අනිද්දා වෙන්නේ. රටේ ජනාධිපතිතුමා ඝාතනය කරන්න, ඒ වාගේම හිටපු ආරක්ෂක ලේකම්තුමා ඝාතනය කරන්න කුමන්ත්‍රණය කළාය කියන චෝදනාවට නාලක ද සිල්වා විතරක් හිර ගෙදරට දමා තිබෙනවා. එදා අර්ජුන් ඇලෝසියස් හිරේට දමනකොට අගමැතිතුමා අර්ජුන මහේන්ද්‍රන් පිට රටට යැව්වා. අද නාලක ද සිල්වා ගෙන ගොස් හිරේට දමනකොට අගමැතිතුමා පොලිස්පතිතුමා අනිවාර්යයෙන්ම පිට රට යවනවා, මේක හංගගන්න. මේවා පිටි පස්සේ ඉන්නේ මේ ආණ්ඩුවේ අගමැතිතුමායි. මේවා පිටි පස්සේ ඉන්නේ අමාත්‍යවරුයි. ඒ සම්බන්ධයෙන් පැහැදිලි සාක්ෂි තිබෙනවා. හැබැයි අද වෙද්දී ඒ කිසිවක් එළියට එන්නේ නැහැ. මොකද, පොලිස්පතිවරයා වශයෙන් ඉන්නේ මේ ආණ්ඩුවේ පොලිස්පතිවරයෙක්. මේ ආණ්ඩුවට කඩේ යන එක්සත් ජාතික පක්ෂ පොලිස්පතිවරයෙක් ඉන්නේ. ඒ නිසා අද ඕනෑ ඕනෑ විධියට නීතිය නැවෙනවා.

අපේ ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාව හිර ගෙදරට දාන්න ඕනෑ වුණාම, මෙතුමන්ලා බිල්පත් වෙනස් කරනවා. FCID එක හරහා බිල්පත් වෙනස් කරලා, බිල්පත් tippex කරලා, තමන්ට ඕනෑ ඒවා ලියලා තමයි FCID එකෙන් හිරේ දාන්නේ. හැබැයි, බැදුම්කර වංචාවට පැහැදිලි සාක්ෂි තිබෙන මේ ආණ්ඩුවේ කවුරුවත් හිරගෙදරට යනවා අපට පෙනෙන්නේ නැහැ. හිර ගෙදරට නොවෙයි, අඩු ගණනේ CID එකට ප්‍රශ්න කිරීමකට යනවා අපට පෙනෙන්නේ නැහැ; FCID එකට යනවා අපට පෙනෙන්නේ නැහැ. මේ කිසිම දෙයක් පෙනෙන්න නැහැ. අපි "Top 10" කියලා අමාත්‍යවරු 10කට විරුද්ධව පරීක්ෂණ ඉල්ලා තිබෙනවා. සාක්ෂිත් එක්කයි අපි මේ පැමිණිලි කළේ. කෝ, ඒවාට පරීක්ෂණ? අද ඒවා නැහැ. අද ඒවා යටගහලායි තිබෙන්නේ. අද මේ ආණ්ඩුව කරන්න දන්නේ එක දෙයයි. හොරකම් කරන්නයි, ජාතික සම්පත් විදේශීයකරණය කරන්න විතරයි මේ ආණ්ඩුව දන්නේ. ෂැන්ග්‍රි-ලා එකට අක්කර හයක් දුන්නා කියලා එදා මෙතැන හිටපු සියල්ලෝම මහින්ද රාජපක්ෂ මැතිතුමාට දොස් කිව්වා; එතුමාට චෝදනා කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර 30ක් දෙන්න.

හැබැයි, අද වෙද්දී, "හිල්ටන්" හෝටලය දෙනවා; "ග්‍රෑන්ඩ් හයිට්" හෝටලය දෙනවා; කොළඹ වරායේ නැහෙනහිර පර්යන්තය දෙනවා. හම්බන්තොට වරාය දුන්නා, මත්තල ගුවන් තොටුපොළ දුන්නා. මෙහෙම ගිහිල්ලා රටේ ජාතික සම්පත් සියල්ලම මේ ආණ්ඩුව විකුණන බව තමයි අපට පෙනෙන්නේ. ඒක නිසා මේවා වහාම නැවත්විය යුතුයි. එහෙම නැත්නම් අපට ඉන්න රටක් නැති වේවි. ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තූතියි. ඊළඟට, ගරු චන්දිම ගමගේ මහතා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.37]

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සක්‍රිය වගකීම් කළමනාකරණ පනත යටතේ යෝජනාව සහ මහා මාර්ග අමාත්‍යාංශ වැය ශීර්ෂයට පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන විවාදයයි අද දිනයේ පැවැත් වෙන්නේ. නමුත් මේ විවාදය පුරාවට අපි දැක්කේ මේ කරුණු කාරණා ගැන කථා කිරීමක් නොවෙයි. මේ කරුණු කාරණාවලට පරිබාහිර කරුණු කාරණා ගැන කථා කරමින් කාලය ගත කළා.

විශේෂයෙන් මම මෙහිදී මතක් කරලා දෙන්නට ඕනෑ, විකිණීම සහ බදු දීම කියන දෙක අතර වෙනස. විකිණීම කියන්නේ එකක්, 99 අවුරුද්දට බදු දීම කියන්නේ එකක්. ඒ විධියට බදු නොදී දීපු ආයතන අපේ රටේ නැතුවා නොවෙයි. ප්‍රීමා සමාගම අවුරුදු 20කට බදු දීලා පසුව රජයට අයිති වුණා. ඒක නිසා බදුදීම සහ විකිණීම කියන දෙකේ වෙනස හඳුනා ගන්න බැරි මන්ත්‍රීවරුන් පිරිසක් මේ සභාවේ සිටීම ගැන මම කනගාටු වෙනවා.

දිගින් දිගටම බැදුම්කර ගනුදෙනුව සම්බන්ධව චෝදනා එල්ල වුණා. අඩුම ගණනේ බැදුම්කර සිද්ධියට අදාළව කිසිම කෙනෙක් උසාවියට ගෙනිව්වේ නැහැ කියලා කිව්වා. හැබැයි, කොමිසමට ගියා. අගමැතිතුමාත් කොමිසමට ගිහිල්ලා උත්තර දුන්නා. අගමැතිතුමාව කොමිසමට ගෙන යන්න පුළුවන්, ඇමතිවරුන් කොමිසමට ගෙන යන්න පුළුවන්, ඇමතිවරුන් බලයෙන් පහ කරන්න පුළුවන්. ඒ වාගේ යහ පාලනයක් අද ක්‍රියාත්මක වෙනවා. බැදුම්කර සිද්ධිය සම්බන්ධයෙන් ඔය තිබෙන චෝදනාව ඉදිරියේදී විභාග වෙනවා කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ.

අද විශේෂයෙන්ම කියැවුණා, ඉන්ධන මිල සූත්‍රය ගැන. ඉන්ධන මිල සූත්‍රය කියන එක මේ රටේ විතරක් තිබෙන දෙයක් නොවෙයි. හැම රටකම ඉන්ධන මිල සූත්‍රයක් තිබෙනවා. හැබැයි, සාමාන්‍යයෙන් රටක් ඒ මිල සූත්‍රය එළියට දාන්නේ නැහැ. හැබැයි, දිගින් දිගටම ප්‍රශ්න කිරීමේදී මේ මිල සූත්‍රයත් එළියට දැම්මා. හැබැයි, මේ මිල සූත්‍රයේ එක කොටසක තිබෙනවා, මූල්‍ය කළමනාකරණය සඳහා අය වෙන මුදල් සහ පොලිය ගැන. ඒ වාගේම overheads තිබෙනවා. මේ වාගේ අංශ කිහිපයක් එකතු කරලා තමයි මේ මිල සූත්‍රය හදන්නේ. මතක තියා ගන්න, මූල්‍යමය පොලීවලට හෙජින් ගිවිසුමෙන් පාඩු වුණු මුදලේ පොලියත් එකතු වෙලා තිබෙන බව. අනුන්ට ඇඟිල්ල දික් කරන කොට තමන් වෙතත් ඇඟිලි කීපයක්ම දික් වෙනවා කියන එකත් ඔබතුමන්ලා මතක තියා ගන්න.

අද වෙන කොට මේ ඩොලරයේ කථාව දිගින් දිගටම කථා කරනවා. මතක තියා ගන්න ඕනෑ, ඩොලරයේ අගය බිඳ වැටීම පටන් ගත්තේ මීට අවුරුදු 10කට ඉස්සෙල්ලා කියලා. ඒ කාලයේ සිටම ඩොලරය ශක්තිමත් කරන ක්‍රමවේදයකට ඒ අය අවතීර්ණ වුණා. ඒ ඩොලර් එක ශක්තිමත් කරන්න ඇමෙරිකාවේ ජනාධිපතිවරයා දැඩි තීන්දු-තීරණ අරගත්තා. විදේශ රටවල තැන්පත් කරලා තිබුණු මුදල් නැවත තමන්ගේ රටට ගෙන්වා ගන්න අවශ්‍ය විධියට ඒ රටේ පොලී ප්‍රමාණයන් ඉහළ දැමීම කළා. ඒ තුළ ඒ රටට ඩොලර් ඇදී ඒමේ යම් කිසි නැඹුරුතාවක් ඇති වුණා. ඒක ඩොලර් එකේ මිල ඉහළ යාමට එක හේතුවක් බවට පත් වුණා. මම කියන්නේ නැහැ, හේතුව ඒක විතරමයි කියලා. විවිධ හේතු කිහිපයක් එකතු වෙලා අවුරුදු 10ක් තිස්සේ කරපු උත්සාහයක -ප්‍රයත්නයක- ප්‍රතිඵලයක් විධියට තමයි ඩොලරය ඉදිරියට යන්නේ. හැබැයි, අපි එහෙම නොවෙයි. එක රජයකින්

ණය අරගෙන යම් යම් ඉදිකිරීම් කරනවා; අසාර්ථක ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා. හැබැයි, තව රජයක් ඇවිල්ලා ඒක ගෙවනවා. ඒ ගෙවන කොට අර ණය ගත්තු කට්ටිය අහනවා, "අපි දැන් හැදුවා, ඔය ගොල්ලන් මොනවාද හැදුවේ?" කියලා. අපි ඒ ගත්තු ණය ගෙවනවා.

ගත්තාම ගෙවනවා. ගෙවන්නේ නැතුව ඉන්න බැහැ. ගෙවන්නේ නැතිව හිටියොත් අපට මේ රටේ ඉදිරි ගමනක් නැහැ කියන එක මතක තියා ගන්න ඕනෑ. යුද්ධය ගැන කථා කරනවා. මේ ආණ්ඩු වෙනස් වෙනකොට යුද අධිකරණ චෝදනාවක් තිබුණා කියන කරුණත් මතක් කර දෙන්න ඕනෑ. විදුලි පුටුවේ චෝදනාවක් තිබුණා. හැබැයි, අද ඒ සියලු දේවල් සමථයට පත් කර තිබෙනවා. එදා අපට විරුද්ධව විදුලි පුටුව ගැන කථා කරපු රටවල් අද අපේ සුළු ජාතීන්ගේ ප්‍රශ්නය විසඳීමට අපට අත දෙන්න කථා කරනවා; ආධාර, උපකාර දෙන්න කථා කරනවා. අද අපි සංහිඳියාව මල් එල ගන්වලා තිබෙනවා. මේවා අමතක කරන්න එපා. විවිධ ආයෝජන ගැන කියලා මුදල් අරගෙන වෙනත් දේවල් කරනවා කියලා කියනවා. එදා භාණ්ඩාගාරයට කියන්නේ නැතිව විවිධ අමාත්‍යාංශ, විවිධ ආයතන මූල්‍ය ආයතනවලින් සෘජු ණය අරගෙන තිබුණා. මේ ආණ්ඩුවෙන් එහෙම දේවල් සිද්ධ වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විදුලි බලය ගැන කථා කළා. මේ ආණ්ඩුව බලයට එනකොට සූර්ය බලශක්තිය "Grid Code" එකට එකතු කිරීමට හැකියාව තිබුණේ නැහැ. ජාතික විදුලි පද්ධතියට සූර්ය බලශක්තිය එකතු කිරීමට අවස්ථාව දුන්නේ නැහැ. අපි අවස්ථා ගණනාවක කොමිටිවල කථා කරලා, ඇමතිවරු එක්ක සාකච්ඡා කරලා, විදුලිබල මණ්ඩලය එක්ක තර්ක විතර්ක කරලා තමයි සූර්ය බලශක්තිය විදුලිබල පද්ධතියට ඇතුළත් කර ගත්තේ කියන එක මතක තියා ගන්න. නොරොච්චෝලේ බලාගාරය ගැන කථා කළා. ඒ කාලයේ නොරොච්චෝලේ බලාගාරය විසිනවවතාක් බිඳ වැටුණා. ඉන් පසුවත් වරක්, දෙවරක් බිඳ වැටුණා තමයි. හැබැයි, අද වන විට නොරොච්චෝලේ බලාගාරය නිසි ආකාරයෙන් කළමනාකරණය කර නඩත්තු කටයුතු කරගෙන යන බව මතක තබාගන්න. ඒ වාගේම රුපියල් 9 සිට රුපියල් 13 දක්වා අපි අද සූර්ය බලශක්තිය මිලදී ගැනීමේ මිල පහත දමා තිබෙනවා. එදා එහෙම සිද්ධ වුණේ නැහැ. එදා රුපියල් 30ට, 40ට තමයි මිලදී ගැනීම් සිද්ධ වුණේ. අද එම කටයුතු නිසි අයුරින් සිද්ධ කරගෙන යනවා. ඒ වාගේම 'සෙනොක්' ආයතනය හරහා පුත්තලමේ සුළං බලාගාරයක් ඉදි කිරීමට මේ වන විට අපි කටයුතු කරගෙන යනවා. එම නිසා අපි මොනවත්ම කළේ නැහැ, මොනවත්ම කළේ නැහැ කියනවාට වැඩිය ඒවා ගැන සොයා බලන්න. අපි මාධ්‍යයෙන් ප්‍රචාරය කරන්නේ නැති එක ඇත්ත. අපි media shows කරන්නේ නැති එක ඇත්ත. අපේ බල ප්‍රදේශවල කොපමණ පාරවල් හදලා තිබෙනවාද කියලා පාරට බැහැලා බලන්න. මගේ ආසනය ගැන බැලුවොත් මේ අවුරුදු 3 1/2 ඇතුළත පාරවල් 22ක් හදලා තිබෙනවා. මේ ආණ්ඩුවට තව අවුරුදු 1 1/2ක් තිබෙනවා. අපි ඕනෑම වේලාවක ඕනෑම මැතිවරණයකට මුහුණ දෙන්න ලැහැස්තියි කියන එක මම විශේෂයෙන් කියන්න ඕනෑ. අපි වැඩ කරලා තිබෙනවා. අවුරුදු ගණනක් මෝචරි නැතිව තිබූ රෝහල්වලට අපි මෝචරි ලබා දී තිබෙනවා. මේ රටේ පාසල් දරුවන්ට බොන්න වතුර තිබුණේ නැහැ වාගේම යන්න වැසිකිලි තිබුණේත් නැහැ. අපි ඒවාත් සකස් කර දී තිබෙනවා. පාසල්වලට "ළඟම පාසල-හොඳම පාසල" ව්‍යාපෘතිය මඟින් විශාල වශයෙන් මුදල් ලබා දී සංවර්ධන කටයුතු කරගෙන යනවා.

ඊළඟට, "Enterprise Sri Lanka" වැඩසටහන ගැන කථා කළා. "Enterprise Sri Lanka" වැඩසටහන ගැනත් යමක් කියන්න ඕනෑ. "Enterprise Sri Lanka" කියන්නේ එදා ලංකා පුත්‍ර බැංකුව හරහා භාණ්ඩාගාරයේ මුදල් තමන්ගේ දේශපාලන හෙංචියලාට ලබා දුන්නා වැනි ක්‍රමවේදයක් නොවෙයි. "Enterprise Sri Lanka" වැඩසටහනින් කරන්නේ මුදල් බැංකුවලට දෙන එක නොවෙයි. අදාළ ප්‍රතිලාභියාගේ - අදාළ ණයකරුවාගේ- පොලියෙන් සියයට 50ක් ආණ්ඩුවෙන් ගෙවන එකයි. ආණ්ඩුවෙන් දරන්නේ පොලියෙන් සියයට 50ක පංගුවක් විතරයි. එදා ලංකා පුත්‍ර බැංකුව හරහා සල්ලි බෙදපු විධිය අපි දැක්කා. ව්‍යාපෘති නැහැ. කිසිම දෙයක් නැහැ. අදාළ ඇමතිවරයා බැංකුවල නිලධාරීන්ට කෙළින්ම බලපෑම් කරනවා. ඒ හරහා එදා සල්ලි මංකොල්ල කාපු හැටි අපි දැක්කා. අද ඒවා සිද්ධ වෙන්නේ නැහැ, මිතුවරුනි. අපි ඒවා සිද්ධ වෙන්න ඉඩ තියලා නැහැ. හැබැයි, එක දෙයක් තිබෙනවා. මොන චෝදනා තිබුණත්, ඒ ඕනෑම චෝදනාවක් ඉදිරියේ ආණ්ඩුවට ඇඟිල්ල දිගු කිරීමට, ඇමතිවරුන් ගෙදර යැවීමට මේ ආණ්ඩුව තුළ හැකියාව තිබෙනවා.

අපේ විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා එක පැත්තකින් කියනවා, "රවි කරුණානායක මැතිතුමා හොඳයි." කියලා. ඊට පසුව කථා කළ කථිකයා කියනවා නරකයි කියලා. විපක්ෂය ඇතුළේම මත දෙකක් තිබෙනවා. විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා කියනවා, "රවි කරුණානායක මැතිතුමා ලෝකයේ හොඳම මුදල් ඇමති වුණා." කියලා. ඒක අපිත් දන්නවා; අපි පිළිගන්නවා. හැබැයි, චෝදනා ආවාට පසුව ඇමතිකමින් ඉවත් කර තිබෙනවා. හැබැයි, එකම පක්ෂයේ, එකම විපක්ෂයේ ඉඳගෙන එක පැත්තකින් කියනවා රවි කරුණානායක මැතිතුමා හොඳයි කියලා; අනෙක් පැත්තෙන් කියනවා නරකයි කියලා. එම නිසා ඔබතුමන්ලා මත දෙකක ඉන්නේ. ඔබතුමන්ලා තනි මතයේ නැහැ. ඔබතුමන්ලා හිතෙන, හිතෙන පැත්තට කථා කළාට එක මතයක නැහැ කියන එක හොඳට මතක තියා ගන්න. විශේෂයෙන් පසුගිය ජනාධිපතිවරණය පැවැත්වුයේ වෙන මොකක්වත් නිසා නොවෙයි, ණය ගෙවන්න බය නිසායි කියා මම පැහැදිලිව කියනවා.

හැබැයි, ඒ අභියෝගය භාරගෙන අපි ණය ගෙවා ගෙන යනවා. අපේ ඇතැම් මැති ඇමතිවරුන්ට විරුද්ධව යම් යම් චෝදනා තිබෙනවා. මම ඒක ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ඒවා ඔප්පු වෙනවා නම් අනිවාර්යයෙන් ඒ උදවියත් හිරේ යන්න ඕනෑයි කියන දැඩි ස්ථාවරයේ අපි ඉන්නවා. මොකද, අපි මේ ආණ්ඩුව හැදුවේ විවිධ අභියෝගවලට මුහුණ දීලායි. එදා අපට රැස්වීමක් තියන්න පිට්ටනියක්වත් දුන්නේ නැහැ. අපි නගරයෙන් කිලෝ මීටර් 10,15 ඈතට ගිහිල්ලායි රැස්වීම් පැවැත්වුවේ. එහෙම කරලායි අපි මේ ආණ්ඩුව හැදුවේ. ඒ නිසා කවුරුත් කියන කියන පදේට නටන්න අපි ලැහැස්ති නැහැ. අපි ඕනෑම අභියෝගයකට මුහුණ දීලා මේ රට ඉදිරියට ගෙන යනවායි කියන එක සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.47]

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ පරිපූරක මුදල සහ සක්‍රීය වගකීම් කළමනාකරණ පනත යටතේ යෝජනාව අද විවාදයට ගෙන තිබෙනවා.

[ගරු ජානක වක්කුඹුර මහතා]

මට ඉස්සෙල්ලා කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, සුළං බලය උපයෝගී කරගෙන විදුලිය දෙන්න ඒ ගොල්ලන් කටයුතු කරනවා කියලා. පළමුවරට එවැනි විදුලි බලාගාරයක් ඩෙන්මාර්ක් ආධාර යටතේ, 1997 වර්ෂයේ හම්බන්තොට ඉදි කළ බව එතුමා දන්නේ නැතිව ඇති. මෑතක් වනතුරුම ඒ බලාගාරය වැඩ කළා. හැබැයි, මේ ආණ්ඩුව හම්බන්තොට වරාය චීනයට විකුණුවාට පස්සේ ඒ විදුලි බලාගාරය වෙනුවෙන් චීනයට බදු ගෙවන්න සිද්ධ වුණා. අපේ රටේ, අපේ ආණ්ඩුවෙන් හදාපු අපේ විදුලි බලාගාරය වෙනුවෙන් චීනයට බදු ගෙවන්න සිද්ධ වුණා. දැන් ඒ විදුලි බලාගාරය ගලවනවා. මා දන්නේ නැහැ මොකක්ද හේතුව කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(මාණ්පුමිකු උறුප්පිනර් ඉරුවර්)
(An Hon. Member)
චීන්නු ගලවන්න කියලා ඇති.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
චීන්නු ගලවන්න කිව්ව නිසා ගලවනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)**
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා - මින්වලු මට්රුම් පුදුප්පික්කත් තක්ක සක්ති ඉරාජාංග අමైච්චර්)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
Sir, I rise to a point of Order.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, කියන්න දෙයක් තිබෙනවා නම් ඔබතුමාගේ වේලාවේදී කියන්න, මගේ කාලය ගන්නේ නැතිව. මොකද, මට හම්බ වෙලා තිබෙන්නේ විනාඩි 10යි. ඔබතුමාගේ වේලාවේදී උත්තර දෙන්න. තමුන්නාන්සේලාට ආණ්ඩුවක් හැටියට ඒ විදුලි බලාගාරය ගලවන්නේ නැතිව තියාගන්න පුළුවන්කමක් නැහැ. තමුන්නාන්සේලාට පුළුවන් නම් ඒක ගලවන්නේ නැතිව තියා ගන්න. [බාධා කිරීම්] චීන ආණ්ඩුවට දීපු නිසා ඒක ගලවා කෞතුක වස්තුවක් හැටියට තියා ගන්න හදනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපේ තිබුණු විදුලි බලාගාරයක් චීනයට බදු දීලා, දැන් ගලවන එක ගැන ලජ්ජා වෙන්න ඕනෑ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමා, උත්තරය අහන්න කැමැති නැද්ද?

**ගරු ජානක වක්කුඹුර මහතා**
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
හොඳයි, කියන්නකෝ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
මට මයික් එක දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් සුළං විදුලි බලාගාරයක ආයු කාලය අවුරුදු 20යි. ඒ බලාගාරවල ආයු කාලය දැන් ඉකුත් වෙලා තිබෙනවා. ඒ බලාගාර 5න් දෙකක් දැන් වැඩ කරන්නේම නැහැ. යන්ත්‍ර සූත්‍ර දිරලා කැඩිලා තිබෙන්නේ. බලාගාර 03ක යන්ත්‍රවල යන්තමින් පෙති කැරකෙනවා. කාර්යක්ෂමතාව ඉතා අඩුයි. අපි ඒ ඉතිරි බලාගාර ඒ තිබෙන ස්ථානයෙන් ගලවා, සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පුනර්ජනනීය බලශක්ති බලාගාර තිබෙන ස්ථානයේ -දැනටමත් කුඩා සූර්ය බලාගාරයක් තිබෙනවා. ඒක පාසල් දරුවන්ට, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට ප්‍රයෝජනවත් පර්යේෂණ කරන තැනක්.- නැවත ස්ථාපනය කරනවා. අවුරුදු 20කට පස්සේ මෙවැනි බලාගාර පවත්වා ගෙන යාමේ වටිනාකමක් නැහැ.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට දැන් පැහැදිලියි. මගේ කාලය යන්නේ. මා ඔබතුමාගෙන් අහනවා, එහෙනම් මොකටද අලුතින් හදන්නේ කියලා. කාලය ඉවර නම් ඒකේ අලුත් දෙයක් කරන්න පුළුවන්. තමුන්නාන්සේලා චීනයට බදු ගෙවන්නේ නැද්ද? තමුන්නාන්සේලා චීනයට බදු ගෙවනවා. [බාධා කිරීම්] බොරු කියන්න එපා. චීනයට බදු ගෙවනවා. පුළුවන් නම් "නැහැ" කියන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා එක්ක කථා කරලා වැඩක් නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
පොඩ්ඩක් ඉන්නකෝ, අහ ගන්න. පාසල් ළමුන්ට බලන්න පැරණි බඩු තියනවා. එහෙම දෙයක් කරන්නේ. අවුරුදු 20කට පස්සේ-

**ගරු ජානක වක්කුඹුර මහතා**
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
පාසල් ළමුන්ට පෙන්වන්න ආණ්ඩුවේ තිබෙන ඒවා ගලවන්න ඕනෑ නැහැ. ගලවන්න වෙලා තිබෙන්නේ චීනයට දීපු නිසායි. තමුන්නාන්සේලා බොරු කියන්න එපා. චීනයට විකුණුවා. [බාධා කිරීම්] හම්බන්තොට වරාය චීනයට විකුණපු නිසා තමයි ඒ බලාගාරය ගලවන්න සිද්ධ වුණේ. එහෙම නැතිව වෙන හේතුවක් නිසා නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ පරිපූරක මුදල් හරහා අද මෙච්චර ලොකු මුදලක් වෙන් කරලා තිබුණත්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

*විසින් ස්ථිර කරන ලදී*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு துஷார இந்துனில் அமரசேன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. K. THURAIRETNASINGAM left the Chair, and THE HON. THUSHARA INDUNIL AMARASENA took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පරිපුරක මුදල හරහා මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට විශාල මුදලක් වෙන් කර තිබෙනවා. මගේ දිස්ත්‍රික්කයේ නොවෙයි, ගම්පහ දිස්ත්‍රික්කයේ අයෙකු අද මට "ෆැක්ස්" එකක් එවා තිබෙනවා, කුකුළේ ගඟ ජල විදුලි බලාගාරය වෙනුවෙන් හදාපු මාර්ගයට අදාළ වන්දි මේ වනතුරු ගෙවා නැහැ කියලා. පාර්ලිමේන්තුවේ අපේ කථානායක, ගරු කරු ජයසූරිය මැතිතුමා 2003දී ගිහිල්ලා - අපේ විජේතුංග මන්ත්‍රීතුමා එතකොට කලවාන ආසනයේ සංවිධායකතුමා- කුකුළේ ගඟ ජල විදුලි බලාගාරය විවෘත කළා. ඒ වෙනුවෙන් හදාපු මාර්ගයේ වන්දි මුදල් තවම ගෙවා නැහැ.

විසිඑක් ලක්ෂයක් ගෙවන්න තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමා මේ මස 19 වෙනි දා ආයෙත් ලියුමක් එවලා තිබෙනවා, චෙක් එක ලියලා තිබෙනවා, සල්ලි නැහැ කියලා. 2003දී කරු ජයසූරිය මැතිතුමා විවෘත කරපු ජල විදුලි බලාගාර මාර්ගයේ වන්දි මුදල තවම ගෙවලා නැහැ. අවුරුදු 20කට ආසන්න කාලයක් ගිහිල්ලාත් ඒ මිනිසුන්ට වන්දි මුදල් ගෙවලා නැහැ. එම නිසා මම මහාමාර්ග ඇමතිතුමාට කියනවා ඒ මුදල් ගෙවන්න කටයුතු කරන්න කියලා.

2015 අය වැය ලේඛනයේ තිබුණා, "රත්නපුර අධිවේගී මාර්ගය හදනවා" කියලා. 2016 අය වැය ලේඛනයේත් තිබුණා. 2017 අය වැය ලේඛනයේත් තිබුණා. නමුත් 2018 අය වැය ලේඛනයේ තිබුණේ නැහැ. පාර්ලිමේන්තුවේ සභානායකතුමා මහාමාර්ග ඇමතිවරයා හැටියට ඉන්න කොට මා එතුමාගෙන් පෞද්ගලිකවත් ඉල්ලීමක් කළා, එතුමාගේ ගමත් කිරිඇල්ල ප්‍රදේශය නිසා මේ මාර්ගය හදන්න කියලා. මේ අවුරුද්දේ ඒ මාර්ගයට සත පහක්වත් වෙන් කරලා නැහැ. මෙය රත්නපුරයට තිබෙන අඩුපාඩුවක්. එම නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා, අඩුම වශයෙන් 2019දිවත් මුදලක් වෙන් කරලා මෙම අධිවේගී මාර්ගය හදන්න කටයුතු කරන්න කියලා. පානදුර පාරේ ඉංගිරියේ ඉඳලා රත්නපුරයට යනකොට කිලෝමීටර් 16ක් තුළ වංගු 100ක් තිබෙනවා. අධිවේගී මාර්ගය හදන්න බැරි නම් ඒ වංගු ටික අයින් කරලා ඒ පාර හදන්න පුළුවන්. අඩුම තරමින් ඒ පාරවත් හදන්න කියලා මම එදා කිව්වා.

රත්නපුර නගරයේ bypass එකක් හදන්න තිබුණා. මම දන්නවා, මේ ආණ්ඩුව ආවාට පසුව අපේ විජේතුංග මන්ත්‍රීතුමා ඒක හදන්න ලොකු උත්සාහයක් ගත්ත බව. ඒකට මුදල් තිබුණා. ඒ මුදල් නුවර අධිවේගී මාර්ගය හදන්න ගත්තා. රත්නපුරයේ ටවුන් එකේ කිලෝමීටර් තුනක් යන්න විනාඩි 45ක් යනවා. බදුල්ලට යන, එහෙම නැත්නම් කතරගම පැත්තට යන, ඇඹිලිපිටිය පැත්තට යන ඔක්කෝම වාහන එතැනින් යන්නේ. නගරය මැද්දේ පුංචි පාරක යනකොට එතැනට විනාඩි 45ක්වත් යනවා. ඒ bypass එක හදන්න අවශ්‍ය සියල්ල කරලා තිබෙනවා. දැන් ඒ කටයුත්තවත් කරන්න මුදල් නැතිව ඉන්නවා.

මගේ මැතිවරණ කොට්ඨාසයේ තිබුණු ලොකුම පාරවල් මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව කාලයේ අපි හැදුවා. රත්නපුරයේ ඉඳන් කලවානට හැදුවා. කලවාන ඉඳන් මතුගමට හැදුවා. රක්වානට යාවෙන කලවාන-රක්වාන මාර්ගයේ කිලෝමීටර් 40න්, කිලෝමීටර් 34ක් හැදුවා. කිලෝමීටර් 6යි ඉතිරි වෙලා තිබුණේ. අද වෙනකල් ඒ ටිකවත් හදලා නැහැ. අපි හැම දාම මේ ආණ්ඩුවට මේවා කරන්න කියලා පෙන්වලා දෙනවා. හැබැයි, කරන්නේ නැහැ. අගමැතිතුමා කියලා තිබුණා, මහින්ද රාජපක්ෂගේ කාලයේ අධිවේගී මාර්ග හැදුවේ කිලෝ මීටර් 182යි, අපි කිලෝමීටර් 185ක් හැදුවා කියලා. මම අහනවා, ඒවා හැදුවේ ඉන්දියාවේ ද කියලා. අපේ රටේ පාරවල් හදලා තිබෙනවා නම් විවෘත කරලා ඒවායේ යන්න තියෙන්න ඕනෑ. කොහේ හරි මුල්ගලක් තියලා එහෙන් මෙහෙන් පස් ටිකක් දාලා බෝක්කුවක් දැම්මාට වැඩක් ඉවර වෙලා නැහැ. අවුරුදු 9ක් ගිහිල්ලා හරි චීනයේ ඉඳලා හොංකොංවලට මුහුදු මතින් යන්න කිලෝමීටර් 55ක් දිග පාලමක් හැදුවා. නමුත් රත්නපුරයට යන්න කිලෝමීටර් 50ක මාර්ගයක් අපේ රටේ තවම හදන්න බැරි වුණා. චීන ආණ්ඩුවට පුළුවන් වුණා, මුහුදු මැද්දෙනුත් මුහුදු යටිනුත් යන්න පුළුවන් විධියේ මාර්ගයක් හදන්න.

මේ ආණ්ඩුව බලයට පත් වන විට කිව්වේ, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුවෙන් හොරකම් කළා. නැත්නම් මේ වාගේ පාරවල් 10ක් හදන්න තිබුණා කියලා. නමුත් අද පාරවල් 10ක් තියා එක පාරක්වත් හදන්නේ නැහැ. එහෙම වැඩ කොටසක් කරයි ද කියලා මේ රටේ මිනිස්සු බලාගෙන ඉන්නවා. නමුත් එහෙම වැඩ කොටසක්වත් කරන්නේ නැහැ. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලන්නේ එදා කියපු දේ අද ඉෂ්ට කරන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරයෙක් තෙල් මිල ගැන කිව්වා. ඔන්න දැන් ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වෙලා තිබෙනවා. බොරතෙල් බැරලයක මිල ඩොලර් 84ට ගිය වෙලාවේ ඔබතුමන්ලා මිල වැඩි කළා. දැන් බොරතෙල් බැරලයක මිල ඩොලර් 75ට අඩු වෙලා තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා, ලබන 10 වෙනි දා වෙනකොට ඩොලර් 75ට සාපේක්ෂව මේ රටේ ජනතාවට සහනය ලැබෙයි කියලා. ඒ නිසා මේ ආණ්ඩුවට කියනවා, අර විදුලි බලාගාර ගලවනවා වාගේ හෙට අනිද්දා වනකොට මේ රටේ ජනතාව මේ ආණ්ඩුව ගලවනවා කියලා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට

[ගරු ජානක වක්කුඹුර මහතා]

යන්න වෙන්නේ කටුගෙට තමයි. වැඩි දවසක් යන්න ඉස්සෙල්ලා අපි මේ ආණ්ඩුව ගෙදර යවලා, රටේ ජනතාව වෙනුවෙන් වැඩ කරන්න පුළුවන්, මිනිස්සු බලාපොරොත්තු වන දේ ඉෂ්ට කරන්න පුළුවන් ආණ්ඩුවක් හදන්න කටයුතු කරන බව කියමින්, මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා. ඔබතුමාට විනාඩි 08ක් තිබෙනවා.

[අ.භා. 4.57]

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් සාකච්ඡාවක් සිදු වන මොහොතේ මටත් කථා කරන්න අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මට පෙර කථා කරපු අපේ ගරු මන්ත්‍රීතුමා, එතුමාගේ කථාවේදී ඉල්ලීමක් කළා, රත්නපුර ප්‍රදේශයට අධිවේගී මාර්ගයක් සකස් කරන්න කියලා. ඒ ගැන මම පුදුම වනවා. මොකද, රූපවාහිනී විවාදයකට හෝ වෙනත් වැඩසටහනකට ආ විට එතුමා රට ඉදිරියේ කියන්නේ, මේ රටේ පාරවල් හැදුවේ පසුගිය ආණ්ඩුව -මහින්ද රාජපක්ෂ ආණ්ඩුව- බවයි. එතුමා කථා කරන්නේ එතුමන්ලා පාරවල්වල නිර්මාතෘවරු වාගේයි. හැබැයි, අවුරුදු 20ක් පළාත් සභාවේ ඇමතිකම් කරලා අද පාර්ලිමේන්තුවේ ඉන්න, මගේ මිත්‍ර මන්ත්‍රීතුමාට අද ඒ අදෝනාව කරන්න සිද්ධ වෙලා තිබෙනවා, අවුරුදු තුනහමාරක ළදරු අපේ ආණ්ඩුවට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊළඟට කියන්න කැමැතියි දක්ෂිණ අධිවේගී මාර්ගය ගැන. දක්ෂිණ අධිවේගී මාර්ගය ගැන අද විවිධ විවාදවලදී, විවිධ උදවිය විවිධ ප්‍රකාශ නිකුත් කරනවා මා දැක තිබෙනවා. දකුණු පළාත නියෝජනය කරන, 1994 ඉඳලා පළාත් සභාවේ දීර්ඝ කාලයක් හිටපු මන්ත්‍රීවරයකු හැටියට මම ඒ ගැන එක කාරණයක් කියන්න කැමැතියි. 2000 වසරට කලින් අපට යම් යම් විධියේ ප්‍රශ්න පැන නැඟුණ බව මට මතකයි. අවංකව කිව්වොත්, දක්ෂිණ අධිවේගී මාර්ගය සැලසුම් කළේ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ යුගයේ. ඉන් පසුව චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේදීත් අධිවේගී මාර්ගයේ සැලසුම් සඳහා යම්කිසි වැඩ කොටසක් කළා. එතුමිය දක්ෂිණ සංවර්ධන අධිකාරිය පිහිටුවලා යම්කිසි වැඩ කොටසක් කළා. ඒ ගැන අපි එතුමියට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. නමුත් 2001 අපේ ආණ්ඩුව පැමිණි මුල් යුගයේ අපට තිබුණු බරපතළම ප්‍රශ්නය තමයි, පාරට බැහැලා ගමනක් යන්න තිබුණු අමාරුකම. මොකද, අධිවේගී මාර්ගයට ඉඩම් ගැනෙන ස්ථානවල පදිංචි ජනතාව බොහෝ විට අපේ වාහනයට අත දාලා, වාහනය නවත්වාගෙන අපට කියනවා, "මන්ත්‍රීතුමා, අනේ පුළුවන් නම් මේ අධිවේගී මාර්ගය අපේ ඉඩම්වලින් යන එක නතර කර දෙන්න. ඒක නතර කරලා, කොහොම හරි මේ අධිවේගී මාර්ගය වෙන පැත්තකින් යවන්න ඔබතුමන්ලා ඉදිරිපත් වෙන්න" කියලා. මේ රටේ භික්ෂූන් වහන්සේලා ඇතුළු පූජ්‍ය පක්ෂය, සමාජ සංවිධාන යනාදී බොහෝ දෙනෙක් එළියට බැහැලා විවිධ උද්ඝෝෂණ කළා, අධිවේගී මාර්ගය හැදෙන ගමන් මාර්ගය වෙනස් කර ගන්න. හැබැයි, අපේ ආණ්ඩුව 2001 බලයට පත් වෙලා කෙටි කාලයකදී තීන්දුවක් ගත්තා, අධිවේගී මාර්ගයට යට වන ඉඩම්වලට ගෙවන වන්දිය යම් ප්‍රමාණයකින් වැඩි කරන්න. මට මතක නැහැ ඒ ප්‍රතිශතය කොච්චර කියලා. නමුත්, සැලකිය යුතු මට්ටමින් ඒ වන්දිය වැඩි කර ලබා දෙන්න තීරණය කළා. ඊට පස්සේ අපි පාරේ බැහැලා යන්න හදන හැම වෙලාවකම මිනිස්සු පාරට බැහැලා, අත දාලා, වාහනය නතර කරවාගෙන අපට කිව්වේ, "පුළුවන් නම් අපේ ඉඩමත් අයිති වන විධියට මේ අධිවේගී මාර්ගයේ ගමන් මඟ සකස් කරන්න" කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කථාව කියන්න උත්සාහ කළේ, දක්ෂිණ අධිවේගී මාර්ගයේ ආරම්භය ගැන කථා කරන හැම වෙලාවේදීම විරුද්ධ කණ්ඩායම් කරන ප්‍රකාශයක් නිසායි. ඒ තමයි, දක්ෂිණ අධිවේගී මාර්ගය පටන් ගත්තේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව -පසුගිය ආණ්ඩුව- කියන එක. නමුත්, අපි එදා බද්දේගමින්, ගාල්ලෙන්, පින්නදුවෙන් හා කොටිටාවෙන් මුල්ගල තියලා දක්ෂිණ අධිවේගී මාර්ගයේ වැඩ පටන් ගන්නකොට අද විපක්ෂයේ ඉන්න සමහර කණ්ඩායම් එදා මහ පාරේ පෙළපාළි ගියා. ඒ වෙලාවේ කොටිටාවේදී පෙළපාළියක් ගියා. ඒ පෙළපාළියේ ගමන් කරපු වයස අවුරුදු 70ක් පමණ වූ මනුස්සයෙක් මධ්‍යාහ්නයේ දැඩි වෙහෙස නිසා ඇද වැටිලා ජීවිතක්ෂයට පත් වුණා. පසුව දා එක්තරා පුවත් පතක පළ වූ ශීර්ෂ පාඨය මොකක්ද? "අධිවේගී මාර්ගය පළමු බිල්ල ගනී." ඒක තමයි එදා පුවත් පත්වල ගිය ශීර්ෂ පාඨය. මම ඒ කරුණ කියන්න උත්සාහ කළේ, දක්ෂිණ අධිවේගී මාර්ගයට මුල්ගල් තැබුවාට පස්සේ අමාරුම කාර්යය වූ අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීවේ 2001 බලයට පත් වුණු 2004 දක්වා අවුරුදු දෙකයි, මාස දෙකයි, දවස් දෙකක් බලයේ හිටපු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බව කියන්නයි.

අද සමහර උදවිය ඔප්පු තිරප්පු ලියා ගන්න හදනවා. "දක්ෂිණ අධිවේගී මාර්ගය හැදුවේ අපි"යි කියලා කියන්න හදනවා. මම කියන්නේ නැහැ, පසුගිය ආණ්ඩුව යම් කිසි වැඩ කොටසක් කළේ නැහැයි කියලා. ඒ පටන් ගත් අධිවේගී මාර්ගයේ වැඩ කටයුතු අවසන් කළා. නමුත්, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයකු වුණත්, මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරන්න කැමැතියි. මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විශේෂයෙන්ම අධිවේගී මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු ගැන, පිරිසිදුකම ගැන, පිළිවෙළ ගැන මීට වඩා සැලකිලිමත් වන්න ඕනෑ. අධිවේගී මාර්ගයේ ticket countersවල සිටින මුදල් අයකැමි තරුණයින්ගේ ඉඳලා විනයක් දකින්න නැහැ. බොහෝ වෙලාවට ඔවුන්ගේත් විනය පිරිහී තිබෙනවා. ඒ වාගේම අධිවේගී මාර්ගය දෙපැත්තේ කැලය වැවිලා සමහර වෙලාවට අශෝභන තත්ත්වයක් දකින්නට තිබෙනවා. ආණ්ඩුවක් හැටියට මේ තත්ත්වය නිවැරදි කර ගන්න කියලා ප්‍රකාශ කරන එක අපේ යුතුකමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කාරණය ගැනත් මා කියන්න කැමැතියි. මා නියෝජනය කරන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ආසනය. ගාල්ල දිස්ත්‍රික්කය තුළ බොහෝ ව්‍යාපෘති මඟින් මාර්ග සංවර්ධනය වුණත්, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ මාර්ග සංවර්ධන අධිකාරිය මේ අවුරුදු තුනහමාර තුළ බද්දේගම ආසනයේ එකම පාරකටවත් කාපට් අතුරන්න මුදල් වෙන් කරලා නැහැ. බද්දේගම ආසනයේ සන්දරවල ඉඳලා වඳුරඹට දිවෙන ප්‍රධාන මාර්ගයක් තිබෙනවා. එය, මධ්‍යම රජයේ මාර්ග සංවර්ධන අධිකාරියට අයිති මාර්ගයක්. අපි අද විශාල පරිපූරක මුදලකට අනුමැතිය දෙනවා. අපි ඉන්නේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේවාට අත උස්සලා යන්න පමණක් නොවෙයි; ළඟ එන අය වැයේදී අත උස්සලා මේ මුදල් අනුමත කර දෙන්න පමණක් නොවෙයි. එම නිසා අපේ මැතිවරණ කොට්ඨාසවල තිබෙන මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගවල සංවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන අපට ලබා දෙන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

මේ අවස්ථාවේ දී මා තව කරුණක් පිළිබඳව කියන්න කැමැතියි. අද දවසේ මේ සභාවේ කළ සමහර කථා අහනකොට මට හිතුණා, මේක පරිපූරකයක් සම්බන්ධ විවාදයක්ද, එහෙම නැත්නම් ආරක්ෂක අමාත්‍යාංශයේ විවාදයක්ද, එහෙම නැත්නම් වෙනත් විවාදයක්ද කියලා. මේ විවාදය මොකක්ද කියලා මට හිතාගන්න බැරිවුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද විවිධ කාරණා ගැන ඉදිරිපත් වුණා. යුද ජයග්‍රහණය ගැනත් කථා කළා. යුද ජයග්‍රහණයේ පංගුව කාටද යන්න පිළිබඳවත්, එහි අභිමානය හා ගෞරවය හිමි විය යුත්තේ කාටද කියන එක ගැනත් කථා කළා. අභිමානය හා ගෞරවය කාට දුන්නත්, කවුරු යුද්ධයේ ලකුණු දමා ගත්තත්, අපට තිබෙන විවේචනය මෙයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යුද්ධය අවසන් වීමෙන් පසුව මේ රටේ ගන්න ඕනෑ තීන්දු තීරණ, කළ යුතු බොහෝ දේවල් ඉටු කරන්න පසුගිය ආණ්ඩුව අසමත් වුණා කියන එක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යුද්ධයෙන් පසුව මේ රටේ බොහෝ දේවල් ඉටු කරන්න හිටපු පාලකයන්ට විශාල අවස්ථාවක් ලැබුණා. මොකද, පසුගිය රජය තුනෙන් දෙකක බලයක් තිබුණු රජයක්. විධායක ජනාධිපති ධුරයේ බලය තිබෙන; පළාත් පාලන ආයතනවල බලය තිබෙන; පළාත් සභා සියල්ලේ බලය තිබෙන රජයක් හැටියට පසුගිය රජයට යුද්ධයෙන් පසුව විශේෂ අවස්ථාවක් ඇති වුණා. ඒ තමයි, යුද්ධයෙන් පස්සේ මේ රටේ මිනිසුන් යම් කිසි විධියක මතයකට ආවා, රටේ පාලකයෝ රට වෙනුවෙන් යම් කිසි තීන්දුවක් ගන්න සූදානම් නම්; රට වෙනුවෙන් ඉදිරි පියවරක් තබන්න සූදානම් නම්, ඕනෑම කැප වීමක් කරලා අපිත් ඒ පසුපස එනවා කියලා. එවැනි මානසිකත්වයක් මිනිසුන් තුළ තිබුණා. ඒක හරියට සුනාමියෙන් පසුව මිනිසුන් පන්සල් යන්න හිතුවා වාගේයි; සුනාමියෙන් පසුව මිනිසුන් තමන්ගේ ජීවිත ගැන ආපසු හිතුවා වාගේයි. යුද්ධයෙන් පස්සේ මිනිසුන් හිතුවා, රට වෙනුවෙන් පාලකයෝ තීන්දු තීරණ ගන්නවා නම්, අපි ඒ මත පෙළ ගැහිලා ඕනෑම කැප වීමක් කරන්න සූදානම් කියලා. හැබැයි, හිටපු පාලකයෝ ඒ අවස්ථාවට පයින් ගැහුවා. ඒ වෙලාව තමන්ට රට වෙනුවෙන් වැඩක් කරන්න තිබුණු වෙලාවක්. ජාතික ප්‍රතිපත්ති ටික හදා ගන්න තිබුණු වෙලාව. ඔවුන් එදා ඒ තීන්දු තීරණ ටික ගත්තා නම්, අද අපට මේ විවේචන බොහොමයක් කරන්න සිද්ධ වන්නේ නැහැ. එදා මේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් පමණක් නොවෙයි, සේවා ආර්ථිකයකුත් ගොඩ නහන්න අවශ්‍ය තීන්දු තීරණ ටික ඔවුන් ගත්තා නම්, අපේ රටෙන් පිට රටට මෙහෙකාර සේවය සඳහා යවන පිරිස වෙනුවට වෘත්තිකයන් පිට රට යවන්න මේ රටේ අධ්‍යාපන ක්‍රමය සකස් කළා නම්, අද තිබෙන තත්ත්වය වෙනස් වන්න ඉඩ තිබුණා. අද අපි නිෂ්පාදන ආර්ථිකයකට යන්න "Enterprise Sri Lanka" වැඩසටහන වැනි වැඩසටහන් නිර්මාණය කරනවා. උතුරු නැඟෙනහිර ප්‍රශ්නයට දීර්ඝ කාලීන විසඳුම් හොයන්න යම් කිසි විධියකට ව්‍යවස්ථාවේ වෙනසක් හෝ වෙනත් කවර හෝ වෙනසක් කරන්න එදා තීන්දු තීරණ ගත්තා නම්, අද මේ රට පත් වෙලා තිබෙන -මෙතුමන්ලා අර්බුදයක් හැටියට දකින, නමුත් අපි අර්බුදයක් හැටියට නොදකින- යම්කිසි ප්‍රශ්නකාරී තත්ත්වයෙන් මේ රට ගලවා ගන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි වර්ෂය ඇතුළත විශේෂයෙන්ම මේ රටේ මහාමාර්ග ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්න බොහොමයක් නිරාකරණය කරන්න මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයටත්, එයට නායකත්වය දෙන ඇමතිවරුන්ටත් ශක්තිය ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

[අ.භා.5.07 ]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම අද දිනයේ දී සාකච්ඡාවට ලක් වන මෙම පරිපූරක මුදල ලබා දීම මඟින් මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට දැවැන්ත මුදල් ප්‍රමාණයක්, මූල්‍යමය ශක්තියක් ලැබෙනවා. ඒ මඟින් අමාත්‍යාංශය කරගෙන යන වැඩ කටයුතු තව තවත් සාර්ථකව ඉටු කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම බෙහෙවින්ම සතුටු වෙනවා. විශේෂයෙන්ම අපේ සභානායකතුමා වන ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා මහාමාර්ග අමාත්‍යවරයා හැටියට කටයුතු කළ අවස්ථාවේ දීත් දැවැන්ත ශක්තියක් අපට ලබා දුන්නා. විශාල මුදල් ප්‍රමාණයක් සෑම ආසනයකටම ලබා දීලා, අපගෙන් යෝජනා අරගෙන එතුමා ඉතා සාර්ථක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. මේ අවස්ථාවේ දී ප්‍රථමයෙන්ම, මගේ ගෞරවය එතුමාට පුද කරන්න ඕනෑ. වර්තමාන මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යවරයා හැටියට ගරු කබීර් හාෂිම් මැතිතුමා, ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා ආරම්භ කර තිබූ වැඩ කටයුත්ත ඉදිරියට ගෙන යන්න අවශ්‍ය ශක්තිය දැන් ලබා දී තිබෙනවා. මහජන නියෝජිතයන් වන අපත් සමඟ එකතු වෙලා සියලු ප්‍රදේශ සංවර්ධනය කරන්න එතුමාත් බලාපොරොත්තුවෙන් වාගේම ආශාවෙන් සිටිනවා. විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති නිහාල් සූරියආරච්චි මහතාටත්, මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරීන්ටත් මේ වෙලාවේ ස්තුති කරන්නට ඕනෑ, ඉතා සාර්ථක වැඩ පිළිවෙළක් මෙහෙය වීම සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්පහ දිස්ත්‍රික්කය ගත්තාම එය නුවර අධිවේගී මාර්ගයට කඩවත, ගම්පහ, මීරිගම කියන ස්ථාන තුනෙන්ම සම්බන්ධ වෙනවා. ඒ තුළින් මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයට විශාල ශක්තියක්, ආලෝකයක්, සංවර්ධනයක් ලැබෙනවා. මහාමාර්ග සංවර්ධනයේ ප්‍රධාන අංගයක් හැටියට නුවර අධිවේගී මාර්ගය ඉදි කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම වට රවුම් මාර්ගය සංවර්ධනය වීමත් සමඟම, පැලියගොඩ ඉඳන් elevated highway එකක් ඉදි කිරීමේ කටයුත්තත් සිදු වන කොට කොළඹ ප්‍රදේශයේ තිබෙන තදබදයටත් විසඳුමක් ලැබෙනවා. මේ ආණ්ඩුව පත් වුණාට පසුව ගත වූ වසර තුන ඇතුළත අපි ඉතා සාර්ථකව රටේ ජනතාවට; අපට ඡන්දය දීලා බලාගෙන සිටින ජනතාවට සාධාරණයක් ඉටු කළා. විපක්ෂයේ සමහර අය අපට චෝදනා කරනවා, "මොනවාද කරලා තිබෙන්නේ?" කියලා. දැන් අපට පෙනෙනවා; දැනෙනවා, මේ මේ වැඩ කටයුත්ත ඉතා සාර්ථකව ගෙන යන බව. නමුත් මේ පිළිබඳව තව තවත් දැනුවත් කිරීම් කරන්න ඕනෑ. මේ පිළිබඳව ජනතාව දැනුවත් කරන්න ඕනෑ, මෙන්න මේ තරම් ප්‍රමාණයක් දැවැන්ත ව්‍යාපෘති කරගෙන යනවා කියා. දැවැන්ත ව්‍යාපෘති කරගෙන යන නමුත් ඒ පිළිබඳව දැනුවත් කිරීමේ අඩුවක් තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා, මේ ඉතාම අත්‍යවශ්‍ය වූ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන්න කියලා.

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

රටක් හැටියට ඉදිරියට යන මේ ගමනේ දී සංචාරක ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන දැවැන්ත දියුණුව ගැනත් මේ අවස්ථාවේ දී මා බෙහෙවින් සතුටට පත් වෙනවා. මා විශේෂයෙන්ම කියන්නට ඕනෑ, සංචාරක ක්ෂේත්‍රයේ සෑම මාසයකම සියයට 10ක වර්ධනයක් ඇති වෙලා තිබෙන බව. සංචාරකයන් පිළිබඳව විශේෂ දැනුවත් කිරීම් කරන, සංචාරක ව්‍යාපාරය සිදු වන රටවල් පිළිබඳව විස්තරාත්මක දැනුවත් කිරීම් කරන ආයතනයක් තමයි, Lonely Planet ආයතනය. එම Lonely Planet ආයතනය විසින් ලෝකයේ සිටින සංචාරකයන්ට ගමන් කරන්න සුදුසු රට හැටියට 2019 වර්ෂය සඳහා අංක 01 හැටියට ශ්‍රී ලංකාව නම් කර තිබෙනවා. එය රටක් හැටියට අප ලබා ගත් දැවැන්ත ජයග්‍රහණයක් කියලා මා හිතනවා. මොකද, මේ රටේ මහා මාර්ග සංවර්ධනය කරන්න, යටිතල පහසුකම් ඇතුළු ඒ හැම දෙයක්ම සංවර්ධනය කරන්න මුදල් අවශ්‍ය බව අපි කවුරුත් දන්නවා. දැන් අපේ රටට මුදල් ලබා දෙන ප්‍රධානම සාධකයක්, මූලාශ්‍රයක් බවට සංචාරක ව්‍යාපාරය පත් වී තිබෙනවා. මේ රටට වැඩියෙන්ම විදේශ විනිමය ගෙන එන ව්‍යාපාරය බවට සංචාරක ව්‍යාපාරය පත් වේවි කියා මා බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙමින්, සංචාරකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් -promotions- ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයෙන් ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරනවා.

Lonely Planet ආයතනය, ලෝකයේ සංචාරකයන්ට වඩාත්ම සුදුසු රට හැටියට ශ්‍රී ලංකාව නම් කර තිබෙනවා. එය රටක් හැටියට අප ලබාගත් විශාල ජයග්‍රහණයක්. ඒ තුළින් අපට විශාල ආදායමක් ලබාගන්න පුළුවන්. අපේ රටට ලබාගන්නා මේ ආදායම අපි සාධාරණව බෙදන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

රටක් හැටියට අප ඒ අවශ්‍ය කාරණා හොඳින් හඳුනාගෙන කටයුතු කරන්න ඕනෑ. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපි දුප්පත්කම තුරන් කිරීමට සහනාධාර විශාල වශයෙන් ලබාදෙන බව. අධ්‍යාපනයට, සෞඛ්‍යයට සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අපි දැවැන්ත මුදල් ප්‍රමාණයක් ලබා දී තිබෙනවා. ඒ වාගේම, මුදල් ලබාගන්නා මාර්ග වැඩි කර ගන්න තිබෙන ආයතන දියුණු කරන්න කළ යුතු දේවල් පිළිබඳවත් අප වැඩි අවධානයක් යොමු කර තිබෙනවා. අපේ ආණ්ඩුව බලයට පත් වෙලා ගතවූ වසර තුනක පමණ කෙටි කාලය තුළ මේ රටේ මූල්‍යමය විනයක් ඇති කරලා, අත්‍යවශ්‍ය කාරණාවලට දැවැන්ත මුදල් ප්‍රමාණයක් ලබා දී තිබෙනවා. විශේෂයෙන්ම, "Enterprise Sri Lanka" වැඩසටහන තුළින් ව්‍යවසායකයන් දිරිමත් කර, ඉතා සාර්ථක වැඩ පිළිවෙළක් කරගෙන යන අතරතුර, " ගම් පෙරළිය" වැනි වැඩසටහන් හරහා ග්‍රාමීය සංවර්ධනයට දැවැන්ත මුදල් ප්‍රමාණයක් ලබා දී තිබෙනවා. අපේ රටේ අවශ්‍යතා මැනවින් හඳුනාගෙන, ප්‍රමුඛස්ථානය දිය යුතු තැන්වලට මේ මුදල් ලබාදෙන්න අප කටයුතු කර තිබෙනවා. මා මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.


***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල : මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාගත් දේශීය හා විදේශීය ණය පියවීම
## குறைநிரப்புத் தொகை: வீதி அபிவிருத்திக் கருத்திட்டம் சம்பந்தமாகப் பெறப்பட்ட உள்நாட்டு மற்றும் வெளிநாட்டுக் கடன்களைத் தீர்த்தல்
## SUPPLEMENTARY SUPPLY: SETTLEMENT OF LOCAL AND FOREIGN FUNDED LOANS OBTAINED FOR ROAD DEVELOPMENT PROJECTS

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2018 ජනවාරි 01 දිනෙන් ආරම්භව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලක් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා ලද මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා ලද ණය මුදලකින් හෝ රුපියල් මිලියන තිස් දහසකට (රු. මිලියන 30,000) නොවැඩි පරිපූරක මුදල පහත දක්වා ඇති උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය.



උපලේඛනය

| | | | රුපියල් මිලියන |
|---|---|---|---|
| ශීර්ෂය - | 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය | | |
| වැඩසටහන - | 2 සංවර්ධන වැඩසටහන | | |
| | ප්‍රාග්ධන වියදම | | 30,000.00 |
| | පුනරාවර්තන වියදම | | - |
| | මුළු වියදම | | **30,000.00** |
| ව්‍යාපෘතිය - 3 | **අධිවේගී මාර්ග සංවර්ධනය** | | 12,987.00 |
| | විදේශීය ණය (මූල්‍යකරණය 12) | 12,641.00 | |
| | විදේශීය මූල්‍යනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය (මූල්‍යකරණය 18) | 346.00 | |
| | (උපලේඛන අංක 01) | | |
| - 4 | **මහාමාර්ග සංවර්ධනය** | | 15,365.00 |
| | විදේශීය ණය (මූල්‍යකරණය 12) | 4,000.00 | |
| | දේශීය අරමුදල් (මූල්‍යකරණය 11) | 11,200.00 | |
| | විදේශීය මූල්‍යනය ආශ්‍රිත පිරිවැය (මූල්‍යකරණය 17) | 165.00 | |
| | (උපලේඛන අංක 02) | | |
| - 6 | **පාලම් සහ ඉවුන් පාලම් ඉදිකිරීම** | | 300.00 |
| | විදේශීය ණය (මූල්‍යකරණය 12) | 300.00 | |
| | (උපලේඛන අංක 03) | | |
| - 7 | **ස්වභාවික ආපදාවන්ගෙන් හානියටපත් මාර්ග පුනරුත්ථාපනය කිරීම** | | 1,348.00 |
| | විදේශීය ණය (මූල්‍යකරණය 12) | 1,000.00 | |
| | දේශීය අරමුදල් (මූල්‍යකරණය 11) | 198.00 | |
| | විදේශීය මූල්‍යනය ආශ්‍රිත පිරිවැය (මූල්‍යකරණය 17) | 150.00 | |
| | (උපලේඛන අංක 04) | | |
| | | | **30,000.00** |

2018 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව
මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය

වැය ශීර්ෂය - 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය
වැඩසටහන - 2 සංවර්ධන වැඩසටහන

| | රුපියල් මිලියන |
|---|---|
| ප්‍රාග්ධන වියදම | 30,000,000,000 |
| මුළු වියදම | 30,000,000,000 |

මෙම ප්‍රතිපාදන පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබේ.

**උපලේඛනය 01**

වියදම් ශීර්ෂය - 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය
වැඩසටහන - 2 සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය - 3 අධිවේගී මාර්ග සංවර්ධනය

| අයිතම | රුපියල් මිලියන |
|---|---|
| - 9 **දක්ෂිණ අධිවේගී මාර්ග දීර්ඝ කිරීම - මාතර සිට හම්බන්තොට දක්වා (ශ්‍රී ලංකා රජය - චීන රජය)** | |
| 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| 1 අදියර 01 (ගොඩගම - බෙලිඅත්ත) | |
| (මූල්‍යකරණය 12) | 2,101.00 |
| 2 අදියර 02 (බෙලිඅත්ත - වැටිය) | |
| (මූල්‍යකරණය 12) | 2,798.00 |
| (මූල්‍යකරණය 18) | 346.00 |
| 3 අදියර 03 (වැටිය - අන්දරවැව) | |
| (මූල්‍යකරණය 12) | 1,710.00 |
| 4 අදියර 04 (අන්දරවැව - මත්තල) | |
| (මූල්‍යකරණය 12) | 1,033.00 |
| 5 උපදේශන සේවා | |
| (මූල්‍යකරණය 12) | 400.00 |
| - 10 **කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ගය (අදියර III) කඩවත සිට කෙලවරපිටිය දක්වා කොටස (ශ්‍රී ලංකා රජය - චීන එක්සිම් බැංකුව)** | |
| 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| (මූල්‍යකරණය 12) | 4,599.00 |
| | **12,987.00** |

**උපලේඛනය 02**

වියදම් ශීර්ෂය - 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය
වැඩසටහන - 2 සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය - 4 මහාමාර්ග සංවර්ධනය

| අයිතම | රුපියල් මිලියන |
|---|---|
| - 40 **බස්නාහිර පළාත් ජාතික මාර්ග ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - OFID අරමුදල)** | |
| 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| (මූල්‍යකරණය 12) | 100.00 |
| (මූල්‍යකරණය 17) | 90.00 |
| - 43 **දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - ආ. සං. බැ.)** | |
| 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| (මූල්‍යකරණය 12) | 400.00 |
| - 44 **ජංකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad) (ශ්‍රී ලංකා රජය - ආ. සං. බැ.)** | |
| 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| (මූල්‍යකරණය 12) | 3,000.00 |
| - 46 **ප්‍රමුඛතා මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 3 අදියර II (ශ්‍රී ලංකා රජය - චීන සංවර්ධන බැංකුව - CDB)** | |
| 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| (මූල්‍යකරණය 12) | 500.00 |
| (මූල්‍යකරණය 17) | 75.00 |
| - 51 **මාර්ග සංවර්ධන අධිකාරියේ බැඳීම්වල මූල්‍ය පරතරය පියවීම** | |
| 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| (මූල්‍යකරණය 11) | 11,200.00 |
| | **15,365.00** |

**උපලේඛනය 03**

වියදම් ශීර්ෂය - 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය
වැඩසටහන - 2 සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය - 6 පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම

| අයිතම | රුපියල් මිලියන |
|---|---|
| - 19 **ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රීලංකා රජය - ජපානය JAICA)** | |
| 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| (මූල්‍යකරණය 12) | 300.00 |
| | **300.00** |

**උපලේඛනය 04**

වියදම් ශීර්ෂය - 117 මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය
වැඩසටහන - 2 සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය - 7 ස්වභාවික ආපදාවන්ගෙන් හානියටපත් මාර්ග පුනරුත්ථාපනය කිරීම

| අයිතම | රුපියල් මිලියන |
|---|---|
| - 8 **දිඹුලු හිතකාමී - නැගෙනහිර පළාත් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන (ශ්‍රී ලංකා රජය - ජපානය)** | |
| 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| (මූල්‍යකරණය 11) | 198.00 |
| - 13 **ජාතික මාර්ග ජාලය නායයාම් ආපදාවලින් ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - ජපානය JAICA)** | |
| 2506 - යටිතල පහසුකම් සංවර්ධනය | |
| (මූල්‍යකරණය 12) | 1,000.00 |
| (මූල්‍යකරණය 17) | 150.00 |
| | **1,348.00** |

**ඉල්ලුම් කරන මුළු ප්‍රතිපාදන ප්‍රමාණය මූල්‍යකරණ සංකේත අනුව**

| | | රුපියල් මිලියන |
|---|---|---|
| විදේශීය ණය | (මූල්‍යකරණය 12) | 17,941.00 |
| දේශීය අරමුදල් | (මූල්‍යකරණය 11) | 11,398.00 |
| විදේශීය මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය | (මූල්‍යකරණය 17) | 315.00 |
| විදේශීය මූල්‍යනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය | (මූල්‍යකරණය 18) | 346.00 |
| සමස්ථ ප්‍රතිපාදන අවශ්‍යතාවය | | **30,000.00** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ ජාතික ආරක්ෂාව පිළිබඳව සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් හාර දී තිබුණත්, එය නියමිත පරිදි අදාළ විෂයය හාර ඇමතිතුමා වෙත නොලැබීම නිසා ගරු ඇමතිතුමා අද දවසේදී එයට පිළිතුරු දීමට සූදානම් නොමැති බව දන්වා තිබුණා. එම නිසා එම

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

යෝජනාව වෙනත් දිනයක ඉදිරිපත් කරන්න ඉඩකඩ ලබා දෙන්න. ගරු ඇමතිතුමා නොමැති බැවින්, ඒ සඳහා පිළිතුරක් ලබාගත නොහැකි නිසා එම කල්තැබීමේ යෝජනාව වෙනත් දිනයක ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*විනා විවාදයකින් තොරව එකඟ විය.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.15ට, අද දින සභා සම්මතිය අනුව, 2018 නොවැම්බර් 05වන සඳුදා අ.භා. 3.00 වන තෙක් කල් ගියේය.***

*අතන්පටි පි. ප. 5.15 මණික්කු පාරාළුමන්රම්, අතනතු ඉන්රෙය තීර්මානත්තිර්කිණංක, 2018 නවම්පර් 05, තිංකට්කිළමෙ පි. ප. 3.00 මණිවරෙ ඔත්තිවෛක්කප්පට්ටතු.*

*Parliament adjourned accordingly at 5.15 p.m. until 3.00 p.m. on Monday, 05th November, 2018 pursuant to the Resolution of Parliamnet of this Day.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.